# SUTTAPITAKE KHUDDAKANIKĀYE

## SINHALESE

15TH INTERNATIONAL TIPITAKA CHANTING CEREMONY
BODHGAYA, INDIA



# Dhammagiri Pāli Ganthamālā

## Khuddakanikāye

## Sinhalese

## Sections:
## Mahāniddesapāḷi
## Cūḷaniddesapāḷi

**Suttapitake Khuddakanikāya**
**Buddha Jayanti Tripitaka Committee**

Artwork & Design (c) Light of Buddhadharma Foundation International
First Edition: 2019

Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, No. 55, Sec. 1, Hang Chow South Road, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org
**This book is strictly for free distribution, it is not to be sold.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

# DEDICATION

Homage to the Buddha, Dharma, and Sangha!

Here under the sacred Bodhi Tree, where Bhagavan Buddha Shakyamuni brought the blessings of Enlightenment into our world, the Mahasangha from eleven countries has assembled once again to recite the Tipitaka. The teachings we commemorate here were spoken to the Sangha at various places in India. They were affirmed by five hundred Arhats who assembled at the Satipattana cave in Rajgir a year after the Blessed One passed into Parinirvana. Led by Mahakassapa, Ananda, and Upali, the noble Arhats, empowered with full recall of all they had heard, recited the teachings and confirmed them as the true words of the Tathagata.

Since this first great council, the Sangha has kept alive the memory of the Buddha's presence and faithfully transmitted the Four Noble Truths and the Eightfold Path in all directions. From their dedication, four major traditions took form and gave rise to eighteen schools. While they emphasized different aspects of the teachings, all relied on the Three Jewels

as the only refuge from the ever-present miseries of Sarvam Dukkam.

Transcending discrimination based on caste and culture, the teachings won the support of the Chakravartin King Ashoka, who recognized the importance of the Dharma and sponsored its transmission throughout his vast empire and beyond, to Sri Lanka and Myanmar, to Kashmir, to lands beyond the Indus, and to Kashgar and Khotan. Through acts of faith and through edicts and inscriptions, Ashoka encouraged people of all regions to awaken faith in the Buddha, cultivate virtue, and practice the Eightfold Path.

For centuries, even as empires flourished and passed away, the Dharma continued to unfold its blessings in land after land. In China, Tibet, and Mongolia; in Korea and Japan, and in all parts of Southeast Asia, the grace and balance inspired by virtuous action manifested in the shapes of temples and stupas, in images of the Enlightened Ones, and in depictions of the Buddha's great actions in this and previous lives. Through the devotion and dedication of countless great beings that transmitted the Dharma across the earth, this Aryadesha is renowned as the spiritual heart of our world. To this day, the pulse of enlightenment still beats within this sacred ground.

We are fortunate that of all the early Dharma traditions, the living lineages of two schools remain: Sarvastivadin, within the Vinaya of the Mahayana traditions, and Theravadin, vital today in the Sanghas of Bangladesh, Cambodia, Indonesia, India, Laos PDR, Myanmar, Nepal, Sri Lanka, Thailand and Vietnam. It has long been my dream that these streams of Sangha would return to Bodh Gaya after an absence of seven hundred years, to bear witness to the Buddha's message of harmony and peace.

Since 2006, the Light of Buddhadharma Foundation International has acted as the primary sponsor of this gathering of the Theravadin Sanghas. Now, in our 15th anniversary, we congratulate all the great Venerable masters and their lay devotees for their exemplary commitment to spreading the Dharma teachings to many parts of the world. We would also like to congratulate the International Mahasangha for organising this ceremony along with the International Tipitaka Chanting Council. We are also grateful to the Bodhgaya Temple Management Committee and the Government of Bihar for their gracious assistance in facilitating this auspicious gathering. These ceremonies are a great symbol of World Peace and help to free us from the bondage of karma and klesha. We have 25 more years to complete the entire 84000 teachings in Pali under the Sacred Bodhi Tree.

We are also grateful to the Corporate Body of the Buddha Education Foundation in Taiwan for printing this volume as a free gift to all lay devotees. Such noble actions are indeed a great cause for all of us to rejoice especially in recognizing their generosity to share the teachings for the benefit of all.

In this chaotic, materialistic world, ruled by self-interest and greed, people everywhere can benefit from prayers that wish all beings freedom from suffering and freedom from thoughts and actions that lead to suffering for self and others. Joined together in this most sacred place, the voices of many cultures can resound as one, reciting Lord Buddha's words that support health and tranquility, easing the force of desire and aggression and promoting harmony and balance in these stressful times of rapid change. Everywhere, people who become disheartened or disillusioned can look for inspiration to the Bodhi Tree and the Mahabodhi Temple, our shining stars that illuminate the way to peace and harmony. It is our great good fortune that we, as humble laypersons, have been granted the honor of supporting these historic assemblies. They manifest the blessings of the Dharma and fill us with hope that the merit generated here will encourage the awakening of more enlightened beings for the benefit of the earth, the

environment, and people everywhere. In these turbulent times, they remind us that there is no need to continue wandering, lost in this samsaric realm. Help is close at hand; the teachings that can awaken us are still here, and we who understand their value must not let them pass away. It is our duty to support the Sangha and keep these teachings alive through our practice and devotion. We pray that we may continue to support these ceremonies as they carry significant blessings for the world.

I am grateful to the leaders of the Sangha for allowing me this opportunity to commemorate the Lord Buddha and honor the beauty of his heritage. I thank my daughter Kunzang Wangmo Dixey and her team, who has coordinated these assemblies over the last fourteen years. May the offering of this year's printed volume of the Khuddakanikāya be received with the great wish that these precious teachings continue to be recited by the Mahasangha for the benefit of all beings. May the sound of the Buddavaccana be loud and heard throughout all realms!

Sarvam Mangalam

Tarthang-pa Kunga Gellek Yeshe Dorje

Tarthang Rinpoche

Founder of the Bodh Gaya Monlam Chenmo,

World Peace Ceremony

Founder, Light of Buddhadharma Foundation International

June 2019

www.lbdfi.org

## Note on Pronunciation of Pāli

Pāli was a spoken language of northern India in the time of Gotama the Buddha. It was written in the Brāhmi script in India in the time of Emperor Asoka and has been preserved in the scripts of the various countries where the language has been maintained. In Roman script, the following set of diacritical marks is used to indicate the proper pronunciation.

The alphabet consists of forty-one characters: eight vowels, thirty-two consonants and one nasal sound (niggahita).

Vowels: a, ā, i, ī, u, ū, e, o

Consonants:

Velar: k, kh, g, gh, ṅ

Palatal: c, ch, j, jh, ñ

Retroflex: ṭ, ṭh, ḍ, ḍh, ṇ

Dental: t, th, d, dh, n

Labial: p, ph, b, bh, m

Miscellaneous: y, r, l, v, s, h, ḷ

Nasal sound (niggahita): ṃ

The vowels a, i, u are short; ā, ī, ū are long; e and o are pronounced short before double consonants: mettā, khetta, koṭṭha, sotthi; and long before single consonants: deva, senā, loka, odana.

a is pronounced like ‘a’ in ‘about’;
ā like ‘a’ in ‘father’;
i is pronounced like ‘i’ in ‘mint’;
ī like ‘ee’ in ‘see’;
u is pronounced like ‘u’ in ‘put’;
ū like ‘oo’ in ‘cool’

Consonants are pronounced mostly as in English. The consonant c is pronounced as ‘ch’ in ‘church’. All the aspirated consonants are pronounced with an audible expulsion of breath following the normal unaspirated sound. Therefore th is not as in ‘three’ but more like the sound in ‘Thailand’, and ph is not as in ‘photo’ but rather is pronounced ‘p’ accompanied by an expulsion of breath.

The retroflex consonants, ṭ, ṭh, ḍ, ḍh, ṇ are pronounced with the tip of the tongue turned back; whereas in the dental consonants, t, th, d, dh, n it touches the upper front teeth.

The palatal nasal, ñ, is the same as the Spanish ‘ñ’, as in ‘señor’. The velar nasal, ṅ, is pronounced like ‘ng’ in ‘singer’ but occurs only with the other consonants in its group: ṅk, ṅkh, ṅg, ṅgh. The pronunciation of ṃ is similar to ṅ but occurs most commonly as a terminal nasalization: ‘evaṃ me sutaṃ’. The Pāli v is a soft ‘v’ or ‘w’ and ḷ produced with the tongue retroflexed, is almost a combined ‘rl’ sound.

Double consonants are very frequent in Pāli and must be strictly pronounced as long consonants, thus nn is like the English ‘nn’ in ‘unnecessary’.

බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 33.

සූත්‍රාන්තපිටකයෙහි

27 වන ග්‍රන්ථය

# මහානිද්දෙසපාළි

## ඛුද්දකනිකාය

එකාදශභාගය

ලඞ්කාබෞද්ධමණ්ඩලයෙහි ආරාධනයෙන්

මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙණෙහි උපප්‍රධානාචාර්‍ය්‍ය

පණ්ඩිත

ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ

විසින් කරණලද

සිංහල පරිවර්තනයෙන් යුක්තයි.

බු. ව. 2550
ක්‍රි. ව. 2006

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

# මහානිද්දෙසපාළි

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

## 1

## කාමසුත්තනිද්දෙසො

### 1 - 1.

"කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති,
අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡති."

**කාමං කාමයමානස්සාති** – 'කාමා'ති උද්දානතො[1] ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච. කතමෙ වත්ථුකාමා? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා, අත්ථරණා පාපුරණා, දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා, ඛෙත්තං වත්ථු[2] හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරං ච, යං කිඤ්චි රජනීයං වත්ථු[3] වත්ථුකාමා.

අපි ච, අතීතා කාමා, අනාගතා කාමා, පච්චුප්පන්නා කාමා, අජ්ඣත්තා කාමා, බහිද්ධා කාමා, අජ්ඣත්තබහිද්ධා කාමා, හීනා කාමා, මජ්ඣිමා කාමා, පණීතා කාමා, ආපායිකා කාමා, මානුසිකා කාමා, දිබ්බා කාමා, පච්චුපට්ඨිතා කාමා, නිම්මිතා කාමා, පරනිම්මිතා කාමා, අනිම්මිතා කාමා[4], පරිග්ගහිතා කාමා, අපරිග්ගහිතා කාමා, මමායිතා කාමා, අමමායිතා කාමා, සබ්බෙ'පි කාමාවචරා ධම්මා, සබ්බෙ'පි රූපාවචරා ධම්මා, සබ්බෙ'පි අරූපාවචරා ධම්මා, තණ්හාවත්ථුකා තණ්හාරම්මණා කාමනීයට්ඨෙන[5] රජනීයට්ඨෙන මදනීයට්ඨෙන කාමා. ඉමෙ වුච්චන්ති වත්ථුකාමා.

1. උද්දානතො - සෑ. මජ්සං. 2. වත්ථු - කත්ථචි. 3. රජනීයවත්ථු - සෑ.
4. 'පරනිම්මිතා කාමා'ති - සී. I. පොත්ථකෙ ච. 'අනිම්මිතා කාමා' ති - සෑ. මජ්සං. PTS පොත්ථකෙසු ච සද්ධම්මපජ්ජොතිකායං ච න දිස්සන්ති.
5. කාමනීයට්ඨෙන - සී. I. II. සෑ.

### සූත්‍රාන්තපිටකයෙහි කුදුගත්සඟියෙහි

# මහානිද්දේශය

———8———

## ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.

---

## 1

## කාමසූත්‍රනිද්දේශය

---

### 1 - 1.

"වස්තුකාමය කැමැති වන සත්ත්වයාහට ඉදින් ඒ කාමය සමෘද්ධ වේ නම්, එකල්හි සත්ත්ව තෙමේ කැමැති වස්තුව ලැබ ඒකාන්තයෙන් සතුටු සිත් ඇත්තේ වේ."

**කාමං කාමයමානස්ස** – 'කාමා' යනු විස්තර විසින් වස්තුකාමයෝ යැ, ක්ලේශකාමයෝ යැ යි කාමයෝ දෙදෙනෙක් වෙති. වස්තුකාමයෝ කවරහ ? යත්: මන වඩන රූපයෝ යැ, මන වඩන ශබ්දයෝ යැ, මන වඩන ගන්ධයෝ යැ, මන වඩන රසයෝ යැ, මන වඩන ස්පර්ශයෝ යැ, අතුරුණු යැ, පොරෝන යැ, දාසිදස්හු යැ, එළු බැටළු යැ, හූරු කුකුළු යැ, ඇත් අස් ගව වෙළඹහු යැ, කෙත් යැ, වතු යැ, කහවණු යැ, රන් යැ, ගම් නියම්ගම් රජදහන්හු යැ, රට යැ, දනවු යැ, කොෂ යැ, කොටුගෙ යැ, යම් කිසි ඇලුම් කට යුතු වස්තු යැ (යන මොහු) වස්තුකාමයෝ යැ.

තව ද, අතීතකාමයෝ යැ, අනාගතකාමයෝ යැ, වර්තමානකාමයෝ යැ, ආධ්‍යාත්මිකකාමයෝ යැ, බාහිරකාමයෝ යැ, අධ්‍යාත්මබාහ්‍යකාමයෝ යැ, හීනකාමයෝ යැ, මධ්‍යමකාමයෝ යැ, ප්‍රණීතකාමයෝ යැ, සතර අපායයෙහි වූ කාමයෝ යැ, මිනිස්ලොවැ වූ කාමයෝ යැ, දෙව්ලොවැ වූ කාමයෝ යැ, එළඹ සිටි කාමයෝ යැ, (අරමුණු මවා රමණය කරන) නිර්මිතකාමයෝ යැ, පරනිර්මිත කාමයෝ යැ, අනිර්මිත (=පියෙවින් පිළියෙල වූ) කාමයෝ යැ, (මේ මාගේ යැ යි) පිළිගත් කාමයෝ යැ, (එසෙයින්) නො පිළිගත් කාමයෝ යැ, (තෘෂ්ණාවශයෙන්) මේ මාගේ යැ යි ගත් කාමයෝ යැ, (එසේ නො ගත්) අමමායිත කාමයෝ යැ, සියලු මැ කාමාවචරධර්මයෝ යැ, සියලු මැ රූපාවචරධර්මයෝ යැ, සියලු මැ අරූපා-වචරධර්මයෝ යැ, තෘෂ්ණාවට කාරණ වූ තෘෂ්ණාවට අරමුණු වූ (ධර්මයෝ) ප්‍රාර්ථනා කළ යුතු අර්ථයෙන් ඇලීමට යොග්‍යාර්ථයෙන් (කුලමදාදි) මද ඉපදවිය යුතු අර්ථයෙන් කාමයෝ යි. මොහු වස්තුකාමයෝ යැ යි කියනු ලැබෙත්.

කතමෙ කිලෙසකාමා? ඡන්දො කාමො, රාගො කාමො, ඡන්දරාගො කාමො; සඞ්කප්පො කාමො, රාගො කාමො, සඞ්කප්පරාගො කාමො; යො කාමෙසු කාමච්ඡන්දො, කාමරාගො, කාමනන්දී, කාමතණ්හා, කාමසිනෙහො, කාමපරිළාහො, කාමමුච්ඡා, කාමජ්ඣොසානං, කාමොඝො, කාමයොගො, කාමුපාදානං, කාමච්ඡන්දනීවරණං.

1. "අද්දසං කාම තෙ මූලං සඞ්කප්පා කාම ජායසි,
න තං සඞ්කප්පයිස්සාමි එවං කාම න හෙහිසි[1]" ති

ඉමෙ වුච්චන්ති කිලෙසකාමා.

කාමයමානස්සාති[2] - කාමයමානස්ස ඉච්ඡමානස්ස සාදියමානස්ස පත්ථයමානස්ස පිහයමානස්ස[3] අභිජප්පමානස්සාති කාමං කාමයමානස්ස.

තස්ස චෙ තං සමිජ්ඣතීති - 'තස්ස චෙ'ති තස්ස ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වා, තන්ති වත්ථුකාමා වුච්චන්ති: මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා; සමිජ්ඣතීති ඉජ්ඣති සමිජ්ඣති ලභති පටිලභති අධිගච්ඡති වින්දතීති තස්ස චෙ තං සමිජ්ඣති.

අද්ධා පීතිමනො හොතීති - අද්ධා ති එකංසවචනං නිස්සංසයවචනං නික්කඞ්ඛවචනං අද්වෙජ්ඣවචනං අද්වෙළ්හකවචනං නියොගවචනං අපණ්ණකවචනං අවත්ථාපනවචනමෙතං අද්ධා ති. පීති ති යා පඤ්චකාමගුණපටිසංයුත්තා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති තුට්ඨි ඔදග්‍යං අත්තමනතා අභිප්ඵරණතා[4] චිත්තස්ස. මනොති යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු. අයං වුච්චති මනො. අයං මනො ඉමාය පීතියා සහගතො හොති සහජාතො සංසට්ඨො සම්පයුත්තො එකුප්පාදො එකනිරොධො එකවත්ථුකො එකාරම්මණො. පීතිමනො හොතීති පීතමනො[5] හොති තුට්ඨමනො හට්ඨමනො පහට්ඨමනො අත්තමනො උදග්ගමනො මුදිතමනො පමුදිතමනො හොතීති අද්ධා පීතිමනො හොති.

---

1. හෙහිසි - සීමු. II PTS. 2. කාමං කාමයමානස්සාති කාමං - සී. 1. සීමු. Iස්‍යා.
3. පිහායමානස්ස. - සී. 1. ස්‍යා. 4. අභිපූරණතා - PTS.
5. පීතිමනො - සීමු. II PTS.

ක්ලේශකාමයෝ කවරහ? යත්: ඡන්දය කාම යැ, රාගය කාම යැ, ඡන්දරාගය කාම යැ, සඞ්කල්පය කාම යැ, රාගය කාම යැ, සඞ්කල්පරාගය කාම යැ, පඤ්චකාමගුණයෙහි යම් කාමසඞ්ඛ්‍යාත ඡන්දයෙක්, කාමරාගයෙක්, කාමනන්දියෙක්, කාමතෘෂ්ණායෙක්, කාමස්නේහයෙක්, කාමපරිදාහයෙක්, කාමමූර්ඡායෙක්, කාමයන්හි ඇතුළු වීමෙක්, කාමසඞ්ඛ්‍යාත ඕඝයෙක්, කාමයෝගයෙක්, කාමෝපාදානයෙක්, කාමච්ඡන්දනීවරණයෙක් වේ ද–

1. කාමය, තා ගේ මුල දිටිමි. කාමය, තෝ සඞ්කල්පය හේතු කොට ගෙන උපදනෙහි. (දැන් මම) තා නො සිතමි. කාමය, මෙසෙසින් තෝ නූපදනෙහි යැ යි.

මොහු ක්ලේශකාමයෝය යි කියනු ලැබෙත්.

**කාමයමානස්ස**– කැමැති වන, ආශංසනය කරන, ආස්වාදනය කරන, ප්‍රාර්ථනා කරන, ලබනු කැමැති වන, තෘෂ්ණායෙන් තෘප්තිය· උපදවන ඔහුට නු යි ‘කාමං කාමයමානස්ස’ යනු වේ.

**තස්ස චෙතං සමිජ්ඣති**– ‘තස්ස චෙ’ යනු: ක්ෂත්‍රිය වූ හෝ බ්‍රාහ්මණ වූ හෝ වෛශ්‍ය වූ හෝ ශූද්‍ර වූ හෝ ගිහි වූ හෝ පැවිදි වූ හෝ දෙවි වූ හෝ මිනිස් වූ හෝ ඔහුට යැ. ‘තං’ යි වස්තුකාමයෝ කියනු ලැබෙති. මන වඩන රූපයෝ යැ, ශබ්දයෝ යැ, ගන්ධයෝ යැ, රසයෝ යැ, ස්පර්ශයෝ යි. සමිජ්ඣති යනු: නිපැදෙයි, මොනවට නිපැදෙයි, ලැබෙයි, පිළිලැබෙයි, පැමිණෙයි, විඳී නු යි ‘තස්ස චෙ තං සමිජ්ඣති’ යනු වේ.

**අද්ධා පීතිමනො හොති**– අද්ධා යනු: ඒකාන්තවචන යැ, නිස්සංශය වචන යැ, නිසැකවචන යැ, අද්වෛධවචන යැ, නොදෙහිත් වචන යැ, නියොගවචන යැ, අවිරුද්ධවචන යැ, සනිටුහන් වචනයෙකි. මේ ‘අද්ධා’ යනු පීති යනු පඤ්චකාමගුණප්‍රතිසංයුක්ත වූ යම් ප්‍රීතියෙක්, ප්‍රාමොද්‍ය–යෙක්, ආමෝදනයෙක්, ප්‍රමෝදනයෙක්, හර්ෂයෙක්, ප්‍රහර්ෂයෙක් (=හවුපහවු ආකාරයෙක්), ප්‍රීතිධනයෙක්, සතුටෙක්, ඔද වැඩිබවෙක්, සතුටුසිත් ඇති බවෙක්, චිත්තයාගේ පැතුරුණුබවෙක් වේ ද එය යි. මනො යනු: යම් සිතෙක්, මනසෙක්, මානසයෙක්, හෘදයයෙක්, පාණ්ඩර වූ භවාඞ්ගසිතෙක්, මනසෙක්, ‘මන’සඞ්ඛ්‍යාත ආයතනයෙක්, මනින්ද්‍රියයෙක්, විඥානයෙක්, විඥානස්කන්ධයෙක්, තදනුරූප වූ (හෙවත් ඒ ස්පර්ශාදිය උපදවන) මනෝ–විඥානධාතුයෙක් වේ ද, මෙය ‘මන’ යැ යි කියනු ලැබේ. මේ මනස මේ ප්‍රීතිය හා සහගත වූයේ, සමග උපන්නේ, සංසෘෂ්ට වූයේ, සම්ප්‍රයුක්ත වූයේ, එක් වැ උපන්නේ, එක් වැ නිරුද්ධ වනුයේ, (හදවත් විසිත්) ඒකවස්තුක වූයේ, එක් අරමුණෙහි වූයේ වේ. පීතිමනො හොති – ප්‍රීති සහිත සිත් ඇතියේ වෙයි. තුටුසිත් ඇතියේ, හටුසිත් ඇතියේ, පහටුසිත් ඇතියේ, අත්තමන වූයේ, ඔද වැඩි සිත් ඇතියේ, මුදිත වූ සිත් ඇතියේ, ප්‍රමුදිත වූ සිත් ඇතියේ වේ නු යි ‘අද්ධා පීතිමනො හොති’ යනු වේ·

**ලද්ධා මච්චො යදිච්ඡතීති** – **ලද්ධා** ති ලභිත්වා[1] අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා; **මච්චොති** – සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[2] ජන්තු ඉන්දගු[3] මනුජො[4]; **යදිච්ඡතීති** – යං ඉච්ඡති යං සාදියති, යං පත්ථෙති, යං පිහෙති[5], යං අභිජප්පති රූපං වා සද්දං වා ගන්ධං වා රසං වා ඵොට්ඨබ්බං වාති 'ලද්ධා මච්චො යදිච්ඡති'.
තෙනාහ භගවා:

"කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති,
අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡතී" ති.

**1 - 2**

"තස්ස චෙ කාමයානස්ස[6] ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධො'ව රුප්පති".

**තස්ස චෙ කාමයානස්සාති** – '**තස්ස චෙ**' ති තස්ස ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වා; **කාමයානස්සාති** – කාමෙ ඉච්ඡමානස්ස සාදියමානස්ස පත්ථයමානස්ස පිහයමානස්ස අභිජප්පමානස්ස; අථවා කාම-තණ්හාය යායති නීයති වුය්හති සංහරීයති, යථා හත්ථියානෙන වා අස්සයානෙන වා ගොයානෙන වා අජයානෙන වා මෙණ්ඩකයානෙන වා ඔට්ඨයානෙන වා ඛරයානෙන වා යායති නීයති වුය්හති සංහරීයති. එවමෙවං කාමතණ්හාය යායති නීයති වුය්හති සංහරීයතීති තස්ස චෙ කාමයානස්ස.

**ඡන්දජාතස්ස ජන්තුනොති** – ඡන්දො ති යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමූපාදානං කාමච්ඡන්දනීවරණං; තස්ස සො කාමච්ඡන්දො ජාතො හොති සඤ්ජාතො නිබ්බත්තො අභිනිබ්බත්තො පාතුභූතො. **ජන්තුනොති** – සත්තස්ස නරස්ස මානවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[7] ජන්තුස්ස ඉන්දගුස්ස මනුජස්සාති 'ඡන්දජාතස්ස ජන්තුනො'

**තෙ කාමා පරිහායන්තීති** – තෙ වා කාමා පරිහායන්ති, සො වා කාමෙහි පරිහායති; කථං තෙ කාමා පරිහායන්ති? තස්ස තිට්ඨන්තස්සෙව තෙ භොගෙ රාජානො වා හරන්ති, චොරා වා හරන්ති, අග්ගි වා දහති[8], උදකං වා වහති, අප්පියා වා දායාදා හරන්ති, නිහිතං[9] වා නාධිගච්ඡති[10], දුප්පයුත්තා වා කම්මන්තා භිජ්ජන්ති, කුලෙ වා කුලඞ්ගාරො[11] උප්පජ්ජති, යො[12] තෙ භොගෙ විකිරති විධමති විද්ධංසෙති, අනිච්චතා එව අට්ඨමී. එවං තෙ කාමා හායන්ති පරිහායන්ති පරිධංසන්ති[13] පරිපතන්ති[14] අන්තරධායන්ති විප්පලුජ්ජන්ති.

---

1. පටිලභිත්වා - ස්‍යා. 2. ජතු - සීමු. I. ජාතු. ස්‍යා. ජගු. මජසං. PTS.
3. හින්දගු - පුරාණ. 4. යසුචි - ස්‍යා. 5. පිහති - ස්‍යා.
6. කාමයමානස්ස - සු. ස. 7. ජාතුස්ස - ස්‍යා. ජතුස්ස. මජසං. සී. I.
8. දය්හති. - මජසං. 9. නිහිතට්ඨානං. - මජසං. 10. විගච්ඡති - මජසං.
11 කුචල - ස. කුලඝාතකො කුලජ්ඣාපකො - ස්‍යා. 12. සො - සීමු. II.
13. පරිධංසෙන්ති. - ස්‍යා. - සීමු. 14 පරිවජ්ජන්ති - ස්‍යා.

**ලද්ධා මච්චො යදිච්ඡති** – **ලද්ධා** යනු: ලැබ, පැමිණ, විඳ, ප්‍රතිලාභ කොට; **මච්චො** යනු: සත්ත්ව තෙම, නර තෙම, මානවයා, පුරුෂයා, පුද්ගලයා, ජීවයා, (ච්‍යුතියෙන් ජාතියට යන්නේ නු යි) ජාගු තෙම, ජන්තු තෙම, (ඉන්ද්‍රසඞ්ඛ්‍යාත කර්මයෙන් යේ නු යි) ඉන්දගු තෙම, මනුජ තෙමේ යි. **යදිච්ඡති** යනු: රූපයක් හෝ ශබ්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්ප්‍රෂ්ටව්‍යයක් හෝ යම් කිසිවක් කැමැති වේ නු යි, යමක් ආස්වාද කෙරේ නු යි, යමක් ප්‍රාර්ථනා කෙරේ නු යි, යමක් (තෘෂ්ණාවශයෙන්) ලබනු කැමැති වේ නු යි, යමෙක (තෘෂ්ණාවශයෙන්) ගුණ කියා නු යි 'ලද්ධා මච්චො යදිච්ඡති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“කාමං කාමයමානස්ස –පෙ– ලද්ධා මච්චො යදිච්ඡති”** යි.

**1 – 2.**

“ඒ වස්තුකාමයන් කැමැති වන්නා වූ උපන් **තෘෂ්ණා** ඇති ඒ පුද්ගලයාගේ ඒ කාමයෝ ඉදින් පිරිහෙත් නම්, එකල්හි හෙතෙම විෂ පෙවූ ශල්‍යයෙකින් (=ඊතලයෙකින්) විදුනා ලද්දකු සෙයින් පෙළනු ලැබේ.”

**තස්ස චෙ කාමයානස්ස** – **තස්ස චෙ** යනු: ඒ ක්ෂත්‍රියයාගේ හෝ බ්‍රාහ්මණයාගේ හෝ වෛශ්‍යයාගේ හෝ ශුද්‍රයාගේ හෝ ගෘහස්ථයාගේ හෝ ප්‍රව්‍රජිතයාගේ හෝ දෙවියාගේ හෝ මිනිසාගේ හෝ යැ. **කාමයානස්ස** යනු: කාමවස්තූන් කැමැති වන්නහුගේ, ඉච්ඡන්තහු (=ආස්වාදනය කරන්නහු)ගේ, ප්‍රාර්ථනා කරන්නහුගේ, ලබනු කැමැති වන්නහුගේ, තෘෂ්ණාවශයෙන් ගුණ කියන්නහුගේ; නොහොත් කාමතෘෂ්ණාව විසින් යවනු ලැබෙයි, පමුණුවනු ලැබෙයි, වහනය කරනු ලැබෙයි, ගෙනයනු ලැබෙයි; යම් සේ ඇත්යානයෙකින් හෝ අශ්වයානයෙකින් හෝ ගවයානයෙකින් හෝ බැටළුයානයෙකින් හෝ මැඩියානයෙකින් හෝ ඔටුයානයෙකින් හෝ කොටළුයානයෙකින් හෝ යවනු ලැබේ ද, පමුණුවනු ලැබේ ද, වහනය කරනු ලැබේ ද, ගෙන යනු ලැබේ ද, එසෙයින් ම කාමතෘෂ්ණාව විසින් යවනු ලැබෙයි, පමුණුවනු ලැබෙයි, වහනය කරනු ලැබෙයි, ගෙන යනු ලැබේ නුයි 'තස්ස චෙ කාමයානස්ස' යනු වේ.

**ඡන්දජාතස්ස ජන්තුනො** – **ඡන්ද** නම්: පඤ්චකාමගුණයෙහි යම් කාම-සඞ්ඛ්‍යාත ඡන්දයෙක්, කාමතෘෂ්ණායෙක්, කාමස්නේහයෙක්, කාමපරිදාහයෙක්, කාමමූර්ච්ඡායෙක්, කාමයන්හි බැසගැනීමෙක්, කාමසංඛ්‍යාත ඕඝයෙක්, කාමයොගයෙක්, කාමොපාදානයෙක්, කාමච්ඡන්දනීවරණයෙක් වේ ද, ඔහුට ඒ කාමච්ඡන්දය තෙමේ උපන්නේ, මොනොවට උපන්නේ, නිපන්නේ, වෙසෙසින් නිපන්නේ, පහළ වූයේ වේ. **ජන්තුනො** යනු: සත්ත්වයාගේ-නරයාගේ, මානවයාගේ, පුරුෂයාගේ, පුද්ගලයාගේ, ජීවයාගේ, ච්‍යුතියෙන් ජාතියට යන්නහුගේ, ජන්තුහු ගේ, කර්මයෙන් යන්නහු ගේ, මිනිසාගේ, නු යි 'ඡන්දජාතස්ස ජන්තුනො' යනු වේ.

**තෙ කාමා පරිහායන්ති** – වස්තුකාමාදි ඒ කාමයෝ හෝ පිරිහෙති, ඒ පුද්ගල තෙමේ හෝ කාමයන් කෙරෙන් පිරිහේ. කිසෙයින් ඒ කාමයෝ පිරිහෙති ? යත්: ඔහු ජීවත් වැ සිටිය දී මැ ඒ (කාමසඞ්ඛ්‍යාත) භොගයන් රජදරුවෝ හෝ හැරගනිති. සොරු හෝ පැහැරගනිති. ගින්න හෝ දවයි. (ඔඝ ආදි) උදකය හෝ මුහුදට ගෙන යයි. අමනාප වූ දායාදයෝ (=නොහිමියෝ) හෝ හැරගනිති. නිධාන කොට තබන ලදුයේ හෝ නො ලැබෙයි. දුෂ්ප්‍රයුක්ත වූ (=වරදවා යොදන ලද කෘෂිවණිජාදි) කර්මාන්තයෝ හෝ බිඳීයෙති. කුලයෙහි ඒ භෝගයන් විසුරුවන, නසන, විධ්වංසනය කරන, කුලඅඟුරෙක් (=කුලඝාතකයෙක්) හෝ උපදී. අනිත්‍යතාව මැ අටවැනි කොට ඇත. මෙසේ ඒ කාමයෝ හෙති, පිරිහෙති, හාත්පසින් වැනැසෙති, වැගිරෙති, අතුරුදහන් වෙති, සුණුවිසුණු වැ යෙත්.

කථං සො කාමෙහි පරිහායති? තිට්ඨන්තෙව තෙ භොගෙ[1] සො චවති මරති අන්තරධායති විප්පලුජ්ජති. එවං සො කාමෙහි හායති පරිහායති පරිධංසති පරිපතති[2] අන්තරධායති විප්පලුජ්ජති.

1. "චොරා හරන්ති රාජානො අග්ගි දහති නස්සති,
අථ[3] අන්තෙන ජහති[4] සරීරං සපරිග්ගහං.

2. එතදඤ්ඤාය මෙධාවී භුඤ්ජෙථ ච දදෙථ ච,
දත්වා ච භුත්වා ච යථානුභාවං,
අනින්දිතො සග්ගමුපෙති ඨානං"ති.

තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පතීති - යථා අයොමයෙන වා සල්ලෙන විද්ධො අට්ඨිමයෙන වා සල්ලෙන දන්තමයෙන වා සල්ලෙන විසාණමයෙන වා සල්ලෙන කට්ඨමයෙන වා සල්ලෙන විද්ධො රුප්පති කුප්පති ඝට්ටියති පීළියති ව්‍යාධිතො[5] දොමනස්සිතො[6] හොති, එවමෙව[7] වත්ථුකාමානං විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. සො කාමසල්ලෙන ච සොකසල්ලෙන ච විද්ධො රුප්පති කුප්පති ඝට්ටියති පීළියති ව්‍යාධිතො[5] දොමනස්සිතො[6] හොතීති - සල්ලවිද්ධොව රුප්පති.

තෙනාහ භගවා:

"තස්ස චෙ කාමයානස්ස[7] ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පතී" ති.

**1 - 3**

"යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං විසත්තිකං ලොකෙ[8] සතො සමතිවත්තතී".

යො කාමෙ පරිවජ්ජෙතීති - යොති යො යාදිසො යථායුත්තො යථාවිහිතො යථාපකාරො යං ඨානං පත්තො යංධම්ම[9]සමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා; කාමෙ පරිවජ්ජෙතීති - 'කාමා'ති උද්දානතො[10] ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා.

කාමෙ පරිවජ්ජෙතීති ද්වීහි කාරණෙහි කාමෙ පරිවජ්ජෙති: වික්ඛම්භණතො වා සමුච්ඡෙදතො වා. කථං වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති? "අට්ඨිකඞ්කලූපමා කාමා අප්පස්සාද[11]ට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. "මංසපෙසූපමා කාමා බහුසාධාරණට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. "තිණුක්කූපමා කාමා අනුදහනට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. 'අඞ්ගාරකාසූපමා කාමා මහාපරිළාහට්ඨෙනා" ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති.

1. භොගා - ස්‍යා. 2. පරිච්චජති - ස්‍යා. 3. අථො - ස්‍යා.
4. අසහන්තෙන ජහති - මජසං. 5. බ්‍යාධිතො - ස්‍යා. මජසං. සීමු. I
6. දොමනස්සනො - සීමු. I
7. කාමයමානස්ස - මු. ස. සී. I 8. ලොකං - PTS.
9. ධම්මං - සීමු. I 10. උද්දානතො - ස්‍යා. මජසං.
11. අප්පස්සාදතා - සීමු. ඡ. සී I.

කිසෙයින් හෙතෙම කාමයන් කෙරෙන් පිරිහෙයි ? යත්: ඒ භොගයන් තිබියැ දී මැ හෙතෙම ච්‍යුත වෙයි, මැරෙයි, අතුරුදන් වෙයි, වැනැසේ. මෙසෙයින් හෙතෙම කාමයන් කෙරෙන් හෙයි, පිරිහෙයි, හාත්පසින් වැනැසෙයි, ගිලිහෙයි, අතුරුදහන් වෙයි, සුණුවිසුණු වේ.

1. "සොරු ද රජදරුවෝ ද (භොගයන්) පැහැරගනිති. ගින්න දවයි. උදකාදියෙන් නැසෙයි. යළි (ශෙෂ වූ) භොගයන් සහිත ශරීරය මරණය සමග හැරපියයි.

2. පණ්ඩිතපුරුෂ තෙමේ තෙල භෝගයන්ගේ විනාශය දුන වලඳනුයේ ද දෙනුයේ ද වෙයි. සම්පත් වූ ලෙසින් දී වළඳා අනින්දිත වූයේ දෙව්ලොවට පැමිණේ."

**සො කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පති** – යම් සේ ලොහොමුවා හීයෙකින් හෝ ඇටමුවා හීයෙකින් හෝ දළමුවා හීයෙකින් හෝ සිඟුමුවා හීයෙකින් හෝ දඬුමුවා හීයෙකින් හෝ විදුනා ලදුයේ විසිරේ ද (=විකාරයට පැමිණේ ද), සැලේ ද (=කිපේ ද), ගැවේ ද, පෙළේ ද, පෙළන ලදුයේ හටගත් දොම්නස් ඇතියේ වේ ද, එසෙයින් ම වස්තුකාමයන්ගේ විපරිණාමයෙන් වූ අන්‍යථාත්වයෙන් සෝකපරිදෙව දුක්ඛ-දොමනස්සුපායාසයෝ උපදිත්. හෙතෙම කාමශල්‍යයෙන් ද ශෝකශල්‍යයෙන් ද විදුනා ලදුයේ විසිරෙයි, සැලෙයි, ගැවෙයි, පෙළෙයි. පෙළන ලදුයේ හටගත් දොම්නස් ඇතියේ වේ නු යි "සල්ලවිද්ධොව රුප්පති" යනු වේ. එයින් වදාළහ බුදුහු:

**"තස්ස චෙ කාමයානස්ස -පෙ- සල්ලවිද්ධොව රුප්පති" යි.**

## 1 – 8.

"යමෙක් වස්තුකාමක්ලේශකාමයන් (එහි ඡන්දරාගය විෂ්කම්භනයෙන් හෝ සමුච්ඡේදයෙන් හෝ) තමාගේ පයින් සර්පයකුගේ හිස මෙන් දුරු කෙරේ ද, ඒ මහණ ලොව්හි විසත්තිකා සඞ්ඛ්‍යාත වූ මේ තෘෂ්ණාව සමෘතිමත් වැ ඉක්මවයි."

**යො කාමෙ පරිවජ්ජෙති** – **යො** – යම් කිසි, යම් බඳු වූ, යමෙකින් යුක්ත වූ, යම්සේ සිටි, යම් ප්‍රකාර වූ, යම් තනතුරකට පැමිණි, යම් ධර්මයෙකින් යුක්ත වූ ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යි. **කාමෙ පරිවජ්ජෙති**– කාමයෝ නම්: විස්තර විසින් කාමයෝ දෙදෙනෙක් වෙති: වස්තුකාමයෝ ද, ක්ලෙශකාමයෝ දූ යි... මොහු වස්තුකාමයෝ යැ යි කියනු ලැබෙත්... මොහු ක්ලෙශකාමයෝ යැ යි කියනු ලැබෙත්.

**කාමෙ පරිවජ්ජෙති** – දෙකරුණෙකින් කාමයන් දුරු කෙරෙයි: විෂ්කම්භණ විසින් හෝ සමුච්ඡේද විසින් හෝ යැ. කෙසේ විෂ්කම්භණ විසින් කාමයන් පරිවර්ජන කෙරේ ද ? යත්: 'අල්පාස්වාද වන බැවින් කාමයෝ ඇටසැකිල්ලක් වැන්නැ' යි නුවණැසින් දක්නේ විෂ්කම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි; බහුසාධාරණ වන බැවින් 'කාමයෝ මාංසපෙශි වැන්නහ'යි නුවණැසින් දක්නේ විෂ්කම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි; 'දහනකෘත්‍යසම්පාදක වන (=හස්තාදිය දවන) බැවින් කාමයෝ තෘණොල්කා (=තණහුලක්) වැන්නහ'යි නුවණින් දක්නේ විෂ්කම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි.

"සුපිනකූපමා කාමා ඉත්තරපච්චුපට්ඨානට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. "යාචිතකූපමා කාමා තාවකාලිකට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. "රුක්ඛඵලූපමා කාමා සම්භඤ්ජනපරිභඤ්ජන[1]ට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. "අසිසූනූපමා කාමා අධිකුට්ටන[2]ට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. "සත්තිසූලූපමා[3] කාමා විනිවිජ්ඣනට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. "සප්පසිරූපමා කාමා සප්පටිභයට්ඨෙනා"ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. "අග්ගික්ඛන්ධූපමා කාමා මහාභි[4]තාපකරට්ඨෙනා[5]"ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති.

බුද්ධානුස්සතිං භාවෙන්තොපි වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. ධම්මානුස්සතිං භාවෙන්තොපි -පෙ- සඞ්ඝානුස්සතිං භාවෙන්තොපි, සීලානුස්සතිං භාවෙන්තොපි, දෙවතානුස්සතිං භාවෙන්තොපි, ආනාපානසතිං[6] භාවෙන්තොපි, මරණසතිං භාවෙන්තොපි, කායගතාසතිං භාවෙන්තොපි, උපසමානුස්සතිං භාවෙන්තොපි වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. පඨමජ්ඣානං භාවෙන්තොපි වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. දුතියජ්ඣානං භාවෙන්තොපි, තතියජ්ඣානං භාවෙන්තොපි, චතුත්ථජ්ඣානං භාවෙන්තොපි, ආකාසානඤ්චායතනසමාපත්තිං භාවෙන්තොපි, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං භාවෙන්තොපි, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තොපි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තොපි වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති. එවං වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙති.

කථං සමුච්ඡෙදතො කාමෙ පරිවජ්ජෙති? සොතාපත්තිමග්ගං භාවෙන්තොපි අපායගමනීයෙ කාමෙ සමුච්ඡෙදතො පරිවජ්ජෙති. සකදාගාමිමග්ගං භාවෙන්තොපි ඔළාරිකෙ කාමෙ සමුච්ඡෙදතො පරිවජ්ජෙති. අනාගාමිමග්ගං භාවෙන්තොපි අණුසහගතෙ කාමෙ සමුච්ඡෙදතො පරිවජ්ජෙති. අරහත්තමග්ගං භාවෙන්තොපි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං[7] සමුච්ඡෙදතො කාමෙ පරිවජ්ජෙති.

**යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරොති** – සප්පො වුච්චති අහි. කෙනට්ඨෙන සප්පො? සංසප්පන්තො ගච්ඡතීති – සප්පො; භුජන්තො[8] ගච්ඡතීති භුජගො, උරෙන ගච්ඡතීති උරගො, පන්නසිරො ගච්ඡතීති පන්නගො; සිරෙන සුපතීති සිරිංසපො[9]; බිලෙ සයතීති බිලාසයො; ගුහායං සයතීති ගුහාසයො; දාඨා තස්ස ආවුධොති දාඨාවුධො; විසං තස්ස ඝොරන්ති ඝොරවිසො; ජිව්හා තස්ස දුවිධාති ද්විජිව්හො; ද්වීහි ජිව්හාහි රසං සායතීති ද්විරසඤ්ඤූ; යථා පුරිසො ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛප්පටිකූලො පාදෙන සප්පසිරං විවජ්ජෙය්‍ය පරිවජ්ජෙය්‍ය අභිනිවජ්ජෙය්‍ය, එවමෙව සුඛකාමො දුක්ඛප්පටිකූලො කාමෙ වජ්ජෙය්‍ය විවජ්ජෙය්‍ය පරිවජ්ජෙය්‍ය අභිනිවජ්ජෙය්‍යාති – **සප්පස්සෙව පදා සිරො.**

---

1. සම්භජ්ජනපරිභජ්ජන - ස. සම්මජ්ජනපරිමජ්ජන - සී II.
2. අධිකන්තන - ස්‍යා. 3. සත්තිසූලූපමා - කත්ථචි.
4. මහග්ගි - ස්‍යා. 5. මහාභිතාපනට්ඨෙන - මජ්ඣං. මහාභිතාපණට්ඨෙන - ස.
6. ආනාපානුස්සතිං - ස්‍යා.
7 අසෙසනිස්සෙසං - ස. 8. භුජන්තො. - සීමු 1. 9. සුපතීති සරීසපො - මජ්ඣං.

‘මහාපරිදාහකර වන බැවින් කාමයෝ අඞ්ගාරකර්ෂූ (=අඟුරුවළ) වැන්නාහ’යි නුවණින් දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. ‘ඉත්වර වැ (=නො පැමිණ හෝ අල්ප වැ එළඹ) සිටි වන බැවින් කාමයෝ ස්වප්නයක් වැන්නාහ’ යි නුවණින් දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. ‘තාවත්කාලික වන බැවින් කාම පිරුළුයෙන් අළ දූයක් වැන්නැ’යි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කෙරෙයි. ‘සම්භඤ්ජනපරිභඤ්ජනකර වන බැවින් කාම වෘක්ෂඵල වැන්නැ’යි නුවණින් දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් පරිවර්ජිත කෙරෙයි. ‘අධිකුට්ටනා*ර්ථයෙන් (=සිඳුනා බැවින්) කාම අසිසූනා (=කඩුව හා මස්ලොඹුව) වැන්නැ’ යි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කෙරෙයි. ‘විනිවිදුනා බැවින් කාමයෝ සැත්හුලක් වැන්නාහ’ යි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කෙරෙයි ‘සප්‍රතිභයාර්ථයෙන් කාමයෝ සර්පශීර්ෂ වැන්නාහ’යි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. ‘මහාභිතාපකර වන බැවින් කාමයෝ වහ්නිස්කන්ධ වැන්නාහ’යි නුවණැසින් දක්නේ කාමයන් පරිවර්ජන කෙරේ.

බුද්ධානුස්මෘතිය වඩනුයේ ද විෂ්කම්භන හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. ධර්මානුස්මෘතිය වඩනුයේ ද... සඞ්ඝානුස්මෘතිය වඩනුයේ ද... ශීලානුස්මෘතිය වඩනුයේ ද... ත්‍යාගානුස්මෘතිය වඩනුයේ ද... දෙවතානුස්මෘතිය වඩනුයේ ද... ආනාපානස්මෘතිය වඩනුයේ ද... මරණානුස්මෘතිය වඩනුයේ ද... කායගතානුස්මෘතිය වඩනුයේ ද... උපශමානුස්මෘතිය වඩනුයේ ද විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කෙරෙයි; ප්‍රථමධ්‍යානය වඩනුයේ ද විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කෙරෙයි. ද්විතීයධ්‍යානය වඩනුයේ ද... තෘතීයධ්‍යානය වඩනුයේ ද... චතුර්ථධ්‍යානය වඩනුයේ ද... ආකාසානඤ්චායතනසමාපත්තිය වඩනුයේ ද... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය වඩනුයේ ද... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය වඩනුයේ ද... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය වඩනුයේ ද විෂ්කම්භන හෙයින් කාමයන් පරිවර්ජිත කෙරෙයි. මෙසේ විෂ්කම්භන හෙයින් කාමයන් පරිවර්ජිත කෙරේ.

කෙසේ සමුච්ඡේද විසින් කාමයන් පරිවර්ජිත කෙරෙයි? යත්: ස්‍රොතාපත්තිමාර්ගය වඩනුයේ ද අපායගමනීය වූ කාමයන් සමුච්ඡේද හෙයින් පරිවර්ජිත කෙරෙයි: සකෘදාගාමිමාර්ගය වඩනුයේ ද ඖදාරික වූ කාමයන් සමුච්ඡේද හෙයින් දුරු කෙරෙයි; අනාගාමිමාර්ගය වඩනුයේ ද අණුසහගත වූ කාමයන් සමුච්ඡේද හෙයින් දුරු කෙරෙයි, අර්හත්වමාර්ගය වඩනුයේ ද සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශේෂ කොට නිරවශේෂ කොට සමුච්ඡේදවශයෙන් කාමයන් පරිවර්ජිත කෙරෙයි. මෙසෙයින් සමුච්ඡේද හෙයින් කාමයන් දුරු කෙරේ.

**යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො** – ‘සප්ප’ යි නාගයා කියනු ලැබෙයි. කවර හෙයෙකින් සර්ප නම් වී ද? යත්: සංසර්පණ කෙරෙමින් යේ නු යි සර්ප යෑ, වක්‍රවක්‍ර වැ යේ නු යි භුජග යෑ; උරයෙන් (ළෙන්) යේ නුයි උරග යෑ; නැමූ ශීර්ෂ ඇති වැ යේ නු යි;= පන්නග යෑ; සිරසින් හොවී නු යි සිරිංසප යෑ; බිලයෙහි හොවී නු යි;= බිලාශය යෑ; ගුහායෙහි හොවී නු යි; ගුහාශය යෑ; දංෂ්ට්‍රා ඔහුට ආයුධ නු යි දංෂ්ට්‍රායුධ යෑ; විෂ ඔහුගේ ඝෝර නු යි ඝෝරවිෂ යෑ; ජිහ්වා ඔහුගේ ද්විවිධ නු යි ද්විජිහ්ව යෑ, දෙදිවින් රස විඳිනු යි ද්විරසඥ යෑ. යම් සේ ජීවත් වනු කැමැති නො මැරෙනු කැමැති සුව කැමැති දුඃඛප්‍රතිකූල වූ පුරුෂයෙක් පයින් සර්පශීර්ෂය හරනේ ද, වෙසෙසින් හරනේ ද, හාත්පසින් හරනේ ද, දුරින් දුරු කෙරේ ද, එසෙයින් ම සුව කැමැති වූයේ දුඃඛප්‍රතිකූල වූයේ කාමයන් හරනේ යෑ, වෙසෙසින් හරනේ යෑ, හාත්පසින් හරනේ යෑ, දුරින් දුරු කෙරේ නු යි **සප්පස්සෙව පදා සිරො** යනු වේ.

* අධිකුට්ටන - ධම්ප්‍රදීපිකා

**සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතීති** - "සො" ති යො කාමෙ පරිවජ්ජෙති; **විසත්තිකා** වුච්චති තණ්හා - යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො, චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං, ගෙධො පලිගෙධො[1] සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනනී සිබ්බනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසතා ආයූහනී දුතියා පණිධි භවනෙත්ති වනං[2] වනථො සන්ථවො සෙනහො අපෙක්ඛා පටිබන්ධු[3] ආසා ආසිංසනා ආසිංසිතත්තං, රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා[4] පුත්තාසා ජීවිතාසා, ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං, ලොලුප්පං[5] ලොලුප්පායනා ලොලුප්පායිතත්තං, පුච්ඡඤ්ජිකතා[6] සාදු[7]කම්‍යතා, අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා, කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා, රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා, ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබළිසං මාරවිසයො, තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො, අභිජ්ඣා ලොභො අකුසලමූලං.

**විසත්තිකාති** - කෙනට්ඨෙන විසත්තිකා? විසතාති විසත්තිකා; විසාලාති විසත්තිකා; විසටාති විසත්තිකා; විසක්කතීති විසත්තිකා; විසං හරතීති විසත්තිකා; විසංවාදිකා[8] ති විසත්තිකා; විසමූලාති විසත්තිකා; විසඵලාති විසත්තිකා; විසපරිභොගාති විසත්තිකා. විසාලා වා පන සා තණ්හා[9] රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ, කුලෙ ගණෙ ආවාසෙ ලාභෙ යසෙ පසංසායං සුඛෙ, චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ, කාමධාතුයා රූපධාතුයා අරූපධාතුයා, කාමභවෙ රූපභවෙ අරූපභවෙ සඤ්ඤාභවෙ අසඤ්ඤාභවෙ නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ එකවොකාරභවෙ චතුවොකාරභවෙ පඤ්චවොකාරභවෙ, අතීතෙ අනාගතෙ පච්චුප්පන්නෙ, දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු විසතා විත්ථතාති විසත්තිකා.

**ලොකෙති** - අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ.

---

1. රොධො පලිරොධො - කත්ථචි. 2. වනං - සීමු. I. මජසං.
3. පටිබන්ධො - සහං. PTS. 4. ජනාසා - මජසං. 5. ලොලුප්පා - සහං.
6. පුච්ඡකතා. - සීමු. I. මුච්ඡඤ්ජිකතා - සහං. PTS. 7. සාධු - ස; මජසං. PTS.
8. විසංවාදිකා - සීමු. I 9. තණ්හා'ති සාමපොත්ථකෙ න දිස්සති.

**සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති** – 'සො' යනු: යමෙක් කාමයන් පරිවර්ජන කෙරේ නම් හේ ය. '**විසත්තිකා**' යි තෘෂ්ණා කියැවෙයි. යම් රාගයෙක් සංරාගයෙක් (පුනපුනා පමුණුවන හෙයින්) අනුනයයෙක් අනුරෝධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක්, චිත්තයාගේ සංරාගයෙක් (අරමුණු කැමැති වන) ඉච්ඡායෙක් (බොල් කෙලෙස් බැමින් මුසපත් කරන) මූර්ඡායෙක් අධ්‍යවසානයෙක්, ගෙධයෙක් පරිගෙධයෙක් (අරමුණෙහි ලැගෙන හෙයින්) සඞ්ගයෙක් (ගැලෙන හෙයින්) පඞ්කයෙක් (ඒ ඒ භවයට ආකර්ෂණ කරන) එජාවෙක් (රවටන හෙයින්) මායාවෙක් (සසරවට උපදවන හෙයින්) ජනිකායෙක් (දුක හා සංයොග කරමින් උපදවන හෙයින්) සංජනනියෙක් (=ච්‍යුති ප්‍රතිසන්ධි විසින් භවයෙහි) මැසීමෙක් ජාලිනියෙක් (සරිත් සදෘශ ව ආකර්ෂණ කරන හෙයින්) නදියෙක් වෙසෙසින් ඇලීමෙක් (බඳනා හෙයින්) හුයෙක් (විසෘත වන හෙයින්) විසතායෙක් ආයූහනියෙක් (සහාය වන හෙයින්) ද්විතීයායෙක් ප්‍රණිධියෙක් භවනෙත්තියෙක් (සමුත්පාපන – ගහන හෙයින්) වනයෙක් (බලවද්භාවයෙන්) වනථයෙක් සන්ථවයෙක් ස්නෙහයෙක් අපෙක්ෂායෙක් ප්‍රතිබන්ධුයෙක් ආශායෙක් ආශංසායෙක් ආශංසිත බවෙක්, රූපයෙහි ආශායෙක් ශබ්දාශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්පර්ශාශායෙක් ධනාශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක්, (ජල්පන කරන හෙයින්) ජල්පායෙක් ප්‍රජල්පායෙක් අභිජල්පායෙක් ජල්පනයෙක් ජල්පිතබවෙක් ලොලුප බවෙක් ලොලුප්පාකාරයෙක් ලොලුප්පායිත බවෙක්, නඟුට සලන බවෙක් මධුර අරමුණු කැමැති වන බවෙක්, අධර්මරාගයෙක් විෂමලොභයෙක් නිකාන්තියෙක් නිකාමනයෙක් ප්‍රාර්ථනායෙක් පිහායෙක් සම්ප්‍රාර්ථනායෙක්, කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණායෙක් විභවතෘෂ්ණායෙක්, රූපතෘෂ්ණායෙක් අරූපතෘෂ්ණායෙක් නිරොධතෘෂ්ණායෙක්, ශබ්දතෘෂ්ණායෙක් ගන්ධතෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්පර්ශතෘෂ්ණායෙක් ධර්මතෘෂ්ණායෙක්, ඔඝයෙක් යොගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් ආවරණයෙක් නීවරණයෙක් (කුසල් දහම් වසන හෙයින්) ඡදනයෙක් බන්ධනයෙක් උපක්ලෙශයෙක් අනුශයයෙක් (උපදනා කුසලවාරය ගන්නා) පරියුට්ඨානයෙක් (පරිවෙෂ්ටන කරන හෙයින්) ලතායෙක් (විවිධ වස්තු කැමැති වන හෙයින්) විවිධ විච්ඡායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබඩිශයෙක් මාරවිෂයයෙක්, තෘෂ්ණානදියෙක් තෘෂ්ණාසඞ්ඛ්‍යාත ජාලයෙක් තෘෂ්ණා සඞ්ඛ්‍යාත ගර්දූල (=ශුනකබන්ධන) යෙක් තෘෂ්ණාසමුද්‍රයෙක්, අභිධ්‍යායෙක් ලෝභ අකුශලමූලයෙක් වේ නම් එය යි.

**විසත්තිකා** – කවරහෙයෙකින් (තෘෂ්ණා තොමෝ) විසත්තිකා නම් වූ ද? යත්: විසෘත වන හෙයින් විසත්තිකා යැ; විශාල වන හෙයින් විසත්තිකා යැ; විසෘෂ්ට වන හෙයින් විසත්තිකා යැ; විශේෂයෙන් සහ්‍ය (=සහනය කළ හැකි) වන හෙයින් විසත්තිකා යැ; වෙසෙසින් සිත හකුළුවන හෙයින් හෝ දුඃඛවිෂය එළවන හෙයින් විසත්තිකා යැ; (අනිත්‍යාදිය) විසංවාදන කරන හෙයින් විසත්තිකා යැ; විෂමූල හෙයින් විසත්තිකා යැ; විෂඵල හෙයින් විසත්තිකා යැ; විෂපරිභොග හෙයින් = විසත්තිකා යැ. යළි විශාල වූ ඒ තෘෂ්ණා තොමෝ රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි, කුලයා කෙරෙහි ගණයා කෙරෙහි ආවාසයෙහි ලාභයෙහි යශස්හි ප්‍රශංසායෙහි සුඛයෙහි, චීවරයෙහි පිණ්ඩපාතයෙහි ශයනාසනයෙහි ග්ලානප්‍රත්‍යයයෙහි, කාමධාතුයෙහි රූපධාතුයෙහි අරූපධාතුයෙහි, කාමභවයෙහි රූපභවයෙහි අරූපභවයෙහි සංඥාභවයෙහි අසංඥාභවයෙහි නෛවසංඥානාසංඥාභවයෙහි එකස්කන්ධභවයෙහි චතුඃස්කන්ධභවයෙහි පඤ්චස්කන්ධභවයෙහි, අතීතකාලයෙහි අනාගතකාලයෙහි ප්‍රත්‍යුත්පන්නකාලයෙහි, දෘෂ්ටශ්‍රැතමූතවිඥාතව්‍යධර්මයන්හි විසෘත විස්තෘත වූ යි 'විසත්තිකා' නමු.

**ලොකෙ** – අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි යැ.

**සතොති** - චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; වෙදනාසු-චිත්තෙ-ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො. අපරෙහිපි චතූහි කාරණෙහි සතො: අසති පරිවජ්ජනාය සතො; සතිකරණීයානඤ්ච ධම්මානං කතත්තා සතො; සතිපටිපක්ඛානං[1] ධම්මානං හතත්තා සතො; සතිනිමිත්තානං ධම්මානං අසම්මුට්ඨත්තා[2] සතො. *[3]අපරෙහිපි චතූහි කාරණෙහි සතො: සතියා සමන්නාගතත්තා සතො; සතියා වසිතත්තා සතො; සතියා පාගුඤ්ඤතාය සතො; සතියා අපච්චොරොපනතාය[4] සතො.* අපරෙහිපි චතූහි කාරණෙහි සතො: සත්තත්තා සතො; සන්තත්තා සතො; සමිතත්තා සතො; සන්තධම්මසමන්නාගතත්තා සතො. බුද්ධානුස්සතියා සතො; ධම්මානුස්සතියා සතො; සඞ්ඝානුස්සතියා සතො; සීලානුස්සතියා සතො; චාගානුස්සතියා සතො; දෙවතානුස්සතියා සතො; ආනාපානසතියා සතො; මරණානුස්සතියා සතො; කායගතාසතියා සතො; උපසමානුස්සතියා සතොති. යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා[5] අසම්මුස්සනතා[6] සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො, අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො හොති සමුපෙතො උපගතො[7] සමුපගතො උපපන්නො සමුපපන්නො[8] සමන්නාගතො. සො වුච්චති සතො.

**සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතීති** - ලොකෙ වෙසා[9] විසත්තිකා; ලොකෙවෙතං[10] විසත්තිකං සතො තරති උත්තරති පතරති සමතික්කමති වීති[11]වත්තතීති 'සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති'.

තෙනාහ භගවා:

"යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතී" ති.

**1 - 4**

"ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා ගවාස්සං දාසපොරිසං,
ථියො බන්ධූ පුථූ කාමෙ යො නරො අනුගිජ්ඣති".

1. පරිපන්ථානං - සීමු. I. පරිබන්ධානං - මජසං. 2. අපම්මුට්ඨත්තා - ස. සී. II. PTS.
*3. පුප්ඵලක්ඛණන්තරිතො භාගො ස්‍යාම පොත්ථකෙ න දිස්සතෙ.
4. අපච්චොරොහනතාය - ස. 5. පිලාපනතා - මජසං.
6. අපම්මුස්සනතා - සීමු. II. සං. 7. උපාගතො - සීමු. II. PTS.
8. සම්පන්නො - සීමු. II 9. ලොකෙ - ස්‍යා. PTS. යා ලොකෙ වා සා. - මජසං. සීමු. II
10. යා ලොකෙ - ස්‍යා. ලොකෙ වා සා. මජසං. සීමු. II. 11. පීති - සීමු. II.

**සතො** – සතර කරුණෙකින් සමෘති ඇතියේ: රූපකායයෙහි කායානුදර්ශනාසමෘතිප්‍රස්ථානය (=කය අනිත්‍යාදි විසින් පුනපුනා දක්නා සිවටත්) වඩනුයේ සමෘති ඇතියේ යැ. වෙදනායෙහි – චිත්තයෙහි – ධර්මයන්හි ධර්මානුදර්ශනාසමෘතිප්‍රස්ථානය වඩනුයේ සමෘති ඇතියේ යි. අනෙකුදු සතර කරුණෙකින් සමෘති ඇතියේ: මුෂිතසමෘතිය දුර ලීමෙන් සමෘති ඇතියේ, සමෘතියෙන් කර්තව්‍ය වූ ධර්මයන් (=සතර මාර්ගයන්) වඩන ලද හෙයින් සමෘති ඇතියේ, (කාමච්ඡන්දාදි) සමෘතිප්‍රතිපක්ෂධර්මයන් නැසූ හෙයින් සමෘති ඇතියේ, සමෘතිනිමිත්ත වූ (කායාදි) ධර්මයන් නො නට හෙයින් සමෘතිමත් වූයේ යැ. අන්‍ය වූ ද සතර කරුණෙකින් සමෘති ඇතියේ: සමෘතියෙන් සමන්විත වන හෙයින් සමෘතිමත් වූයේ, සමෘතිවශිතාවයට පැමිණි හෙයින් සමෘතිමත් වූයේ, සමෘතියෙහි ප්‍රගුණ බැවින් සමෘතිමත් වූයේ, සමෘතියෙන් අපරිවර්තිත වන (=නො පසුබස්නා) බැවින් සමෘතිමත් වූයේ. අන්‍ය වූ ද සතර කරුණෙකින් සමෘතිමත් වූයේ: සත්ත්ව (=ස්වභාවයෙන් විද්‍යමාන) වන බැවින් සමෘතිමත් වූයේ, ශාන්ත (=නිවුණ වන) බැවින් සමෘතිමත් වූයේ, කෙලෙස් සන්හිඳුවන ලද බැවින් සමෘතිමත් වූයේ, සත්පුරුෂධර්මයන්ගෙන් සමන්විත වන බැවින් සමෘතිමත් වූයේ. බුද්ධානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ධර්මානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, සඞ්ඝානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ශීලානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ත්‍යාගානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, දෙවතානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ආනාපානසමෘතියෙන් සමෘතිමත් වූයේ, මරණානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, කායගතසමෘතියෙන් සමෘතිමත් වූයේ, උපශමානුසමෘතියෙන් සමෘතිමත් වූයේ යි. යම් සිහියෙක් නැවත නැවත සිහි කිරීමෙක් අභිමුඛ ව මෙන් සිහි කිරීමෙක් සිහියක් සිහි කරන අයුරක් (ශ්‍රැතය) ධරන බවෙක් (අරමුණෙහි) බැසගන්නා බවෙක් (චිරකෘත භාෂිතයන්) ප්‍රමොෂ (=විස්මෘත) නොවන බවෙක් සමෘතියෙක් සමෘතීන්ද්‍රියයෙක් සමෘතිබලයෙක් සම්‍යක්සමෘතියෙක් සමෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද, මෝ සමෘති නමැයි කියනු ලැබේ. මේ සමෘතියෙන් උපෙත වූයේ සමුපෙත වූයේ උපගත වූයේ සමුපගත වූයේ නොවෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ වෙයි. හේ **සමෘතිමත්** වූයේ ය යි කියනු ලැබේ. **සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති** – මේ විසත්තිකා තොමෝ ස්කන්ධලොකයෙහි මැ වෙයි. ස්කන්ධලොකයෙහි මැ පවත්නා වූ මේ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව සමෘතිමත් වූයේ (කාමයන් දුරු කෙරෙමින්) තරණය කෙරෙයි. (කෙලශයන් දුරු කෙරෙමින්) උත්තරණය කෙරෙයි. (ඔවුන්ගේ ප්‍රතිඝාතහේතුව සිඳිමින්) ප්‍රතරණය කෙරෙයි. (සසර ඉක්මවමින්) සමතික්‍රමණය කෙරෙයි, (ප්‍රතිසන්ධියට අභව්‍යොත්පත්තික කෙරෙමින්) ඉක්මවා නු යි "සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති" යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යො කාමෙ පරිවජ්ජෙති** –පෙ– **සතො සමතිවත්තති"** යි.

## 1-4.

"යම් මිනිසෙක් හැල් ආදි කෙත් හෝ ගෙවතු ආදි වතු හෝ අමුරන් හෝ ගවයන් අසුන් හෝ දසුන් කම්කරු පුරුෂයන් හෝ නෑයන් හෝ අන් බොහෝ කාමයනු ද පුනපුනා ප්‍රාර්ථනා කෙරේ නම්"

**ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා** ති – 'ඛෙත්ත'න්ති සාලික්ඛෙත්තං වීහික්ඛෙත්තං මුග්ගක්ඛෙත්තං මාසක්ඛෙත්තං යවක්ඛෙත්තං ගොධූමක්ඛෙත්තං තිලක්ඛෙත්තං; **වත්ථුන්ති**[1] – ඝරවත්ථුං කොට්ඨකවත්ථුං පුරෙවත්ථුං පච්ඡාවත්ථුං ආරාමවත්ථුං විහාරවත්ථුං; **හිරඤ්ඤන්ති** – හිරඤ්ඤං වුච්චති කහාපණොති 'ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා.'

**ගවාස්සං දාසපොරිසන්ති** – 'ගවා'ති ගාවො* වුච්චන්ති. **අස්සාති** පසුකාදයො වුච්චන්ති. **දාසාති** – චත්තාරො දාසා: අන්තොජාතකො දාසො, ධනක්කීතකො දාසො, සාමං වා දාසව්‍යං උපෙති, අකාමතො වා දාසව්‍යං[2] උපෙති.

1. "ආමාය[3] දාසා'පි භවන්ති හෙකෙ
ධනෙන කීතාපි භවන්ති දාසා,
සාමං ච එකෙ උපයන්ති දාසව්‍යං[4]
භයා පණුන්නාපි භවන්ති දාසා" ති.

**පුරිසාති** – තයො පුරිසා: භතකා කම්මකරා උපජීවිනොති 'ගවාස්සං දාසපොරිසං.'

**ථියො බන්ධු පුථුකාමෙ'ති** – 'ථියො ති ඉත්ථිපරිග්ගහො වුච්චති. **බන්ධූති** – චත්තාරො බන්ධූ: ඤාතිබන්ධවාපි බන්ධු, ගොත්තබන්ධවාපි බන්ධු, මන්තබන්ධවාපි බන්ධු, සිප්පබන්ධවාපි බන්ධු. **පුථු කාමෙති** – බහූ කාමෙ; එතෙ පුථුකාමා: මනාපිකා රූපා –පෙ– මනාපිකා ඵොට්ඨබ්බාති 'ථියො බන්ධු පුථු කාමෙ.'

**යො නරො අනුගිජ්ඣතීති** – 'යො'ති යො යාදිසො යථායුත්තො[5] යථාවිහිතො යථාපකාරො යං[6] ඨානං පත්තො යංධම්ම[7]සමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා. **නරොති** – සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[8] ජන්තු ඉන්දගු[9] මනුජො; **අනුගිජ්ඣතීති** – කිලෙසකාමෙන වත්ථුකාමෙසු ගිජ්ඣති අනුගිජ්ඣති පලිගිජ්ඣතීති 'යො නරො අනුගිජ්ඣති.'

තෙනාහ භගවා:

"ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා ගවාස්සං දාසපොරිසං,
ථියො බන්ධු පුථු කාමෙ යො නරො අනුගිජ්ඣතී" ති.

**1 – 5.**

"අබලා නං බලීයන්ති මද්දන්තෙ නං පරිස්සයා,
තතො නං දුක්ඛමන්වෙති නාවං භින්නමිවොදකං".

1. "වත්ථු"ඉති සසා- PTS. 2. දාසවියං – මජසං. සීමු. I. සී. II PTS.
3. ආමාස – සීමු. I. 4. දාසං – සී. I සීමු. I. සසා. PTS. 5. යථාවුත්තො – සීමු. I.
6. යථා – සීමු. I. 7. ධම්මං – සීමු. I. ස. 8. ජතු – සීමු. I. ජාතු – සසා.
9. ඉන්දගූ. – සීමු. I * 'ගවන්ති ගවා' – සබ්බත්ථ.

**ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා** – 'ඛෙත්ත' නම්: හැල්කෙත යැ, වීකෙත යැ, මුංකෙත යැ, මෑකෙත යැ, යවකෙත යැ, තිරිඟුකෙත යැ, තලකෙත යි.

**වත්ථු** නම්: ගෙවතු යැ, කොටුවතු යැ, ගේ පෙරටුයෙහි වතු යැ, අරම්වතු යැ, වෙහෙරවතු යි. **හිරඤ්ඤ** නම්: කහවුණු හිරණ්‍ය යැ යි කියනු ලැබේ නු යි (මෙසේ) "ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා" යනු වේ.

**ගවාස්සං දාසපොරිසං** – 'ගවා' යි ගවයෝ (=ගෙරිහු) කියනු ලැබෙත්. **අස්සා** යි එළු ආදි සිවුපාහු කියනු ලැබෙත්. **දාසා** යනු: දාසයෝ සතර දෙනෙකි: (ඇතුළුගෙයි දාසියගේ කුසෙහි උපන්) අන්තර්දාසයා යැ, ධන-යෙන් විකොට ගත් දාසයා යැ, තෙමේ මැ හෝ දස්බවට පැමිණියේ යැ, කරමරානීත (=බැඳ ලා ගැනීමෙන්) නො කැමැත්තෙන් දාසබවට පැමිණියේ යි.

1. "ඇතැම් කෙනෙක් ඇතුළත්හි උපන් දාසයෝ වෙත් මැ ය. ධනයෙන් විකිණියක් දාසයෝ ද වෙති. තව ද ඇතැම් කෙනෙක් තුමූ ම දාසබවට පැමිණෙති. බියෙන් මඩනා ලද්දාහු ද දාසයෝ වෙත්."

**පුරිසා** යනු: පුරුෂයෝ තිදෙනෙකි: බැලයෝ යැ, කම්කරුවෝ යැ, ඇසුරු කොට ජිවත් වන්නාහු යැ යි "ගවාස්සං දාසපොරිසං" යනු වේ.

**පියො බන්ධූ පුථූ කාමෙ** – 'පියො' යි ස්ත්‍රීපරිග්‍රහය කියනු ලැබෙයි. **බන්ධූ** යනු: සතර බන්ධු කෙනෙකි: මවුපිය දෙපස ඥාති වූ බාන්ධවයෝ ද බන්ධූහු යැ. සමානගොත්‍ර ඇති බාන්ධවයෝ ද බන්ධූහු යැ. (එක් ඇදුරුකුලයෙහි උගත් මන්ත්‍ර ඇති) මන්ත්‍රබාන්ධවයෝ ද බන්ධූහු යැ. (එක් වැ උගත් ශිල්ප ඇති) ශිල්පබාන්ධවයෝ ද බන්ධූහු යි. **පුථූ කාමෙ** යනු: බොහෝ කාමයන්; බොහු යැ පුථුකාමයෝ: මන වඩන රූපයෝ යැ . . . මන වඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යි "පියො බන්ධූ පුථූ කාමෙ" යනු වේ.

**යො නරො අනුගිජ්ඣති** - 'යො' යනු: යමෙක් යම්බඳු වූයෙක්, (තවකම් ආදි) යමෙකින් යුක්ත වූයෙක්, යම්සේ සිටියෙක්, යම් ප්‍රකාර වූයෙක්, යම් තනතුරකට පැමිණියෙක්, යම් ධර්මයෙකින් යුක්ත වූයෙක්, ක්‍ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යැ. **නරො** යනු: සත්ත්වයෙක්, නරයෙක්, මානවයෙක්, පුරුෂයෙක්, පුද්ගලයෙක්, ජීවයෙක්, ජාතියට පැමිණෙනුයෙක්, ජන්තුයෙක්, කර්මයෙන් යනුයෙක්, මනුජයෙක් යැ. **අනුගිජ්ඣති**- ක්ලේශකාමයෙන් වස්තුකාමයන්හි ගිජු වෙයි, පුනපුනා පතයි, හාත්පසින් ගිජු වේ නු යි "යො නරො අනුගිජ්ඣති" යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා –පෙ– යො නරො අනුගිජ්ඣති"** යි.

**1 – 5.**

"අබල වූ කෙලෙස්හු ඒ මිනිසා මැඩ ගනිති. යළි ප්‍රකට අප්‍රකට උපද්‍රවයෝ ඒ කාමගිද්ධයා මඩිති. එහෙයින් සිදුරු වූ නැවකට ජලය වදනා සෙයින් ජාත්‍යාදි දුක ඔහු අනුව යේ"

**අබලා නං බලීයන්තීති** – අබලාති අබලා කිලෙසා දුබ්බලා අප්පබලා අප්පථාමා හීනා නිහීනා පරිහීනා ඔමකා ලාමකා ජත්තකා[1] පරිත්තා. තෙ කිලෙසා තං[2] පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්තීති එවම්පි **අබලා නං බලීයන්ති**. අථවා අබලං පුග්ගලං දුබ්බලං අප්පබලං අප්පථාමකං හීනං නිහීනං පරිහීනං ඔමකං ලාමකං ජත්තකං පරිත්තං, යස්ස නත්ථි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං. තෙ කිලෙසා තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්තීති එවම්පි අබලා නං බලීයන්ති.

**මද්දන්තෙ නං පරිස්සයාති** – **පරිස්සයාති** ද්වෙ පරිස්සයා: පාකට පරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච. කතමෙ පාකටපරිස්සයා? සීහා ව්‍යග්ඝා දීපි අච්ඡා තරච්ඡා කොකා[3] මහිසා හත්ථි අහි විච්ඡිකා සතපදී, චොරා වා අස්සු මාණවා වා කතකම්මා වා අකතකම්මා වා, චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා[4] සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රබසා[5] විතච්ඡිකා ලොහිතපිත්තං[6] මධුමෙහො අංසා[7] පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සා ඉති වා, ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා.

කතමෙ පටිච්ඡන්නපරිස්සයා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථිනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ අකුසලාභිසඞ්ඛාරා, ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා.

---

1. ස. - ජතුක්කා. සිමු. II, PTS. 2. තං. - සිමු. I, සනා.
3. තරච්ඡා කොකා - සිමු. I, කොමහිසා - PTS. 4 පක්ඛන්දිකා - සිමු. I, සී. II.
5. තබසා - සිමු. I 6. ලොහිතං පිත්තං. - සනා. 7. අරිසා - ස.

**අබලා නං බලීයන්ති - අබලා** යනු: කෙලෙස්හු අබලයෝ යැ, දුබලයෝ යැ, අල්පබලයෝ යැ, අල්පශක්ති ඇතියෝ යැ, හීනයෝ යැ, නිහීනයෝ යැ, පරිහීනයෝ යැ, අවමත(අවඥාත)යෝ යැ, ලාමකයෝ යැ, ප්‍රත්‍යයහීනයෝ යැ, පරිත්තයෝ යි. ඒ කෙලෙස්හු ඒ පුද්ගලයා සහනය කෙරෙති (-මඩිති), හාත්පසින් මඩිති, අභිභවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් අල්වාගනිති, මර්දනය කෙරෙත් නුයි මෙසෙයින් ද අබලයෝ ඔහු මඩිති. නොහොත් ශ්‍රද්ධාබල වීර්‍යබල ස්මෘතිබල සමාධිබල ප්‍රඥාබල හිරිබල ඔත්තප්පබල යමක් හට නැද්ද, (එහෙයින්) අබල වූ දුබල වූ අල්පබල වූ අල්පශක්ති වූ හීන වූ නිහීන වූ පරිහීන වූ අවමත වූ ලාමක වූ ප්‍රත්‍යයහීන වූ පරිත්ත වූ ඒ පුද්ගලයා ඒ කෙලශයෝ සහනය කෙරෙති, හාත්පසින් මඩිති, අභිභවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් ගනිති, මිරිකත් නුයි මෙසෙයින් ද "අබලයෝ ඔහු මඩිත්".

**මද්දන්තෙනං පරිස්සයා - පරිස්සයා** යනු: පරිශ්‍රය (උපද්‍රවයෝ) දෙදෙනෙකැ: ප්‍රකටපරිශ්‍රය යැ, ප්‍රතිච්ඡන්නපරිශ්‍රය යැයි. ප්‍රකට උපද්‍රවයෝ කවරහ? යත්: සිංහ යැ, වග යැ, දිවි යැ, වලස් යැ, තරස් යැ, කොක්නා යැ, මියු යැ, ඇත් යැ, සප් යැ, නුහුහු යැ, පත්තෑ යැ, කළ සොරකම් ඇති හෝ කළ සොරකම් නැති හෝ සොරු හෝ සැහැසියෝ යැ; චක්ෂුරෝග යැ ශ්‍රෝත්‍රරෝග යැ ඝ්‍රාණරෝග යැ ජිහ්වාරෝග යැ කායරෝග යැ ශීර්ෂ-රෝග යැ කර්ණරෝග යැ මුඛරෝග යැ දන්තරෝග යැ කාශ යැ ශ්වාස යැ පීනස යැ දාහ යැ ජ්වර යැ කුක්ෂිරෝග යැ මූර්ඡා යැ රක්තාතීසාර යැ ආමශූල යැ විසූචිකා යැ කුෂ්ඨ යැ ගණ්ඩ යැ කිලාසකුෂ්ඨ යැ ක්ෂය යැ අපස්මාර යැ දද යැ කැසි යැ කස් යැ ව්‍රණ යැ විතච්ඡිකා (-තලරෝග) යැ රක්තපිත්ත යැ මධුමේහ යැ අර්ශස් යැ පොළ යැ භගන්දරා යැ පිතින් නැඟි ආබාධ යැ සෙමින් නැඟි ආබාධ යැ වතින් නැඟි ආබාධ යැ සාන්නිපාතික ආබාධ යැ ඍතුපරිණාමයෙන් උපන් ආබාධ යැ විෂම වූ ඊර්යාපථයෙන් නැඟි ආබාධ යැ උපක්‍රමයෙන් උපන් ආබාධ යැ කර්මවිපාකයෙන් උපන් ආබාධ යැ ශීත යැ උෂ්ණ යැ ජිඝත්සා යැ පිපාසා යැ උච්චාර යැ ප්‍රස්‍රාව යැ, මැසි - මදුරු - වා - අව් - දික්ද යන මොවුන්ගේ පහසින් උපන් පීඩා යැ යන මේ හෝ සි. මොහු ප්‍රකට උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ කවරහ? යත්: කායදුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනෝදුශ්චරිත යැ, කාමච්ඡන්දනීවරණ යැ ව්‍යාපාදනීවරණ යැ ථීනමිද්ධනීවරණ යැ උද්ධච්චකුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යැ, රාග යැ ද්වේෂ යැ මෝහ යැ ක්‍රෝධ යැ උපනාහ යැ ම්‍රක්ෂ (මෙරමා ගුණ මැකීම) යැ පලාස (යුගග්‍රාහ) යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය යැ මායා (ස්වදෝෂ ගුහන) යැ සාඨෙය්‍ය (අසද් ගුණ ප්‍රකාශ) යැ (ඔවා නො ගන්නා) ස්තම්භ යැ සංරම්භ යැ මාන යැ අතිමාන යැ මද යැ ප්‍රමාද යැ, සියලු කෙලශයෝ යැ සියලු දුශ්චරිතයෝ යැ සියලු දරථයෝ යැ සියලු (කෙලශ) පරිදාහයෝ යැ සියලු (කෙලශ) සන්තාපයෝ යැ සියලු අකුශලාභිසංස්කාරයෝ යැ යන මොහු ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

**පරිස්සයාති** - කෙනට්ඨෙන පරිස්සයා? පරිසහන්තීති පරිස්සයා, පරිහානාය සංවත්තන්තීති පරිස්සයා, තත්‍රාසයාති පරිස්සයා. කථං පරිසහන්තීති පරිස්සයා? තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති[1] පරියාදියන්ති මද්දන්ති. එවං පරිසහන්තීති පරිස්සයා.

කථං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා? තෙ පරිස්සයා කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්තීති. කතමෙසං කුසලානං ධම්මානං? සම්මාපටිපදාය අනුලොමපටිපදාය අපච්චනීකපටිපදාය අවිරුද්ධ-පටිපදාය අන්වත්ථපටිපදාය ධම්මානුධම්මපටිපදාය සීලෙසු පරිපූරකාරිතාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය භොජනෙ මත්තඤ්ඤුතාය ජාගරියානුයොගස්ස සතිසම්පජඤ්ඤස්ස චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගස්ස චතුන්නං සම්මප්පධානානං භාවනානුයොගස්ස චතුන්නං ඉද්ධිපාදානං භාවනානු-යොගස්ස පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනානුයොගස්ස පඤ්චන්නං බලානං භාවනානුයොගස්ස සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවනානුයොගස්ස අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගස්ස, ඉමෙසං කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. එවං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා.

කථං තත්‍රාසයාති පරිස්සයා? තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයා යථා බිලෙ බිලාසයා පාණා සයන්ති, දකෙ දකාසයා පාණා සයන්ති, වනෙ වනාසයා පාණා සයන්ති, රුක්ඛෙ රුක්ඛාසයා පාණා සයන්ති; එවමෙව තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයාති. එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

"සාන්තෙවාසිකො භික්ඛවෙ, භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු විහරති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරති? ඉධ භික්ඛවෙ, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති යෙ පාපකා අකුසලා ධම්මා සරසංකප්පා සංයොජනීයා, ත්‍යස්ස අන්තො වසන්ති අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකො'ති වුච්චති. තෙ නං සමුදාචරන්ති - සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති. පුන ච පරං භික්ඛවෙ, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති යෙ පාපකා අකුසලා ධම්මා සරසංකප්පා සංයොජනීයා, ත්‍යස්ස අන්තො වසන්ති අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකො'ති වුච්චති. තෙ නං සමුදාචරන්ති - සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා සාචරියකො'ති වුච්චති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරතී'' ති. එවම්පි[3] තත්‍රාසයාති පරිස්සයා.

1. අජ්ඣොත්ථරන්ති. - සිමු. I. 2. අන්වාස්සවන්ති - සී මු I. 3. එවං - සී මු I.

**පරිස්සයා** යනු කවරහෙයින් පරිස්සය වෙති ? යත්: පරිසහනය කෙරෙත් නුයි ‘පරිස්සය’ නම් වෙති, පරිහානයටං වැටෙත් නුයි ‘පරිස්සය’ නම් වෙති, එහි ආසය ඇත්තාහු නුයි - පරිස්සය නම් වෙත්.

කෙසේ ‘පරිසහනය කෙරෙත්’ නුයි ‘පරිස්සය’ නම් වෙති ? යත්: ඒ උපද්‍රවයෝ ඒ පුඟුල්හු සහනය කෙරෙති, පරිසහනය කෙරෙති, මැඩගෙන සිටිති, හාත්පසින් අල්වාගනිති, මිරිකාගනිත්. මෙසේ පරිසහනය කෙරෙත් නුයි ‘පරිස්සය’ නම් වෙත්.

කෙසේ ‘පරිහානයට වැටෙත්’ නුයි ‘පරිස්සය’ නම් වෙති ? යත්: ඒ උපද්‍රවයෝ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පරිහානය (හැරීම) පිණිස පවතිත්. කවර කුශලධර්මයන්ගේ ද යත්: සම්‍යක්ප්‍රතිපත් යැ අනුලොමප්‍රතිපත් යැ අප්‍රත්‍යනීකප්‍රතිපත් යැ අවිරුද්ධප්‍රතිපත් යැ අන්‍වර්ථ-(අර්ථානුගත)ප්‍රතිපත් යැ ධර්මානුධර්මප්‍රතිපත් යැ ශීලයෙහි පරිපූරකාරිත්‍ව යැ ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා යැ භොජනයෙහි මාත්‍රඥතා යැ ජාගර්‍ය්‍යානුයොග යැ ස්මෘතිසම්ප්‍රඥත යැ චතුර්විධ ස්මෘතිප්‍රස්ථානයන්ගේ භාවනානුයොග යැ චතුර්විධ ඍද්ධිපාදයන්ගේ භාවනානුයොග යැ පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනානුයොග යැ පඤ්චබලයන්ගේ භාවනානුයොග යැ සප්තබොධ්‍යඞ්ගයන්ගේ භාවනානුයොග යැ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයාගේ භාවනානුයොග යැ යන මේ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පරිහානය පිණිස වැටෙත්. මෙසේ පරිහානයට වැටෙත් නුයි ‘පරිස්සය’ නම් වෙත්.

කෙසේ ‘එහි ආසය ඇත්තාහු’ නුයි ‘පරිස්සය’ නම් වෙති ? යත්: ඒ ඇත්බැව්හි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසිරි කොට උපදිත්. යම්සේ බිලය ඇසුරු කරන ප්‍රාණීහු බිලයෙහි හොවිත් ද, දිය ඇසුරු කරන ප්‍රාණීහු දියෙහි හොවිත් ද, වනය ඇසුරු කරන ප්‍රාණීහු වෙනෙහි හොවිත් ද, රුක ඇසුරු කරන ප්‍රණීහු රුක්හි හොවිත් ද, එසෙයින් ම අත්බැව ඇසුරු කරන තෙල ලාමක අකුශලධර්මයෝ ඒ අත්බැව්හි උපදිත්. මෙසෙයිනුදු තත්‍රාසය (එහි ආසය) ඇත්තාහු නුයි පරිස්සය නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

“මහණෙනි, සන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙයි. මහණෙනි, කෙසේ නම් සාන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙයි ? යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණක් හට ඇසින් රූපයක් දක සරසංකල්ප (-අරමුණුවල හැසිරෙන හෙයින් සංකල්පනය කටයුතු) වූ සංයොජනයන්ට හිත වූ යම් ලාමක අකුශලධර්ම කෙනෙක් උපදිත් ද, ඒ අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති. සන්තානයට පිවිස වෙසෙති. එහෙයින් ‘සාන්තෙවාසික’ යයි කියනු ලැබේ. යම් හෙයකින් ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු හසුරුවත් ද, ඔහු කෙරෙහි පවතිත් ද, එහෙයින් ‘සාචරියක’ යයි කියනු ලැබේ. තවද මහණෙනි, මහණක් හට කනින් ශබ්දයක් අසා... නාසයෙන් ගඳක් අසා... දිවින් රසයක් විඳ... කයින් පහසක් පැහැස... සිතින් දහමක් දන නානාලම්බනයෙහි හැසිරීම් වශයෙන් පරිකල්පිත වූ සංයොජනීය වූ යම් ලාමක අකුශලධර්ම කෙනෙක් උපදිත් ද, ඒ ලාමක අකුශල ධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති. ඔහුගේ සන්තානයට පිවිස වෙසෙති. එහෙයින් ‘සාන්තෙවාසික’ යයි කියනු ලැබේ. යම් හෙයකින් ඒ ලාමක අකුශල ධර්මයෝ ඔහු හසුරුවත් ද, ඔහු කෙරෙහි පවතිත් ද, එහෙයින් ‘සාචරියක’ යයි කියනු ලැබේ. මෙසෙයින් මහණෙනි, මහණ තෙමේ සාන්තෙවාසික වූයේ සාචරියක වූයේ දුකසේ වෙසෙයි, සුවසේ නො වෙසේ යයි. මෙසේත් තත්‍රාසය වෙත් නුයි උපද්‍රව නම් වෙත්.

වුත්තං හෙතං භගවතා:

"තයො මෙ භික්ඛවෙ, අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා. කතමෙ තයො? ලොභො භික්ඛවෙ, අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. දොසො භික්ඛවෙ -පෙ- මොහො භික්ඛවෙ, අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා" ති.

1. "අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

2. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං[1] තදා හොති යං ලොභො සහතෙ නරං.

3. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

4. කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං[1] තදා හොති යං කොධො සහතෙ නරං.

5. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති,
අන්ධන්තමං[1] තදා හොති යං මොහො සහතෙ නරං"ති.

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

"තයො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො? ලොභො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. මොහො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය[2]. ඉමෙ ඛො මහාරාජ, තයො, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායාති.

7. ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරං'ව සම්ඵල" න්ති.

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

8. "රාගො ච දොසො ච ඉතො නිදානා
අරතී රතී ලොමහංසො ඉතොජා,[3]
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා[4] ධංකමිවොස්සජන්ති"

---

1. අන්ධතමං - සයා
2. අඵාසුවිහාරායාති - සීමු. I.
3. ජාතො. ස, PTS. ජාතා - ස.
4. කුමාරිකා - මජසං.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"මහණෙනි, ඇතුළත මලයෝ ඇතුළත අමිත්‍රයෝ ඇතුළත සතුරෝ ඇතුළත වධකයෝ ඇතුළත පසමිතුරෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද ? යත්: මහණෙනි, ලොභය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි. මහණෙනි, ද්වෙෂය... මහණෙනි, මොහය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි. මහණෙනි, මොහු තිදෙන ඇතුළත මලයෝ යැ, ඇතුළත අමිත්‍රයෝ යැ, ඇතුළත සතුරෝ යැ, ඇතුළත වධකයෝ යැ, ඇතුළත පසමිතුරෝ' යි.

1 – 2. ලොභය අනර්ථ උපදවන්නේ යැ. ලොභය සිත චලනය කරන්නේ යැ. හේ ඇතුළත (සිත්හි මැ) උපන් භයහෙතුයෙක. ඒ භය බාල මහාජන තෙමේ නො දනී. ලොභී වූයේ (ලෞකිකලොකොත්තර) අර්ථය නො දනී. (අර්ථයට හෙතු වූ) ධර්මය නො දකී. යම් කලෙක්හි ලොභය තෙම මිනිසා මැඩගනී ද එකල්හි බහල වූ අන්ධකාරය වේ.

3 – 4. ද්වෙෂය අනර්ථජනක යැ, ද්වෙෂය සිත චලනය කෙරෙයි. හේ සිත්හි උපන් භය කාරණයෙක. බාලජන තෙමේ එය අවබොධ නො කෙරෙයි. කිපියේ අර්ථය නො දනී. ධර්මය නො දකී. ක්‍රොධය මිනිසා යටපත් කරන කල්හි බහල වූ අන්ධකාරය වේ.

5 – 6. මොහය අනර්ථ උපදවයි. මොහය සිත කලඹයි. හේ සිත තුළ උපදනා භය කාරණයෙක. බාලජන තෙමේ එය අවබොධ නො කෙරෙයි. මුළා වූයේ අර්ථය නො දනී. ධර්මය නො දකී. මොහය මිනිසා මැඩගන්නා කල්හි බහල වූ අන්ධකාරය වේ.

මෙසේත් 'තත්‍රාසය වෙත්' නුයි උපද්‍රව නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"මහරජ, පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනා ධර්මයෝ තිදෙනෙක් අහිත පිණිස දුක් පිණිස අපුබවිහරණය පිණිස උපදිති. කවර තිදෙනෙක් ද ? යත්: මහරජ, ලොභධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදී. මහරජ, ද්වෙෂධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදී. මහරජ, මොහධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදී. මහරජ, මේ ධර්මයෝ තිදෙන පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනාහු අහිත පිණිස දුක් පිණිස අප්‍රාසුවිහරණය පිණිස උපදිත්.

7. ලොභය ද්වෙෂය හා මොහය ද ස්වසන්තානයෙහි උපන්නාහු ස්වකීය ඵලය තචසාර (හුණගසක්) මෙන් පව්සිත් ඇති පුරුෂයා නසත්. මෙසෙයිනු ද තත්‍රාසය නුයි උපද්‍රව නම් වෙත්.

වදාරන ලද මැයි මේ බුදුන් විසින්:

8. රාගය ද ද්වෙෂය ද කුශලධර්මයෙහි උත්කණ්ඨාව ද පස්කම්හි ඇලීම හා ලොමහර්ෂය ද මේ ආත්මභාවය නිදාන කොට ඇත්තාහුය. මේ අත්බැවින් උපන්නාහුය. ලාමක වූ මනොවිතර්කයෝ මේ අත්බැවින් ඉපද, කුඩා–දරුවන් දිග හුයකින් පය බැඳ හරන ලද කවුඩකු සෙයින් සිත (බැඳ හවයෙහි) හැර පියත්.

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

**මද්දනෙතං පරිස්සයාති** – තෙ පරිස්සයා තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති[1] පරියාදියන්ති මද්දන්තීති මද්දනෙතං පරිස්සයා.

**තතො නං දුක්ඛමන්වෙතීති** – තතොති[2] තතො පරිස්සයතො තං පුග්ගලං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ජාතිදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ජරාදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ව්‍යාධිදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. මරණදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. නෙරයිකං දුක්ඛං –පෙ– තිරච්ඡානයොනිකං දුක්ඛං –පෙ– පෙත්තිවිසයිකං[3] දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. මානුසිකං දුක්ඛං[4] –පෙ– ගබ්භොක්කන්තිමූලකං දුක්ඛං –පෙ– ගබ්භට්ඨිති[5] මූලකං දුක්ඛං –පෙ– ගබ්භවුට්ඨානමූලකං දුක්ඛං –පෙ– ජාතස්සූපනිබන්ධනං දුක්ඛං –පෙ– ජාතස්ස පරාධෙය්‍යකං[6] දුක්ඛං –පෙ– අත්තූපක්කමං දුක්ඛං –පෙ– පරූපක්කමං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. දුක්ඛදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. සඞ්ඛාරදුක්ඛං –පෙ– විපරිණාමදුක්ඛං –පෙ– චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො[7] ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා[8] විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සදුක්ඛං –පෙ– මාතුමරණං දුක්ඛං –පෙ– පිතුමරණං දුක්ඛං –පෙ– භාතුමරණං දුක්ඛං –පෙ– භගිනිමරණං දුක්ඛං –පෙ– පුත්තමරණං දුක්ඛං –පෙ– ධීතුමරණං දුක්ඛං –පෙ– ඤාතිව්‍යසනං දුක්ඛං –පෙ– භොගව්‍යසනං දුක්ඛං –පෙ– රොගව්‍යසනං දුක්ඛං –පෙ– සීලව්‍යසනං දුක්ඛං –පෙ– දිට්ඨිව්‍යසනං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොතීති තතො නං දුක්ඛමන්වෙති.

**නාවං භින්නමිවොදකන්ති** – යථා භින්නං නාවං උදකදූසිතො[9] තතො තතො උදකං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. පුරතොපි උදකං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. පච්ඡතොපි, හෙට්ඨතොපි, පස්සතොපි උදකං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. එවමෙව තතො තතො පරිස්සයතො තං පුග්ගලං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ජාතිදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. –පෙ– දිට්ඨිව්‍යසනං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොතීති නාවං භින්නමිවොදකං. තෙනාහ භගවා:

"අබලා නං බලීයන්ති මද්දනෙතං පරිස්සයා,
තතො නං දුක්ඛමන්වෙති නාවං භින්නමිවොදක" න්ති.

## 1 – 6.

"තස්මා ජන්තු සදා සතො කාමානි පරිවජ්ජයෙ,
තෙ පහාය තරෙ ඔඝං නාවං සිත්වාව පාරගූ."

1. අජ්ඣොත්තරන්ති - මු. I. 2. තතොති තතො - මු. I. මජසං.
3. පෙතවිසයිකං - ස්‍යා. 4. මානුසකදුක්ඛං - ස්‍යා. 5. ගබ්භට්ඨිති - සීමු. I.
6. පරාධෙය්‍යකං - සීමු. I. මජසං. 7. ඩාහො - මජසං. 8. නඛසා - මු. I.
9. උදකං අන්වායිකං - ස්‍යා; උදකංදූසතං - සීමු. 1; දකමෙසිං - මජසං.

මෙ පරිච්ඡේදයෙන් ද තත්‍රාසය නුයි – 'පරිස්සය (–උපද්‍රව)' නම් වෙත්.

**මද්දමානා නං පරිස්සයා** – ඒ උපද්‍රවයෝ ඒ පුහුල්හු සඝාතය කෙරෙති, පරිසඝාතය කෙරෙති, අභිඝාතය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් අල්වාගනිති, මිරිකත් නුයි 'මද්දන්තා නං පරිස්සයා' යනු වේ.

**තතො නං දුක්ඛමන්වෙති** – තතො යනු: ඒ උපද්‍රව හේතු කොට ගෙන ඒ පුද්ගලයා කරා දුක එයි, සමීපයට යයි, පැමිණියේ වෙයි. ජාතිදුක අනුව එයි, ළඟට යයි, පැමිණියේ වෙයි. ජරාදුක... ව්‍යාධි දුක .. මරණදුක... සොක – පරිදෙව – දුක්ඛ – දොමනස්ස – උපායාස දුක අනුව එයි, සමීපයට යයි, පැමිණියේ වෙයි. නිරය දුක... තිරිශ්චීනයොනියෙහි දුක... ප්‍රෙතවිෂයෙහි දුක... මිනිස්ලොවැ (වධබන්ධනාදි) දුක... ගර්භාවක්‍රාන්ති–මූලක දුක... ගර්භස්ථිතිමූලක දුක... ගර්භව්‍යුත්ථානමූලක දුක... උපන්නහු පිළිබඳ්ධ දුක... උපන්නහු පරා අයත්බැව්හි දුක... ආත්මොපක්‍රම දුක... පරොපක්‍රම දුක අනුව එයි... දුඃඛදුඃඛය... සංස්කාර දුඃඛය... විපරිණාම දුඃඛය... චක්ෂුරොග ශ්‍රොත්‍රරොග ඝ්‍රාණරොග ජිහ්වාරොග කායරොග ශීර්ෂරොග කර්ණරොග මුඛරොග දන්තරොග කාස ශ්වාස පීනස දාහ ජ්වර කුක්ෂිරොග මූර්ඡා ප්‍රස්කන්දිකා ශූල විසූචිකා කුෂ්ඨ ගණ්ඩ කිලාස ක්ෂය අපස්මාර දද්‍රු කණ්ඩූති කච්ඡු රඛසා විතච්ඡිකා රක්තපිත්ත මධුමෙහ අර්ශස් පිඩකා භගන්දර පිත්තජරොග ශ්ලෙෂ්මජරොග සාන්නිපාතිකාබාධ සෘතුපරිණාමජආබාධ විෂමපරිහාරජආබාධ ඖපක්‍රමිකආබාධ කර්මවිපාකජ ආබාධ, ශීතොෂ්ණ ජිඝත්සා පිපාසා උච්චාර ප්‍රස්‍රාව, මැසි – මදුරු – වා – අව් දිග් දෑ පහසින් වූ දුක... මාතෘමරණයෙන් වූ දුක... පිතෘමරණ දුක... භ්‍රාතෘ–මරණ දුක... භගිනීමරණ දුක... පුත්‍රමරණ දුක... ධීතෘමරණ දුක... ඥාතිව්‍යසනයෙන් වූ දුක... භොගව්‍යසන දුක... රොගව්‍යසන දුක... ශීලව්‍යසන දුක... දෘෂ්ටිව්‍යසන දුක අනුව එයි, සමීපයට යයි, පැමිණේ නුයි 'තතො නං දුක්ඛමන්වෙති' යනු වේ.

**නාවං භින්නමිවොදකං** – යම් සේ බිඳුණු නැවට ඒ ඒ සිදුරෙන් දිය පිවිසේ ද, පිටුපසින් ද යටින් ද දෙපසින් ද ජලය පිවිසේ ද, එසෙයින් ම ඒ ඒ උපද්‍රවයෙන් ඒ පුද්ගලයා කරා දුක පිවිසෙයි, අනුව යෙයි, පැමිණේ. ජාතිදුක පිවිසෙයි... දෘෂ්ටිව්‍යසනයෙන් වූ දුක පිවිසෙයි, අනුව යෙයි, පැමිණේ නුයි 'නාවං භින්නමිවොදකං' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

**"අබලානං බලීයන්ති**–පෙ– **නාවං භින්නමිවොදකං**"යි.

### 1 – 6.

එහෙයින් සත්ත්ව තෙමේ සියලු කල්හි සිහි ඇතිවැ කාමයන් දුරු කරන්නේ යැ. මෙසේ ඒ කාමයන් දුරුකොට බිඳුණු නැව දිය ඉස පරතෙර යන්නකු සෙයින් චතුරොඝය තරණය කරන්නේ යි.

**තස්මා ජන්තු සදා සතොති** – තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා එතං ආදීනවං සම්පස්සමානො කාමෙසූති තස්මා; **ජන්තූති** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[1] ජන්තු ඉන්දගු මනුජො; **සදාති** සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං සතතං සමිතං අබ්බොකිණ්ණං[2] පොඞ්ඛානුපොඞ්ඛං[3] උදකොමිකාජාතං අවීචි සන්තති සහිතං ඵුස්සිතං[4] පුරෙභත්තං පච්ඡාභත්තං පුරිමං යාමං මජ්ඣිමං යාමං පච්ඡිමං යාමං, කාළෙ ජුණ්හෙ වස්සෙ හෙමන්තෙ ගිම්හෙ පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙ; **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තොපි සතො. අපරෙහිපි චතූහි කාරණෙහි සතො -පෙ-* සො වුච්චති 'සතො' ති. තස්මා ජන්තු සදා සතො.

**කාමානි පරිවජ්ජයෙති** – කාමාති උද්දානතො ද්වෙ කාමා: වත්ථු කාමා ච කිලෙසකාමා ච. -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙස කාමා. **කාමානි පරිවජ්ජයෙති** ද්වීහි කාරණෙහි කාමෙ පරිවජ්ජෙය්‍ය: වික්ඛම්භණතො වා සමුච්ඡෙදතො වා. කථං වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙය්‍ය? අට්ඨිකඞ්කලූපමා කාමා අප්පස්සාදට්ඨෙනාති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙය්‍ය. මංසපෙසූපමා කාමා බහුසාධාරණ-ට්ඨෙනාති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙය්‍ය. තිණුක්කූපමා කාමා අනුදහනට්ඨෙනාති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙය්‍ය. -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තොපි වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙය්‍ය. එවං වික්ඛම්භණතො කාමෙ පිරිවජ්ජෙය්‍ය. -පෙ- එවං සමුච්ඡෙදතො කාමෙ පරිවජ්ජෙය්‍යාති කාමානි පරිවජ්ජයෙ.

**තෙ පහාය තරෙ ඔඝන්ති** – තෙති වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙස-කාමෙ **පහාය** පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා කාමච්ඡන්දනීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, ව්‍යාපාදනීවරණං -පෙ- ථිනමිද්ධනීවරණං -පෙ- උද්ධච්චකුක්කුච්චනීවරණං -පෙ- විචිකිච්ඡානීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා කාමොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරෙය්‍ය උත්තරෙය්‍ය පතරෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍යාති – තෙ පහාය තරෙ ඔඝං.

---

1. ජගු – සීමු. I, සී. I, ජතු – ස්‍යා.
2. අබ්බොච්ඡින්නං – සීමු. I. අබ්බොකිණ්ණං – ස්‍යා
3. පොඛානුපොඛං – සී. 1 ස්‍යා.
4. ඵුසිතං. සීමු. I.

* 14 වන පිටුව බැලිය යුතු.

**තස්මා ජන්තු සදා සතො** - එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් කාමයන්හි මෙල ආදීනව දක්නේ නුයි තස්මා; **ජන්තු** සත්ත්ව - නර-මානව- පුරුෂ-පුද්ගල - ජීව - ජාගු - ජන්තු- ඉන්දගු - මනුජ තෙමේ; **සදා** - සියලු දවස්හි, සියලු කල්හි, දවසක් පාසා, අව්‍යච්ඡින්න ව, නිරතුරු, අව්‍යාකීර්ණ ව, පිළිවෙළින් එක් ව, රළවැළක් මෙන් අවිරල ව, නො සිඳී, එක් ව, ස්පෘෂ්ට ව, පෙරබත, පසුබත, පෙරයමෙහි, මැදියමෙහි, පසුයමෙහි, අවපස, පුරපස, වසන්හි, හිමන්හි, ගිමන්හි, පෙරවියෙහි, මැදිවියෙහි, පසුවියෙහි; **සතො** යනු: සතරකරුණෙකින් සිහි ඇතියේ, කයෙහි කායානුපස්සනා සිවටන් වඩමින් සිහි ඇතියේ, වෙදනා- වන්හි... චිත්තයෙහි... ධර්මයන්හි ධම්මානුපස්සනා සිවටන් වඩමින් සිහි ඇතියේ; අන්‍ය වූ ද සතර කාරණයකින් සිහි ඇතියේ... *හෙතෙම ස්මෘතිමත් වූයේ සිහි ඇතියේ යයි කියනු ලැබේ නුයි 'තස්මා ජන්තු සදා සතො' යනු වේ.

**කාමානි පරිවජ්ජයෙ** - **කාමා** යනු: විස්තර හෙයින් වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ දැයි කාමයෝ දෙදෙනෙක් වෙති. (වස්තුකාමයෝ නම් මනාපිකරූපාදීහු)... මොහු වස්තුකාමයෝ යැයි කියනු ලැබෙත්. (ක්ලේශ- කාමයෝ නම් ඡන්දකාමාදීහු)... මොහු ක්ලේශකාමයෝ යැයි කියනු ලැබෙත්. **කාමානි පරිවජ්ජයෙ** - දෙ කරුණෙකින් කාමයන් දුරු කරන්නේ ය: විෂ්කම්භන හෙයින් හෝ සමුච්ඡෙද හෙයිනැ. කෙසෙයින් විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ ද යත්: අස්ථිකඞ්කාලයක් (ඇටසැකිල්ලක්) වැන්නැ කාමයෝ අල්පාස්වාද හෙයිනැයි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ යැ. මාංසපෙශියක් වැන්නැ කාමයෝ බහුසාධාරණ වන බැවිනැයි දක්නේ කාමයන් විෂ්කම්භන හෙයින් දුරු කරන්නේ යැ. තෘණොල්කාවක් (තණහුලක්) වැන්නැ කාමයෝ අනුදහන (දහනකිස සපයන) බැවිනැයි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ යැ... නෛවසංඥානාසංඥායතන සමාපත්ති වඩනුයේ ද විෂ්කම්භන විසින් කාමයන් දුරු කරන්නේ යැ. මෙපරිද්දෙන් විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ යි. (සෝවාන් මග වඩමින් අපායගමනීය කාමයන් සමුච්ඡෙද හෙයින් දුරු කරන්නේ යැ)... මෙසෙයින් සමුච්ඡෙද හෙයින් කාමයන් දුරු කරන්නේ නුයි 'කාමානි පරිවජ්ජයෙ' යනු වේ.

**තෙ පහාය තරෙ ඔඝං**- **තෙ** යනු: වස්තුකාමයන් පරිජානනය කොට ක්ලේශකාමයන් **පහාය** - (හැර) දුරු කොට විනොදනය කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා, කාමච්ඡන්දනීවරණය හැර දුරු කොට විනොදනය කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා, ව්‍යාපාද නීවරණය... ථිනමිද්ධනීවරණය... උද්ධච්චකුක්කුච්චනීවරණය... විචිකිච්ඡා- නීවරණය... අනභාවයට පමුණුවා, කාමෞඝය භවෞඝය දෘෂ්ට්‍යෞඝය අවිද්‍යෞඝය තරණය කරන්නේය, උත්තරණය, ප්‍රතරණය, සමතික්‍රමණය කරන්නේය ඉක්මවන්නේ නුයි 'තෙ පහාය තරෙ ඔඝං' යනු වේ.

---

* 15 වන පිටුව බැලිය යුතු.

**නාවං සිත්වාව පාරගූති** – යථා ගරුකං නාවං භාරිකං උදකං සිඤ්චිත්වා ඔසිඤ්චිත්වා ඡඩ්ඩෙත්වා ලහුකාය නාවාය ඛිප්පං ලහුං අප්පකසිරෙනෙව පාරං ගච්ඡෙය්‍ය, එවමෙවං වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, කාමච්ඡන්දනීවරණං-ව්‍යාපාදනීවරණං-ථීනමිද්ධනීවරණං-උද්ධච්චකුක්කුච්චනීවරණං-විචිකිච්ඡානීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා ඛිප්පං ලහුං පාරං අප්පකසිරෙනෙව ගච්ඡෙය්‍ය. පාරං වුච්චති අමතං නිබ්බානං. යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. ‘පාරං ගච්ඡෙය්‍යා’ති පාරං අධිගච්ඡෙය්‍ය පාරං ඵුසෙය්‍ය පාරං සච්ඡිකරෙය්‍ය. **පාරගූති** යො’පි පාරං ගන්තුකාමො සො’පි පාරගූ, යො’පි පාරං ගච්ඡති සො’පි පාරගූ, යො’පි පාරං ගතො සො’පි පාරගූ.

වුත්තං හෙතං භගවතා:

“තිණ්ණො පාරගතො[1] ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො”ති ඛො භික්ඛවෙ, අරහතො එතං අධිවචනං. සො අභිඤ්ඤාපාරගූ පරිඤ්ඤාපාරගූ පහාණපාරගූ භාවනාපාරගූ සච්ඡිකිරියාපාරගූ සමාපත්තිපාරගූ; අභිඤ්ඤාපාරගූ සබ්බධම්මානං, පරිඤ්ඤාපාරගූ සබ්බදුක්ඛානං, පහාණපාරගූ සබ්බකිලෙසානං, භාවනාපාරගූ චතුන්නං අරියමග්ගානං, සච්ඡිකිරියා[2]පාරගූ නිරොධස්ස, සමාපත්තිපාරගූ සබ්බසමාපත්තීනං. සො වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සීලස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සමාධිස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය පඤ්ඤාය, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය විමුත්තියා. සො පාරගතො පාරප්පත්තො අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙණගතො ලෙණප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො අච්චුතප්පත්තො අමතගතො අමතප්පත්තො නිබ්බාණගතො නිබ්බාණප්පත්තො. සො වුත්ථවාසො චිණ්ණචරණො ගතද්ධො[3] ගතදිසො ගතකොටිකො පාලිතබ්‍රහ්මචරියො උත්තමදිට්ඨිප්පත්තො භාවිතමග්ගො පහීණකිලෙසො පටිවිද්ධාකුප්පො සච්ඡිකතනිරොධො.

1. පාරංගතො – සීමු. I, මජ්ඣං. 2. සච්ඡිකිරියාය – මු. 1.
3. විගතද්ධො – මජ්ඣං.

**නාවං සිත්වාවපාරගූ** - යම්සේ බර වූ බඩු පුරවන ලද නැවක් දිය ඉස, ඉවත් කොට, හැරදමා, සැහැල්ලු වූ නැවින් ශීඝ්‍ර වැ වහා නිදුකින් මැ පරතෙරට යන්නේ ද, එසෙයින් වස්තුකාමයන් තීරණප්‍රඥාවෙන් දැන කෙලශකාමයන් (ප්‍රහාණ පරිඥාවෙන්) පරිත්‍යාග කොට හැරදමා විනොදනය කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා, කාමච්ඡන්දනීවරණය - ව්‍යාපාදනීවරණය - ථිනමිද්ධනීවරණය - උද්ධච්චකුක්කුච්චනීවරණය - විචිකිච්ඡානීවරණය පරිත්‍යාග කොට, හැරදමා, විනොදනය කොට, විගතාන්ත කොට, අනභාවයට පමුණුවා, ශීඝ්‍ර වැ වහා නිදුකින් මැ පරතෙරට යන්නේ යැ. අමෘත වූ නිර්වාණය 'පාර' යයි කියනු ලැබේ. යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් කෙලශවිරාගයෙක් දුඃඛනිරොධයෙක් වේ ද, ඒ නිර්වාණයයි. 'පාරං ගවෙෂය්‍ය' යනු: (ඒ නිර්වාණ සඞ්ඛ්‍යාත වූ) පාරය අධිගම කරන්නේ යැ, පාරය (දුභතො ව්‍යුත්ථාන මාර්ගඥනයෙන්) සපර්ශ කරන්නේ යැ, (ප්‍රත්‍යවෙක්ෂාඥනයෙන්) පාරය ප්‍රත්‍යක්ෂ කරන්නේ යි. **පාරාගූ** යනු: යමෙක් පාරයට යනු කැමැති වූයේ නම් හෙ ද 'පාරගූ' නමැ, යමෙක් පාරයට යේ නම් හෙ ද 'පාරගූ' නමැ, යමෙක් පාරයට ගියේ නම් හෙ ද 'පාරගූ' නමි.

මේ වදාළේ මැනු භාගවත්හු විසින්:

**"තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො"** යි මහණෙනි, තෙල රහත් හට අධිවචනයෙකි (නමෙකි.) හේ 'අභිඤ්ඤාපාරගූ' යැ, 'පරිඤ්ඤාපාරගූ' යැ, 'පහාණපාරගූ' යැ, 'භාවනාපාරගූ' යැ, 'සච්ඡිකිරියාපාරගූ' යැ, 'සමාපත්තිපාරගූ' ද වේ. සියලු (පඤ්චස්කන්ධාදි) ධර්මයන්ගේ අභිඥ (-ඥතපරිඥ) වෙන් නිර්වාණපාරයට ගියේ වෙයි, සියලු (ජාත්‍යාදි) දුඃඛයන්ගේ තීරණපරිඥවෙන් පාරයට ගියේ වෙයි, (කායදුශ්චරිතාදි) සියලු කෙලශයන්ගේ ප්‍රහාණපරිඥවෙන් පාරයට ගියේ වෙයි, (ස්‍රොතාපත්ත්‍යාදි) සතර ආර්‍ය්‍යමාර්ගයන්ගේ භාවනායෙන් පාරයට ගියේ වෙයි, ඵල - නිර්වාණවශයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිර්වාණයාගේ පාරයට ගියේ වෙයි, (අෂ්ටවිධ රූපාරූප) සියලු සමාපත්තීන්ගේ සමාපත්තියෙන් පාරයට ගියේ වේ. හෙතෙම ආර්‍ය්‍ය (-උත්තම හෝ නිර්දොෂ) ශීලයෙහි වශීභාවයට අවසානයට (-නිෂ්ඨාවට) පැමිණියේ, ආර්‍ය්‍යසමාධියෙහි වශීභාවයට අවසානයට පැමිණියේ, ආර්‍ය්‍යප්‍රඥයෙහි වශීභාවයට අවසානයට පැමිණියේ ආර්‍ය්‍යවිමුක්තියෙහි වශීභාවයට අවසානයට පැමිණියේ; හෙතෙම (මාර්ගයෙන්) පාරයට ගියේ, (ඵලයෙන්) පාරයට පැමිණියේ, (මාර්ගයෙන් සංස්කාරලොකයෙහි) අන්තයට ගියේ, (ඵලයෙන්) අන්තයට පැමිණියේ, (මාර්ගයෙන් සංස්කාරයන්ගේ) කොටි - කෙළවරට ගියේ, ඵලයෙන් කෙළවරට පැමිණියේ, (මාර්ගයෙන් ආයතනාදි ලොක) පර්‍ය්‍යන්තයට ගියේ පර්‍ය්‍යන්තයට පැමිණියේ, (මාර්ගයෙන් අවසානයට ගියේ, (ඵලයෙන්) අවසානයට පැමිණියේ, ත්‍රාණයට ගියේ ත්‍රාණප්‍රාප්ත වූයේ, ලෙනයට ගියේ ලෙනප්‍රාප්ත වූයේ, සරණ - ප්‍රතිෂ්ඨාවට ගියේ සරණප්‍රාප්ත වූයේ, අභයගත - අභයප්‍රාප්ත වූයේ, අච්‍යුතිගත - අච්‍යුතිප්‍රාප්ත වූයේ, අමෘතගත - අමෘතප්‍රාප්ත වූයේ, (මාර්ගයෙන්) නිර්වාණගත වූයේ (ඵලයෙන්) නිර්වාණප්‍රාප්ත වූයේ; හෙතෙම (දශවිධ ආර්‍ය්‍යවාසය) වැස නිමවූයේ, (ශීලය හා සමාධියෙහි) චීර්ණවශී වූයේ, සසර අදන්මග ඉක්මවූයේ, (පෙර නො ගිය විරූ) නිවන් දෙසට ගියේ, (අනුපාදිශෙෂ නිර්වාණකොටියට පැමිණ සිටියේ, රක්ෂිත බ්‍රහ්මචරියවාස ඇත්තේ, උත්තම සම්‍යග්දෘෂ්ටියට පැමිණියේ, භාවිතමාර්ග ඇත්තේ, ප්‍රහීණ කෙලශ ඇත්තේ, ප්‍රතිවෙධ කළ (අර්හත්ඵලසඞ්ඛ්‍යාත) අකොප්‍යය ඇත්තේ, සාක්ෂාත්කෘත නිරොධ ඇත්තේ වෙයි.

දුක්ඛං තස්ස පරිඤ්ඤාතං, සමුදයො පහීණො, මග්ගො භාවිතො, නිරොධො සච්ඡිකතො. අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං, පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං, පහාතබ්බං පහීණං, භාවෙතබ්බං භාවිතං, සච්ඡිකාතබ්බං සච්ඡිකතං. සො උක්ඛිත්තපලිඝො සඞ්කිණ්ණපරිඛො අබ්බූළ්හෙසිකො නිරග්ගළො අරියො පන්නද්ධජො පන්නභාරො විසඤ්ඤුත්තො. පඤ්චඞ්ගවිප්පහීණො ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරපස්සෙනො පනුණ්ණපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිලසඞ්කප්පො පස්සද්ධකායසංඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො කෙවලී වුසිතවා උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිප්පත්තො.

සො නෙව ආචිනාති න අපචිනාති අපචිනිත්වා[1] ඨිතො. නෙව පජහති න උපාදියති පජහිත්වා ඨිතො. නෙව සිනෙති[2] න උස්සිනෙති විසිනිත්වා ඨිතො. නෙව විධූපෙති න සන්ධූපෙති විධූපෙත්වා ඨිතො. අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන සමාධික්ඛන්ධෙන අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො. සච්චං සම්පටිපාදියිත්වා ඨිතො, එජං සමතික්කමිත්වා ඨිතො, කිලෙසග්ගිං පරියාදියිත්වා ඨිතො, අපරිගමනතාය ඨිතො. කථං[3] සමාදාය ඨිතො, මුත්තිපටිසෙවනතාය ඨිතො, මෙත්තාය පාරිසුද්ධියා ඨිතො, කරුණාය මුදිතාය උපෙක්ඛාය පාරිසුද්ධියා ඨිතො, අච්චන්තපාරිසුද්ධියා ඨිතො, අතම්මයතාය[4] පාරිසුද්ධියා ඨිතො, විමුත්තත්තා ඨිතො, සන්තුස්සිතත්තා ඨිතො, ඛන්ධපරියන්තෙ ඨිතො, ධාතුපරියන්තෙ ඨිතො, ආයතන පරියන්තෙ ඨිතො, ගතිපරියන්තෙ ඨිතො, උපපත්තිපරියන්තෙ ඨිතො, පටිසන්ධිපරියන්තෙ ඨිතො, සංසාරපරියන්තෙ ඨිතො, වට්ටපරියන්තෙ ඨිතො, අන්තිමෙ භවෙ ඨිතො, අන්තිමෙ සමුස්සයෙ ඨිතො, අන්තිමදෙහධරො අරහා.

1. තස්සායං පච්ඡිමකොටි[5] චරිමොයං සමුස්සයො,
ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති.

නාවං සිත්වාව පාරගූ.

තෙනාහ භගවා:

"තස්මා ජන්තු සදා සතො කාමානි පරිවජ්ජයෙ,
තෙ පහාය තරෙ ඔඝං නාවං සිත්වාව පාරගූ"ති.

**කාමසුත්තනිද්දෙසො පඨමො සමත්තො.**

---

1. සො නෙව චිනාති නාපචිනාති - මජසං. 2. නෙව සංසිබ්බති - මජසං.
3. කට්ඨං. ස්‍යා. කටං. - සීමු. I, මජසං.
4. අකම්මස්සකතාය. - සීමු I, අකම්මඤ්ඤතාය. - ස්‍යා. 5. පච්ඡිමකො - සීමු. II

ඔහු විසින් දුක පරිඥාත යෑ, සමුදය ප්‍රහීණ යෑ, මාර්ග භාවිත යෑ, නිරොධය සාක්ෂාත්කෘත යි. (ස්වලක්ෂණාවබොධයෙන්) අභිඥතව්‍යය - දතයුත්ත අභිඥාත යෑ, (සාමාන්‍ය ලක්ෂණාවබොධයෙන්) පරිඥාතව්‍යය-හාත්පසින් දතයුත්ත පරිඥාත යෑ, ප්‍රහාතව්‍යය ප්‍රහීණ යෑ, භාවිතව්‍යය භාවිත යෑ, සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත්කෘත යි.

හෙතෙම නගන ලද (උත්ක්ෂිප්ත) අවිද්‍යාපරිඝය ඇත්තේ යෑ, සංකීර්ණ (විසුරුවන ලද) කර්මාභිසංස්කාරපරිඛා ඇත්තේ යෑ, උදුරන ලද තෘෂ්ණා එෂිකා ඇත්තේ යෑ, (ඔරම්භාගිය සංයොජන සඞ්ඛ්‍යාත) අර්ගල රහිත යෑ, ආර්‍ය්‍ය (නිකෙලෙශ) යෑ, හෙලන ලද මානධ්වජ ඇත්තේ යෑ, තබන ලද ස්කන්ධාදි භාර ඇත්තේ යෑ, (චතුර්විධ යොගයෙන්) විසංයුක්ත යෑ, (කාමච්ඡන්දාදි) පඤ්චාඞ්ගවිප්‍රහීණ යෑ, ෂඩඞ්ගොපෙක්ෂාවෙන් සමන්විත යෑ, (ස්මෘතිසඞ්ඛ්‍යාත) එකාරක්ෂා ඇත්තේ යෑ, (ප්‍රතිසෙවනාදි) චතුර්විධ අපශ්‍රයන ඇත්තේ යෑ, බැහැර කළ ප්‍රත්‍යෙකසත්‍ය ඇත්තේ යෑ, මොනවට හරන ලද සියලු එෂණා (-සෙවීම්) ඇත්තේ යෑ, අනාවිලසංකල්ප ඇත්තේ ය, සන්හිඳුණු කායසංස්කාර ඇත්තේ යෑ, සුවිමුක්තචිත්ත යෑ, සිවිමුක්තප්‍රාඥ යෑ, පරිපූර්ණ යෑ, ඉසුරු බ්‍රහ්මචර්‍යය ඇත්තේ යෑ, උත්තමපුරුෂ යෑ, පරමපුරුෂ යෑ, පරමප්‍රාප්තියට පැමිණියේ සි.

හෙතෙම (කුශලාකුශලවිපාකය) රැස් නො කෙරෙයි. (ඵලයෙහි සිටි හෙයින් විපාක) විධ්වංශනය නො කෙරෙයි. කෙලෙසුන් නසා සිටියේ වෙයි. (අවිද්‍යමාන හෙයින් කෙලෙසුන්) නො මැ දුරු කෙරෙයි. (තෘෂ්ණා - මාන දෘෂ්ටි විසින්) උපාදානය නො කෙරෙයි. (කෙලෙසුන්) දුරු කොට සිටියේ වෙයි. (තෘෂ්ණාවශයෙන්) නො මැ සීවනය (-බැඳීම) කෙරෙයි. (මානවශයෙන්) උත්කර්ෂණය නො කෙරෙයි. තෘෂ්ණාබන්ධනය දුරු කොට සිටියේ වෙයි. (අවිද්‍යමාන හෙයින් කෙලෙස්ගිනි) නො මැ නිවයි. නො ද දල්වයි. විධූපනය කොට (-නිවා) සිටියේ වේ. අශෛක්ෂ වූ ශීලස්කන්ධයෙන් සමන්විත බැවින් සිටියේ, අශෛක්ෂ වූ සමාධිස්කන්ධයෙන්... අශෛක්ෂ වූ ප්‍රඥාස්කන්ධයෙන්... අශෛක්ෂ වූ විමුක්තිස්කන්ධයෙන්... අශෛක්ෂ වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්විත බැවින් සිටියේ, චතුස්සත්‍යය ප්‍රතිවෙධ කොට සිටියේ, තෘෂ්ණාව ඉක්මවා සිටියේ, කෙලෙස්ගිනි ගෙවා සිටියේ, නැවත සංසාරයෙහි ගමන් නැති බැවින් සිටියේ, නයග්‍රහණයෙන් ගෙන සිටියේ, විමුක්තිප්‍රතිසෙවනභාවයෙන් සිටියේ, මෛත්‍රීපාරිශුද්ධියෙන් සිටියේ, කරුණා - මුදිතා - උපෙක්ෂාපාරිශුද්ධියෙන් සිටියේ, අත්‍යන්තපාරිශුද්ධියෙන් සිටියේ, අතම්මයතා (-තෘෂ්ණා - දෘෂ්ටි මානාභාව) පාරිශුද්ධියෙන් සිටියේ, සර්වකෙලශවිමුක්තභාවයෙන් සිටියේ, (යථාලාභාදි) සන්තුෂ්ටභාවයෙහි සිටියේ, ස්කන්ධපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ධාතුපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ආයතනපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ගතිපර්‍ය්‍යන්තයෙහි සිටියේ, උත්පත්තිපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ප්‍රතිසන්ධිපර්‍ය්‍යන්තයෙහි සිටියේ, සංසාරපර්‍ය්‍යන්තයෙහි සිටියේ, වෘත්තපර්‍ය්‍යන්තයෙහි සිටියේ, අන්තිමභවයෙහි සිටියේ, අන්තිම ශරීරයෙහි සිටියේ, අන්තිමදෙහධර වූයේ, ආරකාදිභාවයෙන් අර්හත් වූයේ වේ.

1. ඒ රහත්හුගේ මේ පශ්චිම කොටිය (කෙළවර) වෙයි. මේ අන්තිම ශරීරය වෙයි. ජාතිමරණසංසාරය, පුනර්භවය ඔහුට නැත්තේ යි. 'නාවං සිත්වාව පාරගූ' යනු මේ.

එයින් වදාළහ බුදුහු:

"තස්මා ජන්තු සදා සතො -පෙ- නාවං සිත්වාව පාරගූ" යනු.

**පළමුවැනි කාමසූත්‍ර නිද්දේශය සමාප්ත යි.**

# 2

# ගුහට්ඨකසුත්තනිද්දෙසො

අථ ගුහට්ඨකසුත්තනිද්දෙසො වුච්චති.

## 2 - 1.

"සත්තො ගුහායං බහුනාභිඡන්නො
තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො,
දූරෙ විවෙකා හි තථාවිධො සො
කාමා හි ලොකෙ න හි සුප්පහායා[1].

**සත්තො ගුහායං බහුනාභිඡන්නොති** – 'සත්තො' ති හි ඛො වුත්තං. අපි ච ගුහා තාව වත්තබ්බා: ගුහා වුච්චති කායො. කායොති වා ගුහාති වා සන්දෙහොති වා නාවාති වා රථොති වා ධජොති වා වම්මිකොති වා නගරන්ති වා නීඩන්ති[2] වා කුටීති වා ගණ්ඩොති වා කුම්භොති වා[3] කායස්සෙතං අධිවචනං.

"සත්තො ගුහාය"න්ති ගුහායං සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පළිබුද්ධො, යථා භිත්තිඛීලෙ වා නාගදන්තෙ වා භණ්ඩං සත්තං විසත්තං ආසත්තං ලග්ගං ලග්ගිතං පළිබුද්ධං, එවමෙවං ගුහායං සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පළිබුද්ධො.

වුත්තං හෙතං භගවතා:

"රූපෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයූපාදානා[4] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තත්‍ර සත්තො තත්‍ර විසත්තො, තස්මා සත්තොති වුච්චති. [වෙදනාය ඛො රාධ – පෙ– සඤ්ඤාය ඛො රාධ –පෙ– සංඛාරෙසු ඛො රාධ –පෙ– විඤ්ඤාණෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයූපාදානා[4] චෙතසො අධිට්ඨානාභි-නිවෙසානුසයා, තත්‍ර සත්තො තත්‍ර විසත්තො, තස්මා සත්තොති වුච්චති] සත්තොති ලග්ගනාධිවචනන්ති."

---

1. සුප්පහායා-ස, සුප්පජහා - සීමු. I, සී. I
2. නිද්දන්ති - සහ. මජසං. නීලං ස. නිඩ්ඩන්ති- මු. I, PTS.
3. කුම්භොතිවා - සී මු. I 4. උපායුපාදානා, සී මු. II.

[ ] ලක්ඛණන්තරිතො භාගො සාමපොත්ථකෙ න දිස්සති.

# 2

# ගුහට්ඨකසුත්‍රනිද්දේශය

ඉක්බිති ගුහට්ඨක සූත්‍රනිද්දේශය කියනු ලැබේ.

**2 – 1.**

යම් මිනිසෙක් ගුහා සඞ්ඛ්‍යාත ශරීරයෙහි ඇලුණේ බොහෝ රාගාදි කෙලෙසුන් විසින් වැසුණේ රාගාදි වශයෙන් සිටුනේ මොහන සඞ්ඛ්‍යාත පස්කම් ගුණයෙහි දැඩි වැ බැසගත්තේ වේ ද, එබඳු වූ ඒ සත්ත්ව තෙම ත්‍රිවිධ විවේකයෙන් දුර මැ වෙයි, යම් හෙයකින් සත්ලොව්හි කාමයෝ සුවසෙන් නො හළ හැක්කාහු ද එහෙයිනි.

**සත්තො ගුහායං බහුනාභිච්ඡන්නො** – 'සත්තො' යනු කියනලද මැය. එතෙකුදු වත් පළමු කොට 'ගුහා' කියැ යුතු යැ. "ගුහා"යි කය කියනු ලැබේ. 'කාය' යැ හෝ, (රාගාදි ව්‍යාලයන් වෙසෙන හෙයින්) 'ගුහා' යැ හෝ, (රාගාදීන් විසින් දවන හෙයින්) 'දෙහ' යැ හෝ, (ප්‍රමත්ත කරන හෙයින්) 'සන්දෙහ' යැ හෝ, (සසර සැරිසරන හෙයින්) 'නාවා' යැ හෝ, (ඊර්‍ය්‍යාපථ ඇති බව හෙයින්) 'රථ' යැ හෝ, (ඉතා උස් වැ නැගි හෙයින්) 'ධජ' යැ හෝ, (කෘමිකුලයනට ආවාස බැවින්) 'වම්මික' යැ හෝ (මනාපං-මනාපයන් සංසරන් හෙයින්) 'නගර' යැ හෝ, (රොගාදීන්ට නීඩ-කැදැලි වන බැවින්) 'නීඩ' යැ හෝ, (ප්‍රතිසන්ධියට නිවාසගෘහ වන හෙයින්) 'කුටි' යැ හෝ, (පූතිභාවයෙන්) 'ගණ්ඩ' යැ හෝ, (බිඳෙන හෙයින්) 'කුම්භ' යැ හෝ, කයට මේ අභිවචන යි.

**සත්තො ගුහායං** – කායගුහායෙහි ශක්ත යැ විශක්ත යැ ආශක්ත යැ ලග්න යැ ලගිත යැ පරිබුද්ධ (–නො හැර සිටියේ) යැ. යම් සේ භිත්ති-ඛිලයෙකැ හෝ නාගදන්තයෙකැ හෝ භාණ්ඩයෙක් ශක්ත විශක්ත ආශක්ත ලග්න ලගිත පරිබුද්ධ වේ ද, එසෙයින් කායගුහායෙහි ශක්ත යැ විශක්ත යැ ආශක්ත යැ ලග්න යැ ලගිත යැ පරිබුද්ධ යි.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

"රාධ, රූපයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණායෙක් යම් තෘෂ්ණා-දෘෂ්ටි උපයයන් දැඩි කොට ගත්තා අකුශල-චිත්තයට අධිෂ්ඨානාභිනිවේශ වූ අනුශය කෙනෙක් වෙද්ද, එහි ශක්ත වූයේ (ඇලුණේ) එහි වෙසෙසින් ඇලුණේ වේ ද, එහෙයින් 'සත්ත්ව' යැ යි කියනු ලැබේ. වෙදනායෙහි... සංඥයෙහි... සංස්කාරයන්හි... විඥනයෙහි රාධ යැ, යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම තෘෂ්ණායෙක් යම් තෘෂ්ණාදෘෂ්ටි සඞ්ඛ්‍යාත උපයයන් දැඩි කොට ගත්තා අකුශලචිත්තයට අධිෂ්ඨාන–අභිනිවේශ වූ අනුශය කෙනෙක් වෙද්ද, එහි (යම්හෙයකින්) ඇලුණේ වෙසෙසින් ඇලුණේ වේ ද, එහෙයින් 'සත්ත්ව' යැ යි කියනු ලැබෙයි. 'සත්ත' යනු වෙසෙසින් ඇලීම ප්‍රකාශ කිරීම යැ" යි.

**සත්තො ගුහායං බහුනාභිච්ඡන්නොති** – බහුකෙහි කිලෙසෙහි ඡන්නො: රාගෙන ඡන්නො දොසෙන ඡන්නො මොහෙන ඡන්නො කොධෙන ඡන්නො උපනාහෙන ඡන්නො මක්ඛෙන ඡන්නො පළාසෙන ඡන්නො ඉස්සාය ඡන්නො මච්ඡරියෙන ඡන්නො මායාය ඡන්නො සාඨෙය්‍යෙන ඡන්නො ථම්භෙන ඡන්නො සාරම්භෙන ඡන්නො මානෙන ඡන්නො අතිමානෙන ඡන්නො මදෙන ඡන්නො පමාදෙන ඡන්නො, සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බපරිළාහෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසංඛාරෙහි ඡන්නො[1] උච්ඡන්නො ආවුතො නිවුතො ඔවුතො[2] පිහිතො පටිච්ඡන්නො පටිකුජ්ජිතොති 'සත්තො ගුහායං බහුනාභිච්ඡන්නො.

**තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හොති** – 'තිට්ඨං නරො' ති තිට්ඨන්තො නරො රත්තො රාගවසෙන තිට්ඨති. දුට්ඨො දොසවසෙන තිට්ඨති. මූළ්හො මොහවසෙන තිට්ඨති විනිබන්ධො[3] මානවසෙන තිට්ඨති. පරාමට්ඨො දිට්ඨිවසෙන තිට්ඨති. වික්ඛෙපගතො උද්ධච්චවසෙන තිට්ඨති. අනිට්ඨංගතො විචිකිච්ඡාවසෙන තිට්ඨති. ථාමගතො අනුසයවසෙන තිට්ඨති. එවම්පි තිට්ඨං නරො.

වුත්තං හෙතං භගවතා:

"සන්ති භික්ඛවෙ, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. සන්ති භික්ඛවෙ, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨතී"[a] ති. එවම්පි තිට්ඨං නරො.

වුත්තං හෙතං භගවතා:

"රූපූපයං[4] වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති රූපාරම්මණං රූපපතිට්ඨං[5]. නන්දූපසෙචනං[6] වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති. වෙදනූපයං[7] වා භික්ඛවෙ -පෙ- සඤ්ඤූපයං වා භික්ඛවෙ -පෙ- සඞ්ඛාරූපයං වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති සංඛාරාරම්මණං සඞ්ඛාරපතිට්ඨං. නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජතී"[b] ති. එවම්පි තිට්ඨං නරො.

---

1. විච්ඡන්නො – ස්‍යා. මජසං. 2. ඔවුටො – ස්‍යා. ස. 3. විනිබද්ධො – ස්‍යා. ස.
4. රූපුපායං – සීමු. II. ස්‍යා. PTS. 5. රූපෙ පතිට්ඨං – සීමු. I.
6. නන්දුපසෙචනං – ස්‍යා සී I ස. PTS. 7. වෙදනූපායං – සීමු. II. ස්‍යා.
a. සංයුත්ත – ලොකකාමගුණවග්ග – මාරපාසසුත්තං.
b. ,, ඛන්ධසංයුත්ත – උපයවග්ග – උපයසුත්තං.

**සත්තො ගුහායං බහුනාභිච්ඡන්නො** - ගොහෝ කෙලෙසුන් විසින් ඡන්න (වැසුණේ) යැ: රාගයෙන් ඡන්න යැ, ද්වේෂයෙන් මෝහයෙන් ... ක්‍රොධයෙන් ... උපනාහයෙන් ... ම්‍රක්ෂයෙන් ... ප්‍රදාසයෙන් ... ඊර්ෂ්‍යායෙන් මාත්සර්‍ය්‍යයෙන් මායායෙන් .. ශාඨ්‍යයෙන් ... ස්තම්භයෙන් ... සංරම්භයෙන් මානයෙන් .. අතිමානයෙන් ... මදයෙන් ... ප්‍රමාදයෙන් ඡන්න යැ, සියලු කෙලෙසුන් විසින් සියලු දුශ්චරිතයන් විසින් සියලු දරථයන් විසින් සියලු පරිදාහයන් විසින් සියලු සන්තාපයන් විසින් සියලු අකුශලාභිසංස්කාරයන් විසින් ඡන්න යැ, (පුනපුනා උපදනෙන්) උපයශ්‍රීපරි ඡන්න යැ, ආවෘත (වළකන ලද) යැ, නිවෘත යැ, අපවෘත (යටකොට වසනලද) යැ, පිහිත යැ, ප්‍රතිච්ඡන්න යැ, යටිහුරු කොට තබන ලද හුයි 'සත්තො ගුහායං බහුනාභිච්ඡන්නො' යනු වේ.

**තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො** - 'තිට්ඨං නරො' යනු: නර (සත්ත්ව) තෙම සිටුනේ රාගවශයෙන් රත් වූයේ සිටී ද්වේෂවශයෙන් දුෂ්ට වූයේ සිටී. මොහවශයෙන් මූඪ වූයේ සිටී. මානවශයෙන් නානාලම්බනයෙහි බැඳී සිටී. දෘෂ්ටිවශයෙන් පරාමෘෂ්ට වැ සිටී. ඖද්ධත්‍යවශයෙන් වික්ෂෙපයට පැමිණැ සිටී. විචිකිත්සාවශයෙන් නිෂ්ඨාවට නො පැමිණැ සිටී. අනුශයවශයෙන් ස්ථිර බවට පැමිණියේ සිටී. මෙසේසිටුනු ද 'තිට්ඨං නරො' යනු වේ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

"මහණෙනි, චක්ෂුර්විඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාවඩන්නා වූ ප්‍රියස්වරූප වූ කාමයෙන් යුක්ත වූ ඇලුම් කටයුතු වූ රූපාලම්බනයෝ ඇත්තාහ. මහණතෙම ඒ අරමුණට තෘෂ්ණාවශයෙන් සතුටු වේ නම්, පසසා නම්, බැසගෙන සිටී නම්; මහණෙනි, ශ්‍රොත්‍රවිඥානයෙන් දතයුතු වූ ... ශබ්දයෝ ඇත ඝ්‍රාණවිඥානයෙන් දතයුතු වූ .. ගන්ධයෝ ඇත ... ජිහ්වාවිඥානයෙන් දතයුතු වූ .. රසයෝ ඇත ... කායවිඥානයෙන් දතයුතු වූ ... ස්ප්‍රෂ්ටව්‍යයෝ ඇත්තාහ ... මනොවිඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමූපසංහිත වූ රජනීය වූ ධර්මාලම්බනයෝ ඇත්තාහ මහණතෙම ඒ අරමුණට (තෘෂ්ණාවශයෙන්) සතුටු වේ නම්, පසසා නම්, බැසගෙන සිටී නම්" මෙසේත් 'තිට්ඨං නරො' යනු වේ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

"මහණෙනි, (තෘෂ්ණා-දෘෂ්ටි උපය විසින්) රූපයට පැමිණි හෝ විඥානය සිටුනේ රූපය අරමුණු කොට ඇතියේ රූපය ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටී. (සප්‍රීතික) තෘෂ්ණාජලයෙන් තෙමන ලදුයේ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි. මහණෙනි, (තෘෂ්ණාදෘෂ්ටිවශයෙන්) වෙදනාවට පැමිණි හෝ මහණෙනි, සංඥාවට පැමිණි හෝ... මහණෙනි, සංස්කාරයන්ට පැමිණි හෝ විඥානය සිටුනේ සංස්කාරයන් අරමුණු කොට ඇතියේ සංස්කාරයන් ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටී. තෘෂ්ණොදකයෙන් තෙමෙන ලදුයේ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි" යයි මෙසේත් 'තිට්ඨං නරො' යනු වේ.

වුත්තං හෙතං භගවතා:

“කබළීකාරෙ චෙ භික්ඛවෙ, ආහාරෙ අත්ථි රාගො, අත්ථි නන්දි, අත්ථි තණ්හා. පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං. යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්සාවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්සාවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි.[1] යත්ථ අත්ථි සඞ්ඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාති ජරා මරණං. යත්ථ අත්ථි ආයතිං ජාති ජරා මරණං, සසොකං තං භික්ඛවෙ, සදරං[2] සඋපායාසන්ති වදාමී”[a]ති. එවම්පි තිට්ඨං නරො.

“ඵස්සෙ චෙ භික්ඛවෙ, ආහාරෙ -පෙ- මනොසඤ්චෙතනාය චෙ භික්ඛවෙ, ආහාරෙ -පෙ- විඤ්ඤාණෙ චෙ භික්ඛවෙ, ආහාරෙ අත්ථි රාගො, අත්ථි නන්දි, අත්ථි තණ්හා. පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං. යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්සාවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්සාවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි. යත්ථ අත්ථි සඞ්ඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාති ජරා මරණං. යත්ථ අත්ථි ආයතිං ජාති ජරා මරණං, සසොකං තං භික්ඛවෙ, සදරං[2] සඋපායාසන්ති වදාමී”[a]ති. එවම්පි තිට්ඨං නරො.

මොහනස්මිං පගාළ්හොති - මොහනා වුච්චන්ති පඤ්ච කාමගුණා: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. කිං කාරණා මොහනා වුච්චන්ති පඤ්ච කාමගුණා? යෙභුය්‍යෙන දෙවමනුස්සා[3] පඤ්චසු කාමගුණෙසු මුය්හන්ති පමුය්හන්ති සම්පමුය්හන්ති මූළ්හා පමූළ්හා සම්පමූළ්හා අවිජ්ජාය අන්ධීකතා ආවුතා නිවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතා.[4] තඞ්කාරණා මොහනා වුච්චන්ති පඤ්ච කාමගුණා. මොහනස්මිං පගාළ්හොති - මොහනස්මිං පගාළ්හා අජ්ඣොගාළ්හා නිමුග්ගාති ‘තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො.’

1. වුද්ධිං - මජ්ඣං. සීමු. I. 2. සරජං - සීමු. II. සහ. PTS.
3. දෙවා මනුස්සා - සීමු. I. 4. තං පටිකුජ්ජිතා - සීමු. I.
a. නිදානසංයුත්ත - මහාවග්ග - අත්ථිරාගසුත්තං.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

"මහණෙනි, ඉදින් කවලීකාරාහාරයෙහි රාගය ඇත්නම්, නන්දිය ඇත්නම්, තෘෂ්ණාව ඇත්නම්, එහි (කර්මය දුවවා පිළිසඳ ගැනීමට පොහොසත් බැවින්) විඥානය පිහිටියේ වැඩුණේ වෙයි. යම් තැනෙක්හි විඥානය පිහිටියේ වැඩුණේ නම්, එහි නාමරූපයාගේ අවක්‍රාන්තිය ඇත. යම් තැනෙක්හි නාමරූපාවක්‍රාන්තිය ඇත්නම්, එහි සංස්කාරයන්ගේ වෘද්ධිය ඇත. යම් තැනෙක්හි සංස්කාරයන්ගේ වෘද්ධිය ඇත්නම්, එහි මත්තෙහි පුනර්භවාභිනිර්වෘත්තිය ඇත. යම් තැනෙක්හි මතු පුනර්භවයාගේ පහලවීම ඇත්නම්, එහි මත්තෙහි ජාති-ජරා-මරණ ඇත. යම් තැනෙක්හි මත්තෙහි ජාති-ජරා-මරණ ඇත්නම්, මහණෙනි, එය ශෝක සහිත යැ, පීඩා සහිත යැ, දුඃඛ ආයාස සහිත යයි කියමි" මෙසේත් 'තිට්ඨං නරෝ' යනු වේ.

"මහණෙනි, ස්පර්ශාහාරයෙහි... මහණෙනි, මනඃසඤ්චේතනාහාරයෙහි... මහණෙනි, විඥානාහාරයෙහි ඉදින් රාගය ඇත්නම්, නන්දිය ඇත්නම්, තෘෂ්ණාව ඇත්නම්, එහි ප්‍රතිසන්ධිවිඥානය පිහිටියේ වැඩුණේ වෙයි. යම් තැනෙක්හි විඥානය පිහිටියේ වැඩුණේ වේ නම්, එහි නාමරූපාවක්‍රාන්තිය ඇත. යම් තැනෙක්හි නාමරූපාවක්‍රාන්තිය ඇත් නම්, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත. යම් තැනෙක්හි සංස්කාරවෘද්ධිය ඇත්නම්, එහි පුනර්භවයාගේ පහලවීම ඇත. යම් තැනෙක්හි පුනර්භවයාගේ පහලවීම ඇත් නම්, එහි මත්තෙහි ජාති-ජරා-මරණ ඇත. යම් තැනෙක්හි ආයති ජාති-ජරා-මරණ ඇත්නම්, මහණෙනි, එය සශෝක යැ සදර යැ සඋපායාස යැයි කියමි" මෙසේත් 'තිට්ඨං නරෝ' යනු වේ.

**මෝහනස්මිං පගාළ්හෝ** – 'මෝහන' යැ යි පඤ්චකාමගුණයෝ කියනු ලැබෙත්: චක්ෂුර්විඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමෝපසංහිත වූ රජනීය වූ රූපයෝ යැ, ශ්‍රෝත්‍රවිඥෙය වූ . . . ශබ්දයෝ යැ, ඝ්‍රාණවිඥෙය වූ . . . ගන්ධයෝ යැ, ජිහ්වාවිඥෙය වූ . . . රසයෝ යැ, කායවිඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියරූප වූ කාමෝපසංහිත වූ රජනීය වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. කුමක් හෙයින් පඤ්චකාමගුණයෝ 'මෝහන' යි කියනු ලැබෙති යත්: යම් හෙයකින් බෙහෙවින් දෙවිමිනිස්හු පස්කම්ගුණයෙහි මුළාවෙත් ද, වෙසෙසින් මුළාවෙත් ද, සම්මෝහාකාරයෙන් මුළාවෙත් ද, මූඪ වූවාහු වෙසෙසින් මූඪ වූවාහු සම්මෝහාකාරයෙන් මූඪ වූවාහු අවිද්‍යායෙන් අන්ධ කරන ලද්දාහු ආවෘත – නිවෘත – අපවෘත පිහිත – ප්‍රතිච්ඡන්න – ප්‍රතිකුබ්ජිත වූවාහු වෙත් ද, එකරුණෙන් පස්කම් ගුණ 'මෝහන' යැ යි කියනු ලැබෙත්. **මෝහනස්මිං පගාළ්හෝ**– මෝහනයෙහි පිවිසියේ ඇතුළු වූයේ ඇතුලත බැසගත්තේ ගැලුණේ නුයි 'තිට්ඨං නරෝ මෝහනස්මිං පගාළ්හෝ' යනු වේ.

**දූරෙ විවෙකා හි තථාවිධො සොති** – විවෙකාති තයො විවෙකා: කායවිවෙකො, චිත්තවිවෙකො, උපධිවිවෙකො.

කතමො කායවිවෙකො? ඉධ භික්ඛු විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. කායෙන ච විවිත්තො විහරති: සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති එකො සෙය්‍යං කප්පෙ[1]ති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති. එකො විහරති ඉරීයති වත්තති පාලෙති යපෙති යාපෙති. අයං කායවිවෙකො.

කතමො චිත්තවිවෙකො? පඨමජ්ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං විවිත්තං හොති. දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං විවිත්තං හොති. තතියජ්ඣානං සමාපන්නස්ස පීතියා චිත්තං විවිත්තං හොති. චතුත්ථජ්ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං විවිත්තං හොති. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. සකදාගාමිස්ස ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අනාගාමිස්ස අනුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අනුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය[2] මානානුසයා අවිජ්ජානුසයා තදෙකට්ඨෙහි ච[3] කිලෙසෙහි බහිද්ධා ච[4] සබ්බනිමිත්තෙහි චිත්තං විවිත්තං හොති. අයං චිත්තවිවෙකො.

කතමො උපධිවිවෙකො? උපධී වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසංඛාරා ච. උපධිවිවෙකොති වුච්චති අමතං නිබ්බානං: යො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං උපධිවිවෙකො. කායවිවෙකො ච වූපකට්ඨකායානං නෙක්ඛම්මාභිරතානං, චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං, උපධිවිවෙකො ච නිරුපධීනං පුග්ගලානං විසංඛාරගතානං.

---

1. කප්පති - සිමු. I. 2. අවිජ්ජා - සිමු. I., සී I. 3. චං - සිමු. I.

**දූරෙ විවෙකා හි තථාවිධො සො** – 'විවේක' යනු විවේක තුනෙකි: කායවිවේක යැ, චිත්තවිවේක යැ, උපධිවිවේක යි.

කායවිවේකය කවරැ යත්: මෙ සසුන්හි මහණ අරණ්‍ය වෘක්ෂමූල පර්වත කන්දර ගිරිගුහා ශමශාන වනප්‍රස්ථ අභ්‍යවකාශ පලාලපුඤ්ජ යන ජනශූන්‍ය වූ සෙනසුනක් ඇසුරු කෙරේ. කයිනු ද විවිකත වැ හිඳී. එකලා වැ හොවී. එකලාවැ ගමට පිඬු සිඟා යෙයි. එකලාවැ පෙරළා එයි. එකලාවැ රහසැ හිඳී. එකලාවැ සක්මන්හි සිටී. එකලාවැ හැසිරෙයි. එකලා වැ වෙසෙයි ඉරියවු පවත්වයි ඉරියවු උපදවයි පාලනය කෙරෙයි යැපෙයි යපනය කරවා. මේ යැ කායවිවේක නම්.

චිත්තවිවේකය කවරැ යත්: පළමුවන ධ්‍යානයට සමවත්හුගේ සිත නීවරණයන්ගෙන් වෙන් වෙයි. දෙවැනි ධ්‍යානයට සමවත්හුගේ සිත විතර්ක – විචාරයන් ගෙන් වෙන් වෙයි. තුන්වැනි ධ්‍යානයට සමවත්හුගේ සිත ප්‍රීතියෙන් වෙන් වෙයි. සතරවැනි ධ්‍යානයට සමවත්හුගේ සිත සුවදුක් දෙකින් වෙන් වෙයි. අකාසානඤ්චායතනයට සමවත්හුගේ සිත රූපසංඥා – ප්‍රතිඝසංඥා – නානාත්වසංඥාවෙන් වෙන් වෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවත්හුගේ සිත ආකාසානඤ්චායතනසංඥාවෙන් වෙන් වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවත්හුගේ සිත විඤ්ඤාණඤ්චායතනසංඥාවෙන් වෙන් වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්හුගේ සිත ආකිඤ්චඤ්ඤායතනසංඥාවෙන් වෙන් වෙයි. සෝවත්හුගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සායෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයෙන් විචිකිත්සානුශයෙන් හා ඔවුන් සමග එක්වැ සිටි කෙලෙසුන්ගෙන් ද වෙන් වෙයි. සැදෑගැමිහුගේ සිත ඖදාරික කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් ඖදාරික කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා ඔවුන් සමග එක්වැ සිටි කෙලෙසුන් ගෙන් ද වෙන් වෙයි. අනාගැමිහුගේ සිත අණුසහගත (-සියුම් වූ) කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් අණුසහගත කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා තදෙකස්ථිත කෙලශයන්ගෙන් ද වෙන් වෙයි රහත්හුගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයයෙන් භවරාගානුශයයෙන් අවිද්‍යානුශයයෙන් තදෙකස්ථිතකෙලශයන්ගෙන් හා බාහ්‍ය වූ සර්වසංස්කාරනිමිත්තයන්ගෙන් ද වෙන් වූයේ වේ. මේ යැ චිත්තවිවේක නම්.

උපධිවිවේකය කවරැ යත්: කෙලශයෝත් ස්කන්ධයෝත් අභිසංස්කාරයෝත් උපධියි කියනු ලැබෙත්. යම් සර්වසංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සර්වෝපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරෝධයෙක් නිර්වාණයෙක් වේද, ඒ අමෘත නිර්වාණය 'උපධිවිවේක'යි කියනු ලැබේ. මේ යැ උපධිවිවේක නම්. ගණසඞ්ගණිකායෙන් වෙන් වූ කය ඇති ප්‍රථමධ්‍යානාදි නෛෂ්ක්‍රම්‍යයෙහි අභිරත වූවන්ට කායවිවේකය ද, පරිශුද්ධ වූ සිත් ඇති උත්තම වොදාන(පරිශුද්ධි) යට පැමිණියවුන්ට චිත්තවිවේකය ද, උපධිරහිත වූ විසංඛාරගත (=නිවනට පැමිණි) පුද්ගලයන්ට උපධිවිවේකය ද වේ.

දූරෙ විවෙකා හීති – යො සො එවං ගුහායං සත්තො එවං බහුකෙහි ච කිලෙසෙහි ඡන්නො එවං මොහනස්මිං පගාළ්හො, සො කායවිවෙකාපි දූරෙ චිත්තවිවෙකාපි දූරෙ උපධිවිවෙකාපි දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා අනාසන්නෙ වවකට්ඨෙ[1]. තථාවිධොති– තාදිසො තස්සණ්ඨිතො තප්පකාරො තප්පටිභාගො; යො සො මොහනස්මිං පගාළ්හොති 'දූරෙ විවෙකා හි තථාවිධො සො'.

කාමා හි ලොකෙ න හි සුප්පහායාති – කාමාති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙස කාමා ච. කතමෙ වත්ථුකාමා ? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථු හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරං ච යං කිඤ්චි රජනීයං වත්ථු වත්ථුකාමා.

අපි ච අතීතා කාමා අනාගතා කාමා පච්චුප්පන්නා කාමා අජ්ඣත්තා කාමා බහිද්ධා කාමා අජ්ඣත්තබහිද්ධා කාමා හීනා කාමා මජ්ඣිමා කාමා පණීතා කාමා ආපායිකා කාමා මානුසිකා කාමා දිබ්බා කාමා පච්චුපට්ඨිතා කාමා නිම්මිතා කාමා පරනිම්මිතා කාමා අනිම්මිතා කාමා පරිග්ගහිතා කාමා අපරිග්ගහිතා කාමා මමායිතා කාමා අමමායිතා කාමා, සබ්බෙපි කාමාවචරා ධම්මා සබ්බෙපි රූපාවචරා ධම්මා සබ්බෙපි අරූපාවචරා ධම්මා තණ්හාවත්ථුකා තණ්හාරම්මණා කාමනීයට්ඨෙන රජනීයට්ඨෙන මදනීයට්ඨෙන කාමා. ඉමෙ වුච්චන්ති වත්ථු කාමා.

කතමෙ කිලෙස කාමා ? ඡන්දො කාමො රාගො කාමො ඡන්දරාගො කාමො, සඞ්කප්පො කාමො රාගො කාමො සඞ්කප්පරාගො කාමො, යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්දනීවරණං–

1. විවෙකට්ඨෙ - සීමු. I. මජ්ඣං. උපකට්ඨෙ - සතං.

**දූරෙ විවෙකා හි** – මෙසෙයින් කායගුහායෙහි ඇලුණු මෙසේ බොහෝ කෙලෙසුන් විසින් වැසුණු මෙසේ පඤ්චකාමගුණමොහනයෙහි ගැලුණු යමෙක් වේ ද, හෙතෙම කායවිවෙකයෙනුදු දුරු වෙයි. චිත්තවිවෙකයෙනුදු දුරු වෙයි. උපධිවිවෙකයෙනුදු දුරු ඉතා දුරු අතිශයින් දුරු නො ළංහි නො හාත්පසැ අනාසන්නයෙහි බැහැර සිටියේ වේ. **තථාවිධො** – තාදෘශ වූයේ තදාකාර වූයේ තත්ප්‍රකාර වූයේ තත්ප්‍රතිභාග වූයේ, ඒ යමෙක් මොහනයෙහි ගැලුණේ වේ ද, එහෙයින් 'දූරෙ විවෙකා හි තථාවිධො සො' යනු වේ.

**කාමා හි ලොකෙ න හි සුප්පහායා** – කාමා යනු: උද්දාන විසින් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද කෙලශකාමයෝ දැයි. වස්තුකාමයෝ කවරහ: මනවඩන රූපයෝ මනවඩන ශබ්දයෝ මනවඩන ගන්ධයෝ මනවඩන රසයෝ මන්වඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ ද, අතුරුණු පොරෝණා දාසිදස්හු එළුතිරෙළුනු කුකුළුහූරනු ඇත්-ගව-අස්-වෙළඹහු කෙත් වත් කහවණු රන් ගම්-නියම්ගම්-රජදහන්හු ද රට දනව් ද කෝස ද කොටුගුළු ද යම් කිසි රජනීය වස්තුවෙක් වේද, මොහු යැ වස්තුකාමයෝ.

තවද අතීත කාමයෝ යැ අනාගතකාමයෝ යැ ප්‍රත්‍යුත්පන්න කාමයෝ යැ අධ්‍යාත්මකාමයෝ යැ බාහ්‍යකාමයෝ යැ අධ්‍යාත්ම-බාහ්‍යකාමයෝ යැ හීනකාමයෝ යැ මධ්‍යමකාමයෝ යැ ප්‍රණීතකාමයෝ යැ ආපායිකකාමයෝ යැ මානුෂිකකාමයෝ යැ දිව්‍යකාමයෝ යැ ප්‍රත්‍යුපස්ථිත (එළැඹ සිටි) කාමයෝ යැ නිර්මිත (මවනලද) කාමයෝ යැ පරනිර්මිත (පරා විසින් මවන ලද) කාමයෝ යැ අනිර්මිත කාමයෝ යැ පරිග්‍රහීත (තමා අයත් කල) කාමයෝ යැ අපරිග්‍රහීත කාමයෝ යැ මමායිත (මාගේ යැයි ගන්නා ලද) කාමයෝ යැ අමමායිත කාමයෝ යැ, සියලු මැ කාමාවචරධර්මයෝ යැ සියලු මැ රූපාවචරධර්මයෝ යැ සියලු මැ අරූපාවචර ධර්මයෝ යැ යන මොහු තෘෂ්ණාවස්තු වූවාහු තෘෂ්ණාලම්බන වූවාහු කමනීය හෙයින් රජනීය හෙයින් මදනීය හෙයින් කාමයෝ සි. මොහු වස්තුකාමයෝ යැයි කියනු ලැබෙත්.

කෙලශකාමයෝ කවරහ? ඡන්දකාම යැ රාගකාම යැ ඡන්දරාගකාම යැ, සංකල්පකාම යැ රාගකාම යැ සංකල්පරාගකාම යැ, කාමවස්තු විෂයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ච්ඡායෙක් කාමාධ්‍යවසානයෙක් (බැස ගැනීමෙක්) කාමෞඝයෙක් කාමයොගයෙක් කාමොපාදානයෙක් කාමච්ඡන්දනීවරණයෙක් වේ ද–

1. "අද්දසං කාම තෙ මූලං සංකප්පා කාම ජායසි,
න තං සංකප්පයිස්සාමි එවං කාම න හෙහිසී"ති.[a]

ඉමෙ වුච්චන්ති කිලෙස කාමා.

**ලොකෙති** – අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ. **කාමා හි ලොකෙ න හි සුප්පහායාති** – කාමා හි ලොකෙ දුප්පහායා දුච්චජා[1] දුප්පරිච්චජා[2] දුන්නිම්මදයා[3] දුන්නිවෙඨයා දුබ්බිනිවෙඨයා දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බිනිවත්තාති කාමා හි ලොකෙ න හි සුප්පහායා.

තෙනාහ භගවා:

"සත්තො ගුහායං බහුනාභිඡන්නො
තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො,
දූරෙ විවෙකා හි තථාවිධො සො
කාමා හි ලොකෙ න හි සුප්පහායා"ති.

**2-2**

ඉච්ඡානිදානා භවසාතබද්ධා
තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා,
පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා
ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං.

**ඉච්ඡානිදානා භවසාතබද්ධාති** - ඉච්ඡා[4] වුච්චති තණ්හා: යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පලිගෙධො[5] සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනනී සිබ්බිනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා ආයූහනී[6] දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො ස්නෙහො අපෙක්ඛා පටිබන්ධු[7] ආසා ආසිංසනා ආසිංසිතත්තං, රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා, ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා සාධුකම්‍යතා, අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා, කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා, රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා, ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං, දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබලිසං මාරවිසයො තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො, අභිජ්ඣා විසමලොභො අකුසලමූලං.

---

1. දුච්චජ්ජා – සීමු. II. මජසං, 2. දුප්පරිච්චජ්ජා – සීමු. II. මජසං.
3. දුන්නිම්මද – සීමු. I. මජසං. 4. ඉච්ඡති – සයා සීමු. I. ස.
5. රොධො පලිරොධො – සයා. 6. ආයුහිනී – සීමු. I. මජසං.
7. පටිබන්ධො – සීමු I. සයා. මජසං.

a. ජාතකපාළි – අට්ඨකවග්ග – ගඞ්ගමාලජාතකං.

**1.** "කාමය, තාගේ මුල දිටිමි. කාමය, තෝ සංකල්පයෙන් උපදනෙහි. දැන් මම තා නො පතමි. කාමය, තෝ මෙසේසින් නූපදනෙහි" යයි.

මොහු ක්ලේශකාමයෝ යැයි කියනු ලැබෙත්.

**ලොකෙ** – අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි ය; **කාමා හි ලොකෙ න හි සුප්පහායා** – යම් හෙයකින් කාමයෝ ලොව්හි දුකසේ ප්‍රහීණ කළ යුත්තාහු ද දුකසේ හළ යුත්තාහු ද දුකසේ පරිත්‍යාග කළ යුත්තාහු ද දුකසේ නිම්ද කළ යුත්තාහු ද දුකසේ මිදිය යුත්තාහු ද දුකසේ විනිර්වෙෂ්ටන කළ යුත්තාහු ද දුස්තර වූවාහු ද වෙසෙසින් දුස්තර වූවාහු ද දුස්සමතික්‍රම වූවාහු ද දුර්විනිවතී වූවාහු ද, එහෙයින් 'කාමා හි ලොකෙ න හි සුප්පහායා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සත්තො ගුහායං –පෙ– න හි සුප්පහායා" යි.

**2 – 2**

කාමතෘෂ්ණාව නිදාන කොට ඇති භවසුඛයෙහි බැඳුණු, යළි අනාගතයෙහි හෝ අතීතයෙහි හෝ වස්තුකාමයන් කැමැති වන, මේ ප්‍රත්‍යුත්පන්න කාමයන් හෝ යට දැක්වූ අතීතානාගතකාමයන් හෝ ප්‍රාර්ථනා කරන ඒ සත්ත්වයෝ දුකසේ මිදියැ යුත්තාහ. අනෙකක්හු විසින් නො මැ මුදනු හැක්කාහු වෙත්.

**ඉච්ඡානිදානා භවසාතබද්ධා** – 'ඉච්ඡා' යි තෘෂ්ණාව කියනු ලබ්: යම් රාගයෙක් සංරාගයෙක් අනුනයෙක් අනුරොධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයා ගේ සංරාගයෙක් ඉච්ඡාවක් මූර්ඡාවක් අධ්‍යවසානයෙක් ගෘධයෙක් පරිගෘධයෙක් සඞ්ගයෙක් පඞ්කයෙක් එජාවක් මායාවක් (සසර උපදවන) ජනිකාවක් සංජනනියක් සීවනියක් (බැඳීමෙක්) ජාලිනියක් සරිතාවක් විසත්තිකාවක් (බඳනා හෙයින්) සූත්‍රයෙක් (රූපාදියෙහි පතළ හෙයින්) විසතාවක් අයූහනය කරවීමෙක් ද්විතීයාවක් ප්‍රණිධියක් භවනෙත්තියක් (ගහන හෙයින්) වනයෙක් වනථයෙක් තෘෂ්ණාසන්ථවයෙක් ස්නෙහයෙක් අපෙක්ෂාවක් (අරමුණෙහි බඳනා හෙයින්) ප්‍රතිබන්ධුයෙක් ආශාවක් ආශංසනාවක් ආශංසිත බවෙක් රූපාශාවක් ශබ්දාශාවක් ගන්ධාශාවක් රසාශාවක් ස්ප්‍රෂ්ටව්‍යාශාවක් ලාභාශාවක් ධනාශාවක් පුත්‍රාශාවක් ජීවිතාශාවක්, (තෘෂ්ණා වශයෙන්) ජල්පනයෙක් ජල්පනාකාරයෙක් ජල්පිත බවෙක් ලොල් බවෙක් ලෞල්‍යාකාරයෙක් ලෞල්‍යසමඞ්ගී බවෙක් පුච්ඡඤ්ජිකා (නගුට සලන = ලාභයෙහි සැලෙන) බවෙක් මධුරකාම්‍යතාවක්, අධර්මරාගයෙක් විෂමලොභයෙක් නිකාන්තියෙක් කැමැතිවන ආකාරයෙක් ප්‍රාර්ථනාවක් පිහායනයෙක් සම්ප්‍රාර්ථනාවක්, කාමතෘෂ්ණාවක් භවතෘෂ්ණාවක් විභවතෘෂ්ණාවක් රූප (භව) තෘෂ්ණාවක් අරූපතෘෂ්ණාවක් නිරොධතෘෂ්ණාවක්, රූප (යෙහි) තෘෂ්ණාවක් ශබ්දතෘෂ්ණාවක් ගන්ධතෘෂ්ණාවක් රසතෘෂ්ණාවක් ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාවක් ධර්මතෘෂ්ණාවක්, (තෘෂ්ණා) ඕඝයෙක් යොගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් ආවරණයෙක් නීවරණයෙක් ඡදනයෙක් බන්ධනයෙක් උපක්ලේශයෙක් අනුශයයෙක් පර්‍ය්‍යුත්ථානයෙක් ලතාවක් විවිධෙච්ඡාවක්, දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබලිසයෙක් මාරවිෂයයෙක් තෘෂ්ණානදියක් තෘෂ්ණාජාලයෙක් තෘෂ්ණාගර්දුලයෙක් තෘෂ්ණාසමුද්‍රයෙක්, අභිධ්‍යාවක් විෂමලොභයෙක් අකුශලමූලයෙක් වේ ද එය යි.

**ඉච්ඡානිදානාති** – ඉච්ඡානිදානා ඉච්ඡාහෙතුකා ඉච්ඡාපච්චයා ඉච්ඡාකාරණා ඉච්ඡාපභවාති ඉච්ඡානිදානා.

**භවසාතබද්ධාති** – එකං භවසාතං: සුඛා වෙදනා, ද්වෙ භවසාතානි: සුඛා ච වෙදනා ඉට්ඨං ච වත්ථු. තීණි භවසාතානි: යොබ්බඤ්ඤං ආරොග්‍යං ජීවිතං. චත්තාරි භවසාතානි: ලාභො යසො පසංසා සුඛං. පඤ්ච භවසාතානි: මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා. ඡ භවසාතානි: චක්ඛුසම්පදා සොතසම්පදා ඝානසම්පදා ජිව්හාසම්පදා කායසම්පදා මනොසම්පදා. **භවසාතබද්ධාති** – සුඛාය වෙදනාය සත්තා බද්ධා ඉට්ඨස්මිං වත්ථුස්මිං, යොබ්බඤ්ඤෙ බද්ධා, ආරොග්‍යෙ බද්ධා, ජීවිතෙ බද්ධා, ලාභෙ බද්ධා, යසෙ බද්ධා, පසංසාය බද්ධා, සුඛෙ බද්ධා, මනාපිකෙසු රූපෙසු බද්ධා, මනාපිකෙසු සද්දෙසු-ගන්ධෙසු-රසෙසු-මනාපිකෙසු ඵොට්ඨබ්බෙසු බද්ධා, චක්ඛුසම්පදාය බද්ධා, සොතසම්පදාය බද්ධා, ඝාන-ජිව්හා-කාය-මනොසම්පදාය බද්ධා, විබද්ධා ආබද්ධා ලග්ගා ලග්ගිතා පලිබද්ධාති 'ඉච්ඡා නිදානා භවසාතබද්ධා.'

**තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛාති** – තෙ වා භවසාතවත්ථූ දුප්පමුඤ්චා, සත්තා[1] වා එතතො දුම්මොචයා. කථං තෙ භවසාතවත්ථූ දුප්පමුඤ්චා[2] ? සුඛා වෙදනා දුප්පමුඤ්චා, ඉට්ඨං වත්ථු දුප්පමුඤ්චං, යොබ්බඤ්ඤං දුප්පමුඤ්චං, ආරොග්‍යං දුප්පමුඤ්චං, ජීවිතං දුප්පමුඤ්චං, ලාභො දුප්පමුඤ්චො, යසො දුප්පමුඤ්චො, පසංසා දුප්පමුඤ්චා, සුඛං දුප්පමුඤ්චං, මනාපිකා රූපා දුප්පමුඤ්චා, මනාපිකා සද්ද-ගන්ධා-රසා-ඵොට්ඨබ්බා දුප්පමුඤ්චා, චක්ඛුසම්පදා දුප්පමුඤ්චා, සොත-ඝාන-ජිව්හා-කාය-මනොසම්පදා දුප්පමුඤ්චා, දුම්මොචයා දුප්පමොචයා දුන්නිවෙඨයා දුබ්බිනිවෙඨයා, දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බිනිවත්තා. එවං තෙ භවසාතවත්ථූ දුප්පමුඤ්චා.

කථං සත්තා එතතො දුම්මොචයා ? සුඛාය වෙදනාය සත්තා දුම්මොචයා, ඉට්ඨස්මා වත්ථුස්මා දුම්මොචයා, යොබ්බඤ්ඤා දුම්මොචයා, ආරොග්‍යා දුම්මොචයා, ජීවිතා දුම්මොචයා, ලාභා දුම්මොචයා, යසා දුම්මොචයා, පසංසාය දුම්මොචයා, සුඛා දුම්මොචයා, මනාපිකෙහි රූපෙහි දුම්මොචයා ,මනාපිකෙහි සද්දෙහි-ගන්ධෙහි-රසෙහි-ඵොට්ඨබ්බෙහි දුම්මොචයා, චක්ඛුසම්පදාය දුම්මොචයා, සොත-ඝාන-ජිව්හා-කාය-මනොසම්පදාය දුම්මොචයා දුප්පමොචයා දුරුද්ධරා[3] දුස්සමුද්ධරා දුබ්බුට්ඨාපයා දුස්සමුට්ඨාපයා දුන්නිවෙඨයා දුබ්බිනිවෙඨයා දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බිනිවත්තා. එවං සත්තා එතතො[4] දුම්මොචයාති 'තෙ දුප්පමුඤ්චා.'

**න හි අඤ්ඤමොක්ඛාති** – තෙ අත්තනා පලිපපලිපන්නා න සක්කොන්ති පරං පලිපපලිපන්නං උද්ධරිතුං.

1. සත්තො - සීමු. I. 2. 'දුම්මුඤ්චා' ඉති විදිසෙසු අඤ්ඤත්‍රාපි - සභා. මජසං.
3. දුද්ධරා - සීමු. I. සභා. මජසං. 4. එතෙහි - සීමු. I.

**ඉච්ඡානිදානා** - ඉච්ඡාව නිදාන කොට ඇත්තාහු ඉච්ඡාව හේතු කොට ඇත්තාහු ඉච්ඡාව ප්‍රත්‍යය කොට ඇත්තාහු ඉච්ඡාව කාරණ කොට ඇත්තාහු ඉච්ඡාව ප්‍රභව කොට ඇත්තාහු නුයි 'ඉච්ඡානිදාන' නම් වෙත්.

**භවසාතබද්ධා** - සුඛවේදනාව එක් භවසාතයෙක, සුඛවේදනාව ද ඉෂ්ටවස්තුව දැයි භවසාත දෙකෙක. යෞවනය ආරෝග්‍යය හා ජීවිතය (ජීවිතෙන්ද්‍රිය පවත්නා බව) දැයි භවසාත තුනෙක. ලාභ යැ යශස් යැ ප්‍රශංසා යැ සුඛ යැයි භවසාත සතරකෙ, මනාපික (මනවඩන) රූප යැ මනාපික ශබ්ද යැ මනාපික ගන්ධ යැ මනාපික රස යැ මනාපික ස්ප්‍රෂ්ටව්‍ය යැයි භවසාත පසෙක, චක්ෂුඃසම්පත් යැ ශ්‍රොත්‍රසම්පත් යැ ඝ්‍රාණසම්පත් යැ ජිහ්වාසම්පත් යැ කායසම්පත් යැ මනස්සම්පත් යැයි භවසාත සයෙකි. භවසාතබද්ධා - සුඛවේදනාවෙහි ඉෂ්ටවස්තුයෙහි සත්ත්වයෝ බඳනා ලද්දාහ, යෞවනයෙහි බද්ධයහ, ආරෝග්‍යයෙහි බද්ධයහ, ජීවිතයෙහි - ලාභයෙහි - යශස්හි - ප්‍රශංසායෙහි - සුඛයෙහි බද්ධයහ, මනාපිකරූපයන්හි බද්ධයහ, මනාපික ශබ්ද - ගන්ධ - රස - මනාපික ස්ප්‍රෂ්ටව්‍යයන්හි බද්ධයහ, චක්ෂුඃසම්පත්හි බද්ධයහ, ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා - කාය- මනස්සම්පත්හි බද්ධයහ, වෙසෙසින් බැඳුණාහ. හාත්පසින් බැඳුණාහ, ලග්න වූහ, ලගිත වූහ, පරිබද්ධ වූවාහු නුයි 'ඉච්ඡානිදානා භවසාතබද්ධා' යනු වේ.

**තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා** - භවයෙහි ආස්වාදවස්තු වූ ඒ ධර්මයෝ හෝ දුකසේ හළ යුත්තාහ. සත්ත්වයෝ මැ හෝ තෙල භවසාත වස්තුහු කෙරෙන් දුර්මොචයෝ යි. ඒ භවයෙහි සාතවස්තූහු දුකසේ හළ යුත්තාහු කිසෙයින යත්: සුඛවේදනාව දුකසේ මිදිය යුත්තී යැ, ඉෂ්ටවස්තුව දුකසේ හළ යුතු යැ, යෞවනය - ආරෝග්‍යය - ජීවිතය - ලාභය - යශස් - ප්‍රශංසාව - සුඛය දුකසේ හළ යුතු යැ, මනාපික රූපයෝ දුස්ප්‍රමුච්‍යයෝ යැ, මනාපික ශබ්දයෝ - ගන්ධයෝ - රසයෝ - ස්ප්‍රෂ්ටව්‍යයෝ දුස්ප්‍රමුච්‍යයහ, චක්ෂුස්සම්පද් දුස්ප්‍රමුච්‍ය යැ, ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා - කාය - මනස්සම්පද් දුස්ප්‍රමුච්‍ය යැ, දුර්මෝච යැ, දුර්නිශ්චෙෂ්ට යැ, දුර්විනිවෙෂ්ට යැ, දුස්තර යැ, දුස්ප්‍රතර යැ, දුස්සමතික්‍රම යැ, දුර්විනිවර්ත් යි. මෙසේ ඒ භවසාත වස්තූහු දුකසේ මිදියැ යුත්තාහ.

සත්ත්වයෝ තෙල වස්තුයෙන් දුකසේ මිදියැ යුත්තාහු කිසෙයින යත්: සුඛවේදනායෙන් සත්ත්වයෝ දුකසේ මිදියැ යුත්තාහ, ඉෂ්ටවස්තූහු කෙරෙන්- යෞවනයෙන් - ආරෝග්‍යයෙන් - ජීවිතයෙන් - ලාභයෙන් - යශසින් - ප්‍රශංසායෙන් - සුවයෙන් දුකසේ මිදිය යුත්තාහ, මනවඩන රූපයෙන් - ශබ්දයෙන් - ගන්ධයෙන් - රසයෙන් - ස්ප්‍රෂ්ටව්‍යයෙන් දුර්මොචයෝ යැ, චක්ෂුස්සම්පත්තියෙන් - ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා - කාය - මනස්සම්පත්තියෙන් දුර්මොචයෝ යැ, අතිශයින් නොමිදිය හැක්කාහ, නො නැගිය හැක්කාහ, අතිශයින් නො නගා සිටුවිය හැක්කාහ, දුර්නිවෙෂ්ටයෝ යැ, දුර්විනිවෙෂ්ට යෝ යැ, දුස්තාරයෝ යැ, අතිශයින් දුස්තරයෝ යැ, නො ඉක්මවිය හැක්කාහ, නො නැවැත්විය හැක්කාහුයැ. මෙසේ සත්ත්වයෝ තෙල සාතවස්තු කෙරෙන් නො මිදිය හැක්කාහු නුයි 'තෙ දුප්පමුඤ්චා' යනු වේ.

**න හි අඤ්ඤමොක්ඛා** - ඔවුහු තමන් මහමඩෙහි ගැලුණාහු මහමඩෙහි ගැලුණු අනෙකක්හු නගාසිටුවන්නට නො හැකි වෙත්.

වුත්තං හෙතං භගවතා:

"සො වත චුන්ද, අත්තනා පලිපපලිපන්නො පරං පලිපපලිපන්නං උද්ධරිස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වත චුන්ද, අත්තනා අදන්තො අවිනීතො අපරිනිබ්බුතො[1] පරං දමෙස්සති විනෙස්සති පරිනිබ්බාපෙස්සතීති නෙතං ඨානං විජ්ජතී"[a]ති එවම්පි න හි අඤ්ඤදමොක්ඛා. අථවා නත්ථඤ්ඤො කොචි මොචෙති. තෙ යදි[2] මුඤ්චෙය්‍යුං, සකෙන ථාමෙන සකෙන බලෙන සකෙන විරියෙන සකෙන පරක්කමෙන සකෙන පුරිසථාමෙන සකෙන පුරිසබලෙන සකෙන පුරිසවිරියෙන සකෙන පුරිසපරක්කමෙන අත්තනා සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං පටිපජ්ජමානා මුඤ්චෙය්‍යුන්ති එවම්පි න හි අඤ්ඤදමොක්ඛා.

වුත්තම්පි හෙතං භගවතා:

1. "නාහං සහිස්සාමි පමොචනාය
කථංකථිං[3] ධොතක කිඤ්චි ලොකෙ,
ධම්මඤ්ච සෙට්ඨං අභිජානමානො
එවං තුවං ඔඝමිමං තරෙසී"[b]ති.

එවම්පි න හි අඤ්ඤදමොක්ඛා.

වුත්තං හෙතං භගවතා:

2. "අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති,
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති,
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤො[4] විසොධයෙ"[c]ති.

එවම්පි න හි අඤ්ඤදමොක්ඛා.

වුත්තම්පි හෙතං භගවතා:

"එවමෙව ඛො බ්‍රාහ්මණ තිට්ඨතෙව නිබ්බානං තිට්ඨති නිබ්බානගාමී[5] මග්ගො, තිට්ඨාමහං සමාදපෙතා. අථ ච පන මම සාවකා මයා එවං ඔවදියමානා එවං අනුසාසියමානා අප්පෙකච්චෙ අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙන්ති. එකච්චෙ නාරාධෙන්ති. එත්ථ ක්‍යාහං බ්‍රාහ්මණ කරොමි, මග්ගක්ඛායී බ්‍රාහ්මණ තථාගතො. මග්ගං බුද්ධො ආචික්ඛති. අත්තනා පටිපජ්ජමානා මුඤ්චෙය්‍යු"[d]න්ති. එවම්පි න හි අඤ්ඤදමොක්ඛාති 'තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤදමොක්ඛා.'

---

1 අපරිනිබ්බුතො ච, - සීමු. II. 2. යදි පරං - සීමු I.
3. කථං කථී - සීමු I 4 න අඤ්ඤො අඤ්ඤං සී. I. - සීමු. I. සයා. I.
5 නිබ්බානගාමිනි - සීමු. I.

a. මජ්ඣිමනිකාය - සල්ලෙඛසුත්තං.
b සුත්තනිපාත - ධොතකසුත්තං.
c ධම්මපද - අත්තවග්ග
d. මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසක - ගණකමොග්ගල්ලානසුත්තං.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

“චුන්දය, යමෙක් තෙමේ ගැඹුරු (මහ) මඩෙහි ගැලුණේ ද හෙතෙම ඒකාන්තයෙන් ගැඹුරු මඩෙහි ගැලුණු අනෙකක්හු නඟාසිටුවන්නේ යැ යන මේ කාරණය නො වෙයි. චුන්දය, යමෙක් තෙමේ නො දැමුණේ නො හික්මුණේ කෙලෙස් පිරිනිවනින් නො පිරිනිවියේ ත් වේ නම් හෙතම ඒකාන්තයෙන් අනෙකක්හු දමන්නේ යැ හික්මවන්නේ යැ පිරිනිවන්නේ යැ යන මෙ කරුණ නො වේ” යයි. මෙසේ ත් අනෙකක් හු විසින් නො මිදියැ හෙන්නාහ. නොහොත් මුදවන අන් කිසිවෙක් නැත. ඉදින් ඔහු මිදෙන්නාහු නම්, සවකීය (ඥත) ශක්තියෙන් සවකීය බලයෙන් සවකීය වීර්‍ය්‍යයෙන් සවකීය පරාක්‍රමයෙන් සවකීය පුරුෂශක්තියෙන් සවකීය පුරුෂබලයෙන් සවකීය පුරුෂවීර්‍ය්‍යයෙන් සවකීය පුරුෂපරාක්‍රමයෙන් තමා විසින් සම්‍යක්ප්‍රතිපදාවට අනුලෝමප්‍රතිපදාවට අවිරුද්ධප්‍රතිපදාවට අන්වර්ථප්‍රතිපදාවට ධර්මානුධර්මප්‍රතිපදාවට පිළිපදනාහු මිදෙන්නාහු නුයි ‘න හි අඤ්ඤමොක්ඛා’ යනු වේ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

1. “ධොතකය, මම් ලොව්හි කාඞ්ක්ෂා සහිත වූ කිසිවෙක්හු මුදන්නට නො හැකි වෙමි. (වෑයම් නොකරමි.) උත්තම ධර්මය විශිෂ්ටඥානයෙන් අවබොධ කෙරෙමින් මෙසේ තෝ මේ චතුරෝඝය තරණය කෙරෙහි” යයි මෙසේ ත් අනෙකක්හු විසින් නො මැ මිදිය හැක්කාහ.

මේ වදාරනලද මැයි භාග්‍යවතුන් විසින්:

2. “යමෙක්හු විසින් තමා මැ පව්කම් කරන ලද ද, හෙතෙම සිවුඅපායදුක් විඳිනුයේ තෙමේ මැ කෙලෙසෙයි. යළි යමෙක්හු විසින් තමා පව්කම් නො කරන ලද ද, හෙතෙම සුගතියට පැමිණියේ තෙමේ මැ විශුද්ධ වෙයි. කුශලාකුශලකර්මසඞ්ඛ්‍යාත ශුද්ධිය ද අශුද්ධිය ද කාරකසන්තානයෙහි – තමා කෙරෙහි පිවා දනවයි. අනෙකෙක් අනෙකක්හු විශුද්ධ නො කෙරේ” යයි, මෙසේ ත් අනෙකක්හු විසින් නො මැ මිදියැ හෙන්නාහ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

“එසෙයින් මැ බමුණ, අමාමහනිවන ඇත් මැය. (පූර්වභාගවිදර්ශනාදියෙහි පටන්) නිවනට පමුණුවන ආර්‍ය්‍යමාර්ගය ඇත. සමාදන් කරවන (පිළිවෙත පිහිටුවන) මම් සිටිම් මැය. එතෙකුදු වුවත් මාගේ සව්වෝ මා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු ඇතැම් කෙනෙක් මැ අත්‍යන්තනිෂ්ඨාව වූ නිවන සම්පාදනය කෙරෙති. ඇතැම් කෙනෙක් සම්පාදනය නො කෙරෙත්. මෙහි ලා (මොවුන් කෙරෙහි) බමුණ, මම් කුමක් කෙරෙම් ද, බමුණ, තථාගතයෝ පිළිවෙත් මග කියන සුල්ලහ. බුදුහු මාර්ගය ප්‍රකාශ කෙරෙත්. තුමූ පිළිවෙත්හි පිළිපදිමින් මිදෙන්නාහ” යි මෙසේත් අනෙකක්හු විසින් නො මැ මිදිය හැක්කාහු නුයි ‘තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා’ යනු වේ.

**පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානාති** - පච්ඡා වුච්චති අනාගතං. පුරෙ වුච්චති අතීතං. අපි ච අතීතං උපාදාය අනාගතඤ්ච පච්චුප්පන්නඤ්ච පච්ඡා, අනාගතං උපාදාය අතීතඤ්ච පච්චුප්පන්නඤ්ච පුරෙ. කථං පුරෙ අපෙක්ඛං කරොති? එවංරූපො[1] අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවංවෙදනො අහොසිං -පෙ- එවංසඤ්ඤො අහොසිං -පෙ- එවංසංඛාරො අහොසිං -පෙ- එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවම්පි පුරෙ අපෙක්ඛං කරොති. අථ වා- ඉති මෙ චක්ඛු අහොසි අතීතමද්ධානං ඉති රූපාති, තත්ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පුරෙ අපෙක්ඛං කරොති. අථ වා-ඉති මෙ සොතං අහොසි අතීතමද්ධානං ඉති සද්දාති -පෙ- ඉති මෙ ඝානං අහොසි අතීතමද්ධානං ඉති ගන්ධාති -පෙ- ඉති මෙ ජිව්හා අහොසි අතීතමද්ධානං ඉති රසාති -පෙ- ඉති මෙ කායො අහොසි අතීතමද්ධානං ඉති ඵොට්ඨබ්බාති -පෙ- ඉති මෙ මනො අහොසි අතීතමද්ධානං ඉති ධම්මාති, තත්ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පුරෙ අපෙක්ඛං කරොති. අථවා යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිතලපිතකීළිතානි, තදස්සාදෙති තං නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති. එවම්පි පුරෙ අපෙක්ඛං කරොති.

කථං[2] පච්ඡා අපෙක්ඛං කරොති? එවංරූපො සියං[3] අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවංවෙදනො සියං[3] -පෙ- එවංසඤ්ඤො සියං[3], -පෙ- එවංසංඛාරො[4] සියං[3] -පෙ- එවංවිඤ්ඤාණො සියං[3] අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවම්පි පච්ඡා අපෙක්ඛං කරොති. අථවා - ඉති මෙ චක්ඛු සියා අනාගතමද්ධානං ඉති රූපාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානප්පච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පච්ඡා අපෙක්ඛං කරොති. අථවා - ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං ඉති සද්දාති -පෙ- ඉති මෙ ඝානං සියා අනාගතමද්ධානං ඉති ගන්ධාති -පෙ- ඉති මෙ ජිව්හා සියා අනාගතමද්ධානං ඉති රසාති -පෙ- ඉති මෙ කායො සියා අනාගතමද්ධානං ඉති ඵොට්ඨබ්බාති -පෙ- ඉති මෙ මනො සියා අනාගතමද්ධානං ඉති ධම්මාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානප්පච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පච්ඡා අපෙක්ඛං කරොති. අථවා - ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානප්පච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පච්ඡා අපෙක්ඛං කරොතීති-පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා.

1. එවරූපො - ස. 2. කථම්පන - සීමු. I. 3. අහොසිං - සීමු. I.
4. එවං සඞ්ඛාරෙ - සීමු. I.

**පච්ඡා පුරෙ චාපි අපෙක්ඛමානා** – 'පච්ඡා' යි අනාගතය කියනු ලැබෙයි. 'පුරෙ' යි අතීතය කියනු ලැබේ. තවද අතීතය නිසා අනාගතයත් ප්‍රත්‍යුත්පන්නයත් 'පච්ඡා' නමි, අනාගතය නිසා අතීතයත් ප්‍රත්‍යුත්පන්නයත් 'පුරෙ' නමි. කිසෙයින් අතීතයෙහි අපෙක්ෂා කෙරෙයි යත්: අතීත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙකිම් වීමි යි ඒ අතීතරූපාරම්මණයෙහි තෘෂ්ණාව එළවයි. මෙබඳු වෙදනා ඇතියෙකිම් වීමි . . . මෙබඳු සංඥ ඇතියෙකිම් වීමි . . . මෙබඳු සංස්කාර ඇතියෙකිම් වීමි . . . මෙබඳු විඥාන ඇතියෙකිම් වීමි අතීත කලැ' යි එහි තෘෂ්ණාව එළවයි. මෙසේත් අතීතයෙහි අපෙක්ෂාව කෙරෙයි. නොහොත් අතීතයෙහි මාගේ ඇස මෙබඳු විය, රූපයෝ මෙබඳු වූහ යි ඒ චක්ෂු රූපයන්හි විඥානය (ජවනචිත්තය) ඡන්දරාගයෙන් ඇලුණේ වෙයි. ඒ ජවනවිඥානය ඡන්දරාගයෙන් බැඳුණු හෙයින් ඒ අරමුණට තෘෂ්ණාවශයෙන් සතුටු වෙයි. එය තෘෂ්ණාවශයෙන් අභිනන්දනය කරණුයේ මෙසේත් අතීතයෙහි අපේක්ෂාව කෙරෙයි. නොහොත් අතීතයෙහි මාගේ කන මෙබඳු විය, ශබ්දයෝ මෙබඳු වූහ යි . . . අතීතයෙහි මාගේ ඝ්‍රාණය මෙබඳු විය, ගන්ධයෝ මෙබඳු වූහ යි . . . අතීතයෙහි මාගේ දිව මෙබඳු විය, රසයෝ මෙබඳු වූහ යි . . . අතීතයෙහි මාගේ කය මෙබඳු විය, පහස්හු මෙබඳු වූහ යි . . . අතීතකාලයෙහි මාගේ මනස මෙබඳු විය, ධර්මයෝ මෙබඳු වූහ යි ඒ මනොධර්මයන්හි ජවනවිඥානය ඡන්දරාගයෙන් බැඳුණේ වෙයි. විඥානය ඡන්දරාගයෙන් බැඳුණු හෙයින් ඒ අරමුණට තෘෂ්ණාවශයෙන් සතුටු වෙයි. ඊට සතුටු වනුයේ මෙසේත් අතීතයෙහි අපේක්ෂාව කෙරෙයි. නොහොත් පෙර ඔහුගේ මාගම සමග යම් ඒ හසිතලපිත ක්‍රීඩිතයෝ වූවාහු ද, එය ආස්වාදනය කෙරෙයි. එය කැමැති වෙයි. යළි එයින් සතුටට පැමිණෙයි. මෙසේත් අතීතයෙහි අපෙක්ෂාව කෙරේ.

කිසෙයින් අනාගතයෙහි අපේක්ෂාව කෙරෙයි යත්: අනාගතකාලයෙහි මෙබඳු රූ ඇති වෙම්ව යි ඒ අනාගතරූපයෙහි තෘෂ්ණාව එළවයි. මෙබඳු වේදනා ඇති වෙම්ව යි . . . මෙබඳු සංඥ ඇති වෙම්ව යි . . . මෙබඳු සංස්කාර ඇති වෙම්ව යි . . . අනාගතයෙහි මෙබඳු විඥාන ඇති වෙම්ව යි එහි තෘෂ්ණාව එළවයි. මෙසේත් අනාගතයෙහි අපේක්ෂාව කෙරෙයි. නොහොත් අනාගතයෙහි මට මෙබඳු ඇසෙක් වේවා, මෙබඳු රූපයෝ වෙත්ව යි නො ලැබුණු චක්ෂූරූපයන්ගේ ප්‍රතිලාභය පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම හේතු කොටගෙන එය තෘෂ්ණාවශයෙන් අභිනන්දනය කෙරෙයි. එය අභිනන්දනය කරනුයේ මෙසේත් අනාගතාපේක්ෂාව කෙරෙයි. නොහොත් අනාගතයෙහි මට මෙබඳු කනෙක් වේවා, මෙබඳු ශබ්දයෝ වෙත්ව යි . . . අනාගතයෙහි මට මෙබඳු ඝ්‍රාණයෙක් වේවා, මෙබඳු ගන්ධයෝ වෙත්ව යි . . . අනාගතයෙහි මට මෙබඳු දිවක් වේවා, මෙබඳු රසයෝ වෙත්වයි . . . අනාගතයෙහි මට මෙබඳු කයෙක් වේවා, මෙබඳු පහස්හු වෙත්ව යි . . . අනාගතයෙහි මට මෙබඳු මනසෙක් වේවා, මෙබඳු ධර්මයෝ වෙත්ව' යි නො ලත් අරමුණු ලැබීම පිණිස සිත පිහිටුවයි. චිත්තප්‍රණිධානප්‍රත්‍යයෙන් ඒ අරමුණට සතුටු වෙයි. ඊට සතුටු වනුයේ මෙසේත් අනාගතාපෙක්ෂාව කෙරෙයි. නොහොත් මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් හෝ දෙවියෙක් හෝ දේවාන්‍යතරයෙක් වන්නෙමි යි නො ලත් අරමුණු ලැබීම පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම කරුණෙන් ඊට සතුටු වෙයි. ඊට සතුටු වනුයේ මෙසේත් අනාගතාපෙක්ෂාව කෙරේ නුයි 'පච්ඡා පුරෙ චාපි අපෙක්ඛමානා' යනු වේ.

**ඉමෙව කාමෙ පුරිමෙව ජප්පන්ති** – "ඉමෙව කාමෙ"ති පච්චුප්පන්නෙ පඤ්චකාම ගුණෙ ඉච්ඡන්තා සාදියන්තා පත්ථයන්තා අභිජප්පන්තා. **පුරිමෙව ජප්පන්ති** – අතීතෙ පඤ්චකාම ගුණෙ ජප්පන්තා පජප්පන්තා අභිජප්පන්තාති– 'ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං.'

තෙනාහ භගවා:

"ඉච්ඡානිදානා භවසාතබද්ධා
තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා,
පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා
ඉමෙව කාමෙ පුරිමෙව ජප්ප"න්ති.

**2 – 3**

කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා[1]
අවදානියා තෙ විසමෙ නිවිට්ඨා,
දුක්ඛූපනීතා පරිදෙවයන්ති
කිං සූ භවිස්සාම ඉතො චුතා සෙ.

**කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හාති** – "කාමා"ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච – පෙ – ඉමෙ වුච්චන්ති වත්ථුකාමා. –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **ගෙධො** වුච්චති තණ්හා, යො රාගො සාරාගො–පෙ–අභිජ්ඣා ලොභො අකුසලමූලං; කිලෙසකාමෙන වත්ථුකාමෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති– කාමෙසු ගිද්ධා. **පසුතාති** – යෙපි කාමෙ එසන්ති ගවෙසන්ති පරියෙසන්ති තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ එසන්ති ගවෙසන්ති පරියෙසන්ති –පෙ– සද්දෙ –පෙ– ගන්ධෙ –පෙ– රසෙ –පෙ– ඵොට්ඨබ්බෙ –පෙ– පරියෙසන්ති තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පටිලභන්ති –පෙ– ඵොට්ඨබ්බෙ පටිලභන්ති තච්චරිතා –පෙ–තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පරිභුඤ්ජන්ති–පෙ–ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජන්ති තච්චරිතා–පෙ–තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යථා කලහකාරකො කලහපසුතො, කම්මකාරකො කම්මපසුතො, ගොචරෙ චරන්තො ගොචරපසුතො, ඣායී ඣානපසුතො, එවමෙවං යෙපි කාමෙ එසන්ති ගවෙසන්ති තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා.

1. සම්මූළ්හා – ස

**ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං** – 'ඉමෙව කාමෙ' යනු: ප්‍රත්‍යුත්පන්න පඤ්චකාමගුණයන් කැමැති වන්නාහු ඉවසන්නාහු පතන්නාහු රුචි වන්නාහු වෙසෙසින් ගුණ කියන්නාහු; **පුරිමෙව ජප්පං** – අතීතපඤ්චකාමගුණයන් (ගුණවශයෙන්) කියන්නාහු ප්‍රකාරයෙන් කියන්නාහු වෙසෙසින් කියන්නාහු නුයි 'ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ඉච්ඡානිදානා -පෙ- පුරිමෙව ජප්පං"යි.

**2 – 8**

ඔහු ක්ලේශකාමයෙන් වස්තුකාමයෙහි ගිජු වූවාහු යෙදුණාහු සම්මොහයට පැමිණියාහු නිරයට යන්නාහු මසුරු වූවාහු හෝ බුද්ධාදීන්ගේ අවවාද නො ගන්නාහු කායවිෂමාදි විෂමයෙහි පිහිටියාහු මරණදුකට පැමිණියාහු 'මෙයින් සැව පරලොව ගියමෝ කුමක් වනුමෝ හො'යි පරිදෙවනා කෙරෙත්.

**කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා** – 'කාම' නම් උදෘත හෙයින් කාමයෝ දෙදෙනෙකි. වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ දැයි ... මොහු වස්තුකාමයෝ යැයි කියනු ලැබෙත්. ... මොහු ක්ලේශකාමයෝ යැයි කියනු ලැබෙත්. **ගෙධ** යි තෘෂ්ණාව කියනු ලබා; යම් රාගයෙක් සංරාගයෙක් ... අභිධ්‍යාවක් ලොභඅකුශලමූලයෙක් වේ ද, එය යි. ක්ලේශකාමයෙන් වස්තුකාමයන්හි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු බැසගන්නාහු ලැගුණාහු එක් වූවාහු හාත්පසින් බැඳුණාහු නුයි 'කාමෙසු ගිද්ධා' යනු වේ. **පසුතා** – යම් කෙනෙක් කාමයන් එෂණ – ගවෙෂණ – පර්‍යෙෂණ කෙරෙත් ද, ඒ කාමයන් පිණිස හැසිරෙන්නාහු තද්බහුල වූවාහු තද්ගුරුක වූවාහු ඊට නැමුණාහු ඊට නැඹුරු වූවාහු ඊට බර වූවාහු එහි වැතුරුණාහු එය අධිපති කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් එෂණ – ගවෙෂණ – පර්‍යෙෂණ කෙරෙත් ද, . : . ශබ්දයන් . . . ගන්ධයන් . . . රසයන් . . . ස්ප්‍රෂ්ටව්‍යයන් එෂණ – ගවෙෂණ – පර්‍යෙෂණ කෙරෙත් ද, තච්චරිත තද්බහුල තද්ගුරුක තන්නින්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත වූවාහු තදධිපත්‍ය කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් ලබත් ද (අත්පත් කෙරෙත් ද) . . . ස්ප්‍රෂ්ටව්‍යයන් තෘෂ්ණාවශයෙන් ලබත් ද, තච්චරිත . . . තදධිපතිත්ව කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ; යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් පරිභොග කෙරෙත් ද, ...ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරෙත් ද, තච්චරිත වූවාහු. . . තදධිපතිත්ව කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ. යම්සේ කලහ කරනුයේ කලහපසුත වේ ද, කර්මාන්ත කරනුයේ කම්මපසුත වේ ද, ගොචරයෙහි හැසිරෙනුයේ ගොචරපසුත වේ ද, ධ්‍යාන ඇතියේ ඣානපසුත වේ ද, එසෙයින් මැ යම් කෙනෙක් කාමයන් එෂණ ගවෙෂණ පර්‍යෙෂණ කෙරෙත් නම්, ඒ පිණිස හැසිරෙත් නම්, එය බහුල කොට එය ගරු කොට ඊට නිම්න ව ඊට ප්‍රවණ ව ඊට බර ව එහි වැතිරැ එය අධිපති කොට වෙසෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ.

යෙපි තණ්හාවසෙන රූපෙ-පෙ-පරියෙසන්ති, සද්දෙ-පෙ-ගන්ධෙ-පෙ-රසෙ-පෙ-ඵොට්ඨබ්බෙ -පෙ- පරියෙසන්ති, තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පටිලභන්ති, සද්දෙ- ගන්ධෙ- රසෙ- ඵොට්ඨබ්බෙ පටිලභන්ති, තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පරිභුඤ්ජන්ති, සද්දෙ- ගන්ධෙ- රසෙ- ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජන්ති, තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා.

**පමූළ්හාති** - යෙභුය්‍යෙන දෙවමනුස්සා පඤ්චසු කාමගුණෙසු මුය්හන්ති පමුය්හන්ති සම්මුය්හන්ති සම්පමුය්හන්ති, මූළ්හා පමූළ්හා සම්මූළ්හා සම්පමූළ්හා, අවිජ්ජාය අන්ධීකතා, ආවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතාති-කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා.

**අවදානියා තෙ විසමෙ නිවිට්ඨාති** - 'අවදානියා'ති අවංගච්ඡන්තී[1]-තිපි අවදානියා, මච්ඡරිනොපි වුච්චන්ති අවදානියා, බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්තීති අවදානියා. කථං අවංගච්ඡන්තීති අවදානියා? අවංගච්ඡන්තීති නිරයං ගච්ඡන්ති, පෙත්තිවිසයං ගච්ඡන්ති, එවං අවංගච්ඡන්තීති-අවදානියා. කථං මච්ඡරිනො වුච්චන්ති අවදානියා? පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං; යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං.[a] අපි ච ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං ගාහො, ඉදං වුච්චති මච්ඡරියං. ඉමිනා මච්ඡරියෙන අවදඤ්ඤුතාය සමන්නාගතා ජනා පමත්තා, එවං මච්ඡරිනො වුච්චන්ති අවදානියා. කථං බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්තීති අවදානියා? බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්ති න සුස්සූසන්ති න සොතං ඔදහන්ති නාඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, අනස්සවා අවචනකරා පටිලොමවුත්තිනො අඤ්ඤෙනෙව මුඛං කරොන්ති. එවං බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්තීති අවදානියාති-අවදානියා.

1. අවගච්ඡන්ති සීමු. I.

a. විභඞ්ගපාළි - ඛුද්දකවත්ථුවිභඞ්ග.

යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන්... පර්යේෂණ කෙරෙත් නම්, ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් ... සොයත් නම්, තච්චරිත තද්බහුල තද්ගුරුක තන්නින්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත වෙත් නම්, එය අධිපති කොට ඇත්තාහු නම්, ඔහු ද කාමපසුතයෝ යෑ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් ප්‍රතිලාභ කෙරෙත් නම්, ශබ්ද-ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් ප්‍රතිලාභ කෙරෙත් නම්, තච්චරිත... තදධිමුක්ත වූවාහු තදධිපතිත්ව කොට ඇත්තාහු නම්, ඔහු ද කාමපසුතයෝ යෑ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් පරිභොග කෙරෙත් නම්, ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරෙත් නම්, තච්චරිත තද්බහුල තද්ගුරුක තන්නින්න තත්ප්‍රවණ තත් ප්‍රාග්භාර තදධිමුක්ත වූවාහු තදධිපතිත්ව කොට ඇත්තාහු නම්, ඔහු ද කාමපසුතයෝ යි.

**පමූළ්හා** – දෙව්මිනිස්හු බෙහෙවින් පස්කම්ගුණයෙහි මූළා වෙති, වෙසෙසින් මූළා වෙති, සම්මොහකාරයෙන් මූළා වෙත්. මූඪ වූවාහු ප්‍රමූඪ වූවාහු සම්මූඪ වූවාහු සම්ප්‍රමූඪ වූවාහු අවිද්‍යාවෙන් අන්ධ කරන ලද්දාහු අවුරන ලද්දාහු (ඇවුරුණාහු නැවැතුණාහු) වැතුරුණාහු වැසුණාහු පිළිසන් වූවාහු පිහිකුළු වූවාහු නුසි 'කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා' යනු වේ.

**අවදානියා තෙ විසමෙ නිවිට්ඨා** - 'අවදානියා' යනු: යටට (අපායට) යෙත් නුසි ද 'අවදානිය' නම් වෙත්: මසුරු වූවාහු ද 'අවදානිය' සි කියනු ලැබෙති. බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිත් නුසි 'අවදානිය' නම් වෙත්. කිසෙයින් අපායට යෙත් නුසි 'අවදානිය' නම් වෙති යත්: 'අවං ගච්ඡන්ති' (අපායට යෙති) යනු: නිරයට යෙති, තිරිසන්යෝනියට යෙති, ප්‍රේතවිෂයට යෙති; මෙසේ අපායට යෙත් නුසි 'අවදානිය' නම් වෙත්. කිසෙයින් මත්සරීහු (=මසුරෝ) 'අවදානිය' සි කියනු ලැබෙති යත්: මාත්සර්‍ය පසෙක: ආවාසමාත්සර්‍ය යෑ, කුලමාත්සර්‍ය යෑ, ලාභමාත්සර්‍ය යෑ, වර්ණමාත්-සර්‍ය යෑ, ධර්මමාත්සර්‍ය සි. මෙ බඳු වූ යම් මසුරුකමක් මසුරුඅයුරක් මසුරුබවක් සිය සමපත් සඟවනු කැමතිබවක් අනාර්‍ය බවක් කවුක බැවින් සිත හකුළුවන බවක් සිත් නො ගත්බවක් වේ නම්, මෙය මාත්සර්‍ය සි කියනු ලැබේ. තවද පඤ්චස්කන්ධයෙහි මසුරුබව ද 'මච්ඡරිය' නම, ධාතුමාත්සර්‍යය ද . . . ආයතනමාත්සර්‍යය ද 'මච්ඡරිය' නම, ග්‍රාහය ද 'මච්ඡරිය' නම්. මෙය මාත්සර්‍ය සි කියනු ලැබේ. මෙ මාත්සර්‍ය හෙතුවෙන් බුදුවදන් නො දැනීමෙන් යුත් ජනයෝ ප්‍රමත්තයෝ යෑ. මෙසෙයින් මත්සරීහු 'අවදානිය' සි කියනු ලැබෙත්. කිසෙයින් බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිත් නුසි 'අවදානිය' නම් වෙති යත්? බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිති, නො අසනු කැමති වෙති, කන නො නමති, දැනීමට සිත නො එළවති, අවවාද නො අසන්නාහු බස් පිළිගෙන නො කරන්නාහු පිළිලොම් වැ පවත්නාහු මුහුණ වෙනතක නමත්. මෙසෙයින් බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිත් නුසි 'අවදානිය' නම් වෙත්.

**තෙ විසමෙ නිවිට්ඨාති** – ‘විසමෙ’ති විසමෙ කායකම්මෙ නිවිට්ඨා, විසමෙ වචීකම්මෙ නිවිට්ඨා, විසමෙ මනොකම්මෙ නිවිට්ඨා, විසමෙ පාණාතිපාතෙ නිවිට්ඨා, විසමෙ අදින්නාදානෙ නිවිට්ඨා, විසමෙ කාමෙසු මිච්ඡාචාරෙ නිවිට්ඨා, විසමෙ මුසාවාදෙ නිවිට්ඨා, විසමාය පිසුනාය වාචාය නිවිට්ඨා, විසමාය ඵරුසාය වාචාය නිවිට්ඨා, විසමෙ සම්ඵප්පලාපෙ නිවිට්ඨා, විසමාය අභිජ්ඣාය නිවිට්ඨා, විසමෙ ව්‍යාපාදෙ නිවිට්ඨා, විසමාය මිච්ඡාදිට්ඨියා නිවිට්ඨා, විසමෙසු සංඛාරෙසු නිවිට්ඨා, විසමෙසු පඤ්චසු කාමගුණෙසු නිවිට්ඨා; විසමෙසු පඤ්චසු නීවරණෙසු නිවිට්ඨා විනිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති– අවදානියා තෙ විසමෙ නිවිට්ඨා.

**දුක්ඛූපනීතා පරිදෙවයන්තීති** – ‘දුක්ඛූපනීතා’ති දුක්ඛප්පත්තා දුක්ඛසම්පත්තා දුක්ඛූපගතා, මාරප්පත්තා මාරසම්පත්තා මාරූපගතා, මරණප්පත්තා මරණසම්පත්තා මරණූපගතා; **පරිදෙවයන්තීති** – ලපන්ති[1] සල්ලපන්ති සොචන්ති කිලමන්ති පරිදෙවන්ති උරත්තාළිං කන්දන්ති සම්මොහං ආපජ්ජන්තීති ‘දුක්ඛූපනීතා පරිදෙවයන්ති.’

**කිං සු භවිස්සාම ඉතො චුතා සෙති** ඉතො චුතා කිං භවිස්සාම? නෙරයිකා භවිස්සාම? තිරච්ඡානයොනිකා භවිස්සාම? පෙත්තිවිසයිකා භවිස්සාම? මනුස්සා භවිස්සාම? දෙවා භවිස්සාම? රූපී භවිස්සාම? අරූපී භවිස්සාම? සඤ්ඤී භවිස්සාම? අසඤ්ඤී භවිස්සාම? නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සාම? භවිස්සාම නු ඛො මයං අනාගතමද්ධානං? න නු ඛො භවිස්සාම අනාගතමද්ධානං? කින්නු ඛො භවිස්සාම අනාගතමද්ධානං? කථන්නු ඛො භවිස්සාම අනාගතමද්ධානං? කිං හුත්වා කිං භවිස්සාම නු ඛො මයං අනාගතමද්ධානන්ති සංසයපක්ඛන්තා[2] විමතිපක්ඛන්තා ද්වෙළ්හකජාතා ලපන්ති සල්ලපන්ති[3] සොචන්ති කිලමන්ති පරිදෙවන්ති උරත්තාළිං කන්දන්ති සම්මොහං ආපජ්ජන්තීති ‘කිං සු භවිස්සාම ඉතො චුතා සෙ.’

තෙනාහ භගවා:

“කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා
අවදානියා තෙ විසමෙ නිවිට්ඨා,
දුක්ඛූපනීතා පරිදෙවයන්ති
කිං සු භවිස්සාම ඉතො චුතා සෙ”ති.

2 4

තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු
යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ,
න තස්ස හෙතු විසමං චරෙය්‍ය
අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා.

**තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තූති** – ‘තස්මා’ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා එතං ආදීනවං පස්සමානො කාමෙසූති තස්මා; **සික්ඛෙථාති** – තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා, අධිපඤ්ඤාසික්ඛා.

---

1. ලාලපන්ති – සා. මජසං.
2. පක්ඛන්දන්තා – සීමු. I. පක්ඛන්දා – මජසං.
3. ලාලපන්ති – සා. මජසං.

**තෙ විසමෙ නිවිට්ඨා** – 'විසමෙ' යනු: විෂම වූ කායකර්මයෙහි පිවිසියාහු, විෂම වූ වාක්කර්මයෙහි පිවිසියාහු, විෂම වූ මනඃකර්මයෙහි පිවිසියාහු, විෂම වූ ප්‍රාණඝාතයෙහි පිවිසියාහු, විෂම වූ අදත්තාදානයෙහි . . . විෂම වූ කාමමිථ්‍යාචාරයෙහි . . . විෂම වූ මෘෂාවාදයෙහි . . . විෂම වූ පෛශුන්‍ය වචනයෙහි . . . විෂම වූ පරුෂවචනයෙහි . . . විෂම වූ සම්පප්‍රලාපයෙහි . . . විෂම වූ අභිධ්‍යායෙහි . . . විෂම වූ මිථ්‍යාදෘෂ්ටියෙහි පිවිසියාහු, විෂම වූ කායාදි සංස්කාරයෙහි ... විෂම වූ පඤ්චකාමගුණයෙහි ... විෂම වූ පඤ්චනීවරණයෙහි පිවිසියාහු වෙසෙසින් පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු පිවිස සිටියාහු බැසගත්තාහු ලැගුණාහු එක් වූවාහු පරිබද්ධ වූවාහු නුයි 'අවදානියා තෙ විසමෙ නිවිට්ඨා' යනු වේ.

**දුක්ඛූපනීතා පරිදෙවයන්ති** – 'දුක්ඛූපනීතා' යනු: දුකට පත් වූවාහු දුකට සැපත් වූවාහු දුකට පැමිණියාහු මරපත් වූවාහු මරසැපත් වූවාහු මාරොපගත වූවාහු මරණපත් වූවාහු මරණසැපත් වූවාහු මරණොපගත වූවාහු. **පරිදෙවයන්ති** යනු: බෙණෙති පුනපුනා බෙණෙති ශොක කෙරෙති වෙහෙසෙති වැලැපෙති ලෙහි පැහැර හඬති මුලාවට පැමිණෙත් නුයි 'දුක්ඛූපනීතා පරිදෙවයන්ති' යනු වේ.

**කිං සු භවිස්සාම ඉතො චුතා සෙ** – 'මෙයින් සැවැ (=මෙලොවින් චුත වැ) කුමක් වනුමෝ ද, කෙරිසත් වනුමෝ ද, තිරිසන්යෝනියෙහි උපදනුමෝ ද, මිනිස් වනුමෝ ද, දෙව් වනුමෝ ද, රූපභවයෙහි උපදනුමෝ ද, අරූපභවයෙහි උපදනුමෝ ද, සංඥීභවයෙහි උපදනුමෝ ද, අසංඥීභවයෙහි උපදනුමෝ ද, ඇපි අනාගතයෙහි වනුමෝ ද, අනාගතයෙහි නො වන්නමෝ ද, අනාගතයෙහි (ක්‍ෂත්‍රියාදීන් අතුරෙන්) කුමක් වනුමෝ ද, අනාගතයෙහි (දීඝ-හ්‍රස්වාදි සටහන් වශයෙන්) කෙසේ වනුමෝ ද, අනාගතයෙහි ඇපි (ක්‍ෂත්‍රියාදීන් අතුරෙන්) කුමක් වැ (බ්‍රාහ්මණාදීන් අතුරෙන්) කුමක් වනුමෝ දැ'යි සැකයට පැමිණියාහු විමතියට පැමිණියාහු හටගත් සැක ඇත්තාහු බෙණෙති පුනපුනා බෙණෙති ශොක කෙරෙති වෙහෙසෙති වැලැපෙති ලෙහි පැහැර හඬති මුලාවට පැමිණෙත් නුයි 'කිං සු භවිස්සාම ඉතො චුතා සෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"කාමෙසු ගිද්ධා -පෙ- ඉතො චුතා සෙ"යි.

## 2 – 4

යම් හෙයකින් සත්ත්ව තෙමේ ලෝකයෙහි යම්කිසි (නිරවශෙෂ වූ) කායදුශ්චරිතාදි විෂමය (විෂම කරන හෙයින්) විෂමයෙකැයි දන්නේ නම්, එහෙයින් ඒ විෂම වූ කායකර්මාදියට හෙතු වූ විෂමයෙහි නො හැසිරෙන්නේ යැ. යම් හෙයකින් ධීරයෝ මේ ජීවිතය අල්ප ය යි කියත් ද, එහෙයින් මෙ ශාසනයෙහි මැ ත්‍රිවිධ ශික්‍ෂාවෙහි හික්මෙන්නේ යැ හෙවත් ත්‍රිවිධශික්‍ෂාව සමාදන් වැ පවත්නේ යි.

**තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු** – 'තස්මා' යනු: එහෙයින් ඒ කරුණෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් පස්කම්හි දොෂ ආදීනවය දක්නේ නුයි තස්මා යනු වේ.

**'සික්ඛෙථ'** යනු: අධිශීලශික්‍ෂා යැ, අධිචිත්තශික්‍ෂා යැ, අධිප්‍රඥාශික්‍ෂා යැයි ශික්‍ෂා තුනෙකි.

කතමා අධිසීලසික්ඛා? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. ඛුද්දකො සීලක්ඛන්ධො මහන්තො සීලක්ඛන්ධො, සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො මොක්ඛං කුසලානං ධම්මානං සමාපත්තියා. අයං අධිසීලසික්ඛා.

කතමා අධිචිත්තසික්ඛා? ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං[2] උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයං අධිචිත්තසික්ඛා.

කතමා අධිපඤ්ඤාසික්ඛා? ඉධ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති, අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති, අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති. අයං අධිපඤ්ඤාසික්ඛා.

---

1. තතියං ඣානං - මජසං.  2. අදුක්ඛමසුඛං - ස.

අධිශීලශික්ෂා කවරැ යත්: මේ සස්නෙහි මහණ ප්‍රාතිමොක්ෂ-සංවරයෙන් සංවෘත වූයේ සිල්වත් වෙයි, ආචාර - ගොචර දෙකින් යුක්ත වූයේ අණුමාත්‍ර වූ ද වරදෙහි භය දක්නාසුලු වූයේ වෙසෙසි. ශික්ෂාපදයන් - ශික්ෂාකොට්ඨාසයන් අතුරෙහි හික්මියැ යුතු සියලු ශික්ෂාව මොනොවට ගෙනැ හික්මෙයි. (සංඝාදිසෙසාදි සාවශෙෂ සඞ්ඛ්‍යාත) ක්ෂුද්‍රශීලස්කන්ධ යැ (පාරාජිකාදි නිරවශෙෂ සඞ්ඛ්‍යාත) මහාශීලස්කන්ධ යැ යන ශීලය චාතුර්භූමකකුශලධර්මයන්ගේ ප්‍රතිලාභයට ප්‍රතිෂ්ඨා යැ ආදි යැ චරණ (-පාද) යැ සංයම යැ සංවර යැ උත්තම යැ ප්‍රමුඛ යි. මෝ අධිශීලශික්ෂා නමු.

අධිචිත්තශික්ෂා කවරැ යත්: මේ සස්නෙහි මහණ වස්තුකාම - ක්ලෙශ-කාමයන්ගෙන් වෙන් ව මැ (ශෙෂනීවරණසඞ්ඛ්‍යාත) අකුශලධර්මයන් ගෙන් වෙන් ව මැ (අරමුණට සිත නගන) විතර්කය සමග පවත්නා වූ (අරමුණෙහි සිත හසුරුවන) විචාරය සමග පවත්නා වූ (නීවරණ විගමයෙන් වූ) විවෙකයෙන් හෝ විවෙකයෙහි උපන් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන දැහැනට පැමිණ වෙසෙසි. විතර්ක විචාර සන්හිඳීමෙන් ස්වකීය අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සමාධිචිත්තයාගේ ශ්‍රෙෂ්ඨ වූ උදය ඇති, හෙවත් (විතර්කවිචාරාභාවයෙන්) එකලා වැ සම්ප්‍රයුක්තධර්මයන් නඟාසිටුවන (භාවනාවෙන් ප්‍රහීණ හෙයින්) විතර්ක - විචාර රහිත වූ ප්‍රථමධ්‍යානසමාධියෙන් හෝ සම්ප්‍රයුක්තසමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවැනි දැහැනට පැමිණ වෙසෙසි. ප්‍රීතිය ද ඉක්මැවීමෙන් විතර්කවිචාරයන් ද සන්හිඳුවීමෙන් ධ්‍යානොපෙක්ෂා ඇති වැ වාසය කරන්නේ ද වෙයි, (ස්මරණලක්ෂණ) සිහි ඇති වැ (අසම්මොහලක්ෂණ) නුවණ ද ඇති වැ නාමකායසම්ප්‍රයුක්ත වූ සැපය (ධ්‍යානයෙන් නැඟිසිටිය ද) රූපකායයෙන් විඳී, යම් ධ්‍යානයක් හෙතු කොටගෙන 'උපෙක්ෂා ඇත්තේ යැ ස්මෘතිමත් යැ සුඛවිහරණ ඇත්තේ යැ'යි ආර්යයෝ ප්‍රශංසා කෙරෙත් නම්, ඒ තුන්වැනි දැහැනට පැමිණ වෙසෙසි. පළමු උපචාරක්ෂණයෙහි මැ කායික සැපයත් කායික දුකත් ප්‍රහාණ කිරීමෙන් සොම්නස් දොම්නසුත් (=චෛතසික සැපදුක්) පළමු මැ අතුරුදහන් වීමෙන් දුක් නැති සැප නැති උපේක්ෂාවෙන් උපදවන ලද ස්මෘතිපාරිශුද්ධිය (පිරිසිදුසිහි) ඇති සිවුවැනි දැහැනට පැමිණ වෙසේ. මෝ අධිචිත්තශික්ෂා නමු.

අධිප්‍රඥා ශික්ෂා කවරැ යත්: මේ සස්නෙහි මහණ උදයව්‍යය ගාමිනී වූ ආර්ය (නිර්දොෂ) වූ නිර්වෙධපක්ෂයෙහි වූ මනා සේ නිවනට පමුණු-වන්නා වූ නුවණින් පරිපූර්ණ වූයේ ප්‍රඥාවත් වෙයි. හෙතෙම 'මේ දුකැ'යි තතු සේ දැනගනී. මේ දුක්සමුදය යැයි තතු සේ දැනගනී. මේ දුක් නිරොධ යැයි තතු සේ දැනගනී. මේ දුක් නිරොධයට පමුණුවන පිළිවෙතැ'යි තතු සේ දැනගනී. මොහු ආශ්‍රවයෝ යැයි තතු සේ දැනගනී. මේ ආශ්‍රවසමුදය යැයි තතු සේ දැනගනී. මේ ආශ්‍රවනිරොධ යැයි තතු සේ දැනගනී. මේ ආශ්‍රවනිරොධයට පමුණුවන පිළිවෙතැ'යි තතු සේ දැනගනී. මෝ අධිප්‍රඥාශික්ෂා නමු.

ඉමායො[1] තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, පස්සන්තො සික්ඛෙය්‍ය, පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය, චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය, සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය, විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය, සතිං උපට්ඨපෙන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො සික්ඛෙය්‍ය, පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය, පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය, ආචරෙය්‍ය, සමාචරෙය්‍ය, සමාදාය වත්තෙය්‍ය.

**ඉධාති** – ඉමිස්සා දිට්ඨියා, ඉමිස්සා ඛන්තියා, ඉමිස්සා රුචියා, ඉමස්මිං ආදායෙ[2], ඉමස්මිං ධම්මෙ, ඉමස්මිං විනයෙ, ඉමස්මිං ධම්මවිනයෙ, ඉමස්මිං පාවචනෙ, ඉමස්මිං බ්‍රහ්මචරියෙ, ඉමස්මිං සත්ථුසාසනෙ, ඉමස්මිං අත්තභාවෙ, ඉමස්මිං මනුස්සලොකෙ, තෙන වුච්චති ඉධාති. **ජන්තූති** – සත්තො නරො –පෙ– මනුජොති 'තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු.'

**යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙති** – යං කිඤ්චීති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'යං කිඤ්චි' ති. **විසමන්ති ජඤ්ඤාති** – විසමං කායකම්මං විසමන්ති ජානෙය්‍ය, විසමං වචීකම්මං විසමන්ති ජානෙය්‍ය, විසමං මනොකම්මං විසමන්ති ජානෙය්‍ය, විසමො පාණාතිපාතො විසමොති ජානෙය්‍ය, විසමං අදින්නාදානං විසමන්ති ජානෙය්‍ය, විසමො කාමෙසු මිච්ඡාචාරො විසමොති ජානෙය්‍ය, විසමො මුසාවාදො විසමොති ජානෙය්‍ය, විසමා පිසුනා වාචා විසමාති ජානෙය්‍ය, විසමා ඵරුසා වාචා විසමාති ජානෙය්‍ය, විසමො සම්ඵප්පලාපො විසමොති ජානෙය්‍ය, විසමං අභිජ්ඣං විසමන්ති ජානෙය්‍ය, විසමො ව්‍යාපාදො විසමොති ජානෙය්‍ය, විසමා මිච්ඡාදිට්ඨි විසමාති ජානෙය්‍ය, විසමා සඞ්ඛාරා විසමාති ජානෙය්‍ය, විසමා පඤ්ච කාමගුණා විසමාති ජානෙය්‍ය, විසමාති පඤ්ච නීවරණාති විසමාති ජානෙය්‍ය ආජානෙය්‍ය විජානෙය්‍ය පටිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍ය; **ලොකෙති** – අපායලොකෙ –පෙ– ආයතනලොකෙති 'යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ.'

**න තස්ස හෙතු විසමං චරෙය්‍යාති** – විසමස්ස කායකම්මස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස වචීකම්මස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස මනොකම්මස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස පාණාතිපාතස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස අදින්නාදානස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස කාමෙසු මිච්ඡාචාරස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස කාමෙසු මිච්ඡචාරස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස මුසාවාදස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමාය පිසුනාය වාචාය හෙතු විසමං න චරෙය්‍ය, විසමාය ඵරුසාය වාචාය හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස සම්ඵප්පලාපස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමාය අභිජ්ඣාය හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස ව්‍යාපාදස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමාය මිච්ඡාදිට්ඨියා හෙතු විසමං න චරෙය්‍ය, විසමානං සංඛාරානං හෙතු විසමං න චරෙය්‍ය, විසමානං පඤ්චන්නං කාමගුණානං හෙතු විසමං න චරෙය්‍ය, විසමානං පඤ්චන්නං නීවරණානං හෙතු විසමං න චරෙය්‍ය, විසමාය චෙතනාය හෙතු විසමං න චරෙය්‍ය, විසමාය පත්ථනාය හෙතු විසමං න චරෙය්‍ය, විසමාය පණිධියා හෙතු විසමං න චරෙය්‍ය න ආචරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍යාති–'න තස්ස හෙතු විසමං චරෙය්‍ය.'

---

1. ඉමා – ස. 2. ආදානෙ – සීමු I.

මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් (වෙන වෙන මැ පුරන්නට) සිතමින් හික්මෙන්නේ යැ, (මේ ශික්‍ෂා යැයි) දනිමින් හික්මෙන්නේ යැ, දක්මින් හික්මෙන්නේ යැ, (දුටු සේ) ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් හික්මෙන්නේ යැ, සිත නො සැලෙන සේ පිහිටුවමින් හික්මෙන්නේ යැ' සැදැහැයෙන් ඇලෙමින් හික්මෙන්නේ යැ, වීර්‍ය්‍ය දැඩි ව ගනිමින් හික්මෙන්නේ යැ, සිහි එළවමින් හික්මෙන්නේ යැ, සිත එකඟ කෙරෙමින් හික්මෙන්නේ යැ, නුවණින් දැනගනිමින් හික්මෙන්නේ යැ, (ස්වභාව ලක්‍ෂණයෙන්) දත යුතු දැය දනිමින් හික්මෙන්නේ යැ, (සාමාන්‍ය ලක්‍ෂණයෙන්) දත යුතු දැය හාත්පසින් දැනගනිමින් හික්මෙන්නේ යැ, හළ යුතු සමුදය දුරු කෙරෙමින් හික්මෙන්නේ යැ, වැඩිය යුතු මඟ වඩමින් හික්මෙන්නේ යැ, පසක් කළ යුතු නිවන පසක් කෙරෙමින් හික්මෙන්නේ යැ, (අධිශීලයෙහි) හැසිරෙන්නේ යැ, (අධිචිත්තයෙහි) මොනොවට හැසිරෙන්නේ යැ, (අධිප්‍රඥාව) මොනොවට ගෙන පවත්නේ යි.

**ඉධ** යනු: මේ බුදුරදුන් විසින් දක්නා ලදුයෙහි, මේ ක්‍ෂාන්තියෙහි, මේ රුචියෙහි, මේ ග්‍රහණයෙහි, මේ ධර්‍මයෙහි, මේ විනයෙහි, මේ ධර්‍ම - විනයෙහි, මේ ප්‍රවචනයෙහි, මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි, මේ ශාස්තෘශාසනයෙහි, මේ අත්බාවෙහි, මේ මිනිස්ලොවැ; එයින් කියනු ලැබේ 'ඉධ'යි. **ජන්තු** යනු: සත්ත්ව නර... මනුජ නුයි 'තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු' යනු වේ.

**යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ** - 'යං කිඤ්චි' යනු: සියල්ලෙන් සියල්ල සියලු පරිද්දෙන් සියල්ල අශෙෂ කොට නිරවශෙෂ කොට ගැනීම් වචනයෙකි මේ. 'යං කිඤ්චි' යනු: **විසමන්ති ජඤ්ඤා** - විෂම වූ කායකර්‍මය විෂම යයි දන්නේ නම්, විෂම වූ වාක්කර්‍මය... මනඃකර්‍මය... විෂම වූ ප්‍රාණඝාතය විෂම යයි දන්නේ නම්, විෂම වූ අදත්තාදානය... කාමමිථ්‍යාචාරය... මෘෂාවාදය... පෛශුන්‍යය... පරුෂවචනය... ප්‍රලාපවචනය... විෂම වූ අභිධ්‍යාව... ව්‍යාපාදය... මිථ්‍යාදෘෂ්ටිය... විෂම වූ කායසංස්කාරයෝ... විෂම වූ පඤ්චකාමගුණයෝ... විෂම වූ පඤ්චනීවරණයෝ විෂමයෝ යැ යි දන්නේ නම්, හාත්පසින් දන්නේ නම්, වෙසෙසින් දන්නේ නම්, මොනොවට දන්නේ නම්, ප්‍රතිවෙධ කරන්නේ නම්; **ලොකෙ** අපායලොකයෙහි... ආයතනලොකයෙහි නුයි 'යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ,' යනු වේ.

**න තස්ස හෙතු විසමං චරෙය්‍ය** - විෂම වූ කායකර්‍මය හෙතු කොට විෂමයෙහි නො හැසිරෙන්නේ යැ, විෂම වූ වාක්කර්‍මය... මනඃකර්‍මය හෙතු කොට... විෂම වූ ප්‍රාණඝාතය හේතු කොට විෂමයෙහි නො හැසිරෙන්නේ යැ, විෂම වූ අදත්තාදානය... කාමමිථ්‍යාචාරය... මෘෂාවාදය... පෛශුන්‍යය... පරුෂවචනය... සම්ප්‍රලාපය... අභිධ්‍යාව... ව්‍යාපාදය... මිථ්‍යාදෘෂ්ටිය... විෂම වූ සංස්කාරයන් හේතු කොට... විෂම වූ පඤ්චකාමගුණයන්... විෂම වූ පඤ්චනීවරණයන් හේතු කොට... විෂම වූ චෙතනාව... විෂම වූ ප්‍රාර්‍ථනාව... විෂම වූ ප්‍රණිධිය හේතු කොට විෂමයෙහි නො හැසිරෙන්නේ යැ, හාත්පසින් නො හැසිරෙන්නේ යැ, මොනොවට නො හැසිරෙන්නේ යැ, මොනොවට ගෙන නො පවත්නේ නුයි 'න තස්ස හෙතු විසමං චරෙය්‍ය' යනු වේ.

**අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරාති** – 'ජීවිත'න්ති ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං; අපිච, ද්වීහි කාරණෙහි අප්පකං ජීවිතං: ඨිතිපරිත්තතාය වා අප්පකං ජීවිතං, සරසපරිත්තතාය වා අප්පකං ජීවිතං. කථං ඨිතිපරිත්තතාය වා අප්පකං? අතීතෙ චිත්තක්ඛණෙ ජීවිත්ථ න ජීවති න ජීවිස්සති, අනාගතෙ චිත්තක්ඛණෙ ජීවිස්සති[1] න ජීවති න ජීවිත්ථ[2], පච්චුප්පන්නෙ චිත්තක්ඛණෙ ජීවති න ජීවිත්ථ න ජීවිස්සති.

1. "ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කෙවලා,
එකචිත්තසමායුත්තා ලහුසො වත්තතෙ[3] ඛණො.

2. චුල්ලාසීති සහස්සානි කප්පං[4] තිට්ඨන්ති යෙ මරූ,
න ත්වෙව තෙපි ජීවන්ති ද්වීහි චිත්තෙහි සංයුතා.[5]

3. යෙ නිරුද්ධා මරන්තස්ස තිට්ඨමානස්ස වා ඉධ,
සබ්බෙව[6] සදිසා ඛන්ධා ගතා අප්පටිසන්ධිකා.[7]

4. අනන්තරා[8] ච යෙ භග්ගා යෙ ච භග්ගා අනාගතා,
තදන්තරෙ නිරුද්ධානං වෙසමං[9] නත්ථි ලක්ඛණෙ.

5. අනිබ්බත්තෙන න ජාතො පච්චුප්පන්නෙන ජීවති,
චිත්තභඞ්ගා මතො ලොකො පඤ්ඤත්ති පරමත්ථියා.[10]

6. යථා නින්නා පවත්තන්ති ඡන්දෙන පරිණාමිතා,
අච්ඡින්නධාරා[11] වත්තන්ති සළායතනපච්චයා.*

7. අනිධානගතා භග්ගා පුඤ්ජො නත්ථි අනාගතෙ,
නිබ්බත්තා යෙව තිට්ඨන්ති ආරග්ගෙ සාසපූපමා.

8. නිබ්බත්තානඤ්ච ධම්මානං භඞ්ගො නෙසං පුරක්ඛතො,
පලොකධම්මා තිට්ඨන්ති පුරාණෙහි අමිස්සිතා.

9. අදස්සනතො ආයන්ති භඞ්ගා ගච්ඡන්ත්‍යදස්සනං,[12]
විජ්ජුප්පාදොව ආකාසෙ උප්පජ්ජන්ති වයන්ති චා"ති.

එවං ඨිතිපරිත්තතාය අප්පකං ජීවිතං.

---

1. ජීවිත්ථ - සීමු. I. 2. ජීවිස්ස - සීමු. I. 3. වත්තති - PTS. 4. කප්පං - වි. 5. සමොහිතා - සීමු. I. සමොහිතා - PTS. 6. සබ්බෙපි - සීමු. II. 7. අප්පටිසන්ධියා - වි. 8. න අන්තරා - ස. 9. වෙසම්මං - ස, PTS. 10. පරමත්ථිති - ස, පරමත්ථියා - වි. 11. අච්ඡින්නවාරා - PTS. * අයං ගාථා විසුද්ධිමග්ගෙ දිස්සති. 12. ගච්ඡන්ති අදස්සනං - සීමු. II.

**අප්පඤ්චිදං ජීවිතං ආහු ධීරා** – ‘ජීවිතං’ යනු: (අරූපධම්මයන්ගේ) ආයුෂය සිටීම යපනය යාපනය (=යැපීම) ඉරියනය පැවැත්ම පාලනය ජීවිතය ජීවිතේන්ද්‍රිය යි. තවද දෙ කරුණෙකින් ජීවිතය අල්ප වෙයි: ස්ථිතික්ෂණය මඳබැවින් හෝ ජීවිතය අල්ප යැ, කෘත්‍යලක්ෂණ හෝ සම්පත්තිලක්ෂණ රසය මඳබැවින් හෝ ජීවිතය අල්ප යි. කිසෙයින් ඨිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි ? යත්: අතීත චිත්තක්ෂණයෙහි ජීවත් විය, ජීවත් නො වෙයි, ජීවත් නො වන්නේ ය; අනාගතචිත්ත-ක්ෂණයෙහි ජීවත් වන්නේ යැ, ජීවත් නො වෙයි, ජීවත් නො වී; වර්තමාන චිත්තක්ෂණයෙහි ජීවත් වෙයි, ජීවත් නො වී, ජීවත් නො වන්නේ යි.

1. (සංස්කාරස්කන්ධ සඞ්ඛ්‍යාත) ජීවිතය ද, (රූපස්කන්ධ සඞ්ඛ්‍යාත) ආත්මභාවය ද, (වේදනාස්කන්ධ සඞ්ඛ්‍යාත) සුඛදුඃඛයෝ ද, (ධ්‍රැවසුඛ-ශුභාත්මභාව රහිත හෙයින්) කෙවල වූවාහු (විඥානස්කන්ධ සඞ්ඛ්‍යාත) එක් සිතක් සමග යෙදුණාහු (ජීවිතාදීන්ගේ) ක්ෂණය අල්පවශයෙන් පවත්නේ යැ.

2. යම් දෙවි කෙනෙක් කප් සුවාසූදහසක් ආයු ගෙන (නෙව-සඤ්ඤානාසඤ්ඤායතනයෙහි) සිටිත් නම්, ඔහු පවා දෙ සිතෙකින් යුක්ත වූවාහු නො මැ ජීවත් වෙති.

3. මෙ ලොවැ මළහු ගේ හෝ ජීවත් වන්නහු ගේ හෝ යම් ස්කන්ධ කෙනෙක් නිරුද්ධ වූවාහු ද, (ච්‍යුතියෙන් උඩ නිරුද්ධ වූ හෝ ප්‍රවෘත්තියෙහි නිරුද්ධ වූ හෝ) ඒ සියලු මැ ස්කන්ධයෝ සදෘශයෝ ය, (නිරුද්ධ වූ ස්කන්ධයන් පෙරළා අවුත් ගැළැපීමක් නැති බැවින්) ගියාහු අප්‍රතිසන්ධිකයෝ යැයි කියනු ලැබෙත්.

4. යම් ස්කන්ධ කෙනෙක් අනන්තර (=අතීත) වැ සිට බිඳීගියාහු ද, යම් අනාගත ස්කන්ධ කෙනෙකුත් බිඳීයන්නාහු ද, ඒ අතුරැ නිරුද්ධ වූ වර්තමානස්කන්ධයන්ගේ ලක්ෂණයෙහි විෂම බවෙක් (නානාත්වයෙක්) නැති.

5. නූපන් අනාගතස්කන්ධයෙන් නූපන්නේ යැ, ක්ෂණප්‍රත්‍යුත්පන්න වූ වර්තමානස්කන්ධයෙන් ජීවත් වෙයි, සත්ත්ව තෙම චිත්තයාගේ බිඳීමෙන් මළේ නමැ, (මළේ යැ යන) ප්‍රඥප්තිය පරමාර්ථ (=චිත්තභඞ්ග)ය ඇසුරැ කොට ඇත්තී යැ.

6. ඡන්ද විසින් පරිණාමිත වූවාහු නතු වූ පරිදි පවත්නාහු යැ. ෂඩායතනප්‍රත්‍යයෙන් නුසුන් ධාරා ඇති වැ පවතිත්.

7. බිඳුණු ස්කන්ධයෝ නිධානයට (=රැස් වීමට) නො ගියාහු යැ, අනාගතයෙහි දු ඔවුන් ගේ රැස් වීමෙක් නැති. ගිදිඅගැ අබඇට සෙයින් ස්ථිතික්ෂණයෙහි උපන්නාහු මැ සිටිත්.

8. ඉපැද්ද පවත්නාවූ ඒ ස්කන්ධධර්මයන්ගේ ද බිඳීම පෙරටු කරන ලද්දේ යැ. නැසෙන පියවි ඇත්තාහු පැරැණි ස්කන්ධයන් හා අමිශ්‍ර වූවාහු සිටිත්.

9. නො දක්නා තැනින් මැ පැමිණෙති. නැසීමෙන් මතු නො දක්නා බවට මැ යෙති. අහසැ විදුලි කෙටීමක් මෙන් උපදනාහු ද නැසෙන්නාහු ද වෙත්.

මෙසේ ඨිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

කථං සරසපරිත්තතාය අප්පකං ජීවිතං? අස්සාසූපනිබද්ධං ජීවිතං, පස්සාසූපනිබද්ධං ජීවිතං, අස්සාසපස්සාසූපනිබද්ධං ජීවිතං, මහාභූතූපනිබද්ධං ජීවිතං, කබලීකාරාහාරූපනිබද්ධං ජීවිතං, උස්මූපනිබද්ධං ජීවිතං, විඤ්ඤාණූපනිබද්ධං ජීවිතං, මූලම්පි ඉමෙසං දුබ්බලං, පුබ්බහෙතූපි ඉමෙසං දුබ්බලා, යෙපි පච්චයා තෙපි දුබ්බලා, යාපි පභාවිකා සාපි[1] දුබ්බලා, සහභූපි[2] ඉමෙසං දුබ්බලා, සම්පයොගාපි ඉමෙසං දුබ්බලා, සහජාපි ඉමෙසං දුබ්බලා, යාපි පයොජිකා සාපි දුබ්බලා, අඤ්ඤමඤ්ඤං නිච්චදුබ්බලා ඉමෙ, අඤ්ඤමඤ්ඤං අනවට්ඨිතා ඉමෙ, අඤ්ඤමඤ්ඤං පරිපාතයන්ති ඉමෙ, අඤ්ඤමඤ්ඤස්ස හි නත්ථි තායිතා, න චාපි ඨපෙන්ති අඤ්ඤමඤ්ඤං ඉමෙ, යොපි නිබ්බත්තකො සො න විජ්ජති.

10. "න ච කෙනචි කොචි හායති භඞ්ගබ්‍යං[3] ච ඉමෙහි සබ්බසො
පුරිමෙහි පභාවිතා ඉමෙ යෙපි පභවකා[4] තෙ පුරෙ මතා,
පුරිමංපි ච පච්ඡිමංපි ච අඤ්ඤමඤ්ඤං න කදාචි මද්දසු" න්ති.

එවං සරසපරිත්තතාය අප්පකං ජීවිතං. අපිච චාතුම්මහාරාජිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. තාවතිංසානං දෙවානං -පෙ- යාමානං දෙවානං -පෙ- තුසිතානං දෙවානං -පෙ- නිම්මාණරතීනං දෙවානං -පෙ- පරනිම්මිතවසවත්තීනං දෙවානං -පෙ- බ්‍රහ්මකායිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. වුත්තම්පි චෙතං භගවතා:

"අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, මන්තාය බොද්ධබ්බං, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං. නත්ථි ජාතස්ස අමරණං, යො භික්ඛවෙ චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භිය්‍යො.

11. අප්පමායු මනුස්සානං හීළෙය්‍ය නං සුපොරිසො,
චරෙය්‍යාදිත්තසීසොව නත්ථි මච්චුස්ස නාගමො.

12. අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති,
ආයු ඛීයති මච්චානං කුන්නදීනංව ඔදකං.ඝ"

1. යෙපි ... තෙපි - සීමු II PTS. 2. සහභූමි පි - සීමු. II. ස.
3. භඞ්ගබ්බා - සීමු II ස. මජ්සං. 4. පභාවිතා .... පභාවිකා-සීමු II. PTS. මජ්සං.
ඝ. මාරසංයුත්ත - පඨමවග්ග. මහානිද්දෙස - ජරාසුත්තනිද්දෙස,

කිසෙයින් සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි යත්: (නැහැසිදුරින් ඇතුළත පිවිසෙන වාත සඞ්ඛ්‍යාත) ආශ්වාසය නිසා පවත්නේ යැ ජීවිතය, ප්‍රශ්වාසය නිසා පවත්නේ යැ ජීවිතය, ආශ්වාසප්‍රශ්වාස පිළිබඳ යැ ජීවිතය, පෘථිව්‍යාදි මහාභූතයන් පිළිබඳ යැ ජීවිතය, කබලීකාරාහාරය පිළිබඳ යැ ජීවිතය, උණුසුම (=කර්මජතේජස) පිළිබඳ යැ ජීවිතය, භවාඞ්ගවිඥානය පිළිබඳ යැ ජීවිතය. මේ ආශ්වාසාදීන්ගේ මූලකාරණය (=හේතුව) ද දුබල යැ, මොවුන් ගේ අවිද්‍යාදි පූර්වහේතුහු ද දුබලයෝ යැ, ආරම්මණාදි සාධාරණ ප්‍රත්‍යයයෝ ද දුබලයෝ යැ, ප්‍රධාන වැ සිට උපදවන ඒ තෘෂ්ණාව ද දුබල යැ, මොවුන්ගේ එක් වැ උපන් රූපාරූපධර්මයෝ ද දුබලයෝ යැ, මොවුන්ගේ එක් වැ යෙදුණු අරූපධර්මයෝ ද දුබලයෝ යැ, මොවුන්ගේ සහජ (= එක් සිතෙහි උපන්) ධර්මයෝ ද දුබලයෝ යැ, ව්‍යුතිප්‍රතිසන්ධි විසින් යොදවන වෘත්තමූලක වූ ඒ තෘෂ්ණාව ද දුබල යැ, මොහු ඔවුනොවුන් නිරතුරු දුබලයෝ යැ, මොහු ඔවුනොවුන් අනවස්ථිතයෝ යැ, මොහු ඔවුනොවුන් පිරිහෙළති, ඔවුනොවුන් රැකීමෙක් නැති, මොහු ඔවුනොවුන් නො ද සිටුවති, (මොවුන්ගේ) උත්පාදකධර්මයෙක් ද නැත්.

10. එකෙක් එකක්හුගේ වශයෙන් නො ද පිරිහෙයි, මේ සියලු මැ ස්කන්ධයෝ සර්වප්‍රකාරයෙන් බිඳීමට යා යුත්තාහු යැ, මේ වර්තමානස්කන්ධයෝ පූර්වහේතුප්‍රත්‍යයයන් විසින් උපදවන ලද්දාහු ය, උත්පාදක වූ ඒ පූර්වහේතුප්‍රත්‍යයයෝ පළමු වැ මළාහු යැ, පූර්වහේතුප්‍රත්‍යයයෝ ද වර්තමාන ප්‍රත්‍යයසමුත්පන්නයෝ ද ඔවුනොවුන් කිසි කලෙක නො දුටු විරූහ.

මෙසේ සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

තවද - චාතුර්මහාරාජික දෙවියන්ගේ ජීවිතය පිණිස මිනිසුන්ගේ ජීවිතය අල්ප යැ, ජීවිතය පරිත්ත යැ, ජීවිතය මඳ යැ, ජීවිතය ක්ෂණික යැ, ජීවිතය සැහැල්ලු යැ, ජීවිතය ඉත්වර (= අදීර්ඝ) යැ, ජීවිතය කල් නො පවත්නේ යැ, ජීවිතය අචිරස්ථායී යැ, ත්‍රායස්ත්‍රිංශත් දෙවියන්ගේ යාමදෙවියන්ගේ - තුෂිතදෙවියන්ගේ - නිර්මාණරති දෙවියන්ගේ - පරනිර්මිතවශවර්ති දෙවියන්ගේ - බ්‍රහ්මකායික දෙවියන්ගේ ජීවිතය නිසා මිනිසුන්ගේ ජීවිතය අල්ප යැ, පරිත්ත යැ මඳ යැ ක්ෂණික යැ ලහුක යැ ඉත්තර යැ අනවස්ථිතය යැ අචිරස්ථායී වේ. වදාළේ මැ නු භාග්‍යවතුන් වහන්සේ විසින්:

"මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුෂ අල්ප යැ, පරලොව යා යුත්තේ යැ, නුවණින් දත යුතු යැ, කුසල් කළ යුතු යැ, බ්‍රහ්මචර විසිය යුතු යැ, උපන්නහුගේ නො මැරීමෙක් නැති.

මහණෙනි, යමෙක් කලක් ජීවත් වේ නම් හෙතෙම අවුරුදු සියයක් ජීවත්වෙයි. අධික වූයේ නම් ස්වල්පයක් මැයි.

11. මිනිසුන් ගේ ආයුෂ අල්ප යැ. සාධුපුරුෂ තෙම ඒ මඳ වූ ආයුෂට ලජ්ජී වන්නේ යැ. හිස ගිනි ගත්තකු සෙයින් කුසල්හි හැසිරෙන්නේ යැ. මරහු ගේ නොපැමිණීමෙක් නම් නැති.

12. රෑදවල්හු ඉක්මැ යෙති. ජීවිතෙන්ද්‍රියය අභාවයට යෙයි. කුඩා නදීන්ගේ දියත්තක් සෙයින් මිනිසුන්ගේ ආයුෂ ගෙවේ.

**අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරාති** – ‘ධීරා’ති[1] ධිතිමාති ධීරං, ධිතිසම්පන්නාති ධීරා, ධිකතපාපාති[2] ධීරා. ධී වුච්චති පඤ්ඤා යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා මන්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[3] තාය පඤ්ඤාය සමන්නාගතත්තා ධීරා. අපිච ඛන්ධධීරා ධාතුධීරා ආයතනධීරා පටිච්චසමුප්පාදධීරා සතිපට්ඨානධීරා සම්මප්පධානධීරා ඉන්ද්‍රියධීරා බොජ්ඣඞ්ගධීරා මග්ගධීරා ඵලධීරා නිබ්බානධීරා. තෙ ධීරා එවමාහු: මනුස්සානං අප්පං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතන්ති එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති ‘අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා’ති.

තෙනාහ භගවා:

“තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු
යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ,
න තස්ස හෙතු විසමං චරෙය්‍ය
අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා”ති.

## 2 – 5.

පස්සාමි ලොකෙ පරිඵන්දමානං
පජං ඉමං තණ්හාගතං භවෙසු,
හීනා නරා මච්චුමුඛෙ ලපන්ති
අවීතතණ්හාසෙ භවාභවෙසු.

**පස්සාමි ලොකෙ පරිඵන්දමානන්ති** – ‘පස්සාමී’ති මංසචක්ඛුනාපි පස්සාමි, දිබ්බචක්ඛුනාපි පස්සාමි, පඤ්ඤාචක්ඛුනාපි, පස්සාමි, බුද්ධචක්ඛුනාපි පස්සාමි, සමන්තචක්ඛුනාපි පස්සාමි, දක්ඛාමි ඔලොකෙමි නිජ්ඣායාමි උපපරික්ඛාමි. **ලොකෙති** – අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ.

1. ‘ධීරා’ති ධීරා – සීමු. II. 2. ධිකතපාපාති – සීමු. II. PTS.
3. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ.

**අප්පකමිදං ජීවිතං ආහු ධීරා** - 'ධීරා' යනු: ධෘතිමත් හුයි ධීරයෝ යැ, ධෘතිසම්පන්න හුයි ධීරයෝ යැ, ගරහන ලද පව් ඇත් හුයි ධීරයෝ සි. ප්‍රඥාව 'ධී' යයි කියනු ලැබෙයි; යම් ප්‍රඥාවක් දැනීම් ආකාරයෙක් අනිත්‍යාදිය විමසීමෙක් ප්‍රකෘතියෙන් විමසීමෙක් සිවුසස්දහම් විමසීමෙක් අනිත්‍යාදීන්ගේ සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිතබවෙක්, කුශල(=දක්ෂ)බවෙක් නිපුණබවෙක් විභාවනයෙක් සිතීමෙක් දැනීමෙක් උපපරීක්ෂාවක් (විස්තෘත හෙයින්) භූරිසඞ්ඛ්‍යාත ප්‍රඥාවක් කෙලෙසුන් නසන හෙයින් මේධාවක් (ලක්ෂණප්‍රතිවේධයට පමුණුවන හෙයින්) පරිණායිකාවක් විදර්ශනාවක් සම්ප්‍රජන්‍යයෙක් (නො දැමුණු සිත මාර්ගවීථියට නඟන හෙයින්) ප්‍රඥා නැමැති ප්‍රතෝදයෙක් (කෙවිටෙක්) ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාලෝකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යෝතයෙක් ප්‍රඥාරත්නයෙක් අමෝහයෙක් ධර්මවිචය-යෙක් සම්‍යග්දෘෂ්ටියක් වූවා ද, ඒ ප්‍රඥාවෙන් සමන්විත හෙයින් ධීරයෝ සි. තවද ස්කන්ධධීරයෝ යැ, ධාතු - ආයතන - ප්‍රතීත්‍යසමුත්පාද - ස්මෘති-ප්‍රස්ථාන - සම්‍යක්ප්‍රධාන - ඍද්ධිපාද - ඉන්ද්‍රිය - බොධ්‍යඞ්ග - මාර්ග - ඵල - නිර්වාණධීරයෝ යැ. ඒ ධීරයෝ මෙසේ කියති: මිනිසුන්ගේ ජීවිතය අල්ප යැ පරිත්ත යැ මඳ යැ ලහුක යැ ඉත්තර යැ අනවස්ථිතිය යැ අචිරස්ථායී යැ යි මෙසේ කීහු. මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ වහරත් හුයි 'අප්පකමිදං ජීවිතං ආහු ධීරා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"තස්මා හි -පෙ- ආහු ධීරා" යනු.

**2 - 5**

කාමාදිභවයෙහි නොහොත් පුනපුනා භවයෙහි අවිගත තෘෂ්ණා ඇති ගිත වූ කායාදිකර්ම ඇති සත්ත්වයෝ මරණමුඛයෙහි වැලැපෙති, ලොවැ කාමාදිභවයෙහි තෘෂ්ණායෙන් මඩනා ලද තෘෂ්ණාදිස්පන්දනයෙන් පොපියනු වූ මේ සත්ත්වසමූහයා මම මසැස් ආදියෙන් දකිමි.

**පස්සාමි ලොකෙ පරිඵන්දමානං** - 'පස්සාමි' යනු: මසැසිනුදු බලමි, දිවැසිනුදු බලමි, පැනැසිනුදු බලමි, බුදුඇසිනුදු බලමි, සමතැසිනුදු බලමි, දක්මි, අවලෝකන කෙරෙමි, සිතමි, විමසමි. **'ලොකෙ'** යනු: අපාය ලෝකයෙහි මනුෂ්‍යලෝකයෙහි දෙවලෝකයෙහි ස්කන්ධලෝකයෙහි ධාතුලෝකයෙහි ආයතනලෝකයෙහි.

**පරිඵන්දමානන්ති** - තණ්හාඵන්දනාය ඵන්දමානං දිට්ඨිඵන්දනාය ඵන්දමානං කිලෙසඵන්දනාය ඵන්දමානං පයොගඵන්දනාය ඵන්දමානං විපාකඵන්දනාය ඵන්දමානං දුච්චරිතඵන්දනාය ඵන්දමානං, රත්තං[1] රාගෙන ඵන්දමානං දුට්ඨං[2] දොසෙන ඵන්දමානං මූළ්හං[3] මොහෙන ඵන්දමානං විනිබද්ධං මානෙන ඵන්දමානං පරාමට්ඨං දිට්ඨියා ඵන්දමානං වික්ඛෙපගතං උද්ධච්චෙන ඵන්දමානං අනිට්ඨාගතං විචිකිච්ඡාය ඵන්දමානං ථාමගතං අනුසයෙහි ඵන්දමානං, ලාභෙන ඵන්දමානං අලාභෙන ඵන්දමානං යසෙන ඵන්දමානං අයසෙන ඵන්දමානං පසංසාය ඵන්දමානං නින්දාය ඵන්දමානං සුඛෙන ඵන්දමානං දුක්ඛෙන ඵන්දමානං ජාතියා ඵන්දමානං ජරාය ඵන්දමානං ව්‍යාධිනා ඵන්දමානං මරණෙන ඵන්දමානං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි ඵන්දමානං, නෙරයිකෙන දුක්ඛෙන ඵන්දමානං තිරච්ඡානයොනිකෙන දුක්ඛෙන ඵන්දමානං පෙත්තිවිසයිකෙන දුක්ඛෙන ඵන්දමානං මානුසිකෙන දුක්ඛෙන ඵන්දමානං ගබ්භොක්කන්ති[4]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං ගබ්භට්ඨිති[5]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං ගබ්භවුට්ඨානමූලකෙන දුක්ඛෙන ඵන්දමානං ජාතස්සූපනිබන්ධකෙන දුක්ඛෙන ඵන්දමානං ජාතස්ස පරාධෙය්‍යකෙන දුක්ඛෙන ඵන්දමානං අත්තූපක්කම[6]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං පරූපක්කම[7]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං දුක්ඛදුක්ඛෙන ඵන්දමානං සංඛාරදුක්ඛෙන ඵන්දමානං විපරිණාමදුක්ඛෙන ඵන්දමානං, චක්ඛුරොගෙන දුක්ඛෙන ඵන්දමානං සොතරොගෙන දුක්ඛෙන ඵන්දමානං ඝානරොගෙන දුක්ඛෙන ජිව්හාරොගෙන දුක්ඛෙන කායරොගෙන දුක්ඛෙන කණ්ණරොගෙන දුක්ඛෙන මුඛරොගෙන දුක්ඛෙන දන්තරොගෙන දුක්ඛෙන කාසෙන සාසෙන පිනාසෙන ඩහෙන ජරෙන කුච්ඡිරොගෙන මුච්ඡාය පක්ඛන්දිකාය සූලාය[8] විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන අපමාරෙන දද්දුයා කණ්ඩුයා කච්ඡුයා රඛසාය[9] විතච්ඡිකාය ලොහිතෙන පිත්තෙන මධුමෙහෙන අංසාය පිළකාය භගන්දලෙන පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන උතුපරිණාමජෙන ආබාධෙන විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය උච්චාරෙන පස්සාවෙන ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන දුක්ඛෙන මාතුමරණෙන දුක්ඛෙන පිතුමරණෙන දුක්ඛෙන භාතුමරණෙන දුක්ඛෙන භගිනිමරණෙන දුක්ඛෙන පුත්තමරණෙන දුක්ඛෙන ධීතුමරණෙන දුක්ඛෙන ඤාතිව්‍යසනෙන දුක්ඛෙන භොගව්‍යසනෙන දුක්ඛෙන රොගව්‍යසනෙන දුක්ඛෙන සීලව්‍යසනෙන දුක්ඛෙන දිට්ඨිව්‍යසනෙන දුක්ඛෙන ඵන්දමානං සම්ඵන්දමානං විප්ඵන්දමානං වෙධමානං පවෙධමානං සම්පවෙධමානං පස්සාමි දක්ඛාමි ඔලොකෙමි නිජ්ඣායාමි උපපරික්ඛාමීති-පස්සාමි ලොකෙ පරිඵන්දමානං.

---

1. රත්ත - සයා. 2. දුට්ඨ - සයා.
3 මූළ්හ. (සයාම පොත්ථකෙ ඊදිසෙසු සමාසො දිස්සති.)
4. ගබ්භාවක්කන්ති - සීමු. 1. 5. ගබ්භ ඨිති - සයා. මජසං.
6. අත්තූපක්කමෙන - සයා. මජසං. 7. පරූපක්කමෙන - සයා මජසං
8. සූලෙන - මජසං. 9. නඛසාය - සීමු. II.

**පරිඵන්දමානං** - තෘෂ්ණාස්පන්දනයෙන් පොපියනු = සැලෙනු වූ, දෘෂ්ටිස්පන්දනයෙන් සැලෙනු වූ, ක්ලේශස්පන්දනයෙන් සැලෙනු වූ, ප්‍රයෝගස්පන්දනයෙන් සැලෙනු වූ, විපාකස්පන්දනයෙන් සැලෙනු වූ, දුශ්චරිතස්පන්දනයෙන් සැලෙනු වූ, රාගයෙන් රක්ත වැ සැලෙනු වූ ද්වේෂයෙන් දුෂ්ට වැ සැලෙනු වූ මෝහයෙන් මූඪ වැ සැලෙනු වූ මානයෙන් අරමුණෙහි බැඳී සැලෙනු වූ දෘෂ්ටියෙන් පරාමෘෂ්ට වැ සැලෙනු වූ ඖද්ධත්‍යයෙන් වික්ෂේපයට පැමිණ සැලෙනු වූ විචිකිත්සායෙන් සන්නිෂ්ඨානයට නො පැමිණ සැලෙනු වූ අනුශයයන්ගෙන් ස්ථිර බවට පැමිණ සැලෙනු වූ ලාභයෙන් සැලෙනු වූ, අලාභයෙන් - යශසින් - අයශසින් - ප්‍රශංසායෙන් - නින්දායෙන් - සුඛයෙන් - දුඃඛයෙන් සැලෙනු වූ, ජාතියෙන් සැලෙනු වූ, ජරායෙන් - ව්‍යාධියෙන් මරණයෙන් - සොක-පරිදෙව-දුක්-දොම්නස්-උපායාසයන්ගෙන් සැලෙනු වූ, නිරයදුකින් සැලෙනු වූ, තිරිසන්යොන්හි දුකින් - ප්‍රෙතවිෂයයෙහි වූ දුකින් - මිනිස්ලොවැ වූ දුකින් සැලෙනු වූ, ගර්භාවක්‍රාන්තිමූලක දුකින් - ගර්භස්ථිතිමූලක දුකින් - ගර්භව්‍යුත්ථානමූලක දුකින් සැලෙනු වූ, උපන්නහු පිළිජග්නා දුකින් - උපන්නහු පරා අයත් කොට ඇති දුකින් - ආත්මොපක්‍රමමූලක දුකින් - පරොපක්‍රමමූලකදුකින් - දුඃඛදුඃඛ සඞ්ඛ්‍යාත කායිකචෛතසිකදුඃඛවේදනායෙන් - සංස්කාරදුඃඛයෙන් - විපරිණාම දුඃඛයෙන් සැලෙනු වූ, චක්ෂූරොගදුඃඛයෙන් සැලෙනු වූ, ශ්‍රොත්‍රරොග දුඃඛයෙන් - ඝ්‍රාණරොගදුඃඛයෙන් - ජිහ්වාරොගදුඃඛයෙන් - කායරොග දුඃඛයෙන් - කර්ණරොගදුඃඛයෙන් - මුඛරොගදුඃඛයෙන් - දන්තරොග දුඃඛයෙන්, කාසයෙන් ශ්වාසයෙන් පීනසයෙන් දාහයෙන් ජ්වරයෙන් කුක්ෂිරොගයෙන් මූර්ඡායෙන් ලොහිතාතිසාරයෙන් ආමශූලයෙන් මහා-විරෙචනයෙන් කුෂ්ඨයෙන් ගණ්ඩයෙන් ශ්වේතකුෂ්ඨයෙන් ශොෂව්‍යාධියෙන් අපස්මාරයෙන් දද්‍රු(=දද)යෙන් කණ්ඩූතියෙන් මහාකණ්ඩූතියෙන් නියපහරින් හටගත් රොගයෙන් විතච්ඡිකායෙන් (=අතුල්පතුල් පැලීමෙන්) රක්තපිත්තයෙන් මධුමෙහයෙන් අර්ශසින් රත්පිළිකාරොගයෙන් භගන්දරායෙන් පිතින් උපදනා රොගයෙන් සෙමින් උපදනා රොගයෙන් වයින් උපදනා රොගයෙන් සාන්නිපාතිකරොගයෙන් ඍතුපරිණාමයෙන් උපදනා රොගයෙන් විෂම වූ ස්ථානනිෂද්‍යාදියෙන් උපදනා රොගයෙන් වධබන්ධනාදි උපක්‍රමයෙන් උපදනා රොගයෙන් කර්මවිපාකයෙන් උපදනා රොගයෙන් ශීතයෙන් උෂ්ණයෙන් ජිඝත්සායෙන් පිපාසායෙන් උච්චාර-(=මලකිස)යෙන් ප්‍රස්‍රාව (=මූකිස)යෙන් මැසි මදුරු වා අවු දික්දූපගසින් වූ දුකින් මව මළ දුකින් පියා මළ දුකින් බෑයන් මළ දුකින් බූන් මළ දුකින් පුතුන් මළ දුකින් දූන් මළ දුකින් නෑයන්ගේ වැසනින් වූ දුකින් භොගව්‍යසනයෙන් වූ දුකින් රොගව්‍යසන දුකින් ශීලව්‍යසන දුකින් දෘෂ්ටිව්‍යසන දුකින් සැලෙනුවහු පුනපුනා සැලෙනුවහු වෙසෙසින් සැලෙනුවහු වෙවුලනුවහු වෙසෙසින් වෙවුලනුවහු පුනපුනා වෙවුලනුවහු බලමි දක්මි අවලොකන කෙරෙමි සිතමි විමසමි නුයි - 'පස්සාමි ලොකෙ පරිඵන්දමානං' යනු වේ.

**පජං ඉමං තණ්හාගතං භවෙසූති** – 'පජා'ති සත්තාධිවචනං. **තණ්හාති** – රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා භවතණ්හා විභවතණ්හා, තණ්හානුගතං තණ්හානුසටං තණ්හාපන්නං[1] තණ්හාපරිපතිතං[2] අභිභූතං පරියාදින්නචිත්තං; භවෙසූ'ති– කාමභවෙ රූපභවෙ අරූපභවෙති 'පජං ඉමං තණ්හාගතං භවෙසු.'

**හීනා නරා මච්චුමුඛෙ ලපන්ති**'ති – 'හීනා නරා'ති හීනෙන කායකම්මෙන සමන්නාගතාති හීනා නරා, හීනෙන වචීකම්මෙන සමන්නාගතාති හීනා නරා, හීනෙන මනොකම්මෙන සමන්නාගතා – හීනෙන පාණාතිපාතෙන සමන්නාගතා–හීනෙන අදින්නාදානෙන– හීනෙන කාමෙසු මිච්ඡාචාරෙන– හීනෙන මුසාවාදෙන– හීනාය පිසුනාය වාචාය– හීනාය ඵරුසාය වාචාය– හීනෙන සම්ඵප්පලාපෙන– හීනාය අභිජ්ඣාය– හීනෙන ව්‍යාපාදෙන– හීනාය මිච්ඡාදිට්ඨියා– හීනෙහි සංඛාරෙහි– හීනෙහි පඤ්චහි කාමගුණෙහි– හීනෙහි පඤ්චහි නීවරණෙහි– හීනාය චෙතනාය– හීනාය පත්ථනාය– හීනාය පණිධියා සමන්නාගතාති හීනා නිහීනා ඔමකා ලාමකා ජතුක්කා[3] පරිත්තාති හීනා නරා. **මච්චුමුඛෙ ලපන්තීති** – 'මච්චුමුඛෙ' ති මාරමුඛෙ මරණමුඛෙ මච්චුපත්තා මච්චුසම්පත්තා මච්චූපගතා මාරපත්තා මාරසම්පත්තා මාරූපගතා මරණපත්තා මරණසම්පත්තා මරණූපගතා ලපන්ති සල්ලපන්ති සොචන්ති කිලමන්ති පරිදෙවන්ති උරත්තාළිං කන්දන්ති සම්මොහං ආපජ්ජන්තීති 'හීනා නරා මච්චුමුඛෙ ලපන්ති.'

**අවීතතණ්හා සෙ භවාභවෙසූ**'ති – 'තණ්හා'ති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා; **භවාභවෙසූති** – භවාභවෙ කම්මභවෙ පුනබ්භවෙ, කාමභවෙ කම්මභවෙ කාමභවෙ පුනබ්භවෙ, රූපභවෙ කම්මභවෙ රූපභවෙ පුනබ්භවෙ, අරූපභවෙ කම්මභවෙ අරූපභවෙ පුනබ්භවෙ, පුනප්පුනභවෙ පුනප්පුනගතියා පුනප්පුනඋප්පත්තියා පුනප්පුනපටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා අවීතතණ්හා අවිගතතණ්හා අචත්තතණ්හා අවන්තතණ්හා අමුත්තතණ්හා අප්පහීනතණ්හා අප්පටිනිස්සට්ඨතණ්හාති 'අවීතතණ්හා සෙ භවාභවෙසු'.

තෙනාහ භගවා:

"පස්සාමි ලොකෙ පරිඵන්දමානං
පජං ඉමං තණ්හාගතං භවෙසු,
හීනා නරා මච්චුමුඛෙ ලපන්ති
අවීතතණ්හා සෙ භවාභවෙසූ"ති.

1. තණ්හාභිපන්නං – ස. 2. පාතිතං – ස. 3. ජතුක්කා – සීමු. II.

**පජං ඉමං තණ්හාගතං භවෙසු** – ‘පජා’ යනු: සත්තට නමෙකි. **තණ්හා** යනු: රූපතෘෂ්ණා යැ ශබ්දතෘෂ්ණා යැ ගන්ධතෘෂ්ණා යැ රසතෘෂ්ණා යැ ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යැ ධර්මතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි. තෘෂ්ණාවට පිවිසි තෘෂ්ණාවෙන් වැසුණු තෘෂ්ණාවට පැමිණි තෘෂ්ණාවෙන් හෙලන ලද මඩනා ලද්දහු හාත්පසින් ගන්නාලද සිත් ඇතියහු; **භවෙසු** – කාමභවයෙහි රූපභවයෙහි අරූපභවයෙහි නුයි: ‘පජං ඉමං තණ්හාගතං භවෙසු’ යනු වේ.

**හීනා නරා මච්චුමුඛෙ ලපන්ති** – ‘හීනා නරා’ යනු: හීන වූ කායකර්මයෙන් යුක්ත වූවාහු නුයි හීනනරයෝ = සත්ත්වයෝ; හීන වූ වාක්කර්මයෙන් යුක්ත වූවාහු නුයි හීනනරයෝ, හීන වූ මනඃකර්මයෙන් යුක්ත වූවාහු – හීන වූ ප්‍රාණඝාතයෙන් යුක්ත වූවාහු – හීන වූ අදත්තාදානයෙන් – හීන වූ කාමමිථ්‍යාචාරයෙන් – හීන වූ මෘෂාවාදයෙන් – හීන වූ පෛශුන්‍ය වචනයෙන් – හීන වූ පරුෂවචනයෙන් – හීන වූ සම්ප්‍රලාපයෙන් – හීන වූ අභිධ්‍යායෙන් – හීන වූ ව්‍යාපාදයෙන් – හීන වූ මිථ්‍යාදෘෂ්ටියෙන් – හීන වූ සංස්කාරයන්ගෙන් – හීන වූ පඤ්චකාමගුණයන්ගෙන් – හීන වූ පඤ්ච නීවරණයෙන් – හීන වූ චේතනායෙන් – හීන වූ ප්‍රාර්ථනායෙන් – හීන වූ ප්‍රණිධියෙන් යුක්ත වූවාහු නුයි හීන වූවාහු නිහීන වූවාහු ඔමක වූවාහු ලාමක වූවාහු අප්‍රත්‍යය වූවාහු පරිත්ත වූවාහු නුයි හීන වූ සත්ත්වයෝ; **මච්චුමුඛෙ ලපන්ති** – ‘මච්චුමුඛෙ’ යනු: මාරමුඛයෙහි මරණමුඛයෙහි මෘත්‍යු = මරු වෙත පැමිණියාහු, මරු වෙත සපැමිණියාහු මරුට උපගත වූවාහු, මරණයට පැමිණියාහු, සපැමිණියාහු, මරණෝපගත වූවාහු කියති, පුනපුනා කියති, ශෝක කෙරෙති, වෙහෙසෙති, පරිදෙවනා කෙරෙති, ළෙහි පැහැරැ හඬති. සම්මෝහයට පැමිණෙත් නුයි – ‘හීනා නරා මච්චුමුඛෙ ලපන්ති’ යනු වේ.

**අවීතතණ්හාසෙ භවාභවෙසු** – ‘තණ්හා’ යනු: රූපතෘෂ්ණා යැ... ධර්මතෘෂ්ණා යි. **භවාභවෙසු** – භව අභව සඞ්ඛ්‍යාතකාමභවයෙහි හා රූපාරූපභවයෙහි වූ, කර්මවෘත්තයෙහි විපාකවෘත්තයෙහි, කාමධාතුයෙහි වූ කර්මවෘත්ත විපාකවෘත්තයෙහි, රූපධාතුයෙහි වූ කර්මවෘත්තවිපාකවෘත්තයෙහි, අරූප–ධාතුයෙහි වූ කර්මවෘත්තවිපාකවෘත්තයෙහි, නැවත නැවත උත්පත්ති–යෙහි, පුනපුනා පස්ගතියෙහි, පුනපුනා උපතෙහි, පුනපුනා පිළිසඳෙහි, පුනපුනා ආත්මභාවයන්ගේ පහළ වීමෙහි පහ නො වූ තෘෂ්ණා ඇති අවිගත තෘෂ්ණා ඇති (තදඞ්ග විසින්) ත්‍යාග නො කළ තෘෂ්ණා ඇති (විෂ්කම්භණ විසින්) වමනය නො කළ තෘෂ්ණා ඇති (සමුච්ඡේද විසින්) නො මිදූ තෘෂ්ණා ඇති (ප්‍රතිප්‍රශ්‍රබ්ධි විසින්) අප්‍රහීණ තෘෂ්ණා ඇති (නිස්සරණ ප්‍රහාණ විසින්) අප්‍රතිනිසෘෂ්ට තෘෂ්ණා ඇත් නුයි – ‘අවීතතණ්හාසෙ භවාභවෙසු’ යනු වේ.

එයින් වදාළහ බුදුහු: “පස්සාමි – පෙ – භවාභවෙසු” යි.

2 - 6

මමායිතෙ පස්සථ ඵන්දමානෙ
මච්ඡෙව[1] අප්පොදකෙ[2] ඛීණසොතෙ,
එතම්පි[3] දිස්වා අමමො චරෙය්‍ය
භවෙසු ආසත්තිමකුබ්බමානො.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ**'ති - 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච.

කතමං තණ්හාමමත්තං? යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමකතං මරියාදිකතං[4] ඔධිකතං පරියන්තකතං පරිග්ගහිතං මමායිතං ඉදං මමං එතං මමං එත්තකං මමං එත්තාවතා මමං මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථු හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ජනපදො කොසො ච කොට්ඨාගාරං ච කෙවලම්පි මහාපඨවිං තණ්හාවසෙන මමායති. යාවතා[5] අට්ඨසතතණ්හාවිචරිතං, ඉදං තණ්හාමමත්තං.

කතමං දිට්ඨිමමත්තං? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං[6] දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො[7] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො අයාථාවකස්මිං 'යාථාවක'න්ති[8] ගාහො යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි, ඉදං දිට්ඨිමමත්තං.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ**'ති මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි ඵන්දන්ති, අච්ඡිජ්ජන්තෙපි[9] ඵන්දන්ති, අච්ඡින්නෙපි ඵන්දන්ති, මමායිතං ච වත්ථුං විපරිණාමසඞ්කිනොපි ඵන්දන්ති, විපරිණාමන්තෙපි ඵන්දන්ති, විපරිණතෙපි ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්ති. එවං ඵන්දමානෙ සම්ඵන්දමානෙ විප්ඵන්දමානෙ වෙධමානෙ පවෙධමානෙ සම්පවෙධමානෙ පස්සථ දක්ඛථ ඔලොකෙථ නිජ්ඣායථ උපපරික්ඛථාති 'මමායිතෙ පස්සථ ඵන්දමානෙ.'

---

1. මච්ඡාව - මු. II. 2. අප්පොදක - ස්‍යා. 3. එවම්පි - මු II.
4. සීමාකතං - මු. II. මරියාදකතං - මු. I. මජසං.
5. 'යාවතා'ති ස්‍යාම පොත්ථකෙ නත්ථි. 6. විප්ඵන්දිකං - සීමු I. මජසං.
7. පතිට්ඨාහො - සීමු. I මජසං.
8. අයාථාවකස්මිං යාථාවකන්ති - සීමු. II. - අයථාවතස්මිං යථාවතන්ති-ස.
9. අච්ඡිජ්ජන්තෙපි - සීමු. II.

**2 – 6.**

සිඳීගිය දහර ඇති දියත්තෙක්හි පොපියන (සැලෙන) මසුන් මෙන් මාගේ යැයි ගත්තා ලද වස්තුයෙහි පොපියන සත්ත්වයන් බලවු. (මමායිත වස්තුයෙහි) තෙල ආදීනවය ද දැක මමායන රහිත වැ කාමාදි-භවයෙහි නො ඇලෙමින් හැසිරෙත්තේ යි.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ** – 'මමත්තා' යනු: තණ්හාමමත්වය ද, දිට්ඨිමමත්වය ද යි මමත්ව (ආලය) දෙකෙකි: තණ්හාමමත්ව කවරේ ? යත්: 'මේ මාගේ යැ, තෙල මාගේ යැ, මෙතෙක් මාගේ යැ, මෙ පමණ මාගේ යැ'යි යම්තාක් තණ්හා කොටසින් හිමි කරන ලද ද, මර්‍යාදා කරන ලද ද, අවධි කරන ලද ද, පරිච්ඡේද කරන ලද ද, අයත් කරන ලද ද, මමායන කරන ලද ද; 'මාගේ රූපයෝ යැ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ඵස්සු යැ අතුරුණු යැ පොරෝන යැ දැසිදස්හු යැ එළුබැටළු යැ හූරුකුකුළු යැ ඇත්අස්ගවවෙළඹු යැ කෙත් යැ වතු යැ අමුරන්, රන්රන්, ගම්නියම්ගම්රජදහන්හු යැ රට යැ දනවු යැ කොෂ යැ කොටුගුළු යැ'යි සියලු මැ මහපොළොව තණ්හාවශයෙන් මමායන කෙරෙයි. යම්තාක් අෂ්ටෝත්තරශතතණ්හාවිචරිතයෙක් වේ ද, මේ යැ තණ්හාමමත්ව නම්.

දිට්ඨිමමත්ව කවරේ ? යත්: ('රූපං අත්තතො සමනුපස්සති' යනාදීන් සිටි) විංශද්වස්තුක සත්කායදිට්ඨි යැ, ('නත්‍ථි දින්නං' යනාදීන් පැවැති) දශවස්තුක මිථ්‍යාදිට්ඨි යැ, ('සස්සතො ලොකො' යනාදි නයින් පැවැති) දශවස්තුක අන්තග්‍රාහිකා දිට්ඨි යැ යන මෙබඳු වූ දිට්ඨියක් දිට්ඨිගත යෙක් දිට්ඨිගහනයෙක් දිට්ඨිකාන්තාරයෙක් (සම්‍යග්දිට්ඨිය විනිවිදින) දිට්ඨිවිශූකයෙක් දිට්ඨිචලනයෙක් දිට්ඨිසංයොජනයෙක් (අරමුණ දැඩි කොට) ගැනීමෙක් බලවත් ගැනීමෙක්(නිත්‍යාදිවශයෙන්)අභිනිවේශයෙක් පරාමර්‍ශ-යෙක් කුත්සිතමාර්‍ගයෙක් අයථාමාර්‍ගයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්‍ථායතන-යෙක් විරුද්ධග්‍රාහයෙක් විපරීතග්‍රාහයෙක් විපර්‍යාසග්‍රාහයෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි ස්වභාව යැයි ගැනීමෙක් වේ ද, යම්තාක් දෙසැට මිසදිටු කෙනෙක් වෙත් ද, මේ යැ දිට්ඨිමමත්ව නම්.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ** – මාගේ යැයි ගත් වස්තුව අසිඳ ගනිතියි සැක ඇති ව ද සැලෙති. අසිඳුනා කල්හි දු සැලෙති. අසිඳගත් කල්හි දු සැලෙත්. තවද මමායිත වස්තුව පෙරළෙයි යන සැක ඇති ව ද සැලෙති. පෙරළෙන කල්හි දු සැලෙති. පෙරළුණු කල්හි දු සැලෙති, අතිශයින් සැලෙති, විවිධ ව සැලෙති, බියෙන් වෙවුලති, තැති ගනිති, ලොමුදහ ගනිත්. මෙසෙයින් සැලෙන විසැලෙන වෙවුලන තැති ගන්නා ලොමුදහ ගන්නා සත්ත්වයන් බලවු, දකිවු සිතවු විමසවු. එහෙයින් 'මමායිතෙ පස්සථ ඵන්දමානෙ' යනු වේ.

**මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ**’ති - යථා මච්ඡා[1] අප්පොදකෙ පරිත්තොදකෙ උදකපරියාදානෙ[2] කාකෙහි වා කුලලෙහි වා බලාකාහි[3] වා යෙහි වා තෙහි පරිපාතියමානා උක්ඛිපියමානා ඛජ්ජමානා ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්ති, එවමෙවං පජා මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි ඵන්දන්ති, අච්ඡින්දන්තෙපි ඵන්දන්ති, අච්ඡින්නෙපි ඵන්දන්ති, මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනොපි ඵන්දන්ති, විපරිණාමන්තෙපි ඵන්දන්ති, විපරිණතෙපි ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්තීති ‘මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ.’

**එතම්පි[4] දිස්වා අමමො චරෙය්‍යා**ති - එතං[5] ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මමත්තෙසූති - එතම්පි දිස්වා; **අමමො චරෙය්‍යා**’ති - ‘මමත්තා’ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච -පෙ- ඉදං තණ්හාමමත්තං. දිට්ඨිමමත්තඤ්ච -පෙ- ඉදං දිට්ඨිමමත්තං. තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අමමායන්තො සොතං අමමායන්තො ඝානං අමමායන්තො ජිව්හං අමමායන්තො කායං අමමායන්තො මනං අමමායන්තො රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ ධම්මෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අමමායන්තො අගණ්හන්තො අපරාමසන්තො අනභිනිවිසන්තො චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති ‘එතම්පි[6] දිස්වා අමමො චරෙය්‍ය.’

**භවෙසු ආසත්තිමකුබ්බමානො**’ති - ‘භවෙසූ’ති කාමභවෙ රූපභවෙ අරූපභවෙ; ආසත්ති වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. ‘භවෙසු ආසත්තිමකුබ්බමානොති’ - ඡන්දං පෙමං රාගං ඛන්තිං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානොති ‘භවෙසු ආසත්තිමකුබ්බමානො.’

තෙනාහ භගවා:

“මමායිතෙ පස්සථ ඵන්දමානෙ
මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ,
එතම්පි[6] දිස්වා අමමො චරෙය්‍ය
භවෙසු ආසත්තිමකුබ්බමානො”ති.

**2 - 7**

උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං
ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො,[7]
යදත්තගරහී තදකුබ්බමානො
න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො.

1. මච්ඡා - සීමු II. 2. පරියාදින්නොදකෙ - සීමු. I. 3. බලාකෙහි - ස්‍යා.
4. එවම්පි - සීමු. II. 5. එවං - සීමු. II. 6. එවම්පි - සීමු. I.
7. අනනුගිද්ධො - ස

**මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ** – මඳ වූ කැලැඹුණු සිඳුණු දියෙහි කපුඹන් හෝ උක්සන් හෝ කොකුන් හෝ අන්‍ය පක්ෂි කෙනකුන් හෝ විසින් වෙහෙසනු ලබන නහනු ලබන කනු ලබන (එහෙයින් ම) සැලෙන විසැලෙන වෙවුලන අතිශයින් වෙවුලන තැති ගත්තා මසුන් මෙන් මේ සත්ත්වයෝ මමායිත වස්තුව අසිඳගනිති සැක ඇති ව සැලෙති, අසිඳුනා කල්හි දු සැලෙති, අසිඳගත් කල්හි දු සැලෙති, මමායිත වස්තුව විපරිණාම (=පෙරළෙන) සැක ඇති ව... පෙරළෙන කල්හි ... පෙරළුණු කල්හි දු සැලෙති, විසැලෙති, වෙවුලති, තැතිගනිති, ලොමුදහ ගනිත් නුයි 'මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ' යනු වේ.

**එතම්පි දිස්වා අමමො චරෙය්‍ය** – මමත්වයෙහි තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත (=ප්‍රකට) කොට නුයි **'එතම්පි දිස්වා අමමො චරෙය්‍ය'** යනු වේ. 'මමත්තා' යනු: තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය දැයි මමත්ව දෙකෙකි...තෘෂ්ණාමමත්වය හැරපියා, දෘෂ්ටිමමත්වය දුරු කොට, ඇස තෘෂ්ණාදෘෂ්ටි විසින් ආලය නො කරනුයේ කන...නැහය...දිව...කය...සිත මමායන (= ආලය) නො කරනුයේ, රූප ශබ්ද ගන්ධ රස පහස් දහම් කුලය ගණයා ආවාසය ලාභය යසස පැසැසුම සුවය සිවුර පිඬුවා සෙනසුන ගිලන්පස බෙහෙත්පිරිකර, කාම – රූප – අරූපධාතුව, කාම – රූප – අරූප භවය, සඤ්ඤ – අසඤ්ඤ – නෙවසඤ්ඤනාසඤ්ඤභවය, එකවොකාර – චතුවොකාර – පඤ්චවොකාරභවය, අතීතය අනාගතය ප්‍රත්‍යුත්පන්නය රූපායතනය, ශබ්දායතනය ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනය ධර්මායතනය ආලය නො කරනුයේ නො ගන්නේ පරාමර්ශ නො කෙරෙමින් නො බස්මින් හැසිරෙන්නේ යැ...යපනය කරන්නේ නුයි 'එතම්පි දිස්වා අමමො චරෙය්‍ය'.

**භවෙසු ආසත්තිමකුබ්බමානො** – 'භවෙසු' යනු: කාම – රූප – අරූප භවයෙහි; 'ආසත්ති' යී තෘෂ්ණාව කියනු ලබා. රාගය සංරාගය... අභිධ්‍යාව ලොභඅකුශලමූලය යි. 'භවෙසු ආසත්තිමකුබ්බමානො' යනු: ඡන්දය ප්‍රේමය රාගය කැමැත්ත නො කරනුයේ නූපදවනුයේ වෙසෙසින් නූපදවනුයේ නො නිපදවනුයේ නුයි 'භවෙසු ආසත්තිමකුබ්බමානො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"මමායිතෙ – පෙ – ආසත්තිමකුබ්බමානො" යී.

**2 - 7.**

(ඵස්ස – ඵස්සසමුදයාදි) දෙ දෙ අන්තයන්හි ඡන්දරාගය දුරු කොට (චක්ඛුසම්ඵස්සාදි) ස්පර්ශය ත්‍රිවිධ පරිඥයෙන් දැන රූපාදියෙහි ගිජු නො වූ කළ නො කළ හෙයින් තමහට ගරහ උපදවන කායදුශ්චරිත කායසුචරිතාදිය නො කරන ධීර (ප්‍රාඥ) තෙම රූප ශබ්ද (ගන්ධරසස්ප්‍රෂ්ටව්‍ය) ආයතනයන්හි තෘෂ්ණාදෘෂ්ටි විසින් නො ඇලේ.

**උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දන්ති** – 'අන්තා'ති ද්වෙ අන්තා: ඵස්සො එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො. අතීතො එකො අන්තො, අනාගතො දුතියො අන්තො. සුඛා වෙදනා එකො අන්තො, දුක්ඛා වෙදනා දුතියො අන්තො. නාමං එකො අන්තො, රූපං දුතියො අන්තො. ඡ අජ්ඣත්තිකානි ආයතනානි එකො අන්තො, ඡ බාහිරානි ආයතනානි දුතියො අන්තො. සක්කායො එකො අන්තො, සක්කායසමුදයො දුතියො අන්තො. **ඡන්දො**'ති යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්දනීවරණං.[*] **උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දන්ති** – උභොසු අන්තෙසු ඡන්දං විනෙය්‍ය පටිවිනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය ව්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති 'උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං.'

**ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධොති** – **'ඵස්සො'**ති චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො අධිවචනසම්ඵස්සො පටිඝසම්ඵස්සො සුඛවෙදනීයො සම්ඵස්සො දුක්ඛවෙදනීයො සම්ඵස්සො අදුක්ඛමසුඛවෙදනීයො සම්ඵස්සො කුසලො ඵස්සො අකුසලො ඵස්සො අව්‍යාකතො ඵස්සො කාමාවචරො ඵස්සො රූපාවචරො ඵස්සො අරූපාවචරො ඵස්සො සුඤ්ඤතො ඵස්සො අනිමිත්තො ඵස්සො අප්පණිහිතො ඵස්සො ලොකියො ඵස්සො ලොකුත්තරො ඵස්සො අතීතො ඵස්සො අනාගතො ඵස්සො පච්චුප්පන්නො ඵස්සො, යො එවරූපො ඵස්සො ඵුසනා සම්ඵුසනා[1] සම්ඵුසිතත්තං, අයං වුච්චති ඵස්සො.

**ඵස්සං පරිඤ්ඤායා**'ති – ඵස්සං තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා ඤාතපරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය.

කතමා ඤාතපරිඤ්ඤා? ඵස්සං ජානාති: 'අයං චක්ඛුසම්ඵස්සො, අයං සොතසම්ඵස්සො, අයං ඝානසම්ඵස්සො, අයං ජිව්හාසම්ඵස්සො, අයං කායසම්ඵස්සො, අයං මනොසම්ඵස්සො, අයං අධිවචනසම්ඵස්සො, අයං පටිඝසම්ඵස්සො, අයං සුඛවෙදනීයො ඵස්සො, අයං දුක්ඛවෙදනීයො ඵස්සො, අයං අදුක්ඛමසුඛවෙදනීයො ඵස්සො, අයං කුසලො ඵස්සො, අයං අකුසලො ඵස්සො, අයං අව්‍යාකතො ඵස්සො, අයං කාමාවචරො ඵස්සො, අයං රූපාවචරො ඵස්සො, අයං අරූපාවචරො ඵස්සො, අයං සුඤ්ඤතො ඵස්සො, අයං අනිමිත්තො ඵස්සො, අයං අප්පණිහිතො ඵස්සො, අයං ලොකියො ඵස්සො, අයං ලොකුත්තරො ඵස්සො, අයං අතීතො ඵස්සො, අයං අනාගතො ඵස්සො, අයං පච්චුප්පන්නො ඵස්සො'ති ජානාති පස්සති. අයං ඤාතපරිඤ්ඤා.

---

1. ඵුස්සනා, සම්ඵුස්සනා - ස. * ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.

**උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං** – ‘අන්තා’ යනු: අන්ත දෙකෙකි: ස්පර්ශය එක් අන්තයෙකැ, ස්පර්ශසමුදය දෙවැනි අන්තය යි. අතීතය එක් අන්තයෙකැ, අනාගතය දෙවැනි අන්තය යි. සුඛවේදනාව එක් අන්තයෙකැ, දුක් වේදනාව දෙවැනි අන්තය යි. නාමය එක් අන්තයෙකැ, රූපය දෙවැනි අන්තය යි. ෂඩ් ආධ්‍යාත්මිකායතනයෝ එක් අන්තයෙකැ, ෂඩ් බාහිරායතනයෝ දෙවැනි අන්තය යි. සත්කාය එක් අන්තයෙකැ, සත්කායසමුදය දෙවැනි අන්තය යි. **ඡන්ද** නම්: පස්කම්ගුණයෙහි කාම සඞ්ඛ්‍යාත ඡන්දය කාමරාගය කාමනන්දිය කාමතෘෂ්ණාව කාමස්නේහය කාමපරිදාහය කාමමූර්ඡාව කාමඅධ්‍යවසානය (–බැසගැනීම) කාමෞඝය කාමයෝගය කාමෝපාදානය කාමච්ඡන්දනීවරණය යි. **උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං** – දෙ දෙ අන්තයන්හි ඡන්දරාගය සන්හිඳුවන්නේ යැ, දුරු කරන්නේ යැ, බැහැර කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අභාවයට පමුණුවන්නේ නුයි ‘උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං’ යනු වේ.

**ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො** – ‘ඵස්සො’ යනු: චක්ඛුසම්ඵස්ස යැ සොත – ඝාන – ජිව්හා – කාය – මනොසම්ඵස්ස යැ අධිවචන(–මනොද්වාරික) සම්ඵස්ස යැ පටිඝ(පඤ්චද්වාරික)සම්ඵස්ස යැ සුඛවේදනීය – දුක්ඛවේදනීය– අදුක්ඛමසුඛවේදනීය සම්ඵස්ස යැ කුසල්සිත් සහගත පහස යැ අකුසල්සිත් සහගත – අව්‍යාකෘත සිත් සහගත – කාමාවචර සිත් සහගත – රූපාවචර – අරූපාවචර – ශූන්‍යත – අනිමිත්ත – අප්‍රණිහිත – ලෞකික – ලෝකොත්තර– අතීත – අනාගත – වර්තමාන පහස යැ යන මෙබඳු වූ පහස පහස්නා අයුරු මොනොවට ස්පර්ශ කළ බව ‘ඵස්ස’ යි කියනු ලැබේ.

**ඵස්සං පරිඤ්ඤාය** – ස්පර්ශය ඥාතපරිඥා තීරණපරිඥා ප්‍රහාණපරිඥා යන තුන් පරිඥායෙන් දැන.

ඥාතපරිඥා කවරී ද යත්: මේ චක්ඛුසම්ඵස්ස යැ, මේ ශ්‍රෝත්‍රසංස්පර්ශ යැ, මේ ඝ්‍රාණසංස්පර්ශ යැ, මේ ජිහ්වාසංස්පර්ශ යැ, මේ කායසංස්පර්ශ යැ, මේ මනඃසංස්පර්ශ යැ, මේ අධිවචනසංස්පර්ශ යැ, මේ ප්‍රතිඝසංස්පර්ශ යැ, මේ සුඛවේදනීයස්පර්ශ යැ, මේ දුඃඛවේදනීයස්පර්ශ යැ, මේ උපෙක්ෂා වේදනීයස්පර්ශ යැ, මේ කුශලස්පර්ශ යැ, මේ අකුශලස්පර්ශ යැ, මේ අව්‍යාකෘතස්පර්ශ යැ, මේ කාමාවචරස්පර්ශ යැ, මේ රූපාවචරස්පර්ශ යැ, මේ අරූපාවචරස්පර්ශ යැ, මේ ශූන්‍යතස්පර්ශ යැ, මේ අනිමිත්තස්පර්ශ යැ, මේ අප්‍රණිහිතස්පර්ශ යැ, මේ ලෞකිකස්පර්ශ යැ, මේ ලෝකොත්තරස්පර්ශ යැ, මේ අතීතස්පර්ශ යැ, මේ අනාගතස්පර්ශ යැ, මේ ප්‍රත්‍යුත්පන්නස්පර්ශ යැ’යි ස්පර්ශය දැනගනී. මේ යැ ඥාතපරිඥා නම්.

කතමා තීරණපරිඤ්ඤා? එවං ඤාතං කත්වා ඵස්සං තීරෙති අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපස්සග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො අලෙණතො අසරණතො අසරණීභූතතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරතො අඝමූලතො වධකතො විභවතො සාසවතො සංඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො ව්‍යාධිධම්මතො °මරණධම්මතො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාස - ධම්මතො සංකිලෙසිකධම්මතො සමුදයතො අත්ථඞ්ගමතො අස්සාදතො ආදීනවතො නිස්සරණතො තීරෙති. අයං තීරණපරිඤ්ඤා.

කතමා පහානපරිඤ්ඤා? එවං තීරෙත්වා ඵස්සෙ ඡන්දරාගං පජහති විනොදෙති ව්‍යන්තිං කරොති අනභාවං ගමෙති. වුත්තං හෙතං භගවතා: "යො භික්ඛවෙ ඵස්සෙසු ඡන්දරාගො, තං පජහථ. එවං සො ඵස්සො පහීනො භවිස්සති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවං ගතො[1] ආයතිං අනුප්පාදධම්මො"ති.[a] අයං පහානපරිඤ්ඤා.

**ඵස්සං පරිඤ්ඤායා**'ති - ඵස්සං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා; **අනානුගිද්ධො**'ති - ගෙධො වුච්චති තණ්හා "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං"[b] යස්සෙසො ගෙධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අගිද්ධො. සො රූපෙ අගිද්ධො සද්දෙ අගිද්ධො ගන්ධෙ අගිද්ධො රසෙ අගිද්ධො ඵොට්ඨබ්බෙ අගිද්ධො කුලෙ ගණෙ ආවාසෙ ලාභෙ යසෙ පසංසායං සුඛෙ චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ කාමධාතුයා රූපධාතුයා අරූපධාතුයා කාමභවෙ රූපභවෙ අරූපභවෙ සඤ්ඤාභවෙ අසඤ්ඤාභවෙ නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ එකවොකාරභවෙ චතුවොකාරභවෙ පඤ්චවොකාරභවෙ අතීතෙ අනාගතෙ පච්චුප්පන්නෙ දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො* පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො* පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො.

---

1. අනභාවංකතො - සීමු I.

a. අයං සුත්තප්පදෙසො පෙය්‍යාලමුඛෙන ඛන්ධසංයුත්තතො ගහිතො'ති මඤ්ඤාම.

b. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ, ඛුද්දකවත්ථු විභඞ්ග.

*. පුප්ඵලකඛණ්ඩන්තරිතො භාගො සීමු. I. පොත්ථකෙ න දිස්සති.

තීරණපරිඥා කවරී ද යත්: මෙසෙයින් ස්පර්ශය ප්‍රකට කොට දැනි-මින් තීරණය කෙරෙයි (=සිතයි. කෙසේ ද ?) අනිත්‍ය හෙයින් සිතයි, දුක් හෙයින් රෝග හෙයින් ගණ්ඩ හෙයින් ශල්‍ය හෙයින් අඝ(=දුක්) හෙයින් ආබාධ හෙයින් පර(අවසඟ) හෙයින් පලෝක (බිඳෙන) හෙයින් ව්‍යසන හෙයින් උපද්‍රව - භය - උපසර්ග - චඤ්චල - බිඳෙනසුලු - අධ්‍රැව - අත්‍රාණ - අලෙන - අශරණ - අශරණීභූත - සිස් - තුච්ඡ - ශූන්‍ය - අනාත්ම - ආදීනව - විපරිණාම-ස්වභාව - අසාර - අඝමූල - වධක - විභව - සාස්‍රව - හේතුප්‍රත්‍යයාභිසංස්කෘත - මාරාමිෂ - ජාතිධර්මී - ජරාධර්මී - ව්‍යාධිධර්මී - මරණධර්ම - ශෝකපරිදේව-දුඃඛදෞර්මනස්‍යෝපායාසධර්මී - සංක්ලේශධර්මී - සමුදය - අස්තඞ්ගම - ආස්වාද-ආදීනව හෙයින් නිස්සරණ හෙයින් තීරණය කෙරෙයි. මෝ යැ තීරණපරිඥා නම්.

ප්‍රහාණපරිඥා කවරී ද යත්: මෙසෙයින් තීරණය කොට ස්පර්ශයෙහි ඡන්දරාගය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අභාවයට පමුණුවයි. මේ වදාරන ලද මැ ය භාග්‍යවතුන් වහන්සේ විසින්: "මහණෙනි, ස්පර්ශයන්හි ඡන්දරාගය දුරු කරවු. එවිට ඒ ස්පර්ශය ප්‍රහීණ වෙයි. උසුන් මුල් ඇතියේ (මුල්සුන්) තල්රුකක් මෙන් කරන ලදුයේ අභාවයට ගියේ මතු නූපදනා පියවි ඇතියේ වේ යැ"යි. මෝ යැ ප්‍රහාණපරිඥා නම්.

**එස්සං පරිඤ්ඤාය** - ස්පර්ශය මේ ත්‍රිවිධ පරිඥායෙන් දැන; **අනානුගිද්ධෝ**- 'ගෙධ' යී තෘෂ්ණාව කියනු ලබා. යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලෝභඅකුශලමූලයෙක් වේ ද, යමක් හට තෙල ගෙධය ප්‍රහීණ වූයේ සිඳුනා ලදුයේ සන්හුන්නේ දුරු කරන ලදුයේ පෙරළා උපදනට අභව්‍ය වූයේ මාර්ගඥාන ගින්නෙන් දවන ලදුයේ වේ ද, හෙතෙම 'අගිද්ධ' යයි කියනු ලැබේ. හේ රූපයෙහි ගිජු නො වූයේ, ශබ්දයෙහි - ගන්ධයෙහි - රසයෙහි - ස්පර්ශයෙහි ගිජු නො වූයේ, කුලයෙහි ගණයෙහි ආවාසයෙහි යශස්හි ප්‍රශංසායෙහි සුඛයෙහි චීවර - පිණ්ඩපාත - සෙනාසන - ගිලන්-පසයෙහි, කාම - රූප - අරූපධාතුයෙහි, කාම - රූප - අරූපභවයෙහි, සඤ්ඤා - අසඤ්ඤා - නෙවසඤ්ඤානාසඤ්ඤා - එකවෝකාර - චතුවෝකාර - පඤ්ච-වෝකාර භවයෙහි, අතීත - අනාගත - ප්‍රත්‍යුත්පන්නයෙහි, දෘෂ්ටශ්‍රැතමුත-විඥාතව්‍ය ධර්මයන්හි ගිජු නො වූයේ නො ගෙතුණේ මුසපත් නො වූයේ නො බැඳුණේ පහ වූ - හරන ලද - වමනය කරන ලද - මුදන ලද - ප්‍රහීණ වූ - දුර ලන ලද තෘෂ්ණා ඇතියේ පහ වූ...දුර ලන ලද රාග ඇතියේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳිනුයේ උතුම් වූ සිතින් යුක්ත ව වෙසේ නුයි 'එස්සං පරිඤ්ඤාය අනානුගිද්ධෝ' යනු වේ.

**සදත්තගරහී තදකුබ්බමානො**'ති - 'යද'න්ති[1] යං; අත්තගරහිති - ද්වීහි කාරණෙහි අත්තානං ගරහති: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති ? 'කතං මෙ කායදුච්චරිතං, අකතං මෙ කායසුචරිත'න්ති අත්තානං ගරහති. 'කතං මෙ වචීදුච්චරිතං, අකතං මෙ වචීසුචරිත'න්ති අත්තානං ගරහති. 'කතං මෙ මනොදුච්චරිතං, අකතං මෙ මනොසුචරිත'න්ති අත්තානං ගරහති. 'කතො මෙ පාණාතිපාතො, අකතා මෙ පාණාතිපාතා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතං මෙ අදින්නාදානං, අකතා මෙ අදින්නාදානා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතො මෙ කාමෙසු මිච්ඡාචාරො, අකතා කාමෙසු මිච්ඡාචාරා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතො මෙ මුසාවාදො, අකතා මෙ මුසාවාදා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතා මෙ පිසුනාවාචා, අකතා මෙ පිසුනාය වාචාය[2] වෙරමණී'ති අත්තානං ගරහති. 'කතා මෙ ඵරුසා වාචා, අකතා මෙ ඵරුසාය වාචාය[3] වෙරමණී'ති අත්තානං ගරහති. 'කතො මෙ සම්ඵප්පලාපො, අකතා මෙ සම්ඵප්පලාපා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතා මෙ අභිජ්ඣා, අකතා මෙ අනභිජ්ඣා'ති[4] අත්තානං ගරහති. 'කතො මෙ ව්‍යාපාදො, අකතො මෙ අව්‍යාපාදො'ති[5] අත්තානං ගරහති. 'කතා මෙ මිච්ඡාදිට්ඨි, අකතා මෙ සම්මාදිට්ඨී'ති[6] අත්තානං ගරහති. එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. අථවා සීලෙසු'ම්හි න පරිපූරකාරීති අත්තානං ගරහති. ඉන්ද්‍රියෙසු'ම්හි අගුත්තද්වාරොති අත්තානං ගරහති. භොජනෙ'ම්හි අමත්තඤ්ඤූති අත්තානං ගරහති. ජාගරියං අනනුයුත්තොම්හීති අත්තානං ගරහති. සතිසම්පජඤ්ඤෙන අසමන්නාගතොති අත්තානං ගරහති. අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති අත්තානං ගරහති. අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති අත්තානං ගරහති. අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති අත්තානං ගරහති. අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති අත්තානං ගරහති. අභාවිතානි මෙ පඤ්ච බලානීති අත්තානං ගරහති. අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති අත්තානං ගරහති. අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති අත්තානං ගරහති. දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති අත්තානං ගරහති. සමුදයො මෙ අප්පහීනොති අත්තානං ගරහති. මග්ගො මෙ අභාවිතොති අත්තානං ගරහති. නිරොධො මෙ අසච්ඡිකතොති අත්තානං ගරහති. එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. එවං අත්තගරහිකං කම්මං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති 'සදත්තගරහී තදකුබ්බමානො.'

**න ලිප්පති දිට්ඨසුතෙසු ධීරොති** - 'ලෙපො'ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච-පෙ-අයං තණ්හාලෙපො-පෙ-අයං දිට්ඨිලෙපො. ධීරොති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. ධීරො තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා දිට්ඨෙ න ලිප්පති සුතෙ න ලිප්පති මුතෙ න ලිප්පති විඤ්ඤාතෙ න ලිප්පති න සංලිප්පති[7] න උපලිප්පති. අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[8] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති 'න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො'ති.

1 යදත්ති - ඡමු. II.    2. පිසුණාවාචා - සීමු. I.    3. ඵරුසවාචා - සීමු. I.
4. අභිජ්ඣාවෙරමණීති - සීමු. I.    5. ව්‍යාපාදා වෙරමණීති. I.
6. මිච්ඡාදිට්ඨිවෙරමණීති - I.    7. පලිප්පති- සීමු. II.
8. නිස්සතො-ස.

**යදත්තගරහී තදකුබ්බමානො** – 'යද' යනු: යං. **අත්තගරහී** – කළ හෙයින් ද නො කළ හෙයින් දැයි දෙ කරුණෙකින් තමහට ගරහයි: කිසෙයින යත්: මා විසින් කායදුශ්චරිතය කරන ලද, කායසුචරිතය නො කරන ලදැයි තමහට ගරහයි. මා විසින් වාග්දුශ්චරිතය කරන ලද, වාක්සුචරිතය නො කරන ලදැයි ද – මා විසින් මනොදුශ්චරිතය කරන ලද, මනසුචරිතය නො කරන ලදැයි ද තමහට ගරහයි. මා විසින් ප්‍රාණඝාතය කරන ලද, ප්‍රාණඝාතයෙන් විරමණය නො කරන ලදැයි ද – අදත්තාදානය කරන ලද, අදින්නාදානවිරමණය නො කරන ලදැයි ද – මා විසින් කාමයෙහි වරදවා හැසිරෙන ලද, කාමමිථ්‍යාචාරවිරමණය නො කරන ලදැයි ද – මෘෂාවාදය කරන ලද, මෘෂාවාදයෙන් විරමණය නොකරන ලදැයි ද – පිසුනුබස් කියන ලද, පිසුනුබසින් විරමණය නො කරන ලදැයි ද – පරොස්බස් කියන ලද, පරොස්බසින් විරමණය නො කරන ලදැයි ද – ප්‍රලාපබස් කියන ලද, ප්‍රලාපබසින් විරමණය නො කරන ලදැයි ද – අභිධ්‍යාව කරන ලද, අනභිධ්‍යාව නො කරන ලදැයි ද – ව්‍යාපාදය කරන ලද, අව්‍යාපාදය නො කරන ලදැයි ද, මා විසින් මිථ්‍යාදෘෂ්ටිය කරන ලද, සම්‍යග්දෘෂ්ටිය නො කරන ලදැයි ද – තම හට ගරහයි. මෙසේ කළ හෙයින් ද නො කළ හෙයින් ද තම හට ගරහයි. නොහොත් සිවුපිරිසුදුසිල් නො පුරනසුලු වෙමි තම හට ගරහයි. පසිඳුරන්හි නො පියූ දොර ඇත්මි – භොජනයෙහි පමණ නො දත්මි – නිදි වැරීමෙහි නො යෙදුණෙමි – සිහිනුවණින් සමන්විත නො වෙමි තම හට ගරහයි. මා විසින් සතර සිවටන් අභාවිතහයි තම හට ගරහයි. සතර සම්‍යක්ප්‍රධානයෝ අභාවිතහයි – සතර ඍද්ධිපාදයෝ අභාවිතහයි – පඤ්චෙන්ද්‍රියයෝ අභාවිතහයි – පඤ්චබලයෝ – සප්තබොධ්‍යඞ්ගයෝ – ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය අභාවිත යැයි – මා විසින් දුඃඛසත්‍යය අපරිඥාත යැයි - සමුදයය අප්‍රහීණ යැයි – මාර්ගය නො වඩනා ලදැයි – නිරොධය ප්‍රත්‍යක්ෂ නො කරන ලදැයි තම හට ගරහයි. මෙසෙයින් කළ හෙයිනු දු නො කළ හෙයිනු දු තම හට ගරහා. මෙසේ ආත්මගර්හකකර්මය නො කරනුයේ නූපදවනුයේ නො නිපදවනුයේ නුයි 'යදත්තගරහී තදකුබ්බමානො' යනු වේ.

**නාලිප්පති දිට්ඨසුතෙසු ධීරො** – 'ලෙප' නම්: තෘෂ්ණාලෙප දිට්ඨිලෙප යැයි ලෙප දෙකකි: . . .මේ තෘෂ්ණාලෙප යැ. . .මේ දිට්ඨිලෙප යි. **ධීරො** යනු: ධීර යැ...මෙධාවී යැ. ධීර වූ පුරුෂ තෙම තෘෂ්ණාලෙපය හැර පියා දෘෂ්ටිලෙපය දුරු කොට රූපායතනයෙහි නො ඇලෙයි. ශබ්දායතන–යෙහි නො ඇලෙයි. ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනයෙහි නො ඇලෙයි. මනායතන–යෙහි නො ඇලෙයි. වෙසෙසින් නො ඇලෙයි. අලිප්ත – අසංලිප්ත – අනුපලිප්ත වූයේ බැහැර වූයේ නික්මුණේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍ය්‍යාද ඇති සිතින් යුක්ත ව වෙසේ නුයි 'න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො' යනු වේ.

තෙනාහ භගවා:

"උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං
ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො
යදත්තගරහී තදකුබ්බමානො
න ලිප්පතී දිට්ඨසුතෙසු ධීරො"ති.

## 2 – 8.

සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං
පරිග්ගහෙසු මුනි නොපලිත්තො,
අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො
නාසිංසති ලොකමිමං පරං ච.

**සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝන්ති** – 'සඤ්ඤා'ති කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා නෙක්ඛම්මසඤ්ඤා අව්‍යාපාදසඤ්ඤා අවිහිංසාසඤ්ඤා රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ධම්මසඤ්ඤා, යා එවරූපා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, අයං වුච්චති සඤ්ඤා. **සඤ්ඤං පරිඤ්ඤාති** – සඤ්ඤං තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා ඤාතපරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය. කතමා ඤාතපරිඤ්ඤා? සඤ්ඤං ජානාති 'අයං කාමසඤ්ඤා අයං ව්‍යාපාදසඤ්ඤා අයං විහිංසාසඤ්ඤා අයං නෙක්ඛම්මසඤ්ඤා අයං අව්‍යාපාදසඤ්ඤා අයං අවිහිංසාසඤ්ඤා අයං රූපසඤ්ඤා අයං සද්දසඤ්ඤා අයං ගන්ධසඤ්ඤා අයං රසසඤ්ඤා අයං ඵොට්ඨබ්බසඤ්ඤා අයං ධම්මසඤ්ඤා'ති ජානාති පස්සති. අයං ඤාතපරිඤ්ඤා.

කතමා තීරණපරිඤ්ඤා? එවං ඤාතං කත්වා සඤ්ඤං තීරෙති: අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපස්සග්ගතො චලතො[1] පභඞ්ගුතො–පෙ– සමුදයතො අත්ථඞ්ගමතො අස්සාදතො ආදීනවතො නිස්සරණතො තීරෙති. අයං තීරණපරිඤ්ඤා.

කතමා පහානපරිඤ්ඤා? එවං ඤාතං කත්වා එවං තීරයිත්වා සඤ්ඤාය ඡන්දරාගං පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. වුත්තම්පි හෙතං භගවතා: "යො භික්ඛවෙ සඤ්ඤාය ඡන්දරාගො, තං පජහථ. එවං සා සඤ්ඤා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවං ගතා[2] ආයතිං අනුප්පාදධම්මා"ති[a]. අයං පහානපරිඤ්ඤා. 'සඤ්ඤං පරිඤ්ඤා'ති සඤ්ඤං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා; **විතරෙය්‍ය ඔඝන්ති**– කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරෙය්‍ය උත්තරෙය්‍ය පතරෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍යාති 'සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං.'

**පරිග්ගහෙසු මුනි නොපලිත්තොති** – 'පරිග්ගහා'ති ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච –පෙ– අයං තණ්හාපරිග්ගහො –පෙ– අයං දිට්ඨිපරිග්ගහො. මුනීති – මොනං[3] වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා–පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි,[b] තෙන ඤාණෙන සමන්නාගතො මුනි මොනප්පත්තොති.

---

1. චලතො – සීමු. I.
2. අනභාවකතා – සීමු. I. අනභාවංකතා–මජසං, අනභාවගතා – ස්‍යා – සීමු. II.

a. ඛන්ධසංයුත්ත – භාරවග්ග.
3. මොනා – සීමු. I.

b ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ. I.

එයින් වදාළහ බුදුහු:
"උභොසු – පෙ – දිට්ඨසුතෙසු ධීරො" යනු.

2 · 8

කාමසංඥාදිසංඥාව නොහොත් සංඥානුසාරයෙන් නාමරූපය ත්‍රිවිධ පරිඥායෙන් දැන චතුරොඝය තරණය කරන්නේ ය. එහෙයින් තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයන්හි නො ඇලුණු ඒ ක්ෂීණාශ්‍රව මුනි තෙම උපුටා හළ රාගාදිශල්‍ය ඇතියේ අප්‍රමත්ත ව හැසිරෙනුයේ (ස්වාත්මභාවාදි සංඛ්‍යාත) මෙලොවත් (පරාත්මභාවාදි සංඛ්‍යාත) පරලොවත් නො පතන්නේ යි.

**සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං** – 'සඤ්ඤා' යනු: කාමසංඥා යැ ව්‍යාපාද – විහිංසා – නෛෂ්කාම්‍ය – අව්‍යාපාද – අවිහිංසා සංඥා යැ, රූපසංඥා යැ ශබ්ද – ගන්ධ – රස – ස්පර්ශ – ධර්මසංඥා යැ යන මෙ බඳු වූ හැඳිනීම හඳුනන අයුරු හැඳිනගන්බව 'සඤ්ඤා' යී කියනු ලැබේ. **සඤ්ඤං පරිඤ්ඤා** – සංඥාව ඥාත තීරණ ප්‍රහාණ යන ත්‍රිවිධපරිඥායෙන් පිරිසිඳ දැන; එහි ඥාතපරිඥා කවරී ද යත්: මේ කාමසංඥා යැ මේ ව්‍යාපාද – විහිංසා – නෛෂ්කාම්‍ය – අව්‍යාපාද – අවිහිංසා සංඥා යැ මේ රූප - ශබ්ද – ගන්ධ – රස – ස්පර්ශ – ධර්මසංඥා යැයි සංඥාව දැනගනී, දකී. මේ යැ ඥාතපරිඥා නම්.

තීරණපරිඥා කවරී ද යත්: මෙසෙයින් සංඥාව ප්‍රකට කොට දැන අනිත්‍ය හෙයින් සිතයි. දුඃඛ – රොග – ගණ්ඩ – ශල්‍ය – අඝ – ආබාධ – පර– පලොක – ඊති – උපද්‍රව – භය – උපසර්ග – චල – පභඞ්ගු හෙයින් .. සමුදය – අස්තඞ්ගම – ආස්වාද – ආදීනව – නිස්සරණ හෙයින් සිතයි. මේ යැ තීරණපරිඥා නම්.

ප්‍රහාණපරිඥා කවරී ද යත්: මෙසෙයින් ප්‍රකට කොට දැන මෙ සෙයින් තීරණ කොට සංඥායෙහි ඡන්දරාගය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අභාවයට පමුණුවයි. වදාරන ලද මැ ය භාග්‍යවතුන් වහන්සේ විසින්: "මහණෙනි, සංඥායෙහි ඡන්දරාගය දුරු කරවූ එවිට ඒ සංඥාව ප්‍රහීණ වූවා වෙයි. උපුටා හළ මුල් ඇත්තී, තාලවස්තුවක් මෙන් කරන ලද්දී, අභාවයට පැමිණියා, මතු නූපදනා පියැවි ඇති වන්නී යැ" යි. මේ යැ ප්‍රහාණපරිඥා නම්. 'සඤ්ඤං පරිඤ්ඤා' යනු: සංඥාව මේ ත්‍රිවිධ පරිඥාවෙන් පිරිසිඳ දැන; විතරෙය්‍ය ඔඝං - කාම – භව – දෘෂ්ටි – අවිද්‍යා ඔඝය තරණය උත්තාරණය ප්‍රතරණය සමතික්‍රමණය කරන්නේ යැ ඉක්මවන්නේ නුයි 'සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං' යනු වේ.

**පරිග්ගහෙසු මුනි නොපලිත්තො** – 'පරිග්ගහ' යනු: තෘෂ්ණාපරිග්‍රහ යැ දෘෂ්ටිපරිග්‍රහ යැයි පරිග්‍රහ දෙකෙකි....මුනි යනු: 'මොන'සී ඥානය කියනු ලැබෙයි. ප්‍රඥාව දැනගන්නා අයුරු...අමොහය ධර්මවිචය සම්‍යග්දෘෂ්ටිය යැ. ඒ ඥානයෙන් යුක්ත වූ මුනි තෙම 'මොනප්පත්ත'යි.

තීණි මොනෙය්‍යානි: කායමොනෙය්‍යං වචීමොනෙය්‍යං මනොමොනෙය්‍යං. කතමං කායමොනෙය්‍යං? තිවිධානං කායදුච්චරිතානං පහානං කායමොනෙය්‍යං. තිවිධං කායසුචරිතං කායමොනෙය්‍යං, කායාරම්මණෙ ඤාණං කායමොනෙය්‍යං, කායපරිඤ්ඤා කායමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො කායමොනෙය්‍යං, කායෙ ඡන්දරාගස්ස පහානං කායමොනෙය්‍යං, කායසංඛාරනිරොධො චතුත්ථජ්ඣානසමාපත්ති කායමොනෙය්‍යං. ඉදං කායමොනෙය්‍යං.

කතමං වචීමොනෙය්‍යං? චතුබ්බිධානං[1] වචීදුච්චරිතානං පහානං වචීමොනෙය්‍යං, වචීසුචරිතං වචීමොනෙය්‍යං, වාචාරම්මණෙ ඤාණං වචීමොනෙය්‍යං, වාචාපරිඤ්ඤා වචීමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො වචීමොනෙය්‍යං, වාචාය ඡන්දරාගස්ස පහානං වචීමොනෙය්‍යං. වචීසංඛාරනිරොධො දුතියජ්ඣානසමාපත්ති වචීමොනෙය්‍යං. ඉදං වචීමොනෙය්‍යං.

කතමං මනොමොනෙය්‍යං? තිවිධානං මනොදුච්චරිතානං පහානං මනොමොනෙය්‍යං, තිවිධං මනොසුචරිතං මනොමොනෙය්‍යං, චිත්තාරම්මණෙ ඤාණං මනොමොනෙය්‍යං, චිත්තපරිඤ්ඤා මනොමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො මනොමොනෙය්‍යං, චිත්තෙ ඡන්දරාගස්ස පහානං මනොමොනෙය්‍යං, චිත්තසංඛාරනිරොධො සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති මනොමොනෙය්‍යං. ඉදං මනොමොනෙය්‍යං.

1, "කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු සබ්බප්පහායිනං. a

2. කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු නින්හාතපාපක"න්ති. b

ඉමෙහි තීහි මොනෙය්‍යෙහි ධම්මෙහි සමන්නාගතා ඡ මුනිනො:[2] අගාරමුනිනො අනගාරමුනිනො සෙඛමුනිනො අසෙඛමුනිනො පච්චෙකමුනිනො මුනිමුනිනොති. කතමෙ අගාරමුනිනො? යෙ තෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අගාරමුනිනො. කතමෙ අනගාරමුනිනො? යෙ තෙ පබ්බජිතා දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අනගාරමුනිනො. සත්ත සෙඛා සෙඛමුනිනො. අරහන්තො අසෙඛමුනිනො. පච්චෙකබුද්ධා පච්චෙකමුනිනො. මුනිමුනිනො වුච්චන්ති තථාගතා අරහන්තො සම්මාසම්බුද්ධා.

3. "න මොනෙන[3] මුනි හොති මූළ්හරූපො අවිද්දසු,
යො ච තුලංව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.

4. පාපානි පරිවජ්ජෙති ස මුනි තෙන සො මුනි,
යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති." c

---

1. චතුබ්බිධා - සීමු. I. 2. මුනයො-සහා. 3. මොනෙය්‍යෙන - ස.

a තිකඞ්ගුත්තර - ආපායිකවග්ග. b ඉතිවුත්තක - දුතියවග්ග.

c ධම්මපද - ධම්මට්ඨවග්ග.

කායමොනෙය්‍ය වචීමොනෙය්‍ය මනොමොනෙය්‍ය යැයි මොනෙය්‍ය තුනෙකි. කායමොනෙය්‍ය කවරේ ? යත්: ත්‍රිවිධ කායදුශ්චරිතයන්ගේ ප්‍රහාණය කායමොනෙය්‍ය යැ. ත්‍රිවිධ කායසුචරිතය කායමොනෙය්‍ය යැ. කය අරමුණු කොට අනිත්‍යාදිවශයෙන් පැවැති ඥානය කායමොනෙය්‍ය යැ. කායපරිඥාව කායමොනෙය්‍ය යැ. පරිඥාසහගත වූ මාර්ගය කායමොනෙය්‍ය යැ. කයෙහි ඡන්දරාගය දුරු කිරීම කායමොනෙය්‍ය යැ. කායසංස්කාර (=ආශ්වාසප්‍රශ්වාස)යන්ගේ නිරොධය වූ චතුර්ථධ්‍යානසමාපත්තිය කාය-මොනෙය්‍යය යි. මේ කායමොනෙය්‍ය නම.

වචීමොනෙය්‍ය කවරේ ? යත්: චතුර්විධ වාග්දුශ්චරිතයන්ගේ ප්‍රහාණය වචීමොනෙය්‍ය යැ. වාක්සුචරිතය – අනිත්‍යාදිවශයෙන් වාගාලම්බනයෙහි පැවැති ඥානය – ත්‍රිවිධ පරිඥාවශයෙන් වාක්පරිඥාව – පරිඥාසහගත මාර්ගය– වාක්හි ඡන්දරාගප්‍රහාණය – වාක්සංස්කාර(විතර්කවිචාර)යන්ගේ නිරොධය වූ ද්විතීයධ්‍යානසමාපත්තිය වචීමොනෙය්‍යය යි. මේ වචීමොනෙය්‍ය නම.

මනොමොනෙය්‍ය කවරේ ? යත්: ත්‍රිවිධ මනොදුශ්චරිතයන්ගේ ප්‍රහාණය මනොමොනෙය්‍ය යැ, ත්‍රිවිධ මනඃසුචරිතය – චිත්තාලම්බනයෙහි පැවැති ඥානය – චිත්තපරිඥාව – පරිඥාසහගත වූ මාර්ගය – චිත්තයෙහි ඡන්දරාග-ප්‍රහාණය – චිත්තසංස්කාරයන්(=සංඥාවෙදනාවන්)ගේ නිරොධය වූ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිය මනොමොනෙය්‍යය යි. මේ මනො-මොනෙය්‍ය නම්.

1. කායදුශ්චරිතප්‍රහාණයෙන් කායමුනි වූ වාග්දුශ්චරිතප්‍රහාණයෙන් වාචාමුනි වූ මනොදුශ්චරිතප්‍රහාණයෙන් මනොමුනි වූ සර්වාකුශලප්‍රහාණයෙන් ඵලයෙහි සිටි හෙයින් මුනිභාවයෙන් යුක්ත වූවහු සියලු කෙලෙසුන් දුරු කළ හෙයින් 'සබ්බප්පහායී' යයි කියත්.

2. ...මාර්ගඥානයෙන් සියලු පව් ධොවනය කළ හෙයින් 'නින්හාතපාපක, යයි කියත්.

මේ ත්‍රිවිධ මෞනෙයධර්මයන්ගෙන් සමන්විත වූ අගාරමුනිහු යැ අනාගාරමුනිහු යැ ශෛක්ෂමුනිහු යැ අශෛක්ෂමුනිහු යැ ප්‍රත්‍යෙකමුනිහු යැ මුනිමුනිහු යැයි ෂඩ්විධමුනි කෙනෙක් වෙති. අගාරමුනිහු කවරහ යත්: ගිහිකමෙහි යෙදුණු දුටු නිවන් ඇති දත් (ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත) තුන් සසුන් ඇත්තාහු අගාරමුනිහු යැ. අනගාරමුනිහු කවරහ යත්: පැවිදි වූ දුටුනිවන් ඇති දත් සසුන් ඇත්තාහු අනගාරමුනිහු යැ. සප්තශෛක්ෂයෝ සෙඛමුනිහු යැ. රහත්හු අසෙඛමුනිහු යැ. පසේබුදුහු පච්චෙකමුනිහු යැ. තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ මුනිමුනිහු යැයි කියනු ලැබෙත්.

3–4. සිස් පියවි ඇති අඥ (=නුවණ නැති) තෙනැත්තේ මෞනභාවයෙන් (=නො බිණීමෙන්) මුනි නම් නො වෙයි. තවද පණ්ඩිත වූ යමෙක් තුලාව (=තරාදිය) ගෙන (අධිකය හැර ඌනය පුරත්තාක් මෙන්) ශීලසමාධ්‍යාදි උතුම් දැය ගෙන පව් දුරු කෙරේ ද, එ කරුණෙන් හෙතෙම මුනි නම් වෙයි. යමෙක් ස්කන්ධාදිලොකයෙහි ආධ්‍යාත්මික බාහ්‍යස්කන්ධාදි උභයාර්ථයන් දනී නම් එ කරුණෙන් හේ මුනි යයි කියනු ලැබේ.

5. "අසන්තඤ්ච සන්තඤ්ච ඤත්වා ධම්මං
අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
දෙවමනුස්සෙහි පූජිතො යො
සඞ්ගජාලමතිච්ච සො මුනී"ති. a

**ලෙපා**ති – ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච –පෙ– අයං තණ්හාලෙපො –පෙ– අයං දිට්ඨිලෙපො. මුනි තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා පරිග්ගහෙසු න ලිප්පති න සංලිප්පති[1] න උපලිප්පති අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[2] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'පරිග්ගහෙසු මුනි නොපලිත්තො.

**අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො**ති – 'සල්ල'න්ති සත්ත සල්ලානි: රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං දුච්චරිතසල්ලං.[3] යස්සෙතෙ සල්ලා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අබ්බූළ්හසල්ලො අබ්බූහිතසල්ලො[4] උද්ධතසල්ලො සමුද්ධතසල්ලො උප්පාටිතසල්ලො සමුප්පාටිතසල්ලො චත්තසල්ලො වන්තසල්ලො මුත්තසල්ලො පහීනසල්ලො පටිනිස්සට්ඨසල්ලො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති 'අබ්බූළ්හසල්ලො.' **චර**න්ති – චරන්තො විහරන්තො ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තො. **අප්පමත්තො**ති – සක්කච්චකාරී සාතච්චකාරී අට්ඨිතකාරී අනොලීනවුත්තිකො අනික්ඛිත්තඡන්දො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා සීලක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය'න්ති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිපූරං වා සමාධික්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා සමාධික්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍යං –පෙ– කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිපූරං වා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙය්‍යං –පෙ– විමුත්තික්ඛන්ධං –පෙ– විමුත්තිඤාණදස්සනක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය'න්ති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිඤ්ඤාතං වා දුක්ඛං පරිජානෙය්‍යං, අප්පහීනෙ වා කිලෙසෙ පජහෙය්‍යං, අභාවිතං වා මග්ගං භාවෙය්‍යං, අසච්ඡිකතං වා නිරොධං සච්ඡිකරෙය්‍ය'න්ති' යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසූති 'අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො.'

---

1. පලිප්පති - සීමු. II
2. නිස්සට්ඨො - සං. නිස්සතො - ස. 3. කථං කථාසල්ලං - ස්‍යා.
4. පහතසල්ලො - ස්‍යා.
a. සුත්තනිපාත - සභියසුත්ත.

5. යමෙක් ආධ්‍යාත්මික වූ ද බාහ්‍ය වූ ද සියලු ලොකයෙහි කුශලාකුශල හෙද වූ සාධූන්ගේ ද අසාධූන්ගේ ද ධර්මය (ප්‍රතිවෙධඥානයෙන්) දැන එහෙයින් මැ රාගාදිසඞ්ගය හා තෘෂ්ණාදෘෂ්ටිජාලය ඉක්මවා සිටියේ දෙව්මිනිසුන් විසින් පුදන ලද්දේ වේ ද, ඒ ක්‍ෂීණාශ්‍රව තෙම 'මුනි' යයි කියනු ලැබේ.

ලෙප නම්: තෘෂ්ණාලෙප යැ දෘෂ්ටිලෙප යැයි ලෙප දෙකෙකි... ක්‍ෂීණාශ්‍රව මුනි තෙම තෘෂ්ණාලෙපය හැර දෘෂ්ටිලෙපය දුරු කොට තෘෂ්ණාදෘෂ්ටීන් ගත් වස්තුයෙහි නො ඇලෙයි, වෙසෙසින් නො ඇලෙයි, නො යෙදෙයි, අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍ය්‍යාද ඇති සිතින් යුක්ත වැ වෙසේ නුයි 'පරිග්ගහෙසු මුනි නොපලිත්තො' යනු වේ.

අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො – 'සල්ල' නම්: රාගශල්‍ය යැ දෙ‍ස – මොහ – මාන – දිට්ඨි – සොක – දුශ්චරිතශල්‍ය යැයි සප්ත ශල්‍ය කෙනෙකි. යමක්හු විසින් තෙල ශල්‍යයෝ ප්‍රහාණ කරන ලද්දාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුවන ලද්දාහු ඉපදීමට නුසුදුසු කරන ලද්දාහු නුවණ-ගින්නෙන් දවන ලද්දාහු ද, හෙතෙම බැහැර කළ ශල්‍ය (= හුල්) ඇත්තේ යැ, උපුටාහල හුල් ඇත්තේ යැ, සිඳුනා ලද හුල් ඇත්තේ යැ, ත්‍යාග කළ – වමනය කළ – මුදන ලද – ප්‍රහාණ කළ – දුරු කළ – හුල් ඇත්තේ යැ, තෘෂ්ණා රහිත යැ, නිවුණේ යැ, සිහිල් වූයේ යැ, සුව විඳිනසුලු වූයේ උතුම් වූ සිතින් යුක්ත වැ වෙසේ නුයි 'අබ්බූළ්හසල්ල' නමි. චරං යනු: හැසිරෙනුයේ වෙසෙනුයේ ඉරියවු පවත්වනුයේ ඉරියවු උපදවනුයේ ඉරියවු රක්නේ යැපෙනුයේ; අප්පමත්තො – කුසල් දහම්හි සත්කාර (සකස් කොට) කරනුයේ සතතභාවයෙන් කරනුයේ නො නැවැත කරනුයේ නො හැකිලැ කරනුයේ නො නැඹු ඡන්දය ඇතියේ නො නැඹූ ධුර (නො පසුබස්නා සිත්) ඇතියේ 'කෙසේ නම් මම නොපිරිපුන් ශීලස්කන්ධය පුරම් දෝ හෝ පිරිපුන් ශීලස්කන්ධය ප්‍රඥයෙන් අනුග්‍රහ කෙරෙම් දෝ හො' යි ඒ කුසල් දහම්හි යම් කර්තුකාම්‍යතාඡන්දයෙක් වෑයමෙක් උත්සාහයෙක් අධිමාත්‍රඋත්සාහයෙක් නො පසු බස්නා වීර්‍ය්‍යයෙක් ස්මෘතියෙක් සම්ප්‍රජන්‍යයෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙක් ප්‍රධන්වීර්‍ය්‍යයෙක් අධිෂ්ඨානයෙක් අනුයොගයෙක් අප්‍රමාදයෙක් වේ ද, 'කෙසේ නම් මම නො පිරිපුන් සමාධිස්කන්ධය පුරම් දෝ හෝ පිරිපුන් සමාධිස්කන්ධය ඒ ඒ තැන නුවණින් අනුගනිම් දෝ හො' යි...නො පිරිපුන් ප්‍රඥස්කන්ධය. . .විමුක්තිස්කන්ධය. . .විමුක්තිඥාන දර්‍ශනස්කන්ධය පුරම් දෝ හෝ... කෙසේ නම් මම අපරිඥාත වූ දුඃඛය ඥාතපරිඥයෙන් දැනගනිම් දෝ හෝ, අප්‍රහීණ වූ කෙලශයන් දුරු කෙරෙම් දෝ හෝ, නො වැඩූ මාර්‍ගය වඩම් දෝ හෝ, නො පසක් කළ නිරොධය පසක් කෙරෙම් දෝ හෝ, යි කුසල්දහම්හි යම් ඡන්දයෙක් වෑයමෙක් උත්සාහයෙක් අධිමාත්‍රඋත්සාහයෙක් නො පසු බස්නා වීර්‍ය්‍යයෙක් ස්මෘතියෙක් සම්ප්‍රජන්‍යයෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙක් ප්‍රධන් වීර්‍ය්‍යයෙක් අධිෂ්ඨානයෙක් අනුයොගයෙක් අප්‍රමාදයෙක් වේ ද, එයින් යුක්ත නුයි .'අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො' යනු වේ.

**නාසිංසතී ලොකමිමං පරං චාති** – ඉමං ලොකං නාසිංසති සකත්තභාවං, පරං ලොකං නාසිංසති පරත්තභාවං, ඉමං ලොකං නාසිංසති සකරූපවෙදනාසඤ්ඤාසංඛාරවිඤ්ඤාණං, පරං ලොකං නාසිංසති පරරූපවෙදනාසඤ්ඤාසංඛාරවිඤ්ඤාණං, ඉමං ලොකං නාසිංසති ඡ අජ්ඣත්තිකානි ආයතනානි, පරං ලොකං නාසිංසති ඡ බාහිරානි ආයතනානි, ඉමං ලොකං නාසිංසති මනුස්සලොකං, පරං ලොකං නාසිංසති දෙවලොකං, ඉමං ලොකං නාසිංසති කාමධාතුං, පරං ලොකං නාසිංසති රූපධාතුං අරූපධාතුං, ඉමං ලොකං නාසිංසති කාමධාතුං රූපධාතුං, පරං ලොකං නාසිංසති අරූපධාතුං, පුනගතිං වා උපපත්තිං වා පටිසන්ධිං වා භවං වා සංසාරං වා වට්ටං වා නාසිංසති න ඉච්ඡති න සාදියති න පත්ථෙති න පිහෙති නාභිජප්පතීති 'නාසිංසතී ලොකමිමං පරං චා'ති.

තෙනාහ භගවා:

"සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං
පරිග්ගහෙසු මුනි නොපලිත්තො,
අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො
නාසිංසතී ලොකමිමං පරං චා"ති.

**ගුහට්ඨකසුත්තනිද්දෙසො දුතියො.**

## 3

## දුට්ඨට්ඨකසුත්තනිද්දෙසො

අථ දුට්ඨට්ඨකසුත්තුද්දෙසං වක්ඛති:

**3 - 1**

වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ
අථොපි වෙ[1] සච්චමනා වදන්ති,
වාදං ච ජාතං මුනි නො උපෙති
තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චි.

**වදන්ති වෙ දුට්ඨමනාපි එකෙති** – එකෙ තිත්ථියා දුට්ඨමනා පදුට්ඨමනා විරුද්ධමනා[2] පටිවිරුද්ධමනා ආහතමනා පච්චාහතමනා ආඝාතිතමනා[3] පච්චාඝාතිතමනා වදන්ති උපවදන්ති භගවන්තං ච භික්ඛුසඞ්ඝං ච අභූතෙනාති 'වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ.'

**අථොපි වෙ[4] සච්චමනා වදන්තීති** –යෙ තෙසං තිත්ථියානං සද්දහන්තා ඔකප්පෙන්තා අධිමුච්චන්තා සච්චමනා සච්චසඤ්ඤිනො භූතමනා භූතසඤ්ඤිනො තථමනා තථසඤ්ඤිනො යාථාවමනා යාථාවසඤ්ඤිනො[5] අවිපරීතමනා අවිපරීතසඤ්ඤිනො වදන්ති උපවදන්ති භගවන්තඤ්ච භික්ඛුසඞ්ඝං ච අභූතෙනාති 'අථොපි වෙ[1] සච්චමනා වදන්ති.'

---

1. අඤ්ඤෙපි තෙ - සීමු. II.
2. විදුට්ඨමනා - කත්ථචි.
3. අඝාටිතමනා - සත.
4. අථොපි තෙ - සීමු. II.
5. යථාවමනා යථාවසඤ්ඤිනො - ස.

**නාසිංසති ලොකමිමං පරං ච** – ස්වාත්මභාවසඞ්ඛ්‍යාත මෙලොව නො පතයි. පරාත්මභාවසඞ්ඛ්‍යාත පරලොව නො පතයි. ස්වකීයරූපවේදනා–සංඥසංස්කාරවිඥන සඞ්ඛ්‍යාත මෙලොව, පරරූපවේදනාසංඥසංස්කාරවිඥන සංඛ්‍යාත පරලොව, ආධ්‍යාත්මිකෂඩායතනසංඛ්‍යාත මෙලොව, බාහ්‍යෂඩායතනසංඛ්‍යාත පරලොව, මනුෂ්‍යලොක සංඛ්‍යාත මෙලොව, දිව්‍යලොක සංඛ්‍යාත පරලොව, කාමභව සංඛ්‍යාත මෙලොව, රූපාරූපභවසංඛ්‍යාත පරලොව, කාම – රූපභවසංඛ්‍යාත මෙලොව, අරූපභව සංඛ්‍යාත පරලොව නො පතයි. පෙරළා පඤ්චගතිය හෝ (සිවුයොනීයෙහි) උපත හෝ පිළිසඳ හෝ කර්මභවය හෝ සසර හෝ ත්‍රෛභූමකවෘත්තය හෝ ආශංසන නො කෙරෙයි, නො කැමැති වෙයි, නො ඉවසයි, නො පතයි, නො ඉස්තේ වෙයි, අභිජල්පන නො කෙරේ නුයි 'නාසිංසතී ලොකමිමං පරඤ්ච' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

"සඤ්ඤං පරිඤ්ඤා – පෙ – පරං ච" යි.

**දෙවැනි වූ ගුහට්ඨකසුත්‍රනිදේශය යි.**

# 3

# දුට්ඨට්ඨකසුත්‍රනිදේශය

ඉක්බිති දුට්ඨට්ඨකසුත්‍රනිදේශය කියනු ලැබේ.

**8 – 1.**

ඇතැම් (අන්‍යතීර්ථ) කෙනෙක් එකාන්තයෙන් විරුද්ධ සිත් ඇත්තාහු මැ (බුදුනට හා සඟනට) උපවාද කෙරෙති (–නුගුණ කියති.) යළි (ඔවුන් ගෙන් ඇසූ) අන් කෙනෙක් එකාන්තයෙන් 'සැබෑවැ' යන සිත් ඇත්තහු මැ උපවාද කෙරෙත්. බුද්ධමුනි තෙම අභූතයෙන් උපන් (තෙල ආක්‍රොශ)වාදයට ද නො පැමිණෙයි. එහෙයින් මුනි තෙම කිසි තැනෙක්හි රාගදි ඛීල (හුල්) නැත්තේ වේ.

**වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ** – ඇතැම් තීර්ථක කෙනෙක් දූෂිත සිත් ඇත්තාහු ප්‍රදූෂිත සිත් ඇත්තාහු විරුද්ධ සිත් ඇත්තාහු කොපයෙන් පහළ සිත් ඇත්තාහු ගැටුණු සිත් ඇත්තාහු බුදුනට ද සඟනට ද අභූතයෙන් (බොරුවෙන්) කියති, උපවාද කෙරෙත් නුයි 'වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ' යනු වේ.

**අථොපි වෙ සච්චමනා වදන්ති** – ඒ තොටුවත්ගේ බස් හදහන ගුණවශයෙන් බැසගත් පැහැදීමෙන් ඉවසන යම් කෙනෙක් වෙත් ද, ඔහු සැබෑවැ යන සිත් ඇත්තාහු සැබෑවැයි හඟනාහු වූයෙකැ යන සිතැත්තාහු වූයෙකැ යි හඟනාහු අවිපරීත සිතැත්තාහු අවිපරීත වැ හඟනාහු නිශ්චල සිතැත්තාහු නිශ්චල වැ හඟනාහු නිශ්චය වූ සිතැත්තාහු නිශ්චයෙන් හඟනාහු බුදුනට ද සඟනට ද අභූතයෙන් බෙණෙති. උපවාද කෙරෙත් නුයි 'අථොපි වෙ සච්චමනා වදන්ති' යනු වේ.

**වාදං ච ජාතං මුනි නො උපෙතීති** - සො වාදො ජාතො හොති සඤ්ජාතො නිබ්බත්තො අභිනිබ්බත්තො පාතුභූතො, පරතොඝොසො අක්කොසො උපවාදො භගවතො ච භික්ඛුසඞ්ඝස්ස ච අභූතෙනාති 'වාදං ච ජාතං.' **මුනි නො උපෙතීති** - 'මුනී'ති මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, තෙන ඤාණෙන සමන්නාගතො මුනි මොනප්පත්තො -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි. යො වාදං උපෙති, සො ද්වීහි කාරණෙහි වාදං උපෙති: කාරකො කාරකතාය වාදං උපෙති අථවා වුච්චමානො උපවදියමානො කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථියති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති අකාරකොම්හීති. යො වාදං උපෙති, සො ඉමෙහි ද්වීහි කාරණෙහි වාදං උපෙති. මුනි ද්වීහි කාරණෙහි වාදං න උපෙති: අකාරකො මුනි අකාරකතාය වාදං න උපෙති. අථවා වුච්චමානො උපවදියමානො න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථියති, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති අකාරකොම්හීති. මුනි ඉමෙහි ද්වීහි කාරණෙහි වාදං න උපෙති න උපගච්ඡති න ගණ්හාති න පරාමසති න අභිනිවිසතීති 'වාදඤ්ච ජාතං මුනි නො උපෙති.'

**තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චීති** - 'තස්මා'ති තස්මා තං කාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා[1] මුනිනො ආහතචිත්තතා[2] ඛිලජාතතාපි නත්ථි, පඤ්චපි චෙතොඛිලා නත්ථි. තයොපි ඛිලා නත්ථි: රාගඛිලො දොසඛිලො මොහඛිලො නත්ථි න සංවිජ්ජති නූපලබ්භති පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො. **කුහිඤ්චීති** - කුහිඤ්චි කිම්හිචි කත්ථචි, අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති 'තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චී'ති.

තෙනාහ භගවා:

"වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ
අථොපි වෙ[3] සච්චමනා වදන්ති,
වාදං ච ජාතං මුනි නො උපෙති
තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චී"ති.

**3 - 2**

සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය
ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො,
සයං සමත්තානි පකුබ්බමානො
යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය.

---

1. තං නිදානං - සීමු. I.
2. ආහතක චිත්තතා - සීමු. I.
3. අඤ්ඤෙපි තෙ - සීමු. II.

**වාදං ච ජාතං මුනි නො උපෙති** – ඒ අංක්‍රොශවාදය බුදුනට ද සඟනට ද අගුනයෙන් උපන්නේ හටගත්තේ තිපත්තේ මොනොවට තිපත්තේ පහළ වූයේ මෙරමා බසින් වූයේ උපවාද වූයේ වේ නුයි 'වාදං ච ජාතං' යනු වෙයි. **මුනි නො උපෙති** – 'මුනි' යනු: (2-8. සුත්තනිද්දෙසය බලන්න) යමෙක් උපවාදයට පැමිණේ නම්, හෙතෙම දෙ කරුණෙකින් උපවාදයට පැමිණෙයි: කාරක (=කළ දොස ඇතියේ) කාරක බැවින් උපවාදයට පැමිණෙයි. නොහොත් කියනු ලබනුයේ උපවාද කරනු ලබනුයේ 'මම අකාරකයෙමි' කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, තදබවට පැමිණෙයි, කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ කෙරෙයි. උපවාදයට පැමිණෙනුයේ මේ දෙ කරුණෙන් පැමිණෙයි. බුද්ධමුනි තෙම දෙ කරුණෙකින් උපවාදයට නො පැමිණෙයි: අකාරක වූ මුනි අකාරක බැවින් උපවාදයට නො පැමිණෙයි, නොහොත් (අන්‍යයන් විසින් කියනු ලබනුයේ උපවාද කරනු ලබනුයේ 'මම අකාරකයෙමි' නො කිපෙයි, පූති නො වෙයි, තද නො වෙයි, කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. මුනි තෙම මේ දෙ කරුණෙන් උපවාදයට නො පැමිණෙයි, නො එළැඹෙයි, පරාමශී නො කෙරෙයි, නො පිවිසේ නුයි 'වාදං ච ජාතං මුනි නො උපෙති' යනු වේ.

**තස්මා මුනි නත්ථි ඛිලො කුහිඤ්චි** – 'තස්මා' යනු: එහෙයින් එ කරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයයෙන් ඒ නිදානයෙන් මුනිහුගේ කොපයෙන් පහළ සිතැති බවෙක් ප්‍රතිඝඛිල (=හුල්) හටගත් බවෙක් නැති. චෙතොඛිල පස ම නැති. රාග ද්වේස මෝහ යන ඛිල තුන ම නැත්තේයි. **නත්ථි** – අවිද්‍යමාන වෙයි, නො ලැබෙයි ප්‍රහීණ වූයේ සමුච්ඡින්න වූයේ සන්සිඳුණේ සැහැල්ලු වූයේ උපතට නො සුදුසු වූයේ නුවණගින්නෙන් දැවුණේ වෙයි. **කුහිඤ්චි** යනු: අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කොහි දු කිසිවෙක්හි දු කිසි තැනෙක්හි දු නුයි 'තස්මා මුනි නත්ථි ඛිලො කුහිඤ්චි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"වදන්ති වෙ –පෙ– නත්ථි ඛිලො කිහිඤ්චි"යි.

## 8-2.

දෘෂ්ටිච්ඡන්දයෙන් මෙහෙයන ලද දෘෂ්ටිරුචියෙහි බැසගත් තීර්ථික ජන තෙමේ ස්වකීය දෘෂ්ටිය කිසෙයින් හරනේ ද, යළි තමා විසින් රැස් කරන ලද ඒ දෘෂ්ටිගතයන් කරනුයේ යම්සේ දනී නම් එසේ මැ කියන්නේ යි.

**සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍යාති** – යෙ තෙ[1] තිත්ථියා සුන්දරිං පරිබ්බාජිකං හන්ත්වා සමණානං සක්‍යපුත්තියානං අවණ්ණං පකාසයිත්වා එවං එතං ලාභං යසං සක්කාරං සම්මානං පච්චාහරිස්සාමා'ති තෙ එවංදිට්ඨිකා එවංඛන්තිකා එවංරුචිකා එවංලද්ධිකා එවංඅජ්ඣාසයා එවමධිප්පායා, තෙ නාසක්ඛිංසු සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං අතික්කමිතුං. අථ ඛො ස්වෙව අයසො තෙ පච්චාගතොති. එවම්පි සකං දිට්ඨිං කථමච්චයෙය්‍ය. අථවා 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති යො සො එවංවාදො සො සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං කථං අච්චයෙය්‍ය අතික්කමෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍ය? තං කිස්ස හෙතු? තස්ස සා දිට්ඨි තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති. එවම්පි 'සකඤ්හි දිට්ඨිං කථමච්චයෙය්‍ය.' අථවා 'අසස්සතො ලොකො, අන්තවා[2] ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න හොති ච තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති යො සො එවංවාදො, සො සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං කථං අච්චයෙය්‍ය අතික්කමෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍ය; තං කිස්ස හෙතු? තස්ස සා දිට්ඨි තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති. එවම්පි 'සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය.'

**ඡන්දානුනීතො රුචියා නිවිට්ඨොති** – 'ඡන්දානුනීතො'ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා යායති නීයති වුය්හති සංහරීයති, යථා හත්ථියානෙන වා අස්සයානෙන වා ගොයානෙන වා මෙණ්ඩකයානෙන වා ඔට්ඨයානෙන වා යායති නිය්‍යති වුය්හති සංහරීයති, එවමෙවං සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා යායති නිය්‍යති වුය්හති සංහරීයතීති ඡන්දානුනීතො; **රුචියා නිවිට්ඨොති** සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා නිවිට්ඨො පතිට්ඨිතො අල්ලීනො උපගතො අජ්ඣොසිතො අධිමුත්තොති 'ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො.'

1. යෙතෙන - සීමු. I. 2. අනන්තවා - සීමු. I.

**සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය** – ඒ තීර්ථකයෝ සුන්දරී පිරිවැජිය නසා ශ්‍රමණශාක්‍යපුත්‍රයන්ගේ අගුණ ප්‍රකට කොට ‘මෙසේ මේ ලාභ යශස් සත්කාර සම්මාන උපදවම්හ’ යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු මෙබඳු කැමැත්ත – මෙබඳු රුචිය – මෙබඳු ලබ්ධිය – මෙබඳු අදහස – මෙබඳු අභිප්‍රාය ඇත්තාහු, ඔහු ස්වකීය දෘෂ්ටිය කැමැත්ත රුචිය ලබ්ධිය අධ්‍යාශය ස්වකීය අභිප්‍රාය ඉක්මවන්නට නො හැකි වූහ. වැලි එ මැ අයස ඔවුන් කරා පෙරලා පැමිණියේ නුයි මෙසේත් ‘සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය’ යනු වේ. නොහොත් ‘ලොකය ශාශ්වත යැ, මේ මැ සැබැවැ, අන්‍යය සිස් යැ’ යන මෙබඳු වාදය ස්වකීය දෘෂ්ටිය සිය කැමැත්ත සිය රුචිය සිය ලබ්ධිය සිය අදහස සිය සිතැඟිය කෙසේ නම් ඉක්මවන්නේ ද, අතික්‍රමණය සමතික්‍රමණය කරන්නේ ද, බැහැර කරන්නේ ද, (නො කරන්නේ මැයැ.) ඊට කරුණු කිම යත්: ඔහුගේ ඒ දෘෂ්ටි තොමෝ එපරිද්දෙන් සම්පූර්ණ වූවා යැ මොනොවට ගන්නා ලද්දී යැ ඇසුරු කොට ගන්නා ලද්දී යැ පරාමර්ශනය කරන ලද්දී යැ අභිනිවෙශය කරන ලද්දී යැ ඇතුළත් වූවා යැ බැසගන්නා ලද්දී යැ (එහෙයිනි). මෙසේත් ‘සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය, යනු වේ. නොහොත් ආත්මභාවසඞ්ඛ්‍යාත ලෝකය අශාශ්වත යැ, ලොකය (ආත්මභාවය) අනන්තවත් යැ, ලොකය අනන්තවත් යැ, ජීවයත් ශරීරයත් හේ මැයැ, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ, සත්ත්ව තෙමේ මරණින් මතු (පරලොවැ) වෙයි. සත්ත්ව තෙමේ පරලොවැ නො මැ වෙයි. සත්ත්ව තෙමේ පරලොවැ උපදනේත් නූපදනේත් වෙයි. පරලොවැ නො මැ වෙයි. නොවන්නේ නො වෙයි. මේ මැ සැබැවැ අන්‍යය සිස් යැ යන මෙබඳු වාද සඞ්ඛ්‍යාත වූ ස්වකීය දෘෂ්ටිය...ස්වකීය හැඟීම කෙසේ නම් ඉක්මවන්නේ ද; ඊට හෙතු කිම ? යත්: ඔහු විසින් ඒ දෘෂ්ටි තොමෝ නො ඉක්මැවියැ හැකි පරිද්දෙන් පුරන ලද, සමාදන් වන ලද ගන්නා ලද, පරාමර්ශ කරන ලද, අභිනිවෙශ කරන ලද, ඇතුළත් වන ලද, බැසගන්නා ලද හෙයිනි. මෙසේත් ‘සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය’ යනු වේ.

**ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො** – ‘ඡන්දානුනීතො’ යනු: ස්වකීය දෘෂ්ටියෙන් – කැමැත්තෙන් – රුචියෙන් – ලබ්ධියෙන් යවනු ලබයි, පමුණුවනු ලබයි, උසුලනු ලබයි, මොනවට හරිනු ලබා. ඇත්යානකින් හෝ අශ්වයානකින් හෝ රියකින් හෝ ගවයානකින් හෝ එළුයානකින් හෝ බැටළුයානකින් හෝ ඔටුයානකින් හෝ කොටළුයානකින් හෝ පමුණුවනු ලබන්නාක් මෙන් තමාගේ දෘෂ්ටියෙන් - කැමැත්තෙන් – රුචියෙන් – ලබ්ධියෙන් යවනු පමුණුවනු උසුලනු සංහරණය කරනු ලබා නුයි ‘ඡන්දානුනීතො’ යනු වේ. ‘රුචියා නිවිට්ඨො’ යනු: තමාගේ දෘෂ්ටියෙහි කැමැත්තෙහි රුචියෙහි ලබ්ධියෙහි පිවිසියේ පිහිටියේ ඇලුණේ උපගත වූයේ ඇතුළත් වූයේ බැසගන්නා ලද්දේ නුයි ‘ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො’ යනු වේ.

**සයං සමත්තානි පකුබ්බමානොති** – සයං සමත්තං කරොති, පරිපුණ්ණං කරොති, අනොමං කරොති, අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති; 'අයං සත්ථා සබ්බඤ්ඤූ'ති සයං සමත්තං කරොති, පරිපුණ්ණං කරොති, අනොමං කරොති; අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති; 'අයං ධම්මො ස්වාක්ඛාතො, අයං ගණො සුප්පටිපන්නො, අයං දිට්ඨි භද්දිකා, අයං පටිපදා සුපඤ්ඤත්තා, අයං මග්ගො නිය්‍යානිකො'ති සයං සමත්තං කරොති, පරිපුණ්ණං කරොති, අනොමං කරොති, අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති ජනෙති සඤ්ජනෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙතීති 'සයං සමත්තානි පකුබ්බමානො.'

**යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍යාති** – යථා ජානෙය්‍ය තථා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍ය. 'සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති යථා ජානෙය්‍ය, තථා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍ය. 'අසස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති යථා ජානෙය්‍ය, තථා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍යාති–යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය.

තෙනාහ භගවා:

"සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය
ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො,
සයං සමත්තානි පකුබ්බමානො
යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍යා"ති.

**8 – 8**

යො අත්තනො සීලවතානි ජන්තු
අනානුපුට්ඨොව පරෙසං[1] පාවා[2]
අනරියධම්මං කුසලා තමාහු
යො ආතුමානං සයමෙව පාවා.

**යො අත්තනො සීලවතානි ජන්තූති** – 'යො'ති යො යාදිසො යථායුත්තො යථාවිහිතො යථාපකාරො යං ඨානං පත්තො යංධම්ම-සමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා; **සීලබ්බතානීති** අත්ථි සීලං චෙව වතං ච, අත්ථි වතං න සීලං. කතමං සීලං චෙව වතං ච? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, යො තත්ථ සඤ්ඤමො සංවරො අනතික්කමො, ඉදං සීලං. යං සමාදානං, තං වතං. සංවරට්ඨෙන සීලං, සමාදානට්ඨෙන වතං. ඉදං වුච්චති සීලං චෙව වතං ච. කතමං වතං න සීලං? අට්ඨ ධුතඞ්ගානි: ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං සපදානචාරිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං යථාසන්ථතිකඞ්ගං, ඉදං වුච්චති වතං න සීලං. විරියසමාදානම්පි වුච්චති වතං න සීලං. "කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසබලෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතී"ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං.

---

1. පරස්ස – සු. 2 පාවද – ස.

**සයං සමත්තානි පකුබ්බමානො** - තෙමේ සම්පූර්ණ කෙරෙයි, පරිපූර්ණ කෙරෙයි, අලාමක කෙරෙයි, අග්‍ර ශ්‍රේෂ්ඨ ජ්‍යෙෂ්ඨ ප්‍රමඛ උත්තම ප්‍රවර කෙරෙයි. 'මේ ශාස්තෘ සර්වඥ යැයි තෙමේ සම්පූර්ණ කෙරෙයි. . . ප්‍රවර කෙරෙයි. මේ ධර්මය ස්වාඛ්‍යාත යැ, මේ ගණ තෙමේ සුප්‍රතිපන්න යැ, මේ දෘෂ්ටි තොමෝ සොඳුරු යැයි, මේ ප්‍රතිපදා මැනැවින් පනවන ලදැයි, මේ මාර්ගය නෛර්යාණික' යැයි තෙමේ සම්පූර්ණ කෙරෙයි පරිපූර්ණ. . .ප්‍රවර කෙරෙයි, උපදවයි, මොනොවට උපදවයි, නිපදවයි, වෙසෙසින් නිපදවා නුයි 'සයං සමත්තානි පකුබ්බමානො' යනු වේ.

**යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය** - යම් සේ දන්නේ නම් එපරිද්දෙන් කියන්නේය, දක්වන්නේය, ව්‍යවහාර කරන්නේයැ; 'ආත්මභාවලොකය ශාශ්වත යැ, මේ මැ සැබැව, අන්‍යය සිස් යැ'යි යම් සේ දනී නම් එසෙයින් කියන්නේ යැ, දක්වන්නේ යැ, වහරන්නේ යැ; ලොකය අශාශ්වත යැ. . . .සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො මැ වන්නේ යැ, නො වන්නේත් නො වෙයි, මෙය මැ සැබැව, අන්‍යය සිස් යැයි යම්සේ දනී නම් එසෙයින් කියන්නේය, පවසන්නේය, දක්වන්නේය වහරන්නේ නුයි 'යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

'සකං හි දිට්ඨිං – පෙ – තථා වදෙය්‍ය' යි.

**3 - 3.**

යම් පුද්ගලයෙක් නො පුළුවුස්නා ලදුයේ මැ තමාගේ ප්‍රාතිමොක්ෂාදි ශීලයන් හා ධුතාඞ්ගාදිව්‍රතයන් අනුනට කියා ද, යමෙක් මෙසේ තමා (ගුණවතැයි) තෙමේ කියා ද, ඔහුගේ ඒ කීම අනාර්යධර්මයෙකැයි ස්කන්ධාදියෙහි කුශල වූ ආර්යයෝ කියත්.

**යො අත්තනො සීලවතානි ජන්තු** - 'යො' යනු: යම්බඳු වූ. . .(1–3 නිදෙදසය) '**සීලබ්බතානි**' යනු: ශීල ද වූ ව්‍රත ද වූයෙක් ඇත, ශීල නො වූ ව්‍රතයෙක් ඇති. සීලනාර්ථයෙන් ශීල වූයේත් සමාදානාර්ථයෙන් ව්‍රත වූයේත් කවරැ? යත්: මේ ශාසනයෙහි මහණ සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ ආචාර ගොචර දෙකින් යුක්ත වැ වෙසෙයි, අණුමාත්‍ර දොෂයෙහි භය දක්නාසුලු වූයේ සමාදන් වැ ශික්ෂා කොටස්හි හික්මෙයි. එහි යම් සංයමයෙක් සංවරයෙක් අනතික්‍රමයෙක් වී නම් මේ ශීල යැ. යම් සමාදානයෙක් වී නම් ඒ ව්‍රත සි. සංවරාර්ථයෙන් ශීල යැ, සමාදානාර්ථයෙන් ව්‍රත සි. මේ ශීලයත් ව්‍රතයත් වේ යැයි කියනු ලැබේ. ශීල නො වූ ව්‍රතය කවරැ? යත් 'ආරණ්‍යකාඞ්ග යැ පිණ්ඩපාතිකාඞ්ග යැ පාංසුකූලිකාඞ්ග යැ තෛචීවරිකාඞ්ග යැ සපදානචාරිකාඞ්ග යැ ඛලුපච්ඡාභත්තිකාඞ්ග යැ නෛසද්‍යිකාඞ්ගය යථාසන්ථතිකාඞ්ග යැ' යන මේ ධුතාඞ්ග අට ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබේ. වීර්යසමාදානයත් ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබෙයි: 'එකාන්තයෙන් ශරීරයෙහි සමත් නහරත් ඇටත් ඉතිරි වේවා, මස් ලේ වියැළේවා, පුරුෂශක්තියෙන් පුරුෂබලයෙන් පුරුෂවීර්යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණියැ යුතු ඒ උත්තමාර්ථයට නො පැමිණ වීර්යයාගේ ශිථිලබවෙක් නො වන්නේ යැ'යි සිත උත්සාහ ගන්වයි, පිහිටුවයි. මෙ බඳු වූ වීර්යසමාදානය ශීල නො වූ ව්‍රත යැයි කියනුලැබේ.

1. "නාසිස්සං න පිවිස්සාමි විහාරතො න නික්ඛමෙ,
නපි පස්සං නිපාතෙස්සං[1] තණ්හාසල්ලෙ අනූහතෙ"ති [*]

චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. "න තාවාහං ඉමං පල්ලඞ්කං භින්දිස්සාමි, යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී"ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං. 'න තාවාහං ඉමම්හා ආසනා වුට්ඨහිස්සාමි, චඞ්කමා ඔරොහිස්සාමි, විහාරා නික්ඛමිස්සාමි, අඩ්ඪයොගා නික්ඛමිස්සාමි, පාසාදා නික්ඛමිස්සාමි, හම්මියා නික්ඛමිස්සාමි, ගුහාය නික්ඛමිස්සාමි, ලෙණා නික්ඛමිස්සාමි, කුටියා නික්ඛමිස්සාමි, කූටාගාරා නික්ඛමිස්සාමි, අට්ටා[2] නික්ඛමිස්සාමි, මාළා නික්ඛමිස්සාමි, උද්දණ්ඩා[3] නික්ඛමිස්සාමි, උපට්ඨානසාලාය නික්ඛමිස්සාමි, මණ්ඩපා නික්ඛමිස්සාමි, රුක්ඛමූලා නික්ඛමිස්සාමි යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී'ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං. 'ඉමස්මිං යෙව පුබ්බණ්හසමයං අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි[4] සච්ඡිකරිස්සාමී'ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං. 'ඉමස්මිංයෙව මජ්ඣන්තිකසමයං -පෙ- සායන්හසමයං - පුරෙභත්තං- පච්ඡාභත්තං- පුරිමං යාමං- මජ්ඣිමං යාමං- පච්ඡිමං යාමං- කාලෙ - ජුණ්හෙ- වස්සෙ - හෙමන්තෙ - ගිම්හෙ - පුරිමෙ වයොඛන්ධෙ - මජ්ඣිමෙ වයොඛන්ධෙ - පච්ඡිමෙ වයොඛන්ධෙ අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි සච්ඡිකරිස්සාමී'ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. **ජන්තූති** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[5] ජන්තු ඉන්දගු හින්දගු මනුජොති 'යො අත්තනො සීලවතානි ජන්තූ.'

**අනානුපුට්ඨොව පරෙසං පාවාති** – 'පරෙස'න්ති පරෙසං ඛත්තියානං බ්‍රාහ්මණානං වෙස්සානං සුද්දානං ගහට්ඨානං පබ්බජිතානං දෙවානං මනුස්සානං; **අනානුපුට්ඨොති** අපුට්ඨො අපුච්ඡිතො අයාචිතො අනජ්ඣිට්ඨො අපසාදිතො; **පාවාති** අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පාවදති: අහමස්මි සීලසම්පන්නොති වා වතසම්පන්නොති වා සීලබ්බතසම්පන්නොති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන[6] වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චාකුලා පබ්බජිතොති වා මහාකුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොති වා උළාරභොගකුලා පබ්බජිතොති වා, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා, ලාභිම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා, විනයධරොති වා ධම්මකථිකොති වා ආරඤ්ඤිකොති වා රුක්ඛමූලිකොති වා පිණ්ඩපාතිකොති වා පංසුකූලිකොති වා තෙචීවරිකොති වා සපදානචාරිකොති වා ඛලුපච්ඡාභත්තිකොති වා නෙසජ්ජිකොති වා යථාසන්ථතිකොති වා, පඨමස්ස ඣානස්ස ලාභීති වා දුතියස්ස ඣානස්ස ලාභීති වා තතියස්ස ඣානස්ස ලාභීති වා චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ලාභීති වා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා පාවදති කථෙති භණති දීපයති වොහරතීති 'අනානුපුට්ඨොව පරෙසං පාවා.'

---

1. නපි පස්සං න නිපාතෙස්සං - සීමු I. 2. අඩ්ඩා - මජ්සං. 3. කුඩ්ඩා - සීමු. I.
4 ඵුසයිස්සාමි - ස්‍යා. 5. ජතු - මු II. ජාතු - ස්‍යා මජ්සං.
[*] ථෙරගාථාපාළි - පච්චයත්ථෙරගාථා - 3 1 2. මුදිතත්ථෙරගාථා - 4 1 12.
6. අජ්ඣායනෙන - සීමු. I.

1. "තාෂණා නමැති හුල උපුටා නො ලූ කල්හි (මම් බාදනාදිය) නො කම්, (යාගු ආදිය) නො බොම්, වෙහෙරින් බැහැර නො යම්, (ඇඳපුටු ආදියෙහි) ඇලය නො තබමි."

සිත උත්සාහ ගත්වයි, පිහිටුවයි. මෙබඳු වූ වීර්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. 'මාගේ සිත උපාදානග්‍රහණය නො කොට (කාමාදි) ආශ්‍රවයන්ගෙන් සමුච්ඡේදවිමුක්තියෙන් නො මිදෙන තාක් මේ පලඟ නො බිඳිමි' සිත උත්සාහ ගත්වයි, පිහිටුවයි. මෙබඳු වීර්‍යසමාදානය ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. 'මාගේ සිත උපාදානග්‍රහණය නො කොට ආශ්‍රවයන්ගෙන් නොමිදෙන තාක් මේ ආසනයෙන් නො නැඟිසිටිමි, සක්මනින් නො බසිමි, ගුරුළුවක් ගෙයින් ප්‍රාසාදයෙන් හර්ම්‍යයෙන් ගුහායෙන් ලෙනින් කිලිඤයෙන් කුළුගෙයින් අටල්ලෙන් වටගෙයින් උපස්ථානයෙන් උච්චැත්හලින් මඩුයෙන් රුක්මුලින් නො නික්මෙමි' සිතට වැර ගත්වයි, පිහිටුවයි. මෙබඳු වීර්‍යසමාදානය ශීල නොවූ ව්‍රත යයි කියනු ලැබේ. 'මේ දවස් මැ ආර්‍යධර්මය (මාගේ සිතට) එළවමි, මොනොවට එළවමි, අධිගමය කරමි, ස්පර්ශ කරමි, ප්‍රත්‍යක්ෂ කරමි, සිත දැඩි කොට ගත්වයි, පිහිටුවයි. මෙබඳු වීර්‍යසමාදානය ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. මේ මැදි දහවල්හි මැ. . .පස්වරුයෙහි පෙරබත්හි පසුබත්හි – පෙරයමැ මැදියමැ අලුයමැ අවපසැ පුරපසැ වැසිකලැ සිමත් කලැ ගිම්කලැ ප්‍රථමවයස්හි මධ්‍යමවයස්හි පශ්චිමවයස්හි අරීදහම් එළවමි, අධිගමය කෙරෙමි, ස්පර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කෙරෙමි' සිත දැඩි කොට ගත්වයි, පිහිටුවයි. මෙබඳු වීර්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. **ජනතු** යනු: (1-1.නිද්දෙසය.) 'යො අත්තනො සීලවතානි ජනතු' යනු වේ.

**අනානුපුට්ඨොව පරෙසං පාවා** – 'පරෙසං' යනු: අන්‍ය වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර ගෘහස්ථ ප්‍රව්‍රජිත දෙව මනුෂ්‍යයනට; **අනානුපුට්ඨො** – අපෘෂ්ට වූයේ නො පුළුවුස්නා ලදුයේ නො අයදනා ලදුයේ නො ඇණවන ලදුයේ නො පහදවන ලදුයේ; **පාවා** – තමා ගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ කියයි: 'මම් සිල්වත්මි හෝ, ව්‍රතවත්මි හෝ, ශීලව්‍රතවත්මි හෝ, ජාතියෙන් ගොත්‍රයෙන් කුලපුත්‍රභාවයෙන් වර්ණසෞන්දර්‍යයෙන් ධනයෙන් අධ්‍යයනයෙන් කර්මාන්තයෙන් ශිල්පයෙන් විද්‍යාවෙන් ශ්‍රැතයෙන් ප්‍රතිභාණයෙන් හෝ එක්තරයෙකින් යුක්ත වෙමි හෝ, උසස් කුලයෙන් නික්මැ පැවිදි වීමි මහාසාරකුලයෙන් පැවිදි වීමි මහද්භොග ඇති කුලයෙන් පැවිදි වීමි උළාරභොග ඇති කුලයෙන් පැවිදි වීමි හෝ, ගැහැවිපැවිද්දන් අතුරෙහි ප්‍රකටයෙමි පිරිවර ඇත්තෙමි හෝ, සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකර ලැබෙමි හෝ, සෞත්‍රාන්තිකයෙමි විනයධරයෙමි ධර්මකථිකයෙමි හෝ, ආරණ්‍යකයෙමි වෘක්ෂමූලිකයෙමි පිණ්ඩපාතිකයෙමි පාංශුකූලිකයෙමි ත්‍රෛචීවරිකයෙමි සපදානචාරිකයෙමි ඛලුපච්ඡාභත්තිකයෙමි නෙසජ්ජිකයෙමි යථාසන්ථතිකයෙමි හෝ, ප්‍රථමධ්‍යානලාභී වෙමි ද්විතීය – තෘතීය – චතුර්ථධ්‍යානලාභී වෙමි ආකාසානඤ්චායතන – විඤ්ඤාණඤ්චායතන – ආකිඤ්චඤ්ඤායතන – නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි හෝ පවසයි කියයි බෙණෙයි දක්වයි ව්‍යවහාර කෙරේ නුයි 'අනානුපුට්ඨොව පරෙසං පවා' යනු වේ.

**අනරියධම්මං කුසලා තමාහූති** - 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ග-කුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා; තෙ කුසලා එවමාහංසු: අනරියානං එසො ධම්මො, නෙසො ධම්මො අරියානං, බාලානං එසො ධම්මො, නෙසො ධම්මො පණ්ඩිතානං, අසප්පුරිසානං එසො ධම්මො, නෙසො ධම්මො සප්පුරිසානන්ති එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති-අනරියධම්මං කුසලා තමාහු.

**යො ආතුමානං සයමෙව පාවාති** - 'ආතුමා' වුච්චති අත්තා. **සයමෙව පාවාති** සයමෙව අත්තානං[1] පාවදති: අහමස්මි සීලසම්පන්නොති වා වතසම්පන්නොති වා සීලබ්බතසම්පන්නොති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චාකුලා පබ්බජිතොති වා මහාකුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොති වා උළාර-භොගකුලා පබ්බජිතොති වා, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා, ලාභිම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා, සුත්තන්තිකොති වා විනයධරොති වා ධම්මකථිකොති වා ආරඤ්ඤිකොති වා පිණ්ඩපාතිකොති වා පංසුකූලිකොති වා තෙචීවරිකොති වා සපදානචාරිකොති වා ඛලුපච්ඡාභත්තිකොති වා නෙසජ්ජිකොති වා යථාසන්ථතිකොති වා පඨමස්ස ඣානස්ස ලාභීති වා දුතියස්ස ඣානස්ස ලාභීති වා තතියස්ස ඣානස්ස ලාභීති වා චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා විඤ්ඤාණඤ්චායතනසමා-පත්තියා ලාභීති වා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා පාවදති කථෙති භණති දීපයති වොහරතීති-යො ආතුමානං සයමෙව පාවාති.

තෙනාහ භගවා:

"යො අත්තනො සීලවතානි ජන්තු
අනානුපුට්ඨොව පරෙසං පාවා,
අනරියධම්මං කුසලා තමාහු
යො ආතුමානං සයමෙව පාවා"ති.

### 8 - 4

සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො
ඉතිහන්ති[2] සීලෙසු අකත්ථමානො,
තමරියධම්මං කුසලා වදන්ති
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ.

**සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තොති** - 'සන්තො' ති රාගස්ස සමිතත්තා සන්තො, දොසස්ස සමිතත්තා සන්තො, මොහස්ස සමිතත්තා සන්තො, කොධස්ස, උපනාහස්ස, මක්ඛස්ස, පලාසස්ස, ඉස්සාය, මච්ඡරියස්ස, මායාය, සාඨෙය්‍යස්ස, ථම්භස්ස, සාරම්භස්ස, මානස්ස, අතිමානස්ස, මදස්ස, පමාදස්ස, සබ්බකිලෙසානං, සබ්බදුච්චරිතානං, සබ්බසන්තාපානං, සබ්බා-කුසලාභිසංඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති-සන්තො; **භික්ඛූති** සත්තන්නං ධම්මානං භින්නත්තා භික්ඛු: සක්කායදිට්ඨි භින්නා හොති, විචිකිච්ඡා භින්නා හොති, සීලබ්බතපරාමාසො භින්නො හොති, රාගො භින්නො හොති, දොසො භින්නො හොති, මොහො භින්නො හොති, මානො භින්නො හොති, භින්නාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා[3] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

---

1. අත්තං - ස. 2. ඉදහන්ති - සීමු. I. 1. සදර - ස.

**අනරියධම්මං කුසලා තමාහු** – ‘කුසලා’ යනු: ස්කන්ධ – ධාතු – ආයතන ප්‍රතීත්‍යසමුත්පාද – සමෘතිප්‍රස්ථාන – සම්‍යක්ප්‍රධාන – ඍද්ධිපාද – ඉන්ද්‍රිය – බල– බොධ්‍යඞ්ග – මාර්ග – ඵල – නිර්වාණයෙහි නිපුණ වූවාහු මෙසේ කියති: ‘මෙල ධර්මය අනාර්යයන්ගේ යැ, ආර්යයන්ගේ ධර්මයෙක් නො වෙයි. බාලයන්ගේ දහමෙක, පණ්ඩිතයන්ගේ දහමෙක් නො වෙයි. අසත්පුරුෂයන්ගේ දහමෙක, සත්පුරුෂයන්ගේ දහමෙක් නො වේ යයි මෙසේ පවසති කියති බෙණෙති දක්වති. මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි ‘අනරියධම්මං කුසලා තමාහු’ යනු වේ.

**යො ආතුමානං සයමෙව පාවා** – ‘අතුමා’ යි ආත්මය කියනු ලැබේ. **සයමෙව පවා** – තෙමේ මැ තමා පවසයි: ‘මම සීලසම්පන්නයෙමි’ හෝ (‘අනානුපුට්ඨො පරෙසං පාවා’ යන්නෙහි නිර්දේශය බලනු.)... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි හෝ පවසයි, කියයි බෙණෙයි දක්වයි වහරා නුයි ‘යො ආතුමානං සයමෙව පාවා’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“යො අත්තනො සීලවතානි –පෙ– ආතුමානං සයමෙව පාවා” යනු

## 8–4.

තවද යම් ක්ෂීණාස්‍රව මහණෙක් රාගාදි කෙලෙස් සන්හිඳීමෙන් ශාන්ත වූයේ රාගාදි ගිනි නිවීමෙන් නිවුණු සිත් ඇත්තේ ‘මම මෙසේ වෙමි’ සිල් නිමිති කොට තමා ළවා කියන තෙපුල් නො කියන්නේ වේ ද, යමක්හුගේ ස්කන්ධාදිලෝකයෙහි කිසි තැනෙක්හි රාගාදිඋත්සදයෝ නැද්ද, ඔහුගේ ඒ සිය ගුණ නො පළකිරීම අර්දහමෙකැයි ස්කන්ධාදියෙහි නිපුණ වූ බුද්ධාදීහු කියත්.

**සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො** – ‘සන්තො’ යනු: රාගය සමිත (සන්හිඳුවන ලද) වන බැවින් ශාන්ත යැ, ද්වේෂය සමිත වන බැවින් ශාන්ත යැ, මෝහය සමිත වන බැවින් ශාන්ත යැ, ක්‍රොධය උපනාහය මක්‍ෂබව පලාස(යුගග්‍රාහ)ය ඊර්ෂ්‍යාව මාත්සර්යය මායාව ශඨබව තදබව කරණුත්තරියකරණය මානය අතිමානය මදය ප්‍රමාදය සියලු කෙලෙසුන් සියලු දුශ්චරිතයන් සියලු දරථයන් සියලු පරිදාහයන් සියලු සන්තාපයන් සියලු අකුශලාභිසංස්කාරයන් ශාන්ත වන බැවින් සමිත වන බැවින් වෙසෙසින් සමිත වන බැවින් දවන ලද වන බැවින් (සියලු සන්තාපයන්) නිවන ලද වන බැවින් දුරු කළ බැවින් ඉපැදීමට. නුසුදුසු කළ බැවින් ශාන්ත වූයේ උපශාන්ත වූයේ නිවුණේ සන්හිඳුණේ නුයි ‘සන්ත’ නම. භික්ඛු – (මතු කියන) සප්තධර්මයන් භින්න වන බැවින් ‘භික්ඛු’ නම. සත්කායදෘෂ්ටිය බිඳුණේ වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය – රාගය – ද්වේෂය – මෝහය – මානය බිඳුණේ වෙයි. ඔහු විසින් කෙලශප්‍රත්‍යය වූ පුනර්භවය දෙන්නා වූ කෙලශදරථ සහිත වූ දුඃඛවිපාක වූ අනාගතයෙහි ජාතිජරාමරණයන්ට කාරණ වූ ලාමක වූ අකුශලධර්මයෝ බිඳුණා ලද්දාහු වෙත්.

1. "පජ්ජෙන කතෙන අත්තනා (සභියාති භගවා)
පරිනිබ්බානගතො විතිණ්ණකඞ්ඛො
විභවං භවං ච විප්පහාය
වුසිතවා ඛීණපුනබ්භවො[1] ස භික්ඛූ"ති-a

සන්තො ච භික්ඛු. •

**අභිනිබ්බුතත්තොති** - රාගස්ස නිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තො; දොසස්සනිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තා. මොහස්ස නිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තො; කොධස්ස, උපනාහස්ස, මක්ඛස්ස, පලාසස්ස, ඉස්සාය, මච්ඡරියස්ස, මායාය, සාඨෙය්‍යස්ස, ථම්භස්ස, සාරම්භස්ස, මානස්ස, අතිමානස්ස, මදස්ස, පමාදස්ස, සබ්බකිලෙසානං, සබ්බදුච්චරිතානං, සබ්බදරථානං, සබ්බපරිළාහානං, සබ්බසන්තාපානං, සබ්බාකුසලාභිසඞ්ඛාරානං නිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තොති 'සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො.'

**ඉතිහන්ති[2] සීලෙසු අකත්ථමානොති** - 'ඉතිහ'න්ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී. අක්ඛරසමවායො ව්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාපෙතං[3] ඉතිහන්ති. **සීලෙසු අකත්ථමානොති** - ඉධෙකච්චො කත්ථී හොති විකත්ථී;[4] සො කත්ථති 'අහමස්මි සීලසම්පන්නො'ති වා 'වතසම්පන්නො'ති වා 'සීලබ්බතසම්පන්නො'ති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා කත්ථති විකත්ථති, එවං න කත්ථති න විකත්ථති, කත්ථනා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති 'ඉතිහන්ති සීලෙසු අකත්ථමානො.'

**තමරියධම්මං කුසලා වදන්තීති** - 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා, තෙ කුසලා එවං වදන්ති: 'අරියානං එසො ධම්මො; නෙසො ධම්මො අනරියානං. පණ්ඩිතානං එසො ධම්මො; නෙසො ධම්මො බාලානං. සප්පුරිසානං එසො ධම්මො; නෙසො ධම්මො අසප්පුරිසාන'න්ති එවං වදන්ති, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති 'තමරියධම්මං කුසලා වදන්ති.'

1. ඛීණපුනබ්භවො - සීමු. I. 2. ඉතිහං - පු.
3. පදානුපුබ්බතාමෙතං - සීමු. I. 4. කත්ථිකො හොති විකත්ථිකො - සී. මු. II.
a. සුත්තනිපාත - සභියසුත්ත.

1. යමෙක් තෙමේ තමා විසින් වැඩූ මාර්ගයෙන් ක්ලේශපරිනිර්වාණයට ගියේ ද, එහෙයින් ම තරණය කළ සැක ඇත්තේ ද, විපත්ති සම්පත්ති ආදි භේද ඇති විභවයත් භවයත් දුරු කොට මාර්ගවාස වැස නිම වූ ක්ෂය කළ පුනර්භව ඇති හෙතෙම භික්ෂු නම් වේ නුයි- 'සන්තො ච භික්ඛු' යනු වේ.

**අභිනිබ්බුතත්තො** - රාගය නිවන ලද වන බැවින් නිවුණු සිත් ඇතියේ ක්‍රෝධය උපනාහය මකුබව පලාස(යුගග්‍රාහ)ය ඊර්ෂ්‍යාව මසුරුබව මායාව ශඨබව තද්බව කරණුත්තරියකරණය මානය අතිමානය මදය ප්‍රමාදය සියලු කෙලෙසුත් සියලු දුශ්චරිතයත් සියලු දරථයත් සියලු පරිදාහයත් සියලු සන්තාපයත් සර්වාකුශලාභිසංස්කාරයත් නිවන ලද වන බැවින් වෙසෙසින් නිවුණු සිත් ඇත්තේ නුයි 'සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො' යනු වේ.

**ඉතිහ නත්ථි සීලෙසු අකත්ථමානො** - 'ඉතිහං' යනු: පදසන්ධි යැ, පදයන්ගේ සංසර්ග යැ, පදයන්ගේ එකතු වීම යැ, ව්‍යඤ්ජනයන්ගේ සිලුටුබව යැ, තෙල 'ඉතිහං' යනු පදයන්ගේ පරිපාටිය ද වේ. **සීලෙසු අකත්ථමානො** - මෙ ලොවැ කිසිවෙක් ආත්මවර්ණනාව කරනුයේ විවිධ කොට ආත්මවර්ණනාව කරනුයේ වෙයි: හෙතෙම 'මම සිල්වත්මි' හෝ කියයි, ව්‍රතසම්පන්නයෙමි හෝ, ශීලව්‍රතසම්පන්නයෙමි හෝ, ජාතියෙන්, ගොත්‍රයෙන්, කුලපුත්‍රභාවයෙන්, වර්ණසෞන්දර්යයෙන් හෝ. . .නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි හෝ කියයි වෙසෙසින් කියයි. මෙසේ නො කියයි, විවිධ කොට නො කියයි. ආත්මවර්ණනායෙන් දුරින් දුරු වූයේ නො ඇලුණේ සියලු ලෙසින් වෙන් වූයේ නික්මුණේ වෙන් වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්තවූයේ විගතමර්යාදා කළ(එක් ව නො යෙදුණු) සිතින් යුක්ත ව වෙසේ නුයි 'ඉතිහ නත්ථි සීලෙසු අකත්ථමානො' යනු වේ.

**තමරියධම්මං කුසලා වදන්ති** - 'කුසලා' යනු: ස්කන්ධයන්හි නිපුණ වූවාහු ධාතු - ආයතන - ප්‍රතීත්‍යසමුත්පාද - ස්මෘතිප්‍රස්ථාන - සම්‍යක්ප්‍රධාන - - ඍද්ධිපාද - ඉන්ද්‍රිය - බල - බොධ්‍යඞ්ග - මාර්ග - ඵල - නිර්වාණයෙහි නිපුණ වූවාහු මෙසේ කියති: 'තෙල ආර්යයන්ගේ දහමෙකි; අනාර්යයන්ගේ දහමෙක් නො වෙයි. පණ්ඩිතයන්ගේ දහමෙකි; බාලයන්ගේ දහමෙක් නො වෙයි. තෙල සත්පුරුෂයන්ගේ දහමෙකි; අසත්පුරුෂයන්ගේ දහමෙක් නො වේ ය'යි මෙසේ පවසති, කියති, බෙණෙති, දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'තමරියධම්මං කුසලා වදන්ති' යනු වේ.

**යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙති** – 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස, **උස්සදා**ති – සත්තුස්සදා: රාගුස්සදො දොසුස්සදො මොහුස්සදො මානුස්සදො දිට්ඨුස්සදො කිලෙසුස්සදො කම්මුස්සදො. තස්සිමෙ උස්සදා නත්ථි න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; **කුහිඤ්චී**ති – කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වා; **ලොකෙති** – අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ආයතනලොකෙති 'යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ'ති.

තෙනාහ භගවා:

"සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො
ඉතිහන්ති සීලෙසු අකත්ථමානො,
තමරියධම්මං කුසලා වදන්ති
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ"ති.

3 – 5

පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා
පුරෙක්ඛතා සන්ති අවෙවදාතා,[1]
යදත්තනි පස්සති ආනිසංසං
තන්නිස්සිතො කුප්පපටිච්චසන්තිං[2],

**පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා**ති – 'පකප්පනා'ති ද්වෙ පකප්පනා: තණ්හාපකප්පනා ච දිට්ඨිපකප්පනා ච –පෙ– අයං තණ්හාපකප්පනා –පෙ– අයං දිට්ඨිපකප්පනා, ඉමා ද්වෙ පකප්පනා. **සඞ්ඛතා**ති – සඞ්ඛතා විසඞ්ඛතා අභිසඞ්ඛතා සණ්ඨපිතා'තිපි සඞ්ඛතා, අථ වා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'තිපි සඞ්ඛතා; **යස්සා**ති – දිට්ඨිගතිකස්ස; **ධම්මා වුච්චන්ති** ද්වාසට්ඨිදිට්ඨිගතානීති 'පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා.'

**පුරෙක්ඛතා සන්ති අවෙවදාතා**ති – 'පුරෙක්ඛතා'[3] ති ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච –පෙ– අයං තණ්හාපුරෙක්ඛාරො. –පෙ– අයං දිට්ඨිපුරෙක්ඛාරො. තස්ස තණ්හාපුරෙක්ඛාරො අප්පහීනො දිට්ඨිපුරෙක්ඛාරො අප්පටිනිස්සට්ඨො. තස්ස තණ්හාපුරෙක්ඛාරස්ස අප්පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස අප්පටිනිස්සට්ඨත්තා සො තණ්හං වා දිට්ඨිං වා පුරතො කත්වා චරති, තණ්හාධජො තණ්හාකෙතු තණ්හාධිපතෙය්‍යො, දිට්ඨිධජො දිට්ඨිකෙතු දිට්ඨාධිපතෙය්‍යො, තණ්හාය වා දිට්ඨියා වා පරිවාරිතො චරතීති පුරෙක්ඛතා; **සන්තී**ති – සන්ති සංවිජ්ජන්ති අත්ථි උපලබ්භන්ති; **අවෙවදාතා**ති – අවෙවදාතා අවොදාතා අපරිසුද්ධා සංකිලිට්ඨා සංකිලෙසිකාති 'පුරෙක්ඛතා සන්ති අවෙවදාතා.'

1. අවිවදාතා – සු. PTS. 2. සන්ති – සීමු. I. 3. පුරෙක්ඛාරා – කත්ථචි.

**යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ** – 'යස්ස' යනු: අර්හත් වූ ක්ෂීණාශ්‍රවයන්හුගේ; **උස්සදා** – උත්සදයෝ සතෙකි: රාගෝත්සදය ද්වේෂ – මෝහ – මාන – දෘෂ්ටි – ක්ලේශ – කර්මෝත්සදය ය යි. ඔහුට මේ උත්සදයෝ නැත, විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරු වූවාහු අභව්‍යෝත්පත්තික වූවාහු නුවණ නමැති ගින්නෙන් දවනා ලද්දාහු වෙත්. **කුහිඤ්චි** – අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කිසි තැනෙක්හි; **ලොකෙ** – අපායලෝකයෙහි මනුෂ්‍ය – දෙව – ස්කන්ධ – ධාතු – ආයතනලෝකයෙහි නුයි 'යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ' යනු වේ.

එහෙයින් වදාළහ බුදුහු:

''සන්තා ච භික්ඛු–පෙ–කුහිඤ්චි ලොකෙ''යි.

**8 – 5.**

යම් දෘෂ්ටිගතිකයන්හුගේ තෘෂ්ණාදෘෂ්ටි විසින් පරිකල්පිත වූ (=සලකන ලද) ප්‍රත්‍යයෙන් සකස් කරන ලද තෘෂ්ණාදෘෂ්ටි පෙරටු කරන ලද අපිරිසුදු වූ දෙසැටදිට්ඨිගත ධර්ම කෙනෙක් ඇත්තාහු ද, හෙතෙම යම් හෙයකින් ඒ දෘෂ්ටියෙහි ප්‍රත්‍යය සත්කාරාදි දෘෂ්ටධාර්මික වූ ද ගතිවිශෙෂාදි සාම්පරායික වූ ද ආනිසංසයක් දක්නේ ද, එහෙයින් විපාකජනක පරිවර්තනශීලි හෙයින් කොප්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ ද සංවෘතිශාන්ති සඞ්ඛ්‍යාත දෘෂ්ටිය ඇසිරි කොට පවත්නේ වේ.

**පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා** – 'පකප්පනා' යි: තෘෂ්ණාප්‍රකල්පනය ද දෘෂ්ටිප්‍රකල්පනය දැයි ප්‍රකල්පනයෝ දෙදෙනෙකි; . . .මේ තෘෂ්ණාප්‍රකල්පනා යැ . . .මේ දෘෂ්ටිප්‍රකල්පනා යි. **සඞ්ඛතා** – ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දාහු වෙසෙසින් සකස් කරන ලද්දාහු මොනොවට සකස් කරන ලද්දාහු ප්‍රත්‍යයවශයෙන් ම මනා කොට තබන ලද්දාහු නුයි 'සඞ්ඛත' නම් වෙති. නොහොත් ඇති වැ නැති වන හෙයින් අනිත්‍ය වූවාහු ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දාහු වස්ත්වාලම්බනයන් නිසා උපන්නාහු ක්ෂය වන සවභාව ඇත්තාහු පිරිහෙන සවභාව ඇත්තාහු නො නැවැතී පහ වන සවභාව ඇත්තාහු නිරුද්ධ වන සවභාව ඇත්තාහු නුයි ද 'සඞ්ඛත' නම් වෙත්. **යස්ස** – දෘෂ්ටිගතිකයන්හුගේ; ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ 'ධම්ම' යි කියනු ලැබෙත් නුයි 'පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා' යනු වේ.

**පුරෙක්ඛතා සන්ති අවෙවදාතා** – 'පුරෙක්ඛතා' යනු: තෘෂ්ණාපුරසකාරය ද දෘෂ්ටිපුරසකාරය දැයි පුරසකාරයෝ දෙදෙනෙක් වෙති. . . .ඔහුට (ඔහු විසින් හෝ) තෘෂ්ණාපුරස්කාරය අප්‍රහීණ යැ, දෘෂ්ටිපුරස්කාරය දුරු නො කරන· ලද්දේ යැ, ඔහු විසින් තෘෂ්ණාපුරස්කාරය අප්‍රහීණ හෙයින් දෘෂ්ටිපුරස්කාරය දුරු නො කළ හෙයින් හෙතෙම තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට හැසිරෙයි, තෘෂ්ණා නමැති ධවජ ඇත්තේ තෘෂ්ණා නමැති කෙහෙලි ඇත්තේ තෘෂ්ණාව අධිපති කොට ඇත්තේ, දෘෂ්ටි නමැති ධවජ ඇත්තේ දෘෂ්ටි නමැති කෙහෙලි ඇත්තේ දෘෂ්ටිය අධිපති කොට ඇත්තේ වෙයි. තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ විසින් පිරිවරන ලදුයේ හැසිරේ නුයි 'පුරෙක්ඛතා' යනු වේ. **සන්ති** – ඇත, විද්‍යමාන වෙති, ලැබෙත්. **අවෙවදාතා** – අනවදාත වූවාහු අපරිශුද්ධ වූවාහු තුමූ කිලිටි වූවාහු කෙලෙසුණාහු නුයි 'පුරෙක්ඛතා සන්ති අවෙවදාතා' යනු වේ.

**යදත්තනි පස්සති ආනිසංසන්ති** 'යදත්තනී'ති යං අත්තනි; අත්තා වුච්චති දිට්ඨිගතං. අත්තනො දිට්ඨියා ද්වෙ ආනිසංසෙ පස්සති: දිට්ඨධම්මිකඤ්ච ආනිසංසං සම්පරායිකඤ්ච ආනිසංසං. කතමො දිට්ඨියා-දිට්ඨධම්මිකො ආනිසංසො? යංදිට්ඨිකො සත්ථා හොති, තංදිට්ඨිකා සාවකා හොන්ති. තංදිට්ඨිකං සත්ථාරං සාවකා සක්කරොන්ති ගරුං-කරොන්ති මානෙන්ති පූජෙන්ති අපචිතිං කරොන්ති. ලභති ච තතො-නිදානං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරං. අයං දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො. කතමො දිට්ඨියා සම්පරායිකො ආනිසංසො? අයං දිට්ඨි අලං නාගත්තාය වා සුපණ්ණත්තාය වා යක්ඛත්තාය වා අසුරත්තාය වා ගන්ධබ්බත්තාය වා මහාරාජත්තාය වා ඉන්දත්තාය වා බ්‍රහ්මත්තාය වා දෙවත්තාය වා, අයං දිට්ඨි අලං සුද්ධියා විසුද්ධියා පරිසුද්ධියා මුත්තියා විමුත්තියා පරිමුත්තියා, ඉමාය දිට්ඨියා සුජ්ඣන්ති විසුජ්ඣන්ති පරිසුජ්ඣන්ති මුච්චන්ති විමුච්චන්ති පරිමුච්චන්ති; ඉමාය දිට්ඨියා සුජ්ඣිස්සාමි විසුජ්ඣිස්සාමි පරිසුජ්ඣිස්සාමි මුච්චිස්සාමි විමුච්චිස්සාමි පරිමුච්චිස්සාමීති ආයතිං ඵලපාටිකඞ්ඛී හොති. අයං දිට්ඨියා සම්පරායිකො ආනිසංසො. අත්තනො දිට්ඨියා ඉමෙ ද්වෙ ආනිසංසෙ පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති 'යදත්තනි පස්සති ආනිසංසං'.

**තං නිස්සිතො කුප්පපටිච්චසන්තින්ති**– තිස්සො සන්තියො: අච්චන්තසන්ති තදඞ්ගසන්ති සම්මුතිසන්ති.[1] කතමා අච්චන්තසන්ති? අච්චන්තසන්ති වුච්චති අමතං නිබ්බානං යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං අච්චන්තසන්ති. කතමා තදඞ්ගසන්ති? පඨමජ්ඣානං සමාපන්නස්ස නීවරණා සන්තා හොන්ති, දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා සන්තා හොන්ති, තතියජ්ඣානං සමාපන්නස්ස පීති සන්තා හොති, චතුත්ථජ්ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛා සන්තා හොන්ති, ආකාසා-නඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා පටිඝසඤ්ඤා නානත්තසඤ්ඤා සන්තා හොන්ති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චා-යතනසඤ්ඤා සන්තා හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා සන්තා හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා සන්තා හොති, අයං තදඞ්ගසන්ති. කතමා සම්මුතිසන්ති? සම්මුතිසන්ති[2] වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි, (ඉමා) දිට්ඨිසන්තියො. අපි ච සම්මුතිසන්ති ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා සන්තීති. **තං නිස්සිතො කුප්පපටිච්ච සන්තින්ති**– කුප්පසන්තිං පකුප්පසන්තිං එරිතසන්තිං[3] සමෙරිතසන්තිං චලිතසන්තිං ඝට්ටිතසන්තිං කප්පිතසන්තිං පකප්පිතසන්තිං අනිච්චං සඞ්ඛතං[4] පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං, සන්තිං නිස්සිතො අස්සිතො අල්ලීනො උපගතො සමුපගතො අජ්ඣොසිතො අධිමුත්තොති තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං.'

---

1 සම්මතිසන්ති - ස්‍යා. 2. සම්මුති සන්තියො - සීමු. II. 3. පරිතසන්ති - ස. 4. අසඞ්ඛතං - සීමු. I.

**යදත්තනි පස්සති ආනිසංසං** – 'යදත්තනි' – යං අත්තනි; 'අත්තා' යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි තමාගේ දෘෂ්ටියෙහි අනුසස් දෙකක් දකී: දෘෂ්ටධාර්මිකආනෘශංසය සාම්පරායිකආනෘශංසය යි කියා යි. දෘෂ්ටියෙහි දෘෂ්ටධාර්මිකආනෘශංසය කවරේ යත්: ශාස්තෘ තෙම යම් බඳු දෘෂ්ටි ඇත්තේ නම්, ශ්‍රාවකයෝ එබඳු දෘෂ්ටි ඇත්තාහු වෙති. එබඳු දෘෂ්ටි ඇති ශාස්තෘහු හට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙති, ගරු කෙරෙති, බුහුමන් කෙරෙති, පුදති, අඤ්ජලිකර්මාදියෙන් අපචායන කෙරෙත්; එකරුණෙන් චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පසබෙහෙත්පිරිකර ලබන්නේත් වෙයි. මේ දෘෂ්ටියෙහි දෘෂ්ටධාර්මිකආනෘශංස යි. දෘෂ්ටියෙහි සාම්පරායික ආනෘශංසය කවරේ යත්: 'මේ දෘෂ්ටිය නාරජබවට හෝ ගුරුළු – යක්සෙනෙවි – අසුර – ගඳෙව් – වරම්රජ – සක්දෙව් – මහබඹ – සම්මුතිදෙව බවට හෝ පමණ යැ, මේ දෘෂ්ටිය ශුද්ධියට විශුද්ධියට පාරිශුද්ධියට මුක්තියට විමුක්තියට සර්වප්‍රකාරයෙන් මුක්තියට පමණ යැ, මේ දෘෂ්ටියෙන් ශුද්ධ වෙති, විශුද්ධ වෙති, පරිශුද්ධ වෙති, මිදෙති, වෙසෙසින් මිදෙති, සර්වප්‍රකාරයෙන් මිදෙති; මේ දෘෂ්ටියෙන් ශුද්ධ වෙමි, විශුද්ධ – පරිශුද්ධ වෙමි, මිදෙමි, වෙසෙසින් මිදෙමි, සර්වප්‍රකාරයෙන් මිදෙමි' අනාගතඵලය කැමැති වන්නේ වෙයි. මේ දෘෂ්ටියෙහි සාම්පරායික ආනෘශංස යි. තමාගේ දෘෂ්ටියෙහි මේ දෙ අනුසස් දකී බලයි සිතයි විමසා නුයි 'යදත්තනි පස්සති ආනිසංසං' යනු වේ.

**තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං** – ශාන්තීහු අත්‍යන්තශාන්ති යැ තදඞ්ගශාන්ති යැ සංවෘතිශාන්ති යැයි තිදෙනෙකි; අත්‍යන්තශාන්ති කවරී ද යත්? සියලු සංස්කාරයන්ගේ සන්හිඳීම ඇති සියලු කාමාදිඋපධි දුරලූ තෘෂ්ණාක්ෂය වූ කෙලෙස්රජස් නො ඇලුණු සියලු දුක් නිරුද්ධ වූ අමාමහනිවන 'අත්‍යන්තශාන්ති' යයි කියනු ලැබේ; මේ යැ අත්‍යන්තශාන්ති නම්. තදඞ්ගශාන්ති කවරී ද යත්? පළමුවන ධ්‍යානට සමවන්හුගේ නීවරණයෝ සන්හිඳුණාහු වෙති, දෙවැනි ධ්‍යානට සමවන්හුගේ විතර්කවිචාරයෝ ශාන්ත වෙති, තෙවැනි ධ්‍යානට සමවන්හුගේ ප්‍රීතිය ශාන්ත වෙයි, සිවුවැනි ධ්‍යානට සමවන්හුගේ සුවදුක් ශාන්ත වෙයි, අකාසානඤ්චායතනයට සමවන්හුගේ රූපසංඥ ප්‍රතිඝසංඥ නානාත්වසංඥවෝ ශාන්ත වේති, විඤ්ඤාණඤ්චායතනයට සමවන්-හුගේ ආකාසානඤ්චායතනසංඥව ශාන්ත වෙයි, ආකිඤ්චඤ්ඤායතනයට සමවන්හුහට විඤ්ඤාණඤ්චායතනසංඥව ශාන්ත වෙයි, නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනයට සමවන්හුහට ආකිඤ්චඤ්ඤායතනසංඥව ශාන්ත (–සන්හිඳුණේ) වේ; මේ තදඞ්ගශාන්තිය යි. සම්මුතිශාන්ති කවරී ද යත්? 'සම්මුතිශාන්ති' යයි දෙසැට දෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. (මොහු) දෘෂ්ටිශාන්තීහු යි. වැලිදු සංවෘතිශාන්තිය මේ අර්ථයෙහි 'ශාන්ති' යයි අදහස් කරන ලදී. **තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං** – (විපාකජනක විසින් ද පරිවර්තන විසින් ද) කොප්‍යශාන්ති වූ වෙසෙසින් කොප්‍යශාන්ති වූ චංචලශාන්ති වූ චලිතශාන්ති වූ පීඩිතශාන්ති වූ කම්පිතශාන්ති වූ ප්‍රකම්පිතශාන්ති වූ අනිත්‍ය වූ සංස්කෘත වූ ප්‍රත්‍යයසමුත්පන්න වූ ක්ෂය වන-සුලු නැසෙනසුලු නො නවත්නාසුලු නිරුද්ධ වන ස්වභාව ඇති ශාන්තිය ඇසුරු කෙළේ වෙසෙසින් ඇසුරු කෙළේ වැළඳගත්තේ ඊට පැමිණියේ ඇතුළු වූයේ ඇලුණේ නුයි 'තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං' යනු වේ.

තෙනාහ භගවා:

"පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා
පුරෙක්ඛතා සන්ති අවෙවදාතා,
යදත්තනී පස්සති ආනිසංසං
තන්නිස්සිතො කුප්පපටිච්චසන්ති" න්ති.

3 - 6

දිට්ඨීනිවෙසා න හි ස්වාතිවත්තා[1]
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා නරො තෙසු නිවෙසනෙසු
නිරස්සති[2] ආදියතිච්ච[3] ධම්මං.

**දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තාති** – 'දිට්ඨීනිවෙසා' ති 'සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨිනිවෙසනං. 'අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨිනිවෙසනන්ති දිට්ඨිනිවෙසා; **න හි ස්වාතිවත්තාති** – දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තා,[1] දුරතිවත්තා දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බිනි- වත්තාති 'දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තා.'

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** – 'ධම්මෙසූ'ති ද්වාසට්ඨි දිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** – නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා[4] විචිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **සමුග්ගහීතන්ති** නිවෙසනෙසු ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො, ඉදං සච්චං තච්ඡං තථං භූතං යථාසභාවං[5] අවිපරීතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තන්ති - ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

**තස්මා නරො තෙසු නිවෙසනෙසූති**– 'තස්මා'ති –තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා; **නරොති** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[6] ජන්තු ඉන්දගු හින්දගු මනුජො; **තෙසු නිවෙසනෙසූති** – තෙසු දිට්ඨිනිවෙසනෙසූති 'තස්මා නරො තෙසු නිවෙසනෙසු.'

---

1. සමාතිවත්තා - සීමු. I. මජසං. ස.
2. නිදස්සති - සයා. PTS.
3. ආදියති ච. PTS.
4. නිච්ඡිත්වා විච්ඡිත්වා 'තිපි පාඨො.
5. යථාවං - ස.
6. ජතු - සීමු. II. ජාතු - සයා.

එයින් වදාළහ බුදුහු:

“පකප්පිතා සඞ්ඛතා-පෙ-කුප්පපටිච්චසන්තිං” යි.

## 3-6.

ඉදංසච්චාභිනිවෙස සඞ්ඛ්‍යාත දෘෂ්ටිනිවේශනයෝ යම් හෙයකින් සුව සේ ඉක්මැවිය හෙත්නාහු නො වෙත් ද, දෙසැට දිටුදම් අතුරෙහි මොනොවට බැසගත් ඒ ඒ ධර්මය නිශ්චය කොට පවත්නේ ද, එහෙයින් සත්ත්ව තෙමේ ඒ දෘෂ්ටිනිවේශනයන්හි අජශීල ගොශීලාදි ධර්මය හරනේ ද වෙයි, ගන්නේත් වේ.

**දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තා** – ‘දිට්ඨිනිවෙසා’ යනු: ‘ආත්මභාව සඞ්ඛ්‍යාත ලොකය ශාශ්වත යෑ, මෙය මැ සැබව, අන්‍යය හිස්’ යෑයි, අභිනිවේශයෙන් පරාමර්ශනය කිරීම දෘෂ්ටිනිවේශන යෑ; (‘අසස්සතො’ යන ආදිය 3-2ගාථානිර්දෙසයෙහි යෑ.) **න හි ස්වාතිවත්තා** – දෘෂ්ටිනිවේශනයෝ නො මැ සුව සේ ඉක්මැවිය හෙත්නාහු, දුක සේ ඉක්මැවිය යුත්තාහු, දුස්තර වූවාහු දුෂ්ප්‍රතර වූවාහු නුයි ‘න හි ස්වාතිවත්තා’ යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං** – ‘ධම්මෙසු’ යනු: ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයන්හි; **නිච්ඡෙය්‍ය** – නිශ්චය කොට විනිශ්චය කොට විමසා සර්වප්‍රකාරයෙන් විමසා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට; **සමුග්ගහීතං** - දෘෂ්ටිනිවේශනයන්හි අවධි කොට ගැනීම යෑ, කොටස් වශයෙන් ගැනීම යෑ, උත්තමග්‍රාහ යෑ, කොට්ඨාසග්‍රාහ යෑ, රාශිවශයෙන් ගැනීම යෑ, විශේෂරාශිවශයෙන් ගැනීම යි; මෙය මැ ස්වභාව යෑ අවිපරීත යෑ අවිපරිණාම යෑ විද්‍යමාන යෑ යථාස්වභාව යෑ විපරීත නො වේ යෑයි ගන්නා ලද පරාමර්ශ කළ අභිනිවේශ කළ බැසගන්නා ලද නිශ්චය කර ගන්නා ලද නුයි ‘ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං’ යනු වේ.

**තස්මා නරො තෙසු නිවෙසනෙසු** – ‘තස්මා’ යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; **නරො** – සත්ත්ව යෑ නර යෑ මානව යෑ පුරුෂ යෑ පුද්ගල යෑ ජීව යෑ (ජාතියට යේ නුයි) ජාගු යෑ ජන්තු යෑ (ඉන්ද්‍රියයෙන් යේ නුයි) ඉන්දගු යෑ (මරණයට යේ නුයි) හින්දගු යෑ මනුජ යෑ; **තෙසු නිවෙසනෙසු** – ඒ දෘෂ්ටිනිවේශනයන්හි නුයි ‘තස්මා නරො තෙසු නිවෙසනෙසු’ යනු වේ.

**නිරස්සති[1] ආදියතී ච[2] ධම්මන්ති** – 'නිරස්සතී'ති ද්වීහි කාරණෙහි නිරස්සති: පරවිච්ඡින්දනාය වා නිරස්සති, අනභිසම්භුණන්තො වා නිරස්සති. කථං පරවිච්ඡින්දනාය වා නිරස්සති? පරො විච්ඡින්දෙති, සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, නත්ථෙත්ථ[3] සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා මුච්චන්ති වා විමුච්චන්ති වා පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ඡත්තකා[4] පරිත්තාති එවං පරො විච්ඡින්දෙති. එවං විච්ඡින්දියමානො සත්ථාරං නිරස්සති, ධම්මක්ඛානං නිරස්සති, ගණං නිරස්සති, දිට්ඨිං නිරස්සති, පටිපදං නිරස්සති, මග්ගං නිරස්සති, එවං පරවිච්ඡින්දනාය නිරස්සති. කථං අනභිසම්භුණන්තො නිරස්සති? සීලං අනභිසම්භුණන්තො සීලං නිරස්සති, වතං අනභිසම්භුණන්තො වතං නිරස්සති, සීලබ්බතං අනභිසම්භුණන්තො සීලබ්බතං නිරස්සති. **ආදියති ච ධම්මන්ති**– සත්ථාරං ගණ්හාති, ධම්මක්ඛානං ගණ්හාති, ගණං ගණ්හාති දිට්ඨිං ගණ්හාති, පටිපදං ගණ්හාති, මග්ගං ගණ්හාති පරාමසති අභිනිවිසතීති 'නිරස්සති ආදියති ච ධම්මං.'

තෙනාහ භගවා:

''දිට්ඨීනිවෙසා න හි ස්වාතිවත්තා
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා නරො තෙසු නිවෙසනෙසු
නිරස්සතී[1] ආදියතී ච[2] ධම්ම''න්ති.

**8 – 7**

ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ
පකප්පිතා දිට්ඨි භවාභවෙසු,
මායඤ්ච මානඤ්ච පහාය ධොනො
ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො.

**ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසූති**– 'ධොනො'ති ධොනා වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි.[a] කිං කාරණා ධොනා වුච්චති පඤ්ඤා?

1. නිදස්සති-සයා, PTS. 2. ආදියති ච PTS.
3. න තත්ථ - සයා. PTS. 4. ඡතුක්කා - සීමු. II. PTS.
a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**නිරස්සති ආදියති ච ධම්මං** – 'නිරස්සති' යනු: දෙකරුණෙකින් දුර ලයි: පරවිච්ඡන්දතායෙන් හෝ දුර ලයි, අනභිසම්භවනයෙන් හෝ දුර ලයි. කිසෙයින් පරවිච්ඡන්දතායෙන් (=අන්‍යයන් විසින් වෙන් කරනු ලැබීමෙන්) දුර ලයි යත්– අනෙකෙක් වියොග කෙරෙයි: 'ඒ ශාස්තෘ සර්වඥ නො වෙයි. ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය සොඳුරු නො වෙයි, ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය නෛර්‍යාණික නො වෙයි, මෙහි ශුද්ධියක් හෝ විශුද්ධියක් – පාරිශුද්ධියක් – මුක්තියක් – විමුක්තියක් – පරිමුක්තියක් හෝ නැත; මෙහි ශුද්ධ වෙති හෝ විශුද්ධ වෙති – පරිශුද්ධ වෙති – මුක්ත වෙති – විමුක්ත වෙති – පරිමුක්ත වෙති හෝ නැත; හීනයෝ යැ, නිහීනයෝ යැ, අවමකයෝ යැ, ලාමකයෝ යැ, ජතුක්ක(=ප්‍රත්‍යයහීන)යෝ යැ, අල්පයෝ යැ'යි මෙසෙයින් අනෙකෙක් වියොග කරවයි. මෙසේ වියෝග කරනු ලබනුයේ ශාස්තෘහු දුර ලයි, ධර්මාඛ්‍යානය – ගණයා – දෘෂ්ටිය – ප්‍රතිපදාව – මාර්ගය දුර ලයි. මෙසේ පරවිච්ඡන්දතායෙන් දුර ලයි. කිසෙයින් අනභිසම්භවනයෙන් (=නො පැමිණෙනුයේ හෝ නො හැකි වනුයේ) දුර ලයි යත්: ශීලය නො පුරනුයේ ශීලය දුර ලයි, ව්‍රතය නො පුරනුයේ ව්‍රතය දුර ලයි, ශීලව්‍රතය නො පුරනුයේ ශීලව්‍රතය දුර ලයි. **ආදියති ච ධම්මං** – ශාස්තෘහු ගනී, ධර්මාඛ්‍යානය – ගණයා – දෘෂ්ටිය – ප්‍රතිපදාව – මාර්ගය ගනී පරාමර්ශ කෙරෙයි, බැසගනී නුයි 'නිරස්සති ආදියති ච ධම්මං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

'දිට්ඨිනිවෙසා–පෙ–ආදියතිච ධම්මං' යනු.

8 – 7.

යම් හෙයකින් ධූතපාප ඇති ක්ෂීණාශ්‍රව මහණහු හට කාමාදිභවයන්හි ආත්මභාවලොකයෙහි කිසි තැනෙක්හි තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රකල්පිත (=සලකන ලද) දෘෂ්ටියක් නැද්ද, එහෙයින් ඒ ක්ෂීණාශ්‍රව තෙම මායාව ද මානය ද දුර ලා සිටියේ රාගාදි කුමකින් නිරයාදිගතිවිශෙෂයකට යන්නේ ද, හෙතෙම තෘෂ්ණාදෘෂ්ටිලෙපය (=දෘෂ) රහිත වූයේ මැයි.

**ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසු** – 'ධොනො' යනු: 'ධොනා' යි ප්‍රඥාව කියනු ලබයි. අනිත්‍යාදිප්‍රකාරයෙන් ධර්මයන් දැනගන්නා වූ අනිත්‍යාදිය විමසන්නා වූ ප්‍රකර්ෂයෙන් විමසන්නා වූ සිවුසස්දහම් විමසන්නා වූ අනිත්‍යාදිය සලකන උපලක්ෂණ – ප්‍රත්‍යුපලක්ෂණ වූ පණ්ඩිතභාව කුසලබව නිපුණබව යයි කියන ලද අනිත්‍යාදිය විභාවනය කරන අනිත්‍යාදිය සිතන පරීක්ෂා කරන පොළොව මෙන් පතල හෙයින් භූරි නම් වූ කෙලෙසුන් නසන හෙයින් මෙධා යයි කියන ලද යාථාවලක්ෂණ– ප්‍රතිවෙධයෙහි පමුණුවන හෙයින් පරිණායිකා නම් වූ අනිත්‍යාදි විසින් ධර්මයන් දක්නා හෙයින් විදර්ශනා නම් වූ අනිත්‍යාදිය දැනගන්නා හෙයින් සම්ප්‍රජන්‍ය නම් වූ නොමග යන සිත විදසුන්මගට නගන හෙයින් ප්‍රතොදයක් (=කෙවිටක්) වැනි වූ ප්‍රඥෙන්ද්‍රිය ප්‍රඥාබලය (කෙලෙස් සිඳින හෙයින්) ප්‍රඥාශස්ත්‍රය (අත්‍යුද්ගත හෙයින්) ප්‍රඥාප්‍රාසාදය ප්‍රඥාලොකය ප්‍රඥාවභාසය ප්‍රඥාප්‍රද්‍යෝතය ප්‍රඥාරත්නය යි කියන ලද අරමුණෙහි නො මුළා වන හෙයින් අමොහ නම් වූ ධර්මවිචය සඞ්ඛ්‍යාත වූ සම්‍යග්දෘෂ්ටි යයි කියන ලද ප්‍රඥාව යි. කවර කරුණෙකින් ප්‍රඥාව 'ධොනා' නම් වූ යැ යත්:

තාය[1] පඤ්ඤාය කායදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, වචීදුච්චරිතං–පෙ–මනොදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, රාගො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, දොසො – මොහො – කොධො – උපනාහො – මක්ඛො – පළාසො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, ඉස්සා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච, සාඨෙය්‍යං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, ථම්භො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, සාරම්භො – මානො – අතිමානො – මදො – පමාදො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, සබ්බෙ කිලෙසා – සබ්බෙ දුච්චරිතා– සබ්බෙ දරථා – සබ්බෙ පරිළාහා –සබ්බෙ සන්තාපා – සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. තංකාරණා ධොනා වුච්චති පඤ්ඤා. අථ වා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨි ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච, සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, සම්මාවාචාය මිච්ඡාවාචා ධුතා ච –පෙ– සම්මාකම්මන්තෙන මිච්ඡාකම්මන්තො ධුතො ච– සම්මාආජීවෙන මිච්ඡාආජීවො ධුතො ච – සම්මාවායාමෙන මිච්ඡාවායාමො ධුතො ච– සම්මාසතියා මිච්ඡාසති ධුතා ච – සම්මාසමාධිනා මිච්ඡාසමාධි ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච සම්මාඤාණෙන මිච්ඡාඤාණං ධුතඤ්ච – සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්ති ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අථ වා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අරහා ඉමෙහි ධොනියෙහි[2] ධම්මෙහි උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො, තස්මා අරහා ධොනො. සො ධුතරාගො ධුතපාපො ධුතකිලෙසො ධුතපරිළාහොති 'ධොනො.'

**කුහිඤ්චීති**– කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වා; **ලොකෙති** – අපායලොකෙ –පෙ– ආයතනලොකෙ. **පකප්පිතාති**[3] – ද්වෙ පකප්පනා: තණ්හාපකප්පනා ච දිට්ඨිපකප්පනා ච –පෙ– අයං දිට්ඨිපකප්පනා. **භවාභවෙසූති** – භවාභවෙ කම්මභවෙ පුනබ්භවෙ, කාමභවෙ කම්මභවෙ කාමභවෙ පුනබ්භවෙ, රූපභවෙ කම්මභවෙ රූපභවෙ පුනබ්භවෙ, අරූපභවෙ කම්මභවෙ අරූපභවෙ පුනබ්භවෙ පුනප්පුන[4]භවෙ පුනප්පුනගතියා පුනප්පුනඋපපත්තියා පුනප්පුනපටිසන්ධියා පුනප්පුනඅත්තභාවාභිනිබ්බත්තියා; "ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසූ"ති – ධොනස්ස කුහිඤ්චි ලොකෙ භවාභවෙසු ච කප්පිතා අභිසඞ්ඛතා සණ්ඨපිතා දිට්ඨි නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති 'ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසු.

---

1. යාය– සීමු. I. 2. ධොනෙය්‍යෙහි - සීමු.II. ප ස්‍යා PTS.
3. පකප්පනාති - ස්‍යා. 4. පුනප්පුනං - ස්‍යා, ක.

ඒ ප්‍රඥාවෙන් කායදුශ්චරිතය කම්පිත වූයේත් ධොවිත =ධෞතා ලදුයේත් සන්ධොවිත නිද්ධොවිත වූයේත් වේ ද, වාග්දුශ්චරිතය - මනොදුශ්චරිතය - රාගය - ද්වේෂය - මොහය - ක්‍රොධය - උපනාහය - මක්ඛබව - පලාස (=යුගග්‍රාහ) ය - ඊර්ෂ්‍යාව - මාත්සර්‍ය්‍යය - මායාව - ශඨබව - තද්බව - සාරම්භ (=කරණුත්තරියකරණ) ය - මානය - අතිමානය - මදය - ප්‍රමාදය ධූත ධෞත සන්ධෞත නිර්ධෞත (=කම්පා කරන ලද සෝදන ලද මැනවින් සෝදන ලද වෙසෙසින් සෝදන ලද) වේ ද, සියලු කෙලෙශයෝ සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත ධෞත සන්ධෞත නිර්ධෞත වූවාහු වෙත් ද, එ කරුණෙන් ප්‍රඥාව 'ධොනා' නම් වූ යැ. නොහොත් සම්‍යග්දෘෂ්ටිය විසින් මිථ්‍යාදෘෂ්ටිය කම්පිත ධොවිත සන්ධොවිත නිද්ධොවිත වූ යැ, සම්‍යක්සඞ්කල්පය විසින් මිථ්‍යාසඞ්කල්පය...සම්‍යග්වචනයෙන් මිථ්‍යාවචනය...සම්‍යක්කර්මාන්තයෙන් මිථ්‍යාකර්මාන්තය. . .සම්‍යගාජීවයෙන් මිථ්‍යාජීවය. . .සම්‍යග්ව්‍යායාමයෙන් මිථ්‍යාව්‍යායාමය...සම්‍යක්ස්මෘතියෙන් මිථ්‍යාස්මෘතිය...සම්‍යක්සමාධියෙන් මිථ්‍යාසමාධිය. . .සම්‍යග්ඥානයෙන් මිථ්‍යාඥානය. . .සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධූත ධෞත සන්ධෞත නිර්ධෞත වූවාත් වෙයි. නොහොත් ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සියලු කෙලෙශයෝ - දුශ්චරිතයෝ - දරථයෝ - පරිදාහයෝ - සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත ධෞත සන්ධෞත නිර්ධෞත වූවාහු ද වෙත්. **ඛීණාස්‍රව** තෙමේ මේ ධොනිය ධර්මයන්ගෙන් යම් හෙයකින් උපෙත - සමුපෙත - උපගත - සමුපගත - උපපන්න - සමුපපන්න - සමන්විත වූයේ වේ ද, එහෙයින් **ඛීණාස්‍රව** 'ධොන' නම් වෙයි. හෙතෙම ධූතරාග ධූතපාප ධූතකෙලශ ධූතපරිදාහ ඇති වන බැවින් 'ධොන' නම් වේ.

**කුහිඤ්චි** - කිසිතැනෙක්හි කිසිවෙක්හි අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ. **ලොකෙ** - අපායලොකයෙහි. . .ආයතනලොකයෙහි. **පකප්පිතා** - තෘෂ්ණාප්‍රකල්පනා යැ දෘෂ්ටිප්‍රකල්පනා යැයි ප්‍රකල්පනා දෙකෙකි. . .**භවාභවෙසු** - භව-අභව (=කාමභව - රූපාරූපභවයන්හි (2-5.ගාථානිද්දෙසය.)...පුනපුනා ආත්මභාවයාගේ පහළ වීමෙහි; **ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසු**- රහත්හු හට අපායාදිලොකයෙහි ද කාමාදිභවයන්හි ද කල්පිත (=සිතින් ගන්නා ලද) පරිකල්පිත වූ ප්‍රත්‍යයෙන් සකස් කළ ප්‍රත්‍යයවශයෙන් ම මොනොවට තබන ලද දෘෂ්ටීහු නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණ වූවාහු සිඳින ලද්දාහු සින්සිඳුණාහු දුර ලන ලද්දාහු උපතට අභව්‍ය වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි 'ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසු' යනු වේ.

**මායඤ්ච මානඤ්ච පහාය ධොනොති**- මායා වුච්චති වඤ්චනිකා චරියා; ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය[1] දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු[2] පාපිකං ඉච්ඡං පණිදහති: මා මං ජඤ්ඤූති ඉච්ඡති. මා මං ජඤ්ඤූති සංකප්පෙති. මා මං ජඤ්ඤූති වාචං භාසති. මා මං ජඤ්ඤූති කායෙන පරක්කමති. යා එවරූපා මායා මායාවිතා අච්චයා[3] වඤ්චනා නිකති නිකිරණා[4] පරිහරණා ගූහනා පරිගූහනා ඡාදනා පරිච්ඡාදනා අනුත්තානීකම්මං අනාවීකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා.[ඍ] **මානොති** – එකවිධෙන මානො: යා චිත්තස්ස උන්නති; දුවිධෙන මානො: අත්තුක්කංසන මානො පරවම්භනමානො; තිවිධෙන මානො: සෙය්‍යොහමස්මීති මානො සදිසොහමස්මීති මානො හීනොහමස්මීති මානො; චතුබ්බිධෙන මානො: ලාභෙන මානං ජනෙති, යසෙන මානං ජනෙති, පසංසාය මානං ජනෙති, සුඛෙන මානං ජනෙති; පඤ්චවිධෙන මානො: ලාභී'ම්හි මනාපිකානං රූපානන්ති මානං ජනෙති, ලාභී'ම්හි මනාපිකානං සද්දානං– ගන්ධානං – රසානං – ඵොට්ඨබ්බානන්ති මානං ජනෙති; ඡබ්බිධෙන මානො: චක්ඛුසම්පදාය මානං ජනෙති, සොතසම්පදාය – ඝානසම්පදාය – ජිව්හාසම්පදාය – කායසම්පදාය – මනොසම්පදාය මානං ජනෙති; සත්තවිධෙන මානො: මානො අතිමානො මානාතිමානො ඔමානො අධිමානො අස්මිමානො මිච්ඡාමානො; අට්ඨවිධෙන මානො: ලාභෙන මානං ජනෙති, අලාභෙන ඔමානං ජනෙති, යසෙන මානං ජනෙති, අයසෙන ඔමානං ජනෙති, පසංසාය මානං ජනෙති, නින්දාය ඔමානං ජනෙති, සුඛෙන මානං ජනෙති, දුක්ඛෙන ඔමානං ජනෙති; නවවිධෙන මානො: සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො, සෙය්‍යස්ස සදිසොහමස්මීති මානො, සෙය්‍යස්ස හීනොහමස්මීති මානො; සදිසස්ස සෙය්‍යොහමස්මීති මානො, සදිසස්ස සදිසොහමස්මීති මානො, සදිසස්ස හීනොහමස්මීති මානො, හීනස්ස සෙය්‍යොහමස්මීති මානො, හීනස්ස සදිසොහමස්මීති මානො, හීනස්ස හීනොහමස්මීති මානො; දසවිධෙන මානො: ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මානො.[ඍ] "මායඤ්ච මානඤ්ච පහාය ධොනො"ති – ධොනො මායඤ්ච මානඤ්ච පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'මායඤ්ච මානඤ්ච පහාය ධොනො.'

---

1. වචසා - ස්‍යා.
2. තප්පටිච්ඡාදනහෙතු - ස.
3. අච්චසරා - ස්‍යා, මජසං.
4. කිරණා - සීමු. I.

ඍ. විභඞ්ගපාළි - ඛුද්දකවත්ථුවිභඞ්ග.

**මායං ච මානං ච පහාය ධොනො**– වඤ්චක ක්‍රියාව (=වඤ්චා කිරීම) 'මායා' නමු. මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට එය ප්‍රකාශ නො වනු නිසා ලාමක වූ ප්‍රාර්ථනාව තබයි: 'මා කළ පව මෙරමා නහමක් දනිත්වා' යි කැමැති වෙයි, – සලකයි, – වචන කියයි, 'මා කළ පව නහමක් දනිත්වා'යි කයින් වෑයම් කෙරෙයි; මෙබඳු වූ මායාව මායා ඇති බව අත්‍යය (=ඉක්මැ යෑම) වඤ්චනාව නිකෘතිය (=මිථ්‍යාක්‍රියාව) 'මම මෙසේ නො කෙරෙමි' පාපවික්ෂේපය පාපපරිහරණය පව් සැඟවීම හාත්පසින් සැඟවීම පව් වැසීම හාත්පසින් වැසීම ප්‍රකට නො කිරීම පව් කොට නො පැවසීම මොනොවට වැසීම පෙරළා පව් කිරීම 'මායා' නැමැයි කියනු ලැබේ. **මාන** නම්: එක් ප්‍රකාරයකින් මානය වෙයි: චිත්තයාගේ උන්නතිය යි; ආත්මෝත්කර්ෂණමාන යැ පරවම්භනමාන යැයි ද්විප්‍රකාරයෙන් මානය වෙයි. 'මම ශ්‍රේෂ්ඨ වෙමි' මාන යැ, සදෘශ වෙමි මාන යැ හීන වෙමි මාන යැයි, ත්‍රිප්‍රකාරයෙන් මානය වෙයි. ලාභයෙන් මානය උපදවයි, යශසින් මානය උපදවයි, ප්‍රශංසායෙන් මානය උපදවයි, සුවය කරණ කොට මානය උපදවා යයි සිවුපරිච්ඡෙදකින් මානය වෙයි. 'මනාප වූ රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් ලබනුයෙමි වෙමි' පඤ්චප්‍රකාරයෙන් මානය වෙයි. චක්ෂුඃසම්පත්තියෙන් මානය උපදවයි, ශ්‍රොත්‍ර – ඝ්‍රාණ – ජිහ්වා – කාය – මනස්සම්පත්තියෙන් මානය උපදවා යැයි සපරිච්ඡෙදකින් මානය වෙයි. මාන යැ අතිමාන යැ මානාතිමාන යැ අවමාන (=හීනමාන) යැ අධිමාන යැ අස්මිමාන යැ මිථ්‍යාමාන යැයි සත් පරිච්ඡෙදකින් මානය වෙයි. ලාභයෙන් මානය උපදවයි, අලාභයෙන් අවමානය උපදවයි, යශසින් මානය – අයශසින් අවමානය – ප්‍රශංසායෙන් මානය – නින්දායෙන් අවමානය – සුවයෙන් මානය – දුකින් අවමානය උපදවා යැයි අෂ්ටප්‍රකාරයෙකින් මානය වෙයි. ශ්‍රේෂ්ඨයා හට ශ්‍රේෂ්ඨ වෙමි මාන යැ, ශ්‍රේෂ්ඨයා හට සදෘශ වෙමි මාන යැ, ශ්‍රේෂ්ඨයා හට හීන වෙමි මානයැ; සදෘශයා හට ශ්‍රේෂ්ඨ වෙමි මාන යැ, සදෘශයාහට සදෘශ වෙමි මාන යැ සදෘශයා හට හීන වෙමි මාන යැ; හීනයාට ශ්‍රේෂ්ඨ වෙමි මාන යැ, හීනයාට සදෘශ වෙමි මාන යැ, හීනයාට හීන වෙමි මාන යැයි නවප්‍රකාරයකින් මානය වේ. මෙලොවැ කිසිවෙක් ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයකින් හෝ ශිල්පායතනයකින් හෝ විද්‍යාවකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ එක්තරා වස්තුවකින් හෝ මානය උපදවා යැයි දශප්‍රකාරයකින් මානය වේ. මෙබඳු වූ යම් මානයෙක් මඤ්ඤනාවෙක් මාන ඇතිබවෙක් උන්නතියෙක් ඔසවා තැබීමෙක් මානධ්වජයෙක් සිත ඔසවාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ නම්' මේ 'මාන' නමැයි කියනු ලැබේ. **මායං ච මානං ච පහාය ධොනො** යනු: ධොන – ක්ෂීණාශ්‍රව තෙමේ මායාවත් මානයත් හැර දුරු කොට බැහැර කොට විනාශනය කොට අනු-අභාවයට (=සමුච්ඡෙදප්‍රහාණයට) පමුණුවා නුයි 'මායං ච මානං ච පහාය ධොනො' යනු වේ.

**ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සොති** – 'උපයං'ති ද්වෙ උපයා: තණ්හාඋපයො ච දිට්ඨිඋපයො ච –පෙ– අයං තණ්හූපයො –පෙ– අයං දිට්ඨූපයො. තස්ස තණ්හූපයො පහීනො, දිට්ඨූපයො පටිනිස්සට්ඨො. තණ්හූපයස්ස පහීනත්තා, දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා අනූපයො පුග්ගලො කෙන රාගෙන ගච්ඡෙය්‍ය? කෙන දොසෙන ගච්ඡෙය්‍ය? කෙන මොහෙන ගච්ඡෙය්‍ය? කෙන මානෙන ගච්ඡෙය්‍ය? කාය දිට්ඨියා ගච්ඡෙය්‍ය? කෙන උද්ධච්චෙන ගච්ඡෙය්‍ය? කාය විචිකිච්ඡාය ගච්ඡෙය්‍ය? කෙහි අනුසයෙහි ගච්ඡෙය්‍ය? රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති[1] වා ථාමගතොති වා? තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන ගච්ඡෙය්‍ය නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා, සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන ගච්ඡෙය්‍යාති 'ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො.'

තෙනාහ භගවා:

"ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ
පකප්පිතා දිට්ඨි භවාභවෙසු,
මායඤ්ච මානඤ්ච පහාය ධොනො
ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො"ති.

8 - 8

උපයො හි ධම්මෙසු උපෙති වාදං
අනූපයං කෙන කථං වදෙය්‍ය,
අත්තං නිරත්තං න හි තස්ස අත්ථි
අධොසි සො දිට්ඨිමිධෙව සබ්බං[3].

**උපයො හි ධම්මෙසු උපෙති වාදන්ති** – 'උපයො'ති ද්වෙ උපයා: තණ්හූපයො ච දිට්ඨූපයො ච –පෙ– අයං තණ්හූපයො –පෙ– අයං දිට්ඨූපයො. තස්ස තණ්හූපයො අප්පහීනො, දිට්ඨූපයො අප්පටිනිස්සට්ඨො. තණ්හූපයස්ස අප්පහීනත්තා දිට්ඨූපයස්ස අප්පටිනිස්සට්ඨත්තා ධම්මෙසු වාදං උපෙති: රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති වා ථාමගතොති වා. තෙ අභිසඞ්ඛාරා අප්පහීනා. අභිසඞ්ඛාරානං අප්පහීනත්තා ගතියා වාදං උපෙති: නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා වාදං උපෙති උපගච්ඡති ගණ්හාති පරාමසති අභිනිවිසතීති 'උපයො හි ධම්මෙසු උපෙති වාදං.'

1. අනිට්ඨගතො – මජ්ඣප. 2. ගතියා පරං – සීමු. I. ගතියො – සීමු. II.
3. සබ්බා – සීමු I. ස.

**ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො** – 'උපය' යනු: තෘෂ්ණා උපය දෘෂ්ටි උපය යැයි 'උපය' දෙකෙක් වෙයි.. ඔහු විසින් තෘෂ්ණාඋපය ප්‍රහීණ යැ. දෘෂ්ටිඋපය දුර ලන ලද්දේ යැ. තෘෂ්ණාඋපය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිඋපය දුර ලන ලද වන බැවින් උපය රහිත වූ පුද්ගල තෙමේ කවර රාගයකින් – කවර ද්වේෂයකින් – කවර මෝහයකින් – කවර මානයකින් – කවර දෘෂ්ටියකින් – කවර ඖද්ධත්‍යයෙකින් – කවර විචිකිත්සායෙකින් – කවර අනුශයධර්මයක්හෙත් – රක්ත වූයෙකැයි හෝ ද්විෂ්ට වූයෙකැයි හෝ මූඪ වූයෙකැයි හෝ විනිබද්ධයෙකැයි හෝ පරාමෘෂ්ටයෙකැයි හෝ වික්ෂෙපයට පැමිණියෙකැයි හෝ නිෂ්ඨාවට නො ගියේ යැයි හෝ ස්ථාම(=තද) බවට ගියේ යැයි හෝ (යමෙකින් නිරයාදි ගතිවිශේෂයෙහි) සඞ්ඛ්‍යාවට යන්නේ ද; ඒ අභිසංස්කාරයෝ ප්‍රහීණයෝ යැ. අභිසංස්කාරයන් ප්‍රහීණ කළ වන බැවින් නිරයෙහි උපදනා සත්ත්වයෙකැයි හෝ තිරිසන්යෝනිහි උපදනෙකැයි හෝ ප්‍රෙතවිෂයයෙහි උපදනෙකැයි හෝ මිනිසෙකැයි හෝ දෙවියෙකැයි හෝ රූපීබ්‍රහ්ම යැයි හෝ සංඥී යැයි හෝ අසංඥී යැයි හෝ නෙවසංඥීනාසංඥී යැයි හෝ කවර අභිසංස්කාරයෙකින් කවර ගතියක් හා සඞ්ඛ්‍යාවට යන්නේ ද; යම් හෙයකින් යේ නම්, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැත් නුයි 'ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ධොනස්ස හි නත්ථි–පෙ–අනූපයො සො" යනු.

**8 – 8.**

තෘෂ්ණාදි උපය (=නිඃශ්‍රය) ඇති සත්ත්ව තෙමේ රාගරක්ත යැ යනාදි ඒ ඒ දහම්හි ලා වාදයට (=කියැ යුතු බවට) පැමිණෙයි. තෘෂ්ණාදෘෂ්ටි පුහුත් බැවින් උපය රහිත වූ ක්ෂීණාස්‍රවයා රාගාදි කවර දහමකින් කිසෙයින් කියන්නේ ද, යම්හෙයකින් ඒ ක්ෂීණාස්‍රවයාහට ආත්මදෘෂ්ටිය හෝ උච්ඡෙදදෘෂ්ටිය නැත්තේ ද, යම් හෙයකින් හෙතෙම මේ අත්බැව්හි මැ නුවණ නැමැති දියෙන් සියලු දෘෂ්ටිගතය දෙවී ද, දුරැ කෙළේ ද, එහෙයිනි.

**උපයො හි ධම්මෙසු උපෙති වාදං** – 'උපය' යනු: තෘෂ්ණාඋපය ද දෘෂ්ටිඋපය දැයි උපය දෙකෙක් වෙයි. ...ඔහු විසින් තෘෂ්ණාඋපය අප්‍රහීණ යැ, දෘෂ්ටිඋපය නො හරන ලද්දේ යැ; තණ්හූපය නො පුහුත් වන බැවින් දිට්ඨූපය නො හළ වන බැවින් රක්ත යැයි හෝ ද්විෂ්ට යැ – මූඪ යැ – විනිබද්ධ යැ – පරාමෘෂ්ට යැ – වික්ෂෙපගත යැ – අනිෂ්ඨාගත යැ – ස්ථාමගත යැයි හෝ වාදයට (=කියැයුතු බවට) පැමිණෙයි. ඒ පුණ්‍යාපුණ්‍යානෙඤ්ජාභිසංස්කාරයෝ අප්‍රහීණ වූවාහු ය. කර්මාභිසංස්කාරයන් අප්‍රහීණ වන බැවින් එක්තරා ගතියකින් කීමට පැමිණෙයි, නිරයෙහි උපදිනුයෙකැයි හෝ තිරශ්චීනයොනි ඇතියෙකැයි හෝ ප්‍රෙතවිෂයයෙහි උපදිනුයෙකැයි හෝ මිනිසෙකැයි හෝ දෙවියෙකැයි හෝ රූපී යැයි හෝ අරූපී යැයි හෝ සංඥී යැයි හෝ අසංඥී යැයි හෝ නෙවසංඥීනාසංඥී යැයි හෝ (එක්තරා ගතියකින්) කථනයට පැමිණෙයි, එළැඹෙයි, ග්‍රහණය කෙරෙයි, පරාමර්ශ කෙරෙයි, මෙසේ නුයි 'උපයො හි ධම්මෙසු උපෙති වාදං' යනු වේ.

**අනූපයං කෙන කථං වදෙය්‍යාති** – ‘උපයාති’ ද්වෙ උපයා: තණ්හූපයො ච දිට්ඨූපයො ච –පෙ– අයං තණ්හූපයො –පෙ– අයං දිට්ඨූපයො. තස්ස තණ්හූපයො පහීනො දිට්ඨූපයො පටිනිස්සට්ඨො. තණ්හූපයස්ස පහීනත්තා දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා අනූපයං පුග්ගලං කෙන රාගෙන වදෙය්‍ය? කෙන දොසෙන වදෙය්‍ය? කෙන මොහෙන වදෙය්‍ය? කෙන මානෙන වදෙය්‍ය? කාය දිට්ඨියා වදෙය්‍ය? කෙන උද්ධච්චෙන වදෙය්‍ය? කාය විචිකිච්ඡාය වදෙය්‍ය? කෙහි අනුසයෙහි වදෙය්‍ය රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති[1] වා ථාමගතොති වා? තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන වදෙය්‍ය නෙරයිකොති වා –පෙ– නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා? සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන[3] වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපයෙය්‍ය වොහරෙය්‍යාති ‘අනූපයං කෙන කථං වදෙය්‍ය.’

**අත්තං නිරත්තං න හි තස්ස අත්ථීති** – ‘අත්තා’ති සස්සතදිට්ඨි[4] නත්ථි; **නිරත්තා**ති උච්ඡෙද දිට්ඨී නත්ථී අත්තාති ගහිතං නත්ථී නිරත්තාති මුඤ්චිතබ්බං නත්ථි. යස්සත්ථි ගහිතං, තස්සත්ථි මුඤ්චිතබ්බං; යස්සත්ථි මුඤ්චිතබ්බං, තස්සත්ථි ගහිතං; ගහණ[5]මුඤ්චනා සමතික්කන්තො[6] අරහා වුද්ධිපරිහානිවීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො ගතද්ධො ගතදිසො. ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති ‘අත්තං නිරත්තං න හි තස්ස අත්ථි.’

**අධොසි සො දිට්ඨිමිධෙව සබ්බන්ති** – තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි. සො සබ්බං දිට්ඨිගතං ඉධෙව අධොසි ධුනි[7] සන්ධුනි නිද්ධුනි පජහි විනොදෙසි ව්‍යන්තිං අකාසි අනභාවං ගමෙසීති ‘අධොසි සො දිට්ඨිමිධෙව සබ්බ’න්ති.

තෙනාහ භගවා:

“උපයො හි ධම්මෙසු උපෙති වාදං
අනූපයං කෙන කථං වදෙය්‍ය,
අත්තං නිරත්තං න හි තස්ස අත්ථි
අධොසි සො දිට්ඨිමිධෙව සබ්බ”න්ති.

**දුට්ඨට්ඨකසුත්තනිද්දෙසො තතියො.**

---

1. අනිට්ඨාගතො – මනුප. 2. ගතියා පරං – සීමු. I. ගතියො – සීමු. II.
3. කෙන – සීමු. I. 4. අත්තානු දිට්ඨි – මු. I. මජසං. 5. ගහණං – සීමු I. මජසං.
6. සමතික්කමන්තො – මනුප. 7. දිට්ඨි ධුනි – සීමු. I.

**අනූපයං කෙන කථං වදෙය්‍ය** – ‘උපය’ යනු: තණ්හූපය ද දිට්ඨූපය දැයි ‘උපය’ දෙකෙකි. . . .ඔහු විසින් තණ්හූපය ප්‍රහීණ යැ. දිට්ඨූපය දුරලන ලද්දේ යැ. තණ්හූපය ප්‍රහීණ වන බැවින් දිට්ඨූපය දුරලන ලද වන බැවින් උපය රහිත වූ පුද්ගලයා කවර රාගයක් හෙතු කොට ගෙන කියන්නේ ද? කවර ද්වේෂයකින් – මොහයකින් – මානයකින් – දෘෂ්ටියෙකින් ඖද්ධත්‍යයෙකින් – විචිකිත්සාවකින් – කවර අනුශයධර්මයකින් රක්ත යැ යි හෝ දුෂ්ට යැ – මූඪ යැ – විනිබද්ධ යැ – පරාමෘෂ්ට යැ – වික්ෂෙපගත යැ – අනිෂ්ඨාගත යැ – ස්ථාමගත යැ යි හෝ කියන්නේ ද? ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයෝ යැ පුණ්‍යාදි අභිසංස්කාරයන් ප්‍රහීණ වන බැවින් කවර රාගාදිකෙලශයක් හෙතු කොට ගෙන නෙරිසත් වන්නේ යැ යි හෝ...නෙවසංඥීනාසංඥී යැයි හෝ එක්තරා ගතියෙකින් කියන්නේ ද; යම් හෙයකින් කියන්නේ නම් බණන්නේ නම් දක්වන්නේ නම් වහරන්නේ නම්, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැත් නු යි ‘අනූපයං කෙන කථං වදෙය්‍ය’ යනු වේ.

**අත්තං නිරත්තං න හි තස්ස අත්ථි** – ‘අත්තා’ යී ශාශ්වතදෘෂ්ටිය නැත, ‘නිරත්තා’ යී උච්ඡෙදදෘෂ්ටිය නැති. ආත්ම යැයි ගන්නා ලද්දෙක් නැත, නිරාත්ම යැයි හළ යුත්තෙක් නැති. යමක් හට ‘මම යැ මා ගේ යැයි ගන්නා ලද්දෙක් ඇත් නම්, ඔහුට හළ යුත්තෙක් ඇති; යමක් හට හළ යුත්තෙක් ඇත් නම්, ඔහුට ගන්නා ලද්දෙක් ඇති. ග්‍රහණමුක්තවන ඉක්මවා සිටි රහත්හු වෘද්ධිපරිහාණි ඉක්මැවූහ. ඒ රහත්හු දශවිධ ආර්‍යාවාසයෙහි වැසෑ නිමවූහ. ශීලය සමග අටසමවත්හි චීර්ණවශීහ. සසරඅදත්මග ඉක්මැවූහ. සිහිනෙහි පවා නොගියවිරූ නිවන්දසාවට ගියහ. ජාතිමරණසංසාර සඞ්ඛ්‍යාත පුනර්භවය ඔවුනට නැත් නු යි ‘අත්තං නිරත්තං න හි තස්ස අත්ථි’ යනු වේ.

**අධොසි සො දිට්ඨිමිධෙව සබ්බං** – ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහාණ කරන ලදහ, මුල් සිඳින ලදහ, සන්හිඳුවන ලදහ, අභව්‍යොත්පත්ති කරන ලදහ, නුවණගින්නෙන් දවන ලදහ. ඒ රහතුන් වහන්සේ සියලු දෘෂ්ටිගතය මේ අත්බැව්හි මැ හළහ... විගතාත්ත කළහ, අනවභාවයට පැමිණැවූහු නු යි ‘අධොසි සො දිට්ඨිමිධෙව සබ්බං’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

> “උපයො හි ධම්මෙසු–පෙ–දිට්ඨිමිධෙව සබ්බං” යනු.

**තුන්වැනි දුට්ඨට්ඨක සූත්‍රනිර්දේශය යි.**

# 4

# සුද්ධට්ඨකසුත්තනිද්දෙසො

අථ සුද්ධට්ඨකසුත්තනිද්දෙසො වුච්චති*

**4 - 1**

පස්සාමි සුද්ධං පරමං අරොගං
දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති,
එවාභිජානං[1] පරමන්ති ඤත්වා
සුද්ධානුපස්සී පච්චෙති ඤාණං.

**පස්සාමි සුද්ධං පරමං අරොගන්ති** – 'පස්සාමි සුද්ධ'න්ති පස්සාමි සුද්ධං, දක්ඛාමි සුද්ධං, ඔලොකෙමි සුද්ධං, නිජ්ඣායාමි සුද්ධං, උපපරික්ඛාමි සුද්ධං; **පරමං අරොගන්ති** – පරමං ආරොග්‍යප්පත්තං[2] ඛෙමප්පත්තං තාණප්පත්තං ලෙණප්පත්තං සරණප්පත්තං අභයප්පත්තං අච්චුතප්පත්තං නිබ්බානප්පත්තන්ති 'පස්සාමි සුද්ධං පරමං අරොගං.'

**දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොතීති** – චක්ඛුවිඤ්ඤාණෙන[3] රූපදස්සනෙන නරස්ස සුද්ධි විසුද්ධි පරිසුද්ධි මුත්ති විමුත්ති පරිමුත්ති හොති; නරො සුජ්ඣති විසුජ්ඣති පරිසුජ්ඣති මුච්චති විමුච්චති පරිමුච්චතීති 'දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති.'

**එවාභිජානං පරමන්ති ඤත්වාති** – එවං අභිජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො ඉදං පරමං අග්ගං[4] සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'එවාභිජානං පරමන්ති ඤත්වා.'

**සුද්ධානුපස්සී පච්චෙති ඤාණන්ති** – යො සුද්ධං පස්සති, සො සුද්ධානුපස්සී; **පච්චෙති ඤාණන්ති** – චක්ඛුවිඤ්ඤාණං රූපදස්සනෙන ඤාණන්ති පච්චෙති, මග්ගොති පච්චෙති, පථො'ති පච්චෙති, නිය්‍යානන්ති[5] පච්චෙතීති 'සුද්ධානුපස්සී පච්චෙති ඤාණ'න්ති.
තෙනාහ භගවා:

"පස්සාමි සුද්ධං පරමං අරොගං
දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති,
එවාභිජානං පරමන්ති ඤත්වා
සුද්ධානුපස්සී පච්චෙති ඤාණ"න්ති.

---

*. න දිස්සතෙ'යං පාඨො කෙසුචි පොත්ථකෙසු. 1. එතාභිජානං - සු.
2. අරොගප්පත්තං - මජසං. 3. චක්ඛුවිඤ්ඤාණං - සීමු.I.
4. තං අග්ගං - සීමු.II. 5. නීයානන්ති - PTS.

# 4

## සුද්ධට්ඨකසුත්‍රනිර්දේශය

ඉක්බිති සුද්ධට්ඨකසුත්‍රනිර්දේශය කියනු ලැබේ.

### 4 - 1.

දෘෂ්ටිගතික බාල තෙමේ කෙලෙස්කිලුටින් අශුද්ධ වූ කෙලෙස් රෝගීන් සරෝග වූවකු දක ශුද්ධ වූ උත්තම නිර්‍වාණයට පැමිණ සිටියක්හු දකිමි යැයි ද, ඒ දෘෂ්ටිසංඛ්‍යාත දර්‍ශනයෙන් මිනිසාගේ සංශුද්ධිය වේ යයි ද, මෙසේ වෙසෙසින් දන්නේ ඒ දර්‍ශනය පරම යයි සලකා ඒ දර්‍ශනයෙහි ශුද්ධිය දක්නාසුලු වූයේ ඒ දර්‍ශනය මාර්‍ගඥාන යයි හඳහයි. (එතෙකුදු වුවත් එය මාර්‍ගඥානය නො වේ.)

**පස්සාමි සුද්ධං පරමං අරොගං** - 'පස්සාමි සුද්ධං' යනු: ශුද්ධ වූවකු බලමි, ශුද්ධ වූවකු දක්මි, අවලොකන කෙරෙමි, සිතමි, ශුද්ධ වූවකු විමසමි. **පරමං අරොගං** - උත්තම වූ ආරෝග්‍යයට පැමිණියක්හු ක්‍ෂේමයට පැමිණියක්හු ත්‍රාණ(-පාලන)යට පැමිණියක්හු ආරක්‍ෂාවට - පිහිටට - නිර්‍යට - අචලබවට - අමෘතයට - නිර්‍වාණයට පැමිණියක්හු නුයි 'පස්සාමි සුද්ධං පරමං අරොගං' යනු වේ.

**දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති** - චක්‍ෂුර්විඥානයෙන් රූපදර්‍ශනය හෙතු කොට ගෙන සත්ත්වයාගේ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වෙයි, සත්ත්ව තෙමේ ශුද්ධ විශුද්ධ පරිශුද්ධ මුක්ත විමුක්ත පරිමුක්ත වේ යයි 'දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති' යනු වේ.

**එවාභිජානං පරමන්ති ඤත්වා** - මෙසේ වෙසෙසින් දන්නේ එකාන්තයෙන් දන්නේ විවිධාකාරයෙන් දන්නේ ඒ ඒ කරුණෙන් විවිධාකාරයෙන් දන්නේ ප්‍රතිවෙධ කරන්නේ මෙය පරම යැ සෙට යැ දෙට්ඨ යැ පාමොක් යැ උතුම් යැ පවර යැයි සලකා දන තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට නුයි 'එවාභිජානං පරමන්ති ඤත්වා' යනු වේ.

**සුද්ධානුපස්සී පච්චෙති ඤාණං** - යමෙක් ශුද්ධ යයි දකී නම්, හේ ශුද්ධානුදර්‍ශී යැ; **පච්චෙති ඤාණං** - රූපදර්‍ශනය හෙතු කොට ගෙන චක්‍ෂුර්-විඥානය ඥානය යි හඳහයි, මාර්‍ගය යි හඳහයි, පථය යි හඳහයි, නිර්‍යාණය යි හඳහා නුයි - 'සුද්ධානුපස්සී පච්චෙති ඤාණං' යනු වේ. එයින් වදාළහ බුදුහු:

"පස්සාමි සුද්ධං -පෙ- පච්චෙති ඤාණං" යි.

**4 - 2**

දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති
ඤාණෙන වා සො පජහාති දුක්ඛං,
අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො
දිට්ඨී හි නං පාව තථා වදානං.

**දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොතීති** - චක්ඛුවිඤ්ඤාණෙන[1] රූපදස්සනෙන චෙ නරස්ස සුද්ධි විසුද්ධි පරිසුද්ධි මුත්ති විමුත්ති පරිමුත්ති හොති, නරො සුජ්ඣති විසුජ්ඣති පරිසුජ්ඣති, මුච්චති විමුච්චති පරිමුච්චතීති 'දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති.'

**ඤාණෙන වා සො පජහාති දුක්ඛන්ති** - චක්ඛුවිඤ්ඤාණෙන[1] රූපදස්සනෙන චෙ නරො ජාතිදුක්ඛං පජහාති,[2] ජරාදුක්ඛං පජහාති, ව්‍යාධිදුක්ඛං පජහාති, මරණදුක්ඛං පජහාති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං පජහාතීති 'ඤාණෙන වා සො පජහාති දුක්ඛං.'

**අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකොති** - අඤ්ඤෙන අසුද්ධිමග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යානිකපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකාමග්ගා[3] නරො සුජ්ඣති විසුජ්ඣති පරිසුජ්ඣති මුච්චති විමුච්චති පරිමුච්චති; **සොපධීකොති** - සරාගො සදොසො සමොහො සමානො සතණ්හො සදිට්ඨී සකිලෙසො සඋපාදානොති 'අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො.'

**දිට්ඨී හි නං පාව තථා වදානන්ති** - සා ච දිට්ඨී තං පුග්ගලං පාවදති: 'ඉති වායං පුග්ගලො මිච්ඡාදිට්ඨිකො විපරීතදස්සනො'ති; **තථා වදානන්ති** - තථා වදන්තං කථෙන්තං භණන්තං දීපයන්තං වොහරන්තං, 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති තථා වදන්තං කථෙන්තං භණන්තං දීපයන්තං වොහරන්තං, 'අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති තථා වදන්තං කථෙන්තං භණන්තං දීපයන්තං වොහරන්තන්ති 'දිට්ඨී හි නං පාව තථාවදානං.'

තෙනාහ භගවා:

"දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති
ඤාණෙන වා සො පජහාති දුක්ඛං,
අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො
දිට්ඨී හි නං පාව තථා වදාන"න්ති.

---

1. චක්ඛුවිඤ්ඤාණෙ - සීමු I. මජ්ස. 2. පජහති - සීමු. II.
3. අට්ඨඞ්ගිකාමග්ගෙන - සෑ.

## 4 – 2.

ඒ රූපදර්ශන සඞ්ඛ්‍යාත වූ දර්ශනය හෙතු කොට ගෙන ඉදින් සත්ත්වයාගේ ශුද්ධිය වේ නම්, නොහොත් ඒ චක්ෂුර්විඥාන සඞ්ඛ්‍යාත ඥානයෙන් හෙතෙම ජාත්‍යාදි දුක දුරු කෙරේ නම්, එකල්හි ආය්‍ර්‍යමාර්ගයෙන් අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙකින් කාමාදි උපධි සහිත වූයේ මැ හෙතෙම ශුද්ධ වේ යයි කිය යුතු බවට පැමිණෙයි; යම් හෙයකින් දෘෂ්ටි තොමෝ එසේ කියන්නා වූ ඔහු 'මේ තෙමේ මිසදිටුවෙකැ'යි පවසා ද, එහෙයිනි.

**දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති** – චක්ෂුර්විඥානයෙන් රූප දකිමෙන් ඉදින් සත්ත්වයාගේ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වේ නම්, සත්ත්ව තෙමේ ශුද්ධ විශුද්ධ පරිශුද්ධ මුක්ත විමුක්ත පරිමුක්ත වේ නම් යි 'දිට්ඨෙන. චෙ සුද්ධි නරස්ස හොති' යනු වේ.

**අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො** – අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් මිථ්‍යාප්‍රතිපදායෙන් අනෛර්‍යාණිකමාර්ගයෙන් සතිපට්ඨානයන්ගෙන් වෙන් වැ සම්‍යක්ප්‍රධානයන්ගෙන් වෙන් වැ ඍද්ධිපාදයන්ගෙන් වෙන් වැ ඉන්ද්‍රියයන්ගෙන් වෙන් වැ බලයන්ගෙන් වෙන් වැ බොධ්‍යඞ්ගයන්ගෙන් වෙන් වැ ආය්‍ර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් වෙන් වැ ශුද්ධ විශුද්ධ පරිශුද්ධ වූයේ වෙයි, මුක්ත විමුක්ත පරිමුක්ත වූයේ වේ. **සොපධීකො** – සරාග වූයේ සද්වෙෂ වූයේ සමොහ වූයේ තෘෂ්ණා සහිත වූයේ දෘෂ්ටි සහිත වූයේ කෙලශ සහිත වූයේ උපාදාන සහිත වූයේ නුයි 'අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො' යනු වේ.

**ඤාණෙන වා සො පජහාති දුක්ඛං** – චක්ෂුර්විඥානයෙන් රූප දකිමෙන් ඉදින් සත්ත්ව තෙමේ ජාතිදුක දුරු කෙරේ නම්, ජරාදුක – ව්‍යාධිදුක – මරණදුක – සොකපරිදෙවදුක්ඛදෞමනස්සුපායාස දුක දුරු කෙරේ නම් යි 'ඤාණෙන වා සො පජහාති දුක්ඛං' යනු වේ.

**දිට්ඨී හි නං පාව තථා වදානං** – තවද ඒ දෘෂ්ටි තොමෝ ඒ පුග්ගලා 'මෙසේත් මේ පුද්ගල තෙමේ මිථ්‍යාදෘෂ්ටි ඇත්තෙක, විපරීත දර්ශන ඇත්තෙකැ' යි ප්‍රකාශ කෙරෙයි. **තථා වදානං** – එසේ පවසන කියන බණන දක්වන බැවහර කරනුවහු, 'ලොකය ශාශ්වත යැ, මේ මැ සැබව, අන්‍යදෘෂ්ටිය හිස් යැ' යි එසේ පවසන්නහු...බැවහර කරනුවහු, ලොකය අශාශ්වත යැ, ලොකය අනන්තවත් යැ, ලොකය අනන්තවත් යැ, යමක් ජීවය ද එය ම ශරීර යැ, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ, සත්ත්ව තෙමේ මරණින් මතු උපදනේ වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු නුපදනේ වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු උපදනේත් නො ද උපදනේත් වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ උපදනේ වෙයි, නුපදනේත් නොවෙයි, මේ මැ සැබව අන්‍යය තුච්ඡ යැ'යි එසේ පවසනුවහු කියනුවහු බණන්නහු දක්වනුවහු බැවහර කරනුවහු යි 'දිට්ඨී හි නං පාව තථාවදානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"දිට්ඨෙන චෙ සුද්ධි –පෙ–තථා වදානං" යි.

## 4 - 8

න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ
දිට්ඨෙ සුතෙ සීලවතෙ[1] මුතෙ වා,
පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො
අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වාති** – නා'ති පටික්ඛෙපො; බ්‍රාහ්මණොති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො: සක්කායදිට්ඨි බාහිතා හොති, විචිකිච්ඡා බාහිතා හොති, සීලබ්බතපරාමාසො බාහිතො හොති, රාගො බාහිතො හොති, දොසො බාහිතො හොති, මොහො බාහිතො හොති, මානො බාහිතො හොති, බාහිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

1. "බාහෙත්වා සබ්බපාපකානි (සභියාති භගවා)
විමලො සාධු සමාහිතො ඨිතත්තො,
සංසාරමතිච්ච කෙවලී සො
අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා".[a]

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහාති** – බ්‍රාහ්මණො අඤ්ඤත අසුද්ධිමග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යාණිකපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ න කථෙති න භණති න දීපයති න වොහරතීති 'න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ.'

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වාති** – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨසුද්ධිකා.[2] තෙ එකච්චානං රූපානං දස්සනං මඞ්ගලං පච්චෙන්ති. එකච්චානං රූපානං දස්සනං අමඞ්ගලං පච්චෙන්ති.

කතමෙසා රූපානං දස්සනං මඞ්ගලං පච්චෙන්ති? තෙ කාලතො වුට්ඨහිත්වා අභිමඞ්ගලගතානි රූපානි පස්සන්ති: චාටක[3]සකුණං පස්සන්ති. ඵුස්සවෙලුවලට්ඨිං[4] පස්සන්ති. ගබ්භිනිත්ථිං පස්සන්ති කුමාරකං ඛන්ධෙ ආරොපෙත්වා ගච්ඡන්තං පස්සන්ති. පුණ්ණඝටං පස්සන්ති. රොහිතමච්ඡං පස්සන්ති. ආජඤ්ඤං පස්සන්ති. ආජඤ්ඤරථං පස්සන්ති. උසභං පස්සන්ති. ගොකපිලං පස්සන්ති. එවරූපානං රූපානං දස්සනං මඞ්ගලං පච්චෙන්ති.

කතමෙසං රූපානං දස්සනං අමඞ්ගලං පච්චෙන්ති? පලාලපුඤ්ජං පස්සන්ති. තක්කඝටං පස්සන්ති. රිත්තඝටං පස්සන්ති. නටං පස්සන්ති. නග්ගසමණං පස්සන්ති. ඛරං පස්සන්ති. ඛරයානං පස්සන්ති. එකයුත්තයානං පස්සන්ති. කාණං පස්සන්ති. කුණිං පස්සන්ති. ඛඤ්ජං පස්සන්ති. පක්ඛහතං පස්සන්ති. ජිණ්ණකං පස්සන්ති. බ්‍යාධිතං[5] පස්සන්ති. මතං පස්සන්ති. එවරූපානං රූපානං දස්සනං අමඞ්ගලං පච්චෙන්ති.

ඉමෙ තෙ[6] සමණබ්‍රාහ්මණා දිට්ඨසුද්ධිකා.[2] තෙ දිට්ඨෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති

1. සීලබ්බතෙ - සීමු. I 2. දිට්ඨි සුද්ධිකා - සීමු. I. ස. මජසං.
3. චාත - ස්‍යා., චාතක සීමු I. 4. වෙලුවලට්ඨං - ස්‍යා., මජසං.
5. බ්‍යාධිකං - සීමු. I. ස්‍යා. මජසං. 6. ඉමෙවෙතෙ - ස්‍යා., මජසං.
a. සුත්තනිපාත - සභියසුත්ත.

## 4 – 8.

ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙමේ ආර්‍ය්‍යමාර්ගඥානයෙන් අන්‍ය වූ අභිමඞ්ගල-සම්මතරූපසඞ්ඛ්‍යාත රූපායතනයෙහි ද, එබඳු මැ වූ ශබ්දායතනයෙහි ද, අව්‍යතික්‍රමසඞ්ඛ්‍යාත ශීලය හා (හස්තිව්‍රතාදි) වූ ව්‍රතයෙහි ද, ගන්ධ රස ස්ප්‍රෂ්ට-ව්‍යායතනයෙහි ද උපන් මිථ්‍යාඥානයෙන් ශුද්ධිය වේ යයි නො කියයි. යම් හෙයකින් හෙතෙම ත්‍රෛධාතුක පුණ්‍යයෙහිත් සියලු පාපයෙහිත් නො ඇලුණේ වේ ද, එහෙයින් ආත්මදෘෂ්ටිය ප්‍රහීණ කෙළේ මේ ත්‍රෛධාතුක ලොකයෙහි පුණ්‍යාභිසංස්කාරාදිය නො කරනුයේ වේ.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** – 'න' යනු: ප්‍රතික්ෂෙප යැ; **බ්‍රාහ්මණො** – සප්තධර්ම් කෙනකුත් දුරු කළ වන බැවින් බ්‍රාහ්මණ යැ: සත්කායදෘෂ්ටිය (ප්‍රහීණ) කරන ලද්දී වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය – රාගය – ද්වේෂය – මෝහය – මානය ප්‍රහීණ කරන ලදුයේ වෙයි, ඔහු විසින් සංක්ලේශික වූ පුනර්භවය ඇති කරන්නාවූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මතුයෙහි ජාතිජරාමරණයට හෙතු වූ ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණ කරන ලද්දාහු වෙත්.

1. ('සභිය' යි අමතා භාග්‍යවත්හු මෙසේ වදාළහ:) සියලු පාපධර්ම-යන් ප්‍රහීණ කොට එහෙයින් ම විගතමල වූ (-ශ්‍රෙෂ්ඨ වූ) මාර්ගඵලසමා-ධියෙන් මොනොවට සමාහිත වූ ලොකධර්මයන්ගෙන් කම්පිත නො වන හෙයින් ස්ථිතාත්ම වූ සංසාර හෙතු ඉක්මා සිටි නිමවන ලද කෘත්‍ය ඇති හෙයින් කෙවලී වූ ඒ ක්ෂීණාශ්‍රව තෙම තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රය නැති හෙයින් 'අසිත' යයි ද, ලොකධර්මයෙන් නිර්විකාර හෙයින් 'තාදී' යයි ද කියනු ලැබේ. හෙතෙම බ්‍රාහ්මණ' නම් වේ.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ** – ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙමේ අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් මිථ්‍යාප්‍රතිපදායෙන් අනෛර්‍ය්‍යාණිකපථයෙන් සතිපට්ඨාන – සම්මප්පධාන – ඉද්ධිපාද – ඉන්ද්‍රිය – බල – බොජ්ඣඞ්ග – ආර්‍ය්‍යඅෂ්ටා-ඞ්ගිකමාර්ගයෙන් වෙන් වූ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො කියයි නො බෙණෙයි නො දක්වයි නො බැවහර කෙරේ හුයි 'න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ' යනු වේ.

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** – දෘෂ්ට(-මඞ්ගලසම්මත රූපායතන)යෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණ බමුණු කෙනෙක් වෙති. ඔහු ඇතැම් රූපයන් දැකීම මඞ්ගල යයි ද ඇතැම් රූපයන් දැකීම අමඞ්ගල යයි ද හඟනති.

කවර රූපයන්ගේ දැකීම 'මඞ්ගල' යයි හඟහති? යත්: ඒ දෘෂ්ට-මාඞ්ගලිකයෝ උදෑසන ම නැගීසිට අභිමඞ්ගල බවට (වෘද්ධිකාරණයට) ගිය ශේකුරුල්ලකු බලති, පුසනකතින් ගිඳුවන ලද තරුණ බෙලිගසක් බලති, ගැබිනිඅඟනක බලති; දරුවකු ඇකයේ හිඳුවා යනුවක්හු බලති, පුන්කලස බලති, රේමසකු බලති, ආජානීය අසකු බලති, ආජානීය අසුන් යෙදූ රියක් බලති, ඍෂභයකු බලති, කබරදෙනක බලත්. මෙබඳු රූපයන් දැකීම මඞ්ගල යයි හඟහත්.

කවර රූපයන්ගේ දැකීම 'අමඞ්ගල' යයි හඟහති? යත්: පිදුරුමිටියක් දකිත් නම්, මෝරුකලයක් – හිස්කලයක් – නළුවකු – නග්නශ්‍රමණයකු – කොටළුවකු – කොටළුරියක් – එක ගවයකු යෙදූ රියක් – කණකු – කොරකු – කුදකු – පිළකු – මහල්ලකු – ලෙඩ වූවකු – මළ එකක්හු දකිත් නම්, මෙබඳු රූපයන්ගේ දැකීම 'අමඞ්ගල' යයි හඟහත්.

ඒ මෙකී මහණබමුණෝ දෘෂ්ටශුද්ධිකයෝ යැ; ඔහු අභිමඞ්ගලසම්මත රූපයෙන් ශුද්ධිය... පරිමුක්තිය කැමැති වෙත්.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සුතසුද්ධිකා. තෙ එකච්චානං සද්දානං සවණං මඞ්ගලං පච්චෙන්ති. එකච්චානං සද්දානං සවණං අමඞ්ගලං පච්චෙන්ති.

කතමේසානං සද්දානං සවණං මඞ්ගලං පච්චෙන්ති? තෙ කාලතො වුට්ඨහිත්වා අභිමඞ්ගලගතානි සද්දානි[1] සුණන්ති: වඩ්ඪාති වා, වඩ්ඪමානාති වා, පුණ්ණාති වා, ඵුස්සාති වා, අසොකාති වා, සුමනාති වා, සුනක්ඛත්තාති වා, සුමඞ්ගලාති වා, සිරීති වා, සිරිවඩ්ඪාති වා, එවරූපානං සද්දානං සවණං මඞ්ගලං පච්චෙන්ති.

කතමේසං සද්දානං සවණං අමඞ්ගලං පච්චෙන්ති? කාණොති වා, කුණීති වා, ඛඤ්ජොති වා, පක්ඛහතොති වා, ජිණ්ණකොති වා, බ්‍යාධිතොති වා, මතොති වා, ඡින්නන්ති වා, භින්නන්ති වා, දඩ්ඪන්ති වා, නට්ඨන්ති වා, නත්ථීති වා, එවරූපානං සද්දානං සවණං අමඞ්ගලං පච්චෙන්ති.

ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා සුතසුද්ධිකා. තෙ සුතෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලසුද්ධිකා. තෙ සීලමත්තෙන සංයම-මත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

සමණො මණ්ඩිකා[2] පුත්තො එවමාහ: "චතූහි ඛො අහං ථපති[3] ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං. කතමෙහි චතූහි? ඉධ ථපති[4] න කායෙන පාපකං කම්මං කරොති. න පාපිකං වාචං භාසති. න පාපකං සංකප්පං සංකප්පෙති. න පාපකං ආජීවං ආජීවති. ඉමෙහි ඛො අහං ථපති චතූහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං"[5][a]. එවමෙව සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලසුද්ධිකා. තෙ සීලමත්තෙන සංයමමත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා වතසුද්ධිකා. තෙ හත්ථිවතිකා වා හොන්ති. අස්සවතිකා වා හොන්ති. ගොවතිකා වා හොන්ති. කුක්කුරවතිකා වා හොන්ති. කාකවතිකා වා හොන්ති. වාසුදෙවවතිකා වා හොන්ති. බලදෙවවතිකා වා හොන්ති. පුණ්ණභද්දවතිකා වා හොන්ති. මණිභද්දවතිකා වා හොන්ති. අග්ගිවතිකා වා හොන්ති. නාගවතිකා වා හොන්ති. සුපණ්ණවතිකා වා හොන්ති. යක්ඛවතිකා වා හොන්ති. අසුරවතිකා වා හොන්ති. ගන්ධබ්බවතිකා වා හොන්ති. මහාරාජවතිකා වා හොන්ති. චන්දවතිකා වා හොන්ති. සුරියවතිකා වා හොන්ති. ඉන්දවතිකා වා හොන්ති. බ්‍රහ්මවතිකා වා හොන්ති. දෙවවතිකා වා හොන්ති. දිසාවතිකා වා හොන්ති. ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා වතසුද්ධිකා. තෙ වතෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

1. සද්දානං - සීමු I. මජසං. 2. මුණ්ඩිකා - සයා.
3. ගහපති - සීමු. I. මජසං. 4. ගහපති - සීමු. I. 5. අයොජ්ජං - මජසං.
a. මජ්ඣිමනිකාය - සමණ මණ්ඩිකාසුත්ත.

මඞ්ගලසම්මත ශබ්දයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු ඇතැම් ශබ්දයන් ඇසීම ‘මඞ්ගල’ යයි ද, ඇතැම් ශබ්දයන් ඇසීම ‘අමඞ්ගල’ යයි ද හදහත්.

කවර ශබ්දයන්ගේ ශ්‍රවණය ‘මඞ්ගල’ යයි හදහති ? යත්: ඔවුහු උදෑසන මැ නැඟීසිට ‘අභිමඞ්ගල’ යැයි සම්මත වැ ගිය ශබ්ද අසති: වැඩෙව (=දිණන්වා) යැ – වර්‍ධමාන යැ –පූර්ණ යැ – පුෂ්‍ය යැ – අශෝක යැ – සුමන යැ – සුනක්ඛත්ත යැ – සුමඞ්ගල යැ – ශ්‍රී යැ – ශ්‍රීවර්‍ධන (–සිරිවඩු) යැ හෝ මෙබඳු වූ ශබ්දයන්ගේ ඇසීම ‘මඞ්ගල’ යයි කැමැති වෙත්.

කවර ශබ්දයන්ගේ ඇසීම ‘අමඞ්ගල’ යයි හදහති ? යත්: ‘කණා යැ හෝ කොර යැ – කුදු යැ – පිළු යැ – මහලු යැ – ලෙඩ ඇත්තෙ යැ – මළේ යැ – දිරුයෙ යැ – බිඳුණෙ යැ – දැවුණෙ යැ – නටුයෙ යැ – ‘නැත’යි හෝ මෙබඳු ශබ්දයන්ගේ ශ්‍රවණය ‘අමඞ්ගල’ යයි හදහති.

ඒ මෙකී මහණබමුණෝ ශ්‍රැතශුද්ධිකයෝ යැ. ඔහු ශ්‍රැත (=අභිමඞ්ගල–සම්මත ශබ්ද) යෙන් ශුද්ධිය...පරිමුක්තිය කැමැති වෙත්.

ශීලයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු ශීලමාත්‍රයෙන් සංයමමාත්‍රයෙන් (=ඉඳුරන් දැමීම් පමණෙකින්) තුන්දොර වැසීම් පමණෙකින් ව්‍යතික්‍රම නො කිරීම් පමණෙකින් ශුද්ධිය ...පරිමුක්තිය කැමැති වෙත්.

මණ්ඩිකාපුත්‍ර වූ ශ්‍රමණ තෙමේ මෙසේ කියයි: “ස්ථපතිය, (=වඩුව,) මම් සතර ධර්‍මයෙකින් සමන්විත වූ පුරුෂයක්හු පරිපූර්ණ වූ කුසල් ඇතියකු පරමකුසල් ඇත්තකු උත්තම වූ අභීතත්වයට (=පැමිණිය යුත්තට) පැමිණියකු නො පරදවාලියැ හැකි මහණකු කොට පනවමි. කවර සතරකිනැ ? යත්: ථපතිය, මෙලොවැ යමෙක් කයින් පව්කම් නො කෙරේ ද, ලාමක බස් නො බොණේ ද, පවිටු කල්පනා (–සංකල්ප) නො සිතා ද, ලාමක ආජීවයෙන් ජීවත් නො වේ ද, ස්ථපතිය, මම් මේ සතර දහමින් යුත් පුඟුලක්හු පරිපූර්ණ වූ සිල් ඇතියක්හු...නො පරදවාලියැ හැකි මහණකු කොට පනවමි”. එසෙයින් මැ ශීලයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු සිල්මතුයෙකින් (සිල් පමණෙකින්) සංයමමතුයෙකින් සංවරමතුයෙකින් අව්‍යතික්‍රමමතුයෙකින් ශුද්ධිය... පරිමුක්තිය කැමැති වෙත්.

ව්‍රතසමාදානයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු හස්තිව්‍රත ඇත්තාහු හෝ වෙති, අශ්වව්‍රත ඇත්තාහු – ගොව්‍රත ඇත්තාහු – කුක්කුර (=බලු) ව්‍රත ඇත්තාහු – කාකව්‍රත ඇත්තාහු – වාසුදෙවව්‍රත – බලදෙවව්‍රත – පූර්ණභද්‍රව්‍රත – මණිභද්‍රව්‍රත – අග්නිව්‍රත – නාග–ව්‍රත – ගරුඩව්‍රත – යක්ෂව්‍රත – අසුරව්‍රත – ගාන්ධර්ව්‍රත – මහාරාජව්‍රත – චන්ද්‍රව්‍රත – සූර්‍යව්‍රත – ඉන්ද්‍රව්‍රත – බ්‍රහ්මව්‍රත – දෙවව්‍රත ඇත්තාහු හෝ පෙරදිග්ආදියට නමස්කාර කරන දිශාව්‍රත ඇත්තාහු හෝ වෙත්. ඒ මේ මහණබමුණෝ ව්‍රතයෙන් ශුද්ධිය කැමැති වන්නාහු වෙත්. ඔහු ව්‍රතයෙන් ශුද්ධිය...පරි–මුක්තිය කැමැති වෙත්.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා මුතසුද්ධිකා. තෙ කාලතො වුට්ඨහිත්වා පථවිං ආමසන්ති. හරිතං ආමසන්ති. ගොමයං ආමසන්ති. කච්ඡපං ආමසන්ති. ඵාලං[1] අක්කමන්ති[2]. තිලවාහං ආමසන්ති. ඵුස්ස[3]තිලං ඛාදන්ති. ඵුස්ස[3]තෙලං මක්ඛෙන්ති. ඵුස්සදන්තකට්ඨං ඛාදන්ති. ඵුස්සමත්තිකාය නහායන්ති. ඵුස්සසාටකං නිවාසෙන්ති. ඵුස්සවෙඨනං වෙඨෙන්ති. ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා මුතසුද්ධිකා. තෙ මුතෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා**ති – බ්‍රාහ්මණො දිට්ඨසුද්ධියාපි සුද්ධිං නාහ; සුතසුද්ධියාපි සුද්ධිං නාහ; සීලසුද්ධියාපි සුද්ධිං නාහ; වතසුද්ධියාපි සුද්ධිං නාහ; මුතසුද්ධියාපි සුද්ධිං නාහ, න කථෙති, න භණති, න දීපයති, න වොහරතීති 'න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා.'

**පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො**ති – පුඤ්ඤං වුච්චති යං කිඤ්චි තෙධාතුකං කුසලාභිසඞ්ඛාරං; අපුඤ්ඤං වුච්චති සබ්බං අකුසලං. යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවඞ්ගතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා පුඤ්ඤෙ ච පාපෙ ච න ලිම්පති න සංලිම්පති, න උපලිම්පති, අලිත්තො අසංලිත්තො[4] අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො.'

**අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො**ති – 'අත්තඤ්ජහො'ති අත්තදිට්ඨිජහො, අත්තං ජහොති ගාහජහො, අත්තං ජහොති තණ්හාවසෙන දිට්ඨිවසෙන ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං, සබ්බං[5] තං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං; **නයිධ පකුබ්බමානො**ති – පුඤ්ඤාභිසඞ්ඛාරං[6] වා අපුඤ්ඤාභිසඞ්ඛාරං වා ආනෙඤ්ජාභිසඞ්ඛාරං වා අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති 'අත්තං ජහො නයිධ පකුබ්බමානො.'

තෙනාහ භගවා:

"න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා,
පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො
අත්තංජහො නයිධ පකුබ්බමානො"ති.

**4 – 4**

පුරිමං පහාය අපරං සිතා සෙ
එජානුගා තෙ න තරන්ති සඞ්ගං,
තෙ උග්ගහායන්ති නිරස්සජන්ති
කපීව සාඛං පමුඛ[7]ඞ්ගහාය.

---

1. ජාලං – සයා. 2. ඵලං ආමසන්ති. මජසං. 3. පුස්ස – සයා. සීමු. I.
4. අපලිත්තො – මජසං. 5. සබ්බස්ස – සීමු. I.
6. සඞ්ඛාරෙ – සීමු. I. 7. පමුඤ්ච – සීමු. I.

මුත(=ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය)යෙන් ශුද්ධිය කැමැති වත ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති: ඔහු උදෑසන මැ නැගීසිට මහපොළොව කයින් ස්පර්ශ කෙරෙති, නෙත් තිල්තණ ස්පර්ශ කෙරෙති, අමුගොම ස්පර්ශ කෙරෙති, කසුබුවකු ස්පර්ශ කෙරෙති, සිවැල් ඇක්මෙති, තලරුසක් ස්පර්ශ කෙරෙති, මඞ්ගල සඳහා සකස් කළ (=පුෂ්‍ය) තල අනුභව කෙරෙති, මඟුල්තෙල් ඇඟ ගල්වති, මඟුල්දැකැපි කති, මඟුල්මැටියෙන් ස්නානය කෙරෙති, මඟුල්සළු හඳිති, මඟුල් හිස්වෙළුම් වෙළති. මොහු ඒ මුතයෙන් ශුද්ධිය පතන මහණබමුණෝ යැ. ඔහු මුතයෙන් ශුද්ධිය...පරිමුක්තිය කැමැති වෙත්.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** – බාහිතපාපී බ්‍රාහ්මණ තෙමේ දෘෂ්ටශුද්ධියයෙනුදු ශුද්ධිය නො කියයි, ශ්‍රැතශුද්ධියෙනුදු ශුද්ධිය නො කියයි, ශීලශුද්ධියෙනු දු ශුද්ධිය නො කියයි, ව්‍රතශුද්ධියෙනුදු ශුද්ධිය නො කියයි, මුතශුද්ධියෙනුදු ශුද්ධිය නො කියයි, නො බෙණෙයි, නො දක්වයි, ව්‍යවහාර නො කෙරේ නුයි 'න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා' යනු වේ.

**පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො** – යම් කිසි ත්‍රෛධාතුක කුශලාභිසංස්කාරයෙක් 'පුණ්‍ය' යි කියනු ලැබෙයි, සියලු අකුශලය 'අපුණ්‍ය' යි කියනු ලැබේ. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරයත් අපුණ්‍යාභිසංස්කාරයත් ආනෙඤ්ජාභිසංස්කාරයත් ප්‍රහීණ වූවාහු උපුටා හළ මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අභාවයට ගියාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින් පුණ්‍යයෙහි ද පාපයෙහි ද නො ඇලෙයි, වෙසෙසින් නො ඇලෙයි, නො තැවැරෙයි, අලිප්ත වූයේ (=නො ඇලුණේ)අසංලිප්ත – අනුපලිප්ත වූයේ නික්මැ ගියේ නිස්සෘත වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වෙසේ නුයි 'පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො' යනු වේ.

**අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො** – 'අත්තඤ්ජහො' යනු: ආත්මදෘෂ්ටිය හළුයේ, 'අත්තං ජහො' – ග්‍රාහය හළුයේ, 'අත්තං ජහො' – තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගන්නා ලද පරාමර්ශ කරන ලද අභිනිවෙශ කළ ඇතුළත් ව සිටි බැස ගෙන සිටි ඒ සියල්ල ත්‍යක්ත වෙයි, වාන්ත මුක්ත ප්‍රහීණ ප්‍රතිනිඃසෘෂ්ට වෙයි. **නයිධ පකුබ්බමානො** – පුණ්‍යාභිසංස්කාරය හෝ අපුණ්‍යාභිසංස්කාරය හෝ ආනෙඤ්ජාභිසංස්කාරය හෝ නො කරනුයේ නො දනවනුයේ වෙසෙසින් නො දනවනුයේ නූපදවනුයේ වෙසෙසින් නූපදවනුයේ නුයි 'අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න බ්‍රාහ්මණො–පෙ–නයිධ පකුබ්බමානො" යි.

**4 – 4.**

පූර්ව ශාස්තෘආදීන් හැරපියා අපර ශාස්තෘ ආදීන් ඇසුරු කරන එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණායෙන් මඩනා ලද්දාහු රාගාදි සඞ්ගය තරණය නො කෙරෙති. යළි ඔහු පූර්වශාඛාව හැරපියා අපරශාඛාවක් ගන්නා වූ වඳුරකු සෙයින් ඒ ඒ ධර්මයන් ගන්නාහු ද වෙත්.

**පුරිමං පහාය අපරං සිතා සෙති** – පුරිමං සත්ථාරං පහාය අපරං සත්ථාරං නිස්සිතා, පුරිමං ධම්මක්ඛානං පහාය අපරං ධම්මක්ඛානං නිස්සිතා, පුරිමං ගණං පහාය අපරං ගණං නිස්සිතා, පුරිමං දිට්ඨිං පහාය අපරං දිට්ඨිං නිස්සිතා, පුරිමං පටිපදං පහාය අපරං පටිපදං නිස්සිතා, පුරිමං මග්ගං පහාය අපරං මග්ගං නිස්සිතා සන්නිස්සිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති 'පුරිමං පහාය අපරං සිතා සෙ.'

**එජානුගා තෙ න තරන්ති සඞ්ගන්ති** – එජා වුච්චති තණ්හා, යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං;[අ] **එජානුගාති**– එජානුගා එජානුගතා එජානුසටා එජායාපන්නා පතිතා අභිභූතා පරියාදින්නචිත්තා; **තෙ න තරන්ති සඞ්ගන්ති** – රාගසඞ්ගං දොසසඞ්ගං මොහසඞ්ගං මානසඞ්ගං දිට්ඨිසඞ්ගං කිලෙසසඞ්ගං දුච්චරිතසඞ්ගං න තරන්ති, න උත්තරන්ති, න සමතික්කමන්ති, න වීතිවත්තන්තීති 'එජානුගා තෙ න තරන්ති සඞ්ගං.'

**තෙ උග්ගහායන්ති නිරස්සජන්තීති** – සත්ථාරං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං සත්ථාරං ගණ්හන්ති, ධම්මක්ඛානං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං ධම්මක්ඛානං ගණ්හන්ති; ගණං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං ගණං ගණ්හන්ති; දිට්ඨිං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං දිට්ඨිං ගණ්හන්ති; පටිපදං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං පටිපදං ගණ්හන්ති; මග්ගං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං මග්ගං ගණ්හන්ති; ගණ්හන්ති ච මුඤ්චන්ති[1] ච ආදියන්ති ච නිරස්සජන්ති චාති 'තෙ උග්ගහායන්ති නිරස්සජන්ති.'

**කපී'ව සාඛං පමුඛඞ්ගහායාති** – යථා මක්කටො අරඤ්ඤෙ පවනෙ චරමානො සාඛං ගණ්හාති, තං මුඤ්චිත්වා අඤ්ඤං සාඛං ගණ්හාති, තං මුඤ්චිත්වා අඤ්ඤං සාඛං ගණ්හාති. එවමෙව පුථුසමණබ්‍රාහ්මණා පුථුදිට්ඨිගතානි ගණ්හන්ති ච මුඤ්චන්ති ච ආදියන්ති ච නිරස්සජන්ති චාති 'කපී ව සාඛං පමුඛඞ්ගහාය.[2]'

තෙනාහ භගවා:

"පුරිමං පහාය අපරං සිතා සෙ
එජානුගා තෙ න තරන්ති සඞ්ගං,
තෙ උග්ගහායන්ති නිරස්සජන්ති
කපීව සාඛං පමුඛඞ්ගහායා"ති.

4 – 5

සයං සමාදාය වතානි ජන්තු
උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො,
විද්වා ච[3] වෙදෙහි සමෙච්ච ධම්මං
න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො.

1. පමුඤ්චන්ති – ස. 2. පමුඤ්චග්ගහාය – සිමු. I.
3. විද්ධා – ස්‍යා. මජ්සං.
අ. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ.

**පුරිමං පහාය අපරං සිතාසෙ** - පූර්වශාස්තෘවරයකු හැරපියා අපර ශාස්තෘවරයකු ඇසුරු කළාහු පළමු ගත් ධර්මය හැරපියා අන්‍ය ධර්මයක් ඇසුරු කළාහු පළමු ගත් ගණයා හැරපියා අන් ගණයක් ඇසුරු කළාහු පළමු ගත් දෘෂ්ටිය හැර අන්‍යදෘෂ්ටියක් ඇසුරු කළාහු පූර්වප්‍රතිපදාව හැර අපරප්‍රතිපදාවක් ඇසුරු කළාහු පූර්වමාර්ගය හැර අපරමාර්ගයක් ඇසුරු කළාහු වෙසෙසින් ඇසුරු කළාහු ඇලුණාහු එළැඹියාහු පිවිසියාහු බැසගත්තාහු නුයි 'පුරිමං පහාය අපරං සිතාසෙ' යනු වේ.

**එජානුගා තෙ න තරන්ති සඞ්ගං** - 'එජා' යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවෙක් ලෝභඅකුශලමූලයෙක් **වේ ද** (එයයි). **එජානුගා** - තෘෂ්ණාව අනුව ගියාහු තෘෂ්ණාවට අනුගත වූවාහු තෘෂ්ණාවට පිවිසියාහු තෘෂ්ණාවට පැමිණියාහු වැටුණාහු මඩනා ලද්දාහු හාත්පසින් අල්ලාගත් සිත් ඇත්තාහු. **තෙ න තරන්ති සඞ්ගං** - රාගසඞ්ගය ද්වේෂසඞ්ගය මෝහසඞ්ගය මානසඞ්ගය දෘෂ්ටිසඞ්ගය ක්ලේශසඞ්ගය දුශ්චරිතසඞ්ගය තරණය නො කෙරෙති උත්තරණය නො කෙරෙති ප්‍රතරණය නො කෙරෙති නො ඉක්මෙති ව්‍යතික්‍රමණය නො කෙරෙත් නුයි 'එජානුගා තෙ න තරන්ති සඞ්ගං' යනු වේ.

**තෙ උග්ගහායන්ති නිරස්සජන්ති** - ශාස්තෘවරයකු ගනිති, ඔහු හැරපියා අන් ශාස්තෘවරයකු ගනිත්; ධර්මාඛ්‍යානයක් ගනිති, එය හැරපියා අන් ධර්මාඛ්‍යානයක් ගනිත්, ගණයක් ගනිති, එය හැරපියා අන් ගණයක් ගනිති, දෘෂ්ටියක් ගනිති, එය හැර අන්‍යදෘෂ්ටියක් ගනිත්; ප්‍රතිපදාවක් ගනිති, එය හැරපියා අන් පිළිවෙතක් ගනිත්; මාර්ගයක් ගනිති, එය හැරපියා අන් මඟක් ගනිත්; ගත්තාහු ද හරණාහු ද ආදානය කරන්නාහු ද බැහැර කරන්නාහු ද වෙත් නුයි 'තෙ උග්ගහායන්ති නිරස්සජන්ති' යනු වේ.

**කපීව සාඛං පමුඤ්චගහාය** - යම් සේ අරණ්‍යසඞ්ඛ්‍යාත මහවෙනෙහි හැසිරෙන වඳුරෙක් එක් ශාඛාවක් ගෙන එය හැරපියා අනෙකක් ගනී ද, එය ද හැරපියා අන් ශාඛාවක් ගනී ද, එසෙයින් මැ බොහෝ මහණබමුණෝ බොහෝ දෘෂ්ටිගතයන් ගන්නාහු ද හරනාහු ද දුරු ලන්නාහු ද වෙත් නුයි 'කපීව සාඛං පමුඤ්චගහාය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පුරිමං පහාය-පෙ-පමුඤ්චගහාය"යි.

**4 - 5.**

කාමාදි සඞ්ගයෙහි ඇලුණා වූ සත්ත්ව තෙමේ හස්තිව්‍රතාදි ව්‍රතයන් තෙමේ මැ සමාදන් වැ එකකින් එකකට යෙයි. පරමාර්ථයෙන් විද්වත් වූ මහාප්‍රඥ ඇති රහත් මහණ සතර මාර්ගඥානවේදයෙන් දහම් අවබෝධ කොට සිටියේ උච්චාවච බවට නො පැමිණේ.

**සයං සමාදාය වතානි ජන්තූති** – ‘සයං සමාදායා’ති සාමං සමාදාය; **වතානීති** – හත්ථිවතං වා අස්සවතං වා ගොවතං වා කුක්කුරවතං වා කාකවතං වා වාසුදෙවවතං වා බලදෙවවතං වා පුණ්ණභද්දවතං වා මණිභද්දවතං වා අග්ගිවතං වා නාගවතං වා සුපණ්ණවතං වා යක්ඛවතං වා අසුරවතං වා –පෙ– දිසාවතං වා, ආදාය සමාදාය ආදියිත්වා සමාදියිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා; **ජන්තූති** – සත්තො නරො –පෙ– මනුජොති ‘සයං සමාදාය වතානි ජන්තු.’

**උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තොති** – සත්ථාරතො සත්ථාරං ගච්ඡති, ධම්මක්ඛානතො ධම්මක්ඛානං ගච්ඡති, ගණතො ගණං ගච්ඡති, දිට්ඨියා දිට්ඨිං ගච්ඡති, පටිපදතො පටිපදං ගච්ඡති, මග්ගතො මග්ගං ගච්ඡති; **සඤ්ඤසත්තොති** – කාමසඤ්ඤාය ව්‍යාපාදසඤ්ඤාය විහිංසාසඤ්ඤාය දිට්ඨිසඤ්ඤාය සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පළිබුද්ධො, යථා භිත්තිඛීලෙ වා නාගදන්තෙ වා භණ්ඩං සත්තං විසත්තං ආසත්තං ලග්ගං ලග්ගිතං පළිබුද්ධං; එවමෙව කාමසඤ්ඤාය ව්‍යාපාදසඤ්ඤාය විහිංසාසඤ්ඤාය දිට්ඨිසඤ්ඤාය සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පළිබුද්ධොති ‘උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො.’

**විද්වා[1] ච වෙදෙහි සමෙච්ච ධම්මන්ති** – ‘විද්වා’ති විද්වා විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී; **වෙදෙහීති** – වෙදා වුච්චන්ති චතූසු මග්ගෙසු ඤාණං, පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි, තෙහි වෙදෙහි ජාතිජරාමරණස්ස අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙණගතො ලෙණප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො[2] අච්චුතප්පත්තො[3] අමතගතො අමතප්පත්තො නිබ්බානගතො නිබ්බානප්පත්තො; වෙදානං වා අන්තගතොති වෙදගූ, වෙදෙහි වා අන්තං ගතොති වෙදගූ, සත්තන්නං වා ධම්මානං විදිතත්තා වෙදගූ: සක්කායදිට්ඨි විදිතා හොති, විචිකිච්ඡා විදිතා හොති, සීලබ්බතපරාමාසො විදිතො හොති, රාගො විදිතො හොති, දොසො විදිතො හොති, මොහො විදිතො හොති, මානො විදිතො හොති, විදිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

1. “වෙදානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
සමණානං යානිපත්ථි[4] බ්‍රාහ්මණානං,
සබ්බවෙදනාසු වීතරාගො
සබ්බං වෙදමතිච්ච වෙදගූ සො”ති.

---

1. විද්ධා – සහා. මජ්ඣං. 2. අච්චුතිංගතො – ස. 3. අච්චුතිප්පත්තො – ස.
4. ධත්ථි – සීමු. 1. මජ්ඣං.

**සයං සමාදාය වතානි ජන්තු** – 'සයං සමාදාය' – තෙමේ මැ සමාදන් වැ; **වතානි** – හස්තිව්‍රතය හෝ අශ්ව – ගෝ – කුක්කුර – කාක – වාසුදේව – බලදේව – පූර්ණභද්‍ර – මණිභද්‍ර – අග්නි – නාග – සුපර්ණ – යක්ෂ – අසුර – ව්‍රතය හෝ...දිශාව්‍රතය හෝ ගෙන මොනොවට ගෙන ආදානය කොට සමාදානය කොට ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවේශ කොට; **ජන්තු** – සත්ත්ව – නර...මනුජ තෙමේ නුයි 'සයං සමාදාය වතානි ජන්තු' යනු වේ.

**උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො** – ශාස්තෘවරයකු කෙරෙන් ශාස්තෘවරයකු කරා යෙයි, ධර්මාඛ්‍යානයකින් ධර්මාඛ්‍යානයකට – ගණයක් කෙරෙන් ගණයක්හු කරා – දෘෂ්ටියකින් දෘෂ්ටියකට – ප්‍රතිපදාවකින් ප්‍රතිපදාවකට – මාර්ගයකින් මාර්ගයකට යෙයි; **සඤ්ඤසත්තො** කාමසංඥායෙහි ව්‍යාපාදසංඥායෙහි විහිංසාසංඥායෙහි දෘෂ්ටිසංඥායෙහි ඇලුණේ වෙසෙසින් ඇලුණේ හාත්පසින් ඇලුණේ ලැගුණේ ලග්න වූයේ පලිබුද්ධ වූයේ, යම් සේ භිත්තිඛිලය (=බිත්තියෙහි සවි කළ හුල)ක හෝ නාගදන්තයක හෝ භාණ්ඩයක් සක්ත විෂක්ත ආසක්ත ලග්න ලග්නකළ පරිබුද්ධ වූයේ ද, එසෙයින් ම කාම – ව්‍යාපාද – විහිංසා – දෘෂ්ටිසංඥායෙහි සක්ත...පරිබුද්ධ වූයේ නුයි 'උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො' යනු වේ.

**විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං** – 'විද්වා' යනු: විද්වද් වූයේ විද්‍යාවට පැමිණියේ නුවණැතියේ නුවණින් විමසනුයේ මෙධා(=අනිත්‍යාදි විසින් තුලනය කළ ඥාන) ඇතියේ; **වෙදෙහි** – සතර මාර්ගයන්හි ඥානය 'වෙද' යි කියනු ලැබේ; ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රියය ප්‍රඥාබලය ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය වීමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය යි; ඒ මාර්ගඥානවෙදයන්ගෙන් ජාතිජරාමරණයන්ගේ අන්තයට ගියේ අන්තයට පැමිණියේ (මාර්ගයෙන්) කෙළවරට ගියේ (ඵලයෙන්) කෙළවරට පැමිණියේ පර්යන්තයට ගියේ පර්යන්තයට පැමිණියේ අවසානයට ගියේ අවසානයට පැමිණියේ (මාර්ගයෙන්) ත්‍රාණයට ගියේ (ඵලයෙන්) ත්‍රාණයට පැමිණියේ නිලීයනයට (මාර්ගයෙන්) ගියේ (ඵලයෙන්) පැමිණියේ ප්‍රතිෂ්ඨාවට (මාර්ගයෙන්) ගියේ (ඵලයෙන්) පැමිණියේ නිර්භයට ගියේ නිර්භයප්‍රාප්ත වූයේ අච්‍යුතිය (=නිවන)ට ගියේ අච්‍යුතප්‍රාප්ත වූයේ අමෘතයට ගියේ අමෘතයට පැමිණියේ මාර්ගයෙන් නිවනට ගියේ ඵලයෙන් නිවනට පැමිණියේ; නොහොත් වෙද (=දතයුතු ධර්ම) යන්ගේ අන්තයට ගියේ නුයි 'වෙදගූ' යැ, සතරමාර්ගඥානවෙදයෙන් වෘත්තදුඃඛයාගේ අන්තයට ගියේ නුයි හෝ 'වෙදගූ' යැ; නොහොත් සප්තධර්මයන් විදිත වන බැවින් 'වෙදගූ' යැ: සත්කායදෘෂ්ටිය විදිත වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය – රාගය – ද්වේෂය – මෝහය – මානය විදිත වෙයි, ඔහු විසින් කෙලෙසුන්ට ප්‍රත්‍යය වූ පුනර්භවය උපදවන කෙලශදරථ සහිත වූ දුඃඛවිපාක දෙන අනාගතයෙහි ජාතිජරාමරණයන්ට ප්‍රත්‍යය වූ ලාමක අකුශලධර්මයෝ විදිත වූවාහු වෙත්.

1. (බුදුහු 'සභිය' යි අමතා මෙසේ වදාළහ:) යමෙක් ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ ශාස්ත්‍ර යයි කියන ලද යම් වෙද කෙනෙක් වෙත් ද, ඒ සියලු වෙදයන් මාර්ගභාවනායෙන් කෘත්‍ය හෙයින් අනිත්‍යාදිවශයෙන් විමසා එහි ඡන්දරාගප්‍රහාණයෙන් ඒ සියලු වෙදයන් ඉක්මවා යළි වෙදප්‍රත්‍යයෙන් හෝ අන් පරිච්ඡෙදකින් උපදනා සියලු වෙදනාවන්හි වීතරාග වූයේ ද හෙතෙම පරමාර්ථවශයෙන් 'වෙදගූ' නම් වේ යයි.

**විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මන්ති** – සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සබ්බෙ ධම්මා අනත්තා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අවිජ්ජා පච්චයා සඞ්ඛාරා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සඞ්ඛාරපච්චයා විඤ්ඤාණ’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘විඤ්ඤාණපච්චයා නාමරූප’න්ති – නාමරූපපච්චයා සළායතනන්ති – සළායතනපච්චයා ඵස්සොති – ඵස්සපච්චයා වෙදනාති – වෙදනාපච්චයා තණ්හාති – තණ්හාපච්චයා උපාදානන්ති – උපාදානපච්චයා භවොති – භවපච්චයා ජාතීති – ජාතිපච්චයා ජරාමරණ’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො’ති – නාමරූපනිරොධා සළායතනනිරොධොති – සළායතනනිරොධා ඵස්සනිරොධොති – ඵස්සනිරොධා වෙදනානිරොධොති – වෙදනානිරොධා තණ්හානිරොධොති – තණ්හානිරොධා උපාදානනිරොධොති – උපාදානනිරොධා භවනිරොධොති – භවනිරොධා ජාතිනිරොධොති – ජාතිනිරොධා ජරාමරණනිරොධො’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘ඉදං දුක්ඛ’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අයං දුක්ඛසමුදයො’ති – අයං දුක්ඛනිරොධොති – අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘ඉමෙ ආසවා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අයං ආසවසමුදයො’ති – අයං ආසවනිරොධොති – අයං ආසවනිරොධගාමිනීපටිපදාති සමෙච්ච අභිසමෙච්ච ධම්මං, ‘ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං, ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති – ඉමෙ ධම්මා පහාතබ්බාති – ඉමෙ ධම්මා භාවෙතබ්බාති – ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සමෙච්ච අභිසමෙච්ච ධම්මං; පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සමෙච්ච අභිසමෙච්ච ධම්මං; චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මන්ති ‘විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං.’

**න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤොති** – න සත්ථාරතො සත්ථාරං ගච්ඡති, න ධම්මක්ඛානතො ධම්මක්ඛානං ගච්ඡති, න දිට්ඨියා දිට්ඨිං ගච්ඡති, න පටිපදාය පටිපදං ගච්ඡති, න මග්ගතො මග්ගං ගච්ඡති. භූරිපඤ්ඤොති භූරිපඤ්ඤො මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො[1] ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො; භූරි වුච්චති පථවී, තාය පථවිසමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතොති ‘න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො.’

1. හාසපඤ්ඤො PTS.

**විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං** – සිවුසස් දහම්ට නුවණින් පැමිණ, සිවුසස් දහම් නුවණින් පිළිවිද; ‘සියලු සංස්කාරයෝ ඇති වැ නැති වන බැවින් අනිත්‍යයහ’යි සිවුසස් දහම් නුවණින් පැමිණ අභිසමය කොට, ‘සියලු සංස්කාරයෝ පීඩා උපදවන බැවින් දුඃඛයහ’යි දහම් දැන අභිසමය කොට, ‘සියලු ධර්මයෝ වශයෙහි නො පවත්නා බැවින් අනාත්මයහ’යි සිවුසස් දහම් නුවණින් දැන අභිසමය කොට; ‘අවිද්‍යාප්‍රත්‍යයෙන් (–අවිද්‍යාව නිසා) තුන් බිමට අයත් කුශලාදි සංස්කාරයෝ පහළ වෙති’ සිවුසස් දහම් නුවණින් දැන ප්‍රතිවෙධ කොට, සංස්කාරප්‍රත්‍යයෙන් චක්ෂුර්විඥානාදි දෙතිස් ලෞකිකවිපාකවිඥානය පහළ වේ යයි...එකුන්විසි ප්‍රතිසන්ධිවිඥාන-ප්‍රත්‍යයෙන් වෙදනා සංඥා සංස්කාරස්කන්ධ සඞ්ඛ්‍යාත නාමය හා රූපය වේ යයි...නාමරූපප්‍රත්‍යයෙන් චක්ෂුරායතනාදි ෂඩායතනය වේ යයි...ෂඩායතනප්‍රත්‍යයෙන් චක්ෂුඃසංස්පර්ශාදි ස්පර්ශය වේ යයි... ස්පර්ශප්‍රත්‍යයෙන් චක්ෂුඃසංස්පර්ශජාදි වෙදනාව වේ යයි...වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ යයි...තෘෂ්ණාප්‍රත්‍යයෙන් කාමාදි උපාදානය වේ යයි...උපාදානප්‍රත්‍යයෙන් භවය වේ යයි...කර්මභවප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධිස්කන්ධ සඞ්ඛ්‍යාත ජාතිය වේ යයි...ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වේ යයි නුවණින් දැන සිවුසස් දහම් ප්‍රතිවෙධ කොට, ‘අවිද්‍යාව ගේ අනුත්පාදනිරොධයෙන් සංස්කාරයන් ගේ අනුත්පාදනිරොධය වේ යයි නුවණින් දැන සිවුසස් දහම් අවබොධ කොට; සංස්කාරයන් ගේ අනුත්පාදනිරොධයෙන් විඥානනිරොධය වේ යයි – ප්‍රතිසන්ධිවිඥානයා ගේ අනුත්පාදනිරොධයෙන් නාමරූපනිරොධය වේ යයි – නාමරූපනිරොධයෙන් ෂඩායතනනිරොධය වේ යයි – ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වේ යයි – ස්පර්ශනිරොධයෙන් වෙදනානිරොධය වේ යයි – වෙදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ යයි – තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වේ යයි – උපාදානනිරොධයෙන් භවනිරොධය වේ යයි – භවනිරොධයෙන් ජාතිනිරොධය වේ යයි – ජාතිනිරොධයෙන් ජරාමරණනිරොධය වේයයි නුවණින් දැන සිවුසස් අවබොධ කොට; ‘මේ දුකැ’යි දැන... මේ දුක් සමුදය යි...මේ දුක් නැසීම යැයි...මේ දුක් නිරොධයට පමුණුවන පිළිවෙතැයි නුවණින් දැන සිවුසස් ප්‍රතිවෙධ කොට; ‘මොහු ආස්‍රවයෝ ය’යි...‘මේ ආස්‍රවසමුදය යි...මේ ආස්‍රවනිරොධය යි...‘මේ ආස්‍රව-නිරොධගාමිනීප්‍රතිපදා ය’යි දැන සිවුසස්දහම් අභිසමය කොට, ‘මේ ධර්මයෝ ස්වභාවලක්ෂණාවබොධවශයෙන් දතයුත්තාහ’යි දැන – මේ (ත්‍රෛභූමක) ධර්මයෝ සාමාන්‍යලක්ෂණාවබොධවශයෙන් හාත්පසින් දතයුත්තාහ’යි දැන – ‘මේ සමුදයපක්ෂයෙහි වූ ධර්මයෝ ඒ ඒ ගුණාඞ්ගයෙන් හළ යුත්තාහ’යි – ‘මේ දහම්හු වැඩිය යුත්තාහ’යි – ‘මේ දහම්හු ප්‍රත්‍යක්ෂ කටයුත්තාහ’යි නුවණින් දැන සිවුසස් දහම් අවබොධ කොට, චක්ෂුරාදි ෂට්ස්පර්ශායතනයන් ගේ සමුදය (–ඉපදීම) ද නිරොධය ද ආශ්වාදය ද ආදීනවය ද නිශ්ශරණය ද දැන දහම් පසක් කොට, පඤ්චොපාදානස්කන්ධයන්ගේ සමුදය ද... නිශ්ශරණය ද දැන – සතරමහාභූතයන්ගේ සමුදය ද...නිශ්ශරණය ද දැන – ‘සමුදයපක්ෂයෙහි වූ සියලු ධර්මජාතය නිරොධස්වභාව ඇතැ’යි නුවණින් දැන සිවුසස් දහම් විශිෂ්ටඥානයෙන් දැන නුයි ‘විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං’ යනු වේ.

**න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො** – ශාස්තෘවරයකු කෙරෙන් ශාස්තෘ-වරයකු කරා නො යෙයි, ධර්මාඛ්‍යානයකින් ධර්මාඛ්‍යානයකට – දෘෂ්ටියකින් දෘෂ්ටියකට – පිළිවෙතකින් පිළිවෙතකට – මඟෙකින් මඟකට නො යන්නේයි. **භූරිපඤ්ඤො** – පෘථිවිය බඳු විපුලප්‍රඥා ඇතියේ මහාප්‍රඥා ඇතියේ පැතුරුණු ප්‍රඥා ඇතියේ තුෂ්ටි බහුල වූ ප්‍රඥා ඇතියේ අනිත්‍යාදියෙහි වහා දිවෙන ප්‍රඥා ඇතියේ තියුණු වූ ප්‍රඥා ඇතියේ ලොභාදිය විනිවිදින ප්‍රඥා ඇතියේ යැ; පෘථිවිය ‘භූරි’ යැයි කියනු ලබයි, ඒ පෘථිවිසම වූ විපුල වූ විස්තෘත වූ ප්‍රඥායෙන් සමන්විත නුයි ‘න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො’ යනු වේ.

තෙනාහ භගවා:

“සයං සමාදාය වතානි ජන්තු
උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො,
විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං
උච්චාවචං ගච්ඡති - භූරිපඤ්ඤො”ති.

4 - 6

ස සබ්බධම්මෙසු[1] විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා,
තමෙව දස්සිං විවටං චරන්තං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

**ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨංව සුතං මුතං වාති**–සෙනා වුච්චති මාරසෙනා; කායදුච්චරිතං මාරසෙනා, වචීදුච්චරිතං මාරසෙනා, මනොදුච්චරිතං මාරසෙනා, රාගො මාරසෙනා, දොසො මාරසෙනා, මොහො මාරසෙනා, කොධො – උපනාහො–පෙ – සබ්බාකුසලාභිසඞ්ඛාරා මාරසෙනා. වුත්තං හෙතං භගවතා:

1. “කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති,
තතියා ඛුප්පිපාසා තෙ චතුත්ථී තණ්හා පවුච්චති.

2. පඤ්චමී[2] ථිනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති,
සත්තමී[3] විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො තෙ අට්ඨමො.

3. ලාභො සිලොකො සක්කාරො මිච්ඡාලද්ධො ච යො යසො,
යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති.

4. එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිප්පහාරිණී,
න නං අසූරො ජිනාති ජෙත්වා ච ලභතෙ සුඛ”න්ති.[a]

යතො චතූහි අරියමග්ගෙහි සබ්බා ච මාරසෙනා සබ්බෙ ච පටිසෙනිකරා කිලෙසා ජිතා ච පරාජිතා ච භග්ගා විප්පලුග්ගා පරම්මුඛා, සො වුච්චති විසෙනිභූතො; සො දිට්ඨෙ විසෙනිභූතො සුතෙ විසෙනිභූතො මුතෙ විසෙනිභූතො විඤ්ඤාතෙ විසෙනිභූතොති – ස සබ්බධම්මෙසු[4] විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා.

---

1. සබ්බෙසු ධම්මෙසු - සීමු. I.
2. පඤ්චමං - සතා.
3. සත්තමං - සීමු. I.
4. සබ්බෙසු ධම්මෙසු - සීමු I.

a. සුත්තනිපාත - පධානසුත්ත.

එහිත් වදාළහ බුදුහු:

"සයං සමාදාය-පෙ-ගච්ඡති භූරිපඤ්ඤෝ"ති.

**4 – 6.**

ඒ භූරිප්‍රාඥ වූ ක්ෂීණාස්‍රව තෙමේ යම් කිසි රූපාලම්බනයක් හෝ ශබ්දාලම්බනයක් හෝ ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය ආලම්බණයක් හෝ වේද, ඒ සියලු ධර්මයන්හි අකුශලාභිසංස්කාර සංඛ්‍යාත මරසෙනඟ වනසා සිටි වන බැවින් විසෙනී වූයේ වෙයි. මෙසේ විශුද්ධ දර්ශන ඇති විවෘත ව හැසිරෙන ඒ රහත්හු මේ ලොව තෘෂ්ණාදි කවර කල්පනයකින් විකල්පනය කරන්නේ ද.

**ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා** – 'සෙනා' යි මාරසෙනාව කියනු ලබයි, කායදුශ්චරිතය මාරසෙනා යැ, වාග්දුශ්චරිතය – මනොදුශ්චරිතය මාරසෙනා යැ, රාගය මාරසෙනා යැ, ද්වේෂය – මෝහය – ක්‍රොධය – උපනාහය...සියලු අකුශලාභිසංස්කාරයෝ මාරසෙනා යි. මේ වදාරන ලද මැය භාග්‍යවත්හු විසින්:

1. "අනාතකය, වස්තුකාම ක්ලේශකාමයෝ තාගේ පළමු වැනි සෙනාව යැ, වනසෙනසුන්හි හෝ අධිකුශලධර්මයන්හි උපදනා අරතිය දෙවැනි සෙනාව යැයි කියනු ලැබෙයි, සා පවස් දෙක තාගේ තෙවැනි සෙනාව යැ, පර්යේෂණතෘෂ්ණාව සතරවැනි සෙනාව යැයි කියනු ලැබේ.

2. ථීනමිද්ධය තාගේ පස්වැනි සෙනාව යැ, තැතිගැනීම් සංඛ්‍යාත බියසුළු බව සවැන්නී යැයි කියනු ලැබෙයි, පර්යාප්තියෙහි සැකය තාගේ සත්වැනි සෙනාව යැ (මානය) මකුබව හා ස්තම්භය තාගේ අටවැනි සෙනාව යි.

3. ලාභය ප්‍රශංසාය සත්කාරය යන මොහු ද මිථ්‍යාවෙන් ලද යශස ද නවවැනි සෙනාව වෙයි, ජාත්‍යාදිය හෙතු කොටගෙන ආත්මොත්-කර්ෂය ද පරවම්භනය ද දසවැනි සෙනාව වේ.

4. අනාතකය, කෘෂ්ණධර්මයෙන් සමන්විත වූ තා ගේ මේ දශවිධ සෙනා තොමෝ මහණබමුණන්ට අන්තරාය කරන සුළු වෙයි, සූර නො වූ පුරුෂ තෙමේ ඒ මරසෙනඟ නො දිනයි, යළි කායජීවිත නිරපෙක්ෂ වූ සූර තෙමේ ජයග්‍රහණය කොට මගපලසුවයට පැමිණේ" යයි.

යම් හෙයකින් සතර ආයර්මාර්ගයෙන් සියලු දශවිධ මාරසෙනාව ද ප්‍රතිපක්ෂ බව කරන සියලු ක්ලේශයෝ ද දිනන ලද්දාහු පරදවන ලද්දාහු, බිඳින ලද්දාහු සුණුවිසුණු කරන ලද්දාහු පරාමමුඛ බවට පමුණුවන ලද්දාහු ද වෙති, හෙතෙම විසෙනිභූත (=නිකෙලශ වූයේ) යැයි කියනු ලැබේ. හෙතෙම රූපායතනයෙහි විසෙනී වූයේ ශබ්දායතනයෙහි – ගන්ධ-රස ස්ප්‍රෂ්ටව්‍යායතනයෙහි – ධර්මායතනයෙහි විසෙනී වූයේ නුයි 'ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා' යනු වේ.

**තමෙව දස්සිං විවටං චරන්තන්ති** – තමෙව සුද්ධදස්සිං විසුද්ධදස්සිං පරිසුද්ධදස්සිං වොදාතදස්සිං පරියොදාතදස්සිං; අථ වා සුද්ධදස්සනං විසුද්ධදස්සනං පරිසුද්ධදස්සනං වොදාතදස්සනං පරියොදාතදස්සනං; **විවටන්ති** තණ්හාඡදනං දිට්ඨිඡදනං කිලෙසඡදනං දුච්චරිතඡදනං, තානි ඡදනානි විවටානි හොන්ති විද්ධංසිතානි උග්ඝාටිතානි සමුග්ඝාටිතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; **චරන්තන්ති** චරන්තං විචරන්තං ඉරියන්තං වත්තෙන්තං පාලෙන්තං යපෙන්තං යාපෙන්තන්ති – තමෙව දස්සිං විවටං චරන්තං.

**කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යාති** – කප්පාති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච –පෙ– අයං තණ්හාකප්පො –පෙ– අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො, දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා කෙන රාගෙන කප්පෙය්‍ය? කෙන දොසෙන කප්පෙය්‍ය? කෙන මොහෙන කප්පෙය්‍ය? කෙන මානෙන කප්පෙය්‍ය? කාය දිට්ඨියා කප්පෙය්‍ය? කෙන උද්ධච්චෙන කප්පෙය්‍ය? කාය විචිකිච්ඡාය කප්පෙය්‍ය? කෙහි අනුසයෙහි කප්පෙය්‍ය රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති වා ථාමගතොති වා? තෙ[1] අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන කප්පෙය්‍ය නෙරයිකොති වා, තිරච්ඡානයොනිකොති වා, පෙත්තිවිසයිකොති වා, මනුස්සොති වා, දෙවොති වා, රූපීති වා, අරූපීති වා, අසඤ්ඤීති වා, නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා? සො හෙතු නත්ථි පච්චයො නත්ථි කාරණං නත්ථි, යෙන කප්පෙය්‍ය විකප්පෙය්‍ය විකප්පං ආපජ්ජෙය්‍ය; **ලොකස්මින්ති** අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙති 'කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.'

තෙනාහ භගවා:

"ස සබ්බධම්මෙසු විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨංව සුතං මුතං වා,
තමෙව දස්සිං විවටං චරන්තං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යා"ති.

4 – 7

න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
අච්චන්තසුද්ධීති[3] න තෙ වදන්ති,
ආදානගන්ථං ගථිතං[4] විසජ්ජ
ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ.

---

1. එතෙ - මජුප. 2. ගතියො - සීමු. II.
3. අච්චන්තසුද්ධී - සීමු. II. මජසං 4. ගධිතං - සීමු. I.

**තමෙව දස්සිං විවටං චරන්තං** – ඒ මෙසේ ශුද්ධදර්ශී වූවහු විශුද්ධදර්ශී වූවහු පරිශුද්ධදර්ශී වූවහු ව්‍යවදාතදර්ශී වූවහු හාත්පසින් විශුද්ධ දර්ශන ඇත්තහු; නොහොත් ශුද්ධදර්ශන විශුද්ධදර්ශන පරිශුද්ධදර්ශන ව්‍යවදාතදර්ශන පර්‍යවදාතදර්ශන ඇත්තහු. **විවටං** – තෘෂ්ණා සඞ්ඛ්‍යාත ඡදන (=සෙවනි) ය දෘෂ්ටිඡදනය ක්ලේශඡදනය දුශ්චරිතඡදනය අවිද්‍යාඡදනය යන මේ කෙලෙස් ඡදනයෝ විවෘත කරන ලද්දාහු වෙති, විධ්වංශන කරන ලද්දාහු උද්ඝාටන කරන ලද්දාහු සමුද්ඝාටන කරන ලද්දාහු ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්සිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යෝත්පත්තික කරන ලද්දාහු නුවණගින්නෙන් දවන ලද්දාහු වෙත්. **චරන්තං** – හැසිරෙනුවහු වෙසෙසින් හැසිරෙනුවහු ඉරියව් පවත්වනුවහු ඉරියව් උපදවනුවහු ඉරියව් රක්නහු යැපෙනුවහු යාපනය කරවනුවහු නුයි 'තමෙව දස්සිං විවටං චරන්තං' යනු වේ.

**කෙනිධ ලොකස්මිං විකප්පයෙය්‍ය** – 'කප්පා' යනු: තෘෂ්ණාකල්පන යැ දෘෂ්ටිකල්පන යැයි කල්පනයෝ දෙදෙනෙකි:...ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ යැ දෘෂ්ටිකල්පය දුරලන ලද; තෘෂ්ණාකල්පනය ප්‍රහීණ හෙයින් දෘෂ්ටිකල්පනය දුරලන ලද හෙයින් කවර රාගයෙකින් කවරෙක් විකල්පනය කරන්නේ ද, කවර ද්වේෂයෙකින් – කවර මෝහයෙකින් – කවර මානයෙකින් – කවර දෘෂ්ටියෙකින් – කවර ඖද්ධත්‍යයෙකින් – කවර විචිකිත්සායෙකින් – කවර අනුසයධර්මයෙකින් රක්ත යැ හෝ ද්විෂ්ට යැ හෝ මූඪ යැ හෝ විනිබද්ධ යැ හෝ පරාමෘෂ්ට යැ හෝ වික්ෂෙපයට ගියේ යැ හෝ අනිශ්චාවට ගියේ යැ හෝ තදබවට ගියේ යැ හෝ කල්පනය කරන්නේ ද, (කල්පනයට හෙතු වූ) ඒ අභිසංස්කාරයෝ ප්‍රහීණයහ. අභිසංස්කාරයන් ප්‍රහීණ වන බැවින් කුමක් හෙතු කොටගෙන නිරයට යන්නෙකැයි හෝ තිරිසන් යොනි ඇතියෙකැයි හෝ ප්‍රෙතවිෂය ඇතියෙකැයි හෝ මිනිස් වෙයි හෝ දෙව් වෙයි හෝ රූපී – අරූපී – සංඥී – අසංඥී – නෙවසංඥීනාසංඥී වෙයි හෝ එක්තරා ගතියෙකින් කල්පනය කරන්නේ ද, යම් හෙයකින් කල්පන විකල්පන කරන්නේ ද, විකල්පයට පැමිණෙන්නේ ද, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැති. **ලොකස්මිං** – අපායලොකයෙහි ... ආයතනලොකයෙහි නුයි 'කෙනිධ ලොකස්මිං විකප්පයෙය්‍ය' යනු වේ. එයින් වදාළහ බුදුහු:

“ස සබ්බධම්මෙසු-පෙ-විකප්පයෙය්‍ය” සී.

4 – 7.

යම් හෙයකින් ඒ ශාන්ත වූ ක්ෂීණාස්‍රවයෝ ද්විවිධ තෘෂ්ණාදි කල්පනයන් හා පුරස්කාරයන් අතුරෙන් කිසිවකින් කල්පනය නො කෙරෙත් ද, පෙරවූ නො කෙරෙත් ද, ඔවුහු (පරමාර්ථ අත්‍යන්තශුද්ධිය අධිගත වන බැවින් අත්‍යන්තශුද්ධ වූවාහු මැ) අක්‍රිය – ශාශ්වතදෘෂ්ටි අත්‍යන්තශුද්ධි යයි නො කියත් ද එහෙයින් ස්වකීය චිත්තසන්තානයෙහි ගෙතුණාවූ ආදානග්‍රන්ථ යයි කියන ලද අභිධ්‍යාදි චතුර්විධ කායග්‍රන්ථය සිඳපියා කිසි ලෝකයෙක්හි තෘෂ්ණාව නූපදවත්.

**න කප්පයන්ති න පුරෙක්ඛරොන්තීති** – 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච –පෙ– අයං තණ්හාකප්පො –පෙ– අයං දිට්ඨිකප්පො. තෙසං තණ්හාකප්පො පහීනො, දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා න කප්පෙන්ති[1] න ජනෙන්ති න සඤ්ජනෙන්ති න නිබ්බත්තෙන්ති නාභිනිබ්බත්තෙන්තීති න කප්පයන්ති; **න පුරෙක්ඛරොන්තීති** 'පුරෙක්ඛාරා'ති ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච –පෙ– අයං තණ්හාපුරෙක්ඛාරො –පෙ– අයං දිට්ඨිපුරෙක්ඛාරො. තෙසං තණ්හාපුරෙක්ඛාරො පහීනො, දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො. තණ්හාපුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා න දිට්ඨිං වා පුරතො කත්වා චරන්ති; න තණ්හාධජා න තණ්හාකෙතූ න තණ්හාධිපතෙය්‍යා න දිට්ඨිධජා න දිට්ඨිකෙතූ න දිට්ඨාධිපතෙය්‍යා, න තණ්හාය වා න දිට්ඨියා වා පරිවාරිතා චරන්තීති – න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති.

**අච්චන්තසුද්ධීති[2] න තෙ වදන්තීති** – අච්චන්තසුද්ධිං සංසාරසුද්ධිං අකිරියදිට්ඨිං[3] සස්සතවාදං න වදන්ති න කථෙන්ති න භණන්ති න දීපයන්ති න වොහරන්තීති 'අච්චන්තසුද්ධින්ති න තෙ වදන්ති.'

**ආදානගන්ථං ගථිතං විසජ්ජාති** – 'ගන්ථා'ති චත්තාරො ගන්ථා: අභිජ්ඣා කායගන්ථො, බ්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො. අත්තනො දිට්ඨියා රාගො අභිජ්ඣා කායගන්ථො. පරවාදෙසු ආඝාතො අප්පච්චයො බ්‍යාපාදො කායගන්ථො. අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පරාමසන්තීති සීලබ්බතපරාමාසො කායගන්ථො. අත්තනො දිට්ඨි ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො. කිං කාරණා වුච්චති[3] ආදානගන්ථො? තෙහි ගන්ථෙහි රූපං ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති. වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං ගතිං උපපත්තිං පටිසන්ධිං භවං සංසාරවට්ටං ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති. තං කාරණා වුච්චති[4] ආදානගන්ථො. **විසජ්ජාති** ගන්ථෙ වොස්සජ්ජිත්වා වා විසජ්ජ; අථ වා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බද්ධෙ විබද්ධෙ ආබද්ධෙ ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ බන්ධනෙ පොටයිත්වා විසජ්ජ; යථා වය්හං වා රථං වා සකටං වා සන්දමානිකං වා සජ්ජං විසජ්ජං කරොන්ති විකොපෙන්ති, එවමෙවං ගන්ථෙ වොස්සජ්ජිත්වා වා විසජ්ජ; අථ වා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බද්ධෙ විබද්ධෙ ආබද්ධෙ ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ බන්ධනෙ පොඨයිත්වා විසජ්ජාති 'ආදානගන්ථං ගථිතං විසජ්ජ.'

1. න කප්පයන්ති - මනුප. 2. අච්චන්තසුද්ධීති - සීමු II. මජසං.
3. අකිරියසුද්ධිං - සතා. 4. වුච්චන්ති - සීමු I මජසං.

**න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති** – ‘කප්පා’ යනු තෘෂ්ණාකල්ප යෑ දෘෂ්ටිකල්ප යෑයි කල්පයෝ දෙදෙනෙක් වෙති:...ඔවුන් විසින් තෘෂ්ණා-කල්පය ප්‍රහීණ යෑ, දෘෂ්ටිකල්පය දුරලන ලද්දේයෑ තෘෂ්ණාකල්පය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිකල්පය දුරලන ලද බැවින් තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ කල්පනය නො කෙරෙති, නූපදවති, නො නිපදවත් නුයි – ‘න කප්පයන්ති’ යනු වේ. **න පුරෙක්ඛරොන්ති** – තෘෂ්ණාපුරස්කාරයෑ දෘෂ්ටිපුරස්කාර යයි පුරස්කාරයෝ දෙදෙනෙක් වෙති:...තෘෂ්ණාපුරස්කාරය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිපුරස්කාරය දුර ලන ලද බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙති; තෘෂ්ණාව ධ්වජ කොට ඇත්තාහු තෘෂ්ණාව කෙහෙලි කොට ඇත්තාහු තෘෂ්ණාව අධිපති කොට ඇත්තාහු, දෘෂ්ටිය ධ්වජ කොට ඇත්තාහු දෘෂ්ටිය කෙහෙලි කොට ඇත්තාහු දෘෂ්ටිය අධිපති කොට ඇත්තාහු නො හැසිරෙති; තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ පිරිවරන ලද්දාහු නො හැසිරෙත් නුයි ‘න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති’ යනු වේ.

**අච්චන්තසුද්ධීති න තෙ වදන්ති** – අක්‍රියදෘෂ්ටිය ත් ශාශ්වතවාදයත් අත්‍යන්තශුද්ධි යෑ සංසාරශුද්ධි යෑයි නො කියති නො බෙණෙති නො දක්වති ව්‍යවහාර නො කෙරෙත් නුයි ‘අච්චන්තසුද්ධීති න තෙ වදන්ති’ යනු වේ.

**ආදානගන්ථං ගථිතං විසජ්ජ** – ‘ගන්ථ’ යනු අභිධ්‍යාකායග්‍රන්ථ යෑ ව්‍යාපාදකායග්‍රන්ථ යෑ ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යෑ ඉදංසත්‍යාභිනිවේශකාය-ග්‍රන්ථ යෑයි ග්‍රන්ථයෝ සතර දෙනෙක් වෙති: ස්වකීය දෘෂ්ටිය පිළිබඳ ඡන්දරාගය ‘අභිධ්‍යාකායග්‍රන්ථ’ නම, පරවාදයන්හි කොපය නො සතුට ‘ව්‍යාපාදකායග්‍රන්ථ’ නම, තමාගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ පරාමර්ශ කෙරෙත් නුයි ‘ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ’ නම, තමාගේ දෘෂ්ටිය ‘ඉදංසත්‍යාභිනිවේශකායග්‍රන්ථ’ නම්. කවර කරුණෙකින් ‘ආදානගන්ථ’ යි කියනු ලැබෙයි? යත්: මෙ කියන ලද අභිධ්‍යාදි නාමකායග්‍රන්ථයන් හෙතු කොටගෙන චතුසමුට්ඨානිකරූපාරම්මණය ආදානය කෙරෙති උපාදානය (=දැඩි කොට ගැනීම) කෙරෙති තෘෂ්ණාග්‍රහණයෙන් ගනිති, දෘෂ්ටිග්‍රහණයෙන් පරාමර්ශ කෙරෙති, මානග්‍රහණයෙන් අභිනිවේශය කෙරෙත්. වෙදනාව සංඥාව සංස්කාරයන් විඥානය ගතිය උත්පත්තිය ප්‍රතිසන්ධිය භවය සංසාරවර්තනය ආදානය කෙරෙති උපාදානය කෙරෙති ග්‍රහණය කෙරෙති පරාමර්ශ කෙරෙති අභිනිවේශය කෙරෙත්. එ කරුණෙන් ‘ආදානග්‍රන්ථ’ යි කියනු ලැබේ. **විසජ්ජ** – ග්‍රන්ථ (බන්ධන) යන් මොනොවට විසුරුවා හෝ හැර, නොහොත් බන්ධනයන් ග්‍රන්ථනයන් බන්ධයන් විබන්ධයන් ආබන්ධ-(=අනෙකවිධබන්ධ) යන් ලග්න වූවන් ලග්ගිත වූවන් යාත්පසින් බද්ධ-වූවන් බන්ධනයන් පොළා දුරු කොට; යම් සේ වාහනයක් හෝ රථයක් හෝ ගැලක් හෝ යානයක් හෝ ගලවා අපරිභොග කෙරෙත් ද සුණු කෙරෙත් ද, එසෙයින් ම කායග්‍රන්ථයන් විසුරුවා හෝ දුරු කොට, නොහොත් ග්‍රන්ථ(=බන්ධන)යන්...හාත්පසින් බද්ධ වූවන් බන්ධනයන් පොළා දුරුකොට නුයි ‘ආදානගන්ථං ගථිතං විසජ්ජ’ යනු වේ.

**ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙති** – ආසා වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **ආසං න කුබ්බන්තීති** ආසං න කුබ්බන්ති න ජනෙන්ති න සඤ්ජනෙන්ති න නිබ්බත්තෙන්ති න අභිනිබ්බත්තෙන්ති; **කුහිඤ්චීති** කුහිඤ්චි කිම්හිචි අජ්ඣත්තං වා බහිද්ධා වා; අජ්ඣත්තබහිද්ධා වා; **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති 'ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ.'

තෙනාහ භගවා:

"න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
අච්චන්තසුද්ධීති න තෙ වදන්ති,
ආදානගන්ථං ගථිතං විසජ්ජ
ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ"ති.

**4 – 8**

සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි
ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතං,
න රාගරාගී[1] න විරාගරත්තො
තස්සීධ නත්ථි පරමුග්ගහීතං.

**සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතන්ති** – 'සීමා'ති චතස්සො සීමායො: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං පඨමා සීමා. ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං දුතියා සීමා. අනුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං අනුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං තතියා සීමා. රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං චතුත්ථා සීමා.[2] යතො ච චතූහි අරියමග්ගෙහි ඉමා චතස්සො සීමායො අතික්කන්තො හොති සමතික්කන්තො වීතිවත්තො, සො වුච්චති සීමාතිගො. **බ්‍රාහ්මණොති** – සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො; සක්කායදිට්ඨි බාහිතා හොති, විචිකිච්ඡා බාහිතා හොති, සීලබ්බතපරාමාසො බාහිතො හොති -පෙ- අසිතො[3] තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා. **තස්සාති** – අරහතො ඛීණාසවස්ස; **ඤත්වාති** – පරචිත්තඤාණෙන වා ඤත්වා, පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා ඤත්වා; **දිස්වාති** – මංසචක්ඛුනා වා දිස්වා, දිබ්බචක්ඛුනා වා දිස්වා; 'සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහීත'න්ති – තස්ස ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං[4] පාමොක්ඛං උත්තමං පවරන්ති, ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති 'සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතං.'

---

1. රාගරාජි – සුති අ.
2. චතුත්ථ සීමා PTS.
3. අනිස්සිතො – ස්‍යා, මජ්සං.
4. විසිට්ඨං – මජ්සං.

**ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ** – 'ආසා' යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභඅකුශලමූලයෙක් වේ ද එයයි. **ආසං න කුබ්බන්ති** – ආශා නො කෙරෙති නො දනවති නූපදවති වෙසෙසින් නූපදවත්. **කුහිඤ්චි** – අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කිසි තැනෙක්හි කොහිත්; **ලොකෙ** – අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි 'ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න කප්පයන්ති-පෙ-කුහිඤ්චි ලොකෙ"යි.

4 – 8.

ඒ භූරිප්‍රාඥ වූ ක්ෂීණාස්‍රව තෙමෙ චතුර්විධ කෙලශසීමාව ඉක්මවූයේ යැ, බාහිතපාපී හෙයින් බ්‍රාහ්මණ යැ, ඒ ක්ෂීණාශ්‍රව හට පරසිත් දත්නා නුවණින් පෙර විසූ කඳපිළිවෙළ දත්නා නුවණින් දූත හෝ මසැසින් හා දිවැසින් දූක හෝ මොනොවට බැස ගත්තා ලද්දක් නැත. තවද හෙතෙම කාමරාගයෙන් රාගවත් නො වෙයි. රූපාරූපරාග සඞ්ඛ්‍යාත විරාගයෙන් රත්ත වූයේ නොවේ යි. ඔහුට මෙලොවැ උතුමැයි දූඩිව ගත්තා ලද කිසිවක් නැත්තේ යි.

**සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහිතං** – 'සීමා' යනු: සතර සීමාවෙකි: සත්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීල-ව්‍රතපරාමර්ශ යැ දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ ඔවුන් හා (සහජේකාර්ථ විසින්) එක් වැ සිටි කෙලශයෝ යැ යන මේ ප්‍රථම සීමා යැ; ඖදාරික වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ, ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ, ඔවුන් හා එක් වැ සිටි කෙලශයෝ යැ යන මෝ තොමෝ දෙවැනි සීමා යැ; අනුසහගත වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ, අනුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ, ඔවුන් හා එක් වැ සිටි කෙලශයෝ යැ යන මෝ තොමෝ තෙවැනි සීමා යැ; රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ, මානානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යැ, ඔවුන් හා සහජේකාර්ථ විසින් එක් වැ සිටි කෙලශයෝ යැ යන මෝ තොමෝ සතරවැනි සීමා යි. සතර ආර්‍යමාර්ගයෙන් මේ සතර කෙලෙස් සීමාවන් ඉක්මවූ වෙසෙසින් ඉක්මවූ අත්‍යන්තයෙන් ඉක්මවූ තැන් සිට හෙතෙම 'සීමාතිග' යයි කියනු ලැබේ. **බ්‍රාහ්මණො** – සප්තධර්ම කෙනකුන් බාහිත වන බැවින් 'බ්‍රාහ්මණ' යැ; සත්කායදෘෂ්ටිය බාහිත වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය බාහිත වෙයි...තෘෂ්ණාදෘෂ්ටීන් අනිශ්‍රිත වූ අචලෝදකම්භී තාදී වූ හෙතෙම 'බ්‍රාහ්මණ' යයි කියනු ලැබේ. **තස්ස** – රහත් හට ක්ෂීණාශ්‍රවහට; **ඤත්වා** – පරචිත්තඥාන-යෙන් හෝ දූන පූර්වනිවාසානුස්මෘති ඥානයෙන් හෝ දූන; **දිස්වා** – මසැසින් හෝ දූක, දිවැසින් හෝ දූක; "සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහිතං" – ඔහුට මේ පරම යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ වෙසෙසින් ශ්‍රෙෂ්ඨ යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි ගත්තා ලද පරාමෘෂ්ට වූ අභිනිවේශය කළ අධ්‍යවසිත වූ අධිමුක්ත වූවක් නැත, අවිද්‍යමාන යැ නො ලැබෙයි ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ ව්‍යුපශාන්ත යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධ යැ අභව්‍යෝත්පත්තික යැ ඥානාග්නීන් දග්ධ නුයි 'සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහිතං' යනු වේ.

**න රාගරාගී න විරාගරත්තොති** – රාගරත්තා වුච්චන්ති යෙ පඤ්චසු කාමගුණෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා; විරාගරත්තා වුච්චන්ති යෙ රූපාවචරඅරූපාවචරසමාපත්තීසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා; 'න රාගරාගී න විරාගරත්තො'ති යතො කාමරාගො ච රූපරාගො ච අරූපරාගො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා 'න රාගරාගී න විරාගරත්තො.'

**තස්සීධ නත්ථි පරමුග්ගහීතන්ති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස; තස්ස ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති 'තස්සීධ නත්ථි පරමුග්ගහීතං.'

තෙනාහ භගවා:

"සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි
ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතං,
න රාගරාගී න විරාගරත්තො
තස්සීධ නත්ථි පරමුග්ගහීතං"න්ති.

**සුද්ධට්ඨකසුත්තනිද්දෙසො චතුත්ථො.**

## 5

# පරමට්ඨකසුත්තනිද්දෙසො

අථ පරමට්ඨකසුත්තනිද්දෙසො වුච්චති.[2]

### 5 – 1

පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො
යදුත්තරිං කුරුතෙ[3] ජන්තු ලොකෙ,
හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ
තස්මා විවාදානි අවීතිවත්තො.

**පරමන්ති දිට්ඨීසු පරිබ්බසානොති** – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා, තෙ 'ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා[4] වසන්ති[5] ආවසන්ති පරිවසන්ති, යථා අගාරිකා වා ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තීසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති, එවමෙව සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා, තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා[4] වසන්ති ආවසන්ති පරිවසන්තීති 'පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො.'

---

1. අනභාවං ගතා – සසං. 2. සුත්තං වක්ඛති – සීමු. II.
3. යදුත්තරි කුරුතෙ – මනුප. 4. සකායදිට්ඨියා – සසං.
5. පවසන්ති – මජසං.

**න රාගරාගී න විරාගරත්තො** – පස්කම්ගුණයෙහි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු ඇතුළත් වූවාහු ලැගුණාහු ඇවුරුණාහු 'රාගරත්ත' යයි කියනු ලැබෙති; රුවාරූ සමවත්හි ඇලුණාහු...ඇවුරුණාහු 'විරාගරත්ත' යයි කියනු ලැබෙත්. 'න රාගරාගී න විරාගරත්තො' – යම් තැනෙක සිට කාමරාගය ත් රූපරාගය ත් අරූපරාගය ත් ප්‍රහීණ වූවාහු වෙත් ද, උපුටා හළ මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අභාවය කරන ලද්දාහු නැවත නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද; මෙතෙකින් 'න රාගරාගී න විරාගරත්ත' නම් වේ.

**තස්සීධ නත්‍ථි පරමුග්ගහීතං** – 'තස්ස' – රහත් හට, ක්‍ෂීණාස්‍රව හට; ඔහුට මේ පරම යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි ගෘහීත වූ පරාමෘෂ්ට වූ අභිනිවිෂ්ට වූ අධ්‍යවසිත වූ අධිමුක්ත වූවක් නැත අවිද්‍යමාන යැ, නො ලැබෙයි ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ ව්‍යුපශාන්ත යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධ යැ අභව්‍යොත්පත්තික යැ ඥානාග්නීන් දග්ධ නුයි – 'තස්සීධ නත්‍ථි පරමුග්ගහීතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු: 'සීමාතිගො–පෙ–පරමුග්ගහීතං''යි.

**සතරවැනි සුද්ධට්ඨක සූත්‍රනිද්දේශය යි.**

## 5

## පරමට්ඨකසූත්‍රනිද්දේශය

ඉක්බිති පරමට්ඨකසූත්‍රනිද්දේශය කියනු ලැබේ.

**5 – 1.**

ලොවැ යම් සත්ත්වයෙක් දෙසැට දිටු අතුරෙන් එක්තරා දෘෂ්ටියක් මෙ පරම යැයි ගෙන තමන් තමන් ගේ දෘෂ්ටියෙහි ඇතුළත් වැ වසනුයේ යම් හෙයකින් තමා ගේ ශාස්තෘ ආදිය උතුමැයි කියා ද, එයින් අන්‍ය වූ සියල්ල හීන යැයි කියා ද, එහෙයින් හෙතෙම දෘෂ්ටිවිවාදයන් නො ඉක්මැ වූයේ වේ.

**පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො** – දෘෂ්ටි ගෙන සිටුනා ඇතැම් මහණ බමුණුකෙනෙක් වෙති, ඔවුහු දෙසැට දෘෂ්ටිගතයන් අතුරෙන් එක්තරා– දෘෂ්ටියක් මේ පරම යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ ප්‍රධාන යැ උත්තම යැ ප්‍රවර යැයි ගෙන දැඩි වැ ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවෙශය කොට තමන් තමන් ගේ දෘෂ්ටියෙහි වෙසෙති වෙසෙසින් වෙසෙති හාත්පසින් වෙසෙත්; යම් සේ ගිහියෝ වැසියෝ තමන් ගේ ගෙවල (නිසැකව) වෙසෙත් ද, අපත්ති බහුල වූවෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ කෙලෙස්හි පිවිසැ වෙසෙත් ද, එසෙයින් මැ දෘෂ්ටි ගෙන සිටුනා ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහ; ඔවුහු දෙසැට දෘෂ්ටිගතයන් අතුරෙන් එක්තරා දෘෂ්ටියක් 'මේ පරම යැ අග්‍ර යැ...ප්‍රවර ය'යි ගෙන... අභිනිවෙශය කොට තමන් තමන් ගේ දෘෂ්ටියෙහි වෙසෙති පිවිසැ වෙසෙති සම්‍යාකාරයෙන් වෙසෙත් නුයි 'පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො' යනු වේ.

**යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙති** - 'යදු'ති[1] යං; **උත්තරිං කුරුතෙති** - උත්තරිං කරොති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති - අයං සත්ථා සබ්බඤ්ඤූති උත්තරිං කරොති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති. අයං ධම්මො ස්වාක්ඛාතො, අයං ගණො සුපටිපන්නො, අයං දිට්ඨි භද්දිකා, අයං පටිපදා සුපඤ්ඤත්තා, අයං මග්ගො නිය්‍යානිකොති උත්තරිං කරොති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති නිබ්බත්තෙති; අභිනිබ්බත්තෙති; **ජන්තූති** සත්තො නරො -පෙ- මනුජො; **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති 'යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ.'

**හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහාති** - අත්තනො සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං ඨපෙත්වා සබ්බෙ පරවාදෙ[2] ඛිපති උක්ඛිපති පරික්ඛිපති: සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුපටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, න තත්ථ[3] සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා, මුච්චන්ති වා, විමුච්චන්ති වා පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ඡත්තකා[4] පරිත්තාති එවමාහ එවං කථෙති එවං භණති එවං දීපයති එවං වොහරතීති 'හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ.'

**තස්මා විවාදානි අවීතිවත්තොති** -'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා; **විවාදානීති** දිට්ඨිකලහානි දිට්ඨිභණ්ඩනානි දිට්ඨිවිග්ගහානි දිට්ඨිවිවාදානි දිට්ඨිමෙධගානි; **අවීතිවත්තොති** - අනතික්කන්තො අසමතික්කන්තො අවීතිවත්තොති තස්මා විවාදානි අවීතිවත්තො.

තෙනාහ භගවා:

"පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො
යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ,
හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ
තස්මා විවාදානි අවීතිවත්තො"ති.

**5 - 2**

යදත්තනී පස්සති ආනිසංසං
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා,
තදෙව සො තත්ථ සමුග්ගහාය
නිහීනතො පස්සති සබ්බමඤ්ඤං.

---

1. යදන්ති - සී . II.
2. පරප්පවාදෙ - සීමු. II.
3. නත්ථෙත්ථ - සීමු. II.
4. ඡතුක්කා - I. සීමු. I.

**යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ** – 'යද' යනු යම් හෙයකින්; **උත්තරිං කුරුතෙ** – අතිරේක කෙරෙයි, අග්‍ර – ශ්‍රේෂ්ඨ – විශිෂ්ට - ප්‍රමුඛ – උත්තම–ප්‍රවර කෙරෙයි: 'මේ ශාස්තෘ තෙමේ සර්වඥ ය'යි අතිරේක කෙරෙයි... ප්‍රවර කෙරෙයි 'මේ ධර්මය ස්වාඛ්‍යාත යැ, මේ ගණ තෙමේ සුප්‍රතිපන්න යැ, මේ දෘෂ්ටි තොමෝ භද්‍ර වූ යැ, මේ ප්‍රතිපදා තොමෝ සුප්‍රඥප්ත යැ, මේ මාර්ගය නෛර්‍යාණික යැ'යි අතිරේක කෙරෙයි, අග්‍ර...ප්‍රවර කෙරෙයි, නිපදවයි වෙසෙසින් නිපදවයි; **ජන්තු** – සත්ත්ව නර...මනුජ තෙමේ; **ලොකෙ** – අපායලෝකයෙහි...ආයතනලෝකයෙහි නුයි 'යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ' යනු වේ.

**හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ** – තමා ගේ ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය තබා සියලු පරවාදයන් හැරදමයි බැහැර කෙරෙයි පරාඞ්මුඛ කෙරෙයි: 'ඒ ශාස්තෘ සර්වඥ නො වෙයි, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය භද්‍ර නො වෙයි ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය නෛර්‍යාණික නො වෙයි, මෙහි ශුද්ධියක් විශුද්ධියක් පරිශුද්ධියක් හෝ මුක්තියක් විමුක්තියක් පරිමුක්තියක් හෝ නැත; එහි පැවිද්දෙන් ශුද්ධ – විශුද්ධ – පරිශුද්ධ හෝ නො වෙති, මුක්ත – විමුක්ත පරිමුක්ත හෝ නො වෙත්; හීන – නිහීන – ඔමක – ලාමක වූවාහ, හරන ලද්දාහ, අල්ප වූවාහ'යි මෙසේ කියයි, මෙසේ බෙණෙයි, මෙසේ දක්වයි, මෙසේ ව්‍යවහාර කෙරේ නුයි 'හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ' යනු වේ.

**තස්මා විවාදානි අවීතිවත්තො** – 'තස්මා' යනු: එහෙයින් එ කරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; **විවාදානි** දෘෂ්ටිකලහයන් දෘෂ්ටිභණ්ඩනයන් දෘෂ්ටිවිග්‍රහයන් දෘෂ්ටිවිවාදයන් දෘෂ්ටිමෙධගයන්; **අවීතිවත්තො** – නො ඉක්මැ වූයේ මොනොවට නො ඉක්මැ වූයේ බැහැර නො කෙළේ නුයි 'තස්මා විවාදානි අවීතිවත්තො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පරමන්ති දිට්ඨීසු–පෙ–අවීතිවත්තො"යි.

**5 – 2**

මෙසේ දෘෂ්ටිකලහයන් නො ඉක්මැවූයේ රූපාලම්බනයෙහි ද ශබ්දාලම්බනයෙහි ද ශීලව්‍රත දෙක්හි ද ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ද උපන් දෘෂ්ටිසංඛ්‍යාත වූ ආත්මයෙහි උක්තප්‍රකාර වූ යම් අනුසසක් දකී ද, හෙතෙම ස්වකීය දෘෂ්ටියෙහි ඒ අනුසස ම ශ්‍රෙෂ්ඨ යයි ද්‍රඪව ගෙන පරශාස්තෘ ආදී අන් සියල්ල නිහීන හෙයින් දක්නේ යි.

**යදත්තනි පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වාති** – 'යදත්තනී'ති යං අත්තනි, අත්තා වුච්චති දිට්ඨිගතං, අත්තනො දිට්ඨියා ද්වෙ ආනිසංසෙ පස්සති: දිට්ඨධම්මිකඤ්ච ආනිසංසං සම්පරායිකඤ්ච ආනිසංසං. කතමො දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො? යංදිට්ඨිකො සත්ථා හොති, තංදිට්ඨිකා සාවකා හොන්ති, තංදිට්ඨිකං සත්ථාරං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති. ලභන්ති ච තතොනිදානං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං. අයං දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො. කතමො දිට්ඨියා සම්පරායිකො ආනිසංසො? අයං දිට්ඨි අලං නාගත්තාය වා සුපණ්ණත්තාය වා යක්ඛත්තාය වා අසුරත්තාය වා ගන්ධබ්බත්තාය වා මහාරාජත්තාය වා ඉන්දත්තාය වා බ්‍රහ්මත්තාය වා දෙවත්තාය වා, අයං දිට්ඨි අලං සුද්ධියා විසුද්ධියා පරිසුද්ධියා මුත්තියා විමුත්තියා පරිමුත්තියා, ඉමාය දිට්ඨියා සුජ්ඣන්ති විසුජ්ඣන්ති පරිසුජ්ඣන්ති මුච්චන්ති විමුච්චන්ති පරිමුච්චන්ති, ඉමාය දිට්ඨියා සුජ්ඣිස්සාමි විසුජ්ඣිස්සාමි පරිසුජ්ඣිස්සාමි මුච්චිස්සාමි විමුච්චිස්සාමි පරිමුච්චිස්සාමීති ආයතිං ඵලපාටිකඞ්ඛී හොති. අයං දිට්ඨියා සම්පරායිකො ආනිසංසො. අත්තනො දිට්ඨියා ඉමෙ ද්වෙ ආනිසංසෙ පස්සති. දිට්ඨසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – සුතසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – සීලසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – වතසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – මුතසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති: දිට්ඨධම්මිකඤ්ච ආනිසංසං සම්පරායිකඤ්ච ආනිසංසං. කතමො මුතසුද්ධියා දිට්ඨධම්මිකො ආනිසංසො? යංදිට්ඨිකො සත්ථා හොති, තංදිට්ඨිකා සාවකා හොන්ති -පෙ- අයං මුතසුද්ධියා දිට්ඨධම්මිකො ආනිසංසො. කතමො මුතසුද්ධියා සම්පරායිකො ආනිසංසො? අයං දිට්ඨි අලං නාගත්තාය වා -පෙ- අයං මුතසුද්ධියා සම්පරායිකො ආනිසංසො. මුතසුද්ධියාපි ඉමෙ ද්වෙ ආනිසංසෙ පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති 'යදත්තනී පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා.'

**තදෙව සො තත්ථ සමුග්ගහායාති** – 'තදෙවා'ති තං දිට්ඨිගතං; **තත්ථා**ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සමුග්ගහායා**ති – ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති තදෙව සො තත්ථ සමුග්ගහාය. **නිහීනතො පස්සති සබ්බමඤ්ඤන්ති** – අඤ්ඤා සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ජත්තකතො[1] පරිත්තතො දිස්සති පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති 'නිහීනතො පස්සති සබ්බමඤ්ඤං.'

තෙනාහ භගවා:

"යදත්තනී පස්සති ආනිසංසං
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා,
තදෙව සො තත්ථ සමුග්ගහාය
නිහීනතො පස්සති සබ්බමඤ්ඤ"න්ති.

1. ජතුක්කතො - සීමු. II ජතුක්කතො - මජුප.

**යදත්තනි පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** – 'යදත්තනි – යං අත්තනි'. 'ආත්ම' යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි. ස්වකීය දෘෂ්ටියෙහි දෙ අනුසසක් දකී: දෘෂ්ටධාර්මික ආනෘශංසය ද සාම්පරායික ආනෘශංසය ද කියායි. දෘෂ්ටියෙහි දෘෂ්ටධාර්මික ආනෘශංසය කවරැ යත් ? ශාස්තෘ තෙමේ යම් දෘෂ්ටියක් ඇත්තේ වේ නම්, ශ්‍රාවකයෝ එබඳු දෘෂ්ටි ඇත්තාහු වෙති, ශ්‍රාවකයෝ ඒ දෘෂ්ටිය ඇති ශාස්තෘ හට සත්කාර කෙරෙති ගරු කෙරෙති බුහුමන් කෙරෙති පුදත්. එහෙයින් සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පසඛෙහෙත්පිරිකර ද ලබයි, මේ (දෘෂ්ටි පිළිබඳ) ඉහාත්මයෙහි විපාක දෙන අනුසසි. දෘෂ්ටියෙහි සාම්පරායික ආනෘශංසය කවරැ යත් ? මේ දෘෂ්ටිය (පරලොවෙහි විපාක දෙන) නාගබවට හෝ ගුරුළුබවට හෝ යක්ඛබවට හෝ අසුරබවට හෝ ගඳෙව්බවට හෝ වරමරජබවට හෝ ශක්‍රබවට හෝ බ්‍රහ්මබවට හෝ දෙව්බවට හෝ පමණ වෙයි, මේ දෘෂ්ටිය ශුද්ධියට විශුද්ධියට පරිශුද්ධියට මුක්තියට විමුක්තියට පරිමුක්තියට ප්‍රමාණ වෙයි, මේ දෘෂ්ටියෙන් සත්ත්වයෝ ශුද්ධ – විශුද්ධ – පරිශුද්ධ වෙති, මුක්ත – විමුක්ත – පරිමුක්ත වෙත්. මේ දෘෂ්ටියෙන් ශුද්ධ – විශුද්ධ – පරිශුද්ධ වෙමි, මුක්ත – විමුක්ත – පරිමුක්ත වෙමි අනාගතයෙහි විපාකඵලය පතන්නේ වෙයි, මේ දෘෂ්ටිය පිළිබඳ පරලොව දී ලැබියයුතු අනුසසි. තමා ගේ දෘෂ්ටියෙහි මේ දෙ අනුසස් දකී. චක්ෂුර්විඥානයෙන් දුටු රූපායතනවශයෙන් ශුද්ධිය හෙතු කොටගෙන ද අනුසස් දෙකක් දකී, ශබ්දායතනශුද්ධියෙන් ද...ශීලශුද්ධියෙන් ද...ව්‍රතශුද්ධියෙන් ද ...ගන්ධරසස්පෘෂ්ටව්‍යායතනශුද්ධියෙන් ද අනුසස් දෙකක් දකී: දෘෂ්ටධාර්මික ආනෘශංසය ද සාම්පරායික ආනෘශංසය ද කියායි. මුතශුද්ධියෙහි දිට්ඨධම්මික (=ඉහාත්මයෙහි) ආනිසංසය කවරැ යත් ? ශාස්තෘ තෙමේ යම් දෘෂ්ටියක් ඇත්තේ නම් ශ්‍රාවකයෝ ඒ දෘෂ්ටිය ඇත්තාහු වෙති...මේ යැ මුතශුද්ධියෙහි ඉහාත්ම ආනෘශංසය. මුතශුද්ධියෙහි සාම්පරායික ආනෘශංසය කවරැ යත් ? මේ දෘෂ්ටි තොමෝ පරලොවැ නාගභාවයට පමණ යැ...මේ මුතශුද්ධියෙහි සාම්පරායික ආනෘශංසය යි. මුතශුද්ධියෙහි මේ අනුසස් දෙක බලයි දකියි අවලොකනය කෙරෙයි සිතයි විමසා නුයි 'යදත්තනි පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා' යනු වේ.

**තදෙව සො තත්ථ සමුග්ගහාය** – 'තදෙව' යනු: ඒ දෘෂ්ටිගතය; **තත්ථ** – ස්වකීය දෘෂ්ටියෙහි – කැමැත්තෙහි – රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි; **සමුග්ගහාය** – මෙය පරම ය අග්‍ර ය ශ්‍රෙෂ්ඨ ය විශිෂ්ට ය ප්‍රධාන ය උත්තම ය ප්‍රවර යයි ගෙන දැඩි වැ ගෙන ග්‍රහණය කොට පරාමර්ශනය කොට අභිනිවෙශ කොට නුයි 'තදෙව සො තත්ථ සමුග්ගහාය' යනු වේ.

**නිහීනතො පස්සති සබ්බමඤ්ඤං** – අන්‍ය ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා ලබ්ධිය ප්‍රතිපදාව මාර්ගය හීනහෙයින් නිහීනහෙයින් පහත් හෙයින් ලාමකහෙයින් ප්‍රත්‍යයහීන හෙයින් අල්ප හෙයින් බලයි දකී අවලොකනය කෙරෙයි සිතයි විමසා නුයි 'නිහීනතො පස්සති සබ්බමඤ්ඤං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යදත්තනි පස්සති-පෙ-නිහීනතො පස්සති සබ්බමඤ්ඤං" යි.

5 - 3

තං[1] වාපි ගන්ථං[2] කුසලා වදන්ති
යන්නිස්සිතො පස්සති හීනමඤ්ඤං,
තස්මා හි දිට්ඨං ච සුතං මුතං වා
සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය.

**තං වාපි ගන්ථං කුසලා වදන්තීති** – 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා. තෙ කුසලා එවං වදන්ති: ගන්ථො[3] එසො, ලග්ගනං[4] එතං, බන්ධනං එතං, පලිබොධො එසොති එවං වදන්ති එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති – 'තං වාපි ගන්ථං කුසලා වදන්ති.'

**යං නිස්සිතො පස්සති හීනමඤ්ඤන්ති** – 'යං නිස්සිතො'ති යං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතො සන්නිස්සිතො[5] අල්ලීනො උපගතො අජ්ඣොසිතො අධිමුත්තො; **පස්සති හීනමඤ්ඤන්ති** අඤ්ඤං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො[6] පරිත්තතො දිස්සති පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපනිජ්ඣායති උපපරික්ඛතීති – 'යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං.'

**තස්මා හි දිට්ඨං ච සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍යාති** – 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා – දිට්ඨං වා දිට්ඨසුද්ධිං වා සුතං වා සුතසුද්ධිං වා මුතං වා මුතසුද්ධිං වා සීලං වා සීලසුද්ධිං වා වතං වා වතසුද්ධිං වා න නිස්සයෙය්‍ය න ගණ්හෙය්‍ය න පරාමසෙය්‍ය න අභිනිවිසෙය්‍යාති – 'තස්මා හි දිට්ඨං ච සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය.'

තෙනාහ භගවා:

"තංවාපි ගන්ථං[7] කුසලා වදන්ති
යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං,
තස්මා හි දිට්ඨං ච සුතං මුතං වා
සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍යා"ති.

5 - 4

දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය
ඤාණෙන වා සීලවතෙන වාපි,
සමොති අත්තානමනූපනෙය්‍ය
හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි.

1. තං වාපි - සයා, මජසං. 2. ගන්ධං - මනුප. 3. ගන්ධො - මනුප.
4. ලම්බනං - සයා. 5. අතිනිස්සිතො - මජසං.
6. ජතුක්කතො - සීමු. II. ජතුක්කන්තො - මනුප. 7. ගන්ධං - මනුප.

5 – 3

මෙසේ දක්නේ තමාගේ යම් ශාස්තෘ ආදියක් ඇසිරු කරන ලදුයේ නම්, එයින් අන්‍ය වූ පරශාස්තෘ ආදිය ලාමක කොට දක්නේය. ඒ දර්ශනය ද ස්කන්ධාදිය දැනීමෙහි නිපුණ වූවාහු බන්ධනයෙකැයි කියති. එහෙයින් ම මහණ තෙමේ රූපාලම්බනය හෝ ශබ්දාලම්බනය හෝ ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය හෝ ශීලව්‍රතසඞ්ඛ්‍යාත ධර්මාලම්බන හෝ ඇසුරු නො කරන්නේ යි.

**තං වාපි ගන්ථං කුසලා වදන්ති** – ‘කුසලා’ යනු: යම් කෙනෙක් රූපාදි පඤ්චස්කන්ධයෙහි නිපුණ වූවාහු ද, ධාතු – ආයතන – ප්‍රතීත්‍යසමුත්පාද – සතිපට්ඨාන – සම්‍යක්ප්‍රධාන – ඍද්ධිපාද – ඉන්ද්‍රිය – බල – බොධ්‍යඞ්ග – මාර්ග – ඵල – නිර්වාණයෙහි නිපුණ වූවාහු ද, ඒ නිපුණයෝ මෙසේ කියති: (එසේ දක්නාවුන්ට) තෙල ග්‍රන්ථයෙක, තෙල (නාගදන්තයක මෙන්) යටට එල්බීමෙක, තෙල බන්ධයෙක, තෙල (සසරින් නික්මැ යා නො දෙන–හෙයින්) පලිබොධයෙකැයි මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි ‘තං වාපි ගන්ථං කුසලා වදන්ති’ යනු වේ.

**යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං** – ‘යං නිස්සිතො’ – යම් ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇසුරු කෙළේ මොනොවට ඇසුරු කෙළේ ඇලුණේ එලැඹියේ ඇතුළත් වූයේ බැසගත්තේ වේ ද; **පස්සති හීනමඤ්ඤං** – අන්‍ය ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය හීනහෙයින් පහත්හෙයින් ලාමකහෙයින් ප්‍රත්‍යන්තහෙයින් අල්පහෙයින් බලයි දකී අවලොකනය කෙරෙයි සිතයි පුනපුනා සිතයි පිරික්සා නුයි ‘යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං’ යනු වේ.

**තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය** – ‘තස්මා’ – එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් රූපායතනය හෝ දෘෂ්ටශුද්ධිය හෝ ශබ්දායතනය හෝ ශ්‍රැතශුද්ධිය හෝ ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යායතනය හෝ මුතශුද්ධිය හෝ ශීලය හෝ ශීලශුද්ධිය හෝ ව්‍රතය හෝ ව්‍රතශුද්ධිය හෝ නො ඇසිරු කරන්නේ ය නො ගන්නේ ය පරාමර්ශනය නො කරන්නේ ය අභිනිවෙශය නො කරන්නේ නුයි ‘තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය’ යනු වේ.
එයින් වදාළහ බුදුහු:

“තං වාපි ගන්ථං කුසලං වදන්ති–පෙ–භික්ඛු න නිස්සයෙය්‍ය”යි.

5 – 4

හුදෙක් ඒ මහණ දෘෂ්ටි-ශ්‍රැතාදිය මතු නො ගන්නේ වෙයි. යළි ලොවැ නුපන් දෘෂ්ටිය ද සමාපත්ත්‍යාදිඥානයෙන් හෝ ශීලව්‍රතයෙන් හෝ නුපන්නේ ය. තවද ජාත්‍යාදිවස්තුයෙන් ‘මම සදෘශයෙමි’ තමා (මානවශයෙන්) නො සිතන්නේ ය, – හීනයෙමි’ ද නො සිතන්නේ යි.

**දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය ඤාණෙන වා සීලවතෙන වාපීති** අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා මිච්ඡාඤාණෙන වා සීලෙන වා වතෙන වා සීලබ්බතෙන වා දිට්ඨිං න කප්පයෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය; **ලොකස්මින්ති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය.

**ඤාණෙන වා සීලවතෙන වාපි සමොති අත්තානමනූපනෙය්‍යාති** සදිසොහමස්මීති අත්තානං න උපනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති 'සමොති අත්තානමනූපනෙය්‍ය.'

**හීනො න මඤ්ඤෙථ විසෙසි වාපීති** – 'හීනොහමස්මී'ති අත්තානං න උපනෙය්‍ය[1] ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, 'සෙය්‍යොහමස්මී'ති අත්තානං න උපනෙය්‍ය[1] ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති 'හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි.'

තෙනාහ භගවා:

"දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය
ඤාණෙන වා සීලවතෙන වාපි,
සමොති අත්තානමනූපනෙය්‍ය
හීනො න මඤ්ඤෙථ විසෙසි වාපී"ති.

**5 – 5**

අත්තං පහාය අනුපාදියානො
ඤාණෙපි[2] සො නිස්සයං නො කරොති,
ස වෙ වියත්තෙසු න වග්ගසාරී
දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි.

**අත්තං පහාය අනුපාදියානොති** – 'අත්තං පහායා'ති අත්තදිට්ඨිං පහාය; 'අත්තං පහායා'ති අත්තගාහං පහාය; 'අත්තං පහායා'ති තණ්හාවසෙන දිට්ඨිවසෙන ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං පහාය පජහිත්වා විනොදයිත්වා[3] ව්‍යන්තිං කරිත්වා අනභාවං ගමෙත්වාති – අත්තං පහාය; **අනුපාදියානොති** චතූහි උපාදානෙහි අනුපාදියමානො අගණ්හමානො අපරාමසමානො අනභිනිවිසමානොති 'අත්තං පහාය අනුපාදියානො.

1. උපවදෙය්‍ය - සීමු II
2. මු: ඤාණෙනාපි - සීමු II.
3. විනොදෙත්වා - ස්‍යා.

**දිට්ඨිම්පි ලෝකස්මිං න කප්පයෙය්‍ය ඤාණෙන වා සීලවතෙන වාපි** – අෂ්ටසමාපත්තිඥානයෙන් හෝ පඤ්චාභිඥාඥානයෙන් හෝ විපරීතඥානයෙන් හෝ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශීලව්‍රතයෙන් හෝ දෘෂ්ටිය නූපදවන්නේ ය මොනොවට නූපදවන්නේ ය මැනවින් නූපදවන්නේ ය. **ලෝකස්මිං** – අපායලෝකයෙහි...ආයතනලෝකයෙහි නුයි 'දිට්ඨිම්පි ලෝකස්මිං න කප්පයෙය්‍ය' යනු වේ.

**ඤාණෙන වා සීලවතෙන වාපි සමොති අත්තානං නූපනෙය්‍ය** – 'මම සදෘශයෙමි', තමා ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයකින් හෝ ශිල්පායතනයකින් හෝ විද්‍යාවකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතර අන්‍යතරවස්තුවෙකින් හෝ නො සිතන්නේ නුයි – 'සමොති අත්තානමනූපනෙය්‍ය' යනු වේ.

**හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි** – 'මම හීනයෙමි' තමා ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ...අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ නො සිතන්නේ ය, 'මම ශ්‍රේෂ්ඨ වෙමි' තමා ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ...අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ නො සිතන්නේ නුයි – 'හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"දිට්ඨිම්පි ලෝකස්මිං-පෙ-හීනො න මඤ්ඤෙථ විසෙසි වාපී"යි.

5 – 5

හෙතෙම (පෙර ගන්නා ලද) ආත්මලබ්ධිය ප්‍රහාණය කොට (අනෙකක් චතුරුපාදානයෙන්) නො ගන්නේ (උක්තප්‍රකාර) ඥානයෙහි පවා තෘෂ්ණා-දෘෂ්ටිනිඃශ්‍රය නො කෙරෙයි. (තවද) හෙතෙම එකාන්තයෙන් දෘෂ්ටිවශයෙන් වෙන් වැ ගිය සත්ත්වයන් කෙරෙහි (ඡන්දාදිවශයෙන්) නො යන ස්වභාව-ඇත්තේ වෙයි. හෙතෙම (දෙසැට දිටු අතුරෙන්) කිසි දෘෂ්ටියකට ද නො පැමිණෙන්නේ වේ.

**අත්තං පහාය අනුපාදියානො** – 'අත්තං පහාය' – ආත්මදෘෂ්ටිය ප්‍රහාණය කොට; **අත්තං පහාය** – ආත්මග්‍රාහය ප්‍රහාණය කොට; **අත්තං පහාය** – තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගන්නා ලද හාත්පසින් ආමර්ශනය කරන ලද අභිනිවේශය කරන ලද ඇතුළු වැ සිටි බැසගන්නා ලද (ආත්මලබ්ධිය) ප්‍රහාණය කොට දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අභාවයට පමුණුවා නුයි – 'අත්තං පහාය' යනු වේ. **අනුපාදියානො** – සතර උපාදානයන්ගෙන් උපාදානය නො කරනුයේ නො ගන්නේ පරාමර්ශනය නො කරනුයේ අභිනිවේශය නො කරනුයේ නුයි – 'අත්තං පහාය අනුපාදියානො' යනු වේ.

**ඤාණෙපි[1] සො නිස්සයං නො කරොතීති** අට්ඨසමාපත්තිඤාණෙ වා පඤ්චාභිඤ්ඤාඤාණෙ වා මිච්ඡාඤාණෙ[1] වා තණ්හානිස්සයං වා දිට්ඨිනිස්සයං වා න කරොති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති – 'ඤාණෙපි[1] සො නිස්සයං නො කරොති.'

**ස වෙ වියත්තෙසු න වග්ගසාරීති** ස වෙ වියත්තෙසු භින්නෙසු ද්වෙජ්ඣාපන්නෙසු ද්වෙළ්හකජාතෙසු නානාදිට්ඨිකෙසු නානාඛන්තිකෙසු නානාරුචිකෙසු නානාලද්ධිකෙසු නානාදිට්ඨිනිස්සයං නිස්සිතෙසු ඡන්දාගතිං ගච්ඡන්තෙසු දොසාගතිං ගච්ඡන්තෙසු මොහාගතිං ගච්ඡන්තෙසු භයාගතිං ගච්ඡන්තෙසු න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති; න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයතීති – 'ස වෙ වියත්තෙසු න වග්ගසාරී.'

**දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චීති** තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; සො කිඤ්චි දිට්ඨිගතං න පච්චෙති න පච්චාගච්ඡතීති – 'දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි.'

තෙනාහ භගවා:

“අත්තං පහාය අනුපාදියානො
ඤාණෙපි[1] සො නිස්සයං නො කරොති,
ස වෙ වියත්තෙසු න වග්ගසාරී
දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චී”ති.

**5 - 6**

යස්සූභයන්තෙ පණිධීධ නත්ථි
භවාභවාය ඉධ වා හුරං වා,
නිවෙසනා තස්ස න සන්ති කෙචි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

1 ඤාණෙන වා – සීමු. II, මනුප.

**ඤාණෙනපි සො නිස්සයං නො කරොති** – අෂ්ටසමාපත්තිඥානයෙහි හෝ පඤ්චාභිඥාඥානයෙහි හෝ මිථ්‍යාඥානයෙහි හෝ තෘෂ්ණානිඃශ්‍රය හෝ දෘෂ්ටිනිඃශ්‍රය හෝ නො කෙරෙයි නො දනවයි සඤ්ජනනය නො කෙරෙයි නූපදවයි වෙසෙසින් නූපදවා නුයි – 'ඤාණෙනපි සො නිස්සයං නො කරොති' යනු වේ.

**ස වෙ වියත්තෙසු න වග්ගසාරී** – හෙතෙම එකාන්තයෙන් ව්‍යක්ත වූ භින්න වූ දෙකට බෙදුණු හටගත් සැක ඇති නානාදෘෂ්ටිකයන් කෙරෙහි නානාඛන්තිකයන් – නානාරුචිකයන් – නානාලබ්ධිකයන් කෙරෙහි නානාදෘෂ්ටිනිඃශ්‍රය ඇසුරු කළවුන් කෙරෙහි ඡන්දයෙන් අගතියට යනුවත්, ද්වේෂයෙන් – මෝහයෙන් – භයින් අගතියට යනුවත් කෙරෙහි ඡන්දාගතියට – ද්වේෂාගතියට – මෝහාගතියට – භයාගතියට නො යෙයි, රාගවශයෙන් නො පැමිණෙයි, ද්වේෂවශයෙන් – මෝහවශයෙන් – මානවශයෙන් – දෘෂ්ටිවශයෙන් – ඖද්ධත්‍යවශයෙන් – විචිකිත්සාවශයෙන් – අනුශයවශයෙන් නො පැමිණෙයි, (ඡන්දාදිවශයෙන්) පැමිණෙන ධර්මයන් ගෙන් නො යැවෙයි නො පමුණුවනු ලැබෙයි වහනය සංහරණය නො කරනු ලැබේ නුයි – 'ස වෙ වියත්තෙසු න වග්ගසාරී' යනු වේ.

**දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි** – ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහුය, මොනොවට සිඳින ලද්දාහුය, සන්සිඳුවන ලද්දාහුය, දුරලන ලද්දාහුය, උපතට නුසුදුසු කරන ලද්දාහුය, නුවණ-ගින්නෙන් දවන ලද්දාහුය; හෙතෙම කිසි දෘෂ්ටිගතයකට නො පැමිණෙයි, පෙරළා නො පැමිණේ නුයි – 'දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අත්තං පහාය–පෙ–සො න පච්චෙති කිඤ්චි" යි.

5 – 6

යම් ක්ෂීණාස්‍රවයක් හට (පෙර කියන ලද) ඵස්ස–ඵස්සසමුදයාදී භෙද වූ උභයාන්තයෙහි ද පුනපුනා භවය පිණිස ද ස්වාත්මභාවයෙහි හෝ පරාත්මභාවයෙහි ද තෘෂ්ණා නැත්තේ ද, ඒ ක්ෂීණාශ්‍රවහට කිසි තෘෂ්ණාදෘෂ්ටිනිවෙසන කෙනෙක් නො වෙති; දෙසැවදිටුදහම්හි නිශ්චය කොට දැඩි ම ගන්නා ලද්දෙක් නැත්තේ යි.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වාති** – **'යස්සා'ති** අරහතො ඛීණාසවස්ස, **අන්තාති** ඵස්සො එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො; අතීතො එකො අන්තො, අනාගතො දුතියො අන්තො; සුඛා වෙදනා එකො අන්තො, දුක්ඛා වෙදනා දුතියො අන්තො; නාමං එකො අන්තො, රූපං දුතියො අන්තො; ඡ අජ්ඣත්තිකානි ආයතනානි එකො අන්තො, ඡ බාහිරානි ආයතනානි දුතියො අන්තො; සක්කායො එකො අන්තො, සක්කායසමුදයො දුතියො අන්තො; **පණිධි** වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **භවාභවායාති** භවාභවාය කම්මභවාය පුනබ්භවාය, කාමභවාය කම්මභවාය, කාමභවාය පුනබ්භවාය, රූපභවාය කම්මභවාය, රූපභවාය පුනබ්භවාය, අරූපභවාය කම්මභවාය, අරූපභවාය පුනබ්භවාය පුනප්පුනභවාය පුනප්පුන ගතියා පුනප්පුන උපපත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා; **ඉධාති** සකත්තභාවො; **හුරංති**[1] පරත්තභාවො; **ඉධාති** සකරූපවෙදනාසඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණං; **හුරංති** පරරූපවෙදනා-සඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණං; **ඉධාති** ඡ අජ්ඣත්තිකානි ආයතනානි; **හුරංති** ඡ බාහිරානි ආයතනානි; **ඉධාති** මනුස්සලොකො; **හුරංති** දෙවලොකො; **ඉධාති** කාමධාතු; **හුරංති** රූපධාතු අරූපධාතු; **ඉධාති** කාමධාතු රූපධාතු; **හුරංති** අරූපධාතු.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වාති** 'යස්ස' උභො අන්තෙ ච භවාභවාය ච ඉධ හුරං ච පණිධි තණ්හා නත්ථි න සන්ති, න සංවිජ්ජති[2], නුපලබ්භති[3], පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා.

**නිවෙසනා තස්ස න සන්ති කෙචීති** – **'නිවෙසනා'**ති ද්වෙ නිවෙසනා තණ්හානිවෙසනා ච දිට්ඨිනිවෙසනා ච -පෙ- අයං තණ්හානිවෙසනා -පෙ- අයං දිට්ඨිනිවෙසනා; **තස්සාති** අරහතො ඛීණාසවස්ස; 'නිවෙසනා තස්ස න සන්ති කෙචී'ති නිවෙසනා තස්ස කෙචි නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – නිවෙසනා තස්ස න සන්ති කෙචි.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** – **'ධම්මෙසූ'**ති ද්වාසට්ඨියා[4] දිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **සමුග්ගහීතන්ති** ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො ඉදං සච්චං තච්ඡං තථං භූතං යාථාවං අවිපරීතන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪන්ති – ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

තෙනාහ භගවා:

> "යස්සූභයන්තෙ පණිධීධ නත්ථි
> භවාභවාය ඉධ වා හුරං වා,
> නිවෙසනා තස්ස න සන්ති කෙචි
> ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං"න්ති.

1. හුරන්ති - සිමු II. සයා.
2. නසංවිජ්ජන්ති - සිමු. II. මජසං.
3. නුපලබ්භන්ති - සිමු. II මජසං.
4. ද්වාසට්ඨි - සිමු I.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා** - **'යස්ස'** යනු: අර්හත් වූ ක්ෂීණාශ්‍රවහට; **'අන්ත'** නම්: ස්පර්ශය එක් අන්තයෙක ස්පර්ශසමුදය දෙවැනි අන්ත යයි, අතීතය එක් අන්තයෙක අනාගතය දෙවැනි අන්තය යි, සුඛවෙදනාව එක් අන්තයෙක දුඃඛවෙදනාව දෙවැනි අන්තය යි, නාමය එක් අන්තයෙක රූපය දෙවැනි අන්තය යි, ෂඩ්ආධ්‍යාත්මිකායතනයෝ එක් අන්තයෙක ෂඩ්බාහ්‍යායතනයෝ දෙවැනි අන්තය යි, සත්කාය එක් අන්තයෙක සත්කායසමුදය දෙවැනි අන්තය යි; **'පණිධි'** යි රාග සංරාග...අභිධ්‍යා, ලොභඅකුශලමූල නම් වූ තෘෂ්ණා කියනු ලබයි; **භවාභවාය** කාමභව - රූපභව - අරූපභවයන් සඳහා, කර්මවෘත්ත -විපාකවෘත්තයන් සඳහා මතුමත්තෙහි භවය සඳහා පඤ්චගතිය - පුනපුන උත්පත්තිය ප්‍රතිසන්ධිය සඳහා නැවත නැවත ආත්මභාවය පහළවීම සඳහා; **ඉධ** යනු: සිය අත්බැව, **හුරං** යනු: පරඅත්බැව; **ඉධ** යනු: ස්වකීය රූපවෙදනාසංඥාසංස්කාරවිඥානය යැ, **හුරං** යනු: පරකීය රූප-වෙදනාසංඥාසංස්කාරවිඥානය යැ; **ඉධ** යනු: සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ යැ, **හුරං** යනු: සවැදෑරුම් බාහ්‍යායතනයෝ යැ; **ඉධ** යනු මිනිස්ලොව යැ, **හුරං** යනු: දෙව්ලොව යැ, **ඉධ** යනු: කාමධාතුව යැ, **හුරං** යනු: රූප-අරූපධාතු යැ; **ඉධ** යනු: කාම-රූපධාතු යැ, **හුරං** යනු: අරූපධාතුව යි.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා** - යම් රහත් මහණක් හට ස්පර්ශාදි උභයාන්තයෙහි ද, කාමාදි භවය සඳහා ද, ස්ව-පරආත්මභාවාදියෙහි ද, ප්‍රාර්ථනා තෘෂ්ණා නැද්ද නො වේ ද, අවිද්‍යමාන වේ ද, නො ලැබේ ද, ප්‍රහීණ වූවා සත්හිඳුණී දුරලන ලද්දී උපතට නුසුදුසු වූවා නුවණ ගින්නෙන් නසන ලද්දී නුයි 'යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා' යනු වේ.

**නිවෙසනා තස්ස න සන්ති කෙචි** - **'නිවෙසනා'** යනු: නිවෙසන දෙකෙකි: තෘෂ්ණානිවෙසන ද දෘෂ්ටිනිවෙසන දැයි කියායි. ...**තස්ස** - රහත් ක්ෂීණාශ්‍රවහට; නිවෙසනා තස්ස න සන්ති කෙචි' යනු. ඔහුට කිසි නිවෙසන කෙනෙක් නැත, නො වෙති, නො ලැබෙත්; ප්‍රහීණ වූවාහු සිඳුනා ලද්දාහු සත්හිඳුණාහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි "නිවෙසනා තස්ස න සන්ති කෙචි" යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං** - **'ධම්මෙසු'** යනු: දෙසැට දෘෂ්ටිගතයන් අතුරෙහි; **නිච්ඡෙය්‍ය** නිශ්චය කොට විනිශ්චය කොට විමසා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට; **සමුග්ගහීතං** - අවධිවශයෙන් කොටස් වශයෙන් - උත්තමවශයෙන් - කොට්ඨාසවශයෙන් රාශිවශයෙන් - විශෙෂරාශිවශයෙන් ගැනීම, මෙ සැබැව් තත්ත්‍ව ය අවිපරිණාම ය විද්‍යමාන ය යථාස්වභාව ය අවිපරීත යයි ගන්නා ලද පරාමර්ශ කළ අභිනිවෙස කළ ඇතුළත් වූ බැසගන්නා ලද්දක් නැත, නො වෙයි අවිද්‍යමාන වෙයි, නො ලැබෙත්, ප්‍රහීණ ය මුලුසුන් කරන ලද සත්හිඳුවන ලද දුරලන ලද උපතට නුසුදුසු කරන ලද නුවණගින්නෙන් නසන ලද නුයි - 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං' යනු වේ.

එසින් වදාළහ, බුදුහු:

"යස්සූභයන්තෙ-පෙ-ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං" යි.

5 - 7

තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා
පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා,
තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

**තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤාති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස, තස්ස දිට්ඨෙ වා දිට්ඨසුද්ධියා වා සුතෙ වා සුතසුද්ධියා වා මුතෙ වා මුතසුද්ධියා වා, සඤ්ඤාපුබ්බඞ්ගමතා සඤ්ඤාවිකප්පයතා, සඤ්ඤාවිග්ගහෙන සඤ්ඤාය උට්ඨපිතා සමුට්ඨපිතා කප්පිතා පකප්පිතා සඞ්ඛතා අභිසඞ්ඛතා සණ්ඨපිතා දිට්ඨි නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – තස්සීධ දිට්ඨෙව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපිසඤ්ඤා.

**තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානන්ති** – බ්‍රාහ්මණොති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො, සක්කායදිට්ඨි බාහිතා හොති, -පෙ- අනිස්සිතො[1] තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා; **තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානන්ති** – තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියන්තං අගණ්හන්තං අපරාමසන්තං අනභිනිවිසන්තන්ති 'තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං.'

**කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යාති** – 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා. කෙන රාගෙන කප්පෙය්‍ය? කෙන දොසෙන කප්පෙය්‍ය? කෙන මොහෙන කප්පෙය්‍ය? කෙන මානෙන කප්පෙය්‍ය? කාය දිට්ඨියා කප්පෙය්‍ය? කෙන උද්ධච්චෙන කප්පෙය්‍ය? කාය විචිකිච්ඡාය කප්පෙය්‍ය? කෙහි අනුසයෙහි කප්පෙය්‍ය රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති වා ථාමගතොති වා? තෙ අභිසඞ්ඛාරා පහීනා, අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන කප්පෙය්‍ය නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා? සො හෙතු නත්ථි පච්චයො නත්ථි කාරණං නත්ථි යෙන කප්පෙය්‍ය විකප්පෙය්‍ය විකප්පං ආපජ්ජෙය්‍ය. **කෙනීධ ලොකස්මින්ති** – අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

තෙනාහ භගවා:

"තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා
පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා,
තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යා"ති.

1. අනිස්සිතො - සයා.
2. ගතියො - සයා.

## 5 - 7

ඒ රහත් මහණ හට රූපායතන සඞ්ඛ්‍යාත දෘෂ්ටශුද්ධියෙහි හෝ ශ්‍රැතශුද්ධියෙහි හෝ මුතශුද්ධියෙහි හෝ තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රකල්පිත වූ අණුමාත්‍ර වූ ද සංඥාවෙන් උපදවන ලද දෘෂ්ටියෙක් නැත, මේ සත්ත්ව-ලොකයෙහි (තෘෂ්ණාමානදෘෂ්ටි විසින්) දෙසැටදිටු නො ගත්තාවූ ඒ බාහිතපාපී බ්‍රාහ්මණයා රාගාදි කවර ධර්මයෙකින් විකල්පනය කරන්නේ ද.

**තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා**- 'තස්ස' යනු: අර්හත් ක්ෂීණාස්‍රව හට; රූපාලම්බනයෙහි හෝ, දෘෂ්ටශුද්ධියෙහි හෝ ශබ්දාලම්බනයෙහි හෝ ශ්‍රැතශුද්ධියෙහි හෝ, ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බන-යෙහි හෝ මුතශුද්ධියෙහි හෝ, සංඥා පූර්වඞ්ගම කොට ඇති සංඥාවිකල්පන ඇති සංඥාවිග්‍රහයෙන් සංඥාවෙන් ඔසවන ලද මොනොවට ඔසවන ලද කල්පිත වූ ප්‍රකල්පිත වූ සකස් කරන ලද මොනොවට සකස් කරන ලද පිහිටුවන ලද දෘෂ්ටියෙක් නැත, නො වෙයි, විද්‍යමාන නො වෙයි, නො ලැබෙයි, ප්‍රහීණ වූවා සමුච්ඡින්න වූවා සන්හිඳුණා දුරලන ලද්දී අභව්‍යොත්පත්තික වූවා ඥානාග්නීන් දවන ලද්දී නුයි - 'තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා' යනු වේ.

**තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං** - 'බ්‍රාහ්මණො' යනු: සප්තධර්ම කෙනකුන් බාහිත හෙයින් බ්‍රාහ්මණ යැ...(4-3.සුත්‍රනිද්දේශය.) **තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං** - ඒ බාහිතපාපී බ්‍රාහ්මණයා දෘෂ්ටිය ආදානය නො කරනුවනු නො ගන්නහු පරාමර්ශනය නො කරනුවහු අභිනිවේශය නො කරනුවහු නුයි 'තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං'යනු වේ.

**කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය** - 'කප්පා' යනු: තෘෂ්ණාකල්ප යැ දෘෂ්ටිකල්ප යැයි දෙ කල්ප කෙනෙකි: ... ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ කරන ලද, දෘෂ්ටිකල්පය දුරලන ලද, තෘෂ්ණාකල්පය ප්‍රහීණ කළ හෙයින් දෘෂ්ටිකල්පය දුරලූ හෙයින් කවර රාගයෙකින් කල්පනය කරන්-නේ ද? කවර ද්වේෂයෙකින් - කවර මොහයෙකින් - කවර මානයෙකින් - කවර දෘෂ්ටියෙකින් - කවර ඖද්ධත්‍යයෙකින් - කවර විචිකිත්සායෙකින් - කවර අනුශයයෙකින් රක්ත යැයි හෝ දුෂ්ට යැයි හෝ මූඪ යැයි හෝ විනිබද්ධ යැයි හෝ පරාමෘෂ්ට යැයි හෝ වික්ෂෙපයට ගියේ යැයි හෝ අනිෂ්ඨාවට ගියේ යැයි හෝ තිරබවට ගියේ යැයි හෝ කල්පනය කරන්නේ නම් ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයහ, අභිසංස්කාරයන් ප්‍රහීණ කළ වන බැවින් ගතිවශයෙන් තිරිසන් යැයි හෝ තිරිසන්ගත යැයි හෝ ප්‍රෙතවිෂය ඇතියෙකැයි හෝ මිනිස් යැයි හෝ දෙවි යැයි හෝ රූපී යැයි හෝ අරූපී යැයි හෝ සංඥී යැයි හෝ අසංඥී යැයි හෝ නෛවසංඥී නාසංඥී යැයි හෝ කුමකින් කල්පනය කරන්නේ ද; යම් කරුණෙකින් කල්පනය - විකල්පනය - කරන්නේ නම් විකල්පනයට පැමිණෙන්නේ නම්, ඒ හෙතුව නැත ප්‍රත්‍යය නැත කාරණය නැති; **කෙනීධ ලොකස්මිං** - අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි - 'කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

"තස්සීධ දිට්ඨෙ ව-පෙ-ලොකස්මිං විකප්පයෙය්‍ය"යි.

5 - 8

න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
ධම්මාපි තෙසං න පටිච්ඡිතාසෙ,
න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො
පාරං ගතො න පච්චෙති තාදී.

**න කප්පයන්ති න පුරෙක්ඛරොන්තීති** – 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච.

කතමො තණ්හාකප්පො? යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමකතං මරියාදිකතං[1] ඔධිකතං පරියන්තකතං[2] පරිග්ගහිතං මමායිතං: ඉදං මමං එතං මමං එත්තකං මමං එත්තාවතා මමං, මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථු හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච කෙවලම්පි මහාපථවිං තණ්හාවසෙන මමායති, යාවතා අට්ඨසතතණ්හාවිචරිතං, අයං තණ්හාකප්පො.

කතමො දිට්ඨිකප්පො? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි, යා එවරූපං දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරං දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පටිග්ගාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො, අයාථාවකස්මිං යාථාවකන්ති[3] ගාහො, යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි; අයං දිට්ඨිකප්පො.

තෙසං තණ්හාකප්පො පහීනො, දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො; තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තෙ තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා න කප්පෙන්ති න ජනෙන්ති න සංජනෙන්ති න නිබ්බත්තෙන්ති නාභිනිබ්බත්තෙන්තීති – න කප්පයන්ති; **න පුරෙක්ඛරොන්තීති පුරෙක්ඛාරාති** ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච -පෙ- අයං තණ්හාපුරෙක්ඛාරො -පෙ- අයං දිට්ඨිපුරෙක්ඛාරො. තෙසං තණ්හාපුරෙක්ඛාරො පහීනො; දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො තණ්හාපුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා න දිට්ඨිං වා පුරතො කත්වා චරන්ති. න තණ්හාධජා න තණ්හාකෙතූ න තණ්හාධිපතෙය්‍යා න දිට්ඨිධජා න දිට්ඨිකෙතූ න දිට්ඨාධිපතෙය්‍යා න තණ්හාය වා න දිට්ඨියා වා පරිවාරෙත්වා චරන්තීති – න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති.

1. මරියාදිකතං - මජසං, සහ. 2. පරියන්තිකතං - සහ.
3. යථාවකන්ති - සිමු.II.

5 - 8

ඒ ක්ෂීණාස්‍රවයෝ තෘෂ්ණාදෘෂ්ටිකල්පයන් නො කෙරෙති, පෙරටු කොට නො හැසිරෙත්; ඔවුන් විසින් දෙසැට දිට්ඨිගතහු ද නො පිළිගන්නා ලද්දාහු වෙති. ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ ශීලව්‍රතය කරණ කොටගෙන ගෙනයා නො හැක්ක. යම්හෙයකින් තාදී වූ රහත් තෙම නිර්වාණපාරයට ගියේ මාර්ගයෙන් නැසූ කෙලෙසුන් කරා පෙරළා නො පැමිණේ ද එහෙයිනි.

න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති – 'කප්පා' යනු: තෘෂ්ණා කල්පය ද දෘෂ්ටිකල්පය දැයි දෙ කල්ප කෙනෙක් වෙති:

තෘෂ්ණාකල්පය කවරැ යත්? යම් පමණ තෘෂ්ණාකොටසින් සීම් කරන ලද ද මර්යාදා කරන ලද ද අවධි කරන ලද ද පර්යන්ත කරන ලද ද අයත් කරන ලද ද මමායන කරන ලද ද: මේ මාගේ යැ, මෙතෙල මාගේ යැ, මෙතෙක් මාගේ යැ, මාගේ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, අතුරුණු බුමුතුරුණු යැ, දැසිදස්හු යැ, එළුතිරෙළු යැ, ඌරුකුකුළු යැ, ඇත්අස්ගවමීවලමු යැ, කෙත්වත් යැ, රන්රුවන් යැ, ගම්නියම්ගම්රජදහන්හු යැ, රට දනව්-කොටුගුල් හා සියලු මැ මහපොළොව තෘෂ්ණාවශයෙන් මමායන කෙරෙයි, යම්තාක් අටෝරාසියක් තෘෂ්ණාවිචරිතය වේ ද, මේ තෘෂ්ණාකල්ප නම් වෙයි.

දෘෂ්ටිකල්පය කවරැ යත්? විංශතිවස්තුකසත්කායදෘෂ්ටි යැ, දශවස්තුකමිථ්‍යාදෘෂ්ටි යැ, දශවස්තුකඅන්තග්‍රාහිකාදෘෂ්ටි යැ යන මෙබඳු වූ යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොම්දෘෂ්ටියෙක් දෘෂ්ටිචලනයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් වේ ද, දෘඪග්‍රහණයෙක් මිථ්‍යාමාර්ගයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසග්‍රාහයෙක් විපරීතග්‍රාහයෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි ස්වභාව යැයි ගැනීමෙක් වේ ද, යම් දෙසැට දෘෂ්ටි කෙනෙක් වෙත් ද මේ දෘෂ්ටිකල්ප නම් වේ. ඒ රහතුන් විසින් තෘෂ්ණාකල්පය පහන ලද, දෘෂ්ටිකල්පය දුරලන ලද, තෘෂ්ණාකල්පය පුහුත් බැවින් දෘෂ්ටිකල්පය දුරුළූ බැවින් ඔවුහු තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ කල්පනය නො කෙරෙති නො දනවති නූපදවත් නුයි –'න කප්පයන්ති, යනු වේ.

න පුරෙක්ඛරොන්ති – 'පුරෙක්ඛාර' නම්: තෘෂ්ණාපුරස්කාරය ද දෘෂ්ටිපුරස්කාරය දැයි දෙ පුරස්කාර කෙනෙක් වෙති ... ඒ රහතුන් විසින් තෘෂ්ණාපුරස්කාරය පහන ලද, දෘෂ්ටිපුරස්කාරය දුරලන ලද, තෘෂ්ණාපුරස්කාරය පුහුත් බැවින් දෘෂ්ටිපුරස්කාරය දුරුළූ බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙති, තෘෂ්ණාව ධ්වජ කොට ඇත්තාහු තෘෂ්ණාව කෙහෙළි කොට ඇත්තාහු තෘෂ්ණාව අධිපති කොට ඇත්තාහු දෘෂ්ටිය ධ්වජ කොට ඇත්තාහු දෘෂ්ටිය කෙහෙළි (=කොඩි) කොට ඇත්තාහු දෘෂ්ටිය අධිපති කොට ඇත්තාහු නො වෙති, තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ නො පිරිවරා හැසිරෙත් නුයි 'න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති' යනු වේ.

**ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙති** – ධම්මා වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; **තෙසන්ති** තෙසං අරහන්තානං ඛීණාසවානං; **න පටිච්ඡිතා සෙති** සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති න පටිච්ඡිතා සෙ, අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති න පටිච්ඡිතා සෙති – ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ.

**න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යොති** – 'නා'ති පටික්ඛෙපො; **බ්‍රාහ්මණොති** සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො, සක්කායදිට්ඨි බාහිතා හොති –පෙ– අසිතො[1] තාදී[2] පවුච්චතෙ ස බ්‍රහ්මා. **න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යොති** – බ්‍රාහ්මණො සීලෙන වා වතෙන[3] වා සීලබ්බතෙන[4] වා න යායති න නිය්‍යති[5] න වුය්හති න සංහරීයතීති – න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො.

**පාරං ගතො න පච්චෙති තාදීති** – පාරං වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, සො පාරං ගතො පාරං පත්තො අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො (විත්ථාරො) ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති– පාරං ගතො; **න පච්චෙතීති** සොතාපත්තිමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති. සකදාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති, අනාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති, අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡතීති – පාරං ගතො න පච්චෙති;

1. අභිස්සිතො - ස්‍යා. 2. තාදි - ස්‍යා. 3. වතන්තෙන - ස්‍යා.
4. සීලවතත්තෙන - ස්‍යා. 5. නිය්‍යාති - ස්‍යා.

**ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ** – 'ධම්මා' යි දෙසැට දෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. **තෙසං** ඒ අර්හත් ක්ෂීණාශ්‍රවයන් විසින්; **න පටිච්ඡිතා සෙ** – ලෝකය ශාශ්වත යැ, මෙ මැ සැබෑ වැ අන්‍යය හිස් යැයි නො පිළිගත්තා ලද්දාහු වෙති. ලෝකය අශාශ්වත යැ, ලෝකය අන්තවත් යැ, ලෝකය අනන්තවත් යැ, ආත්ම සඞ්ඛ්‍යාත ජීවයත් ශරීරයත් එය ම යැ, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ, සත්ත්ව තෙමේ මරණින් මතු විද්‍යමාන වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු අවිද්‍යමාන වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේ ත් නො වන්නේ ත් වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි, මෙ මැ සැබෑ වැ අන්‍යය හිස් යැයි නොපිළිගත්තා ලද්දාහු තුයි – 'ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ' යනු මෙ.

**න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො** – 'න' යනු ප්‍රතික්ෂෙප යැ, **බ්‍රාහ්මණො** – සප්තධර්ම කෙනකුන් බාහිත (–ප්‍රහීණ කළ) වන බැවින් බ්‍රාහ්මණ යැ, සත්කායදෘෂ්ටිය බාහිත වෙයි,...(4–3 නිද්දේසය) **න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො** – ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙමේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශීලව්‍රතයෙන් හෝ නො යවනු ලැබෙයි නො පමුණුවනු ලැබෙයි නො අදනු ලැබෙයි නො එලවනු ලැබේ තුයි – 'න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො' යනු මේ.

**පාරං ගතො න පච්චෙති තාදී** – අමාමහනිවන 'පාරං' යයි කියනු ලැබෙයි, සියලු සංස්කාරයෙන් සන්හිඳුණු සියලු උපධි දුරු කළ තෘෂ්ණාක්ෂය වූ කෙලෙස්රජස් නැති සියලු දුක් නිරුද්ධ වූ නිර්වාණය යි; ඒ ක්ෂීණාශ්‍රව පාරයට ගියේ පාරයට පැමිණියේ... (1–6.සුත්තනිද්දේසය.) තුයි – 'පාරං ගතො' යනු මේ. **න පච්චෙති** – සෝවාන්මගින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා නැවත නො එයි පෙරළා නො එයි ආපසු නො පැමිණෙයි, සකෘදාගාමිමගින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා පෙරළා නො පැමිණෙයි-අනාගාමිමගින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා පෙරළා නො පැමිණෙයි – රහත් මගින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා නැවත නො එයි පෙරළා නො පැමිණෙයි ආපසු නො පැමිණේ තුයි – 'පාරං ගතො න පච්චෙති' යනු මේ.

**තාදීති** අරහා පඤ්චහාකාරෙහි තාදී: ඉට්ඨානිට්ඨෙ තාදී, චත්තාවීති තාදී, තිණ්ණාවීති තාදී, මුත්තාවීති තාදී, තන්නිද්දෙසා තාදී. කථං අරහා ඉට්ඨානිට්ඨෙ තාදී? අරහා ලාභෙපි තාදී, අලාභෙපි තාදී, යසෙපි තාදී, අයසෙපි තාදී, පසංසායපි තාදී, නින්දායපි තාදී, සුඛෙපි තාදී, දුක්ඛෙපි තාදී, එකං චෙ බාහං[1] ගන්ධෙන ලිම්පෙය්‍යුං,[2] එකං චෙ බාහං[1] වාසියා තච්ඡෙය්‍යුං, අමුස්මිං නත්ථි රාගො, අමුස්මිං නත්ථි පටිඝං. අනුනයපටිඝවිප්පහීනො උග්ඝාතිනිග්ඝාති-වීතිවත්තො අනුරොධවිරොධං සමතික්කන්තො; එවං අරහා ඉට්ඨානිට්ඨෙ තාදී. කථං අරහා චත්තාවීති තාදී? අරහතො රාගො චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො, දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා චත්තා වන්තා මුත්තා පහීනා පටිනිස්සට්ඨා, එවං අරහා චත්තාවීති තාදී. කථං අරහා තිණ්ණාවීති තාදී? අරහා කාමොඝං තිණ්ණො භවොඝං තිණ්ණො දිට්ඨොඝං තිණ්ණො අවිජ්ජොඝං තිණ්ණො සබ්බං සංසාරපථං[3] තිණ්ණො උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො, සො වුට්ඨවාසො චිණ්ණචරණො ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති. එවං අරහා තිණ්ණාවීති තාදී. කථං අරහා මුත්තාවීති තාදී? අරහතො රාගා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; දොසා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; මොහා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; කොධා උපනාහා මක්ඛා පළාසා ඉස්සාය මච්ඡරියා මායාය සාඨෙය්‍යා ථම්භා සාරම්භා මානා අතිමානා මදා පමාදා සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බපරිළාහෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; එවං අරහා මුත්තාවීති තාදී. කථං අරහා තන්නිද්දෙසා තාදී? අරහා සීලෙ සති සීලවාති තන්නිද්දෙසා තාදී; සද්ධාය සති සද්ධොති තන්නිද්දෙසා තාදී, විරියෙ සති විරියවාති තන්නිද්දෙසා තාදී, සතියා සති සතිමාති තන්නිද්දෙසා තාදී, සමාධිස්මිං සති සමාහිතොති තන්නිද්දෙසා තාදී, පඤ්ඤාය සති පඤ්ඤවාති තන්නිද්දෙසා තාදී, විජ්ජාය සති තෙවිජ්ජොති තන්නිද්දෙසා තාදී, අභිඤ්ඤාය සති ඡළභිඤ්ඤොති තන්නිද්දෙසා තාදී, එවං අරහා තන්නිද්දෙසා තාදීති – පාරඞ්ගතො න පච්චෙති තාදී.

තෙනාහ භගවා:

“න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ,
න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො
පාරඞ්ගතො න පච්චෙති තාදීති.

**පරමට්ඨකසුත්තනිද්දෙසො පඤ්චමො.**

---

1. අඞ්ගං - සීමු. I. 2. විලිම්පෙය්‍යුං - සීමු. II.
3. සබ්බසංසාරපථං - මජුප. සබ්බසඞ්ඛාරපථං - සීමු. II.

තාදී යනු - රහත්හු පස්කරුණෙකින් තාදීහ: ඉට්ඨඅනිට්ඨයෙහි තාදී (-සමානය) හ, කෙලෙසුන් හළහු හුයි තාදීහ, සසර තරණය කළාහු හුයි තාදීහ, රාගාදියෙන් මිදුණාහු හුයි තාදීහ, තන්නිර්දේශයෙන් (-ඒ ඒ ශීලශ්‍රද්ධාදියෙන් දක්විය යුත්තාහු හුයි) තාදීහ. කිසෙයින් රහත්හු ඉෂ්ටානිෂ්ටයෙහි තාදී සේක් ද යත්: රහත්හු ලාභයෙහි දු තාදීහ, අලාභයෙහි දු - යශස්හි දු - අයශස්හි දු - ප්‍රශංසායෙහි දු - නින්දායෙහි දු සුඛයෙහි දු - දුඃඛයෙහි දු තාදී සේක. ඉදින් එක් බාහුවක් සිවුද්දගඳින් ආලේප කරන්නාහු නම්, අනෙක් බාහුව වෑයකින් සස්නාහු නම් අර ගන්ධාලේපයෙහි ඇලීමෙක් නැත, අර සැසීමෙහි කෝපයෙක් නැත; රාගද්වේෂ දුරු කොට සිටියහ, අනුග්‍රහනිග්‍රහ ඉක්මවා සිටියහ, අනුනයප්‍රතිඝ මොනොවට ඉක්මැවූහ. මෙසේ රහත්හු ඉෂ්ටානිෂ්ටයෙහි තාදී සේක. කිසෙයින් රහත්හු කෙලෙස් හළ හෙයින් 'තාදී' වූහ යත්: රහත්හු විසින් රාගය ත්‍යක්ත යැ වාන්ත යැ ප්‍රහීණ යැ දුරලන ලද්දේයැ, ද්වේෂය - මෝහය - ක්‍රෝධය - උපනාහය - මක්ඛය - යුගග්‍රාහය - ඊර්ෂ්‍යාව - මාත්සර්‍ය්‍යය - මායාව - ශඨබව - තදබව - සාරම්භය - මානය - අතිමානය මදය - ප්‍රමාදය - සියලු කෙලෙසයෝ - සියලු දුශ්චරිතයෝ - සියලු දරථයෝ - සියලු පරිදාහයෝ - සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ - ත්‍යක්තයහ වාන්තයහ මුක්තයහ ප්‍රහීණයහ දුරලන ලද්දහ. මෙසෙයින් රහත්හු කෙලෙසුන් හළ හෙයින් 'තාදී' නම් වූ සේක. කිසෙයින් රහත්හු සසර තරණය කළහෙයින් 'තාදී' වූහ යත්: රහත්හු කාමෞඝය තරණය කළහ, භවෞඝය - දෘෂ්ට්‍යෞඝය - අවිද්‍යා - ඕඝය තරණය කළහ, සියලු සංසාරපථය තරණය කළහ, උත්තරණය - නිස්තරණය කළහ, ඉක්මැවූහ, මැනවින් ඉක්මැවූහ, වෙසෙසින් ඉක්මැවූහ, ඒ රහත්හු වුසූ ආර්‍ය්‍යවාස ඇතියහ, පුරුදු කළ චරණධර්ම ඇතියහ... (1-6. සූත්‍රනිර්දේශය.) මෙසෙයින් රහත්හු තරණය කළහෙයින් රහත් නම් වූ සේක. කිසෙයින් රහත්හු මිදුණු හෙයින් 'තාදී' වූහ යත්: රහත්හුගේ සිත රාගයෙන් මුක්ත ය විමුක්ත ය සුවිමුක්ත ය, ද්වේෂයෙන් - මෝහයෙන් මුක්ත ය විමුක්ත ය සුවිමුක්තය, ක්‍රෝධයෙන් උපනාහයෙන් ම්‍රක්ෂයෙන් පලාසයෙන් ඊර්ෂ්‍යායෙන් මායාවෙන් ශාඨ්‍යයෙන් ස්තම්භයෙන් සාරම්භයෙන් මානයෙන් අතිමානයෙන් ප්‍රමාදයෙන් මදයෙන් සර්වදුශ්චරිතයෙන් සර්වදරථයෙන් සර්වපරිදාහයෙන් සර්වසන්තාපයෙන් සර්වාකුශලාභිසංස්කාරයන් කෙරෙන් මුක්තය විමුක්තය සුවිමුක්තය. මෙසෙයින් රහත්හු රාගාදියෙන් මිදුණු හෙයින් තාදී නම් වූහ. කිසෙයින් රහත්හු තන්නිර්දේශයෙන් 'තාදී' වූහ යත්: ශීලය ඇති කල්හි 'සිල්වත්හ, යි ඒ ශීලයෙන් දක්විය යුතු හෙයින් තාදීහ, ශ්‍රද්ධා ඇති කල්හි 'සැදැහැවත්හ' යි එයින් නිදෙසිය යුතු හෙයින් තාදීහ, වීර්‍ය්‍ය ඇති කල්හි 'වීර්‍ය්‍යවත්හ'යි...ස්මෘතිය ඇති කල්හි 'ස්මෘතිමත්හ'යි...සමාධිය ඇති කල්හි 'සමාහිත'යයි.. ප්‍රඥාව ඇති කල්හි 'ප්‍රඥාවත්හ'යි...විද්‍යාව ඇති කල්හි 'ත්‍රිවිද්‍යා ඇත්තාහ'යි...අභිඥාව ඇති කල්හි 'ෂඩභිඥයහ'යි ඒ අභිඥායෙන් දක්වියයුතු හෙයින් තාදී නම් වූහ. මෙසෙයින් රහත්හු තන්නිර්දේශයෙන් 'තාදී' නම් වූවාහු හුයි - 'පාරං ගතො න පච්චෙති තාදී' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න කප්පයන්ති-පෙ-න පච්චෙති තාදී" යනු.

පස්වැනි පරමට්ඨකසුත්තනිර්දේශය යි.

# 6

# ජරාසුත්තනිද්දෙසො

අථ ජරාසුත්තනිද්දෙසො[1] වුච්චති:

### 6 - 1

අප්පං වත ජීවිතං ඉදං
ඔරං වස්සසතාපි මීයති,[2]
යො චෙපි අතිච්ච ජීවති
අථ ඛො සො ජරසාපි මීයති.

**අප්පං වත ජීවිතං ඉදන්ති** - 'ජීවිත'න්ති ආයු ඨිති[3] යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං; අපිච ද්වීහි කාරණෙහි අප්පකං ජීවිතං, ථොකකං ජීවිතං; ඨිතිපරිත්තතාය වා අප්පකං ජීවිතං, සරසපරිත්තතාය වා අප්පකං ජීවිතං. කථං ඨිති පරිත්තතාය වා අප්පකං ජීවිතං? අතීතෙ චිත්තක්ඛණෙ ජීවිත්ථ න ජීවති න ජීවිස්සති; අනාගතෙ චිත්තක්ඛණෙ ජීවිස්සති න ජීවති න ජීවිත්ථ; පච්චුප්පන්නෙ චිත්තක්ඛණෙ ජීවති න ජීවිත්ථ න ජීවිස්සති.

1. ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කෙවලා,
එකචිත්තසමායුත්තා ලහුසො වත්තතෙ ඛණො.

2. චුල්ලාසීති සහස්සානි කප්පා[4] තිට්ඨන්ති යෙ මරූ,
නත්වෙව තෙපි ජීවන්ති ද්වීහි චිත්තෙහි සංයුතා[5].

3. යෙ නිරුද්ධා මරන්තස්ස තිට්ඨමානස්ස වා ඉධ,
සබ්බෙපි[6] සදිසා ඛන්ධා ගතා අප්පටිසන්ධිකා.[7]

4. අනන්තරා ච යෙ භග්ගා යෙ ච භග්ගා අනාගතා,
තදන්තරෙ නිරුද්ධානං වෙසමං[8] නත්ථි ලක්ඛණෙ.

5. අනිබ්බත්තෙන න ජාතො පච්චුප්පන්නෙන ජීවති,
චිත්තභඞ්ගා මතො ලොකො පඤ්ඤත්තිපරමත්ථියා.[9]

6. යථා නින්නා පවත්තන්ති ඡන්දෙන පරිණාමිතා,
අච්ඡින්නධාරා වත්තන්ති සළායතනපච්චයා.

7. අනිධානගතා භග්ගා පුඤ්ජො නත්ථි අනාගතෙ,
නිබ්බත්තායෙව තිට්ඨන්ති ආරග්ගෙ සාසපූපමා.

---

1. ජරාසුත්තං - සීමු. II.
2. මීය්‍යති - සු, ස.
3. ආයුට්ඨිති - සීමු. II.
4. කප්පං - වි.
5. සමොහිතා - සීමු. II. සමාහිතා - වි.
6. සබ්බෙව - සීමු. II.
7. අප්පටිසන්ධියා - වි.
8. වෙසම්මං - ස.
9. පරමට්ඨියා - වි. පරමට්ඨිති - ස.

# 6

# ජරාසූත්‍රනිද්දේශය

ඉක්බිති ජරාසූත්‍රනිද්දේශය කියනු ලැබේ:

## 6 – 1

මිනිසුන්ගේ මේ ජීවිතය ඒකාන්තයෙන් අල්ප වෙයි. අවුරුදු සියයකින් මෙපිට (කලලාදි කාලයෙහි ද) මැරෙයි. ඉදින් යමෙක් සියක් වස් ඉක්මවා ජීවත් වේ නම්, එකල හෙතෙම ජරාවෙන් නමුදු මියන්නේ යි.

**අප්පං වත ජීවිතං ඉදං** – 'ජීවිතං' යනු: (අරූපධර්මයන්ගේ) ආයුෂය සිටීම යපනය යාපනය (=යැපීම) ඉරියනය පැවැත්ම පාලනය ජීවිතය ජීවිතේන්ද්‍රිය යි. තවද, දෙ කරුණෙකින් ජීවිතය අල්ප වෙයි: ස්ථිතික්‍ෂණය මඳ බැවින් හෝ ජීවිතය අල්ප යැ, කෘත්‍යලක්‍ෂණ හෝ සම්පත්තිලක්‍ෂණ රසය මඳ බැවින් හෝ ජීවිතය අල්ප යි. කිසෙයින් ස්ථිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි යත්? අතීත චිත්තක්‍ෂණයෙහි ජීවත් විය, ජීවත් නො වෙයි, ජීවත් නො වන්නේ ය; අනාගත චිත්තක්‍ෂණයෙහි ජීවත් වන්නේ යැ, ජීවත් නො වෙයි, ජීවත් නො වී; වර්තමාන චිත්තක්‍ෂණයෙහි ජීවත් වෙයි, ජීවත් නො වී, ජීවත් නො වන්නේ යි.

1. (සංස්කාරස්කන්ධ සඞ්ඛ්‍යාත) ජීවිතය ද, (රූපස්කන්ධ සඞ්ඛ්‍යාත) ආත්මය ද, (වේදනාස්කන්ධ සඞ්ඛ්‍යාත) සුවදුක් ද, (ධ්‍රුවසුඛසුභත්තභාව රහිත හෙයින්) කෙවල වූවාහු (විඥානස්කන්ධ සඞ්ඛ්‍යාත) එක් සිතක් සමග යෙදුණාහු ඒ (ජීවිතාදීන්ගේ) ක්‍ෂණය අල්ප වශයෙන් පවත්නේ යැ.

2 යම් දෙවි කෙනෙක් කප් සුවාසූදහසක් ආයු ගෙන (නෛවසංඥානාසංඥායතනයෙහි) සිටිත් නම්, ඔහු පවා දෙ සිතෙකින් යුක්ත වූවාහු නො මැ ජීවත් වෙති.

3. මෙ ලොවැ මළහුගේ හෝ ජීවත් වන්නහුගේ හෝ යම් ස්කන්ධ කෙනෙක් නිරුද්ධ වූවාහු ද, (ච්‍යුතියෙන් උඩ නිරුද්ධ වූ හෝ) ප්‍රවෘත්තියෙහි නිරුද්ධ වූ හෝ ඒ සියලු මැ ස්කන්ධයෝ ගියාහු අප්‍රතිසන්ධිකයෝ යැයි කියනු ලැබෙත්.

4. යම් ස්කන්ධ කෙනෙක් අනන්තර (=අතීත) වැ සිට බිඳී ගියාහු ද, යම් අනාගත ස්කන්ධ කෙනෙකුත් බිඳී යන්නාහු ද, ඒ අතුරෙ නිරුද්ධ වූ වර්තමානස්කන්ධයන්ගේ ලක්‍ෂණයෙහි විෂම බවෙක් (=නානාත්වයෙක්) නැති.

5. නූපන් අනාගතස්කන්ධයෙන් නූපන්නේ යැ, ක්‍ෂණප්‍රත්‍යුත්පන්න වූ වර්තමානසකන්ධයෙන් ජීවත් වෙයි, ලෝවැසි තෙම චිත්තයාගේ බිඳීමෙන් මළේ නම, (දත්ත මළේය, තිස්ස මළේය යන) ප්‍රඥප්තිය චිත්තභඞ්ගසඞ්ඛ්‍යාත පරමාර්ථය නිඃශ්‍රිත කොට ඇත.

6. ඡන්ද විසින් පරිණාමිත වූවාහු නතු වූ පරිදි පවත්නාහු යැ, ෂඩායතනප්‍රත්‍යයෙන් නුසුන් ධාරා (=සන්තති) ඇති වැ පවතිත්.

7. බිඳුණු ස්කන්ධයෝ නිධානයට (=රැස්වීමට) නො ගියාහු යැ, අනාගතයෙහි ද ඔවුන්ගේ රැස්වීමෙක් නැති, උපන්නාහු මැ ගිදිඅගැ අබඇට සෙයින් ස්ථිතික්‍ෂණයෙහි සිටිත්.

8. නිබ්බත්තානඤ්ච ධම්මානං භඞ්ගො තෙසං පුරක්ඛතො,
පලොකධම්මා තිට්ඨන්ති පුරාණෙහි අමිස්සිතා.

9. අදස්සනාතො ආයන්ති භඞ්ගා ගච්ඡන්ති අදස්සනං,[1]
විජ්ජුප්පාදෙව ආකාසෙ උප්පජ්ජන්ති වයන්ති ච.

එවං ඨිතිපරිත්තතාය අප්පකං ජීවිතං.

කථං සරසපරිත්තතාය අප්පකං ජීවිතං? අස්සාසූපනිබද්ධං ජීවිතං, පස්සාසූපනිබද්ධං ජීවිතං, අස්සාසපස්සාසූපනිබද්ධං ජීවිතං, මහාභූතූපනිබද්ධං ජීවිතා, කබළීකාරාහාරූපනිබද්ධං ජීවිතං, උස්මූපනිබද්ධං ජීවිතං, විඤ්ඤාණූපනිබද්ධං ජීවිතං. මූලම්පි ඉමෙසං දුබ්බලං, පුබ්බහෙතූ'පි ඉමෙසං දුබ්බලා, යෙපි පච්චයා තෙ'පි දුබ්බලා, යාපි පභවිකා සා'පි[2] දුබ්බලා, සහභූපි[3] ඉමෙසං දුබ්බලා, සම්පයොගා'පි ඉමෙසං දුබ්බලා, සහජාපි ඉමෙසං දුබ්බලා, යා'පි පයොජිකා සා'පි දුබ්බලා, අඤ්ඤමඤ්ඤං නිච්චදුබ්බලා ඉමෙ, අඤ්ඤමඤ්ඤං අනවට්ඨිතා ඉමෙ, අඤ්ඤමඤ්ඤං පරිපාතයන්ති ඉමෙ, අඤ්ඤමඤ්ඤස්ස හි නත්ථි තායිතා, න චාපි ඨපෙන්ති අඤ්ඤමඤ්ඤං ඉමෙ. යො'පි නිබ්බත්තකො සො න විජ්ජති.

10. "න ච කෙනචි කොචි හායති භඞ්ගබ්‍යා[4] ඉමෙ හි සබ්බසො,
පුරිමෙහි පභාවිතා ඉමෙ යෙපි පභවකා[5] තෙ පුරෙ මතා
පුරිමා'පි ච පච්ඡිමා'පි ච අඤ්ඤමඤ්ඤං න කදාචිමාද්දසු"න්ති.

එවං සරසපරිත්තතාය අප්පකං ජීවිතං.

අපි ච චාතුම්මහාරාජිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. තාවතිංසානං දෙවානං – යාමානං දෙවානං – තුසිතානං දෙවානං – නිම්මාණරතීනං දෙවානං – පරනිම්මිතවසවත්තීනං දෙවානං – බ්‍රහ්මකායිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. වුත්තම්පි චෙතං භගවතා:

"අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, මන්තාය බොද්ධබ්බං, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං. යො හි භික්ඛවෙ චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භිය්‍යො."[a]

---

1. ගච්ඡන්තාදස්සනං - වි.
2. යෙපි පභාවිකා තෙපි - සීමු. II.
3. සහභූමි පි - සීමු. II.
4. භඞ්ගබ්බා - සීමු II.
5. පභාවිතා - සීමු. II.
a. මාරසංයුත්ත - පඨමවග්ග.

8. ඉපැදැ පවත්තාවූ ඒ ස්කන්ධධර්මයන්ගේ ද බිඳීම පෙරටු කරන ලද්දේ යැ, නැසෙන පියවි ඇත්තාහු පැරණි ස්කන්ධයන් හා අමිශ්‍ර වූවාහු සිටිත්.

9. නොදක්නාහු මැ පැමිණෙති (=උපදිති). නැසීමෙන් මතු නො දක්නා බවට මැ යෙති. අහසැ විදුලි කෙටීමක් මෙන් උපදනාහු ද නැසෙන්නාහු ද වෙත්.

මෙසේ සපිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

කිසෙයින් සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි යත්? ආශ්වාසය නිසා පවත්නේ යැ ජීවිතය, ප්‍රශ්වාසය නිසා පවත්නේ යැ ජීවිතය, ආශ්වාසප්‍රශ්වාස පිළිබඳ යැ ජීවිතය, පෘථිව්‍යාදි මහාභූතයන් පිළිබඳ යැ ජීවිතය, කවලීකාරාහාරය පිළිබඳ යැ ජීවිතය. උණුසුම (=කර්මජතෙජස) පිළිබඳ යැ ජීවිතය, භවාඞ්ගවිඥානය පිළිබඳ යැ ජීවිතය. මේ ආශ්වාසාදීන් ගේ මූලකාරණය (=හෙතුව) ද දුබල යැ, මොවුන් ගේ අවිද්‍යාදි පූර්වහෙතුහු ද දුබලයෝ යැ, ආරම්මණාදි අසාධාරණප්‍රත්‍යයෝ ද දුබලයෝ යැ, ප්‍රධාන වැ සිට උපදවන ඒ තෘෂ්ණාව ද දුබල යැ, මොවුන්ගේ සමග උපන් රූපාරූපධර්මයෝ ද දුබලයෝ යැ, මොවුන් ගේ එක් වැ යෙදුණු අරූප-ධර්මයෝ ද දුබලයෝ යැ, මොවුන්ගේ සහජධර්මයෝ ද දුබලයෝ යැ, ච්‍යුතිප්‍රතිසන්ධි විසින් යොදවන වෘත්තමූලක වූ ඒ තෘෂ්ණාව ද දුබල යැ, මොවුහු ඔවුනොවුන් නිරතුරු දුබලයෝ යැ. මොහු ඔවුනොවුන් අනවස්ථිතයෝ යැ, මොහු ඔවුනොවුන් පිරිහෙලති, ඔවුනොවුන් රැකීමෙක් නැති, මොහු ඔවුනොවුන් නො ද සිටුවති. මොවුන්ගේ උත්පාදකධර්මය ද නැත්.

10. එකෙක් එකක්හුගේ වශයෙන් නො ද පිරිහෙයි. මේ සියලු මැ ස්කන්ධයෝ සර්වප්‍රකාරයෙන් බිඳීමට යායුත්තාහු යැ. මේ වර්තමානස්කන්ධ-යෝ පූර්වහෙතුප්‍රත්‍යයන් විසින් උපදවන ලද්දාහු යැ. උත්පාදක වූ ඒ පූර්වහෙතුප්‍රත්‍යයෝ පළමු මැ මළාහු යැ. පූර්වහෙතුප්‍රත්‍යයෝ ද වර්තමාන ප්‍රත්‍යයසමුත්පන්නයෝ ද ඔවුනොවුන් කිසි කලෙක නොදුටුවිරූහ.

මෙසේ සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

තවද - චාතුර්මහාරාජික දෙවියන්ගේ ජීවිතය පිණිස මිනිසුන්ගේ ජීවිතය අල්ප යැ, ජීවිතය පරිත්ත යැ, ජීවිතය මඳ යැ, ජීවිතය ක්‍ෂණික යැ, ජීවිතය සැහැල්ලු යැ, ඉත්වර යැ, ජීවිතය කල් නොපවත්නේ යැ, ජීවිතය චිරස්ථායී නො වේ. ත්‍රයත්‍රිංශත් දෙවියන්ගේ - යාමදෙවියන්ගේ - තුෂිතදෙවියන්ගේ - නිර්මාණරතිදෙවියන්ගේ - පරනිර්මිතවශවර්ති දෙවි-යන්ගේ - බ්‍රහ්මකායික දෙවියන්ගේ ජීවිතය පිණිස මිනිසුන්ගේ ජීවිතය අල්ප යැ, ජීවිතය පරිත්ත යැ, ජීවිතය මඳ යැ, ජීවිතය ක්‍ෂණික යැ, ජීවිතය ලහුක යැ, ජීවිතය ඉත්වර යැ, ජීවිතය අනද්ධනිය යැ, ජීවිතය අචිරස්ථායී වේ. වදාරන ලද මැනු භාග්‍යවත්හු විසින්:

"මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුස අල්ප යැ, පරලොව යා යුත්තේ යැ, නුවණින් දත යුතු යැ, කුසල් කළ යුතු යැ. බඹසර සිරියැ යුතු යැ, උපන්හුගේ නොමැරීමෙක් නැති. මහණෙනි, යමෙක් කලක් ජීවත් වේ නම් හෙතෙම හවුරුදු සියයක් ජීවත් වෙයි. අධික වූයේ නම් ස්වල්පයක් මැයි.

11. "අප්පමායු මනුස්සානං හීළෙය්‍ය නං සුපොරිසො,
චරෙය්‍යාදිත්තසීසොව නත්ථි මච්චුස්සනාගමො.

12. අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති,
ආයු ඛීයති මච්චානං කුන්නදීනංව ඔදක"න්ති.[ක]

**අප්පං වත ජීවිතං ඉදං ඔරං වස්සසතාපි මියතීති**[1] - කලලකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, අබ්බුදකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, පෙසිකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ඝනකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, පසාඛකාලෙපි[2] චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ජාතමත්තොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, සූතිඝරෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, අද්ධමාසිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, මාසිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ද්වෙමාසිකොපි - තෙමාසිකොපි - චතුමාසිකොපි - පඤ්චමාසිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ඡමාසිකොපි - සත්තමාසිකොපි - අට්ඨමාසිකොපි - නවමාසිකොපි - දසමාසිකොපි - සංවච්ඡරිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ද්වෙවස්සිකොපි - තිවස්සිකොපි - චතුවස්සිකොපි පඤ්චවස්සිකොපි - ඡවස්සිකොපි - සත්තවස්සිකොපි - අට්ඨවස්සිකොපි - නවවස්සිකොපි - දසවස්සිකොපි - වීසතිවස්සිකොපි - තිංසවස්සිකොපි - චත්තාරීසවස්සිකොපි - පඤ්ඤාසවස්සිකොපි - සට්ඨිවස්සිකොපි - සත්තතිවස්සිකොපි - අසීතිවස්සිකොපි - නවුතිවස්සිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජතීති 'ඔරං වස්සසතාපි මියති.[3]'

**යො චෙපි අතිච්ච ජීවතීති** - යො වස්සසතං අතික්කමිත්වා ජීවති, සො එකං වා වස්සං[4] ජීවති, ද්වෙ වා වස්සානි ජීවති, තීණි වා වස්සානි ජීවති, චත්තාරි වා වස්සානි ජීවති, පඤ්ච වා වස්සානි ජීවති -පෙ- දස වා වස්සානි ජීවති, වීසතිං වා වස්සානි ජීවති, තිංසං වා වස්සානි ජීවති, චත්තාරීසං වා වස්සානි ජීවතීති 'යො චෙපි අතිච්ච ජීවති.'

**අථ ඛො සො ජරසාපි මීයතීති** - යදා ජිණ්ණො හොති වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො, ඛණ්ඩදන්තො පලිතකෙසො,[5] විලූනං ඛලිතංසිරො වලිතා තිලකාහතගත්තො වඞ්කො භොග්ගො දණ්ඩපරායණො, සො ජරායපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, නත්ථි මරණම්හා මොක්ඛො.

13. "ඵලානමිව පක්කානං පාතො පපතනා භයං,
එවං ජාතාන මච්චානං නිච්චං මරණතො භයං.

14. යථාපි කුම්භකාරස්ස කතං මත්තිකභාජනං,[6]
සබ්බං භෙදනපරියන්තං[7] එවං මච්චාන ජීවිතං.

15. දහරා ච මහන්තා ච යෙ බාලා යෙ ච පණ්ඩිතා,
සබ්බෙ මච්චුවසං යන්ති සබ්බෙ මච්චුපරායණා."

---

1. මිය්‍යතීති - සීමු. II. 2. පඤ්චසාඛකාලෙපි - ස්‍යා.
3. මිය්‍යති - සීමු. II. 4. වස්සසතං - සීමු. II. 5. ඵලිතකෙසො - ස.
6. කතා මත්තිකභාජනා - මජ්සං. ස්‍යා. 7. සබ්බෙ භෙදනපරියන්තා - මජ්සං. ස්‍යා.
ක. මාරසංයුත්ත - පඨමවග්ග.

11. මිනිසුන්ගේ ආයුස අල්ප යැ. සාධුපුරුෂ තෙම ඒ මඳ වූ ආයුසයට ලජ්ජා වන්නේ යැ. හිස ගිනි ගත්තකු සෙයින් කුසල්හි හැසිරෙන්නේ යැ. මරහුගේ නොපැමිණීමෙක් නම් නැති.

12. රෑදවල්හු ඉක්මැ යෙති. ජීවිතෙන්‍ද්‍රියය අභාවයට යෙයි. කුඩා නදියක දියත්තක් සෙයින් මිනිසුන්ගේ ආයුස ගෙවේ.

**අප්පං වත ජීවිතං ඉදං ඔරං වස්සසතාපි මීයති** – කලලකාලයෙහිදු ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසෙයි. අර්බුදකාලයෙහි දු... පෙශීකාලයෙහි දු...ඝනකාලයෙහි දු...ප්‍රශාඛකාලයෙහි දු...උපන්කෙණෙහි දු...තිඹිරිගෙහි දු ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනසෙයි. අඩමැසි වූයේ ද...එක්මැසි වූයේ ද... දෙමැසි වූයේ ද...තෙමැසි වූයේ ද...සිවුමැසි වූයේ ද...පස්මැසි වූයේ ද...සමැසි වූයේ ද...සත්මැසි වූයේ ද...අටමැසි වූයේද...නවමැසි වූයේ ද...දසමැසි වූයේ ද ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසෙයි. එක්හැවිරිදි වූයේ ද...දෙහැවිරිදි වූයේ ද... තුන්හැවිරිදි වූයේ ද...සිවුහැවිරිදි වූයේ ද...පස්හැවිරිදි වූයේ ද...සහැවිරිදි වූයේ ද...සත්හැවිරිදි වූයේ ද...අටහැවිරිදි වූයේ ද...නවහැවිරිදි වූයේ ද...දසහැවිරිදි වූයේ ද. . .විසිහැවිරිදි. . .තිස්හැවිරිදි. . .සතලිස්හැවිරිදි. . . පනස්හැවිරිදි...සැටහැවිරිදි...සැත්තෑහැවිරිදි...අසූහැවිරිදි...අනූහැවිරිදි වූයේ ද ච්‍යුතවෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසේ නුයි 'ඔරං වස්සසතාපි මීයති' යනු වේ.

**යො චෙපි අතිච්ච ජීවති** – යමෙක් අවුරුදු සියය ඉක්මවා ජීවත් වේ නම්, හෙතෙම එක් වසක් හෝ ජීවත් වෙයි, දෙවසක් හෝ... තෙවසක් හෝ...සිවුවසක් හෝ...පස්වසක් හෝ ජීවත්වෙයි, ...දසවසක් හෝ හෝ...විසිවසක් හෝ...තිස්වසක් හෝ...සතලිස්වසක් හෝ ජීවත් වේ නුයි – 'යො චෙපි අතිච්ච ජීවති' යනු වේ.

**අථ ඛො සො ජරසාපි මීයති** – යම් කලෙක ජරාවෙන් දිරූයේ වේ ද වයසින් වෘද්ධ වූයේ මහලු වූයේ තුන්වයස් ඉක්මැවූයේ අන්තිම වයසට පැමිණියේ වේ ද, (එකල්හි) කඩ (ගිලිහුණු) දත් ඇතියේ පැසුණු කෙස් ඇතියේ සිඳුණු කෙස් ඇති බල්වාටයිකී වූයේ රැලිහටගත් තලකැලලින් යුත් සිරුරු ඇතියේ වක්වූයේ බිඳුණු සිරුරු ඇතියේ සැරයටිය පිහිට කොට ඇතියේ හෙතෙම ජරාවෙන් මඩනා ලදුයේම ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසෙයි. මරණයෙන් මිදීමෙක් නැති.

13. එලහිමියනට පැසුණු ගෙඩි උදෑසන වැටීමෙන් උපදනා බිය මෙන් මෙසේ උපන් සත්නට නිරතුරු මරණයෙන් බිය උපදනේය.

14. කුඹලා විසින් කරන ලද මැටිබඳුන් සියල්ල යම්සේ බිඳීම අවසන් කොට ඇත්තේ ද, එසෙයින් සත්ත්වයන්ගේ ජීවිතය මරණය අවසන් කොට ඇත්තේය.

15. තරුණයෝ ද මහල්ලෝ ද බාලයෝ ද පණ්ඩිතයෝ ද යන සියල්ලෝ මරහුගේ වශයට යෙති. සියල්ලෝ මරණය පරායණ කොට ඇත්තාහ.

16. “තෙසං මච්චුපරෙතානං ගච්ඡතං පරලොකතො,
න පිතා තායතෙ පුත්තං ඤාතී වා පන ඤාතකෙ.

17. පෙක්ඛතඤ්ඤෙව ඤාතීනං පස්ස ලාලපතං[1] පුථු,
එකමෙකොව මච්චානං ගොවජ්ඣො විය නීයති.
එවමබ්භාහතො ලොකො මච්චුනා ච ජරාය චා”ති.[a]

අථ ඛො සො ජරසාව මීයති.

තෙනාහ භගවා:

“අප්පං වත ජීවිතං ඉදං
ඔරං වස්සසතාපි මීයති,
යො චෙපි අතිච්ච ජීවති
අථ ඛො සො ජරසාව මීයතී”ති.

## 6 - 2

සොචන්ති ජනා මමායිතෙ
න හි සන්ති නිච්චා පරිග්ගහා,
විනාභාවං සන්තමෙවිදං
ඉති දිස්වා නාගාරමාවසෙ.[2]

**සොචන්ති ජනා මමායිතෙති** - ‘ජනා’ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච; මමත්තාති- ද්වෙ මමත්තා: තණ්හාමමත්තං ච දිට්ඨිමමත්තං ච -පෙ- ඉදං තණ්හාමමත්තං -පෙ- ඉදං දිට්ඨිමමත්තං. මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි සොචන්ති. අච්ඡිජ්ජන්තෙපි සොචන්ති. අච්ඡින්නෙපි සොචන්ති. මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනොපි සොචන්ති. විපරිණාමන්තෙපි සොචන්ති. විපරිණතෙපි සොචන්ති, කිලමන්ති, පරිදෙවන්ති, උරත්තාළිං කන්දන්ති, සම්මොහං ආපජ්ජන්තීති ‘සොචන්ති ජනා මමායිතෙ.’

**න හි සන්ති නිච්චා පරිග්ගහාති** - ‘පරිග්ගහා’ති - ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච -පෙ- අයං තණ්හාපරිග්ගහො -පෙ- අයං දිට්ඨිපරිග්ගහො. තණ්හාපරිග්ගහො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො විපරිණාමධම්මො. දිට්ඨිපරිග්ගහො ච අනිච්චො සඞ්ඛතො[3] පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො විපරිණාමධම්මො.

වුත්තං හෙතං භගවතා:

“පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, තං පරිග්ගහං, ය්වාස්ස[4] පරිග්ගහො නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සතීති? නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, අහම්පි ඛො එතං භික්ඛවෙ පරිග්ගහං න සමනුපස්සාමි, ය්වාස්ස[4] පරිග්ගහො නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සතී”ති.[b] පරිග්ගහා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්තීති ‘න හි සන්ති නිච්චා පරිග්ගහා’.

---

1 ලාලපතං - සීමු II. ලාලප්පතං - මජ්ස. a. සුත්තනිපාත - සල්ලසුත්ත.
2. න ඝරමාවසෙ - මනුප. 3. අසඞ්ඛතො - සීමු. I.
4. යවායං - සීමු. II. යායං - PTS.
b. මජ්ඣිමනිකාය - අලගද්දූපමසුත්ත

16. මරණයෙන් පීඩිත වූ මෙලොවින් පරලොවට යන ඒ සත්ත්වයන් පිළිබඳ ව යම්හෙයකින් පියා පුතු නො රකි ද, නෑ කෙනෙක් හෝ නෑයන් නො රකිත් ද, එහෙයින් -

17. බලව! තත් අඬුරින් වැලැපෙන්නාවූ නෑයන් බලාසිටිය දී මැ මිනිසුන් අතුරෙන් එකඑකා මැ වධයට ගෙන යන ගවයකු මෙන් මරණයට පමුණුවනු ලැබෙයි. මෙසෙයින් ලොවැයි තෙමේ මරණය විසින් හා ජරාව විසින් ද මඩනා ලදුයේ නුයි - 'අථ ඛො සො ජරසාව මීයති' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

"අප්පං වත-පෙ-අථ ඛො සො ජරසාව මීයති" යි.

## 6 - 2

සත්ත්වයෝ තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් මමත්වයෙන් ගන්නා ලද වස්තුවිෂයෙහි (=වස්තුව කරණ කොටගෙන) ශොක කෙරෙති. එතෙකුදු වත් නිත්‍ය වූ පරිග්‍රහ කෙනෙක් නො මැ වෙති. මේ විනාභාවය විද්‍යමාන වූයේ මැ යයි දැක (නුවණැත්තේ) ගිහිගෙයි නො වසන්නේ යි.

**සොචන්ති ජනා මමායිතෙ** - 'ජනා' යනු: ක්‍ෂත්‍රිය-බ්‍රාහ්මණ-වෛශ්‍ය-ශුද්‍ර-ගෘහස්ථ-ප්‍රව්‍රජිත-දෙව-මනුෂ්‍යයෝ ය; 'මමායිතා' යනු: තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය දැයි මමත්වයෝ දෙදෙනෙක් වෙති...මාගේ යයි ගන්නා ලද වස්තුව 'අසිද ගතිති' යන සැක ඇත්තාහු ද (සිතින්) ශොක කෙරෙති, අසිදුනා කල්හි දු ශොක කෙරෙති, අසිදගත් කල්හි දු ශොක කෙරෙත්, මමායිත වස්තුව 'විපරීත වෙති' සැක ඇත්තාහු ද ශොක කෙරෙති, විපරීත වන කල්හි දු ශොක කෙරෙති, විපරීත වූ කල්හි දු ශොක කෙරෙති, වෙහෙසෙති විලාප කියති ළෙහි අත් ගසා හඬති සම්මොහයට පැමිණෙත් නුයි - 'සොචන්ති ජනා මමායිතෙ' යනු වේ.

**න හි සන්ති නිච්චා පරිග්ගහා** - 'පරිග්ගහා' යනු: තෘෂ්ණාපරිග්‍රහය ද දෘෂ්ටිපරිග්‍රහය දැයි පරිග්‍රහයෝ දෙදෙනෙක් වෙති...තෘෂ්ණාපරිග්‍රහය අනිත්‍ය යැ, සංඛත (=ප්‍රත්‍යයන් විසින් කරන ලද) යැ, ප්‍රත්‍යයසාමග්‍රිය නිසා උපන, ක්‍ෂය වන සුලු යැ, නැසෙන සුලු යැ, නොඇලෙන පියවි ඇත්තේ යැ, නිරුද්ධ වන පියවි ඇත්තේ යැ, පෙරළෙන පියවි ඇත්තේ යැ; දෘෂ්ටිපරිග්‍රහය ද අනිත්‍ය යැ සංඛත යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්‍ෂයධම් යැ ව්‍යයධම් යැ විරාගධම් යැ නිරොධධම් යැ විපරිණාමධම් යි.

මේ වදාරන ලද්දේ මැනු, බුදුන් විසින්:

"මහණෙනි, තෙපි නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ අවිපරිණාමස්වභාව වූ යම් පරිග්‍රහයෙක් ශාශ්වතිකයක් සෙයින් එසේ ම සිටුනේ නම්, එබඳු පරිග්‍රහයක් දකිවු දැ?'යි 'නෙල නැත් මැ ය වහන්ස'. සොඳුරු යැ මහණෙනි, ඇපි දු මහණෙනි, යම් පරිග්‍රහයෙක් නිත්‍ය-ධ්‍රැව-ශාශ්වත-අවිපරිණාමස්වභාව වූයේ ශාශ්වතිකයක් මෙන් එසෙයින් මැ සිටුනේ නම්, නෙල පරිග්‍රහය නො දකුම්හ''යි. පරිග්‍රහයෝ නිත්‍ය වූවාහු ස්ථිර වූවාහු ශාශ්වත වූවාහු අවිපරිණාමස්වභාව වූවාහු නැති, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත් නුයි 'න සන්ති නිච්චා පරිග්ගහා' යනු වේ.

**විනාභාවං සන්තමෙවිදන්ති** – නානාභාවෙ විනාභාවෙ අඤ්ඤථාභාවෙ සන්තෙ සංවිජ්ජමානෙ[1] උපලබ්භියමානෙ; වුත්තං හෙතං භගවතා; "අලං ආනන්ද, මා සොචි, මා පරිදෙවි. නනු එතං මයා ආනන්ද, පටිගච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො. තං කුතෙත්ථ ආනන්ද, ලබ්භා, යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජතී"ති.[a] පුරිමානං පුරිමානං ඛන්ධානං ධාතූනං ආයතනානං විපරිණාමඤ්ඤථාභාවා පච්ඡිමා පච්ඡිමා ඛන්ධා ච ධාතුයො ච ආයතනානි ච පවත්තන්තීති– 'විනාභාවං සන්තමෙවිදං.'

**ඉති දිස්වා නාගාරමාවසෙති** – 'ඉතී'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං ඉතීති. **ඉති දිස්වා** – පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මමත්තෙසූති 'ඉති දිස්වා'; **නාගාරමාවසෙති**[2] – සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපලිබොධං ඡින්දිත්වා සන්නිධිපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චන[3]භාවං උපගන්ත්වා එකො චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති 'ඉති දිස්වා නාගාරමාවසෙ'.

තෙනාහ භගවා:

"සොචන්ති ජනා මමායිතෙ
න හි සන්ති නිච්චා පරිග්ගහා,
විනාභාවං සන්තමෙවිදං
ඉති දිස්වා නාගාරමාවසෙ"ති.[2]

## 6 – 8

මරණෙනපි තං පහීයති
යං පුරිසො මමිදන්ති මඤ්ඤති,
එතං දිස්වාන[4] පණ්ඩිතො
න මමත්තාය නමෙථ මාමකො.

**මරණෙනපි තං පහීයතීති** – 'මරණ'න්ති යා[5] තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්සුපච්ඡෙදො;[b] තන්ති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං; **පහීයතීති** – පහීයති ජහීයති විජහීයති අන්තරධායති විප්පලුජ්ජති. භාසිතම්පිහෙතං:

1. "පුබ්බෙව මච්චං විජහන්ති භොගා
මච්චො ච තෙ පුබ්බතරං ජහාති,
අසස්සතා භොගිනො කාමකාමී
තස්මා න සොචාමහං සොකකාලෙ.[c]

---

1. සංවිජ්ජමානෙ අඤ්ඤ – සීමු. I. 2. න ඝරමාවසෙති – මනුප.
3. ආකිඤ්චන – ස්‍යා. 4. එතම්පි විදිත්වා – ස්‍යා, මනුප. 5. යං – සීමු. I.
a. දීඝනිකාය – මහාපරිනිබ්බානසුත්ත. b. පටිච්චසමුප්පාදවිභඞ්ග.
c. මණිකුණ්ඩලජාතක.

**විනාභාවං සන්තමෙවිදං** - නානාභාවය විශොගභාවය අන්‍යථාභාවය ඇතිකල්හි විද්‍යමාන කල්හි ලැබෙන කල්හි; මේ වදාරන ලද මැ ය බුදුන් විසින්: "ආනන්‍ද, තහමක් ශොක කර, තහමක් පරිදෙවනා කර; ආනන්‍ද, මා විසින් මෙය පලමු (කලින්) මැ කියන ලද්දේ නො වේ ද, සියලු මැ ප්‍රිය මනාපයන් කෙරෙන් (ජාත්‍යාදිය හෙතු කොටගෙන) නානාභාවය විශොගභාවය අන්‍යථාභාවය වෙයි. ආනන්‍ද, යමක් ජාත නම් භූත නම් ප්‍රත්‍යයොත්පන්න නම් බිඳෙන පියවි ඇත් නම් එය තහමක් බිඳේව'යි, එය කොයින් ලැබේ ද, මේ කාරණය විද්‍යමාන නො වේ"ය යි. පලමු පලමු හටගත් ස්කන්ධ-ධාතු-ආයතනයන්ගේ ප්‍රකෘතිය හැර අන්‍යථාත්වයට පැමිණීම හෙතු කොට ගෙන පසු පසු වූ ස්කන්ධ-ධාතු-ආයතනයෝ පවත්නාහු නුයි - 'විනාභාවං සන්තමෙවිදං' යනු වේ.

**ඉති දිස්වා නාගාරමාවසෙ** - 'ඉති' - තෙල 'ඉති' යනු: පදසන්ධි යැ, පදසංයොග යැ පදපූරණ යැ, අක්‍ෂරසන්නිපාත යැ, ව්‍යඤ්ජනයන්ගේ සිලිටුබව යැ, පදයන්ගේ අනුපිළිවෙල නම් වේ. **දිස්වා** මමායිත වස්තුවිෂයෙහි බලා තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නුයි 'ඉති දිස්වා' යනු වේ. **නාගාරමාවසෙ** - සියලු ගෘහවාසපලිබොධය (=කරදරය) සිඳ, අඹුදරුපලිබොධය සිඳ, ඥාතිපලිබොධය සිඳ, මිත්‍රාමාත්‍යපලිබොධය සිඳ, සන්නිධිපලිබොධය සිඳ, කෙස්දැළිරවුළු බහා කහවත් හැඳපෙරවැ, ගිහිගෙන් නික්මැ සස්නෙහි පැවිදි වැ, කිසිවක් නැතිබවට පැමිණ, එකලා වැ හැසිරෙන්නේය වෙසෙන්නේය ඉරියවු පවත්වන්නේය පාලන-යපන-යාපනය කරන්නේ නුයි 'ඉති දිස්වා නාගාරමාවසෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සොචන්ති ජනා-පෙ-ඉති දිස්වා නාගාරමාවසෙ" යනු.

**6 – 8**

පුරුෂ තෙමේ යම් රූපාදියක් 'මේ මාගේ' යයි මමායනාවශයෙන් හඟනේ නම්, එය මරණයෙන් නමුදු දුරුකරනු ලැබෙයි. බුද්ධාදීන් කෙරෙහි මාමක වූ පණ්ඩිත තෙමේ රූපාදීයෙහි තෙල ආදීනවය දැක මමත්වයට නො නැමෙන්නේ යි.

**මරණෙනපි තං පහීයති** - 'මරණං' යනු: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙන් යම් ච්‍යුතියෙක් ච්‍යුතවන බවෙක් බිඳීමෙක් අතුරුදහන් වීමෙක් මෘත්‍යුසඞ්ඛ්‍යාත මරණයෙක් කළුරියකිරීමෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් කළෙවරයාගේ බහාලීමෙක් ජීවිතෙන්‍ද්‍රියයාගේ සිඳීමෙක් වේ ද එය යි. **තං** - ඒ රූපය වෙදනාව සංඥාව සංස්කාරය විඥානය; **පහීයති** - ප්‍රහීණ කරනු ලැබෙයි, හරිනු ලැබෙයි, වෙසෙසින් හරිනු ලැබෙයි, අතුරුදහන් වෙයි, සුණුවිසුණු වේ. මේ කියන ලදුයේ මැ ය:

1. භොගයෝ පලමු මැ මිනිසා දුරු කෙරෙති (=අත්හරිති). මිනිසා ද ඊටත් පෙරටුව ඒ භොගයන් දුරු කෙරෙයි. එම්බා කාමකාමිය, (ලොවැ) කාමභොගීනු අශාශ්වතයෝ යැ. එහෙයින් මම මහාජනයා ශොක කරන කල්හි ශොක නො කෙරෙමි.

2. උදෙති ආපූරති වෙති චන්දො
අත්ථඞ්ගමෙත්වාන පලෙති සූරියො,
විදිතා මයා සත්තුක! ලොකධම්මා
තස්මා න සොචාමහං සොකකාලෙ”ති.[a]

මරණෙනපි තං පහීයති.

**යං පුරිසො මමිදන්ති මඤ්ඤතීති** – ‘ය’න්ති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං; **පුරිසොති** සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො; **මමිදන්ති මඤ්ඤතීති** තණ්හාමඤ්ඤනාය මඤ්ඤති, දිට්ඨිමඤ්ඤනාය මඤ්ඤති, මානමඤ්ඤනාය මඤ්ඤති, කිලෙසමඤ්ඤනාය මඤ්ඤති, දුච්චරිතමඤ්ඤනාය මඤ්ඤති, පයොගමඤ්ඤනාය මඤ්ඤති, විපාකමඤ්ඤනාය මඤ්ඤතීති ‘යං පුරිසො මමිදන්ති මඤ්ඤති.’

**එතං දිස්වාන[1] පණ්ඩිතොති** – එතං ආදීනවං ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මමත්තෙසූති –එතං[2] දිස්වාන; **පණ්ඩිතොති** – ධීරො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවීති – ‘එතං දිස්වාන පණ්ඩිතො.’

**න මමත්තාය නමෙථ මාමකොති** – ‘මමත්තා’ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තං ච දිට්ඨිමමත්තං ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං; **මාමකොති** – මාමකො බුද්ධමාමකො ධම්මමාමකො සඞ්ඝමාමකො; සො තං භගවන්තං මමායති. භගවා තං පුග්ගලං පරිග්ගණ්හාති. වුත්තං හෙතං භගවතා: “යෙ තෙ භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ, භික්ඛූ මාමකා. අපගතා ච තෙ භික්ඛවෙ, භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. න ච පන තෙ ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. යෙ ච ඛො තෙ භික්ඛවෙ, භික්ඛූ නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා, තෙ ඛො මෙ භික්ඛවෙ, භික්ඛූ මාමකා. අනපගතා ච තෙ භික්ඛවෙ, භික්ඛූ ඉමස්මා ධම්මවිනයා; තෙ ච ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති.[b]

3. “කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා,
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ.

4. නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ”ති.[b]

---

1. එතම්පි විදිත්වා - ස්‍යා. මනුප  2. එතම්පි - සීමු. II
a. ජාතක - පඤ්චකනිපාත - මණිකුණ්ඩලජාතක.
b. චතුක්කඞ්ගුත්තර - උරුවෙලවග්ග.

2. එම්බා සත්තුකය, මා විසින් (ලාභාලාභාදි) ලෝකධර්මයෝ දැනගන්නා ලද්දහ, සඳු උදයට පැමිණෙයි, පිරෙයි, යළි ගෙවී යෙයි. හිරු උදයට පැමිණ යළි අස්තයට යෙයි. (එසෙයින් භොගයෝ උපදිති යළි වැනැසෙත්;) එහෙයින් මම මහජනයා ශොක කරන කල්හි ශොක නො කරමි යයි.

**යං පුරිසො මමිදන්ති මඤ්ඤති** - 'යං' යනු: යම් රූප-වේදනා සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණගතයක්; **පුරිසො** යනු: සඞ්ඛ්‍යා යැ සංඥා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ නාමකර්ම යැ නාමධෙය්‍ය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප යි; **මමිදන්ති මඤ්ඤති** - තෘෂ්ණායෙන් උපන් මානයෙන් සිතයි (-මාන කෙරෙයි,) දෘෂ්ටිමඤ්ඤනාවෙන් මාන කෙරෙයි, සහජාත මානමඤ්ඤනාවෙන් මාන කෙරෙයි' ක්ලේශමඤ්ඤනාවෙන් මාන කෙරෙයි, දුශ්චරිතමඤ්ඤනාවෙන් මාන කෙරෙයි, ප්‍රයොගමඤ්ඤනාවෙන් මාන කෙරෙයි, විපාකමඤ්ඤනාවෙන් මාන කෙරේ නුයි - 'යං පුරිසො මමිදන්ති මඤ්ඤති' යනු වේ.

**එතං දිස්වාන පණ්ඩිතො** - මමත්ව කළ වස්තුවිෂයෙහි තෙල ආදීනවය දැන තුලනය කොට තීරණය කොට විභාවිතය කොට විභූත කොට නුයි 'එතං දිස්වාන' යනු වේ. **පණ්ඩිතො** - ධීර වූයේ ප්‍රඥාවත්-බුද්ධිමත්-ඥානවත් - විද්වත් වූයේ මෙධා ඇතියේ නුයි - 'එතං දිස්වාන පණ්ඩිතො' යනු වේ.

**න මමත්තාය නමෙථ මාමකො** - 'මමත්තා' යනු මමත්ව දෙකෙක... **මාමකො** - මමත්වය ඇතියේ බුද්ධමාමක - ධම්මමාමක - සඞ්ඝමාමක වූයේ; හෙතෙම ඒ බුදුන් මමායන කෙරෙයි. බුදුහු ඒ පුහුලා විමසති: මේ වදාරන ලද මැයි, භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, යම් ඒ මහණ කෙනෙක් කුහක වූවාහු තද වූවාහු ප්‍රත්‍යය නිමිත්තෙන් බණන්නාහු සැරෙසන පියවි ඇත්තාහු නැගුණු මානනල ඇත්තාහු සමාධි රහිත වූවාහු වෙත් ද, මහණෙනි ඒ මාගේ භික්ෂූහු මා අයත් වූවාහු නො වෙති, මහණෙනි, ඒ භික්ෂූහු මෙ සස්නෙන් බැහැර වූවාහු ද වෙති. තවද ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වෘද්ධියට ස්ථිරබවට විපුල බවට නො ද පැමිණෙත්. මහණෙනි, තවද යම් භික්ෂු කෙනෙක් කුහක නොවූවාහු ලපක නොවූවාහු ධීර වූවාහු නොතද වූවාහු එකඟ සිත් ඇත්තාහු වෙත් ද, මහණෙනි, ඒ මාගේ භික්ෂූහු මා අයත් වූවාහු වෙති, තවද මහණෙනි, ඒ භික්ෂූහු මෙ සස්නෙන් බැහර නොවූවාහු වෙති, ඔවුහු මෙ සස්නෙහි වැඩීමට ස්ථාවුරු බවට පැතුරුණු බවට ද පැමිණෙත්.

3. කුහක වූ කොපයෙන් හා මානයෙන් තද වූ ප්‍රත්‍යය පිළිබඳ කොට කථා කරන නැගුණු මානනල ඇති සමාධි රහිත වූ යම් කෙනෙක් වෙත් නම්, ඔවුහු සම්මාසම්බුදුන් වදාළ සසුන්දහම්හි නො වැඩෙත්.

4. කුහක නො වූ ලපක නො වූ ධෘතිමත් වූ නොතද වූ මොනොවට එකඟ කළ සිත් ඇති යම් කෙනෙක් වෙත් නම්, ඔවුහු එකාන්තයෙන් සම්මාසම්බුදුන් වදාළ සසුන්දහම්හි වැඩෙත්.

**න මමත්තාය නමෙථ මාමකොති** – මාමකො තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා මමත්තාය න නමෙය්‍ය, න ඔනමෙය්‍ය, න තන්නින්නො අස්ස, න තප්පොණො න තප්පබ්භාරො න තදධිමුත්තො න තදධිපතෙය්‍යොති – න මමත්තාය නමෙථ මාමකො.
තෙනාහ භගවා:

"මරණෙනපි තං පහීයති
යං පුරිසො මමිදන්ති මඤ්ඤති,
එතං දිස්වාන පණ්ඩිතො
න මමත්තාය නමෙථ මාමකො''ති.

### 6 – 4

සුපිනෙන[1] යථාපි සඞ්ගතං[2]
පටිබුද්ධො පුරිසො න පස්සති,
එවං[3] පියායිතං ජනං
පෙතං කාලකතං න පස්සති.

**සුපිනෙන යථාපි සඞ්ගතන්ති** – සඞ්ගතං සමාගතං සමාහිතං සන්නිපතිතන්ති 'සුපිනෙන යථාපි සඞ්ගතං.'

**පටිබුද්ධො පුරිසො න පස්සතීති** – යථා පුරිසො සුපිනගතො චන්දං පස්සති, සූරියං පස්සති, මහාසමුද්දං පස්සති, සිනෙරුං පබ්බතරාජානං පස්සති, හත්ථිං පස්සති, අස්සං පස්සති, රථං පස්සති, පත්තිං පස්සති, සෙනාබ්‍යූහං පස්සති, ආරාමරාමණෙය්‍යකං පස්සති, වනරාමණෙය්‍යකං පස්සති, භූමිරාමණෙය්‍යකං පස්සති, පොක්ඛරණීරාමණෙය්‍යකං පස්සති; පටිබුද්ධො න කිඤ්චි පස්සතීති 'පටිබුද්ධො පුරිසො න පස්සති.'

**එවං පියායිතං ජනන්ති** – 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං; **පියායිතං ජනන්ති** පියායිතං මමායිතං ජනං, මාතරං වා පිතරං වා භාතරං වා භගිනිං වා පුත්තං වා ධීතරං වා මිත්තං වා අමච්චං වා ඤාතිසාලොහිතං වාති[4] 'එවං පියායිතං ජනං.'[5] **පෙතං කාලකතං න පස්සතීති** – පෙතො වුච්චති මතො කාලකතො, තං පෙතං න පස්සති, න දක්ඛති, නාධිගච්ඡති, න වින්දති, න පටිලභතීති – පෙතං කාලකතං න පස්සති.
තෙනාහ භගවා:

සුපිනෙන[6] යථාපි සඞ්ගතං
පටිබුද්ධො පුරිසො න පස්සති,
එවං[7] පියායිතං ජනං
පෙතං කාලකතං න පස්සතී''ති.

### 6 – 5

දිට්ඨාපි සුතාපි තෙ ජනා
යෙසං නාමමිදං පවුච්චති,
නාමමෙවාවසිස්සති
අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො.

**දිට්ඨාපි සුතාපි තෙ ජනාති** – 'දිට්ඨා'ති යෙ චක්ඛුවිඤ්ඤාණාභිසම්භූතා; **සුතාති** යෙ සොතවිඤ්ඤාණාභිසම්භූතා; **තෙ ජනාති** ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා චාති 'දිට්ඨාපි සුතාපි තෙ ජනා.'

1. සුපිනෙපි - මනුප. 2. සංඛතං - ස. 3. එවම්පි - මනුප.
4. වා - සීමු II. 5. ජනන්ති - සීමු II. මනුප.
6. සුපිනෙපි - මනුප. 7. එවම්පි - මනුප.

**න මමත්තාය නමෙථ මාමකො** - බුද්ධාදීන් කෙරෙහි මමත්වය ඇතියේ තෘෂ්ණාමමත්වය හැර දෘෂ්ටිමමත්වය දුරු කොට මමත්වයට නො නැමෙත්තේය, අවනත නො වන්නේය, ඊට නැමුණේ ඊට ප්‍රවණ වූයේ ඊට බර වූයේ එහි ඇලුණේ එය අධිපති කොට ඇතියේ නො වන්නේ නුයි 'න මමත්තාය නමෙථ මාමකො, යනු වේ.

එසින් වදාළහ බුදුහු:

"මරණෙනපි තං පහීයති-පෙ-න මමත්තාය නමෙථ මාමකො" යි.

## 6 - 4

පුරුෂ තෙමේ සිහිනෙන් පැමිණ හෝ දක්නා ලද චන්ද්‍රාදි කිසිවක් පිබිදියේ යම්සේ නො දකී ද, එසෙයින් පරලොව ගිය කලුරිය කළා වූ ප්‍රිය කළ සත්ත්වයා නො දකී.

**සුපිනෙන යථාපි සඞ්ගතං** - හමු වූ සමීපයට පැමිණි එක් වූ පිඬු වූවාහු නුයි 'සුපිනෙන යථාපි සඞ්ගතං, යනු වේ.

**පටිබුද්ධො පුරිසො න පස්සති** - පුරුෂ තෙමේ නිදන්නේ සඳ දකී, හිරු දකී, මහමුහුද දකී, මහමෙර දකී, ඇතකු - අසකු - රියක් - පාබලසෙනඟක් - සේනාසමූහයක් දකී, සිත්කලු අරම් - සිත්කලු උයන් - සිත්කලු බිම්පෙදෙස් - සිත්කලු පොකුණු දකී, (එතෙකුදු වත්) පිබිදියේ යම්සේ කිසිවක් නො දකී ද, එහෙයින් 'පටිබුද්ධො පුරිසො න පස්සති, යනු වේ.

**එවං පියායිතං ජනං** - 'එවං' යනු: ඖපම්‍ය දැක්වීම යි; **පියායිතං ජනං** - ප්‍රිය කළ මමත්වය කළ සත්ත්වයා: මව හෝ පියා හෝ බෑයා හෝ බුහුන හෝ පුතු හෝ දූ හෝ මිතුරකු හෝ යහළුවකු හෝ නෑ-සහලේ-නෑයකු හෝ නුයි 'එවං පියායිතං ජනං' යනු වේ. **පෙතං කාලකතං න පස්සති** - මළේ කලුරිය කෙළේ 'ප්‍රෙත, යයි කියනු ලැබේ. ඒ මළහු නො දකී නො පැමිණෙයි නො ලැබෙයි ප්‍රතිලාභ නො වේ නුයි 'පෙතං කාලකතං න පස්සති' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

"සුපිනෙන යථාපි-පෙ-කාලකතං න පස්සති" යි.

## 6 - 5

ක්ෂත්‍රියාදි යම් කෙනකුන්ගේ නාමප්‍රඥප්තිය මේ යැයි කියනු ලැබේ ද, ඒ සත්ත්වයෝ ඇසින් දුටු චක්ෂුසමුට්ඨානික රූපයෝ ද කනින් ඇසූ ශ්‍රොත්‍රසමුට්ඨානික ශබ්දයෝ ද වෙති. පරලොව ගිය සත්ත්වයාගේ නාමමාත්‍රය ම කියන්නට ඉතිරි වේ.

**දිට්ඨාපි සුතාපි තෙ ජනා** - **දිට්ඨා** - චක්ෂුර්විඥානයෙන් දක්නා ලද චක්ෂුසමුට්ඨානික රූපයෝ; **සුතා** - ශ්‍රොත්‍රවිඥානයෙන් අසන ලද ශ්‍රොත්‍රසමුට්ඨානික ශබ්දයෝ; **තෙ ජනා** - ක්ෂත්‍රිය - බ්‍රාහ්මණ - වෛශ්‍ය - ශූද්‍ර - ගෘහස්ථ - ප්‍රව්‍රජිත - දෙව - මනුෂ්‍යයෝ නුයි දිට්ඨාපි සුතාපි තෙ ජනා.

**යෙසං නාමමිදං පවුච්චතීති** – ‘යෙස’න්ති ඛත්තියානං බ්‍රාහ්මණානං වෙස්සානං සුද්දානං ගහට්ඨානං පබ්බජිතානං දෙවානං මනුස්සානං; **නාමන්ති** සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො; **පවුච්චතීති** වුච්චති පවුච්චති කථීයති භණීයති දීපීයති වොහරීයතීති ‘යෙසං නාමමිදං පවුච්චති.’

**නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යන්ති** – රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං පහියති ජහියති අන්තරධායති විප්පලුජ්ජතීති – නාමමෙවාවසිස්සති; **අක්ඛෙය්‍යන්ති** – අක්ඛාතුං කථෙතුං භණිතුං දීපයිතුං වොහරිතුන්ති ‘නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යං.’

**පෙතස්ස ජන්තුනො**–‘පෙතස්සා’ති පෙතස්ස කාලකතස්ස; **ජන්තුනොති** සත්තස්ස නරස්ස මාණවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[1] ජන්තුස්ස ඉන්දගුස්ස හින්දගුස්ස මනුජස්සාති – අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො.

තෙනාහ භගවා:

"දිට්ඨාපි සුතාපි තෙ ජනා
යෙසං නාමමිදං පවුච්චති,
නාමමෙවාවසිස්සති
අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො"ති.

**6 – 6**

සොකපරිදෙවමච්ඡරං[2]
න ජහන්ති ගිද්ධා මමායිතෙ
තස්මා මුනයො පරිග්ගහං
හිත්වා අචරිංසු ඛෙමදස්සිනො.

**සොකපරිදෙවමච්ඡරං[2] න ජහන්ති ගිද්ධා මමායිතෙති** – ‘සොකො’ති ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො අන්තොදාහො[3] අන්තොපරිදාහො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං a; **පරිදෙවොති** – ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස – පෙ – දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[4] ලාලප්පිතත්තං[5]a; **මච්ඡරියන්ති** – පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං, යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං.b අපි ච ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං, ගාහො; ඉදං වුච්චති[6] මච්ඡරියං.

---

1. ජතුස්ස – සීමු. II. මජසං සක. 2. මච්ඡරං – මනුප. 3. ඩාහො – ස.
4. ලාලපායනා – සීමු. II. මනුප. 5. ලාලපායිතත්තං – සීමු. II. මනුප.
6. ගාහො වුච්චති – II. මනුප. a. පටිච්චසමුප්පාදවිභඞ්ග.
b. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**යෙසං නාමමිදං පවුච්චති** – යෙසං – (යම්) ක්‍ෂත්‍රිය–බ්‍රාහ්මණ – වෛශ්‍ය –ශුද්‍ර–ගෘහස්ථ–ප්‍රව්‍රජිත–දෙව–මනුෂ්‍යයන්ගේ; **නාමං** – සංඛ්‍යාව සංඥාව ප්‍රඥප්තිය ව්‍යවහාරය නාමය නාමකර්මය නාමධෙය්‍යය නිරුක්තිය ව්‍යඤ්ජනය අභිලාප යි; **පවුච්චති** – පවසනු ලැබෙයි' කියනු ලැබෙයි, බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි, වහරනු ලැබේ නුයි – 'යෙසං නාමමිදං පවුච්චති' යනු වේ.

**නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යං** – රූපය වෙදනාව සංඥාව සංස්කාරය විඥානය ප්‍රහීණ වෙයි, හරිනු ලැබෙයි, අතුරුදහන් වෙයි, වැනැසේ නුයි – 'නාමමෙවාවසිස්සති' යනු වේ. **අක්ඛෙය්‍යං** – පවසන්නට කියන්නට බණන්නට දක්වන්නට වහරන්නට නුයි – 'නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යං' යනු වේ.

**පෙතස්ස ජන්තුනො** – **පෙතස්ස** යනු: පරලොව ගියහු කළුරිය කළහුගේ; **ජන්තුනො** – සත්ත්වයාගේ නර – මානව – පුරුෂ – පුද්ගල – ජීව – ජාගු – ජන්තු – ඉන්දගු – හින්දගු – මනුජයන්හුගේ නුයි – "අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"දිට්ඨාපි සුතාපි තෙ ජනා-පෙ-අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො,,යි.

## 6 - 6

මමත්වය කළ වස්තු විෂයෙහි ගිජු වූවාහු ශොකපරිදෙවමාත්සය්‍යීය යම් හෙයකින් නො හරිත් ද, එහෙයින් මුනීහු තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහය හැරපියා ක්‍ෂෙමසඞ්ඛ්‍යාත නිවන දකිමින් විසූහ.

**සොකපරිදෙවමච්ඡරං න ජහන්ති ගිද්ධා මමායිතෙ** – 'සොක' නම්: ඥතීන්ගේ විනාශයෙන් මඩනා ලද්දහුගේ හෝ භොගයන්ගේ විනාශයෙන් මඩනා ලද්දහුගේ හෝ රොගව්‍යසනයෙන් – ශීලව්‍යසනයෙන් – දෘෂ්ටිව්‍යසනයෙන් මඩනා ලද්දහුගේ හෝ මිත්‍රව්‍යසනාදි යම් කිසි ව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ හෝ යම් කිසි දුක්හෙතුවකින් මඩනා ලද්දහුගේ හෝ ශොකයෙක් ශොක කරන අයුරෙක් ශොක කරන බවෙක් අභ්‍යන්තරශොකයෙක් සිත තුළ අධිකශොකයෙක් අභ්‍යන්තරදාහයෙක් අභ්‍යන්තරපරිදාහයෙක් සිත දැවෙන අයුරෙක් දෞර්මනස්‍යෙක් ශොකශල්‍යයෙක් වේ නම් එයයි. 'පරිදෙව' නම්: නෑයන්ගේ ව්‍යසනයෙන් මඩනා ලද්දහුගේ හෝ...දෘෂ්ටිව්‍යසනයෙන් – යම් කිසි ව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ හෝ යම් කිසි දුඃඛහෙතුවකින් මඩනා ලද්දහුගේ හෝ හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් හඬන අයුරෙක් හඬන බවෙක් ගුණ කියා හඬන බවෙක් වචනයෙක් ප්‍රලාපයෙක් විප්‍රලාපයෙක් පුනපුනා කීමෙක් පුනපුනා කියන අයුරෙක් පුනපුනා කියන බවෙක් වේ නම් එය යි. **මච්ඡරියං** – මාත්සය්‍යී:... (2-3.සූත්‍රනිද්දේශය.) මේ මාත්සය්‍යී යයි කියනු ලැබේ.

**ගෙධො** වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **මමත්තා**ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තං ච දිට්ඨිමමත්තං ච -පෙ- ඉදං තණ්හාමමත්තං - පෙ - ඉදං දිට්ඨිමමත්තං; මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනො'පි සොචන්ති. අච්ඡිජ්ජන්තෙපි සොචන්ති. අච්ඡින්නෙපි සොචන්ති. මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනො'පි සොචන්ති. විපරිණමන්තෙ'පි[1] සොචන්ති. මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනො'පි පරිදෙවන්ති. අච්ඡිජ්ජන්තෙ'පි පරිදෙවන්ති. අච්ඡින්නෙ'පි පරිදෙවන්ති. මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනො'පි පරිදෙවන්ති. විපරිණමන්තෙ'පි පරිදෙවන්ති. විපරිණතෙ'පි පරිදෙවන්ති. මමායිතං වත්ථුං රක්ඛන්ති ගොපෙන්ති පරිග්ගණ්හන්ති. මමායන්ති මච්ඡරායන්ති.[2] මමායිතස්මිං වත්ථුස්මිං සොකං න ජහන්ති. පරිදෙවං න ජහන්ති. මච්ඡරියං න ජහන්ති. ගෙධං න ජහන්ති. නප්පජහන්ති න විනොදෙන්ති න බ්‍යන්තිං කරොන්ති න අනභාවං ගමෙන්තීති-සොකපරිදෙවමච්ඡරං න ජහන්ති ගිද්ධා මාමයිතෙ.

**තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනො**ති – 'තස්මා' ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා එතං ආදීනවං සම්පස්සමානා[3] මමත්තෙසූති තස්මා; **මුනයො**ති – මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි; තෙන ඤාණෙන සමන්නාගතා මුනයො මොනප්පත්තා. තීණි මොනෙය්‍යානි: කායමොනෙය්‍යං වචීමොනෙය්‍යං මනොමොනෙය්‍යං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; **පරිග්ගහ**න්ති – ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච -පෙ- අයං තණ්හාපරිග්ගහො -පෙ- අයං දිට්ඨිපරිග්ගහො; මුනයො තණ්හාපරිග්ගහං පරිච්චජිත්වා දිට්ඨිපරිග්ගහං පටිනිස්සජ්ජිත්වා චජිත්වා පරිච්චජිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තිං කරිත්වා අනභාවං ගමෙත්වා අචරිංසු විචරිංසු[4] ඉරියිංසු වත්තයිංසු පාලයිංසු යපයිංසු යාපයිංසු; **ඛෙමදස්සිනො**ති – ඛෙමං වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං; **ඛෙමදස්සිනො**ති – ඛෙමදස්සිනො තාණදස්සිනො ලෙණදස්සිනො සරණදස්සිනො අභයදස්සිනො අච්චුතදස්සිනො අමතදස්සිනො නිබ්බානදස්සිනොති 'තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනො.'

තෙනාහ භගවා:

"සොකපරිදෙවමච්ඡරං
න ජහන්ති ගිද්ධා මමායිතෙ,
තස්මා මුනයො පරිග්ගහං
හිත්වා අචරිංසු ඛෙමදස්සිනො"ති.

**6 – 7**

පතිලීනචරස්ස භික්ඛුනො
භජමානස්ස විවිත්තමාසනං,[5]
සාමග්ගියමාහු තස්ස තං[6]
යො අත්තානං[7] භවනෙ න දස්සයෙ.

---

1. විපරිණාමෙන්තෙපි - මජසං, සයා. 2. මමායිතන්ති මච්ඡරායිතන්ති - සයා.
3. සම්පස්සමානො - සීමු. I. 4. විහරිංසු - මජසං.
5. විවිත්තමාසනං - මනුප. 6. තස්ස තං - මනුප. සයා. 7. අත්තානං - මනුප.

**ගෙධ** යයි තෘෂ්ණාව කියනු ලබයි,... යම් රාගයෙක් සංරාගයෙක්... ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. **මමත්තා** – තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය දැයි මමත්ව දෙකෙකි, ... මමත්වය කළ වස්තුව අසිදගතිති සැක ඇතිව ද සොවිති, අසිඳුනා කල්හි ද සොවිති, අසිඳගත් කල්හි ද සොවිත්. මමායිත වස්තුව වෙනස් වෙතී සැක ඇතිව ද සොවිති, වෙනස් වන කල්හි ද සොවිති, වෙනස් වූ කල්හි ද සොවිත්; මමායිත වස්තුව අසිඳගතිතී සැක ඇතිව ද හඬති, අසිඳුණා කල්හි ද හඬති, • අසිඳගත් කල්හි ද හඬත්; මමත්වය කළ වස්තුව වෙනස් වෙතී සැක ඇතිව ද හඬති, වෙනස් වන කල්හි ද හඬති, වෙනස් වූ කල්හි ද හඬත්; මමත්වය කළ වස්තුව රකිති ගොපනය කෙරෙති විමසති මමායන කෙරෙති මච්ඡරායන කෙරෙති. මමායිත වස්තුවිෂයෙහි ශොකය නො හරිති, පරිදෙව නො හරිති, මසුරුබව නො හරිති, ගිජුබව නො හරිති, නො දුරු කෙරෙති නො බැහැර කෙරෙති කෙළවර නො කෙරෙති අනභාවයට නො පමුණුවත් නුයි 'සොකපරිදෙවමච්ඡරං න ජහන්ති ගිද්ධා මමායිතෙ' යනු වේ.

**තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනො** – තස්මා – එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මමායිත වස්තුවිෂයෙහි තෙල ආදීනවය දක්නාහු නුයි 'තස්මා' යනු වේ. **මුනයො** – 'මොන' යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රකාශ දැනීමෙක්...අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එයයි. ඒ නුවණින් සමන්විත වූ මුනීහු මොනප්‍රාප්තයෝ යි. මොනෙය්‍ය තුනෙකි: කායමොනෙය්‍ය වචීමොනෙය්‍ය මනොමොනෙය්‍ය යයි...(2-8.සූත්‍රනිද්දේශය.) **පරිග්ගහො** – පරිග්‍රහයෝ දෙදෙනෙකි: තෘෂ්ණාපරිග්‍රහය ද දෘෂ්ටිපරිග්‍රහය දැයි,...මුනීහු තෘෂ්ණාපරිග්‍රහය හැරපියා දෘෂ්ටිපරිග්‍රහය දුරලා ත්‍යාග කොට හැර බැහැර කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා හැසුරුණාහ වෙසෙසින් හැසුරුණාහ ඉරියවු පැවැත්වූහ පාලන – යපන – යාපන කළහ. **ඛෙමදස්සිනො** – 'ඛෙම' යි අමාමහනිවන කියනු ලැබෙයි, සියලු සංස්කාරයන්ගේ සන්හිඳීම ඇති සියලු උපධීන්ගේ දුරලීම ඇති තෘෂ්ණාක්ෂය වූ විරාග වූ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණයයි. **ඛෙමදස්සිනො** – ක්ෂෙමය දක්නාහු ත්‍රාණය – ලෙනය – ශරණය – අභය – අච්‍යුතය – අමෘතය – නිර්වාණය දක්නාහු නුයි – 'තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සොකපරිදෙවමච්ඡරං –පෙ– හිත්වා අචරිංසු ඛෙමදස්සිනො"යි.

## 6 – 7

ඒ ඒ අරමුණෙන් වැළැක්වූ සිත්හසර ඇති විවෙක අසුනක් සෙවුනා වූ ශෛක්ෂ මහණ හට ද නිරයාදි භවනයෙහි (ප්‍රතිසන්ධි විසින්) තමා නොදක්වන ඒ රහත් මහණ හට ද නිර්වාණසාමග්‍රියෙහි ලා මේ (නිරයාදි භවනයෙහි තමා නොදැක්වීම) අනුරූප යයි කියත්.

**පතිලීනචරස්ස භික්ඛුනොති** – පතිලීනචරා වුච්චන්ති සත්ත සෙඛා; අරහා පතිලීනො. කිං කාරණා පතිලීනචරා වුච්චන්ති සත්ත සෙඛා? තෙ තතො තතො චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා[1] පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා[2] සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. චක්ඛුද්වාරෙ චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. සොතද්වාරෙ චිත්තං – ඝානද්වාරෙ චිත්තං – ජිව්හාද්වාරෙ චිත්තං – කායද්වාරෙ චිත්තං – මනොද්වාරෙ චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. යථා කුක්කුටපත්තං වා නහාරුදද්දුලං වා අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරීයති, එවමෙවං තෙ තතො තතො චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. චක්ඛුද්වාරෙ චිත්තං – සොතද්වාරෙ චිත්තං – ඝානද්වාරෙ චිත්තං – ජිව්හාද්වාරෙ චිත්තං – කායද්වාරෙ චිත්තං – මනොද්වාරෙ චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. තං කාරණා පතිලීනචරා වුච්චන්ති සත්ත සෙඛා. **භික්ඛුනොති** – පුථුජ්ජනකල්‍යාණකස්ස[3] වා භික්ඛුනො සෙඛස්ස වා භික්ඛුනොති 'පතිලීනචරස්ස භික්ඛුනො.'

**භජමානස්ස විවිත්තමාසනන්ති** – ආසනං වුච්චති යත්ථ නිසීදන්ති, මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාලසන්ථාරො; තං ආසනං අසප්පායරූපදස්සනෙන රිත්තං විවිත්තං පවිවිත්තං, අසප්පායසද්දස්සවණෙන – අසප්පායගන්ධායතනෙන – අසප්පායරසායතනෙන – අසප්පායඵොට්ඨබ්බඵුසනෙන – අසප්පායෙහි පඤ්චහි කාමගුණෙහි රිත්තං විවිත්තං පවිවිත්තං, තං විවිත්තං ආසනං භජතො සම්භජතො සෙවතො නිසෙවතො සංසෙවතො පටිසෙවතොති 'භජමානස්ස විවිත්තමාසනං.'

**සාමග්ගියමාහු තස්සෙතං යො අත්තානං භවනෙ න දස්සයෙති**– 'සාමග්ගී'ති[4] තිස්සො සාමග්ගියො: ගණසාමග්ගී ධම්මසාමග්ගී අනභිනිබ්බත්තිසාමග්ගී. කතමා ගණසාමග්ගී? බහූ චෙපි භික්ඛූ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. අයං ගණසාමග්ගී. කතමා ධම්මසාමග්ගී? චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො, තෙ එකතො පක්ඛන්දන්ති පසීදන්ති සම්පතිට්ඨන්ති විමුච්චන්ති. න තෙසං ධම්මානං විවාදො පටිවාදො අත්ථි. අයං ධම්මසාමග්ගී.

---

1. පතිකුජ්ජන්තා - සයා. 2. සන්නිරුද්ධන්තා - මජසං. සයා.
3. කල්‍යාණපුථුජ්ජනස්ස - සයා. 4. සාමග්ගීයොති - සීමු. ii. සාමග්ගියාති - සයා.

**පතිලීනචරස්ස භික්ඛුනො** – සප්ත ශෛක්‍ෂයෝ පතිලීනචරයෝ යැයි කියනු ලැබෙත්. රහත්හු පතිලීනයහ. කුමක් හෙයින් සප්ත ශෛක්‍ෂයෝ පතිලීනචරයෝ යැයි කියනු ලැබෙති යත් ? ඔහු ඒ ඒ අරමුණෙන් සිත නවතමින් හකුළුවමින් පෙරළමින් අවුරමින් නිගත්මින් වළහමින් රක්මින් ගොපනය කෙරෙමින් හැසිරෙති ඉරියවු පවත්වති පාලනය – යපනය – යාපනය කෙරෙත්, චක්‍ෂුර්ද්වාරයෙහි සිත නවතමින් හකුළුවමින් හකුළමින් අවුරමින් නිගත්මින් වළනමින් රක්මින් ගොපනය කෙරෙමින් සෙරෙති හැසිරෙති ඉරියවු පවත්වති ඉරියවු උපදවති පාලනය කෙරෙති යපනය යාපනය කෙරෙති, ශ්‍රොත්‍රද්වාරයෙහි සිත...ඝ්‍රාණ – ජිහ්වා – කාය – මනො-ද්වාරයෙහි සිත නවතමින් (පස්බස්වමින්) ... පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත්. යම්සේ කුකුළුපතෙක් හෝ නහරදුදුලෙක් හෝ ගින්නෙහි ලන ලදුයේ හැකිළේ ද, නො පැතිරේ ද, එසෙයින් ම ඒ (පතිලීනචරයෝ) ඒ ඒ අරමුණෙන් සිත නවතමින් හකුළුවමින් ... වෙසෙති ... යැපෙත්. චක්‍ෂුර්ද්වාරයෙහි ..ශ්‍රොත්‍ර – ඝ්‍රාණ – ජිහ්වා – කාය – මනොද්වාරයෙහි සිත නවතමින්. . .හැසිරෙති. . . යැපෙත්. එකරුණෙන් සප්ත ශෛක්‍ෂයෝ පතිලීනචරයෝ යැයි කියනු ලැබෙත්. **භික්ඛුනො** – කල්‍යාණපෘථග්ජන භික්‍ෂුහුගේ හෝ . ශෛක්‍ෂභික්‍ෂුහුගේ හෝ නුඹ 'පතිලීනචරස්ස භික්ඛුනො, යනු වේ.

**භජමානස්ස විවිත්තමාසනං** – ඇඳ පුටු කිසි පත්කඩ සම්කඩ තණඇතිරි පත්ඇතිරි පිදුරුඇතිරි යන මේ හිඳිනා තැන 'ආසන' යයි කියනු ලැබේ, ඒ අප්‍රිය අසත්ප්‍රාය (=නොසරුප්) රූප දැකීමෙන් හිස් යැ ශූන්‍ය යැ වෙසෙසින් ශූන්‍ය යැ, අසත්ප්‍රායශබ්දශ්‍රවණයෙන් – අසත්ප්‍රාය – ගන්ධාඝ්‍රාණයෙන් – අසත්ප්‍රාය රස විඳීමෙන් – අසත්ප්‍රාය ස්පර්ශයෙන් – අසත්ප්‍රාය වූ ස්ත්‍රීන් පිළිබඳ රූපාදි පඤ්චකාමගුණයන්ගෙන් හිස් යැ ශූන්‍ය යැ වෙසෙසින් ශූන්‍ය යි, ඒ විවික්ත (=ශූන්‍ය) වූ අප්‍රිය සෙවුනා හට මැනැවින් සෙවුනා හට එළඹෙනුවහුට නිෂෙවනය කරනුවහුට මැනැවින් සෙවනය කරනුවහුට පුනපුනා ඇසුරු කරනුවහුට නුඹ 'භජමානස්ස විවිත්තමාසනං' යනු වේ.

**සාමග්ගියමාහු තමෙස්සතං යො අත්තානං භවනෙ න දස්සයෙ** – 'සාමග්ගි' – තුන් සාමග්‍රි කෙනෙක් වෙති: 'ගණසාමග්ගි ධම්මසාමග්ගි අනභිනිබ්බත්තිසාමග්ගි යැයි. 'ගණසාමග්ගි' කවරී ද යත් ? ඉදින් බොහෝ භික්‍ෂූහු නමුදු කයින් සමඟ වූවාහු සිතින් සතුටු වන්නාහු බසින් විවාද නො කරන්නාහු කිරි මුසු දිය මෙන් වූවාහු ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වෙසෙත් නම්, මෝ ගණසාමග්ගි නමු. 'ධම්මසාමග්ගි' කවරී ද යත් ? සතර සතිපට්ඨානයෝ යැ සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර සෘද්ධිපාදයෝ යැ පඤ්චේන්ද්‍රියයෝ යැ පඤ්ච බලයෝ යැ සප්ත බොධ්‍යඞ්ගයෝ යැ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගී යැ යන මොහු යි, ඔවුහු එක අරමුණෙහි පිවිසෙති පහදිති පිහිටා සිටිති විමුක්තියට පැමිණෙත්. ඒ ධර්මයන්ගේ විවාදයෙක් ප්‍රකර්ෂවිවාදයෙක් නැති, මෝ 'ධම්මසාමග්ගි' නමු.

කතමා අනභිනිබ්බත්තිසාමග්ගී? බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති. න තෙන[1] නිබ්බානධාතුයා ඌනත්තං වා පූරත්තං වා පඤ්ඤායති. අයං අනභිනිබ්බත්තිසාමග්ගී.

**භවනෙති** – නෙරයිකානං නිරයො භවනං තිරච්ඡානයොනිකානං තිරච්ඡානයොනි භවනං; පෙත්තිවිසයිකානං පෙත්තිවිසයො භවනං; මනුස්සානං මනුස්සලොකො භවනං; දෙවානං දෙවලොකො භවනන්ති 'සාමග්ගියමාහු තස්සෙතං.'

**යො අත්තානං භවනෙ න දස්සයෙති** – තස්සෙසා සාමග්ගී එතං ඡන්නං එතං පතිරූපං එතං අනුච්ඡවිකං එතං අනුලොමං, යො එවං පටිච්ඡන්නෙ නිරයෙ අත්තානං න දස්සෙය්‍ය, තිරච්ඡානයොනියා අත්තානං න දස්සෙය්‍ය, පෙත්තිවිසයෙ අත්තානං න දස්සෙය්‍ය, මනුස්සලොකෙ අත්තානං න දස්සෙය්‍ය, දෙවලොකෙ අත්තානං න දස්සෙය්‍යාති. **එවමාහු** – එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති 'සාමග්ගියමාහු තස්සෙතං යො අත්තානං භවනෙ න දස්සයෙ.'

තෙනාහ භගවා:

"පතිලීනචරස්ස භික්ඛුනො
භජමානස්ස විවිත්තමාසනං,
සාමග්ගියමාහු තස්සෙතං
යො අත්තානං භවනෙ න දස්සයෙ"ති.

**6 – 8**

සබ්බත්ථ මුනී අනිස්සිතො
න පියං කුබ්බති නොපි අප්පියං,
තස්මිං පරිදෙවමච්ඡරං
පණ්ණෙ වාරි යථා න ලිප්පති.

**සබ්බත්ථ මුනී අනිස්සිතොති** – 'සබ්බං' වුච්චති ද්වාදසායතනානි: චක්ඛුඤ්චෙව රූපා ච, සොතඤ්ච සද්දා ච, ඝානඤ්ච ගන්ධා ච, ජිව්හා ච රසා ච, කායො ච ඵොට්ඨබ්බා ච, මනො ච, ධම්මා ච; **මුනීති** – මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; **අනිස්සිතොති** – ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො; මුනි තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සිතො සොතං අනිස්සිතො ඝානං අනිස්සිතො ජිව්හං අනිස්සිතො කායං අනිස්සිතො මනං අනිස්සිතො රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ ධම්මෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං සබ්බෙ ධම්මෙ අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො[2] අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො[3] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'සබ්බත්ථ මුනී අනිස්සිතො.'

1. තෙසං - සීමු. I. 2. අනජ්ඣොසිතො - සීමු. 3. නිස්සටො - ස.

'අනභිනිබ්බත්තිසාමග්ගී' කවරී ද යත්? ඉදින් බොහෝ භික්ෂූහු පවා නිරුපධිශේෂනිර්වාණධාතුයෙන් පිරිනිවෙත් නමුදු එයින් නිර්වාණධාතුහුගේ ඌනබවෙක් හෝ පිරුණුබවෙක් හෝ නො පැනෙයි; මෝ තොමෝ 'අනභිනිබ්බත්තිසාමග්ගී' නම් වන්නීය.

**භවනෙ** – නෙරිසත්නට නරකය භවන (=ගෘහ) යැ, තිරිසන් යෝනි ඇතියනට තිරිසන් යෝනිය භවන යැ, ප්‍රේතවිෂය ඇතියනට ප්‍රේතවිෂය භවන යැ, මිනිසුන්ට මිනිස් ලොව භවන යැ, දෙවියනට දෙව්ලොව භවනය නුයි 'සාමග්ගියමාහු තස්සෙතං' යනු වේ.

**යො අත්තානං භවනෙ න දස්සයෙ** – යමෙක් මෙසේ ප්‍රතිච්ඡන්න වූ නිරයෙහි තමා නො දක්වන්නේ නම්, තිරිසන් යෝනියෙහි – ප්‍රේතවිෂයෙහි මිනිස්ලොවැ – දෙව්ලොවැ තමා නො දක්වන්නේ නම්, ඒ ක්ෂීණාස්‍රවයාහට මෝ නිර්වාණසාමග්‍රිය වෙයි, මෙය සුදුසුය ප්‍රතිරූප ය අනුච්ඡවික ය අනුලොම් වේ යයි; **එවමාහු** – මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි "සාමග්ගියමාහු තස්සෙතං යො අත්තානං භවනෙ න දස්සයෙ" යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පතිලීනචරස්ස භික්ඛුනො –පෙ– යො අත්තානං භවනෙ න දස්සයෙ" යි.

## 6 – 8

ද්වාදශායතන සංඛ්‍යාත සියලු තැන්හි තෘෂ්ණා–දෘෂ්ටිනිඃශ්‍රය රහිත වූ ක්ෂීණාස්‍රව මුනි තෙම (සත්ත්වයන් හා සංස්කාරයන් කෙරෙහි) රාගවශයෙන් ප්‍රිය නො කෙරෙයි, ප්‍රතිඝවශයෙන් අප්‍රිය නො ද කෙරෙයි, ඒ රහත්හු කෙරෙහි පරිදේවය හා මාත්සර්‍ය්‍යය පියුම්පත දිය සෙයින් නො ඇලේ.

**සබ්බත්ථ මුනි අනිස්සිතො** – 'සබ්බ' යි දොළොස් ආයතනයෝ කියනු ලැබෙති: ඇසත් රූපයෝත්, කනත් ශබ්දයෝත්, නැහැයත් ගන්ධයෝත්, දිවත් රසයෝත්. කයත් ස්ප්‍රෂ්ටව්‍යයෝත්, සිතත් ධර්මයෝත් යන මොහු යි; මුනි යනු: 'මොන' යි ඥානය කියනු ලැබෙයි,... **අනිස්සිතො** – තෘෂ්ණානිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය දැයි නිඃශ්‍රයයෝ දෙදෙනෙකි... මුනි තෙම තෘෂ්ණානිශ්‍රය හැරදමා දෘෂ්ටිනිශ්‍රය දුරලා ඇස තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් අනිඃශ්‍රිත වූයේ කන අනිඃශ්‍රිත වූයේ නැහැය අනිඃශ්‍රිත වූයේ දිව අනිඃශ්‍රිත වූයේ කය අනිඃශ්‍රිත වූයේ සිත අනිඃශ්‍රිත වූයේ රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය – ධර්මයන් කුලය ගණයා ආවාසය ලාභය යශස ප්‍රශංසාය සැපය සිවුර පිණ්ඩපාතය සෙනස්න ගිලන්පසබෙහෙත්පිරිකර කාමධාතුව රූපධාතුව අරූපධාතුව කාමභවය රූපභවය අරූපභවය සඤ්ඤාභවය අසඤ්ඤාභවය නෙවසඤ්ඤානාසඤ්ඤාභවය එකවොකාරභවය චතුවොකාරභවය පඤ්චවොකාරභවය අතීතය අනාගතය වර්තමානය රූපායතනය සද්දායතනය ගන්ධ-රස-පොට්ඨබ්බායතනය ධම්මායතනය සියලු ධර්මයන් තෘෂ්ණාදෘෂ්ටි විසින් අනිශ්‍රිත වූයේ නො ඇලුණේ නො පැමිණියේ ඇතුළු නො වූයේ නො බැසගත්තේ නික්මැ ගියේ හළයේ වෙසෙසින් මිදුණේ විසංයොග වූයේ විගතමර්‍ය්‍යාද කළ සිතින් යුක්ත වැ වෙසේ නුයි 'සබ්බත්ථ මුනී අනිස්සිතො' යනු වේ.

**න පියං කුබ්බති නොපි අප්පියන්ති** - පියාති ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා පියා? ඉධ යස්ස තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා, මාතා වා පිතා වා භාතා වා භගිනී වා පුත්තා වා ධීතා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, ඉමෙ සත්තා පියා. කතමෙ සඞ්ඛාරා පියා? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා පියා.

**අප්පියාති** - ද්වෙ අප්පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා අප්පියා? ඉධ යස්ස තෙ හොන්ති අනත්ථකාමා අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා ජීවිතා වොරොපෙතුකාමා, ඉමෙ සත්තා අප්පියා. කතමෙ සඞ්ඛාරා අප්පියා? අමනාපිකා රූපා අමනාපිකා සද්දා අමනාපිකා ගන්ධා අමනාපිකා රසා අමනාපිකා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා අප්පියා.

**න පියං කුබ්බති නොපි අප්පියන්ති** 'අයං මෙ සත්තො පියො,' ඉමෙ ච මෙ සඞ්ඛාරා මනාපා'ති රාගවසෙන පියං න කරොති. 'අයං මෙ සත්තො අප්පියො, ඉමෙ සඞ්ඛාරා අමනාපා'ති පටිඝවසෙන අප්පියං න කරොති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති 'න පියං කුබ්බති නොපි අප්පියං.'

**තස්මිං පරිදෙවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පතීති** - 'තස්මි'න්ති තස්මිං පුග්ගලෙ අරහන්තෙ ඛීණාසවෙ, **පරිදෙවොති** - ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[1] ලාලප්පිතත්තං[a][2] **මච්ඡරියන්ති** පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා[3] අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං.[b] අපිච, ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං, ගාහො වුච්චති මච්ඡරියං.

**පණ්ණෙ වාරි යථා න ලිප්පතීති** - පණ්ණං වුච්චති පදුමපත්තං; **වාරි** වුච්චති උදකං; යථා වාරි පදුමපත්තෙ න ලිප්පති න සංලිප්පති න උපලිප්පති, අලිත්තං අසංලිත්තං අනුපලිත්තං, එවමෙවං තස්මිං පුග්ගලෙ අරහන්තෙ ඛීණාසවෙ පරිදෙවො ච මච්ඡරියඤ්ච න ලිප්පති න සංලිප්පති න උපලිප්පති අලිත්තො අසංලිත්තො අනුපලිත්තො; සො ච පුග්ගලො තෙහි කිලෙසෙහි න ලිප්පති න සංලිප්පති න උපලිප්පති අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[4] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'තස්මිං පරිදෙවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පති.'

---

1. ලාලප්පායනා - සීමු. II. 2. ලාලප්පායිතත්තං සීමු. II. මනුප.
3. කටුකඤ්චුතා - මනුප. 4 නිස්සතො - ස.
a විභඞ්ගපාළි - පටිච්චසමුප්පාදවිභඞ්ග. b. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**න පියං කුබ්බති නොපි අප්පියං** – ‘පියා’ යනු: ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. කවර සත්හු ප්‍රියයෝ ද යත්? මෙලොවැ මව හෝ පියා හෝ බෑයා හෝ භගිනිය හෝ දුව හෝ පුතා හෝ මිතුරෝ හෝ සබඳයෝ හෝ නෑයෝ හෝ සහලේනෑයෝ හෝ යම් කෙනෙක් වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු සුව කැමැත්තාහු යොගක්ෂේමය කැමැත්තාහු වෙත් නම්, මේ සත්ත්වයෝ ප්‍රියයෝ යැ. ප්‍රිය වූ සංස්කාරයෝ කවරහු ද යත්? මනවඩන රූපයෝ යැ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යන මොහු ප්‍රිය වූ සංස්කාරයෝ යි.

**අප්පියා** යනු: අප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. අප්‍රිය සත්ත්වයෝ කවරහ යත්? මේ ලොවැ යම් කෙනෙක් අවැඩ කැමැත්තාහු අහිත කැමැත්තාහු නො සුව කැමැත්තාහු අයොගක්ෂේමය කැමැත්තාහු දිවි තොරකරනු කැමැත්තාහු වෙත් නම්, මේ සත්හු අප්‍රියයෝ යැ. අප්‍රිය වූ සංස්කාරයෝ කවරහ යත්? අමනාප වූ රූපයෝ යැ – ශබ්දයෝ යැ – ගන්ධයෝ යැ – රසයෝ යැ අමනාප වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, යන මොහු අප්‍රිය වූ සංස්කාරයෝ යි.

**න පියං කුබ්බති නොපි අප්පියං** – ‘මේ සත්ත්ව මට ප්‍රිය යැ, මේ සංස්කාරයෝ මට මනාපයෝ යැ’යි රාගවශයෙන් ප්‍රිය නොකෙරෙයි. ‘මේ සත්ත්ව මට අප්‍රිය යැ, මේ සංස්කාරයෝ අමනාපයෝ යැ’යි ප්‍රතිඝවශයෙන් අප්‍රිය නො කෙරෙයි, නො දනවයි, නූපදවා නුයි ‘න පියං කුබ්බති නොපි අප්පියං’ යනු වේ.

**තස්මිං පරිදේවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පති** – ‘තස්මිං’ යි ඒ අර්හත් වූ ක්ෂීණාශ්‍රව වූ පුගුල්හු කෙරෙහි; **පරිදේව** – නම්: ඥාතිව්‍යසනයෙන් (=විනාශයෙන්) මඩනා ලද්දහුගේ හෝ, භොග විපත්තින් හෝ – රොග විපත්තින් හෝ – සීල විපත්තින් හෝ – දෘෂ්ටි විපත්තින් හෝ මඩනා ලද්දහුගේ යම්කිසි විපතකින් යුක්ත වූවහුගේ හෝ පරිදෙවදුකට හෙතු වූ යම් කිසිවකින් මඩනා ලද්දහුගේ නම කියා හැඬීම ගුණ කියා හැඬීම හඬන ආකාරය හඬන බව වචනය ප්‍රලාපය විප්‍රලාපය පුනපුනා ලපනය ලපනාකාරය පුනපුනා ලපනය කරන බව යි. **මච්ඡරිය** නම්: මාත්සර්ය්‍ය පසෙකි: ආවාසමාත්සර්ය්‍යය කුලමාත්සර්ය්‍යය ලාභමාත්සර්ය්‍යය වර්ණමාත්සර්ය්‍යය ධර්මමාත්සර්ය්‍යය කියායි. යම් මෙබඳු වූ මසුරුකමෙක් මසුරුඅයුරෙක් මසුරුකම් ඇතිබවෙක් සම්පත් සඟවන බවෙක් අනාර්ය්‍ය බවෙක් කටුකකමින් සිත හැකිළැවීමෙක් සිත මසුරුකමින් ගත්තා ලද බවෙක් වේ ද, මේ මාත්සර්ය්‍ය යයි කියනු ලැබේ. තවද ස්කන්ධමාත්සර්ය්‍යය ද – ධාතුමාත්සර්ය්‍යය ද – ආයතනමාත්සර්ය්‍යය ද ‘මච්ඡරිය’ නම්. ග්‍රහණය මාත්සර්ය්‍ය යයි කියනු ලැබේ.

**පණ්ණෙ වාරි යථා න ලිප්පති** – ‘පණ්ණෙ’ යි පියුම්පත කියනු ලැබෙයි; ‘වාරි’ යි ජලය කියනු ලැබේ. යම් සේ ජලය පියුම්පතෙහි නො ඇලේ ද වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වේ ද එසෙයින් ම අර්හත් ක්ෂීණාශ්‍රව වූ ඒ පුගුල්හු කෙරෙහි පරිදෙවය ද, මාත්සර්ය්‍යය ද නොඇලෙයි වෙසෙසින් නො ඇලෙයි නො තැවැරෙයි, අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ වෙයි; ඒ පුද්ගල තෙමේ ද ඒ කෙලෙසුන් සමග නො ඇලෙයි වෙසෙසින් නො ඇලෙයි නො තැවැරෙයි අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ නික්මැ ගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ වෙන්වූයේ විගතමර්‍යාදා කළ (=මිදීගිය) සිතින් යුක්ත ව වෙසේ නුයි – “තස්මිං පරිදේවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පති” යනු වේ.

තෙනාහ භගවා:

"සබ්බත්ථ මුනි අනිස්සිතො
න පියං කුබ්බති නොපි අප්පියං,
තස්මිං පරිදෙවමච්ඡරං
පණ්ණෙ වාරි යථා න ලිප්පතී"ති.

## 6 – 9

උදබින්දු යථාපි පොක්ඛරෙ
පදුමෙ වාරි යථා න ලිප්පති,[1]
එවං මුනි නොපලිප්පති
යදිදං දිට්ඨසුතං[2] මුතෙසු වා.

**උදබින්දු යථාපි පොක්ඛරෙ**ති – උදබින්දු වුච්චති උදකථෙවො;[3] පොක්ඛරං වුච්චති පදුමපත්තං; යථා උදබින්දු පදුමපත්තෙ න ලිප්පති න පලිප්පති න උපලිප්පති අලිත්තං අපලිත්තං[4] අනුපලිත්තන්ති 'උදබින්දු යථාපි පොක්ඛරෙ.'

**පදුමෙ වාරි යථා න ලිප්පතී**ති – පදුමං වුච්චති පදුමපුප්ඵං;[5] වාරි වුච්චති උදකං; යථා වාරි පදුමපුප්ඵෙ න ලිප්පති න පලිප්පති න උපලිප්පති අලිත්තං අපලිත්තං අනුපලිත්තන්ති 'පදුමෙ වාරි යථා න ලිප්පති.'

**එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වා**ති – 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං; මුනීති මොනං වුච්චති ඤාණං –පෙ– සඞ්ගමතිච්ච සො මුනි; 'ලෙපා'ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච –පෙ– අයං තණ්හාලෙපො –පෙ– අයං දිට්ඨිලෙපො; මුනි තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා දිට්ඨෙ න ලිප්පති, සුතෙ න ලිප්පති, මුතෙ න ලිප්පති, විඤ්ඤාතෙ න ලිප්පති න පලිප්පති න උපලිප්පති. අලිත්තො අපලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති 'එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වා.'

තෙනාහ භගවා:

"උදබින්දු යථාපි පොක්ඛරෙ
පදුමෙ වාරි යථා න ලිප්පති,
එවං මුනි නොපලිප්පති
යදිදං දිට්ඨසුතං[6] මුතෙසු වා"ති.

## 6 – 10

ධොනො න හි තෙන මඤ්ඤති
යදිදං දිට්ඨසුතං[6] මුතෙසු වා,
නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති
න හි සො රජ්ජති නො විරජ්ජති.

1. ලිම්පති – මු. II. සහ. 2. දිට්ඨසුතෙ – සීමු. II.
3. උදකථෙවකො – පු. 4. අසංලිත්තං – සීමු. II.
5. පදුමපත්තං – සීමු. I. 6. දිට්ඨසුතෙ – සීමු. II.

එයින් වදාළහ බුදුහු:

"සබ්බත්‍ථ මුනී අනිස්සිතො-පෙ-පණ්ණෙ වාරි යථා න ලිප්පති" යි.

## 6 – 9

පොකුරුපත්හි දියබිඳු යම්සේ නො ඇලේ ද, පියුමෙහි දිය යම් සේ නො ඇලේ ද, එසෙයින් ක්ෂීණාශ්‍රව මුනි තෙම දිට්ඨශ්‍රුතයෙහි හෝ මුතයෙහි නො ඇලේ.

**උදබින්‍දු යථාපි පොක්ඛරෙ** – 'උදබින්‍දු' යයි උදකසොතවය (=දියබිඳ) කියනු ලැබේ; 'පොක්ඛර' යි පියුම්පත කියනු ලැබේ; යම්සේ දියබිඳක් පියුම්පතෙහි නො ඇලේ ද, වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, අලිප්ත අප්‍රලිප්ත අනුපලිප්ත වේ ද එයින් 'උදබින්‍දු යථාපි පොක්ඛරෙ' යනු වේ.

**පදුමෙ වාරි යථා න ලිප්පති** – 'පදුම'යි පියුම්මල කියනු ලැබේ; 'වාරි' යි දිය කියනු ලැබෙයි; යම්සේ දිය පියුම්මලෙහි නො ඇලේ ද වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, අලිප්ත අප්‍රලිප්ත අනුපලිප්ත වේ ද, එයින් 'පදුමෙ වාරි යථා න ලිප්පති' යනු වේ.

**එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වා** – 'එවං' යනු ඖපම්‍යසම්ප්‍රතිපාදනා යැ; මුනි – 'මොන' යි ඥානය කියනු ලැබෙයි... (2-8සූත්‍රනිර්දේශය.) **ලෙපා** – තණ්හාලෙපය ද දිට්ඨිලෙපය දැයි ලෙපයෝ දෙදෙනෙකි...මුනි තෙම තණ්හාලෙපය හැරපියා දිට්ඨිලෙපය දුරලා, රූපායතනයෙහි නො ඇලෙයි, සද්දායතනයෙහි – ගන්ධ – රස – ඵොට්ඨබ්බායතනයෙහි ධර්මායතනයෙහි නො ඇලෙයි, වෙසෙසින් නො ඇලෙයි නො තැවැරෙයි, අලිප්ත අප්‍රලිප්ත අනුපලිප්ත වූයේ නික්මැගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ විසංයොග වූයේ විසංයුක්ත වූ සිතින් යුක්ත ව වෙසේ නුයි 'එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"උදබින්‍දු යථාපි පොක්ඛරෙ-පෙ-යදිදං දිට්ඨසුතං මුතෙසු වා"යි.

## 6 – 10

ක්ෂීණාස්‍රව තෙම යම් මේ (දුටු ඇසූ) රූප-ශබ්දාලම්බනයෙක් වේ ද, ඒ වස්තුවෙන් මඤ්ඤනා වශයෙන් නො සිතයි, (දැනගත්) මුත-ධර්මාලම්බනයන් කෙරෙහි හෝ මඤ්ඤනාවශයෙන් නො සිතයි, හෙ තෙම අනිත් අශුද්ධිමාර්ගයෙකින් ශුද්ධිය නො කැමැති වෙයි, හෙතෙම (බාලපුහුදුනුවන් මෙන්) නො මැ ඇලෙයි, (කලණ පුහුදුනුවන් හා ශෛක්ෂයන් මෙන්) විරාග නො ද වේ.

**ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං[1] මුතෙසු වාති** – 'ධොනො' ති ධොනා වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි.[a] කිං කාරණා ධොනා වුච්චති පඤ්ඤා? තාය පඤ්ඤාය කායදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච; වචීදුච්චරිතං – මනොදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච; රාගො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, දොසො– මොහො – කොධො – උපනාහො – මක්ඛො – පළාසො – ඉස්සා – මච්ඡරියං– මායා – සාඨෙය්‍යං – ථම්භො –සාරම්භො– මානො – අතිමානො –මදො –පමාදො –සබ්බෙ කිලෙසා – සබ්බෙ දුච්චරිතා – සබ්බෙ දරථා – සබ්බෙ පරිළාහා– සබ්බෙ සන්තාපා – සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච; තංකාරණා ධොනා වුච්චති පඤ්ඤා. අථවා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨි ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච; සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච; සම්මාවාචාය මිච්ඡාවාචා ධුතා ච ධොතා ච – සම්මාකම්මන්තෙන මිච්ඡාකම්මන්තො ධුතො ච ධොතො ච – සම්මාආජීවෙන මිච්ඡාආජීවො ධුතො ච ධොතො ච – සම්මාවායාමෙන මිච්ඡාවායාමො ධුතො ච ධොතො ච – සම්මාසතියා මිච්ඡාසති ධුතා ච ධොතා ච – සම්මාසමාධිනා මිච්ඡාසමාධි ධුතො ච ධොතො ච – සම්මාඤාණෙන මිච්ඡාඤාණං ධුතඤ්ච ධොතඤ්ච– සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්ති ධුතා ච ධොතා ච සන්ධොතා ච. අථවා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අරහා ඉමෙහි ධොනෙහි ධම්මෙහි උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො. තස්මා අරහා ධොනො. සො ධුතරාගො ධුතපාපො ධුතකිලෙසො ධුතපරිළාහොති – ධොනො.

**ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං[1] මුතෙසු වාති** – ධොනො දිට්ඨං න මඤ්ඤති. දිට්ඨස්මිං න මඤ්ඤති. දිට්ඨතො න මඤ්ඤති. දිට්ඨං මෙති න මඤ්ඤති. සුතං න මඤ්ඤති. සුතස්මිං න මඤ්ඤති. සුතතො න මඤ්ඤති. සුතං මෙති න මඤ්ඤති. මුතං න මඤ්ඤති. මුතස්මිං න මඤ්ඤති. මුතතො න මඤ්ඤති. මුතං මෙති න මඤ්ඤති. විඤ්ඤාතං න මඤ්ඤති. විඤ්ඤාතස්මිං න මඤ්ඤති. විඤ්ඤාතතො න මඤ්ඤති. විඤ්ඤාතං මෙති න මඤ්ඤති. වුත්තම්පි හෙතං භගවතා:

---

1. දිට්ඨසුතෙ – සීමු. II. 2. අසම්භාති – සීමු. II.

a. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ

**ධොනො නහි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා** - 'ධෝනෝ' යනු - 'ධෝනා' යි ප්‍රඥාව කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රජානනයෙක්...අමෝහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එය යි. කුමක් හෙයින් ප්‍රඥාව 'ධෝනා' යි කියනු ලැබෙයි යත්? ඒ ප්‍රඥායෙන් කායදුශ්චරිතය කම්පා කරන ලද්දේ ද සෝදන ලද්දේ ද මැනවින් දෙවන ලද්දේ ද වෙසෙසින් දෙවන ලද්දේ ද; වාග්දුශ්චරිතය මනෝදුශ්චරිතය ධූත-ධෝත-සන්ධෝත-නිද්ධෝත වූයේත් වෙයි, රාගය ධූත-ධෝත-සන්ධෝත-නිද්ධෝත වූයේත් වෙයි; ද්වේෂය - මෝහය - ක්‍රෝධය - උපනාහය - ම්‍රක්ෂය - පලාසය - ඊර්ෂ්‍යාව - මාත්සර්‍ය්‍යය - මායාව - ශඨබව - තද්බව - සාරම්භය - මානය - අතිමානය - මදය - ප්‍රමාදය - සියලු කෙලෙසයෝ සියලු දුශ්චරිතයෝ - සියලු දරථයෝ - සියලු සන්තාපයෝ - සියලු අකුශලාභිසංස්කාරයෝ - ධූත - ධෝත - සන්ධෝත - නිද්ධෝත වූවාහු ද වෙත්. එකරුණෙන් ප්‍රඥාව 'ධෝන' යයි කියනු ලබයි, නොහොත් සම්‍යග්දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය කම්පා කරන ලද්දී ධෝවනය කරන ලද්දී මැනැවින් ධෝවනය කරන ලද්දී වෙසෙසින් ධෝවනය කරන ලද්දී ද වෙයි; සම්‍යක්සංකල්පයෙන් මිථ්‍යාසංකල්පය කම්පිත ධෝවිත සන්ධෝවිත නිද්ධෝවිත ද වෙයි; සම්‍යග්වචනයෙන් මිථ්‍යාවචනය. .සම්‍යක්කර්මාන්තයෙන් මිථ්‍යාකර්මාන්තය... සම්‍යගාජීවයෙන් මිථ්‍යාජීවය. . .සම්‍යග්ව්‍යායාමයෙන් මිථ්‍යාව්‍යායාමය. . . සම්‍යක්ස්මෘතියෙන් මිථ්‍යාස්මෘතිය . .සම්‍යක්සමාධියෙන් මිථ්‍යාසමාධිය. . . සම්‍යග්ඥානයෙන් මිථ්‍යාඥානය. . .සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධූත-ධෝවිත-සන්ධෝවිත-නිද්ධෝවිත වූවා ද වෙයි. නොහොත් ආර්‍ය්‍යඅෂ්ටාංගිකමාර්ගයෙන් සියලු කෙලෙසයෝ සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත-ධෝත-සන්ධෝත-වූවාහු ද වෙත්. රහත්හු මේ ධෝනධර්මයන්ගෙන් උපේත වූවාහු සමුපේත උපාගත සමුපාගත උපපන්න සමුපපන්න සමන්නාගත වූවාහු වෙත්; එහෙයින් රහත්හු ධෝනයහ; ඔහු ධූතරාගයහ ධූතපාපයහ ධූතකෙලෙශයහ ධූතපරිදාහ නුයි 'ධෝන' නම් වෙත්.

**ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා** - ධෝන සඞ්ඛ්‍යාත ක්ෂීණාශ්‍රව තෙමේ (මසැසින් හෝ දිවැසින් දුටු) රූපායතනය (ත්‍රිවිධ මන්‍යනායෙන්) නො සිතයි, රූපායතනයෙහි ආත්මය ඇතැයි නො සිතයි, රූපායතනයෙන් අන්‍ය වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, රූපායතනය මාගේ යැයි නො සිත යි; ශබ්දායතනය ත්‍රිවිධ මන්‍යනායෙන් ආත්මයයි නො සිතයි, ශබ්දායතනයෙහි ආත්මය ඇතැයි නො සිතයි, ශබ්දායතනයෙන් පිටත (අන්‍ය) වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, ශබ්දායතනය මාගේ යයි නො සිතයි; (ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යායතන සඞ්ඛ්‍යාත) මුතය ආත්මයයි නො සිතයි, මුතයෙහි ආත්මය ඇතැයි නො සිතයි, මුතයෙන් අන්‍ය වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, මුතය මාගේ යයි නො සිතයි; (සිතින් දැනගත් ධර්මායතන සඞ්ඛ්‍යාත) විඥානය ආත්මයයි නො සිතයි, විඥානයෙහි ආත්මය ඇතැයි නො සිතයි, විඥානයෙන් අන්‍ය වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, විඥානය මාගේ යයි නො සිතයි. මේ වදාරන ලද මැය භාග්‍යවතුන් විසින්:

"අස්මීති[1] භික්ඛවෙ මඤ්ඤිතමෙතං. අයමහමස්මීති[1] මඤ්ඤිතමෙතං. භවිස්සන්ති මඤ්ඤිතමෙතං. න භවිස්සන්ති මඤ්ඤිතමෙතං. රූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං අරූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. මඤ්ඤිතං හි භික්ඛවෙ, රොගො, මඤ්ඤිතං ගණ්ඩො, මඤ්ඤිතං සල්ලං, මඤ්ඤිතං උපද්දවො, තස්මාතිහ භික්ඛවෙ අමඤ්ඤමානෙන චෙතසා විහරිස්සාමාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බ"න්ති[a] 'ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා.'

**නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡතීති** - ධොනො අඤ්ඤෙන අසුද්ධිමග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යාණිකපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං න ඉච්ඡති න සාදියති න පත්ථෙති න පිහෙති නාභිජප්පතීති 'නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති.'

**න හි සො රජ්ජති නො විරජ්ජතීති** - 'සබ්බෙ බාලපුථුජ්ජනා රජ්ජන්ති. පුථුජ්ජනකල්‍යාණකං උපාදාය සත්ත සෙඛා විරජ්ජන්ති. අරහා නෙව රජ්ජති නො විරජ්ජති. විරත්තො සො ඛයා රාගස්ස වීතරාගත්තා ඛයා දොසස්ස වීතදොසත්තා ඛයා මොහස්ස වීතමොහත්තා සො වුත්ථවාසො චිණ්ණචරණො -පෙ- ජාතිජරාමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති 'න හි සො රජ්ජති නො විරජ්ජති.'

තෙනාහ භගවා:

"ධොනො න හි තෙන මඤ්ඤති
යදිදං දිට්ඨසුතං මුතෙසු වා,
නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති
න හි සො රජ්ජති නො විරජ්ජතී"ති.

**ජරාසුත්තනිද්දෙසො ඡට්ඨො.**

# 7

# තිස්සමෙත්තෙය්‍යසුත්තනිද්දෙසො

**අථ තිස්සමෙත්තෙය්‍යසුත්තනිද්දෙසො වුච්චති:[2]**

**7 - 1**

මෙථුනමනුයුත්තස්ස (ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො)
විඝාතං බ්‍රූහි මාරිස,
සුත්වාන තව සාසනං
විවෙකෙ සික්ඛිස්සාම සෙ.

---

1. අස්මීනි - මු ii 2. සුත්තං වක්ඛති - සිමු II.
a සළායතනසංයුත්ත - ආසීවිසවග්ග.

“මහණෙනි; නිත්‍ය වෙමි යන මෙය මඤ්ඤිත (=දෘෂ්ටිකල්පන) යෙකි, මේ මම වෙමි යන මෙය මඤ්ඤිතයෙකි, (අනාගතයෙහි) වන්නෙමි මඤ්ඤිතයෙකි, නො වන්නෙමි මඤ්ඤිතයෙකි, සංඥී වන්නෙමි මඤ්ඤිතයෙකි, අසංඥී වන්නෙමි මඤ්ඤිතයෙකි, නෛවසංඥීනාසංඥී වන්නෙමි මඤ්ඤිතයෙකි; මහණෙනි, යම් හෙයකින් මඤ්ඤිතය රෝගයෙක් වේ ද, මඤ්ඤිතය ගණ්ඩයෙක් වේ ද, මඤ්ඤිතය ශල්‍යයෙක් වේ ද, මඤ්ඤිතය උපද්‍රවයෙක් වේ ද, එහෙයින් මහණෙනි, මෙහි ලා (තෘෂ්ණා-මාන-දෘෂ්ටි විසින්) මඤ්ඤනා නො කරන සිතින් යුක්ත ව වාසය කරම්‘හයි මෙසේ මැ තොප විසින් හික්මියැ යුත්තේයැ”යි. එහෙයින් ‘ධෝනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා’ යනු වේ.

**නාඤ්ඤෙන සුද්ධිමිච්ඡති** – ධෝන (=ක්ෂීණාශ්‍රව) තෙමේ සතර සතිපට්ඨානයන් හා, සතර සම්‍යක්ප්‍රධානයන් – සතර ඍද්ධිපාදයන් – පඤ්චෙන්ද්‍රියයන් – පඤ්චබලයන් – සප්තබොධ්‍යඞ්ගයන් – ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය හැරපියා අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙකින් මිථ්‍යාප්‍රතිපදාවකින් අනෛර්‍යාණිකපථයෙකින් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො කැමැති වෙයි, නො ඉවසයි නො පතයි නො රිසි වෙයි නො කියා නුයි ‘නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති’ යනු වේ.

**න හි සො රජ්ජති නො විරජ්ජති** – සියලු බාලපෘථග්ජනයෝ ඇලෙති, කල්‍යාණපෘථග්ජනයා පටන් සප්තශෛක්ෂයෝ විරාගයට පැමිණෙත්. රහත්හු නො මැ ඇලෙති, විරාගයට නො පැමිණෙත්. රාගය ක්ෂය වීමෙන් වීතරාග හෙයින් ද්වේෂය ක්ෂය වීමෙන් වීතදෙස හෙයින් මෝහය ක්ෂය වීමෙන් වීතමෝහ හෙයින් හෙතෙම විරක්ත යැ, වැස නිම වූ ආර්‍යවාස ඇත්තේ යැ, පුරුදු කළ චරණධම් ඇත්තේ යැ...ඔහුට ජාති ජරා මරණ ද (කඳපිළිවෙළ යයි කියන ලද) සසර ද පුනර්භවය ද නැත් නුයි ‘න හි සො රජ්ජති නො විරජ්ජති’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“ධෝනො න හි තෙන මඤ්ඤති-පෙ-න හි සො රජ්ජති නො විරජ්ජති” යි.

**සවැනි වූ ජරාසුත්‍රනිද්දේශය යි.**

# 7

# තිස්සමෙත්තෙය්‍යසුත්‍රනිද්දේශය

**ඉක්බිති තිස්සමෙත්තෙය්‍යසුත්‍රනිද්දේශය කියනු ලැබේ.**

## 7 - 1

**නිදුකාණෙනි, මෙවුන්දම්හි යෙදුණහුට (වන) උපද්‍රවය වදාළ මැනව, මුබ වහන්සේගේ අනුසසුන් අසා ත්‍රිවිධ විවේකයෙහි හික්මෙනුවම්හ. (ආයුෂ්මත් තිෂ්‍යමෛත්‍රෙය තෙමේ මෙසේ විචාළේයි.)**

**මෙථුනමනුයුත්තස්සාති** - මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො දුට්ඨුල්ලො ඔදකන්තිකො රහස්සො ද්වයංද්වයසමාපත්ති;[a] කිංකාරණා වුච්චති මෙථුනධම්මො? උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තංකාරණා වුච්චති මෙථුනධම්මො. යථා උභො කලහකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භණ්ඩනකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භස්සකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො විවාදකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො අධිකරණකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො වාදිනො 'මෙථුනකා'ති වුච්චන්ති, උභො සල්ලාපකා 'මෙථුනකා'ති වුච්චන්ති, එවමෙවං උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තං කාරණා වුච්චති මෙථුනධම්මො; **මෙථුනමනුයුත්තස්සාති** - මෙථුනධම්මෙ යුත්තස්ස පයුත්තස්ස ආයුත්තස්ස සමායුත්තස්ස තච්චරිතස්ස තබ්බහුලස්ස තග්ගරුකස්ස තන්නින්නස්ස තප්පොණස්ස තප්පබ්භාරස්ස තදධිමුත්තස්ස තදධිපතෙය්‍යස්සාති 'මෙථුනමනුයුත්තස්ස.'

**ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යොති** - 'ඉච්චා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං ඉච්චාති; **ආයස්මාති** - පියවචනං ගරුවචනං සගාරවවචනං සප්පතිස්සවචනමෙතං ආයස්මාති; **තිස්සොති** - තස්ස ථෙරස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො; **මෙත්තෙය්‍යොති** - තස්ස ථෙරස්ස ගොත්තං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරොති 'ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො.'

**විඝාතං බ්‍රූහි මාරිසාති** - 'විඝාත'න්ති විඝාතං උපඝාතං පීළනං ඝට්ටනං උපද්දවං උපස්සග්ගං; **බ්‍රූහි** - ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහි; **මාරිසාති** - 'පියවචනං ගරුවචනං සගාරවවචනං සප්පතිස්සවචනමෙතං මාරිසාති 'විඝාතං බ්‍රූහි මාරිස.'

**සුත්වාන තව සාසනන්ති** - 'තුය්හං වචනං ව්‍යප්පථං දෙසනං අනුසාසනං අනුසිට්ඨිං[1] සුත්වා සුණිත්වා උග්ගහෙත්වා උපධාරයිත්වා උපලක්ඛයිත්වාති 'සුත්වාන තව සාසනං.'

---

1. අනුසත්ථිං - ස.

a. විනයමහාවිභඞ්ග - පඨමපාරාජිකං. (තත්‍ථ "දුට්ඨුල්ලං' ඔදකන්තිකං රහස්ස"න්ති නපුංසකලිඞ්ගවසෙන දිස්සති).

**මෙථුනමනුයුත්තස්ස** – 'මෙථුනධම්ම' නම්: යම් අසද්ධර්මයෙක් ග්‍රාමධර්මයෙක් වෘෂලධර්මයෙක් වේ ද, දුෂ්ටුතිඃශ්‍රිත වූ දියකිස අන්ත කොට ඇති රහස්‍ය වූ ධර්මයෙක්, ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද එයයි. කුමක් හෙයින් 'මෙථුනධම්ම' යි කියනු ලැබේ ද යත්? රාගයෙන් රත් වූ වෙසෙසින් රුඳුණු කෙලශයෙන් තෙත් වූ කුසලවාරය මැඩගෙන සිටි කුසල්සිත ගෙවාගෙන සිටි ස්ත්‍රීපුරුෂ දෙදෙනක්හුගේ සමාන කෙලෙස් ඇති දෙදෙනක්හුගේ සවභාවය නුයි, එකරුණෙන් 'මෙථුනධම්ම' යි කියනු ලැබේ. යම් සේ කලහකරුවෝ දෙදෙන මෛථුනක(-සදෘශ)යෝ යැයි කියනු ලැබෙත් ද, ඩබරකරුවෝ දෙදෙන මෛථුනකයෝ යැයි කියනු ලැබෙත් ද, බසින් කලහකරනුවෝ දෙදෙන – විවාදකරුවෝ දෙදෙන – අධිකරණකරුවෝ දෙදෙන – වාදපථය කියනුවෝ දෙදෙන – කථා කරනුවෝ දෙදෙන මෛථුනකයෝ යැයි කියනු ලැබෙත් ද, එසෙයින් ම රාගයෙන් රත් වූ වෙසෙසින් රත් වූ කෙලෙසුත්යෙන් තෙත් වූ කුසලවාරය මැඩගෙන සිටි හාත්පසින් යටකොට ගත් කුශලචිත්තය ඇති ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ සමාන කෙලෙස් ඇති ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ සවභාවය නුයි එකරුණෙන් 'මෛථුනධම්ම' යි කියනු ලැබේ. **මෙථුනධම්මමනුයුත්තස්ස** – මෙවුන්දම්හි යෙදුණු ආදරයෙන් යෙදුණු වෙසෙසින් යෙදුණු එක්වැ යෙදුණු එය කරන්නාවූ එය බහුල කොට ඇති එය ගරුකරන්නාවූ එහි නැමුණු සිත් ඇති එහි නැමුණු කය ඇති එහි අභිමුඛ වූ කය ඇති එහි ඇලුණාවූ එය අධිපති කොට ඇත්තහුගේ නුයි 'මෙථුනමනුයුත්තස්ස' යනු වේ.

**ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො** – 'ඉච්ච' යනු. පදසන්ධි යැ, පදසංසර්ග යැ, පදපූරණ යැ, අක්ෂරසමවාය යැ, ව්‍යඤ්ජනයන්ගේ සිලිට්බව යැ, පදානුපූර්වීය නම් වෙයි මේ 'ඉච්ච' යනු; **ආයස්මා** යනු ප්‍රියවචන යැ, ගරුවචන යැ, සගෞරවවචන යැ, සප්‍රතිශ්‍රවවචන යැ මේ 'ආයස්මා' යනු. **තිස්සො** යනු: ඒ තෙරුන්ගේ නම යැ සංඛ්‍යාව යැ සංඥව යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ නාමකර්ම යැ නාමධෙය්‍ය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප යයි. **මෙත්තෙය්‍යො** – යනු: ඒ තෙරුන්ගේ ගොත්‍ර යැ සංඛ්‍යාව යැ සංඥව යැ ප්‍රඥප්තිය යැ ව්‍යවහාරය නුයි 'ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො' යනු වේ.

**විඝාතං බ්‍රෑහි මාරිස** – 'විඝාතං' යනු: වෙහෙස හිංසාව පෙළුම් ගැටුම උවදුර උපද්‍රවය; **බ්‍රෑහි** – කියව දෙසව පනවව පිහිටුවව විවරණ කරව විභංග කරව ප්‍රකට කරව ප්‍රකාශ කල මැනව; **මාරිස** යනු: ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරවවචන යැ සප්‍රතිශ්‍රවවචනයෙකි මේ 'මාරිස' යනු. එහෙයින් 'විඝාතං බ්‍රෑහි මාරිස' යනු වේ.

**සුත්වාන තව සාසනං** – ඔබගේ වචනය වාක්පථය දෙසුම අනුසස්න අනුශිෂ්ටිය අසා ශ්‍රවණය කොට උගෙන විමසා සලකා නුයි 'සුත්වාන තව සාසනං' යනු වේ.

**විවෙකෙ සික්ඛිස්සාම සෙති** - ‘විවෙකො’ති තයො විවෙකා: කායවිවෙකො චිත්තවිවෙකො උපධිවිවෙකො.

කතමො කායවිවෙකො? ඉධ භික්ඛු විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. කායෙන විවිත්තො විහරති. සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති. එකො සෙය්‍යං කප්පෙති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. අයං කායවිවෙකො.

කතමො චිත්තවිවෙකො? පඨමං ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං විවිත්තං හොති. දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං විවිත්තං හොති. තතියං ඣානං සමාපන්නස්ස පීතියා චිත්තං විවිත්තං හොති. චතුත්ථං ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං විවිත්තං හොති. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. සකදාගාමිස්ස ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අනාගාමිස්ස අනුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි බහිද්ධා ච සබ්බනිමිත්තෙහි චිත්තං විවිත්තං හොති. අයං චිත්තවිවෙකො.

කතමො උපධිවිවෙකො? උපධි වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච. උපධිවිවෙකො වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං උපධිවිවෙකො.

කායවිවෙකො ච වවකට්ඨකායානං[1] නෙක්ඛම්මාභිරතානං. චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං. උපධිවිවෙකො ච නිරූපධීනං පුග්ගලානං විසඞ්ඛාරගතානං.

**විවෙකෙ සික්ඛිස්සාම සෙති** - සො ථෙරො පකතියා සික්ඛිතසික්ඛො. අපි ච, ධම්මදෙසනං උපාදාය ධම්මදෙසනං යාචන්තො[2] එවමාහ: ‘විවෙකෙ සික්ඛිස්සාම සෙ’ති. තෙනාහ තිස්සො මෙත්තෙය්‍යො:

“මෙථුනමනුයුත්තස්ස (ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො)
විඝාතං බ්‍රූහි මාරිස,
සුත්වාන තව සාසනං
විවෙකෙ සික්ඛිස්සාම සෙ”.ති

---

1. විවෙකට්ඨකායානං - සීමු. II. වූපකට්ඨකායානං - PTS.
2. යාචමානො - මජසං.

**විවෙකෙ සික්ඛිස්සාම සෙ** – 'විවේක' නම්: කායවිවේක යැ චිත්තවිවේක යැ උපධිවිවේක යැ යි තුන් විවේක කෙනෙක් වෙති

කායවිවේකය කවරැ යත්? මෙ සස්නෙහි මහණ තෙමේ අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කඳුරැ යැ ගල්ලෙන් යැ සොහොන යැ වනපෙත් යැ අබ්බස යැ පිදුරු බිසි (කුටි) යැ යන විවේකසේනාසනයක් ඇසුරු කෙරෙයි. කයින් විවික්ත වැ වෙසෙයි. හේ එකලා වැ යෙයි. එකලා වැ සිටී. එකලා වැ හොවී. එකලා වැ ගමට පිඬු සිඟා යෙයි. එකලා වැ පෙරළා එයි. එකලා වැ රහසැ හිඳී. එකලා වැ සක්මන් කෙරෙයි. එකලා වැ හැසිරෙයි. වෙසෙයි. ඉරියව් පවත්වයි යැපෙයි යාපනය කෙරෙයි. මේ 'කායවිවේක' යැ.

චිත්තවිවේකය කවරැ යත්? ප්‍රථමධ්‍යානයට සමවැදුනහුගේ සිත නීවරණයන්ගෙන් වෙන් වූයේ වෙයි, ද්විතීයධ්‍යානයට සමවැදුනහුගේ සිත විතර්කවිචාරයන්ගෙන් වෙන් වූයේ වෙයි, තෘතීයධ්‍යානයට සමවැදුනහුගේ සිත ප්‍රීතියෙන් වෙන් වූයේ වෙයි, චතුර්ථධ්‍යානයට සමවැදුනහුගේ සිත සුඛදුඃඛයන්ගෙන් වෙන් වූයේ වෙයි, ආකාසානඤ්චායතනයට සමවැදුනහුගේ සිත රූපසංඥයෙන් ප්‍රතිඝසංඥයෙන් නානාත්මසංඥයෙන් වෙන් වූයේ වෙයි, විඤ්ඤාණඤ්චායතනයට සමවත්නහුගේ සිත ආකාසානඤ්චායතනසංඥයෙන් විවික්ත වෙයි, ආකිඤ්චඤ්ඤායතනයට සමවත්නහුගේ සිත විඤ්ඤාණඤ්චායතනසංඥයෙන් විවික්ත වෙයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්නහුගේ සිත ආකිඤ්චඤ්ඤායතනසංඥයෙන් විවික්ත වෙයි, ස්‍රොතාපන්නයාගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සායෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයයෙන් විචිකිත්සානුශයයෙන් හා ඔවුන් හා එක්වැ සිටි කෙලෙසුන්ගෙන් ද විවික්ත වෙයි, සකෘදාගාමිහුගේ සිත ඖදාරිකකාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් ඖදාරික කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා තදෙකස්ථ කෙලෙශයන් ගෙන් ද විවික්ත වෙයි, අනාගාමිහුගේ සිත අනුසහගත වූ කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් අනුසහගත කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා තදෙකස්ථ කෙලෙශයන් ගෙන් ද විවික්ත වෙයි, රහත්හු ගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යාවෙන් මානානුශයයෙන් භවරාගානුශයයෙන් අවිද්‍යානුශයයෙන් හා තදෙකස්ථ වූ කෙලෙශයන්ගෙන් ද බාහ්‍ය ව පැවැති සියලු සංස්කාරනිමිත්තයන්ගෙන් ද විවික්ත වූයේ වේ. මේ යැ චිත්තවිවේක ය.

උපධිවිවේක කවරැ යත්? කෙලෙශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද 'උපධි' යයි කියනු ලැබෙති; අමාමහ නිවන 'උපධිවිවේක' යයි කියනු ලැබේ. හේ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම යැ සියලු උපධීන්ගේ දුරැලීම යැ තෘෂ්ණාක්ෂය යැ විරාග යැ නිරොධ යැ නිර්වාණයයි. මේ උපධිවිවේක යි.

ගණසඞ්ගනිකායෙන් වෙන් වූ නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණවුන්ගේ කායවිවේකය ද, පිරිසිදු සිත් ඇති උත්තමපාරිශුද්ධියට පැමිණියවුන්ගේ චිත්තවිවේකය ද, උපධිරහිත වූ නිවනට ගිය සිත් ඇති පුද්ගලයන්ගේ උපධිවිවේකය ද වේ.

**විවෙකෙ සික්ඛිස්සාම සෙ** – ඒ තෙරණුවෝ පියවින් හික්මුණු ත්‍රිවිධ ශික්ෂා ඇත්තාහ; තමද දම්දෙසුම් සඳහා දම්දෙසුම අයදමින් මෙසේ කියති: 'විවෙකෙ සික්ඛිස්සාම සෙ' යි. එයින් කීහ, තිෂ්‍යමෛත්‍රෙය තෙරණුවෝ:

"මෙථුනමනුයුත්තස්ස -පෙ- සික්ඛිස්සාම සෙ" යි.

**7 - 2**

මෙථුනමනුයුත්තස්ස (මෙත්තෙය්‍යාති භගවා)
මුස්සතෙ වාපි[1] සාසනං,
මිච්ඡා ච පටිපජ්ජති
එතං තස්මිං අනාරියං.

**මෙථුනමනුයුත්තස්සාති** - මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො දුට්ඨුල්ලො ඔදකන්තිකො රහස්සො ද්වයංද්වයසමාපත්ති,[a] කිං කාරණා වුච්චති මෙථුනධම්මො? උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තං කාරණා වුච්චති මෙථුනධම්මො, යථා උභො කලහකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භණ්ඩනකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භස්සකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො විවාදකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො අධිකරණකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො වාදිනො 'මෙථුනකා'ති වුච්චන්ති, උභො සල්ලාපකා 'මෙථුනකා'ති වුච්චන්ති, එවමෙවං උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තං කාරණා වුච්චති මෙථුනධම්මො. මෙථුනමනුයුත්තස්සාති මෙථුනධම්මෙ යුත්තස්ස පයුත්තස්ස ආයුත්තස්ස සමායුත්තස්ස තච්චරිතස්ස[2] තබ්බහුලස්ස තග්ගරුකස්ස තන්නින්නස්ස තප්පොණස්ස තප්පබ්භාරස්ස තදධිමුත්තස්ස තදධිපතෙය්‍යස්සාති 'මෙථුනමනුයුත්තස්ස'.

**මෙත්තෙය්‍යාති** - භගවා තං ථෙරං ගොත්තෙන ආලපති; භගවාති ගාරවාධිවචනං; අපිච, භග්ගරාගොති භගවා; භග්ගදොසොති භගවා; භග්ගමොහොති භගවා; භග්ගමානොති භගවා; භග්ගදිට්ඨීති භගවා; භග්ගකණ්ටකොති භගවා; භග්ගකිලෙසොති භගවා; භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා; භවානං අන්තකරොති භගවා; භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා; භජි වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා; භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා; භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා.

---

1, මුස්සතෙ වාපි - සු අ. මුස්සතෙ වාති - ස. 2. තංචරිතස්ස - ස.
a. විනයමහාවිභඞ්ග - පඨමපාරාජිකා.

7 – 2

(මෛත්‍රෙය, සී බුදුහු මෙසේ වදාළහ:) මෙවුන්දම්හි ඇලුණහුගේ (පර්‍ය්‍යාප්ති-ප්‍රතිපත්ති) ශාසනය නැසෙයි, යළි (හෙතෙම) වරදවා පිළිපදී, ඔහු කෙරෙහි තෙල මිථ්‍යාප්‍රතිපදාව අනාර්‍ය්‍යධර්මයෙකි.

**මෙථුනමනුයුත්තස්ස** – 'මෛථුනධම්ම' නම්: යම් අසද්ධර්මයෙක් ග්‍රාම්‍යධර්මයෙක් දුෂ්ටබහුල වූ ධර්මයෙක් දියකිස අනත කොට ඇති රහස්‍ය වූ (ධර්මයෙක්) ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද එයයි. කවර කරුණෙකින් 'මෛථුනධම්ම' සී කියනු ලැබේ ද යත්? (රාගයෙන්) රත් වූ වෙසෙසින් රත් වූ (කෙලශයෙන්) තෙත් වූ කුශලවාරය මැඬගෙන සිටි කුසල්සිත යටපත් කළ ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ කෙලශයෙන් සදෘශ වූ දෙදෙනා ගේ ධර්මය නුයි එ කරුණෙන් 'මෛථුනධම්ම' සී කියනු ලැබේ; යම්සේ කලහකරුවෝ දෙදෙනෙක් මෛථුනකයෝ යැයි කියනු ලැබෙත් ද, ඩබරකරුවෝ දෙදෙනෙක් – වාක්කලහකරුවෝ දෙදෙනෙක් – විවාදකරුවෝ දෙදෙනෙක් – අධිකරණකරුවෝ දෙදෙනෙක් – වාදීහු දෙදෙනෙක් – කථාකරුවෝ දෙදෙනෙක් 'මෛථුනකයෝ' යැයි කියනු ලැබෙත් ද, එසෙයින් ම රක්ත වූ සංරක්ත වූ (කෙලශයෙන්) තෙත් වූ කුශලසිත මැඬගෙන සිටි යටපත් කළ කුසල්සිත ඇති ස්ත්‍රීපුරුෂදෙදෙනා ගේ සදෘශ වූ ස්ත්‍රීපුරුෂදෙදෙනාගේ ධර්මය නුයි - එ කරුණෙන් 'මෛථුනධම්ම' සී කියනු ලැබේ.

**මෙථුනමනුයුත්තස්ස** – මෛථුනධර්මයෙහි යුක්ත වූ ප්‍රයුක්ත වූ විශෙෂයෙන් යුක්ත වූ එක් වැ යෙදුණා වූ එය කරන්නාවූ එය බහුල වැ කරන්නාවූ එය ගරු කරන්නාවූ ඊට නැමුණාවූ ඊට නතු වූ ඊට බර වූ එහි ඇලුණා වූ එය අධිපති කොට පවත්නාහු ගේ නුයි 'මෙථුනමනුයුත්තස්ස' යනු වේ.

**'මෙත්තෙය්‍ය'** සී බුදුහු ඒ තෙරුන් ගොත්‍රයෙන් ආමන්ත්‍රණ කෙරෙති; **භගවා** යනු: ගෞරවාධිවචන සි; තවද- භග්න කළ රාග ඇත් නුයි - භගවත් යැ, භග්න ද්වෙෂ ඇත් නුයි - භගවත් යැ, භග්න මොහ ඇත් නුයි - භගවත් යැ, භග්න (=බුන්) මාන ඇත් නුයි - භගවත් යැ, බුන් දෘෂ්ටි ඇත් නුයි - භගවත් යැ; බුන් කෙලෙස් කටු ඇත් නුයි - භගවත් යැ, බුන් කෙලෙස් ඇත් නුයි - භගවත් යැ, ධර්මරත්නය භාග-විභාග-ප්‍රවිභාග කෙළේ නුයි - භගවත් යැ, භවයන් කෙළවර කෙළේ නුයි - භගවත් යැ, භාවිතකාය - භාවිතසීල - භාවිතචිත්ත - භාවිතප්‍රඥ ඇත් නුයි - භගවත් යැ, නොහොත් බුදුහු ශබ්ද රහිත වූ නිර්ඝොෂ රහිත වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස්‍යකාරණයට ස්ථාන වූ විවෙකයට අනුරූප වූ වනසෙනසුන් වෙනෙහි දුර සෙනසුන් ඉතා දුර සෙනසුන් සෙවනය කළාහු නුයි - භගවත් යැ, නොහොත් බුදුහු චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පසබෙහෙත්පිරිකරට හිමි වූවාහු නුයි - භගවත් යැ, බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමිවූවාහු නුයි - හෝ භගවත් යැ.

භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා; භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං, ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා; භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා; භගවාති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති 'මෙත්තෙය්‍යාති භගවා.'

**මුස්සතෙ වාපි[1] සාසනන්ති** – ද්වීහි කාරණෙහි සාසනං මුස්සති: පරියත්තිසාසනම්පි මුස්සති. පටිපත්තිසාසනම්පි මුස්සති. කතමං තං පරියත්තිසාසනං? යන්තස්ස පරියාපුතං[2] සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, ඉදං පරියත්තිසාසනං. තම්පි මුස්සති සම්මුස්සති පමුස්සති සම්පමුස්සති පරිබාහිරො හොතීති – 'එවම්පි මුස්සතෙ වාපි සාසනං' කතමං පටිපත්තිසාසනං? සම්මාපටිපදා අනුලොමපටිපදා අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරිපූරකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො, ඉදං පටිපත්තිසාසනං. තම්පි මුස්සති සම්මුස්සති පමුස්සති සම්පමුස්සති පරිබාහිරො හොතීති එවම්පි 'මුස්සතෙ වාපි සාසනං.'

**මිච්ඡා ච පටිපජ්ජතීති** – 'පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණතීති 'මිච්ඡා ච පටිපජ්ජති.'

**එතං තස්මිං අනාරියන්ති** – එතං තස්මිං පුග්ගලෙ අනරියධම්මො බාලධම්මො මූළ්හධම්මො අඤ්ඤාණධම්මො අමරාවික්ඛෙපධම්මො යදිදං මිච්ඡාපටිපදාති 'එතං තස්මිං අනාරියං.'

තෙනාහ භගවා:

"මෙථුනමනුයුත්තස්ස (මෙත්තෙය්‍යාති භගවා)
මුස්සතෙ වාපි සාසනං,
මිච්ඡා ච පටිපජ්ජති
එතං තස්මිං අනාරිය"න්ති.

1. මුස්සතෙ වාසි – ස.
2. පරියාපුණනං – සීමු. II. පරියාපුටං – මනුප. පරියාපුත්තං – පු.

බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රමාණ්‍යයන්ට සතර අරූප-සමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු අෂ්ටවිමොක්ෂයන්ට අෂ්ටඅභිභායතනයන්ට නවානුපූර්විහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු දශසංඥභාවනාවන්ට දශකෘත්ස්නසමාපත්තීන්ට ආනාපානස්මෘතිසමාධියට අශුභසමාපත්තියට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු සතර සතිපට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්චබලයන්ට සප්තබොධ්‍යඞ්ගයන්ට ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුයි - භගවත් යැ, බුදුහු දශවිධ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍යයන්ට සිව් පිළිසැඹියාවන්ට ෂඩ් අභිඥාවන්ට ෂඩ් බුද්ධධර්මයන්ට හිමි වූවාහු නුයි - භගවත් යැ; තෙල 'භගවත්' යන නම මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑණන් විසින් නො කරන ලද, බූණන් විසින් නො කරන ලද, සගයනළුවන් විසින් නො කරන ලද, නෑ-සහලේනෑයන් විසින් නො කරන ලද, මහණ-බමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද; යම් භගවත් යන නමක් වී නම් තෙල භාග්‍යවත් බුදුවරයන්ට විමොක්ෂාන්තයෙහි බෝමුලැ සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමග අභීත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වූවා නුයි 'මෙත්තෙය්‍යාති භගවා' යනු වේ.

**මුස්සතෙ වාපි සාසනං** - දෙ කරුණෙකින් ශාසනය නැසෙයි: පර්‍ය්‍යාප්තිශාසනය ද නැසෙයි, ප්‍රතිපත්තිශාසනය ද නැසෙයි; පර්‍ය්‍යාප්ති-ශාසනය කවරැ යත්? ඔහු විසින් පුහුණු කළ යම් සූත්‍රයෙක් ගෙය්‍ය - වෙය්‍යාකරණ - ගාථා - උදාන - ඉතිවුත්තක - ජාතක - අද්භූතධර්මයෙක් වේ ද, මේ යැ පර්‍ය්‍යාප්තිශාසනය; හෙ ද නැසෙයි වෙසෙසින් නැසෙයි ප්‍රකර්ෂයෙන් නැසෙයි අත්‍යන්තයෙන් නැසෙයි පරිබාහිර වේ නුයි මෙසේත් 'මුස්සතෙ වාපි සාසනං' යනු වේ. ප්‍රතිපත්තිශාසනය කවරැ යත්? සම්‍යක්ප්‍රතිපදාව අනුලොමප්‍රතිපදාව අවිරුද්ධප්‍රතිපදාව අන්වර්ථප්‍රතිපදාව ධර්මානුධර්මප්‍රතිපදාව සිල් පුරනසුලු බව ඉඳුරන්හි පියූ දොර ඇති බව බොජුන්හි පමණ දන්නා බව නිදිවැරීමෙහි යෙදීම සිහිනුවණ ඇති බව සතර සතිපට්ඨානය සතර සම්‍යක්ප්‍රධානය සතර ඍද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය පඤ්චබලය සප්තබොධ්‍යඞ්ගය ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යන මේ යැ ප්‍රතිපත්තිශාසනය; හෙ ද මුෂ්‍ය - සම්මුෂ්‍ය - ප්‍රමුෂ්‍ය - සම්ප්‍රමුෂ්‍ය වෙයි, පරිබාහිර වේ නුයි මෙසේත් 'සම්මුස්සතෙ වාපි සාසනං' යනු වේ.

**මිච්ඡා ච පටිපජ්ජති** - ප්‍රාණඝාත ද කෙරෙයි, නුදුන් දෙය ද ගනී, ගෘහසන්ධි බිදියි, ගම් පැහැරීම ද කෙරෙයි, ගෙවල් පැහැරීම ද කෙරෙයි, මංපැහැරීම ද කෙරෙයි, පරඹුන් කරා ද යෙයි, බොරු ද කියා නුයි 'මිච්ඡා ච පටිපජ්ජති' යනු වේ.

**එතං තස්මිං අනාරියං** - යම් මිථ්‍යාප්‍රතිපදාවක් වේ ද, තෙල ඒ පුද්ගලයා කෙරෙහි අනාර්‍ය්‍ය බව යැ බාල බව යැ මූඪ බව යැ, අඥාන බව යැ, අමරාවික්ෂෙපභාවය නුයි 'එතං තස්මිං අනාරියං' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

"මෙථුනමනුයුත්තස්ස -පෙ- එතං තස්මිං අනාරියං"යි,

7 - 8

එකො පුබ්බෙ චරිත්වාන
මෙථුනං යො නිසෙවති,
යානං භන්තංව තං ලොකෙ
හීනමාහු පුථුජ්ජනං.

**එකො පුබ්බෙ චරිත්වානාති** - ද්වීහි කාරණෙහි එකො පුබ්බෙ චරිත්වාන: පබ්බජ්ජාසඞ්ඛාතෙන වා ගණා වවස්සග්ගට්ඨෙන[1] වා. කථං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො පුබ්බෙ චරිත්වාන? සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපලිබොධං ඡින්දිත්වා සන්නිධිපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. එවං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො පුබ්බෙ චරිත්වාන; කථං ගණා වවස්සග්ගට්ඨෙන[1] එකො පුබ්බෙ චරිත්වාන? සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති. එකො සෙය්‍යං කප්පෙති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. එවං ගණා වවස්සග්ගට්ඨෙන[1] 'එකො පුබ්බෙ චරිත්වාන'.

**මෙථුනං යො නිසෙවතීති** - මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො -පෙ- ද්වයංද්වයසමාපත්ති, -පෙ- තං කාරණා වුච්චති මෙථුනධම්මො; **මෙථුනං යො නිසෙවතීති** යො අපරෙන සමයෙන බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා මෙථුනං ධම්මං සෙවති නිසෙවති සංසෙවති පටිසෙවතීති 'මෙථුනං යො නිසෙවති.'

**යානං භන්තංව තං ලොකෙති** - 'යාන'න්ති හත්ථියානං අස්සයානං ගොයානං අජයානං මෙණ්ඩයානං ඔට්ඨයානං ඛරයානං, භන්තං අදන්තං අකාරිතං අවිනීතං උප්පථං ගණ්හාති, විසමං ඛාණුම්පි පාසාණම්පි අභිරූහති, යානම්පි ආරොහකම්පි[2] භඤ්ජති[3] පපාතෙපි පපතති, යථා තං භන්තං යානං අදන්තං අකාරිතං අවිනීතං උප්පථං ගණ්හාති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො උප්පථං ගණ්හාති මිච්ඡාදිට්ඨිං ගණ්හාති -පෙ- මිච්ඡාසමාධිං ගණ්හාති. යථා තං භන්තං යානං අදන්තං අකාරිතං අවිනීතං විසමං ඛාණුම්පි පාසාණම්පි අභිරූහති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො විසමං කායකම්මං අභිරූහති. විසමං වචීකම්මං - විසමං මනොකම්මං අභිරූහති, විසමං පාණාතිපාතං අභිරූහති. විසමං අදින්නාදානං අභිරූහති. විසමං කාමෙසු මිච්ඡාචාරං අභිරූහති. විසමං මුසාවාදං අභිරූහති. විසමං පිසුනවාචං අභිරූහති. විසමං ඵරුසවාචං අභිරූහති. විසමං සම්ඵප්පලාපං අභිරූහති. විසමං අභිජ්ඣං අභිරූහති විසමං ව්‍යාපාදං අභිරූහති. විසමං මිච්ඡාදිට්ඨිං අභිරූහති. විසමෙ සඞ්ඛාරෙ අභිරූහති. විසමෙ පඤ්ච කාමගුණෙ අභිරූහති. විසමෙ පඤ්ච නීවරණෙ අභිරූහති.

1. ගණවවස්සග්ගට්ඨෙන - ස. 2. ආරොහකං - සීමු. I. 3. විභඤ්ජති - සීමු. II.

7 - 8

යමෙක් පෙර (පැවිද්දෙත්) එකලා වැ ලොවැ හැසිර (පසුව) මෙවුන්දම් සෙවුණේ නම්, නො හික්මුණු (ඇත් ආදී) යානයක් සෙයින් ඒ (සිවුරලූ) පෘථග්ජනයා ලාමක යැයි කියත්.

**එකො පුබ්බෙ චරිත්වාන** - දෙ කරුණෙකින් පෙර එකලා වැ හැසිර; ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත වූ හෝ ගණසඞ්ගණිකායෙන් වෙන් ව විසීම් අර්ථ වූ හෝ දෙ කරුණෙනි. කිසෙයින් පැවිදිකොටසින් පෙර එකලා වැ හැසිර ද යත්? ගෘහාවාසපලිබොධය සිඳ අඹුදරු පලිබොධය සිඳ ඥාතිපලිබොධය සිඳ මිත්‍රාමාත්‍යපලිබොධය සිඳ සන්නිධිපලිබොධය සිඳ කෙස්රවුළු බහා කසාවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිව කිසිවක් නැතිබවට පැමිණ එකලා වැ සෙරෙයි හැසිරෙයි ඉරියවු පවත්වයි වැටෙයි රැකෙයි යැපෙයි යාපනය වේ; මෙසේ පැවිදිකොටසින් පෙර එකලා වැ හැසිර; කිසෙයින් ගණසඞ්ගණිකායෙන් වෙන් ව විසීම් අර්ථයෙන් පෙර එකලා වැ හැසිර ද යත්? හේ මෙසේ පැවිදි වූයේ එකලා වැ නිශ්ශබ්ද වූ අතිඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස්‍යයට කාරණ වූ විවෙකානුරූප වූ වනසෙනසුන් වෙනෙහි දුරසෙනසුන් ඉතා දුරසෙනසුන් ඇසුරු කෙරෙයි' හෙතෙම එකලා වැ යෙයි, එකලා වැ සිටී, එකලා වැ හිඳී, එකලා වැ හොවී, එකලා වැ ගමට පිඬු සිඟා යෙයි, එකල වැ පෙරලා එයි, එකලා වැ විවෙකව හිඳී, එකලා වැ සක්මන් කෙරෙයි, එකලා වැ සෙරෙයි හැසිරෙයි ඉරියවු පවත්වයි වැටෙයි රැකෙයි යැපෙයි යාපනය වේ. මෙසේ ගණව්‍යවස්සර්ගාර්ථයෙන් පෙර එකලා වැ හැසිර.

**මෙථුනං යො නිසෙවති** - 'මෙවුන්දම' නම්: යම් අසද්ධර්මයෙක්... ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද එයයි,... එකරුණෙන් 'මෙවුන්දම ය' යි කියනු ලැබේ. **මෙථුනං යො නිසෙවති** - යමෙක් පසු කලෙක බුදුන් දහම් සඟුන් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කොට හීන වූ ගිහිබවට පෙරළී මෙවුන්දම් සෙවන නිසෙවන සංසෙවන ප්‍රතිසෙවන කෙරේ නුයි 'මෙථුනං යො නිසෙවති' යනු වේ.

**යානං භන්තංව තං ලොකෙ** - 'යාන' නම්: ඇත්යාන යැ අශ්වයාන යැ ගවයාන යැ එළුයාන යැ බැටළුයාන යැ ඔටුයාන යැ කොටළුයාන යි. **භන්තං** - නො දමුණු නො හික්මුණු අවිනීත වූ (යානය) නො මඟට පැමිණෙයි, විෂම ව සිටි කණුවට ද ගලට ද නගී, යානය ද ආරෝහකයාගේ අත්පා ආදිය ද බිඳී, ප්‍රපාතයෙහි ද වැටෙයි, යම්සේ නො දමුණු නො හික්මුණු අවිනීත වූ ඒ භ්‍රාන්තයානය නො මඟට යේ ද, එසෙයින් ම ඒ සිවුරලූ තෙමේ නො දමුණු යානයක් බඳු වූයේ නො මඟට පැමිණෙයි, මිථ්‍යාදෘෂ්ටිය ගනී...මිථ්‍යාසමාධිය ගනී; යම්සේ අදාන්ත වූ අශික්ෂිත වූ අවිනීත වූ භ්‍රාන්ත වූ යානය විෂම ව සිටි කණුවට හා ගලට ත් නගී ද, එසෙයින් ම භ්‍රාන්තයානයක් බඳු වූ ඒ විභ්‍රාන්තක (=සිවුරලූ) තෙම විෂම වූ කායකර්මය උපදවයි, විෂම වූ වාක්කර්මය - විෂම වූ මනඃකර්මය උපදවයි, විෂම වූ ප්‍රාණඝාතය උපදවයි (=කෙරෙයි) විෂම වූ අදත්තාදානය - විෂම වූ කාමමිථ්‍යාචාරය - විෂම වූ මෘෂාවාදය - විෂම වූ පෛශුන්‍යවචනය - විෂම වූ පරුෂවචනය - විෂම වූ සම්ප්‍රලාපය - විෂම වූ අභිධ්‍යාව - විෂම වූ ව්‍යාපාදය - විෂම වූ මිථ්‍යාදෘෂ්ටිය උපදවයි, විෂම වූ සංස්කාරයන් උපදවයි, විෂම වූ පස්කම්ගුණ උපදවයි, විෂම වූ පඤ්චනීවරණයන් උපදවයි.

යථා තං භන්තා යානං අදන්තා අකාරිතං අවිනීතං යානම්පි ආරොහකම්පි භඤ්ජති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො නිරයෙ අත්තානං භඤ්ජති. තිරච්ඡානයොනියං අත්තානං භඤ්ජති. පෙත්තිවිසයෙ අත්තානං භඤ්ජති. මනුස්සලොකෙ අත්තානං භඤ්ජති. දෙවලොකෙ අත්තානං භඤ්ජති. යථා තං භන්තං යානං අදන්තං අකාරිතං අවිනීතං පපාතෙ පපතති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො ජාතිපපාතම්පි පපතති. ජරාපපාතම්පි පපතති. ව්‍යාධිපපාතම්පි පපතති. මරණපපාතම්පි පපතති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසපපාතම්පි පපතති. **ලොකෙති** – අපායලොකෙ -පෙ- මනුස්සලොකෙති 'යානං භන්තංව තං ලොකෙ.'

**හීනමාහු පුථුජ්ජනන්ති** – 'පුථුජ්ජනා'ති කෙනට්ඨෙන පුථුජ්ජනා? පුථු කිලෙසෙ ජනෙන්තීති පුථුජ්ජනා. පුථු අවිහතසක්කායදිට්ඨිකාති පුථුජ්ජනා. පුථු සත්ථාරානං මුඛුල්ලොකිකාති පුථුජ්ජනා. පුථු සබ්බගතීහි අවුට්ඨිතාති පුථුජ්ජනා, පුථු නානාභිසඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්තීති පුථුජ්ජනා. පුථු නානාඔඝෙහි වුය්හන්තීති පුථුජ්ජනා. පුථු නානාසන්තාපෙහි සන්තප්පන්තීති[1] පුථුජ්ජනා. පුථු නානාපරිළාහෙහි පරිඩය්හන්තීති පුථුජ්ජනා. පුථු පඤ්චසු කාමගුණෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා[2] ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති පුථුජ්ජනා. පුථු පඤ්චහි නීවරණෙහි ආවුතා නිවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතාති පුථුජ්ජනා. **හීනමාහු පුථුජ්ජනන්ති**– පුථුජ්ජනං හීනං නිහීනං ඔමකං ලාමකං ඡතුක්කං[3] පරිත්තන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති 'හීනමාහු පුථුජ්ජනං.'

තෙනාහ භගවා:

"එකො පුබ්බෙ චරිත්වාන
මෙථුනං යො නිසෙවති,
යානං භන්තංව තං ලොකෙ
හීනමාහු පුථුජ්ජන"න්ති.

**7 - 4**

යසො කිත්ති ච යා පුබ්බෙ
හායතෙ වාපි තස්ස සා,
එතම්පි[4] දිස්වා සික්ඛෙථ
මෙථුනං විප්පහාතවෙ.

**යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සාති** – කතමො යසො? ඉධෙකච්චො පුබ්බෙ සමණභාවෙ සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අයං යසො.

1. සන්තපන්තීති - සීමු. II. 2. අජ්ඣොසන්නා - මජ්සං. 3. ජතුක්කං - සීමු. II.
4. එවම්පි - සීමු II. එතං - මනුප.

යම්සේ අදාන්ත වූ අශික්ෂිත වූ අවිනීත වූ ඒ භ්‍රාන්තයානය වාහනයත් ආරෝහකයාගේ අත්පා ආදියත් බිඳී ද, එසෙයින් ම ඒ නොදමුණු යානයක් බඳු සිවුරලු තෙමේ නිරයෙහි ආත්මය පුණුවිපුණු කෙරෙයි, තිරිසන් යෝනියෙහි ආත්මය පෙළයි, ප්‍රේතවිෂයෙහි ආත්මය පෙළයි, මිනිස්ලොවැ (කම්කටොලු විසින්) ආත්මය පෙළයි, දෙව්ලොවැ (විෂයෝ-දුකින්) ආත්මය පෙළයි. යම්සේ අදාන්ත වූ අශික්ෂිත වූ අවිනීත වූ ඒ භ්‍රාන්තයානය ප්‍රපාතයෙහි වැටේ ද, එසෙයින් ම ඒ නොහික්මුණු යානයක් බඳු ඒ සිවුරලු තෙමේ ජාතිප්‍රපාතයට ද වැටෙයි' ජරාප්‍රපාතයට ද වැටෙයි, ව්‍යාධිප්‍රපාතයට ද – මරණප්‍රපාතයට ද – ශෝකපරිදෙවදුඃඛ-දෞර්මනස්‍යඋපායාසප්‍රපාතයට ද වැටෙයි. **ලොකෙ** – අපායලෝකයෙහි... මනුෂ්‍යලොකයෙහි නුයි 'යානං භන්තංව තං ලොකෙ' යනු වේ.

**හීනමාහු පුථුජ්ජනං** – 'පුථුජ්ජනා' යනු: කවර අරුතෙකින් පෘථග්ජන-යෝ වෙති යත්? බොහෝ කෙලෙසුන් උපදවත් නුයි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ නොනසන ලද සත්කායදෘෂ්ටි ඇත්තාහු නුයි – පෘථග්ජනයෝ යැ බොහෝ ශාස්තෘන් ගේ මුහුණු බලත් නුයි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ සියලු ගතිවලින් නොනැඟීසිටියාහු නුයි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ විවිධ අභිසංස්කාරයන් රැස් කෙරෙත් නුයි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ විවිධ ඔඝවලින් වැහෙත් නුයි – පෘථග්ජනයෝ යැ පුථු නානා සන්තාපයන් ගෙන් තැවෙත් නුයි – පුථු නානා පරිදාහයන් ගෙන් දැවෙත් නුයි පෘථග්ජනයෝ යැ බොහෝ වූ පස්කම්ගුණයන්හි රැඳුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු ඇතුළු වූවාහු ලැගුණාහු ලගනිත වූවාහු පිළිපන්නාහු නුයි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ පඤ්චනීවරණයන් ගෙන් එතුණාහු නැවැත්තාහු වැසුණාහු යටින් වැසුණාහු පිළිසන් වූවාහු යටිහුරු වූවාහු නුයි – පෘථග්ජනයෝ යි. **හීනමාහු පුථුජ්ජනං** – පුහුදුනනු හීන යැ නිහීන යැ අවමත යැ ලාමක යැ ත්‍යක්ත යැ පරිත්ත යැ යි මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ වහරත් නුයි 'හීනමාහු පුථුජ්ජනං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එකො පුබ්බෙ චරිත්වාන -පෙ- හීනමාහු පුථුජ්ජනං" යි.

**7 – 4**

තවද පෙර මහණබැව්හි ඔහුගේ යම් යශසකුත් කීර්තියකුත් වී නම් ඒ යශස හා කීර්ති පිරිහේ මැ ය, තෙල යශස් කීර්තති හානිය ද දැක මෙවුත්දම් දුරලනු සඳහා (ත්‍රිවිධ ශික්ෂාව) හික්මෙන්නේ ය.

**යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සා** – යශස් කවරේ ද? මෙ ශාසනයෙහි කිසිවෙක් පෙර මහණ බැව්හි සිටියේ සත්කාර කරන ලදුයේ ගරු කරන ලදුයේ බුහුමන් කරන ලදුයේ පුදන ලදුයේ අපචායන කරන ලදුයේ චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලන්පස බෙහෙත්සත් පිරිකර ලබන සුලු වූයේ වෙයි, මේ යශස් යැ.

කතමා කිත්ති. ? ඉධෙකච්චො පුබ්බෙ සමණභාවෙ කිත්තිවණ්ණහතො[1] හොති: පණ්ඩිතො වියත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො, සුත්තන්තිකොති වා, විනයධරොති වා, ධම්මකථිකොති වා, ආරඤ්ඤිකොති වා, පිණ්ඩපාතිකොති වා, පංසුකූලිකොති වා, තෙචීවරිකොති වා, සපදානචාරිකොති වා ඛලුපච්ඡාභත්තිකොති වා, නෙසජ්ජිකොති වා, යථාසන්ථතිකොති වා, පඨමස්ස ඣානස්ස ලාභීති වා, දුතියස්ස ඣානස්ස ලාභීති වා, තතියස්ස ඣානස්ස ලාභීති වා, චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා, ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ලාභීති වා, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා අයං කිත්තීති 'යසො කිත්ති ච යා පුබ්බෙ.'

හායතෙ වාපි තස්ස සාති - තස්ස අපරෙන සමයෙන බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තස්ස සො ච යසො සා ච කිත්ති හායති පරිහායති පරිධංසති පරිපතති[2] අන්තරධායති විප්පලුජ්ජතීති 'යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සා.'

එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙති - 'එත'න්ති පුබ්බෙ සමණභාවෙ යසො කිත්ති ච, අපරභාගෙ බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තස්ස අයසො ච අකිත්ති ච, එතං සම්පත්ති-විපත්තිං;[3] දිස්වාති පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති - එතම්පි දිස්වා. සික්ඛෙථාති තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. කතමා අධිසීලසික්ඛා ? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, ඛුද්දකො සීලක්ඛන්ධො මහන්තො සීලක්ඛන්ධො සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො මොක්ඛං පමොක්ඛං[4] කුසලානං ධම්මානං සමාපත්තියා. අයං අධිසීලසික්ඛා. කතමා අධිචිත්තසික්ඛා ? ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- දුතියං ඣානං - තතියං ඣානං - චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති අයං අධිචිත්තසික්ඛා. කතමා අධිපඤ්ඤාසික්ඛා ? ඉධ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො හොති අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා, සො 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. 'ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. 'අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. අයං අධිපඤ්ඤාසික්ඛා.

---

1. කිත්තිවණ්ණගතො - සීමු. II. 2. පරිපචති - ස.
3. සම්පත්තිං විපත්තිං - සීමු. II. 4. මුඛං පමුඛං - සීමු. II. මජසං.

කීර්ත්ති කවරී ද යත්? මේ ශාසනයෙහි කිසිවෙක් පෙර මහණබැව්හි සිටියේ දරු කීර්ත්තිශබ්දය හා ගුණ ඇතියේ වෙයි: පණ්ඩිතයැ ව්‍යක්ත යැ ප්‍රඥවත් යැ බහුශ්‍රැත යැ චිත්‍රකථා ඇත්තේ යැ සුන්දර ප්‍රඥ ඇත්තේ යැ සෞත්‍රාන්තික යැ හෝ විනයධර යැ හෝ ධර්මකථික යැ හෝ ආරණ්‍යක යැ හෝ පිණ්ඩපාතික යැ හෝ පාංශුකූලික යැ හෝ තෛචීවරික යැ හෝ සපදානචාරික යැ හෝ ඛලුපච්ඡාභත්තික යැ හෝ නෙසජ්ජික යැ හෝ යථාසන්තතිකාඞ්ග ඇත්තේ යැ හෝ ප්‍රථමධ්‍යාන ලාභී යැ හෝ ද්විතීයධ්‍යානලාභී යැ හෝ තෘතීයධ්‍යාන ලාභී යැ හෝ චතුර්ථධ්‍යාන ලාභී යැ හෝ ආකාසානඤ්චායතනසමාපත්තිලාභී යැ හෝ විඤ්ඤාණඤ්චායතනසමාපත්තිලාභී යැ හෝ ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිලාභී යැ හෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී යැ හෝ යි; මේ කීර්ත්තිය යි එහෙයින් "යසො කිත්ති ච යා පුබ්බෙ" යනු වේ.

**හායෙත වාපි තස්ස සා** - පසු කලෙක බුදුන් දහම් සඟුන් ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කොට ලාමක වූ ගිහිබවට හැරුණු ඒ සිවුරලූවාගේ ඒ යශස ද ඒ කීර්ත්තිය ද හෙයි පිරිහෙයි ගිලිහෙයි පෙරළෙයි අතුරුදහන් වෙයි වැනැසේ නුයි 'යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සා' යනු වේ.

**එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ** - 'එතං' යනු: පෙර මහණබැව්හි යශස හා කීර්ත්තිය ද පසුව බුදුන් දහම් සඟුන් ශික්‍ෂාව හැරපියා ගිහි බවට පෙරළා ආවහුගේ අයශස් හා අකීර්ත්තිය ද යන තෙල සම්පත් පිළිබඳ විපත්; **දිස්වා** - දැක තුලනය තීරණය විභාවනය කොට විභූත කොට නුයි: 'එතම්පි දිස්වා' යනු වේ. **සික්ඛෙථ** - අධිශීලශික්‍ෂා අධිචිත්තශික්‍ෂා අධිප්‍රඥශික්‍ෂා ය යි ශික්‍ෂා තුනෙකි: අධිශීලශික්‍ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම සිල්වත් වෙයි, ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් සංවර වූයේ වෙසෙයි, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වූයේ අල්පමාත්‍ර අකුශලයෙහි භය දක්නා සුලු වූයේ ශික්‍ෂාපදයන් සමාදන් ව හික්මෙයි; ක්‍ෂුද්‍රශීලස්කන්ධ ය මහාශීලස්කන්ධ ය යි යන ශීලය කුශලධර්මයන්ගේ ප්‍රතිලාභයට ප්‍රතිෂ්ඨා යැ ආදි යැ චරණ යැ සංයම යැ සංවර යැ ප්‍රමුඛ යැ පූර්වඞ්ගම යි. මේ අධිශීලශික්‍ෂාව යැ. අධිචිත්තශික්‍ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම කාමච්ඡන්දනීවරණයෙන් වෙන් ව ම අකුශලධර්මයන් ගෙන් වෙන් ව විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි... ...ද්විතීයධ්‍යානයට... ... තෘතීයධ්‍යානයට චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි මේ අධිචිත්තශික්‍ෂාව යැ. අධිප්‍රඥශික්‍ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම ප්‍රඥවත් වෙයි, ආර්ය්‍ය වූ (ලෝභාදිය) සිඳීමට සමර්ථ වූ දුක් ක්‍ෂය වීමට යනසුලු වූ උදයව්‍යය අවබොධ කිරීමට පොහොසත් වූ ප්‍රඥයෙන් සමන්විත වූයේ වෙයි, හෙතෙම 'මේ දුක යැ' යි තත්වූ පරිද්දෙන් දැනගනී, 'මේ දුඃඛසමුදය යැ' යි තත්වූ පරිද්දෙන් දැනගනී, 'මේ දුඃඛනිරොධය'යි තත්වූ පරිද්දෙන් දැනගනී, 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාව යැ' යි තත්වූ පරිද්දෙන් දැනගනී; 'මොහු ආශ්‍රවයෝ යැ' යි තතුසෙයින් දැනගනී, 'මේ ආශ්‍රවසමුදය යැ' යි තතුසේ දැනගනී, 'මේ ආශ්‍රවනිරොධය යැ' යි තතුසේ දැනගනී, 'මේ ආශ්‍රවනිරොධයට පමුණුවන ප්‍රතිපදාව ය'යි තතුසේ දැනගනී. මේ අධිප්‍රඥශික්‍ෂා යි.

**මෙථුනධම්මො** නාම: යො සො අසද්ධම්මො -පෙ- ද්වයංද්වයසමාපත්ති[a]. -පෙ- තං කාරණා වුච්චති මෙථුනධම්මො. **එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙති** – මෙථුනධම්මස්ස පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය. අධිචිත්තම්පි සික්ඛෙය්‍ය. අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය. ජානන්තො සික්ඛෙය්‍ය. පස්සන්තො සික්ඛෙය්‍ය. පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය. චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය. සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය. විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය සතිං උපට්ඨපෙන්තො සික්ඛෙය්‍ය චිත්ත සමාදහන්තො සික්ඛෙය්‍ය. පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය. අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය. පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය. පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය. භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය. සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ.'

තෙනාහ භගවා:

"යසො කිත්ති ච යා පුබ්බෙ
හායතෙ වාපි තස්ස සා,
එතම්පි දිස්වා සික්ඛෙථ
මෙථුනං විප්පහාතවෙ"ති.

## 7 - 5

සඞ්කප්පෙහි පරෙතො සො[1]
කපණො විය ඣායති,
සුත්වා පරෙසං නිග්ඝොසං
මඞ්කු හොති තථාවිධො.

**සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායතීති** –කාමසඞ්කප්පෙන බ්‍යාපාදසඞ්කප්පෙන විහිංසාසඞ්කප්පෙන දිට්ඨිසඞ්කප්පෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො පිහිතො; **කපණො විය** මන්දො විය මොමූහො විය ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති; යථා උලූකො රුක්ඛසාඛායං මූසිකං මගයමානො ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, යථා කොත්ථු නදීතීරෙ මච්ඡෙ මගයමානො ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, යථා බිළාරො[2] සන්ධිසමලසංකටීරෙ මූසිකං මගයමානො ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, යථා ගද්‍රභො වහච්ඡින්නො සන්ධිසමලසඞ්කටීරෙ ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, එවමෙවං සො විබ්භන්තකො කාමසඞ්කප්පෙන බ්‍යාපාදසඞ්කප්පෙන විහිංසාසඞ්කප්පෙන දිට්ඨිසඞ්කප්පෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො පිහිතො කපණො විය මන්දො විය මොමූහො විය ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායතීති 'සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායති'.

---

a. විනයමහාවිභඞ්ග - පඨමපාරාජිකා.
1. යො - සු. 2. විළාරො - ස.

**මෙථුනධම්ම නම්:** යම් ඒ අසද්ධර්මයෙක්... ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද ...එ කරුණෙන් මෛථුනධර්මය යි කියනු ලැබේ. **එතමපි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ** මෛථුන්දම් දුරුලීම පිණිස සන්හිඳුවීම පිණිස බැහැරලීම පිණිස 'පටිපස්සද්ධි (=එල)ය පිණිස අධිශීලය ද අධිචිත්තය ද අධිප්‍රඥාව ද හික්මෙත්තේය, මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙත්තේය, දැනගනිමින් හික්මෙත්තේය, බලමින් හික්මෙත්තේය, ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙත්තේය, සිත පිහිටුවමින් හික්මෙත්තේය, ශ්‍රද්ධාවෙන් නිශ්චය කෙරෙමින් හික්මෙත්තේය, වීර්‍ය්‍යය දැඩි කොට ගනිමින් හික්මෙත්තේය, සිහි එළවමින් හික්මෙත්තේය, සිත පිහිටුවමින් හික්මෙත්තේය, ප්‍රඥාවෙන් දැනගනිමින් හික්මෙත්තේය, (ස්වභාවලක්ෂණාවබොධයෙන්) අභිජානනය කළයුතු ධර්මය අභිජානනය කෙරෙමින් - සාමාන්‍යලක්ෂණාවබොධයෙන් පරිඥෙය්‍යවූ ධර්මයන් හාත්පසින් දැනගනිමින් - ප්‍රහාතව්‍ය වූ (සමුදය) ප්‍රහීණ කෙරෙමින් - භාවිතව්‍ය වූ (මාර්ගය) වඩමින් - ප්‍රත්‍යක්ෂ කළයුතු (නිරොධය) ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙත්තේය, හැසිරෙන්නේය, මොනොවට හැසිරෙන්නේය. සමාදන්ව පවත්නේ නුයි 'එතමපි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යසෙසං කිත්ති ච යා පුබ්බෙ -පෙ- මෙථුනං විප්පහාතවෙ"යි.

**7 - 5**

කාමාදි සංකල්පයන් විසින් මඩනා ලද ඒ සිවුරලූ තෙම දිළින්දකු සෙයින් සිතයි, එබඳු පුද්ගල තෙම උපාධ්‍යායාදි අන්‍යයන් ගේ වදන් අසා මකු වන්නේ යි.

**සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායති** - කාමසඞ්කල්පයෙන් ව්‍යාපාදසඞ්කල්පයෙන් විහිංසාසඞ්කල්පයෙන් දෘෂ්ටිසඞ්කල්පයෙන් ස්පර්ශ කරන ලදුයේ මඩනා ලදුයේ යුක්ත වූයේ සමන්වාගත වූයේ පිහිත වූයේ, **කපණො විය:** අඥතයකු මෙන් සම්මොහ වූවකු මෙන් සිතයි, අතිශයින් සිතයි, අනෙකප්‍රකාරයෙන් සිතයි, එයින් බැහැරව සිතයි; යම්සේ මහමුහුණෙක් අතු අග මියකු බලමින් සිතා ද අතිශයින් සිතා ද අනෙකප්‍රකාරයෙන් සිතා ද බැහැර සිතා ද, යම්සේ සිවලෙක් ගංඉවුරෙහි මසුන් සොයමින් ධ්‍යාන ප්‍රධ්‍යාන නිධ්‍යාන අපධ්‍යාන කෙරේ ද, යම්සේ බළලෙක් ගෘහසන්ධි - දියනැසිති - කසළගොඩහි මීයකු සොයමින් ධ්‍යාන ප්‍රධ්‍යාන නිධ්‍යාන අපධ්‍යාන කෙරේ ද, යම්සේ කොඳුඇට සිඳුණු කොටළුවෙක් සන්ධි - නැසිති - කසළගොඩෙහි ධ්‍යාන - ප්‍රධ්‍යාන නිධ්‍යාන - අපධ්‍යාන කෙරේ ද, එසෙයින් ම ඒ සිවුරලූ තෙම කාමසඞ්කල්පයෙන් ව්‍යාපාදසඞ්කල්පයෙන් විහිංසාසඞ්කල්පයෙන් දෘෂ්ටිසඞ්කල්පයෙන් ස්පර්ශ කරන ලදුයේ යුක්ත වූයේ ඇතුළත පිරිසියේ සමන්විත වූයේ පිහිත වූයේ කෘපණයකු මෙන් අඥතයකු මෙන් සම්මූඪ වූවකු මෙන් සිතයි අතිශයින් සිතයි නොයෙක් ලෙසින් සිතයි ඉන් බැහැරව සිතා නුයි 'සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායති' යනු වේ.

**සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථාවිධොති** – 'පරෙස'න්ති උපජ්ඣායා වා ආචරියා වා සමානුපජ්ඣායකා වා සමානාචරියකා වා මිත්තා වා සන්දිට්ඨා වා සම්භත්තා වා සහායා වා චොදෙන්ති: "තස්ස තෙ ආවුසො අලාභා, තස්ස තෙ දුල්ලද්ධං, යං ත්වං එවරූපං උළාරං සත්ථාරං ලභිත්වා එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා එවරූපං අරියගණං ලභිත්වාපි හීනස්ස මෙථුනධම්මස්ස කාරණා බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තොසි. සද්ධාපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. හිරීපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. ඔත්තප්පම්පි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. වීරියම්පි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. සතිපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. පඤ්ඤාපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසූ"ති. තෙසං වචනං බ්‍යප්පථං දෙසනං අනුසාසනං අනුසිට්ඨිං, **සුත්වා** – සුණිත්වා උග්ගහෙත්වා උපධාරෙත්වා උපලක්ඛයිත්වා; **මඞ්කු හොති** – පීළිතො ඝට්ටිතො[1] බ්‍යාධිතො දොමනස්සිතො හොති. **තථාවිධොති** – තථාවිධො තාදිසො තස්සණ්ඨිතො තප්පකාරො තප්පටිභාගො යො සො විබ්භන්තකොති – 'සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථාවිධො'.

තෙනාහ භගවා:

"සඞ්කප්පෙහි පරෙතො සො
කපණො විය ඣායති,
සුත්වා පරෙසං නිග්ඝොසං
මඞ්කු හොති තථාවිධො"ති.

**7 – 6**

අථ සත්ථානි කුරුතෙ
පරවාදෙහි චොදිතො,
එස ඛ්වස්ස මහාගෙධො
මොසවජ්ජං පගාහති.

**අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතොති** – 'අථා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං අථාති; **සත්ථානීති** – තීණි සත්ථානි: කායසත්ථං වචීසත්ථං මනොසත්ථං. තිවිධං කායදුච්චරිතං කායසත්ථං, චතුබ්බිධං වචීදුච්චරිතං වචීසත්ථං, තිවිධං මනොදුච්චරිතං මනොසත්ථං.

**පරවාදෙහි චොදිතොති** – උපජ්ඣායෙහි වා ආචරියෙහි වා සමානුපජ්ඣායකෙහි[2] වා සමානාචරියකෙහි වා මිත්තෙහි වා සන්දිට්ඨෙහි වා සම්භත්තෙහි වා සහායෙහි වා චොදිතො සම්පජානමුසා භාසති: "අභිරතො[3] අහං භන්තෙ අහොසිං පබ්බජ්ජාය. මාතා මෙ පොසෙතබ්බා. තෙනම්හි විබ්භන්තො"ති භණති. "පිතා මෙ පොසෙතබ්බො. තෙනම්හි විබ්භන්තො"ති භණති. "භාතා මෙ පොසෙතබ්බො"ති භණති. "භගිනී මෙ පොසෙතබ්බා"ති භණති. "පුත්තො මෙ පොසෙතබ්බො, ධීතා මෙ පොසෙතබ්බා, මිත්තා මෙ පොසෙතබ්බා, අමච්චා මෙ පොසෙතබ්බා, ඤාතකා මෙ පොසෙතබ්බා, සාලොහිතා මෙ පොසෙතබ්බා. තෙනම්හි විබ්භන්තො"ති භණති. වචීසත්ථං කරොති සඞ්ඛරොති ජනෙති සඤ්ජනෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙතීති – 'අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො.'

1. ඝට්ටිතො – මනුප. 2. සමානුපජ්ඣායෙහි – සීමු. II. 3. අනභිරතො – ස.

**සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථාවිධො** – ‘පරෙසං’ යනු: උපාධ්‍යායයෝ හෝ ආචාර්‍ය්‍යයෝ හෝ සමානෝපාධ්‍යායකයෝ හෝ සමානාචාර්‍ය්‍යකයෝ හෝ මිත්‍රයෝ හෝ සන්දෘෂ්ටයෝ හෝ සම්භක්තයෝ හෝ සහායයෝ හෝ (මෙසේ) චෝදනා කෙරෙති: “ඇවැත්නි, තෙපි යම්හෙයකින් මෙබඳු උදාර වූ ශාස්තෘවක්හු ලැබ මෙසේ ස්වාඛ්‍යාත ශාසනයක පැවිදිව මෙබඳු ආචාර්‍ය්‍යධනයක් ලැබත් ඒ මෙවුත්දම් හෙතුයෙන් බුදුන් දහම් සඟුන් ශික්ෂාව හැරපියා හීනබවට පෙරළුණාව, තොපට කුසල් දහම්හි ශ්‍රද්ධාවකු දු නො වීය. කුසල්දහම්හි ලජ්ජාවකු දු නො වීය, කුසල් දහම්හි බියකු දු නො වීය, කුසල්දහම්හි වීර්‍ය්‍යයකු දු නො වීය, කුසල්දහම්හි සිහියකු දු නො වීය, කුසල්දහම්හි ප්‍රඥාවකු දු නො වීය, ඒ තොපට අලාභයෙක, ඒ තොප විසින් දුලබ්ධ යැ” යි ඔවුන් ගේ වචනය වදත්මඟ දෙසුම අනුසස්ත අනුශිෂ්ටිය; **සුත්වා** – අසා උගෙන විමසා සලකා; **මඞ්කු හොති** – පෙළුණේ ගැටුණේ වෙහෙසින් පෙළුණේ උපන් දෙම්නස් ඇතියේ; **තථාවිධො** – එබඳු වූ තාදෘශ වූ එසේ සිටි තත්ප්‍රකාර වූ, තත්ප්‍රතිභාග වූ ඒ සිවුරලූ තෙමේ නුයි ‘සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථා විධො’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“සඞ්කප්පෙහි පරෙතො සො –පෙ– මඞ්කු හොති තථාවිධො”යි.

**7 – 6**

ඉක්බිති අන්‍යයන් ගේ වචනයෙන් චෝදනා කරන ලදුයේ දුශ්චරිත නමැති ශස්ත්‍රයන් කෙරෙයි, තෙල ඔහු ගේ මහාබන්ධනය තෙමේ මෘෂාවාදයට බැසගත්තේ වේ.

**අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො** – ‘අථ’ යනු: පදයන් ගේ සන්ධි යැ පදසංසර්ගී යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්විතා නමැ තෙල ‘අථ’ යනු. **සත්ථානි** – කායශස්ත්‍ර යැ වාක්ශස්ත්‍ර යැ මනශ්ශස්ත්‍ර යැයි ශස්ත්‍ර (ආයුධයෝ) තිදෙනෙකි. ත්‍රිවිධ කායදුශ්චරිතය කායශස්ත්‍ර යැ චතුර්විධ වාග්දුශ්චරිතය වාක්ශස්ත්‍ර යැ ත්‍රිවිධ මනෝදුශ්චරිතය මනශ්ශස්ත්‍රය යි.

**පරවාදෙහි චොදිතො** – උපාධ්‍යායයන් විසින් හෝ ආචාර්‍ය්‍යයන් – සමානෝපාධ්‍යායකයන් – සමානාචාර්‍ය්‍යකයන් – මිත්‍රයන් – සන්දෘෂ්ටයන් – සම්භක්තයන් – සහායයන් විසින් හෝ චෝදනා කරන ලදුයේ දැනැ දැනැ බොරු කියයි: ස්වාමීනි, මම පැවිද්දට ඇලුම් ඇති වීමි, (එහෙත්) මා විසින් මව පොෂණය කළ යුත්තීය, එහෙයින් සිවුරු හළෙමි’ කියයි. ‘පියා මා විසින් පොෂණය කළ යුතු හෙයින් සිවුරු හළෙමි’ කියයි. ‘බෑයා මා විසින් පොෂණය කළ යුතු හෙයින් සිවුරු හළෙමි’ කියයි. ‘භගිනිය මා විසින් පොෂණය කළ යුත්තීය’යි කියයි. ‘පුත්‍රයා මා විසින් පොෂණය කළ යුත්තේය, දුහිතෘව මා විසින් පොෂණය කළ යුත්තීය, මිත්‍රයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, සගයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, නෑයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, සහලේනෑයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, එහෙයින් සිවුරු හළෙමි’ කියයි; වචන අවිය කෙරෙයි, මොනවට කෙරෙයි, උපදවයි මැනවින් උපදවයි නිපදවයි මැනවින් නිපදවා නුයි ‘අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො’ යනු වේ.

**එසඛ්වස්ස මහාගෙධොති** - එසො ඛො තස්ස මහාගෙධො මහාවනං මහාගහනං මහාකන්තාරො මහාවිසමො මහාකුටිලො මහාපඞ්කො මහාපලිපො මහාපලිබොධො මහාබන්ධනං යදිදං සම්පජානමුසාවාදොති 'එසඛ්වස්ස මහාගෙධො.'

**මොසවජ්ජං පගාහතීති** - මොසවජ්ජං වුච්චති මුසාවාදො. ඉධෙකච්චො සභග්ගතො වා පරිසග්ගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො "එහම්භො පුරිස, යං ජානාසි, තං වදෙහී"ති. සො අජානං වා ආහ: 'ජානාමී'ති. ජානං වා ආහ: 'න ජානාමී'ති. අපස්සං වා ආහ: 'පස්සාමී'ති. පස්සං වා ආහ: 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ධනහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසති.[a] ඉදං වුච්චති මොසවජ්ජං. අපි ච තීහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති. භණන්තස්ස හොති 'මුසා භණාමී'ති. භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. ඉමෙහි තීහාකාරෙහි මුසාවාදො හොති. අපි ච, චතූහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති. භණන්තස්ස හොති 'මුසා භණාමී'ති. භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. විනිධාය දිට්ඨිං. ඉමෙහි චතූහාකාරෙහි මුසාවාදො හොති. අපිච, පඤ්චහාකාරෙහි -ඡහාකාරෙහි - සත්තහාකාරෙහි - අට්ඨහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති. භණන්තස්ස හොති 'මුසා භණාමී'ති. භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය සඤ්ඤං, විනිධාය භාවං. ඉමෙහි අට්ඨහාකාරෙහි මුසාවාදො හොති. **මොසවජ්ජං පගාහතීති** - මොසවජ්ජං පගාහති ඔගාහති අජ්ඣොගාහති පවිසතීති 'මොසවජ්ජං පගාහති.'

තෙනාහ භගවා:

> "අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො,
> එසඛ්වස්ස මහාගෙධො මොසවජ්ජං පගාහතී"ති.

7 - 7

> පණ්ඩිතොති සමඤ්ඤාතො ඒකචරියමධිට්ඨිතො,
> සචාපි[1] මෙථුනෙ යුත්තො මන්දොව පරිකිස්සති.

**පණ්ඩිතොති සමඤ්ඤාතොති** - ඉධෙකච්චො පුබ්බෙ සමණභාවෙ- කිත්තිවණ්ණහතො[2] හොති පණ්ඩිතො වියත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො සුත්තන්තිකොති වා විනයධරොති වා ධම්මකථිකොති වා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා, එවං ඤාතො හොති සඤ්ඤාතො[3] සමඤ්ඤාතො හොතීති - පණ්ඩිතොති සමඤ්ඤාතො.

---

1. අථාපි - PTS. 2. කිත්තිවණ්ණගතො - සීමු II.
3. පඤ්ඤාතො - සීමු. II. මජ්සං.
a. මජ්ඣිමනිකාය - සාලෙය්‍යකසුත්ත, තිකඞ්ගුත්තර - පුග්ගලවග්ග.

**එසබ්බස්ස මහාගෙධො** – යම් සම්පජාන මුසාවාදයෙක් වේ ද, තෙල වනාහි ඔහුගේ මහාගෙධ(=බන්ධ) යැ මහාවන යැ මහලුහැබ යැ මහත් කාන්තාර යැ මහද්විෂම යැ මහාපඞ්ක යැ මහමඩවල යැ මහහැල යැ මහාදුර්ගයැ මහාබන්ධනය නුසි 'එසබ්බස්ස මහාගෙධො' යනු වේ.

**මොසවජ්ජං පගාහති** – මුසාවාද ය 'මොසවජ්ජ' සී කියනු ලැබෙයි. මෙලොවැ කිසිවෙක් සභායෙහි සිටියේ හෝ ගම් සභායෙහි සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ සෙනා මැද සිටියේ හෝ රජෙල් මැද සිටියේ හෝ සාක්ෂියට කැඳවනු ලදුයේ 'එව එම්බා පුරුෂය, දත්තා දැය කිය'සි සාක්ෂි අසන ලදුයේ හෙතෙම නො දනිමින් හෝ දනිමි' කියයි, දනිමින් හෝ 'නො දනිමි' කියයි, නො දක්මින් හෝ 'දක්මි' කියයි, දක්මින් හෝ 'නො දක්මි' කියයි; මෙසේ තමා නිසා හෝ මෙරමා නිසා හෝ ධනය නිසා හෝ මඳ වූ අල්ලසක් නිසා හෝ දැනැ දැනැ බොරු කියයි. මේ 'මොසවජ්ජ' සී කියනු ලැබෙයි. තවද තුන් අයුරෙකින් මෘෂාවාදය වෙයි: පළමු මැ ඔහුට 'බොරුවක් කියන්නෙමි' සිත වෙයි, කියන්නා හට 'මෘෂා (බොරු) බෙණෙමි' සිත වෙයි, කීවහුට, 'මෘෂා මා විසින් කියන ලද'සි සිත වෙයි; මේ තුන් අයුරින් මෘෂාවාද වේ. තවද සතර අයුරෙකින් මෘෂාවාද වෙයි: පළමු මැ ඔහුට 'මෘෂා බණන්නෙමි' සිත වෙයි, කියන්නා හට මෘෂා බෙණෙමි' සිත වෙයි, කීවහුට 'මෘෂා මා විසින් බණන ලද' සි සිත වෙයි. ලබ්ධිය සඟවාගෙන කියයි. මේ සතර අයුරින් මෘෂාවාද වේ. තවද පස් පරිද්දෙකින් – සපරිද්දෙකින් – සත්– පරිද්දෙකින් – අට පරිද්දෙකින් මෘෂාවාද වෙයි. පළමු මැ ඔහුට බොරු කියන්නෙමි' සිත වෙයි. කියන්නහුට 'බොරු කියමි' සිත වෙයි. කීවහුට 'බොරු මා විසින් කියන ලද' සි සිත වෙයි. ලබ්ධිය සඟවා කියයි. කැමැත්ත සඟවා කියයි, රුචිය සඟවා කියයි, සංඥාව සඟවා කියයි, භාවය සඟවා කියයි. මේ අට අයුරින් මෘෂාවාද වේ. **මොසවජ්ජං පගාහති** – මෘෂාවාදයට බසී බැසගනී ඇතුළු වෙයි පිවිසේ නුසි 'මොසවජ්ජං පගාහති' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"අථ සත්ථානි කුරුතෙ –පෙ– මොසවජ්ජං පගාහති"** සී.

7 – 7

පෙර පණ්ඩිතයෙකැ'යි ප්‍රසිද්ධ වූයේ එකලා චංයෙහි පිහිටියේ යළි මෙවුන්දම්හි යෙදුණේ වී නම් හෙතෙම මූඪයකු මෙන් කෙලෙසෙන්නේ සී.

**පණ්ඩිතොති සමඤ්ඤාතො** – මේ සසුන්හි කිසිවෙක් පෙර මහණුවම් කරන කල්හි කීර්ති සඞ්ඛ්‍යාත යශසට පැමිණියේ වෙයි; පණ්ඩිතයෙක් ව්‍යක්තයෙක නුවණැත්තෙක බහුශ්‍රැතයෙක චිත්‍රකථිකයෙක සුන්දරප්‍රඥ ඇත්තෙක සෞත්‍රාන්තික යැ හෝ විනයධර යැ හෝ ධර්මකථික යැ හෝ... නෙවසංඥානාසංඥායතනසමාපත්තිලාභියෙකැයි හෝ මෙසේ දත්තා ලදුයේ පැතුණේ ප්‍රසිද්ධ වේ නුසි 'පණ්ඩිතොති සමඤ්ඤාතො' යනු වේ.

**ඒකචරියං අධිට්ඨිතෝති** – ද්වීහි කාරණෙහි එකචරියං අධිට්ඨිතො පබ්බජ්ජාසඞ්ඛාතෙන වා ගණා වවස්සග්ගට්ඨෙන වා. කථං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකචරියං අධිට්ඨිතො? සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා -පෙ- එවං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකචරියං අධිට්ඨිතො. කථං ගණා වවස්සග්ගට්ඨෙන එකචරියං අධිට්ඨිතො? සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤවනපත්ථානි -පෙ- එවං ගණා වවස්සග්ගට්ඨෙන එකචරියං අධිට්ඨිතොති – එකචරියං අධිට්ඨිතො.

**සචාපි මෙථුනෙ යුත්තොති** – මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො -පෙ- තංකාරණා වුච්චති මෙථුනධම්මො. "සචාපි මෙථුනෙ යුත්තො"ති සො අපරෙන සමයෙන බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා මෙථුනධම්මෙ යුත්තො සංයුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තොති 'සචාපි මෙථුනෙ යුත්තො.'

**මන්දොව පරිකිස්සතීති** – කපණො විය මන්දො විය මොමූහො විය කිස්සති පරිකිස්සති පරිකිලිස්සති, පාණම්පි හනති, අදින්නම්පි ආදියති. සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සති. තමෙනං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්ති: කසාහිපි තාළෙන්ති, වෙත්තෙහිපි තාළෙන්ති, අද්ධදණ්ඩකෙහිපි තාළෙන්ති, හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති, කණ්ණම්පි ඡින්දන්ති, නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති, බිලඞ්ගථාලිකම්පි කරොන්ති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති, රාහුමුඛම්පි කරොන්ති, ජොතිමාලිකම්පි කරොන්ති, හත්ථපජ්ජොතිකම්පි කරොන්ති, එරකවත්තිකම්පි කරොන්ති, චීරකවාසිකම්පි කරොන්ති, එණෙය්‍යකම්පි කරොන්ති, බලිසමංසිකම්පි කරොන්ති, කහාපණකම්පි[1] කරොන්ති, ඛාරාපතච්ඡිකම්පි කරොන්ති, පලිඝපරිවත්තිකම්පි කරොන්ති, පලාලපීඨකම්පි කරොන්ති, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති, සුනඛෙහිපි ඛාදාපෙන්ති, ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති, අසිනාපි සීසං ඡින්දන්ති එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සති. අථවා කාමතණ්හාය අභිභූතො පරියාදින්නචිත්තො භොගෙ පරියෙසන්තො නාවාය මහාසමුද්දං පක්ඛන්දති: සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො[2] ඛුප්පිපාසාහි මීයමානො[3] තිගුම්බං[4] ගච්ඡති, තක්කොලං ගච්ඡති, තක්කසිලං ගච්ඡති, කාලමුඛං ගච්ඡති, පරමුඛං[5] ගච්ඡති, වෙසුඞ්ගං ගච්ඡති, වෙරාපථං ගච්ඡති, ජවං ගච්ඡති, තාමලිං[6] ගච්ඡති, වඞ්ගං[7] ගච්ඡති, එළවද්ධනං[8] ගච්ඡති, සුවණ්ණකූටං ගච්ඡති, සුවණ්ණභූමිං ගච්ඡති, තම්බපණ්ණිං ගච්ඡති, සුප්පාරකං[9] ගච්ඡති, භරුකච්ඡං[10] ගච්ඡති, සුරට්ඨං[11] ගච්ඡති, අඞ්ගලොකං[12] ගච්ඡති, ගඞ්ගණං[13] ගච්ඡති, පරමගඞ්ගණං[14] ගච්ඡති, යොනං ගච්ඡති, පරමයොනං ගච්ඡති,
තවකං[15] ගච්ඡති, මූලපදං[16] ගච්ඡති,

---

1. කහාපණ්කම්පි සීමු II. 2. පිළියමානො – සීමු. II. මජසං.
3. පිළියමානො – PTS. 4. ගුම්භං – සීමු. I. ගුබ්බං – ස.
5. මරණපාරං – සී. පුරපුරං – මජස.
6. කමලිං. තමසිං – සී. තම්මුනිං – මනුප. තක්කල්ඞ්ගං – සී. 7. වඞ්කං – සී.
8. එලබන්ධනං – සී. මජසං. ජලවාං – සීමු. II. 9. සුප්පාදකං – මජසං. සුප්පාරං – සී.
10. භාරුකච්ඡං – සීමු. II. භරුකං – භාරුකච්ඡිං – සී. 11. සුරද්ධං – සුරරට්ඨං – සී.
12. සඞ්ගනෙලාකං – සීමු. II. ගඞ්ගනෙලාකං – මජස. අඞ්ගනෙකං – PTS
13. තඞ්ගණං – සීමු. I යඞ්ගණං – සීමු. II. සඞ්ගණං – මජසං.
14 පදපතඞ්ගං – සීමු. I. පදමතඞ්ගණං – සී. සරමතඞ්ගණං – මජසං
15. විතකං – මජස, විකං – සී. 16. මූලපද්දං – මනුප.

**ඒකචරියං අධිට්ඨිතො** – දෙකරුණෙකින් ඒකචර්‍යාවෙහි පිහිටියේ: ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත වූ හෝ ගණයා කෙරෙන් වෙන් ව පිසීම සඞ්ඛ්‍යාත වූ හෝ දෙකරුණෙනි. කෙසේ ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත කරුණෙන් ඒකචර්‍යාවෙහි පිහිටියේ ද යත්? සියලු ගෘහාවාසපරිබොධය සිඳපියා...(7 – 3 සූත්‍රනිර්දේශය) මෙසේ පැවිදිකොටසින් ඒකලාවාසයෙහි පිහිටියේ; කෙසේ ගණව්‍යවස්සග්ගාර්ථයෙන් ඒකචර්‍යාවෙහි පිහිටියේ ද යත්? හෙතෙම මෙසේ පැවිදි වූයේ එකලා ව...මෙසේ ගණව්‍යවස්සග්ගාර්ථයෙන් ඒකචර්‍යාවෙහි පිහිටියේ නුයි 'ඒකචරියං අධිට්ඨිතො' යනු වේ.

**සචාපි මෙථුනෙ යුත්තො** – 'මෛථුනධම්ම' නම්: යම් අසද්ධර්මයෙක් ග්‍රාමධර්මයෙක් වසලධර්මයෙක්...එහෙයින් 'මෛථුනධම්ම' යයි කියනු ලැබේ. **සචාපි මෙථුනෙ යුත්තො** – හේ පසු කලෙක බුදුන් දහම් සඟුන් ශික්‍ෂාව හැරපියා ගිහිබවට පෙරළී මෛථුන්දම්හි යෙදුණේ සංයුක්ත ප්‍රයුක්ත ආයුක්ත සමායුක්ත වූයේ නුයි 'සචාපි මෙථුනෙ යුත්තො' යනු වේ.

**මන්දොව පරිකිස්සති** – කෘපණයකු මෙන් අඥයකු මෙන් මූඪයකු මෙන් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. ප්‍රාණවධ ද කෙරෙයි, අදත්තාදානය ද කෙරෙයි, ගෘහසන්ධි ද සිඳී, ගම් පහරයි, ගෙවල් පහරයි, මං පහරයි, පරඹුත් කරු ද යෙයි, මෘෂා ද බෙණෙයි; මෙසේ ත් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. ඒ (අපරාධ කරු) රජවරු අල්වාගෙන විවිධ කම්කටොලු කරවති: කසයෙනුදු තළවති, වේවැලිනු දු තළවති, අඩදඬියෙනු දු තළවති, අත් සිඳුවති, පා සිඳුවති, අත්පා ද සිඳුවති, කනු දු සිඳුවති, නැහැය ද සිඳුවති, කන්නාසා ද සිඳුවති, කාඩිසැළි කම්කටොලු ද කෙරෙති, සක්මුඩු කම්කටොලු ද කෙරෙති, රාහුමුඛ කම්කටොලු ද කෙරෙති, ගිනිවැලලු කම්කටොලු ද කෙරෙති, අත් දල්වන කම්කටොලු ද කෙරෙති, එරැවත් කම්කටොලු ද කෙරෙති, තීහිරිවත් කම්කටොලු ද කෙරෙති, ඒණෙය්‍යක කම්කටොලු ද කෙරෙති, බිළියෙන් මස් සිඳුණා කම්කටොලු ද කෙරෙති, කහාපණික කම්කටොලු ද කෙරෙති, කොස්සෙන් කාරම් ගල්වති, පරිඝපරිවර්තන-කම්කටොලු ද කෙරෙති, පිදුරුපිටු කම්කටොලු ද කෙරෙති, කකාල තෙල් ද ඉස්වති, ශුනකයන් (– කිණිබල්ලන්) ලවා කවති, දිවස්හුල ද හිඳුවති, කඩුවෙනු දු හිස සිඳිත්; මෙසේ ත් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. නොහොත් කාමතෘෂ්ණාවෙන් මඩනා ලදුයේ හාත්පසින් අල්වාගත් සිත් ඇතියේ භොගයන් සොයමින් නැවින් මහමුහුදට පිවිසෙයි, සීතල පෙරටු කොට උෂ්ණය පෙරටු කොට මැසිමදුරු අව්සුළං හා සපුන් ගේ පහසින් වෙහෙසෙමින් සාපවසින් මැරෙමින් තිගුම්බජනපදයට යෙයි, තක්කෝලයට – තක්ෂශිලාවට – කාලමුඛයට – පරාමුඛයට – වෙසුඞ්ගයට – වෙරාපථයට – ජාවකරටට – තාමලිප්තියට – වංගරටට – එළවද්ධනයට – සුවණ්ණකූටයට – සුවණ්ණභූමියට – තාම්‍රපර්ණියට – සුප්පාරකයට – භරුකච්ඡජනපදයට – සෞරාෂ්ට්‍රයට – අඞ්ගලොකයට – ගඞ්ගණයට – පරමගඞ්ගණයට – යවනරටට – පරමයවනයට – අලසන්දවට – නවකජනපදයට මූලපදරටට යෙයි,

මරුකන්තාරං ගච්ඡති, ජණ්ණුපථං ගච්ඡති, අජපථං ගච්ඡති, මෙණ්ඩපථං ගච්ඡති, සඞ්කුපථං ගච්ඡති, ඡත්තපථං ගච්ඡති, වංසපථං ගච්ඡති; සකුණපථං[1] ගච්ඡති, මූසිකපථං ගච්ඡති, දරිපථං ගච්ඡති, වෙත්තාධාරං[2] ගච්ඡති, එවම්පි කිස්සති, පරිකිස්සති, පරිකිලිස්සති. ගවෙසන්තො න වින්දති. අලාභමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සති. ගවෙසන්තො වින්දති[3] ලද්ධා ච ආරක්ඛමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති: "කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං' න චොරා හරෙය්‍යුං' න අග්ගි දහෙය්‍ය' න උදකං වහෙය්‍ය' න අප්පියා දායාදා හරෙය්‍යු"න්ති. තස්ස එවං ආරක්ඛතො ගොපයතො තෙ භොගා විප්පලුජ්ජන්ති. සො විප්පයොගමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සතීති – සචාපි මෙථුනෙ යුත්තො මන්දොව පරිකිස්සති.

තෙනාහ භගවා:

"පණ්ඩිතොති සමඤ්ඤාතො එකචරියමධිට්ඨිතො,
සචාපි මෙථුනෙ යුත්තො මන්දොව පරිකිස්සතී"ති.

7 – 8

එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ,
එකචරියං දළ්හං කයිරා න නිසෙවෙථ මෙථුනං.

**එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධාති** – 'එත'න්ති පුබ්බෙ සමණභාවෙ යසො ච කිත්ති ච, අපරභාගෙ බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තස්ස අයසො ච අකිත්ති ච, එතං සම්පත්තිවිපත්තිං[4] ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; මුනීති මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනි; ඉධාති ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං සත්ථුසාසනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං අත්තභාවෙ ඉමස්මිං මනුස්සලොකෙති 'එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ.'

1. අංසපථං - සී. 2. වෙත්තාචාරං - සීමු. II. මජසං. වෙත්තාධාරං - මනුප.
3. න වින්දති - සීමු. II.
4. සම්පත්තිං විපත්තිං - සීමු. II. සම්පත්තිවිපත්තිඤ්ච - මනුප.

වැලිකතරට යෙයි, දණ්ඩගට යෙයි, අජපථයට යෙයි, මෙණ්ඩපථයට යෙයි, (කණ්ඩාකඃයන) ශඞ්කුපථයට යෙයි ඡත්‍රපථයට යෙයි, වංසපථයට යෙයි, ශකුණපථයට යෙයි, මූසිකපථයට යෙයි, දරිපථයට යෙයි, වෙත්තාධාරයට පැමිණෙයි;* මෙසේත් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. සොයතුදු නො ලැබෙයි, නො ලැබීම නිසා උපන් දුකට දොම්නසට ද පැමිණෙයි, මෙසේත් කෙලෙසෙයි, පෙළෙයි වෙහෙසට පැමිණේ. සොයතුදු ලැබෙයි, ලැබ වැලිත් කිසෙයිත් මා ගේ භොගයන් රජවරු නො මැ ගත්තාහු ද, සොරු නො ගත්තාහු ද, ගින්නෙන් නො දැවේ ද, වතුරෙන් නො වැගේ ද, අමිත්‍රප වූ අහිමියෝ නො ගත්තාහු ද'යි රැකීම නිසා උපදනා දුකට දොම්නසට ද පැමිණෙයි; මෙසේ රක්ෂණ ගොපනය කරන්නා වූ ඔහු ගේ ඒ භොගයෝ වැනසෙති; හෙතෙම වියොගය නිසා උපදනා දුකට දොම්නසට ද පැමිණේ. මෙසේ ත් කෙලෙසෙයි පෙළෙයි වෙහෙසට පැමිණේ නුයි 'සචාපි මෙථුනෙ යුත්තො මග්ගෙව පරිකිස්සති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පණ්ඩිතොති සමඤ්ඤාතො -පෙ- මග්ගෙව පරිකිස්සති" යි.

7 - 8

මේ සසුන්හි මුනි තෙම පෙර මහණකමෙහි (යශස්කීර්ති) සැපත ද පසුව (ගිහි වූවහුගේ විපත ද යන) සම්පත්හුගේ විපත්ති සඞ්ඛ්‍යාත මෙය ආදීනවය දැක එකලා වාසය දැඩි කරන්නේය, මෙවුන්දම් නො සෙවුණේය.

එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ – 'එතං' යනු: පෙර මහණ බව්හි යශස් ද කීර්තිය ද පසුකලෙක බුදුන් දහම් සඟුන් හා ශික්ෂාව හැරපියා ගිහි වූවහුගේ අයශස් හා අකීර්තිය ද (යන) මෙය සම්පත්හුගේ විපත්තිය දැන දැනැගෙන තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට; මුනි – 'මෞන'යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක්,...(2 - 8 සුත්‍රනිද්දේශය). ඉධ – මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්තියෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්මවිනයෙහි මේ ප්‍රවචනයෙහි මේ ශාස්තෘශාසනයෙහි මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි මේ ආත්මභාවයෙහි මේ මනුෂ්‍යලොකයෙහි නුයි 'එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ' යනු වේ.

---

* පිටපත්වල අතිශයින් ව්‍යාකූල ව තුබූ ජනපදනාම පණ්ඩිත වැලිවිටියේ සොරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හා පුරාවිද්‍යාධිකාරී ආචාර්‍ය්‍ය සෙනරත් පරණවිතාන මහතාණන් ගේ උපදෙසින් මෙසේ සකස් විය. Sylvain Levi මහතාගේ P'taleinee Le Middesa Etle Brbat Katha නැමති ග්‍රන්ථය ද මෙහි උපකාර විය.

**ඒකචරියං දළ්හං කයිරාති** – ද්වීහි කාරණෙහි ඒකචරියං දළ්හං කරෙය්‍ය: පබ්බජ්ජාසඞ්ඛාතෙන වා ගණා වවස්සග්ගට්ඨෙන වා. කථං පබ්බජ්ජාසඞ්ඛාතෙන ඒකචරියං දළ්හං කරෙය්‍ය? සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා ඒකො චරෙය්‍ය විහරෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය. එවං පබ්බජ්ජාසඞ්ඛාතෙන ඒකචරියං දළ්හං කරෙය්‍ය. කථං ගණා වවස්සග්ගට්ඨෙන ඒකචරියං දළ්හං කරෙය්‍ය.? සො එවං පබ්බජිතො සමානො ඒකො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවෙය්‍ය අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො ඒකො ගච්ඡෙය්‍ය. ඒකො තිට්ඨෙය්‍ය. ඒකො නිසීදෙය්‍ය ඒකො සෙය්‍යං කප්පෙය්‍ය. ඒකො ගාමං පිණ්ඩාය පවිසෙය්‍ය. ඒකො පටික්කමෙය්‍ය. ඒකො රහො නිසීදෙය්‍ය. ඒකො චඞ්කමං අධිට්ඨෙය්‍ය. ඒකො චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය. එවං ගණා වවස්සග්ගට්ඨෙන ඒකචරියං දළ්හං කරෙය්‍ය ඒකචරියං ථිරං[1] කරෙය්‍ය, විරියං කරෙය්‍ය දළ්හසමාදානො අස්ස, අවට්ඨිතසමාදානො අස්ස කුසලෙසු ධම්මෙසූති 'ඒකචරියං දළ්හං කයිරා.'

**න නිසෙවෙථ මෙථුනන්ති** – මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො –පෙ– තංකාරණා වුච්චති මෙථුනධම්මො. මෙථුනධම්මං න සෙවෙය්‍ය, න නිසෙවෙය්‍ය, න සංසෙවෙය්‍ය න පටිසෙවෙය්‍ය, න චරෙය්‍ය, න සමාචරෙය්‍ය, න සමාදාය වත්තෙය්‍යාති 'න නිසෙවෙථ මෙථුනං'.

තෙනාහ භගවා:

> "එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ,
> ඒකචරියං දළ්හං කයිරා න නිසෙවෙථ මෙථුන"න්ති.

## 7 – 9

> විවෙකඤ්ඤෙව[2] සික්ඛෙථ එතදරියානමුත්තමං[3],
> තෙන සෙට්ඨො න මඤ්ඤෙථ ස වෙ නිබ්බානසන්තිකෙ.

**විවෙකඤ්ඤෙව සික්ඛෙථාති** – 'විවෙකො'ති තයො විවෙකා: කායවිවෙකො චිත්තවිවෙකො උපධිවිවෙකො. කතමො කායවිවෙකො? –පෙ– අයං උපධිවිවෙකො. කායවිවෙකො ච වවකට්ඨකායානං[4] නෙක්ඛම්මාභිරතානං. චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං. උපධිවිවෙකො ච නිරූපධීනං පුග්ගලානං විසඞ්ඛාරගතානං. "සික්ඛා"ති. තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා, අධිපඤ්ඤාසික්ඛා –පෙ– අයං අධිපඤ්ඤාසික්ඛා. **විවෙකඤ්ඤෙව සික්ඛෙථාති** – විවෙකඤ්ඤෙව සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'විවෙකඤ්ඤෙව සික්ඛෙථ.'

---

1. දළ්හං - සීමු. II. 2. විවෙකං යෙව - සු.
3. එතමරියානමුත්තමං - ස. 4. විවෙකට්ඨකායානං - සීමු. II; මජ්සං.

**එකචරියං දළ්හං කයිරා** – දෙ කරුණෙකින් එකලා වාසය දැඩි කරන්නේය: පැවිදි කොටසින් හෝ ගණයා කෙරෙන් වෙන් ව විසීමෙන් හෝ යැ, කිසෙසින් පැවිදි කොටසින් එකචර්‍යාව දැඩි කරන්නේ ද යත්? සියලු ගෘහාවාසපළිබෝධය සිඳපියා පුත්‍රදාරපළිබෝධය – ඥාතිපළිබෝධය– මිත්‍රාමාත්‍යපළිබෝධය සිඳපියා කෙස් දැළිරවුළු බහා කසටවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදිව කිසිවක් නැති බවට පැමිණ එකලා වැ හැසිරෙන්නේය, වෙසෙන්නේය, වැටෙන්නේ ය, රැකෙන්නේය, යැපෙන්නේය, පාලනය වන්නේය, මෙසේ පැවිදි කොටසින් එකචර්‍යාව දැඩි කරන්නේය. කිසෙසින් ගණයා කෙරෙන් වෙන්ව විසීමෙන් එකලා වාසය දැඩි කරන්නේද යත්? හේ මෙසේ පැවිදි වූයේ අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍යයන්ට යොග්‍ය වූ විවේකයට අනුරූප වූ වනසෙනසුන් වෙනෙහි දුර සෙනසුන් ඉතා දුරසෙනසුන් සෙවුණේය, හේ තනි වැ යෙයි, තනි වැ සිටී, තනි වැ හිඳී, තනි වැ හොවී, තනි වැ ගමට පිඬු සිඟායයි, තනි වැ පෙරළා එයි, තනි වැ රහසැ හිඳී, තනි වැ සක්මන් කරන්නේය, තනි වැ හැසිරෙන්නේය, වෙසෙන්නේය, ඉරියවු පවත්වන්නේය පවත්නේය රැකෙන්නේය යැපෙන්නේය පාලනය වන්නේ යි. මෙසේ ගණයා කෙරෙන් වෙන්ව සිටීමෙන් එකචර්‍යාව දැඩි කරන්නේය, එකචර්‍යාව නො ලිහිල් කරන්නේය, වීර්‍ය්‍ය කරන්නේය. කුසල්දහම්හි දැඩි සමාදන ඇති වන්නේය, සනිටුහන් කළ සමාදන ඇතිවන්නේ නුයි 'එකචරියං දළ්හං කයිරා' යනු වේ.

**න නිසෙවෙථ මෙථුනං** – 'මෛථුනධම්ම' නම්: යම් අසද්ධර්මයෙක් ග්‍රාමධර්මයෙක්...එහෙයින් 'මෛථුනධම්ම' යයි කියනු ලැබේ. මෛථුන්දම් නො සෙවුණේය, නිසෙවන – සංසෙවන – ප්‍රතිසෙවනය නො කරන්නේය; නො හැසිරෙන්නේය, නො යෙදෙන්නේය, සමාදන්ව නො පවත්නේ නුයි 'න නිසෙවෙථ මෙථුනං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**එතමාදීනවං ඤත්වා –පෙ– න නිසෙවෙථ මෙථුනං**" යි

**7 – 9**

බුද්ධාදි ආර්‍ය්‍යයන් ගේ උතුම් වූ තෙල විවේකයෙහි ම හික්මෙන්නේය, ඒ විවේකය හෙතුකොටගෙන 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' නො සිතන්නේය, හෙතෙම එකාන්තයෙන් නිවන සමීපයෙහි වන්නේ යි.

**විවෙකඤ්ඤෙව සික්ඛෙථ** – 'විවෙක' යනු: කායවිවෙක යැ චිත්ත විවෙක යැ උපධිවිවෙක යැ යන තුන් විවෙකයෝ ය. කායවිවෙකය කවරැ යත්?...මේ උපධි විවෙක යි. ගණයා කෙරෙන් වෙන්වූ කය ඇති නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණවුන්ට කායවිවෙකය ද පිරිසිදු සිත් ඇති උත්තම පරිශුද්ධියට පැමිණියවුන්ට චිත්තවිවෙකය ද ආරම්මණවශයෙන් නිවනට පැමිණි උපධි රහිත පුද්ගලයන්ට උපධිවිවෙකය ද වේ. **සික්ඛා** යනු: අධිශීලශික්‍ෂා යැ අධිචිත්තශික්‍ෂා යැ අධිප්‍රඥාශික්‍ෂා යැයි ශික්‍ෂා තුනෙකි.... මේ අධිප්‍රඥාශික්‍ෂා යි. **විවෙකඤ්ඤෙව සික්ඛෙථ** – විවේකයෙහි මැ හැසිරෙන්නේය වෙසෙසින් හැසිරෙන්නේය, සමාදන්ව පවත්නේ ය, හික්මෙන්නේ නුයි 'විවෙකඤ්ඤෙව සික්ඛෙථ' යනු වේ.

**එතදරියානමුත්තමන්ති** – අරියා වුච්චන්ති බුද්ධා ච බුද්ධසාවකා ච පච්චෙකබුද්ධා ච. අරියානං එතං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං යදිදං විවෙකචරියාති 'එතදරියානමුත්තමං.'

**තෙන සෙට්ඨො න මඤ්ඤෙථාති** – තාය විවෙකචරියාය උන්නතිං න කරෙය්‍ය, උන්නමං න කරෙය්‍ය, මානං න කරෙය්‍ය, ථාමං න කරෙය්‍ය, ථම්භං න කරෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති 'තෙන සෙට්ඨො න මඤ්ඤෙථ.'

**ස වෙ නිබ්බානසන්තිකෙති** – සො නිබ්බානස්ස සන්තිකෙ සාමන්තා ආසන්නෙ අවිදූරෙ උපකට්ඨෙති – ස වෙ නිබ්බානසන්තිකෙ.

තෙනාහ භගවා:

> "විවෙකඤ්ඤෙව[1] සික්ඛෙථ එතදරියානමුත්තමං,[2]
> තෙන සෙට්ඨො න මඤ්ඤෙථ ස වෙ නිබ්බානසන්තිකෙ"ති.

## 7 – 10

> රිත්තස්ස මුනිනො චරතො කාමෙසු අනපෙක්ඛිනො,
> ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා[3] පජා.

**රිත්තස්ස මුනිනො චරතොති** – 'රිත්තස්සා'ති රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස කායදුච්චරිතෙන රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස, වචීදුච්චරිතෙන රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස, මනොදුච්චරිතෙන රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස, රාගෙන දොසෙන මොහෙන කොධෙන උපනාහෙන මක්ඛෙන පළාසෙන ඉස්සාය මච්ඡරියෙන මායාය සාඨෙය්‍යෙන ථම්භෙන සාරම්භෙන මානෙන අතිමානෙන මදෙන පමාදෙන සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බපරිළාහෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි[4] රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස; **මුනීති** මොනං වුච්චති ඤාණං –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනි; **චරතොති** චරතො විහරතො ඉරියතො වත්තතො පාලයතො යපයතො යාපයතොති 'රිත්තස්ස මුනිනො චරතො.'

**කාමෙසු අනපෙක්ඛිනොති** – 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා කාමෙසු අනපෙක්ඛමානො චත්තකාමො වන්තකාමො මුත්තකාමො පහීනකාමො පටිනිස්සට්ඨකාමො වීතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති 'කාමෙසු අනපෙක්ඛිනො.'

1. විවෙකංයෙව – සු. 2. එතමරියානමුත්තමං – ස.
3. ගධිතා – මජුප. මජසං. PTS. 4. සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි – සීමු. II.

**එතදරියානමුත්තමං** - බුදුවරු ද බුදුසව්වෝ ද පසේබුදුවරු ද ආය්‍යීයෝ යැයි කියනු ලැබෙත්. ආය්‍යීයන්ගේ යම් විවෙකවාසයෙක් වේ ද මෙය අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ අතිශ්‍රෙෂ්ඨ යැ ප්‍රමුඛ යැ උත්තම යැ ප්‍රවර නුයි 'එතදරියානමුත්තමං' යනු වේ.

**තෙන සෙට්ඨො න මඤ්ඤෙථ** - ඒ විවෙකයෙහි යෙදීමෙන් (තමා) උසස් නො කරන්නේ යැ නො නඟන්නේ යැ මානය නො කරන්නේ යැ බල නො කරන්නේ යැ දැඩි නො කරන්නේ යැ එයින් මානය නූපදවන්නේ යැ එයින් තද වූයේ වෙසෙසින් තද වූයේ ඔසවාගත් හිස ඇත්තේ නො වන්නේ නුයි 'තෙන සෙට්ඨො න මඤ්ඤෙථ' යනු වේ.

**ස වෙ නිබ්බානසන්තිකෙ** - හෙතෙම නිවන සමීපයෙහි වැලත අසල නුදුරු ළඟ නුයි 'ස වෙ නිබ්බානසන්තිකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"විවෙකඤ්ඤෙව සික්ඛෙථ -පෙ- ස වෙ නිබ්බානසන්තිකෙ" යි.**

## 7 - 10

කෙලෙසුන් කෙරෙන් සිස් වූ එකලා වැ හැසිරෙන කාමයන්හි අපෙක්ෂා රහිත වූ චතුරොඝතරණය කළ ක්ෂීණාස්‍රව මුනි හට කාමයන්හි ගෙතුණා වූ සත්ත්වයෝ කැමැති වෙත්.

**රිත්තස්ස මුනිනො චරතො** - 'රිත්තස්ස' යනු: කායදුශ්චරිතයෙන් හිස් වූ වෙන් වූ විවෙක වූවහුට, වාග්දුශ්චරිතයෙන් - මනොදුශ්චරිතයෙන් හිස් වූ වෙන් වූ විවෙක වූවහුට, රාගයෙන් ද්වෙෂයෙන් මොහයෙන් ක්‍රොධයෙන් වෛරයෙන් මකුබැවින් යුගග්‍රාහයෙන් ඊර්ෂ්‍යායෙන් මසුරුබැවින් ශඨබැවින් තදබැවින් එකටෙක කිරීමෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් සියලු කෙලෙසුන් ගෙන් සියලු දුසිරිත් වලින් සියලු දරථවලින් සියලු පරිදාහයන්ගෙන් සියලු සන්තාපයන්ගෙන් සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් හිස් වූ වෙන් වූ විවෙක වූවහුගේ; මුනිනො 'මොන'යි ඥානය කියනු ලැබෙයි...චරතො හැසිරෙනුවනුගේ වෙසෙන - ඉරියව් පවත්වන-පැවැතෙන - රකෙන - යැපෙනුවහුගේ නුයි 'රිත්තස්ස මුනිනො චරතො' යනු වේ.

**කාමෙසු අනපෙක්ඛිනො**-'කාමා' යනු: වස්තුකාමයෝ ද ක්ලෙශකාමයෝ දැයි උදාන හෙයින් කාමයෝ දෙදෙනෙකි...වස්තුකාමයන් හැඳින ක්ලෙශකාමයන් හැරපියා දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා කාමයන්හි අපෙක්ෂා නැතියේ ත්‍යාග කළ කාම ඇතියේ වමනය කළ - මුදන ලද - ප්‍රහීණ කළ - දුරලන ලද කාම ඇතියේ වීතරාග වූයේ ත්‍යක්තරාග වූයේ වාන්තරාග වූයේ මුක්තරාග වූයේ ප්‍රහීණරාග වූයේ දුරලන ලද රාග ඇතියේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිසිල් වූයේ සුව විඳිනුයේ උතුම් වූ සිතින් යුක්ත ව වෙසේ නුයි 'කාමෙසු අනපෙක්ඛිනො' යනු වේ.

**ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා[1] පජාති** – "පජා"ති සත්තාධිවචනං, පජා කාමෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා; තෙ කාමොඝතිණ්ණස්ස භවොඝතිණ්ණස්ස දිට්ඨොඝතිණ්ණස්ස අවිජ්ජොඝතිණ්ණස්ස සබ්බසංසාරපථං[2] තිණ්ණස්ස උත්තිණ්ණස්ස නිත්තිණ්ණස්ස අතික්කන්තස්ස සමතික්කන්තස්ස වීතිවත්තස්ස පාරං ගතස්ස පාරං පත්තස්ස අන්තං ගතස්ස අන්තං පත්තස්ස කොටිං ගතස්ස කොටිං පත්තස්ස පරියන්තං ගතස්ස පරියන්තං පත්තස්ස වොසානං ගතස්ස වොසානං පත්තස්ස තාණං ගතස්ස තාණං පත්තස්ස ලෙණං ගතස්ස ලෙණං පත්තස්ස සරණං ගතස්ස සරණං පත්තස්ස අභයං ගතස්ස අභයං පත්තස්ස අච්චුතං ගතස්ස අච්චුතං පත්තස්ස අමතං ගතස්ස අමතං පත්තස්ස නිබ්බානං ගතස්ස නිබ්බානං පත්තස්ස ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්ති. යථා නාම ඉණායිකා ආනණ්‍යං පත්ථෙන්ති පිහයන්ති, යථා ආබාධිකා ආරොග්‍යං පත්ථෙන්ති පිහයන්ති, යථා බන්ධනබද්ධා බන්ධනමොක්ඛං පත්ථෙන්ති පිහයන්ති, යථා දාසා භුජිස්සං පත්ථෙන්ති පිහයන්ති, යථා කන්තාරද්ධානපක්ඛන්තා[3] ඛෙමන්තභූමිං පත්ථෙන්ති පිහයන්ති, එවමෙවං පජා කාමෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා. තෙ කාමොඝතිණ්ණස්ස භවොඝතිණ්ණස්ස –පෙ– නිබ්බානං ගතස්ස නිබ්බානං පත්තස්ස ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්තීති 'ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා[1] පජා.'

තෙනාහ භගවා:

"රිත්තස්ස මුනිනො චරතො කාමෙසු අනපෙක්ඛිනො,
ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා පජා"ති.

**තිස්සමෙත්තෙය්‍යසුත්තනිද්දෙසො සත්තමො.**

# 8

# පසූරසුත්තනිද්දෙසො

## 8 – 1

අථ පසූරසුත්තනිද්දෙසො වුච්චති:

"ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති[4]
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
යං නිස්සිතා තත්ථ සුභං වදානා
පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා.

1. ගධිතා - මනුප. මජසං. PTS. 2. සබ්බසඞ්ඛාරපථං - ස.
3. පක්ඛන්ධා - සීමු. I. පක්ඛන්ද - මජසං. 4. වාදියන්ති - සු. PTS.

**ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගධිතා පජා** – 'පජා' යනු: සත්ත්වයන්ට නමෙකි; සත්ත්වයෝ කාමයන්හි ඇලුණාහුය, ගිජු වූවාහුය ගෙතුණාහුය මුසපත් වූවාහුය ඇතුළු වූවාහුය ලැගුණාහුය එල්බුණාහුය ඇවුරුණාහුය ඔවුහු කාමෞඝය – භවෞඝය – දිට්ඨෞඝය – අවිද්‍යෞඝය තරණය කළ සියලු සසරමග තරණය කළ එතෙර වූ නිස්තරණය කළ ඉක්ම වූ මැනවින් ඉක්ම වූ ව්‍යතික්‍රමණය කළ නිර්වාණපාරයට ගිය පාරයට පැමිණි අන්තයට ගිය අන්තයට පැමිණි කෙළවරට ගිය කෙළවරට පැමිණි පර්‍යන්තයට ගිය පර්‍යන්තයට පැමිණි අවසානයට ගිය අවසානයට පැමිණි ත්‍රාණයට ගිය ත්‍රාණයට පැමිණි ලෙනයට ගිය ලෙනයට පැමිණි සරණයට ගිය සරණයට පැමිණි අභයට ගිය අභයට පැමිණි අච්‍යුතියට ගිය අච්‍යුතියට පැමිණි අමෘතයට ගිය අමෘතයට පැමිණි නිර්වාණයට ගිය නිර්වාණයට පැමිණි (ක්ෂීණාස්‍රවයා) හට කැමැති වෙති, ආස්වාදය කෙරෙති, ප්‍රාර්ථනා කෙරෙති, රිසි උපදවති, තෘප්තියට පැමිණෙත්; ණයගැතියෝ අනණ (ණයනැති) බව යම්සේ පතත් ද, කැමැති වෙත් ද, රෝගීහු අරෝග බව – සිරබන්ධනයෙන් බැඳුණාහු බන්ධනයෙන් මිදීම – දාසයෝ නිදාස බව – කතරම්හට පිවිසියාහු ක්ෂේමභූමිය යම්සේ ප්‍රාර්ථනා කෙරෙත් ද කැමැති වෙත් ද එසෙයින් සත්ත්වයෝ කාමයන් හි ඇලුණාහු ගිජුවූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු පිවිසියාහු ලැගුණාහු එල්බුණාහු ඇවුරුණාහු වෙති, ඔවුහු කාමෞඝය තරණය කළ භවෞඝය තරණය කළ...නිවනට ගිය නිවනට පැමිණි ක්ෂීණාස්‍රවය හට කැමති වෙති, ආස්වාදය කෙරෙති, ප්‍රාර්ථනා කෙරෙති, රිසි උපදවති තෘප්තියට පැමිණෙත් නුයි '**ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගධිතා පජා**' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"රිත්තස්ස මුනිනො චරතො -පෙ- කාමෙසු ගධිතා පජා"**යි

**සත්වැනි තිස්සමෙත්තෙය්‍ය සූත්‍රනිර්දේශය යි.**

# 8

# පසූරසූත්‍රනිර්දේශය

ඉක්බිති පසූරසූත්‍රනිර්දේශය කියනු ලැබේ.

**8 – 1**

යම් ශාස්තෘ ආදියක් ඇසුරු කළා වූ ඒ ස්වකීය දෘෂ්ටියෙහි ශුභවාද ඇත්තා වූ බොහෝ මහණ බමුණෝ වෙන වෙන සත්‍යයන්හි බැසගත්තාහු ද (මේ දෘෂ්ටිගතිකයෝ) මෙහි මැ ශුද්ධිය වේ යැයි වාද කෙරෙති අන්‍ය ධර්මයන්හි විශුද්ධිය නැතැයි කියත්.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්තීති** - ඉධෙව සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; 'සස්සතො ලොකො, අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති.'

**නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහූති** - අත්තනො සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං ඨපෙත්වා සබ්බෙ පරවාදෙ ඛිපන්ති උක්ඛිපන්ති පරික්ඛිපන්ති: සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, න තත්ථ සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා; න තත්ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා මුච්චන්ති වා විමුච්චන්ති වා පරිමුච්චන්ති වා; හීනා නිහීනා ඔමකා ලාමකා ජතුක්කා[1] පරිත්තාති, එවමාහංසු එවං වදන්ති එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති 'නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු.'

**යත්‍ථනිස්සිතා තත්ථ සුභං වදානාති** - 'යත්ථනිස්සිතා' ති යං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතා අස්සිතා[2] අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා; **තත්ථාති** - සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සුභංවදානාති** සුභවාදා සොභනවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති 'යත්ථනිස්සිතා තත්ථ සුභංවදානා.'

**පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨාති** - පුථූ සමණබ්‍රාහ්මණා පුථූ පච්චෙකසච්චෙසු නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා 'සස්සතො ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා; 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති 'පච්චෙක සච්චෙසු පුථූ නිවිට්ඨා.'

තෙනාහ භගවා:

"ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
යත්ථනිස්සිතා තත්ථ සුභංවදානා
පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා"ති.

1. ජතුක්කා - සීමු. II ජතුක්කා - මජසං. චතුක්කා - මජුප
2. ආනිස්සිතා - සී. මජසං. යත්‍රනිස්සිතා - PTS. පතිට්ඨිතා - සීමු II.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති** - මෙහි මැ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වේ යයි පවසති කියති බෙණෙති දක්වති වහරත්. ‘ලෝකය ශාශ්වත යැ ලෝකය අශාශ්වත යැ ලෝකය අන්තවත් යැ ලෝකය අනන්තවත් යැ ආත්මයත් ශරීරයත් එකෙක් මැ ය ආත්මය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ සත්ත්වයා මරණින් මතු විද්‍යමාන වෙයි, සත්ත්වයා මරණින් මතු නො වෙයි, සත්ත්වයා මරණින් මතු වන්නේ ත් නො වන්නේ ත් වෙයි, සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි මේ මැ ඇබව අන්‍යය හිස් යැ යි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි‘ ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති’ යනු වේ.

**නාඤ්ඤේසු ධම්මේසු විසුද්ධිමාහු** - තමාගේ ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය තබා සියලු පරවාදයන් බැහැර කෙරෙති දුරු කෙරෙති ප්‍රතික්ෂෙප කෙරෙත්; ඒ ශාස්තෘහු අසර්වඥ යැ, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය භද්‍ර නො වෙයි, ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය අනෛර්යාණික යැ, එහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය හෝ මුක්තිය විමුක්තිය පරිමුක්තිය හෝ නැත. (සත්ත්වයෝ) එහි ශුද්ධ විශුද්ධ පරිශුද්ධ හෝ නො වෙති, මුක්ත විමුක්ත පරිමුක්ත හෝ නො වෙත්; (ඔහු) හීනයෝ යැ නිහීනයෝ යැ අවමතයෝ යැ ලාමකයෝ යැ අප්‍රත්‍යයෝ යැ අල්පයෝ යැයි මෙසේ කියති පවසති කථා කෙරෙති බෙණෙති දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි ‘නාඤ්ඤේසු ධම්මේසු විසුද්ධිමාහු’ යනු වේ.

**යං නිස්සිතා තත්ථ සුභං වදානා** - යං ‘නිස්සිතා’ යනු: යම් ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇසුරු කළාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු; **තත්ථ** - ස්වකීය දෘෂ්ටියෙහි සිය කැමැත්තෙහි සිය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි; **සුභං වදානා**- ස්වකීය ලබ්ධියෙහි ශුභවාද ඇත්තාහු සුන්දර යයි කියන්නාහු (ඇපි) පණ්ඩිතයම්හ යි කියන්නාහු ස්ථිරවාද ඇතියම්හයි - න්‍යායවාද ඇතියම්හයි- හේතුවාද ඇතියම්හයි - ලක්ෂණය යුතු දෑ කියම්හයි - සකාරණ ව කියම්හයි - නැවැතුණු වාද ඇතියම්හයි කියන්නාහු නුයි ‘යං නිස්සිතා තත්ථ සුභං වදානා, යනු වේ.

**පච්චේකසච්චේසු පුථූ නිවිට්ඨා** - බොහෝ මහණබමුණෝ බොහෝ වූ වෙන වෙන ම සත්‍යයන්හි පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු ‘ලෝකය ශාශ්වත යැ මේ මැ සැබව අන්‍යය තුච්ඡ යැ’ යි පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු; ‘ලෝකය අශාශ්වත යැ...‘සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මෙය මැ සැබව අන්‍යය තුච්ඡ යැ’ යි පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළුවූවාහු බැසගත්තාහු නුයි ‘පච්චේකසච්චේසු පුථූ නිවිට්ඨා, යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

**“ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති -පෙ- පච්චේකසච්චේසු පුථූ නිවිට්ඨා”** යි.

**8 - 2**

තෙ වාදකාමා පරිසං විගය්හ
බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං,
වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං
පසංසකාමා කුසලාවදානා.

**තෙ වාදකාමා පරිසං විගය්හාති** – 'තෙ වාදකාමා' ති තෙ වාදකාමා වාදත්ථිකා වාදාධිප්පායා වාදපුරෙක්ඛාරා වාදපරියෙසනං චරන්තා; **පරිසං**– ඛත්තියපරිසං බ්‍රාහ්මණපරිසං ගහපතිපරිසං සමණපරිසං විගය්හ ඔගය්හ; **විගය්හාති**– අජ්ඣොගාහෙත්වා පවිසිත්වාති 'තෙ වාදකාමා පරිසං විගය්හ.'

**බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤන්ති** – 'මිථූ' ති ද්වෙ ජනා ද්වෙ කලහකාරකා ද්වෙ භණ්ඩනකාරකා ද්වෙ භස්සකාරකා ද්වෙ විවාදකාරකා ද්වෙ අධිකරණකාරකා ද්වෙ වාදිනො ද්වෙ සල්ලාපකා; තෙ අඤ්ඤමඤ්ඤං හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡත්තකතො පරිත්තතො දහන්ති පස්සන්ති දක්ඛන්ති ඔලොකෙන්ති නිජ්ඣායන්ති[1] උපපරික්ඛන්තීති 'බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං.'

**වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජන්ති** – තෙ අඤ්ඤං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතා අස්සිතා[2] අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා; **කථොජ්ජං** වුච්චති කලහො භණ්ඩනං විග්ගහො විවාදො මෙධගං; අථවා **කථොජ්ජන්ති** අනොජවන්තී[3] සා කථා[4] කථොජ්ජං වදන්ති, කලහං වදන්ති. භණ්ඩනං වදන්ති. විග්ගහං වදන්ති. විවාදං වදන්ති. මෙධගං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං.'

**පසංසකාමා කුසලාවදානාති** – 'පසංසකාමා'ති පසංසකාමා පසංසත්ථිකා පසංසාධිප්පායා පසංසාපුරෙක්ඛාරා පසංසාපරියෙසනං චරන්තා; **කුසලාවදානාති** කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති 'පසංසකාමා කුසලාවදානා.'

තෙනාහ භගවා:

"තෙ වාදකාමා පරිසං විගය්හ
බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං,
වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං
පසංසකාමා කුසලාවදානා"ති.

**8 - 3**

යුත්තො කථායං පරිසාය මජ්ඣෙ
පසංසමිච්ඡං විනිඝාති හොති,
අපාසදස්මිං[5] පන මඞ්කු හොති,
නින්දාය සො කුප්පති රන්ධමෙසී.

1. නිගණ්හායන්ති - PTS.
2. පතිට්ඨිතා - සීමු. II. අභිස්සිතා - මනුප. ආභිස්සිතා - මජසං. සන්නිස්සිතා - PTS. 3. අනොජවන්තීති - සීමු II. 4. නිසාකථා - මජසං.
5. අපාහතස්මිං - සීමු II. අවාසදස්මිං - මජසං.

## 8 - 2

ඔවුහු වාද කැමැත්තාහු පිරිස්මැදට වැද වාදකරුවෝ දෙදෙන ඔවුනොවුන් බාලයයි සිතති, ඔහු අන්‍ය ශාස්තෘ ආදිය ඇසුරු කළාහු පැසසුම් කැමැති ව (ඇපි) පණ්ඩිතවාදඇතියම්හ'යි විවාද කථා කියත්.

**තෙ වාදකාමා පරිසං විගය්හ** - 'තෙ වාදකාමා' යනු: ඔහු වාද කැමැත්තාහු වාදාර්ථි වූවාහු වාද අදහස් ඇත්තාහු වාද පෙරටු කොට ඇත්තාහු වාද සෙවීමෙහි හැසිරෙන්නාහු; **පරිසං විගය්හ** – ක්ෂත්‍රිය පිරිසට බ්‍රාහ්මණ - ගෘහපති - ශ්‍රමණ පිරිසට පැමිණ බැස ඇතුළුව පිවිස නුයි 'තෙ වාදකාමා පරිසං විගය්හ' යනු වේ.

**බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං** – 'මිථු' යනු දෙදෙනා කලහකරුවෝ දෙදෙන ඩබරකරුවෝ – (විවාද) කථාකරුවෝ – විවාදකරුවෝ–අධිකරණ කරුවෝ - වාදකරුවෝ - කථාකරනුවෝ දෙදෙන, ඔහු ඔවුනොවුන් හීනවසයෙන් නිහීනවසයෙන් අවමත්වසයෙන් ලාමකවසයෙන් පරිත් වසයෙන් අල්පවසයෙන් සලකති බලති දකිති අවලොකන කෙරෙති සිතති විමසත් නුයි 'බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං' යනු වේ.

**වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං** – ඔවුහු අන්‍ය ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් ලබ්ධියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇසුරු කළාහු වෙසෙසින් ඇසුරු කළාහු ඇලුණාහු පැමිණියාහු පිවිසියාහු බැසගත්තාහු; '**කථොජ්ජ**' යි කලහය ඩබරය විග්‍රහය විවාදය මෙධගය කියනු ලැබෙයි. නොහොත් **කථොජ්ජං** – අනොජවත් වූ ඒ කථාව 'කථොජ්ජ' යයි කියති, කලහ – භණ්ඩන – විග්‍රහ – විවාද – මෙධග යයි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං' යනු වේ.

**පසංසකාමා කුසලාවදානා** – 'පසංසකාමා' යනු: පැසැසුම් කැමැත්තාහු ප්‍රශංසාර්ථී වූවාහු ප්‍රශංසාභිප්‍රාය ඇත්තාහු පැසැසුම් පෙරටු කොට සිටියාහු පැසැසුම් සෙවීමෙහි හැසිරෙත්තාහු; **කුසලාවදානා** – ස්වකීය ලබ්ධියෙහි කුසලවාද – පණ්ඩිතවාද – ස්ථිරවාද – න්‍යායවාද – හෙතුවාද-ලක්ෂණවාද – කාරණවාද – ස්ථානවාද ඇත්තාහු නුයි 'පසංසකාමා කුසලාවදානා' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

**“තෙ වාදකාමා -පෙ- කුසලාවදානා”යි**

## 8 - 3

පිරිස් මැද වාදකථායෙහි උත්සුක වූයේ (තමහට) පැසැසුම් කැමැති වෙමින් (පලමු මැ) සැක ඇතියේ වෙයි. යළි (විමංසකයන් විසින් ඔහු ගේ වාදය) බැහැර කරනු ලැබූ කල්හි මකු වෙයි. සිදුරු සොයන්නාවූ හෙයින්ම නින්දාවෙන් කොපයට පැමිණේ.

**යුත්තෙන කථායං පරිසාය මජ්ඣෙති** - ඛත්තියපරිසාය වා බ්‍රාහ්මණපරිසාය වා ගහපතිපරිසාය වා සමණපරිසාය වා මජ්ඣෙ අත්තනො කථායං යුත්තා පයුත්තා ආයුත්තා සමායුත්තා සම්පයුත්තා කථෙන්තීති 'යුත්තෙන කථායං පරිසාය මජ්ඣෙ.'

**පසංසමිච්ඡං විනිඝාති හොතීති** - 'පසංසමිච්ඡ'න්ති පසංසං ථොමනං කිත්තිං වණ්ණහාරියං ඉච්ඡන්තො පත්ථයන්තො පිහයන්තො අභිජප්පන්තො; විනිඝාති හොතීති - පුබ්බෙව සල්ලාපා කථංකථී විනිඝාති හොති: 'ජයො නු ඛො මේ භවිස්සති, පරාජයො නු ඛො මෙ භවිස්සති, කථං නිග්ගහං කරිස්සාමි, කථං පටිකම්මං කරිස්සාමි, කථං විසෙසං කරිස්සාමි, කථං පටිවිසෙසං කරිස්සාමි, කථං ආවෙඨියං කරිස්සාමි, කථං නිබ්බෙඨියං කරිස්සාමි, කථං ඡෙදං[1] කරිස්සාමි, කථං මණ්ඩලං කරිස්සාමී'ති. එවං පුබ්බෙව සල්ලාපා කථංකථී විනිඝාති හොතීති 'පසංසමිච්ඡං විනිඝාති හොති.'

**අපාසදස්මිං[2] පන මඞ්කු හොතීති** - 'යෙ තෙ පඤ්හවීමංසකා පරිසා පාරිසජ්ජා පාසාරිකා[3] තෙ අපසාදෙන්ති: 'අත්ථාපගතං භණිත'න්ති අත්ථතො අපසාදෙන්ති. 'බ්‍යඤ්ජනාපගතං භණිත'න්ති බ්‍යඤ්ජනතො අපසාදෙන්ති.[4] 'අත්ථබ්‍යඤ්ජනාපගතං භණිත'න්ති අත්ථබ්‍යඤ්ජනතො අපසාදෙන්ති. 'අත්ථො තෙ දුන්නීතො. බ්‍යඤ්ජනං තෙ දුරොපිතං. අත්ථබ්‍යඤ්ජනං තෙ දුන්නීතං දුරොපිතං. නිග්ගහො තෙ අකතො. පටිකම්මං තෙ දුක්කතං. විසෙසො තෙ අකතො. පටිවිසෙසො තෙ දුක්කතො. ආවෙඨියා තෙ අකතා. නිබ්බෙඨියා තෙ දුක්කතා. ඡෙදො තෙ අකතො. මණ්ඩලං තෙ දුක්කතං. විසමං කථිතං[5] දුක්කථිතං දුබ්භණිතං දුල්ලපිතං දුරුත්තං දුබ්භාසිත'න්ති අපසාදෙන්ති.[6] අපාසදස්මිං[2] පන මඞ්කු හොතීති අපාසදස්මිං මඞ්කු හොති පීළිතො ඝට්ටිතො බ්‍යාධිතො දොමනස්සිතො හොතීති අපාසදස්මිං පන මඞ්කු හොති.'

**නින්දාය සො කුප්පති රන්ධමෙසීති** - 'නින්දාය ගරහාය අකිත්තියා අවණ්ණහාරිකාය කුප්පති බ්‍යාපජ්ජති පතිට්ඨීයති. කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොතී'ති නින්දාය සො කුප්පති. රන්ධමෙසීති රන්ධමෙසී විරන්ධමෙසී අපරද්ධමෙසී ඛලිතමෙසී ගලිතමෙසී ඝට්ටිතමෙසී විවරමෙසීති 'නින්දාය සො කුප්පති රන්ධමෙසී.'

තෙනාහ භගවා:

"යුත්තො කථායං පරිසාය මජ්ඣෙ
පසංසමිච්ඡං විනිඝාති හොති,
අපාසදස්මිං[2] පන මඞ්කු හොති
නින්දාය සො කුප්පති රන්ධමෙසී"ති.

1 ඡෙදනං - ස. 2. අපාහතස්මිං - සීමු. II. PTS.
3. පාසනිකා - PTS. පාසාදනියා - ස. 4. අපහරන්ති - සීමු. II. PTS.
5. විසමකථං - සීමු. II. 6. අපහරන්ති - සීමු. II.

**යුත්තා කථායං පරිසාය මජ්ඣෙ** – ක්‍ෂත්‍රියපර්ෂද් හෝ බ්‍රාහ්මණපර්ෂද් හෝ ගෘහපතිපර්ෂද් හෝ ශ්‍රමණපර්ෂද් හෝ මැද තමාගේ වාදකථායෙහි කියන්නට උත්සුක වූයේ ප්‍රයුක්ත වූයේ ආයුක්ත වූයේ සංයුක්ත වූයේ සම්ප්‍රයුක්ත වූයේ නුයි ‘යුත්තා කථායං පරිසාය මජ්ඣෙ’ යනු වේ.

**පසංසමිච්ඡං විනිඝාති හොති** – ‘පසංසමිච්ඡං’ යනු: පැසැසුම් තෙමුම් කීර්තිය යසස්වැඩිම කැමැති වෙමින් ඉවසමින් පතමින් බලාපොරොත්තු වෙමින් ගුණ කියමින්; **විනිඝාති හොති** – වාදකථාවෙන් පළමු මැ සැක ඇතියේ ගැටෙනුයේ වෙයි: ‘මට ජය වෙයි දෝ හෝ, මට පරාජය වෙයි දෝ හෝ, කිසෙසින් නිග්‍රහ කෙරෙම් ද කෙසේ පිළියම් කෙරෙම් ද කිසෙයින් විශෙෂ (=අතිරෙක) කෙරෙම් ද කිසෙසින් පුන පුනා විශෙෂ කෙරෙම් ද කිසෙසින් වෙළුම් කෙරෙම් ද කිසෙසින් (මාගේ) වෙළුම් හරිම් ද කෙසේ (වාදය) සිඳිම් ද කෙසේ මඬුලු කෙරෙම් ද’යි මෙසේ වාදකථාවෙන් පෙර මැ සැක ඇතියේ ගැටෙනුයේ වේ නුයි ‘පසංසමිච්ඡං විනිඝාති හොති’ යනු වේ.

**අපාහතස්මිං පන මඞ්කු හොති** – පිරිස්වැසි වූ පිරිවර වූ කාරුණික වූ යම් ප්‍රශ්නවිමංසකයෝ වෙත් ද ඔවුහු බැහැර කෙරෙති: ‘අර්ථයෙන් බැහැර ව කියන ලද්දැ’යි අර්ථයෙන් බැහැර කෙරෙති. ‘ව්‍යඤ්ජන රහිත ව කියන ලද්දැ’යි ව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති. ‘අර්ථව්‍යඤ්ජන රහිතව කියන ලද්දැ’යි අර්ථව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති. ‘තා විසින් අර්ථය වරදවා එළවන ලද. තා විසින් ව්‍යඤ්ජනය වරදවා තබන ලද. තා විසින් අර්ථව්‍යඤ්ජනය වරදවා එළවන ලද. තබන ලද. තා විසින් නිග්‍රහය නො කරන ලද. තා විසින් පිළියම් (ලබ්ධිය පිහිටුවීම) වරදවා කරන ලද. විශෙෂය තා විසින් නො කරන ලද. ප්‍රතිවිශෙෂය තා විසින් වරදවා කරන ලද. වෙළුම තා විසින් නො කරන ලද. වෙළුම් හැරිම තා විසින් වරදවා කරන ලද. වාද සිඳුම තා විසින් නො කරන ලද. මණ්ඩලය තා විසින් වරදවා කරන ලද. විෂම ව කියන ලද, වරදවා කියන ලද, වරදවා බණින ලද, වරදවා විසඳන ලද, වරදවා උපුරුවන ලද, විරූපව කියන ලද්දැ’යි බැහැර කෙරෙත්. **අපාහතස්මිං පන මඞ්කු හොති** – බැහැර කළ කල්හි මකු වෙයි. පෙළෙණේ ගැටුණේ ව්‍යාධිත වූයේ දොම්නස් වූයේ වේ නුයි ‘අපාහතස්මිං පන මඞ්කු හොති’ යනු වේ.

**නින්දාය සො කුප්පති රන්ධමෙසී** – නින්දායෙන් ගර්හායෙන් අපකීර්තියෙන් අගුණ වැකීමෙන් කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, (කොපයෙන්) තද බවට පැමිණෙයි. කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ කෙරේ නුයි ‘නින්දාය සො කුප්පති’ යනු වේ. **රන්ධමෙසී** – රන්ධ්‍රය (=අතර) සොයනුයේ සිදුරු සොයනුයේ දොෂය සොයනුයේ පැකුළුම සොයනුයේ ගිලිහුම සොයනුයේ ගැටුම සොයනුයේ විවරය සොයනුයේ නුයි ‘නින්දාය සො කුප්පති රන්ධමෙසී’ යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**“යුත්තා කථායං** -පෙ- **කුප්පති රන්ධමෙසී”යි.**

## 8 - 4

යමස්ස වාදං පරිහීනමාහු
අපාසදං[1] පඤ්හවීමංසකා සෙ,
පරිදෙවති සොචති හීනවාදො
උපච්චගා මන්ති අනුත්ථුනාති.

**යමස්ස වාදං පරිහීනමාහූති** - යං අස්ස[2]වාදං හීනං නිහීනං පරිහීනං පරිහාපිතං න පරිපූරිතං එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති 'යමස්ස වාදං පරිහීනමාහු.'

**අපාසදං පඤ්හවීමංසකා සෙති** - යෙ තෙ පඤ්හවීමංසකා පරිසා පාරිසජ්ජා පාසාරිකා[3] තෙ අපසාදෙන්ති: 'අත්ථාපගතං භණිත'න්ති අත්ථතො අපසාදෙන්ති. 'බ්‍යඤ්ජනාපගතං භණිතන්ති' 'බ්‍යඤ්ජනතො අපසාදෙන්ති. 'අත්ථබ්‍යඤ්ජනාපගතං භණිත'න්ති අත්ථබ්‍යඤ්ජනතො අපසාදෙන්ති. 'අත්ථො තෙ දුන්නීතො. බ්‍යඤ්ජනං තෙ දුරොපිතං. අත්ථබ්‍යඤ්ජනං දුන්නීතං දුරොපිතං. නිග්ගහො තෙ අකතො. පටිකම්මං තෙ දුක්කතං. විසෙසො තෙ අකතො. පටිවිසෙසො තෙ දුක්කතො. ආවෙඨියා තෙ අකතා. නිබ්බෙඨියා තෙ දුක්කතා, ඡෙදො තෙ අකතො, මණ්ඩලං තෙ දුක්කතං, විසමං කථිතං[4] දුක්කථිතං දුබ්භණිතං දුල්ලපිතං දුරුත්තං දුබ්භාසිතන්ති අපහරන්තීති - 'අපාසදං පඤ්හවීමංසකා සෙ.'

**පරිදෙවති සොචති හීනවාදොති**-'පරිදෙවතී'ති 'අඤ්ඤං මයා ආවජ්ජිතං, අඤ්ඤං චින්තිතං, අඤ්ඤං උපධාරිතං, අඤ්ඤං උපපරික්ඛිතං, අඤ්ඤං උපලක්ඛිතං. සො මහාපක්ඛො මහාපරිසො මහාපරිවාරො. පරිසා'යං වග්ගා න සමග්ගා. සමග්ගාය පරිසාය හෙතු කථාසල්ලාපො. පුන භඤ්ජිස්සාමී'ති[5] යා එවරූපා වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[6] ලාලප්පිතත්තන්ති[7] පරිදෙවති. සොචතීති 'තස්ස ජයො'ති සොචති, 'මය්හං පරාජයො'ති සොචති. 'තස්ස ලාභො'ති සොචති. 'මය්හං අලාභො'ති සොචති. 'තස්ස යසො'ති සොචති. 'මය්හං අයසො'ති සොචති. 'තස්ස පසංසා'ති සොචති. 'මය්හං නින්දා'ති සොචති; 'තස්ස සුඛ'න්ති සොචති; 'මය්හං දුක්ඛ'න්ති සොචති. 'සො සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අහමස්මි අසක්කතො අගරුකතො අමානිතො අපූජිතො අනපචිතො න ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජතීති පරිදෙවති සොචති.' **හීනවාදොති** - හීනවාදො පරිහීනවාදො පරිහාපිතවාදො න පරිපූරවාදොති 'පරිදෙවති සොචති හීනවාදො.'

---

1. අපාහතං - සීමු II. මජසං, PTS. 2. තස්ස - මජුප. 3. පසාදනීයා - ස.
4. විසමකථං - සීමු. II. 5. භඤ්ජිස්සාමීති - සීමු. II භජිස්සාමීති - මජුප. භිඤ්ජිස්සාමීති - ස. 6. ලාලප්පායනා - සීමු. II මජසං. PTS
7. ලාලප්පාසිතත්තන්ති - සීමු II. මජ

**8 - 4**

යම් හෙයකින් ඔහුගේ වාදය ප්‍රශ්නවිමංසකයෝ හීන වූයේ බැහැර කරන ලදැයි කියත් ද, (එහෙයින්) පිරිහුණු වාද ඇති හෙතෙම 'වාදයෙන් මා ඉක්මවා ගියේ යැ'යි වැලපෙයි ශෝක කෙරෙයි තැවෙන්නේ යි.

**යමස්ස වාදං පරිහීනමාහු** - යම් හෙයකින් ඔහුගේ වාදය හීන යැ නිහීන යැ පරිහීන යැ පිරිහෙළන ලද නො පුරන ලදැයි මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති, මෙසේ දක්වති මෙසේ විහරත් නුයි 'යමස්ස වාදං පරිහීනමාහු' යනු වේ.

**අපාහතං පඤ්හවීමංසකා සෙ** - පිරිස් වැසි වූ පිරිවර වූ කාරුණික වූ යම් ප්‍රශ්නවිමංසකයෝ වෙත් ද, ඔවුහු බැහැර කෙරෙති: 'අර්ථ රහිත ව කියන ලදැ'යි අර්ථයෙන් බැහැර කෙරෙති. 'ව්‍යඤ්ජන රහිත ව කියන ලදැ'යි ව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති. 'අර්ථව්‍යඤ්ජන රහිත ව කියන ලදැ'යි අර්ථව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති, 'අර්ථය තා විසින් වරදවා එලවන ලද, ව්‍යඤ්ජනය තා විසින් වරදවා තබන ලද, අර්ථව්‍යඤ්ජනය තා විසින් වරදවා කියන ලද තබන ලද, නිග්‍රහය තා විසින් නො කරන ලද, ප්‍රතිකර්මය තා විසින් වරදවා කරන ලද, විශෙෂය තා විසින් නො කරන ලද, ප්‍රතිවිශෙෂය තා විසින් වරදවා කරන ලද, වෙළුම තා විසින් නො කරන ලද, වෙළුම් හැරීම තා විසින් වරදවා කරන ලද, වාදච්ඡේදය තා විසින් නො කරන ලද, වාදමණ්ඩලය තා විසින් වරදවා කරන ලද, විෂම ව කියන ලද, වරදවා කියන ලද, වරදවා බණන ලද, වරදවා විසඳන ලද, වරදවා උසුරුවන ලද, විරූප කොට කියන ලදැ'යි බැහැර කෙරෙත් නුයි 'අපාහතං පඤ්හවීමංසකා සෙ' යනු වේ.

**පරිදෙවති සොචති හීනවාදො** - 'පරිදෙවති' යනු: 'අන් සැරැණක් මා විසින් (සිතට) නතු කරන ලද, අනෙකක් සිතන ලද, අනෙකක් විමසන ලද, අනෙකක් හික්මෙන ලද, අනෙකක් සලකන ලද. හේ මහාපක්ෂ ඇතියේ යැ, මහපිරිස් ඇතියේ යැ, මහපිරිවර ඇතියේ යැ. මේ පිරිස වගී වූ යැ. සමගි නො වේ. සමගි පිරිස හේතු කොට කථාසංලාපය වෙයි. නැවත කිදින්නෙමි' මෙබඳු වූ යම් වචනය ප්‍රලාපය විප්‍රලාපය පුන පුනා ලපනය ලපනාකාරය ලපනය කළ බව නුයි 'පරිදෙවති' යනු වේ. **සොචති** - 'ඔහුට ජය යැ'යි ශෝක කෙරෙයි, 'මට පරාජය යැ'යි ශෝක කෙරෙයි, 'ඔහුට ලාභ යැ'යි සෝවී, 'මට අලාභ යැ'යි සෝවී, 'ඔහුට කීර්තිය යැ'යි සෝවී, 'මට අපකීර්තිය යැ'යි සෝවී, 'ඔහුට ප්‍රශංසාව යැ'යි සෝවී, 'මට නින්දාව යැ'යි සෝවී, 'ඔහුට සැප යැ'යි සෝවී, 'මට දුකැ'යි සෝවී. 'හෙතෙම සත්කාර කරන ලද ගරු කරන ලද බුහුමන් කරන ලද පුදන ලද සලකන ලද චීවරපිණ්ඩපාතසේනාසන ගිලන්පසබෙහෙත් පිරිකර ලබන සුලු යැ, මම් අසත්කෘතයෙමි අගරුකෘතයෙමි අමානිතයෙමි අපූජිතයෙමි අනපචිතයෙමි චීවරපිණ්ඩපාතසේනාසන ගිලන්පසබෙහෙත් පිරිකර නො ලැබෙමි' ශෝක කෙරෙයි, වෙහෙසෙයි වැලපෙයි ළෙහි පැහැර හඬයි මුළාවට පැමිණේ නුයි 'පරිදෙවති සොචති' යනු වේ. **හීනවාදො** - හීනවාද ඇතියේ නිහීනවාද ඇතියේ පරිහීනවාද ඇතියේ පිරිහෙළ වාද ඇතියේ නො පිරුණු වාද ඇතියේ නුයි 'පරිදෙවති සොචති හීනවාදො' යනු වේ.

**උපච්චගා මන්ති අනුත්ථුනාතීති** - 'සො මං වාදෙන වාදං අච්චගා උපච්චගා අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො'ති එවම්පි උපච්චගා මන්ති; අථවා 'මං වාදෙන වාදං අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දයිත්වා චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙතී'ති එවම්පි උපච්චගා මන්ති; අනුත්ථුනාතීති වුච්චති වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පායනා ලාලප්පායිතත්තන්ති 'උපච්චගා මන්ති අනුත්ථුනාති.'

තෙනාහ භගවා:

"යමස්ස වාදං පරිහීනමාහු
අපාහතං පඤ්හවිමංසකා යෙ,
පරිදෙවති සොචති හීනවාදො
උපච්චගා මන්ති අනුත්ථුනාතී"ති.

8 - 5

එතෙ විවාදා සමණෙසු ජාතා
එතෙසු උග්ඝාති නිඝාති හොති,
එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං
න හඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභා.

**එතෙ විවාදා සමණෙසු ජාතාති** – 'සමණා'ති යෙ කෙචි ඉතො බහිද්ධා පරිබ්බාජූපගතා[1] පරිබ්බාජසමාපන්නා.[2] එතෙ දිට්ඨිකලහා දිට්ඨිභණ්ඩනා දිට්ඨිවිග්ගහා දිට්ඨිවිවාදා දිට්ඨිමෙධගා සමණෙසු ජාතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතාති 'එතෙ විවාදා සමණෙසු ජාතා.'

**එතෙසු උග්ඝාති නිඝාති හොතීති** - ජයපරාජයො හොති, ලාභාලාභො හොති, යසායසො හොති, නින්දාපසංසා හොති, සුඛදුක්ඛං හොති, සොමනස්සදොමනස්සං හොති, ඉට්ඨානිට්ඨං හොති, අනුනයපටිඝං හොති, උග්ඝාතිනිඝාතිතං[3] හොති, අනුරොධවිරොධො හොති, ජයෙන චිත්තං උග්ඝාතිතං හොති, පරාජයෙන චිත්තං නිඝාතිතං හොති, ලාභෙන චිත්තං උග්ඝාතිතං හොති, අලාභෙන චිත්තං නිඝාතිතං හොති, යසෙන චිත්තං උග්ඝාතිතං හොති, අයසෙන චිත්තං නිඝාතිතං හොති, පසංසාය චිත්තං උග්ඝාතිතං හොති, නින්දාය චිත්තං නිඝාතිතං හොති, සුඛෙන චිත්තං උග්ඝාතිතං හොති, දුක්ඛෙන චිත්තං නිඝාතිතං හොති, සොමනස්සෙන චිත්තං උග්ඝාතිතං හොති, දොමනස්සෙන චිත්තං නිඝාතිතං හොති, උන්නතියා[4] චිත්තං උග්ඝාතිතං හොති, ඔනතියා චිත්තං නිඝාතිතං හොතීති 'එතෙසු උග්ඝාති නිඝාති හොති.'

**එතම්පි දිස්වා විරමෙ කථොජ්ජන්ති** – 'එතම්පී'ති එතං ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා දිට්ඨිකලහෙසු දිට්ඨිභණ්ඩනෙසු දිට්ඨිවිග්ගහෙසු දිට්ඨිවිවාදෙසු දිට්ඨිමෙධගෙසූති එතම්පි දිස්වා; **විරමෙ කථොජ්ජන්ති** – 'කථොජ්ජං' වුච්චති කලහො භණ්ඩනං විග්ගහො විවාදො මෙධගං. අථවා, **කථොජ්ජන්ති** අනොජවන්තී සා කථා. කථොජ්ජං න කරෙය්‍ය, කලහං න කරෙය්‍ය, භණ්ඩනං න කරෙය්‍ය, විග්ගහං න කරෙය්‍ය, විවාදං න කරෙය්‍ය, මෙධගං න කරෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගං පජහෙය්‍ය, විනොදෙය්‍ය බ්‍යන්තිං කරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පයුත්තො[5] විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති 'එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං.'

---

1. පරිබ්බජූපගතා - මජසං. 2. පරිබ්බාජසමාපන්නා - මජසං. පරිබ්බාජසමාපන්නා - PTS.
3. උග්ඝාතිනිඝාති - PTS. 4. උණ්ණතියා - ස්‍යා. 5. විප්පමුත්තා - සී.

**උපච්චගා මන්ති අනුත්ථුනාති** - 'හෙතෙම මා වාදයෙන් වාදය ඉක්මැ ගියේ යැ අතිශයින් ඉක්මැ ගියේ යැ ඉක්මැවූයේ යැ අතිශයින් ඉක්මැවූයේ යැ පසු කෙළේ යැ'යි මෙසේත් 'උපච්චගා මං'යි; නොහොත් 'මා වාදයෙන් වාදය යට කොට වතුරැවා අල්වාගෙන මැඩැගෙන හැසිරෙයි වෙසෙයි ඉරියවු පවත්වයි වැජෙයි පාලන යපන යාපනය කෙරේ නුයි මෙසේත් 'උපච්චගා මං' යි. **අනුත්ථුනාති** – බෙණෙයි, (මෙබඳු වූ) වචනය ප්‍රලාපය විප්‍රලාපය ලපනය ලපනාකාරය ලපනය කරා බව නුයි 'උපච්චගා මන්ති අනුත්ථුනාති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**සමණස්ස වාදං -පෙ- උපච්චගා මන්ති අනුත්ථුනාතී**" යි.

**8 - 5**

**තෙල දෘෂ්ටිවිවාදයෝ බාහ්‍ය පරිව්‍රාජකයන් කෙරෙහි උපන්නාහුය. තෙල වාදවිෂයෙහි (ජය-පරාජයාදි වශයෙන්) අනුග්‍රහ නිග්‍රහ ද වෙයි. මේ ආදීනවය ද දැක කලහය දුරු කරන්නේය. ප්‍රශංසා ලාභයෙන් අන්‍ය වූ අර්ථයෙක් මෙහි නැති හෙයිනි.**

**එතෙ විවාදා සමණෙසු ජාතා** – 'සමණ' යනු මේ ශාසනයෙන් බැහැර පිරිවැජි බවට එළැඹි, පිරිවැජි බවට පැමිණි යම් කිසි කෙනෙකි. තෙල දෘෂ්ටිකලහයෝ දෘෂ්ටිභණ්ඩනයෝ දෘෂ්ටිවිග්‍රහයෝ දෘෂ්ටිවිවාදයෝ දෘෂ්ටිමේධගයෝ පරිව්‍රාජකශ්‍රමණයන් කෙරෙහි උපන්නාහු මොනවට උපන්නාහු නිපන්නාහු වෙසෙසින් නිපන්නාහු පහළ වූවාහු නුයි 'එතෙ විවාදා සමණෙසු ජාතා' යනු වේ.

**එතෙසු උග්ඝාති නිඝාති හොති** – ජය පරාජය වෙයි, ලාභඅලාභ-යශස් අයශස් – නින්දා ප්‍රශංසා – සුඛ දුඃඛ – සොම්නස් දොම්නස් – ඉෂ්ට අනිෂ්ට – සෙනහ කොප – අනුග්‍රහ නිග්‍රහ – අනුනය කොප වෙයි. ජය හෙතු කොට සිත අනුගෘහීත වෙයි, පරාජය හෙතු කොට සිත නිගෘහීත වෙයි. ලාභයෙන් සිත අනුගෘහීත වෙයි, අලාභයෙන් නිගෘහීත වෙයි. යශසින් සිත අනුගෘහීත වෙයි, අයශසින් නිගෘහීත වෙයි. ප්‍රශංසාවෙන් සිත අනුගෘහීත වෙයි, නින්දාවෙන් නිගෘහීත වෙයි. සැපයෙන් සිත අනුගෘහීත වෙයි, දුකින් නිගෘහීත වෙයි. සොම්නසින් සිත අනුගෘහීත වෙයි. දොම්නසින් නිගෘහීත වෙයි. උන්නතියෙන් සිත අනුගෘහීත වෙයි, අවනති-යෙන් සිත නිගෘහීත වේ නුයි 'එතෙසු උග්ඝාති නිඝාති හොති' යනු වේ.

**එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං** – 'එතම්පි' යනු: දෘෂ්ටිකලහයෙහි දෘෂ්ටිභණ්ඩනයෙහි දෘෂ්ටිවිග්‍රහයෙහි දෘෂ්ටිවිවාදයෙහි දෘෂ්ටිමේධගයෙහි තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට නුයි– 'එතම්පි දිස්වා' යනු වේ. **විරමෙ කථොජ්ජං**– 'කථොජ්ජ' යි කලහය ඩබරය විග්‍රහය විවාදය මේධගය කියනු ලැබෙයි. නොහොත් **කථොජ්ජං** යනු: තෙද රහිත වූ මේ කථාව යැ. ඒ නිස්තෙජ වූ කථාව නො කරන්නේ යැ කලහය නො කරන්නේ යැ ඩබරය නො කරන්නේ යැ විග්‍රහය නො කරන්නේ යැ විවාදය නො කරන්නේ යැ මේධගය නො කරන්නේ යැ කලහභණ්ඩනවිග්‍රහවිවාදමේධගය දුරු කරන්නේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනුඅභාවයට පමුණුවන්නේ යැ. කලහභණ්ඩනවිග්‍රහවිවාදමේධගයෙන් දුරු වන්නේ යැ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැ ගියේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං' යනු වේ.

**නහඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභාති** – පසංසලාභා අඤ්ඤො අත්ථො නත්ථි අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්තී'ති 'න හඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභා.'

තෙනාහ භගවා:

"එතෙ විවාදා සමණෙසු ජාතා
එතෙසු උග්ඝාතිනිඝාති හොති,
එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං
නහඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභා"ති.

8 – 6

පසංසිතො වා පන තත්ථ හොති
අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ,
සො තං හසති[1] උන්නමතිච්ච[2] තෙන
පප්පුය්‍ය[3] තමත්ථං යථාමනො අහු.

**පසංසිතො වා පන තත්ථ හොතීති** – 'තත්ථා'ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා පසංසිතො ථොමිතො කිත්තිතො වණ්ණිතො හොතීති 'පසංසිතො වා පන තත්ථ හොති.'

**අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙති** – ඛත්තියපරිසාය වා බ්‍රාහ්මණපරිසාය වා ගහපතිපරිසාය වා සමණපරිසාය වා මජ්ඣෙ අත්තනො වාදං අක්ඛාය ආචික්ඛිත්වා අනුවාදං අක්ඛාය ආචික්ඛිත්වා ථොමයිත්වා බ්‍රූහයිත්වා දීපයිත්වා ජොතයිත්වා වොහරිත්වා පරිග්ගණ්හිත්වාති 'අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ.'

**සො තං හසති උන්නමතිච්ච තෙනාති** – සො තෙන ජයත්ථෙන තුට්ඨො හොති හට්ඨො පහට්ඨො අත්තමනො පරිපුණ්ණසංකප්පො; අථවා දන්තවිදංසකං හසමානො සො හසති. **උන්නමතිච්ච තෙනාති** – සො තෙන ජයත්ථෙන උන්නතො හොති. උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්සාති 'සො තං හසති උන්නමතිච්ච තෙන.'

**පප්පුය්‍ය තමත්ථං යථාමනො අහූති** – 'තං ජයත්ථං 'පප්පුය්‍ය පාපුණිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා; **යථාමනො අහූති** යථාමනො අහු යථාචිත්තො අහු යථාසංකප්පො අහු යථාවිඤ්ඤාණො අහූති – 'පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු.'

තෙනාහ භගවා:

"පසංසිතො වා පන තත්ථ හොති
අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ,
සො තං හසති උන්නමතිච්ච තෙන
පප්පුය්‍ය[3] තමත්ථං යථාමනො අහූ"ති

1. සො හස්සති - මජ්සං., PTS. 2. උන්නමතී ච - මජ්සං.
3. සම්පුය්‍ය - සකුචි.

**න හඤ්ඤදත්'ථි පසංසලාභා** – ප්‍රශංසාලාභයෙන් අන්‍ය වූ අර්ථයෙක් නැති: ආත්මාර්ථයෙක් හෝ පරාර්ථයෙක් හෝ උභයාර්ථයෙක් හෝ දෘෂ්ටධාර්මිකාර්ථයෙක් හෝ සාම්පරායිකාර්ථයෙක් හෝ නො ගැඹුරු අර්ථයෙක් හෝ ගැඹුරු අර්ථයෙක් හෝ සැඟවුණු අර්ථයෙක් හෝ අප්‍රකට අර්ථයෙක් හෝ නෙය්‍යාර්ථයෙක් හෝ නීතාර්ථයෙක් හෝ අනවද්‍යාර්ථයෙක් හෝ නිෂ්ක්ලේශාර්ථයෙක් හෝ පරිශුද්ධාර්ථයෙක් හෝ පරමාර්ථයෙක් හෝ නැති, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත් නුයි 'න හඤ්ඤදත්'ථි පසංසලාභා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"එතෙ විවාදා -පෙ- න හඤ්ඤදත්'ථි පසංසලාභා" යි.**

## 8 - 6

තවද (යමෙක්) ඒ ස්වකීය ලබ්ධියෙහි පසස්නා ලද්දේ හෝ වේ ද, හෙතෙම පිරිස් මැද ඒ දෘෂ්ටිවාදය ප්‍රකාශ කොට ඒ ජයාර්ථයට පැමිණි සිත් සේ වූ හෙයින් ඒ ජයහේතුයෙන් (දත් විදහා) සිනා සෙයි. යළි උඩඟු වේ.

**පසංසිතො වා පන තත්ථ හොති** – 'තත්ථ' යනු: ස්වකීය දෘෂ්ටියෙහි කැමැත්තෙහි රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි පසස්නා ලද්දේ ස්තුති කරන ලද්දේ කීර්තනය කරන ලද්දේ වර්ණනා කරන ලද්දේ වේ නුයි 'පසංසිතො වා පන තත්ථ හොති' යනු වේ.

**අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ** – කැත්පිරිස් හෝ බමුණුපිරිස් හෝ ගැහැවිපිරිස් හෝ මහණපිරිස් හෝ මැද තමාගේ වාදය කියා ප්‍රකාශ කොට අනුවාදය කියා ප්‍රකාශ කොට පුරා වඩා දක්වා බබුළුවා ව්‍යවහාර කොට පරිග්‍රහණය කොට නුයි 'අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ' යනු වේ.

**සො තං හසති උන්නමතිච්ච තෙන** – හෙතෙම ඒ ජයාර්ථයෙන් තුටු වූයේ හටු වූයේ පහටු වූයේ සතුටුසිත් ඇතියේ පිරිපුන් අදහස් ඇතියේ නොයොන් දත් විදහා සෙමින් හෝ සිනා සෙයි. **උන්නමතිච්ච තෙන** – හෙතෙම ඒ ජයාර්ථයෙන් උඩඟු වෙයි, නැඟුණු ධ්වජයක් මෙන් වූයේ ඔසවාගත් සිතැතියේ චිත්තයාගේ කෙතුකම්‍යතාව නුයි 'සො තං හසති උන්නමතිච්ච තෙන' යනු වේ.

**පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු** – ඒ ජයාර්ථයට පැමිණ සපැමිණ අධිගමය කොට ලැබ ප්‍රතිලාභ කොට; **යථාමනො අහු** – සිත් සේ විය, යථාචින්තිත විය, යථාසංකල්ප විය යථාවිඥාත වූයේ නුයි 'පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"පසංසිතො වා පන -පෙ- පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු" යි.**

8 - 7

යා උණ්ණතී සාස්ස විඝාතභූමි
මානාතිමානං වදතෙ[1] පනෙසො,
එතම්පි දිස්වා න විවාදයෙථ
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.

**යා උණ්ණතී සාස්ස විඝාතභූමීති** – 'යා'ති යා උණ්ණාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්සාති යා උණ්ණති; **සාස්ස විඝාතභූමීති** සා තස්ස විඝාතභූමි උපඝාතභූමි පීළනභූමි ඝට්ටනභූමි උපද්දවභූමි උපස්සග්ගභූමීති – 'උණ්ණතී සාස්ස විඝාතභූමි.'

**මානාතිමානං වදතෙ[2] පනෙසොති** – සො පුග්ගලො මානං ච වදති, අතිමානං ච වදතීති – 'මානාතිමානං වදතෙ පනෙසො.'

**එතම්පි දිස්වා න විවාදියෙථාති** – එතං ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා දිට්ඨිකලහෙසු දිට්ඨිභණ්ඩනෙසු දිට්ඨිවිග්ගහෙසු දිට්ඨිවිවාදෙසු දිට්ඨිමෙධගෙසූති – එතම්පි දිස්වා; **න විවාදියෙථාති** – න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තිං කරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පයුත්තො[3] විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති 'එතම්පි දිස්වා න විවාදියෙථ.'

**න හි තෙන සුද්ධිං කුසලා වදන්තීති** – 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා දිට්ඨිකලහෙන දිට්ඨිභණ්ඩනෙන දිට්ඨිවිග්ගහෙන දිට්ඨිවිවාදෙන දිට්ඨිමෙධගෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං න වදන්ති, න කථෙන්ති, න භණන්ති න දීපයන්ති, න වොහරන්තීති 'න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.'

තෙනාහ භගවා:

"යා උණ්ණති සාස්ස විඝාතභූමි
මානාතිමානං වදතෙ පනෙසො,
එතම්පි දිස්වා න විවාදයෙථ
න හි තෙන සුද්ධිං කුසලා වදන්තී"ති.

8 - 8

සූරො යථා රාජඛාදාය පුට්ඨො
අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං,
යෙනෙව සො තෙන පලෙහි සූර[4]
පුබ්බෙව නත්ථි යදිදං යුධාය.

---

1. වදනෙ - සීමු. II. මජසං. 2. වදනෙ - මජසං.
3. විප්පමුත්තො - සීමු II. PTS. 4. සූරං - මජසං.

8 - 7

යම් උන්නතිය (-උඩඟුබව) ක් වේ ද එය ඔහුට උපද්‍රව භූමි වෙයි. යශ්‍රී තෙතෙම මානය ද අතිමානය ද පවසයි. තෙල ආදීනවය ද දැක විවාද නො කරන්නේ යැ. ස්කන්ධාදියෙහි නිපුණයෝ ඒ දෘෂ්ටිවාදයෙන් ශුද්ධිය නො මැ කියත්.

**යා උන්නති සාස්ස විඝාතභූමි** – 'යා' යනු: යම් බඳු උන්නාමය ධ්වජය නඟා ගැනීම චිත්තයාගේ කෙතුකම්‍යතාව නුයි –යා උන්නති, 'යනු වේ. **සාස්ස විඝාතභූමි** – ඒ (උඩඟුව) ඔහුට විඝාතභූමි යැ උපඝාතභූමි යැ පෙළෙන බිම යැ ගැටෙන බිම යැ උපද්‍රවභූමි යැ උපසර්ගභූමි නුයි 'යා උන්නති සාස්ස විඝාතභූමි' යනු වේ.

**මානාතිමානං වදතෙ පනෙසො** – ඒ පුද්ගල තෙම මානය ද පවසයි අතිමානය ද පවසා නුයි 'මානාතිමානං වදතෙ පනෙසො' යනු වේ.

**එතම්පි දිස්වා න විවාදියෙථ** – දෘෂ්ටිකලහයන්හි දෘෂ්ටිභණ්ඩන-දෘෂ්ටිවිග්‍රහ – දෘෂ්ටිවිවාද – දෘෂ්ටිමෙධගයන්හි තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විමසා විභූත කොට නුයි 'එතම්පි දිස්වා' යනු වේ.

**න විවාදියෙථ** – කලහ නො කරන්නේ යැ, ඩබරය – විග්‍රහය – විවාදය මෙධගය නො කරන්නේ යැ, කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගය හරණේ යැ දුරු කරන්නේ යැ සන්හිඳුවන්නේ යැ අනුඅභාවයට පමුණුවන්නේ යැ. කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගයෙන් දුරුවන්නේ යැ වෙන් වූයේ භාත්පසින් වෙන් වූයේ නික්මුණේ නිස්මැ ගියේ නො යෙදුණේ නො බැඳුණේ නො හිමි කළ සිතින් වෙසේ නුයි 'එතම්පි දිස්වා න විවාදියෙථ' යනු වේ.

**න හි තෙන සුද්ධිං කුසලා වදන්ති** – 'කුසලා' යනු: යම් ස්කන්ධයන්හි නිපුණයෝ වෙත් ද, ධාතු – ආයතන – ප්‍රතීත්‍යසමුත්පාද සතිපට්ඨාන – සම්‍යක්ප්‍රධාන – ඍද්ධිපාද – ඉන්ද්‍රිය – බල – බොධ්‍යඞ්ග – මාර්ග – ඵල – නිර්වාණයෙහි නිපුණයෝ වෙත් ද ඒ නිපුණයෝ දෘෂ්ටිකලහයෙන් දෘෂ්ටිභණ්ඩනයෙන් දෘෂ්ටිවිග්‍රහයෙන් දෘෂ්ටිවිවාදයෙන් දෘෂ්ටිමෙධගයෙන් ශුද්ධිය විශුද්ධිය – පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො පවසති නො කියති නො බෙණෙති නො දක්වති ව්‍යවහාර නො කෙරෙත්නුයි 'න හි තෙන සුද්ධිං කුසලා වදන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යා උන්නති -පෙ- න හි තෙන සුද්ධිං කුසලා වදන්ති"** යි.

8 - 8

යම්සේ රාජභොජනයෙන් වැඩුණු ශූරයෙක් ප්‍රතිමල්ලයා පතනුයේ ගර්ජනා කෙරෙමින් ඒ ද, ශූරය, ඒ (තාගේ) ප්‍රතිශූර තෙමේ යම් තැනෙක්හි ද (තෝ) එහි මැ පලායව. කලහ සඳහා යම් කෙලෙස් කෙනෙක් වෙත් නම් ඔහු පළමු මැ (බෝමුල්හි දී නැසූ හෙයින් මට) නැත.

**සූරො යථා රාජඛාදාය පුට්ඨොති** – 'සූරො'ති සූරො වීරො වික්කන්තො අභීරු අඡම්භී අනුත්‍රාසී අපලායී; **රාජඛාදාය පුට්ඨොති** රාජඛාදනීයෙන රාජභොජනීයෙන පුට්ඨො පොසිතො ආපාදිතො[1] වඩ්ඪිතොති 'සූරො යථා රාජඛාදාය පුට්ඨො.'

**අභිගජ්ජමෙති පටිසූරමිච්ඡන්ති** – සො ගජ්ජන්තො උග්ගජ්ජන්තො අභිගජ්ජන්තො එති උපෙති උපගච්ඡති පටිසූරං පටිපුරිසං පටිසත්තුං පටිමල්ලං ඉච්ඡන්තො සාදියන්තො පත්ථයන්තො පිහයන්තො අභිජප්පන්තොති 'අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං.'

**යෙනෙව සො තෙන පලෙහි සූරාති** – යෙනෙව සො දිට්ඨිගතිකො තෙන පලෙහි, තෙන වජ[2], තෙන ගච්ඡ, තෙන අභික්කම. සො තුය්හං පටිසූරො පටිපුරිසො පටිසත්තු පටිමල්ලොති 'යෙනෙව සො තෙන පලෙහි සූර.'

**පුබ්බෙව නත්ථි යදිදං යුධායාති** – 'පුබ්බෙව බොධියා මූලෙ යෙ පටිසෙනිකරා කිලෙසා පටිලොමකරා පටිකණ්ටකකරා[3] පටිපක්ඛකරා, තෙ නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; යදිදං යුධායාති යදිදං යුද්ධත්ථාය කලහත්ථාය භණ්ඩනත්ථාය විග්ගහත්ථාය විවාදත්ථාය මෙධගත්ථායාති 'පුබ්බෙව නත්ථි යදිදං යුධාය.'

තෙනාහ භගවා:

"සූරො යථා රාජඛාදාය පුට්ඨො
අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං,
යෙනෙව සො තෙන පලෙහි සූර
පුබ්බෙව නත්ථි යදිදං යුධායා"ති.

8 – 9

යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති[4]
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,[5]
තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි
වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා.

**යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්තීති** – යෙ ද්වාසට්ඨිදිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා ගණ්හිත්වා උග්ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති, විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ. අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡා වචනීයං පුරෙ අවච. ආචිණ්ණං[6] තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහීතොසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි[7] වා සචෙ පහොසී'ති 'යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති.'

---

1. අපාදිතො – මජසං. 2. වද – සිමු. I.
3. පටිහණ්ඩකරා – සිමු. II. පටිකණ්ඩකරා – මජුප පටිකණ්ඩකකරා – මජසං.
4. විවාදියන්ති – සිමු II. PTS. 5. වාදියන්ති – PTS.
6. අචිණ්ණං – සිමු. II. මජසං. PTS. අවිණ්ණං – මජුප.
7. නිබ්බෙඨෙහි – සිමු II. නිබ්බෙධෙහි – මජසං. PTS.

**සූරො යථා රාජඛාදාය පුට්ඨො** – 'සූරො' යනු සූරු වූයේ විරු වූයේ විකුම් ඇත්තේ බියසුලු නො වූයේ නො තැතිගත්තේ උත්‍රාස රහිත වූයේ නො පැනයන සුලු වූයේ; **රාජඛාදාය පුට්ඨො** – රාජඛාද්‍යයෙන් රාජභොජ්‍යයෙන් පුෂ්ට පොෂණය කළ පාලනය කළ වඩන ලද්දේ තුයි 'සූරො යථා රාජඛාදාය පුට්ඨො' යනු වේ.

**අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං** – හෙතෙම ගර්ජන කෙරෙමින් උත්කට ගර්ජන කෙරෙමින් සිංහනාද කෙරෙමින් එයි පැමිණෙයි එළැඹෙයි, ප්‍රතිශූරයකු විරුද්ධ පුරුෂයකු විරුද්ධ ව සිටි සතුරකු ප්‍රතිමල්ලයකු ඉස්තේ ඉච්ඡනුයේ පතනුයේ කැමැතිවනුයේ අභිගර්ජන කරනුයේ තුයි 'අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං, යනු වේ.

**යෙනෙව සො තෙන පලෙහි සූර** – ඒ දෘෂ්ටිගතික තෙම යම් තැනෙක්හි මැ වේ ද, එහි පලායව, එහි වදුව, එසි යව, එහි නික්මෙව, හේ තට ප්‍රතිශූර යැ ප්‍රතිපුරුෂ යැ ප්‍රතිශත්‍රු යැ ප්‍රතිමල්ල වූයේ තුයි 'යෙනෙව සො තෙන පලෙහි සූර' යනු වේ.

**පුබ්බෙව නත්ථි යදිදං යුධාය** – පෙර මැ බෝමුල්හි දී ප්‍රතිපක්ෂකර වූ ඝාතිකර වූ ප්‍රතිකණ්ටකර වූ ප්‍රතිවිරුද්ධකර වූ යම් ක්ලේශ කෙනෙක් වෙත් ද ඔවුහු නැත නො වෙති විද්‍යමාන නො වෙති නො ලැබෙත්; ප්‍රහීණ වූවාහු මුලුසුන් වූවාහු සන්සිඳුණාහු දුරලන ලද්දහු උපනට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දැවුණාහුය; **යදිදං යුධාය** – යුද්ධ සඳහා කලහ සඳහා ඩබර සඳහා විග්‍රහ සඳහා විවාද සඳහා මෙධග සඳහා තුයි 'පුබ්බෙව නත්ථි යදිදං යුධාය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සූරො යථා -පෙ- යදිදං යුධාය" යි"

8 - 9

යම් කෙනෙක් (දෙසැට දිටු අතුරෙන්) එක්තරා දෘෂ්ටියක් දැඩිව ගෙන විවාද කෙරෙත් ද, සත්‍ය මෙය මැ සැබවැයි කියත් ද, තෝ ඔවුනට කිය, වාදයක් උපන් කල්හි විරුද්ධකාරක වූ ඕනු මෙහි සස්නෙහි නැති හෙයිනි.

**යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති** – යම් කෙනෙක් දෙසැට දිටු අතුරෙන් එක්තරා දෘෂ්ටියක් ගෙන ග්‍රහණය කොට දැඩිව ගෙන පරාමර්ශනය කොට අභිනිවෙශය කොට විවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විරුද්ධවාද කෙරෙති, මෙධග කෙරෙති: 'තෝ මේ ධම්මවිනය නො දන්නෙහි ය, මම මේ ධම්මවිනය දනිමි, කිමැ තෝ මේ ධම්මවිනය දනි ද ? තෝ වරදවා පිළිපන්නෙහි ය, මම සම්‍යක්ප්‍රතිපන්න යෙමි, මාගේ වචනය අර්ථසහිත ය, තාගේ වචනය අනර්ථසංහිතය, පළමු කියැයුත්ත පසුව කිවූය, පසුව කියැයුත්ත පළමු කිවූය. තා විසින් ආචීර්ණ වූ දෙය (මාගේ වාදයට පැමිණ) නැවැතිණ, තට (මා විසින්) දොෂාරොපණය කරන ලද. නිග්‍රහ කරන ලදුයෙහි දෙසින් මිදෙනු සඳහා පිළිතුරු සොයා යව. පොහොසත්හි නම් (මා තැගු දෙසින්) මිදෙව්'යි 'යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති' යනු වේ.

**ඉදමෙව සච්චන්ති ච වාදයන්තීති** – ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති වාදයන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; ‘අසස්සතො ලොකො -පෙ- නෙව හොති, න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති වාදයන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති ‘ඉදමෙව සච්චන්ති ච වාදයන්ති’

**තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තාති** – තෙ ත්වං දිට්ඨිගතිකෙ වදස්සු වා වාදෙන වාදං විග්ගහෙන විග්ගහං පටිකම්මෙන පටිකම්මං විසෙසෙන විසෙසං පටිවිසෙසෙන පටිවිසෙසං ආවෙඨියාය ආවෙඨියං නිබ්බෙඨියාය නිබ්බෙඨියං ඡෙදෙන ඡෙදං මණ්ඩලෙන මණ්ඩලං. තෙ තුය්හං පටිසූරා පටිපුරිසා පටිසත්තු පටිමල්ලාති තෙ ත්වං වදස්සු; **නහි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තාති** – වාදෙ ජාතෙ සඤ්ජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙයෙව පටිසෙනිකත්තා පටිලොමකත්තා පටිකණ්ටකත්තා පටිපක්ඛකත්තා කලහං කරෙය්‍යුං, භණ්ඩනං කරෙය්‍යුං, විග්ගහං කරෙය්‍යුං, විවාදං කරෙය්‍යුං, මෙධගං කරෙය්‍යුං. තෙ නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති ‘තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා.’

තෙනාහ භගවා:

“යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,
තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි
වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා”ති.

## 8 – 10

විසෙනිකත්වා පන යෙ චරන්ති
දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා,
තෙසු ත්වං කිං ලභෙථො[1] පසූර
යෙසී'ධ නත්ථි පරමුග්ගහීතං.

**විසෙනිකත්වා පන යෙ චරන්තීති** – ‘සෙනා’ වුච්චති මාරසෙනා: කායදුච්චරිතං මාරසෙනා, වචීදුච්චරිතං මාරසෙනා, මනොදුච්චරිතං මාරසෙනා, ලොභො[2] මාරසෙනා, දොසො මාරසෙනා, මොහො මාරසෙනා, කොධො මාරසෙනා, උපනාහො මාරසෙනා, මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා මාරසෙනා. වුත්තං හෙතං භගවතා:

1. කිංසු ලභෙථ - සීමු 1, කිං ලභෙථ - සියා. 2. රාගො - PTS

**ඉදමෙව සච්චන්ති ච වාදයන්ති** – 'ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ' යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්; 'ලොකය අශාශ්වත යැ...සත්ත්වයා මරණින් මතු තො මැ වෙයි නො වන්නේ නො වෙයි, මේ මැ සැබව, අන්‍යය මොස යැ'යි පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'ඉදමෙව සච්චන්ති ච වාදයන්ති' යනු වේ.

**තෙ ඡවං වදසුසු න හි තෙධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා**– තෙපි ඒ දෘෂ්ටිගතිකයන්ට වාදයෙන් වාදය විග්‍රහයෙන් විග්‍රහය ප්‍රතිකර්මයෙන් ප්‍රතිකර්මය විශෙෂයෙන් විශෙෂය ප්‍රතිවිශෙෂයෙන් ප්‍රතිවිශෙෂය වෙළුමෙන් වෙළුම මිදුමෙන් මිදුම සිඳුමෙන් සිඳුම මණ්ඩලයෙන් මණ්ඩලය කියවූ, ඔවුහු තට ප්‍රතිශූර ප්‍රතිපුරුෂ ප්‍රතිශත්‍රු ප්‍රතිමල්ලයෝ වෙත් නුයි 'තෙ ඵවං වදසුසු යනු වේ. **න හි තෙධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා** – වාදය උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙසෙසින් නිපන් කල්හි පහළවූ කල්හි මැ විරුද්ධ කාරක තෙම ප්‍රතිලොමකර්ත්‍ෘ තෙම ප්‍රතිභණ්ඩකාරක තෙම ප්‍රතිපක්ෂ කාරක තෙම කලහ කරන්නේ යැ, ඩබර කරන්නේ යැ, විග්‍රහ කරන්නේ යැ, විවාද කරන්නේ යැ, මෙධග කරන්නේ සි; ඒ (ප්‍රතිපක්ෂකර) කෙලෙශයෝ නැත, නො වෙති අවිද්‍යමාන වෙති නො ලැබෙත්; (ඔහු) ප්‍රහීණයෝ යැ සමුච්ඡින්නයෝ යැ සන්හිඳුණාහුය, දුරලන ලද්දාහු යැ උපනට නුසුදුසු වූවාහු යැ නුවණගින්නෙන් දැවුණාහු නුයි – 'තෙ ඵවං වදසුසු න හි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යෙ දිට්ඨිමුග්ගය්හ -පෙ- පටිසෙනිකත්තා" යි.

## 8 – 10

තවද යම් කෙනෙක් (කෙලෙස්මාරසෙනහ)වනසා දෙසැට දෘෂ්ටියෙන් දෘෂ්ටිගතට අවිරුද්ධ වෙමින් වෙසෙත් ද, මේ සස්නෙහි යම් කෙනකුන්ට මේ පරම යයි දැඩිව ගන්නා ලද්දක් නැත්තේ ද, පසූරය, තෝ ඒ රහතුන් කෙරෙහි කවර ප්‍රතිමල්ලයකු ලබන්නෙහි ද ?

**විසෙනි කත්වා පන යෙ චරන්ති** – මරසෙනහ 'සෙනා' යයි කියනු ලැබෙයි, කායදුශ්චරිතය මාරසෙනා යැ, වාග්දුශ්චරිතය මාරසෙනා යැ, මනොදුශ්චරිතය මාරසෙනා යැ, ලොභය මාරසෙනා යැ, ද්වෙෂය මාරසෙනා යැ, මොහය මාරසෙනා යැ, ක්‍රොධය මාරසෙනා යැ, උපනාහය මාරසෙනා යැ, මකුබව මාරසෙනා යැ, යුගග්‍රාහය මාරසෙනා යැ, ඊර්ෂ්‍යාව මාත්සර්‍ය්‍යය මායාව ශඨබව තදබව කරණුත්තරියකරණය මානය අතිමානය මදය සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ මාරසෙනා යි. මේ වදාරන ලද මැය භාග්‍යවත්හු විසින්:

1. "කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති -පෙ-
ජෙත්වා ච ලභතෙ සුඛන්ති."[a]

යතො චතූහි අරියමග්ගෙහි සබ්බා ච මාරසෙනා සබ්බෙ ච පටිසෙනිකරා කිලෙසා ජිතා ච පරාජිතා ච භග්ගා විප්පලුග්ගා[1] පරම්මුඛා තෙන වුච්චති "විසෙනිකත්වා"ති. යෙති - අරහන්තො ඛීණාසවා; චරන්තීති චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්තීති 'විසෙනිකත්වා පන යෙ චරන්ති.'

**දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානානි** - යෙසං ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, තෙ දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා අප්පටිවිරුජ්ඣමානා අඝට්ටියමානා අප්පටිහඤ්ඤමානා අප්පටිහනමානාති* 'දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා.'

**තෙසු ත්වං කිං ලභෙථො[1] පසූරාති** - තෙසු අරහන්තෙසු ඛීණාසවෙසු කිං ලභෙථො පටිසූරං පටිපුරිසං පටිසත්තුං පටිමල්ලන්ති 'තෙසු ත්වං කිං ලභෙථො[1] පසූර.'

**යෙසීධ නත්ථි පරමුග්ගහීතන්ති** - යෙසං අරහන්තානං ඛීණාසවානං ඉදං පරමං අග්ගං සෙට්ඨං විසිට්ඨං[2] පාමොක්ඛං උත්තමං පවරන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති - 'යෙසීධ නත්ථි පරමුග්ගහීතං.'

තෙනාහ භගවා:

"විසෙනිකත්වා පන යෙ චරන්ති
දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා,
තෙසු ත්වං කිං ලභෙථො[1] පසූර
යෙසීධ නත්ථි පරමුග්ගහීත"න්ති.

## 8 - 11

අථ ත්වං පවිතක්කමාගමො[3]
මනසා දිට්ඨිගතානි චින්තයන්තො,
ධොනෙන යුගං සමාගමා[4]
න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ.

---

1. විප්පලුත්තා - මනුප. 2. විසෙට්ඨං - PTS.
3. මාගම - සීමු. II. මාගමා - මජ්ඣසං. PTS. 4. සමාගම - සීමු. II.
a. සුත්තනිපාත - පසූරසුත්ත.
* සබ්බපොත්ථකෙසු 'අප්පටිහතමානා'ති දිස්සති.

1. "කාමයෝ තාගේ පළමුවැනි සෙනාව ය, දෙවැන්නී අරතිය යි කියනු ලැබෙයි .." (4-6 සූත්‍රනිර්දේශය)

යම් හෙයකින් සතර ආර්‍යමාර්ගයෙන් සියලු මාරසේනාවෝ ද සියලු ප්‍රතිපක්ෂකර ක්ලේශයෝ ද ජයගන්නා ලද්දාහු පරදවන ලද්දාහු බිඳින ලද්දාහු නසන ලද්දාහු පරාඞ්මුඛ කරන ලද්දාහු වෙත් ද, එහෙයින් 'විසෙනි කත්වා, යි කියනු ලැබේ. **යෙ** යනු: අර්හත් ක්ෂීණාස්‍රවයෝ යැ; **චරන්ති** - හැසිරෙති, වෙසෙති ඉරියවු පවත්වති වැටෙති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'විසෙනි කත්වා පන යෙ චරන්ති' යනු වේ.

**දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා** - යම් කෙනකුන් විසින් දෙසැට දෘෂ්ටි-ගතයෝ ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු උපනට අභව්‍ය කරන ලද්දාහු ඥානාග්නියෙන් දවන ලද්දාහු ද ඔහු (දෙසැට) දෘෂ්ටීන් දෘෂ්ටියකට අවිරුද්ධ වන්නාහු ද්‍රෝහ නො ගන්නාහු නො ගැටෙන්නාහු අප්‍රතිහත වන්නාහු නුයි 'දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා' යනු වේ.

**තෙසු ත්වං කිං ලභෙථො පසූර** - ඒ අර්හත් ක්ෂීණාස්‍රවයන් කෙරෙහි ප්‍රතිශූරයකු ප්‍රතිපුරුෂයකු විරුද්ධ සතුරකු ප්‍රතිමල්ලයකු කිම ලබන්නෙහි ද යි 'තෙසු ත්වං කිං ලභෙථො පසූර' යනු වේ.

**යෙසී'ධ නත්ථි පරමුග්ගහීතං** - යම් අර්හත් ක්ෂීණාස්‍රව කෙනකුන්ට මේ පරම යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි ගන්නා ලද පරාමර්ශනය කළ අභිනිවේශ කළ අධ්‍යවසිත අධිමුක්ත වූවක් නැත් ද නො වෙත් ද අවිද්‍යමාන වෙත් ද නො ලැබෙත් ද ප්‍රහීණ කරන ලද සමුච්ඡින්න කරන ලද සන්හිඳුවන ලද දුරලන ලද අභව්‍යෝත්පත්තික කරන ලද ඥානාග්නීන් දවන ලද නුයි 'යෙසීධ නත්ථි පරමුග්ගහීතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**විසෙනි කත්වා පන -පෙ- පරමුග්ගහීතං**" යි.

**8 - 11**

තවද තෝ සිතින් දෘෂ්ටිගතයන් සිතමින් (මට ජය වේ දෝ හෝයි ආදිය) විතර්ක කෙරෙමින් ආයෙහි. ධූතක්ලේශ වූ බුදුන් සමග යුග-ග්‍රාහයට ආයෙහි. එතෙකුදුවත් තෝ සම්පයට පැමිණෙන්නට නො හැකි වන්නෙහි.

**අථ ත්වං පවිතක්කමාගමොති** – ‘අථා’ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං ‘අථා’ති. **පවිතක්කමාගමොති** – තක්කෙන්තො විතක්කෙන්තො සංකප්පෙන්තො ‘ජයො නු ඛො මෙ භවිස්සති පරාජයො නු ඛො මෙ භවිස්සති, කථං නිග්ගහං කරිස්සාමි? කථං පටිකම්මං කරිස්සාමි? කථං විසෙසං කරිස්සාමි? කථං පටිවිසෙසං කරිස්සාමි? කථං ආවෙඨියං කරිස්සාමි? කථං නිබ්බෙඨියං කරිස්සාමි? කථං ඡෙදං කරිස්සාමි? කථං මණ්ඩලං කරිස්සාමී’ති එවං තක්කෙන්තො විතක්කෙන්තො සංකප්පෙන්තො ආගතොසි උපාගතොසි සම්පත්තොසි මයා සද්ධිං සමාගතොසීති ‘අථ ත්වං පවිතක්කමාගමො.’

**මනසා දිට්ඨිගතානි චින්තයන්තොති** – ‘මනො’ති යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු[ෂ], චින්තෙන්තො දිට්ඨිං චින්තෙන්තො විචින්තෙන්තො ‘සස්සතො ලොකො’ති වා, ‘අසස්සතො ලොකො’ති වා –පෙ– ‘නෙව හොති න න හොති තථාගතො පරම්මරණා’ති වා’ති ‘මනසා දිට්ඨිගතානි චින්තයන්තො.’

**ධොනෙන යුගං සමාගමො[1] නහි ත්වං සක්ඛසි සම්පයාතවෙති** – ධොනා වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා –පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[ෂ], කිං කාරණා ධොනා වුච්චති පඤ්ඤා? තාය පඤ්ඤාය කායදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, වචීදුච්චරිතං –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අථවා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨි සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පො –පෙ– සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්ති ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අථවා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. භගවා ඉමෙහි ධොනෙය්‍යහි ධම්මෙහි උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො, තස්මා භගවා ධොනො. සො ධුතරාගො ධුතපාපො ධුතකිලෙසො ධුතපරිළාහොති – ධොනො.

1. සමාගම – සීමු. II. සමාගමා – මජසං. PTS.

ෂ. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ

**අථ තථං පවිතක්කමාගමෙ** – ‘අථ’ යනු: පදසන්ධි යැ පදසංසග්ගී යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්වතා නමැ තෙල ‘අථ’ යනු. **පවිතක්කමාගමෙ** – තර්ක කෙරෙමින් සලකමින් ‘මට ජය වන්නේ දෝ හෝ මට පරාජය වන්නේ දෝ හෝ කෙසේ නිග්‍රහ කෙරෙම් ද, කෙසේ පිළියම් (-ලබ්ධිශුද්ධිය) කෙරෙම් ද, කෙසේ විශෙෂ කෙරෙම් ද, කෙසේ ප්‍රතිවිශෙෂ කෙරෙම් ද, කෙසේ ආවෙෂ්ටන කෙරෙම් ද, කෙසේ නිර්වේෂ්ටන කෙරෙම් ද, කෙසේ වාදච්ඡේද කෙරෙම් ද, කෙසේ වාදමණ්ඩල කෙරෙම් දැ’ යි මෙසේ තර්කණ විතර්කණ සංකල්පන කෙරෙමින් ආයෙහි පැමිණියෙහි සපැමිණියෙහි මා සමග එක්වූයෙහි තුසි ‘අථ තථං පවිතක්කමාගමෙ’ යනු වේ.

**මනසා දිට්ඨිගතානි චින්තයන්තො** – ‘මනො’ යනු: යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයෙක් පණ්ඩර (-භවාඞ්ග) සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද, ඒ සිතින් ‘ලොකය ශාශ්වතැ’යි, හෝ ලොකය අශාශ්වතැ’යි හෝ...සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි හෝ’ යි දෘෂ්ටිය සිතනුයේ වෙසෙසින් සිතනුයේ තුසි ‘මනසා දිට්ඨිගතානි චින්තයන්තො’ යනු වේ.

**ධොතෙන යුගං සමාගමා න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ** – ‘ධොතා’ යි ප්‍රඥාව කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් දැනීමෙක්...අමොහයෙක් ධර්මවිචය යෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එයයි. කුමක් හෙයින් ප්‍රඥාව ‘ධොතා’ යි කියනු ලැබෙයි යත්? ඒ ප්‍රඥාවෙන් කායදුශ්චරිතය කම්පා කරන ලද ද දෙවුණා ලද ද මැනවින් දෙවුණා ලද ද වෙසෙසින් දෙවුණා ලද ද වෙයි, වාග්දුශ්චරිතය...සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත – ධෞත – සංධෞත – ද වෙත්; නොහොත් සම්‍යග්දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය, සම්‍යක් සංකල්පයෙන් මිථ්‍යාසංකල්පය...සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධූත – ධෞත – සංධෞත – නිර්ධෞත ද වෙයි, නොහොත් අර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සියලු කෙලශයෝ සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ අකුශලාභිසංස්කාරයෝ ධූත – ධෞත – සංධෞත – නිර්ධෞත ද වෙත්. බුදුහු මේ ධෞතෙයධර්මයන්ගෙන් උපෙතයහ සමුපෙතයහ සමුපාගතයහ අවියුක්තයහ පරිපූර්ණයහ සමන්විතයහ, එහෙයින් බුදුහු ධොතයෝ යැ; ඒ භාග්‍යවත්හු ධූතරාගයහ ධූතපාපයහ ධූතකෙලශයහ ධූතපරිදාහයෝ තුසි ‘ධොත’ නම් වෙත්.

**ධොනෙන යුගං සමාගමා න හි ත්වං සක්ඛසි සම්පයාතවෙති** – පසූරො පරිබ්බාජකො නප්පටිබලො ධොනෙන බුද්ධෙන භගවතා සද්ධිං යුගසමාගමං[1] සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිත්වා සාකච්ඡෙතුං[2] සල්ලපිතුං සාකච්ඡං සමාපජ්ජිතුං. තං කිස්ස හෙතු? පසූරො පරිබ්බාජකො හීනො නිහීනො ඔමකො ලාමකො ජත්තකො[3] පරිත්තො. සො හි භගවා අග්ගො ච සෙට්ඨො ච විසිට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච. යථා සසො න පටිබලො මත්තෙන මාතඞ්ගෙන සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිතුං, යථා කොත්ථුකො න පටිබලො සීහෙන මිගරඤ්ඤා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිතුං, යථා වච්ඡකො තරුණකො ධෙනුපකො න පටිබලො උසභෙන චලක්කකුනා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිතුං, යථා ධඞ්කො න පටිබලො ගරුළෙන වෙනතෙය්‍යෙන සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිතුං, යථා චණ්ඩාලො න පටිබලො රඤ්ඤා චක්කවත්තිනා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිතුං, යථා පංසුපිසාචකො න පටිබලො ඉන්දෙන දෙවරඤ්ඤා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිතුං, එවමෙවං පසූරො පරිබ්බාජකො න පටිබලො ධොනෙන බුද්ධෙන භගවතා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුග්ගාහං ගණ්හිත්වා සාකච්ඡෙතුං[2] සල්ලපිතුං සාකච්ඡං සමාපජ්ජිතුං. තං කිස්ස හෙතු? පසූරො පරිබ්බාජකො හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ජත්තකපඤ්ඤො පරිත්තපඤ්ඤො. සො හි භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො[4] ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො අඩ්ඪො මහද්ධනො[5] ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා.

සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච පනස්ස එතරහි සාවකා විහරන්ති පච්ඡාසමන්නාගතා.

1. යුගං සමාගමං - සීමු. II. මජසං. PTS. 2. සාකච්ඡිතුං - ස.
3. ජතුක්කො - මජසං. PTS. ජතුකො - සීමු. II. ජතුසොකා - මනුප.
4. හාසපඤ්ඤො - මජසං. 5. මහාධනො - පු.

**ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ** – පසූර පරිව්‍රාජක තෙම ධොත වූ භාග්‍යවත් බුදුන් සමග එක්විට සමාගමයට පැමිණ යුගග්‍රාහය ගෙන සාකච්ඡා කරන්නට සල්ලාප කරන්නට සාකච්ඡාවට පැමිණෙන්නට සමර්ථ නො වෙයි, ඒ කවර හෙයින යත්? පසූරපරිව්‍රාජක හීන යැ නිහීන යැ අධම යැ ලාමක යැ අහෙතුක යැ අල්ප සි. ඒ බුදුහු වූ කලි අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද විශිෂ්ට ද උත්තම ද ප්‍රවර ද වෙත්. යම් සේ සාශවක් මතැතක්හු සමග එක් පැහැර පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ සිවලෙක් සිංහමෘගරාජයකු සමග යුග සමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ කිරි බොන වසුපැටෙක් සැලෙන මොල්ලිය ඇති වෘෂභයකු සමග යුගසමාගමයට (කරට කර) පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ කවුඩෙක් ගුරුළුරජකු සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ සැඬොලෙක් සක්විතිරජක්හු සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ පාංශුපිශාචයෙක් (කසළපිසසෙක්) සක්දෙව්රජහු සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, එසෙයින් මැ පසූර පිරිවැජ් තෙම කෙලෙස් දෙවූ භගවත් බුදුන් සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහය ගෙන කථා කරන්නට සල්ලාප කරන්නට සාකච්ඡාවට පැමිණෙන්නට අසමර්ථ වෙයි. ඊට හෙතු කිම ? යත්: පසූර පිරිවැජ් තෙම හීනප්‍රඥ ඇත්තේ යැ නිහීනප්‍රඥ ඇත්තේ යැ අධමප්‍රඥ ඇත්තේ යැ ලාමකප්‍රඥ ඇත්තේ යැ අහෙතුකප්‍රඥ ඇත්තේ යැ අල්පප්‍රඥ ඇත්තේ යි. ඒ බුදුහු වූ කලි මහාප්‍රඥ ඇතියහ ශීඝ්‍රප්‍රඥ ඇතියහ දිවෙන ප්‍රඥ ඇතියහ තියුණු ප්‍රඥ ඇතියහ නිර්වේධික ප්‍රඥ ඇතියහ. ප්‍රඥාප්‍රභෙදයෙහි නිපුණයහ ප්‍රභෙදගත ඥාන ඇත්තාහ අධිගම කළ ප්‍රතිසංවිද් ඇත්තාහ. චතුර්වෛශාරද්‍යයට පැමිණියහ දශ-බලධාරීහ පුරුෂශ්‍රෙෂ්ඨයහ පුරුෂසිංහයහ පුරුෂනාගයහ පුරුෂාජානෙයහ පුරුෂධෞරෙයහ අනන්තඥානයහ අනන්තතෙජස් ඇත්තාහ අනන්තයශස් ඇත්තාහ (ප්‍රඥාධනයෙන්) ආඪ්‍යයහ මහාධන ඇත්තාහ ධනවත්හ. (නිවනට පමුණුවන හෙයින්) නෙතෘ වූහ (විනයන කරන හෙයින්) විනෙතෘ වූහ අනුනෙතෘ වූහ (සැක සිඳ අර්ථය) පනවනුවහ නිශ්චය කරවනුවහ (පිළිවෙත්) දක්වනුවහ (ප්‍රතිපත්තිඵලයෙන්) පහදනුවහ.

තවද ඒ බුදුහු නූපන් මාර්ගය සවසන්තානයෙහි උපදවනුවහ, (වෛනෙය සන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය දනවනුවහ, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණ වශයෙන්) ප්‍රකාශ කරනුවහ, (ප්‍රත්‍යවෙක්ෂාවශයෙන්) මාර්ගය දතුවහ, මාර්ගය දන්නා නුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ. ඒ බුදුන් විසින් හෙළි කළ මාර්ගය හෙතු කොට මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදිගුණයෙන්) පසුපස යමින් වෙසෙත්.

සො හි භගවා ජානං ජානාති. පස්සං පස්සති. චක්ඛුභූතො ඤාණභූතො, ධම්මභූතො, බ්‍රහ්මභූතො වත්තා ධම්මභූතො, වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. නත්ථි තස්ස භගවතො අනඤ්ඤාතං[1] අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං[2] පඤ්ඤාය. අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති. යං කිඤ්චි ඤෙය්‍යං නාම අත්ථි ධම්මං ජානිතබ්බං, අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො සබ්බං තං අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති. සබ්බං වචීකම්මං ඤාණානුපරිවත්ති[3]. සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්ති.

අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං. අනාගතෙ අප්පටිහතං ඤාණං. පච්චුප්පන්නෙ අප්පටිහතං[4] ඤාණං. යාවතකං ඤෙය්‍යං, තාවතකං ඤාණං. යාවතකං ඤාණං, තාවතකං ඤෙය්‍යං. ඤෙය්‍යපරියන්තිකං ඤාණං. ඤාණපරියන්තිකං ඤෙය්‍යං. ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති. ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵුස්සිතානං හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො, එවමෙවං බුද්ධස්ස භගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො. යාවතකං ඤෙය්‍යං, තාවතකං ඤාණං. යාවතකං ඤාණං, තාවතකං ඤෙය්‍යං. ඤෙය්‍යපරියන්තිකං ඤාණං. ඤාණපරියන්තිකං ඤෙය්‍යං. ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති. ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති.

සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛනපටිබද්ධා මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා. සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසඤ්ච සත්තානං භගවා ආසයං ජානාති. අනුසයං ජානාති. චරිතං ජානාති. අධිමුත්තිං ජානාති. අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තො මහාසමුද්දෙ පරිවත්තන්ති, එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති.

1. අඤ්ඤාතං - ස, PTS. 2. අඵුසිතං - PTS.
3. ඤාණානුපරිවත්තන්ති - සීමු1. 4. අප්පතිඝාතං - ස.

තවද ඒ බුදුහු දතයුතු (ඥෙයධර්මය) දනිති, දක්ක යුත්ත (නුවණැසින්) දකිති; ඇසක් මෙන් වූවහ, ඥානමය වූවහ, ධර්මමය වූවහ, වක්තෘයහ, ප්‍රවක්තෘයහ, නිනෙතෘයහ, ශ්‍රෙෂ්ඨ වූවහ; (දහම් දෙසන හෙයින්) වක්තෘයහ (ඥෙය දක්වනුයෙන්) නිනෙතෘයහ, අමෘතය දෙනුවහ, ධර්මස්වාමීහ, තථාගතයහ. ඒ බුදුන් විසින් (මගනැණින්) නො දත්තා ලද්දෙක් (සව්නේ දත් නැණින්) නො දක්නා ලද්දෙක් අවිදිත වූයෙක් ප්‍රත්‍යක්ෂ නො කරන ලද්දෙක් ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දෙක් නැති. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ ද, අතීතානාගත-ප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන් ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙත්. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ටධාර්මිකාර්ථය ද සාම්පරායිකාර්ථය ද උත්තානාර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නීතාර්ථය ද අනවද්‍යාර්ථය ද නිෂ්ක්ලේශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථාර්ථය (= නිර්වාණය) ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පවතී, භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී, සියලු වාක්කර්මය ඥානය අනුව පවතී, සියලු මනඃකර්මය ඥානය අනුව පවතී.

අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (= නිරාවරණ) යැ අනාගතයෙහි ඥානය අප්‍රතිහත යැ, ප්‍රත්‍යුත්පන්නයෙහි ඥානය අප්‍රතිහත යැ, දතයුත්ත යම් පමණ ද ඥානය එපමණ යැ, ඥානය යම් පමණ ද ඥෙයය එපමණ යැ, ඥානය ඥෙයපර්යන්තික යැ ඥෙයය ඥානපර්යන්තික යැ, ඥෙයය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැත, ඒ ධර්මයෝ අන්‍යෝන්‍යපර්යන්තයෙහි පවත්නා සුල්ලහ; යම් සේ මනාකොට පැහැසූ පුමුගුපටල (= තහඩු) දෙකෙකින් යට පුමුගුපටල උපරිමය නො ඉක්මවා ද, උඩ පුමුගුපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔහු ඔවුනොවුන් ගේ කෙළවර සිටුනා සුළු වෙත් ද; එසෙයින් මැ භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යෝන්‍යපර්යන්තයෙහි පවත්නාසුල්ලහ; යම්තාක් ඥෙයය ද ඒතාක් ඥානය යැ, යම්තාක් ඥානය ද ඒතාක් ඥෙය යැ ඥානය ඥෙයපර්යන්තික යැ, ඥෙයය ඥානපර්යන්තික යැ ඥෙයය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති; ඒ දහම්හු අන්‍යෝන්‍යපර්යන්තයෙහි සිටුනාසුල්ලහ.

සියලු දහම් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී, සියලු දහම්හු භාග්‍යවත් බුදුන් ගේ මනොද්වාරාවර්ජනයට අයත්හු වෙති, රුචිය ප්‍රතිබද්ධයහ, මනසිකාර ප්‍රතිබද්ධයහ, චිත්තොත්පාදප්‍රතිබද්ධයහ; සියලු සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී, බුදුහු සියලු සත්ත්වයන්ගේ ආශය දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති, අල්ප වූ කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති සුන්දර ආකාර ඇති ගර්හිතාකාර ඇති සුවිඥෙය වූ දුර්විඥෙය වූ භව්‍යාභව්‍ය සත්ත්වයන් දනිති, මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත ලෝ වැසි තෙම මහණ බමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජාව බුද්ධඥානය තුළ පවතී, යම්සේ තිමි තිමිංගල පටන් කොට යම් මස්කැසුබු කෙනෙක් වෙත් නම් ඔහු මහමුහුද තුළ හැසිරෙත් ද එසෙයින් මරුන් බඹුන් සහිත වූ සදෙවක ලොක තෙමේ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව බුද්ධඥානය තුළ පවතී;

යථා යෙ කෙචි පක්ඛී අන්තමසො ගරුළං වේනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙවං යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය, තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති. බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨතියෙව. යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හෙ අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විස්සජ්ජිතාව තෙ පඤ්හා භගවතා හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකාව තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවාව තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති - ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ.

තෙනාහ භගවා:

"අථ ත්වං පවිතක්කමාගමො
මනසා දිට්ඨිගතානි චින්තයන්තො,
ධොනෙන යුගං සමාගමො
න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ"ති.

**පසූරසුත්තනිද්දෙසො අට්ඨමො.**

## 9

## මාගන්දියසුත්තනිද්දෙසො

අථ මාගන්දියසුත්තනිද්දෙසො වුච්චති:

### 9 - 1

දිස්වාන තණ්හං අරතිං රගඤ්ච[1]
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං?
පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ.

**දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මින්ති** තණ්හඤ්ච අරතිඤ්ච රගඤ්ච[2] මාරධීතරො දිස්වා පස්සිත්වා මෙථුනධම්මෙ ඡන්දො වා රාගො වා පෙමං වා නාහොසීති - දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං.

**කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙති** - කිමෙවිදං සරීරං මුත්තපුණ්ණං කරීසපුණ්ණං සෙම්හපුණ්ණං රුධිරපුණ්ණං අට්ඨිසඞ්ඝාතං[3] නහාරුසම්බන්ධං රුධිරමංසාවලෙපනං චම්මාවනද්ධං[4] ඡවියා පටිච්ඡන්නං ඡිද්දාවඡිද්දං උග්ඝරන්තං පග්ඝරන්තං[5] කිමිසඞ්ඝනිසෙවිතං නානාකලිමලපරිපූරං පාදෙන අක්කමිතුං න ඉච්ඡෙය්‍යං,[6] කුතො පන සංවාසො වා සමාගමො වාති - කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ.

තෙනාහ භගවා:

"දිස්වාන තණ්හං අරතිං රගඤ්ච
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං
පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ"ති.

1. අරතිඤ්ච රාගං - PTS. 2. රාගඤ්ච - PTS. 3. අට්ඨිසංඝාටං - ස.
4. චම්මවිනද්ධං - ස. 5 උග්ඝරං පග්ඝරං - ස. 6. ඉච්ඡෙය්‍ය - සීමු. II. මජ්ඣං.

යම්සේ වෛනතෙය ගුරුළුරජහු පටන් කොට යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම් ඔහු අහස්හි පෙදෙසෙක හැසිරෙත් ද, එසෙයින් මැ යම් කෙනෙක් නුවණින් සැරියුත් තෙරුන් සමවූවාහු නම් ඔවුහු ද බුද්ධඥානයාගේ පෙදෙසෙක පවත්නාහුය. බුද්ධඥානය දෙව්මිනිසුන්ගේ ප්‍රඥාව පැතිරැ මැඩගෙනැ සිටී මැය. නිපුණ වූ කළ පරවාද ඇති වල් විදුනා දුනුවායන් බඳු ප්‍රසිද්ධ වූ යම් ක්ෂත්‍රිය - බ්‍රාහ්මණ - ගෘහපති - ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥාවෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද බොහෝ ප්‍රශ්න සකස් කොට ගෙන බුදුන් කරා පැමිණ විචාරති. ඒ ප්‍රශ්නයෝ බුදුන් විසින් සකාරණ ව කියන ලද්දාහු විසඳන ලද්දාහු ද වෙති. තවද ඔවුහු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක වූවාහු මැ වෙත්. යම් බුදුහු මැ එහි ප්‍රඥාවෙන් අතිශයින් බබළත් නුයි 'ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අථ ත්වං -පෙ- සක්ඛසි සම්පයාතවෙ" යි.

අටවැනි 'පසූර' සූත්‍ර නිර්දේශය යි.

## 9

## මාගන්දියසූත්‍රනිර්දේශය

ඉක්බිති මාගන්දිය සූත්‍රනිර්දේශය කියනු ලැබේ.

### 9 – 1

තෘෂ්ණා යැ අරති යැ රගා යැ යන (මාරදුහිතෘන්) තිදෙනා දැක මෙවුන්දම්හි ඡන්දයෙක් හෝ නො වී යැ. මලමූයෙන් පිරුණු මේ සිරුර දැක කවර කරුණෙකින් (ඡන්දයෙක් වේ ද නො වේ මැයි.) ඒ සිරුර පයින් දු ස්පර්ශ කරන්නට නො රිස්සෙමි.

**දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං**– තෘෂ්ණා ද අරතී ද රගා ද යන මාරදුහිතෘන් දැක පවා, මෙවුන්දම්හි ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රෙමයෙක් හෝ නො වී නුයි 'දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං' යනු වේ.

**කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ** – මූයෙන් පිරුණු මලයෙන් පිරුණු සෙමින් පිරුණු ලෙයින් පිරුණු ඇටසඟුළු වූ නහරවැලින් බැඳුණු, ලේමසින් ආලෙප කළ සමින් එතුණු සිවියෙන් වැසුණු නොයෙක් සිදුරු ඇති (ඇස් ආදියෙන්) ඉතිරෙන (අධොභාගයෙන්) වැගිරෙන පණුකැලන් ගැවැසෙන නොයෙක් අසුචිමල යෙන් හාත්පසින් පිරුණු මේ සිරුර කියනු මැ කිම. (එය) පයින් ඇක්මෙන්නට (පවා) නො රිස්සෙමි. වැලි කවර කරුණෙකින් සංවාසයෙක් හෝ සමාගමයෙක් හෝ වේ දැ'යි 'කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ, යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"දිස්වාන තණ්හං -පෙ- පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ"යි.

9 - 2

එතාදිසං චෙ රතනං න ඉච්ඡසි
නාරිං නරින්දෙහි බහූහි පත්ථිතං,
දිට්ඨිගතං සීලවතානුජීවිතං
භවූපපත්තිඤ්ච වදෙසි කීදිසං.

අනච්ඡරියමෙවෙතං මනුස්සා යං දිබ්බෙ කාමෙ පත්ථයන්තා මානුසකෙ කාමෙ න ඉච්ඡෙය්‍යුං, මානුසකෙ වා කාමෙ පත්ථයන්තා දිබ්බෙ කාමෙ න ඉච්ඡෙය්‍යුං, යං ත්වං උභොපි න ඉච්ඡසි[1] න සාදියසි න පත්ථෙසි න පිහෙසි නාභිජප්පසි, කිං තෙ දස්සනං? කතමාය ත්වං දිට්ඨියා සමන්නාගතො'ති පුච්ඡති.

"එතාදිසං චෙ රතනං න ඉච්ඡසි
නාරිං නරින්දෙහි බහූහි පත්ථිතං,
දිට්ඨිගතං සීලවතානුජීවිතං
භවූපපත්තිඤ්ච වදෙසි කීදිස"න්ති.

9 - 3

ඉදං වදාමීති න තස්ස හොති (මාගන්දියා'ති භගවා)
ධම්මෙසු[2] නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය
අජ්ඣත්තසන්තිං පචිනං අදස්සං.

**ඉදං වදාමීති න තස්ස හොති** - 'ඉදං වදාමී'ති ඉදං වදාමි. එතං වදාමි. එත්තකං වදාමි. එත්තාවතා වදාමි. ඉදං දිට්ඨිගතං වදාමි. 'සස්සතො ලොකො'ති වා -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා; **න තස්ස හොතීති** - න මය්හං හොති එත්තාවතා වදාමීති න තස්ස හොතීති - 'ඉදං වදාමීති න තස්ස හොති.' **මාගන්දියා**ති - භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති; **භගවා**ති - ගාරවාධිවචනං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති - 'මාගන්දියාති භගවා.'

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** - 'ධම්මෙසූ'ති ද්වාසට්ඨිදිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා විචිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො ඉදං සච්චං තච්ඡං තථං භූතං යාථාවං[3] අවිපරීතන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සංවිජ්ජති නුපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.'

---

1. ඉච්ඡති - මු. II   2. න ච ධම්මෙසු - මු. II. මජ්ඣං.
3. යථාවං - සිමු. II.

## 9 – 2

බොහෝ රජුන් විසින් පතන ලද දිව්‍යස්ත්‍රීරත්නයක් වැනි වූ මෙබඳු ස්ත්‍රියක ඉදින් නො කැමැත්තවූ නම්, (එකල්හි) තොපගේ දෘෂ්ටිය ද ශීලව්‍රතය ද ජීවිතය ද භවොත්පත්තිය ද කෙබඳු දැ'යි කියනු මැනවැ' යි.

යම් හෙයකින් මිනිසෙක් දිව්‍යකාමයන් ප්‍රාර්ථනා කෙරෙමින් මානුෂිකකාමයන් නො කැමැති වන්නේ නම්, මානුෂිකකාමයන් හෝ ප්‍රාර්ථනා කෙරෙමින් දිව්‍යකාමයන් නො කැමැති වන්නේ නම්, තෙල ආශයවශීයෙක් නො වෙයි. යම් හෙයකින් තෙපි දෙක මැ නො රිසියවූ ද නො ඉවසවූ ද, නො පතවූ ද, නො කැමැති වවූ ද, නො සිතවූ ද, (එහෙයින්) තොප ගේ දර්ශනය කිම ? තෙපි කවර ලබ්ධියකින් සමන්විතයවූ දැ'යි විචාරයි:

"එතාදිසං චෙ –පෙ– වදෙසි කීදිසං", යි

## 9 – 3

(බුදුහු මාගන්දිය, යි මෙසේ වදරති:) දෙසැටදිට්ඨිදහම්හි, නිශ්චය කොට මෙය මැ (සැබැවැයි මෙසේ) කියමි දැඩි ව ගන්නා ලද්දෙක් මට නො වෙයි, යළි දෙසැට දෘෂ්ටීන්හි (ආදීනවය) දක්නෙම් (කිසි දෘෂ්ටියක්) දැඩි ව නො ගෙන (සිව්සස්) සොයනුයෙම් අධ්‍යාත්මශාන්ති යයි කියන ලද නිවන දිටිමි.

**ඉදං වදාමීති න තස්ස හොති** – 'ඉදං වදාමි' යනු: මේ කියමි, තෙල කියමි, මෙතෙක් කියමි, මෙතෙකින් කියමි, මේ දෘෂ්ටිගතය කියමි: 'ලොකය ශාශ්වතැ'යි හෝ...සත්ව නෙම මරණින් මතුයෙහි නො මැ වෙයි, නො වන්නේ නො වේය යි; **න තස්ස හොති** – මට නොවෙයි, මෙතෙකින් කියමි, ඒ මට නො වේ නුයි 'ඉදං වදාමීති න තස්ස හොති' යනු වේ. **'මාගණ්ඩිය'** යි බුදුහු ඒ බමුණු නමින් අමතන සේක....'භගවා' යනු: ගෞරවාධිවචන යැ...මේ 'භගවා' යනු (සර්වධර්මයන්) ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියෙක් නුයි 'මාගන්දියාති භගවා' යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං** – 'ධම්මෙසු' යනු: දෙසැට දෘෂ්ටිගතයන්හි; **නිච්ඡෙය්‍ය** – නිශ්චය කොට විනිශ්චය කොට විමසා වෙසෙසින් විමසා තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට, අවසි කොට ගැනීම කොටස් වශයෙන් ගැනීම උතුම් කොට ගැනීම කොටස් කොට ගැනීම රාශිවශයෙන් ගැනීම විශෙෂරාශිවශයෙන් ගැනීම, මේ සැබව අවිපරීත යැ භූත යැ යාථාවත් යැ අවිපරීත යැයි ගන්නා ලද පරාමර්ශ කළ අභිනිවෙශ කළ ඇතුළත් වැ සිටි බැසගන්නා ලද්දක් නැත, විද්‍යමාන නො වේයි, නො ලැබෙයි, ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ සන්හිඳුවන ලද දුරලන ලද අභව්‍යොත්පත්තික කරන ලද නුවණගින්නෙන් දවන ලද නුයි 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං' යනු වේ.

**පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහායාති** – ‘දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි න පරාමසාමි නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය, අථවා, ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තතීති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි න පරාමසාමි නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය’. අථවා, ‘අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තතීති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’ අථවා, ඉමා දිට්ඨියො එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවං අභිසම්පරායාති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි– ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’ අථවා, ඉමා දිට්ඨියො නිරයසංවත්තනිකා තිරච්ඡානයොනිසංවත්තනිකා පෙත්තිවිසයසංවත්තනිකාති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’ අථවා, ඉමා දිට්ඨියො අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මාති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි. අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි– ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’

**පසඞ්ඛාය දිට්ඨිසු අනුග්ගහාය** - දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටීන් නො ගත්මි, පරාමර්ශ නො කරමි, පිවිසැ නො සිටිමි; නොහොත් නො ගතයුත්තාහුය නො දැහැගතයුත්තාහුය, නො පිවිසැ සිටිය යුත්තාහුය යි මෙසේත් 'පසඞ්ඛාය දිට්ඨිසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'ලෝකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය මෝඝය' යන තෙල දෘෂ්ටිගතය දෘෂ්ටිගහනය දෘෂ්ටිකාන්තාරය දෘෂ්ටි නමැති හුල දෘෂ්ටිවලනය දෘෂ්ටිසංයෝජනය (කායික) දුක් සහිත යැ (චෛතසික) පීඩා සහිත යැ දැඩි ආයාස සහිත යැ පරිදාහ සහිත යැ සංසාර (වට්ටයෙහි) නිර්වේදය පිණිස නො වෙයි, විරාගය පිණිස උපශමය පිණිස අභිජානනය පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස නො පවත්නේ නුයි දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටීන් නො ගත්මි, පරාමර්ශ නො කරමි, පිවිසැ නො සිටිමි; නොහොත් නො ගත යුත්තාහු යැ පරාමර්ශ නො කල යුත්තාහු යැ නො පිවිසැ සිටිය යුත්තාහු නුයි මෙසේත් "පසඞ්ඛාය දිට්ඨිසු අනුග්ගහාය" යනු වේ. නොහොත් 'ලෝකය අශාශ්වත යැ, ලෝකය අන්තවත් යැ, ලෝකය අනන්තවත් යැ, ජීවය ත් ශරීරයත් ඒ මැය, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකි, මරණින් මතු සත්ත්ව තෙම වෙයි, මරණින් මතු සත්ත්ව තෙම නො වෙයි, මරණින් මතු සත්ත්ව තෙමේ වන්නේ ද නො ද වන්නේ ද වෙයි, මරණින් මතු සත්ත්ව තෙමේ නො මැ වෙයි නො වන්නේ නො වෙයි, මෙය මැ සැබව, අන්‍යය මෝඝ යැ යන තෙල දෘෂ්ටිගතය දෘෂ්ටිගහනය දෘෂ්ටිකාන්තාරය දෘෂ්ටිශූලය දෘෂ්ටිවිෂ්පන්දනය දෘෂ්ටිසංයෝජනය දුක් සහිත යැ පීඩා සහිත යැ දැඩි ආයාස සහිත යැ පරිදාහ සහිත යැ නිර්වේදය පිණිස නො පවතී, විරාගය පිණිස - නිරෝධය පිණිස - උපශමය පිණිස අභිඥාව පිණිස - සම්බෝධය පිණිස - නිර්වාණය පිණිස නො පවතී නුයි දෘෂ්ටීන් කෙරෙහි ආදීනව දක්නෙම් දෘෂ්ටීන් නො ගන්මි, පරාමර්ශ නො කරමි, පිවිසැ නොසිටිමි; නොහොත් නො ගතයුත්තාහු යැ පරාමර්ශ නො කල යුත්තාහු යැ නො පිවිසියැ යුත්තාහු යැ'සි මෙසේ ත් 'පසඞ්ඛාය දිට්ඨිසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'මේ දෘෂ්ටිහු මෙසේ ගන්නා ලද්දාහු මෙසේ පරාමර්ශ කරන ලද්දාහු මෙබඳු ගති ඇත්තාහු මෙබඳු පරලොව ඇත්තාහු වෙති' දෘෂ්ටීන්හි ආදීනව දක්නෙම් දෘෂ්ටි නො ගත්මි, පරාමර්ශ නො කරමි; නොහොත් නො ගතයුත්තාහු ය, නො දැහියයුත්තාහු යැ, නො පිවිසි යැ යුත්තාහු නුයි මෙසේත් 'පසඞ්ඛාය දිට්ඨිසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'මේ දෘෂ්ටිහු නිරයෙහි ඉපදීම පිණිස පවත්නාහු යැ තිරිසන්යෝන්හි ඉපදීම පිණිස පවත්නාහු යැ ප්‍රෙතවිෂයයෙහි ඉපදීම පිණිස පවත්නාහු යැ' සි දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටි නො ගන්මි, නො දහමි, නො පිවිසැ සිටිමි; නොහොත් නො ගතයුත්තාහු යැ නො දැහියයුත්තාහුය, නො පිවිසියැ යුත්තාහු නුයි මෙසේත් 'පසඞ්ඛාය දිට්ඨිසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'මේ දෘෂ්ටිහු අනිත්‍යයහ ප්‍රත්‍යයන් විසින් කරන ලද්දාහු ය, ප්‍රතීත්‍යසමුත්පන්නයහ, ක්ෂයවන සුල්ලහ, නැසෙන සුල්ලහ, නො රුඳෙන සුල්ලහ, නිරුද්ධවන සුල්ලහ'සි දෘෂ්ටීන්හි ආදීනව දක්නෙම් දෘෂ්ටි නො ගන්මි, නො දහමි නො පිවිසෙමි; නොහොත් නො ගතයුත්තාහු යැ පරාමර්ශ නො කල යුත්තාහු යැ අභිනිවේශ නො කලයුත්තාහු නුයි මෙසේ ත් 'පසඞ්ඛාය දිට්ඨිසු අනුග්ගහාය' යනු වේ.

**අජ්ඣත්තසන්තිං පචිනං අදස්සන්ති** – ‘අජ්ඣත්තසන්ති’න්ති අජ්ඣත්තං රාගස්ස සන්තිං දොසස්ස සන්තිං මොහස්ස සන්තිං කොධස්ස – උපනාහස්ස මක්ඛස්ස – පළාසස්ස – ඉස්සාය – මච්ඡරියස්ස – මායාය – සාඨෙය්‍යස්ස ථම්භස්ස – සාරම්භස්ස – මානස්ස – අතිමානස්ස – මදස්ස – පමාදස්ස – සබ්බකිලෙසානං – සබ්බදුච්චරිතානං – සබ්බදරථානං – සබ්බපරිළාහානං – සබ්බසන්තාපානං – සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තිං උපසන්තිං වූපසන්තිං නිබ්බුතිං පටිප්පස්සද්ධිං; **පචිනන්ති** – පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො; ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො; ‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති –පෙ– ‘සබ්බෙ ධම්මා අනත්තා’ති පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභූතං කරොන්තො; ‘යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්ම’න්ති පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො; **අදස්සන්ති** – අදස්සං[1] අදක්ඛිං අපස්සිං පටිවිජ්ඣින්ති ‘අජ්ඣත්තසන්තිං පචිනං අදස්සං.’

තෙනාහ භගවා:

“ඉදං වදාමීති න තස්ස හොති (‘මාගන්දියා’ති භගවා)
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
පස්සඤ්ච දිට්ඨිසු අනුග්ගහාය
අජ්ඣත්තසන්තිං පචිනං අදස්ස”න්ති.

9 - 4

විනිච්ඡයා යානි පකප්පිතානි (ඉති මාගන්දියො)
තෙ වෙ මුනී බ්‍රූසි අනුග්ගහාය,
අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං
කථන්නු ධීරෙහි පවෙදිතං තං.[2]

**විනිච්ඡයා යානි පකප්පිතානීති** – ‘විනිච්ඡයා’ වුච්චන්ති ද්වාසට්ඨි-දිට්ඨිගතානි; **පකප්පිතානීති** – කප්පිතා පකප්පිතා අභිසඞ්ඛතා සණ්ඨපිතාතිපි පකප්පිතානි; අථවා, අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා විපරිණාමධම්මාතිපි පකප්පිතානීති- විනිච්ඡයා යානි පකප්පිතානි; **ඉති මාගන්දියොති** – ‘ඉතී’ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං ‘ඉතී’ති; **මාගන්දියොති** – තස්ස බ්‍රාහ්මණස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරොති ‘ඉති මාගන්දියො.’[3]

**තෙ වෙ මුනි බ්‍රූසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථන්ති** – ‘තෙ වෙ’ති ද්වාසට්ඨිදිට්ඨිගතානි; **මුනීති** – මොනං වුච්චති ඤාණං –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනීති; **අනුග්ගහායාති** – දිට්ඨිසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි න පරාමසාමි නාභිනිවිසාමීති ච භණසි අජ්ඣත්තසන්තීති ච භණසි; **යමෙතමත්ථන්ති** – යං පරමත්ථන්ති – ‘තෙ වෙ මුනි බ්‍රූසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං.’

1. අද්දසං - ස.    2. පවෙදිතන්ති - මනුප.    3. මාගන්දියොති - සීමු. II.

**අජ්ඣත්තසන්තිං පවිනං අද්දසං** - 'අජ්ඣත්තසන්තිං' යනු: අධ්‍යාත්ම යෙහි රාගයාගේ සන්හිඳීම ද්වේෂයාගේ - මෝහයාගේ සන්හිඳීම ක්‍රෝධයාගේ - උපනාහ - මකුබව - පලාස - ඊර්ෂ්‍යා - මාත්සය්‍ය - මායා - ශාඨ්‍ය-ස්තම්භ - සාරම්භ - මාන - අතිමාන - මද - ප්‍රමාදයාගේ - සියලු කෙලෙසුන්-ගේ සියලු දුශ්චරිතයන්ගේ - සියලු දරථයන්ගේ - සියලු පරිදාහයන්ගේ සියලු සන්තාපයන්ගේ - සියලු අකුශලාභිසංස්කාරයන්ගේ ශාන්තිය ව්‍යුපශාන්තිය නිර්වෘතිය ප්‍රතිප්‍රශ්‍රබ්ධිය; **පවිනං** - (සිව්සස්) වඩමින් වෙසෙසින් වඩමින් ප්‍රකර්ෂයෙන් වඩමින් තුලනය කෙරෙමින් තීරණය කෙරෙමින් සලකමින් ප්‍රකට කෙරෙමින්; 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි...'සියලු සංස්කාරයෝ දුක්ඛ' යි...'සියලු ධර්මයෝ අනාත්මයෝ යැ'යි 'යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් ඒ සියල්ල නැසෙන සුලු යැ යි' වඩමින් වෙසෙසින් වඩමින් ප්‍රකර්ෂයෙන් වඩමින් තුලනය කෙරෙමින් තීරණය කෙරෙමින් විභාවනය කෙරෙමින් විභූත කෙරෙමින්; **අද්දසං**- දුටිමි දිටිමි බැලුවෙමි (නුවණින්) ප්‍රතිවේධ කෙළෙමි නුයි 'අජ්ඣත්ත-සන්තිං පවිනං අද්දසං' යනු' වේ.

එසින් වදාලහ බුදුහු:

"**ඉදං වදාමීති -පෙ- අජ්ඣත්තසන්තිං පවිනං අද්දසං**" යි.

## 9 – 4

(මාගන්දිය තෙම මෙසේ කීය:) විනිශ්චය කොට ගන්නා ලද යම් දෙසැට දෘෂ්ටිධර්ම කෙනෙක් ප්‍රකල්පිත වූවාහු ද, ඒ දෘෂ්ටිධර්මයන් සම්බන්ධ මුනි වූ තෙපි ඒකාන්තයෙන් නො ගෙන අධ්‍යාත්මශාන්ති යයි තෙල යම් අර්ථයක් වදාළහු ද, ධීරයන් විසින් ඒ පරමාර්ථය කෙසේ ප්‍රකාශ කරන ලද ද ?

**විනිච්ඡයා යානි පකප්පිතානි** - 'විනිච්ඡය' යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. **පකප්පිතානි** - කල්පිත ප්‍රකල්පිත අභිසංස්කෘත වූවාහු මොනොවට පිහිටුවන ලද්දාහු නුයි 'පකප්පිත' නම් වෙති; නොහොත් අනිත්‍ය - සංස්කෘත - ප්‍රතීත්‍යසමුත්පන්න වූවාහු ක්ෂයවන සුලු නැසෙන සුලු නො ඇලෙන සුලු නිරුද්ධවන සුලු විපරිණාමස්වභාව ඇත්තාහු නුයි ද 'පකප්පිත' නුයි 'විනිච්ඡයා යානි පකප්පිතානි' යනු වේ. **ඉති මාගන්දියො**- 'ඉති' යනු: පදසන්ධි යැ පදසංසර්ග යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්විතා නමැ තෙල 'ඉති' යනු. 'මාගන්දියො' යනු ඒ බමුණුගේ නම යැ සංඛ්‍යා යැ සංඥා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාරය නුයි 'ඉති මාගන්දියො' යනු වේ.

**තෙ වෙ මුනි බ්‍රූසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං**- 'තෙ වෙ' යනු: ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ යි. **මුනි** යනු: 'මෞන' යි ඥානය කියනු ලැබෙයි ..(2-8 සූත්‍රනිද්දේශය.) **අනුග්ගහාය** - දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටි නො ගන්මි පරාමර්ශ නො කෙරෙමි අභිනිවේශ නො කෙරෙමි ද කියවූ, අධ්‍යාත්මශාන්තිය'යි ද කියවූ; **යමෙතමත්ථං** - යම් පරමාර්ථයක් නුයි 'තෙ වෙ මුනි බ්‍රූසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං' යනු වේ.

**කථංනු ධීරෙහි පවෙදිතං තන්ති** – 'කථංනූ'ති පදං සංසයපුච්ඡා විමතිපුච්ඡා ද්වෙළ්හකපුච්ඡා අනෙකංසපුච්ඡා, එවංනු ඛො න නු ඛො කිංනු ඛො කථංනු ඛොති කථංනු; **ධීරෙහීති** – ධීරෙහි පණ්ඩිතෙහි පඤ්ඤවන්තෙහි බුද්ධිමන්තෙහි ඤාණීහි විභාවීහි මෙධාවීහි; **පවෙදිතන්ති** – වෙදිතං පවෙදිතං ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විභත්තං උත්තානීකතං පකාසිතන්ති 'කථංනු ධීරෙහි පවෙදිතං තං'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"විනිච්ඡයා යානි පකප්පිතානි (ඉති මාගන්දියො)
තෙ වෙ මුනි බ්‍රූසි අනුග්ගහාය,
අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං
කථංනු ධීරෙහි පවෙදිතං ත"න්ති.

9 - 5

න දිට්ඨියා න සුතියා න ඤාණෙන ('මාගන්දියා'ති භගවා)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා[1]
අසීලතා අබ්බතා නොපි තෙන.
එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය
සන්තො අනිස්සාය භවං න ජප්පෙ.

**න දිට්ඨියා න සුතියා න ඤාණෙනාති** – දිට්ඨියාපි[2] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි[3] න භණාමි[4] න දීපයාමි; න වොහරාමි සුතියාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි[5], න භණාමි,[6] න දීපයාමි[7] න වොහරාමි දිට්ඨියා සුතියාපි[8] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමි; ඤාණෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි න දීපයාමි, න වොහරාමීති – න දිට්ඨියා න සුතියා න ඤාණෙන. **මාගන්දියාති භගවාති** – 'මාගන්දියා'ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති; භගවාති – ගාරවාධිවචනං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති – 'මාගන්දියාති භගවා.'

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහාති** – සීලෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමි; වතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමි; සීලබ්බතෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමීති 'සීලබ්බතෙනාපි න සුද්ධිමාහ.'

1. අස්සුතියා අඤ්ඤාණා - ස. මනුප. 2. දිට්ඨෙන - සීමු. II. දිට්ඨෙනාපි - මජසං. PTS.
3. කථෙසි - සබ්බත්ථ. 4. භණසි - සබ්බත්ථ. 5. කථෙසි - සීමු. II. PTS.
6. භණසි - සීමු. II. 7. දීපයසි. සීමු. II. 8. සුතෙනාපි - සබ්බත්ථ.

**කථංකථා ධීරෙහි පවෙදිතං තං** - යනු: 'කථංකථා' යන පදය සැක විචාරීම යැ විමතිපාවණා යැ විචිකිත්සාපාවණා යැ අනෙකාංශපාවණා යැ: මෙසේ ද්දේ හෝ, නො වේ ද්දේ හෝ, කිමෙක් ද්දේ හෝ, කෙසේ ද්දේ හෝ නුයි 'කථංකථා' යනු වේ. **ධීරෙහි** - ධීරයන් විසින් පණ්ඩිතයන් විසින් ප්‍රඥාවතුන් විසින් බුද්ධිමතුන් විසින් ඥානීන් විසින් විභාවීන් විසින් ප්‍රාඥයන් විසින්; **පවෙදිතං** - දක්නා ලද ප්‍රකාශ කරන ලද කියන ලද දෙසන ලද පනවන ලද තබන ලද විභාග කරන ලද ප්‍රකට කරන ලද ප්‍රකාශ කරන ලද නුයි 'කථංකථා ධීරෙහි පවෙදිතං තං' යනු වේ.

එයින් කියැ ඒ බමුණු:

"විනිච්ඡයා යානි -පෙ- පවෙදිතං තං" යි.

## 9 - 5

(බුදුහු 'මාගන්දිය' යි මෙසේ වදාළහ:) මම දෘෂ්ටියෙන් ශුද්ධිය නො කියමි. ශ්‍රැතියෙන් - සමාපත්තිඥානයෙන් - බාහිර ශීලව්‍රතයෙනු දු ශුද්ධිය නො කියමි. (දශවස්තුක) සම්‍යග්දෘෂ්ටියෙන් වෙන් වැ නවාඞ්ගශ්‍රැතියෙන් වෙන් වැ කර්මස්වකතා සත්‍යානුලොමිකඥානයෙන් වෙන් වැ ප්‍රාතිමොක්ෂ-සංවරයෙන් වෙන් වැ ධූතාඞ්ගව්‍රතයෙන් වෙන් වැ ශුද්ධිය නො කියමි. ඒ සම්‍යග්දෘෂ්ට්‍යාදිමාත්‍රය කිනු දු නො කියමි. තවද තෙල දෘෂ්ටි ආදි ධර්මයන් දුරු කොට අදෘෂ්ටි ආදි ධර්මයන් අනුග්‍රහ කොට ශාන්ත තෙමේ (චක්ඛාදීන් අතුරෙන් කිසිවක්) නිඃශ්‍රය නො කොට කාමාදි භවය නො පතන්නට සමර්ථ වන්නේය.

**න දිට්ඨියා න සුතියා න ඤාණෙන** - දෘෂ්ටියෙන් ද ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය, **නාහ** - නො කියමි. නො බෙණෙමි. නො දක්වමි. නො වහරමි. ශ්‍රැතියෙනු දු ශුද්ධිය විශුද්ධිය පරි-ශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **නාහ** - නො කියමි, නො බෙණෙමි නො දක්වමි නො වහරමි. දෘෂ්ටිශ්‍රැතියෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **නාහ** - නො කියමි, නො බෙණෙමි නො දක්වමි නො වහරමි. සමාපත්තිඥානයෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය '**නාහ**' නො කියමි. නො බෙණෙමි නො දක්වමි ව්‍යවහාර නො කෙරෙමි නුයි 'න දිට්ඨියා න සුතියා න ඤාණෙන' යනු වේ. **මාගන්දියාති භගවා** - 'මාගන්දිය' යි බුදුහු ඒ බමුණා නමින් ආමන්ත්‍රණය කෙරෙති. **භගවා** - යනු: ගෞරවාධිවචන යැ...මේ 'භගවා' යනු සියලු ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් නුයි 'මාගන්දියාති භගවා' යනු වේ.

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහ** - ශීලයෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **නාහ** - නො කියමි නො බෙණෙමි නො දක්වමි නො වහරමි. ව්‍රතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය '**නාහ**' නො කියමි නො බෙණෙමි නො දක්වමි නො වහරමි. ශීලව්‍රතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය '**නාහ**' නො කියමි නො බෙණෙමි නො දක්වමි නො වහරමි නුයි 'සීලබ්බතෙනාපි න සුද්ධිමාහ' යනු වේ.

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙනාති**– දිට්ඨිපි[1] ඉච්ඡිතබ්බා දසවත්ථුකා සම්මාදිට්ඨි: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. සවණම්පි ඉච්ඡිතබ්බං පරතොඝොසො: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. ඤාණම්පි ඉච්ඡිතබ්බං: කම්මස්සකතං ඤාණං, සච්චානුලොමිකං ඤාණං, අභිඤ්ඤාඤාණං සමාපත්තියා ඤාණං. සීලම්පි ඉච්ඡිතබ්බං: පාතිමොක්ඛසංවරො. වතම්පි ඉච්ඡිතබ්බං අට්ඨ ධුතඞ්ගානි: ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං සපදානචාරිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං යථාසන්ථතිකඞ්ගන්ති– අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා. **නොපි තෙනාති** – නාපි සම්මාදිට්ඨිමත්තෙන නාපි සවණමත්තෙන නාපි ඤාණමත්තෙන නාපි සීලමත්තෙන නාපි වතමත්තෙන අජ්ඣත්තසන්තිං පත්තො හොති. නපි විනා එතෙහි ධම්මෙහි අජ්ඣත්තසන්තිං පාපුණාති. අපිච, සම්භාරා ඉමෙ ධම්මා හොන්ති අජ්ඣත්තසන්තිං පාපුණිතුං අධිගන්තුං ඵුසිතුං[2] සච්ඡිකාතුන්ති 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන.'

**එතෙ ච නිස්සජ්ජ අනුග්ගහායාති** – 'එතෙ'ති කණ්හපක්ඛිකානං ධම්මානං සමුග්ඝාතතො පහානං ඉච්ඡිතබ්බං, තෙධාතුකෙසු කුසලෙසු ධම්මෙසු අතම්මයතා[3] ඉච්ඡිතබ්බා, යතො කණ්හපක්ඛියා ධම්මා සමුග්ඝාතප්පහානෙන පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[4] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තෙධාතුකෙසු ච කුසලෙසු ධම්මෙසු අතම්මයතා හොති. එත්තාවතාපි න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසති. අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි– 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය.' යතො තණ්හා ච දිට්ඨි ච මානො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[4] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා[5], එත්තාවතාපි න ගණ්හාති න පරාමසති නාභිනිවිසතීති එවම්පි – 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය.' යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතාපි න ගණ්හාති න පරාමසති නාභිනිවිසතීති එවම්පි– 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය.'

1. දිට්ඨි - සිමු. II. 2. ඵස්සිතුං - මජසං. 3. අකම්මයතා - සිමු. II.
4. තාලවත්ථුකතා - ස. 5. අනුප්පාදධම්මාති - සිමු. II. මජසං.

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නො'පි තෙන** - 'දෙන ලද්දෙහි ඵල ඇත, යදන ලද්දෙහි ඵල ඇත, පුදන ලද්දෙහි ඵල ඇත, කුශලාකුශලකර්මයන්ගේ ඵල විපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත' මවු ඇත, පියා ඇත, ඕපපාතික සත්ත්වයෝ ඇත්තාහ. මෙලොවත් පරලොවත් තුමූ මැ නුවණින් දැන ප්‍රකාශ කරන සම්‍යග්ගත වූ සම්‍යක්-ප්‍රතිපන්න වූ ශ්‍රමණබ්‍රාහ්මණයෝ ලොකයෙහි ඇත්තාහ' යන දශවස්තුක සම්‍යග්දෘෂ්ටි සඞ්ඛ්‍යාත දෘෂ්ටිය ද කැමැති විය යුත්තීය.' සූත්‍ර යැ ගෙය්‍ය යැ වෙය්‍යාකරණ යැ ගාථා යැ උදාන යැ ඉතිවුත්තක යැ ජාතක යැ අබ්භුතධම්ම යැ වෙදල්ල යැ යන (නවාඞ්ගවශයෙන්) පරතොඝොෂ සඞ්ඛ්‍යාත ශ්‍රවණය ද කැමැති වියයුතු යැ. කර්මස්වකතාඥානය යැ සත්‍යානු-ලොමිකඥානය යැ අභිඥාඥානය යැ සමාපත්තිඥානය යැ යන ඥානය ද කැමැති විය යුතු යැ. ප්‍රාතිමොක්ෂසංවර සඞ්ඛ්‍යාත ශීලය ද කැමැති විය යුතු යැ. ආරණ්‍යකාඞ්ග යැ පිණ්ඩපාතිකාඞ්ග යැ පාංශුකූලිකාඞ්ග යැ තෙචීවරිකාඞ්ග යැ සපදානචාරිකාඞ්ග යැ ඛලුපච්ඡාභත්තිකාඞ්ග යැ නෙසජ්ජිකාඞ්ග යැ යථාසන්ථතිකාඞ්ග යැ යන අෂ්ට ධූතාඞ්ගසඞ්ඛ්‍යාත ව්‍රතය ද කැමැති වියයුත්තේ නුයි 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා' යනු වේ. **නො පි තෙන** - නො ද සම්‍යග්දෘෂ්ටිමාත්‍රයෙන් නො ද ශ්‍රවණ මාත්‍රයෙන් නො ද ඥානමාත්‍රයෙන් නො ද ශීලමාත්‍රයෙන් නො ද ව්‍රතමාත්‍රයෙන් අධ්‍යාත්මශාන්තියට පැමිණියේ වෙයි. තෙල ධර්මයන්ගෙන් වෙන් වැ අධ්‍යාත්මශාන්තියට නො ද පැමිණෙයි. තවද මෙ ධර්මයෝ අධ්‍යාත්ම-ශාන්තියට පැමිණෙන්නට අධිගම කරන්නට ස්පර්ශ කරන්නට ප්‍රත්‍යක්ෂ කරන්නට උපකාර වූවාහු වෙත් නුයි 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නො 'පි තෙන' යනු වේ.

**එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය** - 'එතෙ' යනු: කෘෂ්ණපක්ෂයෙහි වූ ධර්මයන්ගේ තැසීමෙන් ප්‍රහාණය කැමැති වියයුතුය; තුන්බිමට අයත් කුශලධර්මයන්හි තෘෂ්ණා රහිත බව කැමැති වියයුතුය; යම් තැනෙක පටන් කෘෂ්ණපක්ෂයෙහි වූ ධර්මයෝ සමුච්ඡේද ප්‍රහාණයෙන් ප්‍රහීණ වූවාහු උදුන්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු වෙත් ද, ත්‍රෛධාතුකකුශල-ධර්මයන්හි දු තෘෂ්ණා රහිත බව වේ ද, මෙතෙකින්නු දු ග්‍රහණය නො කෙරෙයි, පරාමර්ශ නො කෙරෙයි, අභිනිවෙශ නො කෙරෙයි. නොහොත් නො ගතයුත්තාහු නො දැඩියයුත්තාහු නො පිවිසියැ යුත්තාහු වෙත් නුයි-මෙසේ ත් 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය' යනු වේ. යම් තැනෙක පටන් තෘෂ්ණාවත් දෘෂ්ටියත් මානයත් ප්‍රහීණ වූවාහු උදුන්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු වෙත් ද, මෙතෙකින්නු දු ග්‍රහණ - පරාමර්ශ-අභිනිවෙශ නො කෙරේ නුයි - මෙසේ ත් 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය' යනු වේ. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරයත් අපුණ්‍යාභිසංස්කාරයත් ආනෙඤ්ජාභිසංස්කාරයත් ප්‍රහීණ වූවාහු උදුන්මුල් ඇත්තාහු අනභාවය කරන ලද්දාහු මත්තෙහි අනුත්පාදස්වභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින්නුදු ග්‍රහණ - පරාමර්ශ - අභිනිවෙශ නො කෙරේ නුයි - මෙසේත් 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය' යනු වේ.

**සන්තො අනිස්සාය භවං න ජප්පති** – ‘සන්තො’ති රාගස්ස සමිතත්තා සන්තො, දොසස්ස සමිතත්තා සන්තො, මොහස්ස සමිතත්තා සන්තො, කොධස්ස – උපනාහස්ස – මක්ඛස්ස – පළාසස්ස – ඉස්සාය – මච්ඡරියස්ස – මායාය – සාඨෙය්‍යස්ස – ථම්භස්ස – සාරම්භස්ස – මානස්ස – අතිමානස්ස – මදස්ස – පමාදස්ස – සබ්බකිලෙසානං – සබ්බදුච්චරිතානං – සබ්බදරථානං – සබ්බපරිළාහානං – සබ්බසන්තාපානං – සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා[1] පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති ‘සන්තො’. **අනිස්සායාති** – ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච –පෙ– අයං තණ්හානිස්සයො –පෙ– අයං දිට්ඨිනිස්සයො. තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සාය සොතං අනිස්සාය ඝානං අනිස්සාය ජිව්හං අනිස්සාය කායං අනිස්සාය මනං අනිස්සාය රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ ධම්මෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අනිස්සාය අගණ්හිත්වා අපරාමසිත්වා අනභිනිවිසිත්වාති – ‘සන්තො අනිස්සාය.’ **භවං න ජප්පති** – කාමභවං න ජප්පෙය්‍ය, රූපභවං න ජප්පෙය්‍ය, අරූපභවං න ජප්පෙය්‍ය, නප්පජප්පෙය්‍ය, න අභිජප්පෙය්‍යාති – ‘සන්තො අනිස්සාය භවං න ජප්පෙ.’

තෙනාහ භගවා:

“න දිට්ඨියා න සුතියා[2] න ඤාණෙන (‘මාගන්දියා’ති භගවා)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා
අසීලතා අබ්බතා නොපි තෙන.
එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය
සන්තො අනිස්සාය භවං න ජප්පෙ”ති.

9 – 6

නො චෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන
(ඉති මාගන්දියො)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා
අසීලතා අබ්බතා නොපි තෙන.
මඤ්ඤෙමහං මොමුහමෙව ධම්මං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං.

---

1. විහතත්තා - මු. II.
2. නස්සුතියා - සිමු. I. සිමු. II.

**සන්තො අනිස්සාය භවං න ජප්පෙ** – 'සන්තො' යනු: රාගය සන්හිඳුවන ලද බැවින් ශාන්ත යැ ද්වේෂය ශමිත වන බැවින් ශාන්ත යැ මෝහය ශමිත වන බැවින් ශාන්ත යැ, ක්‍රෝධය – උපනාහය – මක්ඛය – පලාසය– ඊර්ෂ්‍යාව – මාත්සර්‍ය්‍යය – මායාව – සාඨේය්‍යය – ථම්භය – සාරම්භය – මානය– අතිමානය – මදය – ප්‍රමාදය – සර්වක්ලේශයන්– සර්වදුශ්චරිතයන්–සර්වදරථයන් සර්වපරිදාහයන් – සර්වසන්තාපයන් – සර්වාකුශලාභිසංස්කාරයන් ශාන්තවන බැවින් ශමිත වන බැවින් ව්‍යුපශමිත වන බැවින් දවන ලද බැවින් නිවන ලද බැවින් දුරුව ගිය බැවින් වෙසෙසින් නසන ලද බැවින් ශාන්ත වූයේ උපශාන්ත වූයේ වෙසෙසින් උපශාන්ත වූයේ නිවුණේ වෙසෙසින් නසන ලදුයේ නුයි 'සන්තො' යනු වේ. **අනිස්සාය** – තෘෂ්ණානිශ්‍රය ද දෘෂ්ටිනිශ්‍රය දැයි නිශ්‍රය...දෙකෙකි; තෘෂ්ණානිශ්‍රය හැර දෘෂ්ටිනිශ්‍රය දුරලා චක්ෂුස්ප්‍රසාදය නො නිසා ශ්‍රොත්‍රප්‍රසාදය නිශ්‍රය නො කොට ඝ්‍රාණප්‍රසාදය නො නිසා ජිහ්වාප්‍රසාදය නො නිසා කායප්‍රසාදය නො නිසා මනඃප්‍රසාදය නො නිසා රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය – ධර්මයන්– කුලය – ගණයා – ආවාසය ලාභය – යශස – ප්‍රශංසාව – සුඛය – චීවරය – පිණ්ඩපාතය – සෙනසුන– ගිලන්පසබෙහෙත්පිරිකර – කාමධාතුව – රූපධාතුව – අරූපධාතුව –කාම– භවය – රූපභවය – අරූපභවය – සඤ්ඤාභවය – අසඤ්ඤාභවය – නෙව– සඤ්ඤානාසඤ්ඤාභවය – ඒකවොකාරභවය – චතුවොකාරභවය – පඤ්ච– වොකාරභවය – අතීතය – අනාගතය – ප්‍රත්‍යුත්පන්නය – දෘෂ්ටශ්‍රැතමුත විඥාතව්‍යධර්මයන් නිශ්‍රය නො කොට ග්‍රහණය නො කොට පරාමර්ශ නො කොට අභිනිවෙශ නො කොට නුයි – 'සන්තො අනිස්සාය' යනු වේ. **භවං න ජප්පෙ** – කාමභවය නො පතන්නේ යැ, රූපභවය නො පතන්නේ යැ, අරූපභවය නො පතන්නේ යැ, ප්‍රකර්ෂයෙන් නො පතන්නේ යැ, වෙසෙසින් නො පතන්නේ නුයි 'සන්තො අනිස්සාය භවං න ජප්පෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"න දිට්ඨියා න සුතියා –පෙ– සන්තො අනිස්සාය භවං න ජප්පෙ"**යි

**9 – 6**

(මාගන්දිය තෙම මෙසේ කීය:) ඉදින් දෘෂ්ටියෙන් ශුද්ධිය නො කියවු නම්, ශ්‍රැතියෙන් – සමාපත්තිඥානයෙන් – ශීලව්‍රතයෙනු දු නො කියවු නම්, යලි දෘෂ්ටියෙන් වෙන් වැ ශ්‍රැතියෙන් වෙන් වැ ඥානයෙන් වෙන් වැ ශීලයෙන් වෙන් වැ ව්‍රතයෙන් වෙන් වැ ශුද්ධිය නො කියවු නම්, ඒ දෘෂ්ට්‍යාදිමාත්‍රයෙනුදු නො කියවු නම්, මම තොපගේ මේ ධර්මය අතිශයින් මූඪ වූවක් මැ කොට සිතමි. ඇතැම් මහණ බමුණු කෙනෙක් දෘෂ්ටියෙන් ශුද්ධිය කැමැති වෙත්.

**නො චෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙනාති** – දිට්ඨියාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ‘නාහ, න කථෙසි, න භණසි, න දීපයසි, න වොහරසි. සුතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං – දිට්ඨසුතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං – ඤාණෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ‘නාහ න කථෙසි න භණසි න දීපයසි න වොහරසීති– ‘නො චෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන.’ **ඉති මාගන්දියාති**– ‘ඉතී’ති පදසන්ධි –පෙ– **මාගන්දියාති** – තස්ස බ්‍රාහ්මණස්ස නාමං –පෙ– ‘ඉති මාගන්දියො.’

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහාති** – සීලෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං –පෙ– වතෙනපි[1] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං –පෙ– සීලබ්බතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ‘නාහ’ න කථෙසි න භණසි න දීපයසි න වොහරසීති ‘සීලබ්බතෙනාපි න සුද්ධිමාහ.’

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙනාති**– දිට්ඨිපි ඉච්ඡිතබ්බාති එවං භණසි; සවණම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි; ඤාණම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි; සීලම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි; වතම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි. න සක්කොසි එකංසෙන අනුජානිතුං න සක්කොසි එකංසෙන පටික්ඛිපිතුන්ති ‘අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන.’

**මඤ්ඤාමහං මොමුහමෙව ධම්මන්ති** – මොමුහධම්මො අයං තුය්හං බාලධම්මො මූළ්හධම්මො අඤ්ඤාණධම්මො අමරාවික්ඛෙපධම්මොති එවං මඤ්ඤාමි එවං ජානාමි එවං ආජානාමි එවං විජානාමි එවං පටිවිජානාමි එවං පටිවිජ්ඣාමීති ‘මඤ්ඤාමහං මොමුහමෙව ධම්මං.’

**දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධින්ති** – දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති: “සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ”න්ති දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති. “අසස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ”න්ති දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්තීති ‘දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං.’

තෙනාහ සො බ්‍රාහ්මණො:

“නො චෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන (ඉති
මාගන්දියො)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා
අසීලතා අබ්බතා නොපි තෙන.
මඤ්ඤාමහං මොමුහමෙව ධම්මං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධි”න්ති.

1. වතෙනපි – PTS.

**නො ච කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන** - දෘෂ්ටියෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය 'නාහ' තෙපි නො කියව්, නො බණව්, නො දක්වව්, නො වහරව්; ශ්‍රැතයෙනුදු ශුද්ධිය... පරිමුක්තිය...දෘෂ්ටිශ්‍රැතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය...ඥානයෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය 'නාහ' නො කියව්, නො බණව්, නො දක්වව්, නො වහරව් නුසි 'නො ච කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන' යනු වේ. **ඉති මාගන්දියො** - 'ඉති' යනු: පදසන්ධි යැ... මාගන්දියො යනු: ඒ බමුණාගේ නම යැ...'ඉති මාගන්දියො' යනු වේ.

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහ** - ශීලයෙනු දු ශුද්ධිය...ව්‍රතයෙනු දු ශුද්ධිය... ශීලයෙන් හා ව්‍රතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය 'නාහ' නො කියව්, නො බණව්, නො දක්වව්, නො වහරව් නුසි 'සීලබ්බතෙනාපි න සුද්ධිමාහ' යනු වේ.

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන** - දෘෂ්ටියක් කැමැති වියයුතු ය'යි මෙසේ කියව්, ශ්‍රවණයත් කැමැති වියයුතුය'යි මෙසේ කියව්, ඥානයත් කැමැති වියයුතුයයි මෙසේ කියව්, ශීලයත් කැමැති විය යුතුයයි මෙසේ කියව්, ව්‍රතයත් කැමැති වියයුතුයයි මෙසේ කියව්; එකාන්තයෙන් අනුඥා කරන්නට නො හැකියව්, එකාන්ත- යෙන් ප්‍රතික්ෂෙප කරන්නටත් නො හැකියව් නුසි 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නො'පි තෙන' යනු වේ.

**මඤ්ඤාමහං මොමුහමෙව ධම්මං** - 'මේ තොපගේ අතිමූඪධර්මයෙක බාලධර්මයෙක මූඪධර්මයෙක අඥානධර්මයෙක අමරාවික්ෂෙපධර්මයෙකැ'යි මෙසේ හඟිමි, මෙසේ දනිමි, මෙසේ හාත්පසින් දනිමි, මෙසේ වෙසෙසින් දනිමි, මෙසේ අවබොධ කෙරෙමි, මෙසේ ප්‍රතිවෙධ කෙරෙමි නුසි- 'මඤ්ඤාමහං මොමුහමෙව ධම්මං' යනු වේ.

**දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං** - දෘෂ්ටියෙන් ඇතැම් මහණ බමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පිළි- ගනිති: 'ලොකය ශාශ්වත යැ, මේ මැ සැබව, අන්‍යය මොඝයැ'යි දෘෂ්ටියෙන් ඇතැම් මහණබමුණෝ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පිළිගනිති; 'ලොකය අශාශ්වත යැ,...සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි, මේ මැ සැබව, සෙස්ස මොඝයැ'යි දෘෂ්ටියෙන් ඇතැම් මහණබමුණෝ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පිළිගනිත් නුසි 'දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

"නො ච කිර දිට්ඨියා -පෙ- දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං"යි.

9 – 7

දිට්ඨිඤ්ච[1] නිස්සාය අනුපුච්ඡමානො (මාගන්දියා'ති භගවා)
සමුග්ගහීතෙසු පමොහමාගතො[2],
ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං
තස්මා තුවං මොමූහතො දහාසි.

**දිට්ඨිඤ්ච[1] නිස්සාය අනුපුච්ඡමානොති** – මාගන්දියො බ්‍රාහ්මණො දිට්ඨිං නිස්සාය දිට්ඨිං පුච්ඡති, ලග්ගනං නිස්සාය ලග්ගනං පුච්ඡති, බන්ධනං නිස්සාය බන්ධනං පුච්ඡති, පලිබොධං නිස්සාය පලිබොධං පුච්ඡති; **අනුපුච්ඡමානොති** – පුනප්පුනං පුච්ඡතීති – 'දිට්ඨිඤ්ච නිස්සාය අනුපුච්ඡමානො.' **මාගන්දියාති** – භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති; **භගවාති** – ගාරවාධිවචනං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති – 'මාගන්දියාති භගවා.'

**සමුග්ගහීතෙසු පමොහමාගතොති** – යා සා දිට්ඨි තයා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තා, තායෙව ත්වං දිට්ඨියා මූළ්හොසි පමූළ්හොසි[3] සම්මූළ්හොසි[4] මොහං ආගතොසි පමොහං ආගතොසි සම්මොහං ආගතොසි අන්ධකාරං පක්ඛන්තොසීති[5] 'සමුග්ගහීතෙසු පමොහමාගතො.'

**ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤන්ති** – ඉතො අජ්ඣත්තසන්තිතො වා පටිපදාතො වා[6] ධම්මදෙසනාතො වා යුත්තසඤ්ඤං වා පත්තසඤ්ඤං වා ලක්ඛණසඤ්ඤං වා කාරණසඤ්ඤං වා ඨානසඤ්ඤං වා නප්පටිලභසි කුතො ඤාණන්ති එවම්පි – 'ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං.' අථවා, අනිච්චං වා අනිච්චසඤ්ඤානුලොමං වා, දුක්ඛං වා දුක්ඛසඤ්ඤානුලොමං වා, අනත්තං වා අනත්තසඤ්ඤානුලොමං වා, සඤ්ඤුප්පාදමත්තං වා සඤ්ඤානිමිත්තං වා නප්පටිලභසි, කුතො ඤාණන්ති එවම්පි – 'ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං.'

**තස්මා තුවං මොමූහතො දහාසීති** – 'තස්මාති' තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා මොමූහධම්මතො බාලධම්මතො මූළ්හධම්මතො අඤ්ඤාණධම්මතො අමරාවික්ඛෙපධම්මතො දහාසි පස්සසි දක්ඛසි ඔලොකෙසි නිජ්ඣායසි උපපරික්ඛසීති 'තස්මා තුවං මොමූහතො දහාසී'ති.

තෙනාහ භගවා:

"දිට්ඨිඤ්ච[7] නිස්සාය අනුපුච්ඡමානො ('මාගන්දියා'ති භගවා)
සමුග්ගහීතොසි පමොහමාගතො[8],
ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං
තස්මා තුවං මොමූහතො දහාසී"ති.

---

1. දිට්ඨිසු – සීමු. II. PTS.
2. පමොහමොග – සීමු. II. PTS. සම්මොහමොගතො – මනුප. පමොහමොගා – මජසං.
3. පමූළ්හො PTS. 4. සම්මූළ්හො – PTS. 5 පවිපන්නොතො – PTS.
6. පක්ඛන්දොසීති – සීමු I. මනුප. පක්ඛන්දෙසීති – මජසං. පක්ඛන්තොසීති – සා. PTS.
7. දිට්ඨිසු – සීමු. II. PTS. 8. පමොහමොග – සීමු. I. පමොහමොගා – මජසං. PTS.

## 9 - 7

(බුදුහු මාගන්දිය යි මෙසේ වදාරති:) දෘෂ්ටිය මැ නිශ්‍රය කොට (-නිසා) පුනපුනා විචාරනුයෙහි දැඩිව ගන්නා ලද දෘෂ්ටීන් කෙරෙහි ප්‍රකර්ෂමෝහයට පැමිණියෙහි යම් හෙයකින් තෝ මේ දහම්හි මඳ වූ සංඥාවකු දු නුදුටුයෙහි ද එහෙයින් අතිමූඪ වූවක් වශයෙන් දක්නෙහි.

**දිට්ඨිඤ්ච නිස්සාය අනුපුච්ඡමානො** - මාගන්දිය බමුණු දෘෂ්ටිය නිසා දෘෂ්ටිය විචාරයි, දෘෂ්ටිලග්නය නිසා (-එල්බගෙන) දෘෂ්ටිලග්නය විචාරයි, දෘෂ්ටිබන්ධනය නිසා දෘෂ්ටිබන්ධනය විචාරයි, දෘෂ්ටිපරිබොධය නිශ්‍රය කොට දෘෂ්ටිපරිබොධය විචාරයි; **අනුපුච්ඡමානො** - පුනපුනා විචාරනුයි 'දිට්ඨිඤ්ච නිස්සාය අනුපුච්ඡමානො' යනු වේ. **මාගන්දිය** යි බුදුහු ඒ බමුණා නමින් ආමන්ත්‍රණය කෙරෙති. **භගවා** යනු: ගෞරවාධිවචන යැ...මේ 'භගවා' යනු ප්‍රත්‍යක්ෂකරණයෙන් උපන් ප්‍රඥප්තියක් නුයි - 'මාගන්දියාති භගවා' යනු වේ.

**සමුග්ගහීතෙසු පමොහමාගතො** - තා විසින් යම් දෘෂ්ටියක් ගන්නා ලද්දී පරාමර්ශ කරන ලද්දී පිවිසැ ගන්නා ලද්දී දැඩි වැ ගන්නා ලද්දී අභිමුක්ත වූවා ද, තෝ ඒ දෘෂ්ටියෙන් මැ මූඪ වූයෙහි ප්‍රමූඪ වූයෙහි සම්මූඪ වූයෙහි මොහයට පැමිණියෙහි ප්‍රමොහයට පැමිණියෙහි සම්මොහයට පැමිණියෙහි අඳුරට පිවිසියෙහි නුයි 'සමුග්ගහීතෙසු පමොහමාගතො' යනු වේ.

**ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං** - මේ අධ්‍යාත්මශාන්තියෙන් හෝ ප්‍රතිපදායෙන් හෝ ධර්මදෙශනාවෙන් හෝ (මහණදම්හි) යුක්තසංඥාවක් හෝ ප්‍රාප්තසංඥාවක් හෝ ලක්ෂණසංඥාවක් හෝ කාරණසංඥාවක් හෝ හෙතුසංඥාවක් හෝ නො ලබව, මාර්ගඥානය වැලින් කොයින් ලබවූ දැ'යි මෙසේත් - 'ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං' යනු වේ. නොහොත් අනිත්‍යය හෝ අනිත්‍යසංඥානුලොමය හෝ දුඃඛය හෝ දුඃඛසංඥානුලොමය හෝ අනාත්මය හෝ අනාත්මසංඥානුලොමය හෝ සංඥෝත්පාද මාත්‍රයක් හෝ සංඥානිමිත්ත හෝ නො ලබව, මාර්ගඥානය කොයින් ලබවූ දැ'යි මෙසේත් - 'ඉතො ච නාද්දක්ඛි අනුම්පි සඤ්ඤං' යනු වේ.

**තස්මා තුවං මොමූහතො දහාසි** - 'තස්මා' යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මොමූහධර්මයක් වශයෙන් බාලධර්මයක් වශයෙන් මූඪධර්මයක් වශයෙන් අඥානධර්මයක් වශයෙන් අමරාවික්ෂෙපධර්මයක් වශයෙන් ගන්ව බලව දක්හි අවලොකනය කෙරෙහි සිතව විමසව'යි 'තස්මා තුවං මොමූහතො දහාසි' යනු වේ.
එයින් වදාළහ බුදුහු:

**"දිට්ඨිං ච නිස්සාය -පෙ- මොමූහතො දහාසි"යි.**

### 9 - 8

සමො විසෙසී උදවා නිහීනො
යො මඤ්ඤති සො විවදෙථ තෙන,
තීසු විධාසු අවිකම්පමානො
සමො විසෙසීති න තස්ස හොති.

**සමො විසෙසී උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙනාති**– 'සදිසොහමස්මී'ති වා 'සෙය්‍යොහමස්මී'ති වා 'හීනොහමස්මී'ති වා, යො මඤ්ඤති, සො තෙන මානෙන තාය දිට්ඨියා තෙන වා පුග්ගලෙන කලහං කරෙය්‍ය භණ්ඩනං කරෙය්‍ය විග්ගහං කරෙය්‍ය විවාදං කරෙය්‍ය මෙධගං කරෙය්‍ය: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සහිතම්මෙ, අසහිතන්තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආචිණ්ණන්තෙ[1] විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහීතොසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි සචෙ පහොසී'ති – සමො විසෙසී උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙන.

**තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොතීති**– යස්සෙතා තිස්සො විධා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො තීසු විධාසු න කම්පති න විකම්පති; අවිකම්පමානස්ස පුග්ගලස්ස 'සදිසොහමස්මී'ති වා 'සෙය්‍යොහමස්මී'ති වා 'හීනො හමස්මී'ති වා; න තස්ස හොතීති න මය්හං හොතීති – තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොති.

තෙනාහ භගවා:

"සමො විසෙසී උදවා නිහීනො
යො මඤ්ඤති සො විවදෙථ තෙන,
තීසු විධාසු අවිකම්පමානො
සමො විසෙසීති න තස්ස හොතී"ති.

### 9 - 9

සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය
මුසාති වා සො විවදෙථ කෙන,
යස්මිං සමං විසමං චාපි නත්ථි
ස කෙන වාදං පටිසංයුජෙය්‍ය[2].

1. අධිචිණ්ණන්තෙ - මු II. මජසං. 2. පටිසඤ්ඤුජෙය්‍ය - මනුප.

## 9 - 8

යමෙක් '(මම) සම වෙමි, හෝ විශිෂ්ට වෙමි, හෝ නොහොත් හීන වෙමි' මාන කෙරේ නම්, හෙතෙම ඒ මානයෙන් හෝ දෘෂ්ටියෙන් හෝ පුද්ගලයා සමග හෝ විවාද කරන්නේ යැ. (යමෙක් ඒ) ත්‍රිවිධ මානයෙහි නො සැලෙනුයේ වේ නම්, ඒ මට 'සම වෙමි හෝ විශිෂ්ට වෙමි' (මානය) නො වේ.

**සමො විසෙසි උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙන**– 'මම සදෘශ වෙමි' හෝ 'මම ශ්‍රේෂ්ඨ වෙමි' හෝ 'මම හීන වෙමි' හෝ යමෙක් හඟනේ නම් හෙතෙම ඒ මානයෙන් හෝ ඒ දෘෂ්ටියෙන් හෝ 'ඒ පුද්ගලයා සමග හෝ කලහ කරන්නේ යැ, ඩබර කරන්නේ යැ, විග්‍රහ කරන්නේ යැ, විවාද කරන්නේ යැ, අරගල කරන්නේ යැ: 'තෙපි මේ ධර්මවිනය නො දන්නහු යැ, මේ ධර්මවිනය මම දනිමි, කිමැ තෙපි මේ ධර්මවිනය දන්නහු ද? තෙපි වරදවා පිළිපන්නහු යැ, මම සම්‍යක්-ප්‍රතිපන්නයෙමි, මාගේ බස අර්ථසංහිත යැ, තාගේ බස අනර්ථසංහිත යැ' පළමු කියැයුත්ත පසුව කීයෙහි, පසුව කියැයුත්ත පළමු කීයෙහි, තා පුහුණු කළ දෙය නැවැතිණ, තට වාදාරෝපණය කරන ලද, නිග්‍රහ කරන ලදුයෙහි, වාදයෙන් ගැලැවෙනු සඳහා පිළිතුරු සොයා යව, ඉදින් පොහොසත්හි නම් (තමා) මුදා ගනැ'යි (විවාද කරන්නේ නුයි) 'සමො විසෙසී උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙන' යනු වේ.

**තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොති**– යමක්හට තෙල ත්‍රිවිධමානයෝ ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු (මාර්ගයෙන්) නසන ලද්දහු උපතට අභව්‍ය වූවාහු නුවණ ගින්නෙන් දවන ලද්දහු වෙත් ද; හෙතෙම තුන් මානයන්හි නො සැලෙයි, වෙසෙසින් නො සැලෙයි, නො සැලෙන පුද්ගලයාහට 'මම සදෘශ වෙමි' හෝ 'මම ශ්‍රේෂ්ඨ වෙමි' හෝ 'මම හීන වෙමි' හෝ– **න තස්ස හොති** – මට නො වේ නුයි 'තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**සමො විසෙසි -පෙ- න තස්ස හොති**"යි.

## 9 - 9

ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙම (මෙය මැ) සැබැවැයි කවර වස්තුවක් (හෝ කුමන කරුණෙකින්) කියන්නේ ද, හෙතෙම (තා කියන්නේ) මෘෂා යැයි හෝ කවර මානයකින් (දෘෂ්ටියකින් හෝ පුද්ගලයකු හා සමග) විවාද කරන්නේ ද, යමක්හු කෙරෙහි සමමානය හෝ විෂමමානය හෝ නැද්ද, හෙතෙම කවර මානයකින් වාදයෙහි යෙදෙන්නේ ද.

**සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍යා**ති – ‘බ්‍රාහ්මණො’ති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො –පෙ– අසිතො තාදී[1] පවුච්චතෙ ස බ්‍රහ්මා; **සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍යා**ති ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති බ්‍රාහ්මණො කිං වදෙය්‍ය? කිං කථෙය්‍ය? කිං භණෙය්‍ය? කිං වොහරෙය්‍ය? ‘අසස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති බ්‍රාහ්මණො කිං වදෙය්‍ය? කිං කථෙය්‍ය? කිං භණෙය්‍ය? කිං දීපයෙය්‍ය? කිං වොහරෙය්‍ය වාති ‘සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය.’

**මුසාති වා සො විවදෙථ කෙනා**ති – බ්‍රාහ්මණො ‘මය්හංව සච්චං, තුය්හං මුසා’ති කෙන මානෙන කාය දිට්ඨියා කෙන වා පුග්ගලෙන කලහං කරෙය්‍ය? භණ්ඩනං කරෙය්‍ය? විග්ගහං කරෙය්‍ය? විවාදං කරෙය්‍ය? මෙධගං කරෙය්‍ය: ‘න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි –පෙ– නිබ්බෙඨෙහි[2] වා සචෙ පහොසී’ති – මුසාති වා සො විවදෙථ කෙන.

**යස්මිං සමං විසමං වාපි නත්ථී**ති – ‘යස්මි’න්ති යස්මිං පුග්ගලෙ අරහන්තෙ ඛීණාසවෙ ‘සදිසොහමස්මී’ති මානො නත්ථි, ‘සෙය්‍යොහමස්මී’ති අතිමානො නත්ථි; ‘හීනොහමස්මී’ති ඔමානො නත්ථි, න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති – යස්මිං සමං විසමං වාපි නත්ථි.

**ස කෙන වාදං පටිසංයුජෙය්‍යා**ති – සො කෙන මානෙන කාය දිට්ඨියා කෙන වා පුග්ගලෙන වාදං පටිසංයුජෙය්‍ය, පටිචරෙය්‍ය, කලහං කරෙය්‍ය, භණ්ඩනං කරෙය්‍ය, විග්ගහං කරෙය්‍ය, විවාදං කරෙය්‍ය, මෙධගං කරෙය්‍ය: ‘න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි –පෙ– නිබ්බෙඨෙහි වා සචෙ පහොසී’ති – ස කෙන වාදං පටිසංයුජෙය්‍ය.

තෙනාහ භගවා:

“සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය
මුසාති වා සො විවදෙථ කෙන,
යස්මිං සමං විසමං වාපි නත්ථි
ස කෙන වාදං පටිසංයුජෙය්‍යා”ති.

## 9 – 10

ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න[3] විග්ගය්හ ජනෙන කයිරා[4].

---

1. අයසිතො අතාදි – ස්‍යා. 2. නිබ්බෙඨයි – ස්‍යා. මජසං.
1. කථන්නු. – මු. II. 2. කාරියා – මජසං.

**සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය** – 'බ්‍රාහ්මණො' යනු: සප්තධර්ම කෙනකුත් බාහිත වන බැවින් බ්‍රාහ්මණ යැ...(4-3 නිද්දේශය) **සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය** – 'ශාශ්වත යැ ලොකය, මේ මැ සැබව, අන්‍යය මොස යැ' යි බ්‍රාහ්මණ තෙමේ කිම කියන්නේ ද ? පවසන්නේ ද ? බණන්නේ ද ? දක්වන්නේ ද? කිම වහරන්නේ ද ? 'අශාශ්වත යැ ලොකය...සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ මැ සැබව, අන්‍යය මොස යැ'යි බ්‍රාහ්මණ තෙමේ කිම පවසන්නේ ද ? කියන්නේ ද ? බණන්නේ ද ? දක්වන්නේ ද කිම වහරන්නේ ද ? එයින් 'සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය' යනු වේ.

**මුසාති වා සො විවදෙථ කෙන** – බාහිතපාපී බ්‍රාහ්මණ තෙම 'මා කියන්නක් මැ සැබව තාගේ බස මෘෂා යැ'යි කවර මානයකින් කවර දෘෂ්ටියකින් හෝ කවර පුඟුලක්හු සමග කලහ කරන්නේ ද, ඩබර විග්‍රහ – විවාද – අරගල කරන්නේ ද; 'තෝ මේ ධර්මවිනය නො දන්නෙහි..., ඉදින් පොහොනෙහි නම් තමා මුදාගනැ'යි 'මුසාති වා සො විවදෙථ කෙන' යනු වේ.

**යස්මිං සමං විසමං වාපි නත්ථි** – 'යස්මිං' යනු: යම් අර්හත් ක්ෂීණාස්‍රව පුද්ගලයක්හු කෙරෙහි 'මම් සදෘශ වෙමි' මානයෙක් නැත, මම් ශ්‍රෙෂ්ඨයෙමි අතිමානයෙක් නැත, 'මම් හීනයෙමි' අවමානයෙක් නැත, නො වෙයි විද්‍යමාන නො වෙයි නො ලැබෙයි, ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ වෙසෙසින් නසන ලද දුරලන ලද අභව්‍යොත්පත්තික යැ ඥානාග්නින් දග්ධ නුයි 'යස්මිං සමං විසමං වා පි නත්ථි' යනු වේ.

**ස කෙන වාදං පටිසංයුජෙය්‍ය** – හෙතෙම කවර මානයකින් කවර දෘෂ්ටියකින් හෝ කවර පුද්ගලයක්හු සමග වාදයෙහි යෙදෙන්නේ ද, හැසිරෙන්නේ ද, කලහ කරන්නේ ද, ඩබර කරන්නේ ද, විග්‍රහ කරන්නේ ද, විවාද කරන්නේ ද, අරගල කරන්නේ ද: 'තෙපි මේ ධර්මවිනය නො දන්නවු යැ...ඉදින් සමර්ථයවු නම් තමා මුදාලව'යි 'ස කෙන වාදං පටිසංයුජෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සච්චන්ති සො බ්‍රාහ්මණො -පෙ- වාදං පටිසංයුජෙය්‍ය"**යි.

## 9 - 10

(රූපනිමිත්තාදි නිකෙතයෙහි නො හැසිරෙන හෙයින්) අනිකෙතසාරී වූ ක්ෂීණාස්‍රව මුනි තෙම රූපවස්තුවාදි විඥානගොචරය – ඔකය හැරපියා ගම්හි ගිහිසන්ථවයන් නො කෙරෙමින් කාමයන් කෙරෙන් වෙන් වූයේ (මතු අත්බව්හි තෘෂ්ණාවශයෙන්) වච්චය පෙරවූ නො කරනුයේ ජනයා සමග විග්‍රාහිකකථාව නො කරන්නේ යී.

"අථ ඛො හලිද්දකානි ගහපති යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො හලිද්දකානි ගහපති ආයස්මන්තං මහාකච්චානං එතදවොච: 'වුත්තමිදං භන්තෙ කච්චාන, භගවතා අට්ඨකවග්ගියෙ[1] මාගන්දියපඤ්හෙ:

1. "ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න[2] විග්ගය්හ ජනෙන කයිරා''ති.[ස]

ඉමස්ස නු ඛො භන්තෙ කච්චාන! භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො?''ති.

"රූපධාතු ඛො ගහපති, විඤ්ඤාණස්ස ඔකො. රූපධාතුරාගවිනිබන්ධඤ්ච[3] පන විඤ්ඤාණං 'ඔකසාරී'ති වුච්චති. වෙදනාධාතු ඛො ගහපති – සඤ්ඤාධාතු ඛො ගහපති – සඞ්ඛාරධාතු ඛො ගහපති, විඤ්ඤාණස්ස ඔකො, සඞ්ඛාරධාතුරාගවිනිබන්ධඤ්ච පන විඤ්ඤාණං 'ඔකසාරී'ති වුච්චති. එවං ඛො ගහපති ඔකසාරී හොති.

කථඤ්ච ඛො ගහපති අනොකසාරී හොති? රූපධාතුයා ඛො ගහපති යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයුපාදානා[4] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[5] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො 'අනොකසාරී'ති වුච්චති. වෙදනාධාතුයා ඛො ගහපති – සඤ්ඤාධාතුයා ඛො ගහපති – සඞ්ඛාරධාතුයා ඛො ගහපති – විඤ්ඤාණධාතුයා ඛො ගහපති, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයුපාදානා[3] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො 'අනොකසාරී'ති වුච්චති. එවං ඛො ගහපති අනොකසාරී හොති.

කථඤ්ච ගහපති, නිකෙතසාරී හොති? රූපනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති 'නිකෙතසාරී'ති වුච්චති. සද්දනිමිත්ත-ගන්ධනිමිත්ත – රසනිමිත්ත – ඵොට්ඨබ්බනිමිත්ත – ධම්මනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති 'නිකෙතසාරී'ති වුච්චති. එවං ඛො ගහපති, නිකෙතසාරී හොති.

1. වග්ගිකෙ - සහා. මජසං. 2. කථං - සීමු. II.
3. විනිබන්ධඤ්ච - සහා. මජසං. 4. උපායුපාදනා - සබ්බත්ථ. 5. තාලවත්ථුකතා - ස.
ස. සුත්තනිපාත - මාගන්දියසුත්ත ඛන්ධසංයුත්ත - නකුලපිතුවග්ග.

"එකල්හි හලිද්දකානි ගෘහපති තෙම ආයුෂ්මත් මහාකාත්‍යායනයන් වහන්සේ සමීපයට එළැඹ, ආයුෂ්මත් මහාකාත්‍යායනයන් වහන්සේට පසග පිහිටුවා වැඳ එකත්පස් වැ හුන්නේය. එකත්පස් වැ හුන් හලිද්දකානි ගෘහපති තෙම ආයුෂ්මත් මහාකාත්‍යායනයන් වහන්සේට මෙපවත් කීය: 'ස්වාමීනි, කාත්‍යායනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටක-වර්ගයෙහි වූ මාගන්දියප්‍රශ්නයෙහි මේ වදාරන ලද්දේය:

1. 'රූපවස්ත්වාදි විඥානයාගේ අවකාශ සඞ්ඛ්‍යාත ඔකය දුරු කොට අනිකේතසාරී වූ ක්ෂීණාස්‍රව මුනි තෙම ගම්හි ගිහීන් හා සන්ථව නො කෙරෙමින් කාමයන් කෙරෙන් වෙන්වූයේ වට්ටය පෙරටු කොට නො සිටියේ ජනයා සමග විග්‍රාහික කථාව නො කරන්නේය'යි.

ස්වාමීනි, කාත්‍යායනයන් වහන්ස, භාග්‍යවතුන් විසින් සැකෙවින් වදාළ මේ භාෂිතයාගේ අර්ථය කෙසේ නම් විස්තරයෙන් දතයුත්තේ ද"යි.

'ගෘහපතිය, රූපස්කන්ධය (කර්ම) විඥානයාගේ ඔක (=ප්‍රත්‍යය) වෙයි, තවද රූපධාතුයෙහි රාගයෙන් බැඳුණු කර්මවිඥානය ඔකසාරී (-ආලයෙහි හැසිරෙන සුලු) යැයි කියනු ලැබෙයි. ගෘහපතිය, වේදනාස්කන්ධය... සංඥාස්කන්ධය...ගෘහපතිය සංස්කාරස්කන්ධය කර්මවිඥානයාගේ ඔකය වෙයි, තවද සංස්කාරස්කන්ධයෙහි රාගයෙන් බැඳුණු කර්මවිඥානය 'ඔකසාරී' යයි කියනු ලැබේ. මෙසෙයින් ගෘහපතිය ඔකසාරී වේ.

තවද ගෘහපතිය, කිසෙයින් 'අනොකසාරී' වෙයි ද යත්? ගෘහපතිය, රූපස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් යම් (තෘෂ්ණා දෘෂ්ටි සඞ්ඛ්‍යාත) උපය කෙනෙක් හා (කාමාදි) උපාදාන කෙනෙක් අකුශල චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවේශ අනුශය වූවාහු ද ඔවුහු තථාගතයන් විසින් ප්‍රහීණ කරන ලද්දාහු උපුත්මුල් කළාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත් ද, එහෙයින් සම්මාසම්බුදුහු 'අනොකසාරී' යයි කියනු ලැබෙති. ගෘහපතිය, වේදනාස්කන්ධයෙහි... සංඥාස්කන්ධයෙහි...සංස්කාරස්කන්ධයෙහි...ගෘහපතිය, විඥානස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් යම් උපය හා උපාදාන කෙනෙක් අකුසල් සිතට ආධාර නිවාස අනුශය වූවාහු නම් ඔවුහු සම්මාසම්බුදුන් විසින් ප්‍රහාණය කරන ලද්දාහු උපුටාහල මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත් ද, එහෙයින් තථාගතයෝ 'අනොකසාරී' යයි කියනු ලැබෙත්. මෙසෙයින් ගෘහපතිය, අනොකසාරී වේ.

තවද ගෘහපතිය, කිසෙයින් නිකේතසාරී වෙයි ද යත්? රූපනිමිත්ත සඞ්ඛ්‍යාත නිකේතයෙහි (-රූප නමැති නිවාසයෙහි) පැතිරීම හා බැඳීම හෙතු කොටගෙන 'නිකේතසාරී' යයි කියනු ලැබෙයි. ශබ්දනිමිත්ත... ගන්ධනිමිත්ත...රසනිමිත්ත . ස්ප්‍රෂ්ටව්‍යනිමිත්ත...ධර්මනිමිත්ත නමැති නිවාසයෙහි විසාරවිනිබන්ධ (-පැතිරීම ත් බැඳීම ත්) හෙතු කොටගෙන 'නිකේතසාරී යයි කියනු ලැබේ. මෙසෙයින් ගෘහපතිය, නිකේතසාරී (-අරමුණෙහි වෙසෙනුයේ) වේ.

“කථඤ්ච ගහපති, අනිකෙතසාරී හොති? රූපනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති, තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො ‘අනිකෙතසාරී’ති වුච්චති. සද්දනිමිත්ත – ගන්ධනිමිත්ත – රසනිමිත්ත – ඵොට්ඨබ්බනිමිත්ත – ධම්මනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති, තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[1] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො ‘අනිකෙතසාරී’ති වුච්චති. එවං ඛො ගහපති, අනිකෙතසාරී හොති.

කථඤ්ච ගහපති, ගාමෙ සන්ථවජාතො හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු ගිහීහි සංසට්ඨො විහරති: සහනන්දී සහසොකී, සුඛිතෙසු සුඛිතො, දුක්ඛිතෙසු දුක්ඛිතො, උප්පන්නෙසු කිච්චකරණීයෙසු අත්තනා වොයොගං ආපජ්ජති. එවං ඛො ගහපති! ගාමෙ සන්ථවජාතො හොති.

කථඤ්ච ගහපති, ගාමෙ න සන්ථවජාතො හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු ගිහීහි අසංසට්ඨො විහරති: න සහනන්දී න සහසොකී න සුඛිතෙසු සුඛිතො, න දුක්ඛිතෙසු දුක්ඛිතො, උප්පන්නෙසු කිච්චකරණීයෙසු න අත්තනා වොයොගං ආපජ්ජති. එවං ඛො ගහපති! ගාමෙ න සන්ථවජාතො හොති.

කථඤ්ච ගහපති, කාමෙහි අරිත්තො හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු කාමෙසු අවීතරාගො හොති අවිගත[2]ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. එවං ඛො ගහපති, කාමෙහි අරිත්තො හොති

කථඤ්ච ගහපති, කාමෙහි රිත්තො හොති? ඉධ ගහපති එකච්චො භික්ඛු කාමෙසු වීතරාගො හොති විගත[3]ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. එවං ඛො ගහපති! කාමෙහි රිත්තො හොති.

කථඤ්ච ගහපති, පුරෙක්ඛරානො හොති? ඉධ ගහපති, එකච්චස්ස භික්ඛුනො එවං හොති: ‘එවංරූපො සියං අනාගතමද්ධාන’න්ති. තත්ථ නන්දිං සමන්නානෙති[4] ‘එවංවෙදනො සියං – එවං සඤ්ඤො සියං – එවංසඞ්ඛාරො සියං – එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධාන’න්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවං ඛො ගහපති, පුරෙක්ඛරානො හොති.

1. තාලවත්ථුකතා – ස.
2. අවීත – සයා. මජසං. PTS.
3. වීත – සයා. මජසං. PTS.
4. සමන්නාගමෙති – සයා. PTS.

තවද ගෘහපතිය, කිසෙයින් **අනිකෙතසාරී** වේ ද? යත්: ගෘහපතිය රූපනිමිත්තනිකෙතයෙහි (කෙලශයන්ගේ) විසාරවිනිබන්ධයෝ තථාගතයන් විසින් ප්‍රහීණයෝ යැ, නැසූ මුල් ඇත්තෝ යැ, තාලවස්තුවක් මෙන් කරන ලද්දේ යැ, නසන ලද්දේ යැ, මතු නූපදනා පියවි ඇත්තෝ යැ. එහෙයින් සම්මාසම්බුද්ධහු ‘අනිකෙතසාරී’ යයි කියනු ලැබෙති ශබ්දනිමිත්ත... ගන්ධනිමිත්ත....රසනිමිත්ත ..ස්ප්‍රෂ්ටව්‍යනිමිත්ත.....ගෘහපතිය, ධම්මනිමිත්තනිකෙතයෙහි විසාරවිනිබන්ධයෝ තථාගතයන් විසින් ප්‍රහීණ කරන ලද්දහුය... මත්තෙහි නූපදනා සවභාව ඇත්තාහුය. එහෙයින් සම්මාසම්බුද්ධහු අනිකෙතසාරී යයි කියනු ලැබෙත්. මෙසෙයින් ගෘහපතිය, අනිකෙතසාරී වේ

තවද ගෘහපතිය, කිසෙයින් ග්‍රාමයෙහි **සන්ථවජාත** වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් ගෘහීන් හා සංසෘෂ්ට වැ වෙසෙයි: එක් වැ සතුටු වෙයි, එක් වැ ශොක ඇත්තේ වෙයි, (දායකයන්) සුඛිත කල්හි (ගෘහශ්‍රිත සැපයෙන්) සුඛිත වෙයි, දුකට පැමිණි කල්හි දුකට පැමිණෙයි, උපන් කටයුතු ඇතිකල්හි තමා උපයොගයට (-කළ යුතුබවට) පැමිණෙයි. මෙසෙයින් ගෘහපතිය, ගම්හි හටගත් සන්ථව ඇත්තේ වේ.

තවද ගෘහපතිය, කෙසේ ගම්හි **නූපන් ගිහිසන්ථව** ඇත්තේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් ගිහීන් හා අසංසෘෂ්ට වූයේ වෙසෙයි: සමග සතුටු නො වන්නේ සමග ශොකී නො වන්නේ සුඛිත කල්හි සුඛිත නො වූයේ දුඃඛිත කල්හි දුඃඛිත නො වූයේ උපන් කටයුතු ඇති කල්හි තමා උපයොගයට නො පැමිණෙයි. මෙසෙයින් ගෘහපතිය, ගම්හි නූපන් ගිහිසන්ථව ඇත්තේ වේ.

යළි ගෘහපතිය, කීසෙයින් කාමයන් කෙරෙන් නො සිස් වූයේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි කිසි මහණෙක් වස්තුකාමයන්හි නො පහ වූ රාග ඇතියේ අවිගත වූ කාමච්ඡන්‍ද ඇතියේ අවිගත වූ ප්‍රෙම ඇතියේ අවිගත වූ පිපාසා ඇතියේ අවිගත වූ පරිදාහ ඇතියේ අවිගත වූ කාම-තෘෂ්ණා ඇතියේ වෙයි. මෙසෙයින් ගෘහපතිය, කෙලශකාමයන් කෙරෙන් අතුච්ඡ වේ.

තවද ගෘහපතිය, කිසෙයින් කාමයන් කෙරෙන් **රික්ත** (-සිස්) වූයේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි කිසි මහණෙක් වස්තුකාමයන් කෙරෙහි පහවැගිය රාග ඇත්තේ විගත වූ කාමච්ඡන්‍ද ඇත්තේ විගත වූ ප්‍රෙම ඇතියේ විගත වූ පිපාසා ඇතියේ විගත වූ පරිදාහ ඇතියේ විගත වූ තෘෂ්ණා ඇතියේ වෙයි. මෙසෙයින් ගෘහපතිය, කෙලශකාමයන් කෙරෙන් රික්ත වූයේ වේ.

තවද ගෘහපතිය, කිසෙයින් වට්ටය පෙරටු කරන්නේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් හට මෙබඳු සිතෙක් වෙයි: ‘අනාගතකාලයෙහි මෙබඳු රූ ඇතියෙම් වෙම්වා’යි එහි තෘෂ්ණාව පිහිටුවයි මෙබඳු සැප වේදනා ඇතියෙම්...මෙබඳු සංඥා ඇතියෙම් ..මෙබඳු සංස්කාර ඇතියෙම්...අනාගතකාලයෙහි මෙබඳු විඥාන ඇතියෙම් වෙම් වා’යි එහි ප්‍රාර්ථනාව පිහිටුවයි. මෙසෙයින් ගෘහපතිය, වට්ටය පෙරටු කරනුයේ වේ.

කථඤ්ච ගහපති, **අපුරෙක්ඛරාණො** හොති? ඉධ ගහපති, එකච්චස්ස භික්ඛුනො එවං හොති: 'එවංරූපො සියං අනාගතමද්ධාන'න්ති න තත්ථ නන්දිං සමන්නානෙති. 'එවංවෙදනො සියං – එවංසඤ්ඤො සියං – එවංසඞ්ඛාරො සියං – එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධාන'න්ති න තත්ථ නන්දිං සමන්නානෙති. එවං ඛො ගහපති, අපුරෙක්ඛරානො හොති.

කථඤ්ච ගහපති, කථං විග්ගය්හ ජනෙන කත්තා හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු එවරූපං කථං කත්තා හොති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. එවං ඛො ගහපති, කථං විග්ගය්හ ජනෙන කත්තා හොති.

කථඤ්ච ගහපති, කථං න විග්ගය්හ ජනෙන කත්තා හොති? ඉධ ගහපති එකච්චො භික්ඛු න එවරූපං කථං කත්තා හොති: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. එවං ඛො ගහපති, කථං න විග්ගය්හ ජනෙන කත්තා හොති. ඉති ඛො ගහපති, යන්තං වුත්තං භගවතා **අට්ඨකවග්ගිකෙ මාගන්දිය පඤ්හෙ:**

'ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා'ති.

ඉමස්ස ඛො ගහපති, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො''ති.[a]

''ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා''ති.

## 9 – 11

යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ
න තානි උග්ගය්හ වදෙය්‍ය[1] නාගො,
එලම්බුජං කණ්ටකං වාරිජං[2] යථා
ජලෙන පඞ්කෙන ච නූපලිත්තං.
එවං මුනී සන්තිවාදො අගිද්ධො
කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො.

**යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙති** – 'යෙහී'ති යෙහි දිට්ඨිගතෙහි; **විවිත්තොති** කායදුච්චරිතෙන රිත්තො විවිත්තො පවිවිත්තො; වචීදුච්චරිතෙන – මනොදුච්චරිතෙන – රාගෙන -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි රිත්තො විවිත්තො පවිවිත්තො; **විචරෙය්‍යාති** විචරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය; **ලොකෙති** මනුස්සලොකෙ -පෙ- ආයතනලොකෙති 'යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ.'

---

a. ඛන්ධසංයුත්ත - නකුලපිතුවග්ග.

1. චරෙය්‍ය - මනුප. 2. කණ්ටකවාරිජං - මජසං.

තවද ගෘහපතිය, කිසෙයින් වට්ටය නො පෙරවූ කරනුයේ වේ ද ? යත්: ගෘහපතිය, මේ සස්නෙහි ඇතැම් මහණෙක් හට මෙසේ සිතෙක් වෙයි: 'අනාගතකාලයෙහි මෙබඳු රූ ඇතියෙම් වෙම්ව'යි එහි ප්‍රාර්ථනාව නො පිහිටුවයි. මෙබඳු වේදනා ඇතියෙම්...මෙබඳු සංඥා ඇතියෙම්...මෙබඳු සංස්කාර ඇතියෙම්...මෙබඳු විඥාන ඇතියෙම් වෙම්ව'යි එහි ප්‍රාර්ථනාව නො පිහිටුවයි. මෙසෙයින් ගෘහපතිය, සසරවට නො පෙරවූ කරනුයේ වේ.

තවද ගෘහපතිය, කිසෙයින් ජනයා සමග විග්‍රාහිකකථාව කරන්නේ වේ ද ? යත්: ගෘහපතිය, මේ සස්නෙහි ඇතැම් මහණෙක් මෙබඳු විවාද-කථාව කරන්නේ වෙයි: 'තෙපි මේ ධම්විනය නො දන්නවූ යෑ...ඉදින් සමර්ථ වූවහු නම් මිදෙව'යි. මෙසෙයින් ගෘහපතිය, ජනයා සමග විග්‍රාහික කථාව කරන්නේ වෙයි.

තවද ගෘහපතිය, කිසෙයින් ජනයා සමග විග්‍රහ නො කරන්නේ වේ ද ? යත්: ගෘහපතිය, මේ සස්නෙහි ඇතැම් මහණෙක් මෙබඳු විවාදකථාව නො කරන්නේ වෙයි: 'තෙපි මේ ධම්විනය නො දන්නවූ යෑ......ඉදින් පොහොනවූ නම් (තමං දෙසින්) මුදාගනුවයි.' මෙසෙයින් ගෘහපතිය, ජනයා සමග විග්‍රාහික කථාව නො කරන්නේ වේ. ගෘහපතිය, මෙසේ භාග්‍යවතුන් විසින් අෂ්ටකවර්ගයෙහි වූ මාගන්දියප්‍රශ්නයෙහි **'ඔකං පහාය -පෙ- න විග්ගය්හ ජනෙන කයිරා'**යි යමක් වදාරන ලද්දේ නම්, ගෘහපතිය, භාග්‍යවත් බුදුන් විසින් සැකෙවින් වදාරන ලද මේ දෙශනාවෙහි විස්තරාර්ථය මෙසේ දතයුත්තේය'යි.

එයින් වදාළහ බුදුහු:

**"ඔකං පහාය -පෙ- න විග්ගය්හ ජනෙන කයිරා"**යි.

## 9 – 11

ක්ෂීණාස්‍රව නාග තෙම යම් දෘෂ්ටිගතාදියෙකින් වෙන් වූයේ ලොවැ හැසිරෙන්නේ ද, (හෙතෙම) ඒ දෘෂ්ටිගතයන් දැඩි වැ ගෙන නො කියන්නේ යෑ. එල සඞ්ඛ්‍යාත ජලයෙහි උපන් කටු සහිත දඬු ඇති පියුම දියෙන් හා කලලින් යම්සේ නො තැවැරුණේ ද, එසෙයින් අධ්‍යාත්මශාන්තිය ප්‍රකාශ කරන තෘෂ්ණා රහිත වූ ක්ෂීණාස්‍රව මුනි තෙම කාමයෙහි ද ලොකයෙහි ද නො ඇලුණේ වේ.

**යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ** –'යෙහි' යනු: යම් දෘෂ්ටිගතයන් ගෙන්; **විවිත්තො** – කායදුශ්චරිතයෙන් සිස් වූයේ වෙන් වූයේ ඉතා වෙන් වූයේ වාග්දුශ්චරිතයෙන්...මනොදුශ්චරිතයෙන්......රාගයෙන්...සියලු අකුශලාභි-සංස්කාරයන් කෙරෙන් රිත්ත – විවිත්ත – ප්‍රවිවිත්ත වූයේ; **විචරෙය්‍ය**– හැසිරෙන්නේය වෙසෙන්නේය ඉරියවු පවත්වන්නේය, රැකෙන්නේය යැපෙන්නේය යාපනය වන්නේය; **ලොකෙ** – මිනිස් ලොවැ...ආයතන-ලොකයෙහි නුයි 'යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ' යනු වේ.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගොති** – 'නාගො'ති ආගුං න කරොතීති නාගො, න ගච්ඡතීති නාගො, නාගච්ඡතීති නාගො. කථං ආගුං න කරොතීති නාගො? ආගු වුච්චන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා[1] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණීයා.

1. "ආගුං න කරොති කිඤ්චි ලොකෙ (සභියාති භගවා)
සබ්බසංයොගෙ විසජ්ජ බන්ධනානි,
සබ්බත්ථ න සජ්ජති විමුත්තො
නාගො තාදී පවුච්චතෙ[2], තථත්තා."[a]

එවං ආගුං න කරොතීති නාගො. කථං න ගච්ඡතීති නාගො? න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයති. එවං න ගච්ඡතීති – නාගො. කථං නාගච්ඡතීති නාගො? සොතාපත්තිමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසා න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡති.[3] සකදාගාමිමග්ගෙන – අනාගාමිමග්ගෙන – අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡති. එවං නාගච්ඡතීති – නාගො.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගොති** – නාගො න තානි දිට්ඨිගතානි ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපයෙය්‍ය වොහරෙය්‍ය, සස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපයෙය්‍ය වොහරෙය්‍යාති – 'න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො.'

**එලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තන්ති** – 'එලං' වුච්චති උදකං. 'අම්බුජං' වුච්චති පදුමං. '**කණ්ටකො**' වුච්චති ඛරදණ්ඩො. '**වාරි**' වුච්චති උදකං. '**වාරිජං**' වුච්චති පදුමං වාරිසම්භවං. '**ජලං**' වුච්චති උදකං. '**පඞ්කො**' වුච්චති කද්දමො. යථා පදුමං වාරිජං වාරිසම්භවං ජලෙන ච පඞ්කෙන ච න ලිප්පති, න සංලිප්පති[4] නූපලිප්පති, අලිත්තං අසංලිත්තං, අනුපලිත්තන්ති – "එලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තං."

1. සදරා – ස. 2. වුච්චතෙ – සං, PTS.
3. කිලෙසා පුනෙන්ති, න පච්චෙන්ති, න පච්චාගච්ඡන්ති – මු. I.
4. උපලිම්පති – මු. II. සංලිම්පති – ස. a. සුත්තනිපාත – සභියසුත්ත.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො** – ‘නාගො’ යනු: පව් නො කෙරේ නුයි ‘නාග’ යැ (අගතියට) නො යේ නුයි ‘නාග’ යැ (පුහුත් කෙලෙසුන් කරා) නො පැමිණේ නුයි ‘නාග’ යැ. කිසෙයිත් පව් නො කරනුයෙන් නාග වෙයි යත්: පීඩාකර වූ පුනර්භවය දෙන්නා වූ දරථ සහිත වූ දුඃඛ විපාක උපදවන මත්තෙහි ජාතිජරාමරණයන්ට ප්‍රත්‍යය වූ ලාමක අකුශල ධර්මයෝ ‘ආගු’ යයි කියනු ලැබෙත්.

1. (‘සභිය’යි බුදුහු මෙසේ වදාළහ:) යමෙක් ලොකයෙහි අල්පමාත්‍ර වූ ද පාපයක් නො කෙරේ නම් එබඳු වූයේ ‘නාග’ යයි කියනු ලැබෙයි. හෙතෙම කාමාදී සියලු යොගයන් ද සංයොජනභෙද වූ බන්ධනයන් ද හැරපියා ස්කන්ධාදී සියලු තැන්හි, කිසි සඞ්ගයෙකින් නො ඇලෙයි, ද්විවිධ විමුක්තියෙන් මිදුණේ ලාභාලාභාදියෙහි තාදී වූයේ ද වේ.

මෙසේ පව් නො කෙරේ නුයි ‘නාග’ යැ. කිසෙයිත් නො යේ නුයි නාග වෙයි යත්: ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, භයින් අගතියට නො යෙයි, රාගවශයෙන් නො යෙයි, ද්වෙෂවශයෙන් – මොහවශයෙන් – මානවශයෙන් දෘෂ්ටිවශයෙන් – ඖද්ධත්‍යවශයෙන් – විචිකිත්සාවශයෙන් – අනුශයවශයෙන් නො යෙයි, වර්ගී වූ ධර්මයන් ගෙන් නො යවනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො වහනු ලැබෙයි, නො හරිනු ලැබේ. මෙසේ නො යේ නුයි– ‘නාග’ යැ. කෙසේ නො ඒ නුයි ‘නාග’ නම් වෙයි යත්: සෝවාන්මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා පෙරළා නො එයි, පසු වැ නො එයි, ආපසු නො එයි. සැදෑගැමිමඟින්...අනාගැමිමඟින්...රහත්මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම්, ඒ කරා පෙරළා නො එයි පසු වැ නො එයි ආපසු නො එයි. මෙසේ නො ඒ නුයි ‘නාග’ නම්.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො** – නාග තෙමේ ඒ දෘෂ්ටිගතයන් නෙන ඔසොවා ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවෙශය කොට නො පවසන්නේය නො කියන්නේය නො බණන්නේය නො දක්වන්නේය නො වහරන්නේය. ‘ශාශ්වත යැ ලොකය...සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ සැබෑ, සෙස්ස මොඝ යැ’යි නො පවසන්නේය නො කියන්නේය නො බණන්නේය නො දක්වන්නේය නො වහරන්නේ නුයි ‘න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො’ යනු වේ.

**එලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තං** – ‘එලං’ යි දිය කියනු ලැබෙයි. ‘අම්බුජ’යි පියුම කියනු ලැබෙයි. ‘කණ්ටක’ යි රළු වූ දණ්ඩ කියනු ලැබෙයි. ‘වාරි’යි දිය කියනු ලැබෙයි. ‘වාරිජ’යි දියෙහි උපන් පියුම කියනු ලැබෙයි. ‘ජල’යි දිය කියනු ලැබෙයි. ‘පඞ්ක’යි කලල් කියනු ලැබේ. යම් සේ දියෙහි උපන් දියෙහි හටගත් පියුම දියෙන් හා කලලින් නො ඇලේ ද වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, නො ඇලුණේ වෙසෙසින් නො ඇලුණේ නො තැවැරුණේ නුයි ‘එලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තං’ යනු වේ.

**එවං මුනි සන්තිවාදො අගිද්ධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තොති** 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං; **මුනීති** මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි. **සන්තිවාදොති** සන්තිවාදො මුනි තාණවාදො ලෙණවාදො සරණවාදො අභයවාදො අච්චුතවාදො අමතවාදො නිබ්බානවාදොති - එවං මුනී සන්තිවාදො. **අගිද්ධොති** ගෙධො වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්ස සො ගෙධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අගිද්ධො. සො රූපෙ අගිද්ධො; සද්දෙ - ගන්ධෙ - රසෙ - ඵොට්ඨබ්බෙ - කුලෙ - ගණෙ - ආවාසෙ - ලාභෙ - යසෙ[1] පසංසාය - සුඛෙ - චීවරෙ - පිණ්ඩපාතෙ - සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ - කාමධාතුයා - රූපධාතුයා - අරූපධාතුයා - කාමභවෙ - රූපභවෙ - අරූපභවෙ - නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ - එකවොකාරභවෙ - චතුවොකාරභවෙ - පඤ්චවොකාරභවෙ අතීතෙ - අනාගතෙ - පච්චුප්පන්නෙ - දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගධිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො[2] වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො පටිනිස්සට්ඨගෙධො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛප්පටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති - එවං මුනී සන්තිවාදො අගිද්ධො.

**කාමෙ ච ලොකෙ ච අනූපලිත්තොති** - 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා; **ලොකෙති** අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ; 'ලෙපා'ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච -පෙ- අයං තණ්හාලෙපො -පෙ- අයං දිට්ඨිලෙපො. මුනි තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා කාමෙ ච ලොකෙ ච න ලිප්පති, න පලිප්පති, න උපලිප්පති. අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[3] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති - එවං මුනී සන්තිවාදො අගිද්ධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො.'

තෙනාහ භගවා:

"යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ
න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො
එලම්බුජං කණ්ටකං වාරිජං යථා
ජලෙන පඞ්කෙන ච නූපලිත්තං,
එවං මුනී සන්තිවාදො අගිද්ධො
කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො"ති.

---

1. යසො - මු. II. 2. අනජ්ඣාපන්නො - මු. II. 3. නිස්සතො - ස.

**එවං මුනි සන්තිවාදො අගෙධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො**- 'එවං' යනු: ඖපම්‍යසම්ප්‍රතිපාදනා යැ; **මුනි** - 'මොන'යි ඥානය කියනු ලැබෙයි...**සන්තිවාදො** - මුනි තෙම අධ්‍යාත්මශාන්තිය කියන්නේ යැ, ත්‍රාණවාද යැ ලෙනවාද යැ ශරණවාද යැ අභයවාද යැ අච්‍යුතවාද යැ අමෘතවාද යැ නිර්වාණවාද (=නිවන පවසා) නුයි 'එවං මුනි සන්තිවාදො' යනු වේ. **අගෙධො**- 'ගෙධ'යි තෘෂ්ණාව කියනු ලැබෙයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද, යමක්හු විසින් ඒ ගෙධ තෙමේ ප්‍රහීණ කරන ලද ද සිඳින ලද ද සන්හිඳුවන ලද ද දුරලන ලද ද, උපනට නුසුදුසු වූයේ නුවණගින්නෙන් දවන ලද ද, හෙතෙම 'අගිද්ධ'යි කියනු ලැබෙයි. හේ රූපයෙහි අගිද්ධ යැ ශබ්දයෙහි - ගන්ධයෙහි - රසයෙහි- ස්ප්‍රෂ්ටව්‍යයෙහි - කුලයා කෙරෙහි - ගණයා කෙරෙහි - ආවාසයෙහි - ලාභ- යශස් - ප්‍රශංසායෙහි - සුවයෙහි - චීවර - පිණ්ඩපාත - සෙනාසන - ගලාන - ප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙහි - කාමධාතුයෙහි - රූපධාතුයෙහි - අරූපධාතුයෙහි - කාම - රූප - අරූපභවයෙහි - නෛවසංඥා - සංඥාභවයෙහි - එකවොකාර - චතුවොකාර - පඤ්චවොකාරභවයෙහි -අතීත අනාගත - ප්‍රත්‍යුත්පන්නයෙහි - දෘෂ්ට ශ්‍රැත මූත විඥාතව්‍යධර්මයන්හි නො ගිජු වූයේ නො ගෙතුණේ මුසපත් නො වූයේ නො බැඳුණේ පහවූ තෘෂ්ණා ඇතියේ පහවගිය තෘෂ්ණා ඇතියේ ත්‍යක්ත වූ තෘෂ්ණා ඇතියේ වාන්ත (=වමනය කළ) තෘෂ්ණා ඇතියේ මුදන ලද තෘෂ්ණා ඇතියේ දුරැ ලූ තෘෂ්ණා ඇතියේ වීතරාග - විගතරාග - ත්‍යක්තරාග - වාන්තරාග - මුක්තරාග- ප්‍රහීණ රාග - ප්‍රතිනිසෘෂ්ටරාග වූයේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ (කයින් සිතින්) සුව විඳිනසුලු වූයේ ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත වැ වෙසේ නුයි 'එවං මුනී සන්තිවාදො අගෙධො' යනු වේ.

**කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො** - 'කාමා' යනු: උදාන හෙයින් කාමයෝ දෙදෙනෙකි:...මොහු කෙලශකාමයෝ යි කියනු ලැබෙත්. **ලොකෙ**- අපායලොකයෙහි මනුෂ්‍ය - දෙව - සකන්ධ - ධාතු - ආයතනලොකයෙහි; 'ලෙප' යනු: තෘෂ්ණාලෙපය ද දෘෂ්ටිලෙපය දැයි ලෙප දෙකෙකි...මුනි තෙම තෘෂ්ණාලෙපය හැර දෘෂ්ටිලෙපය දුරලා කාමයෙහි ද, ලොකයෙහි ද, නො ඇලෙයි වෙසෙසින් නො ඇලෙයි, නො තැවැරෙයි. අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ නික්මැගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ (අරමුණුවලින්) මිදුණු සිතින් යුක්ත වැ වෙසේ නුයි 'එවං මුනී සන්තිවාදෙ අගෙධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යෙසු විවිත්තො -පෙ- කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො"යි.

**9 - 12**

න වෙදගූ දිට්ඨියා න මුතියා
ස මානමෙති න හි තම්මයො[1] සො,
න කම්මුනා[2] නොපි සුතෙන නෙය්‍යො
අනූපනීතො ස[3] නිවෙසනෙසු.

**න වෙදගූ දිට්ඨියා න මුතියා ස මානමෙතීති** - 'නා'ති පටික්ඛෙපො. වෙදගූති 'වෙදං' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං, පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි. තෙහි වෙදෙහි ජාතිජරාමරණස්ස අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙණගතො ලෙණප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො අච්චුතප්පත්තො අමතගතො අමතප්පත්තො නිබ්බානගතො නිබ්බානප්පත්තො. වෙදානං වා අන්තං ගතොති වෙදගූ. වෙදෙහි වා අන්තං ගතොති වෙදගූ. සත්තන්නං ධම්මානං විදිතත්තා වෙදගූ: සක්කායදිට්ඨි විදිතා හොති, විචිකිච්ඡා විදිතා හොති, සීලබ්බතපරාමාසො විදිතො හොති, රාගො විදිතො හොති, දොසො විදිතො හොති, මොහො විදිතො හොති, මානො විදිතො හොති, විදිතා'ස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා[4] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණීයා.

1. "වෙදානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
සමණානං යානි'ධත්ථි[5] බ්‍රාහ්මණානං,
සබ්බ[6]වෙදනාසු වීතරාගො
සබ්බං[7]වෙදමතිච්ච වෙදගූ සො"ති a

**න දිට්ඨියාති** - තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි. සො දිට්ඨියා න යායති, න නීයති, න වුය්හති, න සංහරීයති, නපි තං දිට්ඨිගතං සාරතො පච්චෙති. න පච්චාගච්ඡතීති - න වෙදගූ දිට්ඨියා.

**න මුතියා ස මානමෙතීති** - මුතරූපෙන වා පරතොඝොසෙන වා මහාජනසම්මුතියා වා මානං නෙති, න උපෙති, න උපගච්ඡති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති - 'න වෙදගූ දිට්ඨියා න මුතියා 'ස මානමෙති'.

**න හි තම්මයො සොති** - න තණ්හාවසෙන න දිට්ඨිවසෙන තම්මයො හොති තප්පරමො තප්පරායණො; යතො තණ්හා ච දිට්ඨි ච මානො ච අස්ස පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[8] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා න තම්මයො හොති, න තප්පරමො, න තප්පරායණොති - න හි තම්මයො සො'.

---

1. සාවිමයො - මජුප. 2. කම්මනා - ස. 3. සො - සු.
4. සද්දර - ස. 5. යානීපත්ථි - මජසං. PTS. 6. සබ්බාසු - සු.
7. සබ්බං - සු. 8. තාලවත්ථුකතා - ස.
a. සුත්තනිපාත - සභිය සුත්ත.

## 9 – 12

සිවුමග නුවණට පැමිණි (මා වැනියෙක්) දෘෂ්ටියට (හෝ දෘෂ්ටියෙන්) යන්නේ නො වෙයි. හෙතෙම (මුතරූපාදි භේද වූ) මුතියෙනු දු මානයට නො පැමිණේ යි. ඒ (තෘෂ්ණා – දෘෂ්ටි විසින්) නො මැ තම්මය වෙයි. කර්මයෙන් හෝ ශ්‍රුතයෙන් හෝ නො ද පැමිණැවියැ යුත්තේ, වෙයි. හේ තෘෂ්ණාදෘෂ්ටිනිවෙසනයන්හි අනූපනීත වේ.

**න වේදගූ දිට්ඨියා න මුතියා ස මානමේති** – 'න' යනු: ප්‍රතික්ෂේප යැ. **වේදගූ** 'වේද'යි සතර මග නුවණ කියනු ලැබෙයි, ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රියය ප්‍රඥාබලය ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය විමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය යි. ඒ මාර්ගඥානවේදයන්ගෙන ජාතිජරාමරණයාගේ අන්තයට ගියේ අන්තයට පැමිණියේ කෙළවරට ගියේ කෙළවරට පැමිණියේ පර්යන්තයට ගියේ පර්යන්තයට පැමිණියේ අවසානයට ගියේ අවසානයට පැමිණියේ ත්‍රාණයට ගියේ ත්‍රාණයට පැමිණියේ ලෙනයට ගියේ ලෙනයට පැමිණියේ ශරණයට ගියේ ශරණයට පැමිණියේ අභයට ගියේ අභයට පැමිණියේ අච්‍යුතයට ගියේ අච්‍යුතයට පැමිණියේ අමෘතයට ගියේ අමෘතයට පැමිණියේ නිවනට ගියේ නිවනට පැමිණියේ නොහොත් වේදයන්ගේ අන්තයට ගියේ නුයි–'වේදගූ'යැ, වේදයන්ගෙන් අන්තයට ගියේ නුයි හෝ – 'වේදගූ' යැ. සප්තධර්මයන් විදිත හෙයින් 'වේදගූ' යැ: සත්කායදෘෂ්ටිය දන්නා ලද්දී වෙයි, විචිකිත්සාව– ශීලව්‍රතපරාමර්ශය – රාගය – ද්වේෂය – මෝහය – මානය විදිත වෙයි. කෙලෙසට කරුණු වූ පුනර්භවය දෙන්නා වූ දරථ සහිත වූ දුඃඛවිපාක ඇති අනාගතයෙහි ජාතිජරාමරණයට හේතු වූ ලාමක අකුශලධර්මයෝ ඔහු විසින් විදිත වූවාහු වෙත්.

1. ("සභිය, යී බුදුහු මෙසේ වදාළහ:) මාර්ගඥානවේදයට පැමිණි ඒ ක්ෂීණාස්‍රව තෙම මේ ලෝකයෙහි මහණබමුණන්ගේ ශාස්ත්‍ර සඞ්ඛ්‍යාත යම් වේද කෙනෙක් ඇත් ද ඒ සියල්ල (අනිත්‍යාදි වශයෙන්) විමසා (එහි ඡන්දරාගප්‍රහාණයෙන්) සියලු ශාස්ත්‍රවේදය ඉක්මැ සියලු වේදනාවන්හි වීතරාග වේ."

**න දිට්ඨියා** – ඔහු විසින් දෙසැට දිටුහු පහන ලද්දුහු සිඳුණා ලද්දුහු සන්හිඳුවන ලද්දුහු දුරලන ලද්දුහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දුහු වෙති;. හෙතෙම දෘෂ්ටිය විසින් නො යවනු ලැබෙයි; නො පමුණුවනු ලැබෙයි, නො වහනු ලැබෙයි, නො හරනු ලැබේ. ඒ දෘෂ්ටියට නො ද සාර හෙයින් පැමිණෙයි, නො පෙරළා ඒ නුයි 'න වේදගූ දිට්ඨියා' යනු වේ.

**න මුතියා ස මානමේති** – මුත (–ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය) රූපයෙන් හෝ පරතෝඝෝෂයෙන් හෝ මහජන සම්මුතියෙන් හෝ මානයට නො එයි නො පැමිණෙයි, නො එළැඹෙයි, නො ගනී, නො ඇලෙයි, නො පිවිසේ නුයි 'න වේදගූ න දිට්ඨියා න මුතියා ස මානමේති' යනු වේ.

**න හි තම්මයො සො** – තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් තන්මය නො වෙයි, තත්පරම තත්පරායණ නො වේ. යම් තැනක සිට තෘෂ්ණාව ත් දෘෂ්ටිය ත් මානය ත් ඔහු විසින් ප්‍රහීණ කරන ලද්දුහු උපුටා හළ මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දුහු අභාවය කරන ලද්දුහු මතු නූපදනා ස්වභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින් එය ප්‍රකෘති කොට ඇත්තේ නො වෙයි, තත්පරම නො වෙයි, තත්පරායණ නො වේ නුයි 'න හි තම්මයො සො' යනු වේ.

**න කම්මුනා නො'පි සුතෙන නෙය්‍යොති** – 'න කම්මුනා'ති පුඤ්ඤාභිසඞ්ඛාරෙන වා අපුඤ්ඤාභිසඞ්ඛාරෙන වා ආනෙඤ්ජාභිසඞ්ඛාරෙන වා න යායති, න නීයති, න වුය්හති, න සංහරීයතීති – න කම්මුනා; **නොපි සුතෙන නෙය්‍යොති** සුතසුද්ධියා වා පරතොඝොසෙන වා මහාජනසම්මුතියා වා න යායති, න නීයති, න වුය්හති, න සංහරීයතීති – න කම්මුනා නොපි සුතෙන නෙය්‍යො.

**අනූපනීතො ස නිවෙසනෙසූති** – 'උපයා'ති ද්වෙ උපයා: තණ්හා-උපයො ච දිට්ඨිඋපයො ච -පෙ- අයං තණ්හාඋපයො -පෙ- අයං දිට්ඨිඋපයො. තස්ස තණ්හාඋපයො පහීනො, දිට්ඨිඋපයො පටිනිස්සට්ඨො; තණ්හූපයස්ස පහීනත්තා දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා සො නිවෙසනෙසු අනූපනීතො අනුපලිත්තො අනුපගතො අනජ්ඣොසිතො[1] අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති අනූපනීතො ස නිවෙසනෙසු.'

තෙනාහ භගවා:

> ''න වෙදගූ දිට්ඨියා න මුතියා
> ස මානමෙති න හි තම්මයො සො,
> න කම්මුනා නො පි සුතෙන නෙය්‍යො
> අනූපනීතො ස නිවෙසනෙසූ''ති.

## 9 - 18

> සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා[2]
> පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා,
> සඤ්ඤං ච දිට්ඨිං ච යෙ අග්ගහෙසුං
> තෙ ඝට්ටයන්තා[3] විචරන්ති[4] ලොකෙ.

**සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථාති** – යො සමථපුබ්බඞ්ගමං අරියමග්ගං[5] භාවෙති, තස්ස ආදිතො උපාදාය ගන්ථා වික්ඛම්භිතා හොන්ති, අරහත්තෙ පත්තෙ[6] අරහතො ගන්ථා ච මොහා ච නීවරණා ච, කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා දිට්ඨිසඤ්ඤා ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මාති – 'සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා.'

**පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා** – යො විපස්සනාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති, තස්සාදිතො උපාදාය මොහා වික්ඛම්භිතා හොන්ති, අරහත්තෙ පත්තෙ[6] අරහතො මොහා ච ගන්ථා ච නීවරණා ච කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා දිට්ඨිසඤ්ඤා ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මාති – 'පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා.'

---

1. අනජ්ඣොසිතො - සීමු. II. 2. ගන්ඨා - මනුප. 3. ඝට්ටමානා - සීමු. II. මජ්ඣං.
4. විවදන්ති - සකුවි. 5. අරියධම්මං - සීමු. II.
6. අරහත්තප්පත්තෙ - සීමු. II. ස්‍යා. PTS.

**න කම්මුනා නො 'පි සුතෙන නෙයෙ‍්‍යා** – 'න කම්මුනා' යනු: පුණ්‍යාභිසංස්කාරයෙන් හෝ අපුණ්‍යාභිසංස්කාරයෙන් හෝ ආනෙඤ්ජාභිසංස්කාරයෙන් හෝ නො යවනු ලැබෙයි, නො ගෙනයනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො හරිනු ලැබේ නුයි 'න කම්මුනා' යනු වේ. **නො 'පි සුතෙන නෙයෙ‍්‍යා** – ශ්‍රැතශුද්ධියෙන් හෝ පරතොඝොෂයෙන් හෝ මහජනසම්මුතියෙන් හෝ නො යවනු ලැබෙයි...නො හරිනු ලැබේ නුයි 'න කම්මුනා නො 'පි සුතෙන නෙයෙ‍්‍යා' යනු වේ.

**අනූපනීතො ස නිවෙසනෙසු** – 'උපය' යනු: තෘෂ්ණා උපය ද දෘෂ්ටි උපය දැයි උපයයෝ දෙදෙනෙක් වෙති...ඔහු විසින් තෘෂ්ණාඋපය ප්‍රහීණ යැ, දෘෂ්ටිඋපය දුරලන ලද; තෘෂ්ණොපය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටූපය දුරලන ලද බැවින් හේ (අපායාදි) නිවෙසනයන්හි නො පමුණුවන ලද්දේ නො ඇලුණේ නො පැමිණියේ නො පිවිසියේ නො ඇතුළු වූයේ නික්මැගියේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ නො බැඳුණේ කෙලෙසුන් හා නො යෙදුණු සිතින් යුක්ත වැ වෙසේ නුයි 'අනූපනීතො ස නිවෙසනෙසු' යනු වේ.

එයින් වදාළහ:

"න වෙදගූ -පෙ- ස නිවෙසනෙසු"යි.

## 9 – 13

ප්‍රහීණ කළ කාමාදි සංඥා ඇත්තහුට (අභිධ්‍යාකායාදි) ග්‍රන්ථයෝ නො වෙති. විදර්ශනාප්‍රඥාවෙන් කෙලෙසුන් කෙරෙන් මිදුණහුට මෝහයෝ නො වෙති. යම් කෙනෙක් කාමාදි සංඥාව ත් දෘෂ්ටිය ත් දැඩි වැ ගත්තාහු නම්, ඔහු උනුත් ගටමින් ලොවැ හැසිරෙත්.

**සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා** – යමෙක් ශමථපූර්වඞ්ගම ආර්‍ය්‍යමාර්ගය වඩා ද ආදියෙහි පටන් ඔහුගේ අභිධ්‍යාකායාදි ග්‍රන්ථයෝ විෂ්කම්භණ වූවාහු වෙති, රහත්බවට පැමිණි කල්හි රහත්හුගේ ග්‍රන්ථයෝ ද මෝහයෝ ද නීවරණයෝ ද කාමසංඥා ව්‍යාපාදසංඥා විහිංසාසංඥා දෘෂ්ටිසංඥා ද ප්‍රහීණ වූවාහු වෙති, උසුත්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මතු නූපදනා පියවි ඇත්තාහු නුයි 'සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා' යනු වේ.

**පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා** – යමෙක් විදර්ශනා පූර්වඞ්ගම වූ ආර්‍ය්‍යමාර්ගය වඩා ද, ඔහුගේ ආදියෙහි පටන් මෝහයෝ විෂ්කම්භණ වූවාහු වෙති, රහත්බවට පැමිණි කල්හි රහත්හුගේ මෝහයෝ ද ග්‍රන්ථයෝ ද නීවරණයෝ ද කාම – ව්‍යාපාද – විහිංසා – දෘෂ්ටිසංඥා ද ප්‍රහීණ වූවාහු වෙති සිඳින ලද මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මතු නූපදනා පියවි ඇත්තාහු නුයි – 'පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා' යනු වේ.

**සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙති** යෙ සඤ්ඤං ගණ්හන්ති කාමසඤ්ඤං ව්‍යාපාදසඤ්ඤං විහිංසාසඤ්ඤං, තෙ සඤ්ඤාවසෙන ඝට්ටෙන්ති සංඝට්ටෙන්ති. රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතිකාපි ගහපතීහි විවදන්ති, මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. පුත්තොපි පිතරා විවදති. භාතාපි භාතරා විවදති. භගිනීපි භගිනියා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනීපි භාතරා විවදති. සහායොපි සහායෙන විවදති. තෙ තත්ථ කලහවිග්ගහවිවාදමාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති. ලෙඩ්ඩූහිපි උපක්කමන්ති. දණ්ඩෙහිපි උපක්කමන්ති. සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති, මරණමත්තම්පි දුක්ඛං. යෙ දිට්ඨිං ගණ්හන්ති 'සස්සතො ලොකො'ති වා -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා, තෙ දිට්ඨිවසෙන ඝට්ටෙන්ති සංඝට්ටෙන්ති. සත්ථාරතො සත්ථාරං ඝට්ටෙන්ති. ධම්මක්ඛානතො ධම්මක්ඛානං ඝට්ටෙන්ති. ගණතො ගණං ඝට්ටෙන්ති. දිට්ඨියා දිට්ඨිං ඝට්ටෙන්ති. පටිපදාය පටිපදං ඝට්ටෙන්ති. මග්ගතො මග්ගං ඝට්ටෙන්ති. අථවා, තෙ විවදන්ති. කලහං කරොන්ති. භණ්ඩනං කරොන්ති. විග්ගහං කරොන්ති විවාදං කරොන්ති. මෙධගං කරොන්ති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි[1] වා සචෙ පහොසී'ති. තෙසං අභිසඞ්ඛාරා අප්පහීනා, අභිසඞ්ඛාරානං අප්පහීනත්තා ගතියා ඝට්ටෙන්ති. නිරයෙ ඝට්ටෙන්ති, තිරච්ඡානයොනියා ඝට්ටෙන්ති. පෙත්තිවිසයෙ ඝට්ටෙන්ති. මනුස්සලොකෙ ඝට්ටෙන්ති. දෙවලොකෙ ඝට්ටෙන්ති. ගතියා ගතිං උපපත්තියා උපපත්තිං පටිසන්ධියා පටිසන්ධිං භවෙන භවං සංසාරෙන සංසාරං වට්ටෙන වට්ටං ඝට්ටෙන්ති සංඝට්ටෙන්ති. ඝට්ටෙන්තා[2], චරන්ති[3], විචරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – 'සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ.'

තෙනාහ භගවා:

"සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා
පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා,
සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං
තෙ ඝට්ටයන්තා[4] විචරන්ති ලොකෙ"ති.

**මාගන්දියසුත්තනිද්දෙසො නවමො.**

## 10

## පුරාභෙදසුත්තනිද්දෙසො

අථ පුරාභෙදසුත්තනිද්දෙසො වුච්චති:

**10 – 1**

කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති,
තං මෙ ගොතම පබ්‍රූහි පුච්ඡිතො උත්තමං නරං.

---

1. නිබ්බෙඨෙහි – PTS.
2. ඝට්ටෙන්තාති පදං – සීමු. II මජසං. පොත්ථකෙසු න දිස්සති.
3. චරන්ති.– සීමු. II. මජසං.
4. ඝට්ටමානා – සීමු. II. මජසං.

**සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ** – යම් කෙනෙක් කාම – ව්‍යාපාද – විහිංසා – යන සංඥාව ගනිත් ද ඒ ගැහැවියෝ සංඥාවශයෙන් ගටති, ඉතා ගටත්. රජහු ද රජුන් සමග විවාද කෙරෙති, ක්ෂත්‍රියයෝත් ක්ෂත්‍රියයන් සමග විවාද කෙරෙති, බමුණෝත් බමුණන් සමග විවාද කෙරෙති, ගැහැවියෝත් ගැහැවියන් සමග විවාද කෙරෙති, මව් ද පුතු සමග විවාද කෙරෙයි, පුතාත් මව සමග විවාද කෙරෙයි, පියතෙමේ ත් පුතු සමග විවාද කෙරෙයි, පුතාත් පියා සමග විවාද කෙරෙයි, සොහොයුරාත් සොහොයුරු සමග විවාද කෙරෙයි, සොහොයුරියත් සොහොයුරිය සමග විවාද කෙරෙයි, සොහොයුරාත් සොහොයුරිය සමග විවාද කෙරෙයි, සොහොයුරියත් සොහොයුරු සමග විවාද කෙරෙයි, යහළුවාත් යහළුහු සමග විවාද කෙරෙයි, ඔවුහු එහි කලහවිග්‍රහවිවාදයට පැමිණියාහු උනුනට අත්වලිනු දු පහර දෙති, කැටගලිනු දු ගසති, දඬුවලිනු දු ගසති, සැතිනු දු පහර දෙත්. ඔවුහු එහි දී මරණයටත් මරණ මාත්‍ර දුකටත් පැමිණෙත්. යම් කෙනෙක් දෘෂ්ටිය ගනිත් ද: 'ශාශ්වත යැ ලොකයැයි හෝ...සත්ත්වතෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වේ යැයි හෝ' ඔවුහු දෘෂ්ටිවශයෙන් ගටති, ඉතා ගටති ශාස්තෘහු වශයෙන් ශාස්තෘහු ගටති, ධර්මාඛ්‍යානයෙන් ධර්මාඛ්‍යානය – ගණයා කෙරෙත් ගණයා – දෘෂ්ටියෙන් දෘෂ්ටිය – පිළිවෙතින් පිළිවෙත – මාර්ගයෙන් මාර්ගය ගටත්. නොහොත් ඔහු විවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විවාද කෙරෙති අරගල කෙරෙති: 'තෙපි මේ ධර්මවිනය නො දන්නවුයැ...ඉදින් පොහොසත්හු නම් තමා මුදා ගනිවුයැ'යි. ඔවුන්ගේ පුණ්‍යාදි අභිසංස්කාරයෝ අප්‍රහීණයහ, අභිසංස්කාරයන් අප්‍රහීණ වන බැවින් (යාගුතු) ගතියෙන් ගටති, නිරයෙහි ලා ගටති, තිරශ්චීනයොනියෙහි ගටති, ප්‍රෙතවිෂයයෙහි ගටති, මනුෂ්‍යලොකයෙහි ගටති, දිව්‍යලොකයෙහි ගටත්. ගතියෙන් ගතිය උපතින් උපත පිළිසඳින් පිළිසඳ භවයෙන් භවය සසරින් සසර වට්ටින් වට ගටති, ඉතා ගටති. ගටමින් ඇවිදිති හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති වැටෙති රැකෙති යැපෙති යපනය වෙත්. **ලොකෙ** – අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි 'සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ' යනු ඒ.

එහෙන් වදාළහ බුදුහු:

**"සඤ්ඤාවිරත්තස්ස -පෙ- තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ"යි.**

**නවවැනි 'මාගන්දිය' සූත්‍රනිද්දේශය යි.**

# 10

# පුරාභෙදසූත්‍රනිද්දේශය

**ඉක්බිති 'පුරාභෙද' සූත්‍රනිද්දේශය කියනු ලැබේ:**

**10 - 1**

**කෙබඳු දර්ශනයකින් යුක්ත වූ කෙබඳු ශීලයකින් යුක්ත වූ පුද්ගල තෙම උපශාන්ත යැයි කියනු ලැබේ ද? ගොතුමාණෙනි, මා විසින් පුළුවුස්නා ලද්දවුහු ඒ උත්තම පුද්ගලයා වදාළ මැනව.**

කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චතීති - 'කථංදස්සී'ති කීදිසෙන දස්සනෙන සමන්නාගතො කිංසණ්ඨිතෙන කිම්පකාරෙන කිංපටිභාගෙනාති කථංදස්සී; කථංසීලොති කීදිසෙන සීලෙන සමන්නාගතො කිංසණ්ඨිතෙන කිම්පකාරෙන කිම්පටිභාගෙනාති - කථංදස්සී කථංසීලො.'

උපසන්තොති වුච්චතීති - සන්තො උපසන්තො වූපසන්තො නිච්ඡාතො නිබ්බුතො පටිප්පස්සද්ධොති වුච්චති පවුච්චති කථියති භණියති දීපියති වොහරියති; 'කථංදස්සී'ති අධිපඤ්ඤං පුච්ඡති; 'කථංසීලො'ති අධිසීලං පුච්ඡති 'උපසන්තො'ති අධිචිත්තං පුච්ඡතීති - 'කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති.'

තං මෙ ගොතම පබ්‍රූහීති - 'තන්ති' යං පුච්ඡාමි යං යාචාමි යං අජ්ඣෙසාමි යං පසාදෙමි; ගොතමාති සො නිම්මිතො බුද්ධං භගවන්තං ගොත්තෙන ආලපති; පබ්‍රූහීති බ්‍රූහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති - 'තං මෙ ගොතම පබ්‍රූහි.'

පුච්ඡිතො උත්තමං නරන්ති - 'පුච්ඡිතො'ති පුට්ඨො පුච්ඡිතො යාචිතො අජ්ඣෙසිතො පසාදිතො; උත්තමං නරන්ති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං නරන්ති - 'පුච්ඡිතො උත්තමං නරං.'

තෙනාහ සො නිම්මිතො:

"කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති,
තං මෙ ගොතම පබ්‍රූහි පුච්ඡිතො උත්තමං නර"න්ති.

### 10 - 2

වීතතණ්හො පුරා භෙදා (ඉති[1] භගවා) පුබ්බමන්තමනිස්සිතො,
වෙමජ්ඣෙ නුපසංඛෙය්‍යො තස්ස නත්ථි පුරෙක්ඛතං.

වීතතණ්හො පුරා භෙදාති - පුරා කායස්ස භෙදා පුරා අත්තභාවස්ස භෙදා පුරා කළෙවරස්ස නික්ඛෙපා පුරා ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදා, වීතතණ්හො විගතතණ්හො චත්තතණ්හො වන්තතණ්හො මුත්තතණ්හො පහීනතණ්හො පටිනිස්සට්ඨතණ්හො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො, නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

1. පුරා භෙදාති - සී. PTS.

**කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති** – 'කථංදස්සී' යනු කෙබඳු වූ කවර සංස්ථාන ඇති කවර ප්‍රකාර වූ කවර ආකාර වූ දර්ශනයකින් සමන්විත වූයේ නුඹ 'කථංදස්සී' යනු වේ. **කථංසීලො** කීදෘශ වූ කෙසේ සිටි කවර ප්‍රකාර වූ කවර ආකාර වූ ශීලයකින් සමන්විත වූයේ නුඹ 'කථංදස්සී කථංසීලො' යනු වේ.

**උපසන්තොති වුච්චති** – ශාන්ත වූයේ උපශාන්ත වූයේ සන්හිඳුණේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ (කෙලෙස්) දුරලන ලද්දේ යයි කියනු ලැබෙයි පවසනු ලැබෙයි කථනය කරනු ලැබෙයි බණනු ලැබෙයි දක්වනු ලැබෙයි වහරනු ලැබේ. 'කථංදස්සී'යි අධිප්‍රඥාව අසයි, 'කථංසීලො' යි අධිශීලය අසයි, 'උපසන්තො' යි අධිචිත්තය අසා නුඹ 'කථංදස්සී කථං–සීලො උපසන්තොති වුච්චති' යනු වේ.

**තං මෙ ගොතම පබ්‍රෑහි** – 'තං, යනු: යම් පුද්ගලයකු අසම් ද යමකු අයැදිම් ද, යමකු ආරාධනා කෙරෙම් ද, පහදවම් ද; ඔහු 'ගොතම'යි ඒ නිර්මිත බුදුහු භාග්‍යවත් බුදුන් ගොත්‍රයෙන් ආමන්ත්‍රණ කෙරෙති; 'පබ්‍රෑහි' කියනු මැනව පවසනු පනවනු තබනු මැන, විවෘත කරනු මැන, විභාග කරනු මැන, පහළ කරනු මැන, ප්‍රකාශ කරනු මැනවැ යි' 'තං මෙ ගොතම, පබ්‍රෑහි' යනු වේ.

**පුච්ඡිතො උත්තමං නරං** – අසන ලදුවනු විචාරන ලදුවනු අයැදන ලදුවනු අරියන ලදුවනු පහදවන ලදුවනු; **උත්තමං නරං** අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ විශිෂ්ට වූ පාමොක් වූ උතුම් වූ ප්‍රවර වූ පුද්ගලයා නුඹ 'පුච්ඡිතො උත්තමං නරං' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"**කථංදස්සී** –පෙ– **උත්තමං නරං**" යි.

## 10 – 2

(බුදුහු මෙසේ වදාරති:) යමෙක් ශරීරය බිඳීමෙන් පෙර මැ ප්‍රහීණ වූ තෘෂ්ණා ඇත්තේ පූර්වාන්ත සඞ්ඛ්‍යාත අතීතය (තෘෂ්ණා දෘෂ්ටීන්) ඇසිරි නො කෙළේ ප්‍රත්‍යුත්පන්නයෙහි (රාගරක්ත යැ යනාදීන්) නො ගිණියැ යුත්තේ වේ ද, ඒ රහත් මහණහට අනාගතයෙහි (තෘෂ්ණාදෘෂ්ටිවශයෙන්) පෙරටු කරන ලද්දෙක් නැත. (ඔහු උපශාන්ත යයි කියමි.)

**වීතතණ්හො පුරා භෙදා** – කය බිඳීමෙන් පෙර ආත්මභාවය බිඳීමෙන් පෙර කළෙවරය නැතිමෙන් පෙර ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමෙන් පෙර, ප්‍රහීණ තෘෂ්ණා ඇත්තේ පහවැගිය තෘෂ්ණා ඇත්තේ හරන ලද තෘෂ්ණා ඇත්තේ වමනය කළ තෘෂ්ණා ඇත්තේ මුදන ලද තෘෂ්ණා ඇත්තේ හෙවන ලද තෘෂ්ණා ඇත්තේ දුරලන ලද තෘෂ්ණා ඇත්තේ වීතරාග වූයේ විගතරාග වූයේ ත්‍යක්තරාග වූයේ වාන්තරාග වූයේ මුක්තරාග වූයේ ප්‍රහීණරාග වූයේ ප්‍රතිනිසෘෂ්ටරාග වූයේ නිර්වෘත වූයේ සිහිල් වූයේ (කායිකචෛතසික) සුඛානුභවනය කරනුයේ ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත වැ වෙසෙයි.

භගවාති ගාරවාධිවචනං; අපිච, භග්ගරාගොති භගවා; භග්ගදොසොති භගවා; භග්ගමොහොති භගවා; භග්ගදිට්ඨීති භගවා; භග්ගමානොති භගවා; භග්ගකණ්ටකොති[1] භගවා; භග්ගකිලෙසොති භගවා; භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා; භවානං අන්තකරොති භගවා; භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා; භජි වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා; භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා; භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා; භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා; භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා; භාගී වා භගවා දසන්නං සඤ්ඤා-භාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමා-පත්තියාති භගවා; භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා; භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා; 'භගවා'ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්ති-කමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති – 'වීතතණ්හො පුරා භෙදා ඉති[2] භගවා,

පුබ්බමන්තමනිස්සිතොති – පුබ්බන්තො වුච්චති අතීතො අද්ධා; අතීතං අද්ධානං ආරබ්භ තණ්හා පහීනා හොති, දිට්ඨි පටිනිස්සට්ඨා; තණ්හාය පහීනත්තා දිට්ඨියා පටිනිස්සට්ඨත්තා එවම්පි පුබ්බමන්තමනිස්සිතො; අථවා, 'එවංරූපො අහොසිං අතීතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති 'එවංවෙදනො අහොසිං, එවංසඤ්ඤො අහොසිං, එවංසඞ්ඛාරො අහොසිං, එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති; එවම්පි – 'පුබ්බමන්තමනිස්සිතො' අථවා, 'ඉති මෙ චක්ඛු අහොසි අතීතමද්ධානං, ඉති රූපා'ති තත්ථ න ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං, න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි – 'පුබ්බමන්තමනිස්සිතො' ඉති මෙ සොතං අහොසි අතීතමද්ධානං, ඉති සද්දා'ති ඉති, මෙ ඝානං අහොසි අතීතමද්ධානං, ඉති ගන්ධා'ති, 'ඉති මෙ ජිව්හා අහොසි අතීතමද්ධානං ඉති රසා'ති', 'ඉති මෙ කායො අහොසි අතීතමද්ධානං, ඉති ඵොට්ඨබ්බා'ති, 'ඉති මෙ මනො අහොසි අතීතමද්ධානං, ඉති ධම්මා'ති තත්ථ න ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං, න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි – 'පුබ්බමන්තම-නිස්සිතො,' අථවා, යාන'ස්සු තානි[3] තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිතලපිතකීළිතානි, න තදස්සාදෙති, න තං නිකාමෙති; න ච තෙන විත්තිං ආපජ්ජති, එවම්පි 'පුබ්බමන්තමනිස්සිතො.'

1 කණ්ටකොති - මජසං. 2. භෙදාති - සිමු II. මජසං. PTS.
3. යානි තානි - මජසං.

**භගවා** – යනු: ගෞරවාධිවචන යැ. තවද: භග්නරාග නුයි – භගවත් යැ, භග්නද්වේෂ නුයි භගවත් යැ, භග්නමෝහ නුයි – භගවත් යැ, භග්නදෘෂ්ටි නුයි – භග්නමාන නුයි – භග්නකණ්ටක නුයි – භග්නක්ලේශ නුයි – භගවත් යැ; ධර්මරත්නය භාග – විභාග – ප්‍රතිවිභාග කෙළේ නුයි – භගවත් යැ, භවයන් කෙළවර කෙළේ නුයි – භගවත් යැ, භාවිතකාය – භාවිතචිත්ත-භාවිතප්‍රඥ ඇත් නුයි භගවත් යැ, බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මනුෂ්‍යයන්ගේ රාහස්‍යයනට ස්ථාන වූ විවේකයට අනුරූප වූ වනයෙහි දුරසෙනසුන් හා ඉතා දුරසෙනසුන් සෙවනය කළාහු නුයි හෝ භගවත් යැ, බුදුහු චීවරපිණ්ඩපාතසේනාසනග්ලාන-ප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයනට හිමි වූවාහු නුයි භගවත් යැ, බුදුහු අර්ථරස යට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රාමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු අෂ්ටවිමෝක්ෂයන්ට අෂ්ට අභිභායතනයන්ට නව අනුපූර්වවිහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ' බුදුහු දශ සංඥාභාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනා-පානසමාධි සමාධියට අශුභසමාපත්තියට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු සතර ස්මෘතිප්‍රස්ථානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයට හිමි වූවාහු නුයි හෝ – භගවත් යැ, බුදුහු දශ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍යයන්ට චතුර්ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධ ධර්මයන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, 'භගවත්' යන මෙල නාමය මව විසින් නො කරන ලද, පියා විසින් – බෑයකු විසින් – බුනකු විසින් මිතුරු – යහළුවන් විසින් – නෑසහලේනෑයන් විසින් – මහණබමුණන් විසින් දෙවියන් විසින් නො කරන ලද, 'භගවත්' යන යම් ප්‍රඥප්තියක් වී ද භගවත් බුදුවරුන්ට රහත්පෙලෙන් උපන් මෙල නාමය බෝමුල දී සර්වඥතාඥානය ලැබීම සමග සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් නුයි 'වීතතණ්හො පුරාභෙද ඉති භගවා' යනු වේ.

**පුබ්බමන්තමනිස්සිතො** – 'පුබ්බන්ත' යි අතීතකාලය කියනු ලැබෙයි. අතීතකාලය නිසා තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී දෘෂ්ටිය දුරලන ලද්දී වෙයි, තෘෂ්ණාව ප්‍රහීණ හෙයින් දෘෂ්ටිය දුරලූ හෙයින් මෙසේත් පූර්වාන්තය අනිඃශ්‍රිත වෙයි; නොහොත් අතීත කාලයෙහි මෙබඳු රූ ඇතියෙම් වීමි' එහි ඇලීම නො එලවයි, 'මෙබඳු වෙදනා ඇතියෙම් වීමි, මෙබඳු සංඥා ඇතියෙම් වීමි, මෙබඳු සංස්කාර ඇතියෙම් වීමි, මෙබඳු විඥාන ඇතියෙම් වීමි' එහි ඇලීම නො එලවයි. මෙසේත් පූර්වාන්තය අනිඃශ්‍රිත වෙයි; නොහොත් 'මා ගේ ඇස අතීතයෙහි මෙසේ විය, රූපයෝ මෙසේ වූහ'යි එහි විඥානය ඡන්දරාගය පිළිබැඳි වූයේ නො වෙයි, විඥානය ඡන්දරාග ප්‍රතිබද්ධ නො වූ හෙයින් එය නො කැමැති වෙයි; එය නො කැමැති වනුයේ මෙසේත් 'පුබ්බමන්තමනිස්සිතො' යනු වේ. 'මාගේ ශ්‍රොත්‍රප්‍රසාදය අතීතකාලයෙහි මෙසේ විය, ශබ්දයෝ මෙසේ වූහ'යි – 'මාගේ ඝ්‍රාණප්‍රසාදය අතීතයෙහි මෙසේ විය, ගන්ධයෝ මෙසේ වූහ'යි – 'මාගේ ජිහ්වාප්‍රසාදය අතීතයෙහි මෙසේ විය, රසයෝ මෙසේ වූහ'යි – 'මාගේ කායප්‍රසාදය අතීතයෙහි මෙසේ විය, ස්ප්‍රෂ්ටව්‍යයෝ මෙසේ වූහ'යි – 'මාගේ භවාඞ්ග චිත්තය මෙසේ විය, මාගේ ත්‍රෛභූමක ධර්මාලම්බනයෝ මෙසේ වූහ'යි එහි විඥානය ඡන්දරාගප්‍රතිබද්ධ වූයේ නො වෙයි, විඥානය ඡන්දරාගප්‍රතිබද්ධ නො වූ හෙයින් එය නො කැමැති වෙයි, එය නො කැමැති වනුයේ මෙසේත් – 'පුබ්බමන්තමනිස්සිතො' යනු වේ. නොහොත් පෙර මාගමක සමග යම්බඳු ඒ ඒ කෙළිසිනාබස් වී නම් එය ආස්වාද නො කෙරෙයි, එය නො කැමැති වෙයි, එයින් නො ද සතුටට පැමිණේ. මෙසේත්– 'පුබ්බමන්තමනිස්සිතො' යනු වේ.

**වෙමජ්ඣෙනුපසංඛෙය්‍යොති** – 'වෙමජ්ඣං' වුච්චති පච්චුප්පන්නො අද්ධා, පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ තණ්හා පහීනා හොති, දිට්ඨි පටිනිස්සට්ඨා; තණ්හාය පහීනත්තා දිට්ඨියා පටිනිස්සට්ඨත්තා 'රත්තො'ති නුපසංඛෙය්‍යො, 'දුට්ඨො'ති නුපසංඛෙය්‍යො, 'මූළ්හො'ති නුපසංඛෙය්‍යො, 'විනිබද්ධො'ති නුපසංඛෙය්‍යො, 'පරාමට්ඨො'ති නුපසංඛෙය්‍යො, 'වික්ඛෙපගතො'ති නුපසං-ඛෙය්‍යො, 'අනිට්ඨංගතො'ති නුපසංඛෙය්‍යො, 'ථාමගතො'ති නුපසංඛෙය්‍යො; තෙ අභිසඞ්ඛාරා පහීනා, අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා නුපසංඛෙය්‍යො: නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා; සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන සඞ්ඛං ගච්ඡෙය්‍යාති – 'වෙමජ්ඣෙනුපසඞ්ඛෙය්‍යො.'

**තස්ස නත්ථි පුරෙක්ඛතන්ති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස; **පුරෙක්ඛාරාති** ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච, -පෙ- අයං තණ්හාපුරෙක්ඛාරො -පෙ- අයං දිට්ඨිපුරෙක්ඛාරො, තස්ස තණ්හාපුරෙක්ඛාරො පහීනො, දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො; තණ්හා-පුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා දිට්ඨිං වා පුරතො කත්වා චරති, න තණ්හාධජො න තණ්හාකෙතු න තණ්හාධිපතෙය්‍යො, න දිට්ඨිධජො න දිට්ඨිකෙතු න දිට්ඨාධිපතෙය්‍යො, න තණ්හාය වා දිට්ඨියා වා පරිවාරිතො චරති; එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' අථවා, 'එවංරූපො සියං අනාගතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති[1]; 'එවංවෙදනො සියං – එවංසඤ්ඤො සියං– එවංසඞ්ඛාරො සියං – එවංවිඤ්ඤාණො සියං 'අනාගතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති;[1] එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' අථවා, 'ඉති මෙ චක්ඛු[2] සියා අනාගතමද්ධානං, ඉති රූපා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති; චෙතසො අප්පණිධානප්පච්චයා[3] න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' 'ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං, ඉති සද්දා'ති– 'ඉති මෙ ඝානං සියා අනාගතමද්ධානං, ඉති ගන්ධා'ති –'ඉති මෙ ජිව්හා සියා අනාගතමද්ධානං, ඉති රසා'ති – 'ඉති මෙ කායො සියා අනාගතමද්ධානං, ඉති ඵොට්ඨබ්බා'ති – 'ඉති මෙ මනො සියා අනාගතමද්ධානං, ඉති ධම්මා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති; චෙතසො අප්පණිධානප්පච්චයා න තදභිනන්දති; න තද-භිනන්දන්තො; එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' අථවා 'ඉමිනාහං සීලෙන වා වතෙන[4] වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති; චෙතසො අප්පණිධානප්පච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.'

තෙනාහ භගවා:

> "වීතතණ්හා පුරාභෙදා (ඉති භගවා) පුබ්බමන්තමනිස්සිතො,
> වෙමජ්ඣෙනුපසංඛෙය්‍යො තස්ස නත්ථි පුරෙක්ඛත"න්ති.

---

1. සමන්නාගමෙති – PTS. සහා.    2. චක්ඛුං – සීමු. II.
3. අපණිධානපච්චයා – ස.    4. වත්තෙන – PTS

**වෙමජ්ඣෙනුපසඞ්ඛෙය්‍යො** – 'වෙමජ්ඣ' යි පවත්නා කාලය කියනු ලැබෙයි; වර්තමානකාලය අරබයා තෘෂ්ණාව ප්‍රහීණ වූවා, දෘෂ්ටිය දුරලන ලද්දී වෙයි, තෘෂ්ණාව ප්‍රහීණ බැවින් දෘෂ්ටිය දුරැලූ බැවින් 'රාගයෙන් රක්ත' යැයි නො ගිණියැ යුත්තේ යැ, 'දුෂ්ට' යැයි – 'මූඪ' යැයි – මානයෙන් බැඳිණැ' යි – 'දෘෂ්ටියෙන් පරාමෘෂ්ට' යැයි – 'ඖද්ධත්‍යයෙන් වික්ෂෙපයට පැමිණිණැ'යි – විචිකිත්සායෙන් අනිෂ්ඨාවට ගියේයැ'යි – 'අනුශයෙන් දෘඪබවට ගියේයැ 'යි නො ගිණියැ යුත්තේ යැ; ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයහ, ප්‍රහීණ බැවින් 'නෛරිසත් වනැ'යි හෝ 'තිරිසන්යොනි ඇතියෙකැ' යි හෝ 'ප්‍රේතගති ඇතියෙකැ'යි හෝ 'මිනිස් වන්නේයැ'යි හෝ 'දෙවි වන්නේයැ'යි හෝ 'රූපී යැ'යි හෝ 'අරූපී යැ'යි හෝ 'සංඥී යැ'යි හෝ 'අසංඥී යැ' යි හෝ 'නෛවසංඥීනාසංඥී යැ'යි හෝ ගතියෙන් නො ගිණියැ යුත්තේ ය; යම් හෙයෙකින් සඞ්ඛ්‍යාවට යන්නේ නම්, ඒ හෙතුව නැත ඒ ප්‍රත්‍යය නැත කාරණය නැත් නුයි 'වෙමජ්ඣෙනුපසඞ්ඛෙය්‍යො' යනු වේ.

**තස්ස නත්ථි පුරෙක්ඛතං** – 'තස්ස' යනු: අර්හත් ක්ෂීණාශ්‍රව හට, **පුරෙක්ඛාර** නම්: තෘෂ්ණාපුරස්කාරය ද දෘෂ්ටිපුරස්කාරය දැ'යි දෙ පුරස්කාර කෙනෙක් වෙති...ඔහු විසින් තෘෂ්ණාපුරස්කාරය ප්‍රහීණ යැ දෘෂ්ටිපුරස්කාරය දුරලන ලද,, තෘෂ්ණාපුරස්කාරය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිපුරස්කාරය දුරැලූ බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙයි, තෘෂ්ණාධ්වජ ඇතියේ නො වෙයි, තෘෂ්ණාකෙතු ඇතියේ – තෘෂ්ණාව අධිපති කොට ඇතියේ දෘෂ්ටිධ්වජ ඇතියේ – දෘෂ්ටිකෙතු ඇතියේ දෘෂ්ටිය අධිපති කොට ඇතියේ නො වෙයි; තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ පිරිවරන ලදුයේ නො හැසිරෙයි; මෙසේ ත් 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. නොහොත් 'අනාගතකාලයෙහි මෙබඳු රූ වෙම්ව'යි එහි නන්දිය (–තෘෂ්ණාව) නො එළවයි, 'මෙබඳු වෙදනා ඇති වෙම්ව'යි මෙබඳු සංඥා ඇති වෙම්ව'යි– මෙබඳු සංස්කාර ඇති වෙම්ව'යි – අනාගතයෙහි මෙබඳු විඥාන ඇති වෙම්ව යි එහි සතුට නො එළවයි; මෙසේත් – 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. නොහොත් 'මාගේ ඇස අනාගතකාලයෙහි මෙසේ වන්නේය, රූපයෝ මෙසේ වන්නාහ' යි නො ලද්දහු ගේ ලැබීම පිණිස සිත නො පිහිටුවයි; චිත්තයා ගේ ප්‍රාර්ථනා නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වන්නේ මෙසේ ත් – 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. මා ගේ ශ්‍රොත්‍රප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය, ශබ්දයෝ මෙසේ වන්නාහ, යි – මා ගේ ඝ්‍රාණප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය, ගන්ධයෝ මෙසේ වන්නාහ'යි – 'මාගේ ජිහ්වාප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය. රසයෝ මෙසේ වන්නාහ'යි – මාගේ කායප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය, ස්ප්‍රෂ්ටව්‍යයෝ මෙසේ වන්නාහ'යි – 'මාගේ භවාඞ්ගචිත්තය අනාගතයෙහි මෙසේ වන්නේය, ත්‍රෛභූමකධර්මාලම්බනයෝ මෙසේ වන්නාහ'යි නො ලද්දහුගේ ලැබීම පිණිස සිත නො පිහිටුවයි, චිත්තයාගේ ප්‍රාර්ථනා නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වනුයේ මෙසේ ත් 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. නොහොත් 'මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් හෝ දෙවියෙක් හෝ දෙවාන්‍යතරයෙක් හෝ වන්නෙමි' නො ලද්දහු ලැබීම පිණිස සිත නො පිහිටුවයි, සිත නො පිහිටුවීම හෙතු කොට ගෙන ඊට නො කැමැති වනුයේ මෙසේ ත් – 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**වීතතණ්හො පුරාභෙදා** –පෙ– **තස්ස නත්ථි පුරෙක්ඛතං**"යි

## 10 - 8

අක්කොධනො අසන්තාසී[1] අවිකත්ථී අකුක්කුචො[2]
මන්තභාණී අනුද්ධතො ස වෙ වාචායතො මුනි.

**අක්කොධනො අසන්තාසීති** - 'අක්කොධනො'ති හි ඛො[3] වුත්තං, අපිච, කොධො තාව වත්තබ්බො: දසහාකාරෙහි කොධො ජායති: 'අනත්ථං මෙ අචරී'ති කොධො ජායති. 'අනත්ථං මෙ චරතී'ති කොධො ජායති. 'අනත්ථං මෙ චරිස්සතී'ති කොධො ජායති. 'පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි, අනත්ථං චරති, අනත්ථං චරිස්සතී'ති කොධො ජායති, 'අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි, අත්ථං චරති, අත්ථං චරිස්සතී'ති කොධො ජායති. අට්ඨානෙ වා පන කොධො ජායති. යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො[4] අනත්තමනතා චිත්තස්ස; අයං වුච්චති කොධො.

අපිච, කොධස්ස අධිමත්තපරිත්තතා වෙදිතබ්බා: අත්ථි කඤ්චි කාලං[5] කොධො චිත්තාවිලකරණමත්තො හොති, න ච තාව මුඛකුලානවිකුලානො හොති; අත්ථි කඤ්චි කාලං කොධො මුඛකුලානවිකුලානමත්තො හොති, න ච තාව හනුසඤ්චොපනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො හනුසඤ්චොපනමත්තො හොති, න ච තාව ඵරුසවාචානිච්ඡාරණො හොති; අත්ථි කඤ්චි කාලං කොධො ඵරුසවාචානිච්ඡාරණමත්තො හොති, න ච තාව දිසාවිදිසානුවිලොකනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දිසාවිදිසානුවිලොකනමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථපරාමසනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දණ්ඩසත්ථපරාමසනමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථඅබ්භුක්කිරණො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දණ්ඩසත්ථඅබ්භුක්කිරණමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථඅභිනිපාතනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දණ්ඩසත්ථඅභිනිපාතනමත්තො හොති, න ච තාව ඡින්නවිච්ඡින්නකරණො[6] හොති, අත්ථි කඤ්චි කාලං කොධො ඡින්නවිච්ඡින්නකරණමත්තො හොති, න ච තාව සම්භඤ්ජනපලිභඤ්ජනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො සම්භඤ්ජනපලිභඤ්ජනමත්තො හොති, න ච තාව අඞ්ගමඞ්ගාපකඩ්ඪනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො අඞ්ගමඞ්ගාපකඩ්ඪනමත්තො හොති, න ච තාව ජීවිතා වොරොපනො[7] හොති; අත්ථි කඤ්චි කාලං කොධො ජීවිතා වොරොපනමත්තො හොති, න ච තාව සබ්බචාගපරිච්චාගාය සණ්ඨිතො හොති, යතො කොධො පරපුග්ගලං ඝාතෙත්වා අත්තානං ඝාතෙති, එත්තාවතා කොධො පරමුස්සදගතො පරමවෙපුල්ලප්පත්තො හොති.

1. අසන්තාපි - මනුප. 2. අකුක්කුච්චො - සීමු. II. 3. යං හි ඛො - මජසං.
4. අස්සුරොපො - සීමු. II. 5. කිඤ්චිකාලං - ස
6. ඡිද්දවිඡිද්දකරණො - ස. PTS. ඡින්නාවිච්ඡින්නකරණො - මනුප.
7. ජීවිතපනාසනො - සතා. PTS.

**10 - 8**

යමෙක් ඉතා කිපෙන පියවි ඇතියේ නො තැතිගන්නා සුලු වූයේ තමා නුවා නො දක්වන සුලු වූයේ කුකුස් රහිත වූයේ නුවණින් විමසා බණනු යේ උඩඟු නො වූයේ වේ ද ඒ ක්ෂීණාස්‍රව මුනි තෙම ඒකාන්තයෙන් වචනයෙන් සංයම වූයේ වේ. (ඔහු උපශාන්ත යයි කියමි.)

**අක්කොධනො අසන්තාසී** – 'අක්කොධනො' යි මැ කියන ලද, තවද පළමු කොට ක්‍රොධය කියයුතු යැ: දස අයුරෙකින් ක්‍රොධය උපදී: 'මට අවැඩ කෙළේ යැ'යි ක්‍රොධය උපදී, 'මට අවැඩ කෙරේ යැයි – 'මට අවැඩ කරන්නේ'යි ක්‍රොධය උපදී; 'මා ගේ ප්‍රිය මනාප වූවහුට අවැඩ කෙළේයැ අවැඩ කරයි – අවැඩ කරන්නේ යැ'යි ක්‍රොධය උපදී; 'මා ගේ අප්‍රිය අමනාප වූවහුට වැඩ කෙළේයැ – වැඩ කරයි – වැඩ කරන්නේයැ'යි ක්‍රොධය උපදී; යළි අස්ථානයෙහි හෝ ක්‍රොධය උපදී, යම් මෙබඳු වූ චිත්තයා ගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් සිත පෙරළීමෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් ක්‍රොධ කරන බවෙක් ද්වෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂ්‍යවන බවෙක් පෙරළීමෙක් පෙරළෙන අයුරෙක් පෙරළුණු බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩබවෙක් නො පිරුණු බසෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ ක්‍රොධ යයි කියනු ලැබේ.

තවද, ක්‍රොධයා ගේ අඩුවැඩි බව දතයුතු යැ: කිසිවිටෙක ක්‍රොධ තෙමේ සිත කලඹන මතුයෙක් වෙයි, තව මුහුණ කුලනු හකුලනු වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය මුහුණ කුලන හකුලන පමණ වූයේ වෙයි, තව හනු සොලවනු වූයේ නො ද වෙයි; කිසි විටෙක කොපය හනු සොලවනුයේ වෙයි, තව පරොස්බස් කියන පමණ වූයේ නො ද වෙයි; කිසි විටෙක කොපය පරොස්බස් කියන පමණ වෙයි, තවම වට පිට බලනු වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය වට පිට බලන පමණ වූයේ වෙයි, තවම දඬු සැත් නො ද ගත්තේ වෙයි; කිසිවිටෙක කොපය දඬු සැත් ගන්නා පමණ වූයේ වෙයි, තවම දඬු සැත් නගනුයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය දඬුසැත් කියපාන (–නගන) පමණ වූයේ වෙයි, තවම දඬු සැත් දමාගසනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය දඬුසැත් දමාගසන පමණ වූයේ වෙයි, තවම (මෙරමා සිරුරු) සිදුරු කරනු වූයේ නො ද වෙයි; කිසි විටෙක කොපය සිරුර සිදුරු බිදුරු කරන පමණ වූයේ වෙයි, තවම සිරුර සුණු විසුණු කරනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය සිරුර සුණු විසුණු කරන පමණ වූයේ වෙයි, තවම අඟපසඟ ඇද කඩනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය අඟපසඟ ඇද කඩන පමණ වූයේ වෙයි, තවම දිවි තොර කරනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය දිවි තොර කරන පමණ වූයේ වෙයි, තවම මෙරමා දිවි නසා සිය දිවි නැසීම පිණිස සිටියේ නො ද වෙයි; යම් කලෙක ක්‍රොධය සතුරා නසා තමා ත් නසා ද, මෙතෙකින් ක්‍රොධ තෙමේ ඉතා බලවත් බවට ගියේ ඉතා මහත් බවට පැමිණියේ වේ.

යස්ස සො කොධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති 'අක්කොධනො.' කොධස්ස පහීනත්තා 'අක්කොධනො.' කොධවත්ථුස්ස පරිඤ්ඤාතත්තා 'අක්කොධනො.' කොධහෙතුස්ස උපච්ඡින්නත්තා 'අක්කොධනො'ති– 'අක්කොධනො.' **අසන්තාසීති** – ඉධෙකච්චො තාසී හොති උත්තාසී පරිත්තාසී, සො තසති උත්තසති පරිතසති භායති සන්තාසං ආපජ්ජති: කුලං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං[1] වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති[2] තසති උත්තසති පරිතසති භායති සන්තාසං ආපජ්ජති. ඉධ භික්ඛු අසන්තාසී හොති අනුත්තාසී අපරිත්තාසී, සො න තසති න උත්තසති න පරිතසති න භායති න සන්තාසං ආපජ්ජති: කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති න තසති න උත්තසති න පරිතසති න භායති න සන්තාසං ආපජ්ජතීති 'අක්කොධනො අසන්තාසී.'

**අවිකත්ථී අකුක්කුචොති** – 'ඉධෙකච්චො කත්ථී හොති විකත්ථී, සො කත්ථති විකත්ථති: අහමස්මි සීලසම්පන්නොති වා වතසම්පන්නොති වා සීලබ්බතසම්පන්නොති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චාකුලා පබ්බජිතොති වා මහාකුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොති වා උළාරභොගකුලා පබ්බජිතොති වා, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා, ලාභිම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා, සුත්තන්තිකොති වා විනයධරොති වා ධම්මකථිකොති වා, ආරඤ්ඤිකොති වා පිණ්ඩපාතිකොති වා පංසුකූලිකොති වා තෙචීවරිකොති වා සපදානචාරිකොති වා ඛලුපච්ඡාභත්තිකොති වා නෙසජ්ජිකොති වා යථාසන්ථතිකොති වා, පඨමස්ස ඣානස්ස ලාභීති වා දුතියස්ස ඣානස්ස ලාභීති වා තතියස්ස ඣානස්ස ලාභීති වා චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා, ආකාසානඤ්චායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා කත්ථති විකත්ථති. එවං න කත්ථති, න විකත්ථති; කත්ථනා විකත්ථනා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'අවිකත්ථී.'

1. ගිලානුපට්ඨානං – සීමු. I. 2 අප්පපඤ්ඤාතොම්හීති – සීමු. I.

යම් භික්ෂු විසින් ඒ ක්‍රෝධය ප්‍රහීණ වූයේ නාසන ලද්දේ සන්හිඳුණේ දුරලනු ලද්දේ අභව්‍යෝත්පත්තික වූයේ නුවණගින්නෙන් දවනු ලද්දේ වේ ද, හෙ තෙම 'අක්කොධන'යි කියනු ලැබේ. ක්‍රෝධය (අනාගැමිමගින්) ප්‍රහීණ කළ බැවින් නො කිපෙනුයේ යැ; ක්‍රෝධවස්තුව පරිඥාත බැවින් නො කිපෙනුයේ යැ; ක්‍රෝධහේතුව සිඳින ලද බැවින් නො කිපෙනුයේ නුයි 'අක්කොධනා' වේ. **අසන්තාසී** – මෙ ලොවැ කිසිවෙක් බියසුලු වෙයි, ඉතා බියසුලු වෙයි, හාත්පසින් බියසුලු වේ. හේ ත්‍රස්ත වෙයි, ඉතා ත්‍රස්ත වෙයි, හාත්පසින් ත්‍රස්ත වෙයි, බියට පැමිණෙයි, සන්ත්‍රාසයට පැමිණෙයි: කුලය හෝ නො ලබම්, ගණයා හෝ – ආවාසය – ලාභ – යශස් – පැසැසුම් – සුව– චීවර – පිණ්ඩපාත – සේනාසන – ගිලන්පසබෙහෙත්පිරිකර – ග්ලානෝපස්ථා–යකයකු හෝ නො ලබම්, නො පැනෙනුයෙම් වෙම්' ත්‍රස්ත වෙයි, ඉතා ත්‍රස්ත වෙයි, හාත්පසින් ත්‍රස්ත වෙයි; තැති ගැනීමට පැමිණේ. මේ ශාසනයෙහි මහණ තෙම බියසුලු නො වෙයි, ඉතා බියසුලු නො වෙයි, හාත්පසින් බියසුලු නො වෙයි. හෙ තෙම ත්‍රස්ත – උත්‍රස්ත – – පරිත්‍රස්ත – නො වෙයි, භය නො වෙයි, සන්ත්‍රාසයට නො පැමිණෙයි: 'කුලය හෝ නො ලබම්, ගණයා – ආවාසය – ලාභ – යශස් – ප්‍රශංසා – සුඛ – චීවර – පිණ්ඩපාත– සෙනාසන – ගිලන්පසබෙහෙත්පිරිකර – ග්ලානොපස්ථායකයකු හෝ නො ලබම්, නො පැනෙනුයෙම් වෙම්' ත්‍රස්ත – උත්‍රස්ත – පරිත්‍රස්ත නො වෙයි, භය නො වෙයි, සන්ත්‍රාසයට නො පැමිණේ නුයි 'අක්කොධනො අසන්තාසී' යනු වේ.

**අවිකත්ථී අකුක්කුචෝ** – මෙ ලොවැ කිසිවෙක් සිය ගුණය කියන සුලු වූයේ විවිධාකාරයෙන් ගුණ කියනසුලු වූයේ වෙයි; හෙතෙම කත්ථන විකත්ථන කෙරෙයි: 'මම් ශීලසම්පන්නයෙමි' හෝ 'ව්‍රතසම්පන්නයෙමි' හෝ 'ශීලව්‍රතසම්පන්නයෙමි' හෝ ජාතියෙන් හෝ ගොත්‍රයෙන් – කුලපුත්‍රභාවයෙන් – වර්ණසෞන්දර්යයෙන් – ධනයෙන් – අධ්‍යයනයෙන් – කර්මායතනයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රති–භානයෙන් හෝ එක්තරා වස්තුවකින් හෝ, උසස් කුලයෙන් (නික්ම) පැවිදි වූයෙමි හෝ මහාසාරකුලයෙන් පැවිදි වූයෙමි හෝ මහාභොග ඇති කුලයෙන් පැවිදි වූයෙමි හෝ බොහෝ සම්පත් ඇති කුලයෙන් පැවිදි වූයෙමි හෝ ගැහැවියන් සහිත පැවිද්දන් අතුරෙහි ප්‍රසිද්ධයෙහි පිරිවර ඇත්තෙමි හෝ චීවරපිණ්ඩපාතසෙනාසන ගිලන්පසබෙහෙත්පිරිකර ලබන සුලු වෙමි හෝ සෞත්‍රාන්තිකයෙමි – විනයධරයෙමි – ධර්මකථිකයෙමි හෝ ආරණ්‍යකාඞ්ග ඇත්තෙමි හෝ පිණ්ඩපාතික – පාංශුකූලික – ත්‍රෛචීවරික– සපදානචාරික – ඛලුපච්ඡාභත්තික – නෛසද්‍යක – යථාසන්ථතිකාඞ්ග ඇත්තෙමි හෝ, ප්‍රථමධ්‍යානලාභී වෙමි හෝ ද්විතීයධ්‍යාන – තෘතීයධ්‍යාන – චතුර්ථධ්‍යාන ලාභී වෙමි හෝ, ආකාසානඤ්චායතනසමාපත්තිය විඤ්ඤාණඤ්චායතන–සමාපත්තිය ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමා–පත්තිලාභී වෙමි' හෝ කත්ථන විකත්ථන කෙරෙයි; මෙසේ කත්ථන විකත්ථන නො කෙරෙයි, කත්ථනයෙන් විකත්ථනයෙන් (–ආත්මශ්ලාඝායෙන්) දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැ ගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාද කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'අවිකත්ථී' යනු වේ.

**අකුක්කුච්චොති** – 'කුක්කුච්ච'න්ති හත්ථකුක්කුච්චම්පි කුක්කුච්චං, පාදකුක්කුච්චම්පි කුක්කුච්චං, හත්ථපාදකුක්කුච්චම්පි කුක්කුච්චං, "අකප්පියෙ කප්පියසඤ්ඤිතා, කප්පියෙ අකප්පියසඤ්ඤිතා, විකාලෙ කාලසඤ්ඤිතා, කාලෙ විකාලසඤ්ඤිතා, අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා, වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා. යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං, චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං[ෂ]". අපිච ද්වීහි කාරණෙහි උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො? 'කතං මෙ කායදුච්චරිතං, අකතං මෙ කායසුචරිත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො; 'කතං මෙ වචීදුච්චරිතං, අකතං මෙ වචීසුචරිත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො; 'කතං මෙ මනොදුච්චරිතං, අකතමෙම මනොසුචරිත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො; 'කතො මෙ පාණාතිපාතො, අකතා මෙ පාණාතිපාතා වෙරමණී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, 'කතං මෙ අදින්නාදානං අකතා මෙ අදින්නාදානා වෙරමණී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, 'කතො මෙ කාමෙසු මිච්ඡාචාරො අකතා මෙ කාමෙසු මිච්ඡාචාරා වෙරමණී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'කතො මෙ මුසාවාදො. අකතා මෙ මුසාවාදා වෙරමණී'ති – 'කතා මෙ පිසුනා වාචා. අකතා මෙ පිසුණාය වාචාය වෙරමණී'ති– 'කතා මෙ ඵරුසා වාචා, අකතා මෙ ඵරුසාය වාචාය වෙරමණී'ති –'කතො මෙ සම්ඵප්පලාපො, අකතා මෙ සම්ඵප්පලාපා වෙරමණී'ති – 'කතා මෙ අභිජ්ඣා, අකතා මෙ අනභිජ්ඣා'ති – 'කතො මෙ ව්‍යාපාදො – අකතො මෙ අව්‍යාපාදො'ති – 'කතා මෙ මිච්ඡාදිට්ඨි, අකතා මෙ සම්මාදිට්ඨී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. එවං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. අථ වා සීලෙසුම්හි න පරිපූරකාරීති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති–භොජනෙ අමත්තඤ්ඤුම්හීති ජාගරියං අනනුයුත්තොම්හීති–න සතිසම්පජඤ්ඤෙන සමන්නාගතොම්හීති – අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති – අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති – අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති – අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති අභාවිතානි මෙ පඤ්චබලානීති – අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති – අභාවිතො[1] මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති–දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති–සමුදයො මෙ අප්පහීනොති, මග්ගො මෙ අභාවිතොති – නිරොධො මෙ අසච්ඡිකතොති උප්පජ්ජති, කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. යස්සෙතං කුක්කුච්චං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අකුක්කුච්චොති – අවිකත්ථී අකුක්කුච්චො.

---

1. අභාවිතා – සීමු. II.

ෂ. විභඞ්ගප්පකරණ – ඣානවිභඞ්ග.

අකුක්කුචෙචා – 'කුක්කුච්ච' නම්: අත්කුකුස (=අතින් කළ කුත්සිත ක්‍රියාව) ද කුකුස යැ, පාකුකුස ද කුකුස යැ, අත්පාකුකුස ද කුකුස යැ, නො කැපයෙහි කැපයැ යන සත් (=සංඥ) ඇතිබව – කැපයෙහි අකැපසත් ඇතිබව – විකාලයෙහි කාලයැ'යි සත් ඇතිබව – කාලයෙහි විකාලයැ'යි සත් ඇතිබව – නිවරදෙහි වරදැයි හැඟීම – වරදෙහි නිවරදැයි හැඟීම යැ යන මෙබඳු යම් කුකුසෙක් කුකුස් අයුරෙක් කුකුස් කළබවෙක් සිතෙහි විපිළිසරෙක් චිත්තවිලෙඛයෙක් වේ ද, මේ 'කුක්කුච්ච' යයි කියනු ලැබේ. තවද දෙ කාරණෙකින් කුකුස චිත්තවිප්පටිසාරය චිත්තවිලෙඛය උපදී: කළ බැවින් හා නො කළ බැවින් හා යැ, කළබැවින් හා නො කළ බැවින් හා කුකුස...විලෙඛය කෙසේ උපදී ද යත් ? 'මා විසින් කායදුශ්චරිතය කරන ලද, මා විසින් කාය සුචරිතය නො කරන ලද'යි කුකුස චිත්තවිප්පටිසාරය චිත්තවිලෙඛය උපදී; 'මා විසින් වාග්දුශ්චරිතය කරන ලද, වාක්සුචරිතය නො කරන ලද'යි... 'මා විසින් මනොදුශ්චරිතය කරන ලද, මා විසින් මනසුචරිතය නො කරන ලද'යි කුකුස සිතෙහි විපිළිසර සිතෙහි විලෙඛය උපදී; 'මා විසින් ප්‍රාණඝාතය කරන ලද, මා විසින් ප්‍රාණඝාතවිරමණය නො කරන ලද'යි... 'මා විසින් අදත්තාදානය කරන ලද, මා විසින් අදත්තාදානවිරමණය නො කරන ලද'යි...'මා විසින් කාමමිථ්‍යාචාරය කරන ලද, මා විසින් කාමමිථ්‍යාචාරයෙන් විරමණය නො කරන ලද'යි...'මා විසින් මෘෂා කියන ලද, මා විසින් මෘෂාවාදවිරමණය නො කරන ලද'යි – 'මා විසින් පිසුනුබස් කියන ලද, පිසුනු බසින් වැළැකීම නො කරන ලද'යි – 'මා විසින් පරුෂවචන කියන ලද, පරුෂවචනයෙන් වැළැකීම නො කරන ලද'යි –'මා විසින් ප්‍රලාප කියන ලද, ප්‍රලාපයෙන් වැළැකීම නො කරන ලද'යි – 'මා විසින්, අභිධ්‍යාව (=දැඩිලොභය) කරන ලද, අනභිධ්‍යාව මා විසින් නො කරන ලද'යි – 'මා විසින් ව්‍යාපාද කරන ලද, අව්‍යාපාද මා විසින් නො කරන ලද'යි – 'මා විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නා ලද, සම්‍යග්දෘෂ්ටි මා විසින් නො ගන්නා ලද'යි කුකුස සිතට විපිළිසර මනොවිලෙඛය උපදී; මෙසේ කළ බැවින් ද නො කළ බැවින් ද කෞකෘත්‍ය චිත්තවිප්‍රතිසාර මනොවිලෙඛ උපදී; නොහොත් ඉන්ද්‍රියයන්හි නො පියූ දොර ඇතියෙම් වීම්–භොජනයෙහි පමණ නො දතුයෙම් වීම් – නිදිවැරීමෙහි නො යෙදුණෙම්–සිහිනුවණින් සමන්විතයෙම් නො වීම් – මා විසින් සතර සිවටත් නො වඩන ලද'යි – සතර සම්‍යක්ප්‍රධාන මා විසින් නො වඩන ලද'යි–සතර ඍද්ධිපාද මා විසින් නො වඩන ලද'යි – පඤ්චෙන්ද්‍රියයෝ මා විසින් නො වඩන ලදහ'යි – පඤ්චබලයෝ මා විසින් නො වඩන ලදහ'යි–සප්තබොධ්‍යඞ්ගයෝ මා විසින් නො වඩන ලදහ'යි – ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය මා විසින් නො වඩන ලද'යි – මා විසින් දුඃඛසත්‍යය අපරිඥෙත යැ'යි–සමුදයසත්‍යය අප්‍රහීණ යැ'යි – මාර්ගසත්‍යය අභාවිත යැ'යි – නිරොධසත්‍යය මා විසින් ප්‍රත්‍යක්ෂ නො කරන ලද'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. යමක්හු හට මෙල කුකුස ප්‍රහීණ ද සමුච්ඡින්න ද සන්හිඳිණි ද නැසිණි ද උපතට නුසුදුසු වී ද, නුවණගින්නෙන් දැවිණි ද, හෙතෙම 'අකුක්කුච්ච' යැයි කියනු ලැබේ නුයි' අවිකත්ථි අකුක්කුචෙචා' යනු වේ.

**මන්තභාණී අනුද්ධතොති** – 'මන්තා' වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා – අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[ඝ]; මන්තාය පරිග්ගහෙත්වා පරිග්ගහෙත්වා වාචං භාසති, බහුම්පි කථෙන්තො බහුම්පි භණන්තො බහුම්පි දීපයන්තො බහුම්පි වොහරන්තො දුක්කථිතං දුබ්භණිතං දුල්ලපිතං දුරුත්තං දුබ්භාසිතං වාචං න භාසතීති මන්තභාණී. **අනුද්ධතො** – තත්ථ කතමං උද්ධච්චං? යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං. යස්සෙතං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අනුද්ධතොති – 'මන්තභාණී අනුද්ධතො.'

**ස වෙ වාචායතො මුනීති** – 'ඉධ භික්ඛු මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති; ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො[1] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති, කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. චතූහි වචීසුචරිතෙහි සමන්නාගතො චතුදොසාපගතං වාචං භාසති, ද්වත්තිංසාය තිරච්ඡානකථාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. දස කථාවත්ථූනි[2] කථෙති, සෙය්‍යථිදං? අප්පිච්ඡකථං කථෙති. සන්තුට්ඨිකථං කථෙති. පවිවෙකකථං අසංසග්ගකථං විරියාරම්භකථං සීලකථං සමාධිකථං පඤ්ඤාකථං විමුත්තිකථං විමුත්තිඤාණදස්සනකථං සතිපට්ඨානකථං සම්මප්පධානකථං ඉද්ධිපාදකථං ඉන්ද්‍රියකථං බලකථං බොජ්ඣඞ්ගකථං මග්ගකථං ඵලකථං නිබ්බානකථං කථෙති; වාචාය යතො යත්තො පරියත්තො ගුත්තො ගොපිතො රක්ඛිතො වූපසන්තො; මුනීති මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා –පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[ඝ] –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනීති – ස වෙ වාචායතො මුනි.

තෙනාහ භගවා:

"අක්කොධනො අසන්තාසී අවිකත්ථී අකුක්කුචො,
මන්තභාණී අනුද්ධතො ස වෙ වාචායතො මුනී"ති.

---

ඝ. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ.

1. සමග්ගරාමො – පු. 2. දස වත්ථූනි – PTS.

**මන්තභාණී අනුද්ධතො** – 'මන්තා'යි ප්‍රඥාව කියනු ලබයි, යම් ප්‍රඥාවක්...අමෝහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වී ද එය යි; මන්තා (–ප්‍රඥා) යෙන් විමස විමසා වචන කියයි, බොහෝ බසුදු කියනුයේ බොහෝ බණනුයේ බොහෝ දක්වනුයේ බොහෝ කොට ත් වහරනුයේ දුෂ්කථිත වූ දුර්භණිත වූ දුලලපිත වූ තපුරු කොට කියන ලද දුබැසි වූ බසක් නො කියා නුයි 'මන්තභාණී' යැ; **අනුද්ධතො** – එහි 'උද්ධච්චය' කවරැ යත්? සිතෙහි යම් උඩඟු බවෙක් නො සන්හුන් බවෙක් සිතෙහි විසුරුණු බවෙක් චිත්තයා ගේ භ්‍රාන්ත (–නැතිගත්) බවෙක් වේ නම්, මේ 'උද්ධච්ච' යයි කියනු ලැබේ. යමක්හු හට මේ උද්ධත බව ප්‍රහීණ ද සමුච්ඡින්න වී ද සන්හිඳිණී ද නැසිණී ද අභව්‍යොත්පත්තික ද, ඥානාග්නීන් දැවිණී ද, හේ 'අනුද්ධත' යයි කියනු ලැබේ නුයි 'මන්තභාණී අනුද්ධතො' යනු වේ.

**ස වෙ වාචායතො මුනි** – මෙ සස්නෙහි මහණ තෙම මෘෂාවාදය හැර මෘෂාවාදයෙන් වැළැකුණේ වෙයි, සැබෑ කියනුයේ සැබැවින් සැබව ගළපනුයේ තිර වූයේ හැදැහිය යුතු බස් ඇතියේ ලොකයා නො රවට නුයේ වෙයි; පිසුනු බස් හැරපියා පිසුනු බසින් වැළැකුණේ වෙයි: මෙතැනින් අසා මුන්ගේ බිඳුමට අතැන නො කියනුයේ, අතැනින් අසා අරුන්ගේ බිඳුමට මොවුන්ට නො කියනුයේ වෙයි, මෙසේ භින්න වූවන් ද සමඟ කරනුයේ සමඟ වූවන් හෝ දැඩි කරනුයේ සමඟියෙහි ඇලුම් ඇතියේ සමඟ වූවන් කෙරෙහි ඇලුණේ සමඟ වූවන්ට සතුටු වූයේ සමඟ කරන බස් කියනුයේ වෙයි. රළුබස් හැරපියා රළුබසින් වැළැකුණේ වෙයි, යම් වචනයෙක් නිදෙස් ද කනට සුව ද පෙම් උපදවා ද සිතට වදී ද, පුරෙහි වූවා ද බොහෝ දෙනාට කැමැති ද බොහෝ දෙනාගේ මන වඩා ද, එබඳු වචන කියන්නේ වෙයි. නිසරු (–ප්‍රලාප) බස් හැරපියා නිසරුබසින් වැළැකුණේ වෙයි, කල් බලා කියනුයේ සැබවක් ම කියනුයේ වැඩදායක කෙපුල් කියනුයේ ධම්වාදී වූයේ විනයවාදී වූයේ සුදුසු කල කරුණු සහිත වූ පිරිසිඳීම් ඇති වැඩ සහිත වූ ලෙහි තැබිය යුතු වූ තෙපුලක් ම කියන්නේ වෙයි, සතර වාක්සුචරිතයෙන් සමන්විත වූයේ සතර දෙසින් වෙන්වූ තෙපුලක් ම කියයි, දෙතිස් තිරිසන් කථාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වෙසෙයි; දශ කථාවස්තූන් කියයි, ඒ මෙසේ යැ: අල්පෙච්ඡකථාව කියයි, ඉතරෙතරප්‍රත්‍යසන්තොෂකථාව කියයි, විවෙකනිශ්‍රිත කථාව කියයි, අසංසර්‍ගකථාව – වීර්‍යාරම්භකථාව – ශීලකථාව – සමාධිකථාව – ප්‍රඥාකථාව– විමුක්තිකථාව – විමුක්තිඥානදර්‍ශනකථාව – සතිපට්ඨාන – සම්‍යක්ප්‍රධාන– ඍද්ධිපාද – ඉන්ද්‍රිය–බල – බොධ්‍යඞ්ග – මාර්‍ග – ඵල – නිර්‍වාණකථාව කියයි; වචනයෙන් සංයම වූයේ දැමුණේ හාත්පසින් දැමුණේ ගොපන වූයේ ගොපිත වූයේ රැකුණේ සන්හිඳුණේ යැ; **මුනි** – 'මොන'යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක්...'ස වෙ වාචායතො මුනි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අක්කොධනො –පෙ– වාචායතො මුනී"යි**

10 - 4

නිරාසත්ති අනාගතෙ අතීතං නානුසොචති,
විවෙකදස්සී ඵස්සෙසු දිට්ඨීසු ච න නීයති.

**නිරාසත්ති අනාගතෙති** – 'ආසත්ති' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං[a], යස්සෙසා ආසත්ති තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා. එවම්පි – 'නිරාසත්ති අනාගතෙ.' අථවා, එවංරූපො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්නානෙති[1], එවංවෙදනො සියං – එවංසඤ්ඤො සියං – එවංසඞ්ඛාරො සියං – එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්නානෙති, එවම්පි නිරාසත්ති අනාගතෙ; අථවා, 'ඉති මෙ චක්ඛුං සියා අනාගතමද්ධානං, ඉති රූපා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති, චෙතසො අප්පණිධානප්පච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි නිරාසත්ති අනාගතෙ; 'ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං, ඉති සද්දා'ති -පෙ- 'ඉති මෙ මනො සියා අනාගතමද්ධානං, ඉති ධම්මා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති, චෙතසො අප්පණිධානප්පච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි නිරාසත්ති අනාගතෙ; අථවා, 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති, අප්පණිධානප්පච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි 'නිරාසත්ති අනාගතෙ.'

**අතීතං නානුසොචතීති** – විපරිණතං වා වත්ථුං න සොචති, විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති; චක්ඛුං මෙ විපරිණතන්ති න සොචති, සොතං මෙ – ඝානං මෙ – ජිව්හා මෙ – කායො මෙ – රූපා මෙ – සද්දා මෙ – ගන්ධා මෙ – රසා මෙ – ඵොට්ඨබ්බා මෙ – කුලං මෙ – ගණො මෙ – ආවාසො මෙ – ලාභො මෙ – යසො මෙ – පසංසා මෙ – සුඛං මෙ – චීවරං මෙ – පිණ්ඩපාතො මෙ – සෙනාසනං මෙ – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො මෙ – මාතා මෙ – පිතා මෙ – භාතා මෙ – භගිනී මෙ – පුත්තො මෙ – ධීතා මෙ – මිත්තා මෙ – අමච්චා[2] මෙ – ඤාතකා මෙ – සාලොහිතා මෙ විපරිණතාති න සොචති. න කිලමති. න පරිදෙවති. න උරත්තාළිං කන්දති. න සම්මොහං ආපජ්ජතීති – 'අතීතං නානුසොචති.'

---

a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

1. සමන්නාගමෙති - PTS. 2. මිත්තාමච්චා - PTS.

## 10 - 4

යමෙක් අනාගතයෙහි තෘෂ්ණා රහිත වේ ද, ඉක්මැගිය දෑයට ශෝක නො කෙරේ ද, වර්තමාන චක්ඛුසම්ඵස්සාදියෙහි ආත්මාදිභාවවිවේකය දකී ද, දෙසැට දිට්ඨි අතුරෙන් කිසි දෘෂ්ටියකින් නො පමුණුවනු ලැබේ ද, (ඔහු උපශාන්ත යයි කියමි.)

**නිරාසත්ති අනාගතෙ**- 'ආසත්ති'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි; යමක්හු විසින් මේ ආසත්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සමුච්ඡින්න වූවා සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී උපතට නුසුදුසු වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ. නොහොත් 'අනාගතයෙහි මෙබඳු රූ ඇති වෙම්ව'යි එහි තෘෂ්ණාව නො එලවයි, 'මෙබඳු වේදනා ඇති වෙම්ව'යි – සංඥා – සංස්කාර – විඥාන ඇති වෙම්ව'යි එහි තෘෂ්ණාව නො එලවයි, මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ' නොහොත් 'අනාගතයෙහි මෙසේ මා ගේ චක්ෂුඃප්‍රසාදය වන්නේය, මෙසේ රූපයෝ වන්නාහ'යි නො ලද්දහු ගේ ලැබීමට සිත නො පිහිටුවයි, සිත පිළිබඳ ප්‍රාර්ථනා නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වන්නේ මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ. 'අනාගතයෙහි මා ගේ ශ්‍රොත්‍රප්‍රසාදය මෙසේ වන්නේය, ශබ්දයෝ මෙසේ වන්නාහ'යි...අනාගතයෙහි මා ගේ භවාඞ්ගචිත්තය මෙසේ වන්නේය, ත්‍රෛභූමකධර්මාලම්බනයෝ මෙසේ වන්නාහ'යි නො ලද්දහු ගේ ලැබීමට සිත නො පිහිටුවයි, චිත්තයා ගේ ප්‍රාර්ථනා නැති බැවින් ඊට නො කැමැති වෙයි, ඊට නො කැමැති වන්නේ මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ. නොහොත් 'මම් මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් හෝ දෙවියෙක් හෝ දෙවාන්‍යතරයෙක් හෝ වන්නෙමි' නො ලද්දහු ගේ ලැබීමට චිත්තප්‍රණිධිය නො පිහිටුවයි, චිත්තප්‍රණිධි නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වන්නේ මෙසේත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ.

**අතීතං නානුසොචති** - නැසුණු වස්තුවට හෝ ශෝක නො කෙරෙයි, වස්තුව නැසෙන කල්හි හෝ ශෝක නො කෙරෙයි, 'මා ගේ ඇස නැසිණැ'යි ශෝක නො කෙරෙයි, සන – නැහැය – දිව – කය – රූප – ශබ්ද – ගන්ධ-රස – ස්ප්‍රෂ්ටව්‍ය – මාගේ කුලය – ගණයා – ආවාසය – ලාභ – යශස් – ප්‍රශංසා සුඛ – චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර-මව- පියා – සහෝදරයා – සහෝදරිය – පුතා – දුව – මිත්‍රයෝ – සහායයෝ-නෑයෝ – සහලේනෑයෝ නැසුණාහ'යි ශෝක නො කරයි, නො වෙහෙසෙයි, නො හඬයි, ළෙහි පැහැර නො හඬයි, සම්මොහයට නො පැමිණේ නුයි 'අතීතං නානුසොචති' යනු වේ.

**විවෙකදස්සී ඵස්සෙසූති** – 'ඵස්සො'ති චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො අධිවචනසම්ඵස්සො පටිඝසම්ඵස්සො සුඛවෙදනීයො ඵස්සො දුක්ඛවෙදනීයො ඵස්සො අදුක්ඛමසුඛවෙදනීයො ඵස්සො. කුසලො ඵස්සො අකුසලො ඵස්සො අබ්‍යාකතො ඵස්සො කාමාවචරො ඵස්සො රූපාවචරො ඵස්සො අරූපාවචරො ඵස්සො සුඤ්ඤතො ඵස්සො අනිමිත්තො ඵස්සො අප්පණිහිතො ඵස්සො ලොකියො ඵස්සො ලොකුත්තරො ඵස්සො අතීතො ඵස්සො අනාගතො ඵස්සො පච්චුප්පන්නො ඵස්සො, යො එවරූපො ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං වුච්චති ඵස්සො.

**විවෙකදස්සී ඵස්සෙසූති** – චක්ඛුසම්ඵස්සං විවිත්තං පස්සති අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා, සොතසම්ඵස්සං විවිත්තං පස්සති – ඝානසම්ඵස්සං විවිත්තං පස්සති – ජිව්හාසම්ඵස්සං විවිත්තං පස්සති – කායසම්ඵස්සං විවිත්තං පස්සති– මනොසම්ඵස්සං විවිත්තං පස්සති – අධිවචනසම්ඵස්සං විවිත්තං පස්සති– පටිඝසම්ඵස්සං විවිත්තං පස්සති – සුඛවෙදනීයං ඵස්සං[1] – දුක්ඛවෙදනීයං ඵස්සං[1] – අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං[1] – කුසලං ඵස්සං – අකුසලං ඵස්සං– අව්‍යාකතං ඵස්සං – කාමාවචරං ඵස්සං – රූපාවචරං ඵස්සං – අරූපාවචරං ඵස්සං – ලොකියං ඵස්සං* විවිත්තං පස්සති අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා; අථවා අතීතං ඵස්සං අනාගතෙහි ච[2] පච්චුප්පන්නෙහි ච ඵස්සෙහි විවිත්තං පස්සති, අනාගතං ඵස්සං අතීතෙහි ච පච්චුප්පන්නෙහි ච ඵස්සෙහි විවිත්තං පස්සති, පච්චුප්පන්නං ඵස්සං අතීතෙහි ච අනාගතෙහි[3] ච ඵස්සෙහි විවිත්තං පස්සති; අථවා, යෙ තෙ ඵස්සා අරියා අනාසවා ලොකුත්තරා සුඤ්ඤතාපටිසඤ්ඤුත්තා, තෙ ඵස්සෙ විවිත්තෙ පස්සති රාගෙන දොසෙන මොහෙන කොධෙන උපනාහෙන මක්ඛෙන පළාසෙන ඉස්සාය මච්ඡරියෙන මායාය සාඨෙය්‍යෙන ථම්භෙන සාරම්භෙන මානෙන අතිමානෙන මදෙන පමාදෙන සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි විවිත්තෙ පස්සතීති – 'විවෙකදස්සී ඵස්සෙසු.'

**දිට්ඨීසු ච න නීයතීති** – තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො දිට්ඨියා න යායති න නීයති න වුය්හති න සංහරීයති නපි තං දිට්ඨිගතං සාරතො පච්චෙති න පච්චාගච්ඡතීති – 'දිට්ඨීසු ච න නීයති.'

තෙනාහ භගවා:

"නිරාසත්ති අනාගතෙ අතීතං නානුසොචති,
විවෙකදස්සී ඵස්සෙසු දිට්ඨීසු ච න නීයතී"ති.

**10 – 5**

පතිලීනො අකුහකො අපිහාලු අමච්ඡරී,
අප්පගබ්භො අජෙගුච්ඡො පෙසුණෙය්‍යෙ ච නො යුතො.

---

1. සම්ඵස්සං - PTS. ස්‍යා. 2. අනාගතෙහි ච ඵස්සෙහි - PTS. ස්‍යා.
3. පච්චුප්පන්නෙහි - සීමු. II.

* 'ලොකුත්තරං ඵස්ස'න්ති පාඨො ස්‍යාම - PTS. පොත්ථකෙසු දිස්සති.

**විවෙකදස්සී ඵස්සෙසු** - 'ඵස්ස' නම්: චක්ෂුර්විඥානසහජාත ස්පර්ශය ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා - කාය - මනොවිඥානසහජාත ස්පර්ශය අධිවචන (=මනොද්වාරික) ස්පර්ශය ප්‍රතිඝ (=පඤ්චද්වාරික) ස්පර්ශය සුඛවෙදනා උපදවන ස්පර්ශය දුඃඛ - උපෙක්ෂාවෙදනීය ස්පර්ශය කුශලචිත්තසහජාත ස්පර්ශය අකුශල - අව්‍යාකෘත - කාමාවචර - රූපාවචර - අරූපාවචර - ශූන්‍යත - අනිමිත්ත - අප්‍රණිහිත - ලෞකික - ලොකොත්තර - අතීත - අනාගත - ප්‍රත්‍යුත්පන්න ස්පර්ශය යන මෙබඳු වූ යම් පහසෙක් පහස්නා අයුරෙක් සංස්පර්ශාකාරයෙක් සංස්පර්ශී කල බවෙක් වේ ද, මේ 'ඵස්ස' යයි කියනු ලැබේ. **විවෙකදස්සී ඵස්සෙසු** - චක්ෂුඃසංස්පර්ශය ආත්මයෙන් හෝ ආත්මනීයභාවයෙන් හෝ නිත්‍ය බැවින් - ධ්‍රැව - ශාශ්වත - අවිපරිණාමභාවයෙන් හෝ වෙන් කොට දකී, ශ්‍රොත්‍රසංස්පර්ශය...ඝ්‍රාණ - ජිහ්වා - කාය - මනො-අධිවචනසංස්පර්ශය - පටිඝ - සුඛවෙදනීය - දුක්ඛවෙදනීය - කුසල - අකුසල අව්‍යාකෘත - කාමාවචර - රූපාවචර - අරූපාවචර - ලෞකිකස්පර්ශය ආත්මභාවයෙන් හෝ ආත්මනීය - නිත්‍ය - ධ්‍රැව - ශාශ්වත - අවිපරිණාමස්වභාවයෙන් හෝ වෙන් කොට දකී; නොහොත් අතීතස්පර්ශය අනාගත වූ ද වර්තමාන වූ ද පහසුන් ගෙන් වෙන් කොට දකී, අනාගතස්පර්ශය අතීත-ප්‍රත්‍යුත්පන්නස්පර්ශයන්ගෙන් ද වෙන් කොට දකී, වර්තමානස්පර්ශය අතීත-අනාගතස්පර්ශයන්ගෙන් ද වෙන් කොට දකී; නොහොත් යම් ඒ පහස් කෙනෙක් ආර්‍ය්‍ය වූවාහු අනාශ්‍රව වූවාහු ලොකොත්තර වූවාහු ශූන්‍යතා ප්‍රතිසංයුක්ත වූවාහු ද, ඒ ස්පර්ශයන් වෙන් වූවන් කොට දකී, රාගයෙන් ද්වෙෂයෙන් මොහයෙන් ක්‍රොධයෙන් උපනාහයෙන් මක්ඛයෙන් පලාසයෙන් ඊර්ෂ්‍යායෙන් මාත්සර්‍ය්‍යයෙන් මායාවෙන් ශාඨ්‍යයෙන් ස්තම්භයෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් සියලු කෙලෙසුන්ගෙන් සියලු දුශ්චරිතයන්ගෙන් සියලු දරථයන්ගෙන් සියලු පරිදාහයන්ගෙන් සියලු සන්තාපයන්ගෙන් සියලු අකුශලාභිසංස්කාරයන්ගෙන් වෙන් වූවන් කොට දකී නුයි 'විවෙකදස්සී ඵස්සෙසු' යනු වේ.

**දිට්ඨීසු ච න නීයති** - ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු ඥානාග්නීන් දග්ධ වූවාහුය, හේ දෘෂ්ටිය විසින් නො යවනු ලැබෙයි නො පමුණුවනු ලැබෙයි නො හරිනු ලැබෙයි, ඒ දෘෂ්ටිගතයට සාරහෙයින් නො ද පැමිණෙයි, නො පෙරලා ඒ නුයි 'දිට්ඨීසු ච න නීයති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"නිරාසත්ති අනාගතෙ -පෙ- දිට්ඨීසු ච න නීයති"**යි.

**10 - 5**

යමෙක් රාගාදිය ප්‍රහීණ කෙළෙ කුහක නො වූයේ තෘෂ්ණා රහිත වූයේ නො මසුරු වූයේ කායාදි ප්‍රගල්භ රහිත වූයේ ජුගුප්සා නො කටයුතු වූයේ පිසුනු කීමෙහි නො යෙදුණේ ත් වේ ද, (ඔහු උපශාන්ත යයි කියමි.)

**පතිලීනො අකුහකොති** – ‘පතිලීනො’ති රාගස්ස පහීනත්තා පතිලීනො දොසස්ස-මොහස්ස පහීනත්තා පතිලීනො; කොධස්ස -උපනාහස්ස -මක්ඛස්ස- පළාසස්ස -ඉස්සාය – මච්ඡරියස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං පහීනත්තා පතිලීනො[1] වුත්තං හෙතං භගවතා: ‘කථඤ්ච භික්ඛවෙ භික්ඛු පතිලීනො[1] හොති? ඉමස්ස භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු පතිලීනො හොතී’’ති[a] ‘පතිලීනො.’

**අකුහකොති**[2] – තීණි කුහනවත්ථූනි: පච්චයපටිසෙධනසඞ්ඛාතං[3] කුහනවත්ථු,[4] ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු, සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං පච්චයපටිසෙධනසඞ්ඛාතං[3] කුහනවත්ථු? ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො පාපිච්ඡො ඉච්ඡාපකතො අත්ථිකො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං භිය්‍යොකම්‍යතං උපාදාය චීවරං පච්චක්ඛාති පිණ්ඩපාතං පච්චක්ඛාති. සෙනාසනං පච්චක්ඛාති. ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පච්චක්ඛාති. සො එවමාහ: කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන? එතං සාරුප්පං – යං සමණො සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සඞ්ඝාටිං ධාරෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන පිණ්ඩපාතෙන? එතං සාරුප්පං – යං සමණො උඤ්ඡාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිකං කප්පෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන සෙනාසනෙන? එතං සාරුප්පං – යං සමණො රුක්ඛමූලිකො වා අස්ස සොසානිකො වා අබ්භොකාසිකො වා. කිං සමණස්ස මහග්ඝෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන? එතං සාරුප්පං – යං සමණො පූතිමුත්තෙන වා හරීතකීඛණ්ඩෙන වා ඔසධං කරෙය්‍යාති. තදුපාදාය ලූඛං චීවරං ධාරෙති. ලූඛං පිණ්ඩපාතං පරිභුඤ්ජති. ලූඛං සෙනාසනං පටිසෙවති. ලූඛං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති. තමෙනං ගහපතිකා එවං ජානන්ති, අයං සමණො අප්පිච්ඡො සන්තුට්ඨො පවිවිත්තො අසංසට්ඨො ආරද්ධවිරියො ධුතවාදො’ති. භිය්‍යො භිය්‍යො නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො එවමාහ: “තිණ්ණං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති: සද්ධාය සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. තුම්හාකං චෙවායං සද්ධා අත්ථි, දෙය්‍යධම්මො ච සංවිජ්ජති. අහඤ්ච පටිග්ගාහකො. සචෙහං න පටිග්ගහෙස්සාමි, එවං තුම්හෙ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ[5]. න මය්හං ඉමිනා අත්ථො. අපි ච, තුම්හාකං යෙව අනුකම්පාය පටිග්ගණ්හාමී’’ති. තදුපාදාය බහුම්පි චීවරං පටිග්ගණ්හාති. බහුම්පි පිණ්ඩපාතං පටිග්ගණ්හාති. බහුම්පි සෙනාසනං පටිග්ගණ්හාති. බහුම්පි ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිග්ගණ්හාති. යා එවරූපා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං පච්චයපටිසෙධනසඞ්ඛාතං කුහනවත්ථු.

---

1. පටිලීනො - මජසං. 2. අකුහකො - මජසං.
3. පච්චයපටිසෙවනසඞ්ඛාතං - සීමු II. මජසං
4. කුහනවත්ථුං සීමු II.
a. චතුක්කඞ්ගුත්තර - චක්කවග්ග. 5. භවිස්සන්ති - සීමු. II.

**පතිලීනො අකුහකො** – 'පතිලීනො' යනු: රාගය ප්‍රහීණ කළ බැවින් 'පතිලීන' යැ, ද්වේෂය – මෝහය ප්‍රහීණ කළ බැවින් – ක්‍රෝධය – උපනාහය – මක්‍ෂබව – යුගග්‍රාහය – ඊර්ෂ්‍යාව – මාත්සර්‍ය්‍යය...සියලු අකුශලාභිසංස්කාරයන් ප්‍රහීණ කළ බැවින් 'පතිලීන' යැ; මේ වදාරන ලද මැය, භාග්‍යවතුන් විසින්: "කෙසේ නම් මහණෙනි, මහණ තෙමේ පතිලීන වේ ද? මහණෙනි, මේ මහණහුගේ අස්මිමානය ප්‍රහීණ වූයේ උපුත් මුල් ඇත්තේ තාල වස්තුවක් මෙන් කරන ලද්දේ අනභාවය කරන ලද්දේ මතු නූපදනා පියවි ඇත්තේ වෙයි. මෙසේ මහණෙනි, මහණ පතිලීන වේ යැ"යි 'පතිලීනො' යනු වේ.

**අකුහකො** – කුහනවස්තු තුනෙකි ප්‍රත්‍යයප්‍රතිෂේධනසඞ්ඛ්‍යාත කුහන වස්තුව යැ ඊර්‍යාපථසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ සාමන්තජල්පනසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැයි.

ප්‍රත්‍යයප්‍රතිෂේධනසඞ්ඛ්‍යාත කුහනවස්තුව කවරැ යත්? මෙහි ගැහැවියෝ මහණක් හට සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකරින් පවරති, හෙතෙම පාපෙච්ඡ වූයේ ආශායෙන් මඩනා ලදුයේ සිවුරු...බෙහෙත් පිරිකර කැමැති වූයේ බොහෝ කැමැති බව නිසා චීවරය ප්‍රතික්‍ෂෙප කරයි. පිණ්ඩපාතය – සෙනස්න – ගිලන්පසබෙහෙත්පිරිකර ප්‍රතික්‍ෂෙප කරයි. හේ මෙසේ කියයි: 'මහණහට මාහැඟි සිවුරෙන් කිම? යම් හෙයකින් මහණ තෙමේ සොහොනින් හෝ කසළගොඩින් හෝ අවුණු රෙදිකැබැලි රැස් කොට සඟළ කොට දරන්නේ නම් තෙල සරුප් වෙයි; මහණ හට මාහැඟි පිණ්ඩපාතයෙන් කිම? යම් හෙයකින් මහණ සිඟා හැසිරීමෙන් පිණ්ඩපාතයෙන් ලද ආලොපයෙන් ජීවිකාව කරන්නේ නම්, තෙල සරුප් වෙයි. මහණ හට මාහැඟි සෙනස්නෙන් කිම? යම් හෙයකින් මහණ රුක්ඛමූලික හෝ සොසානික හෝ අබ්භොකාසික හෝ වන්නේ නම්, තෙල සරුප් වෙයි. මහණ හට මාහැඟි ගිලන්පසබෙහෙත්පිරිකරින් කිම? යම් හෙයකින් මහණ පූතිමූත්‍රයෙන් හෝ අරළුකණ්ඩකින් හෝ බෙහෙත් කරන්නේ නම්, තෙල සරුප් යැයි. එතැන් පටන් රළු සිවුරු දරයි, රළු පිණ්ඩපාතය වළඳයි, රළු සෙනසුන් ඇසුරු කරයි, රළු ගිලන්පසබෙහෙත්පිරිකර සේවනය කරයි. ගෘහපතියෝ ඔහු මෙසේ දැනගනිති: 'මේ මහණ අල්පෙච්ඡ යැ, සන්තුෂ්ට යැ 'ප්‍රවිවික්ත යැ' අසංසෘෂ්ට යැ, ආරබ්ධවීර්‍ය්‍යය යැ, ධුතවාද යැ'යි චීවර...බෙහෙත්පිරිකරින් මතුමත්තෙහි පවරත්. හෙතෙම මෙසේ කියයි: "තිදෙනකුන්ගේ සම්මුඛ භාවයෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍ර තෙමේ බොහෝ පින් රැස් කරයි: ශ්‍රද්ධාව හමු වීමෙන් සැදැහැති කුලපුත් තෙම බොහෝ පින් රැස් කරයි, දෙය්‍යධර්මය ඉදිරිපත් වීමෙන්...ප්‍රතිග්‍රාහකයන් සම්මුඛ වීමෙන් සැදැහැවත් කුලපුත්‍ර තෙම බොහෝ පින් රැස් කරයි; තොපට වැලිත් මේ ශ්‍රද්ධාව ඇත් මැය, දෙය්‍යධර්මය ද විද්‍යමාන වෙයි, මම ද ප්‍රතිග්‍රාහක වෙමි; ඉදින් මම් නො පිළිගනිම් නම්, මෙසේ කල්හි තෙපි පිනින් පරිබාහිර වන්නාහුය, මට මෙයින් ප්‍රයොජනයෙක් නැත, තොපට මැ අනුකම්පා පිණිස පිළිගනිමි"යි එතැන් පටන් බොහෝ සිවුරුත් පිළිගනී, බොහෝ පිණ්ඩපාතයත් – බොහෝ සෙනාසනත් – බොහෝ ගිලන්පසබෙහෙත්පිරිකරත් පිළිගනී. මෙබඳු වූ යම් මුහුණ හැකිළීමෙක් මුහුණ හකුළුවනා සුලු බවෙක් විස්මය කරවීමෙක් කුහනාකාරයෙක් කුහිත (–කොහොන්) බවෙක් වේ ද, මේ ප්‍රත්‍යයප්‍රතිෂේධනසඞ්ඛ්‍යාත කුහනවස්තු යැ.

කතමං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො 'එවං මං ජනො සම්භාවෙස්සතී'ති ගමනං සණ්ඨපෙති. ඨානං සණ්ඨපෙති. නිසජ්ජං සණ්ඨපෙති. සයනං සණ්ඨපෙති. පණිධාය ගච්ඡති. පණිධාය තිට්ඨති. පණිධාය නිසීදති. පණිධාය සෙය්‍යං කප්පෙති. සමාහිතො විය ගච්ඡති. සමාහිතො විය තිට්ඨති. සමාහිතො විය නිසීදති. සමාහිතො විය සෙය්‍යං කප්පෙති. ආපාථකජ්ඣායී ච හොති.[1] යා එවරූපා ඉරියාපථස්ස අට්ඨපනා[2] ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො 'එවං මං ජනො සම්භාවෙස්සතී'ති[3] අරියධම්මසන්නිස්සිතං වාචං භාසති: 'යො එවරූපං චීවරං ධාරෙති, සො සමණො මහෙසක්ඛො'ති භණති. 'යො එවරූපං පත්තං ධාරෙති, ලොහථාලකං ධාරෙති, ධම්මකරකං[4] ධාරෙති, පරිස්සාවනං ධාරෙති, කුඤ්චිකං ධාරෙති, උපාහනං ධාරෙති, කායබන්ධනං ධාරෙති, ආයොගං ධාරෙති, සො සමණො මහෙසක්ඛො'ති භණති. 'යස්ස එවරූපො උපජ්ඣායො සො සමණො මහෙසක්ඛො'ති භණති. 'යස්ස එවරූපො ආචරියො, එවරූපා සමානුපජ්ඣායකා, සමානාචරියකා, එවරූපා මිත්තා සන්දිට්ඨා සම්භත්තා සහායා, සො සමණො මහෙසක්ඛො'ති භණති. 'යො එවරූපෙ විහාරෙ වසති, සො සමණො මහෙසක්ඛො'ති භණති. යො එවරූපෙ අඩ්ඪයොගෙ වසති, පාසාදෙ වසති, හම්මියෙ වසති, ගුහායං වසති, ලෙණෙ වසති, කුටියා වසති, කූටාගාරෙ වසති, අට්ටෙ වසති, මාළෙ වසති, උද්දණ්ඩෙ වසති, උපට්ඨානසාලායං වසති, මණ්ඩපෙ වසති, රුක්ඛමූලෙ වසති, සො සමණො මහෙසක්ඛො'ති භණති. අථවා, කොරඤ්ජිකකොරඤ්ජිකො භාකුටිකභාකුටිකො කුහකකුහකො ලපකලපකො, මුඛසම්භාවිතො 'අයං සමණො ඉමාසං එවරූපානං සන්තානං විහාරසමාපත්තීනං ලාභී'ති[5] තාදිසං ගම්භීරං ගුළ්හං[6] නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතාපටිසංයුත්තං කථං කථෙති. යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං. ඉදං වුච්චති සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

යස්සිමානි තීණි කුහනවත්ථූනි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො වුච්චති අකුහකොති - 'පතිලීනො අකුහකො.'

1. ආපාථකජ්ඣායි ච - මජසං. සයා. PTS. මු. II.
2. ආඨපනා - PTS. ඨපනා, ආඨපනා මජසං. 3. සම්භාවිස්සතීති - PTS.
4. ධම්මකරණං - මජසං. 5. ලාභි - PTS. 6. ගුය්හං - PTS.

ඊර්යාපථසංඛ්‍යාත කුහනවස්තුව කවරේ යත්? මෙහි කිසිවෙක් පවිටු වූ අදහස් ඇතියේ ඉච්ඡායෙන් මඩනා ලදුයේ බුහුමන් කරවන අදහස් ඇතියේ 'මෙසේ ජන තෙමේ මා බුහුමන් කරන්නේ යැ'යි ගමන සකස් කෙරෙයි, සිටීම - හිඳීම - ශයනය සකස් කෙරෙයි. පතාගෙන (-සිත පිහිටුවා) යෙයි. පතා ගෙන සිටී. පතාගෙන හිඳී, පතාගෙන නිදයි. ධ්‍යාන සමාපන්නයකු මෙන් ගමන් යෙයි. සමාහිතයකු මෙන් සිටී. සමාහිතයකු මෙන් හිඳී, සමාහිතයකු මෙන් නිදයි. හමුයෙහි ධ්‍යාන කරන්නේ ද වෙයි. මෙබඳු යම් ඉරියවු ආදියෙහි තැබීමෙක් තබන අයුරෙක් මොනොවට තැබීමෙක් මුහුණ හැකිළීමෙක් මුහුණ හකුළුවන බවෙක් විස්මය කැරවීමෙක් විස්මය පැවැත් වීමෙක් කොහොත් බවෙක් වේ ද. මේ ඊර්යාපථසංඛ්‍යාත කුහනවස්තුව යැ.

සාමන්තජල්පන සංඛ්‍යාත කුහනවස්තුව කවරේ යත්? මෙහි කිසිවෙක් පවිටු අදහස් ඇතියේ ආශායෙන් මඩන ලදුයේ 'ජනයා මා මෙසේ සලකන්නේයැ'යි බුහුමන් කරවන අදහස් ඇතියේ ආර්‍යධර්මයන් ඇසුරු කල බස් බෙණෙයි: 'යමෙක් මෙබඳු සිවුරක් දරා නම් ඒ මහණ මහත් අනුහාව ඇත්තේ යැ'යි බෙණෙයි, යමෙක් මෙබඳු පාත්‍රයක් දරා නම්, ලෝහො තලුවක් - ධම්කරුවක් - පෙරහනක් - කෙස්සක් - වහනක් - කාබානක් - ආධාරකයක් දරා නම්, ඒ මහණ මහත් අනුහාව ඇත්තේ යැ'යි බෙණෙයි. 'යමක් හට මෙබඳු වූ උපාධ්‍යායයෙක් වේ නම්, ඒ මහණ මහානුභාව ඇත්තේ යැ'යි බෙණෙයි. මෙබඳු වූ ආචාර්‍යයෙක් - සමානෝපාධ්‍යායයෝ - සමානාචාර්‍යයෝ - මිත්‍රයෝ - දෘෂ්ටමාත්‍රමිත්‍රයෝ - සම්භක්තයෝ - සහායයෝ වේද නම්, ඒ මහණ මහේශාක්‍ය යැ'යි කියයි. 'යමෙක් මෙබඳු විහාරයෙක වෙසේ නම්, දික් පනයෙක - සිවුරුස්පහයෙක - සඳලු ඇති ගෙයෙක - ගල් ගුහායෙක - ගල්ලෙනෙක - කිලියෙක - කුළුගෙයෙක - අටල්ලෙක - මහලෙක - දිග්නලෙක - උපස්ථානශාලායෙක - මණ්ඩපයෙක - රුක්මුලෙක වෙසේ නම්, ඒ මහණ මහත් අනුහාව ඇත්තේ යැ'යි කියයි. නොහොත් ඉතා හැකිලෙනුයේ ඉතා මුහුණුහකුළුවන සුලු වූයේ ඉතා විස්මය කරවනුයේ ඉතා ප්‍රලාප නෙපුල් බණනුයේ සිය මුවින් මැ (අනුන් විසින්) සම්භාවනා කරන ලද්දේ 'මේ මහණ මෙබඳු වූ ශාන්ත වූ විහාරසමාපත්තීන් ලබනසුලු යැ'යි එබඳු වූ ගැඹුරු වූ ගුඪ වූ සියුම් වූ මුවහ කටයුතු වූ ලොකොත්තර වූ නිර්වාණප්‍රතිසංයුක්ත වූ කථා කියයි. මෙබඳු යම් මුහුණ හැකුළුමෙක් මුහුණ හකුළුවන බවෙක් විස්මය කැරවීමෙක් විස්මය පැවැත් වීමෙක් කොහොත් බවෙක් වේ ද, මේ සාමන්තජල්පනසංඛ්‍යාත කුහනවස්තුව යැයි කියනු ලැබේ.

යමක්හු විසින් මේ තුන් කුහනවස්තූහු ප්‍රහීණ කරන ලද්දාහු... ඥානාග්නීන් දග්ධ වූවාහු ද, හේ 'අකුහක' යැයි කියනු ලැබේ නුයි 'පතිලීනො අකුහකො' යනු වේ.

**අපිහාලු අමච්ඡරීති** – ‘පිහා’ වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං.ඍ යස්සෙසා පිහා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අපිහාලු; සො රූපෙ න පිහෙති. සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ, කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං, චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං, කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං, අතීතං අනාගතං පච්චුප්පන්නං, දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ න පිහෙති න ඉච්ඡති න සාදියති න පත්ථෙති නාභිජප්පතීති – අපිහාලු; **අමච්ඡරීති** පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං වණ්ණමච්ඡරියං ලාභමච්ඡරියං ධම්මමච්ඡරියං,ඍ යං එවරූපං මච්ඡරියං[1] මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා[2] අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං. අපිච, ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං, ගාහො, ඉදං වුච්චති මච්ඡරියං. යස්සෙතං මච්ඡරියං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අමච්ඡරීති – අපිහාලු අමච්ඡරී.

**අප්පගබ්භො අකුක්කුච්චොති** – ‘පාගබ්භිය’න්ති තීණි පාගබ්භියානි: කායිකං පාගබ්භියං වාචසිකං පාගබ්භියං චෙතසිකං පාගබ්භියං. කතමං කායිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි කායිකං පාගබ්භියං දස්සෙති. ගණගතොපි කායිකං පාගබ්භියං දස්සෙති. භොජනසාලායම්පි කායිකං පාගබ්භියං දස්සෙති. ජන්තාඝරෙපි කායිකං පාගබ්භියං දස්සෙති. උදකතිත්ථෙපි කායිකං පාගබ්භියං දස්සෙති. අන්තරඝරං පවිසන්තොපි කායිකං පාගබ්භියං දස්සෙති. අන්තරඝරං පවිට්ඨොපි කායිකං පාගබ්භියං දස්සෙති.

කථං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති. ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තීකාරකතො ථෙරානං භික්ඛූනං අනුපාහනානං චඞ්කමන්තානං සඋපාහනො චඞ්කමති. නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං උච්චෙ චඞ්කමෙ චඞ්කමති. ඡමාය[3] චඞ්කමන්තානං චඞ්කමෙ චඞ්කමති, ඝට්ටයන්තොපි තිට්ඨති. ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති.

---

ඍ. ඛුද්දකවත්ථුවිභඞ්ග.

1. මච්ඡෙරං - මජසං  2. කටුකඤ්චුකතා - PTS  3. ඡමායං, PTS. ස්‍යා

**අපිහාලු අමච්ඡරී** – 'පිහා'යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක්... ලොභඅකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල පිහාව තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී – නුවණගින්නෙන් දවන ලද්දී ද හේ 'අපිහාලු යැයි කියනු ලැබෙයි. හෙතෙම රූපයන් නො කැමැති වෙයි. ශබ්ද – ගන්ධ-රස ස්ප්‍රෂ්ටව්‍යයන් - කුලය – ගණයා – ආවාසය – ලාභය – යශස් – ප්‍රශංසා– සුඛය, චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලන්පසබෙහෙසත්පිරිකර, කාම– ධාතුව – රූප – අරූපධාතුව, කාමභවය – රූප – අරූප – සංඥ – අසංඥ– නෙවසංඥනාසංඥ – එකවොකාර – චතුවොකාර – පඤ්චවොකාරභවය, අතීත – අනාගත – ප්‍රත්‍යුත්පන්නාය, දෘෂ්ටශ්‍රැතමූතවිඥාතව්‍යධර්මයන් නො කැමැති වෙයි, නො රිසි වෙයි, නො ඉවසයි, නො පතයි, අභිජල්පනය නො කෙරේ නුයි 'අපිහාලු' යනු වේ. **අමච්ඡරී** 'ආවාසමච්ඡරිය කුලමච්ඡරිය වණ්ණමච්ඡරිය ලාභමච්ඡරිය ධම්මමච්ඡරිය' යි මාත්සයර්‍ය පසෙක් වෙයි; මෙබඳු යම් මසුරුබවෙක් මසුරු කරන අයුරෙක් මසුරුකමින් යුත් බවෙක් (සම්පත්) සඟවනු කැමැතිබවෙක් තදමසුරුබවෙක් කටුකබැවින් සිත හැකිළීමෙක් සිත හාත්පසින් ගත්බවෙක් වේ ද, මේ 'මච්ඡරිය'යි කියනු ලැබේ. තවද ස්කන්ධමාත්සයර්‍ය ද 'මච්ඡරිය' යැ ධාතුමාත්සයර්‍ය ද– ආයතනමාත්සයර්‍ය ද 'මච්ඡරිය' යැ, ග්‍රාහයැ යන මේ 'මච්ඡරිය' යි කියනු ලැබෙයි. යමක්හු විසින් තෙල මාත්සයර්‍ය ප්‍රහීණ කරන ලද ද...නුවණ ගින්නෙන් දවන ලද ද, හේ 'අමච්ඡරී' යැයි කියනු ලැබේ නුයි 'අපිහාලු අමච්ඡරී' යනු වේ.

**අප්පගබ්භො අජෙගුච්ඡො** – 'පාගබ්භිය' නම්: කායික ප්‍රාගල්භ්‍ය (–බුහුටිබව) යැ, වාචසික ප්‍රාගල්භ්‍ය යැ, චෛතසික ප්‍රාගල්භ්‍ය යැයි ප්‍රාගල්භ්‍යයෝ තිදෙනෙක් වෙති. කායික ප්‍රාගල්භ්‍යය කවරැ යත්? මෙහි කිසිවෙක් සඟමැදට පැමිණියේ ද කායිකප්‍රාගල්භ්‍ය (–නො සරුප් බුහුටිබව) දක්වයි, ගණමැදට ගියේ ද – භොජනශාලායෙහි දු – ගිනිහල්ගෙයි දු – දිය තොටෙහි දු – ඇතුළුගමට පිවිසෙනුයේ ද – ඇතුළුගමට පිවිසියේ ද– කායිකප්‍රගල්භතාව දක්වයි.

කෙසේ සඟමැදට පැමිණියේ කායික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත්? මෙහි එකෙක් සඟමැදට පැමිණියේ නො කළ බුහුමන් ඇතියේ ස්ථවිර භික්ෂූන් ගටම්නු දු සිටී, ගටම්නු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්තෙහිදු හිඳී, හිස් වසා පෙරවැ හිඳී. සිට ද බෙණෙයි, අත සලසලා ද බෙණෙයි. මෙසේ සඟමැදට පැමිණියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ගණමැදට පැමිණියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත්? මෙහි එකෙක් ගණමැදට පැමිණියේ බුහුමන් රහිත වූයේ ස්ථවිරභික්ෂූන් වහන් නැති වැ සක්මන් කරන කල්හි වහන් නැඟී සක්මන් කෙරෙයි, පහත් සක්මනැ සක්මන් කරන කල්හි උස් සක්මනැ සක්මන් කෙරෙයි, බිමැ සක්මන් කරන කල්හි සක්මනෙහි සක්මන් කෙරෙයි, ගටම්නු දු සිටී, ගටම්නු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්තෙහි දු හිඳී, හිස් වසා පෙරවැ හිඳී, සිට ද බෙණෙයි, අත සල සලා ද බෙණෙයි. මෙසේ ගණයා මැදට පැමිණියේ කායික වූ ප්‍රාගල්භ්‍යය (–නො සරුප් බුහුටිබව) දක්වයි.

කථං භොජනසාලායං කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො භොජනසාලායං අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදති. නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහති. ඝට්ටයන්තොපි තිට්ඨති. ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං භොජනසාලායං කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ජන්තාඝරෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. අනාපුච්ඡාපි කට්ඨං පක්ඛිපති. අනාපුච්ඡාපි ද්වාරං[1] පිදහති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො උදකතිත්ථෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ඔතරති. පුරතොපි ඔතරති. ඝට්ටයන්තොපි නහායති[2]. පුරතොපි නහායති. උපරිතොපි නහායති. ඝට්ටයන්තොපි උත්තරති. පුරතොපි උත්තරති. උපරිතොපි උත්තරති. එවං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිසන්තො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිසන්තො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ගච්ඡති. පුරතොපි ගච්ඡති. වොක්කම්මාපි ථෙරානං භික්ඛූනං පුරතො පුරතො[3] ගච්ඡති. එවං අන්තරඝරං පවිසන්තොපි කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො 'න පවිස[4] භන්තෙ'ති වුච්චමානො පවිසති. 'න තිට්ඨ භන්තෙ'ති වුච්චමානො තිට්ඨති. 'න නිසීද භන්තෙ'ති වුච්චමානො නිසීදති. අනොකාසම්පි පවිසති. අනොකාසෙපි තිට්ඨති. අනොකාසෙපි නිසීදති. යානි තානිපි හොන්ති කුලානං ඔවරකානි ගූළ්හානි ච පටිච්ඡන්නානි ච, යත්ථ කුලිත්ථියො කුලධීතරො[5] කුලසුණ්හායො කුලකුමාරිකායො නිසීදන්ති, තත්ථපි සහසා පවිසති. කුමාරකස්සපි සීසං පරාමසති. එවං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති.

කතමං වාචසිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති. ගණගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති. අන්තරඝරං පවිට්ඨොපි වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං සඞ්ඝගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. පාතිමොක්ඛං උද්දිසති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

---

1. ආකුලීත්වානං ද්වාරං - මජසං. PTS. පොත්ථකෙසු, 2. නහායති - මජසං.
3. පුරතො - PTS. 4. පවිස - මජසං. සයා. PTS.
5. කුලධීතායො - සීමු. II.

කෙසේ බොජුන්හල්හි කායික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් බොජුන්හල්හි බුහුමන් රහිත වූයේ ස්ථවිර භික්ෂූන් හුන් තැනට වැද හිඳී. නවක භික්ෂූන් ද අස්නෙන් පිළිබහයි. ගැටෙමිනු ද සිටී. ගැටෙමිනු ද හිඳී. ඉදිරියෙහි ද සිටී. ඉදිරියෙහි ද හිඳී. උසස්නෙහි ද හිඳී. හිස වසා පෙරවැගෙන ද හිඳී. සිට ද බෙණෙයි. අත සල සලා ද බෙණෙයි. මෙසේ බොජුන්හල්හි කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ගිනිහල්ගෙහි කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ජන්තාඝරයෙහි බුහුමන් රහිත වූයේ ස්ථවිරභික්ෂූන් ගටමිනි ද සිටී...නො පිළිවිසැ දර හා බහාලයි. නො පිළිවිසැ දොර හා පියා ලයි. අත සල සලා ද බෙණෙයි. මෙසේ ජන්තාඝරයෙහි කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ පැන්තොටැ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් පැන්තොට බුහුමන් රහිත වූයේ ස්ථවිරභික්ෂූන් ගටමිනු ද බසී. පෙරටුව ද බසී. ගටමිනු ද නහයි. ඉදිරියෙහි ද නහයි. උඩුගංහි ද නහයි. ගටමිනු ද නැගෙයි, පෙරටුව ද නැගෙයි, උඩිනු ද නැගෙයි. මෙසේ පැන්තොටැ කායික ප්‍රගල්භ බව දක්වයි.

කෙසේ ගොදුරුගමට වදනේ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ගොදුරුගමට වදනේ නො කල බුහුමන් ඇතියේ ස්ථවිරභික්ෂූන් ගටමිනු ද යෙයි. පෙරටුව ද යෙයි. ඉක්මවා ද ස්ථවිරභික්ෂූන්ට පෙරටු පෙරටුවැ යෙයි. මෙසේ ගොදුරුගමට පිවිසෙනුයේ ද කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ඇතුළුගමට පිවිසියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ඇතුළුගමට පිවිසියේ 'නො පිවිසෙත්න වහන්සැ'යි කියනු ලබන්නේ පිවිසෙයි. 'නො සිටින්න වහන්සැ'යි කියනු ලබන්නේ සිටී. 'නො හිඳින්න වහන්සැ'යි කියනු ලබන්නේ හිඳී. අනවකාශයට ද පිවිසෙයි, අනවකාශයෙහි ද සිටී, අනවකාශයෙහි ද හිඳී, කුලවැස්සන්ගේ (පියවින්) මුවහඩු ද (තිරආදියෙන්) මුවහකළා වූ ද කුලස්ත්‍රීන් කුලදුහිතෘන් කුලපුණ්‍යාවන් හිඳිනා යම් ඔවරක (-ඇතුළුගබඩා) වෙත් තම එහි ද ලාහෙලා පිවිසෙයි. කුමරුන් හිස ද පිරිමදී. මෙසේ ඇතුළුගමට පිවිසියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

වාචසික ප්‍රාගල්භ්‍යය කවර යත් ? මෙහි එකෙක් සඟමැදට ගියේ ද - ගණ මැදට ගියේ ද - ඇතුළුගමට පිවිසියේ ද වාචසිකප්‍රාගල්භ්‍යය දක්වයි: කෙසේ සඟමැදට ගියේ වාචසික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් සඟමැදට ගියේ නො කළ බුහුමන් ඇතියේ ස්ථවිරභික්ෂූන් නො පිළිවිසැ හෝ නො ඇණවන ලද වැ හෝ බණ කියයි. පැන විසඳයි. පාමොක් උදෙසයි. සිටියේ ද බෙණෙයි. අත සල සලා ද බෙණෙයි. මෙසේ සඟමැදට ගියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කථං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ආරාමගතානං භික්ඛූනං ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. ආරාමගතානං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො ඉත්ථිං වා කුමාරිං වා එවමාහ: 'ඉත්ථංනාමෙ, ඉත්ථංගොත්තෙ, කිං අත්ථි? යාගු අත්ථි? භත්තං අත්ථි? ඛාදනීයං අත්ථි? කිං පිවිස්සාම? කිං භුඤ්ජිස්සාම? කිං ඛාදිස්සාම,? කිං වා අත්ථි,? කිං වා මෙ දස්සථා'ති විප්පලපති. *එවං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති. ඉදං වාචසිකං පාගබ්භියං.

කතමං චෙතසිකං පාගබ්භියං? ඉධෙකච්චො න උච්චාකුලා පබ්බජිතො සමානො උච්චාකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන, න මහාකුලා පබ්බජිතො සමානො මහාකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන, න මහාභොගකුලා පබ්බජිතො සමානො මහාභොගකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන, න උළාරභොගකුලා පබ්බජිතො සමානො – න සුත්තන්තිකො සමානො සුත්තන්තිකෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන. න විනයධරො සමානො – න ධම්මකථිකො සමානො – න ආරඤ්ඤිකො සමානො – න පිණ්ඩපාතිකො සමානො – න පංසුකූලිකො සමානො – න තෙචීවරිකො සමානො – න සපදානචාරිකො සමානො – න ඛලුපච්ඡාභත්තිකො සමානො – න නෙසජ්ජිකො සමානො – න යථාසන්ථතිකො සමානො – න පඨමස්ස ඣානස්ස ලාභී සමානො පඨමස්ස ඣානස්ස ලාභිනා සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන. –පෙ– න නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභී සමානො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභිනා සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන. ඉදං චෙතසිකං පාගබ්භියං.

යස්සිමානි තීණි පාගබ්භියානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො වුච්චති අප්පගබ්භොති – 'අප්පගබ්භො.'

* යා එවරූපා -පෙ- ලාලප්පිතත්තං ඉතිපි මජ්ඣං PTS පොත්ථකෙසු දිස්සති. තං පන පරිච්ඡෙදනිද්දෙසෙ දෙසිතං ඉධ න යුජ්ජතීති මඤ්ඤෙ.

කෙසේ ගණමැදට ගියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ගණමැදට ගියේ නො කළ මුහුණත් ඇතියේ සංවිරහිකෘත් නො පිළිවිසෑ හෝ නො පවරන ලද්දේ හෝ අරමට වත් මහණුන්ට බණ කියයි, පැන විසඳයි, සිටියේ ද බෙණෙයි, අත සල සලා ද බෙණෙයි, අරමට වත් මෙහෙණනට – උවසුවනට – උවැසියනට බණ කියයි, පැන විසඳයි, සිටියේ ද බෙණෙයි. අත සලසලා ද බෙණෙයි. මෙසේ ගණමැදට ගියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ඇතුළුගමට පිවිසියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ගොදුරුගමට පිවිසියේ ස්ත්‍රියකට හෝ කුමරියකට හෝ මෙසේ කියයි: ‘මෙ නම් ඇත්තිය, මෙ ගොත් ඇත්තිය, කුමක් ඇද්ද ? කැඳ ඇත් ද, බත් ඇත් ද ? කැවුතු ඇත් ද ? කුමක් බොන්නමෝ ද ? කුමක් වළඳන්නමෝ ද ? කුමක් කන්නමෝ ද ? කුමක් හෝ ඇද්ද ? කුමක් හෝ මට දෙවු ද’යි නන් දොඩයි; මෙසේ අන්තරඝරයට පිවිසියේ වාචසික ප්‍රාගල්භ්‍යය දක්වයි. මෙ වාචසිකප්‍රාගල්භ්‍යය යි.

චෛතසිකප්‍රාගල්භ්‍යය කවරේ ද යත් ? මෙහි එකෙක් උසස් නො වූ කුලයෙන් නික්මෑ පැවිදි වූයේ උසස් කුලයෙන් පැවිදිවූවකු හා තමා සම කොට සිතින් දනයි, නො මහත්කුලයෙන් නික්මෑ පැවිදි වූයේ...නො මහත් භොග ඇති කුලයෙන් නික්මෑ පැවිදි වූයේ...උදාරභොගවත් නො වූ කුලයෙන් නික්මෑ පැවිදි වූයේ...සෞත්‍රාන්තිකයකු හා තමා සදෘශ කොට සිතින් දනයි, විනයධර නො වූයේ – ධර්මකථික නො වූයේ – ආරණ්‍යක නො වූයේ – පිණ්ඩපාතික නො වූයේ – පංසුකූලික නො වූයේ – තෛචීවරික නො වූයේ – සපදානචාරික නො වූයේ – ඛලුපච්ඡාභත්තික නො වූයේ – නෙසජ්ජික නො වූයේ – යථාසන්ථතික නො වූයේ – ප්‍රථමධ්‍යානලාභී නො වූයේ ප්‍රථමධ්‍යානලාභියකු හා තමා සදෘශ කොට සිතින් දනයි,... නෛවසංඥානාසංඥායතනසමාපත්තිලාභී නො වූයේ නෛවසංඥානාසංඥායතනසමාපත්තිලාභියකු හා තමා සදෘශ කොට සිතින් දනයි. මෙ චෛතසිකප්‍රාගල්භ්‍යය යි.

යමක්හු විසින් මෙ ත්‍රිවිධ ප්‍රගල්භභාවයෝ ප්‍රහීණ කරන ලද්දාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු ඥානාග්නීන් දග්ධ වූවාහු ද හේ අප්‍රගල්භ යයි කියනු ලැබේ නුයි ‘අප්පගබ්භො’ යනු වේ.

අජෙගුච්ඡොති - අත්ථි පුග්ගලො ජෙගුච්ඡො. අත්ථි අජෙගුච්ඡො. කතමො ච පුග්ගලො ජෙගුච්ඡො? ඉධෙකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො අසුචිසඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. අයං වුච්චති පුග්ගලො ජෙගුච්ඡො. අථවා, කොධනො හොති උපායාසබහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. අයං වුච්චති පුග්ගලො ජෙගුච්ඡො. අථවා, කොධනො හොති උපනාහී,* මක්ඛී හොති පළාසී, ඉස්සුකී හොති මච්ඡරී, සඨො හොති මායාවී, ථද්ධො හොති අතිමානී, පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨි, සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී; අයං වුච්චති පුග්ගලො ජෙගුච්ඡො.

කතමො ච පුග්ගලො අජෙගුච්ඡො? ඉධ භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අයං වුච්චති පුග්ගලො අජෙගුච්ඡො. අථවා, අක්කොධනො හොති අනුපායාසබහුලො, බහුම්පි වුත්තො සමානො නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. අයං වුච්චති පුග්ගලො අජෙගුච්ඡො. අථවා, අක්කොධනො හොති අනුපනාහී,* අමක්ඛී හොති අපළාසී, අනුස්සුකී හොති අමච්ඡරී, අසඨො හොති අමායාවී, අථද්ධො හොති අනතිමානී, න පාපිච්ඡො හොති, න මිච්ඡාදිට්ඨි, අසන්දිට්ඨිපරාමාසී හොති අනාධානගාහී සුප්පටිනිස්සග්ගී. අයං වුච්චති පුග්ගලො අජෙගුච්ඡො. සබ්බෙ බාලපුථුජ්ජනා ජෙගුච්ඡා. පුථුජ්ජනකල්‍යාණකං උපාදාය අට්ඨ අරියපුග්ගලා[1] අජෙගුච්ඡාති - අප්පගබ්භො අජෙගුච්ඡො.

පෙසුණෙය්‍යෙ ච නො යුතොති - 'පෙසුඤ්ඤ'න්ති ඉධෙකච්චො පිසුනවාචො[2] හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය; අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය; ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො, වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදං වුච්චති පෙසුඤ්ඤං.

* සයා°. PTS. පොත්ථකෙසු 'හොති' සද්දො සබ්බපදෙසු යොජිතො.
1. සබ්බා කල්‍යාණපුථුජ්ජනං උපාදාය අරියපුග්ගලා, PTS.
2. පිසුණවාචො - මජසං, සීමු. II.

අජෙගුච්ඡො – ජුගුප්සා (-පිළිකුල්) කටයුතු පුද්ගලයෙක් ඇත, ජුගුප්සා නො කටයුතු පුද්ගලයෙක් ඇත. ජුගුප්සා කටයුතු පුද්ගලයා කවරේ ද යත්? මෙහි එක් පුද්ගලයෙක් දුශ්ශීල වෙයි, ලාමකස්වභාව ඇත්තේ අපවිත්‍ර වූ සැකයෙන් සිහි කළයුතු හැසිරීම් ඇත්තේ සැඟ වූ කායවාක්කර්ම ඇත්තේ අශ්‍රමණ වූයේ 'ශ්‍රමණයෙමි' ප්‍රතිඥා ඇත්තේ අබ්‍රහ්මචාරී වූයේ 'බ්‍රහ්මචාරී වෙමි' ප්‍රතිඥා ඇත්තේ (කුසල් නැතියෙන්) ඇතුළත කුණු වූයේ රාගයෙන් තෙත් වූයේ කසළ වැනි වූයේ වේ. මේ පුද්ගල තෙම ජුගුප්සා කටයුත්තේ යයි කියනු ලැබේ. නොහොත් කිපෙන සුලු වූයේ උපායාස බහුල කොට ඇත්තේ වෙයි, මඳකුදු කියන ලද්දේ ලැගෙයි කිපෙයි ප්‍රකෘතිය හරී තදබවට පැමිණෙයි කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරෙයි. මේ පුද්ගල තෙමේ ජුගුප්සා කටයුතු වෙයි. නොහොත් කිපෙන සුලු වූයේ බද්ධවෛර ඇත්තේ වෙයි, මකු වූයේ යුගග්‍රාහ ඇත්තේ වෙයි, ඊර්ෂ්‍යා කරනුයේ මසුරු වූයේ වෙයි, ශඨ (-කෛරාටික) වූයේ මායා ඇත්තේ වෙයි, තද වූයේ අතිකමාන ඇත්තේ වෙයි, පාපෙච්ඡ වූයේ මිථ්‍යා-දෘෂ්ටි ඇත්තේ වෙයි, සවදෘෂ්ටිය පරාමර්ශ කරනුයේ දැඩි ව ගත්තේ දුර ලන්නට නො හැකි වූයේ වේ. මේ පුද්ගල තෙමේ ජුගුප්සිතව්‍ය යැයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් ජුගුප්සා නො කටයුත්තේ වේ ද යත්? මේ සස්නෙහි මහණ තෙමේ සිල් ඇත්තේ වෙයි, ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සංවර වූයේ වෙසෙයි, ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්ත වූයේ අණු මාත්‍ර වූ වරදෙහි දු භය දක්නේ මොනොවට ගෙන ශික්ෂා කොටසෙහි හික්මෙයි; මේ පුද්ගල තෙමේ ජුගුප්සා නො කටයුතු යැයි කියනු ලැබේ. නොහොත් නො කිපෙන සුලු වූයේ උපායාස බහුල කොට නැත්තේ වෙයි, බොහෝ කොට ද කියන ලද්දේ නො ඇලෙයි, නො කිපෙයි, ප්‍රකෘතිය නො හරී, තදබවට නො පැමිණෙයි, කෝපය ත් ද්වේෂය ත් නො සතුට ත් නො පහළ කෙරෙයි. මේ පුද්ගල තෙම ජුගුප්සා නො කටයුතු යයි කියනු ලැබේ. නොහොත් නො කිපෙනසුලු වූයේ බද්ධවෛර නැත්තේ වෙයි, නො මකු වූයේ යුගග්‍රාහ නැත්තේ වෙයි, ඊර්ෂ්‍යා නැත්තේ නො මසුරු වෙයි, ශඨ නො වූයේ මායා රහිත වෙයි, නො තද වූයේ අතිමාන රහිත වෙයි, ලාමක ආශා රහිත වූයේ මිථ්‍යාදෘෂ්ටි නැත්තේ වෙයි, සවකීය දෘෂ්ටිය පරාමර්ශ නො කරනුයේ දැඩි කොට නො ගත්තේ සුවසේ දුරලිය හැක්කේ වෙයි; මේ පුද්ගල තෙමේ අජුගුප්-සිතව්‍ය යයි කියනු ලැබේ. සියලු මැ බාලපෘථග්ජනයෝ ජුගුප්සා කට යුත්තෝ යැ කල්‍යාණපෘථග්ජනයා පටන් අෂ්ටාර්‍යපුද්ගලයෝ ජුගුප්සා නො කටයුත්තාහු යයි 'අප්පගබ්භො අජෙගුච්ඡො' යනු වේ.

පෙසුණෙය්‍යෙ ච නො යුතො – 'පෙසුඤ්ඤ' නම්: මෙහි එකෙක් පිසුනු බස් කියන්නේ වෙයි: මෙ තැනින් අසා මුත්ගේ බිඳුමට එතැන කියන්නේ වෙයි, එතැනින් හෝ අසා අරුන්ගේ බිඳීමට මුත්ට කියන්නේ වෙයි, මෙසේ සමඟවූවන් හෝ බිඳිනුයේ භෙදවූවන් හෝ දැඩි කරනුයේ වගී වීමෙහි ඇලුණේ වගී වූවන් කෙරෙහි රුචි ඇත්තේ වගී වූවන්ට සතුටු වනුයේ වගී කරන බස් කියන්නේ වෙයි; මේ පෛශුන්‍ය යයි කියනු ලැබේ.

අපිච, ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරති: පියකම්‍යතාය වා භෙදාධිප්පායො වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති? 'ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමී'ති එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති. කථං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති? 'කථං ඉමෙ නානා අස්සු, විනා අස්සු, වග්ගා අස්සු, ද්වෙධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං අඵාසුං විහරෙය්‍යු'න්ති එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති. යස්සෙතං පෙසුඤ්ඤං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො පෙසුඤ්ඤෙ නො[1] යුත්තො න යුත්තො නප්පයුත්තො න සමායුත්තොති - 'පෙසුනෙය්‍යෙ ච නො යුතො.'

තෙනාහ භගවා:

"පතිලීනො අකුහකො අපිහාලු අමච්ඡරී,
අප්පගබ්භො අජෙගුච්ඡො පෙසුනෙය්‍යෙ ච නො යුතො"ති.

## 10 - 6

සාතියෙසු අනස්සාවී අතිමානෙ ච නො යුතො,
සණ්හො ච පටිභානවා න සද්ධො න විරජ්ජති.

**සාතියෙසු අනස්සාවීති** - 'සාතියා' වුච්චන්ති පඤ්ච කාමගුණා. කිං කාරණා සාතියා වුච්චන්ති පඤ්ච කාමගුණා? යෙභුය්‍යෙන දෙවමනුස්සා පඤ්ච කාමගුණෙ ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්ති. තංකාරණා සාතියා වුච්චන්ති පඤ්ච කාමගුණා. යෙසං එසා සාතියා තණ්හා අප්පහීනා, තෙසං චක්ඛුතො රූපතණ්හා සවති ආසවති[2] සන්දති පවත්තති. සොතතො සද්දතණ්හා -පෙ- ඝානතො ගන්ධතණ්හා - ජිව්හාතො රසතණ්හා - කායතො ඵොට්ඨබ්බතණ්හා, මනතො ධම්මතණ්හා සවති ආසවති[2] සන්දති පවත්තති. යෙසං එසා සාතියා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; තෙසං චක්ඛුතො රූපතණ්හා න සවති නාසවති[3] න සන්දති නප්පවත්තති. සොතතො සද්දතණ්හා -පෙ- මනතො ධම්මතණ්හා න සවති නාසවති[3] න සන්දති න පවත්තතීති - 'සාතියෙසු අනස්සාවී.'

1. පෙසුඤ්ඤෙන - සිමු. II. 2. ආසවති - ස. මජුප.- පසවති PTS.
3. නාසවති - මජුප. නපසවති PTS.

තවද දෙකරුණෙකින් පිසුනු එළවා කියයි: ප්‍රියකාම්‍යතායෙන් හෝ භෙදාධිප්‍රාය ඇති වැ හෝ යැ. කෙසේ ප්‍රිය කැමැති බැවින් පිසුනු කියා ද යත්? මොහුට ප්‍රිය වන්නෙමි, මනාප වන්නෙමි, විස්වැසි වන්නෙමි, අභ්‍යන්තරික වන්නෙමි, සුහෘද් වන්නෙමි' මෙසේ ප්‍රියකාම්‍යතායෙන් පිසුනු බස් කියයි. කෙසේ භෙදාධිප්‍රායයෙන් පිසුනුබස් කියා ද යත්? මොහු කෙසේ නම් නානා වන්නාහු ද? වෙන් වන්නාහු ද? වගී වන්නාහු ද? දෙපරිදි වන්නාහු ද? දෙකඩ වන්නාහු ද? දෙ පසඃ වන්නාහු ද? බිඳෙන්නාහු නො එක්වන්නාහු ද? දුකසේ නො සුවයෙන් වෙසෙන්නාහු දැ'යි මෙසේ භෙද කරන අදහස් ඇති වැ පිසුනු කියයි. යමක්හු විසින් තෙල පෛශූන්‍යය ප්‍රහීණ ද සමුච්ඡින්න ද සන්හිඳුවන ලද ද, දුරලන ලද ද, අභව්‍යොත්පත්තික ද ඥානාග්නින් දග්ධ ද, හෙතෙම පෛශූන්‍යයෙහි නො යෙදුණේ අතිශයින් නො යෙදුණේ සංයුක්ත නො වූයේ නුයි 'පෙසුණෙය්‍ය ච නො යුතො' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

"පතිලීනො අකුහකො -පෙ- පෙසුණෙය්‍යෙ ච නො යුතො"යි.

## 10 - 6

(යමෙක් හට) පස්කම්ගුණයෙහි තෘෂ්ණාව නො පවතී ද, (යමෙක්) අතිමානයෙහි නො යෙදුණේත් වේ ද, සිනිඳු වූ කායකර්මාදියෙන් යුක්ත ද, ප්‍රතිභානයෙන් සමන්විත වූයේ ද, (පරප්‍රත්‍යයෙන්) නො හදහා ද, (වීතරාග හෙයින්) නො රඳනේ ත් වේ ද, (ඔහු උපශාන්ත යයි කියමි.)

**සාතියෙසු අනස්සාවී** - 'සාතියා'යි පස්කම් ගුණයෝ කියනු ලැබෙත්. කුමක් හෙයින් පස්කම්ගුණයෝ 'සාතියා' යි කියනු ලැබෙත් ද යත්? බොහෝ සෙයින් දෙවිමිනිස්හු පස් කම්ගුණයන් ආශා කෙරෙයි, ඉවසයි පතයි කැමැති වෙයි අභිජල්පන කෙරෙත්; එ කරුණෙන් පස් කම්ගුණයෝ 'සාතියා'යි කියනු ලැබෙයි. යම් කෙනකුන්ට මේ පඤ්චකාමගුණයෙහි තෘෂ්ණාව අප්‍රහීණ වූවා ද, ඔවුන්ට චක්ෂුර්ද්වාරයෙහි (ජවනසම්ප්‍රයුක්ත) රූපාලම්බනතෘෂ්ණාව උපදී, හාත්පසින් උපදී, ගලයි, පවතී. ශ්‍රොත්‍රද්වාරයෙහි ශබ්දතෘෂ්ණාව - ඝ්‍රාණද්වාරයෙහි ගන්ධතෘෂ්ණාව - ජිහ්වාද්වාරයෙහි රසතෘෂ්ණාව - කායද්වාරයෙහි ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව - මනොද්වාරයෙහි ධර්මතෘෂ්ණාව උපදී, හාත්පසින් උපදී, ගලයි පවතී; යම් කෙනකුන් විසින් මේ පඤ්චකාම ගුණ තෘෂ්ණාව ප්‍රහීණකරන ලද්දී සිඳින ලද්දී සන්හිඳුණී දුරලන ලද්දී අභව්‍යොත්පත්තික වූවා ඥානාග්නින් දවන ලද්දී ද, ඔවුන්ට චක්ෂුර්ද්වාරයෙහි රූපතෘෂ්ණාව නූපදී - ශ්‍රොත්‍රද්වාරයෙහි ශබ්දතෘෂ්ණාව...මනොද්වාරයෙහි ධර්මතෘෂ්ණාව නූපදී, හාත්පසින් නූපදී, නො ගලයි, නො පවතී නුයි 'සාතියෙසු අනස්සාවී' යනු වේ.

**අතිමානෙ ච නො යුතොති** – කතමො අතිමානො? ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති අතිමානො. යස්සෙසො අතිමානො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො අතිමානෙ ච නො යුතො න යුත්තො නප්පයුත්තො න සම්පයුත්තොති 'අතිමානෙ ච නො යුතො.'

**සණ්හො ච පටිභානවාති** – 'සණ්හො'ති සණ්හෙන කායකම්මෙන සමන්නාගතොති සණ්හො; සණ්හෙන වචීකම්මෙන සමන්නාගතොති සණ්හො; සණ්හෙන මනොකම්මෙන සමන්නාගතොති සණ්හො; සණ්හෙහි සතිපට්ඨානෙහි සමන්නාගතොති සණ්හො; සණ්හෙහි සම්මප්පධානෙහි- සණ්හෙහි ඉද්ධිපාදෙහි – සණ්හෙහි ඉන්ද්‍රියෙහි – සණ්හෙහි බලෙහි සණ්හෙහි බොජ්ඣඞ්ගෙහි සමන්නාගතොති සණ්හො; සණ්හෙන අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතොති සණ්හො; **පටිභානවාති** – තයො පටිභානවන්තො: පරියත්තිපටිභානවා පරිපුච්ඡාපටිභානවා අධිගමපටිභානවා. කතමො පරියත්තිපටිභානවා? ඉධෙකච්චස්ස පකතියාපි පරියාපුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං; තස්ස පරියත්තිං නිස්සාය පටිභාති[1]. අයං පරියත්තිපටිභානවා. කතමො පරිපුච්ඡාපටිභානවා? ඉධෙකච්චො පරිපුච්ඡිතා[2] හොති අත්ථෙ ච ඤායෙ ච ලක්ඛණෙ ච කාරණෙ ච ඨානාඨානෙ ච, තස්ස තං පරිපුච්ඡං නිස්සාය පටිභාති. අයං පරිපුච්ඡාපටිභානවා. කතමො අධිගමපටිභානවා? ඉධෙකච්චස්ස අධිගතා හොන්ති චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො චත්තාරො අරියමග්ගා චත්තාරි සාමඤ්ඤඵලානි චතස්සො පටිසම්භිදායො ඡ අභිඤ්ඤායො; තස්ස අත්ථො ඤාතො. ධම්මො ඤාතො. නිරුත්ති ඤාතා. අත්ථෙ ඤාතෙ අත්ථො පටිභාති.[1] ධම්මෙ ඤාතෙ ධම්මො පටිභාති[1] නිරුත්තියා ඤාතාය නිරුත්ති පටිභාති[1] ඉමෙසු තීසු ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා, ඉමාය පටිභානපටිසම්භිදාය උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො. සො වුච්චති පටිභානවා. යස්ස පරියත්ති නත්ථි, පරිපුච්ඡා නත්ථි, අධිගමො නත්ථි, කිං තස්ස පටිභායිස්සතීති – 'සණ්හො ච පටිභානවා...

1 පටිභායති - සීමු. II මජසං. PTS. 2. පරිපුච්ඡිතා- සීමු. II. පරිපුච්ඡකතා - මජුප.

**අතිමානෙ ච නො යුතො** – අතිමානය කවරේ යත්? මෙහි එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...එක්තරා කරුණකින් හෝ මෙරමා ඉක්මැ සිතයි; මෙබඳු යම් මානයෙක් මාන කරන අයුරෙක් මාන කරන බවෙක් උන්නතියෙක් නඟා තැබීමෙක් මානධවජයෙක් දැඩිව ගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතාවක් වේ ද, මේ අතිමාන යයි කියනු ලැබේ. යමක්හු විසින් තෙල අතිමාන ප්‍රහීණ කරන ලද්දේ...නුවණගින්නෙන් දවන ලද්දේ ද, හෙතෙම අතිමානයෙහි ද නො යෙදුණේ යුක්ත නො වූයේ ප්‍රයුක්ත නො වූයේ හාත්පසින් නො යෙදුණේ නුයි 'අතිමානෙ ච නො යුතො' යනු වේ.

**සණ්හො ච පටිභානවා** – 'සණ්හො' යනු: මෘදු වූ කායකර්මයෙන් යුක්ත වූයේ නුයි 'සණ්හ'යැ, මෘදු වූ වාක්කර්මයෙන් – මෘදු වූ මනඃකර්මයෙන් – මෘදු වූ සතිපට්ඨානයන් ගෙන් – මෘදු වූ සම්‍යක්ප්‍රධානයන් ගෙන් – ඍද්ධිපාදයන් ගෙන් ඉන්ද්‍රියයන් ගෙන් බලයන් ගෙන් – බොධ්‍යඞ්ගයන් ගෙන් – මෘදු වූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සමන්විත වූයේ නුයි 'සණ්හ' යැ; **පටිභානවා**– පර්‍ය්‍යාප්තිප්‍රතිභානවත් යැ, පරිපෘච්ඡාප්‍රතිභානවත් යැ, අධිගමප්‍රතිභානවත් යැයි ප්‍රතිභානවත්හු තිදෙනෙක් වෙති: කවරෙක් පර්‍ය්‍යාප්තිප්‍රතිභානවත් ද යත්? මේ සස්නෙහි එකක්හු විසින් සූත්‍ර යැ ගෙය්‍ය – වෙය්‍යාකරණ– ගාථා – උදාන – ඉතිවුත්තක – ජාතක – අබ්භුතධම්ම – වෙදල්ල යැ (යන නවාඞ්ගය) පියවින් මැ පුහුණු කරන ලද වෙයි, ඔහුට පර්‍ය්‍යාප්තිය නිසා ඥානය අභිමුඛ වෙයි; මේ පර්‍ය්‍යාප්තිප්‍රතිභානවත් යැ. කවරෙක් පරිපෘච්ඡාප්‍රතිභානවත් වේ ද යත්? මේ සස්නෙහි එකෙක් ආත්මාර්ථයන් ද න්‍යායාර්ථයන් ද ලක්ෂණයන් ද කාරණයන් ද ස්ථානාස්ථානයන් ද පුළුවුස්නේ වෙයි, ඔහුට ඒ පිළිවිසීම නිසා ඥානය අභිමුඛ වෙයි, මේ තෙම පරිපෘච්ඡා– ප්‍රතිභානවත් යැ. කවරෙක් අධිගමප්‍රතිභානවත් වේ ද යත්? මේ සස්නෙහි එකක්හු විසින් සතර සතිපට්ඨානයෝ අධිගත වූවාහු වෙති, සතර සම්‍යක්ප්‍රධානයෝ – සතර ඍද්ධිපාදයෝ – පඤ්චෙන්ද්‍රියයෝ – පඤ්ච බලයෝ– සප්ත බොධ්‍යඞ්ගයෝ – ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය – සතර ආර්‍ය්‍යමාර්ගයෝ– සතර ශ්‍රාමණ්‍යඵලයෝ – සතර ප්‍රතිසම්භිදාහු – ෂඩභිඥාවෝ අධිගත වූවාහු වෙත්. ඔහු විසින් අර්ථය දන්නා ලද, ධර්මය දන්නා ලද, නිරුක්තිය දන්නා ලදු. අර්ථ (–හෙතුඵල)ය ප්‍රකට වූ කල්හි අර්ථය නුවණට අභිමුඛ වෙයි, ධර්ම (–ප්‍රත්‍යය)ය ප්‍රකට වූ කල්හි ධර්මය නුවණට අභිමුඛ වෙයි, නිරුක්තිය ප්‍රකට වූ කල්හි නිරුක්තිය නුවණට අභිමුඛ වෙයි, මේ ත්‍රිවිධඥානයෙහි ප්‍රභෙදඥාන වූ ඥානය 'පටිභානපටිසම්භිදා' නමු, මේ පටිභානපටිසම්භිදායෙන් උපෙත සමුපෙත උපාගත සමුපාගත උපපන්න සමුපපන්න සමන්වාගත වෙයි, හේ 'ප්‍රතිභානවත්'යයි කියනු ලැබෙයි. යමක් හට පර්‍ය්‍යාප්තිය නැත් නම්, පරිපෘච්ඡාව නැත් නම්, අධිගමය නැත් නම්, ඔහුට කුමක් වැටහෙන්නේ දැ'යි 'සණ්හො ච පටිභානවා' යනු වේ.

**න සද්ධො න විරජ්ජතීති** – 'න සද්ධො'ති සාමං සයං අභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මං න කස්සචි සද්දහති. අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා දෙවස්ස වා මාරස්ස වා බ්‍රහ්මුනො වා. 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති සාමං සයං අභිඤ්ඤාතං -පෙ- 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති- 'සබ්බෙ ධම්මා අනත්තා'ති – 'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'ති -පෙ- 'ජාතිපච්චයා ජරාමරණ'න්ති – 'අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො'ති -පෙ- 'ජාතිනිරොධා ජරාමරණනිරොධො'ති – 'ඉදං දුක්ඛ'න්ති -පෙ- 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති 'ඉමෙ ආසවා'ති -පෙ- 'අයං ආසවනිරොධගාමිනීපටිපදා'ති 'ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා'ති -පෙ- 'ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති සාමං සයමභිඤ්ඤාතං -පෙ- ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච. පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච -පෙ- චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සාමං සයමභිඤ්ඤාතං -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති සාමං සයමභිඤ්ඤාතං, අත්තපච්චක්ඛං ධම්මං න කස්සචි සද්දහති, අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා දෙවස්ස වා මාරස්ස වා බ්‍රහ්මුනො වා. වුත්තං හෙතං භගවතා:

"සද්දහසි ත්වං සාරිපුත්ත සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං? විරියින්ද්‍රියං – සතින්ද්‍රියං- සමාධින්ද්‍රියං – පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසාන'න්ති. නඛ්වාහං එත්ථ භන්තෙ භගවතො සද්ධාය ගච්ඡාමි. සද්ධින්ද්‍රියං – විරියින්ද්‍රියං –සතින්ද්‍රියං –සමාධින්ද්‍රියං –පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති යෙසං හි එතං භන්තෙ අඤ්ඤාතං අස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය; තෙ තත්ථ පරෙසං සද්ධාය ගච්ඡෙය්‍යුං: සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං, විරියින්ද්‍රියං -සතින්ද්‍රියං – සමාධින්ද්‍රියං– පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති. යෙසඤ්ච ඛො එතං භන්තෙ ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය නික්කඞ්ඛා තෙ තත්ථ නිබ්බිචිකිච්ඡා: සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං විරියින්ද්‍රියං – සතින්ද්‍රියං – සමාධින්ද්‍රියං- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති. මය්හඤ්ච ඛො එතං භන්තෙ ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය. නික්කඞ්ඛාහං තත්ථ නිබ්බිචිකිච්ඡො. සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං- සතින්ද්‍රියං – සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති. සාධු සාධු සාරිපුත්ත, යෙසං හෙතං සාරිපුත්ත, අඤ්ඤාතං අස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය, තෙ තත්ථ පරෙසං සද්ධාය ගච්ඡෙය්‍යුං. සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති.a

1. සද්දහති PTS

a සංයුත්තනිකාය - ඉන්ද්‍රියසංයුත්ත.

**න සද්ධෝ න විරජ්ජති** – 'න සද්ධෝ' යනු: තෙමේ මැ තමා විසින් අවබෝධ කළ තම හට ප්‍රත්‍යක්ෂ වූ ධර්මය අන් මහණකුගේ හෝ බමුණකුගේ හෝ දෙවියකුගේ හෝ මරකුගේ හෝ බඹකුගේ හෝ කිසිවෙකුගේ බසින් නො හදහයි; 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි තෙමේ මැ තමා විසින් අවබෝධ කළ...'සියලු සංස්කාරයෝ දුඃඛයෝ යැ'යි . සියලු ධර්මයෝ අනාත්මයෝ යැ'යි.. 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති'... 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැ'යි...'මේ දුඃඛසත්‍ය යැ'යි...'මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාව යැ'යි...'මොහු ආස්‍රවයෝ යැ'යි...'මේ ආස්‍රවනිරෝධගාමිනීප්‍රතිපදාව යැ'යි...'මේ ධර්මයෝ දතයුත්තාහ'යි....'මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කටයුත්තාහ'යි තෙමේ මැ තමා විසින් අවබෝධ කළ... සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ පහළවීම ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද, පඤ්චෝපාදානස්කන්ධයන්ගේ සමුදය ද...සතර මහාභූතයන්ගේ සමුදය ද අස්තඞ්ගමය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තෙමේ මැ තමා විසින් අවබෝධ කළ...'යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් ඒ සියල්ල නිරුද්ධ වන පියවි ඇතැ'යි තෙමේ මැ තමා විසින් අවබෝධ කළ තම හට ප්‍රත්‍යක්ෂ වූ ධර්මය අන් කිසි මහණකුගේ හෝ බමුණකුගේ හෝ දෙවියකුගේ හෝ මරකුගේ හෝ බඹකුගේ හෝ බසින් නො හදහයි. මේ වදාරන ලද මැය, බුදුන් විසින්:

"ශාරිපුත්‍රයෙනි, නෙපි ශ්‍රද්ධේන්ද්‍රිය වඩන ලදුයේ නැවත නැවත වඩන ලදුයේ නිවනෙහි ඇතුළත් වෙයි, නිවන පිහිට කොට ඇත, නිවන කෙළවර කොට ඇතැ"යි හදහනු ද ? වීර්යේන්ද්‍රිය – ස්මෘතීන්ද්‍රිය– සමාධීන්ද්‍රිය – ප්‍රඥේන්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතෝගධ අමතපරායණ අමතපරියෝසාන වේ යයි හදහනු ද"යි. ස්වාමීනි, මම මෙහිලා භාග්‍යවතුන් වහන්සේගේ (වචනය) හැදැහීමෙන් අවබෝධ නො කෙරෙමි, සද්ධින්ද්‍රිය– විරියින්ද්‍රිය – සතින්ද්‍රිය – සමාධින්ද්‍රිය – පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමෘතයෙහි ඇතුළත් වූයේ අමෘතය ප්‍රතිෂ්ඨා කොට ඇත්තේ අමෘතය නිෂ්ඨා කොට ඇත්තේය'යි. ස්වාමීනි, යම් කෙනකුන් විසින් මෙල නො දන්නා ලද්දේ (නුවණින්) නො දක්නා ලද්දේ අවබෝධ නො කරන ලද්දේ ප්‍රත්‍යක්ෂ නො කරන ලද්දේ ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දේ වේ නම්, ඔව්හු එහිලා මෙරමා බස් හැදැහීමෙන් අවබෝධ කරන්නාහුය: 'ශ්‍රද්ධේන්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ – වීර්යේන්ද්‍රිය–ස්මෘතීන්ද්‍රිය– සමාධීන්ද්‍රිය – ප්‍රඥේන්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතෝගධ අමතපරායණ අමතපරියෝසාන වේ යැ'යි. තවද ස්වාමීනි, යම් කෙනකුන් විසින් මෙල දන්නා ලද දක්නා ලද අවබෝධ කරන ලද ප්‍රත්‍යක්ෂ කරන ලද ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද නම්, ඔව්හු එහි නිසැකයෝ යැ, විචිකිත්සා රහිතයෝ යැ: සද්ධින්ද්‍රිය – විරිය – සති – සමාධි – පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතෝගධ අමතපරායණ අමතපරියෝසාන කොට ඇත්තේ යයි. ස්වාමීනි, මා විසින් වැලිත් මෙල ඥාත යැ දෘෂ්ට යැ විදිත යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද, මම එහි නිසැකයෙමි, විචිකිත්සා රහිතයෙමි, සද්ධින්ද්‍රිය – විරිය – සති – සමාධි – පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතෝගධ අමතපරායණ අමතපරියෝසාන කොට ඇතැ'යි. 'සාධු! සාධු!! ශාරිපුත්‍රයෙනි, සැබව ශාරිපුත්‍රයෙනි, යම් කෙනකුන් විසින් මෙල අඥාත අදෘෂ්ට අවිදිත අසාක්ෂාත්කෘත ප්‍රඥාවෙන් අස්පෘෂ්ට වන්නේ නම්, ඔහු එහි පරප්‍රත්‍යයෙන් අවබෝධ කරන්නාහුය: සද්ධින්ද්‍රිය.. පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතෝගධ අමතපරායණ අමතපරියෝසාන වේ"යයි.

1. අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච යො නරො,
හතාවකාසො වන්තාසො ස වෙ උත්තමපොරිසො"ති.[*]

**න විරජ්ජතීති** - සබ්බෙ බාලපුථුජ්ජනා රජ්ජන්ති, පුථුජ්ජනකල්‍යාණකං[1] උපාදාය සත්ත සෙඛා විරජ්ජන්ති; අරහා නෙව රජ්ජති නො විරජ්ජති. විරතත්තා[2] සො ඛයා රාගස්ස වීතරාගත්තා ඛයා දොසස්ස වීතදොසත්තා ඛයා මොහස්ස වීතමොහත්තා; සො වුත්ථවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති 'න සද්ධො න විරජ්ජති.'

තෙනාහ භගවා:

"සාතියෙසු අනස්සාවී අතිමානෙ ච නො යුතො,
සණ්හො ච පටිභානවා න සද්ධො න විරජ්ජතී"ති.

## 10 - 7

ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති,
අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති.

**ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පතීති** - කථං ලාභකම්‍යා සික්ඛති? "ඉධ භික්ඛු භික්ඛුං පස්සති ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං; තස්ස එවං හොති 'කෙන නු ඛො අයමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. තස්ස එවං හොති: 'අයං ඛො ආයස්මා සුත්තන්තිකො. තෙනායමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. සො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො සුත්තන්තං පරියාපුණාති. එවම්පි ලාභකම්‍යා සික්ඛති. අථවා, භික්ඛු භික්ඛුං පස්සති ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. තස්ස එවං හොති: 'කෙන නු ඛො අයමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. තස්ස එවං හොති: 'අයං ඛො ආයස්මා විනයධරො -පෙ- ධම්මකථිකො[3], තෙනායමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. සො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො අභිධම්මං පරියාපුණාති. එවම්පි ලාභකම්‍යා සික්ඛති. අථවා, භික්ඛු භික්ඛුං පස්සති. ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. තස්ස එවං හොති: 'කෙන නු ඛො අයමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. තස්ස එවං හොති, 'අයං ඛො ආයස්මා ආරඤ්ඤිකො - පිණ්ඩපාතිකො - පංසුකූලිකො - තෙචීවරිකො - සපදානචාරිකො - ඛලුපච්ඡාභත්තිකො - නෙසජ්ජිකො - යථාසන්ථතිකො. තෙනායමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති. සො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො ආරඤ්ඤිකො හොති. -පෙ- යථාසන්ථතිකො හොති. එවම්පි ලාභකම්‍යා සික්ඛති.

---

[*]. ධම්මපද - අරහන්තවග්ග. 1. කල්‍යාණපුථුජ්ජනා - සෙ. PTS.
2. විරත්තො - PTS. 3. ආභිධම්මිකො - සෙ. PTS.

1. යම් පුද්ගලයෙක් (තමා අධිගත හෙයින්) අනුන්ගේ බසින් නො හදහා ද, අකත නම් වූ නිවන ප්‍රත්‍යක්‍ෂ කොට දන්නේ ද, වෘත්තසන්ධි (සංසාරසන්ධි) සිඳපුයේ ද, නසන ලද ප්‍රතිසන්ධ්‍යවකාශ ඇත්තේ ද, වමනය කළ සියලු ආශා ඇත්තේ ද, හෙතෙම ඒකාන්තයෙන් උත්තමපුරුෂ නම් වේ.

**න විරජ්ජති** – සියලු බාලපෘථග්ජනයෝ ඇලෙති, කල්‍යාණපෘථග්ජනයා පටන් සප්ත ශෛක්‍ෂයෝ විරාගයට පැමිණෙති, ක්‍ෂීණාස්‍රව තෙම නො ම ඇලෙයි, විරාගයට නො පැමිණේ. හෙතෙම රාගය ක්‍ෂය කිරීමෙන් වීතරාග හෙයින් ද්වේෂය ක්‍ෂය කිරීමෙන් වීතද්වේෂ හෙයින් මෝහය ක්‍ෂය කිරීමෙන් වීතමෝහ හෙයින් විරක්ත යැ, වැස නිමවූ මගබඹසර ඇත්තේ යැ, පුරුදු කළ චරණධර්ම ඇත්තේ යැ...ඔහුට ජාති මරණසංසාරය පුනර්භවය නැත් නුයි 'න සද්ධෝ න විරජ්ජති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“සාතියෙසු -පෙ- න සද්ධෝ න විරජ්ජති”යි

## 10 – 7

යමෙක් ලාභප්‍රාර්ථනාවෙන් නො හික්මේ ද, අලාභයෙහිත් නො කිපේ ද, (විරෝධ නැත්තෙන්) අවිරෝධ වේ ද, තෘෂ්ණාවෙන් රසයෙහි ගෘධය (-ගිජුබව)ට නො පැමිණේ ද; (ඔහු උපශාන්ත යයි කියමි.)

**ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති** – කිසෙයින් ලාභ-ප්‍රාර්ථනාවෙන් හික්මේ ද යත්? 'මේ සස්නෙහි මහණෙක් චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පසබෙහෙත් පිරිකර ලබනසුලු මහණක්හු දකී. ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් තෙම කවර කරුණෙකින් සිවුරු... බෙහෙත්පිරිකර ලබනසුලු දැ'යි; ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් සෞත්‍රාන්තික යැ, එයින් මේ ආයුෂ්මත් සිවුරු...බෙහෙත් පිරිකර ලබනසුලු' යැයි. හෙතෙම ලාභ හේතුයෙන් ලාභ නිසා ලාභ කරුණෙන් ලාභ නිපදවනු පිණිස ලාභය උපදවන්නේ සූත්‍රාන්තය පුහුණු කරයි; මෙසේත් ලාභප්‍රාර්ථනාවෙන් හික්මෙයි. නොහොත් මහණෙක් සිවුරු...බෙහෙත් පිරිකරලබනසුලු මහණක්හු දකී. ඔහුට මේ සිත වෙයි: 'කුමකින් මේ ආයුෂ්මත් සිවුරු...ලබනසුලු වේ දැ'යි. ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් විනයධර යැ...ධර්මකථික යැ, එහෙයින් මේ ආයුෂ්මත්...ලබනසුලු වේ ය'යි. හෙතෙම ලාභහේතුයෙන්...ලාභය උපදවනුයේ අභිධර්මය පුහුණු කරයි; මෙසේ ලාභ කැමැත්තෙන් හික්මෙයි. නොහොත් මහණෙක් චීවර... ලාභී වූ මහණක්හු දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'කුමක් හෙයින් මේ ආයුෂ්මත් චීවර ..ලබනසුලු වේ දැ'යි. ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් වූ කලී ආරණ්‍යක යැ – පිණ්ඩපාතික යැ– පාංසුකූලික යැ – තෛචීවරික යැ– සපදානචාරික යැ · ඛලුපච්ඡාභත්තික යැ – නෛසද්‍යික යැ – යථාසන්ථතික යැ. එයින් මේ ආයුෂ්මත් තෙම චීවර...පරිෂ්කාරයන් ලබනසුලු වේ ය'යි. හෙතෙම ලාභහේතුවෙන්...ලාභය උපදවනුයේ ආරණ්‍යක වෙයි...යථාසන්ථ-තික වේ. මෙසේත් ලාභප්‍රාර්ථනාවෙන් හික්මෙයි.

කථං න ලාභකම්‍යා සික්ඛති? ඉධ භික්ඛු න ලාභහෙතු න ලාභපච්චයා න ලාභකාරණා න ලාභාභිනිබ්බත්තියා න ලාභං පරිපාචෙන්තො යාවදෙව අත්තදමථාය අත්තසමථාය අත්තපරිනිබ්බාපනත්ථාය සුත්තන්තං පරියාපුණාති. විනයං පරියාපුණාති අභිධම්මං පරියාපුණාති. එවම්පි න ලාභකම්‍යා සික්ඛති. අථවා, භික්ඛු න ලාභහෙතු න ලාභපච්චයා න ලාභකාරණා න ලාභාභිනිබ්බත්තියා න ලාභං පරිපාචෙන්තො යාවදෙව අප්පිච්ඡඤ්ඤෙව නිස්සාය සන්තුට්ඨිඤ්ඤෙව[1] නිස්සාය සල්ලෙඛඤ්ඤෙව නිස්සාය පවිවෙකඤ්ඤෙව නිස්සාය ඉදමත්ථිතඤ්ඤෙව[2] නිස්සාය ආරඤ්ඤිකො හොති. පිණ්ඩපාතිකො හොති. පංසුකූලිකො හොති. තෙචීවරිකො හොති. සපදානචාරිකො හොති. ඛලුපච්ඡාභත්තිකො හොති. නෙසජ්ජිකො හොති. යථාසන්ථතිකො හොති. එවම්පි න ලාභකම්‍යා සික්ඛතීති - ලාභකම්‍යා න සික්ඛති.

අලාභෙ ච න කුප්පතීති - කථං අලාභෙ කුප්පති? ඉධෙකච්චො කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථියති[3] කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. එවං අලාභෙ කුප්පති. කථං අලාභෙ න කුප්පති? ඉධ භික්ඛු කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි -පෙ- අප්පඤ්ඤාතොම්හීති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථියති න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. එවං අලාභෙ ච න කුප්පතීති - ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති.

අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣතීති - 'විරුද්ධො'ති යො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො[4] අනත්තමනතා චිත්තස්ස[8]. අයං වුච්චති විරොධො. යස්සෙසො විරොධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො. සො වුච්චති අවිරුද්ධො. තණ්හාති රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා. රසොති මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො, අම්බිලං මධුරං තිත්තකං[5] කටුකං ලොණිකං ඛාරිකං ලපිලං[6] කසාවො සාදුං අසාදුං[7] සීතං උණ්හං; සන්තෙකෙ සමණබ්‍රාහ්මණා රසගිද්ධා, තෙ ජිව්හග්ගෙන රසග්ගානි පරියෙසන්තා ආහිණ්ඩන්ති. තෙ අම්බිලං ලභිත්වා අනම්බිලං පරියෙසන්ති. අනම්බිලං ලභිත්වා අම්බිලං. පරියෙසන්ති. මධුරං ලභිත්වා අමධුරං පරියෙසන්ති. අමධුරං ලභිත්වා මධුරං පරියෙසන්ති තිත්තකං ලභිත්වා අතිත්තකං පරියෙසන්ති. අතිත්තකං ලභිත්වා තිත්තකං පරියෙසන්ති. කටුකං ලභිත්වා අකටුකං පරියෙසන්ති. අකටුකං ලභිත්වා කටුකං පරියෙසන්ති. ලොණිකං ලභිත්වා අලොණිකං පරියෙසන්ති. අලොණිකං ලභිත්වා ලොණිකං පරියෙසන්ති.

---

1. සන්තුට්ඨිංයෙව - ස. 2. ඉදමත්ථිතඤ්ඤෙව - සී. II.
3 පතිට්ඨියති - ස්‍යා. PTS. - පතිට්ඨීයති - මජ්ඣ. 4. අස්සුරොපො - සීමු II.
5. තිත්තිකං - PTS. 6. ලබිල - මජ්ඣ. ලම්බිලං - PTS.
7. සාදු අසාදු - මජ්ඣ. 8. ධම්මසඞ්ගණී - තිකපකණ්ඩ.

කිසෙසින් ලාභප්‍රාර්ථනාවෙන් නො හික්මේ ද යත්? මෙ සස්නෙහි මහණ තෙම ලාභහෙතුයෙන් නො වැ ලාභය නො නිසා ලාභකරුණෙන් නො වැ ලාභ නූපදවනු පිණිස ලාභය නො නිපදවනුයේ යම්තාක් ආත්මදමනය පිණිස ආත්මසමාධානය පිණිස ආත්මපරිනිර්වාණය පිණිස සූත්‍රාන්තය-විනය - අභිධර්මය පුහුණු කෙරෙයි. මෙසේත් ලාභප්‍රාර්ථනාවෙන් නො හික්මෙයි. නොහොත් මහණ තෙම ලාභහෙතුවෙන් නො වැ...ලාභය නො නිපදවනුයේ යම්තාක් අපිස්බව ම නිසා සන්තොස්බව ම නිසා කෙලෙස් නැසීම ම නිසා උත්තමවිවේකය ම නිසා මේ කුශලධර්මයන්ගෙන් ප්‍රයොජන ඇතිබව ම නිසා ආරණ්‍යක වෙයි, පිණ්ඩපාතික...යථාසන්ථතික වෙයි. මෙසේත් ලාභකාම්‍යයෙන් නො හික්මේ නුයි - 'ලාභකම්‍යා න සික්ඛති' යනු වේ.

**අලාභෙ ච න කුප්පති** - කිසෙසින් අලාභයෙහි කිපේ ද යත්? මෙහි එකෙක් 'කුලය හෝ නො ලබමි, ගණයා හෝ - ආවාසය හෝ - ලාභය හෝ - යශස් හෝ - පැසසුම් හෝ - සුව හෝ නො ලබමි, සිවුරු හෝ-පිණ්ඩපාත - සෙනසුන් - ගිලන්පසබෙහෙත්පිරිකර හෝ නො ලබමි ග්ලානොපස්ථායකයකු හෝ නො ලබමි, නො පැනෙනුයෙමි වෙමි' කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, තදබවට පැමිණෙයි, කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ කෙරෙයි; මෙසේ අලාභයෙහි කිපෙයි. කිසෙසින් අලාභයෙහි නො කිපේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙම 'කුලය හෝ නො ලබමි, ගණයා හෝ නො ලබමි...නො පැනෙනුයෙමි වෙමි' නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තදබවට නො පැමිණෙයි, කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. මෙසේ අලාභයෙහි දු නො කිපේ නුයි 'ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති' යනු වේ.

**අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති** - 'විරුද්ධො' යනු: චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කිපීමෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් චිත්තයාගේ ප්‍රකෘතිය හැරීමෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් ක්‍රොධ වූ බවෙක් ද්වෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් ව්‍යාපාදකාරයෙක් ව්‍යාපාදයට පැමිණි බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් චණ්ඩබවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් සිතෙහි නො සතුටු බවෙක් වේ ද, මේ 'විරොධ'යයි කියනු ලැබේ. යමක්හු විසින් තෙල විරොධය ප්‍රහීණ කරන ලද ද සන්සිඳුවන ලද ද දුරලන ලද ද අනවෛය්‍යාසප්පත්තික වූයේ ද ඥානාග්නීන් දග්ධ ද, හෙතෙම 'අවිරුද්ධ'යයි කියනු ලැබේ. තණ්හා යනු: රූපතණ්හා යැ සද්ද - ගන්ධ - රස - ඵොට්ඨබ්බ - ධම්මතණ්හා යැ; රස නම්: මුල්රස යැ කඳගැසි රස යැ පොතුරස යැ පත්රස යැ මල්රස යැ පලරස යැ ඇඹුල් මිහිරි තිත්ත යැ කුළු යැ ලුණුරස යැ කරරස යැ ලපිල - (නො කසටරස) යැ කසටරස යැ මිහිරි යැ නො මිහිරි යැ සිසිල් රස යැ හුණුරස යි; රසයෙහි ගිජු වූ මහණ බමුණු කෙනෙක් ඇත්තාහ. ඔහු දිවගින් අග්‍රරස සොයමින් ඇවිදිති: ඔහු ඇඹුලක් ලැබ නො ඇඹුලක් සොයති, නො ඇඹුලක් ලැබ ඇඹුල් සොයති, මිහිරක් ලැබ අමිහිරි දු සොයති, අමිහිරක් ලැබ මිහිරි දු සොයති, තිත්ත දයක් ලැබ නො තිත්ත දු සොයති, නො තිත්ත දු ලැබ තිත්ත දු සොයති, කුළු දු ලැබ නො කුළු දු සොයති, නො කුළු දු ලැබ කුළු දයක් සොයති, ලුණක් ලැබ ලුණු නැත්තක් සොයති, ලුණුනැති දු ලැබ ලුණු ඇති දු සොයති.

ඛාරිකං ලභිත්වා අඛාරිකං පරියෙසන්ති. අඛාරිකං ලභිත්වා ඛාරිකං පරියෙසන්ති. ලපිලං[1] ලභිත්වා කසාවං පරියෙසන්ති. කසාවං ලභිත්වා ලපිලං පරියෙසන්ති. සාදුං ලභිත්වා අසාදුං පරියෙසන්ති. අසාදුං ලභිත්වා සාදුං පරියෙසන්ති. සීතං ලභිත්වා උණ්හං පරියෙසන්ති. උණ්හං ලභිත්වා සීතං පරියෙසන්ති. තෙ යං යං ලභිත්වා තෙන තෙන[2] න සන්තුස්සන්ති. අපරාපරං පරියෙසන්ති. මනාපිකෙසු රසෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා. යස්සෙසා[3] රසතණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිපස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා.

සො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි[4] නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො ච. යථා වණං[5] ආලිම්පෙය්‍ය යාවදෙව රොපනත්ථාය; යථා වා පන අක්ඛං අබ්භඤ්ජෙය්‍ය[6] යාවදෙව භාරස්ස නිත්ථරණත්ථාය; යථා වා පන පුත්තමංසං ආහාරං ආහරෙය්‍ය යාවදෙව කන්තාරස්ස නිත්ථරණත්ථාය; එවමෙව භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, 'නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චා'ති. රසතණ්හං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. රසතණ්හාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන[7] චෙතසා විහරතීති - 'අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣතී.'

තෙනාහ භගවා:

ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති,
අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣතී"ති.

## 10 - 8

උපෙක්ඛකො සදා සතො න ලොකෙ මඤ්ඤතෙ සමං,
න විසෙසී න නීචෙය්‍යො තස්ස නො සන්ති උස්සදා.

**උපෙක්ඛකො සදා සතොති** - 'උපෙක්ඛකො'ති ඡළඞ්ගුපෙක්ඛාය සමන්නාගතො: චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො; සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො. චක්ඛුනා රූපං දිස්වා මනාපං නාභිගිජ්ඣති නාභිහංසති[8] න රාගං ජනෙති. තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං.

---

1. ලබිලං - මජසං, PTS. 2. තෙන - PTS. 3. යස්ස - PTS.
4. පටිකංඛාමි - PTS. 5. වනං - මජසං. 6. අබ්භඤ්ජස්ස - PTS.
7. විමරියාදිකතෙන - මජසං. 8. නාභිහසති - සීමු. II. PTS.

ක්ෂාරරසයක් ලැබ නො ක්ෂාරරස සොයයි, නො ක්ෂාරරස දෙයක් ලැබ ක්ෂාරරස සොයති, නො කසටක් ලැබ කසට සොයයි, කසට දෑ ලැබ නො කසට දෑ සොයයි, මිහිරක් ලැබ අමිහිරි දෑ සොයයි, අමිහිරක් ලැබ මිහිරි දෑ සොයති, සිසිලක් ලැබ හුණු දෑ සොයති, හුණු දෙයක් ලැබ සිසිල් සොයත්. ඔවුහු යම් යම් දෙයක් ලැබ ඒ ඒ දෑයින් නො සතුටු වෙයි, මතුමත්තෙහි සොයයි. මන වඩන රසයෙහි රැඳුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු වැතුරුණාහු ලැගුණාහු ඇළුණාහු බැසගත්තාහු ය. යමක්හු විසින් මෙතෙල රසතෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳින ලද්දී සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී උපනට නුසුදුසු වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද.

මෙතෙම නුවණින් විමසා අහර වළඳයි, කෙළි පිණිස නො මැ වළඳයි, මද පිණිස-අලඞ්කාර පිණිස - සැරැසුම් පිණිස නො වළඳයි, යම්තාක් මේ කය පැවැත්ම පිණිස යැපීම පිණිස බඩගිනි වේදනා නැසීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස වළඳයි, මෙසේ 'පැරණි බඩගිනි වේදනා නසමි, අලුත් වේදනාත් නූපදවමි, මාගේ යැපීම ද වන්නේය, අනවද්‍යභාවය ද සුව විහරණය ද වන්නේය; යම්සේ මිස්වැඩිම් පමණට ව්‍රණය ආලේප කරන්නේ ද, නැවද යම්සේ බර ගෙන යන පමණට අක්ෂය තෙල් ගල්වන්නේ ද, නැවද යම්සේ කතරමග තරණය කරන පමණට පුත්‍රමාංසාහාරය අනුභව කරන්නේ ද, එපරිද්දෙන් ම මහණ තෙම නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට අහර වළඳයි, නො මැ කෙළි පිණිස වළඳයි,...මාගේ ජීවිත යාත්‍රාව ද අනවද්‍යතාව ද ඵාසුවිහරණය ද වන්නේ යැ'යි. රසතෘෂ්ණාව දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අභාවයට පමුණුවයි. රසතෘෂ්ණාවෙන් දුරු වූයේ වෙන් වූයේ නික්මුණේ නික්මැ ගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ වන්නේය, විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති'යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ලාභකම්‍යා න සික්ඛති -පෙ- රසෙ ච නානුගිජ්ඣති"යි

## 10 - 8

යමෙක් ෂඩඞ්ගොපෙක්ෂාවෙන් සමන්විත වූයේ හැමකල්හි සමෘතිමත් වූයේ ලෝවැ (කිසිවක්හු හා) සම කොට නො සිතා ද, (මම) ශ්‍රෙෂ්ඨ වෙමි නො සිතා ද හීන වෙමි මත් නැත්තේ වේ ද, ඒ පුද්ගලයා හට උත්සදයෝ නො වෙති. (ඔහු උපශාන්ත යයි කියමි.)

**උපෙක්ඛකො සදා සතො** - 'උපෙක්ඛකො' යනු: ෂඩඞ්ගොපෙක්ෂාවෙන් සමන්නාගත වූයේ ඇසින් රූපයක් දැක (ලොභවශයෙන්) නො මැ සතුටු සිත් ඇත්තේ වෙයි, (ද්වෙෂවශයෙන්) දුර්මුඛ සිත් ඇත්තේ නො වෙයි, සිහි ඇතියේ නුවණැතියේ උපෙක්ෂා සහිත වූයේ වෙසෙයි; කනින් ශබ්දයක් අසා...සිතින් ධර්මාලම්බනයක් දැන නො මැ සොම්නස් ඇත්තේ වෙයි, දොම්නස් ඇත්තේ නො වෙයි, සිහි නුවණ ඇතියේ උපෙක්ෂා සහිත වූයේ වෙසෙයි, ඇසින් මනාප වූ රූපයක් දැක නො ගිජු වෙයි, නො සතුටු වෙයි, රාග නූපදවයි; ඔහු ගේ චක්ෂුරාදි කාය සිටියේ (නිශ්චල වූයේ) මැ වෙයි, අධ්‍යාත්මයෙහි සිත සිටියේ සුනිශ්චල වූයේ සුවිමුක්ත වූයේ වෙයි.

චක්ඛුනා ඛො පනෙව රූපං දිස්වා අමනාපං න මඞ්කු හොති අප්පතිට්ඨිතචිත්තො අලීනමනසො[1] අබ්‍යාපන්නචෙතසො, තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං; සොතෙන සද්දං සුත්වා - ඝානෙන ගන්ධං ඝායිත්වා- ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය - මනාපං නාභිගිජ්ඣති නාභිහංසති න රාගං ජනෙති, තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. මනසා ඛො පනෙව ධම්මං විඤ්ඤාය අමනාපං න මඞ්කු හොති අප්පතිට්ඨිතචිත්තො අලීනමනසො[1] අබ්‍යාපන්නචෙතසො තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. චක්ඛුනා රූපං දිස්වා මනාපාමනාපෙසු රූපෙසු තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මනාපාමනාපෙසු ධම්මෙසු තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. චක්ඛුනා රූපං දිස්වා රජනීයෙ න රජ්ජති. දොසනීයෙ න දුස්සති. මොහනීයෙ න මුය්හති. කොපනීයෙ න කුප්පති. කිලෙසනීයෙ න කිලිස්සති. මදනීයෙ න මජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය රජනීයෙ න රජ්ජති. දොසනීයෙ න දුස්සති. මොහනීයෙ න මුය්හති. කොපනීයෙ න කුප්පති. කිලෙසනීයෙ න කිලිස්සති. මදනීයෙ න මජ්ජති. දිට්ඨෙ දිට්ඨමත්තො. සුතෙ සුතමත්තො. මුතෙ මුතමත්තො. විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තො. දිට්ඨෙ න ලිප්පති.[2] සුතෙ න ලිප්පති.[2] මුතෙ න ලිප්පති. විඤ්ඤාතෙ න ලිප්පති. දිට්ඨෙ අනුපයො අනපායො[3] අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. සුතෙ මුතෙ විඤ්ඤාතෙ අනුපයො අනපායො[3] අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති.

සංවිජ්ජති අරහතො චක්ඛු.[4] පස්සති අරහා චක්ඛුනා රූපං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. සංවිජ්ජති අරහතො සොතං. සුණාති අරහා සොතෙන සද්දං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. සංවිජ්ජති අරහතො ඝානං. ඝායති අරහා ඝානෙන ගන්ධං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. සංවිජ්ජති අරහතො ජිව්හා. සායති අරහා ජිව්හාය රසං. ඡන්දරාගො අරහතො නත්ථි. සංවිජ්ජති අරහතො කායො. ඵුසති අරහා කායෙන ඵොට්ඨබ්බං. -පෙ- සංවිජ්ජති අරහතො මනො. විජානාති අරහා මනසා ධම්මං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. චක්ඛුං රූපාරාමං රූපරතං රූපසම්මුදිතං. තං අරහතො දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. සොතං සද්දාරාමං -පෙ- ඝානං ගන්ධාරාමං ජිව්හා රසාරාමා රසරතා රසසම්මුදිතා. සා අරහතො දන්තා ගුත්තා රක්ඛිතා සංවුතා. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. කායො ඵොට්ඨබ්බාරාමො -පෙ- මනො ධම්මාරාමො ධම්මරතො ධම්මසම්මුදිතො. සො අරහතො දන්තො ගුත්තො රක්ඛිතො සංවුතො. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති.

---

අප්පතිට්ඨිතචිත්තො ආදීනමනසො - PTS. 2. ලිම්පති - සීමු. II. මජසං. PTS.
3. අනූපයො - සයා. PTS. 4. චක්ඛුං - සීමු II.

යළි ඇසින් මැ අමනාප වූ රූපයක් දැක නො මකු වූයේ (ක්‍රොධවශයෙන්) නො පිහිටි සිත් ඇතියේ නො හැකුළුණු සිත් ඇතියේ ව්‍යාපාද රහිත සිත් ඇත්තේ වෙයි; ඔහුගේ කය නිශ්චල වූයේ මැ වෙයි. සිත නිශ්චල වූයේ අධ්‍යාත්මයෙහි සුසංස්ථිත සුවිමුක්ත වූයේ වෙයි. කනින් ශබ්දයක් අසා.. නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට දිවින් රසයක් ආස්වාද කොට – කයින් පහසක් ස්පර්ශ කොට – මනසින් ධර්මයක් දැන ඉෂ්ටාලම්බනයට නො ගිජු වෙයි, නො සතුටු වෙයි, රාග නූපදවයි. ඒ රහත්හුගේ කාය නිශ්චල වූයේ මැ වෙයි, අධ්‍යාත්මයෙහි සිත නිශ්චල වූයේ මොනොවට පිහිටියේ වෙසෙසින් මිදුණේ වෙයි. යළි සිතින් මැ අමනාප වූ ධර්මාලම්බනයක් දැන නො මකු වෙයි, (ක්‍රොධවශයෙන්) නො පිහිටි සිත් ඇතියේ නො හැකුළුණු සිත් ඇතියේ ව්‍යාපාද රහිත සිත් ඇතියේ වෙයි. ඔහුගේ කය නිශ්චල වූයේ මැ වෙයි, අධ්‍යාත්මයෙහි සිත පිහිටියේ සුසංස්ථිත සුවිමුක්ත වෙයි. ඇසින් රූපයක් දැක මනාපාමනාපරූපයන්හි ඔහුගේ කාය සිටියේ (-නිශ්චල වූයේ) මැ වෙයි, සිත අධ්‍යාත්මයෙහි සිටියේ සුපිහිටියේ සුවිමුක්ත වෙයි. කනින් ශබ්දයක් අසා...මනසින් ධර්මයක් දැන මනාපාමනාපධර්මයන්හි ඔහුගේ කාය සිටියේ මැ වෙයි, සිත... සුවිමුක්ත වෙයි. ඇසින් රූපයක් දැක ඇලුම් කටයුතු වස්තුවෙහි නො ඇලෙයි, ද්වේෂ ඉපදවියැ යුත්තෙහි ද්වේෂය නූපදවයි, මුළාවියැ යුත්තෙහි මුළා නො වෙයි, කිපියැ යුත්තෙහි නො කිපෙයි, කෙලෙසියැ යුත්තෙහි නො කෙලෙසෙයි, මත්වියැ යුත්තෙහි නො මත් වෙයි. කනින් ශබ්දයක් අසා...මනසින් ධර්මයක් දැන රජනීය වස්තුවෙහි නො ඇලෙයි, දෙසනීයයෙහි – මොහනීයයෙහි – කොපනීයයෙහි – කිලෙසනීයයෙහි – මදනීය වස්තුවෙහි නො මත් වෙයි. රූපාලම්බනයෙහි (චක්ෂුර්විඥානයෙන්) දුටු පමණ වූයේ ශබ්දායතනයෙහි ශ්‍රැතමාත්‍ර වූයේ මුතාලම්බනයෙහි මුත (-පැමිණ ගන්නා ලද) මාත්‍ර වූයේ ධම්මාරම්මණයෙහි විඥාතමාත්‍ර වූයේ වෙයි; චක්ෂුර් විඥානයෙන් දුටු) රූපාරම්මණයෙහි (තෘෂ්ණාදෘෂ්ටිඋපලෙපයෙන්) නො ඇලෙයි, ශබ්දාලම්බනයෙහි නො ඇලෙයි, ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි නො ඇලෙයි, ධර්මාලම්බනයෙහි නො ඇලෙයි; රූපාලම්බනයෙහි තෘෂ්ණා නැත්තේ දූෂ්‍ය නො වූයේ අනිඃශ්‍රිත වූයේ නො බැඳුණේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විමර්යාදීකෘත සිතින් යුක්ත ව වෙසෙයි, ශ්‍රැතයෙහි – මුතයෙහි–විඥාතයෙහි තෘෂ්ණා නැත්තේ...විමර්යාදීකෘත සිතින් යුක්ත වැ වෙසෙයි.

රහත්හට ඇස ලැබෙයි, රහත් තෙම ඇසින් රූප දකී, ඡන්දරාගයෙක් රහත් හට නැත, රහත් තෙම වෙසෙසින් මිදුණු සිත් ඇත්තේ ය. රහත්හට ශ්‍රොත්‍රප්‍රසාදය ලැබෙයි, රහත් තෙම කනින් ශබ්ද අසයි, ඡන්දරාගය රහත් හට නැත, රහත් තෙම සුවිමුක්තචිත්ත යැ. රහත් හට ඝ්‍රාණය – රහත් තෙම සුවිමුක්තචිත්ත යැ. ජිහ්වාප්‍රසාදය – කායප්‍රසාදය– රහත් හට මනස ලැබෙයි, රහත් තෙම මනසින් ධර්මය දැනගනී, ඡන්දරාගය රහත් හට නැත, රහත් තෙම සුවිමුක්තචිත්ත යැ, ඇස රූපාරාම යැ, රූපයෙහි ඇලුණේ යැ, රූපයෙහි සතුටු වූයේ යැ, එය රහත්හු විසින් දමනය කරන ලද, ගොපනය කරන ලද, රක්නා ලද, සංවර කරන ලද, යළි ඒ ඇස සංවර පිණිස දහම් දෙසයි. කන ශබ්දාරාම යැ... නැහැය ගන්ධාරාම යැ – දිව රසාරාම යැ – කය ස්ප්‍රෂ්ටව්‍යාරාම යැ – මනස ධර්මය ඇලුම් කොට ඇත්තේ යැ, ධර්මරත යැ ධර්මයෙහි සතුටු වූයේ යැ. ඒ මනස රහත්හු විසින් දමනය යැ ගුප්ත යැ රක්ෂිත යැ සංවෘත යි, ඒ මනස සංවර පිණිස දහම් දෙසයි.

1. "දන්තං නයන්ති සමිතිං දන්තං රාජාභිරූහති,
දන්තො සෙට්ඨො මනුස්සෙසු යො'තිවාක්‍යං තිතික්ඛති.a

2. වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා,
කුඤ්ජරා ච[1] මහානාගා අත්තදන්තො තතො වරං.a

3. න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං,
යථත්තනා[2] සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති.a

4. විධාසු න විකම්පන්ති[3] විප්පමුත්තා පුනබ්භවා,
දන්තභූමිමනුප්පත්තා තෙ ලොකෙ විජිතාවිනො.b

5. යස්සින්ද්‍රියානි භාවිතානි[4] අජ්ඣත්තබහිද්ධා ච සබ්බලොකෙ,
නිබ්බිජ්ඣ ඉමං පරඤ්ච ලොකං කාලං කඞ්ඛති භාවිතො
සදන්තො[5]"තිc

**උපෙක්ඛකො සදාති** – සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං –පෙ– පච්ඡිමෙ වයොඛන්ධෙ.[6] **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, වෙදනාසු – චිත්තෙ – ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො –පෙ– සො වුච්චති සතො'ති – 'උපෙක්ඛකො සදා සතො.'

**න ලොකෙ මඤ්ඤතෙ සමන්ති** – 'සදිසො හමස්මී'ති මානං න ජනෙති ජාතියා වා ගොත්තෙන වා –පෙ– අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති – 'න ලොකෙ මඤ්ඤතෙ සමං.'

**න විසෙසී න නීචෙය්‍යොති** – 'සෙය්‍යො හමස්මී'ති අතිමානං න ජනෙති ජාතියා වා ගොත්තෙන වා –පෙ– අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා; 'හීනොහමස්මී'ති ඔමානං න ජනෙති ජාතියා වා ගොත්තෙන වා –පෙ– අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා'ති – න විසෙසී න නීචෙය්‍යො, **තස්ස නො සන්ති උස්සදාති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස, උස්සදාති සත්තුස්සදා රාගුස්සදො දොසුස්සදො මොහුස්සදො මානුස්සදො දිට්ඨුස්සදො කිලෙසුස්සදො කම්මුස්සදො; තස්සිමෙ උස්සදා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති – 'තස්ස නො සන්ති උස්සදා.'

තෙනාහ භගවා:

"උපෙක්ඛකො සදා සතො න ලොකෙ මඤ්ඤතෙ සමං,
න විසෙසී න නීචෙය්‍යො තස්ස නො සන්ති උස්සදා"ති.

---

1. කුඤ්ජරා ච - PTS. 2. යථාත්තනා - PTS 3 විකප්පන්ති සිමු. I. PTS. 4. විභාවිතානි - සිමු. II. PTS. 5. සුදන්තො - සං. PTS.
6 වයොඛන්ධෙ - සිමු. II. පච්ඡිමවයොඛන්ධෙ -PTS. a ධම්මපද - නාගවග්ග.
b. ඛන්ධසංයුත්ත - ඛජ්ජනීය වග්ග. c. සුත්තනිපාත - සභියසුත්ත.

1. දමුණු ඇතකු අසකු මැ බොහෝදෙනා රැස්වූ තැනට පමුණුවති, රජ ද දමුණු ඇතකු පිට මැ නැගෙයි, යමෙක් අනුත් කිණු පරොස්බස් ඉවසා නම් දමුණා වූ හෙතෙම මිනිසුන් අතුරෙහි උතුම යි.

2. අශ්වතරයෝ දමුණාහු මැ උතුම් වෙති, ආජානෙය අශ්වයෝ ද සෛන්ධවයෝ ද කුඤ්ජර නම් වූ මහඇත්හු ද දමුණාහු මැ උතුම් වෙයි, ඊට වඩා (මාර්ගභාවනාවෙන්) ආත්මදමනය කරන ලද්දේ උතුම යි.

3. දමුණු මහණ තෙම (පූර්වභාගයෙහි ඉන්ද්‍රියදමනයෙන්) දමුණා වූ (අපරභාගයෙහි ආර්‍යමාර්ගභාවනාවෙන්) මනාව දමුණා වූ සිතින් අගත නම් වූ නිර්වාණදිශාවට යම්සේ යේ ද, මේ ඇත්ආදි යානයෙන් එසේ නො මැ යන්නේ යි.

4. යම් කෙනෙක් ත්‍රිවිධමානයෙහි කම්පා නො වෙත් ද, පුනර්භවයෙන් මිදුණාහු ද, (රහත්ඵල සඞ්ඛ්‍යාත) දාන්තභූමියට පැමිණියාහු ද ඔවුහු මේ සත්ත්වලොකයෙහි දිනුවාහු නම් වෙත්.

5. යමක්හු විසින් අධ්‍යාත්ම වූ ද බාහිර වූ ද සියලු ලොකයෙහි (චක්ෂුරාදි) ෂඩින්ද්‍රියයෝ (ත්‍රිලක්ෂණයට නගා) වෙසෙසින් වඩන ලද්දාහු ද, භාවිත ඉන්ද්‍රිය ඇති ඒ දාන්ත වූ පුද්ගල තෙම (ස්වපරසන්තති සඞ්ඛ්‍යාත) මෙ ලොව හා පරලොව හා දත මරණකාලය බලාපොරොත්තු වේ යයි.

**උපෙක්ඛකො සදා** – හැමදා සියලුදා සියලු කල දිනපතා නිරතුරු පශ්චිම වයස් කොටසෙහි; **සතො** – සතර කරුණකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, වෙදනාචිත්තධර්මයන්හි – ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ... හෙතෙම සිහි ඇතැයි කියනු ලැබේ නුසි ‘උපෙක්ඛකො සදා සතො’ යනු වේ.

**න ලොකෙ මඤ්ඤතෙ සමං** – ‘මම් සදෘශයෙමි’ ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...එක්තරා වස්තුවකින් හෝ මානය නූපදවා නුසි ‘න ලොකෙ මඤ්ඤතෙ සමං’ යනු වේ.

**න විසෙසී න නීචෙය්‍යො** – ‘මම් ශ්‍රෙෂ්ඨ වෙමි’ ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...එක්තරා වස්තුවකින් හෝ අතිමානය නූපදවයි; ‘මම් හීන වෙමි’ ජාතියෙන් හෝ...එක්තරා වස්තුවකින් හෝ මානය නූපදවා නුසි ‘න විසෙසී න නීචෙය්‍යො’ යනු වේ.

**තස්ස නො සන්ති උස්සදා** – ‘තස්ස’ යනු: අර්හත් ක්ෂීණාස්‍රව හට; **උස්සදා** යනු: උත්සදයෝ සතෙකි: රාගොත්සදය ද්වෙෂ – මොහ – මාන – දෘෂ්ටි – ක්ලෙශ – කර්මොත්සද යැ’යි; ඒ රහත් හට මේ උත්සදයෝ නැත, නො වෙති, අවිද්‍යමාන වෙති, නො ලැබෙත්; ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු ඥානාග්නීන් දග්ධ වූවාහු නුසි ‘තස්ස නො සන්ති උස්සදා’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“උපෙක්ඛකො -පෙ- තස්ස නො සන්ති උස්සදා”යි.

## 10 - 9

යස්ස නිස්සයතා නත්ථි ඤත්වා ධම්මං අනිස්සිතො,
භවාය විභවාය වා[1] තණ්හා යස්ස න විජ්ජති.

**යස්ස නිස්සයතා නත්ථීති** - 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස; **නිස්සයතාති** ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච; -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො. තස්ස තණ්හානිස්සයො පහීනො දිට්ඨිනිස්සයො පටිනිස්සට්ඨො. තණ්හානිස්සයස්ස පහීනත්තා දිට්ඨිනිස්සයස්ස පටිනිස්සට්ඨත්තා නිස්සයතා යස්ස නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති. පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති - 'යස්ස නිස්සයතා නත්ථි'.

**ඤත්වා ධම්මං අනිස්සිතොති** - 'ඤත්වා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති 'සබ්බෙ ධම්මා අනත්තා'ති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **අනිස්සිතොති** ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො. තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සිතො සොතං අනිස්සිතො ඝානං අනිස්සිතො ජිව්හං අනිස්සිතො කායං අනිස්සිතො මනං අනිස්සිතො. රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලං ගණං ආවාසං -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො[2] විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතී'ති - 'ඤත්වා ධම්මං අනිස්සිතො.'

**භවාය විභවාය වා[1] තණ්හා යස්ස න විජ්ජතීති** - 'තණ්හා'ති රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා. **යස්සාති** -අරහතො ඛීණාසවස්ස; **භවායාති** -භවදිට්ඨියා; **විභවායාති** විභවදිට්ඨියා; භවායාති - සස්සතදිට්ඨියා වා; **විභවායාති** - උච්ඡෙදදිට්ඨියා; 'භවායා'ති පුනප්පුනභවාය[3] පුනප්පුන ගතියා පුනප්පුන උපපත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා, තණ්හා යස්ස නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති - භවාය විභවාය ච තණ්හා යස්ස න විජ්ජති.

තෙනාහ භගවා:

"යස්ස නිස්සයතා නත්ථි ඤත්වා ධම්මං අනිස්සිතො,
භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජතී"ති.

1. විභවාය ච - PTS. 2. නිසටො - PTS.
3. පුනප්පුනං භවාය - සං. - PTS.

## 10 - 9

යම් ක්ෂීණාශ්‍රවයක් හට (තෘෂ්ණාදෘෂ්ටි) නිඃශ්‍රය බව නැත් ද, (යමෙක් අනිත්‍යාදි ආකාරයෙන් සියලු) ධර්මය දැන අනිඃශ්‍රිත වූයේ ද, යමක්හුට භවදෘෂ්ටියෙහි හෝ විභවදෘෂ්ටියෙහි තෘෂ්ණාව අවිද්‍යමාන වේ ද; (ඔහු උපශාන්ත යයි කියමි.)

**යස්ස නිස්සයතා නත්ථි** – 'යස්ස' යනු: අර්හත් ක්ෂීණාශ්‍රවයක් හට; **නිස්සයතා** – තෘෂ්ණානිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය ද'යි නිඃශ්‍රය දෙකෙකි...ඔහු විසින් තෘෂ්ණානිඃශ්‍රය නසන ලද, දෘෂ්ටිනිඃශ්‍රය දුරලන ලද; තෘෂ්ණානිඃශ්‍රය ප්‍රහීණ හෙයින් දෘෂ්ටිනිඃශ්‍රය දුරලූ හෙයින් නිඃශ්‍රය බව යමක් හට නැත්ද නො වේ ද අවිද්‍යමාන ද නො ලැබේ ද, ප්‍රහීණ වූවා . ඥානාග්නීන් දග්ධ නුයි 'යස්ස නිස්සයතා නත්ථි' යනු වේ.

**ඤත්වා ධම්මං අනිස්සිතො** – 'ඤත්වා' යනු: දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට, 'සියලු සංස්කාරයෝ අනිත්‍යය'යි, 'සියලු සංස්කාරයෝ දුක්ඛ'යි, 'සියලු ධර්මයෝ අනාත්මය යි. . උපදනා පියම් ඇති ඒ සියල්ල නැසෙනසුලු යැ'යි දැන.. විභූත කොට; **අනිස්සිතො**– තෘෂ්ණා දෘෂ්ටි යැයි නිඃශ්‍රයයෝ දෙදෙනෙකි... තෘෂ්ණානිඃශ්‍රය නසා දෘෂ්ටිනිඃශ්‍රය දුරලා චක්ෂුස අනිඃශ්‍රිත වූයේ ශ්‍රොත්‍ර – ඝ්‍රාණ – ජිහ්වා– මනස අනිඃශ්‍රිත වූයේ, රූප ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් – කුලය– ගණයා – ආවාසය. . දෘෂ්ට ශ්‍රැත මූත විඥාතව්‍ය ධර්මයන් ඇසුරු නො කෙළේ නො ඇලුණේ නො පැමිණියේ නො පිවිසියේ නො බැසගත්තේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් වේසේ නුයි 'ඤත්වා ධම්මං අනිස්සිතො' යනු වේ.

**භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජති** – 'තණ්හා' යනු: රූපයෙහි තෘෂ්ණාව ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය – ධර්මතෘෂ්ණා යි **යස්ස**– අර්හත් ක්ෂීණාශ්‍රව හට; **භවාය** – භවදෘෂ්ටියෙහි; **විභවාය** – විභවදෘෂ්ටියෙහි; **භවාය** –ශාශ්වතදෘෂ්ටියෙහි හෝ; **විභවාය** – උච්ඡේදදෘෂ්ටියෙහි; **භවාය** – පුනපුනා භවයෙහි පුනපුනා ගතියෙහි පුනපුනා උත්පත්තියෙහි පුනපුනා ප්‍රතිසන්ධියෙහි පුනපුනා ආත්මභාවයාගේ පහළ වීමෙහි තෘෂ්ණාව යමක් හට නැත් ද නො වේ ද විද්‍යමාන නො වේ ද නො ලැබේ ද, ප්‍රහීණ වූවා සමුච්ඡින්න වූවා සන්සිඳුණි දුරලන ලද්දී උපතට නුසුදුසු වූවා නුවණ–ගින්නෙන් දවන ලද්දී නුයි 'භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජති' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

**යස්ස නිස්සයතා නත්ථි -පෙ- තණ්හා යස්ස න විජ්ජතී"යි**

10 - 10

තං බ්‍රෑමි උපසන්තො’ති කාමෙසු අනපෙක්ඛිනං,
ගන්ථා[1] තස්ස න විජ්ජන්ති අතරි[2] සො විසත්තිකං.

**තං බ්‍රෑමි උපසන්තොති** - උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධො’ති තං බ්‍රෑමි තං කථෙමි තං භණාමි තං දීපයාමි තං වොහරාමී’ති - තං බ්‍රෑමි උපසන්තො.

**කාමෙසු අනපෙක්ඛිනන්ති** - ‘කාමා’ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදිත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා; **කාමෙසු අනපෙක්ඛිනන්ති** වීතකාමො චත්තකාමො වන්තකාමො මුත්තකාමො පහීනකාමො පටිනිස්සට්ඨකාමො, කාමෙසු වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතී’ති - ‘කාමෙසු අනපෙක්ඛිනං.’

**ගන්ථා[1] තස්ස න විජ්ජන්තීති** - ‘ගන්ථා’ති චත්තාරො ගන්ථා. අභිජ්ඣා කායගන්ථො ව්‍යාපාදො කායගන්ථො[3] සීලබ්බතපරාමාසො කායගන්ථො ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො; අත්තනො දිට්ඨියා රාගො අභිජ්ඣා කායගන්ථො[3]; පරවාදෙසු ආඝාතො අප්පච්චයො ව්‍යාපාදො කායගන්ථො; අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පරාමසති සීලබ්බතපරාමාසො කායගන්ථො; අත්තනො දිට්ඨි ඉදං සච්චාභිනිවෙසො කායගන්ථො[3] **තස්සාති** අරහතො ඛීණාසවස්ස; ගන්ථා තස්ස නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා’ති - ‘ගන්ථා තස්ස න විජ්ජන්ති.’

**අතරි සො විසත්තිකන්ති** - ‘විසත්තිකා’ වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. **විසත්තිකාති** - කෙනට්ඨෙන විසත්තිකා විසතාති විසත්තිකා; විසාලාති විසත්තිකා, විසටාති[4] විසත්තිකා, විසමාති විසත්තිකා, විසක්කතී’ති විසත්තිකා, විසංහරතී’ති විසත්තිකා, විසංවාදිකා’ති විසත්තිකා, විසමූලා’ති විසත්තිකා, විසඵලා’ති විසත්තිකා, විසපරිභොගා’ති විසත්තිකා; විසාලා වා පන සා තණ්හා රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලෙ ගණෙ ආවාසෙ -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු විසටා විත්ථතා’ති විසත්තිකා. “අතරී සො විසත්තික”න්ති සො ඉමං විසත්තිකං තණ්හං අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තතී’ති ‘අතරී සො විසත්තිකං’.

තෙනාහ භගවා:

“තං බ්‍රෑමි උපසන්තො’ති කාමෙසු අනපෙක්ඛිනං,
ගන්ථා තස්ස න විජ්ජන්ති අතරී සො විසත්තික”න්ති.

1. ගණ්ඨා - මජසං 2. අතාරි - PTS. 3. කායගණ්ඨො - මජසං.
4. විසටායි - PTS.

## 10 – 10

වස්තුකාමක්ලේශකාමයන්හි අපේක්ෂා රහිත වූ ඒ රහත්හු 'උපශාන්ත ය'යි කියති. ඔහුට (අභිධ්‍යාකායාදි) ග්‍රන්ථයෝ විද්‍යමාන නො වෙති. මෙසේ ම තෘෂ්ණාව තරණය කෙළේ යි.

**තං බ්‍රෑමි උපසන්තො** – (යට දක්වූ) ඔහු සන්හිඳුණේ යැ වෙසෙසින් සන්හිඳුණේ යැ නිවුණේ යැ නැසූ කෙලෙස් ඇත්තේ යැයි පවසමි ඔහු කියමි බෙණෙමි – දක්වමි – ව්‍යවහාර කෙරෙමි නුසි 'තං බ්‍රෑමි උපසන්තො' යනු වේ.

**කාමෙසු අනපෙක්ඛිනං** – 'කාමා' යනු: උදෙස් විසින් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ දැයි. වස්තුකාමයන් පරිජානනය කොට ක්ලේශකාමයන් හැර දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා. **කාමෙසු අනපෙක්ඛිනං** – පහවූ කාම ඇත්තේ හරන ලද – වමනය කළ – මුදන ලද – ප්‍රහීණ කළ – දුරලන ලද කාම ඇත්තේ; කාමයන්හි පහවූ රාග ඇත්තේ විගතරාග වූයේ ත්‍යක්තරාග– වාන්තරාග මුක්තරාග – ප්‍රහීණරාග – ප්‍රතිනිස්සෘෂ්ටරාග වූයේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳින සුලු වූයේ ශ්‍රේෂ්ඨ වූ සිතින් යුක්ත ව වෙසේ නුසි 'කාමෙසු අනපෙක්ඛිනං' යනු වේ.

**ගන්ථා තස්ස න විජ්ජන්ති** – 'ගන්ථා' යනු: ග්‍රන්ථයෝ සතර දෙනෙකි: අභිධ්‍යාකායග්‍රන්ථ යැ, ව්‍යාපාදකායග්‍රන්ථ යැ, ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යැ, ඉදංසත්‍යාභිනිවේශකායග්‍රන්ථ යැයි; තමා ගන්නා ලද දෘෂ්ටියෙහි රාගය අභිධ්‍යාකායග්‍රන්ථ යැ, පරවාදයන්හි කොපය හා නො සතුට ව්‍යාපාදකාය–ග්‍රන්ථ යැ, තමාගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය දැඩිව ගැනීම ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යැ, තමා (නුනුවණින්) ගත් දෘෂ්ටිය ඉදංසත්‍යාභි–නිවේශකායග්‍රන්ථ යයි. **තස්ස** – අර්හත් ක්ෂීණාශ්‍රව හට; **ගන්ථා තස්ස න විජ්ජන්ති** – ග්‍රන්ථයෝ ඔහුට නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණයහ සමුච්ඡින්නයහ සන්හිඳුණාහ, දුරලන ලද්දාහු අනභ්‍යුත්පත්තිකයහ ඥානාග්නියෙන් දග්ධ වූවාහු නුසි – 'ගන්ථා තස්ස න විජ්ජන්ති' යනු වේ.

**අතරි සො විසත්තිකං** – 'විසත්තිකා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභඅකුශලමූලයෙක් වේ ද, එය යි. **විසත්තිකා** – කිනම් අර්ථයෙකින් 'විසත්තිකා' වූ ද යත්? පතළ වූවා නුසි විසත්තිකා යැ, විශාලවූවා නුසි විසත්තිකා යැ, විසෘත නුසි විසත්තිකා යැ, විෂමවූවා නුසි විසත්තිකා යැ, ඉවසා නුසි විසත්තිකා යැ, (සිත) වෙසෙසින් හකුළුවා නුසි විසත්තිකා යැ, විසංවාදන කරන්නී නුසි විසත්තිකා යැ, විෂ (=දුඃඛහෙතු කර්ම) යට මූල වූවා නුසි විසත්තිකා යැ, විෂඵල ඇත් නුසි විසත්තිකා යැ, විෂපරිභොග ඇත් නුසි විසත්තිකා යැ; නවද විශාල වූ ඒ තෘෂ්ණාව රූපයෙහි ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයෙහි කුලයෙහි ගණයෙහි ආවාසයෙහි...දෘෂ්ටශ්‍රැතමුතවිඥාතව්‍ය ධර්මයන්හි පතළා විසෘත වූවා නුසි විසත්තිකා නම්. **අතරි සො විසත්තිකං** – මෙසේ ම මේ විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කෙළේ ය, උත්තරණය ප්‍රතරණය සමතික්‍රමණය කෙළේ ය, ඉක්මැ වූයේ නුසි 'අතරි සො විසත්තිකං' යනු වේ

එයින් වදාළහ බුදුහු:

"තං බ්‍රෑමි උපසන්තොති -පෙ- අතරි සො විසත්තිකං"යි.

**10 - 11**

න තස්ස පුත්තා පසවො[1] ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති,
අත්තා වාපි නිරත්තා[2] වා න තස්මිං උපලබ්භති.

**න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජතීති** - 'නා'ති පටික්ඛෙපො; **තස්සාති** අරහතො ඛීණාසවස්ස; **පුත්තාති** චත්තාරො පුත්තා: අත්‍රජො පුත්තො, ඛෙත්තජො පුත්තො, දින්නකො පුත්තො, අන්තෙවාසිකො පුත්තො; **පසවොති** අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා; **ඛෙත්තන්ති** සාලික්ඛෙත්තං වීහික්ඛෙත්තං මුග්ගක්ඛෙත්තං මාසක්ඛෙත්තං යවක්ඛෙත්තං ගොධුමක්ඛෙත්තං තිලක්ඛෙත්තං; **වත්ථුන්ති** ඝරවත්ථු[3] කොට්ඨවත්ථු පුරෙවත්ථු පච්ඡාවත්ථු ආරාමවත්ථු විහාරවත්ථු. **න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජතීති** තස්ස පුත්තපරිග්ගහො වා පසුපරිග්ගහො වා ඛෙත්තපරිග්ගහො වා වත්ථුපරිග්ගහො වා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති[4] නුපලබ්භන්ති[5] පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති - 'න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති.'

**අත්තා වාපි නිරත්තා වා න තස්මිං උපලබ්භතීති** - 'අත්තා'ති සස්සතදිට්ඨි නත්ථි. නිරත්තාති උච්ඡෙදදිට්ඨි නත්ථි. 'අත්තා'ති ගහිතං නත්ථි; 'නිරත්තා'ති මුඤ්චිතබ්බං නත්ථි; යස්ස නත්ථි ගහිතං, තස්ස නත්ථි මුඤ්චිතබ්බං. යස්ස නත්ථි මුඤ්චිතබ්බං, තස්ස නත්ථි ගහිතං. ගාහමුඤ්චනසමතික්කන්තො අරහා වුද්ධිපරිහානිවීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො'ති - අත්තා වා පි නිරත්තා වා න තස්මිං උපලබ්භති.

තෙනාහ භගවා:

"න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති,
අත්තා වා පි නිරත්තා වා න තස්මිං උපලබ්භතී"ති.

**10 - 12**

යෙන නං වජ්ජුං[6] පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා,
තං තස්ස අපුරෙක්ඛතං තස්මා වාදෙසු නෙජති.

---

1. පසවො ච - මජසං. 2. අත්තං වාප නිරත්තං - PTS.
3 ඝරවත්ථු. සී 11. [illegible] 4 විජ්ජන්ති - [illegible]
5. නුපලබ්භන්ති PTS 6 වජ්ජු - සී.

**10 - 11**

ඒ ක්ෂීණාශ්‍රව හට පුත්‍රයෝ ද (ගෙරිසරක් ආදී) පසුවර්ගයෝ ද නැත්තාහු ය, කෙත් වත් ද නැත. තවද ඔහු කෙරෙහි ශාශ්වතදෘෂ්ටිය හෝ උච්ඡේදදෘෂ්ටිය හෝ නො ලැබේ.

**න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති** – 'න' යනු: ප්‍රතිෂෙධ යැ; **තස්ස** – අර්හත් ක්ෂීණාශ්‍රව හට; **පුත්තා** – පුත්‍රයෝ සතර-දෙනෙකි: අත්‍රජපුත්‍ර යැ, ක්ෂෙත්‍රජපුත්‍ර යැ, දින්නකපුත්‍ර යැ, අන්තෙවාසික පුත්‍ර යැයි. **පසවො** – එළුබැටළු යැ, කුකුළුඌරු යැ, ඇත්අස්ගවමෙළඹහු යි. **ඛෙත්තං** – හැල්කෙත යැ, වීකෙත යැ, මුංකෙත යැ, මෑකෙත යැ, යවකෙත යැ, තිරිඟුකෙත යැ, තලකෙත යි. **වත්ථුං** – ගෙවතු යැ, කොටුවතු යැ, පෙරවතු යැ, පසුවතු යැ, අරම්වතු යැ, වෙහෙරවතු යි. **න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති** – ඔහුට පුත්‍රපරිග්‍රහයෙක් (=පුත්‍රයන් ගේ අයැතියෙක්) හෝ... නැත, නො වෙයි විද්‍යමාන නො වෙයි නො ලැබේ; (ඔහු විසින් පරිග්‍රහයෝ) ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්සිඳුණාහු දුරලන ලද්දාහු උපනට නො සුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි. 'න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති' යනු වේ.

**අත්තා වා පි නිරත්තා වා න තස්මිං උපලබ්භති** – **අත්තා**– ශාශ්වත-දෘෂ්ටිය නැත; **නිරත්තා** – උච්ඡේදදෘෂ්ටිය නැත; 'ආත්ම'යැ'යි ගතයුත්තෙක් නැත, 'නිරාත්ම යැ'යි හළයුත්තෙක් නැත; යම් පුද්ගලයකුට (තෘෂ්ණාදි වශයෙන්) ගතයුත්තෙක් නැත් නම්, ඔහුට හළ යුත්තෙක් නැත, යමක් හට හළයුත්තෙක් නැත් නම්, ඔහුට ගතයුත්තෙක් නැත; ගැනීමත් හැරීමත් ඉක්මැ වූ රහත් තෙම වැඩීමත් පිරිහීමත් ඉක්මැවූයේ යැ. හෙතෙම වුසූ බඹසරවස් ඇත්තේ යැ, පුරුදු කළ චරණධම් ඇත්තේ යැ...ඔහුට ජාතිමරණසංසාරය පුනර්භවය නැත් නුයි 'අත්තා වා'පි නිරත්තා වා න තස්මිං උපලබ්භති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“න තස්ස පුත්තා පසවො -පෙ- න තස්මිං උපලබ්භති”යි.**

**10 - 12**

යම් (රාගාදි) දොසකින් (දිව්‍යමනුෂ්‍යාදි) පෘථග්ජනයෝ ද, (ශාසන යෙන් පිටත්හි) මහණබමුණෝ ද, (ඒ රහත්හු රාගරක්ත යැ යනාදීන්) කියන්නාහු නම්, ඒ දොෂය ඔහු විසින් නො පෙරටු කරන ලද්දේය. එහෙයින් (හෙතෙම) නින්දාවචනයන්හි කම්පා නො වේ.

**යෙන නං වජ්ජු[1] පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණාති** – 'පුථුජ්ජනා'ති පුථු කිලෙසෙ ජනෙන්තී'ති පුථුජ්ජනා, පුථු අවිහතසක්කායදිට්ඨිකා'ති පුථුජ්ජනා, පුථු සත්ථාරානං මුඛුල්ලොකිකා'ති පුථුජ්ජනා, පුථු සබ්බගතීහි අවුට්ඨිතා'ති පුථුජ්ජනා, පුථු නානාභිසඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්තී'ති පුථුජ්ජනා, පුථු නානාඔඝෙහි වුය්හන්තී'ති පුථුජ්ජනා, පුථු නානාසන්තාපෙහි සන්තප්පන්තී'ති පුථුජ්ජනා, පුථු නානාපරිළාහෙහි පරිඩය්හන්තී'ති පුථුජ්ජනා, පුථු පඤ්චසු කාමගුණෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා'ති පුථුජ්ජනා; පුථු පඤ්චහි නීවරණෙහි ආවුතා නිවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතා'ති පුථුජ්ජනා. **සමණාති**– යෙ කෙචි ඉතො බහිද්ධා පරිබ්බාජූපගතා පරිබ්බාජකසමාපන්නා. **බ්‍රාහ්මණාති**– යෙ කෙචි භොවාදිකා. **යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණාති**– පුථුජ්ජනා යෙන රාගෙන වදෙය්‍යුං, යෙන දොසෙන වදෙය්‍යුං, යෙන මොහෙන වදෙය්‍යුං, යෙන මානෙන වදෙය්‍යුං, යාය දිට්ඨියා වදෙය්‍යුං, යෙන උද්ධච්චෙන වදෙය්‍යුං, යාය විචිකිච්ඡාය වදෙය්‍යුං, යෙහි අනුසයෙහි වදෙය්‍යුං, රත්තො'ති වා දුට්ඨො'ති වා මූළ්හො'ති වා විනිබද්ධො'ති වා පරාමට්ඨො'ති වා වික්ඛෙපගතො'ති වා අනිට්ඨංගතො'ති වා ථාමගතො'ති වා; තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා යෙන නං වදෙය්‍යුං නෙරයිකො'ති වා තිරච්ඡානයොනිකො'ති වා පෙත්තිවිසයිකො'ති වා මනුස්සො'ති වා දෙවො'ති වා රූපී'ති වා අරූපී'ති වා සඤ්ඤී'ති වා අසඤ්ඤී'ති වා නෙවසඤ්ඤීනාසඤ්ඤී'ති වා; සො හෙතු නත්ථි පච්චයො නත්ථි කාරණං නත්ථි යෙන නං වදෙය්‍යුං කථෙය්‍යුං භණෙය්‍යුං දීපයෙය්‍යුං වොහරෙය්‍යුන්ති - 'යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා.

**තං තස්ස අපුරෙක්ඛතන්ති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස. **පුරෙක්ඛාරාති** – ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච –පෙ– අයං තණ්හාපුරෙක්ඛාරො –පෙ– අයං දිට්ඨිපුරෙක්ඛාරො –පෙ– තස්ස තණ්හාපුරෙක්ඛාරො පහීනො, දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො. තණ්හාපුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා දිට්ඨිං වා පුරතො කත්වා චරති න තණ්හාධජො න තණ්හාකෙතු න තණ්හාධිපතෙය්‍යො න දිට්ඨිධජො න දිට්ඨිකෙතු න දිට්ඨාධිපතෙය්‍යො. න තණ්හාය වා දිට්ඨියා වා පරිවාරිතො චරතී'ති – 'තං තස්ස අපුරෙක්ඛතං'

**තස්මා වාදෙසු නෙජතීති** – 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා[2] තංනිදානා[3] වාදෙසු උපවාදෙසු නින්දාය ගරහාය අකිත්තියා අවණ්ණහාරිකාය නෙජති න ඉඤ්ජති න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධතීති – 'තස්මා වාදෙසු නෙජති.'

1. වජ්ජු - සු. යෙන වජ්ජුං - PTS
2. තං පච්චයා - සබ්බත්ථ
3. තංනිදානා - සීමු. II.

**යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා** – 'පුථුජ්ජනා' යනු: බොහෝ කෙලෙසුන් උපදවත් නුසි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නො නැසූ සත්කායදෘෂ්ටි ඇත්තාහු නුසි පුහුදුනුවෝ යැ, බොහෝ ශාස්තෘන්ගේ මුහුණු බලන්නාහු නුසි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නිරයාදි සියලු ගතිවලින් නො නැඟිසිටියාහු නුසි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා කර්මාභිසංස්කාරයන් රැස් කෙරෙත් නුසි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා ඕඝයන් යෙන් වහනය කරනු ලැබෙත් නුසි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා සන්තාපයන් යෙන් තැවෙත් නුසි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා පරිදාහයන් ගෙන් දැවෙත් නුසි පුහුදුනුවෝ යැ, බොහෝ වූ පස්කම්ගුණයන්හි ඇලුණාහු ගිජුවූවාහු ගෙතුණාහු මූසපත් වූවාහු ඇතුළත් වූවාහු ලග්න වූවාහු ලග්නිත වූවාහු පරිරුද්ධ වූවාහු නුසි-පුහුදුනුවෝ යැ, බොහෝ වූ පඤ්චනීවරණයන්ගෙන් ආවෘත – නිවෘත – අපවෘත – පිහිත – ප්‍රතිච්ඡන්න – අබොමුඛ වූවාහු නුසි – පුහුදුනුවෝ යි. **සමණා** – මේ ශාසනයෙන් බැහැර යම් කිසි පැවිද්දකට පැමිණියාහු පැවිදි වූවාහු යැ. **බ්‍රාහ්මණා** – යම් කිසි භොවාදි බමුණෝ යැ. **යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණාති** – පෘථග්ජනයෝ යම් රාගයකින් (නුගුණ) කියන්නාහු නම්, යම් ද්වේෂයකින් – මෝහයකින් – මානයකින් – දෘෂ්ටියකින් – ඖද්ධත්‍යයකින් – විචිකිත්සාවකින් – යම් අනුශයධර්මයන්ගෙන් රාගරක්ත යැ හෝ ද්විෂ්ට යැ – මූඪ යැ – විනිබද්ධ යැ – පරාමෘෂ්ට යැ – වික්ෂෙපයට ගියේ යැ – අනිශ්ඨාවට ගියේ යැ හෝ තදබවට ගියේ යැයි හෝ කියන්නාහු නම්, ඒ අභිසංස්කාරයෝ ප්‍රහීණ කරන ලද්දාහුය, අභිසංස්කාරයන් ප්‍රහීණ කළ හෙයින් යම් හෙතුවකින් ඔහු නෙරයික වන්නේ යැයි හෝ තිරිසන් යොනි ඇත්තෙකැයි හෝ ප්‍රෙතගති ඇත්තෙකැයි හෝ මිනිසෙකැයි හෝ දෙවියෙකැයි හෝ රූපී යැ හෝ අරූපී යැ හෝ සංඥී යැ හෝ අසංඥී යැ හෝ නෙවසංඥී නාසංඥී යැයි හෝ එක්තරා ගතියකින් කියන්නාහු නම්, යම් හෙයකින් කියන්නාහු නම්, බණන්නාහු නම්, දක්වන්නාහු නම්, වනරන්නාහු නම්, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැත් නුසි 'යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා' යනු වේ.

**තං තස්ස අපුරෙක්ඛතං** – 'තස්ස' යනු ඒ අහීන් ක්ෂීණාශ්‍රවයා විසින්. **පුරෙක්ඛාරා** – තෘෂ්ණාපුරස්කාරය දෘෂ්ටිපුරස්කාරය දැයි පෙරටු කිරීම් දෙකෙකි... ඔහු විසින් තෘෂ්ණාපුරස්කාරය නසන ලද්දේය, දෘෂ්ටිපුරස්කාරය දුරලන ලද්දේය. තෘෂ්ණාපුරස්කාරය නැසූ හෙයින් දෘෂ්ටිපුරස්කාරය දුරලූ හෙයින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙයි, තෘෂ්ණාධ්වජ ඇතියේ – තෘෂ්ණා කෙහෙලි ඇතියේ – තෘෂ්ණාධිපති බව ඇත්තේ – දෘෂ්ටිධ්වජ ඇතියේ – දෘෂ්ටිකෙතු ඇතියේ – දෘෂ්ට්‍යධිපතිභාවය ඇත්තේ නො හැසිරෙයි, තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ පිරිවරන ලදුයේ නො හැසිරේ නුසි 'තං තස්ස අපුරෙක්ඛතං' යනු වේ.

**තස්මා වාදෙසු නෙජති** – 'තස්මා' යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; **වාදෙසු** – උපවාදයන්හි නින්දායෙන් ගර්හායෙන් අකීර්තියෙන් නො කැපෙයි නො කම්පා වෙයි නො සැලෙයි නො වෙවුලයි ඉතා නො වෙවුලයි. පුනපුනා නො වෙවුලා නුසි 'තස්මා වාදෙසු නෙජති' යනු වේ.

තෙනාහ භගවා:

"යෙන නං වජ්ජුං[1] පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා,
තං තස්ස අපුරෙක්ඛතං තස්මා වාදෙසු නෙජතී"ති.

## 10 - 18

වීතගෙධො අමච්ඡරී න උස්සෙසු[2] වදතෙ මුනි,
න සමෙසු න ඔමෙසු කප්පං නෙති අකප්පියො.

**වීතගෙධො අමච්ඡරීති** - 'ගෙධො' වුච්චති තණ්හා. යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. යස්සෙසො ගෙධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො; සො වුච්චති වීතගෙධො. සො රූපෙ අගිද්ධො -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගධිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො නිච්ඡාතො -පෙ- බ්‍රහ්මභූතෙන අත්තනා විහරතී'ති වීතගෙධො. අමච්ඡරීති - මච්ඡරියන්ති පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡරියා -පෙ- ගාහො වුච්චති මච්ඡරියං. යස්සෙතං මච්ඡරියං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අමච්ඡරී'ති - 'වීතගෙධො අමච්ඡරී'.

**න උස්සෙසු[2] වදතෙ මුනි න සමෙසු න ඔමෙසූති** - 'මුනී'ති මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; සෙය්‍යොහමස්මී'ති වා සදිසොහමස්මී'ති වා හීනොහමස්මී'ති වා න වදති න කථෙති න භණති න දීපයති න වොහරතී'ති - න උස්සෙසු වදතෙ මුනි න සමෙසු න ඔමෙසු.

**කප්පං නෙති අකප්පියොති** - 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො; තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා නෙති න උපෙති න උපගච්ඡති න ගණ්හාති න පරාමසති, නාභිනිවිසතී'ති - 'කප්පං නෙති.' **අකප්පියොති** 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච. -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තස්ස තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා න කප්පෙති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතී'ති - 'කප්පං නෙති අකප්පියො.'

---

1. යෙන වජ්ජුං - PTS. 2. ඌස්සෙසු - PTS.

එයින් වදාළහ බුදුහු:

**"යෙන නං වජ්ජුං -පෙ- තස්මා වාදෙසු නෙජති"** යි.

## 10 - 18

පහවූ තෘෂ්ණා ඇති නො මසුරු වූ ක්ෂීණාස්‍රව මුනි තෙම විශිෂ්ටයන් කෙරෙහි (තමා ඇතුළත් කොට අභිමාන වශයෙන්) නො කියයි, සමානයන් කෙරෙහි ලා නො කියයි, හීනයන් කෙරෙහි ලා නො කියයි. තෘෂ්ණාදෘෂ්ටිකල්ප රහිත වූයේ කල්පනයට නො පැමිණේ.

**වීතගෙධො අමච්ඡරී** – 'ගෙධ' යයි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල ගෙධය නසන ලද ද සිඳින ලද ද සන්සිඳුවන ලද ද දුරලන ලද ද උපනට නුසුදුසු කරන ලද ද නුවණගින්නෙන් දවන ලද ද හෙතෙම 'වීතගෙධ' යයි කියනු ලැබේ. හෙතෙම රූපයෙහි අගිද්ධ යැ...දෘෂ්ටශ්‍රුතමුතවිඥාතව්‍ය ධර්මයන්හි නො ගිජු යැ, නො ගෙතුණේ යැ, නො මුසපත් වූයේ යැ, නො බැසගත්තේ යැ, වීතගෙධ යැ විගත – ත්‍යක්ත – මුක්ත – ප්‍රහීණ – ප්‍රතිනිස්සෘෂ්ටගෙධ යැ, තෘෂ්ණා රහිත වූයේ...ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත ව වෙසේ නුයි 'වීතගෙධො' යනු වේ. **අමච්ඡරී** – 'මච්ඡරිය' නම්: ආවාස – කුල – ලාභ – වර්ණ – ධර්මමාත්සර්ය යැයි මාත්සර්ය පසෙකි. මෙබඳු වූ යම් මසුරු බවෙක්...ග්‍රාහයෙක් වේ නම්, එම මච්ඡරිය යි කියනු ලැබෙයි. යමක්හු විසින් තෙල මාත්සර්යය නසන ලද ද සිඳින ලද ද සන්සිඳුවන ලද ද දුරලන ලද ද උපනට නුසුදුසු කරන ලද ද නුවණගින්නෙන් නසන ලද ද හෙතෙම, 'අමච්ඡරී' යයි කියනු ලැබේ නුයි 'වීතගෙධො අමච්ඡරී' යනු වේ.

**න උස්සෙසු වදතෙ මුනි න සමෙසු න ඔමෙසු** – 'මුනි' යනු 'මොන'යි නුවණ කියනු ලැබෙයි...'මම ශ්‍රෙෂ්ඨයෙමි' හෝ 'මම සදෘශයෙමි' හෝ 'මම හීනයෙමි' හෝ නො පවසයි නො කියයි නො බෙණෙයි නො දක්වයි, නො වහරා නුයි 'න උස්සෙසු වදතෙ මුනි න සමෙසු න ඔමෙසු' යනු වේ.

**කප්පං නෙති අකප්පියො** – 'කප්ප නම්: තෘෂ්ණාකල්ප යැ දෘෂ්ටිකල්ප යැයි කල්පනයෝ දෙදෙනෙකි. ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ යැ, දෘෂ්ටිකල්පය ප්‍රතිනිස්සෘෂ්ට යැ, තෘෂ්ණාකල්පය ප්‍රහීණ බැවින් දෘෂ්ටිකල්පය ප්‍රතිනිස්සෘෂ්ට බැවින් තෘෂ්ණාකල්පයට හෝ දෘෂ්ටිකල්පයට හෝ නො පැමිණෙයි නො එළඹෙයි නො ගනී නො පරාමර්ශ කෙරෙයි නො පිවිසේ නුයි 'කප්පං නෙති' යනු වේ. **අකප්පියො** – 'කප්පා' යනු කල්පයෝ දෙදෙනෙකි: තෘෂ්ණාකල්පය දෘෂ්ටිකල්පය දැයි...තෘෂ්ණාකල්පය ප්‍රහීණ හෙයින් දෘෂ්ටිකල්පය ප්‍රතිනිස්සෘෂ්ට හෙයින් තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ කල්පනය නො කෙරෙයි, නූපදවයි, වෙසෙසින් නූපදවයි, නො නිපදවයි, වෙසෙසින් නො නිපදවා නුයි 'කප්පං නෙති අකප්පියො' යනු වේ.

තෙනාහ භගවා:

“වීතගෙධො අමච්ඡරී න උස්සෙසු වදතෙ මුනි,
න සමෙසු න ඔමෙසු කප්පං නෙති අකප්පියො”ති.

## 10 - 14

යස්ස ලොකෙ සකං නත්ථි අසතා ච න සොචති,
ධම්මෙසු ච න ගච්ඡති ස වෙ සන්තො’ති වුච්චති.

**යස්ස ලොකෙ සකං නත්ථීති** - ‘යස්සා’ති අරහතො ඛීණාසවස්ස; සකං නත්ථීති යස්ස ‘මය්හං වා ඉදං, පරෙසං වා ඉද’න්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති -පෙ- ඤාණග්ගිනා දඩ්ඪන්ති - ‘යස්ස ලොකෙ සකං නත්ථි.’

**අසතා ච න සොචතීති** - ‘විපරිණතං වා වත්ථුං න සොචති; විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති; චක්ඛුං මෙ විපරිණතන්ති න සොචති. සොතං මෙ - ඝානං මෙ - ජිව්හා මෙ - කායො මෙ - මනො මෙ - රූපා මෙ - සද්දා මෙ - ගන්ධා මෙ - රසා මෙ - ඵොට්ඨබ්බා මෙ - කුලං මෙ - ගණො මෙ - ආවාසො මෙ - ලාභො මෙ - යසො මෙ - පසංසා මෙ - සුඛං මෙ - චීවරං මෙ - පිණ්ඩපාතො මෙ - සෙනාසනං මෙ - ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො මෙ - මාතා මෙ - පිතා මෙ - භාතා මෙ - භගිනී මෙ - පුත්තො මෙ - ධීතා මෙ - මිත්තා මෙ - අමච්චා මෙ - ඤාතකා මෙ - සාලොහිතා මෙ විපරිණතා’ති න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජතී’ති - එවම්පි අසතා ච න සොචති. අථවා, අසාතාය[1] දුක්ඛාය වෙදනාය ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. සොතරොගෙන ඝානරොගෙන ජිව්හාරොගෙන කායරොගෙන සීසරොගෙන කණ්ණරොගෙන මුඛරොගෙන දන්තරොගෙන කාසෙන සාසෙන පිනාසෙන ඩහෙන ජරෙන කුච්ඡිරොගෙන මුච්ඡාය පක්ඛන්දිකාය සූලාය විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන අපමාරෙන දද්දුයා කණ්ඩුයා කච්ඡුයා නඛසාය[2] විතච්ඡිකාය ලොහිතෙන පිත්තෙන මධුමෙහෙන අංසාය පිළකාය භගන්දලාය පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන[3] උතුපරිණාමජෙන ආබාධෙන[3] විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජතී’ති - එවම්පි ‘අසතා ච න සොචති.

---

1. අසතාය - සිමු II PTS අසන්තාය - මනුප, මජසං.
2. රඛසාය - සිමු. I. 3. ආබාධෙහි - PTS.

එයින් වදාළහ බුදුහු:

“වීතගෙධො අමච්ඡරී -පෙ- කප්පං නෙති අකප්පියො”ති

## 10 - 14

ලොවැ යම් ක්ෂීණාශ්‍රවයක්හට මාගේ යැයි ගන්නා ලද දෙයෙක් නැත් ද, යළි අවිද්‍යමාන බැවින් ශෝක නො කෙරේ ද, සියලු ධර්මයන්හි ඡන්දාදිවශයෙන් අගතියට නො යේ ද, ඒ රහත් තෙම ඒකාන්තයෙන් ‘ශාන්තයෙකැ’යි කියනු ලැබේ.

**යස්ස ලොකෙ සකං නත්ථි** - ‘යස්ස’ යනු: අර්හත් ක්ෂීණාශ්‍රවයක්හට **සකං නත්ථි** - යමක්හට ‘මේ මාගේ හෝ යැ, මේ මෙරමාගේ හෝ යැ’යි ගන්නා ලද පරාමර්ශිතය කළ අභිනිවේශ කළ ඇතුළත් වැ සිටි බැසගන්නා ලද කිසි රූපගතයෙක් වේදනා - සඤ්ඤා - සංස්කාර - විඤ්ඤාණ- ගතයෙක් නැත් ද අවිද්‍යමාන ද ..නුවණගින්නෙන් දවන ලද හුයි ‘යස්ස ලොකෙ සකං නත්ථි’ යනු වේ.

**අසතා ච න සොචති** - ‘විපරිණත (-වෙනස් වූ) වස්තුවට හෝ ශෝක නො කෙරෙයි, වස්තුව වෙනස් වූ කල්හි හෝ ශෝක නො කෙරෙයි, මාගේ ඇස වෙනස් වී යැයි ශෝක නො කෙරෙයි, මාගේ කන - නැහැය- දිව - කය - මනස - රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයෝ - කුලය- ගණය - ආවාසය - - ලාභය - යශස - ප්‍රශංසාව - සුඛය - චීවර - පිණ්ඩපාත- සේනාසන - ගිලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර - මවු - පියා - බෑයා - බූනෑණියා- පුත්‍රයා - දුහිතාව - මිත්‍රයෝ - සහායයෝ - නෑයෝ - මාගේ සහලේනෑයෝ වෙනස් වූහ’යි ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ හුයි මෙසේ ත්‘ - අසතා ච න සොචති’ යනු වේ. නොහොත් අසාත (-අමිහිරි) වූ දුඃඛවේදනාවෙන් ස්පර්ශ කරන ලදුයේ මඩනා ලදුයේ පිවිසියේ සමන්විත වූයේ ශෝක නො කෙරෙයි...සම්මෝහයට නො පැමිණෙයි, චක්ෂූරෝගයෙන් ස්පර්ශ කරන ලදුයේ පීඩිත වූයේ සමවහිත වූයේ සමන්විත වූයේ ශෝක නො කෙරෙයි...සම්මෝහයට නො පැමිණෙයි, ශ්‍රොත්‍රරෝගයෙන් - ඝ්‍රාණ- රෝගයෙන් - ජිහ්වාරෝගයෙන් - කායරෝගයෙන් - ශීර්ෂරෝගයෙන් කර්ණ- රෝගයෙන් මුඛරෝගයෙන් - දන්තරෝගයෙන් - කාසයෙන් - ශ්වාසයෙන්- පීනසයෙන් - දාහයෙන් - ජ්වරයෙන් - කුක්ෂිරෝගයෙන් - මූර්ඡායෙන්- අතිසාරයෙන් - ආමශූලයෙන් - විරේචනයෙන් - කුෂ්ඨයෙන් - ගණ්ඩයෙන්- කිලාසයෙන් - ශෝෂයෙන් - අපස්මාරයෙන් - දද්රුයෙන් - කණ්ඩූතියෙන්- මහාකුෂ්ඨයෙන් - නියපහරින් - අතුල්පතුල් පැළීමෙන් - රත්පිතින් - මධුමේහ යෙන් - අර්ශසින් - පොළයෙන් - භගන්දරයෙන් - පිත්තරෝගයෙන් - ශ්ලේෂ්ම- රෝගයෙන් - වාතරෝගයෙන් - සාන්නිපාතිකරෝගයෙන් - සෘතුවිපර්‍යාස- යෙන් උපන් රෝගයෙන් විෂමපරිහරණයෙන් උපන් රෝගයෙන් - උපක්‍රමයෙන් උපන් රෝගයෙන් - කර්මවිපාකජ ආබාධයෙන් - සීතයෙන් - උෂ්ණයෙන් - සයින් - පවසින් - මැසිමදුරු වා අව් දිය්ද පහසින් ස්පර්ශ කරන ලදුයේ පීඩිත වූයේ පිවිසියේ සමන්විත වූයේ ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ හුයි මෙසේත්- ‘අසතා ච න සොචති’ යනු වේ.

අථවා, අසන්තෙ අසංවිජ්ජමානෙ අනුපලබ්භමානෙ[1] අහු වත මෙ[2], තං වත මෙ නත්ථි, සියා වත මෙ, තං වතා'හං න ලභාමී'ති[3] න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජතී'ති – 'එවම්පි අසතා ච න සොචති.'

**ධම්මෙසු ච න ගච්ඡතීති** – න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති; න රාගවසෙන ගච්ඡති; න දොසවසෙන ගච්ඡති; න මොහවසෙන ගච්ඡති; න මානවසෙන ගච්ඡති; න දිට්ඨිවසෙන ගච්ඡති; න උද්ධච්චවසෙන ගච්ඡති; න විචිකිච්ඡාවසෙන ගච්ඡති; න අනුසයවසෙන ගච්ඡති; න ච වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයතී'ති – 'ධම්මෙසු ච න ගච්ඡති.

**ස වෙ සන්තොති වුච්චතීති** – 'සො සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධො'ති වුච්චති පවුච්චති කථීයති භණීයති දීපීයති වොහරීයතී'ති – 'ස වෙ සන්තො'ති වුච්චති.

තෙනාහ භගවා:

“යස්ස ලොකෙ සකං නත්ථි අසතා ච න සොචති,
ධම්මෙසු ච න ගච්ඡති ස වෙ සන්තො'ති වුච්චතී”ති.

**පුරභෙදසුත්තනිද්දෙසො දසමො.**

# 11

# කලහවිවාදසුත්තනිද්දෙසො

අථ කලහවිවාදසුත්තනිද්දෙසො වුච්චති:

**11 - 1**

කුතො පහූතා කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුණා ච
කුතො පහූතා[4] තෙ තදිඞ්ඝ බ්‍රෑහි.

**කුතො පහූතා[4] කලහා විවාදා'ති** – 'කලහො'ති එකෙන ආකාරෙන කලහො; විවාදොතිපි තඤ්ඤෙව; යො කලහො, සො විවාදො. යො විවාදො, සො කලහො. අථවා, අපරෙන ආකාරෙන විවාදො වුච්චති: කලහස්ස පුබ්බභාගො විවාදො; රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතීපි[5] ගහපතීහි විවදන්ති. මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. පුත්තොපි පිතරා විවදති. භාතාපි භාතරා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනීපි භාතරා විවදති. සහායොපි සහායෙන විවදති. අයං විවාදො.

---

1. අනුපලබ්භියමානෙ – PTS. 2. අහු වත මෙ තං – සීමු. II, PTS.
3. න ච ලභාමීති – සීමු. II. 4. පභූතා – මජසං.
5. ගහපතිකාපි – PTS.

නොහොත් නැත්තාවූ අවිද්‍යමාන වූ නොලැබෙන්නාවූ වස්තුවෙකි මට ඒදෙය එකාන්තයෙන් වූයේ ය, ඒ පෙර උපන් දෙය දූන් මට නැත, යමක් මට වන්නේ නම්, මම එය එකාන්තයෙන් නො ලබමි' ශෝක නො කෙරෙයි, නො ක්ලමෙයි, නො වැලපෙයි, ළෙයි අත් ගසා නො හඬයි, බලවත් මෝහයට නො පැමිණේ නුයි මෙසේ ත් 'අසතා ච න සොචති' යනු වේ.

ධම්මෙසු ච න ගච්ඡති - ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි, මෝහයෙන් අගතියට නො යෙයි, භයින් අගතියට නො යෙයි, රාගවශයෙන් නො යෙයි, ද්වේෂවශයෙන් - මෝහවශයෙන් - මානවශයෙන් - දෘෂ්ටිවශයෙන් - ඖද්ධත්‍යවශයෙන් - විචිකිත්සා වශයෙන් - අනුශය වශයෙන් නො යෙයි, ව්‍යග්‍ර වූ ධර්මයන් විසින් නො ද යවනු ලැබෙයි, පමුණුවනු ලැබෙයි, වහනය කරනු ලැබෙයි, ගරිනු ලැබේ නුයි 'ධම්මෙසු ච න ගච්ඡති' යනු වේ.

ස වෙ සන්තොති වුච්චති - හෙතෙම ශාන්ත යැ උපශාන්ත යැ ව්‍යුපශාන්ත යැ නිවුණේ යැ පහවූ කෙලෙස්දරථ ඇත්තේ යැ'යි වුච්චති පවසනු ලැබෙයි කියනු ලැබෙයි බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි ව්‍යවහාර කරනු ලැබේ නුයි 'ස වෙ සන්තො'ති වුච්චති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යස්ස ලොකෙ -පෙ- ස වෙ සන්තොති වුච්චති"යි.

දසවැනි 'පුරාභෙද' සූත්‍ර නිර්දේශය යි.

# 11

# කලහවිවාදසුත්තනිද්දේසය

ඉක්බිති 'කලහවිවාද' සූත්‍රනිර්දේශය කියනු ලැබේ:

## 11 - 1

කලහයෝත් විවාදයෝත් කොතැනින් උපන්නාහු ද ? පරිදේව - ශෝකයෝ ද මාත්සර්‍ය්‍යයෝ ද මාන - අතිමානයෝ ද පිසුනු වචනයෝ ද යන ඒ (අටවැදෑරුම්) කෙලෙස්ධර්මයෝ කොතැනින් උපන්නාහු ද ඒ අර්ථය වදාළ මැනවි.

කුතො පහුතා කලහා විවාදා - 'කලහ' නම්: එක් අයුරෙකින් කලහයෑ. 'විවාද' නමුදු එය මැ යි, යමෙක් කලහය නම්, හේ විවාද යැ, යමෙක් විවාදය නම් හේ කලහ යයි, නොහොත් අන් අයුරෙකින් විවාදය කියනු ලැබෙයි: කලහයාගේ පූර්වභාගය විවාද යයි; රජහු ද රජුන් සමග විවාද කෙරෙති, ක්ෂත්‍රියයෝ ද ක්ෂත්‍රියයන් සමග විවාද කෙරෙති, බමුණෝ ද බමුණන් සමග විවාද කෙරෙති, ගැහැවියෝ ද ගැහැවියන් සමග විවාද කෙරෙති, මවු ද පුතු සමග විවාද කෙරෙයි, පුතා ද මව සමග විවාද කෙරෙයි, පියා ද පුතු සමග විවාද කෙරෙයි, පුතා ද පියහු සමග විවාද කෙරෙයි, සොහොයුරා ද සොහොයුරු සමග විවාද කෙරෙයි, සොහොයුරා ද සොහොයුරිය සමග විවාද කෙරෙයි, සොහොයුරී ද සොහොයුරු සමග විවාද කෙරෙයි, යහළුවා ද යහළුවා සමග විවාද කෙරෙයි; මේ විවාදයයි.

කතමො කලහො? ආගාරිකා[1] දණ්ඩපසුතා කායෙන වාචාය කලහං කරොන්ති. පබ්බජිතා ආපත්තිං ආපජ්ජන්තා කායෙන වාචාය කලහං කරොන්ති. අයං කලහො.

**කුතො පහූතා කලහා විවාදා**'ති - කලහං ච විවාදං ච කුතො පහූතා? කුතො ජාතා? කුතො සඤ්ජාතා? කුතො නිබ්බත්තා? කුතො අභිනිබ්බත්තා? කුතො පාතුභූතා? කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවා'ති කලහස්ස ච විවාදස්ස ච මූලං පුච්ඡති. හෙතුං පුච්ඡති, නිදානං පුච්ඡති, සම්භවං පුච්ඡති, පභවං පුච්ඡති, සමුට්ඨානං පුච්ඡති, ආහාරං පුච්ඡති, ආරම්මණං පුච්ඡති, පච්චයං පුච්ඡති, සමුදයං පුච්ඡති, පපුච්ඡති, යාචති, අජ්ඣෙසති[2], පසාදෙතීති - 'කුතො පහූතා කලහා විවාදා.'

**පරිදෙවසොකා සහමච්ඡරා චා**'ති - 'පරිදෙවො'ති ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා, ආදෙවිතත්තං පරිදෙවිතත්තං, වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[3] ලාලප්පිතත්තං;[4][a] **සොකො**ති ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොග - රොග - සීල - දිට්ඨි බ්‍යසනෙන වා ඵුට්ඨස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස, සොකො සොචනා සොචිතත්තං, අන්තොසොකො අන්තොපරිසොකො අන්තොදාහො[5] අන්තොපරිදාහො, චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං; **මච්ඡර**න්ති පඤ්ච මච්ඡරියානි: - ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං, වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස;[b] ඉදං වුච්චති මච්ඡරියං. අපිච ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං; ගාහො වුච්චති මච්ඡරියන්ති - පරිදෙවසොකා සහමච්ඡරා ච.

**මානාතිමානා සහපෙසුනා**[6] **චා**'ති - 'මානො'ති ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන[7] වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා[8] සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. **අතිමානො**ති ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා.

1. අගාරිකා - සිමු. II. 2. අජ්ඣෙසති - සිමු II.
3. ලාලප්පායනා - සිමු. II. මජසං. PTS.
4. ලාලප්පායිතත්තං - සිමු. II මජසං. PTS 5. ඩාහො - ස.
6. පෙසුණා - සිමු. II. 7. අජ්ඣෙයනෙන - ස.
8. විජ්ජාට්ඨානෙන වා - කත්ථචි.
a. සච්ච-පටිච්චසමුප්පාදවිභඞ්ග. b. ඛුද්දකවත්ථුවිභඞ්ග.

කලහය කවරේ ද? ගිහිවැසියෝ දඬුවමෙහි යෙදුණාහු කයින් වචසින් කලහ කෙරෙති. පැවිද්දෝ ඇවැත් අවදනාහු කයින් වචසින් කලහ කෙරෙත්. මේ කලහ යයි. **කුතො පහූතා කලහා විවාද** - කලහයෝ ද විවාදයෝ ද කොතැනින් වූවාහු ද කොයින් උපන්නාහු ද කොයින් හටගත්තාහු ද කොයින් නිපන්නාහු ද කොයින් වෙසෙසින් නිපන්නාහු ද කොයින් පහළ වූවාහු ද කුමක් නිදාන කොට ඇත්තාහු ද කුමක් සමුදය කොට ඇත්තාහු ද කුමක් ජාති කොට ඇත්තාහු ද කුමක් ප්‍රභව කොට ඇත්තාහු දැයි කලහයාගේ ද විවාදයාගේ ද මූලය විචාරයි, හේතුව - නිදානය - සම්භවය - ප්‍රභවය - සමුත්ථානය - ආහාරය - ආලම්බනය - ප්‍රත්‍යය - සමුදය විචාරයි, වෙසෙසින් විචාරයි, අයාචනය කෙරෙයි, කැමැති කරවයි, පහදවා නුයි 'කුතො පහූතා කලහා විවාද' යනු වේ

**පරිදෙවසොකා සහමච්ඡරා ච** - 'පරිදෙව' නම්: නෑයන්ගේ විනාශයෙන් පහස්නා ලද්දහුගේ හෝ භොගවිනාශයෙන් හෝ - රොගව්‍යසනයෙන් හෝ - ශීලව්‍යසනයෙන් හෝ - දෘෂ්ටිව්‍යසනයෙන් හෝ - එක්තරා ව්‍යසනයකින් හෝ යුක්ත වූවහුගේ එක්තරා දුඃඛහෙතුවකින් හෝ පහස්නා ලද්දහුගේ නම කියා හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් හඬන අයුරෙක් ගුණ කියා හඬනා අයුරෙක් හඬනා බවෙක් ගුණ කියා හඬන බවෙක් ප්‍රලාපයෙක් විප්‍රලාපයෙක් පුනපුනා ලපනයෙක් ලාලප්පනාකාරයෙක් ලාලප්පිත බවෙක් වේ ද එය යි. 'සොක' නම්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භොග - රොග - ශීල - දෘෂ්ටිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ එක්තරා ව්‍යසනයකින් හෝ යුක්ත වූවහුගේ එක්තරා දුඃඛහෙතුවකින් ස්පර්ශ කරන ලද්දහුගේ ශොකයෙක් ශොකාකාරයෙක් ශොක කළ බවෙක් අභ්‍යන්තර ශොකයෙක් අභ්‍යන්තරයෙහි පරිශොකයෙක් අභ්‍යන්තරදාහයෙක් අභ්‍යන්තරපරිදාහයෙක් සිත දවන අයුරෙක් දෞර්මනස්සෙක් ශොක නමැති හුලෙක් වේ ද එයයි. 'මච්ඡර' නම්: ආවාසමාත්සර්ය යැ කුල - ලාභ - වර්ණ - ධර්මමාත්සර්ය යැයි මාත්සර්ය පසෙකි. මෙබඳු වූ යම් මසුරු බවෙක් මසුරු ආකාරයෙක් මාත්සර්යයෙන් යුක්ත බවෙක් සඟවනු කැමැති බවෙක් අනාර්ය බවෙක් කටුකත්වයෙන් සිත හකුළුවන බවෙක් සිත ගාත්පසින් ගන්නා ලද බවෙක් වේ ද, මේ මාත්සර්ය යි කියනු ලැබේ. නවද ස්කන්ධමාත්සර්යය ද - ධාතු - ආයතන මාත්සර්යය ද මාත්සර්ය යැ; ග්‍රාහය මාත්සර්ය යැයි කියනු ලැබේ නුයි 'පරිදෙවසොකා සහමච්ඡරා ච' යනු වේ.

**මානාතිමානා සහපෙසුනා ච** - 'මාන' නම්: මෙ ලොවැ එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් - කුලයෙන් - කුලපුත්‍රභාවයෙන් - වර්ණසෞන්දර්යයෙන් - ධනයෙන් - අධ්‍යයනයෙන් - කර්මායතනයකින් - ශිල්පායතනයකින් විද්‍යාස්ථානයකින් - ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ එක්තරා වස්තුවකින් හෝ මානය උපදවයි. 'අතිමාන' නම්: මෙ ලොවැ එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන්...එක්තරා වස්තුවකින් හෝ මෙරමා ඉක්මවා සිතයි.

පෙසුඤ්ඤන්ති – ඉධෙකච්චො පිසුණවාචො හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා, භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදං වුච්චති පෙසුඤ්ඤං; අපිච, ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරති: පියකම්‍යතාය වා භෙදාධිප්පායො වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති? ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමීති එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති. කථං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති? කථං ඉමෙ නානා අස්සු, විනා අස්සු, වග්ගා අස්සු, ද්විධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං න ඵාසු විහරෙය්‍යුන්ති. එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරතීති – 'මානාතිමානා සහපෙසුණා ච.

කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහීති – 'කලහො ච විවාදො ච පරිදෙවො ච සොකො ච මච්ඡරියං ච මානො ච අතිමානො ච පෙසුඤ්ඤඤ්චාති ඉමෙ අට්ඨ කිලෙසා කුතො පහූතා? කුතො ජාතා? කුතො සඤ්ජාතා? කුතො නිබ්බත්තා? කුතො අභිනිබ්බත්තා? කුතො පාතුභූතා? කිංනිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවාති? ඉමෙසං අට්ඨන්නං කිලෙසානං මූලං පුච්ඡති, හෙතුං පුච්ඡති, නිදානං පුච්ඡති, සම්භවං පුච්ඡති, පභවං පුච්ඡති, සමුට්ඨානං පුච්ඡති, ආහාරං පුච්ඡති, ආරම්මණං පුච්ඡති, පච්චයං පුච්ඡති, සමුදයං පුච්ඡති, පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති– කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහීති ඉඞ්ඝ බ්‍රෑහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති – කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහීති.

තෙනාහ සො නිම්මිතො:

"කුතො පහූතා කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුණා ච
කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහී'ති.

## 11 - 2

පියප්පහූතා[1] කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුණා ච
මච්ඡෙරයුත්තා කලහා විවාදා
විවාදජාතෙසු ච පෙසුණානි.

---

1. පියා පහූතා - සු. පියප්පභූතා - මජුප.

**'පෙසුණෙය්‍ය'** නම්: මෙ ලොවැ එකෙක් පෛශුන්‍යවචන ඇත්තේ වෙයි: මෙතැනින් අසා මුන්ගේ භේදය පිණිස එතැන කියන්නේ වෙයි, නොහොත් එතැනින් අසා උන්ගේ බිඳීම පිණිස මුන්ට කියන්නේ වෙයි; මෙසේ සමඟ වූවන් හෝ බිඳිනුයේ භින්න වූවන් හෝ භේදය දැඩි කරනුයේ වර්‍ගය (=අසමගිය) සතුටු වූයේ වර්‍ග වූවන් කෙරෙහි ඇලුණේ වර්‍ග වූවන් දුන සතුටු වනුයේ වර්‍ග කරන බස් කියනුයේ වෙයි. මේ පෛශුන්‍යය' යයි කියනු ලැබේ. තවද දෙ කරුණෙකින් පිසුනුබස් එලවා කියයි: ප්‍රියකාම්‍යතායෙන් හෝ භේදාභිප්‍රාය ඇත්තේ හෝ යැ. කෙසේ ප්‍රියකාම්‍යතායෙන් පිසුනු කියා ද ? යත්: 'මොහුට ප්‍රියයෙම් වෙමි, මන වඩනුයෙම් වෙමි, පිත්වැයි වෙමි, ඇතුළත් වූයෙම් වෙමි, යහළු වෙමි, මෙසේ ප්‍රිය කැමැති බැවින් පිසුනු කියයි. කෙසේ භේදාභිප්‍රාය ඇතියේ පිසුනු කියා ද ? යත්: 'කෙසේ නම් මොහු නානා වන්නාහු ද, වෙන් වන්නාහු ද වර්‍ග වන්නාහු ද, විවිධ වන්නාහු ද, දෙ කඩවන්නාහු ද, දෙපක්‍ෂ වන්නාහු ද, බිඳෙන්නාහු ද, සමඟම නොවන්නාහු ද, දුක සේ නො සුවසේ වසන්නාහු දැ'යි මෙසේ භේද කරන සිත් ඇතියේ පිසුනු එලවා කියා නුයි 'මානාතිමානා සහපෙසුනා ච' යනු වේ.

**කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහි** - කලහය ද විවාදය ද පරිදෙවය ද ශෝකය ද මාත්සර්‍යය ද මානය ද අතිමානය ද පෛශුන්‍යය ද යන මේ අටකෙලෙස්හු කොතැනින් වූවාහු ද ? කොහි උපන්නාහු ද ? කොහි හටගත්තාහු ද ? කොහි උපන්නාහු ද ? කොහි වෙසෙසින් උපන්නාහු ද? කොහි පහළ වූවාහු ද ? කුමක් නිදාන - සමුදය - ජාති - ප්‍රභව කොට ඇත්තාහු දැ'යි මේ අටකෙලෙසුන්ගේ මූලය විචාරයි, හේතුව - නිදානය සම්භවය - සමුත්ථානය - ආහාරය - ආලම්බනය - ප්‍රත්‍යය විචාරයි, වෙසෙසින් විචාරයි, යාඥා කෙරෙයි, අධ්‍යෙෂණය කෙරෙයි, (කියනු සඳහා) පහදවා නුයි 'කුතො පහූතා තෙ' යනු වේ. **තදිඞ්ඝ බ්‍රෑහි**- වදාළ මැනව, ප්‍රකාශ කළ මැනව, දෙශනා කළ මැනව, පනවනු මැනව, විස්තරයෙන් තබනු මැනව, විවරණ - විභජන කරනු මැනව, ප්‍රකට කරනු මැනව, ප්‍රකාශ කරනු මැනවැයි 'කුතො පහූතා තෙ තදිඞ්ඝ බෑහි' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

**"කුතො පහූතා කලහා විවාද -පෙ- තෙ තදිඞ්ඝ බ්‍රෑහි"**යි

## 11 - 2

කලහයෝ ද විවාදයෝ ද පරිදෙව - ශෝකයෝ ද මාත්සර්‍යයෝ ද මානාතිමානයෝ ද පෛශුන්‍යයෝ ද ප්‍රියවස්තූහු කෙරෙන් උපන්නාහුය. කලහයෝ ද විවාදයෝ ද (පරිදෙව - ශොක - මාන - අතිමාන - පෛශුන්‍යයෝ ද) මාත්සර්‍යයෙහි යෙදුණාහු වෙති. විවාද උපන් කල්හි පිසුනු වචනයෝ වෙත්.

**පියප්පහූතා කලහා විවාදා පරිදෙවසොකා සහමච්ඡරා චාති** – පියාති ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා පියා? ඉධ යස්ස[1] තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා, මාතා වා පිතා වා භාතා වා භගිනී වා පුත්තා වා ධීතා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, ඉමෙ සත්තා පියා. කතමෙ සඞ්ඛාරා පියා? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා පියා. පියං වත්ථුං අච්ඡෙදසංකිනොපි කලහං කරොන්ති. අච්ඡිජ්ජන්තෙපි කලහං කරොන්ති. අච්ඡින්නෙපි කලහං කරොන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි කලහං කරොන්ති. විපරිණාමන්තෙපි කලහං කරොන්ති. විපරිණතෙපි කලහං කරොන්ති. පියං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි විවදන්ති. අච්ඡිජ්ජන්තෙපි විවදන්ති. අච්ඡින්නෙපි විවදන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි විවදන්ති. විපරිණාමන්තෙපි විවදන්ති. විපරිණතෙපි විවදන්ති. පියං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි පරිදෙවන්ති. අච්ඡිජ්ජන්තෙපි පරිදෙවන්ති. අච්ඡින්නෙපි පරිදෙවන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි පරිදෙවන්ති. විපරිණාමන්තෙපි පරිදෙවන්ති. විපරිණතෙපි පරිදෙවන්ති. පියං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි සොචන්ති. අච්ඡිජ්ජන්තෙපි සොචන්ති. අච්ඡින්නෙපි සොචන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි සොචන්ති. විපරිණාමන්තෙපි සොචන්ති. විපරිණතෙපි සොචන්ති. පියං වත්ථුං රක්ඛන්ති ගොපෙන්ති පරිග්ගණ්හන්ති මමායන්ති මච්ඡරායන්ති.

**මානාතිමානා සහපෙසුණා චාති** – පියං වත්ථුං නිස්සාය මානං ජනෙන්ති. පියං වත්ථුං නිස්සාය අතිමානං ජනෙන්ති. කථං පියං වත්ථුං නිස්සාය මානං ජනෙන්ති? "මයං ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බානං. ඉමෙ පනඤ්ඤෙ න ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බාන"න්ති එවං පියං වත්ථුං නිස්සාය මානං ජනෙන්ති. කථං පියං වත්ථුං නිස්සාය අතිමානං ජනෙන්ති? "මයං ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බානං. ඉමෙ පනඤ්ඤෙ න ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බාන"න්ති එවං පියං වත්ථුං නිස්සාය අතිමානං ජනෙන්ති.

**පෙසුඤ්ඤන්ති** – ඉධෙකච්චො පිසුනවාචො හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය -පෙ- එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරතීති 'මානාතිමානා සහපෙසුණා ච.'

**මච්ඡෙරයුත්තා කලහා විවාදා**'ති – කලහො ච විවාදො ච පරිදෙවො ච සොකො ච මානො ච අතිමානො ච පෙසුඤ්ඤඤ්චාති ඉමෙ සත්ත කිලෙසා මච්ඡරියෙ යුත්තා පයුත්තා ආයුත්තා සමායුත්තාති – 'මච්ඡෙරයුත්තා කලහා විවාදා.'

---

1. යස්ස - සීමු II

**පියප්පහූතා කලහා විවාදා පරිදෙවසොකා සහමච්ඡරා ච** – 'පියා' යනු: ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ ද සංස්කාරයෝ දැයි. කවර සත්ත්වයෝ ප්‍රියයෝ ද යත්? මෙලොවැ මවු හෝ පියා හෝ බෑයා හෝ බූනැණිය හෝ පුතා හෝ දූ හෝ මිතුරෝ හෝ යහළුවෝ හෝ නෑයෝ හෝ ඔහුට වැඩ කැමැති වූ හිත කැමැති වූ සුව කැමැති වූ යොගක්ෂෙමය කැමැති වූ යම් කෙනෙක් වෙත් ද මේ සත්ත්වයෝ ප්‍රියයෝ වෙත්. කවර සංස්කාරයෝ ප්‍රියයෝ ද යත්? මනවඩන රූපයෝ මනවඩන ශබ්දයෝ මනවඩන ගන්ධයෝ මනවඩන රසයෝ මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, මේ සංස්කාරයෝ ප්‍රිය වෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද කලහ කෙරෙති, අසිඳුනා කල්හි ද කලහ කෙරෙති, අසිදගත් කල්හි ද කලහ කෙරෙති, ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද – පෙරළෙන කල්හි ද පෙරළුණු කල්හි ද කලහ කෙරෙති, ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද විවාද කෙරෙති, අසිඳුනා කල්හි ද – අසිදගත් කල්හි ද – ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද – පෙරළෙන කල්හි ද – පෙරළුණු කල්හි ද විවාද කෙරෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද පරිදෙවනා කෙරෙති, අසිඳුනා කල්හි ද අසිදගත් කල්හි ද – ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි ද – පෙරළුණු කල්හි ද පරිදෙවනා කෙරෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද ශොක කෙරෙති, අසිඳ ගත්තා කල්හි ද – අසිදගත් කල්හි ද – ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි ද – පෙරළුණු කල්හි ද ශොක කෙරෙත්. ප්‍රියවස්තුව රකිති, ගොපනය කෙරෙති, අයත් කෙරෙති, මමායන කෙරෙති, මසුරු කෙරෙත්.

**මානාතිමානා සහපෙසුනා ච** – ප්‍රියවස්තුව නිසා මානය උපදවති ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවත්. කිසෙයින් ප්‍රියවස්තුව නිසා මානය උපදවති? යත්: 'අපි මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් ලබන සුල්ලම්හ, එහෙත් මේ අන්‍යයෝ මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් නො ලබන සුල්ලහ'යි මෙසේ ප්‍රියවස්තුව නිසා මානය උපදවත්. කෙසේ ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවති? යත් 'අපි මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් ලබන සුලල්ම්හ, මේ අන්‍යයෝ වැලිත් මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් නො ලබන සුල්ලහ'යි මෙසේ ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවත්. **පෙසුණෙය්‍යං** – මෙහි එකෙක් පිසුනුබස් කියනුයේ වෙයි: මෙතැනින් අසා මොවුන්ගේ හෙදුම පිණිස එතැන කියන්නේ වෙයි ..මෙසේ බිඳුවන අදහස් ඇතියේ පිසුනුබස් එලවා කියා නුයි 'මානාතිමානා සහපෙසුනා ච' යනු වේ.

**මච්ඡෙරයුත්තා කලහා විවාදා** – කලහය ද විවාදය ද පරිදෙවය ද ශොකය ද මානය ද අතිමානය ද පෛශුන්‍යය ද යන සපත කෙලෙශයෝ මාත්සය්‍ර්යෙහි යෙදුණාහු අතිශයින් යෙදුණාහු හාත්පසින් යෙදුණාහු වෙසෙසින් යෙදුණාහු නුයි 'මච්ඡෙරයුත්තා කලහා විවාදා' යනු වේ.

**විවාදජාතෙසු ච පෙසුණානීති** – 'විවාදෙ ජාතෙ සඤ්ජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙ පෙසුඤ්ඤං උපසංහරන්ති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛායන්ති ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛායන්ති අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තාරො භින්නානං වා අනුප්පදාතාරො වග්ගාරාමා වග්ගරතා වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතාරො හොන්ති. ඉදං වුච්චති පෙසුඤ්ඤං. අපිච, ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරන්ති: පියකම්‍යතාය වා භෙදාධිප්පායා වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරන්ති? ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමීති. එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරන්ති. කථං භෙදාධිප්පායා පෙසුඤ්ඤං උපසංහරන්ති? කථං ඉමෙ නානා අස්සු, විනා අස්සු, වග්ගා අස්සු, ද්වෙධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං න ඵාසු විහරෙය්‍යුන්ති. එවං භෙදාධිප්පායා පෙසුඤ්ඤං උපසංහරන්තීති – 'විවාද-ජාතෙසු ච පෙසුණානී'ති

"පියප්පහූතා කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුණා ච
මච්ඡරයුත්තා කලහා විවාදා
විවාදජාතෙසු ච පෙසුණානී"ති.

## 11 - 8

පියා සු ලොකස්මිං කුතොනිදානා
යෙ වාපි[1] ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච කුතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්ති.

**පියා සු ලොකස්මිං කුතොනිදානාති** – පියා කුතොනිදානා, කුතොජාතා, කුතොසඤ්ජාතා, කුතොනිබ්බත්තා, කුතොඅභිනිබ්බත්තා, කුතොපාතුභූතා, කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති පියානං මූලං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති[2] පසාදෙතීති– 'පියා සු ලොකස්මිං කුතොනිදානා.'

1. චාපි - PTS 2. අජ්ඣෙසති - සීමු. II.

**විවාදජාතෙසු ච පෙසුනානි** - විවාදය උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙසෙසින් නිපන් කල්හි පහළ වූ කල්හි පිසුනුබස් එළවා කියති: මෙතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස එතැන කියති, එතැනින් හෝ අසා ඔවුන්ගේ භේදය පිණිස මොවුන්ට කියති: මෙසේ සමඟ වූවන් හෝ බිඳින්නාහු භේද වූවන්ගේ හෝ භේදය දැඩි කරන්නාහු වර්ගය කැමැති වූවාහු වර්ග වීමෙහි ඇලුණාහු වර්ග වීමට සතුටු වන්නාහු වර්ග කරන බස් කියන්නාහු වෙත්. මේ 'පෙසුඤ්ඤ'යි කියනු ලැබෙයි. තවද දෙකරුණෙකින් පිසුනු කියති: ප්‍රියකාම්‍යතාවයෙන් හෝ භේදාභි- ප්‍රායයෙන් හෝ යැ. කිසෙයින් ප්‍රියකාම්‍යතායෙන් පිසුනු කියති ? යත්: මොහුට ප්‍රිය වම්හ. මනාප වම්හ, විස්වැසි වම්හ, ආභ්‍යන්තරික වම්හ, සුහෘද් වම්හ'යි මෙසේ ප්‍රියකාම්‍යතායෙන් පෛශුන්‍යවචන කියත්. කිසෙයින් භේදාභිප්‍රාය ඇත්තාහු පිසුනුබස් එළවා කියති යත් ? 'කෙසේ නම් මොහු නානා වන්නාහු ද වෙන් වන්නාහු ද වර්ග වන්නාහු ද ද්වෛධ වන්නාහු ද දෙකඩ වන්නාහු ද දෙපක්ෂ වන්නාහු ද බිඳෙන්නාහු ද සමාගම් නො වන්නාහු ද දුකසේ නො සුවසේ වාසය කරන්නාහු ද'යි මෙසේ භේදාභිප්‍රායයෙන් පෛශුන්‍ය කියත් නුයි 'විවාදජාතෙසු ච පෙසුනානි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**පියප්පහූතා** -පෙ- **විවාදජාතෙසු ච පෙසුනානී**"යි.

11 - 8

ලොවැ ප්‍රියවස්තුහු කොයින් උපන්නාහු ද ? නොහොත් කුමක් හේතු කොට ඇත්තාහු ද ? තවද ලොවැ ක්ෂත්‍රියාදි යම් කෙනෙක් ලෝභය හේතු- කොටගෙන හැසිරෙත් නම්, (ඒ ලෝභය කුමක් හේතු කොට ඇත්තේ ද ? ආශාවත් (ඒ ආශාවගේ) සමෘද්ධියත් කොයින් උපන්නාහු ද ? (කුමක් නිදාන කොට ඇත්තාහු ද ?) යම් ධර්ම කෙනෙක් සත්ත්වයා හට පරලොවැ පිහිට පිණිස වෙත් නම්, ඒ ධර්මයෝ කොයින් උපන්නාහු ද ? (කුමක් නිදාන කොට ඇත්තාහු ද ?)

**පියා සු ලොකස්මිං කුතොනිදානා** - ප්‍රියවස්තූහු කුමක් නිදාන කොට ඇත්තාහු ද ? කොයින් උපන්නාහු ද ? කොයින් හටගත්තාහු ද ? කොයින් නිපන්නාහු ද ? කොයින් වෙසෙසින් නිපන්නාහු ද ? කොයින් පහළ වූවාහු ද ? කුමක් නිදාන කොට ඇත්තාහු ද ? කුමක් උත්පත්ති කොට ඇත්තාහු ද ? කුමක් ජාති කොට ඇත්තාහු ද ? කුමක් ප්‍රභව කොට ඇත්තාහු දැයි ප්‍රියවස්තූන්ගේ මූලය විචාරති ...සමුදය විචාරති, පුළුවුස්ති අසැදිති අධ්‍යේෂණ කෙරෙති පහදවත් නුයි 'පියා සු ලොකස්මිං කුතො- නිදානා' යනු වේ.

**යෙ වාපි ලොභා විචරන්ති ලොකෙති**–'යෙ වාපී'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච; **ලොභාති** යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං[a] **විචරන්තීති** විචරන්ති විහරන්ති ඉරියන්ති වත්තන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති; **ලොකෙති** අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙති– 'යෙ වාපි ලොභා විචරන්ති ලොකෙ.'

**ආසා ච නිට්ඨා ච කුතොනිදානාති** – 'ආසා ච නිට්ඨා ච කුතොනිදානා කුතො ජාතා කුතො සඤ්ජාතා කුතො නිබ්බත්තා කුතො අභිනිබ්බත්තා කුතො පාතුභූතා කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිම්පභවා'ති ආසාය ච නිට්ඨාය ච මූලං පුච්ඡති –පෙ– සමුදයං පුච්ඡති, පපුච්ඡති යාචති අජ්ඣෙසති[1] පසාදෙතීති – 'ආසා ච නිට්ඨා ච කුතොනිදානා.'

**යෙ සම්පරායාය නරස්ස හොන්තීති** – යෙ නරස්ස පරායනා හොන්ති. දීපා හොන්ති, තාණා හොන්ති, ලෙණා හොන්ති, සරණා හොන්ති, නරො නිට්ඨා පරායනො හොතීති[2] 'යෙ සම්පරායාය නරස්ස හොන්ති.'

තෙනාහ සො නිම්මිතො:

"පියා සු ලොකස්මිං කුතොනිදානා
යෙ වාපි[3] ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච කුතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්ති"ති.

## 11 - 4

ඡන්දනිදානානි පියානි ලොකෙ
යෙ වාපි[3] ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච ඉතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්ති.

**ඡන්දනිදානානි පියානි ලොකෙති** – 'ඡන්දො'ති යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්දනීවරණං. අපිච, පඤ්ච ඡන්දා: පරියෙසනච්ඡන්දො පටිලාභච්ඡන්දො පරිභොගච්ඡන්දො සන්නිධිච්ඡන්දො විස්සජ්ජනච්ඡන්දො. කතමො පරියෙසනච්ඡන්දො? ඉධෙකච්චො අජ්ඣොසිතොයෙව අත්ථිකො ඡන්දජාතො රූපෙ පරියෙසති. සද්දෙ–ගන්ධෙ රසෙ – ඵොට්ඨබ්බෙ පරියෙසති. අයං පරියෙසනච්ඡන්දො. කතමො පටිලාභච්ඡන්දො? ඉධෙකච්චො අජ්ඣොසිතොයෙව අත්ථිකො ඡන්දජාතො රූපෙ පටිලභති. සද්දෙ – ගන්ධෙ - රසෙ – ඵොට්ඨබ්බෙ පටිලභති. අයං පටිලාභච්ඡන්දො.

---

a ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ

1 අජ්ඣෙසති - සීමු. II  2. නිට්ඨාපරායනා හොන්තීති - මජසං, සීමු II.

3. යෙ වාපි - ස්‍යා, PTS.

**යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ** - 'යෙ චා පි' යනු: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශූද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මනුෂ්‍යයෝ ද; **ලොභා** – යම් ලොභයෙක් ලොභ කරන අයුරෙක් ලොභ කරන බවෙක් ඇලීමෙක් ඇලෙන අයුරෙක් ඇලුණු බවෙක් දැඩි ලොභයෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද; **විචරන්ති** – හැසිරෙති වෙසෙති ඉරියව් පවත්වති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත්; **ලොකෙ**– අපායලොකයෙහි මනුෂ්‍ය – දෙව – ස්කන්ධ – ධාතු – ආයතනලොකයෙහි නුයි 'යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ' යනු වේ.

**ආසා ච නිට්ඨා ච කුතොනිදානා** – ආශාව ත් ආශාසමෘද්ධිය ත් කුමන හෙතු ඇත්තාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හටගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් හැඟුණාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් නිදාන කොට – කුමක් සමුදය කොට – කුමක් ජාති කොට – කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද'යි ආශාවේ ත් ආශාසමෘද්ධිය ගේ ත් මූලය විචාරති...සමුදය විචාරති, පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙති පහදවත් නුයි 'ආසා ච නිට්ඨා ච කුතොනිදානා' යනු වේ.

**යෙ සම්පරායාය නරස්ස හොන්ති** – යම් ධම් කෙනෙක් සත්ත්වයා හට (පරලොවට) පිහිට වෙත් ද ප්‍රතිෂ්ඨා වෙත් ද ත්‍රාණ වෙත් ද රක්ෂාස්ථාන වෙත් ද සරණ වෙත් ද. මිනිසා ඒ සමෘද්ධිය පරායණ කොට ඇත් නුයි – 'යෙ සම්පරායාය නරස්ස හොන්ති' යනු වේ.

එයින් කීහ, ඒ නිර්මිත බුදුහු:

"පියා සු ලොකස්මිං -පෙ- යෙ සම්පරායාය නරස්ස හොන්ති"යි

## 11 – 4

ලොව්, ප්‍රියවස්තූහු කාමච්ඡන්දය නිදාන කොට ඇත්තාහුය, තවද ලොව්, යම් කෙනෙක් ලොභය හෙතු කොට හැසිරෙත් ද, (ඔවුන්ගේ ඒ ලොභයත් කාමච්ඡන්දය හෙතු කොට ඇත්තේය,) ආශාව ත් ආශාසමෘද්ධියත් මේ කාමච්ඡන්දය ම නිදාන කොට ඇත්තාහු ය, යම් ධම් කෙනෙක් සත්ත්වයා හට පරලොව පිහිට පිණිස වෙත් නම්, (ඔහු ද කාමච්ඡන්දයෙන් ම උපන්තාහු යි.)

**ඡන්දනිදානානි පියානි ලොකෙ** – 'ඡන්ද' නම්: කාමවස්තූන් කෙරෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණාවෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡාවෙක් කාමයන්හි ගැලීමෙක් කාමෞඝයෙක් කාමයොගයෙක් කාමොපාදානයෙක් කාමච්ඡන්දනීවරණයෙක් වේ ද, එයයි; තවද ඡන්ද පසෙකි: පයෙෂ්ණ (=සෙවීම)ඡන්දය, ප්‍රතිලාභච්ඡන්දය, පරිභොගච්ඡන්දය, සන්නිධි (=රැස්කිරීම) ඡන්දය, විසර්ජන (=වියදම් කිරීම) ඡන්දය දැයි; එහි පයෙෂ්ණච්ඡන්දය කවරැ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලද්දේ වැ කැමැති වූයේ හටගත් ඡන්දය ඇත්තේ රූපයන් සොයයි, ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් සොයයි, මේ පයෙෂ්ණච්ඡන්ද යයි. ප්‍රතිලාභච්ඡන්දය කවරැ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලද්දේ වැ අර්ත්ථි වූයේ හටගත් ඡන්දය ඇත්තේ රූපයන් ලබයි, ශබ්ද– ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් ලබයි, මේ ප්‍රතිලාභච්ඡන්ද යයි.

කතමො පරිභොගච්ඡන්දො? ඉධෙකච්චො අජ්ඣොසිතොයෙව අත්ථිකො ඡන්දජාතො රූපෙ පරිභුඤ්ජති, සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජති. අයං පරිභොගච්ඡන්දො. කතමො සන්නිධිච්ඡන්දො? ඉධෙකච්චො අජ්ඣොසිතොයෙව අත්ථිකො ඡන්දජාතො ධනසන්නිචයං කරොති ආපදාසු භවිස්සතීති; අයං සන්නිධිච්ඡන්දො. කතමො විසජ්ජනච්ඡන්දො? ඉධෙකච්චො අජ්ඣොසිතොයෙව අත්ථිකො ඡන්දජාතො ධනං විස්සජ්ජෙති හත්ථාරොහානං අස්සාරොහානං රථිකානං ධනුග්ගහානං පත්තිකානං 'ඉමෙ මං රක්ඛිස්සන්ති ගොපිස්සන්ති සම්පරිවාරෙස්සන්තී'ති. අයං විසජ්ජනච්ඡන්දො. **පියානීති** ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා -පෙ- ඉමෙ සත්තා පියා -පෙ- ඉමෙ සඞ්ඛාරා පියා; **ඡන්දනිදානානි පියානි ලොකෙති** පියා ඡන්දනිදානා ඡන්දසමුදයා ඡන්දජාතිකා ඡන්දපභවාති – 'ඡන්දනිදානානි පියානි ලොකෙ.'

**යෙ චාපි ලොභා විචරන්ති ලොකෙති** – 'යෙ චාපී'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච; **ලොභාති** යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං[a]; **විචරන්තීති** විචරන්ති විහරන්ති ඉරියන්ති වත්තන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති; **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – 'යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ.'

**ආසා ච නිට්ඨා ච ඉතොනිදානාති** – 'ආසා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං[b]; **නිට්ඨාති** ඉධෙකච්චො රූපෙ පරියෙසන්තො රූපං පටිලභති, රූපනිට්ඨො හොති. සද්දෙ- ගන්ධෙ- රසෙ- ඵොට්ඨබ්බෙ, කුලං, ගණං, ආවාසං, ලාභං, යසං, පසංසං, සුඛං, චීවරං, පිණ්ඩපාතං, සෙනාසනං, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, සුත්තන්තං, විනයං, අභිධම්මං, ආරඤ්ඤිකඞ්ගං, පිණ්ඩපාතිකඞ්ගං, පංසුකූලිකඞ්ගං, තෙචීවරිකඞ්ගං, සපදානචාරිකඞ්ගං, ඛලුපච්ඡාභත්තිකඞ්ගං, නෙසජ්ජිකඞ්ගං, යථාසන්ථතිකඞ්ගං, පඨමජ්ඣානං, දුතියජ්ඣානං, තතියජ්ඣානං, චතුත්ථජ්ඣානං, ආකාසානඤ්චායතනසමාපත්තිං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං, පරියෙසන්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලභති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිනිට්ඨො හොති.

1 "ආසාය කසතෙ[1] ඛෙත්තං බීජං ආසාය වප්පති
ආසාය වාණිජා යන්ති සමුද්දං ධනහාරකා;
යාය ආසාය තිට්ඨාමි[2] සා මෙ ආසා සමිජ්ඣතූ"ති[3][c]

---

a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ. b ධම්මසඞ්ගණී නික්ඛෙපකණ්ඩ
1. කස්සතෙ - මනුප. 2. තිට්ඨාදි - සීමු. II. පතිට්ඨාමි - ස්‍යා.
3. සමිජ්ඣතීති - සීමු II. PTS. c. ථෙරගාථා - 10. 1. 1.

පරිභොගච්ඡන්දය කවරැ යත්: මෙහි එකෙක් කාමයෙන් මඩනා ලදුයේ මැ අර්පිත වූයේ හටගත් ඡන්දය ඇත්තේ රූපයන් පරිභොග කෙරෙයි, ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරෙයි, මේ පරිභොගච්ඡන්ද යයි. සන්නිධිච්ඡන්දය කවරැ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලදුයේ මැ අර්පිත වූයේ හටගත් ඡන්දය ඇත්තේ 'විපත්තෙහි වත්තේයැ' යි ධන රැස් කෙරෙයි, මේ සන්නිධිච්ඡන්ද යයි, විසජ්ජනච්ඡන්දය කවරැ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලදුයේ මැ අර්පිත වූයේ හටගත් ඡන්දය ඇත්තේ 'මොවුහු මා රක්ෂණ ගොපනය කරන්නාහුය, පිරිවරා සිටින්නාහ'යි ඇතරුවන්ට අසරුවන්ට රියැදුරන්ට දුනුවාවන්ට පාබලසෙනගට ධනය වියදම් කරයි, මේ විසජ්ජනච්ඡන්ද යයි. පියානි - ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ;...මේ ප්‍රියවූ සංස්කාරයෝ යි. ඡන්දනිදානානි පියානි ලොකෙ - ප්‍රිය වූ සත්ත්ව - සංස්කාරයෝ ඡන්දය නිදාන කොට ඇත්තාහුය, ඡන්දය උත්පත්ති කොට ඇත්තාහුය, ඡන්දය ජාති කොට ඇත්තාහුය, ඡන්දය ප්‍රභව කොට ඇත්තාහු නුයි 'ඡන්දනිදානානි පියානි ලොකෙ' යනු වේ.

යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ - 'යෙ චාපි' යනු: ක්‍ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ගැහැවියෝ ද පැවිද්දෝ ද දෙවියෝ ද මිනිස්හු ද; ලොභා - යම් ලොභයෙක් ලොභායනයෙක් ලොභ කරන බවෙක් ඇලීමෙක් ඇලෙන අයුරෙක් ඇලුණු බවෙක් අභිධ්‍යාවෙක් ලොභ අකුශලමූල-යෙක් වේ ද එයයි. විචරන්ති - හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති, වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්; ලොකෙ - අපායලොකයෙහි.... ආයතනලොකයෙහි නුයි 'යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ' යනු වේ.

ආසා ච නිට්ඨා ච ඉතො නිදානා - 'ආසා'යි තෘෂ්ණාව කියනු ලබයි. යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවෙක් ලොභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එයයි; නිට්ඨා - මෙලොවැ එකෙක් රූපයන් සොයනුයේ රූපය ලබයි, රූපසමෘද්ධිය ඇත්තේ වෙයි, ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් - කුලය - ගණයා - ආවාසය - ලාභය යශස් - ප්‍රශංසාව - සුඛය - චීවර - පිණ්ඩපාත - සෙනාසන - ගිලන්පසබෙහෙත්පිරිකර - සූත්‍රාන්තය - විනය - අභිධර්මය - ආරණ්‍යකාඞ්ගය - පිණ්ඩපාතිකාඞ්ගය - පංසුකූලිකාඞ්ගය - තෙචීවරි-කාඞ්ගය - සපදානචාරිකාඞ්ගය - ඛලුපච්ඡාභත්තිකාඞ්ගය - නෙසජ්ජිකාඞ්ගය - යථාසන්තිකාඞ්ගය - ප්‍රථමධ්‍යානය - ද්විතීය - තෘතීය - චතුර්ථධ්‍යානය - ආකාසානඤ්චායතනසමාපත්තිය - විඤ්ඤාණඤ්චායතන - ආකිඤ්චඤ්ඤායතන - නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය සොයනුයේ නෙවසඤ්ඤානාසඤ්ඤා-යතන සමාපත්තිය ලබයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති සමෘද්ධිය ඇත්තේ වේ.

1. ආශාව හෙතු කොට (ගොවියා) කෙත සාසි, ආශාව හෙතු කොට කිප්පවට වපුරනු ලැබෙයි, ධනය රැස්කර ගන්නා වූ වෙළෙන්දෝ ආශාව හෙතු කොට (නැවින්) මුහුදට යෙති, යම් ආශාවකින් මම් මෙහි සිටිම් නම්, ඒ මාගේ ආශාව සමෘද්ධ වේවා'යි.

ආසාය සමිද්ධි වුච්චතෙ[1] නිට්ඨා; ආසා ච නිට්ඨා ච ඉතොනිදානාති ආසා ච නිට්ඨා ච ඉතො ඡන්දනිදානා ඡන්දසමුදයා ඡන්දජාතිකා ඡන්දපභවාති– ආසා ච නිට්ඨා ච ඉතොනිදානා.

**යෙ සම්පරායාය නරස්ස හොන්තීති** – යෙ නරස්ස පරායනා හොන්ති, දීපා හොන්ති, තාණා හොන්ති, ලෙනා හොන්ති, සරණා හොන්ති. නරො නිට්ඨා පරායනො හොතීති[2] – යෙ සම්පරායාය නරස්ස හොන්ති.

තෙනාහ භගවා:

"ඡන්දනිදානානි පියානි ලොකෙ
යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච ඉතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්තී"ති.

**11 - 5**

ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො
විනිච්ඡයා චාපි කුතො පහූතා,
කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
යෙ චාපි[3] ධම්මා සමණෙන වුත්තා.

**ඡන්දො නු ලොකස්මිං – කුතොනිදානොති** – ඡන්දො කුතොනිදානො කුතො ජාතො කුතො සඤ්ජාතො කුතො නිබ්බත්තො කුතො අභිනිබ්බත්තො කුතො පාතුභූතො කිංනිදානො කිංසමුදයො කිංජාතිකො කිම්පභවොති ඡන්දස්ස මූලං පුච්ඡති –පෙ– සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති[4] පසාදෙතීති – ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො.

**විනිච්ඡයා චාපි කුතො පහූතාති** – විනිච්ඡයා කුතො පහූතා කුතො ජාතා කුතො සඤ්ජාතා කුතො නිබ්බත්තා කුතො අභිනිබ්බත්තා කුතො පාතුභූතා කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිම්පභවාති විනිච්ඡයානං මූලං –පෙ– සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති– විනිච්ඡයා චාපි කුතො පහූතා.

**කොධො මොසවජ්ජඤ්ච කථංකථා චාති** 'කොධො'ති – යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො, දොසො පදොසො සම්පදොසො, චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො, කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං, දොසො දුස්සනා දුස්සිතත්තං, බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං, විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස [a]; මොසවජ්ජං වුච්චති මුසාවාදො, කථංකථා වුච්චති විචිකිච්ඡා'ති – කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච.

1. වුච්චති - ස. 2. නිට්ඨා පරායනා හොන්තීති- මජ්සං. නිට්ඨා හොන්ති පරායණා හොන්ති - සීමු II.
3. වාපි- සයා. PTS. ස. 4. අජ්ඣෙසති සීමු. II.
a. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.

ආශාසමෘද්ධිය 'නිට්ඨා, (ඵලනිප්ඵත්ති) යයි කියනු ලැබේ. **ආසා ච නිට්ඨා ච ඉතොනිදානා** - ආශාවත් නිෂ්ඨාව (-සමෘද්ධිය) ත් මේ (රූපාදි) ඡන්දය නිදාන කොට ඇත්තාහුය, ඡන්දය උත්පත්ති කොට - ඡන්දය ජාති කොට - ඡන්දය ප්‍රභව කොට ඇත්තාහු හුයි 'ආසා ච නිට්ඨා ච ඉතොනිදානා' යනු වේ.

**යෙ සම්පරායාය නරස්ස හොන්ති** - යම් ධර්ම කෙනෙක් සත්ත්වයා හට පරායණ වෙත් ද, ප්‍රතිෂ්ඨා වෙත් ද, ත්‍රාණ වෙත් ද, රක්‍ෂාස්ථාන වෙත් ද, සරණ වෙත් ද, මිනිසා ඒ ආශාසමෘද්ධිය පරායණ කොට ඇත් හුයි 'යෙ සම්පරායාය නරස්ස හොන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඡන්දනිදානානි** -පෙ- **යෙ සම්පරායාය නරස්ස හොන්ති"**යි.

## 11 - 5

ලොව්හි කාමච්ඡන්ද තෙමේ කුමක් නිදාන කොට ඇත්තේ ද? (තෘෂ්ණා දෘෂ්ටි) විනිශ්චයයෝ හෝ කොයිබින් උපන්නාහු ද? ක්‍රෝධය ත් මෘෂාවාදයත් විචිකිත්සාව ත් බුද්ධශ්‍රමණයන් විසින් දෙසූ යම් අකුශලධර්ම කෙනෙකුත් වෙත් නම්, ඔවුහු ත් කොයිබින් උපන්නාහු ද?

**ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො** - කාමච්ඡන්ද තෙමේ කුමක් නිදාන කොට ඇත්තේ ද? කොතැනින් උපන්නේ ද? කොයින් හට ගත්තේ ද? කොයින් පැනුණේ ද? කොයිබින් පහළ වූයේ ද? කුමක් නිදාන කොට - කුමක් සමුදය කොට - කුමක් ජාති කොට - කුමක් ප්‍රභව කොට ඇත්තේ ද'යි ඡන්දයා ගේ මූලය විචාරති...සමුදය විචාරති පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙති, පහදවත් හුයි 'ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො' යනු වේ.

**විනිච්ඡයා වා පි කුතො පහූතා** - තෘෂ්ණා - දෘෂ්ටිවිනිශ්චයයෝ කොයින් වූවාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හටගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් පැනනැඟුණාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් නිදාන - සමුදය - ජාති - ප්‍රභව කොට ඇත්තාහු දැ'යි විනිශ්චයයන්ගේ මූලය විචාරති...සමුදය විචාරති පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙති පහදවත් හුයි 'විනිච්ඡයා වා'පි කුතො පහූතා'. යනු වේ.

**කොධො මොසවජ්ජඤ්ච කථංකථා** ච -'කොධො' යනු: මෙබඳු වූ චිත්තයා ගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරෝධයෙක් කෝපයෙක් සම්ප්‍රකෝපයෙක් ද්වේෂයෙක් ප්‍රද්වේෂයෙක් සම්ප්‍රද්වේෂයෙක් චිත්තයාගේ ව්‍යාපත්තියෙක් සිතෙහි දූෂ්‍ය බවෙක් කිපීමෙක් කිපෙන අයුරෙක් කිපුණු බවෙක් දූෂ්‍ය වීමෙක් දූෂ්‍යාකාරයෙක් දූෂ්‍ය බවෙක් ව්‍යාපත්තියෙක් ව්‍යාපත්තාකාරයෙක් ව්‍යාපන්න බවෙක් විරෝධයෙක් ප්‍රතිවිරෝධයෙක් චණ්ඩ බවෙක් නො පිරුණු වචන ඇති බවෙක් සිත පිළිබඳ නො සතුටු බවෙක් වේ ද එයයි. **'මොසවජ්ජ'**යි මෘෂාවාදය කියනු ලැබෙයි; **'කථංකථා'**යි විචිකිත්සාව කියනු ලබා හුයි 'කොධො මොසවජ්ජං ච කථංකථා ච' යනු වේ.

**යෙ චාපි ධම්මා සමණෙන වුත්තා**'ති– 'යෙ චාපී'ති යෙ කොධෙන ච මොසවජ්ජෙන ච කථංකථාය ච සහගතා සහජාතා සංසට්ඨා සම්පයුත්තා එකුප්පාදා එකනිරොධා එකවත්ථුකා එකාරම්මණා, ඉමෙ වුච්චන්ති 'යෙ චාපි ධම්මා' අථවා, යෙ තෙ කිලෙසා අඤ්ඤජාතිකා අඤ්ඤවිහිතකා, ඉමෙ වුච්චන්ති 'යෙ චාපි ධම්මා' සමණෙන වුත්තා'ති සමණෙන සමිතපාපෙන බ්‍රාහ්මණෙන බාහිතපාපධම්මෙන[1] භික්ඛුනා භින්නකිලෙසමූලෙන සබ්බාකුසලමූලබන්ධනා[2] පමුත්තෙන වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතා'ති – 'යෙ චාපි ධම්මා සමණෙන වුත්තා.'

තෙනාහ භගවා:

"ඡන්දං නු ලොකස්මිං කුතොනිදානො
විනිච්ඡයා චාපි කුතො පහූතා,
කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
යෙ චාපි ධම්මා සමණෙන වුත්තා"ති.

**11 – 6**

සාතං අසාතන්ති යමාහු ලොකෙ
තමූපනිස්සාය පහොති ඡන්දො,
රූපෙසු දිස්වා විභවං භවඤ්ච
විනිච්ඡයං කුරුතෙ[3] ජන්තු ලොකෙ.

**සාතං අසාතන්ති යමාහු ලොකෙ**ති – 'සාත'න්ති සුඛා ච වෙදනා ඉට්ඨඤ්ච වත්ථු,[4] අසාතන්ති දුක්ඛා ච වෙදනා අනිට්ඨඤ්ච වත්ථු; යමාහු ලොකෙති යං ආහංසු යං කථෙන්ති යං භණන්ති යං දීපයන්ති යං වොහරන්තීති – 'සාතං අසාතන්ති යමාහු ලොකෙ.'

"තමූපනිස්සාය පහොති ඡන්දොති, සාතාසාතං නිස්සාය සුඛ දුක්ඛං නිස්සාය සොමනස්ස දොමනස්සං නිස්සාය, ඉට්ඨානිට්ඨංනිස්සාය අනුනය පටිඝං නිස්සාය. ඡන්දො හොති පහොති පභවති සඤ්ජායති නිබ්බත්තති අභි නිබ්බත්තති තමූපනිස්සාය පහොති ඡන්දො"

**රූපෙසු දිස්වා විභවං භවඤ්චා**'ති –'රූපෙසූ'ති චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං. කතමො රූපානං භවො? යො රූපානං භවො ජාති සඤ්ජාති නිබ්බත්ති අභිනිබ්බත්ති පාතුභාවො; අයං රූපානං භවො. කතමො රූපානං විභවො? යො රූපානං ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං; අයං රූපානං විභවො. රූපෙසු දිස්වා විභවං භවඤ්චා'ති රූපෙසු භවඤ්ච විභවඤ්ච දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති – 'රූපෙසු දිස්වා විභවං භවඤ්ච.'

---

1. බාහිතපාපෙන - සං. 2. සබ්බාකුසලබන්ධනා - ස.
3. කුබ්බති - මජසං. 4. වත්ථුං - ඵමු. II.

**යෙ වා'පි ධම්මා සමණෙන වුත්තා** – 'යෙ වාපි' යනු: යම් ධර්ම කෙනෙක් ක්‍රෝධයත් මෘෂාවාදයත් විචිකිත්සාවත් සමග සංගත වූවාහු ද සහජාත – සංසෘෂ්ට – සම්ප්‍රයුක්ත වූවාහු ද එක් වැ උපදනාහු එක් වැ නිරුද්ධ වන්නාහු සමාන වස්තු ඇත්තාහු සමාන අරමුණු ඇත්තාහු වෙත් ද මොවුහු 'යම් ධර්මයෝ' යි කියනු ලැබෙත්. නොහොත් යම් කෙලෙස් කෙනෙක් අන්‍යස්වභාව ඇත්තාහු අන් කරුණෙකින් වූවාහු වෙත් ද, මොවුහු 'යම් ධර්මයෝ'යි කියනු ලැබෙත්. **සමණෙන වුත්තා**– නිවුණු පව් ඇති ශ්‍රමණයා විසින්, නැසූ පව් ඇති බ්‍රාහ්මණයා විසින්, බුත් කෙලෙස්මුල් ඇති භික්ෂුහු විසින්, සියලු අකුශලමූලබන්ධනයෙන් මිදුණහු විසින් කියන ලද පවසන ලද ප්‍රකාශ කරන ලද දෙසන ලද පනවන ලද පිහිටුවන ලද විවෘත කළ විභාග කළ ප්‍රකට කළ ප්‍රකාශ කරන ලද්දහු නුයි 'යෙ වා'පි ධම්මා සමණෙන වුත්තා' යනු වේ.

එසේත් කීහ, ඒ නිර්මිත බුදුහු:

**"ඡන්දං නු ලොකස්මිං –පෙ– යෙ වා පි ධම්මා සමණෙන වුත්තා"යි**

**11 - 6**

මේ ලොවැ සුව යැයි ද දුකැයි ද යමක් කියත් නම්, ඒ සාතාසාත වේදනාව නිසා ඡන්දය උපදී, ලොවැ සත්ත්ව තෙමේ භූතොපාදායරූපයන්හි විනාශය ත් උත්පත්තිය ත් දැක තෘෂ්ණා – දෘෂ්ටිවිනිශ්චය කරන්නේ සි.

**සාතං අසාතන්ති යමාහු ලොකෙ** – 'සාත' නම්, සුඛවේදනාව හා ඉෂ්ටවස්තුව යැ: **අසාත** – නම්: දුඃඛවේදනාව හා අනිෂ්ටවස්තුව යැ; **යමාහු ලොකෙ** – යමක් පවසත් නම්, යමක් කියත් නම් යමක් බෙණෙත් නම් යමක් දක්වත් නම් යමක් වහරත් නම් නුයි 'සාතං අසාතන්ති යමාහු ලොකෙ' යනු වේ.

**තම්බූපනිස්සාය පභොති ඡන්දො** – සාතාසාත (වේදනාව හා වස්තුව) නිසා සැපදුක් නිසා සොම්නස් දොම්නස් නිසා ඉට්ඨඅනිට්ඨ නිසා අනුනය ප්‍රතිඝ නිසා ඡන්දය වෙයි පහළ වෙයි උපදී හටගනී නිපදී වෙසෙසින් නිපදී නුයි 'තම්බූපනිස්සාය පභොති ඡන්දො' යනු වේ.

**රූපෙසු දිස්වා විභවං භවඤ්ච** – 'රූපෙසු' යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා උපදනා රූපය ද වේ; රූපයන්ගේ භවය කවරේ යත්? රූපයන් ගේ යම් භවයෙක් ජාතියෙක් හටගැනීමෙක් නිපැදීමෙක් වෙසෙසින් නිපැදීමෙක් පහළ වීමෙක් වේ ද, මේ රූපයන්ගේ භවයයි; රූපයන්ගේ විභවය කවරේ යත්? රූපයන්ගේ යම් ක්ෂයවීමෙක් වැනැසීමෙක් භේදයෙක් පරිභේදයෙක් අනිත්‍ය බවෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ රූපයන් ගේ විභව යයි. **රූපෙසු දිස්වා විභවං භවඤ්ච** – රූපයන්හි හටගැනීම් ද වැනැසීම ද දැක බලා තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට නුයි 'රූපෙසු දිස්වා විභවං භවඤ්ච' යනු වේ.

විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙති – 'විනිච්ඡයා'ති ද්වෙ විනිච්ඡයා – තණ්හාවිනිච්ඡයො ච දිට්ඨිවිනිච්ඡයො ච. කථං තණ්හාවිනිච්ඡයං කරොති? ඉධෙකච්චස්ස අනුප්පන්නා චෙව භොගා[1] න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති; තස්ස එවං හොති: 'කෙන නු ඛො මෙ උපායෙන අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති? උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්තී'ති. තස්ස පන එවං හොති: 'සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගං අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති. විකාලවිසිඛාචරියානුයොගං අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති. සමජ්ජාභිචරණං අනුයුත්තස්ස මෙ – ජූතප්පමාදට්ඨානානුයොගං අනුයුත්තස්ස මෙ – පාපමිත්තානුයොගං අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති. ආලස්සානුයොගං[2] අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්තී'ති එවං ඤාණං කත්වා ඡ භොගානං අපායමුඛානි න සෙවති. ඡ භොගානං ආයමුඛානි සෙවති. එවම්පි තණ්හාවිනිච්ඡයං කරොති.

අථවා කසියා වා වණිජ්ජාය වා ගොරක්ඛෙන වා ඉස්සත්තෙන වා රාජපොරිසෙන[3] වා සිප්පඤ්ඤතරෙන වා පටිපජ්ජති. එවම්පි තණ්හාවිනිච්ඡයං කරොති. කථං දිට්ඨිවිනිච්ඡයං කරොති? චක්ඛුස්මිං උප්පන්නෙ ජානාති 'අත්තා මෙ උප්පන්නො'ති. චක්ඛුස්මිං අන්තරහිතෙ ජානාති 'අත්තා මෙ අන්තරහිතො, විගතො මෙ අත්තා'ති. එවම්පි දිට්ඨිවිනිච්ඡයං කරොති. සොතස්මිං– ඝානස්මිං– ජිව්හාය– කායස්මිං– රූපස්මිං– සද්දස්මිං– ගන්ධස්මිං– රසස්මිං– ඵොට්ඨබ්බස්මිං උප්පන්නෙ ජානාති 'අත්තා මෙ උප්පන්නො'ති. ඵොට්ඨබ්බස්මිං අන්තරහිතෙ ජානාති 'අත්තා මෙ අන්තරහිතො, විගතො මෙ අත්තා'ති. එවම්පි දිට්ඨිවිනිච්ඡයං කරොති, ජනෙති සඤ්ජනෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙති. ජන්තූති සත්තො නරො මානවො –පෙ– මනුජො; ලොකෙ'ති අපායලොකෙ –පෙ– ආයතනලොකෙති – 'විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ.'

තෙනාහ භගවා:

"සාතං අසාතන්ති යමාහු ලොකෙ
තමූපනිස්සාය පහොති ඡන්දො,
රූපෙසු දිස්වා විභවං භවං ච
විනිච්ඡයං කුරුතෙ[4] ජන්තු ලොකෙ"ති.

## 11 – 7

කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ,
කථංකථී ඤාණපථාය සික්ඛෙ
ඤත්වා පවුත්තා සමණෙන ධම්මා.

---

1. ලොභා. – සිමු. II. 2. ආලසානුයොගං – මජසං.
3. රාජපොරිසෙන – සිමු. II. 4. කුබ්බති – මජසං.

**විනිච්ඡය කුරුතෙ ජන්තු ලොකෙ** – 'විනිච්ඡය' නම්: තෘෂ්ණා-විනිශ්චය ද දෘෂ්ටිවිනිශ්චය දැයි විනිශ්චය දෙකෙකි: කෙසේ තෘෂ්ණාවිනිශ්චය කෙරෙයි යත්? මෙහි එකක් හට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් ක්ෂය වීමට යෙති; ඔහුට මෙසේ සිතෙක් වෙයි: 'කවර උපායෙකින් මට නූපන් භොගයෝ ත් නූපදිත් ද, උපන් භොගයෝත් ක්ෂය වීමට යෙත් දැ'යි. යළි ඔහුට මෙසේ සිත් වෙයි: 'මද්‍යට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පීමෙහි නැවත නැවත යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහෙති: නො කල්හි විපිසඤ්චාරයෙහි පුනපුනා යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහීමට යෙති; නෘත්‍යාදිය දැකීම් වශයෙන් පිරිස්හි හැසිරීමෙහි පුනපුනා යෙදුණු මට – ප්‍රමාදයට කරුණු වූ ද්‍යූතයෙහි පුනපුනා යෙදුණු මට – පාපමිත්‍රානුයොගයෙහි පුනපුනා යෙදුණු මට – ආලස්‍යයෙන් යුක්ත බැවිහි පුනපුනා යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදියි, උපන් භොගයෝ ත් පිරිහීමට යෙති' මෙසේ නුවණ උපදවා සවැදෑරුම් වූ භොගයන් ගේ විනාශයෙහි දොරටු සෙවනය නො කෙරෙයි, සවැදෑරුම් වූ භොගයන් ගේ ආයද්වාරයන් සෙවනය කෙරෙයි; මෙසේත් තෘෂ්ණා විනිශ්චය කෙරෙයි.

නොහොත් ගොවිතැනින් හෝ වෙළෙඳාමෙන් හෝ ගවපාලනයෙන් හෝ ධනුශිල්පයෙන් හෝ රාජසෙවායෙන් හෝ එක්තරා ශිල්පයෙකින් හෝ උත්සාහ කෙරෙයි; මෙසේ ත් තෘෂ්ණාවිනිශ්චය කෙරෙයි. කෙසේ දෘෂ්ටිවිනිශ්චය කෙරෙයි යත්? සසම්භාර චක්ෂුස උපන් කල්හි 'මා ගේ ආත්මය උපනැ'යි දෘෂ්ටිවශයෙන් දැනගනී, චක්ෂුස නැසුණු කල්හි, 'මා ගේ ආත්මය නැසිණ, මා ගේ ආත්මය ඉක්මැ ගියේ යැ'යි දෘෂ්ටිවශයෙන් දැනගනී; මෙසේ ත් දෘෂ්ටිවිනිශ්චය කෙරෙයි, ශ්‍රොත්‍රය – ඝ්‍රාණය – ජිහ්වාව– කායය – රූපය – ශබ්දය – ගන්ධය – රසය – ස්ප්‍රෂ්ටව්‍යය උපන්කල්හි 'මා ගේ ආත්මය උපනැ'යි දෘෂ්ටිවශයෙන් දැනගනී, ස්ප්‍රෂ්ටව්‍යය නැසුණු කල්හි 'මා ගේ ආත්මය නැසිණ, මා ගේ ආත්මය පහව ගියේ වනැ'යි දෘෂ්ටි වශයෙන් දැනගනී; (–දෘෂ්ටිය ගනී යයි සේයි.) මෙසේ ත් දෘෂ්ටිවිනිශ්චය කෙරෙයි, උපදවයි, මොනොවට උපදවයි, නිපදවයි, වෙසෙසින් නිපදවයි. **ජන්තු** – සත්ත්ව– නර –මානව...මනුජ තෙමේ. **ලොකෙ** –අපායලොකයෙහි... ආයතනලොකයෙහි නුයි 'විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“සාතං අසාතන්ති -පෙ- විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ”යි.**

**11 - 7**

ක්‍රොධය ද මෘෂාවාදය ද විචිකිත්සාව ද යන මේ ධර්මයෝ ද සාතාසාත දෙක ඇති කල්හි මැ වෙති, විචිකිත්සා සහිත වූ පුද්ගල තෙම ඥානදර්ශන-ඥානාධිගමය පිණිස ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නේ ය, බුද්ධශ්‍රමණයන් විසින් දැන (අනිත්‍යාදි) ධර්මයෝ දෙසන ලද්දාහු ය

**කොධො මොසවජ්ජඤ්ච කථංකථා චාති** – 'කොධො'ති යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො -පෙ- මොසවජ්ජං වුච්චති මුසාවාදො; කථංකථා වුච්චති විචිකිච්ඡා; ඉට්ඨං වත්ථුං නිස්සායපි කොධො ජායති; අනිට්ඨං වත්ථුං නිස්සායපි කොධො ජායති. ඉට්ඨං වත්ථුං නිස්සායපි මුසාවාදො උප්පජ්ජති. අනිට්ඨං වත්ථුං නිස්සායපි මුසාවාදො උප්පජ්ජති, ඉට්ඨං වත්ථුං නිස්සායපි කථංකථා උප්පජ්ජති, අනිට්ඨං වත්ථුං නිස්සායපි කථංකථා උප්පජ්ජති.

කථං අනිට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති? පකතියා අනිට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති: අනත්ථං මෙ අචරීති කොධො ජායති. අනත්ථං මෙ චරතීති කොධො ජායති. අනත්ථං මෙ චරිස්සතීති කොධො ජායති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි – අනත්ථං චරති – අනත්ථං චරිස්සතීති කොධො ජායති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි – අත්ථං චරති – අත්ථං චරිස්සතීති කොධො ජායති. එවං අනිට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති. කථං ඉට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති? ඉට්ඨං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි[1] කොධො ජායති, අච්ඡිජ්ජන්තෙපි කොධො ජායති, අච්ඡින්නෙපි කොධො ජායති. ඉට්ඨං වත්ථුං විපරිණාමසඞ්කිනොපි කොධො ජායති. විපරිණමන්තෙපි කොධො ජායති. විපරිණතෙපි කොධො ජායති. එවං ඉට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති.

කථං අනිට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති? ඉධෙකච්චො අන්දුබන්ධනෙන[2] වා බද්ධො[3] තස්ස බන්ධනස්ස මොක්ඛත්ථාය සම්පජානමුසා භාසති. රජ්ජුබන්ධනෙන වා බද්ධො,[3] සඞ්ඛලිකබන්ධනෙන වා බද්ධො, වෙත්තබන්ධනෙන වා බද්ධො, ලතාබන්ධනෙන වා බද්ධො, පක්ඛෙපබන්ධනෙන වා බද්ධො, පරික්ඛෙපබන්ධනෙන වා බද්ධො, ගාමනිගමනගරජනපදරට්ඨබන්ධනෙන වා බද්ධො, ජනපදබන්ධනෙන වා බද්ධො, තස්ස බන්ධනස්ස මොක්ඛත්ථාය සම්පජානමුසා භාසති. එවං අනිට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති. කථං ඉට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති? ඉධෙකච්චො මනාපිකානං[4] රූපානං හෙතු සම්පජානමුසා භාසති, මනාපිකානං සද්දානං -ගන්ධානං- රසානං-ඵොට්ඨබ්බානං හෙතු- චීවර හෙතු- පිණ්ඩපාතහෙතු - සෙනාසන හෙතු – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සම්පජානමුසා භාසති, එවං ඉට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති. කථං අනිට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජති? 'මුච්චිස්සාමි[5] නු ඛො චක්ඛුරොගතො, න නු ඛො මුච්චිස්සාමි චක්ඛුරොගතො, මුච්චිස්සාමි නු ඛො සොතරොගතො, ඝානරොගතො, ජිව්හාරොගතො, කායරොගතො, සීසරොගතො, කණ්ණරොගතො, මුඛරොගතො, මුච්චිස්සාමි[5] නු ඛො දන්තරොගතො, න නු ඛො මුච්චිස්සාමි දන්තරොගතො'ති එවං අනිට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජති. කථං ඉට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජති? 'ලභිස්සාමි නු ඛො මනාපියෙ[6] රූපෙ, න නු ඛො ලභිස්සාමි මනාපියෙ රූපෙ, ලභිස්සාමි නු ඛො මනාපියෙ[6] සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර'න්ති එවං ඉට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජතී'ති – කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච.

---

1. වත්ථුච්ඡෙදසඞ්කිනොපි - ස්‍යා 2. අන්දුබන්ධනෙන- ස්‍යා. PTS.
3. බන්ධො- ස්‍යා. PTS 4. මනාපානං- සීමු. II 5. මුඤ්චිස්සාමි- සීමු. II.
6. මනාපිකෙ - මජසං.

**කොධො මොසවජ්ජං ච කථංකථා ච** – ‘කොධො’ යනු: මෙබඳු වූ චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක්...‘**මොසවජ්ජ**’යි මෘෂාවාදය කියනු ලැබෙයි; ‘**කථංකථා**’යි විචිකිත්සාව කියනු ලබයි; ඉෂ්ටවස්තුව නිසා ද කොපය උපදී, අනිෂ්ටවස්තුව නිසා ද කොපය උපදී; ඉෂ්ටවස්තුව නිසා ද මෘෂාවාදය උපදී, අනිෂ්ටවස්තුව නිසා ද මෘෂාවාදය උපදී; ඉෂ්ට-වස්තුව නිසා ද විචිකිත්සාව උපදී, අනිෂ්ටවස්තුව නිසා ද විචිකිත්සාව උපදී;

කිසෙයින් අනිෂ්ටවස්තුව නිසා කොපය උපදී ද යත්: පියවින් මැ අනිෂ්ටවස්තුව නිසා කොපය උපදී; ‘මට අනර්ථ කෙළේ යැ’යි කොපය උපදී, මට අනර්ථ කෙරෙයි කොපය උපදී, ‘මට අනර්ථ කරන්නේ යැ’යි කොපය උපදී, ‘මාගේ ප්‍රිය වූ මනාප වූවහුට අනර්ථ කෙළේය – අනර්ථ කරයි – අනර්ථ කරන්නේයැ’යි කොපය උපදී; ‚මා ගේ අප්‍රිය අමනාප වූවහුට අර්ථ කෙළේය – අර්ථ කරයි – අර්ථ කරන්නේයැ’යි කොපය උපදී; මෙසේ අනිෂ්ට වස්තුව නිසා ක්‍රොධය උපදී. කිසෙයින් ඉෂ්ටවස්තුව නිසා ක්‍රොධය උපදී ද යත්: ඉෂ්ටවස්තුව ‘අසිද ගනිති’ සැක ඇත්තහුට ද ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව අසිඳුනා කල්හි දු ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව අසිඳගත් කල්හි දු ක්‍රොධය උපදී; ඉෂ්ටවස්තුව ‘වෙනස් වෙති’ සැක ඇත්තහුට ද ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව වෙනස් වන කල්හි දු ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව වෙනස් වූ කල්හි දු ක්‍රොධය උපදී; මෙසේ ඉෂ්ටවස්තුව නිසා ක්‍රොධය උපදී.

කිසෙයින් අනිෂ්ටවස්තුව නිසා මෘෂාවාදය උපදී ද යත්: මෙහි එකෙක් අන්දුබන්ධනයෙන් (–යදමින්) හෝ බඳනා ලදුයේ ඒ බන්ධනය මුදනු සඳහා දැන දැන බොරු කියයි, රැහැනින් හෝ බඳනා ලදුයේ – හැකිළි බැඳුමෙන් හෝ බඳනා ලදුයේ – වේ වැලින් හෝ බඳනා ලදුයේ– ලතාබන්ධනයෙන් හෝ බඳනා ලදුයේ – සිරබැඳුමෙන් හෝ බඳනා ලදුයේ– පවුරුබැඳුමෙන් හෝ බඳනා ලදුයේ – ගම් නියම්ගම් නගර රටබැඳුමෙන් හෝ බඳනා ලදුයේ – දනවුබැඳුමෙන් හෝ බඳනා ලදුයේ ඒ බන්ධනය මුදනු සඳහා දැන දැන බොරු කියයි; මෙසේ අනිෂ්ට වස්තුව නිසා මුසාවාදය උපදී. කිසෙයින් ඉෂ්ටවස්තුව නිසා මුසාවාදය උපදී ද යත්? මෙහි එකෙක් මනවඩන රූපයන් හේතු කොට දැන දැන බොරු කියයි, මන වඩන ශබ්දයන්– ගන්ධ – රස ස්ප්‍රෂ්ටව්‍යයන් හෙතු කොට - සිවුරු හෙතුයෙන් පිණ්ඩපාත – සෙනසුන් – ගිලන්පස බෙහෙත් පිරිකර හෙතුයෙන් දැන දැන බොරු කියයි: මෙසේ ඉෂ්ටවස්තුව නිසා මෘෂාවාදය උපදී. කිසෙයින් අනිෂ්ටවස්තුව නිසා විචිකිත්සාව (–සැකය) උපදී ද යත් ? චක්ෂුරොගයෙන් මිදෙම් දෝ හෝ චක්ෂුරොගයෙන් නො මිදෙම් දෝ හෝ ශ්‍රොත්‍රරොගයෙන්– ඝ්‍රාණරොගයෙන් – ජිහ්වාරොගයෙන් – කායරොගයෙන් – ශිර්ෂරොගයෙන්– කර්ණරොගයෙන් – මුඛරොගයෙන් – දන්තරොගයෙන් මිදෙම් දෝ හෝ, දන්තරොගයෙන් නො මිදෙම් දෝ හෝ’යි මෙසේ අනිෂ්ටවස්තුව නිසා සැක උපදී, කෙසේ ඉෂ්ටවස්තුව නිසා සැක උපදී ද යත් ? මනවඩන රූපයන් ලැබෙම් දෝ හෝ, ‘මනවඩන රූපයන් නො ලැබෙම් දෝ හෝ, මනවඩන ශබ්ද– ගන්ධ – රස - ස්ප්‍රෂ්ටව්‍යයන් – කුලයා – ගණයා – ආවාසය – ලාභය– යශස්– පැසැසුම් – සුව – සිවුරු පිණ්ඩපාත – සෙනසුන් – ගිලන්පසබෙහෙත්පිරිකර නො ලැබෙම් දෝ හෝ’යි මෙසේ ඉෂ්ටවස්තුව නිසා සැක උපදී නුයි ‘කොධො මොසවජ්ජං ච කථංකථා ච’ යනු වේ.

එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙති - සාතාසාතෙ සන්තෙ සුඛදුක්ඛෙ[1] සන්තෙ සොමනස්සදොමනස්සෙ සන්තෙ ඉට්ඨානිට්ඨෙ සන්තෙ අනුනයපටිඝෙ සන්තෙ සංවිජ්ජමානෙ අත්ථි උපලබ්භමානෙති - එවම්පි ධම්මා ද්වයමෙව සන්තෙ.

කථංකථී ඤාණපථාය සික්ඛෙථාති - ඤාණම්පි ඤාණපථො ඤාණස්ස ආරම්මණම්පි ඤාණපථො; ඤාණසහභුනොපි ධම්මා ඤාණපථො; යථා අරියමග්ගො අරියපථො, දෙවමග්ගො දෙවපථො, බ්‍රහ්මමග්ගො බ්‍රහ්මපථො; එවමෙව ඤාණම්පි ඤාණපථො, ඤාණස්ස ආරම්මණම්පි ඤාණපථො, ඤාණසහභුනොපි ධම්මා ඤාණපථො; සික්ඛෙථාති තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. කතමා අධිසීලසික්ඛා? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු; ඛුද්දකො සීලක්ඛන්ධො මහන්තො සීලක්ඛන්ධො සීලං පතිට්ඨා ආදි චරණං සංවරො මුඛං පමුඛං කුසලානං ධම්මානං සමාපත්තියා, අයං අධිසීලසික්ඛා. කතමා අධිචිත්තසික්ඛා? ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති; අයං අධිචිත්තසික්ඛා. කතමා අධිපඤ්ඤාසික්ඛා? ඉධ භික්ඛු පඤ්ඤවා හොති, උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා; සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති; ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති, අයං අධිපඤ්ඤාසික්ඛා.

කථංකථී ඤාණපථාය සික්ඛෙථාති - කථංකථී පුග්ගලො සකඞ්ඛො සවිලෙඛො සද්වෙළ්හකො සවිචිකිච්ඡො ඤාණාධිගමාය ඤාණඵුසනාය[2] ඤාණසච්ඡිකිරියාය අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය; ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, පස්සන්තො සික්ඛෙය්‍ය, පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය, චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය, සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය, විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය, සතිං උපට්ඨපෙන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො සික්ඛෙය්‍ය, පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය, පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය, සමාදාය වත්තෙය්‍යා'ති - කථංකථී ඤාණපථාය සික්ඛෙ.

---

1. සුඛාසුඛෙ ස්‍යා    2. ඤාණදස්සනාය - ස

**එතෙ පි ධම්මා ද්වයමෙව සන්තෙ** - සාතාසාත (දෙක) ඇති කල්හි සුව - දුක් ඇති කල්හි සොම්නස් දොම්නස් ඇති කල්හි ඉට්ඨ අනිට්ඨ ඇති කල්හි අනුනය ප්‍රතිඝයන් විද්‍යමාන කල්හි සංවිද්‍යමාන කල්හි ඇති කල්හි ලැබෙන කල්හි නුසි 'එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ' යනු වේ.

**කථංකථී ඤාණපථාය සික්ඛෙ** - ඥානය ඥානපථ යැ, ඥානයා ගේ අරමුණ ද ඥානපථ යැ, ඥානය හා සහජාත වූ ධර්මයෝ ද ඥානපථ යි; යම් සේ ආර්‍යමාර්ගය ආර්‍යපථ වී ද, දෙවමාර්ගය දෙවපථ වී ද, බ්‍රහ්මමාර්ගය බ්‍රහ්මපථ වී ද, එසෙයින් ම ඥානය ත් ඥානපථ යැ, ඥානයා ගේ ආරම්මණය ත් ඥානපථ යැ, ඥානය සමග උපන් චිත්ත චෛතසික ධර්මයෝත් ඥානපථ යි. **සික්ඛෙ** - ශික්‍ෂා තුනෙකි: අධිශීලශික්‍ෂා යැ, අධිචිත්තශික්‍ෂා යැ, අධිප්‍රඥාශික්‍ෂා යැයි, අධිශීලශික්‍ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම සිල්වත් වෙයි, ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් සංවර වූයේ ආචාරගොචර දෙකින් සමන්විත වූයේ අණුමාත්‍ර වරදෙහි භය දක්නාසුලු වූයේ වෙසෙයි, මොනොවට ගෙන ශික්‍ෂාකොට්ඨාසයන්හි හික්මෙයි; ක්‍ෂුද්‍රශීලස්කන්ධ යැ, මහත්ශීලස්කන්ධ යැ (යන) ශීලය චාතුර්භූමක කුශලධර්මයන් ගේ ප්‍රතිෂ්ඨා වෙයි, ආදි වෙයි, පාදය වෙයි, සංයමය වෙයි, සංවරය වෙයි, ද්වාරය වෙයි, ප්‍රමුඛ වේ. මේ අධිශීලශික්‍ෂා යැ. අධිචිත්තශික්‍ෂා කවරී ද යත්? මේ සස්නෙහි මහණ තෙමේ කාමච්ඡන්දනීවරණයෙන් වෙන්ව මැ...සිවුවැනි ධ්‍යානට පැමිණ වාසය කෙරෙයි; මේ අධිචිත්තශික්‍ෂා යැ. අධිප්‍රඥාශික්‍ෂා කවරී ද යත්? මේ සස්නෙහි මහණ තෙමේ ප්‍රඥාවත් වෙයි, නිදෝෂ වූ නිර්වේධය පිණිස පවත්නා වූ මනා කොට නිවනට පමුණුවන්නා වූ අභිවෘද්ධිගාමිනී ප්‍රඥාවෙන් පරිපූර්ණ වූයේ වෙයි, හෙතෙම 'මේ දුකැ'යි තත්වූ පරිද්දෙන් දනගනී,...'මේ දුක් නැසීමට පමුණුවන පිළිවෙතැ'යි තත්වූ පරිද්දෙන් දනගනී; මොහු ආශ්‍රවයෝ යැයි තත්වූ පරිද්දෙන් දනගනී,...'මේ ආශ්‍රවනිරොධයට පමුණුවන ප්‍රතිපදාව යැ'යි තත් වූ පරිද්දෙන් දනගනී. මේ තොමෝ අධිප්‍රඥාශික්‍ෂා යි.

**කථංකථී ඤාණපථාය සික්ඛෙ** - විචිකිත්සාවත් පුද්ගල තෙමේ සැක සහිත වූයේ විත්තවිලෙඛ (-සිතේ හිරි) සහිත වූයේ දෙසිත් සහිතවූයේ විචිකිත්සා සහිත වූයේ නුවණ ලැබීම පිණිස ඥානස්පර්ශය පිණිස නුවණ ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේය, අධිචිත්තයෙහි ද හික්මෙන්නේය අධිප්‍රඥාවෙහි ද හික්මෙන්නේය; මෙහි ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේය, දනිමින් හික්මෙන්නේය, දක්මින් හික්මෙන්නේය, ප්‍රත්‍යවෙක්‍ෂා කරමින් හික්මෙන්නේය, සිතෙහි පිහිටුවමින් හික්මෙන්නේය, සැදැහැයෙන් සතිවුහන් කෙරෙමින් හික්මෙන්නේය, වීර්‍යය දැඩිව ගනිමින් හික්මෙන්නේය, සිහියට එළවමින් හික්මෙන්නේය, සිත පිහිටුවමින් හික්මෙන්නේය, නුවණින් දනගනිමින් හික්මෙන්නේය, (සලක්‍ෂණාවබොධයෙන්) දතයුත්ත විශිෂ්ටඥානයෙන් දනගනිමින් හික්මෙන්නේය, (සාමාන්‍යලක්‍ෂණාවබොධයෙන් කෘත්‍යවශයෙන්) දතයුත්ත හාත්පසින් දනගනිමින් හික්මෙන්නේය, හළයුතු සමුදය දුරුකරමින් හික්මෙන්නේය, වැඩියයුතු මාර්ගය වඩමින් හික්මෙන්නේය, ප්‍රත්‍යක්‍ෂ කටයුතු නිවන ප්‍රත්‍යක්‍ෂ කරමින් හික්මෙන්නේය, හැසිරෙන්නේය, මොනොවට හැසිරෙන්නේය, සමාදන්ව පවත්නේ නුසි 'කථංකථී ඤාණපථාය සික්ඛෙ' යනු වේ.

**ඤත්වා පවුත්තා සමණෙන ධම්මාති** – 'ඤත්වා' ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතා 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතා. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති – සබ්බෙ ධම්මා අනත්තාති – අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති –පෙ– ජාතිපච්චයා ජරාමරණන්ති – අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති –පෙ– ජාතිනිරොධා ජරාමරණනිරොධොති, ඉදං දුක්ඛන්ති –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති, ඉමෙ ආසවාති –පෙ– අයං ආසවනිරොධගාමිනී පටිපදාති, ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති, ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති, ඉමෙ ධම්මා පහාතබ්බාති, ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති, ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච, පඤ්චන්නං උපාදානක්ඛන්ධානං – චතුන්නං මහාභූතානං – 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතා. වුත්තං හෙතං භගවතා: "අභිඤ්ඤායාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි; නො අනභිඤ්ඤාය. සනිදානාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි; නො අනිදානං. සප්පාටිහාරියාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි; නො අප්පාටිහාරියං. තස්ස මයහං භික්ඛවෙ අභිඤ්ඤාය ධම්මං දෙසයතො නො අනභිඤ්ඤාය, සනිදානං ධම්මං දෙසයතො නො අනිදානං, සප්පාටිහාරියං ධම්මං දෙසයතො නො අප්පාටිහාරියං, කරණීයො ඔවාදො; කරණීයා අනුසාසනී. අලඤ්ච පන වො භික්ඛවෙ[1] තුට්ඨියා අලං පාමොජ්ජාය[2] අලං සොමනස්සාය 'සම්මා සම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො[3] ධම්මො, සුපටිපන්නො සඞ්ඝො'ති ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ දසසහස්සී[4] ලොකධාතු අකම්පිත්ථා''ති – ඤත්වා පවුත්තා සමණෙන ධම්මා.

තෙනාහ භගවා:

"කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ,
කථංකථී ඤාණපථාය සික්ඛෙ
ඤත්වා පවුත්තා සමණෙන ධම්මා"ති.

## 11 – 8

සාතං අසාතඤ්ච කුතොනිදානා?
කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං මෙ පබ්‍රෑහි යතොනිදානං.

---

1 භික්ඛවෙ එවං - ස්‍යා. II. 2 අත්තමනතා - අභ.
3 භගවතා ධම්මො - අභ 4 සහස්සී - අභ
අඞ්ගුත්තර - තිකනිපාත - කුසිනාරවග්ග

**ඤත්වා පවුත්තා සමණෙන ධම්මා** – 'ඤත්වා' යනු: දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට කියන ලද්දාහු වෙසෙසින් කියන ලද්දාහු දක්වන ලද්දාහු දෙසන ලද්දාහු තබන ලද්දාහු ප්‍රකට කරන ලද්දාහු විභාග කරන ලද්දාහු නො ගැඹුරු කරන ලද්දාහු ප්‍රකාශ කරන ලද්දාහු යැ; 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට උක්තයහ, ප්‍රොක්ත – ආචක්ෂිත – දෙශිත – ප්‍රඥප්ත – ප්‍රස්ථාපිත – විවෘත – විභක්ත – උත්තානීකෘත – ප්‍රකාශිතයහ,' 'සියලු සංස්කාරයෝ දුඃඛයහ'යි...'සියලු ධර්මයෝ අනාත්මයහ'යි – 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති...ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වේ යයි – අවිද්‍යාවගේ නිරෝධයෙන් සංස්කාරනිරෝධ යයි...ජාතිනිරෝධයෙන් ජරාමරණනිරෝධය වේ යයි– මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාආර්යසත්‍ය යැයි – මොහු ආස්‍රවයෝ යැයි...මේ ආස්‍රවනිරෝධගාමිනීප්‍රතිපදාව යැයි – මේ ධර්මයෝ අවබෝධ කළයුත්තාහ'යි මේ ධර්මයෝ පරිජානනය කළයුත්තාහ'යි – මේ ධර්මයෝ ප්‍රහීණ කළ යුත්තාහ'යි–මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළයුත්තාහ'යි–සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉපදීම ද නැසීම ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද– පඤ්චෝපාදානස්කන්ධයන්ගේ – සතර මහාභූතයන්ගේ – යම් කිසි සමුදය– ධර්මයෙක් වේ නම් ඒ සියල්ල නැසෙන පියවි ඇතැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට කියන ලද්දේ යැ වෙසෙසින් කියන ලද්දේ යැ දක්වන ලද්දේ යැ දෙසන ලද්දේ යැ පනවන ලද්දේ යැ තබන ලද්දේ යැ විවෘත කරන ලද්දේ යැ විභාග කරන ලද්දේ යැ නො ගැඹුරු කරන ලද්දේ යැ පවසන ලද්දේ යි. මේ වදාළේ මැනු, භාග්‍යවතුන් විසින්: – 'මහණෙනි, මම මාර්ගාවබෝධය පිණිස දහම් දෙසමි, අනභිඥාව පිණිස නො දෙසමි: මහණෙනි, මම නිදාන (–ප්‍රත්‍යය) සහිත ව දහම් දෙසමි, ප්‍රත්‍යය රහිත කොට නො දෙසමි, මහණෙනි, මම නෛර්යාණික කොට දහම් දෙසමි, අනෛර්යාණික කොට නො දෙසමි, මහණෙනි, අභිඥාව පිණිස දහම් දෙසන අනභිඥාව පිණිස නො දෙසන, සනිදාන කොට දහම් දෙසන අනිදාන කොට නො දෙසන, නෛර්යාණික කොට දහම් දෙසන අනෛර්යාණික කොට නො දෙසන ඒ මා විසින් අවවාද කටයුත්තේය, අනුශාසනා කළයුත්තීය. තවද මහණෙනි, 'භාග්‍යවත්හු සම්‍යක්සම්බුද්ධයහ, ධර්මය ස්වාක්ඛ්‍යාත යැ, සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න යැයි තොපගේ සතුටට පමණ යැ ප්‍රාමොද්‍යයට පමණ යැ, සොම්නසට පමණ වේ. තවද මේ වෛයාකරණය දෙසනු ලබන කල්හි දශසහස්‍රීලෝකධාතුව කම්පා වී' යයි. 'ඤත්වා පවුත්තා සමණෙන ධම්මා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"කෝධෝ මෝසවජ්ජඤ්ච –පෙ– ඤත්වා පවුත්තා සමණෙන ධම්මා'ති.**

## 11 – 8

සුඛ වේදනාව ද දුක් වේදනාව ද (යන මොහු) කුමක් හේතු කොට උපදනාහු ද ? කුමක් අවිද්‍යමාන කල්හි මොහු පහළ නො වෙත් ද ? යළි ඒ සාතාසාතයන්ගේ විනාශය ද පහළ වීම ද යන යම් මේ අර්ථයෙක් යමක් කරුණු කොට ඇත්තේ ද, තෙල කාරණය මට ප්‍රකාශ කළ මැනව.

**සාතං අසාතඤ්ච කුතොනිදානාති** - සාතා අසාතා කුතොනිදානා? කුතො ජාතා? කුතො සඤ්ජාතා? කුතො නිබ්බත්තා? කුතො අභිනිබ්බත්තා? කුතො පාතුභූතා? කින්නිදානා? කිංසමුදයා? කිංජාතිකා කිම්පභවාති සාතාසාතානං මූලං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති - 'සාතං අසාතඤ්ච කුතොනිදානා.'

**කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙති** - 'කිස්මිං අසන්තෙ අසංවිජ්ජමානෙ නත්ථි අනුපලබ්භමානෙ සාතා අසාතා න භවන්ති, න ජායන්ති, න සඤ්ජායන්ති, න නිබ්බත්තන්ති, න අභිනිබ්බත්තන්තීති - 'කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ.'

**විභවං භවඤ්චාපි යමෙතමත්ථන්ති** - කතමො සාතාසාතානං භවො? යො සාතාසාතානං භවො පභවො ජාති සඤ්ජාති නිබ්බත්ති අභිනිබ්බත්ති පාතුභාවො, අයං සාතාසාතානං භවො. කතමො සාතාසාතානං විභවො? යො සාතාසාතානං ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං, අයං සාතාසාතානං විභවො; **යමෙතමත්ථන්ති** යං පරමත්ථන්ති - 'විභවං භවඤ්චාපි යමෙතමත්ථං.'

**එතං මෙ පබ්රූහි යතොනිදානන්ති** - 'එත'න්ති[2] යං පුච්ඡාමි, යං යාචාමි, යං අජ්ඣෙසාමි,[1] යං පසාදෙමි; **පබ්රූහීති** බ්‍රූහි වදෙහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහී'ති එතං මෙ පබ්රූහි; **යතොනිදානන්ති** යන්නිදානං යං සමුදයං යඤ්ජාතිකං යම්පභවන්ති - 'එතං මෙ පබ්රූහි යතොනිදානං.'

තෙනාහ සො නිම්මිතො:

"සාතං අසාතඤ්ච කුතොනිදානා
කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං මෙ පබ්රූහි යතොනිදාන"න්ති.

**11 - 9**

ඵස්සනිදානං සාතං අසාතං
ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවං චාපි යමෙතමත්ථං
එතං තෙ පබ්රූමි ඉතොනිදානං.

1. අජ්ඣෙසාමි - සීමු. II. මජසං. 2. එතං මෙති - සීමු. I.

**සාතං අසාතං ච කුතොනිදානා** – සාත අසාතවෙදනාවෝ කුමක් නිදාන කොට ඇත්තාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හට-ගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් කරුණු කොට ඇත්තාහු ද? කුමක් සමුදය කොට – කුමක් ජාති කොට කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද'යි සාතාසාතයන්ගේ මූලය විචාරති... සමුදය විචාරති, පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙති පහදවත් නුයි 'සාතං අසාතං ච කුතොනිදානා' යනු වේ.

**කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ** – කුමක් අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නැති කල්හි නො ලැබෙන කල්හි සාතවෙදනාත් අසාතවෙදනාත් නො වෙත් ද, නූපදිත් ද, නො හටගනිත් ද, නො නිපදිත් ද, නො පහළ වෙත් ද'යි 'කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ' යනු වේ.

**විභවං භවඤ්චාපි යමෙතමත්ථං**-සාතාසාතයන්ගේ භවය (–හට ගැනීම) කවරේ ද යත්? සාතාසාතයන්ගේ යම් භවයෙක් ප්‍රභවයෙක් ජාතියෙක් සඤ්ජාතියෙක් නිර්වෘත්තියෙක් අභිනිර්වෘත්තියෙක් ප්‍රාදුර්භාවයෙක් වේ ද මේ සාතාසාතයන්ගේ ඉපැදීම යැ; සාතාසාතයන්ගේ විනාශය කවරේ ද යත්? සාතාසාතයන්ගේ යම් ක්‍ෂය වීමෙක් ව්‍යය වීමෙක් බිඳීමෙක් භාත්පසින් බිඳීමෙක් අනිත්‍ය බවෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ සාතාසාතයන්ගේ විනාශය යි. **යමෙතමත්ථං** යනු: යම් පරමාර්ථයෙක් නුයි 'විභවං භවඤ්චාපි යමෙතමත්ථං' යනු වේ.

**එතං මෙ පබ්‍රූහි යතොනිදානං** – 'එතං' යනු: යමක් විචාරම් ද, යමක් අයදිම් ද, යමක් අධ්‍යෙෂණය කෙරෙම් ද, යමක් පහදවම් ද; **පබ්‍රූහි** – කියනු මැනව, වදාළ මැනව, ප්‍රකාශ කළ මැනව, දෙසුව මැනව, පනවනු මැනව, තබනු මැනව, විවෘත කළ මැනව, විභාග කළ මැනව, ප්‍රකට කළ මැනව, ප්‍රකාශ කළ මැනවැ'යි 'එතං මෙ පබ්‍රූහි' යනු වේ. **යතොනිදානං** – යම් කරුණක් යම් සමුදයක් යම් ඉපැද්මක් යම් ප්‍රභවයක් නුයි 'එතං මෙ පබ්‍රූහි යතොනිදානං' යනු වේ.

එයින් කිහ ඒ නිර්මිත බුදුහු:

"සාතං අසාතං ච –පෙ– එතං මෙ පබ්‍රූහි යතොනිදානං"යි.

## 11 – 9

සුඛවෙදනාව ද, දුක්වෙදනාව ද ස්පර්ශය ප්‍රත්‍යය කොට ඇත්තේ ය, ස්පර්ශය අවිද්‍යමාන කල්හි මොවුහු නො පහළ වෙති, (සුවදුක් වෙදනාවන් ගේ) විනාශය ද ඉපැදීම ද යන යම් අර්ථයෙක් මේ ඵස්ස කරුණු කොට උපදී ද, තෙල අර්ථය ඔබට කියමි.

**ඵස්සනිදානං සාතං අසාතන්ති** – සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. යා තස්සෙව සුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛවෙදනා, සා නිරුජ්ඣති, සා වූපසම්මති. දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. යා තස්සෙව දුක්ඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා, සා නිරුජ්ඣති; සා වූපසම්මති[1]. අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. යා තස්සෙව අදුක්ඛමසුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා, සා නිරුජ්ඣති; වූපසම්මති. **ඵස්සනිදානං සාතං අසාතන්ති** සාතාසාතා ඵස්සනිදානා ඵස්සසමුදයා ඵස්සජාතිකා ඵස්සපභවා'ති – 'ඵස්සනිදානං සාතං අසාතං.'

**ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙති** – ඵස්සෙ අසන්තෙ අසංවිජ්ජමානෙ නත්ථි අනුපලබ්භමානෙ සාතා අසාතා න භවන්ති නප්පභවන්ති න ජායන්ති න සඤ්ජායන්ති න නිබ්බත්තන්ති නාභිනිබ්බත්තන්ති න පාතුභවන්තී'ති – 'ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ'.

**විභවං භවඤ්චාපි යමෙතමත්ථන්ති** – භවදිට්ඨිපි ඵස්සනිදානා විභවදිට්ඨිපි ඵස්සනිදානා; **යමෙතමත්ථන්ති** යං පරමත්ථන්ති – 'විභවං භවං චාපි යමෙතමත්ථං.'

**එතං තෙ පබ්‍රූමි ඉතොනිදානන්ති** – 'එත'න්ති යං පුච්ඡසි, යං යාචසි, යං අජ්ඣෙසසි, යං පසාදෙසි; **පබ්‍රූමීති** බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති– 'එතං තෙ පබ්‍රූමි.' **ඉතොනිදානන්ති** ඉතො ඵස්සනිදානං ඵස්සසමුදයං ඵස්සජාතිකං ඵස්සපභවන්ති – 'එතං තෙ පබ්‍රූමි ඉතොනිදානං.'

තෙනාහ භගවා:

"ඵස්සනිදානං සාතං අසාතං
ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං තෙ පබ්‍රූමි ඉතොනිදාන"න්ති.

## 11 – 10

ඵස්සො නු ලොකස්මිං කුතොනිදානො
පරිග්ගහා චාපි කුතො පහූතා,
කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි
කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා.

**ඵස්සනිදානං සාතං අසාතං** – 'සුඛවෙදනාවට කරුණු වූ පහස නිසා සුඛවෙදනාව උපදී. එ මැ සුඛවෙදනීය වූ ස්පර්ශයාගේ නිරොධයෙන් තදනුරූප වෙදනා ඇති සුඛවෙදනීය වූ යම් පහසක් නිසා උපන් යම් සුඛවෙදනාවක් වී නම්, එය නිරුද්ධ වෙයි. එය සන්හිඳෙයි. දුක්වෙදනාවට නිමිත්ත වූ පහස නිසා දුක් වෙදනා උපදී, එ මැ දුඃඛවෙදනීය වූ ස්පර්ශයාගේ නිරොධයෙන් තදනුරූප වූ වෙදනා ඇති දුඃඛවෙදනීය වූ යම් පහසක් නිසා උපන් යම් දුක් වෙදනාවක් වූ නම්, එය නිරුද්ධ වෙයි. එය සන්හිඳෙයි. උපෙක්ෂාවෙදනාවට නිමිත්ත වූ ස්පර්ශය නිසා උපෙක්ෂාවෙදනාව උපදී. එ මැ උපෙක්ෂාවෙදනාවට හිත වූ ස්පර්ශයාගේ නිරොධයෙන් තදනුරූප වෙදනා ඇති උපෙක්ෂා-වෙදනාවට හිත වූ යම් පහසක් නිසා උපන් යම් උපෙක්ෂාවෙදනාවක් වූ නම් එය නිරුද්ධ වෙයි. එය සන්හිඳෙයි. **ඵස්සනිදානං සාතං අසාතං**– සුවදුක් වෙදනාවෝ පහස නිදාන කොට ඇත්තාහු ය, පහස සමුදය කොට ඇත්තාහු ය, පහස ජාති කොට ඇත්තාහු ය, ස්පර්ශය ප්‍රභව කොට ඇත්තාහු නුයි – 'ඵස්සනිදානං සාතං අසාතං' යනු වේ.

**ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ** – ස්පර්ශය අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නැති කල්හි නො ලැබෙන කල්හි සාතාසාතයෝ නො වෙති, ප්‍රභව නො වෙති, නූපදිති, නො හටගනිති, නො නිපදිති, නො වැඩෙති, නො පහළ වෙත් නුයි 'ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ' යනු වේ.

**විභවං භවඤ්චාපි යමෙතමත්ථං** – භවදෘෂ්ටිය ද ස්පර්ශය නිදාන කොට ඇත්තීය, විභවදෘෂ්ටිය ද ස්පර්ශය නිදාන කොට ඇත්තීය; **යමෙතමත්ථං**= යම් පරමාර්ථයක් නුයි 'විභවං භවඤ්චාපි යමෙතමත්ථං' යනු වේ.

**එතං තෙ පබ්‍රෑමි ඉතොනිදානං** – 'එතං' යනු: යමක් විචාරවූ ද; යමක් අයැදිවූ ද, යමක් අධ්‍යෙෂණ කරවූ ද, යමක් (සඳහා) පහදවවූ ද, **පබ්‍රෑමි** – කියමි පවසමි දෙසමි පනවමි තබමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි ප්‍රකට කෙරෙමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'එතං තෙ පබ්‍රෑමි' යනු වේ. **ඉතොනිදානං** – මේ පහස නිදාන කොට ඇත්තේය, පහස උත්පත්ති කොට ඇත්තේ ය, පහස ජාති කොට ඇත්තේ ය, ස්පර්ශය ප්‍රභව කොට ඇත්තේ නුයි 'එතං තෙ පබ්‍රෑමි ඉතොනිදානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**ඵස්සනිදානං** –පෙ– **එතං තෙ පබ්‍රෑමි ඉතොනිදානං**"යි.

**11 – 10**

ලොකයෙහි ස්පර්ශ තෙමේ කුමක් නිදාන (-මූලකාරණ) කොට ඇත්තේ ද ? තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයෝ ත් කොතැනින් පහළ වූවාහු ද ? කුමක් අවිද්‍යමාන කල්හි තෘෂ්ණාදෘෂ්ටිමමත්වය නැත්තේ ද ? කුමක් ඉක්මැගිය කල්හි (චක්ඛුසම්ඵස්සාදි) පහස්හු ස්පර්ශ නො කෙරෙත් ද?

**ඵස්සො නු ලොකස්මිං කුතොනිදානොති** – ඵස්සො කුතො නිදානො? කුතො ජාතො? කුතො සඤ්ජාතො? කුතො නිබ්බත්තො? කුතො අභිනිබ්බත්තො? කුතො පාතුභූතො? කින්නිදානො? කිං සමුදයො? කිඤ්ජාතිකො? කිම්පභවොති ඵස්සස්ස මූලං පුච්ඡති, හෙතුං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති, පපුච්ඡති, යාචති, අජ්ඣෙසති, පසාදෙතීති – ඵස්සො නු ලොකස්මිං කුතොනිදානො.

**පරිග්ගහා චාපි කුතො පහූතාති** – පරිග්ගහා කුතො පහූතා? කුතො ජාතා? කුතො සඤ්ජාතා? කුතො නිබ්බත්තා? කුතො අභිනිබ්බත්තා? කුතො පාතුභූතා? කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවාති පරිග්ගහානං මූලං පුච්ඡති, හෙතුං පුච්ඡති, -පෙ- සමුදයං පුච්ඡති, පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති – පරිග්ගහා චාපි කුතො පහූතා.

**කිස්මිං අසන්තෙ න මමත්තමත්ථීති** – කිස්මිං අසන්තෙ අසංවිජ්ජමානෙ[1] අනුපලබ්භමානෙ මමත්තා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි.

**කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සාති** – කිස්මිං විභූතෙ විභාවිතෙ අතික්කන්තෙ සමතික්කන්තෙ වීතිවත්තෙ ඵස්සා න ඵුසන්තී’ති – කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා.

තෙනාහ සො නිම්මිතො:

“ඵස්සො නු ලොකස්මිං කුතොනිදානො
පරිග්ගහා චාපි කුතො පහූතා,
කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි
කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා”ති.

**11 – 11**

නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො
ඉච්ඡානිදානානි පරිග්ගහානි,
ඉච්ඡාය’සන්ත්‍යා න මමත්තමත්ථි
රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා.

**නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සොති** – චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; චක්ඛු ච[2] රූපා ච රූපස්මිං, චක්ඛුසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො;

1. අසංවිජ්ජමානෙ නත්ථි - මජසං සීමු.II.
2. චක්ඛුං ච සීමු. II.

**එසොා නු ලොකසමිං කුතොනිදානො** – පහස කුමක් කරුණු කොට ඇත්තේ ද? කොයින් උපන්නේ ද? කොයින් හටගත්තේ ද? කොයින් නිපන්නේ ද? කොයින් වැඩුණේ ද? කොතැනින් පහළ වූයේ ද? කුමක් නිදන කොට ඇත්තේ ද? කුමක් සමුදය කොට – කුමක් ජාති කොට – කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ'යි ස්පර්ශයාගේ මූලය විචාරති, හෙතුව විචාරති...සමුදය විචාරති, අසති, අයැදිති, අධ්‍යෙෂණ කෙරෙති, පහදවත් නුයි 'එසොා නු ලොකසමිං කුතොනිදානො' යනු වේ.

**පරිග්ගහා චාපි කුතො පහූතා** – පරිග්‍රහයෝ කොයින් වූවාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හටගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් වැඩුණාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් නිදන කොට ඇත්තාහු ද? කුමක් සමුදය කොට ඇත්තාහු ද? කුමක් ජාති කොට ඇත්තාහු ද? කුමක් ප්‍රභව කොට ඇත්තාහු දැ'යි පරිග්‍රහයන්ගේ මූලය විචාරති, හෙතුව විචාරති...සමුදය විචාරති, පුළුවුස්ති, යාඥා කෙරෙයි අධ්‍යෙෂණ කෙරෙති, පහදවත් නුයි – 'පරිග්ගහා චාපි කුතො පහූතා' යනු වේ.

**කිසමිං අසනෙත න මමත්තමත්ථි**-කුමක් අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නො ලැබෙන කල්හි මමත්වයෝ නැත් ද, අවිද්‍යමාන වෙත් ද අසංවිද්‍යමාන වෙත් ද නො ලැබෙත් ද ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්සිඳුණාහු දුරලන ලද්දාහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි 'කිසමිං අසනෙත න මමත්තමත්ථි' යනු වේ.

**කිසමිං විභූතෙ න ඵුසන්ති එසොා** – කුමක් ඉක්මැවූ කල්හි නො වැඩූ කල්හි ඉක්මැගිය කල්හි මොනවට ඉක්මැගිය කල්හි ව්‍යතික්‍රමණය කළ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත් දැයි 'කිසමිං විභූතෙ න ඵුසන්ති එසොා' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"එසොා නු ලොකසමිං -පෙ- කිසමිං විභූතෙ න ඵුසන්ති එසොා"යි.

## 11 – 11

සම්ප්‍රයුක්ත නාමය ද වස්තුවාලම්බන රූපය ද නිසා ස්පර්ශය වෙයි, තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයෝ ඉච්ඡා (–ආශා) ව නිදන කොට ඇත්තාහු ය, ඉච්ඡාසඞ්ඛ්‍යාත තෘෂ්ණාව නැති කල්හි මමත්වය නැත්තේ ය, රූපය ඉක්මැගිය කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත්.

**නාමං ච රූපං ච පටිච්ච එසොා** – චක්ෂුස ද රූපයන් ද නිසා චක්ෂුර්-විඥානය උපදී, (චක්ඛුරූප විඥාන යන) තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය උපදී; ප්‍රසාද චක්ෂුස ද රූපාලම්බනයෝ ද රූප කොටසෙහි වෙති, (තිදෙනාගේ සංගතියෙන් උපන්) චක්ෂුසම්ඵස්සය හැර (සෙසු) සම්ප්‍රයුක්තධර්මයෝ නාම කොටසෙහි වෙති, මෙසේ ත් නාමය ත් රූපයත් නිසා ස්පර්ශය උපදී;

සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; සොතඤ්ච සද්දා ච රූපස්මිං, සොතසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. ඝානං ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; ඝානඤ්ච ගන්ධා ච රූපස්මිං, ඝානසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; ජිව්හා ච රසා ච රූපස්මිං, ජිව්හාසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; කායො ච ඵොට්ඨබ්බා ච රූපස්මිං, කායසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; වත්ථුරූපං රූපස්මිං, ධම්මා රූපිනො රූපස්මිං, මනොසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො.

**ඉච්ඡානිදානානි පරිග්ගහානීති** – 'ඉච්ඡා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං; **පරිග්ගහා**ති ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච –පෙ– අයං තණ්හාපරිග්ගහො –පෙ– අයං දිට්ඨිපරිග්ගහො. **ඉච්ඡානිදානානි පරිග්ගහානීති** පරිග්ගහා ඉච්ඡානිදානා ඉච්ඡාහෙතුකා ඉච්ඡාපච්චයා ඉච්ඡාකාරණා ඉච්ඡාපභවාති – ඉච්ඡානිදානානි පරිග්ගහානි.

**ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථී'ති** – 'ඉච්ඡා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං; **මමත්තා**ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං; **ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථීති** ඉච්ඡාය අසන්ත්‍යා අසංවිජ්ජමානාය නත්ථි අනුපලබ්භමානාය මමත්තා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථි.

**රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා**ති – 'රූපෙ'ති චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං; **රූපෙ විභූතෙ**ති චතූහාකාරෙහි රූපං විභූතං හොති. ඤාතවිභූතෙන[1] තීරණවිභූතෙන පහානවිභූතෙන සමතික්කමවිභූතෙන. කථං ඤාතවිභූතෙන[2] රූපං විභූතං හොති? රූපං ජානාති යං කිඤ්චි රූපං, සබ්බං රූපං චත්තාරි ච මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපන්ති ජානාති පස්සති

1. ඤාණවිභූතෙන - සීමු. II ඤාතවිතිවත්තෙන - ස. 2. ඤාණවිභූතෙන - සීමු. II.

ශ්‍රොත්‍රප්‍රසාදය ද ශබ්දයන් ද නිසා ශ්‍රොත්‍රවිඥානය උපදී, තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය උපදී; ශ්‍රොත්‍රප්‍රසාදයත් ගබ්දයෝත් රූප කොට්ඨාසෙහි වෙති; සොතසම්ඵස්සය හැර (සෙසු) සම්ප්‍රයුක්ත ධර්මයෝ නාම කොට්ඨාසෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී. ඝ්‍රාණය ද ගන්ධයන් ද නිසා ඝ්‍රාණවිඥානය උපදී, තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි; ඝ්‍රාණයත් ගන්ධයෝත් රූපයෙහි වෙති, ඝ්‍රාණසංස්පර්ශය හැර (සෙසු) සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී. දිව ද රසයන් ද නිසා ජිහ්වාවිඥානය උපදී, තිදෙනාගේ සඞ්ගතියෙන් ස්පර්ශය වෙයි; දිවත් රසයෝත් රූපයෙහි වෙති, ජිහ්වාසංස්පර්ශය හැර සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී. කය ද ස්ප්‍රෂ්ටව්‍යයන් ද නිසා කායවිඥානය උපදී, තිදෙනාගේ සඞ්ගතියෙන් ස්පර්ශය වෙයි; කයත් ස්ප්‍රෂ්ටව්‍යයෝත් රූපයෙහි වෙති, කායසංස්පර්ශය හැර සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී, මනස ද ධර්මයන් ද නිසා මනොවිඥානය උපදී, තිදෙනාගේ සඞ්ගතියෙන් ස්පර්ශය වෙයි; හෘදයවස්තුරූපය රූපයෙහි වෙයි, රූපී ධර්මයෝ රූපයෙහි වෙති, මනසංස්පර්ශය හැර සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී.

**ඉච්ඡානිදානානි පරිග්ගහානි** – 'ඉච්ඡා'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සාරාගයෙක්....අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **පරිග්ගහා** – පරිග්‍රහයෝ දෙදෙනෙකි: තෘෂ්ණාපරිග්‍රහය ද දෘෂ්ටිපරිග්‍රහය දැයි... මේ දෘෂ්ටිපරිග්‍රහය යි. **ඉච්ඡානිදානානි පරිග්ගහානි** – පරිග්‍රහයෝ ඉච්ඡා (–ඊප්සා) ව නිදාන කොට ඇත්තාහ, ඊප්සාව හෙතු කොට ඇත්තාහ, ඊප්සාව ප්‍රත්‍යය කොට ඇත්තාහ, ඊප්සාව කරුණු කොට ඇත්තාහ, ඊප්සාවෙන් පහළවූවාහු නුයි – 'ඉච්ඡානිදානානි පරිග්ගහානි' යනු වේ.

**ඉච්ඡාය'සන්තයා න මමත්තමත්ථි** – 'ඉච්ඡා'යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් සංරාගයෙක්...ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි; **මමත්තා**–මමත්වයෝ දෙදෙනෙකි: තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය දැයි...මේ දෘෂ්ටිමමත්වය යි. **ඉච්ඡාය'සන්තයා න මමත්තමත්ථි** – ඊප්සාව අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නැති කල්හි නො ලැබෙන කල්හි මමත්වයෝ නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත්, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්සිඳුණාහු දුරලන ලද්දාහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි 'ඉච්ඡාය'සන්තයා න මමත්තමත්ථි' යනු වේ.

**රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා** – 'රූපෙ' යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද; **රූපෙ විභූතෙ** – සතර අයුරකින් රූපය ඉක්මවන ලද වෙයි; ඥාතවිභූතයෙන් තීරණවිභූතයෙන් ප්‍රහාණවිභූතයෙන් සමතික්‍රමවිභූතයෙනි: කිසෙයින් ඥාතවිභූතයෙන් රූපය විභූත (–ඉක්මවන ලද) වේ ද යත්? රූපය (මෙසේ) දැන ගනී. යම් කිසි රූපයෙක් වේ නම්, සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය දැයි සියලු රූපය දැන ගනී, දකී;

එවං ඤාතවිභූතෙන රූපං විභූතං හොති. කථං තීරණවිභූතෙන රූපං විභූතං හොති? එවං ඤාතං කත්වා රූපං තීරෙති; අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපසග්ගතො චලතො පභඞ්ගුරතො[1] අද්ධුවතො අතාණතො අලෙණතො අසරණතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො[2] අඝමූලතො වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො බ්‍යාධිධම්මතො මරණධම්මතො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මතො සඞ්කිලෙසිකධම්මතො සමුදයතො අත්ථඞ්ගමතො අස්සාදතො[3] ආදීනවතො නිස්සරණතො තීරෙති. එවං තීරණවිභූතෙන රූපං විභූතං හොති. කථං පහානවිභූතෙන රූපං විභූතං හොති? එවං තීරයිත්වා රූපෙ ඡන්දරාගං පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. වුත්තං හෙතං භගවතා: "යො භික්ඛවෙ රූපෙ ඡන්දරාගො, තං පජහථ; එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං[4] අනභාවකතං ආයතිං අනුප්පාදධම්ම"න්ති.[ස] එවං පහානවිභූතෙන රූපං විභූතං හොති. කථං සමතික්කමවිභූතෙන රූපං විභූතං හොති? චතස්සො අරූපසමාපත්තියො පටිලද්ධස්ස රූපා විභූතා හොන්ති විභාවිතා අතික්කන්තා සමතික්කන්තා වීතිවත්තා. එවං සමතික්කමවිභූතෙන රූපං විභූතං හොති. ඉමෙහි චතූහි කාරණෙහි රූපං විභූතං හොති. **රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සාති** රූපෙ විභූතෙ විභාවිතෙ අතික්කන්තෙ සමතික්කන්තෙ වීතිවත්තෙ පඤ්ච ඵස්සා න ඵුසන්ති: චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො – රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා.

තෙනාහ භගවා:

"නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සා
ඉච්ඡානිදානානි පරිග්ගහානි,
ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථි
රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා"ති.

## 11 – 12

කථං සමෙතස්ස විභොති රූපං
සුඛං දුඛං[5] වාපි කථං විභොති,
එතං මෙ පබ්‍රෑහි යථා විභොති
තං ජානියාම ඉති[6] මෙ මනො අහු.

---

1. පභඞ්ගතො - PTS. පභඞ්ගුතො - ස. 2. අසරණතො - ස්‍යා
3. අසාරතො - සීමු.II. 4. තාලවත්ථුකතං - ස.
5. දුක්ඛං - ස්‍යා මනුප. PTS. දුඛඤ්චාපි - මජසං.
6. ජානිස්සාමාති - සීමු.II. මජසං. ස. ඛන්ධසංයුත්ත - භාරවග්ග.

මෙසෙයින් ඥාතවිභූතයෙන් (නුවණින් ඉක්මවීමෙන්) රූපය විභූත වෙයි. කිසෙයින් තීරණවිභූතයෙන් රූපය විභූත වේ ද යත්? මෙසේ ප්‍රකට කොට රූපය තීරණය කෙරෙයි: අනිත්‍ය හෙයින් දුඃඛ හෙයින් රෝග හෙයින් ගණ්ඩ හෙයින් ශල්‍ය හෙයින් ව්‍යසන හෙයින් ආබාධ හෙයින් පර හෙයින් පලෝක (-බිඳීම්) හෙයින් ඊති (-විපත්ති) හෙයින් උපද්‍රව හෙයින් භය හෙයින් උපසර්ග හෙයින් සැලෙන හෙයින් බිඳෙනසුලු හෙයින් අධ්‍රැව (-අස්ථිර) හෙයින් අත්‍රාණ හෙයින් අලෙන හෙයින් අසරණ හෙයින් රික්ත (-හිස්) හෙයින් තුච්ඡ හෙයින් ශූන්‍ය හෙයින් අනාත්ම හෙයින් ආදීනව හෙයින් විපරිණාමස්වභාව හෙයින් අසාර හෙයින් ව්‍යසනමූල හෙයින් වධක හෙයින් විගතභව හෙයින් සාස්‍රව හෙයින් සඞ්ඛත (-හේතුප්‍රත්‍යයෙන් සකස් කළ) හෙයින් මාරාමිෂ හෙයින් ජාතිධර්ම (ජාතිය පියවි කොට ඇති) හෙයින් ජරාධර්ම හෙයින් ව්‍යාධිධර්ම හෙයින් මරණධර්ම හෙයින් ශෝකපරිදේවදුඃඛ-දෞර්මනස්‍යඋපායාසධර්ම හෙයින් සංක්ලේශධර්ම (-තෘෂ්ණාදි සංක්ලේශයන්ට විෂයස්වභාව) හෙයින් සමුදය හෙයින් අස්තඞ්ගම හෙයින් ආස්වාද හෙයින් ආදීනව හෙයින් නිස්සරණ හෙයින් තීරණ කෙරෙයි, මෙසෙයින් තීරණ-විභූතයෙන් රූපය විභූත වෙයි. කිසෙයින් ප්‍රහාණවිභූතයෙන් රූපය විභූත වේ ද යත්? මෙසේ තීරණය කොට රූපයෙහි ඡන්දරාගය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි; මේ වදාරන ලද මැයි, භාග්‍යවතුන් විසින්: "මහණෙනි, රූපයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම්, එය දුරු කරවු, මෙසේ ඒ රූපය ප්‍රහීණ වන්නේ ය, උදුත් මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරන ලද්දේ අනභාවය කරන ලද්දේ මතු නූපදනා පියවි ඇත්තේ යැ"යි. මෙසෙයින් ප්‍රහාණවිභූතයෙන් රූපය විභූත වෙයි. කිසෙයින් සමතික්‍රමවිභූතයෙන් රූපය විභූත වේ ද යත්? සතර අරූපසමාපත්තීන් ලද්දහු විසින් රූපයෝ ඉක්මවන ලද්දහු විභාවිත වූවාහු අතික්‍රමණය-සමතික්‍රමණය-ව්‍යතික්‍රමණය කරන ලද්දහු වෙති; මෙසෙයින් සමතික්‍රමවිභූතයෙන් රූපය විභූත වෙයි. මේ සතර කාරණයන් ගෙන් රූපය විභූත වේ. රූපය විභූත වූ (ඉක්මවූ) කල්හි ස්පර්ශ නො කෙරෙත්. ඵස්සා - රූපය විභූත කල්හි විභාවිත කල්හි අතික්‍රාන්ත කල්හි සමතික්‍රාන්ත කල්හි ඉක්මගිය කල්හි චක්ඛුසම්ඵස්ස සෝතසම්ඵස්ස ඝානසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස යන පඤ්ච ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත් නුයි - 'රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නාමං ච රූපං ච -පෙ- රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා"යි.

## 11 - 12

කෙසේ පිළිපන්නහුට රූපය නො වේ ද? යළි සැප දුක් (ඉටු අනිටු රූපය) හෝ කෙසේ නො වේ ද? තෙල (රූප - සුඛ - දුක්ඛය) යම් සේ නො වේ නම් (එසේ) මට දෙශනා කළ මැනව, එය දත ගනුම්හ'යි මට සිතෙක් වී.

**කථං සමෙතස්ස විභොති රූපන්ති** – ‘කථං සමෙතස්සා’ති කථං සමෙතස්ස, කථං පටිපන්නස්ස, කථං ඉරියන්තස්ස, කථං වත්තන්තස්ස, කථං පාලෙන්තස්ස, කථං යපෙන්තස්ස, කථං යාපෙන්තස්ස රූපං විභොති, විභාවියති[1] අතික්කමියති[2] සමතික්කමියති, වීතිවත්තියතීති– කථං සමෙතස්ස විභොති රූපං.

**සුඛං දුඛං වාපි කථං විභොතීති** – සුඛං ච දුක්ඛං ච කථං විභොති විභාවියති අතික්කමියති සමතික්කමියති වීතිවත්තියතීති – සුඛං දුඛං වාපි කථං විභොති.

**එතං මෙ පබ්‍රෑහි යථා විභොතීති** – ‘එත’න්ති යං පුච්ඡාමි, යං යාචාමි, යං අජ්ඣෙසාමි[3] යං පසාදෙමීති එතං; **මෙ පබ්‍රෑහීති** මෙ පබ්‍රෑහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති එතං මෙ පබ්‍රෑහි; **යථා විභොතීති** යථා විභොති විභාවියති අතික්කමියති සමතික්කමියති වීතිවත්තියතීති – එතං මෙ පබ්‍රෑහි යථා විනොති.

**තං ජානිස්සාම ඉති මෙ මනො අහූති** – ‘තඤ්ජානිස්සාමා’ති තං ජානෙය්‍යාම ආජානෙය්‍යාම[4] විජානෙය්‍යාම පටිවිජානෙය්‍යාම පටිවිජ්ඣෙය්‍යාමා’ති; තං ජානිස්සාම; **ඉති මෙ මනො අහූති** ඉති මෙ මනො අහු, ඉති මෙ චිත්තං අහු, ඉති මෙ සඞ්කප්පො අහු, ඉති මෙ විඤ්ඤාණං අහූති – තං ජානිස්සාම ඉති මෙ මනො අහු.

තෙනාහ සො නිම්මිතො:

“කථං සමෙතස්ස විභොති රූපං
සුඛං දුඛං වාපි කථං විභොති,
එතං මෙ පබ්‍රෑහි යථා විනොති
තං ජානිස්සාම ඉති මෙ මනො අහූ”ති.

## 11 – 13

න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී
නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී,
එවං සමෙතස්ස විභොති රූපං
සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤීති** – සඤ්ඤසඤ්ඤිනො වුච්චන්ති යෙ පකතිසඤ්ඤාය ඨිතා, නපි සො පකතිසඤ්ඤාය ඨිතො; විසඤ්ඤසඤ්ඤිනො වුච්චන්ති උම්මත්තකා, යෙ ච ඛිත්තචිත්තා; නපි සො උම්මත්තකො, නොපි ඛිත්තචිත්තොති – න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී.

1. විභාවියාති සිමු. II. PTS. 2. අතික්කමියාති – සිමු. II. PTS.
3. අජ්ඣෙසාමි – සිමු. II 4. පජානෙය්‍යාම – ස.

**කථං සමෙතස්ස විභොති රූපං** – 'කථං සමෙතස්ස' යනු: කෙසේ යෙදුණහුට කෙසේ පිළිපන්නහුට කෙසේ ඉරියවු පවත්වන්නහුට කෙසේ වැවෙන්නහුට කෙසේ පාලනය වන්නහුට කෙසේ යැපෙන්නහුට කෙසේ යපනය වන්නහුට රූපය නො වේ ද? නො පැවැතේ ද? ඉක්මවනු ලැබේ ද? මොනොවට ඉක්මවනු ලැබේ ද? වෙසෙසින් ඉක්මවනු ලැබේ ද'යි – 'කථං සමෙතස්ස විභොති රූපං' යනු වේ.

**සුඛං දුඛං වා'පි කථං විභොති** – සුවය ද දුක ද කෙසේ නො වේ ද? නො පැවැතේ ද? ඉක්මවනු ලැබේ ද? මොනොවට ඉක්මවනු ලැබේ ද? වෙසෙසින් ඉක්මවනු ලැබේ ද'යි – 'සුඛං දුඛං වා'පි කථං විභොති' යනු වේ.

**එතං මෙ පබ්‍රූහි යථා විභොති** – 'එතං' යනු: යමක් විචාරම් ද, යමක් යදිම් ද, යමක් ආරාධනා කෙරෙම් ද, යමක් (සඳහා) පහදවම් නුසි – 'එතං' යනු වේ; **මෙ පබ්‍රූහි** – මට කිව මැනව වදාළ මැනව දෙසුව මැනව පැනවුව මැනව නැඹුව මැනව විවෘත කළ මැනව විභාග කළ මැනව ප්‍රකට කළ මැනව ප්‍රකාශ කළ මැනවැ'යි 'එතං මෙ පබ්‍රූහි, යනු වේ. **යථා විභොති** – යම් සේ නො වේ ද නො පැවැතේ ද අතික්‍රමණ සමතික්‍රමණ කරනු ලැබේ ද වෙසෙසින් ඉක්මවනු ලැබේ ද'යි – 'එතං මෙ පබ්‍රූහි යථා විභොති' යනු වේ.

**තං ජානිස්සාම ඉති මෙ මනො අහු** – 'තං ජානිස්සාම' යනු: එය දතගනුම්හ, හාත්පසින් දතගනුම්හ වෙසෙසින් දතගනුම්හ මැනවින් දතගනුම්හ (සිතින්) අවබොධ කරම්හ'යි, 'තං ජානිස්සාම' යනු වේ. **ඉති මෙ මනො අහු** – මෙසේ මා ගේ මනස විය, මෙසේ මා ගේ සිත විය, මෙසේ මාගේ සඞ්කල්පය විය, මෙසේ මාගේ විඥනය වී නුසි – 'තං ජානිස්සාම ඉති මෙ මනො අහු' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"කථං සමෙතස්ස –පෙ- ඉති මෙ මනො අහු"යි.

## 11 - 13

(රූපය නො වන සේ පිළිපන් හෙතෙම) ප්‍රකෘතිසංඥවෙන් සංඥ ඇත්තේ නො වෙයි, විකෘතිසංඥවෙන් විසංඥ වූයේ නො වෙයි, සංඥ විරහිත වූයේ ද නො වෙයි, ඉක්මවූ සංඥ ඇත්තේ ද නො වෙයි, මෙසේ (සංඥ සංඥිතාදිභාවයෙහි නො සිට) පිළිපන්නහුට රූපය නො වෙයි, තෘෂ්ණාදි ප්‍රපඤ්චයෝ සංඥනිදාන කොට ඇත්තාහු ම වෙත් ද එහෙයිනි.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී** – ප්‍රකෘතිසංඥවෙහි සිටි යම් කෙනෙක් වෙත් නම් ඔහු 'සඤ්ඤසඤ්ඤීහු' යයි කියනු ලැබෙති, යථා සමෙතයක්හු ගේ රූපය විභවයට යේ නම්) හෙතෙම ප්‍රකෘතිසංඥයෙහි සිටියේ නො ද වෙයි; උමතුවෝ ද ක්ෂිප්තචිත්තයෝ (–යක්උමතුවෝ) ද 'විසඤ්ඤසඤ්ඤීහු' යයි කියනු ලැබෙති, හෙතෙම උමතුවෙක් නො ද වෙයි, ක්ෂිප්තචිත්තයෙක් ද නො වේ නුසි – 'න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී' යනු වේ.

**නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤීති** - අසඤ්ඤිනො වුච්චන්ති නිරොධසමාපන්නා යෙ ච අසඤ්ඤසත්තා; නපි සො නිරොධසමාපන්නො, නපි අසඤ්ඤසත්තො. විභූතසඤ්ඤිනො වුච්චන්ති යෙ චතුන්නං ආරුප්පසමාපත්තීනං ලාභිනො; නපි සො චතුන්නං අරූපසමාපත්තීනං ලාභීති- නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී.

**එවං සමෙතස්ස විභොති රූපන්ති** - "ඉධ භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආකාසානඤ්චායතන සමාපත්තිපටිලාභත්ථාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති", ආරුප්පමග්ගසමඞ්ගීති. **එවං සමෙතස්සාති** එවං පටිපන්නස්ස එවං ඉරියන්තස්ස එවං වත්තන්තස්ස එවං පාලෙන්තස්ස එවං යපෙන්තස්ස එවං යාපෙන්තස්ස රූපං විභොති විභාවීයති අතික්කමීයති සමතික්කමීයති වීතිවත්තීයතීති - එවං සමෙතස්ස විභොති රූපං.

**සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛාති** - පපඤ්චායෙව පපඤ්චසඞ්ඛා; තණ්හා පපඤ්චසඞ්ඛා, දිට්ඨි පපඤ්චසඞ්ඛා, මාන පපඤ්චසඞ්ඛා; සඤ්ඤානිදානා සඤ්ඤාසමුදයා සඤ්ඤාජාතිකා සඤ්ඤාපභවාති - සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා.

තෙනාහ භගවා:

"න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී
නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී,
එවං සමෙතස්ස විභොති රූපං
සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා'ති.

## 11 - 14

යන්තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහි,
එත්තාවතග්ගං නු[1] වදන්ති හෙකෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ
උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො.

**යන්තං අපුච්ඡිම්හ අකිත්තයී නොති** - යන්තං අපුච්ඡිම්හ අයාචිම්හ අජ්ඣෙසිම්හ පසාදයිම්හ; **අකිත්තයී නොති** කිත්තිතං ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවටං විභත්තං උත්තානීකතං පකාසිතන්ති-යන්තං අපුච්ඡිම්හ අකිත්තයී නො.

---

1. නො - ස. PTS

**නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී** - නිරොධසමාපත්ති සමාපන්නයෝ ද අසංඥසත්ත්වයෝ ද 'අසඤ්ඤීහු' යයි කියනු ලැබෙති, හෙතෙම නිරොධ-සමාපන්නයෙක් නො ද වෙයි, අසංඥසත්ත්වයෙක් ද නො වේ. සතර අරූපසමාපත්තිලාභීහු 'විභූතසඤ්ඤීහු' යයි කියනු ලැබෙති, හෙතෙම සතර අරූපසමාපත්තිලාභී වූයේ ද නො වේ නුයි - 'නො'පි අසඤ්ඤී න විභූතසඤ්ඤී' යනු වේ.

**එවං සමෙතස්ස විභොති රූපං** - 'මෙහි මහණ තෙම සුඛයාගේ ද ප්‍රහාණයෙන්...සතරවැනි ධ්‍යානයට පැමිණ වෙසෙයි, හෙතෙම මෙසේ (සතරවැනි ධ්‍යානයෙන්) සිත එකඟවූ කල්හි (උපෙක්ෂා ස්මෘතිපාරිශුද්ධියෙන්) පිරිසිදු කල්හි (පරිශුද්ධ හෙයින්) ප්‍රභාස්වර කල්හි (රාගාදි අඞ්ගන නැසූ හෙයින්) අනඞ්ගන කල්හි (අනඞ්ගන හෙයින් ම) පහවූ උපක්ලේශ ඇති කල්හි (සුභාවිත හෙයින්) මෘදුවූ කල්හි (මෘදු හෙයින් ම) කර්මක්ෂම වූ කල්හි (මේ පරිශුද්ධභාවාදියෙහි සිටි හෙයින් ම) සිටින කල්හි (සිටි හෙයින් ම) අචල බවට පැමිණි කල්හි ආකාසානඤ්චායතනසමාපත්තිය ලැබීම සඳහා සිත එළවයි නතුකරයි, අරූපසමාපත්තියෙන් යුක්ත වූයේ යයි; **එවං සමෙතස්ස** - මෙසේ පිළිපන්නහුට මෙසේ ඉරියවු පවත්වන්නහුට මෙසේ වැටෙන්නහුට මෙසේ යැපෙන්නහුට මෙසේ යපනය වන්නහුට රූපය නො වෙයි, නො පැවැතෙයි, ඉක්මවනු ලැබෙයි, මනාකොට ඉක්මවනු ලැබෙයි, වෙසෙසින් ඉක්මවනු ලැබේ නුයි - 'එවං සමෙතස්ස විභොති රූපං' යනු වේ.

**සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා** - ප්‍රපඤ්චයෝ ම 'පපඤ්චසඞ්ඛා' නම් වෙති; තෘෂ්ණාව ප්‍රපඤ්චසඞ්ඛ යැ, දෘෂ්ටිය ප්‍රපඤ්චසඞ්ඛ යැ, මානය ප්‍රපඤ්චසඞ්ඛ යැ, (ඔහු) සංඥාව නිදාන කොට ඇත්තාහු සංඥාව සමුදය කොට ඇත්තාහු සංඥාව ජාති කොට ඇත්තාහු සංඥාව ප්‍රභව කොට ඇත්තාහු නුයි - 'සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**න සඤ්ඤසඤ්ඤී** -පෙ- **සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා**"යි.

## 11 - 14

යමක් විචාළමෝ නම්, එය අපට දෙශනා කළහ, අනෙකකුදු ඔබ ගෙන් විචාරම්හ, එ ද වදාළ මැනව, මේ ලොවැ පණ්ඩිතවාද ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් මේ අරූපසමාපත්තිමාත්‍රයෙන් ම සත්ත්වයා ගේ අග්‍ර වූ ශුද්ධිය කියත් ද? නොහොත් තෙල අරූපසමාපත්තියෙන් අනෙකු දු ශුද්ධියක් කියත් ද?

යං **තං අපුච්ඡිම්හ අකිත්තයී නො** - යමක් විචාළමෝ යාඥ කළමෝ අධ්‍යේෂණ කළමෝ පැහැදවූම්හු නම් එය; **අකිත්තයී නො** - කීර්තනය කරන ලද පවසන ලද දෙසන ලද පනවන ලද තබන ලද විවෘත කරන ලද විභාග කරන ලද ප්‍රකට කරන ලද ප්‍රකාශ කරන ලද නුයි-'යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො' යනු වේ

**අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහී**ති - අඤ්ඤං තං පුච්ඡාම, අඤ්ඤං තං පපුච්ඡාම, අඤ්ඤං තං අජ්ඣෙසාම, අඤ්ඤං තං පසාදෙම, උත්තරිං තං පුච්ඡාම; තදිඞ්ඝ බ්‍රූහීති ඉඞ්ඝ බ්‍රූහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති - අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහි.

**එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ**ති- එකෙ සමණබ්‍රාහ්මණා එතා අරූපසමාපත්තියො අග්ගං සෙට්ඨං විසිට්ඨං පාමොක්ඛං උත්තමං පවරං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. **යක්ඛස්සා**'ති සත්තස්ස නරස්ස මානවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[1] ජන්තුස්ස ඉන්දගුස්ස[2] මනුජස්ස; **සුද්ධින්ති** සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං; **ඉධ පණ්ඩිතා සෙ**'ති ඉධ පණ්ඩිතවාදා වීරවාදා[3] ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියා'ති- 'එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ.'

**උදහු අඤ්ඤම්පි වදන්ති එත්තො**'ති - උදහු එකෙ සමණබ්‍රාහ්මණා එතා අරූපසමාපත්තියො අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තෙත්වා, එත්තො අරූපසමාපත්තිතො අඤ්ඤං උත්තරිං යක්ඛස්ස සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති - උදහු අඤ්ඤම්පි වදන්ති එත්තො.

තෙනාහ සො නිම්මිතො:

"යන්තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහි,
එත්තාවතග්ගං නු වදන්ති හෙ'කෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ
උදහු අඤ්ඤම්පි වදන්ති එත්තො"ති.

**11 - 15**

එත්තාවතග්ගම්පි වදන්ති හෙ'කෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ,
තෙසං පනෙකෙ සමයං වදන්ති
අනුපාදිසෙසෙ කුසලාවදනා.

**එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ**ති- සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා එතා අරූපසමාපත්තියො අග්ගං සෙට්ඨං විසිට්ඨං පාමොක්ඛං උත්තමං පවරං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; **යක්ඛස්සා**'ති සත්තස්ස නරස්ස මානවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[1] ජන්තුස්ස ඉන්දගුස්ස[2] මනුජස්ස; **සුද්ධින්ති** සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං; **ඉධ පණ්ඩිතා සෙ**'ති ඉධ පණ්ඩිතවාදා වීරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියා'ති - එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ

1. ජන්තුස්ස - සීමු. II. ජගුස්ස - PTS 2. සින්දගුස්ස - පු
ධීරවාදා - ස්‍යා. - PTS.

**අඤ්ඤම්පි තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි** - අනෙකක් ඔබ විචාරම්හ, අනෙකක් ඔබ පුළුවුසුම්හ, අනෙකක් ඔබ අතිශයින් විචාරම්හ, අනෙකක් ඔබ අධ්‍යෙෂණ කරම්හ, අනෙකකට ඔබ පහදවම්හ, මත්තෙහි ඔබ විචාරම්හ; **තදිඞ්ඝ බ්‍රෑහි**- වතුල මැනව, ප්‍රකාශ කල මැනව, දෙසුව මැනව, පැනවුව මැනව, තැබුව මැනව, විවෘත කල මැනව, විභාග කල මැනව, ප්‍රකට කල මැනව, ප්‍රකාශ කල මැනවැයි - 'අඤ්ඤම්පි තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි' යනු වේ.

**එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ** - ඇතැම් මහණබමුණු කෙනෙක් මෙතෙක් අරූපසමාපත්තීහු අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. **යක්ඛස්ස** - සත්ත්වයාගේ; නර-මාතව - පුරුෂ - පුද්ගල - ජීව - ජාගු - ජන්තු - ඉන්දගු - මනුජයාගේ; **සුද්ධිං** - ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය; **ඉධ පණ්ඩිතා සෙ** - මෙ ලොවැ සවකීය ලබ්ධියෙහි (ඇපි පණ්ඩිතයම්හ'යි) පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද - න්‍යායවාද - හෙතුවාද - ලක්ෂණවාද- කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි - 'එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ' යනු වේ.

**උදාහු අඤ්ඤම්පි වදන්ති එතෙතා** - නොහොත් ඇතැම් මහණබමුණු කෙනෙක් මෙතෙ අරූසමවත් ඉක්මවා මැනවින් ඉක්මවා පසු කොට, මෙතෙ අරූපසමාපත්තියෙන් අන්‍ය වූ මත්තෙහි යක්ෂ (-සත්ත්ව)යාගේ ශුද්ධියක් විශුද්ධියක් පරිශුද්ධියක් මුක්තියක් විමුක්තියක් පරිමුක්තියක් පවසත් ද බෙණෙත් ද, දක්වත් ද, ව්‍යවහාර කෙරෙත් දැයි - 'උදාහු අඤ්ඤම්පි වදන්ති එතෙතා' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"යන්තං අපුච්ඡිම්හ -පෙ- උදාහු අඤ්ඤම්පි වදන්ති එතෙතා"යි

**11 - 15**

මෙ ලොවැ පණ්ඩිතමානී වූ (ශාශ්වතවාදී) ඇතැම් මහණබමුණු කෙනෙක් මේ අරූපසමාපත්තිමාත්‍රයෙනු ද සත්ත්වයාගේ අග්‍ර වූ ශුද්ධිය කියත් මැයි. යළි ඔවුනතුරෙහි (උච්ඡේදවාදී) ඇතැම් මහණබමුණු කෙනෙක් අනුපාදිශෙෂයෙහි පණ්ඩිතවාද ඇත්තාහු උච්ඡේදය (ශුද්ධියයි) කියත්.

**එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ**- ශාශ්වතවාදය පවසන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. (ඔහු) මේ අරූපසමාපත්තීන් අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. **යක්ඛස්ස**- සත්ත්වයාගේ නර - මාතව - පුරුෂ - පුද්ගල - ජීව - ජාගු - ජන්තු - ඉන්දගු මනුජයාගේ; **සුද්ධිං** - විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය; **ඉධ පණ්ඩිතා සෙ** - මෙ ලොවැ සවකීය දෘෂ්ටියෙහි පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද - න්‍යායවාද - හෙතුවාද - ලක්ෂණවාද - කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි - 'එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ 'යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ' යනු වේ.

**තෙසං පනෙකෙ සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානා'ති**- තෙසංයෙව සමණබ්‍රාහ්මණානං එකෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා භවතජ්ජිතා විභවං අභිනන්දන්ති, තෙ සත්තස්ස සමං උපසමං වූපසමං නිරොධං පටිප්පස්සද්ධින්ති වදන්ති. යතො කිං හො අයං අත්තා කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා, එත්තාවතා අනුපාදිසෙසො හොති. **කුසලාවදානා'ති** කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියා'ති - 'තෙසං පනෙකෙ-සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානා.

තෙනාහ භගවා:

"එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ,
තෙසං පනෙකෙ සමයං වදන්ති
අනුපාදිසෙසෙ කුසලාවදානා"ති.

**11 - 16**

එතෙ ච ඤත්වා උපනිස්සිතා'ති
ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී,
ඤත්වා විමුත්තො න විවාදමෙති[1]
භවාභවාය න සමෙති ධීරො.

**එතෙ ච ඤත්වා උපනිස්සිතා'ති** - 'එතෙ'ති දිට්ඨිගතිකෙ; **උපනිස්සිතා'ති** සස්සතදිට්ඨිනිස්සිතා'ති ඤත්වා, උච්ඡෙදදිට්ඨිනිස්සිතා'ති ඤත්වා, සස්සතුච්ඡෙද-දිට්ඨිනිස්සිතා'ති ඤත්වා, ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා'ති - එතෙ ච ඤත්වා උපනිස්සිතා"ති.

**ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී'ති** - 'මුනී'ති මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; මුනි සස්සතදිට්ඨිනිස්සිතා'ති ඤත්වා, උච්ඡෙදදිට්ඨිනිස්සිතා'ති ඤත්වා, සස්සතුච්ඡෙදදිට්ඨිනිස්සිතා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **සො විමංසී'ති** පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී'ති - ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී.

---

1. නපි වාදමෙති - කත්ථචි.

**තෙසං පනෙ'කෙ සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානා**– ඒ මහණබමුණන් අතුරෙන් උච්ඡේදවාද ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් භවයෙන් නැති ගැනුණාහු විභව (–උච්ඡේද) යට සතුටු වෙති, ඔහු සත්ත්වයා ගේ නො පැවැත්ම උපශමය ශාන්තිය අනුත්පාදය අපුනරුත්පත්තිය වේ යයි කියත්. භවත්ති, යම් හෙයකින් මේ ආත්මය කය බිඳීමෙන් මරණින් මතු සිඳීයේ ද වැනැසේ ද නො වේ ද, මෙතෙකින් අනුපාදිශෙෂය වේ. **කුසලාවදානා** – ස්වකීය ලබ්ධියෙහි කුසලවාද ඇත්තාහු පණ්ඩිතවාද – ස්ථිරවාද – න්‍යායවාද – හෙතුවාද – ලක්ෂණවාද– කාරණවාද – ස්ථානවාද ඇත්තාහු නුයි – 'තෙසං පනෙකෙ සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එත්තාවතග්ගම්පි -පෙ- අනුපාදිසෙසෙ කුසලාවදානා"යි

**11 – 16**

තවද තෙල දෘෂ්ටිගතිකයන් (මොහු ශාශ්වතොච්ඡේද) 'දෘෂ්ටි ඇසුරු කළාහු යැ'යි දැන, තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රයන් දැන, ඒ පණ්ඩිත වූ බුද්ධිමුනි තෙම (දුඃඛාතිත්‍යාදි විසින්) ධර්මයන් දැන (අනුපාදවිමොඃක්ෂයෙන්) මිදුණේ විරුද්ධවාදයට නො පැමිණෙයි, ඒ ධීර තෙම පුනපුනා භවයට ද නො පැමිණේ.

**එතෙ ච ඤත්වා උපනිස්සිතාති** – 'එතෙ' යනු: දෘෂ්ටිගතිකයන්; **උපනිස්සිතාති** – ශාශ්වතදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, උච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, ශාශ්වතොච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, දැනගෙන තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට නුයි – 'එතෙ ච ඤත්වා උපනිස්සිතාති' යනු වේ.

**ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී** – 'මුනි' යනු: 'මොන'යි ඥානය කියනු ලැබෙයි... මුනි තෙම (ඔවුන්) ශාශ්වතදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, උච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන ශාශ්වතොච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවිත කොට: විභූත කොට, **සො විමංසී**–පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැත්තේ විභාවී වූයේ මෙධාවී වූයේ නුයි – 'ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී' යනු වේ.

**ඤත්වා විමුත්තො න විවාදමෙතීති** – ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, විමුත්තො'ති මුත්තො විමුත්තො සුවිමුත්තො පරිමුත්තො අච්චන්තඅනුපාදාවිමොක්ඛෙන, "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා"ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මුත්තො විමුත්තො සුවිමුත්තො පරිමුත්තො අච්චන්තඅනුපාදාවිමොක්ඛෙන, "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති –පෙ– "සබ්බෙ ධම්මා අනත්තා"ති –පෙ– "යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්ම"න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, මුත්තො විමුත්තො සුවිමුත්තො පරිමුත්තො අච්චන්තඅනුපාදාවිමොක්ඛෙනාති – ඤත්වා විමුත්තො; **න විවාදමෙතී'ති** – න කලහං කරොති, න භණ්ඩනං කරොති, න විග්ගහං කරොති, න විවාදං කරොති, න මෙධගං කරොති. වුත්තං හෙතං භගවතා: "එවං විමුත්තචිත්තො ඛො අග්ගිවෙස්සන, භික්ඛු න කෙනචි සංවදති. න කෙනචි විවදති, යඤ්ච ලොකෙ වුත්තං, තෙන ච වොහරති අපරාමස"න්ති[a] – ඤත්වා විමුත්තො න විවාදමෙති.

**භවාභවාය න සමෙති ධීරො'ති** – "භවාභවායා"ති භවාභවාය[1] කම්මභවාය පුනබ්භවාය කාමභවාය; කම්මභවාය කාමභවාය පුනබ්භවාය; රූපභවාය කම්මභවාය රූපභවාය පුනබ්භවාය; අරූපභවාය කම්මභවාය අරූපභවාය පුනබ්භවාය; පුනප්පුන භවාය; පුනප්පුන ගතියා පුනප්පුන උපපත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා න සමෙති න සමාගච්ඡති න ගණ්හාති න පරාමසති නාභිනිවිසති. ධීරො'ති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී'ති – භවාභවාය න සමෙති ධීරො.

තෙනාහ භගවා:

"එතෙ ච ඤත්වා උපනිස්සිතාති
ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී,
ඤත්වා විමුත්තො න විවාදමෙති
භවාභවාය න සමෙති ධීරො"ති.

**කලහවිවාදසුත්තනිද්දෙසො සමත්තො**

**එකාදසමො.**

# 12

# චූලවියූහසුත්තනිද්දෙසො

අථ චූලවියූහසුත්තනිද්දෙසො වුච්චති:

**12 – 1**

සකං සකං දිට්ඨිපරිබ්බසානා
විග්ගය්හ නානා[2] කුසලා වදන්ති,
එවං පජානාති[3] ස වෙදි[4] ධම්මං
ඉදං පටික්කොසමකෙවලී සො.

1. භවාය - සීමු II. a. මජ්ඣිමනිකාය - දීඝනඛසුත්ත.
2. වාදා - කත්ථචි. 3. යො එවං ජානාති - සභා. මජ්ඣං. 4. පවෙදී - කත්ථචි.

**ඤත්වා විමුත්තො න විවාදමෙති** – දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට; **විමුත්තො** – අත්‍යන්ත වූ අනුපාදවිමොක්ෂයෙන් මිදුණේ මැනවින් මිදුණේ වෙසෙසින් මිදුණේ හාත්පසින් මිදුණේ 'සර්වසංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට අත්‍යන්ත අනුපාදවිමොක්ෂයෙන් මුක්ත විමුක්ත සුවිමුක්ත පරිමුක්ත වූයේ, 'සර්ව-සංස්කාරයෝ දුඃඛයෝ යැ'යි.... 'සර්වධර්මයෝ අනාත්මයෝයැ'යි...'යම් කිසි සමුදයධර්මයෙක් වේ නම්, ඒ සියල්ල නැසෙනසුලු යැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට අත්‍යන්තඅනුපාදවිමොක්ෂයෙන් මුක්ත විමුක්ත සුවිමුක්ත පරිමුක්ත වූයේ නුයි – 'ඤත්වා විමුත්තො' යනු වේ; **න විවාදමෙති** – කලහ නො කෙරෙයි, ඩබර නො කෙරෙයි, විග්‍රහ නො කෙරෙයි, විරුද්ධවාද නො කෙරෙයි, කොලාහල නො කෙරෙයි; මේ වදාරන ලද මැයැ, භාග්‍යවතුන් විසින්: 'ගිහිවෙස්න, මෙසේ මිදුණු සිත් ඇති මහණ තෙම කිසිවක්හු සමග සංවාද නො කෙරෙයි, කිසිවක්හු සමග විවාද නො කෙරෙයි, ලොවැ යමකුත් කියන ලද නම්, දැඩිව නො ගනිමින් එයින් ව්‍යවහාර කෙරේ යැ''යි.– 'ඤත්වා විමුත්තො න විවාදමෙති' යනු වේ.

**භවාභවාය න සමෙති ධීරො** – 'භවාභවාය' යනු: කාමභවයෙහි හා රූපාරූපභවයෙහි කර්මවෘත්තයට, (පුනර්භවික වූ) විපාකවෘත්තයට, කාම-ධාතුයෙහි කර්මවෘත්තයට, කාමධාතුයෙහි විපාකවෘත්තයට, රූපධාතුයෙහි කර්මවෘත්තයට, රූපධාතුයෙහි විපාකවෘත්තයට, අරූපධාතුයෙහි කර්මවෘත්තයට අරූපධාතුයෙහි විපාකවෘත්තයට, පුනපුනා භවයට පුනපුනා ගතියට පුනපුනා උපතට පුනපුනා පිළිසඳට පුනපුනා අත්බැවට නැවත නැවත පහළ වීමට නො එයි, නො පැමිණෙයි, නො ගනී, නො පරාමර්ශ කෙරෙයි, නො පිවිසේ; ධීරො– ධීර වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැත්තේ විභාවී මෙධාවී නුයි – 'භවාභවාය න සමෙති ධීරො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එතෙ ච ඤත්වා -පෙ- භවාභවාය න සමෙති ධීරො"යි

එකොළොස් වැනි කලහවිවාද සූත්‍රනිර්දේශය යි.

## 12

## චූලවියූහ සූත්‍රනිර්දේශය

ඉක්බිති 'චූලවියූහ' සූත්‍රනිර්දේශය කියනු ලැබේ:

### 12 – 1

තමතමාගේ දෘෂ්ටියෙහි වෙසෙන්නාහු (ඒ දෘෂ්ටිය) දෘෂ්ටිග්‍රාහයෙන් ගෙන (ඇපි එහි) දක්ෂයම්හ'යි වෙන වෙනම කියති. (යමෙක්) මෙසේ දනී නම්, හෙතෙම දහම් දැනගත්තේ ය, මෙය ගරහන්නාවූ (යමෙක් වේ නම් හෙතෙම) ලාමක වන්නේ යයි ද (කියත්.)

**සකං සකං දිට්ඨිපරිබ්බසානා**'ති – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා; තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්ති. යථා අගාරිකා වා[1] ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තීසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති. එවමෙවං සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා, තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්තීති – සකං සකං දිට්ඨිපරිබ්බසානා.

**විග්ගය්හ නානා කුසලා වදන්තී**'ති – 'විග්ගය්හා'ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා, නානා වදන්ති විවිධං වදන්ති අඤ්ඤමඤ්ඤං[2] වදන්ති පුථු[3] වදන්ති න එකං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. **කුසලා**'ති කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති – විග්ගය්හ නානා කුසලා වදන්ති.

**එවං පජානාති ස වෙදි ධම්ම**න්ති – යො ඉදං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං ජානාති, සො ධම්මං වෙදි, අඤ්ඤාසි, අපස්සි, පටිවිජ්ඣීති[4] – එවං පජානාති ස වෙදි ධම්මං.

**ඉදං පටික්කොසමකෙවලී සො**ති – යො ඉමං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං පටික්කොසති, අකෙවලී සො අසමත්තො සො අපරිපුණ්ණො සො, හීනො නිහීනො ඔමකො ලාමකො ජතුක්කො[5] පරිත්තොති.

තෙනාහ සො නිම්මිතො:

"සකං සකං දිට්ඨි පරිබ්බසානා
විග්ගය්හ නානා කුසලා වදන්ති,
එවං පජානාති ස වෙදි ධම්මං
ඉදං පටික්කොසමකෙවලී සො"ති.

**12 – 2**

එවම්පි විග්ගය්හ විවාදයන්ති
බාලො පරො අක්කුසලො'ති[1] චාහු,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හී'මෙ කුසලාවදානා.

**එවම්පි විග්ගය්හ විවාදයන්තී**ති – එවං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති, විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති; 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි –පෙ– නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'[a]ති – එවම්පි විග්ගය්හ විවාදයන්ති.

---

1. අගාරිකා - සීමු. II. 2 අඤ්ඤමඤ්ඤං - ස. 3. පුථුං - සීමු. II.
4. පටිවිජ්ඣතීති - සීමු. II. 5. ජතුක්කො - සීමු. II ඡතුක්කො - මජසං.
a දීඝනිකාය - බ්‍රහ්මජාල, සාමඤ්ඤඵල, අම්බට්ඨ, සඞ්ගීතිසුත්ත.

**සකං සකං දිට්ඨි පරිබ්බසානා** - දෘෂ්ටිගතික වූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති, ඔහු දෙසැට දිටු අතුරෙන් අන්‍යතරාන්‍යතර දෘෂ්ටියක් ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට පිවිසැගෙන තමතමාගේ දෘෂ්ටියෙහි වෙසෙති මොනොවට වෙසෙති පිවිසැ වෙසෙති හාත්පසින් වෙසෙත්; ගෘහිමියෝ හෝ සිය ගෙවල යම් සේ වෙසෙත් ද, ඇවැත් බහුලයෝ හෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ හෝ කෙලෙස්හි වෙසෙත් ද, එසෙයින් ම දෘෂ්ටිගතික වූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති, ඔහු දෙසැට දිටු අතුරෙන් අන්‍යතරාන්‍යතර දෘෂ්ටියක් ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවෙශ කොට තමතමාගේ දෘෂ්ටියෙහි වෙසෙති පිවිසැ වෙසෙති වෙසෙසින් වෙසෙති හාත්පසින් වෙසෙත් නුයි 'සකං සකං දිට්ඨිපරිබ්බසානා' යනු වේ.

**විග්ගය්හ නානා කුසලා වදන්ති** - 'විග්ගය්හ' යනු: ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන; **නානා වදන්ති** - විවිධ ව කියති, එකිනෙක කියති, වෙන වෙන ම කියති, එකක් නො කියති, නො බෙණෙති නො දක්වති, ව්‍යවහාර නො කෙරෙත්; **කුසලා** -ස්වකීය ලබ්ධියෙහි කුසලවාද ඇත්තාහු පණ්ඩිතවාද - ස්ථිරවාද - න්‍යායවාද - හේතුවාද- ලක්ෂණවාද - කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි 'විග්ගය්හ නානා කුසලා වදන්ති' යනු වේ.

**එවං පජානාති ස වෙදි ධම්මං** - යමෙක් මේ දහම දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය දනී නම්, හෙතෙම ධර්මය දත්තේ ය, දුනගත්තේ ය, දක්කේ ය, අවබොධ කෙළේ නුයි 'එවං පජානාති ස වෙදි ධම්මං' යනු වේ.

**ඉදං පටික්කොසමකෙවලී සො** - යමෙක් මේ දහම දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය ගරහා ද; **අකෙවලී සො** - හේ අසම්පූර්ණ යැ, හේ අපරිපූර්ණ යැ, හීන යැ අවමත යැ අප්‍රධාන යැ අල්පවූයේ නුයි 'ඉදං පටික්කොසම-කෙවලී සො' යනු වේ.

එයින් කීහ ඒ මැවුණු බුදුහු:

"සකං සකං දිට්ඨි -පෙ- ඉදං පටික්කොසමකෙවලී සො"යි.

## 12 - 2

මෙසේ (ස්වකීය ලබ්ධිය) දැඩිව ගෙන විවාද කෙරෙති, මෙරමා බාල යැයි ද අදක්ෂ යැයි ද කියති, මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වූයේ ද? මේ සියලු මැ මහණබමුණෝ පණ්ඩිතවාද ඇත්තාහු ද?

**එවම්පි විග්ගය්හ විවාදයන්ති** - මෙසේ ගෙන වෙසෙසින් ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන විරුද්ධවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විවාද කෙරෙති, මෙධග කෙරෙත්: 'තෙපි මේ ධර්මවිනය නො දත්තවුය,...ඉදින් පොහොසත්හු නම්, (තෙමෙ මැ) මුදාලව'යි 'එවම්පි විග්ගය්හ විවාදයන්ති' යනු වේ.

**බාලො පරො අක්කුසලොති[1] චාහූති** – පරො බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තො අකුසලො අවිද්වා අවිජ්ජාගතො අඤ්ඤාණී අවිභාවී දුප්පඤ්ඤොති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – බාලො පරො අක්කුසලො'ති චාහු.

**සච්චො නු වාදො කතමො ඉමෙසන්ති** – ඉමෙසං සමණබ්‍රාහ්මණානං කතමො සච්චො තච්ඡො තථො භූතො යාථාවො[2] අවිපරීතොති – සච්චො නු වාදො කතමො ඉමෙසං.

**සබ්බෙව හි'මෙ කුසලාවදානාති** – සබ්බෙපි ඉමෙ සමණබ්‍රාහ්මණා කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති – සබ්බෙව හි'මෙ කුසලාවදානා.

තෙනාහ භගවා:

"එවම්පි විග්ගය්හ විවාදයන්ති
බාලො පරො අක්කුසලො'ති චාහු,
සච්චො නු වාදො කතමො ඉමෙසං?
සබ්බෙව හිමෙ කුසලාවදානා"ති.

## 12 - 8

පරස්ස චෙ ධම්මමනානුජානං[3]
බාලො මගො[4] හොති නිහීනපඤ්ඤො,
සබ්බෙව[5] බාලා සුනිහීනපඤ්ඤා[6]
සබ්බෙ විමෙ දිට්ඨිපරිබ්බසානා.

**පරස්ස චෙ ධම්මමනානුජානන්ති** – පරස්ස ධම්මං පටිපදං මග්ගං අනනු[7] ජානන්තො අනනුපස්සන්තො අනනුමනන්තො අනනුමඤ්ඤන්තො අනනුමොදන්තොති – පරස්ස චෙ ධම්මමනානුජානං.

**බාලො මගො හොති නිහීනපඤ්ඤො'ති** – පරො බාලො හොති, හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තො හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ඡතුක්කපඤ්ඤො පරිත්තපඤ්ඤො'ති – බාලො මගො හොති නිහීනපඤ්ඤො.

**සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤාති** – සබ්බෙවිමෙ සමණබ්‍රාහ්මණා බාලා හීනා නිහීනා ඔමකා ලාමකා ඡතුක්කා පරිත්තා, සබ්බෙව හීනපඤ්ඤා නිහීනපඤ්ඤා ඔමකපඤ්ඤා ලාමකපඤ්ඤා ඡතුක්කපඤ්ඤා[8] පරිත්තපඤ්ඤා'ති – සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා.

---

1 අකුසලොති – සහ. සු. ස  2. යථාවො – ස  3. මනනුජානං – මනුප.
4. බාලොමකො – මනුප. මජසං. PTS.  5 සබ්බෙපි මෙ – ස
6. නිහීනපඤ්ඤා – මනුප.  7. අනානු – මජසං. සබ්බපදෙසු.
8. ජතුක්කපඤ්ඤා – සීමු. II.

**බාලො පරො අක්කුසලො'ති චාහු** - මෙරමා බාල යැ හීන යැ නිහීන යැ අවමත යැ ලාමක යැ අහේතුක යැ අල්ප යැ අදක්‍ෂ යැ අපණ්ඩිත යැ අවිඥුවට පැමිණියේ යැ අඥාන යැ අවිමංසක යැ දුෂ්ප්‍රාඥ යැයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'බාලො පරො අක්කුසලොති චාහු' යනු වේ.

**සච්චො නු වාදො කතමො ඉමෙසං** - මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය ද ? තො සිස් ද ? අවිපරීත ද ? විද්‍යමාන ද ? යථා ස්වභාව ද ? විපරීත නො වේ ද ? යි 'සච්චො නු වාදො කතමො ඉමෙසං' යනු වේ.

**සබ්බෙව හිමෙ කුසලාවදානා** - මේ සියලු මැ මහණබමුණෝ ස්වලබ්ධියෙහි කුශලවාද ඇත්තෝ යැ පණ්ඩිතවාද - ස්ථිරවාද - න්‍යායවාද- හේතුවාද - ලක්‍ෂණවාද - කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි 'සබ්බෙව හි'මෙ කුසලාවදානා' යනු වේ.

එයින් කීහ ඒ මැවූණු බුදුහු:

"එවම්පි විගය්හ -පෙ- සබ්බෙව හිමෙ කුසලාවදානා"යි.

## 12 - 8

ඉදින් මෙරමාගේ දෘෂ්ටිය අනුඥ නො කරනුයේ බාලයෙක් මෘග (සදෘශ) යෙක් ලාමක ප්‍රඥ ඇතියෙක් වේ නම්, (එකල්හි) සියලු මැ මහණබමුණෝ බාලයෝ වෙති අතිශයින් නිහීනප්‍රඥ ඇතියෝ වෙත්, මේ සියලු මැ මහණ බමුණෝ තමතමාගේ දෘෂ්ටියෙහි වසත්තාහු ද, එහෙයිනි.

**පරස්ස චෙ ධම්මමනානුජානං** - අන්‍යයාගේ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය නො දන්නේ නො දක්නේ අනුඥ නො කරනුයේ නො පිළිගන්නේ නො අනුමෝදන් වනුයේ නුයි 'පරස්ස චෙ ධම්මමනානුජානං' යනු වේ.

**බාලො මගො හොති නිහීනපඤ්ඤො** - මෙරමා අපණ්ඩිත වූයේ වෙයි, හීන වූයේ නිහීන - ඔමක - ලාමක - ජතුක්ක - පරිත්ත වූයේ හීනප්‍රඥ ඇත්තේ නිහීනප්‍රඥ ඇත්තේ අවමතප්‍රඥ ඇත්තේ ලාමකප්‍රඥ ඇත්තේ ජතුක්කප්‍රඥ ඇත්තේ පරිත්තප්‍රඥ ඇත්තේ නුයි 'බාලො මගො හොති නිහීනපඤ්ඤො' යනු වේ.

**සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා** - මේ සියලු මැ මහණබමුණෝ බාලයෝ යැ හීනයෝ යැ නිහීනයෝ යැ අවමතයෝ යැ ලාමකයෝ යැ අහේතුකයෝ යැ අල්පයෝ යැ සියල්ලෝ මැ හීනප්‍රඥ ඇත්තෝ යැ අවමත ප්‍රඥ ඇත්තෝ යැ ලාමකප්‍රඥ ඇත්තෝ යැ ජතුක්කප්‍රඥ ඇත්තෝ යැ අල්ප වූ ප්‍රඥ ඇත්තාහු නුයි 'සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා' යනු වේ.

**සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා**’ති – සබ්බෙවිමෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා. තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා, සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්ති. යථා අගාරිකා වා ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තීසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති, එවමෙවං සබ්බෙවිමෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා –පෙ– පරිවසන්තීති – සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා.

තෙනාහ භගවා:

“පරස්ස චෙ ධම්මමනානුජානං
බාලො මගො හොති නිහීනපඤ්ඤො,
සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා
සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා”ති.

**12 - 4**

සන්දිට්ඨියා චෙව න වෙවදාතා[1]
සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා,
තෙසං න කොචි පරිහීනපඤ්ඤො
දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා.

**සන්දිට්ඨියා චෙව න වෙවදාතා**’ති – සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා, න වෙවදාතා අවොදාතා අපරියොදාතා සඞ්කිලෙසිකාති – සන්දිට්ඨියා චෙව න වෙවදාතා.

**සංසුද්ධපඤ්ඤා කුසලා මුතිමාති** – “සංසුද්ධපඤ්ඤා”ති සුද්ධපඤ්ඤා පරිසුද්ධපඤ්ඤා ඔදාතපඤ්ඤා පරියොදාතපඤ්ඤා; අථවා, සුද්ධදස්සනා විසුද්ධදස්සනා පරිසුද්ධදස්සනා වොදාතදස්සනා පරියොදාතදස්සනා’ති – සංසුද්ධපඤ්ඤා; ‘**කුසලා**’ති කුසලා පණ්ඩිතා පඤ්ඤවන්තො බුද්ධිමන්තො ඤාණිනො විභාවිනො මෙධාවිනොති සංසුද්ධපඤ්ඤා කුසලා; ‘**මුතිමා**’ති මුතිමා පණ්ඩිතා පඤ්ඤවන්තො බුද්ධිමන්තො ඤාණිනො විභාවිනො මෙධාවිනොති – සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා.

**තෙසං න කොචි පරිහීනපඤ්ඤො**ති – තෙසං සමණබ්‍රාහ්මණානං න කොචි හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ඡත්තකපඤ්ඤො[2] පරිත්තපඤ්ඤො, අත්ථි, සබ්බෙව සෙට්ඨපඤ්ඤා විසිට්ඨපඤ්ඤා පාමොක්ඛපඤ්ඤා උත්තමපඤ්ඤා පවරපඤ්ඤාති – තෙසං න කොචි පරිහීනපඤ්ඤො.

**දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා**ති – තෙසං සමණබ්‍රාහ්මණානං දිට්ඨී තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති – දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා.

තෙනාහ භගවා:

“සන්දිට්ඨියා චෙව න වෙවදාතා
සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමං,
තෙසං න කොචි පරිහීනපඤ්ඤො
දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා”ති.

1. සන්දිට්ඨියා චෙ පන වෙවදාතා - සු. සන්දිට්ඨියා චෙ න වෙවදාතා - පු.
සන්දිට්ඨී යා චෙ පන විවදාතා - PTS.
2. ජතුක්කපඤ්ඤො - සීමු. II.

**සබ්බෙව දිට්ඨිපරිබ්බසානා** - මේ සියලු මැ මහණබමුණෝ දෘෂ්ටිගතිකයෝ යැ, ඔහු දෙසැට දිටු අතුරෙන් අන්‍යතරාන්‍යතර දෘෂ්ටියක් ගෙන වෙසෙසින් ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාංගන ස්වකීය ස්වකීය දෘෂ්ටියෙහි වෙසෙති, මොනවට වෙසෙති, පැමිණ වෙසෙති, හාත්පසින් වෙසෙත්; ගෙහිමියෝ හෝ සිය ගෙවල යම් සේ වෙසෙත් ද, ඇවැත් බහුලයෝ හෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ හෝ කෙලෙස්හි වෙසෙත් ද, එසෙසින් මේ සියලු මැ මහණබමුණෝ දෘෂ්ටිගතිකයෝ යැ... හාත්පසින් වෙසෙත් නුයි 'සබ්බෙව දිට්ඨිපරිබ්බසානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පරස්ස චෙ ධම්මමනානුජානං -පෙ- සබ්බෙව දිට්ඨිපරිබ්බසානා"යි

## 12 - 4

ඉදින් ස්වකීය දෘෂ්ටියෙන් පිරිසුදු නො වූවාහු සංශුද්ධප්‍රඥ ඇත්තාහු දක්‍ෂ වූවාහු බුද්ධිමත් වූවාහු වෙත් නම්, ඒ මහණබමුණන් අතුරෙන් කිසිවෙක් පිරිහුණු නුවණැතියේ නො වෙයි, යම් හෙයකින් දෘෂ්ටිය ඔවුන් විසිනු ද එසේ සමාදන් වූවාහු ද එහෙයිනි.

**සන්දිට්ඨියා චෙව න වීවදාතා** - ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය ක්‍ෂාන්තියෙහි ස්වකීය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි නො බබලන්නාහු අපරිශුද්ධ වූවාහු ප්‍රභාස්වර නො වූවාහු සංක්ලිෂ්ට වූවාහු සංකෙලශික වූවාහු නුයි 'සන්දිට්ඨියා චෙව න වීවදාතා' යනු වේ.

**සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා** - 'සංසුද්ධපඤ්ඤා' යනු: ශුද්ධප්‍රඥ ඇත්තාහු පරිශුද්ධප්‍රඥ ඇත්තාහු අවදාතප්‍රඥ ඇත්තාහු හාත්පසින් බබලන ප්‍රඥ ඇත්තාහු, නොහොත් ශුද්ධදර්‍ශන ඇත්තාහු විශුද්ධදර්‍ශන ඇත්තාහු පරිශුද්ධදර්‍ශන ඇත්තාහු ව්‍යවදාතදර්‍ශන ඇත්තාහු පර්‍ය්‍යවදාතදර්‍ශන ඇත්තාහු නුයි 'සංසුද්ධපඤ්ඤා' යනු වේ. **කුසලා** - දක්‍ෂ වූවාහු පණ්ඩිත වූවාහු ප්‍රඥාවත් වූවාහු බුද්ධිමත් වූවාහු ඥානවත් වූවාහු විමංසනප්‍රඥ ඇත්තාහු තීරණප්‍රඥ ඇත්තාහු නුයි 'සංසුද්ධපඤ්ඤා කුසලා' යනු වේ. **මුතීමා**- සමාතිමත් වූවාහු පණ්ඩිත - ප්‍රඥාවත් - බුද්ධිමත් - ඥානවත් - විමංසන-ප්‍රඥාවත් වූවාහු නුයි 'සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා' යනු වේ.

**තෙසං න කොචි පරිහීනපඤ්ඤෝ** - ඒ මහණබමුණන් අතුරෙන් හීනප්‍රඥ ඇති නිහීනප්‍රඥ ඇති පහත් වූ ප්‍රඥ ඇති ලාමක වූ ප්‍රඥ ඇති ඡත්තකප්‍රඥ ඇති අල්ප වූ ප්‍රඥ ඇති කිසිවෙක් නැති, සියල්ලෝ මැ ශ්‍රෙෂ්ඨප්‍රඥ ඇත්තාහු විශිෂ්ටප්‍රඥ ඇත්තාහු ප්‍රමුඛප්‍රඥ ඇත්තාහු උත්තම ප්‍රඥ ඇත්තාහු ප්‍රවරප්‍රඥ ඇත්තාහු නුයි 'තෙසං න කොචි පරිහීනපඤ්ඤෝ' යනු වේ.

**දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා** - ඒ මහණබමුණන් විසින් දෘෂ්ටිය එපරිද්දෙන් සපුරන ලද්දී මොනවට ගන්නා ලද්දී ග්‍රහණය කරන ලද්දී පරාමර්‍ශ කොට ගන්නා ලද්දී අභිනිවෙශ කරන ලද්දී පිවිස ගන්නා ලද්දී බැසගන්නා ලද්දී නුයි 'දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සන්දිට්ඨියා චෙව -පෙ- දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා"යි

## 12 - 5

න වාහමේතං[1] තථියන්ති[2] බ්‍රෑමි
යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං,
සකං සකං දිට්ඨිමකංසු සච්චං
තස්මා හි බාලෝති පරං දහන්ති.

**න වාහමේතං තථියන්ති බ්‍රෑමීති** - ‘නා’ති පටික්ඛේපෝ; ‘ඒතං’ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; නාහං ඒතං තච්ඡං තථං භූතං යාථාවං[3] අවිපරීතන්ති බ්‍රෑමි, ආචික්ඛාමි, දේසේමි, පඤ්ඤපේමි, පට්ඨපේමි, විවරාමි, විභජාමි, උත්තානීකරෝමි, පකාසේමීති - න වාහමේතං තථියන්ති බ්‍රෑමි.

**යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤන්ති** - ‘මිථූ’ති ද්වේ ජනා, ද්වේ කලහකාරකා, ද්වේ භණ්ඩනකාරකා, ද්වේ භස්සකාරකා, ද්වේ විවාදකාරකා, ද්වේ අධිකරණකාරකා, ද්වේ වාදිනෝ, ද්වේ සල්ලාපකා; තේ අඤ්ඤමඤ්ඤං බාලතෝ හීනතෝ නිහීනතෝ ඕමකතෝ ලාමකතෝ ඡතුක්කතෝ පරිත්තතෝ ඒවමාහංසු, ඒවං කථෙන්ති, ඒවං භණන්ති, ඒවං වෝහරන්තීති - යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං.

**සකං සකං දිට්ඨිමකංසු සච්චන්ති** - සස්සතෝ ලෝකෝ ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති සකං සකං දිට්ඨිමකංසු සච්චං. අසස්සතෝ ලෝකෝ ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති -පෙ- නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා, ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති - සකං සකං දිට්ඨිමකංසු සච්චං.

**තස්මා හි බාලෝති පරං දහන්තීති** - ‘තස්මා’ති තස්මා තංකාරණා තංහේතු තප්පච්චයා තන්නිදානා; පරං බාලතෝ හීනතෝ නිහීනතෝ ඕමකතෝ ලාමකතෝ ඡතුක්කතෝ පරිත්තතෝ; දහන්ති, පස්සන්ති, දක්ඛන්ති, ඕලෝකෙන්ති, නිජ්ඣායන්ති, උපපරික්ඛන්තී’ති - තස්මා හි බාලෝ’ති පරං දහන්ති.

තේනාහ භගවා:

“න වාහමේතං තථියන්ති බ්‍රෑමි
යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං,
සකං සකං දිට්ඨිමකංසු සච්චං
තස්මා හි බාලෝති පරං දහන්තී”ති.

## 12 - 6

යමාහු සච්චං තථියන්ති[4] ඒකේ
තමාහු අඤ්ඤේ තුච්ඡං මුසාති,
ඒවම්පි විග්ගය්හ විවාදයන්ති[5]
කස්මා න ඒකං සමණා වදන්ති.

---

1. ත වාහමේතං - සී. ස. මජසං. PTS.
2. තථවන්ති - මජුප. තථිවන්ති - සී. ස්‍යා. PTS. 3. යථාවතං - ස.
4. තථවන්ති - මජුප. මජසං. 5. විවාදියන්ති - සී. PTS.

## 12 - 5

මම තෙල ද්වාෂෂ්ටිදෘෂ්ටිජාතය සත්‍ය යැයි නො ද කියමි, යම් හෙයකින් කලහකාරක වූ දෙදෙනෙක් ඔවුනොවුන් බාල හෙයින් කියත් ද, (ඔහු) තමතමාගේ ලබ්ධිය සැබවැයි වාද කළාහු ද, එහෙයින් මැ වාදකාරක වූ අන්‍යයා බාලයෙකැයි සලකත්.

**න වාහමෙතං තථියන්ති බ්‍රෑමි** – 'න' යනු: ප්‍රතික්‍ෂෙප යැ; 'එතං' යනු: ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ; මම් තෙල දෘෂ්ටිගතය නො සිස් යැ අවිපරීත යැ විද්‍යමාන යැ සංවිද්‍යමාන යැ අවිසංවාදක යැයි නො කියමි, නො පවසමි, නො දෙසමි, නො පනවමි, නො තබමි, විවරණය නො කරමි, විභාග නො කරමි, ප්‍රකට නො කරමි, ප්‍රකාශ නො කෙරෙමි 'න වාහමෙතං තථියන්ති බ්‍රෑමි' යනු වේ.

**යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං** – 'මිථු' යනු: දෙදෙනෙක්, කලහකරුවෝ දෙදෙන ඩබර කරුවෝ දෙදෙන බසින් කලහ කරනුවෝ දෙදෙන විවාදකරුවෝ දෙදෙන අධිකරණකරුවෝ දෙදෙන වාදකරුවෝ දෙදෙන සංලාප කරනුවෝ දෙදෙන, ඔවුහු ඔවුනොවුන් බාල හෙයින් හීන හෙයින් නිහීන හෙයින් ඔමක හෙයින් ලාමක හෙයින් ජතුක්ක හෙයින් පරිත්ත හෙයින් මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං' යනු වේ.

**සකං සකං දිට්ඨිමකංසු සච්චං** – 'ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි – 'සකං සකං දිට්ඨිමකංසු සච්චං' යනු වේ. 'අශාශ්වත යැ ලොකය, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි...'සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නෙ: මැ වෙයි, නො වන්නේ නො වෙයි, මෙය මැ සැබව, අන්‍යය තුච්ඡ යැ' යි 'සකං සකං දිට්ඨිමකංසු සච්චං' යනු වේ.

**තස්මා හි බාලො'ති පරං දහන්ති** – 'තස්මා' යනු: එ හෙයින් එ කාරණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මෙරමා බාල හෙයින් හීනහෙයින් නිහීන හෙයින් ඔමකහෙයින් ලාමකහෙයින් ජතුක්ක හෙයින් සලකති, බලති දකිති අවලොකනය කෙරෙති, සිතති, විමසත් නුයි 'තස්මා හි බාලො'ති පරං දහන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"න වාහමෙතං -පෙ- තස්මා හි බාලොති පරං දහන්ති"සි**

## 12 - 6

ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දෘෂ්ටිසත්‍යයක් සැබවැයි කියත් ද, එයින් අන්‍ය වූ මහණබමුණෝ ඒ දෘෂ්ටිසත්‍යය තුච්ඡ වූ මෘෂායෙකැයි කියත්. (ඔහු) මෙසේත් දෘෂ්ටිය දැඩිව ගෙන විවාද කෙරෙති. කුමක් හෙයින් ශ්‍රමණයෝ එක් සත්‍යයක් නො කියත් ද ?

**යමාහු සච්චං තථියන්ති එකෙති** – යං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා ඉදං සච්චං තච්ඡං භූතං යාථාවං[1] අවිපරීතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති එවං දීපයන්ති, එවං වොහරන්තීති – යමාහු සච්චං තථියන්ති එකෙ.

**තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාතීති[2]** – තමෙව ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා තුච්ඡං එතං මුසා එතං අභූතං එතං අලිකං එතං අයාථාවං එතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති.

**එවම්පි විග්ගය්හ විවාදයන්තීති** – එවං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති, 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති – එවම්පි විග්ගය්හ විවාදයන්ති.'

**කස්මා න එකං සමණා වදන්තීති** – 'කස්මා'ති කස්මා කිංකාරණා කිංහෙතු කිම්පච්චයා කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතියා කිම්පභවා න එකං වදන්ති? නානා වදන්ති විවිධං වදන්ති? අඤ්ඤදඤ්ඤං වදන්ති? කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – කස්මා න එකං සමණා වදන්ති.

තෙනාහ සො නිම්මිතො:

"යමාහු සච්චං තථියන්ති එකෙ
තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති,
එවම්පි විග්ගය්හ විවාදයන්ති
කස්මා න එකං සමණා වදන්තී"ති.

**12 - 7**

එකං හි සච්චං න දුතියමත්ථි
යස්මිං පජා නො විවදෙ පජානං,
නානා තෙ සච්චානි සයං ථුනන්ති
තස්මා න එකං සමණා වදන්ති.

**එකං හි සච්චං න දුතියමත්ථීති** – එකං සච්චං වුච්චති දුක්ඛනිරොධො නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අථවා එකං සච්චං වුච්චති මග්ගසච්චං නිය්‍යානසච්චං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධීති – එකං හි සච්චං න දුතියමත්ථි.

---

1. යථාවතං - ස. 2. මුසාති - සීමු. II.

යමාහු සච්චං තථියන්ති එකෙ - ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දහමක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් "මේ සැබව තො සිස් යැ අවිපරීත යැ විද්‍යමාන යැ සංවිද්‍යමාන යැ අවිසංකෙත යැයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'යමාහු සච්චං තථියන්ති එකෙ' යනු වේ.

තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති - ඇතැම් මහණබමුණු කෙනෙක් එ මැ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය 'තෙල සිස් යැ තෙල මෘෂා යැ තෙල අභූත යැ තෙල බොරු යැ තෙල අසංවිද්‍යමාන යැ'යි මෙසේ පවසති, මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි "තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසායි' යනු වේ.

එවම්පි විග්ගය්හ විවාදයන්ති - මෙසේ ගෙන වෙසෙසින් ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන විරුද්ධවාද කෙරෙති කලහ කෙරෙති ඩබර කෙරෙති විග්‍රහ කෙරෙති විවාද කෙරෙති මෙධග කෙරෙති; 'තෙපි මේ ධම්විනය නො දත්තවූ යැ...ඉදින් සමර්ථ වූවහු නම් මුදාගනැ'යි (කියත්) නුයි 'එවම්පි විග්ගය්හ විවාදයන්ති' යනු වේ.

කස්මා න එකං සමණා වදන්ති - 'කස්මා' යනු: කුමක් හෙයින් කිකරුණෙන් කවර හෙතුයෙන් කවර ප්‍රත්‍යයෙන් කවර නිදානයකින් කවර සමුදයකින් කවර ද්‍රයකින් කවර ප්‍රභවයකින් එකක් නො කියත් ද? නොයෙක් ලෙස කියත් ද? විවිධ ව කියත් ද එකිනෙක කියත් ද වෙන වෙන කියත් ද පවසත් ද බෙණෙත් ද දක්වත් ද ව්‍යවහාර කෙරෙත් දැයි 'කස්මා න එකං සමණා වදන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යමාහු සච්චං -පෙ- කස්මා න එකං සමණා වදන්ති"යි

## 12 – 7

සත්‍යය එකෙක් මැ (නිරෝධය හෝ මාර්ගය හෝ) වෙයි, දෙවැන්නෙක් නැත, යම් සත්‍යයක් දත්තාවූ පුද්ගල තෙමේ විවාද නො කරන්නේ නම් එය යි; ඒ මහණබමුණෝ නානා සත්‍යයන් තුමූ මැ කියති, එ කරුණෙන් මහණබමුණෝ එක් සත්‍යයක් නො කියත්.

එකං හි සච්චං න දුතියමත්ථි - එක් සත්‍ය යැයි දුඃඛනිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය කියනු ලැබෙයි, යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරුලීමෙක් නැසීමෙක් කෙලශවිරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එයයි; නොහොත් එක් සත්‍ය යැයි මාර්ගසත්‍යය කියනු ලැබෙයි, නෛර්‍යාණිකසත්‍යය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදා සඞ්ඛ්‍යාත ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය යි. ඒ කවරේ ද යත්: සම්‍යග්දෘෂ්ටිය සම්‍යක් සංකල්පය සම්‍යග්වචනය සම්‍යක්කර්මාන්තය සම්‍යගාජීවය සම්‍යග්-ව්‍යායාමය සම්‍යක්ස්මෘතිය සම්‍යක්සමාධිය නුයි 'එකං හි සච්චං න දුතියමත්ථි' යනු වේ.

**යස්මිං පජා නො විවදෙ පජානන්ති** – ‘යස්මි’න්ති යස්මිං සච්චෙ; ‘පජා’ති සත්තාධිවචනං; ‘පජානං’ යං සච්චං පජානන්තා විජානන්තා පටිවිජානන්තා පටිවිජ්ඣන්තා න කලහං කරෙය්‍යුං, න භණ්ඩනං කරෙය්‍යුං, න විග්ගහං කරෙය්‍යුං, න විවාදං කරෙය්‍යුං, න මෙධගං කරෙය්‍යුං, කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං පජහෙය්‍යුං, විනොදෙය්‍යුං, බ්‍යන්තීකරෙය්‍යුං, අනභාවං ගමෙය්‍යුන්ති – යස්මිං පජා නො විවදෙ පජානං.

**නානා තෙ සච්චානි සයං ථුනන්තීති** – නානා තෙ සච්චානි සයං ථුනන්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, ‘සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති, සයං ථුනන්ති, වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – නානා තෙ සච්චානි සයං ථුනන්ති.

**තස්මා න එකං සමණා වදන්තීති** – ‘තස්මා’ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා න එකං වදන්ති, නානා වදන්ති, විවිධං වදන්ති, අඤ්ඤමඤ්ඤං වදන්ති පුථු වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – තස්මා න එකං සමණා වදන්ති

තෙනාහ භගවා:

“එකං හි සච්චං න දුතියමත්ථි
යස්මිං පජා නො විවදෙ පජානං,
නානා තෙ සච්චානි සයං ථුනන්ති
තස්මා න එකං සමණා වදන්තී”ති.

## 12 - 8

කස්මා නු සච්චානි වදන්ති නානා
පවාදියා සෙ කුසලාවදානා,
සච්චානි සුතානි[1] බහූනි නානා
උදාහු තෙ තක්කමනුස්සරන්ති.

**කස්මා නු සච්චානි වදන්ති නානාති** – ‘කස්මා’ති කස්මා කිං කාරණා කිංහෙතු කිම්පච්චයා කිංනිදානා සච්චානි නානා වදන්ති? විවිධානි වදන්ති? අඤ්ඤමඤ්ඤානි වදන්ති? පුථූනි වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – කස්මා නු සච්චානි වදන්ති නානා.

**පවාදියා සෙ කුසලාවදානාති** – ‘පවාදියාසෙ’ති විප්පවදන්තීතිපි පවාදියාසෙ; අථ වා සකං සකං දිට්ඨිගතං පවදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති පවදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති අසස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති පවදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. කුසලාවදානාති කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා, සකාය ලද්ධියාති – පවාදියා සෙ කුසලාවදානා.

1. සුතානි – සං. PTT.

**යස්මිං පජා නො විවදෙ පජානං** – 'යස්මිං' යනු: යම් සත්‍යයක්; 'පජා' යනු: සත්ත්වයනට නමෙකි; **පජානං** – යම් සත්‍යයක් ප්‍රකෘතියෙන් දන්නාහු හාත්පසින් දන්නාහු වෙසෙසින් දන්නාහු මැනවින් දන්නාහු සිහින් අවබොධ කරන්නාහු කලහ නො කරන්නාහු ය, ඩබර නො කරන්නාහු ය, විග්‍රහ නො කරන්නාහු ය, විවාද නො කරන්නාහු ය, මෙධග නො කරන්නාහු ය, කලහ භණ්ඩන විග්‍රහ විවාද මෙධග හරනාහු ය, දුරලන්නාහු ය, බැහැර කරන්නාහු ය, අනභාවයට පමුණුවන්නාහු නුයි 'යස්මිං පජා නො විවදෙ පජානං' යනු වේ.

**නානා තෙ සච්චානි සයං ථුනන්ති** – ඔවුහු නානා සත්‍යයන් තුමූ මැ පසසති, පවසති කියති බෙණෙති දක්වති බැවහර කෙරෙත්; 'ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි පසසති පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'නානා තෙ සච්චානි සයං ථුනන්ති' යනු වේ.

**තස්මා න එකං සමණා වදන්ති** –'තස්මා' යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් එකක් නො කියති, නොයෙක් සේ කියති, විවිධ ව කියති, අනන්මන කියති, වෙන වෙන මැ කියති පවසති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'තස්මා න එකං සමණා වදන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එකං හි සච්චං –පෙ– තස්මා න එකං සමණා වදන්ති"යි.

**12 – 8**

විරුද්ධවාද ඇති (සවලබ්ධියෙහි) පණ්ඩිතවාද ඇති (ඔහු) කුමක් හෙයින් නානා සත්‍යයන් කියත් ද ? (ඔවුන් විසින්) බොහෝ වූ නානා සත්‍යයන් අසන ලද්දහු ද ? නොහොත් ඔවුහු තර්කමාත්‍රයක් අනුව යෙත් ද ?

**කස්මා නු සච්චානි වදන්ති නානා** – 'කස්මා' යනු: කුමක් හෙයින් කිකරුණෙන් කවර හෙතුයෙකින් කවර ප්‍රත්‍යයෙකින් කවර නිදානයෙකින් සත්‍යයන් නන් ලෙස කියත් ද ? විවිධ ව කියත් ද ? අනන්මන කියත් ද ? වෙන වෙන මැ පවසත් ද ? කියත් ද ? බෙණෙත් ද ? දක්වත් ද ? ව්‍යවහාර කෙරෙත් දැ'යි 'කස්මා නු සච්චානි වදන්ති නානා' යනු වේ.

**පවාදියා සෙ කුසලාවදානා** – 'පවාදියා සෙ' යනු: විවිධ ව කියත් නුයි ද 'පවාදියා සෙ' යනු වේ; නොහොත් තමතමාගේ දෘෂ්ටිගතය පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්: 'ශාශ්වත යැ ලොකය, මෙ මැ සැබව, අන්‍යය තුච්ඡ යැ'යි පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. 'අශාශ්වත යැ ලොකය...සත්ත්වයා මරණින් මත්තෙහි නො මැ වෙයි, නො වන්නේ නො වෙයි. මෙ මැ සැබව, අන්‍යය තුච්ඡ යැ'යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. **කුසලාවදානා** – සවලබ්ධියෙහි කුශල යැ යන වාද ඇත්තාහු පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු න්‍යායවාද ඇත්තාහු හෙතුවාද ඇත්තාහු ලක්ෂණවාද ඇත්තාහු කාරණවාද ඇත්තාහු ස්ථානවාද ඇත්තාහු නුයි 'පවාදියා සෙ කුසලාවදානා' යනු වේ.

**සච්චානි සුතානි බහූනි නානාති** – සච්චානි සුතානි බහුකානි නානානි විවිධානි අඤ්ඤමඤ්ඤානි පුථූනීති – සච්චානි සුතානි බහූනි නානා.

**උදාහු තෙ තක්කමනුස්සරන්ති'ති** – උදාහු තක්කෙන විතක්කෙන සඞ්කප්පෙන යායන්ති නීයන්ති වුය්හන්ති සංහරිය්‍යන්තීති එවම්පි – උදාහු තෙ තක්කමනුස්සරන්ති. අථවා තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං වදන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති එවම්පි–උදාහු තෙ තක්ක-මනුස්සරන්ති.

තෙනාහ සො නිම්මිතො:

"කස්මා නු සච්චානි වදන්ති නානා
පවාදියාසෙ කුසලාවදානා,
සච්චානි සුතානි බහූනි නානා
උදාහු තෙ තක්කමනුස්සරන්ති"ති.

12 - 9

නහෙව සච්චානි බහූනි නානා
අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ,
තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා
සච්චං මුසාති ද්වයධම්මමාහු.

**නහෙව සච්චානි බහූනි නානාති** – නහෙව සච්චානි බහුකානි නානානි විවිධානි අඤ්ඤමඤ්ඤානි පුථූනීති – න හෙව සච්චානි බහූනි නානා.

**අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙති** – අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චගාහා එකඤ්ඤෙව සච්චං ලොකෙ කථීයති[1] භණීයති[2] දීපීයති[3] වොහරීයති[4] දුක්ඛ-නිරොධො නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අථවා, එකං සච්චං වුච්චති මග්ගසච්චං නිය්‍යානසච්චං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියො අට්ඨඞ්ගිකො මග්ගො; සෙය්‍යථීදං? සම්මාදිට්ඨි –පෙ– සම්මාසමාධීති – අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ.

**තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසාති ද්වයධම්මමාහූති**– තක්කං විතක්කං සඞ්කප්පං තක්කයිත්වා විතක්කයිත්වා සඞ්කප්පයිත්වා දිට්ඨිගතානි ජනෙන්ති සඤ්ජනෙන්ති නිබ්බත්තෙන්ති අභිනිබ්බත්තෙන්ති; දිට්ඨිගතානි ජනෙත්වා සඤ්ජනෙත්වා නිබ්බත්තෙත්වා අභිනිබ්බත්තෙත්වා 'මය්හං සච්චං තුය්හං මුසා'ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසාති ද්වයධම්මමාහු.

1. කථීයන්ති සීමු. II. කථීයති - PTS. 2. භණීයන්ති - සීමු. II. භණීයති - PTS
3. දීපියන්ති - සීමු. II. දීපයති - PTS.
4. වොහරීයන්ති - සීමු. II. වොහරීයති - PTS.

**සච්චානි සුතානි බහූනි නානා** – බොහෝ වූ නන් වැදෑරුම් වූ විවිධ වූ අනන්තමත වූ වෙන් වෙන් වූ සත්‍යයෝ අසන ලද්දාහු දැ’යි ‘සච්චානි සුතානි බහූනි නානා’ යනු වේ.

**උදාහු තෙ තක්කමනුස්සරන්ති** – නොහොත් තර්කයෙන් සංකල්පයෙන් යවනු ලැබෙති, පමුණුවනු ලැබෙති, වහනය කරනු ලැබෙති, මොනවට හරිනු ලැබෙත් නුයි – මෙසේ ත් ‘උදාහු තෙ තක්කමනුස්සරන්ති’ යනු වේ. නොහොත් තර්කයෙන් හාත්පසින් එලවන ලද තමාගේ හැඟීමෙන් විමසන ලද ස්වකීය ප්‍රතිභානය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි – මෙසේත් ‘උදාහු තෙ තක්කමනුස්සරන්ති’ යනු වේ.

එයින් කීහ ඒ මැඩුණු බුදුහු:

“කස්මා නු සච්චානි –පෙ– උදාහු තෙ තක්කමනුස්සරන්ති”යි

## 12 – 9

ලොවැ සංඥාමාත්‍රයෙන් නිත්‍ය යයි ගන්නා ලද ග්‍රහණයත් හැර නන්වැදෑරුම් වූ බොහෝ සත්‍යයෝ නො මැ වෙති, දෘෂ්ටීන්හි (තමන් ගේ) මිථ්‍යාසංකල්පමාත්‍රය ද උපදවා (මාගේ වචනය) සැබෑව, (තාගේ වචනය) බොරු යැ යන යුග්මධර්මය (–දෙ කරුණ) කියත්.

**නහෙව සච්චානි බහූනි නානා** – බොහෝ වූ නානා වූ විවිධ වූ අන්‍යෝන්‍ය වූ වෙන් වෙන් වූ සත්‍යයෝ නො මැ වෙත් නුයි ‘නහෙව සච්චානි බහූනි නානා’ යනු වේ.

**අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ** – සංඥාමාත්‍රයෙන් නිත්‍ය යයි ගන්නා ලද ග්‍රහණයෙන් වෙන් ව ලොවැ දුඃඛනිරොධ යයි කියන ලද නිර්වාණ නම් වූ එක මැ සත්‍යය කියනු ලැබෙයි, බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි, ව්‍යවහාර කරනු ලැබේ; යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාව නැසීමෙක් කෙලශවිරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. නොහොත් එක් සත්‍ය යැ’යි මාර්ගසත්‍යය කියනු ලැබෙයි, නෛර්‍යාණිකසත්‍යය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය යි, ඒ කවරේ ද යත්? සම්‍යග්දෘෂ්ටිය... සම්‍යක් සමාධිය නුයි ‘අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ’ යනු වේ.

**තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසා’ති ද්වයධම්මමාහු**–තර්කය විතර්කය සඞ්කල්පය තර්කණය කොට විතර්කණය සඞ්කල්පනය කොට දෘෂ්ටිගතයන් උපදවති, මොනවට උපදවති, නිපදවති, වෙසෙසින් නිපදවත්, දෘෂ්ටිගතයන් (මතුමත්තෙහි) උපදවා මොනවට උපදවා නිපදවා වෙසෙසින් නිපදවා මාගේ (–වදන) සැබෑව, තාගේ (වදන) බොරු යයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි ‘තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසාති ද්වයධම්මමාහු’ යනු වේ.

තෙනාහ භගවා:

“න හෙව සච්චානි බහූනි නානා
අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ,
තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා
සච්චං මුසාති ද්වයධම්මමාහු”ති.

## 12 - 10

දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා
එතෙ ච[1] නිස්සාය විමානදස්සී,
විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො[2]
බාලො පරො අක්කුසලො’ති[3] චාහ.

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච[1] නිස්සාය විමානදස්සීති** දිට්ඨං වා දිට්ඨසුද්ධිං වා සුතං වා සුතසුද්ධිං වා සීලං වා සීලසුද්ධිං වා වතං වා වතසුද්ධිං වා මුතං වා මුතසුද්ධිං වා නිස්සාය උපනිස්සාය ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති – දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා.

**එතෙ ච නිස්සාය විමානදස්සීති** – න සම්මානෙතීතිපි විමානදස්සී; අථවා, දොමනස්සං ජනෙතීතිපි විමානදස්සීති – දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච නිස්සාය විමානදස්සී.

**විනිච්ඡයෙ ඨත්වා පහස්සමානොති** – විනිච්ඡයා වුච්චන්ති ද්වාසට්ඨි-දිට්ඨිගතානි; දිට්ඨිවිනිච්ඡයෙ විනිච්ඡයදිට්ඨියා ඨත්වා පතිට්ඨහිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති – විනිච්ඡයෙ ඨත්වා; **පහස්සමානොති** – තුට්ඨො හොති හට්ඨො පහට්ඨො අත්තමනො පරිපුණ්ණසඞ්කප්පො; අථවා, දන්තවිදංසකං පහස්සමානො[2] ති – විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො.

**බාලො පරො අක්කුසලොති චාහාති** – පරො බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ඡත්තකො[4] පරිත්තො අකුසලො අවිද්වා අවිජ්ජාගතො අඤ්ඤාණී අවිභාවී අමෙධාවී දුප්පඤ්ඤොති එවමාහ, එවං කථෙති, එවං භණති, එවං දීපයති, එවං වොහරතීති – බාලො පරො අක්කුසලොති චාහ.

තෙනාහ භගවා:

“දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා
එතෙ ච නිස්සාය විමානදස්සී,
විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො
බාලො පරො අක්කුසලොති[3] චාහා”ති.

## 12 - 11

යෙනෙව බාලොති පරං දහාති
තෙනාතුමානං කුසලොති චාහ,
සයමත්තනා සො කුසලාවදානො
අඤ්ඤං විමානෙති තදෙව පාවා[5].

---

1. එතෙසු - සීමු II මුද්‍ර. 2 පහංසමානො - සීමු. II.
3. අකුසලොති - ස, සු. සං. PTS.
4. ඡතුක්කො - මජ්ඣං. ඡතුක්කො - සීමු. II. PTS. 1. පාවද - සීමු. II. පාව. - මජ්ඣං.

එයින් වදාළහ බුදුහු:

"න හෙව සච්චානි -පෙ- සච්චං මුසාති ද්වයධම්මමාහු"යි

## 12 - 10

(රූපාලම්බන සඞ්ඛ්‍යාත) දෘෂ්ටශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද (ගන්ධරසස්ප්‍රෂ්ට-ව්‍යාලම්බන සඞ්ඛ්‍යාත) මූතශුද්ධිය ද යන මොවුන් නිසා අසම්මානය දක්නේ නොහොත් දෙම්නස් උපදවනුයේ දෘෂ්ටිවිනිශ්චයෙහි සිට පහටු වනුයේ මෙරමා හීන යයි ද අදක්ෂ යයි ද කියයි.

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච නිස්සාය විමානදස්සී**- රූපාලම්බනය හෝ දෘෂ්ටශුද්ධිය හෝ, ශබ්දාලම්බනය හෝ ශ්‍රැතශුද්ධිය හෝ, ශීලය හෝ ශීලශුද්ධිය හෝ, ව්‍රතය හෝ ව්‍රත ශුද්ධිය හෝ, ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය හෝ මූතශුද්ධිය හෝ නිසා ඇසුරු කොට ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන නුයි 'දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා' යනු වේ.

**එතෙ ච නිස්සාය විමානදස්සී** - සම්මාන නො කෙරේ නුයි ද විමානදර්ශී යැ, නොහොත් දෙම්නස් දනවා නුයි ද විමානදර්ශී නුයි 'දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච නිස්සාය විමානදස්සී' යනු වේ.

**විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො** - 'විනිච්ඡය'යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. දෘෂ්ටිවිනිශ්චයෙහි විනිශ්චය (-සනිටුහන්) කොට ගත් දෘෂ්ටියෙහි සිට පිහිටා ග්‍රහණය කොට දැඩිව ගෙන පිහිටා ගෙන නුයි 'විනිච්ඡයෙ ඨත්වා' යනු වේ. **පහස්සමානො** - තුටු වූයේ පහටු වූයේ තුටුසිත් ඇතියේ පිරුණු සංකල්ප ඇතියේ; නොහොත් දත් විදහා සිනහ සෙනුයේ නුයි 'විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො' යනු වේ.

**බාලො පරො අක්කුසලොති චාහ** - මෙරමා බාල යැ හීන යැ නිහීන-යැ අවමත යැ ලාමක යැ ඡත්තක යැ අල්ප යැ අදක්ෂ යැ අපණ්ඩිත යැ නුවණ නැත්තේ යැ විමංසනප්‍රඥා රහිත යැ තීරණප්‍රඥා රහිත යැ දුෂ්ප්‍රාඥ යැයි මෙසේ පවසයි, මෙසේ කියයි, මෙසේ බෙණෙයි, මෙසේ දක්වයි, මෙසේ ව්‍යවහාර කෙරේ නුයි 'බාලො පරො අක්කුසලොති චාහ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"දිට්ඨෙ සුතෙ -පෙ- බාලො පරො අක්කුසලොති චාහ"යි.

## 12 - 11

යම් මැ කරුණෙකින් මෙරමා බාලයෙකැයි හගී නම්, යළි එ කරුණෙන් ම තමා 'පණ්ඩිත වෙමි' කියයි, තෙමේ මැ තමහට (මම්) පණ්ඩිතයෙමි කියන්නාවූ හෙතෙම එය මැ කියනුයේ අනෙකක්හු ගරහයි.

**යෙනෙව බාලොති පරං දහාතීති** – යෙනෙව හෙතුනා යෙන පච්චයෙන යෙන කාරණෙන යෙන පභවෙන පරං බාලතො හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො දහති පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති – යෙනෙව බාලොති පරං දහාති.

**තෙනාතුමානං කුසලොති චාහාති** – 'ආතුමා[1]' වුච්චති අත්තා; සොපි තෙනෙව හෙතුනා තෙන පච්චයෙන තෙන කාරණෙන තෙන පභවෙන අත්තානං 'අහමස්මි කුසලො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී'ති – තෙනාතුමානං කුසලොති චාහ.

**සයමත්තනා සො කුසලාවදානොති** – සයමෙව අත්තානං කුසල-වාදො පණ්ඩිතවාදො ධීරවාදො ඤායවාදො හෙතුවාදො ලක්ඛණවාදො කාරණවාදො ඨානවාදො සකාය ලද්ධියාති – සයමත්තනා සො කුසලා-වදානො.

**අඤ්ඤං විමානෙති තදෙව පාවාති[2]** – න සම්මානෙතීතිපි 'අඤ්ඤං විමානෙති' අථවා, දොමනස්සං ජනෙතීතිපි 'අඤ්ඤං විමානෙති' **තදෙව පාවාති** තදෙව තං දිට්ඨිගතං පාවදති: 'ඉති වායං පුග්ගලො මිච්ඡාදිට්ඨිකො විපරීතදස්සනො'ති – අඤ්ඤං විමානෙති තදෙව පාවා.

"යෙනෙව බාලොති පරං දහාති
තෙනාතුමානං කුසලොති චාහ,
සයමත්තනා සො කුසලාවදානො
අඤ්ඤං විමානෙති තදෙව පාවා"ති[2].

**12 – 12**

අතිසාරදිට්ඨියා[3] සො සමත්තො
මානෙන මත්තො පරිපුණ්ණමානී,
සයමෙව සාමං මනසාභිසිත්තො
දිට්ඨී හි සා තස්ස තථා සමත්තා.

**අතිසාරදිට්ඨියා සො සමත්තොති** – අතිසාරදිට්ඨියො වුච්චන්ති ද්වාසට්ඨි-දිට්ඨිගතානි, කිංකාරණා අතිසාරදිට්ඨියො වුච්චන්ති ද්වාසට්ඨිදිට්ඨිගතානි? සබ්බා තා දිට්ඨියො කාරණාතික්කන්තා ලක්ඛණාතික්කන්තා ඨානාතික්කන්තා තංකාරණා **අතිසාරදිට්ඨියො** වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; සබ්බාපි දිට්ඨියො අතිසාරදිට්ඨියො; කිංකාරණා සබ්බාපි දිට්ඨියො වුච්චන්ති අතිසාර-දිට්ඨියො? තෙ අඤ්ඤමඤ්ඤං අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා දිට්ඨිගතානි ජනෙන්ති සඤ්ජනෙන්ති නිබ්බත්තෙන්ති අභිනිබ්බත්තෙන්ති; තංකාරණා සබ්බාපි දිට්ඨියො වුච්චන්ති අතිසාරදිට්ඨියො. **අතිසාරදිට්ඨියා සො සමත්තොති** අතිසාරදිට්ඨියා සමත්තො පරිපුණ්ණො අනොමොති – අතිසාරදිට්ඨියා සො සමත්තො.

---

1. ආතුමානො – සීමු. II. මජ්ඣං. 2. පාවදති – සීමු. II.
3. අතිසාරංදිට්ඨියා – ස්‍යා. PTS.

**යෙනෙව බාලොති පරං දහාති** - යම් මැ හෙතුවකින් යම් ප්‍රත්‍යයෙකින් යම් කරුණෙකින් යම් පහළවීමෙකින් මෙරමා බාලහෙයින් හීන හෙයින් නිහීන හෙයින් අවමත හෙයින් ලාමක හෙයින් අහෙතුක හෙයින් අල්ප හෙයින් සලකා නම් බලා නම් දකී නම් අවලොකන කෙරේ නම් සිතා නම් විමසා නම් සී 'යෙනෙව බාලො'ති පරං දහාති' යනු වේ.

**තෙනාතුමානං කුසලො'ති චා'හ** - 'ආතුමා'යි තෙමේ කියනු ලැබෙයි, හෙ තෙමේ ද ඒ හෙතුයෙන් ම ඒ ප්‍රත්‍යයෙන් ඒ කරුණෙන් ඒ පහළවීමෙන් තමා 'මම් දක්ෂයෙමි පණ්ඩිතයෙමි ප්‍රඥාවත්මි බුද්ධිමත්මි ඥානවත්මි විමංසනප්‍රඥා ඇත්තෙමි තීරණප්‍රඥා ඇත්තෙමි (කියා) නුයි 'තෙනාතුමානං කුසලො'ති චා'හ' යනු වේ

**සයමත්තනා සො කුසලාවදානො** - ස්වකීය ලබ්ධියෙහි තෙමේ ම තම හට 'මම් දක්ෂයෙමි, යහ වාද ඇත්තේ පණ්ඩිතවාද ඇත්තේ ස්ථිරවාද ඇත්තේ න්‍යායවාද ඇත්තේ හෙතුවාද ඇත්තේ ලක්ෂණවාද ඇත්තේ කාරණවාද ඇත්තේ ස්ථානවාද ඇත්තේ නුයි 'සයමත්තනා සො කුසලා-වදානො' යනු වේ.

**අඤ්ඤං විමානෙති තදෙව පාවා** - සම්මාන නො කෙරේ නුයි ද, අඤ්ඤං විමානෙති' යනු වේ. නොහොත් දොම්නස් දනවා නුයි 'අඤ්ඤං විමානෙති' යනු වේ. **තදෙව පාවා** - 'මෙසේ හෝ පුද්ගල තෙම මිථ්‍යාදෘෂ්ටි ඇත්තෙක විපරීත දර්ශන ඇත්තෙකැ'යි එය ම එ දෘෂ්ටිගතය ම කියා නුයි 'අඤ්ඤං විමානෙති තදෙව පාවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යෙනෙව බාලොති -පෙ- අඤ්ඤං විමානෙති තදෙව පාවා"යි**

## 12 - 12

හෙතෙම ආශ්‍රෂ්ටිදෘෂ්ටියෙන් සම්පූර්ණ වූයේ (-ඉදිමුණේ) දෘෂ්ටිමානයෙන් මත් වූයේ පරිපූර්ණයෙමි මාන ඇතියේ තමා මැ තෙමේ සිතින් අභිෂෙක කරන ලදුයේ වෙයි, යම් හෙයෙකින් ඔහු විසින් ඒ දෘෂ්ටිය එපරිද්දෙන් ගන්නා ලද්දී ද එහෙයිනි.

**අතිසාරදිට්ඨියා සො සමත්තො** - 'අතිසාරදිට්ඨි' යයි දෙසැට දිට්ඨිගතයෝ කියනු ලැබෙති, කවර කරුණෙකින් ආශ්‍රෂ්ටිදෘෂ්ටිගතයෝ 'අතිසාරදිට්ඨි' යැයි කියනු ලැබෙත් ද යත්: ඒ සියලු දෙසැට දෘෂ්ටීහු කාරණ ඉක්මවූවාහුය ලක්ෂණ ඉක්මවූවාහුය ස්ථාන ඉක්මවූවාහුය, එ කරුණෙන් ආශ්‍රෂ්ටි දෘෂ්ටිගතයෝ අතිසාරදිට්ඨි' යැයි කියනු ලැබෙති; සියලු මැ දෘෂ්ටීහු අතිසාර දෘෂ්ටීහු යැ, කවර කරුණෙකින් සියලු මැ දෘෂ්ටීහු 'අතිසාරදිට්ඨි' යයි කියනු ලැබෙත් ද ? ඔවුහු ඔවුනොවුන් ඉක්මවා මොනොවට ඉක්මවා වෙසෙසින් ඉක්මවා දෘෂ්ටිගතයන් උපදවති, මෙනොවට උපදවති- නිපදවති වෙසෙසින් නිපදවත්; එ කරුණෙන් සියලු මැ දෘෂ්ටීහු 'අතිසාර දිට්ඨි' යයි කියනු ලැබෙත්. **අතිසාරදිට්ඨියා සො සමත්තො** - දෙසැට දෘෂ්ටියෙන් සම්පූර්ණ වූයේ පරිපූර්ණ වූයේ අනූන වූයේ නුයි 'අතිසාරදිට්ඨියා සො සමත්තො' යනු වේ.

**මානෙන මත්තො පරිපුණ්ණමානීති** – සකාය දිට්ඨියා දිට්ඨිමානෙන මත්තො පමත්තො උම්මත්තො අතිමත්තොති – මානෙන මත්තො; **පරිපුණ්ණමානීති** පරිපුණ්ණමානී සමත්තමානී අනොමමානීති – මානෙන මත්තො පරිපුණ්ණමානී.

**සයමෙව සාමං මනසාභිසිත්තොති** – සයමෙව අත්තානං චිත්තෙන අභිසිඤ්චති: 'අහමස්මි කුසලො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී'ති 'සයමෙව සාමං මනසාභිසිත්තො.'

**දිට්ඨි හි සා තස්ස තථා සමත්තාති** – තස්ස සා දිට්ඨි තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති–දිට්ඨි හි සා තස්ස තථා සමත්තා.

තෙනාහ භගවා:

"අතිසාරදිට්ඨියා සො සමත්තො
මානෙන මත්තො පරිපුණ්ණමානී,
සයමෙව සාමං මනසා'භිසිත්තො
දිට්ඨි හි සා තස්ස තථා සමත්තා"ති.

**12 - 18**

පරස්ස චෙ හි වචසා නිහීනො
තුමො සහා හොති නිහීනපඤ්ඤො,
අථ චෙ[1] සයං වෙදගූ හොති ධීරො
න කොචි බාලො සමණෙසු අත්ථි.

**පරස්ස චෙ හි වචසා නිහීනොති** – පරස්ස චෙ වාචාය වචනෙන නින්දිතකාරණා ගරහිතකාරණා උපවදිතකාරණා පරො බාලො හොති හීනො නිහීනො ඔමකො ලාමකො ඡත්තකො[2] පරිත්තොති – පරස්ස චෙ හි වචසා නිහීනො.

**තුමො සහා හොති නිහීනපඤ්ඤොති** – සොපි තෙනෙව සහා හොති හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ඡත්තකපඤ්ඤො පරිත්තපඤ්ඤොති – තුමො සහා හොති නිහීනපඤ්ඤො.

**අථ චෙ සයං වෙදගූ හොති ධීරොති** – අථ චෙ සයං වෙදගූ හොති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවීති – අථ චෙ සයං වෙදගූ හොති ධීරො.

**න කොචි බාලො සමණෙසු අත්ථීති** – සමණෙසු න කොචි බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ඡත්තකො පරිත්තො අත්ථි, සබ්බෙව සෙට්ඨපඤ්ඤා විසිට්ඨපඤ්ඤා පාමොක්ඛපඤ්ඤා උත්තමපඤ්ඤා පවරපඤ්ඤාති– න කොචි බාලො සමණෙසු අත්ථි.

1. අථවා - සිමු. II. PTS. 2. ඡතුක්කො - මජසං.

**මානෙන මත්තො පරිපුණ්ණමානී** - ස්වකීය දෘෂ්ටියෙහි දෘෂ්ටිමානයෙන් මත්වූයේ පමත්වූයේ උමතු වූයේ ඉතා මත්වූයේ නුයි 'මානෙන මත්තො' යනු වේ; **පරිපුණ්ණමානී** පරිපූර්ණමාන ඇතියේ සම්පූර්ණමාන ඇතියේ අනූනමාන ඇතියේ නුයි 'මානෙන මත්තො පරිපුණ්ණමානී' යනු වේ.

**සයමෙව සාමං මනසාභිසිත්තො** - 'මම් දක්‍ෂයෙම් පණ්ඩිතයෙම් ප්‍රඥාවත්මි බුද්ධිමත්මි ඥානවත්මි විමංසනප්‍රඥ ඇත්තෙමි තීරණප්‍රඥ ඇත්තෙමියි' තෙමේ ම තමා විසින් අභිෂෙක කෙරේ නුයි 'සයමෙව සාමං මනසාභිසිත්තො' යනු වේ.

**දිට්ඨී හි සා තස්ස තථා සමත්තා** - ඔහු විසින් ඒ දෘෂ්ටි තොමෝ එපරිද්දෙන් පුරන ලද්දී සමාදන් වූවා ගන්නා ලද්දී දැහැගන්නා ලද්දී පිහිටා ගන්නා ලද්දී පිවිසියා බැසගන්නා ලද්දී නුයි 'දිට්ඨී හි සා තස්ස තථා සමත්තා' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**"අතිසාරදිට්ඨියා සො -පෙ- දිට්ඨී හි සා තස්ස තථා සමත්තා"යි**

## 12 - 13

ඉදින් (යමෙක් දෘෂ්ටිවිනිශ්චයෙහි සිටි) අන්‍යයාගේ නින්දාවචනයෙන් නිහීනයෙක් වේ නම්, තෙමේත් ඔහු සමග ම නිහීනප්‍රඥ ඇත්තේ වෙයි. යළි තෙමේ මැ ඉදින් වේදන්තයට ගියා වූ ධීරයෙක් වේ නම්, ශ්‍රමණයන් කෙරෙහි බාල වූ කිසිවෙක් නැත්තේ යි.

**පරස්ස චෙ හි වචසා නිහීනො** - ඉදින් අන්‍යයාගේ වචනයෙන් භාෂිතයෙන් නින්දාහෙතුයෙන් අවමානහෙතුයෙන් උපවාදකාරණයෙන් අන්‍යයා බාලයෙක් හීනයෙක් නිහීනයෙක් අවමතයෙක් ලාමකයෙක් අහෙතුකයෙක් අල්පයෙක් වේ නම්යි 'පරස්ස චෙ හි වචසා නිහීනො' යනු වේ.

**තුමෝ සහා හොති නිහීනපඤ්ඤො** - හෙතෙමේත් ඔහු සමග මැ හීනප්‍රඥ ඇත්තේ වෙයි, නිහීනප්‍රඥ ඇත්තේ අවමතප්‍රඥ ඇත්තේ ලාමකප්‍රඥ ඇත්තේ අහෙතුකප්‍රඥ ඇත්තේ අල්ප වූ ප්‍රඥ ඇත්තේ වේ නුයි 'තුමෝ සහා හොති නිහීනපඤ්ඤො' යනු වේ.

**අථ චෙ සයං වෙදගූ හොති ධීරො** - යළි ඉදින් තෙමේ වේදන්තයට පැමිණියේ වේ නම්, ධීර වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැත්තේ විමංසනප්‍රඥ ඇත්තේ තීරණප්‍රඥ ඇත්තේ වී නම් යි 'අථ චෙ සයං වෙදගූ හොති ධීරො' යනු වේ.

**න කොචි බාලො සමණෙසු අත්ථි** - ශ්‍රමණයන් කෙරෙහි කිසි බාලයෙක් හීනයෙක් නිහීනයෙක් අවමතයෙක් ලාමකයෙක් ඡත්තකයෙක් පරිත්තයෙක් නැති. සියල්ලෝ මැ ශ්‍රෙෂ්ඨප්‍රඥ ඇත්තාහු විශිෂ්ටප්‍රඥ ඇත්තාහු ප්‍රමුඛප්‍රඥ ඇත්තාහු උත්තමප්‍රඥ ඇත්තාහු ප්‍රවරප්‍රඥ ඇත්තාහු නුයි 'න කොචි බාලො සමණෙසු අත්ථි' යනු වේ.

තෙනාහ භගවා:

“පරස්ස චෙ හි වචසා නිහීනො
තුමො සහා හොති නිහීනපඤ්ඤො,
අථ චෙ සයං වෙදගූ හොති ධීරො
න කොචි බාලො සමණෙසු අත්ථී”ති.

## 12 – 14

අඤ්ඤං ඉතො යා’භිවදන්ති ධම්මං
අපරද්ධා සුද්ධිමකෙවලී තෙ,[1]
එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති
සන්දිට්ඨිරාගෙන හි තෙ’භිරත්තා.[2]

**අඤ්ඤං ඉතො යා’භිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙති** – ඉතො අඤ්ඤං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං යෙ අභිවදන්ති, තෙ සුද්ධිමග්ගං විසුද්ධිමග්ගං වොදාතමග්ගං පරියොදාතමග්ගං විරද්ධා අපරද්ධා ඛලිතා ගලිතා අඤ්ඤාය අපරද්ධා[3] **අකෙවලී තෙති** අසමත්තා තෙ අපරිපුණ්ණා තෙ හීනා නිහීනා ඔමකා ලාමකා ඡතුක්කා පරිත්තාති – අඤ්ඤං ඉතො යා’භිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙ.[1]

**එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්තීති** – ‘තිත්ථං’ වුච්චති දිට්ඨිගතං, තිත්ථියා වුච්චන්ති දිට්ඨිගතිකා; පුථු තිත්ථියා[4] පුථු දිට්ඨිගතානි වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති.

**සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තාති** – සකාය දිට්ඨියා දිට්ඨිරාගෙන රත්තා අභිරත්තාති – සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා.

තෙනාහ භගවා:

“අඤ්ඤං ඉතො යා’භිවදන්ති ධම්මං
අපරද්ධා සුද්ධිමකෙවලී තෙ,
එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති
සන්දිට්ඨිරාගෙන හි තෙ’භිරත්තා”ති.

## 12 – 15

ඉධෙව සුද්ධිං ඉති[5] වාදයන්ති[6]
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා
සකායනෙ තත්ථ දළ්හං වදානා.

---

1. සුද්ධිමකෙවලිනො – ස්‍යා. 2. තෙවාභිරත්තා – මනුප.
3. ඤායාපරද්ධා – සු. 4. පුථුදිට්ඨියා – සීමු. II. මජසං. PTS.
5. සුද්ධි ඉති – සීමු. II. සුද්ධිමිති – සු. 6. වාදියන්ති – PTS.

එයින් වදාළහ බුදුහු:

**"පරස්ස චෙ හි -පෙ- න කොචි බාලො සමණෙසු අත්ථි"යි.**

## 12 - 14

යම් කෙනෙක් මෙයින් අන්‍ය වූ දහමක් (-දෘෂ්ටියක්) කියා නම්, අපරිපූර්ණ වූ ඔහු ශුද්ධිය වැරැද්දූහුය, මෙසේත් තීර්ථකයෝ බොහෝ දෘෂ්ටිවශයෙන් කියති, යම් හෙයකින් ඔවුහු ස්වකීය දෘෂ්ටිරාගයෙන් ඇලුණාහු ද එහෙයිනි.

**අඤ්ඤං ඉතො යාභිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙ** - යම් කෙනෙක් මෙයින් අන්‍ය වූ දහමක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් කියත් නම්, ඔවුහු ශුද්ධිමාර්ගය විශුද්ධිමාර්ගය පරිශුද්ධිමාර්ගය පාණ්ඩරමාර්ගය ප්‍රභාවත්මාර්ගය වැරැද්දූහුය පැරැද්දූහුය පිරිහුණාහුය ගිලිහුණාහුය නො දුත පරාජයට පැමිණියාහුය; **අකෙවලී තෙ** - ඔවුහු අසමස්තයෝ යැ, ඔවුහු අපරිපූර්ණයෝ යැ, හීන - නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්තක වූවාහු නුයි 'අඤ්ඤං ඉතො යා 'භිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙ' යනු වේ.

**එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති** - 'තිත්ථ'යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි, දෘෂ්ටිගතිකයෝ 'තිත්ථිය' යි කියනු ලැබෙත්, බොහෝ දෘෂ්ටිගතිකයෝ නානා දෘෂ්ටිගතයන් පවසති කියති බෙණෙති දක්වති වහරත් නුයි 'එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති' යන වේ.

**සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා** - ස්වකීය දෘෂ්ටියෙහි දෘෂ්ටිරාගයෙන් රැඳුණාහු වෙසෙසින් රැඳුණාහු නුයි 'සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අඤ්ඤං ඉතො -පෙ- සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා"යි.**

## 12 - 15

මෙසේ (අභිරක්ත වූ තීර්ථකයෝ) මෙහි ම ශුද්ධිය කියති, අන්‍යධර්මයන්හි විශුද්ධිය නො කියත්; මෙසේ ත් ස්වකීය මාර්ගයෙහි බොහෝ සෙයින් බැසගත් තීර්ථකයෝ ඒ ස්ව ලබ්ධියෙහි දෘඪවාද ඇත්තාහු වෙත්.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්තීති** – ඉධ සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; ‘සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති ඉධ සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; ‘අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති ඉධ සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති.

**නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහූති** – අත්තනො සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං ඨපෙත්වා සබ්බෙ පරවාදෙ ඛිපන්ති උක්ඛිපන්ති පරික්ඛිපන්ති: සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, නත්ථෙ’ත්ථ සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා මුච්චන්ති වා විමුච්චන්ති වා පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ජතුක්කා[1] පරිත්තාති එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති – නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු.

**එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨාති** – තිත්ථං වුච්චති දිට්ඨිගතං; තිත්ථියා වුච්චන්ති දිට්ඨිගතිකා; පුථු තිත්ථියා පුථු දිට්ඨිගතෙසු නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති – එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා.

**සකායනෙ තත්ථ දළ්හං වදානාති** – ධම්මො සකායනං, දිට්ඨි සකායනං පටිපදා සකායනං, මග්ගො සකායනං, සකායනෙ දළ්හවාදා ථිරවාදා බලිකවාදා අවට්ඨිතවාදාති – සකායනෙ තත්ථ දළ්හං වදානා.

තෙනාහ භගවා:

“ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා
සකායනෙ තත්ථ දළ්හං වදානා”ති.

**12 – 16**

සකායනෙ වාපි දළ්හං වදානො
කං තත්ථ[2] බාලොති පරං දහෙය්‍ය,
සයං ’ව සො මෙධගමාවහෙය්‍ය[3]
පරං වදං බාලමසුද්ධිධම්මං.

1. ජතුක්කා - සීමු. II.
2. කමෙත්ථ - මජසං. PST. 3. මෙධකං ආවහෙය්‍ය - ප.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති** - මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති, කියති බෙණෙයි දක්වති ව්‍යවහාර කෙරෙත්: 'ශාශ්වත යැ ලොකය, මෙය මැ සැබව, අන්‍යය මොඝ යැයි මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. 'අශාශ්වත යැ ලොකය . සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නොවෙයි, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති යනු වේ.

**නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු** - තමාගේ ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය හැර සියලු පරවාදයන් දුරු කෙරෙති, බැහැර කෙරෙති, විසුරුවත්: 'ඒ ශාස්තෘ අසර්වඥ යැ, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය සොඳුරු නො වෙයි, ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය නෛර්‍ය්‍යාණික නො වෙයි, එහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය හෝ මුක්තිය විමුක්තිය පරිමුක්තිය හෝ නැත, එහි (සත්ත්වයෝ) ශුද්ධ - විශුද්ධ පරිශුද්ධ හෝ නො වෙති, මුක්ත - විමුක්ත - පරිමුක්ත හෝ වන්නාහු නැති, හීනයෝ යැ නිහීනයෝ යැ ඔමකයෝ යැ ලාමකයෝ යැ ඡත්තකයෝ යැ පරිත්තයෝ යැ'යි මෙසේ පවසති, මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු' යනු වේ.

**එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා** - 'තිත්ථ'යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි, තිත්ථියා'යි දෘෂ්ටිගතිකයෝ කියනු ලැබෙත්; බොහෝ තීර්ථකයෝ බොහෝ දෘෂ්ටිගතයන්හි පිවිසියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු නුයි 'එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා' යනු වේ.

**සකායනෙ තත්ථ දළ්හං වදානා** - ධර්ම සවකීය මාර්ග යැ, දෘෂ්ටිය සවකීය මාර්ග යැ, ප්‍රතිපදාව සවකීය මාර්ග යැ, මාර්ගය සවකීය මාර්ග යැ සවකීය මාර්ගයෙහි දැඩි වාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු බලවත් වාද ඇත්තාහු පිහිටා කියන ලද වාද ඇත්තාහු නුයි 'සකායනෙ තත්ථ දළ්හං වදානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“ඉධෙව සුද්ධිං ඉති -පෙ- සකායනෙ තත්ථ දළ්හං වදානා”යි.

12 - 16

තවද සවකීය දෘෂ්ටිමාර්ගයෙහි මැ දැඩිව කියන්නාවූ තීර්ථක තෙම ඒ සවකීය මාර්ගයෙහි ලා අන්‍ය වූ කවරක්හු බාල යැයි දක්වන්නේ ද, හෙතෙම අන්‍යයා බාලයක්හු කොට අශුද්ධිධර්ම ඇත්තක්හු කොට කියනුයේ තෙමේ මැ කලහය එළවන්නේ යි.

**සකායනෙ වාපි දළ්හං වදානොති** – ධම්මො සකායනං, දිට්ඨි සකායනං, පටිපදා සකායනං, මග්ගො සකායනං සකායනෙ දළ්හවාදො වීරවාදො බලිකවාදො අවට්ඨිතවාදොති – සකායනෙ වාපි දළ්හං වදානො.

**කං තත්ථ බාලොති පරං දහෙය්‍යාති** – තත්ථාති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා පරං බාලතො හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො කං දහෙය්‍ය? කං පස්සෙය්‍ය? කං දක්ඛෙය්‍ය? කං ඔලොකෙය්‍ය? කං නිජ්ඣායෙය්‍ය? කං උපපරික්ඛෙය්‍යාති – කං තත්ථ බාලොති පරං දහෙය්‍ය.

**සයංව සො මෙධගමාවහෙය්‍ය පරං වදං බාලමසුද්ධිධම්මන්ති** – පරො බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තො අසුද්ධිධම්මො අවිසුද්ධිධම්මො අපරිසුද්ධිධම්මො අවොදාතධම්මොති එවං වදන්තො එවං කථෙන්තො එවං භණන්තො එවං දීපයන්තො එවං වොහරන්තො සයමෙව කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං ආවහෙය්‍ය සමාවහෙය්‍ය ආහරෙය්‍ය සමාහරෙය්‍ය ආකඩ්ඪෙය්‍ය සමාකඩ්ඪෙය්‍ය ගණ්හෙය්‍ය[1] පරාමසෙය්‍ය අභිනිවිසෙය්‍යාති – සයංව සො මෙධගමාවහෙය්‍ය පරං වදං බාලමසුද්ධි-ධම්මං.

තෙනාහ භගවා:

"සකායනෙ වාපි දළ්හං වදානො
කං තත්ථ බාලොති පරං දහෙය්‍ය,
සයංව සො මෙධගමාවහෙය්‍ය
පරං වදං බාලමසුද්ධිධම්ම"න්ති.

## 12 – 17

විනිච්ඡයෙ ඨත්වා සයං පමාය
උද්ධං සො[2] ලොකස්මිං විවාදමෙති,
හිත්වාන සබ්බානි විනිච්ඡයානි
න මෙධගං[3] කුරුතෙ[4] ජන්තු ලොකෙ.

**විනිච්ඡයෙ ඨත්වා සයං පමායාති** – 'විනිච්ඡයා' වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨි-ගතානි; විනිච්ඡයදිට්ඨියා ඨත්වා පතිට්ඨහිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනි-විසිත්වාති – විනිච්ඡයෙ ඨත්වා; **සයං පමායාති** සයං පමාය පමිණිත්වා[5] අයං සත්ථා සබ්බඤ්ඤූ'ති සයං පමාය පමිණිත්වා අයං ධම්මො ස්වාක්ඛාතො, අයං ගණො සුපටිපන්නො, අයං දිට්ඨි භද්දිකා, අයං පටිපදා සුපඤ්ඤත්තා, අයං මග්ගො නීයානිකො'ති සයං පමාය පමිණිත්වාති – විනිච්ඡයෙ ඨත්වා සයං පමාය.

---

1. ගණ්හෙය්‍ය – මජ්සං. 2. උද්ධං ස. – සීමු. II. මජ්සං. 3. මෙධකං – ප.
4. මෙධගං කුබ්බති – සීමු. II. මජ්සං. 5. සමිනිත්වා – පු.

**සකායනෙ වාපි දළ්හං වදානො** - ධර්මය සවකීය මාර්ග යැ, දෘෂ්ටිය සවමාර්ග යැ, ප්‍රතිපදාව සවමාර්ග යැ මාර්ගය සවමාර්ග යැ සවකීය දෘෂ්ටිමාර්ගයෙහි දැඩි වාද ඇත්තේ ස්ථිරවාද ඇත්තේ බලවත් වාද ඇත්තේ පිහිටා කියන ලද වාද ඇත්තේ තුමී 'සකායනෙ වාපි දළ්හං වදානො' යනු වේ.

**කං තත්ථ බාලොති පරං දහෙය්‍ය** - 'තත්ථ' යනු: සවකීය දෘෂ්ටියෙහි සවකීය කැමැත්තෙහි සවකීය රුචියෙහි සවකීය ලබ්ධියෙහි බාල හෙයින් නිහීන හෙයින් ඔමක හෙයින් ලාමක හෙයින් ජත්තක හෙයින් පරිත්ත හෙයින් අන්‍ය වූ කවරක්හු සලකන්නේ ද, කවරක්හු බලන්නේ ද කවරක්හු දක්නේ ද කවරක්හු අවලොකනය කරන්නේ ද, කවරක්හු සිතන්නේ ද, කවරක්හු විමසන්නේ දැයි 'කං තත්ථ බාලොති පරං දහෙය්‍ය' යනු වේ.

**සයං ච සො මෙධගමාවහෙය්‍ය පරං වදං බාලමසුද්ධිධම්මං** - මෙරමා බාල යැ හීන යැ නිහීන යැ ඔමක යැ ලාමක යැ ජත්තක යැ පරිත්ත යැ අශුද්ධිධර්ම ඇත්තේ යැ අවිශුද්ධිධර්ම ඇත්තේ යැ අපරිශුද්ධිධර්ම ඇත්තේ යැ අනවදාතධර්ම ඇත්තේ යැ'යි මෙසේ පවසනුයේ මෙසේ කියනුයේ මෙසේ බණනුයේ මෙසේ දක්වනුයේ මෙසේ වහරනුයේ තෙමේ මැ කලහය භණ්ඩනය විග්‍රහය විවාදය මේධගය එළවන්නේය මොනවට එළවන්නේය, හැර ගන්නේය මොනවට හැරගන්නේය, අදින්නේය මොනවට අදින්නේය, ගන්නේය, දැහැගන්නේය, පිහිටාගන්නේ තුමී 'සයං ච සො මෙධගමාවහෙය්‍ය පරං වදං බාලමසුද්ධිධම්මං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“සකායනෙ වාපි -පෙ- පරං වදං බාලමසුද්ධි ධම්මං”යි.**

**12 - 17**

හෙතෙම ලබ්ධිවිනිශ්චයෙහි සිට තෙමේ මැ (ශාස්තෘ ආදිය) ප්‍රමාණ කොට ගෙන ලොකයෙහි බොහෝ සෙයින් (-මතුමත්තෙහි) විවාදයට පැමිණෙයි. (මෙසේ ලබ්ධියෙහි දෙෂ දුටු) පුද්ගල තෙම සියලු දෘෂ්ටිවිනිශ්චයන් හැරපියා ලොකයෙහි කලහ නො කරන්නේ යි.

**විනිච්ඡයෙ ඨත්වා සයං පමාය** - 'විනිච්ඡය'යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙති, විනිශ්චයදෘෂ්ටියෙහි සිට පිහිටා ගෙන දැහැගෙන පිළිගෙන තුමී 'විනිච්ඡයෙ ඨත්වා' යනු වේ; **සයං පමාය** - 'මේ ශාස්තෘ සර්වඥ ය'යි තෙමේ මැනැ පමණ කොට, 'මේ ධර්මය ස්වාඛ්‍යාත යැ'යි තෙමේ මැනැ පමණ කොට, 'මේ ගණයා සුප්‍රතිපන්න යැ' මේ දෘෂ්ටිය භද්‍ර යැ' 'මේ ප්‍රතිපදාව සුප්‍රඥප්ත යැ, 'මේ මාර්ගය නෛර්‍යාණික යැ'යි තෙමේ මැනැ පමණ කොට තුමී 'විනිච්ඡයෙ ඨත්වා සයං පමාය' යනු වේ.

**උද්ධං සො ලොකස්මිං විවාදමෙතීති** - ‘උද්ධං’[1] වුච්චති අනාගතං අත්තනො වාදං උද්ධං ඨපෙත්වා සයමෙව කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං එති උපෙති උපගච්ඡති ගණ්හාති පරාමසති අභිනිවිසතීති එවම්පි - උද්ධං සො ලොකස්මිං විවාදමෙති. අථවා අඤ්ඤෙන උද්ධං වාදෙන සද්ධිං කලහං කරොති භණ්ඩනං කරොති විග්ගහං කරොති විවාදං කරොති මෙධගං කරොති: ‘න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී’ති එවම්පි - උද්ධං සො ලොකස්මිං විවාදමෙති.

**හිත්වාන සබ්බානි විනිච්ඡයානීති** - විනිච්ඡයං වුච්චන්ති ද්වාසට්ඨිදිට්ඨිගතානි; දිට්ඨිවිනිච්ඡයා සබ්බෙ විනිච්ඡයෙ[2] හිත්වා චජිත්වා පරිච්චජිත්වා ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති - හිත්වාන සබ්බානි විනිච්ඡයානි.

**න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙති** - න කලහං කරොති, න භණ්ඩනං කරොති, න විග්ගහං කරොති, න විවාදං කරොති, න මෙධගං කරොති. වුත්තං හෙතං භගවතා: “එවං විමුත්තචිත්තො ඛො අග්ගිවෙස්සන භික්ඛු න කෙනචි සංවදති, න කෙනචි විවදති, යඤ්ච ලොකෙ වුත්තං, තෙන ච වොහරති අපරාමස”න්ති[a] **ජන්තූති** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[3] ජන්තු ඉන්දගු[4] මනුජො; **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති - න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙති.

තෙනාහ භගවා:

“විනිච්ඡයෙ ඨත්වා සයං පමාය
උද්ධං සො ලොකස්මිං විවාදමෙති,
හිත්වාන සබ්බානි විනිච්ඡයානි
න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙති”.

**චූළවියූහසුත්තනිද්දෙසො සමත්තො ද්වාදසමො.**

# 13

## මහාවියූහසුත්තනිද්දෙසො

අථ මහාවියූහසුත්තනිද්දෙසො වුච්චති.

**13 - 1**

යෙ කෙචි’මෙ දිට්ඨිපරිබ්බසානා
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,[5]
සබ්බෙව තෙ නින්දමන්වානයන්ති
අථො පසංසම්පි ලභන්ති තත්ථ.

---

1 උද්ධං සො - සීමු. II. මජසං.
2. සබ්බා විනිච්ඡයදිට්ඨියො - මජුප. සබ්බා විනිච්ඡිතදිට්ඨියො. - PTS.
3. ජතු - සීමු. II. ජගු - PTS. 4. හින්දගු - සීමු. II.
5. පවාදියන්ති - PTS. a. මජ්ඣිමනිකාය - දීඝනඛසුත්ත.

**උද්ධං සො ලොකස්මිං විවාදමෙති** – 'උද්ධං' යි අනාගතය කියනු ලැබෙයි, තමාගේ වාදය මතුයෙහි තබා තෙමේ මැ කලහ – භණ්ඩන – විග්‍රහ – විවාද – මේධගට එයි පැමිණෙයි එළැඹෙයි, ග්‍රහණය කෙරෙයි පරාමර්ශ කෙරෙයි අභිනිවේශය කෙරේ නුයි මෙසේ ත් – 'උද්ධං සො ලොකස්මිං විවාදමෙති' යනු වේ; නොහොත් තමා මතුයෙහි ලා කථා කරන අනෙකක්හු සමග කලහ කෙරෙයි, ඩබර කෙරෙයි, විග්‍රහ කෙරෙයි, විවාද කෙරෙයි, මේධග කෙරෙයි: 'තෝ මේ ධර්මවිනය නො දන්නෙහි...නොහොත් ඉදින් පොහොනෙහි නම් (තමා) මුදාගනැ'යි මෙසේත් 'උද්ධං සො ලොකස්මිං විවාදමෙති' යනු වේ.

**හිත්වාන සබ්බානි විනිච්ඡයානි** – 'විනිච්ඡය'යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙති; දෘෂ්ටිවිනිශ්චයයන්, සියලු දෙසැට දෘෂ්ටීන් හැර ත්‍යාග කොට පරිත්‍යාග කොට බැහැර කොට දුරු කොට නසා විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'හිත්වාන සබ්බානි විනිච්ඡයානි, යනු වේ.

**න මේධගං කුරුතෙ ජන්තු ලොකෙ** – කලහ නො කෙරෙයි, ඩබර නො කෙරෙයි, විග්‍රහ නො කෙරෙයි, විවාද නො කෙරෙයි, මේධග නො කෙරෙයි; මේ වදාළේ මැයි: භාග්‍යවතුන් විසින් – "ගිනිවෙස්න, මෙසේ මිදුණු සිත් ඇති මහණ තෙම කිසිවක්හු සමග සංවාද නො කෙරෙයි, කිසිවක්හු සමග විවාද නො කෙරෙයි, තවද ලොකයෙහි යමක් කියන ලද නම්, දැඩිව නො ගනිමින් එයින් ව්‍යවහාර කෙරේ යැ"යි. **ජන්තු** යනු: සත්ත්ව– නර – මානව –පුරුෂ – පුද්ගල –ජීව – ජාගු – ජන්තු–ඉන්දගු–මනුජ තෙම; **ලොකෙ** යනු: අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි 'න මේධගං කුරුතෙ ජන්තු ලොකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"විනිච්ඡයෙ ඨත්වා -පෙ- න මේධගං කුරුතෙ ජන්තු ලොකෙ"යි.**

**දොළොස්වැනි 'චූලවියූහ' සූත්‍රනිර්දේශය සමාප්ත යි.**

# 13

# මහාවියූහසූත්‍රනිර්දේශය

ඉක්බිති 'මහාවියූහ' සූත්‍රනිර්දේශය කියනු ලැබේ:

## 13 – 1

**සවකීය දෘෂ්ටිය දැඩි වැ ගෙන වසන්නාවූ යම් කිසි මහණබමුණු කෙනෙක් 'මේ (අපගේ ලබ්ධිය) මැ සැබව, අන්‍යය තුච්ඡ යැ'යි ද කියත් නම්, ඔහු සියල්ලෝ මැ (තමන් වෙත) නින්දාව පුනපුනා එළවත් ද? නොහොත් ඒ දෘෂ්ටිය නිමිති කොට ගෙන ප්‍රශංසාත් ලබත් ද?**

**යෙ කෙචි'මෙ දිට්ඨිපරිබ්බසානාති** – 'යෙ කෙචී'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'යෙ කෙචී'ති. **දිට්ඨිපරිබ්බසානාති** සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා. තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්ති. යථා අගාරිකා වා ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තිසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති, එවමෙවං සන්තෙකෙ -පෙ- පරිවසන්තීති 'යෙ කෙචි' මෙ දිට්ඨි පරිබ්බසානා.'

**ඉදමෙව සච්චන්ති ච වාදයන්තීති** – 'සස්සතො ලොකො' ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – ඉදමෙව සච්චන්ති ච වාදයන්ති.

**සබ්බෙව තෙ නින්දමන්වානයන්තීති** – සබ්බෙව තෙ සමණබ්‍රාහ්මණා නින්දමෙව අන්වෙන්ති, ගරහමෙව අන්වෙන්ති, අකිත්තිමෙව අන්වෙන්ති, සබ්බෙ නින්දිතායෙව හොන්ති, ගරහිතායෙව හොන්ති අකිත්තිතා යෙව හොන්තීති – සබ්බෙව තෙ නින්දමන්වානයන්ති.

**අථො පසංසම්පි ලභන්ති තත්ථාති** – තත්ථ සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා පසංසං ථොමනං කිත්තිං වණ්ණ-හාරිකං[1] ලභන්ති පටිලභන්ති උපගච්ඡන්ති වින්දන්තීති – අථො පසංසම්පි ලභන්ති තත්ථ.

තෙනාහ සො නිම්මිතො:

"යෙ කෙචි 'මෙ දිට්ඨිපරිබ්බසානා
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,
සබ්බෙව තෙ නින්දමන්වානයන්ති
අථො පසංසම්පි ලභන්ති තත්ථා"ති.

**18 - 2**

අප්පඤ්හි එතං න අලං[2] සමාය
දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමි,
එතම්පි දිස්වා න විවාදයෙථ
ඛෙමාභිපස්සං අවිවාදභූමිං.[3]

**අප්පඤ්හි එතං න අලං සමායාති** – 'අප්පඤ්හි එත'න්ති අප්පකං එතං, ඔමකං එතං, ථොකං එතං, ලාමකං එතං, ඡතුක්කං එතං, පරිත්තකං එතන්ති – අප්පඤ්හි එතං; **න අලං සමායාති** නාලං රාගස්ස සමාය දොසස්ස සමාය මොහස්ස සමාය කොධස්ස උපනාහස්ස මක්ඛස්ස පළාසස්ස ඉස්සාය මච්ඡරියස්ස මායාය සාඨෙය්‍යස්ස ථම්භස්ස සාරම්භස්ස මානස්ස අතිමානස්ස මදස්ස පමාදස්ස සබ්බකිලෙසානං සබ්බදුච්චරිතානං සබ්බ-පරිළාහානං සබ්බසන්තාපානං සබ්බාකුසලාභිසඞ්ඛාරානං සමාය උපසමාය වූපසමාය නිබ්බානාය[4] පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියාති – අප්පඤ්හි එතං න අලං සමාය.

---

1. වණ්ණහාරියං – ස. 2. අප්පඤ්හෙතං නාලං – මජසං.
3. අවිවාදභුම්මං – PTS. 4. නිබ්බාපනාය – ස.

**යෙ කෙචි මෙ දිට්ඨිපරිබ්බසානා** – 'යෙ කෙචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වාකාරයෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි, තෙල 'යෙ කෙචි' යනු; **දිට්ඨිපරිබ්බසානා**–දෘෂ්ටිගතික වූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔවුහු දෙසැට දිට්ඨි අතුරෙන් එක්තරා දෘෂ්ටිනතයක් ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිවිසගෙන තම්තමාගේ දෘෂ්ටියෙහි වෙසෙති මොනවට වෙසෙති වෙසෙසින් වෙසෙති හාත්පසින් වෙසෙත්. යම්සේ ගෙහිමියෝ හෝ ගෙවල වෙසෙත්ද, ඇවැත් බහුලයෝ හෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ හෝ කෙලෙස්හි වෙසෙත් ද, එපරිද්දෙන් ඇතැම් මහණබමුණු කෙනෙක්... හාත්පසින් වෙසෙත් නුයි 'යෙ කෙචි'මෙ දිට්ඨිපරිබ්බසානා' යනු වේ.

**ඉදමෙව සච්චන්ති ච වාදයන්ති** - 'ශාශ්වත යැ ලොකය, මෙය මැ සැබෑව අන්‍යය මොස යැ'යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. 'අශාශ්වත යැ ලොකය...සත්ත්වයා මරණින් මත්තෙහි නො මැ වෙයි, නො වන්නේ නො වෙයි. මෙය මැ සැබව, අන්‍යය මොස යැ'යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'ඉදමෙව සච්චන්ති ච වාදයන්ති' යනු වේ.

**සබ්බෙව තෙ නින්දමන්වානයන්ති** – ඒ සියලු මැ මහණබමුණෝ නින්දාවට ම පැමිණෙති, ගර්හාවට ම, පැමිණෙති අකීර්තියට ම පැමිණෙයි, සියල්ලෝ නිගා කරන ලද්දාහු ම වෙති, ගරහන ලද්දාහු ම වෙති, අවමන් කරන ලද්දාහු ම වෙත් නුයි 'සබ්බෙව තෙ නින්දමන්වානයන්ති' යනු වේ.

**අථො පසංසම්පි ලභන්ති තත්ථ** – එහි සවකීය දෘෂ්ටියෙහි සවකීය කැමැත්තෙහි සවකීය රුචියෙහි සවකීය ලබ්ධියෙහි ප්‍රශංසාව ස්තුතිය කීර්තිය ගුණ වැඩීම ලබති පිළිලබති පැමිණෙති විඳිත් නුයි 'අථො පසංසම්පි ලභන්ති තත්ථ' යනු වේ.

එසින් කීහ ඒ මැවූණු බුදුනු:

**"යෙ කෙචි මෙ –පෙ– අථො පසංසම්පි ලභන්ති තත්ථ"**යි.

## 13 - 2

තෙල ප්‍රශංසා සඞ්ඛ්‍යාත වාදඵලය අල්ප මැ ය. (රාගාදීන්ගේ) සන්හිඳීම පිණිස සමර්ථ නො වේ. විවාදයාගේ (ජය – පරාජයාදි) ඵල දෙකක් කියමි. (විවාදයාගේ) තෙල ආදීනවය ද දැක, අවිවාදභූමි සඞ්ඛ්‍යාත නිවන ක්ෂේම යයි දක්මින් විවාද නො කරන්නේ යි.

**අප්පඤ්හි එතං න අලං සමාය** – 'අප්පඤ්හි එතං' යනු: තෙල අල්ප යැ, තෙල පහත් යැ, තෙල මඳ යැ, තෙල පච්චූ යැ, තෙල අහේතුක යැ, තෙල පරිත්ත නුයි 'අප්පඤ්හි එතං' යනු වේ. **න අලං සමාය** – රාගයාගේ ශමනයට ද්වේෂයාගේ ශමනයට මෝහයාගේ ශමනයට ක්‍රොධ – උපනාහ මක්ඛ – පලාස – ඊර්ෂ්‍යා – මාත්සර්‍ය- මායා – සාඨෙය්‍ය – ස්තම්භ – සංරම්භ- මාන – අතිමාන – මද – ප්‍රමාදයාගේ සියලු කෙලෙසුන්ගේ සියලු දුශ්චරිත- යන්ගේ සියලු දරථයන්ගේ සියලු පරිදාහයන්ගේ සියලු සන්තාපයන් ගේ සියලු අකුශලාභිසංස්කාරයන්ගේ ශමනයට උපශමනයට සන්හිඳු වීමට අමාමහනිවනට (මාර්ගයෙන්) කෙලෙසුන් දුරලීමට (ඵලයෙන්) අනුත්පාදනිරොධයට සමර්ථ නො වේ නුයි 'අප්පඤ්හි එතං න අලං සමාය' යනු වේ.

**දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමීති** – දිට්ඨිකලහස්ස දිට්ඨිභණ්ඩනස්ස දිට්ඨිවිග්ගහස්ස දිට්ඨිවිවාදස්ස දිට්ඨිමෙධගස්ස ද්වෙ ඵලානි හොන්ති: ජයපරාජයො හොති, ලාභාලාභො හොති, යසායසො හොති, නින්දාපසංසා හොති, සුඛදුක්ඛං හොති, සොමනස්සදෙමනස්සං හොති, ඉට්ඨානිට්ඨං හොති, අනුනයපටිඝං හොති, උග්ඝාතිනිග්ඝාති හොති, අනුරොධවිරොධො හොති; අථ වා තං කම්මං නිරයසංවත්තනිකං තිරච්ඡානයොනිසංවත්තනිකං පෙත්තිවිසයසංවත්තනිකන්ති බ්‍රෑමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති – දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමි.

**එතම්පි දිස්වා න විවාදයෙථාති** – ‘එතම්පි දිස්වා’ති එතං ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා දිට්ඨිකලහෙසු දිට්ඨිභණ්ඩනෙසු දිට්ඨිවිග්ගහෙසු දිට්ඨිවිවාදෙසු දිට්ඨිමෙධගෙසූති එතම්පි දිස්වා; **න විවාදයෙථාති** න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, කලහා භණ්ඩනා විග්ගහා විවාදා මෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – එතම්පි දිස්වා න විවාදයෙථ.

**ඛෙමාභිපස්සං අවිවාදභූමින්ති** – අවිවාදභූමිං වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං; එතං අවිවාදභූමිං ඛෙමතො තාණතො ලෙණතො සරණතො අභයතො අච්චුතතො අමතතො නිබ්බානතො පස්සන්තො දක්ඛන්තො ඔලොකෙන්තො නිජ්ඣායන්තො උපපරික්ඛන්තොති – ඛෙමාභිපස්සං අවිවාදභූමිං.

තෙනාහ භගවා:

“අප්පඤ්හි එතං න අලං සමාය
දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමි,
එතම්පි දිස්වා න විවාදයෙථ
ඛෙමාභිපස්සං අවිවාදභූමි”න්ති.

**18 - 8**

යා කාචිමා සම්මුතියො පුථුජ්ජා
සබ්බාව එතා න උපෙති විද්වා,
අනුපයො සො උපයං කිමෙය්‍ය[1]
දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො.[2]

**යා කාචිමා සම්මුතියො පුථුජ්ජාති** – ‘යා කාචී’ති සබ්බෙන සබ්බං සබ්බථා[3] සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං[4] යා කාචී’ති; **සම්මුතියොති** සම්මුතියො වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි දිට්ඨිසම්මුතියො;[5] **පුථුජ්ජාති** පුථුජ්ජනෙහි ජනිතා සම්මුතියොති පුථුජ්ජා; පුථු නානා ජනෙහි ජනිතා වා සම්මුතියොති පුථුජ්ජාති – යා කාචි’මා සම්මුතියො පුථුජ්ජා.

1. කමෙය්‍ය - මජසං. 2. ඛන්තිමකුප්පමානො - මජසං.
3. සබ්බතො - ස්‍යා. 4. පරියාදනවචනමෙතං - මජසං.
5. තා සම්මුතියො - ස.

**දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමි** – දෘෂ්ටිකලහයාගේ දෘෂ්ටිභණ්ඩනයාගේ දෘෂ්ටිවිග්‍රහයාගේ දෘෂ්ටිවිවාදයාගේ දෘෂ්ටිමෙධගයාගේ ඵල දෙකෙක් වෙති; ජය – පරාජය වෙයි, ලාභ – අලාභ වෙයි, යශස් – අයශස් වෙයි, නින්‍දා – ප්‍රශංසා වෙයි, සුව – දුක් වෙයි, සොමිනස් – දොම්නස් වෙයි, ඉෂ්ට – අනිෂ්ට වෙයි, අනුනය – ප්‍රතිඝ වෙයි, අනුග්‍රහ – නිග්‍රහ වෙයි, සෙනහ – කොප වේ; නොහොත් ඒ කර්මය නිරයෙහි ඉපදීම පිණිස පවත්නේය, තිරිසන්යොන්හි ඉපදීම පිණිස පවත්නේය, ප්‍රෙතවිෂයෙහි ඉපදීම පිණිස පවත්නේයැ'යි කියමි පවසමි පනවමි පිහිටුවමි, විවරණ කෙරෙමි, විභාග කෙරෙමි, ප්‍රකට කෙරෙමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමි' යනු වේ.

**එතම්පි දිස්වා න විවාදයෙථ** – 'එතම්පි දිස්වා' යනු: තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට දෘෂ්ටිකලහයෙහි දෘෂ්ටිභණ්ඩනයෙහි දෘෂ්ටිවිග්‍රහයෙහි දෘෂ්ටිවිවාදයෙහි දෘෂ්ටිමෙධගයෙහි නුයි 'එතම්පි දිස්වා' යනු වේ. **න විවාදයෙථ** – කලහ නො කරන්නේය, ඛබර නො කරන්නේය, විග්‍රහ නො කරන්නේය, විවාද නො කරන්නේය, මෙධග නො කරන්නේය, කලහ භණ්ඩන විග්‍රහ විවාද මෙධග හරන්නේය, දුරු කරන්නේය විගතාන්ත කරන්නේය, අනභාවයට පමුණුවන්නේය, කලහයෙන් භණ්ඩන – විග්‍රහ – විවාද – මෙධගයෙන් දුරු වූයේ වෙන්වූයේ වෙසෙසින් වෙන්වූයේ නික්මැගියේ බැහැරි වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ වන්නේය, විගතමර්‍යාදා කල සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'එතම්පි දිස්වා න විවාදයෙථ' යනු වේ.

**ඛෙමාභිපස්සං අවිවාදභූමිං** – 'අවිවාදභූමි'යි අමාමහනිවන කියනු ලැබෙයි: යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාක්‍ෂයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්‍වාණයෙක් වේ ද එය යි, තෙල අවිවාද භූමිය ක්‍ෂෙම හෙයින් ත්‍රාණ හෙයින් ලෙන හෙයින් සරණ හෙයින් අභය හෙයින් අච්‍යුත හෙයින් අමෘත හෙයින් නිර්‍වාණ හෙයින් බලනුයේ දක්නේ අවලොකනය කරනුයේ සිතනුයේ විමසනුයේ නුයි 'ඛෙමාභිපස්සං අවිවාදභූමිං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අප්පකඤ්හි එතං -පෙ- ඛෙමාභිපස්සං අවිවාදභූමිං"**යි.

**13 - 8**

පුහුදුනුවන් කෙරෙන් පහළ වූ යම් කිසි දෘෂ්ටි කෙනෙක් වෙත් ද, විද්වද් තෙමේ තෙල සියලු මැ දෘෂ්ටීන්ට නො පැමිණෙයි. (තෘෂ්ණා දෘෂ්ටි) උපය රහිත වූ හෙතෙම දෘෂ්ට – ශ්‍රැත – මුතශුද්ධියෙහි රුචි නො කරනුයේ රූපාදි උපයකට කිම පැමිණෙන්නේ ද.

**යා කාචිමා සම්මුතියො පුථුජ්ජා** – 'යා කාචි' යනු: සියල්ලෙන් සියල්ල සර්‍වථායෙන් සියල්ල අශෙෂ කොට නිශෙෂ කොට භාත්පසින් ගන්නා වචනයෙකි: තෙල 'යා කාචි' යනු; **සම්මුතියො** – 'සම්මුති'යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙති, ඒ දෘෂ්ටිසම්මුතීහු; **පුථුජ්ජා** – පුහුදුනුවන් විසින් උපදවන ලද සම්මුතීහු නුයි 'පුථුජ්ජා' නම් වෙති: බොහෝ නානා ජනයන් විසින් උපදවන ලද සම්මුතීහු නුයි හෝ 'පුථුජ්ජා' නම් වෙත් නුයි 'යං කාචිමා සම්මුතියො පුථුජ්ජා' යනු වේ.

**සබ්බාව එතා න උපෙති විද්වාති** – විද්වා විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී; සබ්බාව එතා දිට්ඨිසම්මුතියො නෙති, න උපෙති, න උපගච්ඡති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති – සබ්බාව එතා න උපෙති විද්වා.

**අනූපයො සො උපයං කිමෙය්‍යාති** – 'උපයොති' ද්වෙ උපයා: තණ්හූපයො ච දිට්ඨූපයො ච –පෙ– අයං දිට්ඨූපයො, තස්ස තණ්හූපයො පහීනො, දිට්ඨූපයො පටිනිස්සට්ඨො; තණ්හූපයස්ස පහීනත්තා දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා අනූපයො පුග්ගලො කිං රූපං උපෙය්‍ය උපගච්ඡෙය්‍ය ගණ්හෙය්‍ය පරාමසෙය්‍ය අභිනිවිසෙය්‍ය 'අත්තා මෙ'ති, කිං වෙදනං – කිං සඤ්ඤං – කිං සඞ්ඛාරෙ – කිං විඤ්ඤාණං – කිං ගතිං – කිං උපපත්තිං – කිං පටිසන්ධිං – කිං භවං – කිං සංසාරං – කිං වට්ටං උපෙය්‍ය උපගච්ඡෙය්‍ය ගණ්හෙය්‍ය පරාමසෙය්‍ය අභිනිවිසෙය්‍යාති – අනූපයො සො උපයං කිමෙය්‍ය.

**දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානොති** – දිට්ඨෙ වා දිට්ඨසුද්ධියා වා සුතෙ වා සුතසුද්ධියා වා මුතෙ වා මුතසුද්ධියා වා ඛන්තිං අකුබ්බමානො ඡන්දං අකුබ්බමානො පෙමං අකුබ්බමානො රාගං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති – දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො.

තෙනාහ භගවා:

"යා කාචිමා සම්මුතියො පුථුජ්ජා
සබ්බාව එතා න උපෙති විද්වා,
අනූපයො සො උපයං කිමෙය්‍ය
දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො"ති.

## 18 – 4

සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං
වතං[1] සමාදාය උපට්ඨිතා සෙ,
ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධිං
භවූපනීතා කුසලාවදානා.

**සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධින්ති** – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලුත්තමවාදා. තෙ සීලමත්තෙන සඤ්ඤමමත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ආහංසු වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; සමණමුණ්ඩිකාපුත්තො එවමාහ: – "චතූහි ඛො අහං ථපති ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං. කතමෙහි චතූහි:

1. වත්තං - PTS.

**සඞ්ඛාය එතා න උපෙති විද්වා** – විද්‍යාද් නොහොත් විද්‍යාවට පැමිණියේ නුවණැතියේ විමංසනප්‍රඥ ඇතියේ තීරණප්‍රඥ ඇතියේ තෙල සියලු මැ දෘෂ්ටිසම්මුතීන්ට නො එයි, නො පැමිණෙයි, උපගමනය නො කෙරෙයි, නො ගනී, නො දැනගනී, නො පිවිසගනී නුයි 'සඞ්ඛාය එතා න උපෙති විද්වා' යනු වේ.

**අනූපයො සො උපයං කිමෙය්‍ය** – 'උපය' නම්: තෘෂ්ණා උපය ද දෘෂ්ටි උපය දැයි උපයයෝ දෙකෙදෙනෙකි...මේ දෘෂ්ටිඋපය නම්. ඔහු විසින් තෘෂ්ණා උපය ප්‍රහීණ යැ, දෘෂ්ටිඋපය දුරලන ලද්දේය. තෘෂ්ණාඋපය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිඋපය දුරලූ බැවින් උපය රහිත වූ පුද්ගල තෙම කිම රූපය 'මාගේ ආත්මය' යි පැමිණෙන්නේ ද එළැඹෙන්නේ ද ග්‍රහණය කරන්නේ ද පරාමර්ශනය කරන්නේ ද අභිනිවෙශය කරන්නේ ද, කිම වේදනාව-සංඥාව – සංස්කාරයන් – විඥානය – ගතිය –උත්පත්තිය – ප්‍රතිසන්ධිය– භවය-සංසාරය – කිම වෘත්තයට පැමිණෙන්නේ ද, එළඹෙන්නේ ද, ග්‍රහණය කරන්නේ ද, පරාමර්ශණය කරන්නේ ද, අභිනිවෙශය කරන්නේ ද'යි 'අනූප යො සො උපයං කිමෙය්‍ය' යනු වේ.

**දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො** – රූපායතන සඞ්ඛ්‍යාත දෘෂ්ටයෙහි හෝ දෘෂ්ටශුද්ධියෙහි හෝ ශබ්දායතන සඞ්ඛ්‍යාත ශ්‍රැතයෙහි හෝ ශ්‍රැතශුද්ධියෙහි හෝ ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතන සඞ්ඛ්‍යාත මූතයෙහි හෝ මූතශුද්ධියෙහි හෝ රුචිය නො කරනුයේ ඡන්දය නො කරනුයේ ප්‍රේමය නො කරනුයේ රාගය නො කරනුයේ නූපදවනුයේ වෙසෙසින් නූපදවනුයේ නො නිපදවනුයේ නො පහළ කරනුයේ නුයි 'දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යා කාචි –පෙ– දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො"යි.

## 18 – 4

ශීලය මැ උතුමැයි හඟනාවූ ඇතැම් මහණබමුණු කෙනෙක් සංයම මාත්‍රයෙන් ශුද්ධිය කියති. (හස්තිව්‍රතාදි) ව්‍රතය සමාදන්ව එළැඹසිටියාහු 'මේ දෘෂ්ටියෙහි මැ හික්මෙනුවම්හ. එකල්හි මෙ සත්ත්වයාගේ ශුද්ධිය වේ' යයි භවයට පැමිණියාහු මැ කියති. (එහෙත් ඔහු) කුශලවාද ඇත්තාහු වෙත්.

**සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං** – ශීලය මැ උතුමැයි සිතන්නාවූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔවුහු ශීලමාත්‍රයෙන් සංයමමාත්‍රයෙන් සංවරමාත්‍රයෙන් අව්‍යතික්‍රමමාත්‍රයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසයි කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. ශ්‍රමණමණ්ඩිකාපුත්‍ර තෙම මෙසේ කියයි: "ගෘහපතිය යම් කරුණු සතරෙකින් සමන්විත වූ පුද්ගලයා පිරිපුන් කුසල් ඇයි උතුම් කුසල් ඇති උත්තම වූ අභීන්ත්වයට පැමිණි අයොධ්‍ය වූ (–වාදයෙන් නො පැරදවිය හැකි) ශ්‍රමණයා යැ'යි දක්වමි. කවර සතරකිනැ යත්:

ඉධ ථපති න කායෙන පාපකං[1] කම්මං කරොති; න පාපකං වාචං භාසති; න පාපකං සඞ්කප්පං සඞ්කප්පෙති; න පාපකං ආජීවං ආජීවති[2]. ඉමෙහි ඛො අහං ථපති චතූහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣ"න්ති.[ෂ] එවමෙවං සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලුත්තමවාදා, තෙ සීලමත්තෙන සඤ්ඤමමත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ආහංසු වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං.

**වතං සමාදාය උපට්ඨිතා සෙති** – 'වත'න්ති හත්ථිවතං වා අස්සවතං වා ගොවතං වා කුක්කුරවතං වා කාකවතං වා වාසුදෙවවතං වා බලදෙවවතං වා පුණ්ණභද්දවතං වා මණිභද්දවතං වා අග්ගිවතං වා නාගවතං වා සුපණ්ණවතං වා යක්ඛවතං වා අසුරවතං වා ගන්ධබ්බවතං වා මහාරාජවතං වා චන්දවතං වා සුරියවතං වා ඉන්දවතං වා බ්‍රහ්මවතං වා දෙවවතං වා දිසාවතං වා ආදාය සමාදාය ආදියිත්වා සමාදියිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා උපට්ඨිතා පච්චුපට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති[3] – වතං සමාදාය උපට්ඨිතා සෙ.

**ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධින්ති** – 'ඉධා'ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සික්ඛෙමාති** සික්ඛෙම ආචරෙම සමාචරෙම සමාදාය වත්තෙමාති ඉධෙව සික්ඛෙම; **අථස්ස සුද්ධින්ති** අථස්ස සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තින්ති – ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධිං.

**භවූපනීතා කුසලාවදානාති** – 'භවූපනීතා'ති භවූපනීතා භවූපගතා භවජ්ඣොසිතා භවාධිමුත්තාති – භවූපනීතා; **කුසලාවදානාති** කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති – භවූපනීතා කුසලාවදානා.

තෙනාහ භගවා:

"සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං
වතං සමාදාය උපට්ඨිතා සෙ,
ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධිං
භවූපනීතා කුසලාවදානා"ති.

**18 – 5**

සචෙ චුතො සීලබ්බතතො[4] හොති
ස වෙධති කම්මං විරාධයිත්වා,
ස ජප්පතී[5] පත්ථයතීධ සුද්ධිං
සත්ථාවහීනො පවසං ඝරම්හා.

---

1. පාපකම්මං - සීමු II. PTS  2. ජීවති - සයා  3. අධිමුත්තාති - සීමු. II.
ෂ. මජ්ඣිමනිකාය - සමණමණ්ඩිකාසුත්ත.
4. සීලවතතො - සීමු. II මජ්ඣං. PTS.  5. පජප්පති - මජ්ඣං. මනුප.

ගෘහපතිය, මෙහි (යමෙක්) කයින් පව්කම් නො කෙරේ ද, ලාමක වූ තෙපුල් නො බෙණේ ද, ලාමක වූ සංකල්පය නො සිතා ද, ලාමක වූ ආජීවයෙන් ජීවත් නො වේ ද, ගෘහපතිය, මේ කරුණු සතරින් යුක්ත වූ පුද්ගලයා පරිපූර්ණ වූ කුසල් ඇති උත්තම වූ කුසල් ඇති උත්තම වූ අභීත්තවයට පැමිණි අයොධ්‍ය වූ ශ්‍රමණයා' යි කියමි." මේ පරිද්දෙන් ශීලය මැ උතුමැයි වාද ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහුය; ඔවුහු ශීලමාත්‍රයෙන් සංයමමාත්‍රයෙන් සංවරමාත්‍රයෙන් අව්‍යතික්‍රමමාත්‍රයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'සීලුත්තමා සඤ්ඤමේනාහු සුද්ධිං' යනු වේ.

**වතං සමාදාය උපට්ඨිතාසෙ** – 'වත' නම්: හස්තිව්‍රතය හෝ අශ්වව්‍රතය හෝ ගොව්‍රතය හෝ කුක්කුරව්‍රතය හෝ කාකව්‍රතය හෝ වාසුදෙවව්‍රතය හෝ බලදෙවව්‍රතය හෝ පූර්ණභද්‍රව්‍රතය හෝ මණිභද්‍රව්‍රතය හෝ අග්නිව්‍රතය හෝ නාගව්‍රතය හෝ සුපර්ණව්‍රතය හෝ යක්ෂව්‍රතය හෝ අසුරව්‍රතය හෝ ගාන්ධර්වව්‍රතය හෝ මහාරාජව්‍රතය හෝ චන්ද්‍රව්‍රතය හෝ සූර්යව්‍රතය හෝ ඉන්ද්‍රව්‍රතය හෝ බ්‍රහ්මව්‍රතය හෝ දෙවව්‍රතය හෝ දිශාව්‍රතය හෝ ගෙන සමාදන්ව ආදානය කොට සමාදානය කොට ග්‍රහණය කොට පරාමර්ශනය කොට අභිනිවේශය කොට එළැඹ සිටියාහු ප්‍රත්‍යුපස්ථිත වූවාහු ඇලුණාහු පැමිණියාහු බැසගත්තාහු වැදගත්තාහු නුයි 'වතං සමාදාය උපට්ඨිතාසෙ' යනු වේ.

**ඉධේව සික්ඛෙම අථස්ස සුද්ධිං** – 'ඉධ' යනු: ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය ක්ෂාන්තියෙහි ස්වකීය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි; **සික්ඛෙම** හික්මෙම්හ හැසිරෙම්හ මොනොවට හැසිරෙම්හ සමාදන්ව පවතුම්හයි 'ඉධේව සික්ඛෙම' යනු වේ. **අථස්ස සුද්ධිං** – එකල්හි ඔහුගේ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වේ නුයි 'ඉධේව සික්ඛෙම අථස්ස සුද්ධිං' යනු වේ.

**භවූපනීතා කුසලාවදානා** – 'භවූපනීතා' යනු: භවයට එළඹියාහු භවයට පැමිණියාහු භවයට බැසගත්තාහු භවයෙහි ඇලුණාහු නුයි 'භවූපනීතා' යනු වේ; **කුසලාවදානා** – ස්වකීය ලබ්ධියෙහි කුසලයම්හ යන වාද ඇත්තාහු පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු න්‍යායවාද ඇත්තාහු හෙතුවාද ඇත්තාහු ලක්ෂණවාද ඇත්තාහු කාරණවාද ඇත්තාහු ස්ථානවාද ඇත්තාහු නුයි 'භවූපනීතා කුසලාවදානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**' සීලුත්තමා -පෙ- භවූපනීතා කුසලාවදානා''** යි

**18 – 5**

ඉදින් ශීලව්‍රතයෙන් ගිලිහුණේ වේ නම්, හෙතෙම ඒ ශීලව්‍රතකර්මය වරදවාගෙන කම්පා වෙයි. තවද හෙතෙම ගෙන් නික්මැගොස් නො රට වසන පුරුෂයෙක් සාර්ථයෙන් පසුවූයේ (ඒ ගෙය හෝ සාර්ථය හෝ පතන්නාක් මෙන්) ඒ ශීලව්‍රතශුද්ධිය ජල්පනය කෙරෙයි. පතන්නේත් වේ.

**සචෙ චුතො සීලබ්බතතො**[1] **හොතීති**-ද්වීහි කාරණෙහි සීලබ්බතතො[1] චවති: පරවිච්ඡින්දනාය[2] වා චවති, අනභිසම්භුණන්තො වා චවති. කථං පරවිච්ඡින්දනාය[2] චවති? පරො විච්ඡින්දති 'සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, නත්ථෙත්ථ සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා, විසුජ්ඣන්ති වා, මුච්චන්ති වා, විමුච්චන්ති වා, පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ඡතුක්කා පරිත්තා'ති, එවං පරො විච්ඡින්දති.[3] එවං විච්ඡින්දියමානො සත්ථාරා චවති. ධම්මක්ඛානා චවති. ගණා චවති. දිට්ඨියා චවති. පටිපදාය චවති මග්ගතො චවති. එවං පරවිච්ඡින්දනාය චවති. කථං අනභිසම්භුණන්තො චවති? සීලං අනභිසම්භුණන්තො සීලතො චවති. වතං අනභිසම්භුණන්තො වතතො චවති. සීලබ්බතං අනභිසම්භුණන්තො සීලබ්බතතො චවති. එවං අනභිසම්භුණන්තො චවතීති-සචෙ චුතො සීලබ්බතතො[1] හොති.

**ස වෙධති කම්මං විරාධයිත්වාති** – 'ස වෙධතී'ති සීලං වා වතං වා සීලබ්බතං වා විරද්ධං මයා අපරද්ධං මයා ඛලිතං මයා ගලිතං මයා අඤ්ඤාය අපරද්ධො අහන්ති වෙධති පවෙධති සම්පවෙධතීති – ස වෙධති; **කම්මං විරාධයිත්වාති** පුඤ්ඤාභිසඞ්ඛාරං වා අපුඤ්ඤාභිසඞ්ඛාරං වා ආනෙඤ්ජාභිසඞ්ඛාරං වා විරද්ධං මයා අපරද්ධං මයා ඛලිතං මයා ගලිතං මයා අඤ්ඤාය අපරද්ධො අහන්ති වෙධති පවෙධති සම්පවෙධතීති – ස වෙධති කම්මං විරාධයිත්වා.

**ස ජප්පති පත්ථයතිච්ච සුද්ධින්ති** – 'ස ජප්පතී'ති සීලං වා ජප්පති, වතං වා ජප්පති, සීලබ්බතං වා ජප්පති පජප්පති අභිජප්පතීති-ස ජප්පති; **පත්ථයතිච්ච සුද්ධින්ති** සීලසුද්ධිං වා පත්ථෙති, වතසුද්ධිං වා පත්ථෙති, සීලබ්බතසුද්ධිං වා පත්ථෙති, පිහෙති අභිජප්පතීති – ස ජප්පති පත්ථයතිච්ච සුද්ධිං.

**සත්ථාවහීනො පවසං ඝරම්හාති** – යථා පුරිසො ඝරතො නික්ඛන්තො සත්ථෙන සහ[1] වසන්තො සත්ථා ඔහීනො තං වා සත්ථං අනුබන්ධෙය්‍ය, සකං වා ඝරං පච්චාගච්ඡෙය්‍ය, එවමෙව සො දිට්ඨිගතිකො තං වා සත්ථාරං ගණ්හාති, අඤ්ඤං වා සත්ථාරං ගණ්හාති, තං වා ධම්මක්ඛානං ගණ්හාති, අඤ්ඤං වා ධම්මක්ඛානං ගණ්හාති, තං වා ගණං ගණ්හාති, අඤ්ඤං වා ගණං ගණ්හාති, තං වා දිට්ඨිං ගණ්හාති, අඤ්ඤං වා දිට්ඨිං ගණ්හාති, තං වා පටිපදං ගණ්හාති, අඤ්ඤං වා පටිපදං ගණ්හාති, තං වා මග්ගං ගණ්හාති, අඤ්ඤං වා මග්ගං ගණ්හාති පරාමසති අභිනිවිසතීති-සත්ථාවහීනො පවසං ඝරම්හා.

1. පවසං - මනුප. මජසං. 2. පරවිච්ඡන්දනාය - ස.
3. විච්ඡෙදෙති - මනුප.

**සචෙ චුතො සීලබ්බතතො හොති** – දෙකරුණෙකින් ශීලව්‍රතයෙන් ච්‍යුත වෙයි (–ගිලිහෙයි): මෙරමා විසින් වෙන් කිරීමෙන් හෝ ච්‍යුත වෙයි. නො පැමිණෙනුයේ හෝ ච්‍යුත වෙයි. කෙසේසිත් පරවිච්ඡේදනායෙන් ච්‍යුත වේ ද යත්: අනෙකෙක් වියොග කෙරෙයි: ‘ඒ ශාස්තෘ තෙම අසර්වඥ යැ, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි. ගණයා සුප්‍රතිපන්න නො වෙයි. දෘෂ්ටිය භද්‍ර නො වෙයි. ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි. මාර්ගය නෛර්යාණික නො වේ. මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය හෝ මුක්තිය විමුක්තිය පරිමුක්තිය හෝ නැත. මෙහි (සත්ත්වයෝ) ශුද්ධ විශුද්ධ පරිශුද්ධ හෝ නො වෙති. මුක්ත විමුක්ත පරිමුක්ත හෝ නො වෙත්. හීනයෝ යැ නිහීනයෝ යැ අවමතයෝ යැ ලාමකයෝ යැ ඡත්තකයෝ යැ පරිත්තයෝයැ’යි මෙසේ අනෙකෙක් වියොග කෙරෙයි. මෙසේ වියොග කරනු ලබනුයේ ශාස්තෘහු කෙරෙන් ච්‍යුත වෙයි. ධර්මාඛ්‍යානයෙන් ගිලිහෙයි. ගණයා කෙරෙන් ගිලිහෙයි. දෘෂ්ටියෙන් ගිලිහෙයි. පිළිවෙතින් ගිලිහෙයි. මාර්ගයෙන් ගිලිහෙයි. මෙසේ පරවිච්ඡේදනායෙන් ච්‍යුත වේ. කෙසේ (ගුණයට) නො පැමිණෙනුයේ ච්‍යුත වේ ද යත්: ශීලය නො පුරනුයේ ශීලයෙන් ච්‍යුත වෙයි. ව්‍රතය නො පුරනුයේ ව්‍රතයෙන් ච්‍යුත වෙයි. ශීලව්‍රතය නො පුරනුයේ ශීලව්‍රතයෙන් ච්‍යුත වෙයි. මෙසේ අසම්පාදනය කරනුයේ ච්‍යුත වේ නුයි ‘සචෙ චුතො සීලබ්බතතො හොති’ යනු වේ.

**ස වෙධති කම්මං විරාධයිත්වා** – ‘ස වෙධති’ යනු: ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ මා විසින් වරදන ලද, මා විසින් අපරාධ කරන ලද, මා විසින් පිරිහෙළන ලද, මා විසින් ගලිත කරන ලද. නො දූනීමෙන් මම පැරැදුණෙමි, වෙවුලයි වෙසෙසින් වෙවුලයි. හාත්පසින් වෙවුලානුයි ‘ස වෙධති’ යනු වේ. **කම්මං විරාධයිත්වා** – පුණ්‍යාභිසංස්කාරය හෝ අපුණ්‍යාභි-සංස්කාරය හෝ ආනෙඤ්ජාභිසංස්කාරය හෝ මා විසින් වරදනා ලද මා විසින් පරදනා ලද, මා විසින් පිරිහෙළන ලද, මා විසින් ගලිත කරන කරන ලද. නො දූනීමෙන් මම පැරැදුණෙමි’ වෙවුලයි. වෙසෙසින් වෙවු-ලයි, හාත්පසින් වෙවුලානුයි ‘ස වෙධති කම්මං විරාධයිත්වා’ යනු වේ.

**ස ජප්පති පත්ථයතීච සුද්ධිං** – ‘ස ජප්පති’ යනු: ශීලය හෝ ජල්පනය කෙරෙයි (–ගුණ කියයි) ව්‍රතය හෝ ජල්පනය කෙරෙයි, ශීලව්‍රතය හෝ ජල්පනය කෙරෙයි, වෙසෙසින් ගුණ කියයි, හාත්පසින් ගුණ කියා නුයි ‘ස ජප්පති’ යනු වේ. **පත්ථයතීච සුද්ධිං** –‘ශීලසුද්ධිය පතයි, ව්‍රතශුද්ධිය හෝ පතයි, ශීලව්‍රතශුද්ධිය හෝ පතයි, කැමැති වෙයි, අභිජල්පනය කෙරේ නුයි ‘ස ජප්පති පත්ථයතීච සුද්ධිං’ යනු වේ.

**සත්ථාව හීනො පවසං ඝරම්හා** – යම් සේ පුරුෂයෙක් ගෙයින් නික්මෙනුයේ සාර්ථ (–සමූහ) යක් සමග වසනුයේ සාර්ථයෙන් වෙන්වැ ගියේ ඒ සාර්ථය හෝ ලුහුබඳී ද, සිය ගෙට හෝ පෙරළා ඒ ද, එපරිද්දෙන් ඒ දෘෂ්ටිගතික තෙම ඒ ශාස්තෘහු හෝ ගනී, අනිත් ශාස්තෘවක්හු හෝ ගනී, ඒ ධර්මාඛ්‍යානය හෝ ගනී, අනිත් ධර්මාඛ්‍යානයක් හෝ ගනී, ඒ ගණයා හෝ ගනී, අනිත් ගණයක් හෝ ගනී, ඒ දෘෂ්ටිය හෝ ගනී, අන් දෘෂ්ටියක් හෝ ගනී, ඒ ප්‍රතිපදාව හෝ ගනී, අන් ප්‍රතිපදාවක් හෝ ගනී, ඒ මාර්ගය හෝ ගනී, අන් මාර්ගයක් හෝ ගනී, පරාමර්ශනය කෙරෙයි, අභිනිවේශය කෙරේ නුයි ‘සත්ථාවහීනො පවසං ඝරම්හා’ යනු වේ.

තෙනාහ භගවා:

"සචෙ චුතො සීලබ්බතතො හොති
ස වෙධති කම්මං විරාධයිත්වා,
ස ජප්පති පත්ථයතීච සුද්ධිං
සත්ථාවහීනො පවසං ඝරම්හා"ති

**13 - 6**

සීලබ්බතං වාපි පහාය සබ්බං
කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං,[1]
සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො
විරතො චරෙ සන්තිමනුග්ගහාය.

**සීලබ්බතං වාපි පහාය සබ්බන්ති** – සබ්බා සීලසුද්ධියො පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, සබ්බා වතසුද්ධියො පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, සබ්බා සීලබ්බතසුද්ධියො පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති – සීලබ්බතං වාපි පහාය සබ්බං.

**කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතන්ති** – සාවජ්ජකම්මං වුච්චති කණ්හං කණ්හවිපාකං; අනවජ්ජකම්මං වුච්චති සුක්කං සුක්කවිපාකං; සාවජ්ජඤ්ච කම්මං අනවජ්ජඤ්ච කම්මං පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං.

**සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානොති** – 'අසුද්ධි'න්ති අසුද්ධිං පත්ථෙන්ති අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති; 'සුද්ධි'න්ති සුද්ධිං පත්ථෙන්ති, පඤ්ච කාමගුණෙ පත්ථෙන්ති; අසුද්ධිං පත්ථෙන්ති – අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති, පඤ්චකාමගුණෙ පත්ථෙන්ති, සුද්ධිං පත්ථෙන්ති – ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙන්ති, අසුද්ධිං පත්ථෙන්ති – අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති; පඤ්චකාමගුණෙ පත්ථෙන්ති; ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙන්ති; සුද්ධිං පත්ථෙන්ති – තෙධාතුකෙ කුසලෙ ධම්මෙ පත්ථෙන්ති; අසුද්ධිං පත්ථෙන්ති – අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති, පඤ්ච කාමගුණෙ පත්ථෙන්ති, ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙන්ති; තෙධාතුකෙ කුසලෙ ධම්මෙ පත්ථෙන්ති, සුද්ධිං පත්ථෙන්ති පුථුජ්ජනකල්‍යාණකා[3] නියාමාවක්කන්තිං පත්ථෙන්ති, සෙඛා අග්ගධම්මං අරහත්තං පත්ථෙන්ති; අරහත්තෙ පත්තෙ අරහං නෙව අකුසලෙ ධම්මෙ පත්ථෙති. නපි පඤ්ච කාමගුණෙ පත්ථෙති. නපි ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙති. නපි තෙධාතුකෙ කුසලෙ ධම්මෙ පත්ථෙති, නපි නියාමාවක්කන්තිං පත්ථෙති, නපි අග්ගධම්මං අරහත්තං පත්ථෙති. පත්ථනාසමතික්කන්තො අරහා වුද්ධිපරිහානිං[4] වීතිවත්තො සො වුත්ථවාසො චිණ්ණචරණො උත්තිණ්ණජාතිජරාමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති – සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො.

---

1. සාවජ්ජානවජ්ජමෙතං - ස    2. කල්‍යාණපුථුජ්ජනා - ස්‍යා. PTS.
3. පාරිහානිං - සීමු II.

එහින් වදාළහ බුදුහු:

"සමෙව චුතො -පෙ- සඤ්ඤාවගිනො පවසං හරම්භා"හි.

**18 - 6**

(ආර්‍යශ්‍රාවක තෙමේ) සියලු ශීලව්‍රතය ද, යලි සාවද්‍යතවද්‍ය (-සියලු අකුශල හා ලෞකික කුශල) කර්මය ද හැරපියා තෙල (පඤ්චකාමගුණාදි භෙද වූ) ශුද්ධිය ද, (අකුශලාදි භෙද වූ) අශුද්ධිය ද මෙසේ නො පතනුයේ දෘෂ්ටිනාශාතිය දූෂිව නොගෙන (ශුද්ධි අශුද්ධි දෙකින්) වෙන් වූයේ හැසිරෙන්නේ යි.

**සීලබ්බතං වාපි පහාය සබ්බං** - සියලු ශීලශුද්ධීන් හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා, සියලු ව්‍රතශුද්ධීන් හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා සියලු ශීලව්‍රතශුද්ධීන් හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'සීලබ්බතං වාපි පහාය සබ්බං' යනු වේ.

**කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං** - 'කෘෂ්ණ වූයේ කෘෂ්ණවිපාක ඇතියේ සාවද්‍යකර්ම යයි කියනු ලැබෙයි. ශුක්ල වූයේ ශුක්ලවිපාක ඇතියේ අනවද්‍යකර්ම යයි කියනු ලැබෙයි. සාවද්‍ය (-අකුශල) කර්මය ද, අනවද්‍ය (-ලෞකික කුශල) කර්මය ද, හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං' යනු වේ.

**සුද්ධිං අසුද්ධිංනති අපත්ථයානො** - 'අසුද්ධිං' යනු: අශුද්ධිය පතයි, අකුශලධර්මයන් පතති; 'සුද්ධිං, යනු: ශුද්ධිය පතති, පඤ්චකාමගුණයන් පතයි; 'අසුද්ධිං පත්ථෙනති' - අකුශලධර්මයන් පතති, පඤ්චකාමගුණයන් පතති; 'සුද්ධිං පත්ථෙනති' - දෙසැටදිට්ඨිගතයන් පතති, 'අසුද්ධිං පත්ථෙනති' අකුශලධර්මයන් පතයි, පඤ්චකාමගුණයන් පතති, දෙසැටදිට්ඨිගතයන් පතයි 'සුද්ධිං පත්ථෙනති-ත්‍රෛධාතුක කුශලධර්මයන් පතති; 'අසුද්ධිං පත්ථෙනති-අකුසල් දහම් පතති, පස්කම්ගුණ පතති, දෙසැටදිට්ඨිගතයන් පතති, තුන්බිමට අයත් කුසල්දහම් පතත්; 'සුද්ධිං පත්ථෙනති' - කල්‍යාණ-පෘථග්ජනයෝ මාර්ගවිදර්ශනාවට බැසගැනීම පතති, ශෛක්ෂයෝ අග්‍රධර්ම වූ අර්හත්වය පතති, රහත්බව පැමිණි කල්හි රහත් තෙම අකුසල්දහම් නො මැ පතයි, නො ද පස්කම්ගුණ පතයි, නො ද දෙසටදිට්ඨිගතයන් පතයි ත්‍රෛධාතුක කුශලධර්මයන් නො ද පතයි, නියාමාවක්‍රාන්තිය නො ද පතයි අග්‍රධර්ම වූ අර්හත්වය නො ද පතයි; ප්‍රාර්ථනා ඉක්මවා සිටි රහත් තෙම වෘද්ධිය හා පරිහාණිය ඉක්මවූයේ යැ, හෙතෙම වැස නිමවූ දශ ආර්‍යවාස ඇත්තේ යැ, සිල් හා අටසමවත්හි චිණ්ණවශී යැ; තරණය කල ජාතිජරා-මරණසංසාරය ඇත්තේ යැ, ඔහුට පුනර්භවය නැත් නුයි 'සුද්ධිං අසුද්ධිනති අපත්ථයානො' යනු වේ.

**විරතො චරෙ සන්තිමනුග්ගහායාති** – 'විරතො'ති සුද්ධිඅසුද්ධියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති විරතො; චරෙති චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති **'විරතො චරෙ සන්තිමනුග්ගහායාති'** සන්තියො වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; දිට්ඨිසන්තියො අගණ්හන්තො අපරාමසන්තො අනභිනිවිසන්තොති – විරතො චරෙ සන්තිමනුග්ගහාය.

තෙනාහ භගවා:

"සීලබ්බතං වාපි පහාය සබ්බං
කම්මඤ්ච සාවජ්ජනවජ්ජමෙතං,
සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො
විරතො චරෙ සන්තිමනුග්ගහායා"ති.

**13 – 7**

තමූපනිස්සාය ජිගුච්ඡිතං වා
අථවාපි දිට්ඨංව සුතං මුතං වා,
උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති
අවීතතණ්හාසෙ භවාභවෙසු.

**තමූපනිස්සාය ජිගුච්ඡිතං වාති** – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා තපොජිගුච්ඡාවාදා[1] තපොජිගුච්ඡාසාරා තපොජිගුච්ඡානිස්සිතා ආනිස්සිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති – තමූපනිස්සාය ජිගුච්ඡිතං වා.

**අථවාපි දිට්ඨංව[2] සුතං මුතං වාති** – දිට්ඨං වා දිට්ඨසුද්ධිං වා සුතං වා සුතසුද්ධිං වා මුතං වා මුතසුද්ධිං වා නිස්සාය උපනිස්සාය ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති – අථවාපි දිට්ඨං ව සුතං මුතං වා.

**උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්තීති** – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා උද්ධංසරවාදා.[3] කතමෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධංසරවාදා? යෙ තෙ සමණබ්‍රාහ්මණා අච්චන්තසුද්ධිකා සංසාරසුද්ධිකා අකිරියදිට්ඨිකා සස්සතවාදා, ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධංසරවාදා, තෙ සංසාරෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ථුනන්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති.

**අවීතතණ්හාසෙ භවාභවෙසූති** – 'තණ්හා'ති රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා.

---

1. ජිගුච්ඡවාදා – ස. PTS 2. දිට්ඨඤ්ච – සිමු. II.
3. උද්ධංසරාවාදා – සිමු. II.

**විරතො චරෙ සන්තිමනුග්ගහාය** – 'විරතො' යනු ශුද්ධි අශුද්ධි දෙකින් දුරු වූයේ වෙන්වූයේ වෙසෙසින් වෙන්වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'විරතො' යනු වේ. චරෙ – හැසිරෙන්නේය වෙසෙන්නේය ඉරියව් පවත්වන්නේය වැටෙන්නේය රැකෙන්නේය යැපෙන්නේය යපනය වන්නේ නුයි 'විරතො චරෙ' යනු වේ. **සන්තිමනුග්ගහාය** – සන්ති'යි දෙසැට දිට්ඨිගතයෝ කියනු ලැබෙති. දෘෂ්ටීන් නො ගන්නේ පරාමර්ශනය නො කරනුයේ අභිනිවේශය නො කරනුයේ නුයි 'විරතො චරෙ සන්තිමනුග්ගහාය' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"සීලබ්බතං වාපි -පෙ- විරතො චරෙ සන්තිමනුග්ගහාය"**යි.

**13 - 7**

තවද (ඇතැම් මහණබමුණු කෙනෙක් බුද්ධාදීන් විසින්) ජුගුප්සිත වූ ඒ අමරතපස් හෝ දෘෂ්ටශුද්ධිය හෝ ශ්‍රැතශුද්ධිය හෝ මුතශුද්ධිය හෝ ඇසුරු කොට (අක්‍රියදෘෂ්ටියෙන් හෝ) උද්ධංසරවාද ඇති වැ පුනපුනා භවයෙහි නො හළ තෘෂ්ණා ඇත්තාහු ශුද්ධිය කියත්.

**තමුපනිස්සාය ජිගුච්ඡිතං වා** – කායපීඩනාදි තපසින් පාපජුගුප්සාව පවසන්නාවූ තපොජුගුප්සාව සාර කොට ඇති තපොජුගුප්සාව ඇසුරු කළ හාත්පසින් ඇසුරු කළ (එහි) ඇලුණු පැසගත් පිවිසියා වූ ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත් නුයි 'තමුපනිස්සාය ජිගුච්ඡිතං වා' යනු වේ.

**අථවාපි දිට්ඨං ව සුතං මුතං වා** – දෘෂ්ට (-රූපායතන)ය හෝ දෘෂ්ටශුද්ධිය හෝ ශ්‍රැතය හෝ ශ්‍රැතශුද්ධිය හෝ මුතය හෝ මුතශුද්ධිය හෝ නිසා ඇසුරු කොට ගෙන දැහැගෙන පිවිස ගෙන නුයි 'අථවාපි දිට්ඨං ව සුතං මුතං වා' යනු වේ.

**උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති** – උද්ධංසරවාද ඇති (-සංසාරයෙන් ශුද්ධිය පවසන) ඇතැම් මහණ බමුණු කෙනෙක් වෙති, සංසාරයෙන් ශුද්ධිය පවසන ඒ මහණ බමුණෝ කවරහු ද යත්? අත්‍යන්තශුද්ධිය පවසන සංසාරශුද්ධිය පවසන අක්‍රියදෘෂ්ටි ඇති ශාශ්වතදෘෂ්ටි ඇති ඒ මේ මහණබමුණෝ උද්ධංසරවාද ඇත්තාහු වෙත්. ඔවුහු සංසාරයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පසසති පවසති කියති බෙණෙති දක්වයි ව්‍යවහාර කෙරෙත් නුයි 'උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති' යනු වේ.

**අවීතතණ්හාසෙ භවාභවෙසු** – 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ශබ්ද තෘෂ්ණා යැ ගන්ධතෘෂ්ණා යැ රසතෘෂ්ණා යැ ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යැ ධර්මතෘෂ්ණා යි.

**භවාභවෙසූති** - භවාභවෙ කම්මභවෙ පුනබ්භවෙ, කාමභවෙ කම්මභවෙ, කාමභවෙ පුනබ්භවෙ, රූපභවෙ කම්මභවෙ, රූපභවෙ පුනබ්භවෙ, අරූපභවෙ කම්මභවෙ, අරූපභවෙ පුනබ්භවෙ, පුනප්පුනභවෙ පුනප්පුනගතියා පුනප්පුන උප්පත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා අවීත තණ්හා අවිගතතණ්හා අචත්තතණ්හා අවන්තතණ්හා අමුත්තතණ්හා අප්පහීනතණ්හා අප්පටිනිස්සට්ඨතණ්හාති - අවීතතණ්හා සෙ භවාභවෙසු.

තෙනාහ භගවා:

"තමූපනිස්සාය ජිගුච්ඡිතං වා
අථවාපි දිට්ඨංව සුතං මුතං වා,
උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති
අවීතතණ්හා සෙ භවාභවෙසූ"ති.

13 - 8

පත්ථයමානස්ස හි ජප්පිතානි
පවෙධිතං[1] වාපි පකප්පිතෙසු,
චුතූපපාතො ඉධ යස්ස නත්ථි
ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙ.

**පත්ථයමානස්ස හි ජප්පිතානීති** - පත්ථනා වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **පත්ථයමානස්සාති** පත්ථයමානස්ස ඉච්ඡමානස්ස සාදියමානස්ස පිහයමානස්ස අභිජප්පමානස්සාති පත්ථයමානස්ස හි; **ජප්පිතානීති** ජප්පනා වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලන්ති - පත්ථයමානස්ස හි ජප්පිතානි.

**පවෙධිතං වාපි පකප්පිතෙසූති** - පකප්පනාති ද්වෙ පකප්පනා: තණ්හා-පකප්පනා ච දිට්ඨිපකප්පනා ච -පෙ- අයං තණ්හාපකප්පනා; -පෙ- අයං දිට්ඨිපකප්පනා; **පවෙධිතං වාපි පකප්පිතෙසූති** - පකප්පිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි වෙධෙන්ති, අච්ඡිජ්ජන්තෙපි[2] වෙධෙන්ති, අච්ඡින්නෙපි වෙධෙන්ති; පකප්පිතං වත්ථුං විපරිණාමසඞ්කිනොපි වෙධෙන්ති, විපරි-ණාමන්තෙපි වෙධෙන්ති, විපරිණතෙපි වෙධෙන්ති, පවෙධෙන්ති සම්පවෙ-ධෙන්තීති - පවෙධිතං වාපි පකප්පිතෙසු.

**චුතූපපාතො ඉධ යස්ස නත්ථීති** - 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස; යස්ස ගමනං ආගමනං ගමනාගමනං කාලං ගති භවාභවො චුති ච උපපත්ති ච නිබ්බත්ති ච භෙදො ච ජාති ජරා මරණඤ්ච නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති - චුතූපපාතො ඉධ යස්ස නත්ථි.

1. සංවෙධිතං - සු PTS.
2. අච්ඡිජ්ජන්තොපි - PTS.

**භවාභවෙසු** - කාමභව රූපාරූපභවයෙහි, කර්මවෘත්තයෙහි පුනර්භවික වූ විපාකවෘත්තයෙහි, කාමභවයෙහි කර්මභවයෙහි, කාමභවයෙහි පුනර්භවයෙහි, රූපභවයෙහි කර්මභවයෙහි, රූපභවයෙහි පුනර්භවයෙහි, අරූපභවයෙහි කර්මභවයෙහි, අරූපභවයෙහි පුනර්භවයෙහි, පුනපුනා භවයෙහි පුනපුනා පස්ගතියෙහි පුනපුනා උපතෙහි පුනපුනා පිළිසඳෙහි පුනපුනා ආත්මභාවය පහළවීමෙහි නො පහවූ තෘෂ්ණා ඇත්තාහු අවිගතතෘෂ්ණා ඇත්තාහු නො හළ තෘෂ්ණා ඇත්තාහු නො වමනය කළ තෘෂ්ණා ඇත්තාහු නො මිදූ තෘෂ්ණා ඇත්තාහු නො පුහුත් තෘෂ්ණා ඇත්තාහු නො බැහැර කළ තෘෂ්ණා ඇත්තාහු නුයි 'අවීතතණ්හා සෙ භවාභවෙසු' යනු වේ.

එහෙයින් වදාළහ බුදුහු:

"**තමුපනිස්සාය -පෙ- අවීතතණ්හා සෙ භවාභවෙසු**"යි

## 18 - 8

(මෙසේ) පතනුවහුට වැලිත් තෘෂ්ණාජල්පිතයෝ වෙති. තවද තෘෂ්ණා දෘෂ්ටීන් ප්‍රකල්පිත වූ වස්තූන් නිමිති කොට අතිශයින් සැලීම ද වෙයි. මෙලොව යම් ක්ෂීණාස්‍රවයෙක් හට ච්‍යුති - උත්පත්ති නැත් ද, හෙතෙම කිනම් රාගාදියකින් සැලෙන්නේ ද, කොහි ජල්පනය කරන්නේ ද.

**පත්ථයමානස්ස හි ජප්පිතානි** - 'පත්ථනා'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලෝභ අකුශලමූලයෙක් වේ ද, එයයි. **පත්ථයමානස්ස** - පතනුවහුට කැමැති වන්නහුට ඉවසනුවහුට රිසිවන්නහුට අභිජල්පනය කරන්නහුට නුයි 'පත්ථයමානස්ස හි' යනු වේ. **ජප්පිතානි** - 'ජප්පනා'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලෝභ අකුශලමූලයෙක් නුයි 'පත්ථයමානස්ස හි ජප්පිතානි' යනු වේ.

**පවෙධිතං වාපි පකප්පිතෙසු** - 'පකප්පනා' යනු: තෘෂ්ණාප්‍රකල්පනය ද දෘෂ්ටිප්‍රකල්පනය දැයි ප්‍රකල්පනා දෙකෙකි...මේ දෘෂ්ටිප්‍රකල්පනා යි. **පවෙධිතං වාපි පකප්පිතෙසු** - ප්‍රකල්පිත වූ වස්තුව 'අසිඳගනිති' සැක ඇත්තාහු ද සැලෙති, අසිඳුනා කල්හි ද සැලෙති, අසිඳගත් කල්හි ද සැලෙත්, ප්‍රකල්පිත වූ වස්තුව 'පරිවර්තන වෙති' සැක ඇත්තාහු ද සැලෙති, පෙරළෙන කල්හි ද සැලෙති, පෙරළුණු කල්හි ද සැලෙති, වෙවුලති, අතිශයින් වෙවුලත් නුයි 'පවෙධිතං වාපි පකප්පිතෙසු' යනු වේ.

**චුතූපපාතො ඉධ යස්ස නත්ථි** - 'යස්ස' යනු: අර්හත් ක්ෂීණාස්‍රව හට, යමක් හට (මෙලොවින්) යෑම පෙරළා ඊම ගමනාගමනය මරණය ගතිය පුනපුනා භවය ච්‍යුතිය උත්පත්තිය නිපැත්ම බිඳීම ජාතිය හා ජරාමරණයත් නැත් ද නො වෙත් ද විද්‍යමාන නො වෙත් ද නො ලැබෙත් ද, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරලන ලද්දනු උපනට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දනු නුයි 'චුතූපපාතො ඉධ යස්ස නත්ථි' යනු වේ.

**ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙති** – සො කෙන රාගෙන වෙධෙය්‍ය, කෙන දොසෙන වෙධෙය්‍ය, කෙන මොහෙන වෙධෙය්‍ය, කෙන මානෙන වෙධෙය්‍ය, කාය දිට්ඨියා වෙධෙය්‍ය, කෙන උද්ධච්චෙන වෙධෙය්‍ය, කාය විචිකිච්ඡාය වෙධෙය්‍ය, කෙහි අනුසයෙහි වෙධෙය්‍ය, රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති වා ථාමගතොති වා, තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා කෙන වෙධෙය්‍ය නෙරයිකොති වා, තිරච්ඡානයොනිකොති වා, පෙත්තිවිසයිකොති වා, මනුස්සොති වා, දෙවොති වා, රූපීති වා, අරූපීති වා, සඤ්ඤීති වා, අසඤ්ඤීති වා, නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා, සො හෙතු නත්ථි; පච්චයො නත්ථි; කාරණං නත්ථි; යෙන වෙධෙය්‍ය පවෙධෙය්‍ය සම්පවෙධෙය්‍යාති – ස කෙන වෙධෙය්‍ය. **කුහිං ච ජප්පෙති** කුහිං වා ජප්පෙය්‍ය, කිම්හි ජප්පෙය්‍ය, කත්ථ ජප්පෙය්‍ය, පජප්පෙය්‍ය අභිජප්පෙය්‍යාති – ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙ.

තෙනාහ භගවා:

"පත්ථයමානස්ස හි ජප්පිතානි
පවෙධිතං වාපි පකප්පිතෙසු,
චුතූපපාතො ඉධ යස්ස නත්ථි
ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙ"ති.

**13 – 9**

යමාහු ධම්මං පරමන්ති එකෙ
තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හි'මෙ කුසලාවදානා.

**යමාහු ධම්මං පරමන්ති එකෙති** – යං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා ඉදං පරමං අග්ගං සෙට්ඨං විසිට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – යමාහු ධම්මං පරමන්ති එකෙ.

**තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙති** – තමෙව ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා හීනං එතං නිහීනං එතං ඔමකං එතං ලාමකං එතං ඡත්තකං එතං පරිත්තකං එතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ.

**සච්චො නු වාදො කතමො ඉමෙසන්ති** – ඉමෙසං සමණබ්‍රාහ්මණානං වාදො කතමො සච්චො තච්ඡො තථො භූතො යාථාවො අවිපරීතොති – සච්චො නු වාදො කතමො ඉමෙසං.

**ස කේන වේධෙය්‍ය කුහිං ව ජප්පෙ** - හෙතෙම කවර රාගයෙකින් සැලෙන්නේ ද, කවර ද්වේෂයෙකින්-කවර මෝහයෙකින්-කවර මානයෙකින් කවර දෘෂ්ටියෙකින් - කවර ඖද්ධත්‍යයෙකින් - කවර විචිකිත්සායෙකින්- කවර අනුශයධර්මයෙකින් සැලෙන්නේ ද, (රාගයෙන්) රක්ත යැ හෝ දුෂ්ට යැ හෝ මූඪ යැ හෝ (මානයෙන්) විනිබද්ධ යැ හෝ (දෘෂ්ටියෙන්) පරාමෘෂ්ට යැ හෝ වික්ෂේපයට පැමිණියේ යැ හෝ නිෂ්ඨාවට නො ගියේ යැ හෝ තදබවට ගියේ යැ හෝ (යත) ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයෝ යැ, අභිසංස්කාරයන් ප්‍රහීණ වූ බැවින් ගතිය හේතු කොට ගෙන කුමකින් සැලෙන්නේ ද, නිරයෙහි උපදනා සත්ත්වයෙකැ හෝ තිරිසන්යොනිහි උපදනෙකැ හෝ ප්‍රෙතවිෂයෙහි උපදනෙකැ හෝ මිනිස් වන්නෙකැ හෝ දෙවි වන්නෙකැ හෝ රූපී යැ හෝ අරූපී යැ හෝ සංඥී යැ හෝ අසංඥී යැ හෝ නෛවසංඥීනාසංඥී යැ හෝ යම් හෙයකින් කම්පා වන්නේ නම් සැලෙන්නේ නම් වෙසෙසින් සැලෙන්නේ නම් ඒ හේතුව නැත, ප්‍රත්‍යය නැති, කාරණා නැත් නුයි ‘ස කෙන වෙධෙය්‍ය’ යනු වේ. **කුහිං ව ජප්පෙ** - කොහි හෝ (තෘෂ්ණාවශයෙන්) ජල්පනය කරන්නේ ද, කවර කරුණෙක ජල්පනය කරන්නේ ද, කො තැන්හි ජල්පනය ප්‍රජල්පනය අභිජල්පනය කරන්නේ දැයි ‘ස කෙන වෙධෙය්‍ය කුහිං ව ජප්පෙ’ යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**“පසංසමානස්ස -පෙ- ස කේන වේධෙය්‍ය කුහිං ව ජප්පෙ”**යි.

## 18 - 9

ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දහමක් උතුමැයි කියත් නම්, යළි අන්‍යයෝ එ මැ දහම හීන යයි කියති. මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වූයේ ද ? මොහු සියල්ලෝ මැ කුශලවාද ඇත්තාහු මැ වෙත් ද ?

**යමාහු ධම්මං පරමන්ති එකෙ** - ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දහමක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ‘මේ පරම යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි ‘යමාහු ධම්මං පරමන්ති එකෙ’ යනු වේ.

**තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ** - ඇතැම් මහණබමුණෝ එ මැ දහම දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය ‘තෙල හීන යැ, තෙල නිහීන යැ, තෙල අවමත යැ, තෙල ලාමක යැ, තෙල ඡත්තක යැ, තෙල අල්ප ය’යි මෙසේ පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි ‘තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ’ යනු වේ.

**සච්චො නු වාදො කතමො ඉමෙසං** - මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වූයේ නො සිස් වූයේ තො වෙනස් වූයේ විද්‍යමාන වූයේ යථාස්වභාව වූයේ අවිපරීත වූයේ දැයි ‘සච්චො නු වාදො කතමො ඉමෙසං’ යනු වේ.

**සබ්බෙව කිමෙ කුසලාවදානාති** – සබ්බෙවිමෙ සමණබ්‍රාහ්මණා කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති – සබ්බෙව කිමෙ කුසලාවදානා.

තෙනාහ සො නිම්මිතො:[1]

"යමාහු ධම්මං පරමන්ති එකෙ
තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හීමෙ කුසලාවදානා''ති.

## 18 – 10

සකං හි ධම්මං පරිපුණ්ණමාහු
අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු,
එවම්පි විග්ගය්හ විවාදයන්ති[2]
සකං සකං සම්මුති[3] මාහු සච්චං.

**සකං හි ධම්මං පරිපුණ්ණමාහූති** – සකං හි ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා ඉදං සමත්තං පරිපුණ්ණං අනොමන්ති එවමාහංසු -පෙ- එවං වොහරන්තීති – සකං හි ධම්මං පරිපුණ්ණමාහු.

**අඤ්ඤස්ස ධම්මං පන හීනමාහූති** – අඤ්ඤස්ස ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා හීනං එතං නිහීනං එතං ඔමකං එතං ලාමකං එතං ජතුක්කං එතං පරිත්තකං එතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු.

**එවම්පි විග්ගය්හ විවාදයන්තීති** – එවං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති, විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති – 'එවම්පි විග්ගය්හ විවාදයන්ති'.

**සකං සකං සම්මුතිමාහු සච්චන්ති** – 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති සකං සකං සම්මුතිමාහු සච්චං; 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති – සකං සකං සම්මුතිමාහු සච්චං.

තෙනාහ භගවා:

"සකං හි ධම්මං පරිපුණ්ණමාහු
අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු,
එවම්පි විග්ගය්හ විවාදයන්ති
සකං සකං සම්මුතිමාහු සච්ච''න්ති.

---

1. භගවා - සයා. PTS. 2. විවාදියන්ති - PTS. 3. සම්මති - සයා.

**සබ්බෙව හි'මෙ කුසලාවදානා** – මේ සියලු මැ මහණබමුණෝ ස්වකීය ලබ්ධියෙහි කුශලවාද ඇත්තාහු පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු න්‍යායවාද ඇත්තාහු හේතුවාද ඇත්තාහු ලක්ෂණවාද ඇත්තාහු කාරණවාද ඇත්තාහු ස්ථානවාද ඇත්තාහු යි 'සබ්බෙව හි' මෙ කුසලාවදානා' යනු වේ.

එයින් කීහ ඒ මැවුණු බුදුහු:

"යමාහු ධම්මං -පෙ- සබ්බෙව හි'මෙ කුසලාවදානා"යි.

## 18 – 10

(ඇතැම් මහණබමුණෝ) තමන් තමන්ගේ මැ ධර්මය පරිපූර්ණ යැයි කියති, යළි අන්‍යයාගේ ධර්මය හීන යැයි කියත්. මෙසේ ත් දැඩි වැ ගෙන විවාද කෙරෙති, තමන් තමන්ගේ මැ දෘෂ්ටිසම්මතිය සැබවැයි කියත්.

**සකං හි ධම්මං පරිපුණ්ණමාහු** – ඇතැම් මහණබමුණු කෙනෙක් තමන් තමන්ගේ මැ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය 'මෙය සමස්තයැ පරිපූර්ණ යැ අලාමක යැ'යි මෙසේ පවසති...මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'සකං හි ධම්මං පරිපුණ්ණමාහු' යනු වේ.

**අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු**–ඇතැම් මහණබමුණෝ අන්‍යයාගේ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය 'තෙල හීන යැ තෙල නිහීන යැ තෙල අවමන යැ තෙල ලාමක යැ තෙල ජත්තක යැ තෙල අල්ප යැ'යි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු' යනු වේ.

**එවම්පි විග්ගය්හ විවාදයන්ති** – මෙසේ ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිරිසගෙන විවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විරුද්ධවාද කෙරෙති, අරගල කෙරෙත්: 'තෙපි මේ ධර්මවිනය නො දන්නවු යැ...ඉදින් පොහොනවු නම් මුදා ගනුව ය'යි 'එවම්පි විග්ගය්හ විවාදයන්ති' යනු වේ.

**සකං සකං සම්මුතිමාහු සච්චං** – 'ශාශ්වත යැ ලෝකය, මේ මැ සැබව අන්‍යය හිස් යැ'යි 'සකං සකං සම්මුතිමාහු සච්චං' යනු වේ. අශාශ්වත යැ ලෝකය...සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ මැ සැබවැ අන්‍යය තුච්ඡ යැ'යි 'සකං සකං සම්මුතිමාහු සච්චං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සකං හි ධම්මං -පෙ- සකං සකං සම්මුතිමාහු සච්චං"යි.

### 13 – 11

පරස්ස චෙ වම්භයිතෙන හීනො
න කොචි ධම්මෙසු විසෙසි අස්ස,
පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං
නිහීනතො සම්හි දළ්හං වදානා.

**පරස්ස චෙ වම්භයිතෙන හීනොති** – පරස්ස චෙ වම්භයිතකාරණා නින්දිතකාරණා ගරහිතකාරණා උපවදිතකාරණා පරො බාලො හොති හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තොති – පරස්ස චෙ වම්භයිතෙන හීනො.

**න කොචි ධම්මෙසු විසෙසි අස්සාති** – ධම්මෙසු න කොචි අග්ගො සෙට්ඨො විසිට්ඨො පාමොක්ඛො උත්තමො පවරො අස්සාති – න කොචි ධම්මෙසු විසෙසි අස්ස.

**පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතොති** – බහුකාපි බහූනං ධම්මං වදන්ති උපවදන්ති නින්දන්ති ගරහන්ති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො; බහුකාපි එකස්ස ධම්මං වදන්ති උපවදන්ති නින්දන්ති ගරහන්ති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො; එකොපි බහුන්නං ධම්මං වදති උපවදති නින්දති ගරහති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො; එකොපි එකස්ස ධම්මං වදති උපදවති නින්දති ගරහති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතොති – පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතො.

**සම්හි දළ්හං වදානාති** – ධම්මො සකායනං, දිට්ඨි සකායනං, පටිපදා සකායනං, මග්ගො සකායනං, සකායනෙන දළ්හවාදා ථිරවාදා බලිකවාදා අවට්ඨිතවාදායි – සම්හි දළ්හං වදානා.

තෙනාහ භගවා:

"පරස්ස චෙ වම්භයිතෙන හීනො
න කොචි ධම්මෙසු විසෙසි අස්ස,
පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං
නිහීනතො සම්හි දළ්හං වදානා"ති.

### 13 – 12

සද්ධම්මපූජා[1] ච පනා තථෙව
යථා පසංසන්ති සකායනානි,
සබ්බෙව වාදා[2] තථියා[3] භවෙය්‍යුං
සුද්ධී හි[4] තෙසං පච්චත්තමෙව.

1. සද්ධම්මපූජා - සීමු. II. ධම්මෙසු පූජා - ස. 2. සබ්බෙ පවාදා - සං. PTS.
3. තථිවා - සීමු. II. සු. 4. සුද්ධිපි - සීමු. II

## 18 - 11

ඉදින් මෙරමා විසින් අවමත් කල කරුණෙන් හීන වූයෙක් වන්නේ නම්, ධර්මයන් අතුරෙහි කිසිවෙක් විශිෂ්ට වූයේ නො වන්නේය. යම් හෙයකින් බොහෝ මහණබමුණෝ මෙරමාගේ දහම නිහීන හෙයින් කියත් ද, සවකීය ධර්මයෙහි දෘඪව කියන්නාහු වෙත් ද එහෙයිනි.

**පරස්ස චෙ වම්භයිතෙන හීනො** - ඉදින් මෙරමා විසින් අවමත් කල කරුණෙන් නිගා කල කරුණෙන් ගැරහූ කරුණෙන් තුගුණ කී කරුණෙන් මෙරමා බාලයෙක් හීනයෙක් නිහීනයෙක් අවමතයෙක් ලාමකයෙක් ඡතුක්කයෙක් පරිත්තයෙක් වේ නම් යි 'පරස්ස චෙ වම්භයිතෙන හීනො' යනු වේ.

**න කොචි ධම්මෙසු විසෙසි අස්ස** - ධර්මයන් අතුරෙහි කිසිවෙක් අග්‍ර වූයේ ශ්‍රේෂ්ඨ වූයේ විශිෂ්ට වූයේ පාමොක් වූයේ උතුම් වූයේ ප්‍රවර වූයේ නො වන්නේ නුයි 'න කොචි ධම්මෙසු විසෙසි අස්ස' යනු වේ.

**පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතො** - බොහෝ දෙනාගේ දහම හීන හෙයින් නිහීන හෙයින් ඔමක හෙයින් ලාමක හෙයින් ඡතුක්ක හෙයින් පරිත්ත හෙයින් කියති උපවාද කෙරෙති නිගා කෙරෙති ගරහත්. බොහෝ දෙනා ද එකක්හුගේ දහම හීන - නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්ත හෙයින් කියති තුගුණ කියයි නිගා කෙරෙයි ගරහත්. එකෙකු ද බොහෝ දෙනාගේ දහම හීන - නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්ත හෙයින් කියයි තුගුණ කියයි නිගා කෙරෙයි ගරහයි. එකෙකු ද එකක්හුගේ දහම හීන - නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්ත හෙයින් කියයි තුගුණ කියයි නිගා කෙරෙයි ගරහා නුයි 'පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතො' යනු වේ

**සකඤ්හි දළ්හං වදනා** - ධර්මය සවකීය මාර්ගී යැ දෘෂ්ටිය සවමාර්ගී යැ ප්‍රතිපදාව සවමාර්ගී යැ මාර්ගීය සවමාර්ගී යයි සවකීය මාර්ගීය හෙතු කොට ගෙන දෘඪවාද ඇත්තාහු ස්ථිර වාද ඇත්තාහු බලවත් වාද ඇත්තාහු අවස්ථිතවාද ඇත්තාහු නුයි 'සකඤ්හි දළ්හං වදනා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පරස්ස චෙ -පෙ- නිහීනතො සකඤ්හි දළ්හං වදනා"යි.

## 18 - 12

තවද (ඒ තීර්ථකයෝ ලබ්ධිමාර්ගීයන්ට යම්සේ පසසත් නම් සවකීය ශාසනා ආදීන්ට පූජාවත් එසේ ම පවත්නේ ය. ඉදින් (ඔහු එහි ප්‍රමාණ වන්නාහු නම්) සියලු මැ වාදයෝ සත්‍ය වන්නාහුය. යම් හෙයකින් ඔවුන් ගේ ශුද්ධිය තමත් තමත් කෙරෙහි පිහිටියේ ද එහෙයිනි.

**සද්ධම්මපූජා ච පනා තථෙවාති** – කතමා සද්ධම්මපූජා: සකං සත්ථාරං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති 'අයං සත්ථා සබ්බඤ්ඤූ"ති අයං සද්ධම්මපූජා. සකං ධම්මක්ඛාතං – සකං ගණං – සකං දිට්ඨිං – සකං පටිපදං – සකං මග්ගං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති "අයං මග්ගො නිය්‍යානිකො"ති අයං සද්ධම්මපූජා. **සද්ධම්මපූජා ච පනා තථෙවාති** – සද්ධම්මපූජා තථා තච්ඡා භූතා යාථාවා අවිපරීතාති – සද්ධම්මපූජා ච පනා තථෙව.

**යථා පසංසන්ති සකායතනානීති** – ධම්මො සකායතනං, දිට්ඨි සකායතනං, පටිපදා සකායතනං, මග්ගො සකායතනං; සකායතනානි පසංසන්ති ථොමෙන්ති කිත්තෙන්ති වණ්ණෙන්තීති – යථා පසංසන්ති සකායතනානි.

**සබ්බෙව වාදා තථියා[1] භවෙය්‍යුන්ති** – සබ්බෙව වාදා තථා තච්ඡා භූතා යාථාවා අවිපරීතා භවෙය්‍යුන්ති – සබ්බෙව වාදා තථියා[1] භවෙය්‍යුං.

**සුද්ධී හි[2] නෙසං පච්චත්තමෙවාති** – පච්චත්තමෙව තෙසං සමණ-බ්‍රාහ්මණානං සුද්ධි විසුද්ධි පරිසුද්ධි මුත්ති විමුත්ති පරිමුත්තීති – සුද්ධී හි[2] තෙසං පච්චත්තමෙව.

තෙනාහ භගවා:

"සද්ධම්මපූජා ච පනා තථෙව
යථා පසංසන්ති සකායතානි,
සබ්බෙව වාදා තථියා භවෙය්‍යුං
සුද්ධී හි[2] තෙසං පච්චත්තමෙවා"ති.

## 18 – 18

න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා විවාදානි උපාතිවත්තො
න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං.

**න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථීති** – 'නා'ති පටික්ඛෙපො; බ්‍රාහ්මණොති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො -පෙ- අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා. න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථීති බ්‍රාහ්මණස්ස පරනෙය්‍යතා නත්ථි, බ්‍රාහ්මණො න පරනෙය්‍යො; න පරපත්තියො, න පරපච්චයො, න පරපටිබද්ධගූ; ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතො. "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා"ති බ්‍රාහ්මණස්ස පරනෙය්‍යතා නත්ථි. බ්‍රාහ්මණො න පරනෙය්‍යො, න පරපත්තියො, න පරපච්චයො' න පරපටිබද්ධගූ ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතො. "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්ම"න්ති බ්‍රාහ්මණස්ස පරනෙය්‍යතා නත්ථි, බ්‍රාහ්මණො න පරනෙය්‍යො, න පරපත්තියො, න පරපච්චයො; න පරපටිබද්ධගූ ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතොති – න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි.

---

1. තච්ඡා - සීමු. II. 2. සුද්ධිපි - සීමු. II.

**සද්ධම්මපූජා ච පනා තථේව** - සද්ධම්මපූජා කවරී ද යත්: "මේ ශාස්තෘ තෙම සර්වඥ යැ"යි ස්වකීය ශාස්තෘහට සත්කාර කෙරෙයි ගරු කෙරෙයි බුහුමන් කෙරෙයි පූජා කෙරෙයි; මෝ 'සද්ධම්මපූජා'යැ. ස්වකීය ධර්මාඛ්‍යානයට - ස්වකීය ගණයාට - ස්වකීය දෘෂ්ටියට- ස්වකීය ප්‍රතිපත්තියට 'මේ මාර්ගය නෛර්යාණික යැ'යි ස්වකීය මාර්ගයට සත්කාර කෙරෙයි ගරු කෙරෙයි බුහුමන් කෙරෙයි පූජා කෙරෙයි, මෝ සද්ධම්මපූජා යි. **සද්ධම්මපූජා ච පනා තථේව** - ස්වකීය ශාස්තෘ ආදීන්ට පූජාව අවිපරීත යැ නො සිස් යැ විද්‍යමාන යැ යාථාවත් යැ නො වෙනස් නුයි 'සද්ධම්මපූජා ච පනා තථේව' යනු වේ.

**යථා පසංසන්ති සකායනානි** - ධර්මය සිය මඟ යැ, දෘෂ්ටිය සිය මඟ යැ, ප්‍රතිපත්තිය සිය මඟ යැ, මාර්ගය සිය මඟැ යි. ස්වකීය මාර්ගයන්ට පසසති තුති කෙරෙති ප්‍රකට කෙරෙති ගුණ කියත් නුයි 'යථා පසංසන්ති සකායනානි' යනු වේ.

**සබ්බේව වාදා තථියා භවෙය්‍යුං** - සියලු මැ වාදයෝ අවිපරීතයෝ තථ්‍යයෝ විද්‍යමානයෝ යාථාවත් වූවෝ නො වෙනස් වූවෝ වන්නාහු නුයි 'සබ්බේව වාදා තථියා භවෙය්‍යුං' යනු වේ.

**සුද්ධී හි නෙසං පච්චත්තමේව** - ඒ මහණබමුණන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය තමන් තමන් කෙරෙහි මැ වේ නුයි 'සුද්ධී හි නෙසං පච්චත්තමේව' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සද්ධම්මපූජා ච -පෙ- සුද්ධී හි නෙසං පච්චත්තමේව"**යි.

**18 - 18**

බාහිතපාපී වූ බ්‍රාහ්මණහට මෙරමා විසින් එළැවිය යුතු ඥනයෙක් යම්හෙයකින් නැත් ද, දෙසැවදිටු දහම්හි (මෙය මැ සැබවැයි) නිශ්චය කොට දැඩි වැ ගන්නා ලද්දකුත් නැත් ද, එහෙයින් දෘෂ්ටිවිවාදයන් ඉක්මවූ හෙතෙම අන් දහමක් ශ්‍රෙෂ්ඨ විසින් නො මැ දක්නේ යි.

**න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි** - 'න' යනු: ප්‍රතික්ෂෙප යැ; 'බ්‍රාහ්මණ නම්: සත් ධර්ම කෙනකුන් බාහිත හෙයින් 'බ්‍රාහ්මණ යැ,... හේ බ්‍රාහ්මණ යි. **න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි** - බ්‍රාහ්මණහට මෙරමා විසින් එළැවියැ යුතු බවෙක් නැත; බ්‍රාහ්මණ තෙමේ මෙරමා විසින් අවබොධ කරවියැ යුත්තේ නො වෙයි, මෙරමා විසින් හැඳූහියැ යුත්තේ නො වෙයි, පරප්‍රත්‍යය රසිත වූයේ වෙයි, මෙරමා පිළිබඳ වූ පැමිණීම් ඇත්තේ නො වෙයි: නො මුළා වූයේ සම්‍යක්ප්‍රඥ ඇත්තේ ස්මෘතිමත් වූයේ දැනගනී දක්නේයි. 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි බ්‍රාහ්මණහට මෙරමා විසින් එළවියැ යුතු බවෙක් නැත, බ්‍රාහ්මණ තෙමේ මෙරමා විසින් අවබොධ කරවියැ යුත්තේ නො වෙයි, මෙරමා විසින් හැඳූහියැ යුත්තේ නො වෙයි, පරප්‍රත්‍යය වූයේ නො වෙයි, මෙරමා පිළිබඳ පැමිණීම් ඇත්තේ නො වෙයි, නො මුළා වූයේ සම්‍යක්ප්‍රඥ ඇත්තේ ස්මෘතිමත් වූයේ (තෙමේ) මැ දැනගනී, දක්නේ යි. 'සියලු සංස්කාරයෝ දුඃඛයෝ ය'යි...'යම් කිසිවෙක් සමුදයධර්ම වේ නම් ඒ සියල්ල නැසෙන සුලු ය'යි බ්‍රාහ්මණහට පරා විසින් එළවියැ යුත්තෙක් නැත, බ්‍රාහ්මණ තෙමේ පරනෙය්‍ය වූයේ නො වෙයි, පරා පිළිබඳ හැඳහීම් ඇත්තේ නො වෙයි, පරප්‍රත්‍යය වූයේ නො වෙයි, පරා අයත් ගමන් ඇත්තේ නො වෙයි. අසම්මූඪ වූයේ සම්‍යක්ප්‍රඥ ඇත්තේ ස්මෘතිමත් වූයේ (තෙමේ ම) දැනගනී දක්නේ නුයි 'න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි' යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** – ‘ධම්මෙසූ’ති ද්වාසට්ඨි දිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා විචිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො, ඉදං සච්චං තථං තච්ඡං භූතං යාථාවං අවිපරීතන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සංවිජ්ජති නුපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති – ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

**තස්මා විවාදානි උපාතිවත්තොති** – ‘තස්මා’ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා දිට්ඨිකලහානි දිට්ඨිභණ්ඩනානි දිට්ඨිවිග්ගහානි දිට්ඨිවිවාදානි දිට්ඨිමෙධගානි උපාතිවත්තො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තොති – තස්මා විවාදානි උපාතිවත්තො.

**න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤන්ති** – අඤ්ඤං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං ධම්මං න පස්සති න දක්ඛති න ඔලොකෙති න නිජ්ඣායති න උපපරික්ඛතීති – න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං.

තෙනාහ භගවා:

“න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා විවාදානි උපාතිවත්තො
න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤ”න්ති.

**13 – 14**

ජානාමි පස්සාමි තථෙව එතං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං,
අද්දක්ඛි[1] චෙ කිං හි තුමස්ස තෙන
අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං.

**ජානාමි පස්සාමි තථෙව එතන්ති** – “ජානාමී”ති පරචිත්තවිජානනඤාණෙන ජානාමි; පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා ජානාමි; **පස්සාමීති** මංසචක්ඛුනා වා පස්සාමි; දිබ්බෙන චක්ඛුනා වා පස්සාමි; **තථෙව එතන්ති** එතං තච්ඡං භූතං යාථාවං අවිපරීතන්ති – ජානාමි පස්සාමි තථෙව එතං.

1. දක්ඛිති - සු.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං** – 'ධම්මෙසු' යනු: දෙසැට දිට්ඨිගතයන්හි; **නිච්ඡෙය්‍ය** යනු: නිශ්චය කොට විනිශ්චය කොට විමසා වෙසෙසින් විමසා තුලනය කොට තීරණය කොට හෙළි කොට විභූත කොට අවධි කොට ගැනීමෙක් කොටස් වශයෙන් ගැනීමෙක් උත්තමග්‍රහණයෙක් කොට්ඨාසග්‍රහණයෙක් රාශි වශයෙන් ගැනීමෙක් විශේෂරාශි වශයෙන් ගැනීමෙක් 'මේ සැබව අවිපරිණාම යැ තථ්‍ය යැ විද්‍යමාන යැ යථාවත් යැ අවිපරීත යැ'යි ගන්නා ලද්දෙක් දෘඪගන්නා ලද්දෙක් පිහිටාගන්නා ලද්දෙක් ඇතුළු වැ ගන්නා ලද්දෙක් ඇලීගන්නා ලද්දෙක් නැත, විද්‍යමාන නො වෙයි, නො ලැබෙයි, ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ සන්සිඳුවන ලද දුරලන ලද උපදනට නො සුදුසු කරන ලද නුවණගින්නෙන් දවන ලද නුයි 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං' යනු වේ.

**තස්මා විවාදානි උපාතිවත්තො** – 'තස්මා' යනු: එහෙයින් එකරුණෙන් ඒ හේතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් දෘෂ්ටිකලහයන් දෘෂ්ටිභණ්ඩනයන් දෘෂ්ටිවිග්‍රහයන් දෘෂ්ටිවිවාදයන් දෘෂ්ටිමෙධගයන් පසු කෙළේ ඉක්මැවූයේ මැනවින් ඉක්මැවූයේ වෙසෙසින් ඉක්මැවූයේ නුයි 'තස්මා විවාදානි උපාතිවත්තො' යනු වේ.

**න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං** – සතිපට්ඨානයන් හැර සම්‍යක්ප්‍රධානයන් හැර ඍද්ධිපාදයන් හැර ඉන්ද්‍රියයන් හැර බලයන් හැර බොධ්‍යඞ්ගයන් හැර ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය හැර අන්‍ය ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපත්තියක් මාර්ගයක් අග්‍ර වූ ශ්‍රෙෂ්ඨ වූ විශිෂ්ට වූ පාමොක් වූ උතුම් වූ ප්‍රවර වූ දහමක් නො බලයි නො දකී අවලොකනය නො කෙරෙයි නො සිතයි නො විමසා නුයි 'න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"න බ්‍රාහ්මණස්ස -පෙ- න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං"යි**

**18 - 14**

ඇතැම් මහණබමුණු කෙනෙක් තෙල එපරිද්දෙන් ම දනිම් දකිම් (කියන්නාහු) දෘෂ්ටියෙන් ශුද්ධිය හදහති. (යම්හෙයකින් ඔවුනතුරෙන් එකෙකු දු) ඉදින් දුටුයේ නමුදු තමාගේ ඒ දර්ශනයෙන් (දුඃඛපරිඥානාදි කුමක් සිදුකරන ලද ද, ඔහු (ආර්‍ය්‍යමාර්ගය) ඉක්මවා අන් මඟෙකින් ශුද්ධිය කියත් ද, නොහොත් (බුද්ධාදීහු) ඔවුන් ඉක්මවා අන් මඟෙකින් ශුද්ධිය කියත් ද, එහෙයිනි.

**ජානාමි පස්සාමි තථෙව එතං** – 'ජානාමි' යනු: පරචිත්තවිජානනඥානයෙන් දනිමි, පූර්වේනිවාසානුස්මෘතිඥානයෙන් හෝ දනිමි; 'පස්සාමි' යනු: මසැසින් හෝ දකිමි, දිවැසින් හෝ දකිමි; **තථෙව එතං** – තෙල සැබව විද්‍යමාන යැ යථාවත් යැ අවිපරීත නුයි 'ජානාමි පස්සාමි තථෙව එතං' යනු වේ.

**දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධින්ති** – දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති; අසස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති – දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්තීති – දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං.

**අද්දක්ඛි[1] චෙ කිං හි තුමස්ස තෙනාති** – "අද්දක්ඛී"ති පරචිත්ත-විජානනඤාණෙන වා අද්දක්ඛි, පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා අද්දක්ඛි; මංසචක්ඛුනා වා අද්දක්ඛි; දිබ්බෙන චක්ඛුනා වා අද්දක්ඛීති – අද්දක්ඛි චෙ; **කිං හි තුමස්ස තෙනාති** – තස්ස තෙන දස්සනෙන කිං කතං? න දුක්ඛපරිඤ්ඤා අත්ථි; න සමුදයස්ස පහානං අත්ථි; න මග්ගභාවනා අත්ථි; න රාගස්ස සමුච්ඡෙදප්පහානං අත්ථි; න දොසස්ස සමුච්ඡෙදප්පහානං අත්ථි; න මොහස්ස සමුච්ඡෙදප්පහානං අත්ථි; න කිලෙසානං සමුච්ඡෙදප්පහානං අත්ථි; න සංසාරවට්ටස්ස උපච්ඡෙදො අත්ථීති – අද්දක්ඛි[1] චෙ කිං හි තුමස්ස තෙන.

**අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධින්ති** – තෙ තිත්ථියා සුද්ධිමග්ගං විසුද්ධිමග්ගං පරිසුද්ධිමග්ගං වොදාතමග්ගං පරියොදාතමග්ගං අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති, එවම්පි, අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං. අථවා බුද්ධා ච බුද්ධසාවකා ච පච්චෙකබුද්ධා ච තෙසං තිත්ථියානං අසුද්ධිමග්ගං අවිසුද්ධි-මග්ගං අපරිසුද්ධිමග්ගං අවොදාතමග්ගං අපරියොදාතමග්ගං අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා චතූහි සතිපට්ඨානෙහි චතූහි සම්මප්පධානෙහි චතූහි ඉද්ධිපාදෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි පඤ්චහි බලෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති එවම්පි –අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං.

තෙනාහ භගවා:

"ජානාමි පස්සාමි තථෙව එතං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං,
අද්දක්ඛි චෙ කිං හි තුමස්ස තෙන
අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධි"න්ති.

## 13 – 15

පස්සං නරො දක්ඛති[1] නාමරූපං
දිස්වාන වා ඤස්සති[2] තානිමෙව,
කාමං බහුං පස්සතු අප්පකං වා
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.

---

1. දක්ඛිති - ස්‍යා.
2. ඤාස්සති - PTS.

**දිට්ඨියා එකෙ පච්චෙනති සුද්ධිං** – ඇතැම් මහණබමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හදහති; ලොකය ශාශ්වත යැ මේ මැ සැබව, අන්‍යය මොඝ යැ යි දෘෂ්ටියෙන් ඇතැම් මහණ බමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හදහති; 'ලොකය අශාශ්වත යැ...තථාගතයා මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ මැ සැබව අන්‍යය මොඝ ය'යි දෘෂ්ටියෙන් ඇතැම් මහණබමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හදහත් නුයි 'දිට්ඨියා එකෙ පච්චෙනති සුද්ධිං' යනු වේ.

**අද්දක්ඛි චෙ කිං හි තුම්හස්ස තෙන** – 'අද්දක්ඛි' යනු: පරසිත් දත්නා නුවණින් හෝ, පෙරවිසූ කඳපිළිවෙල සිහි කරන නුවණින් හෝ, මසැසින් හෝ, දිවැසින් හෝ දුටුයේ නුයි 'අද්දක්ඛි චෙ' යනු වේ. **කිං හි තුම්හස්ස තෙන** – ඔහුගේ ඒ දැක්මෙන් කුමක් කරන ලද ද? දුඃඛපරිඥාවක් නැත, සමුදයප්‍රහාණයෙක් නැත, මාර්ගභාවනායෙක් නැත, ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීමෙක් නැත, රාගයාගේ සමුච්ඡෙදප්‍රහාණයෙක් නැත, ද්වෙෂයාගේ සමුච්ඡෙදප්‍රහාණයෙක් නැත, මොහයාගේ සමුච්ඡෙදප්‍රහාණයෙක් නැත, කෙලශයන්ගේ සමුච්ඡෙදප්‍රහාණයෙක් නැත, සංසාරවෘත්තයාගේ සිඳීමෙක් නැත් නුයි 'අද්දක්ඛි චෙ කිං හි තුම්හස්ස තෙන' යනු වේ.

**අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං** – ඒ තීර්ථකයෝ ශුද්ධිමාර්ගය විශුද්ධිමාර්ගය පරිශුද්ධිමාර්ගය පණ්ඩරමාර්ගය ප්‍රභාවත් මාර්ගය ඉක්මවා මොනවට ඉක්මවා වෙසෙසින් ඉක්මවා සතර සිවටන් හැරපියා සම්‍යක්-ප්‍රධානයන් – සෘද්ධිපාදයන් – ඉන්ද්‍රියයන් – බලයන් – බොධ්‍යඞ්ගයන් – ආර්‍ය්‍ය-අෂ්ටාඞ්ගිකමාර්ගය හැරපියා ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි මෙසේත් 'අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං' යනු වේ. නොහොත් බුදුවරයෝ ද බුදුසව්වෝ ද පසේබුදුහු ද ඒ තීර්ථකයන්ගේ අශුද්ධිමාර්ගය අවිශුද්ධිමාර්ගය අපරිශුද්ධිමාර්ගය අපණ්ඩරමාර්ගය අප්‍රභාස්වරමාර්ගය ඉක්මවා මොනවට ඉක්මවා වෙසෙසින් ඉක්මවා සතර සතිපට්ඨානයන් ගෙන් සතර සම්‍යක්ප්‍රධානයන්ගෙන් සතර සෘද්ධිපාදයන් ගෙන් පඤ්චෙන්ද්‍රියයන් ගෙන් පඤ්චබලයන් ගෙන් සප්තබොධ්‍යඞ්ගයන්ගෙන් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික-මාර්ගයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි මෙසේත් 'අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“ජානාමි පස්සාමි** –පෙ– **අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං**”යි.

## 18 – 15

සත්ත්ව තෙමේ (පරචිත්තවිජානනඥානාදියෙන්) බලනුයේ නාමරූපය (නිත්‍යාදි විසින්) දක්නේ ය, දැක ඒ නාමරූපයන් ම (නිත්‍යාදි විසින්) දැනගන්නේය. ඒකාන්තයෙන් (හෙතෙම) බොහෝ කොට හෝ මඳ ව හෝ දක්නේ ය. බුද්ධාදි කුශලයෝ ඒ දර්ශනයෙන් සංසාර ශුද්ධිය නො මැ කියත්.

**පස්සං නරො දක්ඛති නාමරූපන්ති** – පස්සං නරො, පරචිත්තවිජානනඤාණෙන වා පස්සන්තො පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා පස්සන්තො මංසචක්ඛුනා වා පස්සන්තො දිබ්බෙන චක්ඛුනා වා පස්සන්තො නාමරූපංයෙව දක්ඛති නිච්චතො සුඛතො අත්තතො; න තෙසං ධම්මානං සමුදයං වා අත්ථඞ්ගමං වා අස්සාදං වා ආදීනවං වා නිස්සරණං වා දක්ඛතීති – පස්සං නරො දක්ඛති නාමරූපං.

**දිස්වාන වා ඤස්සති තානිමෙවාති** – 'දිස්වා'ති පරචිත්තඤාණෙන වා දිස්වා පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා දිස්වා මංසචක්ඛුනා වා දිස්වා දිබ්බෙන චක්ඛුනා වා දිස්වා නාමරූපංයෙව දිස්වා ඤස්සති නිච්චතො සුඛතො අත්තතො; න තෙසං ධම්මානං සමුදයං වා අත්ථඞ්ගමං වා අස්සාදං වා ආදීනවං වා නිස්සරණං වා ඤස්සතීති – දිස්වාන වා ඤස්සති තානිමෙව.

**කාමං බහුං පස්සතු අප්පකං වාති** – කාමං බහුකං වා පස්සන්තො නාමරූපං අප්පකං වා නිච්චතො සුඛතො අත්තතොති – කාමං බහුං පස්සතු අප්පකං වා.

**න හි තෙන සුද්ධිං කුසලා වදන්තීති** – 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා පරචිත්තඤාණෙන වා පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා මංසචක්ඛුනා වා දිබ්බෙන චක්ඛුනා වා නාමරූපදස්සනෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං න වදන්ති, න කථෙන්ති, න භණන්ති, න දීපයන්ති, න වොහරන්තීති–නහි තෙන සුද්ධිං කුසලා වදන්ති.

තෙනාහ භගවා:

"පස්සං නරො දක්ඛති නාමරූපං
දිස්වාන වා ඤස්සති තානිමෙව,
කාමං බහුං පස්සතු අප්පකං වා
න හි තෙන සුද්ධිං කුසලා වදන්තී"ති.

**18 – 16**

"නිවිස්සවාදී න හි සුබ්බිනායො
පකප්පිතං දිට්ඨි පුරෙක්ඛරානො,
යං නිස්සිතො තත්ථ සුභංවදානො
සුද්ධිංවදො තත්ථ තථද්දසා සො.

**පස්සං නරො දක්ඛති නාමරූපං** - බලන්නා වූ සත්ත්ව තෙමේ පරසිත් දන්නා නුවණින් හෝ දක්නේ පෙර විසූ කඳපිළිවෙල සිහිකරන නුවණින් හෝ දක්නේ මසැසින් හෝ දක්නේ දිවැසින් හෝ දක්නේ නාමරූපය මැ නිත්‍ය හෙයින් සුඛහෙයින් ආත්ම හෙයින් දක්නේ ය. ඒ ධර්මයන්ගේ ඉපදීම හෝ නැසීම හෝ ආස්වාදය හෝ ආදීනවය හෝ නිස්සරණය හෝ නො දක්නේ තුසි 'පස්සං නරො දක්ඛති නාමරූපං' යනු වේ.

**දිස්වාන වා ඤස්සති තානිමෙව** - 'දිස්වා' යනු: පරසිත් දන්නා නුවණින් හෝ දැක, පෙර විසූ කඳපිළිවෙල සිහි කරන නුවණින් හෝ දැක මසැසින් හෝ දැක, දිවැසින් හෝ දැක, නාමරූපය ම දැක නිත්‍ය හෙයින් සුඛ හෙයින් ආත්මහෙයින් දැනගන්නේය; ඒ ධර්මයන්ගේ ඉපදීම හෝ නැසීම හෝ ආස්වාදය හෝ ආදීනවය හෝ නිස්සරණය හෝ නො දැනගන්නේ තුසි 'දිස්වාන වා ඤස්සති තානිමෙව' යනු වේ.

**කාමං බහුං පස්සතු අප්පකං වා** - ඒකාන්තයෙන් බොහෝ කොට හෝ මඳ කොට හෝ නාමරූපය බලනුයේ නිත්‍ය හෙයින් සුඛ හෙයින් ආත්ම හෙයින් දක්නේ තුසි 'කාමං බහුං පස්සතු අප්පකං වා' යනු වේ.

**න හි තෙන සුද්ධිං කුසලා වදන්ති** - 'කුසලා' යනු: බුද්ධාදි යම් කෙනෙක් තුමූ ස්කන්ධයන්හි දක්ෂ වූවාහු ද ධාතූන්හි - ආයතනයන්හි- ප්‍රතීත්‍යසමුත්පාදයෙහි - සතිපට්ඨානයන්හි-සම්‍යක්ප්‍රධානයන්හි - ඍද්ධිපාද-යන්හි - ඉන්ද්‍රියයන්හි - බලයන්හි - බොධ්‍යඞ්ගයන්හි - මාර්ගයෙහි - ඵලයෙහි- නිර්වාණයෙහි දක්ෂ වූවාහු ද ඒ දක්ෂයෝ පරසිත් දන්නා නුවණින් හෝ පෙරවිසූ කඳපිළිවෙල සිහි කරන නුවණින් හෝ මසැසින් හෝ දිවැසින් හෝ නාමරූප දැකීමෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො පවසති නො කියති නො බෙණෙති නො දක්වති නො ව්‍යවහාර කෙරෙත් තුයි 'න හි තෙන සුද්ධිං කුසලා වදන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

**"පස්සං නරො -පෙ- න හි තෙන සුද්ධිං කුසලා වදන්ති"යි**

**18 - 16**

(යමෙක් දෘෂ්ටියෙහි) පිහිටා කියන්නේ වේ ද (හෙතෙම) නො මැ පැවසෙස් හික්මියැ හැකි වෙයි. සිතින් ගන්නා ලද දෘෂ්ටිය පෙරටු කොට හැසිරෙනුයේ යම් ශාස්තෘ ආදියක් ඇසුරු කරනුයේ එහි ශුභවාද ඇතියේ ඒ ස්වකීය දෘෂ්ටියෙහි ශුද්ධිය කියන්නේ වේ ද, හෙතෙම ඒ දෘෂ්ටිය එසේ මැ දුටුයේ වේ.

**නිවිස්සවාදී න හි සුබ්බිනායොති** – ‘සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති නිවිස්සවාදී, අසස්සතො ලොකො –පෙ– නෙව හොති, න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති නිවිස්සවාදී; **න හි සුබ්බිනායොති** නිවිස්සවාදී දුබ්බිනයො දුප්පඤ්ඤාපියො[1] දුන්නිජ්ඣාපියො දුප්පෙක්ඛාපියො දුප්පසාදියොති – නිවිස්සවාදී න හි සුබ්බිනායො.

**පකප්පිතං දිට්ඨි පුරෙක්ඛරානොති** – කප්පිතං පකප්පිතං අභිසඞ්ඛතං සණ්ඨපිතං දිට්ඨිං පුරක්ඛතං කත්වා චරති, දිට්ඨිධජො දිට්ඨිකෙතු දිට්ඨාධිපතෙය්‍යො දිට්ඨියා පරිවාරිතො චරතීති – පකප්පිතං දිට්ඨි පුරෙක්ඛරානො.

**යං නිස්සිතො තත්ථ සුභංවදානොති** – ‘යං නිස්සිතො’ති යං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතො සන්නිස්සිතො අල්ලීනො උපගතො අජ්ඣොසිතො අධිමුත්තොති යං නිස්සිතො; **තත්ථාති** සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සුභංවදානොති** සුභවාදො සොභනවාදො පණ්ඩිතවාදො ධීරවාදො ඤායවාදො හෙතුවාදො ලක්ඛණවාදො කාරණවාදො ඨානවාදො සකාය ලද්ධියාති – යං නිස්සිතො තත්ථ සුභංවදානො.

**සුද්ධිංවදො තත්ථ තථද්දසා සොති** – සුද්ධිවාදො විසුද්ධිවාදො පරිසුද්ධිවාදො පරියොදාතවාදො, අථවා සුද්ධිදස්සනො විසුද්ධිදස්සනො පරිසුද්ධිදස්සනො වොදාතදස්සනො පරියොදාතදස්සනොති සුද්ධිංවදො; **තත්ථාති** සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා තථං තච්ඡං භූතං යාථාවං අවිපරීතන්ති අද්දස අදක්ඛි අපස්සි පටිවිජ්ඣීති – සුද්ධිංවදො තත්ථ තථද්දසා සො.

තෙනාහ භගවා:

“නිවිස්සවාදී න හි සුබ්බිනායො
පකප්පිතං දිට්ඨිපුරෙක්ඛරානො,
යං නිස්සිතො තත්ථ සුභංවදානො
සුද්ධිංවදො තත්ථ තථද්දසා සො”ති.

## 18 – 17

න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛා
න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු,
ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා
උපෙක්ඛති උග්ගහණන්ති මඤ්ඤෙ.

1. දුප්පඤ්ඤාපයො – මජසං. ස්‍යා.

**නිවිස්සවාදී න හි සුබ්බිනායො** - 'ශාශ්වත යැ ලොකය මේ මැ සැබව අන්‍යය මොස යැ'යි පිහිටා කියනුයේ; 'අශාශ්වත යැ ලොකය...'සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වත්නේ නො වෙයි, මේ මැ සැබව අන්‍යය මොස යැ'යි පිහිටා කියනුයේ; න හි සුබ්බිනායො- පිහිටා කියන පුද්ගල තෙම හික්මවනු දුෂ්කර යැ හඟවනු දුෂ්කර යැ විමසවනු දුෂ්කර යැ .දක්වනු දුෂ්කර යැ පහදවනු දුෂ්කර වේ නුයි 'නිවිස්සවාදී න හි සුබ්බිනායො' යනු වේ.

**පකප්පිතං දිට්ඨි පුරෙක්ඛරානො** - කල්පිත වූ ප්‍රකල්පිත වූ අභිසංස්කෘත වූ මොහනාවට පිහිටුවන ලද දෘෂ්ටිය පෙරටු කොට හැසිරෙයි, දෘෂ්ටිය ධ්වජ කොට ඇතියේ දෘෂ්ටිය කෙතෙලි කොට ඇතියේ දෘෂ්ටිය අධිපති කොට ඇතියේ දෘෂ්ටියෙන් පිරිවරන ලදුයේ හැසිරේ නුයි 'පකප්පිතං දිට්ඨි-පුරෙක්ඛරානො' යනු වේ.

**යං නිස්සිතො තත්ථ සුභංවදානො** - 'යං නිස්සිතො' යනු: යම් ශාස්තෘවක්නු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපත්තියක් මාර්ගයක් ඇසුරු කෙළේ මොහවට ඇසුරු කෙළේ ඇලුණේ එළැඹියේ පිවිසියේ බැසගත්තේ නුයි 'යං නිස්සිතො' යනු වේ; තත්ථ යනු: ස්වකීය දෘෂ්ටියෙහි සිය කැමැත්තෙහි සිය රුචියෙහි සිය ලබ්ධියෙහි; සුභංවදානො යනු: ස්වකීය ලබ්ධියෙහි ශුභවාද ඇතියේ ශොභනවාද - පණ්ඩිතවාද - ස්ථිරවාද-න්‍යායවාද - හෙතුවාද - ලක්ෂණවාද - කාරණවාද - ස්ථානවාද ඇතියේ නුයි 'යං නිස්සිතො තත්ථ සුභංවදානො' යනු වේ.

**සුද්ධිංවදෙ තත්ථ තථද්දසා සො** - 'ශුද්ධිවාද ඇතියේ විශුද්ධිවාද-පරිශුද්ධිවාද - පණ්ඩරවාද - ප්‍රභාස්වරවාද ඇතියේ; නොහොත් ශුද්ධිය දක්නේ විශුද්ධිය දක්නේ පරිශුද්ධිය දක්නේ පණ්ඩරදර්ශන ඇතියේ ප්‍රභාස්වරදර්ශන ඇතියේ නුයි - 'සුද්ධිංවදෙ' යනු වේ; තත්ථ යනු: ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය ක්ෂාන්තියෙහි ස්වකීය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි සත්‍යය තථ්‍යය භූත යැ යාථාවත් යැ අවිපරීත යැ'යි දුටුයේයැ දුක්කේ යැ දර්ශනය කෙළේ යැ ප්‍රතිවෙධ කෙළේ නුයි 'සුද්ධිං වදෙ තත්ථ තථද්දසා සො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නිවිස්සවාදී -පෙ- සුද්ධිංවදෙ තත්ථ තථද්දසා සො"යි.

**13 - 17**

ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ නුවණින් දැන තෘෂ්ණාදෘෂ්ටිකල්පයට නො පැමිණෙයි. දෘෂ්ටියෙහි හැසිරෙනුයේ නො වෙයි. සමාපත්තිඥානාදියෙන් කෘත තෘෂ්ණාබන්ධ ඇත්තේ නො ද වෙයි. තවද හෙතෙම පුහුදුහුන් කෙරෙන් උපන් දෙසැට දෘෂ්ටීන් දැන උපෙක්ෂා කෙරෙයි. අන්‍යයෝ දැඩිව ගනිත්.

**න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛන්ති** – 'නා'ති පටික්ඛෙපො; **බ්‍රාහ්මණො**ති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො -පෙ- අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා; **කප්පා**ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො; **සඞ්ඛා** වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි; **න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛන්ති** බ්‍රාහ්මණො සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා නෙති, න උපෙති, න උපගච්ඡති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති – න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං.

**න දිට්ඨිසාරී නපි ඤාණබන්ධූ**ති – තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; සො දිට්ඨියා න යායති න නිය්‍යති න වුය්හති න සංහරීයති; නපි තං දිට්ඨිගතං සාරතො පච්චෙති, න පච්චාගච්ඡතීති 'න දිට්ඨිසාරී;' **නපි ඤාණබන්ධූ**ති අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා මිච්ඡාඤාණෙන වා තණ්හාබන්ධං වා දිට්ඨිබන්ධං වා න කරොති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති – න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු.

**ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා**යි – 'ඤත්වා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා: 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා: 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛායි -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති– ඤත්වා ච සො; **සම්මුතියො** වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි දිට්ඨිසම්මුතියො; **පුථුජ්ජා**ති පුථුජ්ජනෙහි ජනිතා වා තා සම්මුතියොති පුථුජ්ජා, පුථු නානාජනෙහි ජනිතා වා තා සම්මුතියොති පුථුජ්ජාති – ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා.

**උපෙක්ඛතී උග්ගහණන්ති මඤ්ඤෙ**ති – අඤ්ඤෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති, අරහා උපෙක්ඛති, න ගණ්හාති න පරාමසති, නාභිනිවිසතීති – උපෙක්ඛතී උග්ගහණන්ති මඤ්ඤෙ.

තෙනාහ භගවා:

"න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං
න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු,
ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා
උපෙක්ඛතී උග්ගහණන්ති මඤ්ඤෙ"ති.

**න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං** - ‘න’ යනු: ප්‍රතික්ෂෙප යැ. බ්‍රාහ්මණො - සප්ත ධර්ම කෙනකුන් බැහැර කළ බැවින් බ්‍රාහ්මණ යැ,... හේ බ්‍රාහ්මණ යැයි කියනු ලැබේ. **කප්පා** යනු: තෘෂ්ණාකල්ප යැ දෘෂ්ටිකල්ප යැයි කල්ප දෙකෙකි...මේ දෘෂ්ටිකල්ප යයි. **සඞ්ඛා** යයි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් පජානනයක්...අමොහසඞ්ඛ්‍යාත ධර්මවිචයයෙක් සම්‍යග්-දෘෂ්ටියක් වේ ද එයයි. **න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං** - ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ නුවණින් දැන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට ‘සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ’යි ‘සියලු සංස්කාරයෝ දුඃඛයෝ යැ’යි...යම් කිසිවෙක් සමුදයධර්ම වේ නම් ඒ සියල්ල නැසෙන සුලු යැ’යි නුවණින් දැන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට තෘෂ්ණා කල්පයට හෝ දෘෂ්ටිකල්පයට හෝ නො එයි, නො පැමිණෙයි, නො එළැඹෙයි, නො ගනී, නො දැහැගනී, නො පිවිසියේ නුයි ‘න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං’ යනු වේ.

**න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු** - ඔහු විසින් දෙසැට දිට්ඨිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහු ය, සිඳින ලද්දාහු ය, සංසිඳුවන ලද්දාහු ය, දුරලන ලද්දාහු ය, උපනට නො සුදුසු කරන ලද්දාහු ය, නුවණගින්නෙන් දවන ලද්දාහු ය; හෙතෙම දෘෂ්ටිය විසින් නො යවනු ලැබෙයි, නො නියනු ලැබෙයි, නො වහනු ලැබෙයි, නො හරිනු ලැබෙයි; ඒ දෘෂ්ටිගතය සාරශෙයින් නො ද දැහැගනී, නො පැමිණේ නුයි-‘න දිට්ඨිසාරී’ යනු වේ. **නපි ඤාණබන්ධු**- අෂ්ටසමාපත්තිඥානයෙන් හෝ පඤ්චාභිඥඥානයෙන් හෝ මිථ්‍යාඥානයෙන් හෝ තෘෂ්ණාබන්ධය හෝ දෘෂ්ටිබන්ධය හෝ නො කෙරෙයි, නො දනවයි, නූපදවයි නො නිපදවයි, අතිශයින් නූපදවා නුයි ‘න දිට්ඨිසාරී න’පි ඤාණබන්ධු’ යනු වේ.

**ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා** - ‘ඤත්වා’ යනු: දැන, දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට, සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ’යි දැන දැනගෙන තුලනය - තීරණය- විභාවනය කොට විභූත කොට, ‘සියලු සංස්කාරයෝ දුඃඛයෝ යැ’යි...යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් ඒ සියල්ල නැසෙන සුලු යැ’යි දැන දැන ගෙන තුලනය - තීරණය - විභාවනය කොට විභූත කොට නුයි ‘ඤත්වා ච සො’ යනු වේ; **සම්මුතියො**’යි දෙසැටදිට්ඨිගතයෝ දෘෂ්ටිසම්මතීහු කියනු ලැබෙත්; **පුථුජ්ජා** යනු: ඒ සම්මතීහු පුහුදුනුවන් විසින් උපදවන ලද්දාහු නුයි ‘පුථුජ්ජා’ යනු වේ, ඒ සම්මතීහු බොහෝ වූ නානා ජනයන් විසින් උපදවන ලද්දාහු නුයි හෝ ‘පුථුජ්ජා’ නම් වෙත් නුයි ‘ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා’ යනු වේ.

**උපෙක්ඛති උග්ගහණන්ති මඤ්ඤෙ** - අන්‍යයෝ තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගනිති, දැහැගනිති, පිවිසෙත්; රහත් තෙම උපෙක්ෂා කෙරෙයි නො ගනී නො දැහැගනී නො පිවිසේ නුයි ‘උපෙක්ඛති උග්ගහණන්ති මඤ්ඤෙ’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“න බ්‍රාහ්මණො -පෙ- උග්ගහණන්ති මඤ්ඤෙ”යි.

**13 - 18**

විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ
විවාදජාතෙසු න වග්ගසාරී,
සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො
අනුග්ගහො උග්ගණ්හන්ති මඤ්ඤෙ.

**විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙති** - 'ගන්ථා'ති චත්තාරො ගන්ථා: අභිජ්ඣා කායගන්ථො, බ්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො, අත්තනො දිට්ඨියා රාගො අභිජ්ඣා කායගන්ථො, පරවාදෙසු ආඝාතො අප්පච්චයො බ්‍යාපාදො කායගන්ථො, අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පරාමසති සීලබ්බතපරාමාසො කායගන්ථො, අත්තනො දිට්ඨි ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො, **විසජ්ජාති** ගන්ථෙ වොස්සජ්ජිත්වා වා විසජ්ජ; අථවා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බද්ධෙ[1] විබද්ධෙ[1] ආබද්ධෙ[1] ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ බන්ධනෙ ඵොටයිත්වා වා විසජ්ජ; යථා වය්හං වා රථං වා සකටං වා සන්දමානිකං වා සජ්ජං විසජ්ජං කරොන්ති විකොපෙන්ති, එවමෙවං ගන්ථෙ වොස්සජ්ජිත්වා වා විසජ්ජ; අථවා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බද්ධෙ විබද්ධෙ ආබද්ධෙ ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ[2] බන්ධනෙ ඵොටයිත්වා වා විසජ්ජ; **මුනීති** මොනං වුච්චති **ඤාණං** -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; **ඉධාති** ඉමිස්සා දිට්ඨියා -පෙ- ඉමස්මිං මනුස්සලොකෙති - විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ.

**විවාදජාතෙසු න වග්ගසාරීති** - විවාදෙ ජාතෙ සඤ්ජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙ[3] ඡන්දාගතිං ගච්ඡන්තෙසු දොසාගතිං ගච්ඡන්තෙසු භයාගතිං ගච්ඡන්තෙසු මොහාගතිං ගච්ඡන්තෙසු න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයතීති - විවාදජාතෙසු න වග්ගසාරී.

**සන්තො අසන්තෙසු උපෙක්ඛකො සොති** - 'සන්තො'ති රාගස්ස සන්තත්තා සන්තො; දොසස්ස සන්තත්තා සන්තො, මොහස්ස සන්තත්තා සන්තො -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති - සන්තො **අසන්තෙසූති** අසන්තෙසු අනුපසන්තෙසු අවූපසන්තෙසු අනිබ්බුතෙසු අප්පටිප්පස්සද්ධෙසූති - සන්තො අසන්තෙසු; **උපෙක්ඛකො සොති** අරහා ඡළඞ්ගුපෙක්ඛාය සමන්නාගතො: චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති, න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො, සොතෙන සද්දං සුත්වා -පෙ- කාලං කඞ්ඛති භාවිතත්තො[4] සුදන්තොති - සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො.

---

1. බන්ධෙ - මජසං. PTS. 2. පලිබුන්ධෙ - සීමු.II.
3. විවාදජාතෙසු පාතුභූතෙසු - සභා. PTS. 4. භාවිතො - සීමු.II. මනුප. PTS.

## 13 - 18

ක්ෂීණාස්‍රව මුනි තෙම මෙලොව චතුර්විධ ග්‍රන්ථයන් හැරපියා හටගත් විවාද ඇතියවුන් අතුරෙහි (ඡන්දාදීන්) වශී ව නො හැසිරෙනුයේ අශාන්තයන් අතුරෙහි ශාන්ත වූයේ උපෙක්ෂායෙන් යුක්ත වූයේ වෙයි, හෙතෙම දෘෂ්ටි-ග්‍රහණ රහිත වෙයි, අන්‍යයෝ (තෘෂ්ණා දෘෂ්ටි විසින්) දැඩිව ගනිත්.

**විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ** – 'ගන්ථා' යනු: සතර ග්‍රන්ථ කෙනෙකි. අභිධ්‍යාකායග්‍රන්ථ යැ, ව්‍යාපාදකායග්‍රන්ථ යැ, ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යැ ඉදම්සත්‍යාභිනිවේශකායග්‍රන්ථ යැයි; තමාගේ දෘෂ්ටියෙහි රාගය අභිධ්‍යාකාය ග්‍රන්ථ යැ, පරවාදයන්හි කොපය නො සතුට ව්‍යාපාදකායග්‍රන්ථ යැ, තමාගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ දැඩිව ගනී, (මේ) ශීලව්‍රත පරාමර්ශකායග්‍රන්ථ යැ, තමාගේ දෘෂ්ටිය ඉදම්සත්‍යාභිනිවේශකායග්‍රන්ථ යයි. **විසජ්ජ** යනු: ග්‍රන්ථයන් පරිත්‍යාග කොට හෝ 'විසජ්ජ' යනු වේ. නොහොත් ග්‍රන්ථයන් ග්‍රථිත වූවත් ග්‍රන්ථිත වූවත් බඳනා ලදුවත් වෙසෙසින් බඳනා ලදුවත් හාත්පසින් බඳනා ලදුවත් ලග්න වූවත් ලග්නිත වූවත් හාත්පසින් බැඳුණුවත් කෙලෙසබන්ධනයන් පොළාපියා හෝ හැරදමා; යම් සේ ගමනට සැරසූ අශ්වයෙක් හෝ රියක් හෝ ගැලක් හෝ යානයක් හෝ විසුරුවත් ද, සුණු කෙරෙත් ද, එසෙයින්ම ග්‍රන්ථයන් පරිත්‍යාග කොට හෝ හැරපියා නොහොත් ග්‍රන්ථයන් ග්‍රථිත – ග්‍රන්ථිත – බද්ධ – විබද්ධ – ආබද්ධ – ලග්න-ලග්නිත – පලිබුද්ධ වූවත් කෙලෙසබන්ධනයන් පොළාපියා හෝ හැරදමා; මුනි යනු: 'මොන'යි ඥානය කියනු ලැබෙයි; ඉධ යනු: මේ දෘෂ්ටියෙහි... මේ මිනිස්ලොව්‍ැ නුයි 'විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ' යනු වේ.

**විවාදජාතෙසු න වග්ගසාරී** – විවාදයක් උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙසෙසින් නිපන් කල්හි පහළ වූ කල්හි (අන්‍යයන්) ඡන්දයෙන් අගතියට යන කල්හි ද්වේෂයෙන් අගතියට යන කල්හි භයින් අගතියට යන කල්හි මොහයෙන් අගතියට යන කල්හි, ඡන්දාගතියට නො යෙයි, ද්වේෂාගතියට නො යෙයි, භයාගතියට නො යෙයි, මොහාගති යට නො යෙයි, රාගවශයෙන් නො යෙයි, ද්වේෂවශයෙන් – භයවශයෙන්- මොහවශයෙන් – මානවශයෙන් – දෘෂ්ටිවශයෙන් – ඖද්ධත්‍යවශයෙන්- විචිකිත්සාවශයෙන් – අනුශයවශයෙන් නො යෙයි; වර්ග වූ ධර්මයන් විසින් නො යවනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො වහනු ලැබෙයි , නො හරිනු ලැබේ නුයි 'විවාදජාතෙසු න වග්ගසාරී' යනු වේ.

**සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො** – 'සන්තො' යනු: රාගය සන්හිඳුවන ලද හෙයින් ශාන්ත යැ, ද්වේෂය ශාන්ත වන බැවින් ශාන්ත යැ, මොහය ශාන්ත වන බැවින් ශාන්ත යැ...සියලු අකුශලාභිසංස්කාරයන් ශාන්ත වන බැවින් ශමිත වන බැවින් ව්‍යුපශමිත වන බැවින් දවන ලද වන බැවින් නිවන ලද වන බැවින් විගත වන බැවින් දුරලන ලද වන බැවින් ශාන්ත යැ උපශාන්ත යැ ව්‍යුපශාන්ත යැ නිර්වෘත යැ දුරලන ලද්දේ නුයි 'සන්තො' යනු වේ. –**අසන්තෙසු** අශාන්තයන් අතුරෙහි අනුප-ශාන්තයන් – අව්‍යුපශාන්තයන් – නො නිවුණුවුන් (කෙලෙස්) නො දුරලන ලදුවන් අතුරෙහි නුයි 'සන්තො අසන්තෙසු' යනු වේ **උපෙක්ඛකො සො**– රහත් තෙමේ ෂඩඞ්ගොපෙක්ෂායෙන් සමන්විත වූයේ යැ; ඇසින් රූපයක් දැක නොම සතුටු සිත් ඇතියේ වෙයි, නො සතුටු සිත් ඇතියේ නො වෙයි, උපෙක්ෂා ඇතියේ සිහි ඇතියේ නුවණැතියේ වෙසෙයි; කනින් ශබ්දයක් අසා...භාවිත වූ සිත් ඇතියේ මොනාවට දමුණේ මරණකාලය අපෙක්ෂා කෙරේ නුයි 'සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො' යනු වේ.

**අනුග්ගහො උග්ගහණන්ති මඤ්ඤෙති** – අඤ්ඤෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන ගණ්හන්ති[1] පරාමසන්ති අභිනිවිසන්ති, අරහා උපෙක්ඛති න ගණ්හාති න පරාමසති නාභිනිවිසතීති – අනුග්ගහො උග්ගහණන්ති මඤ්ඤෙ.

තෙනාහ භගවා:

"විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ
විවාදජාතෙසු න වග්ගසාරී,
සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො
අනුග්ගහො උග්ගහණන්ති මඤ්ඤෙ"ති

**18 - 19**

පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං
න ඡන්දගූ නොපි නිවිස්සවාදී,
ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො
න ලිප්පති[2] ලොකෙ අනත්තගරහී.

**පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බන්ති** – පුබ්බාසවා වුච්චන්ති අතීතා රූපවෙදනාසඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණා, අතීතෙ සඞ්ඛාරෙ ආරබ්භ යෙ කිලෙසා උප්පජ්ජෙය්‍යුං, තෙ කිලෙසෙ හිත්වා චජිත්වා පරිච්චජිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති – පුබ්බාසවෙ හිත්වා; **නවෙ අකුබ්බන්ති** 'නවා'' වුච්චන්ති පච්චුප්පන්නා රූපවෙදනාසඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණා, පච්චුප්පන්නෙ සඞ්ඛාරෙ ආරබ්භ ඡන්දං අකුබ්බමානො පෙමං අකුබ්බමානො රාගං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති – පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං.

**න ඡන්දගූ නොපි නිවිස්සවාදීති** – න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නිය්‍යති වුය්හති සංහරීයතීති – න ඡන්දගූ; **නොපි නිවිස්සවාදීති** 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති න නිවිස්සවාදී –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති න නිවිස්සවාදීති – න ඡන්දගූ නොපි නිවිස්සවාදී.

**ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරොති** – තස්ස ද්වාසට්ඨිදිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; සො දිට්ඨිගතෙහි විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති; **ධීරොති** ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවීති – ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො.

1. ගණ්හන්තෙ - සීමු. II. 2. ලිම්පති සීමු. II. PTS.

**අනුග්ගහො උග්ගණ්හන්ති මඤ්ඤෙ** – අන්‍යයෝ තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගනියි, දැඩිගනියි, පිවිස ගනිත්; රහත් තෙම උපෙක්ෂා කෙරෙයි, නො ගනී නො දැඩිගනී නො පිවිසේ නුයි 'අනුග්ගහො උග්ගණ්හන්ති මඤ්ඤෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“**විසජ්ජ ගන්ථානි** -පෙ- **උග්ගණ්හන්ති මඤ්ඤෙ**”යි.

## 18 – 19

ඉක්මැගිය (රූපාදීන් අරබයා උපන් කාමාදි) ආශ්‍රවයන් හැර වර්තමාන (රූපාදිය අරබයා උපදනා) ආශ්‍රවයන් නො කරන්නාවූ ඡන්දාදි වශයෙන් අගතියට නො යන්නා වූ නො ද දෘෂ්ටියෙහි පිහිටා කියන්නා වූ දෘෂ්ටිගතයන් ගෙන් වෙසෙසින් මිදුණා වූ ධීර වූ ඒ ක්ෂීණාශ්‍රව තෙම (කෘතාකෘතවශයෙන්) තම හට නො ගරහනු යේ ලොවැ (තෘෂ්ණාදෘෂ්ටි) විසින් නො ඇලෙන්නේ යි.

**පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං** –'පුබ්බාසවා'යි ඉක්මැගිය රූපවෙදනාසංඥාසංස්කාරවිඥානයෝ කියනු ලැබෙති, අතීත සංස්කාරයන් අරබයා යම් කෙලෙස් කෙනෙක් උපදනාහු නම්, ඒ කෙලෙසුන් හැර ත්‍යාග කොට පරිත්‍යාග කොට දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'පුබ්බාසවෙ හිත්වා' යනු වේ. **නවෙ අකුබ්බං** 'නවා'යි වර්තමාන රූපවෙදනාසංඥාසංස්කාරවිඥානයෝ කියනු ලැබෙති; වර්තමාන සංස්කාරයන් අරබා ඡන්දය නො කරනුයේ ප්‍රෙමය නො කරනුයේ රාගය නො කරනුයේ නො දනවනුයේ මැනවින් නො දනවනුයේ නො නිප(ද)වනුයේ නූපදවනුයේ නුයි 'පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං' යනු වේ.

**න ඡන්දගූ නොපි නිවිස්සවාදී** – ඡන්දයෙන් අගතියට නො යයි, ද්වේෂයෙන් අගතියට නො යයි, භයින් අගතියට නො යයි, මෝහයෙන් අගතියට නො යයි, රාගවශයෙන් නො පැමිණෙයි, ද්වේෂවශයෙන්- මෝහවශයෙන් – මානවශයෙන් දෘෂ්ටිවශයෙන් – ඖද්ධත්‍ය – වශයෙන්- විචිකිත්සාවශයෙන් – අනුශයවශයෙන් නො යයි, වර්ගී වූ ධර්මයන්ගෙන් නො යවනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො වනනු ලැබෙයි, නො හරිනු ලැබේ නුයි 'න ඡන්දගූ' යනු වේ. **නො පි නිවිස්සවාදී** 'ශාශ්වත යැ ලොකය මේ මැ සැබෑව, අන්‍යය මොඝ යැ'යි නො පිහිටා කියනුයේ... සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ මැ සැබෑව, අන්‍යය මොඝ යැ'යි නො පිහිටා කියනුයේ නුයි 'න ඡන්දගූ නොපි නිවිස්සවාදී' යනු වේ.

**ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො** – ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහුය, සිඳින ලද්දාහුය, සන්සිඳුවන ලද්දාහුය දුරලන ලද්දාහුය උපනට නුසුදුසු කරන ලද්දාහුය, නුවණගින්නෙන් දවන ලද්දාහුය, හෙයින් ම දෘෂ්ටිගතයන් ගෙන් වෙසෙසින් මිදුණේ වෙන් වූයේ විගතමර්‍යාදා කළ සිතින් යුක්ත ව වෙසෙයි. **ධීරො** යනු: ධීර වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැතියේ විමංසනප්‍රඥා ඇතියේ තීරණප්‍රඥා ඇතියේ නුයි 'ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො' යනු වේ.

**න ලිප්පති[1] ලොකෙ අනත්තගරහීති** – ‘ලෙපා’ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච –පෙ– අයං තණ්හාලෙපො –පෙ– අයං දිට්ඨිලෙපො; තස්ස තණ්හා ලෙපො පහීනො දිට්ඨිලෙපො පටිනිස්සට්ඨො; තණ්හාලෙපස්ස පහීනත්තා දිට්ඨිලෙපස්ස පටිනිස්සට්ඨත්තා අනුපලිත්තො අපායලොකෙ න ලිප්පති; මනුස්සලොකෙ න ලිප්පති; දෙවලොකෙ න ලිප්පති; ඛන්ධලොකෙ න ලිප්පති; ධාතුලොකෙ න ලිප්පති; ආයතනලොකෙ න ලිප්පති; න සංලිප්පති, න උපලිප්පති, අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති – න ලිප්පති ලොකෙ, **අනත්තගරහීති** ද්වීහි කාරණෙහි අත්තානං ගරහති: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති? කතං මෙ කායදුච්චරිතං අකතං මෙ කායසුචරිතන්ති අත්තානං ගරහති. කතං මෙ වචීදුච්චරිතං– කතං මෙ මනොදුච්චරිතං – කතො මෙ පාණාතිපාතො –පෙ– කතා මෙ මිච්ඡාදිට්ඨි අකතා මෙ සම්මාදිට්ඨීති අත්තානං ගරහති. එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. අථවා සීලෙසුම්හි න පරිපූරකාරීති අත්තානං ගරහති. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති–භොජනෙම්හි අමත්තඤ්ඤූති ජාගරියම්හි අනනුයුත්තොති – න සතිසම්පජඤ්ඤෙනම්හි සමන්නාගතොති– අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති – අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති – අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති – අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති – අභාවිතානි මෙ පඤ්ච බලානීති – අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති – අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති – දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති – දුක්ඛසමුදයො මෙ අප්පහීනොති – මග්ගො මෙ අභාවිතොති – නිරොධො මෙ අසච්ඡිකතොති අත්තානං ගරහති එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. එවං අත්තගරහිං කත්තං[2] කම්මං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානො අනත්තගරහීති – න ලිප්පති[1] ලොකෙ අනත්තගරහී.

තෙනාහ භගවා:

“පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං
න ඡන්දගූ නොපි නිවිස්සවාදී,
ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො
න ලිප්පති[1] ලොකෙ අනත්තගරහී”ති.

## 18 – 20

ස සබ්බධම්මෙසු විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා,
ස පන්නභාරො මුනි විප්පමුත්තො
න කප්පියො නූපරතො න පත්ථියො (ඉති භගවා.)

1. ලිම්පති – සිමු II. PTS. 2. අත්තගරයි තයිදං – සිමු. II. PTS

න ලිප්පති ලොකෙ අනත්තගරහී – 'ලේප' නම්: තෘෂ්ණාලේපය ද දෘෂ්ටිලේපය දැයි ලේපයෝ දෙදෙනෙකි:...මේ දෘෂ්ටිලේපයයි; ඔහු විසින් තෘෂ්ණාලේපය ප්‍රහීණ යැ, දෘෂ්ටිලේපය දුරලන ලද, තෘෂ්ණාලේපය ප්‍රහීණ බැවින් දෘෂ්ටිලේපය දුරැලූ බැවින් නො ඇලුණේ අපායලොකයෙහි නො ඇලෙයි, මිනිස්ලොවැ නො ඇලෙයි, දෙව්ලොවැ නො ඇලෙයි, ස්කන්ධලොකයෙහි නො ඇලෙයි, ධාතුලොකයෙහි නො ඇලෙයි, ආයතනලොකයෙහි නො ඇලෙයි, නො තැවැරෙයි, හාත්පසින් නො ඇලෙයි, නො ඇලුණේ නො වැකුණේ නො තැවැරුණේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වෙසේ නුයි 'න ලිප්පති ලොකෙ' යනු වේ. අනත්තගරහී – දෙ කරුණෙකින් තම හට ගරහයි: කළ හෙයින් හා නො කළ හෙයින් හා යැ; කිසෙයින් කළ හෙයින් හා නො කළ හෙයින් හා තමහට ගරහා ද යත්? 'මා විසින් කායදුශ්චරිතය කරන ලද, කායසුචරිතය නො කරන ලදැ'යි තමහට ගරහයි, මා විසින් වාග්දුශ්චරිතය කරන ලද...මා විසින් මනොදුශ්චරිතය කරන ලද... මා විසින් ප්‍රාණවධ කරන ලද...මා විසින් මිථ්‍යාදෘෂ්ටිය කරන ලද... මා විසින් සම්‍යග්දෘෂ්ටිය නො කරන ලදැ'යි තම හට ගරහයි, මෙසේ කළ හෙයින් හා නො කළ හෙයින් හා තම හට ගරහයි; නොහොත් 'ශීලයෙහි පරිපූර්‍ණකාරී නො වූයෙමි තම හට ගරහයි, ඉන්ද්‍රියයන්හි පියූ දොර ඇතියෙම් නො වීමි... භොජනයෙහි පමණ දතුයෙම් නො වීමි... නිදි දුරැ කිරීමෙහි නො යෙදුනෙම් වීමි... සිහිනුවණින් සමන්විත වූයෙම් නො වීමි... මා විසින් සතර සතිපට්ඨානයෝ නො වඩන ලදහ'යි– සතර සම්‍යක්ප්‍රධානයෝ නො වඩන ලදහ'යි - සතර ඍද්ධිපාදයෝ නො වඩන ලදහ'යි– පඤ්චෙන්ද්‍රියයෝ නො වඩන ලදහ'යි– පඤ්චබලයෝ නො වඩන ලදහයි – සප්තබොධ්‍යඞ්ගයෝ නො වඩන ලදහයි – ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නො වඩන ලදැයි – දුඃඛසත්‍යය මා විසින් අපරිඥාත යැ යි – දුඃඛසමුදය මා විසින් අප්‍රහීණ යැයි – මාර්ගය මා විසින් අභාවිත යැ යි– නිරොධය මා විසින් ප්‍රත්‍යක්ෂ නො කරන ලදැයි තම හට ගරහයි; මෙසේ කළ හෙයින් ද නො කළ හෙයින් ද තම හට ගරහයි, මෙසේ තම හට ගරහන සුලු වෙයි. ඒ මේබඳු කර්‍මය නො කරනුයේ නො දනවනුයේ නූපදවනුයේ නො නිපදවනුයේ නො පහළ කරනුයේ තමහට නො ගරහනුයේ 'න ලිප්පති ලොකෙ අනත්තගරහී' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

“පුබ්බාසවෙ හිත්වා -පෙ-.න ලිප්පති ලොකෙ අනත්තගරහී”යි.

**18 - 20**

ඒ ක්ෂීණාස්‍රව තෙම යම් කිසි රූපාලම්බනයෙක් හෝ ශබ්දාලම්බනයෙක් හෝ ගන්ධරස ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙක් හෝ (ධර්‍මාලම්බනයෙක හෝ වේ ද) ඒ සර්‍වධර්‍මයන්හි මරසෙන් වනසා සිටියේ වෙයි. ඒ රහත් තෙම බහාතැබූ බර ඇත්තේ (කෙලෙසුත් කෙරෙන්) වෙසෙසින් මිදුණේ තෘෂ්ණාදෘෂ්ටි කල්පය නො කෙරෙයි, උපරති සහිත ද නො වෙයි. තෘෂ්ණා රහිත වූයේත් වේ. (බුදුහු මෙසේ වදාළ සේක.)

**ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං-වාති** - සෙනා වුච්චති මාරසෙනා, කායදුච්චරිතං මාරසෙනා, වචීදුච්චරිතං මාරසෙනා, මනොදුච්චරිතං මාරසෙනා, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභි-සඞ්ඛාරා මාරසෙනා.

වුත්තං හෙතං භගවතා:

1. "කාමා තෙ පඨමා සෙනා දුතියාඅරති[1] වුච්චති,
   තතියා ඛුප්පිපාසා තෙ චතුත්ථී තණ්හා පවුච්චති.

2. පඤ්චමී[2] ථීනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති,
   සත්තමී විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො තෙ අට්ඨමො.[3]

3. ලාභො සිලොකො සක්කාරො මිච්ඡාලද්ධො ච යො යසො,
   යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති.

4. එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිප්පහාරිණී,
   න නං අසූරො ජිනාති ජෙත්වා[4] ච ලභතෙ සුඛ"න්ති.[a]

යතො චතූහි අරියමග්ගෙහි සබ්බා ච මාරසෙනා සබ්බෙ ච පටිසෙනිකරා කිලෙසා ජිතා ච පරාජිතා ච භග්ගා විප්පලුග්ගා[5] පරම්මුඛා, සො වුච්චති **විසෙනිභූතො**, සො දිට්ඨෙ විසෙනීභූතො සුතෙ මුතෙ විඤ්ඤාතෙ විසෙනී-භූතොති - ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා.

**ස පන්නභාරො මුනි විප්පමුත්තොති** - 'භාරො'ති තයො භාරා ඛන්ධභාරො කිලෙසභාරො අභිසඞ්ඛාරභාරො; කතමො ඛන්ධභාරො? පටිසන්ධියා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, අයං ඛන්ධභාරො. කතමො කිලෙසභාරො? රාගො දොසො මොහො -පෙ- සබ්බාකුසලාභි-සඞ්ඛාරා, අයං කිලෙසභාරො. කතමො අභිසඞ්ඛාරභාරො? පුඤ්ඤාභි-සඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො, අයං අභිසඞ්ඛාරභාරො. යතො ඛන්ධභාරො ච කිලෙසභාරො ච අභිසඞ්ඛාරභාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා; සො වුච්චති පන්නභාරො පතිතභාරො ඔරොපිතභාරො සමොරොපිතභාරො නික්ඛිත්තභාරො පටිප්පස්සද්ධභාරො.

1. දුතියා රති - කංඑවි. පඤ්චමං - සීමු. II, මජසං. PTS.
3. අට්ඨමො - සීමු. II, මජසං. PTS. 4. ජෙත්වා - PTS.
5. විප්පලුත්තා - සීමු. II. PTS. a. සුත්තනිපාත - පධානසුත්ත

**ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා** 'සෙනා'යි මාරසෙන් කියනු ලැබෙයි, කායදුශ්චරිතය මාරසෙනා යැ, වාග්දුශ්චරිතය - මනොදුශ්චරිතය මාරසෙනා යැ, රාගය ද්වෙෂය මොහය ක්‍රොධය උපනාහය මකුබව යුගග්‍රාහය ඊර්ෂ්‍යාය මාත්සර්‍ය්‍යය මායාව ශඨාව තදබව කරණුත්තරියකරණය මානය අතිමානය මදය ප්‍රමාදය සියලු කෙලෙස් සියලු දුසිරිත් සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ මාරසෙනා සි.

මේ වදාරන ලද මැය, භාග්‍යවතුන් විසින්:

1. කාමයෝ තාගේ පළමුවැනි සෙනාව යැ, දෙවැන්නී අරති යයි කියනු ලබයි, සාපවස් දෙක තාගේ තෙවැනි සෙනාව යැ, සිවුවැන්නී තෘෂ්ණාව යයි කියනු ලබයි.

2. ථිනමිද්ධය තාගේ පස්වැනි සෙනාව යැ, සවැන්නී බියසුලු බව යයි කියනු ලබයි, විචිකිත්සාව තාගේ සත්වැනි සෙනාව යැ, මකුබව හා තදබව තාගේ අටවැනි සෙනාවයි.

3. ලාභය ප්‍රශංසාවය සත්කාරය හා මිථ්‍යාවෙන් ලද යශස ද (නව වැනි වෙයි) යමෙකු ත් තමා උසස් කරන්නේ පරහට අවඥත් කෙරේ ද, (එය දසවැනි වේ.)

4. අනාතකය, කෘෂ්ණධර්මයෙන් සමන්විත වූ තාගේ තෙල (දසවිධ) සෙනා තොමෝ මහණබමුණන් පෙළන්නී වෙයි, අසූර වූ පුරුෂ තෙම ඒ මරසෙනග නො දිනයි, යළි (සූර තෙමේ) ජයග්‍රහණය කොට මගපලසුව ලබා'යයි.

යම් හෙයකින් සතර ආර්‍ය්‍යමාර්ගයෙන් සියලු මරසෙනගත් සියලු ප්‍රතිපක්‍ෂකර කෙලශයෝත් දිනන ලද්දාහු ද පරදවන ලද්දාහු ද බිඳුණාහු සුණුවිසුණු වූවාහු විමුඛබවට පමුණුවන ලද්දාහු ද, හෙතෙම විසෙනිභූත යයි කියනු ලැබෙයි; හේ රූපායතනයෙහි නිකෙලශ වූයේ ශබ්දායතනයෙහි නිකෙලශ වූයේ ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනයෙහි නිකෙලශ වූයේ ධර්මායතනයෙහි නිකෙලශ වූයේ නුයි 'ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා' යනු වේ.

**ස පන්නභාරො මුනි විප්පමුත්තො** – 'භාර' නම් තුන් බරෙකි: ස්කන්ධභාරය කෙලශභාරය අභිසංස්කාරභාරය යි; ස්කන්ධභාරය කවරැ යත්? ප්‍රතිසන්ධියෙහි රූපය වෙදනාව සංඥව සංස්කාරයෝ විඥනය (යන) මේ ස්කන්ධභාරය යි; කෙලශභාරය කවරැ යත්? රාගය ද්වෙෂය මොහ ...සියලු අකුශලාභිසංස්කාරයෝ යැ, මේ කෙලශභාරය යි; අභිසංස්කාරභාරය කවරැ යත්? පුණ්‍යාභිසංස්කාර යැ අපුණ්‍යාභිසංස්කාර යැ ආනෙඤ්ජාභිසංස්කාර යැ (යන) මේ අභිසංස්කාරභාරය යි. යම් තැනෙකැ පටන් ස්කන්ධභාරය ත් කෙලශභාරය ත් අභිසංස්කාරභාරයත් ප්‍රහීණ වූවාහු වෙත් ද, උදුන් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය ගරන ලද්දාහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු වෙත් ද, හෙතෙම තැබූ බර ඇත්තේ යැ හෙළූ බර ඇත්තේ යැ. බහාතැබූ බර ඇත්තේ යැ මොනොවට බහාතැබූ බර ඇත්තේ යැ නික්‍ෂෙප කළ බර ඇත්තේ යැ සන්හිඳුවන ලද බර ඇත්තේ යැයි කියනු ලැබේ.

මුනීති මොනං වුච්චති ඤාණං, “යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි”a තෙන ඤාණෙන සමන්නාගතො මුනි මොනප්පත්තො.

තීණි මොනෙය්‍යානි: කායමොනෙය්‍යං, වචීමොනෙය්‍යං, මනොමොනෙය්‍යං කතමං කායමොනෙය්‍යං? තිවිධානං කායදුච්චරිතානං පහානං කායමොනෙය්‍යං. තිවිධං කායසුචරිතං කායමොනෙය්‍යං. කායාරම්මණඤාණං කායමොනෙය්‍යං. කායපරිඤ්ඤා කායමොනෙය්‍යං. පරිඤ්ඤාසහගතො මග්ගො කායමොනෙය්‍යං. කායෙ ඡන්දරාගස්ස පහානං කායමොනෙය්‍යං. කායසඞ්ඛාරනිරොධො චතුත්ථජ්ඣානසමාපත්ති කායමොනෙය්‍යං. ඉදං කායමොනෙය්‍යං.

කතමං වචීමොනෙය්‍යං? චතුබ්බිධානං වචීදුච්චරිතානං පහානං වචීමොනෙය්‍යං. චතුබ්බිධං වචීසුචරිතං වචීමොනෙය්‍යං. වාචාරම්මණං ඤාණං වචීමොනෙය්‍යං. වාචාපරිඤ්ඤා වචීමොනෙය්‍යං. පරිඤ්ඤාසහගතො මග්ගො වචීමොනෙය්‍යං. වාචාය ඡන්දරාගස්ස පහානං වචීමොනෙය්‍යං. වචීසඞ්ඛාරනිරොධො දුතියජ්ඣානසමාපත්ති වචීමොනෙය්‍යං. ඉදං වචීමොනෙය්‍යං.

කතමං මනොමොනෙය්‍යං? තිවිධානං මනොදුච්චරිතානං පහානං මනොමොනෙය්‍යං. තිවිධං මනොසුචරිතං මනොමොනෙය්‍යං. චිත්තාරම්මණං ඤාණං මනොමොනෙය්‍යං. චිත්තපරිඤ්ඤා මනොමොනෙය්‍යං. පරිඤ්ඤාසහගතො මග්ගො මනොමොනෙය්‍යං. චිත්තෙ ඡන්දරාගස්ස පහානං මනොමොනෙය්‍යං. චිත්තසඞ්ඛාරනිරොධො සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති මනොමොනෙය්‍යං. ඉදං මනොමොනෙය්‍යං.

5. “කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු සබ්බප්පහායිනං.b

6. කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු නින්හාතපාපක”න්තිc

ඉමෙහි තීහි මොනෙය්‍යෙහි ධම්මෙහි සමන්නාගතා ඡ මුනිනො: අගාරමුනිනො අනගාරමුනිනො සෙඛමුනිනො අසෙඛමුනිනො පච්චෙකමුනිනො මුනිමුනිනො.

---

a. ධම්මසඞ්ගණී නිද්දෙසවාර. b. තිකඞ්ගුත්තර - ආපායිකවග්ග
c. ඉතිවුත්තක - දුතියවග්ග.

මුනි යනු: ‘මොන’යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රකණ්ඨයෙන් දැනීමෙක් අනිත්‍යාදිය විමසීමෙක් ප්‍රකණ්ඨයෙන් විමසීමෙක් සිවුසස් දහම් විමසීමෙක් අනිත්‍යාදිය සැලකීමෙක් උපලක්‍ෂණයෙක් ප්‍රත්‍යුපලක්‍ෂණයෙක් පණ්ඩිත බවෙක් කුසල බවෙක් නිපුණ බවෙක් (අනිත්‍යාදීන්ගේ) විභාවනයෙක් සිතීමෙක් පරීක්‍ෂාවක් භූරි සඞ්ඛ්‍යාත ප්‍රඥාවක් කෙලෙස් නසන ප්‍රඥාවක් පරිණායකප්‍රඥාවක් විදර්ශනාවක් සම්ප්‍රජන්‍යයක් පතොදය වැනි ප්‍රඥාවක් ප්‍රඥාවක් ප්‍රඥෙන්‍ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥා-ප්‍රාසාදයෙක් ප්‍රඥාලොකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එයයි. ඒ ඥානයෙන් සමන්විත වූ මුනි තෙම මොනප්‍රාප්ත යැ.

මෞනෙය්‍යයෝ තිදෙනෙකි: කායමොනෙය්‍ය යැ වචීමොනෙය්‍ය යැ මනොමොනෙය්‍ය යැයි; කායමොනෙය්‍ය ය කවරැ යත්: ත්‍රිවිධ කාය-දුශ්චරිතයන් ගේ ප්‍රහාණය කායමොනෙය්‍ය යැ, ත්‍රිවිධකායසුචරිතය කාය-මොනෙය්‍ය යැ කය අරමුණු කොට උපන් නුවණ කායමොනෙය්‍ය යැ, කායපරිඥාව කායමොනෙය්‍ය යැ, පරිඥාසහගත වූ මාර්ගය කායමොනෙය්‍ය යැ, කයෙහි ඡන්දරාගය දුරලීම කායමොනෙය්‍ය යැ, කායසංස්කාර නිරොධය ඇති චතුර්ථධ්‍යානසමාපත්තිය කායමොනෙය්‍ය යැ’ මේ කායමොනෙය්‍ය නම්.

වචීමොනෙය්‍යය කවරැ යත්: චතුර්විධ වාග්දුශ්චරිතයන්ගේ ප්‍රහාණය වචීමොනෙය්‍ය යැ, චතුර්විධ වාක්සුචරිතය වචීමොනෙය්‍ය යැ, වාක් අරමුණු කොට උපන් නුවණ වචීමොනෙය්‍ය යැ වාක්පරිඥාව වචීමොනෙය්‍ය පරිඥාසහගත මාර්ගය වචීමොනෙය්‍ය යැ වාක්හි ඡන්දරාගප්‍රහාණය වචීමොනෙය්‍ය යැ, වාක්සංස්කාරනිරොධය ඇති ද්විතීයධ්‍යානසමාපත්තිය වචීමොනෙය්‍ය යැ, මේ වචීමොනෙය්‍ය නම්.

මනොමොනෙය්‍යය කවරැ යත්: ත්‍රිවිධ මනොදුශ්චරිතයන්ගේ ප්‍රහාණය මනොමොනෙය්‍ය යැ, ත්‍රිවිධ මනස්සුචරිතය මනොමොනෙය්‍ය යැ, සිත අරමුණු කොට උපන් නුවණ මනොමොනෙය්‍ය යැ, චිත්තපරිඥාව මනො-මොනෙය්‍ය යැ, පරිඥාසහගත මාර්ගය මනොමොනෙය්‍ය යැ, සිතෙහි ඡන්ද-රාගප්‍රහාණය මනොමොනෙය්‍ය යැ චිත්තසංස්කාරයන්ගේ නිරොධය ඇති සංඥාවෙදයිතනිරොධසමාපත්තිය මනොමොනෙය්‍ය යැ, මේ මනොමොනෙය්‍ය නම්.

5. (කායවාග්මනොදුශ්චරිතය දුරලීම් වශයෙන්) කායමුනි වූ වාග්මුනි වූ මනොමුනි වූ අනාස්‍රව වූ (ඵලයෙහි සිටි හෙයින් මොනෙය්‍යසම්පන්න වූ මුනිහු සියලු කෙලෙසුන් දුරු කෙළේ යයි කියත්.

6. කායමුනි වූ වාග්මුනි වූ මනොමුනි වූ අනාස්‍රව වූ මොනෙය්‍යසම්පන්න වූ මුනිහු සෝදු හළ පව් ඇත්තෙකැ යි කියත්.

මේ තුන් මෞනෙය්‍යධර්මයන්ගෙන් සමන්විත වූ මුනිහු සදෙනෙකි: අගාරමුනිහු යැ අනගාරමුනිහු යැ ශෛක්‍ෂමුනිහු යැ අශෛක්‍ෂමුනිහු යැ ප්‍රත්‍යෙකමුනිහු යැ මුනිමුනිහු යැයි.

කතමෙ **අගාරමුනිනො?** යෙ තෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා; ඉමෙ අගාරමුනිනො. කතමෙ **අනගාරමුනිනො?** යෙ තෙ පබ්බජිතා දිට්ඨපදා විඤ්ඤාතසාසනා; ඉමෙ අනගාරමුනිනො. සත්ත සෙඛා **සෙඛමුනිනො** අරහන්තො **අසෙඛමුනිනො** පච්චෙකබුද්ධා **පච්චෙකමුනිනො**. **මුනිමුනිනො** වුච්චන්ති තථාගතා අරහන්තො සම්මාසම්බුද්ධා.

7. “න මොනෙන[1] මුනි හොති මූළ්හරූපො අවිද්දසු,
යො ච තුලංව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.

8. පාපානි පරිවජ්ජෙති ස මුනී තෙන සො මුනි,
යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති[ක].

9. අසතඤ්ච සතඤ්ච ඤත්වා ධම්මං අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ
දෙවමනුස්සෙහි පූජිතො යො සඞ්ගජාලමතිච්ච සො මුනි.[ඛ]

**විප්පමුත්තොති** – මුනිනො රාගා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; දොසා චිත්තං – මොහා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තන්ති – ස පන්නභාරො මුනි විප්පමුත්තො.

**න කප්පියො නූපරතො න පත්ථියොති** භගවාති – ‘කප්පා’ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච –පෙ– අයං තණ්හාකප්පො –පෙ– අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො. දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා න කප්පෙති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති – න කප්පියො; **නූපරතොති** සබ්බෙ බාලපුථුජ්ජනා රජ්ජන්ති, කල්‍යාණපුථුජ්ජනං උපාදාය සබ්බෙ සෙඛා අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය ආරමන්ති විරමන්ති පටිවිරමන්ති; අරහා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති – න කප්පියො නූපරතො;

1. මොනෙය්‍යෙන - ස. ක. ධම්මපද - ධම්මට්ඨවග්ග
ඛ. සුත්තනිපාත - සභියසුත්ත.

අගාරමුනිහු කවරහු ද යත්: දක්නාලද නිවන ඇති දත්තාලද ශික්ෂාත්‍රය ශාසනය ඇති යම් ගිහියෝ වැසි කෙනෙක් වෙත් ද, මොහු අගාරමුනිහු යැ; අනගාරමුනිහු කවරහු ද යත්? දුටු නිවන ඇති දත් සහුන් ඇති යම් පැවිදි කෙනෙක් වෙත් ද, මොහු අනගාරමුනි හුයැ; සප්ත ශෛක්ෂයෝ සෛඛමුනිහු යැ; රහත්හු අසෛඛමුනිහු යැ; පසේබුදුවරයෝ ප්‍රත්‍යේකමුනිහු යැ; තථාගත වූ අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ මුනිමුනිහු යයි කියනු ලැබෙත්.

7. මුසප්‍රකෘති ඇති අවිද්‍යා තෙම මෞනභාවය (-නො බැණ සිටීම) හේතු කොටගෙන මුනි වූයේ නො වෙයි. තවද පණ්ඩිත වූ යමෙක් තුලාව ගෙන සිටියක්හු සෙයින් උත්තම වූ ශීලසමාධ්‍යාදිය ගෙන-

8 අකුශලධර්මයන් දුරු කෙරේ ද, හේ මුනි නම් වෙයි. යට කී කාරණෙන් හෙතෙම මුනි වූයේ යැ. යමෙක් ස්කන්ධාදි ලොකයෙහි අධ්‍යාත්ම බාහිරාදි උභයාර්ථයන් දනානී ද, එ කරුණෙන් හෙතෙම මුනි යයි කියනු ලැබේ.

9. යමෙක් කුශලාකුශලප්‍රභෙද වූ සදසත් ධර්මය ද සියලු ස්කන්ධාදි ලොකයෙහි අධ්‍යාත්මබාහිරාදි ධර්මය ද දැන රාගාදි සඞ්ගය හා තෘෂ්ණා-දෘෂ්ටිජාලය ඉක්මවා සිටියේ ද ඒ ක්ෂීණාශ්‍රව මුනි තෙම දෙවිමිනිසුන් විසින් පුදනු ලද්දේ වේ.

**විප්පමුත්තො** - මුනිහුගේ සිත රාගයෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යැ, ද්වෙෂයෙන්...මොහයෙන් සිත මුක්ත - විමුක්ත - සුවිමුක්ත යැ . සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් සිත මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත නුයි 'ස පහානකාරො මුනි විප්පමුත්තො' යනු වේ.

**න කප්පියො නූපරතො න පත්ථියො** 'ති භගවා - 'කප්ප' යනු, තෘෂ්ණාකල්පය ද දෘෂ්ටිකල්පය දැයි කල්ප දෙකෙකි. .මේ දෘෂ්ටිකල්පය යි. ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ යැ, දෘෂ්ටිකල්පය දුරලන ලද; තෘෂ්ණාකල්පය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිකල්පය දුරලූ බැවින් තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටි-කල්පය හෝ නො කෙරෙයි, නො දනවයි නූපදවයි නො නිපදවයි නො පහළ කෙරේ නුයි 'න කප්පියො' යනු වේ. **නූපරතො** - සියලු බාලපෘථග්ජනයෝ ඇලෙති, කල්‍යාණපෘථග්ජනයා පටන් සියලු ශෛක්ෂයෝ නො පැමිණි මාර්ගයාගේ පැමිණීම පිණිස අනධිගත වූ ඵලයාගේ අධිගමය පිණිස පසක් නො කළ නිර්වාණ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස නො ඇලෙති; විරාගයට පැමිණෙති, වෙසෙසින් විරාගයට පැමිණෙත්, ක්ෂීණාශ්‍රව තෙම දුරුවූයේ වෙන්වූයේ සම්ප්‍රකාරයෙන් වෙන්වූයේ නික්මැගියේ පහවගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'න කප්පියො නූපරතො' යනු වේ.

**න පත්ථියොති** – පත්ථනා වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙසා පත්ථනා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති න පත්ථියො; භගවාති ගාරවාධිවචනං; අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා, භජි[1] වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා, භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා, භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා, භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා, භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤාණානං[2] ඡන්නං බුද්ධධම්මානන්ති භගවා, භගවාති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති – න කප්පියො නූපරතො න පත්ථියොති භගවාති.

තෙනාහ භගවා:

“ස සබ්බධම්මෙසු විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා,
ස පන්නභාරො මුනි විප්පමුත්තො
න කප්පියො නූපරතො න පත්ථියොති භගවා”ති.

**මහාවියූහසුත්තනිද්දෙසො සමත්තො**

**තෙරසමො.**

---

1. භාගී - සිමු II. 2. අභිඤ්ඤාණානං - සිමු I අභිඤ්ඤානං - මජසං.

න පත්ථේයා – යනු: 'පත්ථනා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි, යම් රාගයෙක් අධික රාගයෙක්.. අභිධ්‍යාවක් ලෝභඅකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල ප්‍රාර්ථනාව තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳින ලද්දී සන්සිඳුවන ලද්දී උපතට නුසුදුසු වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, හෙතෙම 'න පත්ථිය'යි කියනු ලැබෙයි. භගවා යනු: ගෞරව නාමයෙකි, තවද – නැසූ රාග ඇත් නුයි 'භගවත්' යෑ, නැසූ ද්වේෂ ඇත් නුයි 'භගවත්'යෑ, නැසූ මෝහ ඇත් නුයි 'භගවත්' යෑ, නැසූ මාන ඇත් නුයි 'භගවත්'යෑ, නැසූ දෘෂ්ටි ඇත් නුයි 'භගවත්'යෑ, නැසූ කෙලෙස් කටු ඇත් නුයි 'භගවත්' යෑ, නැසූ කෙලෙස් ඇත් නුයි 'භගවත්' යෑ, දහම්රුවන් භාග – විභාග – ප්‍රතිවිභාග කෙළේ නුයි 'භගවත්'යෑ භවයන් අන්ත කෙළේ නුයි 'භගවත්'යෑ වැඩූ සිල් වැඩූ සිත වැඩූ නුවණ ඇත් නුයි 'භගවත්'යෑ. බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස් කරුණට ස්ථාන වූ විවේකයට අනුරූප වූ වනසෙනසුන් වනයෙහි දුරසෙනසුන් වනශකලවර සෙනසුන් ඇසුර කළාහු නුයි භගවත්'යෑ. බුදුහු සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකරට හිමි වූවාහු නුයි හෝ 'භගවත්'යෑ. බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු නුයි හෝ 'භගවත්'යෑ. බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්'යෑ. බුදුහු අෂ්ට විමෝක්ෂයන්ට අෂ්ට අභිභායතනයන්ට නව අනුපූර්වවිහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' යෑ. බුදුහු දශ සංඥාභාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනාපානසමෘතිසමාධියට අශුභසමාපත්තියට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' යෑ. බුදුහු සතර සමෘතිප්‍රස්ථානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර සෘද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුයි හෝ 'භගවත්'යෑ. බුදුහු දශ තථාගතබලයන්ට සතර වෛශාරද්‍යයන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්විධ බුද්ධධර්මයන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' නම් වූහ. 'භගවත්' යන තෙල නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, භ්‍රාතෘහු විසින් නො කරන ලද, භගිනිය විසින් නො කරන ලද, මිත්‍රාමාත්‍යයන් විසින් නො කරන ලද, නෑසහලේනෑයන් විසින් නො කරන ලද, මහණබමුණන් විසින් නො කරන ලද, දෙවතාවන් විසින් නො කරන ලද, යම් මේ 'භගවත්' යන නාමයෙක් වේ ද, භාග්‍යවත් බුදුවරයන්ට අර්හත්මාර්ගාන්තයෙහි උපන් තෙල නාමය බෝධිමණ්ඩයෙහි සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමඟ අර්හත්ඵලප්‍රත්‍යක්ෂකරණයෙන් හෝ සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී නුයි 'න කප්පියො නූපරතො න පත්ථියොති භගවා යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ස සබ්බධම්මෙසු -පෙ- න පත්ථියො'ති භගවා"යි.

**තෙළෙස්වැනි මහාවියූහ සුත්තනිද්දේසය සමාප්තයි.**

# 14

# තුවටකසුත්තනිද්දෙසො

අථ තුවටකසුත්තනිද්දෙසො වුච්චති:

## 14 - 1

පුච්ඡාමි තං ආදිච්චබන්ධුං[1]
විවෙකං සන්තිපදඤ්ච මහෙසිං,
කථං දිස්වා නිබ්බාති භික්ඛු
අනුපාදියානො ලොකස්මිං කිඤ්චි.

**පුච්ඡාමි තං ආදිච්චබන්ධූනති**[2] - 'පුච්ඡා'ති තිස්සො පුච්ඡා: අදිට්ඨජොතනා පුච්ඡා, දිට්ඨසංසන්දනා පුච්ඡා, විමතිච්ඡෙදනා පුච්ඡා.

කතමා **අදිට්ඨජොතනා පුච්ඡා**? පකතියා ලක්ඛණං අඤ්ඤාතං හොති අදිට්ඨං අතුලිතං අතීරිතං අවිභූතං අවිභාවිතං, තස්ස ඤාණාය දස්සනාය තුලනාය තීරණාය විභාවනාය පඤ්හං පුච්ඡති. අයං අදිට්ඨජොතනා පුච්ඡා.

කතමා **දිට්ඨසංසන්දනා පුච්ඡා**? පකතියා ලක්ඛණං ඤාතං හොති දිට්ඨං තුලිතං තීරිතං විභූතං විභාවිතං, අඤ්ඤෙහි පණ්ඩිතෙහි සද්ධිං සංසන්දනත්ථාය පඤ්හං පුච්ඡති. අයං දිට්ඨසංසන්දනා පුච්ඡා.

කතමා **විමතිච්ඡෙදනා පුච්ඡා**? පකතියා සංසයපක්ඛන්නො[3] හොති විමතිපක්ඛන්නො ද්වෙළ්හකජාතො 'එවං නු ඛො, න නු ඛො, කිං නු ඛො, කථං නු ඛො'ති සො විමතිච්ඡෙදනත්ථාය පඤ්හං පුච්ඡති. අයං විමතිච්ඡෙදනා පුච්ඡා. ඉමා තිස්සො පුච්ඡා.

අපරාපි තිස්සො පුච්ඡා: මනුස්සපුච්ඡා, අමනුස්සපුච්ඡා, නිම්මිතපුච්ඡා.

කතමා **මනුස්සපුච්ඡා**? මනුස්සා බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති - භික්ඛූ පුච්ඡන්ති, භික්ඛුනියො පුච්ඡන්ති, උපාසකා පුච්ඡන්ති, උපාසිකායො පුච්ඡන්ති, රාජානො පුච්ඡන්ති, ඛත්තියා පුච්ඡන්ති, බ්‍රාහ්මණා පුච්ඡන්ති, වෙස්සා පුච්ඡන්ති, සුද්දා පුච්ඡන්ති, ගහට්ඨා පුච්ඡන්ති, පබ්බජිතා පුච්ඡන්ති. අයං මනුස්සපුච්ඡා.

කතමා **අමනුස්සපුච්ඡා**? අමනුස්සා බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති - නාගා පුච්ඡන්ති, සුපණ්ණා පුච්ඡන්ති, යක්ඛා පුච්ඡන්ති, අසුරා පුච්ඡන්ති, ගන්ධබ්බා පුච්ඡන්ති, මහාරාජානො පුච්ඡන්ති, ඉන්දා පුච්ඡන්ති, බ්‍රහ්මානො පුච්ඡන්ති, දෙවතායො පුච්ඡන්ති. අයං අමනුස්සපුච්ඡා.

1. ආදිච්චබන්ධු - සීමු II මජසං. 2 ආදිච්චබන්ධූති - සීමු II මජසං.
3 පක්ඛන්නො - PTS.

# 14

## තුවටක සූත්‍රනිර්දේශය.

ඉක්බිති 'තුවටක' සූත්‍රනිර්දේශය කියනු ලැබේ.

### 14 - 1

ආදිච්චබන්ධු වූ මහර්ෂි වූ මුබ පුළුවුස්මි: යොගාවචර මහණ තෙම (කායාදි) ත්‍රිවිධ විවේකය ද (නිවනට කරුණු වූ) බොධිපාක්ෂිකධර්මය ද කවර කරුණෙකින් දැක (කායාදි) ලොකයෙහි (රූපාදි) කිසි ධර්මයක් උපාදානය නො කෙරෙමින් (රාගාදි කෙලෙසුන්) සන්හිඳුවන්නේ ද ?

**පුච්ඡාමි තං ආදිච්චබන්ධුං** - 'පුච්ඡා'යනු පෘච්ඡා තුනෙකි: අදිට්ඨජොතනා පුච්ඡා යැ, දිට්ඨසංසන්‍දනා පුච්ඡා යැ, විමතිච්ඡේදනා පුච්ඡා යි.

**අදිට්ඨජොතනා පුච්ඡා** කවර යත්: ධර්මයන්ගේ තථලක්ෂණය පියවින් නො දන්නා ලද නො දක්නා ලද තුලනය නො කරන ලද තීරණය නො කරන ලද ප්‍රකට නො කරන ලද නුවණින් නො වඩන ලද වේ ද, ඒ ධර්මයාගේ ලක්ෂණය දැනීමට තුලනයට තීරණයට ප්‍රකට කිරීමට ප්‍රශ්න විචාරයි. මෝ අදිට්ඨජොතනා පුච්ඡා යැ.

**දිට්ඨසංසන්‍දනා පුච්ඡා** කවර යත්: පියවින් තථලක්ෂණය දන්නා ලද දක්නා ලද තුලනය කරන ලද තීරණය කරන ලද ප්‍රකට කරන ලද විභාවන කරන ලද වේ ද, අන්‍ය පණ්ඩිතයන් හා සසඳලීම පිණිස ප්‍රශ්න විචාරයි. මෝ දිට්ඨසංසන්‍දනා පුච්ඡායැ.

**විමතිච්ඡේදනා පුච්ඡා** කවර යත්: 'මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ දෝ හෝ'යි පියවින් සැකයට පැමිණියේ විමතියට පැමිණියේ හටගත් සැක ඇත්තේ වේ ද, හෙතෙම සැක සිඳීම සඳහා ප්‍රශ්න විචාරයි. මෝ 'විමතිච්ඡේදනා පුච්ඡා' යැ; මේ තුන් ප්‍රශ්නයෝ යි.

අන්‍යවූ ද ප්‍රශ්න තුනෙක් වෙයි: මනුෂ්‍යපෘච්ඡා යැ, අමනුෂ්‍යපෘච්ඡා යැ නිර්මිතපෘච්ඡා යැයි.

**මනුෂ්‍යපුච්ඡා** කවර යත්: මනුෂ්‍යයෝ භගවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති- භික්ෂූහු විචාරති, භික්ෂුණීහු විචාරති, උපාසකයෝ විචාරති, උපාසිකාවෝ විචාරති, රජවරු විචාරති, ක්ෂත්‍රියයෝ විචාරති, බමුණෝ විචාරති, වෛශ්‍යයෝ විචාරති, ශුද්‍රයෝ විචාරති, ගැහැවියෝ විචාරති, පැවිද්දෝ විචාරත්; මෝ මනුෂ්‍යපෘච්ඡා යැ.

**අමනුෂ්‍යපුච්ඡා** කවර යත්: අමනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති- නාගයෝ විචාරයි, සුපර්ණයෝ විචාරති, යක්ෂයෝ විචාරයි, අසුරයෝ විචාරති, ගන්ධර්වයෝ විචාරයි, වරම්රජහු විචාරයි, ඉන්‍ද්‍රයෝ විචාරයි, බ්‍රහ්මයෝ විචාරති, දෙවතාවෝ විචාරත්. මෝ අමනුෂ්‍ය-පෘච්ඡා යැ.

කතමා **නිම්මිතපුච්ඡා**? යං භගවා රූපං අභිනිම්මිනාති මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියං, තං සො නිම්මිතො බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡති. භගවා විස්සජ්ජෙති. අයං නිම්මිතපුච්ඡා. ඉමා තිස්සො පුච්ඡා.

අපරාපි තිස්සො පුච්ඡා: අත්තත්ථපුච්ඡා, පරත්ථපුච්ඡා, උභයත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: දිට්ඨධම්මිකත්ථපුච්ඡා, සම්පරායිකත්ථපුච්ඡා, පරමත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අනවජ්ජත්ථපුච්ඡා, නික්කිලෙසත්ථපුච්ඡා, වොදානත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අතීතපුච්ඡා, අනාගතපුච්ඡා, පච්චුප්පන්නපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අජ්ඣත්තපුච්ඡා, බහිද්ධාපුච්ඡා, අජ්ඣත්තබහිද්ධාපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: කුසලපුච්ඡා, අකුසලපුච්ඡා, අබ්‍යාකතපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: ඛන්ධපුච්ඡා, ධාතුපුච්ඡා, ආයතනපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: සතිපට්ඨානපුච්ඡා, සම්මප්පධානපුච්ඡා, ඉද්ධිපාදපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: ඉන්ද්‍රියපුච්ඡා, බලපුච්ඡා, බොජ්ඣඞ්ගපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: මග්ගපුච්ඡා, ඵලපුච්ඡා, නිබ්බානපුච්ඡා.

**පුච්ඡාමි තන්ති** – පුච්ඡාමි තං, යාචාමි තං; අජ්ඣෙසාමි තං, පසාදෙමි තං; කථයස්සු මෙති- පුච්ඡාමි තං; **ආදිච්චබන්ධූනති** ආදිච්චො වුච්චති සූරියො; සූරියො ගොතමො ගොත්තෙන; භගවාපි ගොතමො ගොත්තෙන. භගවා සූරියස්ස ගොත්තඤාතකො ගොත්තබන්ධු, තස්මා බුද්ධො ආදිච්චබන්ධූති-පුච්ඡාමි තං ආදිච්චබන්ධුං.[1]

**විවෙකං සන්තිපදඤ්ච මහෙසිනති** – 'විවෙකො'ති තයො විවෙකා: කායවිවෙකො, චිත්තවිවෙකො, උපධිවිවෙකො.

කතමො **කායවිවෙකො**? ඉධ භික්ඛු විවිත්තං සෙනාසනං භජති, අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. කායෙන ච විවිත්තො විහරති, සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති. එකො සෙය්‍යං කප්පෙති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති' අයං කායවිවෙකො.

1. ආදිච්චබන්ධු - සීමු. II. මජසං.

**නිර්මිතපෘච්ඡා** කවර යත්: බුදුහු මනෝමය වූ සියලු අඟපසඟ ඇති අවිකල ඉඳුරන් ඇති යම් බුදුරුවක් මවත් ද, ඒ නිර්මිත බුදුහු භාග්‍යවත් වූ ඒ බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති, බුදුහු විසඳන සේක. මෝ නිර්මිතපෘච්ඡා යැ. මොහු තුන් පෘච්ඡා යි.

අනෙකුදු ප්‍රශ්න තුනෙක් වෙයි: ආත්මාභිපෘච්ඡා යැ, පරාභිපෘච්ඡා යැ, උභයාභිපෘච්ඡා යැයි. අනෙකුදු ප්‍රශ්න තුනෙකි: දෘෂ්ටධාර්මිකාභිපෘච්ඡා යැ, සාම්පරායිකාභිපෘච්ඡා යැ, පරමාර්ථාභිපෘච්ඡා යැයි. අනෙකුදු ප්‍රශ්න තුනෙකි: අනවද්‍යාභිපෘච්ඡා යැ, නිෂ්ක්ලේශාභිපෘච්ඡා යැ, ව්‍යවදානාභිපෘච්ඡා යැයි අනෙකුදු ප්‍රශ්න තුනෙක් වෙයි: අතීතපෘච්ඡා යැ, අනාගතපෘච්ඡා යැ, වර්තමානපෘච්ඡා යැයි. අනෙකුදු තුන් ප්‍රශ්නයෙකි: අධ්‍යාත්මපෘච්ඡා යැ, බාහ්‍යපෘච්ඡා යැ, අධ්‍යාත්ම බාහ්‍යපෘච්ඡා යැයි. අන්‍ය වූ ද ප්‍රශ්න තුනෙකි: කුශලපෘච්ඡා යැ, අකුශල-පෘච්ඡා යැ, අව්‍යාකෘතපෘච්ඡා යැයි. අන්‍යවූ ද ප්‍රශ්න තුනෙකි: ස්කන්ධපෘච්ඡා යැ, ධාතුපෘච්ඡා යැ, ආයතනපෘච්ඡා යැයි. අන්‍යවූ ද තුන් ප්‍රශ්නයෙකි. සතිපට්ඨානපෘච්ඡා යැ, සම්‍යක්ප්‍රධානපෘච්ඡා යැ ඍද්ධිපාදපෘච්ඡා යැයි. අන්‍ය වූ ද තුන් ප්‍රශ්නයෙකි: ඉන්ද්‍රියපෘච්ඡා යැ, බලපෘච්ඡා යැ, බෝධ්‍යඞ්ගපෘච්ඡා යැයි. අන්‍ය වූ ද තුන් ප්‍රශ්නයෙකි: මාර්ගපෘච්ඡා යැ, ඵලපෘච්ඡා යැ, නිර්වාණපෘච්ඡා යැයි.

**පුච්ඡාමි තං** – මුබ පුළුවුස්මි, මුබ අයැදිමි, මුබ ආරාධනය කෙරෙමි, මුබ පහදවමි, මට වදාළ මැනවැයි. 'පුච්ඡාමි තං' යනු වේ. ආදිච්චබන්ධුං 'ආදිච්ච'යි හිරු කියනු ලැබෙයි, හිරු ගෝත්‍රයෙන් ගෞතම යැ. භගවත්හු ද ගෝත්‍රයෙන් ගෞතම යැ. බුදුහු හිරුට ගෝත්‍රයෙන් ඥතීහ, ගොත්‍රයෙන් බන්ධු වූහ. එහෙයින් බුදුහු ආදිත්‍යබන්ධු වූහ'යි 'පුච්ඡාමි තං ආදිච්චබන්ධුං' යනු වේ.

**විවේකං සන්තිපදං ච මහෙසිං** – 'විවේකො' යනු: විවෙක තුනෙකි: කාය විවෙක යැ, චිත්තවිවෙක යැ, උපධිවිවෙක යැයි.

කායවිවෙකය කවරේ ද යත්: මේ ශාසනයෙහි මහණ ආරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කන්දර යැ ගිරිගුහා යැ ශමශාන යැ වානප්‍රස්ථ යැ අභ්‍යවකාශ යැ පලාලපුඤ්ජ යැ යන විවෙක සෙනාසනයක් ඇසුරු කෙරෙයි, කයින් ද විවික්ත වැ වෙසෙයි. හෙතෙම එකලා වැ යෙයි, එකලා වැ සිටියි, එකලා වැ හිඳී, එකලා වැ හොවී, එකලා වැ ගමට පිඬුසිඟා යයි, එකලා වැ පෙරලා එයි, එකලා වැ රහසැ හිඳී, එකලා වැ සක්මන් කෙරෙයි, එකලා වැ හැසිරෙයි වෙසෙයි ඉරියව් පවත්වයි වැටෙයි රැකෙයි යැපෙයි යාපනය වේ. මේ කායවිවෙක යැ.

කතමො චිත්තවිවෙකො? පඨමං ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං විවිත්තං හොති. දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං විවිත්තං හොති. තතියං ඣානං සමාපන්නස්ස පීතියා චිත්තං විවිත්තං හොති. චතුත්ථං ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං විවිත්තං හොති. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. සකදාගාමිස්ස[1] ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා, පටිඝසඤ්ඤොජනා, ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා, තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අනාගාමිස්ස අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා, අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා, තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා, තදෙකට්ඨෙහි ච කිලෙසෙහි, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි චිත්තං විවිත්තං හොති. අයං චිත්තවිවෙකො.

කතමො උපධිවිවෙකො? උපධි වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච; උපධිවිවෙකො වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං උපධිවිවෙකො.

කායවිවෙකො ච වූපකට්ඨ[2]කායානං නෙක්ඛම්මාභිරතානං, චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං, උපධිවිවෙකො ච නිරූපධීනං පුග්ගලානං විසඞ්ඛාරගතානං.

**සන්තීති** එකෙන ආකාරෙන සන්තිපි සන්තිපදම්පි තංයෙව අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. වුත්තං හෙතං භගවතා: "සන්තමෙතං පදං පණීතමෙතං පදං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන"න්ති.[a] අථවා අපරෙන ආකාරෙන යෙ ධම්මා සන්තාධිගමාය සන්තිඵුසනාය සන්තිසච්ඡිකිරියාය සංවත්තන්ති සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො. ඉමෙ වුච්චන්ති සන්තිපදං තාණපදං ලෙනපදං සරණපදං අභයපදං අච්චුතපදං අමතපදං නිබ්බානපදං.

---

1. සකදාගාමිකස්ස - සිමු. II. 2. වවකට්ඨ - ස.

[a] මජ්ඣිමනිකාය - අලගද්දසුත්ත.

**චිත්තවිවේකය** කවරැ යත්: පළමුවන ධ්‍යානයට සමවත්හුගේ සිත නීවරණයන්ගෙන් වෙන් වෙයි, දෙවැනි ධ්‍යානයට සමවත්හුගේ සිත විතර්කවිචාරයන්ගෙන් වෙන් වෙයි, තෙවැනි ධ්‍යානයට සමවත්හුගේ සිත ප්‍රීතියෙන් වෙන් වෙයි, සිවුවැනි ධ්‍යානයට සමවත්හුගේ සිත සුවදුක් දෙකින් වෙන් වෙයි, ආකාසානඤ්චායතනයට සමවත්හුගේ සිත රූපසංඥාවෙන් ප්‍රතිඝසංඥාවෙන් නානාත්මසංඥාවෙන් වෙන් වෙයි, විඤ්ඤාණඤ්චායතනයට සමවත්හුගේ සිත ආකාසානඤ්චායතනසංඥාවෙන් වෙන් වෙයි, ආකිඤ්චඤ්ඤායතනයට සමවත්හුගේ සිත විඤ්ඤාණඤ්චායතනසංඥාවෙන් වෙන් වෙයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්හුගේ සිත ආකිඤ්චඤ්ඤායතනසංඥාවෙන් වෙන් වෙයි, සෝවාන්හුගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සායෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයෙන් විචිකිත්සානුශයෙන් ඔවුන් හා එක්වැ සිටි කෙලෙසුන්ගෙන් ද වෙන් වෙයි. සෙදගැමිහුගේ සිත ඖදාරික වූ කාමරාගසංයෝජනයෙන් ද, ප්‍රතිඝසංයෝජනයෙන් ද, ඖදාරික වූ කාමරාගානුශයෙන් ද, ප්‍රතිඝානුශයෙන් ද, තදෙකස්ථ කෙලශයන්ගෙන් ද වෙන් වෙයි. අනාගැමිහුගේ සිත අණුසහගත වූ කාමරාගසංයෝජනයෙන් හා ප්‍රතිඝසංයෝජනයෙන් ද, අණුසහගත වූ කාමරාගානුශයෙන් හා ප්‍රතිඝානුශයෙන් ද, තදෙකස්ථ කෙලශයන්ගෙන් ද වෙන් වෙයි. රහත්හුගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යාවෙන් ද, මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් ද, තදෙකස්ථ කෙලශයන්ගෙන් ද බාහ්‍ය වූ සියලු සංස්කාරනිමිත්තයන්ගෙන් ද වෙන් වෙයි. මේ චිත්තවිවෙක යැ.

**උපධිවිවේකය** කවරැ යත්: කෙලශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද උපධි යි කියනු ලැබෙයි. සියලු සංස්කාරයන් සන්හිඳුණු සියලු උපධි දුරලූ තෘෂ්ණා ක්‍ෂය වූ කෙලෙස්රජස් නො ඇලුණු දුක නිරුද්ධ වූ තෘෂ්ණාවෙන් නික්මුණු ඒ අමාමහනිවන උපධිවිවෙක යයි කියනු ලැබේ. මේ උපධිවිවෙක යයි.

ගණසඞ්ගණිකායෙන් වෙන් වූ කය ඇති (ප්‍රථමධ්‍යානාදි) නිෂ්කාම්‍යයෙහි ඇලුණවුන්ට කායවිවෙකය ද, පිරිසුදු සිත් ඇති පරමපාරිශුද්ධියට පැමිණියවුන්ට චිත්තවිවෙකය ද, විසංඛාරයට (-අරමුණු කිරීම් වශයෙන් නිවනට) පැමිණි උපධි රහිත පුද්ගලයන්ට උපධිවිවෙකය ද වේ.

**සන්ති** - යනු: එක් අයුරෙකින් ශාන්තිය ද ශාන්තිපදය ද එ මැ අමාමහ නිවන යැ, සියලු සංස්කාරයන් සන්හිඳුණු සියලු උපධීන් දුරුවැ සිටි තෘෂ්ණාක්‍ෂය වූ විරාග වූ දුඃඛනිරොධ වූ ඒ නිර්වාණය යි. මේ වදාරන ලද මැය භාග්‍යවතුන් විසින්: යම් මේ සර්වසංස්කාරයන්ගේ ශමථයෙක් සර්වොපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාක්‍ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද, මෙතල ශාන්තපද යැ, මෙතල ප්‍රණීතපද යැයි. මෙයාගෙන් අන්‍ය වූ ආකාරයෙකින් යම් ධර්ම කෙනෙක් ශාන්ති (-නිර්වාණ) ප්‍රතිලාභය පිණිස ශාන්තිය (ඥානයෙන්) ස්පර්ශ කිරීම පිණිස ශාන්තිය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවත්නාහු ද, ඒ කවරහු ද යත්: සතර සතිපට්ඨානයෝ යැ, සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්ච බලයෝ යැ සප්තබොධ්‍යඞ්ගයෝ යැ ආර්ය අෂ්ටාඞ්ගිකමාර්ග යැ යන මොහු යි. මේ ධර්මයෝ ශාන්තිපද යැ ත්‍රාණපද යැ ලෙනපද යැ සරණපද යැ අභයපද යැ අච්‍යුතපද යැ අමෘතපද යැ නිර්වාණපද යැයි කියනු ලැබෙත්.

**මහෙසින්ති**, මහෙසී භගවා; මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති මහෙසී. මහන්තං සමාධික්ඛන්ධං - මහන්තං පඤ්ඤාක්ඛන්ධං - මහන්තං විමුත්තික්ඛන්ධං - මහන්තං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති මහෙසී. මහතො තමොකායස්ස පදාලනං, මහතො විපල්ලාසස්ස භෙදං, මහතො තණ්හාසල්ලස්ස අබ්බුහනං, මහතො දිට්ඨිසඞ්ඝාටස්ස විනිවෙඨනං, මහතො මානධජස්ස පපාතනං[1] මහතො අභිසඞ්ඛාරස්ස වූපසමනං, මහතො ඔඝස්ස නිත්ථරණං,[2] මහතො භාරස්ස නික්ඛෙපනං, මහතො සංසාරවට්ටස්ස උපච්ඡෙදං, මහතො සන්තාපස්ස නිබ්බාපනං, මහතො පරිළාහස්ස පටිප්පස්සද්ධිං, මහතො ධම්මධජස්ස උස්සාපනං එසි ගවෙසි පරියෙසීති මහෙසී මහන්තෙ සතිපට්ඨානෙ - මහන්තෙ සම්මප්පධානෙ - මහන්තෙ ඉද්ධිපාදෙ - මහන්තානි ඉන්ද්‍රියානි - මහන්තානි බලානි - මහන්තෙ බොජ්ඣඞ්ගෙ මහන්තං අරියං අට්ඨඞ්ගිකං මග්ගං - මහන්තං පරමත්ථං අමතං නිබ්බානං එසි ගවෙසි පරියෙසීති මහෙසී. මහෙසක්ඛෙහි වා සත්තෙහි එසිතො ගවෙසිතො පරියෙසිතො 'කහං බුද්ධො, කහං භගවා, කහං දෙවදෙවො' කහං නරාසභො'ති මහෙසීති - විවෙකං සන්තිපදඤ්ච මහෙසිං.

**කථං දිස්වා නිබ්බාති භික්ඛූති** - කථං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා අත්තනො රාගං නිබ්බාපෙති? දොසං නිබ්බාපෙති? මොහං නිබ්බාපෙති? කොධං, උපනාහං, මක්ඛං, පළාසං, ඉස්සං, මච්ඡරියං, මායං, සාඨෙය්‍යං, ථම්භං, සාරම්භං, මානං, අතිමානං, මදං, පමාදං, සබ්බෙ කිලෙසෙ, සබ්බෙ දුච්චරිතෙ, සබ්බෙ දරථෙ, සබ්බෙ පරිළාහෙ, සබ්බෙ සන්තාපෙ, සබ්බාකුසලාභිසඞ්ඛාරෙ නිබ්බාපෙති සමෙති උපසමෙති වූපසමෙති පටිප්පස්සම්භෙති? භික්ඛූති පුථුජ්ජනකල්‍යාණකො වා භික්ඛු සෙඛො වා භික්ඛූති - කථං දිස්වා නිබ්බාති භික්ඛු.

**අනුපාදියානො ලොකස්මිං කිඤ්චීති** - චතූහි උපාදානෙහි අනුපාදියමානො අගණ්හමානො අපරාමසමානො අනභිනිවිසමානො; **ලොකස්මින්ති** අපායලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ; **කිඤ්චීති** කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතන්ති - අනුපාදියානො ලොකස්මිං කිඤ්චි.

තෙනාහ භගවා:

"පුච්ඡාමි තං ආදිච්චබන්ධුං
විවෙකං සන්තිපදඤ්ච මහෙසිං,
කථං දිස්වා නිබ්බාති භික්ඛු
අනුපාදියානො ලොකස්මිං කිඤ්චි"ති.

**14 - 2**

මූලං පපඤ්චසඞ්ඛායාති භගවා
මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ,
යා කාචි තණ්හා අජ්ඣත්තං
තාසං විනයා සදා සතො සික්ඛෙ.

1. පවාහනං - සං. 2. නිත්ථාරණං - සීමු. II, PTS.

**මහෙසි** - යනු: බුදුහු මහර්ෂි යෑ, මහත් වූ ශීලස්කන්ධය එෂණ ගවේෂණ පර්යෙෂණ කෙළේ නුයි මහර්ෂි යෑ: මහත් වූ සමාධිස්කන්ධය මහත් වූ ප්‍රඥාස්කන්ධය - මහත් වූ විමුක්තිස්කන්ධය - මහත් වූ විමුක්ති-ඥානදර්ශනස්කන්ධය එෂණ ගවේෂණ පර්යෙෂණ කෙළේ නුයි මහර්ෂි යෑ, මහත් වූ තමස්කායයා ගේ ප්‍රදාලනය, මහත් වූ විපර්‍යාසයා ගේ බිඳීම, මහත් වූ තෘෂ්ණාශල්‍යය ඉදිරීම, මහත් වූ දෘෂ්ටිසඞ්ඝාටය ලෙහීම, මහත් වූ මානධ්වජය හෙළීම, මහත් වූ අභිසංස්කාරය සන්හිඳුවීම, මහත් වූ ඔඝය තරණය කිරී , මහත් වූ (පස්කඳ) බර බහා තැබීම, මහත් වූ සසරවට සිඳීම, මහත් වූ (කෙලෙස්) තැවිලිය නිවීම, මහත් වූ (ක්ලේශ) පරිදාහය සන්හිඳුවීම, මහත් වූ ධර්මධ්වජය එසැවීම එෂණ ගවේෂණ පර්යෙෂණ කෙළේ නුයි මහර්ෂි යෑ. මහත් වූ සතිපට්ඨානයන් - මහත් සම්‍යක්ප්‍රධාන-යන් - මහත් ඍද්ධිපාදයන් - මහත් ඉන්ද්‍රියයන් - මහත් බලයන් - මහත් බොධ්‍යඞ්ගයන් - මහත් වූ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය - මහත් වූ පරමාර්ථ වූ අමාමහනිවන එෂණ ගවේෂණ පර්යෙෂණ කෙළේ නුයි මහර්ෂි යෑ: නොහොත් මහෙශාඛ්‍ය වූ සත්ත්වයන් විසින් 'කොහි යෑ බුදුහු, කොහි යෑ භාග්‍යවත්හු, කොහි යෑ දෙවියනට දෙවි වූවෝ, කොහි යෑ නරශ්‍රෙෂ්ඨයෝ යෑ'යි එෂිත ගවේෂිත පර්යෙෂිත නුයි මහර්ෂි නම් වෙත් යයි 'විවෙකං සන්තිපදඤ්ච මහෙසිං' යනු වේ.

**කථං දිස්වා නිබ්බාති භික්ඛු** - කිසෙසින් දැක බලා තුලනය කොට තීරණය කොට විමසා විභූත කොට තමා ගේ රාගය නිවා ද? ද්වෙෂය නිවා ද? මෝහය නිවා ද? ක්‍රොධය - උපනාහය - මක්ඛය - පලාසය-ඊර්ෂ්‍යාව මාත්සර්‍යය - මායාව - ශාඨ්‍යය - ස්තම්භය - සාරම්භය - මානය - අතිමානය මදය - ප්‍රමාදය - සියලු කෙලෙසුන් සියලු දුශ්චරිතයන් - සියලු දරථයන්- සියලු පරිළාහයන් - සියලු සන්තාපයන් - සියලු අකුශලාභිසංස්කාරයන් නිවා ද? ශමනය උපශමනය ව්‍යුපශමනය කෙරේ ද? සන්හිඳුවා ද? **භික්ඛු** යනු: පෘථග්ජනකල්‍යාණ භික්ෂු හෝ ශෛක්ෂ භික්ෂු හෝ නුයි 'කථං දිස්වා නිබ්බාති භික්ඛු' යනු වේ.

**අනුපාදියානො ලොකස්මිං කිඤ්චි** - සතර උපාදානයන්ගෙන් උපාදානය නො කරනුයේ නො ගන්නේ නො දැඩිගන්නේ නො පිවිසෙනුයේ; **ලොකස්මිං** යනු: අපායලොකයෙහි මිනිස්ලොවැ දෙව්ලොවැ ස්කන්ධලොක-යෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි; **කිඤ්චි** යනු: කිසි රූපගතයක් වෙදනාගතයක් සංඥාගතයක් සංස්කාරගතයක් විඥානගතයක් නුයි 'අනුපාදියානො ලොකස්මිං කිඤ්චි' යනු වේ.

එසින් කීහ ඒ නිර්මිත බුදුහු:

**"පුච්ඡාමි තං -පෙ- අනුපාදියානො ලොකස්මිං කිඤ්චී"**යි.

**14 - 2**

බුදුහු මෙසේ වදාළ සේක: 'ප්‍රපඤ්ච සඞ්ඛ්‍යාත තෘෂ්ණාදෘෂ්ටිහුගේ (අවිද්‍යාදි ක්ලේශ) මූලය ද මම වෙමි' පැවැති මානය ද නුවණින් සියල්ල වළහන්නේ යෑ, අධ්‍යාත්මයෙහි යම් කිසි තෘෂ්ණාවක් උපදනේ ද ඔවුන්ගේ ප්‍රහාණය පිණිස හැමකල්හි (එළඹ සිටි) සිහි ඇති වැ හික්මෙන්නේ යි.

**මූලං පපඤ්චසඞ්ඛායාති** භගවා මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙති- පපඤ්චායෙව පපඤ්චසඞ්ඛා; තණ්හාපපඤ්චසඞ්ඛා, දිට්ඨිපපඤ්චසඞ්ඛා, කතමං තණ්හාපපඤ්චස්ස මූලං? අවිජ්ජා මූලං, අයොනිසො මනසිකාරො මූලං, අස්මිමානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං, ඉදං තණ්හාපපඤ්චස්ස මූලං, කතමං දිට්ඨිපපඤ්චස්ස මූලං? අවිජ්ජා මූලං අයොනිසො මනසිකාරො මූලං. අස්මිමානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං, ඉදං දිට්ඨිපපඤ්චස්ස මූලං.

**භගවාති** ගාරවාධිවචනං. අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායොති භගවා, භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා. භජි[1] වා භගවා- අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා; භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා. භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස, අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා, භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානස්සතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා, භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා. භගවාති නෙතං නාමං මාතරා කතං; න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති – මූලං පපඤ්චසඞ්ඛායාති භගවා.

**මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙති** – 'මන්තා' වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි; අස්මීති රූපෙ අස්මීති මානො, අස්මීති ඡන්දො, අස්මීති අනුසයො; වෙදනාය – සඤ්ඤාය – සඞ්ඛාරෙසු – විඤ්ඤාණෙ අස්මීති මානො, අස්මීති ඡන්දො, අස්මීති අනුසයොති – මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති.

---

1. භාගී සීමු. II.

**මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ**- ප්‍රපඤ්චයෝ මැ 'පපඤ්චසඞ්ඛා' නම, තෘෂ්ණාව 'පපඤ්චසඞ්ඛා' යැ, දෘෂ්ටිය පපඤ්චසඞ්ඛා යැ, තෘෂ්ණාප්‍රපඤ්චයා ගේ මූලය කවරැ යත්? අවිද්‍යාව මූල යැ, අයොනිසො මනසිකාරය මූල යැ, අස්මිමානය මූල යැ, අහිරිකය මූල යැ, අනොත්තප්පය මූල යැ, උද්ධච්චය මූල යැ; මේ තෘෂ්ණාප්‍රපඤ්චයාගේ මූලය යි. දෘෂ්ටිප්‍රපඤ්චයාගේ මූලය කවරැ යත්? අවිද්‍යාව මූල යැ, අයොනිසො මනසිකාරය මූල යැ, අස්මිමානය මූල යැ, අහිරිකය මූල යැ, අනොත්තප්පය මූල යැ, උද්ධච්චය මූල යැ, මේ දෘෂ්ටිප්‍රපඤ්චයා ගේ මූලය යි.

**භගවා** යනු: ගෞරව නාමයෙකි; තවද බිඳහළ රාග ඇත් හුයි භගවත් යැ, නැසූ ද්වේෂ ඇත් හුයි - නැසූ මෝහ ඇත් හුයි - නැසූ මාන ඇත් හුයි- නැසූ දෘෂ්ටි ඇත් හුයි - නැසූ කෙලෙස්කටු ඇත් හුයි - නැසූ කෙලෙස් ඇත් හුයි භගවත් යැ. දහම්රුවන් භාග - විභාග - ප්‍රතිවිභාග කෙළේ හුයි භගවත් යැ භවයන් අන්ත කෙළේ හුයි - භාවිතකාය හුයි - භාවිතශීල- භාවිතචිත්ත- භාවිතප්‍රඥ ඇත් හුයි භගවත් යැ: නොහොත් බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මනුෂ්‍යයන්ගේ රාහස්‍යයට කාරණ වූ විවේකයට යොග්‍ය වූ වනසෙනසුන් වෙනෙහි දුර සෙනසුන් වනකෙළවර සෙනසුන් භජනය කළාහු හුයි භගවත් යැ, බුදුහු චීවර - පිණ්ඩපාත- සෙනාසන - ගිලානපච්චයභෙසජ්ජ- පරික්ඛාරයනට හිමි වූවාහු හුයි භගවත් යැ, බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු හුයි භගවත් යැ, බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රාමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු හුයි හෝ භගවත් යැ, බුදුහු අෂ්ට-විමෝක්ෂයන්ට අෂ්ට අභිභායතනයන්ට නව අනුරූපවිහාරසමාපත්තීන්ට හිමි වූවාහු හුයි - බුදුහු දශ සංඥාභාවනාවන්ට දසකසිණසමාපත්තීන්ට ආනාපානසතිසමාධියට අසුභසමාපත්තියට හිමි වූවාහු හුයි - බුදුහු සතර සතිපට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍යඅෂ්ටාඞ්ගික-මාර්ගයට හිමි වූවාහු හුයි - බුදුහු දශ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍ය-යන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධධර්මයන්ට හිමි වූවාහු හුයි හෝ 'භගවත්' නම්. තෙල 'භගවත්' යන නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් - බෑයකු විසින්-බූනකු විසින්- සගයහළුවන් විසින් - නෑසහලේනෑයන් විසින් - මහණබමුණන් විසින් - දෙවතාවන් විසින් නො කරන ලද, මේ 'භගවත්' යන තෙල නාමය භාග්‍යවත් බුදුවරයන්ට අර්හත්මාර්ගයාගේ අන්තයෙහි බෝමුල දී සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමග රහත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් හෝ සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී හුයි - 'මූලං පපඤ්ච-සඞ්ඛායා යි භගවා' යනු වේ.

**මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ** - 'මන්තා'යි ප්‍රඥාව කියනු ලබයි; යම් ප්‍රඥාවක්...අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එයයි. අස්මි යනු රූපයෙහි මම් වෙමි යන මාන ය මම් වෙමි යන ඡන්දය, මම් වෙමි යන අනුසය, වෙදනාවෙහි - සංඥාවෙහි - සංස්කාරයන්හි - විඥානයෙහි අස්මි යන මානය අස්මි යන ඡන්දය, අස්මි යන අනුසය හුයි 'මූලං පපඤ්ච-සඞ්ඛායාති භගවා මන්තා අස්මීති' යනු වේ.

**සබ්බමුපරුන්ධෙති** - පපඤ්චසඞ්ඛාය මූලඤ්ච අස්මිමානඤ්ච මන්තාය සබ්බං රුන්ධෙය්‍ය උපරුන්ධෙය්‍ය නිරොධෙය්‍ය වූපසමෙය්‍ය අත්ථඞ්ගමෙය්‍ය පටිප්පස්සම්භෙය්‍යාති - මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ.

**යා කාචි තණ්හා අජ්ඣත්තන්ති** - 'යා කාචී'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියන[1]වචනමෙතං යා කාචීති. **තණ්හාති** රූපතණ්හා -පෙ- ධම්මතණ්හා; **අජ්ඣත්තන්ති** අජ්ඣත්තසමුට්ඨානා වා සා තණ්හාති අජ්ඣත්තං; අථවා අජ්ඣත්තං වුච්චති චිත්තං, යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු; [ක] චිත්තෙන සා තණ්හා සහගතා සහජාතා සංසට්ඨා සම්පයුත්තා එකුප්පාදා එකනිරොධා එකවත්ථුකා එකාරම්මණාතිපි අජ්ඣත්තන්ති - යා කාචි තණ්හා අජ්ඣත්තං.

**තාසං විනයා සදා සතො සික්ඛෙති** - 'සදා'ති සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං සතතං සමිතං අබ්බොකිණ්ණං පොඞ්ඛානුපොඞ්ඛං උදකොමිකජාතං[2] අවීචිසන්තතිසහිතං ඵුස්සිතං[3] පුරෙභත්තං පච්ඡාභත්තං, පුරිමං යාමං මජ්ඣිමං යාමං පච්ඡිමං යාමං, කාළෙ ජුණ්හෙ, වස්සෙ හෙමන්තෙ ගිම්හෙ, පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙ; **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; අපරෙහිපි චතූහි කාරණෙහි සතො; අසතිපරිවජ්ජනාය සතො; සතිකරණීයානං ධම්මානං කතත්තා සතො; සතිපටිපක්ඛානං ධම්මානං හතත්තා සතො; සතිනිමිත්තානං ධම්මානං අසම්මුට්ඨත්තා සතො; අපරෙහිපි චතූහි කාරණෙහි සතො: සතියා සමන්නාගතත්තා සතො; සතියා වසිතත්තා සතො; සතියා පාගුඤ්ඤතාය සතො; සතියා අපච්චොරොහණතාය සතො. අපරෙහි චතූහි කාරණෙහි සතො: සතත්තා[4] සතො, සමිතත්තා සතො, සන්තත්තා සතො, සන්තධම්මසමන්නාගතත්තා සතො, බුද්ධානුස්සතියා සතො, ධම්මානුස්සතියා සතො, සඞ්ඝානුස්සතියා සතො, සීලානුස්සතියා සතො, චාගානුස්සතියා සතො, දෙවතානුස්සතියා සතො, ආනාපානසතියා සතො, මරණසතියා සතො, කායගතාසතියා සතො, උපසමානුස්සතියා සතො. යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො, [ක] අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො සමුපෙතො උපගතො[5] සමුපගතො[6] උපපන්නො සමුපපන්නො සමන්නාගතො. සො වුච්චති සතො.

---

1. පරියාදය - සීමු. II. PSS.
2. උදකුම්මිකජාතං - සීමු. II. PTS.
3. ඵුසිතං - සීමු. II.
4. සතතා - සීමු. II. PTS.
5. උපාගතො - මජසං
6. සමුපාගතො - මජසං.

ක. ධම්මසඞ්ගණී - නිද්දෙසවාර

**සබ්බමුපරුන්ධෙ** – තෘෂ්ණාදෘෂ්ටිප්‍රපඤ්චයාගේ මූලය ද අස්මිමානය ද ප්‍රඥාවෙන් සියල්ල වළහන්නේය, වෙසෙසින් වළහන්නේය, නිරුද්ධ කරන්නේය, සන්හිඳුවන්නේය, අස්තයට පමුණුවන්නේය, දුරලන්නේ නුයි 'මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ' යනු වේ.

**යා කාචි තණ්හා අජ්ඣත්තං** – 'යා කාචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වාංගයෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට ගන්නා වචනයෙකි මෙල 'යා කාචි' යනු. **තණ්හා** යනු: රූපතෘෂ්ණා යැ...ධර්මතෘෂ්ණා යි. **අජ්ඣත්තං** යනු: ඕ තෘෂ්ණාව අධ්‍යාත්මයෙහි උපදනී නුයි හෝ 'අජ්ඣත්තං' යනු වේ; නොහොත් 'අජ්ඣත්තං'සි සිත කියනු ලැබෙසි, යම් සිතෙක් මනසෙක් මානසයෙක් හදයෙක් භවාඞ්ගසිතෙක් මනසෙක් මනායතනයෙක් මනෝන්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥාන- ධාතුවෙක් වේ ද එය සි: ඕ තෘෂ්ණාව සිත හා සහගත වූවා සහජාත- සංසෘෂ්ට - සම්ප්‍රයුක්ත - එකෝත්පාද - එකනිරෝධ - එකවස්තුක - එකාලම්බන වූවා නුයි ද 'අජ්ඣත්ත' වේ නුයි 'යා කාචි තණ්හා අජ්ඣත්තං' යනු වේ.

**තාසං විනයා සදා සතො සික්ඛෙ** – 'සදා' යනු: සැමදා සැමකල සැමවිට දිනපතා නිරතුරු එක්ව අනෙකක් හා අමිශ්‍රව පිළිවෙළින් ගැටී දියරළක් මෙන් අවිරලව නො සිඳී එක්ව පැහැසී පෙරබත පසුබත පෙරයම මැදියම පැසුම්යම කෘෂ්ණපක්ෂයෙහි ශුක්ලපක්ෂයෙහි වසන්හි හිමන්හි ගිම්හි පෙරවියෙහි මැදිවියෙහි පසුවියෙහි; **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ වෙදනායෙහි...චිත්තයෙහි...ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ. අන්‍යත් සතර කරුණෙකින් සිහි ඇතියේ: මුළා සිහිය දුරු කිරීමෙන් සිහි ඇතියේ; සිහියෙන් කටයුතු ධර්මයන් කළ හෙයින් සිහි ඇතියේ; සිහියට ප්‍රතිපක්ෂ වූ ධර්මයන් නැසූ බැවින් සිහි ඇතියේ, සතියට නිමිත්ත වූ ධර්මයන් නො නට බැවින් සිහි ඇතියේ; අන්‍යත් සතර කරුණෙකින් සිහි ඇතියේ: සිහියෙන් සමන්විත වන බැවින් සිහි ඇතියේ, සිහිය වසීභාවයට පැමිණ වූ හෙයින් සිහි ඇතියේ, සිහිය ප්‍රගුණ වන බැවින් සිහි ඇතියේ, සිහිය නො පසුබස්නා බැවින් සිහි ඇතියේ; අන්‍යවූ ද සතර කරුණෙකින් සිහි ඇතියේ: විද්‍යමාන බැවින් (හෝ චක්ෂුත්‍රයෙහි ඇලුණු බැවින්) සිහි ඇතියේ, කෙලෙස් සන්හිඳු වූ බැවින් සිහි ඇතියේ, නිවුණු බැවින් සිහි ඇතියේ, සත්පුරුෂධර්මයෙන් සමන්විත බැවින් සිහි ඇතියේ, බුද්ධානුස්මෘතියෙන් - ධර්මානුස්මෘතියෙන් - සඞ්ඝානුස්මෘතියෙන්- ශීලානුස්මෘතියෙන් - ත්‍යාගානුස්මෘතියෙන් - දෙවතානුස්මෘතියෙන් - ආනාපානස්මෘතියෙන් - මරණසතියෙන් - කායගතාසතියෙන් - උපශමානුස්මෘතියෙන් සිහි ඇතියේ, යම් ස්මෘතියක් අනුස්මෘතියක් ප්‍රතිස්මෘතියක් වේ ද, සිහියක් සිහි කරන බවක් ධරන බවක් සිහි කරවන බවක් නො මුළාවන බවක් වේ ද, ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද, මෝ 'සති' යයි කියනු ලබයි. මේ සතියෙන් යුක්ත වූයේ වෙසෙසින් යුක්ත වූයේ උපගත වූයේ සමුපගත වූයේ සමෘද්ධ වූයේ වෙසෙසින් සමෘද්ධ වූයේ සමන්විත වූයේ ද හෙතෙම 'සිහි ඇතියේ' යයි කියනු ලැබේ.

**සික්ඛෙති** – තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා, අධිපඤ්ඤාසික්ඛා.

කතමා **අධිසීලසික්ඛා?** ඉධ භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. ඛුද්දකො සීලක්ඛන්ධො, මහන්තො සීලක්ඛන්ධො, සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො, මුඛං පමුඛං කුසලානං ධම්මානං සමාපත්තියා. අයං අධිසීලසික්ඛා.

කතමා **අධිචිත්තසික්ඛා?** ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො විහරති සතො ච සම්පජානො, සුඛං ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං අධිචිත්තසික්ඛා.

කතමා **අධිපඤ්ඤාසික්ඛා?** ඉධ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා; සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති; ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති; අයං අධිපඤ්ඤාසික්ඛා.

**තාසං විනයා සදා සතො සික්ඛෙ**'ති – තාසං තණ්හානං විනයාය පටිවිනයාය පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය. ඉමා තිස්සො සික්ඛායො[1] ආවජ්ජෙන්තො සික්ඛෙය්‍ය, පජානන්තො සික්ඛෙය්‍ය; පස්සන්තො සික්ඛෙය්‍ය; පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය; චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය; සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය; විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය; සතිං උපට්ඨහන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො සික්ඛෙය්‍ය; පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය; අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය; පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය; පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය; භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය; සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය; ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති – තාසං විනයා සදා සතො සික්ඛෙ.

තෙනාහ භගවා:

"මූලං පපඤ්චසඞ්ඛායාති භගවා
මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ,
යා කාචි තණ්හා අජ්ඣත්තං
තාසං විනයා සදා සතො සික්ඛෙ"ති.

1. තිස්සො සික්ඛා - PTS.

**සික්ඛ** යනු: ශික්‍ෂා තුනෙකි: අධිශීලශික්‍ෂා අධිචිත්තශික්‍ෂා අධිප්‍රඥශික්‍ෂා යයි.

**අධිශීලශික්‍ෂා** කවරැ යත්: මේ සස්නෙහි මහණ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් සංවර වූයේ ආචාර - ගොචර දෙකින් යුක්ත වූයේ මඳ පමණ වූ අකුශලයෙහි භය දක්නාසුලු වූයේ වෙසෙයි, ඒ ඒ ශික්‍ෂාපදය සමාදන් ව හික්මෙයි. ක්‍ෂුද්‍රශීලස්කන්ධ යැ මහාශීලස්කන්ධ යැ, ශීලය පිහිට යැ ආදි යැ චරණ (-පාද) යැ සංයම යැ සංවරයැ, කුශලධර්මයන්ගේ ප්‍රතිලාභයට ද්වාරය වෙයි, උත්තම වේ. මේ අධිශීලශික්‍ෂා යැ.

**අධිචිත්තශික්‍ෂා** කවරැ යත්: මේ සස්නෙහි මහණ කාමච්ඡන්දයෙන් වෙන් ව අකුශලධර්මයන් ගෙන් වෙන් ව සවිතර්ක වූ සවිචාර වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුව ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදය ඇති චිත්තයාගේ එකොදීභාවය ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුව ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, ප්‍රීතිය ද ඉක්මවීමෙන් උපෙක්‍ෂාවෙන් යුක්ත ව වෙසෙයි, සමෘති ඇතියේ සම්‍යක්ප්‍රඥ ඇතියේ කයින් ධ්‍යානසුඛය ද විඳී, උපෙක්‍ෂා ඇත්තේ ය සමෘතිමත් ය සුඛවිහරණ ඇත්තේ යයි ආර්‍යයන් ප්‍රකාශ කරන ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, කායිකසුඛය ද කායිකදුඃඛය ද ප්‍රහාණයෙන් පළමු මැ සොම්නස්දොම්නසුන් අතුරුදහන් වීමෙන් දුක් නැති සුව නැති උපෙක්‍ෂාව හා සමෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ අධිචිත්තශික්‍ෂා යැ.

**අධිප්‍රඥශික්‍ෂා** කවරැ යත්: මේ සස්නෙහි මහණ ප්‍රඥවත් වෙයි, නිර්දොෂ වූ ලොභාදිය සිඳීමට පොහොසත් වූ මනාකොට දුක් ක්‍ෂය කිරීමට පමුණුවන උදයව්‍යයගාමිනී ප්‍රඥවෙන් සමන්විත වූයේ වෙයි, හෙතෙම මේ දුකැ’යි තතු සේ දනගනී, ‘මේ දුඃඛසමුදයැ’යි තතු සේ දනගනී, ‘මේ දුඃඛනිරොධ යැ’යි තතු සේ දනගනී, ‘මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව යැ’යි තතු සේ දනගනී; මොහු ආස්‍රවයෝ යැයි තතු සේ දනගනී, මේ ආස්‍රවසමුදයැයි තතු සේ දනගනී, මේ ආස්‍රවනිරොධ යැයි තතු සේ දනගනී, මේ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපදාව යැයි තතු සේ දනගනී. මේ අධිප්‍රඥශික්‍ෂා යි.

**තාසං විනයා සදා සතො සික්ඛෙ** - ඒ තෘෂ්ණාවන්ගේ විනය පිණිස ප්‍රතිවිනය පිණිස ප්‍රහාණය පිණිස සන්හිඳුවීම පිණිස දුරලීම පිණිස නූපදීම පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේය, අධිචිත්තයෙහි ද හික්මෙන්නේය, අධිප්‍රඥවෙහි ද හික්මෙන්නේය; මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේය, දනගනිමින් - දක්මින් - ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමින් හික්මෙන්නේය, සිත පිහිටුවමින් හික්මෙන්නේය, සැදැහැයෙන් සනිටුහන් කෙරෙමින් - වීර්‍ය්‍ය දැඩිව ගනිමින් - සිහි එළවමින් - සිත පිහිටුවමින් - නුවණින් දැන ගනිමින් - වෙසෙසින් දතයුත්ත මනාකොට දනගනිමින් - සමාන්‍යලක්‍ෂණාවබොධයෙන් දතයුත්ත හාත්පසින් දනගනිමින් - ප්‍රහීණ කළ යුත්ත ප්‍රහීණ කෙරෙමින් - වැඩිය යුතු මාර්ගය වඩමින් - පසක් කළයුතු නිර්වාණ පසක් කෙරෙමින් හික්මෙන්නේය, හැසිරෙන්නේය, මොනොවට හැසිරෙන්නේය සමාදන් ව පවත්නේ නුයි ‘තාසං විනයා සදා සතො සික්ඛෙ’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“මූලං පපඤ්චසඞ්ඛාය -පෙ- සදා සතො සික්ඛෙ”යි.**

**14 - 8**

යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා,
අජ්ඣත්තං අථවාපි බහිද්ධා,
න තෙන ථාමං [1]කුබ්බෙථ
න හි සා නිබ්බුති සතං වුත්තා.

**යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තන්ති** – යං කිඤ්චි අත්තනො ගුණං ජානෙය්‍ය කුසලෙ වා ධම්මෙ අබ්‍යාකතෙ වා ධම්මෙ. කතමෙ අත්තනො ගුණා? උච්චාකුලා පබ්බජිතො වා අස්සං[2] මහාභොගකුලා පබ්බජිතො වා අස්සං; උළාරභොගකුලා පබ්බජිතො වා අස්සං, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා අස්සං; ලාභිම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා අස්සං, සුත්තන්තිකො වා අස්සං, විනයධරො වා අස්සං, ධම්මකථිකො වා අස්සං, ආරඤ්ඤිකො වා අස්සං, පිණ්ඩපාතිකො වා අස්සං, පංසුකූලිකො වා අස්සං, තෙචීවරිකො වා අස්සං, සපදානචාරිකො වා අස්සං, ඛලුපච්ඡාභත්තිකො වා අස්සං, නෙසජ්ජිකො වා අස්සං, යථාසන්ථතිකො වා අස්සං, පඨමස්ස ඣානස්ස ලාභීයි වා අස්සං, දුතියස්ස ඣානස්ස ලාභීති වා අස්සං; තතියස්ස ඣානස්ස ලාභීති වා අස්සං; චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා අස්සං; ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා අස්සං; විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා– ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා – නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා අස්සං; ඉමෙ වුච්චන්ති අත්තනො ගුණා. යං කිඤ්චි අත්තනො ගුණං ජානෙය්‍ය ආජානෙය්‍ය විජානෙය්‍ය පටිවිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍යාති– යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තං.

**අථවාපි බහිද්ධාති** – උපජ්ඣායස්ස වා ආචරියස්ස වා තෙ ගුණා අස්සූති අජ්ඣත්තං අථවාපි බහිද්ධා.

**න තෙන ථාමං කුබ්බෙථාති** – අත්තනො වා ගුණෙන පරෙසං වා ගුණෙන ථාමං න කරෙය්‍ය, ථම්භං න කරෙය්‍ය, මානං න කරෙය්‍ය, උන්නතිං න කරෙය්‍ය, උන්නාමං න කරෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති – න තෙන ථාමං කුබ්බෙථ.

**න හි සා නිබ්බුති සතං වුත්තාති** – සතානං සන්තානං සප්පුරිසානං බුද්ධානං බුද්ධසාවකානං පච්චෙකබුද්ධානං සා නිබ්බුතීති න වුත්තා; න පවුත්තා, න ආචික්ඛිතා, න දෙසිතා, න පඤ්ඤපිතා න පට්ඨපිතා, න විවටා, න විභත්තා, න උත්තානීකතා, නප්පකාසිතාති – න හි සා නිබ්බුති සතං වුත්තා

තෙනාහ භගවා:

"යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා,
අජ්ඣත්තං අථවාපි බහිද්ධා,
න තෙන ථාමං කුබ්බෙථ
න හි සා නිබ්බුති සතං වුත්තා"ති.

---

1. මානං - සුත. 2. අස්සං - ස්‍යා.

**14 - 8**

තමා කෙරෙහි වූ ද නොහොත් (උපාධ්‍යායාදි) බැහැර වූ ද යම් කිසි (කුලීනත්වාදි) ගුණයක් දන්නේ නම් ඒ හේතුකොටගෙන මානය නො කරන්නේය. ඒ උන්නතිය බුද්ධාදීන් විසින් නිබ්බුති යයි නො කියන ලද්දී ද එහෙයිනි.

**යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තං** - කුශලධර්මයෙහි හෝ අව්‍යාකෘතධර්මයෙහි හෝ යම් කිසි තමාගේ ගුණයක් දන්නේ නම් - තමාගේ ගුණයෝ කවරහු යත්? උසස් කුලයෙන් පැවිදි වූයෙම් හෝ වෙමි, ගැහැවි මහසල් කුලයෙන් පැවිදි වූයෙම් හෝ වෙමි, මහත් භෝග ඇති කුලයෙන් පැවිදි වූයෙම් හෝ වෙමි, ගැහැවියන් සහිත පැවිද්දන් අතුරෙහි ප්‍රකටයෙම් යශස් ඇත්තෙම් හෝ වෙමි, සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර ලබන්නෙම් හෝ වෙමි, සූත්‍ර හදාරන්නෙම් හෝ වෙමි, විනයධරයෙම් හෝ වෙමි, ධර්මකථිකයෙම් හෝ වෙමි, ආරණ්‍යකයෙම් හෝ වෙමි, පිණ්ඩපාතිකයෙම් හෝ වෙමි, පාංශුකූලිකයෙම් හෝ වෙමි, ත්‍රෛචීවරිකයෙම් හෝ වෙමි, සපදානචාරිකයෙම් හෝ වෙමි, ඛලුපච්ඡාභත්තිකයෙම් හෝ වෙමි, නෛසජ්ජිකයෙම් හෝ වෙමි, යථාසන්ථතිකාඞ්ග ඇත්තෙම් හෝ වෙමි, ප්‍රථමධ්‍යානලාභී හෝ වෙමි, ද්විතීයධ්‍යානලාභී හෝ වෙමි, තෘතීයධ්‍යානලාභී හෝ වෙමි, චතුර්ථධ්‍යානලාභී හෝ වෙමි, ආකාසානඤ්චායතනසමාපත්තිලාභී හෝ වෙමි, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිලාභී හෝ වෙමි, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති - නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී හෝ වෙමි. මොහු තමාගේ ගුණයෝ යැයි කියනු ලැබෙති. යම් කිසි තමාගේ ගුණයක් දන්නේ නම් හාත්පසින් දන්නේ නම් වෙසෙසින් දන්නේ නම් මැනැවින් දන්නේ නම් අවබෝධ කරන්නේ නම් යි 'යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තං' යනු වේ.

**අථවාපි බහිද්ධා** - උපාධ්‍යායයන්ගේ හෝ ආචාර්යයන්ගේ හෝ ඒ ගුණයෝ වන්නාහු නුයි 'අථවාපි බහිද්ධා' යනු වේ.

**න තෙන ථාමං කුබ්බෙථ** - තමාගේ ගුණයෙන් හෝ අනුන්ගේ ගුණයෙන් හෝ ථාමය නො කරන්නේය, තදබව නො කරන්නේය, මානය නො කරන්නේය, උන්නතිය නො කරන්නේය, උඩඟුබව නො කරන්නේය, එයින් මානය නූපදවන්නේය, එයින් තද වූයේ දැඩි වූයේ නැඟූ හිස ඇත්තේ නො වන්නේ යයි 'න තෙන ථාමං කුබ්බෙථ' යනු වේ.

**න හි සා නිබ්බුති සතං වුත්තා** - සාධූන් ශාන්තයන් සත්පුරුෂයන් බුදුවරුන් බුද්ධශ්‍රාවකයන් පසේබුදුවරුන් විසින් ඒ උන්නතිය නිර්වෘතියයි නො කියන ලද්දීය, නො පවසන ලද්දීය, නො දෙසන ලද්දීය, නො පනවන ලද්දීය, නො තබන ලද්දීය, අවිවෘතය, අවිභක්තය, ප්‍රකට නො කරන ලද, ප්‍රකාශ නො කරන ලද්දී නුයි 'න හි සා නිබ්බුති සතං වුත්තා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා -පෙ- න හි සා නිබ්බුති සතං වුත්තා"යි**

## 14 - 4

සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය
නීචෙය්‍යො අථවාපි සරික්ඛො,
ඵුට්ඨො අනෙකරූපෙහි
නාතුමානං විකප්පයං තිට්ඨෙ.

**සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍යාති** – සෙය්‍යො'හමස්මීති අතිමානං න ජනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති – සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය.

**නීචෙය්‍යො[1] අථවාපි සරික්ඛොති** – හීනො'හමස්මීති ඔමානං න ජනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා සදිසො'හමස්මීති මානං න ජනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති – නීචෙය්‍යො අථවාපි සරික්ඛො.

**ඵුට්ඨො අනෙකරූපෙහීති** – අනෙකවිධෙහි ආකාරෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතොති – ඵුට්ඨො අනෙකරූපෙහි.

**නාතුමානං විකප්පයං තිට්ඨෙති** – 'ආතුමා' වුච්චති අත්තා. අත්තානං කප්පෙන්තො විකප්පෙන්තො විකප්පං ආපජ්ජන්තො න තිට්ඨෙය්‍යාති – නාතුමානං විකප්පයං තිට්ඨෙ.

තෙනාහ භගවා:

"සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය
නීචෙය්‍යො අථවාපි සරික්ඛො,
ඵුට්ඨො අනෙකරූපෙහි
නාතුමානං විකප්පයං තිට්ඨෙ"ති.

## 14 - 5

"අජ්ඣත්තමෙව උපසමෙ[2]
නාඤ්ඤතො[3] භික්ඛු සන්තිමෙසෙය්‍ය,
අජ්ඣත්තං උපසන්තස්ස
නත්ථි අත්තා කුතො නිරත්තා වා."

**අජ්ඣත්තමෙව උපසමෙති** – අජ්ඣත්තං රාගං සමෙය්‍ය, දොසං සමෙය්‍ය, මොහං සමෙය්‍ය, කොධං උපනාහං මක්ඛං පළාසං ඉස්සං මච්ඡරියං මායං සාඨෙය්‍යං ථම්භං සාරම්භං මානං අතිමානං මදං පමාදං සබ්බෙ කිලෙසෙ සබ්බෙ දුච්චරිතෙ සබ්බෙ දරථෙ සබ්බෙ පරිළාහෙ සබ්බෙ සන්තාපෙ සබ්බාකුසලාභිසඞ්ඛාරෙ සමෙය්‍ය උපසමෙය්‍ය වූපසමෙය්‍ය නිබ්බාපෙය්‍ය පටිප්පස්සම්භෙය්‍යාති – අජ්ඣත්තමෙව උපසමෙ.

---

1. නීචෙය්‍යා - මනුප. 2. අජ්ඣත්තමෙවූපසමෙ - සීමු. II. මජසං.
3. න අඤ්ඤතො - සීමු. II. මජසං.

## 14 - 4

ඒ මානයෙන් මම උතුමැයි ද හීනයෙමි ද නොහොත් සදෘශයෙමි ද නො හඟතේ යැ. (කුලීනත්වාදී) විවිධාකාරයෙන් යුක්ත වූයේ තමා විකල්පනය කෙරෙමින් නො සිටිතේ යි.

**සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය** – ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යාවෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ 'මම ශ්‍රෙෂ්ඨයෙමි' අතිමානය නූපදවත්තේ නුයි 'සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය' යනු වේ.

**නීචෙය්‍යො අථවාපි සරික්ඛො** – ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ... අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ 'මම හීනයෙමි' අවමානය නූපදවත්තේය. ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත් බැවින් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යාවෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ 'මම සදෘශයෙමි' මානය නූපදවත්තේ නුයි 'නීචෙය්‍යො අථවා පි සරික්ඛො යනු' වේ.

**ඵුට්ඨො අනෙකරූපෙහි** – අනෙකවිධ වූ ආකාරයන්ගෙන් පහස්නා ලද්දේ යුක්ත වූයේ රැස් වූයේ සමන්විත වූයේ නුයි 'ඵුට්ඨො අනෙකරූපෙහි' යනු වේ.

**නාතුමානං විකප්පයං තිට්ඨෙ** – 'ආතුමා'යි තෙමේ කියනු ලැබෙයි. තමා කල්පන කෙරෙමින් විකල්පන කෙරෙමින් විකල්පයට පැමිණෙමින් නො සිටිතේ නුයි 'නාතුමානං විකප්පයං තිට්ඨෙ' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**"සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය -පෙ- නාතුමානං විකප්පයං තිට්ඨෙ"යි.**

## 14 - 5

මහණ තෙමේ අධ්‍යාත්මයෙහි ම (රාගාදිය) සන්හිඳුවත්තේය. අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් ශාන්තිය නො සොයත්තේය. අධ්‍යාත්මයෙහි (රාගාදිය) සන්හිඳුණු (ක්ෂීණාශ්‍රවහට) ආත්මදෘෂ්ටිය නැත. උච්ඡේදදෘෂ්ටිය හෝ කොයින් ද ?

**අජ්ඣත්තමෙව උපසමෙ** – අධ්‍යාත්මයෙහි රාගය සන්හිඳුවත්තේ ය, ද්වේෂය සන්හිඳුවත්තේ ය, මෝහය සන්හිඳුවත්තේය, ක්‍රෝධය – උපනාහය මක්ඛය – පලාසය – ඊර්ෂ්‍යාව – මාත්සර්යය – මායාව – ශාඨ්‍යය – ස්තම්භය – සාරම්භය – මානය – අතිමානය – මදය – ප්‍රමාදය – සියලු කෙලෙසයන් - සියලු දුශ්චරිතයන් – සියලු දරථයන් – සියලු පරිදාහයන් – සියලු සන්තාපයන් – සියලු අකුශලාභිසංස්කාරයන් ශමනය කරත්තේය, ව්‍යුපශමනය කරත්තේය, නිවත්තේ ය, දුරලත්තේ නුයි 'අජ්ඣත්තමෙව උපසමෙ' යනු වේ.

**නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍යාති** - අඤ්ඤතො අසුද්ධිමග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යානපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා සන්තිං උපසන්තිං වූපසන්තිං නිබ්බුතිං පටිප්පස්සද්ධිං න එසෙය්‍ය න ගවෙසෙය්‍ය න පරියෙසෙය්‍යාති - නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය.

**අජ්ඣත්තං උපසන්තස්සාති** - අජ්ඣත්තං රාගං සන්තස්ස[1] දොසං සන්තස්ස මොහං සන්තස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරෙ සන්තස්ස උපසන්තස්ස වූපසන්තස්ස නිබ්බුතස්ස පටිප්පස්සද්ධස්සාති - අජ්ඣත්තං උපසන්තස්ස.

**නත්ථි අත්තා කුතො නිරත්තා වාති** - 'නත්ථී'ති පටික්ඛෙපො. **අත්තාති** අත්තදිට්ඨි නත්ථි, **නිරත්තාති** උච්ඡෙදදිට්ඨි නත්ථි, අත්තාති ගහිතං නත්ථි, නිරත්තාති මුඤ්චිතබ්බං නත්ථි. යස්සත්ථි ගහිතං තස්සත්ථි මුඤ්චිතබ්බං, යස්ස නත්ථි මුඤ්චිතබ්බං තස්ස නත්ථි ගහිතං, ගාහමුඤ්චනසමතික්කන්තො අරහා වුද්ධිපරිහානිං වීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති - නත්ථි අත්තා කුතො නිරත්තා වා.

තෙනාහ භගවා:

> "අජ්ඣත්තමෙව උපසමෙ නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය,
> අජ්ඣත්තං උපසන්තස්ස නත්ථි අත්තා කුතො නිරත්තා වා"ති.

## 14 - 6

> මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති,
> එවං ඨිතො අනෙජස්ස උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

**මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොතීති** - සමුද්දො චතුරාසීතියොජනසහස්සානි උබ්බෙධෙන ගම්භීරො. හෙට්ඨා චත්තාරීසයොජනසහස්සානි උදකං මච්ඡකච්ඡපෙහි කම්පති. උපරි චත්තාරීසයොජනසහස්සානි උදකං වාතෙහි කම්පති. මජ්ඣෙ චත්තාරි[2] යොජනසහස්සානි උදකං න කම්පති න විකම්පති න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධති අනෙරිතො අඝට්ටිතො අචලිතො අලුළිතො අභන්තො වූපසන්තො. තත්‍ර ඌමි නො ජායති ඨිතො හොති සමුද්දොති. එවම්පි - යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති. අථ වා සත්තන්නං පබ්බතානං අන්තරිකාසු සත්ත සීදන්තරා මහාසමුද්දා,[3] තත්‍ර උදකං න කම්පති, න විකම්පති න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධති. අනෙරිතො අඝට්ටිතො අචලිතො අලුළිතො අභන්තො වූපසන්තො. තත්‍ර ඌමි නො ජායති ඨිතො හොති සමුද්දොති. එවම්පි - මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති.

---

1. උපසන්තස්ස - PTS 2. චත්තාරීස - සී, මජ්ඣං, චත්තාලීස - PTS.
3. සීදන්තර සමුද්දා - PTS.

**නාසංසුදෙන්තො භික්ඛු සන්තිමෙමෙසයා** - (සතිපට්ඨානාදීයෙන්) අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් මිථ්‍යාප්‍රතිපදායෙන් අනෛර්‍යාණිකපථයෙන්, සතිපට්ඨාන-යන්ගෙන් වෙන් ව සම්‍යක්ප්‍රධානයන්ගෙන් වෙන් ව සෘද්ධිපාදයන්ගෙන් වෙන් ව ඉන්ද්‍රියයන්ගෙන් වෙන් ව බලයන්ගෙන් වෙන් ව බොධ්‍යඞ්ගයන් ගෙන් වෙන් ව ආයර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් වෙන් ව ශාන්තිය උපශාන්තිය ව්‍යුපශාන්තිය නිවන පටිපස්සද්ධිය නො සොයන්නේ ය, ගවේෂණය නො කරන්නේය, පර්‍යෙෂණය නො කරන්නේ යි 'නාසංසුදෙන්තො භික්ඛු සන්ති-මෙමෙසයා' යනු වේ.

**අජ්ඣත්තං උපසන්තස්ස** - අධ්‍යාත්මයෙහි රාගය සන්හුන්නහුට ද්වේෂය සන්හුන්නහුට මෝහය සන්හුන්නහුට...සියලු අකුශලාභිසංස්කාරයන් සන්හුන්නහුට උපශාන්ත වූවහුට ව්‍යුපශාන්ත වූවහුට නිවුණහුට දුරලූ-වහුට නුයි 'අජ්ඣත්තං උපසන්තස්ස' යනු වේ.

**නත්ථි අත්තා කුතො නිරත්තා වා** - 'නත්ථි' යනු ප්‍රතික්‍ෂෙප යැ; **අත්තා** යනු: ආත්මදෘෂ්ටිය නැත. **නිරත්තා** යනු: උච්ඡේදදෘෂ්ටිය නැත. 'ආත්ම යැ' යි ගන්නා ලද්දක් නැත, 'නිරාත්ම යැ'යි හළ යුත්තක් නැත. යමකුට ගන්නා ලද්දක් ඇත් නම් ඔහුට හළයුත්තකු දු ඇත, යමකුට හළයුත්තක් නැත් නම් ඔහුට ගතයුත්තකු දු නැත. රහත් තෙම ගැනීම ද හැරීම ද ඉක්මවූයේ ය, වෘද්ධිය ද හානිය ද ඉක්මවා සිටියේ ය. හෙතෙම වැස නිම වූ දශ ආර්‍යවාස ඇත්තේ ය. වසන කළ චරණධර්ම ඇත්තේ ය...ඔහුට ජාතිමරණසංසාරය පුනර්භවය නැත් නුයි 'නත්ථි අත්තා කුතො නිරත්තා වා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අජ්ඣත්තමෙව උපසමෙ -පෙ- කුතො නිරත්තා වා"යි.

## 14 - 6

මහාසාගරයාගේ (යොදුන් සාරදහසක් පමණ වූ) මධ්‍යභාගයෙහි යම් සේ රළ නො හටගනී ද, (නිශ්චල ව) සිටියේ වේ ද, එසෙයින් තෘෂ්ණා රහිත වූ ක්‍ෂීණාස්‍රව තෙම (අමලෝදහමින් නො සැලී) සිටියේ වන්නේ ය. එබඳු මහණ කිසිවෙක්හි (රාගාදි) උත්සදයක් නො කරන්නේ යි.

**මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති** - සමුද්‍රය යට පත්ලෙන් සුවාසූදහසක් යොදුන් ගැඹුරු යැ. යටින් සතළිස්දහසක් යොදුන් ජලය මස්කැස්බන්ගෙන් කම්පා වෙයි. මත්තෙහි සතළිස්-දහසක් යොදුන් දිය වාතයෙන් කම්පා වෙයි. මැද සාරදහසක් යොදුන් දිය නො සැලෙයි, ඔබිනොබ නො සැලෙයි, නිශ්චල වෙයි, නො වෙවුලයි, නො පෙරළෙයි, නො කැරළෙයි, කම්පා නො වූයේ නො ගැටුණේ නො සැලුණේ නො කැලැඹුණේ නො කැරළුණේ සන්හිඳුණේ වෙයි. එහි රළ නූපදී, සමුද්‍රය සිටියේ වේ නුයි මෙසේත් 'මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති' යනු වේ. නො හොත් (යුගන්ධරාදි) සත් පර්වතයන් අතර සප්ත සීදන්තර මහාසමුද්‍රයෝ වෙති. එහි දිය කම්පන විකම්පන නො වෙයි, නො සැලෙයි, නො වෙවුලයි, නො පෙරළෙයි, නො කැරළෙයි. කම්පා නො වූයේ නො ගැටුණේ නො සැලුණේ නො කැලැඹුණේ නො බැමුණේ සන්හිඳුණේ වෙයි. එහි රළ නූපදී, සමුද්‍රය සිටියේ වේ නුයි මෙසේත් 'මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති' යනු වේ.

**එවං ඨිතො අනෙජස්සාති** – ‘එව’න්ති ඔපම්මසම්පටිපාදනං; **ඨිතො**ති ලාභෙපි න කම්පති, අලාභෙපි න කම්පති, යසෙපි න කම්පති, අයසෙපි න කම්පති, පසංසායපි න කම්පති, නින්දායපි න කම්පති, සුඛෙපි න කම්පති, දුක්ඛෙපි න කම්පති, න විකම්පති, න චලති, න වෙධති, නප්පවෙධති, න සම්පවෙධතීති එවං ඨිතො. **අනෙජස්සා**ති ‘එජා’ වුච්චති තණ්හා, යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං. යස්සෙසා එජා තණ්හා පහීනා උච්ඡින්නා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා, ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අනෙජො. එජාය පහීනත්තා අනෙජො. සො ලාභෙපි න ඉඤ්ජති, අලාභෙපි න ඉඤ්ජති, යසෙපි න ඉඤ්ජති, අයසෙපි න ඉඤ්ජති, පසංසායපි න ඉඤ්ජති, නින්දායපි න ඉඤ්ජති, සුඛෙපි න ඉඤ්ජති, දුක්ඛෙපි න ඉඤ්ජති, න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධතීති – එවං ඨිතො අනෙජස්ස.

**උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චීති** – ‘උස්සද’න්ති සත්තුස්සදා: රාගුස්සදං[1] දොසුස්සදං මොහුස්සදං මානුස්සදං දිට්ඨුස්සදං කිලෙසුස්සදං කම්මුස්සදං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය; **කුහිඤ්චී**ති කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති – උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

තෙනාහ භගවා:

> “මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති,
> එවං ඨිතො අනෙජස්ස උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චී”ති.

## 14 - 7

> අකිත්තයී විවටචක්ඛු සක්ඛිධම්මං පරිස්සයවිනයං,
> පටිපදං වදෙහි භද්දන්තෙ පාතිමොක්ඛමථවාපි[2] සමාධිං.

**අකිත්තයී විවටචක්ඛූති** – ‘අකිත්තයී’ති කිත්තිතං ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවටං විභත්තං උත්තානීකතං පකාසිතන්ති – අකිත්තයී. **විවටචක්ඛූ**ති භගවා පඤ්චහි චක්ඛූහි විවටචක්ඛු; මංසචක්ඛුනාපි විවටචක්ඛු, දිබ්බචක්ඛුනාපි විවටචක්ඛු, පඤ්ඤාචක්ඛුනාපි විවටචක්ඛු, බුද්ධචක්ඛුනාපි විවටචක්ඛු, සමන්තචක්ඛුනාපි විවටචක්ඛු.

---

1. රාගුස්සදං - PTS. 2. පාතිමොක්ඛං අථවාපි - PTS.

**එවං ඨිතො අනෙජස්ස** - 'එවං' යනු: ඖපම්‍යසම්ප්‍රතිපාදන යැ, **ඨිතො** යනු: ලාභයෙහි ද නො සැලෙයි, අලාභයෙහි ද නො සැලෙයි, යශස්හි ද නො සැලෙයි, අයශස්හි ද නො සැලෙයි, ප්‍රශංසායෙහි ද නො සැලෙයි, නින්දායෙහි ද නො සැලෙයි, සුවයෙහි ද නො සැලෙයි, දුකෙහි ද නො සැලෙයි, ඔබිනොබැ නො සැලෙයි, නිශ්චල වෙයි, නො වෙව්ලයි, නො පෙරළෙයි, පරිභ්‍රම නො වේ නුයි මෙසේ සිටියේ; **අනෙජස්ස** යනු: 'එජා'යි තෘෂ්ණාව කියනු ලබයි. යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. යමක්හු විසින් තෙල එජාව තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී මුලුසුන් කරන ලද්දී සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී අභව්‍යොත්පත්තික වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, හේ 'අනෙජ' යයි කියනු ලැබේ. එජාව ප්‍රහීණ බැවින් 'අනෙජ'යි. හේ ලාභයෙහි ද නො සැලෙයි, අලාභයෙහි ද - යශස්හි ද - අයශස්හි ද -ප්‍රශංසායෙහි ද-නින්දායෙහි- ද සුවයෙහි ද - දුකෙහි ද නො සැලෙයි, නිශ්චල වෙයි, නො වෙව්ලයි, ඔබිනොබැ නො වෙව්ලයි, නො පෙරළේ නුයි 'එවං ඨිතො අනෙජස්ස යනු වේ.

**උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි** - 'උස්සද' යනු: උත්සද සතෙකි: රාගොත්සදය ද්වෙෂොත්සදය මොහොත්සදය මානොත්සදය දෘෂ්ට්‍යුත්සදය ක්ලෙශොත්සදය කර්මොත්සදය නො කරන්නේ ය, නො දනවන්නේ ය, නූපදවන්නේ ය, නො නිපදවන්නේ ය. නො පහළ කරන්නේ ය. **කුහිඤ්චි** යනු: කිසිවෙක්හි කිසි තැනෙක්හි කවර තැනෙක්හි අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ නුයි 'උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"මජ්ඣෙ යථා සමුද්දස්ස -පෙ- උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චී"යි**

**14 - 7**

අනාවරණ වූ පසැස් ඇතියේ උවදුරු දුරු කරන්නා වූ තමන් අසන් වූ නොහොත් තමන් විසින් ප්‍රත්‍යක්ෂ කළ ධර්මය වදාළේ ය. මුඹට කල්‍යාණයෙක් වේවා. නොහොත් මුඹගේ භද්‍ර වූ ප්‍රතිපදාව වදාල මැනවි. ප්‍රතිමොක්ෂය ද යළි සමාධිය ද වදාළ මැනැවි.

**අකිත්තයී විවටචක්ඛු** - 'අකිත්තයී' යනු: දක්වන ලද පවසන ලද දෙසන ලද පනවන ලද තබන ලද විවෘත කරන ලද විභාග කරනලද ප්‍රකට කරන ලද ප්‍රකාශ කරන ලද නුයි 'අකිත්තයී' යනු වේ. **විවටචක්ඛු** යනු: බුදුහු පසැසකින් විවටචක්ඛු වූහ: මසැසිනු ද විවටචක්ඛු යහ, දිවැසිනු ද විවටචක්ඛු යහ, පැනැසිනු ද විවටචක්ඛු යහ, බුදුඇසිනු ද විවටචක්ඛු යහ, සමතැසිනු ද විවටචක්ඛු වූහ.

කථං භගවා මංසචක්ඛුනාපි විවටචක්ඛු? මංසචක්ඛුම්හි භගවතො පඤ්චවණ්ණා සංවිජ්ජන්ති: නීලො ච වණ්ණො, පීතකො ච වණ්ණො, ලොහිතකො ච වණ්ණො, කණ්හො ච වණ්ණො, ඔදාතො ච වණ්ණො. අක්ඛිලොමානි ච භගවතො – යත්ථ ච අක්ඛිලොමානි පතිට්ඨිතානි තං නීලං හොති සුනීලං පාසාදිකං දස්සනෙය්‍යං, උමා[1]පුප්ඵසමානං. තස්ස පරතො පීතං හොති සුපීතකං සුවණ්ණවණ්ණං පාසාදිකං දස්සනෙය්‍යං කණිකාරපුප්ඵසමානං. උභයතො ච අක්ඛිකූටානි භගවතො ලොහිතකානි හොන්ති සුලොහිතකානි පාසාදිකානි දස්සනෙය්‍යානි ඉන්දගොපකසමානානි. මජ්ඣෙ කණ්හං හොති සුකණ්හං අලූඛං සිනිද්ධං පාසාදිකං දස්සනෙය්‍යං අද්දාරිට්ඨකසමානං. තස්ස පරතො ඔදාතං හොති සුඔදාතං සෙතං පණ්ඩරං පාසාදිකං දස්සනෙය්‍යං ඔසධීතාරකාසමානං. තෙන භගවා පාකතිකෙන මංසචක්ඛුනා අත්තභාවපරියාපන්නෙන පුරිමසුචරිතකම්මාභිනිබ්බත්තෙන සමන්තා යොජනං පස්සති දිවා චෙව රත්තිඤ්ච. යදා හි චතුරඞ්ගසමන්නාගතො අන්ධකාරො හොති: සූරියො ච අත්ථඞ්ගතො හොති, කාළපක්ඛො ච උපොසථො හොති, තිබ්බො ච වනසණ්ඩො හොති, මහා ච කාළමෙඝො අබ්භුට්ඨිතො හොති, එවරූපෙපි චතුරඞ්ගසමන්නාගතෙ අන්ධකාරෙ සමන්තා යොජනං පස්සති, නත්ථි සො කුට්ටො[2] වා කවාටං වා පාකාරො වා පබ්බතො වා ගච්ඡං වා ලතා වා ආවරණං රූපානං දස්සනාය. එකඤ්චෙ තිලඵලං නිමිත්තං කත්වා තිලවාහෙ පක්ඛිපෙය්‍ය, තඤ්ඤෙව තිලඵලං උද්ධරෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො පාකතිකං මංසචක්ඛු. එවං භගවා මංසචක්ඛුනාපි විවටචක්ඛු.

කථං භගවා දිබ්බෙන චක්ඛුනාපි විවටචක්ඛු? භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ‘ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා’ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආකඞ්ඛමානො ච භගවා එකම්පි ලොකධාතුං පස්සෙය්‍ය. ද්වෙපි ලොකධාතුයො පස්සෙය්‍ය. තිස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය. චතස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය. පඤ්චපි ලොකධාතුයො පස්සෙය්‍ය. දසපි ලොකධාතුයො පස්සෙය්‍ය. වීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. තිංසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. චත්තාළීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. පඤ්ඤාසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. සතම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. සහස්සිම්පි චූළනිකං ලොකධාතුං පස්සෙය්‍ය. ද්විසහස්සිම්පි[3] මජ්ඣිමිකං ලොකධාතුං පස්සෙය්‍ය. තිසහස්සිං මහාසහස්සිම්පි ලොකධාතුං[4] පස්සෙය්‍ය. යාවතා වා පන ආකඞ්ඛෙය්‍ය තාවතකං පස්සෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො දිබ්බං චක්ඛු. එවං භගවා[5] දිබ්බෙන චක්ඛුනාපි විවටචක්ඛු.

1. උම්මාර - ස්‍යා. 2. කුඩ්ඩො - ස්‍යා. 3. ද්විසහස්සම්පි - සීමු. II. 4. තිසහස්සිම්පි ලොකධාතුං - ස්‍යා 5. භගවතො - සීමු II.

කිසෙසින් බුදුහු මසැසිනුදු 'විවටචක්ඛු' වූහ යත්: භාග්‍යවත්හුගේ මසැස්හි නිල්පැහැය ද රන්වන් පැහැය ද රත්පැහැය ද කළුපැහැය ද සුදුපැහැය ද යන පඤ්චවර්ණයෝ විද්‍යමාන වෙති. තවද බුදුන්ගේ අක්ෂිරෝම යම් තැනෙක්හි පිහිටියේද එතැන දියමෙරළියමල් සදිසි සුනිල් පිරිසුදු දකුම්කලු නිල්පැහැ වෙයි. එ ඉක්බිති කිණිහිරිමල් සදිසි සුකසාවත් රන්වන් පිරිසුදු දකුම්කලු කසාවන් පැහැ වෙයි. බුදුන්ගේ දෙනෙතග රතිඳුගොව් සදිසි සුරත් පිරිසුදු දකුම්කලු රත්පැහැ වෙයි. මැද රැක්පෙණල ඇට සදිසි ඉතා කළු මොලොක් සිනිඳු පිරිසුදු දකුම්කලු කළුපැහැ වෙයි. ඉනික්බිති දවගත්තරු සදිසි ඉතා සුදු සිත පඬර පිරිසුදු දකුම්කලු සුදුපැහැ වෙයි. බුදුහු අත්බැව ඇසුරු කල පෙර පින්කමින් උපන් ඒ පියවි මසැසින් දහවල්හි දු රැයි දු හාත්පසින් යොදුනක් දකිති. යම් කලෙක චතුරඞ්ගසමන්නාගත අන්ධකාරය වේ ද: හිරු අස්තයට ගියේත් වේ ද, කෘෂ්ණපක්ෂයෙහි පොහොයත් වේ ද, ඝනත වූ වනලැහැබත් වේ ද, මහත් කළු වලාකුළු නැගුණේත් වේ ද, මෙබඳු වූ චතුරඞ්ගසමන්නාගත අන්ධකාරයෙහි පවා හාත්පස යොදුනක් දකිති, එහි ඒ බිත්තියක් හෝ දොරක් පවුරක් ගලක් ගසක් වැලක් හෝ රූපදර්ශනයට ආවරණයෙක් නොවේ. ඉදින් එක් තලඇටයෙක් ලකුණු කොට තලගැලෙක බහාලත්තේ නම්, ඒ තලඇටය මැ නඟාගන්නා සේක. බුදුන්ගේ පියවි මසැස මෙසේ පිරිසිදු වේ. මෙසේ බුදුහු මසැසිනුදු විවටචක්ඛු වන සේක.

කිසෙසින් බුදුහු දිවැසිනුදු 'විවටචක්ඛු' වූහ යත්: බුදුහු විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටියා වූ දිවැසින් ච්‍යුත වන්නාවූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද සත්ත්වයන් බලන සේක: 'යහත, මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද කළාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටි වශයෙන් සමාදන් වූ විවිධ කර්ම ඇත්තාහු ය. ඔහු කය බිඳීමෙන් මරණින් මත්තෙහි අය රහිත වූ දුකට ගති වූ විවශව පතිත වන නිරයට පැමිණියාහු ය. යළි මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනසුචරිතයෙන් යුක්ත වූවාහු (බුද්ධාදී) ආර්‍ය්‍යයනට උපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිවශයෙන් සමාදන් වූ කර්ම ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මතු සුන්දර ගති ඇති සැපයෙන් අග්‍ර වූ ලොකයට පැමිණියාහ'යි කර්ම වූ පරිද්දෙන් පැමිණි සත්ත්වයන් දනගන්නා සේක. මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටි දිවැසින් ච්‍යුත වන්නාවූ ද උපදනාවූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද සත්ත්වයන් බලනා සේක. කර්ම වූ පරිදි (පරලොව) පැමිණි සත්ත්වයන් දනගන්නා සේක. තවද බුදුහු කැමැති වන්නාහු නම් එක් ලොකධාතුවකු දු බලන සේක. ලොකධාතු දෙකක් ද – තුන් ලොකධාතුවකුදු – සිවු ලොකධාතුවකු දු–පස් ලොකධාතුවකු දු බලන සේක. දස ලොකධාතුවකු දු – විසි ලොකධාතුවකු දු තිස් ලොකධාතුවකු දු සතලිස් ලොකධාතුවකු දු පනස් ලොකධාතුවකු දු සියක් ලොකධාතුහු ද බලන සේක, සහස්‍රී චූලනීලොකධාතුව ද බලන සේක. ද්විසහස්‍රී මධ්‍යමලොකධාතුව ද බලන සේක, ත්‍රිසහස්‍රීමහාසහස්‍රීලොකධාතුව ද බලන සේක. තවද යම් පමණ කැමැති වන සේක් නම්, එපමණ බලන සේක. බුදුන්ගේ දිවැස මෙසේ පරිශුද්ධ වේ. මෙසේ බුදුහු දිවැසිනු දු 'විවටචක්ඛු' වන සේක.

කථං භගවා පඤ්ඤාචක්ඛුනාපි විචරචක්ඛු? භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො[1] ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො, චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො[2] අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො, අඩ්ඪො මහද්ධනො ධනවා, නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා. සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා. මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡාසමන්නාගතා. සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති. චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා, ධම්මස්සාමී තථාගතො. නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං[3] පඤ්ඤාය, අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති. යං කිඤ්චි ඤෙය්‍යං[4] නාම අත්ථි ධම්මං ජානිතබ්බං, අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො[5] වා අත්ථො පරමත්ථො වා අත්ථො, සබ්බං තං අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්තති. සබ්බං වචීකම්මං - සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්තති. අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං අනාගතෙ - පච්චුප්පන්නෙ අප්පටිහතං ඤාණං. යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං. තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵුසිතානං හෙට්ඨිමං[6] සමුග්ගපටලං උපරිමං[7] නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ, එවමෙවං බුද්ධස්ස භගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො. යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා.

---

1 හාසපඤ්ඤො - සයා. 2. ධොරෙය්‍යහො - සයා. 3 අඵුසිතං - සයා.
4. නෙයං - සිමු. II. PTS. 5. වොදනො - සයා.
6. හෙට්ඨිමං ච - සයා 7. උපරිමං ච - සයා

කිසෙයින් බුදුහු පැනැසිනු ද 'විවටචක්ඛු' වූහ යත්? බුදුහු මහත් ප්‍රඥා ඇතියහ. පතල ප්‍රඥා ඇතියහ, ශීඝ්‍ර ප්‍රඥා ඇතියහ, දිවෙන ප්‍රඥා ඇතියහ, තියුණු ප්‍රඥා ඇතියහ, විනිවිද යන ප්‍රඥා ඇතියහ, ප්‍රඥාප්‍රභෙද යෙහි නිපුණයහ, ප්‍රභෙදයට පැමිණි ඥාන ඇතියහ, අධිගම කල ප්‍රතිසංවිද් ඇතියහ. චතුර්වෛශාරද්‍යයට පැමිණියහ, දශබලධාරීහ, පුරුෂශ්‍රේෂ්ඨයහ, පුරුෂසිංහයහ, පුරුෂනාගයහ, පුරුෂාජානෙයහ, පුරුෂධෞරෙය්‍යහ. අනන්තඥානයහ, අනන්ත තෙජස් ඇතියහ, අනන්ත යශස් ඇතියහ. (ප්‍රඥාධනයෙන්) ආඪ්‍යයහ, මහත් වූ ප්‍රඥාධන ඇතියහ, ප්‍රඥාධනවත්හ. (නිවනට පමුණුවන හෙයින්) නෙතෘ වූහ, (වෛනෙයයන් විනයන කරන හෙයින්) විනෙතෘ වූහ, (සැක සිඳුනා හෙයින්) අනුනෙතෘ වූහ. (අර්ථය) පනවනුවහ, නිශ්චය කරවනුවහ, (පිළිවෙත්) දක්වනුවහ, (ප්‍රතිපත්තිඵල යෙන්) පහදනුවහ. තවද ඒ බුදුහු (නූපන් විරූ) අරිමග සිය සතන්හි ඉපැදවූහ, (වෛනෙය සන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය උපදවනුවහ, ප්‍රකාශ නො කල මාර්ගය (විවරණ වශයෙන්) ප්‍රකාශ කරනුවහ, (ප්‍රත්‍යවේක්ෂා වශයෙන්) මාර්ගය දනුවහ, මාර්ගය දන්නා සුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ. තවද මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදි ගුණයෙන්) පසුපස යමින් වෙසෙත්. ඒ බුදුහු දතයුතු ඥෙයධර්ම දනිති. දැක්ක යුතු ඥෙයපථය නුවණැසින් දකිති. (දර්ශන පරිණායක හෙයින්) ඇසක් මෙන් වූහ, ඥානමය වූහ, ධර්මමය වූහ, ශ්‍රේෂ්ඨ වූහ, (දහම් දෙසන හෙයින්) වක්තෘ වූහ, ප්‍රවක්තෘ වූහ, (අර්ථය දක්වනුයෙන්) නිර්ණෙතෘ වූහ, අමෘතය දෙනුවහ, ධර්මස්වාමීහ, තථාගත වූහ. ඒ බුදුන් විසින් (මගනැණින්) නො දන්නා ලද්දක් (නුවණැසින්) නො දක්නා ලද්දක් අවිදිත වූවක් නො පසක් කරන ලද්දක් ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දක් නැති. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ ද, අතීතානාගතප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට සඞ්ඛතාසඞ්ඛත වූ සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන් ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙත්. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ටධාර්මිකාර්ථය ද සාම්පරායිකාර්ථය ද උත්තානාර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නෙය්‍යාර්ථය ද නීතාර්ථය ද නිර්දෝෂාර්ථය ද නික්ලෙශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථාර්ථය ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පැතිර පවතී. භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී, සියලු වාක්කර්මය ඥානය අනුව පවතී, සියලු මනඃකර්මය ඥානය අනුව පවතී. අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (-අනාවරණ) යැ, අනාගතයෙහි ඥානය අනාවරණ යැ, ප්‍රත්‍යුත්පන්නයෙහි ඥානය අනාවරණ යැ. දතයුත්ත යම් පමණ ද ඥානය එ පමණ යැ. ඥානය යම් පමණ ද දතයුත්ත එ පමණ යැ. ඥානය ඥෙය පර්යන්තික යැ, ඥෙයය ඥානපර්යන්තික යැ. ඥෙයය ඉක්මැ ඥානයෙක් නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති, ඒ ධර්මයෝ අන්‍යොන්‍යපර්යන්තයෙහි පවත්නා සුල්ලහ. යම්සේ මනාකොට පැහැසූ සමුගුපටල (-තැබඩු) දෙකක්හුගේ යට සමුගුපටල උපරිමය නො ඉක්මවා ද, උඩ සමුගුපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔවුහු ඔවුනොවුන්ගේ කෙළවර සිටුනා සුලු වෙත් ද; එසෙයින් භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යොන්‍යපර්යන්තයෙහි පවත්නා සුල්ලහ; යම් තාක් ඥෙයය ද ඒ තාක් ඥාන යැ, යම් තාක් ඥානය ද ඒ තාක් ඥෙය යැ; ඥානය ඥෙයපර්යන්තික යැ, ඥෙයය ඥානපර්යන්තික යැ; ඥෙයය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙය්‍ය පථයෙක් නැති, ඒ දහම්හු අන්‍යොන්‍යපර්යන්තයෙහි සිටුනා සුල්ලහ.

සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛපටිබද්ධා මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා. සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසං සත්තානං භගවා ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති. අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තොමහාසමුද්දෙ පරිවත්තන්ති, එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි පක්ඛී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙව යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය, තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති. බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨති. යෙ ච තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා[1] කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විසජ්ජිතා ච තෙ පඤ්හා භගවතා[2] හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකා ච[3] තෙ භගවතො සම්පජ්ජන්ති. අථඛො භගවා ච තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති. එවං භගවා පඤ්ඤාචක්ඛුනාපි විවටචක්ඛු.

කථං භගවා බුද්ධචක්ඛුනාපි විවටචක්ඛු? භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ, අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ. සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියා වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකා අනුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි සමොදකං ඨිතානි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති අනුපලිත්තානි උදකෙන, එවමෙවං භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ, අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

1. නිදුක්ඛ - සයා. 2. භගවන්තො - සීමු. II.
3. උපක්ඛිත්තකා ච - සීමු. II.

සියලු දහම් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී. සියලු දහම්හු භාග්‍යවත් බුදුන්ගේ මනොද්වාරාවර්ජිතයට අයත්හු වෙති, රුචිය ප්‍රතිබද්ධයහ, මනසිකාර ප්‍රතිබද්ධයහ, චිත්තොත්පාද ප්‍රතිබද්ධයහ. සියලු සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී. බුදුහු සියලු සතුන් ගේ ආශය දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති. (නුවණැසෙහි) අල්ප වූ රාගාදි රජස් ඇති මහත් වූ රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති සුන්දර වූ (ශ්‍රද්ධාදි) ආකාර ඇති ගර්හිත වූ (අශ්‍රද්ධාදි) ආකාර ඇති සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ භව්‍යාභව්‍ය සත්ත්වයන් දැනගනිත්. මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත ලෝවැසි තෙම - දෙවිමිනිසුන් සහිත වූ මහණබමුණන් සහිත ප්‍රජාව, ඇතුළු බුදුනුවණෙහි පවතී. තිමි - තිමිංගල පටන් යම් මස් - කැසුබු කෙනෙක් වෙත් නම්, ඔහු යම් සේ ඇතුළු මහමුහුදෙහි හැසිරෙත් ද, එසේසින් මරුන් බඹුන් සහිත වූ සදෙවක ලොක තෙමේ - ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත සදෙවමනුෂ්‍ය ප්‍රජාව ඇතුළු බුදුනුවණෙහි පවතී. යම්සේ විනතා පුත් ගුරුළුරජහු පටන් යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම්, ඔහු අහසැ පෙදෙසැ හැසිරෙත් ද, එසෙසින් මැ යම් කෙනෙක් නුවණින් සැරියුත් තෙරුන් සම වූවාහු නම්, ඔව්හු ද බුද්ධඥානයාගේ පෙදෙසෙක පවත්නාහුය. බුද්ධඥානය දෙවිමිනිසුන්ගේ ප්‍රඥාව පැතිර මැඩගෙනැ සිටී. නිපුණ වූ කල පරවාද ඇති වල්විදුනා දුනුවායන් බඳු ප්‍රසිද්ධ වූ යම් ක්‍ෂත්‍රිය-බ්‍රාහ්මණ - ගෘහපති - ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥාවෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද බොහෝ ප්‍රශ්න රචනා කොට බුදුන් වෙත පැමිණ විචාරත් ද, භාග්‍යවතුන් විසින් ඒ ප්‍රශ්නයෝ සකාරණ ව කියන ලද්දාහු විසඳන ලද්දාහු මැ වෙත්. ඔව්හු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක බවට (උපාසක බවට හෝ) පැමිණියාහු මැ වෙත්. යළි බුදුහු මැ එහි ප්‍රඥාවෙන් අතිශයින් ප්‍රකාශ වෙත් නුයි මෙසේ බුදුහු පැතැසිනූ ද 'විවටචක්ඛු' වූහ.

කිසෙසින් බුදුහු බුදුඇසිනු ද 'විවටචක්ඛු' වූහ යත්: බුදුහු බුදුඇසින් ලොව බලත් සේක් (නුවණැස්හි) අල්ප වූ (රාගාදි) කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති (ශ්‍රද්ධාදි) සුන්දරාකාර ඇති ගර්හිත වූ (අශ්‍රද්ධාදි) ආකාර ඇති සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ සත්ත්වයන්, ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නා සුලු වැ වසනුවත්, ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නා සුලු වැ නො වසනුවත් දුටු සේක. යම්සේ උපුල්විලකැ හෝ පියුම්විලකැ හෝ නෙළුම්විලකැ හෝ ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැඟුණාහු ඇතුළත ගැලී පොහොනි වූවාහු ද, ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දිය හා සම වැ සිටියාහු ද, ඇතැම් උපුල් හෝ පියුම් හෝ නෙළුම් හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් උඩට නැඟී දිය හා නො වැකුණාහු සිටිත් ද, එසෙයින් ම බුදුහු බුදුඇසින් ලොව බලන සේක් අල්පරජසක වූ ද මහාරජස්ක වූ ද තියුණු ඉඳුරන් ඇත්තාවූ ද මෘදු ඉඳුරන් ඇත්තාවූ ද සුන්දරාකාර වූ ද ගර්හිතාකාර වූ ද සුවිඥෙය්‍ය වූ ද දුර්විඥෙය්‍ය වූ ද සත්ත්වයන්, පරලොකයෙහිත් වද්‍යයෙහිත් භය දක්නාසුලු වැ වසනුවත්, ඇතැම් කෙනකුන් පරලොක වද්‍යයෙහි භය දක්නාසුලු වැ නො වසනුවත් දුටු සේක.

ජානාති භගවා අයං පුග්ගලො රාගචරිතො, අයං දොසචරිතො, අයං මොහචරිතො, අයං විතක්කචරිතො, අයං සද්ධාචරිතො, අයං ඤාණචරිතොති. රාගචරිතස්ස භගවා පුග්ගලස්ස අසුභකථං කථෙති. දොසචරිතස්ස භගවා පුග්ගලස්ස මෙත්තාභාවනං ආචික්ඛති. මොහචරිතං භගවා පුග්ගලං උද්දෙසෙ පරිපුච්ඡාය කාලෙන ධම්මස්සවනෙ කාලෙන ධම්මසාකච්ඡාය ගරුසංවාසෙ නිවෙසෙති. විතක්කචරිතස්ස භගවා පුග්ගලස්ස ආනාපානස්සතිං ආචික්ඛති. සද්ධාචරිතස්ස භගවා පුග්ගලස්ස පසාදනියං නිමිත්තං ආචික්ඛති බුද්ධසුබොධිං ධම්මසුධම්මතං සඞ්ඝසුප්පටිපත්තිං සීලානි ච අත්තනො. ඤාණචරිතස්ස භගවා පුග්ගලස්ස ආචික්ඛති විපස්සනානිමිත්තං අනිච්චාකාරං දුක්ඛාකාරං අනත්තාකාරං.

1. "සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ,
පාසාදමාරුය්හ සමන්තචක්ඛු,
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූත"න්ති.[a]

එවං භගවා බුද්ධචක්ඛුනාපි විවටචක්ඛු.

කථං භගවා සමන්තචක්ඛුනාපි විවටචක්ඛු? සමන්තචක්ඛු වුච්චති සබ්බඤ්ඤුතඤාණං; භගවා සබ්බඤ්ඤුතඤාණෙන උපෙතො සමුපෙතො උපගතො[1] සමුපගතො[2] උපපන්නො සමපන්නො සමන්නාගතො.

2. "න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං[3]
තථාගතො තෙන සමන්තචක්ඛූ"ති[b].

එවං භගවා සමන්තචක්ඛුනාපි විවටචක්ඛූති – අකිත්තයී විවටචක්ඛු.

සක්ඛිධම්මං පරිස්සයවිනයන්ති – 'සක්ඛිධම්ම'න්ති න ඉතිහිතිහං න ඉතිකිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයමභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මන්ති සක්ඛිධම්මං.

---

1. උපාගතො - පු. සීමු. II. 2. සමුපාගතො - පු සීමු. II.
3. නෙය්‍යං - සීමු. II.

a. දීඝනිකාය - මහාපදානසුත්ත, මජ්ඣිමනිකාය - අරියපරියෙසනසුත්ත, බොධිරාජකුමාර සුත්ත බ්‍රහ්මසංයුත්ත - පඨමවග්ග, ඉතිවුත්තක - දුතියවග්ග.

b පටිසම්භිදාමග්ග - ඤාණකථා, ඉන්ද්‍රියකථා.

'මේ පුද්ගල තෙම රාගචරිතයෙක, මේ ද්වේෂචරිතයෙක, මේ මෝහචරිතයෙක, මේ විතර්කචරිතයෙක, මේ ශ්‍රද්ධාචරිතයෙක, මේ ඥානචරිතයෙකැ'යි බුදුහු දැනගන්නා සේක. බුදුහු රාග බහුල පුද්ගලයාහට අශුභකථාව වදාරති. ද්වේෂබහුල පුද්ගලයාහට බුදුහු මෛත්‍රීභාවනාව පවසති. බුදුහු මෝහ බහුල පුද්ගලයා උදෙසීමෙහි ද පරිපෘච්ඡා (-අටුවා) යෙහි කාලෙක (-සුදුසු කල්හි) ධර්මශ්‍රවණයෙහි ද කාලෙක ධර්මසාකච්ඡාවෙහි ගුරුන් ඇසුරු කිරීමෙහි ද (ඇදුරන් වෙත) සිටුවන සේක. බුදුහු විතර්ක බහුල පුද්ගලයාහට ආනාපානසතිය දෙසන සේක. ශ්‍රද්ධා බහුල පුද්ගලයාට බුදුහු ප්‍රසාද උපදවන සූත්‍රයක් ද බුදුන්ගේ බුද්ධත්වප්‍රතිවේධය ද ධර්මය ස්වාඛ්‍යාත බව ද සඞ්ඝයා සුප්‍රතිපන්න බව ද තමා සතු ශීලයන් ද පවසන සේක. ඥානචරිත පුද්ගලයාහට බුදුහු (උදයව්‍යයාදි) විදර්ශනානිමිත්ත වූ අනිත්‍යාකාරය දුඃඛාකාරය අනාත්මාකාරය පවසන සේකි.

1. යම්සේ සෙල්මුවා පව්වක් මත සිටි යේ මැ (ඇස් ඇති පුරුෂයෙක්) හාත්පස ජනතාව බලන්නේ ද, එසෙයින් ඔබ ද සුන්දර ප්‍රඥා ඇති සමන්තචක්ෂුස් වූ භාග්‍යවත්නි, දහම්මුවා පහයට නැගී (තුමූ) පහවූ ශෝක ඇත්තාහු ශෝකයට බට ජාතිජරායෙන් මඩනා ලද ජනතාව බලනු මැනැවැ'යි.

මෙසේ බුදුහු බුදුඇසිනුදු 'විවටචක්ඛු' වූහ.

කිසෙයින් බුදුහු සමන්තචක්ෂුසිනු දු 'විවටචක්ඛු' වූහ යත්: 'සමන්තචක්ඛු'යි සර්වඥතාඥානය කියනු ලැබෙයි. බුදුහු සර්වඥතාඥානයෙන් උපෙත යහ, සමුපෙතයහ, උපගතයහ, සමුපගතයහ, තො වෙත් වූහ, පරිපූර්ණයහ සමන්විත වූහු.

2. ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුකලෝකයෙහි (මේ කල හෝ පැනැසිත් නුදුටු කිසිවක් නැත, යලි (අතීත වූ) නො දත් කිසිවක් නැත, (අනාගත වූ) නො දැනෙන කිසි (ධර්මජාතයෙකු) දු නැත. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබොධ කළහ. එහෙයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' වූහ.

මෙසේ බුදුහු සර්වඥතාඥානයෙනු දු 'විවටචක්ඛු' වූවාහු නුයි 'අකිත්තයී විවටචක්ඛු' යනු වේ.

**සක්ඛිධම්මං පරිස්සයවිනයං** – 'සක්ඛිධම්මං' යනු: 'මෙසේ මෙසේ වී ලැයි නො වැ, 'මෙල මෙසේ ලැ'යි නො වැ, පරම්පරාකථාවෙනු දු නො වැ. 'පිටක සම්ප්‍රදය හා සම වේ යැ'යි නො වැ, තර්කහෙතුවෙනු දු නො වැ, නයග්‍රහණයෙනු දු නො වැ, ('මේ සොඳුරු යැ'යි) කරුණු සැලකීමෙනු දු නො වැ 'අපට රුචි වූ දෘෂ්ටිය හා සම වේ යැ' යි, නො වැ, තෙමේ මැ තමා විසින් නුවණින් අවබොධ කළ, තමා ඊසින් ප්‍රත්‍යවේක්ෂා කළ ධර්මය නුයි 'සක්ඛිධම්මං' යනු වේ.

**පරිස්සයවිනයන්ති** 'පරිස්සයා'ති ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච.

කතමෙ පාකටපරිස්සයා? සීහා ව්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී අහි විච්ඡිකා සතපදී චොරා වා අස්සු මාණවා වා කතකම්මා වා අකතකම්මා වා, චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො, දද්දු කණ්ඩු කච්ඡු රඛසා[1] විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා, පිත්තසමුට්ඨානා ආබාධා, සෙම්හසමුට්ඨානා ආබාධා, වාතසමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිණාමජා ආබාධා, විසමපරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො, ඩංසමකසවාතාතප-සිරිංසප සම්ඵස්සා ඉති වා, ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා.

කතමෙ පටිච්ඡන්නපරිස්සයා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනො-දුච්චරිතං, කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථිනමිද්ධනීවරණං උද්ධච්ච-කුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො සබ්බෙ කිලෙසා සබ්බානි දුච්චරිතානි සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභි-සඞ්ඛාරා. ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා.

**පරිස්සයාති** – කෙනට්ඨෙන පරිස්සයා? පරිසහන්තීති පරිස්සයා, පරි-හානාය සංවත්තන්තීති පරිස්සයා, තත්‍රාසයාති පරිස්සයා. කථං පරිසහන්තීති පරිස්සයා? තෙ පරිස්සයා තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්ති. එවං පරිසහන්තීති පරිස්සයා. කථං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා? තෙ පරිස්සයා කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. කතමෙසං කුසලානං ධම්මානං? සම්මා-පටිපදාය අනුලොමපටිපදාය අපච්චනීකපටිපදාය අන්වත්ථපටිපදාය ධම්මානු-ධම්මපටිපදාය සීලෙසු පරිපූරකාරිතාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය භොජනෙසු මත්තඤ්ඤුතාය ජාගරියානුයොගස්ස සතිසම්පජඤ්ඤස්ස, චතුන්නං සති-පට්ඨානානං භාවනානුයොගස්ස, චතුන්නං සම්මප්පධානානං – චතුන්නං ඉද්ධිපාදානං – පඤ්චන්නං ඉන්ද්‍රියානං – පඤ්චන්නං බලානං – සත්තන්නං බොජ්ඣඞ්ගානං – අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගස්ස. ඉමෙසං කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. එවම්පි පරිහානාය සංවත්තන්තීති පරිස්සයා.

1. රඛසා - කළුවි.

**පරිස්සයවිනයං** – පරිස්සය යනු: ප්‍රකට උපද්‍රවයෝ ද, ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ දැයි පරිශ්‍රය දෙකෙකි: ප්‍රකට උපද්‍රවයෝ කවරහ යත්: සිහ යෑ වග යෑ දිවි යෑ වලස් යෑ තරස් යෑ වෘක යෑ මහිෂ යෑ ඇත් යෑ අහි යෑ තුහුසු යෑ කළ සොරකම් ඇති හෝ නැති හෝ සොරු හෝ සැහැසියෝ හෝ වන්නාහුය. චක්ෂුරෝග යෑ ශ්‍රොත්‍රරෝග යෑ ඝ්‍රාණරෝග යෑ ජිහ්වාරෝග යෑ කායරෝග යෑ ශීර්ෂරෝග යෑ මුඛරෝග යෑ දන්තරෝග යෑ කාශ යෑ ශ්වාස යෑ පීනස යෑ දහ යෑ ජ්වර යෑ කුක්ෂිරෝග යෑ මූර්ඡා යෑ ලෝහිතාතීසාර යෑ ආමශූල යෑ මහාවිරේචන යෑ කුෂ්ට යෑ ගණ්ඩ යෑ කාර යෑ ක්ෂයරෝග යෑ අපස්මාර යෑ දද්දු යෑ කණ්ඩූති යෑ මහාකුෂ්ට යෑ නියගිරි යෑ අතුල් පතුල් පැළීම යෑ රක්තපිත්ත යෑ මධුමේහ යෑ අර්ශස් යෑ පොළ යෑ භගන්දර යෑ පිතින් උපදනා රෝග යෑ සෙමින් උපදනා රෝග යෑ වයින් උපදනා රෝග යෑ තුන්දොසින් උපදනා රෝග යෑ, ඍතුවිපර්‍ය්‍යාසයෙන් උපදනා රෝග යෑ විෂම පැවැත්මෙන් උපදනා රෝග යෑ උපක්‍රමයෙන් හටගන්නා රෝග යෑ කර්මවිපාකයෙන් හටගන්නා රෝග යෑ, ශීත – උෂ්ණ – සා – පවස් මල – මූ යෑ, මැසි – මදුරු – වා – අව් – දීඝ්දූපහස් යෑ යන මොහු හෝ සි. මොහු ප්‍රකට උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ කවරහ යත්: කායදුශ්චරිත යෑ වාග්දුශ්චරිත යෑ මනෝදුශ්චරිත යෑ, කාමච්ඡන්දනීවරණ යෑ ව්‍යාපාදනීවරණ යෑ ථීනමිද්ධනීවරණ යෑ උද්ධච්චකුක්කුච්චනීවරණ යෑ විචිකිච්ඡානීවරණයෑ, රාග යෑ ද්වේෂ යෑ මෝහ යෑ ක්‍රෝධ යෑ බද්ධවෛර යෑ මකුබව යෑ යුගග්‍රාහ යෑ ඊර්ෂ්‍යා යෑ මාත්සර්‍ය්‍ය යෑ මායා යෑ ශාඨ්‍ය යෑ ස්තබ්ධ යෑ කරණුත්තරියකරණ යෑ මාන යෑ අතිමාන යෑ මද යෑ ප්‍රමාද යෑ, සියලු ක්ලේශයෝ යෑ, සියලු දුශ්චරිතයෝ යෑ, සියලු දරථයෝ යෑ, සියලු පරිදාහයෝ යෑ, සියලු සන්තාපයෝ යෑ, සියලු අකුශලාභිසංස්කාරයෝ යෑ, යන මොහු ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

**පරිස්සයා** යනු: කවර අර්ථයෙකින් පරිශ්‍රය වූවාහු ද යත්: පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රයයෝ යෑ, පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රයයෝ යෑ එහි වෙසෙත් නුයි පරිශ්‍රයයෝ යි. කිසෙයින් පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය වූහ යත්? ඒ උපද්‍රවයෝ ඒ පුහුල්හු සහනය කෙරෙති, හාත්පසින් සහනය කෙරෙති, අභිභවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් අල්වාගනිති, මර්දනය කෙරෙත්. මෙසෙයින් පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය නම් වෙත්. කිසෙයින් පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රය වූහ යත්? ඒ උපද්‍රවයෝ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවත්නාහුය. කවර කුශලධර්මයන්ගේ ද යත්? සම්‍යක්ප්‍රතිපත්තිය අනුලෝමප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමෝක්ෂශීලයෙහි පරිපූර්ණකාරිත්වය ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාර ඇතිබව භෝජනයෙහි මාත්‍රඥ බව නිදි දුරැකිරීමෙහි යෙදීම ස්මෘතිසම්ප්‍රජන්‍යය, සතර සිවටන් භාවනාවෙහි යෙදීම සතර සම්‍යක්ප්‍රධානය සතර ඍද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය පඤ්චබලය සප්ත බොධ්‍යඞ්ගය ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය (යන මොවුන්ගේ) භාවනාවෙහි යෙදීම – (යන) මේ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවතිත්. මෙසේත් පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රය නම් වෙත්.

කථං තත්‍රාසයාති පරිස්සයා: තත්ථ තත්ථ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයා. යථා බිලෙ බිලාසයා පාණා සයන්ති, දකෙ දකාසයා පාණා සයන්ති, වනෙ වනාසයා පාණා සයන්ති, රුක්ඛෙ රුක්ඛාසයා පාණා සයන්ති, එවමෙවං තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයාති. එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තඤ්හෙතං භගවතා:

“සාන්තෙවාසිකො භික්ඛවෙ, භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු විහරති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරති? ඉධ භික්ඛවෙ, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනීයා, ත්‍යාස්ස[1] අන්තො වසන්ති අන්වාස්සවසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති. පුනචපරං භික්ඛවෙ භික්ඛුනො සොතෙන සද්දං සුත්වා - ඝානෙන ගන්ධං ඝායිත්වා - ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනීයා. ත්‍යාස්ස අන්තො වසන්ති, අන්වාස්ස වසන්ති පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරතී”ති.[a] එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තඤ්හෙතං භගවතා;

“තයො'මෙ භික්ඛවෙ අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා. කතමෙ තයො? ලොභො භික්ඛවෙ, අන්තරාමලං අන්තරාමිත්තො අන්තරාසපත්තො අන්තරාවධකො අන්තරාපච්චත්ථිකො. දොසො භික්ඛවෙ - මොහො භික්ඛවෙ අන්තරාමලං අන්තරාමිත්තො අන්තරාසපත්තො අන්තරාවධකො අන්තරාපච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො අන්තරා මලා අන්තරා මිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකාති.[b]

3. අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.[b]

---

1. ත්‍යාස්ස - සීමු. II. මජසං.
2. අන්වාස්සවසන්ති - සීමු. II අන්තාස්ස වසන්ති - සං. අන්වාස්ස වසන්ති - ස.
a. සළායතනසංයුත්ත - නවපුරාණවග්ග b. ඉතිවුත්තක - චතුත්ථවග්ග - මලසුත්ත

කිසෙසයින් එහි වෙසෙත් නුයි පරිශ්‍රය වූහ යත්: ඒ ආත්මභාවයෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදිත්. යම්සේ බිලයෙහි බිලාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, දියෙහි ජලාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, වෙනෙහි වනාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, රුකෙහි වෘක්ෂාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, එසෙසින් ම ඒ අත්බවෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදිත් නුයි මෙසේත් එහි වෙසෙත් නුයි පරිශ්‍රය නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"මහණෙනි, සාන්තෙවාසික වූ (-අන්තවාසික කෙලෙස් සමග වසන) සාචාර්යක වූ (-සමුදාචරණ කෙලෙස් සමග වසන) මහණ තෙමේ දුකසේ නො සුවසේ වෙසෙයි. මහණෙනි, කිසෙසයින් සාන්තෙවාසික වූ සාචාර්යක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙයි යත්: 'මහණෙනි, මෙහි මහණක් හට ඇසින් රූපයක් දැක, (නොයෙක් අරමුණෙහි හැසිරීම් වශයෙන් උපන්) සඞ්කල්පනා ඇයි සංයොජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම්, ඒ ලාමක අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති, ඔහුගේ සන්තානය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් සාන්තෙවාසික යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු කෙරෙහි නිරතුරු හැසිරෙයි, ඔහු හෝ හසුරුවත් නුයි එහෙයින් 'සාචරියක'යි කියනු ලැබේ. තවද මහණෙනි, මහණක්හට කනින් ශබ්දයක් අසා-නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට - දිවින් රසයක් විඳ - කයින් පහසක් පැහැස - මනසින් දහමක් දැන අරමුණෙහි හැසිරීමෙන් උපන් සඞ්කල්පනා ඇයි සංයොජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම් ඒ ලාමක අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති, ඔහුගේ සන්තානය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් 'සාන්තෙවාසික' යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු කෙරෙහි හැසිරෙති. ඔහු හෝ හසුරුවත් නුයි එහෙයින් 'සාචරියක' යයි කියනු ලැබේ. මෙසේත් මහණෙනි, සාන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකසේ නො සුවසේ වෙසේ යයි. මෙසේත් එහි වෙසෙත් නුයි පරිශ්‍රය වෙත්.

වදාරන ලද මැය බුදුන් විසින්:

"මහණෙනි, මේ ඇතුළත මලයෝ ඇතුළත අමිත්‍රයෝ ඇතුළත සතුරෝ ඇතුළත වධකයෝ ඇතුළත පසමිතුරෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද යත්: මහණෙනි, ලෝභය ඇතුළත මල යැ ඇතුළත අමිත්‍ර යැ ඇතුළත සතුරු යැ ඇතුළත වධක යැ ඇතුළත පසමිතුරු යි. මහණෙනි, ද්වේෂය - මහණෙනි, මෝහය අන්තර්මල යැ අන්තරමිත්‍ර යැ අන්තර් සපත්න යැ අන්තර් වධක යැ අන්තර් ප්‍රත්‍යනීක යි. මහණෙනි, මොහු තිදෙන අන්තර් මලයෝ යැ අන්තරමිත්‍රයෝ යැ අන්තර් සපත්නයෝ යැ අන්තර් වධකයෝ යැ අන්තර් ප්‍රත්‍යනීකයෝ යැ"යි.

3. ලෝභය අනර්ථ උපදවන්නේ යැ. ලෝභය (කුසල්) සිත චලනන්නේ යැ. අභ්‍යන්තරයෙහි උපන් භයෙකැ. බාලජන තෙමේ එය නොදනී·

4. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං ලොභො සහතෙ නරං.

5. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං කොධො සහතෙ නරං.

7. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

8. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං මොහො සහතෙ නර"න්ති.a

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

"තයො ඛො'මෙ මහාරාජ, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො: ලොභො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො ඛො මහාරාජ – මොහො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. ඉමෙ ඛො මහාරාජ, තයො පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය.b

9. "ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරං'ව සම්ඵල"න්තිb

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තඤ්හෙතං භගවතා:

10. "රාගො ච දොසො ච ඉතොනිදානා
අරතී රතී ලොමහංසා ඉතොජා,
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධඞ්කමිවොස්සජන්තී"න්තිc.

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

**පරිස්සය විනයන්ති** – පරිස්සයවිනයං පරිස්සයපහානං පරිස්සයවූපසමං පරිස්සයපටිනිස්සග්ගං පරිස්සයපටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති – සඞ්ඛිධම්මං පරිස්සයවිනයං.

a. ඉතිවුත්තක - චතුත්ථවග්ග - මලසුත්ත
b. කොසලසංයුත්ත - පඨමවග්ග. c. සුත්තනිපාත - සූචිලොමසුත්ත.

4. ලොභී තෙමේ (ලෝභී - ලොද්භුතුරා) අර්ථය නො දනී. ලුබ්ධ තෙමේ දහම් නො දකී. යම් හෙයකින් ලොභය තෙමේ මිනිසා අභිභවා ද එකල්හි බහලාන්ධකාරය වේ.

5. ද්වේෂය අනර්ථජනක යැ. ද්වේෂය කුසල් සිත චලහන්නේ යැ. ඇතුලත උපන් භයෙකැ. බාලජන තෙමේ එය නො දතගනී.

6. කිපියේ අර්ථය නො මැ දනී. කිපියේ අනර්ථහෙතුව නො දකී. යම් හෙයකින් ක්‍රොධය මිනිසා අභිභවා ද එකල්හි බහලාන්ධකාරය වේ.

7. මෝහය අනර්ථජනක යැ. මෝහය කුසල්සිත චලහන්නේ යැ. සිත තුල උපන් භයෙකැ. බාලජන තෙමේ එය අවබොධ නො කෙරේ.

8. මූඪ වූයේ ලෞකික - ලොකොත්තරාර්ථය නො දනී. මූඪ තෙමේ අනර්ථහෙතුව නො දකී. යම් හෙයකින් මෝහය තෙමේ මිනිසා අභිභවා ද එකල්හි බහල වූ මෝහාන්ධකාරය වේ යයි.

මෙසේත් තත්‍රාශය නුසි පරිශ්‍රයයෝ සි.

මේ වදාරන ලද මැය බුදුන් විසින්:

“මහරජ, මේ ධර්මයෝ තිදෙනෙක් පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනාහු අහිත පිණිස දුක් පිණිස නො සුවසේ වාසය පිණිස උපදනාහුය. කවර තිදෙනෙක් ද යත්: මහරජ, ලොභය පුරුෂයාගේ සිත තුල උපදනේ අහිතට දුකට නො සුවවිහරණයට උපදී. මහරජ, ද්වේෂය... මහරජ, මෝහය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතට දුකට අඵාසුවිහරණයට උපදී. මහරජ, මේ තුන් ධර්මයෝ පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනාහු අහිතට දුකට අඵාසුවිහරණයට උපදනාහු”යි.

9. ලොභය ද ද්වේෂය ද මෝහය ද තම සිත තුල උපන්නාහු ස්වකීය ඵලය හුණගස සෙයින් පව්සිත් ඇති මිනිසා වනසත්.

මෙසේත් තත්‍රාශය නුයි පරිශ්‍රය නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

10. රාගයත් ද්වේෂයත් මේ ආත්මභාවය නිදාන කොට ඇත්තාහුය. අරතිය රතිය හා රොමහර්ෂයෝ මේ අත්බවින් උපන්නාහ. පාපවිතර්කයෝ මේ අත්බවින් ඉපිද කුමරනු හුයින් පා බැඳි කවුඩක්හු සෙයින් හැරපියත්.

මෙසේත් තත්‍රාශය නුයි පරිශ්‍රය නම් වෙත්.

**පරිස්සයවිනයං** – උපද්‍රවප්‍රහාණය උපද්‍රව සන්හිඳීම උපද්‍රව හැරපීම උපද්‍රව දුරලීම වූ අමාමහ නිවන නුයි ‘සක්ඛිධම්මං පරිස්සයවිනයං’ යනු වේ.

**පටිපදං වදෙහි භද්දන්තෙති** - පටිපදං වදෙහි සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං සීලෙසු පරිපූරකාරිතං ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතං භොජනෙ මත්තඤ්ඤුතං ජාගරියානුයොගං සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං; **වදෙහි** ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති - පටිපදං වදෙහි; **භද්දන්තෙති** සො නිම්මිතො බුද්ධං භගවන්තං ආලපති. අථවා, යං ත්වං ධම්මං ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසි, සබ්බං තං සුන්දරං භද්දකං කල්‍යාණං අනවජ්ජං සෙවිතබ්බන්ති - පටිපදං වදෙහි භද්දන්තෙ.

**පාතිමොක්ඛං අථවාපි සමාධින්ති** - පාතිමොක්ඛන්ති: සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො මුඛං පමුඛං කුසලානං ධම්මානං සමාපත්තියා.[a] **අථවාපි සමාධින්ති** යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි[b] - පාතිමොක්ඛං අථවාපි සමාධිං.

තෙනාහ සො නිම්මිතො:

> "අකිත්තයී විවටචක්ඛු - සක්ඛිධම්මං පරිස්සයවිනයං,
> පටිපදං වදෙහි භද්දන්තෙ - පාතිමොක්ඛං අථවාපි සමාධි"න්ති.

### 14 - 8

> චක්ඛූහි නෙව ලොලස්ස
> ගාමකථාය ආවරයෙ සොතං,
> රසෙ ච නානුගිජ්ඣෙය්‍ය
> න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං.

**චක්ඛූහි නෙව ලොලස්සාති** - කථං 'චක්ඛුලොලො' හොති? ඉධෙකච්චො භික්ඛු චක්ඛුලොලො චක්ඛුලොලියෙන සමන්නාගතො හොති: අදිට්ඨං දක්ඛිතබ්බං, දිට්ඨං සමතික්කමිතබ්බන්ති ආරාමෙන ආරාමං, උය්‍යානෙන උය්‍යානං, ගාමෙන ගාමං, නිගමෙන නිගමං, නගරෙන නගරං, රට්ඨෙන රට්ඨං, ජනපදෙන ජනපදං, දීඝචාරිකං අනවත්ථිතචාරිකං[1] අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි චක්ඛුලොලො හොති.

---

a. ඣානවිභඞ්ග. b. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

1 අනවට්ඨිතචාරිකං - මජසං.

**පටිපදං වදෙහි භද්දමත්ථු** - ප්‍රතිපත්තිය වදාල මැනැව, සම්‍යක් ප්‍රතිපත්තිය අනුලොමප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමොක්ෂශීලයෙහි පරිපූරකාරීත්වය ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාරතාව භොජනයෙහි මාත්‍රාඥතාව ජාගරියානුයොගය සමෘතිසම්ප්‍රජන්‍යය සතර සතිපට්ඨාන සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය පඤ්ච බල සප්ත බොධ්‍යඞ්ග ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය හා නිර්වාණය ද නිර්වාණගාමිනීප්‍රතිපත්තිය ද, **වදෙහි** - පැවසුව මැනව, දෙසුව මැනව, පැනවූව මැනව, තැබුව මැනව, විවෘත කල මැනව, විභාග කල මැනව, ප්‍රකට කල මැනව, ප්‍රකාශ කල මැනවැ යි 'පටිපදං වදෙහි' යනු වේ. **භද්දමත්ථු** යනු ඒ නිර්මිත බුදුහු භාග්‍යවත් බුදුන් ආමන්ත්‍රණය කෙරෙති. නොහොත් නුඹ වහන්සේ යම් දහමක් පැවසූහු ද පැනවූහු ද තැබූහු ද විවෘත කලහු ද විභාග කලහු ද ප්‍රකට කලහු ද දෙසූහු ද, ඒ සියල්ල සුන්දර යැ භද්‍ර යැ කල්‍යාණ යැ අනවද්‍ය යැ සෙවිතව්‍ය නුයි 'පටිපදං වදෙහි භද්දමත්ථු' යනු වේ.

**පාතිමොක්ඛමථවාපි සමාධිං** 'පාතිමොක්ඛං' යනු: කුශලධර්මයන්ගේ සමාපත්තියට (-ලැබීමට) ශීලය ප්‍රතිෂ්ඨා යැ ආදි යැ පාද යැ සංයම යැ සංවර යැ ද්වාර යැ ප්‍රමුඛ යි. **අථවාපි සමාධිං** - සිත (අරමුණෙහි නිශ්චලව) යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් (උද්ධච්ච - විචිකිච්ඡා වසයෙන්) චිත්තයාගේ නො පැතිරීමෙක් සිත නො විසිරීමෙක් චිත්තයාගේ නො පැතුරුණු බවෙක් සමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් නුයි 'පාතිමොක්ඛමථවාපි සමාධිං' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"**අක්ඛාතාසි විවටචක්ඛු** -පෙ- **පාතිමොක්ඛමථවාපි සමාධිං**"යි.

**14 - 8**

ඇසින් (රූපදර්ශනයට) ලොල් වූයේ නො මැ වන්නේ යැ. ග්‍රාම්‍ය (තිරශ්චීන) කථාවෙන් කන වලහන්නේ යැ. (මුලරසාදි) රසයෙහි ද නො ගිජු වන්නේ යැ. ලොවැ (රූපාදි) කිසිවක් (තෘෂ්ණා - දෘෂ්ටි) මමත්ව-යෙන් නො ගන්නේ යි.

**චක්ඛූහි නෙව ලොලස්ස** - කිසෙයින් චක්ඛුලොල වෙයි යත්: මෙහි කිසි මහණෙක් (සක්දෙර උපත් ලොභ විසින්) ඇසින් ලොල්වූයේ චක්ෂුර්ලෞල්‍ය යෙන් සමන්විත වෙයි. 'නුදුටු රූපාලම්බනය දක්ක යුතු යැ, දක්නා ලද්ද ඉක්මැවියැ යුතු යැ'යි අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමයෙන් නිගමයට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දිඝී චාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි යෙදුණේ රූපදර්ශනය සඳහා හැසිරෙයි. මෙසේත් චක්ඛුලොල වෙයි.

අථවා, භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො අසංවුතො ගච්ඡති හත්ථිං ඔලොකෙන්තො, අස්සං ඔලොකෙන්තො, රථං ඔලොකෙන්තො, පත්තිං ඔලොකෙන්තො, ඉත්ථියො ඔලොකෙන්තො, පුරිසෙ ඔලොකෙන්තො, කුමාරකෙ ඔලොකෙන්තො, කුමාරිකායො ඔලොකෙන්තො, අන්තරාපණං ඔලොකෙන්තො, ඝරමුඛානි ඔලොකෙන්තො, උද්ධං ඔලොකෙන්තො, අධො ඔලොකෙන්තො, දිසාවිදිසං විපෙක්ඛමානො[1] ගච්ඡති. එවම්පි චක්ඛුලොලො හොති-

අථවා, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. එවම්පි චක්ඛුලොලො හොති. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනගරකං[2] චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං ගොයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං[3] උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අණීකදස්සනං ඉති වා. එවම්පි චක්ඛුලොලො හොති-

කථං න චක්ඛුලොලො හොති? ඉධෙකච්චො භික්ඛු න චක්ඛුලොලො න චක්ඛුලොලියෙන සමන්නාගතො හොති. අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බන්ති න ආරාමෙන ආරාමං න උය්‍යානෙන උය්‍යානං න ගාමෙන ගාමං න නිගමෙන නිගමං න නගරෙන නගරං න රට්ඨෙන රට්ඨං න ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවත්ථචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි න චක්ඛුලොලො හොති. අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො සංවුතො ගච්ඡති: න හත්ථිං ඔලොකෙන්තො, න අස්සං ඔලොකෙන්තො, න රථං ඔලොකෙන්තො, න පත්තිං ඔලොකෙන්තො, න ඉත්ථියො ඔලොකෙන්තො, න පුරිසෙ ඔලොකෙන්තො, න කුමාරකෙ ඔලොකෙන්තො, න කුමාරිකායො ඔලොකෙන්තො, න අන්තරාපණං ඔලොකෙන්තො, න ඝරමුඛානි ඔලොකෙන්තො, න උද්ධං ඔලොකෙන්තො, න අධො ඔලොකෙන්තො, න දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති. එවම්පි න චක්ඛුලොලො හොති-

අථවා, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවම්පි න චක්ඛුලොලො හොති. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං -පෙ- අණීකදස්සනං ඉති වා. එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. එවම්පි න චක්ඛුලොලො හොති-

1 පෙක්ඛමානො - සීමු. II. 2. සොභනකං - මජසං. 3. නිබ්බුද්ධං - මජසං.

නොහොත් මහණ තෙමේ ඇතුළුගමට පිවිසියේ වීථියට පිළිපන්නේ අසංවර වූ යෙයි: ඇතුන් බලමින් අසුන් බලමින් රිය බලමින් පාබල සෙන් බලමින් ස්ත්‍රීන් බලමින් පුරුෂයන් බලමින් කුමරුන් බලමින් කුමරියන් බලමින් ඇතුළු අවුණ (-සාඛතුල) බලමින් ගෙදොර බලමින් උඩ බලමින් යට බලමින් දිශාවිදිශා බලමින් යෙයි. මෙසේත් චක්ඛුලොල වෙයි-

නොහොත් මහණ තෙම ඇසින් රූපයක් දැක (කෙලෙසවස්තු වූ) නිමිති ගන්නේ වෙයි, (හස්තපාදාදි) ආකාර විසින් ගන්නේ වෙයි, යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවෘත වූ වසන මොහු අභිධ්‍යා - දෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදී, චක්ෂුරින්ද්‍රියය නො රකී. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි; මෙසේත් චක්ඛුලොල වෙයි. තවද යම්සේ ඇතැම් භවත් මහණ බමුණු කෙනෙක් කම්පල අදහා දුන් බොජුන් වළඳා, ඔවුහු මෙබඳු වූ විසුළු දැකීමෙහි යෙදී වෙසෙති: ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් නළුමුළු භාරතාදිය කියන තැන සස්තල ඝනතාල (කුළු තාලම් හෝ මලසිරුර මන්ත්‍රයෙන් නගාලීම) කල පිඹීම (බුඹිමංඩි?) ප්‍රතිභානචිත්‍ර සැඩොලුන්ගේ සණදෙවුන්කෙළි වස්කුලල් ඇට දෙවීම ඇත්පොර අස්පොර මීහිපොර වෘෂපොර ගවපොර බැටළුපොර එළුපොර කුකුළුපොර වටුපොර දඬුපොර මිටුපොර මල්ලපොර යුද පෙරමුණ බලසෙන් ගණන තැන කඳවුර බලඇණි දැකීම යනු හෝ යැ. මෙසේත් 'චක්ඛුලොල' වේ.

කිසෙසින් 'චක්ඛුලොල' නො වෙයි යත්: මේ ශාසනයෙහි කිසි මහණෙක් ඇසින් ලොල් නො වූයේ චක්ෂුර්ලෞල්‍යයෙන් යුක්ත නො වූයේ වෙයි: නුදුටු දෙය දක්ක යුතු යැ, දුටුදෙය ඉක්මැවිය යුතු යැයි අරමින් අරමට නො යෙයි, උයනින් උයනට - ගමින් ගමට - නිගමයෙන් නිගමයට - නුවරින් නුවරට - රටින් රටට - දනව්වෙන් දනව්වට රූපදර්ශනය පිණිස දීර්ඝචාරිකාවෙහි නො නිති චාරිකාවෙහි නො යෙදුණේ වෙයි. මෙසේත් 'චක්ඛුලොල' නො වූයේ වෙයි. නොහොත් මහණ තෙමේ ඇතුළු ගමට පිවිසියේ වීදියට පිළිපන්නේ සංවර වූ යෙයි: ඇතුන් නො බලමින් අසුන් නො බලමින් රිය නො බලමින් පාබලසෙන් නො බලමින් ගෑනුන් නො බලමින් පිරිමිනින් නො බලමින් කුමරුන් නො බලමින් කුමරියන් නො බලමින් ඇතුළු අවුණු නො බලමින් ගෙදොර නො බලමින් උඩ නො බලමින් යට නො බලමින් දිශාවිදිශා නො බලමින් යෙයි. මෙසේත් 'චක්ඛුලොල' නො වූයේ වෙයි-

නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නො ගන්නේ අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවර වූ වසන මොහු අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම්, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී, චක්ෂුරින්ද්‍රියය රකී, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි: මෙසේත් 'චක්ඛුලොල' නො වූයේ වෙයි. තවද යම්සේ ඇතැම් භවත් මහණ බමුණු කෙනෙක් කම්පල අදහා දෙන ලද බොජුන් වළඳා ඔවුහු මෙබඳු වූ විසුළු දැක්මෙහි නො යෙදී වෙසෙති. ඒ මෙසේ යැ; නැටුම් ගැයුම් වැයුම් රඟමඬුලු (භාරතාදිය) පැවසීම...බල ඇණි දැකීම යනාදිය යි. මෙබඳු විසුළු දස්සනයෙන් වැළැකුණේ වෙයි. මෙසේත් 'චක්ඛුලොල' නො වූයේ වේ.

**චක්ඛූහි නෙව ලොලස්සාති** – චක්ඛුලොලියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. චක්ඛුලොලියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – චක්ඛූහි නෙව ලොලස්ස.

**ගාමකථාය ආවරයෙ සොතන්ති** – ගාමකථා වුච්චති බත්තිංස තිරච්ඡානකථා. සෙය්‍යථිදං: රාජකථා චොරකථා මහාමත්තකථා සෙනාකථා භයකථා යුද්ධකථා අන්නකථා පානකථා වත්ථකථා යානකථා සයනකථා මාලාකථා ගන්ධකථා ඤාතිකථා ගාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ඉත්ථිකථා පුරිසකථා සූරකථා විසිඛාකථා කුම්භට්ඨානකථා පුබ්බපෙතකථා නානත්තකථා[1] ලොකක්ඛායිකා සමුද්දක්ඛායිකා ඉතිභවාභවකථා ඉති වා.

**ගාමකථාය ආවරයෙ සොතන්ති** – ගාමකථාය සොතං ආවරෙය්‍ය නිවාරෙය්‍ය සන්නිවාරෙය්‍ය රක්ඛෙය්‍ය ගොපෙය්‍ය පිදහෙය්‍ය පච්ඡින්දෙය්‍යාති – ගාමකථාය ආවරයෙ සොතං.

**රසෙ ච නානුගිජ්ඣෙය්‍යාති** – 'රසො'ති මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො අම්බිලං මධුරං තිත්තකං කටුකං ලොණිකං ඛාරිකං ලම්බිලං[2] කසාවො සාදුං අසාදුං සීතං උණ්හං. සන්තෙකෙ සමණබ්‍රාහ්මණා රසගිද්ධා. තෙ ජිව්හග්ගෙන රසග්ගානි පරියෙසන්තා ආහිණ්ඩන්ති. තෙ අම්බිලං ලභිත්වා අනම්බිලං පරියෙසන්ති, අනම්බිලං ලභිත්වා අම්බිලං පරියෙසන්ති –පෙ– සීතං ලභිත්වා උණ්හං පරියෙසන්ති, උණ්හං ලභිත්වා සීතං පරියෙසන්ති. තෙ යං යං ලභිත්වා තෙන තෙන න තුස්සන්ති, අපරාපරං පරියෙසන්ති. මනාපිකෙසු රසෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා. යස්සෙසා රසතණ්හා පහීනා සමුච්ඡින්නා –පෙ– ඤාණග්ගිනා දඩ්ඪා. සො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය –පෙ– ඵාසුවිහාරො චා'ති. යථා වණං ආලිම්පෙය්‍ය යාවදෙව ආරුහණත්ථාය, යථා වා අක්ඛං අබ්භඤ්ජෙය්‍ය යාවදෙව භාරස්ස නිත්ථරණත්ථාය, යථා වා පුත්තමංසං ආහාරං ආහාරෙය්‍ය යාවදෙව කන්තාරස්ස නිත්ථරණත්ථාය, එවමෙව භික්ඛු පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය –පෙ– අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. රසතණ්හං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, රසතණ්හාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – රසෙ ච නානුගිජ්ඣෙය්‍ය.

1. නානාකථා - සීමු. II.

**චක්ඛූහි නෙව ලොලස්ස** - චක්ෂුර්ලෞල්‍යය (ඇසින් රූප දැක්මෙහි ලොල් බව) බැහැර කරන්නේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යැ. චක්ෂුර්ලෞල්‍යයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ වන්නේ යැ, විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'චක්ඛූහි නෙව ලොලස්ස යනු' වේ.

**ගාමකථාය ආවරයෙ සොතං** - දෙතිස් තිරශ්චීනකථාව 'ග්‍රාමකථා යැ'යි කියනු ලැබෙයි. ඒ මෙසේ යැ: රජුන් පිළිබඳ (ගෘහාශ්‍රිත) කථා යැ චෞරකථා යැ මහාමාත්‍යකථා යැ සේනාකථා යැ භයකථා යැ යුද්ධකථා යැ ආහාර පිළිබැඳි කථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ යානකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥාතිකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගර කථා යැ ජනපදකථා යැ ස්ත්‍රීකථා යැ පුරුෂකථා යැ ශූරකථා යැ වීථි පිළිබැඳි කථා යැ දියතොට (හෝ කළදෑසින්) පිළිබැඳි කථා යැ පූර්වප්‍රේත (=පෙර නෑයන්) පිළිබැඳි කථා යැ නන්වැදෑරුම් (නිරර්ථක) කථා යැ ලෝකායතකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ වෘද්ධි - හානි පිළිබැඳි කථා යැ යන දිය සි.

**ගාමකථාය ආවරයෙ සොතං** - ගම්වැසියන්ගේ කථාවෙන් ශ්‍රොත්‍රෙන්ද්‍රිය ආවරණය කරන්නේ යැ වළහන්නේ යැ මොනවට වළහන්නේ යැ රක්නේ යැ ගොපනය කරන්නේ යැ වසන්නේ යැ පසිඳින්නේ නුයි 'ගාමකථාය ආවරයෙ සොතං' යනු වේ.

**රසෙ ච නානුගිජ්ඣෙය්‍ය** - 'රස' නම් මූලරස යැ ස්කන්ධරස යැ තචක් රස යැ පත්‍රරස යැ පුෂ්පරස යැ ඵලරස යැ, අම්බිල යැ මධුර යැ තික්ත යැ කටුක යැ ලවණ යැ ක්ෂාර යැ ලපිල (=ඇඹුල්මුසු) යැ කසට යැ ළිහිරි යැ අළිහිරි යැ ශීත යැ උෂ්ණරස යි. රසයෙහි ගිජු වූ ඇතැම් මහණ බමුණු කෙනෙක් වෙයි. ඔවුහු දිවගින් අග්‍රරස සොයමින් ඇවිදිති. ඔවුහු ඇඹුලක් ලැබ නො ඇඹුලක් සොයති. නො ඇඹුලක් ලැබ ඇඹුලක් සොයති... සිහිලක් ලැබ උණුසුමක් සොයති, උණුසුමක් ලැබ සිහිලක් සොයති. ඔවුහු යමක් යමක් ලැබ ඒ ඒ ලද දෙයින් නො සතුටු වෙති: මතුමත්තෙහි සොයත්. මනවඩන රසයන්හි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු බැසගත්තාහු ලග්න වූවාහු ලග්නිත වූවාහු වෙළුණාහුය. යමක්හු විසින් තෙල රසතෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳින ලද්දී...නුවණගින්නෙන් දවන ලද්දී ද, හෙතෙම නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ආහාරය වළඳයි: ක්‍රීඩා පිණිස නො වෙයි...පහසුවිහරණය ද වේ යයි. යම්සේ ආරුහණය පමණින් ව්‍රණය ආලේප කරන්නේ ද, නවද යම්සේ බර ඇද ගන්නා පමණින් ගැල්අකුර තෙල් ගල්වන්නේ ද, යම්සේ කාන්තාරය තරණය කරන පමණින් පුත්‍රමාංසාහාරය හෝ අනුභව කරන්නේ ද, එසෙයින් ම මහණ තෙමේ නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ආහාරය වළඳයි: ක්‍රීඩා පිණිස නො මැ වෙයි...අනවද්‍යතාවය ද පහසුවිහරණය ද වන්නේ යැයි. රසතෘෂ්ණාව හරන්නේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ. රසතෘෂ්ණාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයොග වූයේ වන්නේ යැ, විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'රසෙ ච නානුගිජ්ඣෙය්‍ය' යනු වේ.

**න ච මමායෙථ කිඤ්චි ලොකස්මින්ති**– 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං. තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං න මමායෙය්‍ය, න ගණ්හෙය්‍ය, න පරාමසෙය්‍ය, නාභිනිවෙසෙය්‍ය, සොතං, ඝානං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, කුලං, ගණං, ආවාසං, ලාභං, යසං, පසංසං, සුඛං, චීවරං, පිණ්ඩපාතං, සෙනාසනං, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, කාමධාතුං, රූපධාතුං, අරූපධාතුං, කාමභවං, රූපභවං, අරූපභවං, සඤ්ඤාභවං, අසඤ්ඤාභවං, නෙවසඤ්ඤානාසඤ්ඤාභවං, එකවොකාරභවං, චතුවොකාරභවං, පඤ්චවොකාරභවං, අතීතං, අනාගතං, පච්චුප්පන්නං, දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ න මමායෙය්‍ය, න ගණ්හෙය්‍ය, න පරාමසෙය්‍ය, නාභිනිවෙසෙය්‍ය. **කිඤ්චීති** කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං; **ලොකස්මින්ති** අපායලොකෙ –පෙ– ආයතනලොකෙති – න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං.

තෙනාහ භගවා:

"චක්ඛූහි නෙව ලොලස්ස
ගාමකථාය ආවරයෙ සොතං,
රසෙ ච නානුගිජ්ඣෙය්‍ය
න ච මමායෙථ කිඤ්චි ලොකස්මි"න්ති.

**14 - 9**

ඵස්සෙන යදා ඵුට්ඨස්ස
පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
භවඤ්ච නාභිජප්පෙය්‍ය
භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය.

**ඵස්සෙන යදා ඵුට්ඨස්සාති** – 'ඵස්සො'ති රොගඵස්සො; රොගඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; සොතරොගෙන, ඝානරොගෙන ජිව්හාරොගෙන, කායරොගෙන, සීසරොගෙන, කණ්ණරොගෙන, මුඛරොගෙන, දන්තරොගෙන, කාසෙන, සාසෙන, පිනාසෙන, ඩහෙන, ජරෙන, කුච්ඡිරොගෙන, මුච්ඡාය, පක්ඛන්දිකාය, සූලාය විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන, අපමාරෙන, දද්දුයා කණ්ඩුයා කච්ඡුයා රඛසාය විතච්ඡිකාය, ලොහිතෙන පිත්තෙන මධුමෙහෙන, අංසාය පිළකාය භගන්දලෙන, පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන උතුපරිණාමජෙන ආබාධෙන විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන, සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය උච්චාරෙන පස්සාවෙන, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති – ඵස්සෙන යදා ඵුට්ඨස්ස.

---

1 දරූතෙන - ස. 2. අලබ්භමානො - PTS.

**න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං** - 'මමත්ත' යනු: තෘෂ්ණාමමත්වය ද, දෘෂ්ටිමමත්වය දැයි මමත්ව දෙකෙකි... මේ දෘෂ්ටිමමත්වය යි. තෘෂ්ණාමමත්වය හැර දෘෂ්ටිමමත්වය දුරලා ඇස මමායනය නො කරන්නේ යැ, නො ගන්නේ යැ, පරාමර්ශ නො කරන්නේ යැ, අභිනිවේශය නො කරන්නේ යැ, කන - දිව - කය - රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය - කුලය - ගණයා - ආවාසය - ලාභ - යශස් - ප්‍රශංසාව - සුවය - සිවුර - පිණ්ඩපාත - සෙනසුන් - ගිලන්පස බෙහෙසත් පිරිකර - කාමධාතුව - රූපධාතුව - අරූපධාතුව - කාමභවය - රූපභවය - අරූපභවය - සංඥාභවය - අසංඥාභවය - නෛවසංඥානාසංඥාභවය - එකවොකාරභවය - චතුවොකාරභවය - පඤ්චවොකාරභවය - අතීතය - අනාගතය - වර්තමානය - දෘෂ්ට - ශ්‍රැත - මුත - විඥාතව්‍යධර්මයන් මමායන නො කරන්නේ යැ, නො ගන්නේ යැ, නො පරාමර්ශ කරන්නේ යැ, අභිනිවේශය නො කරන්නේ යි. **කිඤ්චි** යනු: කිසි රූපගතයක් වේදනාගතයක් සංඥාගතයක් සංස්කාරගතයක් විඥානගතයක්; **ලොකස්මිං** යනු: අපායලොකයෙහි.. ආයතනලොකයෙහි නුයි 'න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"චක්ඛූහි නෙව ලොලස්ස -පෙ- න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං"යි**

## 14 - 9

මහණ තෙම යම් කලෙක රොගස්පර්ශයෙන් මඩනා ලද්දේ වන්නේ නම්, (එකල්හි) පරිදෙවනා නො කරන්නේ ය. (කාමභවාදි) භවය ද නො පතන්නේ ය. භය අරමුණු නිමිති කොට ද කම්පා නො වන්නේ යි.

**ඵස්සෙන යදා ඵුට්ඨස්ස** - 'ඵස්ස' නම්: රොගස්පර්ශ යැ, රොග පහසින් ස්පර්ශ කරන ලදුයේ මඩනා ලදුයේ ඇතුලත පිවිසියේ සමන්වාගත වූයේ වන්නේ නම්, චක්ෂුරොගයෙන් ස්පර්ශ කරන ලදුයේ මඩනා ලදුයේ පිවිසියේ සමන්විත වූයේ වන්නේ නම්, ශ්‍රොත්‍රරොගයෙන් - ඝ්‍රාණරොගයෙන් - ජිහ්වාරොගයෙන් - කායරොගයෙන් - ශීර්ෂරොගයෙන් - කර්ණරොගයෙන් - මුඛරොගයෙන් - දන්තරොගයෙන් - කාශයෙන් - ශ්වාසයෙන් - පීනසින් - දහයෙන් - ජ්වරයෙන් - කුක්ෂිරොගයෙන් - මූර්ඡාවෙන් - ලොහිතපිත්තයෙන් - ආමශූලයෙන් - මහාවිරෙචනයෙන් - කුෂ්ඨයෙන් - ගණ්ඩයෙන් ශ්වේතකුෂ්ට (කබරරොග) යෙන් - ක්ෂයරොගයෙන් - අපස්මාරයෙන් - දද්දයෙන් කණ්ඩුතියෙන් - මහාකුෂ්ටයෙන් - නියපහරින් වූ රොගයෙන් - අතුල් පතුල් පැලීමෙන් - රක්තපිත්තයෙන් - මධුමෙහයෙන් - අර්ශසින් - පොළයෙන් - භගන්දරයෙන් - පිත්තජ ආබාධයෙන් - ශ්ලෙෂ්මජ ආබාධයෙන් - වාතජ ආබාධයෙන් සාන්නිපාතික ආබාධයෙන් - ඍතුජ ආබාධයෙන් - විෂමපරිහරණයෙන් වූ ආබාධයෙන් - ඖපක්‍රමික ආබාධයෙන් - කර්මවිපාකජ ආබාධයෙන් - ශීතයෙන් උෂ්ණයෙන් - ජිඝච්ඡායෙන් - පිපාසායෙන් - උච්චාරයෙන් ප්‍රස්‍රාවයෙන් - මැසි මදුරු - වා අව් - දීඝ ජාතීන්ගේ පහසින් ස්පර්ශ කරන ලදුයේ මඩනා ලදුයේ සමවහිත වූයේ සමන්විත වූයේ නුයි 'ඵස්සෙන යදා ඵුට්ඨස්ස' යනු වේ.

**පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චීති** – ආදෙවං පරිදෙවං ආදෙවනං පරිදෙවනං ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලපං විප්පලාපං ලාලප්පං ලාලප්පායනං ලාලප්පායිතත්තං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය. කුහිඤ්චීති කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති – පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

**භවඤ්ච නාභිජප්පෙය්‍යාති** – කාමභවං න ජප්පෙය්‍ය, රූපභවං න ජප්පෙය්‍ය, අරූපභවං න ජප්පෙය්‍ය න පජප්පෙය්‍ය නාභිජප්පෙය්‍යාති – භවඤ්ච නාභිජප්පෙය්‍ය.

**භෙරවෙසු ච න සම්පවෙධෙය්‍යාති** – 'භෙරවා'ති එකෙනාකාරෙන භයම්පි භෙරවම්පි තඤ්ඤෙව. වුත්තං හෙතං භගවතා: "එතං නූන තං භයභෙරවං[1] ආගච්ඡතී"ති[a]. බහිද්ධාරම්මණං වුත්තං: සීහා බ්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා[2] අස්සා හත්ථී අහිවිච්ඡිකා සතපදී චොරා වා අස්සු මාණවා කතකම්මා වා අකතකම්මා වා; අථාපරෙන ආකාරෙන භයං වුච්චති අජ්ඣත්තිකං චිත්තසමුට්ඨානං භයං භයානකං[3] ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උබ්බෙගො උත්‍රාසො, ජාතිභයං ජරාභයං ව්‍යාධිභයං මරණභයං රාජභයං චොරභයං අග්ගිභයං උදකභයං අත්තානුවාදභයං පරානුවාදභයං දණ්ඩභයං දුග්ගතිභයං ඌමිභයං කුම්භීලභයං ආවට්ටභයං සුසුකාභයං ආජීවිකභයං[4] අසිලොකභයං පරිසාය සාරජ්ජභයං මදනභයං දුග්ගතිභයං භයානකං[3] ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උබ්බෙගො උත්‍රාසො. **භෙරවෙසු ච න සම්පවෙධෙය්‍යාති** – භෙරවෙ පස්සිත්වා වා සුණිත්වා වා න වෙධෙය්‍ය නප්පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය න තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය; අභීරු අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති – භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය.

තෙනාහ භගවා:

"එතෙසු යදා ඤත්වා[?]

"එසෙන යදා ජුට්ඨස්ස
පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
භවඤ්ච නාභිජප්පෙය්‍ය
භෙරවෙසු ච න සම්පවෙධෙය්‍යා"ති.

1. භයං භෙරවං - සීමු II. මජසං, PTS. 2. මහිංසා - මජසං, ගොමහිසා - PTS.
3. භයානකං - PTS. 4. ආජීවකභයං - සීමු II. PTS.
a. මජ්ඣිමනිකාය - භයභෙරවසුත්ත.

**පරිදේවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි** - තම කියා හැඬීම, ගුණ කියා හැඬීම තම කියා හඬන අයුරු ගුණ කියා හඬන අයුරු තම කියා හඬන බව ගුණ කියා හඬන බව, බස සිස් බස විරූප වූ හිස් බස, පුනපුනා කීම පුනපුනා කියන අයුරු පුනපුනා කියන බව නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නූපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, වෙසෙසින් නො නිපදවන්නේ යි. **කුහිඤ්චි** - කොහි වත් කිසිවෙක්හි කිසි තැනෙක්හි අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ නුයි 'පරිදේවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි' යනු වේ.

**භවඤ්ච නාභිජප්පෙය්‍ය** - කාමභවය නො පතන්නේ යැ, රූපභවය නො පතන්නේ යැ, අරූපභවය නො පතන්නේ යැ, ප්‍රජල්පනය නො කරන්නේ යැ, වෙසසින් ජල්පනය නො කරන්නේ යැ'යි 'භවඤ්ච නාභිජප්පෙය්‍ය' යනු වේ.

**භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය** - 'භෙරව' නම්: එක් අයුරෙකින් භයත් භෛරවයත් හේ (එකෙක්) මැ ය. මේ වදාරන ලද මැ ය. බුදුන් විසින්: "තෙල එකාන්තයෙන් ඒ භයඅරමුණ පැමිණේ" යයි බාහ්‍යාලම්බනය වදාරන ලද්දේය: සිංහයෝ යැ ව්‍යාඝ්‍රයෝ යැ දිවියෝ යැ වලස්සු යැ තරස්සු යැ මිහිවෙරි යැ අස්හු යැ ඇත්හු යැ සර්පයෝ යැ නුහුසු යැ සියපා යැ කළ සොරකම් ඇති හෝ නැති හෝ සොරු හෝ සැහැසියෝ වන්නාහු ය. යළි අන් අයුරෙකින් අධ්‍යාත්මයෙහි වූ සිත්හි උපදනා බිය භයාකාරය තැතිගන්නා බව ලොමුදැහ ගැන්ම චිත්තයාගේ උද්වෙගය උත්‍රාසය 'භය'යි කියනු ලැබෙයි, ජාතිය නිසා උපදනා බිය ජරාභය ව්‍යාධිභය මරණභය රාජභය චෞරභය අග්නිභය උදකභය තමා නුගුණ කීමෙන් උපදනා බිය මෙරමා නුගුණ කීමෙන් උපදනා බිය දඬුවමින් උපදනා බිය දුගතිය නිසා උපදනා බිය මුහුදුරළ නිසා උපදනා බිය මස්කැලන්ගෙන් උපදනා (හෝ කිඹුල්) බිය දියසුළි නිසා උපදනා බිය සැඩමසුන් (සුසුකා) නිසා උපදනා බිය දිවි පැවැතුම් හෙතුවෙන් උපදනා බිය ගර්හාවෙන් උපදනා බිය පිරිස්හි නැති ගැනීමෙන් වන බිය කාමයෙන් වන 'බිය දුගතිබිය (යන) මෙසින් උපදනා බිය, භයාකාරය, තැති ගන්නා බව, ලොමුදැහ ගැන්ම, චිත්තයාගේ උද්වෙගය, උත්‍රාසය යි.

**භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය** - භය අරමුණු දැක හෝ අසා හෝ නො වෙවුලන්නේ යැ වෙසෙසින් නො සැලෙන්නේ යැ පුනපුනා නො සැලෙන්නේ යැ, නො තැවෙන්නේ යැ වෙසෙසින් නො තැවෙන්නේ යැ, පුනපුනා නො තැවෙන්නේ යැ, නො බිය වන්නේ යැ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යැ, බියසුලු නො වන්නේ යැ, නො තැතිගන්නා සුලු- ත්‍රාසනා නො වන සුලු - නො පලායනා සුලු වන්නේ යැ, ප්‍රහීණ වූ භය අරමුණු ඇති වැ පහවූ රෝමෝද්ගම ඇති වැ වාසය කරන්නේ යැයි 'භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඵස්සෙන යදා ඵුට්ඨස්ස -පෙ- භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය"යි.**

**14 - 10**

අන්නානමථො පානානං
ඛාදනීයානමථොපි වත්ථානං,
ලද්ධා න සන්නිධිං කයිරා
න ච පරිත්තසෙ තානි අලභමානො.[1]

**අන්නානමථො පානානං ඛාදනීයානමථොපි වත්ථානන්ති** - 'අන්නාන'න්ති ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං; **පානානන්ති** අට්ඨපානානි: අම්බපානං ජම්බුපානං චොචපානං මොචපානං මධුපානං මුද්දිකාපානං සාලුකපානං ඵාරුසකපානං. අපරානිපි අට්ඨ පානානි: කොසම්බපානං කොලපානං බදරපානං ඝතපානං තෙලපානං පයොපානං යාගුපානං රසපානං; **ඛාදනීයානන්ති** පිට්ඨඛජ්ජකං පූවඛජ්ජකං මූලඛජ්ජකං තචඛජ්ජකං පත්තඛජ්ජකං පුප්ඵඛජ්ජකං ඵලඛජ්ජකං; **වත්ථානන්ති** ඡ චීවරානි: ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගන්ති - අන්නානමථො පානානං ඛාදනීයානමථොපි වත්ථානං.

**ලද්ධා න සන්නිධිං කයිරාති** - 'ලද්ධා'ති ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා න කුහනාය න ලපනාය න නෙමිත්තිකතාය න නිප්පෙසිකතාය න ලාභෙන ලාභං නිජිගීංසනතාය න කට්ඨදානෙන[1] න වෙළුදානෙන න පත්තදානෙන න පුප්ඵදානෙන න ඵලදානෙන න සිනානදානෙන න චුණ්ණදානෙන න මත්තිකාදානෙන න දන්තකට්ඨදානෙන න මුඛොදකදානෙන න චාටුකම්‍යතාය න පාරිභට්ටතාය න පිට්ඨිමංසිකතාය න වත්ථුවිජ්ජාය න තිරච්ඡානවිජ්ජාය න අඞ්ගවිජ්ජාය න නක්ඛත්තවිජ්ජාය න දූතගමනෙන න පහිණගමනෙන න ජඞ්ඝපෙසනියෙන න වෙජ්ජකම්මෙන න නවකම්මෙන න පිණ්ඩපටිපිණ්ඩකෙන න දානානුප්පදානෙන ධම්මෙන සමෙන ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වාති - ලද්ධා; **න සන්නිධිං කයිරාති** අන්නසන්නිධිං පානසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍යාති - ලද්ධා න සන්නිධිං කයිරා.

1. අලබ්භමානො - PTS.

**14 - 10**

නැවත (මගණ තෙම) ආහාර - පානයන් හා ඛාද්‍යයන් සම්බන්ධ වූ ද යළි වස්ත්‍රයන් සම්බන්ධ වූ ද (කිසිවක්) ලැබ සන්නිධිය (රැස් කිරීම) නො කරන්නේ යැ, ඒ ආහාරාදිය නො ලබනුයේ නො ද තැවෙන්නේ යි.

**අන්නානමථො පානානං ඛාදනීයානමථොපි වත්ථානං** -'අන්නානං' යනු: (හැල් ආදී) බත් යැ යවකොමු යැ හත්සුණු යැ මාංශ යැ මසි; **පානානං** යනු අෂ්ට පානයෝ යැ: අඹපැන, දඹපැන, ඇටකෙසෙල්පැන, මස්කෙසෙල්පැන, මීහිපැන, මිදිපැන, හෝලුපැන, බොරළුදම්බුපැන; අන්‍යත් අෂ්ටපානයෙකි: කොසඹපැන, ඩෙබරපැන, මහඩෙබරපැන, සෘතපාන යැ තෛලපාන යැ ක්ෂීරපාන යැ යාගු (කැඳ) පාන යැ (ශාකාදි) රසපාන යි; **ඛාදනීයානං** යනු: (හැල් ආදී) පිටියෙන් කළ ඛාද්‍ය යැ පූවඛාද්‍ය යැ මූලඛාද්‍ය යැ ත්වක්ඛාද්‍ය යැ පත්‍රඛාද්‍ය යැ පුෂ්පඛාද්‍ය යැ ඵලඛාද්‍ය යි; **වත්ථානං** යනු ෂට්චීවර යැ: කොමුපිළී කපුපිළී හිඟිරිපිළී පළස සණවැහැරි මුසුපිළී යැයි 'අන්නානමථො පානානං ඛාදනීයානමථොපි වත්ථානං' යනු වේ.

**ලද්ධා න සන්නිධිං කයිරා** - 'ලද්ධා' යනු: ලැබ ලබාගෙන අධිගමය කොට වින්දනය කොට ප්‍රතිලාභ කොට, විසමය කරවීමෙන් නො වැ, ලපනා යෙන් නො වැ, (කායවාක්) නෛමිත්තිකතායෙන් නො වැ, (මෙරමා ගුණ) පිංසනතායෙන් නො වැ, ලාභයෙන් ලාභ සෙවීමෙන් නො වැ, කාෂ්ඨදානයෙන් වේණුදානයෙන් - පත්‍රදානයෙන් - පුෂ්පදානයෙන් - ඵලදානයෙන් - නහනු දීමෙන් - සුණු - මැටි - දැහැටිදඬු - මුව දෝනා දිය දීමෙන් නො වැ, චාටූකාස් කීමෙන් නො වැ, මුද්ගසූප්‍ය වැනි බොරු මුසු කථායෙන් නො වැ, (දරුවන් නැළැවීමාදි) පාරිභට්ටතායෙන් නො වැ, පිට්ඨිමංසිකතා (-ගෙවලට පිවිස සිඳිනා බැවින්) නො වැ, වාස්තු විද්‍යාවෙන් නො වැ, (අඞ්ගශාස්ත්‍රාදි) තිරශ්චීනවිද්‍යාවෙන් නො වැ, අඞ්ගවිද්‍යාවෙන් - නක්ෂත්‍රවිද්‍යාවෙන් - මෙහෙවර ගමනින් - (ගෙන් ගෙට) හසුන්පත් ගෙන යෑමෙන් - (ගමින් ගමැ) හසුන් පිළිහසුන් ගෙන යෑමෙන් - වෙදකමින් - නවකමින් - පිඬු පෙරළා පිඬු දීමෙන් - දානානුප්‍රදානයෙන් නො වැ, දැහැමෙන් සෙමෙන් ලැබ, ලබා ගෙන අධිගමය කොට වින්දනය කොට ප්‍රතිලාභ කොට තුයි 'ලද්ධා' යනු වේ. **න සන්නිධිං කයිරා** - ආහාරසන්නිධි පානසන්නිධි වස්ත්‍රසන්නිධි යානසන්නිධි ශයනසන්නිධි ගන්ධසන්නිධි ආමිසසන්නිධිය නො කරන්නේ යැ, නො දනවන්නේ යැ නූපදවන්නේ යැ නො නිපදවන්නේ යැ වෙසෙසින් නො නිපදවන්නේ තුයි 'ලද්ධා න සන්නිධිං කයිරා' යනු වේ.

**න ච පරිත්තසෙ තානි අලභමානො**[1]ති – අන්නං වා න ලභාමි, පානං වා න ලභාමි, වත්ථං වා න ලභාමි, කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති න තසෙය්‍ය, න උත්තසෙය්‍ය, න පරිත්තසෙය්‍ය, න භායෙය්‍ය, න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරූ අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති – න ච පරිත්තසෙ තානි අලභමානො.

තෙනාහ භගවා:

“අන්නානමථො පානානං
ඛාදනීයානමථොපි වත්ථානං,
ලද්ධා න සන්නිධිං කයිරා
න ච පරිත්තසෙ තානි අලභමානො”ති.

## 14 – 11

ඣායී න පාදලොලස්ස
විරමෙ කුක්කුච්චං නප්පමජ්ජෙය්‍ය,
අථාසනෙසු සයනෙසු
අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය.

**ඣායී න පාදලොලස්සා**ති – “ඣායී”ති පඨමෙනපි ඣානෙන ඣායී, දුතියෙනපි ඣානෙන ඣායී, තතියෙනපි ඣානෙන ඣායී, චතුත්ථෙනපි ඣානෙන ඣායී, සවිතක්කසවිචාරෙනාපි ඣානෙන ඣායී, අවිතක්කවිචාරමත්තෙනාපි ඣානෙන ඣායී, අවිතක්කඅවිචාරෙනාපි ඣානෙන ඣායී, සප්පීතිකෙනාපි ඣානෙන ඣායී, නිප්පීතිකෙනාපි ඣානෙන ඣායී, පීතිසහගතෙනාපි ඣානෙන ඣායී, සාතසහගතෙනාපි ඣානෙන ඣායී, සුඛසහගතෙනාපි ඣානෙන ඣායී, උපෙක්ඛාසහගතෙනාපි ඣානෙන ඣායී, සුඤ්ඤතෙනාපි ඣානෙන ඣායී, අනිමිත්තෙනාපි ඣානෙන ඣායී, අප්පණිහිතෙනාපි ඣානෙන ඣායී, ලොකියෙනාපි ඣානෙන ඣායී, ලොකුත්තරෙනාපි ඣානෙන ඣායී, ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකොති – ඣායී.

**න පාදලොලස්සා**ති – කථං ‘පාදලොලො’ හොති? ඉධෙකච්චො භික්ඛු පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති:

1. අලබ්භමානො - PTS.

**න ච පරිත්තසෙ තානි අලභමානො** – 'ආහාර හෝ නො ලැබෙමි, පාන හෝ නො ලැබෙමි, වස්ත්‍ර හෝ – කුලය හෝ – ගණයා හෝ–ආවාසය හෝ – ලාභ හෝ – යශස් හෝ – පැසැසුම් හෝ – සුව හෝ –සිවුරු හෝ– පිණ්ඩපාත හෝ – සෙනසුන් හෝ – ගිලන්පස බෙහෙසත් පිරිකර හෝ නො ලැබෙමි, ගලානොපසථායකයකු හෝ නො ලැබෙමි, අප්‍රකටයෙමි වෙමි' නො තැතිගන්නේ යෑ, උත්‍රාසත නෙ වන්නේ යෑ, පරිත්‍රස්ත නො වන්නේ යෑ, නො බිය වන්නේ යෑ, තැයි ගැනුමට නො පැමිණෙන්නේ යෑ, නො බියසුලු නො සැලෙනසුලු නො තැතිගන්නාසුලු නොපලායනසුලු වන්නේ යෑ, පහවූ බිය අරමුණු ඇතියේ පහවගිය ලොමුදහ ඇතිසේ වෙසෙන්නේ නුයි 'න ච පරිත්තසෙ තානි අලභමානො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අන්නානමථො –පෙ– න ච පරිත්තසෙ තානි අලභමානො"**යි.

**14 – 11**

ධ්‍යාන කරනුයේ පාදලෞල්‍යයෙක් නො වන්නේ යෑ, කුකුසින් දුරු වන්නේ යෑ, නො පමා වන්නේ යෑ. යළි මහණ තෙම අල්පශබ්ද වූ අසුන් සෙනසුන්හි වාසය කරන්නේ යි.

**ඣායී න පාදලොලස්ස** – 'ඣායී' යනු: පළමුවන දුහැතිනු දු ධ්‍යාන කරනුයේ, දෙවැනි දුහැතිනු දු – තෙවැනි දුහැතිනු දු – සිවුවැනි දුහැතිනු දු ධ්‍යාන කරනුයේ, සවිතර්කසවිචාරධ්‍යානයෙනු දු ධ්‍යාන කරනුයේ, අවිතර්ක විචාරමාත්‍රධ්‍යානයෙනු දු–අවිතර්ක අවිචාර ධ්‍යානයෙනු දු – සප්‍රීතික ධ්‍යාන–යෙනු දු - නිෂ්ප්‍රීතික ධ්‍යානයෙනු දු – ප්‍රීතිසහගත ධ්‍යානයෙනු දු – සාතසහගත ධ්‍යානයෙනු දු – සුඛසහගත ධ්‍යානයෙනු දු – උපෙක්ෂාසහගත ධ්‍යානයෙනු දු – ශූන්‍යතධ්‍යානයෙනු දු – අනිමිත්තධ්‍යානයෙනු දු – අප්‍රණිහිත ධ්‍යානයෙනු දු – ලෞකිකධ්‍යානයෙනු දු – ලොකොත්තර ධ්‍යානයෙනු දු ධ්‍යාන කරනුයේ, ධ්‍යානයෙහි ඇලුණේ එකග බවෙහි යෙදුණේ සවාර්ථගරුක වූයේ නුයි 'ඣායී' යනු වේ.

**න පාදලොලස්ස** – කිසෙයින් 'පාදලොල' වෙයි යත්: මෙහි කිසි මහණෙක් පාදලොල වූයේ පාදලෞල්‍යයෙන් යුක්ත වූයේ වෙයි:

ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං ගාමෙන ගාමං නිගමෙන නිගමං නගරෙන[1] නගරං රට්ඨෙන රට්ඨං ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවට්ඨිතචාරිකං අනුයුත්තො විහරති, එවම්පි පාදලොලො හොති. අථවා භික්ඛු අන්තොපි සඞ්ඝාරාමෙ පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති, න අත්ථහෙතු න කාරණහෙතු උද්ධතො අවූපසන්තචිත්තො පරිවෙණතො පරිවෙණං ගච්ඡති, විහාරතො විහාරං ගච්ඡති, අඩ්ඪයොගතො අඩ්ඪයොගං ගච්ඡති, පාසාදතො පාසාදං ගච්ඡති, හම්මියතො හම්මියං ගච්ඡති, ගුහාය ගුහං ගච්ඡති, ලෙනතො ලෙනං ගච්ඡති, කුටිතො කුටිං ගච්ඡති, කූටාගාරතො කූටාගාරං ගච්ඡති, අට්ටතො අට්ටං ගච්ඡති, මාලතො මාලං ගච්ඡති, උද්දණ්ඩතො උද්දණ්ඩං ගච්ඡති, උද්දොසිතතො උද්දොසිතං ගච්ඡති, උපට්ඨානසාලතො උපට්ඨානසාලං ගච්ඡති, මණ්ඩලමාලතො මණ්ඩලමාලං ගච්ඡති, රුක්ඛමූලතො රුක්ඛමූලං ගච්ඡති. යත්ථ වා පන භික්ඛූ නිසීදන්ති තහිං ගච්ඡති, තත්ථ එකස්ස වා දුතියො හොති, ද්වින්නං වා තතියො හොති, තිණ්ණං වා චතුත්ථො හොති. තත්ථ බහුං සම්ඵප්පලාපං පලපති. සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං යානකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථි-කථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉතිවා– එවම්පි පාදලොලො හොති.

**න පාදලොලස්සාති** පාදලොලියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, පාදලොලියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍ය චරෙය්‍ය විචරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය, පටිසල්ලානාරාමො අස්ස පටිසල්ලානරතො අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං ඣායී ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථ[2]– ගරුකොති – ඣායී න පාදලොලස්ස.

**විරමෙ කුක්කුච්චං නප්පමජ්ජෙය්‍යාති** – 'කුක්කුච්ච'න්ති හත්ථකුක්කුච්චම්පි කුක්කුච්චං, පාදකුක්කුච්චම්පි කුක්කුච්චං; හත්ථපාදකුක්කුච්චම්පි කුක්කුච්චං; අකප්පියෙ කප්පියසඤ්ඤිතා කප්පියෙ අකප්පියසඤ්ඤිතා අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා, යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං. අපි ච ද්වීහි කාරණෙහි උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො:

1. අනවට්ඨිත - මජසං. 2. පරමත්ථ - මජසං.

අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමින් නිගමට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දීඝචාරිකාවෙහි නො නවත්නා චාරිකාවෙහි යෙදුණේ වෙසෙසි. මෙසේත් පාදලොල වෙයි. නොහොත් මහණ ඇතුළු සඟරුවෙහි ද පාදලොල්ල වූයේ පාදලෝල්‍යයෙන් යුක්ත වූයේ වෙයි. ප්‍රයොජන නැති වැ කාරණ නැති වැ උඩඟු වූයේ නො සන්හුන් සිත් ඇතියේ පිරිවෙනින් පිරිවෙනට වෙහෙරින් වෙහෙරට යෙයි, අඩීයොගයෙන් අඩීයොගයට යෙයි, ප්‍රාසාදයෙන් ප්‍රාසාදයට යෙයි, සඳලුහෙයින් සඳලුගෙට යෙයි, ගුහාවෙන් ගුහාවට යෙයි, ලෙනින් ලෙනට - කිළියෙන් කිළියට - කුළුගෙන් කුළුගෙට - අටල්ලෙන් අටල්ලට - මහලින් මහලට - උද්දණ්ඩ (එක් වහලින් යුත් ගෙය) යෙන් උද්දණ්ඩයට - බඹුහලින් බඹුහලට - උවටැන්හලින් උවටැන්හලට - මණ්ඩලයෙන් මණ්ඩලයට - රුක්මුලින් රුක්මුලට යෙයි. තවද යම් තැනෙක භික්ෂූහු හිඳිත් නම්, එහි යෙයි; එහි එකක් හට හෝ දෙවැන්නා වෙයි, දෙදෙනකුන්ට හෝ තෙවැන්නා වෙයි, තිදෙනකුන්ට හෝ සිවුවැන්නා වෙයි. එහි දී බොහෝ නිරර්ථක කථා පවසයි. ඒ මෙසේ යැ: රජකථා යැ චොරකථා යැ මහාමාත්‍ය-කථා යැ සෙනාකථා යැ භයකථා යැ යුද්ධකථා යැ ආහාරකථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ යානකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥාතිකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගරකථා යැ ජනපදකථා යැ ස්ත්‍රීකථා යැ පුරුෂකථා යැ සූරකථා යැ වීථිකථා යැ කුම්භස්ථාන (=පැන් තොට පිළිබැඳි) කථා යැ අතීත ඥාතීන් පිළිබැඳි කථා යැ නානත්වැදෑරුම් නිරර්ථකකථා යැ ලෝකායතකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ - වෘද්ධි - හානි පිළිබැඳි කථා යැ යනාදිය යි. මෙසේ ත් පාදලොල වේ.

**න පාදලොලස්ස** - පාදලෝල්‍යය දුරු කරන්නේ යැ, සන්හිඳුවන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනුත්පාවයට පමුණුවන්නේ යැ, පාදලෝල්‍ය-යෙන් දුරු වූයේ වන්නේ යැ, නො ඇලුණේ වෙසෙසින් වෙන්වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ යැ හැසිරෙන්නේ යැ වෙසෙසින් හැසිරෙන්නේ යැ ඉරියවු පවත්වන්නේ යැ වැටෙන්නේ යැ රැකෙන්නේ යැ යැපෙන්නේ ය යාපනය වන්නේ යැ, විවේකය සතුටු වූයේ විවේකයෙහි ඇලුණේ අධ්‍යාත්මයෙහි වූ චිත්තසමාධියෙහි යෙදුණේ වන්නේ ය, බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් සමන්විත වූයේ ශූන්‍යාගාරයෙහි කරන ශමථවිදර්ශනා භාවනාව වඩන්නේ යැ ධ්‍යාන කරනුයේ ධ්‍යානයෙහි ඇලුණේ එකාග්‍රතාවෙහි යෙදුණේ ස්වාර්ථය ගරු කරන්නේ නුයි 'ඣායී න පාදලොලස්ස' යනු වේ.

**විරමෙ කුක්කුච්චං නප්පමජ්ජෙය්‍ය** - 'කුක්කුච්ච' නම්: අත්කුකුස ද කුකුස් යැ, පාකුකුස ද කුකුස් යැ, අත්පාකුකුස ද කුකුස් යැ, අකැපයෙහි කැපසංඥා ඇතිබව යැ, කැපයෙහි අකැප සංඥා ඇතිබව යැ, නිවරදෙහි වද්‍යසංඥා ඇතිබව යැ, වරදෙහි අවද්‍යසංඥා ඇතිබව යැ, මෙබඳු වූ යම් කුකුසක් කුකුස් අයුරක් කුකුසට පැමිණි බවක් චිත්තයාගේ විපිළිසර යෙක් මනොවිලෙඛයෙක් වේ නම්, මේ කුකුසැයි කියනු ලැබෙයි. තවද දෙකරුණෙකින් කුකුස සිතැ විපිළිසර මනොවිලෙඛය උපදී:

කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො? ‘කතං මෙ කායදුච්චරිතං අකතං මෙ කායසුචරිත’න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ‘කතං මෙ වචීදුච්චරිතං අකතං මෙ වචීසුචරිත’න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ‘කතං මෙ මනො-දුච්චරිතං අකතං මෙ මනොසුචරිතං -පෙ- කතො මෙ පාණාතිපාතො අකතා මෙ පාණාතිපාතා වෙරමණී’ති උප්පජ්ජති කුක්කුච්චං -පෙ- මනොවිලෙඛො. ‘කතං මෙ අදින්නාදානං – කතො මෙ කාමෙසු මිච්ඡාචාරො – කතො මෙ මුසාවාදො – කතා මෙ පිසුණා වාචා – කතා මෙ ඵරුසා වාචා කතො මෙ සම්ඵප්පලාපො – කතා මෙ අභිජ්ඣා – කතො මෙ බ්‍යාපාදො– කතා මෙ මිච්ඡාදිට්ඨි අකතා මෙ සම්මාදිට්ඨී’ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. එවං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො.

අථවා, සීලෙසුම්හි න පරිපූරකාරීති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති – භොජනෙ අමත්තඤ්ඤුම්හීති – ජාගරියං අනනුයුත්තොම්හීති – න සතිසම්පජඤ්ඤෙන සමන්නාගතොම්හීති – අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති – අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති – අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති– අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති – අභාවිතානි මෙ පඤ්චබලානීති – අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති – අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති සමුදයො මෙ අප්පහීනොති මග්ගො මෙ අභාවිතොති නිරොධො මෙ අසච්ඡිකතො’ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො.

**විරමෙ කුක්කුච්චන්ති** –කුක්කුච්චා ආරමෙය්‍ය විරමෙය්‍ය පටිවිරමෙය්‍ය, කුක්කුච්චං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, කුක්කුච්චා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – විරමෙ කුක්කුච්චං.

කල බැවින් ද නො කල බැවින් දූසි. කිසෙයින් (අකුශලය) කල බැවින් හා (කුශලය) නො කල බැවින් කුකුස සිත්හි විපිළිසර චිත්තවිලෙඛය උපදී ද යත්: 'මා විසින් කායදුශ්චරිතය කරන ලද, මා විසින් කායසුචරිතය නොකරන ලද'යි කුකුස සිතේ විපිළිසර මනෝවිලෙඛය උපදී; 'මා විසින් වාග්දුශ්චරිතය කරන ලද, මා විසින් වාක්සුචරිතය නො කරන ලද'යි කුකුස සිතේ විපිළිසර මනොවිලෙඛය උපදී; 'මා විසින් මනොදුශ්චරිතය කරන ලද, 'මා විසින් මනඃසුචරිතය නො කරන ලද'යි...'මා විසින් ප්‍රාණවධ කරන ලද, 'මා විසින් ප්‍රාණඝාත විරමණය නො කරන ලද'යි කුකුස්...උපදී; 'මා විසින් අදත්තාදාන කරන ලද...මා විසින් කාමමිථ්‍යාචාර කරන ලද...මා විසින් මෘෂාවාද කියන ලද...මා විසින් පෛශුන්‍යවාක් කියන ලද...මා විසින් පරුෂවචන කියන ලද...මා විසින් සම්ඵප්‍රලාප කියන ලද...මා විසින් අභිධ්‍යා කරන ලද...මා විසින් ව්‍යාපාද කරන ලද...මා විසින් මිථ්‍යාදෘෂ්ටි ගත්තා ලද, මා විසින් සම්‍යග්දෘෂ්ටි නො ගත්තා ලද'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. මෙසෙයින් කෘත හෙයින් ද අකෘත හෙයින් ද කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී.

නොහොත් 'ප්‍රාතිමොක්ෂශීලයෙහි පරිපූරකාරී නො වූයෙමි' කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී; ඉන්ද්‍රියයන්හි අගොපිතද්වාර ඇත්තෙම් වූයෙමි...භොජනයෙහි අමාත්‍රඥයෙම් වීමි...නිදි දුරුකිරීමෙහි නො යෙදුණෙම් වීමි...සමෘතිසම්ප්‍රජන්‍යයෙන් යුක්තයෙම් නො වූයෙමි...මා විසින් සතර සතිපට්ඨානයෝ නො වඩන ලදහයි...මා විසින් සතර සම්‍යක්ප්‍රධානයෝ නො වඩන ලදහයි...මා විසින් සතර ඍද්ධිපාදයෝ නො වඩන ලදහයි...මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ නො වඩන ලදහයි...මා විසින් පඤ්චබලයෝ නො වඩන ලදහයි...මා විසින් සප්තබොධ්‍යඞ්ගයෝ නො වඩන ලදහයි...මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නො වඩන ලදැයි මා විසින් දුඃඛසත්‍යය අපරිඥාත යැයි...මා විසින් සමුදය අප්‍රහීණ යැයි...මා විසින් මාර්ගය නො වඩන ලදැයි...මා විසින් නිරොධය ප්‍රත්‍යක්ෂ නො කරන ලදැයි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී.

විරමෙ කුක්කුච්චා – කෞකෘත්‍යයෙන් හාත්පසින් වෙන් වන්නේ යෑ, වෙසෙසින් වෙන් වන්නේ යෑ, සර්වප්‍රකාරයෙන් වෙන් වන්නේ යෑ, කුකුස දුරු කරන්නේ යෑ බැහැර කරන්නේ යෑ විගතාන්ත කරන්නේ යෑ අනභාවයට පමුණුවන්නේ යෑ; කුකුසින් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් දුරු වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍ය්‍යාද කල සිතින් යුක්ත ව වාසය කරන්නේනුයි 'විරමෙ කුක්කුච්චා' යනු වේ.

**නප්පමජ්ජෙය්‍යාති** සක්කච්චකාරී අස්ස සාතච්චකාරී අට්ඨිතකාරී අනොලීනවුත්තිකො අනික්ඛිත්තඡන්දො අනික්ඛිත්තධුරො අප්පමත්තො කුසලෙසු ධම්මෙසු; ‘කදාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා සීලක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය’න්ති; යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච ථාමො ච අප්පටිවාණී ච සති ච සම්පජඤ්ඤඤ්ච, ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසු; ‘කදාහං අපරිපූරං වා සමාධික්ඛන්ධං පඤ්ඤාක්ඛන්ධං විමුත්තික්ඛන්ධං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං, කදාහං අපරිඤ්ඤාතං වා දුක්ඛං පරිජානෙය්‍යං, අප්පහීනෙ වා කිලෙසෙ පජහෙය්‍යං, අභාවිතං වා මග්ගං භාවෙය්‍යං, අසච්ඡිකතං නිරොධං සච්ඡිකරෙය්‍ය’න්ති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච ථාමො ච අප්පටිවාණී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසූති – විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය.

**අථාසනෙසු සයනෙසු අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍යාති** – ‘අථා’ති පදසන්ධි -පෙ- ආසනං වුච්චති යත්ථ නිසීදති මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාලසන්ථාරො; සයනං වුච්චති සෙනාසනං විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහාති– අථාසනෙසු සයනෙසු.

**අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍යාති** අප්පසද්දෙසු අප්පනිග්ඝොසෙසු විජනවාතෙසු මනුස්සරාහසෙය්‍යකෙසු පටිසල්ලානසාරුප්පෙසු සෙනාසනෙසු චරෙය්‍ය විචරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති - අථාසනෙසු සයනෙසු අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය.

තෙනාහ භගවා:

“ඣානී න පාදලොලස්ස
විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය,
අථාසනෙසු සයනෙසු
අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍යා”ති.

**14 – 12**

නිද්දං න බහුලීකරෙය්‍ය
ජාගරියං භජෙය්‍ය ආතාපී,
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං
මෙථුනං විප්පජහෙ සවිභූසං.

**නිද්දං න බහුලීකරෙය්‍යාති** රත්තින්දිවං ඡ කොට්ඨාසෙ කරිත්වා පඤ්ච කොට්ඨාසෙ පටිජග්ගෙය්‍ය[1] එකං කොට්ඨාසං නිපජ්ජෙය්‍යාති – නිද්දං න බහුලීකරෙය්‍ය.

1. ජග්ගෙය්‍ය - ස.

**නප්පමජ්ජෙය්‍ය** - සත්කාර කොට කරන සුලු වන්නේ යැ, සතත භාවයෙන් කරන සුලු වන්නේ යැ, නො නැවැත කරන සුලු වන්නේ යැ, නො හැකුළුණු පැවැතුම් ඇතියේ නො තැබූ වීර්‍ය්‍යච්ඡන්දය ඇතියේ නො තැබූ වීර්‍ය්‍යධුර ඇතියේ කුශලධර්‍මයන්හි නො පමා වූයේ වන්නේ යැ; කවර දවසෙක මම් අපරිපූර්‍ණ වූ ශීලස්කන්ධය හෝ පුරන්නෙම් ද, පරිපූර්‍ණ වූ ශීලස්කන්ධය හෝ ඒ ඒ තැන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහණය කරන්නෙම් ද'යි, එහි යම් ඡන්දයෙක් ව්‍යායාමෙක් උත්සාහයෙක් අධික උත්සාහයෙක් ස්ථිර බවෙක් නො නැවැත්මෙක් සමෘතියක් හා සම්ප්‍රජන්‍යයකුත් වේ ද, (එබඳු වූ) කෙලෙස් තවන වීර්‍ය්‍ය උත්තම වීර්‍ය්‍ය අධිෂ්ඨානය නැවත නැවත යෙදීම කුශලධර්‍මයන්හි අප්‍රමාදය වන්නේ යැ; කවර දවසෙක මම් අපරිපූර්‍ණ වූ සමාධිස්කන්ධය - ප්‍රඥාස්කන්ධය - විමුක්තිස්කන්ධය - විමුක්තිඥානදර්‍ශනස්කන්ධය - 'කවර දවසෙක මම් අපරිඥාත වූ දුක හෝ අශේෂයෙන් දැන ගන්නෙම් ද, අප්‍රහීණ වූ කෙලශයන් හෝ ප්‍රහීණ කරන්නෙම් ද, අභාවිත වූ මාර්‍ගය හෝ වඩන්නෙම් ද, ප්‍රත්‍යක්ෂ නො කළ නිරොධය ප්‍රත්‍යක්ෂ කරන්නෙම් ද'යි එහි යම් ඡන්දයෙක් ව්‍යායාමෙක් උත්සාහයෙක් අධික උත්සාහයෙක් ස්ථිර බවෙක් නො නවත්නා බවෙක් සමෘතියක් හා සම්ප්‍රජන්‍යයකුත් වේ ද, (එබඳු වූ) කෙලෙස් තවන වීර්‍ය්‍ය උත්තම වීර්‍ය්‍ය අධිෂ්ඨානය අනුයොගය කුශලධර්‍මයන්හි අප්‍රමාදය වන්නේ නුයි 'විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය' යනු වේ.

**අථාසනේසු සයනේසු අප්පසද්දේසු භික්ඛු විහරෙය්‍ය** - 'අථ' යනු පදසන්ධි යැ...ඇඳ පුටුව බිස්ස තට්ටිකාව සම්කඩ තණඇතිරිය පත් ඇතිරිය පිදුරුඇතිරිය (යන) යම් තැනෙක හිඳී නම් (එය) 'ආසන' යයි කියනු ලැබෙයි; විහාරය අඩ්ඩයොගය ප්‍රාසාදය සඳලුතෙය ගුහාව (යන මේ) සෙනසුන 'සයන' යයි කියනු ලැබේ නුයි 'අථාසනේසු සයනේසු' යනු වේ.

**අප්පසද්දේසු භික්ඛු විහරෙය්‍ය** - අල්පශබ්ද වූ අල්පනිර්‍ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍යකාරණයට යොග්‍ය වූ විවේකයට සුදුසු වූ සෙනසුන්හි හැසිරෙන්නේ යැ වෙසෙන්නේ යැ වාසය කරන්නේ යැ ඉරියව් පවත්වන්නේ යැ වැටෙන්නේ යැ රැකෙන්නේ යැ යපන යාපනය වන්නේ නුයි 'අථාසනේසු සයනේසු අප්පසද්දේසු භික්ඛු විහරෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඣායී න පාදලොලස්ස** -පෙ- **අප්පසද්දේසු භික්ඛු විහරෙය්‍ය"**යි.

## 14 - 12

කෙලෙස් තවන වෙර ඇතියේ නිදි බහුල නො කරන්නේ යැ, නිදි වැරීම සෙවුනේ යැ, තන්ද්‍රා (අලස බව) ද මායාව ද හාස්‍යය ද ක්‍රීඩාව ද විභූෂණ සහිත වූ මෛථුන්දම් ද වෙසෙසින් දුරු කරන්නේ යි.

**නිද්දං න බහුලීකරෙය්‍ය** - රෑදවල ස කොටසක් කොට පස් කොටසක් නිදි වරන්නේ යැ, එක් කොටසක් නිදන්නේ නුයි 'නිද්දං න බහුලීකරෙය්‍ය' යනු වේ.

**ජාගරියං භජෙය්‍ය ආතාපීති** - ඉධ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙය්‍ය, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙය්‍ය, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙය්‍ය පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා; රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙය්‍ය. **ජාගරියං භජෙය්‍යාති** ජාගරියං භජෙය්‍ය සම්භජෙය්‍ය සෙවෙය්‍ය නිසෙවෙය්‍ය සංසෙවෙය්‍ය පටිසෙවෙය්‍යාති 'ජාගරියං භජෙය්‍ය. **ආතාපීති** ආතප්පං වුච්චති වීරියං, යො චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො.a ඉමිනා ආතාපෙන උපෙතො සමුපෙතො උපගතො[1] සමුපගතො උපපන්නො[2] සම්පන්නො[3] සමන්නාගතො සො වුච්චති ආතාපීති - ජාගරියං භජෙය්‍ය ආතාපී.

**තන්දිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසනන්ති** - 'තන්දී'ති 'යා තන්දී තන්දියනා තන්දිමනකතා[4] ආලස්‍යං ආලස්‍යායනා ආලස්‍යායිතත්තං, අයං වුච්චති තන්දී. **මායාති** මායා වුච්චති වඤ්චනිකා චරියා. 'ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය - මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති, මා මං ජඤ්ඤූති ඉච්ඡති, මා මං ජඤ්ඤූති සඞ්කප්පෙති, මා මං ජඤ්ඤූති වාචං භාසති, මා මං ජඤ්ඤූති කායෙන පරක්කමති, යා එවරූපා මායා මායාවිතා අච්චාසරා වඤ්චනා නිකති විකිරණා ගූහනා පරිගූහනා ඡාදනා පටිච්ඡාදනා අනුත්තානීකම්මං අනාවිකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා.b **'හස්සන්ති** ඉධෙකච්චො අතිවෙලං දන්තවිදංසකං හසති. වුත්තං හෙතං භගවතා: "කොමාරකමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං අතිවෙලං දන්තවිදංසකං හසිත"න්ති.c **ඛිඩ්ඩාති** ද්වෙ ඛිඩ්ඩා කායිකා ච ඛිඩ්ඩා වාචසිකා ච ඛිඩ්ඩා. කතමා කායිකා ඛිඩ්ඩා? හත්ථීහිපි කීළන්ති, අස්සෙහිපි කීළන්ති, රථෙහිපි කීළන්ති, ධනූහිපි කීළන්ති, අට්ඨපදෙපි[5] කීළන්ති, දසපදෙපි[5] කීළන්ති, ආකාසෙපි[6] කීළන්ති, පරිහාරපථෙපි කීළන්ති, සන්තිකායපි[7] කීළන්ති, ඛලිකායපි කීළන්ති, ඝටිකායපි කීළන්ති,

---

1. උපාගතො - සු. 2. උපපන්නො - ස.
3. සමුපපන්නො - ස. 4. තන්දිසිතත්තං මනත්තං - සීමු. II.
5. පදෙහි - සීමු II. PTS. 6. අකාසෙහිපි - සීමු. II. PTS.
7. සන්තිකායපි - ස.

a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ. b. ඛුද්දකවත්ථුවිභඞ්ග.
c. තිකඞ්ගුත්තර - සම්බොධිවග්ග.

**ජාගරියං භජෙය්‍ය ආතාපී** – මේ සස්නෙහි මහණ දහවල සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් (හෝ සියලු අකුශලයන්ගෙන්) සිත පිරිසුදු කරන්නේ යැ, රෑ පෙරයම චඞ්ක්‍රමණයෙන් හා නිෂද්‍යාවෙන් ආවරණීය ධර්මයන්ගෙන් සිත විශුද්ධ කරන්නේ යැ, රෑ මැදියම දකුණු පයෙහි වම්පය මදක් ඇද ගෙන සමෘතිසම්ප්‍රජන්‍යයෙන් යුක්ත වූයේ උත්ථාන සංඥාව මෙනෙහි කොට දකුණැලයෙන් සිංහශය්‍යාව කරන්නේ යැ, රෑ අලුයම නැඟීසිට චඞ්ක්‍රමණයෙන් නිෂද්‍යාවෙන් ආවරණීය ධර්මයන්ගෙන් සිත පරිශුද්ධ කරන්නේ යි. **ජාගරියං භජෙය්‍ය** නිදිවැරීම බජනේ යැ මැනවින් බජනේ යැ, සෙවුනේ යැ නිරතුරු සෙවුනේ යැ වෙසෙසින් සෙවුනේ යැ පිළිසෙවුනේ නුසි 'ජාගරියං භජෙය්‍ය' යනු වේ. **ආතාපී** 'ආතප්ප'යි වීර්‍ය්‍ය කියනු ලැබෙයි. යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් කුසීතභාවයෙන් නික්මැයැමෙක් පරාක්‍රමයෙක් උද්‍යොගයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් ස්ථිර බවෙක් කුශලසන්තානය බැරීමෙක් නො ලිහිල් වූ පරාක්‍රම ඇති බවෙක් නො නැඹු වීර්‍ය්‍යච්ඡන්දය ඇති බවෙක් නො නැඹු වීර්‍ය්‍යධුර ඇතිබවෙක් ධුරය දැඩි කොට ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද මේ 'කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් උපෙත වූ සමුපෙත වූ යුක්ත වූ සංයුක්ත වූ නො වෙන් වූ සම්පූර්ණ වූ සමන්විත වූ හෙතෙම 'ආතාපී' යයි කියනු ලැබේ නුසි 'ජාගරියං භජෙය්‍ය ආතාපී' යනු වේ.

**තන්ද්‍රිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසං** – 'තන්ද්‍රිං' යනු: යම් මැලිබවෙක් මැලි අයුරෙක් මැලියෙන් මඩනා ලද බවෙක් මැලියෙන් මැඩුණු සිත් ඇති බවෙක් අලසබවෙක් අලස අයුරෙක් ආලස්‍යයෙන් මඩනා ලද බවෙක් වේ ද, මෝ 'තන්ද්‍රි'යි කියනු ලබයි; **මායා නම්:** වඤ්චනික ක්‍රියාව යැ, මෙහි කිසිවෙක් කයින් දුශ්චරිත යෙහි හැසිර, බසින්...සිතින් දුශ්චරිතයෙහි හැසිර 'එය ප්‍රතිච්ඡාදන හෙතුයෙන් ලාමක වූ ඉච්ඡාව පිහිටුවයි, 'නහමක් මා දනිව'යි කැමැති වෙයි, 'නහමක් මා දනිව'යි සලකයි, 'නහමක් මා දනිව'යි වචන බෙණෙයි, 'නහමක් මා දනිව'යි කයින් උත්සාහ කෙරෙයි; යම් මෙබඳු වූ මායාවක් මායා ඇතිබවෙක් ඉක්මවා යැමෙක් වඤ්චනාවක් රැවැටීමෙක් පාපයන් යටපත් කිරීමෙක් බැහැර කිරීමෙක් සැඟවීමෙක් හාත්පසින් සැඟවීමෙක් වැසීමෙක් හාත්පසින් වැසීමෙක් ප්‍රකට නො කිරීමෙක් ප්‍රකාශ නො කිරීමෙක් මොනවට වැසීමෙක් පාපක්‍රියාවක් වේ ද, මේ 'මායා'යි කියනු ලබයි; **හස්සං** යනු: මෙහි කිසිවෙක් පමණ ඉක්මවා දත් විවෘත කොට සිනාසෙයි; මේ වදාරන ලද මැයැ, භාග්‍යවතුන් විසින්: "මහණෙනි, පමණ ඉක්මවා දත් විදහා යම් සිනාසීමෙක් වේ ද, මෙය ආර්‍ය්‍යවිනයෙහි කුමරුන් කළයුතු දැය'යි. **ඛිඩ්ඩා නම්:** කායික ක්‍රීඩා ද වාචසික ක්‍රීඩා දැ'යි ක්‍රීඩා දෙකෙකි: කායික ක්‍රීඩා කවර යත්: ඇතුන් සමග ද කෙළිති, අසුන් සමග ද කෙළිති, රිය සමග ද කෙළිති, දුනුවලින් ද කෙළිති, අටපදයෙහි ද කෙළිති, දසපදයෙහි ද කෙළිති, අහස්හි ද කෙළිති, පරිහාරපථයෙහි ද කෙළිති, සන්තිකා කෙළි ද කෙළිති, පසැවිනු ද කෙළිති, ඝටිකායෙන් (–කල්ලි) ද කෙළිති,

සලාකහත්ථෙනපි කීළන්ති, අක්ඛෙනපි කීළන්ති, පඞ්ගචීරෙනපි[1] කීළන්ති, වඞ්කකෙනපි කීළන්ති, මොක්ඛචිකායපි කීළන්ති, චිඞ්ගුලකෙනපි කීළන්ති, පත්තාළ්හකෙනපි කීළන්ති, රථකෙනපි කීළන්ති, ධනුකෙනපි කීළන්ති, අක්ඛරිකායපි කීළන්ති, මනෙසිකායපි කීළන්ති, යථාවජ්ජෙනපි කීළන්ති. අයං කායිකඛිඩ්ඩා. කතමා වාචසිකා ඛිඩ්ඩා? මුඛභෙරිකං මුඛාලම්බරං මුඛදෙණ්ඩිමකං මුඛවලිමකං මුඛභෙරුළකං[2] මුඛදද්දරිකං නාටකං ලාසං ගීතං දවකම්මං. අයං වාචසිකා ඛිඩ්ඩා.

මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො දුට්ඨුල්ලො ඔදකන්තිකො රහස්සො ද්වයංද්වයසමාපත්ති. කිං කාරණා වුච්චති මෙථුනධම්මො? උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති තං කාරණා වුච්චති මෙථුනධම්මො; යථා උභො කලහකාරකා මෙථුනකාති වුච්චන්ති, උභො භණ්ඩනකාරකා - උභො භස්සකාරකා - උභො අධිකරණකාරකා - උභො විවාදකාරකා - උභො වාදිනො - උභො සල්ලාපකා මෙථුනකාති වුච්චන්ති, එවමෙවං උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති තං කාරණා වුච්චති මෙථුනධම්මං.

විභූසාති ද්වෙ විභූසා: අත්ථි අගාරියස්ස විභූසා; අත්ථි පබ්බජිතස්ස විභූසා. කතමා අගාරියස්ස විභූසා? කෙසා ච මස්සු ච මාලා ච ගන්ධා ච විලෙපනා ච ආභරණා ච පිළන්ධනා ච වත්ථඤ්ච සාරසාටනඤ්ච[3] වෙඨනඤ්ච උච්ඡාදනං පරිමද්දනං න්හාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා-විලෙපනං මුඛචුණ්ණකං මුඛලෙපං හත්ථබන්ධනං සිඛාබන්ධනං දණ්ඩං නාලිකං ඛග්ගං ඡත්තං චිත්‍රා උපාහනා උණ්හීසං මණිං වාළබීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි ඉති වා, අයං අගාරියස්ස විභූසා. කතමා පබ්බජිතස්ස විභූසා? චීවරමණ්ඩනා පත්තමණ්ඩනා සෙනාසනමණ්ඩනා ඉමස්ස වා පූතිකායස්ස බාහිරානං වා පරික්ඛාරානං මණ්ඩනා විභූසනා කෙළනා පරිකෙළනා ගෙධිතතා[4] ගෙධිතත්තං චපලතා චාපල්‍යං, අයං පබ්බජිතස්ස විභූසා.

තන්දිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසන්ති - තන්දිං ච මායං ච හස්සං ච ඛිඩ්ඩා ච මෙථුනධම්මං ච සවිභූසං සපරිවාරං සපරිභණ්ඩං සපරික්ඛාරං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති - තන්දිං -පෙ- සවිභූසං.

තෙනාහ භගවා:

"නිද්දං න බහුලීකරෙය්‍ය
ජාගරියං භජෙය්‍ය ආතාපී,
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං
මෙථුනං විප්පජහෙ සවිභූස"න්ති.

---

1. පඞ්ගචීරෙනපි - සිමු. II. PTS. 2. මුඛභෙරිලං - සභා. ස.
3. පසාදනඤ්ච - PTS. සයනාසනඤ්ච - සිමු. II. මජසං. හරපනඤ්ච - මිනුප. රසනඤ්ච - පු. 4. ගධිතතා - ස.

ලාවටිනු දු කෙළියි, ගුළ (-පන්දු)යෙනු දු කෙළිති, පත්නාලයෙනු දු කෙළිති, කුඩා නඟුලිනු දු කෙළිති, පරිවර්තන කෙළි දු කෙළියි, පත්-බමරිනු දු කෙළිති, පත්නැළියෙනු දු කෙළිති, කුඩා රියෙනු දු කෙළිති, කුඩා දුන්නෙනු දු කෙළිති, අකුරුකෙළි දු කෙළිති, සිතැඟිකෙළියෙනු දු කෙළිති, යථාවද්‍යයෙනුදු කෙළිත්. මෝ කායික ක්‍රීඩා යැ. වාචසික ක්‍රීඩා කවර යත්: මුවබෙරය මුවපණාවරය මුවපටහය මුඛවාලිකය (-සීරුසන්) මුවඩමරුය නාටකය ඔල්වරහඬය ගායනය සිනාකෙළිය යනු මේ වාචසික ක්‍රීඩා යි.

මෛථුනධම්ම නාම: යම් ඒ අසද්ධර්මයෙක් ග්‍රාමධර්මයෙක් වසලධර්මයෙක් දුළුල් දහමෙක් ඕදකාන්තිකධර්මයෙක් රහස්‍යධර්මයෙක් ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද එයයි. කවර කරුණෙකින් 'මෛථුනධම්ම'යි කියනු ලැබෙයි යත්: රාගයෙන් රත් වූ වෙසෙසින් රත් වූ කෙලෙසින් තෙත් වූ කුසල් සිත මැඩගෙන සිටියා වූ කුසල්සිත ගෙවාගෙන සිටියා වූ (ස්ත්‍රී-පුරුෂ) දෙදෙනාගේ කෙලෙසුන්ගෙන් සම වූ දෙදෙනාගේ සවභාවය නුයි-එකරුණෙන් 'මෛථුනධම්ම'යි කියනු ලැබෙයි. යම් සේ කලහකරුවෝ දෙදෙන මෛථුනකයෝ (-සදෘශයෝ) යයි කියනු ලැබෙත් ද, ඩබරකරුවෝ දෙදෙන - බසින් සැලහ කරනුවෝ දෙදෙන - අධිකරණකාරකයෝ (-නඩු කියනුවෝ) දෙදෙනා - විවාදකරුවෝ දෙදෙනා - වාදීහු දෙදෙන - කථා කරනුවෝ දෙදෙනා සමානයෝ යැයි කියනු ලැබෙත් ද, එසෙයින් ම රත් වූ වෙසෙසින් රත් වූ කෙලෙශයෙන් තෙත් වූ කුසල් සිත යටපත් වූ කුසල් සිත ගෙවාගෙන සිටි දෙදෙනාගේ සදෘශ වූ දෙදෙනාගේ සවභාව නුයි-එ කරුණෙන් 'මෛථුනධම්ම'යි කියනු ලැබේ.

විභූස නාම: සැරැසුම් දෙකෙකි: ගිහියේ වැසියාගේ සැරැසුමෙක් ඇත. පැවිද්දාගේ සැරැසුමෙක් ඇත. ගිහියේවැසියාගේ සැරැසුම කවරැ යත්: (කතුරෙන්) හිසකෙස් කැපීම ද (දළු තබා) රවුළු බෑම ද මල් ගඳ විලෙවුන් ද අබරණ ද පලඳනා ද වස්ත්‍ර ද බඳපට ද (හෝ රසන්දම) හිස්වෙළුම ද, ඇඟ ඉලීම ඇඟ මැඩීම (දරුවන්) නැහැවීම සම්බාහනය කැඩපත අඳුන් මල් විලෙවුන් මුවසුණු මුඛාලේප හස්තාබන්ධන සිළුබැඳුම දඬුතල කඩු ඡත්‍රය විසිතුරු වහන් තලල්පට සිළුමිණ විල්විදුනා දික්දුවලු ඇති සුදු වත් යනාදිය යි. මේ ගිහි වැසියාගේ සැරැසුමැ. පැවිද්දාගේ සැරසුම් කවරැ යත්: චීවරමණ්ඩනය පාත්‍රමණ්ඩනය ශයනාසනමණ්ඩනය මේ කුණු කය හෝ බාහිර පරිෂ්කාරයන් හෝ මණ්ඩනය සැරැසීම කෙලෑවීම හාත්පසින් කෙලෑවීම කැමැති බව ගිජු බව චපල බව චාපල්‍යය යන මේ පැවිද්දාගේ සැරැසුම්.

තන්දිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසං - මැලිබව ද මායා (-වංචා) ව ද හාස්‍යය ද ක්‍රීඩාව ද සැරැසුම් සහිත වූ පිරිවර සහිත වූ පිරිබඩ සහිත වූ පිරිකර සහිත වූ මෙවුන්දම් ද හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ නුයි 'තන්දිං...සවිභූසං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නිද්දං න බහුලීකරෙය්‍ය -පෙ- මෙථුනං විප්පජහෙ සවිභූසං"යි.

**14 - 18**

ආථබ්බණං[1] සුපිනං ලක්ඛණං
නො විදහෙ අථොපි නක්ඛත්තං,
විරුතඤ්ච ගබ්භකරණං
තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථොපි නක්ඛත්තන්ති** ආථබ්බණිකා ආථබ්බණං පයොජෙන්ති නගරෙ වා රුද්ධෙ සඞ්ගාමෙ වා පච්චුපට්ඨිතෙ පරසෙනාය පච්චත්ථිකෙසු පච්චාමිත්තෙසු ඊතිං උප්පාදෙන්ති, උපද්දවං උප්පාදෙන්ති, රොගං උප්පාදෙන්ති, පජ්ජරකං කරොන්ති, සූලං කරොන්ති, විසූචිකං කරොන්ති, පක්ඛන්දිකං කරොන්ති. එවං ආථබ්බණිකා ආථබ්බණං පයොජෙන්ති.

සුපිනපාඨකා සුපිනං ආදිසන්ති: 'යො පුබ්බණ්හසමයං සුපිනං පස්සති, එවං විපාකො හොති. යො මජ්ඣන්තිකසමයං සුපිනං පස්සති, එවං විපාකො හොති. යො සායන්හසමයං සුපිනං පස්සති, එවං විපාකො හොති. යො පුරිමෙ යාමෙ - යො මජ්ඣිමෙ යාමෙ - යො පච්ඡිමෙ යාමෙ- යො දක්ඛිණෙන පස්සෙන නිපන්නො - යො වාමෙන පස්සෙන නිපන්නො යො උත්තානං නිපන්නො - යො අවකුජ්ජනිපන්නො - යො චන්දං පස්සති, යො සූරියං පස්සති, යො මහාසමුද්දං පස්සති, යො සිනෙරුං පබ්බතරාජානං පස්සති, යො හත්ථිං පස්සති, යො අස්සං පස්සති, යො රථං පස්සති, යො පත්තිං පස්සති, යො සෙනාබ්‍යූහං පස්සති, යො ආරාමරාමණෙය්‍යකං පස්සති, යො වනරාමණෙය්‍යකං පස්සති, යො භූමිරාමණෙය්‍යකං පස්සති, යො පොක්ඛරණීරාමණෙය්‍යකං පස්සති, එවං විපාකො හොතී'ති එවං සුපිනපාඨකා සුපිනං ආදිසන්ති.

ලක්ඛණපාඨකා ලක්ඛණං ආදිසන්ති: 'මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරිකාලක්ඛණං කුමාරලක්ඛණං දාසිලක්ඛණං දාසලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගොණලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං ඉතිවා'ති එවං ලක්ඛණපාඨකා ලක්ඛණං ආදිසන්ති.

නක්ඛත්තපාඨකා නක්ඛත්තං ආදිසන්ති: 'අට්ඨවීසති නක්ඛත්තානි; ඉමිනා නක්ඛත්තෙන ඝරප්පවෙසො කත්තබ්බො. ඉමිනා නක්ඛත්තෙන මකුටං බන්ධිතබ්බං. ඉමිනා නක්ඛත්තෙන වාරෙය්‍යං කාරෙතබ්බං. ඉමිනා නක්ඛත්තෙන බීජනීහාරො කත්තබ්බො. ඉමිනා නක්ඛත්තෙන සංවාසො ගන්තබ්බො'ති එවං නක්ඛත්තපාඨකා නක්ඛත්තං ආදිසන්ති.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථොපි නක්ඛත්තන්ති** ආථබ්බණඤ්ච සුපිනඤ්ච ලක්ඛණඤ්ච නක්ඛත්තඤ්ච නො විදහෙය්‍ය, න චරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍ය; අථවා න ගණ්හෙය්‍ය න ධාරෙය්‍ය, න උපධාරෙය්‍ය, න උපලක්ඛෙය්‍ය නප්පයොජෙය්‍ය - ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථොපි නක්ඛත්තං.

1. ආතප්පනං - මජසං.

**14 - 18**

බුද්ධාදි මාමක වූ මහණ තෙමේ අථර්වණමන්ත්‍ර ප්‍රයොගය ද ස්වප්න ශාස්ත්‍රය ද (මණිලක්‍ෂණාදි) ලක්‍ෂණශාස්ත්‍රය ද යළි නකත් කීම ද නො කරන්නේ යැ. විරුත (මෘගවාක්‍ය) ශාස්ත්‍රය ද ගබ් ගැන්වීම ද චිකිත්සාව ද නො සෙවුනේයි.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථො'පි නක්ඛත්තං**– අථර්වණ (ශමරමා ඝාසන) මන්ත්‍ර දන්නාහු අථර්වණමන්ත්‍ර (සූනියම්) කෙරෙති, නුවර ඇවුරු කල හෝ යුද පැමිණි කල හෝ සතුරු සෙනා– වෙහි විරුද්ධ වූ සතුරන් කෙරෙහි ශරීරකම්පා උපදවති, උවදුරු උපදවති, රොග උපදවති, ජ්වර උපදවති, ආමශූල (හෝ ඉදිමුම්) උපදවති, පාචන උපදවති, රක්තාතීසාර කෙරෙත්. මෙසේ ආථර්වණිකයෝ අථර්වණමන්ත්‍ර යොදත්.

ස්වප්නපාඨකයෝ සිහින පවසති: 'යමෙක් පෙරවරුයෙහි සිහින දකී නම් මෙබඳු විපාක වෙයි, යමෙක් මධ්‍යාහ්නයෙහි සිහින දකී නම්, මෙසේ විපාක වෙයි, යමෙක් සවස් කලැ සිහින දකී නම්, මෙසේ විපාක වෙයි, යමෙක් පෙරයම්...මැදියම්...අලුයම්...යමෙක් දකුණැලයෙන් හෝනේ...යමෙක් වමැලයෙන් හෝනේ... යමෙක් උඩුබැලි වැ හෝනේ... යමෙක් යටිනුරු වැ හෝනේ...යමෙක් චන්ද්‍රයා දකී නම් යමෙක් සූර්‍ය්‍යයා දකී නම් යමෙක් මහමුහුද දකී නම් යමෙක් මහමෙර දකී නම් යමෙක් ඇතකු දකී නම් යමෙක් අසකු දකී නම් යමෙක් රිය දකී නම් යමෙක් පාබල දකී නම් යමෙක් කඳවුරු දකී නම් යමෙක් රමණී අරම් දකී නම් යමෙක් රමණී උයන් දකී නම් යමෙක් රමණී බිම් පෙදෙස් දකී නම් යමෙක් රමණී පොකුණු දකී නම්, මෙසේ විපාක වේ යැ'යි මෙ පරිද්දෙන් ස්වප්නපාඨකයෝ සිහින ප්‍රකාශ කෙරෙත්.

ලක්‍ෂණපාඨකයෝ ලක්‍ෂණ ප්‍රකාශ කෙරෙති: 'මණිලක්‍ෂණය දණ්ඩ– ලක්‍ෂණය වස්ත්‍රලක්‍ෂණය ඛඩ්ගලක්‍ෂණය හී ලකුණ දුනු ලකුණ අවි ලකුණ ස්ත්‍රීලක්‍ෂණ පුරුෂලක්‍ෂණ කුමාරිකාලක්‍ෂණ කුමාරලක්‍ෂණ දාසිලකුණ දස්ලකුණ ඇත්ලකුණ අස්ලකුණ මිහිලකුණ වැහැබිලකුණ ගවලකුණ බැටෙළුලකුණ එළුලකුණ කුකුළුලකුණ වටුලකුණ ගොයිලකුණ කණණිකා ලක්‍ෂණ කච්ඡපලක්‍ෂණ මෘගලක්‍ෂණ යනාදිය' යි මෙසේ ලක්‍ෂණ පාඨකයෝ ලක්‍ෂණ ප්‍රකාශ කෙරෙත්.

නක්‍ෂත්‍රපාඨකයෝ නකත් පවසති: නකත් අටවිස්සෙකි; මේ නකතින් ගෙවැදි යැ යුත්තේ යැ මේ නකතින් මුහුළු බැන්ද යුතු යැ, මේ නකතින් ආවාහවිවාහ කරවිය යුතු යැ, මේ නකතින් බිජු (කොටුවින්) අල යුතු යැ, මේ නකතින් සංවාසයට යා යුතු යැ'යි මෙසේ නැකැත්තෝ නකත් පවසති.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථො'පි නක්ඛත්තං**– සිහින ද නිමිති ද නො කරන්නේ යැ නො හැසිරෙන්නේ යැ, වෙසෙසින් නො හැසිරෙන්නේ යැ, මොනවට ගෙන නො පවත්නේ යැ, නොහොත් නො ගන්නේ යැ, නො දරන්නේ යැ, නො විමසන්නේ යැ, නො සලකන්නේ යැ නො යොදන්නේ නුසි 'ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථො පි නක්ඛත්තං' යනු වේ.

**විරූතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍යාති** – විරුතං වුච්චති මිගවාක්‍යං.[1] මිගවාක්‍යපාඨකා[2] මිගවාක්‍යං ආදිසන්ති: සකුන්තානං වා චතුප්පදානං වා රුතං වස්සිතං ජානන්ති; එවං මිගවාක්‍යපාඨකා මිගවාක්‍යං ආදිසන්ති. ගබ්භකරණීයා ගබ්භං සණ්ඨාපෙන්ති. ද්වීහි කාරණෙහි ගබ්භො න සණ්ඨාති: පාණකෙහි වා වාතකුපෙහි වා. පාණකානං වා වාතකුපානං වා පටිඝාතාය ඔසධං දෙන්තීති එවං ගබ්භකරණීයා ගබ්භං සණ්ඨාපෙන්ති. **තිකිච්ඡාති** පඤ්ච තිකිච්ඡා: සාලාකියං සල්ලකත්තියං කායතිකිච්ඡං භූතියං කොමාරභච්චං[3]. **මාමකොති** බුද්ධමාමකො ධම්මමාමකො සඞ්ඝමාමකො; සො වා භගවන්තං මමායති, භගවා වා තං පුග්ගලං පරිග්ගණ්හාති. වුත්තං හෙතං භගවතා: "යෙ තෙ භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ භික්ඛූ මාමකා අපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. න ච තෙ භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. යෙ ච ඛො භික්ඛවෙ භික්ඛූ නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා, තෙ ඛො මෙ භික්ඛවෙ භික්ඛූ මාමකා. අනපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. තෙ ච භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති[a]

1. "කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා,
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ.

2. නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ"ති.[a]

**විරූතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍යාති** – විරූතඤ්ච ගබ්භකරණඤ්ච තිකිච්ඡඤ්ච මාමකො න සෙවෙය්‍ය, න නිසෙවෙය්‍ය න සංසෙවෙය්‍ය න පටිසෙවෙය්‍ය න චරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍ය, අථවා න ගණ්හෙය්‍ය න උග්ගණ්හෙය්‍ය න උපධාරෙය්‍ය න උපලක්ඛෙය්‍ය න පයොජෙය්‍යාති – විරූතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය.

තෙනාහ භගවා:

"ආථබ්බණං සුපිනං ලක්ඛණං
නො විදහෙ අථොපි නක්ඛත්තං,
විරූතඤ්ච ගබ්භකරණං
තිකිච්ඡං මාමකො න සෙවෙය්‍යා"ති.

---

1. මිගවාක්කං - මජසං. මිගචක්කං - සආ. PTS. මිගපක්ඛ - ස.
2. මිගවාක්කපාඨකා - මජසං. මිගචක්කපාඨිකා - PTS.
3. කොමාරකභච්චං - සආ.

a. චතුක්කඞ්ගුත්තර - උරුවෙලවග්ග.

**විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය** – 'විරුතං' යි මෘගවාක්‍යය කියනු ලැබෙයි; මෘගවාක්‍යපාඨකයෝ සතුන්ගේ හඬ දක්වති: ලිහිණින්ගේ හෝ සිවුපාවුන්ගේ හෝ නාදය හැඬීම දැනගනිති. මෙසේ මෘගවාක්‍යපාඨකයෝ සතුන්ගේ හැඬීම දක්වත්. ගර්භසංස්ථාපකයෝ ගැබ් පිහිටුවති; දෙකාරණෙකින් ගැබ නො පිහිටයි: පණුවන් හෙතු කොට හෝ වාතකෝපයන් හෙතු කොට හෝ යැ; පණුවන් හෝ වාතකෝපයන් හෝ නැසීම පිණිස බෙහෙත් දෙත් නුයි මෙසේ ගර්භසංස්ථාපකයෝ ගැබ් පිහිටුවත්. **තිකිච්ඡා** නම්: චිකිත්සා පසෙකි: ශාලාක්‍ය යැ ශල්‍යකර්ම යැ කායචිකිත්සා යැ භූතවිද්‍යා යැ කෞමාරභෘත්‍ය යැයි. **මාමකො** යනු: බුද්ධමාමක ධර්මමාමක සඞ්ඝමාමක වූයේ, හෙතෙම හෝ බුදුන් මාමයන කෙරෙයි, බුදුහු හෝ ඒ පුද්ගලයා විමසන සේක; මේ වදාරන ලද මැය බුදුන් විසින්: "මහණෙනි, යම් ඒ මහණ කෙනෙක් කුහක වූවාහු තද වූවාහු ප්‍රත්‍යය පිළිබඳ වචන කියන්නාහු සැරසෙන පියවි ඇත්තාහු උපචාර අර්පණාසමාධි රහිත වූවාහු වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූහු මට මාමක වූවාහු නො වෙති, තවද මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙන් බැහැර වූවාහු වෙති, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වැඩීමට වැඩුණුබවට විපුල බවට නො ද පැමිණෙත්. තවද මහණෙනි, යම් භික්ෂු කෙනෙක් කුහක නො වූවාහු ලපක නො වූවාහු ධීර වූවාහු නො තද වූවාහු මොනොවට එකඟ සිත් ඇත්තාහු වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූහු මට මාමක වූවාහු වෙති, තවද මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙන් නො බැහැර වූවාහු වෙති, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වෘද්ධියට විරූඪ බවට විපුල බවට ද පැමිණෙත්.

1. කුහක වූ (ක්‍රොධ – මාන වශයෙන්) තද වූ (ප්‍රත්‍යය පිළිබඳ කථා වෙත්) උපලාපක වූ (ප්‍රකට) කෙලෙස්සිඟු ඇති නැඟුණු මානනල ඇති චිත්තෙකාග්‍රතා රහිත වූ ඔවුහු සම්මාසම්බුදුන් වදාළ ශාසනධර්මයෙහි නො වැඩෙත්.

2. කුහක නො වූ ලපක නො වූ ධීර වූ නො තද වූ සුසමාහිත සිත් ඇති ඔවුහු එකාන්තයෙන් සම්මාසම්බුදුන් වදාළ ධර්මයෙහි වෙසෙසින් වැඩෙත්."යි

**විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය** – විරුත ශාස්ත්‍රය ද ගර්භසංස්ථාපනය ද චිකිත්සාව ද බුද්ධාදිමාමක වූ මහණ තෙම නො සෙවුනේ යැ, නිසෙවනය නො කරන්නේ යැ, සංසෙවනය නො කරන්නේ යැ, ප්‍රතිසෙවනය නො කරන්නේ යැ, නො හැසිරෙන්නේ යැ, සමාචරණය නො කරන්නේ යැ, සමාදන් වැ නො පවත්නේ යැ; නොහොත් නො ගන්නේ යැ, හූගන්නේ යැ, සිත්හි නො තබන්නේ යැ, නො විමසන්නේ යැ, (අනුනට කීම් වශයෙන්) නො යොදන්නේ යැයි 'විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ආථබ්බණං සුපිනං -පෙ- තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය"**යි.

14 - 14

නින්දාය නප්පවෙධෙය්‍ය
න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛු,
ලොභං සහ මච්ඡරියෙන
කොධං පෙසුණියඤ්ච[1] පනුදෙය්‍ය.

**නින්දාය නප්පවෙධෙය්‍යාති** - ඉධෙකච්චෙ භික්ඛුං නින්දන්ති: ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා නින්දන්ති ගරහන්ති උපවදන්ති. නින්දිතො ගරහිතො උපවදිතො නින්දාය ගරහාය උපවාදෙන අකිත්තියා අවණ්ණහාරිකාය න වෙධෙය්‍ය නප්පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය න තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය. අභීරූ අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - නින්දාය නප්පවෙධෙය්‍ය.

**න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛූති** - ඉධෙකච්චෙ භික්ඛුං පසංසන්ති: ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා පසංසන්ති ථොමෙන්ති කිත්තෙන්ති වණ්ණෙන්ති. පසංසිතො ථොමිතො කිත්තිතො වණ්ණිතො පසංසාය ථොමනෙන කිත්තියා වණ්ණහාරිකාය උන්නතිං න කරෙය්‍ය, උන්නාමං න කරෙය්‍ය, මානං න කරෙය්‍ය, ථම්භං න කරෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති - න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛු.

**ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච[1] පනුදෙය්‍යාති** - **ලොභොති** "යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං;"[a] **මච්ඡරියන්ති** පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං -පෙ- ගාහො වුච්චති මච්ඡරියං; **කොධොති** "යො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො, දොසො පදොසො සම්පදොසො චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො, කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං, දොසො දුස්සනා දුස්සිතත්තං, බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං, විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස."[b]

1. පෙසුණෙය්‍යං ච - ස. 2. අස්සුරොපො - සීමු II.
a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ. b. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ

## 14 - 14

මහණ තෙම නින්දාවචනයෙන් නො කම්පා වන්නේ යැ. පසස්නා ලදුයේ උඩඟු නො වන්නේ යැ. මාත්සය්‍ර්‍යය සමග ලොභය ක්‍රොධය හා පෛශුන්‍යය ද දුරු කරන්නේ යි.

**නින්දාය නප්පවෙධෙය්‍ය** - මෙහි ඇතැම් කෙනෙක් මහණ හට නින්දා කෙරෙති: ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දය්‍ර්‍යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් හෝ නින්දා කෙරෙති, ගරහති නුගුණ කියත්. නිගා කරන ලදුයේ ගරහන ලදුයේ නුගුණ කියන ලදුයේ නින්දාවෙන් ගර්හාවෙන් උපවාදයෙන් අකීර්තියෙන් නුගුණ එළැවීමෙන් කම්පා නො වන්නේ යැ, ප්‍රකම්පා නො වන්නේ යැ, පුනපුනා කම්පා නො වන්නේ යැ, ත්‍රස්ත - උත්‍රස්ත - පරිත්‍රස්ත නො වන්නේ යැ භය නො වන්නේ යැ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යැ. නො බිය-, සුලු වූයේ නො සැලෙනසුලු වූයේ නො තැතිගන්නාසුලු වූයේ නො පලායන සුලු වූයේ වන්නේ යැ. ප්‍රහීණ වූ භය අරමුණු ඇතියේ පහ වූ ලොමුදහ ඇතියේ වාසය කරන්නේ නුයි 'නින්දාය නප්පවෙධෙය්‍ය' යනු වේ.

**න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛු** - මෙහි ඇතැම් කෙනෙක් මහණ හට ප්‍රශංසා කෙරෙති: ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දය්‍ර්‍යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර කාරණයෙකින් හෝ පසසති, තුති කෙරෙති, ප්‍රකට කෙරෙති, ගුණ කියත්. ප්‍රශංසිත - සතුත - කීර්තිත - වර්ණණිත වූයේ ප්‍රශංසායෙන් සතුතියෙන් කීර්තියෙන් ගුණ ප්‍රකාශ කිරීමෙන් උන්නතිය නො කරන්නේ යැ, උන්නාමය නො කරන්නේ යැ, මානය නො කරන්නේ යැ, ස්තම්භය නො කරන්නේ යැ, එයින් මානය නුපදවන්නේ යැ. එයින් තද වූයේ අතිශයින් තද වූයේ හැඟු හිස ඇත්තේ නො වන්නේ ය යි - 'න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛු' යනු වේ.

**ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය** - ලොභ නම්: යම් ලෝභයෙක් ලොභාකාරයෙක් ලොභ කළ බවෙක් අභිකාරාගයෙක් ඇලෙන අනුරෙක් ඇලුණු බවෙක් අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. මච්ඡරිය නම් - මාත්සය්‍ර්‍ය පසෙකි: ආවාසමාත්සය්‍ර්‍යය...ග්‍රාහය මාත්සය්‍ර්‍ය යයි කියනු ලැබේ. ක්‍රොධ නම්: චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් වේ ද, සිත පෙරළුණු බවෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් කිපුණු බවෙක් ද්වෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් විපය්‍ර්‍යාසයෙක් විපය්‍ර්‍යාසාකාරයෙක් විපය්‍ර්‍යස්ත බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩ බවෙක් නො පිරුණු වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද එය යි.

**පෙසුනියන්ති** ඉධෙකච්චො පිසුනවාචො හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඉති වුච්චති පෙසුඤ්ඤං.. අපි ච ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරති: පියකම්‍යතාය වා භෙදාධිප්පායෙන වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති? 'ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමී'ති එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති. කථං භෙදාධිප්පායෙන පෙසුඤ්ඤං උපසංහරති? 'කථං ඉමෙ නානා අස්සු, වග්ගා අස්සු, ද්වෙධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං න ඵාසු විහරෙය්‍යු'න්ති එවං භෙදාධිප්පායෙන පෙසුඤ්ඤං උපසංහරති. **ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුනියඤ්ච පනුදෙය්‍යාති** ලොභඤ්ච මච්ඡරියඤ්ච කොධඤ්ච පෙසුඤ්ඤඤ්ච නුදෙය්‍ය පනුදෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති – ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුනියඤ්ච පනුදෙය්‍ය.

තෙනාහ භගවා:

"නින්දාය නප්පවෙධෙය්‍ය
න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛු,
ලොභං සහ මච්ඡරියෙන
කොධං පෙසුනියඤ්ච පනුදෙය්‍යා"ති.

## 14 – 15

කයවික්කයෙ න තිට්ඨෙය්‍ය
උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය
ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය.

**කයවික්කයෙ න තිට්ඨෙය්‍යාති** – යෙ කයවික්කයා විනයෙ පටික්ඛිත්තා, න තෙ ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා. කථං කයවික්කයෙ තිට්ඨති? පඤ්චන්නං සද්ධිං පත්තං වා චීවරං වා අඤ්ඤං වා කිඤ්චි පරික්ඛාරං වඤ්චනියං වා කරොන්තො උදයං වා පත්ථයන්තො පරිවත්තෙති, එවං කයවික්කයෙ තිට්ඨති. කථං කයවික්කයෙ න තිට්ඨති? පඤ්චන්නං සද්ධිං පත්තං වා චීවරං වා අඤ්ඤං වා කිඤ්චි පරික්ඛාරං න වඤ්චනියං වා කරොන්තො න උදයං වා පත්ථයන්තො පරිවත්තෙති. එවං කයවික්කයෙ න තිට්ඨති. **කයවික්කයෙ න තිට්ඨෙය්‍යාති** කයවික්කයෙ න තිට්ඨෙය්‍ය, න සන්තිට්ඨෙය්‍ය, කයවික්කයං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, කයවික්කයා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – කයවික්කයෙ න තිට්ඨෙය්‍ය.

**පෙසුණියං** යනු මෙහි කිසිවෙක් පිසුනුබස් ඇතියේ වෙයි: මෙතැනින් අසා මොවුන්ගේ බිඳීමට එතැන කියන්නේ වෙයි, එතැන හෝ අසා අරුන්ගේ බිඳීමට මුන්ට කියන්නේ වෙයි. මෙසේ සමඟ වූවන් හෝ බිඳිනුයේ භින්න වූවන් හෝ සන්ධානය නො කරනුයේ වර්ග වීමෙහි සතුටු වූයේ වර්ග වීමෙහි ඇලුණේ වර්ගයෙහි සතුටු වූයේ වර්ග කරන බස් කියන්නේ වෙයි. එහෙයින් පෛශුන්‍ය යැයි කියනු ලැබේ. තවද දෙ කරුණෙකින් පිසුනු එළවා කියයි: ප්‍රියකාම්‍යතායෙන් හෝ භේදාධි-ප්‍රායෙන් හෝ යැ. කිසෙයින් ප්‍රියකාම්‍යතායෙන් පිසුනු කියා ද යත්: 'මොහුට ප්‍රිය වූයෙම් වන්නෙමි, මනාප වූයෙම් වන්නෙමි, විශ්වාසියෙම් වන්නෙමි, අභ්‍යන්තරිකයෙම් වන්නෙමි, සුහෘද් වන්නෙමි, මෙ සෙයින් ප්‍රියකාම්‍යතාශයෙන් පිසුනු කියයි. කිසෙයින් භේදාධිප්‍රායෙන් පිසුනු කියා ද යත්: 'කෙසේ නම් මොහු වෙන් වන්නාහු ද, වර්ග වන්නාහු ද, දෙ කොටස් වන්නාහු ද, දෙ කඩ වන්නාහු ද, දෙ පක්ෂ වන්නාහු ද, බිඳෙන්නාහු ද, නො සමඟ වන්නාහු ද, දුකසේ නො පහසුවේ වසන්නාහු ද'යි මෙසේ බිඳෙන අදහසින් පෙහෙසුන් බස් කියයි. **ලෝභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය** - ලෝභය ද මාත්සර්යය ද ක්‍රෝධය ද පෛශුන්‍යය ද දුරු කරන්නේ යැ වෙසෙසින් දුරු කරන්නේ යැ හරණේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ ය යි 'ලෝභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නින්දාය නප්පවෙධෙය්‍ය -පෙ- කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය"යි

## 14 - 15

මහණ තෙමේ ක්‍රයවික්‍රයයෙහි නො පිහිටන්නේ යැ. (ඇතුළතැ පිටතැ) කිසි තැනෙක්හි (අනුන් ලවා) උපවාද නො කරවන්නේ යැ. ගම්හි දු නො ඇලෙන්නේ යැ ලාභහේතුයෙන් ජනයාට ලපනය නො කරන්නේ යි.

**කයවික්කයෙ න තිට්ඨෙය්‍ය** - යම් ක්‍රයවික්‍රය කෙනෙක් විනයෙහි ප්‍රතික්ෂෙප කරන ලද්දාහු නම්, ඔහු මෙ අර්ථයෙහි අදහස් නො කරන ලදහ. කිසෙයින් ක්‍රයවික්‍රයයෙහි සිටි ද යත්: පස් සහධාර්මිකයන් සමඟ පාත්‍රයක් හෝ සිවුරක් හෝ අන් කිසි පිරිකරක් හෝ වඤ්චා කෙරෙමින් හෝ උදය (-වැඩියක්) පතමින් හෝ පරිවර්තන කෙරේ නම්, මෙසේ ක්‍රයවික්‍රයයෙහි සිටී. කිසෙයින් ක්‍රයවික්‍රයයෙහි නොසිටී ද යත්: පස් සහධාර්මිකයන් සමඟ පාත්‍රයක් හෝ සිවුරක් හෝ අන් කිසි පිරිකරක් හෝ වඤ්චා නො කෙරෙමින් හෝ උදය නො පතමින් හෝ පරිවර්තන කෙරේ නම්, මෙසේ ක්‍රයවික්‍රයයෙහි නො සිටී. **කයවික්කයෙ න තිට්ඨෙය්‍ය**- ක්‍රයවික්‍රයයෙහි නො සිටින්නේ යැ, නො පවත්නේ යැ, ක්‍රයවික්‍රය (-ගනු දෙනු) හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනු-අභාවයට පමුණුවන්නේ යැ. ක්‍රයවික්‍රයයෙන් දුරු වූයේ වෙසෙසින් දුරු වූයේ භාත්පසින් දුරු වූයේ වන්නේ යැ, නික්මුණේ නික්මැගියේ වෙසෙ-සින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාද කළ සිතින් යුක්ත ව වසන්නේ නුයි 'කයවික්කයෙ න තිට්ඨෙය්‍ය' යනු වේ.

**උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චීති** – කතමෙ උපවාදකරා කිලෙසා? සන්ති එකෙ සමණබ්‍රාහ්මණා ඉද්ධිමන්තො දිබ්බචක්ඛුකා පරචිත්තවිදුනො. තෙ දූරතොපි පස්සන්ති, ආසන්නාපි න දිස්සන්ති, චෙතසාපි චිත්තං පජානන්ති. දෙවතාපි ඛො සන්ති ඉද්ධිමන්තිනියො දිබ්බචක්ඛුකා පරචිත්තවිදුනියො. තා දූරතොපි පස්සන්ති, ආසන්නාපි න දිස්සන්ති, චෙතසාපි චිත්තං පජානන්ති. තෙ ඔළාරිකෙහි වා කිලෙසෙහි මජ්ඣිමෙහි වා කිලෙසෙහි සුඛුමෙහි වා කිලෙසෙහි උපවදෙය්‍යුං. කතමෙ ඔළාරිකා කිලෙසා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. ඉමෙ වුච්චන්ති ඔළාරිකා කිලෙසා. කතමෙ මජ්ඣිමා කිලෙසා? කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො. ඉමෙ වුච්චන්ති මජ්ඣිමා කිලෙසා. කතමෙ සුඛුමා කිලෙසා? ඤාතිවිතක්කො ජනපදවිතක්කො අමරවිතක්කො පරානුද්දයතාපටිසඤ්ඤුත්තො විතක්කො ලාභසක්කාරසිලොකපටිසඤ්ඤුත්තො විතක්කො අනවඤ්ඤත්තිපටිසඤ්ඤුත්තො විතක්කො. ඉමෙ වුච්චන්ති සුඛුමා කිලෙසා. තෙහි ඔළාරිකෙහි වා කිලෙසෙහි මජ්ඣිමෙහි වා කිලෙසෙහි සුඛුමෙහි වා කිලෙසෙහි න උපවදෙය්‍ය, උපවාදං න කරෙය්‍ය, උපවාදකරෙ කිලෙසෙ න කරෙය්‍ය, න ජනෙය්‍ය, න සඤ්ජනෙය්‍ය, න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය. උපවාදකරෙ කිලෙසෙ පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. උපවාදකරෙහි කිලෙසෙහි ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍ය. කුහිඤ්චීති කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති 'උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.'

**ගාමෙ ච නාභිසජ්ජෙය්‍යාති** – කථං ගාමෙ සජ්ජති? ඉධ භික්ඛු ගාමෙ ගිහීහි සංසට්ඨො විහරති සහනන්දී සහසොකී සුඛිතෙසු සුඛිතො දුක්ඛිතෙසු දුක්ඛිතො. උප්පන්නෙසු කිච්චකරණීයෙසු අත්තනා වොයොගං ආපජ්ජති. එවම්පි ගාමෙ සජ්ජති. අථවා භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්‍ර තත්‍ර සජ්ජති. තත්‍ර තත්‍ර ගණ්හාති. තත්‍ර තත්‍ර බජ්ඣති. තත්‍ර තත්‍ර අනයබ්‍යසනං ආපජ්ජති. එවම්පි ගාමෙ සජ්ජති.

**උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි** – උපවාදකර ක්ලේශයෝ කවරහු ද යත්: ඍද්ධිමත් වූ දිව්‍යස් ඇති පරසිත් දන්නා ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත්තාහු ය. ඔහු දුර සිටියාහු ද දකිති. ලං වූවාහු ද නො පැනෙති. තමන්ගේ සිතින් අනුන්ගේ සිත දැන ගනිත්. ඍද්ධිමත් වූ දිව්‍යස් ඇති පරසිත් දන්නා වූ දේවතාවෝ ද ඇත්තාහු යැ. ඔහු දුර සිට ද දකිති. සමීප වූවාහු ද නො පැනෙති. තම සිතින් මෙරමා සිත ද දැන ගනිත්. ඔහු (කායදුශ්චරිතාදි) ඖදාරික ක්ලේශයන්ගෙන් හෝ (කාමවිතර්කාදි) මධ්‍යම ක්ලේශයන්ගෙන් හෝ (ඥාතිවිතර්කාදි) සූක්ෂ්ම ක්ලේශයන්ගෙන් හෝ උපවාද කරන්නාහු ය. ඖදාරික ක්ලේශයෝ කවරහු ද යත්: කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනෝදුශ්චරිතය යන මොහු ඖදාරික ක්ලේශයෝ'යි කියනු ලැබෙත්. මධ්‍යම ක්ලේශයෝ කවරහු ද යත්: කාමවිතර්ක යැ ව්‍යාපාදවිතර්ක යැ විහිංසාවිතර්ක යැ යන මොහු මධ්‍යම ක්ලේශයෝ යි කියනු ලැබෙත්. සූක්ෂ්ම ක්ලේශයෝ කවරහු ද යත්: ඥාතිවිතර්ක යැ ජනපදවිතර්ක යැ අමරවිතර්ක යැ පරානුද්දයතා-ප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ ලාභසත්කාරකීර්ති ප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ අනවඥත බව ප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ යන මොහු සූක්ෂ්මක්ලේශයෝ යි කියනු ලැබෙත්. ඒ ඖදාරික ක්ලේශයන්ගෙන් හෝ මධ්‍යම ක්ලේශ-යන්ගෙන් හෝ සූක්ෂ්ම ක්ලේශයන්ගෙන් හෝ 'න උපවදෙය්‍ය, උපවාද නො කරන්නේ යැ, උපවාදකර ක්ලේශයන් නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නූපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, නො පහළ කරන්නේ යැ. උපවාදකර ක්ලේශයන් හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. උපවාදකර ක්ලේශයන්ගෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ යි. **කුහිඤ්චි** යනු: අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කොහි කිසිවෙක්හි කොතැනෙක්හි නුසි 'උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි' යනු වේ.

**ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය** – කිසෙසින් ගම්හි ඇලෙයි යත්: මෙහි මහණ තෙම ගම්හි ගිහීන් සමඟ සංසෘෂ්ට වැ වෙසෙයි, සමඟ සතුටු වනුයේ සමඟ ශෝක ඇතියේ (ඔවුන්) සුඛිත කල්හි සුඛිත වූයේ දුඃඛිත කල්හි දුඃඛිත වූයේ වෙයි. උපන් කළයුතු කිස ඇති කල්හි තමා උපයෝගයට (කිස කළ යුතු බවට) පැමිණෙයි. මෙසේත් ගම්හි ඇලෙයි. නොහොත් මහණ තෙම පෙරවරුයෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන නො රක්නා ලද කයින් නො රක්නා ලද වචනයෙන් නො රක්නා ලද සිතින් යුක්ත වැ නො එළැඹ සිටි සිහියෙන් අසංවර වූ ඉඳුරන්ගෙන් යුක්ත වැ ගමට හෝ නියම්ගමට හෝ පිඬු සිඟා යැයි. හෙතෙම ඒ ඒ අරමුණෙහි ඇලෙයි. ඒ ඒ අරමුණට පිවිසෙයි, ඒ ඒ අරමුණෙහි බැඳෙයි. ඒ ඒ අරමුණෙහි අනයව්‍යසනයට පැමිණේ. මෙසේත් ගම්හි ඇලෙයි.

කථං ගාමෙ න සජ්ජති ? ඉධ භික්ඛු ගාමෙ ගිහීහි අසංසට්ඨො විහරති: න සහනන්දී න සහසොකී න සුඛිතෙසු සුඛිතො, න දුක්ඛිතෙසු දුක්ඛිතො. උප්පන්නෙසු කිච්චකරණීයෙසු න අත්තනා වොයොගං ආපජ්ජති. එවම්පි ගාමෙ න සජ්ජති. අථවා භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති රක්ඛිතෙනෙව කායෙන රක්ඛිතාය වාචාය රක්ඛිතෙන චිත්තෙන උපට්ඨිතාය සතියා සංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්‍ර තත්‍ර න සජ්ජති. තත්‍ර තත්‍ර න ගණ්හාති. තත්‍ර තත්‍ර න බජ්ඣති. තත්‍ර තත්‍ර න අනයබ්‍යසනං ආපජ්ජති. එවම්පි ගාමෙ න සජ්ජති. ගාමෙ ච නාභිසජ්ජෙය්‍යාති ගාමෙ න සජ්ජෙය්‍ය න ගණ්හෙය්‍ය න බජ්ඣෙය්‍ය න පලිබජ්ඣෙය්‍ය. අගිද්ධො අස්ස අගථිතො[1] අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො -පෙ- බ්‍රහ්මභූතෙන අත්තනා විහරෙය්‍යාති - ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය.

ලාභකම්‍යා ජනං න ලපයෙය්‍යාති - කතමා ලපනා ? ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස ආමිසචක්ඛුකස්ස ලොකධම්මගරුකස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුග්ගසූප්‍යතා[2] පාරිභට්‍යතා පරපිට්ඨිමංසිකතා. යා තත්ථ සණ්හවාචතා සඛිලවාචතා සිථිලවාචතා අඵරුසවාචතා, අයං වුච්චති ලපනා, අපි ච ද්වීහි කාරණෙහි ජනං ලපති: අත්තානං වා නීචං ඨපෙත්වා පරං උච්චං ඨපෙත්වා ජනං ලපති, අත්තානං වා උච්චං ඨපෙත්වා පරං නීචං ඨපෙත්වා ජනං ලපති. කථං අත්තානං නීචං ඨපෙත්වා පරං උච්චං ඨපෙත්වා ජනං ලපති ? 'තුම්හෙ මෙ බහූපකාරා, අහං තුම්හෙ නිස්සාය ලභාමි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං. යෙපි මෙ අඤ්ඤෙ දාතුං වා කාතුං වා මඤ්ඤන්ති, තුම්හෙ නිස්සාය තුම්හෙ සම්පස්සන්තා. යම්පි මෙ පුරාණං මාතාපෙත්තිකං නාමධෙය්‍යං, තම්පි මෙ අන්තරහිතං. තුම්හෙහි අහං ඤායාමි අසුකස්ස කුලූපකො අසුකාය කුලූපකො'ති. එවං අත්තානං නීචං ඨපෙත්වා පරං උච්චං ඨපෙත්වා ජනං ලපති. කථං අත්තානං උච්චං ඨපෙත්වා පරං නීචං ඨපෙත්වා ජනං ලපති ? 'අහං තුම්හාකං බහූපකාරො, තුම්හෙ මං ආගම්ම බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා. අහං තුම්හාකං උද්දෙසං දෙමි, පරිපුච්ඡං දෙමි -

1. අගධිතො - සීමු. II. මජ්ඣං.    2. මුග්ගසුප්පතා - සීමු. II. මුග්ගසුපතා - PTS.

කිසෙසයින් ගම්හි නො ඇලෙයි යත්: මේ සස්නෙහි මහණ තෙමේ ගම්හි ගිහීන් හා අසංසෘෂ්ට වූයේ වෙසෙයි: සමග සතුටු නො වනුයේ සමග ශෝකී නො වනුයේ (ඔවුන්) සුවපත් කල්හි සුවපත් නො වනුයේ දුප්පත් කල්හි දුප්පත් නො වනුයේ වෙයි, උපන් කළයුතු කිස ඇති කල්හි එය තමා විසින් කළ යුතු බවට නො පැමිණෙයි. මෙසේත් ගම්හි නො ඇලෙයි. නොහොත් මහණ තෙමේ පෙරවරුයෙහි හැඳපෙරවැ පාසිවුරු ගෙන රක්නා ලද කායද්වාරයෙන් යුක්ත වැ රක්නා ලද වාග්ද්වාරයෙන් යුක්ත වැ රක්නා ලද මනොද්වාරයෙන් යුක්ත වැ එළැඹසිටි සිහියෙන් සංවර කළ ඉඳුරන් ගෙන් යුක්ත වැ ගමට හෝ නියම් ගමට හෝ පිඬු සිඟා යෙයි. හෙතෙම ඒ ඒ අරමුණෙහි නො ඇලෙයි. ඒ ඒ අරමුණෙහි නො පිවිසෙයි. ඒ ඒ අරමුණෙහි නො බැඳෙයි, ඒ ඒ අරමුණෙහි අනයව්‍යසනයට නො පැමිණේ. මෙසේත් ගම්හි නො ඇලේ. **ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය** - ගම්හි නො ඇලෙන්නේ යැ නො ගන්නේ යැ, නො බැඳෙන්නේ යැ, හාත්පසින් නො බැඳෙන්නේ යැ. (රාගයෙන්) නො ගෙතුණේ මුසපත් නො වූයේ නො මඩනා ලදුයේ වන්නේ යැ. පහවූ තෘෂ්ණා ඇතියේ විගත තෘෂ්ණා ඇතියේ වමනය කළ තෘෂ්ණා ඇතියේ...ශ්‍රේෂ්ඨ වූ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය' යනු වේ.

**ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය** - 'ලපනා' කවරී ද යත්: ලාභසත්කාරකීර්ති ඇසුරු කළ ලාමක ඉච්ඡා (-ආශා) ඇති ඉච්ඡායෙන් මඩනා ලද ආමිෂයෙහි ලොල් වූ (රූපාදි) ලෝකධම් ගරු කොට වසන්නහුගේ අන්‍යයන්ට යම් ආදියෙහි බිණීමෙක් ලපනයෙක් මොනවට බිණීමෙක් උසස් කොට බිණීමෙක් හාත්පසින් උසස් කොට බිණීමෙක් උස් කොට බැඳීමෙක් හාත්පසින් පුනපුනා බැඳීමෙක් උසස් කොට දක්වීමෙක් හාත්පසින් උසස් කොට දක්වීමෙක් පුනපුනා ප්‍රිය වදන් කියන බවෙක් චාටුවචන ඇති බවෙක් මුද්ගසූපය වැනි වචන ඇති බවෙක් පරිභට (-දරුවන් නළවන) බවෙක් මෙරමා පිටුමස් කන බවෙක් වේ ද, එහි යම් මොළොක් වචන ඇති බවෙක් සිලුටු වචන ඇති බවෙක් ලිහිල් වචන ඇති බවෙක් මිහිරි වචන ඇති බවෙක් වේ ද, මෙය් 'ලපනා' යයි කියනු ලබයි. තවද දෙ කරුණෙකින් ජනයාට බෙණෙයි: තමා හෝ පහත් කොට තබමින් මෙරමා උස් කොට තබමින් ජනයාට බෙණෙයි, තමා හෝ උස් කොට තබමින් මෙරමා පහත් කොට තබමින් ජනයාට බෙණෙයි. කිසෙසයින් තමා නීච කොට තබමින් පරා උච්ච කොට තබමින් ජනලපනය කෙරෙයි යත්: 'තෙපි මට බොහෝ උපකාර ඇතියව, මම තොප නිසා සිවුරු පිණ්ඩපාත සෙනසුන් බෙහෙසත්පිරිකර ලැබෙමි, මේ අත්නු ද දෙන්නට හෝ කරන්නට හෝ සිතත් නම්, තොප නිසා තොප බලමින් (දෙන්නට සිතති) පැරණි මවුපියන් සතු මාගේ යම් නමෙක් වී නම්: මාගේ ඒ නම ද වැසිණි, තොප හෙතු කොටගෙන මම 'අසුවල්හුගේ කුලූපග යැ, අසුවලගේ කුලූපග යැ'යි ප්‍රකට වෙමි. මෙසෙයින් තමා නීච කෙරෙමින් පරා උසස් කෙරෙමින් ජනලපනය කෙරෙයි. කිසෙසයින් තමා උසස් කෙරෙමින් පරා පහත් කෙරෙමින් ජනලපනය කෙරෙයි යත්: 'මම තොපට බොහෝ උපකාර යෙමි, තෙපි මා කරා අවුත් බුදුන් සරණ ගියව, දහම් සරණ ගියව, සඟුන් සරණ ගියව, ප්‍රාණවධයෙන් වැළැක්කවු යැ, අදත්තාදානයෙන්-කාමමිථ්‍යාචාරයෙන් - මෘෂාවාදයෙන් - මද්‍යප්‍රමාදයට කාරණ වූ රහමෙර පීමෙන් වැළැක්කවු යැ, මම තොපට උදෙස් දෙමි, පරිපෘච්ඡා දෙමි-

උපොසථං ආවිකරොමි. නවකම්මං අධිට්ඨාමි. අථ ච පන තුම්හෙ මං උජ්ඣිත්වා අඤ්ඤෙ සක්කරොථ ගරුංකරොථ මානෙථ පූජෙථා'ති එවම්පි අත්තානං උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො ජපං ලපති. **ලාභකම්‍යා ජනං න ලපයෙය්‍යාති** ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො ජපං න ලපෙය්‍ය ලපනං පජහෙය්‍ය, විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, ලපනා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො, විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය.

තෙනාහ භගවා;

“කයවික්කයෙ න තිට්ඨෙය්‍ය
උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය
ලාභකම්‍යා ජනං න ලපයෙය්‍යා”ති.

## 14 - 16

න ච කත්ථිකො සියා භික්ඛු
න ච වාචං පයුත්තං[1] භාසෙය්‍ය,
පාගබ්භියං න සික්ඛෙය්‍ය
කථං විග්ගාහිකං න කථයෙය්‍ය.

**න ච කත්ථිකො සියා භික්ඛූති** – ඉධෙකච්චො කත්ථී හොති විකත්ථී. සො කත්ථති විකත්ථති “අහමස්මි සීලසම්පන්නො'ති වා, වතසම්පන්නො'ති වා, සීලබ්බතසම්පන්නො'ති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා, ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චා කුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොති වා උළාරභොගකුලා පබ්බජිතොති වා, සුත්තන්තිකොති වා විනයධරොති වා ධම්මකථිකොති වා ආරඤ්ඤිකොති වා –පෙ– නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා” කත්ථති විකත්ථති. එවං න කත්ථෙය්‍ය න විකත්ථෙය්‍ය, කත්ථනං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. කත්ථනා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො, විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – න ච කත්ථිකො සියා භික්ඛු.

1. සංයුත්තං - ස. පයුතං - සු.

පොහොය පවසමි, නවහම්හි පිහිට වෙමි. එතෙකු ද වත් තෙපි මා හැර පියා අනුනට සත්කාර කරව, ගරු කරව, බහුමත් කරව, පුදව'යි මෙසේත් තමා උසස් කෙරෙමින් පරා පහත් කෙරෙමින් ජනලපනය කෙරේ. **ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය** - ලාභ හෙතුයෙන් ලාභප්‍රත්‍යයෙන් ලාභ කාරණයෙන් ලාභ උපදවනු පිණිස ලාභ වඩනුයේ ජනලපනය නො කරන්නේ යැ, ලපනය හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ. ලපනයෙන් දුරු වූයේ වෙන් වූයේ හාත්පසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාදීකෘත කල සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“කය වික්කයෙ න තිට්ඨෙය්‍ය -පෙ- ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය”යි**

**14 - 16**

මහණ තෙමේ ආත්මවර්ණනා කරන්නෙක් නො ද වන්නේ යැ, ප්‍රත්‍යය සඳහා යොදන ලද බසක් නො ද කියන්නේ යැ, (කායාදී) බහුපිබැව්හි නො හැසිරෙන්නේ යැ, විග්‍රාහික කථාව නො කියන්නේ යි.

**න ච කත්ථිකො සියා භික්ඛු** - මෙහි කිසිවෙක් කත්ථන විකත්ථන (=ආත්මවර්ණනාව) කරන්නේ වෙයි. හෙතෙම කත්ථනය විකත්ථනය කෙරෙයි: 'මම ශීලසම්පන්නයෙමි හෝ ව්‍රතසම්පන්නයෙමි හෝ ශීලව්‍රතසම්පන්නයෙමි හෝ ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත් බැවින් හෝ පැහැපත් සිරුරු ඇති බැවින් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුවකින් හෝ උසස් කුලයෙන් පැවිදි වූයෙමි' හෝ ගැහැවිමහසල්කුලයෙන් පැවිදි වූයෙමි හෝ බොහෝ සැපත් ඇති කුලයෙන් පැවිදි වූයෙමි හෝ සෞත්‍රාන්තිකයෙමි හෝ විනයධරයෙමි හෝ ධර්මකථිකයෙමි හෝ ආරණ්‍යකයෙමි හෝ...නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි හෝ' තමාගේ ගුණ කියයි, වෙසෙසින් කියයි. මෙසේ සිය ගුණය නො කියන්නේ යැ, වෙසෙසින් නො කියන්නේ යැ, ගුණ කීම හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. ගුණ කථනයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ. නික්මැගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ වියොග වූයේ විගතමර්‍යාදීකෘත කල සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'න ච කත්ථිකො සියා භික්ඛු' යනු වේ.

න ච වාචං පයුත්තං භාසෙය්‍යාති - කතමා පයුත්තවාචා? ඉධෙකච්චො චීවරපයුත්තං වාචං භාසති, පිණ්ඩපාතපයුත්තං වාචං භාසති, සෙනාසනපයුත්තං වාචං භාසති, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපයුත්තං වාචං භාසති. අයම්පි වුච්චති පයුත්තවාචා. අථ වා චීවරහෙතු පිණ්ඩපාතහෙතු සෙනාසනහෙතු ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සච්චම්පි භණති, මුසාපි භණති, පිසුණම්පි භණති, අපිසුණම්පි භණති, ඵරුසම්පි භණති, අඵරුසම්පි භණති, සම්ඵප්පලාපම්පි භණති, අසම්ඵප්පලාපම්පි භණති, මන්තාපි වාචං භාසති. අයම්පි වුච්චති පයුත්තවාචා. අථ වා, පසන්නචිත්තො පරෙසං ධම්මං දෙසෙති: 'අහො, වත මෙ ධම්මං සුණෙය්‍යුං, සුත්වා ච ධම්මෙ පසීදෙය්‍යුං, පසන්නා ච මෙ පසන්නාකාරං කරෙය්‍යු'න්ති. අයම්පි වුච්චති පයුත්තවාචා. න ච වාචං පයුත්තං භාසෙය්‍යාති - අන්තමසො ධම්මදෙසනං වාචං උපාදාය පයුත්තවාචං න භාසෙය්‍ය, න කථෙය්‍ය, න භණෙය්‍ය, න දීපයෙය්‍ය, න වොහරෙය්‍ය, පයුත්තං වාචං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, පයුත්තවාචාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - න ච වාචං පයුත්තං භාසෙය්‍ය.

පාගබ්භියං න සික්ඛෙය්‍යාති - 'පාගබ්භිය'න්ති තීණි පාගබ්භියානි: කායිකං පාගබ්භියං, වාචසිකං පාගබ්භියං, චෙතසිකං පාගබ්භියං. කතමං කායිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි කායිකං පාගබ්භියං දස්සෙති, ගණගතොපි කායිකං පාගබ්භියං දස්සෙති, භොජනසාලායපි කායිකං පාගබ්භියං දස්සෙති, ජන්තාඝරෙපි කායිකං පාගබ්භියං දස්සෙති, උදකතිත්ථෙපි කායිකං පාගබ්භියං දස්සෙති, අන්තරඝරං පවිසන්තොපි කායිකං පාගබ්භියං දස්සෙති, අන්තරඝරං පවිට්ඨොපි කායිකං පාගබ්භියං දස්සෙති.

කථං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති, සසීසං පාරුපිත්වාපි නිසීදති, ඨිතකොපි භණති, බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තීකාරකතො ථෙරානං භික්ඛූනං අනුපාහනානං චඞ්කමන්තානං සඋපාහනො චඞ්කමති, නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං උච්චෙ චඞ්කමෙ චඞ්කමති, ඡමාය චඞ්කමන්තානං චඞ්කමෙ චඞ්කමති, ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති.

**න ච වාචං පයුත්තං භාසෙය්‍ය** – ප්‍රයුක්තවාචා කවරී ද යත්: මෙහි කිසිවෙක් චීවරප්‍රයුක්ත වූ වචන කියයි, පිණ්ඩපාතප්‍රයුක්ත වචන කියයි, සෙනාසනප්‍රයුක්ත වචන කියයි, ගිලන්පසබෙහෙත්පිරිකර හා යෙදුණු වචන කියයි. මෙ ද 'පයුත්තවාචා' යි කියනු ලබයි. නොහොත් සිවුරු හෙතුයෙන් පිණ්ඩපාත හෙතුයෙන් සෙනසුන් හෙතුයෙන් ගිලන්පස බෙහෙසත්පිරිකර හෙතුයෙන් සැබව ද කියයි, බොරු ද කියයි, පිසුනු ද කියයි, නො පිසුනු ද කියයි, රළුබස් ද කියයි, නො රළුබස් ද කියයි, සිස් වදන් ද කියයි, නො සිස් වදන් ද කියයි, නුවණින් දුන ද වචන කියයි. මෙ ද 'පයුත්තවාචා' යි කියනු ලබයි. හොහොත් පහන් සිතැති ව අනුනට දහම් දෙසයි: 'මා ගේ දහම් අසන්නාහු නම් ඉතා යෙහෙක, අසා දහම්හි පහදනාහු නම් යෙහෙක, පැහැදුණාහු පඬුරු එළවන්නාහු නම් යෙහෙකැ යි. මෙ ද 'පයුත්තවාචා'යි කියනු ලබයි. **න ච වාචං පයුත්තං භාසෙය්‍ය**–යටත් පිරිසෙයින් දම්දෙසුම් වචනය පටන් ප්‍රයුක්ත වචනය නො පවසන්නේ යැ නො කියන්නේ යැ නො බණන්නේ යැ නො දක්වන්නේ යැ නො වහරන්නේ යැ. ප්‍රයුක්ත වචනය හරනේ යැ දුරු කරන්නේ යැ විගතානත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ. ප්‍රයුක්ත වචනයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ. නික්මැගියේ පහවැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ යැ'යි 'න ච වාචං පයුත්තං භාසෙය්‍ය' යනු වේ.

**පාගබ්භියං න සික්ඛෙය්‍ය** – 'පාගබ්භිය' නම්: ප්‍රාගල්භ්‍ය තුනෙකි: කායික ප්‍රාගල්භ්‍ය යැ වාචසික ප්‍රාගල්භ්‍ය යැ චෛතසික ප්‍රාගල්භ්‍ය යැයි කියායි. කායික ප්‍රාගල්භ්‍යය කවර යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ ද කායික ප්‍රාගල්භ්‍ය (-නො සරුප් බව) දක්වයි, ගණමැදට ගියේ ද කායික වූ නො සරුප් බව දක්වයි, බොජුන්හලට ගියේ ද කායික නො සරුප් බව දක්වයි, ගිනිහල්හි දු කායික නො සරුප් බව දක්වයි, දිය තොට ද කායික නො සරුප් බව දක්වයි, ඇතුළුගමට පිවිසෙනුයේ ද කායික නො සරුප් බව දක්වයි, ඇතුළුගමට පිවිසියේ ද කායික නො සරුප් බව දක්වයි.

කිසෙයින් සඟමැදට ගියේ කායික නො සරුප් බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්තෙහි දු හිඳී, හිස වසා පෙරෙවැගෙන ද හිඳී, සිට ද බෙණෙයි, අත් සලමිනු දු බෙණෙයි. මෙසේ සඟමැදට ගියේ කායික නො සරුප්බව දක්වයි,

කිසෙයින් ගණමැදට ගියේ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ගණමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් වහන් නැති වැ සක්මන් කරද්දී වහන් ඇති වැ සක්මන් කෙරෙයි, පහත් සක්මනෙහි සක්මන් කරද්දී උසස් සක්මනෙහි සක්මන් කෙරෙයි, පියවි බිමැ සක්මන් කරද්දී සක්මනෙහි සක්මන් කෙරෙයි, ගටමිනිදු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්තෙහි දු හිඳී, හිස වසා පෙරෙවැ ද හිඳී, සිට ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි, මෙසේ ගණමැදට ගියේ කායික නො සරුප්බව දක්වයි.

කථං භොජනසාලාය කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො භොජනසාලාය අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදති, නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහති, ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති, සසීසං පාරුපිත්වාපි නිසීදති, ඨිතකොපි භණති, බාහාවික්ඛෙපකොපි භණති. එවං භොජනසාලාය කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ජන්තාඝරෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති, අනාපුච්ඡාපි කට්ඨං පක්ඛිපති, අනාපුච්ඡාපි ද්වාරං පිදහති. එවං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො උදකතිත්ථෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ඔතරති, පුරතොපි ඔතරති, ඝට්ටයන්තොපි නහායති[1] පුරතොපි නහායති, උපරිතොපි නහායති, ඝට්ටයන්තොපි උත්තරති, පුරතොපි උත්තරති, උපරිපි උත්තරති. එවං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිසන්තො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිසන්තො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ගච්ඡති, පුරතොපි ගච්ඡති. වොක්කම්මපි ථෙරානං භික්ඛූනං පුරතො පුරතො ගච්ඡති. එවං අන්තරඝරං පවිසන්තො කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො 'න පවිසථ[2] භන්තෙ'ති වුච්චමානො පවිසති. 'න තිට්ඨථ භන්තෙ'ති වුච්චමානො තිට්ඨති. 'න නිසීදථ භන්තෙ'ති වුච්චමානො නිසීදති. අනොකාසම්පි පවිසති, අනොකාසෙපි[3] තිට්ඨති, අනොකාසෙපි නිසීදති. යානිපි තානි හොන්ති කුලානං ඔවරකානි ගුළ්හානි ච පටිච්ඡන්නානි ච යත්ථ කුලිත්ථියො කුලධීතරො[4] කුලසුණ්හායො කුලකුමාරියො නිසීදන්ති, තත්ථපි සහසා පවිසති. කුමාරකස්සපි සීසං[5] පරාමසති. එවං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති. ඉදං කායිකං පාගබ්භියං.

කතමං වාචසිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති, ගණගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති, අන්තරඝරං පවිට්ඨොපි වාචසිකං පාගබ්භියං දස්සෙති.

1. නහායති - මජ්සං. PTS. 2. පවිස - මජ්සං. සිමු. II PTS.
3. අනොකාසම්පි - සිමු. II. 4. කුලධීතායො - සිමු. II.
5. කුමාරකස්ස සීසම්පි - මජ්සං. සිමු. II.

කිසෙයින් බොජුන්හලැ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් බොජුන්හලැ බුහුමන් රහිත වූයේ ස්ථවිර භික්ෂූන් මැදට පිවිස හිඳී, නවක භික්ෂූන් ද අසුනෙන් බැහැර කෙරෙයි, ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්නෙහි දු හිඳී, හිස වසා පෙරෙවැගෙන ද හිඳී, සිට ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. මෙසේ බොජුන්හලැ කායික නො සරුප් බව දක්වයි.

කිසෙයින් ගිනිහල්හි කායික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත්: මෙහි කිසි-වෙක් ගිනිහල්හි බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි ද සිටී, ඉදිරියෙහි ද හිඳී, උසස්නෙහි දු හිඳී, නො පිළිවිසැ දර ඔවයි, නො පිළිවිසැ දොර පියයි. මෙසෙයින් ගිනිහල්හි කායික ප්‍රාගල්භ්‍යය දක්වයි.

කිසෙයින් දියතොටැ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් දියතොටැ බුහුමන් නැති වැ ස්ථවිරභික්ෂූන් ගටමිනු දු (තොටට) බසී, ඉදිරියෙහි දු බසී, ගැටෙමිනු දු නහයි, ඉදිරියෙහි දු නහයි, උඩුගඟ ද නහයි, ගැටෙමිනු දු ගොඩ නඟී, ඉදිරියෙනු දු ගොඩ නඟී, උඩතොටිනු දු ගොඩ නඟී. මෙසෙයින් දියතොටැ කායික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ඇතුළුගමට වදනේ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ඇතුළුගමට පිවිසෙනුයේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් ගටමිනු දු යෙයි, ඉදිරියෙහි දු යෙයි, පසු කොට ද ස්ථවිර භික්ෂූන් ඉදිරි-යෙහි යෙයි. මෙසෙයින් ඇතුළුගමට පිවිසෙනුයේ කායික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ඇතුළුගමට පිවිසියේ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ඇතුළුගමට පිවිසියේ 'නො යව වහන්සැ'යි කියනු ලබනුයේ පිවිසෙයි, 'නො සිටිනු මැනවැ වහන්සැ'යි කියනු ලබනුයේ සිටී, 'නො හිඳිනු මැනවැ වහන්සැ'යි කියනු ලබනුයේ හිඳී, අනවකාශ ව ද පිවිසෙයි, අනවකාශයෙහි දු සිටී, අනවකාශයෙහි දු හිඳී. කුලස්ත්‍රීන් කුලධීතෘන් කුලවධූන් කුලකුමාරිකාවන් හිඳිනා පිළියන් වූ (අභ්‍යන්ත ගෙන්) පිළියන් කරන ලද කුලයන්ගේ යහන්ගෙවල් වෙත නමි එහි දු සැහැසි වැ පිවිසෙයි. ළදරුවන්ගේ හිස ද පිරිමදී. මෙසයින් ඇතුළු-ගමට පිවිසියේ කායික නො සරුප්බව දක්වයි. මේ කායික ප්‍රාගල්භ්‍ය යයි.

වාචසික ප්‍රාගල්භ්‍යය කවරැ යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ ද වාචසික නො සරුප්බව දක්වයි, ගණමැදට ගියේ ද වාචසික නො සරුප්බව දක්වයි, ඇතුළුගමට ගියේ ද වාචසික නො සරුප්බව දක්වයි.

කථං සඞ්ඝගතො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ආරාමගතානං භික්ඛූනං ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. පාතිමොක්ඛං උද්දිසති. ඨිතකොපි භණති බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ආරාමගතානං භික්ඛූනං ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. ආරාමගතානං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො ඉත්ථිං වා කුමාරිං වා එවමාහ: ඉත්ථන්නාමෙ, ඉත්ථං ගොත්තෙ, කිං අත්ථි? යාගු අත්ථි? භත්තං අත්ථි? ඛාදනීයං අත්ථි? කිං පිවිස්සාම? කිං භුඤ්ජිස්සාම? කිං ඛාදිස්සාම? කිං වා අත්ථි කිං වා මෙ දස්සථාති විප්පලපති. එවං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති. ඉදං වාචසිකං පාගබ්භියං.

කතමං චෙතසිකං පාගබ්භියං? ඉධෙකච්චො න උච්චාකුලා පබ්බජිතො සමානො උච්චාකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන, න මහාභොගකුලා පබ්බජිතො සමානො මහාභොගකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන, න උළාරභොගකුලා පබ්බජිතො සමානො උළාරභොගකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. න සුත්තන්තිකො සමානො සුත්තන්තිකෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන, න විනයධරො සමානො, න ධම්මකථිකො සමානො, න ආරඤ්ඤිකො සමානො, න පිණ්ඩපාතිකො සමානො, න පංසුකූලිකො සමානො, න තෙචීවරිකො සමානො, න සපදානචාරිකො සමානො, න ඛලුපච්ඡාභත්තිකො සමානො, න නෙසජ්ජිකො සමානො, න යථාසන්ථතිකො සමානො යථාසන්ථතිකෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. න පඨමස්ස ඣානස්ස ලාභී සමානො පඨමස්ස ඣානස්ස ලාභිනා සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. න දුතියස්ස ඣානස්ස – න තතියස්ස ඣානස්ස – න චතුත්ථස්ස ඣානස්ස ලාභී සමානො න ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභී සමානො – න විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා – න ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා – න නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභී සමානො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභිනා සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. ඉදං චෙතසිකං පාගබ්භියං.

කිසෙයින් සඟමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්‍ෂූන් නො පිළිවිසැ හෝ නො ඇණවන ලදු වැ හෝ අරමට ගිය භික්‍ෂූන්ට බණ කියයි, පැන විසඳයි, පාමොක් උදෙසයි, සිටගෙන ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. මෙසෙයින් සඟමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ගණමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ගණමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්‍ෂූන් නො පිළිවිසැ හෝ නො ඇණවන ලදු වැ හෝ අරමට ගිය භික්‍ෂූන්ට බණ කියයි, පැන විසඳයි, සිටගෙන ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. ...අරමට ගිය මෙහෙණනට -උවසුවන්ට - උවැසියනට බණ කියයි, පැන විසඳයි, සිට ගෙන ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. මෙසෙයින් ගණමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ඇතුළුගමට පිවිසියේ වාචසික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ඇතුළුගමට පිවිසියේ ගැහැනියකට හෝ කුමරියකට හෝ මෙසේ කියයි: 'මේ නම් ඇත්තිය, මෙ ගොත් ඇත්තිය, කුමක් ඇද් ද? සැද ඇද් ද? බත් ඇත් ද? කැවුතු ඇත් ද? කුමක් බොත්තමෝ ද? කුමක් වළඳත්තමෝ ද? කුමක් කත්තමෝ ද? කුමක් හෝ ඇත් ද? කුමක් හෝ මට දෙවූ ද'යි නත් දෙඩයි. මෙසේ ඇතුළුගමට පිවිසියේ වාචසික නො සරුප්බව දක්වයි. මේ වාචසික ප්‍රාගල්භ්‍යය යි.

චෛතසික ප්‍රාගල්භ්‍යය කවරේ යත්: මෙහි කිසිවෙක් උසස් කුලයෙන් නො පැවිදි වූයේ උසස් කුලයෙන් පැවිදි වූවහු සමග සිතින් තමා සදෘශයකු කෙරෙයි. ගැහැවිමහසල්කුලයෙන් නො පැවිදි වූයේ ගැහැවිමහසල්කුලයෙන් පැවිදි වූවකු සමග සිතින් තමා සමාන කෙරෙයි. බොහෝ සැපත් ඇති කුලයෙන් නො පැවිදි වූයේ බොහෝ සැපත් ඇති කුලයෙන් පැවිදි වූවකු හා සිතින් තමා සමාන කෙරෙයි. සෞත්‍රාන්තික නො වූයේ සූත්‍රාන්තයෙහි සෙදුණහු හා සිතින් තමා සමාන කෙරෙයි. විනයධර නොවූයේ – ධර්මකථික නො වූයේ -ආරණ්‍යක නො වූයේ-පිණ්ඩපාතික නො වූයේ-පාංශුකූලික නො වූයේ-ත්‍රෛචීවරික නො වූයේ-සපදානචාරික නො වූයේ-ඛලුපච්ඡාභත්තික නො වූයේ - නෛසජ්ජික නො වූයේ - යථාසන්ථතිකාඞ්ග නො වූයේ යථාසන්ථතිකාඞ්ග ඇත්තහු හා සිතින් තමා සමාන කෙරෙයි. ප්‍රථමධ්‍යානලාභී නො වූයේ ප්‍රථමධ්‍යානලාභී වූවහු හා සිතින් තමා සමාන කෙරෙයි. ද්විතීයධ්‍යානලාභී නො වූයේ - තෘතීයධ්‍යානලාභී නො වූයේ - චතුර්ථධ්‍යානලාභී නො වූයේ - ආකාසානඤ්චායතනසමාපත්තිලාභී නො වූයේ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිලාභී නො වූයේ - ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිලාභී නො වූයේ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී නො වූයේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වූවහු හා සිතින් තමා සමාන කෙරෙයි. මේ චෛතසික ප්‍රාගල්භ්‍යය යි.

**පාගබ්භියං න සික්ඛෙය්‍යාති** - පාගබ්භියං න සික්ඛෙය්‍ය න චරෙය්‍ය න ආචරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍ය, පාගබ්භියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, පාගබ්භියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - පාගබ්භියං න සික්ඛෙය්‍ය.

**කථං විග්ගාහිකං න කථයෙය්‍යාති** - කතමා විග්ගාහිකා කථා? ඉධෙකච්චො එවරූපිං කථං කත්තා හොති: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති වුත්තං හෙතං භගවතා: "විග්ගාහිකාය ඛො මොග්ගල්ලාන කථාය සති කථාබාහුල්ලං පාටිකඞ්ඛං, කථාබාහුල්ලෙ සති උද්ධච්චං, උද්ධතස්ස අසංවරො, අසංවුතස්ස ආරා චිත්තං සමාධිම්හා"ති.a

**කථං විග්ගාහිකං න කථයෙය්‍යාති** විග්ගාහිකං කථං න කථෙය්‍ය න භණෙය්‍ය න දීපෙය්‍ය න වොහරෙය්‍ය; විග්ගාහිකං කථං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය; විග්ගාහිකකථාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - කථං විග්ගාහිකං න කථයෙය්‍ය.

තෙනාහ භගවා:

"න ච කත්ථිකො සියා භික්ඛු
න ච වාචං පයුත්තං භාසෙය්‍ය,
පාගබ්භියං න සික්ඛෙය්‍ය
කථං විග්ගාහිකං න කථයෙය්‍යා"ති.

**14 - 17**

මොසවජ්ජෙ න නීයෙථ
සම්පජානො සඨානි න කයිරා,
අථ ජීවිතෙන පඤ්ඤාය
සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ.

**මොසවජ්ජෙ න නීයෙථාති** - මොසවජ්ජං වුච්චති මුසාවාදො; ඉධෙකච්චො සභාගතො වා පරිසගතො වා -පෙ- ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති.b ඉදං වුච්චති මොසවජ්ජං. අපි ච තීහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති; භණන්තස්ස හොති 'මුසා භණාමී'ති; භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. ඉමෙහි තීහාකාරෙහි මුසාවාදො හොති. අපි ච චතූහාකාරෙහි පඤ්චහාකාරෙහි - ඡහාකාරෙහි - සත්තහාකාරෙහි - අට්ඨහාකාරෙහි මුසාවාදො හොති; පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති; භණන්තස්ස හොති 'මුසා භණාමී'ති; භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය සඤ්ඤං, විනිධාය භාවං, ඉමෙහි අට්ඨහාකාරෙහි මුසාවාදො හොති.

---

a. සත්තකඞ්ගුත්තර - අව්‍යාකතවග්ග

b. මජ්ඣිමනිකාය - සාලෙය්‍යසුත්ත, තිකඞ්ගුත්තර - පුග්ගලවග්ග.

**පාගබ්භියං න සික්ඛෙය්‍ය** - ප්‍රගල්භ බවෙහි නො හික්මෙන්නේ යැ, නො හැසිරෙන්නේ යැ, හාත්පසින් නො හැසිරෙන්නේ යැ, මොනවට නො හැසිරෙන්නේ යැ, සමාදන් වැ නො පවත්නේ යැ. ප්‍රගල්භ බව හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණු වන්නේ යැ. ප්‍රාගල්භ්‍යයෙන් දුරු වූයේ වෙන්වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, බැහැර වූයේ පහව ගියේ විප්‍රමුක්ත - විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වසන්නේ නුයි 'පාගබ්භියං න සික්ඛෙය්‍ය' යනු වේ.

**කථං විග්ගාහිකං න කථෙය්‍ය** - විග්‍රාහිකකථාව කවර යත්: මෙහි කිසිවෙක් මෙබඳු කථාව කරන්නේ වෙයි: 'තෙපි මේ ධම්විනය නො දනිවු... ඉදින් පොහොනවූ නම් මුදගනිවු' යැයි. මේ වදාරන ලද මැය බුදුන් විසින්: "මුගලන, විග්‍රාහික කථාව ඇති කල්හි කථාබාහුල්‍යය කැමැති විය යුතු යැ. කථාබාහුල්‍යය ඇති කල්හි ඖද්ධත්‍යය වෙයි. උද්ධතයා හට අසංවරය වේ. සංවර රහිත වූවහුගේ සිත සමාධියෙන් දුරු වේ යැ"යි.

**කථං විග්ගාහිකං න කථෙය්‍ය** - විග්‍රාහික කථාව නො කියන්නේ යැ, නොබණන්නේ යැ, නො දක්වන්නේ යැ, නො වහරන්නේ යැ, විග්‍රාහික කථාව හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. විග්‍රාහික කථාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ; නික්මැගියේ පහවැගියේ වෙසෙසින් මිදුණේ වන්නේ යැ. විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'කථං විග්ගාහිකං න කථෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න ච කත්ථිතා සියා භික්ඛු -පෙ- කථං විග්ගාහිකං න කථෙය්‍ය"යි

## 14 - 17

සම්‍යක් ප්‍රඥ ඇති මහණ තෙම මුසවා කිණිමෙහි නො යෙදෙන්නේ යැ. කපටිකම් නො කරන්නේ යැ. ගැලි දිවි පැවැත්මෙන් ප්‍රඥවෙන් හා ශීලව්‍රතයෙන් අන්‍යයන් ඉක්මවා නො සිතන්නේ යි.

**මොසවජ්ජෙ න නියෙථ** - 'මොසවජ්ජ'යි මෘෂාවාදය කියනු ලැබෙයි. මෙහි කිසිවෙක් සභාවට ගියේ හෝ පිරිස් වෙත ගියේ හෝ...අල්පමාත්‍ර ලාභයක් හෙතු කොට හෝ දනැ දනැ බොරු කියන්නේ වෙයි. මේ 'මොසවජ්ජ'යි කියනු ලැබේ. තවද තුන් අයුරෙකින් මෘෂාවාදය වෙයි: පළමු මැ ඔහුට 'මෘෂා කියන්නෙමි' සිත වෙයි, කියන්නාහුට 'මෘෂා කියමි' සිත වෙයි, කීවහුට 'මා විසින් මෘෂා කියන ලදැ'යි සිත වේ යයි. මේ තුන් අයුරෙන් මෘෂාවාදය වේ. තවද සතර අයුරෙකින් - පස් අයුරෙකින්- ෂඩාකාරයෙකින් - සත් අයුරෙකින් - අට අයුරෙකින් මෘෂාවාදය වෙයි: පළමු මැ ඔහුට 'මුසවා කියන්නෙමි' සිත වෙයි. කියන්නාහුට 'මුසවා කියමි' සිත වෙයි. කීවහුට 'මා විසින් මුසවා කියන ලදැ'යි සිත වෙයි. ලබ්ධිය සඟවා, කැමැත්ත සඟවා, රුචිය සඟවා, සංඥව සඟවා, භාවය සඟවා; මේ අෂ්ටාකාරයෙන් මෘෂාවාදය වේ.

**මොසවජ්ජෙ න නීයෙථාති** - මොසවජ්ජෙන න යායෙය්‍ය න නීයෙය්‍ය න වුය්හෙය්‍ය න සංහරෙය්‍ය, මොසවජ්ජං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය; මොසවජ්ජා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති - මොසවජ්ජෙ න නීයෙථ.

**සම්පජානො සඨානි න කයිරාති** - කතමං සාඨෙය්‍යං? ඉධෙකච්චො සඨො හොති පරිසඨො. යං තත්ථ සඨං සඨතා සාඨෙය්‍යං කක්කරතා කක්කරියං පරික්ඛත්තතා පාරික්ඛත්තියං, ඉදං වුච්චති සාඨෙය්‍යං.[a]

**සම්පජානො සඨානි න කයිරාති** - සම්පජානො හුත්වා සාඨෙය්‍යං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය, සාඨෙය්‍යං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය; සාඨෙය්‍යා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති - සම්පජානො සඨානි න කයිරා.

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙති** - 'අථා'ති පදසන්ධි -පෙ- පදානුපුබ්බතා එතං අථාති. ඉධෙකච්චො ලූඛජීවිකං ජීවන්තො පරං පණීතජීවිකං ජීවන්තං අතිමඤ්ඤති: කිං පනායං බහුලාජීවො සබ්බං සම්භක්ඛති, සෙය්‍යථීදං: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[1] අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං, අසනිවිචක්ක[2] දන්තකූටං සමණප්පවාදෙනාති[3]. සො තාය ලූඛජීවිකාය පරං පණීතජීවිකං ජීවන්තං අතිමඤ්ඤති. ඉධෙකච්චො පණීතජීවිකං ජීවන්තො පරං ලූඛජීවිකං ජීවන්තං අතිමඤ්ඤති: "කිං පනායං අප්පපුඤ්ඤො අප්පෙසක්ඛො න ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන"න්ති. සො තාය පණීතජීවිකාය පරං ලූඛජීවිකං ජීවන්තං අතිමඤ්ඤති. ඉධෙකච්චො පඤ්ඤාසම්පන්නො හොති, සො පුට්ඨො පඤ්හං විස්සජ්ජෙති. තස්ස එවං හොති: අහමස්මි පඤ්ඤාසම්පන්නො; ඉමෙ පනඤ්ඤෙ න පඤ්ඤාසම්පන්නාති. සො තාය පඤ්ඤාසම්පදාය පරං අතිමඤ්ඤති. ඉධෙකච්චො සීලසම්පන්නො හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. තස්ස එවං හොති: 'අහමස්මි සීලසම්පන්නො ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ දුස්සීලා පාපධම්මා'ති. සො තාය සීලසම්පදාය පරං අතිමඤ්ඤති. ඉධෙකච්චො වතසම්පන්නො හොති: ආරඤ්ඤිකො වා පිණ්ඩපාතිකො වා පංසුකූලිකො වා තෙචීවරිකො වා සපදානචාරිකො වා ඛලුපච්ඡාභත්තිකො වා නෙසජ්ජිකො වා යථාසන්ථතිකො වා. තස්ස එවං හොති: 'අහමස්මි වතසම්පන්නො. ඉමෙ පනඤ්ඤෙ න වතසම්පන්නා'ති. සො තාය වතසම්පදාය පරං අතිමඤ්ඤති.

---

1. ඵලුබීජං - සිමු. II. ‌ ‌ 2. අසනිවිචක්කං - සිමු. II.
3. සමණප්පවාදෙනාති - සිමු. II අසනිවිචක්කදන්තකූටසමණප්පවාදෙනාති - මජසං. අසනිවිචක්කදන්තකූටසමණප්පවාදෙනාතිඅණණපි - PTS.

a. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**මොසවජ්ජෙ න නියෙථ** – මෘෂාවාදයෙහි නො යවනු ලබන්නේ යැ නො කියනු ලබන්නේ යැ නො වහනු ලබන්නේ යැ නො හරිනු ලබන්නේ යැ, මෘෂාවාදය හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අභාවයට පමුණුවන්නේ යැ, මෘෂාවාදයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ බැහැර වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විමර්යාදීකෘත සිතින් යුක්ත ව වෙසෙන්නේ නුයි 'මොසවජ්ජෙ න නියෙථ' යනු වේ.

**සම්පජානො සඨානි න කයිරා** – 'සාඨෙය්‍ය' කවරැ යත්: මෙහි කිසිවෙක් ශඨ වූයේ හාත්පසින් ශඨ වූයේ වෙයි. එහි යම් (අසද්ගුණදක්වන) කෛරාටික බවෙක් ශඨබවෙක් ශාඨ්‍යයෙක් කර්කශබවෙක් ඉතා කර්කශ බවෙක් දෘඩ කර්කශ බවෙක් ඉතා දෘඩ කර්කශ බවෙක් වේ ද, මේ 'සාඨෙය්‍ය'යි කියනු ලැබෙයි.

**සම්පජානො සඨානි න කයිරා** – දැනගෙන ශඨබව නො කරන්නේ යැ නො දනවන්නේ යැ නූපදවන්නේ යැ වෙසෙසින් නූපදවන්නේ යැ, ශාඨ්‍යය හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අභාවයට පමුණුවන්නේ යැ; ශාඨ්‍යයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ පහවැගියේ විප්‍රමුක්ත විසංයුක්ත වූයේ විමර්යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'සම්පජානො සඨානි න කයිරා' යනු වේ.

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ** – 'අථ' යනු පදසන්ධි යැ...පදානුපූර්වීතා යැ තෙල 'අථ' යනු. මෙහි කිසිවෙක් රූක්ෂ ජීවිකාවෙන් ජීවත්වනුයේ මෙරමා ප්‍රණීතජීවිකාවෙන් ජීවත්වන්නහු ව අවමන් කෙරෙයි: 'මේ කවරෙක් ද ? බහුලාජීව ඇතියේ සියල්ල කාදමයි. ඒ මෙසේ යැ: මූලබීජ යැ ස්කන්ධබීජ යැ පර්වබීජ යැ අග්‍රබීජ යැ බීජබීජය මැ පස්වැනි වෙයි. මොහුගේ දත්කුල සෙනවලල්ලෙකි. එහෙත් ප්‍රවාද-යෙන් ශ්‍රමණ ය'යි. හෙතෙම ඒ රූක්ෂජීවිකාව හෙතු කොට ගෙන ප්‍රණීතජීවිකාවෙන් ජීවත්වන මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් ප්‍රණීතජීවිකාවෙන් ජීවත්වනුයේ රළුදිවියෙන් ජීවත්වන මෙරමා ඉක්මවා සිතයි: 'මේ කවරෙක් ද ? මඳපිනැත්තෙක අල්පයශස්කයෙක චීවර-පිණ්ඩපාත - සෙනාසන – ගිලන්පසබෙහෙත්පිරිකර නො ලබන පුල්ලෙකැ යි. හෙතෙම ඒ ප්‍රණීතජීවිකාව හෙතු කොටගෙන රළුදිවියෙන් ජීවත්වන මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් නුවණැත්තේ වෙයි. හෙතෙම විචාරන ලදුයේ පැන විසඳයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මම ප්‍රඥා-සම්පන්නයෙම් වෙමි. මේ අන්‍යයෝ වැලිත් ප්‍රඥාසම්පන්නයෝ නො වෙති' යි. හේ ඒ ප්‍රඥාසම්පත්තියෙන් මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් ශීල-සම්පන්න වෙයි: ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවර වූයේ ආචාරගොචර දෙකින් යුක්ත වූයේ අණුමාත්‍ර දොෂයෙහි භයදක්නා සුලු වැ වෙසෙයි. ශික්ෂාකොට්ඨා-සයන් සමාදන් වැ හික්මෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මම ශීල-සම්පන්නයෙම් වෙමි. මේ අන්‍යයෝ දුශ්ශීලයෝ යැ, පාපධර්මී ඇත්තාහ'යි. හේ ඒ ශීලසම්පත්තියෙන් මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් ව්‍රතසම්පන්න වෙයි: ආරණ්‍යක හෝ පිණ්ඩපාතික හෝ පාංශුකූලික හෝ තෙචීවරික හෝ සපදානචාරික හෝ ඛලුපච්ඡාභත්තික හෝ නෙසජ්ජික හෝ යථාසන්ථතික හෝ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම ව්‍රතසම්පන්නයෙම් වෙමි, මේ අන්‍යයෝ ව්‍රතසම්පන්නයෝ නො වෙති' යි. හේ ඒ ව්‍රතසම්පත්තියෙන් මෙරමා ඉක්මවා සිතයි.

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙති** – ලූඛජීවිකාය වා පණීතජීවිකාය වා පඤ්ඤාසම්පදාය වා සීලසම්පදාය වා වතසම්පදාය වා පරං නාතිමඤ්ඤෙය්‍ය නාවජානෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති – අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ.

තෙනාහ භගවා:

"මොසවජ්ජෙ න නිය්‍යෙථ
සම්පජානො සඨානි න කයිරා,
අථ ජීවිතෙන පඤ්ඤාය
සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ"ති.

## 14 - 18

සුත්වා දූසිතො[1] බහුං වාචං
සමණානං වා පුථුවචනානං,
ඵරුසෙන නෙ න පටිවජ්ජා
න හි සන්තො පටිසෙනිං[2] කරොන්ති.

**සුත්වා දූසිතො බහුං වාචං සමණානං වා පුථුවචනානන්ති** – 'දූසිතො'ති දූසිතො ඛුංසිතො ඝට්ටිතො වම්භිතො ගරහිතො උපවදිතො; සමණාති යෙ කෙචි ඉතො බහිද්ධා පරිබ්බාජූපගතා පරිබ්බාජසමාපන්නා; පුථුවචනානන්ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච තෙ බහුකාහි වාචාහි අනිට්ඨාහි අකන්තාහි අමනාපාහි අක්කොසෙය්‍යුං පරිභාසෙය්‍යුං රොසෙය්‍යුං විරොසෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං කරෙය්‍යුං; තෙසං බහුවාචං අනිට්ඨං අකන්තං අමනාපං සුත්වා සුණිත්වා උග්ගහිත්වා උපධාරයිත්වා උපලක්ඛයිත්වාති – සුත්වා දූසිතො[1] බහුං වාචං සමණානං වා පුථුවචනානං.

**ඵරුසෙන නෙ න පටිවජ්ජාති** – 'ඵරුසෙනා'ති ඵරුසෙන කක්ඛළෙන; න පටිවජ්ජා න පටිභණෙය්‍ය, අක්කොසන්තං න පච්චක්කොසෙය්‍ය, රොසන්තං නප්පටිරොසෙය්‍ය, භණ්ඩන්තං න පටිභණ්ඩෙය්‍ය, න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – ඵරුසෙන නෙ න පටිවජ්ජා.

1. රුසිතො - සු. 2. පටිසෙනි - සු

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ** - රූක්ෂ ජීවිකාවෙන් හෝ ප්‍රණීතජීවිකාවෙන් හෝ ප්‍රඥාසම්පත්තියෙන් හෝ ශීලසම්පත්තියෙන් හෝ ව්‍රතසම්පත්තියෙන් හෝ මෙරමා ඉක්මවා නො සිතන්නේ යෑ, අවමන් නො කරන්නේ යෑ, ඒ රූක්ෂජීවිකාදිය හේතු කොටගෙන මානය නූපදවන්නේ යෑ, එයින් තද වූයේ වෙසෙසින් තද වූයේ නැඟූ හිස ඇතියේ නො වන්නේ යෑයි - 'අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“මොසවජ්ජෙ න නීයෙථ -පෙ- සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ”යි.**

**14 - 18**

බැහැරි ශ්‍රමණුන්ගේ හෝ බොහෝ ක්ෂත්‍රියාදීන්ගේ හෝ අනිටු වූ බොහෝ බස් අසා ගැටුණේ රළු බසින් ඔවුන්ට පෙරළා නො කියන්නේ යෑ. යම් හෙයකින් සත්හුත් රාගාදි කෙලෙස් ඇත්තාහු ප්‍රතිපක්ෂ බව නො කෙරෙත් ද, එහෙයිනි.

**සුත්වා දූසිතො බහුං වාචං සමණානං වා පුථුවචනානං** - 'දූසිතො' යනු: දූෂ්‍ය වූයේ ආක්‍රෝශ කරන ලදුයේ ගටන ලදුයේ අවඥා කරනු ලදුයේ ගර්හා කරන ලදුයේ නුගුණ කියන ලදුයේ; සමණ නම්: මෙ සස්නෙන් බැහැර පැවිද්දට පැමිණියාහු පරිව්‍රාජ බවට පැමිණියාහු; පුථුවචනානං - ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණ - වෛශ්‍ය - ශූද්‍ර - ගෘහස්ථ - ප්‍රව්‍රජිත - දෙව - මනුෂ්‍යයෝ ද; ඔහු අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ බොහෝ වචනයන්ගෙන් ආක්‍රෝශ කරන්නාහු ය, පරිභව කරන්නාහු ය, කොප කරන්නාහු ය, වෙසෙසින් කොප කරන්නාහු ය, හිංසා කරන්නාහු ය, වෙහෙසන්නාහු ය, පෙළන්නාහු ය, වෙසෙසින් පෙළන්නාහු ය, නසන්නාහු ය, වෙසෙසින් නසන්නාහු ය, උපඝාත කරන්නාහු ය. ඔවුන්ගේ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ බොහෝ බස් අසා, ශ්‍රවණය කොට, ගෙන, විමසා සලකා නුයි - 'සුත්වා දූසිතො බහුං වාචං සමණානං වා පුථුවචනානං' යනු වේ.

**ඵරුසෙන තෙ න පටිවජ්ජා** - 'ඵරුසෙන' යනු: පරුෂ වූ කර්කශ වූ බසින්; **න පටිවජ්ජා** - පෙරළා නො කියන්නේ යෑ, ආක්‍රෝශ කරන්නහුට පෙරළා ආක්‍රෝශ නො කරන්නේ යෑ, කොප කරන්නහුට පෙරළා කොප නො කරන්නේ යෑ, ඩබර කරන්නහුට පෙරළා ඩබර නො කරන්නේ යෑ, කලහ නො කරන්නේ යෑ, භණ්ඩන - විග්‍රහ - විවාද - මෙධග නො කරන්නේ යෑ, කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධග හරනේ යෑ, දුරු කරන්නේ යෑ, විගතාන්ත කරන්නේ යෑ, අනභාවයට පමුණුවන්නේ යෑ, කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යෑ, නික්මුණේ නික්මැගියේ විප්‍රමුක්ත විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් වෙසෙන්නේ නුයි 'ඵරුසෙන තෙ න පටිවජ්ජා' යනු වේ.

**න හි සන්තා පටිසෙනිං කරොන්තීති** – 'සන්තො'ති රාගස්ස සන්තත්තා සන්තො, දොසස්ස – මොහස්ස – කොධස්ස – උපනාහස්ස –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො, උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති 'සන්තො'.

**න හි සන්තා පටිසෙනිං කරොන්තීති** සන්තො පටිසෙනිං පටිමල්ලං පටිකණ්ඨකං පටිපක්ඛං න කරොන්ති න ජනෙන්ති න සඤ්ජනෙන්ති න නිබ්බත්තෙන්ති නාභිනිබ්බත්තෙන්තීති – න හි සන්තා පටිසෙනිං කරොන්ති.

තෙනාහ භගවා:

"සුත්වා දූසිතො බහුං වාචං[1]
සමණානං පුථුවචනානං,
ඵරුසෙන නෙ න පටිවජ්ජා
න හි සන්තො පටිසෙනිං කරොන්තී"ති.

**14 – 19**

එතඤ්ච ධම්මමඤ්ඤාය
විචිනං භික්ඛු සදා සතො සික්ඛෙ,
සන්තීති නිබ්බුතිං ඤත්වා
සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය.

**එතඤ්ච ධම්මමඤ්ඤායාති** – 'එත'න්ති ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවටං විභත්තං උත්තානීකතං පකාසිතං. **ධම්මමඤ්ඤායාති** ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති එවම්පි – එතඤ්ච ධම්මමඤ්ඤාය. අථවා, සමඤ්ච විසමඤ්ච පථඤ්ච විපථඤ්ච සාවජ්ජඤ්ච අනවජ්ජඤ්ච හීනඤ්ච පණීතඤ්ච කණ්හඤ්ච සුක්කඤ්ච විඤ්ඤූගරහිතඤ්ච විඤ්ඤුප්පසත්ථඤ්ච ධම්මං අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති එවම්පි එතඤ්ච ධම්මමඤ්ඤාය. අථවා සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං සීලෙසු පරිපූරකාරිතං ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතං භොජනෙ මත්තඤ්ඤුතං ජාගරියානුයොගං සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං ධම්මං අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති එවම්පි – එතඤ්ච ධම්මමඤ්ඤාය.

**විචිනං භික්ඛු සදා සතො සික්ඛෙති** – 'විචින'න්ති විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තොති විචිනං භික්ඛු; සදාති සදා සබ්බදා සබ්බකාලං –පෙ– පච්ඡිමෙ වයොඛන්ධෙ; සතොති චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො –පෙ– සො වුච්චති සතො.

1. බහුවාචං - සීමු. II.

**ත හි සන්තා පටිසෙනිං කරොන්ති** - 'සන්තො' යනු: රාගය ශාන්ත වන බැවින් ශාන්ත යැ, ද්වේෂය - මෝහය - උපනාහය... සියලු අකුශලාභි-සංස්කාරයන් ශාන්ත - ශමිත - ව්‍යුපශමිත වන බැවින් දවන ලද - නිවන ලද - විගත කළ - උරලන ලද බැවින් ශාන්ත - උපශාන්ත - ව්‍යුපශාන්ත - නිර්වෘත - පටිප්පස්සද්ධ හුයි ශාන්ත යැ.

**න හි සන්තො පටිසෙනිං කරොන්ති** - ශාන්ත වූවාහු ප්‍රතිවිරුද්ධය ප්‍රතිමල්ල බව ප්‍රතිභණ්ඩනය ප්‍රතිපක්ෂ බව නො කෙරෙති, නො දනවති, නූපදවති, නො නිපදවති, නො පහළ කෙරෙත් හුයි 'න හි සන්තො පටිසෙනිං කරොන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සුත්වා දුසිතො බහුං වාචං -පෙ- න හි සන්තො පටිසෙනිං කරොන්ති"**යි

## 14 - 19

මහණ තෙමේ තෙල (යථොක්ත) ධර්මය දැන (අනිත්‍යාදිය) විමසනුයේ සියලු කල්හි ස්මෘතිමත් වූයේ (ත්‍රිවිධ ශික්ෂාවෙහි) හික්මෙන්නේ යැ. (රාගාදීන්ගේ) නිවීම ශාන්තිය යි දැන ගෞතම්බුද්ධශාසනයෙහි නො පමා වන්නේ යි.

**එතඤ්ච ධම්මමඤ්ඤාය** - 'එතං' යනු: කියන ලද දෙසන ලද පන-වන ලද පිහිටුවන ලද විවෘත කළ විභාග කළ ප්‍රකට කළ ප්‍රකාශ කළ; **ධම්මමඤ්ඤාය** - දැන තුලනය කොට තීරණය කොට විභාවනය කොට ප්‍රකාශ කොට හුයි මෙසේත් 'එතඤ්ච ධම්මමඤ්ඤාය' යනු වේ. නොහොත් (කායසුචරිතාදි) සමය ද (කායදුශ්චරිතාදි) විෂමය ද දශකුශලකර්මපථය ද දශ අකුශලකර්මපථය ද සාවද්‍ය (අකුශල) අනවද්‍ය (කුශල) හීන-ප්‍රණීත - කෘෂ්ණ-ශුක්ල - විඥයන් විසින් ගර්හිත වූ ද විඥප්‍රශස්ත වූ ද ධර්මය දැන, දැනගෙන, තුල-නය කොට, තීරණය කොට, විභාවනය කොට විභූත කොට හුයි මෙසේත් 'එතඤ්ච ධම්මමඤ්ඤාය' යනු වේ. නොහොත් සම්‍යක්ප්‍රතිපත්තිය අනුලොම ප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමොක්ෂශීලයෙහි පරිපූරකාරීත්වය ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාරතාව භොජන-යෙහි මාත්‍රඥතාව ජාගර්‍යානුයොගය ස්මෘතිසම්ප්‍රජන්‍යය සතර සතිපට්ඨාන සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය පඤ්ච බල සප්ත බොධ්‍යඞ්ග ආර්යඅෂ්ටාඞ්ගිකමාර්ගය නිර්වාණය ද නිර්වාණගාමිනී ප්‍රතිපත්තිය ද යන ධර්මය දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට හුයි මෙසේත් 'එතඤ්ච ධම්මමඤ්ඤාය' යනු වේ.

**විචිනං භික්ඛු සදා සතො සික්ඛෙ** - 'විචිනං' යනු: (සිවුසස්) සොය-නුයේ වෙන වෙන ම විසඳනුයේ (වඩනුයේ) තුලනය කරනුයේ තීරණය කරනුයේ විභාවන කරනුයේ විභූත කරනුයේ සියලු සංස්කාරයෝ අනිත්‍ය-යහ'යි...යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නැසෙන සුලු යයි වඩනුයේ වෙන වෙනම වඩනුයේ තුලනය කරනුයේ තීරණය කරනුයේ විභාවනය කරනුයේ විභූත කරනුයේ හුයි 'විචිනං භික්ඛු' යනු වේ. **සදා** යනු: සැමදා සියලු කල...පශ්චිම වයස්හි; **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ...හෙතෙම 'සිහි ඇතියේ' යයි කියනු ලැබේ.

**සික්ඛෙති** තිස්සො සික්ඛායො: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය -පෙ- සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'විවිත්තං භික්ඛු සදා සතො සික්ඛෙ'.

**සන්තීති නිබ්බුතිං ඤත්වාති** - රාගස්ස නිබ්බුතිං සන්තීති ඤත්වා, දොසස්ස - මොහස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං නිබ්බුතිං සන්තීති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති - සන්තීති නිබ්බුතිං ඤත්වා.

**සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍යාති** - ගොතමස්ස සාසනෙ බුද්ධසාසනෙ ජිනසාසනෙ තථාගතසාසනෙ දෙවදෙවසාසනෙ[1] අරහන්තසාසනෙ; නප්පමජ්ජෙය්‍යාති සක්කච්චකාරී අස්ස සාතච්චකාරී අට්ඨිතකාරී අනොලීනවුත්තිකො අනික්ඛිත්තඡන්දො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු 'කදාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං -පෙ- අපරිපූරං වා සමාධික්ඛන්ධං - පඤ්ඤාක්ඛන්ධං විමුත්තික්ඛන්ධං - විමුත්තිඤාණදස්සනක්ඛන්ධං- කදාහං අපරිඤ්ඤාතං වා දුක්ඛං පරිජානෙය්‍යං, අප්පහීනෙ වා කිලෙසෙ පජහෙය්‍යං, අභාවිතං වා මග්ගං භාවෙය්‍යං, අසච්ඡිකතං නිරොධං සච්ඡිකරෙය්‍ය'න්ති. යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච ථාමො ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසූති - සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය.

තෙනාහ භගවා:

"එතඤ්ච ධම්මමඤ්ඤාය
විවිත්තං භික්ඛු සදා සතො සික්ඛෙ,
සන්තීති නිබ්බුතිං ඤත්වා
සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍යා"ති.

### 14 - 20

අභිභූ හි සො අනභිභූතො
සක්ඛිධම්මමනීතිහමදස්සී,
තස්මා හි තස්ස භගවතො සාසනෙ
අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති. (භගවා)

1. දෙවසාසනෙ - සීමු. II. PTS. මජසං.

**සික්ඛෙ** යනු: ශික්‍ෂා තුනෙකි: අධිශීලශික්‍ෂා යැ, අධිචිත්තශික්‍ෂා යැ, අධිප්‍රඥශික්‍ෂා යැයි. මෝ අධිප්‍රඥශික්‍ෂා නමි. මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙත්තේ යැ,...හික්මෙත්තේ යැ හැසිරෙත්තේ යැ මැනැවින් හැසිරෙන්නේත් යැ සමාදන් වැ පවත්තේ නුයි 'විචිතං භික්ඛු සදා සතො සික්ඛෙ' යනු වේ.

**සන්තීති නිබ්බුතිං ඤත්වා**-රාගයාගේ නිවීම ශාන්තිය යි දැන ද්වේෂයාගේ මෝහයාගේ...සියලු අකුශලාභිසංස්කාරයන්ගේ නිවීම 'ශාන්තිය'යි දැන දැනගෙන තුලනය - තීරණය - විභාවනය - විභූත කොට නුයි 'සන්තීති නිබ්බුතිං ඤත්වා' යනු වේ.

**සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය** - ගෞතමයන්ගේ ශාසනයෙහි බුද්ධශාසනයෙහි ජිනශාසනයෙහි තථාගතශාසනයෙහි දෙවදෙවයන්ගේ ශාසනයෙහි අර්හත්ශාසනයෙහි; **නප්පමජ්ජෙය්‍ය** - සකස් කොට කරන සුලු වන්නේ යැ, සතතභාවයෙන් කරන සුලු වූයේ නො නැවත කරන සුලු වූයේ නො හැකුළුණු පැවතුම් ඇතියේ කුශලධර්මයන්හි නො නැඹූ වීර්‍යච්ඡන්ද ඇතියේ නො නැඹූ වීර්‍යධුර ඇතියේ 'කවදා මම් නො පිරිපුන් ශීලස්කන්ධය හෝ පුරම් ද...නො පිරිපුන් සමාධිස්කන්ධය හෝ-ප්‍රඥස්කන්ධය - විමුක්තිස්කන්ධය - විමුක්තිඥානදර්ශනස්කන්ධය - කවදා මම (මගනුවණින්) නො දැනගත් දුක හෝ දැනගනිම් ද, නොපුහුත් කෙලෙසුන් හෝ දුරු කෙරෙම් ද, නො වැඩූ මඟ හෝ වඩම් ද, නො පසක් කළ නිවන හෝ පසක් කෙරෙම් දැ'යි එහි යම් ඡන්දයකුත් වෑයමකුත් උත්සාහයකුත් දැඩි උත්සාහයකුත් නො නැවැත්මකුත් සිහියකුත් නුවණකුත් වේ ද, (එබඳු වූ) කෙලෙස් තවන වීර්‍යය උත්තමවීර්‍යය අභිෂ්ඨානය නැවත නැවත යෙදීම කුශලධර්මයන්හි අප්‍රමාදය නුයි 'සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"එතදඤ්ඤාය ධම්මමඤ්ඤාය**-පෙ-**සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය"**යි

**14 - 20**

රූපාදිය අභිභවනය කළා වූ ඒ බුදුහු (කෙලෙසුන් විසින්) නො මැඩුණේ 'මෙසේ වී ලැ'යි නො තකන ලද ආත්මප්‍රත්‍යක්‍ෂ වූ ධර්මය යම් හෙයකින් දුටු සේක් ද, එහෙයින් මැ ඒ භාග්‍යවතුන්ගේ ශාසනයෙහි නො පමා වූයේ සියලු කල්හි (ඒ බුදුනට නිදෙරින්) නමස්කාර කෙරෙමින් (ත්‍රිවිධ ශික්‍ෂායෙහි) හික්මෙත්තේ යැයි (බුදුහු වදාළ සේකි.)

**අභිභූ හි සො අනභිභූතොති** – ‘අභිභූ’ති රූපාභිභූ සද්දාභිභූ ගන්ධාභිභූ රසාභිභූ ඵොට්ඨබ්බාභිභූ ධම්මාභිභූ, අනභිභූතො කෙහිචි කිලෙසෙහි; අභිභොසි[1] නෙ භීතෙ පාපකෙ අකුසලෙ ධම්මෙ සංකිලෙසිකෙ පොනොබ්භවිකෙ සදරෙ දුක්ඛවිපාකෙ ආයතිං ජාතිජරාමරණියෙති – අභිභූ හි සො අනභිභූතො.

**සක්ඛිධම්මමනීතිහමදස්සීති** – ‘සක්ඛිධම්ම’න්ති න ඉතිහීතිහං න ඉතිකිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයමභිඤ්ඤාතං අත්තපච්චක්ඛධම්මං අදස්සි අද්දක්ඛි අපස්සි පටිවිජ්ඣීති – සක්ඛිධම්මමනීතිහමදස්සි.

**තස්මා හි තස්ස භගවතො සාසනෙති** – ‘තස්මා’ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානං. තස්ස භගවතො සාසනෙති තස්ස භගවතො සාසනෙ ගොතමසාසනෙ බුද්ධසාසනෙ ජිනසාසනෙ තථාගතසාසනෙ දෙවදෙවසාසනෙ අරහන්තසාසනෙති – තස්මා හි තස්ස භගවතො සාසනෙ.

**අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති භගවාති** – ‘අප්පමත්තො’ති සක්කච්චකාරී –පෙ– අප්පමාදො කුසලෙසු ධම්මෙසු, සදාති සදා සබ්බදා සබ්බකාලං –පෙ– පච්ඡිමෙ වයොඛන්ධෙ; නමස්සන්ති කායෙන වා නමස්සමානො වාචාය වා නමස්සමානො චිත්තෙන වා නමස්සමානො අන්වත්ථපටිපත්තියා වා නමස්සමානො ධම්මානුධම්මපටිපත්තියා වා නමස්සමානො සක්කරමානො ගරුං කුරුමානො මානයමානො පූජයමානො අපචයමානො. අනුසික්ඛෙති තිස්සො සික්ඛායො: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා –පෙ– අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය –පෙ– සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය චරෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍ය; භගවාති ගාරවාධිවචනං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති – අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති භගවා.

තෙනාහ භගවා:

> “අභිභූ හි සො අනභිභූතො
> සක්ඛිධම්මමනීතිහමදස්සී,
> තස්මා හි තස්ස භගවතො සාසනෙ
> අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති. (භගවා”ති.)

**තුවටකසුත්තනිද්දෙසො සමත්තො**
**චුද්දසමො.**

---

1. අභිභූ හි - සිමු II. මජසං. PTS. අභිභොසි - ස.

**අභිභූ හි සො අනභිභූතො** – 'අභිභූ' යනු: රූපයන් අභිභවනය කෙළේ ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය - ධර්මයන් අභිභවනය කෙළේ, කිසි කෙලෙස් කෙනකුන් විසින් අනභිභූත වූයේ (-නො මැඩුණේ) කෙලශ-ප්‍රත්‍යය වූ පුනර්භවය දෙන්නා වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරාමරණයට කාරණ වූ ඒ නීච වූ ලාමක වූ අකුශලධර්මයන් අභිභවනය කෙළේ නුඹ 'අභිභූ හි සො අනභිභූතො' යනු වේ.

**සක්ඛිධම්මමනීතිහමද්දසී** – 'සක්ඛිධම්මං' යනු: 'මෙසේ මෙසේ වීලු'යි ඇසී වූ, මේ 'මෙසේ ලූ'යි නො වූ, පරම්පරාකථාවෙන් නො වූ, පිටකසම්පදායෙන් නො වූ, තර්කහේතුවෙන් නො වූ, න්‍යායහේතුවෙන් නො වූ, (මේ මැනැවැයි) ආකාර සැලැකීමෙන් නො වූ, අප විසින් විමසා ගන්නා ලද දෘෂ්ටිය හා සම යයි නො වූ, තුමූ මැ තමන් විසින් අවබොධ කළ තම හට ප්‍රත්‍යක්ෂ වූ ධර්මය දුටුවහ, දර්ශනය කළහ, අවලොකනය කළහ, ප්‍රතිවෙධ කළහ'යි 'සක්ඛිධම්මමනීතිහමද්දසී' යනු වේ.

**තස්මා හි තස්ස භගවතො සාසනෙ** – 'තස්මා' යනු: එහෙයින් එ කාරණෙන් ඒ හේතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; **තස්ස භගවතො සාසනෙ** – ඒ භාග්‍යවත්හුගේ ශාසනයෙහි ගෞතමශාසනයෙහි බුද්ධ-ශාසනයෙහි ජිනශාසනයෙහි තථාගතශාසනයෙහි දෙවදෙවියන්ගේ ශාසන-යෙහි අර්හත්ශාසනයෙහි නුඹ 'තස්මා හි තස්ස භගවතො සාසනෙ' යනු වේ.

**අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති භගවා** – 'අප්පමත්තො' යනු: සකස් කොට කරන සුලු වූයේ...කුශලධර්මයන්හි අප්‍රමාද වූයේ, **සදා** යනු: සැමදා සියලුදා සියලු කල...පශ්චිම වයස් කොටසෙහි; **නමස්සං** යනු: කයින් හෝ නමස්කාර කරනුයේ වචනයෙන් හෝ නමස්කාර කරනුයේ සිතින් හෝ නමස්කාර කරනුයේ අර්ථානුගතප්‍රතිපත්තියෙන් හෝ නමස්කාර කරනුයේ ධර්මානුධර්ම (-නවලොවුතුරු දහම් හා විදසුන් ඈ) ප්‍රතිපත්තියෙන් නමස්කාර කරනුයේ සත්කාර කරනුයේ ගරු කරනුයේ බුහුමන් කරනුයේ පුදනුයේ අපචායන කරනුයේ. **අනුසික්ඛෙ**-ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා අධිචිත්තශික්ෂා අධිප්‍රඥාශික්ෂා...මේ අධිප්‍රඥා-ශික්ෂා යි: මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේ යැ... ප්‍රත්‍යක්ෂ කළ යුතු තිවන ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙන්නේ යැ, හැසිරෙන්නේ යැ මැනැවින් හැසිරෙන්නේ යැ සමාදන් වැ පවත්නේ යි. **භගවා** යනු: ගෞරවාධිවචන යැ...මේ 'භගවා' යනු: අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් හෝ සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකැ'යි 'අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙ'ති භගවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අභිභූ හි සො අනභිභූතො -පෙ- සදා නමස්සමනුසික්ඛෙති භගවා"යි

තුදුස්වැනි තුවටක සූත්‍ර නිද්දේශය සමාප්ත යි.

# 15

## අත්තදණ්ඩසුත්තනිද්දෙසො.

අථ අත්තදණ්ඩසුත්තනිද්දෙසො වුච්චති:

### 15 - 1

අත්තදණ්ඩා භයං ජාතං
ජනං පස්සථ මෙධගං,
සංවෙගං කිත්තයිස්සාමි
යථා සංවිජිතං මයා.

**අත්තදණ්ඩා භයං ජාතන්ති** – ‘දණ්ඩා’ති තයො දණ්ඩා: කායදණ්ඩො වචීදණ්ඩො මනොදණ්ඩො. තිවිධං කායදුච්චරිතං කායදණ්ඩො, චතුබ්බිධං වචීදුච්චරිතං වචීදණ්ඩො, තිවිධං මනොදුච්චරිතං මනොදණ්ඩො. භයන්ති ද්වෙ භයානි: දිට්ඨධම්මිකඤ්ච භයං සම්පරායිකඤ්ච භයං. කතමං දිට්ඨධම්මිකං භයං? ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති. තමෙනං ගහෙත්වා රඤ්ඤො දස්සෙන්ති: ‘අයං දෙව’ චොරො ආගුචාරී. ඉමස්ස යං ඉච්ඡති, තං දණ්ඩං පණෙහීති. තමෙනං රාජා පරිභාසති. සො පරිභාසපච්චයා භයං උප්පාදෙති, දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. එත්තකෙනපි රාජා න තුස්සති. තමෙනං රාජා බන්ධාපෙති අන්දුබන්ධනෙන වා රජ්ජුබන්ධනෙන වා සඞ්ඛලිකබන්ධනෙන වා වෙත්තබන්ධනෙන වා ලතාබන්ධනෙන වා පක්ඛෙපබන්ධනෙන වා පරික්ඛෙපබන්ධනෙන වා ගාමබන්ධනෙන වා නිගමබන්ධනෙන වා නගරබන්ධනෙන වා රට්ඨබන්ධනෙන වා ජනපදබන්ධනෙන වා, අන්තමසො සවචනීයම්පි කරොති ‘න තෙ ලබ්භා ඉතො පක්කමිතු’න්ති. සො බන්ධනපච්චයාපි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. එත්තකෙනපි රාජා න තුස්සති. රාජා තස්ස ධනං ආහරාපෙති: සතං වා සහස්සං වා සතසහස්සං වා. සො ධනජානිපච්චයාපි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. එත්තකෙනපි රාජා න තුස්සති. තමෙනං රාජා විවිධා කම්මකාරණා කාරාපෙති:

# 15

# අත්තදණ්ඩසුත්‍රනිද්දේශය

ඉක්බිති අත්තදණ්ඩසුත්‍ර නිද්දේශය කියනු ලැබේ.

## 15 - 1

ආත්මදණ්ඩය (-තමාගේ කායාදි දුශ්චරිතය) හෙතු කොටගෙන දෘෂ්ට-ධාර්මිකාදි) භය උපන. (එසේ කල්හි) ප්‍රතිවිරුද්ධ වූ ජනයා බලවු. මා විසින් යම්සේ (තමා මැ තම හට) සංවෙග උපදවන ලද ද, (එපරිද්දෙන්) සංවෙගය ප්‍රකාශ කරන්නෙමි.

**අත්තදණ්ඩා භයං ජාතං** - 'දණ්ඩා' යනු: දණ්ඩයෝ තිදෙනෙකි: කාය-දණ්ඩ යැ, වාග්දණ්ඩ යැ, මනොදණ්ඩ යැයි. ත්‍රිවිධ කායදුශ්චරිතය කායදණ්ඩ යැ, චතුර්විධ වාග්දුශ්චරිතය වාග්දණ්ඩ යැ, ත්‍රිවිධ මනොදුශ්චරිතය මනො-දණ්ඩ යි. භයං යනු; භය දෙකෙකි: දෘෂ්ටධාර්මිකභය යැ, සාම්පරායිකභය යි. දෘෂ්ටධාර්මිකභය කවරැ යත්: මෙලොවැ කිසිවෙක් කයින් දුශ්චරිත-යෙහි හැසිරෙයි, වචනයෙන් දුශ්චරිතයෙහි හැසිරෙයි, සිතින් දුශ්චරිත-යෙහි හැසිරෙයි, ප්‍රාණවධ ද කෙරෙයි, නුදුන් දෙය ද ගනී, ගෘහසන්ධි ද සිඳී, ගම් පැහැරීම ද ගෙවල් පැහැරීම ද මං පැහැරීම ද කෙරෙයි, පරඹුන් කරා ද යෙයි, මුසාවා ද බෙණේ. ඒ තුළුහු අල්වාගෙන 'දෙවයිනි, මේ අපරාධකාරී සොරෙක, මොහුට යමක් කැමැති නම් ඒ දඬුවම් පැණවුව මැනවැ'යි රජුට දක්වති. රජ ඔහුට පරිභව බෙණෙයි. හෙතෙම පරිභව හෙතුවෙන් බිය උපදවයි, දුක් දොම්නස් විඳී. මෙල බිය දුක් දොම්නස් ඔහුට කොයිනැ යත්: ආත්මදණ්ඩයෙන් (-තම පවින්) උපන හටගත නිපන වෙසෙසින් නිපන පහළ වී. මෙතෙකිනුදු රජ නො සතුටු වෙයි. රජ ඒ තුළුහු සිරබැඳුමෙන් හෝ රැහැන් බැඳුමෙන් හෝ හැකිලි බැඳුමෙන් හෝ වේවැල් බැඳුමෙන් හෝ ලතාබන්ධනයෙන් හෝ ප්‍රක්ෂෙ-පබන්ධනයෙන් හෝ පරික්ෂෙපබන්ධනයෙන් හෝ ග්‍රාමබන්ධනයෙන් හෝ නිගමබන්ධනයෙන් හෝ නගරබන්ධනයෙන් හෝ රාෂ්ට්‍රබන්ධනයෙන් හෝ ජනපදබන්ධනයෙන් හෝ බන්දවයි, යටත් පිරිසෙයින් 'තට මෙයින් බැහැර යන්නට නො ලැබේ'යයි (පළිබොධ සඳහා) කියැයුතු ද කෙරෙයි. හෙතෙම බන්ධන හෙතුවෙන් ද දුක් දොම්නස් විඳී. මෙල බිය දුක් දොම්නස් ඔහුට කොයිනැ යත්: ආත්මදණ්ඩයෙන් උපන හටගත නිපන වෙසෙසින් නිපන පහළ විය. මෙල පමණෙකිනු ද රජ නො සතුටු වෙයි. රජ ඔහුගේ ධනය සියයක් හෝ දහසක් හෝ සියදහසක් හෝ ගෙන්වා ගනී. හෙතෙම ධනහානිය හෙතු කොටගෙන ද දුක් දොම්නස් විඳී. මෙල බිය දුක් දොම්නස් ඔහුට කොයිනැ යත්: ආත්මදණ්ඩයෙන් උපන, හටගත නිපන වෙසෙසින් නිපන පහළ විය. මෙතෙකිනු ද රජ නො සතුටු වෙයි. රජ ඔහුට විවිධ තාඩිකර්ම කරවයි:

කසාහිපි තාළෙන්ති. වෙත්තෙහිපි තාළෙන්ති. අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති. හත්ථම්පි ඡින්දන්ති. පාදම්පි ඡින්දන්ති. හත්ථපාදම්පි ඡින්දන්ති. කණ්ණම්පි ඡින්දන්ති. නාසම්පි ඡින්දන්ති. කණ්ණනාසම්පි ඡින්දන්ති. බිළඞ්ගථාලිකම්පි කරොන්ති. සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති. රාහුමුඛම්පි කරොන්ති. ජොතිමාලිකම්පි කරොන්ති හත්ථපජ්ජොතිකම්පි කරොන්ති. එරකවත්තිකම්පි කරොන්ති. චීරකවාසිකම්පි කරොන්ති. එණෙය්‍යකම්පි කරොන්ති. බලිසමංසිකම්පි කරොන්ති. කහාපණිකම්පි කරොන්ති. ඛාරාපතච්ඡිකම්පි කරොන්ති. පලිඝපරිවත්තිකම්පි කරොන්ති. පලාලපිට්ඨිකම්පි කරොන්ති. තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති. සුනඛෙහිපි ඛාදාපෙන්ති. ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති. අසිනාපි සීසං ඡින්දන්ති. සො කම්මකාරණපච්චයාපි. දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස ? අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. රාජා ඉමෙසං චතුන්නං දණ්ඩානං ඉස්සරො.

සො සකෙන කම්මෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. තමෙනං නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කාරණං කාරෙන්ති. තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති. තත්තං අයොඛිලං දුතියෙ හත්ථෙ ගමෙන්ති. තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති. තත්තං අයොඛිලං දුතියෙ පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති. සො තත්ථ දුක්ඛා කටුකා තිප්පා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති.a එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. තමෙනං නිරයපාලා සංවෙසෙත්වා කුඨාරීහි තච්ඡන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති. තමෙනං නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා වාසීහි තච්ඡන්ති. තමෙනං නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පථවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්තිපි පච්චාසාරෙන්තිපි[2] -පෙ- තමෙනං නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි -පෙ- තමෙනං නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති. සකිම්පි අධො ගච්ඡති. සකිම්පි තිරියං ගච්ඡති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති. යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. තමෙනං නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති. සො ඛො පන මහානිරයො:

1. කරණපච්චයාපි - සීමු. II 2 හාරෙන්තිපි පච්චාහාරෙන්තිපි - සීමු. II

a. මජ්ඣිමනිකාය - දෙවදූතසුත්ත

කසයෙනු දු තළවයි, වේවැලිනු දු තළවයි, අඩදඬියෙනු දු තළවයි, අත ද සිඳී, පය ද සිඳී, අත්පා ද සිඳී, කන ද සිඳී, නැහැය ද සිඳී, කන්නාසා ද සිඳී, බිලඞ්ගථාලික කම්කටොලු දු කෙරෙයි, සක්මුඩු දු කෙරෙයි, රාහුමුඛ කම්කටොලු ද කෙරෙයි, ජෝතිමාලික කම්කටොලු ද කෙරෙයි, හත්ථපජ්ජෝතික කම්කටොලු දු කෙරෙයි, එරැවතු කම්කටොලු දු කෙරෙයි, තිහිරිවත් කම්කටොලු දු කෙරෙයි, එණෙය්‍යක කම්කටොලු දු කෙරෙයි, බිලියෙන් ඤම්මස්තනහර ද උපුටයි, කහවණුවම් ද කෙරෙයි, කාරමු දු ගල්වයි, පරිඝපරිවර්තන කම්කටොලු දු කෙරෙයි පලාලපිඨක කම්කටොලු දු කෙරෙයි, රත්කල තෙලු දු ඉසී, ශුනකයන් ලවා ද කවයි, දිවස්හුල ද හිඳුවයි, කඩුවෙනු දු හිස සිඳී; හෙතෙම කම්කටොලු හෙතුයෙනු දු දුක් දොම්නස් විඳී. තෙල බියදුක් දොම්නස් ඔහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩයෙන් උපන, හටගත නිපන වෙසෙසින් නිපන පහළ වූයේ වන. රජ මේ සතර දඬුවමට පොහොසත් (-සමර්ථ) වේ.

හෙතෙම සිය පව්කැමින් කාබුත් මරණින් මතු සැප නැති දුකට ගති වූ විවසව පතිත වන නිරයට පැමිණෙයි; ඔහුට නිරයපාලයෝ පඤ්චවිධ බන්ධන නම් කම්කටොලු කරවති: රත් වූ යහුලක් අතෙහි ගසති, රත් යවුලක් දෙවැනි අතෙහි ගසති, රත් යවුලක් පයෙහි ගසති, රත් යවුලක් දෙවැනි පයෙහි ගසති, රත් යවුලක් ළමැද ගසත්. හේ එහි තියුණු වූ කටුක වූ දුක් වෙදනා විඳී. යම් තාක් ඒ පව්කම් නො ගෙවේ නම්, ඒ තාක් නො ද මියෙයි. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩ හෙතුවෙන් ජාත යැ සඤ්ජාත යැ නිර්‍ජාත යැ අභිනිර්‍ජාත යැ ප්‍රාදුර්භූත යි. යමපල්හු ඒ පව්කම් කළහු බිමැ හොවා කෙටේරියෙන් සස්නි; හේ එහි තියුණු කටුක දුක් වෙදනා විඳී. යම් තාක් ඒ පව්කම් නො ගෙවේ නම්, ඒ තාක් නො ද මියෙයි. යමපල්හු ඒ පව්කම් කළහු ඌර්ධ්වපාද කොට අධඃශීර්ෂ කොට ගෙන වෑයෙන් සස්නි. ඒ පව්කම් කළහු නිරයපාලයෝ (ගින්නෙන් දිලියෙන) රියෙහි යොදා හාත්පසින් දල්වෙන අතිශයින් දිලියෙන ගිනිදල් සහිත වූ පොළොවෙහි ඉදිරියට ඇවිදුවත්-නාහු ද නවතත්නාහු ද වෙති, පව්කම් කළ ඔහු යමපල්හු ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ජ්වාලා සහිත වූ මහත් අඞ්ගාරපර්වතයට නංවති. බස්වත්නාහු ද වෙත්...යමපල්හු පව්කම් කළ ඔහු ඌර්ධ්වපාද අධඃශීර්ෂ කොට ගෙන තප්ත වූ ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ජ්වාලා සහිත වූ ලොහකුම්භියෙහි ප්‍රක්‍ෂෙප කෙරෙත්. හේ එහි පෙණපිඩක් බඳු දෙහ ඇති වැ පැසෙයි. හේ එහි පෙණපිඩක් බඳු දෙහ ඇති වැ පස්නේ වරක් උඩට ද නැඟෙයි, වරක් යටට ද බසී, වරක් සරස ද ඇවිදී. හේ එහි තීව්‍ර වූ කටුක වූ දුක් වෙදනා විඳී. යම් තාක් ඒ පව්කම් නො ගෙවේ නම්, ඒ තාක් නො ද මියෙයි. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩයෙන් (සිය කැමින්) උපන, සඤ්ජාත යැ නිර්‍ජාත යැ ප්‍රාදුර්භූත යි. ඒ පව්කම් කළ ඔහු යමපල්හු මහානිරයෙහි ප්‍රක්‍ෂෙප කෙරෙත්. ඒ මහානිරය වූ කලී:

1. චතුක්කණ්ණො චතුද්වාරො
විභත්තො භාගසො මිතො,
අයොපාකාරපරියන්තො
අයසා පටිකුජ්ජිතො.

2. තස්ස අයොමයා භූමි
ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං
ඵරිත්වා තිට්ඨති සබ්බදා.[a]

3. කදරියා තපනා[1] ඝොරා අච්චිමන්තො දුරාසදා,
ලොමහංසනරූපා ච භිස්මා පටිභයා දුඛා.[b]

4. පුරත්ථිමාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ පච්ඡිමාය පටිහඤ්ඤති.

5. පච්ඡිමාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ පුරත්ථිමාය පටිහඤ්ඤති.

6. උත්තරාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ දක්ඛිණාය පටිහඤ්ඤති.

7. දක්ඛිණාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ උත්තරාය පටිහඤ්ඤති.

8. හෙට්ඨතො ච සමුට්ඨාය අච්චික්ඛන්ධො භයානකො,
දහන්තො පාපකම්මන්තෙ ඡදනස්මිං පටිහඤ්ඤති.

9. ඡදනම්හා සමුට්ඨාය අච්චික්ඛන්ධො භයානකො,
දහන්තො පාපකම්මන්තෙ භූමියං පටිහඤ්ඤති.

10. අයොකපාලමාදිත්තං සන්තත්තං ජලිතං යථා,
එවං අවීචිනිරයො හෙට්ඨා උපරි පස්සතො.

11. තත්ථ සත්තා මහාලුද්දා මහාකිබ්බිසකාරිනො,
අච්චන්තපාපකම්මන්තා පච්චන්ති න ච මිය්‍යරෙ.

12. ජාතවෙදසමො කායො තෙසං නිරයවාසිනං,
පස්ස කම්මානං දළ්හත්තං න භස්මා හොති න මසි.

13. පුරත්ථිමෙනපි ධාවන්ති තතො ධාවන්ති පච්ඡිමං,
උත්තරෙනපි ධාවන්ති තතො ධාවන්ති දක්ඛිණං.

14. යං යං දිසං පධාවන්ති තං තං ද්වාරං පිධීයති,
අභිනික්ඛමිතාසා තෙ සත්තා මොක්ඛගවෙසිනො.

15. න තෙ තතො නික්ඛමිතුං ලභන්ති කම්මපච්චයා,
තෙසං ච පාපකම්මන්තං අවිපක්කං කතං බහු''න්ති.

1. කදරියා තපසා - සීමු II.
a. මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසක - දෙවදූතසුත්ත
b. සඞ්කිච්චජාතක.

1. (ඒ මහානිරය) සතර කන් ඇත්තේ යැ, සතර දොර යැ, වෙන වෙන මැ කොටස් වශයෙන් බෙදන ලද, යපවුරෙන් පරික්ෂිප්ත යැ, යපියනින් වසන ලද.

2. ඒ මහානරකයාගේ යපොළොව ජ්වලිත වූ තෙජසින් යුක්ත යැ. හාත්පස සියක් යොදුන් තැනැ සියලු කල්හි පැතිර සිටී.

3. (ඒ අෂ්ට මහානරකයෝ) නිරතුරු තවන්නාහු ඝෝර වූවාහු (කල්පස්ථායී) ගිනිසිළු ඇත්තාහු ලංවිය නො හැක්කාහු ලොමුදහගන පියවි ඇත්තාහු බිහිසුණු වූවාහු බිය උපදවන්නාහු දුක් වූවාහු ද වෙත්.

4. පෙරදිග බිතින් නැඟුණු ගිනිකඳ පව්කම් කළ සත්ත්වයන් දවමින් (ගොස්) පැසුළු බිත වැදෙයි.

5. පශ්චිම භිත්තියෙන් නැඟුණු ගිනිකඳ පව්කම් කළ සත්ත්වයන් දවමින් ගොස් පූර්වභිත්තියෙහි වැදෙයි.

6. උතුරු බිතින් නැඟුණු ගිනිකඳ පව්කම් කළවුන් දවමින් ගොස් දකුණු බිත වැදෙයි.

7. දකුණු බිතින් නැඟුණු ගිනිකඳ පව්කම් කළවුන් දවමින් ගොස් උතුරු බිත වැදෙයි.

8. යට පොළොවිනු දු බිය එළවන ගිනිකඳ නැඟී පව්කම් කළවුන් දවමින් ගොස් ඡදනයෙහි (-සියන්හි) පැහැර සිටී.

9. ඡදනයෙන් බිය එළවන ගිනිකඳ නැඟී පාපකර්ම කළ සත්ත්වයන් දවමින් ගොස් බිම පැහැර සිටී.

10. අවීචිනරකය උඩ යට බලනුවහුට හාත්පසින් දිලියෙන අතිශයින් තැවුණු දල්වුණු යකඩලක් මෙනි.

11. එහි මහද්රෞද්‍ර වූ මහදරුණුකම් කරන පුලු වූ අතිශයින් පව්කම් ඇති සත්ත්වයෝ පැසෙති, නො ද මියෙත්.

12. ඒ නිරවැසියන්ගේ කය ගිනි වැන්න. කර්මයන්ගේ දැඩි සේ බල. හළ නො වෙයි, දුලි නො වේ.

13. (කිසි කාලෙක පූර්වද්වාරය විවෘත වූ කල්හි) ඒ දිගට ද දිවෙති, යළි පශ්චිමද්වාරයට දිවෙති, උත්තරද්වාරයට දිවෙති, යළි දක්ෂිණද්වාරයට දිවෙත්.

14. යම් යම් දිශාවකට වේගයෙන් දිවෙත් නම්, (සම්ප්‍රාප්ත කල්හි) ඒ ඒ ද්වාරය වැසෙයි. නික්මැ යන ආශා ඇති ඒ නිරිසත්හු මිදෙන උපාය සොයන්නාහු වෙත්.

15. කර්මහෙතුයෙන් ඔහු එයින් නික්මෙන්නට නො ලැබෙති. යම් හෙයකින් ඔවුන් විසින් නො පැසුණු විපාක ඇති පාපකර්මය බොහෝ කොට කරන ලද ද ඒහෙයිනි.

එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. යානි ච නෙරයිකානි දුක්ඛානි යානි ච තිරච්ඡානයොනිකානි දුක්ඛානි යානි ච පෙත්තිවිසයිකානි දුක්ඛානි යානි ච මානුසිකානි දුක්ඛානි, තානි කුතො ජාතානි, කුතො සඤ්ජාතානි, කුතො නිබ්බත්තානි, කුතො අභිනිබ්බත්තානි, කුතො පාතුභූතානි: අත්තදණ්ඩතො ජාතානි සඤ්ජාතානි නිබ්බත්තානි අභි-නිබ්බත්තානි පාතුභූතානි.

**අත්තදණ්ඩා භයං ජාතං ජනං පස්සථ මෙධගන්ති** ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවතා ච මනුස්සා ච මෙධගං ජනං කලහං ජනං විරුද්ධං ජනං පටිවිරුද්ධං ජනං ආහතං ජනං පච්චාහතං ජනං ආඝාතිතං[1] ජනං පච්චාඝාතිතං ජනං පස්සථ දක්ඛථ ඔලොකෙථ නිජ්ඣායෙථ උපපරික්ඛථාති - ජනං පස්සථ මෙධගං.

**සංවෙගං කිත්තයිස්සාමීති** - සංවෙගං උබ්බෙගං උත්‍රාසං භයං පීළනං ඝට්ටනං උපද්දවං උපස්සග්ගං; කිත්තයිස්සාමි පකිත්තයිස්සාමි ආචික්ඛිස්සාමි දෙසිස්සාමි පඤ්ඤපිස්සාමි පට්ඨපිස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසිස්සාමීති - සංවෙගං කිත්තයිස්සාමි.

**යථා සංවිජිතං මයාති** - යථා මයා අත්තනායෙව අත්තා[2] සංවෙජිතො උබ්බෙජිතො සංවෙගමාපාදිතොති - යථා සංවිජිතං මයා.

තෙනාහ භගවා:

> "අත්තදණ්ඩා භයං ජාතං
> ජනං පස්සථ මෙධගං,
> සංවෙගං කිත්තයිස්සාමි
> යථා සංවිජිතං මයා"ති.

**15 - 2**

> ඵන්දමානං පජං දිස්වා මච්ඡෙ අප්පොදකෙ යථා,
> අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙ දිස්වා මං භයමාවිසි.

**ඵන්දමානං පජං දිස්වාති** - 'පජා'ති සත්තාධිවචනං; පජං තණ්හා-ඵන්දනාය ඵන්දමානං, දිට්ඨිඵන්දනාය ඵන්දමානං, කිලෙසඵන්දනාය ඵන්දමානං, දුච්චරිතඵන්දනාය ඵන්දමානං, පයොගඵන්දනාය ඵන්දමානං, විපාකඵන්දනාය ඵන්දමානං, රත්තං රාගෙන ඵන්දමානං, දුට්ඨං දොසෙන ඵන්දමානං, මූළ්හං මොහෙන ඵන්දමානං, විනිබද්ධං මානෙන ඵන්දමානං, වික්ඛෙපගතං උද්ධච්චෙන ඵන්දමානං, අනිට්ඨංගතං විචිකිච්ඡාය ඵන්දමානං, ථාමගතං අනුසයෙහි ඵන්දමානං, ලාභෙන ඵන්දමානං, අලාභෙන ඵන්දමානං, යසෙන ඵන්දමානං, අයසෙන ඵන්දමානං, පසංසාය ඵන්දමානං, නින්දාය ඵන්දමානං, සුඛෙන ඵන්දමානං, දුක්ඛෙන ඵන්දමානං, ජාතියා ඵන්දමානං, ජරාය ඵන්දමානං, බ්‍යාධිනා ඵන්දමානං, මරණෙන ඵන්දමානං, සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසෙහි ඵන්දමානං, නෙරයිකෙන දුක්ඛෙන ඵන්දමානං, තිරච්ඡානයොනිකෙන දුක්ඛෙන ඵන්දමානං, පෙත්තිවිසයිකෙන දුක්ඛෙන ඵන්දමානං, --

1. ආඝාටිතං, සයා. 2. සද්ද - සීමු. II.

තෙල බිය දුක් දොම්නස් ඕහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩය හෙතු කොට ජාත යැ සඤ්ජාත යැ නිර්වෘත යැ අභිනිර්වෘත යැ ප්‍රාදුර්භූත යි. යම් නිරයදුකක් තිරිසන්යොන්හි යම් දුකක් ප්‍රෙතවිෂයෙහි යම් දුකක් මානුෂ වූ යම් දුකකුත් වේත් නම්, එ දුක් කොයින් උපන්නාහු ද, කොයින් හටගත්තාහු ද, කොයින් නිපන්නාහු ද, කොයින් වෙසෙසින් නිපන්නාහු ද, කොයින් පහළ වූවාහු ද යත්: ආත්මදණ්ඩයෙන් ජාත - සඤ්ජාත - නිර්වෘත - අභිනිර්වෘත - ප්‍රාදුර්භූත වූවාහුය.

**අත්තදණ්ඩා භයං ජාතං ජනං පස්සථ මෙධගං** - ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශූද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දේවතාවෝ ද මනුෂ්‍යයෝ ද යන හිංසාවට පැමිණි ජනයා කලහ කරන - විරුද්ධ වූ - ප්‍රතිවිරුද්ධ වූ - ආහත වූ - ප්‍රත්‍යාහත වූ - පීඩිත වූ - ප්‍රතිපීඩිත වූ ජනයා බලවු, දකිවු, අවලෝකනය කරවු, නැවත නැවත සිතවු, නැවත නැවත පරීක්ෂා කරවු යයි 'ජනං පස්සථ මෙධගං' යනු වේ.

**සංවෙගං කිත්තයිස්සාමි** - සංවේගය උද්වේගය තැතිගැනීම භය ලෙළීම ගැටීම උපද්‍රවය උපසර්ගය (-ඇවිරීම) කීර්තනය කරන්නෙමි, ප්‍රකීර්තනය කරන්නෙමි, පවසන්නෙමි දෙසන්නෙමි පනවන්නෙමි පිහිටුවන්නෙමි විවරණය කරන්නෙමි විභාග කරන්නෙමි ප්‍රකට කරන්නෙමි ප්‍රකාශ කරන්නෙමි හුයි 'සංවෙගං කිත්තයිස්සාමි' යනු වේ.

**යථා සංවිජිතං මයා** - යම්සේ මා විසින් තමා මැ තෙමේ සංවේගයට පත් කරන ලදුයේ උද්වේග කරන ලදුයේ සංවේගයට පමුණුවන ලදුයේ හුයි 'යථා සංවිජිතං මයා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“අත්තදණ්ඩා භයං ජාතං -පෙ- යථා සංවිජිතං මයා”යි.**

## 15 - 2

දියත්තෙක මසුන් මෙන් (තෘෂ්ණාදියෙන්) සැලෙන සත්ත්වවර්ගයා දැක, ඔවුනොවුන් හා සමග විරුද්ධ වූවන් දැක, බිය මා කරා පැමිණියේ ය. (-මට බිය උපන.)

**ඵන්දමානං පජං දිස්වා** - 'පජා' යනු සත්ත්වයනට නමෙකි. තෘෂ්ණාස්පන්දනයෙන් සැලෙන ප්‍රජාව දෘෂ්ටිස්පන්දනයෙන් සැලෙන ක්ලේශස්පන්දනයෙන් සැලෙන දුශ්චරිතස්පන්දනයෙන් සැලෙන කායාදි ප්‍රයොගස්පන්දනයෙන් සැලෙන විපාකස්පන්දනයෙන් සැලෙන ප්‍රජාව, රාගයෙන් රත් වැ සැලෙන, ද්වේෂයෙන් දුෂ්ට වැ සැලෙන, මෝහයෙන් මුළා වැ සැලෙන, මානයෙන් විනිබද්ධ වැ සැලෙන, ඖද්ධත්‍යයෙන් වික්ෂෙපයට පැමිණැ සැලෙන, විචිකිත්සාවෙන් නිෂ්ඨාවට නො පැමිණැ සැලෙන, අනුශයෙන් තදබවට පැමිණැ සැලෙන, ලාභයෙන් සැලෙන, අලාභයෙන් සැලෙන, යශසින් සැලෙන, අයශසින් සැලෙන, ප්‍රශංසායෙන් සැලෙන, නින්දායෙන් සැලෙන, සුවයෙන් සැලෙන, දුකින් සැලෙන, ජාතියෙන් සැලෙන, ජරායෙන් සැලෙන, ව්‍යාධියෙන් සැලෙන, මරණයෙන් සැලෙන, ශොකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් සැලෙන, නිරයදුකින් සැලෙන, තිරිසන්යොන්හි වූ දුකින් සැලෙන, ප්‍රෙතවිෂයෙහි වූ දුකින් සැලෙන, -

මානුසිකෙන දුක්ඛෙන ඵන්දමානං, ගබ්භොක්කන්තිමූලකෙන දුක්ඛෙන-ගබ්භට්ඨිතිමූලකෙන දුක්ඛෙන - ගබ්භවුට්ඨානමූලකෙන දුක්ඛෙන - ජාතස්සූපනිබන්ධකෙන දුක්ඛෙන - ජාතස්ස පරාධෙය්‍යකෙන දුක්ඛෙන- අත්තූපක්කමෙන දුක්ඛෙන - පරූපක්කමෙන දුක්ඛෙන - දුක්ඛදුක්ඛෙන-සඞ්ඛාරදුක්ඛෙන -විපරිණාමදුක්ඛෙන - චක්ඛුරොගෙන දුක්ඛෙන-සොතරොගෙන- ඝානරොගෙන-ජිව්හාරොගෙන- සීසරොගෙන-කායරොගෙන -කණ්ණරොගෙන - මුඛරොගෙන - දන්තරොගෙන - කාසෙන - සාසෙන - පිනාසෙන ඩාහෙන - ජරෙන - කුච්ඡිරොගෙන - මුච්ඡාය - පක්ඛන්දිකාය - සූලාය-විසූචිකාය - කුට්ඨෙන - ගණ්ඩෙන - කිලාසෙන - සොසෙන - අපමාරෙන-දද්දුයා - කණ්ඩුයා - කච්ඡුයා - නඛසාය[1] - විතච්ඡිකාය - ලොහිතපිත්තෙන[2]-මධුමෙහෙන -අංසාය - පිළකාය - භගන්දලෙන -පිත්තසමුට්ඨානෙන ආබාධෙන-සෙම්හසමුට්ඨානෙන ආබාධෙන - වාතසමුට්ඨානෙන ආබාධෙන - සන්නිපාතිකෙන ආබාධෙන - උතුපරිණාමජෙන ආබාධෙන - විසමපරිහාරජෙන ආබාධෙන - ඔපක්කමිකෙන ආබාධෙන - කම්මවිපාකජෙන ආබාධෙන-සීතෙන - උණ්හෙන - ජිඝච්ඡාය - පිපාසාය - උච්චාරෙන - පස්සාවෙන-ඩංසමකසවාතාතපසිරිංසප[3] සම්ඵස්සෙන දුක්ඛෙන-මාතුමරණෙන දුක්ඛෙන-පිතුමරණෙන දුක්ඛෙන -භාතුමරණෙන දුක්ඛෙන-භගිනිමරණෙන දුක්ඛෙන-පුත්තමරණෙන දුක්ඛෙන - ධීතුමරණෙන දුක්ඛෙන - ඤාතිමරණෙන දුක්ඛෙන - භොගව්‍යසනෙන දුක්ඛෙන - රොගව්‍යසනෙන දුක්ඛෙන - සීලව්‍යසනෙන දුක්ඛෙන - දිට්ඨිව්‍යසනෙන දුක්ඛෙන ඵන්දමානං සම්ඵන්දමානං විප්ඵන්දමානං වෙධමානං පවෙධමානං සම්පවෙධමානං; දිස්වාති දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති - ඵන්දමානං පජං දිස්වා.

**මච්ඡෙ අප්පොදකෙ යථාති** - යථා මච්ඡා අප්පොදකෙ උදකපරියාදානෙ කාකෙහි වා කුලලෙහි වා බලාකාහි වා පරිපාතියමානා[4] උක්ඛිපියමානා ඛජ්ජමානා ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්ති; එවමෙවං පජා තණ්හාඵන්දනාය ඵන්දන්ති -පෙ-දිට්ඨිබ්‍යසනෙන දුක්ඛෙන ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්තීති - මච්ඡෙ අප්පොදකෙ යථා.

**අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙති** - අඤ්ඤමඤ්ඤා සත්තා විරුද්ධා පටිවිරුද්ධා ආහතා[5] පච්චාහතා ආඝාතිතා[6] පච්චාඝාතිතා රාජානොපි රාජූහි විවදන්ති, ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති, බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති, ගහපතීපි ගහපතීහි විවදන්ති, මාතාපි පුත්තෙන විවදති, පුත්තාපි මාතරා විවදති, පිතාපි පුත්තෙන විවදති, පුත්තොපි පිතරා විවදති, භාතාපි භාතරා විවදති, භගිනීපි භගිනියා විවදති, භාතාපි භගිනියා විවදති.

---

1. රඛසාය - ස, රක්ඛසාය - පු. PTS.
2. ලොහිතෙන පිත්තෙන - සිමු. II PTS.
3. සරීසප - මජසං.
4. පරිපාටියමානා - සිමු. II. මජසං.
5. ආහතා - සිමු II.
6. ආඝාපිතා ස්‍යා.

මිනිස්ලොව වූ දුකින් සැලෙන, ගර්භාවක්‍රාන්තිමූලක දුකින් සැලෙන, ගර්භස්ථිතිමූලක දුකින් - ගර්භව්‍යුත්ථානමූලක දුකින් - උපන්නහු පිළිබඳිනා දුකින් - උපන්නහු පරා අයත් දුකින් - ආත්මෝපක්‍රම දුකින් - පරෝපක්‍රම දුකින් - දුඃඛදුඃඛයෙන් - සංස්කාරදුඃඛයෙන් - විපරිණාම - දුඃඛයෙන් - චක්ෂූරෝගයෙන් වූ දුකින් - ශ්‍රොත්‍රරෝගයෙන් - ඝ්‍රාණරෝගයෙන් - ජිහ්වාරෝගයෙන් - කායරෝගයෙන් - ශීර්ෂරෝගයෙන් - කර්ණරෝගයෙන් - මුඛරෝගයෙන් - දන්තරෝගයෙන් - කාසයෙන් - ශ්වාසයෙන් - පීනසින් - දාහයෙන් - ජ්වරයෙන් - කුක්ෂිරෝගයෙන් - මූර්ඡායෙන් - ලෝහිතාතිසාරයෙන් ආමශූලයෙන් - විරේචනයෙන් - කුෂ්ඨරෝගයෙන් - ගණ්ඩරෝගයෙන් - කබරයෙන් - ක්ෂයරෝගයෙන් - අපස්මාරයෙන් - දදපොළින් - කුඩාපොළින් - මහපොළින් - නියඟිරින් - අතුල් පතුල් පැළීමෙන් - රත්පිතින් මධුමෙහයෙන් - අශීසින් - ළෙල්පොළින් - භගන්දරයෙන් - පිතින් උපදනා රෝගයෙන් - සෙමින් උපදනා රෝගයෙන් - වයින් උපදනා රෝගයෙන් - සාන්නිපාතික රෝගයෙන් - ඍතුවිපර්යාසයෙන් උපදනා රෝගයෙන් - විෂම විහරණයෙන් උපදනා රෝගයෙන් - උපක්‍රමයෙන් හටගත්තා රෝගයෙන් කර්මවිපාකයෙන් උපදනා රෝගයෙන් - ශීතයෙන් - උෂ්ණයෙන් - ජිඝත්සායෙන් - පිපාසායෙන් - උච්චාරයෙන් - ප්‍රශ්‍රාවයෙන් - මැසි මදුරු වා අව් දික්සර්ප පහසින් වූ දුකින් - මවගේ මරණයෙන් වූ දුකින් - පියාගේ මරණයෙන් වූ දුකින් - බෑයාගේ මරණයෙන් වූ දුකින් - බූනගේ මරණයෙන් වූ දුකින් - පුතා මළ දුකින් - දූ මළ දුකින් - නෑයන් මළ දුකින් - භෝගවිපත්ති දුකින් - රෝගවිපත්ති දුකින් - ශීලවිපත්ති දුකින් - දෘෂ්ටිවිපත්ති දුකින් සැලෙන මොනොවට සැලෙන වෙසෙසින් සැලෙන වෙව්ලන වෙසෙසින් වෙව්ලන අතිශයින් වෙව්ලන ප්‍රජාව; **දිස්වා** - දැක පෙනී තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට නුයි 'ඵන්දමානං පජං දිස්වා' යනු වේ.

**මච්ඡෙ අප්පොදකෙ යථා** - මද දියෙහි දිය සිඳුණු කල්හි කවුඩන් විසින් හෝ උකුස්සන් විසින් හෝ කොකුන් විසින් හෝ නසනු ලබන්නාවූ තඟනු ලබන්නා වූ කනු ලබන්නා වූ මත්ස්‍යයෝ යම් සේ සැලෙත් ද සම්පාකාරයෙන් සැලෙත් ද විවිධ වැ සැලෙත් ද, වෙව්ලත් ද, වෙසෙසින් වෙව්ලත් ද අතිශයින් වෙව්ලත් ද, එපරිද්දෙන් ම ප්‍රජාව තෘෂ්ණාස්පන්දනයෙන් සැලෙති... දෘෂ්ටිව්‍යසන දුකින් සැලෙති සම්පාකාරයෙන් සැලෙති විවිධ වැ සැලෙති, වෙව්ලති වෙසෙසින් වෙව්ලති අතිශයින් වෙව්ලත් නුයි 'මච්ඡෙ අප්පොදකෙ යථා' යනු වේ.

**අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙ** - සත්ත්වයෝ ඔවුනොවුන් විරුද්ධ වූවාහු ප්‍රතිවිරුද්ධ වූවාහු කෝපයෙන් පහළාහු වෙසෙසින් පහළාහු ගැටුණාහු වෙසෙසින් ගැටුණාහු රජ්ජුහු ද රජුන් සමග විවාද කෙරෙති, ක්ෂත්‍රියයෝත් ක්ෂත්‍රියයන් සමග විවාද කෙරෙති, බමුණෝත් බමුණන් සමග විවාද කෙරෙති, ගැහැවියෝත් ගැහැවියන් සමග විවාද කෙරෙති, මවු ද පුතා සමග විවාද කෙරෙයි, පුතාත් මව සමග විවාද කෙරෙයි, පියාත් පුතු සමග විවාද කෙරෙයි, පුතාත් පියා සමග විවාද කෙරෙයි, බෑයාත් බෑයා සමග විවාද කෙරෙයි, භගනිය (-බූන) ද භගිනිය සමග විවාද කෙරෙයි, බෑයාත් බූන සමග විවාද කෙරෙයි,-

භගිනීපි භාතරා විවදති, සහායොපි සහායෙන විවදති. තෙ තත්ථ කලහවිග්ගහවිවාදපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති, ලෙඩ්ඩූහිපි උපක්කමන්ති, දණ්ඩෙහිපි උපක්කමන්ති, සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති. මරණමත්තම්පි දුක්ඛන්ති – අඤ්ඤමඤ්ඤෙහි ව්‍යාරුද්ධෙ.

**දිස්වා මං භයමාවිසීති** – 'දිස්වා'ති දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා භයං පීළනං ඝට්ටනං උපද්දවො උපසග්ගො ආවිසීති – දිස්වා මං භයමාවිසි.

තෙනාහ භගවා:

> “ඵන්දමානං පජං දිස්වා
> මච්ඡෙ අප්පොදකෙ යථා,
> අඤ්ඤමඤ්ඤෙහි ව්‍යාරුද්ධෙ
> දිස්වා මං භයමාවිසී”ති.

**15 - 8**

> සමන්තමසාරො ලොකො
> දිසා සබ්බා සමෙරිතා,
> ඉච්ඡං භවනමත්තනො
> නාද්දසාසිං[1] අනොසිතං.

**සමන්තමසාරො ලොකොති** – 'ලොකො'ති නිරයලොකො තිරච්ඡානයොනිලොකො පෙත්තිවිසයලොකො මනුස්සලොකො දෙවලොකො ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො අයං ලොකො පරො ලොකො බ්‍රහ්මලොකො දෙවලොකො; අයං වුච්චති ලොකො. නිරයලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. තිරච්ඡානයොනිලොකො – පෙත්තිවිසයලොකො – මනුස්සලොකො – දෙවලොකො – ඛන්ධලොකො – ධාතුලොකො – ආයතනලොකො – අයං ලොකො – පරො ලොකො – බ්‍රහ්මලොකො – දෙවලොකො[2] අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා දුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. යථා පන නළො අසාරො නිස්සාරො සාරාපගතො, යථා එරණ්ඩො අසාරො නිස්සාරො සාරාපගතො, යථා උදුම්බරො අසාරො නිස්සාරො සාරාපගතො, යථා සෙතවච්ඡො[3] අසාරො නිස්සාරො සාරාපගතො, යථා පාරිභද්දකො අසාරො නිස්සාරො සාරාපගතො, යථා ඵෙණපිණ්ඩො අසාරො නිස්සාරො සාරාපගතො, යථා උදකබුබ්බුළකං අසාරං නිස්සාරං සාරාපගතං, යථා මරීචි අසාරා නිස්සාරා සාරාපගතා, යථා කදලික්ඛන්ධො[4] අසාරො නිස්සාරො සාරාපගතො, යථා මායා අසාරා නිස්සාරා සාරාපගතා, එවමෙව නිරයලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා; –

1. නාද්දසාමි - සීමු. II. 2. සදෙවලොකො - සයා. PTS.
3. සෙතකච්ඡො - මජසං. සෙතගච්ඡො - PTS. 4. බදලික්ඛන්ධො - සීමු II.

බූත ද බෑයා සමග විවාද කෙරෙයි, යහළුවාත් යහළුවා සමග විවාද කෙරෙයි. ඔවුහු එහි කලහ - විග්‍රහ - විවාදයට පැමිණියාහු ඔවුනොවුන්ට අතින් ද පහර දෙති, කැටින් ද පහර දෙති, දඬුයෙන් ද පහර දෙති, අවියෙන් ද පහර දෙත්. ඔවුහු එහි මරණයට ද මරණමාත්‍රවූ දුකට ද පැමිණෙත් නුයි 'අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙ' යනු වේ.

**දිස්වා මං භයමාවිසි** - 'දිස්වා' යනු: දැක දෙපත් තුලනය - තීරණය - විභාවනය - විභූත කොට, බිය පෙළුම ගැවුම උපද්‍රවය උපසර්ගය පැමිණියේ නුයි 'දිස්වා මං භයමාවිසි' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

"ඵන්දමානං පජං දිස්වා -පෙ- දිස්වා මං භයමාවිසී"ති.

## 15 - 8

නිරයාදි ලෝකය හාත්පසින් නිසරු යැ. සියලු දෙස අනිත්‍යතායෙන් කම්පිත යැ. (එහින්) තමහට ත්‍රාණය කැමැති චිත්තෙම් ජරාදීන් නො මැඩුණු තැනක් නුදුටිමි.

**සමන්තමසාරො ලොකො** - 'ලොක' නම්: නිරයලෝක යැ තිරශ්චීන-ලෝක යැ ප්‍රෙතවිෂයලෝක යැ මනුෂ්‍යලෝක යැ දේවලෝක යැ ස්කන්ධ-ලෝක යැ ධාතුලෝක යැ ආයතනලෝක යැ මෙලොව යැ පරලොව යැ බඹලොව යැ දෙව්ලොව යැ. (යන) මේ 'ලොක'යි කියනු ලැබේ. නිරයලොකය නිත්‍යසාර සාරයෙන් හෝ සුඛසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ ආත්මසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමස්වභාවයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරයෙන් අපගත යි. තිරශ්චීනයොනිලෝකය - ප්‍රේතවිෂයලෝකය - මනුෂ්‍යලෝකය - දේවලෝකය - ස්කන්ධලෝකය - ධාතුලෝකය - ආයතනලෝකය - මෙලොව - පරලොව - බඹලොව - දෙව්ලොව නිත්‍යසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ සුඛසාරසාර-යෙන් හෝ ආත්මසාරසාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමස්වභාවයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරයෙන් අපගත යි. තවද බටගස යම්සේ හර රහිත වූයේ නිසරු වූයේ හරයෙන් අපගත වූයේ ද, යම්සේ එරබදු ගස අසාර වූයේ නිසරු වූයේ සාරයෙන් අපගත ද, යම්සේ දිඹුල්ගස අසාර ද නිස්සාර ද සාරාපගත ද, යම්සේ වරණගස අසාර ද නිස්සාර ද සාරාපගත ද, යම්සේ එරබදුගස අසරු වූයේ නිසරු වූයේ හරයෙන් අපගත වූයේ ද, යම්සේ පෙණපිඩ අසරු ද නිසරු ද හර නැත් ද, යම්සේ දියබුබුළ අසරු ද, නිසරු ද හර නැත් ද, යම්සේ මිරිඟුව අසරු ද නිසරු ද සාරාපගත ද, යම්සේ කෙසෙල්කඳ අසරු ද නිසරු ද සාරාපගත ද, යම්සේ මායාව අසරු ද නිසරු ද සාරාපගත ද, එසෙයින් මැ නිරයලොකය නිත්‍යසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ සුඛසාරසාරයෙන් හෝ ආත්මසාරසාරයෙන් හෝ නිත්‍ය යෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමස්වභාවයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරයෙන් අපගත වූයේ යි. -

තිරච්ඡානයොනිලොකො - පෙත්තිවිසයලොකො - මනුස්සලොකො - දෙවලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. ඛන්ධලොකො - ධාතුලොකො - ආයතනලොකො - අයං ලොකො - පරො ලොකො - බ්‍රහ්මලොකො - දෙවලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වාති - සමන්තමසාරො ලොකො.

**දිසා සබ්බා සමෙරිතාති** - යෙ පුරත්ථිමාය දිසාය සඞ්ඛාරා තෙපි එරිතා සමෙරිතා චලිතා ඝට්ටිතා අනිච්චතාය, ජාතියා අනුගතා, ජරාය අනුසටා, ව්‍යාධිනා අභිභූතා, මරණෙන අබ්භාහතා, දුක්ඛෙ පතිට්ඨිතා, අතාණා අලෙණා අසරණා අසරණීභූතා. යෙ පච්ඡිමාය දිසාය සඞ්ඛාරා - යෙ උත්තරාය දිසාය සඞ්ඛාරා - යෙ දක්ඛිණාය දිසාය සඞ්ඛාරා - යෙ පුරත්ථිමාය අනුදිසාය[1] සඞ්ඛාරා - යෙ පච්ඡිමාය අනුදිසාය සඞ්ඛාරා - යෙ උත්තරාය අනුදිසාය සඞ්ඛාරා - යෙ දක්ඛිණාය අනුදිසාය සඞ්ඛාරා - යෙ හෙට්ඨිමාය දිසාය සඞ්ඛාරා - යෙ උපරිමාය දිසාය සඞ්ඛාරා - යෙ දසසු දිසාසු සඞ්ඛාරා, තෙපි එරිතා සමෙරිතා චලිතා ඝට්ටිතා අනිච්චතාය, ජාතියා අනුගතා, ජරාය අනුසටා, ව්‍යාධිනා අභිභූතා, මරණෙන අබ්භාහතා දුක්ඛෙ පතිට්ඨිතා, අතාණා අලෙණා අසරණා අසරණීභූතා.

භාසිතම්පි චෙතං:

1. "කිඤ්චාපි තෙ'තං[2] ජලතෙ[3] විමානං
ඔභාසයං උත්තරස්සං දිසායං,[4]
රූපෙ රණං දිස්වා සදා පවෙධිතං
තස්මා න රූපෙ රමතී සුමෙධො"a

2. "මච්චුනාබ්භාහතො ලොකො ජරාය පරිවාරිතො,
තණ්හාසල්ලෙන ඔතිණ්ණො ඉච්ඡාධූමායිතො සදා"b

3. "සබ්බො ආදීපිතො ලොකො සබ්බො ලොකො පධූපිතො,
සබ්බො පජ්ජලිතො ලොකො සබ්බො ලොකො පකම්පිතො"ති.c

දිසා සබ්බා සමෙරිතා.

---

1. දිසාය - සිමු. II. 2. චෙතං - සිමු. II. 3. ජලති - සිමු. II.
4. උත්තරියං දිසාය - සිමු. II. මජසං. PTS
a. භික්ඛුනීසංයුත්ත - පඨමවග්ග. b. දෙවතාසංයුත්ත - අද්ධවග්ග
c. භික්ඛුනීසංයුත්ත.

තිරශ්චීනයෝනිලෝකය - ප්‍රෙතවිෂයලෝකය - මනුෂ්‍යලෝකය - දේව-ලෝකය නිත්‍යසාරසාරයෙන් හෝ සුඛසාරසාරයෙන් හෝ ආත්මසාර-සාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමධර්මයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. ස්කන්ධලෝකය - ධාතුලෝකය - ආයතනලෝකය - මෙලොව - පරලොව - බඹලොව - දෙව්ලොව නිත්‍යසාරසාරයෙන් හෝ සුඛසාරසාරයෙන් හෝ ආත්මසාරසාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමධර්මයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරාපගත නුයි 'සමන්තමසාරො ලොකො' යනු වේ.

දිසා සබ්බා සමේරිතා - පෙර දිග යම් සංස්කාර කෙනෙක් වෙත් නම්, ඔවුහු ද අනිත්‍යතායෙන් කම්පිත වූවාහුය මොනොවට කම්පිත වූවාහුය සැලුණාහුය ගැවුණාහුය, ජාතියෙන් අනුව ගියාහුය, ජරාවෙන් යුක්ත වූවාහුය, ව්‍යාධියෙන් මඩනා ලද්දාහුය, මරණයෙන් පහළාහුය දුකෙහි පිහිටියාහුය, ත්‍රාණ (-ආරක්‍ෂා) රහිත වූවාහුය, ලෙනවරණ රහිත වූවාහුය, පිහිට නැත්තාහුය, (තුමූ) පිහිට නො වන්නාහුය. පැළදෙස යම් සංස්කාර කෙනෙක් - උතුරු දෙස යම් සංස්කාර කෙනෙක් - දකුණු දෙස යම් සංස්කාර කෙනෙක් - පූර්ව අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක්- පශ්චිම අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - උත්තර අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - දක්‍ෂිණ අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක්- යට දිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - උඩ දිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - දශදිශාවන්හි යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔවුහු ද අනිත්‍යතායෙන් කම්පිත වූවාහුය, සඞ්කම්පිත වූවාහුය, සැලුණාහුය, ගැවුණාහුය; ජාතියෙන් අනුව ගියාහුය, ජරාවෙන් යුක්ත වූවාහුය, ව්‍යාධි-යෙන් මඩනා ලද්දාහුය, මරණයෙන් පහළාහුය, දුකෙහි පිහිටියාහුය, පාලන රහිත වූවාහුය, ලෙනවරණ රහිත වූවාහුය, අසරණ වූවාහුය, සරණ නො වන්නාහු යි.

මේ කියන ලද මැ යැ:

1. "නවද තාගේ තෙල විමන උතුරු දෙස බබුළුවමින් දිලියේ නමුදු (ජාතිජරාභඞ්ග සඞ්ඛ්‍යාත) වූ රූපයෙහි දෝෂය දැක සියලු කල්හි ශීතාදියෙන් කම්පිත වූ රූපය දැක, එ කරුණෙන් සොඳුරු නුවණැති-ශාස්තෘ තෙම රූපයෙහි නො ඇලෙ."

2. "ලෝවැසි තෙම මරණයෙන් මඩනා ලද, ජරාවෙන් පිරිවරන ලද, තෘෂ්ණා නැමැති ශල්‍යයෙන් අවතීර්ණ යැ. සියලු කල්හි ඉච්ඡා (-ආශා වෙන්) දුමන ලද්දේ යි."

3. "සියලු සත්ත්ව ලොක තෙමේ භාත්පසින් දුල්වෙන ලද. සියලු ලොකය දුමන ලද. සියලු ලොකය ප්‍රජ්වලිත යැ. සියලු ලොකය ප්‍රකම්පිත වූයේ ය යි."

'දිසා සබ්බා සමේරිතා' යනු වේ.

ඉච්ඡං භවනමත්තනොති – අත්තනො භවනං තාණං ලෙණං සරණං ගතිං පරායනං ඉච්ඡන්තො සාදියන්තො පත්ථයන්තො පිහයන්තො අභිජප්පන්තොති – ඉච්ඡං භවනමත්තනො.

නාද්දසාසිං අනොසිතන්ති – අජ්ඣොසිතං යෙව අද්දසං; අනජ්ඣොසිතං නාද්දසං. සබ්බං යොබ්බඤ්ඤං ජරාය ඔසිතං. සබ්බං ආරොග්‍යං බ්‍යාධිනා ඔසිතං. සබ්බං ජීවිතං මරණෙන ඔසිතං. සබ්බං ලාභං අලාභෙන ඔසිතං. සබ්බං යසං අයසෙන ඔසිතං. සබ්බං පසංසං නින්දාය ඔසිතං. සබ්බං සුඛං දුක්ඛෙන ඔසිතං.

4. "ලාභො අලාභො අයසො යසො ච නින්දා පසංසා ච සුඛං දුක්ඛඤ්ච,
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා අසස්සතා විපරිණාමධම්මා"ති[ස]

'නාද්දසාසිං අනොසිතං'.

තෙනාහ භගවා:

"සමන්තමසාරො ලොකො දිසා සබ්බා සමෙරිතා,
ඉච්ඡං භවනමත්තනො නාද්දසාසිං අනොසිත"න්ති.

## 15 – 4

ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙ දිස්වා මෙ අරතී අහු,
අථෙත්ථ සල්ලමද්දක්ඛිං දුද්දසං හදයනිස්සිතං.

ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙති – 'ඔසානෙත්වෙවා'ති සබ්බං යොබ්බඤ්ඤං ජරා ඔසාපෙති; සබ්බං ආරොග්‍යං බ්‍යාධි ඔසාපෙති; සබ්බං ජීවිතං මරණං ඔසාපෙති; සබ්බං ලාභං අලාභො ඔසාපෙති; සබ්බං යසං අයසො ඔසාපෙති; සබ්බං පසංසං නින්දා ඔසාපෙති; සබ්බං සුඛං දුක්ඛං ඔසාපෙතීති 'ඔසානෙත්වෙව;' බ්‍යාරුද්ධෙති යොබ්බඤ්ඤකාමා සත්තා ජරාය පටිවිරුද්ධා; ආරොග්‍යකාමා සත්තා බ්‍යාධිනා පටිවිරුද්ධා; ජීවිතුකාමා සත්තා මරණෙන පටිවිරුද්ධා; ලාභකාමා සත්තා අලාභෙන පටිවිරුද්ධා; යසකාමා සත්තා අයසෙන පටිවිරුද්ධා; පසංසාකාමා සත්තා නින්දාය පටිවිරුද්ධා; සුඛකාමා සත්තා දුක්ඛෙන පටිවිරුද්ධා ආහතා පච්චාහතා ආඝාතිතා පච්චාඝාතිතාති 'ඔසානෙත්වෙව බ්‍යාරුද්ධෙ.'

ස. අඞ්ගුත්තර – මෙත්තාවග්ග

**ඉච්ඡං භවනමත්තනො** - තමාගේ භවනය පාලනය රැකවරණය දුක් නැසීම ප්‍රතිෂ්ඨාව උතුම් පැවැත්ම ඉස්නෙම් ඉවසනුයෙම් පතනුයෙම් කැමැති වනුයෙම් අභිජල්පනය කරනුයෙම් නුසි 'ඉච්ඡං භවනමත්තනො' යනු වේ.

**නාද්දසාසිං අනොසිතං** - (ජරාදිය විසින්) මඩනා ලදුවක් ම දිටිමි, නො මඩනා ලද්දක් නුදුටිමි. සියලු යොවුන් බව ජරාවෙන් මඩනා ලද. සියලු අරොග බව ව්‍යාධියෙන් මඩනා ලද. සියලු ජීවිතය මරණයෙන් මඩනා ලද. සියලු ලාභය අලාභයෙන් මඩනා ලද. සියලු යශස අයශසින් මඩනා ලද. සියලු පැසැසුම් නිඥාවෙන් මඩනා ලද. සියලු සැපය දුකින් මඩනා ලදි.

4. "ලාභය ද අලාභය ද අයශස් ද යශස් ද නින්දාව ද ප්‍රශංසාව ද සුවය ද දුක ද යන මිනිසුන් කෙරෙහි වූ මේ ධර්මයෝ අනිත්‍යයෝ ය, අශාශ්වතයෝ ය, පෙරළෙන සවභාව ඇත්තාහු ය"යි.

'නාද්දසාසිං අනොසිතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සමන්තමසාරො ලොකො -පෙ- නාද්දසාසිං අනොසිතං"යි.

**15 - 4**

යළි (යෞවනාදීන්ගේ) අවසානයෙහි මැ ('ජරාදිය සමග) ප්‍රතිවිරුද්ධ වූ සත්ත්වයන් දැක මට අනභිරතිය උපන. අනතුරුව මෙහි සත්ත්වයන් විෂයෙහි වූ නො දක්ක හැකි සිත ඇසුරු කළ රාගාදී (සප්ත විධ) ශල්‍යය දිටිමි.

**ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙ** - 'ඔසානෙ ත්වෙව' යනු: ජරාව සියලු යොවුන් බව අවසාන කෙරෙයි, ව්‍යාධිය සියලු අරෝග බව අවසාන කෙරෙයි, මරණය සියලු ජීවිතය අවසාන කෙරෙයි, සියලු ලාභය අලාභය තෙමේ අවසාන කෙරෙයි, සියලු යශස් අපකීර්තිය අවසාන කෙරෙයි, නින්දාව සියලු පැසැසුම් අවසාන කෙරෙයි, දුක සියලු සුවය අවසාන කෙරේ නුසි 'ඔසානෙ ත්වෙව' යනු වේ. බ්‍යාරුද්ධෙ - යොවුන් බව කැමැති සත්ත්වයෝ ජරාව හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, ආරෝග්‍යය කැමැති සත්ත්වයෝ ව්‍යාධිය හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, ජීවත්වනු කැමැති සත්ත්වයෝ මරණය සමග ප්‍රතිවිරුද්ධ වූවාහුය, ලාභ කැමැති සත්ත්වයෝ අලාභය හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, යශස් කැමැති සත්ත්වයෝ අයශස් හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, ප්‍රශංසා කැමැති සත්ත්වයෝ නින්දාව හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, සුව කැමැති සත්ත්වයෝ දුක හා ප්‍රතිවිරුද්ධ වූවාහුය (කෝපයෙන්) පහළාහු පිළිමල් වැ පහළාහු පැමිණියාහු අවසෙසින් ගැවුණාහු නුසි 'ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙ' යනු වේ.

**දිස්වා මෙ අරති අහුති** – ‘දිස්වා’ති දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති දිස්වා; **මෙ අරතීති** යා අරති යා අනභිරති යා අනභිරමණා යා උක්කණ්ඨිතතා යා පරිතස්සිතා අහුති- දිස්වා මෙ අරති අහු.

**අථෙත්ථ සල්ලමද්දක්ඛින්ති** – ‘අථා’ති පදසන්ධි -පෙ- පදානුපුබ්බතා මෙතං ‘අථා’ති; **එත්ථාති** සත්තෙසු; **සල්ලන්ති** සත්ත සල්ලානි: රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං කථංකථාසල්ලං; **අද්දක්ඛින්ති** අද්දසං අදක්ඛිං අපස්සිං පටිවිජ්ඣින්ති – අථෙත්ථ සල්ලමද්දක්ඛිං.

**දුද්දසං හදයනිස්සිතන්ති** – ‘දුද්දස’න්ති දුද්දසං දුද්දක්ඛං දුප්පස්සං දුබ්බුජ්ඣං දුරනුබුජ්ඣං දුප්පටිවිජ්ඣන්ති දුද්දසං; **හදයනිස්සිතන්ති** හදයං වුච්චති චිත්තං; “යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු;[2] හදයනිස්සිතං හදයනිස්සිතං චිත්තසිතං චිත්තනිස්සිතං චිත්තෙන සහජාතං සහගතං සංසට්ඨං සම්පයුත්තං එකුප්පාදං එකනිරොධං එකවත්ථුකං එකාරම්මණන්ති– “දුද්දසං හදයනිස්සිතං”.

තෙනාහ භගවා:

> “ඔසානෙ ත්වෙව ව්‍යාරුද්ධෙ දිස්වා මෙ අරතී අහු,
> අථෙත්ථ සල්ලමද්දක්ඛිං දුද්දසං හදයනිස්සිත”න්ති.

## 15 – 5

> යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති,
> තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති.

**යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවතීති** – ‘සල්ල’න්ති සත්ත සල්ලානි: රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං කථංකථාසල්ලං.

කතමං රාගසල්ලං? යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දිරාගො චිත්තස්ස සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං ඉදං රාගසල්ලං.

කතමං දොසසල්ලං? අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතී’ති ආඝාතො ජායති -පෙ- චණ්ඩික්කං අසුරොපො[1] අනත්තමනතා චිත්තස්ස, ඉදං දොසසල්ලං.

1. අස්සුරොපො - සු සිමු. II PTS.
2. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**දිස්වා මම අරතී අහු** – ‘දිස්වා’ යනු: දැක පෙනී තුලනය කොට තීරණය කොට වෙසෙසින් සලකා විභූත කොට තුයි ‘දිස්වා’ යනු වේ. **මම අරති** යනු: යම් නො ඇල්මෙක් යම් නො ඇලුණු බවෙක් යම් නො ඇලුණු අභිරතියක් යම් උකටලිබවෙක් යම් හාත්පසින් තියවන බවෙක් වී තුයි ‘දිස්වා මේ අරතී අහු’ යනු වේ.

**අථෙත්ථ සල්ලමද්දක්ඛිං** – ‘අථ’ යනු: පදසන්ධිය…පදානුපූර්වතා යැ තෙල ‘අථ’ යනු. **එත්ථ** යනු: සත්ත්වයන් විෂයෙහි; **සල්ල** නම්: සත් ශල්‍ය කෙනෙක්: රාගශල්‍ය යැ ද්වේෂශල්‍ය යැ මෝහශල්‍ය යැ මානශල්‍ය යැ දෘෂ්ටි–ශල්‍ය යැ ශෝකශල්‍ය යැ කථංකථාශල්‍ය යැ’යි; **අද්දක්ඛිං** යනු: දිටිම් අවබොධ කෙළෙම් තුයි ‘අථෙත්ථ සල්ලමද්දක්ඛිං’ යනු වේ.

**දුද්දසං හදයස්සිතං** – ‘දුද්දසං’ යනු: දුර්දර්ශ යැ නො දක්ක හැකි යැ නො බැලිය හැකි යැ නො දත හැකි යැ අවබොධ කළ නො හැකි යැ ප්‍රතිවෙධ කළ නො හැක්කැයි ‘දුද්දසං’ යනු වේ. **හදයස්සිතං** යනු: ‘හදය’ යි සිත කියනු ලැබෙයි; යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් භවාඞ්ගසිතෙක් මනසක් මනසඞ්ඛ්‍යාත ආයතනයෙක් මනෙන්ද්‍රියයෙක් විඥාන–යෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුවෙක් වේ ද එය යි. හෘදය (-සිත) ඇසුරු කළ හෘදයනිඃශ්‍රිත වූ සිත ඇසුරු කළ චිත්තනිඃශ්‍රිත වූ සිත හා සහගත (-නො වෙන්) වූ සමග උපන් සංසෘෂ්ට වූ සම්ප්‍රයුක්ත වූ එක් වැ උපදනා එක් වැ නිරුද්ධ වන (හෘදයවස්තු වශයෙන්) එකවස්තුක වූ (රූපාදි වශයෙන්) එකාලම්බන වූයේ තුයි ‘දුද්දසං හදයස්සිතං’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“ඛයානෙන තෙවව බ්‍යාරූපෙබ -පෙ- දුද්දසං හදයස්සිතං”යි

## 15 – 5

යම් රාගාදි ශල්‍යයෙකින් අවතීර්ණ වූ (-විදුනා ලද) සත්ත්ව තෙමේ සියලු දිගට දිවෙන්නේ ද, (එහෙයින්) ඒ ශල්‍යය මැ උදුරාපියා (සියලු දිගට සියලු ගති ආදියෙහි) නො දිවෙයි. (චතුරොඝයෙහි) නො ගැලේ.

**යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති** – ‘සල්ල’ නම්: සත් ශල්‍ය කෙනෙකි: රාගශල්‍ය යැ ද්වේෂශල්‍ය යැ මෝහශල්‍ය යැ මානශල්‍ය යැ දෘෂ්ටිශල්‍ය යැ ශෝකශල්‍ය යැ කථංකථාශල්‍ය යි.

රාගශල්‍යය කවරැ යත්: යම් රාගයෙක් බලවත් රාගයෙක් නැවත නැවත පැමිණැවීමෙක් කැමැති වීමෙක් නන්දි සඞ්ඛ්‍යාත රාගයෙක් චිත්තයාගේ බලවද්රාගයෙක්…අභිධ්‍යාවක් ලෝභ අකුශලමූලයෙක් වේ ද මේ රාගශල්‍ය යි.

ද්වේෂශල්‍යය කවරැ යත්: ‘මට අනර්ථ කළැ’යි ආඝාත උපදී, මට අනර්ථ කෙරෙයි’ ආඝාත උපදී, ‘මට අනර්ථ කරන්නේ වනැ’යි ආඝාත උපදී…සැඩපරුෂවක් නො පිරුණු වචන ඇතිබවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ ද්වේෂශල්‍ය යි.

කතමං මොහසල්ලං? දුක්ඛෙ අඤ්ඤාණං -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං, පුබ්බන්තෙ -පෙ- අපරන්තෙ - පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසඞ්ගාහනා[1] අපරියොගාහනා අසම්පෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී[2] මොහො අකුසලමූලං, ඉදං මොහසල්ලං.

කතමං මානසල්ලං? සෙය්‍යොහමස්මීති මානො, සදිසොහමස්මීති මානො, හීනොහමස්මීති මානො; යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, ඉදං මානසල්ලං.

කතමං දිට්ඨිසල්ලං? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි; යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො අයාථාවතස්මිං[3] යාථාවතන්ති ගාහො යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි, ඉදං දිට්ඨිසල්ලං.

කතමං සොකසල්ලං? ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො අන්තොදාහො අන්තොපරිදාහො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං, ඉදං සොකසල්ලං.

1. අසඞ්ගහනා - සී II
2. ලඞ්ගි - සී II.
3. අයාථාවකස්මිං - සී II

මෝහශල්‍යය කවරේ යත්: දුඃඛසත්‍යයෙහි නො දැනීම...දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදාසත්‍යයෙහි නො දැනීම, පූර්වාන්තයෙහි ..අපරාන්තයෙහි... පූර්වාපරාන්තයෙහි නො දැනීම, ඉදම්ප්‍රත්‍යතා සඞ්ඛ්‍යාත ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නො දැනීම (යන) මේ බඳු වූ යම් නො දක්මෙක් (දකුම්) නො දැනීමෙක් (අනුරූප වශයෙන්) නො දැනීමෙක් අවබෝධ නො කිරීමෙක් ප්‍රතිවේධ නො කිරීමෙක් (අනිත්‍යාදි සාමාන්‍ය හෙයින්) නො ගැනීමෙක් හාත්පසින් බැස නො ගැනීමෙක් සමව නො බැලීමෙක් ප්‍රත්‍යවේක්ෂා නො කිරීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් (චිත්තසන්තානයාගේ) අපවිත්‍ර බවෙක් බාලබවෙක් මෝහයෙක් බලවත් මෝහයෙක් සම්මෝහයෙක් අවිද්‍යාවෙක් අවිද්‍යෞඝයෙක් අවිද්‍යායෝගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යාපර්‍යුත්ථානයෙ (-සිත මැඩගැනීමෙ) ක් අවිද්‍යා නමැති කතයමෙක් මෝහ අකුශලමූලයෙක් වේ ද, මේ මෝහශල්‍ය යි.

මානශල්‍යය කවරේ යත්: 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' මානය වෙයි, 'මම සදෘශ වෙමි' මානය වෙයි, 'මම හීන වෙමි' මානය වෙයි. මෙබඳු වූ යම් මානයෙක් මානාකාරයෙක් මානය කළ බවෙක් උන්නතියෙක් ඔසවා තැබීමෙක් මානධ්වජයෙක් දැඩිව ගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතාවෙක් වේ ද, මේ මානශල්‍ය යි.

දෘෂ්ටිශල්‍යය කවරේ යත්: විංශතිවස්තුක සත්කායදෘෂ්ටිය දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය දශවස්තුක අන්තග්‍රාහිකා දෘෂ්ටිය (යන) මෙබඳු වූ යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් (සම්‍යග්දෘෂ්ටිය විනිවිදින හෙයින්) දෘෂ්ටිවිසූකායිකයෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් (අරමුණ දැඩිව) ගැනීමෙක් පිහිටාගැනීමෙක් (නිත්‍යාදි වශයෙන්) අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසයෙන් ගැනීමෙක් විපරීත ව ගැනීමෙක් (නිත්‍යාදි වශයෙන්) පරිවර්තන කොට ගැනීමෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි ස්වභාව යයි ගැනීමෙක් වේ ද, යම් පමණ ද්වාෂෂ්ටි දෘෂ්ටිගතයෝ වෙත් ද, මේ දෘෂ්ටිශල්‍ය යි.

ශෝකශල්‍යය කවරේ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ භෝගව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ රෝගව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ ශීලව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් සමන්විත වූවහුගේ අන්‍යතරාන්‍යතර දුඃඛධර්මයෙකින් මඩනා ලදහුගේ ශෝකයෙක් ශෝකාකාරයෙක් ශෝක කළ බවෙක් අන්තර්ශෝකයෙක් ඇතුළත හාත්පසින් ශෝක කිරීමෙක් අන්තර්දාහයෙක් ඇතුළත හාත්පසින් දැවීමෙක් සිත දැවෙන අසුරෙක් දෙම්නසෙක් වේ ද, මේ ශෝකශල්‍ය යි.

කතමං කථංකථාසල්ලං? දුක්ඛෙ කඞ්ඛා දුක්ඛසමුදයෙ කඞ්ඛා දුක්ඛනිරොධෙ කඞ්ඛා දුක්ඛනිරොධගාමිනියා පටිපදාය කඞ්ඛා පුබ්බන්තෙ කඞ්ඛා අපරන්තෙ කඞ්ඛා පුබ්බන්තාපරන්තෙ කඞ්ඛා ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛා, යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ඡම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො; ඉදං කථංකථාසල්ලං.

**යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවතීති** – රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති, පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති. එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, එවම්පි රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සංධාවති සංසරති. අථවා රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො භොගෙ පරියෙසන්තො නාවාය මහාසමුද්දං පක්ඛන්දති: සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො ඛුප්පිපාසාහි[1] මීයමානො[2] තිගුම්බං ගච්ඡති, තක්කොලං ගච්ඡති, තක්කසිලං ගච්ඡති, කාලමුඛං ගච්ඡති, පරමුඛං[3] ගච්ඡති, වෙසුඞ්ගං ගච්ඡති, වෙරපථං ගච්ඡති, ජවං ගච්ඡති, තාමලිං[4] ගච්ඡති, වඞ්ගං[5] ගච්ඡති, එළවද්ධනං[6] ගච්ඡති, සුවණ්ණකූටං ගච්ඡති, සුවණ්ණභූමිං ගච්ඡති, තම්බපණ්ණිං ගච්ඡති, සුප්පාරකං[7] ගච්ඡති, භරුකච්ඡං[8] ගච්ඡති, සුරට්ඨං[9] ගච්ඡති, අඞ්ගලොකං[10] ගච්ඡති, ගඞ්ගණං[11] ගච්ඡති, පරමගඞ්ගණං[12] ගච්ඡති, යොනං ගච්ඡති, පරමයොනං ගච්ඡති, විනකං[13] ගච්ඡති, මූලපදං ගච්ඡති, මරුකන්තාරං ගච්ඡති, ජණ්ණුපථං ගච්ඡති, අජපථං ගච්ඡති, මෙණ්ඩපථං ගච්ඡති, සඞ්කුපථං ගච්ඡති, ඡත්තපථං ගච්ඡති, වංසපථං[14] ගච්ඡති, සකුණපථං ගච්ඡති, මූසිකපථං ගච්ඡති, දරිපථං ගච්ඡති, වෙත්තාධාරං[15] ගච්ඡති. පරියෙසන්තො න ලභති. අලාභමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පරියෙසන්තො ලභති, ලද්ධා ආරක්ඛමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති: කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං, න චොරා හරෙය්‍යුං, න අග්ගි දහෙය්‍ය, න උදකං වහෙය්‍ය, න අප්පියා දායාදා හරෙය්‍යුන්ති. තස්ස එවං ආරක්ඛතො ගොපයතො තෙ භොගා විප්පලුජ්ජන්ති. සො විප්පයොගමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සංධාවති සංසරති.

---

1. ඛුප්පිපාසාය - සීමු. II. මජසං. PTS. 2. පිලියමානො - සීමු. II.
3. මරණපාරං - සීමු. II. පුරපුරං - මජසං.
4. තමලිං - සීමු II. තම්බලිඞ්ගං - සිඞ්ගං - සී. 5. වඞ්කං - සී.
6. එළබන්ධනං - සීමු. II. මජසං. ජලවත්තං - මජුප.
7. සුප්පාදකං - මජසං. සුප්පාරං - සීමු. I.
8 භාරුකච්ඡං - සීමු II. භරුකච්ඡිං - භරුකං - සී. 9 සුරද්ධං - සුරරට්ඨං - සී.
10 සඞ්ගලොකං - මජසං. සඞ්ගලොකං - සී
11. ගඞ්ගණං - මජසං. සඞ්ගණං - තඞ්ගණං - සී.
12. පුරම්ගඞ්ගණං. මජසං. පදපතඞ්ගං. - සී. පදපතඞ්ගණං - සී.
13. විතකං - මජසං. වීතකං - මුසී. I. 14. අංසපථං - සී 15. වෙත්තාචාරං - සී.

කථංකථාශල්‍යය කවරේ යත්: දුඃඛයෙහි සැකය දුඃඛසමුදයෙහි සැකය දුඃඛනිරොධයෙහි සැකය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත්තියෙහි සැකය පූර්වාන්තයෙහි සැකය අපරාන්තයෙහි සැකය පූර්වාපරාන්තයෙහි සැකය ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි සැකය (යන) මෙබඳු වූ යම් සැකයෙක් සැක අයුරක් සැකයට පැමිණියාවූ බවෙක් විමතියෙක් විචිකිත්සාවක් දෙපරිද්දෙන් පැවැත්මෙක් ද්විධාපථයෙක් සැකයෙක් අනෙකාන්තග්‍රාහයෙක් (අරමුණෙන්) බැහැර යැමෙක් හාත්පසින් බැහැර යැමෙක් (අරමුණට) නො බැසගැනීමෙක් සිතහි තදබවෙක් චිත්තවිලෙඛයෙක් වේ ද, මේ කථංකථාශල්‍ය යි

**යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති** – රාගශල්‍යයෙන් මඩනා ලද්දේ විදිනා ලද්දේ පහස්නා ලද්දේ පෙළෙණ බැසගන්නා ලද්දේ සමන්විත වූයේ කයින් දුසිරිතෙහි හැසිරෙයි, බසින් දුසිරිතෙහි හැසිරෙයි, සිතින් දුසිරිතෙහි හැසිරෙයි, ප්‍රාණවධ ද කෙරෙයි, නො දුන් දැය ද හැරගනී, ගෘහසන්ධි ද සිඳී, ගම් පැහැරීම ද ගෙවල් පැහැරීම ද මං පැහැරීම ද කෙරෙයි, පරඹුන් කරා ද යෙයි, මුසා ද බෙණෙයි. මෙසේත් රාගශල්‍යයෙන් මඩනා ලද්දේ විදිනා ලද්දේ පහස්නා ලද්දේ පීඩිත වූයේ බැසගත්තා ලද්දේ සමන්විත වූයේ දිවෙයි, වෙසෙසින් දිවෙයි, වේගයෙන් දිවෙයි, ඔබිනොබැ හැසිරෙයි. නොහොත් රාගශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ – ස්පෘෂ්ට – පරෙත – සමන්විත – සමන්වාගත වූයේ ධනය සොයමින් සීත පෙරටු කොට, උෂ්ණ පෙරටු කොට, මැසි මදුරු වා අව් දික්දූපහසින් වෙහෙසෙමින් සාපවසින් මැරෙමින් නැවින් මහමුහුදට පිවිසෙයි: ත්‍රිගුල්ම ජනපදයට යෙයි, තක්කෝලයට යෙයි, තක්ෂශිලාවට යෙයි, කාලමුඛයට යෙයි, පරාඩ්මුඛයට යෙයි, වෙසුඞ්ගයට යෙයි, වේරාපථයට යෙයි, ජාවරටට යෙයි, තාමලීජනපදයට යෙයි, වඞ්ගරටට යෙයි, එළවර්ධනයට යෙයි, සුවණ්ණකූටයට යෙයි, සුවණ්ණභූමියට යෙයි, තාම්‍රපර්ණියට යෙයි, සුප්පාරකජනපදයට යෙයි, භරුකච්ඡජනපදයට යෙයි, සෞරාෂ්ට්‍රයට යෙයි, අඞ්ගලෝකයට යෙයි, ගඞ්ගණයට යෙයි, පරමගඞ්ගණයට යෙයි, යවනරටට යෙයි, පරමයවනයට යෙයි, තවකරමට යෙයි, මූලපදරටට යෙයි, මරුකාන්තාරයට යෙයි, ජණ්ණුපථයට යෙයි, අජපථයට යෙයි, මෙණ්ඩපථයට යෙයි, ශඞ්කුපථයට යෙයි, ඡත්‍රපථයට යෙයි, වංශපථයට යෙයි, ශකුණපථයට යෙයි, මූෂිකපථයට යෙයි, දරීපථයට යෙයි, වේත්‍රාධාරයට යෙයි. සොයනුයේ (භොගයන්) නො ලැබෙයි එකල්හි නො ලැබීම හේතු කොට ද දුක් දොම්නස් විඳී. සොයනුයේ ලැබේ නම්, ලැබ ආරක්ෂාමූලක වූ ද දුක් දොම්නස් විඳී: 'කවර උපායෙකින් මාගේ භොගයන් රජවරු නො මැ හැරගත්තාහු ද සොරු නො පැහැරගත්තාහු ද ගිනි නො දවා ද වතුරු නො ගලා ද අප්‍රියදායාදයෝ නො හරතාහු ද'යි. මෙසේ රක්නා වූ පාලනය කරන්නා වූ ඔහුගේ ඒ භොගයෝ වැනැසෙති, හෙතෙම විප්‍රයොගමූලක වූ ද දුක් දොම්නස් විඳී. මෙසේත් රාගශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලද්දේ පහස්නා ලද්දේ පීඩිත වූයේ පිවිසියේ සමන්විත වූයේ දිවෙයි, වෙසෙසින් දිවෙයි, වේගයෙන් දිවෙයි, ඔබිනොබැ හැසිරේ,

දොසසල්ලෙන - මොහසල්ලෙන - මානසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති, පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති. එවං මානසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අචෙලකො හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො, න එහිභදන්තිකො, න තිට්ඨභදන්තිකො, නාභිහටං න උද්දිස්ස කතං න නිමන්තනං සාදියති. සො න කුම්භිමුඛා පතිගණ්හාති. න කළොපිමුඛා පතිගණ්හාති න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිණී, න මච්ඡං, න මංසං, න සුරං, න මෙරයං, න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති. එකාලොපිකො වා. ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො -පෙ- සත්තාගාරිකො වා හොති. සත්තාලොපිකො. එකිස්සාපි දත්තියා යාපෙති. ද්වීහිපි දත්තීහි යාපෙති -පෙ- සත්තහිපි දත්තීහි යාපෙති. එකාහිකම්පි ආහාරං ආහාරෙති. ද්වාහිකම්පි ආහාරං ආහාරෙති -පෙ- සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති. එවම්පි දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

අථවා දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො සො සාකභක්ඛො වා හොති, සාමාකභක්ඛො වා හොති, නීවාරභක්ඛො වා හොති, දද්දුලභක්ඛො වා හොති, හටභක්ඛො වා හොති, කණභක්ඛො වා හොති, ආචාමභක්ඛො වා හොති, පිඤ්ඤාකභක්ඛො වා හොති, තිලභක්ඛො වා හොති, තිණභක්ඛො වා හොති, ගොමයභක්ඛො වා හොති, වනමූලඵලාහාරො වා යාපෙති පවත්තඵලභොජනො. සො සාණානිපි ධාරෙති, මසාණානිපි ධාරෙති, ඡවදුස්සානිපි ධාරෙති, පංසුකූලානිපි ධාරෙති, -

ද්වෙෂශල්‍යයෙන් - මෝහශල්‍යයෙන් - මානශල්‍යයෙන් අවතීර්ණ විද්ධ ස්පෘෂ්ට පරේත සමවහිත සමන්වාගත වූයේ කයින් දුසිරිතෙහි හැසිරෙයි, බසින් දුසිරිතෙහි හැසිරෙයි, සිතින් දුසිරිතෙහි හැසිරෙයි, ප්‍රාණවධ ද කෙරෙයි, නුදුන් දෑය ද ගනී, ගෘහසන්ධි ද සිඳී, ගම් පැහැරීම ද කෙරෙයි, ගෙවල් පැහැරීම ද කෙරෙයි, මං පැහැරීම් ද කෙරෙයි, පරඹුන් වෙත ද යයි, මුසාවා ද බණෙයි. මෙසේසින් මානශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදිනා ලදුයේ පහස්නා ලදුයේ මඩනා ලදුයේ ඇතුලත පිවිසියේ සමන්විත වූයේ ඉදිරියෙහි දිවෙයි, එසෙසින් දිවෙයි, වේගයෙන් දිවෙයි, ඔබිනොබැ හැසිරේ.

දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ වූයේ ස්පෘෂ්ට වූයේ පීඩිත වූයේ ප්‍රවිෂ්ට වූයේ සමන්විත වූයේ අචේලක (-නග්නශ්‍රමණ) වෙයි, හරන ලද ආචාර ඇත්තේ වෙයි, අත ලෙව්නේ වෙයි, (භික්ෂා ගැනීම සඳහා) ‘එව වහන්සැ’යි කියන ලදුයේ නො එයි, ‘සිට වහන්සැ’යි කියන ලදුයේ නො සිටී, පළමු එළවූ භික්ෂාව නො ගනී, උදෙසා කළ භික්ෂාව නො ගනී, නිමන්ත්‍රණය නො ඉවසයි. හෙතෙම කළමුවින් නඟා දුන් භික්ෂාව නො ගනී, සැළමුවින් නඟා දෙන ලද්ද නො පිළිගනී, එළිපත අතර කොට දුන් භික්ෂාව නො ගනී, දඬු අතර කොට දුන් භික්ෂාව - මෝල්කොල් අතර කොට දුන් භික්ෂාව නො පිළිගනී, වළඳන දෙදෙනකු ගෙන් එකකු නැඟීසිට දුන් භික්ෂාව නො පිළිගනී, ගැබිනියක දුන් භික්ෂාව - කිරිපොවන තෙනැත්තියක දුන් භික්ෂාව - පුරුෂයන් අතරට ගිය තෙනැත්තිය දුන් භික්ෂාව - සංකීර්තනය කොට දුන් කල්හි නො ගනී. ශුනකයකු එළඹසිටි තැන භික්ෂාව - මැස්සන් මුළුමුළුවැ හුන් තැන දුන් භික්ෂාව නො පිළිගනී. මත්ස්‍යමාංස රහ - මේර නො පිළිගනී, තුසෝදය (-සෞවීරකාරසය) පානය නො කෙරෙයි. හෙතෙම පිණ්ඩකත එක ගෙයක් ඇත්තේ හෝ එක ආලෝපයකින් යැපෙන්නේ හෝ වෙයි, දෙ ගෙයක් ඇත්තේ හෝ දෙ ආලෝපයකින් යැපෙන්නේ හෝ වෙයි...සප්තාගාරික හෝ සප්තාලොපික වූයේ වෙයි, එක් දත්තිය (කුඩා බත් තලිය) කින් ද යැපෙන්නේ වෙයි, බත්තලි දෙකකින් ද..බත්තලි සතකින් ද යැපෙන්නේ වෙයි; එකාහික (-එක දවසක් අතුරු කළ) ආහාරය ද වළඳයි, දෙ දවසක් අතුරු කළ ආහාරය ද වළඳයි... සප්තාහික ආහාරය ද වළඳයි. මෙසේ මෙබඳු අර්ධමාසික වූ ද වාරබත වැළඳීමෙහි යෙදී වෙසෙසි. මෙසේත් දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ වූයේ ස්පෘෂ්ට වූයේ පීඩිත වූයේ ප්‍රවිෂ්ට වූයේ සමන්වාගත වූයේ ධාවන-විධාවන - සන්ධාවනය කෙරෙයි, සංසරණය කෙරේ.

නොහොත් දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදිනා - පහස්නා - මඩනා ලදුයේ පිවිසියේ සමන්විත වූයේ හෙතෙම අමුපලා කන්නේ හෝ වෙයි, බොඩනමුඟහල් බුදින්නේ හෝ වෙයි, සවයංජාත වී (හුරුගැල්) බුදින්නේ හෝ වෙයි, සම්කැබැලි බුදින්නේ හෝ වෙයි, රුක්ලාටු බුදින්නේ හෝ වෙයි, කුඩු බුදින්නේ හෝ වෙයි, දඹුබත් බුදින්නේ හෝ වෙයි, මූරුවට බුදින්නේ හෝ වෙයි, තල බුදින්නේ හෝ වෙයි, තණකොළ බුදින්නේ හෝ වෙයි, ගොම බුදින්නේ හෝ වෙයි, වනමුල්ඵල ආහාර කොට ඇත්තේ හෝ වැටුණු ගෙඩි බුදිනුයේ යැපෙයි. හේ සණවැහැරි ද දරයි, මිශ්‍රක-වස්ත්‍ර ද දරයි, මලසිරුරින් බැහැර කළ වස්ත්‍ර ද දරයි, පාංශුකූල ද දරයි-

තිරීටානිපි ධාරෙති, අජිනානිපි ධාරෙති, අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාලකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි ධාරෙති. කෙසමස්සුලොචකොපි හොති, කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො විහරති. උබ්භට්ඨකොපි හොති ආසනපටික්ඛිත්තො, උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානමනුයුත්තො. කණ්ටකාපස්සයිකොපි හොති කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති, ඵලකසෙය්‍යම්පි කප්පෙති, ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති, එකපස්සයිකො හොති රජොජල්ලධරො, අබ්භොකාසිකො හොති යථාසන්ථතිකො, වෙකටිකොපි හොති විකට-භොජනානුයොගමනුයුත්තො, අපානකොපි හොති අපානකත්තමනුයුත්තො, සායතතියකම්පි උදකොරොහනානුයොගමනුයුත්තො විහරති. ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති. එවම්පි දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

සොකසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. වුත්තං හෙතං භගවතා: “භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරිස්සා ඉත්ථියා මාතා කාලමකාසි. සා තස්සා කාලකිරියාය උම්මත්තිකා ඛිත්තචිත්තා රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ මාතරං අද්දසථ ? අපි මෙ මාතරං අද්දසථා’ති.[a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤ-තරිස්සා ඉත්ථියා පිතා කාලමකාසි - භාතා කාලමකාසි - භගිනී කාලමකාසි පුත්තො කාලමකාසි - ධීතා කාලමකාසි - සාමිකො කාලමකාසි. සා තස්ස කාලකිරියාය උම්මත්තිකා ඛිත්තචිත්තා රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ සාමිකං අද්දසථ ? අපි මෙ සාමිකං අද්දසථා’ති.[a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤ-තරස්ස පුරිසස්ස මාතා කාලමකාසි. සො තස්සා කාලකිරියාය උම්මත්තකො ඛිත්තචිත්තො රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ මාතරං අද්දසථ ? අපි මෙ මාතරං අද්දසථා’ති.[a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරස්ස පුරිසස්ස පිතා කාලමකාසි - භාතා කාලමකාසි - භගිනී කාලමකාසි - පුත්තො කාලමකාසි - ධීතා කාලමකාසි - පජාපති කාලමකාසි. සො තස්සා කාලකිරියාය උම්මත්තකො ඛිත්තචිත්තො රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: ‘අපි මෙ පජාපතිං අද්දසථ ? අපි මෙ පජාපතිං අද්දසථා’ති [a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරා ඉත්ථී ඤාතිකුලං අගමාසි. තස්සා තෙ ඤාතකා සාමිකං අච්ඡින්දිත්වා අඤ්ඤස්ස දාතුකාමා. සා ච තං න ඉච්ඡති. අථ ඛො සා ඉත්ථී සාමිකං එතදවොච: ‘ඉමෙ මං අය්‍යපුත්ත, ඤාතකා තව අච්ඡින්දිත්වා අඤ්ඤස්ස දාතුකාමා. උභො මයං මරිස්සාමා’ති. අථ ඛො සො පුරිසො තං ඉත්ථිං ද්විධා ඡෙත්වා අත්තානං ඔපාතෙසි[1] උභො පෙච්ච භවිස්සාමා’ති.[a] එවං සොක-සල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

1. ඔපාතෙති - සීමු. II.

a. මජ්ඣිමනිකාය - මජ්ඣිමපණ්ණාසක - පියජාතිකසුත්ත.

රුක්සුඹුළු වස්ත්‍ර ද දරයි, අඳුන්මුවසම් ද දරයි, මැදින් පැළූ අඳුන්මුවසම් ද දරයි, කුසවැහැරි ද දරයි, සුඹුලු වැහැරි ද දරයි, පුවරුවැහැරිද දරයි, මිනිස් කෙසින් කළ කම්බිලි ද දරයි, අස්වලින් කළ කම්බිලි දරයි, බකමූණුපියාපතින් කළ වස්ත්‍ර දරයි. කෙස් රවුළු උදුරන්නේ ද වෙයි, කෙස් රවුළු ඉදිරීමෙහි යෙදී වාසය කෙරෙයි. ආසන ප්‍රතික්ෂෙප කෙළේ උඩුකුරුව සිටින්නේ ද වෙයි, උක්කුටික වීර්‍ය්‍යයෙහි යෙදුණේ උක්කුටික වූයේ ද වෙයි, කටුඇතිරියෙහි නියුක්ත වූයේ ද වෙයි, කටුඇතිරියෙහි ශයනය කෙරෙයි. පුවරුවෙහි ශයනය ද කෙරෙයි, උස්බිම ශයනය ද කෙරෙයි, රජස් දූලි දරනුයේ එක් ඇලයකින් හෝනේ වෙයි, අතුල සේ හිඳිනා ඇඳ වූයේ අභ්‍යවකාශයෙහි යෙදුණේ වෙයි. විකෘත (ගූථ) භොජනයෙහි යෙදුණේ විකෘතය බුදිනසුලු වූයේ ද වෙයි, දිය නුබුනු බත් බිදීමෙහි යෙදුණේ ප්‍රතික්ෂෙප කළ සිහිල් දිය ඇත්තේ ද වෙයි. සවස තුන්වැනි කොට උදකාවරොහණයෙහි යෙදුණේ වාසය කෙරෙයි. මෙසේ මොහු අනෙකප්‍රකාර වූ කය තවන හාත්පසින් තවන යොගයෙහි යෙදුණේ වාසය කෙරෙයි. මෙසේත් දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදිනා ලදුයේ පහස්නා ලදුයේ මඩනා ලදුයේ ඇතුළත පිවිසියේ සමන්විත වූයේ ධාවනය විධාවනය සන්ධාවනය කෙරෙයි, සංසරණය කෙරේ.

ශොකශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ - ස්පෘෂ්ට - පරෙත - සමවහිත - සමන්වාගත වූයේ ශොක කෙරෙයි, වෙහෙසෙයි, විලාප කියයි, ළෙහි පැහැර හඬයි, සම්මොහයට පැමිණේ. මේ වදාරණ ලද මැ ය, භාග්‍යවතුන් විසින්: “බමුණ, පෙර වූවක් කියමි: මේ සැවැත්නුවර මැ එක්තරා ගැහැනියකගේ මව මළා යැ. ඕ තොමෝ ඇගේ මරණයෙන් උමතු වූවා නට සිත් ඇත්තී වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: ‘මාගේ මව දුටුවහු ද? මාගේ මව දුටුවහු ද’යි. බමුණ, පෙර වූවක් කියමි: මේ සැවැතෙහි එක්තරා ගැහැනියකගේ පියා මළේ ය - බෑයා මළේ ය - බූන මළා යැ - පුත් මළේ ය - දූව මළා යැ - සැමියා මළේ ය. ඕ තොමෝ ඔහුගේ මරණයෙන් උමතු වූවා නට සිත් ඇත්තී වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: ‘මාගේ සැමියා දුටුවහු ද? මාගේ සැමියා දුටුවහු ද’යි. බමුණ පෙර වූවකි: මේ සැවැතෙහි එක්තරා මිනිසකුගේ මව මළා ය. හෙතෙම ඇගේ මරණයෙන් උමතු වූයේ නට සිත් ඇත්තේ වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: ‘මාගේ මව දුටුවහු ද? මාගේ මව දුටුවහු ද’යි. බමුණ, පෙර වූවකි: මේ සැවැතෙහි මැ එක්තරා මිනිසකුගේ පියා මළේ ය -බෑයා මළේ ය- භගිනිය මළා ය- පුතා මළේ ය- දුව මළා ය-භාර්‍ය්‍යාව මළා ය. හෙතෙම ඇගේ මරණයෙන් උමතු වූයේ නට සිත් ඇතියේ වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: ‘මාගේ භාර්‍ය්‍යාව දුටුවහු ද? මාගේ භාර්‍ය්‍යාව දුටුවහු ද’යි. බමුණ, පෙර වූවකි: මේ සැවැතෙහි මැ එක්තරා ගැහැනියක් ඥාතිකුලයට ගියා යැ. ඇගේ ඒ නෑයෝ සැමියාගෙන් අසිදගෙන අන් මිනිසකුට දෙනු කැමැති වූහ. එහෙත් ඕ ඒ මිනිසා නො කැමැති වෙයි. ඉක්බිති ඕ ස්ත්‍රිය සැමියාට කීව: ‘සාමිදරුවාණෙනි, මේ නෑයෝ මා තොපගෙන් අසිදගෙන අනෙකකු හට දෙනු කැමැත්තාහ. ඇපි දෙදෙන මැරෙම්හ’යි. එකල ඒ මිනිසා ඒ ගැහැනිය දෙකඩ කොට සිද තමා නැසීය. “දෙදෙන පරලොව ගොස් එක්වම්හ”යි. මෙසේ ශොකශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ-ස්පෘෂ්ට පරෙත - සමවහිත සමන්වාගත වූයේ ධාවන- විධාවන -සන්ධාවන කෙරෙයි, සංසරණය කෙරේ.

කථංකථාසල්ලෙන ඔතිණ්ණො විනද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො සංසයපක්ඛන්දො හොති විමතිපක්ඛන්දො ද්වෙළ්හකජාතො: 'අහොසිං නු ඛො අහං අතීතමද්ධානං? න නු ඛො අහොසිං අතීතමද්ධානං? කිං නු ඛො අහොසිං අතීතමද්ධානං? කථං නු ඛො අහොසිං අතීතමද්ධානං? කිං හුත්වා කිං අහොසිං නු ඛො අතීතමද්ධානං? භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං? න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං? කිං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං? කථං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං? කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අනාගතමද්ධානං? එතරහි වා පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කථංකථී හොති: අහං නු ඛොස්මි? නො නු ඛොස්මි? කිං නු ඛොස්මි? කථං නු ඛොස්මි? අයං නු ඛො සත්තො කුතො ආගතො? සො කුහිං ගාමී භවිස්සතී'ති. එවං කථංකථාසල්ලෙන ඔතිණ්ණො විනද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති. තෙ සල්ලෙ අභිසඞ්ඛරොති. තෙ සල්ලෙ අභිසඞ්ඛරොන්තො සල්ලාභිසඞ්ඛාරවසෙන පුරත්ථිමං දිසං ධාවති. පච්ඡිමං දිසං ධාවති. උත්තරං දිසං ධාවති. දක්ඛිණං දිසං ධාවති. තෙ සල්ලාභිසඞ්ඛාරා අප්පහීනා. සල්ලාභිසඞ්ඛාරානං අප්පහීනත්තා ගතියා ධාවති නිරයෙ ධාවති. තිරච්ඡානයොනියා ධාවති. පෙත්තිවිසයෙ ධාවති. මනුස්සලොකෙ ධාවති. දෙවලොකෙ ධාවති. ගතියා ගතිං උපපත්තියා උපපත්තිං පටිසන්ධියා පටිසන්ධිං භවෙන භවං සංසාරෙන සංසාරං වට්ටෙන වට්ටං ධාවති විධාවති සන්ධාවති සංසරතීති - යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති.

තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදතීති - තමෙව රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං කථංකථාසල්ලං අබ්බුය්හ අබ්බුහිත්වා උද්ධරිත්වා සමුද්ධරිත්වා උප්පාටයිත්වා සමුප්පාටයිත්වා[1] පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා නෙව පුරත්ථිමං දිසං ධාවති. න පච්ඡිමං දිසං ධාවති. න උත්තරං දිසං ධාවති. න දක්ඛිණං දිසං ධාවති. තෙ සල්ලාභිසඞ්ඛාරා පහීනා. සල්ලාභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා න ධාවති. නිරයෙ න ධාවති. තිරච්ඡානයොනියා න ධාවති. පෙත්තිවිසයෙ න ධාවති. මනුස්සලොකෙ න ධාවති. දෙවලොකෙ න ධාවති. න ගතියා ගතිං - න උපපත්තියා උපපත්තිං - න පටිසන්ධියා පටිසන්ධිං - න භවෙන භවං - න සංසාරෙන සංසාරං - න වට්ටෙන වට්ටං ධාවති විධාවති සන්ධාවති සංසරතීති - තමෙව සල්ලමබ්බුය්හ. න ධාවති න සීදතීති කාමොඝෙ න සීදති. භවොඝෙ න සීදති. දිට්ඨොඝෙ න සීදති. අවිජ්ජොඝෙ න සීදති. න සංසීදති න අවසීදති න ගච්ඡති න අවගච්ඡතීති - තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති.

තෙනාහ භගවා:

"යෙන සල්ලෙන ඔතිණ්ණො
දිසා සබ්බා විධාවති,
තමෙව සල්ලමබ්බුය්හ
න ධාවති න සීදතී"ති

1. උප්පාදයිත්වා සමුප්පාදයිත්වා - සයා. මජසං. PTS.

කථංකථාශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලදුයේ පහස්නා ලදුයේ පීඩිත වූයේ පිවිසියේ සමන්විත වූයේ සැකයට පැමිණියේ වෙයි. විමතියට පැමිණියේ දෙසිත් වූයේ වෙයි: 'මම් අතීතකාලයෙහි වූයෙම් දෝ හෝ අතීතයෙහි නො වූයෙම් දෝ හෝ (ජාත්‍යාදිය නිසා) අතීතයෙහි කුමක් වූයෙම් දෝ හෝ අතීතයෙහි කෙසේ වූයෙම් දෝ හෝ අතීතයෙහි (ජාත්‍යාදිය අතුරෙන්) කුමක් ව කුමක් වූයෙම් දෝ හෝ, මම් අනාගතකාලයෙහි වන්නෙම් දෝ හෝ අනාගතයෙහි නො වන්නෙම් දෝ හෝ (ජාත්‍යාදිය නිසා) අනාගතයෙහි කුමක් වන්නෙම් දෝ හෝ අනාගතයෙහි කෙසේ වන්නෙම් දෝ හෝ අනාගතයෙහි (ජාත්‍යාදිය අතුරෙන්) කුමක් ව කුමක් වන්නෙම් දෝ හෝ, මේ වර්තමානකාලය අරබයා හෝ සැක ඇත්තේ වෙයි: මම වෙම් දෝ හෝ නො වෙම් දෝ හෝ කුමක් වෙම් දෝ හෝ කෙසේ වෙම් දෝ හෝ මේ සත්ත්වයා කොයින් ආයේ දෝ හෝ කොහි යනසුලු වන්නේ දැ'යි. මෙසේ කථංකථාශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලද්දේ පහස්නා ලද්දේ මැඩුණේ පිවිසියේ සමන්විත වූයේ ධාවන විධාවන - සන්ධාවන කෙරෙයි, සංසරණය කෙරේ; ඒ රාගාදි ශල්‍යයන් උපදවයි. ඒ ශල්‍යයන් උපදවනුයේ ශල්‍යයන් ඉපදවීම් වශයෙන් පෙරදිගට දිවෙයි, පැලදෙසට දිවෙයි, උතුරු දෙසට දිවෙයි, දකුණු දෙසට දිවේ. ඒ රාගාදි ශල්‍යප්‍රයෝගයෝ අප්‍රහීණ වූවාහු ය. ශල්‍යාභිසංස්කාරයන් අප්‍රහීණ වන බැවින් ගතියෙහි දිවෙයි, නිරයෙහි දිවෙයි, තිරිසන්යෝනියෙහි දිවෙයි, ප්‍රේතවිෂයයෙහි දිවෙයි, මිනිස්ලොව දිවෙයි, දෙව්ලොව දිවෙයි, ගතියෙන් ගතියට උපතින් උපතට පිළිසඳින් පිළිසඳට භවයෙන් භවයට සසරින් සසරට වටින් වටට ධාවන - විධාවන - සන්ධාවනය කෙරෙයි. සංසරණය කෙරේ නුයි 'යෙන සල්ලේන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති' යනු වේ.

තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති - එ මැ රාගශල්‍යය ද්වේෂශල්‍යය මෝහශල්‍යය මානශල්‍යය දෘෂ්ටිශල්‍යය ශෝකශල්‍යය කථංකථා ශල්‍යය බැහැර කොට බැහැර පියා උදුරා මොනොවට උදුරා උපුටා මොනොවට උපුටා හැර දුරු කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා පෙරදිගට නො මැ දිවෙයි, පැලදෙසට නො දිවෙයි, උතුරුදෙසට නො දිවෙයි, දකුණුදෙසට නො දිවෙයි. ඒ රාගාදිශල්‍යප්‍රයෝගයෝ ප්‍රහීණ වූවාහු ය. ශල්‍යාභිසංස්කාරයන් ප්‍රහීණවන බැවින් ගතියෙහි නො දිවෙයි, නිරයෙහි නො දිවෙයි, තිරිසන්යෝනියෙහි නො දිවෙයි, ප්‍රේතවිෂයෙහි නො දිවෙයි, මිනිස්ලොව නො දිවෙයි, දෙව්ලොව නො දිවෙයි, ගතියෙන් ගතියට - උපතින් උපතට - පිළිසඳින් පිළිසඳට - භවයෙන් භවයට - සසරින් සසරට - වටින් වටට නො දිවෙයි, වෙහෙසින් නො දිවෙයි, වේගයෙන් නො දිවෙයි, ඔබිනොබ නො හැසිරේ නුයි 'තමෙව සල්ල-මබ්බුය්හ' යනු වේ. න ධාවති න සීදති - කාමෞඝයෙහි නො ගැලෙයි, භවෞඝයෙහි නො ගැලෙයි, දෘෂ්ට්‍යෞඝයෙහි නො ගැලෙයි, අවිද්‍යෞඝයෙහි නො ගැලෙයි, හාත්පසින් නො ගැලෙයි, ඇතුළත නො ගැලෙයි, නො පිවිසෙයි, නො සෙයි, නො බැසගනී නුයි 'තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යෙන සල්ලෙන ඔතිණ්ණො -පෙ- න ධාවති න සීදති"යි.

15 - 6

තත්ථ සික්ඛානුගීයන්ති
යානි ලොකෙ ගධිතානි,[1]
න තෙසු පසුතො සියා
නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ,
සික්ඛෙ නිබ්බානමත්තනො.

**තත්ථ සික්ඛානුගීයන්ති යානි ලොකෙ ගධිතානීති** – ‘සික්ඛා’ති හත්ථිසික්ඛා අස්සසික්ඛා රථසික්ඛා සාලාකියං සල්ලකත්තියං කායතිකිච්ඡං භූතියං කොමාරභච්චං.[2] **ගීයන්තීති** නිගීයන්ති කථීයන්ති භණීයන්ති දීපීයන්ති වොහරීයන්ති. අථවා **ගීයන්ති** – ගණ්හීයන්ති උග්ගණ්හීයන්ති ධාරීයන්ති උපධාරීයන්ති උපලක්ඛීයන්ති ගධිතපටිලාභාය. ගධිතා වුච්චන්ති පඤ්ච කාමගුණා: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. කිං කාරණා ගධිතා වුච්චන්ති පඤ්ච කාමගුණා? යෙභුය්‍යෙන දෙවමනුස්සා පඤ්ච කාමගුණෙ ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්ති; තංකාරණා ගධිතා වුච්චන්ති පඤ්ච කාමගුණා. **ලොකෙති** මනුස්ස -පෙ- ලොකෙති – තත්ථ සික්ඛානුගීයන්ති යානි ලොකෙ ගධිතානි.

**න තෙසු පසුතො සියාති** – තාසු වා සික්ඛාසු තෙසු වා පඤ්චසු කාමගුණෙසු න පසුතො සියා, න තන්නින්නො අස්ස, න තප්පොණො න තප්පබ්භාරො න තදධිමුත්තො න තදධිපතෙය්‍යොති – න තෙසු පසුතො සියා.

**නිබ්බිජ්ඣ සබ්බසො කාමෙති** – ‘නිබ්බිජ්ඣා’ති පටිවිජ්ඣිත්වා; සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති පටිවිජ්ඣිත්වා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති පටිවිජ්ඣිත්වා -පෙ- ‘යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම’න්ති පටිවිජ්ඣිත්වා; **සබ්බසොති** සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං සබ්බසොති; **කාමාති** උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමාති – නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ.

**සික්ඛෙ නිබ්බානමත්තනොති** –‘සික්ඛා’ති තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. **නිබ්බානමත්තනොති** අත්තනො රාගස්ස නිබ්බාපනාය දොසස්ස නිබ්බාපනාය මොහස්ස නිබ්බාපනාය -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං සමාය උපසමාය වූපසමාය නිබ්බාපනාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය.

1. ගධිතානි - සීමු. II. 2. කොමාරතිකිච්ඡං - ස්‍යා

**15 - 6**

සත්ත්වලොකයෙහි යම් පස්කම්ගුණ කෙනෙක් වෙත් නම්, ඒ නිමිති කොට (හස්තිශිල්පාදි) අනෙක ශිල්ප උගන්නා ලැබෙත්. (නුවණැති කුලපුත්‍ර තෙමේ) ඒ පස්කම්ගුණයන්හි හෝ හස්තිශික්ෂාදියෙහි ප්‍රයුක්ත වූයේ නො වන්නේ ය. (එහෙයින්) වස්තුකාමකෙලශකාමයන් සම්භාරයෙන් (අනිත්‍යාදි දර්ශනයෙන්) ප්‍රතිවෙධ කොට තමාගේ (රාගාදිය) නිවීමට හික්මෙන්නේ යි.

**තත්ථ සික්ඛානුගීයන්ති යානි ලොකෙ ගථිතානි** – 'සික්ඛා' යනු: හස්තිශික්ෂා යැ අශ්වශික්ෂා යැ රථශික්ෂා යැ ධනුශ්ශික්ෂා යැ ශාලාක්‍යතන්ත්‍ර යැ ශල්‍යකර්ම යැ කායචිකිත්සා යැ භෞතිකවිද්‍යා යැ කෞමාරභෘත්‍ය යි. **ගීයන්ති** යනු: ගයනු ලැබෙති, කියනු ලැබෙති, බණනු ලැබෙති, දක්වනු ලැබෙති, ව්‍යවහාර කරනු ලැබෙත්. නොහොත් **ගීයන්ති** – පස්කම්ගුණ ප්‍රතිලාභය සඳහා ගන්නා ලැබෙති, උගන්නා ලැබෙති, දරනු ලැබෙති, විමසනු ලැබෙති, සලකනු ලැබෙත්. 'ගථිත'යි පස්කම්ගුණයෝ කියනු ලැබෙත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව වූ කාමාස්වාදයෙන් යුත් ඇලුම් කටයුතු වූ චක්ෂුර්විඥානයෙන් දත්යුතු රූපයෝ යි. කවර කරුණෙකින් පස්කම්ගුණයෝ 'ගථිත'යි කියනු ලැබෙති යත්: බොහෝසෙයින් දිව්‍යමනුෂ්‍යයෝ පස්කම්ගුණයන් කැමැති වෙයි, ඉච්ඡති, පත්ති, රුචි කෙරෙති, අභිජල්පනය කෙරෙත්; එකරුණෙන් පස්කම්ගුණයෝ 'ගථිත' යි කියනු ලැබෙත්. **ලොකෙ** යනු: මිනිස්ලොව්...ආයතනලොකයෙහි නුයි 'තත්ථ සික්ඛානුගීයන්ති යානි ලොකෙ ගථිතානි' යනු වේ.

**න තෙසු පසුතො සියා** – ඒ ශික්ෂාවන්හි හෝ ඒ පස්කම්ගුණයන්හි හෝ නො ඇලුණේ වන්නේ යැ, ඊට නැමුණේ නො වන්නේ යැ, ඊට නැඹුරු වූයේ නො වන්නේ යැ, ඊට බර වූයේ නො වන්නේ යැ, එහි මුසපත් වූයේ නො වන්නේ යැ, එය අධිපති කොට ඇත්තේ නො වන්නේ නුයි 'න තෙසු පසුතො සියා' යනු වේ.

**නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ** – 'නිබ්බිජ්ඣ, යනු: ප්‍රතිවෙධ කොට 'සියලු සංස්කාරයෝ අනිත්‍යයහ'යි ප්‍රතිවෙධ කොට 'සියලු සංස්කාරයෝ දුක්හ'යි ප්‍රතිවෙධ කොට...'යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නිරුද්ධ වන ස්වභාව ඇතැ'යි ප්‍රතිවෙධ කොට; **සබ්බසො** යනු: සියල්ලෙන් සියල්ල සියලු ලෙසින් සියල්ල අශෙෂ කොට නිඃශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි මේ 'සබ්බසො' යනු. **කාමා** යනු: විස්තර වශයෙන් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද කෙලශකාමයෝ ද'යි...මොහු කෙලශකාමයෝ යි කියනු ලැබෙත් නුයි 'නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ' යනු වේ.

**සික්ඛෙ නිබ්බානමත්තනො** – 'සික්ඛා' නම්: ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥශික්ෂා යැයි...මේ අධිප්‍රඥශික්ෂා යි. **නිබ්බානමත්තනො** යනු තමාගේ රාගය නිවීමට ද්වෙෂය නිවීමට මොහය නිවීමට...සියලු අකුශලාභිසංස්කාරයන් ශමනයට මතු මත්තෙහි ශමනයට සන්සිඳුවීමට නිර්වාපණයට (මාර්ගයෙන්) දුරලීමට (ඵලයෙන්) අප්‍රතරුත්පත්තියට අධිශීලයෙහි ද හික්මෙන්නේ යැ, අධිචිත්තයෙහි ද හික්මෙන්නේ යැ අධිප්‍රඥාවෙහි ද හික්මෙන්නේ ය.

ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය ජානන්තො සික්ඛෙය්‍ය -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'සික්ඛෙ නිබ්බානමත්තනො'.

තෙනාහ භගවා:

"තත්ථ සික්ඛානුගීයන්ති
යානි ලොකෙ ගථිතානි,
න තෙසු පසුතො සියා
නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ,
සික්ඛෙ නිබ්බානමත්තනො"ති.

## 15 - 7

**සච්චො සියා අප්පගබ්භො අමායො රිත්තපෙසුණො,**
**අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි.**

**සච්චො සියා අප්පගබ්භොති** – 'සච්චො සියා'ති සච්චවාචාය සමන්නාගතො සියා, සම්මාදිට්ඨියා සමන්නාගතො සියා, අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො සියාති සච්චො සියා; **අප්පගබ්භොති** තීණි පාගබ්භියානි: කායිකං පාගබ්භියං වාචසිකං පාගබ්භියං චෙතසිකං පාගබ්භියං -පෙ- ඉදං චෙතසිකං පාගබ්භියං. යස්සිමානි තීණි පාගබ්භියානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො වුච්චති අප්පගබ්භොති – සච්චො සියා අප්පගබ්භො.

**අමායො රිත්තපෙසුණොති** – මායා වුච්චති වඤ්චනිකා චරියා. ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති: 'මා මං ජඤ්ඤා'ති ඉච්ඡති, 'මා මං ජඤ්ඤා'ති සඞ්කප්පෙති, 'මා මං ජඤ්ඤා'ති වාචං භාසති, 'මා මං ජඤ්ඤා'ති කායෙන පරක්කමති. යා එවරූපා මායා මායාවිතා අච්චසරා වඤ්චනා නිකති නිකරණා පරිහරණා ගූහනා පරිගූහනා ඡාදනා පටිච්ඡාදනා[1] අනුත්තානීකම්මං අනාවිකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා. යස්සෙසා මායා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අමායො. **රිත්තපෙසුණොති** 'පෙසුඤ්ඤ'න්ති: ඉධෙකච්චො පිසුණවාචො හොති -පෙ- එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති; යස්සෙතං පෙසුඤ්ඤං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති රිත්තපෙසුණො විවිත්තපෙසුණො පවිවිත්තපෙසුණොති – අමායො රිත්තපෙසුණො.

---

1 පරිච්ඡාදනා - ස.

මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙත්තේ යැ, දැනගනිමින් හික්මෙත්තේ යැ... ප්‍රත්‍යක්‍ෂ කටයුතු නිවන ප්‍රත්‍යක්‍ෂ කෙරෙමින් හික්මෙත්තේ යැ, හැසිරෙත්තේ යැ, මොනොවට හැසිරෙත්තේ යැ, සමාදන් වැ පවත්තේ නුයි 'සික්ඛෙ නිබ්බානමත්තනො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"තස්ස සික්ඛානුගීයන්ති -පෙ- සික්ඛෙ නිබ්බානමත්තනො"ති.**

## 15 - 7

(නිවනට හික්මෙන) මුනි තෙම සත්‍යයෙන් යුක්ත වූයේ වන්නේ යැ ප්‍රාගල්භ්‍ය රහිත වන්නේ යැ, මායාවෙන් වෙන් වූයේ වන්නේ යැ, ප්‍රහීණ කළ පෛශුන්‍ය ඇත්තේ වන්නේ යැ, ක්‍රෝධ නො කරනුයේ ලෝභපාපය ද මාත්සර්‍ය්‍ය ද ඉක්මවන්නේ යි.

**සච්චො සියා අප්පගබ්භො** - 'සච්චො සියා' යනු: සත්‍යවචනයෙන් සමන්විත වූයේ වන්නේ යැ, සම්‍යග්දෘෂ්ටියෙන් සමන්විත වූයේ වන්නේ යැ, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සමන්විත වූයේ වන්නේ නුයි, 'සච්චො සියා' යනු වේ. **අප්පගබ්භො** යනු: ප්‍රාගල්භ්‍ය තුනෙකි: කායිකප්‍රාගල්භ්‍ය යැ වාචසිකප්‍රාගල්භ්‍ය යැ චෛතසිකප්‍රාගල්භ්‍ය යැයි...මේ චෛතසිකප්‍රාගල්භ්‍ය යයි. යමක්හු විසින් මේ තුන් ප්‍රාගල්භ්‍යයෝ ප්‍රහීණ කරන ලද්දාහු මුලුසුන් කරන ලද්දාහු සන්සිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යෝත්පත්තික වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු ද, හේ 'අප්පගබ්භ'යි කියනු ලැබේ නුයි 'සච්චො සියා අප්පගබ්භො' යනු වේ.

**අමායො රිත්තපෙසුණො** - 'මායා'යි වංචා නිසා හැසිරීම කියනු ලැබෙයි. මෙහි කිසිවෙක් කයින් දුසිරිතෙහි හැසිර, බසින් දුසිරිතෙහි හැසිර, සිතින් දුසිරිතෙහි හැසිර, එය වසනු නිසා ලාමක ආශාව පිහිටුවයි; 'නහමක් මා දනිව'යි කැමැති වෙයි; 'නහමක් මා දනිව'යි සලකයි; 'නහමක් මා දනිව'යි වචන කියයි; 'නහමක් මා දනිව'යි කයින් වෑයම් කෙරෙයි; මෙබඳු වූ යම් මායාවක් මායා ඇතිබවක් ඉක්මැයැමක් වංචාවක් (ප්‍රතිරූපයෙන් රවටන) නිකෘතියක් (පාපය) යටපත් කිරීමක් බැහැර කිරීමක් සැඟවීමක් හාත්පසින් සැඟවීමක් වැසීමක් හාත්පසින් වැසීමක් ප්‍රකාශ නො කිරීමක් ප්‍රකට නො කිරීමක් මොනොවට වැසීමක් පාපක්‍රියාවක් වේ ද, මේ මායා යි කියනු ලබයි. යමක්හු විසින් මෙල මායාව ප්‍රහීණ කරන ලද්දී මුලුසුන් කරන ලද්දී සන්සිඳුවන ලද්දී දුරලන ලද්දී අභව්‍යෝත්පත්තික වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, හෙතෙම 'අමාය' යි කියනු ලැබෙයි. **රිත්තපෙසුණො** 'පෙසුඤ්ඤ' නම්: මෙහි කිසිවෙක් පිසුනුබස් කියන්නේ වෙයි... මෙසේ බිඳුවන අදහස් ඇතියේ පිසුනුබස් එලවා කියයි. යමකු විසින් මෙල පෛශුන්‍යය ප්‍රහීණ කරන ලද ද මුල් සිඳින ලද ද සන්සිඳුවන ලද ද දුරලන ලද ද උපතට නුසුදුසු කරන ලද ද නුවණගින්නෙන් දවන ලද ද, හෙතෙම 'රිත්තපෙසුන'යැ විවිත්තපෙසුන යැ පවිවිත්තපෙසුන යැයි කියනු ලැබේනුයි- 'අමායො රිත්තපෙසුණො' යනු වේ.

**අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනීති** - අක්කොධනොති හි වුත්තං. අපි ච කොධො තාව වත්තබ්බො. දසහාකාරෙහි කොධො ජායති: අනත්ථං මෙ අචරීති කොධො ජායති -පෙ- යස්සෙසො කොධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිපස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අක්කොධනො. කොධස්ස පහීනත්තා අක්කොධනො, කොධවත්ථුස්ස පරිඤ්ඤාතත්තා අක්කොධනො, කොධහෙතුස්ස උපච්ඡින්නත්තා අක්කොධනො. ලොභොති යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; වෙවිච්ඡං වුච්චති පඤ්ච මච්ඡරියානි ආවාසමච්ඡරියං -පෙ- ගාහො වුච්චති මච්ඡරියං. මුනීති මොනං වුච්චති ඤාණං -පෙ- "සඞ්ගජාලමතිච්ච සො මුනි". **අක්කොධනො. ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනීති** - මුනි ලොභපාපඤ්ච වෙවිච්ඡඤ්ච අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයීති - අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි.

තෙනාහ භගවා:

"සච්චො සියා අප්පගබ්භො අමායො රිත්තපෙසුණො,
අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනී"ති.

**15 - 8**

නිද්දං තන්දිං සහෙ ථීනං පමාදෙන න සංවසෙ,
අතිමානෙ න තිට්ඨෙය්‍ය නිබ්බානමානසො නරො.

**නිද්දං තන්දිං සහෙ ථීනන්ති** - 'නිද්දා'ති යා කායස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔනාහො පරියොනාහො අන්තොසමොරොධො මිද්ධං සොප්පං[1] පචලායිකා[2] සොප්පනා සුපනා සුපිතත්තං[3] **තන්දීති** යා තන්දී තන්දියනා තන්දිමනකතා ආලස්‍යං ආලසියං ආලස්‍යායනා ආලස්‍යායිතත්තං[ක]; **ථීනන්ති** යා චිත්තස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථීනං ථීයනා ථීයිතත්තං චිත්තස්ස;[ක] නිද්දං තන්දිං සහෙ ථීනන්ති නිද්දඤ්ච තන්දිඤ්ච ථීනඤ්ච. සහෙ - සහෙය්‍ය පරිසහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති - නිද්දං තන්දිං සහෙ ථීනං.

---

1. සුප්පං - සීමු. II. මජසං. 2. චපලායිකා - PTS. පචලායිකා - සීමු. II.
3 සුප්පනා සුප්පනත්තං - සීමු. I. ක. ඛානාවිභඞ්ග.

**අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි** – 'අක්කොධනො' යි මැ වදාරන ලද. තවද ක්‍රොධය පළමු කොට කියනුත් තේ යෑ; දස අයුරකින් ක්‍රොධය උපදී: 'මට අවැඩ කළේ'යි ක්‍රොධය උපදී...යමක් විසින් තෙල ක්‍රොධය ප්‍රහීණ කරන ලද ද මුල්සිඳින ලද ද සන්හිඳුවන ලද ද දුරලන ලද ද උපතට නුසුදුසු කරන ලද ද නුවණගින්නෙන් දවන ලද ද, හෙතෙම 'අක්කොධන'යි කියනු ලැබේ. ක්‍රොධවස්තුව පරිඥානය කළ බැවින් 'අක්කොධන' යෑ. ක්‍රොධහේතුව සිඳින ලද බැවින් 'අක්කොධන'යි. ලොභ නම්: යම් ලොභයෙක් ලොභාකාරයෙක් ලොභ කළ බවක්...දැඩි ලොභයක් ලොභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එයයි: වෙවිච්ඡ යි පඤ්ච මාත්සර්යයෝ කියනු ලැබෙත්. ආවාසමාත්සර්යය... ග්‍රාහ්‍යය (–දැඩිව ගැනීම) 'මාත්සර්යයි යයි කියනු ලැබේ. මුනි යනු: 'මෞන'යි ඥානය කියනු ලැබෙයි...'සඞ්ගජාලමතිච්ච සො මුනි'. අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි - මුනි තෙම ලොභ සඞ්ඛ්‍යාත පාපය ද මාත්සර්යය ද තරණය කෙළේ ය, උත්තරණය කෙළේ ය, ප්‍රතරණය කෙළේ ය, ඉක්ම වූයේ ය, වෙසෙසින් ඉක්මවූයේ ය, ව්‍යතික්‍රමණය කෙළේ නුයි 'අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සච්චා සියා අප්පගබ්භො -පෙ- වෙවිච්ඡං විතරෙ මුනි"යි.

**15 - 8**

නිවතෙයි නැමුණු සිත් ඇති සත්ත්ව තෙමේ (වේදනාදි ස්කන්ධත්‍රය සඞ්ඛ්‍යාත) නාමකායයාගේ අකර්මණ්‍ය බව (–මිද්ධය) ද කායාලස්‍යය ද චිත්තයාගේ අකර්මණ්‍ය බව ද මැඩපවත්වන්නේ යෑ, ස්මෘතිවිප්‍රවාසය සඞ්ඛ්‍යාත) ප්‍රමාදයෙන් නො වසන්නේ යෑ, අතිමානයෙහි නො පවත්නේ යි.

**නිද්දං තන්දිං සහෙ ථීනං** – 'නිද්‍රා' නම්: ස්කන්ධත්‍රය සඞ්ඛ්‍යාත නාම-කායයා ගේ අකල්‍ය (–ගිලන්) බවෙක් අකර්මණ්‍ය බවෙක් (මේඝය අහස මෙන්) කය පහත් කොට බැඳීමෙක් හාත්පසින් බැඳීමෙක් ඇතුළත ඇවිරීමෙක් (අකර්මණ්‍යභාවයෙන්) පෙළීමෙක් නිදීමෙක් කපිනිද්‍රාවක් නිදී-මෙක් නිදන අයුරෙක් නිදිගත් බවෙක් වේ ද එයයි. තන්දිං යනු: තන්ද්‍රාවක් තන්ද්‍රාකාරයෙක් තන්ද්‍රාවෙන් මඩනා ලද සිත් ඇති බවෙක් ආලස්‍ය-යක් අලසබවක් ආලස්‍යාකාරයක් ආලස්‍යයෙන් මඩනා ලද සිත් ඇති බවක් වේ ද එය යි. ථීනං යනු: චිත්තයාගේ යම් ගිලන්බවෙක් අකර්මණ්‍ය බවෙක් එල්ලෙන අයුරෙක් මැනවින් එල්ලෙන අයුරෙක් හැකිළීමෙක් හැකිළෙන අයුරෙක් හැකුළුණු බවක් චිත්තයාගේ නො පැතිරීමෙක් නො පැතිරෙන අයුරෙක් නො පැතුරුණු බවෙක් වේ ද එයයි. නිද්දං තන්දිං සහෙ ථීනං - ගිලන් බව ද ආලස්‍යය ද තදබව ද; සහෙ – සහනය කරන්නේ යෑ, හාත්පසින් සහනය කරන්නේ යෑ, මඩනේ යෑ, යටපත් කරන්නේ යෑ, අල්වාගන්නේ යෑ, හාත්පසින් ගන්නේ යෑ, මර්දනය කරන්නේ නුයි 'නිද්දං තන්දිං සහෙ ථීනං' යනු වේ.

**පමාදෙන න සංවසෙති** - පමාදො වත්තබ්බො: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං[1] වා, කුසලානං වා ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනට්ඨිතකිරියතා[2] ඔලීනවුත්තිතා නික්ඛිත්තඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො, යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං, අයං වුච්චති පමාදො. **පමාදෙන න සංවසෙති** පමාදෙන න වසෙය්‍ය න සංවසෙය්‍ය න ආවසෙය්‍ය න පරිවසෙය්‍ය, පමාදං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. පමාදා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - පමාදෙන න සංවසෙ.

**අතිමානෙ න තිට්ඨෙය්‍යා'ති** - අතිමානොති ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස. අයං වුච්චති අතිමානො. **අතිමානෙ න තිට්ඨෙය්‍යා'ති.** අතිමානෙ න තිට්ඨෙය්‍ය, න සන්තිට්ඨෙය්‍ය, අතිමානං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, අතිමානා ආරතො අස්ස, විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - අතිමානෙ න තිට්ඨෙය්‍ය.

**නිබ්බානමානසො නරොති** - ඉධෙකච්චො දානං දෙන්තො සීලං සමාදියන්තො උපොසථකම්මං කරොන්තො පානීයං පරිභොජනීයං උපට්ඨපෙන්තො පරිවෙණං සම්මජ්ජන්තො චෙතියං වන්දන්තො චෙතියෙ ගන්ධමාලං ආරොපෙන්තො චෙතියං පදක්ඛිණං කරොන්තො යං කිඤ්චි තෙධාතුකං කුසලාභිසඞ්ඛාරං අභිසඞ්ඛරොන්තො න ගතිහෙතු න උපපත්තිහෙතු න පටිසන්ධිහෙතු න භවහෙතු න සංසාරහෙතු න වට්ටහෙතු සබ්බං තං විසංයොගාධිප්පායො නිබ්බානනින්නො නිබ්බානපොණො නිබ්බානපබ්භාරො අභිසඞ්ඛරොතීති එවම්පි නිබ්බානමානසො නරො; අථවා සබ්බසඞ්ඛාරධාතුයා චිත්තං පටිවාපෙත්වා[3] අමතාය ධාතුයා චිත්තං උපසංහරති: එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති එවම්පි 'නිබ්බානමානසො නරො.'

---

1. වොස්සග්ගානුපාදනං - මජුප; වොස්සග්ගානුප්පාදනං - සිමු. II.
2. අනිවට්ඨිතකිරියතා - සිමු II. මජසං. 3. පටිවාපෙත්වා - මජසං.

**පමාදෙන න සංවසෙ** – ප්‍රමාදය කියයුත්තේ යැ: කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනොදුශ්චරිතයෙහි හෝ පඤ්චකාමගුණයන්හි හෝ චිත්තයාගේ දුරලීම (-සමාති විරහය) නැවත නැවත දුරලීම හෝ, කුශලධර්මයන්ගේ හෝ වැඩීමෙහි නො සකස් ව කරන බව සතතභාවයෙන් නො කරන බව නිරතුරු නො කරන බව හැකුළුණු පැවතුම් ඇති බව වීර්‍යයච්ඡන්දය හළ බව වීර්‍යයධුරය බහාතැබූ බව නො සෙවුණා බව නො වැඩීම බහුල නො කිරීම නො පිහිටීම නො යෙදීම ප්‍රමාද වීම, (යන) මෙබඳු වූ යම් ප්‍රමාදයෙක් ප්‍රමාදවන අයුරක් ප්‍රමාදවන බවක් වේ ද, මේ 'ප්‍රමාද'යයි කියනු ලැබේ. පාමදෙන න සංවසෙ ප්‍රමාදයෙන් නො වසන්නේ යැ, නො වෙසෙසින් වසන්නේ යැ, නො පැමිණ වසන්නේ යැ, හාත්පසින් නො වසන්නේ යැ; ප්‍රමාදය දුරු කරන්නේ යැ බැහැර කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යැ; ප්‍රමාදයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වාසය කරන්නේ නුසි 'පමාදෙන න සංවසෙ' යනු වේ.

**අතිමානෙ න තිට්ඨෙය්‍ය** – 'අතිමාන' නම්: මෙහි කිසිවෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...යම් කිසි වස්තුවකින් හෝ මෙරමා පහත් කොට සිතයි. මෙබඳු වූ යම් මානයෙක් මානාකාරයෙක් මාන කරන බවක් උන්නතියක් උඩගුබවක් මානධ්වජයක් සිත දැඩි කොට ගැනීමක් චිත්තයාගේ කෙතුකම්‍යතාවක් වේ ද, මේ 'අතිමානය'යයි කියනු ලැබේ. අතිමානෙ න තිට්ඨෙය්‍ය අතිමානයෙහි නො සිටින්නේ යැ, වෙසෙසින් නො සිටින්නේ යැ, අතිමානය දුරු කරන්නේ යැ, බැහැර කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ: අතිමානයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ විප්‍රමුක්ත විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වාසය කරන්නේ නුසි 'අතිමානෙ න තිට්ඨෙය්‍ය' යනු වේ.

**නිබ්බානමානසො නරො** – මෙහි කිසිවෙක් දන් දෙනුයේ සිල් සමාදන් වනුයේ පෙහෙවස්කම් කරනුයේ පියයුතු පරිභොග කළයුතු පැන් එළවා තබනුයේ පිරිවෙන හමදිනුයේ සෑය වඳිනුයේ සෑයෙහි සුවඳමල්දම් නගනුයේ සෑය පැදකුණු කරනුයේ තුන්බිමට අයත් යම් කිසි කුශලාභිසංස්කාරයක් රැස් කරනුයේ (දිව්‍යාදි) ගතිහෙතුයෙන් නො කෙරෙයි. උත්පත්තිය හෙතුකොට – ප්‍රතිසන්ධිය හෙතුකොට – භවය හෙතු කොට – සංසාරය හෙතු කොට – වෘත්තය හෙතු කොට නො කෙරෙයි. ඒ සියල්ල විසංයොගයෙහි ප්‍රාර්ථනා ඇතියේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට අභිමුඛව නැමුණේ රැස් කෙරේ නුසි– මෙසේත් 'නිබ්බානමානසො නරො' යනු වේ. නොහොත් සියලු ත්‍රෛභූමක සංස්කාරධාතුයෙන් සිත නවත්වා, නිර්වාණධාතුවට සිත එළවයි: යම් මේ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්‍ෂය වීමෙක් කෙලෙස්රජුන්ගේ නො ඇලීමෙක් දුඃඛනිරොධයෙක් නිර්වාණයෙක් වේ ද, තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැයි මෙසේත් 'නිබ්බානමානසො නරො' යනු වේ

1. “න පණ්ඩිතා උපධිසුඛස්ස හෙතු
දදන්ති දානානි පුනබ්භවාය,
කාමඤ්ච තෙ උපධිපරික්ඛයාය
දදන්ති දානං අපුනබ්භවාය.

2. න පණ්ඩිතා උපධිසුඛස්ස හෙතු
භාවෙන්ති ඣානානි පුනබ්භවාය,
කාමඤ්ච තෙ උපධිපරික්ඛයාය
භාවෙන්ති ඣානං අපුනබ්භවාය.

3. තෙ නිබ්බුතිං ආසිංසමානා දදන්ති
තන්නින්නචිත්තා තදධිමුත්තා,
නජ්ජො යථා සාගරමජ්ඣුපෙතා
භවන්ති නිබ්බානපරායණා තෙ”ති

'නිබ්බානමානසො නරො.'

තෙනාහ භගවා:

“නිද්දං තන්දිං සහෙ ථීනං
පමාදෙන න සංවසෙ,
අතිමානෙ න තිට්ඨෙය්‍ය
නිබ්බානමානසො නරො”ති.

**15 – 9**

මොසවජ්ජෙ න නීයෙථ රූපෙ සෙනහං න කුබ්බයෙ,
මානඤ්ච පරිජානෙය්‍ය සාහසා විරතො චරෙ.

**මොසවජ්ජෙ න නීයෙථාති** – 'මොසවජ්ජං' වුච්චති මුසාවාදො. ඉධෙකච්චො සභග්ගතො[1] වා පරිසග්ගතො[2] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස, යං ජානාසි තං වදෙහී'ති. සො අජානං වා ආහ[3] 'ජානාමී'ති, ජානං වා ආහ[3] 'න ජානාමී'ති, අපස්සං වා ආහ[3] 'පස්සාමී'ති පස්සං වා ආහ 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසති. ඉදං වුච්චති මොසවජ්ජං. අපි ච තීහාකාරෙහි – චතූ – පඤ්ච – ඡ–සත්ත – අට්ඨහාකාරෙහි –පෙ– ඉමෙහි අට්ඨහාකාරෙහි මුසාවාදො හොති. **මොසවජ්ජෙ න නීයෙථාති** – මොසවජ්ජෙ න යායෙය්‍ය න නිය්‍යායෙය්‍ය න වුය්හෙය්‍ය න සංහරෙය්‍ය, මොසවජ්ජං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය. මොසවජ්ජා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සට්ඨො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති – මොසවජ්ජෙ න නීයෙථ.

1. සභාගතො - සීමු II. 2. පරිසගතො - සීමු. II. 3. අහං - සීමු. II.

1. පණ්ඩිත වූ මනුෂ්‍යයෝ කාමසුඛයට හෙතු වූ පුනර්භවය සඳහා දන් නො දෙති. වැලි ඔහු එකාන්තයෙන් (කාමාදි) උපධි ක්ෂය වීම පිණිස (අපුනර්භව සඞ්ඛ්‍යාත) නිර්වාණය සඳහා දන් දෙත්.

2. පණ්ඩිතයෝ උපධිසුඛය හෙතු කොට පුනර්භවය සඳහා ධ්‍යානයන් නො වඩති. වැලි ඔහු උපධීන්ගේ ක්ෂය වීම පිණිස නිර්වාණය සඳහා ධ්‍යාන වඩත්.

3. ඔහු නිවන පතමින් ඊට නැමුණු සිත් ඇත්තාහු එහි ඇලුණාහු දන් දෙති. සයුර කරා පැමිණී ගඞ්ගාවන් මෙන් ඔහු නිවන පිහිට කොට ඇත්තාහු වෙත් නුයි-

'නිබ්බානමානසො නරො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නිද්දං තරඞ්ගං සඟෙ පිනං -පෙ- නිබ්බානමානසො නරො"යි.

## 15 - 9

මුසාවාදයෙහි නො යෙදෙන්නේ යෑ. (භූතොපඝාතයනෙද වූ) රූපයෙහි සෙනහය නො කරන්නේ යෑ. මානය ද (ත්‍රිවිධපරිඥායෙන්) පිරිසිඳ දැන-ගන්නේ යෑ. සාහසවයයිනංවෙන් වෙන් ව හැසිරෙන්නේ යි.

**මොසවජ්ජෙ න නියෙථ** - 'මොසවජ්ජ'යි මෘෂාවාදය කියනු ලැබෙයි. මෙහි කිසිවෙක් සභාවට ගියේ හෝ පිරිස්මැදට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සෙනාමැදට ගියේ හෝ රාජකුලයා මැද මහාවිනිශ්චයෙහි සිටියේ හෝ 'එව එම්බා පුරුෂය, යමක් දන්නෙහි නම් එය කියව'යි අභිමුඛයට පමුණුවන ලද්දේ සාක්ෂි කොට විචාරන ලද්දේ ගෙතෙම නො දන්නේ හෝ 'දනිමි' කියයි. දන්නේ හෝ 'නො දනිමි' කියයි. නො දක්නේ හෝ 'දක්මි' කියයි. දක්නේ හෝ 'නො දක්මි' කියයි. මෙසේ තමා හෙතු කොට හෝ මෙරමා හෙතු කොට හෝ අල්පමාත්‍ර ආමිෂයක් හෙතු කොට හෝ දැන දැන මුසවා බෙණෙයි. මේ 'මොසවජ්ජ' යි කියනු ලැබෙයි. තවද තුන් අයුරකින් - සතර - පස් - ස - සත් - අට අයුරකින්...මේ අට අයුරින් මෘෂාවාදය වේ. **මොසවජ්ජෙ න නියෙථ** මෘෂාවාදයෙහි නො යවනු ලබන්නේ යෑ, නො කියනු ලබන්නේ යෑ, නො වහනු ලබන්නේ යෑ, නො හරිනු ලබන්නේ යෑ, මෘෂාවාදය හරනේ යෑ, දුරු කරන්නේ යෑ, විනාශාන්ත කරන්නේ යෑ, අනුඅභාවයට පමුණුවන්නේ යෑ. මෘෂාවාදයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යෑ; නික්මුණේ බැහැර වූයේ විප්‍රමුක්ත - විසංයුක්ත වූයේ විමයාදී දීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'මොසවජ්ජෙ න නියෙථ' යනු වේ.

රූපෙ ස්නෙහං න කුබ්බයෙති –'රූප'න්ති: චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදායරූපං. රූපෙ ස්නෙහං න කුබ්බයෙති රූපෙ ස්නෙහං න කරෙය්‍ය, ඡන්දං න කරෙය්‍ය, පෙමං න කරෙය්‍ය, රාගං න කරෙය්‍ය, න ජනෙය්‍ය, න සඤ්ජනෙය්‍ය, න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍යාති –රූපෙ ස්නෙහං න කුබ්බයෙ.

මානඤ්ච පරිජානෙය්‍යාති – 'මානො'ති එකවිධෙන මානො: යා චිත්තස්ස උන්නති. දුවිධෙන මානො: අත්තුක්කංසනමානො, පරවම්භනමානො. තිවිධෙන මානො: සෙය්‍යොහමස්මීති මානො, සදිසොහමස්මීති මානො, හීනොහමස්මීති මානො. චතුබ්බිධෙන මානො: ලාභෙන මානං ජනෙති, යසෙන මානං ජනෙති, පසංසාය මානං ජනෙති, සුඛෙන මානං ජනෙති. පඤ්චවිධෙන මානො: ලාභිම්හි මනාපිකානං රූපානන්ති මානං ජනෙති, ලාභිම්හි මනාපිකානං සද්දානං – ගන්ධානං – රසානං – ඵොට්ඨබ්බානන්ති මානං ජනෙති. ඡබ්බිධෙන මානො: චක්ඛුසම්පදාය මානං ජනෙති, සොතසම්පදාය – ඝානසම්පදාය – ජිව්හාසම්පදාය – කායසම්පදාය – මනොසම්පදාය මානං ජනෙති. සත්තවිධෙන මානො: අතිමානො, මානාතිමානො, ඔමානො, සදිසමානො, අධිමානො, අස්මිමානො, මිච්ඡාමානො. අට්ඨවිධෙන මානො: ලාභෙන මානං ජනෙති, අලාභෙන ඔමානං ජනෙති, යසෙන මානං ජනෙති, අයසෙන ඔමානං ජනෙති, පසංසාය මානං ජනෙති, නින්දාය ඔමානං ජනෙති, සුඛෙන මානං ජනෙති, දුක්ඛෙන ඔමානං ජනෙති. නවවිධෙන මානො: සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො, සෙය්‍යස්ස සදිසොහමස්මීති මානො, සෙය්‍යස්ස හීනොහමස්මීති මානො, සදිසස්ස සෙය්‍යොහමස්මීති මානො, සදිසස්ස සදිසොහමස්මීති මානො, සදිසස්ස හීනොහමස්මීති මානො, හීනස්ස සෙය්‍යොහමස්මීති මානො, හීනස්ස සදිසොහමස්මීති මානො, හීනස්ස හීනොහමස්මීති මානො. දසවිධෙන මානො: ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා –පෙ–* අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මානො.

මානඤ්ච පරිජානෙය්‍යාති – මානං තීහි පරිඤ්ඤාහි පරිජානෙය්‍ය: ඤාතපරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය.

කතමා ඤාතපරිඤ්ඤා? මානං ජානාති: අයං එකවිධෙන මානො, යා චිත්තස්ස උන්නති; අයං දුවිධෙන මානො: අත්තුක්කංසනමානො පරවම්භනමානො –පෙ– අයං දසවිධෙන මානො: ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා –පෙ– අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති ජානාති පස්සති. අයං ඤාතපරිඤ්ඤා.

* 110 - ඔලොකෙතබ්බං.

**රූපෙ සෙනහං න කුබ්බයෙ** – 'රූප' නම්: සතර මහාභූතයන් හා සතර මහාභූතයන් නිසා පවත්නා රූපයෝ යි. **රූපෙ සෙනහං න කුබ්බයෙ** රූපයෙහි සෙනහය නො කරන්නේ යැ, ඡන්දය නො කරන්නේ යැ, ප්‍රේමය නො කරන්නේ යැ, රාගය නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නුපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, වෙසෙසින් නුපදවන්නේ නුයි 'රූපෙ සෙනහං න කුබ්බයෙ' යනු වේ.

**මානඤ්ච පරිජානෙය්‍ය** – 'මාන' නම්: එක් පරිද්දෙකින් මානය වෙයි: චිත්තයාගේ යම් උන්නතියක් වේ ද එයයි. දෙ පරිද්දෙකින් මානය වෙයි: ආත්මොත්කර්ෂණමානය, පරවම්භනමාන යැයි. තුන් පරිද්දෙකින් මානය වෙයි: 'මම් ශ්‍රේෂ්ඨ වෙමි' මානය වෙයි, 'මම සදෘශයෙමි' මානය වෙයි, 'මම හීනයෙමි' මානය වේ. සතර පරිද්දෙකින් මානය වෙයි: ලාභයෙන් මානය උපදවයි, යශසින් මානය උපදවයි, ප්‍රශංසායෙන් මානය උපදවයි, සුවයෙන් මානය උපදවයි. පස්පරිද්දෙකින් මානය වෙයි: 'මනවඩන රූපයන් ලබනසුල්ලෙමි' මානය උපදවයි, 'මනවඩන ශබ්දයන් ලබනසුල්ලෙමි' – ගන්ධයන් – රසයන් – ස්ප්‍රෂ්ටව්‍යයන් ලබනසුල්ලෙමි' මානය උපදවයි. ස පරිද්දෙකින් මානය වෙයි: චක්ෂුඃසම්පත්තියෙන් මානය උපදවයි, ශ්‍රොත්‍රසම්පත්තියෙන් – ඝ්‍රාණසම්පත්තියෙන් – ජිහ්වාසම්පත්තියෙන් – කායසම්පත්තියෙන් – මනස්සම්පත්තියෙන් මානය උපදවයි. සත් පරිද්දෙකින් මානය වෙයි: අතිමාන යැ මානාතිමාන යැ අවමාන යැ සදෘශමාන යැ අධිමාන යැ අස්මිමාන යැ, මිථ්‍යාමාන යැයි. අට පරිද්දෙකින් මානය වෙයි: ලාභයෙන් මානය උපදවයි, අලාභයෙන් අවමානය උපදවයි, යශසින් මානය උපදවයි, අයශසින් අවමානය උපදවයි, ප්‍රශංසායෙන් මානය උපදවයි, නින්දාවෙන් අවමානය උපදවයි, සුවයෙන් මානය උපදවයි, දුකින් අවමානය උපදවයි. නව පරිද්දෙකින් මානය වෙයි: ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමි' මානය වෙයි, ශ්‍රේෂ්ඨයාට සදෘශ වෙමි' මානය වෙයි 'ශ්‍රේෂ්ඨයාට හීන වෙමි' මානය වෙයි, 'සදෘශයාට ශ්‍රේෂ්ඨවෙමි' මානය වෙයි, සදෘශයාට සදෘශ වෙමි' මානය වෙයි, සදෘශයාට හීන වෙමි' මානය වෙයි, 'හීනයාට ශ්‍රේෂ්ඨ වෙමි' මානය වෙයි, හීනයාට සදෘශ වෙමි' මානය වෙයි, 'හීනයාට හීන වෙමි' මානය වේ. දස පරිද්දෙකින් මානය වෙයි: මෙහි කිසිවෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ*... අන්‍යතරාන්‍යතර වස්තුවකින් හෝ මානය උපදවයි. මෙබඳු වූ යම් මානයෙක් මානය කරන අයුරෙක් මානය කරන බවෙක් උන්නතියක් නගා තැබීමෙක් මාන නමැති ධවජයෙක් සිත දැඩි කොට ගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතාවක් වේ ද, මේ මාන යයි කියනු ලැබේ.

**මානඤ්ච පරිජානෙය්‍ය** – මානය ඥාතපරිඥා, තීරණපරිඥා, පහානපරිඥා යන ත්‍රිවිධ පරිඥාවෙන් පිරිසිඳ දැනගන්නේ යැ.

**ඥාතපරිඥා** කවර යත්: මානය ඥාතපරිඥයෙන් දැනගනී: චිත්තයාගේ යම් උන්නතියක් වී නම්, මේ එක් පරිද්දෙකින් මාන යැ. ආත්මොත්කර්ෂණමාන යැ පරවම්භනමාන යැ යන මේ දෙ පරිද්දෙකින් මාන යැ,...මේ දස පරිද්දෙකින් මාන යැ මෙහි කිසිවෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ... අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ මානය උපදවා යයි දැනගනී, බලයි. මෝ තොමෝ 'ඥාතපරිඥා'යැ.

* 111 වන පිටුව බලන්න.

කතමා තීරණපරිඤ්ඤා? එවං ඤාතං කත්වා මානං තීරෙති: අනිච්චතො දුක්ඛතො -පෙ- අනිස්සරණතො තීරෙති. අයං තීරණපරිඤ්ඤා.

කතමා පහානපරිඤ්ඤා? එවං තීරයිත්වා මානං පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. අයං පහානපරිඤ්ඤා. **මානඤ්ච පරිජානෙය්‍යාති** - මානං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානෙය්‍යාති - මානඤ්ච පරිජානෙය්‍ය.

**සාහසා විරතො චරෙති** - කතමං සාහසා චරියා? රත්තස්ස රාගචරියා සාහසා චරියා, දුට්ඨස්ස දොසචරියා සාහසා චරියා, මූළ්හස්ස මොහචරියා සාහසා චරියා; විනිබද්ධස්ස මානචරියා සාහසා චරියා, පරාමට්ඨස්ස දිට්ඨිචරියා සාහසා චරියා, වික්ඛෙපගතස්ස උද්ධච්චචරියා සාහසා චරියා, අනිට්ඨංගතස්ස විචිකිච්ඡා චරියා සාහසා චරියා, ථාමගතස්ස අනුසයචරියා සාහසා චරියා, අයං සාහසා චරියා. **සාහසා විරතො චරෙති** සාහසාචරියා ආරතො අස්ස, විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍ය චරෙය්‍ය විචරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති - සාහසා විරතො චරෙ.

තෙනාහ භගවා:

“මොසවජ්ජෙ න නීයෙථ රූපෙ ස්නෙහං න කුබ්බයෙ,
මානඤ්ච පරිජානෙය්‍ය සාහසා විරතො චරෙ”ති.

**15 - 10**

පුරාණං නාභිනන්දෙය්‍ය නවෙ ඛන්තිං න කුබ්බයෙ,
හීයමානෙ න සොචෙය්‍ය ආකාසං[1] න සිතො සියා.

**පුරාණං නාභිනන්දෙය්‍යාති** - ‘පුරාණං’ වුච්චන්ති අතීතා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං. අතීතෙ සඞ්ඛාරෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන නාභිනන්දෙය්‍ය, නාභිවදෙය්‍ය, න අජ්ඣොසෙය්‍ය, අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති - පුරාණං නාභිනන්දෙය්‍ය.

1. ආකාසං - ස්‍යා.

**තීරණපරිඤ්ඤා** කවර යත්: තෙල මානය ප්‍රකට කොට අනිත්‍ය හෙයින් තීරණය කෙරෙයි, දුඃඛ හෙයින්...අනිශ්ශරණ හෙයින් තීරණය කෙරෙයි. මේ තොමෝ 'තීරණපරිඤ්ඤා' යැ.

**පහානපරිඤ්ඤා** කවර යත්: මෙසේ තීරණය කොට මානය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනුඅභාවයට පමුණුවයි. මේ තොමෝ 'පහානපරිඤ්ඤා'යි. **මානං ච පරිජානෙය්‍ය** යනු: මානය මේ ත්‍රිවිධපරිඥායෙන් පිරිසිඳ දැනගන්නේ නුයි 'මානඤ්ච පරිජානෙය්‍ය' යනු වේ.

**සාහසා විරතො චරෙ** – සාහසචර්‍ය්‍යාව කවර යත්: රාගයෙන් රත් වූවහුගේ රාගචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, ද්වෙෂයෙන් දුෂ්ට වූවහුගේ ද්වෙෂචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, මොහයෙන් මූඪ වූවහුගේ මොහචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, මානයෙන් විනිබද්ධයාගේ මානචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, දෘෂ්ටියෙන් පරාමෘෂ්ට වූවහුගේ දෘෂ්ටිචර්‍ය්‍යාව සැහැසි කාරුණෙක්, විසුරුණු සිතැත්තහුගේ ඖද්ධත්‍යචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, නිෂ්ඨාවට නො ගියහුගේ විචිකිත්සාචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, අනුශයයෙන් තද වූවහුගේ අනුශයචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි. **සාහසා විරතො චරෙ**– සැහැසි කරුණෙන් (-හැසිරීමෙන්) දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ යැ, හැසිරෙන්නේ යැ, වෙසෙසින් හැසිරෙන්නේ යැ, ඉරියවු පවත්වන්නේ යැ, වැවෙත්තේ යැ, රැකෙන්නේ යැ, යැපෙන්නේ යැ, යාපනය වන්නේ නුයි 'සාහසා විරතො චරෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"මොසවජ්ජෙ න නියෙථ -පෙ- සාහසා විරතො චරෙ"**යි

## 15 – 10

අතීත වූ රූපාදිඅරමුණට (තෘෂ්ණාදි විසින්) නො සතුටු වන්නේ යැ. වර්තමාන රූපාදියෙහි රුචිය නො කරන්නේ යැ. (රූපාදිය) නැසෙන කල්හි ශොක නො කරන්නේ යැ, තෘෂ්ණාව ඇසුරු කළේ නො වන්නේ යි.

**පුරාණං නාභිනන්දෙය්‍ය** – 'පුරාණ'යි ඉක්මැගිය රූප – වෙදනා–සංඥා–සංස්කාර – විඥානය කියනු ලැබෙයි. අතීත වූ සංස්කාරයන් තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් නො සතුටු වන්නේ යැ, සතුටුබස් නො කියන්නේ යැ, නො බැසගන්නේ යැ; අභිනන්දනය අභිවදනය බැසගැනීම ග්‍රාහය දැඩිගැනීම පිවිසසිටීම හරන්නේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ නුයි 'පුරාණං නාභිනන්දෙය්‍ය' යනු වේ.

නවෙ ඛන්තිං න කුබ්බයෙති - 'නවා' වුච්චන්ති පච්චුප්පන්නා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං. පච්චුප්පන්නෙ සඞ්ඛාරෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන ඛන්තිං න කරෙය්‍ය, ඡන්දං න කරෙය්‍ය, පෙමං න කරෙය්‍ය, රාගං න කරෙය්‍ය, න ජනෙය්‍ය, න සඤ්ජනෙය්‍ය, න නිබ්බත්තෙය්‍ය, නාභිනිබ්බත්තෙය්‍යාති - නවෙ ඛන්තිං න කුබ්බයෙ.

හීයමානෙ න සොචෙය්‍යාති - හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ විගච්ඡමානෙ අන්තරධායමානෙ න සොචෙය්‍ය, න කිලමෙය්‍ය, න පරාමසෙය්‍ය, න පරිදෙවෙය්‍ය, න උරත්තාළිං කන්දෙය්‍ය, න සම්මොහං ආපජ්ජෙය්‍ය. චක්ඛුස්මිං හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ විගච්ඡමානෙ අන්තරධායමානෙ - සොතස්මිං ඝානස්මිං - ජිව්හාය - කායස්මිං - රූපස්මිං - සද්දස්මිං - ගන්ධස්මිං - රසස්මිං - ඵොට්ඨබ්බස්මිං - කුලස්මිං - ගණස්මිං - ආවාසස්මිං - ලාභස්මිං - යසස්මිං - පසංසාය - සුඛස්මිං චීවරස්මිං - පිණ්ඩපාතස්මිං - සෙනාසනස්මිං - ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරස්මිං හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ විගච්ඡමානෙ අන්තරධායමානෙ න සොචෙය්‍ය, න කිලමෙය්‍ය, න පරාමසෙය්‍ය, න පරිදෙවෙය්‍ය, න උරත්තාළිං කන්දෙය්‍ය, න සම්මොහං ආපජ්ජෙය්‍යාති-හීයමානෙ න සොචෙය්‍ය.

ආකාසං න සිතො සියාති - 'ආකාසං' වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. කිංකාරණා ආකාසං වුච්චති තණ්හා: යාය තණ්හාය රූපං ආකසති සමාකසති ගණ්හාති පරාමසති අභිනිවිසති, වෙදනං - සඤ්ඤං - සඞ්ඛාරෙ - විඤ්ඤාණං - ගතිං - උපපත්තිං - පටිසන්ධිං - භවං - සංසාරං - වට්ටං ආකසති සමාකසති ගණ්හාති පරාමසති අභිනිවිසති. තංකාරණා 'ආකාසං' වුච්චති තණ්හා.

ආකාසං න සිතො සියාති - තණ්හානිස්සිතො න සියා, තණ්හං පජහෙය්‍ය, විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, තණ්හාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - ආකාසං න සිතො සියා.

තෙනාහ භගවා:

"පුරාණං නාභිනන්දෙය්‍ය නවෙ ඛන්තිං න කුබ්බයෙ,
හීයමානෙ න සොචෙය්‍ය ආකාසං න සිතො සියා"ති.

**15 - 11**

ගෙධං බ්‍රූමි මහොඝොති ආජවං[1] බ්‍රූමි ජප්පනං,
ආරම්මණං පකම්පනං[2] කාමපඞ්කො දුරච්චයො.

---

1. ආචමං - PTS. 2. පකප්පනං - PTS.

**නවෙ ඛන්තිං න කුබ්බයෙ** – 'නව'යි වර්තමාන රූප - වේදනා-සංඥා-සංස්කාර – විඥානය කියනු ලැබෙයි. වර්තමානසංස්කාරයන් තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් රුචි නො කරන්නේ යැ, ඡන්දය නො කරන්නේ යැ, ප්‍රේමය නො කරන්නේ යැ, රාගය නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නූපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, වෙසෙසින් නූපදවන්නේ නුයි 'නවෙ ඛන්තිං න කුබ්බයෙ' යනු වේ.

**හීයමානෙ න සොචෙය්‍ය** – නැසෙන කල්හි හෙන කල්හි පිරිහෙන කල්හි නො වන කල්හි පහව යන කල්හි අතුරුදහන් වන කල්හි ශෝක නො කරන්නේ යැ, නො වෙහෙසෙන්නේ යැ, නො දැහැගන්නේ යැ, නො හඬන්නේ යැ. ළෙහි පැහැර නො හඬන්නේ යැ, සම්මෝහයට නො පැමිණෙන්නේ යැ; ඇස නැසෙන කල්හි හෙන කල්හි පිරිහෙන කල්හි නො වන කල්හි විගත වන කල්හි අතුරුදහන් වන කල්හි කන-නැහැය දිව – කය – රූපය-ශබ්දය – ගන්ධය – රසය – ස්ප්‍රෂ්ටව්‍යය – කුලය – ගණයා-ආවාසය – ලාභය – යශස – ප්‍රශංසාව – සුවය – චීවරය – පිණ්ඩපාතය-සේනාසන – ගිලන්පසබෙහෙසත් පිරිකර නැසෙන කල්හි හෙන කල්හි පිරිහෙන කල්හි නො වන කල්හි විගත වන කල්හි අතුරුදහන් වන කල්හි ශෝක නො කරන්නේ යැ, නො වෙහෙසෙන්නේ යැ, නො දැහැගන්නේ යැ, නො හඬන්නේ යැ, ළෙහි පැහැර නො හඬන්නේ යැ, සම්මෝහයට නො පැමිණෙන්නේ නුයි 'හීයමානෙ න සොචෙය්‍ය' යනු වේ.

**ආකාසං න සිතො සියා** – තෘෂ්ණාව 'ආකාස'යි කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක්...අභිධ්‍යාවක් ලෝභ අකුශලමූලයෙක් වේ ද එය යි. කවර කරුණෙකින් තෘෂ්ණාව 'ආකාස'යි කියනු ලැබෙයි යත්: යම් තෘෂ්ණාවකින් රූපය ආකර්ෂණය කෙරේ ද, සමාකර්ෂණය කෙරේ ද, ගනී ද, දැහැගනී ද, අභිනිවේශය කෙරේ ද, වේදනාව – සංඥාව – සංස්කාර යන් – විඥානය – ගතිය – උත්පත්තිය – ප්‍රතිසන්ධිය – භවය – සංසාරය-වෘත්තය ආකර්ෂණ – සමාකර්ෂණ – ග්‍රහණ පරාමර්ෂණ – අභිනිවේශ කෙරේද; එකරුණෙන් තෘෂ්ණාව 'ආකාස'යි කියනු ලැබේ.

**ආකාසං න සිතො සියා** – තෘෂ්ණාව ඇසුරු කළේ නො වන්නේ යැ, තෘෂ්ණාව දුරු කරන්නේ යැ, බැහැර කරන්නේ යැ' විගතාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යැ; තෘෂ්ණාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ බැහැර වූයේ විමුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'ආකාසං න සිතො සියා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"පුරාණං නාභිනන්දෙය්‍ය -පෙ- ආකාසං න සිතො සියා"යි**

**15 – 11**

**(මම වූ කලී තෘෂ්ණාව රූපාදියෙහි ගිජුවන බැවින්) ගෙධ යැයි කියමි. මහවතුරෙකැයි ද, (දිවෙන හෙයින්) ආජවයෙකැයි ද ජල්පනයෙකැයි ද ආලම්බනයෙකැයි ද ප්‍රකම්පනයෙකැයි ද කියමි. තෙල කාමපඞ්කය තෙමේ ඉක්මැවිය නො හැක්කේ යි.**

**ගෙධං බ්‍රූමි මහොඝොති** – ‘ගෙධො’ වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; ‘මහොඝො’ වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **ගෙධං බ්‍රූමි මහොඝොති**'ති ගෙධං මහොඝොති බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති – ගෙධං බ්‍රූමි මහොඝොති.

**ආජවං බ්‍රූමි ජප්පනන්ති** – ‘ආජවා’ වුච්චති තණ්හා: යො රාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං, ‘ජප්පනා’පි වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **ආජවං බ්‍රූමි ජප්පනන්ති** ආජවං ජප්පනාති බ්‍රූමි, ආචික්ඛාමි -පෙ- උත්තානීකරොමි, පකාසෙමීති – ආජවං බ්‍රූමි ජප්පනං.

**ආරම්මණං පකම්පනන්ති** – ආරම්මණම්පි වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; පකම්පිතම්පි වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලන්ති – ආරම්මණං පකම්පනං.

**කාමපඞ්කො දුරච්චයොති** – කාමපඞ්කො කාමකද්දමො කාමකිලෙසො කාමපලිපො කාමපලිබොධො දුරච්චයො දුරතිවත්තො දුත්තරො දුප්පතරො දුස්සමතික්කමො දුබ්බීතිවත්තොති – කාමපඞ්කො දුරච්චයො.

තෙනාහ භගවා:

“ගෙධං බ්‍රූමි මහොඝොති ආජවං බ්‍රූමි ජප්පනං,
ආරම්මණං පකම්පනං කාමපඞ්කො දුරච්චයො”ති.

## 15 – 12

සච්චා අවොක්කමං[1] මුනි ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො,
සබ්බං සො[2] පටිනිස්සජ්ජ ස වෙ සන්තො'ති වුච්චති.

**සච්චා අවොක්කමං මුනීති** – සච්චවාචාය අවොක්කමන්තො සම්මාදිට්ඨියා අවොක්කමන්තො අරියා අට්ඨඞ්ගිකා මග්ගා අවොක්කමන්තො මුනී'ති ‘මොනං’ වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනී'ති – සච්චා අවොක්කමං මුනි.

**ථලෙ තිට්ඨති බ්‍රාහ්මණොති** – ‘ථලං’ වුච්චති අමතං නිබ්බානං: යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. බ්‍රාහ්මණොති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො -පෙ- අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා. **ථලෙ තිට්ඨති බ්‍රාහ්මණොති** ථලෙ තිට්ඨති, දීපෙ තිට්ඨති, තාණෙ තිට්ඨති, ලෙණෙ තිට්ඨති, සරණෙ තිට්ඨති, අභයෙ තිට්ඨති, අච්චුතෙ තිට්ඨති, අමතෙ තිට්ඨති, නිබ්බානෙ තිට්ඨතීති – ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

1. අවොක්කම්ම – සු, ස. 2. සබ්බසො – මජුප.

**ගෙධං බ්‍රෑමි මහොඝොති** – 'ගෙධ'යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් අධික රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. 'මහොඝ' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුසලමූලයෙක් වේ ද එය යි. **ගෙධං බ්‍රෑමි මහොඝොති**– ගෙධය මහෞඝ යැයි කියමි, පවසමි, දෙසමි, පනවමි, පිහිටුවමි, විවරණය කරමි, විභාග කරමි, ප්‍රකට කරමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'ගෙධං බ්‍රෑමි මහොඝොති' යනු වේ.

**ආජවං බ්‍රෑමි ජප්පනං** – 'ආජවා'යි තෘෂ්ණාව කියනු ලබයි: යම් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුසශලමූලයෙක් වේ ද එය යි. 'ජප්පනා'යි තෘෂ්ණාව කියනු ලබයි: යම් රාගයෙක්. අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **ආජවං බ්‍රෑමි ජප්පනං** – ආජවය 'ජප්පනා' යැයි කියමි, පවසමි...ප්‍රකට කරමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'ආජවං බ්‍රෑමි ජප්පනං' යනු වේ.

**ආරම්මණං පකම්පනං** – 'ආරම්මණ'යි ද තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. 'පකම්පන' යි ද තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය නුයි 'ආරම්මණං පකම්පනං' යනු වේ.

**කාමපඞ්කො දුරච්චයො** – කාම නැමති මඩ කාමකර්දමය කාමක්ලෙශය කාමලෙපය කාමපරිරොධය පසු කළ නො හැක්ක, ඉක්මැවිය නො හැක්ක, තරණය – ප්‍රතරණය – සමතික්‍රමණය ව්‍යතික්‍රමණය කළ නො හැක්කේ නුයි 'කාමපඞ්කො දුරච්චයො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**ගෙධං බ්‍රෑමි මහොඝොති –පෙ– කාමපඞ්කො දුරච්චයො**"යි

**15 – 12**

සත්‍යයෙන් නො ඉක් මැ සිටිනා වූ මුනි වූ ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙම නිර්වාණස්ථලයෙහි සිටී. හෙතෙම එකාන්තයෙන් සියලු ආයතනයන් දුරලා (සිටියේ) ශාන්ත වූයේ යයි කියනු ලැබේ.

**සච්චා අවොක්කම්ම මුනි** – සත්‍යවචනයෙන් නො ඉක්මෙනුයේ සම්‍යග්දෘෂ්ටියෙන් නො ඉක්මෙනුයේ ආර්ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් නො ඉක්මෙනුයේ; මුනි යනු: 'මොන'යි ඥානය කියනු ලැබෙයි...සඞ්ගජාලය ඉක්මවා හෝ මුනි වූයේ නුයි 'සච්චා අවොක්කම්ම මුනි' යනු වේ.

**ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො** – 'ථල'යි අමාමහනිවන කියනු ලැබෙයි: යම් සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාව ක්ෂය වීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. බ්‍රාහ්මණො යනු: සප්ත ධර්ම කෙනකුන් බාහිත වන බැවින් බ්‍රාහ්මණ යැ...නාදී වූ හෙතෙම බ්‍රාහ්මණ යයි කියනු ලැබේ. **ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො** යනු: ස්ථලයෙහි සිටී, ද්වීපයෙහි සිටී, ත්‍රාණයෙහි සිටී, ලෙණයෙහි සිටී, සරණයෙහි සිටී; අභයයෙහි සිටී, අච්‍යුතයෙහි සිටී, අමෘතයෙහි සිටී, නිර්වාණයෙහි සිටී නුයි 'ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො' යනු වේ.

**සබ්බං සො පටිනිස්සජ්ජාති** – 'සබ්බං' වුච්චති ද්වාදසායතනානි: චක්ඛුඤ්චෙව රූපා ච –පෙ– මනො චෙව ධම්මා ච; යතො අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු ඡන්දරාගො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො; එත්තාවතාපි සබ්බං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං. යතො තණ්හා ච දිට්ඨි ච මානො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතාපි සබ්බං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං, යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතාපි සබ්බං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨන්ති – සබ්බං සො පටිනිස්සජ්ජ.

**ස වෙ සන්තොති වුච්චතීති** – සො සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති වුච්චති කථීයති භණීයති දීපීයති වොහරීයතීති – ස වෙ සන්තොති වුච්චති.

තෙනාහ භගවා:

> "සච්චා අවොක්කම්ම මුනි ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො,
> සබ්බං සො පටිනිස්සජ්ජ ස වෙ සන්තොති වුච්චතී"ති.

## 15 – 18

> ස වෙ විද්වා ස වෙදගූ ඤත්වා ධම්මං අනිස්සිතො,
> සම්මා සො ලොකෙ ඉරියානො න පිහෙතීධ කස්සචි.

**ස වෙ විද්වා ස වෙදගූති** – 'විද්වා'ති විද්වා විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී; 'වෙදගූ'ති වෙදා වුච්චන්ති චතූසු මග්ගෙසු ඤාණං –පෙ– සබ්බවෙදනාසු වීතරාගො සබ්බං වෙදමතිච්ච වෙදගූ සොති – ස වෙ විද්වා ස වෙදගූ.

**ඤත්වා ධම්මං අනිස්සිතොති** – 'ඤත්වා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **අනිස්සිතොති** ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච –පෙ– අයං තණ්හානිස්සයො –පෙ– අයං දිට්ඨිනිස්සයො. තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සිතො සොතං අනිස්සිතො – ඝානං අනිස්සිතො –පෙ– දිට්ඨ – සුත – මුත – විඤ්ඤාතබ්බෙ ධම්මෙ අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති – ඤත්වා ධම්මං අනිස්සිතො.

**සබ්බං සො පටිනිස්සජ්ජ** – 'සබ්බං'යි ද්වාදශායතන කියනු ලැබෙයි: ඇස ද රූපයෝ ද...මනස ද ධර්මයෝ දැයි. යම් තැනෙක සිට ආධ්‍යාත්මික බාහ්‍යායතනයන්හි ඡන්දරාගය ප්‍රහීණ වූයේ උසුන් මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරන ලද්දේ අනුඅභාවය කරන ලද්දේ අනාගතයෙහි නූපදනා සැහැවි ඇතියේ වෙයි; මෙතෙකින් ද සියල්ල ත්‍යාග කරන ලද්දේ වමනය කරන ලද්දේ මුදන ලද්දේ ප්‍රහීණ කරන ලද්දේ දුරලන ලද්දේ වෙයි. යම් තැනෙක සිට තෘෂ්ණාව ද දෘෂ්ටිය ද මානය ද ප්‍රහීණ වූවාහු උසුන් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මතු නූපදනා සැහැවි ඇත්තාහු වෙත් ද, මෙතෙකින් ද සියල්ල ත්‍යක්ත – වාන්ත – මුක්ත – ප්‍රහීණ – ප්‍රතිනිස්සෘෂ්ට වේ ද. යම් තැනෙක සිට පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වූවාහු උසුන් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින් ද සියල්ල ත්‍යක්ත වූයේ වාන්ත වූයේ මුක්ත වූයේ ප්‍රහීණ වූයේ දුරලන ලද්දේ වේ නුයි 'සබ්බං සො පටිනිස්සජ්ජ' යනු වේ.

**ස වෙ සන්තො ති වුච්චති** – හෙතෙම ශාන්ත යැ උපශාන්ත යැ වෙසෙසින් සන්හිඳුණේ යැ නිවුණේ යැ (ඵලයෙන්) පටිප්පස්සම්භිත වූයේ යයි කියනු ලැබෙයි, පවසනු ලැබෙයි, බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි, වහරනු ලැබේ නුයි 'ස වෙ සන්තො'ති වුච්චති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සමෙචා අවොක්කම්ම මුනි -පෙ- ස වෙ සන්තොති වුච්චති"යි

## 15 – 13

අනිත්‍යාදිවශයෙන් සංස්කෘත ධර්මයන් දැන තෘෂ්ණා – දෘෂ්ටිනිශ්‍රය රහිත වූ හෙතෙම එකාන්තයෙන් පණ්ඩිත වූයේ වෙයි. හෙතෙම සතර මාර්ගඥානවේදයට පැමිණියේ වෙයි. හෙතෙම සත්ත්වලොකයෙහි මැනැවින් ඉරියවු පවත්වනුයේ මෙලොවැ කිසිවකුට ත් තෘෂ්ණා නො කෙරේ.

**ස වෙ විද්වා ස වෙදගූ** – 'විද්වා' යනු: විද්වත් වූයේ විඥාවට පැමිණියේ නුවණැත්තේ විමංසන ප්‍රඥ ඇත්තේ ධාරණ ප්‍රඥ ඇත්තේ; **වෙදගූ** යනු: යැයි සතර මාර්ගඥානය වෙදයෝ කියනු ලැබෙති,...සියලු ශාස්ත්‍රවේදය ඉක්මවා සියලු වෙදනාවන්හි පහවූ ඡන්දරාග ඇති හෙතෙම වෙදගූ වේ යයි 'ස වෙ විද්වා ස වෙදගූ' යනු වේ.

**ඤත්වා ධම්මං අනිස්සිතො** – 'ඤත්වා' යනු: දැන දැනැගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට: 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි දැන දැනැගෙන තුලනය – තීරණය – විභාවනය– විභූත කොට, 'සියලු සංස්කාරයෝ දුක් වූහ'යි...යම් කිසිවක් සමුදයධර්ම නම් ඒ සියල්ල නැසෙන සුලු යැ යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට, **අනිස්සිතො** යනු: නිඃශ්‍රය දෙකෙකි: තෘෂ්ණා නිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය දැ'යි,.. මේ දෘෂ්ටිනිඃශ්‍රය යි, තෘෂ්ණානිශ්‍රය හැරදමා, දෘෂ්ටිනිශ්‍රය දුරලා, ඇස ඇසුරු නො කෙළේ – කන ඇසුරු නො කෙළේ– නැහැය ඇසුරු නො කෙළේ...දෘෂ්ට – ශ්‍රැත – මුත – විඥාතව්‍යධර්මයන් (තෘෂ්ණා දෘෂ්ටි විසින්) අනිඃශ්‍රිත වූයේ නො ඇලුණේ නො පැමිණියේ නො පිවිසියේ නො බැසගත්තේ (එයින්) නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍යාදා කල සිතින් යුක්ත ව වෙසේ නුයි 'ඤත්වා ධම්මං අනිස්සිතො' යනු වේ.

**සම්මා සො ලොකෙ ඉරියානොති** – යතො අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු ඡන්දරාගො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, එත්තාවතාපි සම්මා ලොකෙ චරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති; යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතාපි සම්මා ලොකෙ චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙතීති– සම්මා සො ලොකෙ ඉරියානො,

**න පිහෙතීධ කස්සචීති** – 'පිහා' වුච්චති තණ්හා: යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙසා පිහා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; සො කස්සචි න පිහෙති ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වාති– න පිහෙතීධ කස්සචි.

තෙනාහ භගවා:

"ස වෙ වීද්වා ස වෙදගූ ඤත්වා ධම්මං අනිස්සිතො,
සම්මා සො ලොකෙ ඉරියානො න පිහෙතීධ කස්සචී"ති.

### 15 – 14

යො ධ[1] කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං,
න සො සොචති නාජ්ඣෙති ඡින්නසොතො අබන්ධනො.

**යො ධ කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයන්ති** – 'යො'ති යො යාදිසො යථායුත්තො[2] යථාවිහිතො යථාපකාරො යංඨානප්පත්තො[3] යංධම්මසමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා; **කාමාති** උද්දානතො[4] ද්වෙ කාමා වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **සඞ්ගාති** සත්ත සඞ්ගා: රාගසඞ්ගා දොසසඞ්ගා මොහසඞ්ගා මානසඞ්ගා දිට්ඨිසඞ්ගා කිලෙසසඞ්ගා දුච්චරිතසඞ්ගා. **ලොකෙති** අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ; **සඞ්ගං ලොකෙ දුරච්චයන්ති** යො[5] කාමෙ ච සඞ්ගෙ ච ලොකෙ දුරච්චයෙ දුරතිවත්තෙ දුත්තරෙ දුප්පතරෙ දුස්සමතික්කමෙ දුබ්බීතිවත්තෙ[6] අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයීති – යො ච කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං.

---

1. යො ච – මුසි. II. 2. යථා වුත්තො – සීමු. II. 3. යණ්ඨානප්පත්තො – සීමු II.
4. උද්දානතො – සීමු. II. 5 සො – සීමු. II.
6. දුබ්බීතිවත්තෙ – සීමු II. PTS.

**සම්මා සො ලොකෙ ඉරියානො** - යම් තැනෙක සිට ආධ්‍යාත්මික බාහ්‍යායතනයන්හි ඡන්දරාගය ප්‍රහීණ වූයේ වේ ද, උදුරන ලද මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරන ලද්දේ අනභාවය කරන ලද්දේ මතු නූපදනා සැහැවි ඇත්තේ වේ ද, මෙතෙමේ ද මනාකොට ලොකයෙහි හැසිරෙයි, ඉරියව් පවත්වයි, වැටෙයි, රැකෙයි යැපෙයි යාපනය වේ. යම් තැනෙක සිට පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වෙත් ද, උදුරන ලද මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කළාහු අනභාවය කළාහු මතු නූපදනා සැහැවි ඇත්තාහු වෙත් ද, මෙතෙමේ ද ලොවැ මැනැවින් හැසිරෙයි, වෙසෙයි, ඉරියව් පවත්වයි, වැටෙයි, රැකෙයි යැපෙයි යාපනය වේ නුයි ‘සම්මා සො ලොකෙ ඉරියානො’ යනු වේ.

**න පිහෙතීධ කඤ්චි** - ‘පිහා’යි තෘෂ්ණාව කියනු ලබයි: යම් රාගයෙක් අතිකරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය යි; යමක්හු විසින් මෙල පිහා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී නසන ලද්දී සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී අභව්‍යොත්පත්තික වූවා ඥානාග්නීන් දවන ලද්දී ද, හෙතෙම ක්ෂත්‍රියයකුට හෝ බමුණකුට හෝ වෛශ්‍යයකුට හෝ ශූද්‍රයකුට හෝ ගිහියකුට හෝ පැවිද්දකුට හෝ දෙවියකුට හෝ මිනිසකුට හෝ කිසිවකුට ත් තෘෂ්ණා නො කෙරේ නුයි ‘න පිහෙතීධ කඤ්චි’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

> “ස ච විද්වා ස වෙදගූ -පෙ- න පිහෙතීධ කඤ්චි”යි

## 15 - 14

මේ සත්ත්වලොකයෙහි යමෙක් වස්තුකාමක්ලේශකාමයන් ද ඉක්මැවීමට දුෂ්කර වූ රාගාදි සඞ්ගය ද ඉක්මැවී නම්, සිඳින ලද තෘෂ්ණා ඇති රාගාදි බන්ධන රහිත වූ හෙතෙම ශොක නො කෙරෙයි, නො සිතයි.

**යො ච කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං** - ‘යො’ යනු යම්බඳු යම් යොග ඇති (තවකම් ආදියෙන්) යථාවිහිත වූ යම් ප්‍රකාර ඇති යම් තනතුරකට පැමිණි යම් ධර්මයකින් යුක්ත වූ ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ; **කාම** නම්: විස්තර හෙයින් වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ දැ’යි කාමයෝ දෙදෙනෙකි:... මොහු ක්ලේශකාමයෝ යයි කියනු ලැබෙත්. **සඞ්ග** නම්: සඞ්ගයෝ සතෙකි: රාගසඞ්ග යැ ද්වේෂ - මෝහ - මාන - දෘෂ්ටි - ක්ලේශ - දුශ්චරිතසඞ්ග යැයි. **ලොකෙ** යනු: අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි; දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි; **සඞ්ගං ලොකෙ දුරච්චයං** යමෙක් ලොවැ පසු කළ නො හැකි, ඉක්මැවිය නො හැකි, තරණය කළ නො හැකි වෙසෙසින් තරණය කළ නො හැකි, දුකසේ ඉක්මැවිය යුතු, දුකසේ නැවැත්විය යුතු කාමයන් ද සඞ්ගයන් ද තරණය කෙළේ උත්තරණය කෙළේ ඉක්මැ වූයේ වෙසෙසින් නැවැත්වී නුයි ‘යො ච කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං’ යනු වේ.

**න සො සොචති නාජ්ඣෙතීති** - විපරිණතං වත්ථුං න සොචති; විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති; 'චක්ඛු මෙ[1] - විපරිණත'න්ති න සොචති; සොතං මෙ - ඝානං මෙ - ජිව්හා මෙ - කායො මෙ - රූපා මෙ - සද්දා මෙ - ගන්ධා මෙ - රසා මෙ - ඵොට්ඨබ්බා මෙ - කුලං - මෙ ගණො මෙ - ආවාසො මෙ - ලාභො මෙ - යසො මෙ - පසංසා මෙ - සුඛං මෙ - චීවරං මෙ - පිණ්ඩපාතො මෙ - සෙනාසනං මෙ - ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරා මෙ - මාතා මෙ - පිතා මෙ - භාතා මෙ - භගිනී මෙ - පුත්තා මෙ - ධීතා මෙ - මිත්තා මෙ - අමච්චා මෙ - ඤාතී මෙ - සාලොහිතා මෙ විපරිණතාති 'න සොචති,' න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති න සොචති; නාජ්ඣෙතීති - නාජ්ඣෙති න අජ්ඣෙති න උපනිජ්ඣායති, න නිජ්ඣායති, න පජ්ඣායති, අථවා න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජතීති නාජ්ඣෙතීති - 'න සො සොචති නාජ්ඣෙති.

**ඡින්නසොතො අබන්ධනොති** - 'සොතා' වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙසා සොතා තණ්හා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති ඡින්නසොතො; **අබන්ධනොති** රාගබන්ධනං දොසබන්ධනං මොහබන්ධනං මානබන්ධනං දිට්ඨිබන්ධනං කිලෙසබන්ධනං දුච්චරිතබන්ධනං, යස්සෙතානි බන්ධනානි පහීනානි සමුච්ඡින්නානි -පෙ- ඤාණග්ගිනා දඩ්ඪානි, සො වුච්චති අබන්ධනොති - ඡින්නසොතො අබන්ධනො.

තෙනාහ භගවා:

"යො'ධ කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං,
න සො සොචති නාජ්ඣෙති ඡින්නසොතො අබන්ධනො"ති.

**15 - 15**

යං පුබ්බෙ තං විසොසෙහි පච්ඡා තෙ මාහු කිඤ්චනං
මජ්ඣෙ චෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසි.

**යං පුබ්බෙ තං විසොසෙහීති** - අතීතෙ සඞ්ඛාරෙ ආරබ්භ යෙ කිලෙසා උප්පජ්ජෙය්‍යුං, තෙ කිලෙසෙ සොසෙහි, විසොසෙහි, සුක්ඛාපෙහි, විසුක්ඛාපෙහි, අබීජං කරොහි, පජහ, විනොදෙහි, බ්‍යන්තීකරොහි, අනභාවං ගමෙහීති එවම්පි - යං පුබ්බෙ තං විසොසෙහි. අථවා යෙ අතීතා කම්මාභිසඞ්ඛාරා අවිපක්කවිපාකා, තෙ කම්මාභිසඞ්ඛාරෙ සොසෙහි, විසොසෙහි, සුක්ඛාපෙහි, විසුක්ඛාපෙහි, අබීජං කරොහි, පජහ, විනොදෙහි, බ්‍යන්තීකරොහි, අනභාවං ගමෙහීති එවම්පි - යං පුබ්බෙ තං විසොසෙහි.

---

1 චක්ඛු මෙ - සිමු. II. මජසං.

**න සො සොචති නාජ්ඣෙති** - විපරිණත (-පෙරළුණු) වස්තුවට ශෝක නො කෙරෙයි, වස්තුව විපරිණත කල්හි හෝ ශෝක නො කෙරෙයි, 'මාගේ ඇස පෙරළුණේ'යි ශෝක නො කෙරෙයි, මාගේ කන - මාගේ නැහැය - මාගේ දිව - මාගේ කය - මාගේ රූපයෝ - මාගේ ශබ්දයෝ - මාගේ ගන්ධයෝ - මාගේ රසයෝ - මාගේ ස්ප්‍රෂ්ටව්‍යයෝ - මාගේ කුලය මාගේ ගණයා - ආවාසය - ලාභය - යශස - ප්‍රශංසාව - සුවය - සිවුර - පිණ්ඩපාතය - සෙනස්න - ගිලන්පසබෙහෙත්පිරිකර - මාගේ මව - පියා - බෑයා - බූනෑණියා - පුත්‍රයා - ධීතෘව - - මිත්‍රයෝ - සගයෝ - නෑයෝ මාගේ සහලේනෑයෝ නැසුණාහ'යි ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ නුයි 'න සොචති' යනු වේ. **නාජ්ඣෙති** යනු: නො සිතයි, 'සමීපව නො සිතයි, අනෙකප්‍රකාරයෙන් නො සිතයි, අතිශයින් නො සිතයි; නොහොත් නූපදී, නො දිරයි, නො මැරෙයි, ච්‍යුත නො වෙයි, ප්‍රතිසන්ධියට නො පැමිණේ යයි නො සිතා නුයි 'න සො සොචති නාජ්ඣෙති' යනු වේ.

**ඡින්නසොතො අබන්ධනො** - 'සොතා'යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් බලවත් රාගයෙක්...අභිධ්‍යාවක් ලෝභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල 'සොත' නම් වූ තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී ද; ඔහුතෙම 'ඡින්නසොත'යි කියනු ලැබෙයි. **අබන්ධනො** යනු: රාගබන්ධන යැ ද්වෙෂබන්ධන යැ මොහබන්ධන යැ මානබන්ධන යැ දෘෂ්ටිබන්ධන යැ කෙලශබන්ධන යැ දුශ්චරිතබන්ධන යැ යන තෙල බන්ධනයෝ යමක්හු විසින් ප්‍රහීණ කරන ලද්දාහු ද සමුච්ඡින්න වූවාහු ද... ඥානාග්නීන් දවන ලද්දාහු ද; හෙතෙම 'අබන්ධන' යයි කියනු ලැබේ නුයි 'ඡින්නසොතො අබන්ධනො' යනු වේ.

එයින් වදාලහ බුදුහු:

"යො ච කාමෙ අච්චතරි -පෙ- ඡින්නසොතො අබන්ධනො"යි.

## 15 - 15

අතීත සංස්කාරයන් ඇරැබැ උපදනා යම් කෙලශජාතයෙක් වේ නම් එය වියලව. අනාගත සංස්කාරයන් අරැබැ උපදනා රාගාදි කිඤ්චනය නහමක් තට වේවා. ඉදින් වර්තමානයෙහි රූපාදි සංස්කාරයන් තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් නො ගන්නෙහි නම්, උපශාන්ත වැ හැසිරෙන්නෙහි ය.

**යං පුබ්බෙ තං විසොසෙහි** - අතීත සංස්කාරයන් අරබයා යම් කෙලෙස් කෙනෙක් උපදනාහු නම්, ඒ කෙලෙසුන් වියලව, වෙසෙසින් වියලව, නීරස කරව වෙසෙසින් නීරස කරව, බොල් කරව, දුරු කරව, බැහැර කරව, විනතාන්ත කරව, අනුඅභාවයට පමුණුව'යි මෙසේ ත් - 'යං පුබ්බෙ තං විසොසෙහි' යනු වේ. නොහොත් අතීත වූ නො මුකුළු විපාක ඇති යම් කර්මාභිසංස්කාර කෙනෙක් වෙත් නම්, ඒ කර්මාභිසංස්කාරයන් ශෝෂණ විශෝෂණ කර, ශුෂ්ක විශුෂ්ක කර, බොල් කර, දුරු කර, බැහැර කර විගතාන්ත කර, අනභාවයට පමුණුවාල'යි; මෙසේත් - යං 'පුබ්බෙ තං විසොසෙහි' යනු වේ.

**පච්ඡා තෙ මාහු කිඤ්චනන්ති** – 'පච්ඡා' වුච්චති අනාගතං; අනාගතෙ සඞ්ඛාරෙ ආරබ්භ යානි උප්පජ්ජෙය්‍යුං රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙසකිඤ්චනං දුච්චරිතකිඤ්චනං, ඉමානි කිඤ්චනානි තුය්හං මා අහු, මා පාතුරකාසි, මා ජනෙසි, මා සඤ්ජනෙසි, මා නිබ්බත්තෙසි, මා අභිනිබ්බත්තෙසි, පජහ, විනොදෙහි, බ්‍යන්තීකරොහි, අනභාවං ගමෙහීති – පච්ඡා තෙ මාහු කිඤ්චනං.

**මජ්ඣෙ චෙ නො ගහෙස්සසීති** – 'මජ්ඣං' වුච්චති පච්චුප්පන්නා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, පච්චුප්පන්නෙ සඞ්ඛාරෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන න ගහෙස්සසි, න උග්ගහෙස්සසි, න ගණ්හිස්සසි, න පරාමසිස්සසි, නාභිවදිස්සසි, න අජ්ඣොසිස්සසි, අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහිස්සසි, විනොදෙස්සසි, බ්‍යන්තීකරිස්සසි, අනභාවං ගමෙස්සසීති – මජ්ඣෙ චෙ නො ගහෙස්සසි.

**උපසන්තො චරිස්සසීති** – රාගස්ස සන්තත්තා සමිතත්තා උපසමිතත්තා දොසස්ස සන්තත්තා සමිතත්තා උපසමිතත්තා –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා උපසමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධො චරිස්සසි විහරිස්සසි ඉරියිස්සසි වත්තිස්සසි පාලෙස්සසි යපිස්සසි යාපෙස්සසීති – උපසන්තො චරිස්සසි.

තෙනාහ භගවා:

> "යං පුබ්බෙ තං විසොසෙහි පච්ඡා තෙ මා'හු කිඤ්චනං,
> මජ්ඣෙ චෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසී"ති.

## 15 - 16

> සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,
> අසතා ච න සොචති ස වෙ ලොකෙ න ජීයති.

**සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතන්ති** – 'සබ්බසො'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'සබ්බසො'ති. **නාමන්ති** චත්තාරො අරූපිනො ඛන්ධා; **රූපන්ති** චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං; **යස්සාති** අරහතො ඛීණාසවස්ස; **මමායිතන්ති** ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං. **සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතන්ති** – සබ්බසො නාමරූපස්මිං මමත්තා යස්ස නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං.

**පච්ඡා තෙ මාහු කිඤ්චනං** – 'පච්ඡා'යි අනාගතය කියනු ලැබෙයි. අනාගත සංස්කාරයන් අරබයා රාගකිඤ්චනය ද්වේෂ – මෝහ – මාන – දෘෂ්ටි – ක්ලේශ – දුශ්චරිතකිඤ්චනය යන යම් ධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ කිඤ්චනයෝ තට නහමක් වේත්වා, නහමක් පහළ කර, නූපදව, නො හටගන්වව, නො නිපදව, වෙසෙසින් නො නිපදව, දුරු කර, බැහැර කර, විගතාන්ත කර, අනභාවයට පමුණුවාල'යි 'පච්ඡා තෙ මාහු කිඤ්චනං' යනු වේ.

**මජ්ඣෙ චෙ නො ගහෙස්සසි** – 'ප්‍රත්‍යුත්පන්න වූ රූප – වේදනා- සංඥා සංස්කාර – විඥානයෝ 'මජ්ඣ'යි කියනු ලැබෙති. වර්තමාන සංස්කාරයන් තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් නො ගන්නෙහි, දැඩිව නො ගන්නෙහි, ග්‍රහණය නො කරන්නෙහි, නො දැහැගන්නෙහි, නො සතුටු වන්නෙහි, නො කියන්නෙහි, නො සිතන්නෙහි, අභිනන්දනය අභිවදනය අධ්‍යවසානය ග්‍රාහය පරාමර්ශය අභිනිවේශය දුරු කරන්නෙහි, බැහැර කරන්නෙහි, විගතාන්ත කරන්නෙහි, අනභාවයට පමුණුවන්නෙහි යයි 'මජ්ඣෙ චෙ නො ගහෙස්සසි' යනු වේ.

**උපසන්තො චරිස්සසි** – රාගය නිවුණු බැවින් සන්හිඳුණු බැවින් වෙසෙසින් සන්හිඳුණු බැවින්, ද්වේෂය ශාන්ත බැවින් ශමිත බැවින් උපශමිත බැවින්... සියලු අකුශලාභිසංස්කාරයන් නිවුණු බැවින් සන්හිඳුණු බැවින් උපශමිත බැවින් ව්‍යුපශමිත බැවින් දවන ලද බැවින් නිවන ලද බැවින් විගත බැවින් දුරලන ලද බැවින් ශාන්ත වැ උපශාන්ත වැ ව්‍යුපශාන්ත වැ නිවුණේ සැහැල්ලු වැ හැසිරෙන්නෙහි වෙසෙන්නෙහි ඉරියව් පවත්වන්නෙහි වැටෙන්නෙහි රැකෙන්නෙහි යැපෙන්නෙහි යාපනය වන්නෙහි නුයි 'උපසන්තො චරිස්සසි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යං පුබ්බෙ තං විසොසෙහි** –පෙ– **උපසන්තො චරිස්සසී"**යි

## 15 – 16

යම් රහතක් හට නාමරූ දෙකෙහි මාගේ යයි ගන්නා ලද්දෙක් හැම්ලෙසින් නැද් ද, මමායිතයක් නැති බැවින් ශෝක නො කෙරේ ද, හෙතෙම ඒකාන්තයෙන් ලොවැ පිරිහීමට නො පැමිණේ.

**සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං** – 'සබ්බසො' යනු: සියල්ලෙන් සියල්ල සර්වාකාරයෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට ගන්නා වචනයෙකි තෙල 'සබ්බසො' යනු. **නාම** නම්: සතර අරූපීස්කන්ධයෝ යැ; **රූප** නම්: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද (යන අටවිසි රූපය යැ); **යස්ස** යනු: රහත් ක්ෂීණාස්‍රව හට, **මමායිතං** යනු: මමත්ව දෙකෙකි: තෘෂ්ණාමමත්වය ද, දෘෂ්ටිමමත්වය දැ'යි... මේ දෘෂ්ටිමමත්වය යි. **සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං** – සර්වප්‍රකාරයෙන් නාමරූපයෙහි මමත්වයෝ යමක් හට නැද්ද, නො වෙත් ද, අවිද්‍යමාන වෙත් ද, නො ලැබෙත් ද, ප්‍රහීණ වූවාහු නසන ලද්දාහු සන්හිඳුණාහු දුරලන ලද්දාහු අභව්‍යෝත්පත්තික වූවාහු ඥානාග්නීන් දවන ලද්දාහු නුයි 'සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං' යනු වේ.

**අසතා ච න සොචතීති** – විපරිණතං වා වත්ථුං න සොචති, විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති: 'චක්ඛුං මෙ විපරිණත'න්ති න සොචති, සොතං මෙ – ඝානං මෙ – ජිව්හා මෙ – කායො මෙ – රූපා මෙ – සද්දා මෙ – ගන්ධා මෙ – රසා මෙ – ඵොට්ඨබ්බා මෙ – කුලං මෙ – ගණො මෙ – ආවාසො මෙ – ලාභො මෙ –පෙ– ඤාතිසාලොහිතා මෙ විපරිණතා'ති න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති. අථවා අසතාය දුක්ඛාය වෙදනාය ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති. අථවා චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො –පෙ– ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති. අථවා, අසන්තෙ අසංවිජ්ජමානෙ අනුපලබ්භමානෙ 'අහු වත මෙ, තං වත මෙ නත්ථි, සියා වත මෙ, තං වතාහං න ලභාමී'ති න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති.

**ස වෙ ලොකෙ න ජීයතීති** – යස්ස 'මය්හං වා ඉදං, පරෙසං වා ඉද'න්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං අත්ථි, තස්ස ජානි අත්ථි. භාසිතම්පි හෙතං:

1. "ජිණ්ණෙ රථස්සෙ[1] මණිකුණ්ඩලෙ ච
පුත්තෙ ච දාරෙ ච තථෙව ජිණ්ණෙ,[2]
සබ්බෙසු භොගෙසු අසෙවිතෙසු
කස්මා න සන්තප්පසි සොකකාලෙ?

2. පුබ්බෙ'ව මච්චං විජහන්ති භොගා
මච්චො ච තෙ පුබ්බතරං ජහාති,
අසස්සතා භොගිනො[3] කාමකාමී
තස්මා න සොචාමහං සොකකාලෙ.

3. උදෙති ආපූරති වෙති චන්දො
අත්ථං ගමිත්වාන[4] පලෙති සූරියො,
විදිතා මයා සත්තුක[5] ලොකධම්මා
තස්මා න සොචාමහං සොකකාලෙ"ති[a]

---

1. ජීනො රථස්සං – මජසං. ජීනො රථස්සං – PTS. 2. ජීනො – මජසං.
[a]. ජාතක–පඤ්චකනිපාත – මණිකුණ්ඩලජාතක.
3. අසස්සතා භාවිනො – සිමු. II. අසස්සතා භාගිනො – PTS.
4. අත්ථං තපෙත්වාන – මජසං. 5. අට්ඨක – සිමු II

**අසතා ච න සොචති** - නැසුණු වස්තුවට හෝ ශෝක නො කෙරෙයි, වස්තුව නැසුණු කල්හි හෝ ශෝක නො කෙරෙයි; 'මාගේ ඇස නැසිණැයි ශෝක නො කෙරෙයි, මාගේ කන - නැහැය - දිව - කය - රූපයෝ ශබ්දයෝ - ගන්ධයෝ - රසයෝ - ස්ප්‍රෂ්ටව්‍යයෝ - මාගේ කුලය - ගණයා- ආවාසය - මාගේ ලාභය... මාගේ නෑසහලේනෑයෝ නැසුණාහ'යි ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, මූලාවට නො පැමිණේ නුයි මෙසේත් 'අසතා ච න සොචති' යනු වේ. නොහොත් අමධුර වූ දුඃඛවේදනාවෙන් පහස්නා ලදුයේ මඩනා ලදුයේ බැසගත්නා ලදුයේ සම්භවිත වූයේ ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ නුයි මෙසේත් 'අසතා ච න සොචති' යනු වේ. නොහොත් චක්ෂුරෝගයෙන් පහස්නා ලදුයේ මඩනා ලදුයේ...මැසි මදුරු අව් සුළං දිග්ද පහසින් පහස්නා ලදුයේ මඩනා ලදුයේ බැසගත්නා ලදුයේ සම්භවිත වූයේ ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ නුයි මෙසේත් 'අසතා ච න සොචති' යනු වේ. නොහොත් නැති කල්හි අවිද්‍යමාන කල්හි නො ලැබෙන කල්හි 'මට එකාන්තයෙන් වූයේ නම්, එය එකාන්තයෙන් මට නැත, මට එකාන්ත- යෙන් වන්නේ යැ, එය මම නො ලබමි' ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, බලවත් මෝහයට නො පැමිණේ නුයි මෙසේත් 'අසතා ච න සොචති' යනු වේ.

**ස වෙ ලොකෙ න ජීයති** - යමෙක් හට 'මෙය මාගේ හෝ යැ, මෙය පරගේ හෝ යැ'යි ගන්නා ලද දැහැගන්නා ලද පිවිසැගත් බැසගත් ඇතුළු වැ ගත් කිසි රූපගතයෙක් වේදනා - සංඥා - සංස්කාර - විඥානගතයෙක් ඇත් නම්, ඔහුට ජානිය ඇත. මේ කියන ලද මැ යැ:

1. රිය හා අසුන් ද මිණිකොඬොල් ද පිරිහුණු කල්හි, අඹුදරුවන් ද එසේ ම පිරිහුණු කල්හි, සියලු භොගයන් නො සෙවුණා කල්හි, (මෙසේ) ශෝකකාලයෙහි කුමක් හෙයින් නො තැවෙහි ද?

2. භොගයෝ හෝ මිනිසා පළමු වැ හරිති. මිනිසා හෝ ඒ භොගයන් ඉනා පළමු වැ දුරු කෙරෙයි, එම්බා කාමකාමිය, (-කාමයන් කැමැසිවන තෙනැත්න) කාමභොගීහු (යම් හෙයකින්) අශාශ්වත වූවාහු ද, එහෙයින් මම (මහාජනයා) ශෝක කරන කල්හි ශෝක නො කෙරෙමි.

3. (යම් හේ) සඳ උදා වේ ද හාත්පසින් පිරේ ද යළි ගෙවේ ද, හිර (අඳුරු නසා) උදයට පැමිණ යළි අස්තයට යේ ද, එපරිද්දෙන් සත්තුකය මා විසින් ලොකධර්මයෝ දන්නා ලද්දාහු ද, එහෙයින් (මහාජනයා) ශෝක කරන කල්හි මම ශෝක නො කෙරෙමි යයි.

යස්ස 'මය්හං වා ඉදං, පරෙසං වා ඉද'න්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි, තස්ස ජාති නත්ථි. භාසිතම්පි හෙතං: "නන්දසි සමණාති? කිං ලද්ධා ආවුසොති? තෙන හි සමණ සොචසීති? කිං ජීයිත්ථ ආවුසොති? තෙනහි සමණ නෙව නන්දසි, න සොචසීති? එවමාවුසොති.a

4. චිරස්සං වත පස්සාමි බ්‍රාහ්මණං පරිනිබ්බුතං,
අනන්දිං අනීඝං භික්ඛුං තිණ්ණං ලොකෙ විසත්තික"න්තිa

'ස වෙ ලොකෙ න ජීයති.'

තෙනාහ භගවා:

"සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,
අසතා ච න සොචති ස වෙ ලොකෙ න ජීයතී"ති.

## 15 - 17

යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං,
මමත්තං සො අසංවින්දං නත්ථි මෙති න සොචති.

**යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනන්ති** – 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස, යස්ස මය්හං වා ඉදං පරෙසං වා ඉදන්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි, න සන්ති, න සංවිජ්ජති, නුපලබ්භති, පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. වුත්තං හෙතං භගවතා: "නායං භික්ඛවෙ කායො තුම්හාකං, නපි අඤ්ඤෙසං. පුරාණමිදං භික්ඛවෙ කම්මං අභිසඞ්ඛතං අභිසංචෙතයිතං වෙදනීයං දට්ඨබ්බං. තත්‍ර භික්ඛවෙ සුතවා අරියසාවකො පටිච්චසමුප්පාදංයෙව සාධුකං යොනිසො මනසි කරොති: ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති. යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා; සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං –පෙ– එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො –පෙ– එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"තිb එවම්පි යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං.

a. දෙවපුත්තසංයුත්ත - දුතියවග්ග. b. සංයුත්තනිකාය - කළාරඛත්තියවග්ග.

යමෙක් හට 'මේය මාගේ හෝ යැ. මේය පරංගේ හෝ යැ'යි ගන්නා ලද දැඩිව ගන්නා ලද පිවිසැ ගන්නා ලද බැසගත්තා ලද ඇතුළු වැ ගන්නා ලද කිසි රූපගතයෙක් වේදනා - සංඥා - සංස්කාර - විඥානගතයෙක් නැත් නම්, ඔහුට ජාතිය නැත. මේ කියන ලද මැ ය: "මහණ, සතුටු වෙහි දැ'යි, කුමක් ලැබ ද ඇවැත්නි; එසේ නම් මහණ, ශෝක කෙරෙහි දැ'යි, ඇවැත්නි; කුමක් නැසිණි දැයි; එසේ නම් මහණ නො මැ සතුටු වෙහි ශෝක නො කෙරෙහි දැයි; එසේ යැ ඇවැත්නි.

4. එකාන්තයෙන් බාහිතපාපී වූ කෙලශපරිනිර්වාණයෙන් පිරිනිවි තෘෂ්ණාවශයෙන් සතුටු නොවන සුලු නිදුක් වූ ලොවැ තෘෂ්ණා සංඛ්‍යාත විසත්තිකාව තරණය කළ මහණක්හු බොහෝ කලකින් දකුම්හ"යි.

'ස වේ ලොකෙ න ජීයති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සබ්බසො නාමරූපස්මිං -පෙ- ස වෙ ලොකෙ න ජීයති"යි**

## 15 - 17

යම් ක්ෂීණාස්‍රවයක් හට 'මේය මාගේ යැ'යි හෝ, යළි අනුන්ගේ යැයි හෝ රූපාදි කිඤ්චනයෙක් නැත් ද, හෙතෙම තෘෂ්ණා - දෘෂ්ටි-මමත්වය නො ලබනුයේ මට මෙය නැතැයි ශෝක නො කෙරේ.

**යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වා'පි කිඤ්චනං** - 'යස්ස' යනු: අර්හත් ක්ෂීණාස්‍රව හට; යමක් හට 'මේය මාගේ හෝ යැ, මේය පරංගේ හෝ යැයි ගන්නා ලද දැඩිව ගන්නා ලද පිවිසැගත් බැසගත්තා ලද ඇතුළු වැ ගන්නා ලද කිසි රූපගතයෙක් වේදනා - සංඥා - සංස්කාර-විඥානගත-යෙක් නැත් ද, නො වේ ද, විද්‍යමාන නො වේ ද, නො ලැබේ ද, ප්‍රහීණ වූයේ සමුච්ඡින්න වූයේ සන්හිඳුණේ දුරලන ලද්දේ උපතට නුසුදුසු වූයේ නුවණ ගින්නෙන් දවන ලද්දේ නුයි මෙසේත් 'යස්ස නත්ථි ඉදං මේ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. තෙල වදාරන ලද මැ ය බුදුන් විසින්: "මහණෙනි, මේ කය තොපගේ නො වෙයි, අනුන්ගේ නො ද වෙයි. මහණෙනි, මේ කර්මයෙන් සකස් කළ සිතින් රැස් කළ වේදනීය වූ පුරාණ කර්මය'යි දතයුතු යැ. මහණෙනි, එහි ලා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ ප්‍රතීත්‍යසමුත්පාදය මැ මනා කොට නුවණින් මෙනෙහි කෙරෙයි: "මෙසේ මේ ධර්මය ඇති කල්හි මෙය වෙයි, මොහුගේ ඉපදීමෙන් මෙය උපදී, මේ ධර්මය නැති කල්හි මෙය නො වෙයි, මොහුගේ නිරොධයෙන් මෙය නිරුද්ධ වෙයි; ඒ මෙසේ යැ: 'අවිද්‍යාව හෙතු කොට (එකුන් තිස් ත්‍රෛභූමක කුශලාකුශලචේතනා සංඛ්‍යාත) සංස්කාරයෝ පහළ වෙති, සංස්කාරයන් හෙතු කොට දෙතිස් ලෞකික විපාක විඥානය පහළ වෙයි... මෙසේ මේ හුදු දුක්රැස පහළ වෙයි. යළි අවිද්‍යාවගේ මැ අශෙෂ-විරාගනිරොධයෙන් කුශලාකුශලසංස්කාරයන්ගේ නිරොධය වෙයි,... මෙසේ මේ හුදු දුක්රැස නිරුද්ධ වේ යැ"යි. මෙසේත් 'යස්ස නත්ථි ඉදං මේ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ.

වුත්තම්පි හෙතං භගවතා:

1. "සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු
මොඝරාජ සදා සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච
එවං මච්චුතරො සියා.
එවං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සතී"ති[a]

එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. වුත්තම්පි හෙතං භගවතා: "යං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති[1] කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. වෙදනා – සඤ්ඤා – සඞ්ඛාරා – විඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨසාඛාපලාසං තං ජනො හරෙය්‍ය වා, ඩහෙය්‍ය වා, යථා පච්චයං වා කරෙය්‍ය; අපි නු තුම්හාකං එවමස්ස: 'අම්හෙ ජනො හරති වා, ඩහති වා, යථා පච්චයං වා කරොතී'ති? නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු? න හි නො එතං භන්තෙ අත්තා වා අත්තනියං වා'ති. එවමෙව ඛො භික්ඛවෙ යං න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති[1]. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ; තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. වෙදනා සඤ්ඤා – සඞ්ඛාරා – විඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ; තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සතී"ති[b] එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං.

භාසිතම්පි හෙතං:

2. "සුද්ධධම්ම[2] සමුප්පාදං සුද්ධසඞ්ඛාරසන්තතිං,
පස්සන්තස්ස යථාභූතං න භයං හොති ගාමණි.

3. තිණකට්ඨසමං ලොකං යදා පඤ්ඤාය පස්සති,
නාඤ්ඤං පත්ථයතෙ කිඤ්චි අඤ්ඤත්‍ර[3] පටිසන්ධියා"ති[c]

එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. වජිරා භික්ඛුනී මාරං පාපිමන්තං එතදවොච:

4. "කින්නු[4] සත්තො'ති පච්චෙසි මාර දිට්ඨිගතං නු තෙ,
සුද්ධසඞ්ඛාරපුඤ්ජො'යං නයිධ සත්තොපලබ්භති.[5]

5. යථාපි අඞ්ගසම්භාරා හොති සද්දො රථො ඉති,
එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති.

---

1. භවිස්සතීති - සීමු. II.    2. සුද්ධංගම - ස්‍යා. PTS.
3. න අඤ්ඤත්‍ර - ස. පු    4. කං නු - සීමු. II.
5. සත්තුපලබ්භති - සං PTS    a සුත්තනිපාත - මොඝරාජසුත්ත.
b ඛන්ධසංයුත්ත - නතුම්හාකවග්ග.    c. අධිමුත්තත්ථෙරගාථා.

මේ විචාරන ලද මැය, බුදුන් විසින්:

1. මොඝරාජය, සියලු කල්හි සමෘතිමත් වූයෙහි ලෝකය ශූන්‍ය හෙයින් බලව, සත්කායදෘෂ්ටිය උදුරාපියා, මෙපරිද්දෙන් මරණය තරණය කරනුයේ වන්නෙහි. මෙසේ ස්කන්ධලෝකය දක්නහු මෘත්‍යුරාජ තෙමේ නො දක්නේ ය'යි.

මෙසේත් 'යස්ස නත්ථි ඉදං මෙ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. මේ විචාරන ලද මැ ය, භාග්‍යවතුන් විසින්: "මහණෙනි, යමක් තොපගේ නො වේ නම්, එය දුරු කරවු; එය තොප විසින් ප්‍රහීණ කරන ලද්දේ බොහෝ කලක් හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි, කුමක් තොපගේ නො වේ ද යත්? මහණෙනි, රූපය තොපගේ නො වෙයි, එය දුරු කරවු, එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ ය. වේදනාව-සංඥාව-සංස්කාරයෝ-විඥානය තොපගේ නො වෙයි, එය හැරපියවු; එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ යැ. මහණෙනි, ඒ කිමැයි සිතවු ද? මේ දෙව්රම්හි යම් තණ – දර – අතු – කොළ වේ නම්, එය ජනයා ගෙනයන්නේ හෝ දවන්නේ හෝ රිසි සේ කරන්නේ හෝ නම්; කිමැ තොපට මෙබඳු සිතෙක් වන්නේ ද: 'ජනයා අප ගෙන යයි හෝ රිසි සේ කෙරෙයි හෝ දැ'යි? 'නෙල නො වේ මැය, ස්වාමීනි, ඊට කරුණු කිමැ යත්? ස්වාමීනි, නෙල අපගේ ආත්ම හෝ ආත්මනීය හෝ නො මැ වේ යැ'යි, එසෙයින් මහණෙනි, යමක් තොපගේ නො වේ නම්, එය හැරපියවු, එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ යැ. මහණෙනි, කුමක් තොපගේ නො වේ ද යත්? මහණෙනි, රූපය තොපගේ නො වෙයි' එය හැරපියවු; එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ යැ. වේදනාව-සංඥාව – සංස්කාරයෝ – විඥානය තොපගේ නො වෙයි, එය හැරපියවු; එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ ය''යි. මෙසේත් 'යස්ස නත්ථි ඉදං මෙ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. මේ කියන ලද මැය:

2. "ග්‍රාමණිය, කෙවල වූ ප්‍රත්‍යයප්‍රත්‍යයොත්පන්න ධර්මමාත්‍රයාගේ සමුත්පාදය ද, (ධ්‍රැවභාවාදියෙන්) අමිශ්‍ර වූ සංස්කාරසන්තතිය ද, තතු සේ දක්නහුට භයෙක් නො වේ.

3. යම් සැලෙක ලෝකය තෘණ කාෂ්ඨ හා සම කොට විදර්ශනා-ප්‍රඥාවෙන් දකී නම්, එකල්හි අන් කිසිවක් නො පතයි, පිළිසඳ පිණිස අන් තැනෙක්හි ප්‍රාර්ථනා නො කරයි.

මෙසේත් – 'යස්ස නත්ථි ඉදං මෙ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. 'වජිරා' භික්ෂුණිය වසවත් මරුට මෙසේ කිව:

4. මාරය, (තෝ) සත්ත්වයෙකැ'යි කුමක් සලකයි ද? තාගේ දෘෂ්ටි-ගතයෙක් නො වේ ද? මේ කෙවල වූ සංස්කාරපුඤ්ජයෙකි, මෙහි සත්ත්ව-යෙක් නො ලැබේ.

5. යම්සේ අවයව සමූහය හෙතු කොට ගෙන 'රථ' යන වාචක ශබ්දය වේ ද, එසෙයින් ස්කන්ධසමූහය ඇති කල්හි 'සත්ත්වයෙක' යන සම්මතය වේ.

6. දුක්ඛමෙව හි සම්භොති දුක්ඛං තිට්ඨති වෙති ච,
නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති නාඤ්ඤං දුක්ඛා නිරුජ්ඣතී"ති[a]

එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. "එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු රූපං සමන්නෙසති, යාවතා රූපස්ස ගති. වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං සමන්නෙසති, යාවතා විඤ්ඤාණස්ස ගති. තස්ස රූපං සමන්නෙසතො යාවතා රූපස්ස ගති, වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං සමන්නෙසතො යාවතා විඤ්ඤාණස්ස ගති, යම්පිස්ස හොති අහන්ති වා මමන්ති වා අස්මීති වා, තම්පි තස්ස න හොතී"ති[b]. එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ සුඤ්ඤො ලොකො'ති වුච්චතී'ති ? යස්මා ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චති. කිඤ්චානන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා ? චක්ඛුං ඛො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා. රූපා සුඤ්ඤා – චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං – චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො – යදිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං – සොතං සුඤ්ඤං – සද්දා සුඤ්ඤා – ඝානං සුඤ්ඤං – ගන්ධා සුඤ්ඤා – ජිව්හා සුඤ්ඤා – රසා සුඤ්ඤා – කායො සුඤ්ඤො – ඵොට්ඨබ්බා සුඤ්ඤා – මනො සුඤ්ඤො – ධම්මා සුඤ්ඤා – මනොවිඤ්ඤාණං සුඤ්ඤං – මනොසම්ඵස්සො සුඤ්ඤො – යදිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා. යස්මා ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චතී"ති[c] එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං.

**මමත්තං සො අසංවින්දන්ති** – 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තං දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං. තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා මමත්තං අවින්දන්තො අසංවින්දන්තො අනධිගච්ඡන්තො අප්පටිලභන්තොති–මමත්තං සො අසංවින්දං.

**නත්ථි මෙති න සොචතීති** = විපරිණතං වා වත්ථුං න සොචති; විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති. චක්ඛු මෙ විපරිණතන්ති න සොචති. සොතං මෙ –පෙ– සාලොහිතා මෙ විපරිණතාති න සොචති; න කිලමති; න පරිදෙවති; න උරත්තාළිං කන්දති; න සම්මොහං ආපජ්ජතීති – නත්ථි මෙති න සොචති.

තෙනාහ භගවා:

"යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං,
මමත්තං සො අසංවින්දං නත්ථි මෙති න සොචතී"ති.

---

a. භික්ඛුනිසංයුත්ත. b. සංයුත්තනිකාය – ආසීවිසවග්ග.
c. සංයුත්තනිකාය – ඡන්නවග්ග.

6. දුක මැ උපදී. දුක මැ පවතී, විදී. දුක හැර අනෙකක් නො ලැබෙයි. දුකින් අන්‍ය වූවක් නිරුද්ධ නො වේ.

මෙසේත් – ‘යස්ස නත්ථි ඉදං මේ’ති පරෙසං වා’පි කිඤ්චනං’ යනු වේ. “මහණෙනි, එසේයින් මැ මහණ රූපයාගේ පැවැත්ම ඇති තාක් රූපය ආවර්ජනා කෙරෙයි, වේදනාව – සංඥාව – සංස්කාරයන් – විඥානයාගේ පැවැත්ම ඇති තාක් විඥානය ආවර්ජනා කෙරෙයි. රූපයාගේ පැවැත්ම පමණින් රූපය ආවර්ජනා කරන්නා වූ ඔහුට වේදනාව – සංඥාව– සංස්කාරයන් – විඥානයාගේ පැවැත්ම පමණින් විඥානය ආවර්ජනා කරන්නා වූ ඔහුට ‘මම යැ හෝ මාගේ යැ හෝ මම් වෙමි හෝ’ ඔහුට යම් දෘෂ්ටියකුත් වේ නම්, හෙ ද ඔහුට නො වේ යැ”යි. මෙසේත් – ‘යස්ස නත්ථි ඉදං මේ’ති පරෙසං වා’පි කිඤ්චනං’ යනු වේ. “ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මේ කීහ: ‘ස්වාමීනි, ලොකය ශූන්‍ය යැ, ලොකය ශූන්‍ය යැ’යි කියනු ලැබෙයි. ස්වාමීනි, කිපමණෙකින් ලොකය ශූන්‍යය’යි කියනු ලැබේ. දැයි ? ‘අනඳයැ, යම් හෙයකින් ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය වේ ද, එහෙයින් ලොකය ශූන්‍ය යැ’යි කියනු ලැබෙයි. ආනන්දය, ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් කුමක් ශූන්‍ය වේ ද යත් ? ආනන්දය, චක්ෂුස ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය යැ, රූපයෝ ශූන්‍යයෝ යැ – චක්ෂුර්විඥානය ශූන්‍ය යැ – චක්ෂුස්සංස්පර්ශය ශූන්‍යය– චක්ෂුස්සංස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදනාවක් උපදී නම්, හෙ ද ශූන්‍ය යැ – ශ්‍රොත්‍රය ශූන්‍ය යැ – ශබ්දයෝ ශූන්‍යයෝ යැ – ඝ්‍රාණය ශූන්‍ය යැ – ගන්ධයෝ ශූන්‍යයෝ යැ – දිව ශූන්‍ය යැ– රසයෝ ශූන්‍යයෝ යැ – කය ශූන්‍ය යැ – ස්ප්‍රෂ්ටව්‍යයෝ ශූන්‍යයෝ යැ– මනස ශූන්‍ය යැ – ධර්මයෝ ශූන්‍යයෝ යැ – මනොවිඥානය ශූන්‍ය යැ– මනස්සංස්පර්ශය ශූන්‍ය යැ – මනස්සංස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදනාවක් උපදී නම්, හෙ ද ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය යි. ආනන්දය, යම් හෙයකින් ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය වේ ද, එහෙයින් ලොකය ශූන්‍ය යැ’යි කියනු ලැබේ යැ”යි මෙසේත් – ‘යස්ස නත්ථි ඉදං මේති පරෙසං වාපි කිඤ්චනං’ යනු වේ

මමත්තං සො අසංවින්දං – ‘මමත්ත’ නම්: තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය ද’යි මමත්වයෝ දෙදෙනෙකි...,...මේ දෘෂ්ටිමමත්වය යි. තෘෂ්ණාමමත්වය හැර දෘෂ්ටිමමත්වය දුරලා මමත්වය නො ලබනුයේ වෙසෙසින් නො ලබනුයේ නො පැමිණෙනුයේ ප්‍රතිලාභ නො කරනුයේ නුයි ‘මමත්තං සො අසංවින්දං’ යනු වේ.

නත්ථි මෙ’ති න සොචති – විනාශ වූ වස්තුවට හෝ ශොක නො කෙරෙයි, වස්තුව නැසෙන කල්හි හෝ ශොක නො කෙරෙයි, ‘මාගේ ඇස නැසිණැ’යි ශොක නො කෙරෙයි, මාගේ කන...මාගේ නෑ සහලේනැයෝ නැසුණාහ’යි ශොක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සමෙමාහයට නො පැමිණේ නුයි ‘නත්ථි මෙති න සොචති’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“යස්ස නත්ථි ඉදං මෙ’ති –පෙ– නත්ථි මෙ’ති න සොචතී”යි.

**15 - 18**

අනිට්ඨුරී[1] අනනුගිද්ධො අනෙජො සබ්බධි සමො,
තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පිනං.

**අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමොති** - කතමං නිට්ඨුරියං? ඉධෙකච්චො නිට්ඨුරියො හොති පරලාභසක්කාර ගරුකාරමානනවන්දනපූජනාසු, ඉස්සති උසූයති ඉස්සං බන්ධති; යං එවරූපං නිට්ඨුරියං නිට්ඨුරියකම්මං ඉස්සා ඉස්සායනා ඉස්සායිතත්තං උසූයා උසූයනා උසූයායිතත්තං, ඉදං වුච්චති නිට්ඨුරියං. යස්සෙතං නිට්ඨුරියං පහීනං සමුච්ඡින්නං -පෙ- ඤාණග්ගිනා දඩ්ඪං; සො වුච්චති අනිට්ඨුරීති. අනනුගිද්ධොති ‘ගෙධො; වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං’ යස්සෙසො ගෙධො පහීනො සමුච්ඡින්නො -පෙ- ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අනනුගිද්ධො. සො රූපෙ අගිද්ධො සද්දෙ -පෙ- දිට්ඨ සුත මුත විඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගථිතො[2] අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති- අනිට්ඨුරී අනනුගිද්ධො.

**අනෙජො සබ්බධි සමොති** - ‘එජා’ වුච්චති තණ්හා; යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙ'සා එජා තණ්හා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අනෙජො. එජාය පහීනත්තා අනෙජො. සො ලාභෙ'පි න ඉඤ්ජති, අලාභෙපි න ඉඤ්ජති යසෙපි න ඉඤ්ජති, අයසෙපි න ඉඤ්ජති, පසංසායපි න ඉඤ්ජති, නින්දායපි න ඉඤ්ජති, සුඛෙපි න ඉඤ්ජති, දුක්ඛෙපි න ඉඤ්ජති, න චලති, න වෙධති, නප්පවෙධති, න සම්පවෙධතීති - අනෙජො. **සබ්බධි සමොති** සබ්බං වුච්චති ද්වාදසායතනානි: චක්ඛු චෙව[3] රූපා ච -පෙ- මනො චෙව ධම්මා ච. යතො අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු ඡන්දරාගො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො ආයතිං අනුප්පාදධම්මා, සො වුච්චති සබ්බධි සමො. සො සබ්බත්ථ තාදී සබ්බත්ථ මජ්ඣත්තො සබ්බත්ථ උපෙක්ඛකොති - අනෙජො සබ්බධි සමො.

---

1. අනුද්ධරී - පු. 2. අගධිතො - සීමු II. මජසං. 3. චක්ඛුඤ්චෙව - සීමු.

## 15 – 18

ඒ කම්පා නො වනසුලු පුද්ගලයා පුළුවුස්නා ලද මම '(හේ) ඊෂ්‍යා නැත්තෙක, (රූපාදියෙහි) නො ගිජු වූයෙක, තෘෂ්ණා රහිතයෙක, සියලු තැන්හි සම පැවැතුම් ඇත්තෙක' යන (ඔහු කෙරෙහි) මේ සතර අනුසස කියමි.

**අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමො** –නෛෂ්ඨුර්‍ය්‍යය නම්වූ යත්: මෙහි කිසිවෙක් අන්‍යයාගේ ලාභ – සත්කාර – ගරු – බුහුමන් – වැඳුම් – පිදුම්හි ඊෂ්‍යා ඇත්තේ වෙයි, ඊෂ්‍යා කෙරෙයි, දොස් පහළ කෙරෙයි, ඊෂ්‍යාව බඳී. මෙබඳු වූ යම් නිෂ්ඨුර බවෙක් ඊෂ්‍යාවක් ඊෂ්‍යා–කාරයෙක් ඊෂ්‍යා කරන බවෙක්, අසූයාවක් (–දොස් පහළකිරීමක්) අසූයා–කාරයෙක් දොස් පහළ කරන බවෙක් වේ ද, මේ නෛෂ්ඨුර්‍ය්‍ය යි. යමක්හු විසින් තෙල නිෂ්ඨුරබව ප්‍රහීණ කරන ලද ද, සමුච්ඡින්න ද...ඥානාග්නින් දග්ධ ද, හේ 'අනිට්ඨුරී' යයි කියනු ලැබේ. **අනනුගිද්ධො** යනු: 'ගෙධ'යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක් අධික රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද, එය යි. යමක්හු විසින් තෙල ගෙධය දුරු කරන ලද ද නසන ලද ද...නුවණ ගින්නෙන් දවන ලද ද, හෙතෙම 'අනනුගිද්ධ' යයි කියනු ලැබේ, හෙතෙම රූපයෙහි නො ගිජු වූයේ ශබ්ද යෙහි...දෘෂ්ටශ්‍රැතමුතවිඥාතව්‍යධර්මයන්හි නො ගිජු වූයේ නො බැඳුණේ මුස–පත් නො වූයේ නො වැතුරුණේ පහවූ ගෙධ (–තෘෂ්ණා) ඇත්තේ පහවූ කිය තෘෂ්ණා ඇත්තේ හළ තෘෂ්ණා ඇත්තේ වමනය කළ තෘෂ්ණා ඇත්තේ මුදන ලද තෘෂ්ණා ඇත්තේ ප්‍රහීණ කළ තෘෂ්ණා ඇත්තේ දුරලූ තෘෂ්ණා ඇත්තේ වීතරාග වූයේ විගත රාග – ත්‍යක්තරාග– වාන්ත රාග – මුක්තරාග – ප්‍රහීණරාග වූයේ දුරැලූ රාග ඇත්තේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳිනසුලු වූයේ ශ්‍රේෂ්ඨ වූ සිතින් යුක්ත වැ වෙසේ නුයි 'අනිට්ඨුරී අනනුගිද්ධො' යනු වේ.

**අනෙජො සබ්බධි සමො** – 'එජා'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳින ලද්දී...නුවණ ගින්නෙන් දවන ලද්දී ද, හේ 'අනෙජ' යයි කියනු ලැබෙයි. එජාව ප්‍රහීණ වන බැවින් 'අනෙජ' යැ. හේ ලාභයෙහි දු නො සැලෙයි, අලාභයෙහි දු නො සැලෙයි, යශස්හි දු නො සැලෙයි, අයශස්හි දු නො සැලෙයි, ප්‍රශංසායෙහි දු නො සැලෙයි, නින්දායෙහි දු නො සැලෙයි, සුඛයෙහි දු නො සැලෙයි, දුඃඛයෙහි දු නො සැලෙයි; චඤ්චල නො වෙයි, නො වෙව්ලයි, වෙසෙසින් නො වෙව්ලයි, හාත්පසින් නො වෙව්ලා නුයි 'අනෙජ'යැ. **සබ්බධි සමො** යනු 'සබ්බධි'යි දොළොස් ආයතනය කියනු ලැබෙයි: ඇස ද රූපයෝ ද ..මනස ද ධර්මයෝ දැ'යි. යම් තැනෙක සිට ආධ්‍යාත්මික බාහ්‍යායතනයන්හි ඡන්දරාගය ප්‍රහීණ වූයේ ද උපුත් මුල් ඇත්තේ ද තාලවස්තුවක් මෙන් කරන ලද්දේ ද, අනුඅභාවය කරන ලද්දේ ද මතු නූපදනා සැහැවි ඇත්තේ ද, හෙතෙම 'සබ්බධි සම' යයි කියනු ලැබේ. හේ සියලු තැන තාදී යැ, සියලු තැන මධ්‍යස්ථ යැ සියලු තැන උපෙක්ෂා සහිත වූයේ නුයි 'අනෙජො සබ්බධි සමො' යනු වේ.

**තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පිනන්ති** – අවිකම්පිනං පුග්ගලං පුට්ඨො පුච්ඡිතො යාචිතො අජ්ඣෙසිතො පසාදිතො ඉමෙ චත්තාරො ආනිසංසෙ පබ්‍රූමි: සො අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමොති බ්‍රූමි ආචික්ඛාමි -පෙ- පකාසෙමීති – තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පිනං.

තෙනාහ භගවා:

"අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමො,
තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පින"න්ති.

**15 – 19**

අනෙජස්ස විජානතො නත්ථි කාචි නිසඞ්ඛිති,[1]
විරතො සො වියාරම්භා[2] ඛෙමං පස්සති සබ්බධි.

**අනෙජස්ස විජානතොති** – 'එජා' වුච්චති තණ්හා; යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං:[a] යස්සෙසා එජා තණ්හා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා; සො වුච්චති අනෙජො. එජාය පහීනත්තා අනෙජො. සො ලාභෙපි න ඉඤ්ජති. අලාභෙපි න ඉඤ්ජති. යසෙපි න ඉඤ්ජති, අයසෙපි න ඉඤ්ජති. පසංසායපි න ඉඤ්ජති. නින්දායපි න ඉඤ්ජති. සුඛෙපි න ඉඤ්ජති. දුක්ඛෙපි න ඉඤ්ජති. න චලති න වෙධති. න සම්පවෙධති. **අනෙජස්ස විජානතොති** – විජානතො පටිවිජානතො පටිවිජ්ඣතො, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති ජානතො ආජානතො විජානතො පටිවිජානතො පටිවිජ්ඣතොති – අනෙජස්ස විජානතො.

**නත්ථි කාචි නිසංඛිතීති** – 'නිසංඛිතියො' වුච්චන්ති පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො; යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා නිසංඛිතියො නත්ථි, න සන්ති, න සංවිජ්ජන්ති, නුපලබ්භන්ති; පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – නත්ථි කාචි නිසංඛිතී.

1. විසංඛිති - සං. නිසංඛති - මජසං. 2. විරියාරම්භා - මජසං.
a. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ, ඛුද්දකවත්ථුවිභඞ්ග.

**තමාහිසංසං පබ්‍රෑමි පුච්ඡිතො අවිකම්පිතං** – කම්පා නො වනසුලු පුද්ගලයා පුළුවුස්නා ලදුයෙම් විචාරනු ලදුයෙම් අයදනු ලදුයෙම් අධ්‍යෙෂිත වූයෙම් පහදවනු ලදුයෙම් මේ සතර අනුසසුන් කියමි: හෙතෙම ඊර්ෂ්‍යා නැත්තේ යැ, ගිජු නො වූයේ යැ, තෘෂ්ණා රහිත යැ, සියලු තන්හි සමයැයි කියමි, පවසමි...ප්‍රකාශ කෙරෙමි නුයි 'තමාහිසංසං පබ්‍රෑමි පුච්ඡිතො අවිකම්පිතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අනිට්ඨුරී අනනුගිද්ධො -පෙ- පුච්ඡිතො අවිකම්පිතං"යි.**

## 15 – 19

තෘෂ්ණා රහිත වූ (සංස්කාරයන් දුඃඛාදි වශයෙන්) දතුවහුට (පුණ්‍යාභිසංස්කාරාදි) කිසි සංස්කාරයක් නැත. හෙතෙම සංස්කාරයෙන් වෙන් වූයේ සියලු තැන්හි ක්ෂෙමය (-අභය) දක්නේ යි.

**අනෙජස්ස විජානතො** – 'එජා'යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් බලවත් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. යමක්හු විසින් තෙල එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සමුච්ඡින්න වූවා...ඥානාග්නියෙන් දවන ලද්දී ද; හෙතෙම 'අනෙජ'යි කියනු ලැබෙයි, එජාව ප්‍රහීණ වන බැවින් 'අනෙජ' යැ. හෙතෙම ලාභයෙහි දු කම්පා නො වෙයි. අලාභයෙහි දු කම්පා නො වෙයි, යශස්හි දු කම්පා නො වෙයි, අයශස්හි දු කම්පා නො වෙයි, ප්‍රශංසායෙහි දු කම්පා නො වෙයි, නින්දායෙහි දු කම්පා නො වෙයි, සුඛයෙහි දු කම්පා නො වෙයි, දුඃඛයෙහි දු කම්පා නො වෙයි. නො සැලෙයි, නො වෙවුලයි, අතිශයින් නො වෙවුලයි. **අනෙජස්ස විජානතො** – දතුවහුට වෙසෙසින් දතුවහුට ප්‍රතිවෙධ කරන්නහුට; 'සියලු සංස්කාරයෝ දුක් වූහ'යි...යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නැසෙනසුලු යැ'යි දන්නහුට හාත්පසින් දන්නහුට වෙසෙසින් දන්නහුට ප්‍රකර්ෂයෙන් දන්නහුට ප්‍රතිවෙධ කරන්නහුට නුයි 'අනෙජස්ස විජානතො' යනු වේ.

**නත්ථි කාචි නිසංඛිති** –'නිසංඛිති' යැයි පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද කියනු ලැබෙති. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වූවාහු උදුරන ලද මුල් ඇත්තාහු තාලාවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, එමෙතකින් 'නිසංඛිතීහු' නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත්, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි 'නත්ථි කාචි නිසංඛිති' යනු වේ.

**විරතො සො වියාරම්භාති** - 'වියාරම්භො' වුච්චති පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො; යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා; එත්තාවතා ආරම්භා වියාරම්භා ආරකතො අස්ස. විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති- විරතො සො වියාරම්භා.

**ඛෙමං පස්සති සබ්බධීති** - රාගො භයකරො, දොසො භයකරො, මොහො භයකරො -පෙ- භයකරා කිලෙසා, භයකරස්ස රාගස්ස පහීනත්තා -පෙ- භයකරානං කිලෙසානං පහීනත්තා සබ්බත්ථ ඛෙමං පස්සති, සබ්බත්ථ අභයං පස්සති, සබ්බත්ථ අනීතිකං පස්සති, සබ්බත්ථ අනුපද්දවං පස්සති, සබ්බත්ථ අනුපස්සග්ගං[1] පස්සතීති - ඛෙමං පස්සති සබ්බධි.

තෙනාහ භගවා:

> "අනෙජස්ස විජානතො නත්ථි කාචි නිසඞ්ඛිති,
> විරතො සො වියාරම්භා ඛෙමං පස්සති සබ්බධී"ති.

**15 - 20**

> න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ[2] මුනි,
> සන්තො සො වීතමච්ඡරො නාදෙති න නිරස්සතී'ති (භගවා).

**න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනීති** - 'මොනං' වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනීති. මුනි සෙය්‍යොහමස්මීති වා, සදිසොහමස්මීති වා, හීනොහමස්මීති වා න වදති, න කථෙති, න භණති, න දීපයති, න වොහරතීති - න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි.

**සන්තො සො වීතමච්ඡරොති** - 'සන්තො'ති රාගස්ස සන්තත්තා සමිතත්තා සන්තො, දොසස්ස - මොහස්ස - පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති - සන්තො සො; **වීතමච්ඡරොති** පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං -පෙ- ගාහො, ඉදං වුච්චති මච්ඡරියං; යස්සෙතං මච්ඡරියං පහීනං සමුච්ඡින්නං -පෙ- ඤාණග්ගිනා දඩ්ඪං; සො වුච්චති වීතමච්ඡරො විගතමච්ඡරො චත්තමච්ඡරො වන්තමච්ඡරො මුත්තමච්ඡරො පහීනමච්ඡරො පටිනිස්සට්ඨමච්ඡරොති - සන්තො සො වීතමච්ඡරො.

---

1. මනුපුස්සගො - සං.  2 වදන - සිමු. II.

**විරතො සො වියාරම්භා** – 'වියාරම්භ' යි පුණ්‍යාභිසංස්කාරය අපුණ්‍යාභිසංස්කාරය ආනෙඤ්ජාභිසංස්කාරය කියනු ලැබෙයි. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වූවාහු උපුටා හළ මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, එ තැන් සිට (පුණ්‍යාභිසංස්කාරාදි) ආරම්භයෙන් විවිධාරම්භයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ. වෙන් වැ ගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ වන්නේ ය, විගතමර්යාදා කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'විරතො සො වියාරම්භා' යනු වේ.

**ඛෙමං පස්සති සබ්බධි** – රාගය බියකරු යැ ද්වේෂය බියකරු යැ මෝහය බියකරු යැ...ක්ලේශයෝ බියකරුහු යැ, බියකරු රාගය ප්‍රහීණ කළ බැවින් සියලු තැන්හි ක්ෂේමය දකී, සියලු තැන්හි අභය දකී, සියලු තැන්හි පීඩා රහිත බව දකී, සියලු තැන්හි අනුපද්‍රවය දකී, සියලු තැන්හි නො ගැටුණු බව දකී නුයි 'ඛෙමං පස්සති සබ්බධි' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**"අනෙජස්ස විජානතො -පෙ- ඛෙමං පස්සති සබ්බධි"** යි

## 15 – 20

ක්ෂීණාස්‍රව මුනි තෙම (මාන විසින් තමා) සම වූවන් කෙරෙහි ලා නො කියයි, හීනයන් කෙරෙහි ලා නො කියයි, ශ්‍රේෂ්ඨයන් කෙරෙහි ලා නො කියයි. සන්හුන් කෙලෙස් ඇති පහවැගිය මාත්සර්‍ය්‍ය ඇති හෙතෙම (රූපාදි කිසි ධර්මයක්) නො ගනී, (එහෙයින් ම) නො බැහැර කෙරෙයි. බුදුහු මෙසේ වදාළ සේක.

**න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි** – 'මෝන' යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රකර්ෂජානනයක්...සබ්ගජාලය ඉක්මවා සිටි හෙතෙම 'මුනි' වේ යයි. මුනි තෙම 'මම ශ්‍රේෂ්ඨ වෙමි' හෝ 'මම සදෘශයෙමි' හෝ 'මම හීනයෙමි' හෝ නො පවසයි, නො කියයි, නො බණයි, නො දක්වයි, ව්‍යවහාර නො කෙරේ නුයි 'න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි' යනු වේ.

**සන්තො සො වීතමච්ඡරො** – 'සන්තො' යනු: රාගය ශාන්ත හෙයින් ශමිත හෙයින් 'ශාන්ත යැ, ද්වේෂය - මෝහය...සියලු අකුශලාභිසංස්කාරයන් ශාන්ත වන බැවින් ශමිත වන බැවින් ව්‍යුපශමිත වන බැවින් දවන ලද බැවින් නිවුණු බැවින් විගත වන බැවින් දුරලන ලද බැවින් ශාන්ත යැ උපශාන්ත යැ ව්‍යුපශාන්ත යැ නිවුණේ යැ දුරලූ කෙලෙස් ඇත්තේ නුයි 'සන්තො සො' යනු වේ. **වීතමච්ඡරො** – මාත්සර්‍ය්‍ය පසෙකි: ආවාසමාත්සර්‍ය්‍ය යැ...ග්‍රාහ යැ; මේ මාත්සර්‍ය්‍ය යැයි කියනු ලැබේ. යමක්හු විසින් මෙල මාත්සර්‍ය්‍යය ප්‍රහීණ කරන ලද ද, හෙතෙම වීතමාත්සර්‍ය්‍ය යැ, විගතමාත්සර්‍ය්‍ය යැ, ත්‍යක්තමාත්සර්‍ය්‍ය යැ, වාන්තමාත්සර්‍ය්‍ය යැ, මුක්තමාත්සර්‍ය්‍ය යැ, ප්‍රහීණ කළ මාත්සර්‍ය්‍ය ඇත්තේ යැ, දුරලූ මාත්සර්‍ය්‍ය ඇත්තේ යැයි කියනු ලැබේ නුයි 'සන්තො සො වීතමච්ඡරො' යනු වේ.

**නාදෙති න නිරස්සතීති භගවාති** – ‘නාදෙතී’ති රූපං නාදියති, න උපාදියති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසති. වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං – ගතිං – උපපත්තිං පටිසන්ධිං – භවං – සංසාරං – වට්ටං නාදියති, න උපාදියති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති – නාදෙති; **න නිරස්සතීති** රූපං න පජහති, න විනොදෙති, න බ්‍යන්තීකරොති, න අනභාවං ගමෙති, වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං – ගතිං – උපපත්තිං – පටිසන්ධිං – භවං – සංසාරං – වට්ටං න පජහති, න විනොදෙති න බ්‍යන්තීකරොති, න අනභාවං ගමෙති; **භගවාති** ගාරවාධිවචනං – පෙ – සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති – නාදෙති න නිරස්සතීති භගවා’ති.

තෙනාහ භගවා:

“න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි,
සන්තො සො වීතමච්ඡරො නාදෙති න නිරස්සතී’ති භගවා”ති.

**අත්තදණ්ඩසුත්තනිද්දෙසො සමත්තො පණ්ණරසමො.**

# 16

# සාරිපුත්තසුත්තනිද්දෙසො

අථ සාරිපුත්තසුත්තනිද්දෙසො වුච්චති:

## 16 – 1

**න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ**
**(ඉච්චායස්මා සාරිපුත්තො)**
**න සුතො උද කස්සචි,**
**එවං වග්ගුවදො සත්ථා**
**තුසිතා ගණිමාගතො.**

**න මෙ දිට්ඨො ඉතො පුබ්බෙති** ඉතො පුබ්බෙ මෙ මයා න දිට්ඨපුබ්බො සො භගවා ඉමිනා චක්ඛුනා ඉමිනා අත්තභාවෙන; යදා භගවා තාවතිංසභවනෙ පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං වස්සං වුත්ථො දෙවගණපරිවුතො මජ්ඣෙ මණිමයෙන සොපානෙන සඞ්කස්සනගරං ඔතිණ්ණො, ඉමං දස්සනං පුබ්බෙ න දිට්ඨොති ‘න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ’.

**ඉච්චායස්මා සාරිපුත්තොති** – ‘ඉච්චා’ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං ‘ඉච්චා’ති. **ආයස්මාති** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සවචනමෙතං ‘ආයස්මා’ති. **සාරිපුත්තොති** තස්ස ථෙරස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො – ඉච්චායස්මා සාරිපුත්තො.

**නාදෙති න නිරස්සතීති භගවා** - 'නාදෙති' යනු: රූපය නො ගනී, දුඃඛ නො ගනී, ග්‍රහණය නො කෙරෙයි, පරාමර්ශනය නො කෙරෙයි, අභිනිවේශය නො කෙරෙයි; වේදනාව - සංඥාව - සංස්කාරයන් - විඥානය - ගතිය - උත්පත්තිය - ප්‍රතිසන්ධිය - භවය - සංසාරය - වෘත්තය ආදානය නො කෙරෙයි, උපාදාන - ග්‍රහණ - පරාමර්ශ - අභිනිවේශ නො කෙරේ නුසි 'නාදෙති' යනු වේ. **න නිරස්සති** යනු: රූපය නො දුරු කෙරෙයි, නො බැහැර කෙරෙයි, විගතාන්ත නො කෙරෙයි, අනභාවයට නො පමුණුවයි; වේදනාව - සංඥාව - සංස්කාරයන් - විඥානය - ගතිය - උත්පත්තිය ප්‍රතිසන්ධිය -භවය -සංසාරය - වෘත්තය නො හැරපියයි, නො බැහැර කෙරෙයි, විගතාන්ත නො කෙරෙයි, අනභාවයට නො පමුණුවයි; භගවා යනු: ගෞරවාධි වචන යැ... මේ 'භගවා' යනු අභීත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකැ'යි 'නාදෙති න නිරස්සතීති භගවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"න සමෙසු න ඔමෙසු -පෙ- නාදෙති න නිරස්සතීති භගවා"යි.**

**පසළොස්වැනි 'අත්තදණ්ඩ'සූත්‍ර නිර්දේශය සමාප්ත යි.**

# 16

# සාරිපුත්තසූත්‍රනිර්දේශය

ඉක්බිති සාරිපුත්තසූත්‍රනිර්දේශය කියනු ලැබේ.

## 16 - 1

(ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ මෙසේ වදාළහ:) මෙසේ මිහිරි වදන් ඇති තුෂිත දෙව්ලොවින් සැළ මවුකුසට පැමිණි, නොහොත් දෙව්ලොවින් ගණ මැදට පැමිණි, හෝ රහත්ගණයා මැදට පැමිණි, නොහොත් රහතුන්ගේ ගණාචාර්ය බවට පැමිණි ශාස්තෘහු මෙයින් පෙර මා විසින් නො දක්නා ලදහු වෙති (පෙර මේ දර්ශනය නො වී යැයි සේ යැ.) නොහොත් කිසිවකුගේ බසින් නො අසන ලදහු වෙත්.

**න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ** - මෙයින් (මේ සංකාශ්‍ය නගරයට බැසීමෙන්) පෙර මෙ - මා විසින් ඒ බුදුහු මේ ඇසින් මේ අත්බවින් නො දුටුවිරූහ. යම් දවසෙක බුදුහු තව්තිසාවෙහි පරසතුමුල පඬුඇඹුල් සලෙයෙහි වස් විසූ සේක් දෙව්ගණා විසින් පිරිවරන ලද්දහු මැද මිණිමුවා හිණින් සංකස්පුරට බටුවාහු ද, මේ දර්ශනය හිස පෙර නො දුටුවිරූහු නුසි 'න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ' යනු වේ.

**ඉච්චායස්මා සාරිපුත්තො** - 'ඉච්ච' යනු: පදසන්ධි යැ, පදසංසර්ග යැ, පදපරිපූර්ණතා යැ, අක්ෂරසමවාය යැ, ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ, පදානුපූර්වතා යැ, මෙල 'ඉච්ච' යනු. **ආයස්මා** යනු: ප්‍රියවචන යැ, ගරුවචන යැ, සගෞරව සප්‍රතිශ්‍රයවචනයෙකි, මෙල 'ආයස්මා' යනු. **සාරිපුත්තො** යනු: ඒ තෙරණුවන්ගේ නම යැ, සඞ්ඛ්‍යා යැ, සංඥා යැ, ප්‍රඥප්ති යැ, ව්‍යවහාර යැ, නාම යැ, නාමකර්ම යැ, නාමධෙය යැ, නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ, අභිලාප නුසි 'ඉච්චායස්මා සාරිපුත්තො' යනු වේ.

න සුතො උද කස්සචීති – ‘නා’ති පටික්ඛෙපො; උදාති පදසන්ධි පද-සංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා-මෙතං උදාති; කස්සචීති කස්සචි ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වාති-න සුතො උද කස්සචි.

එවං වග්ගුවදො සත්ථාති – එවං වග්ගුවදො මධුරවදො පෙමනීයවදො හදයඞ්ගමවදො කරවීකරුතමඤ්ජුස්සරො.[1] අට්ඨඞ්ගසමන්නාගතො ඛො පන තස්ස භගවතො මුඛතො ඝොසො නිච්ඡරති: විස්සට්ඨො ච විඤ්ඤෙය්‍යො ච මඤ්ජු ච සවනීයො ච බින්දු ච අවිසාරී ච ගම්භීරො ච නින්නාදී ච යථාපරිසං ඛො පන සො භගවා සරෙන විඤ්ඤාපෙති. න අස්ස බහිද්ධා පරිසාය ඝොසො නිච්ඡරති. බ්‍රහ්මස්සරො ඛො පන සො භගවා කරවීකභාණීති-එවං වග්ගුවදො. සත්ථාති සත්ථා භගවා සත්ථවාහො; යථා සත්ථවාහො සත්තෙ කන්තාරං තාරෙති, දුබ්භික්ඛකන්තාරං තාරෙති, නිරුදකකන්තාරං තාරෙති, උත්තාරෙති, නිත්තාරෙති, පතාරෙති, ඛෙමන්තභූමිං සම්පාපෙති, එවමෙවං භගවා සත්ථවාහො සත්තෙ කන්තාරං තාරෙති; ජාතිකන්තාරං තාරෙති, ජරාකන්තාරං තාරෙති, බ්‍යාධි -පෙ- මරණ – සොක – පරිදෙව-දුක්ඛ – දොමනස්සුපායාසකන්තාරං තාරෙති, රාගකන්තාරං තාරෙති, දොස-මොහ – මාන – දිට්ඨි – කිලෙස – දුච්චරිතකන්තාරං තාරෙති, රාග-ගහනං තාරෙති, දොස – මොහ – මාන – දිට්ඨිගහනං – කිලෙසගහනං-දුච්චරිතගහනං තාරෙති, උත්තාරෙති, නිත්තාරෙති, පතාරෙති; ඛෙමන්තං අමතං නිබ්බානං සම්පාපෙතීති එවම්පි භගවා සත්ථවාහො. අථවා භගවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතාති එවම්පි භගවා සත්ථවාහො. අථවා භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො; මග්ගානුගා ච පන[2] එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතාති එවම්පි භගවා සත්ථවාහොති – එවං වග්ගු-වදො සත්ථා.

1. මඤ්ජුස්සරො - සං. 2. පන - සිමු II

**න සුතො උද කස්සචි** - 'න' යනු: ප්‍රතික්ෂෙප යැ; **උද** යනු: පදසන්ධි යැ, පදසංසග්ගී යැ, පදපාරිපූරි යැ, අක්ඛරසමවාය යැ, ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ, පදානුපූර්විතා යැ, තෙල 'උද' යනු; **කස්සචි** - කිසිවක්හුගේ (බසින්) ක්ෂත්‍රියයකුගේ හෝ බ්‍රාහ්මණයකුගේ හෝ වෛශ්‍යයකුගේ හෝ ශූද්‍රයකුගේ හෝ ගෘහස්ථයකුගේ හෝ ප්‍රව්‍රජිතයකුගේ හෝ දෙවියකුගේ හෝ මනුෂ්‍යයකුගේ හෝ නුසි 'න සුතො උද කස්සචි' යනු වේ.

**එවං වග්ගුවදො සත්ථා** - මෙසේ මනහර වදන් ඇති මිහිරි වදන් ඇති පෙම් වඩන වදන් ඇති සිත් ගන්නා වදන් ඇති කුරවිකද සෙයින් මනහර ඝොෂ ඇතියේ; ඒ බුදුන්ගේ මුවින් අෂ්ටාඞ්ගසමන්නාගත වූ ඝොෂය නික්මෙයි: නො පැකිළෙනුයේ ද, මැනවින් දත හැක්කේ ද, මධුර වූයේ ද, කනට සුව වූයේ ද, හැපුණේ ද, නො පැතුරුණේ ද, ගැඹුරු වූයේ ද, නිනද ඇත්තේ ද වේ. තවද ඒ බුදුහු පිරිස් පමණින් ස්වරයෙන් හඟවාලන සේක. ඒ බුදුන්ගේ ඝොෂය පිරිසෙන් බැහැර නො නික්මේ. තවද ඒ බුදුහු බ්‍රහ්මඝොෂ ඇත්තාහු කුරවිකොවුල්හඬ මෙන් මිහිරි වදන් ඇති සේක් නුසි 'එවං වග්ගුවදො' යනු වේ. **සත්ථා** යනු: බුදුහු ශාස්තෘ වූහ, සාත්ථවාහයකු වැන්නහ. යම්සේ සාත්ථවාහක සත්ත්වයන් කාන්තාරය තරණය කරවා ද, දුර්භික්ෂකාන්තාරය තරණය කරවා ද, නිරුදකකාන්තාරය තරණය කරවා ද, එතෙර කරවා ද, නිස්තරණය කරවා ද, ප්‍රතරණය කරවා ද, නිර්භය භූමියට පමුණුවා ද; එලෙසින් මැ බුදුහු සාත්ථවාහ වූ සේක් වෛනෙයසත්ත්වයන් කතරින් තරවන සේක්, ජාතිකාන්තාරය තරණය කරවන සේක, ජරාකාන්තාරය තරණය කරවන සේක, ව්‍යාධිකාන්තාරය... මරණ - ශොක - පරිදෙව - දුඃඛ - දෞර්මනස්‍ය - උපායාස කාන්තාරය තරවන සේක, රාගකාන්තාරය තරවන සේක, ද්වෙෂ-මොහ-මාන-දෘෂ්ටි - ක්ලෙශ - දුශ්චරිතකාන්තාරය තරවන සේක, රාග නමැති ගහනය තරවන සේක, ද්වෙෂ - මොහ - මාන - දෘෂ්ටි නමැති ගහනය තරවන සේක, ක්ලෙශගහනය දුශ්චරිතගහනය තරවන සේක, උත්තරණය නිස්තරණය ප්‍රතරණය කරවන සේක, නිර්භය වූ අමාමහනිවනට පමුණුවන සේක් නුසි මෙසේත් 'බුදුහු සාත්ථවාහ' යැ. නොහොත් බුදුහු (නිවනට පමුණුවනුයෙන්) නෙතෘ වන සේක, (දර්ශනකාලයෙහි සංවර - ප්‍රහාණ විනය වශයෙන් වෛනෙයයනට) විනෙතෘ වන සේක, (දෙශනාකාලයෙහි සැක සිඳින හෙයින්) අනුනෙතෘ වන සේක, (සැක සිඳ අර්ථය) පනවන සේක, (පැනවූ අර්ථයන්) නිශ්චය කරවන සේක, (පිළිවෙත්) දක්වන සේක, (ප්‍රතිපත්තිඵලයෙන්) පහදවන සේක් නුසි මෙසේත් බුදුහු 'සාත්ථවාහ' යැ. නොහොත් බුදුහු (පෙර ස්වසන්තානයෙහි) නූපන්විරූ ආර්‍යමාර්ගය ඉපදවූ සේක, (වෛනෙයසන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය උපදවන සේක, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණ දීම වශයෙන්) ප්‍රකාශ කරන සේක, (ප්‍රත්‍යවෙක්ෂා වශයෙන්) මාර්ගය දන්නා සේක, (වෛනෙයසන්තානයෙහි ඉපැදවියයුතු ආර්‍යමාර්ගය) දන්නාසුළු සේක, (බෝසත්නට පැවැසිය යුතු) මාර්ගයෙහි විචක්ෂණ වූ සේක. තවද ඒ බුදුන් විසින් හෙළිකළ මාර්ගය හේතු කොට මේ කල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදිගුණයෙන්) පසුපස යෙමින් වෙසෙත් නුසි මෙසේත් බුදුහු 'සාත්ථවාහ' වූහ'යි 'එවං වග්ගුවදො සත්ථා' යනු වේ.

**තුසිතා ගණිමාගතොති** - භගවා තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කන්තොති එවම්පි තුසිතා ගණිමාගතො; අථවා දෙවා වුච්චන්ති තුසිතා; තෙ තුට්ඨා සන්තුට්ඨා අත්තමනා පමුදිතා පීති-සොමනස්සජාතා; දෙවලොකතො ගණිං ආගතොති එවම්පි තුසිතා ගණිමා-ගතො; අථ වා අරහන්තො වුච්චන්ති තුසිතා. තෙ තුට්ඨා සන්තුට්ඨා අත්තමනා පරිපුණ්ණසඞ්කප්පා. අරහන්තානං ගණිං ආගතොති එවම්පි තුසිතා ගණිමාගතො; 'ගණී'ති ගණී භගවා; ගණාචරියොති ගණී; ගණස්ස සත්ථාති ගණී; ගණං පරිහරතීති ගණී; ගණං ඔවදතීති ගණී; ගණ-මනුසාසතීති ගණී; විසාරදො ගණං උපසඞ්කමතීති ගණී; ගණොස්ස[1] සුස්සූසති සොතං ඔදහති අඤ්ඤා චිත්තං උපට්ඨපෙතීති ගණී; ගණං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතීති ගණී; භික්ඛුගණස්ස ගණී, භික්ඛුනීගණස්ස ගණී, උපාසකගණස්ස ගණී, උපාසිකාගණස්ස ගණී, රාජගණස්ස ගණී, ඛත්තියගණස්ස - බ්‍රාහ්මණගණස්ස - වෙස්සගණස්ස-සුද්දගණස්ස - දෙවගණස්ස -බ්‍රහ්මගණස්ස[2] ගණී, සඞ්ඝී, ගණී, ගණාචරියො; **ආගතොති** ආගතො උපාගතො සමුපාගතො සම්පත්තො[3] සඞ්කස්ස-නගරන්ති - තුසිතා ගණිමාගතො.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ
(ඉච්චායස්මා සාරිපුත්තො)
න සුතො උද කස්සචි,
එවං වග්ගුවදො සත්ථා
තුසිතා ගණිමාගතො"ති.

## 16 - 2

සදෙවකස්ස ලොකස්ස
යථා දිස්සති චක්ඛුමා,
සබ්බං තමං විනොදෙත්වා
එකොව රතිමජ්ඣගා.

**සදෙවකස්ස ලොකස්සාති** - සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සායාති - සදෙවකස්ස ලොකස්ස.

**යථා දිස්සති චක්ඛුමාති** - යථා භගවන්තං තාවතිංසභවනෙ පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං නිසින්නං ධම්මං දෙසෙන්තං දෙවතා පස්සන්ති; තථා මනුස්සා පස්සන්ති; යථා මනුස්සා පස්සන්ති, තථා දෙවතා පස්සන්ති; යථා දෙවානං දිස්සති, තථා මනුස්සානං දිස්සති; යථා මනුස්සානං දිස්සති, තථා දෙවානං දිස්සතීති එවම්පි යථා දිස්සති චක්ඛුමා. යථා වා පනෙ'කෙ භොන්තො සමණබ්‍රාහ්මණා අදන්තා දන්තවණ්ණෙන දිස්සන්ති, අසන්තා සන්තවණ්ණෙන දිස්සන්ති, අනුපසන්තා උපසන්තවණ්ණෙන දිස්සන්ති, අනිබ්බුතා නිබ්බුතවණ්ණෙන දිස්සන්ති.

---

1. ගණස්ස - ස. 2. බ්‍රාහ්මණගණස්ස - සිමු. II. 3. සමුපපන්නො සිමු. මජසං.

**තුසිතා ගණිමාගතො** - බුදුහු තුසිපුරයෙන් සැවැ සිහි නුවණ ඇති වැ මවුකුස පිළිසඳ ගත්තාහු නුයි මෙසේත් ‘තුසිතා ගණිමාගතො’ යනු වේ. නොහොත් දෙවියෝ තුසිතයෝ යැයි කියනු ලැබෙති, ඔවුහු තුටු වූවාහු සතුටු වූවාහු සියමන වූවාහු ප්‍රමුදිත වූවාහු උපන් සතුටු සොම්නස් ඇත්තාහු ය; එ දෙව්ලොවින් ගණ මැදට ආවාහු නුයි. මෙසේත් ‘තුසිතා ගණිමාගතො’ යනු වේ. නොහොත් රහත්හු තුසිතයෝ යැයි කියනු ලැබෙති, ඔවුහු තුෂ්ටයෝ යැ, සන්තුෂ්ටයෝ යැ, තුටුසිත් ඇත්තෝ යැ, පරිපූර්ණ සංකල්ප ඇත්තෝ සි; රහතුන්ගේ ගණමැදට ආවාහු නුයි මෙසේත් ‘තුසිතා ගණිමාගතො’ යනු වේ. **ගණී** යනු: බුදුහු ගණී වූහ, ගණාචාර්‍ය්‍ය නුයි-ගණී ය, ගණයට ශාස්තෘ වූවාහු නුයි - ගණී යැ, ගණයා පරිහරණය කෙරෙත් නුයි - ගණී යැ, ගණයාට අවවාද දෙත් නුයි - ගණී යැ, ගණයාට අනුශාසනා කෙරෙත් නුයි - ගණී යැ, විශාරද වැ ගණයා වෙත එළැඹෙත් නුයි- ගණී යැ, ගණ තෙමේ ඔබගේ බස අසනු කැමැති වෙයි, (ඇසීමට) කන තබයි, දැනැගැනීමට සිත එළවා නුයි - ගණී යැ; ගණයා අකුශලයෙන් නඟා කුශලයෙහි පිහිටිවාලන සේක් නුයි - ගණී යැ, භික්‍ෂුගණයා සම්බන්ධ ගණ ඇති සේක, (-භික්‍ෂුගණයට ගණී යැ) භික්‍ෂුණීගණයට ගණී යැ, උපාසක ගණයට ගණී යැ, උපාසිකාගණයට ගණී යැ, රාජගණයට ගණී යැ, ක්‍ෂත්‍රියගණයට - බ්‍රාහ්මණගණයට - වෛශ්‍යගණයට - ශූද්‍රගණයට - දෙව ගණයට - බ්‍රහ්මගණයට ගණී යැ; සමූහ ඇති සේක, ගණ ඇති සේක, ගණාචාර්‍ය්‍ය වූ සේකි; **ආගතො** යනු: සකස් නුවරට එළැඹියහ, පැමිණි සේක් නුයි ‘තුසිතා ගණිමාගතො’ යනු වේ.

එයින් වදාළහ ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ:

“**න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ** -පෙ- **තුසිතා ගණිමාගතො**”යි.

**16 - 2**

පසැස් ඇති බුදුහු සදෙවක ලොකයාට යම්සේ පැනෙන සේක් නම්, (මිනිසුන්ට ද එසේ පැනෙති) නොහොත් සදෙවක ලොකයාට අවිපරීත වැ පැනෙන සේක. එකලා වූවාහු මැ (රාගාදි) සියලු අඳුරු දුරු කොට (නෛෂ්ක්‍රම්‍යාදි)රතියට පැමිණි සේකි.

**සදෙවකස්ස ලොකස්ස** - දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොවට මහණබමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජාවට නුයි ‘සදෙවකස්ස ලොකස්ස’ යනු වේ.

**යථා දිස්සති චක්ඛුමා** - තව්තිසාබවනෙහි පරසතුමුල පඬුඇඹුල් සලයෙහි වැඩහිඳ දහම් දෙසන බුදුන් දෙවියෝ යම්සේ දකිත් නම් එසෙයින් මිනිස්සු දකිති; මිනිස්සු යම්සේ දකිත් නම්, දෙවියෝ එසේ දකිත්; යම්සේ දෙවියනට පැනෙන සේක් නම්, එසේ මිනිස්නට පැනෙන සේක. යම්සේ මිනිසුන්ට පැනෙන සේක් නම්, එසෙයින් දෙවියනට පැනෙන සේක් නුයි මෙසේත් ‘යථා දිස්සති චක්ඛුමා’ යනු වේ. තවද යම්සේ ඇතැම් මහණබමුණු කෙනෙක් නො දැමුණාහු දැමුණු ලෙසින් දක්නා ලැබෙත් ද, නො සන්හිඳුණාහු සන්හුන් ලෙසින් දක්නා ලැබෙත් ද, අනුපශාන්ත වූවාහු උපශාන්ත ලෙසින් දක්නා ලැබෙත් ද, නො නිවුණාහු නිවුණු ලෙසින් දක්නා ලැබෙත් ද,

1. "පතිරූපකො මත්තිකාකුණ්ඩලොව
ලොහඩ්ඪමාසොව සුවණ්ණඡන්නා,
චරන්ති ලොකෙ පරිවාරඡන්නා
අන්තො අසුද්ධා බහි සොභමානා"ති[a].

න භගවා එවං දිස්සති. භගවා භූතෙන තච්ඡෙන තථෙන යාථාවෙන අවිපරීතෙන සභාවෙන දන්තො දන්තවණ්ණෙන දිස්සති, සන්තො සන්තවණ්ණෙන දිස්සති, උපසන්තො උපසන්තවණ්ණෙන දිස්සති, නිබ්බුතො නිබ්බුතවණ්ණෙන දිස්සති; අකප්පිතඉරියාපථා ච බුද්ධා භගවන්තො පණිධිසම්පන්නාති එවම්පි - යථා දිස්සති චක්ඛුමා. අථවා භගවා විසුද්ධසද්දො ගතකිත්තිසද්දසිලොකො නාගභවනෙ ච සුපණ්ණභවනෙ ච යක්ඛභවනෙ ච අසුරභවනෙ ච ගන්ධබ්බභවනෙ ච මහාරාජභවනෙ ච ඉන්දභවනෙ ච බ්‍රහ්මභවනෙ ච දෙවභවනෙ ච එදිසො ච තාදිසො ච තතො ච භිය්‍යොති එවම්පි - යථා දිස්සති චක්ඛුමා. අථවා භගවා දසහි බලෙහි සමන්නාගතො චතූහි වෙසාරජ්ජෙහි චතූහි පටිසම්භිදාහි ඡහි අභිඤ්ඤාහි ඡහි බුද්ධධම්මෙහි තෙජෙන ච බලෙන ච ගුණෙන ච විරියෙන ච පඤ්ඤාය ච දිස්සති ඤායති පඤ්ඤායති.

2. "දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තොව පබ්බතො,
අසන්තෙත්ථ න දිස්සන්ති රත්ති ඛිත්තා යථා සරා"ති[b]

එවම්පි යථා දිස්සති චක්ඛුමා. චක්ඛුමාති භගවා පඤ්චහි චක්ඛූහි චක්ඛුමා: මංසචක්ඛුනාපි චක්ඛුමා, දිබ්බචක්ඛුනාපි චක්ඛුමා, පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා, බුද්ධචක්ඛුනාපි චක්ඛුමා, සමන්තචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා මංසචක්ඛුනාපි චක්ඛුමා? මංසචක්ඛුම්හි භගවතො පඤ්ච වණ්ණා සංවිජ්ජන්ති: නීලො ච වණ්ණො පීතකො ච වණ්ණො ලොහිතකො ච වණ්ණො කණ්හො ච වණ්ණො ඔදාතො ච වණ්ණො. අක්ඛිලොමානි ච භගවතො - යත්ථ ච අක්ඛිලොමානි පතිට්ඨිතානි තං නීලං හොති සුනීලං පාසාදිකං දස්සනෙය්‍යං උම්මාපුප්ඵසමානං. තස්ස පරතො පීතකං හොති සුපීතකං සුවණ්ණවණ්ණං පාසාදිකං දස්සනෙය්‍යං කණිකාරපුප්ඵසමානං. උභතො අක්ඛිකූටානි භගවතො ලොහිතකානි හොන්ති සුලොහිතකානි, පාසාදිකානි දස්සනෙය්‍යානි ඉන්දගොපකසමානානි. මජ්ඣෙ කණ්හං හොති සුකණ්හං අලූඛං සිනිද්ධං[1] පාසාදිකං දස්සනෙය්‍යං අද්දාරිට්ඨකසමානං.[2] තස්ස පරතො ඔදාතං හොති සුඔදාතං සෙතං පණ්ඩරං පාසාදිකං දස්සනෙය්‍යං ඔසධිතාරකාසමානං. තෙන භගවා පාකතිකෙන මංසචක්ඛුනා අත්තභාවපරියාපන්නෙන පුරිමසුචරිතකම්මාභිනිබ්බත්තෙන සමන්තා යොජනං පස්සති දිවා චෙව රත්තිඤ්ච.

---

a. කොසලසංයුත්ත - දුතියවග්ග. b. ධම්මපද - පකිණ්ණකවග්ග.

1. සුද්ධං - මජසං. සීමු. II. 2. අද්දාරිට්ඨකසමානං - ස.

1. "සුවර්ණප්‍රතිරූප වූ මැටියෙන් කළ කුණ්ඩලාභරණයක් සෙයින් ද, රතින් වැසූ ලොහොමස්සක් සෙයින් ද, ලොව්‍ පිරිවරින් වැසුණාහු ඇතුළත රාගාදියෙන් අශුද්ධ වූවාහු පිටත චීවරාදියෙන් ශෝභමාන වූවාහු හැසිරෙත්" යයි.

බුදුහු එසේ නො දක්නා ලැබෙත්. බුදුහු විද්‍යමාන වූ සැබෑ වූ තතු වූ යථාවත් වූ අවිපරීත වූ ස්වභාවයෙන් දැමුණාහු දැමුණු වර්ණයෙන් දක්නා ලැබෙති, සන්හුන් සේ ශාන්තවර්ණයෙන් දක්නා ලැබෙති, උපශාන්ත වූ සේ උපශාන්තවර්ණයෙන් දක්නා ලැබෙති, (ක්ලේශපරිනිර්වාණයෙන්) නිවුණාහු නිවුණු වර්ණයෙන් දක්නා ලැබෙත්. තවද භාග්‍යවත් බුදුවරයෝ අකල්පිත (-නො සැරසූ) ඉරියව් ඇත්තාහු පරිපූර්ණ ප්‍රාර්ථනා ඇත්තාහු නුයි මෙසේත් 'යථා දිස්සති චක්ඛුමා' යනු වේ. නොහොත් බුදුහු පවිත්‍ර වූ කීර්තිඝෝෂ ඇති සේ පැතිරගිය කීර්තිඝෝෂ හා ප්‍රශංසා ඇත්තාහු නාවිමන්හි ද ගුරුළුවිමන්හි ද යක්විමන්හි ද අසුරවිමන්හි ද ගදඹ්විමන්හි ද සිවුවරමුන්ගේ විමන්හි ද දෙව්රදැවිමන්හි ද බඹවිමන්හි ද දෙව්විමන්හි ද එබඳු වූවාහු ද එසින් අතිරේක වූවාහු ද දක්නා ලැබෙත් නුයි මෙසේත් 'යථා දිස්සති චක්ඛුමා' යනු වේ. නොහොත් බුදුහු දශබලයෙන් චතුර්වෛශාරද්‍යයෙන් සිවුපිළිසිඹියාවෙන් ෂඩභිඥාවෙන් ෂඩ්විධ බුද්ධධර්ම-යෙන් ද තේජසින් ද බලයෙන් ද ගුණයෙන් ද වීර්යයෙන් ද ප්‍රඥාවෙන් ද සමන්විත වූවාහු දක්නා ලැබෙති, දන්නා ලැබෙති, පැනෙන සේකි.

2. (උත්සන්න කුශලමූල ඇති) සත්පුරුෂයෝ දුර සිටියාහු නමුදු හිමවත් පර්වතය සෙයින් ප්‍රකාශ වෙති. මේ ලොව්‍ (ආමිෂගරුක වූ) අසජ්ජනයෝ රෑ විදි හී සෙයින් නො පැනෙන්නාහු යි.

මෙසේත් 'යථා යථා දිස්සති චක්ඛුමා' යනු වේ. චක්ඛුමා යනු බුදුහු පසැසකින් චක්ෂුර්මත් වූහ: මසැසිනු ද චක්ෂුර්මත්හ, දිවැසිනු ද චක්ෂුර්මත්හ, පැනැසිනු ද චක්ෂුර්මත්හ, බුදුඇසිනු ද චක්ෂුර්මත්හ, සමතැසිනු ද චක්ෂුර්මත්හු යි.

කෙසෙයින් බුදුහු මසැසිනු ද චක්ෂුර්මත් වූහ යත්: බුදුන්ගේ මසැස්හි නිල් පැහැය ද රත්වන් පැහැය ද රත් පැහැය ද කළු පැහැය ද සුදු පැහැය ද යන පඤ්ච වර්ණයෝ විද්‍යමාන වෙති. තව ද බුදුන්ගේ අක්ෂිරෝම වෙයි, යම් තැනෙක්හි අක්ෂිරෝම පිහිටියේ ද එතැන දියමෙරළියමල් සුදුසු සුනිල් පිරිසුදු දැකුම්කලු නිල් පැහැ වෙයි. එ ඉක්බිති කිණිහිරිමල් සුදුසු සුකසාවත් රත්වන් පිරිසුදු දැකුම්කලු කසාවත් පැහැ වෙයි. බුදුන්ගේ දෙනෙතග රතිඳුගොව් සුදුසු සුරත් පිරිසුදු දැකුම්කලු රත්පැහැ වෙයි, මැද රුක්පෙණලඇට සුදුසු ඉතා කළු මෙලෙක් සිනිඳු පිරිසුදු දැකුම්කලු කළු-පැහැ වෙයි, එ ඉක්බිති දවහත්තරු සුදුසු ඉතා සුදු හෙළ පබෙර පිරිසුදු දැකුම්කලු සුදුපැහැ වේ. බුදුහු අත්බැව ඇසුරු කළ පෙර පින්කමින් උපන් ඒ පස්පැ දිස්නා පියවි මසැසින් ඇවල්හි ද රැසිඳු හාත්පස සියක් යොදුන් දකිති.

යදා හි චතුරඞ්ගසමන්නාගතො අන්ධකාරො හොති: සූරියො ච අත්ථඞ්ගතො හොති, කාළපක්ඛො ච උපොසථො හොති, තිබ්බො ච වනසණ්ඩො හොති, මහා ච කාළමෙඝො අබ්භුට්ඨිතො හොති, එවරූපෙපි චතුරඞ්ගසමන්නාගතෙ අන්ධකාරෙ සමන්තා යොජනං පස්සති. නත්ථි සො කුඩ්ඩො වා කවාටං වා පාකාරො වා පබ්බතො වා ගච්ඡො වා ලතා වා ආවරණං රූපානං දස්සනාය, එකඤ්චෙ තිලඵලං නිමිත්තං කත්වා තිලවාහෙ පක්ඛිපෙය්‍ය, තඤ්ඤෙව තිලඵලං උද්ධරෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො පාකතිකං මංසචක්ඛු. එවං භගවා මංසචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා දිබ්බෙන චක්ඛුනාපි[2] චක්ඛුමා? භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා, මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා, මිච්ඡාදිට්ඨිකම්මසමාදානා; තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා; තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආකඞ්ඛමානො ච භගවා එකම්පි ලොකධාතුං පස්සෙය්‍ය, ද්වෙපි ලොකධාතුයො පස්සෙය්‍ය, තිස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය, චතස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය, පඤ්චපි ලොකධාතුයො පස්සෙය්‍ය, දසපි ලොකධාතුයො පස්සෙය්‍ය, වීසතිම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, තිංසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, චත්තාළීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, පඤ්ඤාසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, සහස්සිම්පි චූළනිකං ලොකධාතුං පස්සෙය්‍ය, ද්විසහස්සිම්පි මජ්ඣිමිකං ලොකධාතුං පස්සෙය්‍ය, තිසහස්සිම්පි මහාසහස්සිං ලොකධාතුං පස්සෙය්‍ය. යාවතකං පන ආකඞ්ඛෙය්‍ය, තාවතකං පස්සෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො දිබ්බචක්ඛු. එවං භගවා දිබ්බෙන චක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා? භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤාණො අනන්තතෙජො

1. යදපි - මජ්ඣං., සිමු. II 2. චක්ඛුනා - සිමු. II.

යම් සේ කලෙක චතුරඞ්ගසමන්වාගත අන්ධකාරය වේ නම්: හිරු අස්තයට ගියේත් වේ ද; කෘෂ්ණපක්ෂයෙහි පොහොයත් වේ ද, ගහන වූ වනලැහැබත් වේ ද, මහත් කළු වලාකුළු නැගුණේත් වේ ද, මෙබඳු වූ චතුරඞ්ගසමන්වාගත අන්ධකාරයෙහි පවා හාත්පස යොදුනක් දක්නා සේක, කිතෙක් වේවයි දොරෙක් වේවයි පවුරෙක් වේවයි ගලෙක් වේවයි ගසෙක් වේවයි වැලෙක් වේවයි රූප දැකීමට එබඳු ආවරණයෙක් නැති, ඉදින් එක් තලඇටයෙක් ලකුණු කොට තලගැලෙක බහාලත්තේ නම්, ඒ තලඇටය මැනහාගන්නා සේක. බුදුන්ගේ පියවි මසැස මෙසේ පරිසුදු වේ. මෙසේ බුදුහු මසැසිනුදු චක්ෂුර්මත් වූ සේක.

කිසෙයිත් බුදුහු දිවැසිනු දු චක්ෂුර්මත් වූහ යත්: බුදුහු විශුද්ධ වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද සත්ත්වයන් බලන සේක: 'අහෝ මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනෝදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්‍යෝපවාද කළාහු, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිවශයෙන් සමාදන් වූ විවිධ කර්ම ඇත්තාහු ය, ඔහු කය බිඳීමෙන් මරණින් මත්තෙහි සුව රහිත වූ දුකට ගති වූ විවශ ව පතිත වන නිරයට පැමිණියාහු ය; යළි මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යෝපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිවශයෙන් සමාදන් වූ කර්ම ඇත්තාහු ය, ඔහු කාබුත් මරණින් මතු සුන්දර ගති ඇති සැපයෙන් අග්‍ර වූ ලොකයට පැමිණියාහ'යි කර්ම වූ පරිද්දෙන් පැමිණි සත්ත්වයන් දැනගන්නා සේක, මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද සත්ත්වයන් බලන සේක, කර්ම වූ පරිදි පරලොව පැමිණි සත්ත්වයන් දැනගන්නා සේක. තවද බුදුහු කැමැති වන්නාහු නම්, එක් ලොකධාතුවකු දු බලන සේක, ලොකධාතු දෙකකු දු බලන්නාහ, තුන් ලොකධාතුවකු දු බලන්නාහ, සතර ලොකධාතුවකු දු බලන්නාහ, පස් ලොකධාතුවකු දු බලන්නාහ, දස ලොකධාතුවකු දු බලන්නාහ, විසි ලොකධාතුවකු දු බලන්නාහ, තිස් ලොකධාතුවකු දු බලන්නාහ, සතලිස් ලොකධාතුවකු දු බලන්නාහ, පනස් ලොකධාතුවකු දු බලන්නාහ, සහස්‍රී චූලනීලොකධාතුව ද බලන්නාහ, ද්විසහස්‍රී මධ්‍යම ලොකධාතුව ද බලන්නාහ, ත්‍රිසහස්‍රී මහාසහස්‍රීලොකධාතුව ද බලන්නාහ, තවද යම් පමණ කැමැතිවන සේක් නම්, ඒ තාක් බලන සේක, මෙසේ බුදුන් ගේ දිවැස පරිශුද්ධ වේ. මෙසේ බුදුහු දිවැසිනු දු චක්ෂුර්මත් වන සේක.

කිසෙයිත් බුදුහු පැනැසිනුදු චක්ෂුර්මත් වූහ යත්: බුදුහු මහත් ප්‍රඥා ඇති සේක, පතල ප්‍රඥා ඇති සේක, ශීඝ්‍රප්‍රඥා ඇති සේක, දිවෙන ප්‍රඥා ඇති සේක, තියුණු ප්‍රඥා ඇති සේක, විනිවිද යන ප්‍රඥා ඇති සේක, ප්‍රඥා ප්‍රභෙදයෙහි නිපුණ වූහ, ප්‍රභෙදයට පැමිණි ප්‍රඥා ඇත්තාහ, අධිගම කළ ප්‍රතිසංවිද් ඇති සේක, චතුර්වෛශාරද්‍යයට පැමිණි සේක, දශබලධාරීහ, පුරුෂශ්‍රෙෂ්ඨයහ, පුරුෂසිංහයහ, පුරුෂනාගයහ, පුරුෂාජානෙයයහ, පුරුෂධෞරෙයයහ, අනන්තඥාන ඇති සේක, අනන්ත තෙජස් ඇති සේක,

අනන්තයසො අගාධො මහද්ධනො ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛෙතා පසාදෙතා. සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා. සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො[1] බ්‍රහ්මභූතො, වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො.

නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය. අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති, යං කිඤ්චි නෙය්‍යං නාම අත්ථි ජානිතබ්බං අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො, සබ්බං තං අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්තති, සබ්බං වචීකම්මං - සබ්බං මනොකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්තති. අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, අනාගතෙ අප්පටිහතං ඤාණං, පච්චුප්පන්නෙ අප්පටිහතං ඤාණං. යාවතකං නෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං නෙය්‍යං නෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං නෙය්‍යං. නෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති. ඤාණං අතික්කමිත්වා නෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵුසිතානං හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො හොන්ති; එවමෙවං බුද්ධස්ස භගවතො නෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො: යාවතකං නෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං නෙය්‍යං. නෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං නෙය්‍යං. නෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා නෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා.

සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා, ආකඞ්ඛපටිබද්ධා, මනසිකාරපටිබද්ධා, චිත්තුප්පාදපටිබද්ධා.

1. මෙත්තභූතො - සිමු. II.

අනන්ත යශස් ඇති සේක, ප්‍රඥාධනයෙන් ආඪ්‍ය වූහ, මහත් වූ ප්‍රඥාධන ඇති සේක, ප්‍රඥාධනයෙන් ධනවත් සේක, (නිවනට පමුණුවන හෙයින්) නේතෘ වූහ, (වෛනෙයයන් හික්මවන හෙයින්) විනේතෘ වූහ, (සැක සිඳින හෙයින්) අනුනේතෘ වූහ, අර්ථය පනවන සේක, නිශ්චය කරවන සේක, පිළිවෙත් දක්වන සේක, ප්‍රතිපත්තිඵලයෙන් පහදවන සේක; තවද ඒ බුදුහු (සිය සන්තන්හි) නූපන් ආර්‍ය්‍යමාර්ගය ඉපද වූ සේක, (වෛනෙය-සන්තානයෙහි) අසඤ්ජාත මාර්ගය උපදවන සේක, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණ දීම් වශයෙන්) ප්‍රකාශ කරන සේක, ප්‍රත්‍යවෙක්‍ෂා වශයෙන් මාර්ගය දන්නා සේක, මාර්ගය දන්නාසුලු වූහ, මාර්ගයෙහි විචක්‍ෂණ වූ සේක. තවද මෙ කල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදි ගුණයෙන්) පසුපස යමින් වෙසෙත්. ඒ බුදුහු දතයුතු ඥෙයධර්මය දන්නා සේක, දක්ක යුතු ඥෙය පථය නුවණැසින් දක්නා සේක, (දර්ශනපරිනායක හෙයින්) ඇසක් මෙන් වූහ, ඥානමය වූහ, ධර්මමය වූහ, ශ්‍රෙෂ්ඨ වූහ, (දහම් දෙසන හෙයින්) වක්තෘ වූහ, ප්‍රවක්තෘ වූහ, (අර්ථය දක්වන හෙයින්) නිනේතෘ වූහ, අමෘතය දෙන සේක, ධර්මස්වාමී සේක, තථාගත වූ සේක.

ඒ බුදුන් විසින් මහනුවණින් නොදන්නා ලද්දක් නුවණැසින් නො දක්නා ලද්දක් නුවණින් අවිදිත වූවක් ප්‍රත්‍යක්‍ෂ නො කරන ලද්දක් ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දක් නම් නැත. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ නම්, අතීතානාගතප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට (සබ්බතා-සබ්බත වූ) සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන්ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙත්. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ට-ධාර්මිකාර්ථය ද සාම්පරායිකාර්ථය ද උත්තාන (-ප්‍රකට) අර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නෙය්‍යාර්ථය ද නීතාර්ථය ද නිර්දෝෂාර්ථය ද නිෂ්ක්ලේශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථය ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පැතිරැ පවතී. භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී, සියලු වාක්කර්මය - භාග්‍යවත් බුදුන්ගේ සියලු මනඃකර්මය ඥානය අනුව පවතී. අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (-අනාවරණ) යැ, අනාගතයෙහි ඥානය අනාවරණ යැ, වර්තමාන-යෙහි ඥානය අනාවරණ යි. දත්යුත්ත යම් පමණ ද, ඥානය එ පමණ යැ, ඥානය යම් පමණ ද, දතයුත්ත එ පමණ යි. ඥානය ඥෙය කෙළවර කොට ඇත්තේ යැ, ඥෙය (-දතයුත්ත) ඥානය කෙළවර කොට ඇත්තේ යැ. ඥෙය ඉක්මැ ඥානයෙක් නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති ඒ ධර්මයෝ අන්‍යොන්‍යපර්‍ය්‍යන්තයෙහි පවත්නාසුල්ලහ. යම්සේ මනා කොට පැහැසු සුමුගුපටල දෙකක්හුගේ යට සුමුගුපටල උපරිමය නො ඉක්මවා ද, උඩ සුමුගුපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔවුහු ඔවුනොවුන්ගේ පර්‍ය්‍යන්තයෙහි සිටිනාසුලු වෙත් ද; එසෙයින් මැ භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යොන්‍යපර්‍ය්‍යන්තයෙහි සිටිනාසුල්ලහ; යම්තාක් ඥෙය ද, ඒතාක් ඥාන යැ; යම්තාක් ඥානය ද ඒතාක් ඥෙය යැ; ඥානය ඥෙයපර්‍ය්‍යන්තික යැ, ඥෙයය ඥානපර්‍ය්‍යන්තික යි. ඥෙය ඉක්මැ ඥානයෙක් නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති. ඒ දහම්හු අන්‍යොන්‍යප-ර්‍ය්‍යන්තයෙහි සිටුනාසුල්ලහ.

සියලු දහම් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවත්නේ යැ, සියලු දහම්හු භාග්‍යවත් බුදුන්ගේ මනොද්වාරාවර්ජනයට අයත්හු වෙති, රුචියට අයත්හු වෙති, මනසිකාරය ප්‍රතිබද්ධ වෙති, චිත්තොත්පාද ප්‍රතිබද්ධ වෙත්.

සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසං සත්තානං භගවා ආසයං ජානාති අනුසයං ජානාති. චරිතං ජානාති. අධිමුත්තිං ජානාති. අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ ජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තො මහාසමුද්දෙ පරිවත්තන්ති, එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි පක්ඛී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙව යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය, තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨති. යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා, සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හෙ අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති: ගුළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විසජ්ජිතාව තෙ පඤ්හා භගවතා හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකාව තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවා'ව තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති. එවං භගවා පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා බුද්ධචක්ඛුනාපි චක්ඛුමා? භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ. සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චෙ උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති අනුපලිත්තානි උදකෙන, එවමෙවං භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

සියලු සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී, බුදුහු සියලු සත්ත්වයන් ගේ ආශය (අදහස්) දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති, (නුවණැසෙහි) අල්ප වූ රාගාදි රජස් ඇති මහත් වූ රජස් ඇති, තියුණු (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති, මෘදු වූ ඉඳුරන් ඇති, සුන්දර වූ (ශ්‍රද්ධාදි) ආකාර ඇති, ගර්හිත වූ (අශ්‍රද්ධාදි) ආකාර ඇති, සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ භව්‍යාභව්‍ය සත්ත්වයන් දැනගන්නා සේක. මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත ලෝවැසි තෙම දෙව්මිනිසුන් සහිත වූ මහණ බමුණන් සහිත ප්‍රජා තොමෝ ඇතුළුබුදුනුවණෙහි පිරිවැටෙයි. තිමි – තිමිඞ්ගල පටන් කොට යම් මස්කැසුබු කෙනෙක් වෙත් නම්, ඔහු යම්සේ මහමුහුදෙහි හැසිරෙත් ද, එසෙයින් මරුන් බඹුන් සහිත සදෙවක ලොක තෙමේ මහණබමුණන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව ඇතුළුබුදුනුවණෙහි පවතී; යම්සේ විනතා පුත් ගුරුළු රජු පටන් කොට යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම්, ඔහු අහසැ පෙදෙසෙකැ හැසිරෙත් ද, එසෙයින් ම යම් කෙනෙක් නුවණින් සැරියුත් තෙරුන් සම වූවාහු නම්, ඔහු ද බුද්ධඥානයාගේ පෙදෙසෙක පවත්නාහු ය; බුද්ධඥානය දෙව්මිනිසුන් ගේ ප්‍රඥාව පැතිරැ මැඩගෙනැ සිටී. නිපුණ වූ කල පරවාද ඇති වල් විදුනා දුනුවායන් බඳු ප්‍රසිද්ධ වූ යම් ක්‍ෂත්‍රියපණ්ඩිත කෙනෙක් බ්‍රාහ්මණපණ්ඩිත කෙනෙක් ගෘහපතිපණ්ඩිත කෙනෙක් ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥාවෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම්, ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද, බොහෝ ප්‍රශ්න රචනා කොට බුදුන් කරා පැමිණ විචාරත්, බුදුන් විසින් ඒ ප්‍රශ්නයෝ සකාරණ ව් වදාරණ ලද්දාහු විසඳන ලද්දාහු මැ වෙත්. ඔවුහු බුදුන්ගේ ශ්‍රාවක බවට (උපාසක බවට හෝ) පැමිණියාහු මැ වෙත්. යළි බුදුහු මැ එහි ප්‍රඥාවෙන් අතිශයින් ප්‍රකාශ වෙත් නුයි මෙසේ බුදුහු පැනැසිනු ද චක්ෂුර්මත් වන සේක.

කිසෙයින් බුදුහු බුදුඇසිනු ද චක්ෂුර්මත් වූහ යත්: බුදුහු බුදුඇසින් ලොව බලන සේක් (නුවණැස්හි) අල්ප වූ (රාගාදි) කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති (ශ්‍රද්ධාදි) සුන්දරාකාර ඇති (අශ්‍රද්ධාදි) ගර්හිතාකාර ඇති සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ සත්ත්වයන් ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නාසුලු වැ වසනුවන් ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නාසුලු වැ නො වසනුවන් දුටු සේක; යම්සේ උපුල්විලෙකැ හෝ පියුම්විලෙකැ හෝ නෙළුම්විලෙකැ හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ නෙළුම් හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැගුණාහු දියතුල ගැලී පොහොනී වූවාහු ද, ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දිය හා සම වැ සිටියාහු ද, ඇතැම් පියුම් උපුල් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් උඩට නැගී දිය හා නො වැකුණාහු සිටිත් ද; එසෙයින් මැ බුදුහු බුදුඇසින් ලොව බලන සේක් අල්පරජස්ක වූ ද මහාරජස්ක වූ ද තියුණු ඉඳුරන් ඇත්තාවූ ද මෘදු ඉඳුරන් ඇත්තාවූ ද සුන්දරාකාර වූ ද ගර්හිතාකාර වූ ද සුවිඥෙය්‍ය වූ ද දුර්විඥෙය්‍ය වූ ද සත්ත්වයන් පරලොව හා වද්‍යයෙහි භය දක්නාසුලු වැ වසනුවන් ඇතැම් කෙනකුන් පරලොක වද්‍යයෙහි භය දක්නාසුලු වැ නො වසනුවන් දුටු සේක;

ජානාති භගවා අයං පුග්ගලො රාගචරිතො, අයං දොසචරිතො, අයං මොහචරිතො, අයං විතක්කචරිතො, අයං සද්ධාචරිතො, අයං ඤාණචරිතො’ති. රාගචරිතස්ස භගවා පුග්ගලස්ස අසුභකථං කථෙති. දොසචරිතස්ස භගවා පුග්ගලස්ස මෙත්තාභාවනං ආචික්ඛති. මොහචරිතං භගවා පුග්ගලං[1] උද්දෙසෙ පරිපුච්ඡාය කාලෙන ධම්මස්සවනෙ කාලෙන ධම්මසාකච්ඡාය ගරුසංවාසෙ[2] නිවෙසෙති. විතක්කචරිතස්ස භගවා පුග්ගලස්ස ආනාපානස්සතිං ආචික්ඛති. සද්ධාචරිතස්ස භගවා පුග්ගලස්ස පසාදනීයං නිමිත්තං ආචික්ඛති: බුද්ධසුබොධිං ධම්මසුධම්මතං සඞ්ඝසුප්පටිපත්තිං සීලානි ච අත්තනො. ඤාණචරිතස්ස භගවා පුග්ගලස්ස විපස්සනානිමිත්තං ආචික්ඛති: අනිච්චාකාරං දුක්ඛාකාරං අනත්තාකාරං.

3. “සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු.
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො,
අවෙක්ඛස්සු ජාතිජරාභිභූත”න්ති a

එවං භගවා බුද්ධචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා සමන්තචක්ඛුනාපි චක්ඛුමා? ‘සමන්තචක්ඛු’ වුච්චති සබ්බඤ්ඤුතඤාණං. භගවා සබ්බඤ්ඤුතඤාණෙන උපෙතො සමුපෙතො උපගතො[3] සමුපගතො[4] උපපන්නො සමුපපන්නො[5] සමන්නාගතො.

4. “න තස්ස අදිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං[6]
තථාගතො තෙන සමන්තචක්ඛූ”ති b

එවං භගවා සමන්තචක්ඛුනාපි චක්ඛුමාති - යථා දිස්සති චක්ඛුමා.

සබ්බං තමං විනොදෙත්වාති - සබ්බං රාගතමං දොසතමං මොහතමං දිට්ඨිතමං කිලෙසතමං දුච්චරිතතමං අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං නුදිත්වා පනුදිත්වා ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති - සබ්බං තමං විනොදෙත්වා.

එකොව රතිමජ්ඣගාති - එකො භගවා: පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො, අදුතියට්ඨෙන එකො, තණ්හාය පහානට්ඨෙන එකො, එකන්තවීතරාගොති එකො, එකන්තවීතදොසොති එකො, එකන්තවීතමොහොති එකො, එකන්තනික්කිලෙසොති එකො, එකායනමග්ගං ගතොති එකො, අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො’ති එකො.

1. මොහචරිතස්ස භගවා පුග්ගලස්ස - මජසං. 2. ගරුසංවෙසෙ - සීමු. II.
3. උපාගතො - සීමු II. 4. සමුපාගතො - සීමු II.
6. නෙය්‍යං - සීමු. II. 5 සමුපපන්නො - මජසං.

a. දීඝනිකාය - මහාපදානසුත්ත, මජ්ඣිමනිකාය - අරියපරියෙසනසුත්ත, බොධිරාජකුමාරසුත්ත, බ්‍රහ්මසංයුත්ත, පඨමවග්ග, ඉතිවුත්තක - දුතියවග්ග.

b පටිසම්භිදාමග්ග - ඤාණකථා, ඉන්ද්‍රියකථා.

'මේ පුද්ගල තෙමේ රාගචරිත ඇත්තෙක, මේ තෙමේ ද්වේෂචරිතයෙක, මේ මෝහචරිතයෙක, මේ විතර්කචරිතයෙක, මේ ශ්‍රද්ධාචරිතයෙක, මේ ඥානචරිත ඇත්තෙකැ'යි බුදුහු දැනගන්නා සේක. බුදුහු රාගබහුල පුද්ගලයාට අශුභකථාව වදාරන සේක. ද්වේෂබහුල පුද්ගලයාහට බුදුහු මෛත්‍රීභාවනාව ප්‍රකාශ කරන සේක. මෝහබහුල පුද්ගලයා බුදුහු (පෙළ) උද්දේසීමෙහි ද (අටුවා) පිළිවිසීමෙහි ද සුදුසු කල ධර්මශ්‍රවණයෙහි ද කාලෙක ධර්මසාකච්ඡාවෙහි ගුරුන් ඇසුරු කිරීමෙහි ද සිටුවන සේක. බුදුහු විතර්ක බහුල පුද්ගලයාහට ආනාපානසමෘතිය පවසන සේක. ශ්‍රද්ධාබහුල පුද්ගලයාට බුදුහු ප්‍රසාද උපදවන (චූලවේදල්ලාදි) සූත්‍රයක් ද බුදුන්ගේ බුද්ධත්වප්‍රතිවේධය ද ධර්මය ස්වාඛ්‍යාත බව ද සඞ්ඝයා සුප්‍රතිපන්න බව ද තමා සතු සිල් ද පවසන සේක. ඥානචරිත පුද්ගලයාහට විදර්ශනා නිමිත්ත වූ අනිත්‍යාකාරය දුඃඛාකාරය අනාත්මාකාරය පවසන සේකි.

3. "යම්සේ සෙල්මුවා පව්වක් මත සිටි යේ මැ (ඇස් ඇති පුරුෂයෙක්) හාත්පස ජනතාව බලන්නේ ද, එසෙයින්, සොඳුරු නුවණැති සමන්තැස් ඇති බුදුරජාණෙනි, නුඹ වහන්සේ ද දහම්මුවා පහයට නැගී, (තුමූ) ශෝක ඇත්තාහු, ශෝකයට බට ජාතිජරායෙන් මඩනා ලද ජනතාව බලනු මැනවැ''යි.

මෙසේ බුදුහු බුදුඇසිනු දු චක්ෂුර්මත් වූ සේක.

කිසෙයින් බුදුහු සමන්තැසිනු දු චක්ෂුර්මත් වූහ යත්: සර්වඥතාඥානය 'සමන්තචක්ඛු' යයි කියනු ලැබේ. බුදුහු සර්වඥතාඥානයෙන් උපෙතයහ, සමුපෙතයහ, උපාගතයහ, සමුපගතයහ, නොංවෙත් වූහ, පරිපූර්ණ වූහ, සමන්විත වූ සේක.

4. ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුකලෝකයෙහි (මෙ කල හෝ) පැනැසින් නුදුටු කිසිවක් නැත, යළි (අතීත වූ) නො දත් කිසිවක් නැත. (අනාගත වූ) නො දැනෙන කිසි (ධර්මජාතයකු) දු නැත. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වී නම්, ඒ සියල්ල අවබෝධ කළහ. එහෙයින් තථාගතයෝ සමන්තචක්ඛු වූ සේකි.

මෙසේ බුදුහු සමන්තැසිනු දු (-සර්වඥතාඥානයෙන්) චක්ෂුර්මත් වූවාහු නුයි 'යථා දිස්සති චක්ඛුමා' යනු වේ.

සබ්බං තමං විනොදෙත්වා - ප්‍රඥාලෝකය අඳුරු කරන, නුවණැස ඇති නො කරන, නො දැනීම් ඇති කරන, පැනැය නසන, පීඩාකොටසෙහි වූ, නිවන පිණිස නො පවත්නා වූ, සියලු රාගාන්ධකාරය ද්වේෂාන්ධකාරය මෝහාන්ධකාරය දෘෂ්ට්‍යන්ධකාරය කෙලශාන්ධකාරය දුශ්චරිතාන්ධකාරය දුරු කොට ත්‍යාග කොට පරිත්‍යාග කොට බැහැර කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා නුයි 'සබ්බං තමං විනොදෙත්වා' යනු වේ.

එකොව රතිමජ්ඣගා - බුදුහු අතුල්‍යයහ: ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාතාර්ථයෙන් අතුල්‍යයහ, අද්විතීයාර්ථයෙන් අතුල්‍යයහ, තෘෂ්ණාප්‍රහාණාර්ථයෙන් අසහායයහ, එකාන්තවීතරාග නුයි අසහායයහ, එකාන්තවීතද්වේෂ නුයි අසහායයහ, එකාන්තවීතමෝහ නුයි අසහායයහ, එකාන්තයෙන් නිකෙලශ නුයි අසහායයහ, එකායනමාර්ගයට ගියාහු නුයි එකායහ, නිරුත්තර වූ සම්‍යක්සම්බෝධිය අවබෝධ කළාහු නුයි එකායන.

කථං භගවා පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො? භගවා දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අකාමකානං මාතාපිතූනං[1] අස්සුමුඛානං රුදන්තානං විලපන්තානං ඤාතිසඞ්ඝං පහාය සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා සන්නිධිපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. එවං භගවා පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො.

කථං භගවා අදුතියට්ඨෙන එකො? සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො චරති, එකො ගච්ඡති, එකො තිට්ඨති, එකො සෙය්‍යං කප්පෙති, එකො ගාමං පිණ්ඩාය පවිසති, එකො පටික්කමති, එකො රහො නිසීදති, එකො චඞ්කමං අධිට්ඨාති, එකො චරති, විහරති ඉරියති වත්තෙති පාලෙති ය පති යාපෙති. එවං භගවා අදුතියට්ඨෙන එකො.

කථං භගවා තණ්හාය පහීනට්ඨෙන එකො? සො එවං එකො අදුතියො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බොධිරුක්ඛමූලෙ මහාපධානං පදහන්තො මාරං සසෙනං කණ්හං නමුචිං පමත්තබන්ධුං විධමිත්වා තණ්හාජාලිනිං විසත්තිකං පජහි, විනොදෙසි, බ්‍යන්තිං අකාසි, අනභාවං ගමෙසීති.

5. "තණ්හාදුතියො පුරිසො දීඝමද්ධානසංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං[2] නාතිවත්තති.

6. එවමාදීනවං[3] ඤත්වා තණ්හා[4] දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ"ති[a].

එවං භගවා තණ්හාය පහීනට්ඨෙන එකො.

කථං භගවා එකන්තවීතරාගොති එකො? රාගස්ස පහීනත්තා එකන්තවීතරාගොති එකො, දොසස්ස පහීනත්තා එකන්තවීතදොසොති එකො, මොහස්ස පහීනත්තා එකන්තවීතමොහොති එකො, කිලෙසානං පහීනත්තා එකන්තනික්කිලෙසොති එකො.

කථං භගවා එකායනමග්ගං ගතොති එකො? එකායනමග්ගො වුච්චති චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

1. මාතාපිතුනං - මජසං PTS.
2. සංසරං - සීමු. II.
3. එතමාදීනවං - සීමු II. PTS. මජසං.
4. තණ්හං - සීමු. PTS. මජසං.
a. චතුක්කඞ්ගුත්තර - භණ්ඩගාමවග්ග, සුත්තනිපාත - ද්වයතානුපස්සනාසුත්ත.

කිසෙයින් බුදුහු ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත අර්ථයෙන් 'එක' වූහ යත්: බුදුහු තරුණ වූවාහු මැ අඳුන්වන් කෙස් ඇත්තාහු සොඳුරු යෞවනයෙන් යුත් පළමු වයසින් යුක්ත වූවාහු නො කැමැති වූ කඳුළින් තෙමුණු මුහුණු ඇති හඬන්නා වූ වැලපෙන්නා වූ මවුපියනට අනාදර කොට ඥාතිසමූහයා හැරපියා සියලු ගෘහාවාසපරිරොධ (-දුර්ග)ය සිඳපියා අඹුදරු ආවරණය සිඳ ඥාතිපරිරොධය සිඳ සන්නිධිපරිරොධය සිඳ කෙස්රවුළු බහා කහවත් හැඳ පෙරෙව, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිව අකිඤ්චන (-කිසිවක් නැති) බවට පැමිණ එකලා ව හැසිරෙති, වෙසෙති ඉරියවු පවත්වති වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්. මෙසේ බුදුහු ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාතයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු අද්විතීයාර්ථයෙන් 'එක' වූහ යත්: උන්වහන්සේ මෙසේ පැවිදි වූවාහු එකලා ව අල්පශබ්ද වූ අල්පනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍යයට සුදුසු වූ විවෙකයට අනුරූප වූ වනයෙහි දුර සෙනසුන් වනපර්යන්ත සෙනසුන් ඇසුරු කෙරෙති. උන්වහන්සේ එකලා ව හැසිරෙති, එකලා ව යෙති, එකලා ව සිටිති, එකලා ව හොවිති. එකලා ව ගමට පිඬු සිඟා පිවිසෙති, එකලා ව රහසැ හිඳිති, එකලා ව සක්මන් කෙරෙති, එකලා ව හැසිරෙති, වෙසෙති, ඉරියවු පවත්වති, වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්. මෙසේ බුදුහු අද්විතීයාර්ථයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු තෘෂ්ණාප්‍රහාණාර්ථයෙන් 'එක' වූහ යත්: උන් වහන්සේ මෙසේ එකලා වූවාහු අද්විතීය වූවාහු අප්‍රමත්ත වූවාහු කෙලෙස් තවන වීර්ය ඇති ව නිවනට මෙහෙයූ සිත් ඇති ව වසන්නාහු නෙරඤ්ජරා නදීතීරයෙහි බෝරුක්මුල මහා ප්‍රධන්වීර්ය කරන සේක් කෘෂ්ණ කම් ඇති (නො මිදියැ දෙන හෙයින්) නමුචි නම් වූ ප්‍රමත්තයනට බන්ධු වූ සෙන් සහිත මරු විධ්වංසන කොට විසත්තිකා නම් වූ තෘෂ්ණාජාලිනිය දුරු කළහ, බැහැර කළහ, විගතාන්ත කළහ, අනභාවයට පැමිණවූ සේක.

5. 'තෘෂ්ණාව දෙවැනි කොට ඇති පුරුෂ තෙමේ දීර්ඝකාලයක් මුළුල්ලෙහි සැරිසරනුයේ ඉත්ථත්තභාව අනාගතාත්මභාව නොහොත් ඉත්ථභාව අන්‍යථාභාව සඞ්ඛ්‍යාත වූ සංසාරය නො ඉක්මවයි.

6. (අතීතාදි සකන්ධයන්හි) මෙසේ ආදීනව දැන, තෘෂ්ණාව දුකට කාරණ යයි දැන, පහවූ තෘෂ්ණා ඇති ආදාන (-ග්‍රහණ) රහිත වූ සමෘතිමත් වූ ක්ෂීණාස්‍රව මහණ තෙම හැසිරෙන්නේ යැ'යි.

මෙසේ බුදුහු තෘෂ්ණා ප්‍රහීණාර්ථයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු එකාන්තවීතරාග නුයි 'එක' වූහ යත්: රාගය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් වීතරාග නුයි 'එක' යහ. ද්වෙෂය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් වීතද්වෙෂ නුයි 'එක' යහ. මොහය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් පහවූ මොහ ඇත්තාහු නුයි 'එක' යහ. කෙලශයන් ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් නිකෙලශ වූවාහු නුයි 'එක' යහ.

කිසෙයින් බුදුහු එකායනමාර්ගයට ගියාහු නුයි 'එක' වූහ යත්: සතර සතිපට්ඨානයෝ යැ, සතර සම්‍යක් ප්‍රධානයෝ යැ, සතර ඍද්ධිපාදයෝ යැ, පඤ්චෙන්ද්‍රියයෝ යැ, පඤ්ච බලයෝ යැ, සප්ත බොධ්‍යඞ්ගයෝ යැ, ආර්ය-අෂ්ටාඞ්ගිකමාර්ග යැ, යන මේ 'එකායනමාර්ගය'යි කියනු ලැබේ.

7. "එකායනං ජාතිඛයන්තදස්සී
මග්ගං පජානාති හිතානුකම්පී,
එතෙන මග්ගෙන තරිංසු පුබ්බෙ
තරිස්සන්ති යෙ ච තරන්ති ඔඝ"න්ති a

එවං භගවා එකායනමග්ගං ගතො'ති එකො.

කථං භගවා එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති එකො? 'බොධි' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි. භගවා තෙන බොධිඤාණෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති බුජ්ඣි. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති බුජ්ඣි. සබ්බෙ ධම්මා අනත්තාති බුජ්ඣි. අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති බුජ්ඣි -පෙ- ජාතිපච්චයා ජරාමරණන්ති බුජ්ඣි. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති බුජ්ඣි. -පෙ- ජාතිනිරොධා ජරාමරණනිරොධොති බුජ්ඣි. ඉදං දුක්ඛන්ති බුජ්ඣි. අයං දුක්ඛසමුදයොති බුජ්ඣි. අයං දුක්ඛනිරොධොති බුජ්ඣි. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති බුජ්ඣි. ඉමෙ ආසවාති බුජ්ඣි -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති බුජ්ඣි. ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති බුජ්ඣි. පහාතබ්බාති - භාවෙතබ්බාති - සච්ඡිකාතබ්බාති බුජ්ඣි. ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච බුජ්ඣි. පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච බුජ්ඣි. චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච බුජ්ඣි. යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති බුජ්ඣි. අථවා යං කිඤ්චි බුජ්ඣිතබ්බං අනුබුජ්ඣිතබ්බං පටිබුජ්ඣිතබ්බං සම්බුජ්ඣිතබ්බං අධිගන්තබ්බං ඵස්සිතබ්බං සච්ඡිකාතබ්බං, සබ්බං තං තෙන බොධිඤාණෙන බුජ්ඣි, අනුබුජ්ඣි, පටිබුජ්ඣි, සම්බුජ්ඣි, සම්මා බුජ්ඣි, අධිගච්ඡි, ඵස්සෙසි, සච්ඡාකාසි. එවං භගවා එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති එකො.

රතිමජ්ඣගා'ති 'රති'න්ති නෙක්ඛම්මරතිං විවෙකරතිං උපසමරතිං සම්බොධිරතිං; අජ්ඣගා - අධිගච්ඡි ඵස්සෙසි සච්ඡාකාසීති - එකොව රතිමජ්ඣගා.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"සදෙවකස්ස ලොකස්ස
යථා දිස්සති චක්ඛුමා,
සබ්බං තමං විනොදෙත්වා
එකොව රතිමජ්ඣගා"ති.

16 - 8

තං බුද්ධං අසිතං තාදිං
අකුහං ගණිමාගතං,
බහුන්නමිධ[1] බද්ධානං
අත්ථි පඤ්හෙන ආගමං.

---

a. සතිපට්ඨානසංයුත්ත - නාලන්දවග්ග. 1. බහූනමිධ - සීමු. II. මජසං.

7. ජාතික්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණය දක්නාසුලු වූ හිතයෙන් අනුකම්පා කරනසුලු වූ බුදුහු ඒකායනමාර්ගය දන්නා සේක. පෙර යම් කෙනෙක් චතුරෞඝය තරණය කළාහු නම් මෙල මාර්ගයෙන් තරණය කළාහු ය. තවද යම් කෙනෙක් (මතු) තරණය කරන්නාහු නම්, දැන් තරණය කෙරෙත් නම්, මේ මගින් තරණය කෙරෙත්.

මෙසේ බුදුහු ඒකායනමාර්ගයට ගියාහු නුයි 'එක' යහ.

කිසෙයින් බුදුහු එකලා වැ අනුත්තර වූ සම්‍යක්සම්බෝධිය අවබෝධ කළාහු නුයි 'එක' වූහ යත්: සතර මාර්ගඥානය ප්‍රඥෙන්ද්‍රියය ප්‍රඥාබලය ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය විමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය 'බෝධි' යයි කියනු ලැබේ. බුදුහු ඒ බෝධිඥානයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ'යි අවබෝධ කළහ (-දත්හ). 'සියලු සංස්කාරයෝ දුක්හ'යි දත්හ. 'සියලු ධර්මයෝ අනාත්මයහ'යි දත්හ. 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති' දත්හ... 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැ'යි දත්හ. 'අවිද්‍යාවගේ අශෙෂ නිරෝධයෙන් සංස්කාරනිරොධය වේ යැ'යි දත්හ...'ජාතිනිරොධයෙන් ජරාමරණනිරෝධය වේ යැ'යි දත්හ. 'මේ දුකැ'යි දත්හ. 'මේ දුක්හෙතුව යැ'යි දත්හ. 'මේ දුක් නැසීම යැ'යි දත්හ. 'මේ දුක් නැසීමට පමුණුවන පිළිවෙතැ'යි දත්හ. 'මොහු ආස්‍රවයෝ යැ'යි දත්හ...මේ ආස්‍රවනිරොධයට පමුණුවන පිළිවෙතැ'යි දත්හ. 'මේ ධර්මයෝ දතයුත්තාහ'යි දත්හ. හළයුත්තාහ'යි-වැඩිය යුත්තාහ'යි - ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ'යි දත්හ. සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ පහළවීම ද නැසීම ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද දත්හ. යම් කිසිවක් සමුදයධර්ම නම් ඒ සියල්ල නැසෙන පියවි ඇතැ'යි අවබෝධ කළහ. නොහොත් යම් කිසිවක් දතයුතු නම්, නැවත නැවත දතයුතු නම්, වෙසෙසින් දතයුතු නම්, මැනැවින් දතයුතු නම්, අධිගම කළයුතු නම්, නුවණින් ස්පර්ශ කළයුතු නම්, ප්‍රත්‍යක්ෂ කළයුතු නම්, ඒ සියල්ල ඒ බෝධිඥානයෙන් දත්හ. අනුබෝධ කළහ. ප්‍රතිබෝධ කළහ. වෙසෙසින් දත්හ. මැනැවින් දත්හ. ස්පර්ශ කළහ. ප්‍රත්‍යක්ෂ කළහ. මෙසේ බුදුහු එකලා වැ අනුත්තර වූ සම්‍යක්සම්බෝධිය අභිසම්බුද්ධ කළාහු නුයි 'එක' නම් වූහ.

රතිමජ්ඣගා – 'රතිං' යනු: නෛෂ්ක්‍රම්‍යරතියට විවේකරතියට උපශමරතියට සම්බෝධිරතියට පැමිණියහ – අධිගම් කළහ; ස්පර්ශ කළහ, ප්‍රත්‍යක්ෂ කළාහු නුයි 'එකො'ව රතිමජ්ඣගා' යනු වේ.

එයින් වදාළහ සැරියුත් මහතෙරණුවෝ:

"සදෙවකස්ස ලොකස්ස -පෙ- එකොව රතිමජ්ඣගා"යි.

**16 – 8**

මෙහි (-මේ ශාසනයෙහි) ක්ෂත්‍රියාදි බොහෝ ශිෂ්‍යයන් අතුරෙන් අර්ථී වූ මම තෘෂ්ණා – දෘෂ්ටිනිශ්‍රය රහිත වූ ලාභාදියෙහි තාදි වූ කුහනවස්තු රහිත වූ ගණාචාර්‍ය්‍ය වූ සකස්පුරයට පැමිණි ඒ බුදුන් කරා ප්‍රශ්නහෙතුයෙන් පැමිණියෙමි.

තං බුද්ධං අසිතං තාදින්ති – ‘බුද්ධො’ති යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි. තත්ථ ච සබ්බඤ්ඤුතං පාපුණි[1]. බලෙසු ච වසීභාවං පාපුණි. ‘බුද්ධො’ති කෙනට්ඨෙන බුද්ධො? බුජ්ඣිතා සච්චානීති බුද්ධො. බොධෙතා පජායාති බුද්ධො. සබ්බඤ්ඤුතාය බුද්ධො. සබ්බදස්සාවිතාය බුද්ධො. අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො. විසවිතාය බුද්ධො. ඛීණාසවසඞ්ඛාතෙන බුද්ධො. නිරුපක්කිලෙසසඞ්ඛාතෙන බුද්ධො. එකන්තවීතරාගොති බුද්ධො. එකන්තවීතදොසොති බුද්ධො. එකන්තවීතමොහොති බුද්ධො. එකන්තනික්කිලෙසොති බුද්ධො. එකායනමග්ගං ගතොති බුද්ධො. එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො. අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභා[2] බුද්ධො. ‘බුද්ධො’ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධොති – තං බුද්ධං.

අසිතන්ති – ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච. කතමො තණ්හානිස්සයො? යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමාකතං ඔධිකතං පරියන්තකතං පරිග්ගහිතං මමායිතං: ‘ඉදං මම, එතං මම, එත්තකං මම, එත්තාවතා මම, මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨඤ්ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච – කෙවලම්පි මහාපථවිං තණ්හාවසෙන මමායති, යාවතා අට්ඨසතං තණ්හාවිචරිතං, අයං තණ්හානිස්සයො.

කතමො දිට්ඨිනිස්සයො? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි; යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පටිග්ගාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො අයාථාවතස්මිං[3] යාථාවතන්ති ගාහො, යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි, අයං දිට්ඨිනිස්සයො.

---

1. පත්තො - ස්‍යා. PTS.
2. පටිලාභත්තා - සීමු. PTS.
3. අයාථාවකස්මිං - සීමු. II. PTS. මජසං.

**තං බුද්ධං අසිතං තාදිං** – 'බුද්ධ' නම්: යම් ඒ භාග්‍යවත් කෙනෙක් තුමූ මැ සර්වඥ වූවාහු ආචාර්යයකු රහිත වැ පෙර නො ඇසූවිරූ දහම් විෂයෙහි තුමූ මැ සිවුසස් අවබොධ කළාහු ද, ඒ සත්‍යයන්හි දු සර්වඥ බවට පැමිණියාහු ද, බලයන්හි දු වශී බවට පැමිණියාහු ද, (ඔහු යැ) බුද්ධ යනු. කවර අර්ථයෙකින් 'බුද්ධ' නම් වී ද යත්? සිවුසස් අවබොධ කෙළේ නුයි 'බුද්ධ'යැ, ප්‍රජාවට අවබොධ කරවනුයේ නුයි 'බුද්ධ'යැ, සර්වඥ බැවින් 'බුද්ධ'යැ, සියල්ල දක්නා හෙයින් 'බුද්ධ'යැ, අනෙකක්හු විසින් අවබොධ නො කැරවිය යුතු හෙයින් 'බුද්ධ'යැ, විවිධගුණ පහළ කරන හෙයින් 'බුද්ධ'යැ, ක්ෂීණාස්‍රව සඞ්ඛ්‍යාවෙන් 'බුද්ධ'යැ, නිරුපක්ලෙශ සඞ්ඛ්‍යාවෙන් 'බුද්ධ'යැ, එකාන්තයෙන් වීතරාග නුයි 'බුද්ධ'යැ, එකාන්තයෙන් වීතද්වෙෂ නුයි 'බුද්ධ'යැ, එකාන්තයෙන් වීතමොහ නුයි 'බුද්ධ'යැ එකාන්තයෙන් කෙලෙස් රහිත නුයි 'බුද්ධ'යැ, එකායනමාර්ගයට ගියේ නුයි 'බුද්ධ'යැ, එකලා වැ අනුත්තර වූ සම්‍යක්සම්බොධිය අවබොධ කෙළේ නුයි 'බුද්ධ'යැ, අබුද්ධිය නැසූ හෙයින් බුද්ධිප්‍රතිලාභය හෙතු කොට ගෙන බුද්ධ යැ. 'බුද්ධ' යන මෙල නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑයකු විසින් නො කරන ලද, බූහක විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරන ලද, නෑසහලේනෑයන් විසින් නො කරන ලද, මහණබමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද. භාග්‍යවත් බුදුවරයනට යම් 'බුද්ධ' යන නාමයෙක් වේ නම්, අර්හත්ඵලයාගේ අන්තයෙහි උපන් මෙල නාමය මහබෝමැඩ දී සර්වඥතාඥනයාගේ ප්‍රතිලාභය සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකැ'යි 'තං බුද්ධං' යනු වේ.

**අසිතං** – යනු: තෘෂ්ණානිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය දැ'යි නිඃශ්‍රය දෙකෙකි. තෘෂ්ණානිඃශ්‍රය කවරැ යත්: යම්තාක් තෘෂ්ණා කොටසින් සීමා කරන ලද ද අවධි කරන ලද ද හිම් කරන ලද ද අයත් කරන ලද ද මමායන කරන ලද දඃ 'මේ මාගේ යැ, මෙල මාගේ යැ, මෙතෙක් මාගේ යැ, මාගේ රූපයෝ යැ, ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, අතුරුණු යැ පොරෝණා යැ දාසිදස්හු යැ එළුබැටළු යැ කුකුළුහූරු යැ ඇත්අස්ගවවෙළඹහු යැ, කෙත් යැ වතු යැ අමුරන් රන්රන් ගම්නියම්ගම්රජදහන්හු යැ රට දනව් කොටු හා කොටුගුළු ද – සියලු මැ මහපොළොව තෘෂ්ණාවශයෙන් මමායන කෙරෙයි, යම්තාක් අටතුරාසියක් තෘෂ්ණාවිචරිතය වේ ද, මේ තෘෂ්ණානිඃශ්‍රය යි.

දෘෂ්ටිනිඃශ්‍රය කවරැ යත්: විංශතිවස්තුක සත්කායදෘෂ්ටි යැ, දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි යැ, දශවස්තුක අන්තග්‍රාහිකාදෘෂ්ටි යැ, යන මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටි නමැති ගහනයෙක් දෘෂ්ටි නමැති කාන්තාරයෙක් දෘෂ්ටි නමැති විසූකායිකයෙක් (–විලොමදෘෂ්ටියක්) දෘෂ්ටිවිලනයෙක් දෘෂ්ටිසංයොජනයෙක් දැඩිව ගැනීමෙක් පිහිටා ගැනීමෙක් (නිත්‍යාදිවශයෙන්) අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් අයථාමාර්ගයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසයෙන් ගැනීමෙක් අස්වභාවයෙන් ගැනීමෙක් පරිවර්තන කොට ගැනීමෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි 'ස්වභාවයැ'යි ගැනීමෙක් වේ ද, යම්තාක් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ වෙත් ද, මේ දෘෂ්ටිනිඃශ්‍රය යි.

බුද්ධස්ස භගවතො තණ්හානිස්සයො පහීනො; දිට්ඨිනිස්සයො පටිනිස්සට්ඨො; තණ්හානිස්සයස්ස පහීනත්තා දිට්ඨිනිස්සයස්ස පටිනිස්සට්ඨත්තා භගවා චක්ඛුං අසිතො, සොතං - ඝානං - ජිව්හං - කායං - මනං - අසිතො, රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අසිතො අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතී'ති - තං බුද්ධං අසිතං.

තාදින්ති - භගවා පඤ්චහාකාරෙහි තාදී: ඉට්ඨානිට්ඨෙ තාදී, චත්තාවීති තාදී, තිණ්ණාවී'ති තාදී, මුත්තාවීති තාදී, තන්නිද්දෙසා තාදී.

කථං භගවා ඉට්ඨානිට්ඨෙ තාදී? භගවා ලාභෙපි තාදී, අලාභෙපි තාදී, යසෙපි තාදී, අයසෙපි තාදී, පසංසායපි තාදී, නින්දායපි තාදී, සුඛෙපි තාදී, දුක්ඛෙපි තාදී. එකං චෙ[1] බාහං ගන්ධෙන ලිම්පෙය්‍යුං, එකං චෙ බාහං වාසියා තච්ඡෙය්‍යුං, අමුස්මිං[2] නත්ථි රාගො, අමුස්මිං[2] නත්ථි පටිඝං. අනුනයපටිඝවිප්පහීනො උග්ඝාතිනිග්ඝාති වීතිවත්තො අනුරොධවිරොධං සමතික්කන්තො. එවං භගවා ඉට්ඨානිට්ඨෙ තාදී.

කථං භගවා චත්තාවීති තාදී? භගවතා රාගො චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො. දොසො - මොහො - කොධො - උපනාහො - මක්ඛො - පළාසො - ඉස්සා - මච්ඡරියං - මායා - සාඨෙය්‍යං - ථම්භො - සාරම්භො - මානො - අතිමානො - මදො - පමාදො - සබ්බෙ කිලෙසා - සබ්බෙ දුච්චරිතා - සබ්බෙ දරථා - සබ්බෙ පරිළාහා - සබ්බෙ සන්තාපා - සබ්බාකුසලාභිසඞ්ඛාරා චත්තා වන්තා මුත්තා පහීනා පටිනිස්සට්ඨා. එවං භගවා 'චත්තාවී'ති තාදී.

කථං භගවා තිණ්ණාවීති තාදී? භගවා කාමොඝං තිණ්ණො, භවොඝං තිණ්ණො, දිට්ඨොඝං තිණ්ණො, අවිජ්ජොඝං තිණ්ණො, සබ්බං සංසාරපථං තිණ්ණො, උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො ගතද්ධො ගතදිසො ගතකොටිකො[3] පාලිතබ්‍රහ්මචරියො උත්තමදිට්ඨිප්පත්තො භාවිතමග්ගො පහීනකිලෙසො පටිවිද්ධාකුප්පො සච්ඡිකතනිරොධො.

---

1. එකඤ්චෙ - සිමු. II. මජසං. 2. අමුකස්මිං - සිමු. II. මජසං. PTS.
3. ගතකොටියො - සිමු. II. මජසං.

භාග්‍යවත් බුදුන් විසින් තෘෂ්ණානිඃශ්‍රය ප්‍රහීණ කරන ලද, දෘෂ්ටිනිඃශ්‍රය දුරු කරන ලද; තෘෂ්ණානිඃශ්‍රය ප්‍රහීණ කල බැවින් දෘෂ්ටිනිඃශ්‍රය දුරුලූ බැවින් බුදුහු ඇස අශ්‍රිතයහ (-ඇසුරු නො කළහ,) කන - නැහැය - දිව - කය- මනස අශ්‍රිතයහ, රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් - කුලය - ගණයා- ආවාසය - ලාභය - යශස -ප්‍රශංසාව -සුඛය -චීවර -පිණ්ඩපාත -ශයනාසන- ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර - කාමධාතුව රූපධාතුව අරූපධාතුව කාම- භවය රූපභවය අරූපභවය සංඥාභවය අසංඥාභවය නෛවසංඥානාසංඥා- භවය එකවෝකාරභවය චතුවෝකාරභවය පඤ්චවෝකාරභවය අතීතය අනාගතය වර්තමානය - දෘෂ්ටශ්‍රැතමුත විඥාතව්‍යධර්මයන්හි අශ්‍රිතයහ, අනිඃශ්‍රිත- යහ, නො ඇලුණාහ, නො පැමිණියහ, නො මැඩුණාහ, නො බැසගත්හ. බැහැර වූවාහු නික්මගියාහු වෙසෙසින් මිදුණාහු විසංයුක්ත වූවාහු විගත- මර්යාද කල සිතින් යුක්ත ව වෙසෙත් නුයි 'තං බුද්ධං අසිතං' යනු වේ.

තාදිං - යනුඃ බුදුහු පස් අයුරෙකින් තාදීහ: ඉෂ්ටානිෂ්ටයෙහි තාදීහ, කෙලෙස් දුරුකලාහු නුයි තාදීහ, සසර තරණය කලාහු නුයි තාදීහ, රාගාදියෙන් මිදුණාහු නුයි තාදීහ, ශීලාදියෙන් නිර්දේශ කොට කියයුතු හෙයින් තාදීහ.

කිසෙයින් බුදුහු ඉෂ්ටානිෂ්ටයෙහි තාදී වූහ යත්: බුදුහු ලාභයෙහි ද තාදී වූහ, අලාභයෙහි ද - යශස්හි ද - අයශස්හි ද - ප්‍රශංසායෙහි ද-නින්දා- යෙහි ද - සුඛයෙහි ද - දුඃඛයෙහි ද තාදී (-සදෘශ) වූහ. ඉදින් එක් බාහුවක් සුවඳින් ගල්වන්නාහු නම්, ඉදින් එක් බාහුවක් වෑයෙන් සස්නාහු නම්, අර සුවඳ ගල්වන්නහු කෙරෙහි සෙනහයෙක් නැත, අර වෑයෙන් සස්නහු කෙරෙහි කොපයකු ත් නැත; ස්නේහය හා කෝපය දුරු කළහ, අනුග්‍රහ නිග්‍රහ ඉක්මවූහ, ස්නෙහකොප වෙසෙසින් ඉක්මවූහ. මෙසේ බුදුහු ඉෂ්ටා- නිෂ්ට ආලම්බනයෙහි තාදී (-සමාන) වූ සේක.

කිසෙයින් බුදුහු ත්‍යක්තවත් නුයි තාදී වූහ යත්: භාග්‍යවත්හු විසින් රාගය ත්‍යක්ත යැ වාන්ත යැ මුක්ත යැ ප්‍රහීණ කරන ලද, දුරලන ලද්දේ ය, ද්වේෂය - මෝහය - ක්‍රෝධය - බද්ධවෛරය - මකුබව - යුගග්‍රාහය - ඊර්ෂ්‍යාව- මාත්සර්‍ය්‍යය - මායාව - ශඨබව - තදබව - කරණුත්තරියකරණය - මානය- අතිමානය - මදය - ප්‍රමාදය - සියලු ක්ලේශයෝ - සියලු දුශ්චරිතයෝ - සියලු දරථයෝ - සියලු පරිදාහයෝ - සියලු සන්තාපයෝ - සියලු අකුශලාභි- සංස්කාරයෝ හරන ලද්දාහු ය, වමනය කරන ලද්දාහු ය, මුදන ලද්දාහු ය, ප්‍රහීණ කරන ලද්දාහු ය, හාත්පසින් දුරලන ලද්දාහු යි. මෙසේ බුදුහු ත්‍යක්තවත් (-කෙලෙස් දුරුකලාහු)නුයි තාදී වූ සේක.

කිසෙයින් බුදුහු තීර්ණවත් නුයි තාදී වූහ යත්: බුදුහු කාමෞඝය තරණය කළහ, භවෞඝය තරණය කළහ, දිට්ඨෞඝය තරණය කළහ, අවිද්‍යෞඝය තරණය කළහ, සියලු සසරමඟ තරණය කළහ, උත්තීර්ණ වූහ, නිස්තීර්ණ වූහ, ඉක්මවූහ, මැනැවින් ඉක්මවූහ, වෙසෙසින් ඉක්මවූහ. ඒ බුදුහු වුසූ මඟබඹසර ඇතියහ, පසලොස් චරණධර්මයෙහි චීර්ණවශී වූහ, ඉක්මවූ සසරමඟ ඇතියහ, නිවන්දෙසට ගියහ, නිවන්කෙල පැමිණියහ, රැකි බඹසර ඇතියහ, උත්තම සම්‍යග්දෘෂ්ටියට පැමිණියහ, වැඩූ මාර්ග ඇතියහ, පුහුණු කෙලෙස් ඇතියහ, පිළිවිදි රහත්පල ඇතියහ, පසක්කල නිවන ඇතියහ.

දුක්ඛං තස්ස පරිඤ්ඤාතං, සමුදයො පහීනො, මග්ගො භාවිතො, නිරොධො සච්ඡිකතො. අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං, පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං, පහාතබ්බං පහීනං, භාවෙතබ්බං භාවිතං, සච්ඡිකාතබ්බං සච්ඡිකතං. සො උක්ඛිත්තපළිඝො සංකිණ්ණපරිඛො අබ්බුළ්හෙසිකො නිරග්ගළො අරියො පන්නද්ධජො පන්නභාරො විසඤ්ඤුත්තො පඤ්චඞ්ගවිප්පහීනො ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරපස්සෙනො[1] පනුන්නපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිලසඞ්කප්පො පස්සද්ධකායසඞ්ඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො කෙවලී වුසිතවා උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො. සො නෙවාචිනාති, න අපචිනාති[2] අපචිනිත්වා ඨිතො. නෙව පජහති, න උපාදියති, පජහිත්වා ඨිතො. නෙව සංසිබ්බති, න විසිනෙති[3], විසිනෙත්වා[4] ඨිතො. නෙව විධූපෙති, න සන්ධූපෙති, විධූපෙත්වා ඨිතො. අසෙඛෙන[5] සීලක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො. සච්චං සම්පටිපාදියිත්වා ඨිතො, එජං සමතික්කමිත්වා ඨිතො, කිලෙසග්ගිං පරියාදියිත්වා ඨිතො, අපරිගමනතාය ඨිතො, කථං[6] සමාදාය ඨිතො, මුත්තපටිසෙවනතාය ඨිතො, මෙත්තාය පාරිසුද්ධියා ඨිතො, කරුණාය පාරිසුද්ධියා ඨිතො, මුදිතාය පාරිසුද්ධියා ඨිතො, උපෙක්ඛාය පාරිසුද්ධියා ඨිතො, අච්චන්තපාරිසුද්ධියා ඨිතො, අතම්මයතාය පාරිසුද්ධියා ඨිතො, විමුත්තත්තා ඨිතො, සන්තුසිතත්තා[7] ඨිතො, ඛන්ධපරියන්තෙ ඨිතො, ධාතුපරියන්තෙ ඨිතො, ආයතනපරියන්තෙ ඨිතො, ගතිපරියන්තෙ ඨිතො, උපපත්තිපරියන්තෙ ඨිතො, පටිසන්ධිපරියන්තෙ ඨිතො, භවපරියන්තෙ ඨිතො, සංසාරපරියන්තෙ ඨිතො, වට්ටපරියන්තෙ ඨිතො, අන්තිමෙ භවෙ ඨිතො, අන්තිමෙ සමුස්සයෙ ඨිතො. අන්තිමදෙහධරො භගවා.

1. "තස්සා'යං පච්ඡිමකොටි[8]
චරිමො'යං සමුස්සයො,
ජාතිමරණසංසාරො
නත්ථි තස්ස පුනබ්භවො"ති.

එවං භගවා තිණ්ණොවිති තාදී.

1. චතුරාපස්සෙනො - සිමු. PTS.
2. අපචිනති - මජසං.
3. උසිනෙති - මජසං. උස්සිනෙති - ස, PTS.
4. විසිබ්බෙත්වා - ස.
5. අසෙක්ඛෙන - ස. PTS
6. කටං - මජසං. PTS
7. සන්තුස්සිතත්තා - සිමු. II
8. පච්ඡිමකො - සිමු. II. PTS. පච්ඡිමකො භවො - මජසං.

ඔවුන් විසින් දුක පිරිසිඳින ලද, සමුදය ප්‍රහීණ කරන ලද, මාර්ගය වඩන ලද, නිරෝධය ප්‍රත්‍යක්ෂ කරන ලද; (ස්වභාවලක්ෂණාවබොධයෙන්) දතයුත්ත වෙසෙසින් දැනගන්නා ලද, (සාමාන්‍යලක්ෂණාවබොධයෙන්) දතයුත්ත හාත්පසින් දැනගන්නා ලද, හලයුත්ත හරනා ලද, වැඩිය යුත්ත වඩනා ලද, පසක්කලයුත්ත පසක්කරන ලද. ඒ බුදුහු නගාපී අවිද්‍යාපරිඝය ඇතියහ, පිසුරුවාලූ (කර්මාභිසංස්කාර නමැති) පරිඛාව ඇතියහ, උදුරාපී (තෘෂ්ණා නමැති) එසිකාව ඇතියහ, (ඔරම්භාගිය සංයෝජන නමැති) අගුළු රහිතයහ, ආර්ය (-පරිශුද්ධ) යහ, හෙළූ මානධ්වජ ඇතියහ, බහාතැබූ (ස්කන්ධාදි) බර ඇතියහ, සතර යොගයෙන් විසංයුක්තයහ, (කාමච්ඡන්දාදි) පසඟ උපායෙන් ප්‍රහීණ කළහ, ෂඩඞ්ගොපෙක්ෂාවෙන් සමන්විතයහ, ස්මෘති සඞ්ඛ්‍යාත උත්තම ආරක්ෂා ඇතියහ, (පටිසෙවනාදි) චතුර්විධ අපාශ්‍රය ඇතියහ, ප්‍රහීණ කළ ප්‍රත්‍යෙකසත්‍ය ඇතියහ, මැනැවින් දුරුකළ සියලු එසනා ඇතියහ, නො කැලැඹුණු සඞ්කල්ප ඇතියහ, දුරලූ කායසංස්කාර ඇතියහ, මොනොවට මිදුණු සිත් ඇතියහ, මොනොවට මිදුණු ප්‍රඥා ඇතියහ, පරිපූර්ණයහ, වුසූ බඹසරවස් ඇතියහ, උත්තමපුරුෂයහ, පරමපුරුෂයහ, පරමප්‍රාප්තියට පැමිණියහ. ඒ බුදුහු (කුශලාකුශලවිපාකය) නො මැ රැස් කෙරෙති, නො වනසති, (කෙලෙස්) වනසා සිටියහ; (ප්‍රහාතව්‍යයක් නැති හෙයින්) නො මැ දුරු කෙරෙති, (තෘෂ්ණාදි විසින්) දැඩි වැ නො ගනිති, දුරලා සිටියහ; (තෘෂ්ණාවශයෙන්) නො මැ සීවනය කෙරෙති, (මානවශයෙන්) උත්කංසනය නො කෙරෙති, විගතබන්ධන වැ සිටියහ; (කෙලෙස්ගිනි) නො මැ නිවති, නො දල්වති, නිවා සිටියහ; අශෛක්ෂ වූ ශීලස්කන්ධයෙන් සමන්විත වන බැවින් (නො පිරනී) සිටියහ, අශෛක්ෂ වූ සමාධිස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, අශෛක්ෂ වූ ප්‍රඥාස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, අශෛක්ෂ විමුක්තිස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, අශෛක්ෂ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, චතුරාර්යසත්‍යය (සිය සතන්හි) සම්පාදනය කොට සිටියහ, තෘෂ්ණාව ඉක්මවා සිටියහ, කෙලෙස්ගිනි ගෙවා සිටියහ, සසර යළි නො යන බැවින් සිටියහ, (නයග්‍රාහික) කථාව ගෙන සිටියහ, (කෙලෙසුන් කෙරෙන්) මිදුණු පලසමවත් සෙවුණා බැවින් සිටියහ, මෛත්‍රීපාරිශුද්ධියෙහි සිටියහ, කරුණාපාරිශුද්ධියෙහි සිටියහ, මුදිතාපාරිශුද්ධියෙහි සිටියහ, උපෙක්ෂාපාරිශුද්ධියෙහි සිටියහ. අත්‍යන්තපාරිශුද්ධියෙහි සිටියහ, තෘෂ්ණාදි අතම්මයභාවයෙන් පාරිශුද්ධියෙහි සිටියහ, කෙලෙසුන් කෙරෙන් මිදුණු බැවින් සිටියහ, (යථාලාභාදියෙන්) සන්තුෂ්ට වන බැවින් සිටියහ, ස්කන්ධයන්ගේ පර්යන්තයෙහි සිටියහ, ධාතුපර්යන්තයෙහි සිටියහ, ආයතනපර්යන්තයෙහි සිටියහ, ගතිපර්යන්තයෙහි සිටියහ, උත්පත්තිපර්යන්තයෙහි සිටියහ, ප්‍රතිසන්ධිපර්යන්තයෙහි සිටියහ, භවපර්යන්තයෙහි සිටියහ, සංසාරපර්යන්තයෙහි සිටියහ, වෘත්තපර්යන්තයෙහි සිටියහ, අන්තිමභවයෙහි සිටියහ, අන්තිමශරීරයෙහි සිටියහ, බුදුහු අන්තිමදෙහය ධරන සේක.

1. "මේ ඒ භාග්‍යවත්හුගේ පශ්චිම කෙලවර යැ. මේ අවසාන ශරීරය වෙයි. උන් වහන්සේට ජාතිය මරණය හා පුනර්භව සඞ්ඛ්‍යාත සංසාරප්‍රවෘත්තිය ද නැතැ"යි.

මෙසේ බුදුහු තීර්ණවූහු හුයි 'තාදී' වූ සේක.

කථං භගවා මුත්තාවීති තාදී? භගවතො රාගා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; දොසා චිත්තං – මොහා චිත්තං – කොධා – උපනාහා – මක්ඛා – පළාසා – ඉස්සාය – මච්ඡරියා – මායාය – සාඨෙය්‍යා – ථම්භා – සාරම්භා – මානා – අතිමානා – මදා – පමාදා – සබ්බකිලෙසෙහි – සබ්බදුච්චරිතෙහි – සබ්බදරථෙහි – සබ්බපරිළාහෙහි – සබ්බසන්තාපෙහි – සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. එවං භගවා මුත්තාවීති තාදී.

කථං භගවා තන්නිද්දෙසා තාදී? භගවා සීලෙ සති සීලවාති තන්නිද්දෙසා තාදී, සද්ධාය සති සද්ධොති තන්නිද්දෙසා තාදී, විරියෙ සති විරියවාති තන්නිද්දෙසා තාදී, සතියා සති සතිමාති තන්නිද්දෙසා තාදී, සමාධිස්මිං සති සමාහිතො'ති තන්නිද්දෙසා තාදී, පඤ්ඤාය සති පඤ්ඤවාති තන්නිද්දෙසා තාදී, විජ්ජාය සති තෙවිජ්ජොති තන්නිද්දෙසා තාදී, අභිඤ්ඤාය සති ඡළභිඤ්ඤොති තන්නිද්දෙසා තාදී, දසබලෙ සති දසබලො'ති තන්නිද්දෙසා තාදී. එවං භගවා තන්නිද්දෙසා තාදී'ති – තං බුද්ධං අසිතං තාදිං.

**අකුහං ගණිමාගතන්ති** – 'අකුහො'ති තීණි කුහනවත්ථූනි; පච්චයපටිසෙධන[1]සඞ්ඛාතං කුහනවත්ථු, ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු, සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං පච්චයපටිසෙධනසඞ්ඛාතං[1] කුහනවත්ථු: ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො පාපිච්ඡො ඉච්ඡාපකතො අත්ථිකො[2] චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං භිය්‍යොකම්‍යතං උපාදාය චීවරං පච්චක්ඛාති, පිණ්ඩපාතං පච්චක්ඛාති, සෙනාසනං පච්චක්ඛාති, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පච්චක්ඛාති. සො එවමාහ: 'කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන? එතං සාරුප්පං: යං සමණො සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සඞ්ඝාටිං කරිත්වා ධාරෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන පිණ්ඩපාතෙන? එතං සාරුප්පං: යං සමණො උඤ්ඡාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිකං කප්පෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන සෙනාසනෙන? එතං සාරුප්පං: යං සමණො රුක්ඛමූලිකො වා අස්ස අබ්භොකාසිකො වා. කිං සමණස්ස මහග්ඝෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන? එතං සාරුප්පං: යං සමණො පූතිමුත්තෙන හරිතකීඛණ්ඩෙන ඔසධං කරෙය්‍යා'ති. තදුපාදාය ලූඛං චීවරං ධාරෙති, ලූඛං පිණ්ඩපාතං පරිභුඤ්ජති, ලූඛං සෙනාසනං පටිසෙවති, ලූඛං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති. තමෙනං ගහපතිකා එවං ජානන්ති:

1. පටිසෙවන - සීමු. II, මජසං. PTS. 2. අතිත්ථිකො - සීමු. II

කිසෙසින් බුදුහු මුක්තවූහු නුයි 'තාදී' වූහ යත්: භාග්‍යවත්හුගේ සිත රාගයෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි, ද්වෙෂයෙන් - මෝහයෙන් - ක්‍රොධයෙන් - බද්ධවෛරයෙන් - මකු බැවින් - යුගග්‍රාහයෙන් - ඊර්ෂ්‍යායෙන් - මාත්සය්‍යීයෙන් - මායාවෙන් - ශාඨ්‍යයෙන් - ස්තම්භයෙන් - සාරම්භයෙන් - මානයෙන් - අතිමානයෙන් - මදයෙන් - ප්‍රමාදයෙන් - සියලු කෙලෙසුන් ගෙන් - සියලු දුශ්චරිතයන් ගෙන් - සියලු දරථයන් ගෙන් - සියලු පරිදාහයන් ගෙන් - සියලු සන්තාපයන් ගෙන් - සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් සිත මුක්ත යැ, විමුක්ත යැ, සුවිමුක්ත යි. මෙසේ බුදුහු මුක්තවත් නුයි - 'තාදී' වූ සේක.

කිසෙසින් බුදුහු තන්නිද්දේශ්‍ය හෙයින් තාදී වූහ යත්: බුදුහු ශීලය ඇති කල්හි සිල්වත්හ'යි තන්නිද්දේශ්‍ය හෙයින් තාදීහ, ශ්‍රද්ධාව ඇති කල්හි ශ්‍රද්ධාවත්හ'යි එයින් දක්වියයුතු හෙයින් තාදීහ, වීය්‍යීය ඇති කල්හි වීය්‍යීවත්හ'යි එයින් දක්වියයුතු හෙයින් තාදීහ, ස්මෘතිය ඇති කල්හි ස්මෘතිමත්හ'යි එයින් දක්වියයුතු හෙයින් තාදීහ, සමාධිය ඇති කල්හි සමාහිතයහ'යි තන්නිද්දේශ්‍ය හෙයින් තාදීහ, ප්‍රඥාව ඇති කල්හි ප්‍රඥාවත්හ'යි තන්නිද්දේශ්‍ය හෙයින් තාදීහ, විද්‍යාව ඇති කල්හි ත්‍රෛවිද්‍යහ'යි තන්නිද්දේශ්‍ය හෙයින් තාදීහ, අභිඥාව ඇති කල්හි ෂඩභිඥ වූහ'යි තන්නිද්දේශ්‍ය හෙයින් තාදීහ, දශබලය ඇති කල්හි දශබලධාරීහ'යි තන්නිද්දේශ්‍ය හෙයින් තාදී වූහ. මෙසේ බුදුහු තන්නිද්දේශ්‍ය හෙයින් තාදී වූ සේකැයි 'තං බුද්ධං අසිතං තාදිං' යනු වේ.

අකුහං ගණිමාගතං - 'අකුහ' නම්: කුහනවස්තු තුනෙකි: ප්‍රත්‍යයප්‍රතිෂේධන සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ, ඊය්‍යාපථ සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ, සාමන්තජල්පන සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැයි.

ප්‍රත්‍යයප්‍රතිෂේධන සඞ්ඛ්‍යාත කුහනවස්තුව කවර යත්: මෙහි ගෘහපතියෝ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකරින් මහණක්හු පවරති. හෙතෙම ලාමක ආශා ඇතියේ ආශායෙන් මඩනා ලදුයේ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකර කැමැති වූයේ වැඩියක් කැමැතිබව නිසා සිවුර ප්‍රතික්ෂෙප කෙරෙයි, පිණ්ඩපාතය ප්‍රතික්ෂෙප කෙරෙයි, සෙනස්න ප්‍රතික්ෂෙප කෙරෙයි, ගිලන්පස බෙහෙසත් පිරිකර ප්‍රතික්ෂෙප කෙරෙයි. හෙතෙම මෙසේ කියයි: මහණ හට මාහැඟි සිවුරෙන් කිම? ඉදින් මහණ තෙම සොහොනින් හෝ කසලගොඩින් හෝ අවුණුදෙරින් හෝ කඩරෙදි අවුලා සඟල කොට දරන්නේ නම්, තෙල සරුප් යැ. මහණහට මාහැඟි පිණ්ඩපාතයෙන් කිම? ඉදින් මහණ සිඟා හැසිරීමෙන් ලද පිඬුඅනරින් දිවි පවත්වන්නේ නම්, තෙල සරුප් යැ. මහණ හට මාහැඟි සෙනස්නෙන් කිම? ඉදින් මහණ රුක්ඛමූලික හෝ අබ්භොකාසික හෝ වන්නේ නම්, තෙල සරුප් යැ, මහණ හට මාහැඟි වූ ගිලන්පස බෙහෙසත්පිරිකරින් කිම? ඉදින් මහණ පූතිමූත්‍රයෙන් අරළුකඩෙකින් බෙහෙත් කරන්නේ නම්, තෙල සරුප් යැයි. එතැන් පටන් රළු සිවුරු දරයි, රළු පිණ්ඩපාතය වළඳයි, රළු සෙනසුන් ඇසුරු කෙරෙයි, රළු වූ ගිලන්පස බෙහෙසත්පිරිකර සෙවනය කෙරෙයි. ගෘහපතියෝ ඔහු මෙසේ දනගනිති:

අයං සමණො අප්පිච්ඡො සන්තුට්ඨො පවිවිත්තො අසංසට්ඨො ආරද්ධවිරියො ධුතවාදෙති භීය්‍යො නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො එවමාහ: "තිණ්ණං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති: සද්ධාය සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. තුම්හාකඤ්චෙවායං සද්ධා අත්ථි. දෙය්‍යධම්මො ච සංවිජ්ජති. අහඤ්ච පටිග්ගාහකො. සචෙ අහං න පටිග්ගහෙස්සාමි, එවං තුම්හෙ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ. න මය්හං ඉමිනා අත්ථො. අපි ච තුම්හාකං යෙව අනුකම්පාය පටිග්ගණ්හාමී'ති". තදුපාදාය බහුම්පි චීවරං පටිග්ගණ්හාති, බහුම්පි පිණ්ඩපාතං පටිග්ගණ්හාති, බහුම්පි සෙනාසනං පටිග්ගණ්හාති, බහුම්පි ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිග්ගණ්හාති. යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං; ඉදං පච්චයපටිසෙවන[1] සඞ්ඛාතං කුහනවත්ථු.

කතමං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො 'එවං මං ජනො සම්භාවෙස්සතී'ති ගමනං සණ්ඨපෙති, ඨානං සණ්ඨපෙති, නිසජ්ජං සණ්ඨපෙති, සයනං සණ්ඨපෙති, පණිධාය ගච්ඡති, පණිධාය තිට්ඨති, පණිධාය නිසීදති, පණිධාය සෙය්‍යං කප්පෙති, සමාහිතො විය ගච්ඡති, සමාහිතො විය තිට්ඨති, සමාහිතො විය නිසීදති, සමාහිතො විය සෙය්‍යං කප්පෙති, ආපාථකජ්ඣායීව හොති. යා එවරූපා ඉරියාපථස්ස අට්ඨපනා[2] ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො 'එවං මං ජනො සම්භාවෙස්සතී'ති අරියධම්මසන්නිස්සිතං වාචං භාසති. යො එවරූපං චීවරං ධාරෙති, සො සමණො මහෙසක්ඛොති භණති. යො එවරූපං පත්තං ධාරෙති, ලොහථාලකං ධාරෙති, ධම්මකරකං[3] ධාරෙති, පරිස්සාවනං ධාරෙති, කුඤ්චිකං ධාරෙති, උපාහනං ධාරෙති, කායබන්ධනං ධාරෙති, ආයොගං ධාරෙති, සො සමණො මහෙසක්ඛොති භණති. යස්ස එවරූපො උපජ්ඣායො, සො සමණො මහෙසක්ඛොති භණති. යස්ස එවරූපො ආචරියො – සමානුපජ්ඣායකා – සමානාචරියකා – මිත්තා – සන්දිට්ඨා – සම්භත්තා – සහායා, සො සමණො මහෙසක්ඛොති භණති. යො එවරූපෙ විහාරෙ වසති, සො සමණො මහෙසක්ඛොති භණති. යො එවරූපෙ අඩ්ඪයොගෙ වසති – පාසාදෙ වසති – හම්මියෙ වසති – ගුහාය වසති – ලෙණෙ වසති – කුටියා වසති – කූටාගාරෙ වසති – අට්ටෙ[4] වසති – මාළෙ වසති – උද්දණ්ඩෙ වසති – උපට්ඨානසාලාය වසති – මණ්ඩපෙ වසති – රුක්ඛමූලෙ වසති, සො සමණො මහෙසක්ඛොති භණති.

1. පටිසෙවන - සීමු. II. මජසං. PTS. 2. ආඨපනා - සීමු. II. මජසං.
3. ධම්මකරණං - මජසං 4 අඩ්ඩ - සීමු. II. මජසං.

'මේ මහණ අල්පේච්ඡ යැ සන්තුෂ්ට යැ උතුම් විවේක ඇත්තෙකැ කුලයා හා සසඟ නැත්තෙකැ පටන්ගත් වීර්ය ඇත්තෙකැ ධුතාඞ්ගගුණ කියන්නෙකැ'යි මතුමත්තෙහි චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙසත්පිරිකරින් පවරත්. හෙතෙම මෙසේ කියයි: තිදෙනකුන්ගේ හමුවීමෙන් සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි: ශ්‍රද්ධාව හමුවීමෙන් (-ඇතිබැවින්) සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි. දෙයධර්මය ඇසිබැවින් සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි. දක්ෂිණාර්හයන් ඇතිබැවින් සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි. තවද තොපට මැ මේ ශ්‍රද්ධාව ඇත. දෙයධර්මය ද විද්‍යමාන වෙයි. මම ද ප්‍රතිග්‍රාහකයෙමි. ඉදින් මම් නො පිළිගනිම් නම්, මෙසේ තෙපි පිනින් පරිබාහිර වන්නහු යැ. මට මෙයින් ප්‍රයෝජන නැත. එහෙත් තොපට මැ අනුකම්පා සඳහා පිළිගනිමි'. එතැන් පටන් බොහෝ සිවුරු ද පිළිගනී, බොහෝ පිණ්ඩපාතය ද පිළිගනී, බොහෝ සෙනසුන් ද පිළිගනී, බොහෝ ගිලන්පස බෙහෙසත්පිරිකර ද පිළිගනී. මෙබඳු වූ යම් බැම බිඳීමෙක් බැම බිඳින බවෙක් කුහනයෙක් කොහොත් බවෙක් විස්මාපිත බවෙක් වේ ද. මේ 'පච්චයපටිසෙවන සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ.

ඊර්යාපථ සඞ්ඛ්‍යාත කොහොත් වස්තුව කවරැ යත්: මෙහි කිසිවෙක් පාපේච්ඡ වූයේ ඉච්ඡාවෙන් මඩනා ලදුයේ බුහුමන් කැමැති වූයේ 'ජනයා මේසේ මට බුහුමන් කරන්නේ යැ'යි ගමන සකස් කෙරෙයි, සිටීම- හිඳීම- ශයනය සකස් කෙරෙයි, පතාගෙන යයි, පතාගෙන සිටී, පතාගෙන හිඳී, පතාගෙන ශයනය කෙරෙයි. සමාධියට පැමිණියකු සෙයින් යෙයි, සමාහිතයකු සෙයින් හිඳී, සමාහිතයකු සෙයින් ශයනය කෙරෙයි; ජනයා හමුයෙහි ධ්‍යාන කරනුයේ මැ වෙයි. මෙබඳු වූ ඊර්යාපථයාගේ යම් ආදි කොට තැබීමෙක් තබන අයුරෙක් සකස් කොට තැබීමෙක් මුහුණු හකුළුවන බවෙක් මුහුණු හකුළුවන සුලු බවෙක් විස්මාපනයෙක් විස්මාපනාකාරයෙක් විස්මාපිත බවෙක් වේ ද; මේ ඊර්යාපථසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ.

සාමන්තජල්පනසඞ්ඛ්‍යාත කොහොත්වන කවරැ යත්: මෙහි කිසිවෙක් පාපේච්ඡ වූයේ ඉච්ඡාවෙන් මඩනා ලදුයේ බුහුමන් කැමැති වූයේ 'ජනයා මට මෙසේ බුහුමන් කරන්නේය'යි ලොවුතුරු දහම් පිළිබඳ වූ වදන් බෙණෙයි: යමෙක් මෙබඳු සිවුරු ධරා නම්, ඒ මහණ මහේශාක්‍ය (මහායශස්ක) යෙකැ'යි බෙණෙයි. යමෙක් මෙබඳු පාත්‍රයක් ධරා නම්-ලෝහලියක් ධරා නම්-දියඩරවක් ධරා නම් - පෙරහනක් ධරා නම් - කෙස්සක් ධරා නම් - වහන්සඟලක් ධරා නම් - කාබනක් ධරා නම් - ආයොගපට ධරා නම්, ඒ මහණ මහත් අනුභාව ඇත්තෙකැ'යි, බෙණෙයි. යමක් හට මෙබඳු උපාධ්‍යාය කෙනෙක් වෙත් නම්, ඒ මහණ අනුභාව ඇත්තෙකැයි බෙණෙයි, යම්කුට මෙබඳු ආචාර්ය කෙනෙක් වෙත් නම් - සමානොපාධ්‍යායයෝ - සමානාචාර්යයෝ- මිත්‍රයෝ- සංදෘෂ්ටයෝ- සම්භක්තයෝ - සහායයෝ වෙත් නම්, ඒ මහණ අනුභාව ඇත්තෙකැයි බෙණෙයි, යමෙක් මෙබඳු විහාරයෙක වෙසේ නම්, ඒ මහණ අනුභාව ඇත්තෙකැ'යි බෙණෙයි, යමෙක් මෙබඳු ගුරුළුවක්ගෙයෙක වෙසේ නම්- පහයෙක වෙසේ නම් - සඳලුපහයෙක වෙසේ නම් - ගුහායෙක වෙසේ නම්- ලෙනක වෙසේ නම් - කිළියෙක වෙසේ නම් - කූළුගෙයෙක වෙසේ නම්- අටල්ලෙක වෙසේ නම් - මළියෙක වෙසේ නම් - උදුණ්ඩියෙක වෙසේ නම් - උවටැන්හලෙක වෙසේ නම් - මඩුයෙක වෙසේ නම් - රුක්මුලෙක වෙසේ නම්, ඒ මහණ අනුභාව ඇතියෙකැයි බෙණෙයි.

අථවා කොරඤ්ජිකකොරඤ්ජිකො භාකුටිකභාකුටිකො කුහකකුහකො ලපකලපකො මුඛසම්භාවිතො - අයං සමණො ඉමාසං එවරූපානං සන්තානං විහාරසමාපත්තීනං ලාභී‘ති තාදිසං ගම්භීරං ගූළ්හං නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතාපටිසඤ්ඤුත්තං කථං කථෙති. යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

බුද්ධස්ස භගවතො ඉමානි තීණි කුහනවත්ථූනි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි. තස්මා බුද්ධො අකුහොති - අකුහං.

ගණිමාගතන්ති-‘ගණී’ති ගණී භගවා; ගණාචරියොති ගණී, ගණස්ස සත්ථාති ගණී; ගණං පරිහරතීති ගණී, ගණං ඔවදතීති ගණී, ගණං අනුසාසතීති ගණී, විසාරදො ගණං උපසංකමතීති ගණී, ගණො’ස්ස සුස්සූසති සොතං ඔදහති අඤ්ඤා චිත්තං උපට්ඨපෙතීති ගණී, ගණං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතීති ගණී, භික්ඛුගණස්ස ගණී, භික්ඛුනීගණස්ස ගණී, උපාසකගණස්ස ගණී, උපාසිකාගණස්ස ගණී, රාජගණස්ස ගණී, ඛත්තියගණස්ස ගණී, බ්‍රාහ්මණගණස්ස ගණී, වෙස්සගණස්ස ගණී, සුද්දගණස්ස ගණී, දෙවගණස්ස ගණී, බ්‍රහ්මගණස්ස ගණී, සඞ්ඝී,[1] ගණී, ගණාචරියො[2]. ආගතන්ති[3] ආගතං උපාගතං සමුපාගතං[4] සම්පත්තං[5] සඞ්කස්සනගරන්ති - අකුහං ගණිමාගතං.

බහුන්නමිධ[6] බද්ධානන්ති - ‘බහුන්න’න්ති බහුන්නං ඛත්තියානං බ්‍රාහ්මණානං වෙස්සානං සුද්දානං ගහට්ඨානං පබ්බජිතානං දෙවානං මනුස්සානං; බද්ධානන්ති බද්ධානං බද්ධචරානං පරිචාරකානං සිස්සානන්ති - බහුන්නමිධ බද්ධානං.

අත්ථි පඤ්හෙන ආගමන්ති - පඤ්හෙන අත්ථිකාම්හ ආගතා[7] පඤ්හං පුච්ඡිතුකාම්හ ආගතා; පඤ්හං සොතුකාමා ආගතම්හාති එවම්පි අත්ථි පඤ්හෙන ආගමං. අථවා පඤ්හත්ථිකානං පඤ්හං පුච්ඡිතුකාමානං පඤ්හං සොතුකාමානං ආගමනං අභික්කමනං උපසඞ්කමනං පයිරුපාසනං[8] අත්ථීති එවම්පි අත්ථි පඤ්හෙන ආගගමං. අථවා පඤ්හාගමො තුය්හං අත්ථි, ත්වම්පි පහු, ත්වමසි අලමත්තො මයා පුච්ඡිතං කථෙතුං විස්සජ්ජෙතුං; වහස්සෙතං භාරන්ති එවම්පි - අත්ථි පඤ්හෙන ආගමං.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

“තං බුද්ධං අසිතං තාදිං
අකුහං ගණිමාගතං,
බහුන්නමිධ[6] බද්ධානං
අත්ථි පඤ්හෙන ආගම”න්ති.

---

1. සඞ්ඝගණස්ස ගණී - සීමු II. 2. ගණාචරියං - සීමු. II.
3. ආගතං - සීමු. II. ආගතො - PTS.
4. උපගතං සමුපගතං - මජසං. උපාගතො සමුපගතො - PTS
5. සමුපපත්තං - මජසං. 6. බහූනමිධ - මජසං - සීමු. II.
7. අත්ථිකො ආගතොම්හි - මජසං. 8 පයිරුපාසනා - සයා.

නොහොත් අතිශයින් හැකුළුණේ අතිශයින් මුහුණ හකුළුවනසුලු වූයේ අතිශයින් විස්මය කරවනුයේ අතිශයින් ප්‍රලාප කථා කරනුයේ තමාගේ මුඛමාත්‍රයෙන් ම අනුන් විසින් බුහුමන් කරන ලදුයේ 'මේ මහණ තෙම මේ මෙබඳු වූ ශාන්ත වූ විහාරසමාපත්තිලාභී'යයි එබඳු ගැඹුරු වූ ගූඪ වූ සියුම් වූ ප්‍රතිච්ඡන්න වූ ලෝකෝත්තර වූ ශූන්‍යතාප්‍රතිසංයුක්ත වූ කථාව කෙරෙයි. මෙබඳු වූ යම් බැම බිඳීමෙක් කුහනයෙක් කොහොත් අශුරෙක් කොහොත්-බවෙක් වේ ද, මේ සාමන්තජල්පන සංඛ්‍යාත කොහොත්වන යි.

භාග්‍යවත් බුදුන් විසින් මේ තුන් කොහොත්වත් ප්‍රහීණ කරන ලද්දාහු ය, සිඳින ලද්දාහු ය, සන්සිඳුවන ලද්දාහු ය, දුරලන ලද්දාහු ය, (ඔහු) උපතට නුසුදුසු වූවාහු ය, නුවණගින්නෙන් දවන ලද්දාහු ය. එහෙයින් බුදුහු අකුහ නුයි 'අකුහං' යනු වේ.

ගණිමාගතං – 'ගණී' යනු: බුදුහු ගණී වූහ; ගණාචාර්ය්‍ය නුයි ගණී යෑ, ගණයා හට ශාස්තෘ නුයි 'ගණී'යෑ ගණයා පරිහරණය කෙරෙත් නුයි 'ගණී'යෑ, ගණයා හට අවවාද කෙරෙත් නුයි 'ගණී'යෑ, ගණයා හට අනුශාසනා කෙරෙත් නුයි – 'ගණී'යෑ, විශාරද වෑ ගණයා වෙත එළැඹෙත් නුයි 'ගණී'යෑ. ගණ තෙමේ ඔවුන්ගේ බස් අසනු රිසි වෙයි, (ඇසීමට) කන නමයි, දැනගැනීමට සිත එළවා නුයි 'ගණී'යෑ. ගණයා අකුශලයෙන් නගා කුශලයෙහි පිහිටුවාලන සේක් නුයි 'ගණී'යෑ, භික්ෂුගණයට 'ගණී'යෑ, භික්ෂුණීගණයට ගණී යෑ, උපාසකගණයට ගණී යෑ, උපාසිකාගණයට ගණී යෑ, රාජගණයට ගණී යෑ, ක්ෂත්‍රියගණයට ගණී යෑ, බ්‍රාහ්මණගණයට ගණී, යෑ, වෛශ්‍යගණයට ගණී යෑ, ශූද්‍රගණයට ගණී යෑ, දෙවගණයට ගණී යෑ. බ්‍රහ්මගණයට ගණී වූ සේක. සමූහ ඇතියහ, ගණයා ඇතියහ, ගණාචාර්ය්‍ය වූහ. ආගතං යනු සකස්පුරයට ආගත උපාගත සමුපාගත සම්ප්‍රාප්ත වූවාහු නුයි 'අකුහං ගණිමාගතං' යනු වේ.

බහුන්නමිධ බද්ධානං – බොහෝ වූ ක්ෂත්‍රියයන් අතුරෙන් බ්‍රාහ්මණ-වෛශ්‍ය – ශූද්‍ර – ගෘහස්ථ – ප්‍රව්‍රජිත – දෙව – මනුෂ්‍යයන් අතුරෙන්; බද්ධානං-බද්ධ වූ (-බැඳුණු) බැඳී හැසිරෙන පරිචාරක වූ ශිෂ්‍යයන් අතුරෙන් නුයි 'බහුන්නමිධ බද්ධානං' යනු වේ.

අත්ථි පඤ්හෙන ආගමං – ප්‍රශ්නයෙන් අර්ත්‍ථී වෑ (-ප්‍රයොජන ඇති වෑ) පැමිණියම්හ, පැන පුළුවුස්නා කැමැති වෑ පැමිණියම්හ, පැන අසනු කැමැති වෑ පැමිණියම්හ'යි – මෙසේ ත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් ප්‍රශ්නාර්ත්‍ථී වූ පැන පුළුවුස්නා වූ පැන අසනු කැමැතියන්ගේ ඊම අභිමුඛයට පැමිණීම එළැඹීම පයිරුපාසනය වන්නේ ය, ඇත් නුයි-මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් ප්‍රශ්නයාගේ පැමිණීම නුඹ වහන්සේට ඇත, නුඹ වහන්සේත් ප්‍රභූ වූහු යෑ, නුඹ වහන්සේ මා විසින් පුළුවුස්නා ලද්ද කියන්නට විසඳන්නට සමර්ථ වූවහු ය, තෙල භාරය උසුලනු මැනවැ'යි මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. එසින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

"තං බුද්ධං අසිතං තාදිං -පෙ- අත්ථි පඤ්හෙන ආගමං"යි.

**16 - 4**

භික්ඛුනො විජිගුච්ඡතො
භජතො රිත්තමාසනං,
රුක්ඛමූලං සුසානං වා
පබ්බතානං ගුහාසු වා.

**භික්ඛුනො විජිගුච්ඡතොති** - 'භික්ඛුනො'ති පුථුජ්ජනකල්‍යාණකස්ස වා භික්ඛුනො, සෙඛස්ස වා භික්ඛුනො; විජිගුච්ඡතොති ජාතියා විජිගුච්ඡතො, ජරාය - ව්‍යාධිනා - මරණෙන - සොකෙහි - පරිදෙවෙහි - දුක්ඛෙහි - දොමනස්සෙහි - උපායාසෙහි විජිගුච්ඡතො, නෙරයිකෙන දුක්ඛෙන තිරච්ඡානයොනිකෙන දුක්ඛෙන පෙත්තිවිසයිකෙන දුක්ඛෙන මානුසකෙන දුක්ඛෙන ගබ්භොක්කන්තිමූලකෙන දුක්ඛෙන ජාතස්සූපනිබන්ධකෙන දුක්ඛෙන ජාතස්ස පරාධෙය්‍යකෙන දුක්ඛෙන අත්තූපක්කමෙන දුක්ඛෙන පරූපක්කමෙන දුක්ඛෙන දුක්ඛදුක්ඛෙන සඞ්ඛාරදුක්ඛෙන විපරිණාමදුක්ඛෙන චක්ඛුරොගෙන දුක්ඛෙන සොතරොගෙන දුක්ඛෙන ඝානරොගෙන දුක්ඛෙන ජිව්හාරොගෙන දුක්ඛෙන කායරොගෙන දුක්ඛෙන සීසරොගෙන දුක්ඛෙන කණ්ණරොගෙන දුක්ඛෙන මුඛරොගෙන දුක්ඛෙන දන්තරොගෙන දුක්ඛෙන කාසෙන සාසෙන පිනාසෙන ඩහෙන ජරෙන කුච්ඡිරොගෙන මුච්ඡාය පක්ඛන්දිකාය සූලාය විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන අපමාරෙන දද්දුයා කණ්ඩුයා කච්ඡුයා රඛසාය විතච්ඡිකාය ලොහිතෙන පිත්තෙන මධුමෙහෙන අංසාය පිළකාය භගන්දලෙන[1] පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන උතුපරිණාමජෙන ආබාධෙන විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය උච්චාරෙන පස්සාවෙන ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන දුක්ඛෙන - මාතුමරණෙන දුක්ඛෙන පිතුමරණෙන දුක්ඛෙන භාතුමරණෙන - භගිනිමරණෙන - පුත්තමරණෙන - ධීතුමරණෙන - ඤාතිමරණෙන - භොගබ්‍යසනෙන - රොගබ්‍යසනෙන - සීලබ්‍යසනෙන - දිට්ඨිබ්‍යසනෙන දුක්ඛෙන විජිගුච්ඡතො අට්ටීයතො හරායතො ජිගුච්ඡතොති - භික්ඛුනො විජිගුච්ඡතො.

**භජතො රිත්තමාසනන්ති** - 'ආසනං' වුච්චති යත්ථ නිසීදති, මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාසසන්ථාරො; තං ආසනං අසප්පායරූපදස්සනෙන රිත්තං විවිත්තං පවිවිත්තං; අසප්පායසද්දස්සවනෙන රිත්තං විවිත්තං පවිවිත්තං; අසප්පායෙහි පඤ්චහි කාමගුණෙහි රිත්තං විවිත්තං පවිවිත්තං; තං පවිවිත්තං ආසනං භජතො සම්භජතො සෙවතො නිසෙවතො සංසෙවතො පටිසෙවතොති - භජතො රිත්තමාසනං.

**රුක්ඛමූලං සුසානං වාති** - රුක්ඛමූලං යෙව රුක්ඛමූලං; සුසානං යෙව 'සුසාන'න්ති - රුක්ඛමූලං සුසානං වා.

---

1 භගන්දලාය - සයා

**16 - 4**

ජාති ආදියෙන් පිළිකුල් කරන රුක්මුල හෝ සොහොන හෝ පර්වතයන් සම්බන්ධ ගුහාවන්හි හෝ (පස්කම්ගුණයෙන්) විවික්ත (ඇඳ පුටු ආදි) ආසනයන් සෙවුනා මහණ හට -

**භික්ඛුනො විජිගුච්ඡතො** - 'භික්ඛුනො' යනු: පෘථග්ජනකල්‍යාණ භික්ෂුහට හෝ ශෛක්ෂ භික්ෂුහට හෝ; **විජිගුච්ඡතො** - ජාතියෙන් පිළිකුල් කරන්නාහුට, ජරාවෙන් - ව්‍යාධියෙන් - මරණයෙන් - ශෝකයෙන් - පරිදේවයෙන් - දුකින් - දොම්නසින් - උපායාසයෙන් පිළිකුල් කරන්නාහුට, නිරයදුකින් - තිරිසන්යෝනියෙහි දුකින් - ප්‍රේතවිෂයෙහි වූ දුකින් - මිනිස්ලොව (වධබන්ධනාදි) දුකින් - ගර්භාවක්‍රාන්තිමූලක දුකින් - ගර්භස්ථිතිමූලක දුකින් - ගර්භව්‍යුත්‍ථානමූලක දුකින් - උපන්නහු පිළිබඳ දුකින් - උපන්නහු පර අයත් කොට ඇති දුකින් - පරෝපක්‍රමයෙන් වූ දුකින් - දුඃඛදුඃඛයෙන් - සංස්කාරදුඃඛයෙන් - විපරිණාමදුඃඛයෙන් - චක්ෂූරෝගයෙන් වූ දුකින් - ශ්‍රෝත්‍රරෝගයෙන් වූ දුකින් - ඝ්‍රාණරෝගයෙන් වූ දුකින් - ජිහ්වාරෝගයෙන් වූ දුකින් - කායරෝගයෙන් වූ දුකින් - ශීර්ෂරෝගයෙන් වූ දුකින් - කර්ණරෝගයෙන් වූ දුකින් - මුඛරෝගයෙන් වූ දුකින් - දන්තරෝගයෙන් වූ දුකින් - කාසයෙන් ශ්වාසයෙන් පීනසින් දාහයෙන් ජ්වරයෙන් කුක්ෂිරෝගයෙන් මූර්ඡායෙන් ලෝහිතාතීසාරයෙන් ආම්ශූලයෙන් මහාවිරේචනයෙන් කුෂ්ඨයෙන් ගණ්ඩයෙන් කබරරෝගයෙන් ක්ෂයරෝගයෙන් අපස්මාරයෙන් දද්‍රුයෙන් කණ්ඩූතියෙන් කුෂ්ඨයෙන් නියහිරිත් අතුල්පතුල් පැලීමෙන් රත්පිතින් මධුමේහයෙන් අර්ශසින් පිළිකායෙන් භගන්දරායෙන් පිතින් උපදනා ආබාධයෙන් සෙමින් උපදනා ආබාධයෙන් වසින් උපදනා ආබාධයෙන් සාන්නිපාතික ආබාධයෙන් ඍතුවිපර්‍යාසයෙන් උපදනා ආබාධයෙන් විෂමපරිහරණයෙන් උපදනා ආබාධයෙන් උපක්‍රමයෙන් උපදනා ආබාධයෙන් කර්මවිපාකජ ආබාධයෙන් සීතලෙන් උණුසුමින් සයින් පවසින් මලයෙන් මූයෙන් මැසි මදුරු වා අව් දිග්ධපහසින් වූ දුකින්, මවගේ මරණයෙන් වූ දුකින් පියාගේ මරණයෙන් වූ දුකින් බෑයා ගේ මරණයෙන් - බූනගේ මරණයෙන් - පුතා ගේ මරණයෙන් - දුව ගේ මරණයෙන් - නෑයන්ගේ විපයින් - භොගයන් ගේ විපතින් - රෝගව්‍යසනයෙන් - ශීලව්‍යසනයෙන් - දෘෂ්ටිව්‍යසනයෙන් වූ දුකින් පිළිකුල් කරන්නාහුට දුක්වන්නාහුට පිළිකුල් වන්නාහුට තුසි 'භික්ඛුනො විජිගුච්ඡතො' යනු වේ.

**භජතො රිත්තමාසනං** - යම් තැනෙක හිඳී නම්, ඇඳ පුටුව බිස්ස තට්ටිකාව සම්කඩ තණඇතිරිය පත්ඇතිරිය කොළඇතිරිය යන මෙය 'ආසන'යි කියනු ලැබේ. ඒ ආසනය අසත්ප්‍රාය (-භූෂට) වූ රූප දැකීමෙන් තුච්ඡ යෑ ශූන්‍ය යෑ අතිශයින් ශූන්‍ය යි; අසත්ප්‍රාය වූ ශබ්දශ්‍රවණයෙන් රික්ත යෑ විවික්ත යෑ අතිශයින් විවික්ත යි; අසත්ප්‍රාය වූ පඤ්චකාමගුණයන් ගෙන් රික්ත යෑ විවික්ත යෑ ප්‍රවිවික්ත යි. ඒ අතිශයින් විවික්ත (-වෙන්) වූ ආසනය භජනය කරන්නාහුට මැනැවින් භජනය කරන්නාහුට සෙවුනාහුට වෙසෙසින් සෙවුනාහුට පුනපුනා සෙවුනාහුට එළැඹ සෙවුනාහුට තුයි 'භජතො රිත්තමාසනං' යනු වේ.

**රුක්ඛමූලං සුසානං වා** - රුක්මුල මැ 'රුක්ඛමූල'යෑ, සොහොන මැ 'සුසානය' තුයි 'රුක්ඛමූලං සුසානං වා' යනු වේ.

පබ්බතානං ගුහාසු වාති - පබ්බතායෙව පබ්බතා; කන්දරායෙව කන්දරා; ගිරිගුහායෙව ගිරිගුහා; පබ්බතන්තරිකායො වුච්චන්ති පබ්බතපබ්භාරාති- පබ්බතානං ගුහාසු වා.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"භික්ඛුනො විජිගුච්ඡතො
භජතො රිත්තමාසනං,
රුක්ඛමූලං සුසානං වා
පබ්බතානං ගුහාසු වා"ති.

16 - 5

උච්චාවචෙසු සයනෙසු කුවන්තො[1] තත්ථ භෙරවා,
යෙහි භික්ඛු න වෙධෙය්‍ය නිග්ඝොසෙ සයනාසනෙ.

උච්චාවචෙසු සයනෙසූති - 'උච්චාවචෙසූ'ති උච්චාවචෙසු හීනප්පණීතෙසු ඡෙකපාපකෙසු; 'සයනං' වුච්චති විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහාති - උච්චාවචෙසු සයනෙසු.

කුවන්තා තත්ථ භෙරවාති - 'කුවන්තා'ති කුවන්තා කූජන්තා නදන්තා සද්දං කරොන්තා; අථවා කිංවන්තාති කති කිත්තකා කීවතකා කීවබහුකා, තෙ භෙරවාති? සීහා බ්‍යග්ඝා දීපි අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී අහි විච්ඡිකා සතපදී චොරා වා අස්සු මානවා වා කතකම්මා වා අකතකම්මා වාති - කුවන්තා තත්ථ භෙරවා.

යෙහි භික්ඛු න වෙධෙය්‍යාති - 'යෙහී'ති යෙහි භෙරවෙහි; භෙරවෙ පස්සිත්වා වා සුණිත්වා වා න වෙධෙය්‍ය නප්පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය න උත්තසෙය්‍ය න පරිතස්සෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරු අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - යෙහි භික්ඛු න වෙධෙය්‍ය.

නිග්ඝොසෙ සයනාසනෙති - අප්පසද්දෙ අප්පනිග්ඝොසෙ විජනවාතෙ මනුස්සරාහසෙය්‍යකෙ පටිසල්ලානසාරුප්පෙ සෙනාසනෙති - නිග්ඝොසෙ සයනාසනෙ.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"උච්චාවචෙසු සයනෙසු
කුවන්තා තත්ථ භෙරවා,
යෙහි භික්ඛු න වෙධෙය්‍ය
නිග්ඝොසෙ සයනාසනෙ"ති.

1. කිංවන්තා - සයා. PTS කිම්වන්තො - සීමු. II කිච්චන්තා - සු පු.

**පබ්බතානං ගුහාසු වා** – පර්වතයෝ මැ, 'පබ්බත' යැ, කඳුරැළි මැ 'කන්දර', යැ ගල්ගුහා මැ 'ගිරිගුහා' යැ, පර්වතකුක්ෂිහු 'පබ්බතන්තරිකා' යි කියනු ලැබෙත් නුයි 'පබ්බතානං ගුහාසු වා' යනු වේ.

එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

**"භික්ඛුනො විජිගුච්ඡතො -පෙ- පබ්බතානං ගුහාසු වා"** යි.

## 16 – 5

මහණ තෙමේ නිඝෝෂ වූ සෙනසුනෙහි යම් භෛරවයෙකින් නො සැලෙන්නේ නම්, ඒ කුදුමහත් (-හීනප්‍රණීත වූ) සෙනසුන්හි කිපමණ භෛරවයෝ වෙත් ද, නොහොත් එහි (කූවන්තෙ -) නාද කරන-භයානක අරමුණු වෙත්.

**උච්චාවචෙසු සයනෙසු** – 'උච්චාවචෙසු' යනු: උස් – මිටි වූ හීනප්‍රණීත වූ උත්තමාධම වූ විහාර යැ අඩ්ඩයෝග යැ ප්‍රාසාද යැ, හර්ම්‍ය යැ ගුහා යැ යන මේ 'සයන'යි කියනු ලැබේ නුයි 'උච්චාවචෙසු සයනෙසු' යනු වේ.

**කූවන්තෙ තත්ථ භෙරවා** – 'කූවන්තෙ' යනු: හඬගසන කූජනය කරන නාද කරන ශබ්ද කරන; නොහොත් කීවන්තෙ යනු: ඒ භෛරවයෝ කෙතෙක් ද? කිපමණ ද? කෙබඳු ද? කිපමණ බොහෝ ද යත්? සිංහයෝ යැ ව්‍යාඝ්‍රයෝ යැ දිවියෝ යැ වලස්හු යැ තරක්හු යැ වෘකයෝ යැ මීවෝ යැ ඇත්තු යැ සර්පයෝ යැ තුහුසුහු යැ සියපාහු යැ, සැල සොරකම් ඇති හෝ නැති හෝ සොරු හෝ නැහැසි මිනිස්සු හෝ වන්තාහු නුයි 'කූවන්තෙ තත්ථ භෙරවා' යනු වේ.

**යෙහි භික්ඛු න වෙධෙය්‍ය** – 'යෙහි' යනු: යම් භෛරවයන්ගෙන්, භෛරවයන් දැක හෝ අසා හෝ නො වෙවුලා නම්, අතිශයින් නො වෙවුලා නම්, හාත්පසින් නො වෙවුලා නම්, නො තැතිගනී නම්, හාත්පසින් නො තැතිගනී නම්, නො බිය වේ නම්, සන්ත්‍රාසයට නො පැමිණේ නම්, බියසුලු නො වූයේ නො තැතිගන්නා සුලු වූයේ ත්‍රාසන නො වන සුලු වූයේ නො පලායනසුලු වූයේ වන්නේ නම්, ප්‍රහීණ වූ බියඅරමුණු ඇත්තේ පහවූ ලොමුදැහැ ඇති වැ වෙසෙන්නේ නම් යි 'යෙහි භික්ඛු න වෙධෙය්‍ය' යනු වේ.

**නිග්ඝොසෙ සයනාසනෙ** – අල්පශබ්ද වූ අල්පනිඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍ය ක්‍රියාවන්ට යෝග්‍ය වූ චිත්තසමාධියට අනුරූප වූ සෙනසුන්හි නුයි 'නිග්ඝොසෙ සයනාසනෙ' යනු වේ.

එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

**"උච්චාවචෙසු සයනෙසු -පෙ- නිග්ඝොසෙ සයනාසනෙ"** යි.

## 16 - 6

කති පරිස්සයා ලොකෙ
ගච්ඡතො අගතං දිසං,
යෙ භික්ඛු අභිසම්භවෙ
පන්තම්හි සයනාසනෙ.

**කති පරිස්සයා ලොකෙති** - 'කතී'ති කති කිත්තකා කීවතකා කීවබහුකා තෙ පරිස්සයාති? ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච, පටිච්ඡන්නපරිස්සයා ච.

කතමෙ පාකටපරිස්සයා? සීහා බ්‍යග්ඝා දීපි අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී අහී විච්ඡිකා සතපදී චොරා වා අස්සු මානවා වා කතකම්මා වා අකතකම්මා වා, චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා විතච්ඡිකා ලොහිතපිත්තං[1] මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා -පෙ- සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සා. ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා.

කතමෙ පටිච්ඡන්නපරිස්සයා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං කාමච්ඡන්දනීවරණං බ්‍යාපාදනීවරණං ථිනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා. ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා.

**පරිස්සයාති** - කෙනට්ඨෙන පරිස්සයා? පරිසහන්තීති පරිස්සයා, පරිහානාය සංවත්තන්තීති පරිස්සයා, තත්‍රාසයාති පරිස්සයා. කථං පරිසහන්තීති පරිස්සයා? තෙ පරිස්සයා, තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්ති, එවං පරිසහන්තීති පරිස්සයා. කථං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා? තෙ පරිස්සයා කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. කතමෙසං කුසලානං ධම්මානං? සම්මාපටිපදාය අනුලොමපටිපදාය අපච්චනීකපටිපදාය අන්වත්ථපටිපදාය ධම්මානුධම්මපටිපදාය සීලෙසු පරිපූරකාරිතාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය භොජනෙ මත්තඤ්ඤුතාය ජාගරියානුයොගස්ස සතිසම්පජඤ්ඤස්ස චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගස්ස චතුන්නං සම්මප්පධානානං-චතුන්නං ඉද්ධිපාදානං-පඤ්චන්නං ඉන්ද්‍රියානං-පඤ්චන්නං බලානං -සත්තන්නං බොජ්ඣඞ්ගානං -අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගස්ස, ඉමෙසං කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. එවං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා.

1. ලොහිතං පිත්තං - සං.

## 16 - 6

මහණ තෙම වනකෙලවර සෙනසුන්හි යම් උපද්‍රව කෙතෙකුත් මැඩ-පවත්වන්නේ නම්, නො බියවිරූ අමාමහනිවන්දෙසට යනුවහුට ලොවැ කෙතෙක් උපද්‍රවයෝ වෙත් ද ?

**කති පරිස්සයා ලොකෙ** – 'කති'යනු ඒ උවදුරු කීයක් ද ? කෙතෙක් ද ? කිපමණ ද ? කිපමණ බොහෝ ද යත්: උපද්‍රවයෝ දෙදෙනෙකි: ප්‍රකට උපද්‍රවයෝ ද ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ දූයි.

ප්‍රකට උපද්‍රවයෝ කවරහ යත්: සිහ යැ වග යැ දිවි යැ වලස් යැ තරස් යැ වෘක යැ මීහි යැ ඇත් යැ නාග යැ නුහුසු යැ සියපා යැ කළු සොරකම් ඇති හෝ නැති හෝ සොරු හෝ සැහැසි මිනිස්හු වත්නාහු ය, චක්ෂුරොග යැ ශ්‍රොත්‍රරොග යැ ඝ්‍රාණරොග යැ ජිහ්වාරොග යැ කායරොග යැ ශීර්ෂරොග යැ කර්ණරොග යැ මුඛරොග යැ දන්තරොග යැ කාස යැ ශ්වාස යැ පීනස යැ දහ යැ ජ්වර යැ කුක්ෂිරොග යැ මූර්ඡා යැ රක්තාතීසාර යැ අංමශූල යැ මහාවිරෙවන යැ කුෂ්ඨ යැ ගණ්ඩ යැ කිලාස යැ ක්ෂයරොග යැ අපස්මාර යැ දද්‍රු යැ කණ්ඩුති යැ කුෂ්ට යැ තියහිරි යැ අතුල්පතුල් පැළීම යැ රක්තපිත්ත යැ මධුමෙහ යැ අර්ශස් යැ පොළ යැ භගන්දරා යැ පිත්තසමුත්ථාන ආබාධ යැ...ශීත යැ උෂ්ණ යැ ජිඝත්සා යැ පිපාසා යැ උච්චාර යැ ප්‍රස්‍රාව යැ මැසිමදුරු – වා අව් දික්දූපහස්හු සි; මොහු ප්‍රකට උපද්‍රවයෝ යයි කියනු ලැබෙත්.

ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ කවරහ යත්: කායදුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනොදුශ්චරිත යැ, කාමච්ඡන්දනීවරණ යැ, ව්‍යාපාදනීවරණ යැ, ථීන-මිද්ධනීවරණ යැ උද්ධච්චකුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යැ රාග යැ ද්වෙෂ යැ මොහ යැ ක්‍රොධ යැ බද්ධවෛර යැ මකුබව යැ යුගග්‍රාහ යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය්‍ය යැ මායා යැ ශඨබව යැ ස්තම්භ යැ සාරම්භ යැ මාන යැ අතිමාන යැ මද යැ ප්‍රමාද යැ සියලු කෙලෙශයෝ යැ, සියලු දුශ්චරිතයෝ යැ, සියලු දරථයෝ යැ, සියලු පරිදාහයෝ යැ, සියලු සන්තා-පයෝ යැ, සියලු අකුශලාභිසංස්කාරයෝ යි. මොහු ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ යයි කියනු ලැබෙත්.

**පරිස්සයා** – යනු: කවර අර්ථයෙකින් 'පරිස්සය' වූහ යත්: පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රයයෝ යැ පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රයයෝ යැ එහි වෙසෙත් නුයි පරිශ්‍රයයෝ යැ. කිසෙසින් පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය වූහ යත්: ඒ උපද්‍රවයෝ ඒ පුගුල්හු සහනය කෙරෙති, හාත්-පසින් සහනය කෙරෙති, අභිනවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්-පසින් ගනිති, මර්දනය කෙරෙත්; මෙසේ පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය වෙත්. කිසෙසින් පරිහාණියට වැටෙත් නුයි 'පරිශ්‍රය' වූහ යත්: ඒ උපද්‍රවයෝ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවත්නා-හුය; කවර කුශලධර්මයන්ගේ ද යත්: සම්‍යක්ප්‍රතිපත්තිය අනුලොම ප්‍රති-පත්තිය අවිරුද්ධ ප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාති-මොක්ෂ ශීලයෙහි පරිපූරකාරිත්වය ඉන්ද්‍රියයන්හි පියූ දොර ඇති බව භොජන-යෙහි පමණ දන්නා බව නිදි දුරු කිරීමෙහි යෙදීම ස්මෘතිසම්ප්‍රඥනය සතර සතිපට්ඨානභාවනාවෙහි යෙදීම සතර සම්‍යක්ප්‍රධානය සතර සෘද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය පඤ්ච බලය සප්ත බොධ්‍යඞ්ගය ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගභාවනා-නුයොගය යන මේ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පරිහාණය පිණිස පවත්නාහු ය. මෙසේ පරිහාණියට වැටෙත් නුයි 'පරිශ්‍රය' නම් වෙත්.

කථං තත්‍රාසයාති පරිස්සයා? තත්ථෙව පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයා යථා බිලෙ බිලාසයා පාණා සයන්ති, දකෙ දකාසයා පාණා සයන්ති, වනෙ වනාසයා පාණා සයන්ති, රුක්ඛෙ රුක්ඛාසයා පාණා සයන්ති, එවමෙවං තත්ථෙව පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයාති. එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

“සාන්තෙවාසිකො භික්ඛවෙ භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු[1] විහරති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු[1] විහරති?

ඉධ භික්ඛවෙ භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසංකප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති, අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා සාචරියකොයි වුච්චති. පුනචපරං භික්ඛවෙ භික්ඛුනො සොතෙන සද්දං සුත්වා – ඝානෙන ගන්ධං ඝායිත්වා – ජිව්හාය රසං සායිත්වා – කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා – මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා සාචරියකොති වුච්චති. පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා – ඝානෙන ගන්ධං ඝායිත්වා – ජිව්හාය – රසං සායිත්වා – කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා – මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති, අන්වාස්ස වසන්ති පාපකා අකුසලා ධම්මා'ති තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මා'ති තස්මා සාචරියකොයි වුච්චති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු[1] විහරතී”ති[a] එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

“තයො'මෙ භික්ඛවෙ අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා. කතමෙ තයො? ලොභො භික්ඛවෙ අන්තරා මලං[3] අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. දොසො භික්ඛවෙ –පෙ– මොහො භික්ඛවෙ අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ තයො අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා”.[b]

1. අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

---

1. ඵාසුං – සං. 2. අන්වාස්සවන්ති – සීමු II. මජ්සං. අන්වාස්සවසන්ති – සං
3. මලා – සයා. a. සංයුත්තනිකාය – නවපුරාණවග්ග.
b. ඉතිවුත්තක – 3. 4. 9. මලසුත්ත.

කිසෙසින් තත්‍රාසය (-එහි වෙසෙත්) නුයි පරිග්‍රය වූය යත්: එ ආත්මභාවයෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදිත්: යම්සේ බිලාශ්‍රය ප්‍රාණීහු බිලයෙහි වෙසෙත් ද, දිය ඇසුරු කරන ප්‍රාණීහු දියෙහි හොවිත් ද, වනය ඇසුරු කරන ප්‍රාණීහු වෙනෙහි හොවිත් ද, රුක ඇසුරු කරන ප්‍රාණීහු රුකෙහි හොවිත් ද, එ පරිද්දෙන් ම ඒ ආත්මභාවයෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදනාහු වෙත් නුයි මෙසේත් තත්‍රාසය නුයි 'පරිග්‍රය' නම් වෙත්.

මේ වදාරන ලද මැ යැ භාග්‍යවත්හු විසින්:

"මහණෙනි, සාන්තෙවාසික වූ (-අතැවැසි කෙලෙසුන් සමග වසන) මහණ තෙමේ දුකසේ නො සුවසේ වෙසෙසි. මහණෙනි, කිසෙසින් සාන්තෙවාසික වූ සාචාර්‍ය්‍යක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙසි යත්:

මහණෙනි, මෙහි මහණක් හට ඇසින් රූපයක් දැක (නොයෙක් අරමුණෙහි හැසිරීම් වශයෙන් උපන්) සඞ්කල්පනා ඇති සංයොජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම්, ඒ ලාමක අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති, ඔහුගේ සන්තානය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් 'සාන්තෙවාසික'යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඒ පුද්ගලයා හසුරුවති, ඔහු කෙරෙහි පවතිත් නුයි එහෙයින් 'සාචරියක' යි කියනු ලැබේ. තැවත ද මහණෙනි, මහණ හට කනින් ශබ්දයක් අසා-නැහැයෙන් ගඳක් ආඝ්‍රාණය කොට - දිවින් රසයක් විඳ - කයින් පහසක් පැහැස - මනසින් දහමක් දැන අරමුණෙහි හැසිරීමෙන් උපන් සඞ්කල්පනා ඇති සංයොජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම්, ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු ගේ සිත තුළ වෙසෙති, ඔහු ගේ සන්තා-නය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් 'සාන්තෙවාසික'යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඒ පුද්ගලයා හසුරුවති, ඔහු කෙරෙහි පවතිත් නුයි එහෙයින් 'සාචරියක'යි කියනු ලැබේ. මහණෙනි, මෙ පරිද්දෙන් මහණ තෙමේ සාන්තෙවාසික වූයේ සාචරියක වූයේ දුකසේ නො සුවසේ වෙසේ"යයි. මෙසේත් තත්‍රාසය නුයි 'පරිග්‍රය' නම් වෙත්.

මේ වදාරන ලද මැයැ බුදුන් විසින්:

"මහණෙනි, මේ ඇතුළත මලයෝ ඇතුළත අමිත්‍රයෝ ඇතුළත සතුරෝ ඇතුළත වධකයෝ ඇතුළත පසමිතුරෝ තිදෙනෙක් වෙති: කවර තිදෙනෙක යත්? මහණෙනි, ලෝභය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍ර-යෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි, මහණෙනි, ද්වේෂය...මහණෙනි, මෝහය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතු-රෙකි. මහණෙනි, මොහු තිදෙනා ඇතුළත මලයෝ යැ, ඇතුළත අමි-ත්‍රයෝ යැ, ඇතුළත සතුරෝ යැ, ඇතුළත වධකයෝ යැ, ඇතුළත පස-මිතුරෝ" යි.

1. ලෝභය අනර්ථජනක යැ, ලෝභය කුසල්සිත චලනන්නේ යැ, ඇතුළත උපන් භයෙකැ, බාලජන තෙමේ එය අවබොධ නො කෙරෙයි.

2. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං ලොභො සහතෙ නරං.

3. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

4. කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං කොධො[1] සහතෙ නරං.

5. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං මොහො සහතෙ නර"න්ති.a

එවම්පි තත්‍රාසයාති පරිස්සයා. වුත්තං හෙතං භගවතා:

"තයො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො? ලොභො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො ඛො මහාරාජ -පෙ- මොහො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. ඉමෙ ඛො මහාරාජ, තයො පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායා"ති.b

7. "ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරංව සම්ඵල"න්ති.b

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

8. "රාගො ච දොසො ච ඉතො නිදානා
අරතී රතී ලොමහංසා ඉතොජා,[2]
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධඞ්කමිවොස්සජන්තී"ති.c

එවම්පි තත්‍රාසයාති පරිස්සයා. ලොකෙති මනුස්සලොකෙ -පෙ- ආයතනලොකෙ'ති - කති පරිස්සයා ලොකෙ?

1. දොසො - සිමු 11. 2. ලොමහංසො ඉතොජාතො - සහ.
a. ඉතිවුත්තක - 3. 4. 9 මලසුත්ත. b. කොසලසංයුත්ත.
c. සුත්තනිපාත - සූචිලොමසුත්ත.

2. ලොභී තෙමේ (ලොබි - ලොවුතුරු) අර්ථය නො දනී. ලොභී තෙමේ දහම් නො දකී. යම් හෙයකින් ලොභය තෙමේ මිනිසා මැඩගනී ද එකල්හි බහල වූ අන්ධකාරය වේ.

3. ද්වේෂය අනර්ථජනක යැ. ද්වේෂය කුසල්සිත චලහන්නේ යැ. ඇතුළත උපන් භයයකැ. බාලජන තෙමේ එය අවබොධ නො කෙරෙයි.

4. කිපියේ අර්ථය නො දනගනී. කිපියේ දහම් නො දකී. යම් කලෙක ක්‍රොධය මිනිසා අභිභවා ද, එකල්හි බහලාන්ධකාරය වේ.

5. මොහය අනර්ථ උපදවන්නේ යැ. මොහය කුසල්සිත චලහන්නේ යැ. සිත තුළ උපන් භයෙකැ. බාලජන තෙමේ එය අවබොධ නො කෙරේ.

6. මූඪ වූයේ ලොවි - ලොවුතුරු අර්ථය නො දනී. මූඪ තෙමේ දහම් (-අනර්ථහෙතුව) නො දකී. යම් කලෙක මොහය තෙමේ මිනිසා අභිභවා ද එකල්හි බහල වූ මොහාන්ධකාරය වේ යයි.

මෙසේ ත් තත්‍රාසය නුයි 'පරිස්සය' නම් වෙත්.

මේ වදාරන ලද මැය බුදුන් විසින්:

"මහරජ, මේ ධර්මයෝ තිදෙනෙක් පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනාහු අහිත පිණිස දුක් පිණිස නො සුවසේ වාසය පිණිස උපදිත්. කවර තිදෙනෙක් ද යත්: මහරජ, ලොභය පුරුෂයාගේ සිත තුළ උපදනේ අහිතට දුකට අප්‍රාසුවිහරණයට උපදී, මහරජ, ද්වේෂය...මහරජ, මොහය පුරුෂයාගේ සිත තුළ උපදනේ අහිතට දුකට අප්‍රාසුවිහරණයට උපදී. මහරජ, මේ ධර්මයෝ තිදෙන පුරුෂයාගේ සිත තුළ උපදනාහු අහිතයට දුකට අප්‍රාසුවිහරණයට උපදනාහුය"යි.

7. ලොභය ද ද්වේෂය ද මොහය ද තම සිත තුළ උපන්නාහු සවකීය ඵලය හුණගස සෙයින් පව්සිත් ඇති මිනිසා වනසත්'යයි.

මෙසේත් තත්‍රාසය නුයි 'පරිස්සය' නම් වෙත්.

තෙල බුදුන් විසින් වදාරන ලද මැය:

8. රාගය ත් ද්වේෂය ත් මේ ආත්මභාවය නිදාන කොට ඇත්තාහු ය. අරතිය රතිය හා රොමහර්ෂයෝ මේ අත්බවින් උපන්නාහ. පාපවිතර්කයෝ මේ අත්බවින් ඉපද කුමරහු හුයින් පය බැඳි කවුඩක්හු සෙයින් හැර-පියත්.

මෙසේත් තත්‍රාසය නුයි 'පරිස්සය නම් වෙත්. ලොකෙ යනු: මිනිස්-ලොවැ...ආයතනලොකයෙහි නුයි 'කති පරිස්සයා ලොකෙ' යනු වේ.

**ගච්ඡෙ අගතං දිසන්ති** – 'අගතා දිසා' වුච්චති අමතං නිබ්බානං, "යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං" අගතපුබ්බා සා දිසා, න සා දිසා ගතපුබ්බා ඉමිනා දීඝෙන අද්ධුනා.

9. "සමතිත්තිකං අනවසෙසකං[1]
තෙලපත්තං යථා පරිහරෙය්‍ය,
එවං සචිත්තමනුරක්ඛෙ
පත්ථයානො දිසං අගතපුබ්බ"න්ති.[a]

අගතපුබ්බං දිසං වජන්තො ගච්ඡන්තො අභික්කමන්තොති ගච්ඡෙ අගතං දිසං.

**යෙ භික්ඛු අභිසම්භවෙති** – 'යෙ'ති යෙ පරිස්සයෙ අභිසම්භවෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති – යෙ භික්ඛු අභිසම්භවෙ.

**පන්තම්හි සයනාසනෙති** – අන්තෙ පන්තෙ පරියන්තෙ සෙලන්තෙ වා වනන්තෙ වා නදන්තෙ වා උදකන්තෙ වා යත්ථ න කසීයති න වපීයති, වනන්තං[2] අතික්කමිත්වා මනුස්සානං අනුපචාරෙ සෙනාසනෙති – පන්තම්හි සයනාසනෙ.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"කති පරිස්සයා ලොකෙ ගච්ඡන්තො අගතං දිසං,
යෙ භික්ඛු අභිසම්භවෙ පන්තම්හි සයනාසනෙ"ති.

## 16 - 7

ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු ක්‍යාස්සස්සු ඉධ ගොචරා,
කානි සීලබ්බතාන'ස්සු පහිතත්තස්ස භික්ඛුනො.

**ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සූති** – කිදිසෙන බ්‍යප්පථෙන සමන්නාගතො අස්ස, කිංසණ්ඨිතෙන කිංපකාරෙන කිංපටිභාගෙනාති වචීපාරිසුද්ධිං පුච්ඡති; කතමා වචීපාරිසුද්ධි? ඉධ භික්ඛු මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති: සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස; පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය; අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති: යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති:

1 ජනන්තං - සීමු. II. 1. අනවසෙසං - මජ්සං. සං. සීමු. II.
a. ජාතක - එකකනිපාත, තෙලපත්තජාතක.

**ගච්ඡතො අගතං දිසං** – අමාමක නිවන 'අගතදිසා'යි කියනු ලැබෙයි. යම් සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාව ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද, ඒ දිග (සිහිනෙන් පවා)නො ගියවිරූ යැ. මේ දීර්ඝකාලයෙහි ඒ දිශාව ගියවිරූ නො වෙයි.

9. "මුවවිට ගසා පිරුණු තෙල් පාත්‍රයක් නො වැගිරෙනු කොට ගෙන යන්නාක් මෙන් නො ගිය විරූ නිවන්දෙස පතනුයේ ස්වකීය චිත්තය රක්නේයැ" යි.

අගතපූර්ව වූ නිර්වාණදිශාවට යනුවහුට ගමන් කරනුවහුට අභිමුඛයට යනුවහුට නුයි 'ගච්ඡතො අගතං දිසං' යනු වේ.

**යෙ භික්ඛු අභිසම්භවෙ** – 'යෙ' යනු: යම් පරිශ්‍රය කෙනකුන් මැඩපවත්වන්නේ නම්, අභිභවනය කරන්නේ නම්, වතුරුවන්නේ නම්' හාත්පසින් ගන්නේ නම්, මඩින්නේ නම් යි 'යෙ භික්ඛු අභිසම්භවෙ, යනු වේ.

**පන්තම්හි සයනාසනෙ** – අන්තයෙහි ප්‍රාන්තයෙහි පර්‍යන්තයෙහි පරීතයන්ගේ අන්තයෙහි හෝ වනාන්තයෙහි හෝ නදීඅන්තයෙහි හෝ උදකාන්තයෙහි හෝ යම් තැනෙක නො සානු ලැබේ ද, නො වපුරනු ලැබේ ද, (එබඳු) වනාන්තය ඉක්මවා සිටි, මිනිසුන්ගේ හැසිරීම් රහිත වූ සෙනස්නෙහි නුයි 'පන්තම්හි සයනාසනෙ' යනු වේ.

එසින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

"**කති පරිස්සයා ලොකෙ** -පෙ- **පන්තම්හි සයනාසනෙ**"යි.

## 16 – 7

ආරබ්ධවීර්‍යයී ඇති ඒ මහණ හට කෙබඳු වචනයෝ වන්නාහු ද? මෙහි ඔහුට කෙබඳු ගොචරයෝ වන්නාහු ද? ඔහුට කීදෘශ වූ ශීලව්‍රත කෙනෙක් වන්නාහු ද?

**ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු** – කෙබඳු වූ ලෙසෙස් සිටි කවර ප්‍රකාර ඇති කවර ආකාර ඇති වචනයෙන් සමන්විත වූයේ වන්නේ දැ'යි වාක්පාරිශුද්ධිය විචාරයි. වාක්පාරිශුද්ධිය කවර යත්: මෙහි මහණ තෙමේ මෘෂාවාදය හැරපියා මුසාවාදයෙන් වැළැකුණේ සැබෑ බස කියනුයේ සැබවින් සැබව ගළපනුයේ තිර වූයේ හැදෑහිය යුතු බස් ඇතියේ ලොව නො රවටනුයේ වෙයි, පිසුනු බස් හැරපියා පිසුනු බසින් වැළැකුණේ වෙයි: මෙතැනින් අසා මුන් ලග් බිඳුමට අතැන නො කියනුයේ, අතැනින් හෝ අසා අරුන්ගේ බිඳුමට මුන්ට නො කියනුයේ වෙයි. මෙසේ භින්න වූවන් හෝ සමඟ කරනුයේ සමඟ වූවන් හෝ දැඩි කරනුයේ සමඟියෙහි ඇලුම් ඇතියේ සමඟ වූවන් කෙරෙහි ඇලුණේ සමඟ වූවනට සතුටු වූයේ සමඟ කරන බස් කියනුයේ වෙයි, රළුබස් හැරපියා රළුබසින් වැළැකුණේ වෙයි. යම් වචනයක් නිදෙස් නම් කනට සුව නම් පෙම් උපදවා නම් සිතට වදී නම්, පුරෙහි වූවා නම් බොහෝ දෙනාට කැමැති නම් බොහෝ දෙනාගේ මන වඩා නම් එබඳු වචන කියන්නේ වෙයි.

කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. චතූහි වචීසුචරිතෙහි සමන්නාගතො චතුදොසාපගතං වාචං භාසති. බත්තිංසාය තිරච්ඡානකථාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. දස කථාවත්ථූනි කථෙති. සෙය්‍යථීදං: අප්පිච්ඡකථං සන්තුට්ඨිකථං පවිවෙකකථං අසංසග්ගකථං විරියාරම්භකථං සීලකථං සමාධිකථං පඤ්ඤාකථං විමුත්තිකථං විමුත්තිඤාණදස්සනකථං, සතිපට්ඨානකථං සම්මප්පධානකථං ඉද්ධිපාදකථං ඉන්ද්‍රියකථං බලකථං බොජ්ඣඞ්ගකථං මග්ගකථං ඵලකථං නිබ්බානකථං කථෙති. වාචාය යතො යත්තො පරියත්තො ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතො. අයං වචීපාරිසුද්ධි. එදිසාය[1] වචීපාරිසුද්ධියා සමන්නාගතො අස්සාති - ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු.

ක්‍යාස්සස්සු ඉධ ගොචරාති - කිදිසෙන ගොචරෙන සමන්නාගතො අස්ස, කිංසණ්ඨිතෙන කිංපකාරෙන කිංපටිභාගෙනාති ගොචරං පුච්ඡති. අත්ථි ගොචරො, අත්ථි අගොචරො:

කතමො අගොචරො? ඉධෙකච්චො වෙසියගොචරො වා හොති, විධවාගොචරො වා හොති, ථුල්ලකුමාරිගොචරො වා හොති, පණ්ඩකගොචරො වා හොති, භික්ඛුනීගොචරො වා හොති, පානාගාරගොචරො වා හොති. සංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන. යානි වා පන තානි කුලානි අස්සද්ධානි අප්පසන්නානි අනොපානභූතානි අක්කොසකපරිභාසකානි අනත්ථකාමානි අහිතකාමානි අඵාසුකාමානි අයොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං, තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති. අයං වුච්චති අගොචරො.

අථවා අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො අසංවුතො ගච්ඡති: හත්ථිං ඔලොකෙන්තො අස්සං ඔලොකෙන්තො රථං ඔලොකෙන්තො පත්තිං ඔලොකෙන්තො ඉත්ථියො ඔලොකෙන්තො පුරිසෙ ඔලොකෙන්තො කුමාරිකායො ඔලොකෙන්තො කුමාරකෙ ඔලොකෙන්තො අන්තරාපණං ඔලොකෙන්තො ඝරමුඛානි ඔලොකෙන්තො උද්ධං ඔලොකෙන්තො[2] අධො ඔලොකෙන්තො දිසාවිදිසං පෙක්ඛමානො[3] ගච්ඡති. අයම්පි වුච්චති අගොචරො.[ෂ]

1. කීදිසාය - සීමු. II.
2. උල්ලොකෙන්තො - සීමු. II.
විපෙක්ඛමානො - සීමු. II
ෂ. ඣානවිභඞ්ග.

නිසරු (-ප්‍රලාප) බස් හැරපියා නිසරු බසින් වැලැකුණේ වෙයි. කල් බලා කියනුයේ සැබවක් ම කියනුයේ වැඩදායක තෙපුල් කියනුයේ ධර්මවාදී වූයේ විනයවාදී වූයේ සුදුසු කල කරුණු සහිත වූ පිරිසිඳුම් ඇති වැඩ සහිත වූ ළෙහි ලා දැරිය යුතු වූ තෙපුලක් මැ කියන්නේ වෙයි. චතුර්විධ වාක්සුචරිතයෙන් යුක්ත වූයේ සතර දෙසින් වෙන් වූ තෙපුලක් මැ කියයි. දෙතිස් තිරිසන් කථාවෙන් දුරු වූයේ වන්නේ යැ, වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වෙසෙයි. දශ කථාවස්තූන් කියයි. ඒ මෙසේ යැ: අල්පේච්ඡකථාව කියයි, ඉතරෙතරප්‍රත්‍යයසන්තොෂ කථාව - විවෙකනිඃශ්‍රිත කථාව - අසංසර්ගකථාව - වීර්‍යාරම්භකථාව - ශීලකථාව - සමාධිකථාව - ප්‍රඥකථාව - විමුක්තිකථාව - විමුක්තිඥානදර්ශනකථාව - සතිපට්ඨානකථාව - සම්‍යක්ප්‍රධානකථාව - ඍද්ධිපාදකථාව - ඉන්ද්‍රියකථාව - බලකථාව - බොධ්‍යඞ්ගකථාව - මාර්ගකථාව - ඵලකථාව - නිර්වාණකථාව කියයි. වචනයෙන් සංයම වූයේ දැමුණේ වෙසෙසින් දැමුණේ ගොපනය වූයේ ගොපිත වූයේ රැකුණේ සංවර වූයේ වේ. මේ තොමෝ වචීපාරිශුද්ධිය යි. මෙබඳු වාක්පාරිශුද්ධියෙන් සමන්විත වූයේ වන්නේ නුයි 'ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු' යනු වේ.

**ක්‍යාස්සස්සු ඉධ ගොචරා** - කෙබඳු වූ කවර පැවැතුම් ඇති, කවර ප්‍රකාර වූ කවර ආකාර ඇති, ගොචරයෙන් සමන්විත වූයේ වන්නේදැ'යි ගොචරය විචාරයි. ගොචරයෙක් ඇත, අගොචරයෙක් ඇත.

අගොචරය කවරැ යත්: මෙහි එකෙක් වෙශ්‍යාවන් ගොචර (-යායුතු තැන්) කොට ඇත්තේ හෝ වේ ද, වැන්දඹුවන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, මැහැලි කුමාරිකාවන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, නපුංසකයන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, මෙහෙණන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, සුරාගෙය ගොචර කොට ඇත්තේ හෝ වේද, රජුන් හා ද රජමහඇමැතියන් හා ද තීර්ථකයන් හා ද තීර්ථකශ්‍රාවකයන් හා ද අනනුලෝමික වූ සංසර්ගයෙන් සංසෘෂ්ට වැ (-හැනී) වෙසේ ද, යළි යම් කුල කෙනෙක් (බුද්ධාදීන් කෙරෙහි) හැදැහිලි නැත්තාහු ද (එහෙයින් මැ) නො පහන් වූවාහු ද ඔපාන (-සතරමංසල කැණි ළිඳක්) මෙන් නො වූවාහු ද මහණුන්ට මෙහෙණන්ට උවසුවන්ට උවැසියන්ට ආක්‍රොශ හා පරිභව කරන්නාහු ද අනර්ථ කැමැති වෙත් ද අහිත කැමැති වෙත් ද නො සුව කැමැති වෙත් ද අයොගක්ෂේමය (භය) කැමැත්තාහු වෙත් ද, එබඳු වූ කුලයන් සෙවනය කෙරේ ද එළැඹේ ද නැවත නැවත එළැඹේ ද, මේ 'ආගොචරය' යි කියනු ලැබේ.

නොහොත් ඇතුළුගමට පිවිසියේ වීදියට පිළිපන්නේ අසංවර වැ යේ ද, ඇතුන් බලමින් අසුන් බලමින් රිය බලමින් පාබලසෙන් බලමින් ගැහැනුන් බලමින් පිරිමින් බලමින් කුමරියන් බලමින් කුමරුන් බලමින් ඇතුළුසල්පිල් බලමින් ගෙදොර බලමින් උඩ බලමින් යට බලමින් දසානුදස බලමින් යේ ද, මෙ ද 'අගොචර' යයි කියනු ලැබේ.

අථ වා චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං -පෙ- මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං; තස්ස අසංවරාය පටිපජ්ජති. න රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ අසංවරං ආපජ්ජති. අයම්පි වුච්චති අගොචරො.

යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාළං කුම්භථූනං සොභනගරං[1] චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං ගොයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අණීකදස්සනං ඉති වා. ඉති එවරූපං විසූකදස්සනං අනුයුත්තො හොති. අයම්පි වුච්චති අගොචරො. පඤ්චපි කාමගුණා අගොචරො.

වුත්තං හෙතං භගවතා:

“මා, භික්ඛවෙ අගොචරෙ චරථ පරවිසයෙ. අගොචරෙ භික්ඛවෙ චරතං පරවිසයෙ ලච්ඡති මාරො ඔතාරං, ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ භික්ඛුනො අගොචරො පරවිසයො? යදිදං පඤ්ච කාමගුණා. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා; සොතවිඤ්ඤෙය්‍යා සද්දා - ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා - ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා - කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. අයං වුච්චති භික්ඛවෙ භික්ඛුනො අගොචරො පරවිසයො”.[a] අයම්පි වුච්චති අගොචරො.

කතමො ගොචරො? “ඉධෙකච්චො[2] න වෙසියගොචරො හොති, න විධවාගොචරො හොති, න ථුල්ලකුමාරිගොචරො හොති, න පණ්ඩකගොචරො හොති, න භික්ඛුනීගොචරො හොති, න පානාගාරගොචරො හොති, අසංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන, යානි වා පන තානි කුලානි සද්ධානි පසන්නානි ඔපානභූතානි කාසාවපජ්ජොතානි ඉසිවාතපටිවාතානි අත්ථකාමානි හිතකාමානි ඵාසුකාමානි යොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං, තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති.”[b] අයම්පි වුච්චති ගොචරො

1. සොභනකරණං - සීමු II. සොභනකං - සීමු II. සොභනගරකං - PTS.
2. ඉධ භික්ඛු - සීමු. II.
a. සතිපට්ඨානසංයුත්ත - අම්බපාලිවග්ග. b ඣානවිභඞ්ග.

නොහොත් ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් ගන්නා සුලු වූයේ (හස්පාදාදී) අනුව්‍යඤ්ජන වශයෙන් ගන්නාසුලු වූයේ වෙයි. යම් හෙයකින් මොහු...මනෙන්ද්‍රියය අසංවෘත වැ වාසය කරන්නහු අභිධ්‍යා - දෞර්මනස්‍ය - සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු ද, ඒ මනෙන්ද්‍රියයාගේ අසංවරයට පිළිපදී ද, මනෙන්ද්‍රියය නො රකී ද, මනෙන්ද්‍රියයෙහි අසංවරයට පැමිණේ ද, මෙ ද 'අගොචරය'යි කියනු ලැබේ.

තවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල හඳහා දුන් බොජුන් වළඳා ඔහු මෙබඳු වූ විසුළු දැකීමෙහි යෙදී වෙසෙති; ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් තළුමුළු භාරතරාමායණාදිය කියන තැන කස්තාලම් කුළුතාලම් (හෝ මන්ත්‍රයෙන් මල සිරුර නැඟුටුවීම) කළ පිඹීම ප්‍රතිභානචිත්‍රය සැඬලුන්ගේ සණදෙවුන් කෙළි වස්කුලල් ඇටදෙවීම ඇත්පොර අස්පොර මීසුපොර වැහැප්පොර ගවපොර බැටළුපොර එළුපොර කුකුළුපොර වටුපොර දඬුපොර මිටුපොර මල්ලපොර යුදපෙරමුණ බලසෙන් ගණන තැන කඳවුර බලඇණි දැකීම යනු හෝ යැ. මෙසේ මෙබඳු විසුළු දැකීමෙහි යෙදුණේ වෙයි. මෙ ද 'අගොචර'යයි කියනු ලැබේ. පස්කම් ගුණයෝ ද අගොචරයෝ යැ.

තෙල වදාරන ලද මැය බුදුන් විසින්:

"මහණෙනි, අගොචරයෙහි (-නො හැසිරියැ යුතු තැන) සතුරන් විෂයෙහි නහමක් හැසිරෙව්. මහණෙනි, අගොචරයෙහි පරවිෂයෙහි හැසිරෙනුවන්ට (කෙලශ) මාර තෙමේ අවකාශ (සිදුරු) ලබන්නේ යැ. මාර තෙමේ අරමුණු ලබන්නේ ය. මහණෙනි, මහණහට අගොචරය පරවිෂය කවරේ ද? යම් පස්කම්ගුණ කෙනෙක් වෙත් ද, (ඔහු යැ.) කවර පසෙක් ද යත්: ඉෂ්ට වූ කමනීය වූ මනවඩන්නාවූ ප්‍රියස්වභාව ඇති කාමය හා යෙදුණු රාගොත්පත්තියට කාරණ වූ චක්ෂුර්විඥානයෙන් දක්කයුතු රූපයෝ යැ, ශ්‍රොත්‍රවිඥානයෙන් ඇසියයුතු ශබ්දයෝ යැ - ඝ්‍රාණවිඥානයෙන් ඇඟි යැ යුතු ගන්ධයෝ යැ - ජිහ්වාවිඥානයෙන් පින්දයුතු රසයෝ යැ - කායවිඥානයෙන් ස්පර්ශ කළ යුතු ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමූපසංහිත වූ රජනීය වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. මහණෙනි, මේ මහණහට 'අගොචර යැ පරවිෂය'යි කියනු ලැබේ. මෙ ද 'අගොචර'යයි කියනු ලැබේ.

ගොචරය කවරැ යත්: මෙ සස්නෙහි මහණ තෙමෙ වේශ්‍යාවන් ගොචර (=යායුතු තැන්) කොට නැත්තේ වේ ද, වැන්දඹුවන් ගොචර කොට නැත්තේ වේ ද, මැහැලි කුමාරිකාවන් ගොචර කොට නැත්තේ වේ ද, නපුංසකයන් ගොචර කොට නැත්තේ වේ ද, භික්ෂුණීන් ගොචර කොට නැත්තේ වේ ද, සුරාගාරය ගොචර කොට නැත්තේ වේ ද, රජුන් හා රජමහමැතියන් හා තීර්ථකයන් හා තීර්ථකශ්‍රාවකයන් හා අනනුලොමික වූ සංසර්ගයෙන් අසංසෘෂ්ට වැ වෙසේ ද, යළි යම් ඒ කුල කෙනෙක් (බුද්ධාදීන් කෙරෙහි) හැදහිලි ඇත්තාහු ද ප්‍රසන්න වූවාහු ද (සතර මංසල කැණි) ළිඳක් වැනි වෙත් ද, (මහණ මෙහෙණන් ගත් පෙරැවි) කහවත්හි ප්‍රභායෙන් එකාලොක වෙද්ද, ගෙට වදන නික්මෙන මහණ මෙහෙණ සඞ්ඛ්‍යාත ඍෂීන් ගේ චීවරවාතයෙන් පරිවාත වෙද්ද, මහණ මෙහෙණ උවසු උවැසියනට වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු සුව කැමැත්තාහු නිර්භය කැමැත්තාහු වෙද්ද, එබඳු කුලයන් සෙවන භජන පර්යුපාසන කෙරේ ද මෙ ද 'ගොචර'යයි කියනු ලැබේ.

අථ වා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො සංවුතො ගච්ඡති: න හත්ථිං ඔලොකෙන්තො න අස්සං ඔලොකෙන්තො න රථං ඔලොකෙන්තො න පත්තිං ඔලොකෙන්තො -පෙ- න දිසාවිදිසං විපෙක්ඛමානො ගච්ඡති, අයම්පි වුච්චති ගොචරො. අථ වා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති -පෙ- මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති; අයම්පි වුච්චති ගොචරො. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං? නච්චං ගීතං වාදිතං -පෙ- අනීකදස්සනං ඉති වා; ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. අයම්පි වුච්චති ගොචරො. චත්තාරොපි සතිපට්ඨානා ගොචරො.

වුත්තං හෙතං භගවතා:

“ගොචරෙ භික්ඛවෙ චරථ සකෙ පෙත්තිකෙ විසයෙ. ගොචරෙ භික්ඛවෙ චරතං සකෙ පෙත්තිකෙ විසයෙ න ලච්ඡති මාරො ඔතාරං, න ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො: යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති, වෙදනාසු -පෙ- චිත්තෙ - ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චති භික්ඛවෙ භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො.[1] අයම්පි වුච්චති ගොචරො. එතෙන ගොචරෙන සමන්නාගතො අස්සාති - ක්‍යාස්සස්සු ඉධ ගොචරා.

කානි සීලබ්බතානාස්සූති - කිඞ්දිසෙන සීලබ්බතෙන සමන්නාගතො අස්ස, කිංසණ්ඨිතෙන කිංපකාරෙන කිංපටිභාගෙනාති සීලබ්බතපාරිසුද්ධිං පුච්ඡති; කතමා සීලබ්බතපාරිසුද්ධි: අත්ථි සීලඤ්චෙව වතඤ්ච, අත්ථි වතං න සීලං. කතමං සීලඤ්චෙව වතඤ්ච: ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. යො තත්ථ සඤ්ඤමො සංවරො අවීතික්කමො ඉදං සීලං. යං සමාදානං, තං වතං. සංවරට්ඨෙන සීලං, සමාදානට්ඨෙන වතං, ඉදං වුච්චති සීලඤ්චෙව වතඤ්ච. කතමං වතං න සීලං: අට්ඨ ධුතඞ්ගානි: ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං සපදානචාරිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං යථාසන්ථතිකඞ්ගං. ඉදං වුච්චති වතං, න සීලං. විරියසමාදානම්පි වුච්චති වතං, න සීලං. ‘කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු, උපසුස්සතු සරීරෙ මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසබලෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතී’ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං, න සීලං.

1. සතිපට්ඨානසංයුත්ත - අම්බපාලිවග්ග.

නොහොත් මහණ තෙමේ ඇතුළුගමට පිවිසියේ වීදියට පිළිපන්නේ සංවර වූයේ ද: ඇතුන් නො බලමින්, අසුන් නො බලමින්, පාබලසෙන් නො බලමින්...දසතුදස නො බලමින් යේ ද; මේ ද 'ගොචර'යයි කියනු ලැබේ. නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නො ගන්නේ වේ ද...මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ ද; මේ ද 'ගොචර'යයි කියනු ලැබේ. තව්ද යම්සේ ඇතැම් භවත් මහණ බමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා ඔහු මෙබඳු වූ විසුළු දස්සනෙහි යෙදී වාසය කෙරෙද්ද, එ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම්...බලඇණි දැකීම ආදිය හෝ යැ; මෙසේ මෙබඳු වූ විසුළු දස්සනෙන් වැළැකුණේ වේ ද; මේ ද 'ගොචර'යයි කියනු ලැබේ. සතර සිව්වටන්හු ද 'ගොචරයැ'.

තෙල වදාරන ලද මැය, භාග්‍යවත්හු විසින්:

"මහණෙනි, ගොචර (=හැසිරීමට යුක්තස්ථාන වූ ස්වකීය පෛතෘක (=පියාගෙන් පැමිණි) විෂයෙහි හැසිරෙවු, මහණෙනි, ගොචර වූ තමා සතු පියාගෙන් පැමිණි විෂයෙහි හැසිරෙනුවන්ට මාර තෙමේ සිදුරු නො ලබන්නේ යැ, මාර තෙමේ අරමුණු නො ලබන්නේ යැ. මහණෙනි, ගොචර වූ ස්වකීය පෛතෘකවිෂය කවරේ යත්: යම් මේ සතර සිව්වටන් කෙනෙක් වෙත් ද, කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමේ රූපකයෙහි කය නැවත නැවත බලමින් වෙසෙයි, වේදනාවන්හි... චිත්තයෙහි... ස්කන්ධාදි ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යක්ප්‍රඥ ඇති වැ ස්මෘතිමත් වූයේ ස්කන්ධාදි ලෝකයෙහි අභිධ්‍යාව හා දෞර්මනස්‍ය දුරු කොට වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණහට ගොචර වූ තමා සතු වූ පියා කෙරෙන් පැමිණි විෂය යයි කියනු ලැබේ. මෙ ද ගොචරය යි කියනු ලැබේ. මෙබඳු වූ ගොචරයෙන් සමන්විත වූයේ වන්නේ නුසි 'ක්‍යාස්සස්සු ඉධ ගොචරා' යනු වේ.

**කානි සීලබ්බතානාස්සු** - කෙබඳු වූ කවර පැවැතුම් ඇති කවර ප්‍රකාර වූ කවර ආකාර ඇති ශීලව්‍රතයෙකින් යුක්ත වූයේ වන්නේ දැ'යි ශීලව්‍රත-පාරිශුද්ධිය විචාරයි. ශීලව්‍රතපාරිශුද්ධිය කවරැ යත්: ශීලය මැ වූ ව්‍රතයකුත් ඇත, ශීල නො වූ ව්‍රතයකුත් ඇත; ශීලය මැ වූ ව්‍රතය කවරැ යත්: මේ සස්නෙහි මහණ තෙමේ සිල්වත් වේ ද, ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සංවර වූයේ ආචාරයෙන් හා ගොචරයෙන් සමන්විත වූයේ මඳ පමණ දොසෙහි දු බිය දක්නාසුළු වූයේ වාසය කෙරේ ද, ශික්ෂාකොට්ඨාසයන්හි සමාදන් වැ හික්මේ ද, එහි යම් සංයමයෙක් සංවරයෙක් නො ඉක්මැවීමෙක් වේ නම්, මේ ශීල යැ; යම් සමාදානයෙක් වී නම්, එය ව්‍රත යැ. සංවරාර්ථයෙන් ශීල යැ, සමාදානාර්ථයෙන් ව්‍රත යි. මේ ශීලය ද ව්‍රතය දැ'යි කියනු ලැබේ. ශීල නො වූ ව්‍රතය කවරැ යත්: අෂ්ට ධූතාඞ්ගයෝ යැ: ආරණ්‍යකාඞ්ග යැ පිණ්ඩපාතිකාඞ්ග යැ පාංශුකූලිකාඞ්ග යැ තෛචීවරිකාඞ්ග යැ සපදානචාරිකාඞ්ග යැ ඛලුපච්ඡාභත්තිකාඞ්ග යැ නෛසද්‍යිකාඞ්ග යැ යථාසන්තතිකාඞ්ගය යි. මේ ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබේ. වීර්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබේ: 'එකාන්තයෙන් සමත් නහරත් ඇටත් ඉතිරි-වන්නේ නමුදු සිරුරෙහි මස් ලේ වියැළෙන්නේ නමුදු පුරුෂශක්තියෙන් පුරුෂබලයෙන් පුරුෂවීර්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණියැ යුතු ඒ උත්තමාර්ථය නො පැමිණැ වීර්‍යයා ගේ ලිහිල්බවෙක් නො වන්නේ යැ'යි සිත උත්සාහ ගන්වයි, පිහිටුවයි; මෙබඳු වූ වීර්‍යසමාදානය ද ශීල නො වූ ව්‍රතය'යි කියනු ලැබේ.

1. "නාසිස්සං න පිවිස්සාමි විහාරතො න නික්ඛමෙ[1]
නපි පස්සං නිපාතෙස්සං තණ්හාසල්ලෙ අනූහතෙ"ති॥

චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. 'න තාවාහං ඉමං පල්ලඞ්කං භින්දිස්සාමි යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී'ති චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. 'න තාවාහං ඉමම්හා ආසනා වුට්ඨහිස්සාමි, න තාවාහං ඉමම්හා චඞ්කමා ඔරොහිස්සාමි, විහාරා නික්ඛමිස්සාමි අඩ්ඪයොගා නික්ඛමිස්සාමි, පාසාදා නික්ඛමිස්සාමි, හම්මියා – ගුහාය – ලෙණා–කුටියා –කූටාගාරා – අට්ටා – මාළා –උද්දණ්ඩා – උපට්ඨානසාලාය – මණ්ඩපා–රුක්ඛමූලා නික්ඛමිස්සාමි, යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී'ති චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. 'ඉමස්මිඤ්ඤෙව පුබ්බණ්හසමයං අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි සච්ඡිකරිස්සාමී'ති චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. ඉමස්මිඤ්ඤෙව මජ්ඣන්තිකසමයං – සායන්හසමයං – පුරෙභත්තං – පච්ඡාභත්තං – පුරිමයාමං – පච්ඡිමයාමං – කාළෙ – ජුණ්හෙ – වස්සෙ – හෙමන්තෙ–ගිම්හෙ – පුරිමෙ වයොඛන්ධෙ – මජ්ඣිමෙ වයොඛන්ධෙ – පච්ඡිමෙ වයොඛන්ධෙ අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි සච්ඡිකරිස්සාමි ඵස්සයිස්සාමීති චිත්තං පග්ගණ්හාති පදහති; එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං.

අයං සීලබ්බතපාරිසුද්ධි; එදිසාය[2] සීලබ්බතපාරිසුද්ධියා සමන්නාගතො අස්සාති – කාති සීලබ්බතානස්සු.

**පහිතත්තස්ස භික්ඛුනොති** –'පහිතත්තස්සා'ති ආරද්ධවිරියස්ස; ථාමවතො[3] දළ්හපරක්කමස්ස අනික්ඛිත්තච්ඡන්දස්ස අනික්ඛිත්තධුරස්ස කුසලෙසු ධම්මෙසු; අථවා පෙසිතත්තස්ස, යස්සත්ථාය පෙසිතො අත්ථෙ ච ඤායෙ ච ලක්ඛණෙ ච කාරණෙ ච ඨානාඨානෙ ච සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති පෙසිතත්තස්ස; සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති පෙසිතත්තස්ස; සබ්බෙ ධම්මා අනත්තාති පෙසිතත්තස්ස; අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති පෙසිතත්තස්ස; –පෙ– ජාතිපච්චයා ජරාමරණන්ති පෙසිතත්තස්ස; අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති පෙසිතත්තස්ස –පෙ– ජාතිනිරොධා ජරාමරණනිරොධොති පෙසිතත්තස්ස; ඉදං දුක්ඛන්ති පෙසිතත්තස්ස –පෙ– අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති පෙසිතත්තස්ස; ඉමෙ ආසවාති පෙසිතත්තස්ස–පෙ– අයං ආසවනිරොධගාමිනී පටිපදාති පෙසිතත්තස්ස; ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති පෙසිතත්තස්ස –පෙ– ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බාති පෙසිතත්තස්ස; ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච පෙසිතත්තස්ස;

1. නික්ඛමිං - සං. PTS. ඍ. පච්චයත්ථෙරගාථා- 3. 1. 2 මුදිතත්ථෙරගාථා- 4. 1. 12
2. කීදිසාය - සී.මු. I මජසං. 3. ථාමගත - සීමු. II.

1. “තෘෂ්ණාශල්‍යය උපුටා නො ලූ කල්හි (මේ බාද්‍යදිය) නො කමි, (යාගු ආදිය) නො බොමි, වෙහෙරින් නො නික්මෙමි, (ඇඳපුටු ආදියෙහි) ඇලය නො තබමි”.

සිත උත්සාහ ගන්වයි, පිහිටුවයි. මෙබඳු වීර්‍ය්‍යසමාදානය ද ‘ශීල නො වූ ව්‍රතය’යි කියනු ලැබේ. ‘යම් තාක් මාගේ සිත උපාදාන රහිත වැ (කාමාදි) ආස්‍රවයන් කෙරෙන් සමුච්ඡෙදවිමුක්තියෙන් නො මිදේ නම්, ඒ තාක් මේ පලග නො බිඳින්නෙමි’ සිත දැඩි වැ ගනී ද, පිහිටුවා ද; මෙබඳු වීර්‍ය්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රතයයි කියනු ලැබේ. (සිත කෙලෙසුන් කෙරෙන් මිදෙන) තාක් මම මේ ආසනයෙන් නො නැගීසිටින්නෙමි, ‘ඒ තාක් මම මේ සක්මනින් නො බස්නෙමි – විහාරයෙන් නො නික්මෙමි – අඩ්ඪයොග (ගුරුළුවක් ගෙයින්) නො නික්මෙමි – පහයෙන් නො නික්මෙමි – සඳලුතලයෙන්-ගුහායෙන් – උද්දණ්ඩයෙන් – උමටැත්හලින් – මණ්ඩපයෙන් – යම්තාක් මාගේ සිත උපාදාන රහිත වැ ආස්‍රවයන් කෙරෙන් නො මිදෙන්නේ නම්, ඒතාක් මේ රුක්මුලින් නො නික්මෙමි’ සිතට වැරගන්වා නම් සිත පිහිටුවා නම්, මෙබඳු වීර්‍ය්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රතයැ’යි කියනු ලැබේ. ‘මේ පෙරවරුයෙහි මැ ආර්‍ය්‍යධර්මය (මාගේ සිතට) එළවමි, මොනවට එළවමි, අධිගමය කෙරෙමි, ස්පර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කෙරෙමි’යි සිතට වැර ගන්වා ද, පිහිටුවා ද, මෙබඳු වීර්‍ය්‍යසමාදානය ත් ශීල නො වූ ව්‍රතය’යි කියනු ලැබේ. මේ මැදිදහවල්හි මැ – පස්වරුයෙහි – පෙරබත්හි – පසුබත්හි – පෙරයමැ – මැදියමැ – අළුයමැ – අවපසැ – පුරපසැ – වැසිකලැ – හිමත්කලැ – ගිම්කලැ – ප්‍රථමවයස්හි – මධ්‍යමවයස්හි – පශ්චිමවයස්හි ආර්‍ය්‍යධර්මය එළවමි, මොනොවට එළවමි, අධිගමය කෙරෙමි, ස්පර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කරන්නෙමි’ සිත දැඩිව ගනී ද, පිහිටුවා ද, මෙබඳු වීර්‍ය්‍යසමාදානයත් ‘ශීල නො වූ ව්‍රතය’යි කියනු ලැබේ.

මෝ තොමෝ ශීලව්‍රතපාරිශුද්ධිය යි. මෙබඳු වූ ශීලව්‍රතපාරිශුද්ධියෙන් සමන්විත වූයේ වන්නේ නුයි ‘කාති සීලබ්බතාන’ස්සු’ යනු වේ.

**පහිතත්තස්ස භික්ඛුනො** – ‘පහිතත්තස්ස’ යනු: රුකුළු වැර ඇත්තහුට කුසල්දහම්හි ශක්තිය ඇත්තහුට දැඩි පරාක්‍රම ඇත්තහුට නැමූ වීර්‍ය්‍යච්ඡන්ද ඇත්තහුට නො නැමූ වීර්‍ය්‍යධුර ඇත්තහුට; නොහොත් මෙහෙයූ සිත් ඇත්තහුට, යම් රහත් බවක් සඳහා ආත්මභාවය පරිත්‍යාග කරන ලද ද, අර්හත් ඵල සඞ්ඛ්‍යාත ආත්මාර්ථයෙහි ද න්‍යාය (ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග) යෙහි ද අනිත්‍යාදි ලක්ෂණප්‍රතිවේධයෙහි ද හේතුයෙහි ද ස්ථානාස්ථානයෙහි ද (-කාරණයෙහි ද අකාරණයෙහි ද;) ‘සියලු සංස්කාරයෝ අනිත්‍ය වූහ’යි මෙහෙයූ සිත් ඇත්තහුට, ‘සියලු සංස්කාරයෝ දුක් වූහ’යි මෙහෙයූ සිත් ඇත්තහුට, ‘සියලු ධර්මයෝ අනාත්ම වූහ’යි මෙහෙයූ සිත් ඇත්තහුට, ‘අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති’ මෙහෙයූ සිත් ඇත්තහුට,...‘ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වේ’ යයි මෙහෙයූ සිත් ඇත්තහුට; අවිද්‍යාවගේ නිරෝධයෙන් සංස්කාරනිරොධය වේ යයි මෙහෙයූ සිතැත්තහුට,...ජාතිනිරොධයෙන් ජරාමරණනිරොධය වේ යයි මෙහෙයූ සිතැත්තහුට; ‘මේ දුඃඛසත්‍ය යැ’යි මෙහෙයූ සිතැත්තහුට,...‘මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත්තිය’යි මෙහෙයූ සිතැත්තහුට; ‘මොහු ආස්‍රවයෝ ය’යි මෙහෙයූ සිතැත්තහුට; ..‘මේ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපත්තිය යි මෙහෙයූ සිතැත්තහුට, ‘මේ ධර්මයෝ දතයුත්තාහ’යි මෙහෙයූ සිතැත්තහුට...‘මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළයුත්තාහ’යි මෙහෙයූ සිතැත්තහුට; සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ පහළවීමට ද නැසීමට ද ආස්වාදයට ද ආදීනවයට ද නිස්සරණයට ද මෙහෙයූ සිතැත්තහුට,

පඤ්චන්නං උපාදානක්ඛන්ධානං - චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච පෙසිතත්තස්ස; යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති පෙසිතත්තස්ස. භික්ඛුනොති පුථුජ්ජනකල්‍යාණකස්ස වා භික්ඛුනො සෙඛස්ස වා භික්ඛුනොති-පහිතත්තස්ස භික්ඛුනො.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු ක්‍යාස්සස්සු ඉධ ගොචරා,
කානි සීලබ්බතානාස්සු පහිතත්තස්ස භික්ඛුනො"ති.

16 - 8

කං සො සික්ඛං සමාදාය එකොදි[1] නිපකො සතො,
කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො.

**කං සො සික්ඛං සමාදායාති** - කං සො සික්ඛං ආදාය සමාදාය ආදියිත්වා සමාදියිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති - කං සො සික්ඛං සමාදාය.

**එකොදි[1] නිපකො සතොති** - 'එකොදී'ති එකග්ගචිත්තො අවික්ඛිත්තචිත්තො අවිසාහටමානසො, සමථො සමාධින්ද්‍රියං සමාධිබලං -පෙ- සම්මාසමාධි; **නිපකොති** නිපකො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී; **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; වෙදනාසු - චිත්තෙ - ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; සො වුච්චති සතොති - සතො.

**කං සො සික්ඛං සමාදායාති** - අධිසීලසික්ඛං පුච්ඡති. **නිපකොති** අධිපඤ්ඤාසික්ඛං පුච්ඡති. **සතොති** පාරිසුද්ධිං පුච්ඡතීති - කං සො සික්ඛං සමාදාය එකොදි නිපකො සතො.

**කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනොති** - 'කම්මාරො' වුච්චති සුවණ්ණකාරො; 'රජතං' වුච්චති ජාතරූපං. යථා සුවණ්ණකාරො ජාතරූපස්ස ඔළාරිකම්පි මලං ධමති සන්ධමති නිද්ධමති; මජ්ඣිමකම්පි මලං ධමති සන්ධමති නිද්ධමති; සුඛුමකම්පි මලං ධමති සන්ධමති නිද්ධමති; එවමෙවං භික්ඛු අත්තනො ඔළාරිකෙපි කිලෙසෙ ධමති සන්ධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති.

1. එකොදි - සීමු. II.

පඤ්චුපාදානස්කන්ධයන්ගේ - සතර මහාභූතයන්ගේ සමුදයට ද අස්තඞ්ගමයට ද ආස්වාදයට ද ආදීනවයට ද නිස්සරණයට ද මෙතෙහු සිතැත්තහුට, 'යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නැසෙන පියවි ඇතැ'යි මෙතෙහු සිතැත්තහුට. භික්ඛුනො යනු: පෘථග්ජනකල්‍යාණක භික්ෂූහුගේ හෝ, ශෛක්ෂභික්ෂූහුගේ හෝ නුයි 'පහිතත්තස්ස භික්ඛුනො' යනු වේ.

එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

“ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු -පෙ- පහිතත්තස්ස භික්ඛුනො”යි.

16 - 8

ඒ මහණ තෙමේ එකඟ වූ සිත් ඇතියේ (පාරිහාරියප්‍රඥාවෙන්) ප්‍රඥාවත් වූයේ ස්මෘතිමත් වූයේ කවර ශික්ෂාවක් සමාදන් වැ, කම්බුරු තෙමේ ජාතරූපයාගේ මලය මෙන් තමාගේ කෙලෙස් මලය පිඹැ හරනේ ද?

කං සො සික්ඛං සමාදාය - ඒ මහණ තෙමේ කවර ශික්ෂාවක් ගෙන සමාදන් වැ ආදානය කොට සමාදානය කොට ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවේශ කොට නුයි 'කං සො සික්ඛං සමාදාය' යනු වේ.

එකොදි නිපකො සතො - 'එකොදි' යනු: එකඟ වූ සිත් ඇතියේ නො විසුරුණු සිත් ඇතියේ උඩඟු නො වූ සිත් ඇතියේ, ශමථය සමාධීන්ද්‍රිය සමාධිබලය...සම්‍යක්සමාධිය ඇතියේ; නිපකො යනු: නිපක වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැතියේ තීරණප්‍රඥා ඇතියේ ධාරණප්‍රඥා ඇතියේ; සතො යනු: සතර කාරණෙකින් සිහි ඇතියේ රූපකායයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, වේදනාවන්හි - චිත්තයෙහි - පඤ්චස්කන්ධාදි ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් ස්මෘතිමත් වූයේ; හෙ තෙමේ සිහි ඇතියේ යයි කියනු ලැබේ නුයි 'සතො' යනු වේ.

කං සො සික්ඛං සමාදාය යි - අධිශීලශික්ෂාව විචාරයි. නිපකොයි අධිප්‍රඥාශික්ෂාව විචාරයි, සතොයි පාරිශුද්ධිය විචාරා නුයි 'කං සො සික්ඛං සමාදාය එකොදි නිපකො සතො' යනු වේ.

කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො - රන්කරු තෙමේ 'කම්මාර'යි කියනු ලැබෙයි. ජාතරූපය 'රජත'යි කියනු ලැබේ. යම්සේ රන්කරුවෙක් ජාතරූපයාගේ ඖදාරික වූ මලය බැහැර කෙරේ ද, මැනැවින් බැහැර කෙරේ ද, නිරවශේෂයෙන් බැහැර කෙරේ ද; මධ්‍යම වූ මලයත් ධමනය සන්ධමනය නිද්ධමනය කෙරේ ද, සියුම් වූ මලයත් බැහැර කෙරේ ද, මැනැවින් බැහැර කෙරේ ද, නිරවශේෂයෙන් බැහැර කෙරේ ද, එසෙයින් ම මහණ තෙමේ තමාගේ ඖදාරික වූ කෙලෙසයන් ද බැහැර කෙරෙයි, මැනැවින් බැහැර කෙරෙයි, නිරවශේෂයෙන් බැහැර කෙරෙයි; දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනුඅභාවයට පමුණුවයි.

මජ්ඣිමකෙපි කිලෙසෙ – සුඛුමකෙපි කිලෙසෙ ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. අථ වා භික්ඛු අත්තනො රාගමලං දොසමලං මොහමලං මානමලං දිට්ඨිමලං කිලෙසමලං දුච්චරිතමලං අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති; අථ වා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨිං ධමති සන්ධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති; සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පං – සම්මාවාචාය මිච්ඡාවාචං – සම්මාකම්මන්තෙන මිච්ඡාකම්මන්තං – සම්මාආජීවෙන මිච්ඡාආජීවං – සම්මාවායාමෙන මිච්ඡාවායාමං – සම්මාසතියා මිච්ඡාසතිං – සම්මාසමාධිනා මිච්ඡාසමාධිං – සම්මාඤාණෙන මිච්ඡාඤාණං – සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්තිං ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. අථවා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසෙ සබ්බෙ දුච්චරිතෙ සබ්බෙ දරථෙ සබ්බෙ පරිළාහෙ සබ්බෙ සන්තාපෙ සබ්බාකුසලාභිසඞ්ඛාරෙ ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති – කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

> “කං සො සික්ඛං සමාදාය එකොදි නිපකො සතො,
> කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො”ති.

## 16 – 9

> විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු
> (සාරිපුත්තාති භගවා)
> රිත්තාසනං සයනං සෙවතො චෙ,
> සම්බොධිකාමස්ස යථානුධම්මං
> තං තෙ පවක්ඛාමි යථා පජානං.

**විජිගුච්ඡමානස්ස යදිදං ඵාසූති** – ‘විජිගුච්ඡමානස්සා’ති ජාතියා විජිගුච්ඡමානස්ස, ජරාය – බ්‍යාධිනා – මරණෙන – සොකෙහි – පරිදෙවෙහි – දුක්ඛෙහි – දොමනස්සෙහි – උපායාසෙහි –පෙ– දිට්ඨිබ්‍යසනෙන දුක්ඛෙන විජිගුච්ඡමානස්ස අට්ටීයමානස්ස හරායමානස්සාති – විජිගුච්ඡමානස්ස; යදිදං ඵාසූති යං ඵාසු ඵාසුවිහාරං තං කථයිස්සාමි; කතමො ඵාසුවිහාරො? සම්මාපටිපදා අනුලොමපටිපදා අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරිපූරකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො නිබ්බානඤ්ච නිබ්බානගාමිනී ච පටිපදා; අයං ඵාසුවිහාරොති – විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු.

මධ්‍යම වූ කෙලෙශයන් ද...සියුම් වූ කෙලෙශයන් ද ධමනය සන්ධමනය නිද්ධමනය කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. නොහොත් මහණ තෙමේ තමාගේ ප්‍රඥාලෝකය නසන ප්‍රඥාචක්ෂුස නො කරන නො දැනීම කරන පැනැස නසන පීඩාකොට්ඨාසයෙහි වූ අමාමහනිවන පිණිස නො පවත්නා වූ රාගමලය ද්වේෂමලය මෝහමලය මානමලය දෘෂ්ටිමලය ක්ලේශමලය දුශ්චරිතමලය බැහැර කෙරෙයි, වෙසෙසින් බැහැර කෙරෙයි, නිරවශේෂයෙන් බැහැර කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. නොහොත් (විදර්ශනා සහිත මාර්ගසම්ප්‍රයුක්ත) සම්‍යග්දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය ධමනය සන්ධමනය නිද්ධමනය කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. සම්‍යක්සංකල්පයෙන් මිථ්‍යාසංකල්පය-සම්‍යග්වචනයෙන් මිථ්‍යාවචනය - සම්‍යක්කර්මාන්තයෙන් මිථ්‍යාකර්මාන්තය-සම්‍යගාජීවයෙන් මිථ්‍යාජීවය - සම්‍යග්ව්‍යායාමයෙන් මිථ්‍යාව්‍යායාමය-සම්‍යක්ස්මෘතියෙන් මිථ්‍යාස්මෘතිය - සම්‍යක්සමාධියෙන් මිථ්‍යාසමාධිය-සම්‍යග්ඥානයෙන් මිථ්‍යාඥානය - සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධමනය සන්ධමනය නිද්ධමනය කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. නොහොත් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සියලු කෙලෙශයන් සියලු දුශ්චරිතයන් සියලු දරථයන් සියලු පරිදාහයන් සියලු සන්තාපයන් සියලු අකුශලාභිසංස්කාරයන් බැහැර කෙරෙයි, වෙසෙසින් බැහැර කෙරෙයි, නිරවශේෂයෙන් බැහැර කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවා නුයි 'කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො' යනු වේ.

එහෙයින් වදාළහ ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ:

"සො සො සික්ඛං සමාදාය -පෙ- නිද්ධමෙ මලමත්තනො"යි.

**16 – 9**

(ශාරීපුත්‍රය සී බුදුහු මෙසේ වදාළහ.) ජාත්‍යාදියෙන් පිළිකුල් කරන්නා වූ එකාන්තයෙන් විවික්තාසනය ශයනය සෙවුණා වූ (සතර මාර්ගඥාන සඞ්ඛ්‍යාත) සම්බෝධිය කැමැත්තා වූ මහණ හට යම් ඒ ඵාසුවිහරණයෙක් වේ ද, යම් අනුධර්මයකුත් වේ ද, එය තොපට (ප්‍රත්‍යක්ෂ කොට) දතුවකු සෙයින් ප්‍රකාශ කරන්නෙමි.

**විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු** – 'විජිගුච්ඡමානස්ස' යනු: ජාතියෙන් ජුගුප්සා කරන්නහුට, ජරාවෙන් – ව්‍යාධියෙන් – මරණයෙන් – ශෝකයෙන්-පරිදේවයෙන් – දුකින් – දොම්නසින් – උපායාසයෙන්...දෘෂ්ටිව්‍යසනයෙන් වූ දුකින් ජුගුප්සා කරන්නහුට දුක් වන්නහුට ලජ්ජා වන්නහුට නුයි 'විජිගුච්ඡමානස්ස' යනු වේ. යදිදං ඵාසු යනු: යම් ඵාසුවිහරණයෙක් වේ නම්, එය කියන්නෙමි. ඵාසුවිහරණය කවරේ යත්: සම්‍යක්ප්‍රතිපත්ති යැ අනුලොමප්‍රතිපත්ති යැ අවිරුද්ධප්‍රතිපත්ති යැ අන්වර්ථප්‍රතිපත්ති යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ ප්‍රාතිමෝක්ෂශීලයෙහි පරිපූර්ණකාරී බව යැ ඉන්ද්‍රියයන්හි පියූ දොර ඇති බව යැ භොජනයෙහි පමණ දන්නා බව යැ නිදි දුරු කිරීමෙහි යෙදීම යැ ස්මෘතිසම්ප්‍රඥානය යැ සතර සතිපට්ඨානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්ච බලයෝ යැ සප්ත බොධ්‍යඞ්ගයෝ යැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යැ නිර්වාණය ද නිර්වාණගාමිනී ප්‍රතිපත්තිය ද යන මේ ඵාසුවිහරණය නුයි 'විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු' යනු වේ.

**සාරිපුත්තාති** – භගවා තං ථෙරං නාමෙනාලපති; භගවාති ගාරවාධිවචනං; අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා, භජි වා භගවා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානී'ති භගවා, භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා, භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා, භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං ආරුප්පසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං චතුන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානස්සතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා; භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා, භගවාති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති – සාරිපුත්තාති භගවා.

**රිත්තාසනං සයනං සෙවතො චෙති** – 'ආසනං' වුච්චති යත්ථ නිසීදති මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාල[1] සන්ථාරො; 'සයනං' වුච්චති සෙනාසනං: විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා, තං සයනාසනං අසප්පායරූපදස්සනෙන රිත්තං විවිත්තං පවිවිත්තං, අසප්පායසද්දස්සවනෙන –පෙ– අසප්පායෙහි පඤ්චහි කාමගුණෙහි රිත්තං විවිත්තං පවිවිත්තං; රිත්තං සයනාසනං සෙවතො නිසෙවතො සංසෙවතො පටිසෙවතොති – රිත්තාසනං සයනං සෙවතො චෙ.

1. පලාස - සං.

**සාරිපුත්ත** - යනු: බුදුහු ඒ තෙරුන් නමින් අමතන සේක. **භගවා** යනු: ගෞරවාධිවචන යැ; තවද, බිඳුණු රාග ඇති හෙයින් භගවත් යැ, බිඳුණු ද්වේෂ ඇති හෙයින් භගවත් යැ, බිඳුණු මෝහ ඇති හෙයින් භගවත් යැ, බිඳුණු මාන ඇති හෙයින් භගවත් යැ, බිඳුණු දෘෂ්ටි ඇති හෙයින් භගවත් යැ, බිඳුණු කෙලෙස් කටු ඇති හෙයින් භගවත් යැ, බිඳුණු කෙලෙස් ඇති හෙයින් භගවත් යැ, දහම්-රුවන් භාග - විභාග - ප්‍රවිභාග කළාහු හෙයින් භගවත් යැ, භවයන් කෙළ-වර කළාහු හෙයින් භගවත් යැ, භාවිත (-වඩන ලද) කය ඇති හෙයින්, භාවිත ශීල - භාවිතචිත්ත - භාවිතප්‍රඥ ඇත්තාහු හෙයින් භගවත් යැ; නොහොත් බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස් කරුණුවලට තැන් වූ විවේකයට අනුරූප වූ වනයෙහි දුර සෙනසුන් ඉතා දුර සෙනසුන් වනප්‍රස්ථාන සෙනසුන් භජනය කළාහු හෙයින් භගවත් යැ, නොහොත් බුදුහු චීවර පිණ්ඩපාතසේනාසන ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍ය-පරිෂ්කාරයනට හිමි වූවාහු හෙයින් භගවත් යැ, නොහොත් බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු හෙයින් භගවත් යැ, නොහොත් බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රාමාණ්‍ය-යන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු හෙයින් භගවත් යැ, නොහොත් බුදුහු අෂ්ට විමෝක්ෂයන්ට සතර අභිභායතනයන්ට නව අනුපූර්වවිහාර-සමාපත්තීන්ට හිමි වූවාහු හෙයින් භගවත් යැ, නොහොත් බුදුහු දශ සංඥා-භාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනාපානස්මෘතිසමාධියට අශුභ සමාපත්තියට හිමි වූවාහු හෙයින් භගවත් යැ, නොහොත් බුදුහු සතර සති-පට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්යඅෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු හෙයින් භගවත් යැ, නොහොත් බුදුහු දශ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍ය-යන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධධර්මයන්ට හිමි වූවාහු හෙයින් භගවත් නම් වූහ. 'භගවත්' යන මේ නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑයකු විසින් නො කරන ලද, බුනකු විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරන ලද, නෑයන් විසින් නො කරන ලද, මහණබමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද, යම් මේ 'භගවත්' යන නාම යෙක් වී නම්, මේ භාග්‍යවත් වූ බුදුවරයන්ට අර්හත්මාර්ගයාගේ අන්ත-යෙහි බෝමුල දී සර්වඥතාඥානය ලැබීම සමග රහත්ඵලය (හෝ සර්වධර්ම-යන්) ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී හෙයින් 'සාරිපුත්තාති භගවා' යනු වේ.

**රිත්තාසනං සයනං සෙවතො වෙ** - යම් තැනෙක හිඳී නම්, එය 'ආසන' යී කියනු ලැබෙයි: ඇඳ පුටු බිසි තට්ටිකා සම්කඩ තණඇතිරිය පත්ඇතිරිය පිදුරුඇතිරිය යි, සේනාසනය 'සයන'යී කියනු ලැබෙයි: විහාර යැ ගුරුළුවක් ගෙයැ ප්‍රාසාදය යැ හර්ම්‍ය යැ ගුහා යි; ඒ ශයනාසනය අසත් ප්‍රාසරූපදර්ශනයෙන් රික්ත යැ විවික්ත යැ ප්‍රවිවික්ත යි; අසත්ප්‍රාය ශබ්ද-ශ්‍රවණයෙන්...අසත්ප්‍රාය වූ පඤ්චකාමගුණයන් ගෙන් සිස් යැ විවෙක යැ අතිශයින් විවෙක යි. විවෙක වූ ශයනාසනය සෙවුණාහට නිති සෙවුණා-හට මැනැවින් සෙවුණාහට වෙසෙසින් සෙවුණාහට හෙයින් 'රිත්තාසනං සයනං සෙවතො වෙ' යනු වේ.

**සම්බොධිකාමස්ස යථානුධම්මන්ති** - 'සම්බොධි' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං -පෙ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි; තං සම්බොධිං බුජ්ඣිතුකාමස්ස අනුබුජ්ඣිතුකාමස්ස පටිවිජ්ඣිතුකාමස්ස සම්බුජ්ඣිතුකාමස්ස අධිගන්තුකාමස්ස ඵස්සිතුකාමස්ස සච්ඡිකාතුකාමස්සාති - සම්බොධිකාමස්ස; **යථානුධම්මන්ති** කතමෙ බොධියා අනුධම්මා? සම්මාපටිපදා අනුලොමපටිපදා අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරිපූරකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙසු මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං; ඉමෙ වුච්චන්ති බොධියා අනුධම්මා; අථවා චතුන්නං මග්ගානං පුබ්බභාගෙ විපස්සනා, ඉමෙ වුච්චන්ති බොධියා අනුධම්මාති - සම්බොධිකාමස්ස යථානුධම්මං.

**තං තෙ පවක්ඛාමි යථා පජානන්ති** - 'ත'න්ති බොධියා අනුධම්මං **පවක්ඛාමීති** පවක්ඛාමි ආචික්ඛිස්සාමි දෙසෙස්සාමි පඤ්ඤපෙස්සාමි පට්ඨපෙස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසිස්සාමි; **යථා පජානන්ති** යථා පජානං යථා පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො, න ඉතිහිතිහං න ඉතිකිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයං අභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මං තං කථයිස්සාමීති - තං තෙ පවක්ඛාමි යථා පජානං.

තෙනාහ භගවා:

"විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු
(සාරිපුත්තාති භගවා)
රිත්තාසනං සයනං සෙවතො චෙ,
සම්බොධිකාමස්ස යථානුධම්මං
තං තෙ පවක්ඛාමි යථා පජාන"න්ති.

## 16 - 10

පඤ්චන්න ධීරො භයානං න භායෙ
භික්ඛු සතො සපරියන්තචාරී,[1]
ඩංසාධිපාතාන සිරිංසපානං[2]
මනුස්සඵස්සාන[3] චතුප්පදානං.

1. සපරියන්තචාරී - මජසං 2. සරීසපානං - මජසං
3. මනුස්සඵස්සානං - මජසං.

**සම්බොධිකාමස්ස යථානුධම්මං** – සතර මාර්ගඥානය ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රිය ප්‍රඥාබලය...ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය විමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය 'සම්බොධි'යි කියනු ලැබෙයි. ඒ සම්බොධිය අවබොධ කරනු කැමැත්තහුට අනුරූපප්‍රතිපත්තියෙන් අවබොධ කරනු කැමැත්තහුට ප්‍රතිවෙධ කරනු කැමැත්තහුට මැනැවින් අවබොධ කරනු කැමැත්තහුට අධිගමය කරනු කැමැත්තහුට ස්පර්ශ කරනු කැමැත්තහුට ප්‍රත්‍යක්ෂ කරනු කැමැත්තහුට නුයි 'සම්බොධිකාමස්ස' යනු වේ. **යථානුධම්මං** යන (මෙහි) බොධියට අනුධර්මයෝ කවරහ යත්: සම්‍යක්ප්‍රතිපත්තිය අනුලොමප්‍රතිපත්තිය අප්‍රත්‍යනීකප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමොක්ෂශීලයෙහි සම්පූර්ණ කරන සුලු බව ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාර ඇති බව භොජනයෙහි පමණ දන්නා බව නිදි දුරු කිරීමෙහි යෙදීම ස්මෘතිය හා සම්‍යක් ප්‍රඥාව යන මොහු මාර්ගඥාන සඞ්ඛ්‍යාත බොධියට අනුධර්මයෝ යයි කියනු ලැබෙත්; නොහොත් සතර ආර්යමාර්ගයන්ගේ පූර්වභාගයෙහි උපන් විදර්ශනාව යි. මොහු මාර්ගඥාන බොධියට අනුධර්මයෝ යයි කියනු ලැබෙත් දැයි 'සම්බොධිකාමස්ස යථානුධම්මං' යනු වේ.

**තං තෙ පවක්ඛාමි යථා පජානං** – 'තං' යනු: බොධියට අනුධර්මය; **පවක්ඛාමි** යනු: කියන්නෙමි දක්වන්නෙමි දෙසන්නෙමි පනවන්නෙමි පිහිටුවන්නෙමි විවෘත කරන්නෙමි විභාග කරන්නෙමි ප්‍රකට කරන්නෙමි ප්‍රකාශ කරන්නෙමි. **යථා පජානං** දතුවකු සෙයින් දැනගත්තකු හාත්පසින් දැනගත්තකු වෙසෙසින් දැනගත්තකු සර්වප්‍රකාරයෙන් දැනගත්තකු ප්‍රතිවෙධ කළ එකක්හු යම්සේ ද එපරිද්දෙන්, මෙසේ මෙසේ වී ලු'යි නො වැ, තෙල මෙලෙස් ලු'යි නො වැ, පරම්පරාකථාවෙන් නො වැ පිටකසම්ප්‍රදාය හා සම වේ ලු'යි නො වැ, තර්කහෙතුවෙන් නො වැ, නයග්‍රාහ හෙතුයෙන් නො වැ, (මේ සොඳුරැ යැයි) කරුණු සැලැකීමෙන් නො වැ, අපට රුචි වූ දෘෂ්ටිය හා සම වේ යැයි නො වැ, තෙමේ මැ තමා විසින් නුවණින් අවබොධ කළ තමහට ප්‍රත්‍යක්ෂ වූ ඒ ධර්මය කියන්නෙමි නුයි 'තං තෙ පවක්ඛාමි යථා පජානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"විජිගුච්ඡමානස්ස -පෙ- තං තෙ පවක්ඛාමි යථා පජානං"**යි.

**16 – 10**

ධීර වූ සමාහිතවත් වූ (ශීලාදි සතර) පර්යන්තයෙහි හැසිරෙනසුලු ඒ මහණ තෙමෙ (මතු දක්වන) පඤ්ච භීතීන්ට නො බියවන්නේ යැ: ඇට මැස්සන් හා සෙසු මැස්සන්ට ද, දීර්ඝජාතීන්ට ද, චෞරාදි මනුෂ්‍යස්පර්ශයන්ට ද, සිංහාදි සිව්පාවුන්ට ද-

**පඤ්චන්නං ධීරො භයානං න භායෙති** - 'ධීරො'ති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. ධීරො පඤ්චන්නං භයානං න භායෙය්‍ය න තසෙය්‍ය න සන්තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරු අඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - පඤ්චන්නං ධීරො භයානං න භායෙ.

**භික්ඛු සතො සපරියන්තචාරීති** - 'භික්ඛූ'ති පුථුජ්ජනකල්‍යාණකො වා භික්ඛු, සෙඛො වා භික්ඛු; **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, **වෙදනාසු** - චිත්තෙ - ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානං භාවෙන්තො සතො; සො වුච්චති සතො; **සපරියන්තචාරීති** චත්තාරො පරියන්තා: සීලසංවරපරියන්තො, ඉන්ද්‍රියසංවරපරියන්තො, භොජනෙ මත්තඤ්ඤුතාපරියන්තො, ජාගරියානුයොගපරියන්තො; කතමො සීලසංවරපරියන්තො? ඉධ භික්ඛු සීලවා හොති. පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, අන්තොපූතිභාවං පච්චවෙක්ඛමානො, අන්තො සීලසංවරපරියන්තෙ චරති; මරියාදං න භින්දති, අයං සීලසංවරපරියන්තො. කතමො ඉන්ද්‍රියසංවරපරියන්තො? ඉධ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං -පෙ- චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා - ඝානෙන ගන්ධං ඝායිත්වා - ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති; රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. ආදිත්තපරියායං පච්චවෙක්ඛමානො අන්තො ඉන්ද්‍රියසංවරපරියන්තෙ චරති, මරියාදං න භින්දති, අයං ඉන්ද්‍රියසංවරපරියන්තො. කතමො භොජනෙ මත්තඤ්ඤුතාපරියන්තො? ඉධ භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය; යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති. අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. අක්ඛබ්භඤ්ජන - වණපටිච්ඡාදන - පුත්තමංසූපමං පච්චවෙක්ඛමානො අන්තො භොජනෙ මත්තඤ්ඤුතාපරියන්තෙ චරති, මරියාදං න භින්දති; අයං භොජනෙ මත්තඤ්ඤුතාපරියන්තො.

**පඤ්චන්න ධීරො භයානං න භායෙ** – 'ධීරෝ' යනු ධීර වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැතියේ තීරණප්‍රඥා ඇතියේ ධාරණප්‍රඥා ඇතියේ වීර වූයේ පඤ්ච භීතීන්ට නො බිය වන්නේ යැ, නො තැති ගන්නේ යැ, සන්ත්‍රස්ත නො වන්නේ යැ, උත්‍රස්ත නො වන්නේ යැ, හාත්පසින් නො තැති ගන්නේ යැ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යැ, නො බියසුලු නො සැලෙනසුලු නො තැතිගන්නාසුලු නො පලායනසුලු වන්නේ යැ, ප්‍රහීණ වූ බිය අරමුණු ඇතියේ පහවූ ලොමුදැහැ ඇතියේ වෙසෙන්නේ නුසි 'පඤ්චන්න ධීරො භයානං න භායෙ' යනු වේ.

**භික්ඛු සතො සපරියන්තචාරී** – 'භික්ඛු' යනු: පෘථග්ජනකල්‍යාණක මහණ හෝ ශෛක්ෂ මහණ හෝ යැ; **සතො** යනු: කරුණු සතරෙකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, වේදනාවන්හි – චිත්තයෙහි – ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, හෙ තෙමෙ සිහි ඇතියේ යයි කියනු ලැබේ. **සපරියන්තචාරී** පර්‍යන්තයෝ සතර දෙනෙකි: ශීලසංවරපර්‍යන්තය යැ, ඉන්ද්‍රියසංවරපර්‍යන්තය යැ, භොජනයෙහි මාත්‍රඥතාපර්‍යන්තය යැ, ජාගරියානුයොගපර්‍යන්තය යැයි. ශීලසංවරපර්‍යන්තය කවරැ යත්: මෙ සස්නෙහි මහණ තෙමෙ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවර වැ වෙසෙයි, ආචාරයෙන් හා ගොචරයෙන් සම්පූර්ණ වූයේ මඳපමණ වරදෙහි බිය දක්නාසුලු වූයේ සමාදන් වැ ශික්ෂාපදයන්හි හික්මෙයි, අභ්‍යන්තරයෙහි පූතිභාවය (–සිල් රහිත බව) ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින්, ශීලසංවරපරිච්ඡේදයාගේ ඇතුළත හැසිරෙයි; ශීලමර්‍යාදාව නො බිඳී. මේ තෙමෙ ශීලසංවරපර්‍යන්තය යි. ඉන්ද්‍රියසංවරපර්‍යන්තය කවරැ යත්? මේ සස්නෙහි මහණ තෙමෙ ඇසින් රූපයක් දැක (කෙලෙශවස්තු වූ) නිමිති නො ගන්නේ වෙයි. (හස්තපාදාදි ආකාර සඞ්ඛ්‍යාත) අනුව්‍යඤ්ජන නො ගන්නේ වෙයි, යම් කරුණෙකින් මොහු... චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි, කනින් ශබ්දයක් අසා – නැහැයෙන් ගඳක් අඝා – දිවින් රසයක් විඳ – කයින් පහසක් පැහැස – මනසින් දහමක් දැන නිමිති නො ගන්නේ වෙයි, අනුව්‍යඤ්ජන නො ගන්නේ වෙයි, යම් කරුණෙකින් මනින්ද්‍රියය අසංවෘත වැ වාසය කරන මොහු අභිධ්‍යා දොම්නස් සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම්, ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී, මනින්ද්‍රියය රකී, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. ආදිත්තපර්‍යාය දෙශනාව ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් ඉන්ද්‍රියසංවරපරිච්ඡේදය අභ්‍යන්තරයෙහි හැසිරෙයි, ඉන්ද්‍රියසංවරමර්‍යාදාව නො බිඳී. මේ තෙමෙ ඉන්ද්‍රියසංවරපර්‍යන්තය යි භොජනයෙහි මාත්‍රඥතාපර්‍යන්තය කවරැ යත්? මෙ ශාසනයෙහි මහණ තෙමෙ නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට අහර වළඳයි, කෙළි පිණිස නො වළඳයි, මද පිණිස – අලඞ්කාර පිණිස – සැරැසුම් පිණිස නො වළඳයි, යම්තාක් මේ කයෙහි පැවැත්ම පිණිස යැපීම පිණිස බඩගිනි වේදනා නැසීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස වළඳයි, මෙසේ 'පැරණි බඩගිනි වේදනාව නසමි, අලුත් වේදනාත් නුපදවමි, මාගේ යැපීම ද වන්නේය, නිවරද බව ද සුවවිහරණය ද වන්නේ ය'යි අක්ෂාභ්‍යඤ්ජනොපමාව ද ව්‍රණප්‍රතිච්ඡාදනොපමාව ද පුත්‍රමාංසොපමාව ද ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් භොජනයෙහි මාත්‍රඥතාපරිච්ඡේදය අභ්‍යන්තරයෙහි හැසිරෙයි, මර්‍යාදාව නො බිඳී. මේ තෙමෙ භොජනයෙහි මාත්‍රඥතාපර්‍යන්තය යි.

කතමො ජාගරියානුයොගපරියන්තො? ඉධ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. භද්දෙකරත්තවිහාරං පච්චවෙක්ඛමානො අන්තොජාගරියානුයොගපරියන්තෙ චරති, මරියාදං න භින්දති; අයං ජාගරියානුයොගපරියන්තොති – භික්ඛු සතො සපරියන්තචාරී.

**ඩංසාධිපාතාන සිරිංසපානන්ති** – 'ඩංසා' වුච්චන්ති පිඞ්ගලමක්ඛිකායො; **'අධිපාතකා'** වුච්චන්ති සබ්බාපි මක්ඛිකායො; කිං කාරණා අධිපාතකා වුච්චන්ති සබ්බාපි මක්ඛිකායො? තා උප්පතිත්වා උප්පතිත්වා ඛාදන්ති; තංකාරණා අධිපාතකා වුච්චන්ති සබ්බාපි මක්ඛිකායො. **'සිරිංසපා'** වුච්චන්ති අහීති – ඩංසාධිපාතාන සිරිංසපානං

**මනුස්සඵස්සාන චතුප්පදානන්ති** – 'මනුස්සඵස්සා' වුච්චන්ති චොරා වා අස්සු මානවා වා කතකම්මා වා අකතකම්මා වා; තෙ භික්ඛුං පඤ්හං වා පුච්ඡෙය්‍යුං, වාදං වා ආරොපෙය්‍යුං, අක්කොසෙය්‍යුං පරිභාසෙය්‍යුං රොසෙය්‍යුං විරොසෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං වා කරෙය්‍යුං. යො කොචි මනුස්සතො උපඝාතො මනුස්සඵස්සො; **චතුප්පදානන්ති** සීහා බ්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී; තෙ භික්ඛුං මද්දෙය්‍යුං ඛාදෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං වා කරෙය්‍යුං, චතුප්පදතො උපඝාතො යං කිඤ්චි චතුප්පදභයන්ති – මනුස්සඵස්සාන චතුප්පදානං.

තෙනාහ භගවා:

"පඤ්චන්න ධීරො භයානං න භායෙ භික්ඛු සතො සපරියන්තචාරී,
ඩංසාධිපාතාන සිරිංසපානං[1] මනුස්සඵස්සාන[2] චතුප්පදාන"න්ති.

**16 – 11**

පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානි,
අථාපරානි අභිසම්භවෙය්‍ය[3] පරිස්සයානි කුසලානුඑසී.

1. ඩංසාධිපාතානං සරිසපානං – මජ්ඣ. 2. මනුස්සඵස්සානං – මජ්ඣ.
3. අභිසම්භවෙය්‍යුං – සයා.

**ජාගරියානුයොගපයුත්තතාය** කවරී යත්: මේ ශාසනයෙහි මහණ තෙමේ දහවල සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන් කෙරෙන් (හෝ සියලු අකුශලධර්මයන්ගෙන්) සිත පිරිසුදු කරන්නේ යැ. රෑ පෙරයම සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන් කෙරෙන් සිත පිරිසුදු කරන්නේ යැ. රෑ මැදියම් දකුණු පයෙහි වම්පය මඳක් ඇදූතබා සිහි නුවණින් 'නැගීසිටිමි' යන සංඥාව මෙනෙහි කොට දකුණුපසින් සිංහශය්‍යාව කෙරෙයි. රෑ අලුයම නැඟීසිට සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් සිත පිරිසුදු කෙරෙයි. භද්‍රෙකරාත්‍රවිභරණය ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමින් ජාගරියානුයොග පරිච්ඡෙදය අභ්‍යන්තරයෙහි හැසිරෙයි. මයහීදව නො බිඳී. මේ තෙමේ ජාගරියානුයොගපයුක්තයා වේ යයි 'භික්ඛු සතතං සමපරියන්තචාරී' යනු වේ.

**ඩංසාධිපාතාන සිරිංසපානං** – පිඹගල මැස්සෝ 'ඩංස'යි කියනු ලැබෙත්: සියලු මැ මැස්සෝ 'අධිපාතක'යි කියනු ලැබෙත්. කවර කරුණෙකින් සියලු මැ මැස්සෝ 'අධිපාතකයෝ' යැයි කියනු ලැබෙත් ද යත්: ඔහු නැගී නැගී කති. එ කරුණෙන් සියලුමැ මැස්සෝ 'අධිපාතකයෝ' යැයි කියනු ලැබෙත්. සර්පයෝ 'සිරිංසප'යි කියනු ලැබෙත් නුයි 'ඩංසාධිපාතාන සිරිංසපානං' යනු වේ.

**මනුස්සඵස්සාන චතුප්පදානං** – කල සොරකම් ඇති හෝ නො කල සොරකම් ඇති හෝ සොරු හෝ සැහැසි මනුෂ්‍යයෝ එන්නාහුය. (ඔහු) 'මනුස්සඵස්ස' යි කියනු ලැබෙත්. ඔහු මහණහු පැන හෝ පුළුවුස්නාහු ය, වාදාරොපණය හෝ කරන්නාහු ය, ආක්‍රොශ කරන්නාහු ය, පරිභව කරන්නාහු ය, කොප කරන්නාහු ය, වෙසෙසින් කොප කරන්නාහු ය, හිංසා කරන්නාහු ය, විහිංසා කරන්නාහු ය, පෙලන්නාහු ය, වෙසෙසින් පෙලන්නාහු ය, නසන්නාහු ය, වෙහෙසන්නාහු ය, උපඝාත හෝ කරන්නාහු ය. මිනිසුන් කෙරෙන් යම් කිසි උපඝාතයෙක් වේ නම් එය 'මනුස්සඵස්ස' නම්. **චතුප්පදානං** යනු සිංහයෝ යැ ව්‍යාඝ්‍රයෝ යැ දිවියෝ යැ වලස්සු යැ තරස්හු යැ වෘකයෝ යැ මිහිවෝ යැ ගස්තීහු යි. ඔහු භික්‍ෂූහු මඩනාහු ය, කන්නාහු ය, හිංසා කරන්නාහු ය, විහිංසා කරන්නාහු ය, පෙලන්නාහු ය, වෙසෙසින් පෙලන්නාහු ය, නසන්නාහු ය, වෙහෙසන්නාහු ය, උපඝාත හෝ කරන්නාහු ය. සිවුපාවුන් කෙරෙන් උපඝාතයෙක් යම් කිසි සිවුපාඩියෙක් නුයි 'මනුස්සඵස්සාන චතුප්පදානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“පඤ්චන්න ධීරො භයානං -පෙ- මනුස්සඵස්සාන චතුප්පදානං”යි.**

**16 – 11**

නො සහදූමියන්ට ද නො බිය වන්නේ යැ. ඔවුන්ගේ බොහෝ බිය උපදවන අරමුණු දැක ද නො තැතිගන්නේ යැ. තවද කුසල් දහම් සොයනුයේ අන් උවදුරු ද මැඩපවත්වන්නේ යි.

**පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානීති** – 'පරධම්මිකා' වුච්චන්ති සත්ත සහධම්මිකෙ ඨපෙත්වා යෙ කෙචි බුද්ධෙ ධම්මෙ සඞ්ඝෙ අප්පසන්නා. තෙ භික්ඛුං පඤ්හං වා පුච්ඡෙය්‍යුං වාදං වා ආරොපෙය්‍යුං, අක්කොසෙය්‍යුං පරිභාසෙය්‍යුං රොසෙය්‍යුං විරොසෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං වා කරෙය්‍යුං. තෙසං බහුභෙරවෙ පස්සිත්වා වා සුණිත්වා වා න වෙධෙය්‍ය න පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය, න තසෙය්‍ය න සන්තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරු අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී, පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති – පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානි.

**අථාපරානි අභිසම්භවෙය්‍ය[1] පරිස්සයානි කුසලානුඑසීති** – අථාපරානිපි අත්ථි අභිසම්භොතබ්බානි අභිභවිතබ්බානි අජ්ඣොත්ථරිතබ්බානි පරියාදියිතබ්බානි මද්දිතබ්බානි. පරිස්සයාති ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච -පෙ- එවම්පි තත්‍රාසයාති පරිස්සයා. කුසලානුඑසීති සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං -පෙ- අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං එසන්තෙන ගවෙසන්තෙන පරියෙසන්තෙන පරිස්සයා අභිසම්භොතබ්බා අභිභවිතබ්බා අජ්ඣොත්ථරිතබ්බා පරියාදියිතබ්බා මද්දිතබ්බාති – අථාපරානි අභිසම්භවෙය්‍ය පරිස්සයානි කුසලානුඑසී.

තෙනාහ භගවා:

"පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය
දිස්වාපි තෙසං බහුභෙරවානි,
අථාපරානි අභිසම්භවෙය්‍ය
පරිස්සයානි කුසලානුඑසී"ති.

**16 - 12**

ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො
සීතං අච්චුණ්හං[2] අධිවාසයෙය්‍ය,
සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො
විරියපරක්කමං දළ්හං කරෙය්‍ය.

**ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨොති** – 'ආතඞ්කඵස්සො' වුච්චති රොගඵස්සො. රොගඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; සොතරොගෙන – ඝානරොගෙන – ජිව්හාරොගෙන – කායරොගෙන -පෙ- ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස. 'ඛුදා' වුච්චති ඡාතකො. ඡාතකෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති – ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො.

1. අභිසම්භවෙය්‍යුං - PTS.
2. අතුණ්හං - සීමු. II

**පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානි** - සත් සහදම්යත් තබා බුදුන් දහම් සඟුන් කෙරෙහි නො පහන් වූ යම් කිසි කෙනෙක් 'පරධම්මිකයෝ' යැයි කියනු ලැබෙත්. ඔහු භික්ෂූහුගෙන් පැන හෝ පුළුවුස්නාහු ය, වාදාරෝපණය හෝ කරන්නාහු ය, ආක්‍රොශ කරන්නාහු ය, පරිභව බණන්නාහු ය, කොප කරන්නාහු ය, වෙසෙසින් කොප කරන්නාහු ය, හිංසා කරන්නාහු ය, විහිංසා කරන්නාහු ය, පෙළන්නාහු ය, වෙසෙසින් පෙළන්නාහු ය, නසන්නාහු ය, වෙහෙසන්නාහු ය, උපඝාත හෝ කරන්නාහු ය. ඔවුන්ගේ බොහෝ වූ බිය උපදවන අරමුණු දැක හෝ අසා හෝ නො සැලෙන්නේ යැ, වෙසෙසින් නො සැලෙන්නේ යැ, හාත්පසින් නො සැලෙන්නේ යැ, නො තැයිගන්නේ යැ, සන්ත්‍රස්ත-උත්‍රස්ත - පරිත්‍රස්ත නො වන්නේ යැ, නො බියවන්නේ යැ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යැ; නො බියපුලු නො සැලෙනසුලු නො තැතිගන්නා සුලු නො පලායනසුලු වන්නේ යැ, ප්‍රහීණ වූ බියඅරමුණු ඇතියේ පහවූ ලොමුදහ ඇතිව වාසය කරන්නේ නුයි 'පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වා පි තෙසං බහුභෙරවානි' යනු වේ.

**අථාපරානි අභිසම්භවෙය්‍ය පරිස්සයානි කුසලානුඑසී** - තවද අන්‍ය වූත් මැඩියැ යුතු අභිභවනය කළ යුතු යටපත් කළයුතු හාත්පසින් ගත යුතු මර්දනය කළ යුත්තාහු ඇති. **පරිස්සය** නම්: ප්‍රකට පරිශ්‍රයෝ ද ප්‍රතිච්ඡන්න පරිශ්‍රයෝ දැයි පරිශ්‍රය (-උපද්‍රව) දෙකෙකි...මෙසේත් 'තත්‍රාසය'නුයි පරිශ්‍රය නම් වෙත්. **කුසලානුඑසී** යනු: සම්‍යක් ප්‍රතිපත්තිය අනුලොම-ප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය...ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නිර්වාණය ද නිර්වාණගාමිනීප්‍රතිපත්තිය ද සොයන්නහු විසින් ගවෙෂණය කරන්නහු විසින් පර්‍ය්‍යෙෂණය කරන්නහු විසින් උපද්‍රවයෝ මැඩිය යුත්තාහු ය, අභිභවනය කළ යුත්තාහු ය, යටපත් කළ යුත්තාහු ය, හාත්පසින් ගත යුත්තාහු ය, මර්දනය කළ යුත්තාහු නුයි 'අථාපරානි අභිසම්භවෙය්‍ය පරිස්සයානි කුසලානුඑසී' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**පරධම්මිකානම්පි -පෙ- පරිස්සයානි කුසලානුඑසී**"යි.

**16 - 12**

රෝගස්පර්ශයෙන් ද ක්ෂුධාවෙන් ද ස්පර්ශ කරන ලදුයේ ශීතය ද යළි උෂ්ණය ද ඉවසන්නේ යැ. හෙ තෙමෙ ඒ රෝගස්පර්ශාදියෙන් බොහෝ සෙයින් පහස්නා ලදුයේ අභිසංස්කාර සහගතවිඥානයට හෝ දුශ්චරිතයට අවකාශ නො කරනුයේ චෛතසික වීර්‍ය්‍යාරම්භය දැඩි ව කරන්නේ යි.

**ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො** - රෝගස්පර්ශය 'ආතඞ්කඵස්ස'යි කියනු ලැබෙයි. රෝගස්පර්ශයෙන් පහස්නා ලදුයේ මඩනා ලදුයේ බැසගන්නා ලදුයේ සමන්විත වූයේ වන්නේ ය; චක්ෂුරෝගයෙන් පහස්නා ලදුයේ පෙළෙණ බැසගන්නා ලදුයේ සමන්විත වූයේ වන්නේ ය, ශ්‍රොත්‍ර-රෝගයෙන් - ඝ්‍රාණරෝගයෙන් - ජිහ්වාරෝගයෙන් - කායරෝගයෙන්... මැසි-මදුරු-වා-අව්-දිග්දූපහසින් පහස්නා ලදුයේ මඩනා ලදුයේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ ය. සාදුක 'ඛුදා'යි කියනු ලැබෙයි. සාදුකින් පහස්නා ලදුයේ මඩනා ලදුයේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ නුයි 'ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො' යනු වේ.

**සීතං අච්චුණ්හං[1] අධිවාසයෙය්‍යාති** – 'සීත'න්ති ද්වීහි කාරණෙහි සීතං හොති: අබ්භන්තරධාතුපකොප[2]වසෙන වා සීතං හොති. බහිද්ධා උතුවසෙන වා සීතං හොති. උණ්හන්ති ද්වීහි කාරණෙහි උණ්හං හොති. අබ්භන්තරධාතුපකොප[2]වසෙන වා උණ්හං හොති. බහිද්ධා උතුවසෙන වා උණ්හං හොතීති – සීතං අච්චුණ්හං. **අධිවාසයෙය්‍යාති** ඛමො අස්ස සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං, දුරුත්තානං දුරාගතානං වචනපථානං, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො අස්සාති – සීතං අච්චුණ්හං[1] අධිවාසයෙය්‍ය.

**සො තෙහි ඵුට්ඨො බහුධා. අනොකොති** – 'සො තෙහී'ති ආතඞ්කඵස්සෙන ච ඛුද්දාය ච සීතෙන ච උණ්හෙන ච ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති – සො තෙහි ඵුට්ඨො. බහුධාති අනෙකවිධෙහි ආකාරෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති – සො තෙහි ඵුට්ඨො බහුධා. **අනොකොති** අභිසඞ්ඛාරසහගතවිඤ්ඤාණස්ස ඔකාසං න කරොතීතිපි – අනොකො. අථවා, කායදුච්චරිතස්ස වචීදුච්චරිතස්ස මනොදුච්චරිතස්ස ඔකාසං න කරොතීතිපි අනොකොති – සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො.

**විරියපරක්කමං දළ්හං කරෙය්‍යාති** – 'විරියපරක්කමො' වුච්චති: "යො චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී අප්පටිවානී ථාමො ධිති[3] අසිථිලපරක්කමතා අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො"ති. **විරියපරක්කමං දළ්හං කරෙය්‍යාති** – විරියපරක්කමං දළ්හං කරෙය්‍ය, ථිරං කරෙය්‍ය, දළ්හසමාදානො අස්ස අවට්ඨිතසමාදානොති – විරියපරක්කමං දළ්හං කරෙය්‍ය.

තෙනාහ භගවා:

"ආතඞ්කඵස්සෙන ඛුද්දාය ඵුට්ඨො
සීතං අච්චුණ්හං අධිවාසයෙය්‍ය,
සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො
විරියපරක්කමං දළ්හං කරෙය්‍යා"ති.

**16 – 13**

ථෙය්‍යං න කරෙය්‍ය[4] න මුසා භණෙය්‍ය
මෙත්තාය ඵස්සෙ තසථාවරානි,
යදාවිලත්තං මනසො විජඤ්ඤා
කණ්හස්ස පක්ඛොති විනොදයෙය්‍ය.

1. අතුණ්හං, සීමු.
2. ධාතුසංඛොභ - ස.
3. ඨිති - සීමු. II.
4. කරෙ - සීමු II මජ්සං.

**සීතං උණ්හං අධිවාසෙය්‍ය** – 'සීතං' යනු: දෙකරුණෙකින් ශීතය වෙයි: අභ්‍යන්තරධාතුප්‍රකෝපවශයෙන් හෝ ශීතය වෙයි. බාහිර සෘතුවශයෙන් හෝ ශීතය වේ. **උණ්හං** යනු: දෙකරුණෙකින් උෂ්ණය වෙයි: අභ්‍යන්තරධාතුප්‍රකෝපවශයෙන් හෝ උෂ්ණය වෙයි. බාහිර සෘතුවශයෙන් හෝ උෂ්ණය වේ නුයි 'සීතං උණ්හං' යනු වේ. **අධිවාසෙය්‍ය** යනු: ශීත උෂ්ණ සා පවස් මැසිමදුරුවාඅව්දිග්දුපහස් ඉවසනුයේ වන්නේ ය, තපුරු කොට කියන ලද දුක් උපදවන අයුරින් පැමිණි වචනයන් ද දුක් වූ තීව්‍ර වූ රළු වූ කටුක වූ අමධුර වූ අමනාප වූ දිවි පැහැරගන්නා වූ උපන් ශාරීරික වේදනාවන් ඉවසන සවභාව ඇත්තේ වන්නේ නුයි 'සීතං උණ්හං අධිවාසෙය්‍ය' යනු වේ.

**සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො** – 'සො තෙහි' යනු: රෝගස්පර්ශයෙන් ද ක්ෂුධායෙන් ද ශීතයෙන් ද උෂ්ණයෙන් ද පහස්නා ලදුයේ මඩනා ලදුයේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ නුයි 'සො තෙහි ඵුට්ඨො' යනු වේ. **බහුධා** යනු: නන්වැදෑරුම් අයුරින් පහස්නා ලදුයේ මඩනා ලදුයේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ නුයි 'සො තෙහි ඵුට්ඨො බහුධා' යනු වේ. **අනොකො** යනු: කුශලාකුශල චේතනාසම්ප්‍රයුක්ත විඥානයට අවකාශ නො කෙරේ නුයි ද 'අනොක'යැ. නොහොත් කායදුශ්චරිතයට වාග්දුශ්චරිතයට මනොදුශ්චරිතයට අවකාශ නො කෙරේ නුයි ද 'අනොක' නුයි 'සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො' යනු වේ.

**විරියපරක්කමං දළ්හං කරෙය්‍ය** – යම් චෛතසිකවීර්‍ය්‍යාරම්භයෙක් කෞසීද්‍යයෙන් නික්මැ යැමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධික උත්සාහයෙක් නො පසුබස්නා බවෙක් ස්ථිර බවෙක් කුශලසන්තානය ධරා සිටීමෙක් නො ලිහිල් පරාක්‍රම ඇති බවෙක් නො තැබූ වීර්‍ය්‍යච්ඡන්ද ඇති බවෙක් නො තැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් වීර්‍ය්‍යධුරය දැඩිව ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද, එය 'විරියපරක්කම'යි කියනු ලැබේ. **විරියපරක්කමං දළ්හං කරෙය්‍ය** – චෛතසිකවීර්‍ය්‍යාරම්භය දැඩි කරන්නේ ය, ස්ථිර කරන්නේ ය, දෘඪසමාදාන ඇත්තේ බැසගන්නා ලද සමාදාන ඇත්තේ වන්නේ නුයි 'විරියපරක්කමං දළ්හං කරෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**ආතඞ්කඵස්සෙන -පෙ- විරියපරක්කමං දළ්හං කරෙය්‍ය**"යි.

**16 - 18**

හොරකම් නො කරන්නේ යැ. මුසවා නො කියන්නේ යැ. තෘෂ්ණා සහිත වූ ද ස්ථාවර වූ ද (-පෘථග්ජන ක්ෂීණාස්‍රව) පුද්ගලයන් මෙත්සිතින් පතුරුවන්නේ යැ. යම් චිත්තයාගේ කැළැඹුණු බවක් දන්නේ නම්, එය මාරයාගේ පක්ෂයෙහි වනැයි දුරු කරන්නේ යි.

**ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍යාති** – 'ථෙය්‍යං න කරෙය්‍යා'ති ඉධ භික්ඛු අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො අස්ස, දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරෙය්‍යාති – ථෙය්‍යං න කරෙය්‍ය. න මුසා භණෙය්‍යාති ඉධ භික්ඛු මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො අස්ස, සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්සාති – ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍ය.

**මෙත්තාය ඵස්සෙ තසථාවරානීති** – 'මෙත්තා'ති "යා සත්තෙසු මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං අනුද්දයා අනුද්දයනා[1] අනුද්දයිතත්තං හිතෙසිතා අනුකම්පා අබ්‍යාපාදො අබ්‍යාපජ්ජො අදොසො කුසලමූලං[a]. තසාති යෙසං තසිතා තණ්හා අප්පහීනා, යෙසඤ්ච භයභෙරවා අප්පහීනා. කිංකාරණා වුච්චන්ති තසා? තෙ තසන්ති උත්තසන්ති පරිතසන්ති භායන්ති සන්තාසං ආපජ්ජන්ති. තංකාරණා වුච්චන්ති තසා. ථාවරාති යෙසං තසිතා තණ්හා පහීනා, යෙසඤ්ච භයභෙරවා පහීනා. කිංකාරණා වුච්චන්ති ථාවරා? තෙ න තසන්ති න උත්තසන්ති න පරිතසන්ති න භායන්ති, සන්තාසං න ආපජ්ජන්ති, තංකාරණා වුච්චන්ති ථාවරා.

**මෙත්තාය ඵස්සෙ තසථාවරානීති** – තසෙ ච ථාවරෙ ච මෙත්තාය ඵස්සෙය්‍ය ඵරෙය්‍ය, මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරෙය්‍යාති – මෙත්තාය ඵස්සෙ තසථාවරානි.

**යදාවිලත්තං මනසො විජඤ්ඤාති**–'යදා'ති යං[2] **මනසොති** "යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු"[a] කායදුච්චරිතෙන චිත්තං ආවිලං හොති ලුළිතං එරිතං ඝට්ටිතං චලිතං භන්තං අවූපසන්තං, වචීදුච්චරිතෙන – මනොදුච්චරිතෙන – රාගෙන – දොසෙන – මොහෙන–කොධෙන – උපනාහෙන – මක්ඛෙන – පළාසෙන – ඉස්සාය – මච්ඡරියෙන–මායාය – සාඨෙය්‍යෙන – ථම්භෙන – සාරම්භෙන – මානෙන – අතිමානෙන–මදෙන – පමාදෙන – සබ්බකිලෙසෙහි – සබ්බදුච්චරිතෙහි – සබ්බදරථෙහි–සබ්බපරිළාහෙහි – සබ්බසන්තාපෙහි –සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං ආවිලං හොති ලුළිතං එරිතං ඝට්ටිතං චලිතං භන්තං අවූපසන්තං. **යදාවිලත්තං මනසො විජඤ්ඤාති** – චිත්තස්ස ආවිලභාවං ජානෙය්‍ය ආජානෙය්‍ය විජානෙය්‍ය පටිවිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍යාති – යදාවිලත්තං මනසො විජඤ්ඤා.

---

1 අනුද්දයතා – සීමු. II.   a ධම්මසඞ්ගණී – නික්ඛෙපකණ්ඩ.
2. යදා – සීමු II

**ථෙය්‍යං න කාරෙය්‍ය න මුසා භණෙය්‍ය** – 'ථෙය්‍යං න කාරෙය්‍ය' යනු මෙහි මහණ තෙමේ; අසිනාදන් හැරපියා අසිනාදනින් වෙන් වූයේ වන්නේ ය, දුන් දැය ගන්නේ දුන් දෙය කැමැති වනුයේ සොර නො වූ පිවිතුරු වූ සිතින් යුතු ව වාසය කරන්නේ නුසි 'ථෙය්‍යං න කාරෙය්‍ය' යනු වේ. **න මුසා භණෙය්‍ය** යනු: මෙහි මහණ තෙමේ මුසාවා හැරපියා මුසාවායෙන් වෙන් වූයේ වන්නේ ය, සත්‍යවාදී වූයේ සත්‍යයෙන් සත්‍යය ගළපනුයේ ස්ථිර වූයේ ඇදහිය යුතු බස් ඇත්තේ ලොව නො රවටනුයේ වන්නේ නුසි 'ථෙය්‍යං න කාරෙය්‍ය න මුසා භණෙය්‍ය' යනු වේ.

**මෙත්තාය ඵස්සෙ තසථාවරානි** – 'මෙත්තා' නම්: සත්ත්වයන් කෙරෙහි යම් මෛත්‍රියෙක් මෛත්‍රී ආකාරයෙක් මෛත්‍රීසහගත සිත් ඇති බවෙක් අනුදයාවෙක් අනුදයාකාරයෙක් අනුදයා ඇති බවෙක් හිතෛෂී බවෙක් අනුකම්පාවෙක් අව්‍යාපාදයෙක් අව්‍යාපාද බවෙක් අද්වේෂකුශලමූලයෙක් වේ ද එය යි. **තස** නම්: යම් කෙනකුන්ගේ තෘෂ්ණාව අප්‍රහීණ වූවා ද, තවද යම් කෙනකුන්ගේ භය හා භයඅරමුණු අප්‍රහීණ වූවාහු ද, (ඔහු යැ.) කවර කරුණෙකින් 'තසයෝ' යැයි කියනු ලැබෙත් ද ? ඔහු ත්‍රස්ත වෙති, උත්‍රස්ත වෙති, පරිත්‍රස්ත වෙති, භය වෙති, සන්ත්‍රාසයට පැමිණෙත්; එකරුණෙන් 'තස'යි කියනු ලැබෙත්. **ථාවර** යනු: යම් කෙනකුන්ගේ තෘෂ්ණාව ප්‍රහීණ වූවා ද, තවද යම් කෙනකුන්ගේ භය හා භයඅරමුණු ප්‍රහීණ වූවාහු ද, (ඔහු යැ.) කවර කරුණෙකින් 'ථාවරයෝ' යැයි කියනු ලැබෙත් ද, ඔහු ත්‍රස්ත නො වෙති, උත්‍රස්ත නො වෙති, පරිත්‍රස්ත නො වෙති, භීත නො වෙති, සන්ත්‍රාසයට නො පැමිණෙත්; එ කරුණෙන් 'ථාවරයෝ' යැයි කියනු ලැබෙත්. **මෙත්තාය ඵස්සෙ තසථාවරානි**– ත්‍රස්තයන් ද ස්ථාවරයන් ද මෙත්සිතින් ස්පර්ශ කරන්නේ ය, පතුරුවන්නේ ය, විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාපාද රහිත වූ මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසය කරන්නේ නුසි 'මෙත්තාය ඵස්සෙ තසථාවරානි' යනු වේ.

**යදාවිලත්තං මනසො විජඤ්ඤා**–'යදා' යනු: යම්; **මනසො** යනු: යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් පණ්ඩර වූ භවාංගසිතෙක් මනසෙක් මනසඞ්ඛ්‍යාත ආයතනයෙක් මනෝන්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද, එය යි. කායදුශ්චරිතයෙන් සිත කැලැඹුණේ ක්ෂොභ වූයේ කම්පිත වූයේ ගැටුණේ සැලුණේ භ්‍රාන්ත වූයේ නො සන්හිඳුණේ වෙයි; වාග්දුශ්චරිතයෙන් – මනොදුශ්චරිතයෙන් – රාගයෙන් – ද්වේෂයෙන් – මොහයෙන් – ක්‍රොධයෙන් – උපනාහයෙන් – මකුබැවින් – පලාසයෙන් – ඊර්ෂ්‍යායෙන් – මාත්සර්‍ය්‍යයෙන් – මායායෙන් – ශාඨ්‍යයෙන් – ස්තම්භයෙන් – සාරම්භයෙන් – මානයෙන් – අතිමානයෙන් – මදයෙන් – ප්‍රමාදයෙන් – සියලු කෙලශයන් ගෙන් – සියලු දුශ්චරිතයන් ගෙන් සියලු දරථයන් ගෙන් – සියලු පරිදාහයන් ගෙන් – සියලු සන්තාපයන් ගෙන් සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් සිත ආවිල වූයේ ලුලිත වූයේ කම්පිත වූයේ ඝට්ටිත වූයේ චලිත වූයේ භ්‍රාන්ත වූයේ අව්‍යුපශාන්ත වූයේ වෙයි; **යදාවිලත්තං මනසො විජඤ්ඤා** – චිත්තයාගේ කැලැඹුණු බව දන්නේ නම් ඥාතපරිඥායෙන් දන්නේ නම්, වෙසෙසින් දන්නේ නම්, සර්වප්‍රකාරයෙන් දන්නේ නම්, ප්‍රතිවෙධ කරන්නේ නම් සී 'යදාවිලත්තං මනසො විජඤ්ඤා' යනු වේ.

**කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍යාති** – ‘කණ්හො’ති යො සො මාරො කණ්හො අධිපති අන්තගූ නමුචි පමත්තබන්ධු. **කණ්හස්ස පක්ඛා** මාරපක්ඛා මාරපාසො මාරබලිසං මාරාමිසං මාරවිසයො මාරනිවාපො[1] මාරගොචරො මාරබන්ධනන්ති පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති – එවම්පි කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය. අථවා **කණ්හස්ස පක්ඛා** – මාරපක්ඛා අකුසලපක්ඛා දුක්ඛුද්‍රයා[2] දුක්ඛවිපාකා නිරයසංවත්තනිකා තිරච්ඡානයොනිසංවත්තනිකා පෙත්තිවිසයසංවත්තනිකාති පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති – එවම්පි කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය.

තෙනාහ භගවා:

“ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍ය
මෙත්තාය ඵස්සෙ තසථාවරානි,
යදාවිලත්තං මනසො විජඤ්ඤා
කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍යා”ති.

## 16 – 14

කොධාතිමානස්ස වසං න ගච්ඡෙ
මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ,
අථප්පියං වා පන අප්පියං වා
අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය.

**කොධාතිමානස්ස වසං න ගච්ඡෙති** – ‘කොධො’ති “යො චිත්තස්ස ආඝාතො පටිඝාතො –පෙ– චණ්ඩික්කං අසුරොපො[3] අනත්තමනතා චිත්තස්ස”[b] **අතිමානොති** “ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා –පෙ– අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා”[c]. **කොධාතිමානස්ස වසං න ගච්ඡෙති** කොධස්ස ච අතිමානස්ස ච වසං න ගච්ඡෙය්‍ය, කොධඤ්ච අතිමානඤ්ච පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති – කොධාතිමානස්ස වසං න ගච්ඡෙ.

**මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙති** – කතමං කොධස්ස මූලං: අවිජ්ජා මූලං, අයොනිසොමනසිකාරො මූලං, අස්මිමානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං. ඉදං කොධස්ස මූලං. කතමං අතිමානස්ස මූලං: අවිජ්ජා මූලං, අයොනිසොමනසිකාරො මූලං, අස්මිමානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං. ඉදං අතිමානස්ස මූලං. **මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙති** කොධස්ස ච අතිමානස්ස ච මූලං පලිඛණිත්වා උද්ධරිත්වා සමුද්ධරිත්වා උප්පාටයිත්වා සමුප්පාටයිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා තිට්ඨෙය්‍ය සන්තිට්ඨෙය්‍යාති – මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ.

---

1. මාරනන්තපො – සහ, PTS. මාරනිවාසො – සීමු II. මජසං.
2. දුක්ඛුද්‍රයො – සීමු. II. මජසං. දුක්ඛුද්දයො. – ස. දුක්ඛුද්‍රයා – PTS.
a. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ.
3. අසුරොපො – සීමු. II.
b. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ. c. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය** - 'කණ්හ' නම්: යම් ඒ මාරයෙක් කෘෂ්ණයෙක් අධිපතියෙක් අන්ත (-මරණ) යට පමුණුවන්නෙක් නමුචි (-අකුශල් නො හරින්) යෙක් ප්‍රමත්තබන්ධුයෙක් වේ ද, හේ යැ. **කණ්හස්ස පක්ඛා** - මාරපාක්ෂයෙක මාරපාශයෙක මාරබලිශයෙක මාරයාගේ ආමිෂයෙක මාරවිෂයෙක මාරනිවාපයෙක මාරයාගේ ගොචරයෙක මාරබන්ධනයෙකැ'යි හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ නුයි මෙසේත් 'කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය' යනු වේ. නොහොත් **කණ්හස්ස පක්ඛා** - මාරපක්ෂයෙහි වූයේ යැ, අකුශලපක්ෂයෙහි වූයේ යැ, දුක් උපදවන්නේ යැ, දුඃඛවිපාක යැ, නිරයෙහි ඉපදීම පිණිස පවත්නේ යැ, තිරිසන්යෝනියෙහි ඉපදීම පිණිස පවත්නේ යැ, ප්‍රෙතවිෂයෙහි ඉපදීම පිණිස පවත්නේ යැයි හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ නුයි මෙසේත් 'කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“ථෙය්‍යං න කරෙය්‍ය -පෙ- කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය”යි**

**16 - 14**

ක්‍රොධයාගේ හා අතිමානයාගේ වශයට නො යන්නේ යැ. ඒ ක්‍රොධාතිමානයන්ගේ අවිද්‍යාදි මූලය ද උදුරාපියා සිටිනේ යැ. තවද (සත්ත්වසංස්කාර සඞ්ඛ්‍යාත) ප්‍රියවස්තුව ද යළි අප්‍රිය වස්තුව ද මඩිනුයේ එකාන්තයෙන් අභිභවනය කරන්නේ යි.

**කොධාතිමානස්ස වසං න ගච්ඡෙ** - 'කොධ' නම්: චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක්...සැඩබවෙක් නො පිරුණු වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද එය යි. **අතිමාන** නම්: මෙහි එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ මෙරමා ඉක්මවා සිතයි. **කොධාතිමානස්ස වසං න ගච්ඡෙ** -ක්‍රොධයාගේ ද අතිමානයාගේ ද වශයට නො යන්නේ යැ; ක්‍රොධය ද අතිමානය ද හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ නුයි 'කොධාතිමානස්ස වසං න ගච්ඡෙ' යනු වේ.

**මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ** - ක්‍රොධයාගේ මූලය කවරැ යත්: අවිද්‍යාව මුල යැ, අයොනිසො මනසිකාරය මුල යැ, අස්මිමානය මුල යැ, අහිරිකය මුල යැ, අනොත්තප්පය මුල යැ, ඖද්ධත්‍යය මුල යි. මේ ක්‍රොධයාගේ මූලය යි. අතිමානයාගේ මූලය කවරැ යත්: අවිද්‍යාව මුල යැ, අයොනිසො මනසිකාරය මුල යැ, 'මම වෙමියි' යන මානය මුල යැ, අහිරිකය මුල යැ, අනොත්තප්පය මුල යැ, ඖද්ධත්‍යය මුල යි. මේ අතිමානයාගේ මූලය යි. **මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ** - ක්‍රොධයාගේ ද අතිමානයාගේ ද මුල සාරා උදුරා මොනොවට උදුරා උපුටා මොනොවට උපුටා හැරපියා දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා සිටින්නේ යැ, මොනොවට සිටින්නේ නුයි 'මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ' යනු වේ.

**අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍යාති** - 'අථා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං 'අථා'ති. **පියාති** ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා පියා: ඉධ යා'ස්ස තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා මාතා වා පිතා වා භාතා වා භගිනී වා පුත්තා වා ධීතා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, ඉමෙ සත්තා පියා. කතමෙ සඞ්ඛාරා පියා: මනාපිකා රූපා මනාපිකා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා පියා. **අප්පියාති** ද්වෙ අප්පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා අප්පියා: ඉධ යා'ස්ස තෙ හොන්ති අනත්ථකාමා, අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා ජීවිතා වොරොපෙතුකාමා. ඉමෙ සත්තා අප්පියා. කතමෙ සඞ්ඛාරා අප්පියා: අමනාපිකා රූපා අමනාපිකා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා අප්පියා. **අද්ධාති** ඒකංසවචනං නික්කඞ්ඛවචනං අද්වෙජ්ඣවචනං අද්වෙළ්හකවචනං නියොගවචනං[1] අපණ්ණකවචනං අවත්ථාපනවචනමෙතං 'අද්ධා'ති; **අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍යාති** පියාප්පියං සාතාසාතං සුඛදුක්ඛං සොමනස්සදොමනස්සං ඉට්ඨානිට්ඨං අභිසම්භවන්තො වා අභිභවෙය්‍ය අධිභවන්තො වා අභිභවෙය්‍යාති - අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය.

තෙනාහ භගවා:

"කොධාතිමානස්ස වසං න ගච්ඡෙ
මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ,
අථප්පියං වා පන අප්පියං වා
අද්ධා භවන්තො අභිසම්භවෙය්‍යා"ති.

## 16 - 15

පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති
වික්ඛම්භයෙ තානි පරිස්සයානි,
අරතිං සහෙථ සයනම්හි පන්තෙ
චතුරො සහෙථ පරිදෙවධම්මෙ.

**පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීතීති** - 'පඤ්ඤා'ති "යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො -පෙ- අමොහො සම්මාදිට්ඨි."[a] **පඤ්ඤං පුරක්ඛත්වාති** ඉධෙකච්චො පඤ්ඤං පුරතො කත්වා චරති පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො විචයබහුලො පවිචයබහුලො පෙක්ඛායන[2] බහුලො සමෙක්ඛායන[3] බහුලො විභූතවිහාරී තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යොති - එවම්පි පඤ්ඤං පුරක්ඛත්වා.

1. නියානිකවචනං - සීමු II. මජසං.
2. ඔක්ඛායන - සීමු. II. සමොක්ඛායන - සීමු. II. PTS. 3. සමෙක්ඛායන - මජසං.
a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය**- 'අථ' යනු: පදසන්ධි යැ පදසංසග්ග යැ පදපාරිපූරි යැ අක්ෂරයන්ගේ සමවාය යැ ව්‍යඤ්ජනයන්ගේ සිලුටුබව යැ පදානුපූර්වීතා යැ, මෙල 'අථ' යනු. **පියා** යනු: ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. ප්‍රිය සත්ත්වයෝ කවරහු යත්: මෙහි යම් සත්ත්ව කෙනෙක් ඔහුට වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු සුව කැමැත්තාහු නිර්භය කැමැත්තාහු වෙත් ද, මව හෝ පියා හෝ බෑයා හෝ බූන හෝ පුතා හෝ දුව හෝ යහළුවෝ හෝ සගයෝ හෝ නෑයෝ හෝ සහලේනෑයෝ හෝ යන මේ සත්ත්වයෝ ප්‍රියයෝ යි. ප්‍රියසංස්කාරයෝ කවරහු යත්: මනවඩන රූපයෝ යැ මන වඩන ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ට-ව්‍යයෝ යි; මේ සංස්කාරයෝ ප්‍රියයෝ යි. **අප්පියා** යනු: අප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. අප්‍රිය සත්ත්වයෝ කවරහු යත්: මෙහි යම් සත්ත්ව කෙනෙක් ඔහුට අවැඩ කැමැත්තාහු අහිත කැමැත්තාහු නො සුව කැමැත්තාහු අයෝගක්ෂේමය කැමැත්තාහු දිවි තොර කරනු කැමැත්-තාහු වෙද් ද, මේ සත්ත්වයෝ අප්‍රියයෝ යි. අප්‍රිය සංස්කාරයෝ කවරහු යත්: අමනාප වූ රූපයෝ යැ අමනාප වූ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යන මේ සංස්කාරයෝ අප්‍රියයෝ යි. **අද්ධා** යනු: ඒකාන්ත වචන යැ නිස්සංශය වචන යැ නිසැක වචන යැ අද්වෛත වචන යැ නිස්සන්දෙහවචන යැ නියොග වචන යැ අවිරුද්ධ වචන යැ සනාථිවාපන (-නිමවන) වචනයෙකි, මෙල 'අද්ධා' යනු. **අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය** - ප්‍රියාප්‍රියය මධුරාමධුරය සුඛදුඃඛය සෞමනස්සදෞර්මනස්ස ඉෂ්ටානිෂ්ටය මෙනෙහාවට මඩමින් හෝ අභිභවනය කරන්නේ යැ, අභිශයින් මඩමින් හෝ අභිභවනය කරන්නේ නුසි 'අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"කොධාතිමානස්ස -පෙ- අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය"යි.**

## 16 - 15

(බුද්ධානුස්මෘති ආදීන් ගේ වශයෙන්) කල්‍යාණප්‍රීතියෙන් යුක්ත වූයේ ප්‍රඥාව පෙරටු කොට ඒ (ප්‍රකට - ප්‍රතිච්ඡන්න) උපද්‍රවයන් යටපත් කරන්-නේ යැ, ප්‍රාන්තශයනාසනයෙහි අරතිය (-නො ඇලීම) මැඩපවත්වන්නේ යැ. චතුර්විධ පරිදෙවධර්මයන් අභිභවනය කරන්නේ යි.

**පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති** - 'පඤ්ඤා' යනු: යම් ප්‍රඥාවක් ප්‍රකෂී-යෙන් දැනීමෙක් විමසීමෙක් ප්‍රකෂීයෙන් විමසීමෙක් දහම් විමසීමෙක්... අමෝහයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එය යි. **පඤ්ඤං පුරක්ඛත්වා** - මෙහි කිසිවෙක් ප්‍රඥාව පෙරටු කොට හැසිරෙයි, ප්‍රඥාව ධ්වජ කොට ඇත්තේ ප්‍රඥාව කෙහෙළි කොට ඇත්තේ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ විමසීම බහුල කොට ඇත්තේ වෙසෙසින් විමසීම බහුල කොට ඇත්තේ නුවණින් දැකීම බහුල කොට ඇත්තේ සෙවීම බහුල කොට ඇතියේ ප්‍රකට වූ විහරණ ඇතියේ ඒ ප්‍රඥාව චරිතය කොට ඇතියේ එය බහුල කොට ඇතියේ එය ගරු කොට ඇතියේ ඊට නැමුණේ ඊට නතු වූයේ ඊට බරවූයේ එහි ඇලුණේ එය අධිපති කොට ඇත්තේ නුසි මෙසේ ද 'පඤ්ඤං පුරක්ඛත්වා' යනු වේ.

අථ වා ගච්ඡන්තො වා 'ගච්ඡාමී'ති පජානාති; ඨිතො වා 'ඨිතොම්හී'ති පජානාති, නිසින්නො වා 'නිසින්නොම්හී'ති පජානාති, සයානො වා 'සයානොම්හී'ති පජානාති, යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති, තථා තථා නං පජානාතීති එවම්පි පඤ්ඤං පුරක්ඛත්වා. අථවා අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොතී'ති එවම්පි පඤ්ඤං පුරක්ඛත්වා. **කල්‍යාණපීතී'ති** බුද්ධානුස්සතිවසෙන උප්පජ්ජති පීතිපාමුජ්ජං කල්‍යාණපීති, ධම්මානුස්සතිවසෙන - සඞ්ඝානුස්සති - සීලානුස්සති - චාගානුස්සති - දෙවතානුස්සති - ආනාපානසති - මරණසති - කායගතාසති - උපසමානුස්සතිවසෙන උප්පජ්ජති පීතිපාමුජ්ජං කල්‍යාණපීතීති - පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති.

**වික්ඛම්භයෙ තානි පරිස්සයානීති** - 'පරිස්සයා'ති ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච -පෙ- ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා. -පෙ- ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා -පෙ- එවම්පි තත්‍රාසයාති පරිස්සයා. **වික්ඛම්භයෙ තානි පරිස්සයානීති** තානි පරිස්සයානි වික්ඛම්භෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති - වික්ඛම්භයෙ තානි පරිස්සයානි.

**අරතිං සහෙථ සයනම්හි පන්තෙති** - 'අරතී'ති 'යා අරති අරතිකා අනභිරති අනභිරමණා උක්කණ්ඨිතා[1] පරිතස්සිකා'.[2][a] **සයනම්හි පන්තෙති** පන්තෙසු වා සෙනාසනෙසු අඤ්ඤතරඤ්ඤතරෙසු ධම්මෙසු අරතිං සහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති - අරතිං සහෙථ සයනම්හි පන්තෙ.

**චතුරො සහෙථ පරිදෙවධම්මෙති** - චතුරො පරිදෙවනීයෙ ධම්මෙ සහෙය්‍ය පරිසහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති -චතුරො සහෙථ පරිදෙවධම්මෙ.

**තෙනාහ භගවා:**

"පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති
වික්ඛම්භයෙ තානි පරිස්සයානි,
අරතිං සහෙථ සයනම්හි පන්තෙ
චතුරො සහෙථ පරිදෙවධම්මෙ"ති.

**16 - 16**

කිංසු අසිස්සං[3] කුවං[4] වා අසිස්සං
දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං,
එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍ය[5]
විනයෙථ සෙඛො අනිකෙතචාරී.

---

1 උක්කණ්ඨිකා - PTS උක්කණ්ඨිතතා - සීමු. II.
2. පරිතස්සනා - සීමු. II, PTS 3. අසිස්සාමි - මු. ස. PTS.
4. කුහිං - සීමු. II. 5. පරිදෙවනීයෙ - ස. a. ඛුද්දකවත්ථුවිභඞ්ග.

නොහොත් ඉදිරයට යෙමින් හෝ 'ඉදිරියට යෙමි' දැනගනී, සිටියේ හෝ 'සිටියෙමි වෙමි' දැනගනී, හුන්නේ හෝ 'හුන්නෙමි වෙමි' දැනගනී, හෝනේ හෝ 'හෝනෙමි වෙමි' දැනගනී, යළි යම් යම් පරිද්දෙකින් හෝ ඔහුගේ කය පිහිටියේ වී නම්, ඒ ඒ පරිද්දෙන් එය දැනගනී නුයි මෙසේත් 'පඤ්ඤං පුරක්ඛත්වා' යනු වේ. නොහොත් ඉදිරියට යෑමෙහි ද නැවැත්මෙහි ද නුවණින් දැන කරන්නේ වෙයි, ඉදිරිය බැලීමෙහි හා අවට බැලීමෙහි ද සම්පජානකාරී වෙයි, අතපය දිගුකිරීමෙහි ද හැකිළීමෙහි ද සම්පජානකාරී වෙයි, සඟළ -පා- සිවුරු දැරීමෙහි සම්පජානකාරී වෙයි, වැළැඳීමෙහි පීමෙහි කෑමෙහි රසවිඳීමෙහි සම්පජානකාරී වෙයි, උච්චාර - ප්‍රස්‍රාවකර්මයෙහි සම්පජානකාරී වෙයි, යෑමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නො බිණීමෙහි නුවණින් දැන කරන්නේ වේ නුයි මෙසේත් 'පඤ්ඤං පුරක්ඛත්වා' යනු වේ. **කල්‍යාණපීති** යනු: බුද්ධානුස්මෘතිවශයෙන් ප්‍රීතිප්‍රාමොද්‍යය, කල්‍යාණපීතිය උපදී. ධර්මානුස්මෘතිවශයෙන් - සඞ්ඝානුස්මෘති - ශීලානුස්මෘති - ත්‍යාගානුස්මෘති - දේවතානුස්මෘති - වේදනානුස්මෘති - ආනාපානස්මෘති - මරණානුස්මෘති - කායගතස්මෘති උපශමානුස්මෘති වශයෙන් ප්‍රීතිප්‍රාමොද්‍යය කල්‍යාණප්‍රීතිය උපදී නුයි 'පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති' යනු වේ.

**වික්ඛම්භයෙ තානි පරිස්සයානි** - 'පරිස්සය' නම්: ප්‍රකට පරිශ්‍රයයෝ ද, ප්‍රතිච්ඡන්නපරිශ්‍රයයෝ ද'යි පරිශ්‍රයයෝ දෙදෙනෙකි...මොහු ප්‍රතිච්ඡන්න පරිශ්‍රයයෝ යැයි කියනු ලැබෙත්...මෙසේත් 'තත්‍රාසය' නුයි - පරිශ්‍රය නම් වෙත්. **වික්ඛම්භෙය තානි පරිස්සයානි** -ඒ උපද්‍රවයන් විෂ්කම්භනය කරන්නේ යැ, මැඩ පවත්වන්නේ යැ, යටපත් කරන්නේ යැ, හාත්පසින් ගන්නේ යැ, මර්දනය කරන්නේ නුයි 'වික්ඛම්භයෙ තානි පරිස්සයානි' යනු වේ.

**අරතිං සහෙථ සයනම්හි පන්තෙ** - 'අරති' යනු: යම් අරතිය (-නො ඇලීමෙ)ක් නො ඇලෙන අයුරෙක් අනභිරතියෙක් අනභිරත්‍යාකාරයෙක් උකටලි බවෙක් තැවෙන අයුරෙක් වේ ද එය යි. **සයනම්හි පන්තෙ** වනසෙලවර සෙනසුන්හි හෝ අන්‍යතරාන්‍යතර කුශලධර්මයන්හි නො ඇලීම නසන්නේ ය, අභිභවනය කරන්නේය, යටපත් කරන්නේය, හාත්පසින් ගන්නේ ය. මඩින්නේ නුයි 'අරතිං සහෙථ සයනම්හි පන්තෙ' යනු වේ.

**චතුරො සහෙථ පරිදෙවධම්මෙ** - චතුර්විධ පරිදෙවනීයධර්මයන් සහනය කරන්නේ යැ, හාත්පසින් සහනය කරන්නේ යැ මැඩපවත්වන්නේ යැ, යටපත් කරන්නේ යැ, හාත්පසින් ගන්නේ යැ, මර්දනය කරන්නේ නුයි 'චතුරො සහෙථ පරිදෙවධම්මෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“පඤ්ඤං පුරක්ඛත්වා -පෙ- චතුරො සහෙථ පරිදෙවධම්මෙ”යි**

**16 - 16**

කුමක් වළඳම් ද, කොහි හෝ වළඳම් ද, මේ රෑ එකානතයෙත් දුකසේ සයනය කෙළෙම්, අද රෑ කොහි හොවිම් ද, යන වැලැපියයුතු වූ මේ සතර විතර්කයන් අප්‍රතිබාධ වැ හැසිරෙනසුලු ශෛක්‍ෂ තෙමේ දුරු කරන්නේ යි.

**කිං සු අසිස්සං කුවං වා අසිස්සන්ති**–'කිංසු අසිස්ස'න්ති[1] කිං භුඤ්ජිස්සාමි ඔදනං වා කුම්මාසං වා සත්තුං වා මච්ඡං වා මංසං වාති – කිං සු අසිස්සං. **කුවං වා අසිස්සන්ති** කත්ථ භුඤ්ජිස්සාමි ඛත්තියකුලෙ වා බ්‍රාහ්මණකුලෙ වා වෙස්සකුලෙ වා සුද්දකුලෙ වාති – කිං සු අසිස්සං කුවං වා අසිස්සං.

**දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සන්ති** – ඉමං රත්තිං දුක්ඛං සයිත්ථ ඵලකෙ වා තට්ටිකාය වා චම්මඛණ්ඩෙ වා තිණසන්ථාරෙ වා පණ්ණසන්ථාරෙ වා පලාලසන්ථාරෙ වා, ආගාමිරත්තිං[2] කත්ථ සුඛං සයිස්සාමි මඤ්චෙ වා පීඨෙ වා භිසියා වා බිම්බොහනෙ වා විහාරෙ වා අඩ්ඪයොගෙ වා පාසාදෙ වා හම්මියෙ වා ගුහාය වාති – දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං.

**එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යාති** – 'එතෙ විතක්කෙ'ති ද්වෙ පිණ්ඩපාතපටිසංයුත්තෙ විතක්කෙ, ද්වෙ සෙනාසනපටිසංයුත්තෙ විතක්කෙ; **පරිදෙවනෙය්‍යාති** ආදෙවනෙය්‍ය පරිදෙවනෙය්‍යාති – එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍ය.

**විනයෙථ සෙඛො අනිකෙතචාරීති** – 'සෙඛො'ති කිං කාරණා වුච්චති සෙඛො? සික්ඛතීති සෙඛො; කිඤ්ච සික්ඛති: අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති. කතමා අධිසීලසික්ඛා? –පෙ– අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො – පස්සන්තො – පච්චවෙක්ඛන්තො – චිත්තං අධිට්ඨහන්තො සික්ඛති, සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං පග්ගණ්හන්තො – සතිං උපට්ඨපෙන්තො– චිත්තං සමාදහන්තො–පඤ්ඤාය පජානන්තො සික්ඛති. අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො– පහාතබ්බං පජහන්තො – භාවෙතබ්බං භාවෙන්තො – සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති, ආචරති සමාචරති සමාදාය සික්ඛති. තං කාරණා වුච්චති සෙඛො. සෙඛො විනයාය පටිවිනයාය පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො –පෙ– සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය, ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති – විනයෙථ සෙඛො. **අනිකෙතචාරීති** කථං නිකෙතචාරී හොති: ඉධෙකච්චො කුලපළිබොධෙන සමන්නාගතො හොති, ගණපළිබොධෙන – ආවාසපළිබොධෙන – චීවරපළිබොධෙන – පිණ්ඩපාතපළිබොධෙන – සෙනාසනපළිබොධෙන – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපළිබොධෙන සමන්නාගතො හොති. එවං නිකෙතචාරී හොති. කථං අනිකෙතචාරී හොති: ඉධ භික්ඛු න කුලපළිබොධෙන සමන්නාගතො න ගණ– න ආවාස – න චීවර – න පිණ්ඩපාත – න සෙනාසන – න ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපළිබොධෙන සමන්නාගතො හොති. එවං අනිකෙතචාරී හොති.

1. අසිස්සාමීති - සීමු. II. 2 ආගමිකරත්තිං - සහා PTS.

**කිං සු අසිස්සං කුව වා අසිස්සං** – ‘කිං සු අසිස්සං’ යනු: කුමක් වළඳම් ද, බත් හෝ කොමු හෝ හත්වට හෝ මාළු හෝ මස් හෝ යැයි ‘කිං සු අසිස්සං’ යනු වේ. **කුව වා අසිස්සං** යනු: කොහි වළඳම් ද ක්ෂත්‍රියකුලයෙහි හෝ බ්‍රාහ්මණකුලයෙහි හෝ වෛශ්‍යකුලයෙහි හෝ ශුද්‍රකුලයෙහි හෝ යැයි ‘කිං සු අසිස්සං කුව වා අසිස්සං’ යනු වේ.

**දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං** – මේ රෑ දුකසේ ශයනය කෙළෙම්, පුවරුයෙහි හෝ තට්ටිකාවෙහි හෝ සම්කඩෙහි හෝ තණඇතිරියෙහි හෝ පත්ඇතිරියෙහි හෝ පිදුරුඇතිරියෙහි හෝ යැ; අද පැමිණෙන රෑ කොහි සුවසේ හොවිම් ද; ඇඳෙක හෝ පුටුවෙක හෝ බිස්සෙක හෝ බිම්බොහනයෙක හෝ විහාරයෙක හෝ අඩුළුවක්ගෙයෙක හෝ පහයෙක හෝ සඳලුගෙයෙක හෝ ගුහාවෙක හෝ යැයි ‘දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං’ යනු වේ.

**එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යො** – ‘එතෙ විතක්කෙ’ යනු: පිණ්ඩපාත ප්‍රතිසංයුක්ත වූ විතර්ක දෙක යැ, සෙනාසනප්‍රතිසංයුක්ත වූ විතර්ක දෙක යි. **පරිදෙවනෙය්‍යො** යනු: වැලැපියයුතු හාත්පසින් වැලැපියයුත්තේ නුයි ‘එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යො’ යනු වේ.

**විනයෙථ සෙඛො අනිකෙතචාරී** – ‘සෙඛො’ යනු: කවර කරුණෙකින් ‘සෙඛ’යි කියනු ලැබේ ද යත්: හික්මේ නුයි ‘සෙඛ’ යැ. කුමක් හික්මෙයි යත්: අධිශීලයෙහි ද හික්මෙයි, අධිචිත්තයෙහි ද හික්මෙයි, අධිප්‍රඥාවෙහි ද හික්මෙයි. අධිශීලශික්ෂා කවර යත්...මේ අධිප්‍රඥාශික්ෂා යි. මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙයි, දැනගනිමින් – නුවණින් දකිමින්– ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් – සිත්හි පිහිටුවමින් හික්මෙයි, සැදැහැයෙන් නිශ්‍රාවට පැමිණෙමින් හික්මෙයි, වීර්‍ය්‍ය දැඩි ව ගනිමින් – සිහි එළවමින් – සිත පිහිටුවමින් – ප්‍රඥාවෙන් දැනගනිමින් හික්මෙයි, ස්වභාවලක්ෂණවශයෙන් වෙසෙසින් දතයුත්ත දැනගනිමින් හික්මෙයි, සාමාන්‍යලක්ෂණවශයෙන් ව්‍යාප්ත කොට දතයුත්ත හාත්පසින් දැනගනිමින් – ප්‍රහීණ කළයුත්ත ප්‍රහීණ කෙරෙමින්–වැඩියැ යුත්ත වඩමින්–ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙයි, හැසිරෙයි මොනොවට හැසිරෙයි සමාදන් වැ හික්මෙයි. එකරුණෙන් ‘සෙඛ’යි කියනු ලැබේ. ශෛක්ෂ තෙමේ (කෙලෙසුන්ගේ) විනය පිණිස දුරුකිරීම පිණිස ප්‍රහාණය පිණිස සන්හිඳීම පිණිස දුරුළීම පිණිස පරිත්‍යාගය පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේ යැ, අධිචිත්තයෙහි ද හික්මෙන්නේ ය, අධිප්‍රඥාවෙහි ද හික්මෙන්නේ ය; මේ ත්‍රිවිධශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේ යැ, දැනගනිමින්...ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙන්නේ යැ, හැසිරෙන්නේ යැ, මොනොවට හැසිරෙන්නේ යැ, සමාදන් වැ පවත්නේ නුයි ‘විනයෙථ සෙඛො’ යනු වේ. **අනිකෙතචාරී** යනු: කිසෙයින් නිකේතචාරී වේ ද යත්: මෙහි කිසිවෙක් කුලපලිබෝධයෙන් යුක්ත වූයේ වේ ද; ගණපලිබෝධයෙන් – ආවාසපලිබෝධයෙන් – චීවරපලිබෝධයෙන් – පිණ්ඩපාතපලිබෝධයෙන් – සෙනාසනපලිබෝධයෙන් – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර පලිබෝධයෙන් යුක්ත වූයේ වේ ද, මෙ පරිද්දෙන් ‘නිකේතචාරී’ වේ. කිසෙයින් ‘අනිකේතචාරී’ වේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙමේ කුලපලිබෝධයෙන් යුක්ත වූයේ නො වේ ද, ගණ - ආවාස – චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලන්පස බෙහෙත්පිරිකර පලිබඳ පලිබෝධයෙන් යුක්ත වූයේ නො වේ ද, මෙසේ ‘අනිකේතචාරී’ වේ.

1. "මගධං ගතා කොසලං ගතා
එකච්චියා පන වජ්ජිභූමියා[1],
මිගා විය[2] අසඞ්ගචාරිනො[3]
අනිකෙතා විහරන්ති භික්ඛවො.[a]

2. සාධු චරිතකං[4] සාධු සුචරිතං
සාධු සදා අනිකෙතවිහාරො,
අත්ථපුච්ඡනං පදක්ඛිණකම්මං
එතං සාමඤ්ඤං අකිඤ්චනස්සා"ති [b]

විනයෙථ සෙඛො අනිකෙතචාරී.

තෙනාහ භගවා:

"කිං සු අසිස්සං කුවං වා අසිස්සං
දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං,
එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යෙ
විනයෙථ සෙඛො අනිකෙතචාරී"ති.

16 - 17

අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ
මත්තං සො ජඤ්ඤා ඉධ තොසනත්ථං,
සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ
රුසිතොපි වාචං ඵරුසං න වජ්ජා.

**අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙති** – 'අන්න'න්ති ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං; **වසනන්ති** – ඡ චීවරානි: ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගං; **අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙති** – චීවරං ලභිත්වා පිණ්ඩපාතං ලභිත්වා, න කුහනාය න ලපනාය න නෙමිත්තිකතාය න නිප්පෙසිකතාය න ලාභෙන ලාභං නිජිගිංසනතාය න දාරුදානෙන න වෙළුදානෙන න පත්තදානෙන න පුප්ඵදානෙන න ඵලදානෙන න සිනානදානෙන න චුණ්ණදානෙන න මත්තිකාදානෙන න දන්තකට්ඨදානෙන න මුඛොදකදානෙන න චාටුකම්‍යතාය න මුග්ගසූපතාය න පාරිභට්ටතාය න පිට්ඨිමංසිකතාය න වත්ථුවිජ්ජාය න තිරච්ඡානවිජ්ජාය න අඞ්ගවිජ්ජාය න නක්ඛත්තවිජ්ජාය න දූතගමනෙන න පහිණගමනෙන න ජඞ්ඝපෙසනියෙන න වෙජ්ජකම්මෙන න පිණ්ඩපටිපිණ්ඩකෙන න දානානුප්පදානෙන ධම්මෙන සමෙන ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වාති – අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ.

**මත්තං සො ජඤ්ඤා ඉධ තොසනත්ථන්ති** – 'මත්තං සො ජඤ්ඤා'ති ද්වීහි කාරණෙහි මත්තං ජානෙය්‍ය; පටිග්ගහණතො වා පරිභොගතො වා. කථං පටිග්ගහණතො මත්තං ජානාති? ථොකෙපි දිය්‍යමානෙ කුලානුද්දයාය කුලානුරක්ඛාය කුලානුකම්පාය පටිග්ගණ්හාති. බහුකෙපි දිය්‍යමානෙ කායපරිහාරිකං චීවරං පටිග්ගණ්හාති, කුච්ඡිපරිහාරිකං පිණ්ඩපාතං පටිග්ගණ්හාති. එවං පටිග්ගහණතො මත්තං ජානාති.

---

1. වජ්ජිභූමියා - සිමු. II. 2. මගසා විය - සයා.
3. සඞ්ඝචාරිනො - සයා මාගධාවියඞ්ඝචාරිනො - PTS.
4 චරිතං - සයා. PTS. a. වනසංයුත්ත. b. කුමාපුත්තත්ථෙරගාථා.

1. (ඒ භික්ෂූහු) කිසිකෙනෙක් මගධරටට ගියාහු ය, කොසොල්රටට ගියාහු ය. යළි කිසි කෙනෙක් වැදූරටට අභිමුඛ ව ගියාහු ය. කිසිකෙනෙක් යුම් මැ තැනෙකැ නො ඇලී හැසිරෙන මුවන් මෙන් ගෘහපරිරොධ රහිත වැ වෙසෙත්.

2. අල්පෙච්ඡතාදි චරිතය මැනැව. සුචරිතය මැනැව. සියලු කල්හි පඤ්චකාමගුණනිකෙත රහිත වූ විහරණය මැනැව. අනී විචාරීම ද අවවාදය ආදර කොට ගැනීම ද මැනව. තෙල කිඤ්චන රහිත වූවහුගේ ශ්‍රමණ බව වේ.

‘විනයෙථ සෙඛො අනිකෙතචාරී’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“කිං සු අසියං -පෙ- විනයෙථ සෙඛො අනිකෙතචාරී”යි.

## 16 – 17

මේ ශාසනයෙහි ඒ මහණ තෙමේ (සිගායත) කාලයෙහි පිණ්ඩපාත සඞ්ඛ්‍යාත ආහාරය ද චීවර සඞ්ඛ්‍යාත වස්ත්‍රය ද ලැබ ඉතරෙතරප්‍රත්‍යය-සන්තොෂය සඳහා (පටිග්ගහනපරිභොගයෙහි) පමණ දන්නේ යැ. හෙ තෙමේ ඒ ප්‍රත්‍යයන්හි සංවර වූයේ ගම්හි සංවර වැ හැසිරෙනුයේ මෙරමා විසින් ගටන ලදුයේ නමුදු පරුෂවචන නො කියන්නේ යි.

**අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ** – ‘අන්නං’ යනු: බත් කොමුපිඩු හත්වට මාළු මස් යන මේ යි. **වසනං** යනු: සවී චීවරයෝ යැ: කොමුපිළී කපු-පිළී තිහිරිපිළී කම්බලපිළී සණපිළී මුහුපිළී යැ. **අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ** – සිවුරු ලැබ පිණ්ඩපාතය ලැබ, විස්මය කරවීමෙන් නො වැ උසස් කොට කිණීමෙන් නො වැ නිමිති කරන බැවින් නො වැ මෙරමා ගුණ නසන බැවින් නො වැ ලාභයෙන් ලාභ සොයන බැවින් නො වැ දුව දීමෙන් නො වැ හුණදඬු දීමෙන් නො වැ (තල් ආදි) පත්‍රදානයෙන් නො වැ පුෂ්ප දානයෙන් නො වැ ඵලදානයෙන් නො වැ නහනු දීමෙන් නො වැ සුණු දීමෙන් නො වැ මැටි දීමෙන් නො වැ දැහැටිදඬු දීමෙන් නො වැ මුව දෝනා දිය දීමෙන් නො වැ චාටුබස් කියන බැවින් නො වැ මුද්ග-සූපයක් වැනි වීමෙන් නො වැ (දරුවන් වැඩීමාදි) පරිභටභාවයෙන් නො වැ මෙරමා පිටුමස් කනබැවින් නො වැ වාස්තුවිද්‍යාවෙන් නො වැ තිරශ්චීන-විද්‍යාවෙන් නො වැ අඞ්ගවිද්‍යාවෙන් නො වැ නක්ෂත්‍රවිද්‍යාවෙන් නො වැ දූතමෙහෙවරින් නො වැ පහිවුඩ ගෙනයෑමෙන් නො වැ පාමෙහෙවරින් නො වැ වෙදකමින් නො වැ පිණ්ඩප්‍රතිපිණ්ඩකයෙන් නො වැ දානානු-ප්‍රදානයෙන් නො වැ දැහැමින් සෙමෙන් ලැබ, ලබා, පැමිණ, විඳ, ප්‍රතිලාභ කොට තුයි ‘අන්නඤ්චලද්ධා වසනඤ්ච කාලෙ’ යනු වේ.

**මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං** – ‘මත්තං ස ජඤ්ඤා’ යනු: දෙ කරුණෙකින් පමණ දන්නේ යැ: ප්‍රතිග්‍රහණ හෙයින් හෝ පරිභොග හෙයින් හෝ යැ. කිසෙයින් ප්‍රතිග්‍රහණ හෙයින් මාත්‍රඥ වේ ද යත්: මඳක් නමුදු දෙනු ලබන කල්හි කුලයන්ට කරුණා සඳහා කුලයන් රක්නා සඳහා කුලයන්ට අනුකම්පා සඳහා පිළිගනී ද, බොහෝවකුදු දෙනු ලබන කල්හි කයට යෙහෙන පමණ සිවුරු පිළිගනී ද, කුසට යැපෙන පමණ පිණ්ඩපාතය පිළිගනී ද, මෙසේ ප්‍රතිග්‍රහණ හෙයින් මාත්‍රඥ වේ.

කථං පරිභොගතො මත්තං ජානාති? පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති: යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං. පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවති: නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො ච. පටිසඞ්ඛා යොනිසො සෙනාසනං පටිසෙවති: යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සයවිනොදනං පටිසල්ලානාරාමත්ථං. පටිසඞ්ඛා යොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති: යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතාය. එවං පරිභොගතො මත්තං ජානාති. මත්තං ස ජඤ්ඤාති – ඉමෙහි ද්විහි කාරණෙහි මත්තං ජානෙය්‍ය ආජානෙය්‍ය පටිවිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍යාති – මත්තං ස ජඤ්ඤා.

ඉධ තොසනත්ථන්ති "ඉධ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච චීවරං න පරිතස්සති, ලද්ධා ච චීවරං අගථිතො[1] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං[2] වම්භෙති. යො[3] හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො,[4] අයං වුච්චති භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. පුන ච පරං භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති, ලද්ධා ච පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති; තාය ච පන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො,[4] අයං වුච්චති භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. පුන ච පරං භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච සෙනාසනහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච සෙනාසනං න පරිතස්සති, ලද්ධා ච සෙනාසනං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති.

1. අගධිතො - සිමු II මජසං. 2. න පරං - සිමු. II.
3. සො - අභි. 4. පටිස්සතො, සිමු. II. මජසං.

කිසෙසිත් පරිභොග හෙයින් මාත්‍රඥ වේ ද යත්: නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට සිවුරු පරිභොග කෙරෙයි: ශීත නසනු පිණිස උෂ්ණ නසනු පිණිස මැසි මදුරු වා අව් දිග්දූපහස් නසනු පිණිස මැ යැ, ලජ්ජාකොපනය වුවහ කරනු පිණිස මැ යි. නුවණින් විමසා පිණ්ඩපාතය වළඳයි: කෙළි පිණිස නො වළඳයි, මද පිණිස නො වළඳයි, අලඞ්කාර පිණිස නො වළඳයි, සැරසුම් පිණිස නො වළඳයි, මේ සිරුර පවත්නා සඳහා යැපීම පිණිස බඩගිනිවේදනා නසනු පිණිස බඹසරට අනුග්‍රහ පිණිස මැ යැ. මෙසේ පැරණි බඩගනි වේදනා ත් නසමි, අලුත් වේදනා ත් නුපදවමි, මාගේ ජීවිතයාත්‍රාව ද අනවද්‍යභාව ද එයසුවිහරණය ද වන්නේ යයි. නුවණින් විමසා සෙනසුන් සෙවන කෙරෙයි: ශීත නසනු පිණිස උෂ්ණ නසනු පිණිස මැසි මදුරු වා අව් දිග්දූපහස් නසනු පිණිස මැ යැ, සෘතුපීඩා නසනු පිණිස හා විවෙකසුව පිණිස මැයි. නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ගිලන්පස බෙහෙසත් පිරිකර වළඳ කරයි: රොගපීඩාවෙන් උපන් වේදනා වන් නසනු පිණිස නිදුක් පරමබව පිණිස මැයි. මෙසේ පරිභොග හෙයින් මාත්‍රඥ වේ. මත්තං ස ජඤ්ඤා – මේ දෙ කරුණෙන් පමණ දන්නේ යැ, හාත්පසින් දන්නේ යැ වෙසෙසින් දන්නේ යැ අවබොධ කරන්නේ නුයි 'මත්තං ස ජඤ්ඤා' යනු වේ.

ඉධ තොසනක්ඛං යනු: මෙහි මහණ තෙමේ ඉතරෙතර චීවරයෙන් සතුටු වූයේ වෙයි, ඉතරෙතර චීවරසන්තොෂයාගේ ගුණ කියන සුලු වූයේත් වේ, චීවරහෙතුයෙන් අයුතු වූ අනෙසනයට නො ද පැමිණෙයි, සිවුරු නො ලැබ ද පීඩාවට නො පැමිණෙයි, සිවුරු දූහැමින් සෙමෙන් ලැබ ද (ලොභයෙන්) නො ගෙතුණේ නො මුසපත් වූයේ තෘෂ්ණායෙන් නො වැතුරුණේ ආදීනව දක්නාසුලු වූයේ නිස්සරණප්‍රඥාවෙන් යුක්ත වැ පරිභොග කෙරෙයි. තවද ඒ ඉතරෙතරචීවරසන්තොෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්ෂණ කෙරෙයි, පරවම්භනය නො කෙරේ. තවද යම් මහණෙක් ඒ චීවරසන්තොෂයෙහි දක්ෂ වූයේ අනලස වූයේ සම්‍යක්ප්‍රඥාවෙන් යුක්ත වූයේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමේ පැරණි වූ ද අග්‍ර යයි දතයුතු වූ ද ආර්‍යවංශයෙහි සිටියේ වේ. නැවැත ද මහණ තෙමේ ඉතරෙතර පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි, ඉතරෙතර පිණ්ඩපාතසන්තොෂයෙහි ගුණ කියන සුලු වූයේ ත් වෙයි, පිණ්ඩපාතය නිසා අයුතු වූ අනෙසනයට නොද පැමිණෙයි, පිණ්ඩපාතය නො ලැබ ද නො තැවෙයි, පිණ්ඩපාතය ලැබ ද නො ගෙතුණේ නො මුසපත් වූයේ නො මඩනා ලදුයේ ආදීනව දක්නා සුලු වූයේ නිස්සරණප්‍රඥාවෙන් යුක්ත වැ පරිභොග කෙරෙයි. තවද ඒ ඉතරෙතරපිණ්ඩපාතසන්තොෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්ෂණය කෙරෙයි, පරවම්භනය නො කෙරේ. තවද යමෙක් ඒ පිණ්ඩපාතසන්තොෂයෙහි දක්ෂ වූයේ අලස නො වූයේ නුවණැතියේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමේ පෞරාණික වූ අග්‍රගණ්‍ය වූ ආර්‍යවංශයෙහි සිටියේ යයි කියනු ලැබේ. නැවැත ද මහණ තෙමේ ඉතරෙතර සෙනාසනයෙන් සතුටු වූයේ වෙයි, ඉතරෙතර සෙනාසනසන්තොෂයෙහි ගුණ කියනසුලු වූයේත් වෙයි, සෙනාසනය නිසා අයුතු වූ අනෙසනයට නො ද පැමිණෙයි, සෙන සුන් නො ලැබ ද නො තැවෙයි, යළි සෙනසුන් ලබා නො ගෙතුණේ නො මුසපත් වූයේ නො මඩනා ලදුයේ ආදීනව දක්නාසුලු වූයේ නිස්සරණ ප්‍රඥාවෙන් යුක්ත වැ පරිභොග කෙරෙයි, තවද ඒ ඉතරෙතර සෙනාසනසන්තොෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්ෂණය කෙරෙයි, පරවම්භනය නො කෙරේ.

සො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො,[1] අයං වුච්චති භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. පුන ච පරං භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන ඉතරීතරගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං න පරිතස්සති, ලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො[1] අයං වුච්චති භික්ඛු 'පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො''[ක]ති – මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං.

සො තෙසු ගුත්තො යතචාරි ගාමෙති – 'සො තෙසු ගුත්තො'ති චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතොති එවම්පි සො තෙසු ගුත්තො. අථවා ආයතනෙසු ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතොති එවම්පි සො තෙසු ගුත්තො. යතචාරි ගාමෙති – ගාමෙ යතො යත්තො[2] පටියත්තො[3] ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතොති – සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ.

රුසිතොපි වාචං ඵරුසං න වජ්ජාති – රුසිතො ඛුංසිතො වම්භිතො ඝට්ටිතො ගරහිතො උපවදිතො ඵරුසෙන කක්ඛළෙන නප්පටිවජ්ජා, නප්පටිභණෙය්‍ය, අක්කොසන්තං න පච්චක්කොසෙය්‍ය, රොසන්තං නප්පටිරොසෙය්‍ය, භණ්ඩන්තං නප්පටිභණ්ඩෙය්‍ය, න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති – රුසිතොපි වාචං ඵරුසං න වජ්ජා.

තෙනාහ භගවා:

"අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ
මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං,
සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ
රුසිතොපි වාචං ඵරුසං න වජ්ජා''ති.

---

1. පටිස්සතො - සීමු II මජසං 2. යතො - සීමු II මජසං PTS.
3. පටියතො - සීමු. II මජසං. PTS.
ක. චතුක්කඅඞ්ගුත්තර - උරුවෙලවග්ග; දීඝනිකාය - සඞ්ගීතිසුත්ත

යමෙක් එ මැ සේනාසනසන්තොෂයෙහි දක්ෂ වූයේ නොලස් වූයේ නුවණැතියේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමෙ පෞරාණික වූ අග්‍රගණ්‍ය වූ ආර්‍යවංශයෙහි සිටියේ යයි කියනු ලැබේ. නැවැත ද මහණ තෙමේ ඉතරීතර ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරයෙන් සතුටු වූයේ වෙයි. ඉතරෙතර ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යසන්තොෂයෙහි ගුණ කියනසුලු වූයේත් වෙයි. ගිලන්පස බෙහෙසත් පිරිකරහෙතුයෙන් අයුතු වූ අනෙසනයට නො ද පැමිණෙයි. ගිලන්පස බෙහෙසත්පිරිකර නො ලැබ ද නො තැවෙයි. ගිලන්පස බෙහෙසත් පිරිකර ලැබ ද නො ගෙතුණේ නො මුසපත් වූයේ නො මඩනා ලදුයේ ආදීනව දක්නාසුලු වූයේ නිස්සරණප්‍රඥා ඇති ව වළඳයි. තවද ඒ ඉතරෙතරග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරසන්තො-ෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්ෂණය කෙරෙයි, පරම්භනය නො කෙරේ. යමෙක් එමැ ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරසන්තොෂයෙහි දක්ෂ වූයේ අනලස් වූයේ නුවණැතියේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමෙ පෞරාණික වූ අග්‍ර යයි දන්නා ලද ආර්‍යවංශයෙහි සිටියේ යයි කියනු ලැබේ නුයි 'මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං' යනු වේ.

සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ – 'සො තෙසු ගුත්තො' යනු: සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකරෙහි පිහිත වූයේ ගොපිත වූයේ රැකුණේ සංවර වූයේ නුයි මෙසේත් 'සො තෙසු ගුත්තො' යනු වේ. නොහොත් ආයතනයන්හි පිහිත වූයේ ගොපිත වූයේ රක්ෂිත වූයේ සංවර වූයේ නුයි මෙසේත් 'සො තෙසු ගුත්තො' යනු වේ. යතචාරි ගාමෙ යනු: ගම්හි සංයත වූයේ සංයත වූ සිත් ඇතියේ අතිශයින් සංයත වූ සිත් ඇතියේ පිහිත වූයේ ගොපිත වූයේ රක්ෂිත වූයේ සංවර වූයේ නුයි 'සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ' යනු වේ.

රුසිතො පි වාචං ඵරුසං න වජ්ජා – කොප කරන ලදුයේ ආක්‍රොශ කරන ලදුයේ අවමන් කරන ලදුයේ ගටන ලදුයේ ගරහන ලදුයේ නුගුණ කියන ලදුයේ පරුෂ වූ කර්කශ වූ වචනයෙන් පෙරළා නො කියන්නේ යැ, පෙරළා නො බණන්නේ යැ, ආක්‍රොශ කරන්නහුට ප්‍රත්‍යාක්‍රොශ නො කරන්නේ යැ, කොප කරන්නහුට ප්‍රතිකොප නො කරන්නේ යැ, ඩබර කරන්නහුට පෙරළා ඩබර නො කරන්නේ යැ, කලහ නො කරන්නේ යැ, ඩබර නො කරන්නේ යැ, විග්‍රහ නො කරන්නේ යැ, විවාද නො කරන්නේ යැ, හිංසා නො කරන්නේ යැ, කලහ භණ්ඩන විග්‍රහ විවාද මෙධගය හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. කලහ – භණ්ඩන – විග්‍රහ – විවාද – මෙධගයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ වන්නේ යැ, විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'රුසිතො පි වාචං ඵරුසං වජ්ජා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අන්නඤ්ච ලද්ධා -පෙ- රුසිතො පි වාචං ඵරුසං න වජ්ජා"යි.

16 - 18

ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො
ඣානානුයුත්තො බහුජාගර'ස්ස,
උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො
තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ[1].

**ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලොති** - කථං ඛිත්තචක්ඛු හොති: "ඉධෙකච්චො භික්ඛු චක්ඛුලොලො චක්ඛුලොලියෙන සමන්නාගතො හොති: 'අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බ'න්ති ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං ගාමෙන ගාමං නිගමෙන නිගමං නගරෙන නගරං රට්ඨෙන රට්ඨං ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවත්ථචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි ඛිත්තචක්ඛු හොති. අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො අසංවුතො ගච්ඡති: හත්ථිං ඔලොකෙන්තො අස්සං ඔලොකෙන්තො රථං ඔලොකෙන්තො පත්තිං ඔලොකෙන්තො ඉත්ථියො ඔලොකෙන්තො පුරිසෙ ඔලොකෙන්තො කුමාරකෙ ඔලොකෙන්තො කුමාරිකායො ඔලොකෙන්තො අන්තරාපණං ඔලොකෙන්තො ඝරමුඛානි ඔලොකෙන්තො උද්ධං ඔලොකෙන්තො අධො ඔලොකෙන්තො දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති, එවම්පි 'ඛිත්තචක්ඛු' හොති. අථවා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. එවම්පි ඛිත්තචක්ඛු හොති. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනගරකං[2] චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිංසයුද්ධං උසභයුද්ධං ගොයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අණීකදස්සනං ඉති වා. එවම්පි ඛිත්තචක්ඛු හොති.

කථං න ඛිත්තචක්ඛු හොති: "ඉධෙකච්චො භික්ඛු න චක්ඛුලොලො න චක්ඛුලොලියෙන සමන්නාගතො හොති. 'අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බ'න්ති න ආරාමෙන ආරාමං න උය්‍යානෙන උය්‍යානං න ගාමෙන ගාමං න නිගමෙන නිගමං න නගරෙන නගරං න රට්ඨෙන රට්ඨං න ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවත්ථචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි න ඛිත්තචක්ඛු හොති. අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො සංවුතො ගච්ඡති: න හත්ථිං ඔලොකෙන්තො -පෙ- න දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති. එවම්පි න ඛිත්තචක්ඛු හොති. අථවා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති -පෙ- චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවම්පි න ඛිත්තචක්ඛු හොති.

1. කුක්කුච්චූපච්ඡින්දෙ - සෑ. PTS. 2. සොභනකං - මජසං.

16 – 18

යට බලා හෙළූ ඇස් ඇතියේ නො ද පාදලෝලත්‍වයෙන් යුක්ත වූයේ ධ්‍යානයෙහි යෙදුණේ බොහෝ කොට නිදිවැරීමෙන් යුක්ත වූයේ වන්නේ යැ. චතුර්ථධ්‍යානොපෙක්‍ෂාව උපදවා එකඟ වූ සිත් ඇතියේ කාමාදි විතර්කය හා විතර්කාශ්‍රය ද කෞකෘත්‍යය ද සිඳින්නේ යි.

ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො – කිසෙයින් 'ඛිත්තචක්ඛු' වේ ද යත්: මෙහි කිසි මහණෙක් (සක්දෙර උපන් ලොභ විසින්) ඇසින් ලොල් වූයේ චක්‍ෂුර්ලෝලත්‍යයෙන් සමන්විත වූයේ වෙයි. 'නුදුටු දෙය දක්ක යුතු යැ, දුටුදෙය ඉක්මැවියැයුතු යැ'යි අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමින් නිගමට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දීර්ඝචාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි රූපදර්ශනය සඳහා යෙදුණේ වෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' වේ. නොහොත් මහණ තෙමේ ඇතුළුගමට පිවිසියේ වීදියට පිළිපන්නේ අසංවර වැ යෙයි: ඇතුන් බලමින් අසුන් බල මින් රිය බලමින් පාබලසෙන් බලමින් ගෑනුන් බලමින් පිරිමින් බලමින් කුමරුන් බලමින් කුමරියන් බලමින් අවුණුතුල බලමින් ගෙදොර බලමින් උඩ බලමින් යට බලමින් දිශානුදිශා බලමින් යෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු වෙයි. නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ වෙයි, අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් අසංවරයක් හෙතු කොට අසංවර වූ චක්‍ෂුරින්ද්‍රිය ඇති වැ වාසය කරන තෙල පුද්ගලයා අභිධ්‍යා දෞර්ම-නස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්‍ෂුරින්ද්‍රියයාගේ සංවරයට නො පැමිණෙයි, චක්‍ෂුරින්ද්‍රිය නො රක්නේ යැ, චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණේ. මෙසේත් 'ඛිත්තචක්ඛු' වේ. තවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල සදහා සැදැහැයෙන් දුන් බොජුන් වළඳා ඔවුහු මෙබඳු වූ විපුළ දස්නෙහි යෙදී වාසය කරන්නාහු ද, ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් නළුමුළු හාරතාදිය කියන තැන කස්තල කුළුතාලම් කල පිඹීම ප්‍රතිභානචිත්‍ර සැබොලුන්ගේ සණදෙවුන්කෙළි වස්-කුලල් ඇට දෙවීම ඇත්පොර අස්පොර මීහිපොර වැහැප්පොර ගවපොර බැටළුපොර එළුපොර කුකුළුපොර වටුපොර දඬුපොර මිටුපොර මල්ලපොර යුදපෙරමුණ බලසෙන් ගණන තැන සෑදවුර බලඇණි දැකීම යනු නොයි යැ. මෙසේත් 'ඛිත්තචක්ඛු' නම් වේ.

කිසෙයින් 'ඛිත්තචක්ඛු' නො වේ ද යත්: මෙ සස්නෙහි ඇතැම් මහ-ණෙක් ඇසින් ලොල් නො වූයේ චක්‍ෂුර්ලෝලත්‍යයෙන් යුක්ත නො වූයේ වෙයි. 'නුදුටු දෙය දක්ක යුතු යැ, දුටු දෙය ඉක්මැවියයුතු ය'යි අරමින් අරමට නො යෙයි, උයනින් උයනට – ගමින් ගමට – නිගමයෙන් නිගමයට-නුවරින් නුවරට – රටින් රටට – දනව්වෙන් දනව්වට රූපදර්ශනය පිණිස දීර්ඝචාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි නො යෙදුණේ වෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වූයේ වේ. නොහොත් මහණ තෙමේ ගොදුරුගමට පිවි-සියේ වීදියට පිළිපන්නේ සංවර වැ යෙයි: ඇතුන් නො බලමින්...දිශානු-දිශා නො බලමින් යෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වූයේ වේ. නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නො වූයේ වෙයි... චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වූයේ වෙයි.

යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා -පෙ- අණ්ඩිකදස්සනං ඉති වා. එවරූපා විසූකදස්සනානුයොගා පටිවිරතො හොති. එවම්පි න ඛිත්තචක්ඛු හොතීති ඔක්ඛිත්තචක්ඛු.

න ච පාදලොලොති - කථං පාදලොලො හොති: ඉධෙකච්චො භික්ඛු පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති: ආරාමෙන ආරාමං -පෙ- දීඝචාරිකං අනිවත්තචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි පාදලොලො හොති. අථවා භික්ඛු අන්තොපි සඞ්ඝාරාමෙ පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති: න අත්ථහෙතු[1] න කාරණහෙතු උද්ධතො අවූපසන්තචිත්තො පරිවෙණතො පරිවෙණං ගච්ඡති. විහාරතො -පෙ- ඉති භවාභවකථං ඉති වා.[2] එවම්පි පාදලොලො හොති. න ච පාදලොලොති පාදලොලියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. පාදලොලියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍ය. පටිසල්ලානාරාමො අස්ස පටිසල්ලානරතො අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං, ඣායී ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකොති - ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො.

ඣානානුයුත්තො බහුජාගරස්සාති - 'ඣානානුයුත්තො'ති ද්වීහි කාරණෙහි ඣානානුයුත්තො: අනුප්පන්නස්ස වා පඨමස්ස ඣානස්ස උප්පාදාය යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තො; අනුප්පන්නස්ස වා දුතියස්ස ඣානස්ස - තතියස්ස ඣානස්ස - චතුත්ථස්ස ඣානස්ස උප්පාදාය යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තොති එවම්පි ඣානානුයුත්තො. අථවා උප්පන්නං වා පඨමං ඣානං ආසෙවති භාවෙති බහුලීකරොති; උප්පන්නං වා දුතියං ඣානං - තතියං ඣානං - චතුත්ථං ඣානං ආසෙවති භාවෙති බහුලීකරොතීති එවම්පි ඣානානුයුත්තො. බහුජාගරස්සාති ඉධ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි 'චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙතීති -ඣානානුයුත්තො බහුජාගරස්ස.

උපෙක්ඛමාරබ්භ සමාහිතත්තොති - 'උපෙක්ඛා'ති යා චතුත්ථෙ ඣානෙ උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා චිත්තසමතා චිත්තප්පස්සද්ධතා මජ්ඣත්තතා චිත්තස්ස,

---

1. අනත්ථහෙතු - PTS. 2. කථං කථෙති - සිමු. II.

තවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල හඳනා දුන් බොජුන් වළඳා...බලඇණි දැකීම යනාදිය හෝ යි. මෙ බඳු වූ විසුළු දස්නෙහි යෙදීමෙන් වැළැකුණේ වේ. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වේ නුයි 'ඔක්ඛිත්තචක්ඛු' යනු වේ.

න ච පාදලොලො – යනු: කිසෙයින් 'පාදලොල' වේ ද යත්: මෙහි කිසි මහණෙක් පාදලොල වූයේ පාදලෞල්‍යයෙන් යුක්ත වූයේ වෙයි: අරමින් අරමට...රූපදර්ශනය පිණිස දීඝචාරිකාවෙහි නො නිමි චාරිකා-වෙහි යෙදුණේ වෙයි. මෙසේත් 'පාදලොල' වේ. නොහොත් මහණ තෙමේ ඇතුළු සඟරමෙහි ද පාදලොල වූයේ පාදලෞල්‍යයෙන් යුක්ත වූයේ වෙයි: ප්‍රයොජන නැති වැ, කාරණ නැති වැ, උඩඟු වූයේ නො සන්හුන් සිත් ඇතියේ පිරිවෙනින් පිරිවෙනට යෙයි, වෙහෙරින් වෙහෙරට...වෘද්ධි හානි පිළිබඳ කථා යැ යනාදිය හෝ යි. මෙසේත් 'පාදලොල' වූයේ වෙයි. න ච පාදලොලො යනු: පාදලෞල්‍යය හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරනේ යැ, අභාවයට පමුණුවන්නේ යැ, පාදලෞල්‍යයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ වත්නේ යැ, විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ යැ, විවෙකයෙහි ඇලුම් ඇතියේ විවෙකයෙහි නිරත වූයේ ස්වකීය චිත්තසමාධියෙහි යෙදුණේ බැහැර නො කළ ධ්‍යාන ඇතියේ (සප්තවිධ) අනුපස්සනායෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරගාවතාව වඩන්නේ වත්නේ යැ, ධ්‍යාන කරනසුලු වූයේ ධ්‍යානයෙහි ඇලුණේ එකීභාවයෙහි යෙදුණේ උත්තමාර්ථ (-හෝ සවාර්ථ) ගරුක වූයේ වත්නේ නුයි 'ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො' යනු වේ.

ඣානානුයුත්තො බහුජාගරස්ස – 'ඣානානුයුත්තො' යනු: දෙ කරු-ණෙකින් ධ්‍යානයෙහි යෙදුණේ වෙයි: නූපන් ප්‍රථමධ්‍යානයාගේ ඉපදීම පිණිස යෙදුණේ වෙසෙසින් යෙදුණේ හාත්පසින් යෙදුණේ මොනොවට යෙදුණේ වෙයි; නූපන් ද්විතීයධ්‍යානයාගේ-තෘතීයධ්‍යානයාගේ- චතුර්ථධ්‍යා-නයාගේ ඉපදීම පිණිස යුක්ත - ප්‍රයුක්ත - ආයුක්ත - සමායුක්ත වූයේ වේ නුයි මෙසේත් 'ඣානානුයුත්තො' යනු වේ. නොහොත් උපන් ප්‍රථමධ්‍යානය හෝ ඇසුරු කෙරෙයි වඩයි බහුල කෙරෙයි, උපන් ද්විතීයධ්‍යානය හෝ... තෘතීයධ්‍යානය හෝ ... චතුර්ථධ්‍යානය හෝ ආසෙවනය කෙරෙයි වඩයි බහුල කෙරේ නුයි මෙසේත් 'ඣානානුයුත්තො' යනු වේ. බහුජාගරස්ස යනු: මෙ සස්නෙහි මහණ තෙමේ දහවල සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්ම-යන්ගෙන් සිත පිරිසුදු කෙරෙයි, රෑ පෙරයම සක්මනින් හිඳීමෙන් නීවරණ-ධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි, රෑ මැදියම දකුණුපයෙහි වම්පය මඳක් ඇද තබා සිහි ඇතියේ නුවණැතියේ උත්ථානසංඥාව මෙනෙහි කොට දකුණැලයෙන් ශයන කෙරෙයි; රෑ අලුයම නැඟිසිට සක්මන් කිරීමෙන් හා හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් සිත පිරිසුදු කෙරේ නුයි 'ඣානානුයුත්තො බහුජාගරස්ස' යනු වේ.

උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො – 'උපෙක්ඛා' යනු: චතුර්ථධ්‍යානයෙහි යම් උපෙක්ෂාවක් උපෙක්ෂාකාරයෙක් අධික වූ උපෙක්ෂාකාරයෙක් චිත්තයාගේ සම බවෙක් චිත්තයාගේ සැහැල්ලු බවෙක් චිත්තයාගේ මධ්‍යස්ථ බවෙක් වේ ද එය යි.

සමාහිතත්තොති "යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි". උපෙක්ඛමාරබ්භ සමාහිතත්තොති චතුත්ථෙ ඣානෙ උපෙක්ඛං ආරබ්භ එකග්ගචිත්තො අවික්ඛිත්තචිත්තො අවිසාහටමානසොති උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො.

තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙති – 'තක්කා'ති "නව විතක්කා: කාමවිතක්කො බ්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො ඤාතිවිතක්කො ජනපදවිතක්කො අමරවිතක්කො පරානුද්දයතාපටිසඤ්ඤුත්තො විතක්කො ලාභසක්කාරසිලොකපටිසඤ්ඤුත්තො විතක්කො අනවඤ්ඤත්තිපටිසඤ්ඤුත්තො විතක්කො. ඉමෙ වුච්චන්ති නව විතක්කා." කාමවිතක්කානං කාමසඤ්ඤාසයො, බ්‍යාපාදවිතක්කානං බ්‍යාපාදසඤ්ඤාසයො, විහිංසාවිතක්කානං විහිංසාසඤ්ඤාසයො; අථවා තක්කානං විතක්කානං සඞ්කප්පානං අවිජ්ජාසයො, අයොනිසො මනසිකාරො ආසයො, අස්මිමානො ආසයො, අනොත්තප්පං ආසයො, උද්ධච්චං ආසයො. කුක්කුච්චන්ති හත්ථකුක්කුච්චම්පි කුක්කුච්චං පාදකුක්කුච්චම්පි කුක්කුච්චං, හත්ථපාදකුක්කුච්චම්පි කුක්කුච්චං, අකප්පියෙ කප්පියසඤ්ඤිතා කප්පියෙ අකප්පියසඤ්ඤිතා අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා, යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං."[2]

අපි ච ද්වීහි කාරණෙහි උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො? 'කතං මෙ කායදුච්චරිතං අකතං මෙ කායසුචරිත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'කතං මෙ වචීදුච්චරිතං – කතං මෙ මනොදුච්චරිතං – කතො මෙ පාණාතිපාතො, අකතා මෙ පාණාතිපාතා වෙරමණී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'කතං මෙ අදින්නාදානං – කතො මෙ කාමෙසු මිච්ඡාචාරො – කතො මෙ මුසාවාදො – කතා මෙ පිසුණා වාචා – කතා මෙ ඵරුසා වාචා – කතො මෙ සම්ඵප්පලාපො – කතා මෙ අභිජ්ඣා – කතො මෙ බ්‍යාපාදො – කතා මෙ මිච්ඡාදිට්ඨි – අකතා මෙ සම්මාදිට්ඨී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. එවං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො.

1. කථෙති - සීමු. II. මජ්ඣං. කථෙසි - PTS.
2. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.

**සමාහිතත්තා** යනු: චිත්තයාගේ යම් ස්ථිතියක් සංස්ථිතියක් අවස්ථිතියක් නො කැලැඹීමෙක් නො විසිරීමෙක් නො කැලැඹුණු සිත් ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද එය සි. **උපෙක්ඛමාරබ්භ සමාහිතත්තා** - චතුර්ථධ්‍යානයෙහි තත්‍රමධ්‍යස්ථෝපෙක්‍ෂාව නිසා එකඟ වූ සිත් ඇතියේ නො විසුරුණු සිත් ඇතියේ නො කැලැඹුණු සිත් ඇතියේ තුයි 'උපෙක්ඛමාරබ්භ සමාහිතත්තා' යනු වේ.

**තක්කාසයං කුක්කුච්චඤ්චූපච්ඡින්දෙ** - 'තක්ක' නම්: නව විතර්කයෝ යැ: කාමවිතර්ක යැ ව්‍යාපාදවිතර්ක යැ විහිංසාවිතර්ක යැ ඥාතිවිතර්ක යැ ජනපදවිතර්ක යැ අමරවිතර්ක යැ පරානුද්දයතාප්‍රතිරූප වූ ගෘහනිඃශ්‍රිතප්‍රේමයෙන් ප්‍රතිසංයුක්ත විතර්ක යැ ලාභසත්කාරකීර්තිප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ අනවඥතාප්‍රතිසංයුක්ත විතර්ක යැ යන මොහු නව විතර්කයෝ යයි කියනු ලැබෙත්. කාමවිතර්කයන්ට කාමසංඥාව ආශය (-වාසස්ථාන) වෙයි. ව්‍යාපාදවිතර්කයන්ට ව්‍යාපාදසංඥාව ආශය යැ, විහිංසාවිතර්කයන්ට විහිංසාසංඥාව ආශය යැ, නොහොත් තර්කයන්ට විතර්කයන්ට සංකල්පයන්ට අවිද්‍යාව ආශය යැ, අයොනිසොමනසිකාරය ආශය යැ, අස්මිමානය ආශය යැ, අනපත්‍රපාව ආශය යැ, ඖද්ධත්‍යය ආශය - වාසස්ථාන සි. **කුක්කුච්චං** යනු: අත්කුකුස ද කුකුසැ, පාකුකුස ද කුකුසැ, අත්පාකුකුස ද කුකුසැ, අකල්‍ප්‍යයෙහි කල්‍ප්‍යසංඥ ඇති බව යැ, කල්‍ප්‍යයෙහි අකල්‍ප්‍යසංඥ ඇති බව යැ, අවද්‍යයෙහි වද්‍යසංඥ ඇති බව යැ, වද්‍යයෙහි අවද්‍යසංඥ ඇති බව යැ යන මෙබඳු වූ යම් කුකුසෙක් කුකුස්අයුරෙක් කුකුස් කරන බවෙක් සිතෙහි විපිළිසරයෙක් මනොවිලෙඛයෙක් වේ ද, මේ 'කුක්කුච්ච' යයි කියනු ලැබේ.

තවද දෙ කරුණෙකින් කෞකෘත්‍ය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. කළ බැවින් හා නො කළ බැවිනි. කෙසේයින් කළ බැවින් හා නො කළ බැවින් කුකුස සිතෙහි විපිළිසර මනොවිලෙඛය උපදී ද යත්: "මා විසින් කායදුශ්චරිතය කරන ලද, මා විසින් කායසුචරිතය නො කරන ලදැ'යි කුකුස සිතෙහි විපිළිසර මනොවිලෙඛය උපදී, මා විසින් වාග්දුශ්චරිතය කරන ලද - මා විසින් මනොදුශ්චරිතය කරන ලද - මා විසින් ප්‍රාණවධ කරන ලද, මා විසින් ප්‍රාණඝාතවිරමණය නො කරන ලදැ"යි කුකුස චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. "මා විසින් අදත්තාදානය කරන ලද - මා විසින් කාමමිථ්‍යාචාරය කරන ලද - මා විසින් මුසවා කියන ලද - මා විසින් පිසුනුබස් කියන ලද - මා විසින් පරුෂවාක් කියන ලද - මා විසින් ප්‍රලාප කියන ලද - මා විසින් අභිධ්‍යාව කරන ලද - මා විසින් ව්‍යාපාදය කරන ලද - මා විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නා ලද, - සම්‍යග්දෘෂ්ටි නො ගන්නා ලදැ"යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. මෙසේ කළ බැවින් ද නො කළ බැවින් ද කුකුස සිතෙහි විපිළිසර මනොවිලෙඛය උපදී.

අථවා සීලෙසුම්හි න පරිපූරකාරීති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති – භොජනෙ අමත්තඤ්ඤුම්හීති – ජාගරියං අනනුයුත්තොම්හීති – න සතිසම්පජඤ්ඤෙන සමන්නාගතොම්හීති – අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති – අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති – අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති – අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති – අභාවිතානි මෙ පඤ්ච බලානීති – අභාවිතා මෙ සත්තබොජ්ඣඞ්ගාති – අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති – දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති – දුක්ඛසමුදයො මෙ අප්පහීනොති – මග්ගො මෙ අභාවිතොති – නිරොධො මෙ අසච්ඡිකතොති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙති තක්කං ච තක්කාසයඤ්ච කුක්කුච්චඤ්චුපච්ඡින්දෙය්‍ය ඡින්දෙය්‍ය උච්ඡින්දෙය්‍ය සමුච්ඡින්දෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ.

තෙනාහ භගවා:

"ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො
ඣානානුයුත්තො බහුජාගරස්ස,
උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො
තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ"ති.

16 – 19

චුදිතො වචීභි සතිමාභිනන්දෙ
සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ,
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
ජනවාදධම්මාය න චෙතයෙය්‍ය.

**චුදිතො වචීභි සතිමාභිනන්දෙති** – 'චුදිතො'ති උපජ්ඣායා වා ආචරියා වා සමානුපජ්ඣායකා වා සමානාචරියකා වා මිත්තා වා සන්දිට්ඨා වා සම්භත්තා වා සහායා වා චොදෙන්ති "ඉදං තෙ ආවුසො අයුත්තං, ඉදං තෙ අප්පත්තං, ඉදං තෙ අසාරුප්පං, ඉදං තෙ අසීලට්ඨ[1]න්ති" සතිං උපට්ඨාපෙත්වා තං චොදනං නන්දෙය්‍ය අභිනන්දෙය්‍ය මොදෙය්‍ය අනුමොදෙය්‍ය ඉච්ඡෙය්‍ය සාදියෙය්‍ය පත්ථයෙය්‍ය පිහයෙය්‍ය අභිජප්පෙය්‍ය. යථා ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසං න්හාතො උප්පලමාලං වා වස්සිකමාලං වා අතිමුත්තකමාලං වා ලභිත්වා උභොහි හත්ථෙහි පටිග්ගහෙත්වා උත්තමඞ්ගෙ සිරස්මිං පතිට්ඨාපෙත්වා නන්දෙය්‍ය අභිනන්දෙය්‍ය මොදෙය්‍ය අනුමොදෙය්‍ය ඉච්ඡෙය්‍ය සාදියෙය්‍ය පත්ථයෙය්‍ය පිහයෙය්‍ය අභිජප්පෙය්‍ය, එවමෙවං සතිං උපට්ඨාපෙත්වා තං චොදනං නන්දෙය්‍ය අභිනන්දෙය්‍ය මොදෙය්‍ය අනුමොදෙය්‍ය ඉච්ඡෙය්‍ය සාදියෙය්‍ය පත්ථයෙය්‍ය පිහයෙය්‍ය අභිජප්පෙය්‍ය.

1. අසීලිට්ඨං - සු. PTS.

නොහොත් 'ශීලයෙහි පරිපූරකාරී නො වූයෙමි' කුකුස චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. ඉන්ද්‍රියයන්හි අපිහිතද්වාර වූයෙමි - භොජනයෙහි අමාත්‍රඥ වූයෙමි - ජාගරියාවෙහි නො යෙදුණෙමි - සමාධිසම්ප්‍රජන්‍යයෙන් සමන්විත නො වූයෙමි - මා විසින් සතර සතිපට්ඨානයෝ නො වඩනා ලදහ'යි - සතර සම්‍යක්ප්‍රධානයෝ නො වඩනා ලදහ'යි - සතර ඍද්ධිපාදයෝ නො වඩනා ලදහ'යි - පඤ්චෙන්ද්‍රියයෝ නො වඩනා ලදහ'යි - පඤ්ච බලයෝ නො වඩනා ලදහ'යි - සප්ත බොධ්‍යඞ්ගයෝ නො වඩනා ලදහ'යි - මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නො වඩනා ලද්ද'යි - මා විසින් දුඃඛසත්‍යය අපරිඥත යැ'යි - මා විසින් දුඃඛසමුදය අප්‍රහීණ යැ'යි - මා විසින් මාර්ගය නො වඩනා ලද්ද'යි - මා විසින් නිරොධය ප්‍රත්‍යක්ෂ නො කරන ලද්ද'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. තක්කාසයං කුක්කුච්චියූපච්ඡින්දෙ- විතර්කය ද විතර්කයන්ගේ ආශය ද කෞකෘත්‍යය ද පසිඳිනේ යැ සිඳිනේ යැ වෙසෙසින් සිඳිනේ යැ මොනොවට සිඳින්නේ යැ දුරු කරන්නේ යැ බැහැර කරන්නේ යැ විනාශාන්ත කරන්නේ යැ අනුඅභාවයට පමුණුවන්නේ නුයි 'තක්කාසයං කුක්කුච්චියූපච්ඡින්දෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

''ඔක්ඛිත්තචක්ඛු -පෙ- තක්කාසයං කුක්කුච්චියූපච්ඡින්දෙ''යි.

**16 – 19**

උපාධ්‍යායාදීන් විසින් වචනයෙන් චොදනා කරන ලදුයේ ස්මෘතිමත් වැ සතුටු වන්නේ යැ. සබ්‍රම්සරුන් කෙරෙහි ගැටුණු සිත් ඇති බව බිඳපියන්නේ යැ. නුවණින් උපදවන ලද තෙපුල් බණන්නේ යැ. කාලවේලා ශීලවේලා ඉක්මැ නො බණන්නේ යැ. ජනයාගේ උපවාදකථාවෙහි සිතිවිලි නුපදවන්නේ යි.

චුදිතො වචීහි සතිමාභිනන්දෙ - 'චුදිතො' යනු: උපාධ්‍යායයෝ හෝ ආචාර්‍ය්‍යයෝ හෝ සමානොපාධ්‍යායයෝ හෝ සමානාචාර්‍ය්‍යයෝ හෝ මිත්‍රයෝ හෝ සංදෘෂ්ටයෝ හෝ සම්භක්තයෝ හෝ සහායයෝ හෝ 'ඇවැත්නි, මෙ තට අයුතු යැ, මෙ තට නො පැමිණියේ යැ, මේ තට නො සරුප් යැ, තාගේ මෙය ශීලයෙහි නො සිටියේ වතැ'යි චොදනා කෙරෙත් නම්, සිහි එළවා ඒ චොදනාවට සතුටු වන්නේ යැ, වෙසෙසින් සතුටු වන්නේ යැ, හවුවන්නේ යැ පහවුවන්නේ යැ කැමැති වන්නේ යැ ඉවසන්නේ යැ පතන්නේ යැ රුචි කරන්නේ යැ අභිජල්පනය කරන්නේ යැ. යම්සේ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තරුණ වූයේ සැරැසෙන පියවි ඇතියේ සනානය කොට සිටියේ උපුල්මාලයක් හෝ දෑසමන්මාලයක් හෝ යොහොඹුමාලයක් හෝ ලැබ දෑතින් පිළිගෙන උතුමඟ හිසෙහි පිහිටුවා තුටුවන්නේ ද සතුටුවන්නේ ද හවුවන්නේ ද පහවුවන්නේ ද රිසිවන්නේ ද ඉවසන්නේ ද පතන්නේ ද කැමැතිවන්නේ ද අභිජල්පනය කරන්නේ ද එපරිද්දෙන් ම සිහි එළවා ඒ චොදනාවට තුටුවන්නේ ය සතුටුවන්නේ ය හවුවන්නේ ය පහවුවන්නේ ය රිසිවන්නේ ය ඉවසන්නේය පතන්නේ ය කැමැතිවන්නේ ය අභිජල්පනය කරන්නේ යැ.

1. "නිධීනංව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං,
නිග්ගය්හ වාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ.
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො"ති[a].

2. "ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ,
සතඤ්හි සො පියො හොති අසතං හොති අප්පියො"ති[a].

චුදිතො වචීහි සතිමාභිනන්දෙ.

සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙති – 'සබ්‍රහ්මචාරී'ති එකකම්මා එකුද්දෙසා සමසික්ඛා. සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙති සබ්‍රහ්මචාරීසු ආහතචිත්තතං ඛිලජාතතං පභින්දෙය්‍ය; පඤ්චපි චෙතොඛිලෙ පභින්දෙය්‍ය; තයොපි චෙතොඛිලෙ පභින්දෙය්‍ය; රාගඛිලං දොසඛිලං මොහඛිලං භින්දෙය්‍ය පභින්දෙය්‍ය සම්භින්දෙය්‍යාති – සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ.

වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලන්ති – ඤාණසමුට්ඨිතං වාචං මුඤ්චෙය්‍ය. අත්ථූපසංහිතං ධම්මූපසංහිතං කාලෙන සාපදෙසං පරියන්තවතිං වාචං මුඤ්චෙය්‍ය පමුඤ්චෙය්‍යාති – වාචං පමුඤ්චෙ කුසලං; නාතිවෙලන්ති 'වෙලා'ති ද්වෙ වෙලා: කාලවෙලා ච සීලවෙලා ච. කතමා කාලවෙලා? කාලාතික්කන්තං වාචං න භාසෙය්‍ය, වෙලාතික්කන්තං වාචං න භාසෙය්‍ය, කාලවෙලාතික්කන්තං වාචං න භාසෙය්‍ය, කාලං අසම්පත්තං වාචං න භාසෙය්‍ය, වෙලං අසම්පත්තං වාචං න භාසෙය්‍ය, කාලවෙලං අසම්පත්තං වාචං න භාසෙය්‍ය.

3. "යො වෙ කාලෙ අසම්පත්තෙ අතිවෙලං පභාසති,
එවං සො නිහතො සෙති කොකිලායෙව අත්‍රජො"ති[b]

අයං කාලවෙලා.

කතමා සීලවෙලා? රත්තො වාචං න භාසෙය්‍ය, දුට්ඨො වාචං න භාසෙය්‍ය, මූළ්හො වාචං න භාසෙය්‍ය, මුසාවාදං න භාසෙය්‍ය, පිසුණං වාචං න භාසෙය්‍ය, ඵරුසං වාචං න භාසෙය්‍ය, සම්ඵප්පලාපං න භාසෙය්‍ය න කථෙය්‍ය න භණෙය්‍ය න දීපයෙය්‍ය න වොහරෙය්‍ය. අයං සීලවෙලාති – වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං.

---

a. ධම්මපද - පණ්ඩිතවග්ග. b කොකාලිය ජාතක.

1. "වරද දක්නාසුලු වූ නිග්‍රහ කොට බණින්නා වූ ප්‍රාඥ වූ යම් කල්‍යාණ මිත්‍රයකු නිදන්සැල තුබු තැන් දක්වන්නකුහු වැනි කොට දක්නේ වේ ද, එබඳු ප්‍රාඥයා සෙවුණේ යැ. එබඳු නුවණැත්තහු සෙවුණාහට ශ්‍රෙයස් (-වැඩෙක්) ම වන්නේ ය. අවැඩෙක් නො වන්නේ" යි.

2. "(කල්‍යාණමිත්‍ර වූ යමෙක් අතැවැසි ආදි කිසිවක් හට) අවවාද කරන්නේ ද, අනුශාසනා කරන්නේ ද, අකුශලයෙන් වළහන්නේ ද, ඒ එබඳු පුද්ගල තෙමේ බුද්ධාදි සත්පුරුෂයන්ට මැ ප්‍රිය වෙයි. අසත්පුරුෂයන්ට අප්‍රිය වේ."

එයින් 'චුදිතො වචීහි සතිමාභිනන්දෙ' යනු වේ.

**සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ** – 'සබ්‍රහ්මචාරී' යනු: එකකම් එකොද්දෙශ්‍ය සමානශික්ෂා ඇත්තාහු යැ. **සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ** – සබ්‍රම්සරුන් කෙරෙහි ගැටුණු සිත් ඇති බව, හටගත් හුල් ඇති බව (-තද බව) බිඳපියන්නේ ය, පස්වූ චෙතොඛිලයන් ද සිඳින්නේ ය, ත්‍රිවිධ චෙතොඛිලයන් ද සිඳින්නේ ය, රාගඛිලය ද්වෙෂඛිලය මොහඛිලය බිඳින්නේය, වෙසෙසින් බිඳින්නේ ය, මොනොවට බිඳින්නේ නුයි 'සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ' යනු වේ.

**වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං** – ඥානසම්ප්‍රයුක්ත සිතින් උපදවන ලද වචනය නිකුත් කරන්නේ ය, අර්ථයෙන් යුක්ත වූ ධර්මයෙන් යුක්ත වූ කරුණු සහිත වූ පර්‍යන්තවත් වූ වචනය සුදුසු කාලයෙහි නිකුත් කරන්නේ ය, වෙසෙසින් නිකුත් කරන්නේ නුයි 'වාචං පමුඤ්චෙ කුසලං' යනු වේ. **නාතිවෙලං** යනු: කාලවෙලාව ද සීලවෙලාව දැයි 'වෙලා' දෙකෙකි. කාලවෙලා කවරැ යත්: කල් ඉක්මැගිය වචනය නො කියන්නේ යැ, හිම් ඉක්මැගිය වචනය නො කියන්නේ යැ, කල්හිම් ඉක්මැගිය වචනය නො කියන්නේ යැ, කල් නො පැමිණි වචනය නො කියන්නේ යැ, හිම් නො පැමිණි වචනය නො කියන්නේ යැ, කල්හිම් නො පත් වචනය නො කියන්නේ ය.

3. "යමෙක් නියමයෙන් තමහට බණන කාලය නො පැමිණි කල්හි හිම් ඉක්මවා බෙහෙවින් බෙණේ ද, මෙසේ හෙතෙම (කැවිඩියගේ කැදැල්ලෙහි වැඩුණු) කෙවිලියගේ පැටියා සෙයින් නසන ලදුයේ හෝනේ" යි. මේ තෙමේ කාලවෙලා යැ.

සීලවෙලා කවරැ යත්: රාගයෙන් රත් වූයේ තෙපුල් නො බණන්නේ යැ, ද්වෙෂයෙන් දුෂ්ට වූයේ වචන නො බණන්නේ යැ, මොහයෙන් මූඪ වූයේ වචන නො බණන්නේ යැ, මුසවා නො බණන්නේ යැ, පිසුනු බස් නො බණන්නේ යැ, රළුබස් නො බණන්නේ යැ, ප්‍රලාප නො බණන්නේ යැ, නො කියන්නේ යැ නො පවසන්නේ යැ නො දක්වන්නේ යැ ව්‍යවහාර නො කරන්නේ යි. මේ තෙමේ සීලවෙලා වූ යැයි 'වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං' යනු වේ.

**ජනවාදධම්මාය න චෙතයෙය්‍යාති** - 'ජනා'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච; ජනස්ස වාදාය උපවාදාය නින්දාය ගරහාය අකිත්තියා අවණ්ණහාරිකාය සීලවිපත්තියා වා ආචාරවිපත්තියා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා න චෙතයෙය්‍ය චෙතනං න උප්පාදෙය්‍ය චිත්තං[1] න උප්පාදෙය්‍ය සඞ්කප්පං න උප්පාදෙය්‍ය මනසිකාරං න උප්පාදෙය්‍යාති - ජනවාදධම්මාය න චෙතයෙය්‍ය.

තෙනාහ භගවා:

"චුදිතො වචීහි සතිමාභිනන්දෙ
සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ,
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
ජනවාදධම්මාය න චෙතයෙය්‍යා"ති.

## 16 - 20

අථාපරං පඤ්ච රජානි ලොකෙ
යෙසං සතීමා විනයාය සික්ඛෙ,
රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං.

**අථාපරං පඤ්ච රජානි ලොකෙති** - 'අථා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං අථාති. **පඤ්ච රජානී'ති** රූපරජො[2] සද්දරජො[2] ගන්ධරජො රසරජො ඵොට්ඨබ්බරජො.

1. රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා[3] පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

2. දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා පණ්ඩිතා
විහරන්ති තෙ විගත රජස්ස සාසනෙ.

3. මොහො රජො න ච පන රෙණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ"ති[a].

**ලොකෙති** - අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙති - අථාපරං පඤ්ච රජානි ලොකෙ.

---

1. චිත්තසඞ්කප්පං න උප්පාදෙය්‍ය - සෑ. PTS    2 රජො - සෑ. PTS.
3. විප්පජහිත්වා - සිමු. II.    a. චූලපදුමජාතක

**ජනවාදධම්මාය න චෙතයෙය්‍ය**-'ජන' නම්: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශුද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවයෝ ද මනුෂ්‍යයෝ ද වෙත්. ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීවවිපත්තියෙන් හෝ ජනයාගේ වචනයට උපවාදයට නින්දාවට ගර්හාවට අකීර්තියට නුගුණ එළැවීමට නො සිතන්නේ යැ. සිතිවිලි නූපදවන්නේ යැ. සිත් නූපදවන්නේ යැ කල්පනා නූපදවන්නේ යැ මෙනෙහි කිරීම නූපදවන්නේ නුයි 'ජනවාදධම්මාය න චෙතයෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"චුදිතො වචීභි -පෙ- ජනවාදධම්මාය න චෙතයෙය්‍ය"යි**

## 16 - 20

නැවත මෙයින් අනෙකක් ද කියමි: සමෘතිමත් වූයේ රූපරාගාදි යම් කෙනකුන්ගේ ප්‍රහාණවිනය පිණිස හික්මෙන්නේ නම්, ලොවැ එබඳු වූ පඤ්ච රජස් කෙනෙක් වෙති. රූපාලම්බනයෙහි ද ශබ්දාලම්බනයෙහි ද යළි රසාලම්බනයෙහි ද ගන්ධාලම්බනයෙහි ද ස්පර්ශාලම්බනයෙහි ද ඡන්දරාගය මඩනේ යි.

**අථාපරං පඤ්ච රජානි ලොකෙ** - 'අථ' යනු: පදසන්ධි යැ පදසංසර්ගී යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්විතා යි. තෙල 'අථ' යනු. **පඤ්ච රජානි** යනු: රූපාලම්බනය නිසා උපන් රාගාදි රජස් යැ ශබ්දරජස් යැ ගන්ධරජස් යැ රසරජස් යැ ස්ප්‍රෂ්ටව්‍යරජයි.

1. රාගය රජස් යැ. රේණු වැලිත් රජස් යි නො ද කියනු ලැබෙයි. තෙල 'රජස්' යනු රාගයට නමෙකි. ඒ පණ්ඩිත වූ භික්ෂූහු තෙල රාග නමැති රජස් වෙසෙසින් දුරු කොට විගත වූ රාගරජස් ඇති බුදුන්ගේ ශාසනයෙහි වාසය කෙරෙත්.

2. ද්වේෂය රජස් යැ...

3. මෝහය රජසෙකි. රේණු වැලිත් රජස් යයි නො ද කියනු ලැබෙයි. තෙල 'රජස්' යනු මෝහයට නමෙකි. ඒ පණ්ඩිත වූ භික්ෂූහු තෙල මෝහ නමැති රජස වෙසෙසින් දුරු කොට විගත වූ මෝහරජස් ඇති බුදුන්ගේ ශාසනයෙහි වාසය කෙරෙත්.

**ලොකෙ** - යනු: අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි සකන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි නුයි 'අථාපරං පඤ්ච රජානි ලොකෙ' යනු වේ.

**යෙසං සතිමා විනයාය සික්ඛෙති** – ‘යෙස’න්ති රූපරාගස්ස සද්දරාගස්ස ගන්ධරාගස්ස රසරාගස්ස ඵොට්ඨබ්බරාගස්ස; **සතිමා**ති “යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො; අයං වුච්චති සති.[1] ඉමාය සතියා උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සම්පන්නො සමන්නාගතො, සො වුච්චති සතිමා. **සික්ඛෙති** තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. කතමා අධිසීලසික්ඛා –පෙ– අයං අධිපඤ්ඤාසික්ඛා. **යෙසං සතිමා විනයාය සික්ඛෙති** – සතිමා පුග්ගලො යෙසං රූපරාගස්ස සද්දරාගස්ස ගන්ධරාගස්ස රසරාගස්ස ඵොට්ඨබ්බරාගස්ස විනයාය පටිවිනයාය පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිපස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, –පෙ– සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති – යෙසං සතිමා විනයාය සික්ඛෙ.

**රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාග**න්ති – රූපෙසු සද්දෙසු ගන්ධෙසු රසෙසු ඵොට්ඨබ්බෙසු රාගං සහෙය්‍ය පරිසහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍යාති – රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං.

තෙනාහ භගවා:

“අථාපරං පඤ්ච රජානි ලොකෙ
යෙසං සතිමා විනයාය සික්ඛෙ,
රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාග”න්ති.

## 16 – 21

එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහනෙ තමං සො (ඉති භගවා).

**එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්ද**න්ති – ‘එතෙසු’ති රූපෙසු සද්දෙසු ගන්ධෙසු රසෙසු ඵොට්ඨබ්බෙසු; **ඡන්දො**ති “යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං –පෙ– කාමච්ඡන්දනීවරණං.[2]” **එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්ද**න්ති එතෙසු ධම්මෙසු ඡන්දං විනෙය්‍ය පටිවිනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති – එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං.

---

1. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ

**යෙසං සතිමා විනයාය සික්ඛෙ** -'යෙසං' යනු: රූපරාගයාගේ ශබ්දරාගයාගේ ගන්ධරාගයාගේ රසරාගයාගේ ස්ප්‍රෂ්ටව්‍යරාගයාගේ; **සතිමා**: යම් ස්මෘතියක් අනුස්මෘතියක් ප්‍රතිස්මෘතියක් සිහියක් සිහි කරන බවෙක් දරන බවෙක් සිහි කරවනබවෙක් නො මුළා වන බවෙක් ස්මෘතියක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද මේ තෙමේ 'සති' යයි කියනු ලබයි. මේ සතියෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ උපගත වූයේ සමුපගත වූයේ සිද්ධියට පැමිණියේ සමෘද්ධ වූයේ සමන්වාගත වූයේ හෙතෙම 'සතිමා' යයි කියනු ලැබේ. **සික්ඛෙ** යනු: ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥා ශික්ෂා යැයි. අධිශීලශික්ෂා කවර...මේ අධිප්‍රඥාශික්ෂා යි. **යෙසං සතිමා විනයාය සික්ඛෙ** ස්මෘතිමත් පුද්ගල තෙමේ යම් රාග කෙනකුන්ගේ රූපරාගයාගේ ශබ්දරාගයාගේ ගන්ධරාගයාගේ රසරාගයාගේ ස්ප්‍රෂ්ටව්‍යරාගයාගේ විනය පිණිස දුරලීම පිණිස ප්‍රහාණය පිණිස සන්සිඳුවීම පිණිස බැහැරලීම පිණිස විගතභාවය පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේ යැ අධිචිත්තයෙහි ද හික්මෙන්නේ යැ අධිප්‍රඥාවෙහි ද හික්මෙන්නේ යැ. මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවජීත කෙරෙමින් හික්මෙන්නේ යැ, දැනගනිමින් හික්මෙන්නේ යැ...ප්‍රත්‍යක්ෂ කළයුතු නිවන ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙන්නේ යැ, හැසිරෙන්නේ යැ මොනොවට හැසිරෙන්නේ යැ සමාදන් වැ පවත්නේ නුයි 'යෙසං සතිමා විනයාය සික්ඛෙ' යනු වේ.

**රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං**- රූපයන්හි ශබ්දයන්හි ගන්ධයන්හි රසයන්හි ස්ප්‍රෂ්ටව්‍යයන්හි රාගය මඩනේ යැ හාත්පසින් මඩනේ යැ අභිභවනය කරන්නේ යැ වතුරුවන්නේ යැ හාත්පසින් ගන්නේ යැ මර්දනය කරන්නේ නුයි 'රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"අථාපරං පඤ්ච රජානි ලොකෙ -පෙ- ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං"යි**

## 16 - 21

එළැඹ සිටි සිහි ඇති කෙලෙසුන් කෙරෙන් මොනොවට මිදුණු සිත් ඇති මහණ තෙමේ තෙල රූපාදි ධර්මයන් කෙරෙහි කාමච්ඡන්දය දුරු කරන්නේ යැ. හෙතෙම සුදුසු කාලයෙහි සියලු සංස්කාරධර්මය මනා කොට අනිත්‍යාදිවශයෙන් විමසනුයේ එකඟ වූ සිත් ඇතියේ සියලු මොහාදි අන්ධකාරය නසන්නේ යි. (බුදුහු මෙසේ වදාළ සේකි.)

**එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං** –'එතෙසු' යනු: රූපයන්හි ශබ්ද-ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන්හි; **ඡන්ද** නම්: කාමවස්තූන් විෂයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණාවෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡායෙක් කාමාධ්‍යවසානයෙක් කාමෞඝයෙක් කාමයොගයෙක් කාමූපාදානයෙක්... කාමච්ඡන්දනීවරණයෙක් වේ ද එය යි. **එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං** – තෙල රූපාදි ධර්මයන්හි කාමච්ඡන්දය දුරු කරන්නේ යැ වෙසෙසින් දුරු කරන්නේ යැ හැරපියන්නේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ නුයි 'එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං' යනු වේ.

**භික්ඛු සතිමා සුවිමුත්තචිත්තොති** – 'භික්ඛූ'ති පුථුජ්ජනකල්‍යාණකො වා භික්ඛු සෙඛො වා භික්ඛු; සතිමාති "යා සති අනුස්සති -පෙ- සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො," අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො සමුපෙතො -පෙ- සො වුච්චති සතිමා; **භික්ඛු සතිමා සුවිමුත්තචිත්තොති** පඨමං ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. තතියං ඣානං සමාපන්නස්ස පීතියා ච චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. චතුත්ථං ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං -පෙ- ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. සකදාගාමිස්ස ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. අනාගාමිස්ස අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි බහිද්ධා ච සබ්බනිමිත්තෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තන්ති – භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො.

**කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානොති** – 'කාලෙනා'ති උද්ධතෙ චිත්තෙ සමථස්ස කාලො. සමාහිතෙ චිත්තෙ විපස්සනාය කාලො.

1. කාලෙ පග්ගණ්හති චිත්තං නිග්ගණ්හාති පුනාපරෙ,[1]
සම්පහංසති කාලෙන කාලෙ චිත්තං සමාදහෙ,[2]
අජ්ඣුපෙක්ඛති කාලෙන සො යොගී කාලකොවිදො.

2. කිම්හි කාලම්හි පග්ගාහෙ කිම්හි කාලෙ විනිග්ගහෙ,
කිම්හි පහංසනා කාලෙ සමථකාලො ච කීදිසො,
උපෙක්ඛාකාලං චිත්තස්ස කථං දස්සෙති යොගිනො?

1. අථාපරෙ - PTS. 2. සමාදහති - PTS.

**භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො**-'භික්ඛු' යනු: පෘථග්ජනකල්‍යාණ භික්ෂු හෝ ශෛක්ෂ භික්ෂු හෝ යැ. **සතිමා** යනු: යම් ස්මෘතියක් අනුස්මෘතියක්... සම්‍යක්ස්මෘතියක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් ඒකායනමාර්ගයෙක් වේ ද, මෝ 'සති' යයි කියනු ලබයි. මේ සතියෙන් උපෙත වූයේ සමුපෙත වූයේ... හෙතෙම 'සතිමා' යයි කියනු ලැබේ. **භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො** - ප්‍රථම-ධ්‍යානයට සමාපන්නයාගේ සිත නීවරණයන් ගෙන් මිදුණේ යැ, වෙසෙසින් මිදුණේ යැ, මොනොවට මිදුණේ යැ; දෙවැනි ධ්‍යානට සමවත්හුගේ සිත විතර්කවිචාරයන්ගෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි; තුන්වැනි ධ්‍යානට සමවත්හුගේ සිත ප්‍රීතියෙන් ද මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි; චතුර්ථ ධ්‍යානයට සමවත්හුගේ සිත සුඛදුඃඛයන්ගෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි. ආකාසානඤ්චායතන සමාපත්තියට සමවත්හුගේ සිත රූප-සංඥාවෙන් ද ප්‍රතිඝසංඥාවෙන් ද නානාත්වසංඥාවෙන් ද මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි. විඤ්ඤාණඤ්චායතනයට සමවත්හුගේ සිත ආකාසානඤ්චායතන සංඥාවෙන්...ආකිඤ්චඤ්ඤායතනයට සමවත්හුගේ සිත විඤ්ඤාණඤ්චායතන සංඥාවෙන්...නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්හුගේ සිත ආකිඤ්චඤ්ඤායතනසංඥාවෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි. ස්‍රොතාපන්නයාගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සාවෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයෙන් විචිකිත්සානුශයෙන් හා තදෙකස්ථකෙලශයන්ගෙන් ද මුක්ත විමුක්ත සුවිමුක්ත වෙයි. සකෘදාගාමීහුගේ සිත ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් හා තදෙකස්ථකෙලශයන්ගෙන් ද මුක්ත විමුක්ත සුවිමුක්ත වෙයි. අනාගාමීහුගේ සිත අණුසහගත වූ කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් අණුසහගත වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් හා තදෙකස්ථ වූ කෙලශයන්ගෙන් ද මුක්ත විමුක්ත සුවිමුක්ත වෙයි. රහත්හුගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යාවෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් හා තදෙකස්ථ වූ කෙලශයන්ගෙන් ද බාහ්‍ය වූ සියලු කෙලශනිමිත්තයන්ගෙන් ද මුක්ත වූයේ විමුක්ත වූයේ සුවිමුක්ත වූයේ වේ නුයි 'භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො' යනු වේ.

**කාලෙන සො ධම්මං පරිවීමංසමානො** - 'කාලෙන' යනු: සිත උද්ධත වූ කල්හි සමාධියට කාල යැ. සිත සමාහිත වූ කල්හි විදර්ශනාවට කාලය යි.

1. අතිශිථිලවීර්‍ය්‍යතාදියෙන් ලීන සිත ඇති කල්හි ධර්මවිචය වීර්‍ය්‍ය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග ඉපදවීමෙන් සිතට අනුග්‍රහ කෙරෙයි. යළි අත්‍යාරබ්ධ-වීර්‍ය්‍යතාදියෙන් උද්ධත සිත ඇති කල්හි ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂාසම්බො-ධ්‍යඞ්ගයන් ඉපදවීමෙන් සිතට නිග්‍රහ කෙරෙයි. සිත නිරාස්වාද වූ කල්හි අෂ්ට සංවෙගවස්තු ප්‍රත්‍යවෙක්ෂාවෙන් සංවෙග කෙරෙයි. ශ්‍රද්ධාප්‍රඥාවන් හා සමාධිවීර්‍ය්‍යයන් සම ව ඇති කල්හි සිත අර්පණාවට පමුණුවන්නේ ය. සිත සමාධිවීථියට පිළිපන් කල්හි මධ්‍යස්ථ වෙයි. මෙබඳු වූ ඒ යෝගී තෙමේ කාලඥ වූයේ වේ.

2. කවර කලෙක චිත්තයාගේ ප්‍රග්‍රහය වේ ද, කවර කලෙක නිග්‍රහය වේ ද, කවර කලෙක ප්‍රහර්ෂණය වේ ද, යළි ශමථකාලය කෙබඳු වූයේ ද, යෝගීහුගේ සිත පිළිබඳ උපෙක්ෂාකාලය කෙසේ දක්වා ද යත්:

3. ලීනෙ චිත්තම්හි පග්ගාහො උද්ධතස්මිං හි නිග්ගහො,
නිරස්සාදගතං චිත්තං සම්පහංසෙය්‍ය තාවදෙ.

4. සම්පහට්ඨං යදා චිත්තං අලීනං භවතනුද්ධතං,
සමථනිමිත්තස්ස සො[1] කාලො අජ්ඣත්තං රමයෙ මනො.

5. එතෙන මෙවුපායෙන[2] යදා හොති සමාහිතං,
සමාහිතං චිත්තමඤ්ඤාය අජ්ඣුපෙක්ඛෙය්‍ය තාවදෙ.

6. එවං කාලවිදූ ධීරො කාලඤ්ඤූ කාලකොවිදො,
කාලෙන කාලං චිත්තස්ස නිමිත්තමුපලක්ඛයෙ"ති.

කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානොති - 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති සම්මා ධම්මං පරිවීමංසමානො, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති සම්මා ධම්මං පරිවීමංසමානො, සබ්බෙ ධම්මා අනත්තාති සම්මා ධම්මං පරිවීමංසමානො -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති සම්මා ධම්මං පරිවීමංසමානොති - කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො.

එකොදිභූතො විහනෙ තමං සොති භගවාති - 'එකොදී'ති එකග්ගචිත්තො අවික්ඛිත්තචිත්තො අවිසාහටමානසො සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධීති එකොදිභූතො. විහනෙ තමං සොති රාගතමං දොසතමං මොහතමං දිට්ඨිතමං මානතමං කිලෙසතමං දුච්චරිතතමං අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං හනෙය්‍ය විහනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය.

---

1. සමථස්සෙව - සො. PTS.
2. එතෙනෙව උපායෙන - සීමු. II. එතෙන මෙවුපායෙන - PTS.

3. අතිශිථිල වීර්‍ය්‍යාදියෙන් සිත ලීන වූ (-හැකුළුණු) කල්හි අනුග්‍රහය වෙයි. අත්‍යාරබ්ධවීර්‍ය්‍යාදියෙන් සිත වික්ෂිප්ත වූ කල්හි නිග්‍රහය වෙයි. යම් විටෙක සිත (ප්‍රඥාප්‍රයෝගය මඳ බැවින් හෝ උපශමසුඛය නැතිවීමෙන් හෝ) නිරාස්වාදයට පැමිණියේ ද එ කෙණෙහි සංවේගවස්තු සිහි කිරීමෙන් සංප්‍රහර්ෂණය කරන්නේ ය.

4. යම් කලෙක සිත සංවේගවස්තු ප්‍රත්‍යවෙක්ෂාවෙන් හෝ රත්නත්‍රය-ගුණානුස්මරණයෙන් හෝ සම්ප්‍රහර්ෂිත වේ ද, වීර්‍ය්‍ය හා යෙදුණු හෙයින් අලීන වේ ද, සමාධිය හා යෙදුණු හෙයින් අනුද්ධත වේ ද, ශමථයට හා ශමථනිමිත්තට ඒ කල් වෙයි. (එකල්හි ධ්‍යානසම්ප්‍රයුක්ත වූ) සිත කසිණාදි ගොචරාධ්‍යාත්මයෙහි අභිරමණය කරවන්නේ ය.

5. මෙ යට කියන ලද උපායෙන් ම යම් කලෙක සිත උපචාර අර්පණාවන්ගෙන් සමාහිත වේ ද, එකල්හි සිත සමාහිත වී යයි දැන එකෙණෙහි අධ්‍යුපෙක්ෂණය කරන්නේ ය.

6. මෙසේ කාලය දන්නා වූ කාලඥ වූ කාලයෙහි ඡේක වූ ප්‍රාඥ තෙමේ කලින් කල සමාධිසම්ප්‍රයුක්ත වූ චිත්තයාගේ නිමිත්ත (අරමුණ) සලකන්නේ යි.

**කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො** – සියලු සප්‍රත්‍යය ධර්ම සඞ්ඛ්‍යාත ත්‍රෛභූමක සංස්කාරයෝ ඇති වැ නැති වන හෙයින් අනිත්‍ය වූවාහු යයි මෙනෙහි කොට සියලු සංස්කෘතධර්මය නුවණින් විමසනුයේ, භවත්‍රය-පර්‍ය්‍යාපන්න සියලු සංස්කාරයෝ ප්‍රතිපීඩනාර්ථයෙන් දුක් වූවාහුය යි මෙනෙහි කොට සියලු ප්‍රත්‍යයොත්පන්නධර්මය නුවණින් විමසනුයේ, සඞ්ඛතා-සඞ්ඛත වූ සියලු ධර්මයෝ අවශයෙහි පවත්නා හෙයින් අනාත්ම වූවාහු යයි මෙනෙහි කොට සියලු ධර්මය නුවණින් විමසනුයේ...යම් කිසිවෙක් සමුදයධර්ම වූයේ නම් ඒ සියල්ල නිරුද්ධ වන (-නැසෙන) ස්වභාව ඇත්තේ යයි මෙනෙහි කොට දහම් නුවණින් විමසනුයේ නුයි ‘කාලෙන සො සම්මා ධම්මං පරි-වීමංසමානො’ යනු වේ.

**එකොදිභූතො විහනෙ තමං සො’ති භගවා** – ‘එකොදි’ යනු: එකග්‍ර වූ (එක අරමුණෙහි පැවැති) සිත් ඇතියේ, ඖද්ධත්‍යවිරහිත හෙයින් නො විසුරුණු සිත් ඇතියේ, (ඖද්ධත්‍යවිචිකිත්සා වශයෙන්) නො කැලැඹුණු සිත් ඇතියේ ශමථය සමාධීන්ද්‍රිය සමාධිබලය සම්‍යක්සමාධිය ඇත් නුයි ‘එකොදිභූතො’ යනු වේ. **විහනෙ තමං සො** යනු: ප්‍රඥාලෝකය වලකන හෙයින් අන්ධ කරන ප්‍රඥාචක්ෂුස නො කරන අඥානයෙන් නො දැනීම කරන, ප්‍රඥා නමැති ඇස නිරුද්ධ කරන, පීඩා කොට්ඨාසයෙහි වූ, අප්‍රත්‍යය අමෘතමහානිර්වාණය පිණිස නො පවත්නා වූ රාග නමැති තමස (-අන්ධකාරය) ද්වේෂ නමැති තමස මෝහ නමැති තමස දෘෂ්ටි නමැති තමස මාන නමැති තමස කෙලශ නැමති තමස දුශ්චරිත නමැති තමස නසන්නේ යැ, වෙසෙසින් නසන්නේ යැ, ස්වකීය සන්තානයෙන් දුරු කරන්නේ යැ, නසාපියන්නේ යැ, විගතාන්ත වූවක් කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යි.

භගවාති ගාරවාධිවචනං. අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා. භවානං අන්තකරොති භගවා. භාවිතකායොති භගවා, භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා. භජි වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා. භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා. භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා. භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා. භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා. භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා. භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා. භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා. –

භගවා යනු: ගුණවිශිෂ්ට වූ සත්ත්වොත්තමයා කෙරෙහි ගරුභාව-වාචක වූ වචනයෙකි. තවද භග්න කළ (-බිඳින ලද) රාග ඇත්තේ නුසි භගවත් යෑ, භග්න කළ ද්වෙෂ ඇත්තේ නුසි භගවත් යෑ, භග්න කළ මොහ ඇත්තේ නුසි භගවත් යෑ, භග්න කළ තවවිධ මානය ඇත්තේ නුසි භගවත් යෑ, භග්න කළ දෘෂ්ටි ඇත්තේ නුසි භගවත් යෑ, භග්න කළ (විනිවිදින අර්ථයෙන්) කෙලෙස් නමැති කණ්ටක ඇත්තේ නුසි භගවත් යෑ, භග්න කළ (රාගාදි) කෙලෙස් ඇත්තේ නුසි භගවත් යෑ. චිත්තීකෘතාදි අර්ථයෙන් රත්න සඞ්ඛ්‍යාත ධර්මය උද්දෙශවශයෙන් භාග කෙළේ යෑ, නිර්දේශ වශයෙන් විවිධ වැ විභාග කෙළේ යෑ, ප්‍රතිනිර්දේශවශයෙන් ප්‍රවිභාග කෙළේ නුසි භගවත් යෑ. (නොහොත් ධර්මරත්නය උද්ඝටිතඥයන්ගේ වශයෙන් භාග කෙළේ යෑ, විපඤ්චිතඥයන්ගේ වශයෙන් විභාග කෙළේ යෑ, නෙයපුද්ගලයන්ගේ වශයෙන් ප්‍රවිභාග කෙළේ නුසි භගවත් යෑ.) කාම-භවාදි නවවිධ භවයන්ගේ පරිච්ඡේදය (අන්තය) කෙළේ නුසි භගවත් යෑ. භාවිත වූ (-වඩනා ලද) කය ඇත්තේ නුසි භගවත් යෑ, වඩනා ලද (සංවරාදි ප්‍රභෙද වූ) ශීල ඇත්තේ නුසි භගවත් යෑ. වඩනා ලද ලෞකික ලොකොත්තර ප්‍රඥා ඇත්තේ නුසි භගවත් යෑ, බුදුහු වනයෙහි (වාක්-ශබ්දයෙන්) අල්පශබ්ද වූ (ග්‍රාම නගරයන් පිළිබඳ නිර්ඝොෂාදි ශබ්දයෙන්) අල්පනිර්ඝොෂ වූ (ඇතුළත හැසිරෙන ජනයාගේ ශරීරවාතයෙන්) ජනවාත විරහිත වූ මිනිසුන්ගේ රහස්‍යකාරණයන්ට සුදුසු වූ විවෙකයට අනුරූප වූ මනුෂ්‍යාපචාරය ඉක්මවා සිටි වනප්‍රස්ථ (-වනයෙහි දුරු) සෙනාසන-යන් ද මිනිසුන්ගේ කෘෂි වපනාදිය රහිත වූ වනපර්යන්ත (-වනයෙහි ඉතා දුර) සෙනාසනයන් ද සෙවනය කළාහු නුසි ‘භගවත්’ යෑ. නොහොත් බුදුහු චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර සඞ්ඛ්‍යාත සිවුපසයට හිමි වූවාහු නුසි ‘භගවත්’ යෑ. නොහොත් බුදුහු හෙතුඵල-සම්පත්ති සඞ්ඛ්‍යාත අර්ථරසයට හෙතුසම්පත්ති සඞ්ඛ්‍යාත ධර්මරසයට අභීත් ඵලසඞ්ඛ්‍යාත විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු නුසි ‘භගවත්’ යෑ. බුදුහු (ප්‍රථමධ්‍යානාදි) චතුර්විධ ධ්‍යානයන්ට (මෛත්‍ර්‍යාදි සඵරණප්‍රමාණ විරහිත වූ) සතර බ්‍රහ්මවිහාරයන්ට (ආකාසා නඤ්චායතනාදි) චතුර්විධ අරූපධ්‍යානයන්ට හිමි වූවාහු නුසි හෝ ‘භගවත්’ යෑ. නොහොත් බුදුහු (රූපී රූපානි පස්සති’ යනාදීන් වදළ ආලම්බන විමුක්ත වූ) අෂ්ට විමොක්ෂයට (අභිභවනය කළ කසිණාරම්මණ ඇති) අෂ්ට අභිභ්වායතනයට (අනුපරිපාටියෙන් සමවැදියැ යුතු) නව අනුපූර්-විහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුසි ‘භගවත්’ යෑ. බුදුහු (අනිත්‍ය-සංඥාදි) දශ සංඥාභාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනාපානස්මෘති සම්ප්‍රයුක්ත සමාධියට අශුභධ්‍යානසමාපත්තියට හිමි වූවාහු නුසි හෝ ‘භගවත්’ යෑ. බුදුහු සතර සතිපට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ග යන්ට ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුසි හෝ ‘භගවත්’යෑ. බුදුහු දශ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍යයන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධධර්මයන්ට හිමි වූවාහු නුසි හෝ භගවත් යෑ. –

'භගවා'ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං. න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්ති-කමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති – එකොදිභූතො විහරෙන තමං සොති භගවා.

තෙනාහ භගවා:

"එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහනෙ තමං සො (ති භගවා"ති.)

සොළසමො
සාරිපුත්තසුත්තනිද්දෙසො
සමත්තො.

# මහානිද්දෙසපාළි නිට්ඨිතා.

'භගවත්' යන මේ නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑණන් විසින් නො කරන ලද, බූණන් විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරන ලද, නෑසහලේනෑයන් විසින් නො කරන ලද, මහණ බමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද. මේ 'භගවත්' යන යම් නාමයෙක් වී නම්, මේ භාග්‍යවත් බුදුවරයන්ට අර්හත්මර්ගයාගේ අනන්තරයෙහි බොධිමණ්ඩයෙහි දී සර්වඥතාඥාන ප්‍රතිලාභය සමග අර්හත්ඵලය (හෝ සර්වධර්මයන්) ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී නුයි 'එකොදිභූතො විහරෙ තමං සො'ති භගවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහරෙ තමං සො (ඉති භගවා"ති.)

සොළොස් වැනි වූ සාරිපුත්ත සූත්‍රනිද්දේශය
සමාප්ත යි.

## මහනිද්දෙස්පෙළ නිමි.

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

# චූලනිද්දෙසපාළි

සුත්තන්තපිටකෙ - ඛුද්දකනිකායෙ

# චූළනිද්දෙසපාළි[1]

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

---

### පාරායනවග්ගො

## වත්ථු ගාථා

---

1. කොසලානං පුරා රම්මා - අගමා දක්ඛිණාපථං
ආකිඤ්චඤ්ඤං පත්ථයානො - බ්‍රාහ්මණො මන්තපාරගූ.

2. සො අස්සකස්ස[2] විසයෙ - මූළකස්ස[3] සමාසනෙ
වසි ගොදාවරී[4] කූලෙ - උඤ්ඡෙන ච ඵලෙන ච.

3. තස්සෙව[5] උපනිස්සාය - ගාමො ච විපුලො අහු
තතො ජාතෙන ආයෙන - මහායඤ්ඤමකප්පයී.

4. මහායඤ්ඤං යජිත්වාන - පුන පාවිසි අස්සමං
තස්මිං[5] පතිපවිට්ඨම්හි[6] - අඤ්ඤො ආගඤ්ඡි[7] බ්‍රාහ්මණො.

5. උග්ඝට්ටපාදො තසිතො - පඞ්කදන්තො රජස්සිරො
සො ච නං උපසඞ්කම්ම - සතානි පඤ්ච යාචති.

6. තමෙනං බාවරී දිස්වා - ආසනෙන නිමන්තයී
සුඛං ච කුසලං පුච්ඡි - ඉදං වචනමබ්‍රවී.

7. යං ඛො මමං දෙය්‍යධම්මං - සබ්බං විස්සජ්ජිතං[8] මයා
අනුජානාහි මෙ බ්‍රහ්මෙ - නත්ථි පඤ්ච සතානි මෙ.

8. සචෙ මෙ යාචමානස්ස - භවං නානුපදස්සති
සත්තමෙ දිවසෙ තුය්හං - මුද්ධා ඵලතු සත්තධා.

---

1. චූළනිද්දෙසො - ස්‍යා,
2. අයකස්ස - සී.
3. මළකස්ස - මජසං, සී.
4. ගොධාවරී - බ, ස්‍යාං
5. තංයෙව. මජසං, ච.
6. පවි පවිට්ඨම්හි - ම ජ සං. සී, ස්‍යා
7. ආගච්ඡි. - සී.
8. විසජ්ජිතං - මජසං.

සූත්‍රාන්තපිටකයෙහි - කුද්දුගත්සගියේ

# චූලනිද්දේශය

**ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා.**

---

## පාරායණ වග්ගය

# වත්ථු ගාථා

---

1. වෙද මන්ත්‍රයෙහි පරතෙරට ගිය (බාවරී) බමුණු අකිඤ්චනභාවය (පරිග්‍රහොපකරණයන්ගෙන් විවික්ත බව) පතනුයේ කොසොල් රට රම්‍ය වූ (සැවැත්) නුවරින් නික්මැ දක්ෂිණාපථයට ගියේ යැ.

2. හෙ තෙම අස්සක රජහුගේ ද මූලක රජහුගේ දැයි දෙරජුන් ගේ දෙ රට ආසන්න පෙදෙසෙහි (හෙවත් ඒ දෙරට අතුරෙහි) ගොදවරී නදී තීරයෙහි (වූ අසපුයෙහි) කෙණෙසි අහරින් හා වෙනෙහි කඳු මුල් පලයෙන් හා (යැපෙමින්) විසී.

3. ඒ ගොදවරී තීරය මැ (නොහොත් ඒ බමුණහු මැ) නිසා මහත් වූ ගමෙක් ද විය. හේ එගමින් උපන් කරවුවරින් මහා යඥයක් කෙළේ යැ (මහ දනක් දුන.)

4. හේ මහදන් දී යළි අසපුවට පිවිසියේ යැ. ඔහු පිවිසි කල්හි අන් බමුණෙක් (එහි) ආයේ යි.

5. (ගමන්හි) ගැටුණු පා ඇති පිපාසිත වූ මල බැඳුණු දත් ඇති දූහුලි වැකුණු හිස ඇති හෙ ද ඔහු කරා එළඹැ (කහවණු) පන්සියයක් ඉල්ලී යැ.

6. බාවරී තවුස් ඔහු දැක අස්නෙකින් පැවැරී යැ, සුව ද අරොග බව ද විචාළේ යැ, මෙවදන් ද කී:

7. "මා සතු යම් දෙයධර්මයෙක් වී නම් මා විසින් එ හැම දෙන ලද. බමුණ, මබස් හදහව, මට (කහවණු) පන්සියෙක් නැති."

8. ඉදින් හවත් තෙමෙ යදනා (ඉල්ලන) මට නො දෙන්නේ නම් (මින්) සත්වන දවසැ තා හිස් සත් කඩ වැ පැළේවා!

9. අභිසඞ්ඛරිත්වා කුහකො - භෙරවං සො අකිත්තයි
තස්ස තං වචනං සුත්වා - බාවරී දුක්ඛිතො අහු.

10. උස්සුස්සති[1] අනාහාරො - සොකසල්ලසමප්පිතො
අථො'පි එවංචිත්තස්ස - ඣානෙ න රමති මනො.

11. උත්‍රස්තං දුක්ඛිතං දිස්වා - දෙවතා අත්ථකාමිනි
බාවරිං උපසඞ්කම්ම - ඉදං වචනමබ්‍රවි.

12. න සො මුද්ධං පජානාති - කුහකො සො ධනත්ථිකො
මුද්ධනි මුද්ධපාතෙ වා - ඤාණං තස්ස න විජ්ජති.

13. භොති චරහි ජානාති - තං මෙ අක්ඛාහි පුච්ඡිතා[2]
මුද්ධං මුද්ධාධිපාතං ච - තං සුණොම වචො තව.

14. අහම්පෙතං[3] න ජානාමි - ඤාණං මෙත්ථ[4] න විජ්ජති
මුද්ධං මුද්ධාධිපාතො[5] ච - ජිනානං හෙතදස්සනං.

15. අථ කො චරහි ජානාති - අස්මිං පුථවි[6]මණ්ඩලෙ
මුද්ධං මුද්ධාධිපාතං ච - තං මෙ[7] අක්ඛාහි දෙවතෙ,

16. පුරා කපිලවත්ථුම්හා - නික්ඛන්තො ලොකනායකො
අපච්චො ඔක්කාකරාජස්ස - සක්‍යපුත්තො පභඞ්කරො.

17. සො හි බ්‍රාහ්මණ, සම්බුද්ධො - සබ්බධම්මාන පාරගූ
සබ්බාභිඤ්ඤාබලප්පත්තො - සබ්බධම්මෙසු චක්ඛුමා
සබ්බකම්මක්ඛයං[8] පත්තො - විමුත්තො උපධිසඞ්ඛයෙ[9].

18. බුද්ධො සො භගවා ලොකෙ - ධම්මං දෙසෙති චක්ඛුමා
තං ත්වං ගන්ත්වාන පුච්ඡස්සු - සො තෙ තං ව්‍යාකරිස්සති[10].

19. සම්බුද්ධොති වචො සුත්වා - උදග්ගො බාවරී අහු
සොකස්ස තනුකො ආසි - පීතිඤ්ච විපුලං ලභි.

---

1. උස්සුයති-සී.
2. පුච්ඡිතො-සු, PTS
3. අහමෙතං-ච.
4. ඤාණමෙත්ථ-ච.
5. මුද්ධා විපාතො-ච.
6. පුථුවි-සී
7. තං වෙ-සා, සු.
8. සබ්බ ධම්මක්ඛයං-සු, PTS
9. උපධික්ඛයෙ-මජසං.
10. ව්‍යාකරිස්සති-ච, PTS

9. ඒ කුහක බමුණු තෙම කොහොත් වත් සකස් කොට බිය දනවන වදන් තෙපලී යැ. ඔහුගේ එවදන් අසා බාවරී තවුස් දෙම්නස් වී යැ.

10. හේ ශෝකශල්‍යයෙන් විදුනා ලදුයේ නිරාහාර වැ වියැළෙයි, තවද මෙබඳු සිත් ඇති ඔහුගේ සිත ධ්‍යානයෙහි නො ඇලෙයි.

11. (එ අරම්හි අරක්ගත්) වැඩ කැමැති දෙවියක් බියපත් වූ දුකට පැමිණි බාවරී බමුණු කරා එළැඹ මෙ බස් කිව;

12. "හේ මුදුන් (හිස) නො දනී, හේ ධන කැමැති කුහකයෙක, මුදුන්හි හෝ මුදුන් පැළුමෙහි නුවණෙක් ඔහුට නැති."

13. "ඉදින් භවතී මුදුනුදු මුදුන් පැළුමුදු දනි නම් මා විසින් විචාරන ලද තෝ එය මට කියව. තී ගේ එ වදන් අසම්හ."

14. "මම ද තෙල නො දන්මී. මට මෙහි ලා නුවණෙක් නැති. මුදුනුදු මුදුන් පැළුමුදු යන මෙය ජිනයන්ගේ මැ දර්‍ශනයෙකි."

15. "එසේ කලැ මේ පොළෝ මඩලෙහි කවරෙක් නම් මුදුනුදු මුදුන් පැළුමුදු දනී ද? දෙවිය, එය මට කියව."

16. පෙර කිඹුල්වත් පුරයෙන් නික්මැ ගිය, ලොවට නායක වූ ඔක්කාක රජහු ගේ පරපුරෙහි වූ ලොවැ ප්‍රද්‍යෝතකය කරන යම් ශාක්‍යපුත්‍රයෙක් වේ ද,

17. බමුණ හේ සම්බුද්ධ යැ, සියලු ධර්‍මයන්ගේ පරතෙරට ගියේ යැ, සියලු අභිඥාබලයට පැමිණියේ යැ, සියලු දහම්හි නුවණැස් ඇත්තේ යැ, සියලු කර්‍මයන්ගේ ක්ෂයට පැමිණියේ යැ, නිවන් අරමුණෙහි (අරමුණු කොට) (භව විමුක්තියෙන්) මිදුණේ යැ.

18. පසැස් ඇති ඒ භාග්‍යවත් බුදුරජ ලොවැ දහම් දෙසයි. මුඹ උන් වහන්සේ වෙත ගොස් විචාරන්නැ. උන් වහන්සේ එය මුඹට හෙළි කරන සේක.

19. බාවරී තෙම 'බුදුහ' යන වදන් අසා ඔද වැඩී සිතැත්තේ විය. ඔහු ගේ ශෝකය ද තුනී විය, විපුල වූ ප්‍රීතියට ද පැමිණියේ යි.

20. සො බාවරී අත්තමනො උදග්ගො
තං දෙවතං පුච්ඡති වෙදජාතො
කතම්හි[1] ගාමෙ නිගමම්හි වා පුන[2]
කතමම්හි වා ජනපදෙ ලොකනාථො
යත්ථ ගන්ත්වා නමස්සෙමු[3] සම්බුද්ධං දිපදුත්තමං.

21. සාවත්ථියං කොසලමන්දිරෙ ජිනො
පහූතපඤ්ඤො වරභූරිමෙධසො
සො සක්‍යපුත්තො විධුරො අනාසවො
මුද්ධාධිපාතස්ස විදූ නරාසභො.

22. තතො ආමන්තයී සිස්සෙ - බ්‍රාහ්මණෙ මන්තපාරගෙ
එථ මාණවා අක්ඛිස්සං - සුණොථ වචනං මම.

23. යස්සෙසො දුල්ලභො ලොකෙ - පාතුභාවො අභිණ්හසො
ස්වජ්ජ[4] ලොකම්හි උප්පන්නො - සම්බුද්ධො ඉති විස්සුතො
ඛිප්පං ගන්ත්වාන සාවත්ථිං - පස්සව්හො දිපදුත්තමං.

24. කථං චරහි ජානෙමු - දිස්වා බුද්ධොති බ්‍රාහ්මණ
අජානතං නො පබ්‍රූහි - යථා ජානෙමු තං මයං.

25. ආගතානි හි මන්තෙසු - මහාපුරිසලක්ඛණා
ද්වත්තිංස ච[5] ව්‍යාඛ්‍යාතා - සමත්තා අනුපුබ්බසො.

26. යස්සෙතෙ හොන්ති ගත්තෙසු - මහාපුරිසලක්ඛණා
ද්වෙයෙව[6] තස්ස ගතියො - තතියා හි න විජ්ජති.

27. සචෙ අගාරං ආවසති[7] - විජෙය්‍ය පඨවිං ඉමං
අදණ්ඩෙන අසත්ථෙන - ධම්මෙනමනුසාසති[8].

28. සචෙ ච සො පබ්බජති - අගාරා අනගාරියං
විවට්ටච්ඡදො[9] සම්බුද්ධො - අරහා භවති අනුත්තරො.

---

1. කතමහි-සු.
2. පන-මජසං.
3. නමස්සො පා.නමස්සමු-ව.
4. සොජ්ජ-සු, මජසං.
5. ද්වත්තිංසානි ච-ව, මජසං.
6. ද්වෙව ච-සු.
7. අජ්ඣාවසති-උ.
8. ධම්මෙන අනුසාසති-සු, PTS
9. විවට ඡදෙ-මජසං. PTS

20. ඒ බාවරී බමුණු සතුටු වූයේ ඔදවැඩී සිතැත්තේ උපන් සොම්නස් ඇත්තේ ''යම් තැනකට ගොස් ද්විපදෝත්තම වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර කරන්නමෝ නම් ඒ ලෝකනායකයෝ කිනම් ගමෙකැ හෝ නියම්ගමෙකැ හෝ යළි කිනම් දනව්වෙකැ හෝ වසන සේක් ද?''යි එ දෙවියා පිළිවිසී යැ.

21. ''පස්මරුන් දිනූ මහාප්‍රාඥ වූ උත්තම විපුල ප්‍රඥ ඇති අප්‍රතිම වූ අනාස්‍රව වූ නරශ්‍රේෂ්ඨ වූ මුදුන් පළාලීම දන්නා වූ ඒ ශාක්‍ය පුත්‍රයන් වහන්සේ කොසොල්රට සැවැත් නුවර වසන සේ කැ''යි.

22. ඉක්බිති බාවරී බමුණු වේදමන්ත්‍රයෙහි පරතෙරට ගිය අතැවැස්-සන් ඇමැතී : එව මාණවකයෙනි, මම් තොපට කියනෙම් මා ගේ වචනය අසවු.

23. ''ලෝකයෙහි තෙල යමක්හුගේ එක්වන් පහළවීම දුර්ලභ වේ ද, 'සම්බුදුහ'යි ප්‍රසිද්ධ වූ උන් වහන්සේ දැන් ලොවැ පහළ වූහු ල. තෙපි වහා සැවැතට ගොස් ඒ ද්විපදෝත්තමයන් වහන්සේ දකිවු''(යි කී යැ).

24. ''බමුණාණෙනි, ඔවුන් දැක 'මේ බුදුහ'යි කිසේ දනුම්හ. ඇපි ඔවුන් යම්සේ දත හෙන්නමෝ නම් නො දන්නා අපට එසෙයින් කිව මැනැවැ''යි (කීහ.)

25. පිළිවෙළින් විස්තර කරන ලද පරිපූර්ණ වූ දෙතිස් මහපුරිස් ලකුණු වේදයෙහි ආයේ යැ,

26. යමක්හුගේ සිරුරෙහි තෙල දෙතිස් මහපුරිස් ලකුණු ඇද්ද, ඔහුට දෙගතියෙක් මැ වෙයි, තෙ වැන්නෙක් නැති.

27. ඉදින් හේ ගිහිගෙයි වෙසේ නම තො දඬින් නො සැතින් මේ පොළොව දිනා දැහැමින් අනුශාසනා කෙරෙයි (සක්විති රජ වෙයි).

28. තවද, ඉදින් හේ ගිහිගෙන් නික්මැ සසුන්හි පැවිදි වේ නම් විවට කළ කෙලෙස් සෙවෙණි ඇති වැ අනුත්තර වූ අර්හත් සම්බුද්ධ වෙයි.

29. ජාතිං ගොත්තං[1] ච ලක්ඛණං – මන්තෙ සිස්සෙ පුනාපරං[2]
මුද්ධං මුද්ධාධිපාතං[3] ච – මනසායෙව පුච්ඡථ.

30. අනාවරණදස්සාවී – යදි බුද්ධො භවිස්සති
මනසා පුච්ඡිතෙ පඤ්හෙ – වාචාය විස්සජෙස්සති[4].

31. බාවරිස්ස වචො සුත්වා – සිස්සා සොළස බ්‍රාහ්මණා
අජිතො තිස්සමෙත්තෙය්‍යො – පුණ්ණකො අථ මෙත්තගූ.

32. ධොතකො උපසීවො ච – නන්දො ච අථ හෙමකො
තොදෙය්‍යකප්පා[5] දුභයො – ජතුකණ්ණී ච පණ්ඩිතො.

33. භද්‍රාවුධො උදයො ච – පොසාලො වාපි බ්‍රාහ්මණො
මොඝරාජා ච මෙධාවී – පිංගියො ච මහාඉසි.

34. පච්චෙකගණිනො සබ්බෙ – සබ්බලොකස්ස විස්සුතා
ඣායී ඣානරතා ධීරා – පුබ්බවාසනවාසිතා.

35. බාවරිං අභිවන්දිත්වා – කත්වා ච නං පදක්ඛිණං
ජටාජිනධරා සබ්බෙ – පක්කාමුං උත්තරාමුඛා.

36. මූලකස්ස[6] පතිට්ඨානං – පුරිමං මාහිස්සතිං තථා[7]
උජ්ජෙනිං චාපි ගොනද්ධං – වෙදිසං වනසව්හයං[8].

37. කොසම්බිං චාපි සාකෙතං – සාවත්ථිං ච පුරුත්තමං
සෙතව්‍යං[9] කපිලවත්ථුං – කුසිනාරං ච මන්දිරං.

38. පාවං ච භොගනගරං – වෙසාලිං මාගධං පුරං
පාසාණකං චෙතියං ච – රමණීයං මනොරමං.

39. තසිතොවුදකං සීතං – මහාලාභං ච වාණිජො
ඡායං ඝම්මාභිතත්තොව – තුසිතා[10] පබ්බතමාරුහුං.

---

1. ජාතිගොත්තං–ච, මජසං.
2. පුනාපරෙ–සු, PTS.
3. මුද්ධා විපාතං–ච.
4. විසජ්ජිස්සති–මජසං
5. කප්පො–ච, සු.
6. මූලකස්ස–ච, මජසං, අලකස්ස–කත්ථචි
7. පුරමාහිස්සතිං තදා–මජසං
8. වනසාවත්ථිං–සු.
9. සෙතබ්‍යං–PTS.
10. තුරිතං–මජසං; ස.

29. (තෙපි මාගේ) ජාති (වයස්) ද ගොතුද ලක්ෂණද උගත් වෙදයනුද සිසුනු ද යළි අන්‍ය වූ මුදුනුද මුදුන් පැළමුද සිතින් මැ පුළුවුස්ව.

30. ඉදින් හේ අනාවරණඥානදර්ශන ඇති බුදු වේ නම් (තොප) සිතින් පුළුවුත් පැන තෙපුලින් විසඳයි යනු කී යැ.

31–33. බාවරී බමුණුගේ බස් අසා අජිත යැ තිස්සමෙත්තෙයා යැ පුණ්ණක යැ යළි මෙත්තගූ යැ ධොතක යැ උපසීව යැ නන්ද යැ යළි හෙමක යැ තොදෙයා, කප්ප දෙදෙනා යැ පණ්ඩිත වූ ජතුකණ්ණී යැ. භද්‍රාවුධ යැ උදය යැ පොසාල නම් බමුණු යැ ප්‍රාඥ වූ මොසරාජ යැ පිංගිය මහතවුස් යැ යන සොළොස් බමුණු අතැවැසියෝ–

34. හැම දෙන වෙන වෙන ශිෂ්‍යගණයා ඇත්තාහු සියලු ලොවැ ප්‍රකට වූවාහු ධ්‍යාන කරන්නාහු ධ්‍යානයෙහි ඇලුණාහු ධෘති සම්පන්න වූවාහු පූර්වපුණ්‍යවාසනා ගුණයෙන් වාසිත සිත් ඇත්තාහු–

35. බාවරීහු අභිවාදන කොට යළි ඔහු පැදකුණු කොට සියල්ලෝ දළ මඩුලු අඳුන් දිවිසම් දරන්නාහු උතුරු දෙසට මුහුණලා නික්මැ ගියෝ.

36. මූලක ජනපදයට අයත් පතිට්ඨාන නගරයට ද, මාහිස්සතී නම් පළමු නගරයට ද, එසේ මැ උඡ්ජේනී නුවරට ද ගොනද්ධ (ගොධ) පුරයට ද, වෙදිස නුවරට ද, වල්සැවැතට ද–

37. කොසොඹෑ නුවරට ද, සාකෙත පුරයට ද, සැවැත් පුරවරයට ද, සෙතව්‍ය නුවරට ද, කිඹුල්වත් පුරයට ද, කුසිනාරා පුරයට ද–

38. පාවා නුවරට ද, භොග නගරයට ද, විසල් පුරට ද, මගධ රට අග-නුවර වූ රජගහ නුවරට ද, සිත්කලු වූ මනරම් වූ පහණ සෑ වෙහෙරට ද–

39. පවස් ඇතියකු සිහිල් දියකට මෙන්, වෙළෙඳක්හු මහත් ලාභයකට මෙන්, ගිම්න් තැවුණක්හු සෙවණකට මෙන් හටගත් සොම්නස් ඇත්තාහු පව්වට නැංගාහ.

40. භගවා ච තස්මිං[1] සමයෙ – භික්ඛුසඞ්ඝපුරක්ඛතො
භික්ඛූනං ධම්මං දෙසෙති – සීහොව නදතී වනෙ.

41. අජිතො අද්දස සම්බුද්ධං – සතරංසිං'ව භානුමං[2]
චන්දං යථා පණ්ණරසෙ – පරිපූරිමුපාගතං[3]

42. අථස්ස ගත්තෙ දිස්වාන – පරිපූරං ච බ්‍යඤ්ජනං
එකමන්තං ඨිතො හට්ඨො – මනොපඤ්හෙ අපුච්ඡථ.

43. ආදිස්ස ජම්මනං බ්‍රෑහි – ගොත්තං බ්‍රෑහි සලක්ඛණං
මන්තෙසු පාරමිං බ්‍රෑහි – කති වාචෙති බ්‍රාහ්මණො.

44. වීසං වස්සසතං ආයු – සො ච ගොත්තෙන බාවරී
තීණස්ස[4] ලක්ඛණා ගත්තෙ – තිණ්ණං වෙදාන පාරගූ.

45. ලක්ඛණෙ ඉතිහාසෙ ච – සනිඝණ්ඩු සකෙටුභෙ
පඤ්ච සතානි වාචෙති – සධම්මෙ පාරමිං ගතො.

46. ලක්ඛණානං පවිචයං – බාවරිස්ස නරුත්තම
තණ්හච්ඡිද පකාසෙහි – මා නො කඞ්ඛායිතං අහු.

47. මුඛං ජිව්හාය ඡාදෙති – උණ්ණස්ස භමුකන්තරෙ
කොසොහිතං වත්ථගුය්හං – එවං ජානාහි මාණව.

48. පුච්ඡඤ්හි කිඤ්චි අසුණන්තො – සුත්වා පඤ්හෙ ව්‍යාකතෙ
විචින්තෙති ජනො සබ්බො – වෙදජාතො කතඤ්ජලී.

49. කොනු දෙවො වා බ්‍රහ්මා වා – ඉන්දො වාපි සුජම්පති
මනසා පුච්ඡිතෙ පඤ්හෙ – කමෙතං පටිභාසති.

50. මුද්ධං මුද්ධාධිපාතං ච – බාවරී පරිපුච්ඡති
තං ව්‍යාකරොහි භගවා – කඞ්ඛං විනය නො ඉසෙ,

---

1. තම්හි–සු. PTS.
2. විතරංසිංව භානුමං–මජසං. විතරංසිව–PTS.
3. පරිපූරං උපාගතං–ව, මජසං පරිපූරිං උපාගතං–PTS.
4. තීනස්ස–සු. PTS.

40. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂුසංඝයා විසින් පුරස්කෘත වූවාහු වනයෙහි සිංහයකු නාද කරන්නා සේ භික්ෂූනට දහම් දෙසන සේක.

41. අජිත මාණව සම්බුදුන් සියගණන් රස් ඇති හිරු සෙයින් පතුරුයි පොහොදවස් සොළොස් කලා පිරුණු සඳු සෙයින් දිටී.

42. ඉක්බිති උන් වහන්සේගේ සිරුරෙහි පිරිපුන් පුරිස් ලකුණු දක සතුටු වූයේ එකත්පස් වැ සිටියේ මනසින් පැන පුළුවුත් :

43. ''අප ඇදුරන් උදෙසා උන්ගේ ජාති (වයස්) කියනු මැන. පුරිස් ලකුණු සහිත කොට ගොත් කියනු මැන, වෙදයන්හි නිමාවට පැමිණීම ද කියනු මැන, හේ කෙතෙක් අතැවැසියන් හදරවා ද''යි (විචාළේ යැ.)

44. '(තොප ඇදුරු උපතින්) එක්සියවිසි හවුරුදු ඇත්තේ යැ, හෙ ද ගොත්‍රයෙන් ප්‍රාවරී (බාවරී) නමැ, ඔහු ගත මහපුරිස් ලකුණු තුනෙක, ත්‍රිවෙදයෙහි පරතෙරට ගියේ යැ.

45. (මහාපුරුෂ) ලක්ෂණශාස්ත්‍රයෙහි ද, නිඝණ්ටු සහිත කෙටුභ ශාස්ත්‍ර සහිත ඉතිහාසයෙහි ද, ස්වකීය බ්‍රාහ්මණ ධර්මයෙහි ද පරතෙරට ගියේ පන්සියක් අතැවැසියන් හදරවයි.

46. තෘෂ්ණාව සිඳ හළ නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, බාවරී බමුණුගේ පුරුෂලක්ෂණයන් ගේ විස්තරය පවසන්නැ, අපට නහමක් සැක වේවා' යි (සිතින් පුළුවුත්.)

47. මාණවකය, හේ (තමා) දිවින් මුහුණ වසයි. උහුගේ දෙබැම අතුරෙහි උණුලොම් වෙයි. අඞ්ගජාතය කොෂාවහිත වේ. මෙසේ මෙ කරුණු දනැ'යි (වදළහ.)

48. සියලු ජන තෙමේ විචාරනු ලබන කිසි පැනයක් නො අසනුයේ විසැඳූ පැන අසා උපන් සොම්නස් ඇත්තේ බඳැදිලි ව මෙසේ සිතයි ;

49. ''කවර දෙවියෙක් හෝ බඹෙක් හෝ සුජාපති වූ ඉන්ද්‍ර හෝ සිතින් විචාළ පැන විසඳා ද? (ඔවුනතුරෙහි) කවරක්හට තෙල පැන වැටහේ ද''යි.

50. ''භාග්‍යවතුන් වහන්ස, බාවරී තෙම මුදුනුදු මුදුන් පැළුමුදු පුළුවුයි. එය විසඳන්නැ, සෘෂීන් වහන්ස, අපගේ සැකය දුරුලන්නැ''යි.

51. අවිජ්ජා මුද්ධාති ජානාහි – විජ්ජා මුද්ධාධිපාතිනී
සද්ධා සති සමාධීහි – ඡන්දවිරියෙන සංයුතා,

52. තතො වෙදෙන මහතා – සන්ථම්භිත්වාන[1] මාණවො
එකංසං අජිනං කත්වා – පාදෙසු සිරසා පති.

53. බාවරී බ්‍රාහ්මණො හොතො – සහ සිස්සෙහි මාරිස
උදග්ගචිත්තො සුමනො – පාදෙ වන්දති චක්ඛුම,[2]

54. සුඛිතො බාවරී හොතු – සහ සිස්සෙහි බ්‍රාහ්මණො
ත්වං චාපි සුඛිතො හොහි – චිරං ජීවාහි මාණව,

55. බාවරිස්ස[3] ච තුම්හං[4] වා – සබ්බෙසං සබ්බසංසයං
කතාවකාසා පුච්ඡව්හො – යං කිඤ්චි මනසිච්ඡථ.

56. සම්බුද්ධෙන කතොකාසො – නිසීදිත්වාන පඤ්ජලී
අජිතො පඨමං පඤ්හං – තත්ථ පුච්ඡි තථාගතං.

වත්ථුගාථා නිට්ඨිතා

1. සත්ථම්භිත්වාන–මජසං.
2. චක්ඛුමා–සු.
3. බ්‍රවරිස්සච – සී, ච, අ. බාවාරියස්ස–සු. වි.
4. තුය්හං–සී, සු., වි.

51. අවිද්‍යාව (සසර හිස් වන බැවින්) මුදු නෑ, ශ්‍රද්ධා ස්මෘති සමාධි ඡන්ද වීර්‍ය්‍ය යන මොවුන් හා සමග යෙදුණු (අර්හත්මාර්ග) විද්‍යාව මුදුන් පළන යයි දනෑ''යි.

52. ඉක්බිති අජිත මාණව මහත් ප්‍රීතියෙන් සංස්තබ්ධ වැ අඳුන් දිවිසම එකස් කොටැ ලා (බුදුන්) පාපිට හිස් තබා වැඳ වැටුණේ යැ.

53. නිදුකාණෙනි, පසැස් ඇතියාණෙනි, බාවරී බ්‍රාහ්මණ තෙම ඔද වැඩි සිත් ඇති වැ සොම්නස් වැ භවත්හු පා වඳී යි.

54. ''බාවරී බමුණු තෙම සිසුන් හා සමග සුවපත් වේවා! මාණවය තො ද සුවපත් වෙයි! සැරදෙයි!'' (වදළෝ.)

55. ''තෙපි කළ අවකාශ ඇතියවු, යම් කිසිවක් පුළුවුස්නට සිතින් කැමැතියවු නම් බාවරිහු ගේ වේවයි තොප හැම ගේ වේවයි එ හැම සංශය පුළුවුස්ව''යි (වදළෝ.)

56. සම්බුදුන් විසින් කළ අවකාශ ඇති අජිත මාණව ඇඳිලි බැඳ හිඳ එහි පළමු පැනය බුදුන් පිළිවිත්.

වත්‍ථු ගාථා නිමි.

## 1. අජිතමාණව පුච්ඡා.

1–1 කෙනස්සු නිවුතො ලොකො (ඉච්චායස්මා අජිතො)
කෙනස්සු නප්පකාසති
කිස්සාභිලෙපනං බ්‍රෑහි
කිං සු තස්ස මහබ්භයං.

1–2 අවිජ්ජාය නිවුතො ලොකො (අජිතාති භගවා)
වෙවිච්ඡා[5] පමාද නප්පකාසති
ජප්පාභිලෙපනං බ්‍රෑමි
දුක්ඛමස්ස මහබ්භයං.

1–3 සවන්ති සබ්බධි සොතා (ඉච්චායස්මා අජිතො)
සොතානං කිං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑහි
කෙන සොතා පිධීයරෙ[1].

1–4 යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි
පඤ්ඤායෙතෙ පිධීයරෙ.

1–5 පඤ්ඤා චෙව සති චාපි[2] (ඉච්චායස්මා අජිතො)
නාමරූපං ච මාරිස
එතං මෙ පුට්ඨො පබ්‍රෑහි
කත්ථෙතං උපරුජ්ඣති.

1–6 යමෙතං පඤ්හං අපුච්ඡි
අජිත තං වදමි තෙ
යත්ථ නාමං ච රූපං ච
අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන
එත්ථෙතං උපරුජ්ඣති.

1–7 යෙ ච සඞ්ඛාතධම්මා[3] සෙ
යෙ ච සෙඛා පුථූ ඉධ
තෙසං මෙ නිපකො ඉරියං
පුට්ඨො පබ්‍රෑහි මාරිස.

1–8 කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය
මනසා නාවිලො සියා
කුසලො සබ්බ ධම්මානං[4]
සතො භික්ඛු පරිබ්බජෙ.

අජිතමාණව පුච්ඡා — නිට්ඨිතා

---

1. විවිච්ඡා–ම. ජ. සං.
2. පිධියරෙ–ම ජ සං.
3. සතිචෙව–සු.
4. සබ්බත ධම්මා–ච
5. සබ්බධම්මෙසු–ස

## 1. අජිත මානව පෘච්ඡා

1-1. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්: ලෝවැසි තෙම කිමෙකින් නිවෘත (වැසුණේ) ද? කවර හෙයින් නො පැනේ ද? කිමෙක් ඔහට අභිලෙපන (ලභටු) යැ යි වදරන සේක් ද? කිමෙක් ඕහට මහද්භය වේ ද?

1-2. (අජිත යැ යි අමතා බුදුහු මෙසේ වදළහ:) ලෝවැසි තෙම අවිද්‍යායෙන් නිවෘත යැ. මාත්සය්‍ය් හෙයින් ප්‍රමාද හෙයින් නො පැනෙයි (ප්‍රකාශ නො වෙයි) තෘෂ්ණාව අභිලෙපන යැ යි කියමි, (ජාත්‍යාදි) දුක ඔහට මහද්භය වෙයි.

1-3. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්:) හැම තන්හි (රූපාදි ආයතනයන්හි තෘෂ්ණාදි) ස්‍රොතස්හු ගලා යෙති, ස්‍රොතසුන්ගේ ආවරණය කවරැ? ස්‍රොතසුන් ගේ සංවරය වදළ මැනැව. කවර දහමෙකින් ස්‍රොතස්හු පියනු ලැබෙත් ද (පසිඳිනු ලැබෙත් ද)?

1-4. (අජිත යැ යි අමතා බුදුහු මෙසේ වදළහ:) ලොවැ යම් ස්‍රොතස් කෙනෙක් වෙත් ද, ස්මෘතිය ඕවුනට ආවරණ වෙයි, (එ මැ ස්මෘතිය) ස්‍රොතසුන්ගේ 'සංවරය' යි කියමි, (මාර්ග) ප්‍රඥාව විසින් තුලුහු පියනු (පසිඳිනු) ලැබෙත්.

1-5. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්.) ප්‍රඥාව ද ස්මෘතිය ද (තදවශෙෂ) නාමරූපය ද යන තෙල සියල්ල කොහි නිරුද්ධ වේ ද? නිදුකාණෙනි, මා විසින් පුළුවුස්නා ලද මුඹ වහන්සේ තෙල කරුණ මට වදළ මැනව.

1-6. අජිත තෙපි යම් පැනයක් විචාළ වු ද, එය තොපට කියමි. යම් තැනෙක්හි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වේ ද, (පශ්චිම) විඥානයාගේ නිරොධය හා මැ (පෙර පසු නො වැ) තෙල විඥාන නිරොධයෙහි මැ තෙල නාමරූපය උපරුද්ධ වෙයි (විඥාන නිරොධය ඉක්ම නො යෙයි.)

1-7. නිදුකාණෙනි, මෙ ලොවැ (අනිත්‍යාදි විසින්) විමසන ලද ධර්ම ඇති යම් (අශෛක්‍ෂ) කෙනෙකුත් වෙත් ද, බොහෝ වූ යම් ශෛක්‍ෂ කෙනෙකුත් වෙත් ද, මා විසින් පුළුවුස්නා ලද (ශෛක්‍ෂාශෛක්‍ෂ ධර්මයෙහි) පණ්ඩිත වූ මුඹ වහන්සේ ඔවුන්ගේ ප්‍රතිපත්තිය මට වදළ මැනැව.

1-8. කාමයෙහි ගිජු නො වන්නේ යැ, සිතින් නො කැළඹුණෙක්, වන්නේ යැ, මහණ තෙම සියලු ධර්මයන්හි දක්‍ෂ වූයේ ස්මෘතිමත් වැ හැසිරෙන්නේ යි.

අජිත මාණව පෘච්ඡා නිමි.

## 2. තිස්සමෙත්තෙය්‍යමාණව පුච්ඡා

2–1 කො'ධ[1] සන්තුසිතො ලොකෙ (ඉච්චායස්මා තිස්ස මෙත්තෙය්‍යො)
කස්ස නො සන්ති ඉඤ්ජිතා
කො උභන්තමභිඤ්ඤාය
මජ්ඣෙ මන්තා න ලිප්පති[2]
කං බ්‍රූසි මහාපුරිසො'ති
කො'ධ සිබ්බනිමච්චගා[3]?

2–2 කාමෙසු බ්‍රහ්මචරියවා (මෙත්තෙය්‍යා'ති භගවා)
වීතතණ්හො සදා සතො
සඞ්ඛාය නිබ්බුතො භික්ඛු
තස්ස නො සන්ති ඉඤ්ජිතා.

2–3 සො උභන්තමභිඤ්ඤාය
මජ්ඣෙ මන්තා න ලිප්පති
තං බ්‍රූමි මහා පුරිසො'ති
සො[4]'ධ සිබ්බනිමච්චගා.

තිස්සමෙත්තෙය්‍යමාණවපුච්ඡා නිට්ඨිතා.

---

## 3. පුණ්ණකමාණව පුච්ඡා

3–1 අනෙජං මූලදස්සාවිං (ඉච්චායස්මා පුණ්ණකො)
අත්ථී පඤ්හෙන[5] ආගමං
කිංනිස්සිතා ඉසයො මනුජා
ඛත්තියා බ්‍රාහ්මණා[6] දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ[7] ඉධ ලොකෙ
පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතං.

---

1. කොඉධ සන්තුස්සිතො–ච
2. නලිම්පති–ච
3. මජ්ඣගා–ච
4. සොධ–සු
5. පඤ්හෙනාගමං–සු
6. බ්‍රාහ්මණ (දෙව) සු
7. පුථූධ–PTS

## 2. තිස්සමෙත්තෙය්‍ය මාණව පෘච්ඡා

2–1. (ආයුෂ්මත් තිස්ස මෙත්තෙය්‍ය මෙසේ පිළිවිත්:) මෙලොවැ කවරෙක් සතුටු වූයේ ද, කවරක්හට (තෘෂ්ණා–දෘෂ්ටි) ඉඤ්ජනයෝ (කම්පනයෝ) නැද්ද, කවරෙක් අන්තද්වය විශිෂ්ටඥානයෙන් දැනැ මධ්‍යයෙහි ප්‍රඥායෙන් නො ඇලේ ද, කවරක්හු 'මහාපුරුෂ' යයි කියනු සේක් ද, කවරෙක් මෙහි තෘෂ්ණා සිබ්බනිය (ගෙතුම) ඉක්මැ ගියේ ද? යි''

2–2. ('මෙත්තෙය්‍ය' යි අමතා බුදුහු මෙසේ වදළහ:) කාමයෙහි (ආදීනව දැක) බඹසර ඇති පහ වූ තෘෂ්ණා ඇති හැම කල්හි ස්මෘතිමත් වූ (අනිත්‍යාදි විසින්) දහම් විමසා (රාගාදිය නිවීමෙන්) නිවුණු යම් මහණෙක් වේ ද, ඔහට ඉඤ්ජිතයෝ නැත්තාහ.

2–3. හේ අන්තද්වය විශිෂ්ටඥානයෙන් දැනැ මධ්‍යයෙහි ප්‍රඥායෙන් නො ඇලෙයි, ඔහු 'මහාපුරුෂ' යයි කියමි. හේ මෙ ලොව්හි තෘෂ්ණා සිබ්බනිය ඉක්මැ ගියේ යි.

**තිස්සමෙත්තෙය්‍යමාණව පෘච්ඡා නිමි.**

---

## පුණ්ණක මාණව පෘච්ඡා

3–1. (ආයුෂ්මත් පුණ්ණක මෙසේ විචාරයි:) තෘෂ්ණා රහිත වූ (එහෙයින්) අටලෝදහම්හි කම්පා රහිත වූ අකුශල මූලාදිය දක්නා සුලු වූ භාග්‍යවතුන් වහන්සේ කරා ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇත්තමෝ ආම්හ, මෙලොවැ සෘෂිහු යැ මනුෂ්‍යයෝ යැ ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ යන බොහෝ යාග කරුවෝ කුමක් ඇසිරි කළාහු දෙවියනට දෙය ධර්මය පර්යේෂණ කෙරෙත් ද? (යාග කෙරෙත් ද?) භාග්‍යවතුන් වහන්ස, එ කරුණ මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල වදළ මැනැවි.

3–2 යෙ කෙචි 'මෙ ඉසයො මනුජා (පුණ්ණකා'ති භගවා)
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ
ආසිංසමානා[1] පුණ්ණක ඉත්ථභාවං
ජරංසිතා යඤ්ඤමකප්පයිංසු.

3–3 යෙ කෙචි 'මෙ ඉසයො මනුජා (ඉච්චායස්මා පුණ්ණකො)
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ
කච්චිස්සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා
අතාරුං ජාතිං ච ජරං ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

3–4 ආසිංසන්ති[2] ථොමයන්ති අභිජප්පන්ති ජුහන්ති
(පුණ්ණකාති භගවා)
කාමාභි[3]ජප්පන්ති පටිච්ච ලාභං
තෙ යාජයොගා භවරාගරත්තා
නාත[4]රිංසු ජාතිජරන්ති බ්‍රෑමි.

3–5 තෙ චෙ නාතරිංසු යාජයොගා (ඉච්චායස්මා පුණ්ණකො)
යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිස
අථ කො චරහි දෙවමනුස්සලොකෙ
අතාරි ජාතිං ච ජරං ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

3–6 සඞ්ඛාය ලොකස්මිං පරොවරානි[5] (පුණ්ණකාති භගවා)
යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ
සන්තො විධූමො අනීඝො නිරාසො
අතාරි සො ජාති ජරන්ති බ්‍රෑමී'ති.

**පුණ්ණකමාණව පුච්ඡා — නිට්ඨිතා**

---

1. ආසීසමානා–ච
2. ආසීසන්ති–ච
3. කාමෙහි–අටුවා
4. නාතාරිංසු–ම ජ සං.
5. පරොපරානි–ච–P T S.

3–2. (බුදුහු මෙසේ වදළහ: පුණ්ණකය,) මෙලොවැ මේ ඍෂිහු යැ මනුෂ්‍යයෝ යැ ක්‍ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ යන යම් බොහෝ යාගකරුවෝ දෙවියනට යාග කෙරෙත් ද, පුණ්ණකය, ඔහු ජරාව (සසරදුක) නිසා මේ මනුෂ්‍යාදිභාවය පතන්නාහු (දෙවියනට) යාග කෙරෙත්.

3–3. (ආයුෂ්මත් පුණ්ණක මෙසේ විචාරයි:) මෙලොවැ මේ ඍෂිහු යැ මනුෂ්‍යයෝ යැ ක්‍ෂත්‍රියෝ යැ බ්‍රාහ්මණයෝ යැ යන යම් බොහෝ යාගකරුවෝ දෙවියනට යාග කෙරෙත් ද, භාග්‍යවතුන් වහන්ස, කිම ඔහු යාගයෙහි අප්‍රමත්ත වූවාහු ජාතිය ත් ජරාව ත් තරණය කළාහු ද? නිදුකාණෙනි, එය මුඹ වහන්සේ විචාරමි. භාග්‍යවතුන් වහන්ස, තෙල මට වදළ මැනැවි.

3–4. (බුදුහු මෙසේ වදළහ: පුණ්ණකය, ඔහු රූප ප්‍රතිලාභාදිය) ප්‍රාර්ථනා කෙරෙති, (යාගාදිය) පසසති, ජල්පනය කෙරෙති, පුදති, (රූපාදි) ලාභය සඳහා පුනපුනා කාමයන් මැ (අපට වන්නේ මැනැවැ'යි) කියත්. යාගයෙහි යෙදුණු භවරාගයෙන් රැඳුණු ඔහු ජාති ජරා (ආදි සසරදුක) තරණය නො කළාහ'යි කියමි.

3–5. (ආයුෂ්මත් පුණ්ණක මෙසේ විචාරයි:) නිදුකාණෙනි, යාගයෙහි යෙදුණු ඔහු ඉදින් යාගයන් කරණ කොට ජාතියත් ජරාවත් නො තරණය කළාහු නම් නිදුකාණෙනි, එකල්හි දෙව්මිනිස්ලොවැ කවරෙක් ජාතියත් ජරාවත් තරණය කෙළේ ද? එකරුණ පුළුවුස්මි. භාග්‍යවතුන් වහන්ස, තෙල මට වදළ මැනැවි.

3–6. (බුදුහු මෙසේ වදළහ: පුණ්ණකය,) සත්ලොවැ (පරාත්මභාව ස්වාත්මභාවාදී) පරාවරයන් නුවණින් විමසා (දත්) යම් ක්ෂීණාශ්‍රවයක්හට ලොවැ කිසි තැනෙක්හි ඉඤ්ජිතයෙක් නැද්ද, (කෙලෙස් සන්හිඳීමෙන්) ශාන්ත වූ (කායදුශ්චරිතාදී) ධූම විරහිත වූ (රාගාදි) උපද්‍රව රහිත වූ ආශා රහිත වූ ඒ ක්ෂීණාශ්‍රව තෙම ජාති ජරා තරණය කෙළේ යයි කියමි.

**පූර්ණක මාණවකපෘච්ඡා නිමි.**

## 4. මෙත්තගූමාණව පුච්ඡා

4–1 පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං (ඉච්චායස්මා මෙත්තගූ)
මඤ්ඤාමි තං වෙදගුං භාවිතත්තං
කුතොනු දුක්ඛා[1] සමුදාගතා ඉමෙ
යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා.

4–2 දුක්ඛස්ස වෙ මං[2] පභවං අපුච්ඡසි (මෙත්තගූ'ති භගවා)
තං තෙ පවක්ඛාමි යථා පජානං
උපධිනිදානා පභවන්ති දුක්ඛා
යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා.

4–3 යො වෙ[3] අවිද්වා උපධිං කරොති
පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො
තස්මා පජානං[4] උපධිං න කයිරා
දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී.

4–4 යන්තං අපුච්ඡිම්හ අකිත්තයී[5] නො (ඉච්චායස්මා මෙත්තගූ)
අඤ්ඤං තං[6] පුච්ඡාම[7] තදිඞ්ඝ බ්‍රෑහි
කථන්නු ධීරා විතරන්ති ඔඝං
ජාති ජරං සොකපරිද්දවං ච[8]
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො.

4–5 කිත්තයිස්සාමි තෙ ධම්මං (මෙත්තගූති භගවා)
දිට්ඨෙ[9] ධම්මෙ අනීතිහං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

4–6 තං චාහං අභිනන්දාමි
මහෙසි ධම්මමුත්තමං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

---

1. දුක්මාය සදගතා—සු
2. වෙමං—ච—වි
3. යොවෙ—ච—වි
4. තස්මාභිජානං—සු
5. අකිත්තයීනො—ච—වි
6. අඤ්ඤඤ්ඤං—වි
7. පුච්ඡාමි—උ—සු
8. පරිදෙවං—ච—වි
පරිද්දවං—සු
9. දිට්ඨෙව ධම්මෙ—ච—සු—වි

## 4. මෙත්තගූමාණව පෘච්ඡා

4-1. (ආයුෂ්මත් මෙත්තගූ මෙසේ විචාරයි:) භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ විචාරමි. වදාළ මැනව. මුඹ වහන්සේ ඥාන - වෙදයාගේ පරතෙරට පැමිණි කෙනකුන් කොට වැඩූ සිත් ඇති කෙනකුන් කොට හඟිමි. ලොවැ අනේක ස්වභාව වූ යම් කිසි දුක් කෙනෙක් වෙත් ද, මේ දුඃඛයෝ කොයින් උපන්නාහු ද?

4-2. (බුදුහු මෙසේ වදාළහ: මෙත්තගූ මාණවකය,) ජාත්‍යාදි දුකට කාරණය (තෙපි) මා විචාරව, එය ප්‍රත්‍යක්ෂ කොට දතානත්තකු සෙයින් තොපට ප්‍රකාශ කරම්හ. ලොවැ අනෙක ස්වරූප වූ යම් දුක් කෙනෙක් ඇද්ද, ඒ හැම දුඃඛයෝ (තෘෂ්ණාදී) උපධි හෙතුයෙන් උපදනාහ.

4-3. අපණ්ඩිත වූ යමෙක් (තෘෂ්ණාදි) උපධිය කෙරේ ද, අඥාන වූ හෙතෙම පුනපූනා සසර දුකට පැමිණෙයි. එහෙයින් (සංසකාරයන් අනිත්‍යාදි විසින්) දනාතේ සසරදුක ජාතිය ප්‍රභව කොට ඇතැ'යි දක්නේ (තෘෂ්ණාදි) උපධිය නො කරන්නේ යි.

4-4. (ආයුෂ්මත් මෙත්තගූ මෙසේ විචාරයි:) ඇපි යමක් විචාළමෝ ද එය මුඹ වහන්සේ අපට වදාළ සේක. අන් කරුණකුදු මුඹ වහන්සේ විචාරම්හ, එය දූන් වදාළ මැනැව, නුවණැත්තෝ (කාමාදි චතුර්විධ) ඔසයත්,ජාති,ජරා,ශෝක,පරිදේව දුකත් කෙසේ ඉක්මවත් ද? සර්ව ඥ මුනිවූ මුඹ වහන්සේ අයදිමි. එය මට විසඳා වදාළ මැනැව. යම් හෙයකින් මුඹ වහන්සේ විසින් තෙල දහම (සත්ත්වයන් විසින් අවබොධ කරන සේ පැනවීම් වශයෙන්) දන්නා ලද ද එහෙයිනි.

4-5. (බුදුහු මෙසේ වදාළහ: ''මෙත්තගූ මාණවකය, )ස්මෘතිමත් වැ හැසිරෙනුයේ දක්නාලද දුඃඛාදි ධර්මයෙහි නොහොත් මෙ අත්බැවහි මැ ආත්ම ප්‍රත්‍යක්ෂ වූ යම් දහමක් දූන ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කරන්නේ නම් ඒ නිර්වාණධර්මය ද (නිර්වාණගාමිනී ප්‍රතිපද්ධර්මය ද) තොපට ප්‍රකාශ කරන්නෙමි''යි.

4-6. මහර්ෂීන් වහන්ස, ස්මෘතිමත් වැ හැසිරෙනුයේ යම් දහමක් දූන ලොවැ විසත්තිකා (තෘෂ්ණා)ව තරණය කරන්නේ නම්, මම මුඹ වහන්සේ ගේ ඒ (ධර්මද්‍යොතක) වචනය ද රුස්මි, උත්තම වූ ඒ ධර්මය ද රුස්මි.

4–7 යං කිඤ්චි සම්පජානාසි[1] (මෙත්තගූ'ති භගවා)
උද්ධං අධො තිරියං චාපි මජ්ඣෙ
එතෙසු නන්දිං[2] ච නිවෙසනං ච
පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ.

4–8 එවංවිහාරී සතො අප්පමත්තො
භික්ඛු චරං හිත්වා මමායිතානි
ජාතිං ජරං සොකපරිද්දවඤ්ච[3]
ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං.

4–9 එතාභිනන්දාමි වචො මහෙසිනො (ඉච්චායස්මා මෙත්තගූ)
සුකිත්තිතං ගොතම නූපධීකං
අද්ධා හි භගවා පහාසි දුක්ඛං
තථා හි තෙ විදිතො එස ධම්මො.

4–10 තෙ චාපි නූන පජහෙය්‍යු දුක්ඛං
යෙ ත්වං මුනි අට්ඨිතං ඔවදෙය්‍ය
තං තං නමස්සාමි සමෙච්ච නාග
අප්පෙව මං (භගවා) අට්ඨිතං ඔවදෙය්‍ය.

4–11 යං බ්‍රාහ්මණං වෙදගුං[4] ආභිජඤ්ඤා (මෙත්තගූ'ති භගවා)
අකිඤ්චනං කාමභවෙ අසත්තං
අද්ධා හි සො ඔඝමිමං අතාරි
තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො.

4–12 විද්වා ච යො[5] වෙදගූ නරො ඉධ
භවාභවෙ සඞ්ගමිමං විසජ්ජ
සො වීතතණ්හො අනීඝො නිරාසො
අතාරි සො ජාතිජරන්ති බ්‍රූමී ති.

**මෙත්තගූමාණව පුච්ඡා — නිට්ඨිතා**

1. සංජානිසි—ව—වි
2. නන්දිං ච—ව—වි
3. පරිදෙවංච—ව—වි
4. වෙදගු මභිජඤ්ඤා—සු
5. විද්වාච සො—PTS.

4–7. (බුදුහු මෙසේ වදළහ: මෙත්තගු මාණවකය,අනාගතකාලාදි) උඩ ද (අතීතකාලාදි) යට ද (වර්තමාන කාලාදි) මැද සරස ද වූ යම් කිසි ධර්මජාතයක් තෙපි දන්නවූ නම් තෙල උද්ධාදි ධර්මයෙහි තෘෂ්ණාව ද දෘෂ්ටිනිවෙසනය ද අභිසංස්කාර විඥානය ද දුරු කරව, දුරු කොට (දෙවැදෑරුම්) භවයෙහි නො සිටිනෝ යි.

4–8. මෙසේ වාසය කරනසුලු ස්මෘතිමත් වූ අප්‍රමත්ත වූ මහණ තෙම මමත්වයන් හැරපියා හැසිරෙනුයේ විද්වත් වූයේ මෙ සස්නෙහි මැ නොහොත්, මෙ අත්බව්හි මැ ජාතිය ද ජරාව ද සෝක–පරිදේව දුක ද දුරලන්නේ යි.

4–9. (ආයුෂ්මත් මෙත්තගු මෙසේ විචාරයි:) මහර්ෂි වූ ඔබ වහන්සේ ගේ තෙල වචනය පිළිගනිමි. ගෞතමයන් වහන්ස, (ඔබ වහන්සේ විසින් නිරුපධි වූ නිර්වාණය මොනොවට ප්‍රකාශ කරනලද. යම් හෙයින් බුදුහු එකාන්තයෙන් වෘත්තදුඃඛය දුරලූහු ද එහෙයින් මැ ඔබ වහන්සේ විසින් තෙල දහම දන්නාලද.

4–10. මුනි වූ සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේ යම් කෙනකුන්ට සකසා (හැම කල්හි හෝ) ඔවා දෙන සේක් ද, ඔහුදු දුක් දුරලන්නාහ'යි හඟිමි. බුද්ධනාගයන් වහන්ස, එහෙයින් එළඹ ඔබ වහන්සේ නමදිමි. භාග්‍යවතුන් වහන්සේ මට එක්වන් අවවාද කරන්නාහු නම් මැනැව.

4–11. (බුදුහු මෙසේ වදළහ: මෙත්තගු මාණවකය,) තෙපි බාහිතපාපි බ්‍රාහ්මණ වූ යමක්හු මාර්ගඥානයෙන් නිවනට පැමිණියකු කොට (රාගාදි) කිඤ්චන රහිතයකු කොට කාමයෙහි ද භවයෙහි ද නො ඇලුණාක්හු කොට දන්නවූ ද, ඒකාන්තයෙන් හෙතෙම මේ (කාමාදි) චතුරොඝය තරණය කෙළේ යැ. ඔඝතරණය කළා වූ ද (රාගාදි) ඛිල රහිත වූ (දුඃඛාදියෙහි) කාංක්ෂා රහිත වූ හෙතෙම නිර්වාණපාරයට ගියේ ය.

4–12. තවද මෙ සස්නෙහි (ආත්මභවයෙහි හෝ) විද්වත් වූ ඥාන වේදයෙන් නිවනට පැමිණි යම් සත්ත්වයෙක් කුදුමහත් භවයෙහි මෙ (රාගාදි) සඞ්ගය දුරලා සිටියේ ද විගත තෘෂ්ණා ඇති හෙතෙම අනුපද්‍රව වූයේ ආශා රහිත වූයේ වෙයි. හෙතෙම ජාති ජරා (මරණය) තරණය කෙළේ යයි කියමි.

මෙත්තගු මාණවක පෘච්ඡා නිමි.

## 5. ධොතකමාණව පුච්ඡා

5–1 පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං (ඉච්චායස්මා ධොතකො)
වාචා'භිකඞ්ඛාමි මහෙසි තුය්හං
තව සුත්වාන නිග්ඝොසං[1]
සික්ඛෙ නිබ්බානමත්තනො.

5–2 තෙන හාතප්පං කරොහි (ධොතකා'ති භගවා)
ඉධෙව නිපකො සතො
ඉතො සුත්වාන නිග්ඝොසං
සික්ඛෙ නිබ්බානමත්තනො.

5–3 පස්සාමහං දෙව මනුස්ස ලොකෙ (ඉච්චායස්මා ධොතකො)
අකිඤ්චනං බ්‍රාහ්මණමිරියමානං
තං තං නමස්සාමි සමන්තචක්ඛු
පමුඤ්ච මං සක්ක[2] කථංකථාහි.

5–4 නාහං සහිස්සාමි[3] පමොචනාය (ධොතකා'ති භගවා)
කථංකථිං ධොතක කඤ්චි ලොකෙ
ධම්මං ච සෙට්ඨං ආජානමානො
එවං තුවං ඔඝමිමං තරෙසි.

5–5 අනුසාස බ්‍රහ්මෙ කරුණායමානො (ඉච්චායස්මා ධොතකො)
විවෙකධම්මං යමහං විජඤ්ඤං
යථාහං[4] ආකාසො'ව අව්‍යාපජ්ජමානො[5]
ඉධෙව සන්තො අසිතො චරෙය්‍යං.

5–6 කිත්තයිස්සාමි තෙ සන්තිං[6] (ධොතකා'ති භගවා)
දිට්ඨෙ ධම්මෙ අනීතිහං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

1. නිඝොසං—වි—ච
2. මං මඝ—වි—ච
3. ස ගමිස්සාමි—සී—මු
4. යථාහමාකාසො—සු
5. අබ්‍යාපජ්ඣමානො—වි—ච—PTS.
6. තෙ සන්ති—වි—ච

## 5. ධොතකමාණව පෘච්ඡා

5–1. (ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි:) භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි, තෙල වදළ මැනැව. මහර්ෂීන් වහන්ස, මුඹ වහන්සේ ගේ වදන් රුස්නෙමි. මුඹ වහන්සේ ගේ ධර්මනිර්ඝොෂය අසා තමාගේ (රාගාදිය) නිවනු සඳහා (අධිශීලාදියෙහි) හික්මෙන්නෙමි.

5–2. (බුදුහු මෙසේ වදළහ: ධොතකය,) එසේ වී නම් මෙහි ම නුවණැති වැ සිහි ඇති වැ උත්සාහ කරව. මෙහි මාගේ වචන අසා තමාගේ කෙලෙස් නිවනු පිණිස (ත්‍රිවිධ ශික්ෂාහි) හික්මෙන්නේ යැ.

5–3. (ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි:) මම දෙව මිනිස් ලොවැ හැසිරෙන පලිබොධ රහිත වූ (බාහිතපාපී හෙයින්) බ්‍රාහ්මණ වූ දෙවාති දේවයන් දකිමි. සමතැස් ඇතියාණෙනි. එබඳු වූ මුඹ වහන්සේ නමදිමි. ශාක්‍යයන් වහන්ස, විචිකිත්සායෙන් මා මුදනු මැනැව.

5–4. (බුදුහු මෙසේ වදළහ: ධොතකය,) ලොවැ විචිකිත්සා ඇති කිසිවකු මුදන්නට මම නො හැක්කෙමි, නොහොත් උත්සාහ නො කෙරෙමි. තෙපි ශ්‍රෙෂ්ඨ ධර්මය (නිවන) දන්මින් මෙසේ මේ ඕඝය තරණය කරන්නාවූ යැ.

5–5. (ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි:) ශ්‍රෙෂ්ඨයන් වහන්ස, මම යම් සියලු සංස්කාරයන්ගෙන් විවික්ත වූ නිර්වාණ ධර්මයක් දැනගන් නෙම් නම් යම්සේ මම් ආකාශය සෙයින් නානාප්‍රකාර බවට නො පැමිණෙන් නෙම්, මෙ අස්නෙහි මැ හුන්නෙම් නොහොත් නිවුනෙම්, (තෘෂ්ණා–දෘෂ්ටි) නිශ්‍රය රහිත වැ හැසිරෙන්නෙම් නම් එසෙයින් (මට) අනුකම්පා කෙරෙමින් අනුශාසන කළ මැනව.

5–6. (බුදුහු මෙසේ වදළහ: ධොතකය,) ස්මෘතිමත් වැ හැසිරෙනුයේ දක්නා ලද දුඃඛාදි ධර්මයෙහි නොහොත් මෙ අත්බව්හි මැ ආත්මප්‍රත්‍යක්ෂ වූ යම් දහමක් දැන ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කරන්නේ නම් ඒ නිර්වාණ ධර්මය (ද නිර්වාණගාමිනී ප්‍රතිපද් ධර්මය ද) තොපට ප්‍රකාශ කරන්නෙමි.

5–7 තං[1] චාහං අභිනන්දාමි (ඉච්චායස්මා ධොතකො)
මහෙසි සන්ති මුත්තමං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

5–8 යං කිඤ්චි සම්පජානාසි (ධොතකා'ති භගවා)
උද්ධං අධො තිරියං චාපි මජ්ඣෙ
එතං විදිත්වා සඞ්ගො'ති ලොකෙ
භවාභවාය මාකාසි තණ්හන්ති.

ධොතකමාණව පුච්ඡා — නිට්ඨිතා.

---

## 6. උපසීවමාණව පුච්ඡා

6–1 එකො අහං සක්ක, මහන්ත මොඝං (ඉච්චායස්මා උපසීවො)
අනිස්සිතො නො විසහාමි තරිතුං[2]
ආරම්මණං බ්‍රෑහි සමන්තචක්ඛු
යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යං.

6–2 ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා (උපසීවා'ති භගවා)
නත්ථීති නිස්සාය තරස්සු ඔඝං
කාමෙ පහාය විරතො කථාහි
තණ්හක්ඛයං නත්තමහාභිපස්ස[3].

6–3 සබ්බෙසු කාමෙසු යො වීතරාගො (ඉච්චා යස්මා උපසීවො)
ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වා අඤ්ඤං[4]
සඤ්ඤා විමොක්ඛෙ පරමෙ'ධිමුත්තො
තිට්ඨෙ නු සො තත්ථ අනානුයායී[5]

6–4 සබ්බෙසු කාමෙසු යො වීතරාගො (උපසීවාති භගවා)
ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං
සඤ්ඤාවිමොක්ඛෙ පරමෙ'ධිමුත්තො
තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී.

1. තංචාහමභිනන්දාමි–සු
2. තාරිතුං ජ–සං,
3. රත්තිමහාභිපස්ස–ච–වි
4. හිත්වා මඤ්ඤං–ම–ජ–සං
5. අනානුවායී–ච–වි
අධිමුත්තො–P T S

5–7. (ආයුෂ්මත් ධොතක මෙසේ කී:) මහර්ෂීන් වහන්ස, ස්මෘතිමත් වැ හැසිරෙනුයේ යම් දහමක් දැන ලොවැ විසත්තිකා (තෘෂ්ණා) ව තරණය කරන්නේ නම් මම මුඹ වහන්සේ ගේ ඒ ධර්මද්‍යොතක වචනය ද රුස්මි, උත්තම වූ ඒ ශාන්තිය ද රුස්මි.

5–8. (බුදුහු මෙසේ වදළහ: ධොතකය,) (අනාගතකාලාදි) උඩ ද (අතීතකාලාදි) යට ද (වර්තමාන කාලාදි) මැද සරස ද වූ යම් කිසි ධර්ම ජාතයක් තෙපි දන්නාවූ නම් තෙල ලොවැ සඞ්ග (ලග්නා තැන) යැ යි දැනැ කුදුමහත් භවයෙහි තෘෂ්ණා නො කරව යි,

ධොතක මාණව පෘච්ඡා නිමි.

---

## උපසීව මාණව පෘච්ඡා

6–1. (ආයුෂමත් උපසීව මෙසේ විචාරයි:) ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්ස, එකලා වූ මම (කිසි පුහුලකු හෝ දහමක් හෝ) ඇසුරු නො කෙළෙම් මහත් වූ (කාමාදි) ඔඝය තරණය කරන්නට නො හැකි වෙමි. සමතැස් ඇති සර්‍වඥයන් වහන්ස, (යම් පුහුලකු හෝ දහමක් ඇසුරු කෙළෙම්) මේ කෙලෙස් වතුරු තරණය කෙරෙම් නම් ඒ නිශ්‍රය වදළ මැනැවි.

6–2. (බුදුහු මෙසේ වදළහ: උපසීව මාණවකය,) සිහි ඇතියෙහි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය (අනිත්‍යාදි විසින්) දක්මින් 'නත්ථි කිඤ්චි'යි පැවැති ඒ සමවත ඇසුරු කොට වතුරෝඝය තරණය කර. වස්තුකාම ක්ලේශකාම හැරපියා කථංකථා සඞ්ඛ්‍යාත විචිකිත්සායෙන් වැළැකුණෙහි රෑදවල්හි තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත නිවන විහූත කොට දක්නෙහි.

6–3. (ආයුෂමත් උපසීව මාණවක මෙසේ විචාරයි:) යමෙක් සියලු කාමයන්හි පහ වූ රාග ඇතියේ අන්‍ය වූ යට සමවත් හැරපියා ආකිඤ්චඤ්ඤා යතනය ඇසුරු කෙළේ උත්තම වූ සංඥාවිමොක්ෂයෙහි ඇලුණේ නම් හෙතෙම ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි වියොගයට නො යන සුලු වැ සිටිනේ ද?

6–4. (බුදුහු මෙසේ වදළහ: උපසීව මාණවකය,) යමෙක් සියලු කාමයන්හි වීතරාග වූයේ අන්‍ය වූ යට සමවත් හැරපියා ආකිඤ්චඤ්ඤා යතනය ඇසුරු කෙළේ උත්තම වූ සංඥා විමොක්ෂයෙහි ඇලුණේ නම් හෙතෙම (එයින්) නො පිරිහෙමින් ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි (කප් සැටදහසක්) සිටිනේ යි.

6–5 තිට්ඨෙ චෙ සො තත්ථ අනානුයායී (ඉච්චායස්මා උපසීවො)
පූගම්පි වස්සානං සමන්තචක්ඛු
තත්ථෙව සො සීති සියා[1] විමුත්තො
චවෙථ[2] විඤ්ඤාණං තථාවිධස්ස.

6–6 අච්චි යථා වාතවෙගෙන ඛිත්තා (උපසීවා'ති භගවා)
අත්ථං පලෙති න උපෙති සඞ්ඛං
එවං මුනී නාමකායා විමුත්තො
අත්ථං පලෙති න උපෙති[3] සඞ්ඛං.

6–7 අත්ථං ගතො සො උදවා[4] සො නත්ථි (ඉච්චායස්මා උපසීවො)
උදාහු වෙ සස්සතියා අරොගො
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො.

6–8 අත්ථං ගතස්ස න පමාණමත්ථි (උපසීවාති භගවා)
යෙන නං වජ්ජු තං තස්ස නත්ථි
සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු
සමූහතා වාදපථාපි සබ්බෙ'ති.

උපසීවමාණව පුච්ඡා නිට්ඨිතා.

---

## 7. නන්දමාණව පුච්ඡා

7–1 සන්ති ලොකෙ මුනයො (ඉච්චායස්මා නන්දො)
ජනා වදන්ති තයිදං කථංසු
ඤාණූපපන්නං නො මුනිං වදන්ති
උදාහු වෙ ජීවිතෙනූපපන්නං.

7–2 න දිට්ඨියා න සුතියා න ඤාණෙන (නන්ද'ති භගවා)
මුනීධ නන්ද කුසලා වදන්ති
විසෙනි කත්වා අනීඝා නිරාසා
චරන්ති යෙ තෙ මුනයො'ති බෘමි.

---

1. සො තියා විමුත්තො—ච–ථි
2. භාවෙථ—උ–ච–ථි
3. නොපෙති—සු
4. උදහිසො නත්ථි—ච–ථි

6–5. (ආයුෂ්මත් උපසීව මෙසේ විචාරයි:) සමතැස් ඇති සර්‍වඥයන් වහන්ස, ඉදින් හෙතෙම එයින් නො පිරිහෙන සුලු වූයේ නොයෙක් හවුරුදු සියදහස් ගණන් ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි සිටිනේ නම් හෙතෙම එහි මැ දුකින් මිදුණේ ශීතිභාවයට පැමිණියේ එහි මැ සිටිනේ ද එබඳු වූවහු ගේ විඤ්ඤානය එහි මැ පිරිනිවේ ද?

6–6. (බුදුහු මෙසේ වදාළහ: උපසීව මාණවකය,) වාතවෙගයෙන් බැහැර කරන (නිවන) ලද ගිනිසිළෙක් යම්සේ අස්තයට යේ ද, (නිවේ ද,) (අසෝ දිගට ගියේ යැ යි) ව්‍යවහාරයට නොයේ ද, එසෙයින් මැ (එහි උපන්) ශෛක්‍ෂමුනි තෙම නාම කයින් මිදුණේ අස්තයට යෙයි. ක්‍ෂත්‍රියා දි ව්‍යවහාරයට නො යෙයි.

6–7. (ආයුෂ්මත් උපසීව මෙසේ විචාරයි:) (මුනීන්ද්‍රයන් වහන්ස,) ඒ පුද්ගල තෙම අස්තයට ගියේ (නිරුද්ධ වූයේ) නොහොත් අවිද්‍යමාන වූයේ ද? නොහොත් ඒකාන්තයෙන් ශාශ්වතභාවයෙන් අරොග වූයේ (අවිපරිණාම ස්වභාව, ඇත්තේ) සිටිනේ ද? මුනීන්ද්‍රයන් වහන්ස, එය මට මැනැවින් ප්‍රකාශ කළ මැනැව. යම් හෙයකින් මුඹ වහන්සේ විසින් තෙල දහම දන්නා ලද ද එහෙයිනි.

6–8. (බුදුහු මෙසේ වදාළහ: උපසීව මාණවකය,) අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවියාහට (රූපාදි) ප්‍රමාණයෙක් නැත. (රාගාදි) යමෙකින් ඔහුට කියන්නාහු නම් එය ඔහුට නැත. (ස්කන්ධාදි) සියලු දහම් නැසූ කල්හි හැම (කෙලශාදි) වාදපථයෝ ද නසන ලදහ'යි.

උපසීව මාණවක ප්‍රශ්ණා නිමි.

## 7. නන්‍දමාණවක ප්‍රශ්ණා

7–1. (ආයුෂ්මත් නන්‍දමාණවක මෙසේ විචාරයි:) 'ලොවැ මුනිහු ඇත්තාහ'යි ජනයෝ කියති. එය කෙසේ ද? (සමාපත්ති–අභිඥා) ඥානයෙන් සමුපෙත වූවහු 'මුනි' යැයි කියත් ද? නොහොත් රූක්‍ෂ ජීවිතයෙන් සමුපෙත වූවහු 'මුනි' යැ යි කියත් ද?

7–2. (බුදුහු මෙසේ වදාළහ: නන්‍දය,) මෙ සස්නෙහි (ස්කන්ධාදියෙහි) දක්‍ෂයෝ දෘෂ්ටියෙන් ශ්‍රැතියෙන් ඥානයෙන් 'මුනි' යැයි නො කියති. යම් කෙනෙක් කෙලෙස් සෙනඟ නසා (රාගාදි) ව්‍යසන රහිත වැ ආශා රහිත වැ හැසිරෙත් නම් ඔහු 'මුනිහු' යැ යි මම කියමි.

7–3 යෙ කෙචි'මෙ සමණබ්‍රාහ්මණා සෙ (ඉච්චායස්මා නන්දො)
දිට්ඨෙ[1] සුතෙනාපි වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං
කච්චි සු තෙ භගවා තත්ථ යතා චරන්තා
අතාරු ජාතිං ච ජරං ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

7–4 යෙ කෙචි'මෙ සමණබ්‍රාහ්මණා සෙ (නන්දා'ති භගවා)
දිට්ඨෙ සුතෙනාපි වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං
කිඤ්චාපි තෙ තත්ථ යතා චරන්ති
නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි.

7–5 යෙ කෙචි'මෙ සමණබ්‍රාහ්මණා සෙ (ඉච්චායස්මා නන්දො)
දිට්ඨෙ[2] සුතෙනාපි වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං.

7–6 තෙ[3] චෙ මුනී බ්‍රෑහි අනොඝතිණ්ණෙ[4]
අථ කො චරහි දෙවමනුස්සලොකෙ
අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

7–7 නාහං[5] සබ්බෙ සමණබ්‍රාහ්මණා සෙ (නන්දාති භගවා)
ජාති ජරාය නිවුතා'ති බ්‍රෑමි
යෙ සුධ දිට්ඨං ව සුතං මුතං වා
සීලබ්බතං වාපි පහාය සබ්බං
අනෙකරූපම්පි පහාය සබ්බං
තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ
තෙ[6] වෙ නරා ඔඝතිණ්ණා'ති බ්‍රෑමි.

---

1. දිට්ඨෙන-සු
දිට්ඨසුතෙන-ච-චි-PTS.
දිට්ඨස්සුත්තෙන-ම ජ සං
2. කච්චිස්සු-චි-ච PTS.
3. සචෙ-උ-සු
4. අනොඝ තිණ්ණා-උ-ච-චි
5. නාචාහං-ච-චි
6. යෙ තෙ නරා-උ

7-3. (ආයුෂමත් නන්දමාණවක මෙසේ විචාරයි:) භාග්‍යවතුන් වහන්ස, යම් කිසි මහණ බමුණු කෙනෙක් දෘෂ්ටයෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය (මුක්තිය) කියත් නම් ශීල ව්‍රතයෙනුදු ශුද්ධිය කියත් නම්, අනේකවිධ කෞතුහලමඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් නම්, නිදුකාණන් වහන්ස, කිම ඔහු (ඒ දෘෂ්ටිගතිකයෝ) ඒ දෘෂ්ටියෙහි ගුප්ත වැ වසන්නාහු ජාතිය ත් ජරාව ත් තරණය කළාහු ද? භාග්‍යවතුන් වහන්ස මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල කරුණ වදළ මැනැව.

7-4. (බුදුහු මෙසේ වදළහ: නන්දය,) යම් කිසි මේ මහණ බමුණු කෙනෙක් දෘෂ්ටයෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය කියත් ද ශීල ව්‍රතයෙනුදු ශුද්ධිය කියත් ද, අනෙකවිධ කෞතුහලමඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් ද, වැළිත් ඔහු ඒ දෘෂ්ටියෙහි ගුප්ත වැ වෙසෙත් නම් ජාතියත් ජරාවත් තරණය නො කළාහ' යි කියමි.

7-5,6 (ආයුෂමත් නන්දමාණවක මෙසේ විචාරයි:) භාග්‍යවතුන් වහන්ස, යම් කිසි මේ මහණබමුණු කෙනෙක් දෘෂ්ටයෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය කියත් ද, ශීලව්‍රතයෙනුදු, ශුද්ධිය කියත් ද අනේකවිධ කෞතුහල මඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් ද මුනීන්ද්‍රයන් වහන්ස, ඉදින් ඒ දෘෂ්ටි ගතිකයන් ඔඝ තරණය නො කළවුනැ'යි වදරන්න වූ නම්, නිදුකාණන් වහන්ස, වැළිත් දෙව්මිනිස් ලොවැ කවරෙක් ජාතිය ත් ජරාව ත් තරණය කෙළේ ද? භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල කරුණ වදළ මැනැවි.

7-7. (බුදුහු මෙසේ වදළහ: නන්දය,) මම් හැම මහණ බමුණහු ජාති ජරා විසින් අවුරන ලදහ'යි නො කියමි. මෙලොව්හි යම් කෙනෙක් හැම දෘෂ්ටිශුද්ධිය ද ශ්‍රැතශුද්ධිය ද මුතශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද හැරපියා හැම අනෙකවිධ කෞතුහලමඞ්ගල ශුද්ධිය ද හැරපියා තෘෂ්ණාව පිරිසිඳ දන අනාස්‍රව වූවාහු ද එ සත්හු ඒකාන්තයෙන් ඕඝතරණය කළාහ යි කියමි.

7–8 එතාභිනන්දාමි වචො මහෙසිනො (ඉච්චායස්මා නන්දො)
සුකිත්තිතං ගොතම නූපධීකං
යෙ සුධ දිට්ඨං ච සුතං මුතං වා
සීලබ්බතං වාපි පහාය සබ්බං
අනෙකරූපම්පි පහාය සබ්බං
තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ
අහම්පි තෙ ඔඝතිණ්ණා'ති බ්‍රූමීති.

නන්දමාණව පුච්ඡා — නිට්ඨිතා.

---

## 8. හෙමකමාණව පුච්ඡා

8–1 යෙ මෙ පුබ්බෙ වියාකංසු (ඉච්චායස්මා හෙමකො)
හුරං[1] ගොතමසාසනා
ඉච්චාසි[2] ඉති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං
සබ්බං තං තක්කවඩ්ඪනං
නාහං තත්ථ අභිරමිං.

8–2 ත්වං ච මෙ ධම්මමක්ඛාහි
තණ්හා නිග්ඝාතනං මුනි
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

8–3 ඉධ දිට්ඨ – සුත – මුත[3] –
විඤ්ඤාතෙසු පියරූපෙසු හෙමක
ඡන්දරාග[4]විනොදනං
නිබ්බානපදමච්චුතං.

8–4 එතදඤ්ඤාය යෙ[5] සතා
දිට්ඨධම්මාභිනිබ්බුතා
උපසන්තා ච තෙ සදා
තිණ්ණා ලොකෙ විසත්තිකන්ති.

හෙමකමාණව පුච්ඡා — නිට්ඨිතා.

---

1. හුදං–ච–වි
2. ඉච්ඡාමි ඉති–ච–වි
3. සුතමුතං–සු–ච–වි
4. ඡන්ද භව විනොදනං–ච–වි
5. එත මඤ්ඤාය මෙසත–ච–වි

7–8. (ආයුෂ්මත් නන්දමාණවක මෙසේ කියයි:) මහර්ෂි වූ මුඹ වහන්සේ ගේ තෙල වදන් මම රුස්මි, ගෞතමයන් වහන්ස, උපධි රහිත වූ නිවන මෙනොවට ප්‍රකාශ කරන ලද යැ. මෙ ලොව්හි යම් කෙනෙක් හැම දෘෂ්ටි ශුද්ධිය ද ශ්‍රැතශුද්ධිය ද මුතශුද්ධිය ද ශීලව්‍රත ශුද්ධිය ද හැරපියා අනෙකවිධ වූ හැම කොතුහල මඩ්ගල ශුද්ධිය ද හැරපියා තෘෂ්ණාව ත්‍රිවිධ පරිඥායෙන් පිරිසිඳ දැන අනාස්‍රව වූවාහු නම් මම ද ඔහු 'ඔඝතරණය කළාහ'යි කියමි.

නන්දමාණව පෘච්ඡා නිමි.

---

## 8. හේමක මාණව පෘච්ඡා

8–1. (ආයුෂමත් හෙමක මාණවක මෙසේ කී:) භාග්‍යවතුන් වහන්ස, පෙර (බාවරී බ්‍රාහ්මණ දි යම් කෙනෙක් ගෞතම ශාසනයෙන් පළමු 'මෙසේ වී ල' 'මෙසේ වන්නේ ල' යි (යම් දහමක් මට ප්‍රකාශ කළාහු ද එ හැම 'මෙසේ මෙසේ යැ'යි උපන් කථායෙක. එ හැම !(කාමවිතර්කාදි) තර්ක වඩනාසුලු යැ. මම එහි නො ඇලුණෙමි.

8–2. මුනීන්ද්‍රයන් වහන්ස, යම් දහමක් දැන සිහි ඇති වැ හැසිරෙනුයේ ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කරන්නේ නම් එබඳු වූ, තෘෂ්ණාව වනසන දහමක් මුඹ වහන්සේ මට වදළ මැනව.

8–3. හෙමක මාණවකය, මෙලො වැ රූපායතන ශබ්දයතන ගන්ධ–රස–ස්පෘෂ්ටව්‍යායතන ධර්මායතන සඞ්ඛ්‍යාත වූ ප්‍රිය ස්වභාවයන්හි ඡන්දරාගය දුරු කිරීම ව්‍යුති රහිත වූ නිර්වාණපදය වෙයි.

8–4. ස්මෘතිමත් වූ දක්නාලද (අනිත්‍යාදි) දහම් ඇති යම් රහත් කෙනෙක් තෙල අමාමහනිවන (මාර්ගඥානයෙන්) දැන (ක්ලෙශ පරිනිර්වාණයෙන් පිරිනිවියාහු සන්හිඳුණාහු ද වෙත්. නම් ඔහු හැම කල්හි ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කළාහු වෙත්.

හේමක මාණව පෘච්ඡා නිමි.

## 9. තොදෙය්‍යමාණවපුච්ඡා

9–1 යස්මිං කාමා න වසන්ති (ඉච්චායස්මා තොදෙය්‍යො)
තණ්හා යස්ස න විජ්ජති
කථංකථා ච යො තිණ්ණො
විමොක්ඛො තස්ස කීදිසො.

9–2 යස්මිං කාමා න වසන්ති (තොදෙය්‍යාති භගවා)
තණ්හා යස්ස න විජ්ජති
කථංකථා ච යො තිණ්ණො
විමොක්ඛො තස්ස නාපරො.

9–3 නිරාසසො[1] සො උද ආසසානො (ඉච්චායස්මා තොදෙය්‍යො)
පඤ්ඤාණ[2] වා සො උද පඤ්ඤකප්පී
මුනිං අහං සක්ක යථා විජඤ්ඤං
තං මෙ වියාචික්ඛ සමන්තචක්ඛු.

9–4 නිරාසසො සො න සො ආසසානො
පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පී
එවම්පි තොදෙය්‍ය මුනිං විජාන
අකිඤ්චනං කාමභවෙ අසත්තන්ති.

තොදෙය්‍යමාණවපුච්ඡා — නිට්ඨිතා.

---

## 10. කප්පමාණවපුච්ඡා

10–1 මජ්ඣෙ සරස්මිං[3] තිට්ඨතං[4] (ඉච්චායස්මා කප්පො)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ
ජරාමච්චුපරෙතානං
දීපං[5] පබ්‍රෑහි මාරිස
ත්වං ච මෙ දීපමක්ඛාහි
යථයිදං නාපරං සියා.

1. නිරාසංසො - PTS.
2. පඤ්ඤාණං වා සො - මජසං
3. පරස්මිං — වි — ච
4. තිට්ඨන්ති — වි — ච
5. දීපං — වි — ච

## 9. තෝදෙය්‍ය මාණවක පෘච්ඡා

9–1. (ආයුෂ්මත් තොදෙය්‍ය මාණවක මෙසේ විචාරයි:) යමක්හු කෙරෙහි කාමයෝ නො ලගිත් ද, යමක්හට තෘෂ්ණාව නැද්ද, යමෙක් විචිකිත්සාවත් තරණය කෙළේ ද, ඔහු ගේ විමොක්ෂය කෙබඳු ද?

9–2. (බුදුහු මෙසේ වදළහ: තොදෙය්‍ය මාණවකය,) යමක්හු කෙරෙහි කාමයෝ නො ලගිත් ද, යමක්හට තෘෂ්ණාව නැද්ද, යමෙක් විචිකිත්සාවත් තරණය කෙළේ ද, ඔහට අන්‍ය විමොක්ෂයෙක් නැති.

9–3. ඒ මුනි තෙම තෘෂ්ණා රහිත වූයේ ද නොහොත් තෘෂ්ණා සහිත වූයේ ද, හේ ප්‍රඥා ඇතියේ ද නොහොත් (සමාපත්ති ආදි) ඥානයෙන් තෘෂ්ණා කල්ප දෘෂ්ටිකල්ප කරනුයේ ද, ශාක්‍යයන් වහන්ස, යම්සේ මම මුනිහු දැනගන්නෙම් නම් සමන්තචක්ෂු වූ භාග්‍යවතුන් වහන්ස, එසෙයින් එකරුණ මට ප්‍රකාශ කළ මැනැව.

9–4. ඒ මුනි තෙම තෘෂ්ණා රහිත වෙයි, හේ තෘෂ්ණා සහිත වූයේ නො වෙයි. හේ ප්‍රඥා ඇත්තේ යැ නො ද (සමාපත්ති ආදි ) ඥානයෙන් තෘෂ්ණාකල්ප දෘෂ්ටිකල්ප කරනුයේ වෙයි. තොදෙය්‍ය මාණවකය, මෙසේ (තෙපි) කාමයෙහි ද භවයෙහි ද නො ඇලුණු පලිබොධ නැතියහු 'මුනි' යැ යි දැනගනුව' යි.

තෝදෙය්‍යමාණව පෘච්ඡා නිමි.

## 10. කප්පමාණව පෘච්ඡා

10–1. (ආයුෂ්මත් කප්පමාණවක මෙසේ විචාරයි:) නිදුකාණන් වහන්ස, (පෙර–පර කෙළවරරහිත බැවින්) මධ්‍ය වූ සංසාරයෙහි සිටුනා වූ ජරායෙන් හා මරණයෙන් හා මඩනා ලද්දවුනට (ජාත්‍යාදි) මහද්භය ඇති (කාමාදි) ඔසය උපන් කල්හි ප්‍රතිෂ්ඨාව වදළ මැනැව. මුඹ වහන්සේ වැළිත් යම්සේ මෙ දුක යළි නො වන්නේ නම් එසෙයින් මට ප්‍රතිෂ්ඨාව වදළ මැනැවි.

10–2 මජ්ඣෙ සරස්මිං තිට්ඨතං (කප්පාති භගවා)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ
ජරාමච්චුපරෙතානං
දීපං පබ්‍රෑමි කප්ප තෙ.

10–3 අකිඤ්චනං[1] අනාදනං
එතං දීපං අනාපරං
නිබ්බානං ඉති නං බ්‍රෑමි
ජරාමච්චුපරික්ඛයං.

10–4 එත දඤ්ඤාය යෙ සතා
දිට්ඨධම්මාභිනිබ්බුතා
න තෙ මාරවසානුගා
න තෙ මාරස්ස පද්ධගූති.

කප්පමාණව පුච්ඡා — නිට්ඨිතා

## 11. ජතුකණ්ණිමාණව පුච්ඡා

11–1 සුත්වාන'හං වීරමකාමකාමිං (ඉච්චායස්මා ජතුකණ්ණි)
ඔඝාතිගං පුට්ඨුමකාමමාගමං
සන්තිපදං බ්‍රෑහි සහජනෙත්ත
යථාතච්ඡං භගවා බ්‍රෑහි මෙතං,

11–2 භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියති
ආදිච්චොව පඨවිං තෙජී තෙජසා
පරිත්තපඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤ
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහානං.

11–3 කාමෙසු විනය ගෙධං (ජතුකණ්ණීති භගවා)
නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො
උග්ගහිතං නිරත්තං වා
මා තෙ විජ්ජිත්ථ කිඤ්චනං.

1. ආකිඤ්චනං–උ–ච–වි

10–2. (බුදුහු මෙසේ වදළහ: කප්පමාණවකය,) මධ්‍ය වූ සසරැ සිටුනා වූ ජරායෙන් හා මරණයෙන් හා මඩනා ලද්දවුනට (ජාත්‍යාදි) මහද්භය ඇති (කාමාදි) ඔඝය උපන් කල්හි ප්‍රතිෂ්ඨාව කප්පය තොපට කියමි.

10–3. අපර ප්‍රතිෂ්ඨා රහිත වූ තෙල ප්‍රතිෂ්ඨාව (රාගාදි) කිසුදුවන (පලිබොධ) රහිත යැ, ආදන (තෘෂ්ණා) රහිත යැ, ජරා මරණ ව්‍යුපශමය වූ එය 'නිවනැ' යි කියමි.

10–4. සමෘතිමත් වූ දක්නා ලද (අනිත්‍යාදි) දහම් ඇති යම් රහත් කෙනෙක් තෙල නිවන දැන (ක්ලේශපරිනිර්වාණයෙන්) පිරිනිවියාහු වෙද්ද, ඔහු මාරවශයට ගියාහු නො වෙති. ඔහු මාරයාගේ මඟ යන්නාහු (පරිවාරකයෝ) නො වෙත් යයි.

කප්පමාණව පෘච්ඡා නිමි.

---

## 11. ජතුකණ්ණිමාණව පෘච්ඡා

11–1. (ආයුෂමත් ජතුකණ්ණිමාණවක මෙසේ විචාරයි:) වීරයන් වහන්ස, මම මුඹ වහන්සේ (කාමයන් නො කැමැති හෙයින්) අකාමකාමී වූ ඔඝය ඉක්ම වූ කෙනකැ යි අසා නිෂ්කාම වූ භාග්‍යවතුන් පුළුවුස්නට ආයෙමි. සහජාත වූ ඥානචක්ෂුස ඇතියාණෙනි ශාන්තිය හා ශාන්තිපදය (නිවන) හා වදළ මැනැව. භාග්‍යවතුන් වහන්ස, තෙල කරුණ තථ්‍ය වූ පරිදි වදළ මැනැව.

11–2. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ තෙද ඇති හිරු තෙදින් පෘථිවිය සෙයින් කාමයන් මැඩලා වාසය කරන සේක් ද, එහෙයින් මහාප්‍රාඥයන් වහන්ස, මෙහි මැ ජාතිජරාවගේ ප්‍රහාණය වූ යම් දහමක් මම දැනගන්නෙම් නම් ඒ දහම මඳ නුවණැති වූ මට වදළ මැනව.

11–3. (බුදුහු මෙසේ වදළහ. ජතුකණ්ණි මාණවකය,) නෛෂ්ක්‍රම්‍යය ක්ෂේම වශයෙන් දැක වස්තුකාම ක්ලේශකාමයෙහි තෘෂ්ණාව දුරු කරව, තෘෂ්ණාදෘෂ්ටි විසින් ගන්නා ලද්දෙක් හෝ හළයුක්තෙක් හෝ (රාගාදි) කිසුදුවනයෙක් හෝ නහමක් තොපට වේවා.

11-4 යං පුබ්බෙ තං විසොසෙහි[1]
පච්ඡා තෙ මාහු කිඤ්චනං
මජ්ඣෙ[2] චෙ නො ගහෙස්සසි
උපසන්තො චරිස්සසි.

11-5 සබ්බසො නාම රූපස්මිං
වීතගෙධස්ස[3] බ්‍රාහ්මණ
ආසවා'ස්ස[4] න විජ්ජන්ති
යෙහි මච්චුවසං වජෙති.

ජතුකණ්ණිමාණව පුච්ඡා — නිට්ඨිතා.

---

## 12. භද්‍රාවුධමාණව පුච්ඡා

12-1 ඔකං[5] ජහං තණ්හච්ඡිදං අනෙජං (ඉච්චායස්මා භද්‍රාවුධො)
නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තං
කප්පං ජහං අභියාචෙ සුමෙධං
සුත්වාන නාගස්ස අපනමිස්සන්ති[6] ඉතො.

12-2 නානා ජනා ජනපදෙහි සඞ්ගතා[7]
තව වීර[8] වාක්‍යං අභිකඞ්ඛමානා[9]
තෙසං තුවං සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො.

12-3 ආදානතණ්හං විනයෙථ සබ්බං (භද්‍රාවුධාති භගවා)
උද්ධං අධො තිරියං චාපි මජ්ඣෙ
යං යං හි ලොකස්මිං උපාදියන්ති
තෙනෙව මාරො අන්වෙති ජන්තුං.

12-4 තස්මා පජානං න උපාදියෙථ
භික්ඛු සතො කිඤ්චනං සබ්බලොකෙ
ආදානසත්තෙ ඉති පෙක්ඛමානො
පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තන්ති.

භද්‍රාවුධමාණව පුච්ඡා — නිට්ඨිතා.

---

1. විසොසෙති — සු
විසොධෙහි — වි — ක
විසොදෙහි — ව
2. මජෙඣ — ව — ක — වි
3. විතරොවස්ස — ව — ක — වි
4. ආසවාස්ස — ව — ක — වි
5. ඔඝං — ව — වි — ක
6. අපනමිස්සන්ති — ව — වි — ක
7. සංගතා — ව — වි — ක
8. ධීර — ව — වි — ක
9. අභිකංඛමානො — ව — වි — ක

11–4. අතීතයෙහි යම් සංස්කාරයෙක් වී නම් එය වියළුව, අනාගත සංස්කාරය තට නහමක් කිඤ්චන (පලිබොධ) වේවා, ඉදින් ප්‍රත්‍යුත්පන්න සංස්කාරයන් (තෘෂ්ණා දෘෂ්ටි විසින්) නො ගන්නෙහි නම් නිවුණෙක් වැ හැසිරෙන්නෙහි.

11–5. බමුණ, සර්වප්‍රකාරයෙන් නාමරූපයෙහි පහකරන ලද තෘෂ්ණා ඇති ඒ රහත්හට යම් ආස්‍රව කෙනකුන් කරණ කොට මාරයාගේ වශයට යා නම්, ඒ ආස්‍රවයෝ නැත්තාහ'යි.

ජතුකණ්ණිමාණව පෘච්ඡා නිමි.

---

## 12. භද්‍රාවුධ මාණව පෘච්ඡා

12–1. (ආයුෂ්මත් භද්‍රාවුධ මෙසේ විචාරයි:) ආලය සඞ්ඛ්‍යාත ඕකය දුරැලූ ෂඩ්විධ තෘෂ්ණාකාය සිඳැලූ, අටලෝදහම්හි නො සැලෙන, අනාගත ප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත නන්දිය දුරැලූ චතුරොඝය තරණය කළා වූ කෙලෙසුන් කෙරෙන් මිදුණු, තෘෂ්ණා–දෘෂ්ටිකල්ප දුරැලූ, ශොභන ප්‍රඥා ඇති බුදුරදුන් වෙසෙසින් අයදිමි. නාග වූ මුඹ වහන්සේ ගේ වදන් අසා (බොහෝ ජනයෝ) මේ පහණ සැයෙන් නික්ම යෙත්.

12–2. වීරයන් වහන්ස, මුඹ වහන්සේ ගේ වදන් කැමැති වූ නානා ජනයෝ අඞ්ගාදි ජනපදයෙන් රැස් වූහු යැ. මුඹ වහන්සේ ඔවුනට දහම් දෙසූව මැනැව. යම් හෙයකින් තෙල දහම් මුඹ වහන්සේ විසින් දන්නා ලද ද එහෙයිනි.

12–3. (බුදුහු මෙසේ වදළහ: භද්‍රාවුධය,) අතීතානාගතවර්තමාන යෙහි වූ හැම ආදන තෘෂ්ණාව (තෘෂ්ණොපාදනය) දුරු කරවු, යම් හෙයකින් ලොවැ (අතීතරූපාදි) යම් යම් වස්තුවක් දැඩි කොට ගනිත් ද, එහෙයින් මැ ස්කන්ධමාර තෙම සත්ත්වයා අනුවැ යෙයි.

12–4. එහෙයින් සමෘතිමත් වූ (සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන්) දන්නා වූ මහණ තෙම මේ ප්‍රජාව 'මෘත්‍යුධෙයයෙහි ඇලිණැ'යි දක්මින් (රූපාදි) ආදනයෙහි ඇලුණු සියලු ලොවැ (රූපාදි) කිසිවක් නො ගන්නේ යැ යි.

භද්‍රාවුධ මාණව පෘච්ඡා නිමි.

## 13. උදයමාණව පුච්ඡා

13–1 ඣායිං විරජමාසීනං[1] (ඉච්චායස්මා උදයො)
කතකිච්චං අනාසවං
පාරගුං සබ්බධම්මානං
අත්ථි පඤ්හෙන ආගමං
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑහි
අවිජ්ජාය පභෙදනං.

13–2 පහානං කාම[2] ච්ඡන්දානං (උදයාති භගවා)
දොමනස්සාන චූභයං
ථීනස්ස ච පනූදනං
කුක්කුච්චානං නිවාරණං

13–3 උපෙක්ඛා සති සංසුද්ධං
ධම්මතක්කපුරෙජවං
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑමි
අවිජ්ජාය පභෙදනං.

13–4 කිං සු සංයොජනො ලොකො (ඉච්චායස්මා උදයො)
කිං සු තස්ස විචාරණං
කිස්සස්ස[3] විප්පහානෙන
නිබ්බානමිති වුච්චති.

13–5 නන්දිසංයොජනො ලොකො (උදයාති භගවා)
විතක්කස්ස විචාරණා
තණ්හාය විප්පහානෙන
නිබ්බානං ඉති වුච්චති.

13–6 කථං සතස්ස චරතො (ඉච්චායස්මා උදයො)
විඤ්ඤාණං උපරුජ්ඣති
භගවන්තං පුට්ඨුමාගම්ම
තං සුණොම වචො තව.

13–7 අජ්ඣත්තං ච බහිද්ධා ච
වෙදනං නාභිනන්දතො
එවං සතස්ස චරතො
විඤ්ඤාණං උපරුජ්ඣතීති.

උදයමාණවපුච්ඡා — නිට්ඨිතා

1. ඣායිං විරජං ආසීනං—ස්‍යා
2. කාම ඡන්දානං—සු
3. කිං ශස්ස විප්පහානෙන—ම-ච වි-ක

## 13. උදයමාණව පෘච්ඡා

13–1. (ආයුෂ්මත් උදය මෙසේ විචාරයි:) ධ්‍යාන කරනසුලු වූ විගත රජස් ඇති වැ වැඩහුන් සිව්මඟින් කළ (සොළොස් වැදෑරුම්) කිස ඇති අනාස්‍රව වූ සියලු ධර්මයන්ගේ පරතෙර පැමිණි භාග්‍යවතුන් වහන්සේ කරා ප්‍රශ්නයෙන් අර්ථී වැ ආයෙමි. අවිද්‍යාව බිඳුනා අඥා විමොක්ෂ සඞ්ඛ්‍යාත නිවන වදළ මැනැව.

13–2. (බුදුහු මෙසේ වදළහ; උදය,) කාමච්ඡන්දයන් ගේ ද දෞර්මනස්‍යයන්ගේ ද යන දෙදෙනාගේ ප්‍රහාණ ය ද ථීනමිද්ධයා ගේ දුරැලීම ද කෞකෘත්‍යයා ගේ වැළකීම ද ඇති—

13–3. චතුර්ථධ්‍යානොපෙක්ෂා—ස්මෘති දෙකින් සංශුද්ධිය ඇති ධර්මතර්ක සඞ්ඛ්‍යාත සම්‍යක්සංකල්පය පෙරටු කොට ඇති අර්හත්ඵල විමොක්ෂය අවිද්‍යාව ගේ බිඳීම යැ යි ප්‍රකාශ කරමි.

13–4. (ආයුෂ්මත් උදය මෙසේ විචාරයි:) ලෝවැසි තෙම කුමක් සංයෝජන කොට ඇත්තේ ද? ඒ ලෝවැසියා ගේ විචාරණය (හැසිරීමට කරුණ) කිම? කිනම් දහමක්හු ගේ ප්‍රහාණයෙන් 'නිවනැ'යි කියනු ලැබේද?

13–5. ලෝවැසි තෙම තෘෂ්ණාව සංයෝජන කොට ඇත්තේ යැ, විතර්කය ඔහුට විචාරණය වෙයි. තෘෂ්ණාව ගේ ප්‍රහාණයෙන් 'නිවනැ' යි කියනු ලැබේ.

13–6. (ආයුෂමත් උදය මෙසේ විචාරයි:) ස්මෘති සම්පන්න වැ වාසය කරන්නහු ගේ විඥානය කිසෙයින් නිරුද්ධ වේ ද? භාග්‍යවතුන් වහන්සේ පුළුවුස්නා සඳහා පැමිණියම්හ, මුඹ වහන්සේ ගේ ඒ වචනය අසම්හ.

13–7. අධ්‍යාත්මාලම්බනයෙහි ද බහිරාලම්බනයෙහි ද උපදනා වෙදනාව නො පතන ස්මෘතිමත් වැ හැසිරෙනුවහු ගේ විඥානය මෙසේ නිරුද්ධ වේ යයි.

**උදය මාණව පෘච්ඡා නිමි.**

## 14. පොසාලමාණව පුච්ඡා

14–1 යො අතීතං ආදිසති (ඉච්චායස්මා පොසාලො)
අනෙජො ඡින්නසංසයො
පාරගූං සබ්බධම්මානං
අත්ථි පඤ්හෙන ආගමං.

14–2 විභූතරූපසඤ්ඤිස්ස
සබ්බකායප්පහායිනො
අජ්ඣත්තං ච බහිද්ධා ච
නත්ථි කිඤ්චීති පස්සතො
ඤාණං සක්කානු[1] පුච්ඡාමි
කථං නෙය්‍යො තථාවිධො.

14–3 විඤ්ඤාණට්ඨිතියො සබ්බා (පොසාලාති භගවා)
අභිජානං තථාගතො
තිට්ඨන්තමෙනං ජානාති
ධිමුත්තං තප්පරායණං.

14–4 ආකිඤ්චඤ්ඤාසම්භවං ඤත්වා[2]
නන්දි සංයොජනං ඉති
එවමෙතං[3] අභිඤ්ඤාය
තතො තත්ථ විපස්සති
එතං ඤාණං තථං තස්ස
බ්‍රාහ්මණස්ස වුසීමතො'ති.

පොසාලමාණව පුච්ඡා — නිට්ඨිතා.

---

## මොඝරාජමාණව පුච්ඡා

15–1 ද්වාහං සක්කං අපුච්ඡිස්සං[4] (ඉච්චායස්මා මොඝරාජා)
න මෙ ව්‍යාකාසි චක්ඛුමා
යාව තතියං ච දෙවිසි[5]
ව්‍යාකරොතීති මෙ සුතං.

---

1. සක්කතනු - ච - වි - ක
2. සම්භවං - උපු
3. එව මෙවං - කෙසුචි.
4. අපුච්ඡිසං - ච - වි - ක
5. දෙසිව - වි - ක

## 14. පොසාලමාණව පෘච්ඡා

14–1. (ආයුෂමත් පොසාල මෙසේ විචාරයි:) තෘෂ්ණා රහිත වූ සිඳුනාලද සැක ඇති යම් සර්වඥ කෙනෙක් ස්වකීය වූ ද පරකීය වූ ද අතීතය (පූර්වනිවාසානුස්මෘති ඥානයෙන්) ප්‍රකාශ කෙරෙත් ද, සියලු ධර්මයන් ගේ පරතෙරට ගිය ඒ සර්වඥයන් කරා ප්‍රශ්නයෙන් අර්ථි වැ ආයෙමි.

14–2. ශාක්‍යමුනින්ද්‍රයන් වහන්ස, ඉක්මවන ලද රූපසංඥා ඇති තදඞ්ගවිෂ්කම්භණ විධින් සියලු රූපකාය ප්‍රහාණය කරන සුලු වූ අධ්‍යාත්මයෙහිද බාහ්‍යයෙහිද කිසිවක් නැතැයි දක්නාහු (ආකිඤ්චඤ්ඤායතනලාභීහු) ගේ ඥානය පුළුවුස්මි. එබඳු වූ පුද්ගල තෙම කිසෙයින් (මත්තෙහි ඥානයට) පැමිණවිය යුත්තේ ද?

14–3. (බුදුහු මෙසේ වදළහ: පොසාලය,) හැම විඥානස්ථිතීන් වෙසෙසින් දන්නා වූ තථාගත තෙමේ ආකිඤ්චඤ්ඤායතනයෙහි අධිමුක්ත වූ එය පරායණ කොට ඇති වැ සිටුනා මේ පුඟුලා දනී.

14–4. ආකිඤ්චඤ්ඤායතනයෙහි උපදවන අරූපරාග සඞ්ඛ්‍යාත තන්දිය ''සංයොජනයෙකැ''යි දැන තෙල මෙසේ ම විශිෂ්ටඥානයෙන් දැන ඉක්බිති එහි (අනිත්‍යාදි වීයින්) විදර්ශනා කෙරෙයි. වැස නිමවූ මාර්ගබ්‍රහ්මචර්යාවාස ඇති බාහිතපාපී වූ ඒ රහත්හු ගේ තෙල අර්හත්මාර්ගඥානය අවිපරීත වේ යයි.

පෝසාලමාණව පෘච්ඡා නිමි.

## 15. මෝඝරාජමාණව පෘච්ඡා

15–1. (ආයුෂමත් මොඝරාජ මෙසේ විචාරයි:) මම දෙවරක් ශාක්‍යමුනිහු විචාළෙමි. චක්ෂුෂ්මත්හු ප්‍රකාශ නො කළහ. දෙවර්ෂිහු තුන්වනවට දක්වා විචාරනලද්දහු ප්‍රකාශ කරන සේකැ යි මා විසින් අසනලද.

15–2 අයං ලොකො පරො ලොකො
බ්‍රහ්මලොකො සදෙවකො
දිට්ඨිං තෙ[1] නාභිජානාති
ගොතමස්ස යසස්සිනො.

15–3 එවං[2] අභික්කන්තදස්සාවිං
අත්ථි පඤ්හෙන ආගමං
කථං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සති.

15–4 සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු
මොඝරාජ සදා සතො
අත්තානුදිට්ඨිං ඌහච්ච
එවං මච්චුතරො සියා
එවං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සතීති.

**මොඝරාජමාණව පුච්ඡා – නිට්ඨිතා**

---

## 16. පිඞ්ගියමාණව පුච්ඡා

16–1 ජිණ්ණො'හමස්මි අබලො වීතවණ්ණො
(ඉච්චායස්මා පිඞ්ගියො)
නෙත්තා න සුද්ධා සවණං න ඵාසු
මාහං නස්සං මොමුහො අන්තරා'ව
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහානං.

16–2 දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ (පිඞ්ගියාති භගවා)
රුප්පන්ති රූපෙසු ජනා පමත්තා
තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො
ජහස්සු රූපං අපුනබ්භවාය.

1. දිට්ඨිං තෙ – කත්ථචි.
2. එතං – සු.

15–2. මෙ මිනිස්ලෝවැසි ද අන් ලෝවැසි ද දෙවියන් සහිත වූ බඹලෝවැසි ද යශසවී වූ ගෞතමගොත්‍ර ඇති මුඹ වහන්සේ ගේ දෘෂ්ටිය නො දනිත්.

15–3. මෙසේ පරමදර්ශී වූ සර්වඥයන් කරා පැන පුළුවුස්නෙන් අර්ථී වැ ආයෙමි, මෘත්‍යුරාජ ලොව කිසෙයින් බලන්නහු නො දකී ද?

15–4. මොඝරාජය, හැම කල්හි සමෘතිමත් වැ සත්කායදෘෂ්ටිය දුරු කොට ලොව ශූන්‍ය තා විසින් බලව, මෙසෙයින් මෘත්‍යුහු ඉක්මවන් නෙහි, මෙසෙයින් ලොව බලන්නහු මෘත්‍යුරාජ නො දක්නේ යි.

මොඝරාජ මාණව පෘච්ඡා නිමි.

---

## 16. පිඞගියමාණව පෘච්ඡා

16–1. (ආයුෂ්මත් පිඞගිය මෙසේ විචාරයි:) මම ජීර්ණයෙමි, දුර්වලයෙමි, විවර්ණයෙමි, (මාගේ) නෙත්‍රයෝ ශුද්ධ නො වෙති. ශ්‍රවණය පහසු නො වෙයි. මම (මුඹ වහන්සේ ගේ දහම් පසක් නො කොට) අතුරෙහි මැ මුළා වූයෙම් නහමක් නැසෙම්වා, මෙ පහණ සැ වෙහෙරෙහි දී මැ ජාතිජරාව ගේ ප්‍රහාණය වූ යම් දහමක් මම් දැනගන්නෙම් නම් ඒ දහම වදළ මැනැව.

16–2. (බුදුහු මෙසේ වදළහ: පිඞගිය,) රූපනිමිත්තින් නැසෙනවුන් දක (කුශල ධර්මයෙහි) ප්‍රමත්ත ජනයෝ රූපනිමිත්තින් පෙළෙති. එහෙයින් පිඞගිය, තෙපි (කුශලධර්මයෙහි) අප්‍රමත්ත වැ පුනර්භවය නො වනු පිණිස රූපය දුරු කරව.

16–3 දිසා චතස්සො විදිසා චතස්සො (ඉච්චායස්මා පිඞ්ගියො)
උද්ධං අධො දසදිසා ඉමායො
න තුය්හං අදිට්ඨං අසුතං අමුතං
අථො අවිඤ්ඤාතං කිඤ්චි නත්ථි ලොකෙ
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහානං.

16–4 තණ්හාධිපන්නෙ මනුජෙ පෙක්ඛමානො (පිඞ්ගියාති භගවා)
සන්තාපජාතෙ ජරසා පරෙතෙ
තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො
ජහස්සු තණ්හං අපුනබ්භවායාති.

පිඞ්ගියමාණව පුච්ඡා – නිට්ඨිතා

---

ඉදමවොච භගවා මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙ පරිචාරකසොළසානං[1] බ්‍රාහ්මණානං අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හං[2] ව්‍යාකාසි, එකමෙකස්ස චෙපි පඤ්හස්ස අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍ය ගච්ඡෙය්‍යෙව ජරාමරණස්ස පාරං. පාරං ගමනීයා ඉමෙ ධම්මා ති තස්මා ඉමස්ස ධම්මපරියායස්ස පාරායනංත්වෙව අධිවචනං.

1. අජිතො තිස්ස මෙත්තෙය්‍යො – පුණ්ණකො අථ මෙත්තගූ
ධොතකො උපසීවො ච – නන්දො ච අථ හෙමකො

2. තොදෙය්‍යකප්පා දුභයො – ජතුකණ්ණී ච පණ්ඩිතො
භද්‍රාවුධො උදයො ච – පොසාලො චාපි බ්‍රාහ්මණො
මොඝරාජා ච මෙධාවී – පිඞ්ගියො ච මහාඉසි

3. එතෙ බුද්ධං උපාගඤ්ඡුං[3] – සම්පන්නචරණං ඉසිං
පුච්ඡන්තා[4] නිපුණෙ පඤ්හෙ – බුද්ධසෙට්ඨං උපාගමුං.

4. තෙසං බුද්ධො ව්‍යාකාසි – පඤ්හෙ පුට්ඨො යථාතථං
පඤ්හානං වෙය්‍යාකරණෙන – තොසෙසි බ්‍රාහ්මණෙ මුනී.

---

1. පරිචාරක සොළසන්නං–P.T.S.
2. පඤ්හෙ–සී.
3. උපගච්ඡුං–ච, වි, ක.
4. පුච්ඡං දනි පුරෙ පඤ්හා–ච, වි, ක.

16–3. සතර දිග යැ සතර අනුදිග යැ උඩ යැ යට යැ යන මේ දසදික් කෙනෙක් වෙත් ද, ලොවැ මෙ හැම තන්හි මුඹවහන්සේ විසින් නො දක්නා ලද නො අසන ලද ආඝ්‍රාණ ස්වාදන සපර්ශන නො කරන ලද යළි නො දන්නා ලද කිසිවක් නැති. මේ පහණසැවෙහෙරෙහි දී මැ ජාතිජරා වගේ ප්‍රහාණය වූ යම (නිර්වාණ) දහමක් මම දැනගන්නෙම් නම් ඒ දහම වදළ මැනැව.

16–4. (බුදුහු මෙසේ වදළහ; පිඞ්ගිය, යම හෙයෙකින් තෙපි) තෘෂ්ණා යෙහි ගැලී සිටි සත්ත්වයන් හටගත් සිත්තැවුලි ඇතියන් ජරායෙන් මඩන ලද්දවුන් වැ දක්න වූ ද, එහෙයින් පිඞ්ගිය තෙපි අප්‍රමත්ත වැ පුනර්භවය නොවනු පිණිස තෘෂ්ණාව දුරු කරවයි.

පිඞ්ගියමාණව පෘච්ඡා නිමි.

---

භාග්‍යවතුන් වහන්සේ මගධරටැ පහණසැ නම වෙහෙරෙහි වැඩ-වසනසේක් (බාවරී තවුසන්ගේ) පරිවාරක (පිඞ්ගිය) හා සමග සොළොස් බමුණන් විසින් අයදනා ලදහු දුන දුනා පුළුවුස්නා ලදහු, පැන විසඳූසේක. ඉදින් යමෙක් එකෙකි පැනයෙකැ පෙළ ඇරුත් දැන පෙළදහම් දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපදනේ නම් හේ ජරාමරණයා ගේ පරතෙරට යන්නේ මැ යැ. යම් හෙයෙකින් මේ ධර්මයෝ (නිර්වාණ) පාරගමනාර්හ වෙත් ද එහෙයින් මේ ධර්මපර්‍යාය 'පාරායණ' යි මැ නම වී.

1. අජිත යැ තිස්සමෙත්තෙය්‍ය යැ පුණ්ණක යැ යළි මෙත්තගූ ය ධොතක යැ උපසීව යැ නන්ද යැ යළි හෙමක යැ,

2. තොදෙය්‍ය–කප්ප දෙදෙනා යැ පණ්ඩිත වූ ජතුකණ්ණි යැ භද්‍රාවුධ යැ උදය යැ පොසාල බ්‍රාහ්මණ යැ නුවණැති මොඝරාජ යැ මහර්ෂි වූ පිඞ්ගිය යැ යන—

3. මොහු සමෘද්ධ වූ පසළොස් චරණධර්ම ඇති ඍෂි වූ බුදුන් කරා පැමිණියහ, සියුම් ප්‍රශ්නයන් පුළුවුස්නාහු බුද්ධශ්‍රේෂ්ඨයන් කරා පැමිණියාහ.

4. පැන පුළුවුස්නා ලද බුදුහු ඔවුනට ඇතිසැටියෙන් ප්‍රකාශ කළහ, සර්වඥමුනිහු පැන විසඳීමෙන් බමුණන් තුටු කළහ.

5. තෙ[1] තොසිතා චක්ඛුමතා – බුද්ධෙනාදිච්චබන්ධුනා
බ්‍රහ්මචරියමචරිංසු – වරපඤ්ඤස්ස සන්තිකෙ.

6. එකමෙකස්ස පඤ්හස්ස – යථා බුද්ධෙන දෙසිතං
තථා යො පටිපජ්ජෙය්‍ය – ගච්ඡෙ පාරං අපාරතො[2]

7. අපාරා පාරං ගච්ඡෙය්‍ය – භාවෙන්තො මග්ගමුත්තමං
මග්ගො සො පාරං ගමනාය – තස්මා පාරායනං ඉති.

8. පාරායනමනුගායිස්සං (ඉච්චායස්මා පිඞ්ගියො)
යථා අද්දක්ඛි තථා අක්ඛාසි
විමලො භූරි මෙධසො
නික්කාමො නිබ්බනො නාගො[3]
කිස්ස හෙතු මුසා භණෙ.

9. පහීනමලමොහස්ස
මානමක්ඛප්පහායිනො
හන්දහං කිත්තයිස්සාමි
ගිරං වණ්ණූපසංහිතං.

10. තමොනුදෙ බුද්ධො සමන්තචක්ඛු
ලොකන්තගූ සබ්බභවාතිවත්තො
අනාසවො සබ්බදුක්ඛප්පහීනො
සච්චව්හයො බ්‍රහ්මෙ උපාසිතො මෙ.

11. දිජො යථා කුබ්බනකං පහාය
බහුප්ඵලං කානනමාවසෙය්‍ය
එවං පහං අප්පදස්සෙ පහාය
මහොදධිං හංසරිවජ්ඣපත්තො.

12. යෙ මෙ පුබ්බෙ වියාකංසු[4]
හුරං ගොතම සාසනා
ඉච්චාසීති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං
සබ්බං තං තක්කවඩ්ඪනං.

1. තතොමතා චක්ඛුමතා—ච, වි, ක.
2. අපාගතො—ච, වි, ක.
3. නාරො—උ. සු.
4. ව්‍යාකංසු—සි.

5. ඔහු පසැස් ඇති සුයඞ්බන්ධු වූ බුදුරජුන් විසින් තුටු කරන ලද්දහු උත්තම ප්‍රාඥ වූ සර්වඥයන් වහන්සේ වෙත බඹසරවස් වුසූහ.

6. එකෙකි පැනයට යම්සේ බුදුරජුන් විසින් වදළ විසැඳුම් වේ ද, යමෙක් එසේ පිළිපදනේ නම් හෙ තෙම අපාර සඞ්ඛ්‍යාත සසරින් පරතෙරට යන්නේ යැ.

7. උතුම් වූ ආයඞීමාර්ගය වඩනුයේ අපාර සඞ්ඛ්‍යාත සසරින් පර තෙරට යන්නේ යැ. පාරගමනයට හේ මාර්ග වෙයි. එහෙයින් 'පාරායණ' නම් වී යයි.

8. (ආයුෂ්මත් පිඞ්ගිය බාවරීහට මෙසේ පැවැසී) පාරායණය බුදුන් වදළ සෙයින් කියනෙම්, (බුදුහු) යම්සේ (සත්‍යාභිසම්බොධයෙන්) දුටු සේක් නම් එසේ වදළහ, නිර්මල වූ විපුලප්‍රඥා ඇති ප්‍රහීණ වූ කාම ඇති කෙලෙස් වල් හෝ තෘෂ්ණා විරහිත බුද්ධනාග තෙමේ කුමක් හෙයින් මුසවා කියන්නේ ද?

9. ප්‍රහීණ වූ මල හා මෝහය හා ඇති මානය හා මකුබව හා දුරැලූ උන් වහන්සේගේ ගුණොපසංහිත වූ වචනය මම එකත්තෙන් කීර්තනය කරනෙම්.

10. බමුණාණෙනි, අවිඳු අඳුර දුරැලූ සමතැස් ඇති ලොකාන්තයට ගිය හැම භවයන් ඉක්ම වූ ආශ්‍රව රහිත වූ සියලු දුක් දුරැලූ සත්‍යනාම ඇති බුදුහු මා විසින් උපාශ්‍රිතයහ.

11. යම්සේ පක්ෂි තෙම කුඩා වනය හැරපියා බොහෝ පලවැළ ඇති වනයකට පැමිණ වසන්නේ ද, එසෙයින් මම් ද (බාවරී ආදි) මඳ නුවණැතියන් හැරපියා (අනාවතප්තාදි) මහවිලකට හංසයකු සෙයින් පැමිණියෙමි.

12. පෙර (බාවරී ආදි) යම් කෙනෙක් ගෞතම ශාසනයෙන් පළමු 'මෙසේ වී ල' 'මෙසේ වන්නේ ල'යි (යම් දහමක්) මට ප්‍රකාශ කළාහු ද එ හැම 'මෙසේ මෙසේ යැ' යි උපන් කථායෙක, එ හැම (කාමවිතර්කාදි) තර්ක වඩනාසුලු යැ.

13. එකො තමනුදසීනො
ජුතිමා[1] සො පභඞ්කරො
ගොතමො භූරිපඤ්ඤාණො
ගොතමො භූරිමෙධසො.

14. යො මෙ ධම්මමදෙසෙසි
සන්දිට්ඨිකමකාලිකං
තණ්හක්ඛයමනීතිකං
යස්ස නත්ථි උපමා ක්වචි.

15. කින්නු තම්හා විප්පවසසි[2]
මුහුත්තමපි පිඞ්ගිය
ගොතමා භූරිපඤ්ඤාණා
ගොතමා භූරිමෙධසා.

16. යො තෙ ධම්මමදෙසෙසි
සන්දිට්ඨිකමකාලිකං
තණ්හක්ඛයමනීතිකං
යස්ස නත්ථි උපමා ක්වචි.

17. නාහං තම්හා විප්පවසාමි
මුහුත්තමපි බ්‍රාහ්මණ
ගොතමා භූරිපඤ්ඤාණා
ගොතමා භූරිමෙධසා.

18. යො මෙ ධම්මමදෙසෙසි
සන්දිට්ඨිකමකාලිකං
තණ්හක්ඛයමනීතිකං
යස්ස නත්ථි උපමා ක්වචි.

19. පස්සාමි නං මනසා චක්ඛුනා ව
රත්තිං දිවං බ්‍රාහ්මණ අප්පමත්තො
නමස්සමානො 'විවසෙමි රත්තිං
තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසං.

---

1. ජාතිමා සී–
2. විප්පවසාසි–ච, වි, ක

13–14. යම් කෙනෙක් මට තමා විසින් දක්ක යුතු ඵල ඇති නො ද කාලාන්තරයෙහි ලැබිය යුතු ඵල ඇති තෘෂ්ණාක්ෂය වූ කෙලෙස් උවදුරු නැති දහම් දෙසූ සේක් ද, යම් කෙනකුන්හට කිසි තැනෙක්හි උපමා නැත් ද ඒ ගෞතමයන් වහන්සේ අසහාය වැ අවිදූ අඳුර දුරලා වැඩ හුන්සේක, ද්‍යුතිමත්හ, ප්‍රභාකරයහ, ඥානධ්වජ ඇති සේක, විපුල ප්‍රඥා ඇති සේකැ'යි.

15–16. පිඞ්ගිය, යම් කෙනෙක් තොපට තමා විසින් දක්කයුතු ඵල ඇති නො ද කාලාන්තරයෙහි ලැබිය යුතු ඵල ඇති තෘෂ්ණාක්ෂය වූ කෙලෙස් උවදුරු නැති දහම් දෙසූහු ද යම් කෙනකුන්හට කිසි තැනෙක්හි උපමා නැත් ද, ඒ ඥානධ්වජ ඇති ගෞතමයන් කෙරෙන් විපුල ප්‍රඥා ඇති ගෞතමයන් කෙරෙන් මොහොතකුදු කිම තෙපි වෙන් වැ වසවු දැ ?යි. (බාවරී කී යැ.)

17–18. බමුණාණෙනි, යම් කෙනෙක් මට තමා විසින් දක්කයුතු ඵල ඇති නො ද කාලාන්තරයෙහි ලැබිය යුතු ඵල ඇති තෘෂ්ණාක්ෂය වූ කෙලෙස් උවදුරු නැති දහම් දෙසූහු ද, යම් කෙනකුන්හට කිසි තැනෙක්හි උපමා නැද්ද ඒ ඥානධ්වජ ඇති ගෞතමයන් කෙරෙන් විපුලප්‍රඥා ඇති ගෞතමයන් කෙරෙන් මොහොතකුදු මම වෙන් වැ නො වෙසෙමි.

19. බ්‍රාහ්මණයෙනි, (මම) අප්‍රමත්ත වූයෙම් දිවරය ඇසින් මෙන් මනසින් ඒ ගෞතම බුදුන් දක්මි, නමස්කාර කෙරෙමින් මැ රය ඉක්මවමි, එයින් මැ අවිප්‍රවාසය හඟිමි.

20. සද්ධා ච පීති ච මනො සති ච
නාපෙන්ති මෙ ගොතමසාසනම්හා
යං යං දිසං වජති භූරිපඤ්ඤො
ස තෙන තෙනෙව නතො'හමස්මි.

21. ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස
තෙනෙව කායො න පලෙති තත්ථ
සංකප්පයත්තාය* වජාමි නිච්චං
මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො.

22. පඞ්කෙ සයානො පරිඵන්දමානො
දීපා දීපං උපපලවිං[1]
අථද්දසාසිං සම්බුද්ධං
ඔඝතිණ්ණමනාසවං.

23. යථා අහු වක්කලි මුත්තසද්ධො
භද්‍රාවුධො ආළවි ගොතමො ච
එවමෙව ත්වම්පි පමුඤ්චස්සු සද්ධං
ගමිස්සසි ත්වං පිඞ්ගිය මච්චුධෙය්‍යස්ස[2] පාරං.

24. එස භීයො පසීදාමි
සුත්වාන මුනිනො වචො
විවත්තච්ඡද්දො[3] සම්බුද්ධො
අඛිලො පටිභානවා.

25. අධිදෙවෙ අභිඤ්ඤාය
සබ්බං වෙදි පරොවරං[4]
පඤ්හානන්තකරො සත්ථා
කඞ්ඛීනං පටිජානතං.

26. අසංහීරං අසංකුප්පං
යස්ස නත්ථි උපමා ක්වචි
අද්ධා ගමිස්සාමි න මෙත්ථ කඞ්ඛා
එවං මං ධාරෙහි අධිමුත්තචිත්තන්ති.

පිඞ්ගියසුත්තන්තං සොළසි

පාරායනවග්ගො නිට්ඨිතො

---

* සංකප්පයත්තාය-මජසං
1. උපප්ලවිං-මජසං, PTS. උප්ලවිං-ව, වි, ක.
2. මච්චුධෙය්‍යපාරං-උ, PTS. මච්චුධෙය්‍යො පාරං-සු
3. විවට්ටච්ඡදෙ-ව, වි, PTS. විවට්ටච්ඡද්දෙ-මජසං
4. පරො පරං-මජසං, PTS.

20. මාගේ ශ්‍රද්ධාව ද ප්‍රීතිය ද මනස ද ස්මෘතිය ද ගෞතමශාසනයෙන් පහවැ නො යෙයි, විපුල ප්‍රඥා ඇති උන් වහන්සේ යම් යම් දසකට වඩනාසේක් ද, ඒ ඒ දසට මැ මම් නමු වූයෙම් වෙමි.

21. ජීර්ණ වූ(එහෙයින් මැ) අල්පවීර්‍ය්‍ය ඇති මාගේ කය එකරුණින් මැ එහි නො යෙයි, සංකල්ප ගමනින් එක්වන් යෙමි. එහෙයින් බ්‍රාහ්මණයෙනි, මාගේ සිත ඒ බුදුන් ඇති තැන්හි යෙදුණේ වෙයි.

22. කාමපඞ්කයෙහි (මඩෙහි)හෝනෙම් හාත්පසින් සැලෙනුයෙම් ශාස්තෘ සඞ්ඛ්‍යාත ද්වීපයෙන් ද්වීපයට පා වැ ගියෙමි. ඉක්බිති (පහණ සැ වෙහෙරෙහි දී) චතුරොඝය තරණය කළ ආශ්‍රව රහිත වූ සම්බුදුන් දිටිමි.

23. මුක්ත ශ්‍රද්ධාඇති වක්කලි ස්ථවිර යැ භද්‍රාවුධ යැ ආළවිගොතම යැ යන මොහු යම් බඳු වූහු ද එසෙයින් මැ තෙපි දු ශ්‍රද්ධායෙහි අධිමුක්ත වව, පිඬගිය, තෙපි මෘත්‍යුධෙය සඞ්ඛ්‍යාත සංසාරයාගේ පාරයට යව.

24. තෙල මම් මුනීන් වහන්සේ ගේ වචනය අසා බෙහෙවින් පහදිමි, සම්බුදුහු පෙරළු (රාගාදි) සියන් ඇතියහ, (රාගාදි) ඛිල රහිතයහ. ප්‍රතිභානප්‍රතිසංවිද් ඥාන ඇතියහ.

25. අධිදේවකර ධර්මයන් ප්‍රත්‍යක්ෂයෙන් දන හීන–ප්‍රණීත වූ (හෝ, තමැත් මෙරමාත් පිළිබඳ වූ) අධිදේවත්වකර සියලු ධර්මජාතය දතුවහ, ශාස්තෘහු සැක ඇති වැ මැ ''නිසැකයම්හ''යි පිළින කරනුවන් ගේ ප්‍රශ්න කෙළවර කරනුවහ.

26. යම් නිවනකට කිසි තැනෙක්හි උපමා නැද්ද, (රාගාදීයෙන්) ගෙන යා නො හැකි අකොප්‍ය වූ නිවන එකත්තෙන් අධිගම කරනෙම්, මෙහි ලා මට සැකයෙක් නැති. මෙසෙයින් පිඬගිය තෙපි මා ශ්‍රද්ධායෙහි අධිමුක්තසිත් ඇතියකු කොට ධරව යි.

**පාරායණ වර්ගය නිමි.**

# 1. අජිත සුත්ත නිද්දෙසො

## 1-1

කෙනස්සු නිවුතො ලොකො (ඉච්චායස්මා අජිතො)
කෙනස්සු නප්පකාසති
කිස්සාභිලෙපනං බ්‍රෑසි
කිං සු තස්ස මහබ්භයං.

**කෙනස්සු නිවුතො ලොකොති:** නිරයලොකො තිරච්ඡාන ලොකො පෙත්තිවිසයලොකො[1] මනුස්සලොකො දෙවලොකො ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො අයං ලොකො පරො ලොකො බ්‍රහ්ම ලොකො දෙවලොකො අයං වුච්චති ලොකො, අයං ලොකො කෙන ආවුතො නිවුතො ඔවුතො[2] පිහිතො පටිච්ඡන්නො පටිකුජ්ජිතොති 'කෙනස්සු නිවුතො ලොකො'.

**ඉච්චායස්මා අජිතොති: ඉච්චාති:** පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො[3] බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං 'ඉච්චාති'. **ආයස්මා'ති:** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං 'ආයස්මා'ති. **අජිතොති:** තස්ස බ්‍රාහ්මණස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්තිබ්‍යඤ්ජනං අභිලාපොති 'ඉච්චායස්මා අජිතො'.

**කෙනස්සු නප්පකාසතීති;** කෙන ලොකො නප්පකාසති න භාසති න තපති න විරොචති න ඤායති න පඤ්ඤායතීති 'කෙනස්සු නප්පකාසති'. **කිස්සාභිලෙපනං බ්‍රෑසීති:** කිං ලොකස්ස ලෙපනං ලග්ගනං බන්ධනං උපක්කිලෙසො. කෙන ලොකො ලිත්තො සංලිත්තො උපලිත්තො කිලිට්ඨො සංකිලිට්ඨො මක්ඛිතො සංසට්ඨො ලග්ගො ලග්ගිතො පලිබුද්ධො. **බ්‍රෑසි:** ආචික්ඛසි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරසි විභජසි උත්තානීකරොසි පකාසෙසීති 'කිස්සාභිලෙපනං බ්‍රෑසි'.

**කිංසු තස්ස මහබ්භයන්ති:** කිං ලොකස්ස භයං මහබ්භයං පීළනං ඝට්ටනං උපද්දවො උපසග්ගොති. 'කිංසු තස්ස මහබ්භයං'.

තෙනාහ සො බ්‍රාහ්මණො–

කෙනස්සු නිවුතො ලොකො
කෙනස්සු නප්පකාසති
කිස්සාභිලෙපනං බ්‍රෑසි
කිංසු තස්ස මහබ්භයන්ති.

---

1. පිත්තිවිසයලොකො–ස්‍යා
2. ඔවුටො–ව, ක, ස්‍යා
3. අක්ඛර සමුච්චයො–ප

## 1. අජිත සූත්‍ර නිර්දෙශය

1-1

(ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්) ලෝවැසි තෙම කිමෙකින් නිවෘත (වැසුණේ) ද? කවර හෙයින් නො පැනේ ද? කිමෙක් ඔහට අභිලෙපන යැ යි වදරන සේක් ද? කිමෙක් ඔහට මහද්භය වේ ද?

**කෙනස්සු නිවුතො ලොකො** යනු: නිරයලොක යැ තිර්‍යක්ලොක යැ ප්‍රෙතලොක යැ මනුෂ්‍යලොක යැ දිව්‍යලොක යැ ස්කන්ධලෝක යැ ධාතුලොක යැ ආයතනලොක යැ මෙලෝ යැ පරලෝ යැ බඹලෝ යැ දෙව්ලෝ යැ යන මේ 'ලෝක' යි කියනු ලැබේ. මෙලොව කිමෙකින් අවුරන ලද්දේ වසන ලද්දේ යටින් වසන ලද්දේ උඩින් වසන ලද්දේ පිළි සන් වූයේ යටිහුරු කරන ලද්දේ ද? 'යි 'කෙනස්සු නිවුතො ලොකො' යනු වේ.

**ඉච්චායස්මා අජිතො** යනු: 'ඉච්ච' යනු පදසන්ධි යැ, පදසංසර්ග යැ පදපූර්ණ යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ තෙල 'ඉච්ච' යනු පදයන්ගේ අනුපූර්වතා යි. **ආයස්මා** යනු: තෙල 'ආයස්මා'යනු ප්‍රියවචන යැ ගරු වචනයැ සගෞරව වචනයැ සප්‍රතිශ්‍රයට නමෙකි. '**අජිතො**' යනු: ඒ බමුණුගේ නම යැ සංඛ්‍යා යැ සංඥ යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ, නාමකර්ම යැ නාමධෙය්‍ය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප යැ නු'යි 'ඉච්චායස්මා අජිතො' යනු වේ.

**කෙනස්සු නප්පකාසති** යනු: කවර කරුණෙකින් ලෝකය ප්‍රකාශ නො කෙරේ ද ඥාන ප්‍රභාෂ නො කෙරේ ද ඥානප්‍රතාප නො කෙරේ ද දීප්ත නො වේ ද නො දන්නේ ද නො පැනේ ද? යි 'කෙනස්සු නප්පකාසති' යනු වේ.

**කිස්සාභිලෙපනං බ්‍රූසි** යනු: කිමෙක් ලොකයාගේ ඇලීම ලැගීම බැඳීම උපක්ලේශය වේ ද, කිමෙකින් ලොකයා ඇලුණේ වෙසෙසින් ඇලුණේ මොනොවට ඇලුණේ කිලිටි වූයේ වෙසෙසින් කිලිටි වූයේ මැකුණේ හැනුණේ ලැගුණේ ලග්නා ලද්දේ ඇවුරුණේයි. බ්‍රූසි කියන සේක් ද දෙසන සේක් ද පනවන සේක් ද පිහිටුවන සේක් ද විවරණය කරන සේක් ද විභාග කරනසේක් ද නො ගැඹුරු කරන සේක් ද ප්‍රකාශ කරන සේක් ද ?යි 'කිස්සාභිලෙපනං බ්‍රූසි'යනු වේ.

**කිංසු තස්ස මහබ්භයං** යනු: කිමෙක් ලෝකයාට භය මහද්භය පීඩා සට්ටන උපද්‍රව උපසර්ග වේ ද? යි 'කිංසු තස්ස මහබ්භයං' යනු වේ. එයින් කී යැ ඒ බමුණු:

**කෙනස්සු – පෙ – මහබ්භයං යි.**

1-2

අවිජ්ජාය නිවුතො ලොකො (අජිතාති භගවා)
විවිච්ඡා[1] පමාදා නප්පකාසති
ජප්පාභිලෙපනං බ්‍රෑමි
දුක්ඛමස්ස මහබ්භයං.

**අවිජ්ජාය නිවුතො ලොකොති:** අවිජ්ජාති: දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා-පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසඞ්ගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වුච්චති අවිජ්ජා.

**ලොකොති:** නිරයලොකො තිරච්ඡානලොකො පෙත්තිවිසයලොකො මනුස්සලොකො දෙවලොකො ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො, අයං ලොකො පරොලොකො බ්‍රහ්මලොකො දෙවලොකො, අයං වුච්චති 'ලොකො'. අයං ලොකො ඉමාය අවිජ්ජාය ආවුතො නිවුතො ඔවුතො පිහිතො පටිච්ඡන්නො පටිකුජ්ජිතො'ති 'අවිජ්ජාය නිවුතො ලොකො'. අජිතාති: භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති.

**භගවාති:** ගාරවාධිවචනං, අපිච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ඨකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා. භජි වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි[2] පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා, භාගීවා භගවා චීවර-පිණ්ඩපාත-සෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා, භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා,

---

1. වෙවිච්ඡා—ප
2. අරඤ්ඤවනපත්ථානි—මජසං

1-2. (බුදුහු මෙසේ වදළහ: අජිතය,) ලෝවැසි තෙම අවිද්‍යායෙන් නිවෘත යැ මසුරු හෙයින් ප්‍රමාද හෙයින් ප්‍රකාශ නො වෙයි, ඔහට තෘෂ්ණාව අභිලෙපන යැ යි කියමි. දුක මහද්භය වෙයි.

අවිජ්ජාය නිවුතො ලොකො යනු "අවිජ්ජා" යනු: දුඃඛසත්‍යයෙහි නො දැනීම දුඃඛසමුදයසත්‍යයෙහි නො දැනීම දුඃඛනිරොධසත්‍යයෙහි නො දැනීම දුඃඛනිරොධගාමිනිප්‍රතිපදසත්‍යයෙහි නො දැනීම පූර්වාන්තයෙහි නො දැනීම අපරාන්තයෙහි නො දැනීම පූර්වාන්තා- පරාන්තයෙහි නො දැනීම ඉදංප්‍රත්‍යයතාව සඞ්ඛ්‍යාත ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන්හි නො දැනීම යැ. මෙ බඳු යම් නො දැන්මෙක් නො දක්මෙක් අනවබොධයෙක් අනනුබොධයෙක් අසම්බොධයෙක් අප්‍රතිවෙධයෙක් (රූපාදිය අනිත්‍යාදි සාමාන්‍යයෙන්) සඞ්ග්‍රහ නො කිරීමෙක් (අනිත්‍යාදීන්) නො බැසගැන්මෙක් සම වැ නොබැලීමෙක් ප්‍රත්‍යවෙක්ෂා නො කිරීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් දුර්මෙධ්‍යයෙක් බාල බවෙක් සම්‍යක්ඥාන රහිත බවෙක් මුළායෙක් බලවත් මුළායෙක් හාත්පසින් මුළායෙක් අවිද්‍යායෙක් අවිද්‍යාඖඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයයෙක් (සිත මැඩලන) අවිද්‍යාපර්යුත්ථානයෙක් අවිද්‍යාපරිඝයෙක් මොහ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, මේ 'අවිද්‍යා' යි කියනු ලැබේ.

ලොකො යනු: නිරයලෝක යැ තිර්‍යක්ලෝක යැ ප්‍රෙතවිෂය ලෝක යැ මනුෂ්‍යලෝක යැ දිව්‍යලෝක යැ ස්කන්ධලෝක යැ ධාතුලෝක යැ ආයතනලෝක යැ මෙලෝ යැ පරලෝ යැ බඹලෝ යැ දෙව්ලෝ යැ යි මේ 'ලොක' යි කියනු ලැබේ. මේ ලොකය මේ අවිද්‍යායෙන් ඇවුරුණේ වැසුණේ යටින් වැසුණේ උඩින් වැසුණේ පිළිසන් වූයේ යටිහුරු කරන ලද්දේ නු යි "අවිජ්ජාය නිවුතො ලොකො" යනු වේ. අජිත යනු බුදුහු ඒ බමුණු නමින් අමතති.

භගවා යනු: ගෞරව නමෙකි, තවද බිඳහළ රාග ඇත් නුයි භගවත් යැ නැසූ ද්වෙෂ ඇත්නුයි- නැසූ මොහ ඇත් නුයි- නැසූ මාන ඇත් නුයි- නැසූ දෘෂ්ටි ඇත් නුයි- නැසූ කෙලෙස්කටු ඇත්නුයි- නැසූ කෙලෙස් ඇත් නුයි- දහම්රුවන් භාග- විභාග- ප්‍රතිවිභාග කෙළේ නුයි භගවත් යැ, භවයන් කෙළවර කෙළේ නුයි- භාවිතකාය- භාවිත ශීල- භාවිතචිත්ත- භාවිත ප්‍රඥා ඇත් නුයි භගවත් යැ නොහොත් බුදුහු අල්ප ශබ්ද වූ අල්පනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මනුෂ්‍යයන්ගේ රහස්‍යයට නිසි වූ විවේකයට යොග්‍ය වූ වන සෙනසුන් වෙනෙහි දුර සෙනසුන් වන කෙළවර සෙනසුන් භජනය කළාහු නුයි භගවත් යැ, බුදුහු චීවර පිණ්ඩපාත සෙනාසන-ගිලානප්පච්චය භෙසජ්ජ පරික්ඛාරය නට හිමි වූවාහු නුයි භගවත් යැ, බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්ති රසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු නුයි භගවත් යැ,

භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා[1] භාගී, වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා, භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා, භගවාති නෙතං නාමං මාතරා කතං න පිතරා කතං න භාතරා කතං න භගිනියා කතං න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං න සමණබ්‍රාහ්මණෙහි කතං න දෙවතාහි කතං විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති.

විච්ඡා පමාද නප්පකාසෙති: විවිච්ඡා වුච්චති පඤ්ච මච්ඡරියානි ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං යං එවරූපං මච්ඡෙරං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස ඉදං වුච්චති මච්ඡරියං. අපි ච ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං. ධාතුමච්ඡරියම්පි මච්ඡරියං. ආයතනමච්ඡරියම්පි මච්ඡරියං. ගාහො වුච්චති මච්ඡරියං.

පමාදො වත්තබ්බො: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු[2] චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං කුසලානං වා ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනට්ඨිතකිරියතා ඔලීනවුත්තිතා නික්ඛිත්තඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො, යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං අයං වුච්චති පමාදො.

1. අරූපසමාපත්තීනං—මජසං
2. පඤ්චකාමගුණෙසුවා—වි,

බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යෑ, බුදුහු අෂ්ටවිමොක්ෂයන්ට අෂ්ට අභිභායතනයන්ට නව අනුපූර්වවිහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුයි– බුදුහු දශ සංඥාභාවනාවන්ට දසකසිණසමාපත්තීන්ට ආනාපානසති සමාධියට අසුභ සමාපත්තියට හිමි වූවාහු නුයි– බුදුහු සතර සතිපට්ඨානයන්ට සතරසම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්චබලයන්ට සප්තබොධ්‍යඞ්ගයන්ට ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුයි– බුදුහු දශ තථාගත බලයන්ට චතුර්වෛශාරද්‍යයන්ට සතර ප්‍රතිසංවිද් ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩබුද්ධධර්මයන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' නමි. මෙල 'භගවත්' යන නාමය මෑණියන් විසින් නොකරන ලද, පියාණන් විසින්– බෑයකු විසින්–බූනක විසින්–සගයහළුවන් විසින්– නෑ සහලේ නෑයන් විසින්– මහණබමුණන් විසින්– දෙවතාවන් විසින් නො කරන ලද, මේ 'භගවත්' යන මෙල නාමය භාග්‍යවත් බුදුවරයන්ට අර්හත්මාර්ගයාගේ අන්තයෙහි බෝමූල දී සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමග රහත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් හෝ සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකි.

**වෙවිච්ඡා පමාදා නප්පකාසති** යනු: පඤ්ච මාත්සර්‍ය්‍යයෝ 'වෙවිච්ඡා'යි කියනු ලැබෙත්: ආවාසමාත්සර්‍ය්‍යයෑ. කුලමාත්සර්‍ය්‍ය යෑ ලාභමාත්සර්‍ය්‍ය යෑ වර්ණමාත්සර්‍ය්‍ය යෑ ධර්මමාත්සර්‍ය්‍ය යෑ යි. යම් මෙ බඳු මසුරු බවෙක් මසුරු අයුරෙක් මාත්සර්‍ය්‍යසමඞ්ගී බවෙක් (ස්වකීය සම්පත්) ව්‍යාප්ත කරනු කැමැති බවෙක් අනාර්‍ය්‍ය බවෙක් (තද මසුරු කමෙක්) කටුක බැවින් සිත හකුළන බවෙක් සිත් නො ගත් බවෙක් වේ ද මේ 'මාත්සර්‍ය්‍ය' යි කියනු ලැබේ. තවද පඤ්චස්කන්ධයෙහි මසුරු බව ද 'මච්ඡරිය' නම, ධාතුමාත්සර්‍ය්‍යය ද ආයතනමාත්සර්‍ය්‍යය ද 'මච්ඡරිය' නම, ග්‍රාහය මාත්සර්‍ය්‍ය යයි කියනු ලැබේ.

ප්‍රමාදය කිය යුත්තේ යෑ: කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනෝදුශ්චරිතයෙහි හෝ පඤ්චකාම ගුණයෙහි හෝ චිත්තයාගේ ව්‍යවසර්ගය (සිත හැරපීම) ව්‍යවසර්ගානුප්‍රදානය දශකුශලධර්මයන්ගේ හෝ භාවනායෙහි නො සකස් වැ කරන බව සතතයෙන් නො කරන බව නො තිමි ක්‍රියා ඇති බව හැකුළුණු පැවැතුම් ඇති බව බහාලූ ඡන්ද ඇති බව බහාලූ ධුර (වීර්‍ය්‍ය) ඇති බව ආසෙවන නො කිරීම භාවනා නො කිරීම පුනපුනා නො කිරීම (කුසල්දහම්හි) නො සිටීම නො යෙදීම ප්‍රමාද නම. යම් මෙ බඳු ප්‍රමාදයෙක් ප්‍රමාද අයුරෙක් ප්‍රමත්ත බවෙක් වෙ ද මේ 'පමාද'යි කියනු ලැබේ.

**විවිච්ඡා පමාද නප්පකාසතීති;** ඉමිනා ච මච්ඡරියෙන ඉමිනා ච පමාදෙන ලොකො නප්පකාසති න භාසති න තපති න විරොචති න ඤායති න පඤ්ඤායතීති "විවිච්ඡා පමාද නප්පකාසති".

**ජප්පාභිලෙපනං බ්‍රූමීති:** ජප්පා වුච්චති තණ්හා යො රාගො සාරාගො අනුනයො අනුරොධො[1] නන්දි නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පළිගෙධො සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනනී සිබ්බිනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා[2] ආයූහනී දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො සිනෙහො අපෙක්ඛා පටිබන්ධු ආසා ආසිංසනා ආසිංසිතත්තං රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා[3] සාධුකම්‍යතා[4] අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබළිසං මාරාමිසං මාරවිසයො මාරනිවාසො මාරගොචරො මාරබන්ධනං තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො අභිජ්ඣා ලොභො අකුසලමූලං අයං වුච්චති ජප්පා, ලොකස්ස ලෙපනං ලග්ගනං බන්ධනං උපක්කිලෙසො ඉමාය ජප්පාය ලොකො ලිත්තො සංලිත්තො උපලිත්තො කිලිට්ඨො සංකිලිට්ඨො මක්ඛිතො[5] සංසට්ඨො ලග්ගො ලග්ගිතො[6] පලිබුද්ධොති බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'ජප්පාභිලෙපනං බ්‍රූමි.'

1. අනුබොධො–ච, ක
2. විසතා–ස
3. පුච්ඡඤ්චිකතා–ස
4. සාධුකම්‍යතා–මජසං
5. මක්ඛීතො–මජසං
6. ලගිතො–ප

**විවිච්ඡා පමාද නප්පකාසති** යනු: මේ මාත්සර්‍යයෙනුදු මේ ප්‍රමාදයෙනුදු ලෝවැසියා ප්‍රකාශ නො වෙයි ඥානප්‍රභාස නො කෙරෙයි ඥානප්‍රතාප නො කෙරෙයි නො බබළයි ප්‍රකට නො වෙයි නො පැනේනුයි 'විවිච්ඡා පමාද නප්පකාසති' යනු වේ.

**ජප්පාභිලෙපනං බ්‍රෑමි** යනු: 'ජප්පා 'යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක් (පුනපුනා පමුණුවන හෙයින්) අනුනයෙක් අනුරෝධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයාගේ සංරාගයෙක් ඊර්ෂ්‍යායෙක් (බොල් කෙලෙස් බැවින් මුසපත් කරන) මූර්ඡායෙක් අධ්‍යවසානයෙක් ගිජු බවෙක් හාත්පසින් ගිජු බවෙක් (අරමුණෙහි ලැගෙන) සඞ්ගයෙක් (ගැලෙන හෙයින්) පඞ්කයෙක් (ඒ ඒ භවයට ආකර්ෂණ කරන හෙයින්) එජාවෙක් (රවටන හෙයින් මායාවෙක්) (සසරවට උපදවන හෙයින්) ජනිකායෙක් (දුක හා සංයෝග කෙරෙමින් උපදවන හෙයින්) සංජනනියෙක් (හිවන බැවින්) සිබ්බනියෙක් ජාලිනියෙක් (සරිත් සදෘශ වැ ආකර්ෂණ කරන හෙයින්) නදියෙක් එවසෙයින් ඇලීමෙක් (බඳනා හෙයින්) සූයෙක් (විස්තෘත වන හෙයින්) විසතායෙක් ආයූහනියෙක් (සහාය වන හෙයින්) ද්විතීයාවක් ප්‍රණිධියෙක් භවනෙත්තියෙක් වනයෙක් (බලවත් බැවින්) වනථයෙක් සන්ථායෙක් ස්නේහයෙක් අපේක්ෂායෙක් ප්‍රතිබන්ධුයෙක් ආශායෙක් ආශංසායෙක් ආශංසිත බවෙක්, රූපයෙහි ආශායෙක් ශබ්දශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්පර්ශාශායෙක් ධනාශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක් (ජල්පන කරන හෙයින්) ජල්පායෙක් ප්‍රජල්පායෙක් අභිජල්පායෙක් ජල්පනයෙක් ජල්පිත බවෙක් (පුනපුනා අරමුණෙහි අඳනා බැවින්) ලොලුප බවෙක් ලොලුපාකාරයෙක් ලොලුපායිත බවෙක් නඟුට සලන බවෙක් මධුර අරමුණු කැමැති වන බවෙක් අධර්මරාගයෙක් විෂමලෝභයෙක් නිකාන්තියෙක් නිකාමනයෙක් ප්‍රාර්ථනායෙක් පිහායෙක් සම්ප්‍රාර්ථනායෙක්, කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණායෙක් විභවතෘෂ්ණායෙක් රූපතෘෂ්ණායෙක් අරූපතෘෂ්ණායෙක් නිරෝධ තෘෂ්ණායෙක් ශබ්දතෘෂ්ණායෙක් ගන්ධතෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්පර්ශතෘෂ්ණායෙක් ධර්මතෘෂ්ණායෙක් ඕඝයෙක් යෝගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් ආවරණයෙක් නීවරණයෙක් (කුසල් දහම් වසන හෙයින්) ඡදනයෙක් බන්ධනයෙක් උපක්ලේශයෙක් අනුශයයෙක් (උපදනා කුශලාචාර ගන්නා) පර්‍යුත්ථානයෙක් (පරිවේෂ්ටන කරන හෙයින්) ලතායෙක් විවිධ විජ්සායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබඩිශයෙක් මාරවිෂයයෙක් තෘෂ්ණා නදියෙක් තෘෂ්ණා සඞ්ඛ්‍යාත ජාලයෙක් තෘෂ්ණා සඞ්ඛ්‍යාත ගර්ද්දුල (ශුනකබන්ධන) යෙක් තෘෂ්ණා සමුද්‍රයෙක්, අභිධ්‍යායෙක් ලෝභ අකුශලමූලයෙක් වේ ද මේ ලෝවැසියාට ජප්පා යැ ලේපන යැ ලග්ගන යැ බන්ධන යැ උපක්කිලෙස' යි කියනු ලැබේ. මේ ජල්පායෙන් ලෝවැසියා ඇලුණේ වෙසෙසින් ඇලුණේ මොනොවට ඇලුණේ කිලිටි වූයේ වෙසෙසින් කිලිටි වූයේ තැවැරුණේ හැනුණේ ලැගුණේ ලග්නා ලද්දේ ඇවුණේ යි බ්‍රෑමි කියමි දෙසමි පනවමි පිහිටුවමි විවෘත කෙරෙමි විභඞ්ග කෙරෙමි නො ගැඹුරු කෙරෙමි ප්‍රකාශ කෙරෙමි 'ජප්පාභිලෙපනං බ්‍රෑමි' යනු වේ.

**දුක්ඛමස්ස මහබ්භයන්ති:** දුක්ඛන්ති ජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකපරිදෙවදුක්ඛං දොමනස්සුපායාසදුක්ඛං නෙරයිකං දුක්ඛං තිරච්ඡානයොනිකං දුක්ඛං[1] පෙත්තිවිසයිකං දුක්ඛං මානුසකං දුක්ඛං ගබ්භොක්කන්තිමූලකං දුක්ඛං ගබ්භෙඨිතිමූලකං දුක්ඛං ගබ්භා වුට්ඨානමූලකං[2] දුක්ඛං ජාතස්ස උපනිබන්ධිකං දුක්ඛං ජාතස්ස පරාධෙය්‍යකං දුක්ඛං අත්තූපක්කමදුක්ඛං පරූපක්කමදුක්ඛං සඞ්ඛාරදුක්ඛං විපරිණාමදුක්ඛං චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා[3] සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා විතච්ඡිකා ලොහිතපිත්තං[4] මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංස–මකස–වාතා තප–සිරිංසප–සම්ඵස්සං දුක්ඛං මාතුමරණං දුක්ඛං[5] පිතුමරණං දුක්ඛං භාතුමරණං දුක්ඛං භගිනීමරණං දුක්ඛං පුත්තමරණං දුක්ඛං ධීතුමරණං දුක්ඛං ඤාතිව්‍යසනං දුක්ඛං භොගව්‍යසනං දුක්ඛං සීලව්‍යසනං දුක්ඛං දිට්ඨිව්‍යසනං දුක්ඛං යෙසං ධම්මානං ආදිතො සමුදාගමනං පඤ්ඤායති අත්ථංගමතො නිරොධො පඤ්ඤායති කම්මසන්නිස්සිතො විපාකො විපාකසන්නිස්සිතං කම්මං නාමසන්නිස්සිතං රූපං රූපසන්නිස්සිතං නාමං ජාතියා අනුගතං ජරාය අනුසටං[6] ව්‍යාධිනා අභිභූතං මරණෙන අබ්භාහතං දුක්ඛෙ පතිට්ඨිතං අතාණං අලෙණං අසරණං අසරණීභූතං, ඉදං වුච්චති දුක්ඛං. ඉදං දුක්ඛං ලොකස්ස භයං මහබ්භයං පීළනං ඝට්ටනං උපද්දවො උපසග්ගොති "දුක්ඛමස්සමහබ්භයං"

තෙනාහ භගවා :

අවිජ්ජා නිවුතො ලොකො (අජිතාති භගවා)
විවිච්ඡා පමාද නප්පකාසති
ජප්පාභිලෙපනං බ්‍රූමි
දුක්ඛමස්ස මහබ්භයන්ති.

1–3

සවන්ති සබ්බධි සොතා (ඉච්චායස්මා අජිතො)
සොතානං කිං නිවාරණං
සොතානං සංවරං බ්‍රූහි
කෙන සොතා පිථීයරෙ.

---

1. තිරච්ඡානයොනි දුක්ඛං—ප
2. ගබ්භා උට්ඨානමූලකං—ච, ක
3. පක්ඛහතිකා—ච, ක
4. ලොහිතං පිත්තං—මජසං
5. මාතුමරණ දුක්ඛං—මජසං
6. අනුසටං—මජසං

**දුක්ඛමස්ස මහබ්භයං** යනු: දුක්ඛං යනු ජාති දුක යැ ජරා දුක යැ ව්‍යාධි දුක යැ මරණ දුක යැ සොක–පරිදෙව–දුක්ඛ–දොමනස්ස–උපායාස දුක යැ නිරැහි වූ දුක යැ තිරිසන්යොනිහි වූ දුක යැ ප්‍රෙතවිෂයයෙහි වූ දුක යැ මිනිසුන් පිළිබඳ දුක යැ ගර්භාවක්‍රාන්තිය මුල් කොට ඇති දුක යැ ගර්භස්ථිතිය මුල් කොට ඇති දුක යැ ගර්භව්‍යුත්ථානය මුල් කොට ඇති දුක යැ උපන්නහු පිළිදග්නා දුක යැ උපන්නහු පරා අයත් බැව්හි දුක යැ ආත්මොපක්‍රම දුක යැ පරොපක්‍රම දුක යැ සංස්කාර දුක යැ විපරිණාම දුක යැ චක්ෂුරොග යැ ශ්‍රොත්‍රරොග යැ ඝ්‍රාණරොග යැ ජිහ්වාරොග යැ කායරොග යැ ශිර්ෂරොග යැ කර්ණරොග යැ මුඛරොග යැ දන්තරොග යැ කාස යැ ශ්වාස යැ පීනස යැ දහ යැ ජ්වර යැ කුක්ෂිරොග යැ මූර්ඡා යැ ප්‍රස්කන්දිකා (රක්තාතිසාර) යැ ශූල යැ විසූචිකා යැ කුෂ්ට යැ ගණ්ඩ යැ කිලාස යැ ක්ෂය යැ අපස්මාර යැ දද්දු(දද) යැ කණ්ඩූති යැ කච්ඡු යැ රඛසා (නියපහරින් වන වණ) යැ විතච්ඡිකා (හොරි) යැ රක්තපිත්ත යැ මධුමෙහ යැ අර්ශස් යැ පිඩකා (පොළ) යැ භගන්දර යැ පිතින් උපදනා ආබාධ යැ සෙමින් උපදනා ආබාධ යැ වයින් උපදනා ආබාධ යැ සාන්නිපාතික ආබාධ යැ ඍතුපරිණාමයෙන් උපදනා ආබාධ යැ විෂමපරිහාරයෙන් උපදනා ආබාධ යැ ඖපක්‍රමික ආබාධ යැ කර්මවිපාකයෙන් උපදනා ආබාධ යැ ශීත–උෂ්ණ සා–පවස් යැ මල–මූ පහ කිරීම යැ මැසි මදුරු – වා– අව්– දිග්දැ පහසින් වූ දුක යැ මාතෘමරණයෙන් වූ දුක යැ පිතෘමරණයෙන් වූ දුක යැ භ්‍රාතෘමරණයෙන් වූ දුක යැ භගිනීමරණයෙන් වූ දුක යැ පුත්‍රමරණයෙන් වූ දුක යැ දුහිතෘමරණයෙන් වූ දුක යැ ඥාතිව්‍යසනයෙන් වූ දුක යැ භොගව්‍යසන දුක යැ ශීලව්‍යසන දුක යැ දෘෂ්ටිව්‍යසන දුක යි. (රූපාදි) යම් ධර්ම කෙනකුන් ගේ ආදියෙහි (පළමු) ඉපදීම පැනේ ද අස්තඞ්ගම (භවඞ්ග) යෙන් නිරුද්ධ වීම පැනේ ද, (කුශලාකුශල) විපාකය තෙමේ කර්මය ඇසුරු කෙළේ ද (කුශලාකුශල) කර්මය තෙමේ විපාකය ඇසුරු කෙළේ ද, (පඤ්චවොකාරයෙහි) රූපය නාමය ඇසුරු කෙළේ ද නාමය රූපය ඇසුරු කෙළේ ද, (යම් දහමක්) ජාතිය විසින් ලුහු බඳනා ලද ජරාව විසින් අනුව හැසිරෙන ලද ව්‍යාධි විසින් මඩනා ලද මරණය විසින් නස්නා ලද වේ ද, දුකෙහි පිහිටියේ ද, ත්‍රාණ–ලෙන–සරණ රහිත ද අසරණ වූයේ ද මේ 'දුක්' යයි කියනු ලැබේ. මේ දුක ලෝ වැසියාහට භය–මහද්භය–පීඩන–සටන–උපද්‍රව–උපසර්ග වේ නුයි 'දුක්ඛමස්ස මහබ්භයං' යනු වේ.

එයින් වදළහ බුදුහු:
අවිජ්ජා නිවුතො ලොකො–පෙ–දුක්ඛමස්ස මහබ්භයං' යි.

1–3. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්.) හැම තන්හි (තෘෂ්ණාදි) ස්‍රොතස්හු (රූපාදි ආයතනයන්හි) ගලා යෙති, ස්‍රොතසුන් ගේ ආවරණය කවරැ? ස්‍රොතසුන්ගේ සංවරය වදළ මැනැව කවර දහමෙකින් ස්‍රොතස්හු පියනු ලැබෙත් ද? (පසිඳනු ලැබෙත් ද?)

සවන්ති සබ්බධි සොතාති: සොතාති තණ්හාසොතො දිට්ඨිසොතො කිලෙසසොතො දුච්චරිතසොතො අවිජ්ජාසොතො. සබ්බධීති සබ්බෙසු ආයතනෙසු. සවන්තීති සවන්ති ආසවන්ති සන්දන්ති පවත්තන්ති චක්ඛුතො රූපෙ සවන්ති ආසවන්ති සන්දන්ති පවත්තන්ති සොතතො සද්දෙ සවන්ති–පෙ–ඝානතො ගන්ධෙ සවන්ති–පෙ–ජිව්හාතො රසෙ සවන්ති–කායතො ඵොට්ඨබ්බෙ සවන්ති–පෙ–මනතො ධම්මෙ සවන්ති ආසවන්ති සන්දන්ති පවත්තන්ති, චක්ඛුතො රූපතණ්හා සවන්ති ආසවන්ති සන්දන්ති පවත්තන්ති' සොතතො සද්දතණ්හා සවන්ති ආසවන්ති සන්දන්ති පවත්තන්ති ඝානතො ගන්ධතණ්හා –පෙ– ජිව්හාතො රසතණ්හා සවන්ති –පෙ– කායතො ඵොට්ඨබ්බතණ්හා සවන්ති–පෙ– මනතො ධම්මතණ්හා සවන්ති ආසවන්ති සන්දන්ති පවත්තන්තීති "සවන්ති සබ්බධි සොතා".

ඉච්චායස්මා අජිතොති: ඉච්චාති පදසන්ධි –පෙ– පදානුපුබ්බතා පෙතං ඉච්චා'ති. 'ආයස්මා'ති පියවචනං –පෙ– අජිතොති තස්ස බ්‍රාහ්මණස්ස නාමං –පෙ– අභිලාපොති 'ඉච්චායස්මා අජිතො.'

සොතානං කිං නිවාරණන්ති– සොතානං කිං ආවරණං නීවරණං සංවරණං රක්ඛණං ගොපනන්ති "සොතානං කිං නිවාරණං" .

සොතානං සංවරං බ්‍රෑහීති සොතානං ආවරණං නීවරණං සංවරණං රක්ඛණං ගොපනං බ්‍රෑහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති "සොතානං සංවරං බ්‍රෑහි." කෙන සොතා පිධීයරෙති කෙන සොතා පිධීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්තීති "කෙන සොතා පිධීයරෙ."

තෙනාහ සො බ්‍රාහ්මණො :

සවන්ති සබ්බධි සොතා (ඉච්චායස්මා අජිතො)
සොතානං කිං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑහි
කෙන සොතා පිධීයරෙති.

**සවන්ති සබ්බධි සොතා** යනු: 'සොත' යනු තෘෂ්ණා ස්‍රොතස (නදිය) දෘෂ්ටිස්‍රොතස ක්ලේශස්‍රොතස දුශ්චරිත ස්‍රොතස අවිද්‍යා ස්‍රොතස. **සබ්බධි** යනු: හැම ආයතනයන්හි සවන්ති යනු: වැගිරෙති (උපදිති) යට බලා යෙති ගලායෙති පුනපුනා පවතිත්. ඇස කෙරෙන් රූපවිෂයයෙහි (තෘෂ්ණා ස්‍රොතස්හු) වැගිරෙති යට බලායෙති ගලායෙති පුනපුනා පවතිත්. කනින් ශබ්ද විෂයයෙහි වැගිරෙති නැහැයෙන් ගන්ධවිෂයයෙහි වැගිරෙති... දිවින් රසවිෂයයෙහි වැගිරෙති... කයින් ස්ප්‍රෂ්ටව්‍යවිෂයයෙහි වැගිරෙති... මනසින් ධර්මවිෂයයෙහි වැගිරෙති යට බලායෙති ගලායෙති පුනපුනා පවතිත්. ඇසින් රූපතෘෂ්ණා (ස්‍රොතස්හු) වැගිරෙති යට බලායෙති ගලායෙති පුනපුනා පවතිත්. කනින් ශබ්දතෘෂ්ණා වැගිරෙති යට බලායෙති ගලායෙති පුනපුනා පවතිත් නැහැයෙන් ගන්ධතෘෂ්ණා වැගිරෙති යට බලායෙති ගලායෙති පුනපුනා පවතිත්. දිවින් රස තෘෂ්ණාව වැගිරෙති යට බලා යෙති ගලායෙති පුනපුනා පවතිත්. කයින් ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා වැගිරෙති යට බලායෙති ගලායෙති පුනපුනා පවතිත්. මනසින් ධර්මතෘෂ්ණා වැගි රෙති යට බලායෙති ගලායෙති පුනපුනා පවතිත් නුයි 'සවන්ති සබ්බධි සොතා' යනු වේ.

**ඉච්චායස්මා අජිතො** යන්නෙහි 'ඉච්ච' යනු පදසන්ධි යැ ...තෙල 'ඉච්ච' යනු පදනුපූර්වතා යැ. ආයස්මා යනු: ප්‍රියවචන යැ... අජිතො යනු ඒ බමුණාගේ නම යැ...අභිලාපය වේ නුයි 'ඉච්චායස්මා අජිතො' යනු වේ.

**සොතානං කිං නිවාරණං** යනු: ස්‍රොතසුන්ට කිමෙක් ආවරණ (ඇවිරීම) යැ නිවරණ (වැසීම) යැ සංවරණ යැ රක්ෂණ යැ ගොපන යැ නුයි 'සොතා-නං කිං නිවාරණං' යනු වේ.

**සොතානං සංවරං බ්‍රෑහි** යනු: ආවරණය නිවරණය සංවරණය රක්ෂණය ගොපනය, **බ්‍රෑහි**– වදළ මැනැව දෙසුව මැනැව පැනවුව මැනැව පිහිටුව මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව නො ගැඹුරු කළ මැනැව ප්‍රකාශ කළ මැනැව නුයි 'සොතානං සංවරං බ්‍රෑහි' යනු වේ. **කෙන සොතා පිධීයරෙ** යනු: කිමෙකින් ස්‍රොතස්හු පියනු ලැබෙත් ද පසිඳනු ලැබෙත් ද නො වැගිරෙත් ද යට බලා නො යෙත් ද නොගලත් ද පුනපුනා නො පවතිත් ද යි 'කෙන සොතා පිධීයරෙ' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

''සවන්ති සබ්බධි සොතා–පෙ–කෙන සොතා පිධීයරෙ' යි.

## 1–4

යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි
පඤ්ඤායෙතෙ පිථීයරෙ.

**යානි සොතානි ලොකස්මින්ති:** යානි එතානි සොතානි මයා කිත්තිතානි පකිත්තිතානි ආචික්ඛිතානි දෙසිතානි පඤ්ඤපිතානි පට්ඨපිතානි විවරිතානි විභජිතානි උත්තානීකතානි පකාසිතානි, සෙය්‍යථීදං: තණ්හාසොතො දිට්ඨිසොතො කිලෙසසොතො දුච්චරිතසොතො අවිජ්ජාසොතො, **ලොකස්මින්ති**– අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙති "යානි සොතානි ලොකස්මිං". **අජිතාති භගවා:** තං බ්‍රාහ්මණං නාමෙන ආලපති.

**සති තෙසං නිවාරණන්ති:** සතීති යා සති අනුස්සති පටිස්සති සති සරණතා[1] ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා[2] සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනො මග්ගො, අයං වුච්චති සති. **නිවාරණන්ති** ආවරණං නීවරණං සංවරණං රක්ඛණං ගොපනන්ති "සති තෙසං නිවාරණං".

**සොතානං සංවරං බ්‍රෑමීති:** සොතානං ආවරණං නීවරණං සංවරණං රක්ඛණං ගොපනං, බ්‍රෑමි ආචික්ඛාමි –පෙ– උත්තානීකරොමි පකාසෙමීති "සොතානං සංවරං බ්‍රෑමි"

**පඤ්ඤායෙතෙ පිථීයරෙති:** "පඤ්ඤා"ති යා පඤ්ඤා පජානනා අමොහො ධම්මවිචයො –පෙ– සම්මාදිට්ඨි. **පඤ්ඤායෙතෙ පිථීයරෙති;** පඤ්ඤාය එතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති.

"සබ්බෙ සංඛාරා අනිච්චා"ති ජානතො පස්සතො පඤ්ඤාය එතෙ සොතා[3] පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති. "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති. "සබ්බෙ සඞ්ඛාරා අනත්තා"ති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති.

---

1. පටිස්සති සරණතා–මජසං
2. අසම්මුස්සනතා–ච,–ස
3. එතෙ සොතානි–මජසං

1-4. (බුදුහු මෙසේ වදළහ: අජිතය) ලොවැ යම් ස්‍රොතස් කෙනෙක් වෙත් ද ස්මෘතිය ඔවුනට ආවරණ වෙයි. (එ මැ ස්මෘතිය) ස්‍රොතසුන් ගේ සංවරය යි කියමි, (මාර්ග) ප්‍රඥාව විසින් තුලුහු පියනු (පසිඳනු) ලැබෙත්.

**යානි සොතානි ලොකස්මිං** යනු: තෙල යම් ස්‍රොතස් කෙනෙක් මා විසින් කීර්තනය කරන ලද්දහු ප්‍රකීර්තනය කරන ලද්දහු කියන ලද්දහු දෙසන ලද්දහු පනවන ලද්දහු පිහිටුවන ලද්දහු විවෘත කරන ලද්දහු විභාග කරන ලද්දහු නො ගැඹුරු කරන ලද්දහු ප්‍රකාශ කරන ලද්දහු ද, ඒ කෙසේ යැ යත්: තෘෂ්ණා ස්‍රොතස යැ දෘෂ්ටි ස්‍රොතස යැ ක්ලේශස්‍රොතසයැ දුශ්චරිතස්‍රොතස යැ අවිද්‍යා ස්‍රොතස යි. ලොකස්මිං යනු අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දිව්‍යලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතු ලොකයෙහි ආයතනලොකයෙහි නුයි 'යානි සොතානි ලොකස්මිං යනු වේ. අජිත යනු: බුදුහු ඒ බමුණු නමින් අමතති.

**සති තෙසං නිවාරණං** යන්නෙහි– සති යනු: යම් සිහියෙක් පුනපුනා සිහි කිරීමෙක් අභිමුඛ වැ මෙන් සිහිකිරීමෙක් සති සඞ්ඛ්‍යාත සිහි කරන බවෙක් ධරන බවෙක් (අරමුණෙහි) බැසගන්නා බවෙක් විස්මෘත නො කරන බවෙක් ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක් ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද මේ 'ස්මෘති' යයි කියනු ලැබේ. **නිවාරණං** යනු: ආවරණ යැ නීවරණ යැ සංවරණ යැ රක්ෂණ යැ ගොපන යැ නුයි ''සති තෙසං නිවාරණං' යනු වේ.

**සොතානං සංවරං බ්‍රෑමි** යනු: ස්‍රොතසුන්ගේ ආවරණය නීවරණය සංවරණය රක්ෂණය ගොපන යි, **බ්‍රෑමි:** කියමි ...... නො ගැඹුරු කෙරෙමි ප්‍රකාශ කෙරෙම් නුයි 'සොතානං සංවරං බ්‍රෑමි' යනු වේ.

**පඤ්ඤායෙතෙ පිථියරෙ** යන්නෙහි: 'පඤ්ඤා' යනු යම් ප්‍රඥායෙක් ප්‍රජානනයෙක් අමොහයෙක් දහම් විමසීමෙක් ......සම්‍යක්දෘෂ්ටියෙක් වේ ද එයයි. **පඤ්ඤායෙතෙ පිථියරෙ** යනු: ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු (වසනු) ලැබෙති පසිඳනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්.

'හැම සංස්කාරයෝ අනිත්‍යහ යි දන්නහු ගේ දක්නහු ගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු වසනු ලැබෙති. පසිඳිති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නොපවතිත්. 'හැම සංස්කාරයෝ දුඃඛහ' යි දන්නහු ගේ දක්නහු ගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්. 'හැම සංස්කාරයෝ අනාත්මහ'යි දන්නහු ගේ දක්නහු ගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුන පුනා නො පවතිත්.

"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"ති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති. "සඞ්ඛාරපච්චයා විඤ්ඤාණ"න්ති –පෙ– විඤ්ඤාණපච්චයා නාමරූපන්ති–පෙ–නාමරූපපච්චයා සළායතනන්ති–පෙ–සළායතනපච්චයා ඵස්සො'ති-පෙ-ඵස්සපච්චයා වෙදනා'ති-පෙ-වෙදනාපච්චයා තණ්හා'ති-පෙ-තණ්හාපච්චයා උපාදානන්ති–පෙ–උපාදානපච්චයා භවො'ති–පෙ–භවපච්චයා ජාති'ති.–පෙ–ජාතිපච්චයා ජරාමරණන්ති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො'ති–පෙ–සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො'ති–පෙ–විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො'ති–පෙ–නාමරූපනිරොධා සළායතනනිරොධො'ති–පෙ–සළායතනනිරොධා ඵස්ස නිරොධො'ති–පෙ-ඵස්සනිරොධා වෙදනානිරොධො'ති–පෙ–වෙදනානිරොධා තණ්හානිරොධො'ති–පෙ–තණ්හානිරොධා උපාදානනිරොධො'ති-පෙ-උපාදාන නිරොධා භවනිරොධො'ති–පෙ–භවනිරොධා ජාතිනිරොධො'ති-පෙ–ජාති නිරොධා ජරාමරණනිරොධො'ති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති.

ඉදං දුක්ඛන්ති-පෙ-අයං දුක්ඛසමුදයොති-පෙ-අයංදුක්ඛනිරොධොති-පෙ අයංදුක්ඛනිරොධගාමිනීපටිපදාති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති.

ඉමෙ[1] ආසවා'ති-පෙ-අයං ආසවසමුදයො'ති-පෙ-අයං ආසවනිරොධොති –පෙ–අයං ආසවනිරොධගාමිනීපටිපදා'ති ජානතො පස්සතො පඤ්ඤා යෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති.

ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති-පෙ-ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති-පෙ-ඉමෙ ධම්මා පහාතබ්බාති-පෙ-ඉමෙ ධම්මා භාවෙතබ්බාති,-පෙ-ඉමෙ ධම්මා සච්ඡිකා තබ්බාති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිථීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති.

1. ඉමෙ ධම්මා–මජසං

'අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති' දන්නහු ගේ දක්නහු ගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නොවැගිරෙති යට බලා නොයෙති නො ගලති පුනපුනා නො පවතිත්.'සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ' යයි ... 'විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වේ' යයි ... ''නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය වේ' යයි ... 'ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ' යයි ... 'ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව වෙ' යයි ... වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ' යයි ... 'තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදන වේ' යයි ... ''උපාදන ප්‍රත්‍යයෙන් භවය වෙ' යයි ... ''භව ප්‍රත්‍යයෙන් ජාතිය වෙ' යයි ... 'ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යයි' දන්නහු ගේ දක්නහු ගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නොවැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්.

'අවිද්‍යා නිරෝධයෙන් සංස්කාරනිරෝධය වේ' යයි ... 'සංස්කාර නිරෝධයෙන් විඥානනිරෝධය වේ' යයි ... විඥානනිරොධයෙන් නාමරූප නිරොධය වේ' යයි ... 'නාමරූපනිරොධයෙන් ෂඩායතන නිරොධය වේ' යයි ... 'ෂඩායතනනිරොධයෙන් ස්පර්ශ නිරොධය වේ' යයි ... 'ස්පර්ශ නිරොධයෙන් වෙදනානිරොධය වේ, යයි ... 'වෙදනා නිරොධයෙන් තෘෂ්ණා නිරොධය වේ යයි ... 'තෘෂ්ණානිරොධයෙන් උපාදනනිරොධය වේ' යයි ...'උපාදනනිරොධයෙන් භවනිරොධය වෙ යයි... භව නිරොධයෙන් ජාතිනිරොධය වේ' යයි ... 'ජාතිනිරොධයෙන් ජරාමරණනිරොධය වෙ' යයි දන්නහුගේ දක්නහුගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්.

'මේ දුකැ'යි ... 'මෙ දුඃඛසමුදයැ'යි ... 'මෙ දුඃඛනිරොධයැ'යි ... 'මෙ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපද' යි දන්නහුගේ දක්නහුගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්.

'මොහු ආස්‍රවය'යි ... 'මෙ ආස්‍රව සමුදය' යි ... 'මෙ ආස්‍රවනිරොධය' යි ... 'මෙ ආස්‍රවනිරොධගාමිනීප්‍රතිපද' යි දන්නහුගේ දක්නහුගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්.

'මෙ ධර්මයෝ ස්වලක්ෂණාවබෝධයෙන් දතයුත්තාහ'යි ... 'මෙ ධර්මයෝ සාමාන්‍ය ලක්ෂණාවබෝධයෙන් දතයුත්තාහ'යි...'මෙ ධර්මයෝ ප්‍රහාතව්‍යාහ'යි ... 'මෙ ධර්මයෝ භාවිතව්‍යාහ'යි ... 'මෙ ධර්මයෝ සාක්ෂාත් කර්තව්‍යහ'යි දන්නහු ගේ දක්නහුගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්.

ජත්තං එස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිධීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්ති.

පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච ජානතො පස්සතො–පෙ–චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච ජානතො පස්සතො–පෙ–යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති ජානතො පස්සතො පඤ්ඤායෙතෙ සොතා පිධීයන්ති පච්ඡිජ්ජන්ති න සවන්ති න ආසවන්ති න සන්දන්ති නප්පවත්තන්තීති "පඤ්ඤායෙතෙ පිධීයරෙ"

තෙනාහ භගවා:

"යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රූමි
පඤ්ඤායෙතෙ පිධීයරෙ"ති.

1–5

පඤ්ඤා චෙව සති චාපි (ඉච්චායස්මා අජිතො)
නාමරූපඤ්ච මාරිස
එතං මෙ පුට්ඨො පබ්‍රූහි
කත්ථෙතං උපරුජ්ඣති.

පඤ්ඤාචෙව සතිචාපීති: පඤ්ඤා'ති යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො[1] පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි. සතීති යා සති අනුස්සති–පෙ– සම්මාසතීති "පඤ්ඤා චෙව සති චාපි" ඉච්චායස්මා අජිතො.–පෙ– අභිලාපො'ති ඉච්චායස්මා අජිතො.

නාමරූපඤ්ච මාරිසාති 'නාම'න්ති චත්තාරො අරූපිනො ඛන්ධා. "රූප"න්ති චත්තාරො ච මහාභූතා චතුන්නං ච මහාභූතානං[2] උපාදායරූපං 'මාරිසා'ති පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං 'මාරිසාති'. "නාමරූපං ච මාරිස".

1. පතොදො - ච,ක
2. චතුන්නං මහාභූතානං - ක

ෂඩ්විධ ස්පර්ශායතනයන්ගේ සමුදය (ප්‍රත්‍යය) ද අස්තගමන ද අනුසස්සුදු දෙසුදු නිර්ගමනදු දන්නාහුගේ දක්නාහුගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳිනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත්.

පඤ්ච උපාදානස්කන්ධයන්ගේ සමුදය ද අස්තගමන ද අනුසස්සුදු දෙසුදු නිර්ගමන දු දන්නාහුගේ දක්නාහුගේ...සතර මහාභූතයන්ගේ සමුදය ද අස්තගමන ද අනුසස්සුදු දෙසුදු නිර්ගමන දු දන්නාහුගේ දක්නාහුගේ ... සමුදය ස්වභාවය ඇති යම් කිසිවක් වේ නම් එහැම නිරොධස්වභාවය ඇත්තේ යයි දන්නාහුගේ දක්නාහුගේ ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙති පසිඳිනු ලැබෙති නො වැගිරෙති යට බලා නො යෙති නො ගලති පුනපුනා නො පවතිත් නුයි ''පඤ්ඤායෙතෙ පිථීයරෙ'' යනුවේ.

එයින් වදළහ බුදුහු:
''යානි සොතානි ලොකස්මිං–පෙ–පඤ්ඤායෙතෙ පිථීයරෙ''යි.

1–5. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්.) ප්‍රඥාව ද ස්මෘතිය ද (තදව ශෙෂ) නාමරූපය ද යන තෙල සියල්ල කොහි නිරුද්ධ වේ ද? නිදුකාණෙනි, මා විසින් පුළුවුස්නාලද මුඹ වහන්සේ තෙල කරුණ මට වදළ මැනැව.

පඤ්ඤා චෙව සතිචාපි යන්නෙහි 'පඤ්ඤා' යනු: යම් ප්‍රඥායෙක් ප්‍රජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රකර්ෂයෙන් විමසීමෙක් දහම් විමසීමෙක් සංලක්ෂණයෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිත බවෙක් කෞශල්‍යයෙක් නිපුණ බවෙක් විභාවනයෙක් චින්තායෙක් (අනිත්‍යාදීන් පිරික්සන) උපපරීක්ෂායෙක් (පෘථිවිය වැනි හෙයින්) භූරිප්‍රඥායෙක් (කෙලෙසුන් නසන) මෙධායෙක් (සම්ප්‍රයුක්තධර්මයන් මෙහෙයන) පරිණායිකායෙක් විදර්ශනායෙක් සම්‍යග්ඥානයෙක් (සිත විපියට නඟන) පතොද ප්‍රඥායෙක් ප්‍රඥායෙක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාආලොකයෙක් ප්‍රඥාඅවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේද එයයි. සති යනු: යම් ස්මෘතියෙක් අනුස්මෘතියෙක් ...සම්‍යක්ස්මෘතියෙක් වේ ද'යි ''පඤ්ඤා චෙව සති චාපි'' යනු වේ. ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්.

නාමරූපඤ්ච මාරිස යන්නෙහි: ''නාමං'' යනු: සතර අරූප ස්කන්ධයෝ යැ, රූපං යනු සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද වෙති. මාරිස යනු: තෙල මාරිස යනු ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරව වචන යැ සප්‍රතිශ්‍රයට නාමෙක් නුයි ''නාමරූපඤ්ච මාරිස'' යනු වේ.

එතං මෙ පුට්ඨො පබ්‍රූහීති 'එතං මෙ'ති යං පුච්ඡාමි යං යාචාමි[1] යං අජ්ඣෙසාමි යං පසාදෙමි. පුට්ඨොති පුච්ඡිතො යාචිතො අජ්ඣෙසිතො පසාදිතො. පබ්‍රූහීති බ්‍රෑහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති. "එතං මෙ පුට්ඨො පබ්‍රූහි".

කත්ථෙතං උපරුජ්ඣතීති කත්ථෙතං නිරුජ්ඣති වූපසම්මති අත්ථං ගච්ඡති පටිප්පස්සම්භතීති "කත්ථෙතං උපරුජ්ඣති"

තෙනාහ සො බ්‍රාහ්මණො:

"පඤ්ඤාචෙව සතී චාපි (ඉච්චායස්මා අජිතො)
නාමරූපඤ්ච මාරිස
එතං මෙ පුට්ඨො පබ්‍රූහි
කත්ථෙතං උපරුජ්ඣතී"ති.

1–6

යමෙතං පඤ්හං අපුච්ඡි - අජිත, තං වදාමි තෙ
යත්ථ නාමං ච රූපං ච - අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන – එත්ථෙතං උපරුජ්ඣති.

යමෙතං පඤ්හං අපුච්ඡීති = යමෙතන්ති පඤ්ඤඤ්ච සතිඤ්ච නාමරූපඤ්ච. අපුච්ඡීති අපුච්ඡසි අයාචසි[2] අජ්ඣෙසසි[3] පසාදෙසීති. "යමෙතං පඤ්හං අපුච්ඡි",

අජිත තං වදාමි තෙ'ති "අජිතා"ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති. තන්ති පඤ්ඤඤ්ච සතිඤ්ච නාමරූපඤ්ච. වදාමීති වදාමි—ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති. "අජිත තං වදාමි තෙ".

යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතීති "නාමන්ති": චත්තාරො අරූපිනො ඛන්ධා, රූපන්ති; චත්තාරො ච මහාභූතා චතුන්නං ච මහාභූතානං උපාදායරූපං. අසෙසන්ති සබ්බෙන සබ්බං සබ්බථා[4] සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං "අසෙසන්ති. උපරුජ්ඣතීති නිරුජ්ඣති වූපසම්මති අත්ථං ගච්ඡති පටිප්පස්සම්භතී ති "යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති".

1. ආයාචාමි –ප,
2. යාචසි–මජ්ඣං
පරියාචසි–සී
3. අජ්ඣෙසසි–ච, ක, මජ්ඣං
4. සබ්බදා-මජ්ඣං

**එතං මෙ පුට්ඨො පබ්‍රෑහි** යනු: "එතං මෙ" යනු යමක් පුළුවුසිම ද යමක් අයදිම් ද යමක් අධ්‍යෙෂණ කෙරෙම ද යම් කරුණකට පහදවම් ද (තෙල කරුණ) **පුට්ඨො** යනු: පුළුවුස්නා ලදහු අයදනා ලදහු අධ්‍යෙෂණ කරන ලදහු පහදවන ලදහු, (මුඹ වහන්සේ) **පබ්‍රෑහි** යනු; කිව මැනැව පැවැසුව මැනැව දෙසුව මැනැව පැනවූව මැනව පිහිටුව මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව නො ගැඹුරු කළ මැනැව ප්‍රකාශ කළ මැනැව යි "එතං මෙ පුට්ඨො පබ්‍රෑහි" යනු වේ.

**කත්ථෙතං උපරුජ්ඣති** යනු: තෙල නාමරූපය කොහි නිරුද්ධ වේ ද නිවේ ද අභාවයට යේ ද සන්හිඳේ ද යි "කත්ථෙතං උපරුජ්ඣති" යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:
"පඤ්ඤා චෙව සති චාපි–පෙ– කත්ථෙතං උපරුජ්ඣති" යි.

1–6.

අජිත තෙපි යම් පැනයක් විචාළ වූ ද, එය තොපට කියමි. යම් තැනෙක්හි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වේ ද (පශ්චිම) විඥනයා ගේ නිරොධය හා මැ (පෙරපසු නො වැ) තෙල විඥාන නිරොධ යෙහි මැ තෙල නාමරූපය උපරුද්ධ වෙයි (විඥාන නිරොධය ඉක්ම නො යෙයි.)

**යමෙතං පඤ්හං අපුච්ඡි** යනුයෙහි: "යමෙතං" යනු ප්‍රඥාව ද ස්මෘතිය ද නාමරූපය ද, අපුච්ඡී යනු විචාළවූ අයැදියවූ අධ්‍යෙෂණ කළ වූ පැහැදවූවහු නු යි "යමෙතං පඤ්හං අපුච්ඡී" යනු වේ.

**අජිත තං වදාමි තෙ** යනු: බුදුහු ඒ බමුණු නමින් අමතති. තං යනු: ප්‍රඥාව ද ස්මෘතිය ද නාමරූපය ද, වදමි යනු කියමි පවසමි දෙසමි පනවමි පිහිටුවමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි නො ගැඹුරු කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි "අජිත තං වදාමි තෙ" යනු වේ.

**යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති** යනු: "නාමං" යනු සතර අරූපස්කන්ධයෝ යැ. රූපං යනු සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද,. අසෙසං යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට හාත්-පසින් ගත්නා වචනයෙකි තෙල 'අසෙසං' යනු. උපරුජ්ඣති යනු නිරුද්ධ වෙයි නිවෙයි අභාවයට යෙයි සන්හිඳේ නුයි "යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති" යනු වේ.

විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතීති: සොතාපත්තිමග්ගඤාණෙන අභිසංඛාරවිඤ්ඤාණස්ස නිරොධෙන සත්ත භවෙ ඨපෙත්වා අනමතග්ගෙ සංසාරෙ යෙ උප්පජ්ජෙය්‍යුං[1] නාමං ච රූපං ච එත්ථෙතෙ නිරුජ්ඣන්ති වූපසම්මන්ති අත්ථං ගච්ඡන්ති පටිප්පස්සම්භන්ති, සකදාගාමිමග්ගඤාණෙන අභිසංඛාරවිඤ්ඤාණස්ස නිරොධෙන ද්වෙ භවෙ ඨපෙත්වා පඤ්චසු භවෙසු යෙ උප්පජ්ජෙය්‍යුං නාමං ච රූපං ච එත්ථෙතෙ නිරුජ්ඣන්ති වූපසම්මන්ති අත්ථං ගච්ඡන්ති පටිප්පස්සම්භන්ති. අනාගාමිමග්ගඤාණෙන අභිසංඛාරවිඤ්ඤාණස්ස නිරොධෙන එකං භවං[2] රූපධාතුයා වා අරූපධාතුයා වා යෙ උප්පජ්ජෙය්‍යුං නාමං ච රූපං ච එත්ථෙතෙ නිරුජ්ඣන්ති වූපසම්මන්ති අත්ථං ගච්ඡන්ති පටිප්පස්සම්භන්ති. අරහත්තමග්ගඤාණෙන අභිසංඛාරවිඤ්ඤාණස්ස නිරොධෙන යෙ උප්පජ්ජෙය්‍යුං නාමං ච රූපං ච එත්ථෙතෙ නිරුජ්ඣන්ති වූපසම්මන්ති අත්ථං ගච්ඡන්ති පටිප්පස්සම්භන්ති. අරහතො අනුපාදිසෙසාය නිබ්බාන-ධාතුයා පරිනිබ්බායන්තස්ස චරිමවිඤ්ඤාණස්ස නිරොධෙන පඤ්ඤා ච සති ච නාමං ච රූපං ච එත්ථෙතෙ නිරුජ්ඣන්ති වූපසම්මන්ති අත්ථං ගච්ඡන්ති පටිප්පස්සම්භන්තීති 'විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣති'

තෙනාහ භගවා:

යමෙතං පඤ්හං අපුච්ඡි – අජිත තං වදාමි තෙ
යත්ථ නාමඤ්ච රූපඤ්ච – අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන – එත්ථෙතං උපරුජ්ඣතීති.

1. සංසාරෙ උප්පජ්ජෙය්‍යුං–මජසං
2. එකභවං–මජසං

**විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣති** යනු: සෝවාන්මඟනැණින් අභිසංස්කාරවිඥානය (කුශලාකුශලසම්ප්‍රයුක්ත චිත්තයා) ගේ (අභාවොත්පත්ති විසින්) නිරුද්ධ වීමෙන් සප්ත භවයන් තබා අනවරාග්‍ර සංසාරවෘත්තයෙහි නාමය ද රූපය ද යන යම් ධර්ම කෙනෙක් උපදනාහු නම් තෙල සෝවාන් මාර්ගයෙහි තෙල නාම රූපධර්මයෝ (අභාවොත්පත්ති විසින්) නිරුද්ධ වෙති නිවෙති අභාවයට යෙති සන්හිඳෙත්. සෙදගැමිමඟනැණින් අභිසංස්කාරවිඥානයාගේ නිරුද්ධ වීමෙන් භව දෙකක් තබා පඤ්චභවයන්හි නාමය ද රූපය ද යන යම් ධර්ම කෙනෙක් උපදනාහු නම් තෙල සෙදගැමි මාර්ගයෙහි තෙල නාමරූපධර්මයෝ නිරුද්ධ වෙති නිවෙති අභාවයට යෙති සන්හිඳෙත්. අනාගැමි මඟනැණින් අභිසංස්කාර විඥානයාගේ නිරුද්ධ වීමෙන් එක් භවයක් තබා රූපධාතුයෙහි වේවයි අරූපධාතුයෙහි වේවයි නාමය ද රූපය ද යන යම් ධර්ම කෙනෙක් උපදනාහු නම් තෙල අනාගැමි මාර්ගයෙහි තෙල නාමරූපධර්මයෝ නිරුද්ධ වෙති නිවෙති අභාවයට යෙති සන්හිඳෙත්. රහත් මඟනැණින් අභිසංස්කාර විඥානය නිරුද්ධ වීමෙන් නාමය ද රූපය ද යන යම් ධර්ම කෙනෙක් උපදනාහු නම් තෙල රහත් මාර්ගයෙහි තෙල නාමරූප ධර්මයෝ නිරුද්ධ වෙති නිවෙති අභාවයට යෙති සන්හිඳෙත්. අනුපාදිශෙෂ පරිනිර්වාණධාතුයෙන් පිරිනිවෙන රහත්හුගේ පශ්චිම විඥානයාගේ (ච්‍යුති චිත්තයාගේ) නිරොධයෙන් ප්‍රඥාව ද ස්මෘතිය ද නාමය ද රූපය ද යන තෙල ධර්මයෝ තෙල අර්හත්මාර්ගයෙහි නිරුද්ධ වෙති නිවෙති අභාවයට යෙති සන්හිඳෙත් නුයි "විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣති" යනු වේ.

එයින් වදළහ බුදුහු:

"යමෙතං පඤ්හං අපුච්ඡි–පෙ–එත්ථෙතං උපරුජ්ඣති"යි.

## 1–7

යෙ ච සඞ්ඛාතධම්මා[1]සෙ – යෙ ච සෙඛා පුථූ ඉධ
තෙසං මෙ නිපකො ඉරියං – පුට්ඨො පබ්‍රූහි මාරිස.

යෙ ච සඞ්ඛාතධම්මාසෙ'ති: "සඞ්ඛාතධම්මා" වුච්චන්ති අරහන්තො ඛීණාසවා, කිං කාරණා සඞ්ඛාතධම්මා[1] වුච්චන්ති අරහන්තො ඛීණාසවා. තෙ සඞ්ඛාතධම්මා ඤාතධම්මා තුලිතධම්මා තීරිතධම්මා විභූතධම්මා විභාවිතධම්මා 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති සඞ්ඛාතධම්මා ඤාතධම්මා තුලිතධම්මා තීරිතධම්මා විභූතධම්මා විභාවිතධම්මා 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති සඞ්ඛාතධම්මා –පෙ– 'සබ්බෙ ධම්මා අනත්තා'ති සඞ්ඛාතධම්මා –පෙ– අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති සඞ්ඛාතධම්මා –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති සඞ්ඛාතධම්මා ඤාතධම්මා තුලිතධම්මා තීරිතධම්මා විභූතධම්මා විභාවිතධම්මා. අථ වා තෙසං ඛන්ධා සඞ්ඛාතා ධාතුයො සඞ්ඛාතා ආයතනානි සඞ්ඛාතානි[2] ගතියො සඞ්ඛාතා උප්පත්තියො සඞ්ඛාතා පටිසන්ධි සඞ්ඛාතා භවා සඞ්ඛාතා සංසාරා සඞ්ඛාතා වට්ටා සඞ්ඛාතා[3] අථ වා තෙ ඛන්ධපරියන්තෙ ඨිතා ධාතුපරියන්තෙ ඨිතා ආයතනපරියන්තෙ ඨිතා ගතිපරියන්තෙ ඨිතා උප්පත්තිපරියන්තෙ ඨිතා පටිසන්ධිපරියන්තෙ ඨිතා භවපරියන්තෙ ඨිතා සංසාරපරියන්තෙ ඨිතා වට්ටපරියන්තෙ ඨිතා අන්තිමෙ භවෙ ඨිතා අන්තිමෙ සමුස්සයෙ ඨිතා අන්තිමදෙහධරා අරහන්තො.

'තෙසා'යං[4] පච්ඡිමකොටි[5] චරිමො'යං සමුස්සයො
ජාතිමරණසංසාරො නත්ථි තෙසං පුනබ්භවො'ති.

තං කාරණා සඞ්ඛාතධම්මා වුච්චන්ති අරහන්තො ඛීණාසවාති. 'යෙ ච සඞ්ඛාතධම්මා සෙ'.

---

1. සඞ්ඛත ධම්මාසෙ–ච–ක
2. ආයතනානි සංඛාතා–ච–ක–ම ජ සං
3. වට්ටං සඞ්ඛාතා–ප
4. තෙසං යංසං–ම ජ සං; තෙසං සාරං–ච–ක; තෙසං යං–ස
5. පච්ඡිමකො–[illegible]

1–7.

නිදුකාණෙනි, මෙ ලොවැ (අනිත්‍යාදි විසින්) විමසන ලද ධර්ම ඇති යම් (රහත්) කෙනෙකුත් වෙත් ද, බොහෝ වූ යම් ශෛක්ෂ කෙනෙකුත් වෙත් ද මා විසින් පුළුවුස්නා ලද (ශෛක්ෂාශෛක්ෂධර්ම යෙහි) පණ්ඩිත වූ මුඹවහන්සේ ඔවුන්ගේ ප්‍රතිපත්තිය මට වදාළ මැනැව.

යෙ ච සඞ්ඛාතධම්මා සෙ යනු: ''සඞ්ඛාතධම්මා'' යි (අනිත්‍යාදි විසින් විමසූ දහම් ඇති) අර්හත් ක්ෂීණාශ්‍රවයෝ කියනු ලැබෙති. කවර කරුණින් අර්හත් ක්ෂීණාශ්‍රවයෝ ''සඞ්ඛ්‍යාතධර්'යි කියනු ලැබෙත් ද යත්: ඔහු විමසූ දහම් ඇතියහ, දන්නා ලද දහම් ඇතියහ, තුලනය කරන ලද දහම් ඇතියහ, තීරණය කරන ලද දහම් ඇතියහ, ප්‍රකට කළ දහම් ඇතියහ, විභාවනය කරන ලද දහම් ඇතියහ, ''හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි විමසූ දහම් ඇතියහ, දන්නා ලද දහම් ඇතියහ, තුලනය කරන ලද දහම් ඇතියහ, තීරණය කරන ලද දහම් ඇතියහ, ප්‍රකට කළ දහම් ඇතියහ,විභාවන කරන ලද දහම් ඇතියහ. 'හැම සංස්කාරයෝ දුඃඛහ'යි විමසූ දහම් ඇතියහ ... 'හැම සංස්කාරයෝ අනාත්මහ'යි විමසූ දහම් ඇතියහ ... 'අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්'යයි විමසූ දහම් ඇතියහ ...'සමුදය ස්වභාවය ඇති යම් කිසිවක් වේ නම් එහැම නිරොධ ස්වභාවය ඇත්තේ යැ'යි විමසූ දහම් දන්නා ලද දහම් තුලනය කරන ලද දහම් තීරණය කරන ලද දහම් ප්‍රකට කරන ලද දහම් විභාවනය කරනලද දහම් ඇතියහ, නොහොත් ඔවුන් විසින් ස්කන්ධයෝ ප්‍රකාශ කරන ලදහ, ධාතූහු ප්‍රකාශ කරන ලදහ, ආයතනයෝ ප්‍රකාශ කරන ලදහ, ගතීහු ප්‍රකාශ කරන ලදහ, උත්පත්තීහු ප්‍රකාශ කරන ලදහ, ප්‍රතිසන්ධිය ප්‍රකාශ කරන ලද යැ, භවයෝ ප්‍රකාශ කරන ලදහ, සංසාරයෝ ප්‍රකාශ කරන ලදහ, වෘත්තයෝ ප්‍රකාශ කරන ලදහ, නොහොත් ඔහු ස්කන්ධපර්‍ය්‍යන්තයෙහි සිටියහ, ධාතු පර්‍ය්‍යන්තයෙහි– ආයතන පර්‍ය්‍යන්තයෙහි– ගතිපර්‍ය්‍යන්තයෙහි – උත්පත්තිපර්‍ය්‍යන්තයෙහි – ප්‍රතිසන්ධි පර්‍ය්‍යන්තයෙහි – භව පර්‍ය්‍යන්තයෙහි – සංසාර පර්‍ය්‍යන්තයෙහි – වෘත්ත පර්‍ය්‍යන්තයෙහි – අන්තිමභවයෙහි – අන්තිම ශරීරයෙහි සිටියහ, රහත් හු අන්තිම දෙහධරයෝ' යි.

1. ''ඔවුන්ගේ මේ පශ්චිම කොටිය (කෙළවර) වෙයි, මේ පශ්චිම ශරීරය යි, ජාතිමරණ සංසාරය, පුනර්භවය ඔවුනට නැතැ'යි''.

එ කරුණින් අර්හත් ක්ෂීණාශ්‍රවයෝ 'සඞ්ඛ්‍යාතධර්ම' යි කියනු ලැබෙති 'යෙ ච සඞ්ඛාතධම්මාසෙ' යනු වේ.

යෙ ච සෙඛා පුථූ ඉධාති: සෙඛාති කිං කාරණා වුච්චන්ති සෙඛා සික්ඛන්තීති සෙඛා. කිඤ්ච සික්ඛන්ති: අධිසීලම්පි සික්ඛන්ති අධිචිත්තම්පි සික්ඛන්ති අධිපඤ්ඤම්පි සික්ඛන්ති. කතමා අධිසීලසික්ඛා: ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, ඛුද්දකො'පි සීලක්ඛන්ධො[1] මහන්තො'පි සීලක්ඛන්ධො[2] සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො මුඛං පමුඛං කුසලානං ධම්මානං සමාපත්තියා. අයං අධිසීල සික්ඛා.

කතමා අධිචිත්තසික්ඛා: ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං – දුතියං ඣානං – තතියං ඣානං – චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං අධිචිත්තසික්ඛා.

කතමා අධිපඤ්ඤා සික්ඛා: ඉධ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛය ගාමිනියා. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති -පෙ- අයං දුක්ඛනිරොධොති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති, ඉමෙ ආසවාති -පෙ- අයං ආසවසමුදයො'ති -පෙ- අයං ආසවනිරොධොති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. අයං අධිපඤ්ඤාසික්ඛා.

ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තා සික්ඛන්ති, ජානන්තා සික්ඛන්ති, පස්සන්තා සික්ඛන්ති, පච්චවෙක්ඛන්තා සික්ඛන්ති චිත්තං අධිට්ඨහන්තා සික්ඛන්ති, සද්ධාය අධිමුච්චන්තා සික්ඛන්ති, විරියං පග්ගණ්හන්තා සික්ඛන්ති, සතිං උපට්ඨපෙන්තා සික්ඛන්ති, චිත්තං සමාදහන්තා සික්ඛන්ති, පඤ්ඤාය පජානන්තා සික්ඛන්ති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තා සික්ඛන්ති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තා සික්ඛන්ති, පහාතබ්බං පජහන්තා සික්ඛන්ති, භාවෙතබ්බං භාවෙන්තා සික්ඛන්ති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තා[3] සික්ඛන්ති, ආචරන්ති සමාචරන්ති සමාදාය වත්තන්ති. තංකාරණා වුච්චන්ති සෙඛා.[4]

පුථූ'ති: බහුකා. එතෙ සෙඛා සොතාපන්නා ච පටිපන්නා ච සකදාගාමිනො ච පටිපන්නා ච අනාගාමිනො ච පටිපන්නා ච අරහන්තො ච පටිපන්නා ච.

ඉධා'ති: ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං සත්ථුසාසනෙ ඉමස්මිං අත්තභාවෙ ඉමස්මිං මනුස්සලොකෙ'ති. "යෙ ච සෙඛා පුථූ ඉධ".

1. ඛුද්දකො සීලක්ඛන්ධො—ච-ක-ම ජ සං
2. මහන්තො සීලක්ඛන්ධො—ච-ක-ම ජ සං
3. සච්ඡිකරොන්තා සික්ඛති—ම ජ සං
4. සෙක්ඛා—පන

යෙ ච සෙඛා පුථූ ඉධ යනු; 'සෙඛා'යි කවර කරුණකින් 'ශෛක්ෂයෝ' යි කියනු ලැබෙති යත්: හික්මෙත් (ශික්ෂාගනිත්) නුයි ශෛක්ෂ නම් වෙත්. කුමක් හික්මෙති යත්. අධිශීලය (අධිශීලයෙහි) ද හික්මෙති, අධිචිත්තය ද හික්මෙති, අධිප්‍රඥාව ද හික්මෙත්. අධිශීලශික්ෂා කවරැ යත්: මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සමන්වාගත වූයේ ආචාර ගොචර සම්පන්න වැ අල්පමාත්‍ර වූ අකුශල ධර්මයෙහි භය දක්නා සුලු වැ වාස කෙරෙයි, (ඒ ඒ ශික්ෂාපදය) මනාකොට ගෙන (සමාදන් වැ) ශික්ෂා කොට්ඨාසයෙහි හික්මෙයි, ක්ෂුද්‍ර වූ ශීලස්කන්ධය ද මහත් වූ ශීලස්කන්ධය ද ශීල යැ කුශල ධර්මයන්ගේ ප්‍රතිලාභයට ප්‍රතිෂ්ඨා යැ ආදි යැ පාද යැ සංයම යැ සංවරයැ මුඛ (ප්‍රධාන) යැ ප්‍රමුඛ යි. මේ 'අධිශීලශික්ෂා'යි.

අධිචිත්තශික්ෂා කවරැ යත්: මෙ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ...ප්‍රථමධ්‍යානයට ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට පැමිණ වාස කෙරේ. මෙ අධිචිත්තශික්ෂා යි.

අධිප්‍රඥාශික්ෂා කවරැ යත්: මෙ සස්නෙහි මහණ උදයව්‍යය ගාමිනී වූ ආර්‍ය්‍ය (නිර්දොෂ) වූ නිර්වෙද පක්ෂයෙහි වූ මනාසේ නිවනට පමුණුවන්නා වූ නුවණින් පරිපූර්ණ වූයේ ප්‍රඥාවත් වෙයි, හෙතෙම 'මෙ දුකැ'යි තතු සේ දැනගනියි. මෙ'දුක්සමුදය' යි...මේ දුක්නිරොධ යයි... මෙ 'දුක් නිරොධයට පමුණුවන පිළිවෙතැ'යි තතු සේ දැනගනී. මොහු 'ආස්‍රවයහ'යි ... මෙ 'ආස්‍රවසමුදය'යි ... මෙ 'ආස්‍රවනිරොධ' යි ... මේ ආස්‍රවනිරොධයට පමුණුවන පිළිවෙතැ'යි තතු සේ දැනගනී. මෙ අධිප්‍රඥාශික්ෂා යි.

මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙති, දනිමින් හික්මෙති දකිමින් හික්මෙති, ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙති, සිත පිහිටුවමින් හික්මෙති, සැදැහැයෙන් ඇලෙමින් හික්මෙති, වීර්‍ය්‍යය දැඩි වැ ගනිමින් හික්මෙති, සිහි එළවමින් හික්මෙති, සිත එකඟ කෙරෙමින් හික්මෙති, ප්‍රඥායෙන් දැනගනිමින් හික්මෙති, සවභාව ලක්ෂණාවබෝධයෙන් දතයුත්ත සවභාවලක්ෂණාවබෝධයෙන් දනිමින් හික්මෙති, සාමාන්‍ය ලක්ෂණාවබොධයෙන් දතයුත්ත සාමාන්‍යලක්ෂණාවබොධයෙන් දනිමින් හික්මෙති, හළයුතු සමුදය හැරපියමින් හික්මෙති, වැඩියයුතු මඟ වඩමින් හික්මෙති, පසක් කළයුතු නිවන පසක් කෙරෙමින් හික්මෙති, හැසිරෙති, මොනොවට හැසිරෙති, මොනොවට ගෙන පවතිත්. එකරුණින් 'ශෛක්ෂහ'යි කියනු ලැබෙත්.

පුථූ යනු: බොහෝ වූ තෙල ශෛක්ෂයෝ සෝවන්හු ද එමඟට පිළිපන්හු ද සෙදගැමිහු ද එමඟට පිළිපන්හු ද අනාගැමිහු ද එමඟට පිළිපන්හු ද රහත්මඟට පැමිණියාහු ද එමඟට පිළිපන්හු ද,

ඉධ යනු: මෙ දෘෂ්ටියෙහි මෙ ක්ෂාන්තියෙහි මෙ රුචියෙහි මෙ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මෙ ධර්මවිනයෙහි මේ ප්‍රවචනයෙහි මෙ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි මෙ ශාස්තෘශාසනයෙහි මෙ අත්බවහි මේ මිනිස්ලොවැ නුයි 'යෙ ච සෙඛා පුථූ ඉධ' යනු වේ.

තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රෑහි මාරිසාති ත්වං හි[1] නිපකො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. තෙසං සඞ්ඛාතධම්මානං ච සෙඛානං ච. ඉරියං'ති: චරියං වුත්තිං පවත්තිං ආචාරං ගොචරං විහාරං පටිපදං. පුට්ඨො'ති: පුච්ඡිතො[1] යාචිතො අජ්ඣෙසිතො පසාදිතො. පබ්‍රෑහීති බ්‍රෑහි[2] ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහි. මාරිසාති පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං මාරිසාති. "තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රෑහි මාරිස"

තෙනාහ සො බ්‍රාහ්මණො:

'යෙ ච සඞ්ඛාතධම්මා සෙ – යෙ ච සෙඛා පුථූ ඉධ
තෙසං මෙ නිපකො ඉරියං – පුට්ඨො පබ්‍රෑහි මාරිසා'ති.

---

1–8

"කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය – මනසානාවිලො සියා
කුසලො සබ්බධම්මානං – සතො භික්ඛු පරිබ්බජෙ."

කාමෙසු නාභිගිජ්ඣෙය්‍යාති: 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච. කතමෙ වත්ථුකාමා: මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දසිදසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරං ච යං කිඤ්චි රජනීයං වත්ථු, වත්ථුකාමා.

අපි ච අතීතා කාමා අනාගතා කාමා පච්චුප්පන්නා කාමා අජ්ඣත්තා කාමා බහිද්ධා කාමා අජ්ඣත්තබහිද්ධා කාමා හීනා කාමා මජ්ඣිමා කාමා පණීතා කාමා ආපායිකා කාමා මානුසිකා කාමා දිබ්බා කාමා පච්චුපට්ඨිතා කාමා නිම්මිතා කාමා පරනිම්මිතා කාමා අනිම්මිතා කාමා පරිග්ගහිතා කාමා අපරිග්ගහිතා කාමා මමායිතා[3] කාමා අමමායිතා[4] කාමා සබ්බෙපි කාමාවචරා ධම්මා සබ්බෙපි රූපාවචරා ධම්මා සබ්බෙපි අරූපාවචරා ධම්මා තණ්හාවත්ථුකා තණ්හාරම්මණා කමනීයට්ඨෙන රජනීයට්ඨෙන මදනීයට්ඨෙන* කාමා. ඉමෙ වුච්චන්ති වත්ථුකාමා.

---

1. පුට්ඨොති පුට්ඨො පුච්ඡිතො–සී, සහා
2. පබ්‍රෑහීති පබ්‍රෑහි–සී.
3. මමායිතා - ච, ක - මජ්ඣං.
4. අමමායිතා - ච - ක - මජ්ඣං

*රමනීයට්ඨෙන අභිසාරට්ඨෙනා'ති කත්ථචි අධික පාඨා.

**තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රෑහි මාරිස** යනු: යම් හෙයකින් නුඹ වහන්සේ නිපුණ ද පණ්ඩිත ද පැනැති සේක් ද බුද්ධිමත් සේක් ද නැණැති සේක් ද ගූඪාර්ථ ප්‍රකට කොට දන්නාසේක් ද තුලිතඥාන ඇති සේක් ද (එහෙයින්) **තෙසං**: ඒ රහතුන්ගේ ද ශෛක්ෂයන්ගේ ද **ඉරියං** යනු: චර්‍යාව වෘත්තිය පැවැත්ම ආචාරය ගොචරය විහරණය ප්‍රතිපදාව, **පුට්ඨො** යනු: පුළුවුස්නා ලදහු විචාරන ලදහු අයදනා ලදහු අධ්‍යෙෂණ කරන ලදහු පහදවන ලදහු, **පබ්‍රෑහි** යනු කිව මැනැව පැවැසුව මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව නො ගැඹුරු කළ මැනැව ප්‍රකාශ කළ මැනැව. **මාරිස** යනු: ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරවවචන යැ, තෙල මාරිස යනු සප්‍රතිශ්‍රයට නාමෙක් නුයි, 'තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රෑහි මාරිස' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

''යෙ ච සඞ්ඛාතධම්මා සෙ–පෙ–පුට්ඨො පබ්‍රෑහි මාරිස''යි.

---

1–8.

කාමයෙහි ගිජු නො වන්නේ යැ සිතින් නො කැළඹුණෙක් වන්නේ යැ සියලු දහම්හි දක්ෂ වූ මහණ ඵතම ස්මෘතිමත් වැ හැසිරෙන්නේ යි.

**කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය** යනු: 'කාමා' යි විස්තර විසින් වස්තු-කාමයෝ යැ ක්ලෙශකාමයෝ යැ යි කාමයෝ දෙදෙනෙක් වෙති. වස්තු කාමයෝ කවරහ යත්: මනවඩන රූපයෝ යැ මනවඩන ශබ්දයෝ යැ මන වඩන ගන්ධයෝ යැ මනවඩන රසයෝ යැ මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ අතුරුණු යැ පොරෝන යැ දාසි දස්හු යැ එළු බැටෙළු යැ හූරු කුකුළු යැ ඇත් අස් ගව වෙළඹුහුයැ කෙත් යැ වතු යැ කහවණු යැ රන් යැ ගම් නියම්ගම් රජදහන්හු යැ රට යැ දනවු යැ කොෂ යැ කොටුගෙ යැ යම් කිසි ඇලුම් කටයුතු වස්තු යැ (යන) මොහු වස්තුකාමයෝ යැ.

තවද, අතීත කාමයෝ යැ අනාගත කාමයෝ යැ වර්තමානකාමයෝ යැ අධ්‍යාත්ම කාමයෝ යැ බාහ්‍ය කාමයෝ යැ අධ්‍යාත්මබාහ්‍ය කාමයෝ යැ හීන කාමයෝ යැ මධ්‍යම කාමයෝ යැ ප්‍රණීත කාමයෝ යැ සතර අපායෙහි වූ කාමයෝ යැ මිනිස් ලොවැ වූ කාමයෝ යැ දෙව්ලොවැ වූ කාමයෝ යැ එළඹ සිටි කාමයෝ යැ (අරමුණු මවා රමණය කරන) නිර්මිත කාමයෝ යැ පරනිර්මිත කාමයෝ යැ අනිර්මිත (පියවින් පිළියෙල වූ) කාමයෝ යැ (මේ මාගේ යැයි) පිළිගත් කාමයෝ යැ (එසෙයින්) නො පිළිගත් කාමයෝ යැ මේ මාගේ යැ යි ගත් කාමයෝ යැ (එසේ නො ගත්) අමමායිත කාමයෝ යැ සියලු මැ කාමාවචර ධර්මයෝ යැ සියලු මැ රූපාවචර ධර්මයෝ යැ සියලු මැ අරූපාවචර ධර්මයෝ යැ තෘෂ්ණාවට කරුණු වූ තෘෂ්ණාවට අරමුණු වූ (ධර්මයෝ) ප්‍රාර්ථනා කළයුතු අර්ථයෙන් ඇලීමට යොග්‍යාර්ත්ථයෙන් (කුලමදාදි) මද ඉපැදවියයුතු අර්ත්ථයෙන් කාමයෝ යි, මොහු වස්තුකාමයෝ යි කියනු ලැබෙත්.

කතමෙ කිලෙසකාමා: ඡන්දො කාමො රාගො කාමො ඡන්දරාගො කාමො සඞ්කප්පො කාමො රාගො කාමො සඞ්කප්පරාගො කාමො, යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාම සිනෙහො කාමපිපාසා කාමපරිළාහො කාමගෙධො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්ද නීවරණං.

2. අද්දසං කාම, තෙ මූලං – සංකප්පා කාම, ජායසි
න තං සංකප්පයිස්සාමි – එවං කාම, න හෙහිසී ති.

ඉමෙ වුච්චන්ති කිලෙසකාමා.

ගෙධො වුච්චති තණ්හා යො රාගො සාරාගො – පෙ – අභිජ්ඣා ලොභො අකුසලමූලං.

කාමෙසු නාභිගිජ්ඣෙය්‍යාති කිලෙසකාමෙන වත්ථුකාමෙසු නාභිගිජ්ඣෙය්‍ය න පළිබුද්ධෙය්‍ය අගිද්ධො අස්ස අගථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරෙය්‍යාති. ''කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය''.

මනසා නාවිලො සියා'ති: මනො'ති යං චිත්තං මනො මානසං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු. කායදුච්චරිතෙන චිත්තං ආවිලං හොති ලුළිතං එරිතං ඝට්ටිතං චලිතං භන්තං අවූපසන්තං වචීදුච්චරිතෙන –පෙ– මනොදුච්චරිතෙන –පෙ– රාගෙන –පෙ– දොසෙන –පෙ– මොහෙන –පෙ– කොධෙන –පෙ– උපනාහෙන –පෙ– මක්ඛෙන –පෙ– පළාසෙන –පෙ– ඉස්සාය –පෙ– මච්ඡරියෙන –පෙ– මායාය –පෙ– සාඨෙය්‍යෙන –පෙ– ථම්භෙන –පෙ– සාරම්භෙන –පෙ– මානෙන –පෙ– අතිමානෙන –පෙ– මදෙන –පෙ– පමාදෙන –පෙ– සබ්බකිලෙසෙහි –පෙ– සබ්බදුච්චරිතෙහි –පෙ– සබ්බදරථෙහි –පෙ–

ක්ලෙශකාමයෝ කවරහ යත්: ඡන්‍දය කාම යැ රාගය කාම යැ ඡන්‍ද-රාගය කාම යැ සංකල්පය කාම යැ රාගය කාම යැ සංකල්පරාගය කාම ය-පඤ්චකාමගුණයෙහි යම් කාමසඞ්ඛ්‍යාත ඡන්‍දයෙක් කාමරාගයෙක් කාම නන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නේහයෙක් කාමපිපාසායෙක් කාම-පරිදාහයෙක් කාමගෙධයෙක් (කාමයෙහි ගිජු බවෙක්) කාමමූර්ඡායෙක් කාමයන්හි ඇතුළු වීමෙක් කාමසඞ්ඛ්‍යාත ඔඝයෙක් කාමයෝගයෙක් කාමෝපාදානයෙක් කාමච්ඡන්‍දනීවරණයෙක් වේ ද.

2\. කාමය, තා ගේ මුල දිටිමි, තෝ සංකල්පය හේතු කොට ගෙන උපදනෙහි, (දැන් මම) තා නො පතමි, කාමය මෙසෙයින් තෝ නූපදනෙහියැ යි.

මොහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත්.

ගෙධ යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක්, බලවත් රාග-යෙක් ... අභිධ්‍යායෙක් ලොභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එයයි.

කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය යනු: ක්ලෙශකාමයෙන් වස්තුකාමයෙහි ගිජු නො වන්නේ යැ, ලොභ නො කරන්නේ යැ, ගිජු නො වූයෙක් නො ගෙතු-ණෙක් මුසපත් නො වූයෙක් නො වතුළෙක් වන්නේ යැ, දුරු කළ ගේධ ඇතියෙක් පහ වූ ගේධ ඇතියෙක් හරන ලද ගේධ ඇතියෙක් වමාළ ගේධ ඇතියෙක් මුදලූ ගේධ ඇතියෙක් ප්‍රහීණ වූ ගේධ ඇතියෙක් දුරලූ ගේධ ඇතියෙක් වන්නේ යැ, දුරු කළ රාග ඇතියෙක් පහ වූ රාග ඇතියෙක් හරන ලද රාග ඇතියෙක් වමාළ රාග ඇතියෙක් මුදලූ රාග ඇතියෙක් පුහුන් රාග ඇතියෙක් දුරලූ රාග ඇතියෙක් තෘෂ්ණා රහිතයෙක් (තෘෂ්ණා පියන් නැතියෙක් හෝ) නිවියෙක් සිහිල් වූයෙක් (කායිකචෛතසික) සුව විඳුනා සුල්ලෙක් වන්නේ යැ, උත්තම ස්වභාවය ඇති සිතින් යුතුවැ වාසය කරන්නේ යැ නුයි 'කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය' යනු වේ.

මනසා නාවිලො සියා යනු: 'මනො' යනු: යම් සිතෙක් මනසෙක් මාන සයෙක්, හෘදයයෙක් පණ්ඩර වූ භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූපමනොවිඥාන ධාතුයෙක් වේද එය යි. කායදුශ්චරිතයෙන් සිත නො පහන් වූයේ කැළඹුණේ කම්පිත වූයේ (අරමුණෙහි) ගැටුණේ සැලුණේ භ්‍රාන්ත වූයේ නො සන් හිඳුණේ වෙයි. වාග්දුශ්චරිතයෙන් ... මනොදුශ්චරිතයෙන්... රාගයෙන්... ද්වෙෂයෙන්... මොහයෙන්... ක්‍රොධයෙන්... උපනාහයෙන්... මකු බැවින් ... පලාසයෙන්... ඊර්ෂ්‍යායෙන්... මාත්සර්‍ය්‍යයෙන්... සඨ බැවින්... ස්තම්භ-යෙන්...සාරම්භයෙන්... මානයෙන්... අතිමානයෙන්... මදයෙන්... ප්‍රමාද-යෙන්... හැම කෙලෙසුන් ගෙන්... හැම දුසිරිතින්... හැම දරථයෙන්...

සබ්බපරිළාහෙහි –පෙ– සබ්බසන්තාපෙහි –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං ආවිලං හොති ලුලිතං එරිතං ඝට්ටිතං චලිතං භන්තං අවූපසන්තං, **මනසා නාවිලොසියා'ති** චිත්තෙන අනාවිලොසියා අලුලිතො අනෙරිතො අඝට්ටිතො අචලිතො අභන්තො වූපසන්තො ආවිලකරෙ කිලෙසෙ ජහෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය ආවිලකරෙහි කිලෙසෙහි ච ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති "මනසා නාවිලොසියා".

**කුසලො සබ්බධම්මානන්ති.** "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා"ති කුසලො සබ්බධම්මානං, "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති කුසලො සබ්බධම්මානං, "සබ්බෙ ධම්මා අනත්තා"ති කුසලො සබ්බධම්මානං, 'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'ති කුසලො සබ්බධම්මානං –පෙ– 'යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති කුසලො සබ්බධම්මානං, එවම්පි කුසලො සබ්බධම්මානං.

අථවා අනිච්චතො කුසලො සබ්බධම්මානං, දුක්ඛතො –පෙ– රොගතො– ගණ්ඩතො– සල්ලතො– අඝතො– ආබාධතො– පරතො– පලොකතො– ඊතිතො– උපද්දවතො– භයතො– උපසග්ගතො– චලතො– පභඞ්ගුතො– අද්ධුවතො– අතාණතො– අලෙනතො– අසරණතො– අසරණීභූතතො– රිත්තතො– තුච්ඡතො– සුඤ්ඤතො– අනත්තතො– ආදීනවතො– විපරිණාමධම්මතො– අසාරකතො– අඝමූලතො– වධකතො– විභවතො– සාසවතො– සංඛතතො– මාරාමිසතො– ජාතිධම්මතො– ජරාධම්මතො– ව්‍යාධිධම්මතො– මරණධම්මතො– සොකපරිදෙව–දුක්ඛදොමනස්සුපායාස–ධම්මතො– සංකිලෙසිකධම්මතො– සමුදයතො– අත්ථංගමතො– අස්සාදතො– ආදීනවතො– නිස්සරණතො කුසලො සබ්බධම්මානං, එවම්පි කුසලො සබ්බධම්මානං.

අථවා ඛන්ධකුසලො ධාතුකුසලො ආයතනකුසලො පටිච්චසමුප්පාද කුසලො සතිපට්ඨානකුසලො සම්මප්පධානකුසලො ඉද්ධිපාදකුසලො ඉන්ද්‍රියකුසලො බලකුසලො බොජ්ඣඞ්ගකුසලො මග්ගකුසලො ඵලකුසලො නිබ්බානකුසලො, එවම්පි කුසලො සබ්බධම්මානං.

හැම පරිදහයන්ගෙන්... හැම සන්තාපයන්ගෙන්... හැම අකුශලාභිසංස්කාරයන්ගෙන් සිත නො පහන් වූයේ කැළඹුණේ කම්පිත වූයේ ගැවුණේ සැලුණේ බැමුණේ නො සන්හිඳුණේ වෙයි. **මනසා නාවිලො සිය** යනු- සිතින් නො පහන් වූයෙක් නො කැළඹුණෙක් කම්පිත නො වූයෙක් නො ගැවුණෙක් නො සැලුණෙක් නො බැමුණෙක් සන්හිඳුණෙක් වන්නේ යැ, නො පහන් බව කරන කෙලෙසුන් හැරපියන්නේ යැ, බැහැර කරන්නේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනු අභාවයට පමුණු වන්නේ යැ. තවද, නො පහන් බව කරන කෙලෙසුන් කෙරෙන් දුරින් දුරුවූයේ නො ඇලුණේ සියලු ලෙසින් වෙන් වූයේ නික්මුණේ වෙන් වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍යාද කළ (එක් වැ නො යෙදුණු) සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'මනසා නාවිලො සියා' යනු වේ.

**කුසලො සබ්බධම්මානං** යනු: 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි හැම දහම්හි දක්ෂ වූයේ, හැම සංස්කාරයෝ දුඃඛයහ' යි හැම දහම්හි දක්ෂ වූයේ, හැම සංස්කාරයෝ අනාත්මයහ'යි හැම දහම්හි දක්ෂ වූයේ, 'අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති' හැම දහම්හි දක්ෂ වූයේ,... සමුදය ස්වභාව ඇති යම් කිසිවක් වේ නම් එ හැම නිරොධස්වභාව ඇත්තේ යයි හැම දහම්හි දක්ෂ වූයේ නුයි මෙසේ ත් 'කුසලො සබ්බධම්මානං' යනු වේ.

නොහොත් අනිත්‍ය හෙයින් හැම දහම්හි දක්ෂ වූයේ දුක් හෙයින්... රොග හෙයින්... ගණ්ඩ හෙයින්... ශල්‍ය හෙයින්... අඝ (දුක්) හෙයින්... ආබාධ හෙයින්... පර(අවසඟ) හෙයින්...බිඳෙන හෙයින්...ව්‍යසන හෙයින්... උපද්‍රව හෙයින්... භය හෙයින්... උපසර්ග හෙයින්...චල හෙයින්– බිඳෙනසුලු හෙයින්... අධ්‍රැවහෙයින්... අත්‍රාණ හෙයින්.,.අලෙන හෙයින්... අශරණ හෙයින්.,. අශරණිභූත හෙයින්... සිස්...තුච්ඡ... ශූන්‍ය... අනාත්ම... ආදීනව... විපරිනාමස්වභාව... අසාර... අඝමූල... වධක... විභව... සාශ්‍රව... හෙතු ප්‍රත්‍යයාභිසංස්කෘත... මාරාමිෂ... ජාතිධර්ම... ජරාධර්ම... ව්‍යාධිධර්ම..මරණ- ධර්ම... ශොකපරිදෙවදුඃඛදෞර්මනස්සොපායාසධර්ම... සාංක්ලෙශික- ධර්ම... සමුදයධර්ම... අස්තඞ්ගම... ආස්වාද... ආදීනව... නිස්සරණ හෙයින් හැම දහම්හි දක්ෂ වූයේ නුයි මෙසේ ත් 'කුසලො සබ්බධම්මානං' යනු වේ.

නොහොත් ස්කන්ධයන්හි නිපුණ වූයේ ධාතු... ආයාතන.. ප්‍රතීත්‍යය සමුත්පාද... ස්මෘතිප්‍රස්ථාන... සම්‍යක් ප්‍රධාන... ඍද්ධිපාද... ඉන්ද්‍රිය... බල... බොද්ධ්‍යඞ්ග... මාර්ග... ඵල... නිර්වාණයෙහි නිපුණ වූයේ නුයි මෙසේත් 'කුසලො සබ්බධම්මානං' යනු වේ.

අථ වා සබ්බධම්මා වුච්චන්ති ද්වාදසායතනානි. චක්ඛුං චෙව රූපා ච සොතං ච සද්දා ච ඝානං ච ගන්ධා ච ජිව්හා ච රසා ච කායො ච ඵොට්ඨබ්බා ච මනො ච ධම්මා ච. යතො ච ඛො අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු ඡන්දරාගො පහීනො ච හොති උච්ඡින්නමූලො තාලවත්ථුකතො අනභාවකතො[1] ආයතිං අනුප්පාදධම්මො, එත්තාවතාපි කුසලො සබ්බධම්මානන්ති 'කුසලො සබ්බධම්මානං'.

සතො භික්ඛු පරිබ්බජෙති: 'සතො'ති චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො.

අපරෙහි'පි චතූහි කාරණෙහි සතො: අසතිපරිවජ්ජනාය සතො, සතිකරණීයානං ධම්මානං කතත්තා සතො, සතිපටිපක්ඛානං[2] ධම්මානං හතත්තා සතො, සතිනිමිත්තානං ධම්මානං අප්පමුට්ඨත්තා සතො.

අපරෙහි'පි චතූහි කාරණෙහි සතො: සතියා සමන්නාගතත්තා සතො, සතියා වසිතත්තා සතො, සතියා පාගුඤ්ඤෙන සමන්නාගතත්තා සතො, සතියා අපච්චොරොහණතාය[3] සතො.

අපරෙහි'පි චතූහි කාරණෙහි සතො: සත්තත්තා සතො, සන්තත්තා සතො, සමිතත්තා සතො, සන්තධම්මසමන්නාගතත්තා සතො, බුද්ධානුස්සතියා සතො, ධම්මානුස්සතියා සතො, සඞ්ඝානුස්සතියා සතො, සීලානුස්සතියා සතො, චාගානුස්සතියා සතො, දෙවතානුස්සතියා සතො, ආනාපානසතියා[4] සතො, මරණසතියා සතො, කායගතාසතියා සතො, උපසමානුස්සතියා සතො. යා සති අනුස්සති -පෙ- සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො, අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො[5] සමන්නාගතො අයං වුච්චති 'සතො.

1. අනභාවංගතො - ව - ක -
2. සතිපරිබන්ධානං - ප - ම ඡ සං
සතිපටිබන්ධානං - ව - ක
3. අපච්චොරොහණතා - පත
4. ආනාපානස්සතියා - ම ඡ සං
5. සමපන්නො - ව - ක

නොහොත් 'සබ්බධම්මා' යි දෙළොස් ආයතනයෝ කියනු ලැබෙති: චක්ෂුස ද රූපයෝ ද ශ්‍රොත්‍රය ද ශබ්දයෝ ද ඝ්‍රාණය ද ගන්ධයෝ ද ජිහ්වාව ද රසයෝ ද කය ද ස්ප්‍රෂ්ටව්‍යයෝ ද මනස ද ධර්මයෝ ද යි. යම් කලෙක ආධ්‍යාත්මිකබාහිර ආයතනයන්හි ඡන්දරාගය ප්‍රහීණ වූයේ උදුරන ලද මුල් ඇත්තේ (උදුරන ලද මුල් ඇති) තල්වත්තක් මෙන් කරන ලද්දේ අනු අභාවය කරන ලද්දේ මත්තෙහි නූපදනා සවභාව ඇත්තේ වේ ද මෙතෙකිනුදු හැම දහම්හි නිපුණ වේ නුයි 'කුසලො සබ්බධම්මානං' යනු වේ.

සතො භික්ඛු පරිබ්බජෙ යනු: 'සතො' යනු සතර කරුණෙකින් සිහි ඇත්තේ කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇත්තේ, වේදනාවන්හි වේදනානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇත්තේ, සිතෙහි චිත්තානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇත්තේ, දහම්හි ධම්මානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇත්තේ යි.

අන්‍ය වූ ද සතර කරුණෙකින් සිහි ඇත්තේ: නො සිහිය හාත්පසින් දුරලීමෙන් සිහි ඇත්තේ, සිහියෙන් කළයුතු දහම් කළ බැවින් සිහි ඇත්තේ, සිහිළිවක් දහම නැසූ බැවින් සිහි ඇත්තේ, සිහියෙන් කළ යුතු (කායාදි) අරමුණු නො නසන ලද බැවින් සිහි ඇත්තේ යි.

අන්‍ය වූ ද සතර කරුණෙකින් සිහි ඇත්තේ: සිහියෙන් සමන්වාගත බැවින් සිහි ඇත්තේ, සිහියෙන් වශීභාවයට පැමිණි බැවින් සිහි ඇත්තේ, ස්මෘතියගේ ප්‍රගුණභාවයෙන් සමන්වාගත බැවින් සිහි ඇත්තේ, සිහිය නො පසුබස්නා බැවින් සිහි ඇත්තේ යි.

අන්‍ය වූ ද සතර කරුණෙකින් සිහි ඇත්තේ: සත්ත්ව (සවභාවයෙන් විද්‍යමාන) වන බැවින් සිහි ඇත්තේ, ශාන්ත (නිවුණ) වන බැවින් සිහි ඇත්තේ, (කෙලෙස්) සන්හිඳුවන ලද බැවින් සිහි ඇත්තේ, සත්පුරුෂධර්මයෙන් සමන්වාගත වන බැවින් සිහි ඇත්තේ, බුද්ධානුස්මෘතියෙන් සිහි ඇත්තේ, ධර්මානුස්මෘතියෙන් සිහි ඇත්තේ, සඞ්ඝානුස්මෘතියෙන් සිහි ඇත්තේ, ශීලානුස්මෘතියෙන් සිහි ඇත්තේ, ත්‍යාගානුස්මෘතියෙන් සිහි ඇත්තේ, දෙවතානුස්මෘතියෙන් සිහි ඇත්තේ, ආනාපානස්මෘතියෙන් සිහි ඇත්තේ, මරණානුස්මෘතියෙන් සිහි ඇත්තේ, කායගතානු ස්මෘතියෙන් සිහි ඇත්තේ, උපශමානුස්මෘතියෙන් සිහි ඇත්තේ යි. යම් සිහියෙක් පුනපුනා සිහි කිරීමෙක් ... සම්‍යක් ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායන මාර්ගයෙක් වේ ද, මේ 'සති' යයි කියනු ලැබෙයි. මේ සතියෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ උපගත වූයේ සමුපගත වූයේ නො වෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ වේ. මේ සිහි ඇත්තේ යි කියනු ලැබේ.

භික්ඛූති සත්තන්නං ධම්මානං භින්නත්තා භික්ඛු: සක්කායදිට්ඨි භින්නා, හොති, විචිකිච්ඡා භින්නා හොති, සීලබ්බතපරාමාසො භින්නො හොති, රාගො භින්නො හොති, දොසො භින්නො හොති, මොහො භින්නො හොති, මානො භින්නො හොති, භින්නා හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පෙ. නොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණීයා.

3. "පජ්ජෙන කතෙන[1] අත්තනා –(සභියාති භගවා)
පරිනිබ්බානගතො විතිණ්ණකඞ්ඛො
විභවඤ්ච භවඤ්ච විප්පහාය
වුසිතවා ඛීණපුනබ්භවො[2] ස භික්ඛූ"ති සතො භික්ඛු

සතො භික්ඛු පරිබ්බජෙති සතො භික්ඛු පරිබ්බජෙ: සතො ගච්ඡෙය්‍ය, සතො තිට්ඨෙය්‍ය, සතො නිසීදෙය්‍ය, සතො සෙය්‍යං කප්පෙය්‍ය, සතො අභික්කමෙය්‍ය, සතො පටික්කමෙය්‍ය, සතො ආලොකෙය්‍ය, සතො විලොකෙය්‍ය, සතො සම්මිඤ්ජෙය්‍ය,[3] සතො පසාරෙය්‍ය, සතො සඞ්ඝාටිපත්තචීවරං ධාරෙය්‍ය, සතො චරෙය්‍ය, විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යා'ති "සතො භික්ඛුපරිබ්බජෙ" තෙනාහ භගවා:

කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය – මනසා නාවිලො සියා
කුසලො සබ්බධම්මානං –සතො භික්ඛු පරිබ්බජෙ'ති.

සහ ගාථාපරියොසානා යෙ තෙ බ්‍රාහ්මණෙන සද්ධිං එකච්ඡන්දා එකපයොගා එකාධිප්පායා එකවාසනවාසිතා තෙසං අනෙකපාණසහස්සානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති. තස්ස ච පන බ්‍රාහ්මණස්ස අනුපාදය ආසවෙහි චිත්තං විමුච්චි. සහ අරහත්තප්පත්තා අජිනජටාවාකචීරතිදණ්ඩකමණ්ඩලුකෙසා ච මස්සු ච අන්තරහිතා, අජිතො[4] භණ්ඩුකාසායවත්ථවසනො සඞ්ඝාටිපත්ත–චීවරධරො අන්වත්ථපටිපත්තියා පඤ්ජලිකො භගවන්තං නමස්සමානො නිසින්නො හොති: සත්ථා මෙ භන්තෙ, භගවා සාවකො'හමස්මීති.

අජිත සුත්තනිද්දෙසො සමත්තො.

1. පජ්ජෙනකතෙන,–සී.
2. ඛීණපුනබ්භවො,–සී.
3. සම්මිඤ්ජෙය්‍යා.–මජසං
4. අජිතො–ස්‍යා, මජසං උදානං

භික්ඛු යනු: සප්ත ධර්මයන් භින්න වන බැවින් භික්ඛු නම: සත්කාය-දෘෂ්ටිය බිඳුණේ වෙයි, විචිකිත්සාව... ශීලව්‍රතපරාමර්ශය... රාගය... ද්වේෂය... මොහය... මානය බිඳුණේ වෙයි. ඔහු විසින් ක්ලෙශප්‍රත්‍යය වූ පුනර්භවය කරන්නා වූ ක්ලෙශදරථ සහිත වූ දුඃඛවිපාක වූ ආයති ජරාමරණයන්ට කාරණ වූ ලාමක වූ අකුශල ධර්මයෝ බිඳුනා ලදහු වෙත්.

3. යමෙක් තමා විසින් වැඩූ මාර්ගයෙන් ක්ලෙශ පරිනිර්වාණයට ගියේ ද, එහෙයින් මැ තරණය කළ සැක ඇත්තේ ද, විපත්ති සම්පත්ති ආදි භෙද ඇති විභවය ත් භවයත් දුරු කොට මාර්ගවාස වැස නිම වූ ක්ෂය කළ පුනර්භව ඇති හෙතෙම භික්ෂු නම් වේ නුයි ''සතො භික්ඛු'' යනු වේ.

සතො භික්ඛු පරිබ්බජෙ යනු: මහණ සිහි ඇති වැ හැසිරෙන්නේ යැ, සිහි ඇති වැ යන්නේ යැ, සිහි ඇති වැ සිටුනේ යැ, සිහි ඇති වැ හිඳුනේ යැ, සිහි ඇති වැ හෝනේ යැ, සිහි ඇති වැ ඉදිරියට යන්නේ යැ, සිහි ඇති වැ පෙරළා එන්නේ යැ, සිහි ඇති වැ ඉදිරි බලන්නේ යැ, සිහි ඇති වැ අවට බලන්නේ යැ, සිහි ඇති වැ අත්පා හකුළුවන්නේ යැ, සිහි ඇති වැ අත්පා දිගු කරන්නේ යැ, සිහි ඇති වැ සඟළ–පා–සිවුරු දරන්නේ යැ, සිහි ඇති වැ හැසිරෙන්නේ යැ, වාසය කරන්නේ යැ ඉරියව් පවත්වන්නේ යැ පවත්නේ යැ පාලනය කරන්නේ යැ යැපෙන්නේ යැ යාපනය කරන්නේ යැ නුයි, ''සතො භික්ඛු පරිබ්බජෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:
''කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය–පෙ–සතො භික්ඛු පරිබ්බජෙ''යි.

ගාථාවසානය හා මැ බමුණු හා සමග සමානච්ඡන්ද ඇති සමාන වූ (කායාදි) ප්‍රයෝග ඇති සමාන අදහස් ඇති සමාන වූ (කුශල) වාසනායෙන් වාසිත වූ (ඉකුත් බුදුසසුන්හි වඩනාලද බවුන් ඇති) යම් කෙනෙක් වූහු නම් ඒ නොයෙක් දහස්ගණන් දෙව්මිනිස් සත්නට ''යම් කිසි සමුදය ධර්ම-යක් ඇද්ද එහැම නිරුද්ධ වන සුලු යැ''යි (රාගාදි) රජස් රහිත වූ (රාගාදි) මල රහිත වූ (ශ්‍රොතාපත්ති මාර්ග සඞ්ඛ්‍යාත) ධර්මචක්ෂුස පහළ විය. ඒ (අජිත) බමුණුහට වැළිත් (තෘෂ්ණාදීන්) උපාදන නො කොට (කාමාදි) ආශ්‍රවයන් කෙරෙන් සිත මිදිණ. රහත් බවට පැමිණීම හා මැ අඳුන්දිවිසම් දළ මඩුලු වැහැරි තිදණ්ඩ කමඩලා ද කෙස් ද දළිරවුළු ද අතුරුදහන් විය. අජිත තෙමේ මුඩුහිස් ඇත්තේ හන්පෙරෙව් කහවත් ඇත්තේ සඟළ–පා–සිවුරු ධරනුයේ අන්වර්ථ ප්‍රතිපත්ති (ඉෂ්ටාර්ත්ථලාභ) යෙන් බඳදිලි වැ ''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට ශාස්තෘ වන සේක, මම ශ්‍රාවකයෙමි' භාග්‍යවතුන් නමදිමින් හුන්නේ යි.

**අජිත සූත්‍රනිර්දේශය නිමි**

## 2. තිස්සමෙත්තෙය්‍ය සුත්තනිද්දෙසො

2–1 කො'ධ සන්තුසිතො ලොකෙ (ඉච්චායස්මා තිස්සමෙත්තෙය්‍යො)
කස්ස නො සන්ති ඉඤ්ජිතා
කො උභන්තමභිඤ්ඤාය
මජ්ඣෙ මන්තා න ලිප්පති
කං බ්‍රෑසි මහාපුරිසො'ති
කො'ධ සිබ්බනිමච්චගා.

**කො'ධ සන්තුසිතො ලොකෙ'ති:** කො ලොකෙ තුට්ඨො සන්තුට්ඨො අත්තමනො පරිපුණ්ණසංකප්පොති 'කොධ සන්තුසිතො ලොකෙ'.

**ඉච්චායස්මා තිස්සමෙත්තෙය්‍යො'ති:** 'ඉච්චා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා. නාමෙතං 'ඉච්චා'ති. **ආයස්මා'ති:** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං 'ආයස්මා'ති. **තිස්සො'ති** තස්ස බ්‍රාහ්මණස්ස නාමං සඞ්ඛා[1] සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො. **මෙත්තෙය්‍යො'ති** තස්ස බ්‍රාහ්මණස්ස ගොත්තං සඞ්ඛා[1] සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො'ති 'ඉච්චායස්මා තිස්සමෙත්තෙය්‍යො.'

**කස්ස නො සන්ති ඉඤ්ජිතා'ති:** තණ්හිඤ්ජිතං දිට්ඨිඤ්ජිතං මානිඤ්ජිතං කිලෙසිඤ්ජිතං කාමිඤ්ජිතං. කස්සිමෙ ඉඤ්ජිතා නත්ථි, න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති "කස්ස නො සන්ති ඉඤ්ජිතා."

**කො උභන්තමභිඤ්ඤායා'ති:** කො උභො අන්තෙ අභිඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා'ති 'කො උභන්තමභිඤ්ඤාය'.

**මජ්ඣෙ මන්තා න ලිප්පතී'ති:** මජ්ඣෙ මන්තාය න ලිප්පති අලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතී ති, 'මජ්ඣෙ මන්තා න ලිප්පති'.

**කං බ්‍රෑසි මහාපුරිසොති :** මහාපුරිසො අග්ගපුරිසො සෙට්ඨපුරිසො විසෙට්ඨපුරිසො පාමොක්ඛපුරිසො උත්තමපුරිසො පධානපුරිසො පවරපුරිසො'ති. **කං බ්‍රෑසි:** කං කථෙසි කං මඤ්ඤසි කං භණසි කං පස්සසි කං වොහරසීති. 'කං බ්‍රෑසි මහාපුරිසො'ති.

---

1. සඞ්ඛ්‍යා–පත

# තිස්සමෙත්තෙය්‍ය සූත්‍රනිර්දෙශය

2–1 (ආයුෂ්මත්, තිස්සමෙත්තෙය්‍ය මෙසේ පිළිවිත්.) ''මෙලොවැ කවරෙක් සතුටු වූයේ ද, කවරක්හට (තෘෂ්ණා දෘෂ්ටි) ඉඤ්ජනයෝ (කම්පනයෝ) නැද්ද, කවරෙක් අන්තද්වය විශිෂ්ටඥානයෙන් දැනැ මධ්‍යයෙහි ප්‍රඥායෙන් නො ඇලේ ද, කවරක්හු 'මහාපුරුෂ' යයි කියන සේක් ද, කවරෙක් මෙහි තෘෂ්ණා සිබ්බනිය (ගෙතුම) ඉක්ම ගියේ දැ''යි.

**කොධ සන්තුසිතො ලොකෙ** යනු: ලොවැ කවරෙක් තුටු වූයේ සතුටු වූයේ සියමත් වූයේ පිරිපුන් මනදෙළ ඇතියේ ද නුයි 'කො' ධ සන්තුසිතො ලොකෙ, යනු වේ.

**ඉච්චායස්මා තිස්සමෙත්තෙය්‍යො** යනු: ඉච්ච යනු: පදසන්ධි යැ පද සංසර්ග යැ පද පූරණ යැ අක්ෂර සමවාය යැ ව්‍යඤ්ජන ශ්ලිෂ්ටතා යැ, තෙල 'ඉච්ච' යනු පදනුපූර්වතා යි. ආයස්මා යනු: තෙල 'ආයස්මා යනු ප්‍රියවචන යැ ගරු වචන යැ සගෞරව වචන යැ සප්‍රතිශ්‍රයට නමෙකි. **තිස්ස** යනු: ඒ බමුණු ගේ නම යැ සඞ්ඛ්‍යා යැ සංඥා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ නාමකර්ම යැ නාමධෙය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප යි. **මෙත්තෙය්‍ය** යනු: ඒ බමුණු ගේ ගොත්‍ර යැ සඞ්ඛ්‍යා යැ සංඥා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර නුයි 'ඉච්චායස්මා තිස්ස මෙත්තෙය්‍යො' යනුවේ.

**කස්ස නො සන්ති ඉඤ්ජිතා** යනු: තෘෂ්ණායෙන් චලන (සැලීම) යැ දෘෂ්ටියෙන් චලන යැ මානයෙන් චලන යැ ක්ලේශයෙන් චලන යැ කාමයෙන් චලන යයි. කවරක්හට මේ චලනයෝ නැද්ද, නො වෙද්ද, විද්‍යමාන නො වෙද්ද, නොලැබෙත් ද, ප්‍රහීණ වූවාහු ද, සිඳුණාහු ද, සන්හිඳුණාහු ද, ප්‍රතිප්‍රශ්‍රබ්ද වූවාහු ද, අභව්‍යෝත්පත්තික වූවාහු ද, නුවණ ගින්නෙන් දැවුණාහු දැ යි 'කස්ස නො සන්ති ඉඤ්ජිතා' යනු වේ.

**කො උභන්තමභිඤ්ඤාය** යනු: කවරෙක් උභය අන්තයන් සච්ලක්ෂණාවබොධයෙන් දැනැ අවබොධ කොට තුලනය කොට තීරණය කොට හෙළි කොට ප්‍රකට කොට නුයි 'කො උභන්තමභිඤ්ඤාය' යනු වේ.

**මජ්ඣෙ මන්තා න ලිප්පති** යනු: මධ්‍යයෙහි ප්‍රඥායෙන් නො ඇලේ ද නො ඇලුණේ ද උපලිප්ත නො වූයේ නික්මුණේ නිඃසෘත වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ වේ ද විගතමර්‍යාද කළ සිතින් යුතු වැ වාසය කෙරේ ද යි 'මජ්ඣෙ මන්තා න ලිප්පති' යනු වේ.

**කං බ්‍රෑසි මහාපුරිසොති** යනු: මහාපුරුෂ යැ අග්‍රපුරුෂ යැ ශ්‍රෙෂ්ඨපුරුෂ යැ විශිෂ්ටපුරුෂ යැ ප්‍රමුඛපුරුෂ යැ උත්තම පුරුෂ යැ ප්‍රධාන පුරුෂ යැ ප්‍රවර පුරුෂ යැ'යි කවරක්හු දෙසන සේක් ද? කවරක්හු කියන සේක් ද? කවරක්හු හඟින සේක් ද? කවරක්හු වදරණ සේක් ද? කවරක්හු දක්නා සේක් ද? කවරක්හු වහරන සේක් ද යි 'කං බ්‍රෑසි මහා පුරිසොති' යනු වේ.

**කො'ධ සිබ්බනිමච්චගා**'ති කො ඉධ සිබ්බනිං තණ්හං අච්චගා[1] උපච්චගා අතික්කන්තො සමතික්කන්තො විතිවත්තො'ති. කොධ සිබ්බනිමච්චගා'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"කො'ධ සන්තුසිතො ලොකෙ (ඉච්චායස්මා තිස්සමෙත්තෙය්‍යො)
කස්ස නො සන්ති ඉඤ්ජිතා
කො උභන්තමභිඤ්ඤාය
මජ්ඣෙ මන්තා න ලිප්පති,
කං බ්‍රෑසි මහාපුරිසො'ති
කො'ධ සිබ්බනිමච්චගා"ති.

---

2–2

කාමෙසු බ්‍රහ්මචරියවා (මෙත්තෙය්‍යාති භගවා)
වීතතණ්හා සදා සතො
සඞ්ඛාය නිබ්බුතො භික්ඛු
තස්ස නො සන්ති ඉඤ්ජිතා.

**කාමෙසු බ්‍රහ්මචරියවා**'ති; **'කාමා'**ති උද්දානතො ද්වෙ කාමා වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා.

**බ්‍රහ්මචරියවා**'ති 'බ්‍රහ්මචරියං' වුච්චති අසද්ධම්මසමාපත්තියා ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලා අනතික්කමො. අපි ච නිප්පරියායෙන බ්‍රහ්මචරියං වුච්චති අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං[2] සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. යො ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන උපෙතො සමුපෙතො උපගතො සමුපගතො[3] උපපන්නො සමුපපන්නො සමන්නාගතො, සො වුච්චති බ්‍රහ්මචරියවා. යථා ච ධනෙන ධනවා'ති වුච්චති, භොගෙන 'භොගවා'ති වුච්චති, යසෙන 'යසවා'ති වුච්චති, සිප්පෙන 'සිප්පවා'ති වුච්චති, සීලෙන 'සීලවා'ති වුච්චති, විරියෙන 'විරියවා'ති වුච්චති, පඤ්ඤාය 'පඤ්ඤවා'ති වුච්චති විජ්ජාය 'විජ්ජවා'ති, වුච්චති, එවමෙව යො ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො සො වුච්චති බ්‍රහ්මචරියවාති 'කාමෙසු බ්‍රහ්මචරියවා.'

---

1. අජ්ඣගා - මජසං
2. සෙය්‍යථිදං - මජසං
3. උපාගතො සමුපාගතො - සු

**කො'ධ සිබ්බනිමච්චගා** යනු: කවරෙක් මෙහි සිබ්බනිය තෘෂ්ණාව 'ඉක්මී ද? ඉක්මගියේ ද? අතික්‍රාන්ත ද? සමතික්‍රාන්ත ද? ව්‍යතිවෘත්ත දැයි 'කො' ධ සිබ්බනි මච්චගා' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

''කො' ධ සන්තුසිතො ලොකෙ–පෙ–කො'ධ සිබ්බනි මච්චගා' යි.

---

## 2–2.

(බුදුහු මෙසේ වදළහ: මෙත්තෙය්‍ය) කාමයෙහි (ආදීනව දැක) බඹසර ඇති, පහ වූ තෘෂ්ණා ඇති, හැම කල්හි ස්මෘතිමත් වූ (අනිත්‍යාදි විසින් දහම්) විමසා (රාගාදිය නිවීමෙන්) නිවුණු යම් මහණෙක් වේ ද, ඔහට ඉඤ්ජිතයෝ නැත්තාහ.

**කාමෙසු බ්‍රහමචරියවා** යනු: 'කාමා' යනු: විස්තර විසින් වස්තුකාම යැ ක්ලෙශකාම යැ යි කාමයෝ දෙදෙනෙක් වෙති......මොහු වස්තු කාමයෝ යැ යි කියනු ලැබෙති ......මොහු ක්ලෙශකාමයෝ යැ යි කියනු ලැබෙත්.

**බ්‍රහමචරියවා** යනු: බ්‍රහ්මචරිය යැ යි අසද්ධර්ම සමාපත්තියෙන් දුරින් දුරුවීම වෙන් වීම හාත්පසින් වෙන් වීම වැළැක්ම නො කිරීම අකරණය නො පැමිණීම මර්‍යාද ඉක්ම යෑ ම කියනු ලැබේ.

තවද, නිෂ්පර්‍ය්‍යාය විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය බ්‍රහ්මචර්‍ය්‍ය යැ යි කියනු ලැබෙයි. හේ මෙසේ යැ: සම්‍යග් දෘෂ්ටි යැ සම්‍යක් සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක් කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක් ස්මෘති යැ සම්‍යක් සමාධි යි. යමෙක් මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ උපගත වූයේ සමුපගත වූයේ නොවෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ වේ ද, හෙතෙම බ්‍රහ්මචර්‍ය්‍යවත් යැ යි කියනු ලැබෙයි. යම්සේ නම් ධන හෙයින් 'ධනවත් යැ යි කියනු ලැබේ ද භොග හෙයින් 'භොගවත්' යැ යි කියනු ලැබේ ද යශස් හෙයින් 'යශස්වත්' යැ යි ශිල්ප හෙයින් 'ශිල්පවත්' යැ යි... ශීල හෙයින් 'ශීලවත්' යැ යි... වීර්‍ය්‍ය හෙයින් 'වීර්‍ය්‍යවත්' යැ යි... ප්‍රඥා හෙයින් 'ප්‍රඥාවත්' යැ යි... විද්‍යා හෙයින් 'විද්‍යාවත්' යැ යි කියනු ලැබේ ද, එසෙයින් මැ යමෙක් මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ උපගත වූයේ සමුපගත වූයේ නො වෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ වේ ද හෙතෙම බ්‍රහ්මචර්‍ය්‍යවත් (බඹසර ඇත්තේ) යැ යි කියනු ලැබේ නුයි 'කාමෙසු බ්‍රහ්මචරියවා' යනු වේ.

**මෙත්තෙය්‍යාති** භගවා, තං බ්‍රාහ්මණං ගොත්තෙන ආලපති. භගවා’ති ගාරවාධිවචනමෙතං –පෙ– සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති. ‘මෙත්තෙය්‍යාති භගවා.’

**වීත තණ්හා සදා සතො**’ති ‘තණ්හා’ති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා. යස්සෙසා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා[1] අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති වීතතණ්හො විගතතණ්හො චත්තතණ්හො වන්තතණ්හො මුත්තතණ්හො පහීනතණ්හො පටිනිස්සට්ඨතණ්හො, වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී[2] බ්‍රහ්මභූතෙන අත්තනා විහරති. සදා’ති සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං සතතං සමිතං අබ්බොකිණ්ණං පොඞ්ඛානුපොඞ්ඛං[3] උදකොමිකජාතං[4] අවීචිසන්තති සහිතං ඵුස්සිතං[5] පුරෙභත්තං පච්ඡාභත්තං පුරිමං යාමං[6] මජ්ඣිමං යාමං පච්ඡිමං යාමං කාළෙ ජුණ්හෙ වස්සෙ හෙමන්තෙ ගිම්හෙ පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙ. සතො’ති චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො –පෙ– සො වුච්චති සතො’ති ‘වීතතණ්හො සදා සතො’.

**සඞ්ඛාය නිබ්බුතො භික්ඛූ**’ති: ‘සඞ්ඛා’ වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා විචයො පවිචයො –පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි. සඞ්ඛායාති සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති –පෙ– සබ්බෙ ධම්මා අනත්තා’ති –පෙ– අවිජ්ජාපච්චයා සඞ්ඛාරා’ති –පෙ– ‘යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම’න්ති සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා.

---

1. පටිපස්සද්ධා – මජ්ඣං
2. සුඛප්පටිසංවෙදී – මජ්ඣං
3. පොඞ්ඛානුපොඞ්ඛං – ස්‍යා
4. උදකූමිකජාතං – මජ්ඣං
5. ඵස්සිතං – මජ්ඣං, ඵුසිතං – ස්‍යා
6. පුරිමයාම – මජ්ඣං
7. භාවිතත්තා – සී

**මෙත්තෙයා** යනු: බුදුහු ඒ බමුණු ගොත්‍රයෙන් අමතති. **භගවා** යනු: තෙල ගෞරවනාමයෙකි ... මෙ 'භගවා' යනු සාක්ෂාත්ප්‍රඥප්තියෙක් නුයි ''මෙත්තෙයාති භගවා'' යනු වේ.

**වීතතණ්හො සදා සතො** යනු: 'තණ්හා' යයි: රූපතෘෂ්ණා යැ...... ධර්මතෘෂ්ණා යි. යමක්හට තෙල තෘෂ්ණාව ප්‍රහීණ ද මුලුසුන් වූද සන්හිඳුණි ද ප්‍රතිප්‍රශ්‍රබ්ධ වූ ද අභව්‍යොත්පත්තික (උපදනුවට නුසුදුසු) වූ ද නුවණ ගින්නෙන් දැවුණි ද හෙතෙම වීතතෘෂ්ණ යැ විගතතෘෂ්ණ යැ ත්‍යක්තතෘෂ්ණ යැ වාන්ත තෘෂ්ණ යැ මුක්තතෘෂ්ණ යැ ප්‍රහීණතෘෂ්ණ යැ ප්‍රතිනිඃසෘෂ්ට තෘෂ්ණ යැ වීතරාග යැ විගතරාග යැ ත්‍යක්තරාග යැ වාන්තරාග යැ මුක්ත රාග යැ ප්‍රහීණරාග යැ ප්‍රතිනිඃසෘෂ්ටරාග යැ තෘෂ්ණා නැත්තේ යැ (හෝ තෘෂ්ණා ඡදන නැත්තේ යැ) නිවියේ යැ සිහිල් වූයේ යැ සුවවිඳුනේ යැ බ්‍රහ්මභූත (උතුම් වූ) සිතින් යුක්ත වැ වාසය කරන්නේ යැ යි කියනු ලැබේ. **සදා** යනු: හැම දවස හැම කල්හි සියලු කල්හි දිනපතා අවිච්ඡින්නවැ නිරතුරු අව්‍යාකීර්ණ වැ පිළිවෙළින් සට්ත වැ රළවැළැක් මෙන් අවිරල වැ නො සිඳ එක් වැ ස්පෘෂ්ට වැ පෙරබතැ පසුබතැ පෙරයම්හි මැදියම්හි පසුයම්හි අවපසැ පුරපසැ වසත්හි හිමත්හි ගිමත්හි පෙරවියෙහි මැදිවියෙහි පසුවියෙහි. **සතො** යනු සතර කරුණෙකින් සිහි ඇතියේ, කයෙහි කායානුපස්සනා සිවටන් වඩමින් සිහි ඇතියේ, වේදනාවන්හි වේදනානුපස්සනා සිවටන් වඩමින් සිහි ඇතියේ, සිත්හි චිත්තානුපස්සනා සිවටන් වඩමින් සිහි ඇතියේ, දහම්හි ධම්මානුපස්සනා සිවටන් වඩමින් සිහි ඇතියේ... හෙතෙම 'සිහි ඇතියේ යැ'යි කියනු ලැබේනු යි 'වීතතණ්හො සදා සතො' යනු වේ.

**සංඛාය නිබ්බුතො භික්ඛු** යනු: **'සඞ්ඛා'** ය ඥානය කියනු ලැබෙයි. යම් ප්‍රඥායෙක් ප්‍රජනනාකාරයෙක් විචයෙක් ප්‍රවිචයෙක්... අමෝහයෙක් ධර්මවිචයෙක්. සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එයයි. **සඞ්ඛාය** යනු: විමසා දැනැ තුලනය කොට තීරණය කොට විභාවනය කොට ප්‍රකට කොට 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි විමසා දැනැ තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට 'හැම සංස්කාරයෝ දුඃඛයහ'යි...හැම ධර්මයෝ අනාත්මහ'යි...අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති'...යම් කිසි සමුදය ධර්මයෙක් ඇද්ද එ හැම නිරුද්ධ වන සුලු යැ'යි විමසා දැනැ තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට.

අථ වා අනිච්චතො සඞ්ඛාය ජානිත්වා –පෙ– දුක්ඛතො –පෙ– රොගතො –පෙ– ගණ්ඩතො –පෙ– සල්ලතො –පෙ– නිස්සරණතො සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. **නිබ්බුතො'ති** රාගස්ස නිබ්බාපිතත්තා නිබ්බුතො, දොසස්ස නිබ්බාපිතත්තා නිබ්බුතො, මොහස්ස නිබ්බාපිතත්තා නිබ්බුතො, කොධස්ස – උපනාහස්ස – මක්ඛස්ස – පළාසස්ස– ඉස්සාය – මච්ඡරියස්ස – මායාය – සාඨෙය්‍යස්ස – ථම්භස්ස – සාරම්භස්ස – මානස්ස – අතිමානස්ස – මදස්ස – පමාදස්ස – සබ්බකිලෙසානං – සබ්බදුච්චරිතානං – සබ්බදරථානං – සබ්බපරිළාහානං – සබ්බසන්තාපානං – සබ්බාකුසලාභිසඞ්ඛාරානං නිබ්බාපිතත්තා නිබ්බුතො. **'භික්ඛූ'ති** සත්තන්නං ධම්මානං භින්නත්තා භික්ඛු –පෙ– වුසිතවා ඛීණපුනබ්භවො ස භික්ඛූ'ති 'සඞ්ඛාය නිබ්බුතො භික්ඛු.'

**තස්ස නො සන්ති ඉඤ්ජිතාති** 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස. **ඉඤ්ජිතා'ති** තණ්හිඤ්ජිතං දිට්ඨිඤ්ජිතං මානිඤ්ජිතං කිලෙසිඤ්ජිතං කාමිඤ්ජිතං, තස්සිමෙ ඉඤ්ජිතා නත්ථි, න සන්ති, න සංවිජ්ජන්ති, නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති 'තස්ස නො සන්ති ඉඤ්ජිතා'.

තෙනාහ භගවා:

"කාමෙසු බ්‍රහ්මචරියවා (මෙත්තෙය්‍යාති භගවා)
වීතතණ්හො සදා සතො,
සඞ්ඛාය නිබ්බුතො භික්ඛු
තස්ස නො සන්ති ඉඤ්ජිතා"ති.

---

2–3

සො උභන්තමභිඤ්ඤාය
මජ්ඣෙ මන්තා න ලිප්පති
තං බ්‍රූමි මහාපුරිසො'ති
සො'ධ[1] සිබ්බනිමච්චගා.

**සො උභන්තමභිඤ්ඤාය මජ්ඣෙ මන්තා න ලිප්පතීති:** 'අන්තා'ති ද්වෙ අන්තා: ඵස්සො එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො, ඵස්සනිරොධො මජ්ඣෙ. අතීතං එකො අන්තො, අනාගතං දුතියො අන්තො, පච්චුප්පන්නං මජ්ඣෙ. සුඛා වෙදනා එකො අන්තො, දුක්ඛා වෙදනා දුතියො අන්තො, අදුක්ඛමසුඛා වෙදනා මජ්ඣෙ. නාමං එකො අන්තො, රූපං දුතියො අන්තො, විඤ්ඤාණං මජ්ඣෙ. ඡ අජ්ඣත්තිකානි ආයතනානි එකො අන්තො, ඡ බාහිරානි ආයතනානි දුතියො අන්තො, විඤ්ඤාණං මජ්ඣෙ. සක්කායො එකො අන්තො, සක්කාය සමුදයො දුතියො අන්තො, සක්කාය නිරොධො මජ්ඣෙ. මන්තා වුච්චති පඤ්ඤා "යා පඤ්ඤා පජානනා –පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි."

1. සො ඉධ – ම.ඡ.සං

නොහොත් අනිත්‍ය හෙයින් විමසා දැන...දුක් හෙයින්...රොග හෙයින්... ගණ්ඩ හෙයින්...ශල්‍ය හෙයින්... නිස්සරණ හෙයින් විමසා දැන තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට. **නිබ්බුතො** යනු: රාගය නිවූ බැවින් නිවියේ, ද්වේෂය නිවූ බැවින් නිවියේ, මොහය නිවූ බැවින් නිවියේ ක්‍රොධය– බද්ධවෛරය–මකු බව– පළාසය (යුගග්‍රාහය)–ඊෂ්‍යාව– මාත්සය්‍යීය– මායාව– සය බව– ස්තම්භය– සාරම්භය– (කරණොත්තරිය කරණ) මානය– අතිමානය– මදය– ප්‍රමාදය– හැම කෙලෙසුන්–හැම දුසිරිත්–හැම දරථයන්– හැම පරිදහයන්– හැම සතැවුලි– හැම අකුශලාභි- සංස්කාරයන් නිවූ බැවින් නිවියේ. භිකඛු යනු: (සත්කායදෘෂ්ටි ආදි) සප්ත ධර්මයන් බුන් බැවින් භික්ෂු යැ ... වැස නියවූ මහබඹසර ඇති ක්ෂය වූ පුනර්භවය ඇති හේ 'භික්ෂු' නමැ'යි 'සඞ්ඛාය නිබ්බුතො භිකඛු' යනු වේ.

**තසස නො සනති ඉඤජිතා** යනු: 'තස්ස' යනු: අර්හත් ක්ෂීණාශ්‍රවහට. **ඉඤජිතා** යනු: තෘෂ්ණා ඉඤ්ජන යැ දෘෂ්ටි ඉඤ්ජන යැ මාන ඉඤ්ජන යැ ක්ලේශ ඉඤ්ජන යැ කාම ඉඤ්ජන යි ඔහට මේ ඉඤ්ජනයෝ නැති, නොවෙති විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණයහ, මුලුසුන්හ, ව්‍යුපශාන්තයහ, ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ, අභව්‍යොත්පත්තිකයහ, නුවණ ගින්නෙන් දැවුණාහු නුයි 'තස්ස නො සන්ති ඉඤ්ජිතා' යනු වේ.

එයින් වදළහ:

''කාමෙසු බ්‍රහ්මචරියවා–පෙ–තස්ස නො සන්ති ඉඤ්ජිතා''යි.

2–3.

හේ අන්තද්වය විශිෂ්ටඥානයෙන් දැන මධ්‍යයෙහි ප්‍රඥායෙන් නො ඇලෙයි, ඔහු 'මහා පුරුෂ' යයි කියමි. හෙතෙම මේ ලොව්හි තෘෂ්ණා සිබ්බනිය ඉක්මගියේ යි.

**සො උභනතමභිඤඤාය මජෙඣ මනතා න ලිපපති** යනු: 'අන්තා'' යනු: අන්ත දෙකෙකි: ස්පර්ශය එක් අන්තයෙකැ, ස්පර්ශසමුදය දෙවැනි අන්තය යි. ස්පර්ශනිරොධය මධ්‍යයෙහි වෙයි. අතීතය එක් අන්තයෙකැ අනාගතය දෙවැනි අන්තය යි. වර්තමානය මධ්‍යයෙහි වෙයි. සුඛවෙදනාව එක් අන්තයෙකැ, දුක්වෙදනාව දෙවැනි අන්ත යයි. නො දුක් නො සුව වෙදනාව මධ්‍යයෙහි වෙයි. නාමය එක් අන්තයෙකැ, රූපය දෙවැනි අන්තය යි. විඥානය මධ්‍යයෙහි වෙයි. ආධ්‍යාත්මික ආයතනයෝ සදෙන එක් අන්ත යෙකැ, බාහිර ආයතනයෝ සදෙන දෙවැනි අන්තය යි. විඥානය මධ්‍යයෙහි වෙයි. සත්කාය එක් අන්තයෙකැ සත්කාය සමුදය දෙවැනි අන්තය යි. සත්කාය නිරොධය මධ්‍යයෙහි වේ. **'මන්තා'**යි ප්‍රඥා කියනු ලැබෙයි. යම් ප්‍රඥායෙක් ප්‍රජානන ආකාරයෙක්... අමොහයෙක් ධර්මවිචය යෙක් ...සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද, එයයි.

ලෙපා'ති ද්වෙ ලෙපා: තණ්හා ලෙපො ච, දිට්ඨිලෙපො ච. කතමො තණ්හා ලෙපො; යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමකතං මරියාදිකතං[1] ඔධිකතං පරියන්තකතං පරිග්ගහිතං මමායිතං, ඉදං මම, එතං මම, එත්තකං මම, එත්තාවතා මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං සුවණ්ණං ගාම නිගම රාජධානියො[2] රට්ඨං ච ජනපදෙ ච කොසො ච කොට්ඨාගාරං ච කෙවලම්පි මහාපඨවිං තණ්හාවසෙන මමායති. යාවතා අට්ඨසතතණ්හාවිචරිතං, අයං තණ්හා ලෙපො. කතමො දිට්ඨිලෙපො: වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දස වත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං ගාහො පටිග්ගාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො[3] විපරීතගාහො විපල්ලාසගාහො මිච්ඡාගාහො අයාථාවතස්මිං යාථාවතන්ති ගාහො යාවතා ද්වාසට්ඨිදිට්ඨිගතානි, අයං දිට්ඨිලෙපො.

**සො උභන්ත මභිඤ්ඤාය මජ්ඣෙ මන්තා න ලිප්පතී**'ති සො උභො ච අන්තෙ මජ්ඣඤ්ච මන්තාය අභිඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, න ලිප්පති න පලිප්පති න උපලිප්පති අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසංයුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති. 'සො උභන්තමභිඤ්ඤාය මජ්ඣෙ මන්තා න ලිප්පති'.

**තං බ්‍රූමි මහාපුරිසො**'ති මහාපුරිසො අග්ගපුරිසො සෙට්ඨපුරිසො විසෙට්ඨපුරිසො පාමොක්ඛපුරිසො උත්තමපුරිසො පවරපුරිසො'ති, තං බ්‍රූමි තං කථෙමි තං භණාමි තං දීපෙමි තං වොහරාමි. ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: "මහාපුරිසො මහාපුරිසො'ති භන්තෙ, වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ මහාපුරිසො හොතී"ති "විමුත්තචිත්තත්තා ඛ්වාහං සාරිපුත්ත මහාපුරිසො'ති වදාමි.

---

1. මරියාදිකතං—ම ඡ සං නත්ථි
2. ගාමනිගමනගර ජනපද රාජධානියො—පන
3. විපරියාසගගාහො—ම ඡ සං

**ලෙපා** යනු: ලෙප දෙකෙකි: තෘෂ්ණා ලෙපය ද දෘෂ්ටි ලෙපය දයි. **තෘෂ්ණාලෙප** කවරැ යත්. මේ මාගේ යැ, තෙල මාගේ යැ, මෙතෙක් මාගේ යැ, මෙ පමණ මාගේ යැ'යි යම්තාක් තෘෂ්ණා කොටසින් හිමි කරන ලද ද, මයඹද කරනලද ද, අවධි කරනලද ද, පරිච්ඡෙද කරන ලද ද, අයත් කරන ලද ද, මමායන කරන ලද ද, මාගේ රූපයෝ යැ, ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්පර්ශයෝ යැ අතුරුණු යැ පොරෝන යැ දසිදස්හු යැ එළුබැටළු යැ හූරු කුකුළු යැ ඇත් අස් ගව වෙළඹු යැ කෙත් යැ වතු යැ අමුරනැ රත්රනැ ගම්නියම්ගම් රජදහන්හු යැ රට යැ දනවූ යැ කොෂ යැ කොටුගුළු යැ'යි සියලු මැ මහ පොළොව තෘෂ්ණා වශයෙන් මමායන කෙරෙයි. යම්තාක් **අෂ්ටොත්තරශත** තෘෂ්ණාවිචරිතයෙක් වේද, මේ තෘෂ්ණාලෙප නම. **දෘෂ්ටි ලෙප** කවරැ යත්: (රූපං අත්තතො සමනුපස්සති' යනාදීන් සිටි) විංශද්වස්තුක සත්කායදෘෂ්ටි යැ, (''නත්ථි දින්නං යනාදීන් පැවැති) දශවස්තුක මිථ්‍යා දෘෂ්ටි යැ, (''**සස්සතො** ලොකො' යනාදීන් පැවැති) දශවස්තුක අන්ත ග්‍රාහිකා දෘෂ්ටි යැ යන මෙබඳු යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහන යෙක් දෘෂ්ටි කාන්තාරයෙක් (සම්‍යග්දෘෂ්ටිය විනිවිදින) දෘෂ්ටිවිශූකයෙක් දෘෂ්ටිචලනයෙක් දෘෂ්ටිසංයොජනයෙක් (අරමුණු දැඩි කොට) ගැනීමෙක් බලවත් ගැනීමෙක් (නිත්‍යාදි වශයෙන්) අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් අයථාමාර්ගයෙක් මිත්‍ථ්‍යා සවභාවයෙක් තීර්ත්ථා-යතනයෙක් විරුද්ධග්‍රාහයෙක් විපරීතග්‍රාහයෙක් විපර්‍ය්‍යාස ග්‍රාහයෙක් මිථ්‍යා ග්‍රාහයෙක් අසවභාවයෙහි සවභාව යැයි ගැනීමෙක් වේ ද, යම් තාක් දෙසැට මිසදිටු කෙනෙක් වෙත් ද, මේ 'දෘෂ්ටිලෙප' නම.

**සො උභන්තමභිඤ්ඤාය මජ්ඣෙ මන්තා න ලිප්පති** යනු: හෙතෙම අන්තද්වය ද මධ්‍යය ද නුවණින් වෙසෙසින් දැනැ ජානනය කොට තුලනය කොට තීරණය කොට විභාවන කොට ප්‍රකට කොට නො ඇලෙයි වෙසෙසින් නො ඇලෙයි උපලිප්ත නො වෙයි නො ඇලුණේ වෙසෙසින් නො ඇලුණේ උපලිප්ත නො වූයේ නික්මුණේ ප්‍රහීණ වූයේ විසංයුක්ත වූයේ විගතමර්‍ය්‍යාද කළ සිතින් යුක්ත වැ වාසය කෙරේ නුයි 'සො උභන්ත-මභිඤ්ඤාය මජ්ඣෙ මන්තා න ලිප්පති' යනු වේ.

**තං බ්‍රූමි මහාපුරිසො** යනු: මහාපුරුෂ යැ අග්‍රපුරුෂ යැ ශ්‍රෙෂ්ඨපුරුෂ යැ විශිෂ්ටපුරුෂ යැ ප්‍රමුඛ පුරුෂ යැ උත්තමපුරුෂ යැ ප්‍රවරපුරුෂ යැ යි **තං බ්‍රූමි** ඔහු කියමි, ඔහු බෙණෙමි, ඔහු දක්වමි, ඔහු වහරමි. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ වදළහ: වහන්ස, ''මහාපුරුෂ යැ මහාපුරුෂ යැ''යි කියනු ලැබෙයි. වහන්ස, කිපමණෙකින් 'මහාපුරුෂ' වේ ද? යි. ශාරීපුත්‍රය, විප්‍රමුක්ත සිත් ඇති බැවින් මම 'මහා පුරුෂ' යයි කියමි. අවිමුක්ත සිත් ඇති බැවින් ''මහා පුරුෂ නො වේ'' යයි කියමි.

අවිමුත්තචිත්තත්තා[1] නො මහාපුරිසො'ති වදාමි. කථං ච සාරිපුත්ත, විමුත්තචිත්තො හොති: ඉධ සාරිපුත්ත, භික්ඛු අජ්ඣත්තං කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, තස්ස කායෙ කායානුපස්සිනො විහරතො චිත්තං විරජ්ජති විමුච්චති අනුපාදාය ආසවෙහි. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො චිත්තං විරජ්ජති විමුච්චති අනුපාදාය ආසවෙහි. එවං ඛො සාරිපුත්ත, විමුත්ත චිත්තො හොති. විමුත්තචිත්තත්තා ඛ්වාහං සාරිපුත්ත, මහාපුරිසොති වදාමි. අවිමුත්තචිත්තත්තා නො මහාපුරිසො'ති වදාමීති.[a] තං බ්‍රෑමි මහා පුරිසො'ති.

සොධ සිබ්බනි මච්චගා'ති 'සිබ්බනී වුච්චති තණ්හා. "යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා, ලොභො අකුසලමූලං" යස්සෙසා සිබ්බනී තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො සිබ්බනිං තණ්හං අච්චගා උපච්චගා අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තොති'සොධ සිබ්බනි මච්චගා.'

තෙනාහ භගවා:

"සො උභන්තමභිඤ්ඤාය
මජ්ඣෙ මන්තා න ලිප්පති
තං බ්‍රෑමි මහාපුරිසො'ති
සො' ධ සිබ්බනිමච්චගා''ති.

සහ ගාථාපරියොසානා යෙ තෙ බ්‍රාහ්මණෙන සද්ධිං එකච්ඡන්දා එකපයොගා එකාධිප්පායා එකවාසනවාසිතා,[2] තෙසං අනෙකපාණ සහස්සානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි. 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති. තස්ස බ්‍රාහ්මණස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි. සහ අරහත්තප්පත්තා අජිනජටාවාකචීරතිදණ්ඩකමණ්ඩලු කෙසා ච මස්සු ච අන්තරහිතා. භණ්ඩු කාසායවත්ථවසනො සඞ්ඝාටිපත්ත චීවරධරො අන්වත්ථ පටිපත්තියා පඤ්ජලිකො භගවන්තං නමස්සමානො නිසින්නො හොති: 'සත්ථා මෙ භන්තෙ භගවා සාවකො' හම'ස්මීති.

තිස්සමෙත්තෙය්‍ය සුත්තනිද්දෙසො සමත්තො.

---

1. අවිමුත්තචිත්තා – පත
2. එකවාසනා වාසිතා – පත

a. සතිපට්ඨානසංයුත්ත – නාලන්දවග්ග – මහා පුරිසසුත්ත

වැළිත් ශාරිපුත්‍රය, කිසෙයින් විමුක්ත සිත් ඇත්තේ වේ ද යත්: ශාරිපුත්‍රය, මෙසස්නෙහි මහණ තෙම තමාගේ කයෙහි කය අනුවැ බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ ස්මෘතිමත් වැ කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යය දුරු කොට වෙසෙයි. කයෙහි කය අනු වැ බලමින් වාසය කරන ඔහුගේ සිත විරාගයට පැමිණෙයි. (විරාග හෙයින්) උපාදන නො කොට ආශ්‍රවයන් කෙරෙන් විමුක්ත වෙයි. වෙදනාවන්හි ... චිත්තයෙහි... ධර්මයනහි ධර්මානුදර්ශී වැ කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ ස්මෘතිමත් වැ ධර්ම සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යය දුරු කොට වෙසෙයි. ධර්මයන්හි ධර්මානුදර්ශී වැ වෙසෙන ඔහුගේ සිත විරාගයට පැමිණෙයි, (විරාග හෙයින්) උපාදන නො කොට ආශ්‍රවයන් කෙරෙන් විමුක්ත වෙයි. ශාරිපුත්‍රය, මෙසෙයින් මහණ තෙම විමුක්තසිත් ඇත්තේ වේ. ශාරිපුත්‍රය, විමුක්ත සිත් ඇති බැවින් 'මහාපුරුෂ' යයි මම කියමි. අවිමුක්ත සිත් ඇති බැවින් 'මහාපුරුෂ' නො වේ' යයි කියමි නුයි. 'තං බ්‍රෑමි මහාපුරිසො' යනු වේ.

**සො' ධ සිබ්බනිමච්චගා** යනු: 'සිබ්බනි' තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ සංඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද, යමක්හට තෙල සිබ්බනිය, (මැසීම) තෘෂ්ණාව මුලුසුන් වූ ද, වූපශාන්ත වූ ද, ප්‍රතිප්‍රශ්‍රබ්ධ වූ ද අභව්‍යොත්පත්තික වූ ද නුවණ ගින්නෙන් දැවුණී ද, හෙතෙම සිබ්බනිය-තෘෂ්ණාව ඉක්ම ගියේ යැ පසු කොට ගියේ යැ ඉක්මී යැ මොනවට ඉක්මී යැ ව්‍යතික්‍රමණය කෙළේ නුයි. 'සො' ධ සිබ්බනි මච්චගා' යනු වේ.

එයින් වදළහ බුදුහු:

''සො උභන්තමභිඤ්ඤාය-පෙ-සො' ධ සිබ්බනිමච්චගා'යි.

ගාථා පර්‍ය්‍යවසානය (කෙළවර) හා සමග, යම් කෙනෙක් ඒ බමුණු හා සමග එක් අදහස් ඇත්තාහු ද, (කාය, වාක්, මනස් පියොවින්) එක් පියොවි ඇත්තාහු ද, එක් රිසි ඇත්තාහු ද, (ඉකුත් බුදුසසුන්හි) එක් මැ කර්මවාසනයෙන් වාසිත වූහු ද ඒ නො එක් දහස් ගණන්-(දෙව්මිනිස්) ප්‍රාණීන්ට 'යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් එ හැම නිරොධස්වභාවය ඇතැ'යි කෙලෙස් රජස් රහිත වූ පහ වූ කෙලෙස් මල ඇති ධර්මචක්ෂුස පහළ විය. ඒ බමුණු ගේ සිත උපාදන නො කොට ආශ්‍රවයන් කෙරෙන් මිදිණ. රහත් බවට පැමිණීම හා සමග අඳුන්දිවිසම්, දළමඩුලු, වල්කලා (වැහැරි) තිදණ්ඩ-කමඬලා හා කෙස්-මස් හා අතුරුදහන් වූහු. මුඩුහිස් ඇතියේ, හන්පෙරෙවි කහවත් ඇතියේ සඟළ-පා-සිවුරු දරුයේ, අන්වර්ත්ථ ප්‍රතිපත්තියෙන් (ඉෂ්ටාර්ථ ලාභයෙන්) යුතු වැ බදැඳිලි ඇති වැ 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෲහ, මම ශ්‍රාවකයෙමි' භාග්‍යවතුන් නමදිමින් හුන්නේ යි.

## තිස්සමෙත්තෙය්‍ය සූත්‍රනිර්දේශය යි

## 3. පුණ්ණක සුත්තනිද්දෙසො.

### 3–1

අනෙජං මූල දස්සාවිං – (ඉච්චායස්මා පුණ්ණකො)
අත්ථි පඤ්හෙන ආගමං
කිං නිස්සිතා ඉසයො මනුජා
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

**අනෙජං මූලදස්සාවින්ති:** 'එජා' වුච්චති තණ්හා. "යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං". සා එජා තණ්හා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො අනෙජො. එජාය පහීනත්තා අනෙජො. භගවා ලාභෙ'පි න ඉඤ්ජති, අලාභෙ'පි න ඉඤ්ජති, යසෙ'පි න ඉඤ්ජති, අයසෙ'පි න ඉඤ්ජති, පසංසායපි න ඉඤ්ජති නින්දාය'පි න ඉඤ්ජති, සුඛෙ'පි න ඉඤ්ජති, දුක්ඛෙ'පි න ඉඤ්ජති, න චලති න වෙධති නප්පවෙධතීති 'අනෙජං'. මූල දස්සාවින්ති භගවා මූලදස්සාවී, හෙතුදස්සාවී නිදානදස්සාවී සම්භවදස්සාවී, පභවදස්සාවී, සමුට්ඨානදස්සාවී, ආහාරදස්සාවී, ආරම්මණ දස්සාවී, පච්චයදස්සාවී, සමුදයදස්සාවී. තීණි අකුසලමූලානි: ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසලමූලං, වුත්තං හෙතං භගවතා: තීණිමානි භික්ඛවෙ නිදානානි කම්මානං සමුදයාය. කතමානි තීණි: ලොභො නිදානං කම්මානං සමුදයාය, දොසො නිදානං කම්මානං සමුදයාය, මොහො නිදානං කම්මානං සමුදයාය. 'න භික්ඛවෙ ලොභජෙන කම්මෙන දොසජෙන කම්මෙන මොහජෙන කම්මෙන දෙවා පඤ්ඤායන්ති, මනුස්සා පඤ්ඤායන්ති, යා වා පනඤ්ඤා'පි කාචි සුගතියො. අථ ඛො භික්ඛවෙ ලොභජෙන කම්මෙන දොසජෙන කම්මෙන මොහජෙන කම්මෙන නිරයො පඤ්ඤායති, තිරච්ඡානයොනි පඤ්ඤායති, පෙත්තිවිසයො පඤ්ඤායති යා වා පනඤ්ඤා'පි කාචි දුග්ගතියො. නිරයෙ තිරච්ඡානයොනියා පෙත්තිවිසයෙ[2] අත්තභාවාභිනිබ්බත්තියා ඉමානි තීණි අකුසල මූලානී"ති[a] භගවා ජානාති, පස්සති. එවම්පි භගවා මූලදස්සාවී –පෙ– සමුදය දස්සාවී.

1. අනභාවංගතා–ච–ක
   අනභාවං කතා–ම ජ සං
2. පිත්තිවිසයෙ–ක ථ වි
a. තිකඞ්ගුත්තර–

## 3. පූර්ණක සූත්‍ර නිර්දේශය

### 3–1.

(ආයුෂ්මත් පූර්ණක මෙසේ විචාරයි,) තෘෂ්ණා රහිත වූ (එහෙයින් අටලෝදහම්හි කම්පා රහිත වූ අකුශලමූලාදිය දක්නාසුළු වූ භාග්‍යවතුන් වහන්සේ කරා ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇත්තමෝ ආම්හ. මෙ ලොවැ සෘෂිහු යැ මනුෂ්‍යයෝ යැ ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ යන බොහෝ යාග කරුවෝ කුමක් ඇසිරි කළාහු දෙවියනට දෙයධර්මය පයෙෂීෂණ කෙරෙත් ද? (යාග කෙරෙත් ද?) භාග්‍යවතුන් වහන්ස, එ කරුණ මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල වදළ මැනැවි.

අනෙජං මූලදස්සාවිං යනු: 'එජා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ සඞ්ඛ්‍යාත අකුශල මූලයෙක් වේ ද, ඒ එජාව තෘෂ්ණාව භාග්‍යවත් බුදුන්ට ප්‍රහීණ යැ උදුරාහළ මුල් ඇත්තී යැ (මුදුන්/සුන්) තල්රුකක් සෙයින් අවාස්තුක කරන ලද යැ අනු අභාවය කරන ලද යැ මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තී යැ එහෙයින් බුදුහු අනෙජ නම් වෙති, එජාව ප්‍රහීණ බැවින් අනෙජ යැ, භාග්‍යවත්හු ලාභයෙහි දු නො සැලෙති, අලාභයෙහි දු නො සැලෙති, යශස්හි දු නො සැලෙති, අයශස්හි දු නො සැලෙති, ප්‍රශංසායෙහි දු නො සැලෙති, නින්දයෙහි දු නො සැලෙති, සුඛයෙහි දු නො සැලෙති, දුඃඛයෙහි දු නො සැලෙති, කම්පිත නො වෙති, නො වෙවුළති, අතිශයින් නො වෙවුළත් නුයි 'අනෙජ' නම් වූ. මූලදස්සාවිං යනු: භාග්‍යවත්හු මූලය දක්නාහු යැ හේතුව දක්නාහු යැ නිදානය දක්නාහු යැ සම්භවය දක්නා හු යැ ප්‍රභවය දක්නාහු යැ සමුත්ථානය දක්නාහු යැ ආහාරය දක්නාහු යැ ආලම්බනය දක්නාහු යැ ප්‍රත්‍යය දක්නාහු යැ සමුදය දක්නාහු යැ, අකුශල මූලයෝ තිදෙනෙකි: ලොභය අකුශලමූලයෙක, ද්වේෂය අකුශලමූලයෙක, මොහය අකුශලමූලයෙකි. භාග්‍යවතුන් විසින් මෙය වදරන ලද මැ යි. ''මහණෙනි, කර්මයන් රැස් කරනු පිණිස මෙ නිදන (කාරණ) තුනෙකි: කවර නිදනතුනෙකැ යත්: ලොභය කර්මයන් රැස් කරනුවට නිදනයෙක, ද්වේෂය කර්මයන් රැස් කරනුවට නිදනයෙක, මොහය කර්මයන් රැස් කරනුවට නිදනයෙකි. මහණෙනි, ලොභයෙන් උපන් කර්මයෙන් ද්වේෂයෙන් උපන් කර්මයෙන් මොහයෙන් උපන් කර්මයෙන් දෙවියෝ නො පැනෙති, මිනිස්සු නො පැනෙති, තවද අන්‍ය වූ යම් කිසි සුගති කෙනෙකුදු නො පැනෙති. මහණෙනි වැළිත් ලොභජකර්මයෙන් ද්වේෂජකර්මයෙන් මොහජකර්මයෙන් නිරය පැනෙයි. තිරිසන් යොනිය පැනෙයි, ප්‍රෙතවිෂය පැනෙයි. තවද අන්‍ය වූ යම්කිසි දුර්ගති කෙනෙක් වෙත් නම් ඔහු ද පැනෙති. නිරයෙහි තිරිසන් යොන්හි ප්‍රෙතවිෂයයෙහි ආත්මභාවයාගේ නිපැත්මට මේ තුන් අකුශලමූලයෝ වෙති'' භාග්‍යවත්හු දනිති, දකිති. මෙසේ ත් භාග්‍යවත් හු මූලය දක්නාහු යැ ...... සමුදය දක්නාහු වෙත්.

තීණි කුසලමූලානි: අලොභො කුසලමූලං, අදොසො කුසලමූලං, අමොහො කුසලමූලං. වුත්තං හෙතං භගවතා: තීණිමානි –පෙ– න භික්ඛවෙ අලොභජෙන කම්මෙන අදොසජෙන කම්මෙන අමොහජෙන කම්මෙන නිරයො පඤ්ඤායති, තිරච්ඡානයොනි පඤ්ඤායති, පෙත්තිවිසයො පඤ්ඤායති, යා වා පනඤ්ඤා'පි කාචි දුග්ගතියො. අථ ඛො භික්ඛවෙ අලොභජෙන කම්මෙන අදොසජෙන කම්මෙන අමොහජෙන කම්මෙන දෙවා පඤ්ඤායන්ති, මනුස්සා පඤ්ඤායන්ති යා වා පනඤ්ඤාපි කාචි සුගතියො දෙවෙසු ච මනුස්සෙසු ච දත්තභාවාභි නිබ්බත්තියා. ඉමානි තීණි කුසලමූලානී'ති. * භගවා ජානාති පස්සති, එවම්පි භගවා මූලදස්සාවී –පෙ– සමුදය දස්සාවී. වුත්තං හෙතං භගවතා, "යෙ කෙචි භික්ඛවෙ ධම්මා අකුසලා අකුසල භාගියා අකුසලපක්ඛිකා සබ්බෙතෙ අවිජ්ජාමූලකා අවිජ්ජා සමොසරණා, අවිජ්ජාසමුග්ඝාතා, සබ්බෙ තෙ සමුග්ඝාතං ගච්ඡන්තී"ති භගවා ජානාති පස්සති. එවම්පි භගවා මූලදස්සාවී – පෙ– සමුදය දස්සාවී.

වුත්තං හෙතං භගවතා"යෙ කෙචි මෙ භික්ඛවෙ ධම්මා කුසලා කුසලභාගියා කුසලපක්ඛිකා සබ්බෙ තෙ අප්පමාදමූලකා, අප්පමාදසමොසරණා, අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායතී"ති භගවා ජානාති පස්සති. එවම්පි භගවා මූලදස්සාවී –පෙ– සමුදයදස්සාවී.

අථ වා භගවා ජානාති පස්සති "අවිජ්ජා මූලං සඞ්ඛාරානං සඞ්ඛාරා මූලං විඤ්ඤාණස්ස, විඤ්ඤාණං මූලං නාමරූපස්ස, නාමරූපං මූලං සළායතනස්ස, සළායතනං මූලං ඵස්සස්ස, ඵස්සො මූලං වෙදනාය, වෙදනා මූලං තණ්හාය, තණ්හා මූලං උපාදානස්ස, උපාදානං මූලං භවස්ස, භවො මූලං ජාතියා, ජාති මූලං ජරාමරණස්සා"ති භගවා ජානාති පස්සති එවම්පි භගවා මූලදස්සාවී –පෙ– සමුදය දස්සාවී.

අථ වා, භගවා ජානාති පස්සති චක්ඛු මූලං චක්ඛුරොගානං, සොතං මූලං සොතරොගානං, ඝානං මූලං ඝානරොගානං, ජිව්හා මූලං ජිව්හාරොගානං කායො මූලං කායරොගානං, මනො මූලං චෙතසිකානං දුක්ඛානන්"ති භගවා ජානාති පස්සති. එවම්පි භගවා මූලදස්සාවී හෙතු දස්සාවී නිදානදස්සාවී සම්භවදස්සාවී පභවදස්සාවී සමුට්ඨානදස්සාවී ආහාරදස්සාවී ආරම්මණ දස්සාවී පච්චයදස්සාවී සමුදයදස්සාවී'ති 'අනෙජං මූලදස්සාවිං.

---

කුශලමූලයෝ තිදෙනෙකි: අලොභය කුශලමූලයෙක, අද්වේෂය කුශලමූලයෙක, අමොහය කුශලමූලයෙකි. මෙය වදාරනලද මැ යි භාග්‍ය වතුන් විසින් ''මහණෙනි, මේ කුශලමූලයෝ තිදෙනෙකි: ... මහණෙනි, අලොභයෙන් උපන් කර්මයෙන් අද්වේෂයෙන් උපන් කර්මයෙන් අමොහයෙන් උපන් කර්මයෙන් නිරය නො පැනෙයි. තිරිසන් යෝනිය නො පැනෙයි, ප්‍රේතවිෂය නො පැනෙයි. තවද අන්‍ය වූත් යම් කිසි දුර්ගති කෙනෙක් ඇත් නම් ඔහු ද නො පැනෙති. මහණෙනි, වැළිත් අලොභජ කර්මයෙන් අද්වේෂජකර්මයෙන් අමොහජකර්මයෙන් දෙවියෝ, පැනෙති, මිනිස්සු පැනෙති, තවද, අන්‍ය වූ ත් යම් කිසි සුගති කෙනෙක් වෙත් නම් ඔහු ද පැනෙති. දෙව්ලෝහි ද මිනිස්ලෝහි ද ආත්ම භාවයා ගේ නිපැත්මට මේ තුන් කුශලමූලයෝ වෙති' භාග්‍යවත්හු දනිති දකිත්. මෙසේත් භාග්‍යවත්හු මූලය දක්නාහු යැ... සමුදය දක්නාහු වෙත් මෙය වදාරණ ලද මැ යි භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, අකුසල් වූ අකුසල් කොටස්හි වූ අකුශලපක්ෂයෙහි වූ යම් කිසි ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම අවිද්‍යාව මුල් කොට ඇතියහ, අවිද්‍යායෙහි බැසැගත්තාහු වෙත්. අවිද්‍යාවගේ නැසීමෙන් එ හැම විනාශයට යෙතැ'යි භාග්‍යවත්හු දනිති, දකිති. මෙසේ ත් භාග්‍යවත්හු මූලය දක්නා හු යැ ......සමුදය දක්නාහු යැ.

මෙය වදරන ලද මැ යි භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, මේ කුසල් වූ කුසල් කොටස්හි වූ කුසල පක්ෂයෙහි වූ යම් කිසි ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම අප්‍රමාදය මුල් කොට ඇතියහ, අප්‍රමාදයෙහි බැසගත්තාහු වෙත්. අප්‍රමාදය ඒ දහමුන්ට අග්‍ර යැ'යි කියනු ලැබේ'යැ යි භාග්‍යවත්හු දනිති දකිති. මෙසේ ත් භාග්‍යවත්හු මූලය දක්නාහු යැ...සමුදය දක්නාහු වෙත්.

නොහොත් භාග්‍යවත්හු සංස්කාරයනට අවිද්‍යාව මුලැ යි දනිති දකිති. සංස්කාරයෝ විඥානයට මුලැ යි, විඥානය නාමරූපයට මුලැ යි, නාමරූපය ෂඩායතනයට මුලැ යි, ෂඩායතනය ස්පර්ශයට මුලැ යි, ස්පර්ශය වෙදනාවට මුලැ යි, වෙදනාව තෘෂ්ණාවට මුලැ යි. තෘෂ්ණාව උපාදනයට මුලැ යි. උපාදනය භවයට මුලැ යි, භවය ජාතියට මුලැ යි ජාතිය ජරාමරණයට මුලැ යි භාග්‍යවත්හු දනිති දකිති. මෙසේ ත් භාග්‍යවත්හු 'මූලදස්සාවී ... සමුදයදස්සාවී නම්වෙත්.

තවද, භාග්‍යවත්හු චක්ෂුස චක්ෂුරොගයනට මුලැ යි දනිති දකිති, ශ්‍රොත්‍රය ශ්‍රොත්‍රරොගයනට මුලැ යි, ඝ්‍රාණය ඝ්‍රාණරොගයනට මුලැ යි, ජිහ්වා ව ජිහ්වාරොගයනට මුලැ යි කය කාය රොගයනට මුලැ යි මනස චෛතසික දුඃඛයනට මුලැ යි භාග්‍යවත්හු දනිති දකිති. මෙසේ ත් භාග්‍ය වත්හු මූලය දක්නාහු හෙතුව දක්නාහු නිදනය දක්නාහු සම්භවය දක්නාහු ප්‍රභවය දක්නාහු සමුත්ථානය දක්නාහු ආහාරය දක්නාහු ආලම්බනය දක්නාහු ප්‍රත්‍යය දක්නාහු සමුදය දක්නාහු තුයි 'අනෙජං මූල දස්සාවී' යනු වේ.

**ඉච්චායස්මා පුණ්ණකො**'ති 'ඉච්චා'ති පදසන්ධි -පෙ- ආයස්මා පුණ්ණකො.

**අත්ථි පඤ්හෙන ආගමන්ති.** පඤ්හෙන අත්ථිකො[1] ආගතොම්හි පඤ්හං පුච්ඡිතුකාමො[2] ආගතොම්හි පඤ්හං සොතුකාමො ආගතොම්හීති එවම්පි 'අත්ථි පඤ්හෙන ආගමං' අථ වා පඤ්හත්ථිකානං පඤ්හං පුච්ඡිතුකාමානං පඤ්හං සොතුකාමානං ආගමනං අභික්කමනං උපසඞ්කමනං පයිරුපාසනං අත්ථීති එවම්පි 'අත්ථි පඤ්හෙන ආගමං' අථ වා පඤ්හාගමො තුය්හං අත්ථි ත්වම්පි පහූ විසවී අලමත්තො මයා පුච්ඡිතං කථෙතුං විසජ්ජෙතුං[3] වහස්සෙතං භාරන්ති එවම්පි 'අත්ථි පඤ්හෙන ආගමං'.

**කිං නිස්සිතා ඉසයො මනුජා**'ති කිං නිස්සිතා ආසිතා[4] අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා.[5] ඉසයො'ති ඉසිනාමකා යෙ කෙචි ඉසිපබ්බජ්ජං පබ්බජිතා: ආජීවකා නිගණ්ඨා ජටිලා තාපසා. **මනුජා**'ති මනුස්සා වුච්චන්තීති 'කිං නිස්සිතා ඉසයො මනුජා'.

**ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානන්ති:** ඛත්තියා'ති යෙ කෙචි ඛත්තියජාතිකා. **බ්‍රාහ්මණා**'ති යෙ කෙචි භොවාදිකා. **දෙවතානන්ති** ආජීවකසාවකානං ආජීවකා දෙවතා, නිගණ්ඨසාවකානං නිගණ්ඨා දෙවතා, ජටිලසාවකානං ජටිලා දෙවතා, පරිබ්බාජකසාවකානං පරිබ්බාජකා දෙවතා, අවරුද්ධකසාවකානං අවරුද්ධකා[6] දෙවතා, හත්ථිවතිකානං හත්ථී දෙවතා, අස්සවතිකානං අස්සා දෙවතා, ගොවතිකානං ගාවො දෙවතා[8] කුක්කුරවතිකානං කුක්කුරා දෙවතා, කාකවතිකානං කාකා දෙවතා, වාසුදෙවවතිකානං වාසුදෙවො දෙවතා, බලදෙවවතිකානං බලදෙවො දෙවතා, පුණ්ණභද්දවතිකානං පුණ්ණභද්දො දෙවතා, මණිභද්දවතිකානං මණිභද්දො දෙවතා, අග්ගිවතිකානං අග්ගි දෙවතා, නාගවතිකානං නාගා දෙවතා, සුපණ්ණවතිකානං සුපණ්ණා දෙවතා, යක්ඛවතිකානං යක්ඛා දෙවතා, අසුරවතිකානං අසුරා දෙවතා, ගන්ධබ්බවතිකානං ගන්ධබ්බා දෙවතා, මහාරාජවතිකානං මහාරාජානො දෙවතා, චන්දවතිකානං චන්දො දෙවතා, සූරියවතිකානං සූරියො දෙවතා, ඉන්දවතිකානං ඉන්දො දෙවතා, බ්‍රහ්මවතිකානං බ්‍රහ්මා දෙවතා, දෙවවතිකානං දෙවො දෙවතා දිසාවතිකානං දිසා දෙවතා. යෙ යෙසං දක්ඛිණෙය්‍යා තෙ තෙසං දෙවතා'ති 'ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං'

---

1. පඤ්හත්ථිකාමහා—බහූසු
2. පඤ්හං පුච්ඡිතමහා—පත
3. විසජ්ජෙතු—මජ්ඣං
4. අයිතා—ව, පත
5. අධිමුත්තා—ව
6. අවිරුද්ධකසාවකානං අවිරුද්ධකා—මජ්ඣං

**ඉච්චායස්මා පුණ්ණකො** යනු: 'ඉච්චා' යනු පදසන්ධි යැ......ආයුෂ්මත් පූර්ණක.

**අත්ථි පඤ්හෙන ආගමං** යනු: ප්‍රශ්නයෙන් අර්ත්ථ ඇති වැ ආයෙමි වෙමි. පැන පුළුවුස්නා කැමැති වැ ආයෙමි වෙමි, පැන විසැඳුම්, අසනු කැමැති වැ ආයෙමි වෙමි යි මෙසේ ත් අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් ප්‍රශ්නාර්ථීන්ගේ පැන පුළුවුස්නා කැමැත්තවුන් ගේ පැන විසැඳුම් අසනු කැමැත්තවුන් ගේ ඊම, අභිමුඛ වැ පැමිණීම, එළැඹීම, පර්යුපාසනය ඇත් නු යි මෙසේ ත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් ප්‍රශ්නාගමයෙක් මුඹ වහන්සේට ඇත. මුඹ වහන්සේ ත් පොහොසත් සේක, පරසන්තානයෙහි වියඹය උපදවන සේක, මා විසින් පුළුවුස්නා ලද් ද කියන්නට විසඳන්නට සමර්ත්ථ සිත් ඇති සේක. තෙල බර උසුලනු මැනැවැ'යි මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ.

**කිං නිසසිතා ඉසයො** මනුජා යනු: කුමක් ඇසිරි කළාහු හාත්පසින් ඇසිරි කළාහු (කිමෙකැ) ඇලුණාහු කුමකට එළැඹියාහු පිවිසියාහු අධිමුක්ත වූවාහු. **ඉසයො** යනු: ඍෂි නම් ඇති යම් කිසි කෙනෙක්, ඍෂි ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි වූවාහු, ආජීවකයෝ, නිගණ්ඨයෝ, ජටිලයෝ, තාපසයෝ. **'මනුජා'**යි මිනිස්සු කියනු ලැබෙත් නුයි 'කිං නිස්සිතා ඉසයො මනුජා' යනු වේ.

**ඛත්තියා බ්‍රාහමණා දෙවතානං** යනු: 'ඛත්තියා' යනු: යම් කිසි ක්ෂත්‍රිය ජාති ඇති කෙනෙක් **බ්‍රාහ්මණා** යනු: භොවාදීවූ යම් කිසි කෙනෙක්. **දෙවතානං** යනු: ආජීවක ශ්‍රාවකයනට ආජීවකයෝ දේවතා යැ, නිගණ්ඨ ශ්‍රාවකයනට නිගණ්ඨයෝ දේවතා යැ, ජටිලශ්‍රාවකයනට ජටිලයෝ දේවතා යැ, පරිව්‍රාජක ශ්‍රාවකයනට පරිව්‍රාජකයෝ දේවතා යැ, අවරුද්ධක ශ්‍රාවකයනට අවරුද්ධකයෝ දේවතා යැ, හස්තිව්‍රත ඇතියනට හස්තීහු දේවතා යැ, අශ්වව්‍රත ඇතියනට අශ්වයෝ දේවතා යැ, ගෝව්‍රත ඇතියනට ගවයෝ දේවතා යැ සුනඛව්‍රත ඇතියනට සුනඛයෝ දේවතා යැ, කවුඩු ව්‍රත ඇතියනට කවුඩුවෝ දේවතා යැ, වාසුදෙව (විෂ්ණු) ව්‍රත ඇතියනට වාසුදෙව දේවතා යැ, බලදෙවව්‍රත ඇතියනට බලදෙව දේවතා යැ පූර්ණභද්‍ර ව්‍රත ඇතියනට පූර්ණභද්‍ර තෙම දේවතා යැ මණිභද්‍ර ව්‍රත ඇතියනට මණිභද්‍ර තෙම දේවතා යැ අග්නිව්‍රත ඇතියනට අග්නිය දේවතා යැ, නාගව්‍රත ඇතියනට නාගයෝ දේවතා යැ, ගරුඩව්‍රත ඇතියනට ගරුඩයෝ දේවතා යැ, යක්ෂව්‍රත ඇතියනට යක්ෂයෝ දේවතා යැ අසුර ව්‍රත ඇතියනට අසුරයෝ දේවතා යැ ගන්ධර්වව්‍රත ඇතියනට ගන්ධර්වයෝ දේවතායැ, මහාරාජ ව්‍රත ඇතියනට මහාරාජයෝ (වරම් රජහු) දේවතා යැ, චන්ද්‍රව්‍රත ඇතියනට චන්ද්‍රයා දේවතා යැ සූර්‍ය්‍යව්‍රත ඇතියනට සූර්‍ය්‍යයා දේවතා යැ, ඉන්ද්‍රව්‍රත ඇතියනට ඉන්ද්‍රයා දේවතා යැ, බ්‍රහ්මව්‍රත ඇතියනට බ්‍රහ්ම දේවතා යැ, දේවව්‍රත ඇතියනට දෙවියා දේවතා යැ, දිශ්ව්‍රත ඇතියනට දිශාවෝ දේවතා යැ, යම් කෙනෙක් යම් කෙනෙකුන්ට දක්ෂිණාර්හ වෙත් ද, ඔහු ඔවුනට දේවතා නුයි 'ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං' යනු වේ.

**යඤ්ඤමකප්පයිංසු පුථූධ ලොකෙති** 'යඤ්ඤං' වුච්චති දෙය්‍යධම්මො; චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං,[1] සෙය්‍යාවසථ පදීපෙය්‍යං, **යඤ්ඤමකප්පයිංසූ**''ති යෙ'පි යඤ්ඤං එසන්ති ගවෙසන්ති පරියෙසන්ති චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං තෙ'පි යඤ්ඤං කප්පෙන්ති. යෙ'පි යඤ්ඤං අභිසඞ්ඛරොන්ති චීවර පිණ්ඩපාත –පෙ– සෙය්‍යාවසථ පදීපෙය්‍යං, තෙ'පි යඤ්ඤං කප්පෙන්ති. යෙ'පි යඤ්ඤං දෙන්ති යජන්ති පරිච්චජන්ති චීවර පිණ්ඩපාත –පෙ– සෙය්‍යාවසථ පදීපෙය්‍යං, තෙ'පි යඤ්ඤං කප්පෙන්ති. පුථූ'ති යඤ්ඤා වා එතෙ පුථූ. යඤ්ඤයාජකා වා[2] එතෙ පුථූ, දක්ඛිණෙය්‍යා වා එතෙ පුථූ.

කථං යඤ්ඤා වා එතෙ පුථූ: බහුකා[3] එතෙ යඤ්ඤා: චීවරපිණ්ඩපාත සෙනාසනගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. එවං යඤ්ඤා වා එතෙ පුථූ.[4] කථං යඤ්ඤයාජකා වා එතෙ පුථූ: බහුකා එතෙ යඤ්ඤයාජකා : ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච, එවං යඤ්ඤයාජකා වා එතෙ පුථූ. කථං දක්ඛිණෙය්‍යා වා එතෙ පුථූ: බහුකා එතෙ දක්ඛිණෙය්‍යා පුථූ; සමණබ්‍රාහ්මණා කපණද්ධික වණිබ්බකයාචකා, එවං දක්ඛිණෙය්‍යා වා එතෙ පුථූ. ඉධ ලොකෙ' ති මනුස්සලොකෙ'ති 'යඤ්ඤමකප්පයිංසු පුථූධ ලොකෙ.'

**පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙත'න්ති** 'පුච්ඡා' ති තිස්සො පුච්ඡා: අදිට්ඨජොතනා පුච්ඡා, දිට්ඨසංසන්දනා පුච්ඡා විමතිච්ඡෙදනා පුච්ඡා, කතමා **අදිට්ඨජොතනා පුච්ඡා:** පකතියා ලක්ඛණං අඤ්ඤාතං හොති අදිට්ඨං අතුලිතං අතීරිතං අවිභූතං අවිභාවිතං තස්ස ඤාණාය දස්සනාය තුලනාය තීරණාය විභාවනාය[5]. පඤ්හං පුච්ඡති, අයං අදිට්ඨජොතනා පුච්ඡා. කතමා **දිට්ඨසංසන්දනා පුච්ඡා :** පකතියා ලක්ඛණං ඤාතං හොති දිට්ඨං තුලිතං තීරිතං විභූතං විභාවිතං. අඤ්ඤෙහි පණ්ඩිතෙහි සද්ධිං සංසන්දනත්ථාය පඤ්හං පුච්ඡති. අයං දිට්ඨසංසන්දනා පුච්ඡා. කතමා **විමතිච්ඡෙදනා පුච්ඡා :** පකතියා සංසයපක්ඛන්තො[6] හොති විමතිපක්ඛන්තො ද්වෙළ්හකජාතො එවන්නු ඛො න නු ඛො කින්නු ඛො කථංනු ඛො'ති. සො විමතිච්ඡෙදනත්ථාය පඤ්හං පුච්ඡති. අයං විමතිච්ඡෙදනා පුච්ඡා. ඉමා තිස්සො පුච්ඡා.

1. මාලාගන්ධං විලෙපනං – ස්‍යා
2. යජකා වා – ස්‍යා
3. බහුකානං – ම ජ සං
4. එතෙ යඤ්ඤාවා එතෙ පුථූ–පන
5. විභූතත්ථාය විභාවනත්ථාය – මජසං, ස්‍යා.
6. සංසය පක්ඛන්දෙ – මජසං

**යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ** යනු: 'යඥ' යයි දෙයධර්මය කියනු ලැබෙයි. සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන්, හෝනාගේ පහනට තෙල් යන මොහු යැ. 'යඤ්ඤමකප්පයිංසු' යනු: යම් කෙනෙකුන් සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර, ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන්, හෝනාගේ පහන්තෙල් යන දෙයධර්මය (යඥය) කැමැති වෙත් ද, බලත් ද, උපදවත් ද, ඔහු ද යඥ කෙරෙත් (දෙය ධර්මය සොයත්) යම් කෙනෙකුන් චීවර පිණ්ඩපාත... ශයනාවසථ ප්‍රදීපෙය්‍ය යන යඥය සකස් කෙරෙත් ද ඔහු ද යඥ කෙරෙති, යම් කෙනෙකුන් චීවර පිණ්ඩපාත ...ශයනාවසථ ප්‍රදීපෙය්‍ය සඞ්ඛ්‍යාත යඥය දෙත් ද, යජනය කෙරෙත් ද, පරිත්‍යාග කෙරෙත් ද, ඔහු ද යඥය කෙරෙත්. **පුථූ** යනු: තෙල දෙයධර්මයෝ හෝ බොහෝ වෙති, තෙල දෙයධර්මදායකයෝ හෝ බොහෝ වෙති. තෙල දක්ෂිණාර්හයෝ හෝ බොහෝ වෙත්.

**කිසෙයින් තෙල දෙයධර්මයො බොහො වෙත් ද** යත්: තෙල දෙයධර්මයෝ බොහෝ වෙති: චීවර- පිණ්ඩපාත- ශයනාසන- ග්ලානප්‍රත්‍යය- භෛෂජ්‍යපරිෂ්කාර යැ අන්න යැ පාන යැ වස්ත්‍ර යැ යාන යැ මාලාගන්ධ-විලෙපන යැ ශයනාගාර- ප්‍රදීපෙය්‍ය යැ යි මෙසෙයින් තෙල දෙයධර්මයෝ හෝ බොහෝ වෙත්. කිසෙයින් තෙල යඥයාජකයෝ හෝ බොහෝ වෙත් ද යත්: තෙල යඥයාජකයෝ බොහෝ වෙති: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශුද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මිනිස්සු ද යි මෙසෙයින් තෙල යඥ යාජකයෝ හෝ බොහෝ වෙත්. කිසෙයින් දක්ෂිණාර්හයෝ හෝ බොහෝ වෙත් ද යත්: තෙල දක්ෂිණාර්හයෝ බොහෝ වෙති: මහණබමුණහු යැ දිළින්දෝ යැ මැගියෝ යැ ගුණ කියා යදනාහු යැ යැදියෝ යැයි මෙසෙයින් තෙල දක්ෂිණාර්හයෝ හෝ බොහෝ වෙත්. **ඉධ ලොකෙ** යනු; මනුෂ්‍යලොකයෙහි නු යි 'යඤ්ඤමකප්පයිංසු පුථුධ ලොකෙ' යනු වේ.

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං** යනු: පුච්ඡා යනු; පෘච්ඡා තුනෙකි: අදෘෂ්ට ද්‍යොතනා පෘච්ඡා යැ දෘෂ්ටසංසන්දනා පෘච්ඡා යැ විමතිච්ඡෙදනා පෘච්ඡා යි. **අදෘෂ්ටද්‍යොතනා පෘච්ඡා** කවරැ යත්: (ධර්මයන්ගේ තථ) ලක්ෂණය පියවින් නො දන්නාලද නො දක්නාලද තුලනය නො කරන ලද තීරණය නො කරන ලද ප්‍රකට නො වූයේ නුවණින් නො වඩන ලද වෙයි, එය දන්නා පිණිස දක්නා පිණිස තුලනය පිණිස තීරණය පිණිස විභාවනය පිණිස පැන පුළුවුස්සි. මේ අදෘෂ්ටද්‍යොතනාපෘච්ඡා යි. **දෘෂ්ටසංසන්දනාපෘච්ඡා** කවරැ යත්: (ධර්මයන්ගේ තථ) ලක්ෂණය පියවින් දනනා ලද දක්නා ලද තුලනය කරන ලද තීරණය කරන ලද ප්‍රකට කරන ලද විභාවන කරන ලද වෙයි. (එය) අන්‍යපණ්ඩිතයන් හා සමග සසඳනු පිණිස පැන පුළුවුස්සි. මේ දෘෂ්ටසංසන්දනාපෘච්ඡා යි. **විමතිච්ඡෙදනා පෘච්ඡා** කවරැ යත්: පියවින් සැකයට පිවිසියේ විමතියට පිවිසියේ මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ දෝ හෝ යි හටගත් සැක ඇත්තේ වෙයි, හෙතෙම විමති සිඳුනා පිණිස පැන පුළුවුස්සි, මේ විමතිච්ඡෙදනා පෘච්ඡා යැ. මොහු තුන් පෘච්ඡා යි.

අපරාපි තිස්සො පුච්ඡා: මනුස්සපුච්ඡා, අමනුස්සපුච්ඡා, නිම්මිතපුච්ඡා. කතමා මනුස්සපුච්ඡා: මනුස්සා බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති: භික්ඛූ පුච්ඡන්ති, භික්ඛුණියො පුච්ඡන්ති, උපාසකා පුච්ඡන්ති, උපාසිකායො පුච්ඡන්ති, රාජානො පුච්ඡන්ති, ඛත්තියා පුච්ඡන්ති, බ්‍රාහ්මණා පුච්ඡන්ති, වෙස්සා පුච්ඡන්ති, සුද්දා පුච්ඡන්ති, ගහට්ඨා පුච්ඡන්ති, පබ්බජිතා පුච්ඡන්ති, අයං මනුස්සපුච්ඡා. කතමා අමනුස්සපුච්ඡා: අමනුස්සා බුද්ධං භගවන්තං උපසංකමිත්වා පඤ්හං පුච්ඡන්ති; නාගා පුච්ඡන්ති, සුපණ්ණා පුච්ඡන්ති, යක්ඛා පුච්ඡන්ති, අසුරා පුච්ඡන්ති, ගන්ධබ්බා පුච්ඡන්ති, මහාරාජානො පුච්ඡන්ති, ඉන්දා පුච්ඡන්ති, බ්‍රහ්මානො පුච්ඡන්ති, දෙවා පුච්ඡන්ති, අයං අමනුස්සපුච්ඡා. කතමා නිම්මිතපුච්ඡා: යං භගවා රූපං අභිනිම්මිනාති මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියං, තං සො නිම්මිතො[3] බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡති, භගවා විසජ්ජෙති. අයං නිම්මිතපුච්ඡා. ඉමා තිස්සො පුච්ඡා.

අපරාපි තිස්සො පුච්ඡා: අත්තත්ථපුච්ඡා පරත්ථපුච්ඡා උභයත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: දිට්ඨධම්මිකත්ථපුච්ඡා සම්පරායිකත්ථපුච්ඡා පරමත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අනවජ්ජත්ථපුච්ඡා නික්කිලෙසත්ථපුච්ඡා වොදානත්ථපුච්ඡා: අපරාපි තිස්සො පුච්ඡා; අතීතපුච්ඡා අනාගතපුච්ඡා පච්චුප්පන්නපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා; අජ්ඣත්තපුච්ඡා බහිද්ධාපුච්ඡා අජ්ඣත්තබහිද්ධා පුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: කුසලපුච්ඡා අකුසලපුච්ඡා අව්‍යාකතපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: ඛන්ධපුච්ඡා ධාතුපුච්ඡා ආයතනපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: සතිපට්ඨානපුච්ඡා සම්මප්පධානපුච්ඡා ඉද්ධිපාදපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා ඉන්ද්‍රියපුච්ඡා බලපුච්ඡා බොජ්ඣඞ්ගපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: මග්ගපුච්ඡා ඵලපුච්ඡා නිබ්බානපුච්ඡාති.

පුච්ඡාමි තන්ති: පුච්ඡාමි තං, යාචාමි තං, අජ්ඣෙසාමි තං, පසාදෙමි තං, කථයස්සු මෙ'ති 'පුච්ඡාමි තං.' භගවාති ගාරවාධිවචනමෙතං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති. බ්‍රෑහි මෙතන්ති බ්‍රෑහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති. 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"අනෙජං මූලදස්සාවිං – (ඉච්චායස්මා පුණ්ණකො)
අත්ථි පඤ්හෙන ආගමං
කිං නිස්සිතා ඉසයො මනුජා
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථුධ ලොකෙ
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙත"න්ති.

---

3. සො නිම්මිතො – මජසං

අන්‍ය වූ ද **පෘච්ඡා** තුනෙකි: මනුෂ්‍ය පෘච්ඡා යැ අමනුෂ්‍ය පෘච්ඡා යැ නිර්මිත පෘච්ඡා යි. **මනුෂ්‍ය පෘච්ඡා** කවරැ යත්: මිනිස්සු භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති, මහණහු පුළුවුස්ති, මෙහෙණහු පුළුවුස්ති, උවසුවෝ පුළුවුස්ති, උවැසියෝ පුළුවුස්ති, රජවරු පුළුවුස්ති, ක්ෂත්‍රියයෝ පුළුවුස්ති, බ්‍රාහ්මණයෝ පුළුවුස්ති, වෛශ්‍යයෝ පුළුවුස්ති, ශූද්‍රයෝ පුළුවුස්ති, ගැහැවියෝ පුළුවුස්ති, පැවිද්දෝ පුළුවුසිත්. මේ මනුෂ්‍යපෘච්ඡා යි. **අමනුෂ්‍යපෘච්ඡා** කවරැ යත්: අමනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති, නාගයෝ පුළුවුස්ති, සුපර්ණයෝ (ගුරුළෝ) පුළුවුස්ති, යක්ෂයෝ පුළුවුස්ති, අසුරයෝ පුළුවුස්ති, ගන්ධර්වයෝ පුළුවුස්ති, වරම් රජවරු පුළුවුස්ති, ඉන්ද්‍රයෝ පුළුවුස්ති බ්‍රහ්මයෝ පුළුවුස්ති, දේවතාවෝ පුළුවුසිත්. මේ අමනුෂ්‍යපෘච්ඡා යි. **නිර්මිත පෘච්ඡා** කවරැ යත්; බුදුහු මනෝමය වූ සියලු අඟපසඟ ඇති නො පිරිහුණු ඉඳුරන් ඇති යම් රූපයක් නිර්මාණය කෙරෙත් ද. ඒ නිර්මිත බුදුහු භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති, බුදුහු විසඳති; මේ නිර්මිත පෘච්ඡා යි. මොහු තුන් පෘච්ඡා යි.

අන්‍යවූ ද පෘච්ඡා තුනෙකි: ආත්මාර්ත්ථ පෘච්ඡා යැ පරාර්ත්ථපෘච්ඡා යැ උභයාර්ත්ථපෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: දෘෂ්ටධාර්මිකාර්ත්ථ පෘච්ඡා යැ සාම්පරායිකාර්ත්ථපෘච්ඡා යැ පරමාර්ත්ථපෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: දනවද්‍යාර්ත්ථපෘච්ඡා යැ නික්ලෙශාර්ත්ථ පෘච්ඡා යැ ව්‍යවදනාර්ත්ථ පෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: අතීතපෘච්ඡා යැ අනාගතපෘච්ඡා යැ ප්‍රත්‍යුත්පන්න පෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: අධ්‍යාත්මපෘච්ඡා යැ බාහ්‍යපෘච්ඡා යැ අධ්‍යාත්මබාහ්‍යපෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: කුශලපෘච්ඡා යැ අකුශලපෘච්ඡා යැ අව්‍යාකෘතපෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: ස්කන්ධපෘච්ඡා යැ ධාතු පෘච්ඡා යැ ආයතන පෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: සතිපට්ඨාන පෘච්ඡා යැ සම්‍යක්ප්‍රධාන පෘච්ඡා යැ ඍද්ධිපාද පෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි. ඉන්ද්‍රිය පෘච්ඡා යැ බලපෘච්ඡා යැ බොධ්‍යඞ්ග පෘච්ඡා යි. අන්‍ය වූ ද පෘච්ඡා තුනෙකි: මාර්ග පෘච්ඡා යැ ඵලපෘච්ඡා යැ නිර්වාණපෘච්ඡා යි.

**පුච්ඡාමි** තං යනු: මුඹ වහන්සේ පුළුවුස්මි, මුඹ වහන්සේ අයදිමි, මුඹ වහන්සේ අණවමි, මුඹ වහන්සේ පහදවමි, මට වදළ මැනැව නුයි 'පුච්ඡාමි තං' යනු වේ. **භගවා** යනු: තෙල ගෞරවනාමයෙකි... මේ 'භගවා' යනු; සාක්ෂාත් ප්‍රඥප්තියෙකි. **බ්‍රෑහි මෙතං** යනු: කිව මැනැව, පැවැසුව මැනැව, දෙසුව මැනැව, පැනැවුව මැනව, පිහිටුව මැනැව, විවෘත කළ මැනැව, විභාග කළ මැනැව, නො ගැඹුරු කළ මැනැව, ප්‍රකාශ කළ මැනැව නු යි 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං' යනු වේ.

එයින් කීයැ ඒ බමුණු:

**"අනෙජං මූලදස්සාවිං–පෙ–පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං"යි.**

3-2

යෙ කෙචි මෙ ඉසයො මනුජා (පුණ්ණකාති භගවා)
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ'ධ ලොකෙ
ආසිංසමානා[1] පුණ්ණක ඉත්ථභාවං[2]
ජරං සිතා යඤ්ඤමකප්පයිංසු.

**යෙ කෙචි මෙ ඉසයො මනුජා**'ති: 'යෙකෙචී'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං[3] යෙ කෙචී'ති. **ඉසයොති** ඉසිනාමකා යෙ කෙචි ඉසිපබ්බජ්ජං පබ්බජිතා: ආජීවකා නිගණ්ඨා ජටිලා තාපසා. **මනුජාති** මනුස්සා වුච්චන්තීති 'යෙ කෙචි මෙ ඉසයො මනුජා පුණ්ණකාති භගවා'.

**ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානන්ති**: 'ඛත්තියා'ති යෙ කෙචි ඛත්තිය ජාතිකා, **බ්‍රාහ්මණාති** යෙ කෙචි භොවාදිකා, **දෙවතානන්ති** ආජීවක සාවකානං ආජීවකා දෙවතා -පෙ- දිසාවතිකානං දිසා දෙවතා, යෙ යෙසං දක්ඛිණෙය්‍යා තෙ තෙසං දෙවතාති 'ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං'.

**යඤ්ඤමකප්පයිංසු පුථූධ ලොකෙති**: යඤ්ඤං වුච්චති දෙය්‍යධම්මො: චීවරපිණ්ඩපාත -පෙ- සෙය්‍යාවසථපදීපෙය්‍යං. **යඤ්ඤමකප්පයිංසූති** යෙපි යඤ්ඤං එසන්ති ගවෙසන්ති පරියෙසන්ති -පෙ- සෙය්‍යාවසථපදීපෙය්‍යං, තෙපි යඤ්ඤං කප්පෙන්ති. **පුථූති** යඤ්ඤා වා එතෙ පුථූ, යඤ්ඤයාජකා වා එතෙ පුථූ, දක්ඛිණෙය්‍යා වා එතෙ පුථූ -පෙ- එවං දක්ඛිණෙය්‍යා වා එතෙ පුථූ. **ඉධ ලොකෙති** මනුස්සලොකෙති 'යඤ්ඤමකප්පයිංසු පුථූධ ලොකෙ.'

**ආසිංසමානා පුණ්ණක ඉත්ථභාවන්ති**: 'ආසිංසමානා'ති රූපපටිලාභං ආසිංසමානා, සද්දපටිලාභං ආසිංසමානා, ගන්ධපටිලාභං ආසිංසමානා, රසපටිලාභං ආසිංසමානා, ඵොට්ඨබ්බපටිලාභං ආසිංසමානා, පුත්තපටිලාභං ආසිංසමානා, දාරපටිලාභං ආසිංසමානා, ධනපටිලාභං ආසිංසමානා, යසපටිලාභං ආසිංසමානා, ඉස්සරියපටිලාභං ආසිංසමානා, ඛත්තියමහාසාලකුලෙ අත්තභාවපටිලාභං ආසිංසමානා, බ්‍රාහ්මණමහාසාලකුලෙ අත්තභාවපටිලාභං ආසිංසමානා, ගහපතිමහාසාලකුලෙ අත්තභාවපටිලාභං

1. ආයිසමානාති- ම ඡ සං
2. ඉත්ථත්තං - මජසං
ඉත්ථතං - සයා
3. පරියාදය වචන මෙතං- පන, සයා

3–2.

(බුදුහු මෙසේ වදළහ: පුණ්ණකය,) මෙ ලොවැ මේ ඍෂිහු යැ මනුෂ්‍යයෝ යැ ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ යන යම් කිසි බොහෝ යාග කරුවෝ දෙවියනට යාග කෙරෙත් ද, පුණ්ණකය, ඔහු ජරාව (සසර දුක) නිසා මේ මනුෂ්‍යාදිභාවය පතන්නාහු (දෙවියනට) යාග කෙරෙත් යයි.

**යෙ කෙචි'මෙ ඉසයො මනුජා** යනු: 'යෙ කෙචි' යනු; තෙල. 'යෙ කෙචි යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි. **ඉසයො** යනු 'ඍෂි' නම් ඇති යම් කිසි ඍෂි ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි වූ ආජිවකයෝ, නිර්ග්‍රන්ථයෝ, ජටිලයෝ තාපසයො. **'මනුජ'** යි මනුෂ්‍යයෝ කියනු ලැබෙත් නුයි 'යෙ කෙචි මෙ ඉසයො මනුජා පුණ්ණකා 'ති භගවා' යනු වේ.

**ඛත්තියා බ්‍රාහමණා දෙවතානං** යනු: 'ඛත්තියා' යි ක්ෂත්‍රියජාති ඇති යම් කිසි කෙනෙක්. **බ්‍රාහමණා** යනු: භොවාදික වූ යම් කිසි කෙනෙක්. **දෙවතානං** යනු: ආජීවකශ්‍රාවකයන්ට ආජීවකයෝ දේවතා යැ'......... දිග්ව්‍රත ඇතියනට දිශාවෝ දෙවතා යැ, යම් කෙනෙක් යම් කෙනකුන්ට දක්ෂිණාර්හ වෙත් ද ඔහු ඔවුනට දෙවතා යැ'යි **ඛත්තියා බ්‍රාහමණා දෙවතානං** යනු වේ.

**යඤ්ඤමකප්පයිංසු පුථූධ ලොකෙ** යනු: 'යඤ්ඤ' යි දෙයධර්මය කියනු ලැබෙයි. සිවුරු පිඩුවා...... යහන්ගේ පහන්තෙලි. **යඤ්ඤමකප්පයිංසු** යනු: යම් කෙනෙකුත් යඥය එෂණ–ගවෙෂණ–පයෙෂණ කෙරෙත් ද, ...යහන්ගේ පහන්තෙලි. ඔහු දූ යඥ කෙරෙත්. **පුථූ** යනු: තෙල යඥයෝ හෝ බොහෝ වෙති, තෙල යඥ යාජකයෝ හෝ බොහෝ වෙති, තෙල දක්ෂිණාර්හයෝ හෝ බොහෝ වෙති.... මෙසෙයින් තෙල දක්ෂිණාර්හයෝ හෝ බොහෝ වෙත්. **ඉධ ලොකෙ** යනු: මනුෂ්‍යලොක යෙහි නුයි 'යඤ්ඤමකප්පයිං සු පුථූධ ලොකෙ' යනු වේ.

**ආසිංසමානා පුණ්ණක ඉත්ථභාවං** යනු: **ආසිංසමානා** යනු රූපප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු ශබ්දප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු ගන්ධප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු රසප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු ස්ප්‍රෂ්ටව්‍යප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු පුත්‍රප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු දරප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු ධනප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු යශස්ප්‍රතිලාභය ප්‍රාර්ථනා කරනනාහු ඓශ්වර්‍ය්‍ය ප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු ක්ෂත්‍රියමහාසාරකුලයෙහි ආත්මභාවප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු බ්‍රාහ්මණමහාසාරකුලයෙහි ආත්මභාවප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු ගෘහපතිමහාසාරකුලයෙහි ආත්මභාව ප්‍රතිලාභය

ආසිංසමානා, චාතුම්මහාරාජිකෙසු,[1] දෙවෙසු අත්තභාවපටිලාභං ආසිංසමානා, තාවතිංසෙසු දෙවෙසු-පෙ-යාමෙසු දෙවෙසු[2]-තුසිතෙසු දෙවෙසු-නිම්මාණරතීසු දෙවෙසු- පරනිම්මිතවසවත්තීසු දෙවෙසු- බ්‍රහ්මකායිකෙසු දෙවෙසු අත්තභාවපටිලාභං ආසිංසමානා, ඉච්ඡමානා[3] සාදියමානා, පත්ථයමානා පිහයමානා අභිජප්පමානාති 'ආසිංසමානා'. පුණ්ණක ඉත්ථභාවන්ති: එත්ථ අත්තභාවාභිනිබ්බත්තිං ආසිංසමානා, එත්ථ ඛත්තියමහාසාලකුලෙ අත්තභාවාභිනිබ්බත්තිං ආසිංසමානා -පෙ- එත්ථ බ්‍රහ්මකායිකෙසු දෙවෙසු අත්තභාවාභිනිබ්බත්තිං ආසිංසමානා ඉච්ඡමානා සාදියමානා පත්ථයමානා පිහයමානා අභිජප්පමානාති 'ආසිංසමානා පුණ්ණක ඉත්ථභාවං.

ජරං සිතා යඤ්ඤමකප්පයිංසූති: ජරානිස්සිතා ව්‍යාධිනිස්සිතා මරණනිස්සිතා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසනිස්සිතා. යදෙව තෙ ජාතිනිස්සිතා තදෙව තෙ ජරානිස්සිතා, යදෙව තෙ ජරානිස්සිතා තදෙව තෙ ව්‍යාධිනිස්සිතා, යදෙව තෙ ව්‍යාධිනිස්සිතා තදෙව තෙ මරණනිස්සිතා, යදෙව තෙ මරණනිස්සිතා තදෙව තෙ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසනිස්සිතා, යදෙව තෙ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසනිස්සිතා තදෙව තෙ ගතිනිසසිතා, යදෙව තෙ ගතිනිසසිතා තදෙව තෙ උපපත්තිනිසසිතා, යදෙව තෙ උපපත්තිනිසසිතා තදෙව තෙ පටිසන්ධිනිසසිතා, යදෙව තෙ පටිසන්ධිනිසසිතා තදෙව තෙ භවනිසසිතා, යදෙව තෙ භවනිසසිතා තදෙව තෙ සංසාරනිසසිතා, යදෙව තෙ සංසාරනිසසිතා තදෙව තෙ වට්ටනිසසිතා, අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති 'ජරං සිතා යඤ්ඤමකප්පයිංසු'.

තෙනාහ භගවා:

"යෙ කෙචි මෙ ඉසයො මනුජා (පුණ්ණකාති භගවා)
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ'ධ ලොකෙ
ආසිංසමානා පුණ්ණක ඉත්ථභාවං
ජරංසිතා යඤ්ඤමකප්පයිංසූ"ති.

1. චාතුම්මහාරාජිකෙසු-ම ඡ සං
2. යාමදෙවෙසු-ව, ක
3. ඉච්ඡයමානා-ම ඡ සං

ප්‍රාර්ථනා කරන්නාහු සිව්මහරද දෙවියන් කෙරෙහි ආත්මභාව ප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු තව්තිසා දෙවියන් කෙරෙහි... යාම දෙවියන් කෙරෙහි... තුෂිත දෙවියන් කෙරෙහි ... නිර්මාණරති දෙවියන් කෙරෙහි... පරනිර්මිතවසවර්ති දෙවියන් කෙරෙහි... බ්‍රහ්මකායික දෙවියන් කෙරෙහි ආත්මභාවප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාහු කැමැති වන්නාහු ඉවසන්නාහු පතන්නාහු ඊප්සා කරන්නාහු අභිජල්පනය කරන්නාහු නුයි 'ආසිංසමානා' යනු වේ. **පුණ්ණක ඉත්ථභාවං** යනු: මෙහි ආත්මභාවයාගේ පහළවීම ප්‍රාර්ත්ථනා කරන්නාහු මෙහි ක්ෂත්‍රිය මහාසාර කුලයෙහි ආත්මභාවයා ගේ පහළ වීම ප්‍රාර්ථනා කරන්නාහු...මෙහි බ්‍රහ්මකායික දෙවියන් කෙරෙහි ආත්මභාවයාගේ පහළ වීම ප්‍රාර්ථනා කරන්නාහු කැමැති වන්නාහු ඉවසන්නාහු පතන්නාහු ඊප්සා කරන්නාහු අභිජල්පනය කරන්නාහු නුයි. 'ආසිංසමානා පුණ්ණක ඉත්ථභාවං' යනු වේ.

**ජරං සිතා යඤ්ඤමකප්පයිංසු** යනු: ජරාදුක ඇසිරි කළාහු ව්‍යාධි දුක ඇසිරි කළාහු මරණ දුක ඇසිරි කළාහු සොක–පරිදෙව–දුක්ඛ–දෙමනස්ස–උපායාස දුක ඇසිරි කළාහු... යම් කලෙක්හි මැ ඔහු ජාතිය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු ජරාව ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි මැ ඔහු ජරාව ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු ව්‍යාධිය ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි මැ ඔහු ව්‍යාධිය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු මරණය ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි මැ ඔහු මරණය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු සොක–පරිදෙව–දුක්ඛ–දෙමනස්ස–උපායාස ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි මැ ඔහු සොක–පරිදෙව–දුක්ඛ–දෙමනස්ස–උපායාස ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු ගතිය ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි මැ ඔහු ගතිය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු උත්පත්තිය ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි ම, ඔහු උත්පත්තිය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු ප්‍රතිසන්ධිය ඇසිරි කළාහු යැ. යම් කලෙක්හි මැ ඔහු ප්‍රතිසන්ධිය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු භවය ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි මැ ඔහු භවය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු සංසාරය ඇසිරි කළාහු යැ, යම් කලෙක්හි මැ ඔහු සංසාරය ඇසිරි කළාහු නම් එකල්හි මැ ඔහු වෘත්තය ඇසිරි කළාහු යැ වැළඳ ගත්තාහු යැ (සසරට) එළඹියාහ පිවිසුණාහු යැ අධිමුක්ත වූවාහු නුයි 'ජරං සිතා යඤ්ඤමකප්පයිංසු' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**''යෙ කෙචි මෙ ඉසයො මනුජා–පෙ–ජරං සිතා යඤ්ඤමකප්පයිංසු''යි.**

3—3

යෙ කෙචි'මෙ ඉසයො මනුජා (ඉච්චායස්මා පුණ්ණකො)
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු[1] පුථූ'ධ ලොකෙ
කච්චි සු[2] තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා
අතාරු[3] ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

**යෙ කෙචි මෙ ඉසයො මනුජාති: 'යෙ කෙචී'ති-පෙ-කච්චි සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තාති:** කච්චිසූ'ති සංසයපුච්ඡා විමතිපුච්ඡා ද්වෙළ්හකපුච්ඡා අනෙකංසපුච්ඡා, එවං නුඛො න නුඛො කිං නුඛො කථං නුඛොති කච්චිසු. තෙ'ති යඤ්ඤ යාජකා වුච්චන්ති. භගවාති ගාරවාධිවචනං -පෙ- සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවා'ති. 'කච්චි සු තෙ භගවා' යඤ්ඤපථෙ අප්පමත්තාති: යඤ්ඤොයෙව වුච්චති යඤ්ඤපථො, යථා අරියමග්ගො අරියපථො, දෙවමග්ගො දෙවපථො, බ්‍රහ්මමග්ගො බ්‍රහ්මපථො, එවමෙව යඤ්ඤොයෙව වුච්චති යඤ්ඤපථො. අප්පමත්තාති. යෙපි* යඤ්ඤපථෙ අප්පමත්තා සක්කච්චකාරිනො සාතච්චකාරිනො අට්ඨිතකාරිනො අනොලීනවුත්තිනො[4] අනික්ඛිත්තච්ඡන්දා අනික්ඛිත්තධුරා තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා[5] තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා තෙපි යඤ්ඤපථෙ අප්පමත්තා, යෙපි යඤ්ඤං එසන්ති ගවෙසන්ති පරියෙසන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං සක්කච්චකාරිනො -පෙ- තදධිපතෙය්‍යා තෙපි යඤ්ඤපථෙ අප්පමත්තා, යෙපි යඤ්ඤං අභිසංඛරොන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං[7] සෙය්‍යාවසථපදීපෙය්‍යං සක්කච්චකාරිනො -පෙ- තදධිපතෙය්‍යා තෙපි යඤ්ඤපථෙ අප්පමත්තා, යෙපි යඤ්ඤං දෙන්ති යජන්ති පරිච්චජන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අන්නං පානං -පෙ- සෙය්‍යාවසථපදීපෙය්‍යං සක්කච්චකාරිනො -පෙ- තදධිපතෙය්‍යා, තෙපි යඤ්ඤපථෙ අප්පමත්තාති 'කච්චි සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා'.

**අතාරු[3] ජාතිඤ්ච ජරඤ්ච මාරිසාති:** ජාතිජරාමරණං[8] අතරිංසු උත්තරිංසු පතරිංසු සමතික්කමිංසු වීතිවත්තිංසු. මාරිසාති පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං 'මාරිසා'ති. 'අතාරු ජාතිඤ්ච ජරඤ්ච මාරිස'.

---

* "යෙපි" ඉති මජසං, සෳාමපොත්ථකෙසු නත්ථි.

1. යඤ්ඤමකප්පිංසු—සෳා.
2. කච්චිස්සු—සෳා.
3. අතාරුං—සෳා.
4. අනොලීනවුත්තිකා—ව, ක, පත
5. තප්පොණා — මජසං
6. තදධිපතෙය්‍යා — සෳා
7. මාලාගන්ධං — සෳා,
8. ජරාමරණං — ම ජ සං

3–3.

(ආයුෂ්මත් පූණ්ණක මෙසේ විචාරයි.) ''මෙලොව‍ැ මේ සෘෂීහු යැ මනුෂ්‍යයෝ යැ ක්ෂත්‍රියයෝ යැ බ්‍රාහ්මණයෝ යැ යන යම් කිසි බොහෝ යාග කරුවෝ දෙවියනට යාග කෙරෙත් ද, භාග්‍යවතුන් වහන්ස, කිම ඔහු යාගයෙහි අප්‍රමත්ත වූවාහු ජාතිය ත් ජරාවත් තරණය කළාහු ද? නිදුකාණෙනි, එය මුඹවහන්සේ විචාරමි. භාග්‍යවතුන් වහන්ස තෙල කරුණ මට වදළ මැනැවි යි.''

යෙ කෙචි'මෙ ඉසයො මනුජා යනු: යෙ කෙචි යනු...

කච්චි සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා යනු: කච්ච සු යි: ''මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ හෝ හො''යි සංශය පෑවිජා යැ විමති පෑවිජා යැ විචිකිත්සා පෑවිජා යැ අනෛකාන්ත පෑවිජා නුයි ''කච්චි සු'' යනු වේ. තෙ යි යඥ යාජකයෝ කියනු ලැබෙති. භගවා යනු: ගෞරවනාමයෙකි...මේ 'භාග්‍යවත්' යනු සාක්ෂාත් ප්‍රඥප්ති නුයි 'කච්චි සු තෙ භගවා' යනු වේ. යඤ්ඤපථෙ අප්පමත්තා යනු: යඥය මැ 'යඥපථ' යි කියනු ලැබෙයි. යම්සේ ආර්‍ය්‍යමාර්ගය ආර්‍ය්‍යපථ වේ ද, දෙවමාර්ගය දෙවපථ වේ ද, බ්‍රහ්මමාර්ගය බ්‍රහ්මපථ වේ ද, එසෙයින් මැ යඥය මැ 'යඥපථ' යි කියනු ලැබේ. අප්පමත්තා යනු: යම් කෙනෙකුන් යඥපථයෙහි අප්‍රමත්ත වූවාහු සකසා කරන්නාහු සතතයෙන් කරන්නාහු නො නැවැත කරන්නාහු නො හැකුළුණු පැවැතුම් ඇත්තාහු නො හළ ඡන්දය ඇත්තාහු නො හළ වීර්‍ය්‍යධුර ඇත්තාහු එහි හැසිරෙන්නාහු එය බහුල කොට ඇත්තාහු එය ගුරු කොට ඇත්තාහු එයට නැමුණ හු එයට අතිශයින් නැමුණ හු එයට නැඹුරු වූවාහු එහි අධිමුක්ත වූවාහු (බැඳුණාහු) එය අධිපති කොට ඇත්තාහු නුයි ඔහු ද යඥපථයෙහි අප්‍රමත්ත වූවාහු වෙති. යම් කෙනෙකුත් සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ආහාර පාන වස්ත්‍ර යාන මල්ගඳ විලෙවුන් යහන්ගේ පහන්තෙල් යන දෙයධර්මය කැමැති වෙත් ද සොයත් ද හැම අයුරින් කැමැති වෙත් ද, සකසා කරන්නාහු ද ... එය අධිපති කොට ඇත්තාහු ද, ඔහු ද යඥපථයෙහි අප්‍රමත්ත වෙති. යම් කෙනෙකුත් සිවුරු පිඩුවා සෙනෙසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ආහාර පාන ... යහන්ගේ පහන්තෙල් යන දෙයධර්මය සකස්කෙරෙත් ද, සකසා කරන්නාහු ද... එය අධිපති කොට ඇත්තාහු ද ඔහු ද යඥපථයෙහි අප්‍රමත්තයෝ යැ. යම් කෙනෙකුත් සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ආහාර පාන... යහන්ගේ පහන්තෙල් යන දෙය ධර්මය දෙත් ද යදිත් ද, පරිත්‍යාග කෙරෙත් ද, සකසා කරන්නාහු ද... එය අධිපති කොට ඇත්තාහු ද, ඔහු ද යඥපථයෙහි අප්‍රමත්තයහ'යි 'කච්චි සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා' යනු වේ.

අතාරු ජාතිඤ්ච ජරඤ්ච මාරිස යනු: ජාති ජරාමරණය තරණය කළහ, උත්තරණය කළහ, ප්‍රකර්ෂයෙන් තරණය කළහ, ඉක්මවූහ, ව්‍යතික්‍රමණය කළහ. මාරිස යනු: තෙල 'මාරිස' යි ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරව සප්‍රතිශ්‍රය වචන නුයි 'අතාරු ජාතිඤ්ච ජරඤ්ච මාරිස' යනු වේ.

පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතන්ති: 'පුච්ඡාමි ත'න්ති පුච්ඡාමි තං යාචාමි තං, අජ්ඣෙසාමි තං, පසාදෙමි තං, කථයස්සු මෙති 'පුච්ඡාමි තං'. භගවාති ගාරවාධිවචනං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති. බ්‍රෑහි මෙතන්ති බ්‍රෑහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"යෙ කෙචි මෙ ඉසයො මනුජා (ඉච්චායස්මා පුණ්ණකො)
ඛත්තියා බ්‍රාහ්මණා, දෙවතානං,
යඤ්ඤමකප්පයිංසු පුථූධ ලොකෙ
කච්චි සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා
අතාරුං ජාතිඤ්ච ජරඤ්ච මාරිස,
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙත"න්ති.

---

3–4

ආසිංසන්ති[1] ථොමයන්ති අභිජප්පන්ති ජුහන්ති
(පුණ්ණකාති භගවා)
කාමාභිජප්පන්ති පටිච්ච ලාභං,
තෙ යාජයොගා භවරාගරත්තා
නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි.

ආසිංසන්ති ථොමයන්ති අභිජප්පන්ති ජුහන්තී'ති: 'ආසිංසන්තී'ති රූපපටිලාභං ආසිංසන්ති, සද්දපටිලාභං ආසිංසන්ති, ගන්ධපටිලාභං ආසිංසන්ති, රසපටිලාභං ආසිංසන්ති, ඵොට්ඨබ්බපටිලාභං ආසිංසන්ති, පුත්තපටිලාභං[2] ආසිංසන්ති, දාරපටිලාභං ආසිංසන්ති, ධනපටිලාභං ආසිංසන්ති, යසපටිලාභං ආසිංසන්ති, ඉස්සරියපටිලාභං ආසිංසන්ති, ඛත්තියමහාසාලකුලෙ අත්තභාවපටිලාභං ආසිංසන්ති, බ්‍රාහ්මණමහාසාලකුලෙ-පෙ-ගහපතිමහාසාලකුලෙ අත්තභාවපටිලාභං ආසිංසන්ති, චාතුම්මහාරාජිකෙසු දෙවෙසු -පෙ- බ්‍රහ්මකායිකෙසු දෙවෙසු අත්තභාවපටිලාභං ආසිංසන්ති, ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්තීති ආසිංසන්ති.

ථොමයන්තීති: යඤ්ඤං වා ථොමෙන්ති, ඵලං වා ථොමෙන්ති, දක්ඛිණෙය්‍යෙ[3] වා ථොමෙන්ති. කථං යඤ්ඤං ථොමෙන්ති: සුචිං දින්නං[4] මනාපං දින්නං, පණීතං දින්නං, කාලෙන දින්නං, කප්පියං දින්නං, විචෙය්‍ය දින්නං, අනවජ්ජං දින්නං, අභිණ්හං දින්නං, දදං චිත්තං පසාදිතන්ති ථොමෙන්ති, කිත්තෙන්ති වණ්ණෙන්ති පසංසන්ති. එවං යඤ්ඤං ථොමෙන්ති.

1. ආසීසන්ති –ච, පත, ම ජ සං
2. පුත්තදාර ධන යස ඉස්සරියං –ච, ක, ම
3. දක්ඛිණෙය්‍යං – ස්‍යා
4. පියං දින්නං – ස්‍යා

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං** යනු: 'පුච්ඡාමි තං' යි: මුඹ වහන්සේ අයදිමි, මුඹ වහන්සේ අධ්‍යෙෂණ කරමි, මුඹ වහන්සේ පහදවමි මට වදළ මැනැවැ යි 'පුච්ඡාමි තං' යනු වේ. භගවා යනු: මේ **'භගවා'** යි ගෞරව-නාමයෙකි ... සාක්ෂාත් ප්‍රඥප්තියෙකි. **බ්‍රෑහි මෙතං** යනු: කිව මැනැව ප්‍රකාශ කළ මැනැව දෙසුව මැනැව පනවනු මැනැව පිහිටුවනු මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව නො ගැඹුරු කළ මැනැව පැවසුව මැනැව නුයි 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං' යනු වේ.

එයින් කීයැ ඒ බමුණු:

යෙ කෙචි' මෙ ඉසයො මනුජා ... පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං'' යි.

---

3–4.

(බුදුහු මෙසේ වදළහ: පුණ්ණකය,) (ඔහු රූප ප්‍රතිලාභාදිය) ප්‍රාර්ත්ථනා කෙරෙති, (යාගාදිය) පසසති, ජල්පනය කෙරෙති, පුදති. (රූපාදි) ලාභය පිණිස පුනපුනා කාමයන් මැ (අපට වන්නේ මැනැව'යි) කියත්. යාගයෙහි යෙදුණු භවරාගයෙන් රුදුණු ඔහු ජාති ජරා (ආදි සසර-දුක) තරණය නො කළාහ'යි කියමි''යි.

**ආසිංසන්ති ථොමයන්ති අභිජප්පන්ති ජුහන්ති** යනු: 'ආසිංසන්ති' යනු: රූප ප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, ශබ්දප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, ගන්ධප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, රසප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති. ස්ප්‍රෂ්ටව්‍යප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, පුත්‍රප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, දරප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, ධනප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, යශස්ප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, ඓශ්වර්‍ය්‍යප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, ක්ෂත්‍රියමහාසාරකුලයෙහි ආත්මභාවප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, බ්‍රාහ්මණමහාසාරකුලයෙහි ... ගෘහපතිමහාසාර කුලයෙහි ආත්මභාවප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, චාතුර්මහාරාජික දෙවියන් කෙරෙහි ... බ්‍රහ්මකායික දෙවියන් කෙරෙහි ආත්මභාවප්‍රතිලාභය ප්‍රාර්ත්ථනා කෙරෙති, කැමැති වෙති, ඉවසති, පතති, ඊප්සා කෙරෙත් නුයි **'ආසිංසන්ති'** යනු වේ.

**ථොමයන්ති** යනු: දනය හෝ වර්ණනා කෙරෙති, (රූපාදිප්‍රතිලාභ) ඵලය හෝ වර්ණනා කෙරෙති, දක්ෂිණාර්හයන් හෝ වර්ණනා කෙරෙත්. කිසෙයින් දනවර්ණනා කෙරෙත් ද යත්: පිරිසිදු කොට දෙන ලද්ද, මන වඩනු කොට දෙන ලද්ද, ප්‍රණීත කොට දෙන ලද්ද, යොග්‍ය කාලයෙහි දෙන ලද්ද, කැප කොට දෙන ලද්ද, විමසා දෙන ලද්ද, නිදොස් කොට දෙනලද්ද, එක්වත් දෙන ලද්ද, දෙමින් පහදවන ලද සිත ථොමනය කෙරෙති, කීර්තනය කෙරෙති, වණති, පසසත් නුයි මෙසෙයින් දනය වර්ණනා කෙරෙත්.

කථං ඵලං ථොමෙන්ති: ඉතො නිදානං රූපපටිලාභො භවිස්සති -පෙ- බ්‍රහ්මකායිකෙසු දෙවෙසු අත්තභාවපටිලාභො භවිස්සතීති ඵලං ථොමෙන්ති, කිත්තෙන්ති වණ්ණෙන්ති පසංසන්තීති එවං ඵලං ථොමෙන්ති.

කථං දක්ඛිණෙය්‍යෙ ථොමෙන්ති: දක්ඛිණෙය්‍යා ජාතිසම්පන්නා ගොත්තසම්පන්නා අජ්ඣායකා මන්තධරා තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකා වෙය්‍යාකරණා ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයාති, වීතරාගා වා රාගවිනයාය වා පටිපන්නා, වීතදොසා වා දොසවිනයාය වා පටිපන්නා, වීතමොහා වා මොහවිනයාය වා පටිපන්නා, සද්ධාසම්පන්නා සීලසම්පන්නා සමාධිසම්පන්නා පඤ්ඤාසම්පන්නා විමුත්තිසම්පන්නා විමුත්තිඤාණදස්සනසම්පන්නාති ථොමෙන්ති කිත්තෙන්ති වණ්ණෙන්ති පසංසන්ති. එවං දක්ඛිණෙය්‍යෙ ථොමෙන්තීති 'ආසිංසන්ති ථොමෙන්ති'.

අභිජප්පන්තීති: රූපපටිලාභං අභිජප්පන්ති, සද්දපටිලාභං අභිජප්පන්ති, ගන්ධපටිලාභං අභිජප්පන්ති, රසපටිලාභං අභිජප්පන්ති -පෙ- බ්‍රහ්මකායිකෙසු, දෙවෙසු අත්තභාවපටිලාභං අභිජප්පන්තීති 'ආසිංසන්ති ථොමයන්ති අභිජප්පන්ති. 'ජුහන්තීති ජුහන්ති දෙන්ති යජන්ති පරිච්චජන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යන්ති 'ආසිංසන්ති ථොමෙන්ති අභිජප්පන්ති ජුහන්ති'

පුණ්ණකාති භගවාති: පුණ්ණකා'ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති. භගවාති ගාරවාධිවචනමෙතං -පෙ- යදිදං භගවාති 'පුණ්ණකාති භගවා'.

කාමාභිජප්පන්ති පටිච්ච ලාභන්ති: රූපපටිලාභං පටිච්ච කාමෙ අභිජප්පන්ති, සද්දපටිලාභං පටිච්ච කාමෙ අභිජප්පන්ති -පෙ- බ්‍රහ්මකායිකෙසු දෙවෙසු අත්තභාවපටිලාභං පටිච්ච කාමෙ අභිජප්පන්ති ජප්පන්තීති 'කාමාභිජප්පන්ති පටිච්ච ලාභං'.

කිසෙයින් ඵලය වර්ණනා කෙරෙත් ද යත්: මෙ (මිනිස් ලොවැ දුන්) කරුණින් රූපප්‍රතිලාභය වන්නේ යැ...බ්‍රහ්මකායික දෙවියන් කෙරෙහි ආත්මභාවප්‍රතිලාභය වන්නේ යැ යි ථොමනය කෙරෙති, කීර්තනය කෙරෙති, වර්ණනා කෙරෙති, ප්‍රශංසා කෙරෙත් නුයි මෙසෙයින් ඵලය වර්ණනා කෙරෙත්.

කිසෙයින් දක්ෂිණාර්හයන් වර්ණනා කෙරෙත් ද යත්: දක්ෂිණාර්හයෝ "ජාති සම්පන්නයහ, ගොත්‍රසම්පන්නයහ, වෙදමන්ත්‍රාධ්‍යාපකයහ, වෙදමන්ත්‍ර ධරනුවහ. නිඝණ්ටු, කෙටුභ (කාව්‍යශාස්ත්‍ර) සහිත වූ ශික්ෂා නිරුක්ති සඞ්ඛ්‍යාත අක්ෂරප්‍රභෙද සහිත වූ ඉතිහාසය පස්වනු කොට ඇති ත්‍රිවෙදයෙහි පරතෙරට ගියාහු පද හදරන්නාහු ව්‍යාකරණ හදරන්නාහු ලොකායත (විතණ්ඩවාදශාස්ත්‍ර) මහාපුරුෂ ලක්ෂණයෙහි අනූනයහ'යි, වීතරාග හෝ රාගවිනයට (රාගය දුරලීමට) පිළිපන්නාහු හෝ වෙති, වීතදෙස හෝ දෙස විනයට පිළිපන්නාහු හෝ වෙති, වීතමොහ හෝ මොහ විනයට පිළිපන්නාහු හෝ වෙති, ශ්‍රද්ධාසම්පන්නයහ, ශීල සම්පන්නයහ, සමාධිසම්පන්නයහ, ප්‍රඥාසම්පන්නයහ, විමුක්තිසම්පන්නයහ, විමුක්ති-ඥානදර්ශන සම්පන්නයහ"යි ථොමනය කෙරෙති, කීර්තනය කෙරෙති වර්ණනා කෙරෙති, ප්‍රශංසා කෙරෙත්, මෙසෙයින් දක්ෂිණාර්හයෝ ථොමනය කෙරෙත් නුයි "ආසිංසනති ථොමයනති' යනු වේ.

**අභිජප්පනති** යනු: රූපප්‍රතිලාභය ප්‍රාර්ථනා කෙරෙති, ශබ්දප්‍රතිලාභය ප්‍රාර්ථනා කෙරෙති, ගන්ධප්‍රතිලාභය ප්‍රාර්ථනා කෙරෙති, රසප්‍රතිලාභය ප්‍රාර්ථනා කෙරෙති ......බ්‍රහ්මකායික දෙවියන් කෙරෙහි ආත්මභාවප්‍රති ලාභය ප්‍රාර්ථනා කෙරෙත් නුයි 'ආසිංසනති ථොමයන්ති අභිජප්පනති' යනු වේ. **ජුහනති** යනු: සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර ආහාර පාන වස්ත්‍ර යාන මල්ගඳවිලෙවුන් යහන්ගේ පහන්තෙල් දනය කෙරෙති, දෙති, යදිති, පරිත්‍යාග කෙරෙත් නුයි. 'ආසිංසනති ථොමයනති අභිජප්පනති ජුහනති, යනු වේ.

පුණ්ණකා'ති භගවා : 'පුණ්ණක' යි බුදුහු ඒ බමුණු නමින් ආලපනය කෙරෙත්. **භගවා** යනු; තෙල ගෞරවාධි වචන යැ ...භගවත් යි 'පුණ්ණකා ති භගවා' යනු වේ.

**කාමාභිජප්පනති පටිච්ච ලාභං** යනු: රූප ප්‍රතිලාභය පිණිස කාමයන් ප්‍රාර්ථනා කෙරෙති, ශබ්දප්‍රතිලාභය පිණිස කාමයන් ප්‍රාර්ථනා කෙරෙති... බ්‍රහ්මකායික දෙවියන් කෙරෙහි ආත්මභාවප්‍රතිලාභය පිණිස කාමයන් ප්‍රාර්ථනා කෙරෙති, කැමැති වෙති, ඉතා කැමැති වෙත් නුයි 'කාමාභි-ජප්පනති පටිච්ච ලාභං' යනු වේ.

**තෙ යාජයොගා භවරාගරත්තා නාතරිංසු ජාතිජරන්ති බ්‍රූමීති:** 'තෙ'ති යඤ්ඤයාජකා වුච්චන්ති. යාජයොගාති යාජයොගෙසු යුත්තා පයුත්තා ආයුත්තා සමායුත්තා තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යාති, 'තෙ යාජයොගා'. භවරාගරත්තාති භවරාගො වුච්චති යො භවෙසු භවච්ඡන්දො භවරාගො භවනන්දී භවතණ්හා භවසිනෙහො භවපරිළාහො භවමුච්ඡා භවජ්ඣොසානං. භවරාගෙන භවෙසු රත්තා ගිද්ධා ගථිතා[1] මුච්ඡිතා අජ්ඣොපන්නා[2] ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති 'තෙ යාජයොගා භවරාගරත්තා'.

**නාතරිංසු ජාතිජරන්ති බ්‍රූමීති:** තෙ යාජයොගා භවරාගරත්තා ජාතිජරාමරණං නාතරිංසු, න උත්තරිංසු න පතරිංසු න සමතික්කමිංසු න වීතිවත්තිංසු, ජාතිජරාමරණා අනික්ඛන්තා[3] අනිස්සටා[4] අනතික්කන්තා අසමතික්කන්තා අවීතිවත්තා අන්තො ජාතිජරාමරණෙ පරිවත්තන්ති අන්තො සංසාරපථෙ පරිවත්තන්ති, ජාතියා අනුගතා ජරාය අනුසටා බ්‍යාධිනා අභිභූතා මරණෙන අබ්භාහතා අතාණා අලෙණා අසරණා අසරණීභූතාති. බ්‍රූමි. ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'තෙ යාජයොගා භවරාගරත්තා නාතරිංසු ජාතිජරන්ති බ්‍රූමි'.

තෙනාහ භගවා:

"ආසිංසන්ති ථොමයන්ති අභිජප්පන්ති ජුහන්ති
(පුණ්ණකාති භගවා)
කාමාභිජප්පන්ති පටිච්ච ලාභං
තෙ යාජයොගා භවරාගරත්තා
නාතරිංසු ජාතිජරන්ති බ්‍රූමී"ති

---

3–5

තෙ චෙ නාතරිංසු යාජයොගා (ඉච්චායස්මා පුණ්ණකො)
යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිස,
අථ කො චරහි දෙවමනුස්සලොකෙ
අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස,
පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතං.

**තෙ චෙ නාතරිංසු යාජයොගාති:** තෙ යඤ්ඤයාජකා යාජයොගා භවරාගරත්තා ජාතිජරාමරණං නාතරිංසු, න උත්තරිංසු, න පතරිංසු, න සමතික්කමිංසු, න වීතිවත්තිංසු, ජාතිජරාමරණා අනික්ඛන්තා[3] අනිස්සටා[4] අනතික්කන්තා අසමතික්කන්තා, අවීතිවත්තා අන්තො ජාතිජරාමරණෙ පරිවත්තන්ති,

1. ගධිතා – බහූසු
2. අජ්ඣොසන්නා–ච–ස–මජ්ඣං
3. අනික්ඛිත්තා – සත
4. අනිස්සටා – ස
අනිස්සිතා – පණ

**තෙ යාජයොගා භවරාගරත්තා නාතරිංසු ජාති ජරන්ති බ්‍රෑමි** යනු: 'තෙ' යි දෙයධර්මය දෙන්නාහු කියනු ලැබෙති. **යාජයොගා** යනු: යඥයොගයෙහි (දීමෙහි) යෙදුණාහු ආදරයෙන් යෙදුණාහු වෙසෙසින් යෙදුණාහු එක් වැ යෙදුණාහු එය කරන්නාහු එය බහුල වැ කරන්නාහු එය ගරු කරන්නාහු එයට නතු වූ සිත් ඇත්තාහු එහි නතු වූ කය ඇත්තාහු එහි අභිමුඛ වූ කය ඇත්තාහු එහි අධිමුක්ත වූවාහු එය අධිපති කොට ඇත්තාහු නු යි 'තෙ යාජයොගා' යනු වේ. **භවරාගරත්තා** යනු: භවයන්හි යම් භවච්ඡන්දයෙක් භවරාගයෙක් භවනන්දියෙක් භවතෘෂ්ණායෙක් භවස්නෙහයෙක් භවපරිදහයෙක් භවමූර්ඡායෙක් භවය ගිලගැනීමෙක් වේ ද, මේ 'භවරාග' යයි කියනු ලැබෙයි. භවරාගයෙන් භවයන්හි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු වැතුරුණාහු ලැගුණාහු ලග්න වූවාහු ඇවුරුණාහු නුයි' තෙ යාජයොගා භවරාගරත්තා' යනු වේ.

**නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි** යනු: දීමෙහි යෙදුණු ඔහු භවරාගයෙහි ඇලුණාහු ජාතිජරාමරණය තරණය උත්තරණය ප්‍රතරණය සමතික්‍රමණය ව්‍යතික්‍රමණය නො කළාහු යෑ. ජාතිජරාමරණයෙන් නො නික්මුණාහු බැහැර නො වූවාහු ඉක්ම නො ගියාහු මොනවට ඉක්ම නොගියාහු ව්‍යතික්‍රමණය නො කළාහු ජාතිජරාමරණය ඇතුළත පෙරළෙති, ඇතුළුසසරමග පෙරළෙති. ජාතියට පිවිසියාහු ජරායෙන් පතළාහු ව්‍යාධියෙන් මඩනා ලද්දාහු මරණයෙන් පහරන ලද්දහු රක්ෂා විරහිත වූවාහු නිලීනස්ථාන රහිත වූවාහු අසරණ වූවාහු තමහට ප්‍රතිෂ්ඨා නො කරන්නාහු යයි කියමි, පවසමි, දෙසමි, පනවමි, පිහිටුවමි, විවෘත කෙරෙමි, විභාග කෙරෙමි, නො ගැඹුරු කෙරෙමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'තෙ යාජයොගා භවරාගරත්තා නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**''ආසිංසන්ති ථොමයන්ති ...නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි''** යි.

---

3–5.

(ආයුෂ්මත්, පුණ්ණක මෙසේ විචාරයි) ''නිදුකාණෙනි, යාගයෙහි යෙදුණු ඔහු ඉදින් යාගයන් කරණ කොට ගෙන ජාතියත් ජරාවත් තරණය නො කළාහු නම් නිදුකාණෙනි, එකල්හි දෙව්මිනිස් ලොවැ කව රෙක් ජාතියත් ජරාවත් තරණය කෙළේ ද? ඒ කරුණ පුළුවුස්මි. භාග්‍ය වතුන් වහන්ස, තෙල මට වදළ මැනැවි. ''

**තෙ චෙ නාතරිංසු යාජයොගා** යනු: ඒ යඥයාජක වූ යාගයෙහි යෙදුණු භවරාගයෙහි ඇලුණාහු ජාතිජරා මරණය තරණ– උත්තරණ– ප්‍රතරණ– සමතික්‍රමණ– ව්‍යතික්‍රමණ– නො කළාහු යෑ. ජාති ජරා මරණයෙන් නො නික්මුණාහු බැහැර නො වූවාහු නො ඉක්මගියාහු මොනොවට නො ඉක්ම ගියාහු නො ඉක්ම පැවැත්තාහු ඇතුළු ජරාමරණයෙහි පෙරළෙති.

අනන්තා සංසාරපථෙ පරිවත්තන්ති ජාතියා අනුගතා, ජරාය අනුසටා[1] බ්‍යාධිනා අභිභූතා, මරණෙන අබ්භාහතා, අතාණා අලෙනා අසරණා අසරණීභූතාති තෙ වෙ නාතරිංසු යාජයොගා. ඉච්චායස්මා පුණ්ණකොති' ඉච්චාති පදසන්ධි –පෙ– ආයස්මා පුණ්ණකො.

යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිසාති 'යඤ්ඤෙහී'ති යඤ්ඤෙහි පහුතෙහි යඤ්ඤෙහි විවිධෙහි යඤ්ඤෙහි පුථූහි 'මාරිසා'ති: පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං 'මාරිසා'ති. 'යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිස'.

අථ කො චරහි දෙවමනුස්සලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිසාති: අථ කො එසො සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ජාතිජරාමරණං අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයි. මාරිසාති පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං මාරිසාති. 'අථ කො චරහි දෙවමනුස්සලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස'.

පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතන්ති: පුච්ඡාමි ත'න්ති පුච්ඡාමි තං, යාචාමි තං, අජ්ඣෙසාමි තං, පසාදෙමි තං. කථයස්සු මෙතන්ති 'පුච්ඡාමි තං'. භගවාති ගාරවාධිවචනං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති. **බ්‍රෑහි මෙතන්ති:** බ්‍රෑහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

තෙ වෙ නාතරිංසු යාජයොගා (ඉච්චායස්මා පුණ්ණකො)
යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිස,
අථ කො චරහි දෙවමනුස්සලොකෙ
අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙත'න්ති.

1. අනුගතා – පත

ඇතුළු සසරමඟ පෙරළෙති. ජාතියට පිවිසියාහු ජරායෙන් පතළාහු ව්‍යාධියෙන් මැඩුණාහු මරණයෙන් පහරන ලද්දහු රක්ෂා විරහිත වූවාහු නිලීයනස්ථාන රහිත වූවාහු අසරණ වූවාහු තමහට ප්‍රතිෂ්ඨා නො කරන්නාහු යයි 'තෙ වෙ නාතරිංසු යාජයොගා' යනු වේ.

**ඉච්චායස්මා පුණ්ණකො** යනු: ඉච්චා' යනු: පද සන්ධි යැ ... ආයස්මා පුණ්ණකො යනු වේ.

**යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිස** යනු: යඤ්ඤෙහි යනු: යාගයන් කරණ කොට බොහෝ වූ යාගයන් කරණකොට විවිධයාගයන් කරණ කොට මහත් වූ යාගයන් කරණ කොට, **මාරිස** යනු: තෙල 'මාරිස' යනු: ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරව සප්‍රතිශ්‍රයනාම යැ යි 'යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිස' යනු වේ.

**අථ කො චරහි දෙවමනුස්සලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස** යනු: එකල්හි තෙල කවරෙක් දෙවියන් සහිත ලොකයෙහි මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වලෝකයෙහි ජාති ජරාමරණය තරණය කෙළේ ද? උත්තරණය කෙළේ ද? ප්‍රතරණය කෙළේ ද? සමතික්‍රමණය කෙළේද? ඉක්ම පැවැත්තේ ද? **මාරිස** යනු: තෙල මාරිස යනු ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරව සප්‍රතිශ්‍රයාධිවචන නුයි 'අථ කො චරහි දෙවමනුස්සලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස' යනු වේ.

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං** යනු: **පුච්ඡාමි තං** යනු: මුඹ වහන්සේ විචාරමි මුඹ වහන්සේ අයදිමි මුඹ වහන්සේ අනාවමි. මුඹ වහන්සේ පහදවමි. තෙල මට වදළ මැනැව නුයි 'පුච්ඡාමි තං' යනු වේ. **භගවා** යනු: තෙල 'භගවා' යනු: ගෞරවනාම යැ ...සාක්ෂාත් ප්‍රඥප්ති යැ. **බ්‍රෑහි මෙතං** යනු: කිව මැනැව, පැවැසුව මැනැව, දෙසුව මැනැව, පැනැවුව මැනැව, පිහිටුව මැනැව, විවෘත කළ මැනැව, විභාග කළ මැනැව, නො ගැඹුරු කළ මැනැව, ප්‍රකාශ කළ මැනැව නුයි 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

"තෙ වෙ නාතරිංසු යාජයොගා ... පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං"යි.

3–6

**සඞ්ඛාය ලොකස්මිං[1] පරොවරානි[2] (පුණ්ණකාති භගවා)**
**යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ**
**සන්තො විධූමො අනීඝො නිරාසො**
**අතාරි සො ජාතිජරන්ති බ්‍රූමි.**

**සඞ්ඛාය ලොකස්මිං පරොවරානීති:** 'සඞ්ඛා' වුච්චති ඤාණං, "යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[අ]

**පරොවරානීති** 'ඔරං' වුච්චති සකත්තභාවො, පරං වුච්චති පරත්තභාවො, ඔරං වුච්චති සකරූපවෙදනාසඤ්ඤාසංඛාරවිඤ්ඤාණං, පරං වුච්චති පරරූපවෙදනාසඤ්ඤාසංඛාරවිඤ්ඤාණං, ඔරං වුච්චති ඡ අජ්ඣත්තිකානි ආයතනානි පරං වුච්චති ඡ බාහිරානි ආයතනානි, ඔරං වුච්චති මනුස්සලොකො, පරං වුච්චති දෙවලොකො, ඔරං වුච්චති කාමධාතු, පරං වුච්චති රූපධාතු අරූපධාතු, ඔරං වුච්චති කාමධාතු-රූපධාතු, පරං වුච්චති අරූපධාතු, **සඞ්ඛාය ලොකස්මිං පරොවරානීති:** පරොවරානි අනිච්චතො සඞ්ඛාය, දුක්ඛතො -රොගතො- ගණ්ඩතො -පෙ- නිස්සරණතො සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'සඞ්ඛාය ලොකස්මිං පරොවරානි.' **පුණ්ණකාති භගවාති:** 'පුණ්ණකා'ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති. **භගවාති** ගාරවාධිවචනමෙතං -පෙ- යදිදං 'භගවා'ති. 'පුණ්ණකාති භගවා'

**යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙති:** 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස. **ඉඤ්ජිතන්ති:** තණ්හිඤ්ජිතං දිට්ඨිඤ්ජිතං මානිඤ්ජිතං කිලෙසිඤ්ජිතං කාමිඤ්ජිතං, යස්සිමෙ ඉඤ්ජිතා නත්ථි, න සන්ති, න සංවිජ්ජන්ති, නූපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා. **කුහිඤ්චීති** කුහිඤ්චි කිස්මිඤ්චි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වා. **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති **'යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ'**

1. ලොකම්හි – ම ජ ස
2. පරොපරානී ච–වි–සා–පත–සාා මජසං,

අ. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ
3. පරොපරානීති –ච–සා–

3–6

(බුදුහු මෙසේ වදළහ: ''පුණ්ණකය,) සත්ලොවැ (පරාත්මභාව ස්වාත්මභාවාදි) පරාවරයන් නුවණින් විමසා (දත්) යම් ක්ෂීණාස්‍රවයක්හට ලොවැ කිසි තැනෙක්හි ඉඤ්ජිතයෙක් නැද්ද, (කෙලෙස් සන්හිඳීමෙන්) ශාන්ත වූ (කායදුශ්චරිතාදි) ධූම විරහිත වූ (රාගාදී) උපද්‍රව රහිතවූ ආශා රහිතවූ ඒ ක්ෂීණාස්‍රව තෙම ජාති ජරා තරණය කෙළේ යයි කියමි''යි.

**සඞ්ඛාය ලොකස්මිං පරොවරානි** යනු: 'සඞ්ඛා'යි ඥානය කියනු ලැබෙයි. යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් ...අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එයයි.

**පරොවරානි** යනු: ස්වාත්මභාවය 'ඔර' යයි කියනු ලැබෙයි, පරාත්මභාවය 'පර' යයි කියනු ලැබෙයි, තමාගේ රූප–වෙදනා–සංඥා–සංස්කාර–විඥානය 'ඔර' යයි කියනු ලැබෙයි, මෙරමා ගේ රූප–වෙදනා–සංඥා සංස්කාර–විඥානය 'පර' යයි කියනුලැබෙයි, ආධ්‍යාත්මික ෂඩායතනය 'ඔර' යයි කියනු ලැබෙයි, බාහිර ෂඩායතනය 'පර' යයි කියනු ලැබෙයි, මනුෂ්‍යලොකය 'ඔර' යයි කියනු ලැබෙයි දිව්‍යලොකය 'පර' යයි කියනු ලැබෙයි කාමධාතුව 'ඔර' යයි කියනු ලැබෙයි, රූපධාතු අරූපධාතු 'පර' යයි කියනු ලැබෙයි, කාමධාතු රූපධාතු 'ඔර' යයි කියනු ලැබෙයි, අරූපධාතු 'පර' යයි කියනු ලැබෙයි, '**සඞ්ඛාය ලොකස්මිං පරොවරානි**' යනු: පරොවර (පරාවර) යන් අනිත්‍ය හෙයින් නුවණින් විමසා, දුඃඛ හෙයින්... රොග හෙයින්–ගණ්ඩ හෙයින්...නිස්සරණ හෙයින් නුවණින් විමසා දැනැ, තුලනය කොට තීරණය කොට, විභාවන කොට ප්‍රකට කොට නුයි 'සඞ්ඛාය ලොකස්මිං පරොවරානි' යනු වේ. **පුණ්ණකා'ති භගවා** යනු: 'පුණ්ණක'යි බුදුහු එ බමුණු නමින් අමතති, 'භගවා' යනු: මේ භගවා' යනු ගෞරව නාම යැ... සාක්ෂාත් ප්‍රඥප්ති නුයි 'පුණ්ණකා'ති භගවා' යනු වේ.

**යස්සිඤ්ජිතං නත්‍ථි කුහිඤ්චි ලොකෙ** යනු: 'යස්ස' යනු අර්හත් ක්ෂීණාස්‍රවයනට ඉඤ්ජිතං යනු; තෘෂ්ණා ඉඤ්ජන (කම්පන) යැ දෘෂ්ටි ඉඤ්ජන යැ මාන ඉඤ්ජන යැ ක්ලෙශ ඉඤ්ජන යැ කාම ඉඤ්ජනයි. යමක්හට මේ ඉඤ්ජනයෝ නැද්ද, නො වෙත් ද, විද්‍යමාන නො වෙත් ද, නො-ලැබෙත් ද, ප්‍රහීණ ද, අ මුලුසුන් ද, සන්හිඳුණාහු ද, ප්‍රතිප්‍රශ්‍රබ්ධ ද, යළි උපදනුවට අභව්‍යයෝ ද, නැණ' ගින් දැවුණාහු ද. කුහිඤ්චි යනු: අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි අධ්‍යාත්මබාහ්‍ය වේවයි කොහි කිසිවෙක්හි කිසි තැනෙකැ. ලොකෙ යනු: අපාය ලොකයෙහි...ආයතන ලොකයෙහි නුයි 'යස්සිඤ්ජිතං නත්‍ථි කුහිඤ්චි ලොකෙ' යනු වේ.

සන්තො විධූමො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රූමීති: ‘සන්තො’ති රාගස්ස සන්තත්තා සන්තො, දොසස්ස -මොහස්ස- කොධස්ස - උපනාහස්ස- මක්ඛස්ස -පෙ- සබ්බාකුසලාභිසංඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති ‘සන්තො’.

විධූමොති: කායදුච්චරිතං විධූමිතං[1] විධමිතං සොසිතං විසොසිතං බ්‍යන්තීකතං වචීදුච්චරිතං- මනොදුච්චරිතං විධූමිතං විධමිතං සොසිතං විසොසිතං බ්‍යන්තීකතං, රාගො-දොසො-මොහො විධූමිතො විධමිතො සොසිතො විසොසිතො බ්‍යන්තීකතො, කොධො- උපනාහො- මක්ඛො- පළාසො- ඉස්සා- මච්ඡරියං- මායා- සාඨෙය්‍යං- ථම්භො- සාරම්භො- මානො- අතිමානො- මදො- පමාදො- සබ්බෙ කිලෙසා- සබ්බෙ දුච්චරිතා- සබ්බෙ දරථා- සබ්බෙ පරිළාහා- සබ්බෙ සන්තාපා- සබ්බාකුසලාභිසඞ්ඛාරා විධූමිතා විධමිතා සොසිතා විසොසිතා බ්‍යන්තීකතා. අථවා[2] ‘කොධො’ වුච්චති ධූමො:

1 “මානො හි තෙ බ්‍රාහ්මණ ඛාරිභාරො
කොධො ධූමො භස්මනි[3] මොසවජ්ජං,
ජිව්හා සුජා හදයං[4] ජොතිට්ඨානං
අත්තා සුදන්තො පුරිසස්ස ජොති.”[a]

අපිච දසහාකාරෙහි කොධො ජායති: ‘අනත්ථං මෙ අචරී’ති කොධො ජායති, ‘අනත්ථං මෙ චරතී’ති කොධො ජායති, ‘අනත්ථං මෙ චරිස්සතී’ති කොධො ජායති, ‘පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි, අනත්ථං චරති, අනත්ථං චරිස්සතී’ති කොධො ජායති, අප්පියස්ස මෙ අමනාපස්ස, අත්ථං අචරි, අත්ථං චරති, අත්ථං චරිස්සතී’ති කොධො ජායති, අට්ඨානෙ වා පන කොධො ජායති. යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති[5]. මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො[6] අනත්තමනතා චිත්තස්ස. අයං වුච්චති කොධො”

1. විධූසිතං -ච, ක
2. අපිච - පත
3. භස්මනි-ච, ක, ස්‍යා
4. තපපරස්ස - ස්‍යා

a. සංයුත්ත සුන්දරික භාරද්වාජසුත්ත
5. බ්‍යාපත්ති - ම ඡ සං
6. අස්සුරොපො - ස්‍යා

**සන්තො විධූමො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරඤ්ච බ්‍රෑමි** යනු: **සන්තො** යනු: රාගය සන්හුන් බැවින් ශාන්ත යැ, ද්වෙෂය–මොහය–ක්‍රොධය බද්ධවෛරය– මකු බව ...සියලු අකුශල සංස්කාරයන් සන්හුන් බැවින් සන්හිඳුවනලද බැවින් ව්‍යුපශමනය කරනලද බැවින් නිවුණු බැවින් නිවෘත බැවින් විගත බැවින් ප්‍රතිප්‍රශ්‍රබ්ද බැවින් ශාන්ත වූයේ උපශාන්ත වූයේ ව්‍යුපශාන්ත වූයේ නිවියේ ප්‍රතිප්‍රශ්‍රබ්ද වූයේ නුයි 'සන්තො' යනු වේ.

**විධූමො** යනු: කායදුශ්චරිතය දුම් විරහිත කරනලද විධමනය කරනලද වියළනලද වෙසෙසින් වියළන ලද විගතාන්ත කරනලද වෙයි, වාග්දුශ්-චරිතය– මනොදුශ්චරිතය දුම් විරහිත කරන ලද විධමනය කරන ලද වියළන ලද වෙසෙසින් වියළන ලද විගතාන්ත කරන ලද වෙයි, රාගය–ද්වේෂය -මොහය විධූමිත ශොෂිත විශොෂිත ව්‍යන්තීකෘත වෙයි, ක්‍රොධය, බද්ධවෛරය, මකුබව, යුගග්‍රාහය ඊර්ෂ්‍යාව, මාත්සය්‍ය්‍යීය, මායාව, සය් බව ස්තම්භය (තද බව) කරණොත්තරීයකරණය, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, හැම කෙලෙස්, හැම දුසිරිත්, හැම දරථ, හැම පරිදහ, හැම සතැවුලි, හැම අකුශලාභිසංස්කාර ධූම විරහිත කරන ලද, විධමනය කරන ලද, වියළන ලද වෙසෙසින් වියළන ලද විගතාන්ත කරන ලද වෙති. නොහොත් ක්‍රොධය 'ධූම' යයි කියනු ලැබෙයි:

1. "බමුණ මානය මැ තාගේ පිරිකරබර වෙයි, ක්‍රොධය ධූමය වෙයි, මෘෂාවාදය හළු යැ, දිව හොම සැන්ද යැ හෘදය ගිනිදල්වන තැන යැ පුරුෂයාගේ මොනොවට දැමුණු සිත ගින්න වේ."

තවද දස අයුරෙකින් ක්‍රොධ උපද්දි. 'මට අනර්ථ කෙළේ යැ' යි ක්‍රොධය උපදී, 'මට අනර්ථ කෙරේ' යයි ක්‍රොධය උපදී, 'මට අනර්ථ කරන්නේ යැ' යි ක්‍රොධය උපදි, 'මා ප්‍රියමනාපයහට අනර්ථ කෙළේ යැ, අනර්ථ කෙරෙයි, අනර්ථ කරන්නේ යැ' යි ක්‍රොධය උපදී, මා 'අප්‍රිය අමනාපයහට අර්ථ කෙළේ යැ, අර්ථ කෙරෙයි, අර්ථ කරන්නේ යැ' යි ක්‍රොධය උපදී, අස්ථානයෙහි හෝ ක්‍රොධය උපද්දි. මෙ බඳු යම් චිත්තයාගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් බලවත් කොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වේෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වේෂයෙක් චිත්තයාගේ ප්‍රකෘතිය හැරපීමෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් කිපෙන අයුරෙක් කිපුණු බවෙක් ද්වේෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් ප්‍රකෘතිය හැරපීමෙක් ප්‍රකෘතිය හැරපියන අයුරෙක් ප්‍රකෘතිය හළ බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩ බවෙක් අපරිපූර්ණ වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද මේ 'ක්‍රොධ' යයි කියනු ලැබේ.

අපිච කොධස්ස අධිමත්තපරිත්තතා වෙදිතබ්බා: අත්ථි කඤ්චිකාලං කොධො චිත්තාවිලකරණමත්තො හොති, න ච තාව මුඛකුලනවිකුලනො[1] හොති, අත්ථි කඤ්චිකාලං කොධො මුඛකුලනවිකුලනමත්තො හොති න ච තාව හනුසඤ්චොපනො හොති, අත්ථි කඤ්චිකාලං කොධො හනුසඤ්චොපනමත්තො හොති න ච තාව ඵරුසවාචං නිච්ඡාරනො හොති, අත්ථි කඤ්චිකාලං කොධො ඵරුසවාචං නිච්ඡාරණමත්තො හොති, න ච තාව දිසාවිදිසානුවිලොකනො හොති, අත්ථි කඤ්චිකාලං කොධො දිසාවිදිසානුවිලොකනමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථපරාමසනො හොති, අත්ථි කඤ්චිකාලං කොධො දණ්ඩසත්ථපරාමසනමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථ අබ්භුක්කිරණො හොති, අත්ථි කඤ්චිකාලං කොධො දණ්ඩසත්ථඅබ්භුක්කිරණමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථඅභිනිපාතනො හොති, අත්ථිකඤ්චිකාලං කොධො දණ්ඩසත්ථඅභිනිපාතනමත්තො හොති, න ච තාව ඡින්නවිච්ඡින්නකරණො හොති, අත්ථි කඤ්චිකාලං කොධො ඡින්නවිච්ඡින්නකරණමත්තො හොති, න ච තාව සම්භඤ්ජනපළිභඤ්ජනො හොති, අත්ථි කඤ්චිකාලං කොධො සම්භඤ්ජනපළිභඤ්ජනමත්තො හොති. න ච තාව අඞ්ගමඞ්ගඅපකඩ්ඪනො[2] හොති. අත්ථි කඤ්චිකාලං කොධො අඞ්ගමඞ්ගඅපකඩ්ඪනමත්තො හොති, න ච තාව ජීවිතා වොරොපනො හොති, අත්ථි කඤ්චිකාලං කොධො ජීවිතා වොරොපනමත්තො හොති, න ච තාව සබ්බචාගපරිච්චාගාය සණ්ඨිතො හොති යතො ඛො කොධො පරං පුග්ගලං[3] ඝාතෙත්වා අත්තානං ඝාතෙති, එත්තාවතා කොධො පරමුස්සදගතො[4] පරමවෙපුල්ලප්පත්තො හොති. යස්ස සො හොති කොධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො සො වුච්චති 'විධූමො'

කොධස්ස පහීනත්තා විධූමො, කොධවත්ථුස්ස පරිඤ්ඤාතත්තා විධූමො, කොධහෙතුස්ස පරිඤ්ඤාතත්තා විධූමො, කොධහෙතුස්ස උපච්ඡින්නත්තා විධූමො. අනීඝොති රාගො නීඝො, දොසො නීඝො, මොහො නීඝො, කොධො නීඝො, උපනාහො නීඝො –පෙ– සබ්බාකුසලාභිසංඛාරා නීඝා, යස්සෙතෙ නීඝා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති 'අනීඝො' නිරාසොති 'ආසා' වුච්චති තණ්හා, 'යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං.'' [a] යස්සෙසා ආසා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා

1. පරිකුලනං – පත
2. ආකඩ්ඪනො – පත–
3. පරපුග්ගලං –ච–වි–ක–
4. පරමුස්සඞ්ගගතො–පත
a. ධම්මසඞ්ගණි – නික්ඛෙපකණ්ඩ

තවද ක්‍රෝධයාගේ අඩුවැඩි බව දතයුතු යැ. කිසිවිටෙක ක්‍රෝධය තෙමේ සිත කළඹනමතුයෙක් වෙයි, තව මුහුණ කුළනු හකුළනු වූයේ නොද වෙයි; කිසිවිටෙක කොපය මුහුණ කුළන හකුළන පමණ වූයේ වෙයි. තව හනු සොලවනු වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය හනු සොලවනු වූයේ වෙයි, තව පරොබස් කියන පමණ වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය පරොස්බස් කියන පමණ වෙයි, තව වටපිට බලනු වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය වටපිට බලන පමණ වෙයි, තව ම දඬුසැත් නො ද ගන්නේ වෙයි; කිසිවිටෙක කොපය දඬුසැත් ගන්නා පමණ වෙයි, තවම දඬුසැත් නඟනුයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය දඬුසැත් නඟන පමණ වූයේ වෙයි, තව ම දඬුසැත් දමාගසනුයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය දඬුසැත් දමාගසන පමණ වූයේ වෙයි, තව ම (මෙරමා සිරුරු) සිදුරු කරනු වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය සිරුර සිදුරු බිදුරු කරන පමණ වූයේ වෙයි, තව ම සිරුර සුණු විසුණු කරනුයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය සිරුර සුණු විසුණු කරන පමණ වූයේ වෙයි, තව ම අඟපසඟ ඇද කඩනුයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය අඟපසඟ ඇද කඩන පමණ වූයේ වෙයි, තව ම දිවි තොර කරනුයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය දිවි තොර කරන පමණ වූයේ වෙයි. තව ම මෙරමා දිවිනසා සියදිවි නැසීම පිණිස සිටියේ නොද වෙයි; යම් කලෙක ක්‍රොධය සතුරා නසා තමාත් නසා ද, මෙතෙකින් ක්‍රොධය තෙමේ ඉතා බලවත් බවට ගියේ ඉතා මහත් බවට පැමිණියේ වේ. යමක්හට ඒ ක්‍රොධය තෙම ප්‍රහීණ වූයේ මුලුසුන් වූයේ සන්හිඳුණේ ප්‍රතිප්‍රශ්‍රබ්ධ වූයේ අභව්‍යොත්පත්තික වූයේ නුවණ ගින්නෙන් දැවුණේ වේ ද, හෙතෙම 'විධූම' යයි කියනු ලැබේ.

ක්‍රොධය ප්‍රහීණ කළ බැවින් 'විධූම' යැ ක්‍රොධවස්තුව පරිඥාත බැවින් 'විධූම' යැ, ක්‍රොධ හෙතුව පරිඥාත බැවින් 'විධූම' යැ, ක්‍රෝධහේතුව සිඳුනා ලද බැවින් 'විධූම' යි.

**අනීඝො** යනු: රාගය උවදුරෙක, ද්වේෂය උවදුරෙක, මොහය උවදුරෙක, ක්‍රොධය උවදුරෙක, බද්ධවෛරය උවදුරෙක, ...හැම අකුශලාභිසංස්කාරයෝ උවදුරුහ. යමක්හු විසින් තෙල උවදුරු ප්‍රහාණ කරන ලද ද, මුලුසුන් කරන ලද ද, සන්හිඳුවන ලද ද, ප්‍රතිප්‍රශ්‍රම්භනය කරන ලද යළි උපදනාට නො නිසි කරන ලද ද, නුවණ ගින්නෙන් දවන ලද ද, හෙතෙම 'අනීඝ' යයි කියනු ලැබේ. **නිරාසො** යනු: තෘෂ්ණාව 'ආශා' යි කියනු ලැබෙයි. යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යා-යෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද, එයයි. යමක්හු විසින් තෙල ආශාව තෘෂ්ණාව ප්‍රහාණය කරන ලද ද, මුලුසුන් කරන ලද ද, සන්හිඳුවන ලද ද, ප්‍රතිප්‍රශ්‍රබ්ධ උපදනාට නො නිසි කරන ලද ද, නුවණ ගින්නෙන් දවන ලද ද,

සො වුච්චති 'නිරාසො' ජාතීති "යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සංජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො"b, ජරාති "යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො"c. **සන්තො විධූමො අනීඝො නිරාසො. අතාරි සො ජාති ජරන්ති බ්‍රූමීති** යො සන්තො ච විධූමො ච අනීඝො ච නිරාසො ච, සො ජාති ජරා මරණං අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයීති බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'සන්තො විධූමො අනීඝො නිරාසො අතාරි සො ජාති ජරන්ති බ්‍රූමි.'

තෙනාහ භගවා:

"සංඛාය ලොකස්මිං පරොවරානි (පුණ්ණකාති භගවා)
යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ,
සන්තො විධූමො අනීඝො නිරාසො
අතාරි සො ජාතිජරන්ති බ්‍රූමී"ති

සහගාථා පරියොසානා -පෙ- පඤ්ජලිකො භගවන්තං නමස්සමානො නිසින්නො හොති. 'සත්ථා මෙ භන්තෙ භගවා සාවකො හමස්මී'ති.

පුණ්ණක සුත්තනිද්දෙසො සමත්තො

---

b. සච්ච විභඞ්ග
c. සච්ච විභඞ්ග

හෙතෙම, 'නිරාස' යැයි කියනු ලැබේ. **ජාති** යනු: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් (අපරිපූර්ණායතන විසින්) ඉපැදීමෙක් (පරිපූර්ණායතන විසින්) මොනොවට ඉපැදීමෙක් (අණ්ඩජ ජරායුජ විසින්) අවක්‍රාන්තියෙක් (සංසෙදජ ඔපපාතික විසින්) පහළ වීමෙක් ස්කන්ධයන්ගේ ප්‍රාදුර්භවයෙක් ආයතනයන්ගේ ප්‍රතිලාභයෙක් ද (සන්තතියෙහි පහළ වීමෙක් වේ ද එය යි. **ජරා** යනු: ඒ ඒ සත්ත්වයන් ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් දිරීමෙක් දිරන අයුරෙක් (දත් නිය ආදීන්ගේ) කැඩුණු බවෙක් (කෙස් ලොම් ආදිය) පැසුණු බවෙක් රැලි ගැසුණු සම් ඇති බවෙක් ආයුෂයාගේ පිරිහීමෙක් ඉඳුරන් මුහුකුරා යෑමෙක් වේ ද, එයයි **සන්තො විධූමො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රෑමි** යනු: යමෙක් ශාන්ත ද විධූම ද අනීඝ ද නිරාස ද වේ නම් හෙතෙම ජාති ජරාමරණය (ප්‍රථමමාර්ගයෙන්) තරණය කෙළේ යැ (ද්විතීය මාර්ගයෙන්) උත්තරණය කෙළේ යැ, (තෘතීය මාර්ගයෙන්) ප්‍රතරණය කෙළේ යැ, (චතුර්ත්ථමාර්ගයෙන්) මොනොවට ඉක්ම ගියේ යැ. ඉක්ම (ඵලයෙහි) සිටියේ යැ'යි කියමි, පවසමි, දෙසමි, පනවමි, පිහිටුවමි, විවෘත කෙරෙමි, විභාග කෙරෙමි නො ගැඹුරු කෙරෙමි, ප්‍රකාශ කෙරෙමි හුයි ''සන්තො විධූමො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රෑමි'' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

''සඞ්ඛාය ලොකස්මිං පරොවරානි-පෙ-අතාරි සො ජාතිජරන්ති බ්‍රෑමි'' යි.

ගාථා පර්‍ය්‍යවසානය හා සමග...''වහන්ස, භාග්‍යවත්හු මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවකයෙමි'' බඳැඳිලි වැ භාග්‍යවතුන් නමඳිමින් හුන්නේ වේ යයි.

**පූර්ණක සූත්‍රනිර්දෙශය නිමි.**

## 4. මෙතතගූ සුතතනිදෙදසො

### 4–1

පුචඡාමි තං භගවා බ්‍රෑහිමෙතං (ඉචචායසමා මෙතතගූ)
මඤඤාමි තං වෙදගුං භාවිතතතං
කුතො නු දුකඛා සමුදගතා[1] ඉමෙ
යෙ කෙචි ලොකසමිං අනෙකරූපා.

**පුචඡාමි තං භගවා බ්‍රෑහි මෙතනති:** 'පුචඡාමී'ති තිසෙසා පුචඡා: අදිටඨජොතනා පුචඡා, දිටඨසංසනදනා පුචඡා, විමතිචෙඡදනා පුචඡා.

කතමා අදිටඨජොතනා පුචඡා: පකතියා ලකඛණං අඤඤාතං හොති අදිටඨං අතුලිතං අතීරිතං අවිභූතං අවිභාවිතං, තසස ඤාණාය දසසනාය තුලනාය තීරණාය[2] විභූතතථාය විභාවනතථාය පඤහං පුචඡති. අයං අදිටඨ ජොතනා පුචඡා.

කතමා දිටඨසංසනදනා පුචඡා: පකතියා[3] ලකඛණං ඤාතං හොති දිටඨං තුලිතං තීරිතං විභූතං විභාවිතං අඤෙඤහි පණඩිතෙහි සදධිං සංසනදනතථාය පඤහං පුචඡති. අයං දිටඨසංසනදනා පුචඡා.

කතමා විමතිචෙඡදනා පුචඡා: පකතියා සංසය පකඛනෙතා[4] හොති, විමති පකඛනෙතා[5] වෙළහකජාතො එවං නු ඛො න නු ඛො කිං නු ඛො කථං නු ඛොති. සො විමතිචෙඡදනතථාය පඤහං පුචඡති. අයං විමතිචෙඡදනා පුචඡා. ඉමා තිසෙසා පුචඡා.

අපරාපි තිසෙසා පුචඡා: මනුසසපුචඡා. අමනුසසපුචඡා, නිමමිතපුචඡා.

කතමා මනුසසපුචඡා: මනුසසා බුදධං භගවනතං උපසඞකමිතවා පඤහං පුචඡනති, භිකඛූ පුචඡනති, භිකඛුණියො පුචඡනති, උපාසකා පුචඡනති, උපාසිකායො පුචඡනති, රාජානො පුචඡනති, ඛතතියා පුචඡනති, බ්‍රාහමණා පුචඡනති, වෙසසා පුචඡනති, සුදදා පුචඡනති, ගහටඨා පුචඡනති, පබබජිතා පුචඡනති. අයං මනුසසපුචඡා.

කතමා අමනුසසපුචඡා: අමනුසසා බුදධං භගවනතං උපසඞකමිතවා පඤහං පුචඡනති, නාගා පුචඡනති, සුපණණා පුචඡනති, යකඛා පුචඡනති, අසුරා පුචඡනති, ගනධබබා පුචඡනති මහාරාජානො පුචඡනති, ඉනදා පුචඡනති, බ්‍රහමානො පුචඡනති, දෙවා පුචඡනති, අයං අමනුසසපුචඡා.

---

1. ගතාමෙ – පත
2. තීරණය විභාවනාය පුචඡති, පත
3. පකතියා—ච, ච, වි, ක, පකඛනෙද – ම ජ සං
4. පකඛනෙතා —ච, වි, ක, පත
5. විමතිපකඛනෙතා —ච, වි, ක, පත

# 4. මෙත්තගූ සූත්‍රනිර්දේශය

4–1. (ආයුෂ්මත් මෙත්තගූ මෙසේ විචාරයි) භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ විචාරමි මෙය වදළ මැන, මුඹ වහන්සේ ඥාන–වෙදයාගේ පරතෙරට පැමිණි කෙනකුන් කොට වැඩූ සිත් ඇති කෙනකුන් කොට හඟිමි. ලොවැ අනේක ස්වභාව වූ යම්කිසි දුක් කෙනෙක් වෙත් ද, මේ දුඃඛයෝ කොයින් උපන්නාහු ද?

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහිමෙතං** යනු: 'පුච්ඡා' යනු: පෘච්ඡා තුනෙකි; අදිට්ඨජොතනා පුච්ඡා යැ දිට්ඨසංසන්‍දනා පුච්ඡා යැ විමතිච්ඡෙදනා පුච්ඡා යි.

අදිට්ඨජොතනා පුච්ඡා කවරැ යත්: පියවින් ධර්මයන්ගේ තථ ලක්ෂණය නොදන්නා ලද නො දක්නා ලද තුලනාය නො කරන ලද තීරණය නො කරන ලද ප්‍රකට නො වූ සිතින් නො වඩන ලද වෙයි, ඒ ධර්මයාගේ ලක්ෂණ ඥානය පිණිස දර්ශනය පිණිස තුලනය පිණිස තීරණය පිණිස පාළ වීම පිණිස විභාවනය පිණිස ප්‍රශ්න විචාරයි. මේ අදිට්ඨජොතනා පුච්ඡා යැ.

දිට්ඨසංසන්‍දනා පුච්ඡා කවරැ යත්: පියවින් ධර්මයන්ගේ තථලක්ෂණය දන්නා ලද දක්නා ලද තුලනය කරන ලද තීරණය කරන ලද ප්‍රකට වූ විභාවන කරන ලද වෙයි. (ඒ ධර්මයන්ගේ ලක්ෂණය) අන්‍ය පණ්ඩිතයන් හා සමග සසඳනු සඳහා පැන පුළුවුසී. මේ දිට්ඨසංසන්දනා පුච්ඡා යැ.

විමතිච්ඡෙදනා පුච්ඡා කවරැ යත්: පියවින් සැකයට පැමිණියේ විමතියට පැමිණියේ මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ දෝ හො යි දෙසිත් බවට පැමිණියේ වෙයි, හෙතෙම විමති සිඳුනා සඳහා පැන පුළුවුසී. මේ විමතිච්ඡෙදනා පුච්ඡා යැ. මේ තුන් පෘච්ඡා යි.

අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: මනුෂ්‍යපෘච්ඡා යැ අමනුෂ්‍ය පෘච්ඡා යැ නිර්මිතපෘච්ඡා යි.

මනුෂ්‍යපෘච්ඡා කවරැ යත්: මනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති, භික්ෂූහු පුළුවුස්ති, භික්ෂුණීහු පුළුවුස්ති, උපාසකයෝ පුළුවුස්ති, උවැසියෝ පුළුවුස්ති, රජදරුවෝ පුළුවුස්ති ක්ෂත්‍රියයෝ පුළුවුස්ති බ්‍රාහ්මණයෝ පුළුවුස්ති, වෛශ්‍යයෝ පුළුවුස්ති, ශුද්‍රයෝ පුළුවුස්ති, ගැහැවියෝ පුළුවුස්ති, පැවිද්දෝ පුළුවුසිත්. මේ මනුෂ්‍යපෘච්ඡා යැ.

අමනුෂ්‍ය පෘච්ඡා කවරැ යත්: අමනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති. නාගයෝ පුළුවුස්ති, සුපර්ණයෝ (ගුරුළෝ) පුළුවුස්ති, යක්ෂයෝ පුළුවුස්ති, අසුරයෝ පුළුවුස්ති, වරම්රජදරුවෝ පුළුවුස්ති, ඉන්ද්‍රයෝ පුළුවුස්ති, බ්‍රහ්මයෝ පුළුවුස්ති, දෙවියෝ පුළුවුසිත්. මේ අමනුෂ්‍ය පෘච්ඡා යැ.

කතමා නිම්මිත පුච්ඡා: යං භගවා රූපං අභිනිම්මිනාති මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියං, සො නිම්මිතො බුද්ධං භගවන්තං උපසංකමිත්වා පඤ්හං පුච්ඡති, භගවා විස්සජ්ජෙති. අයං නිම්මිතපුච්ඡා. ඉමා තිස්සො පුච්ඡා.

අපරාපි තිස්සො පුච්ඡා: අත්තත්ථපුච්ඡා, පරත්ථපුච්ඡා, උභයත්ථපුච්ඡා, අපරාපි තිස්සො පුච්ඡා: දිට්ඨධම්මිකත්ථපුච්ඡා, සම්පරායිකත්ථපුච්ඡා. පරමත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අනවජ්ජත්ථපුච්ඡා, නික්කිලෙසත්ථපුච්ඡා, වොදානත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අතීතාපුච්ඡා, අනාගතාපුච්ඡා, පච්චුප්පන්නා පුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අජ්ඣත්ත පුච්ඡා, බහිද්ධා පුච්ඡා, අජ්ඣත්තබහිද්ධා පුච්ඡා, අපරාපි තිස්සො පුච්ඡා: කුසල පුච්ඡා, අකුසල පුච්ඡා, අබ්‍යාකත පුච්ඡා, අපරාපි තිස්සො පුච්ඡා: ඛන්ධපුච්ඡා, ධාතුපුච්ඡා, ආයතනපුච්ඡා, අපරාපි තිස්සො පුච්ඡා: සතිපට්ඨාන පුච්ඡා, සම්මප්පධානපුච්ඡා, ඉද්ධිපාදපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: ඉන්ද්‍රිය පුච්ඡා, බලපුච්ඡා, බොජ්ඣඞ්ගපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: මග්ගපුච්ඡා, ඵලපුච්ඡා, නිබ්බානපුච්ඡා.

පුච්ඡාමි තන්ති: පුච්ඡාමි තං, යාචාමි තං, අජ්ඣෙසාමි තං, පසාදෙමි තං, 'කථයස්සු මෙ' ති 'පුච්ඡාමි තං'. භගවාති ගාරවාධිවචනමෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති 'පුච්ඡාමි තං භගවා'. බ්‍රෑහි මෙතන්ති බ්‍රෑහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානිං කරොහි පකාසෙහීති 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං'. ඉච්චායස්මා මෙත්තගූති, –'ඉච්චා'ති පදසන්ධි –පෙ– ඉච්චායස්මා මෙත්තගූ:

මඤ්ඤාමි තං වෙදගුං[1] භාවිතත්තන්ති: 'වෙදගූ'ති තං මඤ්ඤාමි 'භාවිතත්තො'ති තං මඤ්ඤාමි, එවං ජානාමි, එවං ආජානාමි,[2] එවං විජානාමි,[3] එවං පටිවිජානාමි, එවං පටිවිජ්ඣාමි 'වෙදගූ භාවිතත්තො'ති. කථං භගවා වෙදගූ; වෙදෙ වුච්චන්ති චතූසු මග්ගෙසු ඤාණං, පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං –පෙ– ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි, භගවා තෙහි වෙදෙහි ජාතිජරාමරණස්ස අන්තගතො,[5]

---

1. 'යං' ති නත්ථි- ව,වි,ම ඡ සං
2. වෙදගූ – ම ඡ සං
3. අජානාමි
4. පජානාමි – සත්ථවි
5. අන්තංගතො –ස, වි

නිර්මිතපෘච්ඡා කවරැ යත්: බුදුහු මනෝමය වූ සියලු අඟපසඟ ඇති අවිකල වූ ඉඳුරන් ඇති යම් රුවක් මවත් ද ඒ මැවුණු බුදුහු භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති, බුදුහු විසඳත්. මේ නිර්මිත පෘච්ඡා යැ මේ තුන් පෘච්ඡා යි.

අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: ආත්මාර්ථ පෘච්ඡා යැ පරාර්ථ පෘච්ඡා යැ උභයාර්ත්ථ පෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: දෘෂ්ටධාර්මිකාර්ථ පෘච්ඡා යැ සාම්පරායිකාර්ථ පෘච්ඡා යැ පරමාර්ථපෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: අනවද්‍යාර්ථපෘච්ඡා යැ නික්ලෙශාර්ථ පෘච්ඡා යැ ව්‍යවදනාර්ථපෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: අතීත පෘච්ඡා යැ අනාගත පෘච්ඡා යැ ප්‍රත්‍යුත්පන්න පෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: අධ්‍යාත්මපෘච්ඡා යැ වාහ්‍යපෘච්ඡා යැ අධ්‍යාත්මබාහ්‍ය පෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: කුශල පෘච්ඡා යැ අකුශල පෘච්ඡා යැ අව්‍යාකෘත පෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙක්: ස්කන්ධපෘච්ඡා යැ ධාතුපෘච්ඡා යැ ආයතන පෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: සතිපට්ඨාන පෘච්ඡා යැ සම්‍යක් ප්‍රධානපෘච්ඡා යැ ඍද්ධිපාද පෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: ඉන්ද්‍රිය පෘච්ඡා යැ බලපෘච්ඡා යැ: බොධ්‍යඞ්ගපෘච්ඡා යි. අන්‍ය වූ ද තුන් පෘච්ඡායෙකි: මාර්ග පෘච්ඡා යැ ඵල පෘච්ඡා යැ නිර්වාණ පෘච්ඡා යි.

**පුච්ඡාමි තං**: මුඹ වහන්සේ පුළුවුස්මි මුඹ වහන්සේ අයදිමි මුඹ වහන්සේ අද්ධ්‍යෙෂණ කෙරෙමි මුඹ වහන්සේ පහදවමි 'මට වදළ මැනැවැ'යි 'පුච්ඡාමි තං' යනු වේ.

**භගවා** යනු: තෙල ගෞරවනාමයෙකි ... යම් භගවත් යන නාමෙක් වී නම් තෙල අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් නූ'යි 'පුච්ඡාමි තං භගවා' යනු වේ. **බ්‍රෑහි මෙතං**: වදළ මැනැව ප්‍රකාශ කළ මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවරණ කළ මැනැව විභාග කළ මැනැව ප්‍රකට කළ මැනැව ප්‍රකාශ කළ මැනැවැ'යි ''පුච්ඡාමි තං භගවා බ්‍රෑහිමෙතං' යනු වේ. **ඉච්චායස්මා මෙත්තගූ**–යනු: ඉච්ච යනු පදසන්ධි යැ...'ඉච්චායස්මා මෙත්තගූ' යනු වේ.

**මඤ්ඤාමි තං වෙදගුං භාවිතත්තං**:මුඹ වහන්සේ 'වේදයාගේ අන්තයට පැමිණියාහ'යි හඟිමි, මුඹ වහන්සේ භාවිතාත්මහ'යි හඟිමි, මෙසේ දනිමි, මෙසේ හාත්පසින් දනිමි, මෙසේ වෙසෙසින් දනිමි, මෙසේ ඒ ඒ කරුණු නිසා වෙසෙසින් දනිමි, මෙසේ ප්‍රතිවෙධ කෙරෙමි. 'වෙදගු භාවිතත්තො'යී කිසෙයින් බුදුහු වෙදගූ වූහ යත්: 'වෙද' යී සතර මාර්ග ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ... ධර්මවිචයසම්බො-ධ්‍යඞ්ගයෙක් වීමංසායෙක් විදර්ශනායෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එයයි. බුදුහු ඒ ප්‍රඥාසඞ්ඛ්‍යාත වෙදයන්ගෙන් ජාතිජරාමරණයාගේ අන්තයටගියහ,

අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙනගතො ලෙනප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො අච්චුතප්පත්තො අමතගතො අමතප්පත්තො නිබ්බානගතො නිබ්බානප්පත්තො. වෙදනං වා අන්තගතොති වෙදගූ, වෙදෙහි වා අන්තගතොති වෙදගූ, සත්තන්නං වා ධම්මානං විදිතත්තා වෙදගූ: සක්කායදිට්ඨි විදිතා හොති, විචිකිච්ඡා විදිතා හොති, සීලබ්බතපරාමාසො විදිතො හොති, රාගො – දොසො – මොහො – මානො විදිතො හොති, විදිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා[1] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා:

1. "වෙදානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
සමණානං යානිප'ත්ථි[2] බ්‍රාහ්මණානං
සබ්බ[3] වෙදනාසු වීතරාගො
සබ්බං වෙදමතිච්ච වෙදගූ සො"ති. [a]

එවං භගවා වෙදගූ.

කථං භගවා භාවිතත්තො: භගවා භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤො භාවිතසතිපට්ඨානො භාවිතසම්මප්පධානො භාවිතඉද්ධිපාදො භාවිතඉන්ද්‍රියො භාවිතබලො භාවිතබොජ්ඣඞ්ගො භාවිතමග්ගො පහීනකිලෙසො පටිවිද්ධාකුප්පො සච්ඡිකතනිරොධො, දුක්ඛං තස්ස පරිඤ්ඤාතං, සමුදයො පහීනො, මග්ගො භාවිතො, නිරොධො සච්ඡිකතො, අභිඤ්ඤෙය්‍යං, අභිඤ්ඤාතං, පරිඤ්ඤෙය්‍යං, පරිඤ්ඤාතං, පහාතබ්බං, පහීනං, භාවෙතබ්බං භාවිතං, සච්ඡිකාතබ්බං සච්ඡිකතං, අපරිත්තො මහන්තො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාළ්හො[4] පහූත රතනො[5] සාගරූපමො[6] ජළඞ්ගුපෙක්ඛාය සමන්නාගතො හොති.

චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති, න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො සොතෙන සද්දං සුත්වා –පෙ– ඝානෙන ගන්ධං ඝායිත්වා –පෙ– ජිව්හාය රසං සායිත්වා –පෙ– කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා –පෙ– මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති, න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො.

1. සද්දරා–සු
2. යානිධත්ථි –ම ජ සං
යානි අත්ථි–සී
3. සබ්බවෙදනාසු–ම,ව,වි,ක

a. සුත්තනිපාතෙ සභියසුත්ත
4. දුපරියොගාළ්හො – පත
5. බහුරතනො –සී.
6. සාගරසමො–කත්වි

අන්තයට පැමිණියහ, කෙළවරට ගියහ, කෙළවරට පැමිණියහ, පර්‍යන්තයට ගියහ, පර්‍යන්තයට පැමිණියහ. අවසානයට ගියහ, අවසානයට පැමිණියහ, ත්‍රාණයට ගියහ, ත්‍රාණයට පැමිණියහ, ලෙනයට ගියහ, ලෙනයට පැමිණියහ, සරණයට ගියහ, සරණයට පැමිණියහ, අභයට ගියහ, අභයට පැමිණියහ, අච්‍යුතයට ගියහ, අච්‍යුතයට පැමිණියහ, අමෘතයට ගියහ, අමෘතයට පැමිණියහ, නිවනට ගියහ, නිවනට පැමිණියහ, වේද (ඥාන) යන් ගේ අන්තයට ගියාහු නු'යි හෝ වෙදගූ නම්හ. වේදයන්ගෙන් අන්තයට ගියාහු නු'යි හෝ වෙදගූ නම්හ, සප්තධර්මයන් විදිත හෙයින් හෝ වේදගූ නම්හ; සත්කායදෘෂ්ටිය දන්නා ලද වෙයි. විචිකිත්සාව දන්නාලද වෙයි, ශීලව්‍රතපරාමර්ශය දන්නා ලද වෙයි. රාගය–ද්වේෂය–මොහය–මානය දන්නාලද වෙයි, ඔබ විසින් ක්ලෙශප්‍රත්‍යය වූ පුනර්භවය දෙන්නා වූ ක්ලෙශදරථ සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරාමරණයට කාරණ වූ ලාමක අකුශල ධර්මයෝ දන්නා ලද්දාහු වෙත්.

1 (බුදුහු 'සභිය'යි අමතා මෙසේ වදළහ) යමෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ ශාස්ත්‍ර යයි කියන ලද යම් වේද කෙනෙක් වෙත් ද, ඒ සියලු වේදයන් මාර්ගභාවනායෙන් කෘත්‍ය හෙයින් අනිත්‍යාදි වශයෙන් විමසා එහි ඡන්දරාග ප්‍රහාණයෙන් ඒ සියලු වේදයන් ඉක්මවා යළි වේද ප්‍රත්‍යයෙන් හෝ අන් පරිද්දෙකින් උපදනා සියලු වේදනාවන්හි වීතරාග වූයේ ද හෙතෙම පරමාර්ථ වශයෙන් වේදගූ නම් වූහ.

මෙසෙයින් බුදුහු වෙදගූ නම් වූහ.

කිසෙයින් බුදුහු භාවිතාත්ම වූහ යත්: බුදුහු වැඩූ කය ඇතියහ. වැඩූ සිල් ඇතියහ. වැඩූ සිත් ඇතියහ වැඩූ ප්‍රඥා ඇතියහ, වැඩූ සතිපට්ඨාන ඇතියහ, වැඩූ ඍද්ධිපාද ඇතියහ, වැඩූ ඉන්ද්‍රිය ඇතියහ, වැඩූ බල ඇතියහ, වැඩූ බොධ්‍යඞ්ග ඇතියහ, වැඩූ මාර්ග ඇතියහ, පුහුණ් කෙලෙස් ඇතියහ, පිළිවිදි රහත්ඵල ඇතියහ, පසක් කළ නිවන ඇතියහ, ඔබ විසින් දුඃඛසත්‍යය පිරිසිඳ දන්නාලද, සමුදය ප්‍රහීණ යැ, මාර්ගය වඩනා ලද නිරොධය පසක් කරනලද, (ස්වභාව ලක්ෂණාවබොධයෙන්) දතයුත්ත දන්නාලද, (සාමාන්‍යලක්ෂණාවබොධයෙන්) දතයුත්ත පිරිසිඳ දන්නාලද, ප්‍රහීණ කළයුත්ත ප්‍රහීණ කරනලද, වැඩියයුත්ත වඩනලද, පසක් කළ යුත්ත පසක් කරනලද. (බුදුහු) අනල්පයහ මහත්හ ගම්භීරයහ පමණ නො කළහැකියහ බැසගැනීමට දුෂ්කර වූ බොහෝ වූ (ධර්ම) රත්න ඇති සාගරය වැන්නහ ෂඩඞ්ගොපෙක්ෂායෙන් සමන්වාගත වෙති.

ඇසින් රූ දැක (ලොභ විසින්) නො මැ සොමනස් වෙති (ද්වෙෂ විසින්) දොම්නස් නො වෙති ස්මෘතිමත් වූවාහු සම්‍යග්ඥාන ඇත්තාහු උපෙක්ෂක වැ වෙසෙති, කනින් ශබ්ද අසා ...නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කොට– දිවින් රස විඳ– කයින් පහස් පැහැසැ–සිතින් දහම් දැනැ නො මැ සොමනස් වෙති, දොම්නස් නො වෙති, ස්මෘතිමත් වූවාහු සම්‍යග්ඥාන ඇති වැ වෙසෙත්.

චක්ඛුනා රූපං දිස්වා මනාපං රූපං නාභිගිජ්ඣති[1] නාභිහංසති[2] න රාගං ජනෙති තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසංඨිතං සුවිමුත්තං. චක්ඛුනා ඛො පනෙව[3] රූපං දිස්වා අමනාපං න මඞ්කු හොති, අප්පතිට්ඨිතචිත්තො[4] අලීනමනසො[5] අබ්‍යාපන්නචෙතසො. තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසංඨිතං සුවිමුත්තං. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මනාපං නාභිගිජ්ඣති නාභිහංසති න රාගං ජනෙති, තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසංඨිතං සුවිමුත්තං. මනසා යෙව ඛො පන ධම්මං විඤ්ඤාය අමනාපං න මඞ්කු හොති, අප්පතිට්ඨිතචිත්තො අලීනමනසො[6] අබ්‍යාපන්නචෙතසො, තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසංඨිතං සුවිමුත්තං.

චක්ඛුනා රූපං දිස්වා මනාපාමනාපෙසු රූපෙසු ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසංඨිතං සුවිමුත්තං. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මනාපාමනාපෙසු ධම්මෙසු ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසංඨිතං සුවිමුත්තං.

චක්ඛුනා රූපං දිස්වා රජනීයෙ න රජ්ජති, දොසනීයෙ[7] න දුස්සති, මොහනීයෙ න මුය්හති, කොපනීයෙ න කුප්පති, මදනීයෙ න මජ්ජති, කිලෙසනීයෙ න කිලිස්සති. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය රජනීයෙ න රජ්ජති, දොසනීයෙ[7] න දුස්සති, මොහනීයෙ න මුය්හති, කොපනීයෙ න කුප්පති, මදනීයෙ න මජ්ජති, කිලෙසනීයෙ න කිලිස්සති. දිට්ඨෙ දිට්ඨමත්තො සුතෙ සුතමත්තො මුතෙ මුතමත්තො විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තො, දිට්ඨෙ න ලිප්පති[8], සුතෙ න ලිප්පති, මුතෙ න ලිප්පති, විඤ්ඤාතෙ න ලිප්පති, දිට්ඨෙ අනූපයො[9] අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො[10] විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති. සුතෙ -පෙ- මුතෙ -පෙ- විඤ්ඤාතෙ අනූපයො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති.

---

1. නාභිජ්ඣායති - පත
2. නාභිහසති-ස
3. චක්ඛුනා ඛො පනෙතං—සී—ස්‍යා
4. අප්පතිට්ඨිතචිත්තො—ස්‍යා
5. ආදීන මනසො—ව—වි—පත—ස්‍යා
- සුත්තනිපාත—සභිය සුත්ත
6. ආදීන මනසො—ව—වි—ප—ස්‍යා
7. දුස්සනීයෙ—ම ජ සං
8. න ලිම්පති—ම ජ සං, ස්‍යා
9. අනූපයො – මජසං
   අනූපයො – ව,වි
10. විමුත්තො —පත—

ඇසින් රූ දැකැ මනවඩන රූපයට ගිජු නො වෙති. (නො පතති) නො සතුටු වෙති, රාග නො දනවති, උන් වහන්සේගේ (චක්ෂුරාදි) කය සිටියේ මැ වෙයි, සිත සිටියේ අධ්‍යාත්මයෙහි මොනොවට සිටියේ සුවිමුක්ත වූයේ වෙයි. යළි ඇසින් මැ අනිෂ්ටාලම්බන වූ රූපයක් දැක නො මකු වෙති (කොප විසින්) නො පිහිටි සිත් ඇත්තාහු නො හැකුළුණු සිත් ඇත්තාහු ව්‍යාපාද රහිත සිත් ඇත්තාහු වෙති. උන් වහන්සේ ගේ කය සිටියේ මැ වෙයි, සිත සිටියේ අධ්‍යාත්මයෙහි මොනොවට සිටියේ සුවිමුක්ත වූයේ වෙයි. කනින් ශබ්ද අසා ...නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කොට–දිවින් රස විඳ– කයින් පහස් පැහැසැ–සිතින් දහම් දැනැ මනවඩන ධර්මයට ගිජු නොවෙති, නො සතුටු වෙති, රාග නො දනවති, උන් වහන්සේගේ චක්ෂුරාදි කය සිටියේ මැ වෙයි, සිත සිටියේ අධ්‍යාත්මයෙහි මොනොවට සිටියේ සුවිමුක්ත වූයේ වෙයි. යළි සිතින් මැ අනිෂ්ටාලම්බන ධර්මයක් දැන නො මකු වෙති. (කොප විසින්) නො පිහිටි සිත් ඇත්තාහු නො හැකුළුණු සිත් ඇත්තාහු ව්‍යාපාද රහිත සිත් ඇත්තාහු වෙති, උන් වහන්සේගේ චක්ෂු රාදි කය සිටියේ මැ වෙයි සිත සිටියේ අධ්‍යාත්මයෙහි මොනොවට සිටියේ සුවිමුක්ත වූයේ වෙයි.

ඇසින් රූ දැක මනාපාමනාප රූපයන්හි චක්ෂුරාදි කය සිටියේ මැ වෙයි. සිත නිශ්චල වූයේ අධ්‍යාත්මයෙහි මොනොවට සිටියේ සුවිමුක්ත වූයේ වේ. කනින් ශබ්ද අසා ... සිතින් දහම් දැන මනාපාමනාප ධර්මයන්හි චක්ෂුරාදි කය සිටියේ මැ වෙයි සිත නිශ්චල වූයේ අධ්‍යාත්මයෙහි මොනවට සිටියේ සුවිමුක්ත වූයේ වේ.

ඇසින් රූ දැක ඇලුම් කටයුතු රූපයෙහි නො ඇලෙති. ද්වෙෂ ඉපැදවිය යුත්තෙහි ද්වෙෂ නූපදවති. මුළා වියැ යුත්තෙහි නො මුළා වෙති. කිපියැ යුත්තෙහි නො කිපෙති. මත් වියැ යුත්තෙහි නො මත් වෙති. තැවිය යුත්තෙහි නො තැවෙත්. කනින් ශබ්ද අසා ... සිතින් දහම් දැන ඇලුම් කටයුත්තෙහි නො ඇලෙති. ද්වෙෂ ඉපැද වියැ යුත්තෙහි ද්වෙෂ නූපදවති. මුළා වියැ යුත්තෙහි නො මුළා වෙති. කිපියැ යුත්තෙහි නො කිපෙති. මත් වියැ යුත්තෙහි නො මත් වෙති. තැවියැ යුත්තෙහි නො තැවෙත්. රූපාලම්බනයෙහි (චක්ෂුර්විඥානයෙන්) දුටු පමණ වූවාහු ශබ්දායතනයෙහි ශ්‍රැතමාත්‍ර වූවාහු ගන්ධ–රස–ස්පර්ශායතනයෙහි (ඝ්‍රාණ–ජිහ්වා–කාය විඥානයෙන්) මුත (පැමිණ ගන්නා ලද) මාත්‍ර වූවාහු මනොවිඥානයෙන් දන්නා ලද්දෙහි විඥානමාත්‍ර වූවාහු (චක්ෂුර්විඥානයෙන් දුටු) රූපාලම්බනයෙහි නො ඇලෙති. (තෘෂ්ණා දෘෂ්ටි ලෙපයෙන්) නො ඇලෙති ශබ්දලම්බනයෙහි නො ඇලෙති ගන්ධ–රස– ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි නො ඇලෙති ධර්මාලම්බනයෙහි නො ඇලෙති රූපාලම්බනයෙහි තෘෂ්ණා රහිත වූවාහු අප්‍රදූෂ්‍ය සිත් ඇත්තාහු අනිශ්‍රිත වූවාහු නො බැඳුණාහු වෙසෙයින් මිදුණාහු නො යෙදුණාහු විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වාසය කෙරෙත්. ශබ්දලම්බනයෙහි... ගන්ධ–රස–ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ... ධර්මාලම්බනයෙහි තෘෂ්ණාදි උපය රහිත වූවාහු අප්‍රදූෂ්‍ය සිත් ඇත්තාහු අනිශ්‍රිත වූවාහු නො බැඳුණාහු වෙසෙයින් මිදුණාහු නො යෙදුණාහු විගත මර්‍යාද කළ සිතින් යුක්ත වැ වාස කෙරෙත්.

සංවිජ්ජති භගවතො චක්ඛු[6] පස්සති භගවා චක්ඛුනා රූපං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා. සංවිජ්ජති භගවතො සොතං, සුණාති භගවා සොතෙන සද්දං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා. සංවිජ්ජති භගවතො ඝානං, ඝායති භගවා ඝානෙන ගන්ධං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා. සංවිජ්ජති භගවතො ජිව්හා, සායති භගවා ජිව්හාය රසං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා. සංවිජ්ජති භගවතො කායො, ඵුසති භගවා කායෙන ඵොට්ඨබ්බං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා. සංවිජ්ජති භගවතො මනො, විජානාති භගවා මනසා ධම්මං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා. චක්ඛුං රූපාරාමං රූපරතං රූපසම්මුදිතං, තං භගවතො දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං, තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. සොතං සද්දාරාමං සද්දරතං සද්දසම්මුදිතං, –පෙ– ඝානං ගන්ධාරාමං ගන්ධරතං ගන්ධසම්මුදිතං –පෙ– ජිව්හා රසාරාමා රසරතා රසසම්මුදිතා, සා භගවතො දන්තා ගුත්තා රක්ඛිතා, සංවුතා තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. කායො ඵොට්ඨබ්බාරාමො ඵොට්ඨබ්බරතො ඵොට්ඨබ්බසම්මුදිතො. මනො ධම්මාරාමො ධම්මරතො ධම්මසම්මුදිතො සො භගවතො දන්තො ගුත්තො රක්ඛිතො සංවුතො, තස්ස ච සංවරාය ධම්මං දෙසෙති.

2. දන්තං නයන්ති සමිතිං දන්තං රාජාභිරූහති,
දන්තො සෙට්ඨො මනුස්සෙසු යොතිවාක්‍යං තිතික්ඛති.a

3. වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා,
කුඤ්ජරා ච මහානාගා අත්තදන්තො තතො වරං.a

4. න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං[2] දිසං,
යථාත්තනා සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති.a

5. විධාසු න විකම්පන්ති විප්පමුත්තා පුනබ්භවා,
දන්තභූමිං අනුප්පත්තා තෙ ලොකෙ විජිතාවිනො.b

6. යස්සින්ද්‍රියානි භාවිතානි අජ්ඣත්තඤ්ච බහිද්ධා ච සබ්බලොකෙ,
නිබ්බිජ්ඣ ඉමං පරඤ්ච ලොකං කාලං කඞ්ඛති භාවිතො ස දන්තොති.c

6. චක්ඛු -සී
1. යථාත්තා – PTS. සී
2. අමතං දිසං ච–වි

a. ධම්මපද – නාගවග්ග
b. මහාධ සංයුත්ත – වජ්ජනීය වග්ග
c. සුත්තනිපාත – සභිය සුත්ත

භාග්‍යවතුන් වහන්සේට චක්ෂුස්ප්‍රසාදය විද්‍යමාන වෙයි. බුදුහු ඇසින් රූප දකිති. ඡන්දරාගයෙක් භාග්‍යවතුන්ට නැත. බුදුහු වෙසෙසින් මිදුණු සිත් ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේට ශ්‍රොත්‍රප්‍රසාදය විද්‍යමාන වෙයි. බුදුහු කනින් ශබ්දය අසති. ඡන්දරාගයෙක් භාග්‍යවතුන්ට නැත, බුදුහු සුවිමුක්තචිත්තයහ. භාග්‍යවතුන් වහන්සේට ඝ්‍රාණ ප්‍රසාදය විද්‍යමාන වෙයි. බුදුහු නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කෙරෙති. භාග්‍යවතුන්ට ඡන්දරාගයෙක් නැත. බුදුහු සුවිමුක්තචිත්තයහ. භාග්‍යවතුන් වහන්සේට ජිහ්වාප්‍රසාදය විද්‍යමාන වෙයි. බුදුහු දිවින් රස විඳිති. ඡන්දරාගයෙක් භාග්‍යවතුනට නැත. බුදුහු සුවිමුක්ත චිත්තයහ. භාග්‍යවතුන් වහන්සේට කායප්‍රසාදය විද්‍යමාන වෙයි. බුදුහු කයින් පහස් පහස්ති, ඡන්දරාගයෙක් භාග්‍යවතුන්ට නැත. බුදුහු සුවිමුක්තචිත්තයහ. භාග්‍යවතුන් වහන්සේට මනස විද්‍යමාන වෙයි. බුදුහු මනසින් දහම් දනිති. ඡන්දරාගයෙක් භාග්‍යවතුන්ට නැත. බුදුහු සුවිමුක්ත චිත්තයහ. ඇස රූපාරාම යැ, රූපයෙහි ඇලුණේ යැ, රූපයෙන් සතුටු වූයේ යැ, ඒ ඇස භාග්‍යවතුන් විසින් දමනය කරන ලද, ගොපනය කරන ලද, රක්නාලද, සංවර කරනලද, යළි ඒ ඇස සංවර පිණිස දහම් දෙසති, කන ශබ්දරාම යැ, ශබ්දරත යැ ශබ්ද සම්මුදිත යැ ... ඝ්‍රාණය ගන්ධාරාම යැ... ජිහ්වාව රසාරාම යැ ... කය ස්ප්‍රෂ්ටව්‍යාරාම යැ ...මනස ධර්මාරාම යැ ධර්මරත යැ ධර්මසම්මුදිත යැ, ඒ මනස භාග්‍යවතුන් විසින් දන්ත යැ, ගුප්ත යැ, රක්ෂිත යැ සංවෘත යි. ඒ මනස සංවරය පිණිස දහම් දෙසනසේක.

(2) දමුණු ඇතකු අසකු මැ බොහෝදෙනා රැස්වූ තැනට පමුණුවති, රජ ද දමුණු ඇතකු පිට මැ නැඟෙයි, යමෙක් අනුන් බිණූ පරොස්බස් ඉවසා නම් දමුණා වූ හෙතෙම මිනිසුන් අතුරෙහි උත්තම යි.

(3) අශ්වතරයෝ දමුණා හු මැ උතුම් වෙති, ආජානෙය අශ්වයෝ ද සෙන්ධවයෝ ද කුඤ්ජර නම් වූ මහ ඇත්හු ද දමුණා හු මැ උතුම් වෙති, ඊට වඩා (මාර්ග භාවනායෙන්) ආත්මදමනය කරන ලද්දේ උත්තම යි.

(4) දමුණු මහණ තෙම, (පූර්වභාගයෙහි ඉන්ද්‍රියදමනයෙන්,) දමුණාවූ (අපරභාගයෙහි ආර්‍ය්‍යමාර්ග භාවනායෙන්) මනාව දමුණුවූ සිතින් අගත නම් වූ නිර්වාණ දිශාවට යම් සේ යේ ද, මේ ඇත් ආදී යානයෙන් එසේ නො මැ යන්නේ යි.

(5) යම් කෙනෙක් ත්‍රිවිධ මානයෙහි කම්පා නො වෙත් ද, පුනර්භවයෙන් මිදුණාහු ද, (රහත්ඵල සඞ්ඛ්‍යාත) දන්ත භූමියට පැමිණියාහු ද ඔහු මේ සත්ත්වලොකයෙහි දිනූවාහු නම් වෙත්.

(6) යමක්හු විසින් අධ්‍යාත්ම වූ ද බාහිර වූ ද සියලු ලෝකයෙහි (චක්ෂුරාදි) ෂඩින්ද්‍රියයෝ (ත්‍රිලක්ෂණයට නගා) වෙසෙසින් වඩන ලද්දාහු ද, භාවිත ඉන්ද්‍රිය ඇති ඒ දන්ත වූ පුද්ගල තෙම (ස්වපරසන්තති සඞ්ඛ්‍යාත) මෙලොව හා පරලොව හා දූන මරණ කාලය බලාපොරොත්තු වේ යයි.

එවං භගවා භාවිතත්තො[1]

පුච්ඡාමි තං වෙදගුං[2] භාවිතත්තං කුතො නු දුක්ඛා සමුදගතා ඉමෙති: 'කුතො නූ'ති සංසයපුච්ඡා, විමතිපුච්ඡා, ද්වෙළ්හකපුච්ඡා, අනෙකංසපුච්ඡා. එවං නු ඛො, න නු ඛො, කිං නු ඛො, කථං නු ඛොති 'කුතො නු'.

දුක්ඛාති ජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං නෙරයිකං දුක්ඛං තිරච්ඡානදුක්ඛං පෙත්තිවිසය දුක්ඛං මානුසිකං[3] දුක්ඛං ගබ්භොක්කන්තිමූලකං දුක්ඛං ගබ්භට්ඨිතිමූලකං දුක්ඛං ගබ්භවුට්ඨානමූලකං දුක්ඛං ජාතස්සූපනිබන්ධනං[4] දුක්ඛං ජාතස්ස පරාධෙය්‍යකං[5] දුක්ඛං අත්තූපක්කමං දුක්ඛං පරූපක්කමං දුක්ඛං දුක්ඛදුක්ඛං සඞ්ඛාරදුක්ඛං විපරිණාමදුක්ඛං, චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො[6] ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුක්ඛං, මාතුමරණං දුක්ඛං පිතුමරණං දුක්ඛං භාතුමරණං දුක්ඛං භගිනීමරණං දුක්ඛං පුත්තමරණං දුක්ඛං ධීතුමරණං දුක්ඛං ඤාතිව්‍යසනං දුක්ඛං භොගව්‍යසනං[7] දුක්ඛං සීලව්‍යසනං දුක්ඛං දිට්ඨිව්‍යසනං දුක්ඛං යෙසං ධම්මානං ආදිතො සමුදගමනං පඤ්ඤායති, අත්ථඞ්ගමතො නිරොධො පඤ්ඤායති. කම්මසන්නිස්සිතො විපාකො, විපාකසන්නිස්සිතං කම්මං, නාමසන්නිස්සිතං රූපං, රූපසන්නිස්සිතං නාමං, ජාතියා අනුගතං, ජරාය අනුසටං, බ්‍යාධිනා අභිභූතං, මරණෙන අබ්භාහතං, දුක්ඛෙ පතිට්ඨිතං, අතාණං අලෙණං අසරණං අසරණීභූතං, ඉමෙ වුච්චන්ති දුක්ඛා.

1. භාවිතත්තොති — ම ඡ සං
2. වෙදගු — ම ඡ සං
3. මානුසිකං — සයා
4. ජාතස්සූපනිබන්ධකං — මඡසං
5. පරාධෙය්‍යකං — මඡසං
6. ඩාහො — මඡසං
7. රොගව්‍යසනං — පත, ම ඡ සං

මෙසෙයින් බුදුහු 'භාවිතත්ත' නම් වූහ.

**මඤ්ඤාමි තං වෙදගුං භාවිතත්තං කුතො නු දුක්ඛා සමුදාගතා ඉමෙ-** 'කුතො නු' යනු; සංශය පෘච්ඡා යැ විමතිපෘච්ඡා යැ ද්වෛධපෘච්ඡා යැ අනෙකාන්තපෘච්ඡා යැ මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ (ජාති ආදීන් අතුරෙහි) කුමක් වූයෙම් දෝ හෝ කෙසේ වූයෙම් දෝ හෝ යි 'කුතො නු' යනු වේ.

දුක්ඛා යනු: ජාති දුක යැ ජරා දුක යැ ව්‍යාධි දුක යැ මරණ දුක යැ සොක පරිදේවදුක්ඛදෙමනස්සුපායාස දුක යැ නිරය දුක යැ තිරිසන් යොන්හි දුක යැ ප්‍රෙතවිෂයෙහි දුක යැ මිනිස්ලොවැ (වධබන්ධනාදි) දුක යැ ගර්භාවක්‍රාන්තිමූලක දුක යැ ගර්භස්ථිතිමූලක දුක යැ ගර්භව්‍යුත්ථාන මූලක දුක යැ උපන්හු පිළිදැග්නා දුක යැ උපන්හු පරා අයත් බැව්හි දුක යැ ආත්මොපක්‍රම දුක යැ පරොපක්‍රම දුක යැ ස්වාභාවික දුක යැ සංස්කාර දුක යැ විපරිණාම දුක යැ චක්ෂුරොග යැ ශ්‍රොත්‍රරොග යැ ඝ්‍රාණ රොග යැ ජිහ්වාරොග යැ කායරොග යැ ශිර්ෂරොග යැ කර්ණරොග යැ මුඛරොග යැ දන්තරොග යැ කාස යැ ශ්වාස යැ පීනස යැ දහ යැ ජ්වර යැ කුක්ෂිරොග යැ මූර්ච්ඡා යැ ප්‍රස්කන්දිකා (රක්තාතිසාර) යැ ශූලරොග යැ මහාවිරෙචන යැ කුෂ්ට යැ ගණ්ඩ යැ කිලාස (කබර) යැ ක්ෂය රොග යැ අපස්මාර යැ දද්‍රු යැ කණ්ඩූති යැ මහකස් යැ නියපහරින් වූ ව්‍රණයැ අතුල් පතුල් පැලීම යැ රක්ත පිත්ත යැ මධු මෙහ යැ අර්ශස් යැ පොළ යැ භගන්දරා යැ පිතින් නැඟි ආබාධ යැ සෙමින් නැඟි ආබාධ යැ වයින් නැඟි ආබාධ යැ සාන්නිපාතික ආබාධ යැ ඍතු පරිණාමයෙන් උපන් ආබාධ යැ විෂම වූ ඊර්යාපථයෙන් නැඟි ආබාධ යැ උපක්‍රමයෙන් උපන් ආබාධ යැ කර්ම විපාකයෙන් උපන් ආබාධ යැ ශීත යැ උෂ්ණ යැ ජිඝත්සා යැ පිපාසා යැ උච්චාර යැ ප්‍රස්‍රාව යැ මැසි මදුරු වා අව් දික් දැ යන මොවුන්ගේ පහසින් උපන් දුක යැ මවගේ මරණයෙන් වූ දුක යැ පියාගේ මරණයෙන් වූ දුක යැ බෑයාගේ මරණයෙන් වූ දුක යැ බුහුන්ගේ මරණයෙන් වූ දුක යැ පුත්‍ර මරණයෙන් වූ දුක යැ දුහිතෘමරණයෙන් වූ දුක යැ ඥාති ව්‍යසනයෙන් වූ දුක යැ භොගව්‍යසනයෙන් වූ දුක යැ ශීලව්‍යසනයෙන් වූ දුක යැ දෘෂ්ටි-ව්‍යසනයෙන් වූ දුක යැ ස්කන්ධාදි යම් ධර්ම කෙනකුන්ගේ ආදියෙහි උත්පත්තිය පැනේ ද අස්තංගම වශයෙන් ඔවුන්ගේ නිරොධය පැනෙයි. විපාකය තෙමේ කර්මය ඇසිරි කෙළේ යැ, කර්මය තෙමේ විපාකය ඇසිරි කෙළේ යැ, රූපය නාමය ඇසිරි කෙළේ යැ, නාමය රූපය ඇසිරි කෙළේ යැ, (හැම කර්මාදිය) ජාතිය අනුව ගියේ යැ, ජරායෙන් පැතිරෙන ලද, ව්‍යාධි-යෙන් මඩනා ලද, මරණයෙන් පහරන ලද, දුකෙහි පිහිටියේ යැ, අත්‍රාණ යැ අලෙන යැ අසරණ යැ අසරණ වූයේ යි, මොහු දුඃඛයෝ යැ යි කියනු ලැබෙත්.

ඉමෙ දුක්ඛා කුතො සමුදගතා, කුතො ජාතා, කුතො සඤ්ජාතා කුතො නිබ්බත්තා කුතො අභිනිබ්බත්තා කුතො පාතුභූතා කිංනිදානා කිංසමුදයා[1] කිංජාතිකා කිංපභවාති ඉමෙසං දුක්ඛානං මූලං පුච්ඡති, හෙතුං පුච්ඡති, නිදානං පුච්ඡති, සම්භවං පුච්ඡති, පභවං පුච්ඡති, සමුට්ඨානං පුච්ඡති, ආහාරං පුච්ඡති, ආරම්මණං පුච්ඡති, පච්චයං පුච්ඡති, සමුදයං පුච්ඡති, පපුච්ඡති යාචති අජ්ඣෙසති[2] පසාදෙතීති 'කුතො නු දුක්ඛා සමුදගතා ඉමෙ.'

යෙ කෙචි ලොකස්මිං අනෙකරූපාති: 'යෙකෙචී'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං යෙකෙචීති.' ලොකස්මින්ති අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ බන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ. අනෙකරූපාති අනෙකවිධා නානප්පකාරා දුක්ඛාති 'යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තං (ඉච්චායස්මා මෙත්තගූ)
මඤ්ඤාමි තං වෙදගුං භාවිතත්තං,
කුතො නු දුක්ඛා සමුදගතා ඉමෙ
යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා"ති.

4–2

දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසි (මෙත්තගූති භගවා)
තං තෙ පවක්ඛාමි යථා පජානං,
උපධිනිදානා පභවන්ති දුක්ඛා
යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා.

දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසී ති: 'දුක්ඛස්සා'ති: ජාතිදුක්ඛස්ස ජරාදුක්ඛස්ස ව්‍යාධිදුක්ඛස්ස මරණදුක්ඛස්ස සොකපරිදෙවදුක්ඛදොමනස්සු-පායාසදුක්ඛස්ස. පභවං අපුච්ඡසීති "දුක්ඛස්ස මූලං පුච්ඡසි, හෙතුං පුච්ඡසි, නිදානං පුච්ඡසි, සම්භවං පුච්ඡසි, පභවං පුච්ඡසි, සමුට්ඨානං පුච්ඡසි, ආහාරං පුච්ඡසි, ආරම්මණං පුච්ඡසි, පච්චයං පුච්ඡසි, සමුදයං පුච්ඡසි, යාචසි අජ්ඣෙසසි පසාදෙසී'ති 'දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසි'.

මෙත්තගූති භගවාති: බ්‍රාහ්මණං නාමෙන ආලපති. භගවාති ගාරවාධිවචනමෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති. 'මෙත්තගූති භගවා'.

1. කිංසමුදයො–ච–චි–ක
2. අජ්ඣෙසසි –ච,චි,ක

මේ දුඃඛයෝ කොයින් පහළ වූවාහු ද, කොයින් උපන්නාහු ද, කොයින් වෙසෙසින් උපන්නාහු ද, කොයින් නිපන්නාහු ද, කොයින් වෙසෙසින් නිපන්නාහු ද, කොයින් පහළ වූවාහු ද, කුමක් නිදාන කොට ඇත්තාහු ද, කුමක් සමුදය කොට ඇත්තාහු ද, කුමක් ජාති කොට ඇත්තාහු ද, කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද' යි මේ දුඃඛයන්ගේ මූලය විචාරයි, හේතුව විචාරයි, නිදානය විචාරයි, සම්භවය විචාරයි, ප්‍රභවය විචාරයි, සමුත්ථානය විචාරයි. ආහාරය විචාරයි, ආලම්බනය විචාරයි, ප්‍රත්‍යය විචාරයි, සමුදය විචාරයි, වෙසෙසින් විචාරයි, ආයාචනය කෙරෙයි, කැමැති කරවයි පහදවා තු' යි 'කුතො නු දුක්ඛා සමුදාගතා ඉමෙ' යනු වේ.

**යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා** — 'යෙ කෙචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වථායෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි තෙල 'යෙ කෙචි' යනු. **ලොකස්මිං** — අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි යැ. **අනෙකරූපා** — අනෙකවිධ වූ නානාප්‍රකාර වූ දුඃඛයෝ තු' යි 'යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**පුච්ඡාමි, තං භගවා . . . ලොකස්මිං අනෙකරූපා යි.**

4–2.

(බුදුහු මෙසේ වදළහ: මෙත්තගූ මාණවකය,) ජාත්‍යාදි දුකට කාරණය (තෙපි) මා විචාරව, එය ප්‍රත්‍යක්ෂ කොට දැනගත්තකු සෙයින් තොපට ප්‍රකාශ කරම්හ. ලොවැ අනෙක ස්වරූප වූ යම් දුක් කෙනෙක් ඇද්ද එ හැම දුඃඛයෝ (තෘෂ්ණාදි) උපධි හේතුයෙන් උපදනාහ.

**දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසි** — 'දුක්ඛස්ස' යනු: ජාති දුකට, ජරා දුකට, ව්‍යාධි දුකට, සොක–පරිදෙව (කායික) දුකට (මානසික) දොමනස්ස උපායාස දුකට. **පභවං අපුච්ඡසි**- යනු: දුකට මූලය විචාරව, හෙතුව විචාරව, නිදානය විචාරව, සම්භවය විචාරව, ප්‍රභවය විචාරව. සමුත්ථානය විචාරව, ආහාරය විචාරව, ආලම්බනය විචාරව, ප්‍රත්‍යය විචාරව, සමුදය විචාරව, යාච්ඤා කරව, අධ්‍යෙෂණ කරව, පහදවා තු'යි 'දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසි' යනු වේ.

**මෙත්තගූ'ති භගවා** යනු: බමණැහු නමින් අමතන සේක. භගවා යනු: තෙල ගෞරවනාමයෙකි. . . යම 'භගවත්' යන නමෙක් වී නම් තෙල අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් තු' යි 'මෙත්තගූ' ති භගවා' යනු වේ.

**තං තෙ පවක්ඛාමි යථා පජානන්ති:** 'තං' ති දුක්ඛස්ස මූලං පවක්ඛාමි, හෙතුං පවක්ඛාමි, නිදානං පවක්ඛාමි, සම්භවං පවක්ඛාමි, පභවං පවක්ඛාමි, සමුට්ඨානං පවක්ඛාමි, ආහාරං පවක්ඛාමි, ආරම්මණං පවක්ඛාමි, පච්චයං පවක්ඛාමි, සමුදයං පවක්ඛාමි, ආචික්ඛිස්සාමි දෙසිස්සාමි පඤ්ඤපෙස්සාමි පට්ඨපෙස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසිස්සාමීති. 'තං තෙ පවක්ඛාමි.'

**යථා පජානන්ති:** යථා පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො න ඉතිහිතිහං න ඉති කිරාය[1] න පරම්පරාය න පිටකසම්පදානෙන න තක්කහෙතු න නයහෙතු න ආකාර පරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයං අභිඤ්ඤාතං අත්ත-පච්චක්ඛධම්මං තං කථයිස්සාමීති 'තං තෙ පවක්ඛාමි යථා පජානං'.

**උපධිනිදානා පභවන්ති දුක්ඛාති:** 'උපධී'ති දස උපධී: තණ්හූපධි දිට්ඨූපධි, කිලෙසූපධි, කම්මූපධි, දුච්චරිතූපධි, ආහාරූපධි, පටිඝූපධි, චතස්සො උපාදින්නධාතුයො උපධී, ඡ අජ්ඣත්තිකානි ආයතනානි උපධී, ඡ විඤ්ඤාණකායා උපධී, සබ්බම්පි දුක්ඛං දුක්ඛමනට්ඨෙන[2] උපධී, ඉමෙ වුච්චන්ති දස උපධී. **දුක්ඛාති** ජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං නෙරයිකං දුක්ඛං –පෙ– දිට්ඨි බ්‍යසනං දුක්ඛං, යෙසං ධම්මානං ආදිතො සමුදාගමනං පඤ්ඤායති අත්ථඞ්ගමතො නිරොධො පඤ්ඤායති, කම්මනිස්සිතං විපාකං, විපාකනිස්සිතං කම්මං, නාමනිස්සිතං රූපං, රූපනිස්සිතං නාමං, ජාතියා අනුගතං, ජරාය අනුසටං, බ්‍යාධිනා අභිභූතං, මරණෙන අබ්භාහතං, දුක්ඛෙ පතිට්ඨිතං, අතාණං අලෙනං අසරණං අසරණීභූතං, ඉමෙ වුච්චන්ති දුක්ඛා. ඉමෙ දුක්ඛා උපධිනිදානා, උපධිහෙතුකා, උපධිපච්චයා, උපධිකාරණා හොන්ති, පභවන්ති සම්භවන්ති ජායන්ති සඤ්ජායන්ති නිබ්බත්තන්ති පාතුභවන්තී'ති 'උපධිනිදානා පභවන්ති' දුක්ඛා.

---

1. න ඉති කිරියාය – ම ඡ සං
2. දුක්ඛමනට්ඨෙන – ම ඡ සං
3. දුක්ඛාය වෙමං – ව–වි–ක

**තං තෙ පවක්ඛාමි, යථා පජානං** — 'තං' යනු: දුකට මූලය පවසමි, හේතුව පවසමි, නිදානය පවසමි. සම්භවය පවසමි, ප්‍රභවය පවසමි, සමුත්ථානය පවසමි, ආහාරය පවසමි, ආලම්බනය පවසමි, ප්‍රත්‍යය පවසමි, සමුදය පවසමි, කියමි, දෙසමි, පනවමි, පිහිටුවමි, විවරණ කෙරෙමි, විභාග කෙරෙමි, නො ගැඹුරු කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නු' යි 'තං තෙ පවක්ඛාමි' යනු වේ.

**යථා පජානං** — ප්‍රතිවෙධ කොට දතුයෙක් හාත්පසින් දතුයෙක් වෙසෙසින් දතුයෙක් මැනැවින් දතුයෙක් අවබොධ කළ කෙනෙක් යම්සේ ද, තෙල මෙසේ වී ල' යි නො වැ තෙල මෙසේ ල' යි නො වැ පරම්පරා කථා වෙනුදු නො වැ පිටක සම්ප්‍රදය හා සම වේ යයි නො වැ තර්ක හෙතුවෙනුදු නො වැ නයග්‍රහණයෙනුදු නො වැ (මේ සොඳුරු යැ යි) කරුණු සැලකීමෙනුදු නො වැ අපට රුචි වූ දෘෂ්ටිය හා සම වේ යයි නො වැ තෙමේ මැ තමා විසින් අවබොධ කළ තමා විසින් ප්‍රත්‍යවෙක්ෂා කළ ධර්මය තොපට කියනෙමි 'තං තෙ පවක්ඛාමි යථා පජානං' යනු වේ.

**උපධිනිදානා පභවන්ති දුක්ඛා** — 'උපධි' යනු: දශ උපධීහු යැ: තෘෂ්ණා උපධි යැ දෘෂ්ටි උපධි යැ ක්ලෙශොපධි යැ කර්මොපධි යැ දුශ්චරිතොපධි යැ ආහාරොපධි යැ ප්‍රතිඝොපධි යැ (පෘථිව්‍යාදි) සතර උපාදින්න ධාතු සංඛ්‍යාත උපධියැ ෂඩ් අධ්‍යාත්ම ආයතන සංඛ්‍යාත උපධියැ ෂඩ්විඥානකාය සංඛ්‍යාත උපධි යැ සියලු ත්‍රෛභූමක දුඃඛය දුස්සහනාර්ථයෙන් උපධි නම් වෙයි. මොහු දශ උපධි යයි කියනු ලැබෙත්. **දුක්ඛා** යනු: ජාති දුක යැ ජරා දුක යැ ව්‍යාධි දුක යැ මරණ දුක යැ සොක–පරිදෙව–දුක්ඛ–දෙම්නස්සුපායාස දුක යැ නිරය දුක යැ . . . දෘෂ්ටි ව්‍යසනයෙන් වූ දුක යි. ස්කන්ධාදි යම් ධර්ම කෙතකුන්ගේ ආදියෙහි උත්පත්තිය පැනේ ද අස්තංගම වශයෙන් ඔවුන්ගේ නිරොධය පැනෙයි, විපාකය තෙමේ කර්මය ඇසිරි කෙළේ යැ, කර්මය තෙමේ විපාකය ඇසිරි කෙළේ යැ; රූපය නාමය ඇසිරි කෙළේ යැ, නාමය රූපය ඇසිරි කෙළේ යැ; (හැම කර්මාදිය) ජාතිය අනුව ගියේ යැ, ජරායෙන් පැතිරෙන ලද, ව්‍යාධියෙන් මඩනා ලද, මරණයෙන් පහරන ලද, දුකෙහි පිහිටියේ යැ අත්‍රාණ යැ අලෙන යැ අසරණ යැ අසරණ වූයේ යි. මොහු දුඃඛයෝ යි කියනු ලැබෙත්. මේ දුඃඛයෝ උපධි නිදන කොට ඇතියාහු, උපධි හේතු කොට ඇතියාහු, උපධි ප්‍රත්‍යය කොට ඇතියාහු, උපධි කාරණ කොට ඇත්තාහු වෙති පහළ වෙති, හටගනිති, උපදිති, මොනොවට උපදිති, නිපැදෙති පහළ වෙත් නු'යි 'උපධිනිදානා පභවන්ති දුක්ඛා, යනුවේ.

**යෙ කෙචි ලොකස්මිං අනෙකරූපාති:** 'යෙ කෙචී'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං යෙ කෙචී'ති. **ලොකස්මින්ති** අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ. **අනෙකරූපාති:** අනෙකවිධා නානප්පකාරා දුක්ඛා'ති 'යෙ කෙචි ලොකස්මිං අනෙක රූපා'.

තෙනාහ භගවා:

"දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසි (මෙත්තගූති භගවා)
තං තෙ පවක්ඛාමි යථා පජානං
උපධිනිදානා පභවන්ති දුක්ඛා
යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා''ති.

---

4-3

යො වෙ අවිද්වා උපධිං කරොති
පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො
තස්මා පජානං උපධිං න කයිරා
දුක්ඛස්ස ජාතිපභවානුපස්සී.

**යො වෙ අවිද්වා උපධිං කරොතීති:** යො'ති යො යාදිසො යථා යුත්තො යථාවිහිතො යථාපකාරො යංඨානප්පත්තො[1] යංධම්ම සමන්නාගතො[2] ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා. **අවිද්වාති** අවිජ්ජාගතො අඤ්ඤාණී අවිභාවී දුප්පඤ්ඤො. **උපධිං කරොතීති** තණ්හූපධිං කරොති. දිට්ඨූපධිං කරොති, කිලෙසූපධිං කරොති, කම්මූපධිං කරොති, දුච්චරිතූපධිං කරොති, ආහාරූපධිං කරොති, පටිඝූපධිං කරොති, චතස්සො උපාදින්නධාතුයො උපධිං[3] කරොති, ඡ අජ්ඣත්තිකානි ආයතනානි උපධිං කරොති, ඡ විඤ්ඤාණකායං උපධිං කරොති, ජනෙති සඤ්ජනෙති නිබ්බත්තෙතීති යො වෙ අවිද්වා උපධිං කරොති:

---

1. යං ඨානං පත්තො – සී
2. සධම්මසමන්නාගතො – බහූසු
3. උපධී – මජසං

**යෙ කෙචි ලොකසමිං අනෙකරූපා** — 'යෙ කෙචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වථායෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි තෙල 'යෙ කෙචි' යනු. '**ලොකසමිං** යනු: අපාය ලොකයෙහි, මනුෂ්‍යලොකයෙහි, ස්කන්ධලොකයෙහි, ධාතුලොකයෙහි, ආයතනලොකයෙහි යැ **අනෙකරූපා** යනු: අනෙකවිධ වූ නානාප්‍රකාර වූ දුඃඛයෝ නු' යි 'යෙ කෙචි ලොකසමිං අනෙකරූපා' යනු වේ.

එයින් වදළහ බුදුහු;

**දුක්ඛස්ස වෙ මං –පෙ– ලොකසමිං අනෙකරූපා යි.**

---

4–3.

අපණ්ඩිත වූ යමෙක් (තෘෂ්ණාදි) උපධිය කෙරේ ද, අඥාන වූ හෙතෙම පුනපුනා සසර දුකට පැමිණෙයි. එහෙයින් (සංස්කාරයන් අනිත්‍යාදි විසින්) දන්නේ සසර දුක ජාතිය ප්‍රභව කොට ඇතැ' යි දක්නේ (තෘෂ්ණාදි) උපධිය නො කරන්නේ යි.

**යො වෙ අවිද්වා උපධිං කරොති** — 'යො' යනු: යම් යම්බඳු වූ යමෙකින් යුක්ත වූ යම්සේ සිටි යම් ප්‍රකාර වූ යම් තනතුරකට පැමිණි යම් ධර්මයෙකින් සමන්වාගත වූ ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශුද්‍රයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ දෙවියෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ යි. **අවිද්වා** යනු: අවිද්‍යාවට පැමිණියේ අඥාන වූයේ අපණ්ඩිත වූයේ දුෂ්ප්‍රාඥ වූයේ යි. **උපධිං කරොති** – තෘෂ්ණා උපධිය කෙරෙයි, දෘෂ්ටි උපධිය කෙරෙයි, ක්ලේශොපධිය කෙරෙයි, කර්මොපධිය කෙරෙයි, දුශ්චරිතොපධිය කෙරෙයි, ආහාරොපධිය කෙරෙයි, ප්‍රතිඝොපධිය කෙරෙයි, සතර උපාදින්නධාතු සංඛ්‍යාත උපධිය කෙරෙයි, ෂඩ්–අධ්‍යාත්මායතන සංඛ්‍යාත උපධිය කෙරෙයි, ෂඩ් විඥානකාය උපධි කෙරෙයි, උපදවයි, මොනොවට උපදවයි, නිපදවා නු' යි 'යො වෙ අවිද්වා උපධිං කරොති' යනු වේ.

**පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො**'ති: පුනප්පුනං ජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං එති සමුපෙති උපගච්ඡති ගණ්හාති පරාමසති අභිනිවිසති. **මන්දො**ති මන්දො මොහො අවිද්වා අවිජ්ජාගතො අඤ්ඤාණී අවිභාවී දුප්පඤ්ඤොති 'පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො'

**තස්මා පජානං උපධිං න කයිරා**ති: 'තස්මා'ති තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා එවං ආදීනවං සම්පස්සමානො උපධීසූති 'තස්මා. **පජාන**න්ති පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො, සබ්බෙ සංඛාරා අනිච්චාති පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො 'සබ්බෙ සංඛාරා දුක්ඛාති -පෙ- සබ්බෙ ධම්මා අනත්තා'ති -පෙ- 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො. **උපධිං න කයිරා**ති තණ්හූපධිං න කරෙය්‍ය, දිට්ඨූපධිං න කරෙය්‍ය, කිලෙසූපධිං න කරෙය්‍ය, කම්මූපධිං න කරෙය්‍ය, දුච්චරිතූපධිං න කරෙය්‍ය, ආහාරූපධිං න කරෙය්‍ය, පටිඝූපධිං න කරෙය්‍ය, චතස්සො උපාදින්නධාතුයො උපධිං න කරෙය්‍ය, ඡ අජ්ඣත්තිකානි ආයතනානි උපධිං න කරෙය්‍ය, ඡ විඤ්ඤාණකායං උපධිං න කරෙය්‍ය, න සංජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍යාති- තස්මා පජානං උපධිං න කයිරා.'

**දුක්ඛස්සා**ති: ජාතිදුක්ඛස්ස ජරාදුක්ඛස්ස ව්‍යාධිදුක්ඛස්ස මරණදුක්ඛස්ස සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛස්ස. **පභවානුපස්සී**ති: දුක්ඛස්ස මූලානුපස්සී[4] හෙතානුපස්සී නිදානානුපස්සී සම්භවානුපස්සී පභවානුපස්සී සමුට්ඨානානුපස්සී ආහාරානුපස්සී ආරම්මණානුපස්සී පච්චයානුපස්සී සමුදයානුපස්සී. 'අනුපස්සනා' වුච්චති පඤ්ඤා යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ඉමාය අනුපස්සනාය පඤ්ඤාය උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො සො වුච්චති අනුපස්සීති "දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී.

තෙනාහ භගවා.

"යො වෙ අවිද්වා උපධිං කරොති
පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො
තස්මා පජානං උපධිං න කයිරා
දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී"ති.

---

4. හෙතුනුපස්සී-ච-වි-ක
හෙතුං පස්සී - ම ඡ සං

**පුනප්පුනං දුක්ඛමුපෙති මන්දෙ** — පුනපුනා ජාතිදුකට ජරාදුකට ව්‍යාධිදුකට මරණ දුකට සෝක-පරිදේව-දුක්ඛ-දෙමනස්සුපායාස දුකට එයි පැමිණෙයි එළැඹෙයි ගනියි පරාමර්ශනය කෙරෙයි පිවිසේ. **මන්දෙ** යනු: බාල වූයේ මුළා වූයේ අවිද්වත් වූයේ අවිද්‍යාවට පැමිණියේ අඥාන වූයේ අපණ්ඩිත වූයේ දුෂ්ප්‍රාඥ වූයේ නු' යි 'පුනප්පුනං දුක්ඛමුපෙති මන්දෙ' යනු වේ.

**තස්මා පජානං උපධිං න කයිරා** — 'තස්මා' යනු: එ කරුණින් එ හෙයින් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මෙසේ උපධීන්හි ආදීනව දක්නේ නු'යි 'තස්මා' යනු වේ. **පජානං** යනු: දන්නේ හාත්පසින් දන්නේ වෙසෙසින් දන්නේ අවබොධ කරනුයේ ප්‍රතිවෙධ කරනුයේ යි, හැම සංස්කාරයෝ අනිත්‍යහ' යි දන්නේ හාත්පසින් දන්නේ වෙසෙසින් දන්නේ අවබොධ කරනුයේ ප්‍රතිවෙධ කරනුයේ යි, හැම සංස්කාරයෝ දුඃඛයහ'යි–හැම සංස්කාරයෝ අනාත්මහ' යි . . යම් කිසි සමුදය ධර්මයෙක් ඇද්ද, එ හැම නිරොධය ස්වභාව කොට ඇතැ යි දන්නේ හාත්පසින් දන්නේ වෙසෙසින් දන්නේ අවබොධ කරනුයේ ප්‍රතිවෙධ කරනුයේ යි. **උපධිං න කයිරා** යනු: තෘෂ්ණා (සංඛ්‍යාත) උපධි නො කරනනේ යැ, දෘෂ්ට්‍යුපධි නො කරනනේ යැ, ක්ලෙශොපධි නො කරන්නේ යැ, කර්මොපධි නො කරන්නේ යැ, දුශ්චරිතොපධි නො කරනනේ යැ, ආහාරොපධි නො කරන්නේ යැ, ප්‍රතිඝොපධි නො කරන්නේ යැ, සතර උපාදින්නධාතු සංඛ්‍යාත උපධි නො කරන්නේ යැ, සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතන සංඛ්‍යාත උපධි නො කරන්නේ යැ, ෂඩ් විඥානකාය සංඛ්‍යාත උපධි නො කරන්නේ යැ, නූපදවන්නේ යැ නො නිපදවන්නේ යැ, අතිශයින් නො නිපදවන්නේ නු' යි 'තස්මා පජානං උපධිං න කයිරා' යනු වේ.

**දුක්ඛස්ස** යනු: ජාති දුකට ජරා දුකට ව්‍යාධි දුකට මරණ දුකට සොක-පරිදෙව-දුක්ඛ-දෙමනස්ස-උපායාස දුකට යැ. **පභවානුපස්සී** යනු: දුඃඛයාගේ මූලය අනුව බලනුයේ හේතුව අනුව බලනුයේ නිදානය අනුව බලනුයේ සම්භවය අනුව බලනුයේ ප්‍රභවය අනුව බලනුයේ සමුත්ථානය අනුව බලනුයේ ආහාරය අනුව බලනුයේ ආලම්බනය අනුව බලනුයේ ප්‍රත්‍යය අනුව බලනුයේ සමුදය අනුව බලනුයේ යි. 'අනුපස්සනා' යි ප්‍රඥාව කියනු ලැබෙයි — යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් . . . අමොහ සංඛ්‍යාත ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එය යි. මේ අනුපස්සනා සංඛ්‍යාත ප්‍රඥායෙන් යුක්ත වූයේ අතිශයින් යුක්ත වූයේ එළැඹ සිටියේ අතිශයින් එළැඹ සිටියේ නො වෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ යි. හේ 'අනුපස්සී' යි කියනු ලැබේ නු 'යි 'දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී' යනු වේ. එයින් වදාළහ බුහුදු:

**යො වෙ අවිද්වා . . . . ජාතිප්පභවානුපස්සී' යනු.**

4–4

යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං[1] පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි
කථන්නුධීරා විතරන්ති ඔඝං
ජාතිජරං[2] සොක[3]පරිද්දවඤ්ච
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො

යං තං අපුච්ඡිම්හ අකිත්තයී නොති: යං තං අපුච්ඡිම්හ අයාචිම්හ අජ්ඣෙසිම්හ පසාදිම්හ. අකිත්තයී නො'ති කිත්තිතං ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවරිතං විභත්තං උත්තානීකතං පකාසිතන්ති 'යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො.'

අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහීති අඤ්ඤං තං පුච්ඡාම, අඤ්ඤං තං යාචාම, අඤ්ඤං තං අජ්ඣෙසාම, අඤ්ඤං තං පසාදෙම, උත්තරිං තං පුච්ඡාම. තදිඞ්ඝ බ්‍රෑහීති තං ඉඞ්ඝ බ්‍රෑහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති 'අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි.'

කථන්නු ධීරා විතරන්ති ඔඝං ජාති ජරං සොකපරිද්දවං . චා'ති: 'කථන්නූ'ති. සංසයපුච්ඡා විමතිපුච්ඡා ද්වෙළ්හකපුච්ඡා අනෙකංසපුච්ඡා, එවන්නු ඛො න නුඛො කිං නුඛො කථන්නුඛොති. කථන්නු ධීරා ති ධීරා පණ්ඩිතා පඤ්ඤවන්තො බුද්ධිමන්තො ඤාණිනො විභාවිනො මෙධාවිනො. ඔඝන්ති කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං. ජාතීති යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො. ජරාති යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො. සොකොති ඤාතිව්‍යසනෙන වා ඵුට්ඨස්ස භොග ව්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගව්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලව්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨි ව්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තො සොකො අන්තො පරිසොකො අන්තො දහො අන්තො පරිදහො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං'

1. අඤ්ඤඤ්චාපි - වි
2. ජාතිං ජරං - මජසං
3. පුච්ඡාමි - උ.සු.මජසං
4. සොක පරිදෙවංච - වවිස

4–4.

(ආයුෂ්මත්, මෙත්තගූ මෙසේ කී යැ:) ඇපි යමක් විචාළමෝ ද එය මුඹ වහන්සේ අපට වදළ සේක. අන් කරුණකුදු මුඹ වහන්සේ විචාරම්හ. එය දූන් වදළ මැනැව, නුවණැත්තෝ (කාමාදි චතුර්විධ) ඔඝයත් ජාති ජරා ශෝක පරිදේවදුකත් කෙසේ ඉක්මවත් ද? සව්ඥ මුනි වූ මුඹ වහන්සේ අයදිමි. එය මට විසඳා වදළ මැනැව, යම් හෙයෙකින් මුඹ වහන්සේ විසින් තෙල දහම සත්ත්වයන් විසින් අවබොධ කරන සේ පැනවීම් වශයෙන් දන්නා ලද ද එහෙයිනි.

**යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො** යනු: (ඇපි) යමක් විචාළමෝ ද අයැදියමෝ ද අධ්‍යෙෂණ කළමෝ ද පැහැද වූවමෝ ද – **අකිත්තයී නො** යනු: කීර්තනය කරන ලද යැ කියන ලද යැ දෙසන ලද යැ පනවන ලද යැ (ඥාන මුඛයෙහි) තබන ලද යැ විවරා කරන ලද යැ විවරණ කරන ලද යැ පහළ කරන ලද යැ ප්‍රකාශ කරන ලද නු' යි 'යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො' යනු වේ.

**අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි** යනු: මුඹ වහන්සේ අනෙකක් විචාරම්හ, මුඹ වහන්සේ අනෙකක් අයදිම්හ, මුඹ වහන්සේ අනෙකක් අධ්‍යෙෂණ කරම්හ, මුඹ වහන්සේ අනෙකක් (කියන්නට) පහදවම්හ, මුඹ වහන්සේ මත්තෙහි විචාරම්හ–**තදිඞ්ඝ බ්‍රෑහි** යනු: එය දූන් වදළ මැනව කියනු මැනැව දෙසනු මැනැව පනවනු මැනැව (ඥානමුඛයෙහි) තබනු මැනැව විවරණ කළ මැනැව විභාග කළ මැනැව පාළ කරනු මැනැව ප්‍රකාශ කළ මැනැව නු' යි 'අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි යනු' වේ.

**කථංනු ධීරා විතරන්ති ඔඝං ජාතිජරං සොක පරිද්දවං ච** යනු: 'කථන්නු' යනු මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ දෝ හො' යි සංශයපෘච්ඡා යැ විමතිපෘච්ඡා යැ ද්වෛධපෘච්ඡා යැ අනෛකාන්ත පෘච්ඡා යි. **ධීරා** යනු: ධීරයෝ පණ්ඩිතයෝ පැනැතියෝ බුද්ධිමත්හු නැණැතියෝ විමර්ෂඥාන ඇත්තාහු (අනිත්‍යාදීන්) තුලිතඥාන, ඇත්තාහු. **ඔඝං** යනු: කාමොඝ යැ භවොඝ යැ දෘෂ්ටි–ඔඝ යැ අවිද්‍යා–ඔඝ යි. **ජාති** යනු: ඒ ඒ සත්ත්වයන් ගේ ඒ ඒ සත්ත්වනිකායයෙහි යම් උපැත්මෙක් හට ගැන්මෙක් අවක්‍රාන්තියක් නිපැද්මෙක් ස්කන්ධයන්ගේ පහළ වීමෙක් ආයතනයන්ගේ ප්‍රතිලාභයෙක් වේ ද, හේ යැ. **ජරා** යනු: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායයෙහි යම් දිරිමෙක් දිරන බවෙක් (දන්ත නඛාදීන්ගේ) කැඩුණු බවෙක් (කෙශාදීන්ගේ) පැසුණු බවෙක් රැලි වැටුණු සම් ඇති බවෙක්, ආයුෂයාගේ පිරිහීමෙක් ඉන්ද්‍රියයන් ගේ පැසීමෙක් වේ ද එය යි. **සොකො** යනු: ඥාති ව්‍යසනයෙන් හෝ **පහස්නා** ලද්දහු ගේ, භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ, රොග ව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ, ශීලව්‍යසන යෙන් හෝ පහස්නා ලද්දහුගේ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ, අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් හෝ සමන්වාගත වූවහු ගේ අන්‍යතරාන්‍යතර දුඃඛධර්මයෙකින් හෝ පහස්නා ලද්දහු ගේ ශොකයෙක් ශොක කරන අයුරෙක් ශොක කළ බවෙක් ඇතුළත ශොකයෙක් ඇතුළත පරිශෝකයෙක් අභ්‍යන්තර දහයෙක් අභ්‍යන්තර පරිදහයෙක් සිත දූවෙන අයුරෙක් දෙම්නසෙක් ශෝකශල්‍යයෙක්.

**පරිදෙවො**ති ඤාතිව්‍යසනෙන වා ඵුට්ඨස්ස, භොගව්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගව්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලව්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිව්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා ලාලප්පිතත්තං.

**කථන්නු ධීරා විතරන්ති ඔඝං ජාතිජරං සොකපරිද්දවඤ්චා**ති ධීරා කථං ඔඝඤ්ච ජාතිඤ්ච ජරඤ්ච දුක්ඛඤ්ච සොකපරිදෙවඤ්ච තරන්ති උත්තරන්ති පතරන්ති සමතික්කමන්ති වීතිවත්තන්තීති 'කථන්නු ධීරා විතරන්ති ඔඝං ජාතිජරං සොකපරිද්දවඤ්ච'

**තං මෙ මුනී සාධු වියාකරොහී**ති 'ත'න්ති යං පුච්ඡාමි, යං යාචාමි, යං අජ්ඣෙසාමි, යං පසාදෙමි. මුනීති මොනං වුච්චති ඤාණං 'යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි,[a] භගවා තෙන ඤාණෙන සමන්නාගතො මුනි මොනප්පත්තො.

තීණි මොනෙය්‍යානි: කායමොනෙය්‍යං, වචීමොනෙය්‍යං, මනොමොනෙය්‍යං. කතමං කායමොනෙය්‍යං: තිවිධානං කායදුච්චරිතානං පහානං කායමොනෙය්‍යං, තිවිධං කායසුචරිතං කායමොනෙය්‍යං, කායාරම්මණං ඤාණං කායමොනෙය්‍යං, කායපරිඤ්ඤා කායමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො කායමොනෙය්‍යං, කායෙ ඡන්දරාගප්පහානං කායමොනෙය්‍යං, කායසංඛාරනිරොධො චතුත්ථජ්ඣානසමාපත්ති කායමොනෙය්‍යං. ඉදං කායමොනෙය්‍යං.

කතමං වචීමොනෙය්‍යං: චතුබ්බිධානං වචීදුච්චරිතානං පහානං වචීමොනෙය්‍යං, චතුබ්බිධං වචීසුචරිතං වචීමොනෙය්‍යං, වාචාරම්මණං ඤාණං වචීමොනෙය්‍යං, වාචාපරිඤ්ඤා වචීමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො වචීමොනෙය්‍යං, වාචාය ඡන්දරාගප්පහානං වචීමොනෙය්‍යං, වාචාසංඛාරනිරොධො දුතියජ්ඣානසමාපත්ති වචීමොනෙය්‍යං, පරිඤ්ඤා සහගතො මග්ගො වචීමොනෙය්‍යං, වාචාය ඡන්දරාගප්පහානං වචීමොනෙය්‍යං, වාචාසංඛාරනිරොධො තතියජ්ඣානසමාපත්ති වචීමොනෙය්‍යං. ඉදං වචීමොනෙය්‍යං.

---

a. ධම්මසඞ්ගණි – චිත්තුප්පාදකණ්ඩ

**පරිදෙවො** යනු: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ ශීලව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහු ගේ අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් හෝ පහස්නා ලද්දහු ගේ සමන්වාගත වූවහු ගේ අන්‍යතරාන්‍යතර දුඃඛධර්මයෙකින් හෝ පහස්නා ලද්දහු ගේ නම කියා හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් නම කියා හඬන අයුරෙක් ගුණ කියා හඬන අයුරෙක් නම කියා හැඬූ බවෙක් ගුණ කියා හැඬූ බවෙක් වචනයෙක් ප්‍රලාපයෙක් (ඩිස් බසෙක්) විප්‍රලාපයෙක් පුනපුනා ලපනයෙක් පුනපුනා ලපනාකාරයෙක් පුනපුනා ලපිත බවෙක් වේද එය යි.

**කථං නු ධීරා විතරන්ති ඔඝං ජාතිජරං සොකපරිද්දවඤ්ච** යනු: ධීරයෝ කිසෙයින් ඔඝයත් ජාතියත් ජරාවත් ශොකයත් පරිදෙවයත් (කාමයන් දුරු කෙරෙමින්) තරණය කෙරෙති, (කෙලෙසුන් දුරු කෙරෙමින්) උත්තරණය කෙරෙති, (හෙතු සිඳිමින්) ප්‍රතරණය කෙරෙති, (සසර) ඉක්මවති, (ප්‍රතිසන්ධිය අභව්‍යොත්පත්තික කෙරෙමින්) ඉක්ම සිටිත් නුයි 'කථං නු ධීරා විතරන්ති ඔඝං ජාතිජරං සොකපරිද්දවඤ්ච' යනු වේ.

**තං මෙ මුනි සාධු වියාකරොහි** යනු: තං යනු: යමක්හු පුළුවුස්නෙම් ද, යමක්හු අයදනෙම් ද, යමක්හු අධ්‍යෙෂණ කෙරෙම් ද, යමක්හු පහදවම් ද, (ඔහු යැ) මුනි යනු: 'මොන' යි ඥානය කියනු ලැබෙයි: යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් . . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යක්දෘෂ්ටියෙක් වේ ද, එයයි. භාග්‍යවතුන් වහන්සේ ඒ ඥානයෙන් සමන්වාගත වූවාහු මුනි වූවාහු මුනිභාවයට පැමිණියහ.

මොනෙය්‍ය තුනෙකි: කායමොනෙය්‍ය යැ වචීමොනෙය්‍ය යැ මනොමොනෙය්‍ය යි. **කායමොනෙය්‍ය** කවරැ යත්: ත්‍රිවිධ කායදුශ්චරිතයන්ගේ ප්‍රහාණය කායමොනෙය්‍ය යැ, ත්‍රිවිධ කායසුචරිතය කායමොනෙය්‍ය යැ, කය අරමුණු කොට පවත්නා ඥානය කායමොනෙය්‍ය යැ කායපරිඥාව කාය මොනෙය්‍ය යැ පරිඥාසහගත (අධ්‍යාත්ම කය සම්මර්ශනය කොට උපදවන ලද) මාර්ගය කායමොනෙය්‍ය යැ කයෙහි ඡන්දරාග ප්‍රහාණය කායමොනෙය්‍ය යැ කායසංඛාර (ආශ්වාස ප්‍රශ්වාස) නිරොධ සංඛ්‍යාත චතුර්ථධ්‍යානසමාපත්තිය කායමොනෙය්‍ය යැ මේ 'කායමොනෙය්‍ය' යි.

**වචීමොනෙය්‍ය** කවරැ යත්: චතුර්විධ කායදුශ්චරිතයන් ගේ ප්‍රහාණය වචීමොනෙය්‍ය යැ චතුර්විධ වාක්සුචරිතය වචීමොනෙය්‍ය යැ, වචනය අරමුණු කොට පවත්නා ඥානය වචීමොනෙය්‍ය යැ, වාක්පරිඥාව වචීමොනෙය්‍ය යැ, පරිඥාසහගත මාර්ගය වචීමොනෙය්‍ය යැ වචනයෙහි ඡන්දරාග ප්‍රහාණය වචීමොනෙය්‍ය යැ, වාක්සංස්කාර (විතර්ක විචාර) නිරොධ සංඛ්‍යාත ද්විතීයධ්‍යානසමාපත්තිය වචීමොනෙය්‍ය යැ, මේ 'වචීමොනෙය්‍ය' යි.

කතමං මනොමොනෙය්‍යං: තිවිධානං මනොදුච්චරිතානං පහානං මනොමොනෙය්‍යං, තිවිධං මනොසුචරිතං මනොමොනෙය්‍යං, චිත්තාරම්මණං ඤාණං මනොමොනෙය්‍යං, චිත්තපරිඤ්ඤා මනොමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො මනොමොනෙය්‍යං, චිත්තෙ ඡන්දරාගප්පහානං මනොමොනෙය්‍යං, චිත්තසඞ්ඛාරනිරොධො සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති මනොමොනෙය්‍යං. ඉදං මනොමොනෙය්‍යං.

7 "කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු සබ්බප්පහායිනං.[a]

8 කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං
මුනිං මොනෙය්‍යසම්පන්නං[1] ආහු නින්හාතපාපක"න්ති.[b]

ඉමෙහි තීහි මොනෙය්‍යෙහි ධම්මෙහි සමන්නාගතා. ඡ මුනිනො: අගාරමුනිනො අනගාරමුනිනො සෙඛමුනිනො අසෙඛමුනිනො පච්චෙකමුනිනො මුනිමුනිනො.

කතමෙ අගාරමුනිනො: යෙ තෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අගාරමුනිනො. කතමෙ අනගාරමුනිනො යෙ තෙ පබ්බජිත දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අනගාරමුනිනො. සත්ත සෙඛා සෙඛමුනිනො. අරහන්තො අසෙඛමුනිනො. පච්චෙකබුද්ධා පච්චෙකමුනිනො. මුනිමුනිනො වුච්චන්ති තථාගතා අරහන්තො සම්මාසම්බුද්ධා.

9 "න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු
යො ච තුලංව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො,

10 පාපානි පරිවජ්ජෙති ස මුනී තෙන සො මුනි
යො මුනාති උභොලොකෙ මුනී තෙන පවුච්චති.[c]

11 අසතං සතඤ්ච ඤත්වා ධම්මං අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ
දෙවමනුස්සෙහි පූජිතො යො සඞ්ගජාලමතිච්ච සො මුනී"ති.[d]

සාධු වියාකරොහීති තං සාධු ආචික්ඛ[2] දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති 'තං මෙ මුනී සාධුවියාකරොහි'.

---

1. සණ්ඨිතො-කත්ථචි
a. තිකඞ්ගුත්තර 3 - ආපායිකවග්ග
b. ඉතිවුත්තක - දුතියවග්ග
c. ධම්මපද-ධම්මට්ඨවග්ග
d. සුත්තනිපාත-සභියසුත්ත
2. ආචික්ඛාහි-මජ සං

**මනොමොනෙය්‍ය** කවරැ යත්: ත්‍රිවිධ මනොදුශ්චරිතයන් ගේ ප්‍රහාණය මනොමොනෙය්‍ය යැ, ත්‍රිවිධමනොසුචරිතය මනොමොනෙය්‍ය යැ චිත්තාලම්බනයෙහි ඥානය මනොමොනෙය්‍ය යැ චිත්තපරිඥාව මනොමොනෙය්‍ය යැ පරිඥා සහගත මාර්ගය මනොමොනෙය්‍ය යැ සිතෙහි ඡන්දරාග ප්‍රහාණය මනොමොනෙය්‍ය යැ චිත්තසංස්කාර (සංඥා වෙදනා) නිරොධ සංඛ්‍යාත සංඥාවෙදයිතනිරොධසමාපත්තිය මනොමොනෙය්‍ය යැ, මේ 'මනොමොනෙය්‍ය' යි.

7 (කායවාග්මනොදුශ්චරිතය දුරැලීම වශයෙන්) කායමුනි වූ වාග්මුනි වූ මනො මුනි වූ අනාස්‍රව වූ (ඵලයෙහි සිටි හෙයින්) මොනෙය්‍යසම්පන්න වූ මුනිහු සියලු කෙලෙසුන් දුරු කෙළේ යයි කියත්.

8 කායමුනි වූ වාග්මුනි වූ මනොමුනි වූ අනාස්‍රව වූ මොනෙය්‍ය සම්පන්න වූ මුනිහු සෝද හළ පව් ඇත්තෙකැ' යි කියත්.

මේ තුන් මොනෙය්‍ය ධර්මයන් ගෙන් සමන්විත වූ මුනිහු සදෙනෙකි: අගාරමුනිහු යැ අනගාරමුනිහු යැ ශෛක්ෂමුනිහු යැ අශෛක්ෂමුනිහු යැ ප්‍රත්‍යෙකමුනිහු යැ මුනිමුනිහු යැ යි.

**අගාරමුනිහු** කවරහ යත්: දක්නා ලද නිවන් ඇති දන්නා ලද (ශික්ෂාත්‍රය) ශාසනය ඇති යම් ගිහිගේ වැසි කෙනෙක් වෙත් ද, මොහු අගාර මුනිහු යැ. **අනගාරමුනිහු** කවරහ යත්: දුටු නිවන ඇති දත් සසුන් ඇති යම් පැවිදි කෙනෙක් වෙත් ද, මොහු අනගාරමුනිහු යැ. සප්ත ශෛක්ෂයෝ **සෙඛමුනිහු**යැ. රහත්හු **අසෙඛමුනිහු** යැ. පසේ බුදුවරයෝ **පච්චෙකමුනිහු** යැ. තථාගත වූ අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ මුනිමුනිහු යයි කියනු ලැබෙත්.

9 මූඪ ප්‍රකෘති ඇති අවිඥ තෙම මෞනභාවය (නො බැණ සිටීම) හෙතු කොට ගෙන මුනි වූයේ නො වෙයි. තවද පණ්ඩිත වූ යමෙක් තුලාව ගෙන සිටියක්හු සෙයින් උත්තම වූ ශීල සමාධ්‍යාදිය ගෙන —

10 අකුශල ධර්මයන් දුරු කෙරේ ද, හේ මුනි නම් වෙයි. යට කී කරුණෙන් හෙතෙම මුනි වූයේ යැ යමෙක් ස්කන්ධාදි ලොකයෙහි අධ්‍යාත්ම බාහිරාදි උභයාර්ථයන් දැන ගනී ද, එ කරුණෙන් හෙතෙම මුනි යයි කියනු ලැබේ.

11 යමෙක් කුශලාකුශල ප්‍රභෙද වූ සදසත්ධර්මය ද සියලු ස්කන්ධාදි ලොකයෙහි අධ්‍යාත්ම බාහිරාදි ධර්මය ද දැන රාගාදි සඞ්ගය හා තෘෂ්ණා දෘෂ්ටිජාලය ඉක්මවා සිටියේ ද ඒ ක්ෂීණාස්‍රව මුනි තෙමේ දෙව්මිනිසුන් විසින් පුදන ලදුයේ වේ.

**සාධු වියාකරොහි** යනු: එය මොනොවට පැවැසුව මැනැව, දෙසුව මැනැව, පැනවුව මැනැව, පිහිටුව මැනැව, විවෘත කළ මැනැව, විභාග කළ මැනැව, නො ගැඹුරු කළ මැනැව, ප්‍රකාශ කළ මැනැව නුයි. 'තං මෙ මුනි සාධු වියාකරොහි' යනු වේ.

තථා හි තෙ විදිතො එස ධම්මොති: තථාහි තෙ විදිතො තුලිතො තීරිතො විභූතො විභාවිතො එස ධම්මොති 'තථා හි තෙ විදිතො එස ධම්මො''
තෙනාහ සො බ්‍රාහ්මණො:

"යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි,
කථන්නු ධීරා විතරන්ති ඔඝං
ජාතිජරං[1] සොකපරිද්දවඤ්ච,
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො''ති.

---

## 4–5

කිත්තයිස්සාමි තෙ ධම්මං (මෙත්තගූති භගවා)
දිට්ඨෙ ධම්මෙ[2] අනීතිහං[3]
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං

කිත්තයිස්සාමි තෙ ධම්මන්ති: 'ධම්ම'න්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං, චත්තාරො සතිපට්ඨානෙ[4] චත්තාරො සම්මප්පධානෙ[5] චත්තාරො ඉද්ධිපාදෙ[6] පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්තබොජ්ඣඞ්ගෙ[7] අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං කිත්තයිස්සාමි, ආචික්ඛිස්සාමි දෙසෙස්සාමි පඤ්ඤපෙස්සාමි පට්ඨපෙස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසෙස්සාමීති 'කිත්තයිස්සාමි තෙ ධම්මං' මෙත්තගූති භගවාති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති.

දිට්ඨෙ ධම්මෙ අනීතිහන්ති: 'දිට්ඨෙ ධම්මෙ'ති දිට්ඨෙ ධම්මෙ ඤාතෙ ධම්මෙ තුලිතෙ ධම්මෙ තීරිතෙ[8] ධම්මෙ විභූතෙ ධම්මෙ විභාවිතෙ ධම්මෙ, සබ්බෙ සංඛාරා අනිච්චාති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති දිට්ඨෙ ධම්මෙ ඤාතෙ ධම්මෙ තුලිතෙ ධම්මෙ තීරිතෙ ධම්මෙ විභූතෙ ධම්මෙ විභාවිතෙ ධම්මෙති එවම්පි 'දිට්ඨෙ ධම්මෙ'.[9] අථවා දුක්ඛෙ දිට්ඨෙ දුක්ඛං කිත්තයිස්සාමි,[10] සමුදයෙ දිට්ඨෙ සමුදයං

1. ජාතිං ජරං–මජසං, ජාතිජ්ජරං–ස්‍යා
2. දිට්ඨෙව ධම්මෙ –ච,සු
3. අනීතිහං –මජසං, ස්‍යා
4. සතිපට්ඨානා –ච, ක
5. සම්මප්පධානා – ච, ක
6. ඉද්ධිපාද –ච, ක
7. සත්තබොජ්ඣඞ්ගා –ච, ක
8. තීරිතෙ – ස්‍යා
9. දිට්ඨෙ ධම්මෙ කථයිස්සාමි–මජසං, ස්‍යා
10. කථයිස්සාමි – ච, ක, වි, – මජසං, ස්‍යා

**තථා හි තෙ විදිතො එස ධම්මො** යනු: යම් හෙයකින් මුඹ වහන්සේ විසින් තෙල දහම දන්නා ලද ද තුලනය කරන ලද ද තීරණය කරන ලද ද ප්‍රකට කරන ලද ද වඩන ලද ද එහෙයිනැයි, 'තථා හි තෙ විදිතො එස ධම්මො' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

"යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො–පෙ–තථා හි තෙ විදිතො එස ධම්මො' යි.

---

4–5.

(බුදුහු මෙසේ වදළහ: "මෙත්තගූ මාණවකය), ස්මෘතිමත් වැ හැසිරෙනුයේ දක්නා ලද දුඃඛාදි ධර්මයෙහි නොහොත් මෙ අත්බැව්හි මැ ආත්මප්‍රත්‍යක්ෂ වූ යම් දහමක් දන ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කරන්නේ නම් ඒ නිර්වාණධර්මය ද නිර්වාණගාමිනී ප්‍රතිපද් ධර්මය ද තොපට ප්‍රකාශ කරන්නෙමි."

**කිත්තයිස්සාමි තෙ ධම්මං** යනු: ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ (අර්ථසම්පත්තියෙන්) සාර්ථ වූ (ව්‍යඤ්ජන සම්පත්තියෙන්) සව්‍යඤ්ජන වූ කෙවල (සකල) පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍ය යැ. සතර සිව්වටන් යැ සතර සම්‍යක්ප්‍රධාන යැ සතර ඍද්ධිපාද යැ පඤ්චෙන්ද්‍රිය යැ පඤ්චබල යැ සප්තබොධ්‍යඞ්ග යැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග යැ යළි නිර්වාණ ය ද නිර්වාණගාමිනීප්‍රතිපදව ද කීර්තනය කරන්නෙමි ප්‍රකාශ කරන්නෙමි, දෙසන්නෙමි, පනවන්නෙමි, පිහිටුවන්නෙමි, විවෘත කරන්නෙමි, විභාග කරන්නෙමි, නො ගැඹුරු කරන්නෙමි, පවසන්නෙම් නුයි 'කිත්තයිස්සාමි තෙ ධම්මං' යනු වේ. **මෙත්තගූ'ති භගවා** යනු: බුදුහු එ බමුණු නමින් අමතත්.

**දිට්ඨෙ ධම්මෙ අනිතිහං** යනු: 'දිට්ඨෙ ධම්මෙ' යනු: දක්නාලද දහම්හි දන්නා ලද දහම්හි තුලනය කරන ලද දහම්හි තීරණය කරන ලද දහම්හි ප්‍රකට වූ දහම්හි වැඩූ දහම්හි, 'හැම සංස්කාරයෝ අනිත්‍යහ' යි...යම් කිසි සමුදය ධර්මයෙක් වේ ද එ හැම නිරොධස්වභාවය ඇතැ'යි දක්නා ලද දහම්හි දන්නා ලද දහම්හි තුලනය කරන ලද දහම්හි තීරණය කරනලද දහම්හි ප්‍රකට වූ දහම්හි වැඩූ දහම්හි නුයි මෙසේ 'දිට්ඨෙ ධම්මෙ' යනු වේ. **නොහොත්** දුක (ලක්ෂණ රස සහිත වැ) දක්නා ලද කල්හි දුක කියන්නෙමි.

කිත්තයිස්සාමි, නිරොධෙ දිට්ඨෙ නිරොධං කිත්තයිස්සාමි, මග්ගෙ දිට්ඨෙ මග්ගං කිත්තයිස්සාමී'ති එවම්පි 'දිට්ඨෙ ධම්මෙ'. අථවා දිට්ඨෙ ධම්මෙ සන්දිට්ඨිකං අකාලිකං එහිපස්සිකං ඔපනයිකං[1] පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහීති එවම්පි 'දිට්ඨෙ ධම්මෙ'. අනීතිහන්ති න ඉතිහිතිහං න ඉතිකිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයං අභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මං, තං කථයිස්සාමීති 'දිට්ඨෙ ධම්මෙ අනීතිහං'.

යං විදිත්වා සතො චරන්ති: යං විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති –පෙ–'සබ්බෙ ධම්මා අනත්තා'ති –පෙ– 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. සතොති චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනා සතිපට්ඨානං භාවෙන්තො සතො –පෙ– සො වුච්චති 'සතො'. චරන්ති චරන්තො විහරන්තො ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තොති 'යං විදිත්වා සතො චරං'.

තරෙ ලොකෙ විසත්තිකන්ති: 'විසත්තිකා' වුච්චති තණ්හා, 'යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසල මූලං'[a] විසත්තිකාති කෙනට්ඨෙන විසත්තිකා: විසතාති[2] විසත්තිකා, විසාලාති විසත්තිකා, විසටාති විසත්තිකා[3] විසමාති විසත්තිකා, විසක්කතීති විසත්තිකා, විසංහරතීති විසත්තිකා, විසංවාදිකාති විසත්තිකා, විසමූලාති විසත්තිකා, විසඵලාති විසත්තිකා, විසපරිභොගාති විසත්තිකා. විසාලා වා පන සා තණ්හා රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලෙ ගණෙ ආවාසෙ ලාභෙ යසෙ පසංසායං සුඛෙ චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ කාමධාතුයා, රූපධාතුයා, අරූපධාතුයා, කාමභවෙ රූපභවෙ අරූපභවෙ

---

1. ඔපනෙය්‍යිකං –ම ඡ සං
2. විසතොති විසත්තිකා – ව, වි, ක
3. විසතාති විසත්තිකා – ව, වි, ක

a ධම්මසඞ්ගණී – නික්ඛෙපකණ්ඩ

සමුදය දක්නාලද කල්හි සමුදය කියන්නෙමි, මාර්ගය දක්නා ලද කල්හි මාර්ගය කියන්නෙමි, නිරොධය දක්නා ලද කල්හි නිරොධය කියන්නෙමි, නුයි මෙසේ ත් 'දිට්ඨෙ ධම්මෙ' යනු වේ. **නොහොත්** මෙ අත්බැව්හි තමා විසින් දක්ක යුතු යැ කල් නො යවා පල දෙන්නේ යැ 'එව බලව' යන විධියට නිසි යැ තමන් තමන් සිත්හි එළවීමට නිසි යැ නුවණැතියන් විසින් තමන් තමන් සිත්හි ලා දතයුතු යැ' යි මෙසේ ත් 'දිට්ඨෙ ධම්මෙ 'යනු වේ. **අනිතිහං** යනු: 'මෙසේ මෙසේ ලැ'යි නො වැ 'මෙසේ වී ලැ' යි නො වැ පරම්පරාකථාවෙන් නො වැ පිටකසම්පදායෙන් නො වැ තර්කහේතුවෙන් නො වැ න්‍යායහේතුවෙන් නො වැ (මෙ මැනැ වැ යි) ආකාර සැලැකීමෙන් නො වැ අප විසින් විශ්වසා ගන්නා ලද දෘෂ්ටිය හා සම යයි නො වැ තුමූ මැ තමන්මැ තමන් විසින් අවබෝධ කළ තමහට ප්‍රත්‍යක්ෂ වූ ධර්ම යැ, එය කියන්නෙමි නුයි 'දිට්ඨෙ ධම්මෙ අනිතිහං' යනු වේ.

**යං විදිත්වා සතො චරං** යනු: යමක් විදිත කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට, 'හැම සංස්කාරයෝ අනිත්‍ය හ'යි විදිත කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට, 'හැම සංස්කාරයෝ දුක්හ'යි– 'හැම දහම්හු අනිත්‍යහ'යි විදිත කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට. **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ, කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ ......හේ 'සිහි ඇතියේ' යයි කියනු ලැබෙයි. **චරං** යනු: .සරනුයේ වාසය කරනුයේ ඉරියව් පවත්වනුයේ පවත්නේ, පාලනය කරනුයේ යාපනය කරනුයේ යැපෙනුයේ නුයි 'යං විදිත්වා සතො චරං' යනු වේ.

**තරෙ ලොකෙ විසත්තිකං** යනු: තෘෂ්ණාව 'විසත්තිකා' යි කියනු ලැබෙයි. යම් රාගයෙක් බලවත් රාගයෙක් ......අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **විසත්තිකා** යනු: කවර අරුතෙකින් 'විසත්තිකා' නම් වූ යැ යත්: විසෘත වන හෙයින් විසත්තිකා යැ, විශාල වන හෙයින් විසත්තිකා යැ, විසෘෂ්ට වන හෙයින් විසත්තිකා යැ, විශෙෂයෙන් සහ්‍ය (සහනය කළ හැකි) වන හෙයින් විසත්තිකා යැ; වෙසෙසින් සිත හකුළුවන හෙයින් හෝ දුඃඛ විෂය එළවන හෙයින් හෝ විසත්තිකා යැ (අනිත්‍යාදිය) විසංවාදන කරන හෙයින් විසත්තිකා යැ, විෂමූල හෙයින් විසත්තිකා යැ විෂඵල හෙයින් විසත්තිකා යැ විෂපරිභොග හෙයින් විසත්තිකා යැ, යළි විශාල වූ ඒ තෘෂ්ණාව රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි ස්ප්‍රෂ්ටව්‍යයෙහි, කුලයා කෙරෙහි ගණයා කෙරෙහි ආවාසයෙහි ලාභයෙහි යශස්හි ප්‍රශංසායෙහි සුඛයෙහි, චීවරයෙහි පිණ්ඩපාතයෙහි ශයනාසනයෙහි ගිලානප්‍රත්‍යයෙහි, කාමධාතුයෙහි රූප ධාතුයෙහි අරූපධාතුයෙහි, කාමභවයෙහි රූපභවයෙහි අරූපභවයෙහි

සඤ්ඤීභවෙ අසඤ්ඤීභවෙ නෙවසඤ්ඤීනාසඤ්ඤීභවෙ, එකවොකාරභවෙ චතුවොකාරභවෙ පඤ්චවොකාරභවෙ, අතීතෙ අනාගතෙ පච්චුප්පන්නෙ, දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු විසතා විත්ථතාති 'විසත්තිකා'. ලොකෙති අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ. තරෙ ලොකෙ විසත්තිකන්ති ලොකෙ වෙසා විසත්තිකා[1] ලොකෙවෙතං විසත්තිකං සතො තරෙය්‍ය, උත්තරෙය්‍ය පතරෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍යාති 'තරෙ ලොකෙ විසත්තිකං'.

තෙනාහ භගවා:

කිත්තයිස්සාමි තෙ ධම්මං (මෙත්තගූති භගවා)
දිට්ඨෙ ධම්මෙ අනීතිහං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තික'න්ති.

---

4–6

තඤ්චාහං අභිනන්දාමි
මහෙසි ධම්මමුත්තමං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

**තඤ්චාහං අභිනන්දාමීති:** 'ත'න්ති තුය්හං වචනං බ්‍යප්පථං[2] දෙසනං අනුසාසනං අනුසිට්ඨිං[3] අභිනන්දාමීති නන්දාමි මොදාමි අනුමොදාමි ඉච්ඡාමි සාදියාමි යාචාමි පත්ථයාමි පිහයාමි අභිජප්පාමීති 'තඤ්චාහං අභිනන්දාමි'.

මහෙසි ධම්මමුත්තමන්ති: 'මහෙසී'ති මහෙසි භගවා; මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති 'මහෙසි' මහන්තං සමාධික්ඛන්ධං මහන්තං පඤ්ඤාක්ඛන්ධං – මහන්තං විමුත්තික්ඛන්ධං – මහන්තං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති 'මහෙසි'

---

1. යා සා ලොකෙ විසත්තිකා—සයා
2. බ්‍යපථං—සයා
3. අනුසිට්ඨං – මජසං
අනුසත්ථිං – ච, වි, ක, ම, සයා

සංඥාභවයෙහි අසංඥාභවයෙහි නෛවසංඥානාසංඥාභවයෙහි එකස්කන්ධ භවයෙහි චතුඃස්කන්ධ භවයෙහි පඤ්චස්කන්ධභවයෙහි, අතීතකාලයෙහි අනාගතකාලයෙහි ප්‍රත්‍යුත්පන්නකාලයෙහි, දෘෂ්ටශ්‍රුතමුතවිඥෙයධර්ම යන්හි විසෘත විස්තෘත නුයි ''විසත්තිකා' නමි. **ලොකෙ** යනු: අපායලොක යෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතු ලොකයෙහි ආයතනලොකයෙහි යි. **තරෙ ලොකෙ විසත්තිකං** යනු: මේ විසත්තිකා තොමෝ ස්කන්ධලොකයෙහි මැ වෙයි. සකන්ධලොක යෙහි මැ පවත්නා වූ මේ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව සිහි ඇතියේ (කාමයන් දුරු කෙරෙමින්) තරණය කරන්නේ යැ, (කෙලෙසුන් දුරු කෙරෙමින්) උත්තරණය කරන්නේ යැ, (ප්‍රතිෂ්ඨාහෙතු සිඳිමින්) ප්‍රතරණය කරන්නේ යැ (සසර ඉක්මවමින්) සමතික්‍රමණය කරන්නේ යැ, (ප්‍රතිසන්ධි යට අභව්‍යොත්පත්තික කෙරෙමින්) ඉක්මවන්නේ නුයි 'තරෙ ලොකෙ විසත්තිකං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

'කිත්තයිස්සාමි තෙ ධම්මං–පෙ–තරෙ ලොකෙ විසත්තිකං' යී.

---

## 4–6.

මහර්ෂීන් වහන්ස, ස්මෘතිමත් වැ හැසිරෙනුයේ යම් දහමක් දූන ලොවැ විසත්තිකා(තෘෂ්ණා)ව තරණය කරන්නේ නම්, මම මුඹ වහන්සේ ගේ ඒ (ධර්මද්‍යොතක) වචනය ද රුස්මි. උත්තම වූ ඒ ධර්මය ද රුස්මි.

**තඤ්වාහං අභිනන්දාමි** යනු: තං' යනු, මුඹ වහන්සේ ගේ කියමන වාක්‍යපථය දේශනය අනුශාසනය අනුශාසනිය. නැඳුම් යනු: සතුටු වෙමි. මුදිත වෙමි, අනුමෝදන් වෙමි, රුස්මි, ඉවසමි, අයදිමි, ප්‍රාර්ත්ථනා කෙරෙමි, ඉස්නෙමි, අභිජල්පනය කෙරෙමි නුයි 'තඤ්වාහං අභිනන්දාමි' යනු වේ.

**මහෙසි ධම්මමුත්තමං** යනු: බුදුහු මහර්ෂි යැ: මහත් වූ ශීලස්කන්ධය එෂණ – ගවෙෂණ – පර්‍යෙෂණ කෙළේ නුයි මහර්ෂි යැ, මහත් වූ සමාධි ස්කන්ධය– මහත් වූ ප්‍රඥා ස්කන්ධය– මහත් වූ විමුක්තිස්කන්ධය– මහත් වූ විමුක්තිඥාන දර්ශනස්කන්ධය එෂණ ගවෙෂණ පර්‍යෙෂණ කෙළේ නුයි මහර්ෂි යැ,

මහතො තමොකායස්ස[1] පදාලනං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’ මහතො විපල්ලාසස්ස පභෙදනං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’ මහතො තණ්හාසල්ලස්ස අබ්බූහනං[2] එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’ මහතො දිට්ඨිසඞ්ඝාටස්ස[3] විනිවෙඨනං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො මානධජස්ස පාතනං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො අභිසංඛාරස්ස වූපසමං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො ඔඝස්ස නිත්ථරණං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො භාරස්ස නික්ඛෙපනං.[4] එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො සංසාරවට්ටස්ස උපච්ඡෙදං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො සන්තාපස්ස නිබ්බාපනං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො පරිළාහස්ස පටිප්පස්සද්ධිං.[5] එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහතො ධම්මධජස්ස උස්සාපනං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහන්තෙ සතිපට්ඨානෙ මහන්තෙ සම්මප්පධානෙ මහන්තෙ ඉද්ධිපාදෙ - මහන්තානි ඉන්ද්‍රියානි මහන්තානි බලානි - මහන්තෙ බොජ්ඣඞ්ගෙ - මහන්තං අරියං අට්ඨඞ්ගිකං මග්ගං - මහන්තං පරමත්ථං අමතං නිබ්බානං එසි ගවෙසි පරියෙසීති ‘මහෙසි’. මහෙසක්ඛෙහි[6] වා සත්තෙහි එසිතො ගවෙසිතො පරියෙසිතො කහං බුද්ධො කහං භගවා, කහං දෙවදෙවො, කහං නරාසභො’ති ‘මහෙසි’.

ධම්මමුත්තමන්ති ‘ධම්මමුත්තමං’ වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, උත්තමන්ති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං ධම්මන්ති මහෙසි ධම්මමුත්තමං.

යං විදිත්වා සතොචරන්ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, ‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති - ‘සබ්බෙ ධම්මා අනත්තා’ති -පෙ- ‘යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම’න්ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. සතොති චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, වෙදනාසු වෙදනානුපස්සනා - චිත්තෙ චිත්තානුපස්සනා - ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො-පෙ- සො වුච්චති ‘සතො’. චරන්ති චරන්තො විහරන්තො ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තොති ‘යං විදිත්වා සතො චරං’

1. මහතො මොහකායස්ස-ස-
2. අබ්බහනං- මජසං
3. දිට්ඨිසඞ්ඝාතස්ස - ම ජ සං
4. නික්ඛෙපනං - ස
5. පටිපස්සද්ධං - ම ජ සං
6. මහෙසක්ඛෙහිවා -එ-වි-ක

මහත් වූ තමස්කායයාගේ ප්‍රදලනය, මහත් වූ විපර්‍යාසයා ගේ බිඳීම, මහත් වූ තෘෂ්ණාශල්‍යය ඉදිරීම, මහත් වූ දෘෂ්ටිසංඝාටය ලිහීම, මහත් වූ මානධ්වජය ලිහලීම, මහත් වූ අභිසංස්කාරය සන්හිඳුවීම, මහත් වූ ඕඝය තරණය කිරීම, මහත් වූ (පස්කඳ) බර බහා තැබීම, මහත් වූ සසරවට සිඳීම, මහත් වූ (කෙලෙස්) තැවුලිය නිවීම, මහත් වූ (ක්ලෙශ) පරිදහය සන්හිඳුවීම, මහත් වූ ධර්මධ්වජය එසැවීම එෂණ ගවෙෂණ පයෙෂණ කෙළේ නුයි මහර්ෂි යැ, මහත් වූ සතිපට්ඨානයන්- මහත් සම්‍යක් ප්‍රධානයන්- මහත් ඍද්ධිපාදයන්- මහත් ඉන්ද්‍රියයන්- මහත් බලයන්- මහත් බොධ්‍යඞ්ගයන්- මහත් වූ ආර්‍යඅෂ්ටාංගිකමාර්ගය- මහත් වූ පරමාර්ථ වූ අමාමහනිවන එෂණ ගවෙෂණ පයෙෂණ කෙළේ නුයි මහර්ෂි යැ. නොහොත් මහෙශාඛ්‍ය වූ සත්ත්වයන් විසින් 'කොහි යැ බුදුහු, කොහි යැ භාග්‍යවත්හු, කොහි යැ දෙවියනට දෙව්වූවෝ, කොහි යැ නර ශ්‍රෙෂ්ඨයෝ ය'යි එෂිත ගවෙෂිත පර්‍යෙෂිත නුයි 'මහෙසි' යනු වේ.

**ධම්මමුත්තමං** යනු: අමාමහනිවන 'උතුම් දහමැ'යි කියනු ලැබෙයි: යමක් හැම සංස්කාරයන්ගේ සන්හිඳීම හැම උපධීන්ගේ හැරපීම තෘෂ්ණාක්ෂය විරාගය නිරොධය නිවන වේ ද, එය යි. **උත්තමං** යනු: අග්‍ර වූ ශ්‍රෙෂ්ඨ වූ අතිශයින් ශ්‍රෙෂ්ඨ වූ ප්‍රමුඛ වූ උතුම් වූ ප්‍රවර වූ දහම නුයි 'මහෙසිධම්මමුත්තමං' යනු වේ.

**යං විදිත්වා සතො චරං** යනු විදිත (දන්නාලද) කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට, 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි විදිත කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට 'හැම සංස්කාරයෝ දුක්හ'යි-'හැම ධර්මයෝ අනාත්මහ'යි... යම් කිසිවක් සමුදය ස්වභාවය ඇත් නම් එහැම නිරොධ ස්වභාවය ඇතැ'යි විදිත කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට. **සතො** යනු: සතර කරුණෙකින් ස්මෘතිමත් වූයේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් ස්මෘතිමත් වූයේ, වේදනාවන්හි- චිත්තයෙහි-ධර්මයන්හි ධම්මානුපස්සනා සතිපට්ඨානය වඩමින් ස්මෘතිමත් වූයේ... හෙතෙම 'ස්මෘතිමත් වූයේ' යි කියනු ලැබේ. **චරං** යනු: හැසිරෙනුයේ වෙසෙනුයේ ඉරියව් පවත්වනුයේ පවත්නේ රැකෙනුයේ යැපෙනුයේ යාපනය කරනුයේ නුයි 'යං විදිත්වා සතො චරං' යනු වේ.

**තරෙ ලොකෙ විසත්තිකන්ති**: 'විසත්තිකා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං' **විසත්තිකාති** කෙනට්ඨෙන විසත්තිකා -පෙ- විසටා විත්ථතාති 'විසත්තිකා' **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙ. **තරෙ ලොකෙ විසත්තිකන්ති** ලොකෙ වෙසා විසත්තිකා, ලොකෙ වෙතං[1] විසත්තිකං සතො තරෙය්‍ය උත්තරෙය්‍ය පතරෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍යාති 'තරෙ ලොකෙ විසත්තිකං'.

තෙනාහ සො බ්‍රාහ්මණො;

"තං චාහං අභිනන්දාමි
මහෙසි ධම්මමුත්තමං,
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තික'න්ති.

---

4-7

යං කිඤ්චි සම්පජානාසි[2] (මෙත්තගූති භගවා)
උද්ධං අධො තිරියං චාපි මජ්ඣෙ[3]
එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච
පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ.

**යං කිඤ්චි සම්පජානාසීති**: යං කිඤ්චි පජානාසි ආජානාසි විජානාසි පටිවිජානාසි පටිවිජ්ඣසීති 'යං කිඤ්චි සම්පජානාසි. **මෙත්තගූති භගවාති** භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති. **භගවාති** ගාරවාධිවචනමෙතං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති 'මෙත්තගූති භගවා'.

**උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙති**: 'උද්ධං' වුච්චති[4] අනාගතං, 'අධො' වුච්චති අතීතං '**තිරියංචාපි මජ්ඣෙති** පච්චුප්පන්නං 'උද්ධ'න්ති දෙවලොකො, 'අධො'ති නිරයලොකො **තිරියං චාපි මජ්ඣෙති** මනුස්ස ලොකො, අථවා **උද්ධන්ති** කුසලා ධම්මා, 'අධො'ති අකුසලා ධම්මා තිරියං චාපි මජ්ඣෙ'ති අබ්‍යාකතා ධම්මා, 'උද්ධ'න්ති අරූපධාතු, 'අධො'ති කාමධාතු, 'තිරියං චාපි මජ්ඣෙ'ති රූපධාතු, 'උද්ධන්ති සුඛා වෙදනා, 'අධො'ති දුක්ඛා වෙදනා, 'තිරියං චාපිමජ්ඣෙ'ති අදුක්ඛමසුඛා වෙදනා, 'උද්ධ'න්ති උද්ධං පාදතලා 'අධො'ති අධො කෙසමත්ථකා, 'තිරියං චාපි මජ්ඣෙ'ති වෙමජ්ඣෙති උද්ධං අධො තිරියං චාපි මජ්ඣෙ.'

1. ලොකෙ වාතං විසත්තිකං -ච, වි, ක
2. සංජානාසි – ප
   සංජානාමි – ච–වි–ක
3. තිරියං චාපි – කත්ථචි
4. උද්ධන්ති – ම ජ සං

**තරෙ ලොකෙ විසත්තිකං** යනු: තෘෂ්ණාව 'විසත්තිකා' යි කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය යි. **විසත්තිකා** යනු: කවර අරුතෙකින් 'විසත්තිකා' නම් වූ යැ යත්: ...විසෘත විස්තෘත නුයි විසත්තිකා යැ. **ලොකෙ** යනු: අපාය ලොකයෙහි ... ආයතනලොකයෙහි යැ. **තරෙ ලොකෙ විසත්තිකං** යනු: මේ විසත්තිකා තොමෝ ස්කන්ධලොකයෙහි මැ වෙයි, ස්කන්ධ-ලොකයෙහි මැ පවත්නා වූ මේ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ස්මෘතිමත් වූයේ තරණය කරන්නේ යැ උත්තරණය කරන්නේ යැ ප්‍රතරණය කරන්නේ යැ මොනොවට ඉක්ම යන්නේ යැ ඉක්ම පවත්නේ යි 'තරෙ ලොකෙ විසත්තිකං' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

"යඤ්වාහං අභිනන්දාමි – පෙ – තරෙ ලොකෙ විසත්තිකං' යි.

---

4–7.

(බුදුහු මෙසේ වදාළහ: මෙත්තගූ මාණවකය,) (අනාගත කාලාදි) උඩ ද (අතීතකාලාදි) යට ද (වර්තමානකාලාදි) මැද සරස ද වූ යම් කිසි ධර්මජාතයක් තෙපි දන්නවූ නම් තෙල උද්ධාදි ධර්මයෙහි තෘෂ්ණාව ද දෘෂ්ටිනිවෙශනය ද අභිසංස්කාරවිඥානය ද දුරු කරව, දුරු කොට (දෙවැදෑරුම්) භවයෙහි නො සිටිනේ යි.

**යං කිඤ්චි සම්පජානාසි** යනු: දන්නෙහි වෙසෙසින් දන්නෙහි ප්‍රකර්ෂයෙන් දන්නෙහි මොනොවට දන්නෙහි සිතින් අවබොධ කරන්නෙහි නුයි 'යං කිඤ්චි සම්පජානාසි' යනු වේ. **මෙත්තගූ'ති භගවා** යනු: බුදුහු ඒ බමුණු නමින් අමතති. **භගවා** යනු: ගෞරවනාමයෙකි . . . මේ 'භගවා' යනු සාක්ෂාත් ප්‍රඥප්තියක් නුයි 'මෙත්තගූ' ති භගවා' යනු වේ.

**උද්ධං අධො තිරියඤ්චා' පි මජ්ඣෙ** යනු: 'උද්ධං' යනු අනාගත යැ, 'අධො' යනු අතීත යැ, **තිරියඤ්චාපි මජ්ඣෙ** යනු වර්තමාන යැ. **උද්ධං** යනු දිව්‍ය ලොක යැ. **අධො** යනු නිරය ලොක යැ, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු මනුෂ්‍යලොක යැ. නොහොත් **උද්ධං** යනු කුශලධර්මයෝ යැ, **අධො** යනු අකුශල ධර්මයෝ යැ, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු අව්‍යාකෘතධර්මයෝ යැ. **උද්ධං** යනු අරූපධාතු යැ, **අධො** යනු කාමධාතු යැ, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු රූපධාතු යැ. **උද්ධං** යනු සුඛවෙදනා යැ, **අධො** යනු දුක්ඛවෙදනා යැ, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු අදුක්ඛමසුඛ වෙදනා යැ. **උද්ධං** යනු පැතෙලෙන් උඩ, **අධො** යනු කෙස්මතුයෙන් යට, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු දෙ මැද නුයි 'උද්ධං අධො තිරියඤ්චා'පි මජ්ඣෙ' යනු වේ.

**එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ**ති: 'එතෙසූ'ති ආචික්ඛිතෙසු දෙසිතෙසු පඤ්ඤපිතෙසු පට්ඨපිතෙසු විවරිතෙසු විභජිතෙසු උත්තානීකතෙසු පකාසිතෙසු. නන්දි වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං" නිවෙසනන්ති ද්වෙ නිවෙසනා: තණ්හානිවෙසනා ච දිට්ඨිනිවෙසනා ච, කතමා තණ්හානිවෙසනා: යාවතා තණ්හාසඞ්ඛාතෙන -පෙ- අයං තණ්හානිවෙසනා. කතමා දිට්ඨිනිවෙසනා: වීසතිවත්ථුකා සක්කායදිට්ඨි -පෙ- අයං දිට්ඨි-නිවෙසනා. **පනුජ්ජ විඤ්ඤාණන්ති** පුඤ්ඤාභිසඞ්ඛාරසහගතං විඤ්ඤාණං අපුඤ්ඤාභිසඞ්ඛාරසහගතං විඤ්ඤාණං, ආනෙඤ්ජාභිසඞ්ඛාරසහගතං-විඤ්ඤාණං, එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච අභිසංඛාරසහගතඤ්ච විඤ්ඤාණං නුජ්ජ පනුජ්ජ නුද පනුද ජහ පජහ විනොදෙහි බ්‍යන්තීකරොහි අනභාවං ගමෙහීති 'එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච පනුජ්ජ විඤ්ඤාණං.'

**භවෙ න තිට්ඨෙ**ති: 'භවා'ති ද්වෙ භවා: කම්මභවො ච පටිසන්ධිකො ච පුනබ්භවො. කතමො කම්මභවො: පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසංඛාරො, අයං කම්මභවො. කතමො පටිසන්ධිකො පුනබ්භවො: පටිසන්ධිකො රූපං වෙදනා[1] සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, අයං පටිසන්ධිකො පුනබ්භවො. **භවෙ න තිට්ඨෙති** නන්දිඤ්ච නිවෙසනඤ්ච අභිසංඛාර-සහගතං විඤ්ඤාණඤ්ච කම්මභවඤ්ච පටිසන්ධිකඤ්ච පුනබ්භවං පජහන්තො විනොදෙන්තො බ්‍යන්තීකරොන්තො අනභාවං ගමෙන්තො කම්මභවෙ න තිට්ඨෙය්‍ය, පටිසන්ධිකෙ පුනබ්භවෙ න තිට්ඨෙය්‍ය, න සන්තිට්ඨෙය්‍යාති '**පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ.**'

**තෙනාහ භගවා;**

**"යං කිඤ්චි සම්පජානාසි (මෙත්තගූති භගවා)**
**උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ,**
**එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච**
**පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ"ති**

1. රූප වෙදනා - සයා

**එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ** යනු: **එතෙසු** යනු: කියන ලද, දෙසන ලද, පනවන ලද, පිහිටුවනලද විවර කරන ලද, විභාග කරන ලද, නො ගැඹුරු කරන ලද, ප්‍රකාශ කරන ලද ධර්මයන්හි තෘෂ්ණාව 'නන්දි' යයි කියනු ලැබෙයි, යම් රාගයෙක් බලවත් රාගයෙක් . . . අභිධ්‍යායෙක් ලොභ අකුශල මූලයෙක් වේ ද, එය යි. **නිවෙසනං** යනු: නිවෙශන දෙකෙකි: තෘෂ්ණා නිවෙශන ද දෘෂ්ටි නිවෙශන ද' යි. **තෘෂ්ණා නිවෙශන** කවර යත්: යම්තාක් තෘෂ්ණා කොට්ඨාසයෙක් . . . මේ තෘෂ්ණා නිවෙශන යැ. දෘෂ්ටි නිවෙශන කවර යත්: විංශද්වස්තුක වූ සත්කාය දෘෂ්ටි යැ . . . මේ දෘෂ්ටි නිවෙශන යි. **පනුජ්ජ විඤ්ඤාණං** යනු: පුණ්‍යාභිසංස්කාර සහගත වූ විඥානයැ අපුණ්‍යාභි සංස්කාර සහගත වූ විඥානයැ ආනෙඤ්ජාභිසංස්කාර සහගත වූ විඥාන යි. තෙල දහම්හි නන්දියත් නිවෙශනයත් අභිසංස්කාර සහගත වූ විඥානයත්, හැරපියව, අතිශයින් හැරපියව, සිඳුව, අතිශයින් සිඳුව, හරුව, දුරු කරව, විගතාන්ත කරව, අනු අභාවයට යව නුයි 'එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච පනුජ්ජ විඤ්ඤාණං' යනු වේ.

**භවෙ න තිට්ඨෙ** යනු: 'භවා' යනු භව දෙකෙකි: කර්මභවය ද ප්‍රතිසන්ධි සංඛ්‍යාත පුනර්භවය ද යි. **කර්මභවය** කවර යත්: පුණ්‍යාභිසංස්කාර යැ අපුණ්‍යාභිසංස්කාර යැ ආනෙඤ්ජාභිසංස්කාර යි. මේ කර්මභව නම් වෙයි. **ප්‍රතිසන්ධිසංඛ්‍යාත පුනර්භවය** කවර යත්: ප්‍රතිසන්ධියෙහි වූ රූප යැ වෙදනා යැ සංඥා යැ සංස්කාර යැ විඥාන යැ යන යම් ධර්ම කෙනෙක් වෙත් ද, මේ ප්‍රති සන්ධික පුනර්භවය වේ. **භවෙ න තිට්ඨෙ** යනු: නන්දිය ත් නිවෙශනයත් අභිසංස්කාර සහගත විඥානයත් කර්මභවය ත් ප්‍රතිසන්ධික පුනර්භවයත් හැරපියනුයේ දුරු කරනුයේ විගතාන්ත කරනුයේ අනු අභාවයට පත් කරනුයේ කර්මභවයෙහි නො සිටුනේ යැ ප්‍රතිසන්ධික පුනර්භවයෙහි නො සිටුනේ යැ මොනොවට නො සිටුනේ යැ නුයි 'පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**''යං කිඤ්චි සම්පජානාසි–පෙ–පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ'යි.**

4–8

එවංවිහාරී සතො අප්පමත්තො
භික්ඛු චරං හිත්වා මමායිතානි,
ජාතිං ජරං[1] සොකපරිද්දවඤ්ච[2]
ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං.

**එවංවිහාරී සතො අප්පමත්තොති** 'එවංවිහාරී'ති: නන්දිඤ්ච නිවෙසනඤ්ච අභිසංඛාරසහගතවිඤ්ඤාණඤ්ච කම්මභවඤ්ච පටිසන්ධිකඤ්ච පුනබ්භවං පජහන්තො විනොදෙන්තො බ්‍යන්තීකරොන්තො අනභාවං ගමෙන්තොති 'එවංවිහාරී'. **සතොති:** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනා සතිපට්ඨානං භාවෙන්තො –පෙ– සො වුච්චති සතො. **අප්පමත්තොති:** සක්කච්චකාරී සාතච්චකාරී අට්ඨිතකාරී අනොලීනවුත්තී අනික්ඛිත්තඡන්දො අනික්ඛිත්තධුරො අප්පමත්තො කුසලෙසු ධම්මෙසු. කථාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා සීලක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය'න්ති[3] යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමත්තො අප්පමාදෙ කුසලෙසු ධම්මෙසු, කථාහං අපරිපූරං වා සමාධික්ඛන්ධං –පෙ– පඤ්ඤාක්ඛන්ධං– විමුත්තික්ඛන්ධං– විමුත්තිඤාණදස්සනක්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා විමුත්තිඤාණදස්සනක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය'න්ති[3]. යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමත්තො අප්පමාදෙ කුසලෙසු ධම්මෙසු, කථාහං අභිඤ්ඤාතං වා දුක්ඛං පරිජානෙය්‍යං, අප්පහීනෙ වා කිලෙසෙ පජහෙය්‍යං, අභාවිතං වා මග්ගං භාවෙය්‍යං, අසච්ඡිකතං වා නිරොධං සච්ඡිකරෙය්‍ය'න්ති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමත්තො අප්පමාදෙ කුසලෙසු ධම්මෙසු'ති 'එවංවිහාරී සතො අප්පමත්තො.

1. ජාති ජරං – සු
2. සොකපරිදෙවං ච –පත–එ
3. අනුග්ගණ්හෙය්‍යාත්ති – ම ජ ෂං

4–8

මෙසේ වාසය කරනසුලු ස්මෘතිමත් වූ අප්‍රමත්ත වූ මහණ තෙම මමත්වයන් හැර පියා හැසිරෙනුයේ විද්වත් වූයේ මෙ සස්නෙහි මැ නොහොත් මෙ අත්බැව්හි මැ ජාතිය ද ජරාව ද සොක–පරිදෙව දුක ද දුරැලන්නේ යි.

එවං විහාරී සතො අප්පමත්තො යනු: එවං විහාරී යි: තන්දිය ත් නිවෙශනය ත් අභිසංස්කාර සහගත විඥානය ත් කර්මභවය ත් ප්‍රතිසන්ධික පුනර්භවය ත් හැරපියනුයේ දුරු කරනුයේ විභතාන්ත කරනුයේ අනු අභාවයට යවනුයේ නුයි 'එවං විහාරී' යනු වේ. සතො යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් . . හේ 'ස්මෘතිමත් වූයේ' යි කියනු ලැබෙයි. අප්පමත්තො යනු: කුසල් දහම්හි සකසා කරනුයේ සතත භාවයෙන් කරනුයේ නො නැවැත කරනුයේ නො හැකුළුණු පැවැතුම් ඇතියේ නො තැබූ ඡන්දය ඇතියේ නො තැබූ වීර්‍ය්‍ය ධුර ඇතියේ අප්‍රමත්ත වූයේ 'කිසෙයින් මම නො පිරිපුන් ශීලස්කන්ධය පුරම් දෝ හෝ පිරිපුන්ශීලස්කන්ධය හෝ ඒ ඒ තන්හි ප්‍රඥායෙන් අනුග්‍රහ කෙරෙම් දෝ හො'යි ඒ කුසල් දහම්හි යම් කර්තුකම්‍යතා කුශලච්ඡන්ද යෙක් වැයමෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් නො පසුබස්නා වීර්‍ය්‍යයෙක් ස්මෘතියෙක් සම්ප්‍රඥානයෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙක් ප්‍රධන් වීර්‍ය්‍යයෙක් අධිෂ්ඨානයෙක් අනුයොගයෙක් නොපමාවෙක් අප්‍රමාදයෙක් වේ ද, කිසෙයින් මම නො පිරිපුන් සමාධිස්කන්ධය . . . ප්‍රඥාස්කන්ධය . . . විමුක්තිස්කන්ධය . . . විමුක්තිඥානදර්ශනස්කන්ධය පුරම් දෝ හෝ පිරිපුන් විමුක්තිඥානදර්ශනස්කන්ධය හෝ ඒ ඒ තන්හි ප්‍රඥායෙන් අනුග්‍රහ කෙරෙම් දෝ හො' යි ඒ කුසල් දහම්හි යම් කර්තුකම්‍යතා කුශලච්ඡන්දයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් නො පසුබස්නා වීර්‍ය්‍යයෙක් ස්මෘතියෙක් සම්ප්‍රඥානයෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙක් ප්‍රධන් වීර්‍ය්‍යයෙක් අධිෂ්ඨානයෙක් අනුයොගයෙක් නොපමාවෙක් අප්‍රමාදයෙක් වේ ද, කිසෙයින් මම අපරිඥාත වූ දුඃඛය ඥාතපරිඥායෙන් දැනගනිම් දෝ හෝ නො පුහුණු කෙලෙස් හෝ ප්‍රහාණය කෙරෙම් දෝ හෝ නො වැඩූ මාර්ගය හෝ වඩම් දෝ හෝ නො පසක් කළ නිරොධය හෝ පසක් කෙරෙම් දෝ හො'යි ඒ කුසල් දහම්හි යම් ඡන්දයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් නො පසුබස්නා වීර්‍ය්‍යයෙක් ස්මෘතියෙක් සම්ප්‍රඥානයෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙක් ප්‍රධන් වීර්‍ය්‍යයෙක් අධිෂ්ඨානයෙක් අනුයොගයෙක් නොපමාවෙක් අප්‍රමාදයෙක් වේ ද, එයින් යුක්ත නුයි 'එවං විහාරී සතො අප්පමත්තො' යනු වේ.

**භික්ඛු චරං හිත්වා මමායිතානීති:** 'භික්ඛූ'ති පුථුජ්ජන කල්‍යාණකො වා භික්ඛු සෙඛො වා[1] භික්ඛු. **චරන්ති:** චරන්තො විහරන්තො ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තො. **මමායිතානීති:** ද්වෙ මමත්තා: තණ්හාමමත්තං ච දිට්ඨිමමත්තං ච -පෙ- ඉදං තණ්හාමමත්තං -පෙ- ඉදං දිට්ඨිමමත්තං. තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා, මමත්තෙ ජහිත්වා චජිත්වා පජහිත්වා පරිච්චජිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'භික්ඛු චරං හිත්වා මමායිතානි.'

**ජාතිං ජරං සොකපරිද්දවං ච ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛන්ති:** 'ජාතී'ති: යා තෙසං තෙසං සත්තානං -පෙ- ජරන්ති: යා තෙසං තෙසං සත්තානං -පෙ- **සොකොති:** ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස -පෙ- **පරිද්දවන්ති**[2] ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස -පෙ- **ඉධාති:** ඉමිස්සා දිට්ඨියා -පෙ- ඉමස්මිං ලොකෙ. **විද්වාති:** විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී. **දුක්ඛන්ති:** ජාතිදුක්ඛං -පෙ- දොමනස්සුපායාසදුක්ඛං. **ජාතිං ජරං සොකපරිද්දවඤ්ච ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛන්ති:** විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී[3] ඉධෙව ජාතිඤ්ච ජරඤ්ච සොකපරිද්දවඤ්ච දුක්ඛඤ්ච පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති 'ජාතිං ජරං සොකපරිද්දවඤ්ච ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං'.

තෙනාහ භගවා:

"එවංවිහාරී සතො අප්පමත්තො
භික්ඛු චරං හිත්වා මමායිතානි
ජාතිං ජරං සොකපරිද්දවඤ්ච
ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛ"න්ති.

---

4-9

එතාභිනන්දාමි වචො මහෙසිනො
සුකිත්තිතං ගොතම නූපධීකං,
අද්ධා හි භගවා පහාසි දුක්ඛං
තථා හි තෙ විදිතො එස ධම්මො.

**එතාභිනන්දාමි වචො මහෙසිනොති:** එත'න්ති: තුය්හං වචනං බ්‍යප්පථං[3] දෙසනං අනුසිට්ඨිං[4] අභිනන්දාමීති නන්දාමි අභිනන්දාමි මොදාමි අනුමොදාමි ඉච්ඡාමි සාදියාමි පත්ථයාමි පිහයාමි අභිජප්පාමි. **මහෙසිනොති** මහෙසි භගවා: මහන්තං සීලක්ඛන්ධං එසී ගවෙසී පරියෙසීති මහෙසි -පෙ- 'කහං නරාසභො'ති මහෙසීති 'එතාභිනන්දාමි වචො මහෙසිනො'

1. සෙඛො වා – පන, ම ජ සං
2. පරිදෙවොති – හෑ
3. බ්‍යප්පථං –ච–වි–ක–සා
4. අනුසිට්ඨිං –ම ජ සං

**භික්ඛු චරං හිත්වා මමායිතානි** යනු: 'භික්ඛු' යි: පෘථග්ජන කල්‍යාණක මහණ හෝ වෙයි, ශෛක්ෂ මහණ හෝ වෙයි. **චරං** යනු: සරනුයේ වාසය කරනුයේ ඉරියව් පවත්වනුයේ පවත්නේ පාලනය කරනුයේ යැපෙනුයේ යාපනය කරනුයේ. **මමායිතානි** යනු: තෘෂ්ණා මමත්ව ද, දෘෂ්ටිමමත්ව ද යි මමත්ව දෙකෙකි . . . මේ තෘෂ්ණා මමත්ව යැ . . . මේ දෘෂ්ටි මමත්ව යැ. තෘෂ්ණාමමත්වය හැරපියා දෘෂ්ටිමමත්වය දුරු කොට මමත්ව යන් බැහැර කොට හැරපියා වෙසෙසින් බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනුඅභාවයට පත් කොට නුයි 'භික්ඛු චරං හිත්වා මමායිතානි' යනු වේ.

**ජාතිං ජරං සොකපරිද්දවඤ්ච ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං** යනු: 'ජාති' යි: ඒ ඒ සත්ත්වයන්ගේ යම් . . . ජරං යි: ඒ ඒ සත්ත්වයන්ගේ යම් . . . **සොකො** යි: ඥාති ව්‍යසනයෙන් පහස්නා ලද්දහු ගේ හෝ . . . **පරිදෙවො** යනු: ඥාතිව්‍යසනයෙන් පහස්නා ලද්දහු ගේ හෝ . . . **ඉධ** යනු: මේ දෘෂ්ටියෙහි . . . මේ මිනිස් ලොවැ. **විද්වා** යනු: ත්‍රිවිද්‍යාවට පැමිණියේ නැණැත්තේ විමසුම් නුවණැත්තේ තුලිතප්‍රඥා ඇත්තේ මෙහි මැ ජාතිය ත් ජරාව ත් සෝකයත් පරිදේවය ත් යන දුක බැහැර කරන්නේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනු අභාවයට යවන්නේ නුයි 'ජාතිං ජරං සොකපරිද්දවඤ්ච, ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

"**එවං විහාරී සතො අප්පමත්තො –පෙ– ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං** යි.

---

## 4–9.

(ආයුෂ්මත් මෙත්තගු මෙසේ කී.) මහර්ෂි වූ, මුඹ වහන්සේ ගේ තෙල වචනය පිළිගනිමි. ගෞතමයන් වහන්ස, (මුඹ වහන්සේ විසින්) නිරුපධි වූ නිර්වාණය මොනවට ප්‍රකාශ කරන ලද. යම් හෙයින් බුදුහු ඒකාන්තයෙන් වෘත්තදුඃඛය දුරුළුහු ද එහෙයින් මැ මුඹ වහන්සේ විසින් තෙල දහම දන්නා ලද.

**එතාභිනන්දාමි වචො මහෙසිනො**, යනු: 'එතං' යි: මුඹ වහන්සේ ගේ කියමන, වාක්‍යපථය දේශනය අනුශාසනය දක්වා කීම පිළිගනිමි, (එයට) සතුටු වෙමි, (එය) අනුමෝදන් වෙමි, ඉස්නෙමි, ඉවසමි, ප්‍රාර්ථනා කෙරෙමි, ඊර්ෂ්‍යා කෙරෙමි, අභිජල්පනය කෙරෙමි. **මහෙසිනො** යනු: කුමක් හෙයින් බුදුහු මහර්ෂි වෙත් ද? යත්: මහත් වූ, ශීලස්කන්ධය එෂණ ගවේෂණ පර්යේෂණ කළාහු නු යි මහර්ෂි හ. . . . "නරශ්‍රේෂ්ඨයෝ කොහි යැ" යි මහර්ෂි වෙත් නුයි 'එතාභිනන්දාමි වචො මහෙසිනො' යනු වේ.

**සුකිත්තිතං ගොතම නූපධීකන්ති** 'සුකිත්තිත'න්ති සුකිත්තිතං සු ආචික්ඛිතං සුදෙසිතං සුපඤ්ඤපිතං සුපට්ඨපිතං සුවිවරිතං සුවිභජිතං සුඋත්තානීකතං සුපකාසිතන්ති 'සුකිත්තිතං'.

**ගොතම / නූපධීකන්ති** උපධී වුච්චන්ති[1] කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච. උපධිපහානං උපධිවූපසමං උපධිපටිනිස්සග්ගං උපධි-පටිප්පස්සද්ධිං[2] අමතං නිබ්බානන්ති 'සුකිත්තිතං ගොතමනූපධීකං'.

**අද්ධා හි භගවා පහාසි දුක්ඛන්ති'** 'අද්ධා' ති එකංසවචනං[3] නිස්සංසය වචනං නික්කඞ්ඛාවචනං අද්වෙජ්ඣවචනං අද්වෙළ්හකවචනං නියොග වචනං[4] අපණ්ණකවචනං අවත්ථාපනවචනමෙතං 'අද්ධා'ති **භගවාති** ගාරවාධිවචනං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති. **පහාසි දුක්ඛන්ති** ජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසදුක්ඛං පහාසි පජහි විනොදෙසි බ්‍යන්තීකරොසි අනභාවං ගමෙසීති 'අද්ධා හි භගවා පහාසි දුක්ඛං'.

**තථා හි තෙ විදිතො එස ධම්මොති** තථා හි තෙ විදිතො තුලිතො තීරිතො විභූතො විභාවිතො එස ධම්මො ති 'තථා හි තෙ විදිතො එස ධම්මො'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"එතාභිනන්දාමි වචො මහෙසිනො
සුකිත්තිතං ගොතම නූපධීකං,
අද්ධා හි භගවා පහාසි දුක්ඛං
තථා හි තෙ විදිතො එස ධම්මො"ති.

---

4–10

**තෙ චාපි නූන පජ්ජහෙය්‍යු දුක්ඛං[5]**
**යෙ ත්වං මුනී අට්ඨිතං[6] ඔවදෙය්‍ය,**
**තං තං නමස්සාමි සමෙච්ච නාගං**
**අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍ය.**

**තෙ චාපි නූන පජ්ජහෙය්‍යු දුක්ඛන්ති:** 'තෙචාපී'ති: ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච[7] මනුස්සා ච. **පජ්ජහෙය්‍යු දුක්ඛන්ති** ජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං පජ්ජහෙය්‍යුං විනොදෙය්‍යුං බ්‍යන්තීකරෙය්‍යුං අනභාවං ගමෙය්‍යුන්ති 'තෙ චාපි නූන පජ්ජහෙය්‍යු දුක්ඛං'.

---

1. වුච්චති – ව–වි–ක
2. උපධිපටිප්පස්සද්ධං – ම ඡ සං
3. එකංසාධිවචනං –ව–වී–ක
4. නිරොධවචනං –ව–වී–ක–මඡසං–පත
5. පජ්ජහෙය්‍ය දුක්ඛං – ව–වි–ක
නූනපපජ්ජහෙය්‍යු දුක්ඛං – ම ඡ සං
6. අට්ඨීතං – පත
7. දෙවතා ච – ප–ව–ක

**සුකිත්තිතං ගොතම නූපධිකං** යනු: 'සුකිත්තිතං' යි: මොනොවට ප්‍රකාශ කරන ලද, මොනොවට කියන ලද, මොනොවට දෙසන ලද, මොනොවට පනවන ලද, මොනොවට පිහිටුවන ලද, මොනොවට විවෘත කරන ලද, මොනොවට විභාග කරන ලද, මොනොවට නො ගැඹුරු කරන ලද, මොනොවට පවසන ලද නුයි 'සුකිත්තිතං' යනු වේ. **ගොතම නූපධිකං** යනු: ක්ලෙශයෝ ද, ස්කන්ධයෝ ද, අභිසංස්කාරයෝ ද 'උපධි' යයි කියනු ලැබෙති. උපධි ප්‍රහාණය, උපධි සන්හිඳුවීම, උපධි හැරපීම, උපධි ප්‍රතිප්‍රශ්‍රබ්ද්ධිය අමාමහනිවන නුයි 'සුකිත්තිතං ගොතම නූපධිකං' යනු වේ.

**අද්ධා හි භගවා පහාසි දුක්ඛං** යනු: 'අද්ධා' යනු: එකාන්ත වචන යැ, නිස්සංශය වචන යැ, නිසැක වචන යැ, අද්වෛධවචන යැ නො දෙගිත් වචන යැ, නියොග වචන යැ, අවිරුද්ධවචන යැ, සනිටුහන් වචනයෙකි. මේ 'අද්ධා' යනු. **භගවා** යනු: තෙල ගෞරවනාමයෙකි . . . මේ 'භගවා' යනු අර්හත්ඵල සාක්ෂාත් කරණයෙන් උපන් ප්‍රඥප්තියෙකි. **පහාසි දුක්ඛං** යනු: ජාති දුක ජරා දුක ව්‍යාධි දුක මරණ දුක සොක–පරිදෙව දුක්ඛ–දොමනස්ස–උපායාස දුක දුරු ලූහ, බැහැර කළහ, විනොදනය කළහ. විගතාන්ත කළහ, අනු අභාවයට යැවූහු නුයි 'අද්ධා හි භගවා පහාසි දුක්ඛං' යනු වේ.

**තථා හි තෙ විදිතො එස ධම්මො** යනු: ඒ එසේ මැ යි, මුඹ වහන්සේ විසින් තෙල දහම දන්නා ලද, තුලනය කරන ලද, තීරණය කරන ලද, ප්‍රකට කරන ලද, විභාවනය කරන ලද නුයි 'තථා හි තෙ විදිතො එස ධම්මො' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**'එතාභිනන්දාමි වචො මහෙසිනො –පෙ– තථා හි තෙ විදිතො එස ධම්මො' යි.**

---

4–10.

මුනි වූ සර්වඥයන් වහන්ස, මුඹ වහන්සේ යම් කෙනකුන්ට සකසා (හැම කල්හි හෝ) ඔවා දෙන සේක් ද, ඔහුදු දුක් දුරුලන්නාහ'යි හඟිමි. බුද්ධනාගයන් වහන්ස, එහෙයින් එළඹ මුඹ වහන්සේ නමදිමි. භාග්‍යවතුන් වහන්සේ මට එක්වන් අවවාද කරන්නාහු නම් මැනැවි.

**තෙවා'පි නූනපජහෙය්‍යු දුක්ඛං** යනු: 'තෙවා 'පි' යනු: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශුද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මිනිස්සු ද. **පජහෙය්‍යු දුක්ඛං** යනු: ජාති දුක ජරා දුක ව්‍යාධි දුක මරණ දුක සොක–පරිදෙව–දුක්ඛ–දොමනස්ස–උපායාස දුක දුරු ලන්නාහ, බැහැර ලන්නාහ, විගතාන්ත කරන්නාහ, අනුඅභාවයට යවන්නාහු' යි 'තෙ වා'පි නූනපජහෙය්‍යු දුක්ඛං' යනු වේ.

**යෙ ත්වං මුනී අට්ඨිතං ඔවදෙය්‍යාති:** ‘යෙති: ඛත්තියෙ ච බ්‍රාහ්මණෙ ච වෙස්සෙ ච සුද්දෙ ච ගහට්ඨෙ ච පබ්බජිතෙ ච දෙවෙ ච මනුස්සෙ ච. **ත්වන්ති:** භගවන්තං භණති. **මුනීති** ‘මොනං’ වුච්චති: ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි. **අට්ඨිතං ඔවදෙය්‍යාති:** අට්ඨිතං ඔවදෙය්‍ය සක්කච්චං ඔවදෙය්‍ය, අභිණ්හං ඔවදෙය්‍ය, පුනප්පුනං ඔවදෙය්‍ය, අනුසාසෙය්‍යාති යෙ ත්වං මුනී අට්ඨිතං ඔවදෙය්‍ය.’

**තං තං නමස්සාමි සමෙච්ච නාගනාථාති:** ‘තන්ති’ භගවන්තං භණති. **නමස්සාමීති** කායෙන වා නමස්සාමි, වාචාය වා නමස්සාමි, චිත්තෙන වා නමස්සාමි, අන්වත්ථපටිපත්තියා වා නමස්සාමි, ධම්මානුධම්මපටිපත්තියා වා නමස්සාමි, සක්කරොමි, ගරුකරොමි[1], මානෙමි, පූජෙමි. **සමෙච්චාති** සමෙච්ච අභිසමෙච්ච සමාගන්ත්වා අභිසමාගන්ත්වා සම්මුඛා තං නමස්සාමි. **නාගනාථාති** නාගො ච භගවා, ‘ආගුං න කරොතීති නාගො, න ගච්ඡතීති නාගො, න ආගච්ඡතීති නාගො. කථං භගවා ආගුං න කරොතීති නාගො: ‘ආගු’ වුච්චති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජරාමරණීයා.

12 ‘‘ආගුං න කරොති කිඤ්චි ලොකෙ (සභියාති භගවා)
සබ්බසංයොගෙ විසජ්ජ බන්ධනානි,[1]
සබ්බත්ථ න සජ්ජති විමුත්තො
නාගො තාදී පවුච්චතෙ තථත්තා’’ති. [a]

එවං භගවා ‘ආගුං න කරොතීති නාගො.

කථං භගවා න ගච්ඡතීති නාගො: භගවා න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති, නීයති වුය්හති සංහරීයති. එවං භගවා ‘න ගච්ඡතී’ති නාගො.

---

1. ගරුං කරොමි - ම ජ සං
2. සබ්බසංයොජනානි විසජ්ජ -ච-වි-ක-පත
a. සුත්තනිපාත - සභියසුත්ත

**යෙ ත්වං මුනී අට්ඨිතං ඔවදෙය්‍ය** යනු: 'යෙ' යනු: ක්ෂත්‍රියයන් ද බ්‍රාහ්මණයන් ද වෛශ්‍යයයන් ද ශුද්‍රයන් ද ගෘහස්ථයන් ද ප්‍රව්‍රජිතයන් ද දෙවියන් ද මිනිසුන් ද. **ත්වං** යනු: භාග්‍යවතුන් වහන්සේ අමතයි. **මුනී** යනු: ඥානය 'මොන' යයි කියනු ලැබේ . . . ඒ මුනි තෙම සඞ්ගජාලය ඉක්ම සිටුනේ යි. **අට්ඨිතං ඔවදෙය්‍ය** යනු: නො නැවැත අවවාද කළ මැනැව, සකසා අවවාද කළ මැනැව, එක්වන් අවවාද කළ මැනැව, පුනපුනා අවවාද කළ මැනැව, අනුශාසනා කළ මැනැව නුයි 'යෙ ත්වං මුනී අට්ඨිතං ඔවදෙය්‍ය' යනු වේ.

**තං තං නමස්සාමි සමෙච්ච නාගං** යනු: 'තං' යි බුදුන් අමතයි. **නමස්සාමි** යනු: කයින් හෝ නමදිමි, වචනයෙන් හෝ නමදිමි, සිතින් හෝ නමදිමි, අර්ථානුගත ප්‍රතිපත්තියෙන් හෝ නමදිමි, ධර්මානුධර්මප්‍රතිපත්තියෙන් හෝ නමදිමි, සත්කාර කෙරෙමි, ගරුකාර කෙරෙමි, මානනය කෙරෙමි, පූජනය කෙරෙමි. **සමෙච්ච** යනු: එළඹ ප්‍රතිවෙධ කොට හමු වැ සමීපයට පැමිණ හමුයෙහි මුඹ වහන්සේ නමදිමි. **නාගං** යනු: භාග්‍යවතුන් වහන්සේ නාග ද වෙති: පව් නො කෙරෙත් නුයි නාග යැ, අගති වශයෙන් නො යෙත් නුයි නාග යැ, (ප්‍රහීණ කෙලෙසුන් කරා) නො එත් නුයි නාග යැ. කිසෙයින් බුදුහු පව් නො කෙරෙත් නුයි නාග නම් වෙත් ද යත්: සංක්ලෙශපක්ෂයෙහි වූ පුනර්භවය කරන්නා වූ දරථ සහිත වූ දුඃඛවිපාක ඇති ආයතිභවයෙහි ජාතිජරාමරණ පිණිස පවත්නා වූ ලාමක අකුශල ධර්මයෝ 'ආගු' යයි කියනු ලැබෙති.

12 (බුදුහු මෙසේ වදළහ: සභියමාණවකයෙනි,) යමෙක් ලොවැ අල්පමාත්‍ර වූ ද, පාපයක් නො කෙරේ ද හෙතෙම හැම සංයොගයෙහි බන්ධනයන් හැර පියා විමුක්ත වූයේ (ස්කන්ධාදි) කිසි තැනෙකැ නො ලැගෙයි, එබඳු වූ තාදී තෙම 'නාග' යයි කියනු ලැබේ.

මෙසෙයින් බුදුහු පව් නො කෙරෙත් නුයි 'නාග' නම් වෙති.

කි සෙයින්, බුදුහු අගතියට නො යෙත් නුයි 'නාග' නම් වෙත් ද යත්: බුදුහු ඡන්දයෙන් අගතියට නො යෙති, ද්වේෂයෙන් අගතියට නො යෙති, මෝහයෙන් අගතියට නො යෙති, භයෙන් අගතියට නො යෙති, රාග වශයෙන් නො යෙති, ද්වේෂ වශයෙන් නො යෙති, මොහ වශයෙන් නො යෙති, මාන වශයෙන් නො යෙති, දෘෂ්ටි වශයෙන් නො යෙති , ඖද්ධත්‍ය වශයෙන් නො යෙති, විචිකිත්සා වශයෙන් නො යෙති අනුශයවශයෙන් නො යෙති, ව්‍යග්‍ර ධර්මයන් විසින් නො යවනු ලැබෙති නො පමුණුවනු ලැබෙති, නුසුලනු ලැබෙති, නො ගෙන යනු ලැබෙත්. මෙසෙයින් නො යෙත් නුයි බුදුහු 'නාග' නම් වෙති.

කථං භගවා න ආගච්ඡතීති නාගො; සොතාපත්තිමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති, න පච්චාගච්ඡති. සකදාගාමිමග්ගෙන—අනාගාමිමග්ගෙන—අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡති. එවං න ආගච්ඡතී'ති 'නාගොති'. 'තං තං නමස්සාමි සමෙච්ච නාගං'.

අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍යාති. අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍ය, සක්කච්චං ඔවදෙය්‍ය, අභිණ්හං ඔවදෙය්‍ය, පුනප්පුනං ඔවදෙය්‍ය, අනුසාසෙය්‍යාති 'අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍ය'.

තෙනාහ සො බ්‍රාහ්මණො;

"තෙ චාපි නූන පජහෙය්‍යු දුක්ඛං
යෙ ත්වං මුනී අට්ඨිතං ඔවදෙය්‍ය,
තං තං නමස්සාමි සමෙච්ච නාගං
අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍යා"ති.

---

## 4–11

යං බ්‍රාහ්මණං වෙදගුං[1] ආභිජඤ්ඤා,
අකිඤ්චනං කාමභවෙ අසත්තං,
අද්ධා හි සො ඔඝමිමං අතාරි
තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො.

යං බ්‍රාහ්මණං වෙදගුං ආභිජඤ්ඤාති 'බ්‍රාහ්මණො'ති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො: සක්කායදිට්ඨි බාහිතා හොති, විචිකිච්ඡා බාහිතා හොති, සීලබ්බතපරාමාසො බාහිතො හොති, රාගො බාහිතො හොති, දොසො බාහිතො හොති, මොහො බාහිතො හොති, මානො බාහිතො හොති, බාහිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණීයා.

1. වෙදගුමාභිජඤ්ඤා – ම ජ සං
වෙදගුමභිජඤ්ඤා –ව–වී–ක

කිසෙයින් බුදුහු නො එත් නුයි 'නාග' නම් වෙත් ද? යත්: සෝවන් මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා පෙරළා නො එති, පසු වැ නො එති, ආපසු නො එති, සෙදගැමි මඟින් අනාගැමි මඟින් රහත් මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම්, ඒ කෙලෙසුන් කරා පෙරළා නො එති, පසු වැ නො එති, ආපසු නො එති. මෙසෙයින් බුදුහු නො එති' 'නාග' වෙත් නුයි 'තං තං නමස්සාමි සමෙච්ච නාගං' යනු වේ.

**අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍ය** යනු: භාග්‍යවතුන් වහන්සේ මට නො කඩ කොට අවවාද කරන්නාහු නම් සකසා අවවාද කරන්නාහු නම් එක්වන් අවවාද කරන්නාහු නම් පුනපුනා අවවාද කරන්නාහු නම් අනුශාසනා කරන්නාහු නම් මැනැව නුයි 'අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍ය' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**"තෙ වා'පි නූනපජ්ජහෙය්‍යු දුක්ඛං -පෙ- අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍ය" යි.**

---

**4-11.**

(බුදුහු මෙසේ වදළහ: මෙත්තගූ මාණවකය,) තෙපි බාහිතපාපී බ්‍රාහ්මණ වූ යමක්හු මාර්ගඥානයෙන් නිවනට පැමිණියකු කොට (රාගාදි) කිඤ්චන රහිතයකු කොට කාමයෙහි ද භවයෙහි ද නො ඇලුණක්හු කොට දන්නවු ද, ඒකාන්තයෙන් හෙතෙම මේ (කාමාදි) චතුරෝඝය තරණය කෙළේ යැ. ඕඝ තරණය කළා වූ ද (රාගාදි ඛිල රහිත වූ දුඃඛාදියෙහි) කාංක්ෂා රහිත වූ හෙතෙම නිර්වාණ පාරයට ගියේ යි.

**යං බ්‍රාහ්මණං වෙදගුං ආභිජඤ්ඤා** යනු: බ්‍රාහ්මණෝ' යි සප්ත ධර්ම කෙනකුන් දුරු කළ බැවින් බ්‍රාහ්මණ යැ: සත්කාය දෘෂ්ටිය දුරු කරන ලද වෙයි, විචිකිත්සාව- ශීල ව්‍රත පරාමර්ශය-රාගය- ද්වේෂය- මෝහය- මානය- දුරු කරන ලද වෙයි. ඔහු විසින් සාංක්ලෙශික වූ පුනර්භවය කරන්නා වූ දුක් සහිත වූ දුඃඛවිපාක ඇති ආයති භවයෙහි ජාතිජරාමරණය පිණිස පවත්නා වූ ලාමක අකුශල ධර්මයෝ දුරු කරන ලද්දාහු වෙත්.

13. "බාහෙත්වා සබ්බපාපකානි (සභියාති භගවා)
විමලො සාධු සමාහිතො ඨිතත්තො,
සංසාරමතිච්ච කෙවලී සො
අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා"[a].

වෙදගූති: 'වෙදෙ' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං -පෙ- සබ්බවෙර මතිච්ච වෙදගූ සො. ආභිජානෙය්‍යාති අභිජානෙය්‍ය, ආජානෙය්‍ය, විජානෙය්‍ය, පටිවිජානෙය්‍ය, පටිවිජ්ඣෙය්‍යාති 'යං බ්‍රාහ්මණං වෙදගුං ආභිජඤ්ඤා.'

අකිඤ්චනං කාමභවෙ අසත්තන්ති: 'අකිඤ්චනං'ති: රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙස කිඤ්චනං දුච්චරිතකිඤ්චනං. යස්සෙතෙ කිඤ්චනා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති 'අකිඤ්චනො'. කාමාති: උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙස කාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙස කාමා, භවාති: ද්වෙ භවා: කම්මභවො ච පටිසන්ධිකො ච පුනබ්භවො -පෙ- අයං පටිසන්ධිකො පුනබ්භවො.

අකිඤ්චනං කාම භවෙ අසත්තන්ති: අකිඤ්චනං පුග්ගලං කාමභවෙ ච අසත්තං අලග්ගං අලග්ගිතං අපළිබුද්ධං නික්ඛන්තං නිස්සටං විප්පමුත්තං[1] විසංයුත්තං විමරියාදිකතෙන චෙතසා විහරන්තන්ති 'අකිඤ්චනං කාමභවෙ අසත්තං'

අද්ධා හි සො ඔඝමිමං අතාරීති: 'අද්ධා'ති: එකංසවචනං -පෙ- අවත්ථාපනවචනමෙතං 'අද්ධා'ති. ඔඝන්ති: කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං. අතාරීති: අතරි උත්තරි පතරි සමතික්කමි. වීතිවත්තයීති 'අද්ධා හි සො ඔඝමිමං අතාරි.'

---

a. සුත්තනිපාත - සභියසුත්ත

1. විප්පයුත්තං -අ-ව-වි-ක-පත

13. ('සභිය' යි අමතා බුදුහු මෙසේ වදළහ:) සියලු පාපධර්මයන් ප්‍රහීණ කොට එහෙයින් මැ විගතමල වූ(ශ්‍රෙෂ්ඨ වූ) මාර්ගඵල සමාධියෙන් මොනාවට සමාහිත වූ, ලෝකධර්මයන්ගෙන් කම්පිත නො වන හෙයින් ස්ථිතාත්ම වූ සංසාර හේතු ඉක්ම සිටි, නිමවන ලද කෘත්‍ය ඇති හෙයින් කේවලී වූ, ඒ ක්ෂීණාස්‍රව තෙම තෘෂ්ණා දෘෂ්ටි නිඃශ්‍රය නැති හෙයින් 'අසිත' යයි ද ලෝක ධර්මයෙන් නිර්විකාර හෙයින් 'තාදී' යයි ද කියනු ලැබෙ. හෙතෙම 'බ්‍රාහ්මණ' නම් වේ.

**වෙදගූ** යනු: සතර මාර්ගයන්හි ඥානය 'වෙද' යි කියනු ලැබෙයි. . . . හෙතෙම සියලු වෙරය ඉක්ම වෙදගූ වෙයි. **ආභිජඤ්ඤා** යනු: වෙසෙසින් දත්තේ යැ එකත්නෙන් දත්තේ යැ නොයෙක් අයුරින් දන්නේ යැ ඒ ඒ කරුණු නිසා දන්නේ යැ ප්‍රතිවෙධ කරන්නේ යැ නුයි 'යං බ්‍රාහ්මණං වෙදගුං ආභිජඤ්ඤා' යනු වේ.

**අකිඤ්චනං කාමභවෙ අසත්තං** යනු: 'අකිඤ්චනං' යයි: රාග පළිබොධ යැ ද්වේෂ පළිබොධ යැ මොහ පළිබොධ යැ මාන පළිබොධ යැ දෘෂ්ටි පළිබොධ යැ ක්ලෙශ පළිබොධ යැ දුශ්චරිත පළිබොධ යි. යමක්හට මෙ පළිබොධයෝ ප්‍රහීණ වූවාහු මුලුසුන් වූවාහු ව්‍යුපශාන්ත වූවාහු සන්හිඳුණාහු අභව්‍යොත්පත්තික (උපදනට නො නිසි) වූවාහු නුවණ ගින්නෙන් දවුණාහු වෙත් ද, හෙතෙම 'අකිඤ්චන' යි කියනු ලැබෙයි. **කාමා** යනු: උද්දාන විසින් වස්තුකාම යැ ක්ලෙශකාම යැ, යි කාම දෙකෙකි . . . මොහු වස්තුකාමහ'යි කියනු ලැබෙති . . . මොහු ක්ලෙශකාමහ' යි කියනු ලැබෙත්. **භවා** යනු: කර්මභවය ද ප්‍රතිසන්ධි සංඛ්‍යාත පුනර්භවය ද යි භව දෙකෙකි. . . . මේ ප්‍රතිසන්ධික පුනර්භව යැ. **අකිඤ්චනං කාමභවෙ අසත්තං** යනු: පළිබොධ රහිත පුහුලක්හු කාමභවයෙහි ද නො ඇලුණු නො ලැගුණු නො ලග්නා ලද නො බැඳුණු නික්මුණු බැහැර වූ වෙසෙසින් මිදුණු විසංයුක්ත වූ විගතමර්‍යාද කළ සිතින් වාසය කරන්නාහු නුයි 'අකිඤ්චනං කාමභවෙ අසත්තං' යනු වේ.

**අද්ධා හි සො ඔඝමිමං අතාරි** යනු: 'අද්ධා' යයි: ඒකාන්තවචන යැ . . . තෙල 'අද්ධා' යනු සනිටුහන් වචනයෙකි. **ඔඝං** යනු: කාමොඝ යැ භවොඝ යැ දිට්ඨොඝ යැ අවිජ්ජොඝ යි. **අතාරි** යනු: තරණ-උත්තරණ-ප්‍රතරණ-සමතික්‍රමණ කෙළේ යැ ඉක්ම (එලයෙහි) සිටියේ යැ නුයි 'අද්ධා හි සො ඔඝමිමං අතාරී' යනු වේ.

**තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛොති:** 'තිණ්ණො'ති: කාමොඝං තිණ්ණො,[1] භවොඝං තිණ්ණො, දිට්ඨොඝං තිණ්ණො, අවිජ්ජොඝං තිණ්ණො, සංසාරපථං තිණ්ණො, උත්තිණ්ණො නිත්තිණ්ණො[2] අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො, සො වුට්ඨවාසො[3] චිණ්ණචරණො ගතද්ධො ගතදිසො ගතකොටිකො පාලිතබ්‍රහ්මචරියො උත්තමදිට්ඨිප්පත්තො භාවිතමග්ගො පහීනකිලෙසො පටිවිද්ධාකුප්පො සච්ඡිකතනිරොධො. දුක්ඛං තස්ස පරිඤ්ඤාතං, සමුදයො පහීනො, මග්ගො භාවිතො, නිරොධො සච්ඡිකතො අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං, පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං, පහාතබ්බං පහීනං, භාවෙතබ්බං භාවිතං, සච්ඡිකාතබ්බං සච්ඡිකතං. සො උක්ඛිත්තපලිඝො සඞ්කිණ්ණපරිඛො අබ්බූළ්හෙසිකො නිරග්ගළො අරියො පන්නද්ධජො පන්නභාරො විසඤ්ඤුත්තො පඤ්චඞ්ගවිප්පහීනො ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරාපස්සෙනො පනුණ්ණපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිලසඞ්කප්පො පස්සද්ධකායසඞ්ඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො කෙවලී වුසිතවා උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිප්පත්තො.[4]

සො නෙව ආචිනාති, න අපචිනාති, අපචිනිත්වා ඨිතො, නෙව පජහති, න උපාදියති, පජහිත්වා ඨිතො, නෙව විසිනෙති, න උස්සිනෙති, විසිනෙත්වා ඨිතො. නෙව ධූපෙති, න සන්ධූපෙති, විධූපෙත්වා ඨිතො. අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො.

1. ඔතිණ්ණො – පත
2. නිත්ථිණ්ණො – ම ජ සං
3. වුට්ඨවාසො – සයා
4. පරම පත්තිප්පත්තො – ම ජ සං

**තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො යනු:** තිණ්ණො යි: කාමොඝය තරණය කෙළේ යැ භවොඝය තරණය කෙළේ යැ දිට්ඨොඝය තරණය කෙළේ යැ අවිජ්ජොඝය තරණය කෙළේ යැ සසර කතර තරණය කෙළේ යැ උත්තරණය කෙළේ යැ නිස්තරණය කෙළේ යැ ඉක්ම වූයේ යැ මොනො-වට ඉක්ම වූයේ යැ ඉක්ම සිටියේ යැ හෙතෙම (දශවිධ ආර්‍ය්‍ය වාසය) වැස නිමවූයේ, (ශීලය හා සමාධියෙහි) චීර්ණවශී වූයේ, සසර අදන්මග ඉක්ම වූයේ, (පෙර නො ගිය විරූ) නිවන් දෙසට ගියේ, (අනුපාදිශෙෂ නිර්වාණ) කොටියට පැමිණ සිටියේ, රක්ෂිත බ්‍රහ්මචරියවාස ඇත්තේ, උත්තම සම්‍යග්දෘෂ්ටියට පැමිණියේ, භාවිතමාර්ග ඇත්තේ, ප්‍රහීණ ක්ලෙශ ඇත්තේ, ප්‍රතිවේධ කළ (අර්හත්ඵල සංඛ්‍යාත) අකොප්‍යය ඇත්තේ, සාක්ෂාත්කෘත නිරොධ ඇත්තේ වෙයි. ඔහු විසින් දුක පිරිසිඳ දන්නා ලද යැ, සමුදය ප්‍රහාණය කරන ලද යැ, මාර්ගය වඩන ලද යැ, නිරොධය ප්‍රත්‍යක්ෂ කරන ලද. ස්ව ලක්ෂණාවබෝධයෙන් දතයුත්ත ස්වලක්ෂණාවබෝධයෙන් දන්නා-ලද යැ, සාමාන්‍ය ලක්ෂණාවබෝධයෙන් දතයුත්ත සාමාන්‍ය ලක්ෂණාව බෝධයෙන් දන්නා ලද යැ, ප්‍රහාණය කළ යුත්ත ප්‍රහාණය කරන ලද යැ, වැඩිය යුත්ත වඩන ලද යැ, ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කරන ලද. හෙතෙම නඟන ලද අවිද්‍යාපරිඝ ඇත්තේ යැ, සංකීර්ණ (විසුරුවන ලද) කර්මාභිසංස්කාර පරිඛා ඇත්තේ යැ, උදුරන ලද තෘෂ්ණා ඒෂිකා ඇත්තේ යැ, (ඔරම්භාගිය සංයොජන සංඛ්‍යාත) අගුළු රහිත යැ. ආර්‍ය්‍ය (නික්ලෙශ) යැ, හෙළන ලද මානධ්වජ ඇත්තේ යැ, තබන ලද (ස්කන්ධාදි) බර ඇත්තේ යැ, සංයොග රහිත යැ, (කාමච්ඡන්දාදි) පඤ්චාංග විප්‍රහීණ යැ, ෂඩංග (උපේක්ෂා යෙන්) සමන්වාගත යැ, (ස්මෘති සංඛ්‍යාත) එකාරක්ෂා ඇත්තේ යැ, (ප්‍රතිසෙවනාදි) චතුර්විධ අපශ්‍රයන් ඇත්තේ යැ, බැහැර කළ ප්‍රත්‍යෙක සත්‍යය ඇත්තේ යැ, මොනොවට හරන ලද සියලු එෂණා (සෙවීම්) ඇත්තේ යැ, නො කැළඹුණු සංකල්ප ඇත්තේ යැ, සන්හිඳුණු කාය සංස්කාර ඇත්තේ යැ, මොනොවට මිදුණු සිත් ඇත්තේ යැ, මොනොවට මිදුණු ප්‍රඥා ඇත්තේ යැ පරිපූර්ණ යැ. වුසු බඹසර ඇත්තේ යැ, උත්තම පුරුෂ යැ, පරම පුරුෂ යැ, පරමප්‍රාප්තියට පැමිණියේ යි.

හෙතෙම (කුශලාකුශල විපාකය) රැස් නො කරයි, (ඵලයෙහි සිටී හෙයින් විපාක) විධ්වංසනය නො කෙරෙයි, කෙලෙසුන් නසා සිටියේ වෙයි, (අවිද්‍යමාන හෙයින් කෙලෙසුන්) නො මැ දුරු කෙරෙයි, (තෘෂ්ණා–මාන–දෘෂ්ටි විසින්) උපාදනය නො කෙරෙයි, (කෙලෙසුන්) දුරු කොට සිටියේ වෙයි, (තෘෂ්ණා වශයෙන්) නො මැ සීවනය (බැඳීම) කෙරෙයි, (මාන වශයෙන්) උත්කර්ෂණය නො කෙරෙයි, තෘෂ්ණා බන්ධනය දුරු කොට සිටියේ වෙයි, (කෙලෙස් ගිනි) නො මැ නිවයි, නො ද දල්වයි, නිවා සිටියේ වෙයි. අශෛක්ෂ වූ ශීලස්කන්ධයෙන් සමන්වාගත බැවින් සිටියේ

අසෙඛෙන සමාධික්ඛන්ධෙන-පඤ්ඤාක්ඛන්ධෙන- විමුත්තික්ඛන්ධෙන- විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො. සච්චං සම්පටිපාදියිත්වා[1] ඨිතො. එජං සමතික්කමිත්වා ඨිතො. කිලෙසග්ගිං පරියාදියිත්වා ඨිතො. අපරිගමනතාය ඨිතො, කථං සමාදාය ඨිතො, මුත්තිපටිසෙවනතාය[2] ඨිතො. මෙත්තාය පාරිසුද්ධියා ඨිතො, කරුණාය -මුදිතාය -උපෙක්ඛාය පාරිසුද්ධියා ඨිතො, අච්චන්තපාරිසුද්ධියා ඨිතො, අතම්මයතාය,[3] පරිසුද්ධියා ඨිතො, විමුත්තත්තා ඨිතො, සංතුසිතත්තා[4] ඨිතො, ඛන්ධපරියන්තෙ ඨිතො, ධාතුපරියන්තෙ ඨිතො, ආයතනපරියන්තෙ ඨිතො, ගතිපරියන්තෙ ඨිතො, උපපත්තිපරියන්තෙ ඨිතො, පටිසන්ධිපරියන්තෙ ඨිතො, භවපරියන්තෙ ඨිතො, සංසාරපරියන්තෙ ඨිතො, වට්ටපරියන්තෙ ඨිතො, අන්තිමෙ භවෙ ඨිතො, අන්තිමෙ සමුස්සයෙ ඨිතො, අන්තිමදෙහධරො අරහා.

14. ‘‘තස්සායං පච්ඡිමකොටි[5] – චරිමොයං සමුස්සයො,
ජාතිමරණ[6] සංසාරො – නත්ථි තස්ස පුනබ්භවො’’ති

**තිණ්ණො ච පාරන්ති** ‘පාරං’ වුච්චති අමතං නිබ්බානං ‘‘යො සො සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං’’ සො පාරගතො පාරප්පත්තො[7] අන්තගතො අන්තප්පත්තො[8]. කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙනගතො ලෙනප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො අච්චුතප්පත්තො[9] අමතගතො අමතප්පත්තො[10] නිබ්බානගතො නිබ්බානප්පත්තො සො වුත්ථවාසො චිණ්ණචරණො[11] -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො’ති ‘තිණ්ණො ච පාරං’.

**අඛිලොති** රාගො ඛිලො දොසො ඛිලො මොහො ඛිලො කොධො ඛිලො උපනාහො ඛිලො -පෙ- සබ්බාකුසලාභිසංඛාරා ඛිලා, යස්සෙතෙ ඛිලා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති ‘අඛිලො.’

1. පටිපාදියිත්වා – ස්‍යා
2. විමුත්තිපටිසෙවනතාය – ම ඡ සං
3. අකම්මඤ්ඤතාය – ස්‍යා
4. සන්තුසිතත්තා – ම ඡ සං
5. පච්ඡිමකො භවෙ – ම ඡ සං, ස්‍යා
6. ජාතිජරාමරණ – ස්‍යා
7. පාරංගතො පාරංපත්තො – ව-වි-ක
8. අන්තංගතො අන්තංපත්තො ව-වි-ක
9. අච්චුතංගතො අච්චුතපත්තො –ප
අච්චන්තගතො අච්චන්තපත්තො-ව-වි-ක
10. අමතංගතො – අමතපත්තො–පත
11. සො වුච්චති චිණ්ණ චරණො – පත

අශෛක්ෂ වූ සමාධිස්කන්ධයෙන් — ප්‍රඥා ස්කන්ධයෙන් — විමුක්ති ස්කන්ධයෙන් — විමුක්තිඥානදර්ශන ස්කන්ධයෙන් සමන්වාගත බැවින් සිටියේ, චතුස්සත්‍යය ප්‍රතිවෙධ කොට සිටියේ, තෘෂ්ණාව ඉක්ම සිටියේ, කෙලෙස් ගිනි ගෙවා සිටියේ, සසර ගමන් නැති බැවින් සිටියේ, නයග්‍රහණයෙන් ගෙන සිටියේ, විමුක්ති ප්‍රතිසෙවන භාවයෙන් සිටියේ, මෛත්‍රීපාරිශුද්ධියෙන් සිටියේ, කරුණා – මෘදුතා — උපේක්ෂා පාරිශුද්ධියෙන් සිටියේ, අත්‍යන්ත පාරිශුද්ධියෙන් සිටියේ, අතම්මයතා (තෘෂ්ණා–දෘෂ්ටි–මානාභාව) පාරිශුද්ධියෙන් සිටියේ, (හැම කෙලෙසුන් කෙරෙන්) විමුක්ත බැවින් සිටියේ, සන්තුෂ්ට භාවයෙහි සිටියේ, ස්කන්ධ පර්‍යන්තයෙහි සිටියේ, ධාතු පර්‍යන්තයෙහි සිටියේ, ආයතන පර්‍යන්තයෙහි සිටියේ, ගති පර්‍යන්තයෙහි සිටියේ, උපප්‍රාප්ති පර්‍යන්තයෙහි සිටියේ, ප්‍රතිසන්ධි පර්‍යන්තයෙහි සිටියේ, භව පර්‍යන්තයෙහි සිටියේ, සංසාර පර්‍යන්තයෙහි සිටියේ, වෘත්තපර්‍යන්තයෙහි සිටියේ, අන්තිම භවයෙහි සිටියේ, අන්තිම ශරීරයෙහි සිටියේ, අන්තිමදෙහධර වූයේ, අර්හත් වූයේ වේ.

14. “ඒ, රහත්හුගේ, මේ පශ්චිම කෙළවර වෙයි, මේ අන්තිම ශරීරය වෙයි, ජාතිමරණ සංසාරය, පුනර්භවය ඔහුට නැත්තේ යි.”

**තිණ්ණො ච පාරං** යනු: අමෘත වූ නිර්වාණය ‘පාර’ යයි කියනු ලැබෙයි, යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් ක්ලේශවිරාගයෙක් දුඃඛනිරොධයෙක් වේ ද ඒ නිර්වාණය යි. හෙතෙම (මාර්ගයෙන්) පාරයට ගියේ, (ඵලයෙන්) පාරයට පැමිණියේ, (සංස්කාර ලොකයෙහි) අන්තයට ගියේ අන්තයට පැමිණියේ, කෙළවරට ගියේ, කෙළවරට පැමිණියේ, (ආයතනාදි ලොක) පර්‍යන්තයට ගියේ, පර්‍යන්තයට පැමිණියේ, අවසානයට ගියේ, අවසානයට පැමිණියේ, ත්‍රාණයට ගියේ, ත්‍රාණයට පැමිණියේ, ලෙනයට ගියේ, ලෙනයට පැමිණියේ, සරණයට ගියේ, සරණයට පැමිණියේ, අභයට (ක්ෂේමයට) ගියේ අභයට පැමිණියේ, අච්‍යුතියට ගියේ, අච්‍යුතියට පැමිණියේ, අමෘතයට ගියේ, අමෘතයට පැමිණියේ, නිර්වාණයට ගියේ, නිර්වාණයට පැමිණියේ, හෙතෙම (දශවිධ ආර්‍යවාස) වැස නිමවූයේ, . . . (ශීලයෙන් සමාපත්තීන්හි) චීර්ණවශී වූයේ . . . ජාතිමරණසංසාරසංඛ්‍යාත පුනර්භවය ඔහුට නැත් නුයි ‘තිණ්ණො ච පාරං’ යනු වේ.

**අඛිලො** යනු: රාගය ඛිල යැ ද්වේෂය ඛිල යැ මොහය ඛිල යැ ක්‍රොධය ඛිල යැ බද්ධවෛරය ඛිල යැ . . . හැම අකුශලාභිසංස්කාරයෝ ඛිලයෝ යි. යමක්හට මේ ඛිලයෝ ප්‍රහීණ වූවාහු ද මුලුපුන් වූවාහු ද සන්හිඳුණාහු ද ප්‍රතිප්‍රශ්‍රබ්ධ ද අභව්‍යොත්පත්තික (උපදනට නො නිසි) ද ඥානාග්නියෙන් දැවුණාහු ද, හෙතෙම ‘අඛිල’ යයි කියනු ලැබේ.

**අකඞ්ඛොති** දුක්ඛෙ කඞ්ඛා, දුක්ඛසමුදයෙ කඞ්ඛා, දුක්ඛනිරොධෙ කඞ්ඛා, දුක්ඛනිරොධගාමිනියා පටිපදය කඞ්ඛා, පුබ්බන්තෙ කඞ්ඛා, අපරන්තෙ කඞ්ඛා, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛා, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛා. යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ඡම්භිතත්තං[1] චිත්තස්ස මනොවිලෙඛො. යස්සෙතෙ කඞ්ඛා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති 'අකඞ්ඛොති' තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො'.

තෙනාහ භගවා:

"යං බ්‍රාහ්මණං වෙදගුං ආභිජඤ්ඤා
අකිඤ්චනං කාමභවෙ අසත්තං,
අද්ධා හි සො ඔඝමිමං අතාරි
තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො"ති.

---

## 4-12

විද්වා ච යො වෙදගූ නරො ඉධ
භවාභවෙ සඞ්ගමිමං විසජ්ජ,
සො වීතතණ්හො අනීඝො නිරාසො
අතාරි[2] සො ජාතිජරන්ති බ්‍රූමි.

**විද්වා ච යො වෙදගූ නරො ඉධාති** 'විද්වා'ති විද්වා විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී. **යො ති** යො යාදිසො -පෙ- දෙවො වා මනුස්සො වා. **වෙදගූති** 'වෙද' වුච්චන්ති චතුසු මග්ගෙසු ඤාණං "පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි." තෙහි වෙදෙහි ජාතිජරාමරණස්ස අන්තගතො අන්තප්පත්තො[3] කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙනගතො ලෙනප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො අච්චුතප්පත්තො අමතගතො අමතප්පත්තො නිබ්බානගතො නිබ්බානප්පත්තො. 'වෙදනං වා අන්තගතො'ති වෙදගූ, 'වෙදෙහි වා අන්තගතො'ති වෙදගූ' සත්තන්නං වා ධම්මානං[4] විදිතත්තා වෙදගූ: සක්කායදිට්ඨි විදිතා හොති, විචිකිච්ඡා– සීලබ්බතපරාමාසො– රාගො– දොසො– මොහො– මානො විදිතො හොති. විදිතාස්ස[5] හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා[6] සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණීයා.

---

1. ජම්භිතත්තං– ම ජ සං, ස්‍යා
2. අතාරි – ස්‍යා
3. අන්තංගතො අන්තංපත්තො – ව–වි–ක
4. සත්තන්නං ධම්මානං – කත්ථචි
5. විදිතස්ස – ව–වි–ක
6. පොනබ්භවිකා – ව–වි–ක

**අකඞ්ඛො** යනු: දුඃඛයෙහි සැක යැ දුඃඛසමුදයෙහි සැක යැ දුඃඛනිරොධයෙහි සැක යැ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදයෙහි සැක යැ, පූර්වාන්තයෙහි සැක යැ අපරාන්තයෙහි සැක යැ පූර්වාපරාන්තයෙහි සැක යැ ඉදං ප්‍රත්‍යයතා සංඛ්‍යාත ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන්හි සැක යයි. යම් මෙ බඳු සැකයෙක් සැක කරන අයුරෙක් සැක කළ බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් (දෙපසට සැලෙන) ද්වෙළ්හකයෙක් ද්විධාපථයෙක් සංශයෙක් අනෙකාන්තග්‍රාහයෙක් (නිශ්චය කළ නො හැකි වැ) අරමුණෙහි පසු බැස්මෙක් (අරමුණට බැසගත නො හැකි වැ) හාත්පසින් පසු බැස්මෙක් (අරමුණෙහි) නො බැසගැන්මෙක් චිත්තයා ගේ තද බවෙක් (සිත හිරි අදනා බඳු) මනොවිලෙඛයෙක් වේ ද එය යි. යමක්හට තෙල සැකය ප්‍රහීණ ද මුලුසුන් වූයේ ද සන්හිඳුණේ ද ප්‍රතිප්‍රශ්‍රබ්ධ ද වටාලා උපදනට නො නිසි ද නුවණ ගින්නෙන් දවන ලද ද, හෙතෙම 'අකඞ්ඛ' යයි කියනු ලැබේ නුයි 'තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**යං බ්‍රාහ්මණං වෙදගුං ආභිජඤ්ඤා –පෙ– තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො'** යී.

---

## 4 -12.

තවද මෙසස්නෙහි (ආත්මභාවයෙහි හෝ) විද්වත් වූ ඥාන වෙදයෙන් නිවනට පැමිණි යම් සත්ත්වයෙක් කුදු-මහත් භවයෙහි මේ (රාගාදි) සඞ්ගය දුරලා සිටියේ ද විගත තෘෂ්ණා ඇති හෙතෙම අනුපද්‍රව වූයේ ආශා රහිත වූයේ වෙයි. හෙතෙම ජාති ජරා (මරණය) තරණය කෙළේ යයි කියමි.

**විද්වා ච යො වෙදගූ නරො ඉධ** – 'විද්වා' යනු: විද්වත් වූයේ විද්‍යාවට පැමිණියේ නුවණැතියේ නුවණින් විමසනුයේ මෙධා (තුලනාය කළ ඥාන) ඇතියේ. **යො** යනු: යමෙක් යම් බඳුයෙක් . . . දෙවි වේවයි මිනිස් වේවයි. **වෙදගු** යනු: සතර මාර්ගයෙහි ඥානය 'වෙද' යී කියනු ලැබේ. ප්‍රඥා යැ ප්‍රඥෙන්ද්‍රිය යැ ප්‍රඥාබල යැ ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යැ වීමංසා යැ විදර්ශනා යැ සම්‍යග්දෘෂ්ටි යි. ඒ මාර්ගඥාන වෙදයන් ගෙන් ජාතිජරාමරණයාගේ අන්තයට (මාර්ගයෙන්) ගියේ (ඵලයෙන්) අන්තයට පැමිණියේ කෙළවරට ගියේ කෙළවරට පැමිණියේ පර්‍යන්තයට ගියේ පර්‍යන්තයට පැමිණියේ අවසානයට ගියේ අවසානයට පැමිණියේ ත්‍රාණයට ගියේ ත්‍රාණයට පැමිණියේ නිලීනයට ගියේ නිලීනයට පැමිණියේ ප්‍රතිෂ්ඨාවට ගියේ ප්‍රතිෂ්ඨාවට පැමිණියේ නිර්භයට ගියේ නිර්භයට පැමිණියේ අච්‍යුතයට ගියේ අච්‍යුතයට පැමිණියේ අමෘතයට ගියේ අමෘතයට පැමිණියේ නිවනට ගියේ නිවනට පැමිණියේ නොහොත් වෙද (දතයුතු ධර්ම) යන් ගේ අන්තයට ගියේ නුයි 'වෙදගූ, යැ, සතර මාර්ගඥාන වෙදයෙන් වෘත්තදුඃඛයාගේ අන්තයට ගියේ නුයි හෝ 'වෙදගූ යැ, නොහොත් සප්ත ධර්මයන් විදිත වන බැවින් 'වෙදගු' යැ: සත්කායදෘෂ්ටිය විදිත (දන්නා ලද) වෙයි. විචිකිත්සාව – ශීලව්‍රත පරාමර්ශය – රාගය–ද්වේෂය – මොහය – මානය විදිත වෙයි. ඔහු විසින් කෙලෙසුන්ට ප්‍රත්‍යය වූ පුනර්භවය උපදවන ක්ලෙශදරථ සහිත වූ දුඃඛ විපාක දෙන අනාගතයෙහි ජාතිජරාමරණයන්ට ප්‍රත්‍යය වූ ලාමක අකුශල ධර්මයෝ විදිත වූවාහු වෙත්.

15 "වෙදානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
සමණානං යානි පත්ථි[1] බ්‍රාහ්මණානං
සබ්බවෙදනාසු වීතරාගො
සබ්බං වෙදමතිච්ච වෙදගූ සො"ති.[2]

**නරොති:** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[3] ජන්තු ඉන්දගු හින්දගු මනුජො. ඉධාති ඉමිස්සා දිට්ඨියා -පෙ- ඉමස්මිං මනුස්සලොකෙති 'විද්වා ච යො වෙදගූ නරො ඉධ'.

**භවාභවෙ සඞ්ගමිමං විසජ්ජාති**—'භවාභවෙ'ති: භවාභවෙ කම්මභවෙ පුනබ්භවෙ, කාමභවෙ කම්මභවෙ කාමභවෙ පුනබ්භවෙ, රූපභවෙ කම්මභවෙ රූපභවෙ පුනබ්භවෙ, අරූපභවෙ කම්මභවෙ අරූපභවෙ පුනබ්භවෙ පුනප්පුනභවෙ පුනප්පුනගතියා පුනප්පුනඋප්පත්තියා පුනප්පුනපටිසන්ධියා[4] පුනප්පුනඅත්තභාවාභිනිබ්බත්තියා. **සඞ්ගාති** සත්තසඞ්ගා: රාගසඞ්ගො දොසසඞ්ගො මොහසඞ්ගො මාන - දිට්ඨි - කිලෙසසඞ්ගො දුච්චරිතසඞ්ගො. **විසජ්ජාති:** සඞ්ගෙ වොස්සජ්ජිත්වා[5] වා විසජ්ජ, අථවා සඞ්ගෙ බද්ධෙ විබද්ධෙ ආබද්ධෙ[6] ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ[7] බන්ධනෙ ඵොටයිත්වා[8] වා විසජ්ජ, යථා වය්හං වා රථං වා සකටං වා සන්දමානිකං වා සජ්ජං විසජ්ජං කරොන්ති විකොපෙන්ති, එවමෙව[9] සඞ්ගෙ වොස්සජ්ජිත්වා වා විසජ්ජ අථවා සඞ්ගෙ බද්ධෙ විබද්ධෙ ආබද්ධෙ ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ බන්ධනෙ ඵොටයිත්වා වා විසජ්ජාති 'භවාභවෙ සඞ්ගමිමං විසජ්ජ.'

**සො වීතතණ්හො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රූමීති** 'තණ්හා'ති: රූපතණ්හා -පෙ- ධම්මතණ්හා, යස්සෙසා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති වීතතණ්හො විගතතණ්හො චත්තතණ්හො වන්තතණ්හො මුත්තතණ්හො පහීනතණ්හො පටිනිස්සට්ඨතණ්හො වීතරාගො චත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති සො වීතතණ්හො.

1. යානිධත්ථි - ම ජ සං
2. සබ්බංවරමතිච්ච වෙදගූතරො-ච-වි-ක
3. ජාතු - ස්‍යා
4. පුනප්පුනං ගතියා පුනප්පුනං උප්පත්තියා පුනප්පුනං පටිසන්ධියා -පත
5. වොසජ්ජෙත්වා - ම ජ සං
6. බන්ධෙ විබන්ධෙ ආබන්ධෙ - ස්‍යා
   වොසජ්ජෙත්වා - ම ජ සං
7. පලිබන්ධෙ - ස
8. මොචයිත්වා වා -ච-වි-ක-ප-ස්‍යා
9. එවමෙතෙ - පත
   එවමෙව තෙ - ම ජ සං

a. සු - සභියසුත්ත

15 (බුදුහු 'සභිය' යි අමතා මෙසේ වදාළහ:) යමෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ශාස්ත්‍ර යයි කියන ලද යම් වේද කෙනෙක් වෙත් ද, ඒ සියලු වේදයන් මාර්ගභාවනායෙන් කෘත්‍ය හෙයින් අනිත්‍යාදි වශයෙන් විමසා එහි ඡන්දරාග ප්‍රහාණයෙන් ඒ සියලු වේදයන් ඉක්මවා යළි වේද ප්‍රත්‍යයෙන් හෝ අන් පරිද්දෙකින් උපදනා සියලු වෙදනාවන්හි වීතරාග වූයේ ද හෙතෙම පරමාර්ථ වශයෙන් 'වෙදගූ' නම් වේ යයි.

**නරො** යනු: සත්ත්ව යැ නර යැ මානව යැ පුරුෂ යැ පුද්ගල යැ ජීව යැ (ජාතියට යේ නුයි) ජාගු යැ (ඉන්ද්‍රියයෙන් යේ නුයි) ඉන්දගු යැ (මරණයට යේ නුයි) හින්ද ගු යැ මනුජ යැ;. **ඉධ** යනු: මේ දෘෂ්ටියෙහි . . . මේ මිනිස් ලොවැ නුයි 'විදවා ච යො වෙදගු නරො ඉධ' යනු වේ.

**භවාභවෙ සඞගමිමං විසජ්ජ** – 'භවාභවෙ' යනු: භව අභව සංඛ්‍යාත කාමභවයෙහි හා රූපාරූපභවයෙහි වූ, කර්මවෘත්තයෙහි විපාක වෘත්තයෙහි, කාමධාතුයෙහි වූ කර්මවෘත්තයෙහි විපාකවෘත්තයෙහි, රූපධාතුයෙහි වූ කර්මවෘත්තවිපාකවෘත්තයෙහි, අරූපධාතුයෙහි වූ කර්මවෘත්තවිපාක වෘත්තයෙහි, නැවත නැවත උත්පත්තියෙහි, පුනපුනා පස්නතියෙහි, පුනපුනා උපතෙහි, පුනපුනා පිළිසඳහි, පුනපුනා ආත්මභාවයන්ගේ පහළ වීමෙහි. **සඞගා** යනු: සඞගයෝ සත් දෙනෙකි: රාග සඞග යැ ද්වේෂ සඞග යැ මොහසඞග යැ මාන–දෘෂ්ටි–ක්ලෙශසඞග යැ දුශ්චරිතසඞග යි. **විසජ්ජ** යනු: සඞගයන් මොනොවට විසුරුවා හෝ හැර, නොහොත් සඞගයන් බඳනා ලදුවන් වෙසෙසින් බඳනා ලදුවන් හාත්පසින් බඳනා ලදුවන් ලැඟුණුවුන් ලග්නා ලදුවන් අවුරා බඳනා ලද බන්ධනයන් පොළා පියා හෝ හැර, යම්සේ ගමනට සැරසූ දෝලාවක් හෝ රියක් හෝ ගැලක් හෝ යානයක් හෝ විසුරුවත් ද, සුණු කෙරෙත් ද, එසෙයින් මැ සඞගයන් පරිත්‍යාග කොට හෝ හැරපියා, නොහොත් සඞගයන් බඳනා ලදුවන් වෙසෙසින් බඳනා ලදුවන් හාත්පසින් බඳනා ලදුවන් ලැඟුණුවුන් ලග්නා ලදුවන් අවුරා බඳනා ලද බන්ධනයන් පොළා පියා හෝ හැරපියා නුයි 'භවාභවෙ සඞගමිමං විසජ්ජා යනු වේ.

**සො වීතතණ්හා අනීඝො නිරාසො අතාරි සො ජාතිජරනති බ්‍රෑමි**– '**තණ්හා**' යනු: රූපතෘෂ්ණා යැ ......ධර්මතෘෂ්ණා යි. යමක්හට තෙල තෘෂ්ණාව ප්‍රහීණ වූ ද, මුලුසුන් වූ ද, සන්හිඳුණා ද ප්‍රතිප්‍රශ්‍රබ්ධ ද යළි උපදනට නො තිසි වූවා ද නුවණගින්නෙන් දැවුණා ද, හෙතෙම ප්‍රහීණ තෘෂ්ණා ඇත්තේ යැ පහවගිය තෘෂ්ණා ඇත්තේ යැ හරනා ලද තෘෂ්ණා ඇත්තේ යැ, වමාළ තෘෂ්ණා ඇත්තේ යැ මුදන ලද තෘෂ්ණා ඇත්තේ යැ නෙවන ලද තෘෂ්ණා ඇත්තේ යැ දුරලන ලද තෘෂ්ණා ඇත්තේ යැ වීතරාග වූයේ යැ විගතරාග වූයේ යැ ත්‍යක්තරාග වූයේ යැ වාන්තරාග වූයේ යැ මුක්තරාග වූයේ යැ ප්‍රහීණරාග වූයේ යැ ප්‍රතිනිසෘෂ්ට රාග වූයේ යැ තෘෂ්ණා රහිත වූයේ යැ නිවියේ යැ සිහිල් වූයේ යැ (කායික චෛතසික) සුඛානුභවනය කරනුයේ ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත වැ වාසය කෙරේ ය යි කියනු ලැබේ.

**අනීඝොති** රාගො නීඝො, දොසො නීඝො, මොහො නීඝො, කොධො නීඝො, උපනාහො -පෙ- සබ්බාකුසලාභිසංඛාරා නීඝා, යස්සෙතෙ නීඝා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා සො වුච්චති 'අනීඝො. **නිරාසොති** 'ආසා' වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං." යස්සෙසා ආසා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති 'නිරාසො'. **ජාතීති** "යා තෙසං තෙසං සත්තානං -පෙ- ආයතනානං පටිලාභො, **ජරාති** "යා තෙසං තෙසං සත්තානං -පෙ- ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා **සො වීතතණ්හො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රූමීති** යො සො වීතතණ්හො ච අනීඝො ච නිරාසො ච සො ඛො ජාතිජරාමරණං අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයීති, බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'සො වීතතණ්හො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රූමි.'

තෙනාහ භගවා;

"විද්වා ච යො වෙදගූ නරො ඉධ
භවාභවෙ සඞ්ගමිමං විසජ්ජ,
සො වීතතණ්හො අනීඝො නිරාසො
අතාරි සො ජාතිජරන්ති බ්‍රූමී"ති

සහ ගාථාපරියොසානා[1] -පෙ- සත්ථා මෙ භගවා සාවකොහමස්මීති.

මෙත්තගූ සුත්තනිද්දෙසො චතුත්ථො

1. පරියොසානෙ - ච-ඒ-ක-පත.

හෙතෙම 'වීතතණ්හ' නම. **අනීඝො** යනු: රාගය උවදුරෙක ද්වෙශය උව දුරෙක මොහය උවදුරෙක ක්‍රොධය උවදුරෙක බද්ධවෛරය උවදුරෙක ......හැම අකුශලාභිසංස්කාරයෝ උවදුරුහ. යමක්හට තෙල උවදුරු ප්‍රහීණ ද මුලුසුන් වූවාහු ද සන්හිඳුණාහු ද ප්‍රතිප්‍රශ්‍රබ්ධ ද යළි උපදනට නො නිසි වූවාහු ද නුවණගින්නෙන් දවුණාහු ද, හෙතෙම 'අනීඝ' යි කියනු ලැබේ. **නිරාසො** යනු: තෘෂ්ණාව 'ආසා' යි කියනු ලැබේ. යම් රාගයෙක් බලවත් රාගයෙක් ...අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හට තෙල ආශාව තෘෂ්ණාව ප්‍රහීණ ද මුලුසුන් වූ ද සන්හිඳුණා ද ප්‍රතිප්‍රශ්‍රබ්ද්ධ ද යළි උපදනට නො නිසි වූ ද නුවණගින්නෙන් දවන ලද ද, හෙතෙම 'නිරාස' යි කියනු ලැබේ. **ජාති** යනු: ඒ ඒ සත්ත්වයන්ගේ යම් ......ආයතන ප්‍රතිලාභයෙක් වේ ද, **ජරා** යනු: ඒ ඒ සත්ත්වයන්ගේ යම් ......ඉන්ද්‍රියයන් ගේ පැසීමෙක් වේ ද මේ 'ජරා' යි කියනු ලැබේ. **සො වීතතණ්හො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරනති බ්‍රෑමි** යනු: යමෙක් ප්‍රහීණ තෘෂ්ණා ඇත්තේ ත් උවදුරු නැත්තේ ත් ආශා රහිත වූයේ ත් වේ ද, හෙතෙම ජාතිජරා මරණය (කාමයන් දුරු කෙරෙමින්) තරණය කෙළේ යැ (කෙලෙස් දුරු කෙරෙමින්) උත්තරණය කෙළේ යැ (ප්‍රතිෂ්ඨා හෙතු සිඳිමින්) ප්‍රතරණය කෙළේ යැ (සසර ඉක්මවමින්) සමතික්‍රමණය කෙළේ යැ (යළි උපදනට නො නිසි කෙරෙමින්) වෙසෙසින් ඉක්මවී යැ යි කියමි පවසමි දෙසමි පනවමි තබමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි නො ගැඹුරු කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි 'සො වීතතණ්හො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරනති බ්‍රෑමි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"විද්‍වා ච යො වෙදගූ නරො ඉධ – පෙ– අතාරි සො ජාතිජරනති බ්‍රෑමි" යි

ගාථා පර්‍ය්‍යවසානය හා සමග ......භාග්‍යවත්හු මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවකයෙමියි.

**සතර වැනි මෙත්තගූ සූත්‍ර නිර්දේශයයි.**

# 5. ධොතක සුත්තනිද්දෙසො

5-1

පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තං (ඉච්චායස්මා ධොතකො)
වාචා'භිකඞ්ඛාමි මහෙසි තුය්හං.
තව සුත්වාන නිග්ඝොසං
සික්ඛෙ නිබ්බානමත්තනො.

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තන්ති:** 'පුච්ඡා'ති[1] තිස්සො පුච්ඡා අදිට්ඨජොතනා පුච්ඡා, දිට්ඨසංසන්දනා පුච්ඡා, විමතිච්ඡෙදනා පුච්ඡා, -පෙ- ඉමා තිස්සො පුච්ඡා -පෙ- නිබ්බානපුච්ඡා. **පුච්ඡාමි තන්ති:** පුච්ඡාමි තං, යාචාමි තං, අජ්ඣෙසාමි තං, පසාදෙමි තං. කථයස්සු මෙති 'පුච්ඡාමි තං,' **භගවාති:** ගාරවාධිවචන මෙතං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති. **බ්‍රෑහි මෙ තන්ති** බ්‍රෑහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ[2] උත්තානීකරොහි පකාසෙහීති පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තං.'

**ඉච්චායස්මා ධොතකොති:** 'ඉච්චා'ති පදසන්ධි[3] -පෙ- **ආයස්මාති** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචන මෙතං 'ආයස්මා'ති. **ධොතකොති:** තස්ස බ්‍රාහ්මණස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපොති 'ඉච්චායස්මා ධොතකො'.

**වාචාභිකඞ්ඛාමි මහෙසි තුය්හන්ති:** තුය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං[4] කඞ්ඛාමි අභිකඞ්ඛාමි ඉච්ඡාමි සාදියාමි පත්ථයාමි පිහයාමි අභිජප්පාමි. **මහෙසීති** මහෙසී භගවා, මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති මහෙසී -පෙ- කහං නරාසභො'ති මහෙසීති 'වාචාභිකඞ්ඛාමි මහෙසි තුය්හං.'

**තව සුත්වාන නිග්ඝොසන්ති** තුය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං සුත්වා සුණිත්වා උග්ගහෙත්වා උපධාරයිත්වා උපලක්ඛයිත්වාති[5] 'තව සුත්වාන නිග්ඝොසං.'

---

1. පුච්ඡාමීති - මජසං, සයා,
2. විවරාහි විභජාහි - ම ජසං, සයා,
3. සරසන්ධි - ච - වි - ක -
4. අනුසාසනං, අනුසිට්ඨං - මජසං, අනුසත්ථිං ස,
5. උපසල්ලක්ඛයිත්වා - වි-ක

# 5. ධොතක සූත්‍රනිර්දේශය

5–1.

(ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි.) භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල වදළ මැනැව, මහර්ෂීන් වහන්ස, මුඹ වහන්සේ ගේ වදන් රුස්නෙමි. මුඹ වහන්සේ ගේ ධර්මනිර්ඝොෂය අසා තමා ගේ (රාගාදිය) නිවනු සඳහා (අධිශීලාදියෙහි) හික්මෙන්නෙමි.

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තං** යනු; **'පුච්ඡා'** යි පෘච්ඡා තුනෙක: අදෘෂ්ටද්‍යොතනා පෘච්ඡා යැ දෘෂ්ටසංසන්දනා පෘච්ඡා යැ විමතිච්ඡෙදනා පෘච්ඡා යි මොහු තුන් පෘච්ඡා යි ...නිර්වාණ පෘච්ඡා යි. **පුච්ඡා මි තං** යනු; මුඹ වහන්සේ පුළුවුස්මි, මුඹ වහන්සේ අයදිමි, මුඹ වහන්සේ අධ්‍යෙෂණය කෙරෙමි, මුඹ වහන්සේ පහදවමි, මට කිවමැනව නුයි **'පුච්ඡාමි තං'** යනු වේ. **භගවා** යනු: තෙල ගෞරවනාමයෙකි ......මේ 'භගවා' යනු සාක්ෂාත් ප්‍රඥප්තියෙකි. **බ්‍රෑහි මෙ තං** යනු: කිව මැනැවැ පැවැසූව මැනැවැ දෙසූව මැනැව පැනවූව මැනැව තැබූව මැනැවැ විවෘත කළ මැනැවැ විභාග කළ මැනැවැ නො ගැඹුරු කළ මැනැවැ ප්‍රකාශ කළ මැනැව නුයි 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තං' යනු වේ.

**ඉච්චායස්මා ධොතකො** යනු: 'ඉච්චා' යි පදසන්ධි යැ ......**ආයසමා** යනු; ප්‍රියවචන යැ ගුරුවචන යැ තෙල 'ආයස්මා' යනු සගෞරව සප්‍රතිශ්‍රයාධි වචන යි. **ධොතකො** යනු: එ බමුණුගේ නාම යැ සඞ්ඛ්‍යාවයැ සංඥාව යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ නාමකර්ම යැ නාමධෙය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප යැ නුයි 'ඉච්චායස්මා ධොතකො' යනු වේ.

**වාචාභිකඞ්ඛාමි මහෙසි තුයහං** යනු: මුඹ වහන්සේගේ කීම වාක්‍ය මාර්ගය අවවාදය අනුශාසනිය කැමැත්තෙමි, වෙසෙසින් කැමැත්තෙමි ඉස්නෙමි ඉවසමි ප්‍රාර්ථනා කෙරෙමි රුස්නෙමි ජල්පන කෙරෙමි. **මහෙසි** යනු: බුදුහු මහර්ෂිහ: මහත් වූ ශීලස්කන්ධය එෂණ ගවෙෂණ පයෙෂණ කෙළේ නුයි මහර්ෂිහ ......නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ කොහි ද යි මහර්ෂි වෙත් නුයි 'වාචාභිකඞ්ඛාමි මහෙසි තුයහං' යනු වේ.

**තව සුත්වාන නිගෙසාසං** යනු: මුඹ වහන්සේ ගේ වචනය වාක්‍ය මාර්ගය අවවාදය අනුශාසනය අසාගෙන උගෙන ධරා සලකා නුයි 'තව සුත්වාන නිග්ඝොසං' යනු වේ.

**සික්ඛෙ නිබ්බානමත්තනොති:** '**සික්ඛා**'ති තිස්සො සික්ඛා: අධිසීල සික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. **නිබ්බානමත්තනොති** අත්තනො රාගස්ස නිබ්බාපනාය දොසස්ස නිබ්බාපනාය, මොහස්ස නිබ්බාපනාය, කොධස්ස නිබ්බාපනාය උපනාහස්ස නිබ්බාපනාය -පෙ- සබ්බාකුසලාභිසංඛාරානං සමාය උපසමාය වූපසමාය නිබ්බාපනාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, පස්සන්තො සික්ඛෙය්‍ය, පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො[1] සික්ඛෙය්‍ය, සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය, විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය, සතිං උපට්ඨපෙන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො සික්ඛෙය්‍ය, පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය, පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය, ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති '**සික්ඛෙ නිබ්බානමත්තනො.**'

තෙනාහ සො බ්‍රාහ්මණො:

> "පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තං (ඉච්චායස්මා ධොතකො)
> වාචාභිකඞ්ඛාමි මහෙසි තුය්හං,
> තව සුත්වාන නිග්ඝොසං
> සික්ඛෙ නිබ්බානමත්තනො''ති.

---

## 5–2.

> තෙන හාතප්පං කරොහි (ධොතකාති භගවා)
> ඉධෙව නිපකො සතො,
> ඉතො සුත්වාන නිග්ඝොසං
> සික්ඛෙ නිබ්බානමත්තනො.

**තෙන හාතප්පං කරොහීති** ආතප්පං කරොහි, උස්සාහං කරොහි, උස්සොළ්හිං කරොහි, ථාමං කරොහි, ධිතිං කරොහි, විරියං කරොහි, ඡන්දං ජනෙහි, සංජනෙහි උපට්ඨපෙහි සමුට්ඨපෙහි නිබ්බත්තෙහි අභිනිබ්බත්තෙහීති 'තෙනහාතප්පං කරොහි.'

1. චිත්තං අධිට්ඨහන්තො-පන
චිත්තං පට්ඨහන්තො-වි-ථි-ක

**සිකෙඛ නිබ්බානමත්තනො** යනු: 'සික්ඛා' යි ශික්ෂා තුනෙක: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥාශික්ෂා යි ...... මෙ අධිප්‍රඥ ශික්ෂා යි. **නිබ්බානමත්තනො** යනු: තමාගේ රාගය නිවනු පිණිස ද්වේෂය නිවනු පිණිස මොහය නිවනු පිණිස ක්‍රොධය නිවනු පිණිස උපනාහය නිවනු පිණිස ...හැම අකුශලාභිසංස්කාරයන්ගේ ශමනය පිණිස මතුමත්තෙහි ශමනය පිණිස සන්හිඳුවීම පිණිස නිවීම පිණිස හැරපීම පිණිස ප්‍රතිප්‍රශ්‍රබ්ධිය පිණිස අධිශීලය ද හික්මෙන්නේ යැ අධිචිත්තය ද හික්මෙන්නේ යැ අධිප්‍රඥාව ද හික්මෙන්නේ යැ මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙන්නේ යැ දනිමින් හික්මෙන්නේ යැ දක්මින් හික්මෙන්නේ යැ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙන්නේ යැ සිත පිහිටුවමින් හික්මෙන්නේ යැ ශ්‍රද්ධායෙන් අධිමුක්තවෙමින් (බැදෙමින්) හික්මෙන්නේ යැ වීර්‍ය්‍යප්‍රග්‍රහය කෙරෙමින් හික්මෙන්නේ යැ සිහි එළවමින් හික්මෙන්නේ යැ චිත්ත සමාධානය කෙරෙමින් හික්මෙන්නේ යැ ප්‍රඥායෙන් ප්‍රජානනය කෙරෙමින් හික්මෙන්නේ යැ ස්වලක්ෂණාවබොධයෙන් දතයුත්ත ස්වලක්ෂණාවබොධයෙන් දනිමින් හික්මෙන්නේ යැ සාමාන්‍ය ලක්ෂණාවබොධයෙන් දත යුත්ත සාමාන්‍යලක්ෂණාවබොධයෙන් දනිමින් හික්මෙන්නේ යැ ප්‍රහාණය කළයුත්ත ප්‍රහාණය කෙරෙමින් හික්මෙන්නේ යැ භාවනා කළ යුත්ත භාවනා කෙරෙමින් හික්මෙන්නේ යැ ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙන්නේ යැ හැසිරෙන්නේ යැ මොනොවට හැසිරෙන්නේ යැ සමාදන් ව ගෙන පවත්නේ නුයි 'සික්ඛෙ නිබ්බානමත්තනො' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**''පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙ තං–පෙ– සිකෙඛ නිබ්බාන මත්තනො''** යි

---

5–2.

(බුදුහු මෙසේ වදළහ: ධොතකය,) එසේ වී නම් මෙහි මැනුවණැති වැ සිහි ඇති වැ උත්සාහ කරව, මෙහි මාගේ වචන අසා තමාගේ කෙලෙස් නිවනු පිණිස (තුන් ශික්ෂා) හික්මෙන්නේ යි.

**තෙන හාතප්පං කරොහි** යනු: කෙලෙස් තවන වීර්‍ය්‍යය කරව, උත්සාහ කරව, අධිමාත්‍ර උත්සාහ කරව, ස්ථිරවීර්‍ය්‍යය කරව, ධෛර්‍ය්‍යය කරව, වීර්‍ය්‍යය කරව, කර්තුකම්‍යතා කුශලච්ඡන්දය උපදව, මොනොවට උපදව, සිහි එළව, මොනොවට සිහි එළව, නිපදව, වෙසෙසින් නිපදව නුයි 'තෙන හාතප්පං කරොහි' යනු වේ.

**ධොතකාති භගවාති:** භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති. **භගවාති** ගාරවාධිවචනමෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති ධොතකාති භගවා.

**ඉධෙව නිපකො සතොති** 'ඉධා'ති ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං සත්ථුසාසනෙ ඉමස්මිං අත්තභාවෙ ඉමස්මිං මනුස්සලොකෙ. **නිපකොති** නිපකො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. **සතොති** චතූහි කාරණෙහි සතො; කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො –පෙ– සො වුච්චති සතොති 'ඉධෙව නිපකො සතො.'

**ඉතො සුත්වාන නිග්ඝොසන්ති** ඉතො මය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං[1] සුත්වා සුණිත්වා උග්ගහෙත්වා[2] උපධාරයිත්වා උපලක්ඛයිත්වාති 'ඉතො සුත්වාන නිග්ඝොසං.'

**සික්ඛෙ නිබ්බානමත්තනොති** 'සික්ඛා'ති තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා –පෙ– අයං අධිපඤ්ඤාසික්ඛා. **නිබ්බාන මත්තනොති** අත්තනො රාගස්ස නිබ්බාපනාය, දොසස්ස නිබ්බාපනාය මොහස්ස නිබ්බාපනාය, කොධස්ස උපනාහස්ස නිබ්බාපනාය –පෙ– සබ්බාකුසලාභිසංඛාරානං සමාය උපසමාය වූපසමාය නිබ්බාපනාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, –පෙ– සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'සික්ඛෙ නිබ්බානමත්තනො.'

තෙනාහ භගවා:

> "තෙන හාතප්පං කරොහි (ධොතකාති භගවා)
> ඉධෙව නිපකො සතො,
> ඉතො සුත්වාන නිග්ඝොසං
> සික්ඛෙ නිබ්බානමත්තනො"ති.

---

1. අනුසාසනං අනුසිට්ඨං–ම ඡ සං
2. උග්ගහිත්වා – පත–උග්ගණ්හිත්වා–ම ඡ සං

**ධොතකා'ති භගවා** යනු: (ධොතක යනු) බුදුහු එ බමුණු නමින් අමතති. **භගවා** යනු: තෙල ගෞරවනාමයෙකි ... මේ 'භගව.' යනු සාක්ෂාත් ප්‍රඥප්ති යෙකි යි 'ධොතකා'ති භගවා' යනු වේ.

**ඉධෙව නිපකො සතො** යනු: 'ඉධ' යි මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්ති-යෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්මවිනයෙහි මේ ප්‍රවචනයෙහි මේ ශ්‍රෙෂ්ඨචයර්‍යායෙහි මේ ශාස්තෘශාසන-යෙහි මේ ආත්මභාවයෙහි මේ මනුෂ්‍ය ලෝකයෙහි. **නිපකො** යනු: භවාඞ්ග ප්‍රඥා ඇත්තේ පණ්ඩිත වූයේ ප්‍රඥා ඇත්තේ බුද්ධි ඇත්තේ ඥාන ඇත්තේ විභාවන ප්‍රඥාඇත්තේ තුලන ප්‍රඥා ඇත්තේ. **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇත්තේ: කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇත්තේ......මෙසෙම 'සතො'යි කියනු ලැබේනුයි 'ඉධෙව නිපකො සතො' යනු වේ.

**ඉතො සුත්වාන නිඝොසං** යනු: මෙහි මාගේ වචනය වාක්‍යපථය දෙශනය අනුශාසනය අසා අසාගෙන උගෙන ධරා සලකා නුයි 'ඉතො සුත්වාන නිග්ඝොසං' යනු වේ.

**සිකෙඛ නිබ්බානමත්තනො** — 'ශික්ෂා' යනු: තුන් ශික්ෂා යි: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥාශික්ෂා යි... මේ අධිප්‍රඥා ශික්ෂා යි. **නිබ්බානමත්තනො** යනු: තමා ගේ රාගය නිවන පිණිස ද්වෙෂය නිවන පිණිස මොහය නිවන පිණිස ක්‍රොධය – උපනාහය – නිවන පිණිස... හැම අකුශලාභිසංස්කාරයන්ගේ ශමනය උපශමනය ව්‍යුපශමනය පිණිස නිවීම පිණිස හැරපීම පිණිස ප්‍රතිප්‍රශ්‍රබ්ධිය පිණිස අධිශීලය ද හික්මෙන්නේ යැ අධිචිත්තය ද හික්මෙන්නේ යැ අධිප්‍රඥාව ද හික්මෙන්නේ යැ මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙන්නේ යැ දනිමින් හික්මෙන්නේ යැ ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් හික්-මෙන්නේ යැ, හැසිරෙන්නේ යැ මොනොවට හැසිරෙන්නේ යැ, සමාදන් වැ ගෙන පවත්නේ නුයි 'සිකෙඛ නිබ්බානමත්තනො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"තෙන හාතප්පං කරොහි – පෙ – සිකෙඛ නිබ්බානමත්තනො'යි.**

5–3

පස්සාමහං දෙවමනුස්සලොකෙ
අකිඤ්චනං බ්‍රාහ්මණං ඉරියමානං[1]
තං තං නමස්සාමි සමන්තචක්ඛු
පමුඤ්ච මං සක්ක කථංකථාහි.

**පස්සාමහං දෙවමනුස්සලොකෙති** 'දෙවා'ති තයො දෙවා: සම්මුතිදෙවා උපපත්තිදෙවා විසුද්ධිදෙවා. කතමෙ සම්මුතිදෙවා: සම්මුතිදෙවා වුච්චන්ති රාජානො ච රාජකුමාරා ච දෙවියො ච ඉමෙ වුච්චන්ති සම්මුතිදෙවා. කතමෙ උපපත්තිදෙවා: උපපත්තිදෙවා වුච්චන්ති චාතුම්මහාරාජිකා දෙවා තාවතිංසා දෙවා යාමා දෙවා තුසිතා දෙවා නිම්මාණරතී දෙවා පරනිම්මිතවසවත්තී දෙවා බ්‍රහ්මකායිකා දෙවා, යෙ ච දෙවා තදුත්තරිං[2] ඉමෙ වුච්චන්ති උපපත්තිදෙවා. කතමෙ විසුද්ධිදෙවා: විසුද්ධිදෙවා වුච්චන්ති තථාගතසාවකා අරහන්තො ඛීණාසවා, යෙ ච පච්චෙකසම්බුද්ධා[3] ඉමෙ වුච්චන්ති විසුද්ධිදෙවා, භගවා සම්මුතිදෙවානං ච උපපත්තිදෙවානං ච විසුද්ධිදෙවානං ච දෙවො ච අතිදෙවො ච දෙවාතිදෙවො ච සීහසීහො නාගනාගො ගණිගණී මුනිමුනී රාජරාජා. **පස්සාමහං දෙවමනුස්සලොකෙති** මනුස්සලොකෙ දෙවං පස්සාමි අතිදෙවං පස්සාමි දෙවාතිදෙවං පස්සාමි දක්ඛාමි ඔලොකෙමි නිජ්ඣායාමි උපපරික්ඛාමීති 'පස්සාමහං දෙවමනුස්සලොකෙ.'

**අකිඤ්චනං බ්‍රාහ්මණං ඉරියමානන්ති** 'අකිඤ්චනන්ති' රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙසකිඤ්චනං දුච්චරිතකිඤ්චනං, තෙ කිඤ්චනා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[4] ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො අකිඤ්චනො. බ්‍රාහ්මණොති භගවා සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො: සක්කායදිට්ඨි බාහිතා හොති, විචිකිච්ඡා බාහිතා හොති, සීලබ්බතපරාමාසො බාහිතො හොති, රාගො බාහිතො හොති, දොසො බාහිතො හොති, මොහො බාහිතො හොති, මානො බාහිතො හොති. බාහිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා[5] සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

1. බ්‍රාහ්මණං ඉරියමානං—ච—වි—ක— බ්‍රාහ්මණවිරිය මානං—ම ජ සං
2. තදුත්තරි – ම ජ සං, සයා
3. පච්චෙක බුද්ධා – ම ජ සං
4. අනභාවංකතා – ම ජ සං, සයා
5. පොනොබ්භවිකා – පත—ක—

5–3.

(ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි:) මම මිනිස් ලොවැ හැසිරෙන පළිබොධ රහිත වූ (බාහිතපාපී හෙයින්) බ්‍රාහ්මණ වූ දේවාති දේවයන් දකිමි. සමතැස් ඇතියාණෙනි, එබඳු වූ මුඹ වහන්සේ නමදිමි. ශාක්‍යයන් වහන්ස, විචිකිත්සායෙන් මා මුදනු මැනැව.

පස්සාමහං දෙවමනුස්සලොකෙ යනු: 'දෙව' යි තුන් දෙව්හ: සම්මුතිදේව යැ උත්පත්තිදේව යැ විසුද්ධිදේව යි. සම්මුති දේවයෝ කවරහ යත්: රජහු ද රජකුමරහු ද දෙවිහු ද සම්මුතිදේව යි කියනු ලැබෙති මොහු 'සම්මුතිදේව' යි කියනු ලැබෙත්. උත්පත්තිදෙවයෝ කවරහ යත්: චාතුර්මහාරාජික දෙව්යෝ ද තව්තිසා දෙව්යෝ ද යාම දෙව්යෝ ද තුෂිත දෙව්යෝ ද නිර්මාණරති දෙව්යෝ ද පරනිර්මිතවසවර්ති දෙව්යෝ ද බ්‍රහ්මකායික දෙව්යෝ ද එයින් මතුයෙහි යම් දෙව් කෙනෙක් වෙත් නම් ඔහු දු 'උත්පත්තිදේව' යි කියනු ලැබෙති. මොහු 'උත්පත්තිදෙව' යි කියනු ලැබෙත්. විශුද්ධිදෙවයෝ කවරහ යත්: තථාගතශ්‍රාවක වූ අර්හත් ක්ෂීණාශ්‍රවයෝ ද යම් පසේබුදු කෙනෙක් වෙත් නම් ඔහු ද 'විශුද්ධිදේව' යි කියනු ලැබෙති. මොහු 'විශුද්ධිදේව' යි කියනු ලැබෙත්. බුදුහු සම්මුතිදේවයනට ද උත්පත්තිදේවයනට ද විශුද්ධිදේවයනට ද, දේව ද අතිදෙව ද දේවාතිදේව ද වෙති, (අභිත බැවින්) සිංහාතිසිංහ යැ (නිකෙලෙස් බැවින් මහත් බැවින් හෝ) නාගාතිනාග ය ගණිනට ගණී යැ මුනිනට මුනි යැ රාජාධිරාජ යි. පස්සාමහං දෙව මනුස්සලොකෙ යනු: මිනිස්ලොවැ දෙව් වූවහු දකිමි, අතිදේව වූවහු දකිමි, දේවාතිදේව වූවහු දකිමි හඳුනමි අවලෝකනය කෙරෙමි සිතමි හාත්පසින් දකිමි නුයි 'පස්සාමහං දෙව මනුස්සලොකෙ' යනු වේ.

අකිඤ්චනං බ්‍රාහමණං ඉරියමානං– 'අකිඤ්චනං' යනු; රාගකිඤ්චන යැ ද්වේෂකිඤ්චන යැ මොහ කිඤ්චන යැ මාන කිඤ්චන යැ දෘෂ්ටි කිඤ්චන යැ ක්ලේශ කිඤ්චන යැ දුශ්චරිත කිඤ්චන යි. ඒ කිඤ්චනයෝ භාග්‍යවත් බුදුනට ප්‍රහීණයෝ යැ උසුන්මුල් ඇත්තාහු යැ තාලවස්තුවක් මෙන් කරන ලදහ, අනුඅභාවය කරන ලදහ, මතු නුපදනා පියවි ඇත්තාහ, එහෙයින් බුදුහු අකිඤ්චනයහ. බ්‍රාහමණො යනු සප්තධර්ම කෙනකුන් දුරු කළ වන බැවින් භාග්‍යවත්හු බ්‍රාහ්මණයහ: සත්කායදෘෂ්ටිය බාහිත (ප්‍රහීණ කරන ලද) වෙයි, විචිකිත්සාව බාහිත වෙයි, ශීලව්‍රතපරාමර්ශය බාහිත වෙයි. රාගය බාහිත වෙයි, ද්වේෂය බාහිත වෙයි. මෝහය බාහිත වෙයි, මානය බාහිත වෙයි, ඔවුන් විසින් සාංක්ලේශික වූ පුනර්භවය ඇති කරන්නා වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මතුයෙහි ජාතිජරාමරණයට කාරණ වූ ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණ කරන ලද්දහු වෙත්.

1 “බාහෙත්වා[1] සබ්බපාපකානි (සභියාති භගවා)
විමලො සාධු සමාහිතො ඨිතත්තො,
සංසාරමතිච්ච කෙවලී සො
අසිතො තාදී පවුච්චතෙ[2] ස බ්‍රහ්මා.” a

ඉරියමානන්ති චරන්තං විහරන්තං ඉරියන්තං[3] වත්තෙන්තං පාලෙන්තං යපෙන්තං යාපෙන්තන්ති 'අකිඤ්චනං බ්‍රාහ්මණං ඉරියමානං.'

තං තං නමස්සාමි සමන්තචක්ඛූති 'තන්ති' භගවන්තං භණති. නමස්සාමීති කායෙන වා නමස්සාමි, වාචාය වා නමස්සාමි, චිත්තෙන වා නමස්සාමි, අන්වත්ථපටිපත්තියා වා නමස්සාමි, ධම්මානුධම්මපටිපත්තියා වා නමස්සාමි, සක්කරොමි ගරුකරොමි මානෙමි පූජෙමි. සමන්තචක්ඛූති 'සමන්තචක්ඛු වුච්චති සබ්බඤ්ඤුතඤ්ඤාණං, භගවා සබ්බඤ්ඤුතඤ්ඤාණෙන උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සම්පන්නො[4] සමන්නාගතො.

2. “න තස්ස අද්දිට්ඨ[5]මිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛූ”ති. a

'තං තං නමස්සාමි සමන්තචක්ඛු'

පමුඤ්ච මං සක්ක කථංකථාහීති 'සක්කා'ති සක්කො භගවා 'සක්‍යකුලා පබ්බජිතො'තිපි සක්කො, අථවා 'අඩ්ඪො මහද්ධනො ධනවා'තිපි සක්කො, තස්සිමානි ධනානි, සෙය්‍යථීදං[6]; සද්ධාධනං සීලධනං හිරිධනං ඔත්තප්පධනං සුතධනං චාගධනං පඤ්ඤාධනං සතිපට්ඨානධනං සම්මප්පධානධනං ඉද්ධිපාදධනං ඉන්ද්‍රියධනං බලධනං බොජ්ඣඞ්ගධනං මග්ගධනං ඵලධනං නිබ්බානධනං, ඉමෙහි අනෙකවිධෙහි ධනරතනෙහි අඩ්ඪො මහාධනො ධනවාති'පි සක්කො.

---

1. බාහිත්වා – ම ජ සං
2. පවුච්චති බ්‍රහ්මා – ව–වි–ක–
3. ඉරියන්තං – ම ජ ස–සයා
4. සමුපපන්නො – ස
   සමුප්පන්නො – ම ජ සං
5. අදිට්ඨ – සයා
6. සෙය්‍යථිදං – ම ජ සං

a. සුත්තනිපාත – සභිය සුත්ත

1 "('සභිය'යි භාග්‍යවත්හු මෙසේ වදළහ:) සියලු පාපධර්මයන් ප්‍රහීණ කොට එහෙයින් මැ විගතමල වූ (ශ්‍රේෂ්ඨ වූ) මාර්ගඵල සමාධියෙන් මැනැවින් එකඟ කළ සිත් ඇති (ලොකධර්මයෙන් කම්පිත නො වන බැවින්) ස්ථිතාත්ම වූ සංසාර හේතු ඉක්මවා සිටි (නිමවන ලද මාර්ගකෘත්‍ය ඇති හෙයින්) කේවලී වූ ඒ ක්ෂීණාස්‍රව තෙමේ (තෘෂ්ණා—දෘෂ්ටි නිඃශ්‍රය නැති හෙයින්) 'අයිත' යි ද (ලොකධර්මයෙන් නිර්විකාර හෙයින්) 'තාදී' යයි ද කියනු ලැබේ. හෙතෙම බ්‍රාහ්මණ නම් වේ."

**ඉරියමානං**—හැසිරෙනුවහු වාසය කරනුවහු ඉරියවූ පවත්වනුවහු වැටෙනුවහු රැකෙනුවහු යැපෙනුවහු යාපනයවනුවහු නුයි 'අකිඤ්චනං බ්‍රාහමණං ඉරියමානං' යනු වේ.

**තං තං නමස්සාමි සමන්තචක්ඛු**— 'තං' යි භාග්‍යවතුන් බෙණෙයි. **නමස්සාමි** – කයින් හෝ නමස්කාර කෙරෙමි, බසින් හෝ නමස්කාර කෙරෙමි, සිතින් හෝ නමස්කාර කෙරෙමි, අන්වර්ථප්‍රතිපදයෙන් හෝ නමස්කාර කෙරෙමි, ධර්මානුධර්ම ප්‍රතිපදයෙන් හෝ නමස්කාර කෙරෙමි සත්කාර කෙරෙමි, ගරු කෙරෙමි, බුහුමන් කෙරෙමි. පුදමි. **සමන්තචක්ඛු** 'සමන්තචක්ඛු' යි සර්වඥතාඥානය කියනු ලැබෙයි, බුදුහු සර්වඥතාඥානයෙන් උපේතයහ, සමුපේතයහ, උපගතයහ, සමුපගතයහ, යුක්තයහ, පරිපූර්ණයහ, සමන්විත වූහු.

2 "ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුක ලොකයෙහි (මෙ කලැ හෝ) පැනැසින් නුදුටු කිසිවක් නැත, යළි (අතීත වූ) නො දත් කිසිවක් නැත, (අනාගත වූ) නො දැනෙන කිසි (ධර්මජාතයෙක්) දු නැත. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබෝධ කළහ. එහෙයින් තථාගත යෝ 'සමන්තචක්ඛු වූහ' යි".

තං තං නමස්සාමි සමන්තචක්ඛු' යනු වේ.

**පමුඤ්ච මං සක්ක කථංකථාහි**— 'සක්ක' යනු: භාග්‍යවත්හු ශාක්‍යයහ, ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූවාහු නුයි ද ශාක්‍යයහ, නොහොත් (ප්‍රඥා ධන සමෘද්ධියෙන්,) ආඪ්‍යයහ, මහත් වූ ප්‍රඥා ධන ඇතියහ, (ප්‍රඥා ධනයෙන්) ධනවත් වූවාහු නුයි ද ශාක්‍යයහ. ඔවුන්ගේ මේ ධනයෝ වෙති, ඒ මෙසේ යි: ශ්‍රද්ධාධන යැ ශීලධන යැ හිරිධන යැ ඔත්තප්පධන යැ ශ්‍රැතධන යැ ත්‍යාගධන යැ ප්‍රඥාධන යැ සතිපට්ඨානධන යැ සම්‍යක්ප්‍රධාන ධන යැ ඍද්ධිපාදධන යැ ඉන්ද්‍රියධන යැ බලධන යැ බොධ්‍යඞ්ගධන යැ මාර්ගධන යැ ඵල ධන යැ නිර්වාණධන යි. මේ නත්වැදෑරුම් ධනරත්නයෙන් ආඪ්‍යයහ, මහද්ධනයහ, ධනවත්හ යි ද ශාක්‍ය නම් වූහ.

අථවා සක්කො 'පහූ විසවී අලමත්තො සූරො වීරො වික්කන්තො අභීරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී, පහීන භයභෙරවො විගතලොමහංසො, තිපි සක්කො, 'කථංකථා' වුච්චති විචිකිච්ඡා, දුක්ඛෙ කඞ්ඛා, දුක්ඛසමුදයෙ කඞ්ඛා, දුක්ඛනිරොධෙ කඞ්ඛා, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය කඞ්ඛා පුබ්බන්තෙ කඞ්ඛා, අපරන්තෙ කඞ්ඛා, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛා, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛා. යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ඡම්භිතත්තං[1] චිත්තස්ස මනොවිලෙඛො. පමුඤ්ච මං සක්ක කථංකථාහීති මුඤ්ච මං, පමුඤ්ච මං, මොචෙහි මං පමොචෙහි මං, උද්ධර මං, සමුද්ධර මං, උට්ඨාපෙහි මං, කථංකථා සල්ලතොති 'පමුඤ්ච මං සක්ක කථංකථාහි.'

තෙනාහ සො බ්‍රාහ්මණො;

"පස්සාමහං දෙව මනුස්සලොකෙ
අකිඤ්චනං බ්‍රාහ්මණං ඉරියමානං,
තං තං නමස්සාමි සමන්තචක්ඛු
පමුඤ්ච මං සක්ක කථංකථාහී"ති.

---

5–4

නාහං සහිස්සාමි[2] පමොචනාය
කථංකථිං ධොතක කඤ්චි ලොකෙ
ධම්මඤ්ච සෙට්ඨං ආජානමානො[3]
එවං තුවං ඔඝමිමං තරෙසි.

**නාහං සහිස්සාමි පමොචනායාති** නාහං තං සක්කොමි මුඤ්චිතුං, පමුඤ්චිතුං මොචෙතුං පමොචෙතුං උද්ධරිතුං සමුද්ධරිතුං[4] උට්ඨාපෙතුං සමුට්ඨාපෙතුං කථංකථාසල්ලතොති එවම්පි නාහං සහිස්සාමි පමොචනාය. අථවා න ඊහාමි, න සමීහාමි, න උස්සහාමි, න වායමාමි න උස්සාහං කරොමි, න උස්සොළ්හිං කරොමි[5], න ථාමං කරොමි, න ධිතිං කරොමි, න විරියං කරොමි, න ඡන්දං ජනෙමි, න සඤ්ජනෙමි, න නිබ්බත්තෙමි න අභිනිබ්බත්තෙමි, අස්සද්ධෙ[6] පුග්ගලෙ අච්ඡන්දිකෙ කුසීතෙ හීනවිරියෙ අප්පටිපජ්ජමානෙ ධම්මදෙසනායාති එවම්පි 'නාහං සහිස්සාමි පමොචනාය:

1. ඡම්භිතත්තං— — මජසං, ස්‍යා, සි
2. සමිස්සාමි — ස්‍යා
3. අජානමානො — ව. වි, ක
4. උද්ධරාපෙතුං සමුද්ධරාපෙතුං — පත
5. න උස්සොළ්හිං කරොමි —ප, ව ,වි—ක
6. අසද්ධෙ — ප—ව—වි—ක
7. අච්ඡන්දිකා— ම ජ සං, ස්‍යා

නොහොත් ශක්‍යයහ ප්‍රභූහ (පරසන්තානයෙහි) වීර්‍ය්‍යය උපදවන්නුවහ සමර්ථ සිත් ඇතියහ ශූර වූවහ පරාක්‍රමවත්හ වික්‍රමවත්හ නො බිය වන සුල්ලහ නො සැලෙන්නුවහ නො තැතිගන්නා සුල්ලහ නො පලායන සුල්ලහ ප්‍රහීණ වූ භය භයඅරමුණු ඇතියහ විගත වූ ලොමුදහ ඇතියහ යි ද ශාක්‍ය නම් වූහ. 'කථංකථා'යි විචිකිත්සාව කියනු ලැබෙයි: දුඃඛයෙහි සැක යැ දුඃඛසමුදයෙහි සැක යැ දුඃඛනිරෝධයෙහි සැක යැ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි සැක යැ ඉදං ප්‍රත්‍යයතා ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන්හි සැක යැ. යම් මෙබඳු සැකයෙක් සැක කරන අයුරෙක් සැක කළ බවෙක් විමතියෙක් විචිකිත්සායෙක් (දෙපසට සැලෙන) ද්වෛළ්හකයෙක් ද්විධාපථයෙක් සංශයෙක් අනෛකාන්ත ග්‍රාහයෙක් (අරමුණ කෙරෙන්) පසු බැස්මෙක් හාත්පසින් පසු බැස්මෙක් නො බැසගැනුමෙක් චිත්තයාගේ තදබවෙක් (සිත හිරි අඳනා බඳු) මනෝවිලෙඛයෙක් වේ ද එය යි. **පමුඤ්ච මං සක්ක කථං කථාහි** යනු: මා මුදනු මැනැවැ මා නොයෙක් අයුරින් මුදනු මැනැවැ මා ලිහිල් කළ මැනැවැ මා ඉතා ලිහිල් කළ මැනැවැ මා (සංසාර පඞ්කයෙන්) නඟාලනු මැනැවැ මොනොවට නඟාලනු මැනැවැ විචිකිත්සාශල්‍යයෙන් මා නඟා සිටුවනු මැනැව නුයි 'පමුඤ්ච මං සක්ක කථංකථාහි' යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**"පස්සාමහං දෙව මනුස්සලොකෙ–පෙ–පමුඤ්ච මං සක්ක කථංකථාහි"** යි.

---

5–4.

(බුදුහු මෙසේ වදළහ: ධොතකය,) ලොවැ විචිකිත්සා ඇති කිසිවකු මුදන්නට මම නො හැක්කෙමි. නොහොත් උත්සාහ නො කෙරෙමි. තෙපි ශ්‍රෙෂ්ඨධර්මය (නිවන) දන්මින් මෙසේ මේ ඔඝය තරණය කරන්නවූ යැ.

**නාහං සහිස්සාමි පමොචනාය** යනු: මම තා කථංකථාශල්‍යයෙන් මුදන්නට වෙසෙසින් මුදන්නට මුදු පියන්නට වෙසෙසින් මුදුපියන්නට නඟන්නට මැනැවින් නඟන්නට නඟා සිටුවන්නට මැනැවින් නඟාසිටුවන්නට නො හැකි යෙම් නුයි මෙසේත් 'නාහං සහිස්සාමි පමොචනාය' යනු වේ. නොහොත් ශ්‍රද්ධා නැති කුශලච්ඡන්ද රහිත වූ කුසීත වූ හීනවීර්‍ය්‍ය ඇති පිළිවෙත්හි නො හැසිරෙන පුද්ගලයනට දහම් දෙසනු සඳහා පියෝ නො කෙරෙමි, මැනැවින් පියෝ නො කෙරෙමි, නො සහමි, වෑයම් නො කෙරෙමි, උත්සාහ නො කෙරෙමි, අධිමාත්‍ර වැ උත්සාහ නො කෙරෙමි, තැත් නො කෙරෙමි, ධෛර්‍ය්‍යය නො කෙරෙමි, වීර්‍ය්‍යය නො කෙරෙමි, රුචි නුපදවමි, වෙසෙසින් රුචි නුපදවමි, නො නිපදවමි, වෙසෙසින් නො නිපදවමි නුයි මෙසේත් 'නාහං සහිස්සාමි පමොචනාය' යනු වේ.

අථවා නත්ථඤ්ඤො කොචි මොචෙතා, තෙ යදි මොචෙය්‍යුං, සකෙන ථාමෙන සකෙන බලෙන සකෙන වීරියෙන සකෙන පරක්කමෙන සකෙන පුරිසථාමෙන අත්තනා සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං පටිපජ්ජමානා මොචෙය්‍යුන්ති[1] එවම්පි 'නාහං සහිස්සාමි පමොචනාය' වුත්තං හෙතං භගවතා: 'සො වත චුන්ද, අත්තනා පලිපපලිපන්නො පරං පලිපපලිපන්නං උද්ධරිස්සතීති නෙතං ඨානං විජ්ජති, සො වත චුන්ද, අත්තනා අදන්තො අවිනීතො අපරිනිබ්බුතො පරං දමෙස්සති විනෙස්සති පරිනිබ්බාපෙස්සතීති නෙතං ඨානං විජ්ජතී''ති[a]

එවම්පි 'නාහං සහිස්සාමි පමොචනාය'

වුත්තම්පි හෙතං භගවතා:

3 අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤො[2] විසොධයෙ'ති.[b]

එවම්පි 'නාහං සහිස්සාමි පමොචනාය'.

වුත්තං හෙතං භගවතා:

''එවමෙව ඛො බ්‍රාහ්මණ, තිට්ඨතෙව නිබ්බානං තිට්ඨති නිබ්බානගාමී මග්ගො තිට්ඨාමහං සමාදපෙතා, අථ ච පන මම සාවකා මයා එවං ඔවදියමානා එවං අනුසාසියමානා අප්පෙකච්චෙ අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙන්ති, එකච්චෙ නාරාධෙන්ති. එත්ථ ක්‍යාහං බ්‍රාහ්මණ, කරොමි මග්ගක්ඛායී[3] බ්‍රාහ්මණ තථාගතො, මග්ගං බුද්ධා ආචික්ඛන්ති, අත්තනා පටිපජ්ජමානා මුච්චෙය්‍යු''න්ති.[c]

එවම්පි 'නාහං සහිස්සාමි පමොචනාය.'

1. මුඤ්චෙය්‍යුන්ති – පත,ච,වි,ක
2. නාඤ්ඤො අඤ්ඤං – ප,ඩි,වි,ක
3. මග්ගමක්ඛායී – පත

a මජ්ඣිම නිකාය – සල්ලෙඛ සුත්ත
b ධම්මපද – අත්තවග්ග
c මජ්ඣිමනිකාය – ගණකමොග්ගල්ලාන සුත්ත

නොහොත් මූදනා අන් කිසිවෙක් නැත, ඉදින් ඔහු මිදෙන්නාහු නම් ස්වකීය ශක්තියෙන් ස්වකීයබලයෙන් ස්වකීය වීර්‍ය්‍යයෙන් ස්වකීය පරාක්‍රමයෙන් ස්වකීය පෞරුෂයෙන් තුමූ සම්‍යක්ප්‍රතිපත් අනුලොම ප්‍රතිපත් අවිරුද්ධ ප්‍රතිපත් අන්වර්ථ ප්‍රතිපත් ධර්මානුධර්මප්‍රතිපත් පිළිපදනාහු මිදෙන්නාහ'යි මෙසේත් 'නාහං සහිස්සාමි පමොචනාය' යනු වේ. භාග්‍යවතුන් විසින් මේ වදරන ලද මැ යි: "චුන්දය, යමෙක් තෙමේ ගැඹුරු (මහ) මඩෙහි ගැලුණේ ද හෙතෙම ගැඹුරු මඩෙහි ගැලුණු අනෙකක්හු නඟා සිටුවන්නේ යැ යන මෙ කරුණ නො වෙයි. චුන්දය, යමෙක් තෙමේ නො දමුණේ නො හික්මුණේ කෙලෙස් පිරිනිවනින් නො පිරිනිවියේත් වෙ නම් හෙතෙම ඒකාන්තයෙන් අනෙකක්හු දමනය කරන්නේ යැ හික්මවන්නේ යැ පිරිනිවන්නේ යැ යන මෙ කරුණ නො වේ" යයි මෙසේත් 'නාහං සහිස්සාමි පමොචනාය' යනු වේ.

මෙ ද වදරන ලද මැ යි භාග්‍යවතුන් විසින්:

3 "යමක්හු විසින් තමා මැ පව්කම් කරන ලද ද, හෙතෙම සිවු අපායක් විඳිනුයේ තෙමේ මැ කෙලෙසෙයි, යළි යමක්හු විසින් තමා පව්කම් නො කරන ලද ද හෙතෙම සුගතියට පැමිණියේ තෙමේ මැ විශුද්ධ වෙයි. කුශලා කුශලකර්ම සඞ්ඛ්‍යාත ශුද්ධිය ද අශුද්ධිය ද කාරක සන්තානයෙහි – තමා කෙරෙහි වීවා දනවයි. අනෙකක් අනෙකෙක්හු විශුද්ධ නො කරන්නේ යැ"යි.

මෙසේත් 'නාහං සහිස්සාමි පමොචනාය' යනු වේ.

භාග්‍යවතුන් විසින් මේ වදරන ලද මැ යි:

"එසෙයින් මැ බමුණ, අමාමහනිවන ඇත් මැ යි. (පූර්වභාග විදර්ශනාදියෙහි පටන් කොට) නිවනට පමුණුවන ආර්‍ය්‍යමාර්ගය ඇත, සමාදන් කරවන (පිළිවෙතැ පිහිටුවන) මම සිටිම් මැ යැ එතෙකුදු වත් මාගේ සව්වෙණ් මා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු ඇතැම් කෙනෙක් මැ අත්‍යන්තනිෂ්ඨා වූ නිර්වාණ සම්පාදනය කෙරෙති, ඇතැම් කෙනෙක් සම්පාදනය නො කෙරෙත්. මෙහි ලා බමුණ, (මොවුන් කෙරෙහි) මම් කුම් කෙරෙම් ද බමුණ, තථාගතයෝ පිළිවෙත් මඟ කියන සුල්ලභ, බුදුහු මාර්ගය ප්‍රකාශ කෙරෙත්, තුමූ පිළිවෙත්හි පිළිපදිමින් මිදෙන්නාහ"යි.

මෙසේත් 'නාහං සහිස්සාමි පමොචනාය' යනු වේ.

කථඞ්කථිං ධොතක කඤ්චි ලොකෙති කථඞ්කථිං පුග්ගලං 'සකඞ්ඛං සවිලෙඛං[1] සද්වෙළ්හකං සවිචිකිච්ඡං. කඤ්චීති කඤ්චි ඛත්තියං වා බ්‍රාහ්මණං වා වෙස්සං වා සුද්දං වා ගහට්ඨං වා පබ්බජිතං වා දෙවං වා මනුස්සං වා. ලොකෙති අපායලොකෙ -පෙ- ආයතනලොකෙති. 'කථඞ්කථිං ධොතක කඤ්චි ලොකෙ,'

ධම්මඤ්ච සෙට්ඨං ආජානමානො[2]ති 'ධම්මං සෙට්ඨං' වුච්චති 'අමතං නිබ්බානං' යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. සෙට්ඨන්ති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං ධම්මං. ආජානමානොති ආජානමානො විජානමානො පටිවිජානමානො පටිවිජ්ඣමානොති 'ධම්මඤ්ච සෙට්ඨං ආජානමානො.'

එවං තුවං ඔඝමිමං තරෙසීති එවං ත්වං කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරෙය්‍යාසි උත්තරෙය්‍යාසි පතරෙය්‍යාසි සමතික්කමෙය්‍යාසි වීතිවත්තෙය්‍යාසීති 'එවං තුවං ඔඝමිමං තරෙසි.'

තෙනාහ භගවා;

"නාහං සහිස්සාමි පමොචනාය (ධොතකාති භගවා)
කථඞ්කථිං ධොතක කඤ්චි ලොකෙ,
ධම්මඤ්ච සෙට්ඨං ආජානමානො
එවං තුවං ඔඝමිමං තරෙසී''ති.

---

5-5

අනුසාස බ්‍රහ්මෙ, කරුණායමානො (ඉච්චායස්මා ධොතකො)
විවෙකධම්මං යමහං විජඤ්ඤං,
යථාහං ආකාසොව[3] අබ්‍යාපජ්ජමානො[4]
ඉධෙව සන්තො අසිතො චරෙය්‍යං.

අනුසාස බ්‍රහ්මෙ, කරුණායමානොති 'අනුසාස බ්‍රහ්මෙ'ති අනුසාස බ්‍රහ්මෙ, අනුග්ගණ්හ බ්‍රහ්මෙ, අනුකම්ප බ්‍රහ්මෙති 'අනුසාස බ්‍රහ්මෙ.' කරුණායමානොති කරුණායමානො අනුද්දයමානො[5] අනුරක්ඛමානො අනුග්ගණ්හමානො අනුකම්පමානොති 'අනුසාස බ්‍රහ්මෙ කරුණායමානො.'

1. සවිලං - ම ජ සං, සයා
2. අජානමානො - ව, වි, ක
3. ආකාසො ව-සයා
4. අබ්‍යාපජ්ඣමානො -සයා
5. අනුදයමානො - ම ජ සං

**කථංකථිං ධොතක කඤ්චි ලොකෙ**– සැක සහිත වූ මනොවිලෙඛ සහිත වූ ද්වෙළ්හක (දෙයිත්) සහිත වූ විචිකිත්සා සහිත වූ සැක ඇති පුහුල්හු. **කඤ්චි** යනු: ක්‍සි ක්ෂත්‍රියයකු හෝ බ්‍රාහ්මණයකු හෝ වෛශ්‍යයකු හෝ ශුද්‍රයකු හෝ ගෘහස්ථයකු හෝ ප්‍රව්‍රජිතයකු හෝ දෙවියකු හෝ මිනිසකු හෝ යි. **ලොකෙ** – අපායලොකයෙහි ... ආයතනලොකයෙහි නුයි 'කථං කථිං ධොතක කඤ්චි ලොකෙ' යනු වේ.

**ධම්මඤ්ච සෙට්ඨං ආජානමානො** යනු: 'ධම්මං සෙට්ඨං' යි අමාමහ නිවන කියනු ලැබෙයි: යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාව ක්ෂය කිරීමෙක් ක්ලේශවිරාගයෙක් දුඃඛ නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. **සෙට්ඨං** යනු: අග්‍ර වූ ශ්‍රෙෂ්ඨ වූ අතිශයින් ශ්‍රෙෂ්ඨ වූ ප්‍රමුඛ වූ උත්තම වූ ප්‍රවර වූ ධර්මය. **ආජානමානො** යනු: නියතයෙන් දන්නේ වෙසෙසින් දන්නේ ඒ ඒ කරුණින් දන්නේ ප්‍රතිවෙධ කරනුයේ නුයි 'ධම්මඤ්ච සෙට්ඨං ආජානමානො' යනු වේ.

**එවං තුවං ඔඝමිමං තරෙසි**– මෙසේ තෝ කාමොඝය භවොඝය දිට්ඨොඝය අවිජ්ජොඝය තරණය කරන්නෙහි උත්තරණය කරන්නෙහි ප්‍රතරණය කරන්නෙහි සමතික්‍රමණය කරන්නෙහි ඉක්මවන්නෙහි යි 'එවං තුවං ඔඝමිමං තරෙසි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**''නාහං සහිස්සාමි පමොචනාය–පෙ–එවං තුවං ඔඝමිමං තරෙසි''යි.**

---

5–5.

(ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි.) ශ්‍රෙෂ්ඨයන් වහන්ස, මම යම් සියලු සංස්කාරයන්ගෙන් විවික්ත වූ නිර්වාණධර්මයක් දනගන්නෙම් නම් යම්සේ ඵම් ආකාශය සෙයින් නානාප්‍රකාර බවට නො පැමිණෙන්නෙම් මෙ අස්නෙහි මැ හුන්නෙම් නොහොත් නිවුණෙම් (තෘෂ්ණා–දෘෂ්ටි) නිඃශ්‍රය රහිත වැ හැසිරෙන්නෙම් නම් එහෙයින් (මට) අනුකම්පා කෙරෙමින් අනුශාසනා කළ මැනැව.

**අනුසාස බ්‍රහ්ම කරුණායමානො**–'අනුසාස බ්‍රහ්මෙ' යනු: ශ්‍රෙෂ්ඨයන් වහන්ස, අනුශාසනා කළ මැනැවැ අනුග්‍රහ කළ මැනැවැ අනුකම්පා කළ මැනැවැ'යි 'අනුසාස බ්‍රහ්මෙ' යනු වේ. **කරුණායමානො**–කරුණා කෙරෙමින් අනුද්දයා කෙරෙමින් අනුරක්ෂණ කෙරෙමින් අනුග්‍රහ කෙරෙමින් අනුකම්පා කෙරෙමින් නුයි 'අනුසාස බ්‍රහ්මෙ කරුණායමානො' යනු වේ.

විවෙකධම්මං යමහං විජඤ්ඤන්ති 'විවෙකධම්මං' වුච්චති අමතං නිබ්බානං. 'යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, යමහං විජඤ්ඤන්ති යමහං ජානෙය්‍යං ආජානෙය්‍යං විජානෙය්‍යං පටිවිජානෙය්‍යං පටිවිජ්ඣෙය්‍යං අධිගච්ඡෙය්‍යං ඵස්සෙය්‍යං සච්ඡිකරෙය්‍යන්ති 'විවෙකධම්මං යමහං විජඤ්ඤං'

යථාහං ආකාසොව අබ්‍යාපජ්ජමානොති යථා ආකාසො න පජ්ජති[1] න ගණ්හාති[2] න බජ්ඣති න පලිබජ්ඣති එවං ආපජ්ජමානො[3] අගණ්හමානො අබජ්ඣමානො අපලිබජ්ඣමානොති එවම්පි ආකාසොව අබ්‍යාපජ්ජමානො' යථා ආකාසො න රජ්ජති ලාඛාය වා හලිද්දියා වා[4] නීලියා වා[5] මඤ්ජෙට්ඨාය වා, එවං අරජ්ජමානො අදුස්සමානො අමුය්හමානො අකිලිස්සමානොති, එවම්පි 'ආකාසොව අබ්‍යාපජ්ජමානො'. යථා ආකාසො න කුප්පති, න බ්‍යාපජ්ජති, න පතිත්ථීයති[6] න පටිහඤ්ඤති, එවං අකුප්පමානො අබ්‍යාපජ්ජමානො අපතිත්ථීයමානො අපටිහඤ්ඤමානොති එවම්පි 'ආකාසොව අබ්‍යාපජ්ජමානො'.

ඉධෙව සන්තො අසිතො චරෙය්‍යන්ති: 'ඉධෙව සන්තො'ති: ඉධෙව සන්තො සමානො, ඉධෙව නිසින්නො සමානො,[7] ඉමස්මිං යෙව ආසනෙ නිසින්නො සමානො, ඉමිස්සායෙව පරිසාය නිසින්නො සමානොති, එවම්පි 'ඉධෙව සන්තො.' අථවා ඉධෙව සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිපස්සද්ධොති එවම්පි 'ඉධෙව සන්තො'. අසිතොති ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච –පෙ– අයං තණ්හානිස්සයො –පෙ– අයං දිට්ඨිනිස්සයො. තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සිතො, සොතං අනිස්සිතො, ඝානං අනිස්සිතො ජිව්හං අනිස්සිතො, කායං අනිස්සිතො, මනං අනිස්සිතො. රූපෙ–සද්දෙ ගන්ධෙ – රසෙ – ඵොට්ඨබ්බෙ – ධම්මෙ – කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං සබ්බෙ ධම්මෙ අසිතො අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසංයුත්තො විමරියාදිකතෙන චෙතසා. චරෙය්‍යන්ති චරෙය්‍යං විහරෙය්‍යං ඉරියෙය්‍යං වත්තෙය්‍යං පාලෙය්‍යං යපෙය්‍යං යාපෙය්‍යන්ති 'ඉධෙව සන්තො අසිතො චරෙය්‍යං.'

---

1. නසජ්ජති – පත, නපපජ්ජති, සයා
2. න ගණ්හති – මජසං
3. අසජ්ජමානො – පත, ච,වි,ක
4. හලිද්දා වා – සයා
5. නීලෙන වා – සයා
6. පතිලීයති – මජසං
   පරිලීයති – සයා
7. ඉධෙව සමානො – මජසං

**විවෙක ධම්මං යමහං විජඤ්ඤං** — 'විවෙකධම්ම' යි අමාමහනිවන කියනු ලැබෙයි: යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාව ක්ෂය කිරීමෙක් ක්ලේශ විරාගයෙක් දුඃඛනිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. **යමහං විජඤ්ඤං** — මම යම් නිවනක් දැන ගනිම් නම් නියතින් දැනගනිම් නම් වෙසෙසින් දැනගනිම් නම් ඒ ඒ කරුණින් දැනගනිම් නම් ප්‍රතිවෙධ කෙරෙම් නම් අවබොධ කෙරෙම් නම් ඥානයෙන් ස්පර්ශ කෙරෙම් නම් ප්‍රත්‍යක්ෂ කෙරෙම් නම් යි 'විවෙකධම්මං යමහං විජඤ්ඤං' යනු වේ.

**යථාහං ආකාසොව අබ්‍යාපජ්ජමානො** — යම්සේ ආකාශය (නානාත්වයට) නො යේ ද නො ගනී ද නො බැඳේ ද හාත්පසින් නො බැඳේ ද එපරිද්දෙන් (නානාත්වයට) නො යනුයෙම් නො ගන්නෙම් නො බැඳෙනුයෙම් හාත්පසින් නො බැඳෙනුයෙම් නුයි මෙසේත් 'ආකාසොව අබ්‍යාපජ්ජමානො' යනු වේ. යම්සේ අහස ලතුයෙන් හෝ කසායෙන් හෝ බෙරුපතින් හෝ මඳටින් හෝ නො රැඳේ ද එසෙයින් නො රැඳෙනුයෙම් දූෂ්‍ය නො වනුයෙම් නො මුළා වනුයෙම් නො කිලිටි වනුයෙම් නුයි මෙසේත් 'ආකාසොව අබ්‍යාපජ්ජමානො' යනු වේ. යම්සේ අහස නො කිපේ ද පියවි නො හරී ද නො තද වේ ද නො ගැටේ ද, එසෙයින් නො කිපෙනුයෙම් පියවි නො හරිනුයෙම් තද බවට නො පැමිණෙනුයෙම් නො ගැටෙනුයෙම් නුයි මෙසේත් 'ආකාසොව අබ්‍යාපජ්ජමානො' යනු වේ.

**ඉධෙව සන්තො අසිතො චරෙය්‍යං** — 'ඉධෙව සන්තො' යනු: මෙහි මැ වූයෙම් මෙහි මැ හුන්නෙම් මෙ අසුනෙහි මැ හුන්නෙම්, මෙ පිරිස්හි මැ හුන්නෙම් නුයි මෙසේත් 'ඉධෙව සන්තො' යනු වේ. නොහොත් මෙහි මැ ශාන්ත වූයෙම් උපශාන්ත වූයෙම් ව්‍යුපශාන්ත වූයෙම් නිවුණෙම් සන්හිඳුණෙම් නුයි මෙසේත් 'ඉධෙව සන්තො' යනු වේ. **අසිතො** — නිඃශ්‍රය දෙකෙකි: තෘෂ්ණා නිශ්‍රය ද දෘෂ්ටිනිශ්‍රය ද යි . . . මේ තෘෂ්ණා නිශ්‍රය යි . . . . මේ දෘෂ්ටිනිඃශ්‍රය යි. තෘෂ්ණානිඃශ්‍රය හැරපියා දෘෂ්ටිනිඃශ්‍රය දුරලා ඇසැ (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) ඇසුරු නො කෙළෙම් කන අනිඃශ්‍රිතයෙම් නැහැය අනිඃශ්‍රිතයෙම් දිව අනිඃශ්‍රිතයෙම් කය අනිඃශ්‍රිතයෙම් සිත අනිඃශ්‍රිතයෙම් රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය-ධර්මයන්- කුලයා- ගණයා- ආවාසය ලාභය යශස ප්‍රශංසාව සුඛය චීවර පිණ්ඩපාත ශයනාසන ගිලන්පස බෙහෙත් පිරිකර, කාමධාතුව රූපධාතුව අරූපධාතුව, කාමභවය රූපභවය අරූපභවය සඤ්ඤාභවය අසඤ්ඤාභවය නේවසඤ්ඤානාසඤ්ඤාභවය එකවෝකාර භවය චතුවෝකාරභවය පඤ්චවොකාරභවය, අතීතය අනාගතය වර්තමානය, රූපායතනය ශබ්දයතනය ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යායතනය ධර්මායතනය, සියලු ධර්මයන් ඇසුරු නො කෙළෙම් අනිඃශ්‍රිතයෙම් නො ඇලුණෙම් නො පැමිණියෙම් ඇතුළු නො වූයෙම් නො බැසගත්තෙම් නික්මගියෙම් බැහැර කෙළෙම් වෙසෙසින් මිදුණෙම් විසංයුක්ත වූයෙම් විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ, **චරෙය්‍යං** යනු: හැසිරෙන්නෙම් වෙසෙන්නෙම් ඉරියවු පවත්වන්නෙම් වැටෙන්නෙම් රැකෙන්නෙම් යැපෙන්නෙම් යාපනය වන්නෙම් නුයි 'ඉධෙව සන්තො අසිතො චරෙය්‍යං' යනු වේ.

තෙනාහ සො බ්‍රාහ්මණො:

“අනුසාස බ්‍රහ්මෙ, කරුණායමානො
විවෙකධම්මං යමහං විජඤ්ඤං,
යථාහං ආකාසොව අබ්‍යාපජ්ජමානො
ඉධෙව සන්තො අසිතො චරෙය්‍ය”න්ති.

---

5-6

කිත්තයිස්සාමි තෙ සන්තිං (ධොතකාති භගවා)
දිට්ඨෙ ධම්මෙ[1] අනීතිහං,
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

**කිත්තයිස්සාමි තෙ සන්තින්ති:** රාගස්ස සන්තිං දොසස්ස සන්තිං මොහස්ස සන්තිං කොධස්ස සන්තිං උපනාහස්ස – මක්ඛස්ස – පළාසස්ස – ඉස්සාය – මච්ඡරියස්ස – මායාය – සාඨෙය්‍යස්ස – ථම්භස්ස – සාරම්භස්ස – මානස්ස – අතිමානස්ස – මදස්ස – පමාදස්ස – සබ්බකිලෙසානං – සබ්බදුච්චරිතානං – සබ්බදරථානං – සබ්බපරිළාහානං – සබ්බසන්තාපානං – සබ්බාකුසලාභිසංඛාරානං සන්තිං උපසන්තිං වූපසන්තිං නිබ්බුතිං පටිප්පස්සද්ධිං කිත්තයිස්සාමි, පකිත්තයිස්සාමි ආචික්ඛිස්සාමි දෙසිස්සාමි පඤ්ඤපෙස්සාමි පට්ඨපෙස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසෙස්සාමීති ‘කිත්තයිස්සාමි තෙ සන්තිං’

**ධොතකාති භගවාති** ‘ධොතකා’ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති. භගවාති ගාරවාධිවචනමෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති ‘ධොතකාති භගවා.’

**දිට්ඨෙ ධම්මෙ අනීතිහන්ති** ‘දිට්ඨෙ ධම්මෙ’ති දිට්ඨෙ ධම්මෙ ඤාතෙ ධම්මෙ තුලිතෙ ධම්මෙ තීරිතෙ ධම්මෙ විභූතෙ ධම්මෙ විභාවිතෙ ධම්මෙ ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම’න්ති දිට්ඨෙ ධම්මෙ ඤාතෙ ධම්මෙ තුලිතෙ ධම්මෙ තීරිතෙ ධම්මෙ විභාවිතෙ ධම්මෙ විභූතෙ ධම්මෙති එවම්පි දිට්ඨෙ ධම්මෙ.

1. දිට්ඨෙව ධම්මෙ – සත –එ–වි–ක

එයින් කී යැ ඒ බමුණු:

**"අනුසාස බ්‍රහ්මෙ-පෙ- අසිතො වරෙය්‍යං"** යි

---

5–6.

(බුදුහු මෙසේ වදළහ: ධොතකය,) ස්මෘතිමත් වැ හැසිරෙනුයේ දක්නා ලද දුඃඛාදි ධර්මයෙහි නොහොත් මෙ අත්බැවහි මැ ආත්මප්‍රත්‍යක්ෂ වූ යම් දහමක් දැනැ ලො වැ විසත්තිකා සංඛ්‍යාත තෘෂ්ණාව තරණය කරන්නේ නම් ඒ නිර්වාණ ධර්මය (ද නිර්වාණ ගාමිනීප්‍රතිපද් ධර්මය ද) තොපට ප්‍රකාශ කරන්නෙමි.

**කිත්තයිස්සාමි තෙ සන්තිං** — රාගයාගේ සන්හිඳීම ද්වෙෂයාගේ සන්හිඳීම මෝහයාගේ සන්හිඳීම ක්‍රෝධයාගේ සන්හිඳීම උපනාහ–මක්ඛ පළාස–ඊර්ෂ්‍යා–මාත්සර්‍ය්‍ය–මායා–සාඨෙය්‍ය– ථම්භ– සාරම්භ–මාන– අතිමාන– මද–ප්‍රමාදයාගේ හැම කෙලෙස්–හැම දුශ්චරිත–හැම දරථ–හැම පරිදහ– හැම සතැවුලි–හැම අකුශලාභිසංස්කාරයන්ගේ සන්හිඳීම උපශාන්තිය ව්‍යුපශාන්තිය නිර්වෘතිය ප්‍රතිප්‍රශ්‍රබ්ධිය කීර්තනය කෙරෙමි ප්‍රකීර්තනය කෙරෙමි පවසමි දෙසමි පනවමි තබමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි නො ගැඹුරු කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි 'කිත්තයිස්සාමි තෙ සන්තිං' යනු වේ.

**ධොතකාති භගවා** — 'ධොතක' යනු: බුදුහු එ බමුණු නමින් අමතති. **භගවා** යනු: තෙල ගෞරවනාමයෙකි . . . මේ 'භගවා' යනු සාක්ෂාත් ප්‍රඥප්තියෙක් නුයි 'ධොතකාති භගවා' යනු වේ.

**දිට්ඨෙ ධම්මෙ අනීතිහං** — 'දිට්ඨෙ ධම්මෙ' යනු: දක්නා ලද (දුඃඛාදි) ධර්මයෙහි දන්නා ලද දහම්හි තුලනය කරන ලද දහම්හි තීරණය කරන ලද දහම්හි ප්‍රකට කරන ලද දහම්හි විභාවනය කරන ලද දහම්හි හැම සංස්කාරයෝ අනිත්‍යහ' යි . . . යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් එ හැම නිරොධ ස්වභාවය ඇතැ'යි දක්නා ලද දහම්හි දන්නා ලද දහම්හි තුලනය කරන ලද දහම්හි තීරණය කරන ලද දහම්හි ප්‍රකට කරන ලද දහම්හි විභාවනය කරන ලද දහම්හි නුයි මෙසේත් 'දිට්ඨෙ ධම්මෙ' යනු වේ.

අථවා දුක්ඛෙ දිට්ඨෙ දුක්ඛං කථයිස්සාමි, සමුදයෙ දිට්ඨෙ සමුදයං කථයිස්සාමි, නිරොධෙ දිට්ඨෙ නිරොධං කථයිස්සාමි, මග්ගෙ දිට්ඨෙ මග්ගං කථයිස්සාමී'ති එවම්පි 'දිට්ඨෙ ධම්මෙ'. අථවා 'සන්දිට්ඨිකං අකාලිකං එහිපස්සිකං ඔපනයිකං පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහී'ති එවම්පි 'දිට්ඨෙ ධම්මෙ' අනීතිහන්ති න ඉතිහිතිහං[1] න ඉති කිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයමභිඤ්ඤාතං අත්තපච්චක්ඛධම්මං තං කථයිස්සාමීති 'දිට්ඨෙ ධම්මෙ අනීතිහ'න්ති

**යං විදිත්වා සතො චරන්ති:** යං විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා 'සබ්බෙ සංඛාරා අනිච්චා'ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා 'සබ්බෙ සංඛාරා දුක්ඛා'ති - 'සබ්බෙ ධම්මා අනත්තා'ති -පෙ- යංකිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. **සතොති:** චතූහි කාරණෙහි සතො; කායෙ කායානුපස්සනා සතිපට්ඨානං භාවෙන්තො සතො -පෙ- සො වුච්චති 'සතො'. **චරන්ති:** චරන්තො විහරන්තො ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තොති 'යං විදිත්වා සතො චරං.'

**තරෙ ලොකෙ විසත්තිකන්ති:** 'විසත්තිකා' වුච්චති තණ්හා. ''යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං.'' **විසත්තිකාති** කෙනට්ඨෙන විසත්තිකා -පෙ- විසටා විත්ථතාති 'විසත්තිකා.' **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙ. **තරෙ ලොකෙ විසත්තිකන්ති** ලොකෙ වෙසා විසත්තිකා[2] ලොකෙ වෙතං විසත්තිකං[3] සතො තරෙය්‍ය උත්තරෙය්‍ය පතරෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍යාති 'තරෙ ලොකෙ විසත්තිකං'

තෙනාහ භගවා:

''කිත්තයිස්සාමි තෙ සන්තිං (ධොතකාති භගවා)
දිට්ඨෙ ධම්මෙ අනීතිහං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකන්ති''.

1. න ඉතිහන්ති - ච,වි,ක
ඉතිහිතිහං-ම ජ සං
2. ලොකෙ වා සා විසත්තිකා - ප,ච,වි
3. ලොකෙ වා තංවිසත්තිකං - ච,වි,ක,

නොහොත් දුක දුටු කල්හි දුක කියම් යි සමුදය දුටු කල්හි සමුදය කියම් යි නිරොධය දුටු කල්හි නිරොධය කියම් යි මාර්ගය දුටු කල්හි මාර්ගය කියම්' මෙසේත් 'දිට්ඨෙ ධම්මෙ' යනු වේ. නොහොත් තමා විසින් දක්ක යුතු යැ, කල් නොයවා පල දෙනසුලු යැ, 'එව බලව' යි කියනට නිසි යැ, සිත්හි ලා එළැවිය යුතු යැ නුවණැතියන් විසින් තමන් කෙරෙහි ලා දතයුතු නුයි මෙසේත් 'දිට්ඨෙ ධම්මෙ' යනු වේ. **අනීතිහං** යනු: මෙසේ මෙසේ යැයි නො වැ මෙසේ වී ලැ' යි නො වැ පරම්පරාකථායෙන් නො වැ පෙළ හා සම යැයි ගැන්මෙන් නො වැ තර්කහෙතුයෙන් නො වැ නය හෙතුයෙන් නො වැ ආකාර සැලැකීමෙන් නො වැ අප ගත් ලබ්ධිය හා සම යැ යි සැලකීමෙන් නො වැ තෙමේ තමා විසින් ස්වලක්ෂණාවබොධයෙන් දන්නා ලද ආත්මප්‍රත්‍යක්ෂ ධර්ම යැ. එය කියම් නු යි 'දිට්ඨෙ ධම්මෙ අනීතිහං' යනු වේ.

**යං විදිත්වා සතො චරං** යනු: යම් දහමක් විදිත කොට තුලන–තීරණ–විභාවන–විභූත කොට 'හැම සංස්කාරයෝ අනිත්‍යහ' යි විදිත කොට තුලන–තීරණ–විභාවන–විභූත කොට 'හැම සංස්කාරයෝ දුක්හ' යි– 'හැම ධර්මයෝ අනිත්‍යහ' යි . . . යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් එ හැම නිරොධ ස්වභාවය ඇතැ' යි විදිත කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට. **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ . . . . හෙතෙම 'සිහි ඇතියේ' යි කියනු ලැබේ. චරං යනු: සරනුයේ වෙසෙනුයේ ඉරියවු පවත්වනුයේ පවත්නේ පාලනය කරනුයේ යැපෙනුයේ යැපීම කරනුයේ නුයි 'යං විදිත්වා සතො චරං' යනු වේ.

**තරෙ ලොකෙ විසත්තිකං** යනු: 'විසත්තිකා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක් . . . අභිධ්‍යායෙක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය යි. **විසත්තිකා** යනු: කවර අරුතෙකින් 'විසත්තිකා' වේ ද ? යත්: . . පැතිරෙන ලද යැ විස්තෘත නුයි 'විසත්තිකා' නම. **ලොකෙ** යනු: අපායලොකයෙහි . . . ආයතනලොකයෙහි යැ.

**තරෙ ලොකෙ විසත්තිකං** යනු: තෙල විසත්තිකා (තෘෂ්ණා) ව ලොකයෙහි මැ වෙයි. ලොකයෙහි මැ වූ තෙල විසත්තිකාව සිහි ඇතියේ (ප්‍රථම මාර්ගයෙන්) තරණය කරන්නේ යැ (ද්විතීය මාර්ගයෙන්) උත්තරණය කරන්නේ යැ (තෘතීය මාර්ගයෙන්) ප්‍රතරණය කරන්නේ යැ (චතුර්ථ මාර්ගයෙන්) සමතික්‍රමණය කරන්නේ යැ (ඵලයට පැමිණ) ඉක්ම සිටුනේ නුයි 'තරෙ ලොකෙ විසත්තිකං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**"කිත්තයිස්සාමි තෙ සන්තිං–පෙ–තරෙ ලොකෙ විසත්තිකං"** යි.

5–7

තඤ්චාහං අභිනන්දාමි
මහෙසි සන්තිමුත්තමං
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං

**තඤ්චාහං අභිනන්දාමීති** 'තං'ති තුය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං[1] නන්දාමි, අභිනන්දාමි මොදාමි අනුමොදාමි ඉච්ඡාමි සාදියාමි පත්ථයාමි පිහයාමි අභිජප්පාමීති 'තඤ්චාහං අභිනන්දාමි.'

**මහෙසි සන්තිමුත්තමන්ති** 'මහෙසී'ති මහෙසි[2] භගවා, 'මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසී'ති මහෙසි. මහන්තං සමාධික්ඛන්ධං –පෙ– කහං දෙවදෙවො කහං නරාසභො'ති මහෙසි. **සන්තිමුත්තමන්ති** 'සන්ති' වුච්චති අමතං නිබ්බානං, "යො සො සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං උත්තමන්ති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති' 'මහෙසි සන්තිමුත්තමං.'

**යං විදිත්වා සතො චරන්ති** යං විදිතං කත්වා –පෙ– 'සබ්බෙ සංඛාරා අනිච්චා'ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති – 'සබ්බෙ ධම්මා අනත්තා'ති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. **සතොති** චතූහි කාරණෙහි සතො; කායෙ කායානුපස්සනා සතිපට්ඨානං භාවෙන්තො සතො –පෙ– සො වුච්චති සතො. චරන්ති චරන්තො –පෙ– යාපෙන්තොති 'යං විදිත්වා සතො චරං.'

**තරෙ ලොකෙ විසත්තිකන්ති** 'විසත්තිකා' වුච්චති තණ්හා. "යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං. **විසත්තිකාති** කෙනට්ඨෙන විසත්තිකා: –පෙ– 'විසටා විත්ථතා'ති විසත්තිකා. **ලොකෙති** අපායලොකෙ –පෙ– ආයතනලොකෙ. **තරෙ ලොකෙ විසත්තිකන්ති** ලොකෙ වෙසා විසත්තිකා ලොකෙ වෙතං විසත්තිකං සතො තරෙය්‍ය[3] උත්තරෙය්‍ය –පෙ– වීතිවත්තෙය්‍යාති 'තරෙ ලොකෙ විසත්තිකං'.

තෙනාහ සො බ්‍රාහ්මණො:
"තඤ්චාහං අභිනන්දාමි
මහෙසි සන්තිමුත්තමං,
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තික"න්ති.

---

1. අනුසන්ධිං – ව,වි,ක්‍ය,, අනුසිට්ඨං–මජ්ඣං

2. කිං මහෙසි – මජ්ඣං

5–7.

(ආයුෂ්මත් ධොතක මෙසේ කී යැ:) මහර්ෂීන් වහන්ස, ස්මෘතිමත් වැ හැසිරෙනුයේ යම් දහමක් දැනැ ලෙ වැ විසත්තිකා (තෘෂ්ණා) ව තරණය කරන්නේ නම මම ඹුඹ වහන්සේ ගේ ඒ ධර්මදෙශනාතක වචනය රුස්මි, උත්තම වූ ඒ ශාන්තිය ද රුස්මි.

**තඤ්චාහං අභිනන්දාමි** — 'තං' යනු: ඹුඹ වහන්සේගේ වචනය වාක්‍යපථය දේශනාව අනුශාසනාව තුස්මි අභිනන්දනය කෙරෙමි සතුටු වෙමි අනුමෝදන් වෙමි ඉස්නෙමි ඉවසමි පතමි කැමැති වෙමි අභිජල්පනය කෙරෙම නුයි 'තඤ්චාහං අභිනන්දමි' යනු වේ.

**මහෙසි සන්තිමුත්තමං** — 'මහෙසි' යනු: බුදුහු මහර්ෂිහ: මහත් වූ ශීලස්කන්ධය එෂණ ගවෙෂණ පයෙෂණ කළහ' යි මහර්ෂිහ, මහත් වූ සමාධිස්කන්ධය . . . දේවාතිදේවයෝ කොහි යැ නරශ්‍රෙෂ්ඨයෝ කොහි යැ' යි මහර්ෂිහ. **සන්තිමුත්තමං**— 'සන්ති' යි අමාමහනිවන කියනු ලැබෙයි: යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ හැරපීමෙක් තෘෂ්ණාව ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. 'උත්තමං' යනු: අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශ්‍රෙෂ්ඨ යැ ප්‍රමුඛ යැ උත්තම යැ ප්‍රවර යැ යි 'මහෙසි සන්තිමුත්තමං' යනු වේ.

**යං විදිත්වා සතො චරං යනු:** යමක් දැනැගෙන . . . 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි දැනැගෙන තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට, 'හැම සංස්කාරයෝ දුඃඛහ' යි– 'හැම ධර්මයෝ අනාත්මහ' යි . . . 'යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ ද එ හැම නිරොධස්වභාවය ඇතැ' යි දැනැ ගෙන තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට. **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ . . . හෙතෙම 'සතො' යි කියනු ලැබෙයි, චරං යනු: සරනුයේ . . . යාපනය කරනුයේ නුයි 'යං විදිත්වා සතො චරං ' යනු වේ.

**තරෙ ලොකෙ විසත්තිකං** යනු: 'විසත්තිකා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක් . . අභිධ්‍යායෙක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය යි. **විසත්තිකා** යනු: කවර අරුතෙකින් 'විසත්තිකා' වේ ද යත්: . . . පැතිරෙන ලද යැ විස්තෘත නුයි විසත්තිකා නම. **ලොකෙ** යනු: අපාය ලෝකයෙහි . . . ආයතන ලෝකයෙහි. **තරෙ ලොකෙ විසත්තිකා** යනු: තෙල විසත්තිකාව ලොකෙයෙහි මැ වෙයි. ලොකයෙහි මැ වූ තෙල විසත්තිකාව සිහි ඇතියේ තරණය උත්තරණය කරන්නේ යැ . . . ඉක්ම සිටුනේ නුයි 'තරෙ ලොකෙ විසත්තිකං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''තඤ්චාහං අභිනන්දාමි–පෙ– තරෙ ලොකෙ විසත්තිකං''යි.**

5–8

යං කිඤ්චි සම්පජානාසි' (ධොතකාති භගවා)
උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ,
එතං විදිත්වා[2] සඞ්ගොති ලොකෙ
භවාභවාය මාකාසි තණ්හං.

**යං කිඤ්චි සම්පජානාසීති** යං කිඤ්චි සම්පජානාසි ආජානාසි විජානාසි පටිවිජානාසි පටිවිජ්ඣසීති 'යං කිඤ්චි සම්පජානාසි'. **ධොතකාති භගවාති** 'ධොතකා'ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති. **භගවාති** ගාරවාධිවචන මෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති 'ධොතකාති භගවා'.

**උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙති** 'උද්ධ' න්ති අනාගතං, අධොති අතීතං, තිරියඤ්චාපි මජ්ඣෙති පච්චුප්පන්නං. 'උද්ධ'න්ති දෙවලොකො, 'අධො'ති අපායලොකො, තිරියඤ්චාපි මජ්ඣෙති මනුස්සලොකො, අථවා උද්ධන්ති කුසලා ධම්මා, 'අධො'ති අකුසලා ධම්මා. 'තිරියං චාපි මජ්ඣෙ'ති අබ්‍යාකතා ධම්මා. උද්ධන්ති අරූපධාතු, 'අධො'ති කාමධාතු, තිරියඤ්චාපි මජ්ඣෙ'ති රූපධාතු. උද්ධ න්ති සුඛා වෙදනා. 'අධො'ති දුක්ඛා වෙදනා, තිරියඤ්චාපි මජ්ඣෙ'ති අදුක්ඛමසුඛා වෙදනා. 'උද්ධ'න්ති උද්ධං පාදතලා 'අධො'ති අධො කෙසමත්ථකා, 'තිරියඤ්චාපි මජ්ඣෙ'ති වෙමජ්ඣෙති උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ'.

**එතං විදිත්වා සඞ්ගොති ලොකෙති** සඞ්ගො එසො ලග්ගනං එතං බන්ධනං එතං පළිබොධො[3] එසොති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'එතං විදිත්වා සඞ්ගොති ලොකෙ.'

**භවාභවාය මාකාසි තණ්හන්ති** 'තණ්හා'ති රූපතණ්හා සද්දතණ්හා –පෙ– ධම්මතණ්හා. **භවාභවායාති** භවාභවාය කම්මභවාය පුනබ්භවාය, කාමභවාය, කම්මභවාය කාමභවාය පුනබ්භවාය, රූපභවාය කම්මභවාය රූපභවාය පුනබ්භවාය, අරූපභවාය කම්මභවාය අරූපභවාය පුනබ්භවාය පුනප්පුනභවාය පුනප්පුනගතියා[4] පුනප්පුන උපපත්තියා පුනප්පුනපටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා තණ්හං මාකාසි, මා ජනෙසි මා සඤ්ජනෙසි මා නිබ්බත්තෙසි මාභිනිබ්බත්තෙසි, පජහ විනොදෙහි බ්‍යන්තීකරොහි අනභාවං ගමෙහීති 'භවාභවාය මාකාසි තණ්හන්ති'.

තෙනාහ භගවා:

"යං කිඤ්චි සම්පජානාසි (ධොතකා'ති භගවා)
උද්ධං අධො තිරියං චාපි මජ්ඣෙ,
එතං විදිත්වා සඞ්ගො'ති ලොකෙ
භවාභවාය මාකාසි තණ්හ''න්ති.

සහගාථාපරියොසානා – පෙ – 'සත්ථා මෙ භන්තෙ භගවා සාවකො හමස්මී'ති.

ධොතක සුත්ත නිද්දෙසො පඤ්චමො.

---

1. සංජානාමි – ව,වි
2. එවං විදිත්වා – පත
3. පලිබොධො – මජසං
4. පුනප්පුන ජාතියා – පත

5–8

(බුදුහු මෙසේ වදළහ: ''ධොතකය,) (අනාගතකාලාදි) උඩ ද (අතීතකාලාදි) යට ද (වර්තමාන කාලාදි) මැද සරස ද වූ යම් කිසි ධර්ම ජාතයක් තෙපි දන්නවු නම් තෙල ලොවැ සඞ්ග (ලග්නා තැන) යැ යි දනැ කුදුමහත් භවයෙහි තෘෂ්ණා නො කරව''යි.

**යං කිඤ්චි සම්පජානාසි** යනු: යම් කිසි ධර්මජාතයක් දන්නවු නම් නියතින් දන්නවු නම් නොයෙක් අයුරින් දන්නවු නම් ඒ ඒ කරුණින් දන්නවු නම් ප්‍රතිවෙධ කරන්නවු නම් නුයි 'යං කිඤ්චි සම්පජානාසි' යනු වේ. **ධොතකා 'ති භගවා**–'ධොතක' යි බුදුහු එ බමුණු නමින් අමතති, **භගවා** යනු: තෙල ගෞරව නාමයෙකි ......මේ 'භගවා' යනු සාක්ෂාත් ප්‍රඥප්ති-යෙකි යි 'ධොතකා'ති භගවා' යනු වේ.

**උද්ධං අධො තිරියඤ්චා'පි මජ්ඣෙ** – 'උද්ධං' යනු: අනාගත යැ **අධො** යනු: අතීත යැ **තිරියඤ්චාපි මජ්ඣෙ** යනු වර්තමාන යි, 'උද්ධං' යනු දිව්‍ය ලොක යැ 'අධො' යනු අපාය ලොක යැ 'තිරියඤ්චාපි මජ්ඣෙ' යනු මනුෂ්‍යලොක යි, නොහොත් 'උද්ධං' යනු: කුශලධර්මයෝ යැ 'අධො' යනු: අකුශලධර්මයෝ යැ 'තිරියඤ්චාපි මජ්ඣෙ' යනු අව්‍යාකෘත ධර්මයෝයි. 'උද්ධං' යනු අරූපධාතු යැ 'අධො' යනු කාමධාතු යැ 'තිරියඤ්චාපි මජ්ඣෙ යනු රූප ධාතු යි. 'උද්ධං' යනු සුඛවේදනා යැ 'අධො' යනු දුඃඛවේදනා යැ 'තිරියඤ්චාපි මජ්ඣෙ' යනු අදුක්ඛමසුඛවේදනා යි, 'උද්ධං' යනු පාදතල-යෙන් උඩ යැ 'අධො' යනු කෙසගින් යට යැ 'තිරියඤ්චාපි මජ්ඣෙ' යනු දෙමැද නුයි 'උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ' යනු වේ.

**එතං විදිත්වා සඞ්ගොති' ලොකෙ** යනු: තෙල සඞ්ග යැ තෙල ලැග්ම යැ තෙල බැඳුම යැ තෙල පළිබොධ යැයි දනැ දැනැගෙන තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට නුයි 'එතං විදිත්වා සඞ්ගො'ති ලොකෙ' යනු වේ.

**භවාභවාය මාකාසි තණ්හං**– 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ශබ්ද තෘෂ්ණා යැ......ධර්මතෘෂ්ණා යි, **භවාභවාය** යනු: පුනපුනා භවයට කර්ම-භවයට විපාකභවයට, කාමධාතුයෙහි කර්මභවයට කාමධාතුයෙහි පුනර්-භවයට රූපධාතුයෙහි කර්මභවයට රූපධාතුයෙහි පුනර්භවයට අරූප-ධාතුයෙහි කර්මභවයට අරූපධාතුයෙහි පුනර්භවයට, පුනපුනාභවයට පුනපුනාගතියට පුනපුනාඋපතට පුනපුනා පිළිසඳට පුනපුනා ආත්ම භාවයන්ගේ නිපැත්මට තෘෂ්ණා නහමක් කරව නහමක් උපදව නහමක් වෙසෙසින් නුපදව නො නිපදව වෙසෙසින් නො නිපදව දුරු කර බැහැර කර විනාශ කර අනභාවයට පමුණුව'යි 'භවාභවාය මාකාසි තණ්හං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

''**යං කිඤ්චි සම්පජානාසි – පෙ – භවාභවාය මාකාසි තණ්හං**''යි.

ගාථා පර්‍ය්‍යවසානය හා සමග ......වහන්ස, භාග්‍යවත්හු මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවකයෙමි'යි.

**පස්වැනි ධොතක සූත්‍ර නිර්දෙශ යි.**

# 6. උපසීව සුත්තනිද්දෙසො

## 6–1

එකො අහං සක්ක, මහන්තමොඝං (ඉච්චායස්මා උපසීවො)
අනිස්සිතො නො විසහාමි තාරිතුං
ආරම්මණං බ්‍රෑහි සමන්තචක්ඛු
යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යං.

**එකො අහං සක්ක මහන්තමොඝන්ති** 'එකො'ති පුග්ගලො වා මෙ දුතියො නත්ථි, ධම්මො වා මෙ දුතියො නත්ථි, යං වා පුග්ගලං නිස්සාය, ධම්මං වා නිස්සාය මහන්තං කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරෙය්‍යං උත්තරෙය්‍යං පතරෙය්‍යං සමතික්කමෙය්‍යං වීතිවත්තෙය්‍යන්ති එකො. **සක්කාති** සක්කො, භගවා 'සක්‍යකුලා පබ්බජිතොති'පි සක්කො. අථවා 'අඩ්ඪො මහද්ධනො ධනවාති'පි සක්කො. තස්සිමානි ධනානි, සෙය්‍යථීදං: සද්ධාධනං සීලධනං හිරිධනං ඔත්තප්පධනං සුතධනං චාගධනං පඤ්ඤාධනං සතිපට්ඨානධනං –පෙ– නිබ්බානධනං, ඉමෙහි අනෙකෙහි ධනරතනෙහි[1] අඩ්ඪො මහද්ධනො ධනවාති'පි සක්කො. අථවා සක්කො පහු විසවී අලමත්තො[2] සූරො වීරො[3] වික්කන්තො අභිරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො'තිපි සක්කොති 'එකො අහං සක්ක මහන්තමොඝං'.

**ඉච්චායස්මා උපසීවොති** 'ඉච්චා'ති පදසන්ධි –පෙ– **ආයස්මාති** පියවචනං –පෙ– **උපසීවොති** තස්ස බ්‍රාහ්මණස්ස නාමං –පෙ– අභිලාපොති 'ඉච්චායස්මා උපසීවො'.

**අනිස්සිතො නො විසහාමි තාරිතුන්ති** අනිස්සිතො'ති පුග්ගලං වා අනිස්සිතො, ධම්මං වා අනිස්සිතො, නො විසහාමි, න උස්සහාමි, න සක්කොමි, න පටිබලො, මහන්තං කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරිතුං උත්තරිතුං පතරිතුං සමතික්කමිතුං වීතිවත්තිතුන්ති 'අනිස්සිතො නො විසහාමි තාරිතුං'.

1. ධම්මරතනෙහි – ච,වි
2. පහු විසවී අලමත්තො – ච,වි,ක
3. ධීරො – ච,වි

# 6. උපසීව සූත්‍රනිර්දෙශය

6–1

(ආයුෂ්මත් උපසීව මෙසේ විචාරයි:) ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්ස, එකලා වූ මම (කිසි පුහුලක්හු හෝ දහමක් හෝ) ඇසුරු නොකෙළෙම් මහත් වූ (කාමාදි) ඔඝය තරණය කරන්නට නො හැකි වෙමි. සමතැස් ඇති සර්වඥයන් වහන්ස, යම් පුහුලක්හු හෝ දහමක් ඇසුරු කෙළෙම් මේ කෙලෙස්වතුරු තරණය කෙරෙම් නම් ඒ නිඃශ්‍රය වදළ මැනැව්.

**එකො අහං සක්ක මහන්තමොඝං**– 'එකො' යනු: යම් පුද්ගලයකු නිසා හෝ දහමක් නිසා හෝ මහත් වූ කාමොඝය භවොඝය දිට්ඨොඝය අවිජ්ජොඝය, තරණය කෙරෙම් ද උත්තරණය කෙරෙම් ද ප්‍රතරණය කෙරෙම් ද මොනොවට ඉක්මවම් ද ඉක්ම සිටුනෙම් ද (එබඳු වූ) දෙවැනි පුද්ගලයෙක් හෝ මට නැත, දෙවැනි දහමෙක් හෝ මට නැත් නු යි 'එකො' යනු වේ. සක්ක යනු: ශාක්‍යයහ, බුදුහු ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූවාහු නුයි ද ශාක්‍යයහ. නොහොත් (ප්‍රඥා ධනයෙන්) ආඪ්‍යයහ මහත් වූ ප්‍රඥාධන ඇතියහ ප්‍රඥාධනයෙන් ධනවත්හ නුයි ද ශාක්‍යයහ. උන්වහන්සේට මේ ධනයෝ වෙති. ඒමෙසේ යැ: ශ්‍රද්ධාධන යැ ශීලධන යැ හිරිධන යැ ඔත්තප්පධන යැ ශ්‍රැතධන යැ ත්‍යාගධන යැ ප්‍රඥාධන යැ සතිපට්ඨානධන යැ ... නිර්වාණධන යැ යි. මේ නොයෙක් ධනරත්නයන් ගෙන් ආඪ්‍යයහ, මහත්ධනයහ, ධනවත්හ යි ද ශාක්‍යයහ. නොහොත් ශාක්‍යයහ ප්‍රභූ වූහ (පර ස්තන්හි) වැර දනවත්නුවහ සමත්සිත් ඇතියහ ශූරයහ පරාක්‍රමවත්හ වික්‍රමවත්හ නො බිය සුල්ලහ නො සැලෙන සුල්ලහ නො තැතිගන්නාසුල්ලහ නො පලායන සුල්ලහ ප්‍රහීණ වූ බිය හා බිය අරමුණු ඇතියහ පහ වූ ලොමුදහ ඇතියහ යි ද ශාක්‍ය නුයි 'එකො අහං සක්ක මහන්තමොඝං' යනු වේ.

**ඉච්චායස්මා උපසීවො**– 'ඉච්චා' යනු: පදසන්ධි යැ... ආයස්මා යනු ප්‍රියවචන යැ ... **උපසීව** යනු: එ බමුණුගේ නාම යැ......අභිලාප නුයි 'ඉච්චා යස්මා උපසීවො 'යනු වේ.

**අනිස්සිතො නො විසහාමි තාරිතුං**'– 'අනිස්සිතො' යනු: පුහුලකු හෝ ඇසිරි නො කෙළෙම් දහමක් හෝ ඇසිරි නො කෙළෙම් මහත් වූ කාමොඝය භවොඝය දෘෂ්ටිඔඝය අවිද්‍යාඔඝය තරණය කරන්නට උත්තරණය කරන්නට ප්‍රතරණය කරන්නට මැනැවින් ඉක්මවන්නට ඉක්ම සිටුනට නො හැක්කෙමි උත්සාහ නො කෙරෙමි නො සමත්මි ප්‍රතිබල නොවෙම් නුයි 'අනිස්සිතො නො විසහාමි තාරිතුං' යනු වේ.

**ආරම්මණං බ්‍රූහි සමන්තචක්ඛූති** 'ආරම්මණ'න්ති ආලම්බනං[1] නිස්සයං උපනිස්සයං. **බ්‍රූහීති** ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහි. **සමන්තචක්ඛූති** 'සමන්තචක්ඛු' වුච්චති සබ්බඤ්ඤුතඤාණං, භගවා තෙන සබ්බඤ්ඤුතඤාණෙන උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො[2] සමුපපන්නො[3] සමන්නාගතො.

> "න තස්ස අදිට්ඨමිධත්ථි කිඤ්චි
> අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
> සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
> තථාගතො තෙන සමන්තචක්ඛූ"ති. [6]

'ආරම්මණං බ්‍රූහි සමන්තචක්ඛු.'

**යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යන්ති** 'යං නිස්සිතො'ති යං පුග්ගලං වා නිස්සිතො, ධම්මං වා නිස්සිතො, මහන්තං කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරෙය්‍යං උත්තරෙය්‍යං පතරෙය්‍යං සමතික්කමෙය්‍යං වීතිවත්තෙය්‍යන්ති 'යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

> "එකො අහං සක්ක මහන්තමොඝං (ඉච්චායස්මා උපසීවො)
> අනිස්සිතො නො විසහාමි තාරිතුං
> ආරම්මණං බ්‍රූහි සමන්තචක්ඛු
> යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍ය"න්ති

---

6–2

> ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා (උපසීවා'ති භගවා)
> නත්ථීති නිස්සාය තරස්සු ඔඝං
> කාමෙ පහාය විරතො කථාහි
> තණ්හක්ඛයං නත්තමහාභිපස්ස[4].

**ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමාති** සො බ්‍රාහ්මණො පකතියා ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිලාභී සන්තංයෙව[5] නිස්සයං න ජානාති 'අයං මෙ නිස්සයො'ති තස්ස භගවා නිස්සයං ච ආචික්ඛති, උත්තරිඤ්ච නිය්‍යාන පථං. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං සතො සමාපජ්ජිත්වා තතො වුට්ඨහිත්වා තත්ථ ජාතෙ චිත්තචෙතසිකෙ ධම්මෙ අනිච්චතො පෙක්ඛමානො දුක්ඛතො – රොගතො – ගණ්ඩතො – සල්ලතො – අඝතො – ආබාධතො– පරතො– පලොකතො– ඊතිතො– උපද්දවතො– භයතො– උපස්සග්ගතො– චලතො– පභඞ්ගුතො– අද්ධුවතො– අතාණතො– අලෙණතො– අසරණතො–

---

1. ආරම්මණං ඇලම්බණං –ම ජ සං, ස්‍යා
2. උපපන්නො – කම්වි
3. සමුප පන්නො–ම ජ සං
4. රත්තමහාභිපස්ස – ස්‍යා
5. සමාපත්තිලාභීයෙව– මජසං, ස්‍යා
6. පටිසම්භිදාමග්ග – ඤාණ කථා, ඉන්ද්‍රිය කථා

**ආරම්මණං බ්‍රෑහි සමන්තචක්ඛු**- 'ආරම්මණං' යනු: අරමුණ නිඃශ්‍රය උපනිඃශ්‍රය, බ්‍රෑහි යනු: කිව මැනැව, දෙසුව මැනැව, පැනැවුව මැනැව, තැබුව මැනැව, විවර කළ මැනැව, විභාග කළ මැනැව, නො ගැඹුරු කළ මැනැව, පැවැසුව මැනැවි. සමන්තචක්ඛු යනු: 'සමන්තචක්ඛු යි සර්වඥතාඥානය කියනු ලැබෙයි, බුදුහු ඒ සර්වඥතාඥානයෙන් උපෙතයහ සමුපෙතයහ යුක්තයහ සංයුක්තයහ නො වෙන් වූහ පරිපූර්ණයහ සමන්වාගතහ.

''ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුකලොකයෙහි මෙකලැ හෝ පැනසින් නුදුටු කිසිවක් නැත, යළි අතීත වූ නො දත් කිසිවක් නැත, අනාගත වූ නො දැනෙන කිසි (ධර්මජාතයෙකු) දු නැති, දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබෝධ කළහ, එහෙයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' වූහ''යි.

''ආරම්මණං බ්‍රෑහි සමන්තචක්ඛු' යනු වේ.

**යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යං**- 'යං නිස්සිතො' යනු: යම් පුඟුලකු හෝ ඇසිරි කෙළෙම් දහමක් හෝ ඇසිරි කෙළෙම් මහත් වූ කාමොඝය භවොඝය දෘෂ්ටිඔඝය අවිද්‍යාඔඝය තරණය කරන්නෙම් උත්තරණය කරන්නෙම් ප්‍රතරණය කරන්නෙම් මැනැවින් ඉක්මවන්නෙම් ඉක්ම සිටුනෙම් නම් නුයි 'යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

''**එකො අහං සක්ක-පෙ- යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යං**''යි.

---

6-2.

(බුදුහු මෙසේ වදළහ:) උපසීව මාණවකය, සිහි ඇතියෙහි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය (අනිත්‍යාදි) විසින් දක්මින් 'නත්ථි කිඤ්චි' යි පැවැති ඒ සමවත ඇසුරු කොට චතුරොඝය තරණය කර, වස්තුකාමක්ලෙශකාම හැරපියා කථංකථා සංඛ්‍යාත විචිකිත්සායෙන් වැළකුණෙහි රැදවල්හි තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිවන විහූත කොට දක්නෙහි.

**ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා**-එ බමුණු පියවින් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිලාභී වූයේ විද්‍යමාන වූ මැ නිඃශ්‍රය 'මෙ මාගේ නිඃශ්‍රය'යි නො දනී. බුදුහු ඍහුට නිඃශ්‍රය ද මත්තෙහි සසරින් නික්ම යන මඟ ද පවසන සේක. සිහි ඇතියේ ආකිඤ්චඤ්ඤායතන සමවතට සමවැද එයින් නැඟී සිට එ සමවත්හි උපන් චිත්තචෛතසිකධර්මයන් අනිත්‍ය විසින් (නුවණින්) බලමින් දුක් විසින්-රොග විසින්- ගඩ විසින්- ශල්‍ය විසින්- අඝ විසින්- ආබාධ විසින් පර විසින්- පලොක (බිඳෙන) විසින්- ව්‍යසන විසින්- උපද්‍රව විසින්- භය විසින්- උපසර්ග විසින්- චඤ්චල විසින්- බිඳෙනසුලු හෙයින්-අධ්‍රැව හෙයින් -අත්‍රාණ හෙයින්-අලෙණ හෙයින්--අසරණ හෙයින්-

අසරණීභූතතො – රිත්තතො – තුච්ඡතො – සුඤ්ඤතො – අනත්තතො – ආදීනවතො – විපරිණාමධම්මතො – අසාරකතො – අඝමූලතො වධකතො විභවතො[1] – සාසවතො – සඞ්ඛතතො – මාරාමිසතො – ජාතිධම්මතො – ජරාධම්මතො – ව්‍යාධිධම්මතො – මරණධම්මතො – සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මතො – සංකිලෙසිකධම්මතො – සමුදයධම්මතො – අත්ථඞ්ගමතො – අස්සාදතො – ආදීනවතො – නිස්සරණතො – පෙක්ඛමානො දක්ඛමානො ඔලොකයමානො නිජ්ඣායමානො උපපරික්ඛමානො. **සතිමාති** "යා සති අනුස්සති පටිස්සති –පෙ– සම්මාසති අයං වුච්චති සති" ඉමාය සතියා උපෙතො හොති –පෙ– සමන්නාගතො සො වුච්චති සතිමාති 'ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා.'

**උපසීවාති භගවාති** 'උපසීවා'ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති, **භගවාති** ගාරවාධිවචනමෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති 'උපසීවාති භගවා'

**නත්ථීති නිස්සාය තරස්සු ඔඝන්ති** 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති' කිං කාරණා 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං සතො සමාපජ්ජිත්වා තතො වුට්ඨහිත්වා තඤ්ඤෙව විඤ්ඤාණං අභාවෙති විභාවෙති[2] අන්තරධාපෙති[3] 'නත්ථි කිඤ්චී'ති පස්සති, තංකාරණා 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති, තං නිස්සාය[3] උපනිස්සාය ආලම්බනං[4] කරිත්වා කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරස්සු උත්තරස්සු පතරස්සු සමතික්කමස්සු වීතිවත්තස්සූති 'නත්ථීති නිස්සාය තරස්සු ඔඝං'.

**කාමෙ පහාය විරතො කථාහීති** 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **කාමෙ පහායාති** වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'කාමෙපහාය'. **විරතො කථාහීති** 'කථංකථා' වුච්චති විචිකිච්ඡා, දුක්ඛෙ කඞ්ඛා –පෙ– ඡම්භිතත්තං[6] චිත්තස්ස මනොවිලෙඛො.' කථංකථාය ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පයුත්තො[7] විසංයුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති එවම්පි 'විරතො කථාහි'. අථවා ද්වත්තිංසාය තිරච්ඡානකථාය ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පයුත්තො[7] විසංයුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති එවම්පි විරතො කථාහීති 'කාමෙ පහාය විරතො කථාහි.'

1. භවතො විභවතො – ච,වි
2. විභාවෙති – ම ඡ සං, ස්‍යා
3. අන්තරධායති – ච, වි,
4. ...සමාපත්තිං නිස්සාය – ම ඡ සං
5. ආලම්බණං – ම ඡ සං, ආරම්මණං, ආලම්බණං–ස්‍යා
6. ඡම්භිතත්තං – ම ඡ සං, ස්‍යා
7. විප්පමුත්තො – ම ඡ සං, ච

අසරණීභූත හෙයින්– රික්ත හෙයින්– තුච්ඡ හෙයින්– ශූන්‍ය හෙයින්– අනාත්ම හෙයින්– ආදීනව හෙයින්– විපරිණාමස්වභාව හෙයින්– අසාර හෙයින්– අඝ (දුක්) මූල හෙයින්– වධක හෙයින්– විභව හෙයින්– සාශ්‍රව හෙයින්– හෙතුප්‍රත්‍යයාභිසංස්කෘත හෙයින් මාරාමිෂ හෙයින්– ජාතිස්වභාව හෙයින්– ජරාස්වභාව හෙයින්– ව්‍යාධිස්වභාව හෙයින්– මරණස්වභාව හෙයින්– සොක–පරිදෙව–දුක්ඛ–දෙමනස්ස–උපායාස ස්වභාව හෙයින්– සංක්ලේශ ස්වභාව හෙයින්– සමුදය ස්වභාව හෙයින්– අස්තඞ්ගම හෙයින්– ආස්වාද හෙයින්– ආදීනව හෙයින්– නිස්සරණ හෙයින් බලමින් දක්මින් අවලෝකනය කෙරෙමින් සිතමින් විමසමින්. **සතිමා**– යම් ස්මෘතියක් අනුස්මෘතියක් ප්‍රතිස්මෘතියක්...සම්‍යක් ස්මෘතියක් වේ ද මේ 'සති' යි කියනු ලැබෙයි. මේ සතියෙන් යුක්ත වූයේ වෙයි... සමන්විත වූයේ වෙයි. හෙ 'සතිමා' යි කියනු ලැබේ නුයි 'ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා' යනු වේ.

**උපසීවා'ති භගවා**– 'උපසීව' යි බුදුහු එ බමුණු නමින් අමතන සේක. **භගවා** යනු: තෙල ගෞරවාධිවචන යැ......යම් භගවත් යන නමක් වී ද තෙල අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තිය නුයි 'උපසීවා'ති භගවා' යනු වේ.

**නත්‍ථී'ති නිස්සාය තරස්සු ඔඝං**– 'නත්ථි කිඤ්චි' යනු: ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති යි. කිකරුණින් 'නත්ථිකිඤ්චි' යි ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති වී ද යත්: සිහි ඇති වැ ආකිඤ්චඤ්ඤායතන සමවත් සමවැද එයින් නැඟී සිට එ මැ (අ කාශාලම්බන) විඥානය අභාවයට පමුණුවයි වෙසෙසින් අභාවයට පමුණුවයි අතුරුදහන් කෙරෙයි 'කිසිත් නැතැ'යි දකියි, එකරුණින් ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය 'නත්ථි කිඤ්චි' නම් වෙයි, එය නිසා ඇසුරු කොට අරමුණු කොට කාමොඝය භවොඝය දිට්ඨොඝය අවිජ්ජොඝය තරණය කර, උත්තරණය කර, ප්‍රතරණය කර, සමතික්‍රමණය කර, ව්‍යතික්‍රමණය කර' යි 'නත්ථීති නිස්සාය තරස්සු ඔඝං' යනු වේ.

**කාමෙ පහාය විරතො කථාහි**– 'කාමා' යනු: විස්තර වියින් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ ද...මොහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත්. **කාමෙ පහාය**– වස්තුකාමයන් තීරණපරිඥායෙන් දැනැ ක්ලේශකාමයන් ප්‍රහාණපරිඥායෙන් දුරු කොට හැරපියා බැහැර කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා නුයි 'කාමෙ පහාය' යනු වේ. **විරතො කථාහි**– 'කථඞ්කථා'යි විචිකිත්සාව කියනු ලබයි. දුඃඛ සත්‍යයෙහි සැකය ... චිත්තයාගේ තදබව මනොවිලෙඛ යි. ඒ කථඞ්කථා යෙන් දුරු වූයේ වෙසෙසින් දුරු වූයේ සර්වප්‍රකාරයෙන් දුරු වූයේ නික්ම ගියේ නිඃසෘත වූයේ වෙන් වූයේ විසංයුක්ත වූයේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වෙසේ නුයි මෙසේ ත් 'විරතො කථාහි' යනු වේ, නොහොත් දෙතිස් තිරශ්චීනකථායෙන් දුරුවූයේ වෙසෙසින් දුරු වූයේ සර්වප්‍රකාර යෙන් දුරු වූයේ නික්ම ගියේ නිඃසෘත වූයේ වෙන් වූයේ විසංයුක්ත වූයේ විගත මර්‍යාද කළ සිතින් යුක්ත වැ වෙසේ නුයි මෙසේ ත් 'විරතො කථාහි' නුයි 'කාමෙ පහාය විරතො කථාහි' යනු වේ.

**තණ්හක්ඛයං නත්තමහාභිපස්සාති** 'තණ්හා'ති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා 'නත්තං' වුච්චති[1] රත්ති, අහොති දිවසො, රත්තිඤ්ච දිවා ච තණ්හක්ඛයං රාගක්ඛයං දොසක්ඛයං මොහක්ඛයං ගතික්ඛයං උපපත්තික්ඛයං පටිසන්ධික්ඛයං භවක්ඛයං සංසාරක්ඛයං[2] වට්ටක්ඛයං පස්ස, අභිපස්ස දක්ඛ ඔලොකය නිජ්ඣාය උපපරික්ඛාති 'තණ්හක්ඛයං නත්තමහාභිපස්ස.'

තෙනාහ භගවා:

"ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා (උපසීවාති භගවා)
නත්ථීති නිස්සාය තරස්සු ඔඝං,
කාමෙ පහාය විරතො කථාහි
තණ්හක්ඛයං නත්තමහාභිපස්සා"ති.

---

6–3

සබ්බෙසු කාමෙසු යො වීතරාගො (ඉච්චායස්මා උපසීවො)
ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වා මඤ්ඤං[3]
සඤ්ඤාවිමොක්ඛෙ පරමෙ'ධිමුත්තො
තිට්ඨෙ නු සො[4] තත්ථ අනානුයායි.[5]

**සබ්බෙසු කාමෙසු යො වීතරාගොති:** 'සබ්බෙසූ'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'සබ්බෙසූ'ති. **කාමෙසූති** 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **සබ්බෙසු කාමෙසු යො වීතරාගොති** සබ්බෙසු කාමෙසු යො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො වික්ඛම්භනතොති 'සබ්බෙසු කාමෙසු යො වීතරාගො.'

**ඉච්චායස්මා උපසීවොති** 'ඉච්චා'ති පදසන්ධි –පෙ– **ආයස්මාති** පියවචන මෙතං –පෙ– **උපසීවොති** තස්ස බ්‍රාහ්මණස්ස නාමං –පෙ– අභිලාපොති ඉච්චායස්මා උපසීවො.

**ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤන්ති:** හෙට්ඨිමා ඡ සමාපත්තියො හිත්වා චජිත්වා පරිච්චජිත්වා අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං නිස්සිතො අස්සිතො අල්ලීනො[6] උපගතො සමුපගතො අජ්ඣොසිතො අධිමුත්තොති 'ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං.'

---

1. රත්තන්ති – සයා
2. භව සංසාරක්ඛයං – ප,ච,වි.
3. හිත්වාමඤ්ඤං – ච,වි,මජසං, – ස
4. තිට්ඨෙය්‍යාං සො – ච,වි,
5. අනානුවායි – ප,ච,වි – ස
6. නිස්සිතො අල්ලීනො – ච,වි,මජසං

**තණ්හක්ඛයං නත්තමහාභිපස්ස**- 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ... ධර්මතෘෂ්ණා යි. 'නත්තං'යි රාත්‍රිය කියනු ලැබෙයි; **අහො** යනු: දහවල් යැ රයිදු දහවල්හිදු රාගක්ෂය ද්වේෂක්ෂය මොහක්ෂය ගතික්ෂය උපප්‍රාප්තික්ෂය ප්‍රතිසන්ධික්ෂය භවක්ෂය සංසාරක්ෂය වෘත්තක්ෂය සඞ්ඛ්‍යාත නිවන බලව, වෙසෙසින් බලව, දකුව, අවලොකනය කර, සිතව, විමසව යි 'තණ්හක්ඛයං නත්තමහාභිපස්ස' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා** -පෙ- **තණ්හක්ඛයං නත්තමහාභිපස්ස**"යි.

---

6–3.

(ආයුෂ්මත් උපසීව මාණවක මෙසේ විචාරයි.) යමෙක් සියලු කාමයන්හි පහ වූ රාග ඇතියේ අන්‍ය වූ යට සමවත් හැරපියා ආකිඤ්චඤ්ඤායතනය ඇසුරු කෙළේ උත්තම වූ සංඥාවිමොක්ෂයෙහි ඇලුණේ නම් හෙතෙම ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි වියෝගයට නො යනසුලු වැ සිටුනේ ද?

**සබ්බෙසු කාමෙසු යො වීතරාගො**- 'සබ්බෙසු' යනු: සියල්ලෙන් සියල්ල ස්වාර්ථයෙන් සියල්ල අනවශේෂ කොට නිශ්ශේෂ කොට හැත්පසින් ගන්නා වචනයෙකි තෙල 'සබ්බෙසු' යනු. **කාමෙසු** 'කාමා' යනු උද්දාන හෙයින් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ ද...... මොහු ක්ලෙශකාමයෝ යි කියනු ලැබෙත්. **සබ්බෙසු කාමෙසු යො වීතරාගො**- යමෙක් සියලු වස්තුකාම ක්ලේශකාමයන්හි විෂ්කම්භණ විසින් වීතරාග වූයේ විගතරාග වූයේ ත්‍යක්තරාග වූයේ වාන්තරාග වූයේ මුක්තරාග වූයේ ප්‍රහීණරාග වූයේ ප්‍රතිනිසෘෂ්ටරාග වූයේ නුයි 'සබ්බෙසු රාගෙසු යො වීතරාගො' යනු වේ.

**ඉච්චායසමා උපසීවො**- 'ඉච්චා' යනු: පදසන්ධි යැ ...**ආයස්මා** යනු: තෙල ප්‍රියවචන යැ... **උපසීවො** යනු: ඒ බමුණුහට නාම යැ...අභිලාප නුයි 'ඉච්චායස්මා උපසීවො' යනු වේ.

**ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වාමඤ්ඤං**–යට ෂට් සමාපත්තීන් හැර දුරු කොට පරිත්‍යාග කොට ඉක්මවා මොනොවට ඉක්මවා වෙසෙසින් ඉක්මවා ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඇසුරු කෙළේ වෙසෙසින් ඇසුරු කෙළේ ඇලුණේ පැමිණියේ මොනොවට පැමිණියේ බැසගත්තේ අධිමුක්ත වූයේ නුයි 'ආකිඤ්චඤ්ඤා නිස්සිතො හිත්වාමඤ්ඤං' යනු වේ.

**සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තොති** 'සඤ්ඤාවිමොක්ඛා' වුච්චන්ති සත්තසඤ්ඤාසමාපත්තියො, යාවතා සඤ්ඤාසමාපත්ති, තාසං[1] ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විමොක්ඛො අග්ගො ච සෙට්ඨො ච විසෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච, පරමෙ අග්ගෙ සෙට්ඨෙ විසෙට්ඨෙ පාමොක්ඛෙ උත්තමෙ පවරෙ අධිමුත්තිවිමොක්ඛෙන අධිමුත්තො තත්‍රාධිමුත්තො තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යොති 'සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තො.'

**තිට්ඨෙය්‍ය නු සො තත්ථ අනානුයායීති** 'තිට්ඨෙය්‍ය නූ'ති සංසයපුච්ඡා විමතිපුච්ඡා ද්වෙළ්හකපුච්ඡා අනෙකංසපුච්ඡා 'එවං නු ඛො න නු ඛො කින්නු ඛො කථන්නු ඛො'ති 'තිට්ඨෙය්‍ය නු'. **තත්ථාති** ආකිඤ්චඤ්ඤායතනෙ, **අනානුයායී[2]ති** අනානුයායී අවිච්චමානො,[3] අවිගච්ඡමානො අනන්තරධායමානො අපරිහායමානො, අථවා අරජ්ජමානො අදුස්සමානො . අමුය්හමානො අකිලිස්සමානොති 'තිට්ඨෙය්‍ය නු සො තත්ථ අනානුයායී.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"සබ්බෙසු කාමෙසු යො වීතරාගො (ඉච්චායස්මා උපසීවො)
ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං,
සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තො
තිට්ඨෙය්‍ය නු සො තත්ථ අනානුයායී"ති.

---

6–4

සබ්බෙසු කාමෙසු යො වීතරාගො (උපසීවාති භගවා)
ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං,
සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තො[4]
තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී.

**සබ්බෙසු කාමෙසු යො වීතරාගොති** 'සබ්බෙසූ'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'සබ්බෙසූ'ති. **කාමෙසූති** 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **සබ්බෙසු කාමෙසු යො වීතරාගොති** සබ්බෙසු කාමෙසු යො වීතරාගො –පෙ– පටිනිස්සට්ඨරාගො වික්ඛම්භනතොති 'සබ්බෙසු කාමෙසු යො වීතරාගො.'

---

1. සඤ්ඤාසමාපත්තීනං – මජසං, ස්‍යා
2. අනානුවායි – කත්ථි
3. අවෙධමානො –ස්‍යා
4. පරමෙවිමුත්තො –ච,වි

**සඤ්ඤාවිමොකෙඛ පරමෙධිමුත්තො**- 'සඤ්ඤාවිමොක්ඛ' යි සත් සංඥා සමාපත්තීහු කියනු ලැබෙත්. යම් පමණ සංඥාසමාපත්තීහු වෙත් ද, ඔවුනතුරෙහි ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති විමොක්ෂය අග්‍ර වූයේ ද ශ්‍රෙෂ්ඨ වූයේ ද වෙසෙසින් ශ්‍රෙෂ්ඨ වූයේ ද පාමොක් වූයේ ද උතුම් වූයේ ද ප්‍රවර වූයේ ද වෙයි. පරමෙ–අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ වෙසෙසින් ශ්‍රෙෂ්ඨ වූ ප්‍රධාන වූ උත්තම වූ ප්‍රවර වූ (සංඥා විමොක්ෂයෙහි) අධිමුක්තිවිමොක්ෂයෙන් අධිමුක්ත වූයේ එහි ඇලුණේ එහි හැසිරෙනුයේ එය බහුල කොට ඇතියේ එය ගරු කොට ඇතියේ එයට නැමුණේ එයට නතු වූයේ එයට නැඹුරු වූයේ එය අධිමුක්ත කොට ඇතියේ එය අධිපති කොට ඇත්තේ නුයි 'සඤ්ඤාවිමොකෙඛ පරමෙධිමුත්තො' යනු වේ.

**තිට්ඨෙය්‍ය නු සො තත්‍ථ අනානුයායී**–'තිට්ඨෙය්‍ය නු' යනු: සංශය පෘච්ඡා යැ විමති පෘච්ඡා යැ විචිකිත්සාපෘච්ඡා යැ අනෙකාන්තපෘච්ඡා යැ 'මෙසේ දෝ හෝ නො වෙදෝ හෝ කිමෙක්දෝ හෝ කෙසේදෝ හො' යි 'තිට්ඨෙය්‍ය නු' යනු වේ. **තත්‍ථ** යනු: ආකිඤ්චඤ්ඤායතනයෙහි, **අනානුයායී**–වියොගයට නො යනුයේ නො වෙන් වනුයේ නො පහවනුයේ අතුරුදහන් නො වනුයේ නො පිරිහෙනුයේ, නොහොත් නො රඳෙනුයේ දෙමනස් නො වනුයේ නො මුළා වනුයේ නො කෙලෙසෙනුයේ නුයි 'තිට්ඨෙය්‍ය නු සො තත්‍ථ අනානුයායී' යනු වේ.

එයින් කීයැ එ බමුණු:

''සබ්බෙසු කාමෙසු –පෙ– තිට්ඨෙය්‍ය නු සො තත්‍ථ අනානුයායී''යි

---

6–4.

(බුදුහු මෙසේ වදළහ:) උපසීව මාණවකය, යමෙක් සියලු කාමයන්හි වීතරාග වූයේ අන්‍ය වූ යට සමවත් හැරපියා ආකිඤ්චඤ්ඤායතනය ඇසුරු කෙළේ උත්තම වූ සංඥාවිමොක්ෂයෙහි ඇලුණේ නම් හෙතෙම (එයින්) නො පිරිහෙමින් ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි (කප් සැට දහසක්) සිටුනේ යි.

**සබ්බෙසු කාමෙසු යො වීතරාගො**- 'සබ්බෙසු' යනු: සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශේෂ කොට නිඃශේෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි, තෙල 'සබ්බෙසු' යනු. **කාමෙසු**– 'කාමං' යනු: උද්දන හෙයින් කාමයෝ දෙදෙනෙකි: වස්තු කාමයෝ ද ක්ලේශකාමයෝ ද... මොහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත්. '**සබ්බෙසු කාමෙසු යො වීතරාගො**- යමෙක් සියලු කාමයන්හි විෂ්කම්භණ විසින් වීතරාග වූයේ... දුරලනලද රාග ඇතියේ නුයි 'සබ්බෙසු කාමෙසු යො වීතරාගො' යනු වේ.

**උපසීවාති භගවාති** 'උපසීවා'ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති, භගවාති ගාරවාධිවචනමෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති 'උපසීවාති භගවා'

**ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤන්ති** හෙට්ඨිමා ඡ සමාපත්තියො හිත්වා චජිත්වා පරිච්චජිත්වා අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං නිස්සිතො අස්සිතො අල්ලීනො උපගතො සමුපගතො අජ්ඣොසිතො අධිමුත්තොති 'ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං'

**සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තොති** 'සඤ්ඤාවිමොක්ඛා' වුච්චන්ති සත්තසඤ්ඤාසමාපත්තියො, යාවතා සඤ්ඤාසමාපත්ති තාසං ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො අග්ගො ච සෙට්ඨො ච විසෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච, පරමෙ අග්ගෙ සෙට්ඨෙ විසෙට්ඨෙ පාමොක්ඛෙ උත්තමෙ පවරෙ අධිමුත්තිවිමොක්ඛෙ අධිමුත්තො තත්‍රාධිමුත්තො තදධිමුත්තො –පෙ– තදධිපතෙය්‍යොති 'සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තො.'

**තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායීති** 'තිට්ඨෙය්‍යා'ති තිට්ඨෙය්‍ය සට්ඨිකප්පසහස්සානි, තත්ථාති ආකිඤ්චඤ්ඤායතනෙ. අනානුයායීති අනානුයායී අවිච්චමානො අවිගච්ඡමානො[1] අනන්තරධායමානො අපරිහායමානො, අථවා අරජ්ජමානො අදුස්සමානො අමුය්හමානො අකිලිස්සමානොති 'තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී.'

තෙනාහ භගවා:

> "සබ්බෙසු කාමෙසු යො වීතරාගො (උපසීවාති භගවා)
> ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං,
> සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තො
> තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී"ති.

---

1. අධිගච්ඡමානො – ච,ව

**උපසීවා'ති භගවා**– 'උපසීව'යි බුදුහු එ බමුණු නමින් අමතන සේක. **භගවා** යනු: ගෙල ගෞරවාධි වචන යැ ... මේ 'භගවා' යනු අර්හත් ඵල ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්ති වී නුයි 'උපසීවා'ති භගවා' යනු වේ.

**ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං**– යට ෂට් සමාපත්තීන් හැර ත්‍යාග කොට පරිත්‍යාග කොට ඉක්මවා මොනොවට ඉක්මවා ව්‍යතික්‍රමණය කොට ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඇසුරු කෙළේ වෙසෙසින් ඇසුරු කෙළේ ඇලුණේ පැමිණියේ මොනොවට පැමිණියේ බැසගත්තේ අධිමුක්ත වූයේ නුයි 'ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වමඤ්ඤං' යනු වේ.

**සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තො**– 'සඤ්ඤාවිමොක්ඛෙ' යි සත් සංඥා සමාපත්තිහු කියනු ලැබෙත්. යම් පමණ සංඥා සමාපත්තිහු වෙත් ද, ඔවුනතුරෙහි ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති විමොක්ෂය අග්‍ර වූයේ ද ශ්‍රේෂ්ඨ වූයේ ද වෙසෙසින් ශ්‍රේෂ්ඨ වූයේ ද පාමොක් වූයේ ද උතුම් වූයෙ ද ප්‍රවර වූයෙ ද වෙයි. **පරමෙ**– අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ වෙසෙසින් ශ්‍රේෂ්ඨ වූ ප්‍රධාන වූ උත්තම වූ ප්‍රවර වූ (සංඥාවිමොක්ෂයෙහි) අධිමුක්තිවිමොක්ෂයෙන් අධිමුක්ත වූයේ එහි ඇලුණේ එහි හැසිරෙනුයේ එය බහුල කොට ඇතියේ එය ගරු කොට ඇතියේ එයට නැමුණේ එයට නතු වූයේ එයට නැඹුරු වූයේ එය අධිමුක්ති කොට ඇතියේ එය අධිපති කොට ඇත්තේ නුයි 'සඤ්ඤාවිමොක්ඛෙ පරමෙධිමුත්තො' යනු වේ.

**තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී**– 'තිට්ඨෙය්‍ය' යනු: සැටදහසක් කප් මුළුල්ලෙහි සිටුනේ යැ. **තත්ථ** යනු: ආකිඤ්චඤ්ඤායතනයෙහි, **අනානුයායී** යනු: වියොගයට නො යනුයේ නො වෙන් වනුයේ නො පහවනුයේ අතුරු දහන් නො වනුයේ නො පිරිහෙනුයේ, නොහොත් නො රැඳෙනුයේ දෙම් නස් නො වනුයේ නො මුළා වනුයේ නො කෙලෙසෙනුයේ නුයි 'තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**"සබ්බෙසු කාමෙසු – පෙ – තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී"යි**

6–5

තිට්ඨෙය්‍ය චෙ සො තත්‍ථ අනානුයායී
පූගම්පි වස්සානං[1] සමන්තචක්ඛු,
තත්‍ථෙව සො සීතිසියා[2] විමුත්තො
චවෙථ[3] විඤ්ඤාණං තථාවිධස්ස,

**තිට්ඨෙය්‍ය චෙ සො තත්‍ථ අනානුයායීති** සචෙ සො තිට්ඨෙය්‍ය සට්ඨිකප්පසහස්සානි; තත්‍ථාති ආකිඤ්චඤ්ඤායතනෙ. **අනානුයායීති** අනානුයායී අවිච්චමානො අවිගච්ඡමානො අනන්තරධායමානො අපරිහායමානො. අථවා අරජ්ජමානො අදුස්සමානො අමුය්හමානො අකිලිස්සමානොති 'තිට්ඨෙය්‍ය චෙ සො තත්‍ථ අනානුයායී.'

**පූගම්පි වස්සානං සමන්තචක්ඛූති** 'පූගම්පි වස්සාන'න්ති පූගම්පි වස්සානං බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි බහූනි කප්පානි බහූනි කප්පසතානි බහූනි කප්පසහස්සානි බහූනි කප්පසතසහස්සානි. **සමන්තචක්ඛූති** 'සමන්තචක්ඛු' වුච්චති සබ්බඤ්ඤුතඤාණං -පෙ- තථාගතො තෙන සමන්තචක්ඛූ'ති 'පූගම්පි වස්සානං[1] සමන්තචක්ඛු'

**තත්‍ථෙව සො සීතිසියා විමුත්තො චවෙථ විඤ්ඤාණං තථාවිධස්සාති** තත්‍ථෙව සො සීතිභාවමනුප්පත්තො නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව තිට්ඨෙය්‍ය.' අථවා තස්ස විඤ්ඤාණං චවෙය්‍ය උච්ඡිජ්ජෙය්‍ය නස්සෙය්‍ය විනස්සෙය්‍ය න භවෙය්‍ය[4] පුනබ්භව පටිසන්ධිවිඤ්ඤාණං නිබ්බත්තෙය්‍ය කාමධාතුයා වා රූපධාතුයා වා අරූපධාතුයා වා'ති ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස[5] සස්සතඤ්ච උච්ඡෙදඤ්ච පුච්ඡති උදාහු තත්‍ථෙව අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායෙය්‍ය අථවා තස්ස විඤ්ඤාණං චවෙය්‍ය, පුන පටිසන්ධිවිඤ්ඤාණං නිබ්බත්තෙය්‍ය කාමධාතුයා වා රූපධාතුයා වා අරූපධාතුයා වා'ති ආකිඤ්චඤ්ඤායතනං උපපන්නස්ස පරිනිබ්බානඤ්ච පටිසන්ධිඤ්ච පුච්ඡති[6]. තථාවිධස්සාති තථාවිධස්ස තාදිසස්ස තස්සණ්ඨිතස්ස[7] තප්පකාරස්ස තප්පටිභාගස්ස[8] ආකිඤ්චඤ්ඤායතනං උපපන්නස්සාති තත්‍ථෙව සො සීතිසියා විමුත්තො චවෙථ විඤ්ඤාණං තථාවිධස්ස'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"තිට්ඨෙය්‍ය චෙ සො තත්‍ථ අනානුයායී
පූගම්පි වස්සානං සමන්තචක්ඛු,
තත්‍ථෙව සො සීතිසියා විමුත්තො
චවෙථ විඤ්ඤාණං තථාවිධස්සා''ති.

---

1. පූගම්පි වස්සානි – ප,ව,වි,මජසං, පු
2. තත්‍ථෙව හොයිති –පත,
   තත්‍ථෙව සාපිතියා – ව, වි
3. භාවෙථ – ව,වි
4. චවෙය්‍ය – ප,ව,වි,ක
   භවෙය්‍යාති – මජසං
5. උපපන්නස්ස – පත
6. වුච්චති – පත
7. තස්සණ්ඨිතස්ස – පත
8. තප්පටිභාගස්ස – පත

6–5.

(ආයුෂ්මත් උපසීව මෙසේ විචාරයි:) සමතැස් ඇති සර්වඥයන් වහන්ස, ඉදින් හෙතෙම එයින් නො පිරිහෙනසුලු වූයේ නොයෙක් හවුරුදු සියදහස් ගණන් ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි සිටුනේ නම් හෙතෙම එහි මැ දුකින් මිදුණේ ශීතිභාවයට පැමිණියේ එහි මැ සිටුනේ ද එ බඳු වූවහුගේ විඥානය එහි මැ පිරිහීමෙ ද?

**තිට්ඨෙය්‍ය චෙ සො තත්‍ථ අනානුයායී**– ඉදින් හේ කප් සැටදහසක් මුළුල්ලෙහි සිටිනේ නම්, **තත්‍ථ** යනු: ආකිඤ්චඤ්ඤායතනයෙහි; **අනානු-යායී** යනු: වියෝගයට නො යනුයේ නො වෙන් වනුයේ නො පහවනුයේ අතුරුදහන් නො වනුයේ නො පිරිහෙනුයේ, නොහොත් නො රැඳෙනුයේ දෙම්නස් නො වනුයේ නො මුළා වනුයේ නො කෙලෙසෙනුයේ නුයි 'තිට්ඨෙ චෙ සො තත්ථ අනානුයායී' යනු වේ.

**පූගම්පි වස්සානං සමන්තචක්ඛු**– 'පූගම්පි වස්සානං' යනු: වර්ෂයන් පිළිබඳ ගණනසමූහයකුදු බොහෝ වර්ෂයන් බොහෝ වර්ෂශතයන් බොහෝ වර්ෂසහස්‍රයන් බොහෝ වර්ෂ ශතසහස්‍රයන් බොහෝ කල්පයන් බොහෝ කල්පශතයන් බොහෝ කල්පසහස්‍රයන් බොහෝ කල්පශත-සහස්‍රයන් මුළුල්ලෙහි, **සමන්තචක්ඛු** යනු: 'සමන්තචක්ඛු'යි සර්වඥතා ඥානය කියනු ලැබෙයි... එයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' නම් වෙත් නුයි 'පූගම්පි වස්සානං සමන්ත චක්ඛු' යනු වේ.

**තත්‍ථෙව සො සීතිසියා විමුත්තො චවෙථ විඤ්ඤාණං තථාවිධස්ස** – හෙතෙම ඒ ආකිඤ්චඤ්ඤායතනයෙහි මැ ශීතිභාවය (නිවන) ට පැමිණියේ නිත්‍ය වූයේ ධ්‍රැව වූයේ ශාශ්වත වූයේ අවිපරිණාම ස්වභාව වූයේ ශාශ්වතිකයක් සෙයින් එසේ මැ සිටුනේ ද, නොහොත් ඔහුගේ විඥානය ච්‍යුත වන්නේ ද, සිඳෙන්නේ ද, නැසෙන්නේ ද, වැනැසෙන්නේ ද, නො වන්නේ ද? කාමධාතුයෙහි හෝ රූපධාතුයෙහි හෝ අරූපධාතුයෙහි හෝ පුනර්භව සඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධි විඥානය උපදනේ දැයි ආකිඤ්චඤ්ඤායතනයට සමවන්හු ගේ ශාශ්වතය ද උච්ඡෙදය විචාරයි. නොහොත් එහි මැ අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙන්නේ ද? නොහොත් ඔහුගේ විඥානය ච්‍යුත වන්නේ ද? කාමධාතුයෙහි හෝ රූපධාතුයෙහි හෝ අරූපධාතුයෙහි හෝ යළි ප්‍රතිසන්ධි විඥානය උපදනේ ද යි ආකිඤ්චඤ්ඤායතනයට (ප්‍රතිසන්ධි විසින්) පැමිණියහුගේ පරිනිර්වාණය ද ප්‍රතිසන්ධිය ද විචාරයි. **තථාවිධස්ස** යනු එබඳු වූවහු ගේ තාදෘශ වූවහු ගේ එසේ සිටියහුගේ තත්ප්‍රකාර වූවහු ගේ තත්ප්‍රතිභාග වූවහුගේ ආකිඤ්චඤ්ඤායතනයට පිළිසඳ විසින් පැමිණියහු ගේ නු යි 'තත්ථෙව සො සීතිසියාවිමුත්තො චවෙථ විඤ්ඤාණං තථාවිධස්ස' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''තිට්ඨෙය්‍ය චෙ සො තත්‍ථ–පෙ– චවෙථ විඤ්ඤාණං තථාවිධස්ස''යී.**

6–6

අච්චි යථා වාතවෙගෙන ඛිත්තා (උපසීවා'ති භගවා)
අත්ථං පලෙති න උපෙති සඞ්ඛං
එවං මුනී නාමකායා විමුත්තො
අත්ථං පලෙති න උපෙති සඞ්ඛං.

**අච්චි යථා වාතවෙගෙන ඛිත්තාති** – 'අච්චි' වුච්චති ජාලසිඛා. වාතාති පුරත්ථිමා වාතා, පච්ඡිමා වාතා, උත්තරා වාතා, දක්ඛිණා වාතා, සරජා වාතා, අරජා වාතා,[1] සීතා වාතා, උණ්හා වාතා, පරිත්තා වාතා, අධිමත්තා වාතා, කාළවාතා,[2] වෙරම්භවාතා, පක්ඛවාතා, සුපණ්ණවාතා, තාලපණ්ණ වාතා, විධූපනවාතා, **වාතවෙගෙන ඛිත්තාති** වාතවෙගෙන ඛිත්තා උක්ඛිත්තා නුන්නා පනුන්නා ඛම්භිතා වික්ඛම්භිතාති 'අච්චි යථා වාතවෙගෙන ඛිත්තා, 'උපසීවාති භගවා'.

**අත්ථං පලෙති න උපෙති සඞ්ඛන්ති** – 'අත්ථං පලෙතී'ති අත්ථං පලෙති, අත්ථං ගමෙති, අත්ථං ගච්ඡති, නිරුජ්ඣති, වූපසමති, පටිප්පස්සම්භති. **න උපෙති සඞ්ඛන්ති** සඞ්ඛං න උපෙති, උද්දෙසං න උපෙති, ගණනං න උපෙති, පණ්ණත්තිං න උපෙති, පුරත්ථිමං වා දිසං ගතො, පච්ඡිමං වා දිසං ගතො, උත්තරං වා දිසං ගතො, දක්ඛිණං වා දිසං ගතො, උද්ධං වා ගතො, අධො වා ගතො, තිරියං වා ගතො, විදිසං වා ගතොති සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි යෙන සඞ්ඛං ගච්ඡෙය්‍යාති අත්ථං පලෙති න උපෙති සඞ්ඛං.

**එවං මුනී නාමකායා විමුත්තොති** 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං, **මුනීති** 'මොනං' වුච්චති ඤාණං –පෙ– සඞ්ගජාල මතිච්ච සො මුනි. **නාමකායා විමුත්තොති** සො මුනි පකතියා පුබ්බෙව රූපකායා විමුත්තො, තදඞ්ගසමතික්කමා වික්ඛම්භනප්පහානෙන පහීනො, තස්ස මුනිනො භවන්තං ආගම්ම චත්තාරො අරියමග්ගා පටිලද්ධා හොන්ති, චතුන්නං අරියමග්ගානං පටිලද්ධත්තා නාමකායො ච රූපකායො ච පරිඤ්ඤාතා හොන්ති, නාමකායස්ස ච රූපකායස්ස ච පරිඤ්ඤාතත්තා නාමකායා ච රූපකායා ච මුත්තො විමුත්තො සුවිමුත්තො අච්චන්තං අනුපාදවිමොක්ඛෙනාති 'එවං, මුනී නාමකායා විමුත්තො.'

1. අසරජාවාතා – පත
2. කාළවාතාති –පත– පොත්ථකෙ නත්ථි

6–6.

(බුදුහු මෙසේ වදළහ: උපසීව මාණවකය,) වාතවේගයෙන් බැහැර කරන (ගිවන) ලද ගිනිසිළෙක් යම්සේ අස්තයට යේ ද (නිවේද) (අසෝ දිගට ගියේ යැ යි) ව්‍යවහාරයට නො යේ ද, එසෙයින් මැ (එහි උපන්) ශෛක්ෂමුනි තෙම නාම කයින් මිදුණේ අස්තයට යෙයි, ක්ෂත්‍රියාදි ව්‍යවහාරයට නො යෙයි.

**අච්චි යථා වාතවෙගෙන ඛිත්තා–** 'අච්චි' යි ගිනිසිළ කියනු ලැබෙයි, **වාතා** යනු: පෙරදිගින් හමන වාත යැ අවරදිගා වාත යැ උතුරුදිගැ වාත යැ දකුණු දිගැ වාත යැ රජස් සහිත වාත යැ රජස් රහිත වාත යැ ශීත වාත යැ උෂ්ණ වාත යැ අල්ප වාත යැ අධිමාත්‍ර වාත යැ කෘෂ්ණපක්ෂ වාත යැ වෙරම්බ වාත යැ පියාපත් වාත යැ සුපර්ණ වාත යැ තල්වැට වාත යැ විධූපන වාත යැ යන මොහු යි. **වාතවෙගෙන ඛිත්තා–** සලන ලද අතිශයින් සලන ලද බැහැර කරන ලද දුරු කරනලද නවතන ලද ඉවත් කරන ලද නුයි 'අච්චියථා වාතවෙගෙන ඛිත්තා' යනු වේ. 'උපසීවා' ති භගවා' යනු වේ.

**අත්ථං පලෙති න උපෙති සඞ්ඛං–** 'අත්ථං පලෙති' යනු: අත්ථං පලෙති යී යෙයි අස්තයට පැමිණෙයි අස්තයට යෙයි නිරුද්ධ වෙයි සන්හි ඳෙයි නිවෙයි. **න උපෙති සඞ්ඛං–** (අසුවල් යොනියට ගියේ යි) ව්‍යවහාර යට නො පැමිණෙයි උදෙසීමට නො පැමිණෙයි ගිණීමට නො පැමිණෙයි ප්‍රඥප්තියට නො පැමිණෙයි පෙරදිගට හෝ ගියේ යැ අවරදිගට හෝ ගියේ යැ උතුරු දිගට හෝ ගියේ යැ දකුණු දිගට හෝ ගියේයැ උඩට හෝ ගියෙ යැ යටට හෝ ගියේ යැ සරසට හෝ ගියේ යැ අනුදිගට හෝ ගියේ යයි යම් හෙයෙකින් ව්‍යවහාරයට යේ ද ඒ හේතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණ නැත් නුයි 'අත්ථං පලෙති න උපෙති සඞ්ඛං' යනු වේ.

**එවං මුනී නාමකායා විමුත්තො–** 'එවං' යනු: ඖපම්‍යසම්ප්‍රතිපාදන යැ; **මුනි** යනු: 'මොන' යි ඥානය කියනු ලැබෙයි. ...රාගාදි සඞ්ගය හා තෘෂ්ණා දෘෂ්ටිජාලය ඉක්ම වා සිටියේ ඒ ක්ෂීණාස්‍රව මුනි නම් වේ. **නාමකායා විමුත්තො–** ඒ මුනි තෙම පියවින් පළමු මැ රූපකායයෙන් විමුක්ත යැ තදඞ්ගවශයෙන් ඉක්මවීමෙන් විෂ්කම්භණ ප්‍රහාණයෙන් ප්‍රහීණ යැ ඒ මුනිහු විසින් භවාන්තයට පැමිණ සතර ආර්‍ය්‍ය මාර්ගයෝ ලද්දහු වෙයි. සතර ආර්‍ය්‍යමාර්ගයන් ලත් බැවින් නාම කය ද රූප කය ද පරිඥාත වෙයි. නාම කය ද රූප කය ද පරිඥාත බැවින් නාම කයින් ද රූප කයින් ද අත්‍යන්ත කොට අනුපාද විමොක්ෂයෙන් මිදුණේ වෙසෙයින් මිදුණේ මොනොවට මිදුණේ නුයි 'එවං මුනී නාමකායා විමුත්තො' යනු වේ.

අත්ථං පලෙති න උපෙති සඞ්ඛන්ති 'අත්ථං පලෙතී'ති: අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, න උපෙති සඞ්ඛන්ති: අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතො සඞ්ඛං න උපෙති උද්දෙසං න උපෙති ගණනං න උපෙති, පණ්ණත්තිං න උපෙති, ඛත්තියොති වා බ්‍රාහ්මණොති වා වෙස්සොති වා සුද්දොති වා ගහට්ඨොති වා පබ්බජිතොති වා දෙවොති වා මනුස්සොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන සඞ්ඛං ගච්ඡෙය්‍යාති 'අත්ථං පලෙති න උපෙති සඞ්ඛං.'

තෙනාහ භගවා:

"අච්චි යථා වාතවෙගෙන ඛිත්තා (උපසීවාති භගවා)
අත්ථං පලෙති න උපෙති සඞ්ඛං,
එවං මුනී නාමකායා විමුත්තො
අත්ථං පලෙති න උපෙති සඞ්ඛන්ති".

---

6–7

අත්ථං ගතො සො උද වා සො නත්ථි
උදාහු වෙ සස්සතියා අරොගො,
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො.

අත්ථං ගතො සො උදවා සො නත්ථීති: සො අත්ථං ගතො උදාහු නත්ථි, සො නිරුද්ධො උච්ඡින්නො විනට්ඨොති 'අත්ථං ගතො සො උදවා සො නත්ථි'.

උදාහු වෙ සස්සතියා අරොගොති 'උදාහු නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව තිට්ඨෙය්‍යාති 'උදාහු වෙ සස්සතියා අරොගො.'

තං මෙ මුනී සාධු වියාකරොහීති 'ත'න්ති: යං පුච්ඡාමි, යං යාචාමි, යං අජ්ඣෙසාමි, යං පසාදෙමි. මුනීති 'මොනං' වුච්චති ඤාණං –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනි. සාධු වියාකරොහීති: සාධු ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'තං මෙ මුනී සාධු වියාකරොහි'.

**අත්ථං පලෙති න උපෙති සඞ්ඛං**— 'අත්ථං පලෙති' යනු අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙයි. **න උපෙති සඞ්ඛං**— අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවියේ ව්‍යවහාරයට නො පැමිණෙයි උදෙසීමට නො පැමිණෙයි ගණනට නො පැමිණෙයි පැනවීමට නො පැමිණෙයි ක්ෂත්‍රිය යැ හෝ බ්‍රාහ්මණ යැ හෝ වෛශ්‍ය යැ හෝ ශුද්‍ර යැ හෝ ගෘහස්ථ යැ හෝ ප්‍රව්‍රජිත යැ හෝ දේව යැ හෝ මනුෂ්‍ය යැ හෝ රූපී යැ හෝ අරූපී යැ හෝ සංඥී යැ හෝ අසංඥී යැ හෝ නෛවසංඥීනාසංඥී යැ හෝ යම් හෙයෙකින් ව්‍යවහාරයට යේ ද ඒ හේතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණ නැත් නුයි 'අත්ථං පලෙති න උපෙති සඞ්ඛං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**''අච්චි යථා වාතවෙගෙන ඛිත්තා -පෙ- අත්ථං පලෙති න උපෙති සඞ්ඛං''** යි.

---

6–7.

(ආයුෂ්මත් උපසීව මෙසේ විචාරයි:) (මුනීන්ද්‍රයන් වහන්ස,) ඒ පුද්ගල තෙම අස්තයට ගියේ (නිරුද්ධ වූයේ) නොහොත් අවිද්‍යමාන වූයේ ද, නොහොත් ඒකාන්තයෙන් ශාශ්වත භාවයෙන් අරොග වූයේ (අවිපරිණාමස්වභාව ඇත්තේ) සිටින්නේ ද, මුනීන්ද්‍රයන් වහන්ස, එය මට මැනැවින් ප්‍රකාශ කළ මැනැව, යම් හෙයෙකින් මුඹ වහන්සේ විසින් තෙල දහම දන්නා ලද ද එහෙයිනි.

**අත්ථං ගතො සො උදවා සො නත්ථි**- හේ අස්තයට ගියේ ද නොහොත් නැද්ද, හේ නිරුද්ධ වූයේ උච්ඡේදයට පැමිණියේ විනෂ්ට වූයේ ද යි 'අත්ථංගතො සො උදවා සො නත්ථි' යනු වේ.

**උදාහු වෙ සස්සතියා අරොගො**– නොහොත් නිත්‍ය වූයේ ධ්‍රැව වූයේ ශාශ්වත වූයේ අවිපරිණාම ස්වභාව වූයේ ශාශ්වතිකයක් මෙන් එසේ මැ සිටුනේ ද යි 'උදාහු වෙ සස්සතියා අරොගො' යනු වේ.

**තං මෙ මුනී සාධු වියාකරොහි**– 'තං' යනු: යමකු විචාරම් ද, යමකු අයදිම් ද, යමකු අධ්‍යෙෂණ කෙරෙම් ද, යමකු සඳහා පහදවම් ද; මුනි යනු 'මොන' යි ඥානය කියනු ලැබෙයි ...සඞ්ග හා තෘෂ්ණා දෘෂ්ටිජාලය ඉක්මවා සිටි ඒ ක්ෂීණාස්‍රව මුනි නම් වේ. **සාධු වියා කරොහි**– අයදිම් වදාළ මැනැව දෙසනු මැනැව පනවනු මැනැව පිහිටුවනු මැනැව විවරණ කළ මැනැව විභාග කළ මැනැව ප්‍රකට කළ මැනැව ප්‍රකාශ කළ මැනවැ යි 'තං මෙ මුනී සාධු වියාකරොහි' යනු වේ.

**තථා හි තෙ විදිතො එස ධම්මොති:** තථා හි තෙ විදිතො තුලිතො තීරිතො විභූතො විභාවිතො එස ධම්මොති 'තථා හි තෙ විදිතො එසධම්මො'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

''අත්ථං ගතො සො උදවා සො නත්ථි
උදාහු වෙ සස්සතියා අරොගො,
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො''ති.

---

6–8

අත්ථං ගතස්ස න පමාණමත්ථි (උපසීවාති භගවා)
යෙන නං වජ්ජු[1] තං තස්ස නත්ථි,
සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු
සමූහතා වාදපථාපි සබ්බෙ.

**අත්ථං ගතස්ස න පමාණමත්ථීති:** 'අත්ථං ගතස්සා'ති අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතස්ස රූපපමාණං නත්ථි, වෙදනාපමාණං නත්ථි, සඤ්ඤාපමාණං නත්ථි, සංඛාරපමාණං නත්ථි, විඤ්ඤාණපමාණං නත්ථි. නත්ථි න සන්ති න සංවිජ්ජති නූපලබ්භති. පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති 'අත්ථං ගතස්ස න පමාණමත්ථි. උපසීවාති භගවාති–පෙ–

**යෙන නං වජ්ජු තං තස්ස නත්ථීති:** යෙන රාගෙන වදෙය්‍යුං, යෙන දොසෙන වදෙය්‍යුං, යෙන මොහෙන වදෙය්‍යුං, යෙන මානෙන වදෙය්‍යුං, යාය දිට්ඨියා වදෙය්‍යුං, යෙන උද්ධච්චෙන වදෙය්‍යුං, යාය විචිකිච්ඡාය වදෙය්‍යුං, යෙහි අනුසයෙහි වදෙය්‍යුං, රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨඞ්ගතොති වා ථාමගතොති වා තෙ අභිසඞ්ඛාරා පහීනා, අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා යෙන වදෙය්‍යුං නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන වදෙය්‍යුං කථෙය්‍යුං භණෙය්‍යුං දීපෙය්‍යුං වොහරෙය්‍යුන්ති 'යෙන නං වජ්ජු තං තස්ස නත්ථි.'

---

1. වජ්ජුං – මජසං

**තථා හි තෙ විදිතො එසධම්මො**-යම් හෙයෙකින් මුඹ වහන්සේ විසින් තෙල දහම දන්නා ලද ද තුලනය කරන ලද ද තීරණය කරන ලද ද විභූත කරන ලද ද විභාවන කරන ලද ද එහෙයිනැ'යි 'තථා හි තෙ විදිතො එස-ධම්මො' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

''අත්‍ථංගතො සො -පෙ- තථා හි තෙ විදිතෙ එසධම්මො'යි.

---

6–8

(බුදුහු මෙසේ වදළහ: උපසීව මාණවකය, අනුපාදිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවියාහට (රූපාදි) ප්‍රමාණයෙක් නැත. (රාගාදි) යමෙකින් ඔහුට කියන්නාහු නම් එය ඔහුට නැත. (ස්කන්ධාදි) සියලු දහම් නැසූ කල්හි හැම (ක්ලේශාදි) වාදපථයෝ ද නසනලදහ යි.

**අත්‍ථංගතස්ස න පමාණමත්‍ථි**– 'අත්‍ථංගතස්ස' යනු: අනුපාදිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවියහුට රූප ප්‍රමාණයෙක් නැත, වේදනා ප්‍රමාණයෙක් නැත, සංඥා ප්‍රමාණයෙක් නැත, සංස්කාර ප්‍රමාණයෙක් නැත, විඥාන ප්‍රමාණයෙක් නැත, නැත්තේ යැ, නො වෙයි, විද්‍යමාන නො වෙයි, නො ලැබේ. ප්‍රහීණ යැ, සමුච්ඡින්න යැ, සන්හිඳුවන ලද, දුරලන ලද, අභව්‍යොත්පත්තික යැ, නුවණ ගින්නෙන් දවන ලද නුයි 'අත්‍ථංගතස්ස න පමාණමත්‍ථි' යනු වේ. **උපසීවා'ති භගවාති**......

**යෙන නං වජ්ජු තං තස්ස නත්‍ථි**-යම් රාගයෙකින් කියන්නාහු නම් යම් ද්වේෂයෙකින් කියන්නාහු නම් යම් මෝහයෙකින් කියන්නාහු නම් යම් මානයෙකින් කියන්නාහු නම් යම් දෘෂ්ටියෙකින් කියන්නාහු නම් යම් ඖද්ධත්‍යයෙකින් කියන්නාහු නම් යම් විචිකිත්සායෙකින් කියන්නාහු නම් යම් අනුශය කෙනකුන්ගෙන් කියන්නාහු නම් රක්ත යැ හෝ දුෂ්ට යැ හෝ මූඪ යැ හෝ විනිබද්ධ යැ හෝ පරාමෘෂ්ට යැ හෝ වික්ෂේපයට ගියේ යැ හෝ අනිෂ්ඨාවට ගියේ යැ හෝ තද බවට ගියේ යැ හෝ යි කියන්නාහු නම් ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයෝ යැ, අභිසංස්කාරයන් ප්‍රහීණ වූ බැවින් තිරිසන් යැ යි හෝ තිරිසන්යොන් ඇතියෙකැ යි හෝ ප්‍රේතවිෂය ඇතියෙකැ යි හෝ මිනිසෙකැ යි හෝ දෙවියෙකැ යි හෝ රූපී යැ යි හෝ අරූපී යැ යි හෝ සංඥී යැ යි හෝ අසංඥී යැ යි හෝ නෛවසංඥී නාසංඥී යැ යි හෝ යම් අභිසංස්කාරයක් හේතු කොට ගෙන ගතියෙන් කියන්නාහු ද, යම් හෙයෙකින් කියන්නාහු නම් පවසන්නාහු නම් බණන්නාහු නම් දක්වන්නාහු නම් ව්‍යවහාර කරන්නාහු නම් ඒ හෙතුව නැත ප්‍රත්‍යය නැත කාරණ නැත් නුයි 'යෙන නං වජ්ජු තං තස්ස නත්‍ථි' යනු වේ.

**සබ්බෙසු ධම්මෙසු සමූහතෙසූති:** සබ්බෙසු ධම්මෙසු සබ්බෙසු ඛන්ධෙසු සබ්බෙසු ආයතනෙසු සබ්බාසු ධාතූසු[1] සබ්බාසු ගතීසු සබ්බාසු උපපත්තීසු සබ්බාසු පටිසන්ධීසු සබ්බෙසු භවෙසු සබ්බෙසු සංසාරෙසු සබ්බෙසු වට්ටෙසු ඌහතෙසු සමූහතෙසු උද්ධතෙසු සමුද්ධතෙසු උප්පාටිතෙසු සමුප්පාටිතෙසු පහීනෙසු සමුච්ඡින්නෙසු වූපසන්තෙසු පටිප්පස්සද්ධෙසු අභබ්බුප්පත්තිකෙසු ඤාණග්ගිනා දඩ්ඪෙසූති 'සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු.'

**සමූහතා වාදපථාපි සබ්බෙති:** 'වාදපථා' වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසංඛාරා ච, තස්ස වාද ච වාදපථා ච අධිවචනානි ච අධිවචනපථා ච නිරුත්ති ච නිරුත්තිපථා ච පඤ්ඤත්ති ච පඤ්ඤත්තිපථා ච ඌහතා සමූහතා උද්ධතා සමුද්ධතා උප්පාටිතා සමුප්පාටිතා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති 'සමූහතා වාදපථාපි සබ්බෙ.'

තෙනාහ භගවා:

"අත්ථං ගතස්ස න පමාණමත්ථි (උපසීවාති භගවා)
යෙන නං වජ්ජු තං තස්ස නත්ථි,
සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු
සමූහතා වාදපථාපි සබ්බෙ"ති.

සහ ගාථාපරියොසානා යෙ තෙ බ්‍රාහ්මණෙන සද්ධිං –පෙ– පඤ්ජලිකො නමස්සමානො නිසින්නො හොති 'සත්ථා මෙ භන්තෙ භගවා සාවකොහමස්මී'ති.

උපසීවසුත්තනිද්දෙසො ඡට්ඨො.

1. සබ්බාසු. ධාතුසු – මජසං

**සබෙබසු ධම්මෙසු සමූහතෙසු**– සියලු ධර්මයන් සියලු ස්කන්ධයන් සියලු ආයතනයන් සියලු ධාතූන් සියලු ගතීන් සියලු උපපත්තීන් සියලු ප්‍රතිසන්ධීන් සියලු භවයන් සියලු සංසාරයන් සියලු වෘත්තයන් නැසූ කල්හි වෙසෙසින් නැසූ කල්හි උදුළ කල්හි මොනොවට උදුළ කල්හි උපුළ කල්හි වෙසෙයින් උපුළ කල්හි ප්‍රහීණ කල්හි සමුච්ඡින්න කල්හි සන්හුන් කල්හි දුරැලූ කල්හි අභව්‍යොත්පත්තික වූ කල්හි නුවණ ගින්නෙන් දැවූ කල්හි නුයි 'සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු' යනු වේ.

**සමූහතා වාදපථාපි සබෙබ**– 'වාදපථයෝ යයි ක්ලේශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද කියනු ලැබෙත්. ඔහු විසින් වාදයෝ ද වාදපථයෝ ද අධිවචනයෝ ද අධිවචනපථයෝ ද නිරුක්තීහු ද නිරුක්තිපථයෝ ද ප්‍රඥප්තීහු ද ප්‍රඥප්තිපථයෝ ද නසන ලදහ මොනොවට නසන ලදහ උදුළහ මොනොවට උදුළහ උපුරන ලදහ මොනොවට උපුරන ලදහ. ප්‍රහීණයහ සමුච්ඡින්නයහ, සන්හිඳුවන ලදහ දුරලන ලදහ, අභව්‍යොත්පත්තික වූහ, නුවණගින්නෙන් දවන ලද්දහු නුයි 'සමූහතා වාදපථා පි සබ්බෙ' යනු වේ.

එයින් වදළහ බුදුහු:

''අත්ථංගතස්ස–පෙ– සමූහතා වාදපථා' පි සබෙබ'' යි.

ගාථා පර්‍යවසානය හා සමග බමුණු හා සමග යම් අතැවැසි කෙනෙක්... බද්ධිලි වූයේ නමස්කාර කෙරෙමින් හුන්නේ වෙයි: ''වහන්ස, බුදුහු මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවක වෙමි.''

**සවැනි උපසීව සූත්‍රනිර්දෙශය යි.**

## 7. නන්ද සුත්තනිද්දෙසො

### 7–1

සන්ති ලොකෙ මුනයො (ඉච්චායස්මා නන්දො)
ජනා වදන්ති තයිදං කථංසු,
ඤාණූපපන්නං නො මුනිං වදන්ති[1]
උදාහු වෙ ජීවිතෙනූපපන්නං[2]

සන්ති ලොකෙ මුනයොති 'සන්ති'ති සන්ති සංවිජ්ජන්ති අත්ථි උපලබ්භන්ති. ලොකෙති අපාය ලොකෙ –පෙ– ආයතනලොකෙ. මුනයො ති මුනිනාමකා ආජීවකා නිගණ්ඨා ජටිලා තාපසා, 'සන්ති ලොකෙ මුනයො' –පෙ– ඉච්චායස්මා නන්දො.

ජනා වදන්ති තයිදං කථංසූති 'ජනා'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච. වදන්තීති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. තයිදං කථංසූති සංසයපුච්ඡා, විමතිපුච්ඡා, ද්වෙළ්හකපුච්ඡා, අනෙකංසපුච්ඡා, එවන්නු ඛො න නු ඛො කින්නු ඛො කථන්නු ඛොති 'ජනා වදන්ති තයිදං කථංසු.'

ඤාණූපපන්නං නො මුනිං වදන්තීති අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා උපෙතං සමුපෙතං උපගතං සමුපගතං උපපන්නං සම්පන්නං[3] සමන්නාගතං මුනිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'ඤාණූපපන්නං නො මුනිං වදන්ති'.

උදාහු වෙ ජීවිතෙනූපපන්නන්ති උදාහු අනෙකවිධලූඛජීවිතානුයොගෙන උපෙතං සමුපෙතං උපගතං සමුපගතං උපපන්නං සම්පන්නං සමන්නාගතං මුනිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'උදාහු වෙ ජීවිතෙනූපපන්නං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"සන්ති ලොකෙ මුනයො (ඉච්චායස්මා නන්දො)
ජනා වදන්ති තයිදං කථංසු,
ඤාණූපපන්නං නො මුනිං වදන්ති
උදාහු වෙ ජීවිතෙනූපපන්නං"ති.

1. මුනී නො වදන්ති – මජසං, සයා
මුනිං නො වදන්ති-ස
2. ජීවිතෙනු පපන්නං – සයා
3. සමුපපන්නං – මජසං, සයා

# 7. තාන්‍ද සූත්‍රනිර්දේශය

## 7–1.

(ආයුෂ්මත් නාන්‍දමාණවක මෙසේ විචාරයි:) 'ලෙ:වැ මුනීහු ඇත්තාහ'යි ජනයෝ කියති. එය කෙසේ ද? (සමාපත්ති–අභිඥා) ඥානයෙන් සමුපෙත වූවහු 'මුනි' යැ යි කියත් ද? නොහොත් රූක්ෂ ජීවිතයෙන් සමුපෙත වූවහු 'මුනි' යැ යි කියත් ද?

**සනති ලොකෙ මුනයො**– 'සන්ති' යනු: ඇත්තාහ, විද්‍යමාන වෙති, ඇති, ලැබෙති. **ලොකෙ** යනු: අපාය ලොකයෙහි ... ආයතනලොකයෙහි. **මුනයො** යනු: මුනි නම් ඇති ආජීවකයෝ යැ නිගණ්ඨයෝ යැ ජටිලයෝ යැ තාපසයෝ යැ යි 'සන්ති ලොකෙ මුනයො' යනු වේ. ඉච්චායස්මා නන්දෙ .......

**ජනාවදනති තයිදං කථංසු**– 'ජනා' යනු: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශුද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මිනිස්සු ද. **වදන්ති** යනු: කියති බෙණෙති ප්‍රකාශ කෙරෙති ව්‍යවහාර කෙරෙත්. **තයිදං කථංසු** යනු: මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ දෝ හො යි සංශයපෘච්ඡා යැ විමතිපෘච්ඡා යැ ද්වෛධපෘච්ඡා ය අනෛකාන්තපෘච්ඡා යැ යි 'ජනාවදන්ති තයිදං කථංසු' යනු වේ.

**ඤාණූපපනනං නො මුනිං වදනති** යනු: අෂ්ට සමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥාඥනයෙන් හෝ උපෙත වූවහු සමුපෙත වූවහු එළඹසිටියහු සංයුක්ත වූවහු නො වෙත් වූවහු පරිපූර්ණ වූවහු සමන්වාගත වූවහු මුනි'යයි **වදන්ති**–කියත් ද බෙණෙත් ද ප්‍රකාශ කෙරෙත් ද ව්‍යවහාර කෙරෙත් දැයි '**ඤාණූපපන්නං නො මුනිං වදන්ති**' යනු වේ.

**උදහු වෙ ජීවිතෙනූපපන්නං** යනු: නොහොත් අනේකවිධ වූ රූක්ෂ ජීවිතයෙන් උපේත වූවහු සමුපේත වූවහු එළඹ සිටියහු සංයුක්ත වූවහු නො වෙත් වූවහු පරිපූර්ණ වූවහු සමන්වාගත වූවහු 'මුනි' යයි **වදන්ති**–කියත් ද බෙණෙත් ද ප්‍රකාශ කෙරෙත් ද ව්‍යවහාර කෙරෙත් ද යි 'උදහු වෙ ජීවිතෙනූපපන්නං යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**"සනති ලොකෙ මුනයො –පෙ– උදහු වෙ ජීවිතෙනූපපනනං'යි.**

7-2

න දිට්ඨියා න සුතියා න ඤාණෙන
මුනීධ නන්ද, කුසලා වදන්ති,
විසෙනිකත්වා අනීඝා නිරාසා
චරන්ති යෙ තෙ මුනයොති බ්‍රෑමි.

**න දිට්ඨියා න සුතියා න ඤාණෙනාති** 'න දිට්ඨියා'ති න දිට්ඨසුද්ධියා, **න සුතියාති** න සුතසුද්ධියා. **න ඤාණෙනාති** නපි අට්ඨසමාපත්තිඤාණෙන, නපි පඤ්චාභිඤ්ඤාඤාණෙන, නපි මිච්ඡාඤාණෙනාති 'න දිට්ඨියා න සුතියා න ඤාණෙන'.

**මුනීධ නන්ද කුසලා වදන්තීති** 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා, තෙ කුසලා දිට්ඨසුද්ධියා වා සුතසුද්ධියා වා අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා මිච්ඡාඤාණෙන වා දිට්ඨෙන වා සුතෙන වා උපෙතං සමුපෙතං උපගතං සමුපගතං උපපන්නං සමුපපන්නං සමන්නාගතං මුනිං න වදන්ති න කථෙන්ති න භණන්ති න දීපයන්ති න වොහරන්තීති 'මුනීධ නන්ද කුසලා වදන්ති.'

**විසෙනිකත්වා අනීඝා නිරාසා චරන්ති යෙ තෙ මුනයොති බ්‍රෑමීති:** 'සෙනා' වුච්චති මාරසෙනා, කායදුච්චරිතං මාරසෙනා, වචීදුච්චරිතං මාරසෙනා, මනොදුච්චරිතං මාරසෙනා, රාගො මාරසෙනා, දොසො මාරසෙනා, මොහො මාරසෙනා, කොධො මාරසෙනා, උපනාහො – මක්ඛො – පළාසො – ඉස්සා – මච්ඡරියං – මායා – සාඨෙය්‍යං – ථම්භො – සාරම්භො – මානො – අතිමානො – මදො – පමාදො – සබ්බෙ කිලෙසා – සබ්බෙ දුච්චරිතා – සබ්බෙ දරථා – සබ්බෙ පරිළාහා – සබ්බෙ සන්තාපා – සබ්බාකුසලාභිසඞ්ඛාරා මාරසෙනා.

වුත්තං හෙතං භගවතා:

1. "කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති
   තතියා ඛුප්පිපාසා තෙ චතුත්ථී තණ්හා පවුච්චති.

2. පඤ්චමී[1] ථීනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති
   සත්තමී විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො තෙ අට්ඨමා[2]

1. පංචමං–ච, වි, මජ්ඣං සත්‍යං.
2. අට්ඨ මො–මජ්ඣං, සත්‍යං.

7-2.

(බුදුහු මෙසේ වදාළහ: නන්දය) මෙ සස්නෙහි (ස්කන්ධාදියෙහි) දක්‍ෂයෝ දෘෂ්ටියෙන් ශ්‍රැතියෙන් ඥානයෙන් 'මුනි' යැ යි නො කියති. යම් කෙනෙක් කෙලෙස් සෙනඟ නසා (රාගාදි) ව්‍යසන රහිත වැ ආශා රහිත වැ හැසිරෙත් නම් ඔහු 'මුනිහු' යැ යි මම් කියමි.

**න දිට්ඨියා න සුතියා න ඤාණෙන**– 'න දිට්ඨියා' යනු: දෘෂ්ට (රූපායතන) ශුද්ධියෙන් නො වෙයි, **න සුතියා** යනු: ශ්‍රැතශුද්ධියෙන් නො වෙයි, **න ඤාණෙන** යනු: අෂ්ටසමාපත්ති ඥානයෙනු දු නො වෙයි පඤ්චාභිඥා ඥානයෙනුදු නො වෙයි, මිථ්‍යාඥානයෙනුදු නො වේ නුයි 'න දිට්ඨියා න සුතියා න ඤාණෙන' යනු වේ.

**මුනීධ නන්ද කුසලා වදන්ති**– 'කුසලා' යනු: යම් කෙනෙක් ස්කන්ධයන්හි නිපුණයෝ වෙත් ද ධාතූන්හි නිපුණයෝ– ආයතනයන්හි නිපුණයෝ– ප්‍රතීත්‍යසමුත්පාදයෙහි නිපුණයෝ–සතිපට්ඨානයන්හි නිපුණයෝ– සම්‍යක් ප්‍රධානයන්හි නිපුණයෝ– ඍද්ධිපාදයන්හි නිපුණයෝ– ඉන්ද්‍රියයන්හි නිපුණයෝ–බලයන්හි නිපුණයෝ–බොධ්‍යඞ්ගයන්හි නිපුණයෝ–මාර්ගයන්හි නිපුණයෝ– ඵලයන්හි නිපුණයෝ–නිර්වාණයෙහි නිපුණයෝ වෙත් ද ඒ නිපුණයෝ දෘෂ්ටශුද්ධියෙන් හෝ ශ්‍රැතශුද්ධියෙන් හෝ අෂ්ටසමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥාඥානයෙන් හෝ මිථ්‍යාඥානයෙන් හෝ රූපායතනයෙන් හෝ ශබ්දයතනයෙන් හෝ උපේත වූවහු සමූපේත වූවහු එළඹ සිටියහු සංයුක්ත වූවහු නො වෙත් වූවහු පරිපූර්ණ වූවහු සමන්වාගත වූවහු 'මුනි' යයි **න වදන්ති**– නො කියති නො බෙණෙති ප්‍රකාශ නො කෙරෙති ව්‍යවහාර නො කෙරෙත් නුයි 'මුනීධ නන්ද කුසලා වදන්ති' යනු වේ.

**විසෙනිකත්වා අනිඝා නිරාසා චරන්ති යෙ තෙ මුනයො'ති බ්‍රෑමි**– යනු: 'සෙනා' යි මරසෙනඟ කියනු ලැබෙයි. කායදුශ්චරිතය මරසෙනඟෙක, වාග්දුශ්චරිතය මරසෙනඟෙක, මනොදුශ්චරිතය මරසෙනඟෙක, රාගය මරසෙනඟෙක, ද්වෙෂය මරසෙනඟෙක, මොහය මරසෙනඟෙක, ක්‍රොධය මරසෙනඟෙක, බද්ධවෛරය මරසෙනඟෙක, මකුබව– යුගග්‍රාහය– ඊර්ෂ්‍යාව– මාත්සය්‍ර්‍යය– මායාව– සඨබව– ස්තම්භය– සාරම්භය– මානය– අතිමානය– මදය– ප්‍රමාදය– හැම කෙලෙස්හු– හැම දුසිරිත්– හැම දරථයෝ හැම පරිදහයෝ– හැම සන්තාපයෝ– හැම අකුශලාභිසංස්කාරයෝ මරසෙනඟෙකි.

තෙල වදරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

1. "අන්තකය, වස්තුකාම ක්ලේශකාමයෝ තාගේ පළමු වැනි සේනාව යැ, වනසෙනසුන්හි හෝ අධිකුශලධර්මයන්හි උපදනා අරතිය දෙවැනි සේනාව යැයි කියනු ලැබෙයි, සා පවස් දෙක තාගේ තෙවැනි සේනාව යැ, පයෙෂණ තෘෂ්ණාව සතර වැනි සේනාව යැ යි කියනු ලැබේ.

2. ථීනමිද්ධය තාගේ පස්වැනි සේනාව යැ, තැතිගැනීම සඞ්ඛ්‍යාත බියසුලු බව සවැන්න යැ යි කියනු ලැබෙයි, පය්‍ර්‍යාප්තියෙහි සැකය තාගේ සත් වැනි සේනාව යැ (මානය) මකු බව හා ස්තම්භය තා ගේ අට වැනි සෙනාව යි.

3. ලාභො සිලොකො සක්කාරො මිච්ඡාලද්ධො ච යො යසො
යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති.[1]

4. එසා නමුචි තෙ[2] සෙනා කණ්හස්සාභිප්පහාරිණී
න නං අසූරො ජිනාති ජෙත්වා ච ලභතෙ සුඛ''න්ති[5]

යතො චතූහි අරියමග්ගෙහි සබ්බා ච මාරසෙනා, සබ්බෙ ච පටිසෙනිකරා කිලෙසා ජිතා ච පරාජිතා ච භග්ගා. විප්පලුග්ගා[3] පරම්මුඛා තෙන වුච්චන්ති[4] 'විසෙනිකත්වා'. අනීසාති: රාගො නීසො, දොසො නීසො, මොහො නීසො, කොධො නීසො, උපනාහො නීසො, –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරා නීසා. යෙසං එතෙ නීසා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා තෙ වුච්චන්ති 'අනීසා' නිරාසාති: 'ආසා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං''[6] යෙසං එසා ආසා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා තෙ වුච්චන්ති 'නිරාසා'. යෙති: අරහන්තො ඛීණාසවා. විසෙනිකත්වා අනීසා නිරාසා චරන්ති යෙ තෙ මුනයොති බ්‍රූමීති: යෙ තෙ විසෙනිංකත්වා අනීසා ච නිරාසා ච චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති, තෙ ලොකෙ 'මුනයො'ති බ්‍රූමි, ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති. 'විසෙනිකත්වා අනීසා නිරාසා චරන්ති යෙ තෙ මුනයොති බ්‍රූමි.'

තෙනාහ භගවා:

''න දිට්ඨියා න සුතියා න ඤාණෙන
මුනීධ නන්ද, කුසලා වදන්ති,
විසෙනි කත්වා අනීසා නිරාසා
චරන්ති යෙ තෙ මුනයොති බ්‍රූමී''ති.

1. අවජානාති–මජසං.
2. තෙ, න මුචි–සයා.
3. විප්පලුත්තා–සයා, පත.
4. තෙ, වුච්චන්ති–සයා.
5. සුත්ත නිපාත–පධාන සුත්ත.
6. ධම්මසඞ්ගණි–චිත්තුප්පාද කණ්ඩ–

3. ලාභය ප්‍රශංසාය සත්කාරය යන මොහු ද මිථ්‍යාවෙන් ලද යශස ද නවවැනි සේනාව වෙයි. ජාත්‍යාදිය හේතු කොට ගෙන ආත්මොත්කර්ෂණය ද පරවම්භනය ද දස වැනි සේනාව වේ.

4. අන්තකය, කෘෂ්ණධර්මයෙන් සමන්විත වූ තාගේ මේ දශවිධ සේනා තොමෝ මහණ බමුණන්ට අන්තරාය කරනසුලු වෙයි. ශූර නො වූ පුරුෂ තෙමේ ඒ මරසෙනඟ නො දිනායි, යළි කායජීවිත නිරපෙක්ෂ වූ ශූර තෙමේ ජයග්‍රහණය කොට මහපල සුවයට පැමිණේ'' යයි.

යම් හෙයෙකින් සතර ආර්‍යමාර්ගයෙන් සියලු දශවිධ මාරසෙනාව ද ප්‍රතිපක්ෂ බව කරන සියලු ක්ලෙශයෝ ද දිනන ලද්දහු, පරදවන ලද්දහු, බිඳින ලද්දහු, සුණුවිසුණු කරන ලද්දහු පරාම්මුඛ බවට පමුණුවන ලද්දහු වෙත් ද, එයින් කියනු ලැබෙති 'විසෙනිකත්වා'යි. අනීසා යනු: රාගය නීස (ව්‍යසන) යැ, ද්වෙෂය නීස යැ, මොහය නීස යැ, ක්‍රොධය නීස යැ, බද්ධවෛරය නීස යැ ... හැම අකුශලාභිසංස්කාරයෝ නීසයෝ යි. යම් කෙනකුන් විසින් තෙල නීසයෝ ප්‍රහාණය කරන ලද්දහු මුලුසුන් කරන ලද්දහු සන්හිඳුවන ලද්දහු නිවන ලද්දහු අභව්‍යොත්පත්තික කරන ලද්දහු නුවණ ගින්නෙන් දවන ලද්දහු වෙත් ද, ඔහු 'අනීසයෝ' යි කියනු ලැබෙත්. නිරාසා යනු: 'ආසා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි. ''යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. යම් කෙනකුන් විසින් තෙල ආශාව තෘෂ්ණාව ප්‍රහාණය කරනලද මුලුසුන් කරන ලද සන්හිඳුවන ලදනිවන ලද යළි උපදනට නො නිසි කරන ලද නුවණ ගින්නෙන් දවනලද වේ ද, ඔහු 'නිරාසයෝ' යි කියනු ලැබෙත්. යෙ යනු: අර්හත් ක්ෂීණාශ්‍රවයෝ යි. **විසෙනිකත්වා අනීසා නිරාසා චරන්ති යෙ තෙ මුනයො' ති බ්‍රෑමි** යනු: යම් කෙනෙක් මරසෙන් පරදවා ව්‍යසන රහිත වැ ආශා රහිත වැ හැසිරෙත් ද වාසය කෙරෙත් ද ඉරියවු පවත්වත් ද වැටෙත් ද පාලනය කෙරෙත් ද යැපෙත් ද යැපනය කෙරෙත් ද ඔහු ලොවැ 'මුනිහු' යයි බ්‍රෑමි– කියමි දෙසමි පනවමි පිහිටුවමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි නො ගැඹුරු කෙරෙමි පවසමි නුයි 'විසෙනිකත්වා අනීසා නිරාසා චරන්ති යෙ තෙ මුනයො' ති බ්‍රෑමි' යි.

එයින් වදළහ බුදුහු:

**න දිට්ඨියා න සුතියා–පෙ– චරන්ති යෙ තෙ මුනයො'ති බ්‍රෑමි''යි.**

## 7–3

යෙ කෙචි'මෙ සමණබ්‍රාහ්මණා සෙ (ඉච්චායස්මා නන්දො)
දිට්ඨෙන සුතෙනාපි[1] වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං
කච්චිස්සු[2] තෙ භගවා තත්ථ යතා චරන්තා[3]
අතාරු[4] ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතං.

**යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණා සෙති:** 'යෙ කෙචී'ති: සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං[5] අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'යෙ කෙචී'ති. **සමණාති:** යෙ කෙචි ඉතො බහිද්ධා පබ්බජ්ජූපගතා පරිබ්බාජකසමාපන්නා. **බ්‍රාහ්මණාති:** යෙ කෙචි භොවාදිකාති 'යෙ කෙචි මෙ සමණබ්‍රාහ්මණාසෙ' –පෙ– 'ඉච්චායස්මා නන්දො.'

**දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධින්ති:** දිට්ඨෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති, කථෙන්ති, භණන්ති දීපයන්ති වොහරන්ති. සුතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං අපරිමුත්තිං වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. දිට්ඨෙන සුතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධිං'

**සීලබ්බතෙනාපි වදන්ති සුද්ධින්ති:** සීලෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. වතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, සීලබ්බතෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති, දීපයන්ති වොහරන්තීති සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං.'

**අනෙකරූපෙන වදන්ති සුද්ධින්ති:** අනෙකවිධවත[6]කොතුහලමඞ්ගලෙන[7] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'අනෙකරූපෙන වදන්ති සුද්ධිං'

---

1. දිට්ඨස්සුතෙනාපි–මජසං.
   දිට්ඨසුතෙනාපි–ප, ච, වි, සයා.
2. කච්චිස්සු–තයිකාවල.
   කිං චිස්සු– ච, වි.
3. යථා චරන්තා– ච, වි, ක.
4. අතාරි– ච, වි, ක.
5. අසෙස නිස්සෙසං– ස.
6. අනෙක විවතත– සයා.
   අනෙකවිධා වත–ච, වි, ක.
7. කුතුහල මඞ්ගලෙන– පන, සයා.

7-3.

(ආයුෂ්මත් හෘදමාණවක මෙසේ විචාරයි:) භාග්‍යවතුන් වහන්ස, යම් කිසි මහණ බමුණු කෙනෙක් දෘෂ්ට (රූපායතන) යෙනුදු ශ්‍රැත (ශබ්දයතන) යෙනුදු ශුද්ධිය (මුක්තිය) කියත් නම් ශීල ව්‍රතයෙනුදු ශුද්ධිය කියත් නම් අනෙකවිධ කෞතූහලමඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් නම් නිදුකාණන් වහන්ස, කිම ඔහු (ඒ දෘෂ්ටිගතිකයෝ) ඒ දෘෂ්ටියෙහි ගුප්ත වැ වසන්නාහු ජාතියත් ජරාවත් තරණය කළාහු ද? භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල කරුණ වදළ මැනැව.

**යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණා සෙ**– 'යෙ කෙචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල ශෙෂ නො කොට නිරවශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි තෙල 'යෙ කෙචි' යනු. **සමණා** යනු: යම් කිසි මෙ සස්නෙන් බැහැර පැවිද්දට පැමිණි පරිව්‍රාජක බවට පැමිණියාහු. **බ්‍රාහ්මණා** යනු: යම් කිසි භොවාදිකයෝ නුයි 'යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණා සෙ' යනු වේ.

**දිට්ඨෙන සුතෙනා'පි වදන්ති සුද්ධිං** යනු: දෘෂ්ට (රූපායතන) යෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය, **වදන්ති**-කියති බෙණෙති දක්වති වහරති. ශ්‍රැත (ශබ්දායතන) යෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය, **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරති. දෘෂ්ටශ්‍රැතයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය, **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරත් නුයි 'දිට්ඨෙන සුතෙනා' පි වදන්ති සුද්ධිං' යනු වේ.

**සීලබ්බතෙනා'පි වදන්ති සුද්ධිං** යනු: ශීලයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරති. ව්‍රතයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරති. ශීලව්‍රතයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරත් නුයි 'සීලබ්බතෙනා'පි වදන්ති සුද්ධිං' යනු වේ.

**අනෙකරූපෙන වදන්ති සුද්ධිං** යනු: අනෙක විධ ව්‍රත කුතුහලමඞ්ගලයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරත් නුයි 'අනෙකරූපෙන වදන්ති සුද්ධිං' යනු වේ.

**කච්චිස්සු තෙ භගවා තත්ථ යතා චරන්තාති:** 'කච්චිස්සු'ති: සංසයපුච්ඡා, විමතිපුච්ඡා, ද්වෙළ්හකපුච්ඡා, අනෙකංසපුච්ඡා, එවන්නු ඛො න නු ඛො කින්නු ඛො කථන්නු ඛොති 'කච්චිස්සු.' **තෙති:** දිට්ඨිගතිකා. **භගවාති** ගාරවාධිවචනමෙතං -පෙ- සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති 'කච්චිස්සු තෙ භගවා' **තත්ථ යතා චරන්තාති:** 'තත්ථා'ති: සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා. **යතාති:** යත්තා පටියත්තා[1] ගුත්තා ගොපිතා සංවුතා. **චරන්තාති:** චරන්තා විහරන්තා[2] ඉරියන්තා වත්තෙන්තා පාලෙන්තා යපෙන්තා යාපෙන්තාති 'කච්චිස්සු තෙ භගවා තත්ථ යතා චරන්තා'.

**අතාරු[3] ජාතිඤ්ච ජරඤ්ච මාරිසාති:** ජාතිජරාමරණං අතරිංසු, උත්තරිංසු පතරිංසු සමතික්කමිංසු වීතිවත්තිංසු. **මාරිසාති:** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං 'මාරිසා'ති 'අතාරු ජාතිඤ්ච ජරඤ්ච මාරිස.'

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතන්ති:** 'පුච්ඡාමි ත'න්ති: පුච්ඡාමි තං, යාචාමි තං, අජ්ඣෙසාමි තං, පසාදෙමි තං, කථයස්සු මෙති. 'පුච්ඡාමි තං' **භගවාති** -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති. **බ්‍රෑහි මෙතන්ති:** බ්‍රෑහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

> "යෙ කෙචි මෙ සමණබ්‍රාහ්මණා සෙ (ඉච්චායස්මා නන්දො)
> දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධිං,
> සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
> අනෙකරූපෙන වදන්ති සුද්ධිං,
> කච්චිස්සු තෙ භගවා තත්ථ යතා චරන්තා
> අතාරු ජාතිඤ්චජරඤ්ච මාරිස,
> පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙත"න්ති.

---

## 7-4

> යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණාසෙ (නන්දාති භගවා)
> දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධිං
> සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
> අනෙකරූපෙන වදන්ති සුද්ධිං,
> කිඤ්චාපි තෙ තත්ථ යතා චරන්ති
> නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි.

**යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණාසෙති:** 'යෙ කෙචි'ති: සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං යෙ කෙචීති **සමණාති:** යෙ කෙචි ඉතො බහිද්ධා පබ්බජ්ජූපගතා පරිබ්බාජක සමාපන්නා. **බ්‍රාහ්මණාති:** යෙ කෙචි භොවාදිකාති 'යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණාසෙ' **නන්දාති භගවාති** -පෙ-

---

1. යත්තා පටියත්තා-මජසං
2. විචරන්තා-පත.
3. අතාරු-පත
4. දිට්ඨ සුතෙනාපි- ව, වි, ක, සාා. දිට්ඨස්සු තෙනාපි-මජසං

**කච්චිස්සු තෙ භගවා තත්ථ යතා චරන්තා**– 'කච්චිස්සු' යනු: සංශය පෘච්ඡා යැ විමති පෘච්ඡා යැ ද්වෙළ්හකපෘච්ඡා යැ අනෙකාංශපෘච්ඡා යැ මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ දෝහො යි 'කච්චිස්සු' යනු වේ. **තෙ** යනු: දෘෂ්ටිගතිකයෝ. **භගවා** යනු: තෙල ගෞරවාධිවචන යැ ... මේ 'භගවා' යනු: අර්හත්ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියෙක් නුයි 'කච්චිස්සු තෙ භගවා' යනු වේ. **තත්ථ යතා චරන්තා**– 'තත්ථ' යනු ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය ක්ෂාන්තියෙහි ස්වකීය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි **යතා** යනු: රැකුණාහු වෙසෙසින් රැකුණාහු ගුප්ත වූවාහු ගොපනය කරන ලද්දහු සංවෘත වූවාහු. **චරන්තා** යනු: හැසිරෙන්නාහු වසන්නාහු ඉරියවු පවත්වන්නාහු වැටෙන්නාහු පාලනය වන්නාහු යැපෙන්නාහු යාපනය කරන්නාහු නුයි 'කච්චිස්සු තෙ භගවා තත්ථ යතා චරන්තා' යනු වේ.

**අතාරු ජාතිඤ්ච ජරඤ්ච මාරිස** යනු: ජාති ජරාමරණය තරණය කළහ උත්තරණය කළහ ප්‍රතරණය කළහ මොනොවට ඉක්මවූහ ව්‍යතික්‍රමණය කළහ. **මාරිස** යනු ප්‍රියවචන යැ ගරුවචන යැ තෙල 'මාරිස' යනු සගෞරව සප්‍රතිශ්‍රය නාමෙක නුයි 'අතාරු ජාතිඤ්ච ජරඤ්ච මාරිස' යනු වේ.

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං**– 'පුච්ඡාමි තං' යනු: මුඹ වහන්සේ පුළුවුස්මි මුඹ වහන්සේ අයදිමි මුඹ වහන්සේ අධ්‍යෙෂණ කෙරෙමි මුඹ වහන්සේ පහදවමි මට වදළ මැනැවැ යි 'පුච්ඡාමි තං' යනු වේ. **භගවා** යනු: ...මේ භගවා යනු අර්හත් ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියකි. **බ්‍රෑහි මෙතං** යනු: **බ්‍රෑහි**– කිව මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව නො ගැඹුරු කළ මැනැව ප්‍රකාශ කළ මැනැව නුයි 'පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"යෙ කෙචිමෙ -පෙ- පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං' යි.**

---

## 7–4.

(බුදුහු මෙසේ වදළහ: නන්‍දය,) 'යම් කිසි මේ මහණ බමුණු කෙනෙක් දෘෂ්ටයෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය කියත් ද ශීලව්‍රතයෙනුදු ශුද්ධිය කියත් ද අනෙකවිධ කොතුහලමඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් ද වැළිත් ඔහු ඒ දෘෂ්ටියෙහි ගුප්ත වැ වෙසෙත් නම් ජාතියත් ජරාවත් තරණය නො කළාහ' යි කියමි.

**යෙ කෙචිමෙ සමණබ්‍රාහමණා සෙ**– 'යෙ කෙචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල ශෙෂ නො කොට නිරවශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි තෙල 'යෙ කෙචි' යනු. **සමණා** යනු: යම් කිසි මෙ සස්නෙන් බැහැර පැවිද්දට එළඹියාහු පරිව්‍රාජක බවට පැමිණියාහු. **බ්‍රාහ්මණා** යනු: යම් කිසි භොවාදිකයෝ නුයි 'යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණාසෙ' යනු වේ. නන්‍ද'ති භගවා යනු...

දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධින්ති: දිට්ඨෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, සුතෙනපි සුද්ධිං -පෙ- දිට්ඨෙන සුතෙනපි සුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධිං'.

සීලබ්බතෙනාපි වදන්ති සුද්ධින්ති: සීලෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, වතෙනපි සුද්ධිං -පෙ- වොහරන්ති, සීලබ්බතෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං -පෙ- වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං.'

අනෙකරූපෙන වදන්ති සුද්ධින්ති: අනෙකවිධවතකොතූහලමඞ්ගලෙන[1] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'අනෙකරූපෙන වදන්ති සුද්ධිං.'

කිඤ්චාපි තෙ තත්ථ යතා චරන්තීති: 'කිඤ්චාපී'ති: පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාපෙතං 'කිඤ්චාපී'ති. තෙති දිට්ඨිගතිකා. තත්ථාති: සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා. යතාති යතා පටියතා[2] ගුත්තා ගොපිතා රක්ඛිතා සංවුතා. චරන්තීති: චරන්ති විහරන්ති[3] ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්තීති 'කිඤ්චාපි තෙ තත්ථ යතා චරන්ති.'

නාතරිංසු ජාතිජරන්ති බ්‍රූමීති: ජාතිජරාමරණං න තරිංසු, න උත්තරිංසු න පතරිංසු, න සමතික්කමිංසු, න වීතිවත්තිංසු ජාතිජරාමරණා අනික්ඛන්තා අනිස්සටා,[4] අනතික්කන්තා අසමතික්කන්තා අවීතිවත්තා අන්තො ජාතිජරාමරණෙ පරිවත්තෙන්ති, අන්තො සංසාරපථෙ පරිවත්තන්ති, ජාතියා අනුගතා, ජරාය අනුසටා, බ්‍යාධිනා අභිභූතා මරණෙන අබ්භාහතා, අතාණා අලෙණා අසරණා අසරණීභූතාති. 'බ්‍රූමී' ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'නාතරිංසු ජාතිජරන්ති බ්‍රූමි.'

තෙනාහ භගවා:

"යෙ කෙචි මෙ සමණබ්‍රාහ්මණා සෙ (නන්දාති භගවා)
දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං
කිඤ්චාපි තෙ තත්ථ යතා චරන්ති
නාතරිංසු ජාතිජරන්ති බ්‍රූමී"ති.

1. අනෙකවිධ කොතූහල මංගලෙන – මජසං
අනෙකවිධ වත්ත කොතූහල මංගලෙන – සයා
2. යත්තා පටියත්ත.–ච, වි, ක, මජසං.
3. විචරන්ති. පන.
4. අනිස්සටා සයා.

**දිට්ඨෙන සුතෙනා'පි වදන්ති සුද්ධිං** යනු: දෘෂ්ට (රූපායතන) යෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති** කියති බෙණෙති දක්වති වහරති, ශ්‍රැත (ශබ්දයතන) යෙනුදු ශුද්ධිය ... දෘෂ්ට ශ්‍රැතයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති** - කියති බෙණෙති දක්වති වහරත් නුයි 'දිට්ඨෙන සුතෙනා' පි වදන්ති සුද්ධිං' යනු වේ.

**සීලබ්බතෙනා'පි වදන්ති සුද්ධිං** යනු: ශීලයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරති, ව්‍රතයෙනුදු ශුද්ධිය ... වහරති, ශීලව්‍රතයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති** - කියති බෙණෙති දක්වති වහරත් නුයි 'සීලබ්බතෙනා'පි වදන්ති සුද්ධිං' යනු වේ.

**අනෙකරූපෙන වදන්ති සුද්ධිං** යනු: අනෙකවිධ ව්‍රතකෞතුකමඞ්ගලයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**- කියති බෙණෙති දක්වති වහරත් නුයි 'අනෙකරූපෙන වදන්ති සුද්ධිං.' යනු වේ.

**කිඤ්චා'පි තෙ තත්ථ යතා චරන්ති**- කිඤ්චා'පි යනු: පදසන්ධි යැ පදසංසර්ග යැ පදපරිපූර්ණතා යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජන ශ්ලිෂ්ටතා යැ තෙල 'කිඤ්චා 'පි' යනු පදනුපූර්වතා යි. **තෙ** යනු: දෘෂ්ටිගතිකයෝ යි. **තත්ථ** යනු: ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය ක්ෂාන්තියෙහි ස්වකීය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි. **යතා** යනු: රැකෙන්නාහු වෙසෙසින්රැකෙන්නාහු ගුප්ත වූවාහු ගොපනය කරන ලද්දහු රක්ෂිත වූවාහු සංවෘත වූවාහු. **චරන්ති** යනු: හැසිරෙති වාසය කෙරෙති. ඉරියවු පවත්වති වැටෙති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'කිඤ්චා' පි තෙ තත්ථ යතා චරන්ති' යනු වේ.

**නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි** යනු: ජාතිජරාමරණය තරණය නො කළහ, උත්තරණය ප්‍රතරණය-සමතික්‍රමණය- ව්‍යතික්‍රමණය නො කළහ. ජාතිජරාමරණයෙන් නො නික්මුණාහු නො බැහැර වූවාහු නො ඉක්මගියාහු මොනොවට නො ඉක්මගියාහු නො ඉක්ම සිටියාහු ඇතුළු ජාතිජරාමරණයෙහි පෙරළෙති, ඇතුළු සසරමඟ පිරිවැටෙති, ජාතියෙහි පිවිසියාහු ජරාව විසින් ලුහුබඳනා ලද්දහු ව්‍යාධියෙන් මැඩුණාහු මරණයෙන් පහළාහු ත්‍රාණ (රක්ෂා) රහිතයහ, ලෙන (ගිලීනස්ථාන) රහිතයහ, අසරණයහ, අසරණීභූතහ'යි බ්‍රෑමි- කියමි දෙසමි පනවමි පිහිටුවමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි නො ගැඹුරු කෙරෙමි පවසමි නුයි 'නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි' යනුවේ.

එයින් වදළහ බුදුහු:

**"යෙ කෙචිමෙ -පෙ- නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි"යි**

7–5, 6

යෙ කෙචි මෙ සමණබ්‍රාහ්මණා සෙ (ඉච්චායස්මා නන්‍දො)
දිට්ඨෙන සුතෙනාපි[1] වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං

තෙ චෙ මුනී බ්‍රෑසි අනොඝතිණ්ණෙ
අථ කො චරහි දෙවමනුස්සලොකෙ,
අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

**යෙ කෙචි මෙ සමණබ්‍රාහ්මණා සෙති:** 'යෙ කෙචී'ති: සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'යෙ කෙචී'ති. **සමණාති:** යෙ කෙචි ඉතො බහිද්ධා පබ්බජ්ජුපගතා පරිබ්බාජකසමාපන්නා. **බ්‍රාහ්මණාති:** යෙ කෙචි භො වාදිකාති 'යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණාසෙ.' **ඉච්චායස්මා නන්‍දොති** –පෙ–

**දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධින්ති:** දිට්ඨෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, සුතෙනාපි සුද්ධිං –පෙ– දිට්ඨෙන සුතෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධිං'

**සීලබ්බතෙනාපි වදන්ති සුද්ධින්ති:** සීලෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. වතෙනාපි සුද්ධිං –පෙ– වොහරන්ති, සීලබ්බතෙනාපි සුද්ධිං' විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති, කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං'.

**අනෙකරූපෙන වදන්ති සුද්ධින්ති:** අනෙකවිධවතකොතූහලමඞ්ගලෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'අනෙකරූපෙන වදන්ති සුද්ධිං'

**තෙ චෙ මුනී බ්‍රෑසි අනොඝතිණ්ණෙති:** 'තෙ චෙ'ති; දිට්ඨිගතිකෙ. **මුනීති:** 'මොනං' වුච්චති ඤාණං –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනි.'

1. දිට්ඨඤ්ඤුතෙනාපි– ම ජ සං.

7–5, 6.

(ආයුෂ්මත් නන්‍දමාණවක මෙසේ විචාරයි:) භාග්‍යවතුන්වහන්ස, යම් කිසි මේ මහණ බමුණු කෙනෙක් දෘෂ්ටයෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය කියත් ද ශීලව්‍රතයෙනුදු ශුද්ධිය කියත් ද අනෙකවිධ කෞතුහලමඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් ද මුනින්ද්‍රයන් වහන්ස, ඉදින් ඒ දෘෂ්ටිගතිකයන් ඔඝතරණය නො කළවුනැ'යි වදරන්නවු නම් නිදුකාණන් වහන්ස, වැළිත් දෙව්මිනිස් ලොවැ කවරෙක් ජාතියත් ජරාවත් තරණය කෙළේ ද? භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල කරුණ වදළ මැනැවි.

**යෙ කෙචිමෙ සමණබ්‍රාහමණා සෙ**– 'යෙ කෙචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි තෙල 'යෙ කෙචි' යනු. **සමණා** යනු: යම් කිසි මෙ සස්නෙන් බැහැර පැවිද්දට එළඹියාහු පරිව්‍රාජකබවට පැමිණියාහු. **බ්‍රාහමණා** යනු: යම් කිසි 'භො වාදිකයෝ යැ' යි 'යෙ කෙචිමෙ සමණබ්‍රාහමණා සෙ' යනු වේ.

**ඉච්චායසමා නන්දෙ** යනු......

**දිට්ඨෙන සුතෙනා'පි වදන්ති සුද්ධිං** යනු: දෘෂ්ටයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**– කියත් ද බෙණෙත් ද දක්වත් ද වහරත් ද, ශ්‍රැතයෙනුදු ශුද්ධිය ... දෘෂ්ට–ශ්‍රැතයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**– කියත් ද බෙණෙත් ද දක්වත් ද වහරත් දැ යි 'දිට්ඨෙන සුතෙනා'පි වදන්ති සුද්ධිං' යනු වේ.

**සීලබ්බතෙනා' පි වදන්ති සුද්ධිං** යනු: ශීලයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වදන්ති–කියත් ද බෙණෙත් ද දක්වත් ද වහරත් ද ව්‍රතයෙනුදු ශුද්ධිය ...වහරත් ද, ශීලව්‍රතයෙනුදු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**–කියත් ද බෙණෙත් ද දක්වත් ද වහරත් දැ'යි 'සීලබ්බතෙනා'පි වදන්ති සුද්ධිං'යනු වේ.

**අනෙකරූපෙන වදන්ති සුද්ධිං** යනු: අනේකවිධ ව්‍රතකෞතුකමඞ්ගලයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **වදන්ති**– කියත් ද බෙණෙත් ද දක්වත් ද වහරත් දැ' යි 'අනෙකරූපෙන වදන්ති සුද්ධිං' යනු වේ.

**තෙ චෙ මුනී බ්‍රූසි අනොඝතිණ්ණෙ**– 'තෙ චෙ' යනු: දෘෂ්ටිගති ඇතියන්. **මුනි** යනු: 'මොන' යි ඥානය කියනු ලැබෙයි... රාගාදි සඞ්ගය හා තෘෂ්ණා දෘෂ්ටිජාලය ඉක්ම සිටි හෙතෙම මුනි නම් වෙයි.

**බ්‍රූසි අනොඝතිණ්ණෙති:** කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං අතිණ්ණෙ අනතික්කන්තෙ අසමතික්කන්තෙ අවීතිවත්තෙ අන්තො ජාතිජරාමරණෙ පරිවත්තන්තෙ අන්තොසංසාරපථෙ පරිවත්තන්තෙ, ජාතියා අනුගතෙ ජරාය අනුසටෙ බ්‍යාධිනා අභිභූතෙ මරණෙන අබ්භාහතෙ අතාණෙ අලෙණෙ අසරණෙ අසරණීභූතෙ. **බ්‍රූසීති:** බ්‍රූසි ආචික්ඛසි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරසි විභජසි උත්තානීකරොසි පකාසෙසීති 'තෙ චෙ මුනී බ්‍රූසි අනොඝතිණ්ණෙ.'

**අථ කො චරහි දෙවමනුස්සලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිසාති:** අථ කො එසො සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ජාතිජරාමරණං අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයි. **මාරිසාති:** පියවචනං ගරු වචනං සගාරව-සප්පතිස්සාධිවචනමෙතං 'මාරිසා'ති 'අථ කො චරහි දෙව මනුස්සලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස'.

**පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතන්ති:** 'පුච්ඡාමි ත'න්ති: පුච්ඡාමි තං, යාචාමි තං, අජ්ඣෙසාමි තං, පසාදෙමි තං. **භගවාති** ගාරවාධිවචන-මෙතං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති. **බ්‍රූහි මෙතන්ති:** බ්‍රූහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති. පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණාසෙ (ඉච්චායස්මා නන්දො)
දිට්ඨෙන සුතෙනාපි වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං
තෙ චෙ මුනී බ්‍රූසි අනොඝතිණ්ණෙ
අථ කො චරහි දෙවමනුස්සලොකෙ,
අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතන්ති".

**බ්‍රෑසි අනොඝතිණ්ණා** යනු: කාමෞඝය භවෞඝය දිට්ඨෞඝය අවිජ්ජෞඝය තරණය නො කළවුන් නො ඉක්මවූවන් මොනොවට නො ඉක්ම වූවන් නො ඉක්ම සිටියවුන් ඇතුළු ජරාමරණයෙහි පිරිවැටෙනු (පෙරළෙනු) වන් ඇතුළු සසරමඟ පිරිවැටෙනු වන් ජාතියෙහි පිවිසියන් ජරාව විසින් ලුහුබඳනා ලදවන් ව්‍යාධියෙන් මැඩුණවුන් මරණයෙන් පහළ වුන් ත්‍රාණ නැතියන් ලෙන නැතියන් අසරණයන් අසරණීභූතයන් කොට බ්‍රෑසි– වදරණ සේක් දෙසන සේක් පනවනසේක් පිහිටුවන සේක් විවෘත කරන සේක් විභාග කරනසේක් පාළ කරනසේක් පවසන සේක් නම් නුයි ‘තෙ වෙ මුනී බ්‍රෑසි අනොඝතිණ්ණා යනු වේ.

**අථ කො චරහි මනුසසලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස** යනු: වැදිත් තෙල කවරෙක් දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොවැ මහණ බමුණන් සහිත වූ දෙව් මිනිසුන් සහිත වූ සත්ත්වලොකයෙහි ජාතිජරාමරණය තරණය කෙළේ ද උත්තරණය– ප්‍රතරණය– සමතික්‍රමණය– ව්‍යතිවර්තනයකෙළේ ද? **මාරිස** යනු: ප්‍රියවචන යැ ගරුවචන යැ තෙල ‘මාරිස’ යනු සගෞරව සප්‍රතිශ්‍රයනාමයෙක් නුයි ‘අථ කො චරහි දෙවමනුසසලොකෙ අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස’ යනු වේ.

**පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං**–‘පුච්ඡාමි තං’ යනු: මුඹ වහන්සේ පුළුවුස්මි, මුඹ වහන්සේ අයදිමි, මුඹ වහන්සේ අධ්‍යෙෂණ කෙරෙමි, මුඹවහන්සේ පහදවමි. **භගවා** යනු: තෙල ගෞරවනාම යැ ... මෙ ‘භගවා’ යනු: අර්හත් ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියෙකි. **බ්‍රෑහි මෙතං** යනු: වදළ මැනැව ප්‍රකාශ කළ මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව පාළ කළ මැනැව පැවැසුව මැනැව නුයි ‘පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං’ යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**‘ යෙ කෙචිමෙ –පෙ– පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං’’ යි**

7–7

නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණාසෙ (නන්දාති භගවා)
ජාතිජරාය නිවුතාති බ්‍රූමි,
යෙ සීධ දිට්ඨංව සුතං මුතං වා
සීලබ්බතං වාපි පහාය සබ්බං
අනෙකරූපම්පි පහාය සබ්බං
තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ
තෙ වෙ නරා[1] ඔඝතිණ්ණාති බ්‍රූමි.

**නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණාසෙ නන්දාති භගවා ජාතිජරාය නිවුතාති බ්‍රූමීති:** නාහං නන්ද, සබ්බෙ සමණබ්‍රාහ්මණා ජාතිජරාය ආවුතා නිවුතා ඔවුතා[2] පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතාති වදමි, අත්ථි තෙ සමණබ්‍රාහ්මණා යෙසං ජාතිච ජරාමරණඤ්ච පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[3] ආයතිං අනුප්පාදධම්මාති බ්‍රූමි. ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති. 'නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණාසෙ නන්දාති භගවා ජාතිජරාය නිවුතාති බ්‍රූමි'.

**යෙ සීධ දිට්ඨංව සුතං මුතං වා සීලබ්බතං වාපි පහාය සබ්බන්ති:** යෙ සබ්බා දිට්ඨසුද්ධියො පහාය ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, යෙ සබ්බා සුතසුද්ධියො[4] පහාය –පෙ– යෙ සබ්බා මුතසුද්ධියො[5] පහාය –පෙ– යෙ සබ්බා දිට්ඨසුතමුතසුද්ධියො පහාය –පෙ– යෙ සබ්බා සීලසුද්ධියො පහාය –පෙ– යෙ සබ්බා වතසුද්ධියො පහාය –පෙ– යෙ සබ්බා සීලබ්බතසුද්ධියො පහාය ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'යෙ සීධ දිට්ඨංව සුතං මුතං වා සීලබ්බතං වාපි පහාය සබ්බං.'

**අනෙකරූපම්පි පහාය සබ්බන්ති:** අනෙකවිධවතකොතූහල මඞ්ගලෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං වීමුත්තිං පරිමුත්තිං පහාය ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'අනෙකරූපම්පි පහාය සබ්බං'.

**තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ තෙ වෙ නරා ඔඝතිණ්ණාති බ්‍රූමීති:** **තණ්හාති:** රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා. **තණ්හං පරිඤ්ඤායාති:** තණ්හං තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා ඤාතපරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය.

1. තෙ වෙ නන්ද– පත.
2. ඔවුවා– ස්‍යා.
3. අනභාවං ගතා– ව, වි, ක. අනභාවං කතා– මජසං.
4. සුත දිට්ඨියො– ව, වි, ක.
5. මුත දිට්ඨියො පහාය– ව, වි, ක.

7–7.

(බුදුහු මෙසේ වදාළහ: තොදෙය,) මම 'හැම මහණබමුණහු ජාති ජරා විසින් අවුරන ලදහ යි නො කියමි. මේ ලොව්හි යම් කෙනෙක් හැම දෘෂ්ටශුද්ධිය ද ශ්‍රැතශුද්ධිය ද මුතශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද හැරපියා හැම කෞතුහල මඞ්ගල ශුද්ධිය ද හැරපියා තෘෂ්ණාව පිරිසිඳ දැන අනාස්‍රව වූවාහු ද එ සත්හු ඒකාන්තයෙන් ඔඝතරණය කළාහ යි කියමි.'

**නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණා සෙ තොදෙය්‍ය'ති භගවා ජාතිජරාය නිවුතා'ති** බ්‍රෑමි යනු: තොදෙය, මම හැම මහණබමුණහු ජාතිජරායෙන් අවුරන ලද්දහු වළහන ලද්දහු උඩින් වැසුණාහු යටින් වැසුණාහු පිළිසන් වූවාහු යටිහුරු වූවාහු යයි නො කියමි. යම් මහණ බමුණු කෙනකුන්ට ජාතියත් ජරාමරණයත් ප්‍රහීණ වූවාහු ද උසුන්මුල් ඇත්තාහු ද හිස්සුන් තල්රුකක් සෙයින් අවස්තුක වූවාහු ද අනු අභාවය කරන ලද්දහු ද ආයතිභවයෙහි නුපදනා පියවි ඇත්තාහු ද, එබඳු මහණබමුණු කෙනෙක් ඇත්තාහ යි බ්‍රෑමි–කියමි දෙසමි පනවමි පිහිටුවමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි ප්‍රකට කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි 'නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණා සෙ තොදෙය්‍ය'ති භගවා ජාතිජරාය නිවුතා'ති බ්‍රෑමි' යනු වේ.

**යෙ සීධ දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං වා'පි පහාය සබ්බං** යනු: යම් කෙනෙක් හැම දෘෂ්ට ශුද්ධීන් හැර හැරපියා වෙසෙසින් හැරපියා දුරු කොට විගතාන්ත කොට අනු අභාවයට පමුණුවා, යම් කෙනෙක් හැම ශ්‍රැතශුද්ධීන් හැර ......යම් කෙනෙක් හැම මුතශුද්ධීන් හැර ......යම් කෙනෙක් හැම දෘෂ්ටශ්‍රැතමුතශුද්ධීන් හැර ... යම් කෙනෙක් හැම ශීලශුද්ධීන් හැර ... යම් කෙනෙක් හැම ව්‍රතශුද්ධීන් හැර ... යම් කෙනෙක් හැම ශීලව්‍රතශුද්ධීන් හැර හැරපියා වෙසෙසින් හැරපියා දුරු කොට විගතාන්ත කොට අනු අභාවයට පමුණුවා නුයි 'යෙ සීධ දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං වා පි පහාය සබ්බං' යනු වේ.

**අනෙකරූපම්පි පහාය සබ්බං** යනු: අනේකවිධ ව්‍රතකෞතුහල මඞ්ගලයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හැර හැරපියා වෙසෙසින් හැරපියා දුරු කොට විගතාන්ත කොට අනු අභාවයට පමුණුවා නුයි 'අනෙකරූපම්පි පහාය සබ්බං' යනු වේ.

**තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ තෙ වෙ නරා ඔඝතිණ්ණා'ති බ්‍රෑමි**– 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ශබ්දතෘෂ්ණා යැ ගන්ධතෘෂ්ණා යැ රස තෘෂ්ණා යැ ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණා යැ ධර්මතෘෂ්ණා යි. **පරිඤ්ඤාය** යනු: ඥාතපරිඥා යැ තීරණපරිඥා යැ ප්‍රහාණපරිඥා යැ යන තුන් පරිඥායෙන් තෘෂ්ණාව පිරිසිඳ දැන.

කතමා 'ඤාතපරිඤ්ඤා': තණ්හං ජානාති[1] 'අයං රූපතණ්හා අයං සද්දතණ්හා අයං ගන්ධතණ්හා අයං රසතණ්හා අයං ඵොට්ඨබ්බතණ්හා අයං ධම්මතණ්හා'ති. ජානාති[1] පස්සති, අයං ඤාතපරිඤ්ඤා.

කතමා 'තීරණපරිඤ්ඤා': එවං ඤාතං කත්වා තණ්හං තීරෙති: අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො -පෙ- නිස්සරණතො තීරෙති, අයං තීරණපරිඤ්ඤා.

කතමා 'පහානපරිඤ්ඤා': එවං තීරයිත්වා තණ්හං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. වුත්තං හෙතං භගවතා: "යො භික්ඛවෙ, තණ්හාය ඡන්දරාගො තං පජහථ, එවං සා තණ්හා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[2] ආයතිං අනුප්පාදධම්මා"ති.[a] අයං පහානපරිඤ්ඤා.

තණ්හං පරිඤ්ඤායාති: තණ්හං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා. අනාසවාසෙති: චත්තාරො ආසවා; කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො. යෙසං ඉමෙ ආසවා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තෙ වුච්චන්ති අනාසවා අරහන්තො ඛීණාසවා.

තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ තෙ වෙ නරා ඔඝතිණ්ණාති බ්‍රූමීති. යෙ තණ්හං පරිඤ්ඤාය අනාසවා තෙ කාමොඝං තිණ්ණා, භවොඝං තිණ්ණා, දිට්ඨොඝං තිණ්ණා, අවිජ්ජොඝං තිණ්ණා, සබ්බසංසාරපථං තිණ්ණා උත්තිණ්ණා නිත්තිණ්ණා[3] අතික්කන්තා සමතික්කන්තා වීතිවත්තාති බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ තෙ වෙ නරා ඔඝතිණ්ණාති බ්‍රූමී"ති.

තෙනාහ භගවා;

"නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණාසෙ (නන්දාති භගවා)
ජාතිජරාය නිවුතාති බ්‍රූමි,
යෙ සීධ දිට්ඨංව සුතං මුතං වා[4]
සීලබ්බතං වාපි පහාය සබ්බං
අනෙකරූපම්පි පහාය සබ්බං
තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ
තෙ වෙ නරා ඔඝතිණ්ණාති බ්‍රූමී"ති.

1. පජානාති– පන, සයා.
2. අනභාවං ගතා– ව, වි, ක, සයා.
3. ඔතිණ්ණ නිත්තිණ්ණා– පන
4. යෙසීධ දිට්ඨංව සුතං මුතංවා– ව, වි, ක, ම
a. ඛන්ධ සංයුත්ත–භාරවග්ග.

ඥාතපරිඥා කවරැ යත්: තෘෂ්ණාව ඥාතපරිඥායෙන් දනගනියි: මේ රූපතෘෂ්ණා යැ මේ ශබ්දතෘෂ්ණා යැ මේ ගන්ධතෘෂ්ණා යැ මේ රස තෘෂ්ණා යැ මේ ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණා යැ මේ ධර්මතෘෂ්ණා යැ යි දනගනියි, දකියි. මෝ තොමෝ ඥාතපරිඥායි.

තීරණපරිඥා කවරැ යත්: මෙසේ දන්නාලද කොට තෘෂ්ණාව තීරණය කෙරෙයි: අනිත්‍ය විසින් දුඃඛ විසින් රොග විසින් ගණ්ඩ විසින් ...නිස්සරණ විසින් තීරණය කෙරෙයි. මෝ තොමෝ තීරණ පරිඥා යි.

ප්‍රහාණ පරිඥා කවරැ යත්: මෙසේ තීරණය කොට තෘෂ්ණාව දුරු කෙරෙයි, බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි.

මෙ වදරණලද මැ යි භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, තෘෂ්ණාව පිළිබඳ යම් ඡන්දරාගයෙක් වී නම් එය දුරු කරවු, මෙසේ ඒ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී යැ උදුන්මුල් ඇත්තී තාලවස්තුවක් මෙන් කරන ලද්දී අනභාවය කරනලද්දී මත්තෙහි නූපදනා සැහැවි ඇත්තී යැ'' යි. මෝ තොමෝ 'ප්‍රහාණ පරිඥා' යි.

**තණ්හං පරිඤ්ඤාය**– තෘෂ්ණාව මේ තුන් පරිඥායෙන් දනගෙන. අනා-සවාසෙ– ආශ්‍රවයෝ සතර දෙනෙකි: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යා-ස්‍රව යැ අවිද්‍යාස්‍රව යි. යම් කෙනකුන්ට මේ ආස්‍රවයෝ ප්‍රහීණ වූවාහු උදුන් මුල් ඇත්තාහු තාලවස්තුවක් සෙයින් කරන ලද්දහු අනභාවය කරන ලද්දහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු ද ඒ අර්හත් ක්ෂීණාස්‍රවයෝ 'අනාස්‍රවහ'යි කියනු ලැබෙත්.

**තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ තෙ වෙ නරා ඔඝතිණ්ණා'ති බ්‍රැමි යනු:** යම් කෙනෙක් තුමූ තෘෂ්ණාව ත්‍රිවිධ පරිඥායෙන් දන අනාස්‍රව වූවැහු ද ඔහු කාමෞඝය තරණය කළාහු යැ භවෞඝය තරණය කළාහු යැ දෘෂ්ට්‍යෝඝය තරණය කළාහු යැ අවිද්‍යෝඝය තරණය කළාහු යැ, සියලු සංසාර පථය තරණය කළාහු යැ උත්තරණය-නිස්තරණය– අතික්‍රමණය - සමතික්‍රමණය කළාහු යැ ඉක්මවූවාහු යයි කියමි පවසමි දෙසමි පනවමි පිහිටුවමි විවරණ කෙරෙමි විභාග කෙරෙමි ප්‍රකට කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි 'තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ තෙ වෙ නරා ඔඝතිණ්ණා'ති බ්‍රැමි' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**''නාහං සබ්බෙ –පෙ– තෙ වෙ නරා ඔඝතිණ්ණා'ති බ්‍රැමි''යි.**

7–8

එතාභිනන්දාමි වචො මහෙසිනො (ඉච්චායස්මා නන්දො)
සුකිත්තිතං ගොතම නූපධීකං
යෙසීධ දිට්ඨං ව සුතං මුතං වා
සීලබ්බතං වාපි පහාය සබ්බං
අනෙකරූපම්පි පහාය සබ්බං,
තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ
අහම්පි තෙ ඔඝතිණ්ණා'ති බ්‍රූමි.

**එතාභිනන්දාමි වචො මහෙසිනොති:** 'එත'න්ති: තුය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං[1] නන්දාමි අභිනන්දාමි මොදාමි අනුමොදාමි ඉච්ඡාමි සාදියාමි පත්ථයාමි පිහයාමි අභිජප්පාමි. මහෙසිනොති මහෙසි[2] භගවා මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති මහෙසී –පෙ– කහං දෙවදෙවො කහං නරාසභොති මහෙසීති 'එතාභිනන්දාමි වචො මහෙසිනො'.

**සුකිත්තිතං ගොතම නූපධීකන්ති:** 'සුකිත්තිත'න්ති: ස්වාචික්ඛිතං[3] සුදෙසිතං සුපඤ්ඤපිතං සුපට්ඨපිතං සුවිවටං[4] සුවිභත්තං සුඋත්තානීකතං සුපකාසිතං ගොතම නූපධීකන්ති: 'උපධි' වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච උපධිපහානං උපධිවූපසමං උපධිපටිනිස්සග්ගං[5] උපධිපටිප්පස්සද්ධිං[6] අමතං නිබ්බානන්ති 'සුකිත්තිතං ගොතම නූපධීකං.'

**යෙ සීධ දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං වාපි පහාය සබ්බන්ති** යෙ සබ්බා දිට්ඨසුද්ධියො පහාය ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, යෙ සබ්බා සුතසුද්ධියො –පෙ– යෙ සබ්බා මුතසුද්ධියො –පෙ– යෙ සබ්බා දිට්ඨසුතමුතසුද්ධියො –පෙ– යෙ සබ්බා සීලසුද්ධියො –පෙ– යෙ සබ්බා වතසුද්ධියො –පෙ– යෙ සබ්බා සීලබ්බතසුද්ධියො පහාය ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'යෙ සීධ දිට්ඨංව සුතං මුතං වා සීලබ්බතං වාපි පහාය සබ්බං'.

**අනෙකරූපම්පි පහාය සබ්බන්ති:** අනෙකවිධවතකොතූහලමඞ්ගලෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පහාය ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'අනෙකරූපම්පි පහාය සබ්බං.'

---

1. අනුසන්ධිං– ච, වි, ක
2. කිං මහෙසි–මජ්ඣං.
3. සු ආචික්ඛිතං– මජ්ඣං, ස්‍යා.
4. සු විවරිතං– පත.
5. උපධි නිස්සග්ගං– ච, වි, ක, මජ්ඣං උපධිපටිනිස්සග්ගො– ස්‍යා.
6. පටිප්පස්සද්ධං– ච, වි, ක, මජ්ඣං.

7–8.

(ආයුෂ්මත් නන්දමාණවක මෙසේ කියයි:) මහර්ෂි වූ මුඹ වහන්සේගේ තෙල වදන් මම රුස්මි. ගෞතමයන් වහන්ස, උපධිරහිත වූ නිවන මොනොවට ප්‍රකාශ කරන ලද යැ, මෙ ලොවෙහි යම් කෙනෙක් හැම දෘෂ්ටශුද්ධිය ද ශ්‍රැතශුද්ධිය ද මුතශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද හැර පියා අනේකවිධ වූ හැම කොතුහලමඞ්ගල ශුද්ධිය ද හැරපියා තෘෂ්ණාව ත්‍රිවිධ පරිඥායෙන් පිරිසිඳ දන අනාස්‍රව වූවාහු නම් මම ද ඔහු ඔඝතරණය කළාහ යි කියමි.

**එතාභිනන්දාමි වචො මහෙසිනො** – 'එතං' යනු: මුඹ වහන්සේගේ වචනය වාක්‍යපථය දේශනාව අනුශාසනය සතුටු වෙමි, වෙසෙසින් සතුටු වෙමි, තුටු වෙමි, අනුමෝදන් වෙමි, රුස්මි, පිළිගනිමි, පතමි, කැමැති වෙමි, අභිජල්පනය කෙරෙමි, **මහෙසිනො** යනු; බුදුහු මහර්ෂිහ, මහත් වූ ශීලස්කන්ධය එෂණ–ගවෙෂණ–පයෙෂ්ෂණ කළාහු නුයි මහර්ෂිහ ... කොහි යැ දෙවියනට දෙව් වූවාහු? කොහි යැ නරශ්‍රෙෂ්ඨ වූවාහු? යයි මහර්ෂිහ නුයි 'එතාභිනන්දාමි වචො මහෙසිනො' යනු වේ.

**සුකිත්තිතං ගොතම නුපධීකං** – 'සුකිත්තිතං' යනු මොනොවට පවසන ලද, මොනොවට දෙසන ලද, මොනොවට පනවනලද, මොනොවට විවෘත කරන ලද. මොනොවට විභාග කරන ලද, මොනොවට ප්‍රකට කරන ලද, මොනොවට ප්‍රකාශ කරන ලද. **ගොතම නුපධීකං**– 'උපාධි'යි ක්ලෙශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද කියනු ලැබෙත්. උපධීනගේ ප්‍රහාණය උපධීන්ගේ සන්හිඳීම උපධින්ගේ දුරැළීම උපධීන්ගේ හැරපීම අමාමහ නිවනැ'යි 'සුකිත්තිතං ගොතම නුපධීකං' යනු වේ.

**යෙ සීධ දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං වාපි පහාය සබ්බං**– යම් කෙනෙක් තුමූ හැමදෘෂ්ටිශුද්ධීන් හැර හැරපියා වෙසෙසින් හැරපියා දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා, යම් කෙනෙක් හැම ශ්‍රැතශුද්ධීන්... යම් කෙනෙක් හැම මුතශුද්ධීන්... යම් කෙනෙක් හැම දෘෂ්ට–ශ්‍රැත – මුතශුද්ධීන් ... යම් කෙනෙක් හැම ශීලශුද්ධීන්... යම් කෙනෙක් හැම ව්‍රතශුද්ධීන්... යම් කෙනෙක් හැම ශීලව්‍රත ශුද්ධීන් හැර හැරපියා වෙසෙසින් හැර පියා දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'යෙ සීධ දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං වා පි පහාය සබ්බං' යනු වේ.

**අනෙකරූපම්පි පහාය සබ්බං**– අනේකවිධ වූ ව්‍රත කෞතුහලමඞ්ගලයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හැර හැරපියා වෙසෙසින් හැරපියා දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'අනෙකරූපම්පි පහාය සබ්බං' යනු වේ.

තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ අහම්පි තෙ ඔඝතිණ්ණොති බ්‍රූමීති: 'තණ්හා'ති: රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා. තණ්හං පරිඤ්ඤායාති: තණ්හං තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා ඤාතපරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය.

කතමා ඤාතපරිඤ්ඤා: තණ්හං ජානාති: 'අයං රූපතණ්හා, අයං සද්දතණ්හා, අයං ගන්ධතණ්හා, අයං රසතණ්හා, අයං ඵොට්ඨබ්බතණ්හා, අයං ධම්මතණ්හා'ති ජානාති[1] පස්සති, අයං ඤාතපරිඤ්ඤා.

කතමා තීරණපරිඤ්ඤා: එවං ඤාතං කත්වා තණ්හං තීරෙති අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපසග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො අලෙණතො අසරණතො අසරණීභූතතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො අඝමූලතො[2] වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො ව්‍යාධිධම්මතො මරණධම්මතො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මතො සංකිලෙසධම්මතො සමුදයතො අත්ථඞ්ගමතො අස්සාදතො[3] ආදීනවතො නිස්සරණතො තීරෙති, අයං තීරණපරිඤ්ඤා.

කතමා පහානපරිඤ්ඤා; එවං තීරයිත්වා තණ්හං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, අයං පහානපරිඤ්ඤා, තණ්හං-පරිඤ්ඤායාති: තණ්හං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා. අනාසවාති: චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො, යෙසං ඉමෙ ආසවා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවඞ්කතා[4] ආයතිං අනුප්පාදධම්මා. තෙ වුච්චන්ති අනාසවා අරහන්තො ඛීණාසවා.

තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ අහම්පි තෙ ඔඝතිණ්ණොති බ්‍රූමීති: යෙ තණ්හං පරිඤ්ඤාය අනාසවා අහම්පි තෙ කාමොඝං තිණ්ණා, භවොඝං තිණ්ණා, දිට්ඨොඝං තිණ්ණා, අවිජ්ජොඝං තිණ්ණා, සබ්බසංසාරපථං තිණ්ණා උත්තිණ්ණා නිත්තිණ්ණා අතික්කන්තා සමතික්කන්තා වීතිවත්තාති බ්‍රූමි වදාමීති 'තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ අහම්පි තෙ ඔඝතිණ්ණොති බ්‍රූමි.

තෙනාහ සො බ්‍රාහ්මණො.

"එතාභිනන්දාමි වචො මහෙසිනො
සුකිත්තිතං ගොතම නූපධීකං,
යෙසීධ දිට්ඨංව සුතං මුතං වා
සීලබ්බතං වාපි පහාය සබ්බං
අනෙකරූපම්පි පහාය සබ්බං
තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ
අහම්පි තෙ ඔඝතිණ්ණොති බ්‍රූමී"ති.

නන්ද සුත්තනිද්දෙසො සත්තමො

---

1. පජානාති – ස්‍යා.
2. අසාරතො අසමූලතො – ච, වි, ක–.
3. අසාරතො – ච, වි, ක.
4. අනභාවං කතා – ච, වි, ක.

**තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ අහමපි තෙ ඔඝතිණ්ණා' ති බ්‍රෑමි**– 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ශබ්දතෘෂ්ණා යැ ගන්ධතෘෂ්ණා යැ රස තෘෂ්ණා යැ ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යැ ධර්මතෘෂ්ණා යි. 'තණ්හං පරිඤ්ඤාය' යනු: තෘෂ්ණාව ඤාතපරිඤ්ඤා යැ තීරණ පරිඤ්ඤා යැ පහාණපරිඤ්ඤා යැ යන තුන් පරිඥායෙන් පිරිසිඳ දැන.

ඤාතපරිඤ්ඤා කවර යත්: තෘෂ්ණාව ඤාතපරිඤ්ඤායෙන් දැන ගනියි: මේ රූපතෘෂ්ණා යැ මේ ශබ්දතෘෂ්ණා යැ මේ ගන්ධතෘෂ්ණා යැ මේ රසතෘෂ්ණා යැ මේ ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යැ මේ ධර්මතෘෂ්ණා යැ යි දැනගනියි දකියි, මෝ තොමෝ ඤාතපරිඤ්ඤා යි.

තීරණපරිඤ්ඤා කවර යත්: මෙසේ දන්නා ලද කොට තෘෂ්ණාව තීරණය කෙරෙයි: අනිත්‍ය විසින් දුඃඛ විසින් රෝග විසින් ගණ්ඩ විසින් ශල්‍ය විසින් ව්‍යසන විසින් ආබාධ විසින් පර විසින් නැසෙනසුලු විසින් ඊති විසින් උවදුරු විසින් බිය විසින් උපසර්ග විසින් චල විසින් බිඳෙනසුලු විසින් අධ්‍රැව විසින් අත්‍රාණ විසින් අලෙන විසින් අසරණ විසින් අසරණීභූත විසින් රික්ත විසින් තුච්ඡ විසින් ශූන්‍ය විසින් අනාත්ම විසින් ආදීනව විසින් විපරිනාමස්වභාව විසින් අසාර විසින් අඝමූල විසින් වධක විසින් සංඛත විසින් මාරාමිෂ විසින් ජාතිස්වභාව විසින් ජරාස්වභාව විසින් ව්‍යාධිස්වභාව විසින් මරණස්වභාව විසින් සෝක–පරිදේව–දුඃඛ–දෞමනස්ස–උපායාස ස්වභාව විසින් සංක්ලෙසස්වභාව විසින් සමුදය විසින් ව්‍යය විසින් ආස්වාද විසින් ආදීනව විසින් නිස්සරණ විසින් තීරණය කෙරෙයි. මෝ තොමෝ 'තීරණපරිඤ්ඤා' යි.

පහාන පරිඤ්ඤා කවර යත්: මෙසේ තීරණය කොට තෘෂ්ණාව දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි. මෝ තොමෝ පහානපරිඤ්ඤා යි.

**තණ්හං පරිඤ්ඤාය** – තෘෂ්ණාව මේ ත්‍රිවිධ පරිඥායෙන් දැන. අනාසවා යනු: ආශ්‍රවයෝ සතර දෙනෙකි: කාමාශ්‍රව යැ භවාශ්‍රව යැ දෘෂ්ට්‍යාශ්‍රව ය අවිද්‍යාශ්‍රව යි, යම් කෙනකුන්ට මේ ආශ්‍රවයෝ ප්‍රහීණ වූවාහු උසුන්මුල් ඇත්තාහු තාලවස්තුවක් සෙයින් කරන ලද්දහු අනභාවය කරන ලද්දහු මත්තෙහි නූපදනා සැහැවි ඇත්තාහු ද ඒ අර්හත් ක්ෂීණාශ්‍රවයෝ අනාශ්‍රවයෝ යැ යි කියනු ලැබෙත්.

**තණ්හං පරිඤ්ඤාය අනාසවාසෙ අහමපි තෙ ඔඝතිණ්ණා'ති බ්‍රෑමි**- යම් කෙනෙක් තෘෂ්ණාව පිරිසිඳ දැන අනාශ්‍රව වූවාහු ද මම ද ඔහු කාමෞඝය තරණය කළාහු යැ භවෞඝය තරණය කළාහු යැ දෘෂ්ටි–ඕඝය තරණය– කළාහු යැ අවිද්‍යා–ඕඝය තරණය කළාහු යැ සියලු සංසාරපථය තරණය උත්තරණය– නිස්තරණය– අතික්‍රමණය– සමතික්‍රමණය කළාහු යැ ඉක්ම වූවාහු යැ'යි කියමි ප්‍රකාශ කෙරෙමි නුයි 'තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ අහමපි තෙ ඔඝතිණ්ණා'ති බ්‍රෑමි' යනු වෙ.

එයින් කී යැ එ බමුණු:

**"එතාභිනන්දාමි –පෙ– අහමපි තෙ ඔඝතිණ්ණා'ති බ්‍රෑමි"යි.**

**සත්වැනි තෘෂ්ණා සූත්‍රනිර්දේශය නිමි.**

# 8. හෙමක සුත්තනිද්දෙසො

## 8–1

යෙ මෙ පුබ්බෙ වියාකංසු–(ඉච්චායස්මා හෙමකො)
හුරං ගොතමසාසනා
ඉච්චාසි ඉති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං,
සබ්බං තං තක්කවඩ්ඪනං
නාහං තත්ථ අභිරමිං.

**යෙ මෙ පුබ්බෙ වියාකංසූති:** 'යෙ'ති: යො ච බාවරී බ්‍රාහ්මණො, යෙ චඤ්ඤෙ තස්ස ආචරියා, තෙ සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං ව්‍යාකංසු ආචික්ඛිංසු, දෙසයිංසු පඤ්ඤපිංසු පට්ඨපිංසු විවරිංසු විභජිංසු උත්තානීඅකංසු[1] පකාසෙසුන්ති 'යෙ මෙ පුබ්බෙ වියාකංසු; ඉච්චායස්මා හෙමකොති: –පෙ–. **හුරං ගොතමසාසනාති:** හුරං ගොතමසාසනා, පරං ගොතමසාසනා, පුරෙ ගොතමසාසනා, පඨමතරං ගොතමසාසනා බුද්ධසාසනා ජිනසාසනා තථාගතසාසනා, දෙවදෙවසාසනා,[2] අරහන්තසාසනාති 'හුරං ගොතම සාසනා'.

**ඉච්චාසි ඉති භවිස්සතීති:** එවං කිර ආසි, එවං කිර භවිස්සතීති 'ඉච්චාසි ඉති භවිස්සති'.

**සබ්බං තං ඉතිහීතිහන්ති:** සබ්බං තං ඉතිහීතිහං, ඉතිකිරාය, පරම්පරාය පිටකසම්පදාය තක්කහෙතු නයහෙතු ආකාරපරිවිතක්කෙන දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා න සාමං සයමභිඤ්ඤාතං න අත්තපච්චක්ඛධම්මං කථයිංසූති 'සබ්බං තං ඉතිහීතිහං.'

**සබ්බං තං තක්කවඩ්ඪනන්ති:** සබ්බං තං තක්කවඩ්ඪනං විතක්කවඩ්ඪනං සඞ්කප්පවඩ්ඪනං කාමවිතක්කවඩ්ඪනං ව්‍යාපාදවිතක්කවඩ්ඪනං විහිංසාවිතක්කවඩ්ඪනං ඤාතිවිතක්කවඩ්ඪනං ජනපදවිතක්කවඩ්ඪනං අමරාවිතක්කවඩ්ඪනං පරානුද්දයතා[3] පටිසංයුත්තවිතක්කවඩ්ඪනං ලාභසක්කාරසිලොකපටිසංයුත්තවිතක්කවඩ්ඪනං අනවඤ්ඤත්ති පටිසංයුත්තවිතක්කවඩ්ඪනන්ති 'සබ්බං තං තක්කවඩ්ඪනං'

1. උත්තානීමකංසු– ප.
2. දෙව දෙවසාසනා යන්න ප–ච–වි–ක– වෙත පොත්වල නැත.
3. පරානුදය– මජ්ඣං පරානුද්දය– පන

# 8. හේමක සූත්‍රනිර්දේශය

8-1.

(ආයුෂ්මත් හේමක මාණවක මෙසේ විචාරයි:) භාග්‍යවතුන්වහන්ස, පෙර (බාවරි බ්‍රාහ්මණාදි) යම් කෙනෙක් ගෞතමශාසනයෙන් පළමු 'මෙසේ වී ල' 'මෙසේ වන්නේ ල' යි (යම් දහමක්) මට ප්‍රකාශ කළාහු ද එ හැම 'මෙසේ මෙසේ යැ' යි උපන් (ඉතිහීතිහ) කථායෙක. එ හැම (කාමවිතර්කාදි) තර්ක වඩන්නාසුලු යැ. මම් එහි නො ඇලුණෙමි.

**යෙ මෙ පුබ්බෙ වියාකංසු**– 'යෙ' යනු: යම් බාවරි නම් බමුණු කෙනෙක් වෙත් ද ඔවුන්ගේ ආචාර්‍ය්‍ය වූ අන්‍ය වූ යම් කෙනෙකුත් වූහු ද ඔහු ස්වකීය දෘෂ්ටිය ස්වකීය ක්ෂාන්තිය ස්වකීය රුචිය ස්වකීය ලබ්ධිය ස්වකීය අධ්‍යාශය ස්වකීය අභිප්‍රාය **වියාකංසු**– කීහ දෙසූහ පැනැවූහ පිහිටුවූහ විවරණය කළහ විභාග කළහ ප්‍රකට කළහ ප්‍රකාශ කළ හු නුයි 'යෙ මෙ පුබ්බෙ වියාකංසු' යනු වේ. **ඉච්චායස්මා හෙමකො** යනු... **හුරං ගොතමසාසනා** යනු: ගෞතම ශාසනයෙන් පූර්වයෙහි, ගෞතම ශාසනයෙන් ඔබ්බෙහි, ගෞතමශාසනයෙන් පෙර, ගෞතම ශාසනයෙන් පළමු, බුද්ධශාසනයෙන් ජිනශාසනයෙන් තථාගතශාසනයෙන් දේවදේව ශාසනයෙන් අර්හත්ශාසනයෙන් පළමු නුයි 'හුරං ගොතමසාසනා' යනු වේ.

**ඉච්චාසි ඉති භවිස්සති** යනු: 'මෙසේ වී ල' 'මෙසේ වන්නෙ ල' නුයි 'ඉච්චාසි ඉති භවිස්සති' යනු වේ.

**සබ්බං තං ඉතිහීතිහං** යනු: ඒ හැම 'මෙසේ මෙසේ යැ'යි උපන් කථා (ඉතිහීතිහ) යෙන්, මෙසේ ල යන කථා (ඉතිකිරා) යෙන්, පරම්පරාකථා-යෙන්, පෙළ හා සම යැ යි ගන්නා පිටකසම්පදයෙන්, තර්කහේතුයෙන්, නය හේතුයෙන්, (මෙය සුන්දර යි) ආකාර සැලකීමෙන්, අප රුචි කොට ගත් දෘෂ්ටිය හා සම යි කීවාහු යැ නො ද තුමූ තමන් විසින් ස්වලක්ෂණාව බොධයෙන් දන්නා ලද්දක්, නො ද තමහට පසක් වූ දහමක් කීවාහු නුයි 'සබ්බං ත ඉතිහීතිහං' යනු වේ.

**සබ්බං තං තක්කවඩ්ඪනං** යනු: එ හැම තර්ක වඩනාසුලු යැ විතර්ක වඩනාසුලු යැ සංකල්ප වඩනාසුලු යැ කාමවිතර්ක වඩනාසුලු යැ ව්‍යාපාද විතර්ක වඩනාසුලු යැ විහිංසාවිතර්ක වඩනාසුලු යැ ඥාතිවිතර්ක වඩනාසුලු යැ ජනපදවිතර්ක වඩනාසුලු යැ අමරාවිතර්කදෘෂ්ටිය වඩනාසුලු යැ ගෙහසිත ප්‍රේමයෙන් යුක්ත විතර්ක වඩනාසුලු යැ ලාභ-සත්කාර- කීර්ති-ශබ්ද ප්‍රතිසංයුක්ත වූ විතර්ක වඩනාසුලු යැ අනවඤ්ඤත්ති (අවමන් නො ලබනු කැමැත්ත) ප්‍රතිසංයුක්ත වූ විතර්ක වඩනාසුලු නුයි 'සබ්බං තං තක්කවඩ්ඪනං' යනු වේ.

නාහං තත්ථ අභිරමින්ති නාහං තත්ථ අභිරමිං න වින්දිං[1] නාධිගච්ඡිං න පටිලභින්ති[2] 'නාහං තත්ථ අභිරමිං.'

තෙනාහ සො බ්‍රාහ්මණො;

"යෙ මෙ පුබ්බෙ වියාකංසු (ඉච්චායස්මා හෙමකො)
හුරං ගොතම සාසනා,
ඉච්චාසි ඉති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං,
සබ්බං තං තක්කවඩ්ඪනං
නාහං තත්ථ අභිරමි"න්ති

8–2

ත්වං ච මෙ ධම්මමක්ඛාහි
තණ්හා නිඝාතනං[3] මුනි,
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

ත්වං ච මෙ ධම්මමක්ඛාහීති 'ත්ව'න්ති භගවන්තං භණති. ධම්මමක්ඛාහීති 'ධම්ම'න්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං, චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්චබලානි සත්තබොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං අක්ඛාහි ආචික්ඛාහි, දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'ත්වං ච මෙ ධම්මමක්ඛාහි'

තණ්හා නිඝාතනං මුනීති තණ්හා'ති රූපතණ්හා -පෙ- ධම්මතණ්හා, තණ්හානිඝාතනං තණ්හාපහානං[4]. තණ්හාවූපසමං තණ්හාපටිනිස්සග්ගං තණ්හාපටිප්පස්සද්ධිං අමතං නිබ්බානං. මුනීති 'මොනං' වුච්චති ඤාණං. -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනීති 'තණ්හානිඝාතනං මුනි'

යං විදිත්වා සතො චරන්ති යං විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති 'සබ්බෙ ධම්මා අනත්තා'ති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති විදිතං කත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. සතොති චතූහි කාරණෙහි සතො; කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො -පෙ- සො වුච්චති සතො. චරන්ති චරන්තො විහරන්තො[5] ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තො ති යං විදිත්වා සතොචරං.'

1. රතිංනාවින්දි පත
2. රතිං නපටිලභින්ති– පත.
3. නිඝාතනං– පත.
4. තණ්හා නිපපතනං තණ්හා පහානං–ම,ච,වි,ක.
5. විචරන්තො– ච,වි,ක.

**නාහං තත්‍ථ අභිරමිං** යනු: මම එහි නො ඇලුණෙමි (එය) නො වින්දෙමි (එයට) නො පැමිණියෙමි. (එය) නො ලැබීමි නුයි 'නාහං තත්‍ථ අභිරමිං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''යෙ මෙ පුබ්බෙ -පෙ- නාහං තත්‍ථ අභිරමිං''** යි.

8–2.

මුනීන්ද්‍රයන් වහන්ස, යම් දහමක් දැන සිහි ඇති වැ හැසිරෙනුයේ ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කරන්නේ නම් එබඳු වූ, තෘෂ්ණාව වනසන දහමක් මුඹ වහන්සේ මට වදාළ මැනැව.

**ත්‍වං ච මෙ ධම්මමක්ඛාහි**– 'ත්වං' යි භාග්‍යවතුන් අමතයි. **ධම්මමක්ඛාහි**– 'ධම්මං' යනු මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ (අර්ත්ථ සම්පත්ති ආදීන්) සාර්ත්ථ වූ (ව්‍යඤ්ජන සම්පත්ති ආදීන්) සව්‍යඤ්ජන වූ සියල්ල පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචය්‍ර්‍යය, සතර සතිපට්ඨානයන් සතර සම්‍යක්ප්‍රධානයන් සතර ඍද්ධිපාදයන් පඤ්චෙන්ද්‍රියයන් පඤ්චබලයන් සප්ත බොධ්‍යඞ්ගයන් ආය්‍ර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය, නිර්වාණය හා නිර්වාණගාමිනී ප්‍රතිපදව හා, **අක්ඛාහි**– වදාළ මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවරණය කළ මැනැව විභාග කළ මැනැව ප්‍රකට කළ මැනැව ප්‍රකාශ කළ මැනැව නුයි 'ත්වං ච මෙ ධම්මමක්ඛාහි' යනු වේ.

**තණ්හානිග්ඝාතනං මුනි**– 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ... ධර්ම තෘෂ්ණා යි. **තණ්හා නිග්ඝාතනං**– තෘෂ්ණාවගේ ප්‍රහාණය තෘෂ්ණාවගේ සන්හිඳීම තෘෂ්ණාවගේ දුරලීම තෘෂ්ණාවගේ ප්‍රතිප්‍රශ්‍රබ්ධිය අමාමහනිවන මුනි යනු; 'මොන' යි ඥානය කියනු ලැබෙයි...රාගාදි සඞ්ගය හා දෘෂ්ටිජාලය ඉක්ම සිටි හේ මුනි වේ නුයි 'තණ්හා නිග්ඝාතනං මුනි, යනු වේ.

**යං විදිත්‍වා සතො චරං** යනු: යමක් දන්නා ලද කොට තුලනය කොට තීරණය කොට විභාවනය කොට ප්‍රකට කොට 'හැම සංස්කාරයෝ අනිත්‍යහ' යි විදිත කොට තුලන– තීරණ– විභාවන– විභූත කොට 'හැම සංස්කාරයෝ දුඃඛයහ'යි 'හැම ධර්මයෝ අනාත්මහ'යි......'යම් කිසි සමුදය සබභාවයෙක් වේ නම් ඒ හැම නිරොධසබභාවය ඇතැ'යි විදිත කොට තුලන– තීරණ– විභාවන–විභූත කොට. **සතො** යනු: සතර කරුණෙකින සිහි ඇතියේ කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ... හේ 'සිහි ඇතියේ' යි කියනු ලැබෙයි. චරං යනු: සරනුයේ වෙසෙනුයේ ඉරියවු පවත්වනුයේ වැටෙනුයේ පාලනය කරනුයේ යැපෙනුයේ යාපනය කරනුයේ නුයි 'යං විදිත්‍වා සතො චරං' යනු වේ.

තරෙ ලොකෙ විසත්තිකන්ති 'විසත්තිකා' වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං." විසත්තිකාති කෙනට්ඨෙන විසත්තිකා -පෙ- විසටා විත්ථතාති විසත්තිකා. ලොකෙති අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ. තරෙ ලොකෙ විසත්තිකන්ති ලොකෙ වෙසා විසත්තිකා, ලොකෙ වෙතං විසත්තිකං සතො තරෙය්‍යං උත්තරෙය්‍යං පතරෙය්‍යං සමතික්කමෙය්‍යං වීතිවත්තෙය්‍යන්ති 'තරෙ ලොකෙ විසත්තිකං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"තඤ්ච මෙ ධම්මමක්ඛාහි
තණ්හානිග්ඝාතනං[1] මුනි,
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකන්ති.

8-3

ඉධ දිට්ඨසුතමුත-
විඤ්ඤාතෙසු පියරූපෙසු (හෙමක)
ඡන්දරාගවිනොදනං
නිබ්බානපදමච්චුතං[2]

ඉධ දිට්ඨසුතමුතවිඤ්ඤාතෙසූති 'දිට්ඨ'න්ති චක්ඛුනා දිට්ඨං, සුතන්ති සොතෙන සුතං, මුතන්ති ඝානෙන ඝායිතං ජිව්හාය සායිතං, කායෙන ඵුට්ඨං, විඤ්ඤාතන්ති මනසා විඤ්ඤාතන්ති 'ඉධ දිට්ඨසුතමුතවිඤ්ඤාතෙසු.'

පියරූපෙසු හෙමකාති 'කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං: චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං, සොතං ලොකෙ පියරූපං සාතරූපං, ඝානං ලොකෙ පියරූපං සාතරූපං, ජිව්හා ලොකෙ පියරූපං සාතරූපං, කායො ලොකෙ පියරූපං සාතරූපං, මනො ලොකෙ පියරූපං සාතරූපං, රූපා ලොකෙ පියරූපං සාතරූපං, සද්දා ලොකෙ - ගන්ධා ලොකෙ - රසා ලොකෙ- ඵොට්ඨබ්බා ලොකෙ - ධම්මා ලොකෙ පියරූපං සාතරූපං, චක්ඛුවිඤ්ඤාණං ලොකෙ පියරූපං සාතරූපං, සොතවිඤ්ඤාණං ලොකෙ- ඝානවිඤ්ඤාණං ලොකෙ - ජිව්හාවිඤ්ඤාණං ලොකෙ - කායවිඤ්ඤාණං ලොකෙ- මනොවිඤ්ඤාණං ලොකෙ පියරූපං සාතරූපං. චක්ඛුසම්ඵස්සො

1. නිඝාතනං– පත
2. නිබ්බානං පරමච්චුතං– ව, වි, ක

**තරෙ ලොකෙ විසත්තිකං**– 'විසත්තිකා'යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක්... බලවත් රාගයෙක් අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **විසත්තිකා** යනු: කවර අරුතින් විසත්තිකා නම් වූ යැ යත්:... පතළා යැ විස්තෘත යැ නුයි 'විසත්තිකා නමු. **ලොකෙ** යනු: අපාය ලෝකයෙහි යැ මනුෂ්‍යලෝකයෙහි යැ දිව්‍යලෝකයෙහි යැ ස්කන්ධ ලෝකයෙහි යැ ධාතුලෝකයෙහි යැ ආයතනලෝකයෙහි යි. **තරෙ ලොකෙ විසත්තිකං** යනු: තෙල විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ලෝකයෙහි ම වෙයි. ලෝකයෙහි මැ වූ තෙල විසත්තිකාව සිහි ඇති වැ තරණය කරන්නේ යැ උත්තරණ– ප්‍රතරණ– සමතික්‍රමණ කරන්නේ යැ ඉක්ම සිටුනේ යැ නුයි 'තරෙ ලොකෙ විසත්තිකං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"තං ච මෙ –පෙ– තරෙ ලොකෙ විසත්තිකං"** යි.

8–3.

හේමක මාණවකය, මෙලොවැ රූපායතන ශබ්දායතන ගන්ධ– රස– ස්ප්‍රෂ්ටව්‍යායතන ධර්මායතන සඞ්ඛ්‍යාත වූ ප්‍රිය ස්වභාවයන්හි ඡන්දරාගය දුරු කිරීම ච්‍යුති රහිත වූ නිර්වාණපදය වෙයි.

**ඉධ දිට්ඨසුතමුතවිඤ්ඤාතෙසු**– 'දිට්ඨං' යනු: ඇසින් දක්නාලද, සුතං යනු: කනින් අසන ලද, මුතං යනු: නැහැයෙන් ආඝ්‍රාණය කරන ලද, දිවින් රස විඳුනා ලද, කයින් පහස්නාලද, විඤ්ඤාතං යනු: මනසින් දන්නා ලද නුයි 'ඉධ දිට්ඨසුතමුතවිඤ්ඤාතෙසු' යනු වේ.

**පියරූපෙසු හේමක** යනු: ලෝකයෙහි ප්‍රියස්වභාවය මධුරස්වභාවය කවර යත්: ඇස ලෝකයෙහි ප්‍රියස්වභාව ඇත්තේ යැ මධුරස්වභාව ඇත්තේ යැ, කන ලෝකයෙහි ප්‍රියස්වභාව ඇත්තේ යැ මධුරස්වභාව ඇත්තේ යැ, නැහැය ලෝකයෙහි ප්‍රියස්වභාව ඇත්තේ යැ මධුරස්වභාව ඇත්තේ යැ, දිව ලෝකයෙහි ප්‍රියස්වභාව ඇත්තේ යැ, මධුරස්වභාව ඇත්තේ යැ කය ලෝකයෙහි ප්‍රියස්වභාව ඇත්තේ යැ මධුරස්වභාව ඇත්තේ යැ, මනස ලෝකයෙහි ප්‍රියස්වභාව ඇත්තේ යැ මධුරස්වභාව ඇත්තේ යි, රූපයෝ ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යැ, ශබ්දයෝ ලෝකයෙහි– ගන්ධයෝ ලෝකයෙහි– රසයෝ ලෝකයෙහි– ස්ප්‍රෂ්ටව්‍යයෝ ලෝකයෙහි ධර්මයෝ ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුර ස්වභාව යි, චක්ෂුර්විඥානය ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යැ, ශ්‍රොත්‍රවිඥානය ලෝකයෙහි– ඝ්‍රාණවිඥානය ලෝකයෙහි– ජිහ්වා විඥානය ලෝකයෙහි– කායවිඥානය ලෝකයෙහි– මනොවිඥානය ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුර ස්වභාව යි, චක්ඛුසම්ඵස්සය

ලොකෙ පියරූපං සාතරූපං, සොත- ඝාන- ජිව්හා-කායසම්ඵස්සො ලොකෙ- මනොසම්ඵස්සො ලොකෙ පියරූපං සාතරූපං, චක්ඛුසම්ඵස්සජා වෙදනා ලොකෙ –පෙ– සොත– ඝාන–ජිව්හා –කාය- මනොසම්ඵස්සජා වෙදනා ලොකෙ පියරූපං සාතරූපං, රූපසඤ්ඤා ලොකෙ– සද්දසඤ්ඤා ලොකෙ –පෙ– ගන්ධ- රස- ඵොට්ඨබ්බ- ධම්මසඤ්ඤා ලොකෙ පියරූපං සාතරූපං, රූපසඤ්චෙතනා ලොකෙ –පෙ– සද්ද- ගන්ධ- රසඵොට්ඨබ්බ- ධම්මසඤ්චෙතනා ලොකෙ පියරූපං සාතරූපං, රූපතණ්හා ලොකෙ –සද්දතණ්හා ලොකෙ –පෙ– ගන්ධ– රස– ඵොට්ඨබ්බ– ධම්ම තණ්හා ලොකෙ පියරූපං සාතරූපං, රූපවිතක්කො ලොකෙ –පෙ– සද්ද– ගන්ධ– රස– ඵොට්ඨබ්බ- ධම්මවිතක්කො ලොකෙ පියරූපං සාතරූපං. රූපවිචාරො ලොකෙ පියරූපං සාතරූපං, සද්දවිචාරො ලොකෙ –පෙ– ගන්ධ– රස– ඵොට්ඨබ්බ– ධම්මවිචාරො ලොකෙ පියරූපං සාතරූපන්ති 'පියරූපෙසු හෙමක.'

**ඡන්දරාග විනොදනන්ති**[1] 'ඡන්දරාගො'ති "යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්දනීවරණං."

**ඡන්දරාග විනොදනන්ති** ඡන්දරාගප්පහානං ඡන්දරාගවූපසමං, ඡන්දරාගපටිනිස්සග්ගං ඡන්දරාගපටිප්පස්සද්ධිං[2] අමතං නිබ්බානන්ති 'ඡන්දරාග විනොදනං.'

**නිබ්බානපදමච්චුතන්ති** නිබ්බානපදං තාණපදං ලෙනපදං සරණපදං අභයපදං, අච්චුතන්ති නිච්චං ධුවං සස්සතං අවිපරිණාම ධම්මන්ති 'නිබ්බාන පදමච්චුතං.'

තෙනාහ භගවා:

"ඉධ දිට්ඨසුතමුත
විඤ්ඤාතෙසු පියරූපෙසු (හෙමක)
ඡන්දරාගවිනොදනං
නිබ්බානපදමච්චුත''න්ති.

---

1. ඡන්ද විනොදනන්ති– ම.
2. ඡන්දරාග පටිප්පස්සද්ධං– ම, ච, වි, ක.

ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුර ස්වභාව යැ සොත - ඝාන - ජිව්හා- කායසම්ඵස්සය ලෝකයෙහි- මනොසම්ඵස්සය ලෝකයෙහි ප්‍රිය ස්වභාව යැ මධුරස්වභාව යි, චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව ලෝකයෙහි... සොත–ඝාන...ජිව්හා– කාය– මනො සම්ඵස්සයෙන් උපන් වෙදනාව ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යි, රූපසංඥාව ලෝකයෙහි- ශබ්දසංඥාව ලෝකයෙහි- ... ගන්ධ–රස, ස්ප්‍රෂ්ටව්‍ය– ධර්මසංඥාව ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යි, රූපසඤ්චෙතනාව ලෝකයෙහි,... ශබ්ද–ගන්ධ-රස– ස්ප්‍රෂ්ටව්‍ය– ධර්මසඤ්චෙතනාව ලෝකයෙහි ප්‍රිය ස්වභාව යැ මධුරස්වභාව යි, රූපතෘෂ්ණාව ලෝකයෙහි– ශබ්දතෘෂ්ණාව ලෝකයෙහි– ...ගන්ධ–රස–ස්ප්‍රෂ්ටව්‍ය– ධර්මතෘෂ්ණාව ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුර ස්වභාව යි, රූපවිතර්කය ලෝකයෙහි ...ශබ්ද–ගන්ධ–රස–ස්ප්‍රෂ්ටව්‍ය ධර්මවිතර්කය ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යි, රූපවිචාරය ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යැ, ශබ්දවිචාරය ලෝකයෙහි... ගන්ධ–රස– ස්ප්‍රෂ්ටව්‍ය– ධර්මවිචාරය ලෝකයෙහි ප්‍රියස්වභාව යැ මධුර ස්වභාව ඇත් නු යි 'පියරූපෙසු හේමක' යනු වේ.

**ඡන්දරාගවිනොදනං**– 'ඡන්දරාගො' යනු: කාමයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියක් කාමතෘෂ්ණාවක් කාමස්නෙහයෙක් කාමපරිදහයෙක් කාමමූර්ඡායෙක් කාම විසින් ගිල අවසන් කොට ගැනීමෙක් කාම (සඞ්ඛ්‍යාත) ඕසයෙක් කාමයොගයෙක් කාමූපාදනයෙක් කාමච්ඡන්දනීවරණයෙක් වේ ද, එය යි.

**ඡන්දරාගවිනොදනං** යනු: ඡන්දරාග ප්‍රහාණ යැ ඡන්දරාගය සන්හිඳුවීම යැ ඡන්දරාගය දුරු කිරීම යැ ඡන්දරාගයා ගේ ප්‍රතිප්‍රශ්‍රබ්ධි යැ අමාමහනිවන නුයි 'ඡන්දරාගවිනොදනං' යනු වේ.

**නිබ්බානපදමච්චුතං** යනු: නිර්වාණපද යැ ත්‍රාණපද යැ ලෙන (නිලීනස්ථාන) පද යැ සරණ පද යැ අභය පද යි. අච්චුතං යනු: නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාම ස්වභාව නුයි 'නිබ්බානපදමච්චුතං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

"ඉධ දිට්ඨසුතමුත –පෙ– නිබ්බානපදමච්චුතං" යි.

8–4

එතදඤ්ඤාය යෙ සතා
දිට්ඨධම්මාභිනිබ්බුතා,
උපසන්තා ච තෙ සදා
තිණ්ණා ලොකෙ විසත්තිකං.

**එතදඤ්ඤාය යෙ සතාති:** 'එත'න්ති අමතං නිබ්බානං "යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං." අඤ්ඤායාති අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා: 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති --පෙ-- සබ්බෙ ධම්මා අනත්තාති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා' යෙති අරහන්තො ඛීණාසවා. සතාති චතූහි කාරණෙහි සතා: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවිතත්තා සතා –පෙ– තෙ වුච්චන්ති සතාති 'එතදඤ්ඤාය යෙ සතා.'.

**දිට්ඨධම්මාභිනිබ්බුතාති:** 'දිට්ඨධම්මා'ති: දිට්ඨධම්මා, ඤාතධම්මා, තුලිතධම්මා, තීරිතධම්මා, විභූතධම්මා, විභාවිතධම්මා. 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති දිට්ඨධම්මා –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති දිට්ඨධම්මා ඤාතධම්මා තුලිතධම්මා තීරිතධම්මා විභූතධම්මා විභාවිතධම්මා, අභිනිබ්බුතාති රාගස්ස නිබ්බාපිතත්තා නිබ්බුතා, දොසස්ස නිබ්බාපිතත්තා නිබ්බුතා, මොහස්ස නිබ්බාපිතත්තා නිබ්බුතා, කොධස්ස –පෙ– උපනාහස්ස –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා නිජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තා උපසන්තා වූපසන්තා නිබ්බුතා පටිප්පස්සද්ධාති 'දිට්ඨධම්මාභිනිබ්බුතා'

**උපසන්තා ච තෙ සදාති:** 'උපසන්තා'ති: රාගස්ස උපසමිතත්තා නිබ්බාපිතත්තා උපසන්තා, දොසස්ස – මොහස්ස – කොධස්ස – උපනාහස්ස – පෙ – සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා උපසමිතත්තා නිජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තා උපසන්තා වූපසන්තා නිබ්බුතා පටිප්පස්සද්ධාති 'උපසන්තා.' තෙති අරහන්තො ඛීණාසවා, සදාති සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං සතතං සමිතං අබ්බොකිණ්ණං පොඞ්ඛානුපොඞ්ඛං උදෙකොධිකජාතං අවීචි සන්තති[1] සහිතං ඵස්සිතං, පුරෙභත්තං පච්ඡාභත්තං පුරිමයාමං මජ්ඣිමයාමං පච්ඡිමයාමං කාළෙ ජුණ්හෙ වස්සෙ හෙමන්තෙ ගිම්හෙ පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙති 'උපසන්තා ච තෙ සදා.'

1. අධිවිසන්තතාති සමිතං –පත.
අවිප්ප සන්තතන්ති පහිත– කවි.
අවිච සන්තතාති ජහිත– විදහ.

8-4. ස්මෘතිමත්වූ දක්නාලද (අනිත්‍යාදි) දහම් ඇති යම් රහත් කෙනෙක් මෙල අමාමහනිවන (මාර්ගඥානයෙන්) දැන (ක්ලෙශපරිනිර්වාණයෙන් පිරිනිවියාහු) සන්හිඳුණාහු ද වෙත් නම් ඔහු හැම කල්හි ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කළාහු වෙත්.

**එතදඤ්ඤාය යෙ සතා**– 'එතං' යනු: අමාමහ නිවන යි: යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳුවීමෙක් සියලු උපධීන්ගේ හැරපීමෙක් තෘෂ්ණා ක්ෂයයෙක් විරාගයෙක් නිරොධ සඞ්ඛ්‍යාත නිවනෙක් වේ ද එය යි. **අඤ්ඤාය** යනු: දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට ප්‍රකට කොට 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි දැන දැනගෙන තුලන-තීරණ-විභාවන විභූත කොට, 'හැම සංස්කාරයෝ දුඃඛයහ'යි 'හැම ධර්මයෝ අනාත්මහ'යි ...යම් කිසි සමුදයස්වභාවයෙක් වේ නම් එ හැම නිරොධස්වභාවය ඇතැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට ප්‍රකට කොට. **යෙ** යනු: අර්හත් ක්ෂීණාස්‍රවයෝ. **සතා** යනු: සතර කරුණෙකින් සිහි ඇත්තාහු: කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වැඩූ බැවින් සිහි ඇත්තාහු... ඔහු සිහි ඇත්තාහු යයි කියනු ලැබෙත් නුයි 'එතදඤ්ඤාය යෙ සතා' යනු වේ.

**දිට්ඨධම්මාභිනිබ්බුතා**– 'දිට්ඨධම්ම' යනු: දක්නාලද දහම් ඇත්තාහු දන්නාලද දහම් ඇත්තාහු තුලනය කරනලද දහම් ඇත්තාහු තීරණය කරන ලද දහම් ඇත්තාහු ප්‍රකට කළ දහම් ඇත්තාහු විභාවන කළ දහම් ඇත්තාහු. 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි දුටු දහම් ඇත්තාහු... 'යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් ඒ හැම නිරොධස්වභාවය ඇතැ'යි දුටු දහම් ඇත්තාහු දත් දහම් ඇත්තාහු, තුලනය කළ දහම් ඇත්තාහු, තීරණය කළ දහම් ඇත්තාහු, ප්‍රකට කළ දහම් ඇත්තාහු, විභාවන කළ දහම් ඇත්තාහු. **අභිනිබ්බුතා** යනු: රාගය නිවූ බැවින් නිවියාහු, ද්වෙෂය නිවූ බැවින් නිවියාහු මොහය නිවූ බැවින් නිවියාහු, ක්‍රොධය... බද්ධවෛරය... හැම අකුශලාභිසංස්කාරයන් සන්හුන් බැවින් සන්හිඳුවන ලද වන බැවින් වෙසෙයින් සන්හිඳුවනලද වන බැවින් නිවන ලද වන බැවින් නිවුණ බැවින් පහවූ බැවින් ප්‍රතිප්‍රශ්‍රබ්ධ බැවින් ශාන්තයහ උපශාන්තයහ ව්‍යුපශාන්තයහ නිර්වෘතයහ ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ යි 'දිට්ඨධම්මාභිනිබ්බුතා' යනු වේ.

**උපසන්තා ච තෙ සදා**– 'උපසන්තා' යනු: රාගය සන්හිඳුවනලද වන බැවින් නිවනලද වන බැවින් උපශාන්ත වූවාහු. ද්වේෂය– මෝහය– ක්‍රෝධය– උපනාහය ... හැම අකුශලාභිසංස්කාරයන් සන්හුන් බැවින් සන්හිඳුවන ලද වන බැවින් උපශමනය කරන ලද වන බැවින් නිවනලද වන බැවින් නිවුණ බැවින් පහවූ බැවින් ප්‍රතිප්‍රශ්‍රබ්ධ බැවින් ශාන්තයහ උපශාන්තයහ ව්‍යුපශාන්තයහ නිර්වෘතයහ ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ යි 'උපසන්තා' යනු වේ. **තෙ** යනු: අර්හත් ක්ෂීණාස්‍රවයෝ. **සදා** යනු: හැම දවස්හි හැම කල්හි (පූර්වාහ්ණාදි) සියලු කල්හි දවසැ දවසැ අවිච්ඡින්න වැ නිරතුරු එක්වන් අව්‍යාකීර්ණ වැ පිළිවෙළින් එක් වැ දියරළක් මෙන් අවිරල වැ නො සිඳී එක් වැ පැහැසී පෙර බත පසු බත පෙරයම මැදියම පැසුම්යම අවපසැ පුරපසැ වසන්හි හිමන්හි ගිමන්හි පෙරවියෙහි මැදිවියෙහි පැසුළු වියෙහි නුයි 'උපසන්තා ච තෙ සදා' යනු වේ.

**තිණ්ණා ලොකෙ විසත්තිකන්ති:** 'විසත්තිකා' වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං, 'විසත්තිකා'ති කෙනට්ඨෙන විසත්තිකා -පෙ- විසතාවිත්ථතාති විසත්තිකා. **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙ. **තිණ්ණා ලොකෙ විසත්තිකන්ති** ලොකෙවෙසා විසත්තිකා, ලොකෙවෙතං විසත්තිකං තිණ්ණා උත්තිණ්ණා[1] නිත්තිණ්ණා අතික්කන්තා සමතික්කන්තා වීතිවත්තාති 'තිණ්ණා ලොකෙ විසත්තිකං'

තෙනාහ භගවා:

"එතදඤ්ඤාය යෙ සතා
දිට්ඨධම්මාභිනිබ්බුතා
උපසන්තා ච තෙ සදා
තිණ්ණා ලොකෙ විසත්තික"න්ති

සහගාථාපරියොසානා -පෙ- සත්ථා මෙ භගවා 'සාවකොහමස්මී'ති

**හෙමක සුත්තනිද්දෙසො සමත්තො.**

1. ඔතිණ්ණා උත්තිණ්ණං- සෙ.

**තිණ්ණා ලොකෙ විසත්තිකං**– 'විසත්තිකා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක්... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **'විසත්තිකා'** යනු කවර අරුතින් 'විසත්තිකා' නම් වූ යැ යත්: ...පතළා යැ විස්තෘත යැ නුයි විසත්තිකා නමු. **ලොකෙ** යනු: අපාය ලොකයෙහි ... ආයතනලොකයෙහි. **තිණ්ණා ලොකෙ විසත්තිකං** යනු: තෙල **විසත්තිකා** සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ලොකයෙහි ම වෙයි, ලොකයෙහිම වූ තෙල විසත්තිකාව තරණය කළාහු උත්තරණය කළාහු නිස්තරණය කළාහු ඉක්මගියාහු මොනොවට ඉක්මගියාහු වෙසෙසින් ඉක්ම සිටියාහු නුයි 'තිණ්ණා ලොකෙ විසත්තිකං යනු වේ.

එයින් වදළහ බුදුහු:

**''එතදඤ්ඤාය යෙ සතා –පෙ– තිණ්ණා ලොකෙ විසත්තිකං''** යී.

ගාථා පර්‍යවසානය හා සමග ... භාග්‍යවතුන් වහන්සේ ම ාගේ ''. ශාස්තෘහ මම ශ්‍රාවකයෙමී.''

**හේමක සූත්‍රනිර්දේශය නිමි.**

## 9. තොදෙය්‍ය සුත්තනිද්දෙසො

### 9–1

යස්මිං කාමා න වසන්ති– (ඉච්චායස්මා තොදෙය්‍යො)
තණ්හා යස්ස න විජ්ජති,
කථංකථා ච යො තිණ්ණො
විමොක්ඛො තස්ස කීදිසො[1]

**යස්මිං කාමා න වසන්තීති:** යස්මිං කාමා න වසන්ති, න සංවසන්ති න ආවසන්ති න පරිවසන්තීති 'යස්මිං කාමා න වසන්ති' ඉච්චායස්මා තොදෙය්‍යොති –පෙ–

**තණ්හා යස්ස න විජ්ජතීති:** තණ්හා යස්ස නත්ථි, න සන්ති[2] න සංවිජ්ජති නුපලබ්භති ඤාණග්ගිනා දඩ්ඪාති 'තණ්හා යස්ස න විජ්ජති'

**කථංකථා ච යො තිණ්ණොති:** කථංකථා ච යො තිණ්ණො උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තොති 'කථංකථා ච යො තිණ්ණො.'

**විමොක්ඛො තස්ස[3] කීදිසොති:** විමොක්ඛො තස්ස කීදිසො, කිං සණ්ඨිතො කිංපකාරො, කිංපටිභාගො, ඉච්ඡිතබ්බොති විමොක්ඛං පුච්ඡතීති විමොක්ඛො තස්ස කීදිසො'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"යස්මිං කාමා න වසන්ති (ඉච්චායස්මා තොදෙය්‍යො)
තණ්හා යස්ස න විජ්ජති,
කථංකථා ච යො තිණ්ණො
විමොක්ඛො තස්ස කීදිසො"ති

### 9–2

යස්මිං කාමා න වසන්ති (තොදෙය්‍යාති භගවා)
තණ්හා යස්ස න විජ්ජති,
කථංකථා ච යො තිණ්ණො
විමොක්ඛො තස්ස නාපරො,

**යස්මිං කාමා න වසන්තීති:** යස්මින්ති යස්මිං පුග්ගලෙ අරහන්තෙ ඛීණාසවෙ, 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා; වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **යස්මිං කාමා න වසන්තීති:** යස්මිං කාමා න වසන්ති, න සංවසන්ති, න ආවසන්ති, න පරිවසන්තීති 'යස්මිං කාමා න වසන්ති'. **තොදෙය්‍යාති භගවාති** –පෙ–

---

1. කිං දිසො– ක–
2. න සති– මජසං.

# 9. තෝදෙය්‍ය සූත්‍රනිර්දෙශය

## 9–1

(ආයුෂ්මත් තොදෙය්‍ය මාණවක මෙසේ විචාරයි). යමක්හු කෙරෙහි කාමයෝ නො ලගිත් ද යමක්හට තෘෂ්ණාව නැද්ද යමෙක් විචිකිත්සාවත් තරණය කෙළේ ද ඔහුගේ විමොක්ෂය කෙබඳු ද?

**යසමිං කාමා න වසනති** යනු: යමක්හු කෙරෙහි කාමයෝ (ප්‍රථමොත්පන්නදෘෂ්ටි විසින්) නො වෙසෙත් ද වැද නො වෙසෙත් ද වෙසෙයින් නො වෙසෙත් ද සර්වප්‍රකාරයෙන් නො වෙසෙත් දැ යි 'යසමිං කාමා න වසන්‌තීති' යනු වේ.

**ඉච්චායසමා තොදෙයෙයා** යනු......

**තණහා යසස න විජජති** යනු: තෘෂ්ණාව යමක්හට නැද්ද නො වේ ද විද්‍යමාන නො වේ ද නො ලැබේ ද නුවණ ගින්නෙන් දවන ලද දැ' යි 'තණ්හා යස්ස න විජ්ජති' යනු වේ.

**කථංකථා ච යො තිණෙණා** යනු: විචිකිත්සාව ද යමෙක් තරණය උත්තරණය නිස්තරණය කෙළේ ද ඉක්මගියේ ද මොනොවට ඉක්ම ගියේ ද වෙසෙසින් ඉක්ම සිටියේ දැ' යි 'කථංකථා ච යො තිණ්ණො' යනු වේ.

**විමොකෙඛා තසස කීදිසො** යනු: ඔහුගේ විමොක්ෂය කිබඳු වූයේ කුමක් වැනි වූයේ කවර ප්‍රකාර වූයේ කවර අයුරු වූයේ කැමැති වියයුත්තේ දැයි විචාරා නුයි 'විමොක්ඛො තස්ස කීදිසො' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''යසමිං කාමා න වසනති-පෙ- විමොකෙඛා තසස කීදිසො'** යි.

## 9–2.

(බුදුහු මෙසේ වදළහ: තොදෙය්‍යමාණවකය,) යමක්හු කෙරෙහි කාමයෝ නො ලගිත් ද යමක්හට තෘෂ්ණාව නැද්ද යමෙක් විචිකිත්සාවත් තරණය කෙළේ ද, ඔහට අන්‍ය විමොක්ෂයෙක් නැති.

**යසමිං කාමා න වසනති**– 'යස්මිං' යනු: අර්හත් වූ ක්ෂීණාශ්‍රව වූ යම් පුඟුලක්හු කෙරෙහි. **කාමා** යනු: උද්දාන විසින් කාම දෙකෙකි: වස්තු කාමයෝ ද ක්ලෙශ කාමයෝ දැ යි ... යස්මිං කාමා න වසන්ති යනු: යම් පුඟුලක්හු කෙරෙහි කාමයෝ නො වෙසෙත් ද නො ලගිත් ද වෙසෙයින් නො වෙසෙත් ද සර්වප්‍රකාරයෙන් නො වෙසෙත් දැ'යි 'යස්මිං කාමා න වසන්ති' යනු වේ. **තොදෙය්‍යා'ති භගවා යනු** ...

තණ්හා යස්ස න විජ්ජතීති: 'තණ්හා'ති: රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා. යස්සාති: අරහතො ඛීණාසවස්ස. තණ්හා යස්ස නවිජ්ජතීති තණ්හා යස්ස නත්ථි, න සන්ති න සංවිජ්ජති නුපලබ්භති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති 'තණ්හා යස්ස න විජ්ජති.' කථංකථා ච යො තිණ්ණොති: 'කථංකථා' වුච්චති විචිකිච්ඡා, දුක්ඛෙ කඞ්ඛා –පෙ– ඡම්භිතත්තං[1] චිත්තස්ස මනොවිලෙඛො. යොති: යො සො අරහං ඛීණාසවො. කථංකථා ච යො තිණ්ණොති කථංකථා ච යො තිණ්ණො, උත්තිණ්ණො, නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තොති 'කථංකථා ච යො තිණ්ණො.'

විමොක්ඛො තස්ස නාපරොති: නත්ථි තස්ස අපරො විමොක්ඛො, යෙන විමොක්ඛෙන විමුච්චෙය්‍ය විමුත්තො සො කතං තස්ස විමොක්ඛෙන කරණීයන්ති විමොක්ඛො තස්ස නාපරො' තෙනාහ භගවා:

''යස්මිං කාමා න වසන්ති (තොදෙය්‍යාති භගවා)
තණ්හා යස්ස න විජ්ජති,
කථංකථා ච යො තිණ්ණො
විමොක්ඛො තස්ස නාපරොති:

9–3

නිරාසසො යො[2] උද ආසසානො
පඤ්ඤාණවා සො උද පඤ්ඤකප්පී,
මුනිං අහං සක්ක යථා විජඤ්ඤං
තං මෙ වියාචික්ඛ සමන්තචක්ඛු.

නිරාසසො සො උද ආසසානොති නිත්තණ්හො[3] සො උදාහු සතණ්හො, රූපෙ ආසිංසති[4] සද්දෙ- ගන්ධෙ- රසෙ- ඵොට්ඨබ්බෙ- කුලං- ගණං- ආවාසලාභං යසං පසංසං- සුඛං- චීවරං- පිණ්ඩපාතං- සෙනාසනං- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං- කාමධාතුං- රූපධාතුං- අරූපධාතුං- කාමභවං- රූපභවං- අරූපභවං- සඤ්ඤාභවං- නෙවසඤ්ඤානාසඤ්ඤාභවං- එකවොකාරභවං- චතුවොකාරභවං- අසඤ්ඤභවං පඤ්චවොකාරභවං- අතීතං අනාගතං පච්චුප්පන්නං- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ ආසිංසති[4] ඉච්ඡති සාදියති පත්ථෙති පිහෙති අභිජප්පතීති 'නිරාසසො සො උද ආසසානො.,

1. ඡම්භිතත්තං- මජසං.
2. නිරාසසො යො- සජා.
නිරාස යො සො- වි.
3. නී තණ්හො- ච, වි, ක.
4. ආසීසති- ච, වි, ක, මජසං.

**තණ්හා යස්ස න විජ්ජති** 'තණ්හා' යනු: රූප තෘෂ්ණා යැ ශබ්දතෘෂ්ණා යැ ගන්ධතෘෂ්ණා යැ රසතෘෂ්ණා යැ ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යැ ධර්මතෘෂ්ණා යි. **යස්ස** යනු: අර්හත් ක්ෂීණාස්‍රවහට. **තණ්හා යස්ස න විජ්ජති** යනු: තෘෂ්ණා ව යමක්හට නැද්ද නො වේ ද විද්‍යමාන නො වේ ද නො ලැබේ ද ප්‍රහීණ ද මුලුසුන් කරන ලද ද සන්හිඳුණි ද ප්‍රතිප්‍රශ්‍රබ්ධ ද යළි උපදනට නො තිසි වූ ද නුවණ ගින්නෙන් දවන ලද දැ'යි 'තණ්හා යස්ස න විජ්ජති' යනු වේ.

**කථඞ්කථා ච යො තිණ්ණො**– 'කථඞ්කථා' යි විචිකිත්සාව කියනු ලැබෙයි: දුඃඛසත්‍යයෙහි සැක යැ ... චිත්තයාගේ තද බව යැ මනොවිලෙඛය (සිත හිරිගැසීම) යි. **යො** යනු: යම් අර්හත් ක්ෂීණාස්‍රව කෙනෙක්. **කථඞ්කථා ච යො තිණ්ණො** යනු: යමෙක් විචිකිත්සාවත් තරණය උත් තරණය නිස්තරණය කෙළේ ද ඉක්මවී ද මොනොවට ඉක්මවී ද වෙසෙසින් ඉක්ම සිටියේ දැ'යි 'කථඞ්කථා ච යො තිණ්ණො' යනු වේ.

**විමොක්ඛො තස්ස නාපරො** යනු: යම් විමොක්ෂයෙකින් විමුක්ත වන්නේ නම් එබඳු අන් විමොක්ෂයෙක් ඔහට නැති. හේ විමුක්ත යැ ඔහු විසින් විමොක්ෂයෙන කටයුතු කරන ලද නුයි 'විමොක්ඛො තස්ස නාපරො' යනු වේ.

එයින් වදළාහ බුදුහු:

**''යස්මිං කාමා –පෙ– විමොක්ඛො තස්ස නාපරො''** යි.

9–3.

ඒ මුනි තෙම තෘෂ්ණා රහිත වූයේ ද නොහොත් තෘෂ්ණා සහිත වූයේ ද, හේ ප්‍රඥා ඇතියේ ද නොහොත් (සමාපත්ති ආදි) ඥානයෙන් තෘෂ්ණා කල්ප දෘෂ්ටි කල්ප කරනුයේ ද, ශාක්‍යයන් වහන්ස, යම්සේ මම මුනිහු දනගන්නෙම් නම් සමන්තචක්ඛු වූ භාග්‍යවතුන් වහන්ස, එසෙයින් එ කරුණ මට ප්‍රකාශ කළ මැනැව.

**නිරාසසො සො උද ආසසානො** යනු: හෙතෙම තෘෂ්ණා රහිත වූයේ ද නොහොත් තෘෂ්ණා සහිත වූයේ ද රූපාලම්බනයන් ප්‍රාර්ථනා කෙරේ ද, ශබ්දලම්බනයන්–ගන්ධාලම්බනයන්–රසාලම්බනයන්–ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයන්– කුලය– ගණය– ආවාසය– ලාභය– යසස– ප්‍රශංසාව– සුඛය– සිවුරු– පිඩුවා– සෙනසුන්– ගිලන්පසබෙහෙසත් පිරිකර– කාමධාතුව– රූපධාතුව– අරූපධාතුව- කාමභවය– රූපභවය– අරූපභවය– සංඥාභවය– අසංඥාභවය නෛවසංඥානාසංඥාභවය– එකවොකාරභවය– චතුවොකාරභවය- පඤ්චවොකාරභවය– අතීතකාලය– අනාගතකාලය– වර්තමානකාලය– දෘෂ්ට ශ්‍රැත මුත විඥාතව්‍ය ධර්මයන් ප්‍රාර්ථනා කෙරේ ද ඉස්නේ ද ආස්වාද කෙරේ ද පතා ද රුස්නේ ද තෘප්ති උපදවා දැ' යි 'නිරාසසො සො උද ආසසානො' යනු වේ.

පඤ්ඤාණවා සො උදපඤ්ඤකප්පී'ති: 'පඤ්ඤාණවා සො'ති: පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. උද පඤ්ඤකප්පීති: උදහු අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා මිච්ඡාඤාණෙන වා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා කප්පෙති, ජනෙති සංජනෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙතීති 'පඤ්ඤාණවා සො උද පඤ්ඤකප්පී.'

මුනිං අහං සක්ක යථා විජඤ්ඤන්ති: 'සක්කා'ති සක්කො භගවා, සක්‍යකුලා පබ්බජිතො තිපි සක්කො. අථවා අඩ්ඪො මහද්ධනො ධනවාතිපි සක්කො, තස්සිමානි ධනානි, සෙය්‍යථීදං: සද්ධාධනං සීලධනං හිරිධනං ඔත්තප්පධනං සුතධනං චාගධනං පඤ්ඤාධනං සතිපට්ඨානධනං සම්මප්පධානධනං ඉද්ධිපාදධනං ඉන්ද්‍රියධනං බලධනං බොජ්ඣඞ්ගධනං මග්ගධනං ඵලධනං නිබ්බානධනන්ති. තෙහි අනෙකවිධෙහි ධනරතනෙහි අඩ්ඪො මහද්ධනො ධනවාතිපි සක්කො. අථවා පහු විසවී අලමත්තො සූරො වීරො වික්කන්තො අභීරු අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසොතිපි සක්කො. මුනිං අහං සක්ක යථා විජඤ්ඤන්ති: සක්ක, යථා අහං මුනිං ජානෙය්‍යං ආජානෙය්‍යං විජානෙය්‍යං පටිවිජානෙය්‍යං පටිවිජ්ඣෙය්‍යන්ති 'මුනිං අහං සක්ක යථා විජඤ්ඤං'.

තං මෙ වියාචික්ඛ සමන්තචක්ඛූති: 'තං'ති: යං පුච්ඡාමි, යං යාචාමි, යං අජ්ඣෙසාමි, යං පසාදෙමි. වියාචික්ඛාති: ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහි. සමන්තචක්ඛූති: 'සමන්තචක්ඛු' වුච්චති සබ්බඤ්ඤුතඤාණං -පෙ- තථාගතො තෙන සමන්තචක්ඛූති 'තං මෙ වියාචික්ඛ සමන්තචක්ඛු.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"නිරාසසො සො උද ආසසානො
පඤ්ඤාණවා සො උද පඤ්ඤකප්පී,[1]
මුනිං අහං සක්ක යථා විජඤ්ඤං
තං මෙ වියාචික්ඛ සමන්තචක්ඛූති.

1. උද සඤ්ඤකප්පී- පන.

**පඤ්ඤාණවා සො උද පඤ්ඤකප්පී**– ‘පඤ්ඤාණවා සො’ යනු: පණ්ඩිත වූයේ ප්‍රඥා ඇතියේ බුද්ධිමත් වූයේ නුවණැත්තේ විභාවන (ප්‍රකට) ප්‍රඥා ඇත්තේ ධාරණ ප්‍රඥා ඇත්තේ ද? උද පඤ්ඤකප්පී යනු: නොහොත් අෂ්ටසමාපත්ති ඥානයෙන් වේවයි පඤ්චාභිඥා ඥානයෙන් වේවයි මිථ්‍යා ඥානයෙන් වේවයි තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ කෙරේ ද උපදවා ද මොනොවට උපදවා ද නිපදවා ද වෙසෙසින් නිපදවා’ද යි ‘පඤ්ඤාණවා සො උද පඤ්ඤකප්පී’ යනු වේ.

**මුනිං අහං සකක යථා විජඤ්ඤං** – ‘සක්ක’ යනු: බුදුහු ශාක්‍යයහ. ‘සැහැ කුලයෙන් නික්ම පැවිදි වූහ’ යි ද ශාක්‍යයහ. නොහොත් ආඪ්‍යයහ මහද්ධන ඇතියහ ධනවත්හ’යි ද ශාක්‍යයහ. උන් වහන්සේට මේ ධනයෝ වෙති, හෙ මෙසේ යැ: ශ්‍රද්ධා ධන යැ ශීලධන යැ හිරිධන යැ ඔත්තප්පධන යැ ශ්‍රැතධන යැ ත්‍යාගධන යැ ප්‍රඥාධන යැ සතිපට්ඨානධන යැ සම්‍යක් ප්‍රධාන ධන යැ ඍද්ධිපාද ධන යැ ඉන්ද්‍රියධන යැ බලධන යැ බොධ්‍යඞ්ගධන යැ මාර්ගධන යැ ඵලධන යැ නිර්වාණ ධන යැ යි. ඒ අනේකවිධ වූ ධනරත්නයන් ගෙන් ආඪ්‍යයහ මහද්ධන ඇතියහ ධනවත්හ’යි ද ශාක්‍යයහ. නොහොත් ප්‍රභූහ, පරසන්තානයෙහි වීයඞීය උපදනුවහ සමර්ථ සිත් ඇතියහ ශූරයහ වීරයහ වික්‍රමවත්හ නො බියසුල්ලහ නො තැතිගන්නාසුල්ලහ උද්වෙග රහිතය හ පලා නො යන සුල්ලහ පහවූ බිය හා බිය අරමුණු ඇතියහ පහවූ ලොමුදහගැනුම් ඇත්තාහ යි ද ශාක්‍යයහ. **මුනිං අහං සකක යථා විජඤ්ඤං** යනු: ශාක්‍යයන් වහන්ස, යම් සේ මම දැනගන්නෙම් ද වෙසෙසින් දැන ගන්නෙම් ද ප්‍රකර්ෂයෙන් දැනගන්නෙම් ද මොනොවට දැනගන්නෙම් ද ප්‍රතිවෙධ කරන්නෙම් ද’ යි ‘මුනිං අහං සක්ක යථා විජඤ්ඤං’ යනු වේ.

**තං මෙ වියාචිකඛ සමන්තචකඛු**– ‘තං’ යනු: යමක්හු විචාරම් ද යමක්හු ගැන අයදිම් ද යමක්හු ගැන අධ්‍යෂණ කෙරෙම්ද යමක්හු ගැන පහදවම් ද ඔහු. **වියාචිකඛ** යනු: වදළ මැනව දෙසුව මැනැව පැනැවූව මැනව පිහිටුව මැනැව පහළ කළ මැනැව විභාග කළ මැනැව ප්‍රකට කළ මැනැව පැවැසුව මැනැව. **සමන්තචක්ඛු** යනු: ‘සමන්තචක්ඛු’ යි සර්වඥතා ඥානය කියනු ලැබෙයි... එයින් තථාගත සමන්තචක්ඛු වෙ නුයි ‘තං මෙ වියාචික්ඛ සමන්තචක්ඛු’ යනු වේ.

**එයින් කී යැ එ බමුණු:**

**“නිරාසයො සො –පෙ– තං මෙ වියාචික්ඛසමන්තචකඛු”යි.**

9–4

නිරාසසො සො න සො[1] ආසසානො
පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පී,
එවම්පි තොදෙය්‍ය, මුනිං විජාන
අකිඤ්චනං කාමභවෙ අසත්තං.

**නිරාසසො සො න සො ආසසානොති:** නිත්තණ්හා සො න යො සතණ්හා සො රූපෙ නාසිංසති[2] සද්දෙ- ගන්ධෙ- -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ නාසිංසති[1] න ඉච්ඡති න[2] සාදියති න පත්ථෙති න පිහෙති නාභිජප්පතීති 'නිරාසසො සො න සො ආසසානො.[3]

**පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පීති[3]** 'පඤ්ඤාණවා'ති පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. න ච පඤ්ඤකප්පීති අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා මිච්ඡාඤාණෙන වා තණ්හාකප්පං වා න කප්පෙති, දිට්ඨිකප්පං වා න කප්පෙති, න ජනෙති, න සංජනෙති, න නිබ්බත්තෙති, නාභිනිබ්බත්තෙතීති 'පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පී.,

**එවම්පි තොදෙය්‍ය මුනිං විජානාති:** 'මුනී'ති: 'මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි. එවම්පි තොදෙය්‍ය මුනිං විජානාති තොදෙය්‍ය එවං මුනිං ජාන, පටිජාන පටිවිජාන පටිවිජ්ඣාති 'එවම්පි තොදෙය්‍ය මුනිං විජාන'.

**අකිඤ්චනං කාමභවෙ අසත්තන්ති:** 'අකිඤ්චන'න්ති: රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙසකිඤ්චනං දුච්චරිතකිඤ්චනං, යස්සෙතානි කිඤ්චනානි[4] පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිපස්සද්ධානි, අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි සො වුච්චති අකිඤ්චනො. කාමාති උද්දානතො ද්වෙ කාමා වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. භවාති ද්වෙ භවා කම්මභවො ච පටිසන්ධිකො ච පුනබ්භවො -පෙ- අයං පටිසන්ධිකො පුනබ්භවො.

---

1. න ච- මජසං
2. නා සිසති- ච, චි, ක. මජසං.
3. පඤ්ඤකප්පීති- පන.
4. එතෙ කිඤ්චනා- සතා.

9–4.

ඒ මුනි තෙම තෘෂ්ණා රහිත වෙයි, හේ තෘෂ්ණා සහිත වූයේ නො වෙයි. හේ ප්‍රඥා ඇත්තේ යැ නො ද (සමාපත්ති ආදි) ඥානයෙන් තෘෂ්ණාකල්ප දෘෂ්ටිකල්ප කරනුයේ වෙයි. තොදෙය්‍යමාණවකය, මෙසේ (තෙපි) කාමයෙහි ද භවයෙහි ද නො ඇලුණු පලිගෙධ නැතියහු 'මුනි' යැ යි දනගනුව' යි.

**නිරාසසො සො න සො ආසසානො** යනු: හෙතෙම තෘෂ්ණා නැත්තේ යැ හෙතෙම තෘෂ්ණා සහිත නො වෙයි. හෙතෙම රූපාලම්බනයන් (ඡන්දරාග වශයෙන්) ප්‍රාර්ථනා නො කෙරෙයි ශබ්දලම්බනයන් ගන්ධාලම්බනයන්...දෘෂ්ට ශ්‍රුතමුත විඥාතව්‍ය ධර්මයන් ප්‍රාර්ථනා නො කෙරෙයි නො කැමැති වෙයි ආස්වාද නො කෙරෙයි නො පතයි රුචි නො කෙරෙයි අභිජල්පන නො කෙරේ නුයි 'නිරාසසො සො න සො ආසසානො' යනු වේ.

**පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පී**– 'පඤ්ඤාණවා' යනු: පණ්ඩිත යැ ප්‍රඥා ඇත්තේ යැ බුද්ධිමත් යැ නැණැත්තේ යැ විමසන නුවණැත්තේ යැ තුලනප්‍රඥා ඇත්තේ යැ. **න ච සො පඤ්ඤකප්පී** යනු: අෂ්ටසමාපත්ති ඥානයෙන් වේවයි පඤ්චාභිඥ ඥානයෙන් වේවයි මිථ්‍යා ඥානයෙන් වේවයි තෘෂ්ණාකල්පයක් හෝ නො කෙරෙයි දෘෂ්ටිකල්පයක් හෝ නො කෙරෙයි නුපදවයි මොනොවට නුපදවයි නො නිපදවයි වෙසෙසින් නුපදවා නුයි 'පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පී' යනු වේ.

**එවම්පි තොදෙය්‍ය මුනිං විජාන**– 'මුනි' යනු: 'මොන' යයි ඥානය කියනු ලැබෙයි... රාගාදි සඞ්ගය **හා** තෘෂ්ණාදෘෂ්ටිජාලය ඉක්මසිටි හෙතෙම මුනි නම් වේ. **එවම්පි තොදෙය්‍ය මුනිං විජාන** යනු: තෝදෙය්‍ය මාණවකය, මෙසෙයින් මුනිහු දනගනුව පිණිස ගනුව වෙසෙසින් දනගනුව ප්‍රතිවෙධ කරව යි 'එවම්පි තොදෙය්‍ය මුනිං විජාන' යනු වේ.

**අකිඤ්චනං කාමභවෙ අසත්තං**– 'අකිඤ්චනං' යනු: රාගකිඤ්චන (පලිබොධ) යැ දෙසකිඤ්චන යැ මොහකිඤ්චන යැ මානකිඤ්චන යැ දිට්ඨිකිඤ්චන යැ කිලෙසකිඤ්චන යැ දුච්චරිතකිඤ්චන යි. යමක්හට මේ කිඤ්චනයෝ ප්‍රහීණ වූව හු ද උඳුන්මුල් ඇත්තාහු ද සන්හිඳුණාහු ද ප්‍රතිප්‍රශ්‍රබ්ධ ද යලි උපදනට නොහැකි වූවාහු ද නුවණ ගින්නෙන් දවුණා හු ද හෙතෙම 'අකිඤ්චන' යි කියනු ලැබෙයි. **කාමා** යනු: උද්දාන විසින් කාම දෙකෙකි; වස්තුකාමයෝ ද ක්ලේශ කාමයෝ ද යි ...මොහු වස්තුකාමයෝ යි කියනු ලැබෙති ...මොහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත්. **භවා** යනු: කර්මභවය ද ප්‍රතිසන්ධි ඇති පුනර්භවය ද යි භව දෙකෙකි.... මේ ප්‍රතිසන්ධි ඇති පුනර්භවය වේ.

අකිඤ්චනං කාමභවෙ අසත්තන්ති: අකිඤ්චනං පුග්ගලං කාමෙ ච භවෙ ච අසත්තං අලග්ගං[1] අලග්ගිතං අපලිබුද්ධං නික්ඛන්තං නිස්සටං විප්පමුත්තං විසංයුත්තං විමරියාදිකතෙන චෙතසා විහරන්තන්ති 'අකිඤ්චනං කාමභවෙ අසත්තං.'

තෙනාහ භගවා;

"නිරාසසො සො න සො ආසසානො
පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පී
එවම්පි තොදෙය්‍ය මුනිං විජාන
අකිඤ්චනං කාමභවෙ අසත්ත"න්ති.

සහ ගාථාපරියොසානා -පෙ- සත්ථා මෙ භන්තෙ භගවා සාවකො හමස්මීති.

තොදෙය්‍ය සුත්තනිද්දෙසො සමත්තො.

1. අලග්ගිකං-පත

**අකිඤ්චනං කාමභවෙ අසත්තං** යනු: කාමයෙහි ද භවයෙහි ද නො ඇලුණු නො ලැගුණු නො ලග්න.ලද පලිබොධ නැති (එයින්) නික්මුණු බැහැරවූ මිදුණු පහවූ සංයොග ඇති විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වාසය කරන්නා වූ අකිඤ්චන පුද්ගලයා තුයි 'අකිඤ්චනං කාමභවෙ අසත්තං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**''නිරාසසො සො –පෙ– අකිඤ්චනං කාමභවෙ අසත්තං''** යි.

ගාථා පර්‍යවසානය හා සමග ...වහන්ස, භාග්‍යවත්හු මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවකයෙමි.

**තෝදෙය්‍ය සූත්‍රනිර්දේශය නිමි.**

## 10. කප්ප සුත්තනිද්දෙසො.

10-1

මජ්ඣෙ සරස්මිං තිට්ඨතං (ඉච්චායස්මා කප්පො)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ,
ජරාමච්චුපරෙතානං
දීපං පබ්‍රූහි මාරිස
ත්වඤ්ච මෙ දීප[1] මක්ඛාහි
යථයිදං නාපරං සියා.

මජ්ඣෙ සරස්මිං තිට්ඨතන්ති: 'සරො' වුච්චති සංසාරො. ආගමනං ගමනං ගමනාගමනං කාලං ගති භවාභවො චුති ච උපපත්ති ච නිබ්බත්ති ච භෙදො ච[2] ජාති ච ජරා ච මරණං ච. සංසාරස්ස පුරිමා[3] කොටි න පඤ්ඤායති, පච්ඡිමාපි කොටි න පඤ්ඤායති, මජ්ඣෙව සංසාරෙ[4] සත්තා ඨිතා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා.

කථං සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති: එත්තකා ජාතියො වට්ටං වත්ති[5], තතො පරං න වත්තතීති[6] හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි ජාතිසතානි වට්ටං වත්ති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි ජාතිසහස්සානි වට්ටං වත්ති, තතො පරං න වත්තතීති. හෙවං නත්ථි, එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි ජාතිසතසහස්සානි වට්ටං වත්ති. තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකා ජාති කොටියො වට්ටං වත්ති. තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි ජාතිකොටිසතානි වට්ටං වත්ති තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි ජාතිකොටිසහස්සානි වට්ටං වත්ති තතොපරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති එත්තකානි ජාතිකොටිසතසහස්සානි වට්ටං වත්ති තතොපරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි වස්සානි වට්ටං වත්ති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි.

---

1. දිසං – ච, වි, ක.
2. නිරොධො ච – ච, වි, ක.
3. පුරිමාපි – මජ්සං.
4. මජ්ඣෙ ච – සයා.
5. වට්ටං වට්ටති – ස
   වට්ටං වත්තති – වි.
6. වත්තතීති – මජ්සං, ස.
   වත්තති – සයා.

# 10. කප්ප සූත්‍රනිර්දේශය

## 10–1

(ආයුෂ්මත් කප්පමාණවක මෙසේ විචාරයි:) ඍිදූකාණන් වහන්ස, (පෙර-අපර කෙළවර රහිත බැවින්) මධ්‍ය වූ සංසාරයෙහි සිටුනා වූ ජරායෙන් හා මරණයෙන් හා මඩනාලද්දවුනට (ජාත්‍යාදි) මහද්භය ඇති (සැමාදි) ඔසය උපන් කල්හි ප්‍රතිෂ්ඨාව වදළ මැනැව. මුඹ වහන්සේ වැළිත් යම්සේ මෙදුක යළි නො වන්නේ නම් එසෙයින් මට ප්‍රතිෂ්ඨාව වදළ මැනැවි.

මජ්ඣෙ සරස්මිං තිට්ඨතං– 'සරො' යි සංසාරය කියනු ලැබෙයි, පෙර භවයෙන් මෙහි ඊම මෙයින් පරලොවට යෑම භවයෙන් භවයට යෑමඊම මරණය නිපැත්ම භවයෙන් භවය ච්‍යුතිය ද උපප්‍රාප්තිය ද නිපැත්ම ද ස්කන්ධයන්ගේ භේදය ද ඉපදීම ද දිරීම ද මරණය ද යි සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි, පශ්චිම කෙළවර ද නො පැනෙයි, මැද සසර සත්ත්වයෝ සිටියාහු යැ පිහිටියාහු යැ ඇලුණාහු යැ එළැඹියාහු යැ බැසැ ගත්තාහු යැ අධිමුක්තයහ.

කිසෙයින් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනේ ද යත්: මෙතෙක් ජාතීන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ (විද්‍යමාන) නො වෙයි. මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් ජාතිශතයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි. මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් ජාතිසහස්‍රයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් ජාති කෝටීන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් ජාතිකෝටිශතයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් ජාතිකෝටිසහස්‍රයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු (මුළුල්ලෙහි) සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි,

එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි වස්සසතානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි වස්සසහස්සානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි වස්සසතසහස්සානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකා වස්සකොටියො වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි වස්සකොටිසතානි වට්ටං වත්තති තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි වස්සකොටිසහස්සානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි වස්සකොටිසතසහස්සානි වට්ටං වත්තති තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි කප්පානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි කප්පසතානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි කප්පසහස්සානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි කප්පසතසහස්සානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකා කප්පකොටියො වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. එත්තකානි කප්පකොටිසතානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති, හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති, එත්තකානි කප්පකොටිසහස්සානි වට්ටං වත්තති, තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති, එත්තකානි කප්පකොටිසතසහස්සානි වට්ටං වත්තති. තතො පරං න වත්තතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. වුත්තං හෙතං භගවතා:

“අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. එවං දීඝරත්තං බො භික්ඛවෙ, දුක්ඛං පච්චනුභූතං තිප්පං පච්චනුභූතං බ්‍යසනං පච්චනුභූතං කටසී වඩ්ඪිතා,[1] යාවඤ්චිදං භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං ති. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති.

1. වඩ්ඪිතං—සක

මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු සියයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු දහසුන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු සියදහසුන් සසර පැවැත්තේ ය එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු කෙළගණන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු කෙළසියයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේ ත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු කෙළදහසුන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නොවෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් හවුරුදු කෙළ සියදහසුන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් කප් මුළුල්ලෙහි සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් කප් සියයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් කප් දහසුන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි. මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් කප්සියදහසුන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැයි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් කප්කෙළගණන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි. මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි මෙතෙක් කප්කෙළසියයන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරය ගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් කප්කෙළදහසුන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි. මෙතෙක් කප්කෙළසියදහසුන් සසර පැවැත්තේ යැ එයින් මතු නො පැවැත්තේ යැ යි මෙසේ නො වෙයි, මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනේ.

මේ වදාරනලද මැ යි බුදුන් විසින්:

"මහණෙනි, අවිද්‍යායෙන් ඇවුරුණු තෘෂ්ණා සඞ්ඛ්‍යාත සංයෝජන ඇති (කාමධාතුයෙහි) පුනපුනා දිවෙන (රූපාරූපධාතුයෙහි) හැසිරෙන සත්ත්වයන්ගේ මෙ සසර අනවරාග්‍ර (නො දත් කෙළවර ඇති) වෙයි, පූර්ව කෙළවර නො පැනෙයි. මහණෙනි, මෙසේ දිඝකලක් මුළුල්ලෙහි (කායික චෛතසික) දුක් අනුභව කරනලද, කටුක දුක් අනුභව කරනලද, වනස් අනුභව කරන ලද. සොහොන් වඩනලද. මහණෙනි, යම් පමණ සංස්කාරයෝ වෙත් ද, එ හැම සංස්කාරයන්හි උකටලී වන්නට වටනේ මැ යැ, විරක්ත වන්නට නිස්ස, විමුක්ත වන්නට නිස්සැ යි මෙසේත් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනේ.

කථං සංසාරස්ස පච්ඡිමා කොටි න පඤ්ඤායති: එත්තකා ජාතියො වට්ටං වත්තිස්සති, තතො පරං න වත්තිස්සතීති හෙවං නත්ථි. එවම්පි සංසාරස්ස පච්ඡිමා කොටි න පඤ්ඤායති, එත්තකානි ජාතිසතානි– එත්තකානි ජාතිසහස්සානි – එත්තකානි ජාතිසතසහස්සානි –පෙ– එත්තකා ජාතිකොටියො එත්තකානි ජාතිකොටිසතානි එත්තකානි ජාතිකොටිසහස්සානි– එත්තකානි ජාතිකොටිසතසහස්සානි,– එත්තකානි වස්සානි– එත්තකානි වස්සසතානි– එත්තකානි වස්සසහස්සානි– එත්තකානි වස්සසතසහස්සානි– එත්තකා වස්සකොටියො – එත්තකානි වස්සකොටිසතානි– එත්තකානි වස්සකොටිසහස්සානි– එත්තකානි වස්සකොටිසතසහස්සානි– එත්තකානි කප්පානි– එත්තකානි කප්පසතානි– එත්තකානි කප්පසහස්සානි– එත්තකානි– කප්පසතසහස්සානි එත්තකා කප්පකොටියො–එත්තකානි කප්පකොටිසතානි– එත්තකානි කප්පකොටිසහස්සානි– එත්තකානි කප්පකොටිසතසහස්සානි වට්ටං වත්තිස්සති, තතො පරං න වත්තිස්සතීති හෙවං නත්ථි, එවම්පි සංසාරස්ස පච්ඡිමා කොටි න පඤ්ඤායති. එවම්පි සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති පච්ඡිමාපි කොටි න පඤ්ඤායති. මජ්ඣෙව සංසාරෙ සත්තා ඨිතා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති 'මජ්ඣෙ සරස්මිං තිට්ඨතං.' ඉච්චායස්මා කප්පො –පෙ–

**ඔඝෙ ජාතෙ මහබ්භයෙති:** කාමොඝෙ භවොඝෙ දිට්ඨොඝෙ අවිජ්ජොඝෙ ජාතෙ සංජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙ. **මහබ්භයෙති:** ජාතිභයෙ ජරාභයෙ ව්‍යාධිභයෙ මරණභයෙති 'ඔඝෙ ජාතෙ මහබ්භයෙ'

**ජරාමච්චුපරෙතානන්ති:** ජරාය ඵුට්ඨානං පරෙතානං, සමොහිතානං සමන්නාගතානං මච්චුනා ඵුට්ඨානං පරෙතානං සමොහිතානං සමන්නාගතානං ජාතියා අනුගතානං ජරාය අනුසටානං බ්‍යාධිනා අභිභූතානං මරණෙන අබ්භාහතානං අතාණානං අලෙනානං අසරණානං අසරණීභූතානන්ති 'ජරාමච්චුපරෙතානං.'

**දීපං පබ්‍රූහි මාරිසාති:** දීපං තාණං ලෙණං සරණං ගතිං පරායනං බ්‍රූහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානී කරොහි පකාසෙහි. **මාරිසාති:** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං මාරිසා'ති 'දීපං[1] පබ්‍රූහි මාරිස.'

1. දිසං පබ්‍රූහි– ච, වි, ක.
දීසං. – ච, වි, ක.

කිංසෙයින් සංසාරයාගේ පශ්චිම කෙළවර නො පැනේ ද යත්: මෙතෙක් ජාතීන් සසර පවත්නේ යැ, එයින් මතු නො පවත්නේ යැ යි මෙසේ නැති. මෙසේත් සංසාරයාගේ පශ්චිම කෙළවර නො පැනෙයි. මෙතෙක් ජාතිශතයන්– මෙතෙක් ජාතිසහස්‍රයන්– මෙතෙක් ජාතිශතසහස්‍රයන්– මෙතෙක් ජාතිකෝටීන්– මෙතෙක් ජාතිකෝටිශතයන්– මෙතෙක් ජාති කෝටිසහස්‍රයන්– මෙතෙක් ජාතිකෝටිශතසහස්‍රයන්, මෙතෙක් වර්ෂයන්– මෙතෙක් වර්ෂශතයන්– මෙතෙක් වර්ෂසහස්‍රයන්– මෙතෙක් වර්ෂශත සහස්‍රයන්– මෙතෙක් වර්ෂකොටීන්– මෙතෙක් වර්ෂකොටිශතයන්– මෙතෙක් වර්ෂ කොටි සහස්‍රයන්– මෙතෙක් වර්ෂකොටිශතසහස්‍රයන්- මෙතෙක් කල්පයන්– මෙතෙක් කල්පශතයන්– මෙතෙක් කල්පසහස්‍රයන්– මෙතෙක් කල්පශතසහස්‍රයන්– මෙතෙක් කල්පකොටීන්- මෙතෙක් කල්පකොටිශතයන්- මෙතෙක් කල්පකොටිසහස්‍රයන්– මෙතෙක් කල්පකොටිශතසහස්‍රයන් මුළුල්ලෙහි සසර පවත්නේ යැ එයින් මතු නො පවත්නේ යැ යි මෙසේ නැති. මෙසේත් සංසාරයාගේ පශ්චිම කෙළවර නොපැනෙයි. මෙසේ සංසාරයාගේ පූර්ව කෙළවර ද නො පැනෙයි පශ්චිම කෙළවර ද නො පැනේ. මැද සසරහි මැ සත්ත්වයෝ සිටියාහු පිහිටියාහු ඇලුණාහු එළඹියාහු බැසගත්තාහු අධිමුක්ත වූවාහු නුයි ''මජ්ඣෙ සරස්මිං තිට්ඨතං'' යනු වේ. ඉච්චායස්මා කප්පො: යනු...

**ඔඝෙ ජාතෙ මහබ්භයෙ** යනු: කාමෞඝය භවෞඝය දිට්ඨෞඝය අවිජ්ජෞඝය උපන් කල්හි මොනොවට උපන් කල්හි නිපන් කල්හි මවසෙයින් නිපන් කල්හි පහළ වූ කල්හි. **මහබ්භයෙ** යනු: ජාතිභය ඇති ජරාභය ඇති ව්‍යාධිභය ඇති මරණභය ඇති නුයි 'ඔඝෙ ජාතෙ මහබ්භයෙ' යනු වේ.

**ජරාමච්චුපරෙතානං** යනු: ජරායෙන් පහස්නා ලදුවනට මඩනාලදුවනට යුක්ත වූවනට සමන්වාගත වූවනට මරණයෙන් පහස්නා ලදුවනට මඩනා ලදුවනට යුක්ත වූවනට සමන්වාගත වූවනට ජාතියෙන් අනුගියවුනට ජරායෙන් ලුහුබඳනා ලදුවනට ව්‍යාධියෙන් මඩනා ලදුවනට මරණයෙන් පහරන ලදුවනට ත්‍රාණ රහිතයනට නිලීනස්ථාන රහිතයනට ශරණ රහිතයනට අශරණීභූතයනට නුයි 'ජරාමච්චුපරෙතානං' යනු වේ.

**දීපං පබ්‍රෑහි මාරිස** යනු: ප්‍රතිෂ්ඨාව රක්ෂාස්ථානය නිලීනස්ථානය ශරණය ගතිය පිහිට. බ්‍රෑහි– වදළ මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවරණය කළ මැනැව විභාග කළ මැනැව පහළ කළ මැනැව ප්‍රකාශ කළ මැනැව. **මාරිස** යනු: තෙල මාරිස යනු: ප්‍රිය වචන යැ ගරුවචන යැ සගෞරව සප්‍රතිශ්‍රය නාමයෙක් නුයි 'දීපං පබ්‍රෑහි මාරිස' යනු වේ.

**ත්වඤ්ච මෙ දීපමක්ඛාහීති:** 'ත්ව'න්ති: භගවන්තං භණති, **දීපමක්ඛාහීති:** දීපං තාණං ලෙනං සරණං ගතිං පරායනං අක්ඛාහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'ත්වඤ්ච මෙ දීපමක්ඛාහි'

**යථයිදං නාපරං සියාති:** යථයිදං දුක්ඛං ඉධෙව නිරුජ්ඣෙය්‍ය, වූපසමෙය්‍ය අත්ථං ගච්ඡෙය්‍ය පටිප්පස්සම්භෙය්‍ය පුන පටිසන්ධිකං දුක්ඛං න නිබ්බත්තෙය්‍ය, කාමධාතුයා වා රූපධාතුයා වා අරූපධාතුයා වා කාමභවෙ වා රූපභවෙ වා අරූපභවෙ වා සඤ්ඤාභවෙ වා අසඤ්ඤාභවෙ වා නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ වා එකවොකාරභවෙ වා චතුවොකාරභවෙ වා පඤ්චවොකාරභවෙ වා පුනගතියා වා උපපත්තියා වා පටිසන්ධියා වා භවෙ වා සංසාරෙ වා වට්ටෙ වා[1] න ජායෙය්‍ය න සඤ්ජායෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය ඉධෙව නිරුජ්ඣෙය්‍ය වූපසමෙය්‍ය අත්ථංගච්ඡෙය්‍ය පටිප්පස්සම්භෙය්‍යාති 'යථයිදං නාපරං සියා'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"මජ්ඣෙ සරස්මිං තිට්ඨතං (ඉච්චායස්මා කප්පො)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ,
ජරාමච්චුපරෙතානං
දීපං පබ්‍රෑහි මාරිස,
ත්වඤ්ච මෙ දීපමක්ඛාහි
යථයිදං නාපරං සියා"ති.

10–2

මජ්ඣෙ සරස්මිං තිට්ඨතං (කප්පාති භගවා)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ
ජරාමච්චුපරෙතානං
දීපං පබ්‍රෑමි කප්ප තෙ.

**මජ්ඣෙ සරස්මිං තිට්ඨතන්ති:** 'සරො' වුච්චති සංසාරො, ආගමනං ගමනං ගමනාගමනං කාලං ගති භවාභවො[2] චුති ච උපපත්ති ච නිබ්බත්ති ච භෙදො ච ජාති ච ජරා ච මරණඤ්ච. සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති පච්ඡිමාපි කොටි න පඤ්ඤායති –පෙ– මජ්ඣෙව සංසාරෙ සත්තා ඨිතා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා. කථං සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති –පෙ– එවං සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති. කථං සංසාරස්ස පච්ඡිමා කොටි න පඤ්ඤායති –පෙ– එවං සංසාරස්ස පච්ඡිමා කොටි න පඤ්ඤායති. එවං සංසාරස්ස පුරිමා කොටි න පඤ්ඤායති, පච්ඡිමාපි කොටි න පඤ්ඤායති. මජ්ඣෙ ච සංසාරෙ සත්තා ඨිතා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති 'මජ්ඣෙ සරස්මිං තිට්ඨතං' කප්පාති භගවාති. –පෙ–

1. වඩ්ඪෙවා– පත.	2. භවාභවෙ– ප, ච.

**ත්වං ච මෙ දීපමක්ඛාහි**– 'ත්වං' යි භාග්‍යවතුන් අමතයි. **දීපමක්ඛාහි** යනු: ප්‍රතිෂ්ඨාව ත්‍රාණය ලෙනය ශරණය ගතිය පිහිට අක්ඛාහි– වදාළ මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව පාළ කළ මැනැව ප්‍රකාශ කළ මැනැව නුයි 'ත්වං ච මෙ දීපමක්ඛාහි'' යනු වේ.

**යථයිදං නාපරං සියා** යනු: යම්සේ මෙ දුක මෙ අත්බැව්හි මැ නිරුද්ධ වන්නේ නම් ව්‍යුපශමනය වන්නේ නම් අස්තයට යන්නේ නම් සන්හි-දෙන්නේ නම් නැවත පිළිසඳින් වන දුක නූපදනේ නම්, කාමධාතුයෙහි හෝ රූපධාතුයෙහි හෝ අරූපධාතුයෙහි හෝ කාමභවයෙහි හෝ රූපභවයෙහි හෝ අරූපභවයෙහි හෝ සංඥාභවයෙහි හෝ අසංඥා භවයෙහි හෝ නෛවසංඥානාසංඥා භවයෙහි හෝ එකවොකාර භවයෙහි හෝ චතුවොකාරභවයෙහි හෝ පඤ්චවොකාරභවයෙහි හෝ නැවත ගතියෙහි හෝ උපපතෙහි හෝ පිළිසඳෙහි හෝ භවයෙහි හෝ සංසාරයෙහි හෝ වෘත්තයෙහි හෝ නූපදනේ නම් මොනොවට නූපදනේ නම් නො නිපදනේ නම් වෙසෙසින් නො නිපදනේ නම් මෙ අත් බැව්හි මැ නිරුද්ධ වන්නේ නම් ව්‍යුපශමනය වන්නේ නම් අස්තයට යන්නේ නම් සන්හිදෙන්නේ නම් නුයි 'යථයිදං නාපරං සියා' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''මජ්ඣෙ සරසමිං –පෙ– යථයිදං නාපරං සියා''යි.**

## 10–2

(බුදුහු මෙසේ වදාළහ: කප්පමාණවකය,) මධ්‍ය වූ සසර සිටුනා වූ ජරායෙන් හා මරණයෙන් හා මඩනා ලද්දවුනට (ජාත්‍යාදි) මහද්භය ඇති (කාමාදි) ඔසය උපන් කල්හි ප්‍රතිෂ්ඨාව කප්පය, තොපට කියමි.

**මජ්ඣෙ සරස්මිං තිට්ඨතං** යනු: 'සරො' යි සංසාරය කියනු ලැබෙයි: පෙර භවයෙන් මෙහි ඊම මෙයින් පරලොවට යෑම භවයෙන් භවයට යෑමඊම මරණය ගතිය භවයෙන් භවය ච්‍යුතිය ද උපප්‍රාප්තිය ද නිර්වෘතිය ද ස්කන්ධ-යන් ගේ භෙදය ද ඉපදීම ද දිරීම ද මරණය ද යි සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනෙයි, පශ්චිම කෙළවර ද නො පැනෙයි. මැද සසර මැ සත්ත්වයෝ සිටියාහු පිහිටියාහු ඇලුණාහු එළඹියාහු බැසගත්තාහු අධිමුක්ත වූවාහු වෙත්. කිසෙයින් සංසාරයාගේ පූර්ව කෙළවර නො පැනේ ද යත්: ... මෙසේ සංසාරයා ගේ පූර්ව කෙළවර නො පැනෙයි. කිසෙයින් සංසාර-යාගේ පශ්චිම කෙළවර නො පැනේ ද යත් ...මෙසෙයින් සංසාරයාගේ පශ්චිම කෙළවර නො පැනෙයි. මෙසෙයින් සංසාරයා ගේ පූර්ව කෙළවර නො පැනෙයි, පශ්චිම කෙළවර ද නො පැනේ. මැද සසර මැ සත්ත්වයෝ සිටියාහු පිහිටියාහු ඇලුණාහු එළැඹියාහු බැසගත්තාහු අධිමුක්ත වූවාහු නුයි ''මජ්ඣෙ සරස්මිං තිට්ඨතං'' යනු වේ. කප්පාති භගවා යනු...

**ඔඝෙ ජාතෙ මහබ්භයෙති:** කාමොඝෙ භවොඝෙ දිට්ඨොඝෙ අවිජ්ජොඝෙ ජාතෙ සඤ්ජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙ. **මහබ්භයෙති;** ජාතිභයෙ ජරාභයෙ ව්‍යාධිභයෙ මරණභයෙති 'ඔඝෙ ජාතෙ මහබ්භයෙ'

**ජරාමච්චුපරෙතානන්ති:** ජරාය ඵුට්ඨානං පරෙතානං සමොහිතානං සමන්නාගතානං මච්චුනා ඵුට්ඨානං පරෙතානං සමොහිතානං සමන්නාගතානං ජාතියා අනුගතානං ජරාය අනුසටානං බ්‍යාධිනා අභිභූතානං මරණෙන අබ්භාහතානං අතාණානං අලෙනානං අසරණානං අසරණීභූතානන්ති 'ජරාමච්චුපරෙතානං'

**දීපං පබ්‍රූමි කප්ප තෙති:** දීපං තාණං ලෙනං සරණං ගතිං පරායනං බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'දීපං පබ්‍රූමි කප්ප තෙ'

තෙනාහ භගවා:

"මජ්ඣෙ සරස්මිං තිට්ඨතං (කප්පාති භගවා)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ,
ජරාමච්චුපරෙතානං
දීපං පබ්‍රූමි කප්ප තෙ"ති.

---

## 10-3

**අකිඤ්චනං අනාදානං – එතං දීපං අනාපරං
නිබ්බානං ඉති නං බ්‍රූමි – ජරාමච්චුපරික්ඛයං.**

**අකිඤ්චනං අනාදානන්ති:** 'කිඤ්චන'න්ති: රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙසකිඤ්චනං දුච්චරිත කිඤ්චනං කිඤ්චනප්පහානං කිඤ්චනවූපසමො[1] කිඤ්චනපටිනිස්සග්ගො[2] කිඤ්චනපටිප්පස්සද්ධි[3] අමතං නිබ්බානන්ති අකිඤ්චනං. **අනාදානන්ති:** 'ආදානං වුච්චති තණ්හා; යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං ආදානප්පහානං ආදානවූපසමො ආදානපටිනිස්සග්ගො ආදානපටිප්පස්සද්ධි අමතං නිබ්බානන්ති "අකිඤ්චනං අනාදානං"

---

1. කිඤ්චනවූපසමං– මජ්සං
2. පටිනිස්සග්ගං– මජ්සං
3. පටිප්පස්සද්ධිං– මජ්සං.

**ඔඝෙ ජාතෙ මහබ්භයෙ** යනු: කාමෝඝය භවෝඝය දිට්ඨෝඝය අවිජ්ජෝඝය උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙසෙසියා නිපන් කල්හි පහළ වූ කල්හි. **මහබ්භයෙ** යනු: ජාතිභය ජරාභය ව්‍යාධිභය මරණභය ඇති කල්හි නුයි 'ඔඝෙ ජාතෙ මහබ්භයෙ' යනු වේ.

**ජරාමච්චු පරෙතානං** යනු: ජරායෙන් පහස්නා ලදුවනට මඩනා ලදුවනට යුක්තයනට සමන්වාගතයනට මරණයෙන් පහස්නා ලදුවනට මඩනා ලදුවනට යුක්තයනට සමන්වාගතයනට ජාතියෙන් අනුගියවුනට ජරාව විසින් ලුහුබඳනා. ලදුවනට ව්‍යාධියෙන් මඩනා ලදුවනට මරණයෙන් පහරන ලදුවනට රක්ෂාස්ථාන රහිතයනට නිලීනස්ථාන රහිතයනට අශරණයනට අශරණීභූතයනට නුයි 'ජරාමච්චු පරෙතානං' යනු වේ.

**දීපං පබ්‍රූමි කප්ප තෙ** යනු: ප්‍රතිෂ්ඨාව රක්ෂාස්ථානය නිලීනස්ථානය ශරණය ගතිය පිහිට බ්‍රෑමි– කියමි දෙසමි පනවමි පිහිටුවමි විවරණය කෙරෙමි විභාග කෙරෙමි පාළ කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි ''දීපං පබ්‍රූමි කප්ප තෙ'' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**''මජ්ඣෙ සරස්මිං –පෙ– දීපං පබ්‍රූමි කප්ප තෙ''** යි.

## 10–3

අපර ප්‍රතිෂ්ඨා රහිත වූ තෙල ප්‍රතිෂ්ඨාව (රාගාදි) කිඤ්චන– (පලිබොධ) රහිත යැ ආදන (තෘෂ්ණා) රහිත යැ ජරාමරණ ව්‍යුපශමය වූ එය 'නිවනැ'යි කියමි.

**අකිඤ්චනං අනාදනං**– 'කිඤ්චනං' යනු: රාගකිඤ්චන යැ ද්වේෂකිඤ්චන යැ මෝහකිඤ්චන යැ මානකිඤ්චන යැ දෘෂ්ටිකිඤ්චන යැ ක්ලෙශකිඤ්චන යැ දුශ්චරිතකිඤ්චන යි. කිඤ්චනප්‍රහාණය කිඤ්චනව්‍යුපශමය කිඤ්චන දුරැලීම කිඤ්චන සන්හිඳීම අමාමහනිවන නුයි 'අකිඤ්චන' නම් වෙයි. **අනාදනං** යනු 'ආදන'යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක්... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද, එය යි. ආදනප්‍රහාණය ආදන ව්‍යුපශමය ආදන දුරැලීම ආදන සන්හිඳීම අමාමහ නිවන නුයි 'අකිඤ්චනං අනාදනං' යනු වේ.

එතං දීපං අනාපරන්ති: එතං දීපං තාණං ලෙනං සරණං ගති පරායනං. අනාපරන්ති: තම්හා පරො අඤ්ඤො දීපො නත්ථි, අථ ඛො සො යෙව[1] දීපො අග්ගො ච සෙට්ඨො ච විසෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො චාති 'එතං දීපං අනාපරං'.

නිබ්බානං ඉති නං බ්‍රෑමීති: 'වානං' වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං". වානප්පහානං වානවූපසමො වානපටිනිස්සග්ගො වානපටිප්පස්සද්ධිං[2] අමතං නිබ්බානං. ඉතීති: පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා පෙතං[3] ඉතීති: බ්‍රෑමීති බ්‍රෑමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'නිබ්බානං ඉති නං බ්‍රෑමි.'

ජරාමච්චුපරික්ඛයන්ති: ජරාමරණස්ස පහානං වූපසමො පටිනිස්සග්ගො පටිප්පස්සද්ධි අමතං නිබ්බානන්ති 'ජරාමච්චුපරික්ඛයං'

තෙනාහ භගවා:

"අකිඤ්චනං අනාදානං, එතං දීපං අනාපරං
නිබ්බානං ඉති නං බ්‍රෑමි ජරාමච්චුපරික්ඛය"න්ති

10–4

එතදඤ්ඤාය[5] යෙ සතා – දිට්ඨධම්මාභිනිබ්බුතා
න තෙ මාරවසානුගා – න තෙ මාරස්ස පද්ධගූ.[6]

එතදඤ්ඤාය යෙ සතාති: 'එත'න්ති: අමතං නිබ්බානං "යො සො සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං." අඤ්ඤායාති: අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. සබ්බෙ සංඛාරා අනිච්චාති -පෙ- 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. යෙති අරහන්තො ඛීණාසවා. සතාති: චතූහි කාරණෙහි සතා: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවිතත්තා සතා -පෙ- තෙ වුච්චන්ති 'සතා'ති 'එතදඤ්ඤාය යෙ සතා.'

1. සො එව- මජසං.
2. වානපටිප්පස්සද්ධි- මජසං
3. මෙතං- ච, වි, ක.
4. භාවෙතත්තා- මජසං, ස්‍යා.
5. එත දඤ්ඤාය- ච, වි, ක.
6. පවද්ධගූ- ස්‍යා.
පවද්ධගු- ච. වි. ක.

**එතං දීපං අනාපරං** යනු: තෙල ප්‍රතිෂ්ඨා යැ රක්ෂාස්ථාන යැ නිලීනස්ථාන යැ ශරණ යැ ගති යැ පිහිට යි. අනාපරං යනු: එයින් මතු අන්‍ය ප්‍රතිෂ්ඨායෙක් නැති. වැළිත් එ මැ අග්‍ර වූත් ශ්‍රෙෂ්ඨ වූත් අතිශයින් ශ්‍රෙෂ්ඨ වූත් ප්‍රමුඛ වූත් උත්තම වූත් ප්‍රවර වූත් ප්‍රතිෂ්ඨා වේ නුයි 'එතං දීපං අනාපරං' යනු වේ.

**නිබ්බානං ඉති නං බ්‍රෑමි**– 'වාන' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක් ...අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. වානප්‍රහාණය වානව්‍යුපශමය වාන දුරලීම වාන සන්හිඳීම, අමාමහනිවන **ඉති** යනු: පදසන්ධි යැ පදසංසර්ග යැ පදපරිපූර්ණභාව යැ— අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ තෙල 'ඉති' යනු පදයන්ගේ අනුපූර්වතා ද වෙයි. **බ්‍රෑමි** යනු: බ්‍රෑමි– කියමි දෙසමි පනවමි පිහිටුවමි විවරණය කෙරෙමි විභාග කෙරෙමි පාළ කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි 'නිබ්බානං ඉති නං බ්‍රෑමි' යනු වේ.

**ජරාමච්චු පරික්ඛයං** යනු: ජරාමරණයාගේ ප්‍රහාණය ව්‍යුපශමය දුරලීම සන්හිඳීම අමාමහනිවන නුයි 'ජරාමච්චු පරික්ඛයං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

''අකිඤ්චනං අනාදනං –පෙ– ජරාමච්චු පරික්ඛයං''යි.

## 10–4

ස්මෘතිමත් වූ දක්නා ලද (අනිත්‍යාදි) දහම් ඇති යම් රහත් කෙනෙක් තෙල නිවන දැන (ක්ලේශපරිනිර්වාණයෙන්) පිරිනිවියාහු වෙත් ද, ඔහු මාරවශයට ගියාහු නො වෙති. ඔහු මාරයාගේ මහ යන්නාහු (පරිචාරකයෝ) නො වෙත්.

**එතදඤ්ඤාය යෙ සතා**– 'එතං' යනු: අමාමහනිවන යි. යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිවීමෙක් වේ ද එය යි. **අඤ්ඤාය** යනු: දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට ප්‍රකට කොට 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි ... යම්කිසි සමුදය සභාව යෙක් වේ නම් එහැම නිරොධ සභාවය ඇතැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට. **යෙ** යනු: අර්හත් ක්ෂීණාශ්‍රවයෝ. **සතා** යනු: සතර කරුණෙකින් ස්මෘතිමත් වූවාහු: කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය භාවිත බැවින් ස්මෘතිමත් වූවාහු ...ඔහු 'සතා'යි කියනු ලැබෙත් නුයි 'එතදඤ්ඤාය යෙ සතා' යනු වේ.

දිට්ඨධම්මාභිනිබ්බුතාති: 'දිට්ඨධම්මා'ති: දිට්ඨධම්මා ඤාතධම්මා තුලිතධම්මා තීරිතධම්මා විභූතධම්මා විභාවිතධම්මා. අභිනිබ්බුතාති: රාගස්ස[1] නිබ්බාපිතත්තා නිබ්බුතා, දොසස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තා උපසන්තා වූපසන්තා නිබ්බුතා පටිප්පස්සද්ධාති 'දිට්ඨධම්මාභිනිබ්බුතා.'

න තෙ මාරවසානුගාති: 'මාරො'ති: "යො සො මාරො කණ්හො අධිපති අන්තගූ නමුචි පමත්තබන්ධු. න තෙ මාරවසානුගාති: න තෙ මාරස්ස වසෙ වත්තන්ති, නපි මාරො තෙසු වසං වත්තෙති තෙ මාරං ච මාරපක්ඛං ච මාරපාසං ච මාරබලිසං ච මාරාමිසං ච මාරවිසයං ච මාරනිවාපං ච[2] මාරගොචරං ච මාරබන්ධනං ච අභිභුය්‍ය අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දිත්වා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්තීති 'න තෙ මාරවසානුගා.'

න තෙ මාරස්ස පද්ධගූති:[3] න තෙ මාරස්ස පද්ධා පද්ධචරා[4] පරිචාරිකා සිස්සා[5] බුද්ධස්ස තෙ භගවතො පද්ධා පද්ධචරා[6] පරිචාරිකා සිස්සාති 'න තෙ මාරස්ස පද්ධගූති.

තෙනාහ භගවා:

"එතදඤ්ඤාය යෙ සතා දිට්ඨධම්මාභිනිබ්බුතා,
න තෙ මාරවසානුගා න තෙ මාරස්ස පද්ධගූති.

සහ ගාථාපරියොසානා -පෙ- සත්ථා මෙ භන්තෙ භගවා සාවකොහමස්මී'ති

කප්ප සුත්තනිද්දෙසො සමත්තො.

1. ලොභස්ස - ච, වි, ක
2. මාරනිවාසං ච, මජසං.
3. පට්ඨගූති- ස්‍යා.
   පට්ඨභූති- ච. වි, ක.
4. පට්ඨා පට්ඨචරා- ච, වි, ක.
5. පරිචාරිකා පියා- මජසං, ච, වි, ක.
6. පට්ඨා පට්ඨචරා- ච, වි, ක, ස්‍යා.

**දිට්ඨධම්මාභිනිබ්බුතා**— 'දිට්ඨධම්මා' යනු දක්නාලද දහම් ඇතියාහු දන්නා ලද දහම් ඇතියාහු තුලනය කළ දහම් ඇතියාහු තීරණය කළ දහම් ඇතියාහු පාළ කළ දහම් ඇතියාහු විභාවන කළ දහම් ඇතියාහු. **අභිනිබ්බුතා** යනු: රාගය නිවනලද බැවින් නිවියාහු ද්වේෂය... හැම අකුශලසංස්කාරයන් සන්හුන් වන බැවින් සන්හිඳුවන ලද බැවින් ව්‍යුපශමනය කරන ලද බැවින් නිවනලද බැවින් නිර්වෘත බැවින් පහවූ බැවින් ප්‍රතිප්‍රශ්‍රබ්ධ බැවින් ශාන්ත උපශාන්ත ව්‍යුපශාන්ත නිර්වෘත ප්‍රතිප්‍රශ්‍රබ්ධ වූවාහු නුයි 'දිට්ඨධම්මාභිනිබ්බුතා' යනු වේ.

**න තෙ මාරවසානුගා** - 'මාරො' යනු: යම් (මහජනයා අනර්ථයෙහි යොදු මරන) මාරයෙක් (අකුශලකර්මයෙහි නියුක්ත බැවින්) තෘෂ්ණායෙක් (කාමාවචරයට අධිපති බැවින්, අධිපතියෙක් (මරණයට පමුණුවන) අන්තයෙක් (පාපජනයා නො මුදන) නමුචියෙක් (ප්‍රමත්තයනට ඥාති වූ) ප්‍රමත්තබන්ධුයෙක් වේ ද හේ යැ. **න තෙ මාරවසානුගා** යනු: ඔහු මාරයාගේ වශයෙහි නො පවතිත්. මාර තෙම ඔවුන් කෙරෙහි අධිපතිභාවය නො පවත්වයි. ඔහු මරහු ද මාරපක්ෂය ද මාරපාශය ද මාරබිලිය ද මාරාමිෂය ද මාරවිෂය ද මාරනිවාපය (ගොදුරු) ද මාරගොචරය ද මාරබන්ධනය ද මැඩ අභිභවනය කොට වතුරුවාගෙන හාත්පසින් මැඩගෙන මර්දනය කොට සරති වෙසෙති ඉරියවු පවත්වති වැටෙති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'න තෙ මාරවසානුගා' යනු වේ.

**න තෙ මාරස්ස පද්ධගූ** යනු: ඔහු මාරයාගේ කොටසෙහි වූවාහු පක්ෂයෙහි හැසිරෙන්නාහු සෙවක වූවාහු ශිෂ්‍ය වූවාහු නො වෙති. ඔහු භාග්‍යවත් බුදුන්ගේ කොටසෙහි වූවාහු පක්ෂයෙහි හැසිරෙන්නාහු සෙවක වූවාහු ශිෂ්‍ය වූවැහු වෙත් නුයි 'න තෙ මාරස්ස පද්ධගූ' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**"එතදඤ්ඤාය යෙ සතා – පෙ – න තෙ මාරස්ස පද්ධගූ"යි.**

**ගාථා පර්‍යවසානය හා සමඟ ... වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවකයෙමි.**

**කප්ප සූත්‍රනිර්දේශය නිමි.**

# 11. ජතුකණ්ණි සුත්තනිද්දෙසො.

11-1

සුත්වානහං වීර අකාමකාමිං (ඉච්චායස්මා ජතුකණ්ණි)
ඔඝාතිගං පුට්ඨුමකාමමාගමං,
සන්තිපදං බ්‍රූහි සහජනෙත්ත[1]
යථාතච්ඡං භගවා බ්‍රූහි මෙතං,

සුත්වානහං වීර අකාමකාමින්ති: 'සුත්වා'ති: සුත්වා සුණිත්වා උග්ගහෙත්වා උපධාරෙත්වා උපලක්ඛයිත්වා 'ඉතිපි සො භගවා අරහං -පෙ- බුද්ධො භගවා'ති 'සුත්වානහං. වීරාති: වීරො භගවා, විරියවාති වීරො, පහූති වීරො[2] විසවීති වීරො[3] අලමත්තොති[4] වීරො, සූරොති වීරො, වික්කන්තො අභීරු අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසොති වීරො..

1. "විරතො ඉධ සබ්බපාපකෙහි
නිරයදුක්ඛමතිච්ච විරියවා සො,
සො විරියවා පධානවා
වීරො තාදී පවුච්චතෙ තථත්තා"ති. [5]

සුත්වානහං වීර.

අකාමකාමින්ති: 'කාමා'ති: උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. බුද්ධස්ස භගවතො වත්ථුකාමා පරිඤ්ඤාතා කිලෙසකාමා පහීනා, වත්ථුකාමානං පරිඤ්ඤාතත්තා කිලෙසකාමානං පහීනත්තා භගවා න කාමෙ කාමෙති, න කාමෙ පත්ථෙති, න කාමෙ පිහෙති, න කාමෙ අභිජප්පති, යෙ කාමෙ කාමෙන්ති කාමෙ පත්ථෙන්ති, කාමෙ පිහෙන්ති, කාමෙ අභිජප්පන්ති, තෙ කාමකාමිනො රාගරාගිනො සඤ්ඤසඤ්ඤිනො, භගවා න කාමෙ කාමෙති, න කාමෙ පත්ථෙති, න කාමෙ පිහෙති, න කාමෙ අභිජප්පති, තස්මා බුද්ධො අකාමො නික්කාමො චත්තකාමො වන්තකාමො මුත්තකාමො පහීනකාමො පටිනිස්සට්ඨකාමො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති 'සුත්වානහං වීර අකාමකාමිං'. ඉච්චායස්මා ජතුකණ්ණීති: ඉච්චාති: පදසන්ධි -පෙ- 'පදානුපුබ්බතාපෙතං ඉච්චා'ති. ආයස්මාති: පියවචනං -පෙ- සප්පතිස්සාධිවචනමෙතං 'ආයස්මා'ති. ජතුකණ්ණීති: තස්ස බ්‍රාහ්මණස්ස ගොත්තං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරොති 'ඉච්චායස්මා ජතුකණ්ණි'.

---

1. සහජනෙත්ත- මජසං. චහාජනෙත්ත- ච, වි, ක.
2. පහූති වීරො- ච, වි, ක.
3. විසති වීරො- ච, වි, ක.
4. අල මත්තොති- ච, වි, ක.
5. සුත්තනිපාත- සභියසුත්ත.

# 11. ජතුකණ්ණි සූත්‍රනිර්දේශය

## 11–1

(ආයුෂ්මත් ජතුකණ්ණිමාණවක මෙසේ විචාරයි:) වීරයන් වහන්ස, මම මුඹ වහන්සේ (කාමයන් නො කැමැති හෙයින්) අකාමකාමී වූ ඕඝය ඉක්ම වූ කෙනකු යැ යි අසා නිෂ්කාම වූ භාග්‍යවතුන් පුළුවුස්නට ආයෙමි. සහජාත වූ ඥානචක්ෂුස ඇතියාණෙනි, ශාන්තිය හා ශාන්තිපදය (නිවන්) හා වදළ මැනැව භාග්‍යවතුන් වහන්ස, තෙල කරුණ තථ්‍ය වූ පරිදි වදළ මැනැවි.

**සුත්වානහං වීර අකාමකාමිං**– 'සුත්වා' යනු: ඒ භාග්‍යවත්හු මෙ කරුණෙනුදු අර්හත්හ... බුද්ධයහ භාග්‍යවත්හ' යි අසා අසාගෙන ඉගෙන විමසා සලකා නුයි 'සුත්වානහං' යනු වේ. වීර යනු: බුදුහු වීරයහ: වීර්‍ය්‍යවත් නුයි වීරයහ, ප්‍රභූ නු යි වීරයහ, (පරසන්තානයෙහි වීර්‍ය්‍යය උපදවන හෙයින්) විසවි නුයි වීරයහ, සමර්ථ සිත් ඇත්තාහු නුයි වීරයහ, ශූර නුයි වීරයහ, වික්‍රම ඇතියහ නො බානසුලල්හ නො තැතිගන්නා සුල්ලහ උත්‍රාස රහිතයහ නො පලායනසුල්ලහ ප්‍රහීණ වූ භය හා භය අරමුණු ඇතියහ පහවූ ලොමුදහගැනුම් ඇත්තාහු නුයි වීරයහ.

1. මෙ ලොව්හි හැම පාපයන්ගෙන් වෙන් වූයේ (එහෙයින් මැ) නිරදුක් ඉක්ම සිටි වීර්‍ය්‍යයට නිවාස වූ ඒ ක්ෂීණාශ්‍රව තෙම වීර්‍ය්‍ය ඇත්තේ වෙයි. එබඳු වූයේ ප්‍රධන් වීර්‍ය්‍ය ඇත්තේ යැ වීර යැ (නිර්විකාර බැවින්) තාදී යැ යි කියනු ලැබේ නුයි. 'සුත්වානහං වීර' යනු වේ.

**අකාමකාමිං**– 'කාමං' යනු: විස්තර විසින් කාම දෙකෙකි: වස්තුකාම ද ක්ලේශකාම ද යි ... මොහු වස්තුකාමයෝ යි කියනු ලැබෙති ... මොහු ක්ලෙශකාමයෝ යි කියනු ලැබෙත්. භාග්‍යවත් බුදුන් විසින් වස්තුකාමයෝ පිරිසිඳ දන්නා ලදහ ක්ලේශකාමයෝ ප්‍රහාණය කරන ලදහ වස්තුකාමයන් පිරිසිඳ දන්නාලද බැවින් ක්ලේශ කාමයන් ප්‍රහීණ වන බැවින් බුදුහු කාමයන් නො කැමැති වෙති කාමයන් නො පතති කාමයන් ඊප්සා නො කෙරෙති කාමයන් අභිජල්පනය නො කෙරෙත්. යම් කෙනෙක් කාමයන් කැමැති වෙත් ද කාමයන් ප්‍රාර්ථනා කෙරෙත් ද කාමයන් ඊප්සා කෙරෙත් ද කාමයන් අභිජල්පනය කෙරෙත් ද ඔහු කාම-කාමීහු යැ රාගරක්තයෝ යැ රාගසංඥායෙන් සංඥාවත්හ. බුදුහු කාමයන් නො කැමැති වෙති කාමයන් ප්‍රාර්ථනා නො කෙරෙති කාමයන් ඊප්සා නො කෙරෙති කාමයන් අභිජල්පනය නො කෙරෙත්. එහෙයින් බුදුහු අකාමයහ නිෂ්කාමයහ ත්‍යක්තකාමයහ වාන්තකාමයහ මුක්තකාමයහ ප්‍රහීණකාමයහ ප්‍රතිනිසෘෂ්ට (දුරු කළ) කාමයහ වීතරාගයහ විගතරාගයහ ත්‍යක්තරාගයහ වාන්ත (වමාළ) රාගයහ මුක්තරාගයහ ප්‍රහීණරාගයහ ප්‍රතිනිසෘෂ්ටරාගයහ තෘෂ්ණාරහිතයහ නිවියහ සිහිල් වූහ. (කායික– චෛතසික සුවවිඳුනාසුල්ලහ ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත වැ වෙසෙත් නුයි 'සුත්වානහං වීර අකාමකාමිං' යනු වේ. **ඉච්චායස්මා ජතුකණ්ණි** – 'ඉච්ච' යනු: පදසන්ධි යැ... තෙල 'ඉච්ච' යනු පදනුපූර්වතා යැ. ආයස්මා යනු: ප්‍රියවචන යැ... තෙල 'ආයස්මා' යනු සප්‍රතිශ්‍රය නාමයෙකි. **ජතුකණ්ණි** යනු: එ බමුණුගේ ගොත්‍ර යැ සඞ්ඛ්‍යා යැ සංඥා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ යි 'ඉච්චායස්මා ජතුකණ්ණි' යනු වේ.

ඔඝාතිගං පුට්ඨුමකාමමාගමන්ති: 'ඔඝාතිග'න්ති: ඔඝාතිගං ඔඝං අතික්කන්තං සමතික්කන්තං වීතිවත්තන්ති 'ඔඝාතිගං'. පුට්ඨුන්ති: පුට්ඨුං පුච්ඡිතුං යාචිතුං අජ්ඣෙසිතුං පසාදෙතුං. අකාමමාගමන්ති: අකාමං පුට්ඨුං නික්කාමං[1] චත්තකාමං වන්තකාමං මුත්තකාමං පහීනකාමං පටිනිස්සට්ඨකාමං වීතරාගං විගතරාගං චත්තරාගං වන්තරාගං මුත්තරාගං පහීනරාගං පටිනිස්සට්ඨරාගං ආගමම්හා ආගතම්හා උපාගතම්හා සම්පත්තම්හා තයා සද්ධිං සමාගතම්හාති 'ඔඝාතිගං පුට්ඨුමකාමමාගමං.'

සන්තිපදං බ්‍රූහි සහාජනෙත්තා[2]ති: 'සන්ති'න්ති: එකෙන ආකාරෙන සන්තිපි සන්තිපදම්පි තමෙව අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං.

වුත්තං හෙතං භගවතා:

සන්තමෙතං පදං, පණීතමෙතං පදං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. අථාපරෙනාකාරෙන යෙ ධම්මා සන්තාධිගමාය සන්තිඵුසනාය සන්තිසච්ඡිකිරියාය සංවත්තන්ති, සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො, ඉමෙ වුච්චන්ති සන්තිපදං සන්තිපදං තාණපදං ලෙනපදං සරණපදං අභයපදං අච්චුතපදං අමතපදං නිබ්බානපදං බ්‍රූහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහි. සහාජනෙත්තාති: 'නෙත්තං' වුච්චති සබ්බඤ්ඤුතඤාණං, බුද්ධස්ස භගවතො නෙත්තං ච ජිනභාවො ච බොධියා මූලෙ අපුබ්බං අචරිමං එකස්මිං ඛණෙ උප්පන්නො, තස්මා බුද්ධො සහාජනෙත්තොති 'සන්තිපදං බ්‍රූහි සහාජනෙත්ත.'

යථාතච්ඡං භගවා බ්‍රූහි මෙතන්ති: යථාතච්ඡං වුච්චති අමතං නිබ්බානං —පෙ— නිරොධො නිබ්බානං. භගවාති: ගාරවාධිවචනමෙතං —පෙ— සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවා'ති. බ්‍රූහි මෙතන්ති: බ්‍රූහි ආචික්ඛාහි —පෙ— පකාසෙහීති 'යථාතච්ඡං භගවා බ්‍රූහි මෙතං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"සුත්වානහං වීර අකාමකාමිං (ඉච්චායස්මා ජතුකණ්ණි)
ඔඝාතිගං පුට්ඨුමකාමමාගමං,
සන්තිපදං බ්‍රූහි සහාජනෙත්ත
යථාතච්ඡං භගවා බ්‍රූහි මෙත"න්ති.

1. නික්කාමං— ව, වි, ක.
2. මහාජනෙත්ත— ව, වි, ක.

**ඔඝාතිගං පුටඨුමකාමමාගමං**– 'ඔඝාතිගං' යනු: ඔඝයන් ඉක්ම ගිය ඔඝයන් අතික්‍රමණය කළ ඔඝයන් සමතික්‍රමණය කළ ඔඝයන් ඉක්මසිටියවුනැ'යි 'ඔඝාතිගං' යනු වේ. **පුච්ඡිතුං** යනු: පුළුවුස්නට විචාරන්නට අයදනට අධ්‍යෙෂණ කරන්නට පහදවන්නට. **අකාමමාගමං** යනු: කාම නැති මුඹ වහන්සේ පුළුවුස්නට කෑම රහිත වූ හැරදමූ කාම ඇති වමාළ කාම ඇති මුදහළ කාම ඇති ප්‍රහාණය කළ කාම ඇති දුරළූ කාම ඇති පහවූ රාග ඇති කසවූ රාග ඇති හැරදමූ රාග ඇති වමාළ රාග ඇති මුදළ රාග ඇති ප්‍රහීණ රාග ඇති දුරු කළ රාග ඇති මුඹ වහන්සේ පුළුවුස්නට ආම්හ ආවම්හ එළැඹියම්හ සැපැමිණියම්හ මුඹ වහන්සේ හා සමග එක්වූම්හ නුයි 'ඔඝාතිගං පුච්ඡුමකාමමාගමං' යනු වේ.

**සන්තිපදං බ්‍රෑහි සහාජනෙත්තො**– 'සන්ති' යනු: එක් අයුරෙකින් ශාන්තිය ද ශාන්තිපදය ද එ මැ අමාමහ නිවන යි. යම් හැම සංස්කාරයන් ගේ සන්හිඳීමෙක් හැම උපධින්ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. තෙල වදරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

''යම් සියලු සංස්කාරයන් ගේ සන්හිඳීමෙක් සියලු උපධින්ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේද තෙල නිර්වාණපදය ශාන්ත යැ තෙල නිර්වාණපදය ප්‍රණීත යි.''

තවද අන් අයුරෙකින් (සතිපට්ඨානාදි) යම් ධර්ම කෙනෙක් නිර්වාණ ප්‍රතිවෙධය පිණිස නිර්වාණස්පර්ශය පිණිස නිවන් පසක් කරනු පිණිස පවතිත් ද, හේ කෙසේ යැ යත්: සතර සතිපට්ඨානයෝ යැ සතර සම්‍යක් ප්‍රධානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්චබලයෝ යැ සප්තබොධ්‍යඞ්ගයෝ යැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය යි මොහු 'ශාන්තිපදයෝ' යි කියනු ලැබෙත්. ශාන්තිපදය ත්‍රාණපදය ලෙනපදය ශරණපදය අභයපදය අච්‍යුතපදය අමෘතපදය නිර්වාණපදය බ්‍රෑහි - වදළ මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව තැබුව මැනැව විවෘත කළ මැනැව විභාග කළ මැනැව ප්‍රකට කළ මැනැව ප්‍රකාශ කළ මැනැවි. සහාජනෙත්ත - 'නෙත්ත'යි සර්වඥතාඥානය කියනු ලැබෙයි. භාග්‍යවත් බුදුන්ගේ නෙත්‍රයත් ජිනභාවයත් බෝමුල්හි දී පෙරපසු නො වැ එක්වට උපන. එයින් බුදුහු 'සහජනෙත්‍ර' නුයි 'සන්තිපදං බ්‍රෑහි සහාජනෙත්ත' යනු වේ.

යථාතච්ඡං භගවා බ්‍රෑහිමෙතං– 'යථාතච්ඡං' යි අමාමහනිවන කියනු ලැබෙයි...නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. **භගවා** යනු: තෙල ගෞරවනාම යැ... මේ 'භගවා' යනු: අර්හත්ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියෙකි. **බ්‍රෑහි මෙතං** යනු: බ්‍රෑහි–වදළ මැනැව ... ප්‍රකාශ කළ මැනැව නුයි 'යථාතච්ඡං භගවා බ්‍රෑහි මෙතං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

''සුත්වානහං වීර......යථාතච්ඡං භගවා බ්‍රෑහි මෙතං'' **යි.**

## 11-2

භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියති
ආදිච්චොව පථවිං තෙජී තෙජසා,
පරිත්තපඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤ,[1]
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහානං.

**භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියතීති:** 'භගවා'ති ගාරවාධිවචනං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති. කාමාති උද්දානතො[2] ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. භගවා වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙස කාමෙ පහාය අභිභුය්‍ය අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දිත්වා[3] චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙතීති 'භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියති.'

**ආදිච්චොව පථවිං තෙජී තෙජසාති:** 'ආදිච්චො' වුච්චති සුරියො, පථවී වුච්චති ජගති, යථා සුරියො තෙජී[4] තෙජෙන සමන්නාගතො පථවිං අභිභුය්‍ය අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා සන්තාපයිත්වා සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච අන්ධකාරං විධමෙත්වා ආලොකං දස්සයිත්වා ආකාසෙ අන්තලික්ඛෙ ගගනපථෙ[5] වෙගෙන ගච්ඡති එවමෙව භගවා ඤාණතෙජී[6] ඤාණතෙජෙන සමන්නාගතො සබ්බං අභිසංඛාරසමුදයං -පෙ- කිලෙසතමං අවිජ්ජන්ධකාරං විධමිත්වා ඤාණාලොකං දස්සෙත්වා වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය අභිභුය්‍ය අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දිත්වා චරති විහරති ඉරියති වත්තෙති[7] පාලෙති යපෙති යාපෙතීති ආදිච්චොව පථවිං තෙජී තෙජසා.

**පරිත්තපඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤාති:** අහමස්මි පරිත්තපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ජතුක්කපඤ්ඤො[8], ත්වම්පි මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො[9] ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො. භූරි වුච්චති පථවී, භගවා තාය පථවියා සමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතොති පරිත්තපඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤ.

---

1. භූරිපඤ්ඤා-මජසං, සයා
2. උද්දානතො- පත.
3. මද්දිත්වා ඉති- මජසං නත්ථි.
4. තෙජී තෙජසා තෙජෙන- ච, ක, වි, ප-
5. ගමන පථෙ- සයා.
6. ඤාණී ඤාණ තෙජෙන- ච-වි-ක.
7. පවත්තෙති- පත.
8. ජතුක්ක- මජසං.
9. හාස පඤ්ඤා- මජසං-ක-

11-2

යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ තෙද ඇති හිරු තෙදින් පෘථිවිය මෙන් කාමයන් මැඩලා වාසය කරන සේක් ද, එහෙයින් මහාප්‍රාඥයන් වහන්ස, මෙහි මැ ජාතිජරාවගේ ප්‍රහාණය වූ යම් දහමක් මම් දැන ගන්නෙම් නම් ඒ දහම මඳ නුවණැති වූ මට වදාළ මැනැව.

**භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියති**– 'භගවා' යනු: ගෞරවනාම යැ ...මේ 'භගවා' යනු සාක්ෂාත් ප්‍රඥප්ති යැ. **කාමා** යනු: විස්තර වශයෙන් වස්තුකාම ද ක්ලේශකාම දැ යි කාම දෙකෙකි.... මොහු වස්තුකාමයෝ යි කියනු ලැබෙති ... මෙ‍ෘහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත්. බුදුහු වස්තු කාමයන් පිරිසිඳ දැන ක්ලේශකාමයන් දුරු කොට මැඩ මැඩලා ගෙවා මර්දනය කොට සරති වෙසෙති ඉරියවු පවත්වති වැටෙති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියති' යනු වේ.

**ආදිච්චොව පඨවිං තෙජී තෙජසා**- 'ආදිච්ච' යි සූර්යයා කියනු ලැබෙයි. 'පඨවි' යි පොළොව කියනු ලැබෙයි. යම්සේ තෙජස් ඇති සූර්‍ය්‍ය තෙම තේජසින් සමන්වාගත වූයේ පොළොව මැඩ අභිභවනය කොට යට කොට ගෙන හාත්පසින් මැඩගෙන තවා ආකාශගත වූ සියලු තමස නසා අන්ධකාරය විධමනය කොට ආලොකය දක්වා අහස්හි අන්තරීක්ෂයෙහි ගුවන්මග වෙගයෙන් යේ ද එසෙයින් මැ බුදුහු ඥානතෙජස් ඇත්තාහු ඥාන තෙජසින් සමන්වාගත වූවාහු හැම අභිසංස්කාර සමුදය ... කෙලෙස් තමස අවිද්‍යාන්ධකාරය විධමනය කොට ඥානාලෝකය දක්වා වස්තු කාමයන් පිරිසිඳ දැන ක්ලේශකාමයන් දුරු කොට මැඩ අභිභවනය කොට යට කොට හාත්පසින් මැඩගෙන මර්දනය කොට සරති වෙසෙති ඉරියවු පවත්වති වැටෙති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'ආදිච්චොව පඨවිං තෙජී තෙජසා' යනු වේ.

**පරිත්තපඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤ** යනු: මම මඳ නුවණ ඇතියෙමි පහත් නුවණ ඇතියෙමි ලාමක ප්‍රඥා ඇතියෙමි බොළඳ නැණ ඇතියෙමි, මුඹ වහන්සේ වැළිත් මහනුවණ ඇතියව්හු පුළුල්නුවණ ඇතියව්හු වහා වැටහෙන නුවණ ඇතියව්හු දිවෙන නුවණ ඇතියව්හු තියුණු නුවණ ඇතියව්හු විනිවිද දක්නා නුවණ ඇතියව්හු යැ. 'භූරි' යි පෘථිවිය කියනුලැබෙයි. බුදුහු ඒ පෘථිවි සම වූ විපුල වූ විස්තෘත වූ ප්‍රඥායෙන් සමන්වාගතහ'යි 'පරිත්ත පඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤ' යනු වේ.

**ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤන්ති:** 'ධම්මන්ති': ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චත්තාරො සතිපට්ඨානෙ -පෙ- නිබ්බාන නිබ්බානගාමිනිඤ්ච පටිපදං ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති. **යමහං විජඤ්ඤන්ති:** යමහං ජානෙය්‍යං ආජානෙය්‍යං විජානෙය්‍යං පටිජානෙය්‍යං පටිවිජ්ඣෙය්‍යං අධිගච්ඡෙය්‍යං ඵස්සෙය්‍යං සච්ඡිකරෙය්‍යන්ති ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං.

**ජාති ජරාය ඉධ විප්පහානන්ති**- ඉධෙව ජාති ජරාය මරණස්ස පහානං වූපසමං පටිනිස්සග්ගං පටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති 'ජාති ජරාය ඉධ විප්පහානං'.

තෙනාහ සො බ්‍රාහ්මණො;

"භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියති
ආදිච්චොව පථවිං තෙජී තෙජසා
පරිත්තපඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤ
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහාන"න්ති.

---

11-3

කාමෙසු විනය ගෙධං (ජතුකණ්ණීති භගවා)
නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො,
උග්ගහිතං නිරත්තං වා
මා තෙ විජ්ජිත්ථ කිඤ්චනං.

**කාමෙසු විනය ගෙධන්ති:** 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. 'ගෙධො' වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. **කාමෙසු විනය ගෙධන්ති:** කාමෙසු ගෙධං විනය[1] පටිවිනය පජහ[2] විනොදෙහි බ්‍යන්තීකරොහි අනභාවං ගමෙහීති කාමෙසු විනය ගෙධං. **ජතුකණ්ණීති භගවාති:** තං බ්‍රාහ්මණං ගොත්තෙන ආලපති. **භගවාති:** ගාරවාධිවචනමෙතං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති 'ජතුකණ්ණීති භගවා'.

---

1. විනෙය්‍ය ගෙධං- සත.
2. පජහාහි- සත.

**ආවිකඛ ධම්මං යමහං විජඤ්ඤං** – 'ධම්මං' යනු: ආදියෙහි කල්‍යාණ වූ මධ්‍යයෙහි කල්‍යාණ වූ අවසානයෙහි කල්‍යාණ වූ (අර්ත්ථසම්පත්තියෙන්) සාර්ත්ථ වූ (ව්‍යඤ්ජන සම්පත්තියෙන්) සව්‍යඤ්ජන වූ සියල්ල පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යාව ද සතර සතිපට්ඨානයන් ද ...නිර්වාණය ද නිර්වාණගාමීප්‍රතිපදාව ද වදළ මැනැව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවරණය කළ මැනැව විභාග කළ මැනැව පෑළ කළ මැනැව ප්‍රකාශ කළ මැනැව. **යමහං විජඤ්ඤං** යනු: යම් දහමක් මම් දැනගන්නෙම් නම් වෙසෙසින් දැන ගන්නෙම් නම් ප්‍රකර්ෂයෙන් දැනගන්නෙම් නම් මොනොවට දැනගන්නෙම් නම් ප්‍රතිවෙධ කරන්නෙම් නම් අධිගම කරන්නෙම් නම් දක්නෙම් නම් ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් නුයි "ආවිකඛ ධම්මං යමහං විජඤ්ඤං" යනු වේ.

**ජාතිජරාය ඉධ විප්පහානං** යනු: මේ අත්බැව්හි මැ ජාතිජරාවගේ මරණයාගේ ප්‍රහාණය සන්හිඳීම දුරැලීම ප්‍රතිප්‍රශ්‍රබ්ධිය අමාමහනිවන නුයි "ජාතිජරාය ඉධ විප්පහානං" යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"භගවා හි කාමෙ –පෙ– ජාතිජරාය ඉධ විප්පහානං"** යි.

---

## 11-3

(බුදුහු මෙසේ වදළහ: ජතුකණ්ණි මාණවකය,) නෛෂ්ක්‍රම්‍යය ක්ෂේම වශයෙන් දැක වස්තුකාම ක්ලේශකාමයෙහි තෘෂ්ණාව දුරු කරව, තෘෂ්ණා දෘෂ්ටි විසින් ගන්නා ලද්දෙක් හෝ හළ යුත්තෙක් හෝ (රාගාදි) කිඤ්චනයක් හෝ නහමක් තොපට වේවා.

**කාමෙසු විනය ගෙධං**– 'කාමා' යනු: විස්තර විසින් කාම දෙකෙකි: වස්තුකාමයෝ ද ක්ලෙශකාමයෝ දැ' යි ...මොහු වස්තුකාමයෝ යි කියනු ලැබෙති ... මොහු ක්ලෙශකාමයෝ යි කියනු ලැබෙත්. **'ගෙධ'යි** තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක්... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **කාමෙසු විනය ගෙධං** යනු: කාමයෙහි තෘෂ්ණාව දුරු කරව වෙසෙසින් දුරු කරව හැර පියව විනොදනය කරව විගතාන්ත කරව අනු අභාවයට පමුණුව යි 'කාමෙසු විනය ගෙධං' යනු වේ. **ජතුකණ්ණීති** භගවා- 'ජතුකණ්ණි' යනු: බුදුහු එ බමුණු ගොත්‍රයෙන් අමතති. භගවා යනු: පෙ.ල ගෞරවනාම යැ ... මේ 'භගවා' යනු අර්හත්ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියෙක් නුයි 'ජතුකණ්ණි' ති භගවා' යනු වේ.

**නෙක්ඛම්මං දට්ඨු ඛෙමතොති:** 'නෙක්ඛම්මන්ති': සම්මා පටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං සීලෙසු පරිපූරකාරිතං ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතං භොජනෙ මත්තඤ්ඤුතං ජාගරියානුයොගං සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං ඛෙමතො තාණතො ලෙණතො සරණතො අභයතො අච්චුතතො අමතතො නිබ්බානතො දට්ඨුං පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො.'

**උග්ගහිතං නිරත්තං වාති:** 'උග්ගහිත'න්ති: තණ්හාවසෙන දිට්ඨිවසෙන ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං. **නිරත්තං වාති;** නිරස්සිතබ්බං[1] මුඤ්චිතබ්බං පජහිතබ්බං[2] විනොදෙතබ්බං[3] බ්‍යන්තීකාතබ්බං අනභාවං ගමෙතබ්බන්ති උග්ගහිතං නිරත්තං වා,.

**මා තෙ විජ්ජිත්ථ කිඤ්චනන්ති** රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙසකිඤ්චනං දුච්චරිතකිඤ්චනං. ඉදං කිඤ්චනං තුය්හං මා විජ්ජිත්ථ, මා සංවිජ්ජිත්ථ, පජහ විනොදෙහි බ්‍යන්තීකරොහි අනභාවං ගමෙහීති 'මා තෙ විජ්ජිත්ථ කිඤ්චනං' තෙනාහ භගවා:

'කාමෙසු විනය ගෙධං (ජතුකණ්ණීති භගවා)
නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො,
උග්ගහිතං නිරත්තං වා
මා තෙ විජ්ජිත්ථ කිඤ්චන''න්ති.

---

11–4

යං පුබ්බෙ තං විසොසෙහි[4]
පච්ඡා තෙ මාහු කිඤ්චනං
මජ්ඣෙ චෙ නො[5] ගහෙස්සසි
උපසන්තො චරිස්සසි–.

**යං පුබ්බෙ තං විසොසෙහීති:** අතීතෙ සඞ්ඛාරෙ ආරබ්භ යෙ කිලෙසා උප්පජ්ජෙය්‍යුං, තෙ කිලෙසෙ සොසෙහි විසොසෙහි සුක්ඛාපෙහි විසුක්ඛාපෙහි අබීජං කරොහි පජහ විනොදෙහි බ්‍යන්තීකරොහි අනභාවං ගමෙහීති එවම්පි 'යං පුබ්බෙ තං විසොසෙහි.' අථවා යෙ අතීතා කම්මාභිසඞ්ඛාරා අවිපක්කවිපාකා තෙ කම්මාභිසංඛාරෙ[6] සොසෙහි විසොසෙහි සුක්ඛාපෙහි විසුක්ඛාපෙහි අබීජං කරොහි පජහ විනොදෙහි බ්‍යන්තීකරොහි අනභාවං ගමෙහීති එවම්පි 'යං පුබ්බෙ තං විසොසෙහි.'

1. නිරත්තං වාති නිරත්තංවා– මජසං.
2. විජහිතබ්බං– මජසං.
3. විනොදිතබ්බං– මජසං.
4. විසොධෙහි– පත.
5. වෙනො– ච, වි, ක, ම.
6. කම්මාභිසංඛාරා– පත.

**නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො**– 'නෙක්ඛම්මං' යනු: සම්‍යක් ප්‍රතිපදාව අනුලොම ප්‍රතිපදාව අවිරුද්ධ ප්‍රතිපදාව අන්වර්ත්ථ ප්‍රතිපදාව ධර්මානුධර්ම ප්‍රතිපදාව ශීලයන්හි සපුරා කරන බව ඉන්ද්‍රියයන්හි පියන ලද දොර ඇති බව වැළඳීමෙහි පමණ දන්නා බව ජාගර්‍යානුයොගය ස්මෘති සම්ප්‍රජන්‍යය සතර සතිපට්ඨානයන් සතර සම්‍යක් ප්‍රධානයන් සතර ඍද්ධිපාදයන් පඤ්චෙන්ද්‍රියයන් පඤ්චබලයන් සප්තබොධ්‍යඞ්ගයන් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නිර්වාණය ද නිර්වාණගාමී ප්‍රතිපදාව ද ක්ෂෙම හෙයින් ත්‍රාණ හෙයින් ලෙන හෙයින් සරණ හෙයින් අභය හෙයින් අච්‍යුත හෙයින් අමෘත හෙයින් නිර්වාණ හෙයින්, දට්ඨුං– දැක තුලනය කොට තීරණය කොට විභාවන කොට ප්‍රකට කොට නුයි 'නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො' යනු වේ.

**උග්ගහිතං නිරත්තං වා**– 'උග්ගහිතං' යනු: තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් ගන්නා ලද පරාමර්ශනය කරන ලද ඇතුළත පිවිසුණු ගිලගන්නා ලද අධිමුක්ත වූ, **නිරත්තං වා** යනු දුරු කළ යුතු මුදා හළ යුතු පරිත්‍යාග කළ යුතු විනොදනය කළ (දුරුකිරීම) යුතු විගතාන්ත කළ යුතු අනු අභාවයට පැමිණවිය යුතු නුයි 'උග්ගහිතං නිරත්තං වා' යනු වේ.

**මා තෙ විජ්ජිත්ථ කිඤ්චනං** යනු: රාග කිඤ්චනය ද්වෙෂ කිඤ්චනය මොහ කිඤ්චනය මාන කිඤ්චනය දෘෂ්ටි කිඤ්චනය ක්ලෙශකිඤ්චනය දුශ්චරිත කිඤ්චනය යන මේ කිඤ්චනය (පළිබොධය) තහමක් තට වේවා! තහමක් මොනොවට වේවා! හැරපියව දුරලව විගතාන්ත කරව අනුඅභාවයට පමුණුව නුයි 'මා තෙ විජ්ජිත්ථ කිඤ්චනං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**''කාමෙසු විනය ගෙධං –පෙ– මා තෙ විජ්ජිත්ථ කිඤ්චනං''යි.**

## 11–4

අතීතයෙහි යම් සංස්කාරයෙක් වී නම් එය වියළව අනාගත සංස්කාරය තට තහමක් කිඤ්චන (පළිබොධ) වේවා, ඉදින් ප්‍රත්‍යුත්පන්න සංස්කාරයන් තෘෂ්ණාදෘෂ්ටි විසින් නො ගන්නෙහි නම් නිවුණෙක් වැ හැසිරෙන්නෙහි.

**යං පුබ්බෙ තං විසොසෙහි** යනු: අතීත සංස්කාරයන් ඇරැබ යම් කෙලෙස් කෙනෙක් උපදනාහු නම් ඒ කෙලෙසුන් වියළව වෙසෙසින් වියළව ශුෂ්ක බවට පමුණුව වෙසෙසින් ශුෂ්ක බවට පමුණුව බීජාභාවය කරව හැරපියව දුරු කරව විගතාන්ත කරව අනුඅභාවයට පමුණුව නුයි මෙසේත් 'යං පුබ්බෙ තං විසොසෙහි' යනු වේ. නොහොත් අතීත වූ නො පැසුණු විපාක ඇති යම් කර්මාභිසංස්කාර කෙනෙක් වෙත් නම් ඒ කර්මාභිසංස්කාරයන් වියළව වෙසෙසින් වියළව ශුෂ්ක බවට පමුණුව වෙසෙසින් ශුෂ්ක බවට පමුණුව බීජාභාවය කරව හැරපියව දුරලව විගතාන්ත කරව අනු අභාවයට පමුණුව නුයි මෙසේත් 'යං පුබ්බෙ තං විසොසෙහි' යනු වේ.

පච්ඡා තෙ මාහු කිඤ්චනන්ති: 'පච්ඡා' වුච්චති අනාගතං, අනාගතෙ සංඛාරෙ ආරබ්භ යානි උප්පජ්ජෙය්‍යුං රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙසකිඤ්චනං දුච්චරිතකිඤ්චනං ඉමානි කිඤ්චනානි තුය්හං මා අහු මාකාසි මා ජනෙසි මා සංජනෙසි මා නිබ්බත්තෙසි මාභිනිබ්බත්තෙසි පජහ විනොදෙහි බ්‍යන්තීකරොහි අනභාවං ගමෙහීති 'පච්ඡා තෙ මාහු කිඤ්චනං'.

මජ්ඣෙ චෙ නො ගහෙස්සසීති: මජ්ඣෙ වුච්චති පච්චුප්පන්නං රූපං වෙදනා සඤ්ඤා සංඛාරා විඤ්ඤාණං, පච්චුප්පන්නෙ සඞ්ඛාරෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන න ගහෙස්සසි න ගණ්හිස්සසි, න පරාමසිස්සසි, න නන්දිස්සසි, නාභිනන්දිස්සසි, න අජ්ඣොසිස්සසි, අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහිස්සසි, විනොදෙස්සසි, බ්‍යන්තීකරිස්සසි, අනභාවං ගමෙස්සසීති 'මජ්ඣෙ චෙ නො ගහෙස්සසි.'

උපසන්තො චරිස්සසීති: රාගස්ස සන්තත්තා සමිතත්තා උපසමිතත්තා දොසස්ස -පෙ- සබ්බාකුසලාභිසංඛාරානං සන්තත්තා සමිතත්තා උපසමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධො චරිස්සසි විහරිස්සසි ඉරියිස්සසි වත්තිස්සසි පාලෙස්සසි යපෙස්සසි යාපෙස්සසීති 'උපසන්තො චරිස්සසි'.

තෙනාහ භගවා:

> "යං පුබ්බෙ තං විසොසෙහි
> පච්ඡා තෙ මාහු කිඤ්චනං,
> මජ්ඣෙ චෙ නො ගහෙස්සසි
> උපසන්තො චරිස්සසී"ති.

**පච්ඡා තෙ මාහු කිඤ්චනං**– 'පච්ඡා'යි අනාගතය කියනු ලැබෙයි. අනාගත සංස්කාරයන් ඇරබැ යම් කිඤ්චන කෙනෙක් උපදනාහු ද: රාගකිඤ්චන යැ ද්වේෂ කිඤ්චන යැ මෝහ කිඤ්චන යැ මාන කිඤ්චන යැ දෘෂ්ටිකිඤ්චන යැ ක්ලේශ කිඤ්චන යැ දුශ්චරිත කිඤ්චන යි. මේ කිඤ්චනයෝ තට නහමක් වෙත්වා නහමක් කරව නහමක් උපදව නහමක් මොනවට උපදව නහමක් පැදව නහමක් වෙසෙසින් නිපදව හැරපියව දුරලව විගතාන්ත කරව අනු අභාවයට පමුණුව නුයි 'පච්ඡා තෙ මාහු කිඤ්චනං 'යනු වේ.

**මජ්ඣෙ වෙ නො ගහෙස්සසි**–'මජ්ඣෙ'යි ප්‍රත්‍යුත්පන්න (වර්තමාන) වූ රූපය වේදනාව සංඥාව සංස්කාර විඥානය කියනු ලැබෙයි. ප්‍රත්‍යුත් පන්න සංස්කාරයන් තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් නො ගන්නෙහි ග්‍රහණය නො කරන්නෙහි පරාමර්ශ නො කරන්නෙහි නො තුටු වන්නෙහි අභිනන්දන නො කරන්නෙහි නො ගිලගන්නෙහි අභිනන්දනය අභිවදනය අජ්ඣොසානය ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය හැරපියන්නෙහි දුරලන් නෙහි විගතාන්ත කරන්නෙහි අනු අභාවයට පමුණුවන්නෙහි නුයි 'මජ්ඣෙ වෙ නො ගහෙස්සසි' යනු වේ.

**උපසන්තො චරිස්සසි** යනු: රාගය සන්හුන් බැවින් ශමනය කරන ලද බැවින් ව්‍යුපශමනය කරනලද බැවින් ද්වේෂය ... හැම අකුශලාභි සංස්කාරයන් සන්හුන් බැවින් ශමනය කරනලද බැවින් ව්‍යුපශමනය කරනලද බැවින් නිවනලද බැවින් නිවුණු බැවින් පහවූ බැවින් සන්හිඳුවන ලද බැවින් ශාන්ත වූයේ උපශාන්ත වූයේ ව්‍යුපශාන්ත වූයේ නිවියේ සන්හිඳුවන ලද්දේ හැසිරෙන්නෙහි වාස කරන්නෙහි ඉරියවූ පවත් වන්නෙහි වැටෙන්නෙහි පාලනය කරන්නෙහි යැපෙන්නෙහි යාපනය කරන්නෙහි නුයි 'උපසන්තො චරිස්සසි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යං පුබ්බෙ තං – පෙ– උපසන්තො චරිස්සසී'යි.**

11-5

සබ්බසො නාමරූපස්මිං
වීතගෙධස්ස බ්‍රාහ්මණ,
ආසවාස්ස[1] න විජ්ජන්ති
යෙහි මච්චුවසං වජෙ.

**සබ්බසො නාමරූපස්මිං වීතගෙධස්ස බ්‍රාහ්මණාති:** 'සබ්බසො'ති: සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'සබ්බසො'ති. නාමන්ති: චත්තාරො අරූපිනො ඛන්ධා. රූපන්ති: චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං. ගෙධො වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං". **සබ්බසො නාමරූපස්මිං වීතගෙධස්ස බ්‍රාහ්මණාති:** සබ්බසො නාමරූපස්මිං වීතගෙධස්ස විගතගෙධස්ස චත්තගෙධස්ස වන්තගෙධස්ස මුත්තගෙධස්ස පහීනගෙධස්ස පටිනිස්සට්ඨගෙධස්ස වීතරාගස්ස විගතරාගස්ස චත්තරාගස්ස වන්තරාගස්ස මුත්තරාගස්ස පහීනරාගස්ස පටිනිස්සට්ඨරාගස්සාති 'සබ්බසො නාමරූපස්මිං වීතගෙධස්ස බ්‍රාහ්මණ.'

**ආසවාස්ස න විජ්ජන්තීති:** 'ආසවා'ති චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො. **අස්සාති:** අරහතො ඛීණාසවස්ස' **න විජ්ජන්තීති** ඉමෙ ආසවා තස්ස නත්ථි, න සන්ති, න සංවිජ්ජන්ති නූපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති 'ආසවාස්ස න විජ්ජන්ති.'

**යෙහි මච්චුවසං වජෙති:** යෙහි ආසවෙහි මච්චුනො වා වසං ගච්ඡෙය්‍ය, මරණස්ස වා වසං ගච්ඡෙය්‍ය, මාරපක්ඛස්ස වා වසං ගච්ඡෙය්‍ය, තෙ ආසවා තස්ස නත්ථි න සන්ති න සංවිජ්ජන්ති, නූපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා, වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති 'යෙහි මච්චුවසං වජෙති.'

තෙනාහ භගවා:

"සබ්බසො නාමරූපස්මිං
වීතගෙධස්ස බ්‍රාහ්මණ,
ආසවාස්ස න විජ්ජන්ති[1]
යෙහි මච්චුවසං වජෙ"ති.

සහගාථාපරියොසානා[2] -පෙ- සත්ථා මෙ භන්තෙ, භගවා සාවකොහමස්මී'ති.

ජතුකණ්ණි සුත්තනිද්දෙසො සමත්තො

1. ආසවාය න විජ්ජන්ති- ච-වි-ක. 2. සහගාථං පරියොසානෙ- පත.

11-5

බමුණ, සර්වප්‍රකාරයෙන් නාමරූපයෙහි පහ කරනලද තෘෂ්ණා ඇති ඒ රහත්හට 'යම් ආස්‍රව කෙනකුන් කරණ කොට ගෙන මාරයාගේ වශයට යේ නම්' ඒ ආස්‍රවයෝ නැත්තාහ' යි.

**සබ්බසො නාමරූපස්මිං වීතගෙධස්ස බ්‍රාහ්මණ**– 'සබ්බසො' යනු: සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල ශේෂ නො කොට නිශ්ශෙෂ කොට ගන්නා වචනයෙකි තෙල 'සබ්බසො' යනු. **නාමං** යනු: සතර අරූපස්කන්ධයෝ යැ. **රූපං** යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද වෙති. **ගෙධ** යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක්... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **සබ්බසො නාමරූපස්මිං වීතගෙධස්ස බ්‍රාහ්මණ** යනු සර්වප්‍රකාරයෙන් නාමරූපයෙහි පහවූ තෘෂ්ණා ඇතියහට කස (දුරු) වූ තෘෂ්ණා ඇතියහට හැරපියන ලද තෘෂ්ණා ඇතියහට වමාළ තෘෂ්ණා ඇතියහට මිදුණු තෘෂ්ණා ඇතියහට ප්‍රහීණ තෘෂ්ණා ඇතියහට දුරු කළ තෘෂ්ණා ඇතියහට පහවූ රාග ඇතියහට කසවූ රාග ඇතියහට හැරපියන ලද රාග ඇතියහට වමාළ රාග ඇතියහට මුදළ රාග ඇතියහට ප්‍රහීණරාග ඇතියහට දුරු කළ රාග ඇතියහට නුයි 'සබ්බසො නාමරූපස්මිං වීතගෙධස්ස බ්‍රාහ්මණ' යනු වේ.

**ආසවාසස න විජ්ජන්ති**–'ආසවා' යනු: ආස්‍රව සතරෙකි: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ටාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි. **අස්ස** යනු: ක්ෂීණාස්‍රව වූ රහත්හට, **න විජ්ජන්ති** යනු: මේ ආස්‍රවයෝ ඔහට නැත්තාහ නො වෙති විද්‍යමාන නො වෙති නො ලැබෙති ප්‍රහීණයහ මුලුසුන්හ සන්හිඳුණාහ ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ යළි උපදනට නො නිස්සහ නුවණ ගින්නෙන් දැවුණාහ නුයි' 'ආසවාස්ස න විජ්ජන්ති' යනු වේ.

**යෙහි මච්චුවසං වජෙ**–යම් ආස්‍රව කෙනෙකුන් කරණකොට ගෙන මාරයාගේ හෝ වශයට යන්නේ නම් මරණයාගේ හෝ වශයට යන්නේ නම් මාරපක්ෂයෙහි හෝ වශයට යන්නේ නම් ඒ ආස්‍රවයෝ ඔහට නැත්තාහ, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණයහ, මුලුසුන්හ. සන්හිඳුණාහ, ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ යළි උපදනට නො නිස්සහ, නුවණ ගින්නෙන් දැවුණාහු නුයි 'යෙහි මච්චුවසං වජෙ' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**'සබ්බසො නාමරූපස්මිං –පෙ– යෙහි මච්චුවසං වජෙ' යි.**

ගාථා පර්යවසානය හා සමග ...වහන්ස, බුදුහු මාගේ ශාස්තෲහ, මම ශ්‍රාවකයෙමි.

**ජතුකණ්ණි සූත්‍රනිර්දේශය නිමි.**

# 12. භද්‍රාවුධ සුත්තනිද්දෙසො

## 12–1

ඔකං ජහං[1] තණ්හච්ඡිදං අනෙජං (ඉච්චායස්මා භද්‍රාවුධො)
නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තං
කප්පං ජහං අභියාචෙ සුමෙධං
සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො.

**ඔකං ජහං තණ්හච්ඡිදං අනෙජන්ති:** ඔකං ජහන්ති: රූපධාතුයා යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයූපාදනා[2] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා[3], තෙ බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවං ගතා[4] ආයතිං අනුප්පාදධම්මා, තස්මා බුද්ධො ඔකඤ්ජහො, වෙදනාධාතුයා– සඤ්ඤාධාතුයා– සඞ්ඛාරධාතුයා– විඤ්ඤාණධාතුයා– යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයූපාදනා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙ බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංගතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා බුද්ධො ඔකඤ්ජහො. **තණ්හච්ඡිදන්ති,** 'තණ්හා'ති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා, සා තණ්හා බුද්ධස්ස භගවතො ඡින්නා උච්ඡින්නා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, තස්මා බුද්ධො 'තණ්හච්ඡිදො'. **අනෙජොති:** 'එජා' වුච්චති තණ්හා ''යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං''. සා එජා තණ්හා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංගතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා බුද්ධො අනෙජො, එජාය පහීනත්තා අනෙජො භගවා ලාභෙපි න ඉඤ්ජති, අලාභෙපි න ඉඤ්ජති, යසෙපි න ඉඤ්ජති, අයසෙපි න ඉඤ්ජති, පසංසායපි න ඉඤ්ජති, නින්දායපි න ඉඤ්ජති, සුඛෙපි න ඉඤ්ජති, දුක්ඛෙපි න ඉඤ්ජති, න චලති, න වෙධති, න පවෙධති, න සම්පවෙධති, තස්මා බුද්ධො අනෙජොති 'ඔකං ජහං තණ්හච්ඡිදං අනෙජං'. **ඉච්චායස්මා භද්‍රාවුධො.** –පෙ–

1. ඔඝං ජහං– ච-වි-ක.
2. උපායූපාදනා– මජසං, සහා, ස.
3. අධිට්ඨානා අභිනිවෙසානුසයා– ච-වි-ක.
4. අනභාවං කතා– මජසං.

# 12. හද්‍රාවුධ සූත්‍රනිර්දෙශය

## 12–1

(ආයුෂ්මත් හද්‍රාවුධ මෙසේ විචාරයි:) ආලය සඞ්ඛ්‍යාත ඔකය දුරලූ ෂඩ්විධ තෘෂ්ණාකාය සිඳැලූ, අටලෝ දහම්හි නො සැලෙන, අනාගතප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත නන්දිය දුරලූ, චතුරොඝය තරණය කළා වූ, කෙලෙසුන් කෙරෙන් මිදුණු, තෘෂ්ණා–දෘෂ්ටි කල්ප දුරලූ, ශොභන ප්‍රඥා ඇති බුදුරදුන් වෙසෙසින් අයදිමි. නාග වූ මුඹ වහන්සේ ගේ වදන් අසා (බොහෝ ජනයෝ) මේ පහණසැයෙන් නික්ම යෙත්.

**ඔකං ජහං තණ්හච්ඡිදං අනෙජං**– ‘ඔකං ජහං’ යනු: රූපධාතුයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් අකුසල් සිතට ප්‍රතිෂ්ඨා වූ අභිනිවෙශ වූ අනුශය වූ යම් උපය (තෘෂ්ණා – දෘෂ්ටි) උපාදන කෙනෙක් වෙත් ද ඔහු භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහාණය කරනලද්දාහු උසුන් (අවිද්‍යා–තෘෂ්ණා) මූල් ඇත්තාහු (මූල් උදුළ) තල්වත්තක් මෙන් කරන ලද්දහු ආයතිභවයෙහි නූපදනා සැහැවි ඇත්තාහු අනුඅභාවයට ගියාහ. එයින් බුදුහු ඔකඤ්ජහ නම් වෙත්. වෙදනා ධාතුයෙහි–සංඥාධාතුයෙහි–සංස්කාර ධාතුයෙහි – විඥානධාතුයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් අකුසල්-සිතට ප්‍රතිෂ්ඨා වූ අභිනිවෙශ වූ අනුශය වූ යම් උපය උපාදන කෙනෙක් වෙත් ද ඔහු භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණයහ උසුන් මූල් ඇතියහ මුල් උදුළ තල්වත්තක් මෙන් කරන ලද්දහු ආයතිභවයෙහි නූපදනා සැහැවි ඇත්තාහු අනු අභාවයට ගියාහ. එයින් බුදුහු ‘ඔකඤ්ජහ’ නම් වෙත්. **තණ්හච්ඡිදං**– ‘තණ්හා’ යනු: රූපතෘෂ්ණා යැ ...ධර්ම තෘෂ්ණා යි. ඒ තෘෂ්ණාව භාග්‍යවත් බුදුන් විසින් සිඳින ලද යැ උදුරනලද යැ මොනොවට උදුරනලද යැ සන්හිඳුවන ලද යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධ යැ වටාලා උපදනට නො හිසි කරනලද යැ නුවණගින්නෙන් දවන ලද, එයින් බුදුහු ‘තණ්හච්ඡිද’ නම් වෙති. ‘අනෙජා’ යනු: ‘එජා’ යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූල යෙක් වේ ද එය යි. ඒ එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව භාග්‍යවත් බුදුන විසින් ප්‍රහීණ යැ උසුන්මුල් ඇත්තී යැ මුල් උදුළ තල්වත්තක් මෙන් කරන ලද යැ ආයතිභවයෙහි නූපදනා සැහැවි ඇත්ති අනු අභාවයට ගියා යැ. එයින් බුදුහු ‘අනෙජ’ නම් වෙති. එජාව ප්‍රහීණ බැවින් ‘අනෙජ’ යි. බුදුහු ලාභයෙහිදු නො සැලෙති අලාභයෙහි දු නො සැලෙති යසස්හිදු නො සැලෙති අයසස්හි දු නො සැලෙති ප්‍රශංසායෙහි දු නො සැලෙති නින්දයෙහි දු නො සැලෙති සුවයෙහිදු නො සැලෙති දුක්හිදු නො සැලෙති චලනය නො වෙති කම්පනය නො වෙති ප්‍රකම්පනය නො වෙති සම්ප්‍රකම්පනය නො වෙත්. එයින් බුදුහු ‘අනෙජ’ නම් වෙත් නුයි ‘ඔකං ජහං තණ්හච්ඡිදං අනෙජං’ යනු වෙ. **ඉච්චායස්මා හද්‍රා වුධො...**

නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තන්ති: 'නන්දි' වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං", සා නන්දි සා තණ්හා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංගතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො නන්දිං ජහො. ඔඝතිණ්ණන්ති: භගවා කාමොඝං තිණ්ණො, භවොඝං තිණ්ණො, දිට්ඨොඝං තිණ්ණො, අවිජ්ජොඝං තිණ්ණො, සබ්බසංසාරපථං[1] තිණ්ණො, උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති 'නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තන්ති: භගවතො රාගා චිත්තං මුත්තං විමුත්තං, සුවිමුත්තං, දොසා චිත්තං- මොහා චිත්තං -පෙ- සබ්බාකුසලාභිසංඛාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තන්ති 'නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තං'.

කප්පං ජහං අභියාචෙ සුමෙධන්ති: කප්පාති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො, බුද්ධස්ස භගවතො තණ්හාකප්පො පහීනො, දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො, තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තස්මා බුද්ධො කප්පං ජහො. අභියාචෙති: යාචාමි අභියාචාමි, අජ්ඣෙසාමි, සාදියාමි, පත්ථයාමි, පිහයාමි, ජප්පාමි, අභිජප්පාමි. සුමෙධන්ති[2]: 'මෙධා' වුච්චති පඤ්ඤා. "යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි" භගවා ඉමාය මෙධාය පඤ්ඤාය උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමපන්නො[3] සමන්නාගතො, තස්මා බුද්ධො සුමෙධොති 'කප්පං ජහං අභියාචෙ සුමෙධං.

සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතොති: 'නාගස්සා'ති: නාගො භගවා, ආගුං න කරොතීති නාගො, න ගච්ඡතීති නාගො, න ආගච්ඡතීති නාගො -පෙ- එවං භගවා නාගච්ඡතීති නාගො. සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතොති: තුය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං සුත්වා සුණිත්වා උග්ගහෙත්වා උපධාරයිත්වා උපලක්ඛයිත්වා ඉතො අපනමිස්සන්ති වජිස්සන්ති පක්කමිස්සන්ති දිසා විදිසං ගමිස්සන්තීති සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"ඔකං ජහං තණ්හච්ඡිදං අනෙජං -(ඉච්චායස්මා භද්‍රාවුධො)
නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තං,
කප්පං ජහං අභියාචෙ සුමෙධං
සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො"ති.

---

1. සබ්බං සංසාරපථං- සයා.
2. සුමෙධොති- ච-වි-ක,
සුමෙධා වුච්චති- මජසං.
3. සමුපපන්නො- මජසං

**නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තං** – ‘නන්දි’ යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ අකුශල මූලයෙක් වේ ද එයයි. ඒ නන්දිය ඒ තෘෂ්ණාව භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණ යැ උසුන් මුල් ඇත්ති යැ මුල් උදුළ තාලවාස්තුවක් මෙන් කරන ලද්දී ආයතිභවයෙහි නූපදනා පියවි ඇත්තී අනු අභාවයට ගියා යැ. එයින් බුදුහු ‘නන්දිඤ්ජහ’ නම් වෙත්. **ඔඝතිණ්ණං** යනු: බුදුහු කාමෞඝය තරණය කළහ භවෞඝය තරණය කළහ දෘෂ්ටි–ඔඝය තරණය කළහ අවිද්‍යා–ඖඝය තරණය කළහ හැම සංස්කාරපථය තරණය කළහ උත්තරණය කළහ නිස්තරණය කළහ ඉක්මගියහ මොනොවට ඉක්ම ගියහ වෙසෙසින් ඉක්ම සිටියහ උන් වහන්සේ වැස නිමවූ දශආර්‍යවාස ඇත්තාහු පුහුණු කළ ශීලාදී චරණ ඇත්තාහු ... (ක්ෂය කළ) ජාතිමරණසංසාරය ඇත්තාහු යැ. උන්වහන්සේට පුනර්භවයෙක් නැත් නුයි ‘නන්දිං ජහං ඔඝතිණ්ණං’ යනු වේ. **විමුත්තං** යනු: භාග්‍යවතුන් විසින් රාගයෙන් සිත මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි, ද්වේෂයෙන් සිත–මෝහයෙන් සිත ... හැම අකුශලාභිසංස්කාරයන් කෙරෙන් සිත මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත නු යි ‘නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තං’ යනු වේ.

**කප්පං ජහං අභියාචෙ සුමෙධං**– ‘කප්ප’ යනු: කල්ප දෙකෙකි: තෘෂ්ණා කල්පය ද දෘෂ්ටිකල්පය ද යි... මේ තෘෂ්ණා කල්ප යැ ... මේ දෘෂ්ටිකල්ප යි. භාග්‍යවත් බුදුන් විසින් තෘෂ්ණා කල්පය ප්‍රහීණ යැ දෘෂ්ටිකල්පය දුරලන ලද. තෘෂ්ණාකල්පය ප්‍රහාණය කළ වන බැවින් දෘෂ්ටිකල්පය දුරලන ලද වන බැවින් එහෙයින් බුදුහු ‘කප්පං ජහං’ නම් වෙත්. **අභියාචෙ** යනු: යදිමි, වෙසෙසින් යදිමි, අධ්‍යෙෂණ කෙරෙමි, ආස්වාද කෙරෙමි, ප්‍රාර්ථනා කෙරෙමි, ඉස්නෙමි, ජල්පනය කෙරෙමි, අභිජල්පනය කෙරෙමි. **සුමෙධං** යනු: ‘මෙධා’ යි ප්‍රඥාව කියනු ලැබෙයි: යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් ... අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එය යි. බුදුහු මේ මෙධා සඞ්ඛ්‍යාත ප්‍රඥායෙන් යුක්ත වූවාහු සමුපෙත වූවාහු එළැඹ සිටියාහු අතිශයින් එළැඹ සිටියාහු නො වෙන් වූවාහු පරිපූර්ණ වූවාහු සමන්වාගත වූවාහු වෙති, එයින් බුදුහු ‘සුමෙධ’ නම් වෙත් නුයි ‘කප්පං ජහං අභියාචෙ සුමෙධං’ යනු වේ.

**සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො**– ‘නාගස්ස’ යනු: බුදුහු නාගයහ: පව් නො කෙරෙත් නුයි නාගයහ (අගතියට) නො යෙත් නුයි නාගයහ (පුහුන් කෙලෙසුන් කරා) නො පැමිණෙත් නුයි නාගයහ ... මෙසෙයින් බුදුහු පෙරළා (පුහුන් කෙලෙසුන් කරා) නො පැමිණෙත් නුයි ‘නාග’ නම් වෙත්. **සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො**– මුඹ වහන් සේ ගේ වචනය වාඩමාර්ගය දේශනාව අනුශාසනාව අසා ශ්‍රවණය කොට ඉගෙන විමසා සලකා මෙයින්, **අපනමිස්සන්ති**– යෙති නික්ම යෙති දසතු දසට යෙත් නුයි ‘සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො’ යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**“ඔකඤ්ජහං. තණ්හච්ඡිදං – පෙ – අපනමිස්සන්ති ඉතො” යි.**

12–2

නානා ජනා ජනපදෙහි සඞ්ගතා
තව වීර[1] වාක්‍යං අභිකඞ්ඛමානා[2]
තෙසං තුවං සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො.

**නානා ජනා ජනපදෙහි සඞ්ගතාති**: 'නානා ජනා'ති: ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච. **ජනපදෙහි සඞ්ගතාති**: අඞ්ගා ච මගධා ච කලිඞ්ගා ච කාසියා ච කොසලා ච වජ්ජියා ච මල්ලා ච චෙතියම්හා ච වංසා ච[3] කුරුම්හා ච පඤ්චාලා ච මච්ඡා ච සූරසෙනා ච අස්සකා ච[4] අවන්තියා ච යොනා ච කම්බොජා ච. **සඞ්ගතාති**: සඞ්ගතා සමාගතා සමොහිතා සන්නිපතිතාති 'නානා ජනා ජනපදෙහි සඞ්ගතා.'

**තව වීර වාක්‍යං අභිකඞ්ඛමානාති**: 'වීරා'ති වීරො භගවා, විරියවා සොති වීරො, පහූති වීරො, විසවීති වීරො, අලමත්තොති වීරො -පෙ- විගතලොමහංසොති වීරො.

1. "විරතො ඉධ සබ්බපාපකෙහි
නිරයදුක්ඛමතිච්ච විරියවා සො,
සො විරියවා පධානවා
වීරො තාදී පවුච්චතෙ තථත්තා"ති[6]

**තව වීර වාක්‍යං අභිකඞ්ඛමානාති**: තුය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං[5]. **අභිකඞ්ඛමානාති**: අභිකඞ්ඛමානා ඉච්ඡමානා සාදියමානා පත්ථයමානා පිහයමානා අභිජප්පමානාති 'තව වීර වාක්‍යං අභිකඞ්ඛමානා.'

**තෙසං තුවං සාධු වියාකරොහීති**: 'තෙස'න්ති තෙසං ඛත්තියානං බ්‍රාහ්මණානං වෙස්සානං සුද්දානං ගහට්ඨානං පබ්බජිතානං දෙවානං මනුස්සානං. **තුවන්ති**: භගවන්තං භණති. **සාධු වියාකරොහීති**: සාධු ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'තෙසං තුවං සාධු වියාකරොහි.'

---

1. ධීර- ච වි-ක.
2. අභිසඞ්ඛමානා- ච-වි-ක.
3. සාගරම්හා ච- ස්‍යා.
4. අසකා ච- ච-වි-ක.
5. අනුසත්ථිං- ච-වි-ක.
6. සුත්ත නිපාත සභිය සුත්ත

12–2

වීරයන් වහන්ස, මුඹ වහන්සේගේ වදන් කැමැති වූ නානාජනයෝ අඞ්ගාදි ජනපදයෙන් රැස්වූහු යැ, මුඹ වහන්සේ ඔවුනට දහම් දෙසුව මැනැවැ, යම් හෙයෙකින් තෙල දහම් මුඹ වහන්සේ විසින් දන්නා ලද ද එහෙයිනි.

**නානා ජනා ජනපදෙහි සඞ්ගතා** – 'නානා ජනා' යනු: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශුද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මනුෂ්‍යයෝ ද, **ජනපදෙහි සඞ්ගතා** –අඟු රටින් ද මගද රටින් ද කලිඟු රටින් ද කසි රටින් ද කොසොල් රටින් ද වැදෑරටින් ද, මල්ල රටින් ද චෙතිය රටින් ද වත්ස රටින් ද කුරුරටින් ද පඤ්චාල රටින් ද මත්ස්‍ය ජනපදයෙන් ද සූරසේන ජනපදයෙන් ද අස්සක රටින් ද අවන්ති රටින් ද යොන් රටින් ද කාම්බොජ රටින් ද, **සඞ්ගතා** යනු: එක් වූවාහු රැස්වූවාහු මුළු වූවාහු එක්රැස් වූවාහු නු යි. 'නානා ජනා ජනපදෙහි සඞ්ගතා' යනු වේ.

**තව වීර වාක්‍යං අභිකඞ්ඛමානා**– 'වීර' යනු: බුදුහු වීරයහ වීර්‍යවත් නුයි වීරයහ ප්‍රභූවූවාහු නුයි වීරයහ විවිධගුණ වහනය කෙරෙත් නුයි වීරයහ සමර්ත්ථ සිත් ඇත්තාහු නුයි වීරයහ... විගතලොමහර්ෂ ඇත්තාහු නුයි වීරයහ.

1. මෙලොවහි හැම පාපයන්ගෙන් වෙන් වූයේ (එහෙයින් මැ) නිරුදුක් ඉක්මයිටි, වීර්‍යයට නිවාස වූ, ඒ ක්ෂීණාශ්‍රව තෙම වීර්‍ය ඇත්තේ වෙයි. එබඳු වූයේ ප්‍රධන්වීර්‍ය ඇත්තේ යැ වීර යැ (නිර්විකාර බැවින්) තාදී යැ යි කියනු ලැබේ.

**තව වීර වාක්‍යං අභිකඞ්ඛමානා** – මුඹ වහන්සේ ගේ වචනය වාඞ්මාර්ගය දේශනාව අනුශාසනාව, අභිකඞ්ඛමානා– කැමැති වන්නාහු ඉස්නාහු ආස්වාද කරන්නාහු ප්‍රාර්ථනා කරන්නාහු රුස්නාහු අභිජල්පනය කරන්නාහු නුයි 'තව වීර වාක්‍යං අභිකඞ්ඛමානා' යනු වේ.

**තෙසං තුවං සාධු වියාකරොහි**– 'තෙසං' යනු: ඒ ක්ෂත්‍රියයන්ගේ බ්‍රාහ්මණයන්ගේ වෛශ්‍යයන් ගේ ශුද්‍රයන් ගේ ගිහියන් ගේ පැවිද්දන්ගේ දෙවියන්ගේ **මිනිසුන්ගේ**, **'තුවං'** යි භාග්‍යවතුන් (සඳහා) බෙණෙයි. **සාධු වියාකරොහි**– මැනැවින් වදළ මැනැව දෙසනු මැනැව පනවනු මැනැව පිහිටුවනු මැනැව විවරණ කළ මැනැව විභාග කළ මැනැව ප්‍රකට කළ මැනැව ප්‍රකාශ කළ මැනැවැ යි 'තෙසං තුවං සාධු වියාකරොහි' යනු වේ.

**තථා හි තෙ විදිතො එස ධම්මොති**: 'තථා' හි තෙ විදිතො තුලිතො තීරිතො විභූතො විභාවිතො එස ධම්මොති 'තථා හි තෙ විදිතො එස ධම්මො.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"නානා ජනා ජනපදෙහි සඞ්ගතා
තව වීර වාක්‍යං අභිකඞ්ඛමානා,
තෙසං තුවං සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො"ති.

---

12-3

ආදාන තණ්හං විනයෙථ සබ්බං (භද්‍රාවුධාති භගවා)
උද්ධං අධො තිරියඤ්චාපි[1] මජ්ඣෙ,
යං යං හි ලොකස්මිං උපාදියන්ති
තෙනෙව මාරො අන්වෙති ජන්තුං.

**ආදානතණ්හං විනයෙථ සබ්බන්ති**: 'ආදානතණ්හා'[2] වුච්චති රූපතණ්හා -පෙ- **ආදානතණ්හාති** කිං කාරණා වුච්චති ආදානතණ්හා: තාය තණ්හාය රූපං ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති, වෙදනං-සඤ්ඤං- සඞ්ඛාරෙ- විඤ්ඤාණං- ගතිං- උපපත්තිං- පටිසන්ධිං- භවං- සංසාරං- වට්ටං- ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති තංකාරණා වුච්චති ආදානතණ්හා. **විනයෙථ සබ්බන්ති**: සබ්බං ආදානතණ්හං විනයෙය්‍ය පටිවිනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති 'ආදානතණ්හං විනයෙථ සබ්බං. **භද්‍රාවුධා**'ති **භගවා** -පෙ-

**උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙති**: 'උද්ධං' වුච්චති[3] අනාගතං, අධො වුච්චති අතීතං, තිරියං චාපි මජ්ඣෙති පච්චුප්පන්නං. උද්ධන්ති දෙවලොකො, අධොති නිරයලොකො, තිරියඤ්චාපි මජ්ඣෙති මනුස්සලොකො. උද්ධන්ති කුසලා ධම්මා, අධොති අකුසලා ධම්මා, තිරියඤ්චාපි මජ්ඣෙති අබ්‍යාකතා ධම්මා, උද්ධන්ති සුඛා වෙදනා, අධොති දුක්ඛා වෙදනා තිරියඤ්චාපි මජ්ඣෙති අදුක්ඛමසුඛා වෙදනා. උද්ධන්ති අරූපධාතු අධොති කාමධාතු, තිරියඤ්චාපි මජ්ඣෙති රූපධාතු. උද්ධන්ති උද්ධං පාදතලා, අධොති අධො කෙසමත්ථකා, තිරියඤ්චාපි මජ්ඣෙති වෙමජ්ඣෙති 'උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ.'

---

1. වාපි – සත
2. අපාදානතණ්හං –ප– ආදානතණ්හං – ම ජ සං.
3. උද්ධන්ති – ම ජ සං, උද්ධන්ති වුච්චති – සනං.

**තථා හි තෙ විදිතො එස ධම්මො**– යම් හෙයකින් මුඹ වහන්සේ විසින් තෙල දහම එපරිද්දෙන් දන්නාලද ද තුලනය කරනලද ද තීරණය කරන ලද ද ප්‍රකට කරන ලද ද විභාවන කරන ලද ද එහෙයිනැ යි.

එයින් කී යැ එ බමුණු:

**"නානා ජනා ජනපදෙහි –පෙ– තථා හි තෙ විදිතො එස ධම්මො යි.**

---

## 12–3

**(බුදුහු මෙසේ වදාළහ: හද්‍රාවුධය,)** අතීතානාගතවර්තමානයෙහි වූ හැම ආදානතෘෂ්ණාව (තෘෂ්ණෝපාදනය) දුරු කරවූ, යම් හෙයෙකින් ලොවැ (අතීතරූපාදි) යම් යම් වස්තුවක් දැඩි කොට ගනිත් ද එහෙයින් මැ ස්කන්‍ධමාර තෙම සත්ත්වයා අනු වැ යේ.

**ආදානතණ්හං විනයෙථ සබ්බං** – 'ආදානතණ්හා' යි රූපතෘෂ්ණාව කියනුලැබෙයි ...**ආදාන තණ්හා**– යි කවර කරුණෙකින් **'ආදානතණ්හා'**යි කියනු ලැබේ ද යත්: ඒ තෘෂ්ණායෙන් රූපය ආදානය කෙරෙති උපාදානය කෙරෙති ගනිති පරාමර්ශ කෙරෙති අභිනිවෙශ කෙරෙත්. වෙදනාව–සංඥාව–සංස්කාරයන්–විඥානය–ගතිය–උත්පත්තිය– ප්‍රතිසන්ධිය– භවය– සංසාරය වර්තය ආදානය උපාදානය ග්‍රහණය පරාමර්ශය අභිනිවෙශය කෙරෙත්. එ කරුණෙන් 'ආදානතණ්හා' යි කියනු ලැබේ. **විනයෙථ සබ්බං**– සියලු ආදානතෘෂ්ණාව හරනේ යැ වෙසෙසින් හරනේ යැ දුරු කරන්නේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනු අභාවයට පමුණුවන්නේ නුයි 'ආදානතණ්හං විනයෙථ සබ්බං' යනු වේ. **හද්‍රාවුධා' ති භගවා...**

**උද්ධං අධො තිරියඤ්චා'පි මජ්ඣෙ**– 'උද්ධං' යි අනාගතය කියනු ලැබෙයි, **අධො** යි අතීතය කියනු ලැබෙයි, තිරියඤ්චා'පි මජ්ඣෙ යනු වර්තමානය යි. **උද්ධං** යනු දේවලෝක යැ, අධො යනු නිරයලෝක යැ, තිරියඤ්චාපි මජ්ඣෙ යනු මනුෂ්‍යලෝක යි. **උද්ධං** යනු කුශලධර්මයෝ යැ, අධො යනු අකුශලධර්මයෝ යැ, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු අව්‍යාකෘත ධර්මයෝ යි. **උද්ධං** යනු සුඛවෙදනා යැ, අධො යනු දුඃඛවෙදනා යැ **තිරියඤ්චාපි මජ්ඣෙ** යනු උපෙක්ෂා වෙදනා යි. **උද්ධං** යනු අරූපධාතු යැ **අධො** යනු කාමධාතු යැ, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු රූපධාතු යි. **උද්ධං** යනු පාදතලයෙන් උඩ යැ, අධො යනු කේශමස්තකයෙන් යට යැ, **තිරියඤ්චා'පි මජ්ඣෙ** යනු වෙමධ්‍යයෙහි නුයි 'උද්ධං අධො තිරියඤ්චා' **පි මජ්ඣෙ'** යනු වේ.

**යං යං හි ලොකස්මිං උපාදියන්තීති:** යං යං රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සංඛාරගතං[1] විඤ්ඤාණගතං ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති. **ලොකස්මින්ති:** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති 'යං යං හි ලොකස්මිං උපාදියන්ති.'

**තෙනෙව මාරො අන්වෙති ජන්තුන්ති:** තෙනෙව කම්මාභිසංඛාරවසෙන පටිසන්ධිකො ඛන්ධමාරො ධාතුමාරො ආයතනමාරො ගතිමාරො උපපත්තිමාරො පටිසන්ධිමාරො භවමාරො සංසාරමාරො වට්ටමාරො අන්වෙති අනුගච්ඡති අන්වායිකො හොති. **ජන්තුන්ති** සත්තං නරං මානවං පොසං පුග්ගලං ජීවං ජාගුං ජන්තුං ඉන්දගුං (හින්දගුං) මනුජන්ති තෙනෙව මාරො අන්වෙති ජන්තුං.

තෙනාහ භගවා:

"ආදානතණ්හං විනයෙථ සබ්බං (භද්‍රාවුධාති භගවා)
උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ,
යං යං හි ලොකස්මිං උපාදියන්ති
තෙනෙව මාරො අන්වෙති ජන්තුන්ති.

---

12–4

තස්මා පජානං න උපාදියෙථ
භික්ඛු සතො කිඤ්චනං සබ්බලොකෙ,
ආදානසත්තෙ ඉති පෙක්ඛමානො
පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තං.

**තස්මා පජානං න උපාදියෙථාති:** 'තස්මා'ති: තස්මා තංකාරණා තංහෙතු තංපච්චයා[2] තන්නිදානා, එතං ආදීනවං සම්පස්සමානො ආදානතණ්හායා'ති 'තස්මා.' **පජානන්ති:** ජානන්තො පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො.' සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති ජානන්තො පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති -පෙ- 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති ජානන්තො පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො. **න උපාදියෙථාති** රූපං නාදියෙය්‍ය න උපාදියෙය්‍ය න ගණ්හෙය්‍ය න පරාමසෙය්‍ය නාභිනිවිසෙය්‍ය වෙදනං– සඤ්ඤං– සඞ්ඛාරෙ– විඤ්ඤාණං– ගතිං– උපපත්තිං– පටිසන්ධිං– භවං– සංසාරං– වට්ටං නාදියෙය්‍ය න උපාදියෙය්‍ය න ගණ්හෙය්‍ය න පරාමසෙය්‍ය නාභිනිවිසෙය්‍යා'ති 'තස්මා පජානං න උපාදියෙථ.'

---

1. අභිසංඛාරගතං -පං-
2. තප්පච්චයා -ච-වි-ක. ම ජ සං

**යං යං හි ලොකස්මිං උපාදියන්ති**– යම් යම් රූපගතයක් වෙදනාගතයක් සංඥාගතයක් සංස්කාරගතයක් විඥානගතයක් ආදනය උපාදනය ග්‍රහණය පරාමර්ශනය අභිනිවේෂය කෙරෙත් ද, ලොකස්මිං යනු: අපායලෝකයෙහි ...ආයතනලෝකයෙහි නුයි 'යං යං හි ලොකස්මිං උපාදියන්ති' යනු වේ.

**තෙනෙව මාරො අන්වෙති ජන්තුං**–එ මැ (උපාදන ප්‍රත්‍යයෙන් උපන්) කර්මාභිසංස්කාරයන්ගේ වශයෙන් ප්‍රතිසන්ධික වූ ස්කන්ධමාර ධාතුමාර ආයතනමාර ගතිමාර උපපත්තිමාර ප්‍රතිසන්ධිමාර භවමාර සංසාරමාර වෘත්තමාර තෙමේ අනු වැ යෙයි අනුගමනය කෙරෙයි අනු වැ යන්නේ වේ. **ජන්තු** යනු: සත්ත්ව– නර– මානව– පුරුෂ– පුද්ගල– ජීව– ජාගු– ජන්තු– ඉන්දගු – (හින්දගු) මනුජයා නුයි 'තෙනෙව මාරො අන්වෙති ජන්තුං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**"ආදානතණ්හං –පෙ– තෙනෙව මාරො අන්වෙති ජන්තුං"** යි.

---

## 12–4

එහෙයින් ස්මෘතිමත් වූ (සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන්) දන්නා වූ මහණ තෙම මේ ප්‍රජාව මෘත්‍යුධෙයයෙහි ඇලිනැ'යි දක්මින් (රූපාදි) ආදනයෙහි ඇලුණු සියලු ලොවැ (රූපාදි) කිසිවක් නො ගන්නේ යැ'යි.

**තස්මා පජානං න උපාදියෙථ**– 'තස්මා' යනු: එහෙයින් එ කරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදනයෙන් ආදනතෘෂ්ණාව පිළිබඳ වූ තෙල ආදීනවය දක්නේ නුයි 'තස්මා' යනු වේ. **පජානං** යනු දන්නේ ප්‍රකර්ෂයෙන් දන්නේ හාත්පසින් දන්නේ වෙසෙසින් දන්නේ ප්‍රතිජානනය කරන්නේ ප්‍රතිවෙධ කරනුයේ, සියලු සංස්කාරයෝ අනිත්‍යහ'යි දන්නේ ප්‍රකර්ෂයෙන් දන්නේ හාත්පසින් දන්නේ වෙසෙසින් දන්නේ ප්‍රතිජානනය කරන්නේ ප්‍රතිවෙධ කරනුයේ, සියලු සංස්කාරයෝ දුඃඛහ'යි ...යම්කිසි සමුදය ධර්මයෙක් වේ නම් එ හැම නිරුද්ධ වන සවභාවය ඇතැ'යි දන්නේ ප්‍රකර්ෂයෙන් දන්නේ හාත්පසින් දන්නේ වෙසෙසින් දන්නේ ප්‍රතිජානනය කරන්නේ ප්‍රතිවෙධ කරනුයේ. **න උපාදියෙථ** යනු: රූපය නො ගන්නේ යැ උපාදනය නො කරන්නේ යැ ග්‍රහණය නො කරන්නේ යැ අභිනිවෙශය නො කරන්නේ යැ, වෙදනාව– සංඥාව– සංස්කාරයන්– විඥානය– ගතිය– උපප්‍රාප්තිය– ප්‍රතිසන්ධිය– භවය– සංසාරය– වර්ත්තය– ආදනය නො කරන්නේ යැ උපාදනය– ග්‍රහණය– පරාමර්ශය– අභිනිවෙශය නො කරන්නේ නුයි 'තස්මා පජානං න උපාදියෙථ' යනු වේ.

**භික්ඛු සතො කිඤ්චනං සබ්බලොකෙති:** භික්ඛූති පුථුජ්ජනකල්‍යාණකො වා භික්ඛු, සෙඛො වා[1] භික්ඛු. සතොති චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනා සතිපට්ඨානං භාවෙන්තො සතො -පෙ- සො වුච්චති සතොති 'භික්ඛු සතො.' කිඤ්චනන්ති: කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං. සබ්බලොකෙති: සබ්බඅපායලොකෙ සබ්බමනුස්සලොකෙ සබ්බදෙවලොකෙ සබ්බඛන්ධලොකෙ සබ්බධාතුලොකෙ සබ්බආයතනලොකෙති 'භික්ඛුසතො කිඤ්චනං සබ්බලොකෙ.'

**ආදානසත්තෙ ඉති පෙක්ඛමානොති:** 'ආදානසත්තා' වුච්චන්ති යෙ රූපං ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති, වෙදනං- සඤ්ඤං- සඞ්ඛාරෙ- විඤ්ඤාණං- ගතිං- උපපත්තිං- පටිසන්ධිං- භවං- සංසාරං- වට්ටං- ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති. ඉතීති පදසන්ධි -පෙ- පදානුපුබ්බතා මෙතං ඉතීති. පෙක්ඛමානොති දක්ඛමානො දිස්සමානො පස්සමානො ඔලොකියමානො නිජ්ඣායමානො උපනිජ්ඣායමානො උපපරික්ඛමානොති 'ආදානසත්තෙ ඉති පෙක්ඛමානො'.

**පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තන්ති:** 'පජා'ති සත්තාධිවචනං' මච්චුධෙය්‍යා වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච. පජා මච්චුධෙය්‍යෙ මාරධෙය්‍යෙ මරණධෙය්‍යෙ සත්තා විසත්තා ආසත්තා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා. යථා භිත්තිඛිලෙ වා නාගදන්තෙ වා භණ්ඩං සත්තං විසත්තං ආසත්තං ලග්ගං ලග්ගිතං පලිබුද්ධං, එවමෙවං පජා මච්චුධෙය්‍යෙ මාරධෙය්‍යෙ මරණධෙය්‍යෙ සත්තා විසත්තා ආසත්තා ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තං.'

**තෙනාහ භගවා:**

"තස්මා පජානං න උපාදියෙථ
භික්ඛු සතො කිඤ්චනං සබ්බලොකෙ,
ආදානසත්තෙ ඉති පෙක්ඛමානො
පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්ත"න්ති.

සහ ගාථා පරියොසානා -පෙ- සත්ථා මෙ භන්තෙ, භගවා සාවකොහමස්මී'ති.

**භද්‍රාවුධ සුත්තනිද්දෙසො සමත්තො.**

1. සෙක්ඛො වා -ප-ච-වි-ක ම ජ සං

**භික්ඛු සතො කිඤ්චනං සබ්බලොකෙ**– 'භික්ඛු' යනු: පෘථග්ජන කල්‍යාණ භික්ෂු හෝ ශෛක්ෂ භික්ෂු හෝ යැ. **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ කයෙහි කායානුපස්සනා සීවටන් වඩමින් සිහි ඇතියේ... හේ සිහි ඇතියේ යැ යි කියනු ලැබෙනුයි 'භික්ඛු සතො' යනු වේ. **'කිඤ්චනං'** යනු: කිසි රූපගතයක් වෙදනාගතයක් සංඥාගතයක් සංස්කාර ගතයක් විඥානගතයක්. **'සබ්බලොකෙ'**– සියලු අපාය ලෝකයෙහි සියලු මනුෂ්‍යලෝකයෙහි සියලු දේවලෝකයෙහි සියලු ස්කන්ධලොකයෙහි සියලු ධාතුලෝකයෙහි සියලු ආයතනලෝකයෙහි නුයි 'භික්ඛු සතො කිඤ්චනං සබ්බලොකෙ' යනු වේ.

**ආදනසත්ත ඉති පෙක්ඛමානො**– යම් කෙනෙක් රූපය ආදනය කෙරෙත් ද උපාදනය ග්‍රහණය පරාමර්ශය අභිනිවෙශය කෙරෙත් ද, වෙදනාව– සංඥාව– සංස්කාරයන්–විඥානය– ගතිය–උපප්‍රාප්තිය– ප්‍රතිසන්ධිය– භවය– සංසාරය– වර්තය ආදනය කෙරෙත් ද, උපාදනය– ග්‍රහණය– පරාමර්ශය– අභිනිවෙශය කෙරෙත් ද ඔහු 'ආදනසත්ත' කියනු ලැබෙත්. **ඉති** යනු පද සන්ධි යැ ... පදනුපූර්වතා යැ තෙල 'ඉති' යනු. **පෙක්ඛමානො**– දක්නේ බලනුයේ අවලෝකනය කරනුයේ සිතනුයේ පුනපුනා සිතනුයේ පිරික්සනුයේ නුයි 'ආදන සත්තෙ ඉති පෙක්ඛමානො' යනු වේ.

**පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තං**– 'පජා' යනු: සත්ත්වයනට නමෙකි. **මච්චුධෙය්‍ය** යි ක්ලෙශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද කියනු ලැබෙත්. ප්‍රජා තොමෝ මෘත්‍යුධෙයයෙහි මාරධෙයයෙහි මරණධෙයයෙහි ඇලුණි යැ වෙසෙසින් ඇලුණි යැ හාත්පසින් ඇලුණි යැ ලග්න වූ යැ ලග්නිත වූ යැ පරිරුද්ධ වූ යැ යම්සේ භිත්ති බිලයෙකැ හෝ නාගදන්තයෙකැ හෝ භාණ්ඩයෙක් සක්ත විසක්ත ආසක්ත ලග්න ලග්නිත පරිරුද්ධ වේ ද එසෙයින් ප්‍රජ තොමෝ මෘත්‍යුධෙයයෙහි මාරධෙයයෙහි මරණධෙයයෙහි සක්ත යැ විසක්ත යැ ආසක්ත යැ ලග්න යැ ලග්නිත යැ පරිරුද්ධ නු යි 'පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**"තස්මා පජානං න උපාදියෙථ –පෙ– පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තං" යි.**

ගාථා පර්‍ය්‍යවසානය හා සමග ... වහන්ස, බුදුහු මාගේ ශාස්තෘ යැ, මම ශ්‍රාවකයෙමි'යි.

**හද්‍රාවුධ සූත්‍රනිර්දේශය නිමි.**

## 13. උදය සුත්තනිද්දෙසො

### 13–1

ඣායිං විරජමාසීනං (ඉච්චායස්මා උදයො)
කතකිච්චං අනාසවං,
පාරගුං සබ්බධම්මානං,
අත්ථි පඤ්හෙන ආගමං
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑහි
අවිජ්ජාය පභෙදනං.

**ඣායිං විරජමාසීනන්ති:** ඣායීති ඣායී භගවා, පඨමෙනපි ඣානෙන ඣායී, දුතියෙනපි ඣානෙන ඣායී, තතියෙනපි ඣානෙන ඣායී, චතුත්ථෙනපි ඣානෙන ඣායී, සවිතක්ක සවිචාරෙනපි ඣානෙන ඣායී, අවිතක්කවිචාරමත්තෙනපි ඣානෙන ඣායී, අවිතක්කඅවිචාරෙනපි ඣානෙන ඣායී, සප්පීතිකෙනපි ඣානෙන ඣායී, නිප්පීතිකෙනපි ඣානෙන ඣායී, සාතසහගතෙනපි ඣානෙන ඣායී, උපෙක්ඛාසහගතෙනපි ඣානෙන ඣායී, සුඤ්ඤතෙනපි ඣානෙන ඣායී, අනිමිත්තෙනපි ඣානෙන ඣායී, අප්පණිහිතෙනපි ඣානෙන ඣායී, ලොකියෙනපි ඣානෙන ඣායී, ලොකුත්තරෙනපි ඣානෙන ඣායී. ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකොති ඣායී. **විරජන්ති:** රාගො රජො, දොසො රජො, මොහො රජො, කොධො රජො, උපනාහො රජො -පෙ- සබ්බ කුසලාභිසංඛාරා රජා. තෙ රජා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො අරජො විරජො නිරජො රජාපගතො රජවිප්පහීනො රජවිප්පමුත්තො[1] සබ්බරජවීතිවත්තො.

1. "රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජ්ඣිත්වා[2] චක්ඛුමා
තස්මා ජිනො විගතරජොති වුච්චති.

2. දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා චක්ඛුමා
තස්මා ජිනො විගතරජොති වුච්චති.

---

1. විප්පමුත්තා -ප.
2. විප්පජහිත්වා -ම ජ සං.

# 13. උදය සූත්‍රනිර්දේශය

## 13–1

(ආයුෂ්මත් උදය මෙසේ විචාරයි:) ධ්‍යාන කරන සුලු වූ විගතරජස් ඇති වැ වැඩහුන් සිව්මහින් කළ (සොළොස් වැදැරුම්) කිස ඇති අනාඃ‍ද්‍රව සියලු ධර්මයන් ගේ පරතෙර පැමිණි භාග්‍යවතුන් වහන්සේ කරා ප්‍රශ්න යෙන් අර්ථී වැ ආයෙමි, අවිද්‍යාව බිඳුනා අඤ්ඤාවිමොක්ඛ සඞ්ඛ්‍යාත ජිවන වදළ මැනැව.

**ඣායිං විරජමාසිනං**– ''ඣායී'' යනු: බුදුහු ධ්‍යාන කරන සුල්ලහ. ප්‍රථම ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, ද්විතීය ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, තෘතීය ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, චතුර්ත්ථධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, සවිතර්ක සවිචාරධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, අවිතර්කවිචාර මාත්‍ර ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, අවිතර්ක අවිචාර ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, සප්‍රීතික ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, නිෂ්ප්‍රීතික ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, සුඛවෙදනා සහගත ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, උපෙක්ෂාසහගත ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, ශූන්‍යත වූ ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, අනිමිත්ත වූ ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, අප්‍රණිහිත වූ ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, ලෞකික ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, ලොකොත්තර ධ්‍යානයෙනුදු ධ්‍යාන කෙරෙති, ධ්‍යානයෙහි ඇලුණාහු යැ එකත්වයෙහි යෙදුණාහු යැ, ස්වාර්ත්ථ සඞ්ඛ්‍යාත අර්හත්වය ගරු කරන්නාහු නුයි 'ඣායී' නම් වෙත්. **විරජං** යනු: රාගය රජසෙක, ද්වෙෂය රජසෙක, මොහය රජසෙක, ක්‍රොධය රජසෙක, බද්ධවෛරය රජසෙක ... හැම අකුශලාභිසංස්කාරයෝ රජස්හු යැ, ඒ රජස්හු භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහාණය කරන ලද්දහු මුලුසුන් කරන ලද්දහු මුල් උදුළ තල්වත්තක් සෙයින් කරන ලද්දහු අනුඅභාවය කරන ලද්දහු ආයතිභවයෙහි නුපදනා පියවි ඇතියහ. එයින් බුදුහු කෙලෙස් නැතියහ පහවූ කෙලෙස් ඇතියහ බැහැර කළ කෙලෙස් ඇතියහ කෙලෙසින් දුරු වූහ කෙලෙස් ප්‍රහීණයහ කෙලෙසින් මිදුණහ හැම කෙලෙසුන් ඉක්ම සිටියහ.

1. රාගය රජසෙකි. ධූලි වූකලි 'රජස්' යි නොද කියනු ලැබෙයි, තෙල 'රජස්' යනු රාගයට නමෙකි. යම්හෙයෙකින් පසැස් ඇති බුදුහු තෙල රාග රජස දුරු කොට සිටිසේක් ද එහෙයින් පස්මරුන් දිනූ බුදුහු 'පහවූ රාග රජස් ඇත්තාහ'යි කියනු ලැබෙති.

2. ද්වෙෂය රජසෙකි. ධූලි වූකලි 'රජස්' යි නොද කියනු ලැබෙයි, තෙල 'රජස්' යනු ද්වෙෂයට නමෙකි. යම්හෙයෙකින් පසැස් ඇති බුදුහු තෙල ද්වෙෂරජස දුරු කොට සිටිසේක් ද එහෙයින් පස්මරුන් දිනූ බුදුහු 'පහවූ ද්වෙෂ රජස් ඇත්තාහ'යි කියනු ලැබෙති.

3. මොහො රජො න ච පන රෙණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා චක්ඛුමා
තස්මා ජිනො විගතරජොති වුච්චති''ති.

විරජං.

ආසීනන්ති: නිසින්නො භගවා පාසාණකෙ චෙතියෙති[1] ආසීනො.

4. ''නගස්ස පස්සෙ ආසීනං මුනිං දුක්ඛස්ස පාරගුං,
සාවකා පයිරුපාසන්ති තෙවිජ්ජා මච්චුහායිනො''ති.

එවම්පි භගවා ආසීනො, අථවා භගවා සබ්බොස්සුක්කපටිප්පස්සද්ධත්තා ආසීනො, වුත්ථවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො''ති එවම්පි භගවා ආසීනොති ඣායිං විරජමාසීනං ඉච්චායස්මා උදයො -පෙ-

කතකිච්චං අනාසවන්ති: බුද්ධස්ස භගවතො කිච්චාකිච්චං කරණීයාකරණීයං පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං[2] ආයතිං අනුප්පාදධම්මං, තස්මා බුද්ධො කතකිච්චො.

5. ''යස්ස ච විසතා[3] නත්ථි ඡින්නසොතස්ස භික්ඛුනො,
කිච්චාකිච්චපහීනස්ස[4] පරිළාහො න විජ්ජතී''ති

කතකිච්චං අනාසවන්ති: 'ආසවා'ති චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො. තෙ ආසවා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා තස්මා බුද්ධො අනාසවොති 'කතකිච්චං අනාසවං.'

පාරගුං සබ්බධම්මානන්ති: භගවා[5] අභිඤ්ඤාපාරගූ, පරිඤ්ඤාපාරගූ පහානපාරගූ[6], භාවනාපාරගූ[7], සච්ඡිකිරියාපාරගූ[8], සමාපත්තිපාරගූ, අභිඤ්ඤාපාරගූ, සබ්බධම්මානං, පරිඤ්ඤාපාරගූ සබ්බදුක්ඛානං, පහානපාරගූ[6] සබ්බකිලෙසානං, භාවනාපාරගූ චතුන්නං මග්ගානං, සච්ඡිකිරියාපාරගූ[8] නිරොධස්ස,

1. චෙතියෙ ආසීනො–ච-වි-ක.
2. අනභාවංගතං –ච–වි-ක.
අනභාවංකතං –ම ජ සං.
3. විසත්තා –ස්‍යා.
4. කිච්චා කිච්චං පහීනස්ස –ස්‍යා.
5. භගවා සබ්බ ධම්මානං –ම ජ සං, ස්‍යා.
6. පහානාය පාරගූ –ප.
7. භාවනාය පාරගූ –වි.
8. සච්ඡිකිරියාය පාරගූ –වි.

3. මෝහය රජසෙකි, ධූලි වූකලි 'රජස්' යි නොද කියනු ලැබෙයි, තෙල 'රජස්' යනු මොහයට නමෙකි. යම්හෙයෙකින් පසැස් ඇති බුදුහු තෙල මොහරජස දුරු කොට සිටිසේක් ද එහෙයින් පස්මරුන් දිනූ බුදුහු 'පහවූ මෝහරජස් ඇත්තාහ'යි කියනු ලැබෙත් නුයි .

'විරජං' යනු වෙ.

ආසීනං යනු: බුදුහු පහණ සැයෙහි වැඩහුන්නාහු නුයි ''ආසීන'' වූහ.

4. පර්වතපාර්ශ්වයෙහි වැඩහුන් වෘත්තදුඃඛයාගේ පරතෙරට ගිය ජුතිහු ත්‍රිවිද්‍යා ඇති පස්මරුන් දුරු කළ ශ්‍රාවකයෝ ඇසුරු කෙරෙත් නුයි,

මෙසේත් බුදුහු 'ආසීන' වූහ. නොහොත් බුදුහු සියලු ක්ලේශොත්සුක යන් දුරු ලූ හෙයින් ''ආසීනයහ. වැස නිමවූ ආයර්‍යවාස ඇත්තාහු පරිචිත වූ චරණධර්ම ඇත්තාහ ... ඒ භාග්‍යවත්හට පුනර්භව සඞ්ඛ්‍යාත වූ ජාතිමරණ සංසාරය නැත් නුයි මෙසේත් බුහුදු 'ආසීන' වූවාහු නුයි ''ඣායිං විරජමාසීනං'' යනු වේ. මෙසෙයින් ආයුෂ්මත් උදය...

කතකිච්චං අනාසවං යනු: භාග්‍යවත් බුදුන් විසින් කෘත්‍යාකෘත්‍යය කටයුතු නො කටයුතු ප්‍රහීණ යැ, උසුන්මුල් ඇත්තේ යැ, මුල් උදුළ තාල වස්තුවක් මෙන් කරන ලද, අනු අභාවය කරන ලද, මත්තෙහි නූපදනා සැහැවි ඇත්තේ යි එහෙයින් බුදුහු කෘතකෘත්‍යයහ.

5. සිඳුනාලද තෘෂ්ණාස්‍රොතස් ඇති යම් මහණක්හට රූපාදියෙහි පැතුරුණු තෘෂ්ණා නැද්ද, කෘත්‍යාකෘත්‍ය ප්‍රහීණ කළ ඒ මහණහට (ක්ලෙශ) පරිදහයෙක් නැතැ'යි.

කතකිච්චං අනාසවං– 'අනාසවා' යනු: ආස්‍රව සතරෙකි: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි. ඒ ආස්‍රවයෝ භාග්‍යවත් බුදුනට ප්‍රහීණයෝ යැ උසුන් මුල් ඇත්තාහු යැ (මුල් උදුළ) තාලවාස්තුවක් මෙන් කරන ලද්දහු යැ අනු අභාවය කරන ලද්දහු යැ මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු'යැ. එහෙයින් බුදුහු අනාස්‍රව වූවාහු නු යි 'කතකිච්චං අනාසවං' යනු වෙ.

පාරගුං සබ්බධම්මානං– බුදුහු අභිඥායෙන් පාරයට ගියහ, පරිඥා පාරයට ගියහ, ප්‍රහාණපාරයට ගියහ, භාවනාපාරයට ගියහ, සච්ඡිකිරියා පාරයට ගියහ, සමාපත්තිපාරයට ගියහ, සියලු (පඤ්චස්කන්ධාදි) ධර්ම යන්ගේ අභිඥා සඞ්ඛ්‍යාත ඥාන පරිඥායෙන් නිර්වාණපාරයට ගියහ, සියලු (ජාත්‍යාදි) දුඃඛයන් ගේ තීරණ පරිඥායෙන් පාරය ට ගියහ, සියලු (කාය දුශ්චරිතාදි) ක්ලේශයන්ගේ ප්‍රහාණ පරිඥායෙන් පාරයට ගියහ, ස්‍රොතාපත්‍යාදි සතර මාර්ගයන්ගේ භාවනායෙන් පාරයට ගියහ, ඵලනිර්වාණ වශයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිර්වාණයාගේ පාරයට ගියහ

සමාපත්තිපාරගූ සබ්බසමාපත්තීනං, සො වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සීලස්මිං වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සමාධිස්මිං වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය පඤ්ඤාය, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය විමුත්තියා. සො පාරගතො පාරප්පත්තො අන්තගතො අන්තප්පත්තො, කොටිගතො කොටිප්පත්තො, පරියන්තගතො පරියන්තප්පත්තො, වොසානගතො වොසානප්පත්තො, තාණගතො තාණප්පත්තො, ලෙනගතො ලෙනප්පත්තො, සරණගතො සරණප්පත්තො, අභයගතො අභයප්පත්තො, අච්චුතගතො[1] අච්චුතප්පත්තො, අමතගතො අමතප්පත්තො, නිබ්බානගතො නිබ්බානප්පත්තො. සො වුට්ඨවාසො –පෙ– නත්ථි තස්ස පුනබ්භවොති 'පාරගුං සබ්බධම්මානං'.

අත්ථි පඤ්හෙන ආගමන්ති: පඤ්හෙන අත්ථිකම්හ[2] ආගතා, පඤ්හං පුච්ඡිතුකාමම්හ ආගතා[3], පඤ්හං සොතුකාමා ආගතම්හාති 'එවම්පි 'අත්ථි පඤ්හෙන ආගමං' අථවා පඤ්හත්ථිකානං පඤ්හං පුච්ඡිතුකාමානං පඤ්හං සොතුකාමානං. ආගමනං අභික්කමනං[4] උපසඞ්කමනං පයිරුපාසනං අත්ථි, එවම්පි අත්ථි පඤ්හෙන ආගමං, අථවා පඤ්හාගමො තුය්හං අත්ථි, ත්වම්පි පහු, ත්වමසි අලමත්තො මයා පුච්ඡිතං කථෙතුං විස්සජ්ජෙතුං, වහස්සෙතං භාරන්ති එවම්පි 'අත්ථි පඤ්හෙන ආගමං'.

අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූහීති: ''අඤ්ඤාවිමොක්ඛො' වුච්චති අරහත්තවිමොක්ඛො, අරහත්තවිමොක්ඛං පබ්‍රූහි ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති 'අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූහි'

අවිජ්ජාය පභෙදනන්ති අවිජ්ජාය භෙදනං පභෙදනං පහානං වූපසමො[5] පටිනිස්සග්ගො[6] පටිප්පස්සද්ධං අමතං නිබ්බානන්ති 'අවිජ්ජාය පභෙදනං'

තෙනාහ සො බ්‍රාහ්මණො:

ඣායිං විරජමාසීනං (ඉච්චායස්මා උදයො)
කතකිච්චං අනාසවං,
පාරගුං සබ්බධම්මානං
අත්ථි පඤ්හෙන ආගමං
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූහි
අවිජ්ජාය පභෙදන''න්ති

1. අච්චුතිගතො –ස.
2. අත්ථිකො ආගතොම්හි –ම ජ සං.
3. ආගතො –ම ජ සං.
4. අභික්කමනං –ච–වි–ක.
5. වූපසමං –ම ජ සං.
6. පටිනිස්සට්ඨං–පත–පටිනිස්සග්ගං –ම ජ සං.

සියලු රූපා රූප සමාපත්තීන්ගේ සමාපත්තියෙන් පාරයට ගියහ. ඒ බුදුහු ආර්‍ය්‍යශීලයෙහි වශීභාවයට අවසානයට පැමිණියහ, ආර්‍ය්‍යසමාධියෙහි වශීභාවයට පරතෙරට පැමිණියහ, ආර්‍ය්‍යප්‍රඥායෙහි වශීභාවයට පරතෙරට පැමිණියහ, ආර්‍ය්‍යවිමුක්තියෙහි වශීභාවයට පරතෙරට පැමිණියහ. ඒ බුදුහු මාර්ගයෙන් පරතෙරට ගියහ, ඵලයෙන් පරතෙරට පැමිණියහ. (මාර්ගයෙන් සංස්කාර ලොකයෙහි) අන්තයට ගියහ, (ඵලයෙන්) අන්තයට පැමිණියහ. (මාර්ගයෙන් සංස්කාරයන් ගේ) කෙළවරට ගියහ, (ඵලයෙන්) කෙළවරට පැමිණියහ. (මාර්ගයෙන් ආයතනාදි ලොකයෙහි) පර්‍ය්‍යන්තයට ගියහ, (ඵලයෙන්) පර්‍ය්‍යන්තයට පැමිණියහ. (මාර්ගයෙන්) අවසානයට ගියහ, (ඵලයෙන්) අවසානයට පැමිණියහ. (මාර්ගයෙන්) ත්‍රාණයට ගියහ, (ඵලයෙන්) ත්‍රාණ ප්‍රාප්තයහ. (මාර්ගයෙන්) ලෙනයට ගියහ, (ඵලයෙන්) ලෙන ප්‍රාප්තයහ. සරණයට ගියහ, සරණ ප්‍රාප්තයහ. අභයට ගියහ අභයප්‍රාප්තයහ. අච්‍යුතයට ගියහ, අච්‍යුතයට පැමිණියහ. අමෘතයට ගියහ, අමෘතයට පැමිණියහ. නිර්වාණයට ගියහ, නිර්වාණප්‍රාප්තයහ. ඒ බුදුහු (දශවිධ ආර්‍ය්‍යවාසය) වැස නිමවූහ ...ඒ සර්වඥයන්ට පුනර්භවයෙක් නැත් නුයි 'පාරගුං සබ්බධම්මානං' යනු වේ.

අත්ථි පඤ්හෙන ආගමං යනු: ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇති වැ ආම්හ, පැන පුළුවුස්නා කැමැති වැ ආම්හ, ප්‍රශ්න අසනු කැමැති වැ ආම්හ' යි මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇතියන් ගේ පැන පුළුවුස්නා කැමැතියන් ගේ ප්‍රශ්න අසනු කැමැතියන්ගේ ඊමෙක් පෙරට ඊමෙක් එළැඹීමෙක් පර්‍ය්‍යුපාසනයෙක් ඇත් නුයි මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් මුඹ වහන්සේට ප්‍රශ්නාගමයෙක් ඇති, මුඹ වහන්සේ වැළිත් ප්‍රභූ වූවහු යැ මා විසින් පුළුවුස්නා ලද්ද කියන්නට විසඳන්නට මුඹ වහන්සේ සමර්ථය වූ යැ, තෙල භාරය උසුලනු මැනැවැ යි මෙසේ ත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ.

අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑහි– 'අඤ්ඤාවිමොක්ඛ' යි අර්හත්ඵල විමොක්ෂය කියනු ලැබෙයි, අර්හත් ඵල විමොක්ෂය වදළ මැනැව කිව මැනැව දෙසනු මැනැව පනවනු මැනැව විවරණය කළ මැනැව විභාග කළ මැනැව ප්‍රකට කළ මැනැව ප්‍රකාශ කළ මැනැව නුයි 'අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑහි' යනු වේ.

අවිජ්ජාය පභෙදනං– අවිද්‍යාව බිඳීම ප්‍රකර්ෂයෙන් බිඳීම ප්‍රහාණය ව්‍යුපශමය දුරැලීම සන්හිඳුවීම අමාමහනිවන නුයි 'අවිජ්ජාය පභෙදනං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

"ඣායිං විරජමාසීනං – පෙ– අවිජ්ජාය පභෙදනං" යි.

13-2

පහානං කාමච්ඡන්දානං (උදයාති භගවා)
දොමනස්සාන චූභයං,
ථීනස්ස ච[1] පනූදනං
කුක්කුච්චානං නිවාරණං.

පහානං කාමච්ඡන්දානන්ති: 'ඡන්දෝ'ති "යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දී කාමතණ්හා කාමසිනෙහො කාමපිපාසා කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමූපාදානං කාමච්ඡන්දනීවරණං." පහානං කාමච්ඡන්දානන්ති: කාමච්ඡන්දානං පහානං වූපසමං පටිනිස්සග්ගං පටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති 'පහානං කාමච්ඡන්දානං'. උදයාති භගවාති -පෙ-

දොමනස්සානචූභයන්ති: දොමනස්ස'න්ති[2] "යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා. දොමනස්සාන චූභයන්ති: කාමච්ඡන්දස්ස ච දොමනස්සස්ස ච උභින්නං පහානං වූපසමො පටිනිස්සග්ගො පටිප්පස්සද්ධි අමතං නිබ්බානන්ති 'දොමනස්සානචූභයං.'

ථීනස්ස ච පනූදනන්ති: 'ථීන'න්ති 'යා චිත්තස්ස අකල්ලතා[3] අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථීනං ථීයනා ථීයිතත්තං චිත්තස්ස." ථීනස්ස ච පනූදනන්ති: ථීනස්ස ච පනූදනං පහානං වූපසමො[4] පටිනිස්සග්ගො පටිප්පස්සද්ධි අමතං නිබ්බානන්ති ථීනස්ස ච පනූදනං.'

කුක්කුච්චානං නිවාරණන්ති: 'කුක්කුච්ච'න්ති: හත්ථකුක්කුච්චම්පි කුක්කුච්චං පාදකුක්කුච්චම්පි කුක්කුච්චං, හත්ථපාදකුක්කුච්චම්පි කුක්කුච්චං. අකප්පියෙ කප්පියසඤ්ඤිතා, කප්පියෙ අකප්පියසඤ්ඤිතා, අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා. "යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ඉදං වුච්චති කුක්කුච්චං'.

1. ථීනස්ස -ම ඡ සං
2. දොමනස්සාති -ම ඡ සං, සහං.
3. අකල්‍යතා -ප -ච-වි-ක, ම ඡ සං.
4. වූපසමං -ම ඡ සං.

13–2

(බුදුහු මෙසේ වදළහ: උදය, ) කාමච්ඡන්දයන් ගේ ද දෞර්මනස්‍යයන්-ගේ ද යන දෙදෙනාගේ ප්‍රහාණය ද ථීනමිද්ධයා ගේ දුරලීම ද කෞකෘත්‍ය-යාගේ වැළැකීම ද ඇති.

**පහානං කාමච්ඡන්දනං**– 'ඡන්දෙ' යනු: වස්තුකාමයෙහි යම් කාමච්-ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නෙහ යෙක් කාමපිපාසායෙක් කාමපරිදහයෙක් කාමමූර්ඡායෙක් කාමයන්හි බැස ගැනීමෙක් කාමඕඝයෙක් කාම යොගයෙක් කාම උපාදනයෙක් කාමච්ඡන්ද නිවරණයෙක් වේ ද එය යි. **පහානං කාමච්ඡන්දනං**– කාමච්ඡන්දයන්ගේ ප්‍රහාණය සන්හිඳීම දුරලීම ප්‍රතිප්‍රශ්‍රබ්ධිය අමාමහනිවන නුයි 'පහානං කාමච්ඡන්දනං' යනු වේ. **උදයාති භගවා...**

**දොමනස්සානවූභයං** – 'දොමනස්සං' යනු: චෛතසික වූ යම් අමධුර බවෙක් චෛතසික දුකෙක් චිත්තසංස්පර්ශයෙන් උපන් අමධුර වූ දුඃඛ වෙදනායෙක් වේද, චිත්තසංස්පර්ශයෙන් උපන් අමධුර වූ දුඃඛවෙදයිත-යෙක් වේ ද, චිත්තසංස්පර්ශයෙන් උපන් අසාත වූ දුඃඛවෙදනායෙක් වේ ද එය යි. **දොමනස්සානවූභයං**– කාමච්ඡන්දයාගේ ද දෞර්මනස්‍යයා ගේ ද යන දෙදෙනාගේ ප්‍රහාණය සන්හිඳීම දුරලීම ප්‍රතිප්‍රශ්‍රබ්ධිය අමාමහනිවන නුයි 'දොමනස්සානවූභයං'' යනු වේ.

**ථිනස්ස ච පනූදනං**– 'ථීනං' යනු: චිත්තයාගේ යම් ගිලන්බවෙක් අකර්මණ්‍යබවෙක් එලෙන අයුරෙක් හැකිළීමෙක් වෙසෙසින් එලෙන අයුරෙක් හැකිළීමෙක් හැකිළෙන අයුරෙක් හැකිළෙන බවෙක් චිත්තයාගේ නො පැතිරීමෙක් නො පැතිරෙන අයුරෙක් වේ ද එය යි. **ථිනස්ස ච පනූදනං** – ථීනයාගේ ද බැහැර කිරීම ප්‍රහාණය ව්‍යුපශමය දුරලීම ප්‍රතිප්‍රශ්‍රබ්ධිය අමෘත සඞ්ඛ්‍යාත නිර්වාණය නුයි ''ථිනස්ස ච පනූදනං'' යනු වේ.

**කුක්කුච්චානං නිවාරණං** – 'කුක්කුච්ච' නම්: අත්කුකුස ද කුකුස් යැ, පාකුකුස ද කුකුස්යැ, අත්පා කුකුස ද කුකුස්යැ, අකැපයෙහි කැප සංඥා ඇති බව යැ, කැපයෙහි අකැප සංඥා ඇති බව යැ, අවද්‍යයෙහි වද්‍යසංඥා ඇති බව යැ, වද්‍යයෙහි අවද්‍යසංඥා ඇති බව යැ, මෙබඳු වූ යම් කුකුසක් කුකුස් අයුරෙක් කුකුසට පැමිණිබවෙක් චිත්තයාගේ විපිළිසරයෙක් මනොවිලෙඛයෙක් වේ නම් මේ කුකුසැ යි කියනු ලැබේ.

අපි ච ද්වීහි කාරණෙහි උප්පජ්ජති කුක්කුච්චං: චෙතසො විප්පටිසාරො
මනොවිලෙඛො, කතත්තා ච අකතත්තා ච[1]. කථං කතත්තා ච
අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනො
විලෙඛො: 'කතං මෙ කායදුච්චරිතං අකතං මෙ කායසුචරි-
ත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො'
කතං මෙ වචීදුච්චරිතං අකතං මෙ වචීසුචරිත'න්ති -පෙ- කතං
මෙ මනොදුච්චරිතං අකතං මෙ මනොසුචරිත'න්ති -පෙ-
කතො මෙ පාණාතිපාතො අකතා මෙ පාණාතිපාතා වෙරමණීති
-පෙ- කතං මෙ අදින්නාදානං අකතා මෙ අදින්නාදානා වෙරමණීති -පෙ-
කතො මෙ කාමෙසු මිච්ඡාචාරො අකතා මෙ කාමෙසු මිච්ඡාචාරා
වෙරමණීති -පෙ- කතො මෙ මුසාවාදො අකතා මෙ මුසාවාදා වෙරමණීති
-පෙ- කතා මෙ පිසුනාවාචා අකතා මෙ පිසුනාය වාචාය වෙරමණීති
-පෙ- කතා මෙ ඵරුසාවාචා අකතා මෙ ඵරුසාය වාචාය වෙරමණීති -පෙ-
කතො මෙ සම්ඵප්පලාපො අකතා මෙ සම්ඵප්පලාපා වෙරමණීති
-පෙ- කතා මෙ අභිජ්ඣා අකතා මෙ අනභිජ්ඣාති -පෙ- කතො මෙ
ව්‍යාපාදො අකතො මෙ අබ්‍යාපාදොති -පෙ- කතා මෙ මිච්ඡාදිට්ඨි
අකතා මෙ සම්මාදිට්ඨීති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො
මනොවිලෙඛො. එවං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං
චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො.

අථවා 'සීලෙසුම්හි න පරිපූරකාරී'ති[2] උප්පජ්ජති කුක්කුච්චං
චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරො'ති-
භොජනෙ අමත්තඤ්ඤුම්හීති- ජාගරියං අනනුයුත්තොම්හීති- න සතිසම්ප
ජඤ්ඤෙන සමන්නාගතොම්හීති- අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති-
අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති- අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති-
අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති- අභාවිතානි මෙ පඤ්චබලානීති- අභාවිතා
මෙ සත්ත බොජ්ඣඞ්ගාති- අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති-
දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති- සමුදයො මෙ අප්පහීනොති- මග්ගො මෙ
අභාවිතොති නිරොධො මෙ අසච්ඡිකතොති උප්පජ්ජති කුක්කුච්චං
චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. කුක්කුච්චානං නිවාරණන්ති:
කුක්කුච්චානං ආවරණං නීවරණං පහානං වූපසමො[3] පටිනිස්සග්ගො
පටිප්පස්සද්ධි[4] අමතං නිබ්බානන්ති කුක්කුච්චානං නිවාරණං.

තෙනාහ භගවා:

"පහානං කාමච්ඡන්දානං (උදයාති භගවා...)
දොමනස්සාන චූභයං,
ථීනස්ස ච පනූදනං
කුක්කුච්චානං නිවාරණ"න්ති.

1. කටත්තාච අකටත්තාච -පත
2. අපරිපූරකාරීති -ම ජ සං.
3. උපසමං වූපසමං -ම ජ සං.
4. පටිනිස්සග්ගං පටිප්පස්සද්ධිං -ම ජ සං.

තවද දෙ කරුණෙකින් කුකුස චිත්තයාගේ විපිළිසර මනොවිලේඛය උපදී: කළ බැවින් ද නො කළ බැවින් ඇ යි කිසෙයින් කළ බැවින් ද නො කළ බැවින් ද කුකුස සිත්හි විපිළිසර මනොවිලෙඛය උපදී ද යත්: 'මා විසින් කායදුශ්චරිතය කරන ලද, මා විසින් කායසුචරිතය නොකරන ලද 'යි කුකුස චිත්තවිප්පටිසාරය මනොවිලෙඛය උපදී. 'මා විසින් වාග්දුශ්චරිතය කරන ලද මා විසින් වාක්සුචරිතය නො කරනලද'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. 'මා විසින් මනොදුශ්චරිතය කරන ලද මා විසින් මනස්සුචරිතය නො කරනලද'යි... 'මා විසින් ප්‍රාණවධ කරන ලද, මා විසින් ප්‍රාණඝාත විරමණය නො කරන ලද'යි කුකුස ... මනොවිලෙඛය උපදී. 'මා විසින් අදත්තාදනය කරන ලද-මා විසින් කාමමිථ්‍යාචාරය කරන ලද- මා විසින් මෘෂාවාද කියන ලද– මා විසින් පිසුණුබස් කියන ලද – මා විසින් පරොස්බස් කියන ලද– මා විසින් හිස්බස් කියන ලද– මා විසින් අභිධ්‍යා කරන ලද–මා විසින් ව්‍යාපාද කරන ලද- මා විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නා ලද, මා විසින් සම්‍යග්දෘෂ්ටි නො ගන්නාලද'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදියි. මෙසෙයින් කෘත හෙයින් ද අකෘත හෙයින් ද කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී.

නොහොත් 'ප්‍රාතිමොක්ෂශීලයෙහි පරිපූරකාරී නො වූයෙමි' කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදියි, ඉන්ද්‍රියයන්හි අගොපිතද්වාර ඇත්තෙම් වූයෙමි ... භොජනයෙහි අමාත්‍රඥයෙම් විමි... නිදි දුරු කිරීමෙහි නො යෙදුණෙම් වීමි ... ස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් යුක්තයෙම් නො වූයෙමි... මා විසින් සතර සතිපට්ඨානයෝ නො වඩන ලදහ යි ... මා විසින් සතර සම්‍යක්ප්‍රධානයෝ නො වඩන ලදහ යි ... මා විසින් සතර ඍද්ධිපාදයෝ නො වඩන ලදහ යි ... මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ නො වඩන ලදහ යි ... මා විසින් පඤ්චබලයෝ නො වඩනලදහ යි... මා විසින් සප්තබොධ්‍යඞ්ගයෝ නො වඩන ලදහ යි ... මා විසින් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය නො වඩන ලද ... යි මා විසින් දුඃඛසත්‍යය අපරිඥාත යැ යි... මා විසින් සමුදය අප්‍රහීණ යැ යි ... මා විසින් මාර්ගය නොවඩන ලදයි... මා විසින් නිරොධය ප්‍රත්‍යක්ෂ නො කරන ලද යි කෞකෘත්‍යය චිත්තයාගේ විප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. කුක්කුච්චානං නිවාරණං යනු: කෞකෘත්‍යයන්ගේ ඇවිරීම වැළහීම ප්‍රහාණය සන්හිඳීම දුරළීම නොපැවැත්ම අමෘත සඞ්ඛ්‍යාත වූ නිර්වාණය නුයි 'කුක්කුච්චානං නිවාරණං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පහානං කාමච්ඡන්දනං –පෙ– කුක්කුච්චානං නිවාරණං" යි.

13–3

උපෙක්ඛාසතිසංසුද්ධං
ධම්මතක්කපුරෙජවං,
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූමි[1]
අවිජ්ජාය පභෙදනං.

**උපෙක්ඛාසතිසංසුද්ධන්ති**: 'උපෙක්ඛා'ති යා චතුත්ථෙ ඣානෙ[2] උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා චිත්තසමථො[3] චිත්තප්පසාදතා[4] මජ්ඣත්තතා චිත්තස්ස. සතීති: "යා චතුත්ථෙ ඣානෙ උපෙක්ඛං ආරබ්භ සති අනුස්සති –පෙ– සම්මාසති". උපෙක්ඛාසතිසංසුද්ධන්ති: චතුත්ථෙ ඣානෙ උපෙක්ඛා ච සති ච සුද්ධා හොන්ති විසුද්ධා සංසුද්ධා පරිසුද්ධා පරියොදාතා අනඞ්ගණා විගතූපක්කිලෙසා මුදුභූතා කම්මනියා ඨිතා ආනෙඤ්ජප්පත්තාති 'උපෙක්ඛාසති සංසුද්ධං'.

**ධම්මතක්කපුරෙජවන්ති**: 'ධම්මතක්කො' වුච්චති සම්මාසංකප්පො, සො ආදිතො හොති, පුරතො හොති, පුබ්බඞ්ගමො හොති, අඤ්ඤාවිමොක්ඛස්සාති එවම්පි 'ධම්මතක්කපුරෙජවං'. අථවා 'ධම්මතක්කො' වුච්චති සම්මාදිට්ඨි, සා ආදිතො හොති, පුරතො හොති, පුබ්බඞ්ගමා[5] හොති, අඤ්ඤාවිමොක්ඛස්සාති එවම්පි 'ධම්මතක්කපුරෙජවං'. අථවා 'ධම්මතක්කො වුච්චති චතුන්නං මග්ගානං පුබ්බභාගවිපස්සනා[6]' සා ආදිතො හොති, පුරතො හොති, පුබ්බඞ්ගමා හොති අඤ්ඤාවිමොක්ඛස්සාති එවම්පි 'ධම්මතක්කපුරෙජවං'.

**අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූමීති**: 'අඤ්ඤාවිමොක්ඛො' වුච්චති අරහත්තවිමොක්ඛො, අරහත්තවිමොක්ඛං පබ්‍රූමි, ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති 'අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූමි'.

**අවිජ්ජාය පභෙදනන්ති**: 'අවිජ්ජා'ති "දුක්ඛෙ අඤ්ඤාණං –පෙ– අවිජ්ජා මොහො අකුසලමූලං." අවිජ්ජාය පභෙදනන්ති[7]: අවිජ්ජා පභෙදනං පහානං වූපසමො පටිනිස්සග්ගො පටිප්පස්සද්ධි අමතං නිබ්බානන්ති 'අවිජ්ජාය පභෙදනං'.

තෙනාහ භගවා:

"උපෙක්ඛාසතිසංසුද්ධං
ධම්මතක්කපුරෙජවං,
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූමි
අවිජ්ජාය පභෙදනන්ති."

---

1. සංබ්‍රූමි –ස්‍යා.
2. චතුත්ථජ්ඣානෙ –ස.
3. චිත්තස්ස සමතා –ච,වි,ක, චිත්තසමතා –ම ඡ සං.
4. චිත්තප්පසාදතා –ස්‍යා. චිත්තප්පසද්ධතා –ම ඡ සං. චිත්තප්පසත්තා–සං
5. පුබ්බඞ්ගමො –ම ඡ සං.
6. විපස්සනා ආදිතො හොති –ප.
7. පභෙදනාති –ච–වි–ක, ම ඡ සං

13–3

චතුර්ථධ්‍යානොපෙක්ෂා ස්මෘති දෙකින් සංශුද්ධිය ඇති ධර්මතර්ක සඞ්ඛ්‍යාත සම්‍යක් සංකල්පය පෙරටු කොට ඇති අර්හත් ඵලවිමොක්ෂය අවිද්‍යාවගේ බිඳීම යැ යි ප්‍රකාශ කරමි.

**උපෙකඛාසතිසංසුද්ධං**– 'උපෙක්ඛා' යනු: චතුර්ත්ථධ්‍යානයෙහි යම් උපෙක්ෂාවක් උපෙක්ෂා කරන අයුරෙක් අධ්‍යුපෙක්ෂණයෙක් චිත්තයාගේ අනූනාධික බවෙක් චිත්තයාගේ මැදහත් බවෙක් වේ ද එය යි. **සති** යනු: චතුර්ථධ්‍යානයෙහි උපෙක්ෂාව අරභයා (උපන්) යම් ස්මෘතියක් අනුස්මෘතියක් ... සම්‍යක් ස්මෘතියක් වේ ද එය යි. **උපෙකඛා සතිසංසුද්ධං** – චතුර්ථධ්‍යානයෙහි උපෙක්ෂාව ද ස්මෘතිය ද ශුද්ධ වූවාහු විශුද්ධ වූවාහු වෙසෙසින් ශුද්ධ වූවාහු භාත්පසින් ශුද්ධ වූවාහු ප්‍රභාස්වර වූවාහු නිර්දෙෂ වූවාහු උපක්ලෙශ රහිත වූවාහු මෘදු වූවාහු කර්මක්ෂම වූවාහු ස්ථිත වූවාහු නිශ්චල බවට පැමිණියාහු වෙත් නුයි 'උපෙක්ඛා සතිසංසුද්ධං' යනු වේ.

**ධම්මතක්කපුරෙජවං** – 'ධම්මතක්ක' යි සම්‍යක් සංකල්පය කියනු ලැබෙයි. ඒ අඤ්ඤාවිමොක්ඛය (රහත් මඟ) ට ආදියෙහි වෙයි පෙරටුයෙහි වෙයි පෙරදැරි වේ නු යි මෙසේත් 'ධම්මතක්කපුරෙජවං' යනු වේ. නොහොත් 'ධම්මතක්ක' යි සම්‍යග්දෘෂ්ටිය කියනු ලැබෙයි. ඕ ආඤ්ඤාවිමොක්ඛයට ආදියෙහි වෙයි, පෙරටුයෙහි වෙයි, පූර්වඞ්ගම වේනුයි මෙසේත් 'ධම්මතක්කපුරෙජවං'' යනු වේ. නොහොත් 'ධම්මතක්ක' යි සතර මාර්ගයන්ගේ පූර්වභාගවිදර්ශනාව කියනු ලැබෙයි. ඕ අඤ්ඤාවිමොක්ඛයට ආදියෙහි වෙයි, පෙරටුයෙහි වෙයි, පූර්වඞ්ගම වේ නුයි මෙසේත් 'ධම්මතක්කපුරෙජවං' යනු වේ.

**අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූමි**– 'අඤ්ඤාවිමොක්ඛ' යි අර්හත්ව විමොක්ෂ (රහත්මඟ) කියනු ලැබෙයි. රහත් මඟ කියමි දක්වමි දෙසමි පනවමි පිහිටුවමි විවරණ කෙරෙමි විභාග කෙරෙමි ප්‍රකට කෙරෙමි ප්‍රකාශ කෙරෙමි නුයි 'අඤ්ඤාවිමොක්ඛං පබ්‍රූමි' යනු වේ.

**අවිජ්ජාය පභෙදනං**– 'අවිජ්ජා' යනු: දුක නො දැනීම ...අවිද්‍යාව මෝහ අකුශලමූලය යි. අවිජ්ජාය පභෙදනං යනු: අවිද්‍යාව බිඳීම ප්‍රහාණය සන්හිඳීම දුරැලීම නො පැවැත්ම අමාමහනිවන නු යි 'අවිජ්ජාය පභෙදනං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**''උපෙකඛාසති සංසුද්ධං –පෙ– අවිජ්ජාය පභෙදනං''** යි.

13-4

කිං සු සංයොජනො ලොකො
කිං සු තස්ස විචාරණං,
කිස්සස්ස විප්පහානෙන
නිබ්බානං ඉති වුච්චති.

**කිං සු සංයොජනො ලොකොති**: කිං ලොකස්ස සංයොජනං ලග්ගනං බන්ධනං උපක්කිලෙසො, කෙන ලොකො යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තො ලග්ගො ලග්ගිතො පලිබුද්ධොති 'කිං සු සංයොජනො ලොකො.'

**කිං සු තස්ස විචාරණන්ති**: 'කිං තස්ස' චාරණං[1] විචාරණං පටිවිචාරණං කෙන ලොකො චරති විචරති පටිවිචරතීති 'කිං සු තස්ස විචාරණං.'

**කිස්සස්ස විප්පහානෙන නිබ්බානං ඉති වුච්චතීති**: කිස්සස්ස විප්පහානෙන වූපසමෙන පටිනිස්සග්ගෙන පටිප්පස්සද්ධියා, නිබ්බානං ඉති වුච්චති පවුච්චති කථීයති භණීයති දීපීයති වොහරීයතීති 'කිස්සස්ස විප්පහානෙන නිබ්බානං ඉති වුච්චති'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"කිං සු සංයොජනො ලොකො
කිං සු තස්ස විචාරණං,
කිස්සස්ස විප්පහානෙන
නිබ්බානං ඉති වුච්චතී"ති.

---

13-5

නන්දිසංයොජනො ලොකො
විතක්කස්ස විචාරණං
තණ්හාය විප්පහානෙන
නිබ්බානං ඉති වුච්චති.

**නන්දිසංයොජනො ලොකොති**: 'නන්දි' වුච්චති තණ්හා, "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසල මූලං" අයං වුච්චති නන්දි. යා නන්දි ලොකස්ස සංයොජනං ලග්ගනං බන්ධනං උපක්කිලෙසො, ඉමාය නන්දියා ලොකො යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තො ලග්ගො ලග්ගිතො පලිබුද්ධොති 'නන්දිසංයොජනො ලොකො.'

1. විචාරණා -ම ජ සං, සයා.
කිං ලොකස්ස විචාරණං -ප.

13–4

(ආයුෂ්මත් උදය මෙසේ විචාරයි:) ලෝවැසි තෙම කුමක් සංයොජන කොට ඇත්තේ ද? ඒ ලෝ වැසියා ගේ විචරණය (හැසිරීමට කරුණ) කිම? කිනම් දහමක්හු ගේ ප්‍රහාණයෙන් 'නිවනැ' යි කියනු ලැබේ ද?

**කිං සු සංයොජනො ලොකො** – ලෝවැසියාගේ සංයොජනය ලැගීම බන්ධනය උපක්ලේශය කිම? ලෝවැසි තෙම කුමකින් යුක්ත වූයේ ප්‍රයුක්ත වූයේ වෙසෙසින් යෙදුණේ එක් වැ යෙදුණේ ලග්න වූයේ ලග්නිත වූයේ නො හැර සිටියේ නුයි 'කිංසු සංයොජනො ලොකො' යනු වේ.

**කිං සු තස්ස විචාරණං** – ඒ ලෝවැසියාගේ හැසිරීම වෙසෙසින් හැසිරීම පුනපුනා හැසිරීම කිම? ලෝ වැසි තෙම කුමක් කරණ කොට හැසිරෙයි වෙසෙසින් හැසිරෙයි පුන පුනා හැසිරේ ද නුයි 'කිං සු තස්ස විචාරණං' යනු වේ.

**කිස්සස්ස විප්පහානෙන නිබ්බානං ඉති වුච්චති** – කවර ධර්මයක් හුගේ ප්‍රහාණයෙන් ව්‍යුපශම යෙන් දුරැලීමෙන් නො පැවැත්මෙන් 'නිර්වාණ' යයි කියනු ලැබෙයි පවසනු ලැබෙයි කථනය කරනු ලැබෙයි බණනු ලැබෙයි දක්වනු ලැබෙයි වහරනු ලැබේ ද නුයි 'කිස්සස්ස විප්පහානෙන නිබ්බානං ඉති වුච්චති' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''කිං සු සංයොජනො ලොකො –පෙ– නිබ්බානං ඉති වුච්චති''**යි.

---

13–5

ලෝවැසි තෙම තෘෂ්ණාව සංයොජන කොට ඇත්තේ යැ විතර්කය ඔහුට විචාරණය වෙයි. තෘෂ්ණාවගේ ප්‍රහාණයෙන් 'නිවනැ' යි කියනු ලැබේ.

**නන්දිසංයොජනො ලොකො** – 'නන්දි' යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද මේ 'නන්දි' යි කියනු ලැබෙයි. යම් නන්දියක් ලෝවැසියාගේ සංයෝජනය ලැගීම බන්ධනය උපක්ලේශය වේ ද මේ නන්දියෙන් ලොකය යුක්ත වූයේ ප්‍රයුක්ත වූයේ වෙසෙසින් යුක්ත වූයේ එක් වැ යෙදුණේ ලග්න වූයේ ලග්නිත වූයේ පරිරුද්ධ වූයේ නුයි 'නන්දිසංයෝජනො ලොකො' යනු වේ.

**විතක්කස්ස විචාරණන්ති** 'විතක්කා'ති[1] නව විතක්කා: කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො ඤාතිවිතක්කො ජනපදවිතක්කො අමරවිතක්කො[2] පරානුද්දයතාපටිසංයුත්තො විතක්කො ලාභසක්කාරසිලොක පටිසංයුත්තො විතක්කො අනවඤ්ඤත්තිපටිසංයුත්තො විතක්කො ඉමෙ වුච්චන්ති නව විතක්කා. ඉමෙ නවවිතක්කා ලොකස්ස චාරණා විචාරණා පටිවිචාරණා. ඉමෙහි නවහි විතක්කෙහි ලොකො චරති විචරති පටිවිචරතීති 'විතක්කස්ස විචාරණං.'

**තණ්හාය විප්පහානෙන නිබ්බානං ඉති වුච්චතීති:** 'තණ්හා'ති රූපතණ්හා -පෙ- ධම්මතණ්හා, **තණ්හාය විප්පහානෙන නිබ්බානං ඉති වුච්චතීති:** තණ්හාය විප්පහානෙන වූපසමෙන පටිනිස්සග්ගෙන පටිප්පස්සද්ධියා නිබ්බානං ඉති වුච්චති පවුච්චති කථීයති භණීයති දීපීයති වොහරීයතීති 'තණ්හාය විප්පහානෙන නිබ්බානං ඉති වුච්චති.'

තෙනාහ භගවා:

"නන්දිසංයොජනො ලොකො
විතක්කස්ස විචාරණං,
තණ්හාය විප්පහානෙන
නිබ්බානං ඉති වුච්චතී"ති.

---

13–6

කථං සතස්ස චරතො
විඤ්ඤාණං උපරුජ්ඣති,
භගවන්තං පුට්ඨුමාගම්හා[3]
තං සුණොම වචො තව.

**කථං සතස්ස චරතොති:** කථං සතස්ස සම්පජානස්ස චරතො විචරතො[4] ඉරියතො වත්තයතො පාලයතො යපයතො යාපයතොති 'කථං සතස්ස චරතො'.

**විඤ්ඤාණං උපරුජ්ඣතීති** විඤ්ඤාණං නිරුජ්ඣති වූපසම්මති අත්ථං ගච්ඡති පටිප්පස්සම්භතීති 'විඤ්ඤාණං උපරුජ්ඣති'.

**භගවන්තං පුට්ඨුමාගම්හාති:** බුද්ධං භගවන්තං පුට්ඨුං පුච්ඡිතුං යාචිතුං අජ්ඣෙසිතුං පසාදෙතුං ආගම්හා ආගතම්හා උපාගතම්හා සම්පත්තම්හා තයා සද්ධිං සමාගතම්හාති 'භගවන්තං පුට්ඨුමාගම්හා'.

---

1. විතක්කාති –ම ජ සං, ස්‍යා.
2. අමරාවිතක්කො –ම ජ සං.
3. පුට්ඨුමාගමා –ම ජ සං. පුට්ඨුමාගමම –සු.
4. විහරතො – ව–ඊ–කස්‍යා ම ජ සං

**විතක්කස්ස විචාරණං**– 'විතක්ක' නම නව විතර්කයෙකි: කාමවිතර්ක යැ ව්‍යාපාදවිතර්ක යැ විහිංසා විතර්ක යැ ඥාතිවිතර්ක යැ ජනපදවිතර්ක යැ අමරවිතර්ක යැ පරානුද්දයතා ප්‍රතිසංයුක්ත විතර්ක යැ ලාභ සත්කාර ප්‍රශංසා ප්‍රතිසංයුක්තවිතර්ක යැ අනවඥාප්‍රතිසංයුක්ත විතර්ක යැ, මොහු නව විතර්කයෝ යැ යි කියනු ලැබෙත්. මෙ නව විතර්කයෝ චාරණ (පැවැත්මට කරුණ) විචාරණ පුනපුනා විචාරණයෝ වෙති. මෙ නව විතර්කයන් හේතු කොට ගෙන ලෝ වැසි තෙමේ හැසිරෙයි වෙසෙසින් හැසිරෙයි පුනපුනා හැසිරේ නුයි 'විතක්කස්ස විචාරණං' යනු වේ.

**තණ්හාය විප්පහාණෙන නිබ්බානං ඉති වුච්චති**– 'තණ්හා' යනු: රූප තෘෂ්ණා යැ ... ධර්මතෘෂ්ණා යි. **තණ්හාය විප්පහාණෙන නිබ්බානං ඉති වුච්චති**– තෘෂ්ණාව වෙසෙසින් ප්‍රහාණය කිරීමෙන් සන්හිඳුවීමෙන් දුරලී මෙන් නො පැවැත්මෙන් නිර්වාණය වේ යයි කියනු ලැබෙයි දක්වනු ලැබෙයි කථනය කරනු ලැබෙයි බණනු ලැබෙයි පවසනු ලැබෙයි වහරනු ලැබේ නුයි 'තණ්හාය විප්පහාණෙන නිබ්බානං ඉති වුච්චති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"නන්දිසංයොජනො ලොකො –පෙ– නිබ්බානං ඉති වුච්චති"**යි.

---

## 13–6

(ආයුෂ්මත් උදය මෙසේ විචාරයි) ස්මෘති සම්පන්න වැ වාසය කරන්නහු ගේ විඥානය කිසෙයින් නිරුද්ධ වේ ද? භාග්‍යවතුන් වහන්සේ පුළුවුස්නා සඳහා පැමිණියම්හ, මුඹ වහන්සේ ගේ ඒ වචනය අසම්හ.

**කථං සතස්ස චරතො** යනු: කිසෙයින් සිහි ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ හැසිරෙනුවහු ගේ වෙසෙසින් හැසිරෙනුවහු ගේ ඉරියවු පවත්වනුවහු ගේ වැටෙනුවහුගේ රැකෙනුවහු ගේ යැපෙනු වහුගේ යාපනය වන්නහු ගේ නුයි **'කථං සතස්සස්ස චරතො'** යනු වේ.

**විඤ්ඤාණං උපරුජ්ඣති**– අභිසංස්කාර විඥානය නිරුද්ධ වෙයි සන්හිඳෙයි අස්තයට යෙයි නො පවත්නේ වේ නුයි **'විඤ්ඤාණං උපරුජ්ඣති'** යනු වේ.

**භගවන්තං පුට්ඨුමාගම්හා**– භාග්‍යවත් බුදුන් පුළුවුස්නට විචාරන්නට යදනට අධ්‍යෙෂණයට ආම්හ ආවම්හ එළැඹියම්හ පැමිණියම්හ. මුඹ වහන්සේ හා එක් වූම්හ නුයි 'භගවන්තං පුට්ඨුමාගම්හා' යනු වේ.

තං සුණොම වචො තවාති: 'ත'න්ති තුය්හං වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං[1] සුණොම උග්ගණ්හාම ධාරෙම උපධාරෙම උපලක්ඛෙමාති 'තං සුණොම වචො තව'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"කථං සතස්ස චරතො
විඤ්ඤාණං උපරුජ්ඣති,
භගවන්තං පුට්ඨුමාගම්හා
තං සුණොම වචො තවා"ති.

---

13–7

අජ්ඣත්තඤ්ච බහිද්ධා ච
වෙදනං නාභිනන්දතො
එවං සතස්ස චරතො
විඤ්ඤාණං උපරුජ්ඣති.

අජ්ඣත්තඤ්ච බහිද්ධා ච වෙදනං නාභිනන්දතොති: අජ්ඣත්තං වෙදනාසු වෙදනානුපස්සී[2] විහරන්තො වෙදනං නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති[3] අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවංගමෙති බහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො වෙදනං නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. අජ්ඣත්තබහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො වෙදනං නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති.

අජ්ඣත්තං සමුදයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො වෙදනං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, අජ්ඣත්තං වයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො -පෙ- අජ්ඣත්තං සමුදයවයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො -පෙ- බහිද්ධා සමුදයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො වෙදනං නාභිනන්දති නාභිවදති

1. අනුසන්ධිං -ච-චි-ක, අනුසාසනං -ම ඡ. සං
2. අජ්ඣත්තං වෙදනං වෙදනානුපස්සී -ප, අජ්ඣත්තවෙදනානුපස්සී -වි.
3. අජ්ඣොසෙති -ම ඡ සං.

**තං සුණොම වචො තව** – "තං" යනු: මුඹ වහන්සේගේ වචනය වාක්පථය දෙසුම අනුසස්න අසම්භ උගනුම්භ ධරම්භ වෙසෙසින් ධරම්භ සලකම්භ නුයි 'තං සුණොම වචො තව' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"කථං සතසස චරතො –පෙ– තං සුණොම වචො තව" යි.**

---

## 13–7

අධ්‍යාත්මාලම්බනයෙහි ද වහිරාලම්බනයෙහි ද උපදනා වෙදනාව නො පතන, ස්මෘතිමත් වැ හැසිරෙනුවහු ගේ විඥානය මෙසේ නිරුද්ධ වේ යයි.

**අජඣතතඤච බහිදධා ච වෙදනං නාභිනනදතො–** අධ්‍යාත්ම වෙදනායෙහි වෙදනාව අනුව බලමින් වාස කරනුයේ වෙදනාවට සතුටු නො වෙයි නො පසසයි බැසගෙන නො සිටියි අභිනන්දනය අභිවදනය බැසගැනිම ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි. බාහිරවෙදනායෙහි වෙදනා අනුව බලමින් වාස කරනුයේ වෙදනාවට සතුටු නො වෙයි නො පසසයි බැසගෙන නො සිටියි අභිනන්දනය අභිවදනය බැසගැනිම ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි. අධ්‍යාත්මබාහ්‍යවෙදනායෙහි වෙදනාව අනුව බලමින් වාස කරනුයේ වෙදනාවට සතුටු නො වෙයි නො පසසයි බැස ගෙන නො සිටියි, අභිනන්දනය අභිවදනය බැසගැනිම ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි.

අධ්‍යාත්මයෙහි සමුදයධර්මයන් අනුව බලනසුලු වූයේ වෙදනායෙහි වෙදනා අනු වැ බලමින් වාස කරනුයේ වෙදනාවට සතුටු නො වෙයි නො පසසයි බැසගෙන නො සිටියි අභිනන්දනය අභිවදනය බැසගැනිම ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි. අධ්‍යාත්මයෙහි ව්‍යයධර්මයන් අනුවැ බලනසුලු වූයේ වෙදනායෙහි වෙදනා අනු වැ බලමින් වාස කරනුයේ... අධ්‍යාත්මයෙහි කලෙකැ සමුදයධර්මයන් කලෙකැ ව්‍යයධර්මයන් අනු වැ බලනසුලු වූයේ වෙදනායෙහි වෙදනානුදර්ශී වැ වාස කරන්නේ ... බාහ්‍ය වූ සමුදය ධර්මයන් අනුවැ බලනසුලු වූයේ වෙදනායෙහි වෙදනානු දර්ශී වැ වාස කරන්නේ වෙදනාවට සතුටු නො වෙයි, නො පසසයි,

න අජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාව ගමෙති. බහිද්ධා වයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො -පෙ- බහිද්ධා සමුදයවයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො -පෙ- අජ්ඣත්ත බහිද්ධා සමුදයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො -පෙ- අජ්ඣත්තබහිද්ධා වයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො -පෙ- අජ්ඣත්තබහිද්ධා[1] සමුදය වයධම්මානුපස්සී වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො වෙදනං නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. ඉමෙහි ද්වාදසහි ආකාරෙහි වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො – පෙ – අනභාවං ගමෙති.

අථවා වෙදනං අනිච්චතො පස්සන්තො වෙදනං නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. වෙදනං දුක්ඛතො – රොගතො – ගණ්ඩතො – සල්ලතො – අඝතො – ආබාධතො -පෙ- නිස්සරණතො පස්සන්තො වෙදනං නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. ඉමෙහි චතුචත්තාලීසාය ආකාරෙහි[2] වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො වෙදනං නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති 'අජ්ඣත්තඤ්ච බහිද්ධා ච වෙදනං නාභිනන්දතො'.

**එවං සතස්ස චරතොති:** එවං සතස්ස සම්පජානස්ස චරතො විචරතො[3] ඉරියතො වත්තයතො පාලයතො යපයතො යාපයතොති. 'එවං සතස්ස චරතො.'

**විඤ්ඤාණං උපරුජ්ඣතීති:** පුඤ්ඤාභිසඞ්ඛාරසහගතං විඤ්ඤාණං අපුඤ්ඤාභිසඞ්ඛාරසහගතං විඤ්ඤාණං ආනෙඤ්ජාභිසඞ්ඛාරසහගතං විඤ්ඤාණං නිරුජ්ඣති වූපසම්මති අත්ථං ගච්ඡති පටිප්පස්සම්භතීති 'විඤ්ඤාණං උපරුජ්ඣති.'

තෙනාහ භගවා:

"අජ්ඣත්තඤ්ච බහිද්ධා ච
වෙදනං නාභිනන්දතො,
එවං සතස්ස චරතො
විඤ්ඤාණං උපරුජ්ඣතීති.

සහගාථාපරියොසානා -පෙ- සත්ථා මෙ භන්තෙ, භගවා සාවකොහමස්මීති.

**උදය සුත්තනිද්දෙසො සමත්තො.**

1. බහිද්ධාසමුදය වය ධම්මානුපස්සී විහරන්තො -ප-ච-වි-ක.
2. ඉමෙහි චත්තාළීසාය ආකාරෙහි– ම ජ සං. ඉමෙහි ද්වාචත්තාළීසාය –ස්‍යා.
3. විහරතො -ච-වි-ක, ම ජ සං.

බැසගෙන නො සිටියි අභිනන්දනය අභිවදනය අධ්‍යවසානය ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි බාහිර වෙදනායෙහි ව්‍යයධර්මයන් අනු වැ දක්නා සුලු වූයේ වෙදනානුදර්ශී වැ වාස කරනුයේ ... බාහ්‍යවෙදනායෙහි සමුදය ව්‍යය ධර්මයන් අනු වැ දක්නා සුලු වූයේ වෙදනානුදර්ශීවැ වාස කරන්නේ... කලෙකැ අධ්‍යාත්මයෙහි කලෙකැ බාහ්‍යයෙහි සමුදයව්‍යය ධර්මයන් අනු වැ බලන සුලු වූයේ වෙදනායෙහි වෙදනානුදර්ශී වැ වාස කරන්නේ වෙදනා වට සතුටු නො වෙයි නො පසසයි බැසගෙන නො සිටියි අභිනන්දනය අභිවදනය බැසගැනීම ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි, මේ දෙළොස් අයුරින් වෙදනායෙහි වෙදනානුදර්ශී වැ වාස කරනුයේ ... අනභාවයට පමුණුවයි.

නොහොත් වෙදනාව අනිත්‍ය වශයෙන් දක්නේ වෙදනාවට සතුටු නො වෙයි නො පසසයි බැසගෙන නො සිටියි අභිනන්දනය අභිවදනය ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරුකෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි. වෙදනාව දුක් හෙයින්– රොග හෙයින්– ගඩ හෙයින්– ශල්‍ය හෙයින් අඝ හෙයින්– ආබාධ හෙයින් ... නිස්සරණ හෙයින් දක්නේ වෙදනාවට සතුටු නොවෙයි නො පසසයි බැසගෙන නො සිටියි අභිනන්දනය අභිවදනය ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවයි. මේ සූසාලිස් අයුරින් වෙදනායෙහි වෙදනානුදර්ශී වැ වාස කරනුයේ වෙදනාවට සතුටු නො වෙයි නො පසසයි බැසගෙන නොසිටියි අභිනන්දනය අභිවදනය ග්‍රාහය පරාමර්ශය අභිනිවෙශය දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නුයි 'අජ්ඣත්තඤ්ච බහිද්ධාච වෙදනං නාභිනන්දතො' යනු වේ.

**එවං සතස්ස චරතො** – මෙසේ සිහි ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ හැසිරෙනුවහුට වෙසෙසින් හැසිරෙනුවහුට ඉරියවු පවත්වනුවහුට වැටෙනු වහුට රකෙනුවහුට යැපෙනුවහුට යාපනය වන්නහුට නුයි 'එවං සතස්ස චරතො' යනු වේ.

**විඤ්ඤාණං උපරුජ්ඣති** – පුණ්‍යාභිසංස්කාර සහගත වූ විඥානය අපුණ්‍යාභිසංස්කාර සහගත වූ විඥානය ආනෙඤ්ජාභිසංස්කාර සහගත වූ විඥානය නිරුද්ධ වෙයි සන්හිඳෙයි අස්තයට යෙයි නො පවති නුයි ''විඤ්ඤාණං උපරුජ්ඣති' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**අජ්ඣත්තඤ්ච බහිද්ධා ච –පෙ– විඤ්ඤාණං උපරුජ්ඣති'' යි.**

ගාථාදේශනාවසානය හා සමඟ ... වහන්ස, භාග්‍යවත්හු මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවක යෙමි'යි.

**උදය සූත්‍රනිර්දේශය නිමි.**

# 14. පොසාල සුත්තනිද්දෙසො

## 14-1

"යො අතීතං ආදිසති (ඉච්චායස්මා පොසාලො)
අනෙජො ඡින්නසංසයො,
පාරගුං සබ්බධම්මානං
අත්ථි පඤ්හෙන ආගමං.

**යො අතීතං ආදිසතීති:** 'යො'ති "යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො බලෙසු ච වසීභාවං අතීතං ආදිසතීති භගවා අත්තනො ච පරෙසං ච අතීතම්පි ආදිසති අනාගතම්පි ආදිසති පච්චුප්පන්නම්පි ආදිසති. කථං භගවා අත්තනො අතීතං ආදිසති: භගවා අත්තනො අතීතං එකම්පි ජාතිං ආදිසති, ද්වෙපි ජාතියො ආදිසති, තිස්සොපි ජාතියො ආදිසති චතස්සොපි ජාතියො ආදිසති, පඤ්චපි ජාතියො ආදිසති, දසපි ජාතියො ආදිසති, වීසම්පි ජාතියො ආදිසති, තිංසම්පි ජාතියො ආදිසති, චත්තාලීසම්පි ජාතියො ආදිසති, පඤ්ඤාසම්පි– ජාතියො ආදිසති, ජාතිසතම්පි– ජාතිසහස්සම්පි– ජාතිසතසහස්සම්පි– අනෙකෙපි සංවට්ටකප්පෙ– අනෙකෙපි විවට්ටකප්පෙ– අනෙකෙපි සංවට්ට විවට්ටකප්පෙ ආදිසති: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදිං තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො 'ඉධූපපන්නොති' ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං ආදිසති. එවං භගවා අත්තනො අතීතං ආදිසති.

කථං භගවා පරෙසං අතීතං ආදිසති: භගවා පරෙසං අතීතං එකම්පි ජාතිං ආදිසති, ද්වෙපි ජාතියො ආදිසති –පෙ– අනෙකෙපි සංවට්ට විවට්ටකප්පෙ ආදිසති අමුත්‍රාසි එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදි තත්‍රාපාසි එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නොති[1] ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං ආදිසති, එවං භගවා පරෙසං අතීතං ආදිසති.

1. ඉධූපපන්නොති –ය–ව–ඩ–ක.

# 14. පෝසාල සූත්‍රනිර්දේශය

## 14–1

(ආයුෂ්මත් පෝසාල මෙසේ විචාරයි:) තෘෂ්ණා රහිත වූ සිඳුනා ලද සැක ඇති යම් සර්වඥ කෙනෙක් ස්වකීය වූ ද පරකීය වූ ද අතීතය (පූර්වෙ-නිවාසානුස්මෘතිඥානයෙන්) ප්‍රකාශ කෙරෙත් ද, සියලු ධර්මයන් ගේ පරතෙරට ගිය ඒ සර්වඥයන් කරා ප්‍රශ්නයෙන් අර්ථී වැ ආයෙමි.

යො අතීතං ආදිසති – 'යො' යනු: යම් භාග්‍යවත් කෙනෙක් ස්වයම්භූ වූවාහු (තමනට) ආචාර්‍ය්‍යයන් නැත්තාහු පෙර නොඇසූ සිව්සස් දහම්හි සත්‍යයන් තුමූ අවබෝධ කළසේක් ද එහිදූ සර්වඥභාවයට පැමිණියාහු බලධර්මයන්හි දූ වශීභාවයට පැමිණියාහු වෙත් ද උන්වහන්සේ යැ. අතීතං ආදිසති යනු: බුදුහු තමන්ගේ ද මෙරමාගේ ද අතීතයත් වදරති අනාගතයත් වදරති වර්තමානයත් වදරත්. කිසෙයින් බුදුහු තමන්ගේ අතීතය වදරත්ද යත්: බුදුහු තමන්ගේ අතීතය එක් ජාතියකුදු වදරති ජාති දෙකකුදු වදරති ජාති තුනකුදු වදරති ජාති සතරකුදු වදරති ජාති පසකුදු වදරති ජාති දසයකුදු– ජාති විස්සකුදු– ජාති තිසකුදු– ජාති සතලිසකදු–ජාති පනසකුදු– ජාති සියයකුදු– ජාති දහසකුදු– ජාති සුවහසකුදු– නො එක් සංවර්ත්තකල්පයනුදු–නො එක් විවර්ත්තකල්පයනුදු– නො එක් සංවර්ත්ත-විවර්ත්තකල්පයනුදු වදරති: අසෝ තැන මෙබඳු නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු පැහැ සටහන් ඇතියෙම් මෙ බඳු ආහාර ඇතියෙම් මෙ බඳු සුවදුක් විඳුනා සුලු වූයෙම් මෙබඳු ආයුඃපර්යන්ත ඇතියෙම් වීමි, ඒ මම එතැනින් ච්‍යුත වැ අසෝ තැන උපන්මි, එහිදු මෙබඳු නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු පැහැසටහන් ඇතියෙම් මෙබඳු ආහාර ඇතියෙම් මෙබඳු සුවදුක් විඳුනා සුලු වූයෙම් මෙබඳු ආයුඃපර්‍ය්‍යන්ත ඇති-යෙම් වීමි, ඒ මම එතැනින් ච්‍යුත වැ මෙහි උපන්මි. මෙසේ ආකාර සහිත වූ උද්දේස සහිත වූ අනේකවිධ වූ පූර්වෙනිවාසය වදරති. මෙසෙයින් බුදුහු තමන් වහන්සේ ගේ අතීතය වදරත්.

කිසෙයින් බුදුහු මෙරමා ගේ අතීතය වදරති යැ යත්: බුදුහු මෙරමා ගේ අතීතය එක් ජාතියකුදු වදරති ජාති දෙකකුදු වදරති ...නො එක් සංවර්ත විවර්තකල්පයනුදු වදරති: අසෝ තැන මෙබඳු නම් ඇතියේ මෙබඳු ගොත්‍ර ඇතියේ මෙබඳු පැහැසටහන් ඇතියේ මෙබඳු ආහාර ඇතියේ මෙබඳු සුවදුක් විඳුනේ මෙබඳු ආයුඃපර්‍ය්‍යන්ත ඇතියේ විය. හේ එතැනින් ච්‍යුත වැ අසෝ තැන උපන, එහිදු මෙබඳු නම් ඇත්තේ මෙබඳු ගොත්‍ර ඇත්තේ මෙබඳු පැහැසටහන් ඇත්තේ මෙබඳු ආහාර ඇත්තේ මෙබඳු සුවදුක් විඳුනේ මෙබඳු ආයුඃ පර්‍ය්‍යන්ත ඇත්තේ විය. හේ එයින් ච්‍යුත වැ මෙහි උපනැ'යි මෙසේ ආකාර සහිත වූ උද්දේස සහිත වූ අනේකවිධ වූ පූර්වෙනිවාසය වදරති. මෙසෙයින් බුදුහු මෙරමාගේ අතීතය වදරත්.

භගවා පඤ්ච ජාතකසතානි[1] භාසන්තො අත්තනො ච පරෙසං ච අතීතං ආදිසති, මහාපදානියසුත්තං[2] භාසන්තො අත්තනො ච පරෙසං ච අතීතං ආදිසති, මහාසුදස්සනියසුත්තං භාසන්තො අත්තනො ච පරෙසං ච අතීතං ආදිසති, මහාගොවින්දියසුත්තං භාසන්තො අත්තනො ච පරෙසං ච අතීතං ආදිසති, මඝදෙවියසුත්තං[3] භාසන්තො අත්තනො ච පරෙසං ච අතීතං ආදිසති, වුත්තං හෙතං භගවතා:

"අතීතං ඛො චුන්ද, අද්ධානං ආරබ්භ තථාගතස්ස සතානුසාරී ඤාණං හොති, සො යාවතකං ආකඞ්ඛති තාවතකං අනුස්සරති, අනාගතං ච ඛො චුන්ද, -පෙ- පච්චුප්පන්නඤ්ච ඛො චුන්ද, අද්ධානං ආර තථාගතස්ස බොධිජං ඤාණං උප්පජ්ජති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො"ති.[a] ඉන්ද්‍රියපරොපරියත්තඤාණං[4] තථාගතස්ස තථාගතබලං. සත්තානං ආසයානුසයඤාණං තථාගතස්ස තථාගතබලං, යමකපාටිහීරෙ ඤාණං තථාගතස්ස තථාගතබලං මහාකරුණාසමාපත්තිඤාණං[5] තථාගතස්ස තථාගතබලං, සබ්බඤ්ඤුතඤාණං තථාගතස්ස තථාගතබලං, අනාවරණඤාණං තථාගතස්ස තථාගතබලං, සබ්බත්ථ අසඞ්ගමප්පටිහතමනාවරණඤාණං තථාගතස්ස තථාගතබලං, එවං භගවා අත්තනො ච පරෙසං ච අතීතම්පි ආදිසති, අනාගතම්පි ආදිසති, පච්චුප්පන්නම්පි ආදිසති, ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති පකාසෙතීති: යො අතීතං ආදිසති. ඉච්චායස්මා පොසාලො -පෙ-

අනෙජො ඡින්නසංසයොති 'එජා'වුච්චති තණ්හා "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං" සා එජා තණ්හා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[6] ආයතිං අනුප්පාදධම්මා තස්මා බුද්ධො 'අනෙජො'. එජාය පහීනත්තා අනෙජො, භගවා ලාභෙපි න ඉඤ්ජති -පෙ- දුක්ඛෙපි න ඉඤ්ජති න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධතීති 'අනෙජො'. ඡින්නසංසයොති: 'සංසයො' වුච්චති විචිකිච්ඡා, "දුක්ඛෙ කඞ්ඛා -පෙ- ඡම්භිතත්තං[7] චිත්තස්ස මනොවිලෙඛො." සො සංසයො බුද්ධස්ස භගවතො පහීනො ඡින්නො උච්ඡින්නො සමුච්ඡින්නො වූපසන්තො පටිපස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො. තස්මා බුද්ධො ඡින්නසංසයොති 'අනෙජො ඡින්නසංසයො.'

1. පඤ්ච ජාතිසතානි -පත.
2. සුත්තන්තං -ම ජ සං.
3. මඝ දෙවිය සුත්තන්තං -ස
මඝා දෙවිය සුත්තන්තං -පත.
4. ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණං -සත.
a. දීඝනිකාය - පාසාදිකසුත්ත.
5. මහා කරුණා සමාපත්තියා ඤාණං -ප-ච-වි-ක
6. අනභාවංකතා -ම ජ ස.
7. ඡම්භිතත්තං - ම ජ සං, සත.

බුදුහු පන්සියක් ජාතකයන් වදරන්නාහු තමන්ගේ ද මෙරමාගේ ද අතීතය වදරති. "මහාපදානිය" සූතත් වදරන්නාහු තමන්ගේ ද මෙරමාගේ ද අතීතය වදරති, 'මහාසුදස්සනිය' සූතත් වදරන්නාහු තමන්ගේ ද මෙරමාගේ ද අතීතය වදරති, 'මහාගොවින්දිය' සූතත් වදරන්නාහු තමන්ගේ ද මෙරමාගේ ද අතීතය වදරති, 'මාඝදෙවිය' සූතත් වදරන්නාහු තමන්ගේ ද මෙරමාගේ ද අතීතය වදරත්. මේ වදරනලද මැ යි භාග්‍යවතුන් විසින්:

"චුන්දයෙනි, අතීත කාලය අරභයා තථාගතයන්ට සති-අනුසාරී ඥානය වෙයි, හේ යම් තාක් කැමති වේ නම් ඒ තාක් සිහි කෙරෙයි චුන්දයෙනි, අනාගතයත් ... චුන්දයෙනි, ප්‍රත්‍යුත්පන්න කාලයත් අරභයා තථාගතයනට බොධියෙන් උපන් ඥානය උපදී: 'මේ අන්තිම ජාතිය වෙයි දන් පුනර්භවයෙක් නැතැ'යි. ඉන්ද්‍රියපරාවරතා ඥානය තථාගතයන් ගේ තථාගතබල වෙයි, සත්ත්වයන්ගේ ආශය අනුශය දන්නා නුවණ තථාගත යන් ගේ තථාගත බල වෙයි, යමක ප්‍රාතිහාර්‍ය්‍ය ඥානය තථාගතයන් ගේ තථාගතබල වෙයි, මහාකරුණා සමාපත්ති ඥානය තථාගතයන් ගේ තථාගතබල වෙයි, අනාවරණ ඥානය තථාගතයන් ගේ තථාගතබල වෙයි, (අතීතාදි) සියලු තැන්හි නො ඇලුණු අප්‍රතිහත වූ අනාවරණ ඥානය තථාගතයන් ගේ තථාගතබල වේ. මෙසෙයින් බුදුහු තමන් වහන්සේ ගේ ද මෙරමාගේ ද අතීතයත් දක්වනසේක, අනාගතයත් දක්වනසේක, ප්‍රත්‍යුත් පන්නයත් දක්වන සේක වදරන සේක දෙසනසේක පනවනසේක පිහිටුවන සේක විවරණ කරනසේක විභාග කරන සේක ප්‍රකට කරන සේක ප්‍රකාශ කරනසේක් නුයි "යො අතීතං ආදිසති" යනු වේ. **ඉච්චායස්මා පොසාලො...**

**අනෙජො ඡින්නසංසයො**– 'එජා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක් අධික රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. ඒ එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව භාග්‍යවත් බුදුන් ට ප්‍රහීණ යැ උසුන්මුල් ඇත්තී යැ-(මුදුන් සුන්) තාලවස්තුවක් මෙන් කරන ලද, පසු අභාවය කරන ලද මත්තෙහි නූපදනා පියවී ඇත්තියැ එහෙයින් බුදුහු "අනෙජයහ", එජා ප්‍රහීණ වන බැවින් අනේජයහ. බුදුහු ලාභයෙහිදු නො සැලෙති ...දුකෙහි දු කම්පා නො වෙති නො සැලෙති නො වෙවුළති වෙසෙයින් නො වෙවුළති අතිශයින් නො වෙවුළත් නුයි 'අනෙජො' යනු වේ. **ඡින්නසංසයො** යනු: 'සංසයො' යි විචිකිත්සාව කියනු ලැබෙයි. දුඃඛසත්‍යයෙහි සැකය ... චිත්තයාගේ තදබව මනොවිලෙඛය යි. ඒ සැකය භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණ යැ සිඳින ලද වෙසෙයින් සිඳින ලද මොනොවට සිඳින ලද සන්හිඳින ලද දුරලන ලද බැහැර කරන ලද උපතට නො නිසි වූයේ යැ නුවණ ගින්නෙන් දවන ලද. එහෙයින් බුදුහු සිඳුනා ලද සැක ඇත්තාහු නුයි "අනෙජො ඡින්නසංසයො" යනු වේ.

**පාරගූ සබ්බධම්මානන්ති**: භගවා අභිඤ්ඤාපාරගූ පරිඤ්ඤාපාරගූ පහානපාරගූ භාවනාපාරගූ සච්ඡිකිරියාපාරගූ සමාපත්තිපාරගූ අභිඤ්ඤාපාරගූ සබ්බධම්මානං -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො'ති 'පාරගූ සබ්බධම්මානං'.

**අත්ථි පඤ්හෙන ආගමන්ති** පඤ්හෙන අත්ථිකම්හා ආගතා -පෙ- වහස්සෙතං භාරන්ති එවම්පි අත්ථි පඤ්හෙන ආගමං:

තෙනාහ සො බ්‍රාහ්මණො:

"යො අතීතං ආදිසති -(ඉච්චායස්මා පොසාලො)
අනෙජො ඡින්නසංසයො,
පාරගූ සබ්බධම්මානං
අත්ථි පඤ්හෙන ආගම"න්ති.

---

14-2

විභූතරූපසඤ්ඤිස්ස[1]
සබ්බකායප්පහායිනො,
අජ්ඣත්තං ච බහිද්ධා ච
නත්ථි කිඤ්චීති පස්සතො,
ඤාණං සක්කානුපුච්ඡාමි
කථං නෙය්යො තථාවිධො.

**විභූතරූපසඤ්ඤිස්සාති** 'කතමා රූපසඤ්ඤා': රූපාවචර සමාපත්තිං සමාපන්නස්ස වා උපපන්නස්ස වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං අයං රූපසඤ්ඤා. **විභූතරූපසඤ්ඤිස්සාති**: චතස්සො අරූපසමාපත්තියො පටිලද්ධස්ස[2] රූපසඤ්ඤා විභූතා හොන්ති[3] විගතා අතික්කන්තා සමතික්කන්තා වීතිවත්තාති 'විභූතරූපසඤ්ඤිස්ස'.

**සබ්බකායප්පහායිනොති** සබ්බො තස්ස පටිසන්ධිකො රූපකායො පහීනො තදඞ්ගසමතික්කමා වික්ඛම්භනප්පහානෙන පහීනො තස්ස රූපකායොති 'සබ්බකායප්පහායිනො'.

**අජ්ඣත්තඤ්ච බහිද්ධා ච නත්ථි කිඤ්චීති පස්සතොති**: 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති, කිංකාරණා 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති, යං විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං සතො සමාපජ්ජිත්වා තතො වුට්ඨහිත්වා තඤ්ඤෙව විඤ්ඤාණං අභාවෙති විභාවෙති අන්තරධාපෙති 'නත්ථි කිඤ්චී'ති පස්සති. තංකාරණා 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනසමාපත්තීති 'අජ්ඣත්තඤ්ච බහිද්ධා ච නත්ථි කිඤ්චීති පස්සතො'.

---

1. රූපං සඤ්ඤිස්ස - පත
2. ලාභිස්ස - ස්‍යා
3. විභූතා හොන්ති - ම-වි

**පාරගූ සබ්බධම්මානං** යනු: බුද්ධහු අභිඥාපාරගූ වෙති පරිඥා පාරගූ වෙති ප්‍රහාණ පාරගූ වෙති භාවනා පාරගූ වෙති සාක්ෂාත්ක්‍රියා පාරගූ වෙති සමාපත්ති පාරගූ ද වෙත්. සියලු (පඤ්චස්කන්ධාදි) ධර්මයන්ගේ අභිඥා (ඥාතපරිඥා) වෙත් නිර්වාණපාරයට ගියහ ... ජාතිමරණසංසාරය පුනර්භවය ඔවුනට නැත්නුයි 'පාරගූං සබ්බධම්මානං' යනු වේ.

**අත්ථී පඤ්හෙන ආගමං** යනු: ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇතියමෝ ආම්හ ... තෙල භාරය උසුලනු මැනව නුයි මෙසේත් 'අත්ථී පඤ්හෙන ආගමං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"යො අතීතං ආදිසති –පෙ– අත්ථි පඤ්හෙන ආගමං"යි.**

---

## 14–2

ශාක්‍යමුනින්ද්‍රයන් වහන්ස, ඉක්මවන ලද රූපසංඥා ඇති තදඞ්ග විෂ්කම්භන විසින් සියලු රූපකාය ප්‍රහාණය කරනසුලු වූ අධ්‍යාත්මයෙහිදු බාහ්‍යයෙහිදු කිසිවක් නැතැ යි දක්න හු (ආකිඤ්චඤ්ඤායතනලාභීහු) ගේ ඥානය පුළුවුස්මි. එබඳු වූ පුද්ගල තෙම කෙසෙයින් (මත්තෙහි ඥානයට) පැමිණවිය යුත්තේ ද?

**විභූතරූපසඤ්ඤිස්ස** යනු: රූපසංඥා කවර. යත් රූපාවචර සමවත් සමවන්නහුගේ වේවයි (විපාක විසින්) එහි උපන්නහු ගේ වේවයි ඉහාත්මසුඛ විහරණ ඇත්තහු ගේ වේවයි සංඥාවක් හඳුනන අයුරෙක් හැඳින ගත් බවෙක් වේ ද මේ රූපසංඥා යි. **විභූතරූපසඤ්ඤිස්ස** යනු: සතර අරූපසමාපත්තීන් ලද්දහුට රූපසංඥාවෝ අප්‍රකට වූවාහු නැසුණාහු ඉක්මුණාහු මොනොවට ඉක්මුණාහු වෙසෙසින් ඉක්ම සිටියාහු වෙත් නුයි 'විභූත රූපසඤ්ඤිස්ස' යනු වේ.

**සබ්බකායප්පහායිනො** යනු: ඒ අරූපසමාපත්ති ලාභීහු ගේ ප්‍රතිසන්ධි ඇති හැම රූප කය තදඞ්ග සමතික්‍රමණයෙන් ප්‍රහීණ යැ ඔහුගේ රූප කය විෂ්කම්භන ප්‍රහාණයෙන් ප්‍රහීණ නුයි 'සබ්බකායප්පහායිනො' යනු වේ.

**අජ්ඣත්තඤ්ච බහිද්ධා ච නත්ථි කිඤ්චි ති පස්සතො**– 'නත්ථි කිඤ්චි' යනු: ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති යැ. කවර කරුණින් 'නත්ථි කිඤ්චි' යනු ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති වේ ද යත්: යම් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියකට සිහි ඇති වැ සමවැද එයින් නැඟී එ මැ විඥානය අභාවයට පමුණුවයි ද වෙයෙසින් අභාවයට පමුණුවයි ද අතුරුදහන් කෙරෙයි ද 'කිසිවක් නැතැ'යි දකී ද එකරුණින් 'නත්ථි කිඤ්චි' යි ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති වේ නුයි 'අජ්ඣත්තඤ්ච බහිද්ධා ච නත්ථි කිඤ්චීති පස්සතො' යනු වේ.

**ඤාණං සක්කානුපුච්ඡාමීති** 'සක්කා'ති සක්කො භගවා, සක්‍යකුලා පබ්බජිතොතිපි සක්කො, –පෙ– පහීනභයභෙරවො විගතලොමහංසොතිපි සක්කො. '**ඤාණං සක්කානුපුච්ඡාමීති** තස්ස ඤාණං පුච්ඡාමි''*[ෂ] කීදිසං කිංසණ්ඨිතං කිංපකාරං කිංපටිභාගං ඉච්ඡිතබ්බන්ති 'ඤාණං සක්කානුපුච්ඡාමි.'

**කථං නෙය්‍යො තථාවිධොති:** කථං සො නෙතබ්බො විනෙතබ්බො අනුනෙතබ්බො පඤ්ඤපෙතබ්බො නිජ්ඣාපෙතබ්බො පෙක්ඛෙතබ්බො පසාදෙතබ්බො, කථං තෙන උත්තරිං ඤාණං උප්පාදෙතබ්බං. තථාවිධොති තථාවිධො තාදිසො තස්සණ්ඨිතො තප්පකාරො තප්පටිභාගො යො සො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිලාභීති 'කථං නෙය්‍යො තථාවිධො'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"විභූතරූපසඤ්ඤිස්ස
සබ්බකායප්පහායිනො,
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච
නත්ථි කිඤ්චීති පස්සතො,
ඤාණං සක්කානුපුච්ඡාමි
කථං නෙය්‍යො තථාවිධො''ති.

---

## 14-3

**විඤ්ඤාණට්ඨිතියො සබ්බා (පොසාලාති භගවා)**
**අභිජානං තථාගතො,**
**තිට්ඨන්තමෙනං ජානාති**
**අධිමුත්තං[1] තප්පරායනං[2]**

**විඤ්ඤාණට්ඨිතියො සබ්බාති** භගවා අභිසඞ්ඛාරවසෙන චතස්සො විඤ්ඤාණට්ඨිතියො ජානාති, පටිසන්ධිවසෙන සත්තවිඤ්ඤාණට්ඨිතියො ජානාති.

කථං භගවා අභිසංඛාරවසෙන චතස්සො විඤ්ඤාණට්ඨිතියො ජානාති: වුත්තං හෙතං භගවතා: ''රූපූපයං[3] වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති[4] රූපාරම්මණං රූපප්පතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති, වෙදනූපයං[5] වා භික්ඛවෙ –පෙ– සඤ්ඤූපයං වා භික්ඛවෙ –පෙ– සඞ්ඛාරූපයං වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති සඞ්ඛාරාරම්මණං සඞ්ඛාරප්පතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජතී''ති.[ෂ] එවං භගවා අභිසඞ්ඛාරවසෙන චතස්සො විඤ්ඤාණට්ඨිතියො ජානාති.

---

1. විමුත්තං – ස්‍යා ම ජ සං
2. තංපරායනං – ස.
3. රූපූපාය – ස්‍යා,
4. තිට්ඨෙය්‍ය – ම ජ සං
5. වෙදනානුපායං – පන, වෙදනූපාය – ස්‍යා

* පඤ්ඤං පුච්ඡාමි සම්බුද්ධං පුච්ඡාමී ති – මජසං – අධික පාඨො

ෂ බ්‍රාහ්මණ සංයුත්ත – උපයවග්ග – උපයසුත්ත

**ඤාණං සකකානුපුච්ඡාමි**– 'සක්ක' යනු: බුදුහු ශාක්‍යයහ: ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදි වූවාහු නුයි ද ශාක්‍යයහ ... ප්‍රහීන වූ බිය හා බිය අරමුණු ඇත්තාහු පහවූ ලොමුදහ ඇත්තාහු නුයි ද ශාක්‍යයහ. **ඤාණං සකකානුපුච්ඡාමි**– ඔහුගේ ඥානය කෙබඳු වූයේ කවර සටහන් ඇතියේ කවර ප්‍රකාර වූයේ කුමක් හා සමාන වූයේ කැමැති වියයුතු ද යි පුළුවුස්මි නුයි '**ඤාණං** සක්කානුපුච්ඡාමි' යනු වේ.

**කථං නෙයෙයා තථාවිධො**– හෙතෙම කිසෙයින් (නිවනට) පැමිණ විය යුත්තේ ද විනයනය කළ යුත්තේ ද (සැක සිදීමෙන්) අනුනයනය කළ යුත්තේ ද පැනවිය යුත්තේ ද නිශ්චය කරවිය යුත්තේ ද දක්විය යුත්තේ ද පැහැදවිය යුත්තේ ද කිසෙයින් ඔහු විසින් මත්තෙහි ඥානය ඉපැදවිය යුතුද. **තථා විධො** යනු: යමෙක් ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති ලාභී වූයේ ද එබඳු වූයේ තාදෘශ වූයේ එබඳු සටහන් ඇතියේ එබඳු ප්‍රකාර ඇතියේ තත්ප්‍රතිභාග වූයේ නු යි 'කථං නෙයෙයා තථාවිධො' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''විභූතරූපසඤ්ඤිසස –පෙ– කථං නෙයෙයා තථාවිධො''** යි.

---

### 14–3

(බුදුහු මෙසේ වදළහ: පොසාලය,) හැම විඥානස්ථිතීන් වෙසෙයින් දන්නා වූ තථාගත තෙමේ ආකිඤ්චඤ්ඤායතනයෙහි අධිමුක්ත වූ එය පරායණ කොට ඇති වැ සිටුනා මේ පුහුලා දනී.

**විඤ්ඤාණට්ඨිතියො සබ්බා** යනු: බුදුහු කර්මාභිසංස්කාරයන් ගේ වශයෙන් සතර විඥාන ස්ථිතීන් දන්නා සේක, ප්‍රතිසන්ධි වශයෙන් සප්ත විඥානස්ථිතීන් දන්නා සේක.

කිසෙයින් බුදුහු අභිසංස්කාර වශයෙන් සතර විඥානස්ථිතීන් දන්නා සේක් ද යත්: මේ වදරන ලද මැ යි භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, (තෘෂ්ණා– දෘෂ්ටි උපය විසින්) රූපයට පැමිණි හෝ රූපය අරමුණු කොට ඇතියේ රූපය ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටී. (සප්‍රීතික) තෘෂ්ණා ජලයෙන් තෙමනලදුයේ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි, මහණෙනි (තෘෂ්ණා– දෘෂ්ටි විසින්) වෙදනාවට පැමිණි හෝ ... මහණෙනි, සංඥාවට පැමිණි හෝ ... මහණෙනි, සංස්කාරයන්ට පැමිණි හෝ විඥානය සිටුනේ සංස්කාරයන් අරමුණු කොට ඇති යේ සංස්කාරයන් ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටියි. තෘෂ්ණොදකයෙන් තෙමන ලදුයේ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ යයි මෙසේ බුදුහු අභිසංස්කාර වශයෙන් සතර විඥානස්ථිතීන් දන්නා සේක.

කථං භගවා පටිසන්ධිවසෙන සත්තවිඤ්ඤාණට්ඨිතියො ජානාති: වුත්තං හෙතං භගවතා: සන්ති භික්ඛවෙ, සත්තා නානත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා, අයං පඨමා විඤ්ඤාණට්ඨිති. සන්ති භික්ඛවෙ, සත්තා නානත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභිනිබ්බත්තා, අයං දුතියා විඤ්ඤාණට්ඨිති. සන්ති භික්ඛවෙ, සත්තා එකත්තකායා නානත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා ආභස්සරා, අයං තතියා විඤ්ඤාණට්ඨිති. සන්ති භික්ඛවෙ, සත්තා එකත්තකායා එකත්තසඤ්ඤිනො සෙය්‍යථාපි දෙවා සුභකිණ්හකා.[1] අයං චතුත්ථී[2], විඤ්ඤාණට්ඨිති, සන්ති භික්ඛවෙ, සත්තා සබ්බසො රූපසඤ්ඤානං සම–තික්කමා පටිඝසඤ්ඤානං අත්ථංගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනූපගා, අයං පඤ්චමී[3] විඤ්ඤාණට්ඨිති. සන්ති භික්ඛවෙ, සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනූපගා, අයං ඡට්ඨා විඤ්ඤාණට්ඨිති. සන්ති භික්ඛවෙ, සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චා–යතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චි'ති ආකිඤ්චඤ්ඤායතනූපගා, අයං සත්තමා[4] විඤ්ඤාණට්ඨිති[a]. එවං භගවා පටිසන්ධිවසෙන සත්තවිඤ්ඤාණට්ඨිතියො ජානාතීති 'විඤ්ඤාණට්ඨිතියො සබ්බා' පොසාලාති භගවා'ති –පෙ–

අභිජානං තථාගතොති: 'අභිජාන'න්ති අභිජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො. තථාගතොති: වුත්තං හෙතං භගවතා: "අතීතං චෙපි චුන්ද, හොති අභූතං අතච්ඡං අනත්ථසංහිතං නෙතං තථාගතො බ්‍යාකරොති, අතීතං චෙපි[5] චුන්ද, හොති භූතං තච්ඡං අනත්ථසංහිතං තම්පි තථාගතො න බ්‍යාකරොති, අතීතං චෙපි චුන්ද, හොති භූතං තච්ඡං අත්ථසංහිතං තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සෙව පඤ්හස්ස වෙය්‍යාකරණාය. අනාගතං චෙපි චුන්ද, හොති –පෙ– පච්චුප්පන්නං චෙපි චුන්ද, හොති අභූතං අතච්ඡං අනත්ථසංහිතං න තං තථාගතො බ්‍යාකරොති[6] පච්චුප්පන්නඤ්චෙපි චුන්ද, හොති භූතං තච්ඡං අනත්ථසංහිතං තම්පි තථාගතො න බ්‍යාකරොති, පච්චුප්පන්නඤ්චෙපි චුන්ද, හොති භූතං තච්ඡං අත්ථසංහිතං තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය. ඉති ඛො චුන්ද, අතීතානාගතපච්චුප්පන්නෙසු ධම්මෙසු තථාගතො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. තස්මා 'තථාගතොති වුච්චති.

1. සුභකිණ්ණා – පත.
2. චතුත්ථා –
3. පඤ්චමා –සයා
4. සත්තමී – පත, සයා, මජසං
5. අතීතංචෙව – පත
6. තං තථාගතො න බ්‍යාකරොති –පත.

a සත්තකඞ්ගුත්තර – අව්‍යාකතවග්ග

කිසෙයින් බුදුහු ප්‍රතිසන්ධි වශයෙන් සප්තවිඥානස්ථිතීන් දන්නා සේක් ද යත්: භාග්‍යවතුන් විසින් මෙය වදරන ලද මැ යි. "මහණෙනි, මිනිසුන් ද ඇතැම් දෙවියන් ද ඇතැම් විනිපාතිකයන් ද සෙයින් (වර්ණ සංස්ථානාදි විසින්) නානාත්වකාය ඇති නානාත්ව වූ ප්‍රතිසන්ධි සංඥා ඇති සත්ත්වයෝ ඇත්තාහ" මේ පළමු වන විඥානස්ථිතිය යැ. මහණෙනි, ප්‍රථමධ්‍යානයෙන් උපන් (බ්‍රහ්මපාරිසජ්ජාදි වූ) බ්‍රහ්මකායික දෙවියන් සෙයින් නානාත්වකාය වූ එකත්වසංඥා ඇති සත්ත්ව කෙනෙක් ඇත්තාහ, මේ දෙ වැනි විඥානස්ථිතිය යැ. මහණෙනි, ආභාස්වර දෙවියන් සෙයින් එකත්වකාය ඇති නානාත්වසංඥා ඇති සත්ත්ව කෙනෙක් ඇත්තාහ, මේ තුන් වැනි විඥානස්ථිතිය යැ. මහණෙනි, ශුභකෘත්ස්න දෙවියන් සෙයින් එකත්වකාය වූ එකත්ව සංඥා ඇති සත්ත්ව කෙනෙක් ඇත්තාහ, මේ සතර වැනි විඥානස්ථිතිය යැ. මහණෙනි, සර්වප්‍රකාරයෙන් රූපසංඥා ඉක්ම වීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥාවන් ගේ අමනසිකාරයෙන් 'ආකාශය අනන්තය' යි ආකාසානඤ්චායතනයට පැමිණි සත්ත්ව කෙනෙක් ඇත්තාහ, මේ පස් වැනි විඥානස්ථිතිය යැ. මහණෙනි, සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඥානය අනන්තය' යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණි සත්ත්ව කෙනෙක් ඇත්තාහ. මේ සවැනි විඥානස්ථිතිය යැ. මහණෙනි, සර්වප්‍රකාරයෙන් විඥාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ' යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණි සත්ත්ව කෙනෙක් ඇත්තාහ, මේ සත් වැනි විඥානස්ථිතිය යි. මෙසෙයින් බුදුහු ප්‍රතිසන්ධි විසින් සප්තවිඥානස්ථිතීන් දන්නාසේක් නුයි 'විඤ්ඤාණ ඨිතියො සබ්බා' යනු වේ. **පොසාලා' ති භගවා** යනු...

**අභිජානං තථාගතො**– 'අභිජානං' යනු: වෙසෙයින් දන්නේ එකතින් දන්නේ නොයෙක් අයුරින් දන්නේ ඒ ඒ කරුණු පිණිස දන්නේ ප්‍රතිවෙධ කරනුයේ. **තථාගතො** යනු: භාග්‍යවතුන් විසින් මෙය වදරණ ලද මැ යි: "චුන්දය, අතීත වූ ද අභූත වූ අතථ්‍ය වූ අනර්ථසංහිතයෙක් වී නම් තෙල තථාගතයෝ ප්‍රකාශ නො කෙරෙති. චුන්දය, අතීත වූ ද භූත වූ තථ්‍ය වූ අනර්ථසංහිතයෙක් වී නම් එ ද තථාගතයෝ ප්‍රකාශ නො කෙරෙති. චුන්දය, අතීත වූ ද භූත වූ තථ්‍ය වූ අර්ත්ථසංහිතයෙක් වී නම් එහි ලා තථාගතයෝ එ මැ ප්‍රශ්නය ප්‍රකාශ කිරිම පිණිස කල් දන්නාහු වෙති. චුන්දය, අනාගත වූ ද ... චුන්දය වර්තමාන වූ ද අභූත වූ අතථ්‍ය වූ අනර්ත්ථසංහිතයෙක් වී නම් එය තථාගතයෝ ප්‍රකාශ නො කෙරෙති. චුන්දය, ප්‍රත්‍යුත්පන්න වූ ද භූත වූ තථ්‍ය වූ අනර්ත්ථ සංහිතයෙක් වී නම් එ ද තථාගතයෝ ප්‍රකාශ නො කෙරෙති. චුන්දය, ප්‍රත්‍යුත්පන්න වූ ද භූත වූ තථ්‍ය වූ අර්ත්ථසංහිතයෙක් වී නම් එහි ලා තථාගතයෝ ඒ ප්‍රශ්නය ප්‍රකාශ කිරිම පිණිස කල් දන්නාහු වෙත්. චුන්දය, මෙසෙයින් තථාගතයෝ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න ධර්මයනහි කාලවාදී භූතවාදී අර්ත්ථවාදී ධර්මවාදී විනයවාදී වෙත්. එහෙයින් 'තථාගත' යි කියනු ලැබෙති.

යං ඛො චුන්ද, සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං, අනුවිචරිතං මනසා, සබ්බං තං තථාගතෙන අභිසම්බුද්ධං, තස්මා 'තථාගතො'ති වුච්චති. යඤ්ච ඛො චුන්ද, රත්තිං තථාගතො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බාන ධාතුයා පරිනිබ්බායති, යං එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති, සබ්බං තං තථෙව හොති, නො අඤ්ඤථා, තස්මා 'තථාගතො'ති වුච්චති. යථාවාදී චුන්ද, තථාගතො තථාකාරී, යථාකාරී තථාවාදී, ඉති යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී, තස්මා 'තථාගතො'ති වුච්චති. සදෙවකෙ චුන්ද, ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති. තස්මා 'තථාගතො'ති වුච්චති''ති[a] අභිජානං තථාගතො'.

නිට්ඨාන්ත මෙතං ජානාතීති: භගවා ඉධට්ඨකොඬුව ජානාති කම්මාභිසඞ්ඛාරවසෙන 'අයං පුග්ගලො කායස්ස භෙදා පරම්මරණා, අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සතී'ති. භගවා ඉධට්ඨකොඬුව[1] ජානාති කම්මාභිසඞ්ඛාරවසෙන 'අයං පුග්ගලො කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡානයොනිං උපපජ්ජිස්සතී'ති. භගවා ඉධට්ඨකොඬුව ජානාති කම්මාභිසඞ්ඛාරවසෙන 'අයං පුග්ගලො කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං[2] උපපජ්ජිස්සතී'ති. භගවා ඉධට්ඨකොඬුව ජානාති කම්මාභිසඞ්ඛාරවසෙන 'අයං පුග්ගලො කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපජ්ජිස්සතී'ති. භගවා ඉධට්ඨකොඬුව ජානාති කම්මාභිසඞ්ඛාරවසෙන 'අයං පුග්ගලො සුපටිපන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සතී'ති.

වුත්තං හෙතං භගවතා :

1. ඉධත්ථකොඬුව – ම ඡ සං.
2. පිත්තිවිසයං – සයා
a. දීඝනිකාය – පාසාදිකසුත්ත

චුන්දය, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයා විසින් දෙව්මිනිසුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාව විසින් යම් රූපාලම්බනයක් ශබ්දලම්බනයක් ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බනයක් (සුඛදුඃඛාදි) ධර්මාලම්බනයක් (සොයා හෝ නො සොයා හෝ) ලබන ලද ද (ලද හෝ නො ලද හෝ) සොයන ලද ද සිතින් විමසන ලද ද එ සියල්ල තථාගතයන් විසින් අවබොධ කරන ලද, එහෙයින් 'තථාගත' යි කියනු ලැබෙයි. චුන්දය යම් රාත්‍රියෙක තථාගතයෝ අනුත්තර වූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙරෙත් ද යම් රාත්‍රියෙක අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවෙත් ද තෙල අතුරෙහි යමක් බෙණෙත් ද පවසත් ද දක්වත් ද ඒ සියල්ල එසෙයින් මැ වෙයි. අන් සෙයෙකින් නො වෙ. එහෙයින් 'තථාගත' යි කියනු ලැබෙයි. චුන්දය, තථාගතයෝ යම්සේ බෙණෙත් නම් එසේ කරන සුලු වෙති, යම්සේ කෙරෙත් නම් එසේ බණන සුලු වෙත්. මෙසේ යථාවාදී තථාකාරී ද යථාකාරී තථාවාදී ද වෙත්. එහෙයින් 'තථාගත' යි කියනු ලැබෙයි. චුන්දය, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි දෙව් මිනිසුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාව කෙරෙහි තථාගතයෝ 'අභිභූ' වූහ, අන්‍යයන් විසින් අනභිභූතයහ, එකාන්තයෙන් සියල්ල දක්නාහ, සියලු ජනයා වශයෙහි පවත්වන්නාහ, එහෙයින් 'තථාගත' යි කියනු ලැබෙ නුයි 'අභිජානං තථාගතො' යනු වෙ.

**තිටඨන්තමෙතං ජානාති**- බුදුහු මෙලොවැ සිටියහු මැ කර්මාභිසංස්කාරයන්ගේ වශයෙන් 'මේ පුද්ගල කාබුන් මරණින්' මත්තෙහි සැප නැති දුකට ගති වූ විවස වැ පතිත වන නිරයට වදනේ යයි දැනගනිති. බුදුහු මෙලොවැ සිටියාහු මැ කර්මාභිසංස්කාර වශයෙන් 'මේ පුද්ගල තෙම කා බුන් මරණින් මත්තෙහි තිරිසන්යොනට වදනේ යැ'යි දැනගනිති. බුදුහු මෙහි සිටියාහු මැ කර්මාභිසංස්කාර වශයෙන් මේ පුද්ගල කා බුන් මරණින් මත්තෙහි ප්‍රෙත විෂයට වදනේ යැ'යි දැනගනිති. බුදුහු මෙහි සිටියාහු මැ 'කර්මාභිංස්කාර වශයෙන් මේ පුද්ගල කා බුන් මරණින් මත්තෙහි මිනිසුන් කෙරෙහි උපදනේ යැ'යි දැනගනිති. බුදුහු මෙහි සිටියාහු මැ කර්මාභිසංස්කාර වශයෙන් 'මේ පුද්ගල සුප්‍රතිපන්න වූයේ කා බුන් මරණින් මත්තෙහි සුන්දරගති ඇති ස්වර්ගලෝකයට වදනේ යැ' යි දැන ගනිත් යයි.

භාග්‍යවතුන් විසින් මෙ වදරන ලද මැ යි:

''ඉධාහං සාරිපුත්ත, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: 'තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජිස්සතී'ති- ඉධ පනාහං සාරිපුත්ත, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා කායස්ස භෙදා පරම්මරණා තිරච්ඡානයොනිං උපපජ්ජිස්සතී'ති- ඉධ පනාහං සාරිපුත්ත, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා පෙත්තිවිසයං උපපජ්ජිස්සතී'ති- ඉධ පනාහං සාරිපුත්ත, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා මනුස්සෙසු උපපජ්ජිස්සතී'ති- ඉධ පනාහං සාරිපුත්ත, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො, යථා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සතී'ති- ඉධ පනාහං සාරිපුත්ත, එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: තථායං පුග්ගලො පටිපන්නො තථා ච ඉරියති තඤ්ච මග්ගං සමාරූළ්හො යථා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී''ති[a]. 'තිට්ඨන්තමෙනං ජානාති'.

අධිමුත්තං[1] තප්පරායණං'ති: 'අධිමුත්ත'න්ති ආකිඤ්චඤ්ඤායතනෙ[2] අධිමුත්තිවිමොක්ඛෙන[3] අධිමුත්තං[4], තත්‍රාධිමුත්තං තදධිමුත්තං තදධිපතෙය්‍යං[5]. අථවා භගවා ජානාති: 'අයං පුග්ගලො රූපාධිමුත්තො සද්දාධිමුත්තො ගන්ධාධිමුත්තො රසාධිමුත්තො ඵොට්ඨබ්බාධිමුත්තො කුලාධිමුත්තො ගණාධිමුත්තො ආවාසාධිමුත්තො ලාභාධිමුත්තො යසාධිමුත්තො පසංසාධිමුත්තො සුඛාධිමුත්තො චීවරාධිමුත්තො පිණ්ඩපාතාධිමුත්තො සෙනාසනාධිමුත්තො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාධිමුත්තො සුත්තන්තාධිමුත්තො විනයාධිමුත්තො අභිධම්මාධිමුත්තො ආරඤ්ඤකඞ්ගාධිමුත්තො පිණ්ඩපාතිකඞ්ගාධිමුත්තො පංසුකූලිකඞ්ගාධිමුත්තො තෙචීවරිකඞ්ගාධිමුත්තො සපදානචාරිකඞ්ගාධිමුත්තො ඛලුපච්ඡාභත්තිකඞ්ගාධිමුත්තො නෙසජ්ජිකඞ්ගාධිමුත්තො යථාසන්ථතිකඞ්ගාධිමුත්තො පඨමජ්ඣානාධිමුත්තො දුතියජ්ඣානාධිමුත්තො

1. විමුත්තිං - පන, ස්‍යා
2. ආකිඤ්චඤ්ඤායතනං - ම ඡ සං
3. ධිමුත්තන්ති විමොක්ඛෙන - ම ඡ සං
4 විමුත්තං - ස්‍යා
5. තදධිපතෙය්‍යං - ව-වි-ක-ම ඡ සං,

a. මජ්ඣිමනිකාය - මහාසීහනාදසුත්ත

ශාරිපුත්‍රයෙනි, මම මෙලොවැ ඇතැම් පුද්ගලයකු මාගේ සිතින් මෙසේ ඔහු ගේ සිත පිරිසිඳ දැනගනිමි: 'මේ පුද්ගල තෙම යම්සේ කා බුන් මරණින් මත්තෙහි අය රහිත වූ දුර්ගති වූ විනිපාත වූ නිරයට යම්සේ පැමිණේ ද එසෙයින් පිළිපන්නේ යැ එසෙයින් ඉරියවු පවත්වයි, එමහට පැමිණියේ යයි'—ශාරිපුත්‍රය, මම මෙලොවැ ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දැනගනිමි: 'මේ පුද්ගල තෙම යම්සේ කා බුන් මරණින් මත්තෙහි තිරිසන්යොනට වදනේ ද එසෙයින් පිළිපන්නේ යැ එසෙයින් ඉරියවු පවත්වයි එමහට පිළිපන්නේ යැ'යි— ශාරිපුත්‍රය, මම මෙලොවැ ඇතැම් පුද්ගලයකු මෙසේ සිතින් සිත පිරිසිඳ දැනගනිමි: 'මේ පුද්ගල තෙම කා බුන් මරණින් මත්තෙහි යම්සේ ප්‍රේතවිෂයට වදනේ ද එසෙයින් පිළිපන්නේ යැ එසෙයින් ඉරියවු පවත්වයි, එමහට ද පැමිණියේ යැ'යි— ශාරිපුත්‍රය, මම මෙලොවැ ඇතැම් පුද්ගලයකු මෙසේ සිතින් සිත පිරිසිඳ දැනගනිමි: මේ පුද්ගල තෙම යම්සේ කාබුන් මරණින් මත්තෙහි මිනිසුන් කෙරෙහි උපදනේ ද එසෙයින් පිළිපන්නේ යැ එසේ ඉරියවු පවත්වයි එමහට ද පැමිණියේ යැ'යි— ශාරිපුත්‍රය, මම මෙලොවැ ඇතැම් පුද්ගලයකු මෙසේ සිතින් සිත පිරිසිඳ දැනගනිමි: 'මේ පුද්ගල තෙම යම්සේ කා බුන් මරණින් මත්තෙහි සුගති වූ ස්වර්ගලොකයට වදනේ ද එසෙයින් පිළිපන්නේ යැ එසේ ඉරියවු පවත්වයි එමහට ද පැමිණියේ යැ' යි— ශාරිපුත්‍රය, මම මෙලොවැ ඇතැම් පුද්ගලයකු මෙසේ සිතින් සිත පිළිසිඳ දැනගනිමි: 'මේ පුද්ගල තෙම යම්සේ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත්බැව්හි මැ තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කෙරේ ද එසෙයින් පිළිපන්නේ යැ එසෙයින් ඉරියවු පවත්වයි එමහට ද පැමිණියේ යැ' යි 'තිට්ඨන්තමෙතං ජානාති' යනු වේ.

**අධිමුත්තං තපසරායණං**—'අධිමුත්තං' යනු: ආකිඤ්චඤ්ඤායතනයෙහි අධිමුක්ති විමොක්ෂයෙන් ඇලුණහු ඒ සමාධියෙහි ඇලුණහු ඒ ධ්‍යානයෙහි ඇලුණහු ඒ ධ්‍යානය අධිපති කොට ඇත්තහු. නොහොත් බුදුහු 'මේ පුද්ගල තෙම රූපයෙහි ඇලුණේ යැ ශබ්දයෙහි ඇලුණේ යැ ගන්ධයෙහි ඇලුනේ යැ රසයෙහි ඇලුණේ යැ ස්ප්‍රෂ්ටව්‍යයෙහි ඇලුණේ යැ කුලයෙහි ඇලුණේ යැ ගණයා කෙරෙහි ඇලුණේ යැ ආවාසයෙහි ඇලුණේ යැ ලාභයෙහි ඇලුණේ යැ යශස්හි ඇලුණේ යැ ප්‍රශංසායෙහි ඇලුණේ යැ සුඛයෙහි ඇලුණේ යැ චීවරයෙහි ඇලුණේ යැ පිණ්ඩපාතයෙහි ඇලුණේ යැ ශයනාසනයෙහි ඇලුණේ යැ ගිලන්පස බෙහෙසත් පිරිකරෙහි ඇලුණේ යැ සූත්‍රාන්තයෙහි ඇලුණේ යැ විනයෙහි ඇලුණේ යැ අභිධර්මයෙහි ඇලුණේ යැ ආරණ්‍යකාඞ්ගයෙහි ඇලුණේ යැ පිණ්ඩපාතිකාඞ්ගයෙහි ඇලුණේ යැ පාංශුකූලිකාඞ්ගයෙහි ඇලුණේ යැ ත්‍රෛචීවරිකාඞ්ගයෙහි ඇලුණේ යැ සපදනචාරිකඞ්ගයෙහි ඇලුණේ යැ ඛලුපච්ඡාභත්තිකඞ්ගයෙහි ඇලුණේ යැ නෙසජ්ජිකඞ්ගයෙහි ඇලුණේ යැ යථාසන්තතිකඞ්ගයෙහි ඇලුණේ යැ ප්‍රථමධ්‍යානයෙහි ඇලුණේ යැ ද්විතීයධ්‍යානයෙහි ඇලුණේයැ

තතියජ්ඣානාධිමුත්තො චතුත්ථජ්ඣානාධිමුත්තො ආකාසානඤ්චායතනසමාපත්තාධිමුත්තො[1] විඤ්ඤාණඤ්චායතනසමාපත්තාධිමුත්තො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තාධිමුත්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තාධිමුත්තොති අධිමුත්තං. **තප්පරායණන්ති**: ආකිඤ්චඤ්ඤායතනමයං තප්පරායණං කම්මපරායණං විපාකපරායණං කම්මගරුකං පටිසන්ධිගරුකං. අථවා භගවා ජානාති 'අයං පුග්ගලො රූපපරායණො -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිපරායණොති 'අධිමුත්තං තප්පරායණං'.

තෙනාහ භගවා :

"විඤ්ඤාණට්ඨිතියො සබ්බා (පොසාලාති භගවා)
අභිජානං තථාගතො,
තිට්ඨන්තමෙනං ජානාති
අධිමුත්තං තප්පරායණ"න්ති.

---

## 14-4

ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වා නන්දිසංයොජනං ඉති,
එවමෙතං[2] අභිඤ්ඤාය තතො තත්ථ විපස්සති,
එතං ඤාණං තථං තස්ස බ්‍රාහ්මණස්ස වුසීමතො,

**ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වාති** 'ආකිඤ්චඤ්ඤසම්භවො'[3] වුච්චති ආකිඤ්චඤ්ඤායතනසංවත්තනිකො කම්මාභිසඞ්ඛාරො, ආකිඤ්චඤ්ඤායතනසංවත්තනිකං කම්මාභිසඞ්ඛාරං ආකිඤ්චඤ්ඤසම්භවොති ඤත්වා ලග්ගනන්ති ඤත්වා බන්ධනන්ති ඤත්වා පලිබොධොති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වා'.

**නන්දිසංයොජනං ඉතීති** 'නන්දිසංයොජනං' වුච්චති අරූපරාගො, අරූපරාගෙන තං කම්මං ලග්ගං ලග්ගිතං පලිබුද්ධං, අරූපරාගං නන්දිසංයොජනන්ති ඤත්වා ලග්ගනන්ති ඤත්වා බන්ධනන්ති ඤත්වා පලිබොධොති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. ඉතීති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාපෙතං 'ඉතී'ති. 'නන්දිසංයොජනං ඉති'.

1. සමාපත්තාධිමුත්තො – පත
2. එවමෙවං – ච-වි-ක.
3. සම්භවොති වුච්චති–ච–වි–ක, ම ජ සං

තෘතියධ්‍යානයෙහි ඇලුණේ යැ චතුර්ත්ථධ්‍යානයෙහි ඇලුණේ යැ ආකාසානඤ්චායතන සමාපත්තියෙහි ඇලුණේ යැ විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙහි ඇලුණේ යැ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි ඇලුණේ යැ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි ඇලුණේ යැ' යි 'අධිමුත්තං' යනු වේ. **තප්පරායණං** යනු: ආකිඤ්චඤ්ඤායතනමය වූ එය පිහිට කොට ඇත්තහු කර්මය පිහිට කොට ඇත්තහු (ප්‍රවෘත්ති) විපාකය පිහිට කොට ඇත්තහු කර්මචේතනාව ගරු කොට ඇත්තහු ප්‍රතිසන්ධිය ගරු කොට ඇත්තහු, නොහොත් බුදුහු මෙසේ දනගනිති: 'මේ පුද්ගල තෙමේ රූප පරායණ යැ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනපරායණ' යයි 'අධිමුත්තං තප්පරායණං' යනු වේ.

එයින් වදළහ බුදුහු:

"විඤ්ඤාණට්ඨිතියො සබ්බා -පෙ- අධිමුත්තං තප්පරායණං" යි.

---

## 14-4

ආකිඤ්චඤ්ඤායතනයෙහි උපදවන අරූපරාග සංඛ්‍යාත නන්දිය 'සංයොගයෙකැ' යි දැන තෙල මෙසේ මැ විශිෂ්ටඥානයෙන් දැන ඉක්බිති එහි (අනිත්‍යාදි විසින්) විදර්ශනා කෙරෙයි. වැස නිමවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවාස ඇති බාහිතපාපි වූ ඒ රහත්හු ගේ තෙල අර්හත්මාර්ගඥානය අවිපරීත වේ යයි.

**ආකිඤ්චඤ්ඤාසම්භවං** – 'ආකිඤ්චඤ්ඤාසම්භව' යි ආකිඤ්චඤ්ඤායතනයෙහි ඉපදීම පිණිස පවත්නා කර්මාභිසංස්කාරය කියනු ලැබෙයි. ආකිඤ්චඤ්ඤායතන සංවත්තනික වූ කර්මාභිසංස්කාරය 'ආකිඤ්චඤ්ඤාසම්භව' යි දැන 'ලග්නයෙකැ' යි දැන 'බන්ධනයෙකැ'යි දැන 'පළිබොධයෙකැ' යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නුයි 'ආකිඤ්චඤ්ඤාසම්භවං ඤත්වා' යනු වේ.

**නන්දිසංයොජනං ඉති** – 'නන්දිසංයොජන'යි අරූපරාගය කියනු ලැබෙයි. අරූපරාගයෙන් ඒ කර්මය ලග්න යැ ලග්නිත යැ පරිරුද්ධ යැ, අරූපරාගය නන්දිසංයොජනයෙකැ' යි දැන බන්ධනයෙකැ' යි දැන පරිරොධයෙකැ' යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූතකොට. ඉති යනු: පදසන්ධි යැ පදසංසර්ග යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්වතා යැ තෙල 'ඉති' යනු.

එවමෙතං අභිඤ්ඤායාති එවං එතං අභිඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'එවමෙතං අභිඤ්ඤාය'.

තතො තත්ථ විපස්සතීති 'තත්ථා'ති ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජිත්වා තතො වුට්ඨහිත්වා තත්ථ ජාතෙ චිත්තචෙතසිකෙ ධම්මෙ අනිච්චතො විපස්සති දුක්ඛතො විපස්සති රොගතො –පෙ– නිස්සරණතො විපස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති 'තතො තත්ථ විපස්සති'.

එතං ඤාණං තථං තස්සාති එතං ඤාණං තච්ඡං භූතං යාථාවං අවිපරීතං තස්සාති 'එතං ඤාණං තථං තස්ස'.

බ්‍රාහ්මණස්ස වුසීමතොති 'බ්‍රාහ්මණො'ති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො –පෙ– අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මාති. බ්‍රාහ්මණස්ස වුසීමතොති පුථුජ්ජනකල්‍යාණං උපාදාය සත්තසෙඛා[1] අප්පත්තස්ස[2] පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්ති, අරහා වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො සො වුත්ථවාසො චිණ්ණචරණො –පෙ– ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො'ති 'බ්‍රාහ්මණස්ස වුසීමතො'.

තෙනාහ භගවා:

"ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වා නන්දිසංයොජනං ඉති,
එවමෙතං අභිඤ්ඤාය තතො තත්ථ විපස්සති.
එතං ඤාණං තථං තස්ස බ්‍රාහ්මණස්ස වුසීමතො"ති.

සහ ගාථාපරියොසානා –පෙ– සත්ථා මෙ භගවා සාවකොහමස්මී'ති.

පොසාල සුත්තනිද්දෙසො සමත්තො

1. සත්තසෙක්ඛා – ච–චි–ක–ම ජ සං
2. අප්පත්තස්ස– ච–චි–ක

**එවමෙතං අභිඤ්ඤාය** – තෙල මෙසේ දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නුයි 'එවමෙතං අභිඤ්ඤාය' යනු වේ.

**තතො තත්ථ විපස්සති** – 'තත්ථ' යනු: ආකිඤ්චඤ්ඤායතනයට සම වැද එයින් නැඟී සිටි එහි උපන් චිත්තචෛතසික ධර්මයන් අනිත්‍ය හෙයින් විදර්ශනා කෙරෙයි දුඃඛ හෙයින් විදර්ශනා කෙරෙයි රොග හෙයින් ... නිස්සරණ හෙයින් විදර්ශනා කෙරෙයි දකියි අවලෝකනය කෙරෙයි සිතයි විමසා නුයි 'තතො තත්ථ විපස්සති' යනු වේ.

**එතං ඤාණං තථං තස්ස** – ඒ රහත් පුඟුල්හු ගේ තෙල රහත්මඟනුවණ තථ්‍ය යැ භූත යැ යථාස්වභාව ඇත්තේ යැ අවිපරීත නුයි "එතං ඤාණං තථං තස්ස" යනු වේ.

**බ්‍රාහ්මණස්ස වුසීමතො** – 'බ්‍රාහ්මණ' යනු: (සත්කාය දෘෂ්ටි ආදි) සප්තධර්ම කෙනකුන් දුරු කළ වන බැවින් බ්‍රාහ්මණ යැ ... (තෘෂ්ණාදෘෂ්ටි නිඃශ්‍රය නැති බැවින්) 'අසිත' යයි ද (ලොකධර්මයෙන් නිර්විකාර බැවින්) 'තාදී' යයි ද කියනු ලැබේ. හෙතෙම 'බ්‍රාහ්මණ' නම් වෙයි. **බ්‍රාහ්මණස්ස වුසීමතො** යනු: පෘථග්ජන කල්‍යාණයා පටන් සප්ත ශෛක්ෂයෝ නො පැමිණි රහත්බවට පැමිණෙනු පිණිස අවබොධ නො කළ රහත්බව අවබෝධ කරනු පිණිස පසක් නො කළ රහත්බව පසක් කරනු පිණිස වෙසෙති වැද වෙසෙති වෙසෙසින් වෙසෙති සර්වප්‍රකාරයෙන් වෙසෙති, රහත්පුඟුල් තෙම වැස නිමවූ බඹසර ඇත්තේ කළ (සිවුමඟ) කිස ඇත්තේ බහා තබන ලද (කෙලෙස්) බර ඇත්තේ පැමිණි උත්තමාර්ත්ථ ඇත්තේ ක්ෂය කළ භවසංයොජන ඇත්තේ මොනොවට රහත්මඟින් (කෙලෙසුන් කෙරෙන්) මිදුණේ වෙයි. හෙතෙම වැස නිමවූ බඹසරවස් ඇත්තේ යැ පරිචිත චරණ ධර්ම ඇත්තේ යැ ... ජාතිමරණ සංඛ්‍යාත පුනර්භවය ඔහුට නැත් නුයි 'බ්‍රාහ්මණස්ස වුසීමතො' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**"ආකිඤ්චඤ්ඤාසම්භවං –පෙ– බ්‍රාහ්මණස්ස වුසීමතො"** යි.

ගාථා පර්‍යවසානය හා සමඟ ... බුදුහු මාගේ ශාස්තෘහ, මම ශ්‍රාවක යෙමි.

**පෝසාල සූත්‍රනිර්දේශය නිමි.**

# 15. මොඝරාජ සුත්තනිද්දෙසො

## 15–1

ද්වාහං සක්කං[1] අපුච්ඡිස්සං (ඉච්චායස්මා මොඝරාජා)
න මෙ බ්‍යාකාසි චක්ඛුමා,
යාව තතියඤ්ච දෙවීසි
බ්‍යාකරොතීති මෙ සුතං,

ද්වාහං සක්කං අපුච්ඡිස්සන්ති සො බ්‍රාහ්මණො ද්වික්ඛත්තුං බුද්ධං භගවන්තං පඤ්හං අපුච්ඡි, තස්ස භගවා පඤ්හං පුට්ඨො න බ්‍යාකාසි තදන්තරා[2] ඉමස්ස බ්‍රාහ්මණස්ස ඉන්ද්‍රියපරිපාකො භවිස්සතීති. සක්කන්ති සක්කො භගවා සක්‍යකුලා[3] පබ්බජිතොතිපි සක්කො, අථවා අඩ්ඪො මහද්ධනො ධනවාතිපි සක්කො, තස්සිමානි ධනානි, සෙය්‍යථීදං: සද්ධාධනං සීලධනං හිරිධනං ඔත්තප්පධනං සුතධනං චාගධනං පඤ්ඤාධනං සතිපට්ඨානධනං සම්මප්පධානධනං ඉද්ධිපාදධනං ඉන්ද්‍රියධනං බලධනං බොජ්ඣඞ්ගධනං මග්ගධනං ඵලධනං, නිබ්බානධනං ඉමෙහි අනෙකවිධෙහි ධනරතනෙහි අඩ්ඪො මහද්ධනො ධනවාතිපි සක්කො. අථවා පහු විසවී අලමත්තො සූරො වීරො වික්කන්තො අභීරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසොතිපි සක්කො. ද්වාහං සක්කං අපුච්ඡිස්සන්ති ද්වාහං සක්කං අපුච්ඡිස්සං අයාචිස්සං අජ්ඣෙසිස්සං පසාදයිස්සන්ති 'ද්වාහං සක්කං අපුච්ඡිස්සං'. ඉච්චායස්මා මොඝරාජති –පෙ–

න මෙ බ්‍යාකාසි චක්ඛුමාති 'න මෙ බ්‍යාකාසී'ති න මෙ බ්‍යාකාසි, න ආචික්ඛි, න දෙසෙසි, න පඤ්ඤපෙසි, න පට්ඨපෙසි, න විවරි, න විභජි, න උත්තානී අකාසි, න පකාසෙසි. චක්ඛුමාති භගවා පඤ්චහි චක්ඛූහි චක්ඛුමා, මංසචක්ඛුනාපි චක්ඛුමා, දිබ්බචක්ඛුනාපි චක්ඛුමා, පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා, බුද්ධචක්ඛුනාපි චක්ඛුමා, සමන්තචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා මංසචක්ඛුනාපි චක්ඛුමා: 'මංස චක්ඛුම්හි භගවතො පඤ්ච වණ්ණා සංවිජ්ජන්ති[4] නීලො ච වණ්ණො පීතකො ච වණ්ණො ලොහිතකො ච වණ්ණො කණ්හො ච වණ්ණො ඔදාතො ච වණ්ණො. අක්ඛිලොමානි ච භගවතො[5] යත්ථ ච අක්ඛිලොමානි පතිට්ඨිතානි තං නීලං හොති සුනීලං පාසාදිකං දස්සනෙය්‍යං උම්මාපුප්ඵසමානං[6] තස්ස පරතො පීතකං හොති සුපීතකං සුවණ්ණවණ්ණං පාසාදිකං දස්සනෙය්‍යං කණිකාරපුප්ඵසමානං, උභතො ච අක්ඛිකූටානි[7] භගවතො ලොහිතකානි හොන්ති.

---

1. සක්ක – ස්‍යා,
2. චක්ඛුසමනන්තරා – ස්‍යා.
3. සාක්‍යකුලා –වි–ක
4. පඤ්චවණ්ණං සංවිජ්ජති– ව–වි–ක
5. 'අක්ඛිලොමානි ච භගවතො' –ම ජ සං, නත්ථි
6. උමා පුප්ඵසමානං – ම ජ සං, උම්මාරපුප්ඵ සමානං – ව–වි–ක–ස්‍යා
7. අක්ඛි කූපානි – සත

# 15. මෝඝරාජ සූත්‍රනිර්දේශය

## 15–1

(ආයුෂ්මත් මෝඝරාජ මෙසේ විචාරයි:) මම දෙවරක් ශාක්‍යමුනිහු විචාළෙමි. චක්ෂුර්මත්හු ප්‍රකාශ නො කළහ, දෙවර්ෂිහු තුන්වනවට දක්වා විචාරන ලද්දහු ප්‍රකාශ කරන සේකැ යි මා විසින් අසන ලද.

**ද්වාහං සක්කං අපුච්ඡිස්සං** යනු: එ බමුණු දෙවරක් භාග්‍යවත් බුදුන් පැන පුළුවුත්. ඔහට බුදුහු පැන පුළුවුස්නා ලද්දහු 'එයට ඉක්බිති මෙ බමුණුහට ඉන්ද්‍රියපරිපාකය වන්නේ යැ'යි ප්‍රකාශ නො කළහ. **සක්කො** යනු බුදුහු ශාක්‍යයහ: ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූහ යි ද ශාක්‍යයහ, නොහොත් ආඪ්‍යයහ මහද්ධන ඇතියහ ධනවත්හ යි ද ශාක්‍යයහ. උන් වහන්සේට මේ ධනයෝ වෙති; හෙ මෙසේයි: ශ්‍රද්ධා ධන යැ ශීල ධනයැ හිරි ධන යැ ඔත්තප්ප ධන යැ ශ්‍රැත ධන යැ ත්‍යාග ධන යැ ප්‍රඥා ධන යැ සතිපට්ඨාන ධන යැ සම්‍යක්ප්‍රධාන ධන යැ ඍද්ධිපාද ධන යැ ඉන්ද්‍රිය ධන යැ බලධන යැ බොධ්‍යඞ්ග ධන යැ මාර්ග ධන යැ ඵලධන යැ නිර්වාණධන යි. මෙ අනේකවිධ ධනරත්නයන් ගෙන් ආඪ්‍යයහ, මහද්ධන ඇතියහ, ධනවත්හ යි ද ශාක්‍යයහ. නොහොත් ශාක්‍යයහ, ප්‍රභූහ පරසන්තානයෙහි වීර්‍ය්‍ය උපදවනුවහ, සමර්ත්ථ සිත් ඇතියහ, ශූරයහ, පරාක්‍රම ඇතියහ, වික්‍රම ඇතියහ, නො බාන සුල්ලහ, නො සැලෙනුවහ, නො තැතිගනුවහ, නො පලායනසුල්ලහ, දුරු කළ බිය හා බිය අරමුණු ඇතියහ, පහවූ ලොමුදහ ඇතියහ නුයි ද ශාක්‍යයහ. **ද්වාහං සක්කං අපුච්ඡිස්සං** යනු: මම දෙවරක් ශාක්‍යයන් වහන්සේ පුළුවුත්මි, අයැදියෙමි, අධ්‍යෙෂණ කෙළෙමි, පැහැද වීම් නුයි 'ද්වාහං සක්කං අපුච්ඡිස්සං' යනුවේ. **ඉච්චායස්මා මොඝරාජා** යනු:...

**න මෙ බ්‍යාකාසි චක්ඛුමා** – 'න මෙ බ්‍යාකාසි' යනු: මට නො පැවැසූහ නො වදළහ නො දෙසූහ නො පැනවූහ නො පිහිටවූහ විවරණය නො කළහ විභාග නො කළහ පාළ නො කළහ ප්‍රකාශ නො කළහ. **චක්ඛුමා** යනු: බුදුහු පසැසින් චක්ෂුෂ්මත්හ: මසැසිනුදු චක්ෂුෂ්මත්හ, දිවැසිනුදු චක්ෂුෂ්මත්හ, පැනැසිනුදු චක්ෂුෂ්මත්හ, බුදු ඇසිනුදු චක්ෂුෂ්මත්හ, සමතැසිනුදු චක්ෂුෂ්මත්හ.

**කිංසෙයින්** බුදුහු මසැසිනුදු චක්ෂුර්මත්හ යත්: භාග්‍යවතුන් වහන්සේ ගේ මසැස්හි පස්පැහැ දිස් වෙයි: නිල් පැහැ යැ රන්වන් පැහැ යැ රත් පැහැ යැ කළු පැහැ යැ සුදු පැහැ යැ යි. තවද බුදුන්ගේ අක්ෂිරොම වෙයි: යම් තැනෙකැ වැළිත් ඇස්ලොම් පිහිටියේ ද එතැන දියමෙරළිය මල් සුදුසු සුනිල් පිරිසුදු දැකුම්කලු නිල්පැහැ වෙයි. එ ඉක්බිති කිණිහිරිමල් සුදුසු සුකසාවන් රන්වන් පිරිසුදු දැකුම්කලු කසාවන් පැහැ වෙයි. බුදුන්ගේ දෙනෙතග රතිඳුංගාව සුදුසු සුරත් පිරිසුදු දැකුම්කලු රත්පැහැ වෙයි. මැද

සුලොහිතකානි පාසාදිකානි දස්සනෙය්‍යානි ඉන්දගොපකසමානානි, මජ්ඣෙ කණ්ණකං හොති සුකණ්ණකං අලූඛං[1] සිනිද්ධං පාසාදිකං දස්සනෙය්‍යං. අඤ්ජූරිට්ඨකසමානං[2] තස්ස පරතො ඔදාතං හොති සුඔදාතං[3] සෙතං පණ්ඩරං පාසාදිකං දස්සනෙය්‍යං ඔසධීතාරකසමානං, තෙන භගවා පකතියෙන මංසචක්ඛුනා අත්තභාවපරියාපන්නෙන පුරිමසුචරිතකම්මාභිනිබ්බත්තෙන සමන්තා යොජනං පස්සති දිවා චෙව රත්තිඤ්ච. යදපි චතුරඞ්ගසමන්නාගතො අන්ධකාරො හොති, සූරියො ච අත්ථං ගතො හොති[4] කාළපක්ඛො ච උපොසථො හොති, තිබ්බො ච වනසණ්ඩො හොති, මහා ච කාළමෙඝො[5] අබ්භුට්ඨිතො හොති. එවරූපෙ චතුරඞ්ගසමන්නාගතෙ අන්ධකාරෙ සමන්තා යොජනං පස්සති.

කථං භගවා දිබ්බෙන චක්ඛුනාපි චක්ඛුමා: භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනූපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ආකඞ්ඛමානො ච භගවා එකම්පි ලොකධාතුං පස්සෙය්‍ය, ද්වෙපි ලොකධාතුයො, පස්සෙය්‍ය තිස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය, චතස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය, පඤ්චපි ලොකධාතුයො පස්සෙය්‍ය, දසපි ලොකධාතුයො පස්සෙය්‍ය, වීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, තිංසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, චත්තාලීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, පඤ්ඤාසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, සතම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, සහස්සිම්පි චූළනිකං ලොකධාතුං පස්සෙය්‍ය, ද්විසහස්සිම්පි මජ්ඣිමිකං ලොකධාතුං පස්සෙය්‍ය, තිසහස්සම්පි මහාසහස්සිං ලොකධාතුං[6] පස්සෙය්‍ය, යාවතා[7] පන ආකඞ්ඛෙය්‍ය තාවතකං පස්සෙය්‍ය, එවං පරිසුද්ධං[8] භගවතො දිබ්බචක්ඛු. එවං භගවා දිබ්බෙන චක්ඛුනාපි චක්ඛුමා.

---

1. ආලුකා – පත
2. අළාරිට්ඨක – ස්‍යා.
3. ඔදාතා සුඔදාතා – පත.
4. අත්ථං ගමිතො, හොති – ස්‍යා.
5. අකාලමෙඝො – ස්‍යා.
6. තිසහස්සිම්පි ලොකධාතුං පස්සෙය්‍ය. මහාසහස්සිම්පි ලොකධාතුපස්සෙය්‍ය– ම ඡ සං,
7. යාවතකං – ම ඡ සං.
8. එවං විසුද්ධං – ප–ච–වි–ක.

රුක්පෙණෙල ඇට සුදුසු ඉතා කළු මොළොක් සිනිඳු පිරිසුදු දැකුම්කලු කළුපැහැ වෙයි. ඉනික්බිති දවහත්තරු සුදුසු ඉතා සුදු සිත පඬර පිරිසුදු දැකුම්කලු සුදු පැහැ වේ. බුදුහු අත්බැව් ඇසුරු කළ පෙර පින්කමින් උපන් ඒ පියවි මසැසින් දහවල්හි ද රැයිදු හාත්පසින් යොදුනක් දකිති. යම් කලෙකැ චතුරඞ්ගසමන්වාගත අන්ධකාරය වේ ද: හිරු අස්තයට ගියේත් වේ ද, කෘෂ්ණපක්ෂයෙහි පොහොය ත් වේ ද, ගහන වූ වන ළැහැබක් වේ ද, මහ කළුවලාකුළු නැඟුණේත් වේ ද, මෙ බඳු වූ චතුරඞ්ගසමන්වාගත අන්ධකාරයෙහි පවා හාත්පසින් යොදුනක් දකිති. එහි ඒ බිත්තියක් හෝ කවුළුවක් හෝ පවුරක් හෝ ගලක් හෝ ඝසක් හෝ වැලක් හෝ රූපදර්ශනයට ආවරණයෙක් නැති. ඉදින් එක් තලැටක් ලකුණු කොට තලගැලෙකැ බහාලන්නේ නම් ඒ තල ඇටය මැ නඟාගන්නා සේ ක. මෙසෙයින් බුදුන්ගේ පියවි මසැස පිරිසුදු වේ. මෙසෙයින් බුදුහු මසැසිනුදු චක්ෂුෂ්මත් වෙති.

කිසෙයින් බුදුහු දිවැසිනුදු චක්ෂුර්මත්හ යත්: බුදුහු විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටියා වූ ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ප්‍රණීත වූ අභිරූප වූ විරූප වූ සුගතියට ගියාවූ දුගතියට ගියා වූ සත්ත්වයන් දකිති. යහහ, මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනො දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයනට උපවාද කළාහු මිත්‍ථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිත්‍ථ්‍යාදෘෂ්ටි වශයෙන් සමාදන් වූ විවිධ කර්ම ඇත්තාහු ය. ඔහු කය බිඳිමෙන් මරණින් මත්තෙහි අය රහිත වූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයට පැමිණියාහු ය. යළි මේ භවත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූවාහු වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයනට උපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටි වශයෙන් සමාදන් වූ කර්ම ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මත්තෙහි සුන්දරගති ඇති සැපයෙන් අග්‍ර වූ ලොකයට පැමිණියාහ යි කම් වූ පරිද්දෙන් පැමිණි සත්ත්වයන් දන්නා සේක. මෙසෙයින් විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටි දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ප්‍රණීත වූ අභිරූප වූ විරූප වූ සුගතියට ගියා වූ දුගතියට ගියා වූ සත්ත්වයන් දකිති. කම් වූ පරිදි (පරලොව) පැමිණි සත්ත්වයන් දන්නා සේක. තවද බුදහු කැමැති වන්නාහු නම් එක් ලොකධාතුවකුදු බලන සේක. ලොකධාතු දෙකක් ද තුන් ලොකධාතුවකුදු – සතර ලොකධාතුවකුදු – පස් ලොකධාතුවකුදු බලන සේක. දස ලොකධාතුවකුදු – විසි ලොකධාතුවකුදු – තිස් ලොකධාතුවකුදු– සතලිස් ලොකධාතුවකුදු– පනස් ලොකධාතුවකුදු– සියක් ලොකධාතුහු ද බලන සේක. සහස්‍රීචූලනීලොකධාතුව ද බලන සේක. ද්විසහස්‍රී මධ්‍යම ලොකධාතුව ද බලන සේක, ත්‍රිසහස්‍රී මහා සහස්‍රී ලොකධාතුව ද බලන සේක. තවද යම් පමණ කැමැති වන සේක් නම් එ පමණ බලන සේක. බුදුන්ගේ දිවැස මෙසෙයින් පිරිසුදු වේ. මෙසෙයින් බුදුහු දිවැසිනුදු චක්ෂුර්මත් වෙති.

කථං භගවා පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා: භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසපඤ්ඤො ජවනපඤ්ඤො[1]. තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාප්පභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො[2]. චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො අඩ්ඪො මහද්ධනො ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛෙතා පසාදෙතා. සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස, මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා.

සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා, අමතස්ස දතා ධම්මසාමි[3] තථාගතො, නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං[4] පඤ්ඤාය, අතීතං අනාගතං පච්චුප්පන්නං[5] උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති. යං කිඤ්චි නෙය්‍යං නාම අත්ථි ධම්මං ජානිතබ්බං[6] අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො, උත්තානො වා අත්ථො, ගම්භීරො වා අත්ථො, ගූළ්හො වා අත්ථො, පටිච්ඡන්නො වා අත්ථො, නෙය්‍යො වා අත්ථො, නීතො වා අත්ථො, අනවජ්ජො වා[7] අත්ථො, නික්කිලෙසො වා අත්ථො, වොදානො වා අත්ථො, පරමත්ථො වා අත්ථො[8]. සබ්බං තං අන්තොබුද්ධඤාණෙ පරිවත්තති, සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති සබ්බං වචීකම්මං ඤාණානුපරිවත්ති, සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්ති,

1. ජවනපඤ්ඤො හාසපඤ්ඤො - ම ජ සං
2. අධිගතපටිසම්භිදප්පත්තො - ම ජ සං,
3. ධම්මසාමී - සයා
4. අඵුසිතං - සයා
5. අතීතානාගත පච්චුප්පන්නං - සයා,
6. අත්ථි, ජානිතබ්බං - ම ජ සං, සයා.
7. අවිරොධො අත්ථො වා - පන.
8. පරමත්ථො වා - ම ජ සං, සයා.

කිසෙයින් බුදුහු පැනැසිනුදු චක්ෂුර්මත්හ යත්: බුදුහු මහත්ප්‍රඥා ඇතියහ, පතළ ප්‍රඥා ඇතියහ, ශීඝ්‍ර ප්‍රඥා ඇතියහ, දිවෙන ප්‍රඥා ඇතියහ, තියුණු ප්‍රඥා ඇතියහ, විනිවිද යන ප්‍රඥා ඇතියහ, ප්‍රඥා ප්‍රභේදයෙහි නිපුණයහ, ප්‍රභේදයට පැමිණි ඥාන ඇතියහ, අධිගම කළ ප්‍රතිසංවිද් ඇතියහ, චතුර්වෛශාරද්‍යයට පැමිණියහ, දශබලධාරීහ, පුරුෂ ශ්‍රෙෂ්ඨයහ, පුරුෂසිංහයහ, පුරුෂනාගයහ, පුරුෂාජානෙයහ, පුරුෂ-ධෞරෙයහ, අනන්ත ඥාන ඇතියහ, අනන්ත තේජස් ඇතියහ, අනන්ත යශස් ඇතියහ, (ප්‍රඥාධනයෙන්) ආඪ්‍යයහ, මහත් වූ ප්‍රඥාධන ඇතියහ, ප්‍රඥාධනවත්හ, (නිවනට පමුණුවන හෙයින්) නේතෘහ, (වෛනෙය ජනයන් විනයන කරන හෙයින්) විනේතෘහ, (සැක සිඳුනා හෙයින්) අනුනේතෘහ, (අර්ථය) පනවනුවහ, නිශ්චය කරනුවහ, (පිළිවෙත්) දක්වනුවහ, (ප්‍රතිපත්තිඵලයෙන්) පහදනුවහ, තවද ඒ බුදුහු නූපන්විරූ අරිමඟ සිය සතන්හි ඉපැදවූහ, (වෛනෙය සන්තානයෙහි) අසඤ්ජාත මාර්ගය උපදනුවහ, ප්‍රකාශ නො කළ මාර්ගය ප්‍රකාශ කරනුවහ, මාර්ගය දතුවහ, මාර්ගය දන්නාසුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ, තවද මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශිලාදි ගුණයෙන්) පසුපස යෙමින් වෙසෙත්.

ඒ බුදුහු දතයුතු ඥෙයධර්මය දනිති, දක්කයුතු ඥෙයපථය නුවණැසින් දකිති, (දර්ශන පරිණායක හෙයින්) ඇසක් මෙන් වූහ, ඥානමය වූහ ධර්මමය වූහ, ශ්‍රෙෂ්ඨ වූහ, (දහම් දෙසන හෙයින්) වක්තෘ වූහ, ප්‍රවක්තෘ වූහ, (අර්ත්ථය දක්වනුයෙන්) නිර්නේතෘ වූහ, අමෘතය දෙනුවහ, ධර්ම ස්වාමීහ, තථාගත වූහ. ඒ බුදුන් විසින් (මහනැණින්) නො දන්නා ලද්දෙක් (නුවණැසින්) නො දක්නා ලද්දෙක් අවිදිතයෙක් නො පසක් කරන ලද්-දෙක් ප්‍රඥායෙන් ස්පර්ශ නො කරන ලද්දෙක් නැති. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ ද, අතීතානාගත ප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට සඞ්ඛතාසඞ්ඛත වූ සියලු ධර්මයෝ සර්වප්‍රකාරයෙන් භාග්‍යවත් බුදුන් ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙත්. ආත්මාර්ත්ථය වේවයි පරාර්ථය වේවයි උභයාර්ථය වේවයි දෘෂ්ටධාර්මිකාර්ත්ථය වේවයි සාම්පරායිකාර්ථය වේවයි උත්තානාර්ත්ථය වේවයි ගම්භීරාර්ත්ථය වේවයි ගූඪාර්ත්ථය වේවයි ප්‍රතිච්ඡන්නාර්ත්ථය වේවයි නෙයාර්ත්ථය වේවයි නීතාර්ත්ථය වේවයි නිර්දෙෂාර්ත්ථය වේවයි නික්ලෙශාර්ත්ථය වේවයි පරිශුද්ධාර්ත්ථය වේවයි පරමාර්ත්ථය වේවයි එ හැම බුද්ධඥානය තුළ පිරිවැටෙයි. භාග්‍ය-වත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී, සියලු වාක්කර්මය ඥානය අනුව පවතී, සියලු මනඃකර්මය ඥානය අනුව පවතී.

අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, අනාගතෙ අප්පටිහතං ඤාණං, පච්චුප්පන්නෙ අප්පටිහතං ඤාණං, යාවතකං නෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං නෙය්‍යං, නෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං නෙය්‍යං, නෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති[1]. ඤාණං අතික්කමිත්වා නෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා, යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵස්සිතානං[2]. හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ[3]. එවමෙව බුද්ධස්ස භගවතො නෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො. යාවතකං නෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං නෙය්‍යං, නෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං නෙය්‍යං, නෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා නෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා.

සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති, සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛපටිබද්ධා[4] මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති, සබ්බෙසඤ්ච සත්තානං භගවා ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති, අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ ජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තොමහාසමුද්දෙ පරිවත්තන්ති. එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො[5] සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති[6]. යථා යෙ කෙචි පක්ඛී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති. එවමෙව යෙපි තෙ[7]. සාරිපුත්තසමා පඤ්ඤාය සමන්නාගතා, තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති. බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨති. යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා[8] මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන[9] දිට්ඨිගතානි, තෙ පඤ්හෙ අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච කථිතා විසජ්ජිතාව[10]. තෙ පඤ්හා භගවතා[11] හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකා ච තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවාව තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති. එවං භගවා පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා.

---

1. ඤාණං න පරිවත්තති - පන.
2. ඵුසිතානං - ම ජ සං, ස්‍යා.
3. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො - ම ජ සං.
4. ආකඞ්ඛන පටිබද්ධා. - පන
5. සමාරකො ලොකො සබ්‍රහ්මකො ලොකො - ම ජ සං
6. පරිවත්තන්ති - ම, වි, ක.
7. යෙකෙචි තෙ - පන
8. තෙ භින්දන්තා - ස්‍යා, ව. වි, ක.
9. දිට්ඨිගතෙහ - පන.
10. කථිතා විසජ්ජිතාව - ව, වි, ක, ම ජ සං
11. භගවතො - ව, වි, ක.

අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (අනාවරණ) යැ, අනාගතයෙහි ඥානය අනාවරණ යැ, ප්‍රත්‍යුත්පන්නයෙහි ඥානය අනාවරණ යැ දතයුත්ත යම් පමණ ද ඥානය එ පමණ යැ, ඥානය යම් පමණ ද දතයුත්ත එ පමණ යැ, ඥානය ඥෙයපර්‍ය්‍යන්තික යැ, ඥෙයය ඥානපර්‍ය්‍යන්තික යැ, ඥෙයය ඉක්මැ ඥානයෙක් නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති, ඒ ධර්මයෝ අන්‍යොන්‍යපර්‍ය්‍යන්තයෙහි පවත්නාසුල්ලහ. යම්සේ මනාකොට පැහැසූ සුමුගු පටල දෙකක්හු ගේ යට සුමුගුපටල උපරිමය නො ඉක්මවා ද උඩ සුමුගුපටල හෙට්ඨිමය නො ඉක්ම සිටී ද, ඔවුහු ඔවුනොවුන් ගේ කෙළවර සිටුනාසුලු වෙත් ද, එසෙයින් භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යොන්‍යපර්‍ය්‍යන්තයෙහි පවත්නාසුල්ලහ. යම්තාක් ඥෙයය ද ඒ තාක් ඥාන යැ, යම් තාක් ඥානය ද ඒ තාක් ඥෙය යැ, ඥානය ඥෙයපර්‍ය්‍යන්තික යැ ඥෙයය ඥානපර්‍ය්‍යන්තික යැ, ඥෙයය ඉක් මැ ඥානය නො පවතී ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති. ඒ දහම්හු අන්‍යොන්‍ය පර්‍ය්‍යන්තයෙහි සිටුනාසුල්ලහ.

සියලු දහම් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥනය පවතී, සියලු දහම්හු භාග්‍යවත් බුදුන්ගේ මනොද්වාරාවර්ජනයට අයත්හු වෙති, රුචිය ප්‍රතිබද්ධයහ, මනසිකාර ප්‍රතිබද්ධයහ, චිත්තොත්පාද ප්‍රතිබද්ධයහ. සියලු සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී. බුදුහු සියලු සතුන්ගේ ආශය දනිති, අනුශය දනිති චරිතය දනිති, අධිමුක්තිය දනිති. අල්ප වූ රාගාදි රජස් ඇති මහත් වූ රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති සුන්දර වූ (ශ්‍රද්ධාදි) ආකාර ඇති ගර්හිත වූ (ශ්‍රද්ධාදි) ආකාර ඇති සුවිඥාප්‍ය වූ දුර්විඥාප්‍ය වූ භව්‍යාභව්‍ය සත්ත්වයන් දනිති. මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත ලෝ වැසි තෙම දෙව්මිනිසුන් සහිත වූ මහණ බමුණන් සහිත ප්‍රජාව බුදුනුවණ තුළ පවතී. තිමි තිමිඞගල පටන් කොට යම් කිසි මස්-කැසුබු කෙනෙක් වෙත් නම්, ඔහු යම්සේ ඇතුළු මහමුහුදෙහි හැසිරෙත් ද, එසෙයින් මරුන් බඹුන් සහිත වූ සදෙවක ලොක තෙමේ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව ඇතුළුබුදුනුවණෙහි පවතී. යම්සේ විනතාපුත් ගුරුළුරජහු පටන් කොට යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම්, ඔහු අහසැ පෙදෙසකැ හැසිරෙත් ද, එසෙයින් මැ යම් කෙනෙක් නුවණින් සැරියුත් තෙරුන් සම වූවාහු නම්, ඔවුහු ද බුද්ධඥානයාගේ පෙදෙසක පවත්නාහු යැ. බුද්ධඥානය දෙව්මිනිසුන්ගේ ප්‍රඥාව පැතිරැ මැඩගෙන සිටී. නිපුණ වූ කළ පරප්‍රවාද ඇති වල්විදුනා දුනුවායන් බඳු ප්‍රසිද්ධ වූ යම් ක්ෂත්‍රිය- බ්‍රාහ්මණ- ගෘහපති- ශ්‍රමණ පණ්ඩිත කෙනෙක් ප්‍රඥායෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද බොහෝ ප්‍රශ්න රචනා කොට බුදුන් වෙත පැමිණ විචාරත් ද භාග්‍යවතුන් විසින් ඒ ප්‍රශ්නයෝ සකාරණ වැ කියන ලද්දහු විසඳන ලද්දහු මැ වෙත්. ඔවුහු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක බවට (උපාසක බවට හෝ) පැමිණියාහු මැ වෙත්. යළි බුදුහු මැ එහි ප්‍රඥායෙන් අතිශයින් ප්‍රකාශ වෙත් නුයි මෙසේ බුදුහු පැනැසිනුදු 'චක්ෂුර්මත්' වූහ.

කථං භගවා බුද්ධචක්ඛුනාපි චක්ඛුමා: භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො[1] අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො[2] විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ. සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි,[3] අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති අනුපලිත්තානි උදකෙන. එවමෙව භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

"ජානාති භගවා" අයං පුග්ගලො රාගචරිතො අයං දොසචරිතො අයං මොහචරිතො, අයං විතක්කචරිතො අයං සද්ධාචරිතො අයං ඤාණචරිතොති. රාගචරිතස්ස භගවා පුග්ගලස්ස අසුභකථං කථෙති.[4] දොසචරිතස්ස භගවා පුග්ගලස්ස මෙත්තාභාවනං ආචික්ඛති, මොහචරිතං භගවා පුග්ගලං[5] උද්දෙසෙ පරිපුච්ඡාය[6] කාලෙන ධම්මස්සවනෙ කාලෙන ධම්මසාකච්ඡාය ගරුසංවාසෙ නිවෙසෙති, විතක්කචරිතස්ස භගවා පුග්ගලස්ස ආනාපානස්සතිං ආචික්ඛති, සද්ධාචරිතස්ස භගවා පුග්ගලස්ස පසාදනීයං නිමිත්තං ආචික්ඛති බුද්ධසුබොධිං ධම්මසුධම්මතං සඞ්ඝසුප්පටිපත්තිං සීලානි ච අත්තනො. ඤාණචරිතස්ස භගවා පුග්ගලස්ස විපස්සනානිමිත්තං ආචික්ඛති අනිච්චාකාරං දුක්ඛාකාරං අනත්තාකාරං.

---

1. වොලොකෙන්තො – ම ජ සං.
2. දස්සාවිනෙ – ච, වි, ක.
3. සමොදකං තිට්ඨන්ති –ප–
4. අසුභං කථං – පත
5. මොහචරිතස්ස භගවා පුග්ගලස්ස–මජසං.
6. උද්දෙස පරිපුච්ඡාය – පණ.

කිසෙයින් බුදුහු බුදු ඇසිනුදු 'චක්ඛුර්මත්' වූහ යත්: බුදුහු බුදු ඇසින් ලොව බලන සේක් (නුවණැස්හි) අල්ප වූ (රාගාදි) කෙලෙස් රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති (ශ්‍රද්ධාදි) සුන්දරාකාර ඇති (අශ්‍රද්ධාදි) ගර්හිත වූ ආකාර ඇති සුවිඥාපාය්‍යවූ දුර්විඥාපාය වූ සත්ත්වයන් ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භය වශයෙන් දක්නාසුලු වැ වසනුවන්, ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භය වශයෙන් දක්නා සුලු වැ නොවසනුවන් දුටුසේක. යම්සේ උපුල්විලෙකැ හෝ පියුම්විලෙකැ හෝ නෙළුම්විලෙකැ හෝ ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැඟුණාහු ඇතුළත ගැලී පොහොනි වූවාහු ද, ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දිය හා සම වැ සිටියාහු ද, ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් උඩට නැඟී දිය හා නො වැකුණාහු සිටිත් ද එසෙයින් මැ බුදුහු බුදුඇසින් ලොව බලන සේක් අල්පරජස්ක වූ ද මහාරජස්ක වූ ද තියුණු ඉඳුරන් ඇත්තා වූ ද මෘදු ඉඳුරන් ඇත්තා වූ ද සුන්දරාකාර ඇති වූ ද ගර්හිතාකාර ඇති වූ ද සුවිඥාපාය වූ ද දුර්විඥාපාය වූ ද සත්ත්වයන්, ඇතැම් කෙනකුන් පරලොකයෙහිත් වද්‍යයෙහිත් භය දක්නාසුලු වැ වසනුවන්, ඇතැම්, කෙනකුන් පරලොක වද්‍යයෙහි භය දක්නාසුලු වැ නොවසනුවන් දුටු සේක.

බුදුහු 'මේ පුද්ගල තෙමේ රාගචරිතයෙක. මේ ද්වෙෂචරිතයෙක, මේ මොහචරිතයෙක, මේ විතර්කචරිතයෙක, මේ ශ්‍රද්ධාචරිතයෙක, මේ ඥානචරිතයෙකැ'යි දන්නා සේක. බුදුහු රාග බහුල පුද්ගලහට අශුභ කථාව වදරති. බුදුහු ද්වේෂ බහුල පුද්ගලහට මෛත්‍රීභාවනාව පවසති. බුදුහු මොහ බහුල පුද්ගලයා උදෙසීමෙහි ද පරිපෘච්ඡා (අටුවා) යෙහි ද කලෙකැ (සුදුසු කල්හි) ධර්මශ්‍රවණයෙහි ද කලෙකැ ධර්මසාකච්ඡායෙන් ගුරුන් ඇසුරු කිරීමෙහි ද (ඇදුරන් වෙත) සිටුවන සේක. බුදුහු විතර්ක බහුල පුද්ගලහට ආනාපානසතිය දෙසන සේක. ශ්‍රද්ධා බහුල පුද්ගලහට බුදුහු ප්‍රසාද උපදවන සූත්‍රයක් ද බුදුන්ගේ බුද්ධත්ව ප්‍රතිවෙධය ද ධර්මය ස්වාක්ඛ්‍යාත බව ද සඞ්ඝයා සුප්‍රතිපන්න බව ද තමා සතු ශීලයන් ද පවසන සේක. ඥානචරිත පුද්ගලහට බුදුහු (උදයව්‍යයාදි) විදර්ශනා නිමිත්ත වූ අනිත්‍යාකාරය දුඃඛාකාරය අනාත්මාකාරය පවසන සේක.

1. ''සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ,
පාසාදමාරුය්හ සමන්තචක්ඛු
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූත''න්ති[a]

එවං භගවා බුද්ධචක්ඛුනාපි චක්ඛුමා:

කථං භගවා සමන්තචක්ඛුනාපි චක්ඛුමා: 'සමන්තචක්ඛු' වුච්චති සබ්බඤ්ඤුතඤ්ඤාණං, භගවා සබ්බඤ්ඤුතඤ්ඤාණෙන[1] උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො[2] සමන්නාගතො.

2. ''න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛූ''ති[b]

එවං භගවා සමන්තචක්ඛුනාපි චක්ඛුමාති 'න මෙ බ්‍යාකාසි චක්ඛුමා.'

**යාවතතියඤ්ච දෙවීසි බ්‍යාකරොතීති මෙ සුතන්ති:** යාව තතියං බුද්ධො සහධම්මිකං පඤ්හං පුට්ඨො බ්‍යාකරොතීති නො සංසාරෙතීති[3] එවං මයා උග්ගහිතං, එවං මයා උපධාරිතං, එවං මයා උපලක්ඛිතං. **දෙවීසීති:** භගවා[4] දෙවො චෙව ඉසි චාති දෙවීසි. යථා රාජපබ්බජිතා[5] වුච්චන්ති රාජීසයො, බ්‍රාහ්මණපබ්බජිතා[6] වුච්චන්ති බ්‍රාහ්මණීසයො, එවමෙව භගවා දෙවො චෙව ඉසි චාති දෙවීසි. අථවා භගවා පබ්බජිතොතිපි ඉසි, මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීතිපි ඉසි, මහන්තං සමාධික්ඛන්ධං –පෙ– මහන්තං පඤ්ඤාක්ඛන්ධං – මහන්තං විමුත්තික්ඛන්ධං – මහන්තං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීතිපි ඉසි, මහතො තමොකායස්ස පදාලනං එසි ගවෙසි පරියෙසීතිපි ඉසි, මහතො විපල්ලාසස්ස පභෙදනං එසි ගවෙසි පරියෙසීතිපි ඉසි, මහතො තණ්හාසල්ලස්ස අබ්බහනං[7] –පෙ– මහතො දිට්ඨිසඞ්ඝාටස්ස විනිවෙඨනං – මහතො මානද්ධජස්ස පපාතනං – මහතො අභිසඞ්ඛාරස්ස වූපසමං – මහතො ඔඝස්ස නිත්ථරණං,–

1. සබ්බඤ්ඤුතඤාණෙන – ව, වි, ක.
2. සමුපපන්නො – ම ඡ සං.
3. නො සම්පායතීති – ස්‍යා. නොසංසාදෙතීති – ක.
4. භගවා චෙව – ම ඡ සං.
5. රාජා පබ්බජිතා – ම ඡ සං.
6. බ්‍රාහ්මණා පබ්බජිතා – ම ඡ සං.
7. අබ්බූළ්හනං – ස්‍යා,

a. දීඝනිකාය – මහාපදාන සුත්ත, මජ්ඣිමනිකාය – අරියපරියෙසනසුත්ත – බොධිරාජකුමාර සුත්ත, බ්‍රාහ්මණසංයුත්ත – පඨමවග්ග, ඉතිවුත්තක – දුතියවග්ග.

b. පටිසම්භිදාමග්ග–ඤාණකථා – ඉන්ද්‍රියකථා.

1. යම්සේ සෙල්මුවා පවු මුදුන්හි සිටි (ඇස් ඇති පුරුෂ) යෙක් හාත්පස ජනතාව බලන්නේ ද, එසෙයින් සුන්දර ප්‍රඥා ඇතියාණෙනි, සමන්තචක්ෂුස් වූ භාග්‍යවත්නි, මුඹ වහන්සේ ද දහම්මුවා පහයට නැඟ (තුමූ) පහ වූ ශොක ඇත්තාහු ශොකාවතීර්ණ වූ ජාතිජරායෙන් මඩනා ලද ජනතාව බලනු මැනැවැ'යි. මෙසෙයින් බුදුහු බුදු ඇසිනුදු චක්ෂුර්මත් වූහ.

කිසෙයින් බුදුහු සමතැසිනුදු 'චක්ෂුර්මත්' වූහ යත්: 'සමන්තචක්ඛු' සර්වඥතාඥානය කියනු ලැබෙයි. බුදුහු සර්වඥතාඥානයෙන් උපෙතයහ, සමුපෙතයහ, උපගතයහ, සමුපගතයහ, නො වෙන් වූහ, පරිපූර්ණයහ සමන්විත වූහු.

2. ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුක ලොකයෙහි (මෙකල හෝ) පැනැසින් නුදුටු කිසිවක් නැත, යළි (අතීත වූ) නො දත් කිසිවක් නැත, (අනාගත වූ) නො දැනෙන කිසි ධර්මජාතයෙකු දු නැති. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබෝධ කළහ. එහෙයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' වූහ.

මෙසෙයින් බුදුහු සමතැසිනුදු 'චක්ෂුර්මත්' වූහු නුයි 'න මෙ බ්‍යාකාසි චක්ඛුමා' යනු වේ.

**යාව තතියඤ්ච දෙවීසි බ්‍යාකරොති' ති** එම සූත්‍රං යනු: බුදුහු තුන්වන වට දක්වා කරුණු සහිත වැ පැන පුළුවුස්නා ලද්දහු ප්‍රකාශ කෙරෙති නො බැහැර කෙරෙති' මෙසේ මා විසින් උගන්නා ලද, මෙසේ මා විසින් විමසන ලද, මෙසේ මා විසින් සලකන ලද. දෙවීසි යනු: බුදුහු 'දෙව' ද 'ඍෂි' දු යි 'දේවර්ෂි' නම. යම්සේ රජපැවිද්දෝ 'රාජර්ෂීහ' යි කියනු ලැබෙත් ද බමුණු පැවිද්දෝ 'බ්‍රාහ්මණර්ෂීහ' යි කියනු ලැබෙත් ද, එසෙයින් මැ බුදුහු 'දේව' ද 'ඍෂි' දු යි දේවර්ෂීහ. නොහොත් බුදුහු පැවිදි වූවාහු නුයි ද ඍෂීහ, මහත් වූ ශීලස්කන්ධය එෂණ ගවෙෂණ පර්යේෂණ කළාහු නුයි ඍෂීහ, මහත් වූ සමාධිස්කන්ධය– මහත් වූ ප්‍රඥාස්කන්ධය– මහත් වූ විමුක්තිස්කන්ධය– මහත් වූ විමුක්තිඥාන දර්ශනස්කන්ධය එෂණ ගවෙෂණ පර්යේෂණ කළාහු නු යි ද ඍෂීහ, මහත් වූ තමස්කායයාගේ විදරණය එෂණ ගවෙෂණ පර්යේෂණ කළාහු නුයි ද ඍෂීහ, මහත් වූ විපර්‍යාසයාගේ බිඳීම එෂණ ගවෙෂණ පර්යේෂණ කළාහු නු යි ද ඍෂීහ, මහත් වූ තෘෂ්ණා ශල්‍යය ඉදිරීම ... මහත් වූ දෘෂ්ටි සඞ්ඝාටය ලිහීම, මහත් වූ මානධ්වජය හෙළීම, මහත් වූ අභිසංස්කාරය සන්හිඳුවීම, මහත් වූ ඔඝය තරණය කිරීම,

මහතො භාරස්ස නික්ඛෙපනං– මහතො සංසාරවට්ටස්ස උපච්ඡෙදං– මහතො සන්තාපස්ස නිබ්බාපනං– මහතො පරිළාහස්ස පටිපස්සද්ධිං– මහතො ධම්මධජස්ස උස්සාපනං එසි ගවෙසි පරියෙසීතිපි ඉසි. මහන්තෙ සතිපට්ඨානෙ මහන්තෙ සම්මප්පධානෙ මහන්තෙ ඉද්ධිපාදෙ මහන්තානි ඉන්ද්‍රියානි මහන්තානි බලානි මහන්තෙ බොජ්ඣඞ්ගෙ මහන්තං අරියං අට්ඨඞ්ගිකං මග්ගං මහන්තං පරමත්ථං අමතං නිබ්බානං එසි ගවෙසි පරියෙසීතිපි ඉසි. මහෙසක්ඛෙහි වා සත්තෙහි එසිතො ගවෙසිතො පරියෙසිතො කහං බුද්ධො කහං භගවා කහං දෙවදෙවො කහං නරාසභොතිපි ඉසීති යාව තතියඤ්ච දෙවීසි බ්‍යාකරොතීති මෙ සුතං.'

තෙනාහ සො බ්‍රාහ්මණො :

"ද්වාහං සක්කං අපුච්ඡිස්සං (ඉච්චායස්මා මොඝරාජා.)
න මෙ බ්‍යාකාසි චක්ඛුමා,
යාව තතියඤ්ච දෙවීසි
බ්‍යාකරොතීති මෙ සුත"න්ති.

15–2

අයං ලොකො පරො ලොකො
බ්‍රහ්මලොකො සදෙවකො,
දිට්ඨිං තෙ නාභිජානාති
ගොතමස්ස යසස්සිනො.

**අයං ලොකො පරො ලොකොති:** 'අයං ලොකො'ති මනුස්සලොකො 'පරො ලොකො'ති මනුස්සලොකං ඨපෙත්වා සබ්බො පරො ලොකො'ති අයං ලොකො පරො ලොකො'.

**බ්‍රහ්මලොකො සදෙවකොති** — සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සාති 'බ්‍රහ්මලොකො සදෙවකො.

**දිට්ඨිං තෙ නාභිජානාතීති**– තුය්හං දිට්ඨිං ඛන්තිං රුචිං ලද්ධිං අජ්ඣාසයං අධිප්පායං ලොකො න ජානාති: 'අයං එවංදිට්ඨිකො එවංඛන්තිකො එවංරුචිකො එවංලද්ධිකො එවංඅජ්ඣාසයො එවංඅධිප්පායො'ති න ජානාති න පස්සති න දක්ඛති නාධිගච්ඡති න වින්දති න පටිලභතීති 'දිට්ඨිං තෙ නාභිජානා'ති.

මහත් වූ (පස්කඳ) බර බහා තැබීම, මහත් වූ සසරවට සිඳීම, මහත් වූ සන්තාපය නිවීම, මහත් වූ (ක්ලේශ) පරිදහය සන්හිඳුවීම, මහත් වූ ධර්ම-ධවජය එසැවීම් එෂණ ගවේෂණ පයෙෘිෂණ කළාහු නු යි ද සෘෂිහ. මහත් වූ, සතිපට්ඨානයන් මහත් වූ සම්‍යක් ප්‍රධානයන් මහත් වූ ඍද්ධිපාදයන් මහත් වූ ඉන්ද්‍රියයන් මහත් වූ බලයන් මහත් වූ බොධ්‍යඞ්ගයන් මහත් වූ ආය්‍යීී අෂ්ටාඞ්ගික මාර්ගය මහත් වූ පරමාර්ත්ථ වූ අමාමහනිවන එෂණ ගවෙෂණ පයෙෘිෂණ කළාහු නුයි ද සෘෂිහ, මහෙශාඛ්‍ය වූ සත්ත්වයන් විසින් හෝ 'කොහි යැ බුදුහු', කොහි යැ භාග්‍යවත්හු, කොහි යැ දෙවියනට දෙවි වූවෝ, කොහි යැ නරශ්‍රෙෂ්ඨයෝ' යි එෂිත ගවෙෂිත පර්යෙෂිත වූහු නුයි ද සෘෂි වෙත් නුයි ''යාව තතියඤ්ච දෙවීසි බ්‍යාකරොතී'ති මෙ සුතං'' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**''ද්වාහං සක්කං –පෙ– බ්‍යාකරොතී'ති මෙ සුතං''යි.**

## 15–2

මේ මිනිස්ලෝවැසි තෙමේ ද අන් ලෝවැසි තෙමේ ද දෙවියන් සහිත වූ බඹලෝවැසි තෙමේ ද යශස්වී වූ ගෞතම ගොත්‍ර ඇති මුඹ වහන්සේ ගේ දෘෂ්ටිය නො දනී.

**අයං ලොකො පරො ලොකො**–'අයං ලොකො' යනු: මනුෂ්‍යලෝක යැ 'පරො ලොකො' යනු: මිනිස්ලොව තබා සියල්ල පරලොව් නුයි 'අයං ලොකො පරො ලොකො' යනු වේ.

**බ්‍රහ්මලොකො සදෙවකො** යනු: මරුන් සහිත බඹුන් සහිත සදේවක-ලෝක යැ දෙව්මිනිසුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාව නුයි 'බ්‍රහ්ම-ලොකො සදෙවකො' යනු වේ.

**දිට්ඨිං තෙ නාභිජානාති** යනු: මුඹ වහන්සේ ගේ දෘෂ්ටිය ක්ෂාන්තිය රුචිය ලබ්ධිය අධ්‍යාශය අභිප්‍රාය ලෝවැසි තෙම නො දනී යි: 'මෙ මෙබඳු දෘෂ්ටි ඇත්තෙක, මෙ බඳු ක්ෂාන්ති ඇත්තෙක, මෙ බඳු රුචි ඇත්තෙක, මෙ බඳු ලබ්ධි ඇත්තෙක, මෙ බඳු අධ්‍යාශය ඇත්තෙක, මෙ බඳු අභිප්‍රාය ඇත්තෙකැ' යි නො දනියි නො දකියි නො දක්නේ යැ නො පැමිණෙයි නො විඳියි නො ලබා නුයි 'දිට්ඨිං තෙ නාභිජානාති' යනු වේ.

**ගොතමස්ස යසස්සිනොති:** භගවා යසප්පත්තොති යසස්සි, අථවා භගවා සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාත සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති'පි යසස්සීති 'ගොතමස්ස යසස්සිනො.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"අයං ලොකො පරො ලොකො
බ්‍රහ්මලොකො සදෙවකො,
දිට්ඨිං තෙ නාභිජානාති,
ගොතමස්ස යසස්සිනො"ති.

15–3

එවං අභික්කන්තදස්සාවිං
අත්ථි පඤ්හෙන ආගමං,
කථං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සති.

**එවං අභික්කන්තදස්සාවින්ති:** එවං අභික්කන්තදස්සාවිං අග්ගදස්සාවිං සෙට්ඨදස්සාවිං විසෙට්ඨදස්සාවිං පාමොක්ඛදස්සාවිං උත්තමදස්සාවිං පරම-දස්සාවින්ති 'එවං අභික්කන්තදස්සාවිං'.

**අත්ථි පඤ්හෙන ආගමන්ති:** පඤ්හත්ථිකම්හා ආගතා[1] – පෙ – වහස්සෙතං භාරන්ති, එවම්පි 'අත්ථි පඤ්හෙන ආගමං.'

**කථං ලොකං අවෙක්ඛන්තන්ති:** කථං ලොකං අවෙක්ඛන්තං පච්චවෙ-ක්ඛන්තං තුලයන්තං තීරයන්තං විභාවයන්තං විභූතං කරොන්තන්ති 'කථං ලොකං අවෙක්ඛන්තං'.

**මච්චුරාජා න පස්සතීති:** මච්චුරාජා න පස්සති න දක්ඛති නාධිගච්ඡති න වින්දති න පටිලභතීති 'මච්චුරාජා න පස්සති'.

තෙනාහ සො බ්‍රාහ්මණො:

"එවං අභික්කන්තදස්සාවිං
අත්ථි පඤ්හෙන ආගමං,
කථං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සතී"ති.

1. පඤ්හෙන අත්ථිකො ආගතොම්හි – ම ජ ඹ.

**ගොතමස්ස යසස්සිනො** යනු: බුදුහු යසසට පැමිණියාහු නුයි යශස්වී යැ නොහොත් බුදුහු සත්කෘතයහ ගරුකෘතයහ මානිතයහ පූජිතයහ (අග්‍රදනාදීන්) අපචායන කරන ලදහ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත පිරිකර ලබනසුල්ලහ'යි 'ගොතමස්ස යසස්සිනො' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"අයං ලොකො පරො ලොකො -පෙ- ගොතමස්ස යසස්සිනො"යි**

## 15-3

මෙසේ පරමදර්ශී වූ සර්වඥයන් කරා පැන පුළුවුස්නෙන් අර්ථී වැ ආයෙමි. ලොවැ කිසෙයින් බලන්නහු මෘත්‍යුරාජ තෙමේ නො දකී ද?

**එවං අභික්කන්තදස්සාවිං** යනු: මෙසෙයින් විශිෂ්ට දර්ශන ඇතියහු අග්‍රදර්ශන ඇතියහු ශ්‍රෙෂ්ඨ දර්ශන ඇතියහු අතිශයින් ශ්‍රෙෂ්ඨ දර්ශන ඇතියහු ප්‍රමුඛ දර්ශන ඇතියහු උත්තමදර්ශන ඇතියහු පරමදර්ශන ඇතියහු නුයි 'එවං අභික්කන්තදස්සාවිං' යනු වේ.

**අත්ථි පඤ්හෙන ආගමං** යනු: පැන පුළුවුස්නෙන් අර්ත්ථ ඇතියමෝ ආම්හ ... තෙල බර උසුලනු මැනැවැ' යි මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ.

**කථං ලොකං අවෙක්ඛන්තං** යනු: කිසෙයින් ලොව බලන්නහු ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහු තුලනය කරන්නාහු තීරණය කරන්නාහු විභාවන කරන්නාහු ප්‍රකට කරන්නාහු නුයි 'කථං ලොකං අවෙක්ඛන්තං'යනු වේ.

**මච්චුරාජා න පස්සති** යනු: මෘත්‍යුරාජයා නො දකී ද නො දක්නේ ද නො පැමිණේ ද නො ලබා ද ප්‍රතිලාභ නො කෙරේ දැ' යි 'මච්චුරාජා න පස්සති' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"එවං අභික්කන්තදස්සාවිං -පෙ- මච්චුරාජා න පස්සති" යි**

15-4

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු
(මොඝරාජ) සදා සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච[1]
එවං මච්චුතරො සියා
එවං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සති

**සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සූති:** 'ලොකො'ති-නිරයලොකො තිරච්ඡානලොකො පෙත්තිවිසයලොකො මනුස්සලොකො දෙවලොකො ඛන්ධලොකො ධාතුලොකො ආයතන ලොකො අයං ලොකො පරො ලොකො බ්‍රහ්මලොකො සදෙවකො. "අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: 'ලොකො ලොකො'ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ ලොකොති වුච්චතීති: ලුජ්ජතීති ඛො භික්ඛු තස්මා ලොකො'ති වුච්චති. කිඤ්ච ලුජ්ජති, චක්ඛුං ඛො භික්ඛු ලුජ්ජති, රූපා ලුජ්ජන්ති, චක්ඛුවිඤ්ඤාණං ලුජ්ජති, චක්ඛුසම්ඵස්සො ලුජ්ජති, යම්පිදං චක්ඛුසම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි ලුජ්ජති, සොතං ලුජ්ජති, සද්දා ලුජ්ජන්ති-ඝානං ලුජ්ජති, ගන්ධා ලුජ්ජන්ති-ජිව්හා ලුජ්ජති, රසා ලුජ්ජන්ති-කායො ලුජ්ජති, ඵොට්ඨබ්බා ලුජ්ජන්ති-මනො ලුජ්ජති, ධම්මා ලුජ්ජන්ති, මනොවිඤ්ඤාණං ලුජ්ජති, මනො-සම්ඵස්සො ලුජ්ජති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති, වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ලුජ්ජති, ලුජ්ජතීති ඛො භික්ඛු තස්මා ලොකො'ති වුච්චතීති."[5]

**සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සූති:** ද්වීහි කාරණෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති: අවසියපවත්තසල්ලක්ඛණවසෙන[2] වා, තුච්ඡ-සඞ්ඛාර[3] සමනුපස්සනාවසෙන වා, කථං අවසියපවත්තසල්ලක්ඛණවසෙන සුඤ්ඤතො ලොකං අවෙක්ඛති: රූපෙ වසො න ලබ්භති, වෙදනාය වසො න ලබ්භති, සඤ්ඤාය වසො න ලබ්භති, සඞ්ඛාරෙසු වසො න ලබ්භති, විඤ්ඤාණෙ වසො න ලබ්භති. වුත්තං හෙතං භගවතා: රූපං භික්ඛවෙ අනත්තා, රූපං ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්ස, නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය, ලබ්භෙථ ච රූපෙ එවං මෙ රූපං හොතු, එවං මෙ රූපං මා අහොසී'ති. යස්මා ච ඛො භික්ඛවෙ රූපං අනත්තා, තස්මා රූපං ආබාධාය සංවත්තති[4], න ච ලබ්භති රූපෙ එවං මෙ රූපං හොතු, එවං මෙ රූපං මා අහොසී'ති. වෙදනා අනත්තා, වෙදනා ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්ස, නයිදං වෙදනා අබාධාය සංවත්තෙය්‍ය,

1. උහච්ච- ච-වි-ක.
2. අවසියපවත්ත- ස්‍යා.
5. සළායතන සංයුත්ත - ගිලානවග්ග.
3. ධාතුසංඛාර - ච, වි, ක.
4. සංවත්තතීති රූපෙ න ලබ්භති - සත

## 15–4

මෝඝරාජය, හැම කල්හි ස්මෘතිමත් වැ සත්කායදෘෂ්ටිය දුරු කොට ලොව ශූන්‍ය හෙයින් බලව, මෙසෙයින් මෘත්‍යුහු ඉක්මවන්නෙහි, මෙසෙයින් ලොව බලන්නහු මෘත්‍යුරාජ තෙම නො දක්නේ යයි.

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු– 'ලොකො' යනු: නිරය ලෝක යැ තිරශ්චීනලෝක යැ ප්‍රෙතවිෂයලෝක යැ මනුෂ්‍යලෝක යැ දෙව්ලෝක යැ ස්කන්ධලෝක යැ ධාතුලෝක යැ ආයතනලෝක යැ මෙ ලොව යැ පර ලොව යැ දෙවියන් සහිත බඹලොව යි. ''එක්තරා මහණෙක් භාග්‍යවතුන්ට මෙසේ කී යැ: 'වහන්ස, 'ලෝක යැ ලෝක යැ'යි. කියනු ලැබෙයි, වහන්ස, කිපමණෙකින් ලොක ය'යි කියනු ලැබේ ද යි. මහණ, (යම්හෙයෙකින්) බිඳේ ද එහෙයින් 'ලෝක' යි කියනු ලැබෙයි. කුමක් බිඳෙයි යත්: මහණ, චක්ෂුස බිඳෙයි රූපයෝ බිඳෙති චක්ෂුර්විඥානය බිඳෙයි, චක්ඛුසම්ඵස්සය බිඳෙයි චක්ෂුස්සංස්පර්ශප්‍රත්‍යයෙන් සුව වේවයි දුක්වේවයි නොදුක් නොසුව වේවයි යම් වෙදයිතයෙක් උපදී නම් එ ද බිඳෙයි, ශ්‍රොත්‍රය බිඳෙයි, ශබ්දයෝ බිඳෙති– ඝ්‍රාණය බිඳෙයි, ගන්ධයෝ බිඳෙති– ජිහ්වාව බිඳෙයි, රසයෝ බිඳෙති– කය බිඳෙයි, ස්පර්ශයෝ බිඳෙති– මනස බිඳෙයි, ධර්මයෝ බිඳෙති, මනොවිඥානය බිඳෙයි, මනොසම්ඵස්සය බිඳෙයි, මනොසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වේදයිතයෙක් උපදී නම් එ ද බිඳේ. මහණ, යම්හෙයෙකින් බිඳේ ද, එහෙයින් 'ලෝක'යි කියනු ලැබේ''යයි .

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු යනු: දෙකරුණෙකින් ශූන්‍ය වසින් ලොව බලයි: නො වසඟ වැ පැවැති සංස්කාරයන් බැලීම් වශයෙන් හෝ තුච්ඡ සංස්කාරයන් පුනපුනා බැලීම් වශයෙන් හෝ යැ කිසෙයින් නො වසඟ වැ පැවැති සංස්කාරයන් බැලීම් වශයෙන් ශූන්‍ය විසින් ලොව බලයි යත්: රූපයෙහි ඉසුරු බැව් නො ලැබෙයි, වෙදනායෙහි ඉසුරු බැව් නො ලැබෙයි, සංඥායෙහි ඉසුරු බැව් නො ලැබෙයි, සංස්කාරයන්හි ඉසුරු බැව් නො ලැබෙයි, විඥානයෙහි ඉසුරු බැව් නො ලැබේ. මේ වදරන ලද මැයි භාග්‍යවතුන් විසින්: ''මහණෙනි රූපය අනාත්ම යැ ඉදින් මහණෙනි, යම් හෙයකින් මේ රූපය ආත්ම වී නම් මේ රූපය ආබාධ පිණිස නො පවත්නේ යැ. රූපයෙහි 'මාගේ රූපය මෙසේ වේවා මාගේ රූපය නහමක් මෙසේ වේව'යි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි, වැළිත් යම් හෙය කින් රූපය අනාත්ම වෙයි ද එහෙයින් රූපය ආබාධ පිණිස පවත්නේ යැ

ලබ්භෙථ ච වෙදනාය එවං මෙ වෙදනා හොතු, එවං මෙ වෙදනා මා අහොසීති. යස්මා ච ඛො භික්ඛවෙ වෙදනා අනත්තා, තස්මා වෙදනා ආබාධාය සංවත්තති, න ච ලබ්භති වෙදනාය එවං මෙ වෙදනා හොතු, එවං මෙ වෙදනා මා අහොසී'ති. සඤ්ඤා අනත්තා, සඤ්ඤා ච හිදං, භික්ඛවෙ අත්තා අභවිස්ස, නයිදං සඤ්ඤා ආබාධාය සංවත්තෙය්‍ය. ලබ්භෙථ ච සඤ්ඤාය එවං මෙ සඤ්ඤා හොතු, එවං මෙ සඤ්ඤා මා අහොසී'ති, යස්මා ච ඛො භික්ඛවෙ සඤ්ඤා අනත්තා, තස්මා සඤ්ඤා ආබාධාය සංවත්තති, න ච ලබ්භති[1] සඤ්ඤාය එවං මෙ සඤ්ඤා හොතු, එවං මෙ සඤ්ඤා මා අහොසී'ති. සඞ්ඛාරා අනත්තා, සඞ්ඛාරා ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්සංසු නයිදං සඞ්ඛාරා ආබාධාය සංවත්තෙය්‍යුං, ලබ්භෙථ ච සංඛාරෙසු එවං මෙ සඞ්ඛාරා හොන්තු, එවං මෙ සංඛාරා මා අහෙසුන්ති. යස්මා ච ඛො භික්ඛවෙ සඞ්ඛාරා අනත්තා, තස්මා සංඛාරා ආබාධාය සංවත්තන්ති, න ච ලබ්භති සඞ්ඛාරෙසු එවං මෙ සඞ්ඛාරා හොන්තු, එවං මෙ සංඛාරා මා අහෙසුන්ති. විඤ්ඤාණං අනත්තා, විඤ්ඤාණං ච හිදං භික්ඛවෙ අත්තා අභවිස්ස, නයිදං විඤ්ඤාණං ආබාධාය සංවත්තෙය්‍ය, ලබ්භෙථ ච විඤ්ඤාණෙ එවං මෙ විඤ්ඤාණං හොතු, එවං මෙ විඤ්ඤාණං මා අහොසීති. යස්මා ච ඛො භික්ඛවෙ විඤ්ඤාණං අනත්තා, තස්මා විඤ්ඤාණං ආබාධාය සංවත්තති, න ච ලබ්භති විඤ්ඤාණෙ එවං මෙ විඤ්ඤාණං හොතු, එවං මෙ විඤ්ඤාණං මා අහොසීති.*

කථං තුච්ඡසඞ්ඛාරසමනුපස්සනාවසෙන සුඤ්ඤතො ලොකං අවෙක්ඛති: රූපෙ සාරො න ලබ්භති, වෙදනාය සාරො න ලබ්භති, සඤ්ඤාය සාරො න ලබ්භති, සංඛාරෙසු සාරො න ලබ්භති, විඤ්ඤාණෙ සාරො න ලබ්භති. රූපං අසාරං[2] නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා, නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. වෙදනා අසාරා[3] නිස්සාරා සාරාපගතා-සඤ්ඤා අසාරා නිස්සාරා සාරාපගතා—සංඛාරා අසාරා නිස්සාරා සාරාපගතා— විඤ්ඤාණං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා.

---

1. තච ලබ්භන්ති – ම ජ සං
2. අස්සාරං – ම ජ සං, ස්‍යා.
3. අස්සාරා – ම ජ සං, ස්‍යා.

*. මරම්ම – ස්‍යාමක්ඛර පොත්ථකෙසු "නායං භික්ඛවෙ කායො" ඉච්චාදිකං සංයුත්තනිකායෙ සුත්තන්තං එත්ථ පක්ඛිත්තං තං පන පරතො යුජ්ජති

රූපයෙහි 'මාගේ රූපය මෙසේ වේවා, මාගේ රූපය නහමක් මෙසේ වේව'යි නො ද ලැබෙයි. වෙදනාව අනාත්ම යැ මහණෙනි, ඉදින් මේ වෙදනාව ආත්ම වී නම් මේ වෙදනාව ආබාධයට නො වැටෙන්නේ යැ වෙදනායෙහි 'මාගේ වෙදනාව මෙසේ වේවා මාගේ වෙදනාව නහමක් මෙසේ වේව'යි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි, වැළිත් යම් හෙයෙකින් වෙදනාව අනාත්ම වෙයි ද, එහෙයින් වෙදනාව ආබාධයට වැටෙන්නේ යැ, වෙදනායෙහි 'මාගේ වෙදනාව මෙසේ වේවා මාගේ වෙදනාව නහමක් මෙසේ වේව'යි නො ද ලැබෙයි. සංඥාව අනාත්ම යැ, මහණෙනි, ඉදින් මේ සංඥාව ආත්ම වී නම් මේ සංඥාව ආබාධයට නො වැටෙන්නේ යැ සංඥායෙහි 'මාගේ සංඥාව මෙසේ වේවා, මාගේ සංඥාව නහමක් මෙසේ වේවා'යි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි වැළිත් යම් හෙයෙකින් සංඥාව අනාත්ම වෙයි ද එහෙයින් සංඥාව ආබාධයට වැටෙයි. සංඥායෙහි 'මාගේ සංඥාව මෙසේ වේවා, මාගේ සංඥාව නහමක් මෙසේ වේව'යි නො ද ලැබෙයි. සංස්කාරයෝ අනාත්මයහ, මහණෙනි, ඉදින් මේ සංස්කාරයෝ ආත්ම වූ නම් මේ සංස්කාරයෝ ආබාධයට නො වැටෙන්නාහු යැ, සංස්කාරයන්හි 'මාගේ සංස්කාරයෝ මෙසේ වෙත්වා, මාගේ සංස්කාරයෝ නහමක් මෙසේ වෙත්ව' යි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි, වැළිත් යම් හෙයෙකින් සංස්කාරයෝ අනාත්ම වෙත් ද, එහෙයින් සංස්කාරයෝ ආබාධයට වැටෙති. සංස්කාරයන්හි මාගේ සංස්කාරයෝ මෙසේ වෙත්වා, මාගේ සංස්කාරයෝ නහමක් මෙසේ වෙත්ව' යි නො ද ලැබෙයි. විඥානය අනාත්ම යැ මහණෙනි, ඉදින් මේ විඥානය ආත්ම වී නම් මේ විඥානය ආබාධයට නො වැටෙන්නේ ය, විඥානයෙහි 'මාගේ විඥානය මෙසේ වේවා, මාගේ විඥානය නහමක් මෙසේ වේව' යි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි, වැළිත් යම් හෙයෙකින් විඥානය අනාත්ම වෙයි ද, එහෙයින් විඥානය ආබාධයට වැටෙයි, විඥානයෙහි (මාගේ විඥානය මෙසේ වේවා මාගේ විඥානය නහමක් මෙසේ වේව'යි නො ද ලැබේ.

කිසෙයින් 'තුච්ඡසංඛාර සමනුපස්සනා' වශයෙන් ශූන්‍ය වීයින්, ලොව බලා ද යත්: රූපයෙහි (නිත්‍ය සාරාදි) සාරයෙක් නො ලැබෙයි, වෙදනායෙහි සාරයෙක් නො ලැබෙයි, සංඥායෙහි සාරයෙක් නො ලැබෙයි, සංස්කාරයන්හි සාරයෙක් නො ලැබෙයි, විඥානයෙහි සාරයෙක් නො ලැබේ. රූපය නිත්‍යසාර සංඛ්‍යාත සාරයෙන් වෙවයි සුඛසාර සංඛ්‍යාත සාරයෙන් වෙවයි ආත්මසාර සංඛ්‍යාත සාරයෙන් වෙවයි නිත්‍යහෙයින් වෙවයි ධ්‍රැවහෙයින් වෙවයි ශාශ්වත හෙයින් වෙවයි අවිපරිණාම ස්වභාව හෙයින් වෙවයි අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. වෙදනාව—අසාර යැ, නිස්සාර යැ සාරාපගත යි. සංඥාව—අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. සංස්කාරයෝ– අසාරයහ නිස්සාරයහ සාරාපගතයෝ යැ. විඥානය නිත්‍ය සාර සාරයෙන් වෙවයි සුඛසාර සාරයෙන් වෙවයි ආත්මසාර සාරයෙන් වෙවයි නිත්‍යයෙන් වෙවයි ධ්‍රැවයෙන් වෙවයි ශාශ්වතයෙන් වෙවයි අවිපරිණාම ස්වභාවයෙන් වෙවයි අසාර යැ නිස්සාර යැ සාරාපගත යි.

යථා පන නළො අසාරො[1] නිස්සාරො සාරාපගතො, යථා එරණ්ඩො අසාරො නිස්සාරො සාරාපගතො, යථා උදුම්බරො අසාරො නිස්සාරො සාරාපගතො, යථා සෙතවච්ඡො[2] අසාරො නිස්සාරො සාරාපගතො, යථා පාරිභද්දකො[3] අසාරො නිස්සාරො සාරාපගතො, යථා ඵෙණපිණ්ඩො[4] අසාරො නිස්සාරො සාරාපගතො, යථා උදකබුබ්බුළකං[5] අසාරං නිස්සාරං සාරාපගතං, යථා මරීචි අසාරා නිස්සාරා සාරාපගතා, යථා කදලික්ඛන්ධො[6] අසාරො නිස්සාරො සාරාපගතො, යථා මායා අසාරා නිස්සාරා සාරාපගතා. එවමෙව රූපං අසාරං නිස්සාරං සාරාපගතං, නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාර සාරෙන වා, නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාමධම්මෙන වා. වෙදනා අසාරා නිස්සාරා සාරාපගතා– සඤ්ඤා අසාරා නිස්සාරා සාරාපගතා– සංඛාරා අසාරා නිස්සාරා සාරාපගතා– විඤ්ඤාණං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා, නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාම ධම්මෙන වා. එවං තුච්ඡ සඞ්ඛාරසමනුපස්සනාවසෙන සුඤ්ඤතො ලොකං අවෙක්ඛති. ඉමෙහි ද්වීහි කාරණෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති.

අපි ච ඡහාකාරෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති: චක්ඛුං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාමධම්මෙන වා, සොතං සුඤ්ඤං–ඝානං සුඤ්ඤං–ජිව්හා සුඤ්ඤා–කායො සුඤ්ඤො– මනො සුඤ්ඤො අත්තෙන වා අත්ත නියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාමධම්මෙන වා. රූපා සුඤ්ඤා– සද්දා සුඤ්ඤා– ගන්ධා සුඤ්ඤා– රසා සුඤ්ඤා– ඵොට්ඨබ්බා සුඤ්ඤා– ධම්මා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාමධම්මෙන වා, චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං -පෙ- මනොවිඤ්ඤාණං සුඤ්ඤං චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො –පෙ– මනොසම්ඵස්සො සුඤ්ඤො– චක්ඛුසම්ඵස්සජා වෙදනා සුඤ්ඤා –පෙ– මනොසම්ඵස්සජා– වෙදනා සුඤ්ඤා –පෙ– රූපසඤ්ඤා සුඤ්ඤා –පෙ– ධම්මසඤ්ඤා සුඤ්ඤා– රූපසංචෙතනා සුඤ්ඤා –පෙ– ධම්මසංචෙතනා සුඤ්ඤා– රූපතණ්හා සුඤ්ඤා– රූපවිතක්කො සුඤ්ඤො–රූපවිචාරො සුඤ්ඤො –පෙ– ධම්මවිචාරො සුඤ්ඤො අත්තෙනවා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිධම්මෙන වා. එවං ඡහාකාරෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති.

---

1. අසස්සාරො – ම ඡ සං, ස්‍යා
2. සෙතගච්ඡො – ම ඡ සං, ස්‍යා,
3. පාලිභද්දකො – ම ඡ සං, ස්‍යා.
4. යථා ච ඵෙණුපිණ්ඩො, ස්‍යා.
5. යථා ච පුබ්බුලකං – ස්‍යා.
6. යථා ච කද්දලික්ඛන්ධො – ස්‍යා.

යම්සේ නම් බටගස හර රහිත වූයේ නිසරු වූයේ හරයෙන් අපගත වූයේ ද, යම්සේ එරඬු ගස අසාර වූයේ නිසරු වූයේ හරයෙන් අපගත වූයේ ද, යම්සේ දිඹුල්ගස අසාර ද නිස්සාර ද සාරාපගත ද, යම්සේ වරණගස අසාර ද නිස්සාර ද සාරාපගත ද, යම්සේ එරබදුගස අසාර ද නිසරු ද හර යෙන් අපගත ද, යම්සේ පෙණ පිඩ අසාර ද නිසරු ද හරයෙන් පහවූයේ ද, යම්සේ දිය බුබුළ අසාර ද නිස්සාර ද හරයෙන් අපගත ද, යම්සේ මිරිඟුව අසාර ද නිසරු ද සාරාපගත ද, යම් සේ කෙසෙල් කඳ අසාර ද නිස්සාර ද සාරාපගත ද, යම්සේ මායාව අසාර ද නිස්සාර ද සාරාපගත ද, එසෙයින් මැ රූපය නිත්‍යසාරසාරයෙන් වෙවයි සුඛසාරසාරයෙන් වෙවයි ආත්මසාර සාරයෙන් වෙවයි නිත්‍ය හෙයින් වෙවයි ධ්‍රැව හෙයින් වෙවයි ශාශ්වත හෙයින් වෙවයි අවිපරිණාම ස්වභාව හෙයින් වෙවයි අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. වෙදනාව–අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. සංඥාව–අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. සංස්කාරයෝ–අසාරයහ නිස්සාරයහ සාරාපගතයෝ යි. විඥානය නිත්‍යසාරසාරයෙන් වෙවයි සුඛසාරසාර යෙන් වෙවයි ආත්මසාරයෙන් වෙවයි නිත්‍ය හෙයින් වෙවයි ධ්‍රැව හෙයින් වෙවයි ශාශ්වත හෙයින් වෙවයි අවිපරිණාම ස්වභාව හෙයින් වෙවයි අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. මෙසෙයින් තුච්ඡ සංඛාරසමනු- පස්සනා වශයෙන් ශූන්‍ය විසින් ලොව බලයි. මේ දෙකරුණින් ශූන්‍ය විසින් ලොව බලා.

තවද ස අයුරෙකින් ශූන්‍ය විසින් ලොව බලයි: චක්ෂුස ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාම ස්වභාව හෙයින් හෝ ශූන්‍ය යැ. ශ්‍රොත්‍රය ශූන්‍ය යැ. ඝ්‍රාණය ශූන්‍ය යැ–ජිහ්වාව ශූන්‍ය යැ– කය ශූන්‍ය යැ– මනස ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාම ස්වභාව හෙයින් හෝ ශූන්‍ය යැ. රූපයෝ ශූන්‍යයහ- ශබ්දයෝ ශූන්‍යයහ- ගන්ධයෝ ශූන්‍යයහ- රසයෝ ශූන්‍යයහ- ස්ප්‍රෂ්ටව්‍යයෝ ශූන්‍යයහ-ධර්මයෝ ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාම ස්වභාව හෙයින් හෝ ශූන්‍යයහ. චක්ෂුර්විඥානය ශූන්‍ය යැ . . . මනොවිඥානය ශූන්‍ය යැ– චක්ඛුසම්ඵස්සය ශූන්‍ය යැ . . . මනොසම්ඵස්සය ශූන්‍ය යැ– චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව ශූන්‍ය යැ . . . මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාව ශූන්‍ය යැ– රූපසංඥාව ශූන්‍ය යැ. . . . ධර්මසංඥාව ශූන්‍ය යැ– රූපසඤ්චෙතනාව ශූන්‍ය යැ. . . . ධර්මසඤ්චෙතනාව ශූන්‍ය යැ– රූපතෘෂ්ණාව ශූන්‍ය යැ. . . රූපවිතර්කය ශූන්‍ය යැ– රූපවිචාරය ශූන්‍ය යැ . . . ධර්මවිචාරය ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාම ස්වභාව හෙයින් හෝ ශූන්‍ය යි. මෙසෙයින් ස අයුරෙකින් ශූන්‍ය විසින් ලොව බලා.

අපි ච දසහාකාරෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති: රූපං රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො අසාරකතො වධකතො විභවතො අඝමූලතො සාසවතො සඞ්ඛතතො. වෙදනං–සඤ්ඤං–සංඛාරෙ–විඤ්ඤාණං–චුතිං උපපත්තිං–පටිසන්ධිං–භවං–සංසාරවට්ටං රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො අසාරකතො වධකතො විභවතො අඝමූලතො සාසවතො සඞ්ඛතතො. එවං දසාහාකාරෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති.

අපි ච ද්වාදසහාකාරෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති: රූපං න සත්තො න ජීවො න නරො න මානවො න ඉත්ථී න පුරිසො න අත්තා න අත්තනියං. නාහං න මම න කොචි න කස්සචි. වෙදනා–සඤ්ඤා–සඞ්ඛාරා–විඤ්ඤාණං න සත්තො න ජීවො න නරො න මානවො න ඉත්ථී න පුරිසො න අත්තා න අත්තනියං. නාහං න මම න කොචි න කස්සචි. එවං ද්වාදසහාකාරෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති. වුත්තං හෙතං භගවතා: "නායං භික්ඛවෙ, කායො තුම්හාකං, නපි අඤ්ඤෙසං, පුරාණමිදං භික්ඛවෙ, කම්මං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං වෙදනීයං දට්ඨබ්බං. තත්‍ර[1] භික්ඛවෙ සුතවා අරියසාවකො පටිච්චසමුප්පාදං යෙව සාධුකං යොනිසො මනසිකරොති: 'ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජාපච්චයා සංඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං –පෙ– එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සංඛාරනිරොධො සංඛාරනිරොධා විඤ්ඤාණනිරොධො –පෙ– එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති''ති [2]. එවම්පි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති. වුත්තං හෙතං භගවතා "යං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං රූපං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. වෙදනා භික්ඛවෙ න තුම්හාකං තං පජහථ.

---

1. තත්‍ර මො - ම ජ සං
2. සංයුත්ත නිකාය - කළාරක්ඛත්තිය වග්ග

තවද දස අයුරෙකින් ලොව ශූන්‍ය හෙයින් බලයි: රූපය රික්ත හෙයින් තුච්ඡ හෙයින් ශූන්‍ය හෙයින් අනාත්ම හෙයින් අසාරක හෙයින් වධක හෙයින් විභව හෙයින් අඝ (දුක්) මූල හෙයින් සාස්‍රව හෙයින් සංඛත හෙයින් බලයි. වෙදනාව– සංඥාව– සංස්කාරයන්–විඥානය–ච්‍යුතිය– උපපත්තිය– ප්‍රතිසන්ධිය– භවය– සංසාරවර්තය රික්ත හෙයින් තුච්ඡ හෙයින් ශූන්‍ය හෙයින් අනාත්ම හෙයින් අසාරක හෙයින් වධක හෙයින් විභව හෙයින් අඝමූල හෙයින් සාස්‍රව හෙයින් සංඛත හෙයින් බලයි. මෙසේ දස අයුරෙකින් ලොකය ශූන්‍ය හෙයින් බලා.

තවද දොළොස් අයුරෙකින් ශූන්‍ය හෙයින් ලොකය බලයි: රූපය සත්ත්ව නො වෙයි, ජීව නො වෙයි, නර නො වෙයි මානව නො වෙයි ස්ත්‍රී නො වෙයි, පුරුෂ නො වෙයි, ආත්ම නො වෙයි, ආත්මනීය නො වෙයි මම නො වෙමි, මා ගේ නො වෙයි, කිසිවෙක් නො වෙයි, කිසිවකුගේ නො වේ. මෙසේ දොළොස් අයුරින් ශූන්‍ය හෙයින් ලොව බලයි. තෙල වදරනලද මැ යි භාග්‍යවතුන් විසින්: “මහණෙනි, මෙ කය තොපගේ නො වෙයි. අනුන්ගේ නො මැ වෙයි, මහණෙනි, මේ රූපය පුරාණ කර්මයෙන් උපන, ප්‍රත්‍යයෙන් සකස් කරන ලද, චෙතනාවස්තුක යැ වෙදනාවට වස්තු යැ යි දතයුතු යැ. මහණෙනි, එහිලා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම ප්‍රතීත්‍යසමුත්පාදය මැ මොනොවට නුවණින් මෙනෙහි කෙරෙයි: ‘මෙසේ මෙය ඇති කල්හි මේ වෙයි මොහු ගේ උපැත්මෙන් මේ උපදී මෙය නැති කල්හි මේ නො වෙයි මොහුගේ නිරොධයෙන් මේ නිරුද්ධ වෙයි’ “මේ අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති, සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වෙයි, .. දුඃඛස්කන්ධයා ගේ සමුදය වේ. අවිද්‍යාවගේ මැ අශෙෂ විරාග සංඛ්‍යාත නිරොධයෙන් සංස්කාරනිරොධය වෙයි සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වෙයි . . . මෙසෙයින් මේ අමිශ්‍ර දුඃඛස්කන්ධයාගේ නිරොධය වේ” යයි මෙසේත් ශූන්‍ය හෙයින් ලොකය බලා. මේ වදරන ලද මැ යි භාග්‍යවතුන් විසින්: “මහණෙනි, යමක් තොපගේ නො වේ ද එය දුරු කරවු. එය තොප විසින් දුරු කරන ලද්දේ දිඝු කලක් මුළුල්ලෙහි හිත පිණිස සුව පිණිස වන්නේ යැ, මහණෙනි, කුමක් තොපගේ නො වේ ද යත්: මහණෙනි, රූපය තොපගේ නො වෙයි එය දුරු කරවු, එය තොප විසින් දුරු කරන ලද්දේ දිඝුකලක් හිත පිණිස සුව පිණිස වන්නේ යැ, මහණෙනි, වේදනාව තොපගේ නොවෙයි එය දුරු කරවු,

සා වො පහීනා දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. සඤ්ඤා භික්ඛවෙ න තුම්හාකං තං පජහථ, සා වො පහීනා දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. සංඛාරා භික්ඛවෙ න තුම්හාකං තෙ පජහථ තෙ වො පහීනා දීඝරත්තං හිතාය සුඛාය භවිස්සන්ති. විඤ්ඤාණං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. තං කිං මඤ්ඤථ[1] භික්ඛවෙ යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨසාඛාපලාසං තං ජනො හරෙය්‍ය වා දහෙය්‍ය වා යථාපච්චයං වා කරෙය්‍ය, අපි නු තුම්හාකං එවමස්ස, අම්හෙ ජනො හරති වා දහති වා යථාපච්චයං වා කරොතීති? නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු: න හි නො එතං[2] භන්තෙ, අත්තා වා අත්තනියං වා'ති. එවමෙව ඛො භික්ඛවෙ යං න තුම්හාකං තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං: රූපං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති.[3] වෙදනා–සඤ්ඤා–සංඛාරා–විඤ්ඤාණං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති''ති, එවම්පි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති.

ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ''සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ සුඤ්ඤො ලොකොති වුච්චතීති? යස්මා ච ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකොති වුච්චති. කිඤ්චානන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා: චක්ඛුං ඛො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, රූපා සුඤ්ඤා–චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං, චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො– යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා. සොතං සුඤ්ඤං–සද්දා සුඤ්ඤා–ඝානං සුඤ්ඤං–ගන්ධා සුඤ්ඤා–ජිව්හා සුඤ්ඤා–රසා සුඤ්ඤා–කායො සුඤ්ඤො–ඵොට්ඨබ්බා සුඤ්ඤා-

1. සෙය්‍යථාපි - ම ඡ සං
2. එවං – ස, ච, වි, ක
3. පස්සෙ - සො

එය තොප විසින් දුරු කරන ලද්දේ දිගු කලක් හිත පිණිස සුව පිණිස වන්නේ යැ, මහණෙනි, සංඥාව තොපගේ නො වෙයි එය දුරු කරවු, එය තොප විසින් දුරු කරන ලද්දේ දිගු කලක් හිත පිණිස සුව පිණිස වන්නේ යැ. මහණෙනි, සංස්කාරයෝ තොපගේ නො වෙති ඔවුන් දුරු කරවු, ඔහු තොප විසින් දුරු කරන ලද්දහු දිගු කලක් හිත පිණිස සුව පිණිස වන්නාහ. මහණෙනි, විඥානය තොපගේ නො වෙයි එය දුරු කරවු, එය තොප විසින් දුරු කරන ලද්දේ දිගු කලක් හිත පිණිස සුව පිණිස වන්නේ යි. මහණෙනි, එය කිමැ යි හඟි වුද? මෙ දෙව්රම්හි යම් තෘණකාෂ්ට ශාඛාපලාසජාතයෙක් වේ ද ජන තෙමේ එය ගෙන යන්නේ නම් හෝ දවන්නේ නම් හෝ රිසි වූවක් හෝ කරන්නේ නම් කිම තොපට 'ජන තෙමේ අප ගෙන යයි හෝ දවයි හෝ රිස්සක් හෝ කෙරේ' යයි මෙ බඳු සිතෙක් වන්නේ ද? වහන්ස, තෙල නො වේ මැ යැ. ඒ කවර හෙයින යත්: වහන්ස, යම් හෙයෙකින් තෙල අපගේ ආත්මය හෝ ආත්මනිය නො වේ ද, එහෙයිනි. එ පරිද්දෙන් මැ මහණෙනි, යමක් තොපගේ නො වේ ද එය දුරු කරවු, එය තොප විසින් දුරු කරන ලද්දේ දිගු කලක් හිත පිණිස සුව පිණිස වන්නේ යැ. මහණෙනි, කුමක් තොපගේ නො වේ ද යත්: මහණෙනි, රූපය තොපගේ නො වෙයි එය දුරු කරවු, එය තොප විසින් දුරු කරන ලද්දේ දිගු කලක් හිත පිණිස සුව පිණිස වන්නේ යැ. වෙදනාව– සංඥාව– සංස්කාරයෝ– මහණෙනි, විඥානය තොපගේ නො වෙයි එය දුරු කරවු, එය තොප විසින් දුරු කරන ලද්දේ දිගු කලක් හිත පිණිස සුව පිණිස වන්නේ යැ'' යි. මෙසේත් ශුන්‍ය හෙයින් ලොකය බලා.

ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ: ''වහන්ස, 'ලෝකය ශුන්‍ය යැ ලෝකය ශුන්‍ය යැ'යි කියනු ලැබෙයි වහන්ස, කිපමණෙකින් 'ලෝකය ශුන්‍ය යැ යි කියනු ලැබේ ද' යි. යම් හෙයෙකින් ආනන්ද, ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ ශුන්‍ය වේ ද එහෙයින් ලෝකය ශුන්‍ය යැ යි කියනු ලැබෙයි. ආනන්ද, කුමක් ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ ශුන්‍ය වේ ද යත්: ආනන්ද, චක්ෂුස ආත්ම හෙයින් ද ආත්මනිය හෙයින් ද ශුන්‍ය යැ, රූපයෝ ශුන්‍යයෝ යැ– චක්ෂුර් විඥානය ශුන්‍ය යැ– චක්ෂුස්සංස්පර්ශය ශුන්‍ය යැ– චක්ෂුස්සංස්පර්ශයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදනේ නම් එ ද ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ ශුන්‍ය යැ, ශ්‍රොත්‍රය ශුන්‍ය යැ– ශබ්දයෝ ශුන්‍යයෝ යැ– ඝ්‍රාණය ශුන්‍ය යැ– ගන්ධයෝ ශුන්‍යයෝ යැ– ජිහ්වාව ශුන්‍ය යැ– රසයෝ ශුන්‍යයෝ යැ– කය ශුන්‍ය යැ– ස්ප්‍රෂ්ටව්‍යයෝ ශුන්‍යයෝ යැ–

මනො සුඤ්ඤො – ධම්මා සුඤ්ඤා – මනොවිඤ්ඤාණං සුඤ්ඤං – මනොසම්ඵස්සො සුඤ්ඤො – යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, යස්මා ච ඛො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා 'සුඤ්ඤො ලොකො'ති වුච්චතී ති.a
එවම්පි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති.

භාසිතම්පි හෙතං:

"සුද්ධං ධම්මසමුප්පාදං සුද්ධං සඞ්ඛාරසන්තතිං,
පස්සන්තස්ස යථාභූතං න භයං හොති ගාමණි.
තිණකට්ඨසමං ලොකං යදා පඤ්ඤාය පස්සති,
නාඤ්ඤං පත්ථයතෙ[4] කිංචි අඤ්ඤත්‍ර අප්පටිසන්ධියා"ති.b

එවම්පි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති.

වුත්තං හෙතං භගවතා: "එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු රූපං සමන්නෙසති යාවතා රූපස්ස ගති. වෙදනං සමන්නෙසති යාවතා වෙදනාය ගති. සඤ්ඤං සමන්නෙසති යාවතා සඤ්ඤාය ගති. සඞ්ඛාරෙ සමන්නෙසති යාවතා සංඛාරානං ගති. විඤ්ඤාණං සමන්නෙසති යාවතා විඤ්ඤාණස්ස ගති, යම්පිස්ස හොති අහන්ති වා මමන්ති වා අස්මීති වා, තම්පි තස්ස න හොතී"ති.c එවම්පි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති.

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සූති; සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු පච්චවෙක්ඛස්සු දක්ඛස්සු තුලෙහි තීරෙහි විභාවෙහි විභූතං කරොහීති 'සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු'.

මොඝරාජ සදා සතොති 'මොඝරාජා'ති භගවා තං බ්‍රාහ්මණං ආලපති. සදාති සබ්බකාලං –පෙ– පච්ඡිමෙ වයොඛන්ධෙ. සතොති-චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො –පෙ– සො වුච්චති සතො'ති 'මොසරාජ සදා සතො'.

4. පත්ථයෙ – ස්‍යා.
a ඛන්ධසංයුත්ත-න තුම්හාකවග්ග.
a. සංයුත්ත නිකාය – ඡන්නවග්ග
b. අධිමුත්ත ථෙරගාථා
c. සංයුත්ත නිකාය ආසීවිසවග්ග

මනස ශූන්‍ය යැ–ධර්මයෝ ශූන්‍යයෝ යැ–මනොවිඥානය ශූන්‍ය යැ–මනො සම්ඵස්සය ශූන්‍ය යැ–මනොසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදනේ නම් එ ද, ආත්ම හෙයින් ද ආත්මනිය හෙයින් ද ශූන්‍ය යැ. යම් හෙයෙකින් ආනන්ද, ආත්ම හෙයින් ද ආත්මනිය හෙයින් ද ශූන්‍ය වේ ද එහෙයින් ලොකය ශූන්‍ය යැ යි කියනු ලැබේ'' යයි. මෙසේත් ශූන්‍ය හෙයින් ලොකය බලා.

මෙ ද වදරන ලද:

''ගාමණිය, හුදු ධර්මසමුත්පාදය හුදු (ක්ලෙශාදි) සංස්කාර ප්‍රබන්ධය තත් වූ පරිද්දෙන් (විදර්ශනා සහිත මාර්ගප්‍රඥායෙන්) දක්නාහට බියෙක් නොවෙයි.

යම් කලෙක (යමෙක්) සංස්කාර ලොකය තෘණකාෂ්ට සම කොට ප්‍රඥායෙන් දකී ද (එකල්හි) හෙතෙම අප්‍රතිසන්ධි සංඛ්‍යාත නිර්වාණය හැර අන් භවයක් ආත්මභාවයක් හෝ කිසිවක් නොපතා'' යි.

මෙසේත් ශූන්‍ය හෙයින් ලොකය බලා.

මෙය වදරන ලද මැ යැ භාග්‍යවතුන් විසින්: මහණෙනි, එපරිද්දෙන් ම මහණ තෙම රූපයාගේ පැවැත්ම යම්තාක් ද එතෙක් රූපය විමසයි. වෙදනාවගේ පැවැත්ම යම්තාක් ද එතෙක් වෙදනාව විමසයි. සංඥාවගේ පැවැත්ම යම් තාක් ද එතෙක් සංඥාව විමසයි. සංස්කාරයන් ගේ පැවැත්ම යම් තාක් ද එතෙක් සංස්කාරයන් විමසයි. විඥානයා ගේ පැවැත්ම යම් තාක් ද එතෙක් විඥානය විමසයි. ඔහට (දෘෂ්ටි විසින්) 'මම' යි හෝ (තෘෂ්ණා විසින්) 'මාගේ' යයි හෝ (මාන විසින්) 'වෙමි' හෝ යමක් වේ නම් එ ද ඔහට නො වේ'' යයි මෙසේත් ලොකය ශූන්‍ය හෙයින් බලා.

**සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු** යනු: ලෝකය ශූන්‍ය හෙයින් බලව ප්‍රත්‍යවෙක්ෂා කරව දකුව තුලනය කරව තීරණය කරව විභාවන කරව ප්‍රකට කරව නුයි 'සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු' යනු වේ.

**මොඝරාජ සදා සතො**– 'මෝඝරාජ' යනු: බුදුහු එ බමුණු නමින් අමතති. සදා යනු: හැම කල්හි . . . පශ්චිම වයඃස්කන්ධයෙහි. සතො යනු: සතර කරුණෙකින් සිහි ඇති යේ: කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ . . . හෙතෙම 'සතො'යි කියනු ලැබේ නුයි 'මොඝරාජ සදා සතො' යනු වේ.

**අත්තානුදිට්ඨිං ඌහච්චාති** — 'අත්තානුදිට්ඨි' වුච්චති වීසතිවත්ථුකා සක්කායදිට්ඨි. "ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො 'රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං— සඤ්ඤං— සංඛාරෙ— විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං, දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං, ගාහො පතිට්ඨාහො[1]. අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො විපරීතගාහො විපල්ලාසගාහො මිච්ඡාගාහො අයාථාවකස්මිං යාථාවකන්ති ගාහො යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි." අයං අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨිං ඌහච්චාති අත්තානුදිට්ඨිං ඌහච්ච සමූහච්ච උද්ධරිත්වා සමුද්ධරිත්වා උප්පාටයිත්වා සමුප්පාටයිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති[2] 'අත්තානුදිට්ඨිං ඌහච්ච'.

**එවං මච්චුතරො සියාති**: එවං මච්චුපි තරෙය්‍යාසි, ජරාපි තරෙය්‍යාසි, මරණම්පි තරෙය්‍යාසි උත්තරෙය්‍යාසි පතරෙය්‍යාසි සමතික්කමෙය්‍යාසි වීතිවත්තෙය්‍යාසීති 'එවං මච්චුතරො සියා.'

**එවං ලොකං අවෙක්ඛන්තන්ති**: එවං ලොකං අවෙක්ඛන්තං පච්චවෙක්ඛන්තං තුලයන්තං තීරයන්තං විභාවයන්තං විභූතං කරොන්තන්ති 'එවං ලොකං අවෙක්ඛන්තං.'

**මච්චුරාජා න පස්සතීති**: මච්චුපි මච්චුරාජා මාරොපි මච්චුරාජා මරණම්පි මච්චුරාජා. න පස්සතීති—මච්චුරාජා න පස්සති න දක්ඛති නාධිගච්ඡති න වින්දති න පටිලභති. වුත්තං හෙතං භගවතා: "සෙය්‍යථාපි භික්ඛවෙ ආරඤ්ඤකො මිගො අරඤ්ඤෙ පවනෙ චරමානො විස්සත්ථො ගච්ඡති විස්සත්ථො තිට්ඨති, විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පෙති තං කිස්ස හෙතු: අනාපාථගතො භික්ඛවෙ, ලුද්දස්ස. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.

---

1. පටිග්ගාහො - ම.ජ.සං   a විභඞ්ග
2. අනභාවං ගමෙත්වාති- ස-ව-වි-ක

**අත්තානුදිට්ඨිං ඌහච්ච**– 'අත්තානුදිට්ඨිං' යි විංශද්වස්තුක වූ සත්කාය දෘෂ්ටිය කියනු ලැබෙයි. මෙලොවැ (බුද්ධාදි) ආර්‍යයන් නො දක්නාසුලු (සතිපට්ඨානාදි භෙද) ආර්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍යධර්මයෙහි නො හික්මුණු (ආගම–අධිගම නැති බැවින්) අශ්‍රැතවත් වූ පෘථග්ජන තෙම රූපය ආත්ම හෙයින් (විපරීත දෘෂ්ටියෙන්) දකියි. ආත්මය රූපවත් යැ හෝ ආත්මයෙහි හෝ රූපය, රූපයෙහි හෝ ආත්මය දකියි. වෙදනාව – සංඥාව – සංස්කාරයන්– විඥානය ආත්ම හෙයින් දකියි. ආත්මය විඥානවත් යැ හෝ, ආත්මයෙහි හෝ විඥානය, විඥානයෙහි හෝ ආත්මය දකියි. මෙ බඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිසූකයෙක් දෘෂ්ටිවිස්පන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් ග්‍රාහයෙක් පිහිටා ගැන්මෙක් අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුත්සිත මාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් විපරීත කොට ගැන්මෙක් වැරද ගැන්මෙක් මිථ්‍යාග්‍රාහයෙක් යථා ස්වභාව නැත්තෙහි යථාස්වභාව ඇතැ යි ගැන්මෙක් යම් පමණ දෙ සැට දෘෂ්ටිගතයෝ වෙත් ද, මේ අත්තානුදිට්ඨි නම. **අත්තානුදිට්ඨිං ඌහච්ච** යනු: සත්කායදෘෂ්ටිය උපුරා මොනොවට උපුරා උදුරා මොනොවට උදුරා උපුටා මොනොවට උපුටා හැරපියා දුරු කොට විගතාන්ත කොට අනු අභාවයට පමුණුවා නුයි 'අත්තානුදිට්ඨිං ඌහච්ච' යනු වේ.

**එවං මච්චුතරො සියා** යනු: මෙසෙයින් මෘත්‍යුහු ද තරණය කරව ජරාව ද තරණය කරව මරණය ද තරණය කරව උත්තරණය කරව ප්‍රතරණය කරව සමතික්‍රමණය කරව ඉක්මව''යි 'එවං මච්චුතරො සියා' යනු වේ.

**එවං ලොකං අවෙක්ඛන්තං** යනු: මෙසේ ලොව බලන්නහු ප්‍රත්‍ය වෙක්ෂා කරන්නහු තුලනය කරන්නහු තීරණය කරන්නහු විභාවන කරන්නහු ප්‍රකට කරන්නහු නුයි 'එවං ලොකං අවෙක්ඛන්තං' යනු වේ.

**මච්චුරාජා න පස්සති** යනු: මෘත්‍යු ද මෘත්‍යුරාජ වෙයි, මාර තෙමෙ ද මෘත්‍යුරාජ වෙයි, මරණය ද මෘත්‍යුරාජ වේ. **න පස්සති** යනු: මෘත්‍යුරාජ තෙම නො දකියි නො දක්නේ යැ නො පැමිණෙයි නො ලැබෙයි ප්‍රතිලාභ නො කෙරේ. මේ වදරන ලද මැ යැ භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, වල්මුව තෙමේ අරනෙහි මහවෙනෙහි හැසිරෙනුයේ විස්වැසි වැ යෙයි, විස්වැසි වැ සිටියි, විස් වැසි වැ හිඳියි, විස්වැසි වැ හොවී. ඒ කවර හෙයින යත්: මහණෙනි, වැද්දාගේ ඇස්හමුවට නො ගියේ ය ද එහෙයිනි. මහණෙනි, එසෙයින් මැ මහණ තෙම කාමයෙන් වෙන් වැ මැ අකුසල් දහමින් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේක (නීවරණවිගම) යෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙරේ ද, මහණෙනි, මෙ මහණ මාරයා අඳ කෙළේ යැ, කෙලෙස් පා රහිත කොට මාරචක්ෂුස නසා පාපී මරහුගේ අදර්ශනයට (නිවනට) ගියේ යැ යි කියනු ලැබේ.''

පුනචපරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං –පෙ– තතියං ඣානං –පෙ– චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.

පුනචපරං භික්ඛවෙ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.

පුනචපරං භික්ඛවෙ භික්ඛු ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො. තිණ්ණො ලොකෙ විසත්තිකං සො විස්සත්ථො ගච්ඡති, විස්සත්ථො තිට්ඨති; විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පෙති, තං කිස්ස හෙතු, අනාපාථගතො භික්ඛු පාපිමතොති[a] 'මච්චුරාජා න පස්සතී'ති.

තෙනාහ භගවා;

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු
මොසරාජා සද සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච
එවං මච්චුතරො සියා,
එවං ලොකං අවෙක්ඛන්තං,
මච්චුරාජා න පස්සතීති.

සහගාථාපරියොසානා – පෙ – සාවකො හමස්මීති

මොසරාජ සුත්තනිද්දෙසො සමත්තො.

[a] මජ්ඣිම නිකාය - නිවාපසුත්ත.

තවද මහණෙනි මහණ තෙම විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ද්විතීයධ්‍යානයට . . . තෘතීය ධ්‍යානයට . . . චතුර්ථධ්‍යානයට පැමිණ වාස කෙරේ. මහණෙනි, මෙ මහණ මාරයා අඳ කෙළේ යැ, කෙලෙස් පා රහිත කොට මාර චක්ඛුස නසා පාපී මරහු ගේ අදර්ශනයට ගියේ යැ යි කියනු ලැබේ.

තවද මහණෙනි, මහණ තෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ගේ විරාගයෙන් ප්‍රතිඝසංඥාවන් ගේ ප්‍රහාණයෙන් නානාත්ව සංඥාවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාශය අනන්ත යැ' යි ආකාසානඤ්චායතනයට පැමිණ වාස කෙරේ ද මහණෙනි, මෙ මහණ මරහු අඳ කෙළේ යැ, කෙලෙස්පා රහිත කොට මාරචක්ඛුස නසා පාපිමත්හුගේ අදර්ශනයට ගියේ යැ යි කියනු ලැබේ.

තවද මහණෙනි, මහණ තෙම ආකාසානඤ්චායතනය ඉක්ම විඥානය අනන්ත යැ යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාස කෙරේ ද, සර්ව ප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිවක් නැතැ' යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාස කෙරේ ද, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාස කෙරේ ද, සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්ම සංඥා වෙදයිත නිරොධයට පැමිණ වාස කෙරේ ද, විදර්ශනා ඥානයෙන් දැක ඔහුට ආශ්‍රවයෝ ක්ෂය වූවාහු වෙත් ද, මහණෙනි, මෙ මහණ මරහු අඳ කෙළේ යැ, කෙලෙස්පා රහිත කොට, මාරචක්ඛුස නසා, පාපිමත්හුගේ අදර්ශන විෂයට ගියේ යැ, ලොකයෙහි විසත්තිකා සංඛ්‍යාත තෘෂ්ණාව තරණය කෙළේ යැ, හේ විස්වැසි වැ යෙයි, විස්වැසි වැ සිටියි, විස්වැසි වැ හිඳියි, විස්වැසි වැ හොවී යයි කියනු ලැබේ. ඒ කවර හෙයින යත්: යම් හෙයෙකින් මහණ පාපිමත්හු ගේ පරාඩමුඛයට ගියේ ද එහෙයිනැ' යි 'මච්චුරාජා න පස්සති' යනු වේ.

එයින් වදළහ බුදුහු:

"සුඤ්ඤතො ලොකං–පෙ– මච්චුරාජා න පසසති" යි.

ගාථා පර්‍යවසානය හා සමඟ . . . මම ශ්‍රාවකයෙමි'

මෝඝරාජ සූත්‍රනිර්දේශය නිමි.

# 16. පිඞ්ගිය සුත්තනිද්දෙසො

## 16 – 1

**ජිණ්ණොහමස්මි අබලො වීතවණ්ණො (ඉච්චායස්මා පිඞ්ගියො)**
**නෙත්තා න සුද්ධා සවනං න ඵාසු,**
**මාහං නස්සං මොමුහො අන්තරාව[1]**
**ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං**
**ජාතිජරාය ඉධ විප්පහානං.**

**ජිණ්ණොහමස්මි අබලො වීතවණ්ණොති:** 'ජිණ්ණොහමස්මීති – ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො වීසංවස්සසතිකො ජාතියා අබලොති අබලො දුබ්බලො අප්පබලො අප්පථාමො.[2] වීතවණ්ණොති වීතවණ්ණො විගතවණ්ණො විගච්ඡිතවණ්ණො. යා සා පුරිමා සුභාවණ්ණනිභා සා අන්තරහිතා ආදීනවො පාතුභූතොති 'ජිණ්ණොහමස්මි අබලො වීතවණ්ණො.'

ඉච්චායස්මා පිඞ්ගියොති - පෙ -

**නෙත්තා න සුද්ධා සවනං න ඵාසූති:** නෙත්තා අසුද්ධා අවිසුද්ධා අපරිසුද්ධා අවොදතා. නො තථා චක්ඛුනා රූපෙ පස්සාමීති නෙත්තා න සුද්ධා. සවනං න ඵාසූති–සොතා අසුද්ධා අවිසුද්ධා අපරිසුද්ධා අවොදතා. නො තථා සොතෙන සද්දං සුණාමීති නෙත්තා න සුද්ධා සවනං න ඵාසු.

**මාහං නස්සං මොමුහො අන්තරාවාති:** 'මාහං නස්සන්ති–මාහං නස්සං මාහං විනස්සං මාහං පනස්සං. මොමුහොති – මොමූහො[3] මොහමූළ්හො අවිද්ධා අවිජ්ජාගතො අඤ්ඤාණී අවිභාවී දුප්පඤ්ඤො. අන්තරාවාති–තුය්හං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං අනඤ්ඤාය අනධිගන්ත්වා, අවිදිත්වා අපටිලභිත්වා අඵස්සයිත්වා අසච්ඡිකරිත්වා අන්තරායෙව කාලංකරෙය්‍යන්ති 'මාහං නස්සං මොමුහො අන්තරාව'.

1. අන්තරාය,–සයා. පන
2. ජාතියා අබලො දුබ්බලො–ච, ජ, ක
3. මොහමූළ්හො – මජසං

# පිඞ්ගිය සූත්‍රනිර්දේශය

## 16-1

(ආයුෂ්මත් පිඞ්ගිය මෙසේ විචාරයි:) මම ජීර්ණයෙමි දුර්වලයෙමි විවර්ණයෙමි, (මාගේ) නෙත්‍රයෝ ශුද්ධ නො වෙති, ශ්‍රවණය පහසු නො වෙයි, මම (මුඹ වහන්සේ ගේ දහම්, පසක් නො කොට) අතුරෙහි මැ මුළා වූයෙම් නහමක් නැසෙම්වා, මේ පහණසැ වෙහෙරෙහිදී මැ ජාතිජරාවගේ ප්‍රහාණය වූ යම් දහමක් මම දැනගන්නෙම් නම් ඒ දහම වදළ මැනැව.

**ජිණ්ණොහමසමි අබලො විවණෙණා**- 'ජිණ්ණොහමස්මි' යනු: ජීර්ණයෙමි වෘද්ධයෙමි මහලුයෙමි තුන් වැනි විය ඉක්ම ගියේ අන්තිම වයසට පැමිණියෙමි ජාතියෙන් එක්සිය විසිවස් ඇත්තෙමි. **අබලො** යනු: බල රහිතයෙමි දුර්වලයෙම් අල්පබල ඇතියෙමි අල්පවීර්‍ය්‍ය ඇතියෙමි. **විවණෙණා** යනු: පෙරළුණු සිවිපැහැ ඇතියෙමි පහ වූ සිවිපැහැ ඇතියෙමි දුරු වූ සිවිපැහැ ඇතියෙමි පළමු යම් සොඳුරු සිවිපැහැයෙක් වී නම් ඒ අතුරු දහන්වී යැ ආදීනව පහළ වී නුයි **'ජිණ්ණොහමස්මි අබලො විවණ්ණො'** යනු වේ.

මෙසේ ආයුෂ්මත් පිඞ්ගිය යනු...

**නෙතතා න සුදධා සවනං න ඵාසු** යනු: නෙත්‍රයෝ අශුද්ධයහ විශුද්ධ නො වෙති අපරිශුද්ධයහ ප්‍රසන්න නො වෙති පෙර මෙන් ඇසින් රූ නොදක්මි නුයි 'නෙත්තා න සුද්ධා' යනුවේ. **සවනං න ඵාසු** යනු: ශ්‍රොත්‍රයෝ අශුද්ධයහ විශුද්ධ නො වෙති පරිශුද්ධ නො වෙති ප්‍රසන්න නො වෙති පෙර මෙන් කනින් හඬ නො අසම්නුයි **'නෙත්තා න සුද්ධා සවනං න ඵාසු'** යනු වේ.

**මාහං නසසං මොමුහො අනතරාව**- 'මාහං නස්සං' යනු: මම නහමක් නැසෙම්වයි මම නහමක් වැනැසෙම්වයි මම නහමක් විනාශ වෙම්වයි. **මොමූහො** යනු: අතිශයින් මූඪ වූයෙම් මොහයෙන් මුළා වූයෙම් අවිද්වත් වූයෙම් අවිද්‍යාවට පැමිණියෙම් අඥාන වූයෙම් අපණ්ඩිත වූයෙම් දුෂ්ප්‍රාඥ වූයෙම්. **අනතරාව** යනු: මුඹ වහන්සේගේ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය අවබොධ නො කොට අධිගම නො කොට නො දැන නො ලැබ ස්පර්ශ නො කොට ප්‍රත්‍යක්ෂ නො කොට අතුරෙහි මැ කලුරිය කරන්නෙම් නුයි **'මාහං නස්සං මොමූහො අන්තරාව'** යනු වේ.

**ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤන්ති:** 'ධම්ම'න්ති–ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං, චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ, පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං ආචික්ඛ, දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහීති **'ආචික්ඛ ධම්මං'. යමහං විජඤ්ඤන්ති** යමහං ජානෙය්‍යං ආජානෙය්‍යං විජානෙය්‍යං පටිවිජානෙය්‍යං පටිවිජ්ඣෙය්‍යං අධිගච්ඡෙය්‍යං ඵස්සෙය්‍යං[1] සච්ඡිකරෙය්‍යන්ති 'ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං'.

**ජාතිජරාය ඉධ විප්පහානන්ති** ඉධෙව ජාතිජරාමරණස්ස පහානං වූපසමං පටිනිස්සග්ගං පටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති 'ජාතිජරාය ඉධවිප්පහානං'.

**තෙනාහ සො බ්‍රාහ්මණො:.**

**''ජිණ්ණොහමස්මි අබලො විවණ්ණො (ඉච්චායස්මා පිඞ්ගියො)**
**නෙත්තා න සුද්ධා, සවනං න ඵාසු**
**මාහං නස්සං මොමුහො අන්තරාව,**
**ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං**
**ජාතිජරාය ඉධ විප්පහාන''න්ති**

## 16 – 2

**දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ (පිඞ්ගියාති භගවා)**
**රුප්පන්ති රූපෙසු ජනා පමත්තා,**
**තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො**
**ජහස්සු රූපං අපුනබ්භවාය.**

**දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙති:** 'රූප'න්ති–චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදය රූපං. සත්තා රූපහෙතු රූපප්පච්චයා රූප කාරණා හඤ්ඤන්ති විහඤ්ඤන්ති උපහඤ්ඤන්ති උපඝාතියන්ති[2] රූපෙ සති විවිධා කම්මකාරණා කාරෙන්ති.[3] කසාහිපි තාළෙන්ති වෙත්තෙහිපි තාළෙන්ති අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති, හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති, කණ්ණම්පි ඡින්දන්ති,

1. පස්සෙය්‍යං–ච, වි, ක
2. උපඝාතයන්ති – ස්‍යා.
3. විවිධ කම්ම කාරණ

**ආවිකඛ ධම්මං යමහං විජඤ්ඤා**– 'ධම්මං' යනු: ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍යවසාන කල්‍යාණ වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ සියල්ල සම්පූර්ණ වූ පරිශුද්ධ වූ ශ්‍රේෂ්ඨචර්‍යා වූ සතර සතිපට්ඨානයන් සතර සම්‍යක් ප්‍රධානයන් සතර ඍද්ධිපාදයන් පඤ්චෙන්ද්‍රියයන් පඤ්ච බල යන් සප්ත බොධ්‍යඞ්ගයන් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය නිර්වාණය හා නිර්වාණ ගාමී ප්‍රතිපත්ති හා වදළ මැනව දෙසුව මැනැව පැනැවුව මැනැව පිහිටුව මැනැව විවරණ කළ මැනැව විභාග කළ මැනැව පහළ කළ මැනැව ප්‍රකාශ කළ මැනැව නුයි 'ආවික්ඛ ධම්මං' යනු වේ. **යමහං විජඤ්ඤං** යනු: යම් දහමක් දැනගන්නෙම් නම් එකාන්තයෙන් දැන ගන්නෙම් නම් විවිධාකරයෙන් දැනගන්නෙම් නම් නොයෙක් අයුරින් දැනගන්නෙම් නම් ප්‍රතිවේධ කරන්නෙම් නම් අධිගම කරන්නෙම් නම්. ස්පර්ශ කරන්නෙම් නම් ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් නුයි 'ආවික්ඛ ධම්මං යමහං විජඤ්ඤං' යනු වේ.

**ජාතිජරාය ඉධ විප්පහානං** යනු: මෙ අත්බැව්හි මැ ජාතිජරාමරණයාගේ ප්‍රහාණය සන්හිඳීම දුරැලීම නො පැවැත්ම අමාමහනිවන නුයි 'ජාතිජරාය ඉධ විප්පහානං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"ජිණ්ණොහමස්මි — පෙ– ජාතිජරාය ඉධ විප්පහානං"** යී.

## 16-2

(බුදුහු මෙසේ වදළහ: පිඞ්ගිය,) රූපනිමිතින් නැසෙනුවන් දැක (කුශල ධර්මයෙහි) ප්‍රමාද වූ ජනයෝ රූපනිමිතින් පෙළෙති. එහෙයින් පිඞ්ගිය, තෙපි (කුශල ධර්මයෙහි) අප්‍රමත්ත වැ පුනර්භවය නො වනු පිණිස රූපය දුරු කරව.

**දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ**– 'රූපං' යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද වෙති. සත්ත්වයෝ රූප හෙතුයෙන් රූපප්‍රත්‍යයෙන් රූපකාරණයෙන් නැසෙති වැනැසෙති වෙසෙසින් නැසෙති වෙසෙසින් නසනු ලැබෙත්. රූපය ඇති කල්හි නො එක් කම්කටොලු කරවති: කසයෙනුදු තළති, වේවැලිනුදු තළති, අඩදඬ්ගෙ (මුගුරි) නුදු තළති, අත් ද සිඳිති, පා ද සිඳිති. අත්පා ද සිඳිති, කනුදු සිඳිති,

නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති, බිලඞ්ගථාලිකම්පි කරොන්ති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති රාහුමුඛම්පි කරොන්ති, ජොතිමාලිකම්පි කරොන්ති හත්ථපජ්ජොතිකම්පි කරොන්ති, එරකවත්තිකම්පි කරොන්ති, චීරකවාසිකම්පි කරොන්ති, එණෙය්‍යකම්පි කරොන්ති බලිසමංසිකම්පි කරොන්ති, කහාපණකම්පි[1] කරොන්ති, ඛාරාපතච්ඡිකම්පි කරොන්ති, පළිඝපරිවත්තිකම්පි කරොන්ති පලාලපිට්ඨි[2]කම්පි කරොන්ති, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති, සුනඛෙහිපි ඛාදාපෙන්ති. ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති, අසිනාපි සීසං ඡින්දන්ති. එවං සත්තා රූපහෙතු රූපපච්චයා රූපකාරණා හඤ්ඤන්ති විහඤ්ඤන්ති උපහඤ්ඤන්ති උපඝාතියන්ති[3]. එවං හඤ්ඤමානෙ විහඤ්ඤමානෙ උපහඤ්ඤමානෙ උපඝාතියමානෙ දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ'.

පිඞ්ගියාති–භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති, භගවාති–ගාරවාධිවචනමෙතං – පෙ – සච්ඡිකා පඤ්ඤත්ති. යදිදං භගවාති 'පිඞ්ගියාති භගවා'.

රුප්පන්ති රූපෙසු ජනා පමත්තාති: 'රුප්පන්ති'ති රුප්පන්ති කුප්පන්ති පීළයන්ති[4] ඝට්ටයන්ති[5] බ්‍යාධිතා දොමනස්සිතා හොන්ති චක්ඛුරොගෙන රුප්පන්ති, කුප්පන්ති පීළයන්ති ඝට්ටයන්ති බ්‍යාධිතා දොමනස්සිතා හොන්ති, සොතරොගෙන – පෙ – කායරොගෙන – ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන රුප්පන්ති කුප්පන්ති පීළයන්ති ඝට්ටයන්ති බ්‍යාධිතා දොමනස්සිතා හොන්තීති රුප්පන්ති රූපෙසු. අථවා චක්ඛුස්මිං හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ[6] විගච්ඡමානෙ අන්තරධායමානෙ රුප්පන්ති – පෙ – දොමනස්සිතා හොන්ති. සොතස්මිං– ඝානස්මිං– ජිව්හාය කායස්මිං– රූපස්මිං– සද්දස්මිං– ගන්ධස්මිං– රසස්මිං– ඵොට්ඨබ්බස්මිං කුලස්මිං– ගණස්මිං– ආවාසස්මිං– ලාභස්මිං– යසස්මිං– පසංසාය– සුඛස්මිං– චීවරස්මිං– පිණ්ඩපාතස්මිං– සෙනාසනස්මිං– ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරස්මිං හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ[6] විගච්ඡමානෙ අන්තරධායමානෙ රුප්පන්ති කුප්පන්ති පීළයන්ති ඝට්ටයන්ති බ්‍යාධිතා දොමනස්සිතා හොන්තීති එවම්පි 'රුප්පන්ති රූපෙසු'. ජනාති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්ද ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච. පමත්තාති. පමාදෙ වත්තබ්බො: කායදුච්චරිතෙන වා වචීදුච්චරිතෙන වා මනොදුච්චරිතෙන වා පඤ්චසු කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො[7] වොස්සග්ගානුප්පදානං කුසලානං වා ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනවට්ඨිතකිරියතා[8] ඔලීනවුත්තිතා නික්ඛිත්තච්ඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදෙ.[a] යො එවරූපො පමාදෙ පමජ්ජනා පමජ්ජිතත්තං අයං වුච්චති පමාදෙ''. ඉමිනා පමාදෙන සමන්නාගතා ජනා පමත්තාති 'රුප්පන්ති රූපෙසු ජනා පමත්තා'.

1. කහාපණිකම්පි – ම ජ සං
2. පළාලපීඨකම්පි – ම ජ සං
3. උපඝාටියන්ති – ච, වි, ක
4. පීළියන්ති – ච-වි-ක, ස්‍යා

a විභඞ්ග–ඛුද්දකවත්ථු විභඞ්ග

5. ඝට්ටියන්ති – ච, වි, ක
6. විහායමානෙ – ච, වි, ක
7. වොස්සග්ගො ම ජ සං
8. අනට්ඨිත කිරියතා – ම ජ සං
අනවට්ඨිත කාරියා – ච, වි, ක

නැහැය ද සිඳිති, කන්නාසා ද සිඳිති, කාඩිසැළි කම්කටොලු ද කෙරෙති, සක්මුඬු කම්කටොලු ද කෙරෙති, රාහුමුඛ කම්කටොලු ද කෙරෙති, ගිනි වළලු කම්කටොලු ද කෙරෙති, අත් දල්වන කම්කටොලු ද කෙරෙති, එරුවත් කම්කටොලු ද කෙරෙති, තිහිරිවත් කම්කටොලු ද කෙරෙති, එණෙයාක කම්කටොලු ද කෙරෙති, බිලියෙන් මස් සිඳුණා කම් කටොලු ද කෙරෙති, කහාපණක කම්කටොලු ද කෙරෙති, කොස්සෙන් කාරම් ගල් වති, පරිසපරිවර්තන කම්කටොලු ද කෙරෙති, පිදුරුපිටු කම්කටොලු ද කෙරෙති, කකාළ තෙල් ද ඉස්වති, ශුනකයන් (කීණ බල්ලන්) ලවා ද කවති, දිවස්හුල ද හිඳුවති. කඩුවෙන්ද්‍ද හිස සිඳිත්. මෙසෙයින් සත්ත්වයෝ රූප හෙතුයෙන් රූප ප්‍රත්‍යයෙන් රූප කාරණයෙන් නැසෙති වැනැසෙති නසනු ලැබෙති වනසනු ලැබෙත්. මෙසේ නැසෙනුවත් වැනැසෙනුවත් නසනු ලබනුවත් වෙසෙසින් නසනු ලබනුවත් දැක බලා තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නුයි 'දිස්වාන රූපෙසු විභඤ්ඤමානෙ' යනු වේ.

පිඩගිය යනු: බුදුහු එ බමුණු නමින් අමතති. භගවා යනු: තෙල ගෞරව නාම යැ . . . මේ 'භගවා' යනු: බෝමුල්හි අර්හත්ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියක් නුයි' පිඩගියා' ති භගවා' යනු වේ.

**රූපපනති රූපෙසු ජනා පමතතා–** රුපපනති යනු: නැසෙති කිපෙති පෙළෙති ගැටෙති පීඩිත වූවාහු හටගත් දෙම්නස් ඇත්තාහු වෙත්. චක්ෂු රොගයෙන් නැසෙති කිපෙති පෙළෙති ගැටෙති පීඩිත වූවාහු හටගත් දෙම්නස් ඇත්තාහු වෙත්. ශ්‍රොත්‍රරොගයෙන් . . . කායරොගයෙන් මැසි–මදුරු–වා–අව්–දිග්දැ ෂහසින් නැසෙති කිපෙති පෙළෙති ගැටෙති පීඩිත වූවාහු හටගත් දෙම්නස් ඇත්තාහු වෙත් නුයි 'රුප්පන්ති රූපෙසු' යනු වේ. නොහොත් ඇස හෙන කල්හි පිරිහෙන කල්හි හාත්පසින් හෙන කල්හි නැසෙන කල්හි විගත වන කල්හි අතුරුදහන් වන කල්හි නැසෙති . . . චිත්තවිඝාතයට පැමිණියාහු වෙත්. කන-නැහැය–දිව–කය– රූපය–ශබ්දය– ගන්ධය– රසය– ස්ප්‍රෂ්ටව්‍යය– කුලය– ගණය– ආවාසය– ලාභය–යසස– ප්‍රශංසාව– සුඛය– සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර හෙන කල්හි පිරිහෙන කල්හි හාත්පසින් හෙන කල්හි නැසෙන කල්හි විගත වන කල්හි අතුරු දහන් වන කල්හි නැසෙති කිපෙති (පෙළෙති පෙළෙති ගැටෙති පීඩිත වූවාහු, චිත්ත විඝාතයට පැමිණියාහු වෙත් නුයි මෙසේත් 'රුප්පන්ති රූපෙසු' යනු වේ. ජනා යනු: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශුද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මිනිස්සු ද. පමත්තා යි'' ප්‍රමාදය කිය යුතු යි: කාය දුශ්චරිතයෙන් වෙවයි වාග්දුශ්චරිතයෙන් වෙවයි මනොදුශ්චරිතයෙන් වෙවයි පස්කම් ගුණයෙහි සිත බැස ගැන්ම බැස ගැන්මට අනුබල දීම, කුශල ධර්මයන්ගේ නො වැඩීම, සකසා නො කරන බව, සතතයෙන් නො කරන බව, නො බැස ගත් ක්‍රියා ඇති බව, පසු බට පැවැතුම් ඇති බව, බහා තුබූ කුශලච්ඡන්ද ඇති බව, බහා තැබූ වියඝීධුර ඇති බව, ආසේවන නො කිරීම, අභාවනය, පුන පුනා නො කිරීම, අනධිෂ්ඨානය, අනනුයොගය, ප්‍රමාදය වෙයි. මෙ බඳු යම් ප්‍රමාදයෙක් ප්‍රමාද අයුරෙක් හටගත් ප්‍රමාද ඇති බවෙක් වේ ද මේ ප්‍රමාද යැ කියනු ලැබේ. මේ ප්‍රමාදයෙන් සමන්වාගත ජනයෝ ප්‍රමත්තයෝ නුයි 'රුප්පන්ති රූපෙසු ජනා පමත්තා' යනු වේ.

**තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තොති:** 'තස්මා'ති– තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා එවං ආදීනවං සම්පස්සමානො රූපෙසූති තස්මා තුවං පිඞ්ගිය. අප්පමත්තොති සක්කච්චකාරී සාතච්චකාරී – පෙ – අප්පමාදෙ කුසලෙසු ධම්මෙසූති 'තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො'.

**ජහස්සු රූපං අපුනබ්භවායාති:** 'රූප'න්ති: චත්තාරො මහාභූතා **චතුන්නඤ්ච** මහාභූතානං උපාදාය රූපං, **ජහස්සු** රූපන්ති– ජහස්සු රූපං, පජහස්සු රූපං, විනොදෙහි රූපං, බ්‍යන්තීකරොහි රූපං, අනභාවං ගමෙහි රූපං. අපුනබ්භවායාති යථා තෙ රූපං ඉධෙව නිරුජ්ඣෙය්‍ය පුන පටිසන්ධිකො භවො න නිබ්බත්තෙය්‍ය කාමධාතුයා වා රූපධාතුයා වා අරූපධාතුයා වා කාමභවෙ වා රූපභවෙ වා අරූපභවෙ වා සඤ්ඤාභවෙ වා අසඤ්ඤාභවෙ වා නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ වා එකවොකාරභවෙ වා චතුවොකාරභවෙ වා පඤ්චවොකාරභවෙ වා පුනගතියා වා උපපත්තියා වා පටිසන්ධියා වා භවෙ වා සංසාරෙ වා වට්ටෙ වා න ජනෙය්‍ය න සංජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය, ඉධෙව නිරුජ්ඣෙය්‍ය, වූපසමෙය්‍ය අත්ථං ගච්ඡෙය්‍ය පටිප්පස්සම්භෙය්‍යාති 'ජහස්සු රූපං අපුනබ්භවාය.'

තෙනාහ භගවා:

''දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ (පිඞ්ගියාති භගවා)
රුප්පන්ති රූපෙසු ජනා පමත්තා,
තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො
ජහස්සු රූපං අපුනබ්භවායා''ති.

16–3

''දිසා චතස්සො විදිසා චතස්සො
උද්ධං අධො දසදිසා ඉමායො,
න තුය්හං අදිට්ඨං අසුතා[1]මුතං වා
අථො අවිඤ්ඤාතං කිඤ්චි[2]නමත්ථි ලොකෙ
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය[3] ඉධ විප්පහානං.

**දිසා චතස්සො විදිසා චතස්සො උද්ධං අධො දසදිසා ඉමායොති** දසදිසා,

**න තුය්හං අදිට්ඨං අසුතාමුතං වා අථො අවිඤ්ඤාතං කිඤ්චනමත්ථි ලොකෙති** තුය්හං අදිට්ඨං අසුතං අමුතං අවිඤ්ඤාතං කිඤ්චි අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො[4] නත්ථි, න සන්ති න සංවිජ්ජන්ති නූපලබ්භන්තීති 'න තුය්හං අදිට්ඨං අසුතාමුතං වා අථො අවිඤ්ඤාතං කිඤ්චනමත්ථි ලොකෙ.'

1. අස්සුතං අමුතං – ම ජ සං
අසුතං මුතං වා – සු
2. කිඤ්චි නමත්ථි– ම ජ සං, ස්‍යා – කිඤ්චනං අත්ථි – සු
3. ජාතිජ්ජරාය – ස්‍යා
4. පරමත්ථො වා – ම ජ සං ස්‍යා

**තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො**– **තස්මා** යනු: එයින් එ කරුණින් එ හෙයින් තත්ප්‍රත්‍යයෙන් තන්නිදානයෙන් මෙසේ රූපයන්හි ආදීනව දක්මින් නුයි ‘තස්මා තුවං පිඞ්ගිය’ යනු වේ. **අප්පමත්තො** යනු: සකසා කරනසුලු සතතයෙන් කරනසුලු . . . කුශලධර්මයන්හි අප්‍රමාද වූයේ නුයි ‘තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො’ යනු වේ.

**ජහස්සු රූපං අපුනබ්භවාය**– ‘රූපං’ යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද, **ජහස්ස රූපං** යනු: රූපය හැරපියව රූපය වෙසෙසින් හැරපියව රූපය දුරලව රූපය විගතාන්ත කරව රූපය අනුඅභාවයට පමුණුව. **අපුනබ්භවාය** යනු: යම් සේ තා ගේ රූපය මෙ අත්බැව්හි මැ නිරුද්ධ වන්නේ නම්, වටාලා පිළිසඳ ඇති භවයෙක් නූපදී නම්, කාමධාතුයෙහි හෝ රූපධාතුයෙහි හෝ අරූපධාතුයෙහි හෝ කාම භවයෙහි හෝ රූප භවයෙහි හෝ අරූප භවයෙහි හෝ සංඥා භවයෙහි හෝ අසංඥා භවයෙහි හෝ නෛවසංඥානාසංඥාභවයෙහි හෝ එකවොකාර භවයෙහි හෝ චතුවොකාරභවයෙහි හෝ පඤ්චවොකාර භවයෙහි හෝ පුනර්ගතයෙහි හෝ උපප්‍රාප්තියෙහි හෝ ප්‍රතිසන්ධියෙහි හෝ භවයෙහි හෝ සංසාරයෙහි හෝ වෘත්තයෙහි හෝ නූපදී නම් මොනොවට නූපදී නම් නො නිපදනේ නම් මොනොවට නො නිපදනේ නම් මෙ අත් බැව්හි මැ නිරුද්ධ වන්නේ නම් සන්හිඳෙන්නේ නම් අස්තයට යේ නම්, නවත්නේ නම් නුයි ‘ජහස්සු රූපං අපුනබ්භවාය’ යනු වේ.

එයින් වදළහ බුදුහු:

**“දිස්වාන රූපෙසු–පෙ–ජහස්සු රූපං අපුනබ්භවාය”යි.**

## 16-3

සතර දිග යැ සතර අනුදිග යැ උඩ යැ යට යැ යන මේ දසදික් කෙනෙක් වෙත් ද ලොවැ මෙ හැම තන්හි මුඹ වහන්සේ විසින් නො දක්නා ලද නො අසන ලද ආඝ්‍රාණ ස්වාදන ස්පර්ශන නො කරන ලද යළි නො දන්නා ලද කිසිවක් නැති මේ පහණසැ වෙහෙරෙහි දී මැ ජාතිජරාවගේ ප්‍රහාණය වූ යම් (නිර්වාණ) දහමක් මම් දැන ගන්නෙම් නම් ඒ දහම වදළ මැනැව.

**දිසා චතස්සො විදිසා චතස්සො උද්ධං අධො දසදිසා ඉමායො** යනු දස දික්නු යැ.

**න තුය්හං අදිට්ඨං අසුතාමුතං වා අථො අවිඤ්ඤාතං කිඤ්චනමත්ථි ලොකෙ** යනු: මුඹ වහන්සේ විසින් නුදුටු නො ඇසූ නො වුන් නො දත් කිසි ආත්මාර්ථයෙක් හෝ පරාර්ථයෙක් හෝ උභයාර්ථයෙක් හෝ දෘෂ්ටධාර්මිකාර්ථයෙක් හෝ සාම්පරායිකාර්ථයෙක් හෝ උත්තානාර්ථයෙක් හෝ ගම්භීරාර්ථයෙක් හෝ ගූඪාර්ථයෙක් හෝ ප්‍රතිච්ඡන්නාර්ථයෙක් හෝ නෙය්‍යාර්ථයෙක් හෝ නීතාර්ථයෙක් හෝ නිරවද්‍යාර්ථයෙක් හෝ නික්ලේශාර්ථයෙක් හෝ ව්‍යවදානාර්ථයෙක් හෝ පරමාර්ථාර්ථයෙක් හෝ නැත. නො වෙයි විද්‍යමාන නො වෙයි නො ලැබේ නුයි ‘න තුය්හං අදිට්ඨං, අසුතාමුතං වා අථො අවිඤ්ඤාතං කිඤ්චනමත්ථි ලොකෙ’ යනු වේ.

ආවිකබ ධම්මං යමහං විජඤ්ඤන්ති ධම්ම'න්ති ආදිකල්‍යාණං -පෙ- නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං ආචික්ඛාහි දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවරාහි විභජාහි උත්තානීකරොහි පකාසෙහි. යමහං විජඤ්ඤන්ති යමහං ජානෙය්‍යං ආජානෙය්‍යං විජානෙය්‍යං පටිවිජානෙය්‍යං පටිවිජ්ඣෙය්‍යං අධිගච්ඡෙය්‍යං ඵස්සෙය්‍යං[1] සච්ඡිකරෙය්‍යන්ති 'ආවිකබ ධම්මං යමහං විජඤ්ඤං'.

ජාතිජරාය ඉධ විප්පහානන්ති 'ඉධෙව ජාතිජරාමරණස්ස පහානං වූපසමං පටිනිස්සග්ගං පටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති ජාතිජරාය ඉධ විප්පහානං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"දිසා චතස්සො විදිසා චතස්සො
උද්ධං අධො දසදිසා ඉමායො,
න තුය්හං අදිට්ඨං අසුතාමුතං වා.
අථො අවිඤ්ඤාතං කිඤ්චනමත්ථි ලොකෙ
ආවිකබ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහාන"න්ති

## 16-4

තණ්හාධිපන්නෙ මනුජෙ පෙක්ඛමානො (පිඞ්ගියාති භගවා)
සන්තාපජාතෙ ජරසා පරෙතෙ
තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො
ජහස්සු තණ්හං අපුනබ්භවාය.

තණ්හාධිපන්නෙ[2] මනුජෙ පෙක්ඛමානොති 'තණ්හා'ති රූපතණ්හා -පෙ- ධම්මතණ්හා, තණ්හාධිපන්නෙති තණ්හාඅධිපන්නෙ තණ්හානුගෙ තණ්හානුගතෙ තණ්හානුසටෙ තණ්හායාපන්නෙ[3] පටිපන්නෙ අභිභූතෙ පරියාදින්නචිත්තෙ. මනුජෙති සත්තාධිවචනං. පෙක්ඛමානොති පෙක්ඛමානො දක්ඛමානො ඔලොකයමානො නිජ්ඣායමානො උපපරික්ඛයමානොති 'තණ්හාධිපන්නෙ මනුජෙ පෙක්ඛමානො.

පිඞ්ගියාති භගවාති -පෙ-

1. පස්සෙය්‍යං- ම, වි, ක
2. තණ්හාවිපන්නෙ වි, ක
3. තණ්හායපන්නෙ - ම ජ සං

**ආවිකඛ ධමමං යමහං විජඤ්ඤං**– 'ධම්මං' යනු: ආදි කල්‍යාණ වූ . . . නිර්වාණය ද නිර්වාණගාමිනී ප්‍රතිපත් ද වදළ මැනැවැ දෙසුව මැනැවැ පැනැවුව මැනැවැ පිහිටුව මැනැවැ විවෘත කළ මැනැවැ විභාග කළ මැනැවැ නො ගැඹුරු කළ මැනැවැ ප්‍රකාශ කළ මැනැව. **යමහං විජඤ්ඤං** යනු: යම් දහමක් මම් දැනගන්නෙම් නම් හාත්පසින් දැනගන්නෙම් නම් වෙසෙසින් දැනගන්නෙම් නම් මොනොවට දැනගන්නෙම් නම් ප්‍රතිවෙධ කරන්නෙම් නම් අධිගම කරන්නෙම් නම් පහස්නෙම් නම් පසක් කරන්නෙම් නම් නුයි 'ආවික්ඛ ධම්මං යමහං විජඤ්ඤං' යනු වේ.

**ජාතිජරාය ඉධ විපපහානං** යනු: මෙ අත්බැව්හි මැ ජාතිජරාමරණ යාගේ ප්‍රහාණය සන්හිඳීම දුරලීම නො පැවැත්ම අමාමහනිවන නුයි 'ජාතිජරාය ඉධ විප්පහානං' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

**"දිසා චතසෙසා –පෙ– ජාතිජරාය ඉධ විපපහානං" යි.**

## 16–4

(බුදුහු මෙසේ වදළහ: පිඞ්ගිය,) (යම් හෙයෙකින් තෙපි) තෘෂ්ණායෙහි ගැලී සිටි සත්ත්වයන් හටගත් සිත් තැවුල් ඇතියන් ජරායෙන් මඩනා ලදුවන් වැ දක්නවු ද, එහෙයින් පිඞ්ගිය, තෙපි අප්‍රමත්ත වැ පුනර්භවය නොවනු පිණිස තෘෂ්ණාව දුරු කරව යි.

**තණහාධිපනෙන මනුජෙ පෙකඛමානො** - 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ . . . ධර්මතෘෂ්ණා යි. **තණහාධිපනෙන** යනු: තෘෂ්ණායෙහි ගැලුණවුන් තෘෂ්ණාව අනුව ගියවුන් තෘෂ්ණායෙහි පිවිසියන් තෘෂ්ණායෙන් වැළුණවුන් තෘෂ්ණාවට පැමිණියවුන් ප්‍රතිපන්නයන් මඩනා ලද්දවුන් හාත්පසින් මැඩ ගත් සිත් ඇතියන්. **මනුජෙ** යනු: සත්ත්වයනට නමෙකි. **පෙකඛමානො** යනු: බලනුයේ දක්නේ අවලෝකනය කරනුයේ සිතනුයේ විමසනුයේ නුයි 'තණ්හාධිපන්නෙ මනුජෙ පෙක්ඛමානො' යනු වේ.

**පිඞගියාති භගවා** යනු . . .

**සන්තාපජාතෙ ජරසා පරෙතෙති:** 'සන්තාපජාතෙ'ති ජාතියා සන්තාපජාතෙ ජරාය සන්තාපජාතෙ ව්‍යාධිනා සන්තාපජාතෙ මරණෙන සන්තාපජාතෙ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි සන්තාපජාතෙ නෙරයිකෙන දුක්ඛෙන සන්තාපජාතෙ -පෙ- දිට්ඨිබ්‍යසනෙන දුක්ඛෙන සන්තාපජාතෙ ඊතිජාතෙ උපද්දව ජාතෙ උපසග්ගජාතෙති 'සන්තාපජාතෙ. **ජරසා පරෙතෙති** ජරාය ඵුට්ඨෙ පරෙතෙ සමොහිතෙ සමන්නාගතෙ ජාතියා අනුගතෙ ජරාය අනුසටෙ බ්‍යාධිනා අභිභූතෙ මරණෙන අබ්භාහතෙ අතාණෙ අලෙනෙ අසරණෙ අසරණීභූතෙති 'සන්තාපජාතෙ ජරසා පරෙතෙ'.

**තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තොති:** 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා, එවං ආදීනවං සම්පස්සමානො තණ්හායාති, 'තස්මා තුවං පිඞ්ගිය. **අප්පමත්තොති** සක්කච්චකාරී -පෙ- අප්පමාදො කුසලෙසු ධම්මෙසූති 'තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො'.

**ජහස්සු තණ්හං අපුනබ්භවායාති** තණ්හාති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා. **ජහස්සු තණ්හන්ති** ජහස්සු තණ්හං පජහස්සු තණ්හං විනොදෙහි තණ්හං, බ්‍යන්තිං කරොහි තණ්හං අනභාවං ගමෙහි තණ්හං. **අපුනබ්භවායාති** යථා තෙ-පෙ-දූන පටිසන්ධිකො භවො න නිබ්බත්තෙය්‍ය, කාමධාතුයා වා රූපධාතුයා වා අරූපධාතුයා වා කාමභවෙ වා රූපභවෙ වා අරූපභවෙ වා සඤ්ඤාභවෙ වා අසඤ්ඤාභවෙ වා නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ වා එකවොකාරභවෙ වා චතුවොකාරභවෙ වා පඤ්චවොකාරභවෙ වා පුනගතියා වා උපපත්තියා වා පටිසන්ධියා වා භවෙ වා සංසාරෙ වා වට්ටෙ වා න ජනෙය්‍ය න සංජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය ඉධෙව නිරුජ්ඣෙය්‍ය වූපසම්මෙය්‍ය අත්ථංගච්ඡෙය්‍ය පටිප්පස්සම්භෙය්‍යාති 'ජහස්සු තණ්හං අපුනබ්භවාය.'

**තෙනාහ භගවා:**

**තණ්හාධිපන්නෙ මනුජෙ පෙක්ඛමානො–(පිඞ්ගියාති භගවා)**
**සන්තාපජාතෙ ජරසා පරෙතෙ,**
**තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො**
**ජහස්සු තණ්හං අපුනබ්භවායා''ති.**

**සහගාථාපරියොසානා** තෙන බ්‍රාහ්මණෙන සද්ධිං එකච්ඡන්දා එකපයොගා එකාධිප්පායා එකවාසනවාසිතා තෙසං නෙකපාණසහස්සානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි. යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති. තස්ස බ්‍රාහ්මණස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි.

**සන්තාපජාතෙ ජරසා පරෙතෙ**- 'සන්තාපජාතෙ' යනු: ජාතියෙන් හටගත් තැවුලි ඇතියන් ජරායෙන් හටගත් තැවුලි ඇතියන් ව්‍යාධියෙන් හටගත් තැවුලි ඇතියන් මරණයෙන් හටගත් තැවුලි ඇතියන් ශොක පරිදෙවදුඃඛදෞර්මනස්‍යයන්ගෙන් හටගත් තැවුලි ඇතියන් නිරයදුකින් හටගත් තැවුලි ඇතියන් . . . දෘෂ්ටි ව්‍යසනදුඃඛයෙන් හටගත් තැවුලි ඇතියන් හටගත් දුක් ඇතියන් හටගත් උවදුරු ඇතියන් හටගත් උපසර්ග ඇතියනැ' යි 'සන්තාපජාතෙ' යනු වේ. **'ජරසා පරෙතෙ'** යනු: ජරායෙන් පහස්නා ලදුවන්, මඩනාලදුවන් ඇතුළත පිවිසියන් සමන්වාගත වූවන් ජාතියෙහි පිවිසියන් ජරායෙන් වැසුණවුන් ව්‍යාධියෙන් මඩනාලදුවන් මරණයෙන් පහළ වූන් රක්ෂාස්ථාන රහිතයන් නිලීනස්ථාන රහිතයන් සරණ රහිතයන් අසරණීභූතයනැ'යි'සන්තාපජාතෙ ජරසා පරෙතෙ,' යනුවේ.

**තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො** – 'තස්මා' යනු: එයින් එ කරුණින් එ හෙයින් එ පසයෙන් ඒ නිදානයෙන්, මෙසේ තෘෂ්ණායෙහි ආදීනව දක්නේ නුයි 'තස්මා තුවං පිඞ්ගිය' යනු වේ. අප්පමත්තො යනු: සකසා කරනසුලු . . . කුසල් දහම්හි නො පමා වූයේ නුයි 'තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො' යනු වේ.

**ජහස්සු තණ්හං අපුනබ්භවාය**- 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ . . . ධර්මතෘෂ්ණා යි. **ජහස්සු තණ්හං** යනු: තෘෂ්ණාව හැරපියව තෘෂ්ණාව වෙසෙසින් හැරපියව තෘෂ්ණාව දුරු කරව තෘෂ්ණාව විගතාන්ත කරව තෘෂ්ණාව අනු අභාවයට පමුණුව. **අපුනබ්භවාය** යනු: යම්සේ තාගේ . . . වටාලා පිළිසඳ ඇති භවය නූපදනේ නම්, කාමධාතුයෙහි හෝ රූපධාතුයෙහි හෝ අරූපධාතුයෙහි හෝ කාමභවයෙහි හෝ රූපභවයෙහි හෝ අරූපභවයෙහි හෝ සංඥාභවයෙහි හෝ අසංඥාභවයෙහි හෝ නෛවසංඥානාසංඥාභවයෙහි හෝ ඒකවෝකාරභවයෙහි හෝ චතුවෝකාරභවයෙහි හෝ පඤ්චවෝකාරභවයෙහි හෝ පුනර්ගතියෙහි හෝ උපප්‍රාප්තියෙහි හෝ ප්‍රතිසන්ධියෙහි හෝ භවයෙහි හෝ සංසාරයෙහි හෝ වෘත්තයෙහි හෝ නූපදනේ නම් (අවයව ප්‍රාදුර්භාවයෙන්) මොනොවට නූපදනේ නම් නො නිපදනේ නම් වෙසෙසින් නො නිපදනේ නම් මෙ අත් බැව්හි ම නිරුද්ධ වන්නේ නම් සන්හිඳෙන්නේ නම් අස්තයට යන්නේ නම් නො පවත්නේ නම් නුයි 'ජහස්සු තණ්හං අපුනබ්භවාය' යනු වේ.

එයින් වදළහ බුදුහු:

**"තණ්හාධිපන්නෙ -පෙ- ජහස්සු තණ්හං අපුනබ්භවාය"යි.**

ගාථා පර්‍යවසානය හා මැ එ බමුණු හා සමග එක් අදහස් ඇති එක් පියෝ ඇති එක් රිසි ඇති වඩන ලද එක් බැවුන් ඇති යම් කෙනෙක් වූහු නම් ඒ නොයෙක් දහස්ගණන් ප්‍රාණීන්ට 'යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් එ හැම නිරොධ ස්වභාවය ඇතැ' යි රාගාදි රජස් රහිත වූ රාගාදි මල රහිත වූ ධර්මචක්ෂුස පහළ විය. එ බමුණුහට 'යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් එ හැම නිරොධ ස්වභාවය ඇතැ' යි විරජ වූ වීතමල වූ ධර්මචක්ෂුස උපන.

යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති. සහ ධම්මචක්ඛුස්ස පටිලාභා අජිනජටාවාකචීර[1]දණ්ඩකමණ්ඩලු කෙසා ච මස්සු ච අන්තරහිතා භණ්ඩුකාසායවත්ථවසනො සඞ්ඝාටිපත්තචීවරධරො භික්ඛු අන්වත්ථපටිපත්තියා පඤ්ජලිකො භගවන්තං නමස්සමානො නිසින්නො හොති 'සත්ථා මෙ භගවා සාවකො 'හමස්මී'ති.[2]

පිඞ්ගිය සුත්තනිද්දෙසො සමත්තො.

1. වාක චීරක - පත 2. සාවකො හමස්මීන්ති - පත

ධර්මචක්ෂුස්හුගේ ප්‍රතිලාභය හා සමඟ අඳුන්දිවිසම් දළමවුලු සණ වැහැරි දඬ කමඬලා හා කෙස් මස් හා අතුරුදහන් වීය. පිඞගිය තෙමේ මුඩුහිස් ඇත්තේ හන්පෙරෙවි කසාවත් ඇත්තේ සහළ -පා-සිවුරු ධරනුයේ අන්වර්ථ ප්‍රතිපත්ති (ඉෂ්ටාර්ථලාභ) යෙන් බඳුදිලි වැ "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට ශාස්තෘ වන සේක, මම ශ්‍රාවකයෙමි" භාග්‍යවතුන් නමදිමින් හුන්නේ යි.

පිඞගිය සූත්‍රනිර්දේශය නිමි.

## 17. පාරායනානුගීති නිද්දෙසො

"ඉදමවොච භගවා මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙ පරිචාරකසොළසානං බ්‍රාහ්මණානං අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හං බ්‍යාකාසි."

ඉදමවොච භගවාති ඉමං පාරායනං[1] අවොච. භගවාති ගාරවාධිවචනමෙතං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං "භගවාති ඉදමවොච භගවා."

මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙති 'මගධෙසූ'ති මගධනාමකෙ ජනපදෙ විහරන්තොති චරන්තො විහරන්තො ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තො. පාසාණකෙ චෙතියෙති. පාසාණකචෙතියං වුච්චති බුද්ධාසනන්ති මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙ.

පරිචාරක සොළසානං බ්‍රාහ්මණානන්ති පිඞ්ගියො බ්‍රාහ්මණො බාවරිස්ස බ්‍රාහ්මණස්ස පද්ධො පද්ධචරො පරිචාරකො සිස්සො. තෙන[2] 'තෙ සොළසා'ති එවම්පි පරිචාරකසොළසානං බ්‍රාහ්මණානං. අථවා තෙ සොළසබ්‍රාහ්මණා බුද්ධස්ස භගවතො පද්ධා පද්ධචරා පරිචාරකා සිස්සාති එවම්පි පරිචාරකසොළසානං බ්‍රාහ්මණානං.

අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හං බ්‍යාකාසීති 'අජ්ඣිට්ඨො'ති අජ්ඣිට්ඨො අජ්ඣෙසිතො. පුට්ඨො පුට්ඨොති පුට්ඨො පුට්ඨො පුච්ඡිතො පුච්ඡිතො යාචිතො යාචිතො අජ්ඣෙසිතො අජ්ඣෙසිතො පසාදිතො පසාදිතො. පඤ්හං බ්‍යාකාසීති පඤ්හං බ්‍යාකාසි ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසීති 'අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හං බ්‍යාකාසි. තෙනෙතං වුච්චති: "ඉදමවොච භගවා මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙ පරිචාරිකසොළසානං බ්‍රාහ්මණානං අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හං බ්‍යාකාසී"ති.

"එකමෙකස්ස චෙපි පඤ්හස්ස අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍ය, ගච්ඡෙය්‍යෙව ජරාමරණස්ස පරං පාරං ගමනියා ඉමෙ ධම්මාති තස්මා ඉමස්ස ධම්මපරියායස්ස පාරායනං ත්වෙව අධිවචනං."

---

1. ඉදං පාරායනං—ම ජ ස, ච, වි, ක

2. පිඞ්ගියෙන—ම ජ සං

# 17. පාරායණානුගීති නිර්දේශය

"භාග්‍යවතුන් වහන්සේ මගධරටැ පහණසෑ නම් වෙහෙරෙහි වැඩ වසනසේක් මේ පාරායණ සූත්‍රය වදළසේක (බාවරි) ඇතැවැසි (පිඞ්ගිය හා සමග) සොළොස් බමුණන් විසින් අයදනා ලද්හු පුළුවුත්හු පුළුවුත්හු පැන විසඳූසේක."

**ඉදමවොච භගවා** යනු: මේ පාරායණ සූත්‍රය වදළහ. **භගවා** යනු: තෙල ගෞරවනාම යැ ... මේ 'භගවත්' යනු බෝමුල්හි සිව්සස් පසක් කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් නුයි 'ඉදමවොච භගවා' යනු වේ.

**මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙ** – **මගධෙසු** යනු: 'මගධ' නම් ඇති දනව්යෙහි. **විහරන්තො** යනු: හැසිරෙන්නාහු වෙසෙන්නාහු ඉරියවු පවත්වන්නාහු වැටෙන්නාහු පාලනය කරන්නාහු යැපෙන්නාහු යාපනය කරන්නාහු. **පාසාණකෙ චෙතියෙ** යනු: 'පාසාණක චෙතිය' යි බුද්ධාසනය කියනු ලැබේ නුයි 'මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙ' යනු වේ.

**පරිවාරකසොළසානං බ්‍රහමණානං** යනු: පිඞ්ගිය බ්‍රාහ්මණ තෙම බාවරී බමුණු ගේ ඇතැවැසි වූයේ පසැහි හැසිරෙනුයේ පරිවාරක වූයේ ශිෂ්‍ය වූයේ යි. පිඞ්ගිය හා සමග ඔහු සොළොස් දෙනෙක් වේත් නුයි මෙසේත් 'පරිවාරකසොළසානං බ්‍රාහ්මණානං' යනු වේ. නොහොත් ඒ සොළොස් බමුණහු භාග්‍යවත් බුදුන්ගේ ඇතැවැසියහ, පසැ හැසිරෙනුව්හ, පරිවාරකයහ, ශිෂ්‍යහ' යි මෙසේත් 'පරිවාරකසොළසානං බ්‍රාහ්මණානං' යනු වේ.

**අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හං බ්‍යාකාසි**- 'අජ්ඣිට්ඨො' යනු: අයදනා ලද්හු අධ්‍යෙෂණ කරන ලද්හු. **පුට්ඨො පුට්ඨො** යනු: පුළුවුස්නා ලද්හු පුළුවුස්නා ලද්හු විචාරන ලද්හු විචාරන ලද්හු යදනා ලද්හු යදනා ලද්හු අධ්‍යෙෂණ කරන ලද්හු අධ්‍යෙෂණ කරන ලද්හු පහදවන ලද්හු පහදවනා ලද්හු. **පඤ්හං බ්‍යාකාසි** යනු: පැන විසඳූහ වදළහ දෙසූහ පැනැවූහ පිහිටුවූහ විවෘත කළහ විභාග කළහ පහළ කළහ පැවැසූහ යි 'අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හං බ්‍යාකාසි' යනු වේ. එයින් තෙල කියනු ලැබෙයි: "**ඉදමවොච භගවා –පෙ– පඤ්හං බ්‍යාකාසි**" යි.

"එකෙකි පැනයෙකැ පෙළ අරුත් දැන පෙළ දහම් දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි (යමෙක්) පිළිපදනේ නම් හේ ජරාමරණයාගේ පරතෙරට යන්නේ මැ යැ, යම් හෙයෙකින් මේ ධර්මයෝ (නිර්වාණ) පාරගමනාර්හ වෙත් ද එහෙයින් මේ ධර්මපර්‍යායය 'පාරායණ' යි මැ නම් වී"

**එකමෙකස්ස චෙපි පඤ්හස්සාති:** එකමෙකස්ස චෙපි අජිත පඤ්හස්ස, එකමෙකස්ස චෙපි තිස්සමෙත්තෙය්‍යපඤ්හස්ස, එකමෙකස්ස චෙපි පුණ්ණකපඤ්හස්ස, එකමෙකස්ස චෙපි මෙත්තගූපඤ්හස්ස, එකමෙකස්ස චෙපි ධොතකපඤ්හස්ස, එකමෙකස්ස චෙපි උපසීවපඤ්හස්ස, එකමෙකස්ස චෙපි නන්දකපඤ්හස්ස, එකමෙකස්ස චෙපි හෙමකපඤ්හස්ස, එකමෙකස්ස චෙපි තොදෙය්‍යපඤ්හස්ස, එකමෙකස්ස චෙපි කප්පපඤ්හස්ස, එකමෙකස්ස චෙපි ජතුකණ්ණිපඤ්හස්ස, එකමෙකස්ස චෙපි භද්‍රාවුධපඤ්හස්ස, එකමෙකස්ස චෙපි උදයපඤ්හස්ස, එකමෙකස්ස චෙපි පොසාලපඤ්හස්ස, එකමෙකස්ස චෙපි මොඝරාජපඤ්හස්ස එකමෙකස්ස චෙපි පිඞ්ගියපඤ්හස්සාති එකමෙකස්ස චෙපි පඤ්හස්ස.

**අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤායාති:** සොවච පඤ්හා ධම්මා, විස්සජ්ජනං අත්ථො, අත්ථමඤ්ඤායාති අත්ථං අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති අත්ථමඤ්ඤාය. ධම්මමඤ්ඤායාති ධම්මං අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය'.

**ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍යාති:** සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං පටිපජ්ජෙය්‍යාති 'ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍ය'.

**ගච්ඡෙය්‍යෙව ජරාමරණස්ස පාරන්ති:** ජරාමරණස්ස පාරං වුච්චති අමතං නිබ්බානං "යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං" ගච්ඡෙය්‍යෙව ජරාමරණස්ස පාරන්ති ජරාමරණස්ස පාරං ගච්ඡෙය්‍ය, පාරං අධිගච්ඡෙය්‍යං පාරං අධිඵස්සෙය්‍ය, පාරං සච්ඡිකරෙය්‍යාති ගච්ඡෙය්‍යෙව ජරාමරණස්ස පාරං.

**පාරං ගමනියා ඉමෙ ධම්මාති;** ඉමෙ ධම්මා පාරං ගමනියා පාරං පාපෙන්ති පාරං සංපාපෙන්ති පාරං සමනුපාපෙන්ති ජරාමරණස්ස තරණාය සංවත්තන්තීති 'පාරං ගමනියා ඉමෙ ධම්මා'ති.

**තස්මා ඉමස්ස ධම්මපරියායස්සාති:** 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා. ඉමස්ස ධම්මපරියායස්සාති ඉමස්ස පාරායනස්සාති 'තස්මා ඉමස්ස ධම්මපරියායස්ස.'

**එකමෙකස්ස චෙ'පි පඤ්හස්ස** යනු: එකෙකි අජිත ප්‍රශ්නයාගේ ද එකෙකි තිස්සමෙත්තෙය්‍ය ප්‍රශ්නයාගේ ද එකෙකි පූණ්ණක ප්‍රශ්නයාගේ ද එකෙකි මෙත්තගූ ප්‍රශ්නයාගේ ද එකෙකි ධොතක ප්‍රශ්නයාගේ ද එකෙකි උපසීව ප්‍රශ්නයාගේ ද එකෙකි නන්දක ප්‍රශ්නයාගේ ද එකෙකි හේමක ප්‍රශ්නයාගේ ද එකෙකි තෝදෙය්‍ය ප්‍රශ්නයාගේ ද එකෙකි කප්ප ප්‍රශ්නයාගේ ද එකෙකි ජතුකණ්ණි ප්‍රශ්නයාගේ ද එකෙකි භද්‍රාවුධ ප්‍රශ්නයාගේ ද එකෙකි උදය ප්‍රශ්නයාගේ ද එකෙකි පොසාල ප්‍රශ්නයාගේ ද එකෙකි මොඝරාජ ප්‍රශ්නයාගෙ ද එකෙකි පිඞ්ගිය ප්‍රශ්නයාගේ ද.

**අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය** යනු: එ මැ ප්‍රශ්නය ධර්ම යැ, විසර්ජනය අර්ත්ථ යි. අත්ථමඤ්ඤාය යනු: අරුත් දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට පහළ කොට නුයි 'අත්ථමඤ්ඤාය' යනු වේ. ධම්මමඤ්ඤාය යනු: පෙළ දහම දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නුයි 'අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය' යනු වේ.

**ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍ය** යනු: සම්‍යක් ප්‍රතිපදාවට අනුලෝම ප්‍රතිපදාවට ප්‍රත්‍යනීක (අවිරුද්ධ) ප්‍රතිපදාවට අන්වර්ත්ථ ප්‍රතිපදාවට ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිළිපදනේ නම් නුයි 'ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍ය' යනු වේ.

**ගච්ඡෙය්‍ය ච ජරාමරණස්ස පාරං**–ජරාමරණයාගේ පාරය යි අමාමහනිවන කියනු ලැබෙයි: යම් සියලු සංස්කාරයන්ගේ ශමථයෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එයයි. **ගච්ඡෙය්‍ය'ච ජරාමරණස්ස පාරං** යනු: ජරාමරණයාගේ පාරයට යන්නේ යැ පාරයට පැමිණෙන්නේ යැ පාරය ස්පර්ශ කරන්නේ යැ පාරය ප්‍රත්‍යක්ෂ කරන්නේ නුයි 'ගච්ඡෙය්‍ය'ච ජරාමරණස්ස පාරං' යනු වේ.

**පාරං ගමනියා ඉමෙ ධම්මා** යනු: මේ ධර්මයෝ පාරගමනාර්හ වූවාහු පාරයට පමුණුවති පාරයට මැනැවින් පමුණුවති පාරයට මොනොවට පමුණුවති ජරාමරණයාගේ තරණය පිණිස පවතිත් නුයි 'පාරං ගමනියා ඉමෙ ධම්මා' යනු වේ.

**තස්මා ඉමස්ස ධම්මපරියායස්ස** – 'තස්මා' යනු: එයින් එ කරුණින් එ හෙයින් තත් ප්‍රත්‍යයෙන් තන්නිදානයෙන්. **ඉමස්ස ධම්මපරියායස්ස** යනු: මේ පාරායණ සූත්‍රයට නුයි 'තස්මා ඉමස්ස ධම්මපරියායස්ස' යනු වේ.

**පාරායනං ත්වෙව අධිවචනන්ති** 'පාරං' වුච්චති, අමතං නිබ්බානං -පෙ- නිරොධො නිබ්බානං, අයනං වුච්චති මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මා සමාධි. අධිවචනන්ති සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපොති 'පාරායනං ත්වෙව අධිවචනං.

තෙනෙතං වුච්චති:

"එකමෙකස්ස චෙපි පඤ්හස්ස අත්ථමඤ්ඤාය[1] ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍ය ගච්ඡෙය්‍යෙව ජරාමරණස්ස පාරං පාරඞ්ගමනියා ඉමෙ ධම්මා"ති තස්මා ඉමස්ස ධම්මපරියායස්ස පාරායනං ත්වෙව අධිවචනන්ති'.

1. "අජිතො තිස්සමෙත්තෙය්‍යො පුණ්ණකො අථ මෙත්තගූ
   ධොතකො උපසීවො ච නන්දො ච අථ හෙමකො,

2. තොදෙය්‍යකප්පා දුභයො ජතුකණ්ණී ච පණ්ඩිතො
   භද්‍රාවුධො උදයො ච පොසාලො චාපි බ්‍රාහ්මණො,
   මොඝරාජා ච මෙධාවී පිඞ්ගියො ච මහාඉසි

3. එතෙ බුද්ධං උපාගඤ්ඡුං[2] සම්පන්නචරණං ඉසිං
   පුච්ඡන්තා නිපුණෙ පඤ්හෙ බුද්ධසෙට්ඨං උපාගමුං."

**එතෙ බුද්ධං උපාගඤ්ඡුන්ති** 'එතෙ'ති සොළස පාරායනියා බ්‍රාහ්මණා. බුද්ධොති "යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි, තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො බලෙසු ච වසීභාවං. බුද්ධොති කෙනට්ඨෙන බුද්ධො: බුජ්ඣිතා සච්චානීති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බදස්සාවිතාය බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, විසවිතාය බුද්ධො, ඛීණාසවසඞ්ඛාතෙන බුද්ධො නිරුපක්කිලෙසසඞ්ඛාතෙන බුද්ධො, එකන්තවීතරාගොති බුද්ධො එකන්තවීතදොසොති බුද්ධො, එකන්තවීතමොහොති බුද්ධො, එකන්තනික්කිලෙසොති බුද්ධො එකායනමග්ගං ගතොති, බුද්ධො එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො. අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභාති බුද්ධො. බුද්ධොති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධොති. **එතෙ බුද්ධං උපාගඤ්ඡුන්ති** එතෙ බුද්ධං උපාගමිංසු, උපසඞ්කමිංසු, පයිරුපාසිංසු, පරිපුච්ඡිංසු; පරිපඤ්හිංසූති 'එතෙ බුද්ධං උපාගඤ්ඡුං'.

1. අභිඤ්ඤායාතාය-ම ජ සං
2. උපාගච්ඡිංසු-ච වි ක

**පාරායනංතෙත්‍ව' ච අධිවචනං** යනු: 'පාරං' යි අමාමහනිවන කියනු ලැබෙයි.... නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. **'අයන'** යි මාර්ගය කියනු ලැබෙ යි. **අධිවචනං** යනු: සංඛ්‍යා යැ සමඥඥා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ නාමකර්ම යැ නාමධෙය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප නු යි 'පාරායනං තෙත්‍ව ච අධිවචනං' යනු වේ.

එයින් තෙල කියනු ලැබෙයි:

**"එකමෙකස්ස චේ'පි – පෙ– පාරායනංතෙත්‍ව'ච අධිවචනං"**යි

1. අජිත යැ, තිස්සමෙත්තෙය්‍ය යැ, පූර්ණක යැ, යළි මෙත්තගූ යැ, ධොතක යැ, උපසීව යැ, නන්ද යැ, යළි හෙමක යැ.

2. තොදෙය්‍ය – කප්ප දෙදෙනා යැ, පණ්ඩිත වූ ජතුකර්ණී යැ, භද්‍රාවුධ යැ, උදය යැ, පොසාල බ්‍රාහ්මණ යැ, නුවණැති මොසරාජ යැ, මහර්ෂි වූ පිඞ්ගිය යැ යන,

3. මොහු සමෘද්ධි වූ පසළොස්චරණ ධර්ම ඇති ඍෂි වූ බුදුන් කරා පැමිණියහ. සියුම් ප්‍රශ්නයන් පුළුවුස්නාහු බුද්ධශ්‍රෙෂ්ඨයන් කරා පැමිණියාහ.

**එතෙ බුද්ධං උපාගඤ්ජුං** – 'එතෙ' යනු: පාරායන සමාගමයෙහි වූ සොළොස් බමුණෝ යි. බුද්ධො යනු: යම් ඒ භාග්‍යවත් කෙනෙක් තුමූ මැ සර්වඥ වූවාහු ආචාර්‍යයකු නැති වැ පෙර නො ඇසූවිරූ දහම්හි තුමූ මැ සිව්සස් අවබොධ කළාහු ද, ඒ සත්‍යයන්හි දු සර්වඥ බවට පැමිණියාහු ද බල ධර්මයන්හි දු වශීභාවයට පැමිණියාහු ද ඕහු යැ. බුද්ධ යනු: කවර අරුතින් බුද්ධ නම් වී ද යත්: සිව්සස් අවබෝධ කෙළේ නුයි 'බුද්ධ' යැ, ප්‍රජාවට අවබෝධ කරවනුයේ නුයි 'බුද්ධ' යැ, සර්වඥ බැවින් 'බුද්ධ' යැ, සියල්ල දක්නා හෙයින් 'බුද්ධ' යැ, අනෙකක්හු විසින් අවබොධ නො කැරැවිය යුතු හෙයින් 'බුද්ධ' යැ, විවිධ ගුණ පහළ කරන හෙයින් 'බුද්ධ' යැ, ක්ෂීණාස්‍රවසංඛ්‍යායෙන් 'බුද්ධ' යැ නිරුපක්ලෙශ සංඛ්‍යායෙන් 'බුද්ධය' යැ, ඒකාන්තයෙන් වීතරාග නුයි 'බුද්ධ' යැ, ඒකාන්තයෙන් වීතද්වේෂ නුයි 'බුද්ධ' යැ, ඒකාන්තයෙන් වීතමෝහ නුයි 'බුද්ධ' යැ, ඒකාන්තයෙන් කෙලෙස් රහිත නුයි 'බුද්ධ' යැ, ඒකායනමාර්ගයට ගියේ නුයි 'බුද්ධ' යැ, එකලා වැ අනුත්තර වූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළේ නුයි 'බුද්ධ' යැ, අබුද්ධිය නැසූ බැවින් බුද්ධිප්‍රතිලාභය හේතු කොට ගෙන 'බුද්ධ' යැ, බුද්ධ යන තෙල නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑයකු විසින් නො කරන ලද, බූනක විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරන ලද, නෑසහලේ නෑයන් විසින් නොකරන ලද, මහණ බමුණන් විසින් නො– කරන ලද, දෙවියන් විසින් නො කරන ලද. භාග්‍යවත් බුදුවරයනට යම් 'බුද්ධ' යන නාමයෙක වේ නම් අර්හත්ඵලයාගේ අන්තයෙහි උපන් තෙල නාමය මහබෝමැඩ දී සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකි. **එතෙ බුද්ධං උපාගඤ්ජු** යනු: තුලුහු බුදුන් කරා පැමිණියහ. එළැඹියහ පර්‍යුපාසන කළහ (සමීපයෙහි හුන්හ) පැන පුළුවුත්හ තුලනය කළාහු නුයි 'එතෙ බුද්ධං උපාගඤ්ජුං' යනු වේ.

සම්පන්නචරණං ඉසින්ති: චරණං වුච්චති සීලපාරමිප්පත්ති,[1] සීලසංවරොපි චරණං, ඉන්ද්‍රියසංවරොපි චරණං, භොජනෙ මත්තඤ්ඤුතාපි චරණං, ජාගරියානුයොගොපි චරණං, සත්තපි සද්ධම්මා චරණං චත්තාරිපි ඣානානි චරණං, සම්පන්නචරණන්ති: සම්පන්නචරණං සෙට්ඨචරණං විසෙට්ඨචරණං පාමොක්ඛචරණං උත්තමචරණං පවරචරණං. ඉසීති: ඉසි භගවා, මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති ඉසි -පෙ- මහෙසක්ඛෙහි වා සත්තෙහි එසිතො, ගවෙසිතො, පරියෙසිතො 'කහං බුද්ධො කහං භගවා කහං දෙවදෙවො කහං නරාසභොති ඉසීති 'සම්පන්නචරණං ඉසිං'.

පුච්ඡන්තා නිපුණෙ පඤ්හෙති: 'පුච්ඡන්තා'ති පුච්ඡන්තා යාචන්තා අජ්ඣෙසන්තා පසාදෙන්තා. නිපුණෙ පඤ්හෙති: ගම්භීරෙ දුද්දසෙ දුරනුබොධෙ සන්තෙ පණීතෙ අතක්කාවචරෙ නිපුණෙ පණ්ඩිතවෙදනීයෙ පඤ්හෙති 'පුච්ඡන්තා නිපුණෙ පඤ්හෙ.'

බුද්ධං සෙට්ඨං උපාගමුන්ති: 'බුද්ධො'ති "යො සො භගවා -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධො"ති. සෙට්ඨන්ති: අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං බුද්ධසෙට්ඨං. උපාගමුන්ති: උපාගමිංසු උපසඞ්කමිංසු පයිරුපාසිංසු පරිපුච්ඡිංසු පරිපඤ්හිංසූති 'බුද්ධසෙට්ඨං උපාගමුං'.

තෙනෙතං වුච්චති:

"එතෙ බුද්ධං උපාගඤ්ඡුං සම්පන්නචරණං ඉසිං
පුච්ඡන්තා නිපුණෙ පඤ්හෙ බුද්ධසෙට්ඨං උපාගමු"න්ති.

4.

තෙසං බුද්ධො බ්‍යාකාසි[2] පඤ්හෙ[3] පුට්ඨො යථා තථං
පඤ්හානං වෙය්‍යාකරණෙන තොසෙසි බ්‍රාහ්මණෙ මුනි.

තෙසං බුද්ධො බ්‍යාකාසීති: 'තෙස'න්ති සොළසන්නං[4] පාරායනියානං බ්‍රාහ්මණානං. බුද්ධොති: යො "සො භගවා -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධො"ති. බ්‍යාකාසීති තෙසං බුද්ධො බ්‍යාකාසි ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානී අකාසි පකාසෙසීති "තෙසං බුද්ධො බ්‍යාකාසි"

---

1. සීලාචාරනිබ්බත්ති-ම ජ සං
2. පබ්‍යාකාසි-ම ජ සං
3. පඤ්හං -ම ජ සං
4. සොළසානං -ම ජ සං

**සම්පන්න චරණං ඉසිං** — 'චරණ' යි ශීලපාරමීප්‍රාප්තිය කියනු ලැබෙයි: ශීල සංවරය ද චරණ යැ ඉන්ද්‍රිය සංවරය ද චරණ යැ භොජනයෙහි මාත්‍රඥතාව ද චරණ යැ ජාගර්‍ය්‍යානුයොගය ද චරණ යැ (ශ්‍රද්ධාදි) සප්ත ධර්මයෝ ද චරණ යැ සතර ධ්‍යානයෝ ද චරණ යි. **සම්පන්න චරණං** යනු: සමෘද්ධ වූ (ශීලාදි) චරණ ඇති ශ්‍රෙෂ්ඨ චරණ ඇති ජ්‍යෙෂ්ඨ චරණ ඇති ප්‍රමුඛචරණ ඇති උත්තමචරණ ඇති ප්‍රවරචරණ ඇති. **ඉසි** යනු: බුදුහු ස්‍වාමිහ, මහත් වූ ශීලස්කන්ධය එෂණ ගවෙෂණ පර්‍ය්‍යෙෂණ කළාහු නුයි ස්‍වාමිහ . . . මහායශස්ක සත්ත්වයන් විසින් හෝ බුදුහු කොහි යැ, භාග්‍යවත්හු කොහි යැ, දෙවදෙවයෝ කොහි යැ, නරශ්‍රෙෂ්ඨයෝ කොහි යැ'යි එෂණ ගවේෂණ පර්‍ය්‍යෙෂණ කරන ලද්ද හු නුයි ස්‍වාමි නම් වේත් නුයි 'සම්පන්න චරණං ඉසිං' යනු වේ.

**පුච්ඡන්තා නිපුණෙ පඤ්හෙ** — 'පුච්ඡන්තා' යනු: පුළුවුස්නාහු යදනාහු අධ්‍යෙෂණ කරන්නාහු පහදවන්නෑහු. **නිපුණෙ පඤ්හෙ** යනු: ගැඹුරු වූ දුකසේ දක්ක යුතු වූ දුකසේ අවබොධ කටයුතු වූ ශාන්ත වූ ප්‍රණීත වූ තර්කාවචර (තර්කයෙන් නො බැසගත යුතු වූ) සියුම් වූ පණ්ඩිතයන් විසින් දත යුතු වූ ප්‍රශ්නය නු යි 'පුච්ඡන්තා නිපුණෙ පඤ්හෙ' යනු වේ.

**බුද්ධසෙට්ඨං උපාගමුං** — 'බුද්ධො' යනු: යම් භාග්‍යවත් කෙනෙක් . . . මේ 'බුද්ධ' යනු සාක්ෂාත් ප්‍රඥප්තියකි. **සෙට්ඨං** යනු: අග්‍ර වූ ශ්‍රෙෂ්ඨ වූ ජ්‍යෙෂ්ඨ වූ ප්‍රමුඛ වූ උත්තම වූ ප්‍රවර වූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් කරා. **උපාගමුං** යනු: සමීපයට පැමිණියහ එළැඹියහ පර්‍ය්‍යුපාසන කළහ. පැන පුළුවුත්හ තුලනය කළාහු නුයි 'බුද්ධ සෙට්ඨං උපාගමුං' යනු වේ.

එයින් තෙල කියනු ලැබෙයි:

"එතෙ බුද්ධං – පෙ – බුද්ධසෙට්ඨං උපාගමුං" යි.

**4.**

පැන පුළුවුස්නා ලද බුදුහු ඔවුනට ඇති සැටියෙන් ප්‍රකාශ කළහ. සර්වඥ මුනිහු පැන විසඳීමෙන් බමුණන් තුටු කළහ.

**තෙසං බුද්ධො බ්‍යාකාසි** – 'තෙසං' යනු: පාරායන සමාගමයෙහි වූ සොළොස් බමුණනට. **බුද්ධො** යනු: යම් භාග්‍යවත් කෙනෙක් . . . මේ 'බුද්ධ' යන නාමය සාක්ෂාත් ප්‍රඥප්තියකි. **බ්‍යාකාසි** යනු: ඔවුනට බුදුහු විවරණ කළහ. වදළහ දෙසූහ පැනෑවූහ පිහිටුවූහ විවෘත කළහ විභාග කළහ පාළ කළහ ප්‍රකාශ කළාහු නුයි 'තෙසං බුද්ධො බ්‍යාකාසි' යනු වේ.

**පඤ්හ පුට්ඨො යථාතථන්ති:** 'පඤ්හ පුට්ඨො'ති පඤ්හං පුට්ඨො, පුච්ඡිතො යාචිතො අජ්ඣෙසිතො පසාදිතො. **යථාතථන්ති:** යථා ආචික්ඛිතබ්බං තථා ආචික්ඛි, යථා දෙසිතබ්බං තථා දෙසෙසි, යථා පඤ්ඤපෙතබ්බං තථා පඤ්ඤපෙසි, යථා පට්ඨපෙතබ්බං තථා පට්ඨපෙසි, යථා විවරිතබ්බං තථා විවරි, යථා විභජිතබ්බං තථා විභජි, යථා උත්තානීකාතබ්බං තථා උත්තානීඅකාසි, යථා පකාසෙසිතබ්බං තථා පකාසෙසීති 'පඤ්හ පුට්ඨො[1] යථා තථං.'

**පඤ්හානං වෙය්‍යාකරණෙනාති:** පඤ්හානං වෙය්‍යාකරණෙන ආචික්ඛනෙන දෙසනෙන[2] පඤ්ඤපනෙන පට්ඨපනෙන විවරණෙන විභජනෙන උත්තානීකම්මෙන පකාසනෙනාති පඤ්හානං වෙය්‍යාකරණෙන'.

**තොසෙසි බ්‍රාහ්මණෙ මුනීති** 'තොසෙසී'ති තොසෙසි විතොසෙසි පසාදෙසි ආරාධෙසි අත්තමනෙ අකාසි. **බ්‍රාහ්මණෙති:** සොළස පාරායනියෙ බ්‍රාහ්මණෙ. **මුනීති:** 'මොනං' වුච්චති ඤාණං -පෙ- සංගජාලමතිච්ච සො මුනීති 'තොසෙසි බ්‍රාහ්මණෙ මුනි'.

**තෙනෙතං වුච්චති:**

"තෙසං බුද්ධො බ්‍යාකාසි පඤ්හ පුට්ඨො[1] යථා තථං
පඤ්හානං වෙය්‍යාකරණෙන තොසෙසි බ්‍රාහ්මණෙ මුනී"ති,

5

තෙ තොසිතා චක්ඛුමතා බුද්ධෙනාදිච්චබන්ධුනා
බ්‍රහ්මචරියමචරිංසු වරපඤ්ඤස්ස සන්තිකෙ.

**තෙ තොසිතා චක්ඛුමතාති:** 'තෙ'ති සොළසපාරායනියා බ්‍රාහ්මණා. **තොසිතාති** තොසිතා විතොසිතා පසාදිතා ආරාධිතා අත්තමනා කතාති 'තෙ තොසිතා.' **චක්ඛුමතාති:** භගවා පඤ්චහි චක්ඛූහි චක්ඛුමා. මංසචක්ඛුනාපි චක්ඛුමා, දිබ්බචක්ඛුනාපි චක්ඛුමා -පෙ- භගවා සමන්තචක්ඛුනාපි චක්ඛුමාති 'තෙ තොසිතා චක්ඛුමතා'.

**බුද්ධෙනාදිච්චබන්ධුනාති** 'බුද්ධො'ති යො සො භගවා -පෙ- සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධොති. **ආදිච්චබන්ධුනාති:** 'ආදිච්චො' වුච්චති සූරියො සො ගොතමො ගොත්තෙන භගවාපි ගොතමො ගොත්තෙන, භගවා සූරියස්ස ගොත්තඤාතකො[3] ගොත්තබන්ධු, තස්මා බුද්ධො ආදිච්චබන්ධූති බුද්ධෙනාදිච්චබන්ධුනා.

1. පඤ්හං -ම ජ සං
2. දස්සනෙන-ච වි ක
3. ගොත්තං ඤාතකො-පත

**පඤ්හ පුට්ඨො යථාතථං** — 'පඤ්හ පුට්ඨො' යනු: ප්‍රශ්නයන් පුළුවුස්නා ලද්දාහු විචාරන ලද්දාහු අයදනා ලද්දාහු අධ්‍යෙෂණ කරන ලද්දාහු පහදවන ලද්දාහු. **යථා තථං** යනු: යම්සේ වදාළ යුතු නම් එසේ වදාළහ, යම්සේ දෙසිය යුතු නම් එසේ දෙසූහ, යම්සේ පැනැවිය යුතු නම් එසේ පැනැවූහ, යම්සේ පිහිටුවිය යුතු නම් එසේ පිහිටුවූහ, යම්සේ විවෘත කළ යුතු නම් එසේ විවෘත කළහ, යම් සේ විභාග කළ යුතු නම් එසේ විභාග කළහ, යම්සේ පැළ කළ යුතු නම් එසේ පාළ කළහ, යම්සේ ප්‍රකාශ කළ යුතු නම් එසේ ප්‍රකාශ කළාහු නුයි 'පඤ්හ පුට්ඨො යථා තථං' යනු වේ.

**පඤ්හානං වෙය්‍යාකරණෙන** යනු: පැන විසඳීමෙන් පැවැසීමෙන් දෙසීමෙන් පැනැවීමෙන් පිහිටුවීමෙන් විවෘත කිරීමෙන් විභාග කිරීමෙන් පාළ කිරීමෙන් ප්‍රකාශ කිරීමෙනැ' යි 'පඤ්හානං වෙය්‍යාකරණෙන' යනු වේ.

**තොසෙසි බ්‍රාහ්මණෙ මුනි** — 'තොසෙසි' යනු: තුටු කළහ, විවිධාකාරයෙන් තුටු කළහ, පැහැද වූහ, සිද්ධියට පැමිණවූහ, සියමන ඇතියන් කළහ. බ්‍රාහ්මණෙ යනු: පාරායණ සමාගමයෙහි වූ බ්‍රාහ්මණයන්. මුනි— 'මොන' යි ඥානය කියනු ලැබෙයි . . . රාගාදි සඞ්ගය හා තෘෂ්ණා දෘෂ්ටිජාලය ඉක්ම සිටි හේ 'මුනි' නම් වේ නුයි 'තොසෙසි බ්‍රාහ්මණෙ මුනි' යනු වේ.

එයින් තෙල කියනු ලැබෙයි:

**"තෙසං බුද්ධො බ්‍යාකාසි –පෙ– තොසෙසි බ්‍රාහ්මණෙ මුනි" යි.**

**5.**

ඔහු පසැස් ඇති සූර්‍ය්‍ය බන්ධු වූ බුදුරජුන් විසින් තුටු කරන ලද්දාහු උත්තම ප්‍රාඥ වූ සර්වඥයන් වහන්සේ වෙත බඹසරවස් වූසූහ.

**තෙ තොසිතා චක්ඛුමතා** — 'තෙ' යනු: පාරායණසමාගමයෙහි වූ සොළොස් බමුණෝහු යැ. **තොසිතා** යනු: තුටු කරන ලද්දාහු විවිධාකාරයෙන් තුටු කරන ලද්දාහු පහදවන ලද්දාහු සිද්ධියට පමුණුවන ලද්දාහු (සොම්නස් විසින්) සියමන ඇතියන් කරන ලද්දාහු නුයි 'තෙ තොසිතා' යනු වේ. **චක්ඛුමතා** යනු: බුදුහු පසැසින් චක්ඛුර්මත්හ: මසැසිනුදු චක්ඛුර්මත්හ, දිවැසිනුදු චක්ඛුර්මත්හ . . . බුදුහු සමතැසිනුදු චක්ඛුර්මත්හ' යි 'තෙ තොසිතා චක්ඛුමතා' යනු වේ.

**බුද්ධෙනාදිච්චබන්ධුනා** — 'බුද්ධ' යනු: යම් භාග්‍යවත් කෙනෙක් . . . මේ 'බුද්ධ' යනු සාක්ෂාත් ප්‍රඥප්තියකි. **ආදිච්චබන්ධුනා** — 'ආදිච්ච' යි සූර්‍ය්‍යයා කියනු ලැබෙයි. හේ ගොත්‍රයෙන් ගෞතම යැ. බුදුහු ද ගොත්‍රයෙන් ගෞතම යැ බුදුහු සූර්‍ය්‍යහට ගොත්‍රයෙන් ඥාතිහ ගොත්‍රයෙන් බන්ධුහ එයින් බුදුහු 'ආදිත්‍ය බන්ධු නම් වෙති' 'බුද්ධෙනා දිච්ච බන්ධුනා' යනු වේ.

බ්‍රහ්මචරියමචරිංසූති 'බ්‍රහ්මචරියං' වුච්චති අසද්ධම්මසමාපත්තියා ආරති විරති පටිවිරති වෙරමණී විරමණා[1] අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො. අපිච නිප්පරියාය වසෙන බ්‍රහ්මචරියා වුච්චති අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං. සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. බ්‍රහ්මචරියමචරිංසූති බ්‍රහ්මචරියං ආචරිංසු[2] සමාදායවත්තිංසූති 'බ්‍රහ්මචරිය මචරිංසු.'

වරපඤ්ඤස්ස සන්තිකෙති: වරපඤ්ඤස්ස අග්ගපඤ්ඤස්ස සෙට්ඨපඤ්ඤස්ස විසෙට්ඨපඤ්ඤස්ස පාමොක්ඛපඤ්ඤස්ස උත්තමපඤ්ඤස්ස පවරපඤ්ඤස්ස. සන්තිකෙති: සන්තිකෙ සාමන්තා ආසන්නෙ අවිදූරෙ උපකට්ඨෙති වරපඤ්ඤස්ස සන්තිකෙ.

තෙනෙතං වුච්චති:

"තෙ තොසිතා චක්ඛුමතා බුද්ධෙනාදිච්ච බන්ධුනා
බ්‍රහ්මචරියමචරිංසු වරපඤ්ඤස්ස සන්තිකෙ"ති.

6.

එකමෙකස්ස පඤ්හස්ස යථා බුද්ධෙන දෙසිතං
තථා යො පටිපජ්ජෙය්‍ය ගච්ඡෙ පාරං අපාරතො[3].

එකමෙකස්ස පඤ්හස්සාති: එකමෙකස්ස අජිතපඤ්හස්ස එකමෙකස්ස තිස්සමෙත්තෙය්‍ය පඤ්හස්ස – පෙ – එකමෙකස්ස පිඞ්ගියපඤ්හස්සාති 'එකමෙකස්ස පඤ්හස්ස'.

යථා බුද්ධෙන දෙසිතන්ති: බුද්ධො'ති යො සො භගවා සයම්භූ – පෙ – සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධො'ති. යථා බුද්ධෙන දෙසිතන්ති: යථා බුද්ධෙන ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවරිතං විභජිතං[4] උත්තානීකතං පකාසිතන්ති යථා බුද්ධෙන දෙසිතං.

තථා යො පටිපජ්ජෙය්‍යාති: සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං පටිපජ්ජෙය්‍යාති තථා යො පටිපජ්ජෙය්‍ය.

1. විරමණං මජසං
2. අචරිංසු–මජසං
3. අපාරගො–පත
4. විභත්තං–ස්‍යා

**බ්‍රහ්මචරියමචරිංසු** — 'බ්‍රහ්මචරිය' යි අසද්ධර්ම සමාපත්තියෙන් දුරුවීම වෙන්වීම සර්වාකාරයෙන් වෙන්වීම, විරමණභාවය, විරමණය, නොකිරීම, අකරණය, ඊට නො පැමිණීම, මර්‍යාද නො ඉක්මවීම, සේතු නැසීම කියනු ලැබෙයි. තවද නිෂ්පර්‍යාය විසින් 'බ්‍රහ්මචරිය' යි ආර්‍ය අෂ්ටාංගික මාර්ගය කියනු ලැබෙයි. හේ මෙසේයි: සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සංකල්ප යැ සම්‍යග් වචන යැ සම්‍යක් කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක් ස්මෘති යැ සම්‍යක් සමාධි යි. **බ්‍රහ්මචරියමචරිංසු** යනු: බ්‍රහ්මචර්‍යායෙහි හැසුරුණහ වෙසෙසින් හැසුරුණහ මොනොවට ගෙන පැවැත්තාහු නුයි 'බ්‍රහ්මචරියමචරිංසු' යනු වේ.

**වරපඤ්ඤස්ස සන්තිකෙ** යනු: උතුම් ප්‍රඥා ඇතියහුගේ අග්‍රප්‍රඥ ඇතියහු ගේ ශ්‍රෙෂ්ඨප්‍රඥා ඇතියහුගේ ජ්‍යෙෂ්ඨප්‍රඥා ඇතියහු ගේ අධිකප්‍රඥ ඇතියහුගේ උත්තමප්‍රඥා ඇතියහුගේ ප්‍රවර ප්‍රඥා ඇතියහුගේ. **සන්තිකෙ** යනු: සමීපයෙහි වෙතැ ආසන්නයෙහි නුදුරෙහි ඉතා ළඟැ නුයි 'වරපඤ්ඤස්ස සන්තිකෙ' යනු වේ.

එයින් තෙල කියනු ලැබෙයි:

**"තෙ තොසිතා චක්ඛුමතා –පෙ– වරපඤ්ඤස්ස සන්තිකෙ"** යී.

6.

එකෙකි පැනයට යම්සේ බුදුරදුන් විසින් වදළ විසැඳුම් වේ ද, යමෙක් එසේ පිළිපදනේ නම් හෙතෙම අපාර සංඛ්‍යාත සසරින් පරතෙරට යන්නේ යැ.

**එකමෙකස්ස පඤ්හස්ස** යනු: එකෙකි අජිත පැනයට එකෙකි තිස්සමෙත්තෙය්‍ය පැනයට . . . එකෙකි පිඞ්ගිය පැනයට නුයි 'එකමෙකස්ස පඤ්හස්ස' යනු වේ.

**යථා බුද්ධෙන දෙසිතං** — 'බුද්ධ' යනු: යම් භාග්‍යවත් කෙනෙක් ස්වයම්භූ වෙත් ද . . . මෙ 'බුද්ධ' යනු: බෝමුල්හි අර්හත්ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියකි. **යථා බුද්ධෙන දෙසිතං** යනු: යම්සේ බුදුන් විසින් වදරන ලද ද, දෙසන ලද ද, පනවන ලද ද, තබන ලද ද, විවෘත කරන ලද ද, විභාග කරන ලද ද, පාළ කරන ලද ද, ප්‍රකාශ කරන ලද දැයි 'යථා බුද්ධෙන දෙසිතං' යනුවේ.

**තථා යො පටිපජ්ජෙය්‍ය** යනු: සම්‍යක් ප්‍රතිපදව අනුලොමප්‍රතිපදව අවිරුද්ධප්‍රතිපදව අන්වර්ථ ප්‍රතිපදව ධර්මානුධර්මප්‍රතිපදව පිළිපදනෙ නම් නුයි 'තථා යො පටිපජ්ජෙය්‍යා' යනු වේ.

**ගච්ඡෙ පාරං අපාරතොති:** පාරං වුච්චති අමතං නිබ්බානං – පෙ – නිරොධො නිබ්බානං. 'අපාරං' වුච්චති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච. ගච්ඡෙ පාරං අපාරතොති: අපාරතො පාරං ගච්ඡෙය්‍ය පාරං අධිගච්ඡෙය්‍ය පාරං ඵස්සෙය්‍ය පාරං සච්ඡිකරෙය්‍යාති 'ගච්ඡෙ පාරං අපාරතො.'

තෙනෙතං වුච්චති:

"එකමෙකස්ස පඤ්හස්ස යථා බුද්ධෙන දෙසිතං
යථා යො පටිපජ්ජෙය්‍ය ගච්ඡෙ පාරං අපාරතො"ති.

7.

අපාරා පාරං ගච්ඡෙය්‍ය භාවෙන්තො මග්ගමුත්තමං
මග්ගො සො පාරං ගමනාය තස්මා පාරායනං ඉති

**අපාරා පාරං ගච්ඡෙය්‍යාති:** 'අපාරං' වුච්චති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච 'පාරං' වුච්චති. අමතං නිබ්බානං –පෙ– තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. **අපාරා පාරං ගච්ඡෙය්‍යාති:** අපාරා පාරං ගච්ඡෙය්‍ය, පාරං අධිගච්ඡෙය්‍ය, පාරං ඵස්සෙය්‍ය, පාරං සච්ඡිකරෙය්‍යාති 'අපාරා පාරං ගච්ඡෙය්‍ය.'

**භාවෙන්තො මග්ගමුත්තමන්ති:** 'මග්ගමුත්තමං' වුච්චති අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං; සම්මාදිට්ඨි –පෙ– සම්මා සමාධි. මග්ගමුත්තමන්ති: මග්ගං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං. භාවෙන්තොති: භාවෙන්තො ආසෙවන්තො බහුලීකරොන්තොති 'භාවෙන්තො මග්ගමුත්තමං'.

**මග්ගො සො පාරං ගමනායාති.**

1. මග්ගො පන්ථො පථො පජ්ජො[1] අඤ්ජසං වටුමායනං
නාවා උත්තරසෙතු ච කුල්ලො ච භිසි සඞ්කමො.[2]

**පාරං ගමනායාති:** පාරං ගමනාය පාරං සම්පාපනාය පාරං සමනුපාපනාය ජරාමරණස්ස තරණායාති 'මග්ගො සො පාරං ගමනාය.'

**තස්මා පාරායනං ඉතීති:** 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා. 'පාරං' වුච්චති අමතං නිබ්බානං –පෙ– නිරොධො නිබ්බානං. 'අයනං' වුච්චති මග්ගො, ඉතීති පදසන්ධි –පෙ– පදානුපුබ්බතාපෙතං ඉතී'ති. 'තස්මා පාරායනං 'ඉති'.

තෙනෙතං වුච්චති:

"අපාරා පාරං ගච්ඡෙය්‍ය භාවෙන්තො මග්ගමුත්තමං
මග්ගො සො පාරං ගමනාය තස්මා පරායනං ඉතීති.

---

1. පථො අද්ධා–ච, වි
2. උත්තරසෙතු පකුල්ලො සඞ්කමො–[illegible]

**ගවෙජ පාරං අපාරතො** — 'පාර' යි අමාමහනිවන කියනු ලැබෙයි: ... නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. 'අපාර' යි ක්ලේශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද කියනු ලැබෙති. **ගවෙජ පාරං අපාරතො** යනු: අපාරයෙන් පාරයට යන්නේ යැ පාරයට පැමිණෙන්නේ යැ පාරය ස්පර්ශ කරන්නේ යැ පාරය ප්‍රත්‍යක්ෂ කරන්නේනුයි 'ගවෙජ පාරං අපාරතො' යනු වේ.

එයින් තෙල කියනු ලැබෙයි:

**''එකමෙකසස පඤ්හසස -පෙ- ගවෙජ පාරං අපාරතො''** යි.

7.

උතුම් වූ ආය්‍යීමාර්ගය වඩනුයේ අපාර සංඛ්‍යාත සසරින් පරතෙරට යන්නේ යැ පාරගමනයට හේ මාර්ග වෙයි. එහෙයින් 'පාරායණ නම් වී යයි.

**අපාරා පාරං ගවෙජයා** — 'අපාර' යි ක්ලෙශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද කියනු ලැබෙති. 'පාර' යි අමාමහනිවන කියනු ලැබෙයි: ... තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. **අපාරා පාරං ගවෙජයා** යනු: අපාරයෙන් පාරයට යන්නේ යැ පාරයට පැමිණෙන්නේ යැ පාරය පහසන්නේ යැ පාරය ප්‍රත්‍යක්ෂ කරන්නේ නුයි 'අපාරා පාරං ගවේජයා' යනු වේ.

**භාවෙනතා මගගමුතතමං** — 'මග්ගමුත්තමං' (උත්තමමාර්ග) යි ආය්‍යී අෂ්ටාංගිකමාර්ගය කියනු ලැබෙයි. හෙ මෙසේයි. සම්‍යග්දෘෂ්ටි යැ ... සම්‍යක් සමාධි යි. **මග්ගමුත්තමං** යනු: අග්‍ර මාර්ග යැ ශ්‍රේෂ්ඨ ජ්‍යෙෂ්ඨ ප්‍රමුඛ උත්තම ප්‍රවර මාර්ගය. **භාවෙනතා** යනු: වඩනුයේ සෙවුනේ බහුල කරනුයේ නුයි 'භාවෙනතා මග්ගමුත්තමං' යනු වේ.

**මගෙගා සො පාරං ගමනාය** යනු:

1. මග්ග යැ පන්ථ යැ පථ යැ පජ්ජ යැ අඤ්ජසය යැ වටුම යැ අයන යැ නාවා යැ උත්තරසෙතු යැ කුල්ල යැ භිසි යැ සඞ්කම යි.

**පාරං ගමනාය** යනු: පාරයට යනු පිණිස පාරයට පැමිණෙනු පිණිස පාරයට මැනැවින් පැමිණෙනු පිණිස ජරාමරණයාගේ තරණය පිණිස නුයි 'මග්ගො සො පාරං ගමනාය' යනු වේ.

**තසමා පාරායනං ඉති** — 'තස්මා' යනු: එයින් එ කරුණින් එ හෙයින් තත්ප්‍රත්‍යයෙන් තන්නිදානයෙන්. 'පාර' යි අමාමහනිවන කියනු ලැබෙයි. .. නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. 'අයන' යි මාර්ගය කියනු ලැබෙයි. ඉති යනු: පද සන්ධි යැ .. තෙල 'ඉති' යනු පදනුපූර්වතා නුයි 'තස්මා පාරායනං ඉති' යනු වේ.

එයින් තෙල කියනු ලැබෙයි:

**''අපාරා පාරං ගවෙජයා -පෙ- තසමා පාරායනං ඉති''** යි.

8.

පාරායනමනුගායිස්සං (ඉච්චායස්මා පිඞ්ගියො)
(යථා අද්දක්ඛි තථා අක්ඛාසි) විමලො භූරි මෙධසො
නික්කාමො නිබ්බනො නාගො කිස්ස හෙතු මුසා භණෙ.

**පාරායනමනුගායිස්සන්ති:** ගීතමනුගායිස්සං කථිතමනුකථයිස්සං,[1] භණිතමනුභණිස්සං, ලපිතමනුලපිස්සං, භාසිතමනුභාසිස්සන්ති 'පාරායන මනුගායිස්සං'.

**ඉච්චායස්මා පිඞ්ගියොති** 'ඉච්චා'ති පදසන්ධි -පෙ- පදානුපුබ්බතාමෙතං 'ඉච්චා'ති. **ආයස්මාති** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සාධිවචනමෙතං 'ආයස්මා'ති. **පිඞ්ගියොති**: තස්ස ථෙරස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපොති 'ඉච්චායස්මා පිඞ්ගියො'.

**යථා අද්දක්ඛි තථා අක්ඛාසීති:** යථා අද්දක්ඛි තථා අක්ඛාසි, ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසි. 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති යථා අද්දක්ඛි තථා අක්ඛාසි ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානී අකාසි පකාසෙසි. 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති -පෙ- 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්ම'න්ති යථා අද්දක්ඛි තථා අක්ඛාසි, ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසීති 'යථා අද්දක්ඛි තථා අක්ඛාසි'.

**විමලො භූරි මෙධසොති:** 'විමලො'ති රාගො මලං, දොසො මලං, මොහො මලං, කොධො- උපනාහො -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරා මලා, තෙ මලා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාව කතා[2] ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො අවලො[3]. විමලො, නිම්මලො, මලාපගතො මලවිප්පහීනො මලවිප්පමුත්තො[4]. සබ්බමලවීති- වත්තො. 'භූරි' වුච්චති. පථවි[5]. භගවා තාය[6]. පථවිසමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතො. 'මෙධා' වුච්චති පඤ්ඤා, "යා පඤ්ඤා පජානනා-පෙ-අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි." භගවා ඉමාය මෙධාය පඤ්ඤාය උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සම්පන්නො[7] සමන්නාගතො තස්මා බුද්ධො සුමෙධසොති 'විමලො භූරි මෙධසො.'

---

1. කථිතමනුගායිස්සං - සයා
2. අනභාවං කතා - ම ඡ සං
3. අමලො බුද්ධො - ම ඡ සං
4. මලවිමුත්තො - ම ඡ සං
5. පථවී - ම ඡ සං
6. භගවා ඉමාය - සයා
7. සමුපපන්නො ම-ඡසං, සයා

8.

ආයුෂ්මත් පිඞගිය (බාවරීහට) මෙසේ පැවැසී:) පාරායණය බුදුන් වදළ සෙයින් කියනෙම්, (බුදුහු) යමසේ (සත්‍යාභිසම්බොධයෙන්) දුටු සේක් නම් එසේ වදළහ, නිර්මල වූ විපුල ප්‍රඥා ඇති ප්‍රහීණ වූ කාම ඇති කෙලෙස් වල් හෝ තෘෂ්ණා විරහිත බුද්ධනාග තෙමේ කුමක් හෙයින් මුසවා කියන්නේ ද?

**පාරායනමනුගායිස්සං** යනු: ගීතය අනුව ගයනෙම් කථිතය අනුව කියනෙම් භණිතය අනුව බණනෙම් ලපිතය අනුව තෙපලනෙම් භාෂිතය අනුව භාෂණය කරනෙම් නුයි 'පාරායනමනුගායිස්සං' යනු වේ.

**ඉච්චායස්මා පිඞගියො** — 'ඉච්චා' යනු: පදසන්ධි යැ . . තෙල 'ඉච්චා' යනු: පදනුපූර්වතා ද වෙයි. ආයස්මා යනු: ප්‍රිය වචන යැ ගරු වචන යැ තෙල 'ආයස්මා' යනුසගෞරව සප්‍රතිශ්‍රය නමෙකි. **පිඞගියො** යනු: ඒ තෙරුන්ගේ නාම යැ සඞ්ඛ්‍යා යැ සමඤ්ඤා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නම යැ නාමකර්මයැ නාමධෙය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප නුයි 'ඉච්චායස්මා පිඞගියො' යනු වේ.

**යථා අද්දක්ඛි තථා අක්ඛාසි** යනු: දුටු පරිදි වදළහ පැවැසූහ දෙසූහ පැනැවූහ තැබූහ විවෘත කළහ විභාග කළහ ප්‍රකට කළහ ප්‍රකාශ කළහ. 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි දුටු පරිදි වදළහ පැවැසූහ දෙසූහ පැනැවූහ තැබූහ විවෘත කළහ විභාග කළහ ප්‍රකට කළහ ප්‍රකාශ කළහ. 'හැම සංස්-කාරයෝ දුක්ඛ'යි . . . 'යම් කිසි සමුදය ධර්මයෙක් ඇත් නම් ඒ හැම නිරොධස්වභාවය ඇතැ'යි දුටු පරිදි වදළහ පැවැසූහ දෙසූහ පැනැවූහ තැබූහ විවරණ කළහ විභාග කළහ ප්‍රකට කළහ ප්‍රකාශ කළාහු නුයි යථා අද්දක්ඛි තථා අක්ඛාසි' යනු වේ.

**විමලො භූරි මෙධසො** — 'විමලො' යනු: රාගය මලයෙක ද්වේෂය මලයෙක මෝහය මලයෙක ක්‍රොධය– උපනාහය . . . . හැම අකුශලාභිසංස්කාරයෝ මලයෝ යි. ඒ මලයෝ භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණයහ මුලසුන් කරනලදහ මුල්උදුළ තල්වත්තක් සෙයින් කරන ලදහ අනුඅභාවය කරන ලදහ (එහෙයින්) ආයතිභවයෙහි නුපදනා පියවි ඇතියහ. එයින් බුදුහු අමලයහ, විමලයහ, නිර්මලයහ, කස වූ මල ඇතියහ, වෙසෙයින් ප්‍රහීණ වූ මල ඇතියහ, මලයෙන් විප්‍රමුක්තයහ, හැම ක්ලේශ මලයන් ඉක්ම වූහ. 'භූරි' යි පෘථිවිය කියනු ලැබෙයි, බුදුහු ඒ පෘථිවි සම වූ විපුල වූ විස්තෘත වූ ප්‍රඥායෙන් සමන්වාගතයහ. **'මෙධා'** යි ප්‍රඥාව කියනු ලැබෙයි, ''යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් . . . අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එය යි. බුදුහු මේ මෙධා සංඛ්‍යාත ප්‍රඥායෙන් යුක්ත වූවාහු සමුපෙත වූවාහු උපගත වූවාහු සමුපගත වූවාහු නො වෙන් වූවාහු පරිපූර්ණ වූවාහු සමන්වාගත වූවාහු වෙති. එයින් බුදුහු 'සුමෙධස' නුයි 'විමලො භූරි මෙධසො' යනු වේ.

නික්කාමො නිබ්බනො නාගොති: 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා, බුද්ධස්ස භගවතො වත්ථුකාමා පරිඤ්ඤාතා කිලෙසකාමා පහීනා, වත්ථුකාමානං පරිඤ්ඤාතත්තා කිලෙසකාමානං පහීනත්තා භගවා න කාමෙ කාමෙති න කාමෙ ඉච්ඡති න කාමෙ පත්ථෙති න කාමෙ පිහෙති න කාමෙ අභිජප්පෙති. යෙ කාමෙ කාමෙන්ති, කාමෙ ඉච්ඡන්ති, කාමෙ පත්ථෙන්ති, කාමෙ පිහෙන්ති, කාමෙ අභිජප්පෙන්ති, තෙ කාමකාමිනො රාගරාගිනො සඤ්ඤසඤ්ඤිනො. භගවා න කාමෙ කාමෙති න කාමෙ ඉච්ඡති, න කාමෙ පත්ථෙති, න කාමෙ පිහෙති, න කාමෙ අභිජප්පෙති, තස්මා බුද්ධො අකාමො නික්කාමො චත්තකාමො වන්තකාමො මුත්තකාමො පහීනකාමො පටිනිස්සට්ඨකාමො, වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො, නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති 'නික්කාමො'. නිබ්බනොති: රාගො වනං, දොසො වනං, මොහො වනං, කොධො වනං, උපනාහො වනං -පෙ- සබ්බාකුසලාභිසංඛාරා වනා. තෙ වනා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො අවනො විවනො නිබ්බනො වනාපගතො වනවිප්පහීනො වනවිප්පමුත්තො[1] සබ්බවනවීතිවත්තොති 'නිබ්බනො'. නාගොති: නාගො භගවා, ආගුං න කරොතීති නාගො, න ගච්ඡතීති නාගො, න ආගච්ඡතීති නාගො -පෙ- එවං භගවා න ආගච්ඡතීති නාගොති' නික්කාමො නිබ්බනො නාගො.

කිස්ස හෙතු මුසා භණෙති: 'කිස්සහෙතූ'ති කිස්ස හෙතු, කිංහෙතු, කිංකාරණා කිංනිදානා, කිංපච්චයාති 'කිස්සහෙතු. මුසා භණෙති මුසා භණෙය්‍ය, කථෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍ය. මුසා භණෙති: මොසවජ්ජං භණෙය්‍ය මුසාවාදං භණෙය්‍ය, අනරියවාදං භණෙය්‍ය, ඉධෙකච්චො සභග්ගතො[2] වා පරිසග්ගතො[3] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො එහම්භො පුරිස, යං ජානාසි තං වදෙහී'ති සො අජානං වා ආහ 'ජානාමී'ති, ජානං වා ආහ 'න ජානාමී'ති, අපස්සං වා ආහ 'පස්සාමී'ති, පස්සං වා ආහ 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසති,[4] ඉදං වුච්චති මොසවජ්ජං,

---

1. වනවිමුත්තො - ම ඡ සං
2. සභාගතො - ම ඡ සං
3. පරිසාගතො - ම ඡ සං
4. මජ්ඣිමනිකාය - සාලෙය්‍යසුත්ත, තිකඞ්ගුත්තර - පුග්ගලවග්ග

**නික්කාමො නිබ්බනො නාගො** — 'කාමා' යනු: විස්තර වශයෙන් වස්තු කාමයෝ ද ක්ලේශකාමයෝ දැයි කාම දෙකෙකි. ... මොහු වස්තුකාමයෝ යි කියනු ලැබෙති ... මොහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත්. භාග්‍යවත් බුදුන් විසින් වස්තුකාමයෝ සාමාන්‍ය ලක්ෂණාවබෝධයෙන් දන්නා ලදහ ක්ලේශකාමයෝ ප්‍රහාණය කරන ලදහ වස්තු කාමයන් පරිඥාත වන බැවින් ක්ලේශකාමයන් ප්‍රහීණ වන බැවින් බුදුහු කාමයන් නො කැමැති වෙති, කාමයන් ඊප්සා නො කෙරෙති, කාමයන් ප්‍රාර්ථනා නො කෙරෙති, කාමයන් පිහායන (මැනැවින් පැතීම) නො කෙරෙති, කාමයන් උදෙසා වාග්භෙද නො කෙරෙත්. යම් කෙනෙක් කාමයන් කැමැති වෙත් ද කාමයන් ඊප්සාකෙරෙත් ද කාමයන් ප්‍රාර්ථනා කෙරෙත් ද කාමයන් පිහායන කෙරෙත් ද කාමයන් උදෙසා වාග්භෙද කෙරෙත් ද, ඔහු කාමකාමීහු රාගරාගීහු සංඥාසංඥීහු වෙති. බුදුහු කාමයන් කැමැති නො වෙති, කාමයන් ඊප්සා නො කෙරෙති, කාමයන් ප්‍රාර්ථනා නො කෙරෙති කාමයන් පිහායන නො කෙරෙති කාමයන් උදෙසා වාග්භෙද නො කෙරෙත්. එයින් බුදුහු අකාමයහ, නිෂ්කාමයහ, ත්‍යක්තකාමයහ, වාන්තකාමයහ, මුක්තකාමයහ, ප්‍රහීණකාමයහ, ප්‍රතිනිසෘෂ්ටකාම (බැහැර කළ කාම ඇති) යහ, වීතරාගයහ, විගතරාගයහ, ත්‍යක්තරාගයහ, වාන්ත රාගයහ, මුක්තරාගයහ, ප්‍රහීණරාගයහ ප්‍රතිනිසෘෂ්ටරාගයහ, තෘෂ්ණා රහිතයහ, නිවියාහ, සිහිල් වූහ, කායික චෛතසික සුව විඳින්නාහු උතුම් පියවි ඇති සිතින් යුතු වැ වාසය කෙරෙත් නුයි 'නික්කාමො' යනු වේ. **නිබ්බනො** යනු: රාගය (වන සදෘශ වන බැවින) වන යැ, ද්වේෂය වන යැ, මොහය වන යැ, ක්‍රොධය වන යැ, බද්ධවෛරය වන යැ ... හැම අකුශලාභිසංස්කාරයෝ වනයෝ යි. ඒ වනයෝ භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණයහ, උඬුන්මුල් ඇතියහ, හිස්සුන් තල්රුකක් සෙයින් අවස්තුක කරන ලදහ, අනුඅභාවය කරන ලදහ, ආයතිභවයෙහි නූපදනා පියවි ඇතියහ. එයින් බුදුහු වන රහිතයහ පහවූ වන ඇතියහ නිර්වණයහ වනයෙන් පහවූහ වන විප්‍රහීණයහ වන විප්‍රමුක්තයහ හැම වනයන් ඉක්මවූහ නුයි නිබ්බනො යනු වේ. **නාගො** යනු: බුදුහු නාගයහ පව් නො කෙරෙත් නුයි නාගයහ (අගතියට) නො යෙත් නුයි නාගයහ (පුහුන් කෙලෙසුන් කරා) නො එත් නුයි නාගයහ ... මෙසෙයින් බුදුහු නොඑත් නුයි නාගයහ' යි 'නික්කාමො නිබ්බනො නාගො' යනු වේ.

**කිසස හෙතු මුසා භණෙ** — 'කිස්ස හෙතු' යනු: කවර හෙයින් කුමක් හෙයින් කවර කරුණින් කුමක් නිදානකොට කුමක් ප්‍රත්‍යය කොට නුයි 'කිස්ස හෙතු' යනු වේ. **මුසා භණෙ** යනු: මුසවා බෙණෙන්නේ ද කියන්නේ ද පවසන්නේ ද වහරන්නේ ද, **මුසා භණෙ** යනු: මුසාබස් බෙණෙන්නේ ද මුසවා බෙණෙන්නේ ද අනාර්‍යවචන බෙණෙන්නේ ද ''මෙලොවැ කිසිවෙක් සභායෙහි සිටියේ හෝ ගම්සභායෙහි සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ සේනා මැද සිටියෙ හෝ රදෙල් මැද සිටියේ හෝ සාක්ෂියට කැඳවන ලදුයේ 'එව එම්බා පුරුෂය, දන්නා දැය කිය' යි සාක්ෂි අසන ලදුයේ හෝ නො දන්නේ මැ 'දනිමි' කියයි, දන්නේ මැ 'නො දනිමි' කියයි, නො දක්නේ මැ 'දක්මි' කියයි, දක්නේ මැ 'නො දක්මි' කියයි. මෙසේ තමා නිසා හෝ මෙරමා නිසා හෝ මඳවූ අල්ලසක් නිසා හෝ දැන දැන බොරු කියයි. මෙ 'මොසවජ්ජ' යි කියනු ලැබෙයි.

අපිච තීහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති භණන්තස්ස හොති 'මුසා භණාමී'ති භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති: ඉමෙහි තීහාකාරෙහි මුසාවාදො හොති. අපිච චතූහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති භණන්තස්ස හොති 'මූසා භණාමී'ති භණිතස්ස හොති 'මූසා මයා භණිත'න්ති විනිධාය දිට්ඨිං. ඉමෙහි චතූහාකාරෙහි මුසාවාදො හොති.

අපිච පඤ්චහාකාරෙහි– ඡහාකාරෙහි– සත්තහාකාරෙහි– අට්ඨහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්සන්ති භණන්තස්ස හොති: 'මුසා භණාමී'ති භණිතස්ස හොති 'මුසා මය භණිත'න්ති, විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං විනිධාය රුචිං විනිධාය සඤ්ඤං විනිධාය භාවං. ඉමෙහි අට්ඨහාකාරෙහි මුසාවාදො හොති කිස්ස හෙතු මුසා භණෙති කිස්ස හෙතු මුසා භණෙය්‍ය කථෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍යාති 'කිස්ස හෙතු මුසා භණෙ':

තෙනාහ ථෙරො පිඞ්ගියො:

පාරායනමනුගායිස්සං (ඉච්චායස්මා පිඞ්ගියො)
(යථා අද්දක්ඛි තථා අක්ඛාසි) විමලො භූරි මෙධසො
නික්කාමො නිබ්බනො නාගො කිස්ස හෙතු මුසා භණෙ''ති.

9.

පහීනමලමොහස්ස මානමක්ඛප්පහායිනො
හන්දහං කිත්තයිස්සාමි ගිරං වණ්ණූපසංහිතං.

පහීනමලමොහස්සාති 'මල'න්ති: රාගො මලං, දොසො මලං, මොහො මලං, මානො මලං, දිට්ඨි මලං, කිලෙසො මලං, සබ්බදුච්චරිතං මලං, සබ්බභවගාමිකම්මං මලං, මොහොති, ''යං දුක්ඛෙ අඤ්ඤාණං –පෙ– අවිජ්ජාලඞ්ගි මොහො අකුසලමූලං, අයං වුච්චති මොහො. මලඤ්ච මොහො ච බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා බුද්ධො පහීනමලමොහොති 'පහීනමල මොහස්ස'.

මානමක්ඛප්පහායිනොති 'මානො'ති එකවිධෙන මානො: යා චිත්තස්ස උන්නති.

දුවිධෙන මානො: අත්තුක්කංසනමානො පරවම්භනමානො.

තිවිධෙන මානො: 'සෙය්‍යොහමස්මී'ති මානො, සදිසො හමස්මී'ති මානො, 'හීනො හමස්මී'ති මානො.

තවද තුන් අයුරෙකින් මෘෂාවාදය වෙයි: පළමු මැ ඔහුට බොරුවක් කියන්නෙමි සිත වෙයි, කියන්නාහට මුසවා බෙණෙමි සිත වෙයි, කිවහුට මුසවා මා විසින් කියනලද්' යි සිත වෙයි. මෙ තුන් අයුරින් මෘෂාවාද වේ. තවද සතර අයුරෙකින් මෘෂාවාද වෙයි: පළමු මැ ඔහුට මුසවා බණන්නෙමි සිත වෙයි, කියන්නාහට මුසවා බෙණෙමි සිත වෙයි, කිවහුට මුසවා මා විසින් කියන ලද්' යි සිත වෙයි, ලබ්ධිය සඟවාගෙන කියයි. මෙ සතර අයුරින් මෘෂාවාද වේ.

තවද පස් අයුරෙකින් — සය අයුරෙකින්—සත් අයුරෙකින්—අට අයුරෙකින් මෘෂාවාද වෙයි: පළමු මැ ඔහුට මුසවා බණන්නෙමි සිත වෙයි, බණන්නාහුට මුසවා බෙණෙමි සිත වෙයි, බිණුවහුට මුසවා මා විසින් බණන ලද්' යි සිත වෙයි, ලබ්ධිය සඟවා කියයි, කැමැත්ත සඟවා කියයි, රුචිය සඟවා කියයි, සංඥාව සඟවා කියයි,භාවය සඟවා කියයි.මේ අට අයුරින් මෘෂාවාද වේ. **කිස්ස හෙතු මුසා භණෙ** යනු: කුමක් හෙයින් මුසවා බණන්නෝ ද කියන්නෝ ද දක්වන්නෝ ද වහරන්නෝ ද' යි 'කිස්ස හෙතු මුසා භණෙ' යනු වේ.

එයින් කීහ පිඩගිය තෙරණුවෝ:

**"පාරායනමනුගායිස්සං -පෙ- කිස්ස හෙතු මුසා භණෙ" යි.**

9.

ප්‍රහීණ වූ මල හා මොහය හා ඇති මානය හා මකුබව හා දුරැලූ උන් වහන්සේගේ ගුණොපසංහිත වූ වචනය මම එකත්තෙන් කීර්තනය කරන්නෙම.

**පහීනමලමොහස්ස** — 'මලං' යනු: රාගය මල යැ, ද්වේෂය මල යැ මොහය මල යැ, මානය මල යැ, දෘෂ්ටිය මල යැ, ක්ලේශය මල යැ, හැම දුශ්චරිතය මල යැ, හැම භවගාමී කර්මය මල යි. **මොහො** යනු: යම් දුකෙහි නො දන්මෙක් . . . අවිද්‍යා පරිසයෙක් මෝහ අකුශලමූලයෙක් වේ ද මේ 'මෝහ' යි කියනු ලැබේ. මලය ද මොහය ද භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණයහ,උසුන්මුල් ඇතියහ,හිස්සුන් තල්රුකක් සෙයින් අවස්තුක කරන ලදහ,අනු අභාවය කරන ලදහ,ආයතිභවයෙහි නුපදනා පියවි ඇතියහ. එයින් බුදුහු ප්‍රහීණ මලමොහ ඇත්තාහු නුයි 'පහීනමලමොහස්ස' යනු වේ.

**මානමක්ඛප්පහායිනො** — 'මානො' යනු: එක් අයුරෙකින් මානය වෙයි: චිත්තයාගේ යම් උන්නතියෙක් වේ ද එය යි.

දෙ අයුරෙකින් මානය වෙයි: ආත්මොත්කර්ෂණමාන යැ, පරවම්භන මාන යයි.

තුන් අයුරෙකින් මානය වෙයි: 'මම ශ්‍රෙෂ්ඨයෙමි' මාන යැ, 'මම සදෘශයෙමි' මාන යැ, 'මම හීනයෙමි' මාන යයි.

චතුබ්බිධෙන මානො: ලාභෙන මානං ජනෙති, යසෙන මානං ජනෙති පසංසාය මානං ජනෙති, සුඛෙන මානං ජනෙති.

පඤ්චවිධෙන මානො: ලාභිම්හි[1] මනාපිකානං රූපානන්ති මානං ජනෙති, ලාභිම්හි මනාපිකානං සද්දානං –ගන්ධානං– රසානං– ඵොට්ඨබ්බානන්ති. මානං ජනෙති.

ඡබ්බිධෙන මානො: චක්ඛුසම්පදාය මානං ජනෙති, සොත සම්පදාය– ඝානසම්පදාය– ජිව්හාසම්පදාය– කායසම්පදාය– මනොසම්පදාය මානං ජනෙති.

සත්තවිධෙන මානො: මානො අතිමානො මානාතිමානො ඔමානො අධිමානො අස්මිමානො මිච්ඡාමානො.

අට්ඨවිධෙන මානො: ලාභෙන මානං ජනෙති, අලාභෙන ඔමානං ජනෙති, යසෙන මානං ජනෙති, අයසෙන ඔමානං ජනෙති, පසංසාය මානං ජනෙති, නින්දාය ඔමානං ජනෙති, සුඛෙන මානං ජනෙති, දුක්ඛෙන ඔමානං ජනෙති.

නවවිධෙන මානො: සෙය්‍යස්ස සෙය්‍යොහමස්මී'ති මානො, 'සෙය්‍යස්ස සදිසොහමස්මී'ති මානො, 'සෙය්‍යස්ස හීනොහමස්මී'ති මානො, 'සදිසස්ස සෙය්‍යොහමස්මී'ති මානො, 'සදිසස්ස සදිසොහමස්මී'ති මානො, 'සදිසස්ස හීනොහමස්මී'ති මානො, 'හීනස්ස සෙය්‍යොහමස්මී'ති මානො, 'හීනස්ස සදිසොහමස්මී'ති මානො, 'හීනස්ස හීනොහමස්මී'ති මානො.[2]

දසවිධෙන මානො; ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා.

'යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස. අයං වුච්චති මානො.

1. ලාභිම්හ–ඡ, වි, ක
2. අවමානො අස්මිමානො–ඡ, වි, ක

සතර අයුරෙකින් මානය වෙයි: ලාභ හෙයින් මානය උපදවයි, යශස් හෙයින් මානය උපදවයි, ප්‍රශංසා හෙයින් මානය උපදවයි, සුව හෙයින් මානය උපදවයි.

පස් අයුරෙකින් මානය වෙයි: 'මනවඩන රූපයන් ලබනසුල්ලෙමි' මානය උපදවයි. 'මනවඩන ශබ්දයන්-ගන්ධයන්-රසයන්-ස්ප්‍රෂ්ටව්‍යයන් ලබනසුල්ලෙමි' මානය උපදවයි.

ස අයුරෙකින් මානය වෙයි: චක්ෂුස්සම්පත් හෙයින් මානය උපදවයි, ශ්‍රොත්‍ර සම්පත් හෙයින්- ඝ්‍රාණ සම්පත් හෙයින්- ජිහ්වාසම්පත් හෙයින්- කායසම්පත් හෙයින්- මනස්සම්පත් හෙයින් මානය උපදවයි.

සත් අයුරෙකින් මානය වෙයි: මාන යැ අතිමාන යැ මානාතිමාන යැ අවමාන යැ අධිමාන යැ අස්මිමාන යැ මිථ්‍යාමාන යැ යි.

අට අයුරෙකින් මානය වෙයි: ලාභයෙන් මානය උපදවයි, අලාභයෙන් අවමානය (හීනමානය) උපදවයි, යසසින් මානය උපදවයි, අයශසින් අවමානය උපදවයි, ප්‍රශංසායෙන් මානය උපදවයි, නින්දයෙන් අවමානය උපදවයි, සුඛයෙන් මානය උපදවයි. දුඃඛයෙන් අවමානය උපදවයි.

නව අයුරෙකින් මානය වෙයි: 'මම ශ්‍රෙෂ්ඨයාහට ශ්‍රෙෂ්ඨයෙමි' මාන යැ, 'මම ශ්‍රෙෂ්ඨයාහට සදෘශයෙමි' මාන යැ, 'මම ශ්‍රෙෂ්ඨයාහට හීනයෙමි'මාන යැ, 'මම සදෘශයාහට ශ්‍රෙෂ්ඨයෙමි' මාන යැ, 'මම සදෘශයාහට සදෘශයෙමි' මාන යැ,'මම සදෘශයාහට හීනයෙමි' මාන යැ,'මම හීනයාහට ශ්‍රෙෂ්ඨයෙමි' මාන යැ, 'මම හීනයාහට සදෘශයෙමි' මාන යැ, 'මම හීනයාහට හීනයෙමි' මාන යැ යි.

දස අයුරෙකින් මානය වෙයි: මෙලොවැ කිසිවෙක් ජාතියෙන් වේවයි ගොත්‍රයෙන් වේවයි කුලපුත්‍රභාවයෙන් වේවයි වර්ණසෞන්දර්‍ය්‍යයෙන් වේවයි ධනයෙන් වේවයි අධ්‍යයනයෙන් වේවයි කර්මායතනයෙකින් වේවයි ශිල්පායතනයෙකින් වේවයි විද්‍යාවකින් වේවයි ශ්‍රැතයෙන් වේවයි ප්‍රතිභානයෙන් වේවයි එක්තරා වස්තුයෙකින් වේවයි මානය උපදවයි.

මෙබඳු වූ යම් මානයෙක් මඤ්ඤනායෙක් මඤ්ඤනා කළ බවෙක් උන්නතියක් ඔසවා තැබීමෙක් මානධවජයෙක් සිත නඟාගැන්මෙක් චිත්තයාගේ කේතුකම්‍යතායෙක් වෙ නම් මෙ 'මාන'යි කියනු ලැබේ.

මක්ඛාති: ‘යො මක්ඛො මක්ඛායනා මක්ඛායිතත්තං නිට්ඨුරියං නිට්ඨුරියකම්මං අයං වුච්චති මක්ඛො. බුද්ධස්ස භගවතො මානො ච මක්ඛො ච පහීනා, උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො මානමක්ඛප්පහායීති ‘මානමක්ඛප්පහායිනො’.

හන්දහං කිත්තයිස්සාමි ගිරං වණ්ණූපසංහිතන්ති – ‘හන්දහ’න්ති: පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාපෙතං[1] ‘හන්දහ’න්ති. කිත්තයිස්සාමි ගිරං වණ්ණූපසංහිතන්ති: වණ්ණෙන උපෙතං සමුපෙතං උපගතං සමුපගතං උපපන්නං සමුපපන්නං සමන්නාගතං. වාචං ගිරං බ්‍යප්පථං උදීරණං කිත්තයිස්සාමි දෙසිස්සාමි[2] පඤ්ඤපෙස්සාමි පට්ඨපෙස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසිස්සාමීති ‘හන්දහං කිත්තයිස්සාමි ගිරං වණ්ණූපසංහිතං.’

තෙනාහ ථෙරො පිඞ්ගියො;

“පහීන මලමොහස්ස මානමක්ඛප්පහායිනො
හන්දහං කිත්තයිස්සාමි ගිරං වණ්ණූපසංහිත”න්ති.

10

තමොනුදො බුද්ධො සමන්තචක්ඛු
ලොකන්තගූ සබ්බභවාතිවත්තො,
අනාසවො සබ්බදුක්ඛප්පහීනො
සච්චව්හයො බ්‍රහ්මෙ උපාසිතො[3] මෙ.

තමොනුදො බුද්ධො සමන්තචක්ඛූති – ‘තමොනුදො’ති: රාගතමං දොසතමං මොහතමං මානතමං දිට්ඨිතමං කිලෙසතමං දුච්චරිතතමං අන්ධකරණං අචක්ඛුකරණං[4] අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං නුදි පනුදි පජහි විනොදෙසි බ්‍යන්තිඅකාසි අනභාවං ගමෙසි. බුද්ධොති: “යො සො භගවා –පෙ– සච්ඡිකා පඤ්ඤත්ති, යදිදං බුද්ධොති. ‘සමන්තචක්ඛු’ වුච්චති සබ්බඤ්ඤුතඤ්ඤාණං –පෙ– තථාගතො තෙන සමන්තචක්ඛූති ‘තමොනුදො බුද්ධො සමන්තචක්ඛු.’

1. පදානුපුබ්බතා මෙතං –ච–වි–ක
2. සම්පන්නං –ච–වි–ක, ම ජ සං
3. බ්‍රහ්මුපාසිතො – සහං පොත්ථකෙසු නත්ථි
4. අචක්ඛුකරණං – ම ජ සං ච–වි–ක

**මක්ඛො** යනු: යම් ගුණ මැකීමෙක් ගුණ මකන අයුරෙක් ගුණ මැකූ බවෙක් ඊෂ්‍ර්‍යාවක් ඊෂ්‍ර්‍යා කර්මයෙක් වේ ද මේ 'මක්ඛ' යි කියනු ලැබේ. භාග්‍යවත් බුදුන් විසින් මානය ද මක්ඛය ද ප්‍රහීණයහ උසුන්මුල් ඇතියහ. හිස්සුන් තල්රුකක් සෙයින් අවස්තුක කරන ලදහ අනු අභාවය කරන ලදහ ආයතිභවයෙහි නූපදනා පියවි ඇතියහ. එයින් බුදුහු මානමක්ඛප්පහායි වෙත් නුයි 'මානමක්ඛප්පහායිනො' යනු වේ.

**හන්‍දහං කිත්‍තයිස්‍සාමි ගිරං වණ්‍ණූපසංහිතං** — 'හන්දහං' යනු: පදසන්ධි යැ පදසංසර්ගී යැ පදපූරණ යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජන ශ්ලිෂ්ටතා යැ තෙල 'හන්දහං' යනු පදානුපූර්වතා ද වෙයි. **කිත්‍තයිස්‍සාමි ගිරං වණ්‍ණූපසංහිතං** යනු: ගුණකථනයෙන් යුක්ත වූ සමුපෙත වූ එළඹ සිටි මොනොවට එළඹ සිටි (සංයුක්ත වූ) නො වෙන් වූ පරිපූර්ණ වූ සමන්වාගත වූ වචනය තෙපුල වාක්‍යපථය ප්‍රකාශය කීර්තනය කරනෙම් දෙසනෙම් පනවනෙම් පිහිටුවනෙම් විවෘත කරනෙම් විභාග කරනෙම් පාළ කරනෙම් ප්‍රකාශ කරනෙම් නුයි 'හන්දහං කිත්තයිස්සාමි ගිරං වණ්ණූපසංහිතං' යනු වේ.

**එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:**

**''පහීනමලමොහස්‍ස -පෙ- ගිරං වණ්‍ණූපසංහිතං''** යි.

## 10

**බමුණාණෙනි, අවිදු අඳුර දුරැලූ සමතැස් ඇති ලෝකාන්තයට ගිය හැමභවයන් ඉක්ම වූ ආශ්‍රව රහිත වූ සියලු දුක් දුරැලූ සත්‍යනාම ඇති බුදුහු මා විසින් උපාශ්‍රිතයහ.**

**තමොනුදො බුද්ධො සමන්‍තචක්‍ඛු** — 'තමොනුදො' යනු: ප්‍රඥා ලෝකය අඳුරු කරන, නුවණැස ඇති නො කරන, නො දැනීම ඇති කරන, පැනැස නසන, පීඩාපක්ෂයෙහි වූ, නිවන පිණිස නො පවත්නා වූ සියලු රාගාන්ධකාරය ද්වේෂාන්ධකාරය මෝහාන්ධකාරය දෘෂ්ට්‍යන්ධකාරය, ක්ලේශාන්ධකාරය දුශ්චරිතාන්ධකාරය දුරු කළහ, වෙසෙසින් දුරු කළහ, පරිත්‍යාග කළහ, බැහැර කළහ, විගතාන්ත කළහ, අනුඅභාවයට පැමිණවූහ. **බුද්ධො** යනු: යම් භාග්‍යවත් කෙනෙක් . . . මේ 'බුද්ධ' යනු සාක්ෂාත් ප්‍රඥප්තියකි. 'සමන්තචක්ඛු' යි සර්වඥතාඥානය කියනු ලැබෙයි . . . එයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' නම් වෙත් නුයි 'තමොනුදො බුද්ධො සමන්තචක්ඛු' යනු වේ.

ලොකන්තගූ සබ්බභවාතිවත්තොති – ‘ලොකො’ති: එකොලොකො: භවලොකො.

ද්වෙ ලොකා: භවලොකො ච සම්භවලොකො ච, සම්පත්තිභව-ලොකො ච සම්පත්තිසම්භවලොකො ච, විපත්තිභවලොකො ච විපත්තිසම්භවලොකො ච.

තයො ලොකා: තිස්සො වෙදනා.
චත්තාරො ලොකා: චත්තාරො ආහාරා.
පඤ්චලොකා: පඤ්චුපාදානක්ඛන්ධා.
ඡ ලොකා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි.
සත්තලොකා: සත්ත විඤ්ඤාණට්ඨිතියො.
අට්ඨලොකා: අට්ඨ ලොකධම්මා.
නවලොකා: නව සත්තාවාසා.
දසලොකා: දස ආයතනානි.
ද්වාදසලොකා: ද්වාදසායතනානි.
අට්ඨාරසලොකා: අට්ඨාරස ධාතුයො.

ලොකන්තගූති: භගවා ලොකස්ස අන්තගතො, අන්තප්පත්තො, කොටිගතො කොටිප්පත්තො, නිබ්බානගතො, නිබ්බානප්පත්තො, සො වුට්ඨවාසො චිණ්ණචරණො –පෙ– ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො’’ති ලොකන්තගූ. සබ්බභවාතිවත්තොති ‘භවා’ති ද්වෙ භවා: කම්මභවො ච පටිසන්ධිකො ච පුනබ්භවො. කතමො කම්මභවො: පුඤ්ඤාභිසංඛාරො අපුඤ්ඤාභිසංඛාරො ආනෙඤ්ජාභිසංඛාරො, අයං කම්මභවො. කතමො පටිසන්ධිකො පුනබ්භවො: පටිසන්ධිකා රූපං[1] වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, අයං පටිසන්ධිකො පුනබ්භවො. භගවා කම්මභවං ච පටිසන්ධිකං ච පුනබ්භවං අතිවත්තො අතික්කන්තො වීතිවත්තොති ලොකන්තගූ සබ්බභවාතිවත්තො.’

අනාසවො සබ්බදුක්ඛප්පහීනොති ‘අනාසවො’ති: චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො. තෙ ආසවා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා බුද්ධො අනාසවො. සබ්බදුක්ඛප්පහීනොති: සබ්බං තස්ස පටිසන්ධිකං ජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං –පෙ– දිට්ඨිබ්‍යසනං දුක්ඛං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, තස්මා බුද්ධො සබ්බදුක්ඛප්පහීනොති ‘අනාසවො සබ්බදුක්ඛප්පහීනො.’

1. රූපං–ම ඡ සං ස්‍යා.

**ලොකන්තගූ සබ්බභවාතිවත්තො** — 'ලොකො' යනු: එක් ලොකයෙක් වෙයි: භවලොකය යි.

ලොකයෝ දෙදෙනෙක් වෙති: භවලොකය ද සම්භවලොකය ද යි, සම්පත්තිභවලොකය ද සම්පත්තිසම්භවලොකය ද යි, විපත්තිභවලොකය ද විපත්තිසම්භව ලොකය ද යි.

ලොකයෝ තිදෙනෙක් වෙති: තුන් වෙදනා යැ.
ලොකයෝ සතර දෙනෙක් වෙති: සතර ආහාරයෝ යැ.
ලොකයෝ පස් දෙනෙක් වෙති: පඤ්ච උපාදනස්කන්ධයෝ යැ.
ලොකයෝ ස දෙනෙක් වෙති: අධ්‍යාත්මික ආයතනයෝ සදෙන යැ.
සප්තලොකයෝ: සප්තවිඥානස්ථිතීහු යැ.
අෂ්ටලොකයෝ: අෂ්ටලොකධර්මයෝ යැ.
නවලොකයෝ: නව සත්තාවාසයෝ යැ.
දශලොකයෝ: දශ ආයතනයෝ යැ.
ද්වාදශලොකයෝ: දෙළොස් ආයතනයෝ යැ.
අටළොස් ලොකයෝ: අටළොස් ධාතූහු යි.

**ලොකන්තගූ** යනු: බුදුහු ලෝකයෙහි අන්තයට ගියහ. අන්තයට පැමිණියහ. කෙළවරට ගියහ කෙළවරට පැමිණියහ. නිවනට ගියහ නිවනට පැමිණියහ. උන් වහන්සේ වැස නිම වූ දශවිධ ආර්‍යවාස ඇතියහ (ශීලයෙහි හා සමාධියෙහි) චීර්ණවශීහ . . . ජාතිමරණසංසාරය පුනර්භවය උන්වහන්සේට නැත් නුයි 'ලොකන්තගූ' යනු වේ. **සබ්බභවාතිවත්තො**— 'භවා' යනු: භවයෝ දෙදෙනෙක් වෙති: කර්මභවය ද ප්‍රතිසන්ධි ඇති පුනර්භවය ද යි. කර්මභවය කවරැ යත්: පුණ්‍යාභිසංස්කාර යැ අපුණ්‍යාභිසංස්කාර යැ ආනෙඤ්ජාභිසංස්කාර යි. මේ කර්මභවය යි. ප්‍රතිසන්ධික පුනර්භවය කවරැ යත්: පිළිසඳ ඇති රූප යැ වෙදනා යැ සංඥා යැ සංස්කාරයෝ යැ විඥාන යැ යි. මේ ප්‍රතිසන්ධික පුනර්භවය යි. බුදුහු කර්මභවය ද ප්‍රතිසන්ධිකපුනර්භවය ද ඉක්මවූහ, අතික්‍රමණය කළහ, වෙසෙසින් ඉක්මවූවාහු නුයි 'ලොකන්තගූ සබ්බභවාතිවත්තො' යනු වේ.

**අනාසවො සබ්බදුක්ඛප්පහායිනො** — 'අනාසවො' යනු: ආශ්‍රවයෝ සතර දෙනෙකි: කාමාශ්‍රව යැ භවාශ්‍රව යැ දෘෂ්ට්‍යාශ්‍රව යැ අවිද්‍යාශ්‍රව යි. ඒ ආශ්‍රවයෝ භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණයහ උදුන්මුල් ඇතියහ හිස්සුන් තල් රුකක් සෙයින් අවස්තුක කරන ලදහ අනු අභාවය කරන ලදහ. (එහෙයින් මැ) ආයතිභවයෙහි නූපදනා පියවි ඇතියහ. එයින් බුදුහු අනාශ්‍රවයහ. **සබ්බදුක්ඛප්පහායිනො** යනු: උන් වහන්සේ විසින් පිළිසඳ ඇති හැම ජාති දුක ජරා දුක ව්‍යාධිදුක මරණ දුක ශෝක පරිදෙවදුඃඛදෞර්මනස්‍ය උපායාස දුක . . . දෘෂ්ටිව්‍යසනයෙන් වන දුක ප්‍රහීණ යැ සිඳුනා ලද යැ සන්හිඳුවන ලද යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධ යැ යළි උපදනට නොහිසි යැ නුවණ ගින්නෙන් දවන ලදි. එයින් බුදුහු 'සබ්බදුක්ඛප්පහායී' වෙත් නුයි 'අනාසවො සබ්බදුක්ඛප්පහීනො' යනු වේ.

සච්චව්හයො බ්‍රහ්මෙ උපාසිතො මෙති – 'සච්චව්හයො'ති: සච්චව්හයො සදිසනාමො සදිසව්හයො සච්චසදිසව්හයො, විපස්සී භගවා සිඛී භගවා වෙස්සභූ භගවා කකුසන්ධො භගවා කොනාගමනො භගවා කස්සපො භගවා, තෙ බුද්ධා භගවන්තො සදිසනාමා, සදිසව්හයා, භගවාපි සක්‍යමුනි තෙසං බුද්ධානං භගවන්තානං සදිසනාමො සදිසව්හයො. තස්මා බුද්ධො සච්චව්හයො. බ්‍රහ්මෙ උපාසිතො මෙති: සො මයා භගවා ආසිතො උපාසිතො පයිරුපාසිතො පරිපුච්ඡිතො පරිපඤ්හිතොති 'සච්චව්හයො බ්‍රහ්මෙ උපාසිතො මෙ'.

තෙනාහ ථෙරො පිඞ්ගියො:

''තමොනුදො බුද්ධො සමන්තචක්ඛු
ලොකන්තගූ සබ්බභවාතිවත්තො,
අනාසවො සබ්බදුක්ඛප්පහීනො
සච්චව්හයො බ්‍රහ්මෙ උපාසිතො මෙ''ති.

## 11.

ද්විජො[1] යථා කුබ්බනකං පහාය
බහුප්ඵලං කානනමා වසෙය්‍ය,
එවම්පහං[2] අප්පදස්සෙ පහාය
මහොදධිං හංසොරිව අජ්ඣපත්තො,[3]

ද්විජො යථා කුබ්බනකං පහාය බහුප්ඵලං කානනමාවසෙය්‍යාති– 'ද්විජො' වුච්චති පක්ඛී. කිං කාරණා ද්විජො වුච්චති පක්ඛී: ද්වික්ඛත්තුං ජායතීති ද්විජො මාතුකුච්ඡිම්හා ච අණ්ඩකොසම්හා ච, තංකාරණා ද්විජො වුච්චති පක්ඛීති ද්විජො. යථා කුබ්බනකං පහායාති: යථා ද්විජො කුබ්බනකං රිත්තවනකං පරිත්තකං වනං[4] අප්පඵලං අප්පභක්ඛං අප්පොදකං පහාය ජහිත්වා අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා අඤ්ඤං බහුප්ඵලං බහුභක්ඛං බහුරුක්ඛං බහූදකං මහන්තං කානනං වනසණ්ඩං අධිගච්ඡෙය්‍ය වින්දෙය්‍ය පටිලභෙය්‍ය, තස්මිං ච වනසණ්ඩෙ වාසං කප්පෙය්‍යාති –දිජො යථා කුබ්බනකං පහාය බහුප්ඵලං කානනමා වසෙය්‍ය'.

---

1. දිජො – ම.ජ.සං. ස්‍යා
2. එවම්හං–ම ජ සං–ව–වි–ක.
3. හංසොරිවජ්ඣපත්තො.–පසා. ස්‍යා
4. පරිත්තවනකං අප්පඵලං–ම ජ සං

**සච්චව්හයො බ්‍රහෙම උපාසිතො මෙ** — 'සච්චව්හයො' යනු: සත්‍ය අභිධාන ඇත්තාහු සුදුසු නම් ඇත්තාහු සුදුසු අභිධාන ඇත්තාහු සත්‍ය සදෘශ අභිධාන ඇත්තාහු, විපස්සී නම් බුදුහු සිඛී නම් බුදුහු වෙස්සභූ නම් බුදුහු කකුසඳ නම් බුදුහු කොනාගමන නම් බුදුහු කාශ්‍යප නම් බුදුහු යන ඒ භාග්‍යවත් බුදුවරු සදෘශ නම් ඇත්තාහු ,සදෘශ අභිධාන ඇත්තාහු වෙති. භාග්‍යවත් ශාක්‍යමුනිහු ද ඒ භාග්‍යවත් බුදුවරයනට සුදුසු නම් ඇතියහ, සදෘශ අභිධාන ඇතියහ, එයින් බුදුහු 'සච්චව්හය' වෙත්. **බ්‍රහෙම උපාසිතො මෙ** යනු: මා විසින් ඒ බුදුහු ඇසුරු කරන ලදහ උපාසන කරන ලදහ පර්යුපාසන කරන ලදහ ගැටපදයෙන් පුළුවුස්නා ලදහ තුලනය කරන ලදහ' යි 'සච්චව්හයො බ්‍රහ්මෙ උපාසිතො මෙ' යනු වේ.

එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:

**"තමොනුදෙ බුදෙධා –පෙ– සච්චව්හයො බ්‍රහෙම උපාසිතො මෙ"** යි.

11.

යම්සේ පක්ෂි තෙම කුඩා වනය හැරපියා බොහෝ පලවැළ ඇති වනයකට පැමිණ වසන්නේ ද, එසෙයින් මම ද (බාවරී ආදි) මඳ නුවණැතියන් හැර පියා (අනවතප්තාදි) මහවිලකට හංසයකු සෙයින් පැමිණියෙමි.

**ද්විජො යථා කුබ්බනකං පහාය බහුප්ඵලං කානනමාවසෙය්‍ය** — 'ද්විජ' යි පක්ෂියා කියනු ලැබෙයි. කවර කරුණෙකින් පක්ෂියා 'ද්විජ' යි කියනු ලැබෙයි යත්: මව් කුසින් ද බිජුවටින් ද යි දෙයළක් උපදී නුයි ද්විජ යැ, එ කරුණින් පක්ෂි තෙම 'ද්විජ' යි කියනු ලැබේ නුයි ද්විජ යැ. **යථා කුබ්බනකං පහාය** යනු: යම් සේ පක්ෂි තෙම මඳ වූ පල වැළ ඇති මඳ වූ ගොදුරු ඇති මඳ වූ දිය ඇති කුඩා වනය මඳ වූ වනය ස්වල්ප වූ වනය හැර හැරපියා ඉක්මවා මැනැවින් ඉක්මවා වෙසෙයින් ඉක්මවා බොහෝ පලවැළ ඇති බොහෝ අහර ඇති බොහෝ රුක් ඇති බොහෝ ජලය ඇති අන්‍ය මහවනයකට වන ලැහැබකට පැමිණෙන්නේ නම් ලබන්නේ නම් පිළිලබන්නේ නම් එ වනලැහැබ්හි වාසය කරන්නේ නුයි 'ද්විජො යථා කුබ්බනකං පහාය බහුප්ඵලං කානනමාවසෙය්‍ය යනු වේ.

එවමහං අප්පදස්සෙ පහාය මහොදධිං හංසොරිව අජ්ඣපත්තොති– එව'න්ති ඔපම්මසම්පටිපාදනං, අප්පදස්සෙ පහායාති: යො ච බාවරී බ්‍රාහ්මණො යෙ චඤ්ඤෙ තස්ස ආචරියා බුද්ධං භගවන්තං උපාදාය අප්පදස්සා, පරිත්තදස්සා ථොකදස්සා ඔමකදස්සා ලාමකදස්සා ජතුක්කදස්සා වා[1] තෙ අප්පදස්සෙ පරිත්තදස්සෙ ථොකදස්සෙ ඔමකදස්සෙ ලාමකදස්සෙ ජතුක්කදස්සෙ පහාය පජහිත්වා අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා බුද්ධං භගවන්තං අප්පමාණදස්සං අග්ගදස්සං සෙට්ඨදස්සං විසෙසදස්සං. පාමොක්ඛදස්සං උත්තමදස්සං පවරදස්සං අසමං අසමසමං අප්පටිසමං අප්පටිභාගං අප්පටිපුග්ගලං දෙවාතිදෙවං නරාසභං පුරිසසීහං පුරිසනාගං පුරිසාජඤ්ඤං පුරිසනිසභං පුරිසධොරය්හං දසබලධාරිං[2] අධිගච්ඡිං වින්දිං පටිලභිං යථා වා හංසො මහන්තං මානසකං වා[3] සරං අනොතත්තං වා දහං මහාසමුද්දං වා අක්ඛොභං අමිතොදකං ජලරාසිං අධිගච්ඡෙය්‍ය වින්දෙය්‍ය පටිලභෙය්‍ය, එවමෙවං බුද්ධං භගවන්තං අක්ඛොභං අමිතතෙජං පභින්නඤාණං විවටචක්ඛුං[4] පඤ්ඤාපභෙදකුසලං අධිගතපටිසම්භිදං චතුවෙසාරජ්ජප්පත්තං සුද්ධාධිමුත්තං සෙතපච්චත්තං අද්වයභාණිං තාදිං තථාපටිඤ්ඤං අපරිත්තං මහන්තං ගම්භීරං අප්පමෙය්‍යං දුප්පරියොගාහං පහූතරතනං සාගරසමං ඡළඞ්ගුපෙක්ඛාය සමන්නාගතං අතුලං විපුලං අප්පමෙය්‍යං තං තාදිසං පවදතං මග්ගවාදිනං මෙරුමිව නගානං ගරුළමිව දිජානං සීහමිව මිගානං උදධිමිව අණ්ණවානං[5] අධිගච්ඡිං තං සත්ථාරං ජිනපවරං මහෙසින්ති 'එවමහං අප්පදස්සෙ පහාය මහොදධිං හංසොරිව අජ්ඣපත්තො'.

තෙනාහ ථෙරො පිංගියො:

දිජො යථා කුබ්බනකං පහාය
බහුප්ඵලං කානනං ආවසෙය්‍ය,
එවම්පහං අප්පදස්සෙ පහාය
මහොදධිං හංසොරිව අජ්ඣපත්තො'ති.

1. ජතුක්කදස්සා—ම ජ සං, ජතුක්කදස්සා—ස්‍යා, ජතුකදස්සා—සී
2. දසබලං තාදිං—ස්‍යා.
3. මානුසකං වා—ස්‍යා.
4. විවත්ත චක්ඛුං—පන
5. අත්වයභාණිං—ච වි ක

**එවමපහං අපපදසෙස පහාය මහොදධිං හංසොරිව අජ්ඣපතෙතා**—

'එවං' යනු: උපමා සම්ප්‍රතිපාදන යැ. **අපපදසෙස පහාය** යනු: යම් බාවරී නම් බමුණු කෙනෙකුත් වෙත් ද, අන්‍ය වූ ඔවුන්ගේ යම් ආචාර්‍ය්‍ය කෙනෙකුත් වෙත් ද ඔහු තුමූ භාග්‍යවත් බුදුන් පිණිස, අල්පදර්ශන ඇතියහ අත්‍යල්ප දර්ශන ඇතියහ මඳ වූ දර්ශන ඇතියහ පහත් දර්ශන ඇතියහ ලාමක දර්ශන ඇතියහ නො අගනා දර්ශන ඇතියාහු හෝ වෙති. අල්ප දර්ශීන් අත්‍යල්පදර්ශීන් මන්දදර්ශීන් පහත්දර්ශීන් ලාමකදර්ශීන් අධමදර්ශීන් හැර හැරපියා ඉක්ම මොනොවට ඉක්ම වෙසෙසින් ඉක්ම අප්‍රමාණදර්ශන ඇති අග්‍රදර්ශන ඇති ශ්‍රෙෂ්ඨදර්ශන ඇති විශිෂ්ට දර්ශන ඇති ප්‍රමුඛදර්ශන ඇති උත්තමදර්ශන ඇති ප්‍රවරදර්ශන ඇති අසම වූ අසමසම වූ අප්‍රතිසම වූ අප්‍රතිභාග වූ අප්‍රතිපුද්ගල වූ දෙවාතිදෙව වූ නරශ්‍රෙෂ්ඨ වූ පුරුෂසිංහ වූ පුරුෂ නාග වූ පුරුෂාජානෙය වූ පුරුෂනිසභ වූ පුරුෂධෞරෙය වූ දශබලධාරී වූ භාග්‍යවත් බුදුන් ලදිමි ලැබුයෙමි ප්‍රතිලාභ කෙළෙමි, යම්සේ හංස තෙම නො කැළඹුණු අප්‍රමාණ වූ ජලය ඇති උදකරාශි ඇති මහත් වූ මදෙල්විල් හෝ නුතත් දහතළා හෝ මහමුහුද හෝ ලබා නම් විදී නම් ප්‍රතිලාභ කෙරේ නම් එ පරිද්දෙන් මැ නො කැළඹුණු අප්‍රමාණ ඥානතෙජස් ඇති ප්‍රභෙදගත (දශබලඥානාදි) ඥාන ඇති සමතැස් ඇති ප්‍රඥාප්‍රභෙදයෙහි දක්ෂ වූ ලබන ලද සිව්පිළිසිඹියා ඇති චතුර්වෛශාරද්‍යප්‍රාප්ත වූ එලසමවත්හි අධිමුක්ත වූ පිරිසුදු වූ ආවෙණික ඍත්මභාව ඇති අද්වය භාණී වූ (ඉෂ්ටානිෂ්ටයෙහි නො සැලෙන බැවින් තාදී වූ ප්‍රතිඥා නො ඉක්මෙන අල්ප නො වූ මහත් වූ ගම්භීර වූ ප්‍රමාණාර්හ නො වූ බැසගත නො හෙන (ශ්‍රද්ධාදි) බොහෝ වූ රත්න ඇති සාගරසම වූ ෂඩඞ්ගොපෙක්ෂායෙන් සමන්වාගත වූ (තුලනය කළ නො හැකි බැවින්) අතුල වූ විපුල වූ අප්‍රමෙය වූ ඒ තාදීගුණ සම්පන්න වූ කථිකයන් අතුරෙහි මහ කියන සුලු වූ, පර්වතයන් අතුරෙහි මෙරුපර්වතය බඳු වූ පක්ෂීන් අතුරෙහි ගුරුළුරජහු බඳු වූ මෘගයන් අතුරෙහි සිංහරාජයා බඳු වූ අර්ණවයන් අතුරෙහි සමුද්‍රය බඳු වූ ඒ ශාස්තෘ වූ ජිනප්‍රවර වූ මහර්ෂි වූ භාග්‍යවත් බුදුන් ලදිම් නුයි 'එවමපහං අප්පදස්සෙ පහාය මහොදධිං හංසොරිව අජ්ඣපත්තො' යනු වේ.

එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:

**"ද්විජො යථා –පෙ– මහොදධිං හංසොරිව අජ්ඣපතෙතා"** යි.

12.

යෙ මෙ පුබ්බෙ වියාකංසු
හුරං ගොතමසාසනා
ඉච්චාසි ඉති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං
සබ්බං තං තක්කවඩ්ඪනං.

යෙ මෙ පුබ්බෙ වියාකංසූති 'යෙ'ති යො ච බාවරී බ්‍රාහ්මණො යෙ චඤ්ඤෙ තස්ස ආචරියා, තෙ සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං වියාකංසු ආචික්ඛිංසු දෙසයිංසු පඤ්ඤපිංසු පට්ඨපිංසු විවරිංසු විභජිංසු උත්තානීඅකංසු පකාසෙසුන්ති 'යෙ මෙ පුබ්බෙ වියාකංසු.'

හුරං ගොතමසාසනාති: හුරං ගොතමසාසනා පරං ගොතමසාසනා පුරෙ ගොතමසාසනා පඨමතරං ගොතමසාසනා බුද්ධසාසනා ජිනසාසනා තථාගතසාසනා දෙවාතිදෙවසාසනා[1] අරහන්තසාසනාති 'හුරං ගොතමසාසනා,'

ඉච්චාසි ඉති භවිස්සතීති එවං කිර ආසි, එවං කිර භවිස්සතීති 'ඉච්චාසි ඉති භවිස්සති,'

සබ්බං තං ඉතිහීතිහන්ති: සබ්බං තං ඉතිහීතිහං ඉතිකිරාය පරම්පරාය පිටකසම්පදාය තක්කහෙතු නයහෙතු ආකාරපරිවිතක්කෙන දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා න සාමං සයං අභිඤ්ඤාතං න අත්තපච්චක්ඛං ධම්මං කථයිංසූති 'සබ්බං තං ඉතිහීතිහං':

සබ්බං තං තක්කවඩ්ඪනන්ති: සබ්බං තං තක්කවඩ්ඪනං විතක්කවඩ්ඪනං සංකප්පවඩ්ඪනං කාමවිතක්කවඩ්ඪනං ව්‍යාපාදවිතක්කවඩ්ඪනං විහිංසාවිතක්කවඩ්ඪනං ඤාතිවිතක්කවඩ්ඪනං ජනපදවිතක්කවඩ්ඪනං අමරාවිතක්කවඩ්ඪනං පරානුද්දයතාපටිසංයුත්තවිතක්කවඩ්ඪනං ලාභසක්කාරසිලොකපටිසංයුත්තවිතක්කවඩ්ඪනං අනවඤ්ඤත්තිපටිසංයුත්තවිතක්කවඩ්ඪනන්ති 'සබ්බං තං තක්කවඩ්ඪනං'

තෙනාහ ථෙරො පිඞ්ගියො:

යෙ මෙ පුබ්බෙ වියාකංසු
හුරං ගොතමසාසනා,
ඉච්චාසි ඉති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං
සබ්බං තං තක්කවඩ්ඪනන්ති.

1. දෙවසාසනා - සෑා ම, ජ සං භාගී

12.

පෙර (බාවරී ආදි) යම් කෙනෙක් ගෞතම ශාසනයෙන් පළමු 'මෙසේ වී ල' 'මෙසේ වන්නේ ල' යි (යම් දහමක්) මට ප්‍රකාශ කළාහු නම් එ හැම 'මෙසේ මෙසේ යැ' යි උපන් කථායෙක, එ හැම (කාමවිතර්කාදි) තර්ක වඩනා සුලු යැ.

**යෙ මෙ පුබ්බෙ වියාකංසු** — 'යෙ' යනු: යම් බාවරී නම් බමුණු කෙනෙකුත් වෙත් ද යම් අන්‍ය වූ ඔවුන් ගේ ආචාර්‍ය්‍ය කෙනෙකුත් වෙත් ද ඔහු ස්වකීය දෘෂ්ටිය සිය කැමැත්ත ස්වරුචිය ස්වලබ්ධිය සිය අදහස ස්වකීය අභිප්‍රාය විවරණ කළහ කීහ දෙසූහ පැනැවූහ තැබූහ විවෘත කළහ විභාග කළහ පාළ කළහ ප්‍රකාශ කළාහු නුයි 'යෙ මෙ පුබ්බෙ වියාකංසු' යනු වේ.

**හුරං ගොතමසාසනා** යනු: ගෞතම ශාසනයෙන් පළමු ගෞතම ශාසනයෙන් ඔබ්බෙහි ගෞතම ශාස්නයෙන් පෙර ගෞතම ශාසනයෙන් බුද්ධශාසනයෙන් ජිනශාසනයෙන් තථාගතශාසනයෙන් දෙවාතිදෙව ශාසනයෙන් අර්හත් ශාසනයෙන් ඉතා පළමු නුයි 'හුරං ගොතමසාසනා' යනු වේ.

**ඉච්චාසි ඉති භවිස්සති** යනු: මෙසේ වී ල මෙසේ වන්නේ ලැ' යි 'ඉච්චාසි ඉති භවිස්සති' යනුවේ.

**සබ්බං තං ඉතිහිතිහං** යනු: එ හැම මෙසේ මෙසේ යැ යි උපන් කථා යැ මෙසේ ලැ යි උපන් කථා යැ ඇදුරොල්හි ආ කථා යැ අපගේ පිටකයෙහි මෙසේ යැ යි උපන් කථා යැ තර්ක හෙයින් න්‍යාය හෙයින් ආකාර පරිවිතර්කයෙන් තමා සිතා ඉවසාගත් දෘෂ්ටිය හා සැසඳේ යයි කියන කථා යැ තුමූ තමන් විසින් විශිෂ්ටඥානයෙන් දන්නා ලද්දක්, තමහට ප්‍රත්‍යක්ෂ වූ ධර්මයක් නො කීවාහු නුයි 'සබ්බං තං ඉතිහිතිහං' යනු වේ.

**සබ්බං තං තක්කවඩ්ඪනං** යනු: එ හැම තර්ක වඩනාසුලු යැ විතර්ක වඩනාසුලු යැ සංකල්ප වඩනාසුලු යැ කාමවිතර්ක වඩනාසුලු යැ ව්‍යාපාද විතර්ක වඩනාසුලු යැ විහිංසා විතර්ක වඩනාසුලු යැ ඥාති විතර්ක වඩනා සුලු යැ ජනපද විතර්ක වඩනාසුලු යැ අමරා විතර්ක වඩනා සුලු යැ පරානුකම්පා ප්‍රතිසංයුක්ත විතර්ක වඩනාසුලු යැ ලාභසත්කාර කීර්තිශබ්ද ප්‍රතිසංයුක්ත විතර්ක වඩනා සුලු යැ අනවඥ ප්‍රතිසංයුක්ත විතර්ක වඩනා සුලු යැ' යි 'සබ්බං තං තක්කවඩ්ඪනං' යනු වේ.

එයින් කීහ පිඩගිය තෙරණුවෝ:

**"යෙ මෙ පුබ්බෙ වියාකංසු –පෙ– සබ්බං තං තක්කවඩ්ඪනං"** යි.

13.

එකො තමොනුදාසීනො
ජුතිමා සො පභඞ්කරො
ගොතමො භූරිපඤ්ඤාණො
ගොතමො භූරිමෙධසො.

**එකො තමොනුදාසීනොති**– 'එකො'ති භගවා පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො, අදුතියට්ඨෙන එකො, තණ්හාය පහානට්ඨෙන එකො, එකන්තවීතරාගොති එකො, එකන්තවීතදොසොති එකො, එකන්තවීතමොහොති එකො, එකන්තනික්කිලෙසොති එකො, එකායනමග්ග ගතොති එකො, එකං අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති එකො.

කථං භගවා පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො: භගවා දහරොව සමානො සුසු කාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අකාමකානං මාතාපිතූනං[1] අස්සුමුඛානං රුදන්තානං විලපන්තානං ඤාතිසඞ්ඝං පහාය සබ්බං ඝරාවාසපළිබොධං ඡින්දිත්වා පුත්තදාරපළිබොධං ඡින්දිත්වා ඤාතිපළිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපළිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙතීති 'එවං භගවා පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො.'

කථං භගවා අදුතියට්ඨෙන එකො: එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි[2] පටිසල්ලානසාරුප්පානි. සො එකො චරති එකො ගච්ඡති, එකො තිට්ඨති, එකො සෙය්‍යං කප්පෙති, එකො ගාමං පිණ්ඩාය පවිසති, එකො පටික්කමති, එකො රහො නිසීදති, එකො චඞ්කමං අධිට්ඨාති, එකො චරති, විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙතීති එවං භගවා අදුතියට්ඨෙන එකො.

කථං භගවා තණ්හාය පහානට්ඨෙන එකො: සො එවං එකො අදුතියො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බොධිරුක්ඛමූලෙ මහාපධානං පදහන්තො මාරං සසෙනං කණ්හං නමුචිං පමත්තබන්ධුං විධමෙත්වා තණ්හාජාලිනිං විසටං[3] විසත්තිකං පජහි විනොදෙසි බ්‍යන්තී අකාසි, අනභාවං ගමෙසි.

---

1. මාතාපිතුනං – ම ජී ස
2. මනුස්සරාහස්සෙය්‍යකානි – ම ජී සං
3. සරිතං – සයා

13.

අවිදු අඳුරු දුරු කළා වූ ද්‍යුතිමත් වූ ප්‍රභාකර වූ මහත් වූ ඥාන ධවජ ඇති ඒ ගෞතමයන් වහන්සේ විපුල ප්‍රඥා ඇති ගෞතමයන් වහන්සේ (පහණසෑ වෙහෙරෙහි) එකලා වැ වැඩහුන් සේක.

**එකො තමොනුදාසිනො** — 'එකො' යනු: බුදුහු ප්‍රව්‍රජ්‍යා සංඛ්‍යාතාර්ථයෙන් අතුල්‍යහ, අද්විතියාර්ථයෙන් අතුල්‍යහ, තෘෂ්ණාප්‍රහාණාර්ථයෙන් අසහායහ, එකාන්තවීතරාග හුයි අසහායහ, එකාන්තවීතද්වෙෂ හුයි අසහායහ, එකාන්තවීතමොහ හුයි අසහායහ, එකාන්තයෙන් නික්ලෙශ හුයි අසහායහ, එකායනමාර්ගයට ගියාහු හුයි අසහායහ, අතුල්‍ය වූ අනුත්තර වූ සම්‍යක් සම්බොධිය අවබොධ කළාහු හුයි එකයහ.

කිසෙයින් බුදුහු ප්‍රව්‍රජ්‍යාසංඛ්‍යාත අර්ථයෙන් 'එක' වූහ යත්: බුදුහු තරුණ වූවාහු මැ අඳුන්වන් කෙහෙ ඇත්තාහු භද්‍රයෞවනයෙන් යුත් ප්‍රථම වයසින්සමන්වාගත වූවාහු නො කැමැති වැ (එහෙයින් මැ) කඳුළින් තෙමුණු මුහුණු ඇති හඬන වැලැපෙන මව්පියනට අනාදර කොට ඥාති-සමූහයා හැරපියා හැම ගෘහාවාස පරිරොධයන් සිඳපියා අඹුදරු පලිබොධ සිඳපියා ඥාතිපරිරොධ සිඳපියා සඟ යහළු පලිබොධ සිඳපියා කෙස්රවුළු බහා කහවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්මැ ශාසනයෙහි පැවිදි වැ අකිඤ්චන (කිසිවක් නැති) බවට පැමිණ එකලා වැ හැසිරෙති, වෙසෙති, ඉරියවු පවත්වති වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්. මෙසේ බුදුහු ප්‍රව්‍රජ්‍යාසංඛ්‍යාතයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු අද්විතියාර්ථයෙන් 'එක' වූහ යත්: උන්වහන්සේ මෙසේ පැවිදි වූවාහු එකලා වැ අල්පශබ්ද වූ, අල්පනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රාහස්‍යයට ස්ථාන වූ විවේකයට අනුරූප වූ, වනයෙහි දුර සෙනසුන් වනපර්‍යන්ත සෙනසුන් ඇසුරු කෙරෙති. උන්වහන්සේ එකලා වැ හැසිරෙති, එකලා වැ යෙති, එකලා වැ සිටිති, එකලා වැ හොවිති, එකලා වැ ගමට පිඬු සිඟා පිවිසෙති, එකලා වැ රහසැ හිඳිති, එකලා වැ සක්මන් කෙරෙති, එකලා වැ හැසිරෙති, වෙසෙති, ඉරියව් පවත්වති, වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්. මෙසේ බුදුහු 'අද්විතියාර්ථයෙන් එකයහ.

කිසෙයින් බුදුහු තෘෂ්ණා ප්‍රහාණාර්ථයෙන් 'එක' වූහ යත්: උන් වහන්සේ මෙසේ එකලා වූවාහු අද්විතීය වූවාහු අප්‍රමත්ත වූවාහු කෙලෙස් තවන වීර්‍ය ඇති වැ නිවනට මෙහෙය වූ සිත් ඇති වැ වසන්නාහු නෙරඤ්ජ-රා නදීතීරයෙහි බෝරුක් මුල මහාප්‍රධන්වීර්‍ය කරනසේක් කෘෂ්ණකර්ම ඇති (නො මිදිය දෙන හෙයින්) නමුච නම් වූ ප්‍රමත්තයනට බන්ධු වූ සෙන් සහිත මරු විධ්වංසන කොට විසත්තිකා නම් වූ තෘෂ්ණාජාලිනිය දුරු කළහ, බැහැර කළහ, විගතාන්ත කළහ, අනභාවයට පැමිණ වූ සේක.

1. "තණ්හා දුතියො පුරිසො දීඝමද්ධාන සංසරං
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති,

2. එතමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ"ති.[a]

එවං භගවා තණ්හාය පහානට්ඨෙන එකො.

කථං භගවා 'එකන්තවීතරාගො'ති එකො: රාගස්ස පහීනත්තා එකන්තවීතරාගොති එකො, දොසස්ස පහීනත්තා එකන්තවීතදොසොති එකො, මොහස්ස පහීනත්තා එකන්තවීතමොහොති එකො, කිලෙසානං පහීනත්තා එකන්තනික්කිලෙසොති එකො.

කථං භගවා එකායනමග්ගං ගතොති එකො: එකායනමග්ගො වුච්චති චත්තාරො සතිපට්ඨානා -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

3. "එකායනං ජාතිඛයන්තදස්සී
මග්ගං පජානාති හිතානුකම්පී,
එතෙන මග්ගෙන තරිංසු පුබ්බෙ
තරිස්සන්ති යෙ ච තරන්ති ඔඝ"න්ති.[b]

එවං භගවා එකායනමග්ගං ගතොති එකො.

කථං භගවා එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති එකො: 'බොධි වුච්චති චතූසු මග්ගෙසු ඤාණං' පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං -පෙ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි. භගවා තෙන බොධිඤාණෙන 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති බුජ්ඣි, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති බුජ්ඣි, 'සබ්බෙ ධම්මා අනත්තා'ති බුජ්ඣි. -පෙ- 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති බුජ්ඣි.

අථවා යං බුජ්ඣිතබ්බං අනුබුජ්ඣිතබ්බං පටිබුජ්ඣිතබ්බං සම්බුජ්ඣිතබ්බං අධිගන්තබ්බං ඵස්සිතබ්බං සච්ඡිකාතබ්බං සබ්බං තං තෙන බොධිඤාණෙන බුජ්ඣි අනුබුජ්ඣි පටිබුජ්ඣි සම්බුජ්ඣි අධිගච්ඡි ඵස්සි[1] සච්ඡාකාසි. එවං භගවා 'එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති එකො.

---

1. ඵස්සෙසි-ම ජ සං
ඵුසෙසි-සයා

a ඉතිවුත්තක පලි
චතුක්කඞ්ගුත්තර භණ්ඩගාම වග්ග
සුත්ත නිපාත ද්වයතානුපස්සනා සුත්ත.

b සතිපට්ඨාන සං නාලන්ද වග්ග

1. 'තෘෂ්ණාව දෙවැනි කොට ඇති පුරුෂ තෙම දිගු කලක් මුළුල්ලෙහි සැරිසරනුයේ ඉභාත්මභාව, අනාගතාත්මභාව නොහොත් ඉත්ථම්භාව අන්‍යථාභාව සංඛ්‍යාත වූ සංසාරය නො ඉක්මවයි.

2. මෙසේ (අතීතාදි ස්කන්ධයන්හි) ආදීනව දැන, තෘෂ්ණාව දුකට කාරණ යයි දැන, පහ වූ තෘෂ්ණා ඇති ආදාන (ග්‍රහණ) රහිත වූ ස්මෘතිමත් වූ ක්ෂීණාශ්‍රව මහණ හැසිරෙන්නේ යැ'යි.

මෙසෙයින් බුදුහු තෘෂ්ණාප්‍රහීණාර්ථයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු 'එකාන්තවීතරාග' නුයි එක වූහ යත්: රාගය ප්‍රහීණ වන බැවින් 'එකාන්තවීතරාග' නුයි 'එක' යහ. ද්වේෂය ප්‍රහීණ වන බැවින් 'එකාන්තවීතරාග නුයි. 'එක' යහ. මොහය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් වීතමොහ නුයි 'එක' යහ, ක්ලෙශයන් ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් නික්ලේශ වූවාහු නුයි 'එක' යහ.

කිසෙයින් බුදුහු එකායනමාර්ගයට ගියාහු නුයි 'එක' වූහ යත්: සතර සතිපට්ඨානයෝ යැ . . . ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය 'එකායන මාර්ගය' යි කියනු ලැබේ.

3. ජාතික්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණය දක්නාසුලු වූ හිතයෙන් අනුකම්පා කරන සුලු වූ බුදුහු එකායනමාර්ගය දන්නා සේක. පෙර යම් කෙනෙක් චතුරොඝය තරණය කළාහු නම් තෙල මාර්ගයෙන් තරණය කළාහු යැ. තවද යම් කෙනෙක් මතු තරණය කරන්නාහු නම්, දැන් තරණය කෙරෙත් නම්, මේ මඟින් තරණය කෙරෙත්.

මෙසෙයින් බුදුහු එකායනමාර්ගයට ගියාහු නුයි 'එක' යහ.

කිසෙයින් බුදුහු එකලා වැ අනුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබෝධ කළාහු නුයි 'එක' වූහ' යත්: සතර මාර්ගඥානය ප්‍රඥෙන්ද්‍රිය ප්‍රඥාබලය... ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය විමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය 'බොධි' යයි කියනු ලැබේ. බුදුහු ඒ බොධිඥානයෙන් 'සියලු සංස්කාරයෝ අනිත්‍යහ යි දත්හ. 'සියලු සංස්කාරයෝ දුක්හ'යි දත්හ. 'සියලු ධර්මයෝ අනාත්ම හ'යි දත්හ. ...යම් කිසිවක් සමුදයධර්ම නම් එ හැම නැසෙන පියවි ඇතැ'යි දත්හ. නොහොත් යම් කිසිවක් දතයුතු නම්, නැවත නැවත දතයුතු නම්, මෙසෙයින් දතයුතු නම්, මැනැවින් දතයුතු නම්, අධිගම කළයුතු නම්, නුවණින් ස්පර්ශ කළයුතු නම්, ප්‍රත්‍යක්ෂ කළයුතු නම් ඒ සියල්ල ඒ බොධි ඥානයෙන් දත්හ, අනුබොධ කළහ, ප්‍රතිබෝධ කළහ. මෙසෙසින් දත්හ, මැනැවින් දත්හ, ස්පර්ශ කළහ, ප්‍රත්‍යක්ෂ කළහ, මෙසෙයින් බුදුහු එකලා වැ අනුත්තර වූ සම්‍යක්සම්බොධිය අභිසම්බුද්ධ කළාහු නුයි 'එක' නම් වූහ.

**තමොනුදොති:** භගවා රාගතමං දොසතමං මොහතමං දිට්ඨිතමං කිලෙසතමං දුච්චරිතතමං අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං පනුදි නුදි පජහි විනොදෙසි බ්‍යන්තීකාසි[1] අනභාවං ගමෙසි. **ආසීනොති:** නිසින්නො භගවා පාසාණකෙ චෙතියෙති 'ආසීනො.'

4. නගස්ස පස්සෙ ආසීනං මුනිං දුක්ඛස්ස පාරගුං
සාවකා පයුරුපාසන්ති තෙවිජ්ජා මච්චුහායිනො''ති[a]

එවම්පි භගවා ආසීනො. අථවා භගවා අප්පොස්සුක්කපටිප්පස්සද්ධත්තා ආසීනො, සො වුත්ථවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො, නත්ථි තස්ස පුනබ්භවො'ති එවම්පි භගවා ආසීනොති 'එකො තමොනුදාසීනො.'

**ජුතිමා සො පභඞ්කරොති** - 'ජුතිමා'ති ජුතිමා මතිමා පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. **පභඞ්කරොති:** පභඞ්කරො ආලොකකරො ඔභාසකරො දීපඞ්කරො පදීපඞ්කරො[2] උජ්ජොතකරො[3] පජ්ජොතකරො[4]ති 'ජුතිමා සො පභඞ්කරො'.

**ගොතමො භූරිපඤ්ඤාණොති:** ගොතමො භූරිපඤ්ඤාණො ඤාණපඤ්ඤාණො[5] පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො විචයබහුලො පවිචයබහුලො පෙක්ඛායනබහුලො[6] සමෙක්ඛායනබහුලො[7] විභූතවිහාරී තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො.

5. "ධජො රථස්ස පඤ්ඤාණං ධූමො පඤ්ඤාණමග්ගිනො
රාජා රට්ඨස්ස පඤ්ඤාණං භත්තා පඤ්ඤාණමිත්ථියා''ති.[b]

එවමෙව ගොතමො භූරිපඤ්ඤාණො ඤාණපඤ්ඤාණො පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො විචයබහුලො පවිචයබහුලො පෙක්ඛායනබහුලො සමෙක්ඛායනබහුලො විභූතවිහාරී තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යොති 'ගොතමො භූරිපඤ්ඤාණො'.

---

1. බ්‍යන්තීමකාසි-ස්‍යා
2. පදීපකරො-ම ජ සං
3. උජ්ජොතංකරො-පත
4. පජ්ජොතංකරො-පත
5. ඤාණපඤ්ඤාතො-සු.
6. ඔක්ඛායන බහුලො-ම ජ සං, ස්‍යාං,
7. සමොක්ඛායන ධම්මො- ම ජ සං -ස්‍යාං,

a. වඞ්ගීසසංයුත්ත - මොග්ගල්ලානසුත්ත
b. දෙවතාසංයුත්ත - රථසුත්ත.

**තමොනුදෙ** යනු: බුද්ධහු ප්‍රඥාලෝකය අඳුරු කරන, නුවණැස නූපදවන නොදැනීම ඇතිකරනා පැනැස නසන පීඩා කොටසෙහි වූ නිවන පිණිස නො පවත්නා වූ රාගාන්ධකාරය ද්වේෂාන්ධකාරය මොහාන්ධකාරය දෘෂ්ට්‍යාන්ධකාරය ක්ලෙශාන්ධකාරය දුශ්චරිතාන්ධකාරය දුරු කළහ වෙසෙසින් දුරු කළහ හැරපීහ බැහැර කළහ විගතාන්ත කළහ අනුඅභාවයට පැමිණවූහු. **ආසිනො** යනු: බුදුහු පහණසැති වැඩ හුන්හ නුස් 'ආසීනො' යනු වේ.

4. "ත්‍රිවිද්‍යා ඇති මැරහු බැහැර කළ ශ්‍රාවකයෝ පර්වතපාර්ශවයෙහි වැඩහුන්, සංසාර දුඃඛයාගේ පාරයට ගිය මුනිහු පර්යුපාසනය කෙරෙති"යි.

මෙසේත් බුදුහු "ආසීන" වෙති. නොහොත් බුදුහු අල්පොත්සුක බව සංහිඳුවන ලද වන බැවින් ආසීනයහ උන් වහන්සේ වැස ගිම වූ දශවිධ ආයතිවාස ඇතියහ පුරුදු කළ චරණධර්ම ඇතියහ...ජාතිමරණ සංසාර සඞ්ඛ්‍යාත පුනර්භවය උන් වහන්සේට නැතැ'යි මෙසේත් බුදුහු 'ආසීනයහ'යි 'එකො තමොනුදසිනො' යනු වේ.

**ජුතිමා සො පභඞ්කරො** 'ජුතිමා' යනු ද්‍යුතිමත්හ ස්මෘතිමත්හ පණ්ඩිත යහ ප්‍රඥා ඇතියහ බුද්ධිමත්හ නුවණ ඇතියහ විභාවනප්‍රඥා ඇතියහ තුලනප්‍රඥා ඇතියහ. පභඞ්කරො යනු: තේජස් කරනුවහ ආලෝක කරනුවහ අවභාස කරනුවහ පහන් කරනුවහ ප්‍රදීපයක් සෙයින් ආලොක කරනුවහ උද්‍යොතකරයහ ප්‍රද්‍යොතකරනුයහ'යි 'ජුතිමා සො පභඞ්කරො' යනු වේ.

**ගොතමො භූරිපඤ්ඤාණො** යනු: ගොයුම් ගොත්හු පුළුල් නුවණ ඇතියහ ඥානයෙන් ප්‍රකටයහ ප්‍රඥාධ්වජ ඇතියහ ඥානකේතු ඇතියහ ප්‍රඥාධිපතිහ විමසීම් බහුල කොට ඇතියහ ප්‍රවිචය බහුල කොට ඇතියහ ප්‍රෙක්ෂණ බහුල කොට ඇතියහ ඒෂණ බහුල කොට ඇතියහ ප්‍රකට කොට දත් විහරණ ඇතියහ එහි (ඥානයෙහි) හැසිරෙනුවහ එය බහුල කොට ඇතියහ එය ගරු කොට ඇතියහ එයට නැඹුරු වූවාහු යැ තත්ප්‍රවණයහ එයට බර වූවාහු යැ එහි අධිමුක්තයහ එය අධිපති කොට ඇතියහ.

5. "ධ්වජය රථයට සලකුණ වෙයි, ධූමය ගින්නට සලකුණ වෙයි, රජ රටට සලකුණ වෙයි, ස්වාමි තෙම ස්ත්‍රියට සලකුණ වේ"යි.

මෙසෙයින් ගොයුම්ගොත්හු පෘථුලප්‍රඥා ඇතියහ ඥානයෙන් ප්‍රකට වූවාහු යැ ඥානධ්වජ ඇතියහ ඥානකේතු ඇතියහ ප්‍රඥාව අධිපති කොට ඇතියහ විමසීම් බහුල කොට ඇතියහ වෙසෙසින් විමසීම් බහුල කොට ඇතියහ ප්‍රෙක්ෂණ බහුල කොට ඇතියහ ඒෂණ බහුල කොට ඇතියහ ප්‍රකට විහරණ ඇතියහ ඒ ඥානයෙහි හැසිරෙනුවහ එය බහුල කොට ඇතියහ තද්ගරුක තන්නිම්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත තදධිපති වූවාහු නුයි 'ගොතමො භූරිපඤ්ඤාණො' යනු වේ.

**ගොතමො භූරිමෙධසොති**– ‘භූරි’ වුච්චති පඨවී[1] භගවා තාය පඨවිසමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතො. ‘මෙධා’ වුච්චති පඤ්ඤා. “යා පඤ්ඤා පජානනා –පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි” භගවා ඉමාය මෙධාය උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සම්පන්නො[2] සමන්නාගතො. තස්මා බුද්ධො සුමෙධසොති[3] ‘ගොතමො භූරිමෙධසො’.

තෙනාහ ථෙරො පිඞ්ගියො:

“එකො තමොනුදාසීනො
ජුතිමා සො පභඞ්කරො,
ගොතමො භූරිපඤ්ඤාණො
ගොතමො භූරිමෙධසො”ති.

14

යො මෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා ක්වචි.

**යො මෙ ධම්මමදෙසෙසීති**– ‘යො’ති “යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි, තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො බලෙසු ච වසීභාවං. **ධම්මමදෙසෙසීති** ‘ධම්ම’න්ති ආදිකල්‍යාණං –පෙ– සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චත්තාරො සතිපට්ඨානෙ –පෙ– අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානං ච නිබ්බානගාමිනිං ච පටිපදං ආවික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසීති ‘යො මෙ ධම්ම මදෙසෙසි.’

**සන්දිට්ඨිකමකාලිකන්ති**: සන්දිට්ඨිකං අකාලිකං එහිපස්සිකං ඔපනයිකං[4] පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහීති. එවම්පි[5] සන්දිට්ඨිකං. අථවා යො දිට්ඨෙව ධම්මෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, තස්ස මග්ගස්ස අනන්තරා සමනන්තරා[6] අධිගච්ඡතෙව[7] ඵලං වින්දති පටිලභතීති එවම්පි සන්දිට්ඨිකමකාලිකං, යථා මනුස්සා කාලිකං ධනං දත්වා අනන්තරා න ලභන්ති[8] කාලං ආගමෙන්ති, නෙවායං ධම්මො. යො දිට්ඨෙව ධම්මෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, තස්ස මග්ගස්ස අනන්තරා සමනන්තරා[6] අධිගච්ඡතෙව ඵලං වින්දති පටිලභති න පරත්ථ න පරලොකෙ[9] එවං අකාලිකන්ති ‘සන්දිට්ඨිකමකාලිකං’.

---

1. පඨවි – ම ජ සං.
2. සමුපපන්නො – ම ජ සං,
3. බුද්ධො සුමෙධොති – පච–වි–ක, භූරිමෙධසොති–සයා
4. ඔපනෙය්‍යිකං – ම ජ සං.
5. එවං – ම ජ සං, සයා.
6. අනන්තරා සමනන්තරා – පත
7. අධිගච්ඡව. ව–වි–ක.
8. අනන්තරා න ලබ්භති. ව–වි–ක.
9. න පරත්ථ න පරලොකෙ – ව–වි–ක

**ගොතමො භූරිමෙධසො** –'භූරි' යි පෘථිවිය කියනු ලැබෙයි. බුදුහු ඒ පෘථිවිය හා සම වූ විපුලවූ විස්තෘතවූ ප්‍රඥයෙන් සමන්වාගතයහ. 'මෙධා' යි ප්‍රඥාව කියනු ලැබෙයි. "යම් ප්‍රඥාවක් ප්‍රජානනාකාරයෙක් ... අමොහයෙක් දහම් විමසීමෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එය යි. බුදුහු මේ මෙධායෙන් යුක්තයහ සමුපෙතයහ එළඹ සිටියහ සංයුක්තයහ අවියුක්තයහ පරිපූර්ණයහ සමන්වාගතයහ, එයින් බුදුහු මහා නුවණ ඇතියාහු නුයි 'ගොතමො භූරිමෙධසො' යනු වේ.

එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:

"එකො තමොනුදො ... ගොතමො භූරිමෙධසො "යි.

14.

යම් භාග්‍යවත් කෙනෙක් මට තමා විසින් දක්ක යුතු ඵල ඇති, නො ද කාලාන්තරයෙහි වින්ද යුතු ඵල ඇති, තෘෂ්ණාක්ෂය වූ, උවදුරු නැති, දහම් දෙසූසේක් ද ඒ භාග්‍යවතුන් වහන්සේ යි.

**යො මෙ ධම්මමදෙසෙසි**— 'යො' යනු: යම් භාග්‍යවත් කෙනෙක් (පරොපදෙශ රහිත වැ) තමන් වහන්සේ මැ (සත්‍යයන්) අවබොධ කළසේක් ද ආචාර්‍ය්‍යයන් නැත්තාහු ද පෙර නො ඇසූවිරූ දහම්හි සත්‍යයන් තුමූ මැ අවබොධ කළාහු ද එහි දූ සර්වඥභාවයට පැමිණියාහු ද බලධර්මයන්හි දූ වශීභාවයට පැමිණියාහු ද උන්වහන්සේ. **ධම්මමදෙසෙසි**— 'ධම්මං' යනු: ආදිකල්‍යාණ වූ ...අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ සියල්ල සම්පූර්ණ වූ පරිශුද්ධ වූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව සතර සතිපට්ඨානය...ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නිවන හා නිවනට යන සුලු පිළිවෙත හා වදළහ දෙසූහ පැනැවූහ තැබූහ විවරණ කළහ විභාග කළහ පාළ කළහ ප්‍රකාශ කළාහු නුයි 'යො මෙ ධම්මමදෙසෙසි' යනු වේ.

**සන්දිට්ඨිකමකාලිකං** යනු: තමා විසින් දක්කයුතු ඵල ඇති කල් නො යවා වින්ද යුතු ඵල ඇති 'එව බලව'යි කීමට නිසි උපනයනයට (එළඹීමට) නිසි නුවණැතියන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු නුයි මෙසේත් 'සන්දිට්ඨික' නම් වෙයි. නොහොත් යමෙක් මෙ අත්බැව්හි මැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩා ද ඒ මාර්ගයට අනතුරු වැ සමනන්තර වැ ඵලය ඒකාන්තයෙන් ප්‍රත්‍යක්ෂ කෙරෙයි විඳියි ප්‍රතිලාභ කෙරේ නුයි මෙසේත් 'සන්දිට්ඨික මකාලිකං' යනු වේ. යමසේ මිනිස්සු කාලික වූ ධනය දී අනතුරු වැ නො ලබත් ද කල් බලත් ද මෙ දහම එසෙයින් නො මැ වෙයි. යමෙක් මෙ අත්බැව්හි ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩා ද ඒ මාර්ගයට අනතුරු වැ සමනන්තර වැ ඵලය ඒකාන්තයෙන් ප්‍රත්‍යක්ෂ කෙරෙයි විඳියි ලබයි. පරාත්මභාවයෙහි පරලෝකයෙහි නො වෙයි මෙසේ අකාලික වේ නුයි 'සන්දිට්ඨිකමකාලිකං' යනු වේ.

**තණ්හක්ඛයමනීතිකන්ති:** ‘තණ්හා’ති ‘රූපතණ්හා -පෙ- ධම්ම තණ්හා’ තණ්හක්ඛයන්ති: තණ්හක්ඛයං රාගක්ඛයං දොසක්ඛයං මොහක්ඛයං ගතික්ඛයං උපපත්තික්ඛයං පටිසන්ධික්ඛයං භවක්ඛයං සංසාරක්ඛයං වට්ටක්ඛයං. අනීතිකන්ති ‘ඊති’ වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච, ඊතිප්පහානං ඊතිවූපසමං ඊතිපටිනිස්සග්ගං ඊති පටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති ‘තණ්හක්ඛයමනීතිකං’.

**යස්ස නත්ථි උපමා ක්වචීති:** ‘යස්සා’ති නිබ්බානස්ස නත්ථි උපමාති, උපමා නත්ථි උපනිධා නත්ථි, සදිසං නත්ථි[1] පටිභාගො නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, **ක්වචීති:** ක්වචි කිම්හිචි කම්හිචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වා’ති ‘යස්ස නත්ථි උපමා ක්වචි.’

තෙනාහ ථෙරො පිඞ්ගියො:

“යො මෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා ක්වචීති.

15.

කින්නු තම්හා විප්පවසසි[2] මුහුත්තමපි පිඞ්ගිය,
ගොතමා භූරිපඤ්ඤාණා ගොතමා භූරිමෙධසා.

**කින්නු තම්හා විප්පවසසීති:** කින්නු බුද්ධම්හා විප්පවසසි අපෙසි අපගච්ඡසි[3] විනා හොසීති ‘කින්නු තම්හා විප්පවසසි.’

**මුහුත්තමපි පිඞ්ගියාති:** මුහුත්තමපි ඛණමපි ලයමපි වයමපි අද්ධමපීති ‘මුහුත්තමපි’ පිඞ්ගියාති බාවරී තං ජාමාතරං නාමෙන ආලපති.

**ගොතමා භූරිපඤ්ඤාණාති:** ගොතමා භූරිපඤ්ඤාණා ඤාණපඤ්ඤාණා පඤ්ඤාධජා පඤ්ඤාකෙතුම්හා පඤ්ඤාධිපතෙය්‍යම්හා විචයබහුලා පවිචයබහුලා පෙක්ඛායනබහුලා සමෙක්ඛායනබහුලා[4] විභූතවිහාරිම්හා තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදාධිපතෙය්‍යම්හාති ‘ගොතමා භූරිපඤ්ඤාණා.’

**ගොතමා භූරි මෙධසාති** ‘භූරි’ වුච්චති පඨවී, භගවා තාය පඨවිසමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතො. ‘මෙධා’ වුච්චති පඤ්ඤා “යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි” භගවා ඉමාය මෙධාය පඤ්ඤාය උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සම්පන්නො සමන්නාගතො. තස්මා බුද්ධො සුමෙධසොති. ‘ගොතමා භූරිමෙධසා’.

තෙනාහ සො බ්‍රාහ්මණො:

15. “කින්නුතම්හා විප්පවසසි මුහුත්තමපි පිඞ්ගිය
ගොතමා භූරිපඤ්ඤාණා ගොතමා භූරිමෙධසා”ති

---

1. සදිසා නත්ථි- ච-වි-ක
2. විප්පවසි – ම ඡ සං
3. අපගච්ඡ – ම ඡ සං
4. සමෙක්ඛායනධම්මා – ම ඡ සං

තණ්හක්ඛයමනීතිකං– 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ... ධර්මතෘෂ්ණා යි. තණ්හක්ඛයං යනු: තෘෂ්ණාක්ෂය යැ රාගාක්ෂය යැ ද්වේෂක්ෂය යැ මොහක්ෂය යැ ගතික්ෂයැ උපප්‍රාප්තික්ෂය යැ ප්‍රතිසන්ධික්ෂය යැ භවක්ෂය යැ සංසාරක්ෂය යැ වෘත්තක්ෂය යැ. අනීතිකං යනු: ක්ලේශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද 'ඊති' යි කියනු ලැබෙති. ඊතිප්‍රහාණ යැ ඊතිව්‍යුපශම යැ ඊති දුරලීම යැ ඊති සන්හිඳුවීම යැ අමාමහනිවන තුයි 'තණ්හක්ඛයමනීතිකං' යනු වේ.

යස්ස නත්ථි උපමා කවචි– 'යස්ස' යනු: නිර්වාණයට යැ. 'නත්ථි උපමා' යනු: උපමා නැත් ද, කවචි යනු: අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි කිසි තැනෙකැ කිසිවකැ තුයි 'යස්ස නත්ථි උපමා ක්වචි' යනු වේ.

එයින් කිහ පිඞ්ගිය තෙරණුවෝ:

'යො මෙ ධම්මමදෙසෙසි –පෙ– යස්ස නත්ථි උපමා කවචි' යි.

15. පිඞ්ගිය, කිම තෙපි ඒ ඥානධ්වජ ඇති ගෞතමයන් කෙරෙන් විපුලප්‍රඥා ඇති ගෞතමයන් කෙරෙන් මොහොතක් පවා වෙන් වැ වසවු ද?

කින්නු තම්හා විප්පවසසි යනු: කිම් බුදුන් කෙරෙන් වෙන් වැ වසවු ද? පහවු ද? බැහැර වවු ද? වෙන් වවු ද? යි 'කින්නු තම්හා විප්පවසසි' යනු වේ.

මුහුත්තමපි පිඞ්ගිය යනු: මොහොතෙක්හි දු, ඇසිල්ලෙක්හි දු ලයෙක් හි දු වියෙක්හි දු ජීවිත කාලයෙක්හි දු තුයි 'මුහුත්තමපි' යනු වේ. පිඞ්ගිය යනු: බාවරී බමුණු ඒ බෑනාණුවන් නමින් අමතයි.

ගොතමා භූරිපඤ්ඤාණා යනු: පෘථුලඥාන ඇති, ඥානයෙන් ප්‍රකට වූ, ප්‍රඥාධවජ ඇති, ප්‍රඥාකෙතු ඇති, ප්‍රඥාධිපති වූ විචය බහුල වූ ප්‍රවිචය බහුල වූ ප්‍රෙක්ෂණබහුල වූ සමීක්ෂණ බහුල වූ දකට විහරණ ඇති ඒ ප්‍රඥාවට බැස සරන එය බහුල කොට ඇති එය ගරු කොට ඇති එයට නැමුණු එයට මැනැවින් නැමුණු එයට බර වූ එහි අධිමුක්ත වූ එය අධිපති කොට ඇති ගෞතමයන් කෙරෙන් තුයි 'ගොතමා භූරිපඤ්ඤාණා' යනු වේ.

ගොතමා භූරිමෙධසා– 'භූරි'යි පෘථිවිය කියනු ලැබෙයි. බුදුහු ඒ පෘථිවි සම වූ විපුල වූ විස්තෘත වූ ප්‍රඥායෙන් සමන්වාගතයහ. 'මෙධා'යි ප්‍රඥාව කියනු ලැබෙයි යම් ප්‍රඥායෙක් ප්‍රජානනාකාරයෙක් ...අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යක්දෘෂ්ටියෙක් වේ ද එය යි. බුදුහු මෙ මෙධායෙන් ප්‍රඥායෙන් උපෙතයහ සමුපෙතයහ උපාගතයහ සමුපාගතයහ තො වෙන් වූහ පරිපූර්ණයහ සමන්වාගතයහ එයින් බුදුහු 'සුමෙධස' තුයි 'ගොතමා භූරිමෙධසා' යනු වේ.

එයින් කී යැ එ බමුණු:

"කින්නුතම්හා විප්පවසසි –පෙ– ගොතම භූරිමෙධසා"යි.

16. යො තෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා ක්වචි.

යො තෙ ධම්මමදෙසෙසීති: 'යො සො භගවා -පෙ- තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො, බලෙසු ච වසීභාවං. ධම්මමදෙසෙසීති: 'ධම්ම'න්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං -පෙ- නිබ්බානං ච නිබ්බානගාමිනිං ච පටිපදං ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසීති 'යො තෙ ධම්මමදෙසෙසි'.

සන්දිට්ඨිකමකාලිකන්ති: සන්දිට්ඨිකං අකාලිකං එහිපස්සිකං ඔපනයිකං පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහීති එවම්පි සන්දිට්ඨිකං. අථවා යො දිට්ඨෙව ධම්මෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, තස්ස මග්ගස්ස අනන්තරා සමනන්තරා ධිගච්ඡතෙව ඵලං විඳති පටිලභතීති එවම්පි සන්දිට්ඨිකං. අකාලිකන්ති: යථා මනුස්සා කාලිකං ධනං දත්වා අනන්තරා න ලභන්ති කාලං ආගමෙන්ති, නෙවායං ධම්මො. යො දිට්ඨෙව ධම්මෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, තස්ස මග්ගස්ස අනන්තරා සමනන්තරා අධිගච්ඡතෙව ඵලං, විඳති පටිලභති න පරත්ථ න පරලොකෙ, එවං අකාලිකන්ති 'සන්දිට්ඨිකමකාලිකං'.

තණ්හක්ඛයමනීතිකන්ති. 'තණ්හා'ති රූපතණ්හා සද්දතණ්හා -පෙ- ධම්මතණ්හා. තණ්හක්ඛයන්ති: තණ්හක්ඛයං රාගක්ඛයං දොසක්ඛයං මොහක්ඛයං ගතික්ඛයං උපපත්තික්ඛයං පටිසන්ධික්ඛයං භවක්ඛයං සංසාරක්ඛයං වට්ටක්ඛයං. අනීතිකන්ති: 'ඊති' වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච. ඊතිප්පහානං ඊතිවූපසමං ඊතිපටිනිස්සග්ගං ඊතිපටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති 'තණ්හක්ඛයමනීතිකං'

යස්ස නත්ථි උපමා ක්වචීති - යස්සාති නිබ්බානස්ස, නත්ථි උපමාති උපමා නත්ථි, උපනිධා නත්ථි'[1] සදිසං නත්ථි[2] පටිභාගො නත්ථි' න සන්ති න සංවිජ්ජති නූපලබ්භති ක්වචීති: ක්වචි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති යස්ස නත්ථි උපමා ක්වචි.'

තෙනාහ සො බාවාරි බ්‍රාහ්මණො:

"යො තෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා ක්වචීති.

---

1. උපනිධි නත්ථි - පන
2. පාටිභොගො - පන

16.

පිඞ්ගිය, යම් කෙනෙක් තොපට තුමා විසින් දක්කයුතු ඵල ඇති තො ද කාලාන්තරයෙහි ලැබියයුතු ඵල ඇති තෘෂ්ණා ක්ෂය වූ කෙලෙස් උවදුරු නැති දහම් දෙසුහු ද, යම් සෙ තකුත්හට කිසි තැනෙක්හි උපමා නැද්ද,

යො තෙ ධම්මමදෙසෙයි යනු: යම් භාග්‍යවත් කෙනෙක් ... එහිදු සර්වඥ භාවයට පැමිණියාහු බලධර්මයන්හිදු වශීභාවයට පැමිණියාහු වෙත් ද උන්වහන්සේ. ධම්මමදෙසෙයි– ධම්මං යනු: ආදියෙහි කල්‍යාණ වූ වූ මධ්‍යයෙහි කල්‍යාණ වූ ... නිර්වාණ ද නිර්වාණගාමී ප්‍රතිපදාව ද වදළහ දෙසූහ පැනවූහ තැබූහ විවෘත කළහ විභාග කළහ ප්‍රකට කළහ ප්‍රකාශ කළාහු නුයි 'යො මෙ ධම්මමදෙසෙසි' යනු වේ.

සන්දිට්ඨිකමකාලිකං යනු: තමා විසින් දක්කයුතු ඵල ඇති තො ද කාලාන්තරයෙහි ලැබිය යුතු ඵල ඇති 'එව බලව' යි දක්වීමට නිසි තමා සිත්හි එළවීමට නිසි නුවණැතියන් වි න් තමන් තමන් කෙරෙහි ලා දතයුතු නුයි මෙසේත් 'සන්දිට්ඨික' නම් වෙයි. නොහොත් යමෙක් මෙ අත් බැව්හි මැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩා ද ඒ මාර්ගයට අනන්තර වැ සමනන්තර වැ එකත්තෙන් ඵලය අධිගම කෙරෙයි විඳියි ලබා නුයි මෙසේත් 'සන්දිට්ඨිකං' යනු වේ. අකාලිකං යනු: යම් සේ මිනිස්සු කාලික වූ ධනය දී අනතුරු වැ නො ලබති කල් බලති. මේ දහම එසේ නො මැ වෙයි. යමෙක් මෙ අත්බැව්හි මැ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වඩා ද ඒ මාර්ගයට අනන්තර වැ සමනන්තර වැ එකත්තෙන් ඵලය අධිගම කෙරෙයි විඳියි ලබයි. පර අත්බැව්හි නො වෙයි පූර ලෙව්හි නො වෙයි. මෙසෙයින් අකාලික නුයි 'සන්දිට්ඨික මකාලිකං' යනු වේ.

තණ්හක්ඛයමනීතිකං– 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ශබ්දතෘෂ්ණා යැ ... ධර්මතෘෂ්ණා යි. තණ්හක්ඛයං යනු: තෘෂ්ණාක්ෂය යැ රාගක්ෂය යැ ද්වේෂක්ෂය යැ මොහක්ෂය යැ ගතික්ෂය යැ උපප්‍රාප්ති ක්ෂය යැ ප්‍රතිසන්ධික්ෂය යැ භවක්ෂය යැ සංසාරක්ෂය යැ වෘත්තක්ෂය යි. අනීතිකං යනු: ක්ලේශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද 'ඊති' යයි කියනු ලැබෙති. ඊතිප්‍රහාණය ඊතිව්‍යුපශමය ඊති දුරලීම ඊති සන්හිඳුවීම අමාමහනිවන නුයි 'තණ්හක්ඛය මනීතිකං' යනු වේ.

යස්ස නත්ථි උපමා ක්වචි– 'යස්ස' යනු: නිවනට. නත්ථි උපමා යනු: උපමා නැත, උපනිධි නැත, සදෘශයෙක් නැත, ප්‍රතිභාගයෙක් නැත, විද්‍යමාන නො වෙයි, නො ලැබේ. ක්වචි යනු: අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි අධ්‍යාත්මබාහ්‍ය වේවයි කිසිවෙකැ කිසිවක්හි කිසි තැනෙක්හි නුයි 'යස්ස නත්ථි උපමා ක්වචි' යනු වේ.

එයින් කී යැ ඒ බාවරි බමුණු:

"යො තෙ ධම්මමදෙසෙයි –පෙ– යස්ස නත්ථි උපමා ක්වචි"යි.

17.

නාහං තමහා විප්පවසාමි මුහුත්තමපි බ්‍රාහ්මණ,
ගොතමා භූරිපඤ්ඤාණා ගොතමා භූරිමෙධසා.

**නාහං තමහා විප්පවසාමීති:** නාහං බුද්ධම්හා විප්පවසාමි, අපෙමි අපගච්ඡාමි විනා හොමීති 'නාහං තමහා විප්පවසාමි'.

**මුහුත්තමපි බ්‍රාහ්මණාති:** මුහුත්තම්පි ඛණම්පි ලයම්පි වයම්පි අද්ධම්පීති 'මුහුත්තමපි'. බ්‍රාහ්මණාති ගාරවෙන මාතුලං ආලපති.

**ගොතමා භූරිපඤ්ඤාණාති:** ගොතමා භූරිපඤ්ඤාණා ඤාණපඤ්ඤාණා පඤ්ඤාධජා පඤ්ඤාකෙතුම්හා පඤ්ඤාධිපතෙය්‍යම්හා විචයබහුලා පවිචයබහුලා පෙක්ඛායනබහුලා සමෙක්ඛායනබහුලා විභූතවිහාරිම්හා තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොනා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යම්හාති ගොතමා භූරිපඤ්ඤාණා.

**ගොතමා භූරිමෙධසාති:** භූරි වුච්චති පථවි. භගවා තාය පථවිසමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතො. 'මෙධා' වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා –පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි. භගවා ඉමාය මෙධාය පඤ්ඤාය උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සම්පන්නො සමන්නාගතො, තස්මා බුද්ධො සුමෙධසොති 'ගොතමා භූරිමෙධසා'

තෙනාහ ථෙරො පිඞ්ගියො:

"නාහං තමහා විප්පවසාමි මුහුත්තමපි බ්‍රාහ්මණ,
ගොතමා භූරිපඤ්ඤාණා ගොතමා භූරිමෙධසා"ති.

18.

යො මෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා කවචි.

**යො මෙ ධම්මමදෙසෙසීති:** යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි, තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො බලෙසු ච වසීභාවං. ධම්මමදෙසෙසීති: 'ධම්මං තෙ ආදිකල්‍යාණං –පෙ– පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං, චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානං ච නිබ්බානගාමිනිං ච පටිපදං ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසීති යො මෙ ධම්මමදෙසෙසි'.

17.

බ්‍රාහ්මණයෙනි, මම ඒ ඥානධ්වජ ඇති ගෞතමයන් කෙරෙන් විපුලප්‍රඥා ඇති ගෞතමයන් කෙරෙන් මොහොතකුදු වෙන් වැ නො වෙසෙමි.

නාහං තම්හා විප්පවසාමි යනු: මම බුදුන් කෙරෙන් වෙන් වැ නො වෙසෙමි, නො පහවෙමි, නො බැහැර වෙමි වෙන් නො වෙම් නුයි 'නාහං තම්හා විප්පවසාමි' යනු වේ.

මුහුත්තමපි බ්‍රාහමණ යනු: මොහොතෙක්හිදු ඇසිල්ලෙක්හිදු ලයෙක් හිදු වියෙක්හි දු ආයුකාලයෙක්හිදු නුයි 'මුහුත්තමපි' යනු වේ. බ්‍රාහමණ යනු: ගෞරවයෙන් මයිලණුවන් අමතයි.

ගොතමා භූරිපඤ්ඤාණා යනු: පෘථුලඥාන ඇති, ඥානයෙන් ප්‍රකට වූ ප්‍රඥාධ්වජ ඇති ප්‍රඥකෙතු ඇති ප්‍රඥාධිපති වූ විචයබහුල වූ ප්‍රවිචය බහුල වූ ප්‍රෙක්ෂණ බහුල වූ සමීක්ෂණබහුල වූ ප්‍රකටවිහරණ ඇති තච්චරිත තද්බහුල තද්ගරුක තන්නිම්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත තදධිපති වූ ගෞතමයන් කෙරෙන් නුයි 'ගොතමා භූරිපඤ්ඤාණා' යනු වේ.

ගොතමා භූරිමෙධසා– 'භූරි' යි පෘථිවිය කියනු ලැබෙයි. බුදුහු ඒ පෘථිවිසම විපුල වූ පතළ වූ ප්‍රඥායෙන් සමන්වාගතයහ. 'මෙධා' යි ප්‍රඥාව කියනු ලැබෙයි. යම් ප්‍රඥායෙක් ප්‍රජානනාකාරයෙක්... අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යක්දෘෂ්ටියෙක් වේ ද එයයි. බුදුහු මේ මෙධායෙන් ප්‍රඥායෙන් උපේතයහ සමුපේතයහ එළඹ සිටියහ මැනැවින් එළඹ සිටියහ යුක්තයහ පරිපූර්ණයහ සමන්වාගතයහ. එයින් බුදුහු 'සුමෙධස' නුයි 'ගොතමා භූරිමෙධසා' යනු වේ.

එයින් කීහ පිඞගිය තෙරණුවෝ:

"නාහං තම්හා විප්පවසාමි –පෙ– ගොතමා භූරිමෙධසා"යි.

18.

යම් කෙනෙක් මට තමා විසින් දක්කයුතු ඵල ඇති නො ද කාලාන්තරයෙහි ලැබිය යුතු ඵල ඇති තෘෂ්ණාක්ෂය වූ කෙලෙස් උවදුරු නැති දහම් දෙසූ සේක් ද, යම් කෙනකුන්හට කිසි තැනෙක්හි උපමා නැද්ද උන් වහන්සේ යි.

යො මෙ ධම්මමදෙසෙසි යනු: යම් භාග්‍යවත් කෙනෙක් තුමූ මැ සර්වඥ වූවාහු ආචාර්‍ය්‍යයකු රහිත වැ පෙර නො ඇසූ විරූ දහම් විෂයෙහි තුමූ මැ සිව්සස් අවබොධ කළාහු ද ඒ සත්‍යයන්හි දු සර්වඥ බවට පැමිණියාහු ද බලයන්හි දු වශී බවට පැමිණියාහු ද උන්වහන්සේ ධම්මමදෙසෙසි– 'ධම්මං' යනු: ආදි කල්‍යාණ වූ... පර්‍ය්‍යවසාන කල්‍යාණ වූ අර්ත්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ සියල්ල පිරිපුන් පිරිසිදු සසුන් බඹසර, සතර සතිපට්ඨානය සතර සම්‍යක්ප්‍රධානය, සතර ඍද්ධිපාදය, පඤ්චෙන්ද්‍රියය, පඤ්ච බලය, සප්තබොධ්‍යඞ්ගය, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය නිර්වාණ හා නිර්වාණ ගාමිනී ප්‍රතිපදව හා වදළහ දෙසූහ පැනවූහ තැබූහ විවරණ කළහ විභාග කළහ පාළ කළහ ප්‍රකාශ කළාහු නුයි 'යො මෙ ධම්මමදෙසෙසි' යනු වේ.

**සන්දිට්ඨික මකාලිකන්ති:** සන්දිට්ඨිකං අකාලිකං එහිපස්සිකං ඔපනයිකං පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහීති. එවම්පි සන්දිට්ඨිකං, අථවා යො දිට්ඨෙව ධම්මෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, තස්ස මග්ගස්ස අනන්තරා සමනන්තරා අධිගච්ඡතෙව ඵලං වින්දති පටිලභතීති එවම්පි සන්දිට්ඨිකං. **අකාලිකන්ති:** යථා මනුස්සා කාලිකං ධනං දත්වා අනන්තරා න ලභන්ති, කාලං ආගමෙන්ති, නෙවායං ධම්මො යො දිට්ඨෙව ධම්මෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, තස්ස මග්ගස්ස අනන්තරා සමනන්තරා අධිගච්ඡතෙව ඵලං වින්දති පටිලභති න පරත්ථ න පරලොකෙති 'එවං අකාලිකන්ති 'සන්දිට්ඨික මකාලිකං'.

**තණ්හක්ඛයමනීතිකන්ති:** 'තණ්හා'ති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා. **තණ්හක්ඛයන්ති:** තණ්හක්ඛයං රාගක්ඛයං දොසක්ඛයං මොහක්ඛයං ගතික්ඛයං උපපත්තික්ඛයං පටිසන්ධික්ඛයං භවක්ඛයං සංසාරක්ඛයං වට්ටක්ඛයං. **අනීතිකන්ති:** 'ඊති'වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච, ඊතිප්පහානං ඊතිවූපසමං ඊතිපටිනිස්සග්ගං ඊතිපටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති 'තණ්හක්ඛයමනීතිකං.'

**යස්ස නත්ථි උපමා කවචීති–** 'යස්සා'ති නිබ්බානස්ස, නත්ථි උපමාති: උපමා නත්ථි, උපනිධා නත්ථි,[1] සදිසං නත්ථි පටිභාගො නත්ථි, න සන්ති න සංවිජ්ජති. නුපලබ්භති, කවචීති: කුවචි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වා'ති 'යස්ස නත්ථි උපමා කවචි'.

තෙනාහ ථෙරො පිඞ්ගියො:

"යො මෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨික මකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා කවචී"ති.

19.

පස්සාමි නං මනසා චක්ඛුනා වා[2].
රත්තිං දිවං බ්‍රාහ්මණ, අප්පමත්තො,
නමස්සමානො විවසෙමි රත්තිං[3].
තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසං.

**පස්සාමි නං මනසා චක්ඛුනා වාති:** යථා චක්ඛුමා පුරිසො ආලොකෙ රූපගතානි පස්සෙය්‍ය, දක්ඛෙය්‍ය ඔලොකෙය්‍ය නිජ්ඣායෙය්‍ය උපපරික්ඛෙය්‍ය එවමෙවාහං බුද්ධං භගවන්තං මනසා පස්සාමි, දක්ඛාමි ඔලොකෙමි නිජ්ඣායාමි උපපරික්ඛාමීති 'පස්සාමි නං මනසා චක්ඛුනාවා'.

---

1. උපනිධි නත්ථි- සත
2. චක්ඛුනා ච – ච–වි–ක
3. නමස්සමානොව වසෙමි රත්තිං – ස

සන්දිට්ඨික මකාලිකං යනු: තමා විසින් දැක්කයුතු ඵල ඇති නො ද කාලාන්තරයෙහි ලැබිය යුතු ඵල ඇති 'එව බලව' යි දක්වීමට නිසි තමා සිත්හි එළවීමට නිසි නුවණැතියන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු නුයි මෙසේත් 'සන්දිට්ඨිකං' යනු වේ. නොහොත් යමෙක් මෙ අත්බැව්හි මැ ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය වඩා ද, ඒ මාර්ගයට අනන්තර වැ සමනන්තරවැ එකත්තෙන් ඵලය අධිගම කෙරෙයි විඳියි ලබා නුයි මෙසේත් 'සන්දිට්ඨිකං' යනු වේ. අකාලිකං යනු: යමසේ මිනිස්සු කාලික වූ ධනය දී අනතුරු වැ නො ලබත් ද කල් බලත් ද මෙ දහම එසෙයින් නො මැ වෙයි. යමෙක් මෙ අත්බැව්හි මැ ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය වඩා ද ඒ මාර්ගයට අනන්තරවැ සමනන්තර වැ එකත්තෙන් ඵලය අධිගම කෙරෙයි විඳියි. ලබියි පර අත්බැව්හි නො වෙයි පරලෙව්හි නො වේ. මෙසෙයින් අකාලික නුයි 'සන්දිට්ඨිකමකාලිකං' යනු වේ.

තණ්හක්ඛයමනීතිකං– 'තණ්හා' යනු රූපතෘෂ්ණා යැ... ධර්මතෘෂ්ණා යි. තණ්හක්ඛයං යනු: තෘෂ්ණාක්ෂය යැ රාගක්ෂය යැ ද්වේෂක්ෂය යැ මොහක්ෂය යැ ගතික්ෂය යැ උපපාත්තික්ෂය යැ ප්‍රතිසන්ධික්ෂය යැ භව-ක්ෂය යැ සංසාරක්ෂය යැ වෘත්තක්ෂය යි. අනීතිකං– 'ඊති' යි ක්ලේශ-යෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද කියනු ලැබෙති. ඊතිප්‍රහාණය ඊති සන්හිඳුවීම ඊති දුරලීම ඊති නො පැවැත්ම අමාමහ නිවන නුයි 'තණ්හක්ඛයමනීතිකං' යනු වේ.

යස්ස නත්ථි උපමා කවචි– 'යස්ස' යනු: නිර්වාණයට. නත්ථි උපමා යනු: උපමා නැති උපනිධි නැති සදෘශයෙක් නැති ප්‍රතිභාගයෙක් නැති නො වේ නො පැනේ නො ලැබේ. කවචි යනු: අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි අධ්‍යාත්ම බාහ්‍ය වේවයි කිසිවකැ කිසිවෙක්හි කිසි තැනෙකැ නුයි 'යස්ස නත්ථි උපමා ක්වචි' යනු වේ.

එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:

''යො මෙ ධම්මමදෙසෙසි –පෙ– යස්ස නත්ථි උපමා කවචි''යි.

19.

බ්‍රාහ්මණයෙනි; (මම,) අප්‍රමත්ත වූයෙම දවරයැ ඇසින් මෙන් මනසින් ඒ ගෞතම බුදුන් දක්මි, නමස්කාර කෙරෙමින් මැ රැය ඉක්මවමි, එයින් මැ අවිප්‍රවාසය හඟිමි.

පස්සාමි නං මනසා චක්ඛුනා වා –යම්සේ ඇස් ඇති පුරුෂයෙක් ආලෝක යෙහි රූපගතයන් බලා නම් දකී නම් අවලෝකනය කෙරේ නම් නිධ්‍යාන කෙරේ නම් විමසා නම් එසෙයින් මැ මම භාග්‍යවත් බුදුන් මනසින් බලමි දකිමි අවලොකනය කෙරෙමි නිධ්‍යාන කෙරෙමි පිරික්සමි නුයි 'පස්සාමි නං මනසා චක්ඛුනා වා' යනු වේ.

**රත්තිං දිවං බ්‍රාහ්මණ අප්පමත්තොති**– රත්තිං ච දිවා ච බුද්ධානුස්සතිං මනසා භාවෙන්තො. අප්පමත්තොති 'රත්තිං දිවං බ්‍රාහ්මණ අප්පමත්තො'.

**නමස්සමානො විවසෙමි රත්තින්ති**– 'නමස්සමානො'ති කායෙන වා නමස්සමානො, වාචාය වා නමස්සමානො, චිත්තෙන වා නමස්සමානො, අන්වත්ථපටිපත්තියා වා නමස්සමානො, ධම්මානුධම්මපටිපත්තියා වා නමස්සමානො, සක්කාරයමානො,[1]. ගරුකාරයමානො[2]. මානයමානො පූජයමානො රත්තිං දිවං විවසෙමි, අතිනාමෙමි අතික්කමාමීති 'නමස්සමානො විවසෙමි රත්තිං'.

**තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසන්ති**: තාය බුද්ධානුස්සතියා භාවෙන්තො. අවිප්පවාසොති තං මඤ්ඤාමි අවිප්පවුත්තොති[3] 'තං මඤ්ඤාමි ජානාමි එවං ජානාමි එවං අජානාමි, එවං විජානාමි, එවං පටිවිජානාමි, එවං පටිවිජ්ඣාමීති 'තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසං.'

තෙනාහ ථෙරො පිඞ්ගියො:

''පස්සාමි නං මනසා චක්ඛුනා වා
රත්තිං දිවං බ්‍රාහ්මණ අප්පමත්තො,
නමස්සමානො විවසෙමි රත්තිං
තෙනෙව මඤ්ඤාමි අවිප්පවාස''න්ති.

20.

සද්ධා ච පීති ච මනො සති ච[4]
නාපෙන්ති මෙ ගොතමසාසනම්හා,
යං යං දිසං වජති[5] භූරිපඤ්ඤො
ස තෙන තෙනෙව නතො'හමස්මි.

**සද්ධා ච පීති ච මනො සතිචාති**– 'සද්ධා'ති ''යා ච භගවන්තං ආරබ්භ සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො[6] සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං –පෙ– පීතීති: ''යා භගවන්තං ආරබ්භ පීති පාමොජ්ජං[7] ආමොදනා[8] පමොදනා හාසො පහාසො විත්ති තුට්ඨි ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස''. මනොති ''යං ච භගවන්තං ආරබ්භ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු''. සතීති: ''යා භගවන්තං ආරබ්භ සති අනුස්සති –පෙ– සම්මාසතීති'' සද්ධා ච පීති ච මනො සතිච'.

---

1. සක්කාරමානො – ම ජ සං ච-වි-ක
2. ගරුකාරමානො – ම ජ සං ච-වි-ක
3. අවිප්පවුත්ථොති – ම ජ සං.
4. සතිමතා – පත
5. යං යං දිසං භජති – ච-වි-ක
6. අභිප්පසාදෙ – ච-වි-ක
7. පාමුජ්ජං – සභා,
8. මොදනා ආමොදනා – ම ජ සං

රත්තිං දිවං බ්‍රාහ්මණ අප්පමත්තො යනු: රැයිදු දවහල්හිදු අප්‍රමත්ත වැ බුද්ධානුස්මෘතිය මනසින් වඩනුයෙම් නුයි 'රත්තිං දිවං බ්‍රාහ්මණ අප්පමත්තො' යනු වෙ.

නමස්සමානො විවසෙමි රත්තිං— 'නමස්සමානො' යනු: කයින් හෝ නමස්කාර කරනුයෙම් වචනයෙන් හෝ නමස්කාර කරනුයෙම් සිතින් හෝ නමස්කාර කරනුයෙම් අන්වර්ත්ථ ප්‍රතිපත්තියෙන් හෝ නමස්කාර කරනුයෙම් ධර්මානුධර්මප්‍රතිපත්තියෙන් හෝ නමස්කාර කරනුයෙම් සත්කාර කරනුයෙම් ගරු කරනුයෙම් මානන කරනු යෙම් පූජා කරනුයෙම් දිවිරැය ගෙවමි ඉක්මවමි අතික්‍රමණය කෙරෙම් නුයි 'නමස්සමානො විවසෙමි රත්තිං' යනු වෙ.

තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසං— ඒ බුද්ධානු ස්මෘතිය වඩනුයෙම් උන් වහන්සේ අවිප්‍රවාස කොට හඟිමි උන් වහන්සේ අවිප්‍රවාස වූවන් කොට හඟිමි, දනිමි මෙසේ දනිමි මෙසේ එකත්තෙන් දනිමි මෙසේ අනෙකප්‍රකාරයෙන් දනිමි මෙසේ සකාරණ වැ දනිමි මෙසේ ප්‍රතිවෙධ කෙරෙම් නුයි 'තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසං' යනු වෙ.

එයින් කිහ පිඞ්ගිය තෙරණුවෝ:

''පස්සාමි නං මනසා -පෙ- තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසං''යි.

20.

මාගේ ශ්‍රද්ධාව ද ප්‍රීතිය ද මනස ද ස්මෘතිය ද ගෞතමශාසනයෙන් පහ වැ නො යෙති. විපුල ප්‍රඥා ඇති උන් වහන්සේ යම් යම් දෙසකට වඩනාසේක් ද ඒ ඒ දෙසට මැ මම් නමු වූයෙම් වෙමි.

සද්ධා ච පීති ච මනො සතිමා— 'සද්ධා' යනු: භාග්‍යවතුන් ඇරබ යම් ශ්‍රද්ධාවක් හදහන අයුරෙක් ගුණයෙහි බැසගැනීමෙක් අතිශය ප්‍රසාදයෙක් හැදැරීමෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයෙක් ශ්‍රද්ධාබලයෙක් ... ප්‍රීති යනු: බුදුන් ඇරබ යම් ප්‍රීතියක් ප්‍රමුදිත බවෙක් ආමොදනායෙක් ප්‍රමොදනායෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් චිත්තියක් තුෂ්ටියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සතුටු බවෙක් වෙ ද එය යි. මනො යනු: භාග්‍යවතුන් ඇරබ යම් චිත්තයෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් පණ්ඩර වූ භවාඞ්ගමනසෙක් මන සඞ්ඛ්‍යාත මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප මනොවිඥාන ධාතුයෙක් වෙ ද එය යි සති යනු: භාග්‍යවතුන් ඇරබ යම් ස්මෘතියක් අනුස්මෘතියක් ... සම්‍යක්ස්මෘතියක් වෙ ද ඒ නුයි 'සද්ධා ච පීති ච මනො සතිච' යනු වෙ.

**නාපෙන්ති මෙ ගොතමසාසනම්හාති:** ඉමෙ චත්තාරො ධම්මා ගොතමසාසනා බුද්ධසාසනා ජිනසාසනා තථාගතසාසනා දෙවදෙවසාසනා අරහන්තසාසනා. නාපෙන්තීති නාපෙන්ති න ගච්ඡන්ති න විජහන්ති න විනාසෙන්තීති 'නාපෙන්ති මෙ ගොතමසාසනම්හා'.

**යං යං දිසං වජති භූරිපඤ්ඤොති:** 'යං යං දි'සන්ති පුරත්ථිමං වා දිසං පච්ඡිමං වා දිසං දක්ඛිණං වා දිසං උත්තරං වා දිසං වජති ගච්ඡති කමති අභික්කමති, භූරිපඤ්ඤොති: භූරිපඤ්ඤො මහාපඤ්ඤො තික්ඛපඤ්ඤො පුථුපඤ්ඤො හාසපඤ්ඤො ජවනපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො. 'භූරි'වුච්චති පඨවී, තාය පඨවිසමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතොති 'යං යං දිසං වජති භූරිපඤ්ඤො'.

**ස තෙන තෙනෙව නතො'හමස්මීති:** සො යෙන බුද්ධො තෙන තෙනෙව නතො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යොති 'ස තෙන තෙනෙව නතො 'හමස්මි'.

තෙනාහ ථෙරො පිඞ්ගියො:

"සද්ධා ච පීති ච මනො සතී ච
නාපෙන්ති මෙ ගොතම සාසනම්හා,
යං යං දිසං වජති භූරිපඤ්ඤො
ස තෙන තෙනෙව නතො'හමස්මී"ති.

21.

**ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස**
**තෙනෙව කායො න පලෙති[1] තත්ථ,**
**සඞ්කප්පයත්තාය[2] වජාමි නිච්චං**
**මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො.**

**ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්සාති** – 'ජිණ්ණස්සා'ති ජිණ්ණස්ස වුද්ධස්ස මහල්ලකස්ස අද්ධගතස්ස වයො අනුප්පත්තස්ස දුබ්බලථාමකස්සාති: දුබ්බලථාමකස්ස අප්පථාමකස්ස පරිත්තථාමකස්සාති 'ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස'.

**තෙනෙව කායො න පලෙති තත්ථාති:** කායො යෙන බුද්ධො තෙන න පලෙති න වජති න ගච්ඡති නාභික්කමතීති 'තෙනෙව කායො න පලෙති තත්ථ'.

---

1. පරෙති – ස    2. සඞ්කප්පජත්තාය – ම ජ සං, සහා

**නාපෙන්ති මෙ ගොතමසාසනම්හා** යනු: මේ සතර ධර්මයෝ ගෞතමශාසනයෙන් බුද්ධශාසනයෙන් ජිනශාසනයෙන් තථාගතශාසනයෙන් දෙවදෙවශාසනයෙන් අර්හත් ශාසනයෙන්. නාපෙන්ති යනු: නො පහ වෙති නො යෙති නො හරිති නො නැසෙත් නුයි 'නාපෙන්ති මෙ ගොතම සාසනම්හා' යනු වේ.

**යං යං දිසං වජති භූරිපඤ්ඤො**– 'යං යං දිසං' යනු: පෙරදිගට හෝ පැළදිගට හෝ දකුණුදිගට හෝ උතුරුදිගට හෝ යේ ද ගමන් කෙරේ ද පිය නගා ද ඉදිරියට යේ ද. 'භූරිපඤ්ඤ' යනු: පෘථුලප්‍රඥා ඇත්තේ මහාප්‍රඥා ඇත්තේ තීක්ෂණ ප්‍රඥා ඇත්තේ විපුල ප්‍රඥා ඇත්තේ හර්ෂබහුල ප්‍රඥා ඇත්තේ ජවනප්‍රඥා ඇත්තේ නිර්වේධික ප්‍රඥා ඇත්තේ. 'භූරි' යි පෘථිවිය කියනු ලැබෙයි. පෘථිවිය හා සම වූ ඒ විපුල වූ (විස්තෘත වූ) ප්‍රඥායෙන් සමන්වාගත වූයේ නුයි 'යං යං දිසං වජති භූරිපඤ්ඤො' යනු වේ.

**ස තෙන තෙනෙ'ව නතො' හමස්මි** යනු: ඒ බුදුහු යම් දිසාභාගයෙක්හි වෙත් ද ඒ ඒ දිසාභාගයෙහි මැ නැමුණෙම් එයට නිමන වූයෙම් එයට නැඹුරු වූයෙම් එයට බර වූයෙම් එහි අධිමුක්ත වූයෙම් එය අධිපති කොට ඇතියෙම් නුයි 'ස තෙන තෙනෙ' ව නතො' හමස්මි' යනු වේ.

එයින් කිහ පිඞ්ගිය තෙරණුවෝ:

"සද්ධා ච පීති ච –පෙ– ස තෙන තෙනෙ'ව නතො' හමස්මි" යි.

**21.**

ජීර්ණ වූ (එයින් මැ) අල්පවීර්‍ය්‍ය ඇති මාගේ කය එ කරුණින් මැ එහි නො යෙයි. සංකල්ප ගමනින් එක්වන් යෙමි. එහෙයින් බ්‍රාහ්මණ යෙනි, මාගේ සිත ඒ බුදුන් ඇති තැන්හි යෙදුණේ වේ යි.

**ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස**– 'ජිණ්ණස්ස' යනු; ජීර්ණ වූ වයොවෘද්ධ වූ මහලු වූ ත්‍රිවිධ වයො කොට්ඨාශයන් ඉක්මගිය තුන් වැනි වයසට පැමිණි. දුබ්බලථාමකස්ස යනු: දුර්වලවීර්‍ය්‍ය ඇති අල්පවීර්‍ය්‍ය ඇති මන්දවීර්‍ය්‍ය ඇති නුයි 'ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස' යනු වේ .

**තෙනෙව කායො න පලෙති තත්‍ථ** – බුදුහු යම් තැනෙක්හි වෙත් ද කය එතැනින් පලා නො යෙයි, නො යෙයි, ගමනය නො කෙරෙයි, නො පෙරටයෙ නුයි 'තෙනෙව කායො න පලෙති තත්‍ථ' යනු වේ.

සඞ්කප්පයත්තාය වජාමි නිච්චන්ති-සඞ්කප්පගමනෙන විතක්කගමනෙන ඤාණගමනෙන පඤ්ඤාගමනෙන බුද්ධිගමනෙන වජාමි ගච්ඡාමි අභික්කමාමීති 'සඞ්කප්පයත්තාය වජාමි නිච්චං'.

මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තොති 'මනො'ති "යං චිත්තං මනො මානසං -පෙ- තජ්ජා මනොවිඤ්ඤාණධාතු. මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තොති: මනො යෙන බුද්ධො තෙන යුත්තො පයුත්තො සංයුත්තොති 'මනොහි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො:

තෙනාහ ථෙරො පිඞ්ගියො.'

"ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස
තෙනෙව කායො න පලෙති තත්ථ,
සංකප්පයත්තාය වජාමි නිච්චං
මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො"ති.

22.

පඞ්කෙ සයානො පරිඵන්දමානො
දීපා දීපං[1] උපපලවිං,[2]
අථද්දසාසිං සම්බුද්ධං
ඔඝතිණ්ණමනාසවං.

පඞ්කෙ සයානො පරිඵන්දමානොති-'පඞ්කෙසයානො'ති කාමපඞ්කෙ කාමකද්දමෙ කාමකිලෙසෙ කාමපලිපෙ[3] කාමපරිළාහෙ කාමපළිබොධෙ සෙමානො සයමානො වසමානො ආවසමානො පරිවසමානොති පඞ්කෙ සයානො. පරිඵන්දමානොති: තණ්හාඵන්දනාය ඵන්දමානො, දිට්ඨිඵන්දනාය ඵන්දමානො, කිලෙසඵන්දනාය ඵන්දමානො පයොගඵන්දනාය ඵන්දමානො, විපාකඵන්දනාය ඵන්දමානො, මනොදුච්චරිතඵන්දනාය ඵන්දමානො, රත්තො රාගෙන ඵන්දමානො, දුට්ඨො දොසෙන ඵන්දමානො, මූළ්හො මොහෙන ඵන්දමානො, විනිබද්ධො[4]' මානෙන ඵන්දමානො, පරාමට්ඨො දිට්ඨියා ඵන්දමානො, වික්ඛෙපගතො උද්ධච්චෙන ඵන්දමානො, අනිට්ඨං ගතො විචිකිච්ඡාය ඵන්දමානො, ථාමගතො අනුසයෙහි ඵන්දමානො, ලාභෙන ඵන්දමානො, අලාභෙන ඵන්දමානො, යසෙන ඵන්දමානො, අයසෙන ඵන්දමානො, පසංසාය ඵන්දමානො, නින්දාය ඵන්දමානො, සුඛෙන ඵන්දමානො, දුක්ඛෙන ඵන්දමානො,

1. දිසාදිසං - ව-වි-ක
2. උපලෙපිං – ම ජ සං,
3. කාමබළිසෙ – ම ජ සං, ස්‍යා,
කාමපලිසෙ – ව-වි-ක
4. විනිබන්ධො – ම ජ සං, ස්‍යා, ව-වි-ක

සඞ්කප්පයත්තාය වජාමි නිච්චං යනු: සංකල්ප ගමනින් විතර්ක ගමනින් ඥාන ගමනින් ප්‍රඥා ගමනින් බුද්ධි ගමනින් යෙම් ගමනය කෙරෙමි පෙරට යෙම් නුයි 'සඞ්කප්පයත්තාය වජාමි නිච්චං' යනු වෙ.

මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො– 'මනො' යනු: යම් සිතෙක් මනසෙක් මානසයෙක් ...තදනුරූපමනොවිඥාන ධාතුයෙක් වේ ද එය යි. මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො යනු: බුදුහු යම් තැනෙක්හි වෙත් ද සිත එතැන්හි යුක්ත යැ ප්‍රයුක්ත යැ සංයුක්ත නුයි 'මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො' යනු වෙ.

එයින් කිහ පිඞ්ගිය තෙරණුවෝ:

"ජිණ්ණස්ස මෙ –පෙ– මනො හි මෙ බ්‍රාහ්මණෙ තෙන යුත්තො"යි.

22.

කාමපඞ්කයෙහි හෝනෙම් හාත්පසින් සැලෙනුයෙම් ශාස්ත්‍ර සඞ්ඛ්‍යාත ද්වීපයෙන් ද්වීපයට පා වැ ගියෙමි. ඉක්බිති (පහණසැ වෙහෙරෙහි දී,) චතුරොඝය තරණය කළ ආශ්‍රව රහිත වූ සම්බුදුන් දිටිමි.

පඞ්කෙසයානො පරිඵන්දමානො– 'පඞ්කෙසයානො' යනු: කාමපඞ්ක (මඩ) යෙහි කාමකර්දමයෙහි කාමක්ලේශයෙහි කාමපලිපයෙහි කාම පරිදහයෙහි කාමපරිරොධයෙහි හෝනෙම් ශයනය කරනු යෙම් වසනුයෙම් වෙසෙසින් වසනුයෙම් සර්වප්‍රකාරයෙන් වසනුයෙම් නුයි 'පඞ්කෙ සයානො' යනු වෙ. පරිඵන්දමානො යනු: තෘෂ්ණාස්පන්දයෙන් ස්පන්දනය වනුයෙම් (සැලෙනුයෙම්) දෘෂ්ටිස්පන්දයෙන් සැලෙනුයෙම් ක්ලෙශස්පන්දයෙන් සැලෙනුයෙම් ප්‍රයෝගස්පන්දයෙන් සැලෙනුයෙම් විපාකස්පන්දයෙන් සැලෙනුයෙම් මනොදුශ්චරිතස්පන්දයෙන් සැලෙනුයෙම් රක්ත වැ රාගයෙන්. සැලෙනුයෙම් දුෂ්ට වැ ද්වෙෂයෙන් සැලෙනුයෙම් මූඪ වැ මොහයෙන් සැලෙනුයෙම් විනිබද්ධ වැ මානයෙන් සැලෙනුයෙම් පරාමෘෂ්ට වැ දෘෂ්ටියෙන් සැලෙනුයෙම් වික්ෂෙපගත වැ ඖද්ධත්‍යයෙන් සැලෙනුයෙම් නිශ්චයට නො පැමිණ විචිකිත්සායෙන් සැලෙනුයෙම් ථාමගත වැ අනුශයෙන් සැලෙනුයෙම් ලාභයෙන් සැලෙනුයෙම් අලාභයෙන් සැලෙනුයෙම් යශසින් සැලෙනුයෙම් අයශසින් සැලෙනුයෙම් ප්‍රශංසායෙන් සැලෙනුයෙම් නින්දායෙන් සැලෙනුයෙම් සුඛයෙන් සැලෙනුයෙම් දුඃඛයෙන් සැලෙනුයෙම්

ජාතියා ඵන්දමානො, ජරාය ඵන්දමානො, බ්‍යාධිනා ඵන්දමානො, මරණෙන ඵන්දමානො, සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසෙහි ඵන්දමානො, නෙරයිකෙන දුක්ඛෙන ඵන්දමානො, තිරච්ඡානයොනිකෙන දුක්ඛෙන ඵන්දමානො, පෙත්තිවිසයිකෙන[1] දුක්ඛෙන ඵන්දමානො, මානුසකෙන[2] දුක්ඛෙන ඵන්දමානො, ගබ්භොක්කන්තිමූලකෙන දුක්ඛෙන ඵන්දමානො ගබ්භට්ඨිතිමූලකෙන දුක්ඛෙන ඵන්දමානො, ගබ්භාවුට්ඨානමූලකෙන දුක්ඛෙන ඵන්දමානො, ජාතස්සූපනිබන්ධකෙන දුක්ඛෙන–ජාතස්ස ජරාධෙය්‍යකෙන දුක්ඛෙන– අත්තුපක්කමෙන දුක්ඛෙන– පරූපක්කමෙන දුක්ඛෙන– සඞ්ඛාරදුක්ඛෙන– විපරිණාමදුක්ඛෙන– චක්ඛුරොගෙන දුක්ඛෙන– සොතරොගෙන දුක්ඛෙන– ඝානරොගෙන දුක්ඛෙන– ජිව්හාරොගෙන දුක්ඛෙන– කායරොගෙන දුක්ඛෙන– සීසරොගෙන දුක්ඛෙන– කණ්ණරොගෙන දුක්ඛෙන– මුඛරොගෙන දුක්ඛෙන– දන්තරොගෙන දුක්ඛෙන– කාසෙන සාසෙන පිනාසෙන ඩහෙන[3] ජරෙන කුච්ඡිරොගෙන මුච්ඡාය පක්ඛන්දිකාය සූලාය විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන අපමාරෙන දද්දුයා කණ්ඩුයා කච්ඡුයා රඛසාය විතච්ඡිකාය ලොහිතපිත්තෙන[4] මධුමෙහෙන අංසාය පිළකාය භගන්දලෙන පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන උතුපරිණාමජෙන ආබාධෙන විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය උච්චාරෙන පස්සාවෙන ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන දුක්ඛෙන මාතුමරණෙන දුක්ඛෙන පිතුමරණෙන දුක්ඛෙන පුත්තමරණෙන දුක්ඛෙන ධීතුමරණෙන දුක්ඛෙන ඤාතිව්‍යසනෙන දුක්ඛෙන භොගව්‍යසනෙන දුක්ඛෙන රොගව්‍යසනෙන දුක්ඛෙන සීලව්‍යසනෙන දුක්ඛෙන දිට්ඨිව්‍යසනෙන දුක්ඛෙන ඵන්දමානො සම්ඵන්දමානො විප්ඵන්දමානො වෙධමානො පවෙධමානො සම්පවෙධමානොති 'පඞ්කසයානො පරිඵන්දමානො'.

දීපා දීපං උපප්ලවින්ති සත්ථාරතො සත්ථාරං ධම්මක්ඛානතො ධම්මක්ඛානං ගණතො ගණං දිට්ඨියා දිට්ඨිං පටිපදය පටිපදං මග්ගතො මග්ගං පලවිං උප්ලවිං උපප්ලවිං සමුපප්ලවින්ති (දීපාදීපං උපප්ලවිං.)

---

1. පිත්තිවිසයිකෙන – පත.
2. මනුස්සකෙන– ම–ච–චි–ක මානුයිකේන මජසං
3. ඩාහෙන – ච–චි–ක, ම ජ සං,
4. ලොහිතෙන පිත්තෙන – ප–චි–ක, සො

ජාතියෙන් සැලෙනුයෙම් ජරායෙන් සැලෙනුයෙම් ව්‍යාධියෙන් සැලෙනුයෙම් මරණයෙන් සැලෙනුයෙම් ශෝකපරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෙන් සැලෙනුයෙම් නිරදුක්න් සැලෙනුයෙම් තිරිසන්යොන්හි වූ දුකින් සැලෙනුයෙම් ප්‍රේතවිෂයෙහි වූ දුකින් සැලෙනුයෙම් මානුෂික දුකින් සැලෙනුයෙම් ගර්භාවක්‍රාන්තිමූලක දුකින් සැලෙනුයෙම් ගර්භස්ථිතිමූලක දුකින සැලෙනුයෙම් ගර්භාව්‍යුත්ථාන මූලක දුකි ්න් සැලෙනුයෙම් උපන්හු පිළිදග්නා දුකින් උපන්හු පරාඅයත්කොට ඇති දුකින් – ආත්මොපක්‍රම දුකින්– පරොපක්‍රම දුකින්- සංස්කාර දුකින්– විපරිණාම දුකින්– චක්ෂුරොගයෙන් වන දුකින්–ශ්‍රොත්‍ර රොගයෙන් වන දුකින්– ඝ්‍රාණරොගයෙන් වන දුකින්– ජිහ්වාරොගයෙන් වන දුකින් කායරොගයෙන් වන දුකින්– ශීර්ෂරොගයෙන් වන දුකින්– කර්ණරොගයෙන් වන දුකින්– මුඛරොගයෙන් වන දුකින්– දන්ත රොගයෙන් වන දුකින්– කාශයෙන් ශ්වාසයෙන් පීනසින් දහයෙන් ජ්වරයෙන් කුස්රොවින් මූර්ඡායෙන් ප්‍රස්කන්දිකායෙන් (අතීසාරයෙන්) ආමශූලරෝගයෙන් විශූචිකායෙන් (මහාවිරෙචනයෙන්) කුෂ්ටරොගයෙන් ගණ්ඩයෙන් කබර රොගයෙන් ශුෂ්කරොගයෙන් අපස්මාරයෙන් පිළිකායෙන් කණ්ඩූතියෙන් කැසීමෙන් රඛසා (නියහිරින් පහළ තැන උපදනා රොග) යෙන් විතච්ජිකා (දතුල්පතුල් හිරිතැලෙන) රොගයෙන් රත්පිතින් මධුමෙහයෙන් අර්ශසින් ලෙහෙ පිළිකායෙන් භගන්දරායෙන් පිතින් උපදනා රොවින් සෙමින් උපදනා රොවින් වයින් උපදනා රොවින් සන්නිපාතික රොවින් ඍතු පරිණාමයෙන් උපදනා රොවින් (ස්ථානගිසදෘහාදි) විෂමපරිහාරයෙන් උපදනා රොවින් උපක්‍රමයෙන් උපදනා රොවින් කර්මවිපාකයෙන් උපදනා රොවින් ශීතයෙන් උෂ්ණයෙන් සයින් පවසින් මලමූ පහ කිරීමෙන් මැසි මදුරු-වා–අව් දිග්දෑ පහසින් වන දුකින් මවගේ මරණයෙන් වන දුකින් පියාගේ මරණයෙන් වන දුකින් පුතාගේ මරණයෙන් වන දුකින් දුව ගේ මරණයෙන් වන දුකින්, ඥාතිව්‍යසන දුකින් භොග ව්‍යසන දුකින් රොග ව්‍යසන දුකින් ශීල ව්‍යසන දුකින් දෘෂ්ටි ව්‍යසන දුකින් සැලෙනුයෙම් මොනොවට සැලෙනුයෙම් වෙසෙසින් සැලෙනුයෙම් කම්පනය වනුයෙම් විවෙසෙසින් කම්පනය වනුයෙම් අතිශයින් කම්පනය වනුයෙම් නුයි ‘පඞ්කෙ සයානො පරිප්ලන්දමානො’ යනු වේ.

දීපා දීපං උපප්ලවිං යනු: ශාස්තෘහු කෙරෙන් ශාස්තෘහු කරා ධර්මඛ්‍යානයෙන් ධර්මඛ්‍යානයට ගණයෙන් ගණයට දෘෂ්ටියෙන් දෘෂ්ටියට ප්‍රතිපත්තියෙන් ප්‍රතිපත්තියට මාර්ගයෙන් මාර්ගයට පාවීම් තරණය කෙළෙම් උත්තරණය කෙළෙම් මැනැවින් උත්තරණය කෙළෙම් නුයි ‘දීපා දීපං උපපලවිං’ යනු වේ.

අථද්දසාසිං සම්බුද්ධන්ති-'අථා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා[1] පෙතං 'අථා'ති, අද්දසාසින්ති: අද්දසං අද්දක්ඛිං අපස්සිං පටිවිජ්ඣිං බුද්ධන්ති: යො සො භගවා සයම්භූ අනාචරියකො - පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධොති, 'අථද්දසාසිං සම්බුද්ධං'.

ඔඝතිණ්ණමනාසවන්ති-'ඔඝතිණ්ණ'න්ති භගවා කාමොඝං තිණ්ණො, භවොඝං තිණ්ණො, දිට්ඨොඝං තිණ්ණො, අවිජ්ජොඝං තිණ්ණො, සබ්බසංසාරපථං තිණ්ණො, උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො සො වුට්ඨවාසො චිණ්ණචරණො - පෙ - ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො'ති 'ඔඝතිණ්ණං'. අනාසවන්ති: චත්තාරො ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො, තෙ ආසවා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා බුද්ධො අනාසවොති 'ඔඝතිණ්ණමනාසවං'.

තෙනාහ ථෙරො පිඞ්ගියො:

"පඞ්කෙ සයානො පරිඵන්දමානො
දීපාදීපං උපප්ලවිං,[2]
අථද්දසාසිං සම්බුද්ධං
ඔඝතිණ්ණමනාසව"න්ති."

23

යථා අහූ වක්කලි මුත්තසද්ධො
භද්‍රාවුධො ආලවි ගොතමො ච,
එවමෙව ත්වම්පි පමුඤ්චස්සු සද්ධං
ගමිස්සසි ත්වං පිඞ්ගිය මච්චුධෙය්‍යස්ස පාරං.

යථා අහූ වක්කලි මුත්තසද්ධො භද්‍රාවුධො ආලවිගොතමො චාති යථා වක්කලිත්ථෙරො මුත්තසද්ධො[3] සද්ධාගරුකො සද්ධාපුබ්බඞ්ගමො සද්ධාධිමුත්තො[4] සද්ධාධිපතෙය්‍යො අරහත්තප්පත්තො, යථා භද්‍රාවුධො ථෙරො මුත්තසද්ධො සද්ධාගරුකො සද්ධා පුබ්බඞ්ගමො සද්ධාධිමුත්තො සද්ධාධිපතෙය්‍යො අරහත්තප්පත්තො. යථා ආලවිගොතමො ථෙරො මුත්තසද්ධො සද්ධාගරුකො සද්ධාපුබ්බඞ්ගමො සද්ධාධිමුත්තො සද්ධාධිපතෙය්‍යො අරහත්තප්පත්තොති යථා අහූ වක්කලි මුත්තසද්ධො භද්‍රාවුධො ආලවිගොතමො ච.

---

1. පුබ්බතා මෙතං අථාති - - ච-වි-ක.
2. ප්ලවිං උපප්ලවිං සම්ප්ලවිං - ම ජ සං.
3. සද්ධො - ම ජ සං
4. සද්ධාවිමුත්තො - පත.

**අථද්දසාසිං සම්බුද්ධං**— 'අථ' යනු: පදසන්ධි යැ පදසංසර්ග යැ පද පරිපූර්ණතා යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජන ශ්ලිෂ්ටතා යැ තෙල 'අථ' යනු පදයන්ගේ අනු පිළිවෙළ නුයි. අද්දසාසිං යනු දිටිමි දුටුයෙමි දර්ශනය කෙළෙමි. ප්‍රතිවෙධ කෙළෙමි. බුද්ධො යනු: යම් භාග්‍යවතුන් කෙනෙක් පරොපදේශ රහිත වැ සිව්සස් අවබොධ කළ කෙනෙක් තමහට ආචාර්‍යයන් නැති කෙනෙක්... මේ 'බුද්ධ' යනු බොධිද්‍රැවමූලයෙහි දී සිව්සස් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් නුයි "අථද්දසාසිං සම්බුද්ධං" යනු වේ.

**ඔඝතිණ්ණමනාසවං**— 'ඔඝතිණ්ණං' යනු; බුදුහු කාමොඝය තරණය කළහ භවොඝය තරණය කළහ දෘෂ්ටි ඔඝය තරණය කළහ අවිද්‍යා ඔඝය තරණය කළහ, හැම සංසාර පථය තරණය කළහ උත්තීර්ණ නිස්තීර්ණ අතික්‍රමණ සමතික්‍රමණ කළහ ඉක්ම සිටියහ. උන් වහන්සේ වැසතිම වූ දශ ආර්‍යවාස ඇතියහ පුරුදු කළ චරණධර්ම ඇතියහ ... ජාතිමරණ සංසාර සඞ්ඛ්‍යාත පුනර්භවය උන්වහන්සේට නැත් නුයි 'ඔඝතිණ්ණං' යනු වේ. අනාසවං යනු: ආශ්‍රව සතරෙකි: කාමාශ්‍රව යැ භවාශ්‍රව යැ දෘෂ්ට්‍යාශ්‍රව යැ අවිද්‍යාශ්‍රව යැ යි ඒ ආශ්‍රවයෝ භාග්‍යවත් බුදුන්ට ප්‍රහීණයහ උසුන් මුල් ඇතියහ හිස්සුන් තල්රුකක් සෙයින් අවස්තු කරන ලදහ. අනු අභාවය කරන ලදහ ආයති භවයෙහි නූපදනා සැහැවි ඇතියහ. එයින් බුදුහු 'අනාශ්‍රව' නුයි 'ඔඝතිණ්ණමනාසවං' යනු වේ.

එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:

**"පඞ්කසයානො –පෙ– ඔඝතිණ්ණමනාසවං"යි.**

**23.**

මුක්තශ්‍රද්ධා ඇති වක්කලී ස්ථවිර යැ භද්‍රාවුධ යැ ආලවිගොතම යැ යන මොහු යම් බඳු වූහු ද එසෙයින් මැ තෙපි ද ශ්‍රද්ධායෙහි අධිමුක්ත වව, පිඞ්ගිය තෙපි මෘත්‍යුධෙය සඞ්ඛ්‍යාත සංසාරයාගේ පාරයට යව.

**යථා අහු වක්කලි මුත්තසද්ධො භද්‍රාවුධො ආලවිගොතමො ච**— යනු: යම් සේ වක්කලි තෙරණුවෝ මුක්තශ්‍රද්ධා ඇතියාහු ශ්‍රද්ධාව ගුරු කොට ඇතියාහු ශ්‍රද්ධා පූරොගාමී කොට ඇතියාහු ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූවාහු ශ්‍රද්ධාව අධිපති කොට ඇත්තාහු රහත් බවට පැමිණියාහු ද යම්සේ භද්‍රාවුධ තෙරණුවෝ මුක්තශ්‍රද්ධා ඇතියාහු ශ්‍රද්ධාව ගුරු කොට ඇතියාහු ශ්‍රද්ධාපූර්වාංගම වූවාහු ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූවාහු ශ්‍රද්ධාව අධිපති කොට ඇත්තාහු රහත් බවට පැමිණියාහු ද යම්සේ ආලවිගොතම තෙරණුවෝ මුක්තශ්‍රද්ධා ඇතියාහු ශ්‍රද්ධාව ගුරු කොට ඇතියාහු ශ්‍රද්ධා පූර්වාඞ්ගම වූවාහු ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූවාහු ශ්‍රද්ධාව අධිපති කොට ඇත්තාහු රහත් බවට පැමිණියාහු ද යි 'යථා අහු වක්කලි මුත්තසද්ධො භද්‍රාවුධො ආලවිගොතමො ච' යනු වේ.

එවමෙව ත්වම්පි පමුඤ්චස්සු සද්ධන්ති– එවමෙව ත්වම්පි[1] සද්ධං මුඤ්චස්සු පමුඤ්චස්සු සම්පමුඤ්චස්සු අධිමුඤ්චස්සු ඔකප්පෙහි. 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති සද්ධං මුඤ්චස්සු පමුඤ්චස්සු සම්පමුඤ්චස්සු අධිමුච්චස්සු ඔකප්පෙහි, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති – සබ්බෙ ධම්මා අනත්තා'ති සද්ධං මුඤ්චස්සු පමුඤ්චස්සු සම්පමුඤ්චස්සු අධිමුච්චස්සු ඔකප්පෙහි – පෙ – 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්ම'න්ති සද්ධං මුඤ්චස්සු පමුඤ්චස්සු සම්පමුඤ්චස්සු අධිමුච්චස්සු ඔකප්පෙහීති 'එවමෙව ත්වම්පි' පමුච්චස්සු සද්ධං'.

ගමිස්සසි ත්වං පිඞ්ගිය මච්චුධෙය්‍යස්ස පාරන්ති: 'මච්චුධෙය්‍යං' වුච්චති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච. මච්චුධෙය්‍යස්ස පාරං වුච්චති අමතං නිබ්බානං "යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. ගමිස්සසි ත්වං පිඞ්ගිය මච්චුධෙය්‍යස්ස පාරන්ති: ත්වං පාරං ගමිස්සසි පාරං අධිගමිස්සසි පාරං පස්සිස්සසි පාරං සච්ඡිකරිස්සසීති 'ගමිස්සසි ත්වං පිඞ්ගිය මච්චුධෙය්‍යස්ස පාරං'.

තෙනාහ භගවා:

යථා අහු වක්කලි මුත්තසද්ධො
භද්‍රාවුධො ආළවිගොතමො ච,
එවමෙව ත්වම්පි පමුඤ්චස්සු සද්ධං
ගමිස්සසි ත්වං පිඞ්ගිය මච්චුධෙය්‍යස්ස පාරන්ති.

24

එස භීයො පසීදමි සුත්වාන මුනිනො වචො,
විවත්තච්ඡද්දො[3] සම්බුද්ධො අඛිලො පටිභානවා.

එස භීයො පසීදමීති– එස භීයො පසීදමි, භීයො භීයො සද්දහාමි භීයො භීයො ඔකප්පෙමි, භීයො භීයො අධිමුච්චාමි, 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති භීයො භීයො පසීදමි, භීයො භීයො සද්දහාමි, භීයො භීයො ඔකප්පෙමි, භීයො භීයො අධිමුච්චාමි, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති භීයො භීයො පසීදමි – පෙ– 'සබ්බෙ ධම්මා අනත්තා'ති භීයො භීයො පසීදමි – පෙ – 'යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති භීයො භීයො පසීදමි, භීයො භීයො සද්දහාමි, භීයො සීයො ඔකප්පෙමි, භීයො භීයො අධිමුච්චාමීති 'එස භීයො පසීදමි'.

1. ත්වං – ච-චි-ක, ම ඡ සං,
2. ත්වං – ප-ච-ඩී-ක.
3. විවත්තච්ඡද්දෙ – පත,
විවට්ටච්ඡදෙ – ම ඡ සං.

එවමෙව ත්වමපි පමුඤ්චස්සු සද්ධං යනු: එසෙයින් මැ තෙපි ද ශ්‍රද්ධාව මුදව වෙසෙයින් මුදව අත්‍යර්ථයෙන් මුදව අධිමොක්ෂ කරව බුහුමන් කරව 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි සැදැහැ මුදව වෙසෙයින් මුදව අත්‍යර්ත්ථයෙන් මුදව අධිමොක්ෂ කරව බුහුමන් කරව. 'හැම සංස්කාරයො අනිත්‍යහ'යි ...හැම ධර්මයෝ අනාත්මහ'යි සැදැහැ මුදව වෙසෙයින් මුදව අත්‍යර්ත්ථයෙන් මුදව අධිමොක්ෂ කරව බුහුමන් කරව ... යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් එ හැම නිරොධස්වභාවය ඇතැ'යි සැදැහැ මුදව වෙසෙයින් මුදව අත්‍යර්ත්ථයෙන් මුදව අධිමොක්ෂ කරව බුහුමන් කරව නුයි 'එවමෙව ත්වම්පි පමුඤ්චස්සු සද්ධං' යනු වේ.

ගමිස්සසි ත්වං පිඬගිය මච්චුධෙය්‍යස්ස පාරං: ක්ලේශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝද 'මච්චුධෙය්‍ය' යි කියනු ලැබෙයි. 'මෘත්‍යුධෙයයාගේ පාර' යි අමාමහනිවන කියනු ලැබෙයි. යම් සියලු සංස්කාරයන් ගේ ශමථයෙක් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාව ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. ගමිස්සසි ත්වං පිඬගිය මච්චුධෙය්‍යස්ස පාරං යනු: තෙපි පරතෙරට යව පාරය අධිගම කරව පාරය දකු පාරය ප්‍රත්‍යක්ෂ කරව නුයි 'ගමිස්සසි ත්වං පිඬගිය මච්චුධෙය්‍යස්ස පාරං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යථා අහු වක්කලි -පෙ- මච්චුධෙය්‍යස්ස පාරං" යි

24

තෙල මම මුනීන්ද්‍රයන් වහන්සේගේ වචනය අසා බෙහෙවින් පහදිමි, සම්බුද්ධහු විවෘත වූ (රාගාදි) සියන් ඇතියහ, '(රාගාදි) බිල රහිතයහ, ප්‍රතිභාන ප්‍රතිසංවිද් ඥාන ඇතියහ.

එස භීයො පසීදාමි යනු: තෙල මම බෙහෙවින් පහදිමි බෙහෙවින් හදහමි බෙහෙවින් බුහුමන් කෙරෙමි බෙහෙවින් අධිමුක්ත වෙමි, 'හැම සංස්කාරයෝ අනිත්‍යහ' යි බෙහෙවින් පහදිමි බෙහෙවින් හදහමි බෙහෙවින් බුහුමන් කෙරෙමි බෙහෙවින් අධිමුක්ත වෙමි, හැම සංස්කාරයෝ දුක්හ'යි බෙහෙවින් පහදිමි ... හැම ධර්මයෝ අනාත්මහ' යි බෙහෙවින් පහදිමි ... යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් එම හැම නිරොධ ස්වභාවය ඇතැ'යි බෙහෙවින් පහදිමි බෙහෙවින් හදහමි බෙහෙවින් බුහුමන් කෙරෙමි බෙහෙවින් අධිමුක්ත වෙමි' නුයි 'එස භීයො පසීදාමි' යනු වේ.

සුත්වාන මුනිනො වචොති– 'මුනී'ති 'මොනං' වුච්චති ඤාණං – පෙ – සඞ්ගජාලමතිච්ච සො මුනි. සුත්වාන මුනිනො වචොති තුය්හං වචනං ව්‍යප්පථං දෙසනං අනුසාසනං අනුසිට්ඨිං[1], සුත්වාන[2] උග්ගහෙත්වාන උපධාරයිත්වාන උපලක්ඛයිත්වානාති 'සුත්වාන මුනිනො වචො'.

විවත්තච්ඡදෙ සම්බුද්ධොති–'ඡදන'න්ති පඤ්ච ඡදනානි: තණ්හාඡදනං දිට්ඨිච්ඡදනං කිලෙසච්ඡදනං දුච්චරිතච්ඡදනං අවිජ්ජාඡදනං තානි ඡදනානි බුද්ධස්ස භගවතො විවටානි[3] විද්ධංසිතානි උග්ඝාටිතානි සමුග්ඝාටිතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, තස්මා බුද්ධො විවත්තච්ඡදො. 'බුද්ධො'ති යො සො භගවා – පෙ – සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධොති 'විවත්තච්ඡදෙ සම්බුද්ධො'.

අඛිලො පටිභානවාති 'අඛිලො'ති රාගො ඛිලො දොසො ඛිලො මොහො ඛිලො කොධො ඛිලො උපනාහො ඛිලො –පෙ– සබ්බාකුසලාභිසංඛාරා ඛිලා. තෙ ඛිලා බුද්ධස්ස භගවතො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[4] ආයතිං අනුප්පාදධම්මා, තස්මා බුද්ධො අඛිලො. පටිභානවාති: තයො පටිභානවන්තො: පරියත්තිපටිභානවා පරිපුච්ඡාපටිභානවා. අධිගමපටිභානවා. කතමො පරියත්තිපටිභානවා: ඉධෙකච්චස්ස පකතියා[5] පරියාපුතං[6] 'හොති; සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං' තස්ස පරියත්තිං නිස්සාය පටිභාති අයං පරියත්තිපටිභානවා.

කතමො පරිපුච්ඡාපටිභානවා: ඉධෙකච්චො පරිපුච්ඡිතො හොති අත්ථෙ ච ඤායෙ ච ලක්ඛණෙ ච කාරණෙ ච ඨානාඨානෙ ච. තස්ස පරිපුච්ඡං නිස්සාය පටිභාති අයං පරිපුච්ඡාපටිභානවා. කතමො අධිගමපටිභානවා: ඉධෙකච්චස්ස අධිගතා හොන්ති චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො චත්තාරො ච අරියමග්ගා චත්තාරි ච සාමඤ්ඤඵලානි චතස්සො පටිසම්භිදායො ඡ ච අභිඤ්ඤායො. තස්ස අත්ථො ඤාතො, ධම්මො ඤාතො, නිරුත්ති ඤාතා. අත්ථෙ ඤාතෙ අත්ථො පටිභාති, ධම්මෙ ඤාතෙ ධම්මො පටිභාති, නිරුත්තියා ඤාතාය නිරුත්ති පටිභාති. ඉමෙසු තීසු ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා. භගවා ඉමාය පටිභානපටිසම්භිදාය උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො තස්මා බුද්ධො පටිභානවා. යස්ස පරියත්ති නත්ථි, පරිපුච්ඡා නත්ථි, අධිගමො නත්ථි, කිං තස්ස පටිභායිස්සතීති 'අඛිලො පටිභානවා'.

---

1. අනුසන්ධිං – ප ව වි ක
   අනුසිට්ඨං – ම ජ සං
2. සුත්වා සුනිත්වා උග්ග හෙත්වා උපධාරෙත්වා – පත
3. විගතානි – ව–වි–ක
4. අනභාවංගතා – ව–වි–ක, ම ජ ස්‍යා,
5. බුද්ධවචනං පකතියා – ම ජ සං,
6. පරියාපුතං – ස්‍යා.

**සුත්වාන මුනිනො වචො** — 'මුනි' යනු: 'මොන' යි ඥාන ය කියනු ලැබෙයි. . . (රාගාදි) සංගජාලය ඉක්ම සිටි හෝ මුනි නම් වෙයි. **සුත්වාන මුනිනො වචො** යනු: මුබ වහන්සේගේ වචනය වාක්‍යපථය දෙශනාව අනුශාසනය අනුසිට්ඨිය අසා උගෙන ධරා ගෙනැ විමසා ගෙනැ නුයි 'සුත්වාන මුනිනො වචො' යනු වේ.

**විවත්තච්ඡදො සම්බුද්ධො** — 'ඡදනං' යනු: ඡදනයෝ පස් දෙනෙකි: තෘෂ්ණාඡදන යැ දෘෂ්ටි ඡදන යැ ක්ලෙශ ඡදන යැ දුශ්චරිතඡදන යැ අවිද්‍යා ඡදන යැ යි. ඒ ඡදනයෝ (සියන්) භාග්‍යවත් බුදුන් විසින් විවෘත කරන ලදහ විධ්වංසනය කරන ලදහ උදුරන ලදහ වෙසෙසින් උදුරන ලදහ ප්‍රහීණය හ සිඳුනා ලදහ සන්හිඳුවන ලදහ අප්‍රවෘත්තියට පමුණුවන ලදහ යළි උපදනට නො හිසි කරන ලදහ නුවණගින්නෙන් දවන ලදහ. එයින් බුදුහු 'විවත්තච්ඡද' නම් වෙති. **බුද්ධො** යනු: යම් භාග්‍යවත් කෙනෙක් . . . මේ 'බුද්ධ' යනු: බොධිමූලයෙහි දී අර්හත්ඵල ප්‍රත්‍යක්ෂයෙන් උපන් ප්‍රඥප්තියක් නුයි 'විවත්තච්ඡදෙ සම්බුද්ධො' යනු වේ.

**අඛිලො පටිභානවා** — 'අඛිලො' යනු රාගය ඛිල යැ ද්වෙෂය ඛිල යැ මොහය ඛිල යැ ක්‍රොධය ඛිල යැ බද්ධවෛරය ඛිල යැ . . . හැම අකුශලාභි සංස්කාරයෝ ඛිලයෝ යි. ඒ ඛිලයෝ භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණයහ උසුන්මුල් ඇතියහ හිස්සුන් තල්රුකක් සෙයින් අවස්තු කරන ලදහ අනුඅභාවය කරන ලදහ ආයති භවයෙහි නූපදනා පියවි ඇතියහ. එයින් බුදුහු අඛිලයහ. **පටිභානවා** යනු: ප්‍රතිභානවත්හු තිදෙනෙකි: පර්‍ය්‍යාප්ති ප්‍රතිභාන ඇත්තේ යැ පරිපුච්ඡා ප්‍රතිභාන ඇත්තේ යැ අධිගම ප්‍රතිභාන ඇත්තේ යි. පර්‍ය්‍යාප්ති ප්‍රතිභාන ඇත්තේ කවරැ යත්: මෙ සස්නෙහි ඇතමකු විසින් පියවින් සූත්‍ර ගෙය වෛය්‍යාකරණ ගාථා උදන ඉතිවුත්තක ජාතක අද්භූත ධර්ම වෙදල්ල යන මේ පිරිවහන ලද වෙයි. ඕහට පර්‍ය්‍යාප්තිය නිසා වැට හෙයි. මේ පර්‍ය්‍යාප්ති ප්‍රතිභාන ඇත්තේ යි.

පරිපුච්ඡා ප්‍රතිභාන ඇත්තේ කවරැ යත්: මෙ සස්හොහි ඇතැමෙක් අර්හත්ඵලයෙහි ද ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි ද (අනිත්‍යාදි) ලක්ෂණයෙහි ද හේතුයෙහි ද කාරණාකාරණයෙහි ද ලා පිළිවිස්නේ වෙයි. ඕහට පරිපුච්ඡාව නිසා වැටහෙයි. මේ පරිපුච්ඡා ප්‍රතිභාන ඇත්තේ යි.

අධිගම ප්‍රතිභාන ඇත්තේ කවරැ යත්: මෙ සස්නෙහි ඇතැමකු විසින් සතර සතිපට්ඨානයෝ සතර සම්‍යක් ප්‍රධානයෝ සතර ඍද්ධිපාදයෝ පඤ්චන්ද්‍රියයෝ පඤ්චබලයෝ සප්තබොධ්‍යංගයෝ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය සතර ආර්‍ය්‍යමාර්ග හා සතර ශ්‍රාමණ්‍යඵල හා සතර ප්‍රතිසංවිත් හා ෂඩභිඥා හා අධිගම කරන ලද වෙති. ඔහු විසින් අර්ථය දන්නා ලද යැ ධර්මය දන්නා ලද යැ නිරුක්ති දන්නා ලද යැ. අර්ථය දන්නා ලද කල්හි අර්ථය වටහයි ධර්මය දන්නා ලද කල්හි ධර්මය වටහයි. නිරුක්තිය දන්නා ලද කල්හි නිරුක්තිය වටහයි. මේ ත්‍රිවිධ ඥානයෙහි ඥානය ප්‍රතිභානප්‍රතිසංවිද යි. බුදුහු මේ ප්‍රතිභානප්‍රතිසංවිදයෙන් යුක්ත වූවාහු සමුපෙත වූවාහු එළඹ සිටියාහු මොනොවට එළඹ සිටියාහු සමෘද්ධ වූවාහු පරිපූර්ණ වූවාහු සමන්වාගත වූවාහු වෙති. එයින් බුදුහු ප්‍රතිභානවත්හ. යමක්හට පර්‍ය්‍යාප්ති නැද්ද පරිපුච්ඡා නැද්ද අධිගම නැද්ද, කුමක් ඕහට වැටහෙන්නේ ද? යි 'අඛිලො පටිභානවා' යනු වේ.

තෙනාහ ථෙරො පිඞ්ගියො:

"එස භීයො පසීදමි සුත්වාන මුනිනො වචො,
විවත්තච්ඡදො සම්බුද්ධො අඛිලො පටිභානවා"ති.

25

අධිදෙවෙ අභිඤ්ඤාය සබ්බං වෙදි පරොපරං,
පඤ්හානන්තකරො සත්ථා කඞ්ඛීනං පටිජානතං.

අධිදෙවෙ අභිඤ්ඤායාති— දෙවා'ති තයො දෙවා සම්මුතිදෙවා උපපත්තිදෙවා විසුද්ධිදෙවා. කතමෙ සම්මුතිදෙවා: 'සම්මුතිදෙවා' වුච්චන්ති රාජානො ච රාජකුමාරා ච දෙවියො ච, ඉමෙ වුච්චන්ති සම්මුතිදෙවා. කතමෙ උපපත්තිදෙවා: 'උපපත්තිදෙවා' වුච්චන්ති චාතුම්මහාරාජිකා දෙවා තාවතිංසා දෙවා. -පෙ- බ්‍රහ්මකායිකා දෙවා යෙ ච දෙවා තදුත්තරි ඉමෙ වුච්චන්ති උපපත්ති දෙවා. කතමෙ විසුද්ධිදෙවා: 'විසුද්ධිදෙවා' වුච්චන්ති තථාගතා තථාගතසාවකා අරහන්තො ඛීණාසවා, යෙ ච පච්චෙකසම්බුද්ධා, ඉමෙ වුච්චන්ති විසුද්ධිදෙවා. භගවා සම්මුතිදෙවෙ අධිදෙවාති[1] අභිඤ්ඤාය උපපත්තිදෙවෙ අධිදෙවාති[1] අභිඤ්ඤාය විසුද්ධිදෙවෙ අධිදෙවාති අභිඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති අධිදෙවෙ අභිඤ්ඤාය.

සබ්බං වෙදි පරොපරන්ති: භගවා අත්තනො ච පරෙසං ච අධිදෙවකරෙ ධම්මෙ වෙදි අඤ්ඤාසි අපස්සි[2]. පටිවිජ්ඣි. කතමෙ අත්තනො අධිදෙවකරා ධම්මා: සම්මාපටිපදා අනුලොමපටිපදා අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරිපූරිකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානා -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො. ඉමෙ වුච්චන්ති අත්තනො අධිදෙවකරා ධම්මා. කතමෙ පරෙසං අධිදෙවකරා ධම්මා: සම්මාපටිපදා -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො. ඉමෙ වුච්චන්ති පරෙසං අධිදෙවකරා ධම්මා. එවං භගවා අත්තනො ච පරෙසං ච අධිදෙවකරෙ ධම්මෙ වෙදි අඤ්ඤාසි. අපස්සි[2]' පටිවිජ්ඣීති 'සබ්බං වෙදි පරොපරං'.

1. අතිදෙවාති - ච-වි-ක
2. පස්සි - ච-වි-ක

එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:

**''එස භීයො පසීදාමි –පෙ– අඛිලො පටිභානවා'' යි.**

25.

අධිදේවකර ධර්මයන් ප්‍රත්‍යක්ෂයෙන් දත හීන–ප්‍රණීත වූ (හෝ තමාත් මෙරමා ත් පිළිබඳ වූ) අධිදේවත්වකර සියලු ධර්මජාතය දතු උහ. ශාසත්‍රහු සැක ඇතියන් වැ මැ 'නිසැකයම්හ' යි පිළින කරනුවන්ගේ ප්‍රශ්න කෙළවර කරනුවහ.

**අධිදෙවෙ අභිඤ්ඤා** — 'දේව' යනු: දෙවියෝ තිදෙනෙකි. සම්මුති දේව යැ උත්පත්ති දේව යැ විශුද්ධි දේව යැ යි. සම්මුති දෙවයෝ කවරහ යත්: රජවරු ද රාජකුමාරයෝ ද දෙවීහි ද 'සම්මුති දේවහ' යි කියනු ලැබෙති. මොහු සම්මුතිදේවහ යි කියනු ලැබෙත්. උත්පත්ති දේවයෝ කවරහ යත්: සිව්මහරද වැසි දෙවියෝ ද තව්තිසා වැසි දෙවියෝ ද . . . බ්‍රහ්මකායික දෙවියෝ ද එයින් මත්තෙහි යම් දෙවි කෙනෙක් වෙත් නම් ඔහු දු උත්පත්ති දෙවහ' යි කියනු ලැබෙති. මෙහු උත්පත්ති දේවහ' යි කියනු ලැබෙත්. විශුද්ධිදේවයෝ කවරහ යත්: තථාගතයෝ ද තථාගත ශ්‍රාවකයෝ ද ක්ෂීණාශ්‍රව රහත්හු ද යම් පසේබුදු කෙනෙක් වෙත් නම් ඔහු දු විශුද්ධි දේවහ' යි කියනු ලැබෙති. මොහු විශුද්ධි දේවහ' යි කියනු ලැබෙත්. බුදුහු සම්මුති දෙවියනට අධිදේවහ' යි දත උත්පත්ති දෙවියනට අධිදෙවහ'යි දත විශුද්ධි දෙවියනට අධිදෙවහ'යි දත, දත ගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත (ප්‍රකට) කොට නුයි 'අධි දෙවෙ අභිඤ්ඤාය' යනු වේ.

**සබ්බං වෙදි පරොපරං යනු**: බුදුහු තමාගේ ද මෙරමා ගේ ද අධිදෙව කරධර්මයන් දතුවහ ජානනය කළහ දුටුවහ ප්‍රතිවේධ කළහ. තමහට අධිදෙව කර ධර්මයෝ කවරහ යත්: ප්‍රශස්ත ප්‍රතිපද යැ අවිරුද්ධ ප්‍රතිපද යැ අප්‍රත්‍යනීක ප්‍රතිපද යැ අර්ථානුගතප්‍රතිපදයැ ධර්මානුධර්ම ප්‍රතිපද යැ ශීලයෙහි සපුරා කරන බව ය ඉඳුරන්හි පියූ දෙර ඇති බව යැ වැළඳීමෙහි පමණ දන්නා බව යැ නිදිවැරීමෙහි යෙදීමයැ ස්මෘති සම්ප්‍රජන්‍ය යැ සතර සතිපට්ඨානයෝ යැ . . ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය යැ යන මොහු 'තමහට අධිදෙවකර ධර්මහ' යි කියනු ලැබෙත්. මෙරමාහට අධිදෙවකර ධර්මයෝ කවරහ යත්: ප්‍රශස්ත ප්‍රතිපද යැ . . ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය යැ යන මොහු 'මෙරමාහට අධිදෙවකර ධර්මහ'යි කියනු ලැබෙත්. මෙසෙයින් බුදුහු තමහට ද මෙරමාහට ද අධිදෙවකරධර්මයන් දතුවහ ජානනය කළහ දුටුවහ ප්‍රතිවෙධ කළාහු නුයි 'සබ්බං වෙදි පරොපරං' යනු වෙ.

**පඤ්හානන්තකරො සත්ථාති:** භගවා පාරායනිකපඤ්හානං අන්තකරො පරියන්තකරො පරිච්ඡේදකරො පරිවටුමකරො. සභියපඤ්හානං අන්තකරො පරියන්තකරො, පරිච්ඡේදකරො පරිවටුමකරො සක්කපඤ්හානං සුයාමපඤ්හානං භික්ඛුපඤ්හානං භික්ඛුනීපඤ්හානං උපාසකපඤ්හානං උපාසිකාපඤ්හානං රාජපඤ්හානං ඛත්තියපඤ්හානං බ්‍රාහ්මණ-වෙස්ස-සුද්දපඤ්හානං දෙවපඤ්හානං බ්‍රහ්මපඤ්හානං අන්තකරො පරියන්තකරො පරිච්ඡේදකරො පරිවටුමකරොති පඤ්හානන්තකරො. **සත්ථාති:** භගවා සත්ථවාහො යථා සත්ථවාහො සත්ථෙ[1] කන්තාරං තාරෙති, චොරකන්තාරං තාරෙති, වාළකන්තාරං තාරෙති, දුබ්භික්ඛකන්තාරං තාරෙති, නිරුදකකන්තාරං තාරෙති, උත්තාරෙති නිත්තාරෙති පතාරෙති ඛෙමන්තභූමිං[2] සම්පාපෙති. එවමෙව භගවා සත්ථවාහො සත්තෙ කන්තාරං තාරෙති ජාතිකන්තාරං තාරෙති, ජරා-ව්‍යාධි-මරණ-සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසකන්තාරං තාරෙති, රාගකන්තාරං තාරෙති, දොස-මොහ-මාන-දිට්ඨි-කිලෙස-දුච්චරිතකන්තාරං තාරෙති, රාගගහනං තාරෙති, දොසගහනං-මොහගහනං-දිට්ඨි-කිලෙස-දුච්චරිතගහනං තාරෙති උත්තාරෙති නිත්තාරෙති පතාරෙති ඛෙමන්තභූමිං අමතං නිබ්බානං සම්පාපෙතීති එවම්පි භගවා සත්ථවාහො,

අථවා භගවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛෙතා[3] පසාදෙතාති එවම්පි භගවා සත්ථවාහො. අථවා භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා. අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො මග්ගානුගා ච පනස්ස[4] එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතාති එවම්පි භගවා සත්ථවාහොති

**කඞ්ඛීනං පටිජානතන්ති:** සකඞ්ඛා ආගන්ත්වා නික්කඞ්ඛා[5] සම්පජ්ජන්ති සලෙඛා[6] ආගන්ත්වා නිල්ලෙඛා සම්පජ්ජන්ති සද්වෙළ්හකා ආගන්ත්වා නිද්වෙළ්හකා සම්පජ්ජන්ති සවිචිකිච්ඡා ආගන්ත්වා නිබ්බිචිකිච්ඡා සම්පජ්ජන්ති සරාගා ආගන්ත්වා වීතරාගා සම්පජ්ජන්ති සදොසා ආගන්ත්වා වීතදොසා සම්පජ්ජන්ති සමොහා ආගන්ත්වා වීතමොහා සම්පජ්ජන්ති සකිලෙසා ආගන්ත්වා නික්කිලෙසා සම්පජ්ජන්තීති 'කඞ්ඛීනං පටිජානතං'

තෙනාහ ථෙරො පිඞ්ගියො:

“අධිදෙවෙ අභිඤ්ඤාය සබ්බං වෙදි පරොපරං,
පඤ්හානන්තකරො සත්ථා කඞ්ඛීනං පටිජානත”න්ති.

---

1. සත්ථං පන
2. ඛෙමන්තං - ම ජ සං
3. පෙක්ඛිතා - ම ජ සං
4. මග්ගානුගාච පන - ම-ජ-සං
5. නිස්සඞ්කා - පන
6. සල්ලෙඛා - ම ජ සං
7. සංකිලෙස - පන

**පඤ්හානන්තකරො සත්ථා** යනු: බුදුහු පාරායනීය බ්‍රාහ්මණයන්ගේ ප්‍රශ්නයන් අවසාන කරනුවහ කෙළවර කරනුවහ මයඞ්ද කරනුවහ පිරිවැටුම් (නිගමන) කරනුවහ. සභිය ප්‍රශ්නයන් අවසන් කරනුවහ කෙළවර කරනුවහ මයඞ්ද කරනුවහ පිරිවැටුම් කරනුවහ . ශක්‍ර ප්‍රශ්නයන් සුයාම-ප්‍රශ්නයන් මහණුන්ගේ ප්‍රශ්නයන් මෙහෙණුන්ගේ ප්‍රශ්නයන් උවසුවන්ගේ ප්‍රශ්නයන් උවැසියන්ගේ ප්‍රශ්නයන් රජුන්ගේ ප්‍රශ්නයන් ක්ෂත්‍රියයන්ගේ ප්‍රශ්නයන් බ්‍රාහ්මණයන්ගේ ප්‍රශ්නයන් වෛශ්‍යයන්ගේ ප්‍රශ්නයන් ශුද්‍රයන්ගේ ප්‍රශ්නයන් දෙවියන්ගේ ප්‍රශ්නයන් බඹුන්ගේ ප්‍රශ්නයන් අවසන් කරනුවහ කෙළවර කරනුවහ මයඞ්ද කරනුවහ පිරිවැටුම් කරනුවහ නුයි පඤ්හානන්තකරො' යනු වේ. **සත්ථා** යනු: බුදුහු සාර්ථවාහයහ: යම්සේ සාත්තුනායක ගැල්සාත්තු කාන්තාරය තරණය කරවා ද, සොර කතර තරවා ද, වල් කතර තරවා ද, දුබික්කතර තරවා ද, මරු කතර තරවා ද, උත්තරණ නිස්තරණ ප්‍රතරණ කරවා ද, ක්ෂේමභූමියට මැනැවින් පමුණුවා ද, එසෙයින් මැ බුදුහු සාතතුනායක වූවාහු සත්ත්වයන් කතර තරවති: ජාතිකාන්තාරය තරණය කරවති. ජරා–ව්‍යාධි-මරණ–ශෝක–පරිදෙව– දුඃඛ–දෞර්මනස්‍ය– උපායාස කාන්තාරය තරණය කරවති, රාග-කාන්තාරය තරණය කරවති, ද්වේෂ–මෝහ–මාන–දෘෂ්ටි-ක්ලෙශ–දුශ්චරිත කාන්තාරය තරණය කරවති, රාගගහනය තරණය කරවති, ද්වේෂගහනය–මොහගහනය–දෘෂ්ටි–ක්ලෙශ– දුශ්චරිතගහනය තරණය කරවති, උත්තරණ නිස්තරණ ප්‍රතරණ කරවති, ක්ෂේමභූමි වූ අමාමහනිවනට පමුණුවා නුයි මෙසේ ත් බුදුහු සාර්ත්ථවාහ වෙති.

නොහොත් බුදුහු (නිවනට පමුණුවන හෙයින්) නේතෘ වූහ (විනයන කරන හෙයින්) විනේතෘ වූහ අනුනේතෘ වූහ (සැක සිඳ අර්ථය) පනවනුවහ නිශ්චය කරනුවහ (පිළිවෙත්) දක්වනුවහ ප්‍රතිපත්ති ඵලයෙන් පහදනුවාහු නුයි මෙසේත් බුදුහු සාර්ථවාහ වෙති. නො හොත් බුදුහු (ස්වසන්තාන-යෙහි) නූපන් මාර්ගය උපදනුවහ (වෛනෙය සන්තානයෙහි) අසඤ්ජාත-මාර්ගය දනවනුවහ. ප්‍රකාශ නො කළ මාර්ගය ප්‍රකාශ කරනුවහ. මාර්ගය දතුවහ, මාර්ගය දන්නා සුල්ලභ මාර්ගයෙහි විචක්ෂණයහ ඒ බුදුන් විසින් හෙළි කළ මාර්ග හෙතු කොට මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදි ගුණයන්) පසු පසැ යෙමින් වෙසෙත් නුයි මෙසේත් බුදුහු සාර්ත්ථ-වාහ නම් වෙත්.

**කඞඛීනං පටිජානතං** — සශංක. වැ අවුත් නිශ්ශංකයෝ වෙති සලෙඛ (විචිකිත්සායෙන් දෙධිත මනස ඇති) වැ අවුත් නිල්ලෙඛයෝ වෙති ද්වෛළ්හක (අනෛකාන්තග්‍රාහ) සහිත වැ අවුත් ද්වෛළ්හක රහිතයෝ වෙති විචිකිත්සා සහිත වැ අවුත් විචිකිත්සා රහිතයෝ වෙති සරාග වැ අවුත් වීතරාගයෝ වෙති සදෙස වැ අවුත් වීතදෙසයෝ වෙති සමොහ වැ අවුත් වීතමොහයෝ වෙති ක්ලෙශ සහිත වැ අවුත් ක්ලෙශ රහිතයෝ වෙත් නුයි 'කඞඛීනං පටිජානතං' යනු වේ.

එයින් කීහ පිඞගිය තෙරණුවෝ:

**"අධිදෙවෙ අභිඤ්ඤාය –පෙ– කඞඛීනං පටිජානතං" යි.**

26.

අසංහීරං අසඞ්කුප්පං
යස්ස නත්ථි උපමා ක්වචි,
අද්ධාගමිස්සාමි නමෙත්ථ කඞ්ඛා
එවං මං ධාරෙහි අධිමුත්තචිත්තං.

අසංහීරං අසඞ්කුප්පන්ති; අසංහීරං වුච්චති අමතං නිබ්බානං "යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අසංහීරන්ති; රාගෙන දොසෙන මොහෙන කොධෙන උපනාහෙන මක්ඛෙන පලාසෙන - ඉස්සාය මච්ඡරියෙන මායාය සාඨෙය්‍යෙන ථම්භෙන සාරම්භෙන මානෙන අතිමානෙන මදෙන පමාදෙන සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බපරිළාහෙහි සබ්බාසවෙහි සබ්බදරථෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසංඛාරෙහි අසංහාරියං නිබ්බානං නිච්චං ධුවං සස්සතං අවිපරිනාමධම්මන්ති අසංහීරං අසංකුප්පන්ති; 'අසංකුප්පං' වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසංඛාරසමථො -පෙ- නිරොධො නිබ්බානං, යස්ස න උප්පාදො පඤ්ඤායති, න වයො පඤ්ඤායති, න තස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති, නිබ්බානං නිච්චං ධුවං සස්සතං අවිපරිනාමධම්මන්ති 'අසංහීරං අසංකුප්පං'.

යස්ස නත්ථි උපමා ක්වචීති—'යස්සා' ති නිබ්බානස්ස[1] නත්ථි උපමා ති උපමා නත්ථි උපනිධා නත්ථි සදිසං නත්ථි පටිභාගො නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භන්ති. ක්වචීති. ක්වචි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති. 'යස්ස නත්ථි උපමා ක්වචි'.[2]

අද්ධා ගමිස්සාමි න මෙත්ථ කඞ්ඛාති 'අද්ධා'ති එකංසවචනං නිස්සංසයවචනං නික්කඞ්ඛාවචනං අද්වෙජ්ඣවචනං අද්වෙළ්හකවචනං නියොගවචනං අපණ්ණකවචනං අවත්ථාපනවචනමෙතං 'අද්ධා'ති. ගමිස්සාමීති ගමිස්සාමි අධිගමිස්සාමි ඵස්සිස්සාමි[3] සච්ඡිකරිස්සාමීති 'අද්ධාගමිස්සාමි'. න මෙත්ථ කඞ්ඛාති 'එත්ථා'ති නිබ්බානෙ. කඞ්ඛා නත්ථි විචිකිච්ඡා නත්ථි ද්වෙළ්හකං නත්ථි සංසයො නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භන්ති පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪොති 'අද්ධා ගමිස්සාමි න මෙත්ථ කඞ්ඛා'.

---

1. නිබ්බානස්ස – ම ඡ සං
2. තස්ස අඤ්ඤදත්ථු – ස්‍යා,
3. පස්සිස්සාමි – මචෙව

26.

යම් නිවනකට කිසි තැනෙක්හි උපමා නැද්ද (රාගාදියෙන්) ගෙන යා නො හැකි අකොප්‍ය වූ නිවන එකත්තෙන් අධිගම කරනෙම් මෙහි ලා මට සැකයෙක් නැති, මෙසෙයින් (පිඬගිය තෙපි) මා ශ්‍රද්ධායෙහි අධිමුක්තසිත් ඇතියකු කොට ධරව' යි.

**අසංහීරං අසංකුප්පං** යනු: අමාමහනිවන 'අසංහීර' යි කියනු ලැබෙයි. යම් සියලු සංස්කාරයන්ගේ ශමථයෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. **අසංහීරං** යනු: රාගයෙන් ද්වේෂයෙන් මොහයෙන් ක්‍රොධයෙන් බද්ධවෛරයෙන් මකු බැවින් පලාසයෙන් ඊෂ්‍යීායෙන් මාත්සර්‍ය්‍යයෙන් මායායෙන් සඨබැවින් ස්තම්භයෙන් කරණොත්තරිය කරණයෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් හැම කෙලෙසුන් විසින් හැම දුසිරිත් විසින් හැම පරිදහ විසින් හැම ආස්‍රව විසින් හැම දරථ විසින් හැම තැවුලි විසින් හැම අකුසලාභිසංස්කාරයන් විසින් අසංහාර්‍ය්‍ය වූ නිවන නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාමස්වභාව ඇත් නුයි 'අසංහීර' නම් වෙයි. **අසංකුප්පං** යනු: අමාමහනිවන 'අසංකුප්ප' යි කියනු ලැබෙයි. යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් . . . නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. යමක්හු ගේ උත්පාදය නො පැනේ ද, ව්‍යය නො පැනේ ද, අන්‍යථාභාවයෙක් නො පැනේ ද, ඒ අසංකොප්‍ය වූ නිවන නිත්‍ය යැ ධ්‍රැව යැ ශාශ්වත යැ අවිපරිණාමස්වභාව ඇත් නුයි 'අසංහීරං අසංකුප්පං' යනු වේ.

**යසස නත්ථි උපමා කවචි** — 'යස්ස' යනු: නිවනට. **නත්ථි උපමා** යනු: උපමා නැති. උපනිධි නැති සදෘශයෙක් නැති ප්‍රතිභාගයෙක් නැති, නො වෙයි, නො පැනෙයි, නො ලැබේ. **කවචි** යනු: අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි අධ්‍යාත්ම බාහ්‍ය වේවයි කිසිවෙකැ කිසි තැනෙකැ නුයි 'යස්ස නත්ථි උපමා ක්වචි' යනු වේ.

**අද්ධා ගමිස්සාමි න මෙත්ථ කඞ්ඛා** — 'අද්ධා' යනු: ඒකාන්තවචන යැ නිස්සංශයවචන යැ නිසැක වචන යැ ද්විවිධ නො වූ වචන යැ (මෙසේ වී ලැයි) නො දෙහඳ වචන යැ නියොග වචන යැ අන්වර්ත්ථ වචන යැ නො සිස් වචන යැ අවිරුද්ධ වචන යැ තෙල 'අද්ධා' යනු සඟිවූහන් වචන යි. **ගමිස්සාමි** යනු: අවබොධ කරනෙම් අධිගම කරනෙම් පහස්නෙම් පසක් කරනෙම් නුයි 'අද්ධා ගමිස්සාමි' යනු වේ. **න මෙත්ථ කංඛා** යනු: 'එත්ථ' යනු නිවනෙහි සැක නැති විසිකිස නැති දෙහඳ බව නැති සංශය නැති, නො වෙයි, නො පැනෙයි, නො ලැබෙයි ප්‍රහීණ යැ සිඳුනා ලද යැ සන්හින අප්‍රවෘත්ත යැ යළි උපදනට නො නිසි කරන ලද යැ නුවණ ගින්නෙන් දවන ලද නුයි 'අද්ධා ගමිස්සාමි න මෙත්ථ කංඛා' යනු වේ.

එවං මං ධාරෙහි අධිමුත්තචිත්තන්ති— 'එවං මං ධාරෙහී'ති එවං මං උපලක්ඛෙහි චිත්තං නිබ්බානනින්නං නිබ්බානපොනං නිබ්බානපබ්භාරං නිබ්බානාධිමුත්තන්ති 'එවං මං ධාරෙහි අධිමුත්තචිත්තන්ති'.

තෙනාහ ථෙරො පිඞ්ගියො:

අසංහීරං අසංකුප්පං
යස්ස නත්ථි උපමා ක්වචි
අද්ධා ගමිස්සාමි න මෙත්ථ කඞ්ඛා
එවං මං ධාරෙහි අධිමුත්තචිත්තන්ති.
පිඞ්ගියසුත්තන්තං සොළසි
පාරායන වග්ගො නිට්ඨිතො

**එවං මං ධාරෙහි අධිමුත්ත චිත්තං** — 'එවං මං ධාරෙහි' යනු: මෙසේ සිත් මා නිවනට නිම්න වූ නිවනට නැඹුරු වූ නිවනට බර වූ නිවනෙහි අධිමුක්ත වූ සිත් ඇතියකු කොට සලකව නුයි 'එවං මං ධාරෙහි අධිමුත්ත චිත්තං'' යනු වේ.

එයින් කීහ පිඞ්ගිය තෙරණුවෝ:

"අසංහීරං අසංකුප්පං -පෙ- එවං මං ධාරෙහි අධිමුත්තචිත්තං'' යි.

සොළොස් වැනි පිඞ්ගිය සූත්‍රාන්තය යි.

පාරායණ වර්ගය නිමි.

# ඛග්ගවිසාණ සුත්තනිද්දෙසො

(1)

සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
අවිහෙඨයං[1]. අඤ්ඤතරම්පි තෙසං,
න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩන්ති**– 'සබ්බෙසූ'ති සබ්බෙන සබ්බං, සබ්බථා සබ්බං, අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං[2] 'සබ්බෙසූ'ති. **භූතෙසූති:** 'භූතා, වුච්චන්ති: තසා ච ථාවරා ච. **තසාති** යෙසං තසිනා තණ්හා[3]. අප්පහීනා, යෙසං ච භයභෙරවා අප්පහීනා, කිං කාරණා වුච්චන්ති තසා: තෙ[4] තසන්ති උත්තසන්ති පරිතසන්ති භායන්ති සන්තාසං[5]. ආපජ්ජන්ති, තංකාරණා වුච්චන්ති තසා. **ථාවරාති:** යෙසං තසිනා තණ්හා[3] පහීනා, යෙසං ච භයභෙරවා පහීනා. කිං කාරණා වුච්චන්ති ථාවරා, තෙ න තසන්ති න උත්තසන්ති න පරිතසන්ති න භායන්ති න සන්තාසං[5]. ආපජ්ජන්ති, තංකාරණා වුච්චන්ති ථාවරා. **දණ්ඩාති[6]:** තයො දණ්ඩා: කායදණ්ඩො වචීදණ්ඩො මනොදණ්ඩො. තිවිධං කායදුච්චරිතං කායදණ්ඩො, චතුබ්බිධං වචීදුච්චරිතං වචීදණ්ඩො, තිවිධං මනොදුච්චරිතං මනොදණ්ඩො. **සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩන්ති** සබ්බෙසු භූතෙසු දණ්ඩං නිධාය නිදහිත්වා ඔරොපයිත්වා සමොරොපයිත්වා නික්ඛිපිත්වා පටිප්පස්සම්භිත්වාති 'සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං.'

**අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසන්ති** එකමෙකම්පි සත්තං පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා අන්දුයා වා[7] රජ්ජුයා වා අවිහෙඨයන්තො, සබ්බෙපි සත්තෙ පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා අන්දුයා වා රජ්ජුයා වා, අවිහෙඨයන්තොති 'අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං.'

---

1. අහෙඨයං – සයා,
2. පරියාදාය වචනමෙතං – සයා,
3. තසිතතණ්හා – ම ජ සං, තණ්හා – සයා
4. තෙන – ප–ච–වි–ක.
5. සන්තාපං – සයා
6. දණ්ඩන්ති – ම ජ සං.
7. අද්දුයා වා – ච–වි–ක, අරුයා වා – සයා

## ඛග්ගවිසාණ සූත්‍රනිර්දෙශය

1. සියලු සතුන් කෙරෙහි කායවාක්මනොදණ්ඩය හැරපියා ඔවුනතුරෙහි කිසි එකකුදු නො වෙහෙසනුයේ කිසි පුතකු නො කැමැති වන්නේ යැ යහළුවකු ඉස්නේ යැ යනු කොයි නැ? කගවෙහෙණ හභක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යි.

**සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං** — 'සබ්බෙසු' යනු: සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශෙෂ කොට නිශ්ශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි මෙල 'සබ්බෙසු' යනු. **භූතෙසු** – තෘෂ්ණා සහිත සත්ත්වයෝ ද රහත්හු ද 'භූතයෝ' යි කියනු ලැබෙත්. **තසා** යනු: යම් කෙනකුන්ගේ තසිනාව (පවස්) තෘෂ්ණාව ප්‍රහීණ නො වූ ද, යම් කෙනකුන්ගේ වැළිත් චිත්තොත්‍රාසයෝ ප්‍රහීණ නො වූවාහු ද ඔහු යැ. කවර කරුණින් 'තසයෝ' යි කියනු ලැබෙත් ද යත්: ඔහු ත්‍රස්ත වෙති උත්ත්‍රස්ත වෙති පරිත්‍රස්ත වෙති භය වෙති සන්ත්‍රාසයට පැමිණෙති. එකරුණින් 'තසයෝ'යි කියනු ලැබෙත්. **ථාවරා** යනු: යම් කෙනකුන්ගේ තසිනාව තණ්හාව ප්‍රහීණ වූ ද යම් කෙනකුන්ගේ වැළිත් චිත්තොත්‍රාසයෝ ප්‍රහීණ වූවාහු ද ඔහු යැ. කවර කරුණින් 'ථාවරයෝ' යි කියනු ලැබෙත් ද යත්: ඔහු ත්‍රස්ත නො වෙති උත්ත්‍රස්ත නො වෙති පරිත්‍රස්ත නො වෙති බිය නො වෙති සන්ත්‍රාසයට නො පැමිණෙත්. එ කරුණින් 'ථාවරයෝ' යි කියනු ලැබෙත්. **දණ්ඩං** යනු: දණ්ඩයෝ තිදෙනෙක්: කායදණ්ඩ යැ වාග් දණ්ඩ යැ මනොදණ්ඩ යැ යි. ත්‍රිවිධ කායදුශ්චරිතය කාය දණ්ඩ නම, චතුර්විධ වාග්දුශ්චරිතය වාග්දණ්ඩ නම, ත්‍රිවිධ මනොදුශ්චරිතය මනො දණ්ඩ නම්. **සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං** යනු: සියලු සත්ත්වයන් කෙරෙහි දඬුවම් හැර පියා තබා බහාතබා දමා පියා බැහැර කොට සන්හිඳුවා නුයි 'සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං' යනු වේ.

**අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං** යනු: එකෙක් සතකුදු අතින් හෝ කැටින් හෝ දඬින් හෝ සැතින් හෝ සිරබැඳුමින් හෝ රැහැනින් හෝ නො වෙහෙසනුයේ හැම සතුන් මැ අතින් හෝ කැටින් හෝ දඬින් හෝ සැතින් හෝ සිර බැඳුමින් හෝ රැහැනින් හෝ නො වෙහෙසනුයේ නුයි 'අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං' යනු වේ.

න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායන්ති— නා’ති පටික්ඛෙපො, පුත්තාති චත්තාරො පුත්තා: අත්‍රජො[1]. පුත්තො ඛෙත්තජො පුත්තො දින්නකො පුත්තො අන්තෙවාසිකො පුත්තො. සහායන්ති සහායා වුච්චන්ති; යෙහි සහ ආගමනං ඵාසු, ගමනං ඵාසු, ගමනාගමනං ඵාසු. ඨානං ඵාසු, නිසජ්ජා[2] ඵාසු, සයනං[3] ඵාසු, ආලපනං ඵාසු, සල්ලපනං ඵාසු, උල්ලපනං ඵාසු, සමුල්ලපනං ඵාසු. න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායන්ති: දුත්තම්පි න ඉච්ඡෙය්‍ය න සාදියෙය්‍ය න පත්ථෙය්‍ය න පිහයෙය්‍ය නාභිජප්පෙය්‍ය, කුතො මිත්තං වා සන්දිට්ඨං වා සම්භත්තං වා සහායං වා ඉච්ඡෙය්‍ය[4] සාදියෙය්‍ය පත්ථෙය්‍ය පිහයෙය්‍ය අභිජප්පෙය්‍යාති 'න දුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං'.

එකො චරෙ ඛග්ගවිසාණකප්පොති 'එකො'ති සො පච්චෙකබුද්ධො පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො, අදුතියට්ඨෙන එකො, තණ්හාය පහානට්ඨෙන[5]. එකො, එකන්තවීතරාගොති එකො, එකන්තවීතදොසොති එකො, එකන්තවීතමොහොති එකො, එකන්තනික්කිලෙසොති එකො, එකායනමග්ගං ගතොති එකො, එකො අනුත්තරං පච්චෙකසම්බොධිං අභිසම්බුද්ධොති එකො.

කථං සො පච්චෙකසම්බුද්ධො පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො: සො පච්චෙකසම්බුද්ධො සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා සන්නිධිපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. එවං සො පච්චෙකසම්බුද්ධො පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො.

කථං සො පච්චෙකසම්බුද්ධො අදුතියට්ඨෙන එකො: සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි[6] සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො චරති, එකො ගච්ඡති, එකො තිට්ඨති, එකො නිසීදති, එකො සෙය්‍යං කප්පෙති, එකො ගාමං පිණ්ඩාය පවිසති, එකො අභික්කමති, එකො පටික්කමති, එකො රහො නිසීදති, එකො චඞ්කමං අධිට්ඨාති, එකො චරති, විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙතීති එවං සො පච්චෙකසම්බුද්ධො අදුතියට්ඨෙන එකො.

1. අත්තජො – ස්‍යා.
2. නිසජ්ජනං – ස්‍යා.
3. නිපජ්ජනං – ස්‍යා.
4. ඉච්ඡිස්සති ස්‍යා
5. තණ්හා පහානට්ඨෙන – පන, ස්‍යා
6. පත්ථානි– ප වි, වි, ක

**න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං** — 'න' යනු: ප්‍රතික්ෂේප යැ. 'පුත්තා' යනු: පුත්‍රයෝ සතර දෙනෙකි: ආත්මජපුත්‍ර යැ ක්ෂේත්‍රජ පුත්‍ර යැ දින්නකපුත්‍ර යැ අන්තවාසික පුත්‍ර යැ යි. **සහායං**— යම් කෙනකුන් හා සමග ඊම පහසු ද යෑම පහසු ද යෑමඊම පහසු ද සිටීම පහසු ද හිඳීම පහසු ද ශයනය පහසු ද ආලපනය පහසු ද සල්ලාපය පහසු ද උල්ලපනය (ඔසොවා කීම) පහසු ද සමුල්ලපනය (හාත්පසින් ඔසොවා කීම) පහසු ද ඔහු යැ. **න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං** – යනු: පුතුදු නො කැමැති වන්නේ යැ ආස්වාද නො කරන්නේ යැ නො පතන්නේ යැ ඊප්සා නො කරන්නේ යැ තෘප්ති නූපදවන්නේ යැ. කවර හෙයින් මිත්‍රයකු හෝ සන්දෘෂ්ටයකු හෝ සම්භක්තයකු හෝ සහායයකු හෝ කැමැති වන්නේ ද ආස්වාද කරන්නේ ද ප්‍රාර්ථනා කරන්නේ ද ඊප්සා කරන්නේ ද තෘප්ති උපදවන්නේ ද නුයි 'න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං' යනු වේ.

**එකො චරෙ ඛග්ගවිසාණකප්පො** – 'එකො' යනු: ඒ පසේ බුදුහු ප්‍රව්‍රජ්‍යා සංඛ්‍යාතාර්ථයෙන් අතුල්‍යයහ, අද්විතියාර්ත්ථයෙන් අතුල්‍යයහ, තෘෂ්ණා ප්‍රහාණාර්ත්ථයෙන් අතුල්‍යයහ, ඒකාන්ත වීතරාග නුයි අතුල්‍යයහ, ඒකාන්ත වීතදෙස නුයි අතුල්‍යයහ, ඒකාන්ත වීතමොහ නුයි අතුල්‍යයහ, ඒකාන්තයෙන් නික්ලේශ නුයි අසහායහ, ඒකායනමාර්ගයට ගියාහු නුයි ඒකයහ, එකලා වැ ප්‍රත්‍යෙකසම්බොධිය අවබොධ කළාහු නු යි ඒකයහ.

යිසෙයින් ඒ පසේ බුදුහු ප්‍රව්‍රජ්‍යා සංඛ්‍යාත අර්ත්ථයෙන් 'එක' වූහ යත්: ඒ පසේබුදුහු හැම ගෘහාවාස පරිරොධය සිඳපියා අඹුදරු ආවරණය සිඳපියා ඥාති පලිබොධය සිඳපියා සන්නිධිපරිරොධය සිඳපියා කෙස්රවුළු බහා කහවත් හැඳ ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදි වැ අකිඤ්චන (කිසිවක් නැති) බවට පැමිණ එකලා වැ හැසිරෙති. වෙසෙති ඉරියවු පවත්වති වැටෙති රකෙති යැපෙති පවත්වත්. මෙසෙයින් ඒ පසේ බුදුහු ප්‍රව්‍රජ්‍යා සංඛ්‍යාත අර්ත්ථයෙන් 'එක' යහ.

කිසෙයින් ඒ පසේ බුදුහු අද්විතියාර්ත්ථයෙන් 'එක' වූහ. යත්: උන්වහන්සේ මෙසෙයින් පැවිදි වූවාහු එකලා වැ අල්පශබ්ද වූ අල්ප නිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රාහස්‍යයට ස්ථාන වූ විවෙකයට අනුරූප වූ වනයෙහි දුරු සෙනසුන් වනපර්‍යන්ත සෙනසුන් ඇසුරු කෙරෙති, උන් වහන්සේ එකලා වැ හැසිරෙති, එකලා වැ යෙති එකලා වැ සිටිති, එකලා වැ හොවිති, එකලා වැ ගමට පිඬුසිගා පිවිසෙති, එකලා වැ රහසැ හිඳිති, එකලා වැ සක්මන් කෙරෙති, එකලා වැ හැසිරෙති, වෙසෙති, ඉරියවු පවත්වති, වැටෙති, රකෙති, යැපෙති, පවත්වත්. මෙසෙයින් බුදුහු අද්විතියාර්ත්ථයෙන් 'එක' යහ.

කථං සො පච්චෙකසම්බුද්ධො තණ්හාය පහානට්ඨෙන එකො, සො එවං එකො අදුතියො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො මහාපධානං පදහන්තො මාරං සසෙනං[1] නමුචිං කණ්හං පමත්තබන්ධුං විධමෙත්වා[2] තණ්හාජාලිනිං[3] සරිතං විසත්තිකං[4] පජහි විනොදෙසි බ්‍යන්තිං අකාසි අනභාවං ගමෙසීති.

1. "තණ්හා දුතියො පුරිසො දීඝමද්ධානසංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

2. එවමාදීනවං[5] ඤත්වා තණ්හා[6] දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ"ති.[ෆ]

එවං සො පච්චෙකසම්බුද්ධො තණ්හාය පහානට්ඨෙන එකො.

කථං සො පච්චෙකසම්බුද්ධො එකන්තවීතරාගොති එකො: රාගස්ස පහීනත්තා එකන්තවීතරාගොති එකො දොසස්ස පහීනත්තා එකන්තවීතදොසොති එකො, මොහස්ස පහීනත්තා එකන්තවීතමොහොති එකො, කිලෙසානං පහීනත්තා එකන්තනික්කිලෙසොති එකො, එවං සො පච්චෙකසම්බුද්ධො එකන්තවීතරාගොති එකො.

කථං සො පච්චෙකසම්බුද්ධො එකායනමග්ගං ගතොති එකො: 'එකායනමග්ගො' වුච්චති; චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්චබලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

1. සසෙනකං – ප–වි–ක, මජසං.
2. විධමෙත්වා ච – ම ජ සං
3. තණ්හං ජාලිනිං – ස්‍යා,
4. විසරිතං විසත්තිකං – ම ජ සං
5. එතමාදීනවං – ප. ම ජ සං
6. තණ්හං – ම ජ සං,
ෆ. චතුක්කඞ්ගුත්තර–භණ්ඩගාමවග්ග සුත්තනිපාත–ද්වයතානුපස්සනාසුත්ත. ඉතිවුත්තක අතීයවග්ග

කිසෙයින් ඒ පසේ බුදුහු තෘෂ්ණාප්‍රහාණාර්ථයෙන් 'එක' වූහ යත්: මෙසෙයින් උන්වහන්සේ එකලා වූවාහු අද්විතීය වූවාහු අප්‍රමත්ත වූවාහු කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වසන්නාහු මහාප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙමින් තෘෂ්ණාකර්ම ඇති (නො මිදිය දෙන හෙයින්) නමුචි නම් වූ ප්‍රමත්තයනට බන්ධු වූ සෙන් සහිත මරු විධමනය කොට විසත්තිකා නම් වූ තෘෂ්ණා ජාලිනිය දුරු කළහ බැහැර කළහ, විගතාන්ත කළහ, අනභාවයට පැමිණ වූ සේක.

1. තෘෂ්ණාව දෙවැනි කොට ඇති පුරුෂතෙම දිගුකලක් මුළුල්ලෙහි සැරිසරනුයේ ඉභාත්මභාව අනාගතාත්මභාව නොහොත් ඉත්ථම්භාව අන්‍යථාභාව සංඛ්‍යාත වූ සංසාරය නො ඉක්මවයි.

2. (අතීතාදි ස්කන්ධයන්හි) මෙසේ ආදීනව දැන, තෘෂ්ණාව දුකට කාරණ යි දැන පහ වූ තෘෂ්ණා ඇති ආදාන (ග්‍රහණ) රහිත වූ ස්මෘතිමත් වූ ක්ෂීණාශ්‍රව මහණ තෙම හැසිරෙන්නේ යැ' යි

මෙසේ ඒ පසේ බුදුහු තෘෂ්ණා ප්‍රහාණාර්ත්ථයෙන් එකයහ.

කිසෙයින් ඒ පසේ බුදුහු එකාන්ත වීතරාග නුයි 'එක' වූහ යත්: රාගය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් වීතරාග නුයි 'එක' යහ, ද්වේෂය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් වීතද්වේෂ නුයි 'එක' යහ, මොහය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් පහ වූ මොහය ඇත්තාහු නුයි 'එක' යහ, ක්ලේශයන් ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් නික්ලේශ වූවාහු නුයි 'එක' යහ.

කිසෙයින් ඒ පසේ බුදුහු එකායන මාර්ගයට ගියාහු නුයි 'එක' වූහ යත්: සතර සතිපට්ඨානයෝ යැ, සතර සම්‍යක් ප්‍රධානයෝ යැ, සතර ඍද්ධි-පාදයෝ යැ, පඤ්චෙන්ද්‍රියයෝ යැ, පඤ්චබලයෝ යැ, සප්තබොධ්‍යඞ්ගයෝ යැ, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග යැ, යන මේ 'එකායන මාර්ගය' යි කියනු ලැබේ.

3. එකායනං ජාතිඛයන්තදස්සී
මග්ගං පජානාති හිතානුකම්පී
එතෙන මග්ගෙන තරිංසු පුබ්බෙ
තරිස්සන්ති යෙ ච තරන්ති ඕඝං'.

එවං සො පච්චෙකසම්බුද්ධො එකායනමග්ගං ගතොති එකො. කථං සො පච්චෙකසම්බුද්ධො එකො අනුත්තරං පච්චෙක සම්බොධිං[1] අභිසම්බුද්ධොති එකො: 'බොධි' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං, "පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං -පෙ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි"සො පච්චෙකසම්බුද්ධො තෙන පච්චෙකබොධිඤාණෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති බුජ්ඣි, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති බුජ්ඣි, සබ්බෙ ධම්මා අනත්තාති බුජ්ඣි, අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති බුජ්ඣි සඞ්ඛාරපච්චයා විඤ්ඤාණන්ති බුජ්ඣි, විඤ්ඤාණපච්චයා නාමරූපන්ති බුජ්ඣි නාමරූපපච්චයා සළායතනන්ති බුජ්ඣි, සළායතනපච්චයා ඵස්සොති බුජ්ඣි, ඵස්සපච්චයා වෙදනාති බුජ්ඣි, වෙදනාපච්චයා තණ්හාති බුජ්ඣි තණ්හා පච්චයා උපාදානන්ති බුජ්ඣි, උපාදානපච්චයා භවොති බුජ්ඣි, භවපච්චයා ජාතීති බුජ්ඣි, ජාතිපච්චයා ජරාමරණන්ති බුජ්ඣි අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති බුජ්ඣි, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණ නිරොධොති බුජ්ඣි, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධොති බුජ්ඣි, නාමරූපනිරොධා සළායතනනිරොධොති බුජ්ඣි, සළායතන නිරොධා ඵස්සනිරොධොති බුජ්ඣි, ඵස්සනිරොධා වෙදනානිරොධොති බුජ්ඣි, වෙදනානිරොධා තණ්හානිරොධොති බුජ්ඣි, තණ්හානිරොධා උපාදාන නිරොධොති බුජ්ඣි උපාදාන නිරොධා භව නිරොධොති බුජ්ඣි, භවනිරොධා ජාති නිරොධොති බුජ්ඣි, ජාතිනිරොධා ජරාමරණ නිරොධොති බුජ්ඣි' ඉදං දුක්ඛන්ති බුජ්ඣි, අයං දුක්ඛසමුදයොති බුජ්ඣි, අයං දුක්ඛනිරොධොති බුජ්ඣි, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති බුජ්ඣි. ඉමෙ ආසවාති බුජ්ඣි, අයං ආසවසමුදයොති බුජ්ඣි, අයං ආසවනිරොධොති බුජ්ඣි අයං ආසවනිරොධගාමිනී පටිපදාති බුජ්ඣි. ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති බුජ්ඣි, ඉමෙ ධම්මා පහාතබ්බාති බුජ්ඣි, ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බාති බුජ්ඣි, ඉමෙ ධම්මා භාවෙතබ්බාති බුජ්ඣි, ඡන්නං ඵස්සායතනානං සමුදයං ච අත්ථඞ්ගමං ච.[2] අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච බුජ්ඣි. පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයං ච -පෙ- නිස්සරණං ච බුජ්ඣි. චතුන්නං මහාභූතානං සමුදයං ච අත්ථඞ්ගමං ච අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච බුජ්ඣි, යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති බුජ්ඣි.

1. පච්චෙක බුද්ධඤාණෙන - ස්‍යා.
2. අත්ථඞ්ගමංච- ච-වි-ක. ම ජ සං,
ස. සතිපට්ඨානසංයුත්ත- තාලපද්වග.

3. ජාතික්ෂය සංඛ්‍යාත නිර්වාණය දක්නා සුලු වූ හිතයෙන් අනුකම්පා කරන සුලු වූ බුද්ධහු ඒකායන මාර්ගය දන්නා සේක. පෙර යම් කෙනෙක් චතුරොඝය තරණය කළාහු නම් තෙල මාර්ගයෙන් තරණය කළාහු ය. තවද යම් කෙනෙක් (මතු) තරණය කරන්නාහු නම්, දැන් තරණය කෙරෙත් නම්, මෙ මඟින් තරණය කෙරෙත්. මෙසෙයින් ඒ පසේ බුද්ධහු ඒකායන මාර්ගයට ගියාහු නුයි 'ඒක' යහ.

කිසෙයින් ඒ පසේබුද්ධහු එකලා වැ අනුත්තර වූ ප්‍රත්‍යෙක සම්බොධිය අවබෝධ කළාහු නුයි 'එක' වූහ යත්: සතර මාර්ග ඥානය ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රියය ප්‍රඥාබලය ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය වීමංසාව විදර්ශනාව සම්‍යග්-දෘෂ්ටිය 'බොධි' යයි කියනු ලැබේ. ඒ පසේ බුද්ධහු ඒ ප්‍රත්‍යෙක බොධි ඥානයෙන් 'හැම සංස්කාරයෝ අනිත්‍යයහ' යි අවබොධ කළහ. 'හැම සංස්කාරයෝ දුක්ඛහ යි අවබොධ කළහ, 'හැම ධර්මයෝ අනාත්මහ' යි අවබොධ කළහ. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති දත්හ. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වේ යැයි දත්හ, විඥානප්‍රත්‍යයෙන් නාමරූපය වේ යැයි දත්හ. නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනය වේ යැයි දත්හ. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ යැයි දත්හ. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව වේ යැයි දත්හ. වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ යැයි දත්හ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදනය වේ යැයි දත්හ. උපාදන ප්‍රත්‍යයෙන් භවය වේ යැයි දත්හ. භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ යැයි දත්හ. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැයි දත්හ. අවිද්‍යා නිරොධයෙන් සංස්කාරනිරොධය වේ යැයි දත්හ. සංස්කාර නිරොධයෙන් විඥාන නිරොධය වේ යැයි දත්හ. විඥාන නිරොධයෙන් නාමරූප නිරොධය වේ යැයි දත්හ. නාමරූප නිරොධයෙන් ෂඩායතන නිරොධය වේ යැයි දත්හ. ෂඩායතන නිරොධයෙන් ස්පර්ශනිරොධය වේ යැයි දත්හ. ස්පර්ශ නිරොධයෙන් වෙදනා නිරොධය වේ යැයි දත්හ. වෙදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ යැයි දත්හ. තෘෂ්ණා නිරොධයෙන් උපාදනනිරොධය වේ යැයි දත්හ. උපාදනනිරොධයෙන් භව නිරොධය වේ යැයි දත්හ. භවනිරොධයෙන් ජාතිනිරොධය වේ යැයි දත්හ. ජාතිනිරොධයෙන් ජරාමරණ නිරොධය වේ යැයි දත්හ. 'මේ (පඤ්ච ස්කන්ධය) දුකැ' යි දත්හ. 'මේ (තෘෂ්ණා සමුදය) දුක්හේතුව යැ' යි දත්හ. 'මේ (තෘෂ්ණා නිරොධය) දුක් නැසීම යැ' යි දත්හ. 'මේ (ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය) දුක් නැසීමට පමුණුවන පිළිවෙතැ' යි දත්හ. 'මෙ ධර්මයෝ දතයුත්තාහ' යි දත්හ. 'මෙ ධර්මයෝ හළ යුත්තාහ' යි දත්හ. 'මෙ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ' යි දත්හ. 'මෙ ධර්මයෝ වැඩිය යුත්තාහ' යි දත්හ. සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ පහළ වීම ද නැසීම ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද දත්හ. පඤ්චොපාදනස්කන්ධයන්ගේ පහළ වීම ද . . . නිස්සරණය ද දත්හ. සතර මහාභූතයන්ගේ පහළ වීම ද නැසීම ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද දත්හ. යම් කිසි සමුදය ස්වභාවයෙක් වේ නම් එ හැම නැසෙන පියවි ඇතැ' යි දත්හ.

අථවා යං බුජ්ඣිතබ්බං අනුබුජ්ඣිතබ්බං පටිබුජ්ඣිතබ්බං සම්බුජ්ඣිතබ්බං අධිගන්තබ්බං ඵස්සිතබ්බං සච්ඡිකාතබ්බං, සබ්බං තං තෙන පච්චෙකබොධිඤාණෙන බුජ්ඣි අනුබුජ්ඣි පටිබුජ්ඣි සම්බුජ්ඣි අධිගච්ඡි ඵස්සෙසි සච්ඡාකාසීති එවං සො පච්චෙකසම්බුද්ධො එකො අනුත්තරං පච්චෙකසම්බොධිං අභිසම්බුද්ධොති එකො.

චරෙති: අට්ඨ චරියායො: ඉරියාපථචරියා ආයතනචරියා සතිචරියා සමාධිචරියා ඤාණචරියා මග්ගචරියා පත්තිචරියා[1] ලොකත්ථචරියා. 'ඉරියාපථචරියා'ති චතූසු ඉරියාපථෙසු. ආයතනචරියාති: ඡසු අජ්ඣත්තිකබාහිරෙසු[2] ආයතනෙසු. 'සතිචරියා'ති චතූසු සතිපට්ඨානෙසු. 'සමාධිචරියා'ති චතූසු ඣානෙසු. ඤාණචරියාති චතූසු අරියසච්චෙසු.[3] 'මග්ගචරියා'ති චතූසු අරියමග්ගෙසු.[4] 'පත්තිචරියා'ති[5] චතූසු සාමඤ්ඤඵලෙසු, ලොකත්ථචරියාති තථාගතෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු, පදෙසෙ[6] පච්චෙකසම්බුද්ධෙසු පදෙසෙ[6] සාවකෙසු ඉරියාපථචරියා ච පණිධිසම්පන්නානං, ආයතනචරියා ච ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරානං, සතිචරියා ච අප්පමාදවිහාරීනං, සමාධිචරියා ච, අධිචිත්තමනුයුත්තානං ඤාණචරියා ච බුද්ධිසම්පන්නානං මග්ගචරියා ච සම්මාපටිපන්නානං, පත්තිචරියා ච[8] අධිගතඵලානං, ලොකත්ථචරියා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, පදෙසෙ පච්චෙකබුද්ධානං, පදෙසෙ[6] සාවකානං, ඉමා අට්ඨචරියායො.

අපරාපි අට්ඨචරියායො: අධිමුච්චන්තො සද්ධාය චරති, පග්ගණ්හන්තො විරියෙන චරති, උපට්ඨපෙන්තො සතියා චරති, අවික්ඛෙපං කරොන්තො සමාධිනා චරති, පජානන්තො[7] පඤ්ඤාය චරති, විජානන්තො විඤ්ඤාණෙන චරති,[8] එවං පටිපන්නස්ස කුසලා ධම්මා ආයාපෙන්තීති ආයතනචරියාය චරති. එවං පටිපන්නො විසෙසමධිගච්ඡතීති විසෙසචරියාය චරති ඉමා අට්ඨචරියායො.

අපරාපි අට්ඨ චරියායො: දස්සනචරියා ච[9] සම්මාදිට්ඨියා, අභිනිරොපනචරියා ච[10] සම්මාසඞ්කප්පස්ස, පරිග්ගහචරියා ච සම්මාවාචාය, සමුට්ඨානචරියා ච සම්මා කම්මන්තස්ස, වොදානචරියා ච සම්මාආජීවස්ස, පග්ගහචරියා ච සම්මාවායාමස්ස, උපට්ඨානචරියා ච සම්මාසතියා, අවික්ඛෙපචරියා ච සම්මාසමාධිස්ස, ඉමා අට්ඨචරියායො.

---

1. පටිපත්තිචරියා – ප, ච, වි, ක
2. ඡඅජ්ඣත්තිකබාහිරෙසු– ප, ච, වි, ක
3. චතූසු සච්චෙසු– ප, ච, වි, ක
4. චතූසු මග්ගෙසු– ප, ච, වි, ක
5. පටිපත්තිචරියාති– ප, ච, වි, ක
6. පදෙසතො– ම ඡ සං, ස්‍යා.
7. පජහන්තො– මඡසං. ස්‍යා.
8. විඤ්ඤාණචරියායචරති– ම ඡ සං ච, වි, ක.
9. දස්සනචරියාඤාණචරියාච සම්මාදිට්ඨියා– ප, ච, වි, ක.
10. අභිරොපනචරියා ම, ඡ, සං.

නොහොත් යම් කිසිවක් දතයුතු නම්, නැවැත නැවැත දතයුතු නම්, වෙසෙසින් දතයුතු නම්, මැනැවින් දතයුතු නම්, අධිගම කළ යුතු නම්, නුවණින් ස්පර්ශ කළ යුතු නම්, ප්‍රත්‍යක්ෂ කළ යුතු නම්, එ හැම ඒ ප්‍රත්‍යෙක බොධිඥානයෙන් දත්හ, අනුබොධ කළහ, ප්‍රතිබොධ කළහ, වෙසෙසින් දත්හ, මැනැවින් දත්හ, ස්පර්ශ කළහ, ප්‍රත්‍යක්ෂ කළාහු නුයි මෙසෙයින් ඒ පසේබුදුහු එකලා වැ අනුත්තර වූ ප්‍රත්‍යෙක සම්බොධිය අභිසම්බුද්ධ නුයි ‘එක’ නම් වූහ.

චරෙ යනු: චර්‍ය්‍යා අටෙකි: ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යා යැ ආයතනචර්‍ය්‍යා යැ ස්මෘතිචර්‍ය්‍යා යැ සමාධිචර්‍ය්‍යා යැ ඥානචර්‍ය්‍යා යැ මාර්ගචර්‍ය්‍යා යැ ඵලචර්‍ය්‍යා යැ ලොකාර්ත්ථචර්‍ය්‍යා යි. ‘ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යා’ යනු සතර ඉරියවුහි යැ. ‘ආයතනචර්‍ය්‍යා’ යනු සවැදෑරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි යැ. ‘ස්මෘතිචර්‍ය්‍යා’ යනු සතර සතිපට්ඨානයන්හි යැ. ‘සමාධිචර්‍ය්‍යා’ යනු සතර ධ්‍යානයන්හි යැ. ‘ඥානචර්‍ය්‍යා’ යනු සතර ආර්‍ය්‍ය සත්‍යයන්හි යැ. ‘මාර්ගචර්‍ය්‍යා’ යනු සතර ආර්‍ය්‍යමාර්ගයන්හි යැ. ‘පත්තිචරියා’ යනු සතර ශ්‍රාමණ්‍ය ඵලයෙහි යැ. ‘ලොකාර්ත්ථචර්‍ය්‍යා’ යනු තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහියැ, එකදේශයෙක්හි පසේබුදුන් කෙරෙහි යැ, එකදෙශයෙක්හි ශ්‍රාවකයන් කෙරෙහි යැ. ප්‍රණිධිසම්පන්නයනට ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යාව ද, ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරයනට ආයතනචර්‍ය්‍යා ද, අප්‍රමාද විහාරීන්ට ස්මෘතිචර්‍ය්‍යා ද, අධිචිත්තයෙහි යෙදුණවුනට සමාධිචර්‍ය්‍යා ද, බුද්ධිසම්පන්නයනට ඥානචර්‍ය්‍යා ද, සම්‍යක්ප්‍රතිපන්නයනට මාර්ගචර්‍ය්‍යා ද, අධිගම කළ ඵල ඇතියනට ඵලචර්‍ය්‍යා ද, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයනට, එකදෙශයෙක්හි ප්‍රත්‍යෙක බුද්ධයනට, එකදෙශයෙක්හි ශ්‍රාවකයනට ලොකාර්ත්ථචර්‍ය්‍යාව දැ යි මේ අට වැදෑරුම් චර්‍ය්‍යාවෝ වෙති.

අන්‍ය වූ ද චර්‍ය්‍යා අටෙකි: අධිමොක්ෂ කරනුයේ ශ්‍රද්ධා වශයෙන් පවතියි, ප්‍රග්‍රහ කරනුයේ වීර්‍ය්‍ය වශයෙන් පවතියි, (අරමුණෙහි) සිහි එළවා තබනුයේ ස්මෘති වශයෙන් පවතියි, අවික්ෂේපය කරනුයේ සමාධි වශයෙන් පවතියි, ප්‍රජානනය කරනුයේ ප්‍රඥා වශයෙන් පවතියි, විජානනය (ආවර්ජනවිඥානයෙන් අරමුණු දැනීම) කරනුයේ විඥාන වශයෙන් පවතියි. මෙසෙයින් පිළිපන්හු ගේ කුශල ධර්මයෝ අතිශයින් පවතිත් නුයි ආයතන චර්‍ය්‍යා වශයෙන් පවතියි. මෙසෙයින් පිළිපන්නේ විශෙෂයට පැමිණේ නුයි විශෙෂචර්‍ය්‍යා වශයෙන් පවතී. මොහු අෂ්ටචර්‍ය්‍යාවෝ වෙති.

අන්‍ය වූ ද චර්‍ය්‍යා අටෙකි: සම්‍යග්දෘෂ්ටියගේ දර්ශන වශයෙන් පැවැත්ම ද සම්‍යක් සංකල්පයාගේ අභිනිරොපණ වශයෙන් පැවැත්ම ද සම්‍යග්වචනයාගේ පරිග්‍රහ වශයෙන් පැවැත්ම ද සම්‍යක් කර්මාන්තයාගේ සමුත්ථාන වශයෙන් පැවැත්ම ද සම්‍යගාජීවයාගේ ව්‍යවදාන වශයෙන් පැවැත්ම ද සම්‍යග් ව්‍යායාමයාගේ ප්‍රග්‍රහ වශයෙන් පැවැත් ම ද, සම්‍යක් ස්මෘතිය ගේ වැටහීම් වශයෙන් පැවැත්ම ද සම්‍යක් සමාධිහු ගේ අවික්ෂෙප වශයෙන් පැවැත් ම ද යන මොහු අෂ්ටචර්‍ය්‍යාවෝ යි.

ඛග්ගවිසාණකප්පොති යථා ඛග්ගස්ස නාම විසාණං එකං හොති අදුතියං. එවමෙව සො පච්චෙකසම්බුද්ධො, තංකප්පො[1] තංසදිසො[2] තප්පටිභාගො. යථා අතිලොණං වුච්චති ලොණකප්පො, අතිතිත්තකං වුච්චති තිත්තකප්පො, අතිමධුරං වුච්චති මධුරකප්පො, අතිඋණ්හං වුච්චති අග්ගිකප්පො, අතිසීතං වුච්චති හිමකප්පො, මහාඋදකක්ඛන්ධො වුච්චති සමුද්දකප්පො, මහාභිඤ්ඤාබලප්පත්තො සාවකො වුච්චති සත්ථුකප්පොති. එවමෙව සො පච්චෙකසම්බුද්ධො තංකප්පො තංසදිසො තප්පටිභාගො එකො අදුතියො මුත්තබන්ධනො සම්මා ලොකෙ චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙතීති 'එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං,
න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

2.

සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහා
ස්නෙහන්වයං දුක්ඛමිදං පහොති,
ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහාති– 'සංසග්ගා'ති ද්වෙ සංසග්ගා: දස්සනසංසග්ගො ච සවනසංසග්ගො ච. කතමො දස්සනසංසග්ගො: ඉධෙකච්චො පස්සති ඉත්ථිං වා කුමාරිං වා අභිරූපං දස්සනීයං පාසාදිකං පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතං, දිස්වා පස්සිත්වා අනුබ්‍යඤ්ජනසො නිමිත්තං ගණ්හාති; කෙසා වා සොභනා, මුඛං වා සොභනං, අක්ඛී වා සොභනා, කණ්ණා වා සොභනා, නාසා වා සොභනා, ඔට්ඨා වා සොභනා, දන්තා වා සොභනා, මුඛං වා සොභනං, ගිවා වා සොභනා, ථනා වා සොභනා, උරං වා සොභනං, උදරං වා සොභනං, කටි වා සොභනං, ඌරු වා සොභනා, ජඞ්ඝා වා සොභනා, හත්ථා වා සොභනා, පාද වා සොභනා, අඞ්ගුලියො වා සොභනා, නඛා වා සොභනාති දිස්වා පස්සිත්වා අභිනන්දති අභිවදති අභිපත්ථෙති අනුස්සරති අනුප්පාදෙති අනුබන්ධති රාගබන්ධනං. අයං දස්සනසංසග්ගො.

1. තක්කප්පො – ම ජ සං ස්‍යා.
2. තස්සදිසො– ම ජ සං. ස්‍යා

**ඛග්ගවිසාණකප්පො** යනු: යම් සේ කගවෙහෙණ හට එක් හඟෙක් වේ ද දෙ වැන්නෙක් නැත්තේ ද, එසෙයින් මැ ඒ පසේ බුදුහු එ බන්දහ, තත්සදෘශයහ, තත්ප්‍රතිභාගයහ. යමසේ ඉතා ලුණු වූයේ 'ලවණකල්ප' යයි කියනු ලැබේ ද, ඉතා තික්ත වූයේ 'තිත්තකල්ප' යයි කියනු ලැබේ ද, ඉතා මිහිරි වූයේ 'මධුරකල්ප' යයි කියනු ලැබේ ද, ඉතා උණු වූයේ 'අග්නි-කල්ප' යයි කියනු ලැබේ ද, ඉතා සිහිල් වූයේ 'හිමකල්ප' යයි කියනු ලැබේ ද, මහදියකඳ 'සමුද්‍රකල්ප' යයි කියනු ලැබේ ද, මහා අභිඥාප්‍රාප්ත ශ්‍රාවක තෙම 'ශාස්තෘ කල්ප' යයි කියනු ලැබේද, එසෙයින් මැ ඒ පසේ බුදුහු, එ බන්දහ. තත්සදෘශයහ, තත්ප්‍රතිභාගයහ. එකලා වූවාහු දෙවැන්නකු නැත්තාහු මිදුණු බැඳුම් ඇතියාහු මැනැවින් ලොවැ හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති රැකෙති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

**"සබ්බසු භූතෙසු –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"** යි.

2.

හටගත් (දර්ශනාදි) සංසර්ග ඇතියහුට ස්නෙහයෝ වෙති, ස්නෙහය අනුව යන මෙ දුක උපදී, ස්නෙහයෙන් උපන් ආදීනව දක්මින් කගවෙහෙණකු සෙයින් එකලා වැ හැසිරෙන්නේ යි.

**සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහා**– 'සංසග්ගා' යනු: දර්ශනසංසර්ගය ද ශ්‍රවණ සංසර්ගය දැ යි සංසර්ග දෙකෙකි. දර්ශන සංසර්ග කවර යත්: මෙ ලොවැ ඇතැමෙක් විශිෂ්ට රූ ඇති දුකුම්කලු ප්‍රසාද එළවන උතුම් වූ වර්ණසෞන්දර්යයීයෙන් සමන්වාගත වූ ස්ත්‍රියක හෝ කුමරියක හෝ දකියි. දැක බලා 'කෙස් හොබනේ යැ හෝ මුහුණ හොබනේ යැ හෝ ඇස් හොබනේ යැ හෝ කන් හොබනේ යැ හෝ නැහැය හොබනේ යැ හෝ ලවන් හොබනේ යැ හෝ දත් හොබනේ යැ හෝ මුඛය හොබනේ යැ හෝ ගෙල හොබනේ යැ හෝ පියවුරු හොබනේ යැ හෝ උරමඩල හොබනේ යැ හෝ උදරය හොබනේ යැ හෝ කටිය හොබනේ යැ හෝ වටොර හොබනේ යැ හෝ දනයුග හොබනේ යැ හෝ අත් හොබනේ යැ හෝ පා හොබනේ යැ හෝ ඇඟිලි හොබනේ යැ හෝ නිය හොබනේ යැ හෝ 'යි අනුව්‍යඤ්ජන විසින් නිමිති ගනියි දැක බලා සතුටු වෙයි තුටුවදන් බෙණෙයි පතයි සිහි කෙරෙයි අනුව්‍යඤ්ජන අල්වා ගනී. ස්නෙහ බන්ධනයෙන් බැඳේ. මෙ දර්ශන සංසර්ග නම.

කතමො සවණසංසග්ගො; ඉධෙකච්චො සුණාති අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා කුමාරී වා අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතාති, සුත්වා සුණිත්වා අභිනන්දති අභිවදති අභිපත්ථෙති අනුපාදෙති අනුබන්ධති රාගබන්ධනං. අයං සවණසංසග්ගො.

සෙනහාති ද්වෙ සෙනහා: තණ්හාසෙනහො ච දිට්ඨිසෙනහො ච. කතමො තණ්හාසෙනහො: යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමකතං මරියාදිකතං[1] ඔධිකතං පරියන්තකතං[2] පරිග්ගහිතං මමායිතං 'ඉදං මම එතං මම, එත්තකං මම, එත්තාවතා මම, රූපා සද්ද ගන්ධා රස, ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා[3] දසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගම-රාජධානියො රට්ඨං ච ජනපදෙ ච[4] කොසො ච කොට්ඨාගාරං ච කෙවලම්පි මහාපඨවිං තණ්හාවසෙන මමායති, යාවතා[5]ට්ඨසතතණ්හාවිචරිතං. අයං තණ්හාසෙනහො.

කතමො දිට්ඨිසෙනහො: වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහණං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨි සංයොජනං ගාහො පතිට්ඨාහො[6], අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො[7] විපරීතගාහො විපල්ලාසගාහො මිච්ඡාගාහො අයාථාවතකස්මිං[8] යාථාවතන්ති ගාහො යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි. අයං දිට්ඨිසෙනහො.

සංසග්ගජාතස්ස භවන්ති සෙනහාති- දස්සනසංසග්ගපච්චයා ච සවණ-සංසග්ගපච්චයා ච තණ්හාසෙනහො ච දිට්ඨිසෙනහො ච භවන්ති සංභවන්ති ජායන්ති සඤ්ජායන්ති නිබ්බත්තන්ති අභිනිබ්බත්තන්ති පාතු භවන්තීති 'සංසග්ගජාතස්ස භවන්ති සෙනහා'.

සෙනහන්වයං දුක්ඛමිදං පහොතීති-'සෙනහාති' ද්වෙ සෙනහා: තණ්හාසෙනහො ච දිට්ඨිසෙනහො ච -පෙ- අයං තණ්හාසෙනහො -පෙ- අයං දිට්ඨිසෙනහො. දුක්ඛමිදං පහොතීති ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති, පාණම්පි හනති[9], අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති,

1. සීමකතං- ච,වි,ක. ම ජ සං
2. පරියන්තිකතං -පනු. ම ජ සං
   පරියන්තිකං- ච,වි,ක
3. පාවුරණා- ම ජ සං.
4. ජනපද ච- ච,වි,ක
5. යා එතා - පන.
6. පරිග්ගාහො- ම ජ සං. සහා.
7. විපරියාසග්ගාහො- ම ජ සං.
   විපරියෙසගාහො- සහා.
8. ආයතාවකම්හි- ච,වි,ක
   අයාථාවකස්මිං-ම ජ සං. සහා.
9. හනති- ම ජ සං. සහා

ශ්‍රවණසංසර්ග කවරයත්: මෙලොව්, ඇතැමෙක් අසුවල් ගමැ හෝ නියම්ගමැ හෝ ස්ත්‍රියක් හෝ කුමරියක් හෝ විශිෂ්ට රූ ඇත්තී යැ දකුම් කලු යැ ප්‍රසාද එළවන්නී යැ උතුම් වර්ණ සෞන්දර්යයෙන් සමන්වාගත යැ' යි අසයි. අසා අසාලා සතුටු වෙයි සතුටු වදත් බෙණෙයි ප්‍රාර්ථනා කෙරෙයි අනුව්‍යඤ්ජන අල්වා ගනී. ස්නෙහ බන්ධනයෙන් බැඳේ. මේ ශ්‍රවණසංසර්ග නමි.

**සෙනහා** යනු ස්නෙහ දෙකෙකි: තෘෂ්ණා ස්නෙහය ද දෘෂ්ටිස්නේහය ද යි. තෘෂ්ණා ස්නේහය කවරයත්: යම් පමණ තෘෂ්ණා සංඛ්‍යාතයෙන් 'මේ මාගේ යැ, ,තෙල මා ගේ යැ මෙතෙක් මාගේ යැ, මෙතෙකින් මාගේ යැ' යි හිම් කරන ලද ද, මයඹිද කරන ලද ද, අවධි කරන ලද ද,පිරියත් කරන ලද් ද, පිරිසිඳගන්නා ලද ද, මමායන කරන ලද ද, රූපයෝ ශබ්දයෝ ගන්ධයෝ රසයෝ ස්ප්‍රෂ්ටව්‍යයෝ අතුරුණු පවුරුණු දසිදස්හු එළුතිරෙළු කුකුළු හූරු ඇත් අස් ගව වෙළඹහු කෙත් වතු අමුරන් රත්රන් ගම්නියම්ගම් රජදහන් රට දනවු කොටු කොටුගුළු මුළුමහපොළොව පවා තෘෂ්ණා වශයෙන් මමායන කෙරේ ද යම් පමණ අටතුරාසියක් තෘෂ්ණා විචරිත වේ ද, මේ තෘෂ්ණා ස්නෙහ නම.

දෘෂ්ටිස්නෙහ කවරැ යත්: විංශද්වස්තුක **සත්කායදෘෂ්ටි** යැ, දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි යැ දශවස්තුක අන්තග්‍රාහිකදෘෂ්ටි යැ යන මෙබඳු, යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිසූකයෙක් දෘෂ්ටිවිස්ඵන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් (අරමුණ දැඩි වැ ගන්නා) ග්‍රාහයෙක් පිහිටා සිටීමෙක් අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් අයථාමාර්ගයෙක් මිථ්‍යාභාවයෙක් තීර්ත්ථායතනයෙක් විපයර්යාස ග්‍රහණයෙක් විපරීතග්‍රහණයෙක් පෙරළි කොට ගැනීමෙක් මිථ්‍යාග්‍රහණයෙක් අයථාස්වභාවයෙහි යථා ස්වභාව යයි ගැනීමෙක් යම් පමණ දෙසැට දෘෂ්ටියෙහි ඇතුළු කෙනෙක් වෙත් ද මේ 'දෘෂ්ටිස්නේහ' නමි.

**සංසග්ගජාතස්ස භවන්ති සෙනහා** යනු: දර්ශන සංසර්ග ප්‍රත්‍යයෙනුදු ශ්‍රවණ සංසර්ග ප්‍රත්‍යයෙනුදු තෘෂ්ණාස්නේහයත් දෘෂ්ටි ස්නේහයත් වෙයි උපදියි හට ගනියි මැනැවින් හටගනියි නිපදියි වෙසෙසින් නිපදියි පහළ වෙතු නුයි 'සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහා' යනු වේ.

**සෙනහන්වයං දුක්ඛමිදං පහොති** — 'ස්නෙහා' යනු: තෘෂ්ණාස්නෙහය ද දෘෂ්ටි ස්නෙහය ද යි ස්නෙහ දෙකකි. . . . මේ තෘෂ්ණා ස්නෙහ යැ . . . මේ දෘෂ්ටි ස්නෙහයි. **දුක්ඛමිදං පහොති** යනු: මෙලොවැ ඇතැමෙක් කයින් දුසිරිත් කෙරෙයි, වචනයෙන් දුසිරිත් කෙරෙයි, මනසින් දුසිරිත් කෙරෙයි. ප්‍රාණවධ ද කෙරෙයි, අදත්තාදන ද කෙරෙයි, ගෘහසන්ධි ද සිඳියි. ගමුදු වොලොගනියි. එක් ගෙයක් පැහැරීමුදු කෙරෙයි.

පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති. තමෙනං ගහෙත්වා රඤ්ඤො දස්සෙන්ති අයං දෙව චොරො ආගුචාරී, ඉමස්ස යං ඉච්ඡති තං දණ්ඩං පණෙහීති. තමෙනං රාජා පරිභාසති, සො පරිභාසපච්චයාපි දුක්ඛං දොමනස්සං.[1] පටිසංවෙදෙති, එතං භයං දුක්ඛං දොමනස්සං. කුතො තස්ස: ලොභපච්චයා ච නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච ජාතං, අත්තකෙනාපි රාජා න තුස්සති.

තමෙනං රාජා බන්ධාපෙති අන්දුබන්ධනෙන වා රජ්ජුබන්ධනෙන වා සඞ්ඛලිකබන්ධනෙන වා වෙත්තබන්ධනෙන වා ලතාබන්ධනෙන වා පක්ඛෙපබන්ධනෙන වා පරික්ඛෙපබන්ධනෙන වා ගාමබන්ධනෙන වා නිගමබන්ධනෙන වා නගරබන්ධනෙන වා රට්ඨබන්ධනෙන වා ජනපදබන්ධනෙන වා, අන්තමසො සවචනීයම්පි කරොති න තෙ ලබ්භා ඉතො පක්කමිතුන්ති. සො බන්ධනපච්චයාපි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: ලොභපච්චයා ච[2] නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච ජාතං, අත්තකෙනාපි රාජා න තුස්සති.

තමෙනං රාජා තස්ස[3] ධනං ආහාරපෙති: සතං වා සහස්සං වා සතසහස්සං වා, සො ධනජානිපච්චයාපි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: ලොභපච්චයා ච නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච ජාතං අත්තකෙනාපි රාජා න තුස්සති,

තමෙනං රාජා විවිධා කම්මකාරණා.[4] කාරාපෙති: කසාහිපි තාළෙති වෙත්තෙහිපි තාළෙති, අඩ්ඪදණ්ඩකෙහිපි[5] තාළෙති, හත්ථම්පි ඡින්දති පාදම්පි ඡින්දති හත්ථපාදම්පි ඡින්දති, කණ්ණම්පි ඡින්දති, නාසම්පි ඡින්දති, කණ්ණනාසම්පි ඡින්දති, බිලඞ්ගථාලිකම්පි කරොති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොති රාහුමුඛම්පි කරොති, ජොතිමාලිකම්පි කරොති, හත්ථපජ්ජොතිකම්පි කරොති, එරකවත්තිකම්පි කරොති, චීරකවාසිකම්පි කරොති, එණෙය්‍යකම්පි කරොති, බලිසමංසිකම්පි කරොති, කහාපණකම්පි කරොති, ඛාරාපතච්ඡිකම්පි කරොති, පළිඝපරිවත්තිකම්පි කරොති, පළාලපීඨකම්පි [ක]රොති, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චති, සුනඛෙහිපි ඛාදාපෙති, ජීවන්තම්පි සූලෙ උත්තාසෙති, අසිනාපි සීසං ඡින්දති, සො කම්මකාරණපච්චයාපි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස ලොභපච්චයා: ච නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච ජාතං, රාජා ඉමෙසං චතුන්නං දණ්ඩානං ඉස්සරො.

1. දුක්ඛදොමනස්සං – සී්‍යා
2. තස්සලොභපච්චයාච – ච–වි–ක
3. තස්ස ච – ම ජ සං.
4. කම්මකාරණානි – ප,–ච–වි,–ක
   කම්මකරණා – ම ජ සං.
5. අඩ්ඪදණ්ඩකෙහිපි – ච–වි–ක, ම ජ සං

කඩපළා සොරකමුදු කෙරෙයි, වීරඹුසොරකමුදු කෙරෙයි මුසවා ද බෙණෙයි. ඔහු ගෙන දේවයෙනි, 'මේ අපරාධකාරී සොරෙක' මොහුට කැමැති දඬයක් පණවනු මැනැවැ' යි රජහට දක්වති. රජ ඔහුට පරිභව බෙණෙයි. හෙතෙම පරිභව බිණීම් ප්‍රත්‍යයෙනුදු දුක් දොම්නස් විඳියි. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපන යත්: ස්නෙහ ප්‍රත්‍යයෙනුදු නන්දිප්‍රත්‍යයෙනුදු රාග ප්‍රත්‍යයෙනුදු නන්දිරාග ප්‍රත්‍යයෙනුදු උපන. රජ මෙතෙකිනුදු තුටු නො වෙයි.

රජ ඔහු සිරබැඳුමින් හෝ රැහැන්බැඳුමින් හෝ හැකිලිබැඳුමින් හෝ වේවැල්බැඳුමින් හෝ ලියබැඳුමින් හෝ සිපිරිගෙ බැඳුමින් හෝ පිරිකෙවබැඳුමින් හෝ ගම්බැඳුමින් හෝ නියම්ගම් බැඳුමින් හෝ නුවර බැඳුමින් හෝ රටබැඳුමින් හෝ දනවුබැඳුමින් හෝ බඳවයි. යටත් පිරිසෙයින් 'තා මෙයින් බැහැර යන්නට නො ලැබේ' යයි සවචනීයකමුදු කෙරේ. හෙතෙම බන්ධනප්‍රත්‍යයෙනුදු දුක් දොම්නස් විඳී. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපන යත්: ස්නෙහ ප්‍රත්‍යයෙනුදු නන්දිප්‍රත්‍යයෙනුදු රාගප්‍රත්‍යයෙනුදු නන්දිරාගප්‍රත්‍යයෙනුදු උපන. මෙතෙකිනුදු රජ තුටු නො වෙයි:

රජ ඔහු ලවා සියක් හෝ දහසක් හෝ සුවහසක් හෝ ඔහුගේ ධනය ගෙන්වයි. හෙතෙම ධනහානි ප්‍රත්‍යයෙනුදු දුක් දොම්නස් විඳියි, තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපන යත්: ස්නෙහප්‍රත්‍යයෙනුදු නන්දි ප්‍රත්‍යයෙනුදු රාගප්‍රත්‍යයෙනුදු නන්දිරාගප්‍රත්‍යයෙනුදු උපන. මෙතෙකිනුදු රජ තුටු නො වෙයි.

රජ උහු ගෙන විවිධ කම්කටොලු කරවයි: (රාජපුරුෂ) කසයෙනුදු තළයි, වේවැලිනුදු තළයි, අඩදඬියෙනුදු තළයි, අත් ද සිඳියි පා ද සිඳියි, අත් පා ද සිඳියි, කනුදු සිඳියි, නැහැය ද සිඳියි, කන්නාසා ද සිඳියි, කාඩිසැළි කම්කටොලුදු කෙරෙයි, සක්මුඩු කම්කටොලුදු කෙරෙයි, රාහුමුව කම්කටොලුදු කෙරෙයි, ගිනිවළලු කම්කටොලුදු කෙරෙයි, අත් දල්වන කම්කටොලුදු කෙරෙයි, එරුවත් කම්කටොලුදු කෙරෙයි, තිහිරිවත් කම්කටොලුදු කෙරෙයි, එණෙයාපක කම්කටොලු දු කෙරෙයි, බිලියෙන් මස් සිඳුනා කම්කටොලු දු කෙරෙයි, කහාපණික කම්කටොලුදු කෙරෙයි, කොස්සෙන් කාරම් ගල්වන කම්කටොලුදු කෙරෙයි, පරිඝපරිවර්තන කම්කටොලුදු කෙරෙයි, පිදුරුපිටු කම්කටොලුදු කෙරෙයි, කකාළ තෙලුදු ඉසියි. ශුනකයන් (කිණබල්ලන්) ලවා ද කවයි, දිවස්හුලැ ද හිඳුවයි, කඩුවෙනුදු හිස සිඳියි, හෙතෙම කම්කටොලු ප්‍රත්‍යයෙනුදු දුක් දොම්නස් විඳී. තෙල බිය දුක් දොම්නස් උහුට කොයින් උපන යත්: ස්නෙහ ප්‍රත්‍යයෙනුදු නන්දිප්‍රත්‍යයෙනුදු රාගප්‍රත්‍යයෙනුදු නන්දිරාගප්‍රත්‍යයෙනුදු උපන. රජ මෙ සිව් වැදෑරුම් දඬුවමට ඊශ්වරයැ.

සො සකෙන කම්මෙන කායස්ස භෙදා පරම්මරණා, අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තමෙනං නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කම්මකාරණං කාරෙන්ති[1] තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛිලං දුතියෙ හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං දුතියෙ පාදෙ ගමෙන්ති. තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා ඛරා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං බ්‍යන්තිහොති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස ලොභපච්චයා ච නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච ජාතං.

තමෙනං නිරයපාලා සංවෙසෙත්වා[2] කුටාරීහි තච්ඡන්ති. තමෙනං නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා[3] වාසීහි තච්ඡන්ති. තමෙනං නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පඨවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්තිපි පච්චාසාරෙන්තිපි.[4] තමෙනං නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි. තමෙනං නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති, සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති, සකිම්පි අධො ගච්ඡති, සකිම්පි තිරියං ගච්ඡති. සො තත්ථ තිප්පා ඛරා[5] කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තිහොති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: ලොභපච්චයා ච නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච ජාතං. තමෙනං නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති. සො ඛො පන මහානිරයො:

1. "චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො
අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො,
2. තස්ස අයොමයා භූමි[6] ජලිතා තෙජසා යුතා
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.[a]
3. කදරියා තාපනා ඝොරා අච්චිමන්තො දුරාසදා[7]
ලොමහංසනරූපා ච භිස්මා පටිභයා දුඛා[8][b]
4. පුරත්ථිමාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො
දහන්තො පාපකම්මන්තෙ පච්ඡිමාය පටිහඤ්ඤති,
5. පච්ඡිමාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො
දහන්තො පාපකම්මන්තෙ පුරත්ථිමාය පටිහඤ්ඤති,

---

1. කම්මකාරණං- පම-කම්මකාරණං කරොන්ති- ම ජ සං
2. සංවෙසිත්වා- ස්‍යා
3. ඨපෙත්වා- ප-ච-වි-ක
4. හරන්තිපි පච්චාහරන්තිපි- ච-වි-ක
5. තිබ්බා ඛරා- ච,වි,ක, ම ජ සං,
6. තස්ස හෙට්ඨා අයොභූමි, ච,වි,ක
7. අච්චික්ඛන්ධා දුරාසදෙ- ම-ච-වි-ක
8. භිස්මා පටිභයා දුක්ඛා- ච,වි,ක

a. මජ්ඣිමනිකාය – උපරිපණ්ණාසක – දෙවදූතසුත්ත.
b. සංකිච්චජාතක.

හේ සියකැමින් කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවශ වැ පතිත වන නරකයෙහි උපදී. නිරු-පල්ලෝ ඔහු ගෙන පඤ්චවිධ බන්ධන නම් වූ කම්කටොලු කරවති: රත් වූ යහුලක් අත්හි ප්‍රවේශ කරවති, රත් වූ යහුලක් දෙ වැනි අත්හි ප්‍රවේශ කරවති, රත් වූ යහුලක් පයැ පිවිසවති, රත් වූ යහුලක් දෙ වැනි පයැ පිවිසවති, රත් වූ යහුලක් උරමැද පිවිසවති. හෙතෙම එහි තීව්‍ර වූ ක්‍රෑර වූ කටුක වූ දුක්වේදනා විඳියි. ඒ පවිකම් විගතාන්ත නො වන තාක් නො ද කලුරිය කෙරේ. තෙල බිය දුක් දෙම්නස් උහුට කොයින් උපන යත්: ස්නෙහ ප්‍රත්‍යයෙනුදු නන්දි ප්‍රත්‍යයෙනුදු රාගප්‍රත්‍යයෙනුදු නන්දිරාගප්‍රත්‍යයෙනුදු උපන.

නිරයපාලයෝ උහු හොවා පොරොවින් සස්ති, නිරයපාලයෝ උහු පා උඩුහුරු කොට හිස යටිහුරු කොට ගෙන වෑයෙන් සස්ති, නිරයපාලයෝ උහු රියෙහි යොද හාත්පසින් දල්වෙන අතිශයින් දිලියෙන ගිනිදල් සහිත වූ පොළොවෙහි ඉදිරියට ඇවිදුවන්නාහු ද නවතන්නාහු ද වෙත්. පවිකම් කළ උහු යමපල්හු ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ජ්වාලා සහිත වූ මහත් අංගාර පර්වතයට නංවති, බස්වන්නාහු ද වෙත්. පවිකම් කළ උහු යමපල්හු ඌර්ධ්වපාද අධඃශීර්ෂ කොට ගෙන තප්ත වූ ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ජ්වාලා සහිත වූ ලොහකුම්භියෙහි බහා ලත්. හේ එහි පෙණපිඬු බඳු දෙහ ඇති වැ පැසෙයි. හේ එහි පෙණපිඬු බඳු දෙහ ඇති වැ පස්නෝ වරක් උඩට ද නැහෙයි. වරක් යටට ද බසියි. වරක් සරසට ද යේ. හේ එහි තියුණු වූ රළු වූ කටුක වූ දුක් වේදනා විඳි. යම් තාක් ඒ පවිකම් නො හෙවෙ නම්, ඒ තාක් නො ද මීයයි. තෙල බිය දුක් දෙම්නස් උහුට කොයින් උපනැ යත්: ස්නෙහප්‍රත්‍යයෙනුදු නන්දිප්‍රත්‍යයෙනුදු රාගප්‍රත්‍යයෙනුදු නන්දිරාගප්‍රත්‍යයෙනුදු උපන. පවිකම් කළ ඔහු යමපල්හු මහානිරයෙහි බහාලත්. ඒ මහානිරය වූ කලි:

1. (ඒ මහානිරය) සතර කන් ඇත්තේ යැ, සතර දොර යැ, වෙන වෙන මැ කොටස් වශයෙන් බෙදන ලද, යපවුරින් පරික්ෂිප්ත යැ, යපියනින් වසන ලද.

2. ඒ මහනිරැහි යපොළොව ජ්වලිත වූවා තේජසින් යුක්ත යැ, හාත්පසැ සියක් යොදුන් තැනැ සියලු කල්හි පැතිරැ සිටී.

3. (ඒ අෂ්ටමහානරකයෝ) නිරතුරු තවන්නාහු ඝොර වූවාහු (කල්පස්ථායී) ගිනිසිළු ඇත්තාහු ළං වියැ නො හැක්කාහු ලොමුදහන පියවි ඇත්තාහු බිහිසුණු වූවාහු බිය උපදවන්නාහු දුක් වූවාහු ද වෙත්.

4. පෙරදිගැ බිතින් නැඟුණු ගිනිකඳ පවිකම් කළ සත්ත්වයන් දවමින් (ගොස්) පැසුළු බිතැ වැදෙයි.

5. පැසුළු බිතින් නැඟුණු ගිනිකඳ පවිකම් කළ සත්ත්වයන් දවමින් ගොස් පෙරදිගැ බිතැ වැදෙයි.

6. උත්තරාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො
දහන්තො පාපකම්මන්තෙ[1] දක්ඛිණාය පටිහඤ්ඤති,

7. දක්ඛිණාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො
දහන්තො පාපකම්මන්තෙ උත්තරාය පටිහඤ්ඤති,

8. හෙට්ඨතො ච සමුට්ඨාය අච්චික්ඛන්ධො භයානකො
දහන්තො පාපකම්මන්තෙ ඡදනස්මිං පටිහඤ්ඤති,

9. ඡදනම්හා සමුට්ඨාය අච්චික්ඛන්ධො භයානකො
දහන්තො පාපකම්මන්තෙ භූමියං පටිහඤ්ඤති,

10. අයොකපාලමාදිත්තං සන්තත්තං ජලිතං යථා
එවං අවීචිනිරයො හෙට්ඨා උපරි පස්සතො,

11. තත්ථ සත්තා මහාලුද්දා මහාකිබ්බිසකාරිනො
අච්චන්තපාපකම්මන්තා පච්චන්ති න ච මීයරෙ,

12. ජාතවෙදසමො කායො තෙසං නිරයවාසිනං
පස්ස කම්මානං දළ්හත්තං න භස්මා හොති නපි මසි.

13. පුරත්ථිමෙනපි ධාවන්ති තතො ධාවන්ති පච්ඡිමං
උත්තරෙනපි ධාවන්ති තතො ධාවන්ති දක්ඛිණං,

14. යං යං දිසං පධාවන්ති තං තං ද්වාරං පිථීයති[2]
අභිනික්ඛමිතාසා තෙ සත්තා මොක්ඛගවෙසිනො,

15. න තෙ තතො නික්ඛමිතුං ලභන්ති කම්මපච්චයා
තෙසං ච පාපකම්මං තං අවිපක්කං කතං බහු' න්ති.

එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: සෙනහපච්චයා ච නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච ජාතං. යානි ච නෙරයිකානි දුක්ඛානි යානි ච තිරච්ඡානයොනිකානි දුක්ඛානි යානි ච පෙත්තිවිසයිකානි දුක්ඛානි යානි ච මානුස්සිකානි දුක්ඛානි තානි කුතො ජාතානි කුතො සඤ්ජාතානි කුතො නිබ්බත්තානි කුතො අභිනිබ්බත්තානි කුතො පාතුභූතානි: සෙනහපච්චයා ච නන්දිපච්චයා ච රාගපච්චයා ච නන්දිරාගපච්චයා ච භවන්ති[3], සම්භවන්ති ජායන්ති සඤ්ජායන්ති නිබ්බත්තන්ති අභිනිබ්බත්තන්ති පාතුභවන්තීති 'සෙනහන්වයං දුක්ඛමිදං පහොති.'

1. මහන්තා පාපකම්මන්තා - ච-වි-ක
2. පිධියති - ම ජ සං
3. භොන්ති - ප-ච-වී

6. උතුරු බිතින් නැඟුණු ගිනිකඳ පච්කම කළවුන් දවමින් ගොස් දකුණු බිතැ වැදෙයි.

7. දකුණු බිතින් නැඟුණු ගිනිකඳ පච්කම කළවුන් දවමින් ගොස් උතුරු බිතැ වැදෙයි.

8. යට පොළොවිනුදු බිය එළවන ගිනිකඳ නැඟී පච්කම කළවුන් දවමින් ගොස් ඡදනයෙහි (සියන්හි) පැහැරැ සිටී.

9. ඡදනයෙන් බිය එළවන ගිනිකඳ නැඟී පච්කම කළ සත්ත්වයන් දවමින් ගොස් බිමැ පැහැර සිටී.

10. අවීචිනරකය උඩ යට බලනුවහුට හාත්පසින් දිලියෙන අතිශයින් තැවුණු දල්වුණු යකබලක් මෙනි.

11. එහි මහද්රෞද්‍ර වූ මහ දරුණුකම් කරන සුලු වූ අතිශයින් පච්කම ඇති සත්ත්වයෝ පැසෙති, නො ද මියෙත්.

12. ඒ නිරැවැසියන්ගේ කය ගිනි වැන්න, කර්මයන්ගේ දැඩි සේ බල, හළු නො වෙයි, දැලි නො ද වේ.

13. (කිසි කලෙක පූර්වද්වාරය, විවර වූ කල්හි) එ දිගට ද දිවෙති, යළි පශ්චිමද්වාරයට ද දිවෙති, උත්තරද්වාරයට ද දිවෙති, යළි දක්ෂිණද්වාරයට ද දිවෙත්.

14. යම් යම් දිශාවකට වේගයෙන් දිවෙත් නම්, (සම්ප්‍රාප්ත කල්හි) ඒ ඒ ද්වාරය වැසෙයි. නික්මැ යන ආශා ඇති ඒ නිරිසත්හු මිදෙන උපාය සොයන්නාහු වෙත්.

15. කර්මහේතුයෙන් ඔහු එයින් නික්මෙන්නට නො ලැබෙති. යම් හෙයකින් ඔවුන් විසින් නො පැසුණු විපාක ඇති පාපකර්මය බොහෝ කොට කරන ලද ද එහෙයිනි.

තෙල බිය දුක් දෙම්නස් ඔහුට කොයින් උපනැ යත්: ස්නෙහ ප්‍රත්‍යයෙනුදු තන්දිප්‍රත්‍යයෙනුදු රාග ප්‍රත්‍යයෙනුදු තන්දිරාගප්‍රත්‍යයෙනුදු උපන. යම් නිරය දුකක් තිරිසන්යොන්හි යම් දුකක් ප්‍රෙතවිෂයෙහි යම් දුකක් මිනිසත් බැව්හි යම් දුකකුත් වෙත් නම්, එ දුක් කොයින් උපන්නාහු ද කොයින් හටගත්තාහු ද කොයින් නිපන්නාහු ද කොයින් වෙසෙසින් නිපන්නාහු ද කොයින් පහළ වූවාහු ද යත්: ස්නෙහප්‍රත්‍යයෙනුදු තන්දිප්‍රත්‍යයෙනුදු රාගප්‍රත්‍යයෙනුදු තන්දිරාගප්‍රත්‍යයෙනුදු වෙති උපදිති හටගනිති සඤ්ජාත වෙති නිපදිති වෙසෙසින් නිපදිති පහළ වෙත් නුයි ‘ස්නෙහන්වයං දුක්ඛමිදං පහොති’ යනු වේ.

**ආදීනවං ස්නෙහජං පෙක්ඛමානොති:** 'ස්නෙහො'ති ද්වෙ ස්නෙහා: තණ්හාස්නෙහො ච දිට්ඨිස්නෙහො ච –පෙ– අයං තණ්හාස්නෙහො –පෙ– අයං දිට්ඨිස්නෙහො. **ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො'ති:** තණ්හාස්නෙහො ච දිට්ඨිස්නෙහො ච ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො දක්ඛමානො ඔලොකයමානො නිජ්ඣායමානො උපපරික්ඛයමානොති 'ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහා
ස්නෙහන්වයං දුක්ඛමිදං පහොති,
ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

3.

මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො
හාපෙති අත්ථං පටිබද්ධචිත්තො,[1]
එතං භයං සන්ථවෙ පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො හාපෙති අත්ථං පටිබද්ධචිත්තොති** 'මිත්තා'ති ද්වෙ මිත්තා: අගාරිකමිත්තො ච අනගාරිකමිත්තො ච කතමො අගාරිකමිත්තො; ඉධෙකච්චො දුද්දදං දදති, දුච්චජං චජති, දුක්කරං කරොති, දුක්ඛමං ඛමති, ගුය්හමස්ස ආචික්ඛති, ගුය්හමස්ස පරිගූහති, ආපදාසු න විජහති, ජීවිතං චස්ස[2] අත්ථාය පරිච්චත්තං හොති, ඛීණෙ නාතිමඤ්ඤති. අයං අගාරිකමිත්තො. කතමො අනගාරිකමිත්තො: ඉධ භික්ඛු පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච වත්තා ච වචනක්ඛමො ච ගම්භීරං ච කථං කත්තා හොති නො ච අට්ඨානෙ නියොජෙති, අධිසීලෙ සමාදපෙති, චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගෙ සමාදපෙති, චතුන්නං සම්මප්පධානානං –පෙ– චතුන්නං ඉද්ධිපාදානං– පඤ්චන්නං ඉන්ද්‍රියානං– පඤ්චන්නං බලානං– සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගෙ සමාදපෙති. අයං අනගාරිකමිත්තො. සුහජ්ජා වුච්චන්ති යෙහි සහ ආගමනං ඵාසු ගමනං ඵාසු නිසජ්ජා ඵාසු සයනං ඵාසු ආලපනං ඵාසු සල්ලපනං ඵාසු උල්ලපනං ඵාසු සමුල්ලපනං ඵාසු.

1. පටිබන්ධචිත්තො– ච, වි
2. ජීවිතස්ස අත්ථාය– ප, ච, වි

**ආදීනවං සෙනහජං පෙකඛමානො** — 'ස්නෙහො' යනු: තෘෂ්ණා ස්නෙහ ද දෘෂ්ටිස්නෙහ ද යි ස්නෙහ දෙකෙකි. . . මේ තෘෂ්ණා ස්නෙහ යැ . . . මේ දෘෂ්ටි ස්නෙහ යි. **ආදීනවං සෙනහජං පෙකඛමානො** යනු: ස්නෙහයෙන් උපන් ආදීනව ප්‍රෙක්ෂණය කෙරෙමින් දක්මින් බලමින් සිතමින් විමසමින් නුයි 'ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදාළහ ඒ පසේ බුදුහු:

**"සංසගගජාතසස -පෙ- එකො චරෙ ඛගගවිසාණකපෙපා"** යි.

**3.**

සුහද මිතුරනට අනුකම්පා කරන පිළිබැඳි සිත් ඇත්තේ අර්ත්ථය නසාලයි. සන්ථවයෙහි තෙල භය දක්නේ කගවෙහෙණ හහක් සෙයින් එකලා වැ සරනේ යි.

**මිතෙත සුහජෙජ අනුකමපමානො හාපෙති අත්‍ථං පටිබදධචිතෙතා** — 'මිත්තා' යනු: ආගාරික මිත්‍ර ද ප්‍රව්‍රජිතමිත්‍ර ද යි මිත්‍රයෝ දෙදෙනෙකි. ආගාරිකමිත්‍ර කවර යත්: මෙලොවැ ඇතැමෙක් නො දිය හැක්ක දෙයි, නො හළ හැක්ක හරියි, නො කළ හැක්ක කරයි, නො ඉවසිය හැක්ක ඉවසයි, තමාගේ සැභැවිය යුත්ත ඔහුට කියයි, ඔහුගේ ගෝපනය කළ යුත්ත ගෝපනය කෙරෙයි, ආපදවන්හි නො හරියි, ඔහු පිණිස ජීවිත පරිත්‍යාග ද කෙරෙයි, පිරිහුණු කල්හි අවමන් නො කෙරේ, මේ අගාරික මිත්‍ර යැ. ප්‍රව්‍රජිතමිත්‍ර කවර යත්: මෙ සස්නෙහි මහණ ප්‍රිය වූයේත් මනාවඩන්නේත් ගුරු වූයේ ත් සම්භාවනාර්හ වූයේ ත් වක්තෘ වූයේ ත් මෙරමා වදන් ඉවසනුයේ ත් ගැඹුරු කථා කියන්නේ ත් වෙයි, නො ද අස්ථානයෙහි යොදයි. අධිශීලයෙහි සමාදන් කරවයි, සතර සතිපට්ඨානයන්ගේ භාවනානුයෝගයෙහි සමාදන් කරවයි, සතර සම්‍යක් ප්‍රධානයන්ගේ . . . සතර ඍද්ධිපාදයන්ගේ . . . පඤ්චෙන්‍ද්‍රියයන්ගේ-පඤ්චබලයන්ගේ-සප්තබොධ්‍යඞගයන්ගේ- ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයාගේ භාවනානුයෝගයෙහි සමාදන් කරවයි. මෙ ප්‍රව්‍රජිතමිත්‍ර යි. යම් කෙනකුන් 'හා සමග ඊම පහසු ද යැම පහසු ද හිදීම පහසු ද නිදීම පහසු ද ආලාපය පහසු ද සල්ලාපය පහසු ද උසස් කොට බිණීම පහසු ද පුනපුනා උසස් කොට බිණීම පහසු ද ඔහු 'සුහදයෝ' යි කියනු ලැබෙත්.

**මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො හාපෙති අත්ථන්ති:** මිත්තෙ ච සුහජ්ජෙ ච සන්දිට්ඨෙ ච සම්භත්තෙ ච සහායෙ ච අනුකම්පමානො අනුපෙක්ඛමානො අනුගණ්හමානො අත්තත්ථම්පි පරත්ථම්පි උභයත්ථම්පි හාපෙති, දිට්ඨධම්මිකම්පි අත්ථං හාපෙති, සම්පරායිකම්පි අත්ථං හාපෙති, පරමත්ථම්පි අත්ථං හාපෙති, පහාපෙති පරිහාපෙති පරිධංසෙති පරිච්චජති අන්තරධාපෙතීති 'මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො හාපෙති අත්ථං'. පටිබද්ධචිත්තො'ති ද්වීහි කාරණෙහි පටිබද්ධචිත්තො හොති: අත්තානං වා නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති දත්තානං වා උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො පබද්ධචිත්තො හොති. කථං අත්තානං නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති: තුම්හෙ මෙ බහූපකාරා අහං තුම්හෙ නිස්සාය ලභාමි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, යෙපි මෙ අඤ්ඤෙ[1] දාතුං වා කාතුං වා මඤ්ඤන්ති, තුම්හෙ නිස්සාය තුම්හෙ සම්පස්සන්තා, යම්පි මෙ පොරාණං මාතාපෙත්තිකං නාමගොත්තං තම්පි අන්තරහිතං, තුම්හෙහි අහං ඤායාමි, අමුකස්ස කුලූපකො අමුකාය කුලූපකොති. එවං අත්තානං නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති.

කථං අත්තානං උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති: අහං තුම්හාකං බහූපකාරො. තුම්හෙ මං ආගම්ම බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා මුසාවාදා පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා. අහං තුම්හාකං උද්දෙසං දෙමි, පරිපුච්ඡං දෙමි, උපොසථං ආචික්ඛාමි, නවකම්මං අධිට්ඨාමි, අථ ච පන තුම්හෙ මං උජ්ඣිත්වා[3] අඤ්ඤෙ සක්කරොථ ගරුකරොථ මානෙථ පූජෙථාති. එවං අත්තානං උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොතීති 'හාපෙති අත්ථං පටිබද්ධචිත්තො'.

---

1. යම්පි අඤ්ඤෙ - පත
2. පටිබන්ධ චිත්තා - ව, වි, ක
3. මං මුඤ්චිත්වා - පත.

**මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො හාපෙති අත්ථං** යනු: මිත්‍රයනට ද සුහදයනට ද සන්දෘෂ්ට (දුටු විසැඹි) යනට ද සම්භක්ත (දළවිසැඹි) යනට ද යහළුවනට ද අනුකම්පා කරනුයේ බලනුයේ අනුග්‍රහ කරනුයේ ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද නසයි, ඓහිකාර්ථය ද නසයි, පාරත්‍රිකාර්ථය ද නසයි, පරමාර්ථාර්ත්ථය ද නසයි, මෙසෙයින් නසයි, පිරිහෙලයි, විධ්වංසන කෙරෙයි, දුරු කෙරෙයි, අතුරුදහන් කෙරේ නුයි 'මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො හාපෙති අත්ථං' යනු වේ. **පටිබද්ධචිත්තො** යනු: දෙ කරුණෙකින් පිළිබැඳිසිත් ඇත්තේ වෙයි. තමා පහත් කොට තබමින් මෙරමා උසස් කොට තබන්නේ හෝ පිළිබැඳිසිත් ඇත්තේ වෙයි. තමා උසස් කොට තබමින් මෙරමා පහත් කොට තබන්නේ හෝ පිළිබැඳිසිත් ඇත්තේ වේ. කිසෙයින් තමා පහත් කොට තබමින් මෙරමා උසස් කොට තබන්නේ පිළිබැඳි සිත් ඇත්තේ වේ ද යත්: තෙපි මට බොහෝ උපකාර ඇතියවු, මම තොප නිසා සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබමි, අන්‍ය වූ යම් කෙනෙකුත් මට දෙන්නට හෝ කරන්නට සිතත් නම් තොප නිසා යැ තොප මුහුණ බලමිනි,-මාගේ මාපියන් සතු යම් පැරණි නම්ගොතෙකුත් වී නම් එ ද අතුරුදහන් වී යැ, තොප කරණ කොට මම 'අසෝ තැනැත්තහු ගේ කුලුපග යැ අසෝ තැනැත්තියගේ කුලුපග යැ, යි ප්‍රකට වෙමි. මෙසෙයින් තමා පහත් කොට තබමින් මෙරමා උසස් කොට තබනුයේ පිළිබැඳි සිත් ඇත්තේ වෙයි.

කිසෙයින් තමා උසස් කොට තබමින් මෙරමා පහත් කොට තබනුයේ පිළිබැඳිසිත් ඇත්තේ වේ ද යත්: මම තොපට බොහෝ උපකාර ඇත්තෙමි. තෙපි මා කරා පැමිණ බුදුන් සරණ කොට ගියවු යැ, දහම් සරණ කොට ගිය වූ යැ, සඟුන් සරණ කොට ගියවු යැ, ප්‍රාණවධයෙන් වැළකුණ වූ යැ, අදත්තාදානයෙන් වැළකුණවු යැ, කාමමිථ්‍යාචාරයෙන් වැළකුණවු යැ, මුසවායෙන් වැළකුණ වූ යැ, මදයට හා ප්‍රමාදයට හා කරුණු වූ රහමෙරින් වැළකුණ වූ යැ. මම තොපට උදෙස් දෙමි, පරිපෘච්ඡා දෙමි, පෙහෙවස් කියමි, නවකම් ඉටමි, එතෙකුදුවත් තෙපි මා හැරපියා අනුනට සත්කාර කරවු, ගරුකාර කරවු, මානන කරවු, පූජන කරවු යයි මෙසෙයින තමා උසස් කොට තබමින් මෙරමා පහත් කොට තබනුයේ පිළිබැඳිසිත් ඇත්තේ වේ නුයි 'හාපෙති අත්ථං පටිබද්ධචිත්තො' යනු වේ.

එතං භයං සන්ථවෙ පෙක්ඛමානොති: 'භයන්ති: ජාතිභයං ජරාභයං ව්‍යාධිභයං මරණභයං රාජභයං චොරභයං අග්ගිභයං උදකභයං අත්තානුවාදභයං පරානුවාදභයං දණ්ඩභයං දුග්ගතිභයං ඌමිභයං[1] කුම්භීලභයං ආවට්ටභයං සුසුකාභයං[2] ආජීවකභයං අසිලොකභයං පරිසාය සාරජ්ජභයං[3] මදනභයං භයානකත්තං ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උබ්බෙගො උත්‍රාසො. සන්ථවෙති ද්වෙ සන්ථවා: තණ්හා සන්ථවො ච දිට්ඨිසන්ථවො ච -පෙ- අයං තණ්හාසන්ථවො -පෙ- අයං දිට්ඨිසන්ථවො. එතං භයං සන්ථවෙ පෙක්ඛමානොති: එතං භයං සන්ථවෙ පෙක්ඛමානො දක්ඛමානො ඔලොකයමානො නිජ්ඣායමානො උපපරික්ඛමානොති 'එතං භයං සන්ථවෙ පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො – හාපෙති අත්ථං පටිබද්ධචිත්තො,
එතං භයං සන්ථවෙ පෙක්ඛමානො – එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

4.

වංසො විසාලොව යථා විසත්තො
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා,
වංසකළීරොව[4] අසජ්ජමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

වංසො විසාලොව යථා විසත්තොති 'වංසො' වුච්චති වෙළුගුම්බො. යථා වෙළුගුම්බස්මිං පොරාණකා වංසා සත්තා විසත්තා[5] ආසත්තා ලග්ගා ලග්ගිතා පළිබුද්ධා' එවමෙව 'විසත්තිකා' වුච්චති තණ්හා: 'යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පළිගෙධො සංගො පඞ්කො එජා මායා ජනිකා සංජනනී සිබ්බිනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා[6] ආයූහනී[7] දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො සිනෙහො අපෙක්ඛා පටිබන්ධු ආසා ආසිංසනා ආසිංසිතත්තං රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා[8] ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා[9] සාධු කම්‍යතා අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සංපත්ථනා කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා

1. උම්මිභයං – ව, වි, ක
2. සුසුමාරභයං – ම ජ සං.
3. පරිසසාරජ්ජභයං – ම ජ සං,
4. වංසාකලීරොව – ප, ව, වි, ක. වංසක්කලීරොව – ම ජ සං.
5. සත්තා පත.
6. විසටා – ම, ව, වි, ක
7. ආයූහානී – ම ජ සං
8. ජප්පායනා – පත
9. පුච්ඡඤ්ජිකතා – ම ජ සං

**එතං භයං සන්ථවෙ පෙක්ඛමානො** — 'භයං' යනු: ජාතිය නිසා උපදනා බිය ජරාභය ව්‍යාධිභය මරණභය රාජභය චොරභය අග්නිභය උදකභය තමා නුගුණ කීමෙන් උපදනා බිය මෙරමා නුගුණ කීමෙන් උපදනා බිය දඬුවමින් උපදනා බිය දුගතිය නිසා උපදනා බිය මුහුදු රළ නිසා උපදනා බිය මස් කැලන්ගෙන් උපදනා (හෝ කිඹුල්) බිය දියසුළි නිසා උපදනා බිය සැඬමසුන් නිසා උපදනා බිය දිවි වැටුම් හෙයින් උපදනා බිය ගර්භාවෙන් උපදනා බිය පිරිස්හි තැති ගැනීමෙන් වන බිය කාමයෙන් වන බිය භයාකාරය තැතිගන්නා බව ලොමුදහ ගැන්ම චිත්තයාගේ උද්වේගය උත්‍රාසය යි. **සන්ථවෙ** යනු: තෘෂ්ණා සන්ථව ද දෘෂ්ටිසන්ථව ද යි සන්ථව දෙකෙකි. . . . මේ තෘෂ්ණාසන්ථව යැ . . . මේ දෘෂ්ටිසන්ථව යි. **එතං භයං සන්ථවෙ පෙක්ඛමානො** යනු: තෙල බිය සන්ථවයෙහි බලමින් දක්මින් අවලොකනය කෙරෙමින් සිතමින් විමසමින් නුයි 'එතං භයං සන්ථවෙ පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

**"මිත්තෙ සුහජ්ජෙ -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො"** යි.

4.

අඹුදරුවන් කෙරෙහි වූ යම් අපෙක්ෂාවක් ඇද්ද එය හුණ ළැහැබෙකැ හිවීගිය මහහුණගසෙක් වැන්න, මම එහි නො ලැගෙන හුණ කිළිලක්සෙයින් කගවෙහෙණ හඟක් බඳු වැ එකලා වැ සරනෙමි.

**වංසො විසාලො'ව යථා විසත්තො** — 'වංසො' යි හුණලැහැබ කියනු ලැබෙයි. යම් සේ හුණ ලැහැබෙහි පැරැණි හුණගස් සක්ත විසක්ත ආසක්ත ලග්න ලග්නිත පලිබුද්ධ වේ ද, එසෙයින් මැ, තෘෂ්ණාව 'විසත්තිකා' යි කියනු ලැබේ. යම් රාගයෙක් බලවත් රාගයෙක් අනුනයෙක් අනුරොධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයාගේ බලවත් රාගයෙක් ඉච්ඡාවක් මූර්ඡායෙක් අධ්‍යවසානයෙක් ගෙධයෙක් පළිගෙධයෙක් සංගයෙක් පංකයෙක් එජායෙක් (වඤ්චනාර්ත්ථයෙන්) මායාවක් (සත්ත්වයන් උපදවන) ජනිකායෙක් සඤ්ජනනියක් (හිවන අර්ථයෙන්) සිබ්බනියක් ජාලිනියක් (සරිත් සදෘශ වැ ආකර්ෂණ කරන හෙයින්) නදියක් වෙසෙයින් ඇලීමෙක් (බඳනා හෙයින්) හූයෙක් (විස්තෘත වන හෙයින්) විසතායෙක් ආයූහනියෙක්) (සහාය වන හෙයින්) ද්විතීයායෙක් ප්‍රණිධියෙක් භවනෙත්තියෙක් (සමුත්ථාපන–ගහන හෙයින්) වනයෙක් (බලවත් භාවයෙන්) වනථයෙක් සන්ථවයෙක් ස්නෙහයෙක් අපේක්ෂායෙක් ප්‍රතිබන්ධුයෙක් ආශායෙක් අශංසනායෙක් ආශංසාකළ බවෙක් රූපාශායෙක් ශබ්දශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්ප්‍රෂ්ටව්‍යාශායෙක් ලාභාශායෙක් ධානශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක් (ජල්පන කරන හෙයින්) ජලිපායෙක් ප්‍රජල්පායෙක් අභිජල්පායෙක් ජල්පනායෙක් ජල්පිත බවෙක් ලොලුප බවෙක් ලොලුපාකාරයෙක් ලොලුපායිත බවෙක් නෑඹුට සලන බවෙක් මධුර අරමුණු කැමැති වන බවෙක් අධර්මරාගයෙක් විෂමලොභයෙක් නිකාන්තියෙක් නිකාමනායෙක් ප්‍රාර්ථනායෙක් පිහායෙක් සම්ප්‍රාර්ත්ථනායෙක් කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණායෙක් විභවතෘෂ්ණායෙක් රූපතෘෂ්ණායෙක්

අරූපතණ්හා නිරොධතණ්හා රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡා දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබලිසං මාරවිසයො[1] තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො අභිජ්ඣා ලොභො අකුසලමූලං*. විසත්තිකාති කෙනට්ඨෙන විසත්තිකා[2]: විසාලාති විසත්තිකා, විසතාති විසත්තිකා, විසටාති විසත්තිකා, විසක්කතීති විසත්තිකා, විසං හරතීති විසත්තිකා, විසංවාදිකාති විසත්තිකා, විසමූලාති විසත්තිකා, විසඵලාති විසත්තිකා, විසපරිභොගාති[3] විසත්තිකා.

විසාලා වා පන තණ්හා රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලෙ ගණෙ ආවාසෙ ලාභෙ යසෙ පසංසාය සුඛෙ චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ කාමධාතුයා රූපධාතුයා අරූපධාතුයා කාමභවෙ රූපභවෙ අරූපභවෙ සඤ්ඤාභවෙ අසඤ්ඤාභවෙ නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ එකවොකාරභවෙ චතුවොකාරභවෙ පඤ්චවොකාරභවෙ අතීතෙ අනාගතෙ පච්චුප්පන්නෙ දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු විසටා විත්ථතාති විසත්තිකාති 'වංසො විසාලොව යථා විසත්තො'.

පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛාති 'පුත්තා'ති: චත්තාරො පුත්තා අත්‍රජො පුත්තො ඛෙත්තජො පුත්තො දින්නකො පුත්තො අන්තෙවාසිකො පුත්තො. දාරා වුච්චන්ති භරියායො. අපෙක්ඛා වුච්චති[4] තණ්හා: "යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො, අකුසලමූල"න්ති 'පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා'.

---

1. මාරගොචරො – පන.
2. විසාලතාති – පන.
3. විසපරිභොගාති – පන.
4. අපෙක්ඛා වුච්චති – ම ඡ සං
*. ධම්මසඞ්ගණි නික්ඛෙපකණ්ඩ.

අරූපතෘෂ්ණායෙක් නිරොධතෘෂ්ණායෙක් ශබ්දතෘෂ්ණායෙක් ගන්ධ-තෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණායෙක් ධර්මතෘෂ්ණායෙක් ඕඝයෙක් යෝගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් ආවරණයෙක් නීවරණ-යෙක් (කුසල් දහම් වසන හෙයින්) ඡදනයෙක් බන්ධනයෙක් උපක්ලෙශ-යෙක් අනුශයයෙක් (උපදනා කුශලවාරය ගන්නා) පරියුට්ඨානයෙක් (හාත්පසින් වෙළන හෙයින්) ලතායෙක් (විවිධ වස්තු කැමැති වන හෙයින්) විවිධ විජ්සායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදනයෙක් දුඃඛප්‍රභවයෙක් මාර පාශයෙක් මාරබඩිශයෙක් මාර විෂයයෙක් තෘෂ්ණානදියක් තෘෂ්ණා සංඛ්‍යාත ජාලයෙක් තෘෂ්ණා සංඛ්‍යාත ගර්දුලයෙක් (ගුනක බන්ධනයෙක්) තෘෂ්ණා සමුද්‍රයෙක් අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ නම් එය යි.

**විසත්තිකා** යනු: කවර අරුතෙකින් (තෘෂ්ණාව) විසත්තිකා නම්වූ ද යත්: විශාල වන හෙයින් විසත්තිකා යැ, විසෘත වන හෙයින් විසත්තිකා යැ, විස්තෘත වන හෙයින් විසත්තිකා යැ, විශෙෂයෙන් සහ්‍ය (සහනය කළ හැකි) වන හෙයින් විසත්තිකා යැ, වෙසෙයින් සිත හකුළුවන හෙයින් හෝ දුඃඛවිෂය එළවන හෙයින් විසත්තිකා යැ, (අනිත්‍යාදිය) විසංවාදන කරන හෙයින් විසත්තිකා යැ, විෂමූල හෙයින් විසත්තිකා යැ, විෂඵල හෙයින් විසත්තිකා යැ, විෂපරිභොග හෙයින් විසත්තිකා යැ, යළි විශාල වූ ඒ තෘෂ්ණාව රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි සප්‍රෂ්ටව්‍යයෙහි කුලයා කෙරෙහි ගණයා කෙරෙහි ආවාසයෙහි ලාභයෙහි යශස්හි ප්‍රශංසායෙහි සුඛයෙහි චීවරයෙහි පිණ්ඩපාතයෙහි ශයනාසනයෙහි ග්ලානප්‍රත්‍යයෙහි කාමධාතුයෙහි රූපධාතුයෙහි අරූපධාතුයෙහි, කාමභවයෙහි රූපභවයෙහි අරූපභවයෙහි සංඥාභවයෙහි අසංඥාභවයෙහි නෛවසංඥානාසංඥා භවයෙහි එකස්කන්ධභවයෙහි චතුඃස්කන්ධභවයෙහි පඤ්චස්කන්ධභව-යෙහි අතීතකාලයෙහි අනාගතකාලයෙහි ප්‍රත්‍යුත්පන්නකාලයෙහි දෘෂ්ට ශ්‍රැත මුතවිඥාතව්‍ය ධර්මයන්හි විසෘත විස්තෘත නුයි විසත්තිකා' නම් වේ නුයි 'වංසො විසාලොව යථා විසත්තො' යනු වේ.

**පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා**–'පුත්තා' යනු පුත්‍රයෝ සතර දෙනෙකි: ආත්මජපුත්‍ර යැ ක්ෂේත්‍රජ පුත්‍ර යැ දින්නක පුත්‍ර යැ අන්තෙවාසිපුත්‍ර යි, **'දාරා'** යි භාර්‍ය්‍යාවෝ කියනු ලැබෙති. **'අපෙක්ඛා'** යි තෘෂ්ණාව කියනු ලැබෙයි. ''යම් රාගයෙක් බලවත් රාගයෙක් ... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද ඒ නුයි 'පුත්තේසු දාරෙසු ච යා අපෙක්ඛා' යනු වෙ.

**වංසකළීරොව අසජ්ජමානොති** 'වංසො' වුච්චති වෙළුගුම්බො, යථා වෙළුගුම්බස්මිං තරුණකා කළීරා[1] අසත්තා අලග්ගා[2] අපළිබුද්ධා නික්ඛන්තා නිස්සටා විප්පමුත්තා, එවමෙව. අසජ්ජාති ද්වෙ සජ්ජා[3] තණ්හාසජ්ජා ච දිට්ඨිසජ්ජා ච -පෙ- අයං තණ්හාසජ්ජා -පෙ- අයං දිට්ඨිසජ්ජා තස්ස පච්චෙකසම්බුද්ධස්ස තණ්හාසජ්ජා පහීනා දිට්ඨිසජ්ජා පටිනිස්සට්ඨා තණ්හාසජ්ජාය[4] පහීනත්තා දිට්ඨිසජ්ජාය පටිනිස්සට්ඨත්තා සො පච්චෙකසම්බුද්ධො රූපෙ න සජ්ජති, සද්දෙ න සජ්ජති, ගන්ධෙ න සජ්ජති, රසෙ න සජ්ජති, ඵොට්ඨබ්බෙ න සජ්ජති, කුලෙ ගණෙ ආවාසෙ ලාභෙ යසෙ පසංසාය සුඛෙ චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ කාමධාතුයා රූපධාතුයා අරූපධාතුයා කාමභවෙ රූපභවෙ අරූපභවෙ සඤ්ඤාභවෙ අසඤ්ඤාභවෙ නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ එකවොකාරභවෙ චතුවොකාරභවෙ පඤ්චවොකාරභවෙ අතීතෙ අනාගතෙ පච්චුප්පන්නෙ දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු න සජ්ජති, න ගණ්හාති[5] න බජ්ඣති න පළිබුජ්ඣති න මුච්චති නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසංයුත්තො. විමරියාදිකතෙන චෙතසා විහරතීති 'වංසකළීරොව අසජ්ජමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'ති.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"වංසො විසාලොව යථා විසත්තො
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා
වංසකළීරොව අසජ්ජමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

5.

මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො[6]
යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය,[7]
විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො යෙනිච්ඡකං ගච්ඡති ගොචරායාති:** 'මිගො'ති ද්වෙ මිගා: එණිමිගො ච පසදමිගො[8] ච යථා ආරඤ්ඤකො මිගො අරඤ්ඤෙ පවනෙ චරමානො විස්සත්ථො ගච්ඡති විස්සත්ථො තිට්ඨති විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පෙති. වුත්තං හෙතං භගවතා: "සෙය්‍යථාපි භික්ඛවෙ ආරඤ්ඤකො මිගො අරඤ්ඤෙ පවනෙ චරමානො විස්සත්ථො ගච්ඡති, විස්සත්ථො තිට්ඨති, විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පෙති. තං කිස්ස හෙතු:

---

1. තරණ කළීරා – ස්‍යා,
   තරුණකා කළීරකා– ම ඡ සං
2. අලග්ගා අගධිතා– ම ඡ සං,,
   අලග්ගා අපලිවෙඨිතා ස්‍යා
3. සජ්ජනා– ම ඡ සං, ස්‍යා
4. තණ්හාසජ්ජනාය – ම ඡ සං, ස්‍යා
5. නගය්හති– පත
6. අබන්ධා– ස්‍යා
7. ගොචරස්මිං– පත.
8. සරභමිගො– ස්‍යා

**වංසකළීරො' ව අසජ්ජමානො**– 'වංසො' යි හුණ ලැහැබ කියනු ලැබෙයි. යම්සේ හුණලැහැබ්හි තුරුණු හුණකිළිල් හු නො ඇලුණාහු නො ලැගුණ හු පළිබොධ නැත්තාහු (ලැහැබින්) නික්මුණාහු බැහැර වූවාහු මිදුනාහු වෙත්ද එසෙයින් මැ. **අසජ්ජා** යනු : සඞ්ග (ඇලීම්) දෙකෙකි : තෘෂ්ණසඞ්ග යැ දෘෂ්ටිසඞ්ග යැ යි... මෙ තෘෂ්ණසඞ්ග යැ ... මෙ දෘෂ්ටිසඞ්ග යි. ඒ පසේ බුදුන් විසින් තෘෂ්ණ සඞ්ගය ප්‍රහීණ යැ දෘෂ්ටිසඞ්ගය බැහැර කරන ලද. තෘෂ්ණාසඞ්ගය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිසඞ්ගය බැහැර කරන ලද වන බැවින් ඒ පසේ බුදුහු රූපයෙහි නො ඇලෙති, ශබ්දයෙහි නො ඇලෙති, ගන්ධයෙහි නො ඇලෙති, රසයෙහි නො ඇලෙති, ස්ප්‍රෂ්ටව්‍යයෙහි නො ඇලෙති, කුලයෙහි ගණයෙහි ආවාසයෙහි ලාභයෙහි යශස්හි ප්‍රශංසායෙහි සුඛයෙහි චීවරයෙහි පිණ්ඩපාතයෙහි ශයනාසනයෙහි ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙහි කාම ධාතුයෙහි රූපධාතුයෙහි අරූපධාතුයෙහි කාමභවයෙහි රූපභවයෙහි අරූප භවයෙහි සංඥාභවයෙහි අසංඥාභවයෙහි නෛවසංඥානාසංඥාභවයෙහි එකවොකාරභවයෙහි චතුවොකාරභවයෙහි පඤ්චවොකාරභවයෙහි අතීත යෙහි අනාගතයෙහි ප්‍රත්‍යුත්පන්නයෙහි දෘෂ්ටශ්‍රැතමුත විඥාතව්‍ය ධර්මයන්හි නො ඇලෙති, නො ගනිති, නො බැඳෙති, පලිබුද්ධ නොවෙති, සටක නො වෙත්. (එයින්) නික්මුණාහු බැහැර වූවාහු මිදුණාහු විසංයොග වූවාහු විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වාස කෙරෙත් නුයි 'වංසකළීරො' ව අසජ්ජමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

**"වංසො විසාලො ච –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"** යි.

5.

යම්සේ අරනෙහි මුවතෙම නො බැඳුණේ කැමැති තැනකට ගොදුරට යේ ද, එසෙයින් ස්වෛරිභාවය අපෙක්ෂා කරන නුවණැති පුරුෂ තෙම කගවෙහෙණ හඟක් සෙයින් එකලා වැ සරනේ යි.

**මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය**– 'මිගො' යනු: මෘගයෝ දෙදෙනෙකි: එණිමෘග ද පසද මෘග ද යි. යම්සේ වල්මුව තෙම අරනෙහි මහවෙනෙහි සරනුයේ විස්වැසි වැ යේ ද, විස්වැසි වැ සිටී ද, විස්වැසි වැ හිඳී ද, විස්වැසි වැ හොවී ද, තෙල වදරන ලද මැ යැ භාග්‍යවතුන් විසින්: "යම්සේ මහණෙනි, වල්මුව තෙම අරනෙහි මහවෙනෙහි සරනුයේ විස්වැසි වැ යේ ද, විස්වැසි වැ සිටී ද, විස්වැසි වැ හිඳී ද, විස්වැසි වැ හොවී ද, ඒ කවර හෙයිනැ යත්:

අනාපාථගතො භික්ඛවෙ ලුද්දස්ස. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො. පුනච'පරං භික්ඛවෙ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො. පුනචපරං භික්ඛවෙ, භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො. පුනචපරං භික්ඛවෙ, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො.

පුනචපරං භික්ඛවෙ, භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො. පුනචපරං භික්ඛවෙ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ- සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො තිණ්ණො ලොකෙ විසත්තිකං සො විස්සත්ථො ගච්ඡති, විස්සත්ථො තිට්ඨති, විස්සත්ථො නිසීදති, විස්සත්ථො සෙය්‍යං කප්පෙති. තං කිස්ස හෙතු: අනාපාථගතො භික්ඛවෙ පාපිමතොති''[1] 'මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය.'

1. මජ්ඣිමනිකාය අරියපරියෙසන සුත්ත.

මහණෙනි, මුව වැදිහු ගේ ඇස්හමුවට නො ගිය හෙයිනි. මහණෙනි, එසෙයින් මැ මහණ තෙම කාමයෙන් වෙන් වැ මැ අකුශල ධර්මයෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. මහණෙනි, මෙ මහණ කෙලෙස් මරුහු හෝ මරදෙව්පිත් අඳ කෙළේ යැ, කෙලෙස්පිය රහිත කොට මාරචක්ෂුස නසා මරුහු ගේ අදර්ශනයට ගියේ යැයි කියනු ලැබෙයි. තවද මහණෙනි, මහණ තෙම විතර්කවිචාරයන් ගේ සන්හිඳීමෙන් සන්තානයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීති සුඛ ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. මහණෙනි, මෙ මහණ මරුහු අඳ කෙළේ යැ කෙලෙස්පිය රහිත කොට මාරචක්ෂුස නසා මරහුගේ අදර්ශ-නයට ගියේ යැ යි කියනු ලැබෙයි. තවද මහණෙනි, මහණ තෙම ප්‍රීතියා ගේ ද විරාගයෙන් උපෙක්ෂා ඇති වැ වාස කෙරෙයි. වැළිත් ස්මෘතිසම්‍යග් ඥාන ඇත්තේ නාමකයින් සම්ප්‍රයුක්ත සුඛවෙදනා විඳියි. යම් ධ්‍යානයක් හේතු කොට (බුද්ධාදි) ආර්‍ය්‍යයෝ (ධ්‍යානසමඞ්ගී පුද්ගල තෙම) 'උපෙක්ෂා ඇත්තේ යැ ස්මෘතිමත් යැ සුඛවිහරණ ඇත්තේ යැ'යි කියත් ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. මහණෙනි, මෙ මහණ මරුහු අඳ කෙළේ යැ, ක්ලෙශපාද රහිතකොට මාරචක්ෂුස නසා මරුහුගේ අදර්ශනයට ගියේ යැයි කියනු ලැබේ. තව ද මහණෙනි, මහණ තෙම සුඛයාගේ ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් කැලැ මැ සොම්නස් දෙම්නසුන්ගේ අස්තඞ්ගම-යෙන් නො දුක් නො සුව වූ උපෙක්ෂායෙන් උපන් ස්මෘති පාරිශුද්ධිය ඇති චතුර්ත්ථධ්‍යානයට පැමිණ වාස කෙරෙයි. මහණෙනි, මෙ මහණ මරහු අඳ කෙළේ යැ කෙලෙස් පා රහිත කොට මාරචක්ෂුස නසා මරුහුගේ අදර්ශනයට ගියේ යැ යි කියනු ලැබෙයි.

තවද මහණෙනි, මහණ තෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥවන් ඉක්ම-වීමෙන් ප්‍රතිඝසංඥවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාශය අනන්තයැ'යි ආකාසානඤ්චායතනයට පැමිණ වාස කෙරෙයි. මහණෙනි, මෙ මහණ 'මරුහු අනධ කෙළේ යැ කෙලෙස්පා නැති කොට මාරචක්ෂුස නසා මරුහුගේ අදර්ශනයට ගියේ ය'යි කියනු ලැබෙයි. තවද මහණෙනි, මහණ තෙම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඥනය අනන්ත යැ'යි. විඤ්ඤාණඤ්චා-යතනයට පැමිණ වාස කෙරෙයි... සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චා-යතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාස කෙරෙයි...සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වාස කෙරෙයි ...සර්වප්‍රකාරයෙන් නෙව-සඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සංඥවෙදයිත නිරොධයට පැමිණ වාස කෙරෙයි. යළි මාර්ගප්‍රඥයෙන් දක ඔහු විසින් ආශ්‍රවයෝ ක්ෂය කරන ලද වෙත්. මහණෙනි, මෙ මහණ මරුහු අඳ කෙළේය කෙලෙස්පිය නැති කොට මර ඇස නසා මරහුගේ අදර්ශනයට ගියේ යැ'යි කියනුලැබේ. ලොවැ විසත්තිකා නම් වූ, තෘෂ්ණාව තරණය කළ හෙතෙම විස්වැසි වැ යෙයි, විස්වැසි වැ සිටියි, විස්වැසි වැ හිඳියි, විස්වැසි වැ හොවී. ඒ කවර හෙයිනැ යත්: මහණෙනි, මරුහුගේ ඇස්හමුවට නො ගිය හෙයිනැ'යි 'මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය' යනුවේ.

**විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානොති:** ‘විඤ්ඤූ’ති පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. ‘නරො’ති සත්තො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු ජන්තු ඉන්දගු මනුජො. **සෙරීති** දෙව සෙරී: ධම්මොපි සෙරී පුග්ගලොපි සෙරී. කතමො ධම්මො සෙරී: චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. අයං ධම්මො සෙරී. කතමො පුග්ගලො සෙරී: යො ඉමිනා සෙරිනා ධම්මෙන සමන්නාගතො සො වුච්චති පුග්ගලො සෙරී.

**විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානොති:** ’විඤ්ඤූ නරො සෙරිතං ධම්මං පෙක්ඛමානො දක්ඛමානො ඔලොකයමානො නිජ්ඣායමානො උපපරික්ඛමානොති ‘විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

තෙනාහ සො පච්චෙක සම්බුද්ධො:

“මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො
යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය,
විඤ්ඤූ නරො සෙරිතං පක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො”ති

6.

ආමන්තනා හොති සහායමජ්ඣෙ
වාසෙ ච ඨානෙ ගමනෙ චාරිකාය,
අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**ආමන්තනා හොති සහායමජ්ඣෙ වාසෙ ච ඨානෙ ගමනෙ චාරිකායාති:** **‘සහායා’ වුච්චන්ති** යෙහි සහ ආගමනං ඵාසු, ගමනං ඵාසු, ගමනාගමනං ඵාසු, ඨානං ඵාසු, නිසජ්ජං[1]. ඵාසු, සයනං ඵාසු, ආලපනං ඵාසු, සල්ලපනං ඵාසු, උල්ලපනං ඵාසු, සමුල්ලපනං ඵාසු. **ආමන්තනා හොති සහායමජ්ඣෙ වාසෙ ච ඨානෙ ගමනෙ චාරිකායාති** සහාය මජ්ඣෙ වාසෙපි ඨානෙපි ගමනෙපි චාරිකායපි අත්තත්ථමන්තනා පරත්ථමන්තනා උභයත්ථමන්තනා දිට්ඨධම්මිකත්ථමන්තනා සම්පරායිකත්ථමන්තනා පරමත්ථමන්තනාති ‘ආමන්තනා හොති සහාය මජ්ඣෙ වාසෙ ච ඨානෙ ගමනෙ චාරිකාය’.

1. නිසජ්ජනං - ශ්‍යජසං

**විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො**– 'විඤ්ඤූ' යනු: පණ්ඩිත වූයේ ප්‍රඥා ඇත්තේ බුද්ධි ඇත්තේ නුවණැත්තේ විමසන නුවණ ඇත්තේ තුලිතඥාන ඇත්තේ. **නරො** යනු: සත්ත්ව යැ මානව යැ (පුස්නා) බැවින් පොස යැ පුද්ගල යැ ජීව යැ (ච්‍යුතියෙන් ජාතියට යන හෙයින්) ජාගු යැ (උපදනා අරුතින්) ජන්තු යැ (කර්මාධිපති වැ යන හෙයින්) ඉන්දගු යැ මනුජ යි. **සෙරි** යනු: සෞවරීහු දෙදෙනෙකි: සෞවරීධර්මයෙක් ද වෙයි, සෙවරීපුද්ගලයෙක් ද වෙයි. සෙවරීධර්ම කවරැ යත්: සතර සතිපට්ඨාන යැ සතර සම්‍යක්ප්‍රධාන යැ සතර ඍද්ධිපාද යැ පඤ්චෙන්ද්‍රිය යැ පඤ්ච බල යැ සප්තබොධ්‍යඞ්ග යැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ග යැ යි මේ සෞවරීධර්ම යැ. 'සෞවරීපුද්ගල' නම කවරැ යත්: යමෙක් මේ සෞවරීධර්මයෙන් සමන්වාගත වූයේ ද හේ 'සෞවරීපුද්ගල' යි කියනු ලැබේ.

**විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො** යනු: නුවණැති පුරුෂ තෙම සෞවරීධර්මය බලනුයේ දක්නේ අවලොකනය කරනුයේ ධ්‍යාන කරනුයේ විමසනුයේ නුයි 'විඤ්ඤූනරො සෙරිතං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

"මිගො අරඤ්ඤම්හි –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.

6

යහළුවන් මැද (සිටියහුට දිවාශයන සඞ්ඛ්‍යාත) වාසයෙහි ද (මහා උපස්ථාන සඞ්ඛ්‍යාත) ස්ථානයෙහි ද ගමනයෙහි ද චාරිකායෙහි ද (මේ අසව දෙව ආදීන්) ඇමැතීම් වෙයි. (එහි කලකුළු මම කාමීන් විසින්) නො ඉස්නා පැවිද්ද ද ධර්මපුද්ගල සෞවරීභාවය ද අපෙක්ෂා කරනුයෙම් කගවෙහෙණ හගක් සෙයින් එකලා වැ සරනෙම්.

**ආමන්තනා හොති සහායමජ්ඣෙ වාසෙ ච ඨානෙ ගමනෙ චාරිකාය**– යම් කෙනකුන් සමග ඊම පහසු ද යැම පහසුද යැමරීම් පහසු ද සිටීම පහසු ද හිඳීම පහසු ද සයනය පහසු ද ආලපනය පහසු ද සල්ලපනය පහසු ද උල්ලපනය පහසු ද සමුල්ලපනය පහසු ද, ඔහු 'සහායයෝ'යි කියනු ලැබෙත්: **ආමන්තනා හොති සහායමජ්ඣෙ වාසෙ ච ඨානෙ ගමනෙ චාරිකාය** යනු: සහායයන් මධ්‍යයෙහි විසීමෙහිදු සිටීමෙහිදු ගමන්හිදු චාරිකායෙහිදු ආත්මාර්ථ පිළිබඳ මන්ත්‍රණ පරාර්ථ පිළිබඳ මන්ත්‍රණ උභයාර්ත්ථ පිළිබඳ මන්ත්‍රණ තම අත්බැව් පිළිබඳ මන්ත්‍රණ පරඅත්බැව් පිළිබඳ මන්ත්‍රණ පරමාර්ථාර්ත්ථ පිළිබඳ මන්ත්‍රණ වෙ නුයි 'ආමන්තනා හොති සහායමජ්ඣෙ වාසෙ ච ඨානෙ ගමනෙ චාරිකාය' යනු වේ.

**අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානොති:** අනභිජ්ඣිතං එතං වත්ථු බාලානං අසප්පුරිසානං තිත්ථියානං තිත්ථියසාවකානං: යදිදං භණ්ඩුකාසායවත්ථවසනතා. අභිජ්ඣිතං එතං වත්ථු පණ්ඩිතානං සප්පුරිසානං බුද්ධසාවකානං පච්චෙකබුද්ධානං යදිදං භණ්ඩුකාසායවත්ථවසනතා. **සෙරීති** ද්වෙ සෙරී: ධම්මොපි සෙරී පුග්ගලොපි සෙරී. කතමො ධම්මො සෙරී: චත්තාරො සතිපට්ඨානා -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො. අයං ධම්මො සෙරී. කතමො පුග්ගලො සෙරී: යො ඉමිනා සෙරිනා ධම්මෙන සමන්නාගතො සො වුච්චති පුග්ගලො සෙරී. **අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානොති:** සෙරිතං ධම්මං පෙක්ඛමානො දක්ඛමානො ඔලොකයමානො නිජ්ඣායමානො උපපරික්ඛමානොති 'අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"ආමන්තනා හොති සහායමජ්ඣෙ
වාසෙ ඨානෙ ගමනෙ චාරිකාය,
අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

7

ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙ
පුත්තෙසු ච විපුලං හොති පෙමං,
පියවිප්පයොගං විජිගුච්ඡමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙති** 'ඛිඩ්ඩා'ති ද්වෙ ඛිඩ්ඩා කායිකා ච ඛිඩ්ඩා වාචසිකා ච ඛිඩ්ඩා. කතමා කායිකා ඛිඩ්ඩා: හත්ථීහිපි කීළන්ති, අස්සෙහිපි කීළන්ති රථෙහිපි කීළන්ති, ධනූහිපි කීළන්ති, අට්ඨපදෙපි කීළන්ති, දසපදෙපි කීළන්ති, ආකාසෙපි කීළන්ති, පරිහාරපථෙපි කීළන්ති, සන්තිකායපි කීළන්ති, ඛලිකායපි කීළන්ති, ඝටිකායපි කීළන්ති, සලාකහත්ථෙනපි කීළන්ති, අක්ඛෙහිපි[1] කීළන්ති, පඞ්ගචීරෙනපි කීළන්ති, වඞ්කකෙනපි කීළන්ති, මොක්ඛචිකායපි කීළන්ති, චිඞ්ගුලකෙනපි කීළන්ති, පත්තාළ්හකෙනපි කීළන්ති, රථකෙනපි කීළන්ති, ධනුකෙනපි කීළන්ති, අක්ඛරිකායපි කීළන්ති, මනෙසිකායපි කීළන්ති, යථාවජ්ජෙනපි කීළන්ති. අයං කායිකා ඛිඩ්ඩා.

1. අක්ඛෙනපි- ව,වි, ම ඡ සං

**අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො** යනු: භණ්ඩුකර්මය කහවත් හඳනා පොරොනා බව යැ යන යමෙක් වේ නම් තෙල කරුණ නුවණමඳ වූ අසත්පුරුෂ වූ තීර්ථකයන් විසින් තීර්ථකශ්‍රාවකයන් විසින් නො පතන ලද යැ භණ්ඩුකර්මය කහවත් හඳනා පොරෝනා බව යැ යන යමෙක් ඇද්ද තෙල කරුණ පණ්ඩිත වූ සත්පුරුෂ වූ බුද්ධශ්‍රාවකයන් විසින් ප්‍රත්‍යෙක සම්බුද්ධයන් විසින් වෙසෙසින් පතනලද යැ. **සෙරී** යනු: සෙවරිහු දෙදෙනෙකි: සෛවරී ධර්මය ද සෛවරී පුද්ගල දූ'යි සෛවරීධර්ම නම් කවරැ යත්: සතර සතිපට්ඨාන යැ... ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග යැ යි. මේ සෛවරීධර්ම නම, සෛවරී පුද්ගල නම් කවරැ යත්: යමෙක් මේ සෛවරී ධර්මයෙන් සමන්වාගත වූයේ නම් හේ 'සෛවරීපුද්ගල' යයි කියනු ලැබෙයි. **අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො** යනු: සෛවරී ධර්මය බලමින් දක්මින් අවලොකනය කෙරෙමින් ධ්‍යාන කෙරෙමින් පිරික්සමිනි නුයි 'අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණ-කප්පො' යනු වේ.

එයින් වදාළහ ඒ පසේ බුදුහු:

**"ආමන්තනා හොති –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"**යි.

7

යහළුවන් මැද ක්‍රීඩාව ද පඤ්චකාම ගුණරතිය ද වෙයි, පුත්‍රයන් කෙරෙහි දු විපුල ප්‍රෙමය වෙයි, ප්‍රියවිප්‍රයොගය ජුගුප්සා කරනුයෙම් කගවෙහෙණ හඟක් සෙයින් එකලාව සරනෙම්.

**ඛිඩ්ඩාරතී හොති සහායමජ්ඣෙ**– 'ඛිඩ්ඩා' යනු: ක්‍රීඩා දෙකෙකි කායික ක්‍රීඩා ද වාචසික ක්‍රීඩා දූ යි. කායික ක්‍රීඩා නම කවරැ යත්: ඇතුන් හා සමග ද කෙළිති, අසුන් හා සමග ද කෙළිති, රිය හා සමග ද කෙළිති, දුන්නෙනුදු කෙළිති, අටපදයෙහිදු කෙළිති, දසපදයෙහි දු කෙළිති, අහස්හි දු කෙළිති, පරිහාරපථයෙහි දු කෙළිති, සන්තිකා කෙළිදු කෙළිති, පසැටිනුදු කෙළිති, ඝටිකායෙන් (කල්ලි) ද කෙළිති, ලහ අතිනුදු කෙළිති, ගුළ (පන්දු) යෙනුදු කෙළිති, පත්නළයෙනුදු කෙළිති, කෙළි නඟුලිනුදු කෙළිති, පරිවර්තන කෙළිදු කෙළිති, පත්බමරිනිදු කෙළිති, පත්නැළියෙනුදු කෙළිති කුඩාරියෙනුදු කෙළිති, කෙළි දුන්නෙනුදු කෙළිති, අකුරු කෙළිදු කෙළිති සිතැඟි කෙළිදු කෙළිති, යථාවද්‍යයෙනුදු කෙළිත්. මේ කායිකක්‍රීඩා යැ.

කතමා වාචසිකා ඛිඩ්ඩා: මුඛභෙරිකං මුඛාලම්බරං මුඛදෙණ්ඩිමකං[1] මුඛවලිමකං[2] මුඛභෙරුළකං[3] මුඛදද්දරිකං නාටකං ලාසං ගීතං දවකම්මං, අයං වාචසිකා ඛිඩ්ඩා. රතීති අනුක්කණ්ඨිතාධිවචනමෙතං රතීති. ‘සහායා’ති යෙහි සහ ආගමනං ඵාසු, ගමනං ඵාසු, ගමනාගමනං ඵාසු, ඨානං ඵාසු, නිසජ්ජා ඵාසු, සයනං ඵාසු, ආලපනං ඵාසු, සල්ලපනං ඵාසු, උල්ලපනං ඵාසු, සමුල්ලපනං ඵාසු. ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙ’ති ඛිඩ්ඩා ච රති ච සහායමජ්ඣෙ හොතීති ‘ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙ’.

පුත්තෙසු ච විපුලං හොති පෙමන්ති: ‘පුත්තා’ති චත්තාරො පුත්තා අත්‍රජො පුත්තො ඛෙත්තජො පුත්තො දින්නකො පුත්තො අන්තෙවාසිකො පුත්තො. පුත්තෙසු ච විපුලං හොති පෙමන්ති පුත්තෙසු ච අධිමත්තං හොති පෙමන්ති ‘පුත්තෙසු ච විපුලං හොති පෙමං’.

පියවිප්පයොගං විජිගුච්ඡමානොති ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා කතමෙ සත්තා පියා: ඉධ යස්ස තෙ හොන්ති, අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා මාතා වා පිතා වා භාතා වා භගිනී වා පුත්තා වා ධීතා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා ඉමෙ සත්තා පියා. කතමෙ සඞ්ඛාරා පියා: මනාපිකා රූපා මනාපිකා-සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා. ඉමෙ සඞ්ඛාරා පියා. පියවිප්පයොගං විජිගුච්ඡමානොති: පියානං විප්පයොගං විජිගුච්ඡමානො අට්ටීයමානො හරායමානොති ‘පියවිප්පයොගං විජිගුච්ඡමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො’.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

“ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙ
පුත්තෙසු ච විපුලං හොති පෙමං,
පියවිප්පයොගං විජිගුච්ඡමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො”ති.

1. මුඛඩිණ්ඩිමකං — ම ඡ සං.
2. මුඛවලිකං — පු.
3. මුඛකෙරෙකං — මඡ සං.

'වාචසික ක්‍රීඩා' කවරැ යත්: මුවබෙර යැ මුවපනාබෙර යැ මුවපටහ යැ මුඛවාලික යැ (සීරුසන්) මුඛ හෙරුලක යැ මුවඩමරු යැ නාටක යැ ඔල්වරහඬ යැ ගායන යැ සිනාකෙළි යැ යන මේ වාචසික ක්‍රීඩා යි. **රති** යනු: තෙල 'රති' යි නො උකටලියට නමෙකි. **සහායා**- යම් කෙනකුන් හා සමග ඊම පහසු ද යෑම පහසු ද යෑමීඊම් පහසු ද සිටීම පහසු ද හිඳීම පහසු ද නිදීම පහසු ද ආලපනය පහසු ද සල්ලපනය පහසු ද උල්ලපනය පහසු ද සමුල්ලපනය පහසු ද ඔහු 'සහාය' යි කියනු ලැබෙත්. **ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙ** යනු: සහායයන් මධ්‍යයෙහි ක්‍රීඩාව ද රතිය ද වේ නුයි 'ඛිඩ්ඩාරතී හොති සහායමජ්ඣෙ' යනු වේ.

**පුත්තෙසු ච විපුලං හොති පෙමං**- 'පුත්තා' යනු: පුත්‍රයෝ සතර දෙනෙකි: ආත්මජ පුත්‍ර යැ ක්ෂෙත්‍රජ පුත්‍ර යැ දෙනුලැබ වඩාගත් පුත්‍ර යැ අතැවැසි පුත්‍ර යැ යි. **පුත්තෙසු ච විපුලං හොති පෙමං** යනු: පුත්‍රයන් කෙරෙහි අධික ප්‍රේමය වේ නුයි 'පුත්තෙසු ච විපුලං හොති පෙමං' යනු වේ.

**පියවිප්පයොගං විජිගුච්ඡමානො**- ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යි. ප්‍රියසත්ත්වයෝ කවරහ යත්: මෙලොවැ යමක්හට වැඩ කැමැති හිත කැමැති පහසු කැමැති සතර යොගයෙන් නිර්භය කැමැති මවක් වේවයි පියෙක් වේවයි බෑයෙක් වේවයි බූනක් වේවයි පුතෙක් වේවයි දුවක් වේවයි මිතුරෙක් වේවයි සගයහළුවෙක් වේවයි නෑයෙක් වේවයි සහලේනෑයෙක් වේවයි යම් කෙනෙක් වෙත් ද, මොහු ප්‍රියසත්ත්වයෝ යි. ප්‍රිය සංස්කාරයෝ කවරහ යත්: මනවඩන රූපයෝ යැ මනවඩන ශබ්දයෝ යැ මනවඩන ගන්ධයෝ යැ මනවඩන රසයෝ යැ මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යන මොහු ප්‍රිය සංස්කාරයෝ යි. **පියවිප්පයොගං විජිගුච්ඡමානො** යනු: ප්‍රියයන්ගේ විප්‍රයොගය ජුගුප්සා කරනුයෙම් (ඉන්) පෙළෙනුයෙම් ලජ්ජා වනුයෙම් නුයි 'පියවිප්පයොගං විජිගුච්ඡමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

**"ඛිඩ්ඩා රතී හොති -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො"** යි.

8.

චාතුද්දිසො අප්පටිඝො ච හොති
සන්තුස්සමානො ඉතරීතරෙන,
පරිස්සයානං සහිතා අඡම්භී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**චාතුද්දිසො අප්පටිඝො ච හොතීති** 'චාතුද්දිසොති සො පච්චෙකසම්බුද්ධො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං, ඉති උද්ධමධො[1] තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[2] ඵරිත්වා විහරති. කරුණාසහගතෙන -පෙ- මුදිතාසහගතෙන -පෙ- උපෙක්ඛාසහගතෙන -පෙ- විහරති. **චාතුද්දිසො අප්පටිඝො ච හොතීති**: මෙත්තාය භාවිතත්තා යෙ පුරත්ථිමාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ දක්ඛිණාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ පච්ඡිමාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ උත්තරාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති. යෙ පුරත්ථිමාය අනුදිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ දක්ඛිණාය අනුදිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ පච්ඡිමාය අනුදිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ උත්තරාය අනුදිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ හෙට්ඨිමාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ උපරිමාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ දිසාසු විදිසාසු සත්තා තෙ අප්පටිකූලා හොන්ති, කරුණාය භාවිතත්තා -පෙ- මුදිතාය භාවිතත්තා - උපෙක්ඛාය භාවිතත්තා. යෙ පුරත්ථිමාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති -පෙ- යෙ දිසාසු විදිසාසු සත්තා තෙ අප්පටිකූලා හොන්තීති 'චාතුද්දිසො අප්පටිඝො ච හොති.'

**සන්තුස්සමානො ඉතරීතරෙනාති**: සො පච්චෙකසම්බුද්ධො සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී න ච චීවරහෙතු[3] අනෙසනං අප්පතිරූපං[4] ආපජ්ජති. අලද්ධා ච චීවරං න පරිතස්සති, ලද්ධා ච චීවරං අගථිතො[5] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති න පරං වම්භෙති,

1. උද්ධං අධො - ප, ච, වි,
2. අබ්‍යාපජ්ජන - ම ජ සං
3. න චීවරහෙතු - ප, වි, ක,
4. අප්පතිරූපං - ප, ච, වි, ක, සා,
5. අගධිතො - ම ජ සං

8.

ඉතරීතර (කුදුමහත් ප්‍රත්‍යය) යෙන් සතුටූ වනුයේ බඹවිහරණ පතළ සිව්දිග ඇතියේ ප්‍රතිඝ රහිත වූයේ ද වෙයි. උවදුරු සහනුයේ තැති ගැනුම් නැත්තේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ සරනේ යි.

**චාතුද්දිසො අප්පටිඝො ච හොති** – 'චාතුද්දිසො' යනු: ඒ පසේබුදුහු මෛත්‍රිසහගත සිතින් එක් දෙසක් අරමුණු කොට වාස කෙරෙති. එසෙයින් දෙ වැනි දෙස එසෙයින් තෙ වැනි දෙස එසෙයින් සතර වැනි දෙස මෙසෙයින් උඩ යට සරස හැම තන්හි හැම දෙන ආත්මසම බැවින් (හෝ මුළු සිතින්) හැම සතුන් ඇති ලොව මෛත්‍රී සහගත වූ (ඵරණ විසින්) විපුල වූ (භූමි විසින්) මහද්ගත වූ (ආලම්බන) විසින් අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ සිතින් ස්පර්ශ (අරමුණු) කොට වාස කෙරෙති. කරුණා සහගත වූ ...මෘදුතා සහගත වූ ... උපෙක්ෂාසහගත වූ ... සිතින් යුක්ත වැ වාස කෙරෙත්. **චාතුද්දිසො අප්පටිඝො ච හොති** යනු: මෛත්‍රිය භාවිත බැවින් පෙරදිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු ප්‍රතිකූල නො වෙති, දකුණුදිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු ප්‍රතිකූල නො වෙති, අවරදිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු ප්‍රතිකූල නො වෙති, උතුරු දිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු ප්‍රතිකූල නො වෙති, පැදුම් අනුදිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු අප්‍රතිකූල වෙති, දකුණු අනුදිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු අප්‍රතිකූල වෙති, පැළ අනුදිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු අප්‍රතිකූල වෙති, උතුරු අනුදිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු අප්‍රතිකූල වෙති, යට දෙස යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු අප්‍රතිකූල වෙති, උඩ දෙස යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු අප්‍රතිකූල වෙති, දසනුදසැ යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු අප්‍රතිකූල වෙත්. කරුණාව භාවිත බැවින්–මෘදුතාව භාවිත බැවින්– උපෙක්ෂාව භාවිත බැවින් පැදුම් දිග යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු නො පිළිකුල් වෙති. ...දිශාවිදිශාවන්හි යම් සත්ත්ව කෙනෙක් ඇත් නම් ඔහු නො පිළිකුල් වෙත් නුයි 'චාතුද්දිසො අප්පටිඝො ච හොති' යනු වේ:

**සන්තුස්සමානො ඉතරීතරෙන** යනු: ඒ පසේබුදුහු කුදුමහත් සිවුරින් සන්තුෂ්ට වෙති, ඉතිරිතර චීවරසන්තුෂ්ටියෙහි ගුණ කියන සුල්ලභ, චීවර හේතුයෙන් අයුතු අනෙසනයට ද නොපැමිණෙති, සිවුරු නො ලැබ (චීවරලාභයෙහි) තෘෂ්ණා නො කෙරෙති. යළි (දැහැමින් සෙමෙන්) සිවුරු ලැබ ලොභග්‍රන්ථ නැති වැ තෘෂ්ණායෙන් මුසපත් නො වැ නො වත-ළාහු ආදීනව දක්නාහු නිස්සරණ ප්‍රඥා ඇත්තාහු වළඳති. තවද ඒ ඉතරීතර චීවරසන්තුෂ්ටියෙන් නො මැ ආත්මොත්කර්ෂ කෙරෙති, නො ද පරවම්භන කෙරෙත්.

යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො. අයං වුච්චති පච්චෙකසම්බුද්ධො පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන -පෙ- සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන -පෙ- සන්තුට්ඨො හොති ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, ඉතරීතරගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති. අලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං න පරිතස්සති, ලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර සන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති න පරං වම්භෙති, යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො. අයං වුච්චති පච්චෙක සම්බුද්ධො පොරාණෙ අග්ගඤ්ඤෙ අරිවංසෙ ඨිතොති ‘සන්තුස්සමානො ඉතරීතරෙන’.

පරිස්සයානං සහිතා අඡම්භීති’– පරිස්සයා’ති ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච. කතමෙ පාකටපරිස්සයා: සීහා ව්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා[1] ‘හත්ථී අහි විච්ඡිකා සතපදී චොරා වා අස්සු මානවා වා කතකම්මා වා අකතකම්මා වා. චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො[2] ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිනාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසප[3]සම්ඵස්සා ඉති වා. ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා.

1. මහිංසා – ම ජ සං, ගොමහිසා– ස්‍යා, ච, වී
2. ඩාහො– ම ජ සං,
3. සරීසප– ම ජ සං,

යම් කෙනෙක් ඒ චීවර සන්තෝෂයෙහි දක්ෂ වූවාහු අනලස වූවාහු සම්‍යග්ඥාන ඇත්තාහු ස්මෘතිසම්ප්‍රයුක්ත වූවාහු වෙත් ද මේ පසේ බුදුහු පෞරාණික වූ 'අග්‍ර' යයි දතයුතු ආර්‍ය්‍යවංශයෙහි සිටියාහ'යි කියනු ලැබෙත්. ඉතරීතර පිණ්ඩපාතයෙන් සන්තුෂ්ට වෙති ... ඉතරීතර ශයනාසනයෙන් සන්තුෂ්ට වෙති ... ඉතරීතර ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයෙන් සන්තුෂ්ට වෙති. ඉතරීතර ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර-සන්තුෂ්ටියෙහි ගුණ කියන සුල්ලහ. ගිලන්පස බෙහෙසත් පිරිකර හෙයින් අයුතු අනෙසනයට නො ද පැමිණෙති, යළි ගිලන්පසබෙහෙසත් පිරිකර නො ලැබ (ලාභයෙහි) තෘෂ්ණා නො කෙරෙති. (දැහැමින් සෙමෙන්) ගිලන්පසබෙහෙසත් පිරිකර ලැබ ද ලොභග්‍රන්ථ නැති වැ තෘෂ්ණායෙන් මුසපත් නො වැ නො වතළාහු ආදීනව දක්නාහු නිස්සරණප්‍රඥ ඇති වැ වළඳති. තවද ඒ ඉතරීතර ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර සන්තුෂ්ටියෙන් නො මැ ආත්මොත්කර්ෂ කෙරෙති, නො ද පරවම්භන කෙරෙති, යම් කෙනෙක් එහි දක්ෂ වූවාහු අනලස වූවාහු සම්‍යක්ඥාන ඇත්තාහු සිහි ඇත්තාහු වෙත් ද, මේ පසේ බුදුහු පෞරාණික වූ 'අග්‍ර' යයි දතයුතු ආර්‍ය්‍යවංශයෙහි සිටියාහ'යි කියනු ලැබෙත් නුයි 'සන්තුස්සමානො ඉතරීතරෙන' යනු වේ.

**පරිසසයානං සහිතා අඡම්භී**– 'පරිස්සයා' යනු: උපද්‍රව දෙකෙකි: ප්‍රකට උපද්‍රව ද ප්‍රතිච්ඡන්න උපද්‍රව ද යි. ප්‍රකට උපද්‍රව නම් කවරැ යත්: සිංහ යැ වග යැ වලස් යැ තරස් යැ කොක්නා යැ මියු යැ ඇත් යැ සප් යැ නුහුසු යැ පත්තෑ යැ කළ සොරකම් ඇති හෝ කළ සොරකම් නැති හෝ සොරු හෝ සැහැසියෝ යැ චක්ෂුරොග යැ ශ්‍රොත්‍රරොග යැ ඝ්‍රාණරොග යැ ජිහ්වාරොග යැ කායරොග යැ ශීර්ෂරොග යැ කර්ණරොග යැ මුඛරොග යැ දන්තරොග යැ කාශ යැ ශ්වාස යැ පීනස යැ දහ යැ ජ්වර යැ කුක්ෂිරොග යැ මූර්ඡා යැ රක්තාතිසාර යැ ආමශූල යැ විසූචිකා යැ කුෂ්ට යැ ගණ්ඩ යැ කිලාසකුෂ්ට යැ ක්ෂය යැ අපස්මාර යැ දද යැ කැසි යැ කස් යැ ව්‍රණ යැ විතච්ඡිකා (තලරොග) යැ රක්තපිත්ත යැ මධුමෙහ යැ අර්ශස් යැ පොළ යැ භගන්දරා යැ පිතින් නැගි ආබාධ යැ සෙමින් නැඟි ආබාධ යැ වයින් නැඟි ආබාධ යැ සන්නිපාතික ආබාධ යැ ඍතුපරිණාමයෙන් උපන් ආබාධ යැ විෂම වූ ඊර්‍ය්‍යාපථයෙන් නැඟි ආබාධ යැ උපක්‍රමයෙන් උපන් ආබාධ යැ කර්මවිපාකයෙන් උපන් ආබාධ යැ ශීත යැ උෂ්ණ යැ ජිඝත්සා යැ පිපාසා යැ උච්චාර යැ ප්‍රස්‍රාව යැ මැසි–මදුරු–වා–අව්–දික්දෑ යන මොවුන්ගේ පහසින් උපන් පීඩා යැ යන මේ හෝ යි, මොහු ප්‍රකට උපද්‍රාවයෝ යි කියනු ලැබෙත්.

කතමෙ පටිච්ඡන්නපරිස්සයා: කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථීනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසංඛාරා. ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා'.

**පරිස්සයාති**- කෙනට්ඨෙන පරිස්සයා: පරිසහන්තීති පරිස්සයා, පරිහානාය සංවත්තන්තීති පරිස්සයා, තත්‍රාසයාති පරිස්සයා.

කථං පරිසහන්තීති පරිස්සයා: තෙ පරිස්සයා තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති පරිමද්දන්ති,[1] එවං පරිසහන්තීති පරිස්සයා.

කථං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා: තෙ පරිස්සයා කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. කතමෙසං කුසලානං ධම්මානං: සම්මාපටිපදය අනුලොමපටිපදය අපච්චනීකපටිපදය අන්වත්ථපටිපදය ධම්මානුධම්මපටිපදය සීලෙසු පරිපූරකාරිතාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය භොජනෙ මත්තඤ්ඤුතාය ජාගරියානුයොගස්ස, සතිසම්පජඤ්ඤස්ස චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගස්ස, චතුන්නං සම්මප්පධානානං - චතුන්නං ඉද්ධිපාදානං - පඤ්චන්නං ඉන්ද්‍රියානං - පඤ්චන්නං බලානං - සත්තන්නං බොජ්ඣඞ්ගානං - අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගස්ස, ඉමෙසං කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති, එවං[2] පරිහානාය සංවත්තන්තීති පරිස්සයා.

කථං තත්‍රාසයාති පරිස්සයා: තත්ථෙතෙ[3] පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයා, යථා බිලෙ බිලාසයා පාණා සයන්ති, දකෙ දකාසයා[4] පාණා සයන්ති, වනෙ වනාසයා පාණා සයන්ති, රුක්ඛෙ රුක්ඛාසයා පාණා සයන්ති, එවමෙව තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයාති එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

---

1. මද්දන්ති- ම ඡ සං, ව, වි
2. ඉති එවං- සත
3. තත්‍ර තෙ- ව ,වි
4. උදකෙ උදකාසයා- ම ඡ සං.

ප්‍රතිච්ඡන්න උපද්‍රව කවරැ යත්: කායදුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනොදුශ්චරිත යැ කාමච්ඡන්දනීවරණ යැ ව්‍යාපාදනීවරණ යැ ථීනමිද්ධනීවරණ යැ උද්ධච්ච කුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යැ රාග යැ ද්වේෂ යැ මෝහ යැ ක්‍රොධ යැ උපනාහ යැ මකු බව යැ පලාස (යුගග්‍රාහ) යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය්‍ය යැ මායා යැ සඨ බව යැ ස්තම්භ යැ සාරම්භ යැ මාන යැ අතිමාන යැ මද යැ ප්‍රමාද යැ, සියලු ක්ලේශයෝ යැ සියලු දුශ්චරිතයෝ යැ සියලු දරථයෝ යැ සියලු පරිදාහයෝ යැ සියලු සන්තාපයෝ යැ සියලු අකුශලාභිසංස්කාරයෝ යැ යන මොහු ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ යි කියනු ලැබෙත්.

**පරිස්සයා** යනු: කවර හෙයින් පරිස්සය වෙති යත්: පරිසහනය කෙරෙත් නුයි 'පරිස්සය' නම් වෙති, පරිහානයට වැටෙත් නුයි'පරිස්සය' නම් වෙති, එහි ආසය ඇත්තාහු නුයි 'පරිස්සය' නම් වෙති.

කිසෙයින් 'පරිසහනය කෙරෙත්' නුයි පරිස්සය නම් වෙති යත්: ඒ උපද්‍රවයෝ ඒ පුඟුල්හු සහනය කෙරෙති, පරිසහනය කෙරෙති මැඩගෙන සිටිති, හැත්පසින් අල්වා ගනිති, මිරිකාගනිත්, මෙසෙයින් පරිසහනය කෙරෙත් නුයි 'පරිස්සය' නම් වෙති.

කිසෙයින් 'පරිහානයට වැටෙත්' නුයි 'පරිස්සය' නම් වෙති යත්: ඒ උපද්‍රවයෝ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පරිහානය (හැරීම) පිණිස පවතිත්. කවර කුශලධර්මයන්ගේ ද යත්: සම්‍යක් ප්‍රතිපත් යැ අනුලොමප්‍රතිපත් යැ අප්‍රත්‍යනීක ප්‍රතිපත් යැ අවිරුද්ධ ප්‍රතිපත් යැ අන්වර්ථ ප්‍රතිපත් යැ ධර්මානුධර්මප්‍රතිපත් යැ ශීලයෙහි පරිපූරකාරිත්ව යැ ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා යැ භොජනයෙහි මාත්‍රඥතා යැ ජාගර්‍ය්‍යානුයොග යැ ස්මෘති සම්ප්‍රඥාන යැ චතුර්විධ ස්මෘති ප්‍රස්ථානයන් ගේ භාවනානුයොග යැ චතුර්විධ ඍද්ධිපාදයන් ගේ භාවනානුයොග යැ පඤ්චන්ද්‍රියයන්ගේ භාවනානු යොග යැ පඤ්චබලයන්ගේ භාවනානුයොග යැ සප්තබොධ්‍යඞ්ගයන්ගේ භාවනානුයොග යැ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයාගේ භාවනානුයොග යැ යන මේ කුශලධර්මයන් ගේ අන්තරාය පිණිස පරිහානය පිණිස වැටෙත්. මෙසෙයින් පරිහානයට වැටෙත් නුයි 'පරිස්සය' නම් වෙති.

කිසෙයින් 'එහි ආසය ඇත්තාහු' නුයි 'පරිස්සය' නම් වෙති යත්: ඒ අත් බැව්හි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසිරි කොට උපදිත්, යම්සේ බිලය ඇසුරු කරන ප්‍රාණීහු බිලයෙහි හොවිත් ද, දිය ඇසුරු කරන ප්‍රාණීහු දියෙහි හොවිත් ද, වනය ඇසුරු කරන ප්‍රාණීහු වෙනෙහි හොවිත් ද, රුක ඇසුරු කරන ප්‍රාණීහු රුක්හි හොවිත් ද, එසෙයින් මැ අත් බැව ඇසුරු කරන තෙල ලාමක අකුශලධර්මයෝ ඒ අත්බැව්හි උපදිත්. මෙසෙයිනුදු තත්‍රාසය (එහි ආසය) ඇත්තාහු නුයි 'පරිස්සය' නම් වෙත්.

වුත්තං හෙතං භගවතා;

"සාන්තෙවාසිකො භික්ඛවෙ, භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු විහරති. කථං ච භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරති; ඉධ භික්ඛවෙ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති යෙ පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා ත්‍යාස්ස අන්තො වසන්ති අන්වාස්සවන්ති පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකො වුච්චති. තෙ නං සමුදචරන්ති[1] සමුදචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා 'සාචරියකො'ති වුච්චති. පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා – පෙ – ඝානෙන ගන්ධං ඝායිත්වා – පෙ – ජිව්හාය රසං සායිත්වා – පෙ – කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා පෙ – මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති යෙ පාපකා අකුසලා ධම්මා සරසංකප්පා සඤ්ඤොජනියා ත්‍යාස්ස අන්තො වසන්ති, අන්වාස්සවන්ති පාපකා අකුසලා ධම්මාති තස්මා 'සාන්තෙවාසිකො'ති වුච්චති. තෙ නං සමුදචරන්ති සමුදචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා. 'සාචරියකො'ති[2] වුච්චති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරතී'ති[a] එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

"තයොමෙ භික්ඛවෙ, අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා. කතමෙ තයො: ලොභො භික්ඛවෙ, අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. දොසො භික්ඛවෙ -පෙ- මොහො භික්ඛවෙ, අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො අන්තරා මලා[3] අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා.[b]

1. "අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

2. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති
අන්ධං තමං තද හොති යං ලොභො සහතෙ නරං.

3. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.[b]

---

1. තෙන සමුදචරෙන – ම ජ සං,
2. සාචරියකොති – ච–ථි
3. අන්තරාමලො – ම ජ සං,

a. සළායතනසංයුත්ත – නවපුරාණවග්ග
b. ඉතිවුත්තක – චතුත්ථවග්ග මලසුත්ත

මෙ වදාරන ලද මැ යි බුදුන් විසින්:

"මහණෙනි, සාන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙයි. මහණෙනි, කෙසේ නම් සාන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකයේ නො සුවසේ වෙසෙයි යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණක්හට ඇසින් රූපයක් දැක සරසංකල්ප (නොයෙක් අරමුණුහි හැසිරෙන හෙයින් සංකල්පනය කටයුතු) වූ සංයොජනයන්ට හිත වූ යම් ලාමක අකුශලධර්ම කෙනෙක් උපදිත් ද ඒ අකුශල ධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති සන්තානයට පිවිස වෙසෙති. එහෙයින් 'සාන්තෙවාසික' යයි කියනු ලැබෙයි. යම් හෙයකින් ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු හසුරුවත් ද, ඔහු කෙරෙහි පවතිත් ද, එහෙයින් 'සාචරියක' යයි කියනු ලැබේ. තවද මහණෙනි, මහණක්හට කනින් ශබ්දයක් අසා ... නැහැයෙන් ගඳක් අසා... දිවින් රසයක් විඳ ... කයින් පහසක් පැහැසැ ... සිතින් දහමක් දැන නානාලම්බනයෙහි හැසිරීම් වශයෙන් පරිකල්පිත වූ සංයොජනීය වූ යම් ලාමක අකුශලධර්ම කෙනෙක් උපදිත් ද, ඒ ලාමක අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති, ඔහුගේ සන්තානයට පිවිස වෙසෙති. එහෙයින් 'සාන්තෙවාසික' යයි කියනු ලැබෙයි. යම්හෙයකින් ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු හසුරුවත් ද ඔහු කෙරෙහි පවතිත් ද, එහෙයින් 'සාචරියක' යයි කියනු ලැබේ. මෙසෙයින් මහණෙනි, මහණ තෙම සාන්තෙවාසික වූයේ සාචරියක වූයේ දුකසේ වෙසෙයි, සුවසේ නො වෙසේයයි" මෙසෙයිනුදු තත්‍රාසය වෙත් නුයි උපද්‍රව නම් වෙත්.

මෙ වදාරන ලද මැ යි භාග්‍යවතුන් විසින්:

"මහණෙනි මෙ ඇතුළත මලයෝ ඇතුළත අමිත්‍රයෝ ඇතුළත සතුරෝ ඇතුළත වධකයෝ ඇතුළත පසමිතුරෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද යත්: මහණෙනි, ලොභය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි. මහණෙනි, ද්වේෂය ... මහණෙනි, මොහය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි. මහණෙනි මොහු තිදෙන ඇතුළත මලයෝ යැ, ඇතුළත අමිත්‍රයෝ යැ, ඇතුළත සතුරෝ යැ, ඇතුළත වධකයෝ යැ, ඇතුළත පසමිතුරෝ යි.

1. ලෝභය අනර්ත්ථ උපදවන්නේ යැ, ලොභය සිත චලනය කරන්නේ යැ, හේ ඇතුළත (සිත්හි) මැ උපන් භයහෙතුයෙක, ඒ භය බාලජන තෙමේ නො දකියි.

2. ලොභී වූයේ (ලෞකික ලොකොත්තර) අර්ත්ථය නො දකියි. (අර්ත්ථයට හේතු වූ) ධර්මය නො දකියි. යම් කලෙක්හි ලොභය තෙම මිනිසා මැඩගනී ද, එකල්හි බහල වූ අන්ධකාරය වේ.

3. ද්වේෂය අනර්ත්ථජනක යැ, ද්වෙෂය සිත චලනය කෙරෙයි. හේ සිත්හි උපන් භය කාරණයෙක, බාලජන තෙම එය අවබෝධ නො කෙරෙයි.

4. දුට්ඨො අත්ථං න ජානාති දුට්ඨො ධම්මං න පස්සති
අන්ධංතමං තද හොති යං දොසො සහතෙ නරං.

5. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති
අන්ධංතමං තද හොති යං මොහො සහතෙ නර''න්ති.*a*

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

"තයො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය, කතමෙ තයො: ලොභො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො ඛො මහාරාජ –පෙ– මොහො ඛො මහාරාජ පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය ඉමෙ ඛො මහාරාජ, තයො පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය."*b*

7. "ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං
හිංසන්ති අත්තසම්භූතා තචසාරංව සම්ඵල''න්ති*b*

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

8. "රාගො ච දොසො ච ඉතොනිදානා
අරතී රතී ලොමහංසො ඉතොජා,
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධංකමිවොස්සජන්ති''ති*c*

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

පරිස්සයානං සහිතාති පරිස්සයෙ සහිතා ආරාධිතා අජ්ඣොත්ථරිතා පරියාදිතා පටිනිස්සට්ඨාති 'පරිස්සයානං සහිතා'.

---

*a.* ඉතිවුත්තක – චතුත්ථවග්ග මලසුත්ත
*b.* කොසල සංයුත්ත – පඨමවග්ග
*c.* සුත්තනිපාත – සූචිලොමසුත්ත

4. ද්වේෂයේ අර්ත්ථය නො දනියි. ධර්මය නො දකියි. ක්‍රොධය මිනිසා යටපත් කරන කල්හි බහල වූ අන්ධකාරය වේ.

5. මෝහය අනර්ථ උපදවයි. මෝහය සිත කලඹයි. මෝහ සිත තුළ උපදනා භය කාරණයෙක, බාලජන තෙම එය අවබොධ නො කෙරෙයි.

6. මුළා වූයේ අර්ත්ථය නො දනියි. ධර්මය නො දකියි. මොහය මිනිසා මැඩගන්නා කල්හි බහල වූ අන්ධකාරය වේ.

මෙසේත් 'තත්‍රාසය වෙත්' නුයි පරිස්සය නම් වෙත්.

මේ වදරනලද මැ යි බුදුන් විසින්:

"මහරජ, පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනා ධර්මයෝ තිදෙනෙක් අහිත පිණිස දුක් පිණිස අසුඛවිහරණය පිණිස උපදිති. කවර තිදෙනෙකු යත්: මහරජ, ලොභධර්මය පුරුෂයා ගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදියි. මහරජ, ද්වෙෂධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදියි. මහරජ, මොහධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදියි. මහරජ, මේ ධර්මයෝ තිදෙන පුරුෂයා ගේ අධ්‍යාත්මයෙහි උපදනාහු අහිත පිණිස දුක් පිණිස අඵාසුවිහරණය පිණිස උපදිත්."

7. ලොභය ද ද්වෙෂය ද මොහය ද ස්වසන්තානයෙහි උපන්නාහු ස්වකීය ඵලය ත්වක්සාර හුණගසක් මෙන් පවසිත් ඇති පුරුෂයා නසත්'යි.

මෙසෙයිනුදු 'තත්‍රාසය' නුයි 'පරිස්සය' නම් වෙත්.

වදරන ලද මැ යි බුදුන් විසින්:

8. රාගය ද ද්වේෂය ද කුශලධර්මයෙහි උත්කණ්ඨාව ද පස්කමිහි ඇලීම හා ලොමහර්ෂය ද මේ ආත්මභාවය නිදන කොට ඇත්තාහු යැ, මෙ අත්බැවින් උපන්නාහු යැ, ලාමක වූ මනොවිතර්කයෝ මෙ අත්බැවින් ඉපැද, කුඩා දරුවන් දික් හුයකින් පය බැඳ හරන ලද කවුඩකු සෙයින් සිත (බැඳ හවයෙහි) හැර පියත්.

මෙසෙයිනුදු 'තත්‍රාසය' නුයි 'පරිස්සය නම් වෙත්.

පරිස්සයානං සහිතා යනු: උපද්‍රව ඉවසනුයේ අරියනුයේ මැඩගත්තේ හාත්පසින් මැඩගත්තේ බැහැර කෙළේ නුයි 'පරිස්සයානං සහිතා' යනුවේ.

**අඡම්භීති** සො පච්චෙකසම්බුද්ධො අභීරු අඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරතීති පරිස්සයානං සහිතා අඡම්භී එකො චරෙ ඛග්ගවිසාණකප්පො,

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"චාතුද්දිසො අප්පටිඝො ච හොති
සන්තුස්සමානො ඉතරීතරෙන,
පරිස්සයානං සහිතා අඡම්භී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

9.

දුස්සඞ්ගහා පබ්බජිතාපි එකෙ
අථො ගහට්ඨා ඝරමාවසන්තා,
අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**දුස්සඞ්ගහා පබ්බජිතාපි එකෙති** "පබ්බජිතාපි ඉධෙකච්චෙ නිස්සයෙපි දිය්‍යමානෙ උද්දෙසෙපි දිය්‍යමානෙ පරිපුච්ඡායපි දිය්‍යමානෙ චීවරෙපි දිය්‍යමානෙ පත්තෙපි දිය්‍යමානෙ ලොහථාලකෙපි දිය්‍යමානෙ ධම්මකරකෙපි"[1] දිය්‍යමානෙ පරිස්සාවනෙපි දිය්‍යමානෙ ථවිකෙපි දිය්‍යමානෙ උපාහනෙපි දිය්‍යමානෙ කායබන්ධනෙපි දිය්‍යමානෙ න සුස්සූසන්ති න සොතං ඔදහන්ති න අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති, අනස්සවා අවචනකරා පටිලොමවුත්තිනො අඤ්ඤෙනෙව මුඛං කරොන්තී'ති 'දුස්සඞ්ගහා පබ්බජිතාපි එකෙ.

**අථො ගහට්ඨා ඝරමාවසන්තාති** ගහට්ඨාපි ඉධෙකච්චෙ හත්ථිම්හිපි දිය්‍යමානෙ -පෙ- රථෙපි - ඛෙත්තෙපි - වත්ථුස්මිම්පි - හිරඤ්ඤෙපි - සුවණ්ණෙපි දිය්‍යමානෙ ගාමෙපි - නිගමෙපි - නගරෙපි - රට්ඨෙපි - ජනපදෙපි - දිය්‍යමානෙ න සුස්සූසන්ති[2] -පෙ-

**අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වාති.** අත්තානං ඨපෙත්වා සබ්බෙ ඉමස්මිං අත්ථෙ පරපුත්තා, තෙසු පරපුත්තෙසු අප්පොස්සුක්කො හුත්වා අව්‍යාවටො හුත්වා අනපෙක්ඛො හුත්වාති 'අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"දුස්සඞ්ගහා පබ්බජිතාපි එකෙ
අථො ගහට්ඨා ඝරමාවසන්තා
අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො 'ති.

---

1. ධම්මකරණෙපි- ම ඡ සං,
2. න සණ්ඨන්ති- ම ඡ සං,

අඡම්භී යනු: ඒ පසේ බුදුහු නො බියසුල්ලහ නො තැතිගනුවහ උත්‍රස්ත නො වනුවහ නො පලායන සුල්ලහ. ප්‍රහීණ වූ බිය හා බිය අරමුණු ඇති වැ පහ වූ ලොමුදහගැනුම් ඇති වැ වාස කෙරෙත් නුයි 'පරිස්සයානං සහිතා අඡම්භී එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේබුදුහු:

''චාතුද්දිසො අප්පටිඝො –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.

9

ඇතැම් පැවිද්දෝ ද යළි ගිහිගෙයි වසන ගෘහස්ථයෝ ද සඞ්ග්‍රහ කිරීමට දුෂ්කර වෙති. (එහෙයින්) පරපුත්‍රයන් කෙරෙහි අල්පොත්සුක වැ කගවෙහෙණ හහක් සෙයින් එකලා වැ සරනේ යි.

දුස්සඞ්ගහා පබ්බජිතා'පි එකෙ යනු: මෙලොවැ ඇතැම් පැවිද්දෝ ත් නිස දෙනු ලබන කල්හිදු උදෙස් දෙනුලබන කල්හිදු පරිපෘච්ඡා දෙනු ලබන කල්හිදු සිවුරු දෙනුලබන කල්හිදු පාත්‍ර දෙනු ලබන කල්හිදු ලොහො තලි දෙනු ලබන කල්හිදු ධඹරා දෙනුලබන කල්හිදු පෙරහන දෙනු ලබන කල්හිදු ථවිකා (පසුම්බි) දෙනුලබන කල්හිදු වහන් දෙනු ලබන කල්හිදු කාබහන් දෙනු ලබන කල්හිදු නො අසති, කන් යොමු නො කෙරෙති, දැනගනු පිණිස සිත නො පිහිටුවති අවවාද නො අසන්නාහු වචන නො කරන්නාහු විරුද්ධ වැ පවත්නාහු ඉවත බලත්නුයි 'දුස්සඞ්ගහා පබ්බජිතා'පි එකෙ' යනු වේ.

අථො ගහට්ඨා ඝරමාවසන්තා යනු: මෙලොවැ ඇතැම් ගෘහස්ථයෝ ද ඇතකුදු දෙනු ලබන කල්හි ...රියකුදු – කෙතකුදු– වත්නකුදු – අමුරනුදු– රත්රනුදු දෙනු ලබන කල්හි ගමකුදු– නියම්ගමකුදු– නුවරකුදු– රටකුදු– දනව්වකුදු දෙනු ලබන කල්හි නො අසති ...

අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වා යනු: තමා හැර හැම දෙන මෙ අරුත්හි පරපුත්‍ර නම් වෙති. ඒ පරපුත්‍රයන් කෙරෙහි අල්පොත්සුක වැ ව්‍යාපෘත නො වැ අපෙක්ෂා රහිත වත්නුයි 'අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

''දුස්සඞ්ගහා පබ්බජිතා පි –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.

10.

වොරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානි
සංසීනපත්තො[1] යථා කොවිළාරො,
ඡෙත්වාන වීරො[2] ගිහිබන්ධනානි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**වොරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානීති** 'ගිහිබ්‍යඤ්ජනං' වුච්චන්ති කෙසා ච මස්සු ච මාලා ච ගන්ධං ච විලෙපනං ච ආභරණං ච පිළන්ධනං ච වත්ථං ච පාරුපනං ච වෙඨනං ච උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාගන්ධවිලෙපනං මුඛචුණ්ණකං මුඛලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩං නාලිකං ඛග්ගං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි, ඉති වා, **වොරොපයිත්වා ගිහි බ්‍යඤ්ජනානීති** ගිහිබ්‍යඤ්ජනානි ඔරොපයිත්වා සමොරොපයිත්වා නික්ඛිපිත්වා පටිප්පස්සම්භයිත්වාති, වොරොපයිත්වා ගිහි බ්‍යඤ්ජනානි'.

**සංසීනපත්තො යථා කොවිළාරොති** යථා කොවිළාරස්ස පත්තානි තානි සංසීනානි[3] පතිතානි පරිපතිතානි, එවමෙව තස්ස පච්චෙක සම්බුද්ධස්ස ගිහිබ්‍යඤ්ජනානි සීනානි සංසීනානි පතිතානීති සංසීන පත්තො යථා කොවිළාරො.

**ඡෙත්වාන වීරො ගිහිබන්ධනානීති** වීරො'ති විරියවාති වීරො, පහූති වීරො, විසවීති වීරො, අලමත්තොති වීරො, සූරොති වීරො, වික්කන්තො අභීරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවොති වීරො, විගතලොමහංසොති වීරො;

1. "විරතො ඉධ සබ්බපාපකෙහි නිරයදුක්ඛමතිච්ච විරියවා සො,
සො විරියවා පධානවා වීරො තාදී, පවුච්චතෙ තථත්තා" ති.

ගිහිබන්ධනානි[4] වුච්චන්ති පුත්තා ච දාරා ච[5] දාසී ච දාසා ච අජෙළකා ච කුක්කුටසූකරා ච හත්ථිගවාස්සවළවා ච ඛෙත්තං ච වත්ථුං ච හිරඤ්ඤං ච සුවණ්ණං ච ගාමනිගමරාජධානියො ච රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරං ච යං කිඤ්චි රජනීයවත්ථු, **ඡෙත්වාන වීරො ගිහිබන්ධනානීති** සො පච්චෙකසම්බුද්ධො වීරො[6] ගිහිබන්ධනානි ඡින්දිත්වා සඤ්ඡින්දිත්වා ජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'ඡෙත්වාන වීරො ගිහි බන්ධනානි එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"වොරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානි
සංසීනපත්තො යථා කොවිළාරො,
ඡෙත්වාන වීරො ගිහිබන්ධනානි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

පඨමො වග්ගො.

---

1. සංඡින්නපත්තො– ම ජ සං, ස්‍යා,
2. ධීරො – ව,–වි
3. ඡින්නානි සංඡින්නානි – ම ජ සං, ස්‍යා
4. ගිහිබන්ධනානිවුච්චන්ති– ප,ව,වි
5. භරියා ච– ම ජ සං,
6. ධීරො– ව–වි

10.

ගිලිහුණු පත්‍ර ඇති කොබළලරුකක් සෙයින් (කෙහෙ රවුළු ආ) ගිහිව්‍යඤ්ජනයන් බැහැර කොට මාර්ගවීර්‍ය්‍යී ඇත්තේ ගිහි (කාම) බන්ධනයන් (මාර්ගඥානයෙන්) සිඳපියා කගවෙහෙණ හඟක් සෙයින් එකලා වැ සරන්නේ යි.

**වොරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානි–** 'ගිහිබ්‍යඤ්ජන' යි කෙස් ද රවුළු ද මල් ද ගඳ ද විලෙවුන් ද අබරණ ද පළඳනා ද වස්ත්‍ර ද පොරෝනා ද හිස් වෙළුම ද සුවඳසුණු ගැල්වීම (තෙල්ගල්වා) පිරිමැදීම සුවඳපැනින් නැහැවීම (මල්ලයන්ගේ අත්පා සෙයින් මුගුරින් මැඩ කරන) සම්බාහනය කැටපත් අඳුන් මල්ගඳවිලෙවුන් මුවසුණු මුඛලෙපන හස්තබන්ධ ශිඛාබන්ධ සෝලුලීය (ලීලාදණ්ඩ) චිත්‍රනාළිකා විසිතුරු කොපු ඇති කඩු විචිත්‍ර ඡත්‍ර විසිතුරු වහන් නළල්පට මිණි වල්විදුනා දික්දහවලු ඇති සුදුවත් යන මොහු හෝ කියනු ලැබෙති. **වොරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානි** යනු: ගිහිව්‍යඤ්ජනයන් බැහැර කොට මැනැවින් බැහැර කොට බහා තබා පටිප්පස්සම්භනය කොට නුයි 'වොරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානි' යනු වේ.

**සංසීනපත්තො යථා කොවිළාරො–** යම්සේ කොබළලරුකක්හු ගේ පත්‍රයෝ ගිලිහුණාහු ද මොනොවට ගිලිහුණාහු ද වැටුණාහු ද වෙසෙසින් වැටුණාහු ද එසෙයින් මැ ඒ පසේබුදුන් ගේ ගිහිව්‍යඤ්ජනයෝ ගිලිහුණාහු මොනොවට ගිලිහුණාහු වැටුණාහු වෙසෙසින් වැටුණාහු වෙත් නුයි 'සංසීනපත්තො යථා කොවිළාරො' යනු වේ.

**ඡෙත්වාන වීරො ගිහිබන්ධනානි–** 'වීරො' යනු: වීර්‍ය්‍යීවත් නුයි වීර යැ ප්‍රභූ නුයි වීරයැ, වශයෙහි පවත්නේ නුයි වීරයැ, සමර්ථයිත් ඇත්තේ නුයි වීර යැ, ශූර නුයි වීර යැ, වික්‍රම ඇත්තේ යැ බිය නැත්තේ යැ තො තැති ගත්තේයැ, උත්‍රාස නැත්තේයැ තො පලායන්නේ යැ ප්‍රහීණ කළ බිය හා බියඅරමුණු ඇත්තේ නුයි වීරයැ, පහ වූ ලොමුදහගැනුම් ඇත්තේ නුයි වීර යැ.

1. "මෙලොවැ සියලු පාපයන් ගෙන් වෙන් වූ වීර්‍ය්‍යීයට නිවාස වූ ඒ ක්ෂීණාස්‍රව තෙම නිරයදුක් ඉක්මැ සිටියේ වෙයි. වීර්‍ය්‍යීය ඇති ප්‍රධන්වීර්‍ය්‍යී ඇති ඒ වීර තෙම තථ බැවින් 'තාදී' යයි කියනු ලැබේ" යයි.

'ගිහිබන්ධන'යි අඹුදරුවෝ ද දාසිදස්හු ද එළුබැටළුවෝ ද කුකුළුවෝ ද හූරෝ ද ඇත්– ගව– අස්– වෙළඹහු ද කෙත්වතු ද අමුරන් ද රත්රන් ද ගම්නියම්ගම් රජදහන් ද රටදනාවු ද කොටු ද කොටු ගුළු ද යම්කිසි සිත් අළවන වස්තු කෙනෙක් වෙත් නම් ඔහු කියනු ලැබෙත්. 'ඡෙත්වාන වීරො ගිහිබන්ධනානි' යනු: ඒ පසේබුත් වීරයෝ ගිහිබන්ධනයන් සිඳපියා මොනවට සිඳපියා හැරපියා දුරු කොට විගතාන්ත කොට අනාභාවයට පමුණුවා නුයි 'ඡෙත්වාන වීරො ගිහිබන්ධනානි එකො චරෙ ඛග්ගවිසාණ කප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

"වොරොපයිත්වා –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.

ප්‍රථමවර්ගය යි.

1.

සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

**සචෙ ලභෙථ නිපකං සහායන්ති:** සචෙ නිපකං පණ්ඩිතං පඤ්ඤවන්තං[1]. බුද්ධිමන්තං ඤාණිං විභාවිං මෙධාවිං සහායං ලභෙය්‍ය, පටිලභෙය්‍ය අධිගච්ඡෙය්‍ය වින්දෙය්‍යාති 'සචෙ ලභෙථ නිපකං සහායං'.

**සද්ධිං චරං සාධුවිහාරි ධීරන්ති:** 'සද්ධිං චර'න්ති එකතො චරං, සාධුවිහාරින්ති පඨමෙනපි ඣානෙන සාධුවිහාරිං දුතියෙනපි ඣානෙන- තතියෙනපි ඣානෙන- චතුත්ථෙනපි ඣානෙන සාධුවිහාරිං මෙත්තායපි චෙතොවිමුත්තියා සාධුවිහාරිං කරුණායපි- මුදිතායපි- උපෙක්ඛායපි චෙතොවිමුත්තියා සාධුවිහාරිං, ආකාසානඤ්චායතනසමාපත්තියාපි සාධුවිහාරිං විඤ්ඤාණඤ්චායතන -පෙ- ආකිඤ්චඤ්ඤායතන -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියාපි සාධුවිහාරිං නිරොධසමාපත්තියාපි සාධුවිහාරිං ඵලසමාපත්තියාපි සාධු විහාරිං. ධීරන්ති: පණ්ඩිතං පඤ්ඤවන්තං[1] බුද්ධිමන්තං ඤාණිං විභාවිං මෙධාවින්ති 'සද්ධිං චරං සාධු විහාරි ධීරං'.

**අභිභුය්‍ය සබ්බානි පරිස්සයානීති:** 'පරිස්සයා'ති ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච -පෙ- ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා -පෙ- ඉමෙ වුච්චන්ති පටිච්ඡන්න පරිස්සයා -පෙ- එවම්පි තත්‍රාසයාති පරිස්සයා -පෙ- අභිභුය්‍ය සබ්බානි පරිස්සයානීති: සබ්බෙ පරිස්සයෙ අභිභුය්‍ය අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දිත්වාති 'අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි'.

**චරෙය්‍ය තෙනත්තමනො සතීමාති** සො පච්චෙකසම්බුද්ධො තෙන නෙපක්කෙන පණ්ඩිතෙන පඤ්ඤවන්තෙන බුද්ධිමන්තෙන ඤාණිනා විභාවිනා මෙධාවිනා සහායෙන සද්ධිං අත්තමනො තුට්ඨමනො හට්ඨමනො පහට්ඨමනො උදග්ගමනො මුදිතමනො චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති 'චරෙය්‍ය තෙනත්තමනො' සතීමාති: සො පච්චෙකසම්බුද්ධො සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතාති 'චරෙය්‍ය තෙනත්තමනො සතීමා'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙනත්තමනො සතීමා"ති"

1. පඤ්ඤාවන්තං-ට-චි

1.

ඉදින් නිපුණ වූ සාධු (අර්පණා-උපචාර) විහරණ ඇති ප්‍රාඥ වූ සමග හැසිරෙන සහායකයකු ලබන්නේ නම් හැම උවදුරු මැඩලා එයින් තුටු වැ සිහි ඇතිව හැසිරෙන් නේ යි.

**සචෙ ලභෙථ නිපකං සහායං** යනු: ඉදින් පියවින් නිපුණ වූ පණ්ඩිත වූ ප්‍රඥා ඇති බුද්ධි ඇති නුවණ ඇති විමසන නුවණ ඇති තුලිතඥාන ඇති සහායකයකු ලැබේ නම් ප්‍රතිලාභ කෙරේ නම් අධිගම කෙරේ නම් විඳී නම් නුයි 'සචෙ ලභෙථ නිපකං සහායං' යනු වේ.

**සද්ධිං චරං සාධුවිහාරි ධීරං**– 'සද්ධිං චරං' යනු: එක් වැ හැසිරෙන. සාධුවිහාරිං යනු: ප්‍රථමධ්‍යානයෙනුදු සාධුවිහාර ඇති ද්විතීය ධ්‍යානයෙනුදු– තෘතීය ධ්‍යානයෙනුදු– චතුර්ත්ථධ්‍යානයෙනුදු සාධුවිහාර ඇති මෛත්‍රීචිත්ත විමුක්තියෙනුදු සාධු විහාර ඇති කරුණායෙනුදු– මෘදුතායෙනුදු– උපෙක්ෂා චිත්තවිමුක්තියෙනුදු සාධුවිහාර ඇති, ආකාසානඤ්චායතන සමාපත්ති-යෙනුදු සාධුවිහාර ඇති විඤ්ඤාණඤ්චායතන –පෙ– ආකිඤ්චඤ්ඤායතන– පෙ– නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙනුදු සාධුවිහාර ඇති නිරොධසමාපත්තියෙනුදු සාධුවිහාර ඇති ඵලසමාපත්තියෙනුදු සාධුවිහාර ඇති. ධීරං යනු: පණ්ඩිත වූ ප්‍රඥා ඇති බුද්ධි ඇති නුවණැති විමසන නුවණ ඇති තුලිතඥාන ඇති නුයි 'සද්ධිං චරං සාධුවිහාරි ධීරං' යනු වේ.

**අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි**– 'පරිස්සය' යනු: ප්‍රකට උපද්‍රව යැ ප්‍රතිච්ඡන්න උපද්‍රව යැ යි උපද්‍රව දෙකෙකි....මොහු ප්‍රකට උපද්‍රව යෙෝයි කියනු ලැබෙති... මොහු ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ යි කියනු ලැබෙත්... මෙසේත් කත්‍රාසය නුයි පරිස්සය නම් වෙත්...අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි යනු: හැම උවදුරු මැඩගෙන අභිභවන කොට යට කොට හාත්පසින් මැඩ-ගෙන මර්දනය කොට නුයි 'අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි' යනු වේ.

**චරෙය්‍ය තෙනත්තමනො සතිමා** යනු: ඒ පසේබුදුහු ඒ පියවින් නිපුණ වූ පණ්ඩිත වූ ප්‍රඥා ඇති බුද්ධිමත් වූ නුවණැති විමසන නුවණැති තුලිතඥාන ඇති සහායයකු සමග සියමන් ඇති වැ තුටුසිත් ඇති වැ හටුසිත් ඇති වැ පහටුසිත් ඇති වැ උදග්‍රසිත් ඇති වැ මුදිතසිත් ඇති වැ හැසිරෙන්නේ යැ වාසය කරන්නේ යැ ඉරියවු පවත්වන්නේ යැ වැටෙන්නේ යැ ඉරියවු රක්නේ යැ යැපෙන්නේ යැ යාපනය කරන්නේ නුයි 'චරෙය්‍ය තෙනත්ත-මනො' යනු වේ. සතිමා යනු: ඒ පසේබුදුහු ස්මෘතිමත් වෙති පරම වූ ස්මෘති නිපකභාවයෙන් සමන්වාගත වූවාහු චිරකෘත (කළ බොහෝ කල් ඉක්මුණු දෑය) ද චිරභාෂිත ද සිහි කරන්නාහු පුනපුනා සිහි කරන්නාහු වෙත් නුයි 'චරෙය්‍ය තෙනත්තමනො සතිමා' යනු වේ.

එයින් වදළහ එ පසේබුදුහු:

**"සචෙ ලභෙථ නිපකං සහායං –පෙ– චරෙය්‍ය තෙනත්තමනො සතිමා"යි.**

2.

නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය
එකො චරෙ ඛග්ගවිසාණකප්පො,

**නො චෙ ලභෙථ නිපකං සහායන්ති** නො චෙ නිපකං පණ්ඩිතං පඤ්ඤවන්තං බුද්ධිමන්තං ඤාණිං විභාවිං මෙධාවිං සහායං ලභෙය්‍ය පටිලභෙය්‍ය අධිගච්ඡෙය්‍ය වින්දෙය්‍යාති 'නො චෙ ලභෙථ නිපකං සහායං'.

**සද්ධිංචරං සාධුවිහාරි ධීරන්ති** 'සද්ධිං චර'න්ති එකතො චරං. **සාධු විහාරින්ති** පඨමෙනපි ඣානෙන සාධුවිහාරිං -පෙ- නිරොධ-සමාපත්තියාපි සාධුවිහාරිං, ඵලසමාපත්තියාපි සාධුවිහාරිං. ධීරන්ති ධීරං පණ්ඩිතං පඤ්ඤවන්තං බුද්ධිමන්තං ඤාණිං විභාවිං මෙධාවින්ති 'සද්ධිං චරං සාධුවිහාරි ධීරං'.

**රාජාව රට්ඨං විජිතං පහායාති:** යථා රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො විජිතසඞ්ගාමො නිහතපච්චාමිත්තො ලද්ධාධිප්පායො පරිපුණ්ණකොස-කොට්ඨාගාරො රට්ඨං ච ජනපදං ච කොසං ච කොට්ඨාගාරං ච පහූතහිරඤ්ඤසුවණ්ණං නගරං ච පරිච්චජිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙති, එවං පච්චෙකසම්බුද්ධොපි සබ්බං ඝරාවාසපළිබොධං ඡින්දිත්වා පුත්තදාරපළිබොධං ඡින්දිත්වා ඤාතිපළිබොධං ඡින්දිත්වා මිත්තාම-ච්චපළිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තෙති[1] පාලෙති යපෙති යාපෙතීති 'රාජාව රට්ඨං විජිතං පහාය එකො චරෙඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

---

1. වත්තති- ප-ච-ඵ-වි

2.

ඉදින් පියවින් නිපුණ වූ සාධුවිහාර ඇති ප්‍රාඥ වූ සමග හැසිරෙන සහායකයකු නො ලැබේ නම් දිනූ රට හැරපියා එකලාව යන රජක්හු සෙයින් බාලයා හැරපියා කගවෙහෙණහක් සෙයින් එකලා වැ සරනේ යි.

නො ච ලභෙථ නිපකං සහායං යනු: ඉදින් පියවින් නිපුණ වූ පණ්ඩිත වූ ප්‍රඥා ඇති බුද්ධිමත් නුවණැති විමසුම් නුවණ ඇති තුලිතඥාන ඇති සහායකයකු නො ලැබේ නම් ප්‍රතිලාභ නො කෙරේ නම් අධිගම නො කෙරේ නම් නො විදී නම් නුයි 'නො ච ලභෙථ නිපකං සහායං' යනු වේ.

සද්ධිං චරං සාධුවිහාරි ධීරං— 'සද්ධිං චරං' යනු: එක් වැ හැසිරෙන සාධුවිහාරිං යනු: ප්‍රථමධ්‍යානයෙහුදු සාධුවිහාර ඇති ...නිරොධසමාපත්තියෙහුදු සාධුවිහාර ඇති, එලසමාපත්තියෙහුදු සාධුවිහාර ඇති. ධීරං යනු: ප්‍රාඥ වූ පණ්ඩිත වූ ප්‍රඥා ඇති බුද්ධිමත් නුවණැති විමසනනුවණ ඇති තුලිතඥාන ඇති නුයි 'සද්ධිං චරං සාධුවිහාරි ධීරං' යනු වේ.

රාජාව රට්ඨං විජිතං පහාය යනු: යම්සේ මුදුනෙහි බිසෙව්ලත් දිනන ලද සඞ්ග්‍රාම ඇති නසනලද පසමිතුරන් ඇති මුදුන්පත් අදහස් ඇති පිරිපුන් කොටු කොටුගුළු ඇති ක්ෂත්‍රිය රජ කෙනෙක් රට ද දනවු ද කොටුදු බොහෝ වූ කළ නොකළ රන් ඇති කොටුගුළුදු නුවර ද හැරපියා කෙහෙරවුළු බහාලා කහවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්ම අනගාරිය පැවිද්දට පැමිණ පළිබොධ රහිත (කිසිත් නැති) බවට පැමිණ එකලා වැ හැසිරෙත් ද වෙසෙත් ද ඉරියවු පවත්වත් ද පවතිත් ද රැකෙත් ද යැපෙත් ද යාපනය කෙරෙත් ද එසෙයින් පසේ බුදුහු ද හැම ගිහිගෙ පළිබොධය සිඳපියා අඹුදරු පළිබොධය සිඳපියා ඥාති පළිබොධය සිඳපියා සගයහළු පළිබොධය සිඳපියා කෙහෙරවුළු බහාලා කහවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම අනගාරියශාසනයට පැමිණ අකිඤ්චනභාවයට පැමිණ එකලා වැ හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති පවතිති රැකෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'රාජා' ච රට්ඨං විජිතං පහාය එකො චරෙ ඛග්ග විසාණකප්පො' යනු වේ.

එයින් වදාළහ එ පසේබුදුහු:

''නො ච ලභෙථ -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.

3.

අද්ධා පසංසාම සහායසම්පදං
සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා
එතෙ අලද්ධා අනවජ්ජභොජී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

අද්ධා පසංසාම සහාය සම්පදන්ති 'අද්ධා'ති එකංසවචනං නිස්සංසයවචනං නික්කඞ්ඛවචනං අද්වෙජ්ඣවචනං අද්වෙළ්හකවචනං නියොගවචනං අපණ්ණකවචනං අවිරුද්ධවචනං අවත්ථාපනවචනමෙතං අද්ධාති. සහාය සම්පදන්ති සහායසම්පද වුච්චති යො සො සහායො අසෙක්ඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙක්ඛෙන සමාධික්ඛන්ධෙන[1] අසෙක්ඛෙන පඤ්ඤාක්ඛන්ධෙන- අසෙක්ඛෙන විමුත්තික්ඛන්ධෙන- අසෙක්ඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. අද්ධා පසංසාම සහායසම්පදන්ති සහායසම්පදං පසංසාම ථොමෙම කිත්තෙම වණ්ණෙමාති 'අද්ධා පසංසාම සහායසම්පදං'.

සෙට්ඨා සමා සෙවිතබ්බා සහායාති: සෙට්ඨා හොන්ති සහායා සීලෙන සමාධිනා පඤ්ඤාය විමුත්තියා විමුත්තිඤාණදස්සනෙන, සමා සදිසා හොන්ති සහායා සීලෙන සමාධිනා පඤ්ඤාය විමුත්තියා විමුත්තිඤාණදස්සනෙන සෙට්ඨා වා සහායා සදිසා වා සහායා සෙවිතබ්බා භජිතබ්බා පයිරුපාසිතබ්බා පරිපුච්ඡිතබ්බා පරිපඤ්හිතබ්බාති 'සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා'.

එතෙ අලද්ධා අනවජ්ජභොජීති: අත්ථි පුග්ගලො සාවජ්ජභොජී, අත්ථි පුග්ගලො අනවජ්ජභොජී.

කතමො ච පුග්ගලො සාවජ්ජභොජී: ඉධෙකච්චො පුග්ගලො කුහනාය ලපනාය නෙමිත්තිකතාය නිප්පෙසිකතාය ලාභෙන ලාභං නිජිගිංසනතාය[2] දාරුදානෙන වෙළුදානෙන පත්තදානෙන පුප්ඵදානෙන ඵලදානෙන සිනානදානෙන චුණ්ණදානෙන මත්තිකාදානෙන දන්තකට්ඨදානෙන මුඛොදකදානෙන චාටුකම්‍යතාය[3] මුග්ගසූප්‍යතාය[4] පාරිභට්‍යතාය[5] පිට්ඨිමංසිකතාය[6] වත්ථුවිජ්ජාය තිරච්ඡානවිජ්ජාය අඞ්ගවිජ්ජාය නක්ඛත්තවිජ්ජාය දූතගමනෙන[7] පහිනගමනෙන ජඞ්ඝපෙසනියෙන වෙජ්ජකම්මෙන පිණ්ඩපටිපිණ්ඩකෙන දානානුප්පදානෙන අධම්මෙන විසමෙන, ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා ජීවිකං කප්පෙති. අයං වුච්චති පුග්ගලො සාවජ්ජභොජී.

1. සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති - මප
2. නිජිගීසනතාය - ම ඡ සං
3. පාතුකම්‍යතාය, ස්‍යා
4. මුග්ගසූපතාය - ස්‍යා
5. පාරිභට්‍යතාය - ම ඡ සං
6. පිට්ඨමද්දිකතාය - ම ඡ සං
7. නාවකම්මිකතා - ම ඡ සං
දූතකම්මිකතා - ස්‍යා ම පොත්ථකෙසු අධිකං

3.

එකත්තෙන් සහායසම්පත් පසසම්හ. ශ්‍රේෂ්ඨ වූ සම වූ සහායයෝ සෙවියයුත්තාහ. නිරවද්‍ය භොජන (ආජීව) ඇත්තේ කුලුන් නො ලැබ කඟවෙහෙණ හඟක් සෙයින් එකලා ව සරන්නේ යි.

අද්ධා පසංසාම සහාය සම්පදං– 'අද්ධා' යනු: ඒකාන්තවචන යැ නිසැක වචන යැ නිශ්ශඞ්කාවචනයැ අද්වෙධවචන යැ නො දෙගිත් වචන යැ නියොගවචන යැ නො බොල් වචන යැ අවිරුද්ධවචන යැ තෙල 'අද්ධා' යනු සනිටුහන් වචන යි. සහාය සම්පදං යනු: යම් සහායයෙක් අශෛක්ෂ වූ ශීලස්කන්ධයෙන් සමන්වාගත වේ ද අශෛක්ෂ වූ සමාධිස්කන්ධයෙන්- අශෛක්ෂ වූ ප්‍රඥාස්කන්ධයෙන්– අශෛක්ෂ වූ විමුක්තිස්කන්ධයෙන්– අශෛක්ෂ වූ විමුක්තිඥානදර්ශන ස්කන්ධයෙන් සමන්වාගත වේ ද, හේ සහායසම්පත් යි කියනු ලැබේ. අද්ධා පසංසාම සහාය සම්පදං යනු: සහායසම්පත් පසසම්හ තෙමම්හ කීර්තනය කරම්හ ගුණකියම්හ නුයි 'අද්ධා පසංසාම සහායසම්පදං' යනු වේ.

සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා යනු: සහායයෝ ශීලයෙන් සමාධියෙන් ප්‍රඥායෙන් විමුක්තියෙන් විමුක්තිඥානදර්ශනයෙන් ශ්‍රේෂ්ඨ වෙති සහායයෝ ශීලයෙන් සමාධියෙන් ප්‍රඥායෙන් විමුක්තියෙන් විමුක්තිඥාන දර්ශනයෙන් සමසදෘශ වෙති. ශ්‍රේෂ්ඨසහායයෝ හෝ සදෘශසහායයෝ හෝ සේවනය කළයුත්තාහ භජනය කළයුත්තාහ පර්යුපාසන කළ යුත්තාහ පිළිවියිය යුත්තාහ පරිප්‍රශ්න කළ යුත්තාහු නුයි 'සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා' යනු වේ.

එතෙ අලද්ධා අනවජ්ජභොජී යනු: 'සාවජ්ජභොජී'' පුද්ගලයෙක් ඇත, 'අනවජ්ජභොජී' පුද්ගලයෙක් ඇති.

සාවජ්ජභොජී පුද්ගල කවරැ යත්: මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් විස්මය කරවීමෙන් උසස් කොට බිණීමෙන් නිමිති කරන බැවින් මෙරමා ගුණ නසන බැවින් ලාභයෙන් ලාභය සොයන බැවින් දුව දීමෙන් හුණදඬු දීමෙන් (තල් ආදී) පත්‍ර දීමෙන් පුෂ්පදානයෙන් ඵලදානයෙන් නහනු දීමෙන් සුණු දීමෙන් මැටි දීමෙන් දැහැටිදඬු දීමෙන් මුවදෝනා දිය දීමෙන් චාටුබස් කියන බැවින් මුද්ගසූපයක් වැනි වීමෙන් (දරුවන් වැඩීමාදී) පරිභටභාවයෙන් මෙරමා පිටුමස් කන බැවින් වාස්තුවිද්‍යායෙන් තිරශ්චීන විද්‍යාවෙන් අඞ්ගවිද්‍යාවෙන් නක්ෂත්‍රවිද්‍යාවෙන් දූතමෙහෙවරින් හසුන් ගෙනයෑමෙන් පා මෙහෙවරින් වෙදකමින් පිණ්ඩප්‍රතිපිණ්ඩකයෙන් දානානුප්‍රදානයෙන් නො දැහැමින් නො සෙමෙන් ලැබ ලබා, පැමිණ, විඳ, ප්‍රතිලාභ කොට දිවි රකී. මෙ 'සාවජ්ජභොජී පුද්ගල' යි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො අනවජ්ජභොජී: ඉධෙකච්චො පුග්ගලො න කුහනාය න ලපනාය න නෙමිත්තිකතාය න නිප්පෙසිකතාය න ලාභෙන ලාභං නිජිගිංසනතාය න දාරුදානෙන න වෙළුදානෙන න පත්තදානෙන න පුප්ඵදානෙන න ඵලදානෙන න සිනානදානෙන න චුණ්ණදානෙන න මත්තිකාදානෙන න දන්තකට්ඨදානෙන න මුඛොදකදානෙන න චාටුකම්‍යතාය න මුග්ගසූප්‍යතාය න පාරිභට්‍යතාය න පිට්ඨිමංසිකතාය න වත්ථුවිජ්ජාය න තිරච්ඡානවිජ්ජාය න අඞ්ගවිජ්ජාය න නක්ඛත්තවිජ්ජාය න දූතගමනෙන න පහිනගමනෙන න ජඞ්ඝපෙසනියෙන න වෙජ්ජකම්මෙන න පිණ්ඩපටිපිණ්ඩකෙන න දානානුප්පදානෙන ධම්මෙන සමෙන ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා ජීවිකං කප්පෙති. අයං වුච්චති පුග්ගලො අනවජ්ජභොජී.

**එතෙ අලද්ධා අනවජ්ජභොජීති** එතෙ අනවජ්ජභොජී අලද්ධා අලභිත්වා අනධිගන්ත්වා අවින්දිත්වා අප්පටිලභිත්වාති 'එතෙ අලද්ධා අනවජ්ජභොජී එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"අද්ධා පසංසාම සහායසම්පදං
සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා,
එතෙ අලද්ධා අනවජ්ජභොජී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

4.

දිස්වා සුවණ්ණස්ස පභස්සරානි
කම්මාරපුත්තෙන සුනිට්ඨිතානි,
සංඝට්ටයන්තානි දුවෙ භුජස්මිං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**දිස්වා සුවණ්ණස්ස පභස්සරානීති** 'දිස්වා'ති දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා. **සුවණ්ණස්සාති**: ජාතරූපස්ස, **පභස්සරානීති**: පරිසුද්ධානි පරියොදාතානීති 'දිස්වා සුවණ්ණස්ස පභස්සරානි'.

**කම්මාරපුත්තෙන සුනිට්ඨිතානීති**: 'කම්මාරපුත්තො' වුච්චති සුවණ්ණකාරො, කම්මාරපුත්තෙන සුනිට්ඨිතානීති: කම්මාරපුත්තෙන සුනිට්ඨිතානි සුකතානි සුපරිකම්මකතානීති 'කම්මාරපුත්තෙන සුනිට්ඨිතානි'.

---

1. සමෙනති—ස්‍යා

"අනවජ්ජභොජී" පුද්ගල කවරේ යත්: මෙ සස්නෙහි ඇතැම් පුද්ගලයෙක් විස්මය කරවීමෙන් නො වැ උසස් කොට බිණීමෙන් නො වැ නිමිති කරන බැවින් නො වැ මෙරමා ගුණ නසන බැවින් නො වැ ලාභයෙන් ලාභය සොයන බැවින් නො වැ දුව දීමෙන් නො වැ හුණදඬු දීමෙන් නො වැ පත්‍රදානයෙන් නො වැ පුෂ්පදානයෙන් නො වැ ඵලදානයෙන් නො වැ නහනු දීමෙන් නො වැ සුණු දීමෙන් නො වැ මැටි දීමෙන් නො වැ දැහැටිදඬු දීමෙන් නො වැ මුවදෙනා දිය දීමෙන් නො වැ චාටුබස් කියන බැවින් නො වැ මුද්ගසූපයක් වැනි වීමෙන් නො වැ පරිභට භාවයෙන් නො වැ මෙරමා පිටුමස් කන බැවින් නො වැ වාස්තුවිද්‍යාවෙන් නො වැ තිරශ්චීන විද්‍යාවෙන් නො වැ අඞ්ගවිද්‍යාවෙන් නො වැ නක්ෂත්‍රවිද්‍යාවෙන් නො වැ දූතමෙහෙවරින් නො වැ හසුන් ගෙන යෑමෙන් නො වැ පාමෙහෙවරින් නො වැ වෙදකමින් නො වැ පිණ්ඩප්‍රතිපිණ්ඩකයෙන් නො වැ දානානුප්‍රදන යෙන් නොවැ දැහැමින් සෙමෙන් ලැබ ලබා, පැමිණ, විඳ, ප්‍රතිලාභ කොට දිවිරකී. මෙ 'අනවජ්ජභොජී පුද්ගල' යි කියනු ලැබේ. එතෙ අලද්ධා අනවජජභොජී යනු: තෙල අනවජ්ජභොජී පුද්ගලයන් නො ලැබ නො ලබා නො පැමිණ නො විඳ ප්‍රතිලාභ නො කොට නුයි 'එතෙ අලද්ධා අනවජ්ජභොජී එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේබුදුහු:

"අද්ධා පසංසාම –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකපෙපා යි.

4.

කරහල් දුතක්හු විසින් මැනැවින් නිමවන ලද දිළියෙනසුලු රන්වලය දෙක අත්හි ගැටෙනු දැක කගවෙහෙණ හඟක් සෙයින් එකලා වැ සරනෙමි.

දිසවා සුවණණසස පහසසරානි– 'දිස්වා' යනු: දැක බලා තුලනාය කොට තීරණය කොට විමසා ප්‍රකට කොට. සුවණණසස යනු: රත්රනැ. පභස්සරානි යනු: පරිශුද්ධ වූ පර්‍ය්‍යවදාත වූ නුයි 'දිස්වා සුවණ්ණස්ස පභස්ස-රානි' යනු වේ.

කම්මාරපුතෙතන සුනිටඨිතානි– 'කම්මාරපුත්ත' යි රන්කරු කියනු ලැබෙයි. කම්මාරපුතෙතන සුනිටඨිතානි යනු: රන්කරු විසින් මොනො වට නිමවන ලද මැනැවින් කළ මොනොවට පිරියම් කරන ලද නුයි 'කම්මාරපුත්තෙන සුනිට්ඨිතානි' යනු වේ.

සංඝට්ටයන්තානි ද්වෙ "භුජස්මින්ති භුජො වුච්චති හත්ථො යථා එකස්මිං හත්ථෙ ද්වෙ නූපුරානි ඝට්ටෙන්ති, එවමෙව සත්තා තණ්හාවසෙන දිට්ඨිවසෙන නිරයෙ ඝට්ටෙන්ති තිරච්ඡානයොනියං ඝට්ටෙන්ති පෙත්තිවිසයෙ ඝට්ටෙන්ති මනුස්සලොකෙ ඝට්ටෙන්ති, දෙවලොකෙ ඝට්ටෙන්ති, ගතියාගතිං උපපත්තියා උපපත්තිං පටිසන්ධියා පටිසන්ධිං භවෙන භවං සංසාරෙන සංසාරං වට්ටෙන වට්ටං ඝට්ටෙන්ති සංඝට්ටෙන්ති සංඝට්ටෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්තීති 'සංඝට්ටයන්තානි ද්වෙ භුජස්මිං එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"දිස්වා සුවණ්ණස්ස පභස්සරානි
කම්මාරපුත්තෙන සුනිට්ඨිතානි,
සංඝට්ටයන්තානි ද්වෙ භුජස්මිං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

5.

එවං දුතියෙන සහා මමස්ස[1]
වාචාභිලාපො අභිසජ්ජනා වා,
එතං භයං ආයතිං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

එවං දුතියෙන සහා මමස්සාති තණ්හාදුතියො වා හොති, පුග්ගලදුතියො වා. කථං තණ්හාදුතියො හොති'. 'තණ්හා'ති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා යස්සෙසා තණ්හා අප්පහීනා සො වුච්චති තණ්හාදුතියො

"තණ්හාදුතියො පුරිසො දීඝමද්ධානං සංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තතී"ති.*

එවං තණ්හාදුතියො වා හොති.

කථං පුග්ගලදුතියො හොති: ඉධෙකච්චො න අහෙතු න කාරණහෙතු උද්ධතො අවූපසන්තචිත්තො එකස්ස වා දුතියො හොති, ද්වින්නං වා තතියො හොති, තිණ්ණං වා චතුත්ථො හොති, තත්ථ බහුං සම්ඵප්පලාපං පලපති සෙය්‍යථීදං: රාජකථං, චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං යානකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං

1. සහ මම ස්‍යා–ම ජ සං
2. අත්ත හෙතු–ස්‍යා

* චතුක්කඞ්ගුත්තර – භණ්ඩගාමවග්ග
සුත්තනිපාත – ද්වයතානුපස්සනාසුත්ත

සංසට්ටයන්තානි දුවෙ භුජස්මිං– 'භුජ' යි හස්තය කියනු ලැබෙයි. යම්සේ එක් අතෙකැ නුරුවලා දෙක ගැටෙ ද, එසෙයින් මැ සත්ත්වයෝ තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් නරකයෙහි ගැටෙති, තිරිසන්යොන්හි ගැටෙති ප්‍රෙතවිෂයෙහි ගැටෙති මිනිස්ලොවැ ගැටෙති, දෙව්ලොව ගැටෙති, ගතියෙන් ගතිය උපපත්තියෙන් උපපත්තිය ප්‍රතිසන්ධියෙන් ප්‍රතිසන්ධිය භවයෙන් භවය සසරින් සසර වට්ින් වට ගටති මොනොවට ගටති ගැටෙ මින් හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති පවතිති රැකෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'සංසට්ටයන්තානි දුවෙ භුජස්මිං එකො චරෙ ඛග්ගවිසාණ-කප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේබුදුහු:

''දිස්වා සුවණ්ණස්ස –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.

5.

මෙසෙයින් (ගණවාසය ඇති කල්හි) මට දෙ වැන්නකු හා සමග වාගභිලාපය (දෙතිස් තිරිසන් කථා) වන්නේ යැ, (ඔහු කෙරෙහි) ඇල්ම හෝ වන්නේ යැ, ආයතිභවයෙහි තෙල බිය දක්මින් කගවෙහෙණහගක් සෙයින් එකලා වැ සරනෙම.

එවං දුතියෙන සහා මමස්ස යනු: තෘෂ්ණාව දෙ වැනි කොට ඇත්තේ හෝ පුද්ගලයකු දෙ වැනි කොට ඇත්තේ හෝ වෙයි. කිසෙයින් ''තණ්හාදුතිය වේ යැ යත්: 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ...ධර්මතෘෂ්ණා යි, යමක්හු විසින් තෙල තෘෂ්ණාව ප්‍රහාණය නො කරන ලද ද හේ තණ්හාදුතිය' යි කියනු ලැබෙයි.

තෘෂ්ණාව දෙ වැනි කොට ඇති පුරුෂ තෙම දිගුකලක් මුළුල්ලෙහි සැරිසරනුයේ මෙ අත්බැවින් අන් අත්බවකට පැමිණීම වූ සසර නොඉක්මවා යි.

මෙසෙයින් 'තණ්හාදුතිය' නම් වෙයි.

කිසෙයින් 'පුද්ගලදුතිය' වේ යැ යත්: මෙලොවැ ඇතැමෙක් අර්ත්‍ථ හෙතුයෙන් නො වැ කාරණහෙතුයෙන් නො වැ උද්ධත වූයේ නො සන්හුන් සිත් ඇත්තේ එකකුට දෙ වැන්නෙක් හෝ වෙයි, දෙදෙනකුන්හට තෙ වැන්නෙක් හෝ වෙයි තිදෙනකුන්හට සතර වැන්නෙක් හෝ වෙයි, එහි දී බොහෝ කොට හිස් බස් තෙපලයි: හේ මෙසේයි: රාජකථා චොරකථා මහාමාත්‍ර (මහඇමැතියන් පිළිබඳ) කථා සෙනා කථා භය කථා යුද්ධකථා ආහාරකථා පානකථා වස්ත්‍රකථා යානකථා ශයනකථා මාලාකථා ගන්ධකථා ඥාතිකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා

පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං කථෙන්ති. එවං දුග්ගලද්ධදුතියො හොතීති 'එවං දුතියෙන සහා මමස්ස[1]'.

**වාචාභිලාපො අභිසජ්ජනා වා**'ති වාචාභිලාපො වුච්චති බාත්තිංස තිරච්ඡානකථා. සෙය්‍යථීදං රාජකථං – පෙ – ඉතිභවාභව කථං. අභිසජ්ජනා වාති ද්වෙ සජ්ජනා: තණ්හාසජ්ජනා ච දිට්ඨිසජ්ජනා ච – පෙ – අයං තණ්හාසජ්ජනා – පෙ – අයං දිට්ඨි සජ්ජනාති 'වාචාභිලාපො අභිසජ්ජනා වා'.

**එතං භයං ආයතිං පෙක්ඛමානො**ති 'භය'න්ති ජාතිභයං ජරාභයං ව්‍යාධිභයං මරණභයං රාජභයං චොරභයං අග්ගිභයං උදකභයං අත්තානුවාදභයං පරානුවාදභයං දණ්ඩභයං දුග්ගතිභයං ඌමිභයං කුම්භීලභයං ආවට්ටභයං සුසුකාභයං[2] ආජීවකභයං අසිලොකභයං පරිසසාරජ්ජභයං මදනභයං භයානකං ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උබ්බෙගො උත්‍රාසො. එතං භයං ආයතිං පෙක්ඛමානොති එතං භයං ආයතිං පෙක්ඛමානො දක්ඛමානො ඔලොකයමානො නිජ්ඣායමානො උපපරික්ඛමානොති 'එතං භයං ආයතිං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"එවං දුතියෙන සහා මමස්ස
වාචාභිලාපො අභිසජ්ජනා වා,
එතං භයං ආයතිං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

6.

කාමා හි[3] චිත්‍රා මධුරා මනොරමා
විරූපරූපෙන මථෙන්ති චිත්තං,
ආදීනවං කාමගුණෙසු දිස්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**කාමා හි චිත්‍රා මධුරා මනොරමා**ති 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා වත්ථුකාමා ච කිලෙසකාමා ච – පෙ – ඉමෙ වුච්චන්ති වත්ථුකාමා – පෙ – ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **චිත්‍රා**ති[4] නානාවණ්ණා රූපා නානාවණ්ණා සද්දා නානා වණ්ණා ගන්ධා නානා වණ්ණා රසා නානා වණ්ණා ඵොට්ඨබ්බා. ඉට්ඨා 'කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා.

1. සහා මමස්සා–ම ජ සං
2. සුසුමාරභයං–ම ජ සං
3. කාමා විචිත්‍රාති–ච, වි,
4. විචිත්‍රාති–ච, වි, ක

පුරුෂකථා ශූරකථා වීථි පිළිබඳ කථා දියතොට (හෝ කළ දසියන් පිළිබඳ) කථා පූර්වප්‍රෙත (පෙර නෑයන් පිළිබඳ) කථා නානාස්වභාව (නිරර්ථක) කථා ලොකායත කථා සමුද්‍රාඛ්‍යාන කථා වෘද්ධි–හානි මෙසේ වේ යැ යන කථා කියයි. මෙසෙයින් 'පුද්ගලදුතිය' වේ නුයි 'එවං දුතියෙන සහා මමස්ස' යනු වේ.

**වාචාභිලාපො අභිසජ්ජනා වා**– 'වාචාභිලාප' යි දෙතිස් තිරිසන් කථා කියනු ලැබෙයි. හෙ මෙසේයි: රාජකථා යැ ... මෙසෙයින් වෘද්ධි–හානි වේ යැ යන කථා යි. **අභිසජ්ජනා වා** යනු: සඞ්ග දෙකෙකි: තෘෂ්ණාසඞ්ග යැ දෘෂ්ටිසඞ්ග යි ... මේ තෘෂ්ණා සඞ්ග යැ...මේ දෘෂ්ටිසඞ්ග නුයි 'වාචාභිලාපො අභිසජ්ජනා වා' යනු වේ.

**එතං භයං ආයතිං පෙක්ඛමානො**– 'භය' යනු: ජාතිය නිසා උපදනා බිය ජරාභය ව්‍යාධිභය මරණභය රාජභය චොරභය අග්නිභය උදකභය තමා නුගුණ කීමෙන් උපදනා බිය මෙරමා නුගුණ කීමෙන් උපදනා බිය දඬුවමින් උපදනා බිය දුගතිය නිසා උපදනා බිය මුහුදුරළ නිසා උපදනා බිය මස්කැලන්ගෙන් උපදනා (හෝ කිඹුල්) බිය දිය සුළි නිසා උපදනා බිය සැඩමසුන් නිසා උපදනා (සුසුකා) බිය දිවි පැවැතුම හෙයින් උපදනා බිය ගර්හාවෙන් උපදනා බිය පිරිස්හි තැතිගැනීමෙන් වන බිය කාමයෙන් වන බිය භයාකාරය, තැති ගන්නා බව, ලොමුදහ ගැනීම, චිත්තයාගේ උද්වේගය, උත්‍රාස යි. **එතං භයං ආයතිං පෙක්ඛමානො** යනු: තෙල බිය ආයති භවයෙහි බලමින් දක්මින් අවලොකනය කෙරෙමින් ධ්‍යාන කෙරෙමින් විමසමිනි නුයි 'එතං භයං ආයතිං පෙක්ඛමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

"එවං දුතියෙන –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.

6.

විසිතුරු වූ මධුර වූ (බාලජනයන්ගේ) සිත් අලවන්නා වූ කාමයෝ විවිධස්වභාවයෙන් සිත අලළති. කාමගුණයෙහි ආදීනව දක කගවෙහෙණ හඟක් සෙයින් ඒකලා වැ සරනෙමි.

**කාමා හි චිත්‍රා මධුරා මනොරමා**– 'කාමා' යනු: උද්දාන විසින් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාම යැ ක්ලේශකාම යැ යි... මොහු 'වස්තු කාමයෝ'යි කියනු ලැබෙති ... මොහු 'ක්ලේශකාමයෝ' යි කියනු ලැබෙත්. **චිත්‍රා** යනු: ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ රාගොත්පත්තියට කාරණ වූ නන්වැදැරුම් වූ රූපයෝ යැ, ශබ්දයෝ යැ, ගන්ධයෝ යැ, රසයෝ යැ, ස්ප්‍රෂ්ටව්‍යයෝ යි.

**මධුරාති**: වුත්තං හෙතං භගවතා: "පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්ද – පෙ – ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා – පෙ – ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා – පෙ – කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපාපියරූපා කාමූපසංහිතා, රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චකාමගුණා. යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං ඉදං වුච්චති කාමසුඛං මීළ්හසුඛං[1] පුථුජ්ජනසුඛං අනරියසුඛං,[2] න සෙවිතබ්බං න භාවෙතබ්බං න බහුලීකාතබ්බං, භායිතබ්බං එතස්ස සුඛස්සාති වදාමී"ති කාමා හි චිත්‍රා මධුරා. **මනොරමාති** 'මනො'ති 'යං චිත්තං – පෙ – තජ්ජාමනොවිඤ්ඤාණධාතු, මනො රමෙන්ති ථොමෙන්ති තොසෙන්ති පහාසෙන්තී'ති 'කාමා හි චිත්‍රා මධුරා මනොරමා'.

**විරූපරූපෙන මථෙන්ති චිත්තන්ති**: නානා වණ්ණෙහි රූපෙහි – පෙ – නානාවණ්ණෙහි ඵොට්ඨබ්බෙහි චිත්තං මථෙන්ති තොසෙන්ති පහාසෙන්තී'ති "විරූපරූපෙන මථෙන්ති චිත්තං".

**ආදීනවං කාමගුණෙසු දිස්වාති**: – වුත්තං හෙතං භගවතා: 'කො ච භික්ඛවෙ කාමානං ආදීනවො: ඉධ භික්ඛවෙ, කුලපුත්තො යෙන සිප්පට්ඨානෙන ජීවිකං කප්පෙති: යදි මුද්දාය යදි ගණනාය යදි සඞ්ඛානෙන යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන[3] යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො[4] ඛුප්පිපාසාය මීයමානො[5] අයං භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

**තස්ස** ච භික්ඛවෙ, කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා නාභිනිප්ඵජ්ජන්ති සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති මොඝං වත මෙ උට්ඨානං[6] අඵලො වත මෙ වායාමො ති. අයම්පි භික්ඛවෙ, කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

---

1. මිළ්හසුඛං – ච, වි, ක.
2. අභූතසුඛං – ච, වි, ක
3. යදිගොරක්ඛතෙන – ච, වි
4. සම පස්සමානො – ච, ච, වි
5. විලියමානො – ච, වි,
6. උපට්ඨානං – ච, වි

**මධුරා–** යනු: මෙ වදරන ලද මැයි භාග්‍යවතුන් විසින්: ''මහණෙනි මේ කාමගුණයෝ පස් දෙනෙක් වෙති: කවර පස්දෙනෙක;‍ යත්: ඉෂ්ට වූ කාන්තවූ මන වඩන්නා වූ ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ රජනීය වූ ඇසින් දතයුතු රූපයෝ යැ කනින් දතයුතු ශබ්දයෝ යැ– නැහැයෙන් දතයුතු ගන්ධයෝ යැ– දිවින් දතයුතු රසයෝ යැ– ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ රාගොත්පත්තියට කාරණ වූ කයින් දතයුතු ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. මහණෙනි, මොහු පඤ්චකාමගුණයෝ යි. මහණෙනි, මේ පස්කම්ගුණය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මෙ සුවය නො සෙවිය යුතු නො වැඩිය යුතු පුනපුනා නො වැඩියයුතු කාම සුව යැ මීළහ සුව යැ පුහුදුන්සුව යැ අනාර්‍ය්‍ය සුව යැයි කියනු ලැබේ. තෙල සුවයට බියවියයුතු යැ යි කියමී''. 'කාමා හි චිත්‍රා මධුරා' යනු වේ. **මනොරමා–** 'මනො' යනු: ''යම් සිතෙක් ... තජ්ජාමනොවිඤ්ඤාණධාතු-වක් වේ ද, එයයි. සිත අලවති පසසති තුටු කෙරෙති පිණවත් නුයි 'කාම හි චිත්‍රා මධුරා මනොරමා' යනු වේ.

**විරූපරූපෙන මථෙනති චිතතං** යනු: නන්වැදෑරුම් වූ රූපයෙන්... නන්වැදෑරුම් වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් සිත අලළති තුටු කෙරෙති ප්‍රහර්ෂ කෙරෙත් නුයි 'විරූපරූපෙන මථෙන්ති චිත්තං' යනු වේ.

**ආදීනවං කාමගුණෙසු දිස්වා** යනු: මෙ වදරනලද මැ යි භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, කාමයන්ගේ ආදීනව කවරයත්: මහණෙනි, මෙ ලොව කුල පුත්‍රයෙක් හස්තමුද්‍රායෙන් වේවයි ගණිතින් වේවයි පිණ්ඩගණනින් වේවයි කෘෂිකර්මයෙන් වේවයි වෙළෙඳහමින් වේවයි ගවයන් රැකීමෙන් වේවයි ධනුශ්ශිල්පයෙන් වේවයි රාජසේවායෙන් වේවයි එක්තරා ශිල්ප-යෙකින් වේවයි ශීතයට පෙරටු වැ උෂ්ණයට පෙරටු වැ මැසි මදුරු වා අව් පහසින් පෙළෙමින් සාපවසින් මැරෙමින් දිවි රකී. මහණෙනි, මේ කාම-යන් ගේ ප්‍රත්‍යක්ෂ ආදීනව යැ. කාමය හේතු කොට ඇති කාමය නිදාන කොට ඇති කාමය අධිකරණ කොට ඇති කාමය මැ හේතු කොට ඇති දුඃඛස්කන්ධ යි''.

මහණෙනි, ඉදින් මෙසේ වීර්‍ය්‍ය කරන සටනා කරන වෑයම් කරන ඒ කුලපුත්හට ඒ භොගයෝ නො නිපයෙත් නම් ශෝක කෙරෙයි ක්ලාන්ත වෙයි වැලපෙයි උර පැහැර හඬයි. එකත්නෙන් මාගේ උත්සාහය සිස් යැ එකත්නෙන් මාගේ වෑයම අඵල යැ යි සම්මොහයට පැමිණෙයි. මහණෙනි, මෙ ද කාමයන්ගේ ප්‍රත්‍යක්ෂ ආදීනව වෙයි කාමය හේතු කොට ඇති කාමය නිදන කොට ඇති කාමය අධිකරණ කොට ඇති කාමය මැ හේතු කොට ඇති දුඃඛස්කන්ධ යි.

තස්ස චෙ භික්ඛවෙ, කුලපුත්තස්ස එවං උට්ඨහතො ඝටතො වායමතො තෙ භොගා අභිනිප්ඵජ්ජන්ති සො තෙසං භොගානං ආරක්ඛාධිකරණං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, කින්ති මෙ භොගෙ[1] නෙව රාජානො හරෙය්‍යුං න චොරා හරෙය්‍යුං න අග්ගි ඩහෙය්‍ය න උදකං වහෙය්‍ය න අප්පියා දයාදා හරෙය්‍යුන්ති. තස්ස එවං ආරක්ඛයතො ගොපයතො තෙ භොගෙ රාජානො වා හරන්ති චොරා වා හරන්ති අග්ගි වා ඩහති උදකං වා වහති අප්පියා වා දයාදා හරන්ති. සො සොචති -පෙ- සම්මොහං ආපජ්ජති යම්පි මෙ අහොසි තම්පි නො නත්ථී'ති. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු -පෙ- කාමානමෙව හෙතු.

පුන ච පරං භික්ඛවෙ කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු රාජානොපි රාජූහි විවදන්ති ඛත්තියා'පි ඛත්තියෙහි විවදන්ති බ්‍රාහ්මණා'පි බ්‍රාහ්මණෙහි විවදන්ති ගහපතී'පි ගහපතිහි විවදන්ති මාතා'පි පුත්තෙන විවදති පුත්තො'පි මාතරා විවදති පිතා'පි පුත්තෙන විවදති පුත්තො'පි පිතරා විවදති භාතා'පි භාගිනියා විවදති භගිනී'පි භාතරා විවදති සහායො'පි සහායෙන විවදති, තෙ තත්ථ කලහවිග්ගහ විවාදපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහි'පි උපක්කමන්ති ලෙඩ්ඩූහි'පි උපක්කමන්ති දණ්ඩෙහි'පි උපක්කමන්ති සත්ථෙහි'පි උපක්කමන්ති, තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති[2] මරණමත්තම්පි දුක්ඛං. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

පුන ච පරං භික්ඛවෙ, කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා උභතො බ්‍යූළ්හං[3] සංගාමං පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානාසු[4] සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතන්තෙසු[5]. තෙ තත්ථ උසූහි'පි විජ්ඣන්ති, සත්තිහි'පි විජ්ඣන්ති, අසිනා'පි සීසං ඡින්දන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති, මරණ මත්තම්පි දුක්ඛං. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

---

1. භොගා-ප, ව, වි
2. ගච්ඡන්ති-ප ම ව වි
3. වියූළ්හං-ව වි
4. ඛිපමානෙසු-ප ව වි
5. විජ්ජොතලන්තෙසු-ම ජ සං. ව. වි.

මහණෙනි, ඉදින් මෙසේ වීයඵී කරන සටනා කරන වැයම් කරන ඒ කුලපුත්හට ඒ භෝගයෝ නිපයෙත් නම් හෙ තෙමෙ කවර උපායෙකින් මාගේ භෝගයන් රජවරු නො මැ හරනාහු ද, සොරු නො හරනා හු ද, ගින්න නො දවා ද, ජලය වහනය නො කෙරේ ද, අප්‍රියදයාදයෝ නො හරනාහු ද යි ඒ භොගයන් ගේ ආරක්ෂාව කරුණු කොට දුක් දෙම්නස් විඳී. මෙසෙයින් රක්ෂණ ගොපන කරන ඔහුගේ ඒ භොගයන් රජවරු හෝ ගෙන යති, සොරු හෝ ගෙන යති, ගින්න හෝ දවයි, ජලය හෝ උල්පවා ගෙන යයි, අප්‍රියදයාදයෝ හෝ ගෙන යති. හෙතෙම ශොක කෙරෙයි ... මට යමකුත් වී නම් එ ද නැතැ'යි විසංඥ බවට පැමිණෙයි. මහණෙනි, මෙ ද කාමයන් ගේ සාංදෘෂ්ටික ආදීනවයෙකි. කාමය හේතු කොට ඇති ...කාමය මැ හෙතු කොට ඇති දුඃඛස්කන්ධයෙකි.

තවද මහණෙනි, කාමය හේතු කොට කාමය මුල් කොට කාමය කරුණු කොට කාමය මැ හේතු කොට රජවරු ද රජුන් හා සමග විවාද කෙරෙති ක්ෂත්‍රියයෝ ද ක්ෂත්‍රියයන් හා සමග විවාද කෙරෙති, බ්‍රාහ්මණයෝ ද බ්‍රාහ්මණයන් හා සමග විවාද කෙරෙති, ගෘහපතියෝ ද ගෘහපතියන් හා සමග විවාද කෙරෙති, මව ද පුතා හා සමග විවාද කෙරෙයි, පුතා ද මව හා සමග විවාද කෙරෙයි, පියා ද පුතා හා සමග විවාද කෙරෙයි, පුතා ද පියා හා සමග විවාද කෙරෙයි, බෑයා ද බූන හා සමග විවාද කෙරෙයි, බූන ද බෑයා හා සමග විවාද කෙරෙයි, යහළුවා ද යහළුවා හා සමග විවාද කෙරේ. ඔහු එහි කලහ– විග්‍රහ– විවාදයට පැමිණියාහු උනුනට අතිනුදු පහර දෙති. කැටිනුදු පහර දෙති, දඬිනුදු පහර දෙති, සැතිනුදු පහර දෙති, ඔහු එහි දී මරණයට ද පැමිණෙති, මරණමාත්‍ර දුකට ද පැමිණෙත්. මහණෙනි, මෙ ද කාමයන්ගේ සාංදෘෂ්ටික ආදීනවයෙකි, කාමය හෙතු කොට ඇති කාමය මුල් කොට ඇති කාමය කරුණු කොට ඇති කාමය මැ හේතු කොට ඇති දුඃඛස්කන්ධයෙකි.

තවද මහණෙනි, කාමය හේතු කොට කාමය මුල් කොට කාමය කරුණු කොට කාමය මැ හේතු කොට කඩුපළිහ ගෙන දුනුහියවුරු බැඳ ගෙන දෙපසැ රැස් වැ සරයනුදු විදිනු ලබන කල්හි සැත්දු විදිනු ලබන කල්හි කඩු දු සිසාරනු ලබන කල්හි යුදට පිවිසෙති. ඔහු එහි සැරයෙනුදු විඳුනා ලැබෙති සැතිනුදු විඳුනා ලැබෙති අසිපතිනුදු හිස සිඳුනා ලැබෙති ඔහු එහි මරණයට ද මරණමාත්‍ර දුකට ද පැමිණෙත්. මහණෙනි, මෙ ද කාමයන් ගේ ප්‍රත්‍යක්ෂ ආදීනවයෙකි. කාමය හෙතු කොට ඇති කාමය මුල් කොට ඇති කාමය කරුණු කොට ඇති කාමය මැ හේතු කොට ඇති දුඃඛස්කන්ධයෙකි.

පුන ච පරං භික්ඛවෙ, කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු අසිචම්මං ගහෙත්වා ධනුකලාපං සන්නය්හිත්වා අද්දාවලෙපනා[1] උපකාරියො පක්ඛන්දන්ති උසූසුපි ඛිප්පමානෙසු සත්තීසුපි ඛිප්පමානාසු අසීසුපි විජ්ජොතලන්තෙසු[2]. තෙ තත්ථ උසූහිපි විජ්ඣන්ති සත්තිහිපි විජ්ඣන්ති. පක්කට්ඨියාපි[3] ඔසිඤ්චන්ති අභිවග්ගෙනපි[4] ඔමද්දන්ති අසිනාපි සීසං ඡින්දන්ති, තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

පුනචපරං භික්ඛවෙ, කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු, සන්ධිම්පි ඡින්දන්ති නිල්ලොපම්පි හරන්ති එකාගාරිකම්පි[5] කරොන්ති, පරිපන්ථෙපි තිට්ඨන්ති, පරදාරම්පි ගච්ඡන්ති. තමෙනරාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්ති[6] කසාහිපි තාලෙන්ති වෙත්තෙහිපි[7] තාලෙන්ති අද්ධදණ්ඩකෙහිපි තාලෙන්ති හත්ථම්පි ඡින්දන්ති -පෙ- අසිනාපි සීසං ඡින්දන්ති, තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති මරණමත්තම්පි දුක්ඛං අයම්පි භික්ඛවෙ, කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු.

පුනචපරං භික්ඛවෙ, කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු කායෙන දුච්චරිතං චරන්ති, වාචාය දුච්චරිතං චරන්ති, මනසා දුච්චරිතං චරන්ති. තෙ කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. අයම්පි භික්ඛවෙ කාමානං ආදීනවො සම්පරායිකො දුක්ඛක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු."[අ]

ආදීනවං කාමගුණෙසු දිස්වාති කාමගුණෙසු ආදීනවං දිස්වා, පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'ආදීනවං කාමගුණෙසු දිස්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"කාමා හි චිත්‍රා මධුරා මනොරමා
විරූපරූපෙන මථෙන්ති චිත්තං,
ආදීනවං කාමගුණෙසු දිස්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

1. අද්ධාවලොපනා—ස්‍යා
2. විජ්ජොතන්තෙසු—ස.
3. ඡක්කනකායපි—අ ට්ඨි
ඡක්කාවියාපි—ම ච වි ක
5. එකාකාරම්පි—පන.
අ. මජ්ඣිමනිකාය – මහාදුක්ඛක්ඛන්ධසුත්ත
6. කරොන්ති—ප ම
7. වෙත්තගිපි—අට්ඨ.
4. අභිවග්ගෙනපි—අ ට්ඨි ප.
අග්ගිවග්ගෙනපි—ච වි ක.

තවද මහණෙනි, කාමය හේතු කොට කාමය මුල් කොට කාමය කරුණු කොට කාමය මැ හේතු කොට කඩුපළිහ ගෙන දුනුහියවුරු බැඳ ගෙන සරයතුදු විදිනු ලබන කල්හි සැතුදු විදිනු ලබන කල්හි අයිපතුදු සිසාරන කල්හි තෙල් කලල් වැකි පවුරු පා වෙත දිව යෙති. ඔහු සඞ්ග්‍රාම යෙහි සරයෙනුදු විදුනා ලැබෙති, සැතිනුදු විදුනා ලැබෙති, (ඔවුනට) කකාළ ගොම්නුදු ඉස්ති, අභිවර්ග නම් යතුරිනුදු මඩිති, කඩුයෙනුදු හිස සිඳුති. ඔහු එහි මරණයට ද මරණමාත්‍ර දුකට ද පැමිණෙත්. මහණෙනි, මෙ ද කාමයන් ගේ ප්‍රත්‍යක්ෂ ආදීනවයෙකි. කාමය හෙතු කොට ඇති කාමය මුල් කොට ඇති කාමය කරුණු කොට ඇති කාමය මැ හේතු කොට ඇති දුඃඛස්කන්ධ යෙකි.

තවද මහණෙනි, කාමය හේතු කොට කාමය මුල් කොට කාමය කරුණු කොට ගෘහසන්ධිදු සිඳුති, මහාවිලොප ද කෙරෙති, එකාගාරික කමුදු කෙරෙති, කඩපළාසොරකමුදු කෙරෙති, වීරඹුසොරකමුදු කෙරෙත්, රජවරු ඔහු අල්වාගෙන විවිධ කම්කටොලු කරවති: කසයෙනුදු තළති වේවැලිනුදු තළති මුගුරිනුදු තළති අතුදු සිඳුති ... අයිපතින් හිස්දු සිඳුති. ඔහු එහි මරණයට ද මරණමාත්‍ර දුකට ද පැමිණෙත්. මහණෙනි, මෙ ද කාමයන් ගේ ප්‍රත්‍යක්ෂ ආදීනවයෙකි. කාමය හේතු කොට ඇති කාමය මුල් කොට ඇති කාමය කරුණු කොට ඇති කාමය මැ හේතු කොට ඇති දුඃඛස්කන්ධයෙකි.

තවද මහණෙනි, කාමය හේතු කොට කාමය මුල් කොට කාමය කරුණු කොට කාමය මැ හේතු කොට කයින් දුසිරිත් කෙරෙති, වචනයෙන් දුසිරිත් කෙරෙති, මනසින් දුසිරිත් කෙරෙත්. ඔහු කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට මනසින් දුසිරිත් කොට කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස වැ පතිත වන නිරයෙහි උපදිත්. මහණෙනි, මෙ ද කාමයන් ගේ සාම්පරායික ආදිනව වූ කාමය හේතු කොට ඇති කාමය මුල් කොට ඇති කාමය කරුණු කොට ඇති කාමය මැ හේතු කොට ඇති දුඃඛස්කන්ධයෙකි.

ආදීනවං කාමගුණෙසු දිස්වා යනු: කාමගුණයෙහි ආදීනව දක බලා තුලනය කොට තීරණය කොට විභාවන කොට ප්‍රකට කොට නුයි 'ආදීනවං කාමගුණෙසු දිස්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදාළහ එ පසේ බුදුහු:

"කාමා හි චිත්‍රා -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.

7.

ඊති ච ගණ්ඩො ච උපද්දවො ච
රොගො ච සල්ලං ච භයං ච මෙතං,
එතං භයං කාමගුණෙසු දිස්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**ඊති ච ගණ්ඩො ච උපද්දවො ච රොගො ච සල්ලං ච භයං ච මෙතන්ති-** වුත්තං හෙතං භගවතා: "භයන්ති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, දුක්ඛන්ති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, රොගොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, ගණ්ඩොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං සල්ලන්ති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, සංගොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, පඞ්කොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, ගබ්භොති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං, කස්මා ච භික්ඛවෙ, භයන්ති කාමාන මෙතං අධිවචනං, යස්මා ච කාමරාගරත්තායං භික්ඛවෙ ඡන්දරාගවිනිබද්ධො දිට්ඨධම්මිකාපි භයා න පරිමුච්චති, සම්පරායිකාපි භයා න පරිමුච්චති, තස්මා භයන්ති කාමානමෙතං අධිවචනං. කස්මා ච භික්ඛවෙ දුක්ඛන්ති-රොගොති-ගණ්ඩොති-සල්ලන්ති-සංගොති-පඞ්කොති-ගබ්භොති කාමානමෙතං අධිවචනං. යස්මා ච කාමරාගරත්තායං භික්ඛවෙ ඡන්දරාගවිනිබද්ධො දිට්ඨධම්මිකාපි ගබ්භා න පරිමුච්චති සම්පරායිකාපි ගබ්භා න පරිමුච්චති, තස්මා ගබ්භොති කාමානමෙතං අධිවචන" න්ති.

1. "භයං දුක්ඛං රොගො ච ගණ්ඩො සල්ලං ච සංගො ච
පඞ්කො ච ගබ්භො උභයං,
2. එතෙ කාමා, පවුච්චන්ති යත්ථ සත්තො පුථුජ්ජනො
ඔතිණ්ණො සාතරූපෙන පුන ගබ්භාය ගච්ඡති."
3. යතො ච භික්ඛු ආතාපී සම්පජඤ්ඤං න රිච්චති,
සො ඉමං පලිපං' දුග්ගං අතික්කම්ම තථාවිධො
පජං ජාතිජරූපෙතං ඵන්දමානං අවෙක්ඛති ති.

**ඊතිච ගණ්ඩො ච උපද්දවොච රොගො ච සල්ලං ච භයං ච මෙතං** එතං භයං කාමගුණෙසු දිස්වාති: එතං භයං කාමගුණෙසු දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'එතං භයං කාමගුණෙසු දිස්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"ඊති ච ගණ්ඩො ච උපද්දවො ච
රොගො ච සල්ලං ච භයං ච මෙතං,
එතං භයං කාමගුණෙසු දිස්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

7.

(ආගන්තුක ව්‍යසන හෙතු වූ) ඊතිය ද ගණ්ඩය ද උපද්‍රවය ද රොගය ද (ඇතුළත පෙළන) ශල්‍යය ද භය ද යන මෙල පස්කම් ගුණයෙහි ආදීනව දක කගවෙහෙණ හඟක් සෙයින් එකලා වැ සරනෙම්.

ඊති ච ගණ්ඩො ච උපද්දවො ච රොගො ච සල්ලං ච භයං ච මෙතං යනු: මෙ වදරනලද මැ යි භාග්‍යවතුන් විසින්: "මහණෙනි, තෙල 'භය' යනු කාමයනට නමෙක, මහණෙනි, තෙල 'දුක' යනු කාමයනට නමෙක, මහණෙනි, තෙල 'රොග' යනු කාමයනට නමෙක, මහණෙනි තෙල 'ගණ්ඩ' යනු කාමයනට නමෙක, මහණෙනි, තෙල 'ශල්‍ය' යනු කාමයනට නමෙක, මහණෙනි, තෙල 'සඞ්ග' යනු කාමයනට නමෙක. මහණෙනි, තෙල 'ගර්භ' යනු කාමයනට නමෙකි. මහණෙනි, වැළිත් කවර හෙයින් තෙල 'භය' යනු කාමයනට අධිවචන වේ යැ යත්: යම් හෙයකින් මහණෙනි, කාමරාගයෙන් රක්ත වූයේ ඡන්දරාගයෙන් බැඳුණේ දෘෂ්ටිධාර්මිකභයෙනුදු නො මිදේ ද සාම්පරායික භයෙනුදු නො මිදේ ද, එහෙයින් තෙල 'භය' යනු කාමයනට අධිවචන වෙයි. කවර හෙයින් මහණෙනි, තෙල 'දුක' යනු– රොග යනු–ගණ්ඩ යනු– ශල්‍ය යනු– සඞ්ග යනු– පඞ්ක යනු– ගර්භ යනු කාමයනට අධිවචන වේ යැ යත්: යම් හෙයකින් මහණෙනි, කාමරාග යෙන් රක්ත වූයේ ඡන්දරාගයෙන් බැඳුණේ දෘෂ්ටිධාර්මිකගර්භයෙනුදු නො මිදේ ද සාම්පරායිකගර්භයෙනුදු නො මිදේ ද එහෙයින් තෙල 'ගර්භ' යනු කාමයනට අධිවචන වේ" යයි.

1–2. "භය ද දුක ද රොගය ද ගණ්ඩය ද ශල්‍යය ද සඞ්ගය ද පඞ්ක යැ ගර්භය යන දෙක ද යන මොහු කාමයෝ යි කියනු ලැබෙති යම් කාමයෙක්හි ඇලුණු මධුරස්වභාවයෙන් බැසගත් පෘථග්ජන තෙම පුනර්භවයට (පරලොකයෙහි ෂඩායතන ගර්භයට) යේ නම් ඔහු යැ.

3. යම් හෙයකින් මහණ තෙම කෙලෙසුන් තවන වීර්‍ය්‍යය ඇත්තේ සම්‍යග්ඥානය නො හරි ද, එබඳු වූ හෙතෙම මේ කර්දම (මඩ) දුර්ගය ඉක්මවා ජාතිජරායෙන් යුක්ත වූ සැලෙන ප්‍රජාව බලා"යි.

ඊති ච ගණ්ඩො ච උපද්දවො ච රොගො ච සල්ලඤ්ච භයඤ්ච මෙතං එතං භයං කාමගුණෙසු දිස්වා යනු: පස්කම්ගුණයෙහි තෙල බිය දක බලා තුලනය කොට තීරණය කොට විභාවන කො ට ප්‍රකට කොට නුයි 'එතං භයං කාමගුණෙසු දිස්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු එවි.

එයින් වදළහ එ පසේබුදුහු:

"ඊති ච ගණ්ඩො ච -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.

8.

සීතං ච උණ්හං ච ඛුදං පිපාසං
වාතාතපෙ ඩංසසිරිංසපෙ ච,[1]
සබ්බානිපෙතානි අභිසම්භවිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**සීතං ච උණ්හං ච ඛුදං පිපාසන්ති**: 'සීත'න්ති ද්වීහි කාරණෙහි සීතං හොති: අබ්භන්තරධාතුකොපවසෙන වා සීතං හොති, බහිද්ධා උතුවසෙන වා සීතං හොති. **උණ්හන්ති** ද්වීහි කාරණෙහි උණ්හං හොති: අබ්භන්තරධාතුකොපවසෙන වා උණ්හං හොති, බහිද්ධා උතුවසෙන වා උණ්හං හොති, ඛුද වුච්චති[2] ඡාතකො, පිපාසා වුච්චති උදකපිපාසාති. 'සීතං ච උණ්හං ච ඛුදං පිපාසං.'

**වාතාතපෙ ඩංසසිරිංසපෙ චාති** 'වාතා'ති පුරත්ථිමා වාතා පච්ඡිමා වාතා උත්තරා වාතා දක්ඛිණා වාතා සරජා වාතා අරජා වාතා සීතා වාතා උණ්හා වාතා පරිත්තා වාතා අධිමත්තා වාතා කාළවාතා[3] වෙරම්භවාතා පක්ඛවාතා සුපණ්ණවාතා තාලපණ්ණවාතා[4] විධූපනවාතා. ආතපො වුච්චති සූරියසන්තාපො. ඩංසා වුච්චන්ති පිඞ්ගලමක්ඛිකා. සිරිංසපා වුච්චන්ති අහීති 'වාතාතපෙ ඩංසසිරිංසපෙ ච.'

**සබ්බානිපෙතානි අභිසම්භවිත්වාති**, අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දිත්වාති සබ්බානි පෙතානි අභිසම්භවිත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

''සීතං ච උණ්හං ච ඛුදං පිපාසං
වාතාතපෙ ඩංසසිරිංසපෙ ච,
සබ්බානිපෙතානි අභිසම්භවිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො''ති.

1. සරිසපෙ ච–ම ජ සං
2. ඛුද්දා වුච්චන්ති–ච, වි, සො
3. කාලවාතා ම, ජ, සං, තයි
4. කාළවච්ඡවාතා–ච, වි, ක

8.

සිහිලස ද උණුසුම ද සාපවස් ද වා–අව්–වැසි– මදුරුවන් හා සපුන් ද යන මෙල සියල්ල මැඩ ගෙන කගවෙහෙණහගක් සෙයින් එකලා වැ සරනෙම්.

සීතං ච උණ්හඤ්ච ඛුද්දං පිපාසං– 'සීතං' යනු: දෙ කරුණෙකින් ශීත වෙයි: ඇතුළත ධාතුකොප වශයෙන් හෝ ශීත වෙයි: පිටත සෘතු වශයෙන් හෝ ශීත වේ. උණ්හං යනු: දෙ කරුණෙකින් උෂ්ණ වෙයි: ඇතුළත ධාතුකොප වශයෙන් හෝ උෂ්ණ වෙයි, පිටත සෘතු වශයෙන් හෝ උෂ්ණ වේ. ඛුද්‍ද යි සාය කියනු ලැබෙයි. පිපාසා යි පැන් බොනු කැමැත්ත කියනු ලැබේ නුයි 'සීතඤ්ච උණ්හඤ්ච ඛුද්දං පිපාසං' යනු වේ.

වාතාතපෙ ඩංසසිරිංසපෙ ච– 'වාතා' යනු: පෙරදිග වාතයෝ යැ පැළදිග වාතයෝ යැ උතුරුදිග වාතයෝ යැ දකුණුදිග වාතයෝ යැ රජස් සහිත වාතයෝ යැ රජස් රහිත වාතයෝ යැ ශීතවාතයෝ යැ උෂ්ණ වාතයෝ යැ මඳපවන් යැ අධිකවාතයෝ යැ කාලවාතයෝ යැ වෙරම්බ වාතයෝ යැ පියාපත් පවන යැ ගුරුළුපවන යැ තල්පත්පවන යැ (වල්විදුනා ආදියෙන් සලනා) විධූපන වාතයෝ යි. 'ආතප'යි සූයඝීසන්තා පය කියනු ලැබෙයි. 'ඩංස' යි ඇට මැස්සෝ කියනු ලැබෙති. 'සිරිංසපා' යි සර්පයෝ කියනු ලැබෙත් නුයි 'වාතාතපෙ ඩංසසිරිංසපෙ ච' යනු වේ.

සබ්බානිපෙතානි අභිසම්භවිත්වා යනු: අභිභවනය කොට වතුරුවා හාත්පසින් මැඩගෙන නුයි 'සබ්බානිපෙතානි අභිසම්භවිත්වා එකොචරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

''සීතඤ්ච උණ්හඤ්ච –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකපෙපා'' යි·

9.

නාගොව යූථානි විවජ්ජයිත්වා
සඤ්ජාතඛන්ධො පදුමී උළාරො,
යථාභිරන්තං විහරං[1] අරඤ්ඤෙ
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

නාගොව යූථානි විවජ්ජයිත්වාති 'නාගො' වුච්චති හත්ථිනාගො, පච්චෙකසම්බුද්ධොපි නාගො, කිංකාරණා පච්චෙකසම්බුද්ධො නාගො: ආගුං න කරොතීති නාගො, න ගච්ඡතීති නාගො, න ආගච්ඡතීති නාගො, කථං සො පච්චෙකසම්බුද්ධො ආගුං න කරොතීති නාගො: 'ආගු' වුච්චති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණීයා.

1. "ආගුං න කරොති කිඤ්චි ලොකෙ (සභියා'ති භගවා)
සබ්බසංයොගෙ[2] විසජ්ජ බන්ධනානි,
සබ්බත්ථ න සජ්ජති විමුත්තො
නාගො තාදී පවුච්චතෙ තථත්තා".

එවං සො පච්චෙකසම්බුද්ධො ආගුං නකරොතීති නාගො.

කථං සො පච්චෙකසම්බුද්ධො න ගච්ඡතීති නාගො: සො පච්චෙකසම්බුද්ධො න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති න අනුසයවසෙන ගච්ඡති න වග්ගෙහි ධම්මෙහි[3] යායති නීයති වුය්හති සංහරීයති. එවං සො පච්චෙකසම්බුද්ධො න ගච්ඡතීති නාගො.

කථං සො පච්චෙකසම්බුද්ධො න ආගච්ඡතීති නාගො: සොතාපත්තිමග්ගෙන සෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති, සකදාගාමිමග්ගෙන -පෙ- අනාගාමිමග්ගෙන -පෙ- අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡති, එවං සො පච්චෙකසම්බුද්ධො න ආගච්ඡතීති නාගො.

1. විහරෙ - ම ඡ සං.
2. සංයොගං - ච වි
3. නවග්ගෙහි කම්මෙහි - ච වි
නවග්ගෙහි කප්පෙසං - ම ඡ සං

9.

ඇත්මුළ හැරපියා අරනෙහි සිත්සේ වෙසෙන මොනොවට වැඩුණු කඳ ඇති පද්මකුල සමභව වූ (වීය‍්‍යීබල ජව ආදියෙන්) මහත් වූ ඇත්රපක්හු සෙයින් හටගත් අශෛක්ෂ ශීලස්කන්ධාදිය ඇතියෙම් පද්ම සදෘෂ බොධ්‍යඞ්ග ඇතියෙම් (හෝ ආය‍්‍යීජාති ඇතියෙම්) උදර වූ ශීලසමාධි ප්‍රඥා ඇතියෙම් ගණයා හැරපියා අරනෙහි සිත්සේ වාස කරනුයෙම් කග වෙහෙණ හභක් සෙයින් එකලා වැ සරනෙම්.

නාගොව යූථානි විවජ්ජයිත්වා - නාග යි හස්තිනාග කියනු ලැබෙයි. පසේ බුදුහු ද නාග නම් වෙති. කවර කරුණෙකින් පසේ බුදුහු 'නාග' නම් වෙති යත්: පව් නො කෙරෙති 'නාග' යැ, (අගතියට) නො යෙති 'නාග' යැ, (පුහුන් කෙලෙසුන් කරා) නො එති 'නාග' යැ කිසෙයින් ඒ පසේබුදුහු 'පව් නො කෙරෙති නාග නම් වෙති යත්: අගු යි පීඩාකරවූ පුනර්භවය දෙන්නා වූ දරථ සහිත වූ දුඃඛවිපාක උපදවන මත්තෙහි ජාති ජරාමරණයන්ට ප්‍රත්‍යය වූ ලාමක අකුශලධර්මයෝ කියනු ලැබෙත්.

1. "(බුදුහු සභිය අමතා මෙසේ වදළහ:) යමෙක් ලොකයෙහි අල්පමාත්‍ර වූ ද පාපයක් නො කෙරෙර් නම් එබඳු වූයේ 'නාග' යයි කියනු ලැබෙයි හෙතෙම කාමාදි සියලු යොගයන් ද සංයොජනභෙද වූ බන්ධනයන් ද හැරපියා ස්කන්ධාදි සියලු තැන්හි කිසි සඞ්ගයෙකින් නො ඇලෙයි, ද්විවිධ විමුක්තියෙන් මිදුණේ ලාභාලාභාදියෙහි තාදී වූයේ ද වේ."

මෙසෙයින් ඒ පසේබුදුහු 'පව් නො කෙරෙති' නාග නම් වෙති.

කිසෙයින් ඒ පසේබුදුහු 'නො යෙති' නාග නම් වෙති යත්: ඒ පසේ බුදුහු ඡන්දයෙන් අගතියට නො යෙති, ද්වේෂයෙන් අගතියට නො යෙති, මෝහයෙන් අගතියට නො යෙති, භයින් අගතියට නො යෙති, රාග වශයෙන් නො යෙති, ද්වෙෂ වශයෙන් නො යෙති, මාන වශයෙන්- දෘෂ්ටි වශයෙන්- ඖද්ධත්‍ය වශයෙන්- විචිකිත්සා වශයෙන්- අනුශය වශයෙන් නො යෙති, වර්ග වූ ධර්මයන් විසින් නො යැවෙති, නො පමුණුවනු ලැබෙති, නො ගෙන යනු ලැබෙත්. මෙසෙයින් ඒ පසේ බුදුහු 'නො යෙති' "නාග" නම් වෙත්.

කිසෙයින් ඒ පසේබුදුහු 'නො එති' නාග නම් වෙති යත්: සෝවාන් මගින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා වටාලා නො එති, පෙරළා නො එති, ආපසු නො එති, සෙදගැමි මගින්... අනාගැමිමගින් ... රහත්මගින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා වටාලා නො එති, පෙරළා නො එති, ආපසු නො එත් මෙසෙයින් ඒ පසේබුදුහු 'නො එති' නාග නම් වෙති.

**නාගොව යූථානි විවජ්ජයිත්වාති:** යථා සො හත්ථිනාගො යූථානි විවජ්ජයිත්වා පරිවජ්ජෙත්වා අභිනිවජ්ජෙත්වා එකො අරඤ්ඤෙ වනමජ්ඣොගාහෙත්වා[1] චරති ඉරියති පාලෙති යපෙති යාපෙති. පච්චෙකසම්බුද්ධොපි ගණං විවජ්ජෙත්වා පරිවජ්ජෙත්වා අභිනිවජ්ජෙත්වා එකො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති, අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො ගච්ඡති, එකො තිට්ඨති, එකො නිසීදති, එකො සෙය්‍යං කප්පෙති, එකො ගාමං පිණ්ඩාය පවිසති, එකො පටික්කමති, එකො රහො නිසීදති, එකො චඞ්කමං අධිට්ඨාති, එකො චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති 'යාපෙතීති නාගොව යූථානි පරිවජ්ජයිත්වා.'

**සඤ්ජාතඛන්ධො පදුමී උළාරොති;** යථා සො හත්ථිනාගො සඤ්ජාතඛන්ධො සත්තරතනො වා හොති අට්ඨරතනො වා. පච්චෙකසම්බුද්ධොපි සඤ්ජාතඛන්ධො අසෙක්ඛෙන සීලක්ඛන්ධෙන අසෙක්ඛෙන සමාධික්ඛන්ධෙන අසෙක්ඛෙන පඤ්ඤාක්ඛන්ධෙන අසෙක්ඛෙන විමුත්තික්ඛන්ධෙන අසෙක්ඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන. යථා සො හත්ථිනාගො පදුමී. පච්චෙකසම්බුද්ධොපි සත්තහි බොජ්ඣඞ්ගපුප්ඵෙහි පදුමී. සතිසම්බොජ්ඣඞ්ගපුප්ඵෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගපුප්ඵෙන විරිය සම්බොජ්ඣඞ්ගපුප්ඵෙන පීතිසම්බොජ්ඣඞ්ගපුප්ඵෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ග පුප්ඵෙන සමාධිසම්බොජ්ඣඞ්ගපුප්ඵෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගපුප්ඵෙන යථා සො හත්ථිනාගො උළාරො ථාමෙන බලෙන ජවෙන සූරෙන පච්චෙකසම්බුද්ධොපි උළාරො සීලෙන සමාධිනා පඤ්ඤාය විමුත්තියා විමුත්තිඤාණදස්සනෙනාති-සඤ්ජාතඛන්ධො පදුමී උළාරො.

**යථාභිරන්තං විහරං[2] අරඤ්ඤෙති;** යථා සො හත්ථිනාගො යථාභිරන්තං අරඤ්ඤෙ විහරති, පච්චෙකසම්බුද්ධොපි යථාභිරන්තං අරඤ්ඤෙ විහරති, පඨමෙනපි ඣානෙන යථාභිරන්තං අරඤ්ඤෙ විහරති, දුතියෙනපි ඣානෙන - තතියෙනපි ඣානෙන - චතුත්ථෙනපි ඣානෙන යථාභිරන්තං අරඤ්ඤෙ විහරති, මෙත්තායපි චෙතොවිමුත්තියා යථාභිරන්තං අරඤ්ඤෙ විහරති, කරුණායපි චෙතොවිමුත්තියා - මුදිතායපි චෙතොවිමුත්තියා - උපෙක්ඛායපි චෙතොවිමුත්තියා යථාභිරන්තං අරඤ්ඤෙ විහරති, ආකාසානඤ්චායතනසමාපත්තියාපි යථාභිරන්තං අරඤ්ඤෙ විහරති, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියාපි - ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියාපි - නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියාපි - නිරොධසමාපත්තියාපි - ඵලසමාපත්තියාපි යථාභිරන්තං අරඤ්ඤෙ විහරතීති 'යථාභිරන්තං විහරං අරඤ්ඤෙ එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

1. අරඤ්ඤෙ වනමජ්ඣොගාහෙත්වා - ච වි
2. විහරෙ - ම ජ සං

**නාගො ච යූථානි විවජ්ජයිත්වා** යනු: යම්සේ ඒ හස්තිනාග ඇත්මුළ හැරපියා දුරු කොට වර්ජනය කොට එකලා වැ අරනෙහි වල්වැද හැසිරේ ද ඉරියව් පවත්වා ද රැකේ ද යැපේ ද යාපනය කෙරේ ද. එසෙයින් පසේබුදුහු ද ගණය හැරපියා දුරු කොට වර්ජනය කොට එකලා වැ අරනෙහි අල්පශබ්ද ඇති අල්පනිර්ඝොෂ ඇති ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස් කමට නිසි වූ විවේකයට සරුප් වූ දුරු සෙනසුන් ප්‍රාන්ත සෙනසුන් සෙවනය කෙරෙති. ඔබ එකලා වැ යෙති එකලා වැ සිටිති එකලා වැ හිඳිති එකලා වැ ශයනය කෙරෙති, එකලා වැ පිඩු පිණිස ගම්වදිති එකලා වැ පෙරළා එති එකලා වැ රහසැ හිඳිති එකලා වැ සක්මන් කරති එකලා වැ හැසිරෙති වෙසෙති ඉරියව් පවත්වති වැටෙති රැකෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'නාගො' ච යූථානි පරිවජ්ජයිත්වා' යනු වේ.

**සඤ්ජාතඛන්ධො පදුමී උළාරො** යනු: යම්සේ ඒ හස්තිනාග වැඩුණු කඳ ඇත්තේ සත්රියන් පමණ හෝ අටරියන් පමණ හෝ වෙයි. පසේ බුදුහු ද අශෛක්ෂ වූ ශීලස්කන්ධයෙන් අශෛක්ෂ වූ සමාධිස්කන්ධයෙන් අශෛක්ෂ වූ ප්‍රඥාස්කන්ධයෙන් අශෛක්ෂ වූ විමුක්තිස්කන්ධයෙන් අශෛක්ෂ වූ විමුක්තිඥානදර්ශන ස්කන්ධයෙන් වැඩුණු කඳ ඇතියහ. යම්සේ ඒ හස්තිනාග තෙමේ පද්මකුල සම්භව වූයේ ද එසෙයින් පසේබුදුහු ද සප්තබොධ්‍යඞ්ග පුෂ්පයෙන් පියුම් බන්දහ: ස්මෘති සම්බොධ්‍යඞ්ගපුෂ්පයෙන, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගපුෂ්පයෙන, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගපුෂ්පයෙන, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගපුෂ්පයෙන, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගපුෂ්පයෙන, සමාධිසම්බොධ්‍යඞ්ගපුෂ්පයෙන, උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගපුෂ්පයෙනි. යම්සේ ඒ හස්තිනාග තෙම වීර්‍ය්‍යයෙන් බලයෙන් ජවයෙන් ශූරත්වයෙන් මහත් වේ ද, එසෙයින් පසේබුදුහුද ශීලයෙන් සමාධියෙන් ප්‍රඥායෙන් විමුත්තියෙන් විමුක්තිඥානදර්ශනායෙන් මහත් වෙත් නුයි 'සඤ්ජාතඛන්ධො පදුමී උළාරො' යනු වේ.

**යථාභිරන්තං විහරං අරඤ්ඤෙ** යනු: යම්සේ ඒ හස්තිනාග සිත්සේ වෙනෙහි වෙසේ ද, එසෙයින් පසේබුදුහු ද සිත්සේ වෙනෙහි වෙසෙති. ප්‍රථමධ්‍යානයෙනුදු සිත්සේ වෙනෙති වෙසෙති ද්විතියධ්‍යානයෙනුදු– තෘතියධ්‍යානයෙනුදු– චතුර්ථධ්‍යානයෙනුදු සිත්සේ වෙනෙහි වෙසෙති. මෛත්‍රිචිත්ත විමුක්තියෙනුදු සිත්සේ වෙනෙහි වෙසෙති කරුණා චිත්තවිමුක්තියෙනුදු – මුදිතාචිත්තවිමුක්තියෙනුදු – උපෙක්ෂාචිත්තවිමුක්ති යෙනුදු සිත්සේ වෙනෙහි වෙසෙති. ආකාශානඤ්චායතනසමාපත්තියෙනුදු සිත්සේ වෙනෙහි වෙසෙති. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙනුදු– ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙනුදු– නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙනුදු– නිරොධසමාපත්තියෙනුදු ඵලසමාපත්තියෙනුදු සිත්සේ වෙනෙහි වෙසෙත් නුයි 'යථාභිරන්තං විහරං අරඤ්ඤෙ එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"නාගොව යූථානි විවජ්ජයිත්වා
සඤ්ජාතඛන්ධො පදුමී උළාරො,
යථාභිරන්තං විහරං අරඤ්ඤෙ
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

10

අට්ඨානතං සඞ්ගණිකාරතස්ස
යං ඵස්සයෙ[1] සාමයිකං[2] විමුත්තිං,
ආදිච්චබන්ධුස්ස වචො නිසම්ම
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**අට්ඨානතං සඞ්ගණිකාරතස්ස යං ඵස්සයෙ සාමයිකං විමුත්තින්ති:** වුත්තං හෙතං භගවතා. "සො වතානන්ද භික්ඛු සංගණිකාරාමො සංගණිකාරතො[3] සංගණිකාරාමතං අනුයුත්තො, ගණාරාමො ගණරතො ගණසම්මුදිතො[4] ගණාරාමතං අනුයුත්තො යං තං නෙක්ඛම්මසුඛං පවිවෙකසුඛං උපසමසුඛං සම්බොධසුඛං, තස්ස සුඛස්ස නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභීති නෙතං ඨානං විජ්ජති සො ච ඛො සො ආනන්ද, භික්ඛු එකො ගණස්මා වූපකට්ඨො විහරති, තස්සෙතං භික්ඛුනො පාටිකඞ්ඛං: යං තං නෙක්ඛම්මසුඛං පවිවෙකසුඛං උපසමසුඛං සම්බොධසුඛං, තස්ස සුඛස්ස නිකාමලාභී භවිස්සති අකිච්ඡලාභී අකසිරලාභීති ඨානමෙතං විජ්ජති. සො වතානන්ද භික්ඛු සඞ්ගණිකාරාමො සඞ්ගණිකරතො සංගණිකාරාමතං අනුයුත්තො ගණාරාමො ගණරතො ගණසම්මුදිතො ගණාරාමතං අනුයුත්තො සාමයිකං වා[5] සන්තං චෙතොවිමුත්තිං[6]. උපසම්පජ්ජ විහරිස්සති අසාමයිකං වා අකුප්පන්ති නෙතං ඨානං විජ්ජති. යො ච ඛො සො ආනන්ද භික්ඛු එකො ගණස්මා වූපකට්ඨො විහරති, තස්සෙතං භික්ඛුනො පාටිකඞ්ඛං සාමයිකං වා සන්තං චෙතොවිමුත්තිං උපසම්පජ්ජ විහරිස්සති, අසාමයිකං වා අකුප්පන්ති ඨානමෙතං විජ්ජතී"ති[a] අට්ඨානතං සංගණිකාරතස්ස යං ඵස්සයෙ සාමයිකං විමුත්තිං.

**ආදිච්චබන්ධුස්ස වචො නිසම්මාති** 'ආදිච්චො' වුච්චති සූරියො සො ගොතමො ගොත්තෙන පච්චෙකසම්බුද්ධොපි ගොතමො ගොත්තෙන සො පච්චෙකසම්බුද්ධො සූරියස්ස ගොත්තඤාතකො ගොත්තබන්ධු, තස්මා පච්චෙකසම්බුද්ධො ආදිච්චබන්ධු. ආදිච්චබන්ධුස්ස වචො නිසම්මාති ආදිච්චබන්ධුස්ස වචනං බ්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං[7] සුත්වා සුණිත්වා උග්ගහෙත්වා උපධාරයිත්වා උපලක්ඛයිත්වාති 'ආදිච්චබන්ධුස්ස වචො නිසම්ම එකො චරෙ ඛග්ගවිසාණකප්පො,.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"අට්ඨානතං සඞ්ගණිකාරතස්ස
යං ඵස්සයෙ සාමයිකං විමුත්තිං,
ආදිච්චබන්ධුස්ස වචො නිසම්ම
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

**දුතියො වග්ගො.**

---

1. ඵුස්සයෙ – ස්‍යා
2. සමායිකං – ව වි
3. සංගණිකරතො – ම ඡ සං.
4. ගණිසමුදිතො – ව වි
5. සාමායිකං – ම ඡ සං
6. සන්තං චෙතොවිමුත්තිං – ව වි ක
7. අනුසිට්ඨිං – මඡසං
a. මජ්ඣිමනිකාය – මහාසුඤ්ඤතසුත්ත

එයින් වදාළහ ඒ පසේබුදුහු:

''නාගො'ව යූථානි විවජ්ජයිත්වා -පෙ- එකො චරෙ ඛග්ගවිසාණ කප්පො'' යි.

10.

යමෙක් යම් කරුණෙකින් සාමයික විමුක්තිය (ලෞකිකසමාපත්තිය) අධිගම කෙරේ නම් ගණයෙහි ඇලුණහුට ඒ අස්ථාන යැ යන පසේබුදුන්ගේ වචනය අසා කඟවෙහෙණ හඟෙක් සෙයින් එකලා වැ සරනෙමි.

අට්ඨානතං සඞ්ගණිකාරතස්ස යං ඵස්සයෙ සාමයිකං විමුත්තිං යනු: මේ වදාරනලද මැ යි භාග්‍යවතුන් විසින්: ''ආනන්දය, එකැතින් ඒ මහණ සඞ්ගණයා කෙරෙහි ඇලෙනුයේ ස්වගණයා කෙරෙහි ඇලුණේ සඞ්ගණයා කෙරෙහි ඇලුම් කරන බැව්හි යෙදුණේ ගණයෙහි ඇලුම් ඇත්තේ ගණයෙහි ඇලුණේ ගණයෙහි තුටු වූයේ ගණයෙහි ඇලුම් කරණ බැව්හි යෙදුණේ ' යම් නෛෂ්ක්‍රම්‍යසුඛයෙක් ප්‍රවිවෙකසුඛයෙක් පලසමවත් සුවයෙක් මාර්ගසුඛයෙක් වේ ද එ සුවය කැමැතියේ ලබනසුලු නිදුකින් ලබනසුලු විපුල වැ ලබනසුලු වන්නේ යැ' යන තෙල කරුණ නො පැනෙයි. තවද ආනන්දය, යම් මහණෙක් එකලා වැ ගණයෙන් පහ වැ වාසය කෙරේ ද ඒ මහණහට මෙය කැමැතිවිය යුතුයැ: යම් නෛෂ්ක්‍රම්‍ය සුඛයෙක් ප්‍රවිවෙක සුඛයෙක් ඵලසමාපත්ති සුඛයෙක් මාර්ගසුඛයෙක් වේ නම් ඒ සුඛය කැමැති සේ ලබනසුලු නිදුකින් ලබන සුලු විපුල වැ ලබන සුලු වන්නේ යැ යන තෙල කරුණ පැනෙයි. ආනන්දය; එකැතින් ඒ මහණ තෙම සඞ්ගණයෙහි ඇලුම් ඇත්තේ ස්වගණයෙහි ඇලුණේ ස්වගණයෙහි ඇලෙන බැව්හි යෙදුණේ ගණයෙහි ඇලුම් ඇත්තේ ගණයෙහි ඇලුණේ ගණයෙහි තුටු වූයේ ගණයෙහි ඇලෙන බැව්හි යෙදුණේ ලෞකික ශාන්තවිමුක්තියට හෝ ලොකොත්තර වූ අකොප්‍යය (මාර්ගය) ට හෝ පැමිණ වාස කරන්නේ යැ යන තෙල කරුණ නො පැනෙයි. තවද ආනන්දය යම් මහණෙක් එකලා වැ ගණයෙන් පහ වැ වාස කෙරේ ද, එ මහණහට මෙය කැමැති වියයුතු යැ: ලෞකික ශාන්තවිමුක්තියට පැමිණ හෝ ලොකොත්තර මාර්ගයට පැමිණ හෝ වාසය කරන්නේ යැ යි තෙල කරුණ පැනේ යයි 'අට්ඨානතං සඞ්ගණිකාරතස්ස යං ඵස්සයෙ සාමයිකං විමුත්තිං' යනු වේ.

ආදිච්චබන්ධුස්ස වචො නිසම්ම – 'ආදිච්චො' යි සූර්‍ය්‍යයා කියනු ලැබෙයි. හේ ගොත්‍රයෙන් ගෞතම යැ පසේ බුදුහු ද ගොත්‍රයෙන් ගෞතම යැ ඒ පසේ බුදුහු සූර්‍ය්‍යහට ගොත්‍රඥාතිහ, ගොත්‍ර බන්ධුහ, එයින් පසේබුදුහු ආදිත්‍යබන්ධු වෙති. ආදිච්චබන්ධුස්ස වචො නිසම්මා යනු: සූර්‍ය්‍යබන්ධුහුගේ වචනය වාක්පථය දෙශනාව අනුශාසනාව අසා අසාගෙන උගෙනැ විමසා සලකා තුයි 'ආදිච්චබන්ධුස්ස වචො නිසම්ම එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදාළහ ඒ පසේ බුදුහු:

''අට්ඨානතං සඞ්ගණිකා රතස්ස -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.

දෙ වැනි වග නිමි.

1.

දිට්ඨිවිසූකානි උපාතිවත්තො
පත්තො නියාමං පටිලද්ධමග්ගො,
උප්පන්නඤාණොම්හි අනඤ්ඤනෙය්‍යො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**දිට්ඨිවිසූකානි උපාතිවත්තොති** 'දිට්ඨිවිසූකානි' වුච්චන්ති වීසතිවත්ථුකා සක්කායදිට්ඨි. "ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො, අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං, වෙදනං– සඤ්ඤං සඞ්ඛාරෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨි ගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං ගාහො පතිට්ඨාහො[1] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො[3] විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො අයාථාවතස්මිං[2] යාථාවතන්ති ගාහො යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි ඉමානි දිට්ඨිවිසූකානි" දිට්ඨිවිසූකානි උපාතිවත්තොති දිට්ඨිවිසූකානි උපාතිවත්තො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තොති 'දිට්ඨිවිසූකානි උපාතිවත්තො'.

**පත්තො නියාමං පටිලද්ධමග්ගොති** 'නියාමා' වුච්චන්ති චත්තාරො මග්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. චතූහි අරියමග්ගෙහි සමන්නාගතො නියාමං පත්තො සම්පත්තො අධිගතො ඵස්සිතො සච්ඡිකතොති 'පත්තො නියාමං'. පටිලද්ධමග්ගොති ලද්ධමග්ගො ටිලද්ධමග්ගො අධිගතමග්ගො ඵස්සිතමග්ගො සච්ඡිකතමග්ගොති 'පත්තො නියාමං පටිලද්ධමග්ගො'.

---

1. පටිග්ගාහො – ම ඡ සං
2. අයාථාවකස්මිං – ම ඡ සං
3. විපරියාසග්ගාහො – ම ඡ සං

1.

දෘෂ්ටිවිසූකයන් (සත්කායදෘෂ්ටිය හෝ දෙ සැට මිථ්‍යාදෘෂ්ටිය ප්‍රථමමාර්ගයෙන්) ඉක්මවූයෙම් සම්මත්තනියාමයට පැමිණියෙම් ලබන ලද ශෛෂමාර්ග ඇතියෙම් උපන් ප්‍රත්‍යෙකබොධිඥාන ඇතියෙම් වෙමි. එහෙයින් අනෙකක්හු විසින් සත්‍යාවබොධයට නො පැමිණැවිය යුතු වූයෙම් කගවෙහෙණ හඟක් සෙයින් එකලා වැ සරනෙම්.

දිට්ඨිවිසූකානි උපාතිවත්තො- 'දෘෂ්ටිවිසූකයො' යි විංශද්වස්තුක සත්කාය දෘෂ්ටි කියනු ලැබෙති. ''මෙලොවැ (බුද්ධාදි) ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි නො හික්මුණු සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුණු අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්ම විසින් සංඥාවිපර්‍ය්‍යාසයෙන් දකී. ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ දකී. වෙදනාව– සංඥාව– සංස්කාරයන් විඥානය ආත්ම විසින් සංඥාවිපර්‍ය්‍යාසයෙන් දකී. ආත්මය විඥානය ඇතියක් කොට හෝ විඥානය ආත්මයෙහි ලා හෝ ආත්මය විඥානයෙහි ලා හෝ දකී. යම් මෙබඳු දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටිවිසූකයෙක් දෘෂ්ටිවිස්ඵන්දිතයෙක් දෘෂ්ටිසංයොජනයෙක් දඩි වැ ගැන්මෙක් පිහිටාගැන්මෙක් වැදගැන්මෙක් පරාමර්ශයෙක් කුමඟෙක් අයථාමාර්ගයෙක් මිථ්‍යාස්වභාවයෙක් (අනර්ත්ථයට නිවාසවූ තිර්ථායතනයෙක් විපර්‍ය්‍යාසග්‍රහණයෙක් විපරීතග්‍රහණයෙක් විපල්ලාසග්‍රාහයෙක් මිථ්‍යාග්‍රහණයෙක් අයථාස්වභාවයෙහි යථාස්වභාව යැයි ගැන්මෙක් යම් පමණ දෙසැට දෘෂ්ටිගතයෙක් වේ ද මොහු දෘෂ්ටි විසූකයෝ යි.'' දිට්ඨිවිසූකානි උපාතිවත්තො යනු: දෘෂ්ටිවිසූකයන් බැහැර කෙළෙම් ඉක්මවූයෙම් මොනොවට ඉක්මවූයෙම් වෙසෙයින් ඉක්මවූයෙම් නු යි 'දිට්ඨිවිසූකානි උපාතිවත්තො' යනු වේ.

පත්තො නියාමං පටිලද්ධමග්ගො– 'නියාමයෝ'යි සතරමාර්ගය ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය කියනු ලැබෙති. හෙමෙසේයි යැ: සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සංකල්ප යැ සම්‍යග් වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යැ යි සතර ආර්‍ය්‍ය මාර්ගයෙන් සමන්වාගත වූයෙම් සම්මත්තනියාමයට පැමිණියෙම් මොනොවට පැමිණියෙම් අධිගම කෙළෙම් ස්පර්ශ කෙළෙම් ප්‍රත්‍යක්ෂ කෙළෙම් නුයි 'පත්තො නියාමං' යනු වේ. පටිලද්ධමග්ගො යනු: ලබන ලද මාර්ග ඇතියෙම් ප්‍රතිලාභ කළ මාර්ග ඇතියෙම් අධිගම කළ මාර්ග ඇතියෙම් ස්පර්ශ කළ මාර්ග ඇතියෙම් ප්‍රත්‍යක්ෂ කළ මාර්ග ඇතියෙම් නුයි 'පත්තො නියාමං පටිලද්ධමග්ගො' යනු වේ.

උප්පන්නඤාණොම්හි අනඤ්ඤනෙය්‍යොති තස්ස පච්චෙකසම්බුද්ධස්ස ඤාණං උප්පන්නං සමුප්පන්නං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති ඤාණං උප්පන්නං සමුප්පන්නං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං, ‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති –පෙ– ‘සබ්බෙ ධම්මා අනත්තා’ති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම’න්ති ඤාණං උප්පන්නං සමුප්පන්නං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතන්ති ‘උප්පන්නඤාණොම්හි’, ‘අනඤ්ඤනෙය්‍යොති: සො පච්චෙකසම්බුද්ධො න පරනෙය්‍යො, න පරපත්තියො, න පරප්පච්චයො න පරපටිබද්ධගූ’[1] යථාභූතං ජනාති! පස්සති අසම්මූළ්හො සම්පජානො[2] පතිස්සතො සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති න පරනෙය්‍යො න පරපත්තියො න පරප්පච්චයො න පරපටිබද්ධගූ යථාභූතං ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතො[3] ‘සබ්බෙ සංඛාරා දුක්ඛා’ති –පෙ– සබ්බෙ ධම්මා අනත්තා’ති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධම්ම’න්ති න පරනෙය්‍යො න පරපත්තියො න පරප්පච්චයො න පටිබද්ධගූ: යථාභූතං ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතොති ‘උප්පන්නඤාණොම්හි අනඤ්ඤනෙය්‍යො, එකො චරෙ ඛග්ගවිසාණකප්පො’.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

“දිට්ඨිවිසූකානි උපාතිවත්තො
පත්තො නියාමං පටිලද්ධමග්ගො,
උප්පන්නඤාණොම්හි අනඤ්ඤනෙය්‍යො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො”ති.

2.

නිල්ලොලුප්පො[4] නික්කුහො නිප්පිපාසො
නිම්මක්ඛො නිද්ධන්තකසාවමොහො,[5]
නිරාසසො සබ්බලොකෙ භවිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

නිල්ලොලුප්පො නික්කුහො නිප්පිපාසොති ‘ලොලුප්පං’ වුච්චති තණ්හා. “යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං” සා ලොලුප්පා තණ්හා පච්චෙකසම්බුද්ධස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාව කතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා පච්චෙකසම්බුද්ධො නිල්ලොලුප්පො[4]. නික්කුහොති: තීණි කුහනවත්ථූනි: පච්චය පටිසෙධන සඞ්ඛාතං[6] කුහනවත්ථු, ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු, සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

1. පටිබන්ධග – ච වි
2. තංජානාති – ච වි
3. පටිපස්සතො – ච වි ම ජ සං
4. නිලොලුපො – ච.වි
5. කාසාමොහො – මජසං, ච,වි,ක
6. පච්චයපටිසෙවන සංඛාතං – මජසං

උප්පන්නඤාණොම්හි අනඤ්ඤනෙය්‍යො— ඒ පසේ බුදුනට ප්‍රත්‍යෙක බොධිඥානය උපන මොහොවට උපන නිපන වෙසෙසින් නිපත පහළ විය. 'හැම සංස්කාරයෝ අනිත්‍යහ'යි ඥානය උපන මොහොවට උපන නිපන වෙසෙසින් නිපන පහළ විය. 'හැම සංස්කාරයෝ දුඃඛයහ' යි . . . 'හැම ධර්මයෝ අනාත්මහ'යි ... යම් කිසි සමුදය ධර්මයෙක් වේ නම් එ හැම නිරොධ සවභාවය ඇතැ'යි ඥානය උපන, මොහොවට උපන නිපන වෙසෙසින් නිපන පහළ වී නුයි 'උප්පන්නඤාණොම්හි' යනු වේ. අනඤ්ඤනෙය්‍යො යනු: ඒ පසේබුදුහු මෙරමා විසින් සත්‍යාවබොධයට නො පැමිණ විය යුත්තාහ. අනෙකක්හු විසින් නො හැදැහැවිය යුත්තාහ. පරප්‍රත්‍යය රහිතයහ මෙරමා පිළිබැඳි ඥානගති නැතියහ. මුළා නො වූවාහු සම්‍යග් ඥාන ඇතියාහු සිහි ඇතියාහු ඇති සැටියෙන් දනිති, දකිති. හැම සංස්කාරයෝ දුඃඛයහ'යි .... හැම ධර්මයෝ අනාත්මහ'යි... යම් කිසි සමුදය ධර්මයෙක් වේ නම් එ හැම නිරොධසවභාවය ඇතැ'යි මෙරමා විසින් සත්‍යාවබොධයට නො පැමිණවිය යුත්තාහ අනෙකක්හු විසින් නො හැදැහැවිය යුත්තාහ, පරප්‍රත්‍යය රහිතයහ, මෙරමා පිළිබැඳි ඥානගති නැතියහ. නො මුළා වැ සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති වැ ඇති සැටියෙන් දනිති, දකිත් නුයි 'උප්පන්නඤාණොම්හි අනඤ්ඤනෙය්‍යො එකොචරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

''දිට්ඨිවිසූකානි උපාතිවත්තො –පෙ– එකො චරෙ ඛග්ගවිසාණ කප්පො'' යි.

2.

(රසතෘෂ්ණායෙහි) ලොල් නො වූයෙම් කුහක නො වූයෙම් (මිහිරිරස බුදිනු කැමැති) පවස් නැතියෙම් මකු නො වූයෙම් බැහැර කළ රාගාදිකසට හා මොහය හා ඇතියෙම් මුළුලොවහි තෘෂ්ණා රහිත වැ කඟවෙහෙණහක් සෙයින් එකලා වැ සරනෙම්.

නිල්ලොලුපො නික්කුහො නිප්පිපාසො— 'ලොලුප්ප' යි තෘෂ්ණාව කියනු ලැබෙයි. ''යම් රාගයෙක් බලවත් රාගයෙක්... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි, ඒ ලොලුප්ප සඞ්ඛ්‍යාත තෘෂ්ණාව පසේබුදුනට ප්‍රහීණ යැ උසුන්මුල් ඇත්තී යැ, හිස්සුන් තාලවස්තුවක් සෙයින් කරන ලද යැ. අනු අභාවය කරන ලද යැ, මත්තෙහි නූපදනා සැහැවි ඇත්තී යැ, එයින් පසේබුදුහු 'නිල්ලොලුප' නම් වෙති. නික්කුහො යනු: කුහනවස්තුහු තිදෙනෙකි: ප්‍රත්‍යය ප්‍රතිෂෙධ සංඛ්‍යාත කුහනවස්තු යැ ඊර්‍යාපථ සඞ්ඛ්‍යාත කුහනවස්තු යැ සාමන්තජල්ප සඞ්ඛ්‍යාත කුහනවස්තු යැ යි.

කතමං පච්චයපටිසෙධනසංඛාතං[1] කුහනවත්ථු: "ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති: චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරෙහි සො පාපිච්ඡො ඉච්ඡාපකතො අත්ථිකො චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං භිය්‍යොකම්‍යතං උපාදාය චීවරං පච්චක්ඛාති, පිණ්ඩපාතං පච්චක්ඛාති, සෙනාසනං පච්චක්ඛාති, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පච්චක්ඛාති, සො එවමාහ: කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන එතං සාරුප්පං: යං සමණො සුසානා වා සඞ්කාර-කූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සංඝාටිකං කත්වා ධාරෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන පිණ්ඩපාතෙන: එතං සාරුප්පං යං සම-ණො උඤ්ඡාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිකං කප්පෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන සෙනාසනෙන, එතං සාරුප්පං: යං සමණො රුක්ඛමූලිකො වා අස්ස සොසානිකො වා අබ්භොකාසිකො වා. කිං සමණස්ස මහග්ඝෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන එතං සාරුප්පං යං සමණො පූතිමුත්තෙන වා හරිතකීඛණ්ඩෙන වා ඔසධං කරෙය්‍යාති තදුපාදාය ලූඛං චීවරං ධාරෙති, ලූඛං පිණ්ඩපාතං පරිභුඤ්ජති, ලූඛං සෙනාසනං පටිසෙවති, ලූඛං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති. තමෙනං ගහපතිකා එවං ජානන්ති; 'අයං සමණො අප්පිච්ඡො සන්තුට්ඨො පවිවිත්තො අසංසට්ඨො ආරද්ධවිරියො ධුතවාදො'ති භිය්‍යො භිය්‍යො නිමන්තෙන්ති[2] චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරෙහි. සො එවමාහ: තිණ්ණං සම්මුඛීභාවා සද්ධො කුල-පුත්තො බහුං පුඤ්ඤං පසවති සද්ධාය සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති දෙය්‍යධම්මස්ස සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති, දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. තුම්හාකං චෙවායං සද්ධා අත්ථි දෙය්‍යධම්මො ච සංවිජ්ජති අහං ච පටිග්ගාහකො. සචෙහං[3] න පටිග්ගහෙස්සාමි එවං තුම්හෙ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ, න මය්හං ඉමිනා අත්ථො තුම්හාකංයෙව[4] අනුකම්පාය පටිග්ගණ්හාමීති, තදුපාදාය බහුම්පි චීවරං පටිග්ගණ්හාති බහුම්පි පිණ්ඩපාතං පටිග්ගණ්හාති බහුම්පි සෙනාසනං පටිග්ගණ්හාති බහුම්පි ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිග්ගණ්හාති, යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං පච්චයපටිසෙධනසඞ්ඛාතං කුහනවත්ථු.

1. පච්චය පටිසෙවන සඞ්ඛාතං – ම ඡ සං
2. භිය්‍යොනිමන්තෙන්ති – ප ච වි
3. සචෙ අහං – ම ච වි ක
4. තුම්හාකඤ්ඤෙව – ම ච වි ක

ප්‍රත්‍යය ප්‍රතිෂෙධන සඞ්ඛ්‍යාත කුහනවස්තු නම් කවරැ යත්: මෙ ලෙව්හි ගැහැවියෝ සිවුරු– පිඩුවා– සෙනසුන්– ගිලන්පස බෙහෙසත් පිරිකරින් මහණක්හු නිමන්ත්‍රණය කෙරෙති. හෙතෙම (නැතිගුණ දක්වන) පාපෙච්ඡා ඇත්තේ ඉච්ඡායෙන් මඩනාලදුයේ අර්ථී වූයේ සිවුරු– පිඩුවා– සෙනසුන්– ගිලන්පස බෙහෙසත්පිරිකර බොහෝ කැමැති බව නිසා සිවුර පිළිකෙව් කෙරෙයි, පිඩුවා පිළිකෙව් කෙරෙයි සෙනසුන පිළිකෙව් කෙරෙයි, ගිලන්පස බෙහෙසත්පිරිකර පිළිකෙව් කෙරේ. හේ මෙසේ කියයි: මහණහට මහඇගි සිවුරින් කවර අර්ථ යැ, මහණ සොහොනින් හෝ කසළගොඩින් හෝ අවුණුදෙරින් හෝ කඩරෙදි අවුළා සඟළ කොට දරන්නේ යැ යන යමෙක් වේ ද, තෙල සාරූප්‍ය වෙයි. මහණහට මහඇගි පිඩුවායෙන් කවර අර්ත්ථ යැ, මහණ සිඟා ලද පිඩු අහරින් දිවි රක්නේ යැ යන යමෙක් වේ ද, තෙල සාරූප්‍ය වෙයි. මහණහට මහඇගි සෙනසුනින් කවර අර්ත්ථ යැ, මහණ රුක්මුල් සෙනසුන් ඇත්තේ හෝ සොහොන්හි වසන්නේ හෝ අබොවස් සෙනසුන් ඇත්තේ හෝ වන්නේ යැ යන යමෙක් වේ ද තෙල සාරූප්‍ය වෙයි, මහණහට මහඇගි ගිලන්පස බෙහෙසත්පිරිකරින් කවර අර්ත්ථ යැ, මහණ ගොමූත්‍රයෙන් හෝ අරළුකඩෙකින් හෝ බෙහෙසත් කිස කරන්නේ යැ යන යමෙක් වේ ද තෙල සාරූප්‍ය වේයයි. හේ එතැන් පටන් රළු සිවුරු දරයි. රළු පිඩුවා බුදියි. රළු සෙනසුන් සෙවුනේ යැ රළු ගිලන්පස බෙහෙසත් පිරිකර සෙවුනේ යැ, ගැහැවියෝ ඔහු මෙසෙයින් දනිති: ''මෙ මහණ අපිස් ගුණ ඇත්තේ යැ සතොස්ගුණ ඇත්තේ යැ ප්‍රකර්ෂවිවේක ඇත්තේ යැ ගණසඞ්ගණිකා රහිත යැ රුකුළුවැර ඇත්තේ යැ ධූතයෙහි අනුසස් කියන්නේ යැ'යි මතුමත්තෙහි සිවුරු– පිඩුවා– සෙනසුන්–ගිලන්පස බෙහෙසත් පිරිකරින් පවරති. හේ මෙසේ කියයි: තිදෙනකුන්ගේ හමුවීමෙන් සැදූහැති කුලපුත් බොහෝ පින් රැස් කෙරෙයි. සැදැහැ ඇති බැවින් සැදැහැති කුලපුත් බොහෝ පින් රැස් කෙරෙයි. දෙයධර්ම ඇති බැවින් සැදූහැති කුලපුත් බොහෝ පින් රැස් කෙරෙයි. දක්ෂිණාර්හයන් ඇති බැවින් සැදැහැති කුලපුත් බොහෝ පින් රැස් කෙරේ. තොපට මැ මේ සැදූහැ ඇත, දෙයධර්මය ද ඇති, මම ද ප්‍රතිග්‍රාහකයෙමි. ඉදින් මම නො පිළිගන්නෙම් නම් මෙසෙයින් තෙපි පිනින් බැහැර වන්නවූ ය. මට මෙයින් අර්ත්ථ නැති. තොපට මැ අනුග්‍රහ පිණිස පිළිගනිමී, එතැන් පටන් බොහෝ සිවුරු ද පිළිගනී. බොහෝ පිඩුවා ද පිළිගනී. බොහෝ සෙනසුන් ද පිළිගනී බොහෝ ගිලන්පස බෙහෙසත් පිරිකර ද පිළිගනී. යම් මෙබඳු මුව හැකිළීමෙක් මුව හකුළන බවෙක් විස්මය ගැන්වීමෙක් විස්මය ගන්වන අයුරෙක් විස්මය කළ බවෙක් වේ ද, මේ ප්‍රත්‍යය ප්‍රතිෂෙධන සඞ්ඛ්‍යාත කුහනවස්තු නම්.

කතමං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු: ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො, එවං මං ජනො සම්භාවිස්සතීති ගමනං සණ්ඨපෙති ඨානං සණ්ඨපෙති නිසජ්ජං සණ්ඨපෙති සයනං සණ්ඨපෙති පණිධාය ගච්ඡති, පණිධාය තිට්ඨති, පණිධාය නිසීදති, පණිධාය සෙය්‍යං කප්පෙති, සමාහිතො විය ගච්ඡති, සමාහිතො විය තිට්ඨති, සමාහිතො විය නිසීදති, සමාහිතො විය සෙය්‍යං කප්පෙති[1] ආපාථකජ්ඣායීව හොති[2] යා එවරූපා ඉරියාපථස්ස අට්ඨපනා ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු; ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො එවං මං ජනො සම්භාවෙස්සතීති අරියධම්මසන්නිස්සිතං වාචං භාසති. යො එවරූපං චීවරං ධාරෙති, සො සමණො මහෙසක්ඛොති භණති, යො එවරූපං පත්තං ධාරෙති, ලොහථාලකං ධාරෙති, ධම්මකරකං[3] ධාරෙති, පරිස්සාවනං ධාරෙති, කුඤ්චිකං ධාරෙති, උපාහනං ධාරෙති, කායබන්ධනං ධාරෙති, ආයොගං ධාරෙති[4], සො සමණො මහෙසක්ඛොති භණති. යස්ස එවරූපො උපජ්ඣායො සො සමණො මහෙසක්ඛොති, භණති, යස්ස එවරූපො ආචරියො, එවරූපා සමානුපජ්ඣායකා සමානාචරියකා මිත්තා සන්දිට්ඨා සම්භත්තා සහායා, සො සමණො මහෙසක්ඛොති භණති. යො එවරූපෙ විහාරෙ වසති, අඩ්ඪයොගෙ වසති - පාසාදෙ වසති – හම්මියෙ වසති – ගුහායං වසති – ලෙණෙ – වසති – කුටියා වසති – කූටාගාරෙ වසති, අට්ටෙ වසති, මාළෙ වසති උද්දණ්ඩෙ වසති, උපට්ඨානසාලායං වසති, මණ්ඩපෙ වසති, රුක්ඛමූලෙ වසති, සො සමණො මහෙසක්ඛොති භණති, අථවා කොරඤ්ජිකකොරඤ්ජිකො භාකුටිකභාකුටිකො කුහකකුහකො ලපකලපකො මුඛසම්භාවිතො අයං සමණො ඉමාසං එවරූපානං සන්තානං විහාරසමාපත්තීනං ලාභීති. තාදිසං ගම්භීරං ගූළ්හං නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතාපටිසඤ්ඤුත්තං කථං කථෙති. යා එවරූපා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

තස්ස පච්චෙකසම්බුද්ධස්ස ඉමානි තීණි කුහනවත්ථූනි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, තස්මා සො පච්චෙකසම්බුද්ධො නික්කුහො,

1. සමාහිතොවිය සයති – පත
2. ආපාථකජ්ඣායී ච හොති – කත්ථචි
3. ධම්මකරණං – ම ජ සං
4. ආයොගබන්ධනං ධාරෙති – සාමං

ඊර්‍ය්‍යාපථ සඞ්ඛ්‍යාත කුහනවස්තු නම් කවර යත්; මෙලෙව්හි ඇතැමෙක් පාප ඉච්ඡා ඇත්තේ ඉච්ඡායෙන්. මඩනා ලද්දේ බුහුමන් ලබන අදහස් ඇත්තේ මෙසෙයින් ජන තෙම මා බුහුමන් කරන්නේ යැ යි ගමන් සකස් කෙරෙයි, සිටීම සකස් කෙරෙයි, හිඳීම සකස් කෙරෙයි, ශයනය සකස් කෙරේ. පතා (ප්‍රාර්ත්ථනා තබා) යෙයි, පතා සිටියි, පතා හිඳියි පතා ශයනය කෙරේ. සමාහිතයකුසෙයින් යෙයි, සමාහිතයකු සෙයින් සිටියි, සමාහිතයකු සෙයින් හිඳියි, සමාහිතයකු සෙයින් ශයනය කෙරේ. ජනයා හමුයෙහි ධ්‍යාන කරන්නකු සෙයින් වෙයි. යම් මෙබඳු ඉරියව් පිහිටුවීමෙක් පිහිටුවන අයුරෙක් සකස් කොට තැබීමෙක් මුව හැකිළී මෙක් මුව හකුළන අයුරෙක් විස්මය ගැන්වීමෙක් විශ්මය ගන්වන අයුරෙක් විස්මිත බවෙක් වේ ද, මේ ඊර්‍ය්‍යාපථ සඞ්ඛ්‍යාත කුහනවස්තු නම

සාමන්තජල්පන සඞ්ඛ්‍යාත කුහනවස්තුව කවර යත්: මෙහි එකෙක් පවිටු අදහස් ඇතියේ ආශායෙන් මඩනා ලදුයේ ජන තෙමේ මා මෙසෙයින් සලකන්නේ වනැ'යි බුහුමන් කරවන සිත් ඇතියේ ලොවුතුරු දහම් පිළිබැඳි කොට බස් බෙණෙයි: 'යම් මහණෙක් මෙබඳු සිවුරක් ධරා නම් එ මහණ මහත් අනුභාව ඇත්තෙ යැ'යි බෙණෙයි. යමෙක් මෙබඳු පාත්‍රයක් ධරා නම්– ලොහො තලුවක් ධරා නම්– ධබරාවක් ධරා නම්– පෙරහනක් ධරා නම්– කෙස්සක් ධරා නම්– වහනක් ධරා නම්– කාබහනක් ධරා නම්– ආයොගයක් ධරා නම් එ මහණ මහෙශාක්‍ය යැ'යි බෙණෙයි. යමක් හට මෙබඳු උපාධ්‍යායයෙක් වේ නම් එ මහණ මහෙශාක්‍ය යැ'යි බෙණෙයි. යමක් හටමෙබඳු ආචාර්‍ය්‍යයෙක්– මෙබඳු සමානොපාධ්‍යායයෝ– සමානාචාර්‍ය්‍යයෝ–මිත්‍රයෝ–දෘෂ්ටමාත්‍රමිත්‍රයෝ–සම්භක්තයෝ–සහායයෝ වෙත් නම්, එ මහණ මහෙශාක්‍ය යැ'යි කියයි. යමෙක් මෙබඳු විහාරයෙක වෙසේ නම්– දික් පහයෙක වෙසේ නම්, සිවුරැස් පහයෙක– සඳලු ගෙයෙක– ගල්ගුහායෙක– ගල්ලෙනෙක– කිළියෙක– කුළුගෙයෙක– අටල්ලෙක– මහලෙක– දික්හලෙක– උවටන් හලෙක– මණ්ඩපයෙක– රුක් මුලෙක වෙසේ නම්, එ මහණ මහත් ආනුභාව ඇත්තේ යැ'යි කියයි. නොහොත් ඉතා හැකිළෙනුයේ ඉතා මුහුණ හකුළුවනසුලු වූයේ ඉතා විස්මය කරවනුයේ ඉතා ප්‍රලාප තෙපුල් බණනුයේ තමා ගේ මුඛ වශයෙන් 'මේ මහණ මෙබඳු වූ ශාන්ත වූ මෙ විහාරසමාපත්තීන් ලැබෙනසුලු යැ'යි (මෙරමා ලවා) සම්භාවනා කරවන ලදුයේ එබඳු ගැඹුරු වූ ගූඪ වූ සියුම් වූ ප්‍රතිච්ඡන්න වූ ලොකොත්තර වූ ශූන්‍යතා ප්‍රතිසංයුක්ත වූ කථා කියයි. මෙබඳු වූ යම් මුහුණ හැකුළුමෙක් මුහුණ හකුළුවන බවෙක් විස්මය කැරැවීමෙක් විස්මය පැවැත්වීමෙක් කොහොන් බවෙක් වේ ද, මේ සාමන්තජල්පන සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ'යි කියනු ලැබේ.

ඒ පසේ බුදුනට මෙ තුන් කොහොන්වත් ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරලන ලද්දහු අභව්‍යොත්පත්තික වූවාහු නුවණ ගින්නෙන් දවන ලද්දහු වෙති. එහෙයින් ඒ පසේ සමුබුදුහු 'නික්කුහ' නම් වෙති.

**නිප්පිපාසොති.** 'පිපාසා' වුච්චති තණ්හා, 'යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං.''[අ] සා පිපාසා තණ්හා තස්ස පච්චෙකසම්බුද්ධස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා, තස්මා සො පච්චෙකසම්බුද්ධො නිප්පිපාසොති 'නිල්ලොලුපො[2] නික්කුහො නිප්පිපාසො.'

**නිම්මක්ඛො නිද්ධන්තකසාවමොහොති** 'මක්ඛො'ති 'යො මක්ඛො මක්ඛායනා මක්ඛායිතත්තං නිට්ඨුරියං නිට්ඨුරියකම්මං: **කසාවොති**' රාගො කසාවො, දොසො කසාවො, මොහො කසාවො, කොධො උපනාහො මක්ඛො පලාසො -පෙ- සබ්බාකුසලාභිසංඛාරා කසාවා. **මොහොති:** දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛසමුදයෙ අඤ්ඤාණං, දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං, පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගි මොහො අකුසලමූලං. තස්ස පච්චෙකසම්බුද්ධස්ස මක්ඛො ච මොහො ච වන්තා සංවන්තා නිද්ධන්තා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති ''සො පච්චෙකසම්බුද්ධො 'නිම්මක්ඛො නිද්ධන්තකසාවමොහො'

**නිරාසසො සබ්බලොකෙ භවිත්වාති** ''ආසා'' වුච්චති තණ්හා, ''යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං'' **සබ්බලොකෙති:** සබ්බඅපාය ලොකෙ සබ්බ මනුස්සලොකෙ සබ්බ දෙවලොකෙ සබ්බඛන්ධලොකෙ සබ්බධාතුලොකෙ සබ්බආයතනලොකෙ. **නිරාසසො සබ්බලොකෙ භවිත්වාති** සබ්බලොකෙ නිරාසසො භවිත්වා. නිත්තණ්හාභවිත්වා, නිප්පිපාසො භවිත්වාති 'නිරාසසො සබ්බලොකෙ භවිත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

''නිල්ලොලුපො නික්කුහො නිප්පිපාසො
නිම්මක්ඛො නිද්ධන්තකසාවමොහො,
නිරාසසො සබ්බලොකෙ භවිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො''ති.

1. අනභාවං ගතා - ච වි ම ජ සං
2. නිල්ලොලුපො - ච වි

අ. ධම්මසඞ්ගණි - චිත්තුප්පාදකණ්ඩ

**නිපපිපාසො** යනු: 'පිපාසා'යි තෘෂ්ණාව කියනු ලබයි. "යම් රාගයෙක්... අධිකරාගයෙක් අභිධ්‍යායෙක් ලොභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එය යි." ඒ පිපාසා සංඛ්‍යාත තෘෂ්ණාව ඒ පසේ බුදුනට ප්‍රහීණ වූ යැ උසුන් මුල් ඇත්තී යැ, තාලවස්තුවක් මෙන් කරන ලදු යැ, අනුඅභාවය කරන ලදු යැ, මත්තෙහි නූපදනා සැහැවි ඇත්තී යැ. එහෙයින් ඒ පසේ සම්බුදුහු 'නිප්පිපාස' වූවාහු නුයි 'නිල්ලොලුපො නික්කුහො නිප්පිපාසො' යනු වේ.

**නිම්මක්ඛො නිද්ධන්තකසාවමොහො** – "මක්ඛො" යනු: "යම් මකුබවෙක් පරගුණ මකන අයුරෙක්, ගුණ මැකූ බවෙක් ඊර්ෂ්‍යාවක් ඊර්ෂ්‍යා බවෙක් වේ ද එය යි. **කසාවො** යනු: රාගය කසට යැ ද්වේෂය කසට යැ මොහය කසට යැ ක්‍රොධය බද්ධවෛරය මකුබව යුගග්‍රාහය ... සියලු අකුශලාභිසංස්කාරයෝ කසටයෝ යි. **මොහො** යනු: දුක්හි නො දත්-මෙක් දුක් උපදනා හේතුයෙහි නො දත්මෙක් දුක්ඛනිරොධයෙහි නො දත්මෙක් දුක් නිරුද්ධ කරන පිළිවෙත්හි නො දත්මෙක් ඉදංප්‍රත්‍යතා ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නො දත්මෙක්, මෙබඳු වූ යම් නො දත් මෙක් නො දක්මෙක් අනවබොධයෙක් අනනුබොධයෙක් අප්‍රතිවෙධයෙක් නො වැදගැන්මෙක් නො බැසගැන්මෙක් සම වැ නො බැලීමෙක් ප්‍රත්‍ය-වෙක්ෂා නො කිරීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් දුර්මෙධ්‍යයෙක් බාල බවෙක් අසම්‍යග් ඥානයෙක් මොහයෙක් ප්‍රමොහයෙක් සම්මොහයෙක් අවිද්‍යායෙක් අවිද්‍යාඕඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යා පර්‍යුත්ථානයෙක් අවිද්‍යා පරිඝයෙක් මොහ අකුශල මූලයෙක් වේ ද එය යි. ඒ පසේ බුදුන් විසින් මකුබව ද කසට ද මොහය ද වමාරනලදහ මැනැවින් වමාරනලදහ වටාලා නූපදනා අයුරින් බැහැර කරන ලදහ ප්‍රහීණයහ මුලුසුන් කරනලදහ සන්හිඳුවන ලදහ ප්‍රතිප්‍රශ්‍රබ්ධයහ යළි උපදනට නො නිසි කරන ලදහ නුවණ ගින්නෙන් දවන ලද නුයි ඒ පසේ බුදුහු 'නිම්මක්ඛ නිද්ධන්ත කසාව මොහ' නම් වෙත්.

**නිරාසසො සබ්බලොකෙ භවිත්වා** යනු: 'ආසා' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක්... අභිධ්‍යායෙක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය යි. **සබ්බලොකෙ** යනු: හැම අපායලෝකයෙහි හැම මනුෂ්‍යලෝකයෙහි හැම දිව්‍යලෝකයෙහි හැම ස්කන්ධලෝකයෙහි හැම ධාතුලෝකයෙහි හැම ආයතනලෝකයෙහි. **නිරාසසො සබ්බලොකෙ භවිත්වා** යනු: සියලු ලොකයෙහි ආශා නැති වැ තෘෂ්ණා නැති වැ පිපාසා නැති වැ නුයි 'නිරාසසො සබ්බලොකෙ භවිත්වා එකො චරෙ ඛග්ගවිසාණ-කප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

"නිල්ලොලුපො –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.

3.

පාපං සහායං පරිවජ්ජයෙථ
අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං,
සයං න සෙවෙ පසුතං පමත්තං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**පාපං සහායං පරිවජ්ජයෙථාති:** 'පාපසහායො' වුච්චති "යො සො සහායො දසවත්ථුකාය මිච්ඡාදිට්ඨියා සමන්නාගතො'. නත්ථි දින්නං නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං.[1] කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරොලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති''ති අයං පාප සහායො. **පාපං සහායං පරිවජ්ජයෙථාති:** පාපං සහායං වජ්ජෙය්‍ය පරිවජ්ජෙය්‍යා'ති 'පාපං සහායං පරිවජ්ජයෙථ'.

**අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨන්ති:** 'අනත්ථදස්සී, වුච්චති යො සො සහායො දසවත්ථුකාය මිච්ඡාදිට්ඨියා සමන්නාගතො, නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති'ති. **විසමෙ නිවිට්ඨන්ති:** විසමෙ කායකම්මෙ නිවිට්ඨං, විසමෙ වචීකම්මෙ නිවිට්ඨං, විසමෙ මනොකම්මෙ නිවිට්ඨං, විසමෙ පාණාතිපාතෙ නිවිට්ඨං, විසමෙ අදින්නාදානෙ නිවිට්ඨං, විසමෙ කාමෙසුමිච්ඡාචාරෙ නිවිට්ඨං, විසමෙ මුසාවාදෙ නිවිට්ඨං, විසමාය පිසුනාය වාචාය නිවිට්ඨං, විසමාය ඵරුසාය වාචාය නිවිට්ඨං, විසමෙ සම්ඵප්පලාපෙ නිවිට්ඨං, විසමාය අභිජ්ඣාය නිවිට්ඨං, විසමෙ ව්‍යාපාදෙ නිවිට්ඨං, විසමාය මිච්ඡාදිට්ඨියා නිවිට්ඨං, විසමෙසු සඞ්ඛාරෙසු නිවිට්ඨං, විසමෙසු පඤ්චසු කාමගුණෙසු නිවිට්ඨං, විසමෙසු පඤ්චසු නීවරණෙසු නිවිට්ඨං විනිවිට්ඨං, සත්තං අල්ලීනං උපගතං අජ්ඣොසිතං අධිමුත්තන්ති 'අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං'.

---

1. සුකට දුක්කටානං – මජසං

3.

අනර්ථ එළවන (විෂමකායකර්මාදි) විෂමයෙහි බැසගත් පාප මිත්‍රයන් දුරලන්නේ යෑ, දෘෂ්ටි විසින් ලැගුණු ප්‍රමත්ත වූවහු (පස්කම ගුණයෙහි වුහුටු සිත් ඇත්තහු) ඥ.මේ නො සෙවුනේ යෑ, කගවෙහෙණ) හඟක් සෙයින් එකලා වැ සරනේ යි.

පාපං සහායං පරිවජ්ජයෙථ– යම් මිතුරෙක් දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්වාගත වූයේ දැ: දුන් දූයෙහි විපාක නැත. යැදි දූයෙහි විපාක නැත, මහායාගයෙහි විපාක නැත, සුකෘතදුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක නැත, මෙලොව නැත, පරලොව නැත, මව නැත, පියා නැත, ඕපපාතික සත්ත්වයෝ නැත, යම් කෙනෙක් මෙලොව ද පරලොව ද තුමූ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් එබඳු සම්‍යග්ගත වූ සම්‍යක් ප්‍රතිපන්න වූ මහණබමුණෝ ලොව් නැතැ'යි මිථ්‍යාදෘෂ්ටි සමන්වාගත වෙ ද, හේ 'පාපසහාය' යි කියනු ලැබෙයි. මේ 'පාපසහාය' නම් වේ. පාපං සහායං පරිවජ්ජයෙථ යනු: පාප මිත්‍රයා හැරපියන්නේ යෑ හාත්පසින් හැර පියන්නේ නුයි 'පාපං සහායං පරිවජ්ජයෙථ' යනු වේ.

අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං– යම් මිතුරෙක් දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්වාගත වේ දැ: දුන් දූයෙහි විපාක නැත, යාගයෙහි විපාක නැත... යම් කෙනෙක් මෙලොව ද පරලොව ද තුමූ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් එබඳු සම්‍යග්ගත වූ එබඳු මහණ බමුණෝ ලොව නැතැ'යි මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්ත වූයේ ද හේ 'අනර්ථදර්ශී'යි කියනු ලැබෙයි. විසමෙ නිවිට්ඨං යනු: විෂම වූ කායකර්මයෙහි පිවිසුණු විෂම වූ වාක්කර්මයෙහි පිවිසුණු විෂම වූ මනොකර්මයෙහි පිවිසුණු විෂම වූ ප්‍රාණවධයෙහි පිවිසුණු විෂම වූ අදත්තාදානයෙහි පිවිසුණු විෂම වූ කාමමිථ්‍යාචාරයෙහි පිවිසුණු විෂම වූ මෘෂා වාදයෙහි පිවිසුණු විෂම වූ පිශුනවචනයෙහි පිවිසුණු විෂම වූ පරුෂවචනයෙහි පිවිසුණු විෂම වූ සම්ඵප්‍රලාපයෙහි පිවිසුණු විෂම වූ අභිධ්‍යායෙහි පිවිසුණු විෂම වූ ව්‍යාපාදයෙහි පිවිසුණු විෂම වූ මිථ්‍යාදෘෂ්ටියෙහි පිවිසුණු විෂම වූ සංස්කාරයන්හි පිවිසුණු විෂම වූ පඤ්චකාමගුණයෙහි පිවිසුණු විෂම වූ පඤ්ච නීවරණයෙහි පිවිසුණු වැදගත් ඍක්ත වූ ඇලුණු එළඹුණු බැසගත් අධිමුක්ත වූ නුයි 'අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං' යනු වේ.

**සයං න සෙවෙ පසුතං පමත්තන්ති**– **පසුතන්ති:** 'යොපි කාමෙ එසති ගවෙසති පරියෙසති තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො– සොපි කාමෙ පසුතො'. 'යොපි තණ්හාවසෙන රූපෙ පරියෙසති, සද්ද-ගන්ධ–රසෙ– ඵොට්ඨබ්බෙ පරියෙසති තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො, සොපි කාමපසුතො[1] යොපි තණ්හා වසෙන රූපෙ පටිලභති සද්දෙ– ගන්ධෙ– රසෙ– ඵොට්ඨබ්බෙ පටිලභති තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො, සොපි කාමපසුතො.. යොපි තණ්හා වසෙන රූපෙ පරිභුඤ්ජති, සද්දෙ– ගන්ධෙ– රසෙ– ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජති තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො, සොපි කාමපසුතො. යථා කලහකාරකො කලහපසුතො, කම්මකාරකො කම්මපසුතො, ගොචරෙ චරන්තො ගොචරපසුතො, ඣායී ඣානපසුතො, එවමෙව යො කාමෙ එසති ගවෙසති පරියෙසති තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො, සොපි කාමපසුතො. යොපි තණ්හා වසෙන රූපෙ පරියෙසති – පෙ – යොපි තණ්හාවසෙන රූපෙ පටිලභති – පෙ – යොපි තණ්හාවසෙන රූපෙ පරිභුඤ්ජති, සද්දෙ – ගන්ධෙ – රසෙ – ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජති, තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො සොපි කාමපසුතො. **පමත්තන්ති:** පමාදො වත්තබ්බො: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා පඤ්චසු කාමගුණෙසු වා චිත්තස්ස වොස්සග්ගො[2] වොස්සග්ගානුප්පදානං[3] කුසලානං ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනවට්ඨිතකිරියතා[4] ඔලීනවුත්තිතා නික්ඛිත්තච්ඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො. 'යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං, අයං වුච්චති පමාදො. **සයං න සෙවෙ පසුතං පමත්තන්ති:** පසුතං න සෙවෙය්‍ය පමත්තං ච සයං න සෙවෙය්‍ය, සාමං න සෙවෙය්‍ය, න නිසෙවෙය්‍ය, න සංසෙවෙය්‍ය න පටිසංසෙවෙය්‍ය න ආචරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදය වත්තෙය්‍යාති 'සයං න සෙවෙ පසුතං පමත්තං එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"පාපං සහායං පරිවජ්ජයෙථ
අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං,
සයං න සෙවෙ පසුතං පමත්තං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

1. කාමප්පසුතො – ම ඡ සං
2. වොස්සග්ගො– ම ඡ සං
3. වොස්සග්ගානුප්පදානං–මඡසං
4. අනිට්ඨිත කිරියතා – ම–ච–වි–ක

සයං න සෙවෙ පසුතං පමත්තං– 'පසුතං' යනු: යමෙකුත් කාමයන් එෂණ ගවෙෂණ පරියෙෂණ කෙරේ ද එහි සරනුයේ එය බහුල කොට ඇතියේ එය ගරු කොට ඇතියේ එයට නැමුණේ අතිශයින් නැමුණේ එයට බර වූයේ එහි අධිමුක්ත වූයේ එය අධිපති කොට ඇතියේ වේ නම් හෙ ද කාමයෙහි 'පසුත' වෙයි. යමෙකුත් තෘෂ්ණා වශයෙන් රූපයන් පරියෙෂණ කෙරේ ද ශබ්දයන්– ගන්ධයන්– රසයන්– ස්ප්‍රෂ්ටව්‍යයන් පරියෙෂණ කෙරේ ද, එහි සරනුයේ එය බහුල කොට ඇත්තේ එය ගුරු කොට ඇත්තේ එයට නැමුණේ අතිශයින් නැමුණේ එයට බැහිල් වූයේ එහි අධිමුක්ත වූයේ එය අධිපති කොට ඇත්තේ වේ නම් හෙ ද කාමයෙහි 'පසුත' වෙයි. යමෙකුත් තෘෂ්ණා වශයෙන් රූපයන් ලබා ද ශබ්දයන්– ගන්ධයන්– රසයන්– ස්ප්‍රෂ්ටව්‍යයන් ලබා ද, එහි සරනුයේ එය බහුල කොට ඇත්තේ එය ගුරු කොට ඇත්තේ තන්නිම්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තද්ධිමුක්ත වූයේ එය අධිපති කොට ඇතියේ වේ නම් හෙ ද කාමයෙහි 'පසුත' වෙයි. යමෙකුත් තෘෂ්ණා වශයෙන් කාමයන් පරිභොග කෙරේ ද, ශබ්දයන්– ගන්ධයන්– රසයන්– ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරේ ද තච්චරිත තබ්බහුල තග්ගරුක තන්නිම්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත තදධිපති වේ නම් හෙ ද කාමයෙහි 'පසුත' වෙයි. යම්සේ කලහ කරනුයේ 'කලහපසුත' නම් වේ ද, කර්ම කරනුයේ 'කම්මපසුත' නම් වේ ද, ගොචරයෙහි සරනුයේ 'ගොචරපසුත' නම් වේ ද, ධ්‍යාන කරනුයේ 'ඣාන පසුත' නම් වේ ද, එපරිද්දෙන් මැ යමෙක් කාමයන් එෂණ ගවෙෂණ පරියෙෂණ කෙරේ නම් තච්චරිත තද්බහුල තද්ගරුක තන්නිම්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත තදධිපති වේ නම් හෙ ද කාමයෙහි 'පසුත' නම් වෙයි. යමෙකුත් තෘෂ්ණා වශයෙන් රූපයන් පරියෙෂණ කෙරේ ද ... යමෙකුත් තෘෂ්ණා වශයෙන් රූපයන් ලබා ද ... යමෙකුත් තෘෂ්ණා වශයෙන් රූපයන් පරිභොග කෙරේ ද, ශබ්දයන්– ගන්ධයන්– රසයන්– ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරේ ද, තච්චරිත තද්බහුල තද්ගරුක තන්නිම්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත තදධිපති වේ නම් හෙ ද කාමයෙහි 'පසුත' නම් වෙයි. පමත්තං යනු: 'පමාද' ය කියයුතු වෙයි: කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනොදුශ්චරිතයෙහි හෝ පස්කම් ගුණයෙහි හෝ සිත බැසැ ගැනීමෙක් පුනපුනා බැසැගැනීමෙක් කුසල්දහම් වැඩීමෙහි නො සකසා කරන බවෙක් සතතයෙන් නො කරන බවෙක් නිරතුරු නො කරන බවෙක් ලීනවෘත්ති ඇති බවෙක්. බහාතැබූ වීර්‍ය්‍යච්ඡන්ද ඇති බවෙක් බහාතැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් ආසෙවන නො කිරීමෙක් නො වැඩීමෙක්. පුනපුනා නො වැඩීමෙක් නො පිහිටීමෙක්. නො යෙදීමෙක් ප්‍රමාදයෙක් වේ ද මෙබඳු යම් ප්‍රමාදයෙක් ප්‍රමාද අයුරෙක් ප්‍රමාද වූ බවෙක් වේ ද මේ ප්‍රමාද යයි කියනු ලැබේ. සයං න සෙවෙ පසුත පමත්තං යනු; ලැඟුණහු (පසුතයා) නො සෙවුනේ යැ ප්‍රමාද වූවහු ද තෙමේ සෙවනය නො කරන්නේ යැ නිසෙවන නො කරන්නේ යැ සංසෙවන නො කරන්නේ යැ පුනපුනා සෙවනය නො කරන්නේ යැ ඇසිරි නො කරන්නේ යැ මැනැවින් ඇසිරි නො කරන්නේ යැ සමාදන් කොට ගෙන නො පවත්නේ නුයි 'සයං න සෙවෙ පසුතං පමත්තං එකොචරෙ බග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

"පාපං සහායං –පෙ– එකො චරෙ බග්ගවිසාණකප්පො"යි.

4

බහුස්සුතං ධම්මධරං භජෙථ
මිත්තං උළාරං පටිභානවන්තං,
අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං
එකො චරෙ ඛග්ග විසාණ කප්පො.

**බහුස්සුතං ධම්මධරං භජෙථාති** බහුස්සුතො හොති මිත්තො සුතධරො සුත සන්නිචයො, යෙ තෙ ධම්මා ආදි කල්‍යාණා - පෙ - සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථා රූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[1] වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. **ධම්මධරන්ති:** ධම්මං ධාරෙන්තං සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. **බහුස්සුතං ධම්මධරං භජෙථාති** බහුස්සුතං ච ධම්මධරං ච මිත්තං භජෙය්‍ය සංභජෙය්‍ය සෙවෙය්‍ය නිසෙවෙය්‍ය සංසෙවෙය්‍ය පටිසෙවෙය්‍යා'ති 'බහුස්සුතං ධම්මධරං භජෙථ'.

**මිත්තං උළාරං පටිභානවන්තන්ති** උළාරො හොති මිත්තො සීලෙන සමාධිනා පඤ්ඤාය විමුත්තියා විමුත්තිඤාණදස්සනෙන. **පටිභානවන්තන්ති:** තයො පටිභානවන්තො[2] පරියත්තිපටිභානවා පරිපුච්ඡාපටිභානවා අධිගමපටිභානවා, කතමො පරියත්තිපටිභානවා; ඉධෙකච්චස්ස බුද්ධවචනං පරියාපුතං[3] හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුධම්මං වෙදල්ලං.

කතමො පරිපුච්ඡා පටිභානවා: ඉධෙකච්චො පරිපුච්ඡිතා'පි හොති, අත්ථෙ ච, ඤායෙ ච ලක්ඛණෙ ච කාරණෙ ච ඨානාඨානෙ ච. තස්ස පරිපුච්ඡං නිස්සාය පටිභාති, අයං පරිපුච්ඡා පටිභානවා.

කතමො අධිගමපටිභානවා ඉධෙකච්චස්ස අධිගතා හොන්ති චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්තබොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො චත්තාරො[4] අරිය මග්ගා චත්තාරි සාමඤ්ඤඵලානි[5] චතස්සො පටිසම්භිදායො ඡ අභිඤ්ඤායො. තස්ස අත්ථො ඤාතො ධම්මො ඤාතො නිරුත්ති ඤාතා. අත්ථෙ ඤාතෙ අත්ථො පටිභාති, ධම්මෙ ඤාතෙ ධම්මො පටිභාති, නිරුත්තියා ඤාතාය නිරුත්ති පටිභාති. ඉමෙසු තීසු ඤාණං පටිභානපටිසම්භිදා. සො පච්චෙක සම්බුද්ධො ඉමාය පටිභාන පටිසම්භිදාය උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සම්පන්නො[5] සමන්නාගතො. තස්මා පච්චෙක සම්බුද්ධො පටිභානවා. යස්ස පරියත්ති නත්ථි පරිපුච්ඡා[6] නත්ථි අධිගමො නත්ථි, කිං තස්ස පටිභායිස්සතීති 'මිත්තං උළාරං පටිභානවන්තං'.

---

1. ධාතා - ම ඡ සං
2. තයොපටිභාණවා - ච-වි
3. පරියාපුට්ඨං හොති - ච-වි
   පරියාපුඨං - ස්‍යා.
4. චත්තාරිමෙ සාමඤ්ඤඵලානි - ප ච වි
5. සමුපපන්නො - ම ඡ සං
6. පරිපුච්ඡං නත්ථි - ච වි

4.

බහුශ්‍රැත වූ ධර්මධර වූ උදර වූ වැටහෙන නුවණ ඇති මිත්‍රයකු භජනය කරන්නේ යෑ (ආත්මාර්ථාදි) අර්ථයන් දන කගවෙහෙණහක් සෙයින් එකලා වැ සරනේ යි.

බහුස්සුතං ධම්මධරං භජේථ යනු: ඇසූ පිරූ තැන් ධරන ඇසූපිරූ තැන් රැස් වූ මිත්‍ර තෙම බහුශ්‍රැත වෙයි. යම් ධර්ම කෙනෙක් ආදිකල්‍යාණ වූවාහු... අර්ත්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ කෙවලපරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්ම චර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙත් ද එබඳු වූ ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද්දාහු ධරනලද්දාහු වචනයෙන් ප්‍රගුණ කරන ලද්දාහු මනසින් පුනපුනා බලනලද්දාහු දෘෂ්ටියෙන් මොනොවට ප්‍රතිවෙධ කරන ලද්දාහු වෙති. ධම්මධරං යනු; සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අද්භූතධර්ම වෙදල්ල යන දහම් දරන. බහුස්සුතං ධම්මධරං භජේථ යනු: බහුශ්‍රැත වූ ද ධර්මධර වූ ද මිත්‍රයකු භජනය කරන්නේ යැ මොනොවට භජනය කරන්නේ යැ සේවනය කරන්නේ යැ නොයෙක් අයුරින් සේවනය කරන්නේ යැ මොනොවට සේවනය කරන්නේ යැ පුනපුනා සේවනය කරන්නේ නුයි 'බහුස්සුතං ධම්මධරං භජේථ' යනු වේ.

මිත්තං උළාර පටිභානවන්තං යනු: ශීලයෙන් සමාධියෙන් ප්‍රඥායෙන් විමුක්තියෙන් විමුක්තිඥානදර්ශනයෙන් මිත්‍ර තෙම උදර වෙයි. පටිභාන වන්තං යනු: පර්‍ය්‍යාප්තිප්‍රතිභාන ඇත්තේ යැ පරිපෘච්ඡාප්‍රතිභාන ඇත්තේ යැ අධිගමප්‍රතිභාන ඇත්තේ යැයි ප්‍රතිභානවත්හු තිදෙනෙකි. පර්‍ය්‍යාප්ති ප්‍රතිභාන ඇත්තේ කවර යත්: මෙසස්නෙහි ඇතැමකු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අද්භූතධර්ම වෙදල්ල යන බුද්ධවචනය පිරිවහන ලද වෙයි. ඔහට පර්‍ය්‍යාප්තිය නිසා වැටහෙයි. මේ පර්‍ය්‍යාප්ති ප්‍රතිභාන ඇත්තේ වෙයි.

පරිපෘච්ඡා ප්‍රතිභාන ඇත්තේ කවර යත්: මෙ සස්නෙහි ඇතැමෙක් අර්ථයෙහි ද න්‍යායයෙහි ද ලක්ෂණයෙහි ද කාරණයෙහි ද ස්ථානාස්ථාන-. යෙහි ද (ගැටපද) පිළිවිස්නේ වෙයි. ඔහට පිළිවිසීම නිසා වැටහෙයි මේ පරිපෘච්ඡාප්‍රතිභාන ඇත්තේ යි.

අධිගම ප්‍රතිභාන ඇත්තේ කවර යත්: මෙ සස්නෙහි ඇතැමකු විසින් සතර සිව්වටන් සතර සම්‍යක්ප්‍රධානය සතර ඍද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය පඤ්චබලය සප්තබොධ්‍යඞ්ගය ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය සතර ආර්‍ය්‍යමාර්ගය සතර ශ්‍රාමණ්‍යඵලය සිව් පිළිසිඹියා ෂඩභිඥා අධිගම කරන ලද වෙති. ඔහු විසින් අර්ත්ථ (හෙතුඵල) ය දන්නා ලද යැ ධර්මය (හෙතුව) දන්නා ලද යැ නිරුක්ති දන්නා ලද යැ. අර්ථය දත් කලැ අර්ත්ථය වටහයි ධර්මය දත් කලැ ධර්මය වටහයි– නිරුක්තිය දත් කලැ නිරුක්තිය වටහයි. මෙතුන් කරුණෙහි ඥානය 'ප්‍රතිභාන ප්‍රතිසංවිත්' නම් වෙයි. ඒ පසේබුදුහු මේ ප්‍රතිභාන ප්‍රතිසංවිද්ඥානයෙන් උපෙතයහ සමුපෙතයහ එළඹිසිටියහ සංයුක්තයහ නො වෙනස් වූහ පරිපූර්ණයහ සමන්වගතයහ එයින් පසේ බුදුහු ප්‍රතිභානවත්හ. යමක්හට පර්‍ය්‍යාප්ති නැද්ද, පරිපෘච්ඡා නැද්ද, අධිගම නැද්ද, ඔහට කුමක් වැටහෙන්නේ ද නුයි 'මිත්තං උළාරං පටිභානවන්තං' යනු වේ.

අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛන්ති: අත්තත්ථං අඤ්ඤාය පරත්ථං අඤ්ඤාය උභයත්ථං අඤ්ඤාය දිට්ඨධම්මිකත්ථං අඤ්ඤාය සම්පරායිකත්ථං අඤ්ඤාය- පරමත්ථං[1] අඤ්ඤාය අභිඤ්ඤාය, ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා කඞ්ඛං විනෙය්‍ය පටිවිනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති 'අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං එකොචරෙ ඛග්ග විසාණ කප්පො.'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

බහුස්සුතං ධම්මධරං භජෙථ
මිත්තං උළාරං පටිභානවන්තං,
අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

5.

ඛිඩ්ඩං රතිං කාමසුඛං ච ලොකෙ
අනලංකරිත්වා අනපෙක්ඛමානො,
විභූසනට්ඨානා විරතො සච්චවාදී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

ඛිඩ්ඩං රතිං[2] කාමසුඛං ච ලොකෙති: 'ඛිඩ්ඩා'ති ද්වෙ ඛිඩ්ඩා කායිකා ඛිඩ්ඩා ච වාචසිකා ඛිඩ්ඩා ච -පෙ- අයං වාචසිකා ඛිඩ්ඩා. රතීති අනුක්කණ්ඨිතාධිවචනමෙතං 'රතී'ති. කාමසුඛන්ති: වුත්තං හෙතං භගවතා: "පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච; චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ පංචකාමගුණා. යං ඛො භික්ඛවෙ ඉමෙ පංචකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං ඉදං වුච්චති කාමසුඛං[4]"[a] ලොකෙති. මනුස්සලොකෙ'ති 'ඛිඩ්ඩං රතිං කාමසුඛං ච ලොකෙ'.

අනලංකරිත්වා අනපෙක්ඛමානොති: ඛිඩ්ඩං ච රතිං ච[3] කාමසුඛං ච ලොකෙ අනලංකරිත්වා අනපෙක්ඛො හුත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා'ති 'අනලං කරිත්වා අනපෙක්ඛමානො'

1. පරමත්ථං - ම ඡ සං
2. ඛිඩ්ඩාරති - ප ව වි
3. කාමෙ සුඛං - ච වි
4. ඛිඩ්ඩා ච රතිං ච - ච වි

a සංයුත්තනිකාය මග්ගසංයුත්ත

අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං යනු: ආත්මාර්ථය දැන පරාර්ථය දැන උභයාර්ත්ථය දැන දෘෂ්ටධාර්මිකාර්ථය දැන සාම්පරායිකාර්ථය දැන පරමාර්ත්ථාර්ථය දැන වෙසෙසින් දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට ප්‍රකට කොට සැකය දුරලන්නේ යැ වෙසෙසින් දුරලන්නේ යැ හරනේ යැ හැරපියන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනු අභාවයට පමුණුවන්නේ නුයි 'අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේබුදුහු:

''බහුස්සුතං ධම්මධරං -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.

5.

ලෝකයෙහි (කායික වාචසික) ක්‍රීඩාව ද (පඤ්චකාමගුණයෙහි) රතිය ද වස්තුකාමසුඛය ද නො ගැණැ අපෙක්ෂා නො කරනුයේ විභූෂණ කරුණින් වෙන් වූයේ සත්‍යය කියනසුලු වූයේ කගවෙහෙණහක් සෙයින් එකලා වැ සරනේ යි.

ඛිඩ්ඩං රතිං කාමසුඛං ච ලොකෙ–'ඛිඩ්ඩා' යනු: කායික ක්‍රීඩා ද වාචසික ක්‍රීඩා දැ යි ක්‍රීඩා දෙකෙකි ... මෙ කායික ක්‍රීඩා යැ... මෙ වාචසික ක්‍රීඩා යි. රති යනු: මෙල 'රති' යනු අනුත්කණ්ඨාවට නමෙකි. කාමසුඛං යනු: මෙ වදරන ලද මැ යි භාග්‍යවතුන් විසින් 'මහණෙනි, මෙ කාමගුණයෝ පස්දෙනෙකි: කවර පස්දෙනෙකැ යත්: ඇසින් දතයුතු ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රිය ස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ ඇලුම් කටයුතු වූ රූපයෝ යැ කනින් දතයුතු වූ ...නැහැයෙන් දතයුතු වූ දිවින් දතයුතු වූ– කයින් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රිය සවභාව ඇති කාමයෙන් යුක්ත වූ ඇලුම් කටයුතු වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. මහණෙනි මොහු පඤ්චකාම ගුණයෝ යි. මහණෙනි මෙ පස්කම්ගුණය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මෙ කාමසුඛ යයි කියනු ලැබේ. ලොකෙ යනු: මනුෂ්‍යලොකයෙහි නුයි 'ඛිඩ්ඩං රතිං කාමසුඛං ච ලොකෙ' යනු වේ.

අනලංකරිත්වා අනපෙක්ඛමානො යනු: ලෝකයෙහි කායික වාචසික ක්‍රීඩාව ද පඤ්චකාමගුණයෙහි රතිය ද වස්තුකාමසුඛය ද නො ගණැ අපෙක්ෂා රහිත වැ හැරපියා දුරු කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා නුයි 'අනලං කරිත්වා අනපෙක්ඛමානො' යනු වේ.

**විභූසනට්ඨානා විරතො සච්චවාදීති** 'විභූසා'ති ද්වෙ විභූසා අත්ථි අගාරියස්ස විභූසා[1] අත්ථි පබ්බජිතස්ස විභූසා[2] කතමා අගාරියස්ස විභූසා කෙසා ච මස්සු ච[3], මාලා ච ගන්ධා[4] ච විලෙපනා ච ආභරණා ච පිළන්ධනා ච[5] වත්ථං ච සාරසාමනං ච වෙඨනං ච උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාගන්ධවිලෙපනං[6] මුඛචුණ්ණං[7] මුඛලෙපනං හත්ථබන්ධනං සිඛාබන්ධනං දණ්ඩං නාලිකං ඛග්ගං ඡත්තං ඡත්‍රුපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි ඉති වා අයං අගාරියස්සං විභූසා.

කතමා පබ්බජිතස්ස විභූසා. චීවරමණ්ඩනා පත්තමණ්ඩනා සෙනාසනමණ්ඩනා ඉමස්ස වා පූතිකායස්ස[8] බාහිරානං වා පරික්ඛාරානං මණ්ඩනා විභූසනා කෙලනා පරිකෙලනා ගෙධිතතා ගෙධිතත්තං[9] චපලතා[10] චාපල්‍යං, අයං පබ්බජිතස්ස විභූසා.

**සච්චවාදීති:** සො පච්චෙකසම්බුද්ධො සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. විභූසනට්ඨානා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසංයුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'විභූසනට්ඨානා විරතො සච්චවාදී එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

ඛිඩ්ඩං රතිං[11] කාමසුඛං ච ලොකෙ
අනලංකරිත්වා අනපෙක්ඛමානො
විභූසනට්ඨානා විරතො සච්චවාදී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො''ති.

6.

පුත්තං ච දරං පිතරං ච මාතරං
ධනානි ධඤ්ඤානි ච බන්ධවානි,
හිත්වාන[12] කාමානි සකොධිකානි[13]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**පුත්තං ච දරං පිතරං ච මාතරන්ති:** 'පුත්තා'ති චත්තාරො පුත්තා: අත්‍රජො පුත්තො, ඛෙත්තජො[14] පුත්තො දින්නකො පුත්තො, අන්තෙවාසිකො පුත්තො. දරා වුච්චන්ති භරියායො. පිතාති යො සො ජනකො, මාතාති යා සා ජනකාති 'පුත්තං ච දරං පිතරං ච මාතරං'.

---

1. අත්ථි අගාරිකස්ස – ම ඡ සං
2. අත්ථි අනාගාරිකස්ස – ම ඡ සං
3. කෙසමස්සුච – ව වි
4. මාලාච ගන්ධාච – ව වි
5. පිළන්ධා ච වත්ථංච සයනාසනංච – ම වි වි ක
6. මාලාවිලෙපනං
7. මුඛ චුණ්ණකං – ප ව වි
8. භූතිකායස්ස – ප ව වි
9. ගධිතතා ගධිතත්තං – ම ඡ සං
10. චාපලතා–චාපල්‍යං – ම ව වි ක
11. ඛිඩ්ඩාරතී – ව වි
12. ජහිත්වාන – ප ව වි
13. යථොධිකානි – ම ඡ සං
14. ඛෙත්‍රජො – ව වි ස්‍යා

විභූසනට්ඨානා විරතො සච්චවාදී– 'විභූසා' යනු: විභූෂණ (සැරසුම්) දෙකෙකි: ගිහිගෙවැසිහට සැරසුමෙක් ඇත, පැවිදිහට සැරසුමෙක් ඇති. ගිහිගෙවැසිහට සැරසුම් කවර යත්: (කතුරෙන්) හිසකෙස් කැපීම ද (දළි තබා) රවුළු බෑම ද මල්ගඳවිලෙවුන් ද අබරණ ද පළඳනා ද වස්ත්‍ර ද බඳපට ද (හෝ රසන්දම) හිස්වෙළුම ද සුවඳසුණු ඉළීම ඇඟ මැඩීම (දරුවන්) නැහැවීම සම්බාහනය කැටපත අඳුන මල්ගඳවිලෙවුන මුවසුණු මුඛාලෙප හස්තබන්ධන සිළු බැඳුම සෝලුලිය විසිතුරු බෙහෙසත්නළ කඩු ඡත්‍රය විසිතුරු වහන් තළල්පට සිළුමිණ වල්විදුනා දික්දවලු ඇති සුදුවත් යනාදිය යි. මේ ගිහිගෙවැසිහට සැරසුමැ.

පැවිදිහට සැරසුම් කවර යත්: චීවරමණ්ඩනය පාත්‍රමණ්ඩනය ශයනාසනමණ්ඩනය මෙ කුණුකය හෝ බාහිර පරිෂ්කාරයන් හෝ මණ්ඩනය සැරසීම කෙලැවීම හාත්පසින් කෙලැවීම කැමැති බව ගිජු බව චපල බව චාපල්‍යය යන මේ පැවිදිහට සැරසුම්.

සච්චවාදී යනු· ඒ පසේබුදුහු සත්‍යය කියනසුල්ලහ, සත්‍යයෙන් සත්‍යය ගළපනුවහ, ස්ථිරකථා ඇතියහ, හැදැහියයුතු වචන ඇතියහ, ලොව විසංවාද නො කරනුවහ. විභූෂණ කරුණින් දුරු වූවාහු වෙන් වූවාහු අත්‍යර්ත්ථයෙන් වෙන් වූවාහු නික්මුණාහු බැහැර වූවාහු මිදුණාහු විසංයොග වූවාහු විගතමයඖද කළ සිතින් යුතු වැ වාස කෙරෙත් නුයි 'විභූසනට්ඨානා විරතො සච්චවාදී එකොචරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේබුදුහු:

"ඛිඩ්ඩං රතිං -පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.

6.

අඹුදරුවන් ද මව්පියන් ද ධනය ද ධාන්‍ය ද බන්ධුසමූහයා ද යන කාමයන් ස්වකීය අවධි වශයෙන් හැරපියා කගවෙහෙණ හභක් සෙයින් එකලා වැ සරනේ යි.

පුත්තං ච දරං පිතරං ච මාතරං– 'පුත්තා' යනු: පුත්‍රයෝ සතර දෙනෙකි: ආත්මජපුත්‍ර යැ ක්ෂේත්‍රජපුත්‍ර යැ දින්නක පුත්‍ර යැ අන්තෙවාසිකපුත්‍ර යැ යි. 'දරා' යි භාර්‍ය්‍යාවෝ කියනු ලැබෙති. පිතා යනු: යම් ජනකයෙක් වේ ද හේ යැ. මාතා යනු: යම් ජනිකාවක් වූ නම් හෝ යැ යි. 'පුත්තං ච දරං පිතරං ච මාතරං' යනු වේ.

**ධනානි ධඤ්ඤානි ච බන්ධවානීති:** ‘ධනානී’ති වුච්චන්ති හිරඤ්ඤං සුවණ්ණං මුත්තා මණි වෙළුරියො සඞ්ඛො සිලා පවාළං රජතං ජාතරූපං ලොහිතඞ්කො[1] මසාරගල්ලං ‘ධඤ්ඤානී’ති වුච්චන්ති පුබ්බන්නං අපරන්නං, පුබ්බන්නං නාම; සාලි වීහි යවො ගොධුමො කඞ්ගු වරකො කුද්‍රූසකො අපරන්නං නාම; සූපෙය්‍යං. **බන්ධවානීති** චත්තාරො බන්ධවා; ඤාතිබන්ධවාපි බන්ධු, ගොත්තබන්ධවාපි බන්ධු, මිත්තබන්ධවාපි බන්ධු, සිප්පබන්ධවාපි බන්ධූති ‘ධනානි ධඤ්ඤානි ච බන්ධවානි’.

**හිත්වාන කාමානි සකොධිකානීති** ‘කාමා’ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **හිත්වාන කාමානීති**[1] වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදිත්වා බ්‍යන්තිං කරිත්වා අනභාවං ගමෙත්වා **හිත්වා[2] කාමානි සකොධිකානීති:** සොතාපත්තිමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති සකදාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා – අනාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා – අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡතීති. ‘හිත්වානකාමානි ‘සකොධිකානි[3] එකො චරෙ ඛග්ගවිසාණකප්පො’.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො;

“පුත්තං ච දාරං පිතරං ච මාතරං
ධනානි ධඤ්ඤානි ච බන්ධවානි,
හිත්වාන කාමානි සකොධිකානි[3]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො”ති.

7.

සඞ්ගො එසො පරිත්තමෙත්ථ සොඛ්‍යං
අප්පස්සාදො දුක්ඛමෙත්ථ භීයො,
ගළො[4] එසො ඉති ඤත්වා මතිමා[5]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**සඞ්ගො එසො පරිත්තමෙත්ථ සොඛ්‍යන්ති:** සඞ්ගොති වා බලිසන්ති වා ආමිසන්ති වා ලග්ගනන්ති වා[6] පළිබොධොති වා පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං, **පරිත්තමෙත්ථ සොඛ්‍යන්ති** වුත්තං හෙතං භගවතා:

1. ලොහිතඞ්ගො – ච වි ම. ජ සං
2. ජහිත්වාන – ච වි
3. යථොධිකානි – මජසං; යථොධිකානි – ච වි ක
4. ගණ්ඩො – සයා
5. මුතිමා – පන ස; සතිමා – ච වි
6. ලග්ගනන්තිවා – පශ; ලගනන්තිවා – ච වි

**ධනානි ධඤ්ඤානි ච බන්ධවානි**– 'ධනානි' යි කහවුණු රත්රන් මුතු මැණික් වෙරළුමිණි සක් සල පබළු රිදී රන් ලොහිතඞ්ක මැසිරිගල් කියනු ලැබෙත්. ධඤ්ඤානි යි පූර්වාන්න අපරාන්න කියනු ලැබෙති. පුබ්බන්න නම්: හැල් යැ වී යැ යව යැ ගොධුම යැ කඞ්ගු යැ වරා යැ කුරහමු යැ. අපරන්න නම්: සූපයට හිත වූයේ යි. (උඳු මුං ආදිය යි) බන්ධවානි යනු: බන්ධූහු සතර දෙනෙකි: ඤාතිබන්ධූහු ද බන්ධු යැ, ගොත්‍ර බන්ධූහු ද බන්ධු යැ, මිත්‍රබන්ධූහු ද බන්ධු යැ, ශිල්පබන්ධූහු ද බන්ධු නු යි 'ධනානි ධඤ්ඤානි ච බන්ධවානි' යනු වේ.

**හිත්වාන කාමානි සකොධිකානි**– 'කාමා' යනු: උද්දාන විසින් වස්තු කාමයෝ ද ක්ලේශකාමයෝ ද යි කාමයෝ දෙදෙනෙකි ... මොහු වස්තුකාමයෝ යි කියනු ලැබෙති ... මොහු ක්ලෙශකාමයෝ යි කියනු ලැබෙත්. **හිත්වාන කාමානි** යනු: වස්තුකාමයන් පිරිසිඳ දැන ක්ලෙශ කාමයන් හැර හැරපියා දුරු කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා. **හිත්වාන කාමානි සකොධිකානි** යනු: සෝවන් මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූහු නම් ඒ කෙලෙසුන් කරා වටාලා නො එයි, පෙරළා නො එයි, ආපසු නො එයි. සෙදගැමි මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූහු නම්– අනගැමි මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූහු නම්– රහත්මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූහු නම් ඒ කෙලෙසුන් කරා වටාලා නො එයි, පෙරළා නො එයි, ආපසු නො ඒනුයි 'හිත්වාන කාමානි සකොධිකානි එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදාළහ ඒ පසේබුදුහු:

**"පුත්තං ච දාරං –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.**

7.

තෙල පස්කම්ගුණය සඞ්ගයෙකි. මෙහි සෞඛ්‍ය (සුඛභාව)ය අල්ප යැ, අල්පාස්වාද ඇත්තේ යැ, මෙහි දුක් බොහෝ යැ, තෙල බිලියකැ යි දැන නුවණැත්තේ කගවෙහෙණහක් සෙයින් එකලා වැ සරනේ යි.

**සඞ්ගො එසො පරිත්තමෙත්ථ සොඛ්‍යං**– සඞ්ග යැ යි හෝ බඩිශ යැ යි හෝ ආමිෂ යැ යි හෝ ලග්ගන යැ යි හෝ තෙල පස්කම්ගුණයට නමි. **පරිත්තමෙත්ථ සොඛ්‍යං** යනු: තෙල වදරන ලද මැ යි භාග්‍යවතුන් විසින්:

"පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච කාමගුණා, යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං ඉදං වුච්චති කාමසුඛං"[a] අප්පකං එතං සුඛං, ඔමකං එතං සුඛං, ථොකං එතං සුඛං, ලාමකං එතං සුඛං, ජතුක්කං එතං සුඛං, පරිත්තකං එතං සුඛන්ති, 'සඞ්ගො එසො පරිත්තමෙත්ථ සොඛ්‍යං'.

අප්පස්සාදො දුක්ඛමෙත්ථ භීයොති "අප්පස්සාදා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීයො, අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා - මංසපෙසූපමා කාමා වුත්තා භගවතා - තිණුක්කූපමා කාමා වුත්තා භගවතා - අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා - සුපිනකූපමා කාමා වුත්තා භගවතා - යාචිතකූපමා කාමා වුත්තා භගවතා - රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා අසිසූනූපමා කාමා වුත්තා භගවතා - සත්තිසූලූපමා කාමා වුත්තා භගවතා - සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීයො"ති[b] අප්පස්සාදො දුක්ඛමෙත්ථ භීයො.

ගළො එසො ඉති ඤත්වා මතිමාති: ගළෙති වා බලිසන්ති වා ආමිසන්ති වා ලග්ගනන්ති වා[1] බන්ධනන්ති වා පලිබොධොති වා පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං. ඉතීති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං ඉතීති. මතිමාති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී.

ගළො එසො ඉති ඤත්වා මතිමාති: මතිමා ගළොති ඤත්වා බලිසන්ති ඤත්වා. ආමිසන්ති ඤත්වා ලග්ගනන්ති'. ඤත්වා බන්ධනන්ති ඤත්වා පලිබොධොති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති: 'ගළො එසො ඉති ඤත්වා මතිමා, එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො.

"සඞ්ගො එසො පරිත්තමෙත්ථ සොඛ්‍යං
අප්පස්සාදො දුක්ඛමෙත්ථ භීයො,
ගළො එසො ඉති ඤත්වා මතිමා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

---

1. ලග්ගනන්ති - පත
ලග්ගනන්ති - ච-චි

a. සංයුත්තනිකාය-මග්ගසංයුත්ත.
b. මජ්ඣිම නිකාය-අලගද්දූපමසුත්ත.

"මහණෙනි, මේ කාමගුණයෝ පස්දෙනෙකි: කවර පස්දෙනෙක යත්: ඇසින් දත යුතු රූපයෝ ... කයින් දතයුතු ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන්නා වූ ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ ඇලුම් කටයුතු වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. මහණෙනි, මෙ පස්කම්ගුණය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ කාමසුඛ යැ යි කියනු ලැබෙයි. තෙල සුඛය අල්ප යැ තෙල සුඛය පහත් යැ තෙල සුඛය මඳ යැ තෙල සුඛය ලාමක යැ තෙල සුඛය හීන යැ තෙල සුඛය ස්වල්ප නූයි 'සඞ්ගො එසො පරිත්තමෙත්ථ සොඛ්‍යං' යනුවේ.

අප්පස්සාදෙ දුක්ඛමෙත්ථ භියෙ‍ය්‍යා යනු: කාමයෝ අල්පාස්වාද ඇතියහ බොහෝ දුක් ඇතියහ බහූපායාස ඇතියහ මෙහි ආදීනව බොහෝ හයි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ ඇටසැකිලි බන්දහ යි වදරන ලදහ– කාමයෝ මාංශපෙශි වැන්නහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ– කාමයෝ තෘණොල්කා (තණහුළුක්) වැන්නහ යි භාග්‍යවතුන් විසින් වදරනලදහ. කාමයෝ අඞ්ගාරකර්ෂූ (අඟුරුවළ) වැන්නහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ සිහිනයක් වැන්නහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ පිරුළුයෙන් අළ දූයක් වැන්නහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ වෘක්ෂඵල වැන්නහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ අසිසූනා (කඩුව හා මස් ලොඹුව) වැන්නහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ සැත්හුල් බන්දහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ සර්පශීර්ෂ බන්දහ බොහෝ දුක් ඇත්තාහ බොහෝ උපායාස ඇත්තාහ මෙහි ආදීනව බොහෝහ යි භාග්‍යවතුන් විසින් වදරන ලද්දාහු නූයි 'අප්පස්සාදෙ දුක්ඛ මෙත්ථ භියෙ‍ය්‍යා' යනු වේ.

ගලෙ‍ළා එසො ඉති ඤත්වා මතිමා– 'ගළ' යැ හෝ 'බලිස' යැ හෝ 'ආමිස' යැ හෝ 'ලග්ගන' යැ හෝ 'බන්ධන' යැ හෝ 'පළිබොධ' යැ හෝ තෙලෙ පස්කම් ගුණයනට නමෙකි. ඉති යනු: පදසන්ධි යැ, පදසංසර්ග යැ පදපාරිපූරි යැ, අක්ෂර සමවාය යැ, ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ, පදනුපූර්වතා යැ තෙල 'ඉති' යනු මතිමා යනු: දුකෙහි නො සැලෙනුයෙන් ධීර යැ සුවයෙහි නො ඉල්පෙනුයෙන් පණ්ඩිත යැ, මෙලෝ පරලෝ අර්ථයෙහි කළ පරිචය ඇතියෙන් ප්‍රඥාවත් යැ, ආත්මාර්ථ පරාර්ථයෙහි නිසලවනුයෙන් බුද්ධිමත් යැ, ගම්භීරඋත්තානාර්ත්ථයෙහි නොපසුබස්නෙන් ඥානවත් යැ, ගූඪ ප්‍රතිච්ඡන්නාර්ත්ථයන් හෙළි කරනුයෙන් විභාවී යැ, නික්ලෙශතායෙන් මොධාවි යැ.

ගලෙ‍ළා එසො ඉති ඤත්වා මතිමා යනු: නුවණැතියේ (තෙල පස්කම්ගුණ) ගළයෙකැයි දැන බලිසයෙකැයි දැන ආමිෂයෙකැයි දැන ලග්නයෙකැයි දැන බන්ධනයෙකැයි දැන පළිබොධයෙකැයි දැන, දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නූයි 'ගලෙ‍ළා එසො ඉති ඤත්වා මතිමා, එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් කීහ ඒ පසේ සම්බුදුහු:

"සඞ්ගො එසො –පෙ– ඛග්ගවිසාණකප්පො"යි.

8.

සන්දාලයිත්වාන සංයොජනානි
ජාලංව භෙත්වා සලිලම්බුචාරී,
අග්ගීව දඩ්ඪං අනිවත්තමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**සන්දාලයිත්වාන සංයොජනානීති:** දස සංයොජනානි'. කාමරාගසංයොජනං පටිඝසංයොජනං මානසංයොජනං දිට්ඨිසංයොජනං විචිකිච්ඡාසංයොජනං සීලබ්බතපරාමාසසංයොජනං භවරාගසංයොජනං ඉස්සාසංයොජනං මච්ඡරියසංයොජනං අවිජ්ජාසංයොජනං, **සන්දාලයිත්වාන සංයොජනානීති:** දසසංයොජනානි දලයිත්වා සන්දලයිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තිං කරිත්වා අනභාවං ගමෙත්වාති 'සන්දාලයිත්වාන සංයොජනානි'.

**ජාලංව භෙත්වා සලිලම්බුචාරීති** 'ජාලං' වුච්චති සුත්තජාලං සලිලං'. වුච්චති උදකං, 'අම්බුචාරී' වුච්චති මච්ඡො, යථා මච්ඡො ජාලං භින්දිත්වා සම්භින්දිත්වා දලයිත්වා පදලයිත්වා සම්පදලයිත්වා චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙති, එවමෙව ද්වෙ ජාලා තණ්හාජාලං ච දිට්ඨිජාලං ච -පෙ- ඉදං තණ්හාජාලං පෙ- ඉදං දිට්ඨිජාලං. තස්ස පච්චෙකසම්බුද්ධස්ස තණ්හාජාලං පහීනං, දිට්ඨිජාලං පටිනිස්සට්ඨං, තණ්හාජාලස්ස පහීනත්තා දිට්ඨිජාලස්ස පටිනිස්සට්ඨත්තා සො පච්චෙකසම්බුද්ධො රූපෙ න සජ්ජති, සද්දෙ න සජ්ජති ගන්ධෙ න සජ්ජති -පෙ- දිට්ඨසුතමුත විඤ්ඤාතබ්බෙසු ධම්මෙසු න සජ්ජති, න ගණ්හාති[1] න බජ්ඣති[2] න පළිබජ්ඣති[3]. නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො, විමරියාදිකතෙන චෙතසා විහරතීති 'ජාලංව භෙත්වා සලිලම්බුචාරී'.

**අග්ගීව දඩ්ඪං අනිවත්තමානොති:** යථා අග්ගි තිණකට්ඨුපාදානං දහන්තො ගච්ඡති අනිවත්තන්තො. එවමෙව තස්ස පච්චෙකසම්බුද්ධස්ස සොතාපත්තිමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති න පච්චාගච්ඡති. සකදාගාමිමග්ගෙන- අනාගාමිමග්ගෙන- අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති න පච්චාගච්ඡතීති 'අග්ගීව දඩ්ඪං අනිවත්තමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"සන්දාලයිත්වාන සංයොජනානි
ජාලංව භෙත්වා සලිලම්බුචාරී,
අග්ගීව දඩ්ඪං අනිවත්තමානො,
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

1. නගය්හති - ව-වි
2. නබුජ්ඣති - පත
3. න පළිබුජ්ඣති - පත
4. ඵාලයිත්වා - ස.

8. දියෙහි දල බිඳ ගිය මසකු සෙයින් සංයොජනයන් පළා, දැවුණු තැනට පෙරළා නො එන ගින්නක් සෙයින් (මාර්ගඥානයෙන් දැවුණු කෙලෙසුන් කරා පෙරළා නො එමින්) කගවෙසෙණහක් සෙයින් එකලා වැ සරනේ යි.

සඤ්ඤලයිත්වාන සඤෙ‍්‍ඤාජනානි යනු: සංයොජනයෝ දස දෙනෙකි: කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ මානසංයොජන යැ දෘෂ්ටිසංයොජන යැ විචිකිත්සාසංයොජන යැ ශීලව්‍රතපරාමර්ශසංයොජන යැ භවරාගසංයොජන යැ ඊර්ෂ්‍යාසංයොජන යැ මාත්සය්‍ය සංයොජන යැ අවිද්‍යා සංයොජන යි. සඤ්ඤලයිත්වාන සඤෙ‍්‍ඤාජනානි යනු: දශසංයොජනයන් පළා මොනොවට පළා හැරපියා දුරු කොට විගතාන්ත කොට අනු අභාවයට පමුණුවා තුයි 'සන්දලයිත්වාන සඤෙ‍්‍ඤාජනානි' යනු වේ.

ජාලංව හෙත්වා සලිලම්බුචාරී– 'ජාලං' යි හුදල කියනු ලැබෙයි. 'සලලං' යි ජලය කියනු ලැබෙයි. 'අම්බුචාරී' යි මත්ස්‍යයා කියනු ලැබෙයි. යම්සේ මත්ස්‍ය තෙම දල බිඳ සිදුරු කොට පළා හිරා හිරිහිරිකොට සෙරෙයි වෙසෙයි ඉරියව් පවත්වා ද වැවේ ද පාලනය කෙරේ ද රැකේ ද යාපනය කෙරේ ද එසෙයින් මැ, තෘෂ්ණාජාල ද දෘෂ්ටිජාල ද යි ජාල දෙකෙකි. ... මේ තෘෂ්ණාජාල යැ ... මේ දෘෂ්ටිජාල යි. ඒ පසේබුදුන් විසින් තෘෂ්ණා ජාලය ප්‍රහීණ යැ දෘෂ්ටිජාලය දුරලනලද, තෘෂ්ණාජාලය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිජාලය දුරලන ලද වන බැවින් ඒ පසේබුදුහු රූපයෙහි නො ඇලෙති ශබ්දයෙහි නොඇලෙති ගන්ධයෙහි නො ඇලෙති ... දෘෂ්ට ශ්‍රැත මුතවිඥාතව්‍ය ධර්මයන්හි නො ඇලෙති නො ගනිති නො බැඳෙති ප්‍රතිබද්ධ නො වෙති (එයින්) නික්මුණාහු බැහැර වූවාහු මිදුණාහු වෙන් වූවාහු විගතමර්‍ය්‍යාද කළ සිතින් යුක්ත වැ වාසය කෙරෙත් තුයි 'ජාලංව හෙත්වා සලිලම්බුචාරී' යනු වේ.

අග්ගීව දඩ්ඪං අනිවත්තමානො යනු: යම්සේ ගින්න තෘණකාෂ්ට පවත් කොට දවමින් නො නැවැතැ යේ ද එසෙයින් මැ ඒ පසේ බුදුන් විසින් සෝවන් මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහාණය කරන ලද වෙත් ද ඒ කෙලෙසුන් කරා වටාලා නො එති පෙරළා නො එති ආපසු නො එති සෙදගැමි මඟින්– අනාගැමිමඟින්– රහත්මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහාණය කරන ලද වෙත් ද ඒ කෙලෙසුන් කරා වටාලා නො එති පෙරළා නො එති ආපසු නො එත් තුයි ''අග්ගී ව දඩ්ඪං අනිවත්තමානො එකො චරෙ ඛග්ගවිසානකප්පො'' යනු වේ.

එයින් වදළහ ඒ පසේබුදුහු:

''සඤ්ඤලයිත්වාන –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.

9.

ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො
ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානො,
අනවස්සුතො අපරිඩය්හමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලොති** කථං - ඛිත්තචක්ඛු හොති: ඉධෙකච්චො භික්ඛු චක්ඛුලොලො චක්ඛුලොලියෙන සමන්නාගතො හොති 'අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බ'න්ති ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං ගාමෙන ගාමං නිගමෙන නිගමං නගරෙන නගරං රට්ඨෙන රට්ඨං ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවට්ඨිත චාරිකං[1] අනුයුත්තො හොති රූපදස්සනාය, එවං ඛිත්තචක්ඛු හොති-

අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො අසංවුතො ගච්ඡති: හත්ථිං ඔලොකෙන්තො අස්සං ඔලොකෙන්තො රථං ඔලොකෙන්තො පත්තිං ඔලොකෙන්තො ඉත්ථියො ඔලොකෙන්තො පුරිසෙ ඔලොකෙන්තො කුමාරකෙ ඔලොකෙන්තො කුමාරිකායො ඔලොකෙන්තො අන්තරාපණං ඔලොකෙන්තො ඝරමුඛානි ඔලොකෙන්තො උද්ධං ඔලොකෙන්තො[2] අධො ඔලොකෙන්තො දිසාවිදිසං විපෙක්ඛමානො[3] ගච්ඡති, එවම්පි ඛිත්තචක්ඛු හොති.

අථවා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං[4] චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං[5] ආපජ්ජති, එවම්පි ඛිත්තචක්ඛු හොති.

යථාවා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාළං කුම්භථූනං සොභනගරකං[6] චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං ඉති වා, එවම්පි ඛිත්තචක්ඛු හොති.

1. අනවට්ඨිත චාරිකං - ම ඡ සං
   අනවත්ථ චාරිකං - ප ච වි ස්‍යා
2. උද්ධං දිසො දිසං පෙක්ඛමානො - ප ච වි
3. පෙක්ඛමානො - ස්‍යා,
4. මෙතං - ප ච වි
5. නච සංවරං - ච වි
6. සොභනකං - ම ඡ සං

9.

යටබලා හෙලූ ඇස් ඇතියේ නො ද පාදලොල වූයේ රක්නා ලද ඉඳුරන් ඇතියේ රක්නා ලද මනස ඇතියේ (කෙලෙසුන් විසින්) නො තෙත් වූයේ (කෙළෙස් ගිනින්) නො දැවුණේ කගවෙහෙණහගක් සෙයින් එකලා වැ සරනේ යි.

ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො යනු: කිසෙයින් 'ඛිත්තචක්ඛු' වේ ද යත්: මෙහි කිසි මහණෙක් (සක්දෙර උපන් ලොභ විසින්) ඇයින් ලොල් වූයේ චක්ෂුර්ලෞල්‍යයෙන් සමන්විත වෙයි. නුදුටු රූපාලම්බන දක්ක යුතු යැ දක්නා ලද්ද ඉක්මවිය යුතු යැ'යි අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමයෙන් නිගමයට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දීර්ඝ චාරිකායෙහි නො නිමි චාරිකායෙහි යෙදුණේ රූපදර්ශනය පිණිස හැසිරෙයි මෙසේ 'ඛිත්තචක්ඛු' වෙයි.

නොහොත් මහණ ඇතුළුගමට පිවිසියේ වෙමහට පිළිපන්නේ අසංවර වැ යෙයි: ඇතුන් බලමින් අසුන් බලමින් රිය බලමින් පාබලසෙන් බලමින් ස්ත්‍රීන් බලමින් පුරුෂයන් බලමින් කුමරුන් බලමින් කුමරියන් බලමින් ඇතුළු අවුණ (කඩතුළ) බලමින් ගෙදොර බලමින් උඩ බලමින් යට බලමින් දසනුදස බලමින් යෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' වෙයි.

නොහොත් මහණ ඇයින් රූපයක් දැක (ක්ලේශවස්තු වූ) නිමිති ගන්නේ වෙයි, (හස්තපාදදි) ආකාර විසින් ගන්නේ වෙයි, යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය අසංවෘත වැ වසන මොහු අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදී, චක්ෂුරින්ද්‍රියය නො රකී, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' වෙයි.

තවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල අදහා දුන් බොජුන් වළඳා ඔවුහු මෙබඳු වූ විසුළු දැකීමෙහි යෙදී වෙසෙති: ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් නළුමුළු භාරතාදිය කියන තැන කස්තල සනතාල කුළුතාලම් හෝ මළසිරුරු මන්ත්‍රයෙන් නහාලීම කළපිඹීම (බුම්මංඩි?) ප්‍රතිභානචිත්‍ර සැඩොලුන්ගේ සණදෙවුන්කෙළි වස්කුලල් ඇට දෙවීම් ඇත්පොර අස්පොර මියුපොර වැහැප්පොර ගවපොර බැටළුපොර එළුපොර කුකුළුපොර වටුපොර දඬුපොර මිටුපොර මල්ල පොර යුදපෙරමුණ බල සෙන් ගණන තැන කඳවුරු බලඇණි දැකීම යනු හෝ යැ. මෙසේත් 'ඛිත්තචක්ඛු' වේ.

කථං ඔක්ඛිත්තචක්ඛු හොති, ඉධෙකච්චො භික්ඛු[1] න චක්ඛුලොලො න චක්ඛුලොලියෙන සමන්නාගතො හොති, අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බන්ති න ආරාමෙන ආරාමං, න උය්‍යානෙන උය්‍යානං, න ගාමෙන ගාමං, න නිගමෙන නිගමං, න නගරෙන නගරං, න රට්ඨෙන රට්ඨං න ජනපදෙන ජනපදං, දීඝචාරිකං අනවත්ථිතචාරිකං[2] අනනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි ඔක්ඛිත්තචක්ඛු හොති.

අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො සංවුතො ගච්ඡති න හත්ථිං ඔලොකෙන්තො න අස්සං ඔලොකෙන්තො න රථං ඔලොකෙන්තො න පත්තිං ඔලොකෙන්තො න ඉත්ථියො ඔලොකෙන්තො න පුරිසෙ ඔලොකෙන්තො න කුමාරකෙ ඔලොකෙන්තො න කුමාරිකායො ඔලොකෙන්තො න අන්තරාපනං ඔලොකෙන්තො න ඝරමුඛානි ඔලොකෙන්තො න උද්ධං ඔලොකෙන්තො න අධො ඔලොකෙන්තො න දිසාවිදිසං[3] විපෙක්ඛමානො ගච්ඡති එවම්පි ඔක්ඛිත්තචක්ඛු හොති.

අථවා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං[4] චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති එවම්පි ඔක්ඛිත්තචක්ඛු හොති.

යථාවා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං –පෙ– අනීකදස්සනං ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො. එවම්පි ඔක්ඛිත්ත චක්ඛු හොති.

න ච පාදලොලොති කථං පාදලොලො හොති: ඉධෙකච්චො භික්ඛු පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං ගාමෙන ගාමං නිගමෙන නිගමං නගරෙන නගරං රට්ඨෙන රට්ඨං ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවත්ථිතචාරිකං අනුයුත්තො විහරති එවම්පි පාදලොලො හොති.

---

1. ඉධ භික්ඛු – ප ව වි
2. අනවට්ඨිත චාරිකං – ම ජ සං
3. න දිසො දිසං – ප ව වි
4. මෙතං – වා–වි

කිසෙයින් 'ඔක්ඛිත්තචක්ඛු' වේ යැ යත්: මෙ සස්නෙහි කිසි මහණෙක් ඇසින් ලොල් නො වූයේ චක්ඛුර්ලොලායෙන් යුක්ත නො වූයේ වෙයි: නුදුටු දය දක්ක යුතු යැ, දුටු දය ඉක්මවිය යුතු යැ'යි අරමින් අරමට නොයෙයි, උයනින් උයනට– ගමින් ගමට– නිගමයෙන් නිගමයට– නුවරින් නුවරට– රටින් රටට– දනව්වෙන් දනව්වට රූපදර්ශනය පිණිස දීර්ඝචාරිකායෙහි නො නිමි චාරිකායෙහි නො යෙදුණේ වෙයි. මෙසේත් 'ඔක්ඛිත්තචක්ඛු' වෙයි.

නොහොත් මහණ ඇතුළුගමට පිවිසියේ වීදියට බටුයේ සංවර වැ යෙයි: ඇතුන් නො බලමින් අසුන් නො බලමින් රිය නො බලමින් පාබල සෙන් නොබලමින් ගැනුන් නො බලමින් පිරිමින් නො බලමින් කුමරුන් නො බලමින් කුමරියන් නො බලමින් ඇතුළු අවුණු නො බලමින් ගෙදෙර නොබලමින් උඩ නො බලමින් යට නො බලමින් දිශාවිදිශා නො බලමින් යෙයි. මෙසේත් 'ඔක්ඛිත්තචක්ඛු' වෙයි.

නොහොත් මහණ ඇසින් රූපයක් දුක නිමිති වශයෙන් නො ගන්නේ අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ඛුරින්ද්‍රියය අසංවර වැ වසන මොහු අභිධ්‍යා දෞර්මනස් සංඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්ඛුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී, චක්ඛුරින්ද්‍රියය රකී. චක්ඛුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මෙසේත් 'ඔක්ඛිත්තචක්ඛු' වෙයි.

තවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල හදහා දෙනලද බොජුන් වළඳා ඔහු මෙබඳු විසුළු දස්නෙහි නො යෙදී වෙසෙති: ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් ... බලඇණි දැකීම යනාදිය යි මෙබඳු විසුළු දස්නෙන් වැළැකුණේ වෙයි. මෙසේත් 'ඔක්ඛිත්තචක්ඛු' වේ.

**න ච පාදලොලො** යනු: කිසෙයින් 'පාදලොල' වේ යැ යත්: මෙහි ඇතැම් මහණෙක් පයින් ලොල්වූයේ පාදලොලායෙන් සමන්විත වූයේ වෙයි: අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමයෙන් නිගමයට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දීර්ඝචාරිකායෙහි නො නිමි චාරිකායෙහි යෙදී වාසය කෙරෙයි. මෙසේත් 'පදලොල' වෙයි.

අථවා භික්ඛු අඤ්ඤෙනාපි සඞ්ඝාරාමෙ[1] පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති. න අත්ථහෙතු න කාරණහෙතු උද්ධතො අවූපසන්තචිත්තො පරිවෙණතො පරිවෙණං ගච්ඡති, විහාරතො විහාරං ගච්ඡති, අඩ්ඪයොගතො අඩ්ඪයොගං ගච්ඡති, පාසාදතො පාසාදං ගච්ඡති, හම්මියතො හම්මියං ගච්ඡති, ගුහාය[2] ගුහං ගච්ඡති, ලෙණතො ලෙණං ගච්ඡති, කුටියා කුටිං ගච්ඡති, කූටාගාරතො කූටාගාරං ගච්ඡති, අට්ටතො අට්ටං ගච්ඡති, මාලතො මාලං ගච්ඡති උද්දණ්ඩතො උද්දණ්ඩං ගච්ඡති, උදොසිතතො උදොසිතං ගච්ඡති, උපට්ඨානසාලතො උපට්ඨානසාලං ගච්ඡති, මණ්ඩලමාලතො මණ්ඩලමාලං[3] ගච්ඡති, රුක්ඛමූලතො රුක්ඛමූලං ගච්ඡති. යත්ථ වා පන භික්ඛූ නිසීදන්ති තහිං ගච්ඡති. තත්ථ එකස්ස වා දුතියො හොති, ද්වින්නං වා තතියො හොති, තිණ්ණං වා චතුත්ථො හොති. තත්ථ බහුං සම්ඵප්පලාපං පලපන්ති[4] සෙය්‍යථිදං: රාජකථං චොරකථං -පෙ- ඉති භවාභවකථං කථෙන්ති. එවම්පි පාදලොලො හොති.

න ච පාදලොලොති: සො පච්චෙකසම්බුද්ධො පාදලොලියා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා පටිසල්ලානාරාමො හොති පටිසල්ලානරතො අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං ඣායී ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකොති ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො.

ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානොති: 'ගුත්තින්ද්‍රියො'ති සො පච්චෙකසම්බුද්ධො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා - ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති 'ගුත්තින්ද්‍රියො' රක්ඛිතමානසානොති ගොපිතමානසානොති 'ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානො'.

---

1. අඤ්ඤතො සඞ්ඝාරාමෙ – ම ජ සං
2. ගුහාතො – ම ජ සං
3. මණ්ඩපතො මණ්ඩපං – ම ජ සං.
4. බහුං සම්ඵපලපන්ති – ව, වි

නොහොත් මහණ ඇතුළු සහරම්හිදු පාදලොල වූයේ පාදලෞල්‍ය-යෙන් යුක්ත වූයේ වෙයි, ප්‍රයෝජන නැති වැ කාරණ නැති වැ උඩඟු වූයේ නො සන්හුන් සිත් ඇත්තේ පිරිවෙනින් පිරිවෙනට යෙයි, වෙහෙරින් වෙහෙරට යෙයි, අර්ධයොගයෙන් අර්ධයොගයට යෙයි, ප්‍රාසාදයෙන් ප්‍රාසාදයට යෙයි, සඳළුගෙයින් සඳළුගෙට යෙයි, ගුහායෙන් ගුහාවට යෙයි, ලෙනින් ලෙනට යෙයි, කිළියෙන් කිළියට යෙයි, කුළුගෙයින් කුළුගෙට යෙයි, අටල්ලෙන් අටල්ලට යෙයි, මහලින් මහලට යෙයි, උද්දණ්ඩ (එක් වහලින් යුතු ගෙ) යෙන් උද්දණ්ඩයට යෙයි, බඩුහලින් බඩුහලට යෙයි, උවටැන්හලින් උවටැන්හලට යෙයි, මණ්ඩලමාලයෙන් මණ්ඩල මාලයට යෙයි, රුක්මුලින් රුක්මුලට යෙයි, යම් තැනෙකැ භික්ෂූහු හිඳිත් නම් එහි හෝ යෙයි, එහි එකක්හට හෝ දෙවැන්නා වෙයි, දෙදෙනකු හට හෝ තෙවැන්නා වෙයි, තිදෙනකු හට හෝ සිවුවැන්නා වෙයි. එහි දී බොහෝ නිරර්ත්ථක කථා පවසයි. ඒ මෙසේ යැ: රාජකථා යැ චොරකථා යැ... මෙසෙයින් වෘද්ධි–හානි වේ යැ යන කථා කෙරෙයි. මෙසේත් 'පාදලොල' වේ.

**න ච පාදලොලො** යනු: ඒ පසේ බුදුහු පාදලෞල්‍යයෙන් දුරු වූවාහු වෙන් වූවාහු වෙසෙයින් වෙන්වූවාහු නික්මුණාහු බැහැරවූවාහු මිදුනාහු විසංයොග වූවාහු විගතමර්‍යාද කළ සිතින් යුතු වැ විවේකයෙහි ඇලුණාහු වෙති, විවේකයෙහි ඇලුණාහු අධ්‍යාත්ම චිත්තසමාධියෙහි ඇලුණාහු බැහැර නො කළ (නො නට) ධ්‍යාන ඇත්තාහු විදර්ශනායෙන් යුක්ත වූවාහු ශූන්‍යාගාරභාවනාව වඩන්නාහු ධ්‍යාන කරනසුලු වූවාහු ධ්‍යානයෙහි ඇලුණාහු එකීභාවයෙහි යෙදුණාහු උත්තමාර්ථ (හෝ ස්වාර්ත්ථ) ගරුක වූවාහු නුයි 'ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො' යනු වේ.

**ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානො**– 'ගුත්තින්ද්‍රියො' යනු: ඒ පසේ බුදුහු ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නො ගන්නාහු අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නාහු වෙති. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවර කොට වසනුවන් අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරයට පැමිණෙති, චක්ෂුරින්ද්‍රියය ගොපනය කෙරෙති, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙති. කනින් ශබ්ද අසා–නැහැයෙන් ගඳ අසා– දිවින් රස විඳ– කයින් පහස් පැහැසැ– මනසින් දහම් දැන නිමිති වශයෙන් නො ගන්නාහු අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නාහු වෙති. යම් කරුණකින් මනින්ද්‍රියය අසංවර කොට වසනුවන් අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරයට පැමිණෙති, මනින්ද්‍රියය ගොපනය කෙරෙති, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙත් නුයි 'ගුත්තින්ද්‍රිය' නම් වෙති. 'රක්ඛිතමානසානො' යනු: ගොපනය කළ සිත් ඇත්තාහු නුයි 'ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානො' යනු වේ.

අනවස්සුතො අපරිඩය්හමානොති: වුත්තං හෙතං ආයස්මතා මහාමොග්ගල්ලානෙන "අවස්සුතපරිසායං ච වො ආවුසො දෙසෙස්සාමි[1] අනවස්සුතපරියායං ච, තං සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති: එවමාවුසොති ඛො තෙ භික්ඛූ අයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසුං. අයස්මා මහාමොග්ගල්ලානො එතදවොච: 'කථං චාවුසො අවස්සුතො හොති; ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ අධිමුච්චති, අප්පියරූපෙ රූපෙ බ්‍යාපජ්ජති අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ අධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ බ්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො. තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති, යත්ථස්ස තෙ[2] උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. අයං වුච්චතාවුසො භික්ඛු අවස්සුතො චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු -පෙ- අවස්සුතො මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු. එවං විහාරිං චාවුසො භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උපසඞ්කමති ලභෙථෙව[3]' මාරො ඔතාරං ලභෙථ මාරො ආරම්මණං. සොතතො චෙපි නං -පෙ- මනතො චෙපි නං මාරො උපසඞ්කමති ලභෙථෙව මාරො ඔතාරං ලභෙථ[4]' මාරො ආරම්මණං.

සෙය්‍යථාපි ආවුසො නළාගාරං වා තිණාගාරං වා සුක්ඛං කොලාපං තෙරොවස්සිකං[5]' පුරත්ථිමාය චෙපි නං දිසාය පුරිසො ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය ලභෙථෙව අග්ගි ඔතාරං ලභෙථ අග්ගි ආරම්මණං පච්ඡිමාය චෙපි නං දිසාය—උත්තරාය චෙපි නං දිසාය—දක්ඛිණාය චෙපි නං දිසාය—හෙට්ඨිමාය චෙපි නං[6] දිසාය—උපරිමාය චෙපි[7] නං දිසාය—යතො කුතොචි චෙපි නං දිසාය පුරිසො ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය ලභෙථෙව අග්ගි ඔතාරං, ලභෙථ අග්ගි ආරම්මණං. එවමෙව ඛො ආවුසො එවං විහාරිං භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උපසඞ්කමති, ලභෙථෙව මාරො ඔතාරං ලභෙථ මාරො ආරම්මණං, සොතතො චෙපි නං -පෙ- මනතො චෙපි නං මාරො උපසඞ්කමති ලභෙථෙව මාරො ඔතාරං, ලභෙථ මාරො ආරම්මණං"

1. දෙසිස්සාමි – ච, වි
2. යත්ථ තෙ උප්පන්නා – ප වි
3. ලභතෙව – ච, වි, ස්‍යා,
4. ලභති මාරො – ස්‍යා,
5. තෙරොවස්සිකං – ච–වි
6. හෙට්ඨිමතො චෙපි නං – ම ඡ සං
7. උපරිමතො චෙපි නං – ම ඡ සං

**අනවස්සුතො අපරිඩය්හමානො** යනු: මේ කියන ලද මැ යි ආයුෂ්මත් මහමුගලන් තෙරුන් විසින්: ''ඇවැත්නි, තොපට 'අවස්සුතපරියාය (කෙලෙසුන් විසින් තෙත් කරුණ) ද අනවස්සුත පරියාය (කෙලෙසුන් විසින් නො තෙත් කරුණ) ද දෙසමි ඒ අසවු මැනැවින් මෙනෙහි කරවු, කියමි. 'එසේ යැ ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහමුගලන් තෙරහු මෙය වදළහ. ඇවැත්නි, කිසෙයින් අවස්සුත (කෙලෙසුන් විසින් තෙත්) වේ ද යත්: ඇවැත්නි, මෙ සස්නෙහි මහණෙක් ඇසින් රූපයක් දක ප්‍රිය සබභාව වූ රූපයෙහි ඇලෙයි, අප්‍රියසබභාවවූ රූපයෙහි ව්‍යාපාදයට පැමිණෙයි, නො එළඹ සිටි කායස්මෘති ඇතියේ ලසු වූ සිත් ඇති වැ වාස කෙරෙයි, යම් තැනෙක ඔහුට උපන් ලාමක අකුශල ධර්මයෝ අනවශේෂ කොට නිරුද්ධ වෙත් ද ඒ චිත්තවිමුක්තිය ප්‍රඥා විමුක්තිය තත් වූ පරිද්දෙන් නො දනියි. කනින් ශබ්ද අසා ... සිතින් දහම් දන ප්‍රියසබභාව වූ දහම්හි ඇලෙයි, අප්‍රියසබභාව වූ දහම්හි ව්‍යාපාදයට පැමිණෙයි, නො එළඹ සිටි කායස්මෘති ඇත්යේ ලසු වූ සිත් ඇති වැ වෙසෙයි, යම් තැනෙක ඔහුට උපන් ලාමක අකුශලධර්මයෝ අපරිශෙෂ වැ නිරුද්ධ වෙත් ද ඒ චිත්ත විමුක්තිය ප්‍රඥා විමුක්තිය තත් වූ පරිද්දෙන් නො දනී. ඇවැත්නි, මෙ මහණ චක්ෂුර්විඥානයෙන් දතයුතු වූ රූපාලම්බනයෙහි අවස්සුත වූයේ... මනොවිඥානයෙන් දතයුතු වූ ධර්මාලම්බනයෙහි අවස්සුත වූයේ යයි කියනු ලැබේ. ඇවැත්නි, මෙසේ වාස කරන ඒ මහණහු කරා මාර තෙමේ චක්ෂුර්ද්වාරයෙනුදු එළැඹෙයි, ශ්‍රොත්‍රද්වාරයෙනුදු ... මනොද්වාරයෙනුදු ඔහු කරා මාර තෙමේ එළැඹෙයි, මාර තෙම සිදුරු ලබන්නේ මැ යැ, මාර තෙමෙ ප්‍රත්‍යය ලබන්නේ මැ යි.

ඇවැත්නි, යම්සේ වියැළි කොලපු වූ බොහෝ කල් ඉක්මගිය බට සෙවෙනි ගෙයක් හෝ තණ සෙවෙනි ගෙයක් හෝ වේ ද ඉදින් පුරුෂයෙක් ගිනි ඇවිළගත් තණසුලකින් යුතු වැ පෙරදිගිනුදු ඒ ගෙය කරා පැමිණේ නම් ගින්න සිදුරු ලබා මැ යැ ප්‍රත්‍යය ලබා මැ යැ, පැසිම් දෙසිනුදු ... උතුරු දෙසිනුදු ... දකුණු දෙසිනුදු– යටදෙසිනුදු– උඩදෙසිනුදු– යම්කිසි දෙසකිනුදු පුරුෂයෙක් ආදීප්ත වූ තණසුලකින් යුතු වැ ඒ ගෙය කරා පැමිණේ නම් ගින්න අතුරු ලබා මැ යැ ගින්න අරමුණු ලබා මැ යැ, එසෙයින් මැ ඇවැත්නි, මෙසේ වාසය කරන මහණහු කරා චක්ෂුද්වාරයෙනුදු මාර තෙමෙ පැමිණේ, නම් මාර තෙමෙ අතුරු ලබා මැ යැ මාර තෙමේ ප්‍රත්‍යය ලබා මැ යැ ශ්‍රොත්‍රද්වාරයෙනුදු ... මනොද්වාරයෙනුදු ඔහු කරා මාර තෙමේ එළැඹේ නම් මාර තෙමෙ අතුරු ලබා මැ යැ මාර තෙමේ අරමුණු ලබා මැ යි.

එවං විහාරිං චාවුසො භික්ඛුං රූපා අභිභංසු.[1] න භික්ඛු රූපෙ අභිභොසි[2] සද්දා භික්ඛුං අභිභංසු න භික්ඛු සද්දෙ අභිභොසි, ගන්ධා භික්ඛුං අභිභංසු න භික්ඛු ගන්ධෙ අභිභොසි, රසා භික්ඛුං අභිභංසු න භික්ඛු රසෙ අභිභොසි, ඵොට්ඨබ්බා භික්ඛුං අභිභංසු, න භික්ඛු ඵොට්ඨබ්බෙ අභිභොසි, ධම්මා භික්ඛුං අභිභංසු න භික්ඛු ධම්මෙ අභිභොසි. අයං වුච්චතාවුසො භික්ඛු රූපාභිභූතො[3] සද්දාභිභූතො ගන්ධාභිභූතො රසාභිභූතො ඵොට්ඨබ්බාභිභූතො ධම්මාභිභූතො අභිභංසු නං පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා, එවං ඛො ආවුසො අවස්සුතො හොති.''

කථං චාවුසො අනවස්සුතො හොති: ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ නාධිමුච්චති, අප්පියරූපෙ රූපෙ න බ්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ නාධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ න බ්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො, තං ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා[4] පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති, අයං වුච්චතාවුසො භික්ඛු අනවස්සුතො චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු -පෙ- අනවස්සුතො මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු. එවං විහාරිං චාවුසො භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උපසඞ්කමති නෙව ලභෙථ[5] මාරො ඔතාරං න ලභෙථ[6] මාරො ආරම්මණං, සොතතො චෙපි නං -පෙ- මනතො චෙපි නං මාරො උපසඞ්කමති නෙව ලභෙථ මාරො ඔතාරං, න ලභෙථ මාරො ආරම්මණං.

1. රූපා අධිභංසු - ම ඡ සං
2. රූපෙ අධිභොසි - ච-වි
3. රූපාධිභූතො සද්දාධිභූතො - ම ඡ සං, ප.
4. යත්ථාස්සාතෙඋප්පන්නා - ම ඡ සං -ච,වි,ක
යත්ථෙ උප්පන්නා - පත.
5. නෙව ලභති - ම ඡ සං -ච-වි-ක
6. න ලභති - ම ඡ සං

තවද ඇවැත්නි, මෙසේ වාසය කරනසුළු භික්ෂුහු රූපාලම්බනයෝ මැඩපීහු යැ, මහණ රූපයන් නො මැඩපී යැ, ශබ්දලම්බනයෝ භික්ෂුහු මැඩපීහු යැ, මහණ තෙම ශබ්දලම්බනයන් නො මැඩපී යැ. ගන්ධාලම්බනයෝ භික්ෂුහු මැඩපීහු යැ, මහණ තෙමේ ගන්ධාලම්බන යන් නො මැඩපී යැ, රසාලම්බනයෝ භික්ෂුව මැඩපීහු යැ, මහණ රසයන් නො මැඩපී යැ, ස්ප්‍රෂ්ටව්‍යයෝ භික්ෂුව මැඩපීහු යැ, මහණ ස්ප්‍රෂ්ටව්‍යයන් නො මැඩපීයැ, ධර්මාලම්බනයෝ භික්ෂුව මැඩපීහු යැ, මහණ නො මැඩපී යැ, ඇවැත්නි, මේ මහණ තෙමේ රූපයන් විසින් මඩනාලද යැ ශබ්දයන් විසින් මඩනා ලද යැ, ගන්ධයන් විසින් මඩනා ලද යැ, රසයන් විසින් මඩනාලද යැ, ස්ප්‍රෂ්ටව්‍යයන් විසින් මඩනාලද යැ, ධර්මයන් විසින් මඩනාලද යැ, ක්ලෙශයනට ප්‍රත්‍යය වූ පුනර්භවය ඇති කරන්නා වූ දරථ සහිත වූ දුඃඛවිපාක වූ ලාමක අකුශල ධර්මයෝ ඒ භික්ෂුව අභිභවනය කළාහුයැ. ඇවැත්නි, මෙසේ 'අවස්සුත' වූයේ වේ.

ඇවැත්නි, කිසෙයින් අනවස්සුත වේ ද යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ ඇසින් රූපයක් දැක ප්‍රියස්වභාව රූපයෙහි නො ඇලෙයි, අප්‍රිය ස්වභාවරූපයෙහි (ද්වෙෂ විසින්) ව්‍යාපාදයට නො පැමිණෙයි, එළැඹසිටි කායිගයාසී ඇති වැ අප්‍රමාණ සිත් ඇති වැ වාස කෙරෙයි. යම් තැනෙක ඔහුට උපන් ඒ ලාමක අකුශලධර්මයෝ නිරවශේෂ වැ නිරුද්ධ වෙත් නම් ඒ චිත්තවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද ඇති සැටියෙන් දැනගනියි. කණින් ශබ්ද අසා ... මනයින් දහම් දැන ප්‍රියස්වභාව ධර්මයෙහි නො ඇලෙයි, අප්‍රිය සවභාව ධර්මයෙහි ව්‍යාපාදයට නො පැමිණෙයි, එළඹසිටි කායිගයාසී ඇති වැ අප්‍රමාණ සිත් ඇති වැ වාස කෙරෙයි. යම් තැනෙක ඔහුට උපන් ලාමක අකුශලධර්මයෝ නිරවශේෂ වැ නිරුද්ධ වෙත් නම් ඒ චිත්ත විමුක්තිය ද ප්‍රඥා විමුක්තිය ද යථාභූතයෙන් දැනගනී. ඇවැත්නි, මේ මහණ චක්ෂුර්විඥානයෙන් දතයුතු රූපයෙහි අනවස්සුත යැ ... මනයින් දතයුතු දහම්හි අනවස්සුත යයි කියනු ලැබේ. ඇවැත්නි, මෙසේ වාස කරන ඒ මහණහු කරා චක්ෂුද්වාරයෙනුදු ඉදින් මාර තෙම එළැඹේ නම් මාර තෙම අතුරු නො ලබන්නේ මැ යැ, මාර තෙම ප්‍රත්‍යය නො ලබන්නේ මැ යි. ශ්‍රොත්‍රද්වාරයෙනුදු ඉදින් ඔහු කරා ... මනොද්වාරයෙනුදු ඉදින් ඔහු කරා මාර තෙම එළැඹේ නම් මාර තෙම අතුරු නො ලබන්නේ මැ යැ, මාර තෙම ප්‍රත්‍යය නො ලබන්නේ මැ යි.

සෙය්‍යථාපි ආවුසො කූටාගාරං වා කූටාගාරසාලා වා බහලමත්තිකා අද්දාවලෙපනා, පුරත්ථිමාය චෙපි නං දිසාය පුරිසො ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය නෙව ලභෙථ අග්ගි ඔතාරං න ලභෙථ අග්ගි ආරම්මණං, පච්ඡිමාය චෙපි නං දිසාය– උත්තරාය චෙපි නං දිසාය– දක්ඛිණාය චෙපි නං දිසාය– හෙට්ඨිමාය චෙපි නං දිසාය– උපරිමාය චෙපි නං දිසාය– යතො කුතොචි චෙපි නං පුරිසො දිසාය ආදිත්තාය තිණුක්කාය උපසංකමෙය්‍ය නෙව ලභෙථ අග්ගි ඔතාරං න ලභෙථ අග්ගි ආරම්මණං. එවමෙව ඛො ආවුසො එවං විහාරිං භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උපසංකමති. නෙව ලභෙථ මාරො ඔතාරං න ලභෙථ මාරො ආරම්මණං සොතතො චෙපි නං –පෙ– මනතො චෙපි නං මාරො උපසංකමති නෙව ලභෙථ මාරො ඔතාරං නලභෙථ මාරො ආරම්මණං. එවං විහාරි චාවුසො භික්ඛු රූපෙ අභිභොසි[1] න රූපා භික්ඛුං අභිභංසු,[2] සද්දෙ භික්ඛු අභිභොසි න සද්දා භික්ඛුං අභිභංසු, ගන්ධෙ භික්ඛු අභිභොසි, න ගන්ධා භික්ඛුං අභිභංසු, රසෙ භික්ඛු අභිභොසි, න රසා භික්ඛුං අභිභංසු; ඵොට්ඨබ්බෙ භික්ඛු අභිභොසි, න ඵොට්ඨබ්බා භික්ඛුං අභිභංසු. ධම්මෙ භික්ඛු අභිභොසි න ධම්මා භික්ඛුං අභිභංසු, අයං වුච්චතාවුසො භික්ඛු රූපාභිභූ[3] සද්දාභිභූ ගන්ධාභිභූ රසාභිභූ ඵොට්ඨබ්බාභිභූ ධම්මාභිභූ අභිභූ අනභිභූතො[4] කෙහිචි කිලෙසෙහි අභිභොසි තෙ පාපකෙ අකුසලෙ ධම්මෙ සංකිලෙසිකෙ පොනොභවිකෙ සදරෙ දුක්ඛවිපාකෙ ආයතිං ජාතිජරාමරණීයෙ. එවං ඛො ආවුසො අනවස්සුතො හොති''ති.

අනවස්සුතො අපරිඩය්හමානොති: රාගජෙන පරිළාහෙන අපරිඩය්හමානො දොසජෙන පරිළාහෙන අපරිඩය්හමානො මොහජෙන පරිළාහෙන අපරිඩය්හමානොති 'අනවස්සුතො අපරිඩය්හමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො,'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

''ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො
ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානො,
අනවස්සුතො අපරිඩය්හමානො[5]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො''ති.

1. අධිභොසි – මජ සං.
2. අධිභංසු – මජ සං.
3. රූපාධිභූ සද්දාධිභූ ගන්ධාධිභූ රසාධිභූ – මජසං
4. අධිභූ අනධිභූතො – මජ සං
5. අපරිදය්හමානො – ච,චි
අල්ලාව ලෙපනා – සහා.
6. සළායතනසංයුත්ත – ආසිවිසවග්ග

ඇවැත්නි, යම්සේ බොල්මැටි ඇති තෙත්මැටි අලෙවිදූන් කුළුගෙයක් හෝ කූටාගාරශාලාවක් හෝ වේ ද, ඉදින් පුරුෂයෙක් ගිනි ඇවිළගත් තණහුලකින් යුතු වැ පැදුන්දෙසිනුදු ඒ කූටාගාරශාලාව කරා එළැඹේ නම් ගින්න නො මැ අතුරු ලැබෙන්නේ ද ගින්න ප්‍රත්‍යය නො ලැබෙන්නේ ද, ඉදින් පැළදෙසිනුදු එය කරා–ඉදින් උතුරු දෙසිනුදු එය කරා–ඉදින් දකුණුදෙසිනුදු එය කරා– ඉදින් යට දෙසිනුදු එය කරා–ඉදින් උඩදෙසිනුදු එය කරා–ඉදින් යම්කිසි දෙසකිනුදු එය කරා පුරුෂයෙක් ගිනි ඇවිළගත් තණහුලකින් යුතු වැ එළැඹේ නම් ගින්න නො මැ අතුරු ලැබෙන්නේ ද, ප්‍රත්‍යය නො ලැබෙන්නේ ද, එසෙයින් මැ ඇවැත්නි, මෙබඳු විහරණ ඇති ඒ මහණහු කරා චක්ෂුර්ද්වාරයෙනුදු ඉදින් මාර තෙම එළැඹේ නම් මාර තෙමේ නො මැ අතුරු ලැබෙන්නේ යැ ප්‍රත්‍යය නො ලැබෙන්නේ යැ, ඉදින් ශ්‍රොත්‍රද්වාරයෙනුදු ඔහු කරා ... මනොද්වාරයෙනුදු ඔහු කරා ඉදින් මාර තෙම එළැඹේ නම් මාර තෙමේ නො මැ අතුරු ලැබෙන්නේ යැ මාර තෙමේ ප්‍රත්‍යය නො ලැබෙන්නේ යි. තවද ඇවැත්නි, මෙබඳු විහරණ ඇති මහණ තෙම රූපයන් මැඩපි යැ. රූපයෝ මහණහු නො මැඩපූහ. මහණ ශබ්දයන් මැඩපි යැ, ශබ්දයෝ මහණහු නො මැඩපූහ. මහණ තෙම ගන්ධයන් මැඩපියැ, ගන්ධයෝ මහණහු නො මැඩපූහ. මහණ තෙම රසයන් මැඩපියැ, රසයෝ මහණහු නො මැඩපූහ. මහණ තෙම ස්ප්‍රෂ්ටව්‍යයන් මැඩපියැ, ස්ප්‍රෂ්ටව්‍යයෝ මහණහු නො මැඩපූහ. මහණ තෙම ධර්මයන් මැඩපි යැ, ධර්මයෝ මහණහු නො මැඩපූහ. ඇවැත්නි මෙ මහණ රූපය මැඩලූයේ යැ, ශබ්දය මැඩලූයේ යැ, ගන්ධය මැඩලූයේ යැ, රසය මැඩලූයේ යැ, ස්ප්‍රෂ්ටව්‍යය මැඩලූයේ යැ, ධර්මය මැඩලූයෙ යයි කියනු ලැබෙයි. කිසි කෙලෙස් කෙනකුන් විසින් නො මඩනා ලද්දේ 'අභිභූ' නම් වෙයි. සාංක්ලෙශික වූ පුනර්භවය ඇතිකරන්නා වූ දරථ සහිත වූ දුඃඛවිපාක ඇති ආයතිභවයෙහි ජාති ජරාමරණ පිණිස පවත්නා වූ ඒ ලාමක අකුශලධර්මයන් මැඩලයි. ඇවැත්නි මෙසෙයින් 'අන්වස්සුත' වේ නුයි 'අනවස්සුතො' යනු වේ.

**අනවස්සුතො අපරිඩයහමානො** යනු: රාගයෙන් උපන් පරිදහයෙන් නො දවෙනුයේ ද්වේෂයෙන් උපන් පරිදහයෙන් නො දවෙනුයේ මෝහයෙන් උපන් පරිදහයෙන් නො දවෙනුයේ නුයි 'අනවස්සුතො අපරිඩයහමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේබුදුහු:

**"ඔක්ඛිත්තචක්ඛු –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො"යි.**

10.

ඔහාරයිත්වා ගිහිබ්‍යඤ්ජනානි
සංඡන්නපත්තො[1] යථා පාරිච්ඡත්තකො,
කාසායවත්ථො අභිනික්ඛමිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

ඔහාරයිත්වා ගිහිබ්‍යඤ්ජනානීති 'ගිහිබ්‍යඤ්ජනා' වුච්චන්ති කෙසා ච මස්සු ච[2] —පෙ— දීඝදසානි ඉතිවා. ඔහාරයිත්වා ගිහිබ්‍යඤ්ජනානීති; ගිහිබ්‍යඤ්ජනානි ඔරොපයිත්වා සමොරොපයිත්වා නික්ඛිපිත්වා පටිප්පස්සම්භිත්වාති 'ඔහාරයිත්වා ගිහිබ්‍යඤ්ජනානි,

සංඤ්ඡන්නපත්තො යථා පාරිච්ඡත්තකොති යථා සො පාරිජත්තකො කොවිළාරො බහලපත්තපලාසො සන්දච්ඡායො.[3] එවමෙව සො පච්චෙකසම්බුද්ධො පරිපුණ්ණපත්තචීවරධරොති 'සඤ්ඡන්නපත්තො'[1] යථා පාරිච්ඡත්තකො .

කාසායවත්ථො අභිනික්ඛමිත්වාති: සො පච්චෙකසම්බුද්ධො සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපලිබොධං ඡින්දිත්වා සන්නිධිපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා[4] කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙතීති 'කාසායවත්ථො අභිනික්ඛමිත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"ඔහාරයිත්වා ගිහිබ්‍යඤ්ජනානි
සංඤ්ඡන්නපත්තො යථාපාරිච්ඡත්තකො,
කාසායවත්ථො අභිනික්ඛමිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

තතියො වග්ගො.

1. සංසීනපත්තො – ස
පච්ඡින්නපත්තො – ච, වී
2. කෙසමස්සු ච – ච, වී
3. සන්නච්ඡායො – ච, වී
සණ්ඩච්ඡායො – සා
4. ඔහාරයිත්වා – සා.

10. (කෙස්රැවුළු ආදී) ගිහිව්‍යඤ්ජනයන් බැහැර කොට සැඳුණු පත්‍ර ඇති පරසතුරුකක් සෙයින් කහවත් ඇති වැ, අභිනිෂ්ක්‍රමණ කොට කගවෙහෙණහගක් සෙයින් එකලා වැ සරනෙයි .

**ඔහාරයිත්වා ගිහිව්‍යඤ්ජනානි**– 'ගිහිව්‍යඤ්ජනයෝ' : කෙස් ද රැවුළු ද ... දික්දවලු ඇති වස්ත්‍ර යනාදිය හෝ කියනු ලැබෙති. **ඔහාරයිත්වා ගිහිව්‍යඤ්ජනානි** යනු: ගිහිව්‍යඤ්ජනයන් බැහැර කොට මැනැවින් බැහැර කොට බහාතබා දුරු කොට නුයි 'ඔහාරයිත්වා ගිහිව්‍යඤ්ජනානි' යනු වේ.

**සඤ්ඡන්නපත්තො යථා පාරිච්ඡත්තකො** යනු: යම්සේ ඒ පරසතු නම් වූ කොබළලරුක බොල්දත්දලු ඇත්තේ ඝන සෙවනලු ඇත්තේ වේ ද, එසෙයින් මැ ඒ පසේ බුදුහු පරිපූර්ණ පාත්‍රචීවර ධරනුවාහු නුයි 'සඤ්ඡන්න-පත්තො යථා පාරිච්ඡත්තකො' යනු වේ.

**කාසායවත්ථො අභිනික්ඛමිත්වා** යනු: ඒ පසේ බුදුහු හැම ගෘහවාසපළි-බොධ සිඳ අඹුදරු පළිබොධ සිඳ ඥාතිපළිබොධ සිඳ සගයහළු පළිබොධ සිඳ සන්නිධිපළිබොධ සිඳ කෙස්රැවුළු බහා කහවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදි වැ අකිඤ්චනභාවයට (කිසිත් නැති බවට) පැමිණ එකලා වැ හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති වැටෙති රකෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'කාසායවත්ථො අභිනික්ඛමිත්වා එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේබුදුහු:

"**ඔහාරයිත්වා –පෙ– එකො චරෙ ඛග්ගවිසාණකප්පො**"යි.

**තුන් වැනි වර්ගයි.**

1. රසෙසු ගෙධං අකරං අලොලො
අනඤ්ඤපොසී සපදානචාරී,
කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**රසෙසු ගෙධං අකරං අලොලොති** 'රසො'ති: මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො, අම්බිලං මධුරං තිත්තකං කටුකං ලොණිකං[1]' ඛාරිකං ලම්බිලං[2]' කසාවො සාදුං අසාදුං[3] සීතං උණ්හං. සන්තෙකෙ සමණබ්‍රාහ්මණා රසගිද්ධා, තෙ ජිව්හග්ගෙන රසග්ගානි පරියෙසන්තා ආහිණ්ඩන්ති, තෙ අම්බිලං ලභිත්වා අනම්බිලං පරියෙසන්ති, අනම්බිලං ලභිත්වා අම්බිලං පරියෙසන්ති, මධුරං ලභිත්වා අමධුරං පරියෙසන්ති, අමධුරං ලභිත්වා මධුරං පරියෙසන්ති, තිත්තකං ලභිත්වා අතිත්තකං පරියෙසන්ති, අතිත්තකං ලභිත්වා තිත්තකං පරියෙසන්ති, කටුකං ලභිත්වා අකටුකං පරියෙසන්ති අකටුකං ලභිත්වා කටුකං පරියෙසන්ති, ලොණිකං ලභිත්වා අලොණිකං පරියෙසන්ති, අලොණිකං ලභිත්වා ලොණිකං පරියෙසන්ති, ඛාරිකං ලභිත්වා අඛාරිකං පරියෙසන්ති, අඛාරිකං ලභිත්වා ඛාරිකං පරියෙසන්ති, කසාවං ලභිත්වා අකසාවං පරියෙසන්ති අකසාවං ලභිත්වා කසාවං පරියෙසන්ති, ලම්බිලං[2]' ලභිත්වා අලම්බිලං පරියෙසන්ති, අලම්බිලං ලභිත්වා ලම්බිලං පරියෙසන්ති, සාදුං ලභිත්වා අසාදුං පරියෙසන්ති, අසාදුං ලභිත්වා සාදුං පරියෙසන්ති, සීතං ලභිත්වා උණ්හං පරියෙසන්ති උණ්හං ලභිත්වා සීතං පරියෙසන්ති. තෙ යං යං ලභන්ති තෙන තෙන න තුස්සන්ති, අපරාපරං පරියෙසන්ති, මනාපිකෙසු රසෙසු රත්තා[4] ගිද්ධා ගධිතා මුච්ඡිතා අජ්ඣොපන්නා[5], ලග්ගා ලග්ගිතා පලිබුද්ධා, සා රසතණ්හා තස්ස පච්චෙකබුද්ධස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා සො පච්චෙකසම්බුද්ධො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වෙදනං පටිහඞ්ඛාමි, නවං ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො ච. යථා වණං ආලිම්පෙය්‍ය යාවදෙව රොපනත්ථාය,[7] යථා වා පන අක්ඛං අබ්භඤ්ජෙය්‍ය යාවදෙව භාරස්ස නිත්ථරණත්ථාය, යථා වා පන පුත්තමංසං ආහාරං ආහරෙය්‍ය[8] යාවදෙව කන්තාරස්ස නිත්ථරණත්ථාය. එවමෙව සො පච්චෙකසම්බුද්ධො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වෙදනං පටිහඞ්ඛාමි, නවං ච වෙදනං න උප්පාදෙස්සාමි,

1. ලොණියං - පත-
2. ලම්බිලං සෑ, ලම්බිකං - ම ඡ සං
3. සාදු අසාදු - ම ඡ සං
4. මනාපිකෙසු රත්තා - ච, වි
5. අජ්ඣොසන්නා - ම ඡ සං
6. අනභාවං කතා - ම ඡ සං
7. ආරුහනත්ථාය - ම ඡ සං
8. ආහාරෙය්‍ය - ම ඡ සං

1.

රසයෙහි ගිජු බව නො කරනුයේ ලොල් නො වූයේ අනෙකක්හු නුපුස්නාසුලු වූයේ ගෙපිළිවෙළින් පිඬුසිගා වඩනුයේ කුලයෙහි (කෙලෙස් විසින්) නො ලැගි සිත් ඇත්තේ කගවෙහෙණ හඟක් සෙයින් එකලා වැ සරනේ යි.

**රසෙසු ගෙධං අකරං අලොලො–** 'රසො' යනු: මුල්රස යැ කඳරස යැ පොතුරස යැ පත්රස යැ මල්රස යැ පලරස යැ, ඇඹුල මිහිර තිත්තරස යැ කුළුරස යැ ලුණුරස යැ කරරස යැ (ගිවුළු ආදී) ලපිල රස යැ කසටරස යැ ඉවුරස යැ අනිවුරස යැ සිහිල්රස යැ උණුරස යි. රසයෙහි ගිජු වූ ඇතැම් මහණ බමුණෝ ඇති. ඔහු දිවගින් අග්‍රරසයන් පිරියෙස් (සොය) මින් ඇවිදුති, ඔහු ඇඹුල ලැබ නො ඇඹුල පිරියෙස්ති (සොයති) නො ඇඹුල ලැබ ඇඹුල පිරියෙස්ති, (ගිතෙල් ආ) මිහිරිරස ලැබ නො මිහිරිරස පිරියෙස්ති නො මිහිරිරස ලැබ මිහිරිරස පිරියෙස්ති, තිත්තරස ලැබ අතිත්තකරස පිරියෙස්ති, අතිත්තකරස ලැබ තිත්තරස පිරියෙස්ති, කුළුරස ලැබ නො කුළුරස පිරියෙස්ති, නො කුළුරස ලැබ කුළුරස පිරියෙස්ති, ලුණුරස ලැබ ලුණු නැත්ත පිරියෙස්ති, ලුණුනැත්ත ලැබ ලුණුරස පිරියෙස්ති, කරරස ලැබ අඛාරිකය (කරරස නැත්ත) පිරියෙස්ති, කරරස නැත්ත ලැබ කරරස පිරියෙස්ති, කසටරස ලැබ කසටරස නැත්ත පිරියෙස්ති, කසටරස නැත්ත ලැබ කසටරස පිරියෙස්ති, ලපිලරස ලැබ ලපිලරස නැත්ත පිරියෙස්ති, ලපිල රස නැත්ත ලැබ ලපිලරස පිරියෙස්ති, ඉවුරස ලැබ අනිවුරස පිරියෙස්ති, අනිවුරස ලැබ ඉවුරස පිරියෙස්ති, සිහිල්රස ලැබ උණුරස පිරියෙස්ති, උණුරස ලැබ සිහිල් රස පිරියෙසිත්. ඔහු යම් යම් රසයක් ලබත් ද ඒ ඒ රසයෙන් තුටු නො වෙති. මනවඩන රසයන්හි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු බැස ගත්තාහු ලැගුණාහු ලග්නිත වූවාහු පරිරුද්ධ වූවාහු මතුමත්තෙහි පිරියෙසිත්. ඒ රසතෘෂ්ණාව ඒ පසේබුදුන් විසින් ප්‍රහීණ යැ, උදුන්මුල් ඇත්තී යැ, හිස්සුන් තල්රුකක් සෙයින් අවස්තු කරන ලද යැ. අනු අභාවය කරන ලද යැ ආයති භවයෙහි නුපදනා පියවි ඇත්තී යැ, එයින් ඒ පසේබුදුහු නුවණින් විමසා අහර වළඳති. කෙළි පිණිස නො මැ වළඳති, මද පිණිස–අලඞ්කාර පිණිස– සැරසුම් පිණිස නො වළඳති, යම්තාක් මේ කය පැවැත්ම පිණිස යැපිම පිණිස බඩගිනි වේදනා නැසීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස වළඳත්. මෙසේ පැරැණි බඩගිනි වේදනා නසමි අලුත් වේදනාත් නුපදවමි මාගේ යැපිම ද වන්නේ යැ අනවද්‍යභාවය ද සුවවිහරණය ද වන්නේ යැ යි. යම්සේ මස්වැඩීම පමණට ව්‍රණය ආලේප කරන්නේ ද, තවද යම්සේ බර ගෙන යන පමණට අක්ෂය තෙල් ගල්වන්නේ ද, තවද යම්සේ කතරමග තරණය කරන පමණට පුත්‍රමාංසාහාරය අනුභව කරන්නේ ද, එපරිද්දෙන් මැ පසේ බුදුහු නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට අහර වළඳති, නො මැ කෙළි පිණිස වළඳති ...

යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. රසතණ්හං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති, රසතණ්හාය ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති ‘රසෙසු ගෙධං’. අලොලොති ‘ලොලුප්පං වුච්චති තණ්හා, “යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං” සා ලොලුප්පා තණ්හා තස්ස පච්චෙකසම්බුද්ධස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා පච්චෙකසම්බුද්ධො අලොලොති ‘රසෙසු ගෙධං අකරං අලොලො.’

අනඤ්ඤපොසී සපදානචාරීති: ‘අනඤ්ඤපොසී’ති සො පච්චෙකසම්බුද්ධො අත්තානඤ්ඤෙව පොසෙති න පරන්ති,

1. “අනඤ්ඤපොසිං අඤ්ඤාතං දන්තං සාරෙ පතිට්ඨිතං.[1]
ඛීණාසවං වන්තදොසං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණ”න්ති.[a]

අනඤ්ඤපොසී සපදානචාරීති; සො පච්චෙකසම්බුද්ධො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති රක්ඛිතෙනෙව කායෙන රක්ඛිතාය වාචාය රක්ඛිතෙන චිත්තෙන උපට්ඨිතාය සතියා සංවුතෙහි ඉන්ද්‍රියෙහි ඔක්ඛිත්තචක්ඛු ඉරියාපථසම්පන්නො, කුලාකුලං අනතික්කමන්තො පිණ්ඩාය චරතීති ‘අනඤ්ඤපොසී සපදානචාරී.’

කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තොති: ද්වීහි කාරණෙහි පටිබද්ධචිත්තො[2] හොති; අත්තානං වා නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති, අත්තානං වා උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති.

1. සාරෙසු සුපතිට්ඨිතං - සභා
2. පටිබන්ධ චිත්තො - ව වි

a උදානපාළි - බොධිවග්ග

මාගේ ජීවිතයාත්‍රාව ද අනවද්‍යතාව ද චාසුවිහරණය ද වන්නේ යැ' යි රසතෘෂ්ණාව දුරු කෙරෙති, බැහැර කෙරෙති, විගතාන්ත කෙරෙති අනාභාවයට පමුණුවති. රසතෘෂ්ණාවෙන් දුරු වූවාහු වෙත්, වූවාහු වෙසෙයිත් වෙන්වූවාහු නික්මුණාහු නික්මැගියාහු වෙසෙසින් මිදුණාහු විසංයුක්ත වූවාහු වන්නාහ, විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වාසය කෙරෙත් නුයි 'රසෙසු ගෙධං' යනුවේ. අලොලො යනු: 'ලොලුප්ප' යි තෘෂ්ණාව කියනු ලැබෙයි. "යම රාගයෙක් බලවත් රාගයෙක්... අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. ඒ ලොලුප්ප සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ඒ පසේබුදුනට ප්‍රහීණ යැ උසුන්මුල් ඇත්ති යැ තාලවස්තුවක් මෙන් කරන ලද අනු අභාවය කරන ලද මත්තෙහි නූපදනා පියවි ඇත්තී යැ, එයින් පසේ බුදුහු 'අලොල' වෙත් නුයි 'රසෙසු ගෙධං අකරං අලොලො' යනු වේ.

අනඤ්ඤපොසී සපදානචාරී–'අනඤ්ඤපොසී' යනු: ඒ පසේබුදුහු තමන් මැ පෝෂණය කෙරෙති මෙරමා පෝෂණය නො කෙරෙත් නුයි,

1. "තමා විසින් පෝෂණය කළ යුතු අනෙකක්හු නැති දන්නා ලද සත්‍යය ඇති දමනය කළ ඉඳුරන් ඇති නිර්වාණසාරයෙහි පිහිටි වාන්ත වූ ද්වේෂ ඇති ඒ ක්ෂීණාසුවයා 'බ්‍රාහ්මණ' යයි මම කියමි"යි.

අනඤ්ඤපොසී සපදානචාරී යනු: ඒ පසේ බුදුහු පෙරවරු කාලයෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන රක්නාලද කායද්වාරයෙන් යුක්ත වැ රක්නාලද වාග්ද්වාරයෙන් යුක්ත වැ රක්නාලද මනොද්වාරයෙන් යුක්ත වැ එළඹැසිටි සිහියෙන් යුක්ත වැ සංවර කළ ඉඳුරන් ඇති වැ යට බලාලූ ඇස් ඇති වැ පිරිපුන් ඉරියවු ඇති වැ ගමට හෝ නියම්ගමට හෝ පිඩු පිණිස පිවිසෙති, කුලයෙන් කුලය නො ඉක්මෙමින් පිඩු පිණිස හැසිරෙත්නුයි 'අනඤ්ඤපොසී සපදානචාරී' යනු වේ.

කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො– ද කරුණෙකින් ඇලුණුසිත් ඇත්තේ වෙයි: තමා හෝ පහත් කොට තබමින් මෙරමා උස් කොට තබනුයේ පිළිබැඳිසිත් ඇති වෙයි, තමා හෝ උස් කොට තබමින් මෙරමා පහත් කොට තබනුයේ පිළිබැඳිසිත් ඇති වෙයි.

කථං අත්තානං නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති: තුම්හෙ මෙ බහූපකාරා, අහං තුම්හෙ නිස්සාය ලභාමි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං යෙපි මෙ අඤ්ඤෙ දාතුං වා කාතුං වා මඤ්ඤන්ති, තුම්හෙ නිස්සාය තුම්හෙ සම්පස්සන්තා, යම්පි මෙ පොරාණං මාතාපෙත්තිකං නාමගොත්තං. තම්පි මෙ අන්තරහිතං, තුම්හෙහි අහං ඤායාමි අසුකස්ස කුලූපකො අසුකාය කුලූපකොති. එවං අත්තානං නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති. කථං අත්තානං උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති: අහං තුම්හාකං බහූපකාරො, තුම්හෙ මං ආගම්ම බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා. තුම්හාකං අහං උද්දෙසං දෙමි, පරිපුච්ඡං දෙමි, උපොසථං ආචික්ඛාමි,[1] නවකම්මං අධිට්ඨාමි. අථ ච පන තුම්හෙ මං උජ්ඣිත්වා අඤ්ඤෙ සක්කරොථ ගරුකරොථ[2] මානෙථ පූජෙථාති. එවං අත්තානං උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො පටිබද්ධචිත්තො හොති.

කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තොති: සො පච්චෙකසම්බුද්ධො කුලපලිබොධෙන අප්පටිබද්ධචිත්තො හොති, ගණපලිබොධෙන අප්පටිබද්ධචිත්තො හොති, ආවාසපලිබොධෙන අප්පටිබද්ධචිත්තො හොති, චීවරපලිබොධෙන අප්පටිබද්ධචිත්තො හොති, පිණ්ඩපාතපලිබොධෙන අප්පටිබද්ධචිත්තො හොති, සෙනාසනපලිබොධෙන අප්පටිබද්ධචිත්තො හොති, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපලිබොධෙන අප්පටිබද්ධචිත්තො හොතීති – කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"රසෙසු ගෙධං අකරං අලොලො
අනඤ්ඤපොසී සපදානචාරී,
කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො."

2.

පහාය පඤ්චාවරණානි චෙතසො
උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙ,
අනිස්සිතො ඡෙත්ව සිනෙහදොසං[3]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

පහාය පඤ්චාවරණානි චෙතසොති: සො පච්චෙකසම්බුද්ධො කාමච්ඡන්දනීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, බ්‍යාපාදනීවරණං- ථිනමිද්ධනීවරණං- උද්ධච්චකුක්කුච්චනීවරණං- විචිකිච්ඡානීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ජ්ඣානං උපසම්පජ්ජ විහරතීති 'පහාය පඤ්චාවරණානි චෙතසො'.

---

1. ආචික්ඛිස්සාමි – ව වි
2. ගරුං කරොථ – ම ජ සං
3. ඡෙත්වා සිනෙහ දොසං – ප වි ව ක

කිසෙයින් තමා නිච කොට තබමින් මෙරමා උස් කොට තබනුයේ පිළිබැඳිසිත් ඇති වේ ද යත්: ' 'තෙපි මට බොහෝ උපකාර ඇතියව මම තොප නිසා සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකර ලැබෙමි මේ අන්හු ද දෙන්නට හෝ කරන්නට හෝ සිතත් නම් තොප නිසා තොප බලයින් (දෙන්නට සිතති) මවපියන් සතු මාගේ යම් පැරණි නාමගොත්‍ර යෙක් වී නම් මාගේ ඒ නම්ගොත් ද වැසිණි. තොප නිසා මම් අඳුවල්හුගේ කුලූපග යැ, අසෝ තැනැත්තිය ගේ කුලූපග යා යි ප්‍රකට වෙමි. මෙසෙයින් තමා නිච කෙරෙමින් පරා උසස් කරනුයේ පිළිබැඳි සිත් ඇතියේ වෙයි. කිසෙයින් තමා උසස් කෙරෙමින් පරා නිච කොට තබනුයේ පිළිබැඳි සිත් ඇති වේ ද යත්: මම් තොපට බොහෝ උපකාර ඇතියෙමි තෙපි මා කරා අවුදු බුදුන් සරණ ගියව, දහම් සරණ ගියව, සඟුන් සරණ ගියව, ප්‍රාණවධයෙන් වැළැක්ක වූ යැ අදත්තාදනයෙන් -කාමමිථ්‍යා චාරයෙන්- මෘෂාවාදයෙන්- මද්‍යප්‍රමාදයට කාරණ වූ රහමෙර පීමෙන් වැළැක්කවූ යැ. මම් තොපට උද්දේශ දෙමි, පරිපෘච්ඡා දෙමි, පොහොය පවසමි, නවහම්හි පිහිට වෙමි. එතෙකුදු වත් තෙපි මා හැරපියා අනුනට සත්කාර කරව, ගරු කරව, බුහුමන් කරව, පුද කරව යි මෙසේ තමා උස් කොට තබමින් පරා පහත් කොට තබනුයේ පිළිබැඳිසිත් ඇතියේ වේ.

**කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො** යනු: ඒ පසේබුදුහු කුලපළිබොධයෙන් නො ලැගුණුසිත් ඇත්තාහු වෙති, ගණපළිබොධයෙන් නො ලැගුණුසිත් ඇත්තාහු වෙති, ආවාස පළිබොධයෙන් නො ලැගුණුසිත් ඇත්තාහු වෙති, චීවරපළිබොධයෙන්- පිණ්ඩපාත පළිබොධයෙන්- සෙනාසනපළිබොධ-යෙන්- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපළිබොධයෙන් නො ලැගුණු සිත් ඇත්තාහු වෙත් නුයි 'කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො එකො චරෙ ඛග්ගවිසාණ කප්පො' යනු වේ.

එයින් වදළහ ඵ පසේබුදුහු:

**''රසෙසු ගෙධං අකරං -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො''යි.**

2.

සිතට ආවරණ වූ පසැඳ නීවරණයන් හැරපියා හැම උපක්ලේශයන් විදසුන්මගින් දුරු කොට (දෘෂ්ටිනිඃශ්‍රයෙන) අනිඃශ්‍රිත වූයේ ත්‍රෛධාතුක වූ ස්නේහදෙෂය සිඳපියා කගවෙහෙණහඟක් මෙන් එකලා වැ හැසිරෙන්-නේ යි.

**පහාය පඤ්චාවරණානි චෙතසො**- ඒ පසේබුදුහු කාමච්ඡන්දනීවරණය හැර හැරපියා බැහැර කොට විනාශාන්ත කොට අනාභාවයට පමුණුවා ව්‍යාපාද නීවරණය- ථිනමිද්ධ නීවරණය- උද්ධච්චකුක්කුච්චනීවරණය- විචිකිච්ඡා නීවරණය හැර හැරපියා බැහැර කොට විගතාන්ත කොට අනාභාවයට පමුණුවා කාමච්ඡන්දයෙන් වෙන් වැ අකුශල ධර්මයන්ගෙන් වෙන් වැ සවිතර්ක වූ සවිචාර වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කෙරේ නුයි 'පහාය පඤ්චාවරණානි චෙතසො' යනු වේ.

**උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙති:** රාගො චිත්තස්ස උපක්කිලෙසො දොසො චිත්තස්ස උපක්කිලෙසො මොහො චිත්තස්ස උපක්කිලෙසො කොධො – උපනාහො -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරා චිත්තස්ස උපක්කිලෙසා. **උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙති:** සබ්බෙ චිත්තස්ස උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ පනුදිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙ'.

**අනිස්සිතො ඡෙත්වා සිනෙහදොසන්ති:** 'අනිස්සිතො'ති ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච, දිට්ඨිනිස්සයො ච -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො. **සිනෙහොති:** ද්වෙ සිනෙහා: තණ්හාසිනෙහො ච දිට්ඨිසිනෙහො ච -පෙ- අයං තණ්හාසිනෙහො -පෙ- අයං දිට්ඨිසිනෙහො **දොසොති** “යො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස’.[a] අනිස්සිතො ඡෙත්වා සිනෙහදොසන්ති සො පච්චෙකසම්බුද්ධො තණ්හාසිනෙහං ච දිට්ඨිසිනෙහං ච දොසං ච ඡෙත්වා උච්ඡින්දිත්වා සමුච්ඡින්දිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා චක්ඛුං අනිස්සිතො සොතං අනිස්සිතො -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'අනිස්සිතො ඡෙත්වා සිනෙහදොසං එකො චරෙ ඛග්ගවිසාණකප්පො.'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

“පහාය පඤ්චාවරණානි චෙතසො
උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙ,
අනිස්සිතො ඡෙත්වා සිනෙහදොසං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො”ති.

---

a ධම්මසඞ්ගණී – නික්ඛෙපකණ්ඩ

**උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙ**- රාගය සිතට උපක්ලේශ යැ ද්වේෂය සිතට උපක්ලේශ යැ මෝහය සිතට උපක්ලේෂ යැ ක්‍රොධය- උපනාහය... සියලු අකුශලාභිසංස්කාරයෝ සිතට උපක්ලේශයෝ යි. **උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙ** යනු: සිතට උපක්ලේශ වූ හැම ධර්මයන්. **බ්‍යපනුජ්ජ**: බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'උපක්කිලෙසෙ බ්‍යපනුජ්ජ සබ්බෙ' යනු වේ.

**අනිස්සිතො ඡෙත්වා සිනෙහදොසං**- 'අනිස්සිතො' යනු: නිඃශ්‍රය දෙකෙකි: තෘෂ්ණා නිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය ද යි ... මේ දෘෂ්ටි නිඃශ්‍රය යි. **සිනෙහො** යනු: ස්නෙහ දෙකෙකි: තෘෂ්ණාස්නෙහය ද දෘෂ්ටිස්නෙහය ද යි... **දොසො** යනු: ''චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වේෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් චිත්තයාගේ ප්‍රකෘතිය හැරීමෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් ක්‍රොධ බවෙක් ද්වේෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිතබවෙක් ව්‍යාපාදයෙක් ව්‍යාපාදකාරයෙක් ව්‍යාපාදයට පැමිණි බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩ බවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් සිතෙහි නො සතුටු බවෙක් වේ ද එය යි. **අනිස්සිතො ඡෙත්වා සිනෙහදොසං** යනු: ඒ පසේ බුදුහු තෘෂ්ණා ස්නෙහය ද දෘෂ්ටිස්නෙහය ද ද්වේෂය ද සිඳ මුලින් සිඳ සමූලයෙන් සිඳ හැර හැර පියා දුරු කොට විගතාන්ත කොට. අනභාවයට පමුණුවා ඇස ඇසුරු නො කෙළේ කන ඇසුරු නො කෙළේ... දෘෂ්ට ශ්‍රැත මුත විඥාතව්‍යධර්මයන් ඇසුරු නො කෙළේ නො ඇලුණේ අනුපගත වූයේ අනධ්‍යවසිත වූයේ අනධිමුක්ත වූයේ නික්ම ගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වාස කෙරේ නුයි 'අනිස්සිතො ඡෙත්වා සිනෙහදොසං එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

**''පහාය පඤ්චාවරණානි චෙතසො -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො''** යි.

3.

විපිට්ඨිකත්වාන සුඛං දුඛං ච[1]
පුබ්බෙව ච සොමනස්සදොමනස්සං,
ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

විපිට්ඨිකත්වාන සුඛං දුඛං ච[1] පුබ්බෙව ච සොමනස්සදොමනස්සන්ති: සො පච්චෙකසම්බුද්ධො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරතීති – 'විපිට්ඨිකත්වාන සුඛං දුඛං ච පුබ්බෙව ච සොමනස්සදොමනස්සං'.

ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධන්ති 'උපෙක්ඛා'ති යා චතුත්ථජ්ඣානෙ උපෙක්ඛා උපෙක්ඛායනා අජ්ඣුපෙක්ඛනා චිත්තසමථො[2] චිත්තප්පස්සද්ධතා මජ්ඣත්තතා චිත්තස්ස. සමථොති "යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි[a] චතුත්ථජ්ඣානෙ[3] උපෙක්ඛා ච සමථො ච සුද්ධා හොන්ති විසුද්ධා පරියොදාතා අනඞ්ගණා විගතූපක්කිලෙසා මුදුභූතා කම්මනියා ඨිතා ආනෙඤ්ජප්පත්තා.[4] ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධන්ති: චතුත්ථජ්ඣානුපෙක්ඛං ච[5] සමථං ච ලද්ධා ලභිත්වා වින්දිත්වා පටිලභිත්වාති 'ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං එකො චරෙ ඛග්ගවිසාණකප්පො.'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"විපිට්ඨිකත්වාන සුඛං දුඛං ච[1]
පුබ්බෙව ච සොමනස්සදොමනස්සං,
ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

---

1. දුක්ඛං ච – ප ච වි
2. චිත්තසමතා – ම ඡ සං
   චිත්තස්ස සමථො – ප ච වි
3. චතුත්ථ ඣානෙ – ම ඡ සං, ච, වි
4. කම්මනියා අනෙඤ්ජප්පත්තා – පත
5. චතු ජ්ඣානං උපපෙක්ඛං ච – ම ඡ සං

a. ධම්මසඞ්ගණි – චිත්තුප්පාදකණ්ඩ

3.

කායිකසුවය ද දුක ද පිටු දුක පළමු මැ සොම්නස් දොම්නස් ද දුරු කොට චතුර්ථධ්‍යාන උපෙක්ෂාව ද (නීවරණයෙන්) විශුද්ධ වූ ශමථය ද ලැබ කගවෙහෙණ හහක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යි.

**විපිට්ඨිකත්වාන සුඛං දුඛඤ්ච පුබ්බෙව ච සොමනස්සදොමනස්සං** යනු: ඒ පසේබුදුහු කායික සුවය ද දුරු කිරීමෙන් කායික දුක ද දුරු කිරීමෙන් පළමු (ප්‍රථමධ්‍යාන උපචාරයෙහි) මැ සොම්නස් දොම්නසුත් දුරු කිරීමෙන් දුක් නො වූ සුව නො වූ උපෙක්ෂාව හා ස්මෘතිපාරිශුද්ධිය ඇති සතර වැනි දැහැනට එළැඹ වෙසේ නුයි 'විපිට්ඨිකත්වාන සුඛං දුඛඤ්ච පුබ්බෙව ච සොමනස්ස දොමනස්සං' යනු වේ.

**ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං** — 'උපෙක්ඛා' යනු: "චතුර්ථ ධ්‍යානයෙහි යම් උපේක්ෂාවක් උපේක්ෂාකාරයෙක් අධ්‍යුපෙක්ෂාවක් චිත්තයාගේ ශමථයෙක් චිත්තයාගේ නො තද බවෙක් චිත්තයාගේ මධ්‍යස්ථ බවෙක් වේ ද එය'' යි. **සමථො** යනු: "චිත්තයාගේ යම් (අරමුණෙහි නිසල වැ සිටීමෙක් මොනවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් (උද්ධච්ච විචිකිච්ඡා විසින්) චිත්තයාගේ නො පැකිරීමෙක් නො විසිරීමෙක් නො විසුරුණු සිත ඇති බවෙක් ශමථයෙක් සමාධින්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක් සමාධියෙක් වේ ද එය" යි. චතුර්ථධ්‍යානයෙහි උපේක්ෂාව ද ශමථය ද ශුද්ධ වූවාහු වෙති, විශුද්ධ වූවාහු හාත්පසින් පිරිසිදු වූවාහු කෙලෙස් රහිත වූවාහු පහ වූ උපක්ලේශ ඇත්තාහු මෘදු වූවාහු කර්මක්‍ෂම වූවාහු ස්ථිත වූවාහු නිශ්චල බවට පැමිණියාහු වෙත්. **ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං** යනු: චතුර්ථධ්‍යානොපෙක්ෂාව ද ශමථය ද ලැබ ලබාගෙන විඳ ප්‍රතිලාභ කොට නුයි 'ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං එකො චරෙ ඛග්ග විසාණකප්පො' යනු වේ.

එයින් වදාළහ ඒ පසේ බුදුහු:

**"විපිට්ඨිකත්වාන සුඛං දුඛඤ්ච -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො" යි**

4.

ආරද්ධවිරියො පරමත්ථපත්තියා
අලීනචිත්තො අකුසීතවුත්ති,
දළ්හනික්කමො ථාමබලූපපන්නො[1]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

ආරද්ධවිරියො පරමත්ථපත්තියාති: ‘පරමත්ථං’ වුච්චති අමතං නිබ්බානං: “යො සො සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං:’ පරමත්ථස්ස පත්තියා ලාභාය පටිලාභාය අධිගමාය ඵුසනාය[2] සච්ඡිකිරියාය ආරද්ධවිරියො විහරති, අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං සම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසූති ‘ආරද්ධවිරියො පරමත්ථපත්තියා’.

අලීනචිත්තො අකුසීතවුත්තීති; සො පච්චෙක සම්බුද්ධො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීයොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහතීති එවම්පි[3] ‘අලීනචිත්තො අකුසීතවුත්ති.’ අථවා කාමං තචො ච නහාරු ච[4] අට්ඨි ච අවසිස්සතු[5] සරීරෙ උපසුස්සතු මංසලොහිතං. යං තං පුරිසථාමෙන පුරිසබලෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං[6] භවිස්සතීති චිත්තං පග්ගණ්හාති පදහති එවම්පි ‘අලීනචිත්තො අකුසීතවුත්ති’

1. නාසිස්සං න පිවිස්සාමි[4] විහාරතො න නික්ඛමෙ,
   නපි පස්සං නිපාතෙය්‍යං තණ්හාසල්ලෙ අනූහතෙ”ති.[a]

චිත්තං පග්ගණ්හාති පදහති, එවම්පි අලීනචිත්තො අකුසීතවුත්ති’ න තාවාහං ඉමං පල්ලඞ්කං භින්දිස්සාමි යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතීති චිත්තං පග්ගණ්හාති පදහති, එවම්පි ‘අලීනචිත්තො අකුසීතවුත්ති’ න තාවාහං ඉමම්හා ආසනා උට්ඨහිස්සාමි. යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතීති චිත්තං පග්ගණ්හාති පදහති, එවම්පි ‘අලීනචිත්තො අකුසීතවුත්ති’.

---

1. ථාමබලූපපන්නො – ච වි
2. ඵස්සනාය – ම ජ සං
3. එවං – ම ජ සං
4. නහාරු ච – ම ජ සං
5. අවසුස්සතු – ස්‍යා
6. සණ්ඨානං – ම ජ සං
   ඨානං – ස්‍යා

a. ථෙරගාථාපාළි – [illegible]
   මුදිතත්ථෙරගාථා

4.

පරමාර්ථ සංඛ්‍යාත නිවනට පැමිණීම පිණිස රුකුළුවැර ඇතියේ නො හැකුළුණු සිත් ඇතියේ ප්‍රධන්වීය්‍ය්‍ය ඇතියේ ස්ථිර වූ ඥානබලයට පැමිණියේ කගවෙහෙණහක් මෙන් එකලා වැ හැසිරෙන්නේ යි.

**ආරද්ධවිරියො පරමත්ථපත්තියා** — 'පරමත්ථ' යි අමාමහ නිවන කියනු ලැබෙයි: යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාව ක්ෂය වීමෙක් ක්ලෙශවිරාගයෙක් දුක්ඛනිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. පරමාර්ථයාගේ ප්‍රාප්තිය පිණිස ලාභය පිණිස ප්‍රතිලාභය පිණිස අධිගමය පිණිස ස්පර්ශය පිණිස ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස රුකුළුවැර ඇති වැ වාස කෙරෙයි, අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ට පැමිණීම පිණිස බල ඇතියේ දෘඪපරාක්‍රම ඇතියේ කුශලධර්මයන් හි නො තැබූ ධුර ඇතියේ තුයි 'ආරද්ධවිරියො පරමත්ථ පත්තියා' යනු වේ.

**අලීනචිත්තො අකුසීතවුත්ති** — ඒ පසේ බුදුහු නූපන් ලාමක අකුශල ධර්මයන්ගේ අනුත්පාදය පිණිස කුශලච්ඡන්දය උපදවති. වෑයම් කෙරෙති වීර්‍ය්‍යාරම්භ කෙරෙති සිත උත්සාහ කරවති පිහිටුවති උපන් ලාමක අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස . . . නූපන් කුශලධර්මයන්ගේ උත්පාදය පිණිස . . . උපන් කුශලධර්මයන්ගේ ස්ථිතිය පිණිස නො නැසීම පිණිස පුනපුනා වැඩීම පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූර්ණ බව පිණිස කුශලච්ඡන්දය උපදවති වෑයම් කෙරෙති වීර්‍ය්‍යාරම්භ කෙරෙති සිත උත්සාහ කරවති පිහිටුවති. මෙසේත් 'අලීනචිත්තො අකුසීතවුත්ති' යනු වේ. නොහොත් 'ඒකාන්තයෙන් ශරීරයෙහි සමත් නහරත් ඇටත් ඉතිරි වේවා, මස්ලේ වියළේවා, පුරුෂශක්තියෙන් පුරුෂබලයෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණිය යුතු ඒ උත්තමාර්ථයට නො පැමිණ වීර්‍ය්‍යයාගේ ශිථිල බවෙක් නො වන්නේ යයි සිත උත්සාහ ගන්වයි, පිහිටුවයි මෙසේත් 'අලීනචිත්තො අකුසීතවුත්ති' යනු වේ.

1. ''තෘෂ්ණා නමැති හුල උපුටා නො ලූ කල්හි (මම බාද්‍යාදිය) නො කමි (යාගු ආදිය) නො බොමි, වෙහෙරින් බැහැර නො යෙමි. (ඇඳ පුටු ආදියෙහි) ඇළය නො තබමි.''

සිත උත්සාහ ගන්වයි පිහිටුවයි මෙසේත් 'අලීන චිත්තො අකුසීත වුත්ති' යනු වේ. මාගේ සිත උපාදාන ග්‍රහණය නො කොට (කාමාදි) ආශ්‍රව-යන්ගෙන් සමුච්ඡෙද විමුක්තියෙන් නො මිදෙන තාක් මෙ පලඟ නො බිඳිමි සිත උත්සාහ ගන්වයි පිහිටුවයි. මෙසේත් 'අලීන චිත්තො අකුසීත වුත්ති' යනු වේ.

න තාවාහං ඉමම්හා චඞ්කමා ඔරොහිස්සාමි- විහාරා නික්ඛමිස්සාමි- අඩ්ඪයොගා නික්ඛමිස්සාමි- පාසාද නික්ඛමිස්සාමි- හම්මියා නික්ඛමිස්සාමි- ගුහාය නික්ඛමිස්සාමි- ලෙනා නික්ඛමිස්සාමි- කුටියා නික්ඛමිස්සාමි- කූටාගාරා නික්ඛමිස්සාමි- අට්ටා නික්ඛමිස්සාමි- මාලා නික්ඛමිස්සාමි උද්දණ්ඩා නික්ඛමිස්සාමි-උපට්ඨානසාලාය නික්ඛමිස්සාමි මණ්ඩපා නික්ඛමිස්සාමි- රුක්ඛමූලා නික්ඛමිස්සාමි- යාව මෙ න අනුපාදය ආසවෙහි චිත්තං විමුච්චිස්සතීති චිත්තං පග්ගණ්හාති පදහති, එවම්පි 'අලීන චිත්තො අකුසීතවුත්ති'.

ඉමස්මිං යෙව පුබ්බණ්හසමයෙ[1] අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි සච්ඡිකරිස්සාමීති චිත්තං පග්ගණ්හාති පදහති. එවම්පි 'අලීනචිත්තො අකුසීත වුත්ති'. ඉමස්මිං යෙව මජ්ඣන්තිකසමයෙ[2] -පෙ- සායණ්හසමයෙ දූරෙභත්තං පච්ඡාභත්තං පුරිමයාමං මජ්ඣිමයාමං පච්ඡිමයාමං කාළෙ ජුණ්හෙ වස්සෙ හෙමන්තෙ ගිම්හෙ පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙ අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි- අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි සච්ඡිකරිස්සාමීති චිත්තං පග්ගණ්හාති පදහති, එවම්පි 'අලීන චිත්තො අකුසීතවුත්ති'.

දළ්හනික්කමො ථාමබලූපපන්නොති: සො පච්චෙකසම්බුද්ධො දළ්හසමාදානො අහොසි අවට්ඨිතසමාදානො[3] කුසලෙසු ධම්මෙසු කාය සුචරිතෙ වචීසුචරිතෙ මනොසුචරිතෙ දනසංවිභාගෙ සීලසමාදානෙ උපොසථුපවාසෙ මත්තෙය්‍යතාය[4] පෙත්තෙය්‍යතාය සාමඤ්ඤතාය බ්‍රහ්මඤ්ඤතාය කුලෙජෙට්ඨාපචායිතාය අඤ්ඤතරඤ්ඤතරෙසු අධිකුසලෙසු ධම්මෙසු'ති දළ්හනික්කමො ථාමබලූපපන්නොති සො පච්චෙකසම්බුද්ධො ථාමෙන ච බලෙන ච විරියෙන ච පරක්කමෙන ච පඤ්ඤාය ච උපෙතො හොති සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සම්පන්නො සමන්නාගතොති 'දළ්හනික්කමො ථාමබලූපපන්නො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො'.

ආරද්ධවිරියො පරමත්ථපත්තියා
අලීනචිත්තො අකුසීතවුත්ති,
දළ්හනික්කමො ථාමබලූපපන්නො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො''ති.

---

1. පුබ්බණ්හ සමයං - ච වි
2. මජ්ඣන්හික සමයෙ - කත්ථචි
3. අවත්ථිතසමාදානා - ම ච වි ක
4. මෙත්තෙය්‍යතාය - ච වි ස්‍යා

'මාගේ සිත උපාදානග්‍රහණය නො කොට ආශ්‍රවයන් කෙරෙන් නො මිදෙන තාක් මෙ ආසනයෙන් නො නැඟී සිටිමි – සක්මනින් නො බස්මි – ගුරුළුවක් ගෙයින් – ප්‍රාසාදයෙන් – හර්ම්‍යයෙන් – ගුහායෙන් – ලෙනින් - කිළියෙන් – කුළුගෙයින් – අටල්ලෙන් – වටගෙයින් – උද්දණ්ඩයෙන් උවැටැන්හලින් – මඬුයෙන් - රුක්මුලින් – නො නික්මෙමී' සිතට වැර ගන්වයි, පිහිටුවයි. මෙසේත් 'අලීනචිත්තො අකුසීතවුත්ති' යනු වේ.

මෙදවස් පෙරවරුයෙහි මැ ආයර්‍ය්‍යධර්මය (මාගේ සිතට) එළවමි මො-නොවට එළවමි, අධිගමය කෙරෙමි, ස්පර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කෙරෙමී, සිත දැඩි කොට ගන්වයි, පිහිටුවයි මෙසේත් 'අලීනචිත්තො අකුසීත වුත්ති' යනු වේ. 'මෙ මැදි දහවල්හි මැ . . . . පස්වරුයෙහි – පෙරබත්හි – පසු-බත්හි – පෙරයමැ – මැදියමැ – අලුයමැ – අවපසැ – පුරපසැ – වැසි කලැ– ගිම්කලැ – හිමත්කලැ – ප්‍රථම වයස්හි – මධ්‍යම වයස්හි – පශ්චිමවයස්හි අරිදහම් එළවමි, මොනොවට එළවමි, අධිගමය කෙරෙමි, සපර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කෙරෙමී. සිත දැඩි කොට ගන්වයි, පිහිටුවයි. මෙසේත් 'අලීනචිත්තො අකුසීතවුත්ති' යනු වේ.

**දළහනික්කමො ථාමබලූපපන්නො** යනු: ඒ පසේබුදුහු කුශලධර්ම-යන්හි දැඩි වූ වීර්‍ය්‍යසමාදන ඇති වූහ, සනිටුහන් කළ සමාදන ඇති වූහ. කායසුචරිතයෙහි වාක්සුචරිතයෙහි මනස්සුචරිතයෙහි දානසංවිභාගයෙහි සීලසමාදනයෙහි පෙහෙවස් විසීමෙහි මවුන් වැටුමෙහි පියන් වැටුමෙහි මහණුන් වැටුමෙහි (බාහිතපාපී) බ්‍රාහ්මණයන් වැටුමෙහි කුලදෙටුවන් පිදීමෙහි අන්‍යතරාන්‍යතර අධිකුශල ධර්මයන්හි දැඩි වූ වීර්‍ය්‍ය ඇති වූවාහු සනිටුහන් කළ සමාදන ඇති වූවාහු නුයි 'දළ්හානික්කමො' යනු වේ. **ථාමබලූපපන්නො** යනු: ඒ පසේ බුදුහු ථාමයෙන් ද බලයෙන් ද වීර්‍ය්‍ය-යෙන් ද පරාක්‍රමයෙන් ද ප්‍රඥායෙන් ද යුක්ත වූවාහු සමුපෙත වූවාහු උපගත වූවාහු සමුපගත වූවාහු නො වෙන් වූවාහු පරිපූර්ණ වූවාහු සමන්වා-ගත වූවාහු නු යි 'දළ්හනික්කමො ථාමබලූපපන්නො එකො චරෙ ඛග්ග-විසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

**"ආරද්ධවිරියො පරමත්ථපත්තියා – පෙ – එකො චරෙ ඛග්ග විසාණකප්පො"** යී.

5.

පටිසල්ලානං ඣානමරිඤ්චමානො
ධම්මෙසු නිච්චං අනුධම්මචාරී,
ආදීනවං සම්මසිතා භවෙසු
එකො චරෙ ඛග්ගවිසාණකප්පො

**පටිසල්ලානං ඣානමරිඤ්චමානොති:** සො පච්චෙකසම්බුද්ධො පටිසල්ලානාරාමො හොති පටිසල්ලානරතො අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං, ඣායී ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකොති 'පටිසල්ලානං'. ඣානමරිඤ්චමානොති සො පච්චෙකසම්බුද්ධො ද්වීහි කාරණෙහි ඣානං න රිඤ්චති; අනුප්පන්නස්ස වා පඨමස්ස ඣානස්ස උප්පාදාය යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තො, අනුප්පන්නස්ස වා දුතියස්ස ඣානස්ස– අනුප්පන්නස්ස වා තතියස්ස ඣානස්ස–අනුප්පන්නස්ස වා චතුත්ථස්ස ඣානස්ස උප්පාදාය යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තොති, එවම්පි 'ඣානං න රිඤ්චති'. අථවා උප්පන්නං වා පඨමං ඣානං ආසෙවති භාවෙති බහුලීකරොති, උප්පන්නං වා දුතියං ඣානං– උප්පන්නං වා තතියං ඣානං– උප්පන්නං වා චතුත්ථං ඣානං ආසෙවති භාවෙති බහුලීකරොති, එවම්පි ඣානං න රිඤ්චතීති 'පටිසල්ලානං ඣානමරිඤ්චමානො'.

**ධම්මෙසු නිච්චං අනුධම්මචාරීති:** ධම්මා වුච්චන්ති චත්තාරො සතිපට්ඨානා –පෙ– අරියො අට්ඨඞ්ගිකො මග්ගො. කතමෙ අනුධම්මා: සම්මාපටිපදා අනුලොමපටිපදා[1] අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරිපූරකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං, ඉමෙ වුච්චන්ති අනුධම්මා. ධම්මෙසු නිච්චං අනුධම්මචාරීති: ධම්මෙසු නිච්චකාලං ධුවකාලං සතතං සමිතං අබ්බොකිණ්ණං[2] පොඞ්ඛානුපොඞ්ඛං උදකොමිකජාතං[3] අවීචිසන්තතිසහිතං ඵස්සිතං පුරෙභත්තං පච්ඡාභත්තං පුරිමයාමං මජ්ඣිමයාමං පච්ඡිමයාමං කාළෙ ජුණ්හෙ වස්සෙ හෙමන්තෙ ගිම්හෙ පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙ චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙතීති 'ධම්මෙසු නිච්චං අනුධම්මචාරී'.

1. අනුලොම පටිපදා – ම ඡ සං නත්ථි   2. අවොකිණ්ණං – ම ඡ සං
3. උදකූමිජාතං – ස්‍යා

5.

කායවිවේකය ද ධ්‍යාන සංඛ්‍යාත චිත්තවිවේකය ද නො හරනුයේ නිරතුරු (විදර්ශනොපග වූ) පඤ්චස්කන්ධාදි ධර්මයන්හි අනු- ධම්මචාරී වූයේ භවත්‍රයෙහි ආදීනව දක්නේ කගවෙහෙණ හගක් මෙන් එකලා වැ හැසිරෙන්නේ යි.

පටිසල්ලානං ඣානමරිඤ්චමානො යනු: ඒ පසේබුදුහු කායවිවේක යෙහි ඇලුණාහු විවේකයෙහි සතුටු වූවාහු වෙති. අධ්‍යාත්මයෙහි වූ චිත්ත- සමාධියෙහි යෙදුණාහු බැහැර නො කළ ධ්‍යාන ඇත්තාහු විදර්ශනායෙන් සමන්විත වූවාහු ශූන්‍යාගාරයෙහි කරන භාවනා වඩන්නාහු යැ, ධ්‍යාන කරන්නාහු ධ්‍යානයෙහි ඇලුණාහු ඒකාග්‍රතායෙහි යෙදුණාහු ස්වාර්ථගරුක වූවාහු නුයි 'පටිසල්ලානං' යනු වෙයි. ඣානමරිඤ්චමානො යනු: ඒ පසේ බුදුහු දෙකරුණෙකින් ධ්‍යානය නො හරිති; නූපන් ප්‍රථමධ්‍යාන- යාගේ හෝ ඉපදීම පිණිස යෙදුණාහු වෙසෙසින් යෙදුණාහු පුන පුනා යෙදුණාහු මොනොවට යෙදුණාහු, නූපන් ද්විතීයධ්‍යානයාගේ හෝ-- නූපන් තෘතියධ්‍යානයාගේ හෝ — නූපන් චතුර්ථධ්‍යානයාගේ හෝ උත්පාදය පිණිස යෙදුණාහු වෙසෙසින් යෙදුණාහු පුන පුනා යෙදුණාහු මොනොවට යෙදුණාහු නුයි මෙසේත් ධ්‍යානය නො හරිති. නොහොත් උපන් ප්‍රථමධ්‍යානය හෝ ආසෙවන කෙරෙති වඩති බහුල කෙරෙති, උපන් ද්විතීයධ්‍යානය හෝ– උපන් තෘතියධ්‍යානය හෝ – උපන් චතුර්ථ ධ්‍යානය හෝ ආසෙවන කෙරෙති වඩති බහුල කෙරෙති. මෙසේත් ධ්‍යානය නො හරිත් නු යි 'පටිසල්ලානං ඣානමරිඤ්චමානො' යනු වේ.

ධම්මෙසු නිච්චං අනුධම්මචාරී — 'ධම්මා' යි සතර සතිපට්ඨානයෝ . . . ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය කියනු ලැබෙති. අනුධර්මයෝ කවරහ: සම්‍යක්ප්‍රතිපදව අනුලොමප්‍රතිපදව අවිරුද්ධප්‍රතිපදව අර්ථානුගතප්‍රතිපදව ධර්මානුධර්මප්‍රතිපදව ශීලයෙහි පරිපූරකාරිත්වය ඉන්ද්‍රියයන්හි පියූ දෙර ඇති බව භොජනයෙහි පමණ දන්නා බව නිදි දුරු කිරීමෙහි යෙදීම සිහි- නුවණ ඇති බව යන මොහු අනුධර්මයෝ යයි කියනු ලැබෙත්. ධම්මෙසු නිච්චං අනුධම්මචාරී යනු: ධර්මයන්හි දවසක් පාසා අවිච්ඡින්න වැ නිරතුරු එක්වන් අව්‍යාකීර්ණ වැ පිළිවෙළින් එක් වැ රළ වැළක් මෙන් අවිරල වැ නො සිඳ එක් වැ පැහැසි වැ පෙරබතැ පසුබතැ පෙරයමැ මැදියමැ පසුයමැ අවපසැ පූරපසැ වසන්හි හිමත්හි ගිමන්හි පෙරවියෙහි මැදිවි- යෙහි පසුවියෙහි හැසිරෙයි වෙසෙයි ඉරියවු පවත්වයි වැටෙයි රැකෙයි යැපෙයි යාපනය කෙරේ නුයි 'ධම්මෙසු නිච්චං අනුධම්මචාරී' යනු වේ.

ආදීනවං සම්මසිතා භවෙය්‍යාති – 'සබ්බෙ සංඛාරා අනිච්චා'ති ආදීනවං සම්මසිතා භවෙය්‍ය 'සබ්බෙ සංඛාරා දුක්ඛා'ති 'සබ්බෙ ධම්මා අනත්තා'ති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති ආදීනවං සම්මසිතා භවෙය්‍ය'ති 'ආදීනවං සම්මසිතා භවෙය්‍ය එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"පටිසල්ලානං ඣානමරිඤ්චමානො
ධම්මෙසු නිච්චං අනුධම්මචාරී,
ආදීනවං සම්මසිතා භවෙසු
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

6.

තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තො.[1]
අනෙළමූගො සුතවා සතිමා,
සඞ්ඛාතධම්මො නියතො පධානවා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තොති: 'තණ්හා'ති රූපතණ්හා –පෙ– ධම්මතණ්හා. තණ්හක්ඛයං පත්ථයන්ති: රාගක්ඛයං දොසක්ඛයං මොහක්ඛයං ගතික්ඛයං උපපත්තික්ඛයං පටිසන්ධික්ඛයං භවක්ඛයං සංසාරක්ඛයං වට්ටක්ඛයං පත්ථයන්තො ඉච්ඡන්තො සාදියන්තො පිහයන්තො අභිජප්පන්තොති 'තණ්හක්ඛයං' පත්ථයං අප්පමත්තොති: සො පච්චෙක සම්බුද්ධො සක්කච්චකාරී සාතච්චකාරී –පෙ– අප්පමත්තො' කුසලෙසු ධම්මෙසූති 'තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තො'.

අනෙළමූගො සුතවා සතිමාති: 'අනෙළමූගො'ති' සො පච්චෙක සම්බුද්ධො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. සුතවාති: සො පච්චෙකසම්බුද්ධො බහුස්සුතො හොති, සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති, ධාතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සතිමාති: සො පච්චෙකසම්බුද්ධො සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතාති 'අනෙළමූගො සුතවා සතිමා.

1. පත්ථයම්පප්පමත්තො – ච වි

**ආදීනවං සම්මසිතා භවෙසු** යනු: 'සියලු සංස්කාරයෝ අනිත්‍යහ' යි භවයෙහි ආදීනව සලකනුයේ 'සියලු සංස්කාරයෝ දුක්හ' යි . . . 'සියලු දහම්හු අනාත්මහ' යි . . . 'යම් කිසි ප්‍රත්‍යයොත්පන්න ධර්මයෙක් වේ ද එ හැම නැසෙන පියවි ඇතැ' යි භවයෙහි ආදීනව සලකනුයේ නුයි 'ආදීනවං සම්මසිතා භවෙසු එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

**"පටිසල්ලානං ඣානමරිඤ්චමානො –පෙ– එකො චරෙ ඛග්ග-විසාණකප්පො"** යි.

6.

තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිර්වාන පතනුයේ නො පමා වූයේ කෙළ තොලු නො වූයේ නොහොත් පණ්ඩිත වූයේ ශ්‍රැතවත් වූයේ ස්මෘතිමත් වූයේ පරිඥානය කළ දහම් ඇතියේ ආර්‍ය්‍යමාර්ගයෙන් නියාමයට පැමිණියේ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ කගවෙහෙණහගක් මෙන් එකලා වැ හැසිරෙන්නේ යි.

**තණ්හක්ඛයං පත්ථයමප්පමත්තො** — 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ . . ධර්මතෘෂ්ණා යි. **තණ්හක්ඛයං පත්ථයං** යනු: රාගක්ෂය ද්වේෂක්ෂය මෝහක්ෂය ගතික්ෂය උපප්‍රාප්තික්ෂය ප්‍රතිසන්ධික්ෂය භවක්ෂය සංසාරක්ෂය වෘත්තක්ෂය පතනුයේ ඉස්නේ ඉවසනුයේ රුචි කරනුයේ අභිජල්පනය කරනුයේ නුයි 'තණ්හක්ඛයං පත්ථයං' යනු වෙයි. **අප්පමත්තො** යනු: ඒ පසේ බුදුහු සත්කෘත්‍යකාරී වූවාහු සාතත්‍යකාරී වූවාහු . . . කුශලධර්මයන්හි අප්‍රමත්ත වූවාහු නුයි 'තණ්හක්ඛයං පත්ථයමප්පමත්තො' යනු වේ.

**අනෙළමූගො සුතවා සතිමා** — 'අනෙළමූගො' යනු: ඒ පසේ බුදුහු පණ්ඩිතයහ ප්‍රඥාවත්හ බුද්ධිමත්හ ඥානවත්හ විමංසනප්‍රඥා ඇත්තාහ තුලනය කරන ලද ප්‍රඥා ඇතියහ **සුතවා** යනු; ඒ පසේ බුදුහු බහුශ්‍රැත වෙති ශ්‍රැතධරයහ ශ්‍රැතසන්නිචයහ, යම් ධර්ම කෙනෙක් ආදිකල්‍යාණ වූවාහු මධ්‍යකල්‍යාණ වූවාහු පර්‍ය්‍යවසාන කල්‍යාණ වූවාහු සාර්ත්ථ සව්‍යඤ්ජන වූවාහු කෙවලපරිපූර්ණ වූ පරිශුද්ධ වූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කෙරෙත් ද ඔවුන් විසින් එබඳු වූ ධර්මයෝ බොහෝ කොට අසන ලද්දහු වෙති. ධරන ලද්දහු වචනයෙන් ප්‍රගුණ කරනලද්දහු සිතින් විමසනලද්දහු නුවණින් ප්‍රතිවෙධ කරන ලද්දහු වෙති. **සතිමා** යනු: ඒ පසේ බුදුහු ස්මෘතිමත් වූවාහු වෙති. උත්තම වූ සමෘතිනිපකභාවයෙන් සමන්විත බැවින් චිරකෘතය ද චිරභාෂිතය ද සිහි කරන්නාහු පුන පුනා සිහි කරන්නාහු වෙත් නුයි 'අනෙළමූගො සුතවා සතිමා' යනු වේ.

සඞ්ඛාතධම්මො නියතො පධානවාති: සඞ්ඛාතධම්මා[1] වුච්චති ඤාණං, "යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි." සඞ්ඛාතධම්මොති: සො පච්චෙකසම්බුද්ධො සඞ්ඛාතධම්මො ඤාතධම්මො තුලිතධම්මො තීරිතධම්මො විභූතධම්මො විභාවිතධම්මො, සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති සඞ්ඛාතධම්මො -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති සඞ්ඛාතධම්මො ඤාතධම්මො තුලිතධම්මො තීරිතධම්මො විභූතධම්මො විභාවිතධම්මො, අථවා තස්ස පච්චෙකසම්බුද්ධස්ස ඛන්ධා සංඛිත්තා ධාතුයො සඞ්ඛිත්තා ආයතනානි සඞ්ඛිත්තානි ගතියො සංඛිත්තා උපපත්තියො සඞ්ඛිත්තා පටිසන්ධියො සංඛිත්තා භවා සංඛිත්තා සංසාරා සංඛිත්තා වට්ටා සංඛිත්තා, අථවා සො පච්චෙකසම්බුද්ධො ඛන්ධපරියන්තෙ ඨිතො ධාතුපරියන්තෙ ඨිතො ආයතනපරියන්තෙ ඨිතො ගතිපරියන්තෙ ඨිතො උපපත්තිපරියන්තෙ ඨිතො පටිසන්ධිපරියන්තෙ ඨිතො භවපරියන්තෙ ඨිතො සංසාරපරියන්තෙ ඨිතො වට්ටපරියන්තෙ ඨිතො අන්තිමභවෙ ඨිතො අන්තිමසමුස්සයෙ[2] ඨිතො අන්තිමදෙහධරො පච්චෙකසම්බුද්ධො:

1. තස්සායං පච්ඡිමකොටි චරිමොයං සමුස්සයො,
ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො''ති.

තංකාරණා පච්චෙකසම්බුද්ධො සඞ්ඛාතධම්මො. නියතොති නියාමා වුච්චන්ති[3] චත්තාරො අරියමග්ගා, චතූහි අරියමග්ගෙහි සමන්නාගතොති නියතො, නියාමං පත්තො සම්පත්තො අධිගතො ඵස්සිතො සච්ඡිකතොති නියතො. පධානවාති: 'පධානං' වුච්චති විරියං, "යො චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හි ථාමො ධිති[4] අසිථිලපරක්කමො අනික්ඛිත්තච්ඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො''[a] සො පච්චෙකසම්බුද්ධො ඉමිනා පධානෙන උපෙතො[5] සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සම්පන්නො[6] සමන්නාගතො. තස්මා සො පච්චෙකසම්බුද්ධො පධානවා'ති 'සඞ්ඛාතධම්මො නියතො පධානවා එකො චරෙ ඛග්ගවිසාණකප්පො.'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තො
අනෙළමූගො සුතවා සතිමා,
සඞ්ඛාතධම්මො නියතො පධානවා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො''ති.

---

1. සංඛාත ධම්මා වුච්චන්ති – ප ච වි
2. අන්තිමෙ සමුස්සයෙ – ච වි
3. නියමා වුච්චති – ප ච වි
4. ධිති – ම ච වි ක
5. ඉමිනා උපෙතො – ම ප වි ක
6. උපපන්නො සම්පන්නො – ච වි ක

a. ධම්මසඞ්ගණි – චිත්තුප්පාදකණ්ඩ

**සඞ්ඛාතධම්මො නියතො පධානවා** — 'සංඛාතධම්ම' යි ඥානය කියනු ලැබෙයි. ''යම් ප්‍රඥාවක් දන්නා අයුරෙක් .. අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එය යි. **සඞ්ඛාත ධම්මො** යනු: ඒ පසේ බුදුහු විමසන ලද දහම් ඇත්තාහු දන්නා ලද දහම් ඇත්තාහු තුලනය කළ දහම් ඇත්තාහු තීරණය කළ දහම් ඇත්තාහු විභාග කළ දහම් ඇත්තාහු ප්‍රකට කළ දහම් ඇත්තාහු වෙති 'සියලු සංස්කාරයෝ අනිත්‍යයහ' යි විමසන ලද දහම් ඇත්තාහු . . . 'යම් කිසි ප්‍රත්‍යයොත්පන්න ධර්මයෙක් වේ ද එ හැම නැසෙන පියවි ඇතැ යි විමසන ලද දහම් ඇතියහ, ඥාත-ධර්මයහ, තුලිත ධර්මයහ, තීරිත ධර්මයහ, විභූත ධර්මයහ, විභාවිත ධර්ම-යහ, නොහොත් ඒ පසේබුදුහු විසින් ස්කන්ධයෝ සංක්ෂිප්තයහ, ධාතූහු සංක්ෂිප්තයහ, ආයතනයෝ සංක්ෂිප්තයහ, ගතිහු සංක්ෂිප්තයහ, උපප්‍රාප්තිහු සංක්ෂිප්තයහ, ප්‍රතිසන්ධිහු — භවයෝ සංසාරයෝ වෘත්තයෝ සංක්ෂිප්තයහ, නොහොත් ඒ පසේ බුදුහු ස්කන්ධයන්ගේ පර්‍යන්තයෙහි සිටියහ, ධාතුපර්‍යන්තයෙහි සිටියහ, ආයතනපර්‍යන්තයෙහි සිටියහ, ගතිපර්‍යන්තයෙහි සිටියහ, උපප්‍රාප්ති පර්‍යන්තයෙහි සිටියහ, ප්‍රතිසන්ධි-පර්‍යන්තයෙහි සිටියහ, භවපර්‍යන්තයෙහි සිටියහ, සංසාරපර්‍යන්තයෙහි සිටියහ, වෘත්තපර්‍යන්තයෙහි සිටියහ, අන්තිමභවයෙහි සිටියහ, අන්තිම ශරීරයෙහි සිටියහ, අන්තිමදෙහධරයහ ප්‍රත්‍යෙක සම්බුද්ධ වූහ.

1. ''මේ ඒ ප්‍රත්‍යෙකසම්බුද්ධයන්ගේ පශ්චිම කෙළවර යැ මේ අවසාන ශරීරය වෙයි, උන්වහන්සේට ජාතිමරණ සංසාර සංඛ්‍යාත පුනර්භවය නැතැ'' යි.

ඒ කරුණින් පසේබුදුහු 'සංඛාත ධම්ම' නම් වෙති. **නියතො** යනු: 'නියාමයෝ' යි සතර ආර්‍යමාර්ගයෝ කියනු ලැබෙති, සතර ආර්‍ය-මාර්ගයෙන් සමන්වාගත වූවාහු නුයි නියතයහ, මාර්ගඥාන නියාමයට පැමිණියහ, සම්ප්‍රාප්තයහ, අධිගතයහ, ස්පර්ශ කරන ලදහ, ප්‍රත්‍යක්ෂ කරන ලද්දහු නුයි 'නියතො' යනු වේ. **පධානවා** යනු: 'පධාන' යි යම් චෛත-සික වීර්‍යාරම්භයෙක් කුසීතභාවයෙන් නික්ම යැමෙක් පරාක්‍රමයෙක් උද්‍යොගයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධිමාත්‍ර උත්සාහයෙක් ස්ථිර බවෙක් කුශල සන්තානය ධැරීමෙක් නො ලිහිල් පරාක්‍රම ඇති බවෙක් නො තැබූ වීර්‍යච්ඡන්දය ඇති බවෙක් නො තැබූ වීර්‍යධුර ඇති බවෙක් ධුරය දැඩි කොට ගැනීමෙක් වීර්‍යයෙක් වීර්‍යෙන්ද්‍රියයෙක් වීර්‍යබලයෙක් සම්‍යග් ව්‍යායාමයෙක් වේ ද එය යි. ඒ පසේ බුදුහු මේ ප්‍රධන් වීර්‍යයෙන් උපෙතයහ සමුපෙතයහ යුක්තයහ සංයුක්තයහ නො වෙන් වූවහ සම්පූර්ණයහ සමන්වාගතයහ, එයින් ඒ පසේබුදුහු ප්‍රධානවත් නුයි ''සංඛාතධම්මො නියතො පධානවා එකො චරෙ ඛග්ගවිසාණකප්පො'' යනු වේ.

**එයින් වදළහ එ පසේබුදුහු:**

**''තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තො –පෙ– එකො චරෙ ඛග්ග-විසාණකප්පො''යි.**

7.

සීහොව සද්දෙසු අසන්තසන්තො
වාතොව ජාලම්හි අසජ්ජමානො,
පදුමංව තොයෙන අලිප්පමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**සීහොව සද්දෙසු අසන්තසන්තොති:** යථා සීහො මිගරාජා සද්දෙසු අසන්තාසී අනුත්‍රාසී, අපරිසන්තාසී අනුබ්බිග්ගො අනුස්සඞ්කී අනුත්‍රාසො අභීරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී, පච්චෙකසම්බුද්ධොපි සද්දෙසු අසන්තාසී අනුත්‍රාසී අපරිසන්තාසී අනුබ්බිග්ගො අනුස්සඞ්කී අනුත්‍රාසො අභීරූ අච්ඡම්භී අනුත්‍රාසී අපලායී. පහීනභයභෙරවො විගතලොමහංසො විහරතීති 'සීහොව සද්දෙසු අසන්තසන්තො'.

**වාතොව ජාලම්හි අසජ්ජමානොති:** වාතො'ති පුරත්ථිමා වාතා පච්ඡිමා වාතා[1] උත්තරා වාතා දක්ඛිණා වාතා සරජා වාතා අරජා වාතා සීතා වාතා උණ්හා වාතා පරිත්තා වාතා අධිමත්තා වාතා කාළවාතා[2] වෙරම්භවාතා පක්ඛවාතා සුපණ්ණවාතා[3] තාලවණ්ටවාතා[4] විධූපනවාතා. ජාලං වුච්චති සුත්තජාලං. යථා වාතො ජාලම්හි න සජ්ජති, න ගණ්හාති, න බජ්ඣති, න පලිබජ්ඣති, එවමෙව ද්වෙ ජාලා: තණ්හාජාලං ච දිට්ඨිජාලං ච -පෙ- ඉදං තණ්හාජාලං -පෙ- ඉදං දිට්ඨිජාලං. තස්ස පච්චෙකසම්බුද්ධස්ස තණ්හාජාලං පහීනං, දිට්ඨිජාලං පටිනිස්සට්ඨං 'තණ්හාජාලස්ස පහීනත්තා දිට්ඨිජාලස්ස පටිනිස්සට්ඨත්තා සො පච්චෙකසම්බුද්ධො රූපෙ න සජ්ජති, සද්දෙ න සජ්ජති -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු න සජ්ජති, න ගණ්හාති[5] න බජ්ඣති න පලිබජ්ඣති, නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො[6] විමරියාදිකතෙන චෙතසා විහරතීති 'වාතොව ජාලම්හි අසජ්ජමානො.'

1. පුරත්ථිමවාතා පච්ඡිමවාතා — ච වි
2. කාළවාතා — මජ්ඣං නත්ථි
3. සුවණ්ණවාතා — ච වි
4. කාලපත්ත වාතා — ච වි
5. න ගය්හති — ච වි
6. විසංයුත්තො — ම ච වි ක

7.

ශබ්දයෙහි කේශරසිංහයකු සෙයින් (අනිත්‍යාදියෙහි) ත්‍රස්ත නො වනුයේ දැලෙහි වාතය සෙයින් (ස්කන්ධායතනාදියෙහි) නො ලැගෙනුයේ ජලය හා සමග පියුමක් සෙයින් සියලු භවයෙහි භෝග ලොභය හා සමග නො තැවැරෙනුයේ කගවෙහෙණහක් සෙයින් එකලා වැ හැසිරෙන්නේයි.

**සීහොව සද්දෙසු අසන්තසන්තො** — යම්සේ සිංහමෘගරාජ ශබ්ද-යෙහි ත්‍රස්ත නො වන සුලු වූයේ උත්‍රස්ත නො වන සුලු වූයේ භාත්පසින් ත්‍රස්ත නො වන සුලු වූයේ උද්වේග නො වනුයේ නො සැක වූයේ උත්‍රස්ත නො වනුයේ නො බිය වූයේ නො සැලෙනුයේ ත්‍රස්ත නො වනුයේ පලා නො යනුයේ වේ ද, එසෙයින් පසේ බුදුහු ද ශබ්දවිෂයෙහි ත්‍රස්ත නො වන සුලු වූවාහු උත්‍රස්ත නො වන්නාහු භාත්පසින් ත්‍රස්ත නො වනසුලු වූවාහු උද්වේග නො වන්නාහු නො සැක වන්නාහු උත්‍රස්ත නො වන්නාහු නො බිය වන්නාහු නො සැලෙන්නාහු ත්‍රස්ත නො වන්නාහු පලා නො යන්නාහු වෙති. ප්‍රහීණ වූ භය හා භය අරමුණු ඇත්තාහු විගත ලොමහර්ෂ ඇති වැ වාස කෙරෙත් නුයි 'සීහොව සද්දෙසු අසන්තසන්තො' යනු වේ.

**වාතොව ජාලම්හි අසජ්ජමානො** — 'වාතො' යනු පෙරදිගින් හමන වාතයෝ යැ අවරදිගින් හමන වාතයෝ යැ උතුරු දිගින් හමන වාතයෝ යැ දකුණු දිගින් හමන වාතයෝ යැ රජස් සහිත වාතයෝ යැ රජස් රහිත වාතයෝ යැ ශීතවාතයෝ යැ උෂ්ණවාතයෝ යැ අල්පවාතයෝ යැ අධිමාත්‍ර වාතයෝ යැ කෘෂ්ණ පක්ෂවාතයෝ යැ වෙරම්බවාතයෝ යැ පක්ෂවාතයෝ යැ සුපර්ණවාතයෝ යැ තාලවෘන්තවාතයෝ යැ විධූපන-වාතයෝ යි. 'ජාල' යි හුයින් කළ දැල කියනු ලැබෙයි. යම්සේ වාතය දැලෙහි නො ලැගේ ද නො ගනී ද නො බැඳේ ද, භාත්පසින් නො බැඳේ ද එසෙයින් මැ- දැල් දෙකෙකි: තෘෂ්ණාජාලය ද දෘෂ්ටිජාලය ද යි. . . මෙ දෘෂ්ටිජාලය යි. ඒ පසේබුදුනට තෘෂ්ණාජාලය ප්‍රහීණ යැ. දෘෂ්ටිජාලය දුරලන ලද. තෘෂ්ණාජාලය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිජාලය දුරලන ලද වන බැවින් ඒ පසේබුදුහු රූපයෙහි නො ලැගෙති ශබ්දයෙහි නො ලැගෙති . . . දෘෂ්ට ශ්‍රැත මුත විඥාතව්‍ය ධර්මයන්හි නො ලැගෙති නො ගනිති නො බැඳෙති භාත්පසින් නො බැඳෙත් නික්ම ගියාහු බැහැර වූවැහු වෙසෙසින් මිදුණාහු විසංයුක්ත වූවැහු විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වෙසෙත් නුයි 'වාතොව ජාලම්හි අසජ්ජමානො' යනු වේ.

**පදුමංව තොයෙන අලිප්පමානොති:** 'පදුමං' වුච්චති පදුමපුප්ඵං, 'තොයං' වුච්චති උදකං. යථා පදුමපුප්ඵං තොයෙන න ලිප්පති න පලිප්පති න උපලිප්පති අලිත්තං අපලිත්තං අනුපලිත්තං. එවමෙව ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච -පෙ- අයං තණ්හාලෙපො -පෙ- අයං දිට්ඨිලෙපො, තස්ස පච්චෙකසම්බුද්ධස්ස තණ්හාලෙපො පහීනො දිට්ඨිලෙපො පටිනිස්සට්ඨො, තණ්හාලෙපස්ස පහීනත්තා දිට්ඨිලෙපස්ස පටිනිස්සට්ඨත්තා සො පච්චෙකසම්බුද්ධො රූපෙ න ලිප්පති සද්දෙ න ලිප්පති -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු න ලිප්පති න පලිප්පති න උපලිප්පති, අලිත්තො[1] අපලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති 'පදුමංව තොයෙන අලිප්පමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"සීහොව සද්දෙසු අසන්තසන්තො
වාතොව ජාලම්හි අසජ්ජමානො,
පදුමංව තොයෙන අලිප්පමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

8.

සීහො යථා දාඨබලී පසය්හ
රාජා මිගානං අභිභුය්‍ය චාරී,
සෙවෙථ පන්තානි සෙනාසනානි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**සීහො යථා දාඨබලී පසය්හ, රාජා මිගානං අභිභුය්‍ය චාරීති:** යථා සීහො මිගරාජා දාඨබලී දාඨාවුධො සබ්බෙ තිරච්ඡානගතෙ පාණෙ අභිභුය්‍ය අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දිත්වා චරති විහරති ඉරියති වත්තෙති[2] පාලෙති යපෙති යාපෙති පච්චෙකසම්බුද්ධොපි පඤ්ඤාබලී පඤ්ඤාවුධො සබ්බපාණභූතෙ පුග්ගලෙ පඤ්ඤාය අභිභුය්‍ය අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දිත්වා චරති විහරති ඉරියති වත්තෙති[3] පාලෙති යපෙති යාපෙතීති 'සීහො යථා දාඨබලී පසය්හ රාජා මිගානං අභිභුය්‍ය චාරී:'

---

1. අසංලිත්තො - ම ඡ සං　　　　2. වත්තති - ව වි ක

**පදුමං ච තොයෙන අලිප්පමානො** — 'පදුම' යි නෙළුම්මල කියනු ලැබෙයි. **'තොය'** යි උදකය කියනු ලැබේ යම්සේ නෙළුම් මල දිය හා සමග නො තැවැරේ ද වෙසෙසින් නො තැවැරේ ද හාත්පසින් නො තැවැරේ ද අලිප්ත වූයේ අපලිප්ත වූයේ අනුපලිප්ත වේ ද එසෙයින් මැ ලෙපයෝ දෙදෙනෙකි: තෘෂ්ණා ලේපය ද දෘෂ්ටිලේපය දූ යි . . . මෙ දෘෂ්ටිලේප යයි කියනු ලැබේ. ඒ පසේබුදුනට තෘෂ්ණාලේපය ප්‍රහීණ යැ දෘෂ්ටිලේපය දුරලන ලද තෘෂ්ණා ලේපය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිලේපය දුරැලූ බැවින් ඒ පසේබුදුහු රූපයෙහි නො ඇලෙති ශබ්දයෙහි නො ඇලෙති . . දෘෂ්ට ශ්‍රැත මුත විඥාතව්‍යධර්මයන්හි නො ඇලෙති, වෙසෙසින් නො ඇලෙති, හාත්පසින් නො ඇලෙති, අලිප්ත වූවාහු අපලිප්ත වූවාහු අනුපලිප්ත වූවාහු නික්ම ගියාහු බැහැර වූවාහු වෙසෙසින් මිදුණාහු විසංයුක්ත වූවාහු විගතමර්‍යාද කළ සිතින් යුක්ත වැ වෙසෙත් නුයි 'පදුමං ච තොයෙන අලිප්පමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනුවේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

**"සීහො ච සද්දෙසු අසන්තසන්තො -පෙ- එකො චරෙ ඛග්ගවිසාණ කප්පො" යි.**

8.

මෘගයනට රජ වූ කේශරසිංහ තෙමේ දළ බල කොට ඇතියේ යම් සේ (කායබලයෙන්) ලාහෙලා හැසිරේ ද (තෙජසින්) අභිභවා හැසිරේ ද, එසෙයින් වනයෙහි දුර සෙනසුන් සෙවුනේ යැ කගවෙහෙණහක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යි.

**සීහො යථා දාඨබලී පසය්හ රාජා මිගානං අභිභුය්‍ය චාරී** යනු: යම්සේ සිංහ මෘගරාජ දළ බල කොට ඇතියේ දළ අවි කොට ඇතියේ හැම තිරිසන් ගිය සතුන් මැඩ අභිභවා යටපත් කොට හාත්පසින් ගෙන මර්දනය කොට හැසිරේ ද වෙසේ ද ඉරියවු පවත්වා ද වැවේ ද රැකේ ද යැපේ ද යාපනය කෙරෙ ද, එසෙයින් පසේ බුදුහු ද නුවණ බල කොට ඇතියාහු නුවණ අවි කොට ඇතියාහු සියලු ප්‍රාණීන් සියලු පුද්ගලයන් ප්‍රඥායෙන් මැඩ අභිභවා යට කොට හාත්පසින් ගෙන මර්දනය කොට හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්නු යි 'සීහො යථා දාඨබලී පසය්හ රාජා මිගානං අභිභුය්‍යචාරී' යනු වේ.

**සෙවෙථ පන්තානි සෙනාසනානීති:** යථා සීහො මිගරාජා අරඤ්ඤෙ වනමජ්ඣොගාහෙත්වා චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙති, පච්චෙකසම්බුද්ධොපි අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො ගච්ඡති, එකො තිට්ඨති, එකො නිසීදති, එකො සෙය්‍යං කප්පෙති, එකො ගාමං පිණ්ඩාය පවිසති, එකො පටික්කමති, එකො රහො නිසීදති, එකො චඞ්කමං අධිට්ඨාති එකො චරති විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙතීති 'සෙවෙථ පන්තානි සෙනාසනානි එකො චරෙ ඛග්ගවිසාණකප්පො;

තෙනාහ සො පච්චෙක සම්බුද්ධො:

"සීහො යථා දාඨබලී පසය්හ
රාජා මිගානං අභිභුය්‍ය චාරී,
සෙවෙථ පන්තානි සෙනාසනානි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

9.

මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං
ආසෙවමානො මුදිතං ච කාලෙ,
සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං ආසෙවමානො මුදිතං ච කාලෙති** සො පච්චෙකසම්බුද්ධො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතා සහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරතීති 'මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං ආසෙවමානො මුදිතං ච කාලෙ'

**සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානොති** මෙත්තාය භාවිතත්තා යෙ පුරත්ථිමාය දිසාය සත්තා තෙ අප්පටිකූලා හොන්ති, යෙ පච්ඡිමාය දිසාය සත්තා - යෙ උත්තරාය දිසාය සත්තා - යෙ දක්ඛිණාය දිසාය සත්තා - යෙ පුරත්ථිමාය අනුදිසාය සත්තා - යෙ පච්ඡිමාය අනුදිසාය සත්තා - යෙ උත්තරාය අනුදිසාය සත්තා - යෙ දක්ඛිණාය අනුදිසාය සත්තා - යෙ හෙට්ඨිමාය දිසාය සත්තා - යෙ උපරිමාය දිසාය සත්තා - යෙ දසසු දිසාසු සත්තා තෙ අප්පටිකූලා හොන්ති, කරුණාය භාවිතත්තා - මුදිතාය භාවිතත්තා - උපෙක්ඛාය භාවිතත්තා යෙ පුරත්ථිමාය දිසාය සත්තා -පෙ- යෙ දසසු දිසාසු සත්තා තෙ අප්පටිකූලා හොන්ති.

**සෙවෙථ පන්තානි සෙනාසනානි** යනු: යමසේ සිංහරාජ අරණ්‍යයෙහි වල් වැද හැසිරේ ද වෙසේ ද ඉරියවු පවත්වා ද වැටේ ද රැකේ ද යැපේ ද, යාපනය කෙරේ ද, එසෙයින් පසේබුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස්‍ය කාරණයට නිසි වූ විවේකයට නිසි වූ වනසෙනසුන් ද වෙනෙහි දුර සෙනසුන් ද වනකෙළවර සෙනසුන් ද ඇසුරු කෙරෙති. ඒ පසේබුදුහු එකලා වැ යෙති, එකලා වැ සිටිති, එකලා වැ හිඳුති, එකලා වැ හොවිති, එකලා වැ ගමට පිඬුසිඟා පිවිසෙති, එකලා වැ පෙරළා යෙති, එකලාවැ රහසැ හිඳුති, එකලාවැ සක්මනට බසිති, එකලා වැ හැසිරෙති, වෙසෙති, ඉරියවු පවත්වති, වැටෙති, රැකෙති, යැපෙති, යපනය කෙරෙත් නුයි 'සෙවෙථ පන්තානි සෙනාසනානි එකො චරෙ ඛග්ග විසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

**"සීහො යථා දඨාබලී පසය්හ -පෙ- එකො චරෙ ඛග්ගවිසාණ කප්පො"** යි.

9.

යුක්තප්‍රාප්තකාලයෙහි මෛත්‍රිය ද උපෙක්ෂාව ද කරුණාව ද මෘදුතාව ද යන චතුර්විධ විමුක්තිය සෙවුනෝ සියලු ලොකයා හා සමඟ අවිරොධ වෙමින් කගවෙහෙණ හඟක් මෙන් එකලා වැ හැසිරෙත්නේයි.

**මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං ආසෙවමානො මුදිතඤ්ච කාලෙ** යනු: ඒ පසේබුදුහු මෛත්‍රි සහගත සිතින් එක් දෙසක් සපර්ශ කොට වෙසෙති, එසෙයින් දෙ වැනි දෙස ද එසෙයින් තෙ වැනි දෙස ද එසෙයින් සිව් වැනි දෙස ද ස්පර්ශ කොට වෙසෙති, මෙසේ උඩ යැ යට යැ සරස යැ යන සියලු තැන්හි සර්වාත්මතායෙන් සියලු සත්ත්වයන් ඇති ලොව මෛත්‍රී සහගත වූ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ සිතින් ස්පර්ශ කොට වෙසෙත් නුයි 'මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං ආසෙවමානො මුදිතඤ්ච කාලෙ' යනු වේ.

**සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො** යනු: මෙත් වැඩූ බැවින් පෙරදිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු අප්‍රතිකූල වූවාහු වෙති, අවරදිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද– උතුරු දිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද– දකුණු දිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද— පෙර අනුදිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද– අවර අනුදිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද– උතුරු අනුදිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද දකුණු අනුදිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද යටදිශායෙහි යම් සත්ත්ව කෙනෙක් වෙත් ද– උඩ දිශායෙහි යම් සත්ත්ව කෙනෙක් වෙත් ද– දශ දිශායෙහි යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු අප්‍රතිකූල වූවාහු වෙති, කරුණා වැඩූ බැවින්– මෘදුතා වැඩූ බැවින්– උපෙක්ෂා වැඩූ බැවින් පෙරදිග යම් සත්ත්ව කෙනෙක් වෙත් ද . . . දශදිශායෙහි යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු අප්‍රතිකූල වූවාහු වෙත්.

**සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානොති:** සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො අප්පටිවිරුජ්ඣමානො අනාඝාතියමානො අප්පටිහඤ්ඤමානොති 'සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං
ආසෙවමානො මුදිතං ච කාලෙ,
සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

10.

රාගං ච දොසං ච පහාය මොහං
සන්දාලයිත්වාන සංයොජනානි[1],
අසන්තසං ජීවිතසඞ්ඛයම්හි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**රාගං ච දොසං ච පහාය මොහන්ති** 'රාගො'ති "යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසල මූලං" **දොසොති** "යො චිත්තස්ස ආඝාතො -පෙ- චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස". **මොහොති** "දුක්ඛෙ අඤ්ඤාණං -පෙ- අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං." **රාගං ච දොසං ච පහාය මොහන්ති** සො පච්චෙකසම්බුද්ධො රාගං ච දොසං ච මොහං ච පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා[2] අනභාවං ගමෙත්වාති 'රාගං ච දොසං ච පහාය මොහං.'

**සන්දාලයිත්වාන සංයොජනානීති** දසසංයොජනානි: කාමරාගසංයොජනං පටිඝසංයොජනං -පෙ- අවිජ්ජාසංයොජනං. **සන්දාලයිත්වාන සංයොජනානීති:** සංයොජනානි සන්දාලයිත්වා පදාලයිත්වා සම්පදාලයිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'සන්දාලයිත්වාන සංයොජනානි.

**අසන්තසං ජීවිතසඞ්ඛයම්හීති:** සො පච්චෙකසම්බුද්ධො ජීවිතපරියොසානෙ අසන්තාසී අනුත්‍රාසී අනුබ්බිග්ගො අනුස්සඞ්කී[3] අනුත්‍රාසො අභීරු අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරතීති 'අසන්තසං ජීවිතසඞ්ඛයම්හි එකො චරෙ ඛග්ගවිසාණකප්පො.'

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"රාගං ච දොස ච පහාය මොහං
සන්දාලයිත්වාන සංයොජනානි,
අසන්තසං ජීවිතසඞ්ඛයම්හි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති.

---

1. සංයොජනානි – මජසං ච, වි
2. බ්‍යන්තිං කරිත්වා – මජසං ච, වි
3. අනුසඞ්කී – මජසං ච, වි

**සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො** යනු: සියලු ලො වැසතුන් හා සමග අවිරුද්ධ වන්නාහු අප්‍රතිවිරුද්ධ වන්නාහු නො ගටනු ලබන්නාහු නො නසනු ලබන්නාහු නුයි 'සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේබුදුහු:

**"මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං -පෙ- එකො චරෙ ඛග්ග-විසාණකප්පො"**යි.

10.

රාගය ද ද්වේෂය ද මොහය ද දුරු කොට දස සංයොජනයන් ප්‍රදලනය කොට ජීවිතක්ෂයෙහි ත්‍රස්ත නො වනුයේ කඟවෙහෙණ හභක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යි.

**රාගඤ්ච දොසඤ්ච පහාය මොහං** — 'රාගො' යනු: "යම් රාගයෙක් සංරාගයෙක් . . අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **දොසො** යනු: "චිත්තයා ගේ යම් ආඝාතයෙක් . . . සැඩ බවෙක් නො පිරිදුන් වචන ඇති බවෙක් චිත්තයා ගේ නො සතුටු බවෙක් වේ ද එය යි. **මොහො** යනු: "දුඃඛසත්‍යයෙහි නො දැනීම යැ . . . අවිද්‍යා ලඞ්ගියක් මොහ අකුශල මූලයෙක් වේ ද එය යි. **රාගඤ්ච දොසඤ්ච පහාය මොහං** යනු: ඒ පසේබුදුහු රාගය ද ද්වේෂය ද මොහය ද හැර හැරපියා දුරු කොට විගතාන්ත කොට අනාභාවයට පමුණුවා නුයි 'රාගඤ්ච දොසඤ්ච පහාය මොහං' යනු වේ.

**සන්දාලයිත්වාන සඤ්ඤොජනානි** — සංයෝජන දශයෙකි: කාම රාගසංයොජන යැ දෘෂ්ටිසංයොජන යැ . . . අවිද්‍යා සංයොජන යි. සන්දාලයිත්වාන සංයොජනානි යනු: සංයොජනයන් සන්දලනය කොට ප්‍රදලනය කොට සම්ප්‍රදලනය කොට දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අනාභාවයට පමුණුවා නුයි 'සන්දලයිත්වාන සඤ්ඤොජනානි' යනු වේ.

**අසන්තසං ජීවිතසඞ්ඛයම්හි** යනු: ඒ පසේ බුදුහු දිවි කෙළවර ත්‍රස්ත නො වන සුල්ලභ උත්‍රස්ත නො වනුවහ උද්වෙග නො වනුවහ නො සැක වනුවහ නො තැතිගනුවහ නො බිය සුල්ලභ නො සැලෙනුවහ උත්‍රාස නො වනුවහ නො පලායන සුල්ලභ ප්‍රහීණ වූ බිය හා බිය අරමුණු ඇතියහ පහ වූ ලොමුදහ ඇති වැ වෙසෙත් නුයි 'අසන්තසං ජීවිතසඞ්ඛයම්හි එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ ඒ පසේ බුදුහු:

**"රාගඤ්ච දොසඤ්ච පහාය මොහං -පෙ- එකො චරෙ ඛග්ගවිසාණ-කප්පො"** යි.

**11.**

භජන්ති සෙවන්ති ච කාරණත්ථා[1]
නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තා,
අත්තත්ථපඤ්ඤා[2] අසුචී මනුස්සා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

**භජන්ති සෙවන්ති ච කාරණත්ථාති**; අත්තත්ථකාරණා පරත්ථකාරණා උභයත්ථකාරණා දිට්ඨධම්මිකත්ථකාරණා සම්පරායිකත්ථකාරණා භජන්ති සම්භජන්ති සෙවන්ති නිසෙවන්ති සංසෙවන්ති පටිසෙවන්තීති 'භජන්ති සෙවන්ති ච කාරණත්ථා'.

**නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තාති**: ද්වෙ මිත්තා: අගාරිකමිත්තො ච පබ්බජිතමිත්තො ච[3] -පෙ- අයං අගාරිකමිත්තො -පෙ- අයං පබ්බජිතමිත්තො. නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තාති: ඉමෙ ද්වෙ මිත්තා අකාරණා නික්කාරණා අහෙතු අප්පච්චයා දුල්ලභා දුල්ලද්ධා සුදුල්ලද්ධාති 'නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තා'.

**අත්තත්ථපඤ්ඤා අසුචී මනුස්සාති**: 'අත්තත්ථපඤ්ඤා'ති අත්තනො අත්ථාය අත්තනො හෙතු අත්තනො පච්චයා අත්තනො කාරණා[5] භජන්ති සම්භජන්ති සෙවන්ති නිසෙවන්ති සංසෙවන්ති පටිසෙවන්ති ආචරන්ති සමාචරන්ති පයිරුපාසන්ති පරිපුච්ඡන්ති පරිපඤ්හන්තීති 'අත්තත්ථපඤ්ඤා'. අසුචී මනුස්සාති: අසුචිනා කායකම්මෙන සමන්නාගතාති අසුචී මනුස්සා, අසුචිනා වචීකම්මෙන සමන්නාගතාති අසුචී මනුස්සා, අසුචිනා මනොකම්මෙන සමන්නාගතාති අසුචී මනුස්සා, අසුචිනා පාණාතිපාතෙන- අසුචිනා අදින්නාදානෙන- අසුචිනා කාමෙසුමිච්ඡාචාරෙන- අසුචිනා මුසාවාදෙන- අසුචියා පිසුණාය වාචාය[6] සමන්නාගතා- අසුචියා ඵරුසාය වාචාය[7] සමන්නාගතා- අසුචිනා සම්ඵප්පලාපෙන සමන්නාගතා- අසුචියා අභිජ්ඣාය සමන්නාගතා- අසුචිනා බ්‍යාපාදෙන සමන්නාගතාති 'අසුචී මනුස්සා, අසුචියා මිච්ඡාදිට්ඨියා සමන්නාගතාති අසුචී මනුස්සා, අසුචියා චෙතනාය සමන්නාගතාති අසුචී මනුස්සා, අසුචියා පත්ථනාය සමන්නාගතාති අසුචී 'මනුස්සා, අසුචිනා පණිධිනා සමන්නාගතාති අසුචී මනුස්සා, අසුචී හීනා නිහීනා ඔමකා ලාමකා' ජතුක්කා පරිත්තාති 'අත්තත්ථපඤ්ඤා අසුචී මනුස්සා'.

---

1. කාරණත්තා – ම ච වි
2. අත්තත්ථ පඤ්ඤා – ම ච වි
3. අනාගාරික මිත්තො ච – වි
4. අයං අනාගාරික මිත්තො – වි
5. අත්ත කාරණ – මජ්ඣං ච වි ක
6. පිසුනා වාචාය – ම ච වි ක
7. ඵරුසා වාචාය – ම ච වි ක

41.

අර්ත්ථය කාරණ කොට ඇත්තාහු භජනය කෙරෙති සේවනය ද කෙරෙති. (අර්ත්ථ ප්‍රතිලාභ කාරණයෙන්) නිෂ්කාරණ වූ ආයඝීමිත්‍රයෝ දුර්ලභ වෙති. ආත්මාර්ථයෙහි ප්‍රඥා ඇති මනුෂ්‍යයෝ අපවිත්‍ර වූ කාය-කර්මාදියෙන් යුක්ත වූවාහු යැ (එහෙයින්) කගවෙහෙණ හගක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යි.

**භජන්ති සෙවන්ති ච කාරණත්ථා** යනු: ආත්මාර්ථ හේතුයෙන් පරාර්ථ හේතුයෙන් උභයාර්ථ හේතුයෙන් ඓහලෞකිකාර්ථ හේතු-යෙන් පාරලෞකිකාර්ථ හෙතුයෙන් භජනය කෙරෙති, මොනොවට භජනය කෙරෙති සෙවනය කෙරෙති නිරතුරු සෙවනය කෙරෙති සංසෙවනය කෙරෙති ප්‍රතිසෙවනය කෙරෙත් නුයි 'භජන්ති සෙවන්ති ච කාරණත්ථා' යනු වේ.

**නික්කාරණා දුල්ලභා අජ්ජමිත්තා** යනු: අගායඝීමිත්‍ර ද ප්‍රව්‍රජිතමිත්‍ර ද යී මිත්‍රයෝ දෙදෙනෙකි . . . මෙ ප්‍රව්‍රජිත මිත්‍ර යි. **නික්කාරණා දුල්ලභා අජ්ජමිත්තා**– මෙ උභයමිත්‍රයෝ (අර්ථත් ප්‍රතිලාභහෙතුයෙන්) අකාරණ වූවාහු නිෂ්කාරණ වූවාහු අහෙතු අප්‍රත්‍යය වූවාහු දුර්ලභ වෙති. දුක සේ ලැබිය හැකි වෙති. අතියෙයින් දුක සේ ලැබිය හැකි වෙත් නුයි 'නික්කාරණා දුල්ලභා අජ්ජමිත්තා' යනු වේ.

**අත්තත්ථපඤ්ඤා අසුචී මනුස්සා** — 'අත්තත්ථපඤ්ඤ' යනු: තම හට වැඩ පිණිස ආත්මහේතුයෙන් ආත්ම ප්‍රත්‍යයෙන් ආත්මකාරණයෙන් භජනය කෙරෙති සංභජනය කෙරෙති සේවනය කෙරෙති නිස්සෙවනය කෙරෙති සංසෙවනය කෙරෙති ප්‍රතිසෙවනය කෙරෙති හැසිරෙති මැනැවින් හැසිරෙති පර්යුපාසනය කෙරෙති ප්‍රශ්න කෙරෙත් නුයි 'අත්තත්ථ පඤ්ඤා' යනු වේ. **අසුචී මනුස්සා** යනු: අපවිත්‍ර වූ කාය කර්මයෙන් සමන්විත වූවාහු නුයි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූ වාක්කර්මයෙන් සමන්විත වූවාහු නුයි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූ මනඃකර්මයෙන් සමන්විත වූවාහු නුයි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූ ප්‍රාණ වධයෙන්– අපවිත්‍ර වූ අදත්තාදානයෙන්– අපවිත්‍ර වූ කාමමිථ්‍යා-චාරයෙන්– අපවිත්‍ර වූ මෘෂාවාදයෙන්– අපවිත්‍ර වූ පිශුනවචනයෙන්– අපවිත්‍ර වූ පරුෂ වචනයෙන්– අපවිත්‍ර වූ ප්‍රලාපවචනයෙන්– අපවිත්‍ර වූ අභිධ්‍යායෙන්– අපවිත්‍ර වූ ව්‍යාපාදයෙන් යුක්ත වූවාහු නු යි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූ මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්ත වූවාහු නුයි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූ චේතනායෙන් යුක්ත වූවාහු නුයි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූ ප්‍රාර්ත්ථනායෙන් යුක්ත වූවාහු නුයි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූ ප්‍රණිධියෙන් යුක්ත වූවාහු නුයි 'අසුචී මනුස්සා' යනු වේ. අපවිත්‍ර වූවාහු හීන වූවාහු නිහීන වූවාහු අවමත වූවාහු ලාමක වූවාහු අප්‍රත්‍යය වූවාහු අල්ප වූවාහු නුයි 'අත්තත්ථපඤ්ඤා අසුචීමනුස්සා' යනු වේ.

එකො චරෙ ඛග්ගවිසාණකප්පො'ති: එකොති සො පච්චෙක සම්බුද්ධො පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො -පෙ- චරෙති: අට්ඨචරියායො -පෙ- ඛග්ගවිසාණකප්පොති යථා ඛග්ගස්ස නාම විසාණං එකං හොති අදුතියං -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො'.

තෙනාහ සො පච්චෙකසම්බුද්ධො:

"භජන්ති සෙවන්ති ච කාරණත්ථා
නික්කාරණා දුල්ලභා අජ්ජමිත්තා,
අත්තත්ථපඤ්ඤා අසුචී මනුස්සා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො'ති.

චතුත්ථො වග්ගො

නිට්ඨිතො ච ඛග්ගවිසාණසුත්තනිද්දෙසො.

1. අජිතො තිස්සමෙත්තෙය්‍යො පුණ්ණකො අථ මෙත්තගූ,
ධොතකො උපසීවො ච නන්දො ච අථ හෙමකො.
2. තොදෙය්‍යකප්පා දුභයො ජතුකණ්ණි ච පණ්ඩිතො,
භද්‍රාවුධො උදයො ච පොසාලො චාපි බ්‍රාහ්මණො.
3. මොඝරාජා ච මෙධාවී පිඞ්ගියො ච මහාඉසි,
සොළසන්නං[1] පනෙතෙසං බ්‍රාහ්මණානංව සාසනං.
පාරායනානං[2] නිද්දෙසා තත්තකානි භවන්ති හි[3]
4. ඛග්ගවිසාණසුත්තානං නිද්දෙසාපි තථෙව ච
නිද්දෙසා දුවිධා ඤෙය්‍යා පරිපුණ්ණා සුලක්ඛිතා''ති

චූළනිද්දෙසපාළි නිට්ඨිතා.

1. සොළසානං – අ – වි
2. පාරායනං – ව
3. භවන්තිච – ම ච වි ක

**එකො චරෙ ඛග්ගවිසාණකප්පො** — 'එකො' යනු: ඒ පසේබුදුහු ප්‍රව්‍රජ්‍යා කොටයිහ ඒකයන . . චරෙ යනු: චර්‍යා අටෙකි: . . . **ඛග්ගවිසාණකප්පො** යනු: යම් සේ කඟවෙහෙණ නම් මෘගයාගේ හඟ එකෙක් මැ වේ ද අද්විතීය වේ ද . . .'එකො චරෙ ඛග්ගවිසාණකප්පො' යනු වේ.

එයින් වදළහ එ පසේ බුදුහු:

**"භජන්ති සේවන්ති ච කාරණත්ථා -පෙ- එකො චරෙ ඛග්ගවිසාණකප්පො"** යි.

සතර වැනි වර්ග යි.

**ඛග්ගවිසාණ සූත්‍රනිර්දේශය නිමියේ යි.**

1. අජිත යැ තිස්ස මෙත්තෙය්‍ය යැ පූර්ණක යැ යළි මෙත්තගූ යැ ධොතක යැ උපසීව යැ නන්ද යැ යළි හෙමක යැ.

2. තොදෙය්‍ය – කප්ප දෙදෙනා යැ පණ්ඩිත වූ ජතුකර්ණී යැ භද්‍රාවුධ යැ උදය යැ පොසාල බ්‍රාහ්මණ යැ නුවණැති මොඝරාජ යැ මහර්ෂි වූ පිඞ්ගිය යැ යන–

3. මේ සොළොස් බමුණනට අනුශාසන ද (එ මැ) පාරායණ සූත්‍රයන්ගේ නිර්දේශ ද එතෙක් මැ වෙති.

4. තවද එසේ මැ ඛග්ගවිසාණ සූත්‍රයන්ගේ නිර්දේශ ද යි සපුරා දක්වන ලද නිර්දේශයෝ ද්විප්‍රකාරහ යි දත යුත්තා හ.

**සුළු නිදෙස් පෙළ නිමි.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

*THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL*

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

*** The Vows of Samantabhadra ***

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

*** The Vows of Samantabhadra Avatamsaka Sutra ***

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛


《斯里蘭卡巴利文：小部阿含經：大義釋・小義釋》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, No. 55, Sec. 1, Hang Chow South Road, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org



**This book is strictly for free distribution, it is not to be sold.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.



Printed in Taiwan
500 copies; September 2019
SR074 - 17056